එක්සත් ජනපදයේ හිටපු තානාපතිවරයා අත්අඩංගුවට ගැනීමට නියෝග නිකුත්කොට තිබෙන්නේ ඇමෙරිකන් එක්සත් ජනපදයේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලය විකිණීම පිළිබඳව. මහ බැංකුවේ හිටපු අධිපතිවරයා අත්අඩංගුවට ගැනීමට නියෝගකොට තිබෙන්නේ මහජනයාගේ කෝටි ගණන් ධනය තමන්ගේ බෑනණුවන්ට හොර පාරෙන් හැරවීම පිළිබඳව. මෙවැනි ප්‍රධාන පෙළේ පුද්ගලයන් අත්අඩංගුවට ගෙන නීතිය ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් පුරවැසියන් තුළ නීතිය සම්බන්ධ විශ්වාසය බිඳ වැටීමට හේතු වුණු බව පිළිගන්නේද?

මෙම පුද්ගලයන්ට එරෙහිව නීතිය ක්‍රියාත්මක කරවීමේ වග කීම ආණ්ඩුවක් ලෙස භාර ගනු ලබන්නේද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, මේ ගැන මම සම්පූර්ණ වාර්තාවක් ලබා ගෙන තිබෙනවා. මම ඒ සම්පූර්ණ පිළිතුර කියවන්නම්. ඒක ටිකක් දිගයි, ගරු කථානායකතුමනි. මම හිතන හැටියට ගරු මන්ත්‍රීතුමාට අවශ්‍ය පිළිතුර ලැබෙයි.

ගරු කථානායකතුමනි, 2008 වසරේ සිට 2014 දක්වා ඇමෙරිකානු එක්සත් ජනපදයේ තානාපතිවරයා ලෙස කටයුතු කළ ජාලිය වික්‍රමසූරිය, 2006 වසරේ සිට 2015 දක්වා රුසියාවේ තානාපතිවරයා හැටියට කටයුතු කළ උදයංග වීරතුංග සහ 2015 ජනවාරි සිට 2016 ජූනි දක්වා මහ බැංකු අධිපතිවරයා ලෙස කටයුතු කළ අර්ජුන මහේන්ද්‍රන් යන තිදෙනා සම්බන්ධයෙන් අධිකරණය විසින් ලබා දී ඇති නියෝග පහත පරිදි වෙනවා.

2008 වසරේ සිට 2014 දක්වා ඇමෙරිකානු එක්සත් ජනපදයේ තානාපතිවරයා ලෙස කටයුතු කළ ජාලිය වික්‍රමසූරිය මහතා ඇමෙරිකන් එක්සත් ජනපදයේ වොෂිංටන්වල පිහිටා ඇති ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට නව ගොඩනැඟිල්ලක් මිලදී ගැනීමට අදාළව ශ්‍රී ලංකා රජය මඟින් වැය කරන ලද මුදලින් ඇමෙරිකන් ඩොලර් ලක්ෂ තුනකට අධික මුදලක් සාපරාධී සාවද්‍ය පරිහරණය කිරීමට අදාළව එවකට ශ්‍රී ලංකා තානාපති කටයුතු කළ ඒ මහතාට එරෙහිව සිදු කරන ලද විමර්ශනය තුළින් අනාවරණ වූ කරුණු මත ඔහු 2016 නොවැම්බර් 08වන දින අත්අඩංගුවට ගෙන 2016 නොවැම්බර් 09වන දින අධිකරණයට ඉදිරිපත් කොට තිබෙනවා.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

අනතුරුව ඔහු රක්ෂිත බන්ධනාගාරගත කිරීම සිදු කර ඇති අතර, රුපියල් 50,000ක මුදල් ඇපයක්ද, රුපියල් ලක්ෂ 10 බැගින් ශරීර ඇපකරුවන් දෙදෙනකු ඉදිරිපත් කිරීමටද, විදේශ ගමන් තහනම් කර, විදේශ ගමන් බලපත්‍රය අධිකරණය භාරයේ තැබීමටද යටත්ව 2017 මාර්තු 20වන දින ඔහු වෙත ඇප ලබා දී තිබෙනවා.

එසේම ජාලිය වික්‍රමසූරිය මහතා පදිංචිව සිටින අංක 65/58, පළමුවන පටුමඟ, කටුවාන පාර, හෝමාගම යන ලිපිනයෙහි පිහිටි නිවසද, ඔහු විසින් පවත්වාගෙන යන ලද නෝ. 02, කර්මාන්ත සංකීර්ණය, කටුවාන පාර, හෝමාගම පිහිටි සිලෝන් රෝයල් ටී ඇන්ඩ් ස්පයිසර් නමැති ලිපිනයද, ඔහු විසින් වංචා කර ඇතැයි පැවසෙන මුදල් ආයෝජනය කොට ඇති පී.පී.පී. ඉන්ටර්නැෂනල් සමාගමේ නොමිමර 36/4 ඒ.සී. මේධානන්ද පාර, පහත සුජාතා පාර, කළුබෝවිල, දෙහිවල යන ලිපිනයන් පරීක්ෂා කිරීම සඳහා අධිකරණ නියෝග මඟින් සෝදිසි වරෙන්තුවක් 2016 නොවැම්බර් 23 වන දින ලබා දී තිබෙනවා.

මීට අමතරව, ඔහුගේ දේශීය හා විදේශීය බැංකු ගිණුම් සම්බන්ධ තොරතුරු ලබා ගැනීම සඳහාත්, ඔහුගේ පී.පී.පී. ඉන්ටර්නැෂනල් සමාගමේ laptop පරිගණක යන්ත්‍ර ද, සිලෝන් රෝයල් ටී සමාගම සතු පරිගණක යන්ත්‍ර ද පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය මඟින් දත්ත පරීක්ෂා කිරීම සඳහාත් ගරු අධිකරණය විසින් නියෝග ලබා දී තිබෙනවා. ඉන් අනතුරුව, අක්ෂි ආබාධයක් හේතුවෙන් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා ඇමෙරිකා එක්සත් ජනපදයේ ජෝර්ජියා ප්‍රාන්තය වෙත විදේශගත වීම සඳහා කර ඇති ඉල්ලීමට අනුව අධිකරණය වෙතින් ඔහුට 2017 ජූලි 17වන දින සිට 2017 සැප්තැම්බර් 08වන දා දක්වා කාලය සඳහා විදේශගත වීමට අවසර ලබා දී තිබෙනවා.

මෙහිදී පෙර ඇපකරුවන්ට අමතරව රුපියල් ලක්ෂ 15 බැගින් අමතර ශාරීරික ඇපකරුවන් දෙදෙනෙක්ද, සහතික ඇපයක් වශයෙන් සැකකරු වෙත අයිතිය ඇති ඉඩමක්ද ඉදිරිපත් කරන ලෙස නියෝග ලබා දී තිබෙනවා. සැකකරු විදේශගත වී සිට 2017 නොවැම්බර් 17 වන දින අධිකරණයට ඉදිරිපත් නොවීම මත එදින අධිකරණය මඟින් වරෙන්තු නිකුත් කර ඇති අතර, මේ දක්වා සැකකරු අධිකරණය වෙත ඉදිරිපත් වීමක් සිදු වී නැත. සැකකරු විදේශගත වන අවස්ථාවේ දී අමතර ඇපකරුවන් වශයෙන් ඉදිරිපත් වූ එච්.එම්. ප්‍රියංගා ඩිලානි විජේසිංහ සහ දීපිකා කුමුදුනී වික්‍රමසූරිය යන අය වෙනද සැකකරු අධිකරණය වෙත ඉදිරිපත් නොකිරීම මත 2018 පෙබරවාරි 16 වන දින වරෙන්තු නිකුත් කර ඇති අතර, එම ඇපකාරියන්ද මෙතෙක් අධිකරණය වෙත ඉදිරිපත් වී නැහැ. විමර්ශන තුළින් අනාවරණ වී ඇත්තේ දැනට එම ඇපකාරියන්ද සැකකරු සමඟ විදේශගත වී ඇති බවයි.

ගරු කථානායකතුමනි, 2006 වසරේ සිට 2015 වසර දක්වා රුසියාවේ තානාපති ලෙස කටයුතු කළ උදයංග වීරතුංග මහතා විසින් 2006 වසරේ දී ශ්‍රී ලංකා ගුවන් හමුදාවට මිග් ගුවන් යානා මිලදී ගැනීමේ දී සිදු වී ඇති මූල්‍ය අක්‍රමිකතා සම්බන්ධයෙන් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් සිදු කරනු ලබන විමර්ශනවලට අදාළව කොළඹ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණය වෙත බී/639/15 යටතේ කරුණු වාර්තා කර ඇති අතර, ඔහු සම්බන්ධයෙන් එම අධිකරණයෙන් පහත සඳහන් අධිකරණ නියෝග නිකුත් කර තිබෙනවා.

- 2015 අප්‍රේල් 06 - උදයංග වීරතුංග විසින් කොමර්ෂල් බැංකුවේ කඩවත ශාඛාවේ රණවීර කළුආරච්චිලාගේ දොන් නොයෙල් රණවීර යන අය සමඟ පවත්වාගෙන ගොස් ඇති බද්ධ ගිණුමට අදාළ විස්තර ලබා ගැනීම.
- 2015 අප්‍රේල් 09 - උදයංග වීරතුංගට සම්බන්ධ ශ්‍රී ලංකන් ලිමිටඩ් ලයබිලිටි යන සමාගම නමින් කොමර්ෂල් බැංකුවේ මූලස්ථාන ශාඛාවේ අක්වෙරළ ගිණුම් අංක 1951458901 දරන ගිණුමේ විස්තර ලබා ගැනීම.
- 2015 අප්‍රේල් 29 - කොමර්ෂල් බැංකු මූලස්ථාන ශාඛාවේ අක්වෙරළ ගිණුම් අංක 1951458901 දරන ගිණුමෙහි ගනුදෙනු අත්හිටුවීමට නියෝග නිකුත් කිරීම.
- 2015 ජූනි 29 - ශ්‍රී ලංකා වරාය අධිකාරිය භාරයේ තිබූ උදයංග වීරතුංගට අයත් MSCU 3324231 දරන කන්ටේනර් බහාලුමෙහි වූ භාණ්ඩ පරීක්ෂා කිරීම සඳහා සෝදිසි වරෙන්තුවක් නිකුත් කිරීම.
- 2016 ජූනි 08 - උදයංග වීරතුංග යන අයට 2016.07.15 දින කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයේ පෙනී සිටින ලෙස නොතිසි නිකුත් කිරීම.
- 2016 ජූලි 08 - උදයංග වීරතුංග යන අය පදිංචි බවට අනාවරණය වී තිබූ විදේශීය ලිපිනය වන Flat No. 20, House No. 07, Mekhanizatoriv Street, Kyiv, 03110 Ukraine දරන ලිපිනය වෙත විදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා නොතිසියක් නිකුත් කිරීම.
- 2016 සැප්තැම්බර් 30 - 2016.09.26 දින උදයංග වීරතුංග යන අයට කොටුව මහෙස්ත්‍රාත් අධිකරණය විසින් නිකුත් කරන ලද නොතිසියට අනුව අධිකරණයේ පෙනී නොසිටීම අනුව, අධිකරණයේ පෙනී නොසිටීම හේතුවෙන් මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් අධිකරණය වෙතින් වරෙන්තුවක් ඉල්ලා සිටීමට අදාළව, වරෙන්තුවක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කර නියෝගයක් නිකුත් කිරීම.
- 2016 ඔක්තෝබර් 11 - මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් විමර්ශනයේ දී අනාවරණය කර ගෙන ඇති කරුණු අනුව, උදයංග වීරතුංග සැකකරුවෙකු ලෙස නම් කිරීම.
- 2016 ඔක්තෝබර් 19 - උදයංග වීරතුංග යන අයට අයත් www. udayanga.net සහ info@udayanga.net යන වෙබ් අඩවි සම්බන්ධයෙන් පරිගණක හදිසි ප්‍රතිචාර සංසදය වෙතින් වාර්තාවක් ලබා ගැනීමට නියෝග නිකුත් කිරීම.
- 2016 ඔක්තෝබර් 19 - උදයංග වීරතුංග යන අයට වරෙන්තුවක් නිකුත් කරන ලෙසට මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය විසින් කරන ලද ඉල්ලීමකට අනුව අධිකරණය විසින් වරෙන්තුවක් නිකුත් කිරීම.
- 2016 නොවැම්බර් 28 - උදයංග වීරතුංග යන අයට අයත් කොමර්ෂල් බැංකුවෙහි බැංකු ගිණුම් 04ක් සහ හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකුවේ බැංකු ගිණුම් 01ක විස්තර වාර්තා ලබාගැනීමට අධිකරණ නියෝග නිකුත් කිරීම.
- 2016 දෙසැම්බර් 15 - උදයංග වීරතුංග යන අයට අයත් කොමර්ෂල් බැංකුවෙහි බැංකු ගිණුම් 11ක් සහ හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකුවේ බැංකු ගිණුම් 01ක විස්තර වාර්තා ලබාගැනීමට අධිකරණ නියෝග නිකුත් කිරීම.
- 2017 ජනවාරි 04 - උදයංග වීරතුංග යන අයට කොමර්ෂල් බැංකුවෙහි බැංකු ගිණුම් 14ක් සහ හොංකොං ඇන්ඩ් ෂැංහයි බැංකුවේ බැංකු ගිණුම් 02ක ගිණුම් කටයුතු අත්හිටුවීමට අධිකරණ නියෝග නිකුත් කිරීම.
- 2017 ජූනි 30 - උදයංග වීරතුංග යන අයට නිකුත් කර තිබූ D3643585 දරන රාජ්‍ය තාන්ත්‍රික විදේශ ගමන් බලපත්‍රය සහ N5400885 දරන සාමාන්‍ය විදේශ ගමන් බලපත්‍රය අවලංගු කරන ලෙසට ආගමන විගමන පාලක වෙත අධිකරණ නියෝග නිකුත් කිරීම.

- 2017 නොවැම්බර් 02 - උදයංග වීරතුංග යන අයට අයත් කොමර්ෂල් බැංකුවේ ගිණුම් අංක 1670000805 සහ 8670000805 දරන ගිණුම්වලින් මුදල් ප්‍රේෂණයන් සිදුකර ඇති පුද්ගලයන් 12කට අයත් ගිණුම් සම්බන්ධයෙන් විස්තර වාර්තා ලබාගැනීමට අධිකරණ නියෝග නිකුත් කිරීම.

- 2018 ජනවාරි 18 - උදයංග වීරතුංග යන අයට අයත් දොම්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි අක්කර 07යි රූඩ් 01යි පර්චස් 24.5ක්, දොම්පේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පිහිටි අක්කර 01යි රූඩ් 0යි පර්චස් 03ක් වන ඉඩම සහ ඇල්විටිගල මාවත, කොළඹ 08 ලිපිනයේ පිහිටි ට්‍රිලියම් නිවාස සංකීර්ණයේ නිවසක් සහ දේපළ විකිණීම සහ අන්සතු කිරීම තහනම් කිරීමට නියෝග නිකුත් කිරීම.

- 2018 පෙබරවාරි 07 - උදයංග වීරතුංග යන අයට එරෙහිව ලබාගත් වරෙන්තුවෙහි ඉංග්‍රීසි භාෂාවෙන් පිටපතක් නිකුත් කිරීම.

ගරු කථානායකතුමනි, 2015 ජනවාරි සිට 2016 ජුනි දක්වා මහ බැංකු අධිපතිවරයා ලෙස කටයුතු කළ අර්ජුන මහේන්ද්‍රන් මහතාට 2018 මාර්තු 08වන දින හෝ ඊට පෙර අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ හමුවන ලෙස ඩීඑච්එල් මඟින් හා අධිවේගී තැපැල් මඟින් දන්වා යැවීමට කොටුව මහෙස්ත්‍රාත් අධිකරණය විසින් 2018 පෙබරවාරි 16වන දින නොතීසි නිකුත් කර තිබෙනවා.

ඉන් අනතුරුව, 2018 මාර්තු 15වන දින කොටුව මහෙස්ත්‍රාත් අධිකරණය වෙතින් ඔහුට වරෙන්තු නිකුත් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මොවුන් තිදෙනා ගරු අධිකරණය වෙත ඉදිරිපත් කිරීම සඳහා මේ වනවිට පහත පරිදි පියවර ගෙන තිබෙනවා.

අධිකරණය වෙත ඉදිරිපත් නොවී, අධිකරණය මඟ හරිමින් සිටින 2008 වසරේ සිට 2014 දක්වා ඇමෙරිකානු එක්සත් ජනපදයේ තානාපතිවරයා ලෙස කටයුතු කළ ජාලිය වික්‍රමසූරිය මහතා අත් අඩංගුවට ගැනීම සඳහා ජාත්‍යන්තර පොලිසියේ සහාය ලබාගැනීම සඳහා රතු නිවේදනයක් ලබා ගැනීමට 2018 අප්‍රේල් 05වන දින ඉල්ලීමක් ඉදිරිපත් කොට තිබෙනවා. මේ වනවිට ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව පොලිස්පති විසින් වාර්තා කොට තිබෙනවා.

2006 වසරේ සිට 2015 දක්වා රුසියාවේ තානාපතිවරයා ලෙස කටයුතු කළ උදයංග වීරතුංග මහතා අත් අඩංගුවට ගැනීම සඳහා 2016 නොවැම්බර් 15වන දින ජාත්‍යන්තර පොලිසිය විසින් නිල් නිවේදනයක් නිකුත් කර තිබෙනවා. ඉන් අනතුරුව 2018 පෙබරවාරි 12වන දින ජාත්‍යන්තර පොලිසිය විසින් උදයංග වීරතුංගට අදාළව රතු නිවේදනයක් නිකුත් කර තිබෙනවා. ජාත්‍යන්තර පොලිසිය විසින් නිකුත් කර ඇති එම නිවේදනයට අනුව 2018 මාර්තු 24වන දින එක්සත් අරාබි එමීර් රාජ්‍යයේදී උදයංග වීරතුංග මහතාව එරට බලධාරීන්ගේ භාරයට ගෙන ඇත. ඉන් අනතුරුව උදයංග වීරතුංග මහතා ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැනීමට විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙහි අබුඩාබි බලධාරීන් වෙත ඉල්ලීමක් යොමු කර තිබෙනවා. එසේම උදයංග වීරතුංග ශ්‍රී ලංකාව වෙත උදර්පණය කිරීම සඳහා ඉල්ලීමක් 2018 මැයි 14වන දින ආරක්ෂක ලේකම් විසින් විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා එක්සත් අරාබි එමීර් රාජ්‍යයෙහි අධිකරණ අමාත්‍යාංශ ලේකම්වරයා වෙත යොමු කර තිබෙනවා.

2015 ජනවාරි සිට 2016 ජුනි දක්වා මහ බැංකු අධිපතිවරයා ලෙස කටයුතු කළ අර්ජුන මහේන්ද්‍රන් මහතා වෙත නිකුත් කරන ලද නොතීසිය ඔහු වෙත යොමු කිරීමට කටයුතු සිදු කර ඇති අතර, නොතීසිය නිකුත් කරන ලද සිංගප්පූරු ලිපිනයේ ඔහු පදිංචිව නොමැති බැවින්, නොතීසිය නිසි පරිදි භාරදීමට නොහැකි වී ඇති බව වාර්තා කර තිබෙනවා. එම පසු බිම තුළ ඔහුගේ ජංගම දුරකථනයට අධ්‍යක්ෂ, අපරාධ පරීක්ෂකගේ දුරකථනයෙන් කෙටි පණිවුඩයක් මඟින්ද, විද්‍යුත් ලිපිනයට විද්‍යුත් ලිපියක් මඟින්ද නොතීසිය පිළිබඳව දැනුම් දී ඇති අතර, අදාළ පණිවුඩය ඔහු වෙත යොමු වී ඇති බවට ජංගම දුරකථනය සහ විද්‍යුත් තැපැල් delivery reports ලැබී ඇති බවට වාර්තා කර ඇත.

ඒ අනුව 2018 මාර්තු 15වන දින අර්ජුන මහේන්ද්‍රන් යන අයට කොටුව මහෙස්ත්‍රාත් අධිකරණය මඟින් විවෘත වරෙන්තුවක් නිකුත් කිරීමට කටයුතු කර තිබෙනවා. අර්ජුන මහේන්ද්‍රන් මහතා සිටින ස්ථානය සොයා මෙරටට ගෙන්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම සඳහා ජාත්‍යන්තර සහාය පතා ඇති අතර, 2018 අප්‍රේල් 05වන දින ජාත්‍යන්තර පොලිස් නිල නිවේදනයක්ද, 2018 අප්‍රේල් 19වන දින ජාත්‍යන්තර රතු නිවේදනයක්ද නිකුත් කොට තිබෙනවා.

නමුත් සිංගප්පූරු නීතිය අනුව ජාත්‍යන්තර පොලිස් රතු නිවේදනය මත පදනම්ව තැනැත්තකු අත් අඩංගුවට නොගන්නා බැවින්, උදර්පන නීතිය යටතේ ඔහු මෙරටට උදර්පනය කිරීම සඳහා නියමිත ක්‍රමවේදයක් අනුව ඉල්ලීමක් කරන ලෙසට සිංගප්පූරු රජය විසින් දන්වා තිබෙනවා. ඒ අනුව, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2018.05.25 දින අර්ජුන මහේන්ද්‍රන් මහතා මෙරටට උදර්පනය කර ගැනීම පිණිස උදර්පණ නීතියට අනුව මෙරට බලධාරියා වන ආරක්ෂක ලේකම් වෙත ඉල්ලීමක් යොමුකර ඇති බව වාර්තා කර තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, පළමුවෙන්ම මට පැහැදිලි කරගන්න ඕනෑ මේ කාරණයයි.

දැන් ආන්දෝලනයට තුඩු දීලා තිබෙනවා, අර්ජුන් ඇලෝසියස්ගේ ගනුදෙනු සහ මුදල් පරිහරණය පිළිබඳව; කාටද මුදල් ලබා දුන්නේ, කොහොමද ලබා දුන්නේ කියලා. ගරු කථානායකතුමනි, අර්ජුන් ඇලෝසියස් මහ රාත්‍රියේ කණ්ඩායමක් එක්ක ගිහින් මහ බැංකුවට කඩා පැන එහි මුදල් මංකොල්ල කෑවා නොවෙයි. එහෙම නම්, අර්ජුන් ඇලෝසියස් පමණයි හොරා. හැබැයි, මේ ගනුදෙනුව සිදුවී තිබෙන්නේ මහ බැංකුවේ හිටපු අධිපතිවරයාගේ නිශ්චිත සහාය සහ මැදිහත්වීම මතයි. එතකොට ඔහු තමයි ආණ්ඩුවේ පාර්ශ්වයේ නියෝජිතයා. අර්ජුන් ඇලෝසියස් කියන්නේ, එය උපයෝගි කරගෙන මුදල් හොරකම් කළ පෞද්ගලික නියෝජිතයායි. ඒ නිසා මෙතැනදී වැඩි වගකීම සහ බර තිබෙන්නේ අර්ජුන් ඇලෝසියස්ට අයථා ලෙස මුදල් උපයා දීම සඳහා ඔහුගේ මාමණ්ඩිය වන අර්ජුන මහේන්ද්‍රන් විසින් සපයන ලද සේවාව; කාර්යය වෙතයි. එතකොට ගරු කථානායකතුමනි, මේ ක්‍රියාදාමයේ -මේ නඩුවේ- වැදගත්ම සාධකය තමයි, අර්ජුන මහේන්ද්‍රන්.

ගරු අගමැතිතුමනි, උදයංග වීරතුංගගේ, ජාලිය වික්‍රමසූරියගේ දේපළ පිළිබඳව දැන් ඔබතුමා සවිස්තරාත්මක සඳහනක් කළා. ගිණුම්වල ගනුදෙනු අත්හිටුවීම, දේපළ අලෙවි කිරීම නැවැත්වීම පිළිබඳව තීන්දු අරගෙන තිබෙනවාය කියා ඔබතුමා කිව්වා. හැබැයි, එවැනි කිසිදු තීන්දුවක් අර්ජුන මහේන්ද්‍රන් පිළිබඳව තවමත් අරගෙන නැහැ. මම කියන්නේ මේකයි, ගරු කථානායකතුමනි.

[ගරු අනුර දිසානායක මහතා]

මේ සාමාන්‍ය පුරවැසියන් නොවෙයි. එක්කෙනෙක් මහ බැංකුවේ හිටපු අධිපතිවරයා. අනික් එක්කෙනා ඇමෙරිකා එක්සත් ජනපදයේ හිටපු ශ්‍රී ලංකා තානාපති. අනික් එක්කෙනා රුසියාවේ හිටපු ශ්‍රී ලංකා තානාපති. එතකොට මේ අය මහ ජනයාගේ ධනය අයථා ලෙස අවභාවිතයේ යෙදවීම පිළිබඳව ඒ අය පත් කරන ලද බලධාරින්ට වග කීමක් නැද්ද කියා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
මම ඉදිරිපත් කළේ මට ලැබුණු වාර්තාවයි. ඒ අයට විරුද්ධව තවත් කරුණු තිබෙනවා නම් ඔබතුමන්ලාට කියන්න පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ආණ්ඩුවක් හැටියට ඒ අය පත් කරපු අය ගැන ඔබතුමා මොනවාද හිතන්නේ?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
ආණ්ඩුවක් හැටියට පත් කරපු අයට විරුද්ධව තමයි,-

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
මහ බැංකුවට අධිපතිවරයෙක් පත් කළා. රුසියාවට තානාපතිවරයෙක් පත් කළා. ඒ ආණ්ඩුවේ පත්වීම් නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
ඔව්, ආණ්ඩුවේ පත්වීම්.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ඇමෙරිකා එක්සත් ජනපදයට තානාපතිවරයෙක් පත් කළා. ඒ අය පත් කළ බලධාරින්ට තිබෙන වගකීම ගැනයි අපි අහන්නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
රජයක් හැටියට වැරැද්දක් තිබුණු නිසා තමයි, අපි නීතිය අනුව ක්‍රියා කළේ.

දැන් නීතිය අනුව තවදුරටත් ක්‍රියා කරන්නේ ඒ නිසායි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දෙවන පැහැදිලි කර ගැනීම.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිසානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මා නැවතත් කියන්නේ, මේ තිදෙනාම සාමාන්‍ය අය නොවෙයි කියන එකයි. මට මතකයි, අර්ජුන මහේන්ද්‍රන් සිංගප්පූරුවට ගියාට පසුව මා ඒ සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් ඇහුවාම ගරු අගමැතිතුමා මේ පාර්ලිමේන්තුවේදී පිළිතුරක් ලබා දුන්නා, ඔහු විවාහ උත්සවයක් සඳහායි සහභාගි වුණේ, ඔහු ඉතා ඉක්මනින්ම ලංකාවට එන බවට. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා මහුල් උත්සවයකට යන එක ගැන මහා භාණ්ඩාගාරය භාර අමාත්‍යවරයාට කියන්න ඕනෑ නැහැ. ගරු අගමැතිතුමනි, ඔහු විවාහ උත්සව සඳහා යන ගමන් පවා ඔබතුමා දන්නවා නම්, එයින් පෙන්නුම් කරනවා, ඔහුත්, ඔබතුමාත් අතර සමීප සබඳතාවක් තිබුණු බව. ඔබතුමා රටේ අග්‍රාමාත්‍යවරයා. මා දන්නවා, ඔබතුමාගේ නිර්දේශය මත තමයි කැබිනට් මණ්ඩලයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා පත් කරන්නේ කියලා. ජාත්‍යන්තර වරෙන්තු, රතු නිවේදන, ජාත්‍යන්තර පොලිස් සහාය, උදර්පණ නීති වැනි ඒවායින් සැහවෙන්නේ නැතුව ඔහු මේ රටට කැඳවා දෙන්න අගමැතිතුමාට මූලික වග කීමක් තිබෙනවා. මොකද, ඔහු ඔබතුමාගේ මිත්‍රයෙක්. පළමුවන කාරණය එයයි.

දෙවන කාරණය මෙයයි. උදයංග වීරතුංග කියන්නේ කවුද? උදයංග වීරතුංග කියන්නේ හිටපු ජනාධිපතිවරයාගේ ඥාති සොහොයුරා. ජාලිය වික්‍රමසූරිය කියන්නේ කවුද? ඔහුත් හිටපු ජනාධිපතිවරයාගේ ඥාතිවරයෙක්. මේ පත්වීම් දෙක දීලා තිබෙන්නේ හිටපු ජනාධිපතිවරයායි. එක පත්වීමක් දීලා තිබෙන්නේ, අග්‍රාමාත්‍යවරයාගේ ඉතාමත් සමීප මිත්‍රයකුටයි. අනික් පත්වීම් දෙක දීලා තිබෙන්නේ, හිටපු ජනාධිපතිවරයාගේ ඉතාමත් කිට්ටු ඥාතීන් දෙදෙනෙකුටයි. වර්තමාන අග්‍රාමාත්‍යවරයාත්, හිටපු ජනාධිපතිවරයාත් මේ රටේ වග කිව යුතු පුරවැසියන් නම්, මා කියන්නේ, මේ අය ලංකාවට ගෙනැවිත් දෙන්න ඒ දෙදෙනා මූලිකව වග කියන්න ඕනෑය කියලායි. ඒ ඇයි? දෙදෙනෙක් සමීප ඥාතීන්. අනික් කෙනා සමීප මිත්‍රයෙක්. ඒ නිසා එයට වග කිව යුතු එක් කෙනෙක් අගමැතිවරයායි, අනික් එක් කෙනා හිටපු ජනාධිපතිවරයායි. ඒ නිසා මෙයට පෞද්ගලිකව මැදිහත් වී මේ අය ලංකාවට ගෙන්වා දීමේ වග කීමක් ඒ දෙදෙනාට තිබෙනවා. ඒ නිසා ගරු අගමැතිතුමනි, ඔබතුමාගේ පාර්ශ්වයේ මිතුරා ගෙන්වා දීම සඳහා ගන්නා ක්‍රියාමාර්ග කවරේද කියා මා දැන ගන්න කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
අර්ජුන මහේන්ද්‍රන් මැතිතුමා මා යටතේ වැඩ කරන අවස්ථාවේදී එතුමා රට යනකොට මට දැනුම් දුන්නා. රට යන්නේ ඇයි කියලා කිව්වා. විශේෂයෙන්ම ඒ අවස්ථාවේදී රට යනකොට මේ ගැන ප්‍රශ්නයක් තිබුණු නිසා ඔහු කිව්වා, "මා යන්නේ විවාහ උත්සවයකටයි. ඊට පස්සේ ලංකාවට එනවා"යි කියලා. දැනට සිටින ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමාත් රට යනකොට මට කියනවා, ඒ හේතු මට දැනුම් දෙනවා. ඒ දෙදෙනා විතරක් නොවෙයි, මගේ අමාත්‍යාංශයේ අනික් නිලධාරිනුත් රට යනකොට මට දැනුම් දෙනවා, රට යන හේතුව මොකක්ද, එය පෞද්ගලික ගමනක්ද, නිල වශයෙන් යන ගමනක්ද කියලා.

අපෙන් ඉවත් වුණාට පස්සේ ඒ වගකීම නැහැ. මම අර්ජුන මහේන්ද්‍රන් මැතිතුමා මීට ඉස්සෙල්ලා දන්නවා. එතුමා රට යනවා, එනවා, මට කිසි දෙයක් කිව්වේ නැහැ. ඒ වාගේම ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මැතිතුමාවත් මම දන්නවා. රට යනවා, එනවා, මට කිව්වේ නැහැ. මීට පස්සෙත් රට යනකොට, එනකොට මට කියන්න වුවමනා නැහැ. ඒ විධියට මිනිස්සු යන එන ඒවා ගැන දැනගන්න කටයුතු කරන්නේ නැහැ. අර්ජුන මහේන්ද්‍රන් මැතිතුමා රට යන්න ඉස්සෙල්ලා මම විශේෂයෙන් ඇහුවා, "මෙතැන ප්‍රශ්න තිබෙනවා. රට යන එක නුවණට හුරුද?" කියලා. දැනට සිටින මහ බැංකු අධිපතිවරයා ගියවර රට ගිය අවස්ථාවේත් මට කරුණු කිව්වා. ඇත්ත වශයෙන්ම ඊට පස්සේ මම ජනාධිපති විමර්ශන කොමිසමට යනකොට අර්ජුන මහේන්ද්‍රන් මැතිතුමා සමඟ මගේ සම්බන්ධයක් තිබුණේ නැහැ. එතුමා අවසන් වරට රට ගිය

අවස්ථාව ගැනත් මම දැනගෙන සිටියේ නැහැ. එතුමා විටින් විට සිංගප්පූරුවේ හිටපු තැන් ගැන මම දැනගෙන සිටියා. මීට ඉස්සෙල්ලාත් එතුමා හොඳ නිවසක් හම්බවනතුරු විටින් විට නිවාස මාරු කරමින් සිටියා. ඒක සිංගප්පූරුවේ සිරිතක්. නමුත්, ඒ එක්කෙනෙක් ගැනවත් මම දන්නේ නැහැ.

උදයංග වීරතුංග පිළිබඳව මට කොහෙත්ම දැනුමක් නැහැ. ජාලිය වික්‍රමසූරිය මහතාව නම් මම හම්බවෙලා තිබෙනවා. ඊට පසුව මම ඔවුන් සමඟ සම්බන්ධකම් තියාගෙන නැහැ. වැඩ කටයුතු කරනකොට මම ආණ්ඩුවේ අදාළ අංශවලින් තමයි තොරතුරු ලබාගෙන තිබෙන්නේ. ඊට පස්සේ සම්බන්ධකම් තිබුණා නම් කියනවා, "මමයි උදව් කරන්නේ." කියලා.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)

கௌரவ சபாநாயகர் அவர்களே, நான் கௌரவ பிரதம அமைச்சர் அவர்களிடம் எனது கேள்வியைக் கேட்கின்றேன்.

ஒட்டுசுட்டான் பிரதேசத்தில் முத்தையன்கட்டு நீர்ப்பாசனப் பொறியியலாளர் அலுவலகத்திற்குச் சொந்தமான 65 ஏக்கர் நிலப்பரப்புக் காணி சுமார் 9 வருட காலமாக இராணுவத்தின் 64வது படைப் பிரிவின் தலைமையகத்தினால் பயன்படுத்தப்பட்டு வருகின்றது. அதன் காரணமாக முத்தையன்கட்டு நீர்ப்பாசனப் பொறியியலாளர் அலுவலகம் அந்த இடத்தில் இயங்காமையினால் அப்பிரதேச மக்கள் பெரிதும் பாதிக்கப்பட்டுள்ளனர்.

அந்தப் பிரதான காரியாலயத்தை அமைப்பதற்கு 15 மில்லியன் நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளதுடன், அதற்காகக் கேள்வி கோரல் நடைபெற்று ஒப்பந்தக்காரரும் தெரிவுசெய்யப்பட்டுள்ளார். எனினும், அந்தக் காரியாலயத்தை நிர்மாணிப்பதற்குத் தேவையான அக்காணியை இராணுவத்தின் 64வது படைப் பிரிவினர் பயன்படுத்துகின்றமையால் அக்கட்டிடத்தை நிர்மாணிப்பதற்குரிய மேலதிக நடவடிக்கைகளை மேற்கொள்ள முடியாதுள்ளது.

எனவே, வடக்கு, கிழக்குப் பிரதேசங்களில் அமைந்துள்ள, தற்போது இராணுவத்தினரால் பயன்படுத்தப்பட்டு வருகின்ற, அரச நிறுவனங்களுக்குச் சொந்தமான இவ்வாறான காணிகளை அந்நிறுவனங்களிடம் மீள ஒப்படைப்பதற்கு நடவடிக்கை எடுக்கப்படுமா? இச்செயற்பாட்டுக்கு எவ்வளவு காலம் எடுக்கும்?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, ඔඩ්ඩුසුඩාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විද්‍යාපුරම් ග්‍රාම නිලධාරී වසමේ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ 64වන බලසේනා මූලස්ථානය ස්ථාපිත ඉඩම සහ අබලන්ව තිබූ ගොඩනැඟිලි යුද්ධ හමුදාව විශාල පිරිවැයක් හා ශ්‍රමයක් යොදවා සංවර්ධනය කර තිබෙනවා. එසේම, යුද්ධ හමුදා මූලස්ථානයෙන් දැනුම් දී තිබෙන්නේ, උපක්‍රමික වශයෙන් ආරක්ෂාව තහවුරු කිරීමේ මර්මස්ථානයක් වන මෙම ස්ථානය අතහැරීමට දැනට නොහැකි බවයි. බලසේනා මූලස්ථානය ස්ථාපිත කිරීමට ප්‍රථමයෙන් මෙම ඉඩමේ වාරිමාර්ග කාර්යාලයක් තිබුණත්, එම ඉඩම වාරිමාර්ග ඉංජිනේරු කාර්යාලයටවත්, වෙනත් කිසිවෙකුටවත් පවරා දී නොතිබුණි. එය රජයේ ඉඩමක් ලෙස තමයි ඒ අවස්ථාවේ ලියා පදිංචි කර තිබුණේ.

ශ්‍රී ලංකා යුද හමුදාව වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමේ කටයුතු දැනට මූලතිව් දිස්ත්‍රික් ලේකම් විසින් සිදු කරමින් පවතිනවා. එම නිසා වඩාත් ඵලදායී විසඳුම වන්නේ, වාරිමාර්ග කාර්යාලයක් ස්ථාපිත කිරීමට රජයට අයත් වෙනත් ඉඩමක් සොයා ගෙන, ඒ අවශ්‍ය කටයුතු සඳහා මුදල් ලබා දෙන එකයි. ඒ සම්බන්ධයෙන් යුද හමුදා මූලස්ථානය මූලතිව් දිස්ත්‍රික් ලේකම් වෙත උපදෙස් දී තිබෙනවා.

උතුරු නැඟෙනහිර ප්‍රදේශවල ත්‍රිවිධ හමුදාව විසින් පරිහරණය කරනු ලබන ඉඩම් අතුරින් අවශ්‍ය නොවන ඉඩම් අත හැර තිබෙනවා. අනෙක් ඉඩම් අත් හරින එක ගැනත් සාකච්ඡා කරගෙන යනවා. මම කිලිනොච්චියේදීත්, විශේෂයෙන් යාපනයේදීත් හමුදාව එක්ක මේ ගැන කථා කරලා, ආපසු හමුදාපතිවරුන් එක්ක කොළඹදීත් කථා කරලා, ජනාධිපතිතුමා එක්කත් කථා කරන්නයි බලාපොරොත්තු වුණේ.

මේ අවස්ථාවේදී මේ ඉඩම පිළිබඳව මම සාකච්ඡා කරලා, පසු අවස්ථාවක මූලතිව්වලටත් පැමිණෙන්න බලාපොරොත්තු වෙනවා.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)

Hon. Speaker, there are 65 acres occupied by the army. If you can take action to release only two acres to construct this Department it will be very useful. The Department has asked for only two acres. Money has already been allocated and tenders have been called. If you can take action, it will be very useful for the people who have been affected.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

I will ask my office to take action, to speak to the army and to follow up with you.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Thank you.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමා මීට කලින් කළ ප්‍රකාශයක් ගැන clarification එකක් කර ගන්න තිබෙනවා. ඔබතුමා දන්නවා -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අගමැතිතුමනි, ඔබතුමා පිළිතුරු දෙන්න සූදානම්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

අගමැතිතුමාට ගැටලුවක් නැහැ. එතුමා මේකට උත්තර දේවි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක හරි. මම දැන ගන්න ඕනෑ එතුමා පිළිතුරු දෙන්න කැමැතිද කියලා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පොඩ්ඩක් ඉන්න. මම ඔබතුමාවත් බේරන්නයි හදන්නේ.

ගරු අගමැතිතුමා දන්නවා, පළාත් සභා මැතිවරණය ගැන සාකච්ඡා කිහිපයක් පැවැත්වූ බව. ඇතැම් පළාත් සභා මාස අටක් තිස්සේ ආණ්ඩුකාරවරුන්ගේ පාලනය යටතේයි තිබෙන්නේ. ආණ්ඩුකාර පාලනය මාස අටක් තිස්සේ පැවතීම ගැන කිසිවෙකු එකඟ නැහැ. ශ්‍රේෂ්ඨාධිකරණය පවා කියලා තිබෙනවා, ඡන්දය තියන්න කියලා. මම අගමැතිතුමාගෙන් අහන්නේ, මේ ඡන්දය තියන්න මැතිවරණ කොමිසමට භාර දෙන්න ඔබතුමා එකඟ වන්නේ කවදාද කියලායි. මැතිවරණ කොමිසම ප්‍රකාශ කරනවා, "ඡන්දය තියන්න අපට අවසර දෙන්නේ නැහැ." කියලා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මම මැතිවරණ කොමිසම සමඟ සාකච්ඡා කරලා නැහැ. මා හිතන විධියට පෙරේදා දින ජනාධිපතිතුමා ප්‍රකාශ කර තිබුණා, ඡන්දය පැවැත්වෙනවා කියලා. අපි බැලුවේ පළාත් සභා සියල්ලේම මැතිවරණය එක දිනයක පවත්වන්නයි.

ඉදිරියේදී තවත් පළාත් සභා දෙකක මැතිවරණය පැවැත්විය යුතු වනවා. එම නිසා මේ පළාත් සභා සියල්ලේම මැතිවරණ එක් දිනයක පැවැත්වුවොත් හොඳයි. මේ සම්බන්ධයෙන් මීළඟ පාර්ලිමේන්තු සතියේම ඔබතුමන්ලා එක්කත් සාකච්ඡා කරලා ජනාධිපතිතුමා එක්ක සාකච්ඡා කරන්න අපට පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

35/'18

2016 අය වැය යෝජනා : ගබඩා ඉදිකිරීම්
2016 வரவு செலவுத்திட்டப் பிரேரணை : களஞ்சிய நிர்மாணம்
BUDGET PROPOSELS 2016 : CONSTRUCTION OF WHEREHOUSES

1. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 132ට අනුව, පොළොන්නරුව, කිලිනොච්චිය සහ රත්නපුර (ඇඹිලිපිටිය) දිස්ත්‍රික්කයන්හි සුවිශාල ගබඩා තුනක් ඉදිකිරීමට සහ මන්නාරම් දිස්ත්‍රික්කයේ ඉදිවන ගබඩාවේ වැඩ නිම කිරීමට රුපියල් මිලියන 1,000 ක් වෙන් කළ බව පිළිගන්නේද;

(ii) මන්නාරම දිස්ත්‍රික්කයෙහි ඉදිකෙරෙන ගබඩා වෙහි මුල් පිරිවැය ඇස්තමේන්තුව සහ මේ දක්වා වූ එහි ප්‍රගති සමාලෝචන වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) කිලිනොච්චිය, ඇඹිලිපිටිය හා පොළොන්නරුවෙහි නව ගබඩා සංකීර්ණ තුන ඉදිකිරීමේ කටයුතුවල ප්‍රගතිය කවරේද;

(iv) 2016 අයවැය යෝජනා අංක 132 වෙනුවෙන් වෙන් කළ රුපියල් මිලියන 1,000 ක මුදල වැය කළ ආකාරය කෙසේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டப் பிரேரணை இல. 132க்கமைய, பொலன்னறுவை, கிளிநொச்சி, இரத்தினபுரி (எம்பிலிபிட்டி) மாவட்டங்களில் மூன்று பாரிய களஞ்சியங்களை நிர்மாணிக்க மற்றும் மன்னார் மாவட்டத்தில் நிர்மாணிக்கப்பட்டுவரும் களஞ்சியத்தின் வேலைகளை பூர்த்தி செய்ய ரூபா 1000 மில்லியன் ஒதுக்கப்பட்டதை அவர் ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(ii) மன்னார் மாவட்டத்தில் நிர்மாணிக்கப்படுகின்ற களஞ்சியத்தின் ஆரம்ப செலவின மதிப்பீட்டையும் மற்றும் இதுவரையான அதன் முன்னேற்ற மீளாய்வு அறிக்கையையும் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iii) கிளிநொச்சி, எம்பிலிபிட்டிய மற்றும் பொலன்னறுவையில் புதிய மூன்று களஞ்சியத் தொகுதிகளை நிர்மாணிக்கின்ற நடவடிக்கைகளின் முன்னேற்றம் யாது என்பதையும்;

(iv) 2016 ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட பிரேரணை இலக்கம் 132 இற்காக ஒதுக்கப்பட்ட ரூபா 1000 மில்லியன் தொகை செலவிடப்பட்ட முறை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Mass Media:

(a) Will he inform this House -

(i) in terms of Budget proposal No. 132 of budget 2016, whether he accepts the fact that Rs. 1000 Million has been allocated to construct three massive warehouses in Polonnaruwa, Kilinochchi and Rathnapura (Embilipitiya) Districts and to complete the construction of a warehouse that is being constructed in Mannar District;

(ii) whether the original cost estimate and the current progress report on the warehouse that is being constructed in Mannar District, will be submitted;

(iii) of the progress made at the constructions of three warehouse complexes in Kilinochchi, Embilipitiya and Polonnaruwa; and

(iv) of the manner in which Rs. 1000 million that was allocated for the proposal No. 132 of budget 2016, was spent?

(b) If not, why?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්. තොරතුරු පහත පරිදි වේ.

	VAT රහිත මුල් පිරිවැය ඇස්තමේන්තුව (රු)	**VAT රහිත දරන ලද සත්‍ය පිරිවැය (රු)**
ඉදිකිරීම්	184,003,122.70	184,693,542.52
යන්ත්‍ර සූත්‍ර හා උපකරණ (ධාන්‍ය වියළීමේ හා ධාන්‍ය පිරිසිදු කිරීමේ යන්ත්‍ර, ජෙනරේටර් යන්ත්‍රය, ට්‍රාන්ස්ෆෝමර් යන්ත්‍රය, සූර්ය බලශක්ති පද්ධතිය, ප්ලාස්ටික් පැලට්, පරිගණක, ප්‍රින්ටර් යන්ත්‍ර හා අන්තර්ජාල පහසුකම් ගබඩාව ඇතුළත හා ඒ අවට පිරිසිදු කිරීමේ උපකරණ ගබඩා මලු මැසීමේ උපකරණ)	48,000,000.00	47,562,065.63
එකතුව	**232,003,122.70**	**232,255,608.15**

එම පිරිවැයන් දෙක බොහෝ දුරට එක හා සමානයි; රුපියල් ලක්ෂ දෙකක වෙනසක් තිබෙන්නේ.

මන්නාරම ගබඩා සංකීර්ණයේ ඉදිකිරීම් කටයුතු නිමකොට යන්ත්‍ර සූත්‍ර සවිකොට 2017 ජනවාරි 26 දින එය විවෘත කරන ලදී. 2017 වසරේදී රුපියල් මිලියන 22ක පමණ වී තොග මෙට්‍රික් ටොන් 657ක් ගබඩා කරන ලදී. අස්වනු නෙළන සමයේ වී කිලෝ එකක මිල රුපියල් 41 සිට 42 පමණ මට්ටමක පැවති අතර, ගබඩා කළ එම වී තොග කිලෝවක් රුපියල් 53 සිට 60 දක්වා වූ මිලකට අලෙවි කිරීමෙන් ගොවීන් 68කට සෘජුවම රුපියල් මිලියන 10.5ක පමණ අමතර ආදායමක් මෙමඟින් උපයා ගත හැකි විය.

(iii)

දිස්ත්‍රික්කය	**ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය**	**අපේක්ෂිත නිම කිරීමේ දිනය**
රත්නපුර (ඇඹිලිපිටිය)	100%	නිමකර ඇත.
කිලිනොච්චිය	83%	2018.06.30
පොළොන්නරුව	75%	2018.07.20

(iv) 2016 අය වැය මඟින් පොළොන්නරුව, කිලිනොච්චිය හා රත්නපුරය දිස්ත්‍රික්කයන්හි නවීන තාක්ෂණයෙන් යුතු ගබඩා සංකීර්ණ තුනක් ඉදිකිරීමට යෝජනා වූ අතර, ඒ සඳහා රුපියල් මිලියන 1,000ක් වෙන් කරන ලදී.

ජාතික තරගකාරී ලංසු කැඳවීම මඟින් පොළොන්නරුව, කිලිනොච්චිය හා රත්නපුර දිස්ත්‍රික්කයන්හි ගබඩා සංකීර්ණ ඉදි කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරාගනු ලැබූ අතර, එකී ප්‍රසම්පාදන ක්‍රියාවලීන් සඳහා සැලකිය යුතු කාලසීමාවක් ගත විය. එහි ප්‍රතිඵලයක් ලෙස, ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වූ අතර, රුපියල් 240,853,739.79ක් පමණ 2016 වසරේදී වියදම් විය. කෙසේ වෙතත්, 2017/2018 වර්ෂ තුළ ඉදිකිරීම් කටයුතුවලින් වැඩි ප්‍රමාණයක් නිම කරන ලද අතර, 2018 මැයි 31 දිනෙන් අවසන් වසර තුනක කාලයේ දී රුපියල් මිලියන 1,000න් රුපියල් 729,446,360.89ක් අදාළ ගබඩා සංකීර්ණ වෙනුවෙන් වියදම් කරන ලදි.

	VAT සහිතව වියදම (රුපියල්)			
	2016	2017	2018	එකතුව
මන්නාරම (ඉදිකිරීම් හා යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම)	147,205,198.85	50,706,475.21	-	197,911,674,06
කිලිනොච්චිය (ඉදිකිරීම්)	46,423,027.24	53,303,500.42	61,689,073.46	161,415,601.12
රත්නපුර (ඉදිකිරීම් හා යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම)	42,288,192.17	151,266,415.25	63,667,976.76	257,222,584.18
පොළොන්නරුව (ඉදිකිරීම)	3,545,541.60	59,779,873.61	47,397,638.73	110,723,053.94
මොනරාගල හා අනුරාධපුර (මෙහෙයුම් වියදම්)	1,391,779.93	781,667.66	-	2,173,447.59
එකතුව	240,853,739.79	315,837,932.15	172,754,688.95	729,446,360.89

(ආ) පැන නොනඟී.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මගේ පළමුවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි. මෙම රාජ්‍ය අය වැයෙන් ගරු සභාවෙන් මුදල් වෙන් කරන්නේ වර්ෂයට අදාළවයි. ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්න ටික දිගින් දිගටම අසාගෙන අසාගෙන එනකොට ඔබතුමාටත් පැහැදිලි වෙනවා, පාර්ලිමේන්තුව නොමඟ යවන අසත්‍ය වෙන් කිරීමක් තමයි අය වැය ලේඛනයෙන් කර තිබෙන්නේ කියලා. ගබඩා තුනක් ඉදිකිරීම සඳහා 2016 වර්ෂයේදී රුපියල් මිලියන 1,000ක් වෙන් කරනවා. හැබැයි, රුපියල් මිලියන 1,000ක් වෙන් කළාට අය වැය කාල පරිච්ඡේදය තුළ වෙන් කරන්නේ රුපියල් මිලියන දෙසිය ගණනයි; පහෙන් එකයි. අය වැය වියදම දානවා; ආදායම දානවා; අය වැය පරතරය දානවා. පරතරය පියවන්න ණය ගන්න උපරිම ණය සීමාව යනාදිය අනුමත කරනවා. පසුගිය කාලයේදී හිටපු මුදල් අමාත්‍යවරයා විසින් කළේ මේ සියල්ල සම්පූර්ණ විගඩමක් බවට පරිවර්තනය කිරීමයි.

ඒ කියන්නේ, මේකේ මුදල් දාලා ඉවර වෙලා යෝජනා හැටහුටහමාරක් කියනවා. එසේ කිව්වාට පස්සේ සභාතොමෝ සතුටින් අත්පොඩි ගහනවා. ඇමතිවරයාට මොනවත් මුදල් ලැබෙන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ අය වැය ක්‍රියාවලිය සඳහා ඔබතුමාගේත්, අපේ රටේත් කාලය ඉතාවිශාල වශයෙන් වැය කරලා කිසිම පසුවිපරමක් නැතිව මෙලෙසින් කරන ක්‍රියාවලිය පිළිබඳව නව මුදල් ඇමතිතුමාට අලුත් ක්‍රමවේදයක් තිබෙනවාද? ඇත්තටම මේ සඳහා වෙන් කරන මුදලත්, ඒ මුදල් ජනයා වෙනුවෙන් වැය කරන ආකාරය පිළිබඳවත් ක්‍රමවත් වැඩ පිළිවෙළක් ඉස්සරහටවත් තිබෙනවා ද කියලා ප්‍රථමයෙන්ම මම දැනගන්න කැමැතියි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා වැදගත් ප්‍රශ්නයක් ඇසුවේ. මම කියන්නේ නැහැ, මෙතැන මොකක් හෝ වහලා කරන්න හදලා තිබෙනවා කියලා. නමුත්, මෙවැනි ගැටලුවක් තිබෙනවා. එක අවුරුද්දක් තුළදී අය වැයෙන් මුදලක් වෙන් කර ගත්තොත්,- [බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඒ අවුරුද්දට මුදල් වෙන් කරලා, ඒ මුදල් ඊළඟ අවුරුද්දට ගෙනියන්න බැහැ. ඒ, ඒ අවුරුද්දේ අය වැය.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඒක තමයි මම පැහැදිලි කරන්නේ. ගරු මන්ත්‍රීතුමනි, මෙතැන තිබෙන්නේ මේක ගැන විතරක් නොවෙයි. මෙතැන න්‍යාය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ කියන්නේ, budget එකෙන් අවුරුද්දක් තුළදී මුදලක් වෙන් කර ගන්නවා. සමහර වෙලාවට ඒ ව්‍යාපෘති ඒ අවුරුද්දේම සම්පූර්ණ වෙන්නේ නැහැ. සමහර විට ඒ සඳහා අවුරුදු දෙකක්, තුනක් යනවා. ඒක අපි හැමෝම දන්නවා. බොහෝ වෙලාවට එහෙම තමයි සිදු වෙන්නේ කියලා අපි හැමෝම දන්නවා. එතකොට සාමාන්‍යයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා පස්සේ ඒක සම්මත කර ගන්නවා. ඔය ක්‍රියාදාමය තමයි තිබෙන්නේ. නමුත්, පුද්ගලික අංශය දෙස බැලුවොත් සාමාන්‍යයෙන් මේවාට rolling budgets තිබෙනවා. ඒ කියන්නේ, ඒ අවුරුද්දේම ව්‍යාපෘතියක් ඉවර කරන්න බැරි වුණොත්, ඊළඟ අවුරුද්දේ ඉවර කරන එක. මම හිතන විධියට මේක සභවලා කරන එකක් නොවෙයි. ඒ අදහස නම් වැරැදියි. නමුත්, මේ ආකාරයට තමයි සිදු වෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය ලක්ෂ සංඛ්‍යාත මුදලක් වියදම් කරලා තෙල් මිල සම්බන්ධයෙන් සම්පූර්ණ අසත්‍ය පුවත් පත් දැන්වීම් පළ කර තිබෙනවා. මේ ගරු සභාව විසින් සම්මත කරන ලද තොරතුරු දැනගැනීමේ පනත යටතේ මම ඔබතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් ඒ පිළිබඳව තොරතුරු ඉල්ලා සිටියා. මෙලෙසින් මහජනයාගේ බදු මුදල්වලින් වැරැදි ලෙස දැන්වීම් දැමීමෙන් මහජන මුදල් අවභාවිත කිරීම පිළිබඳව අනාගත කාලයේදී චෝදනා එල්ල වෙන්න පුළුවන්. ඒ නිසා තොරතුරු දැනගැනීමේ පනත යටතේ ඔබතුමාගේ අමාත්‍යාංශයේ ලේකම්ගෙන් මම ඉල්ලා තිබෙනවා, අසත්‍ය පුවත් පත් දැන්වීම් පළ කිරීමට කොපමණ මුදලක් වැය වුණා ද කියලා. අද වෙනකම් ඒ තොරතුරු ටික දීලා නැහැ. පනත් කෙටුම්පත් මේ පාර්ලිමේන්තුවේදී සම්මත වුණාට ඒ පනත්වලට අදාළ තොරතුර අඩුම ගණනේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ටවත් දැනගන්න බැරි නම්, රටේ ජනතාවට කවර පිහිටක් ද? ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ දළ අදහස දැනගන්න කැමැතියි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
පළමුවෙන්ම කියන්න ඕනෑ, වෙනසක් කරන කොට ඒක රටේ ජනතාවට දැනුම් දිය යුතුය කියන එක. ඒ නිසා සමහරවිට මෙවැනි දැන්වීම් දමන්න සිදු වෙනවා. [බාධා කිරීමක්] නැහැ, ඔබතුමා තර්ක කරන්නේ ඒ දැන්වීම සඳහා වැය කළ මිල ගැනයි. ඔබතුමා ඒක ඉල්ලා තිබෙන බව කිව්වා. ඔබතුමාට පිළිතුර එවන්න කියලා මම අනිවාර්යයෙන්ම ලේකම්තුමාට දැනුම් දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 2 - 239/'18-(1), ගරු හේෂාන් විතානගේ මැතිතුමා.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශයට අදාළ නොවන බවත්, එය අදාළ වන්නේ සමාජ සවිබල ගැන්වීමේ අමාත්‍යාංශයට බවත් දැනුම් දී තිබෙනවා. ඒ නිසා එම ප්‍රශ්නය නැවත අදාළ අමාත්‍යාංශයට යොමු කරන ලෙස දන්වා සිටිනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒ ප්‍රශ්නය අදාළ අමාත්‍යාංශයට යොමු කරන්න.

ගරු හේෂාන් විතානගේ මහතා
(මාණ්පුමිකු ෂෙහාන් විතානකේ)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, ඊයේ මහවැලි සංවර්ධන අමාත්‍යාංශයෙන් ප්‍රශ්නයක් ඇහුවා. අදාළ අමාත්‍යාංශයට නොවෙයි යොමු කර තිබුණේ. ප්‍රශ්න යොමු කිරීම පිළිබඳව පොඩි ගැටලුවක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මේ දවස්වල පොඩි පොඩි වෙනස්වීම් තිබෙනවා නේ. කාර්ය මණ්ඩලය ඒ ගැන සොයා බලා කටයුතු කරන්න.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෙ මට්ටොරු තිනත්තිට් සමර්ප්පික්කක් කට්ටළෙ යිටප්පට්ටදු.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 - 308/'18-(1), ගරු බුද්ධික පතිරණ මැතිතුමා.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෙ මට්ටොරු තිනත්තිට් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 - 386/'18 - (1), ගරු කේ. කාදර් මස්තාන් මැතිතුමා.

ගරු කේ. කාදර් මස්තාන් මහතා
(මාණ්පුමිකු කා. කාදර් මස්තාන්)
(The Hon. K. Kader Masthan)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෙ මට්ටොරු තිනත්තිට් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 - 390/'18-(1), ගරු ටී. රංජිත් ද සොයිසා මැතිතුමා

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(මාණ්පුමිකු ரී. රඤ්ජිත් ත සොය්සා)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, මම ඒ ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මේ පළමුවැනි වතාවද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
පළමුවැනි වතාව.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
විනාවෙ මට්ටොරු තිනත්තිට් සමර්ප්පික්කක් කට්ටළෙයිටප්පට්ටදු.
Question ordered to stand down.

පානීය ජල ව්‍යාපෘති : මන්නාරම දිස්ත්‍රික්කය
குடிநீர் வழங்கல் கருத்திட்டம்: மன்னார் மாவட்டம்
DRINKING WATER PROJECTS: MANNAR DISTRICT

407/'18

6. ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 1983 වර්ෂය වනවිට මන්නාරම දිස්ත්‍රික්කය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් පිරිසිදු පානීය ජලය සපයා තිබූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට පිරිසිදු පානීය ජලය සපයනු ලබන නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) 1983 වර්ෂයෙන් පසුව යුද්මය තත්ත්වය නිමවන තුරු පානීය ජලය ලබා දීම වෙනුවෙන් එක් එක් වර්ෂය සඳහා රජය විසින් වෙන් කරන ලද මුළු මුදල කොපමණද;

[ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා]

(iv) යුද්මය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය වනතෙක් පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘති වෙනුවෙන් රජය වෙන් කරන ලද මුළු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

නගරත් තිට්ටමිටල් මත්‍රුම් නීර් වළඟ්කල් අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) 1983 ආම් ආණ්ටලවිල් මන්නාර් මාවට්ටත්තිල් තේසිය නීර් වළඟ්කල් මත්‍රුම් වඩිකාලමෙප්පුච් චපෙයිනාල් සුත්තිකරික්කප්පට්ට කුඩිනීර් වළඟ්කප් පට්ටිරුන්ත වීටුකළින් එණ්ණික්කෙ යාතු;

(ii) ඉන්‍රලවිල් සුත්තිකරික්කප්පට්ට කුඩිනීර් වළඟ්කප් පඩුකින්‍ර වීටුකළින් එණ්ණික්කෙ යාතු;

(iii) 1983 ආම් ආණ්ටින් පින්නර් යුත්ත නිලෙමෙ මුඩිවටෙයුම් වරෙ කුඩිනීර් වළඟ්කුවතර්කාක ඔව්වෝර් ආණ්ටිර්කුම් අරචාඞ්කම් ඔදුක්කිය මොත්තප් පණත්තොකෙ යාතු;

(iv) යුත්ත නිලෙමෙ මුඩිවටෙන්ත පින්නර් 2015 ආම් ආණ්ටුවරෙ කුඩිනීර් වළඟ්කල් කරුත්තිට්ටඞ් කළුක්කාක අරචාඞ්කම් ඔදුක්කිය මොත්ත පණත්තොකෙ ආණ්ටු වාරියාක තනිත්තනියාක එව්වළවු;

(v) මේර්පඩි අනෙත්තිනුම් මුන්නේර්ර්මෙ පර්රිය අරික්කෙයෙච් චමර්ප්පිප්පාරා;

එන්පතෙ අවර් ඉච්චපෙයික්කු අරිවිප්පාරා?

(ආ) ඉන්‍රේල්, ඒන්?

asked the Minister of City Planning and Water Supply:

(a) Will he inform this House-

(i) how many households within the Mannar District had been connected to the supply of clean drinking water by the National Water Supply and Drainage Board by 1983;

(ii) how many households are provided with clean drinking water by now;

(iii) what amount was allocated by the Government in each year for providing drinking water after 1983 until the end of the war situation;

(iv) what amounts had been allocated by the Government for projects implemented for the supply of drinking water, separately in respect of each of the years following the war situation until the year 2015; and

(v) whether he will table a progress report on all above?

(b) If not, why?

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 1983 වර්ෂය වන විට පිරිසිදු පානීය ජලය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව 162යි.

(ii) 2017 අවසානය දක්වා පිරිසිදු පානීය ජලය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව 12,899යි.

(iii) 1983 සිට 2009 දක්වා වෙන් කරන ලද මුදල: මිලියන 5 (ඩොයිෂ් මාර්ක්- DM)+ රු. මිලියන 71.3

(iv)

වර්ෂය	ආසියානු සංවර්ධන බැංකු 5 වන ව්‍යාපෘතිය (ADB 5th)	උතුරු හදිසි ප්‍රතිපාදන ව්‍යාපෘතිය (ENREP)	එකතුව
2009	රු.මි. 5.72	රු.මි. නැත	රු.මි. 5.72
2010	රු.මි. 51.2	රු.මි. 0.33	රු.මි. 51.53
2011	රු.මි. 87.2	රු.මි. 73.22	රු.මි. 160.42
2012	රු.මි. 165.2	රු.මි. 219.30	රු.මි. 384.50
2013	රු.මි. 377.2	රු.මි. 122.79	රු.මි. 499.99
2014	රු.මි. 640.0	රු.මි. 24.38	රු.මි. 664.38
2015	රු.මි. 680.0	රු.මි. 39.17	රු.මි. 719.17
	රු.මි.2006.52	රු.මි. 479.19	
2009 සිට 2015 දක්වා වෙන් කරන ලද මුළු මුදල			රු.මි. 2,485.71

(v) ඔව්.

දිස්ත්‍රික්කය	ව්‍යාපෘතිය	වෙන් කළ මුදල	මූල්‍ය ආධාර	ව්‍යාපෘති කාල සීමාව	ලබා දී ඇති සම්බන්ධන ගණන හා ප්‍රතිලාභීන්
මන්නාරම	ජර්මානු තාක්ෂණික ව්‍යාපෘතිය (GTZ)	මිලියන 5 (ඩොයිෂ් මාර්ක් DM) රු.මිලියන 71.3	GTZ (ජර්මන්)	1985 - 1989	ජල සම්බන්ධන ආසන්න වශයෙන් 3,500
	උතුරු නැඟෙනහිර හදිසි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය (NEERP)	රු. මිලියන 22.3	ලෝක බැංකුව	2003 - 2004	ජල සම්බන්ධන ආසන්න වශයෙන් 1,000
	උතුරු නැඟෙනහිර ප්‍රජා ප්‍රතිසංස්කරණ හා සංවර්ධන ව්‍යාපෘතිය (NECORD)	රු. මිලියන 49	ලෝක බැංකුව	2006 - 2007	ජල සම්බන්ධන ආසන්න වශයෙන් 2,000
	උතුරු හදිසි ප්‍රතිපාදන ව්‍යාපෘතිය (ENREP)	රු. මිලියන 479.19	ලෝක බැංකුව	2010 - 2013	ජල සම්බන්ධන ආසන්න වශයෙන් 2,500
	ආසියානු සංවර්ධන බැංකු 5 වන ව්‍යාපෘතිය (ADB 5th)	රු. මිලියන 2006.52	ආසියානු සංවර්ධන බැංකු (ADB)	2011 - 2015	ජල සම්බන්ධන ආසන්න වශයෙන් 3,899 2035 වසරේදී ADB 5th ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතියේ මුළු ප්‍රතිලාභීන් 59,250

(ආ) අදාළ නොවේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, මගේ අතුරු ප්‍රශ්න දෙකෙන් දෙවැනි අතුරු ප්‍රශ්නය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් අහනවා ඇති.

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මම ගරු ඇමතිතුමාට යොමු කරනවා. ගරු ඇමතිතුමා ලබා දුන් දීර්ඝ පිළිතුර අනුව 1983 වර්ෂය වනවිට -යුද්ධය ආරම්භ වන වසර වනවිට- මන්නාරම දිස්ත්‍රික්කය තුළ ජල සම්පාදන අමාත්‍යාංශය හරහා පිරිසිදු පානීය ජලය ලැබුණු පවුල් සංඛ්‍යාව විධියට සඳහන් වෙන්නේ පවුල් 162යි. නමුත් 2017 වනවිට එම දිස්ත්‍රික්කය තුළ එසේ පානීය ජලය ලැබුණු පවුල් සංඛ්‍යාව 12,899ක් දක්වා වැඩි වී තිබෙනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා පැහැදිලි කළ ආකාරයට 1983න් පසුව -1983 සිට 2017 වනතෙක්- ඒ සඳහා වෙන් කළ සම්පූර්ණ මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 71.3ක් කියන එක තමයි මට හැඟී ගියේ. ඔබතුමා කියපු විධියට එහෙම නේද, ගරු ඇමතිතුමනි?

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
2015 වෙනකොට රුපියල් මිලියන 2,485යි.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
රුපියල් මිලියන 2,485ක් නේද?

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මන්නාරම කියන්නේ ලංකාවේ වියළි කලාපයේ පවතින දිස්ත්‍රික්කයක්. මෙම දිස්ත්‍රික්කය අධික වියළි කලාපයක් බැවින් එම දිස්ත්‍රික්කයේ ජනතාව බොහෝ කාලයක් තිස්සේ පානීය ජල ගැටලුවට මුහුණ දෙනවා. ඒ වාගේම, එම දිස්ත්‍රික්කයේ වාරිමාර්ග හරහා ගොවිතැන්බත් කරන ජනතාව වාරිමාර්ග ජල ගැටලුවටත් මුහුණ දෙනවා. ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම අද දවසේ තිබෙන ගැටලුවක් තමයි පිරිසිදු පානීය ජල ගැටලුව. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට තිබෙන අභියෝගයක් තමයි, මේ දිස්ත්‍රික්කයේ තිබෙන පාසල්වලට හා ග්‍රාමීය ප්‍රදේශවලට පිරිසිදු පානීය ජලය ලබා දීම. අපේ මොණරාගල දිස්ත්‍රික්කයේත් මෙම ගැටලුව පවතින ප්‍රදේශ තිබෙනවා. වකුගඩු රෝගය තිබෙන, වකුගඩු රෝගය ව්‍යාප්ත වෙන දිස්ත්‍රික්ක තමයි, මේවා.

ගරු ඇමතිතුමනි, මේ ආණ්ඩුව බලයට පත් වුණාට පසුව මන්නාරම දිස්ත්‍රික්කය තුළ පිරිසිදු පානීය ජල ගැටලුව තිබෙන ප්‍රදේශ හඳුනාගෙන තිබෙනවාද, එම ගැටලුව තිබෙන ප්‍රදේශ පිළිබඳ වාර්තාවක් මේ පාර්ලිමේන්තුවට ලබා දිය හැකිද, එම ප්‍රදේශ වෙනුවෙන් ජල සම්පාදන අමාත්‍යාංශය හරහා වාර්ෂිකව වෙන් කරන ලද ප්‍රතිපාදන කොපමණද, එසේ ප්‍රතිපාදන වෙන් කරන ලද ව්‍යාපෘති කවරේද යන්න දන්වන්න පුළුවන්ද කියන එකයි මම ඔබතුමාගෙන් අහන්නේ.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)

ගරු කථානායකතුමනි, අවශ්‍ය වාර්තාව ලබා දිය හැකියි කියලා තමයි මම අන්තිමට උත්තරයක් වශයෙන් සඳහන් කළේ.

දැනට ක්‍රියාත්මක වන මේ ව්‍යාපෘතීන්ට අමතරව, කල්ලාරු ගඟ හරස්කර ජලාශයක් ඉදිකරලා මන්නාරමේ එක කොටසකට - මන්නාරම දූපත ඇතුළුව- ජලය සැපයීමේ තවත් ව්‍යාපෘතියක් සකස් කරන්න අපි යෝජනා කරලා තිබෙනවා. දැන් එහි ශක්‍යතා වැඩකටයුතු චීන සමාගමක් විසින් කරගෙන යනවා. එය අවසන් වුණු විගසම මුදල් ලබාගෙන එකී ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න බලපොරොත්තු වනවා. මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම, මඩු,

[ගරු රවුෆ් හකීම් මහතා]

මාන්තෙයි බටහිර, මුසලි සහ නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කරමින් එම ව්‍යාපෘතිය කරන්න තමයි බලාපොරොත්තු වන්නේ.

මඩු ප්‍රදේශය කියන්නේ කතෝලික ජනතාවට ඉතාම වැදගත් වන පූජනීය ස්ථානයක් තිබෙන ප්‍රදේශයක්. මඩු දේවස්ථානයේ පූජකතුමාත් අපෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා, ජල සම්පාදන ක්‍රම වැඩිදියුණු කරලා දෙන්න කියලා. අපි එයත් කරන්නට අදහස් කරනවා. 2020 වනකොට දිස්ත්‍රික්කයෙන් සියයට 60ක භූමි ප්‍රමාණයක් ආවරණය කළ හැකි ජල ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වනවා. දැනට සියයට 19ක ප්‍රතිශතයක් තමයි ආවරණය කරන්නේ. අපි බලාපොරොත්තු වනවා, මේවා ඔක්කෝම නිම කරන්න අපට පුළුවන්කම ලැබෙයි කියා.

ඒ අතර වකුගඩු රෝගය බහුල ප්‍රදේශයක් හැටියට මේ ප්‍රදේශය හඳුනාගෙන දැන් ජල පෙරන යන්ත්‍ර සවි කරමින් යනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන අතුරු ප්‍රශ්නය ඇසීමට ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දෙවන අතුරු ප්‍රශ්නය ඇසීමට මට අවස්ථාව ලබාදීම ගැන ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වනවා.

ගරු ඇමතිතුමනි, මේ වෙනකොට සතියකට වැඩි කාලයක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයන් අතිකාල වැඩ කරන්නේ නැහැ; දැන් වැඩ කිරීමත් නතර කරලා තිබෙනවා. ඊයේ දහස් ගණනක් ඇවිල්ලා ඔබතුමාගේ අමාත්‍යාංශය වටලා තිබුණා. ඔබතුමා ගැන මට කනගාටුයි. මොකද, ඔබතුමාගේ ලේකම්තුමා වැටුප් වැඩිවීමක් නිකුත් කළා. ලිඛිතව දුන්නු ඒ වැටුප් වැඩිවීම ක්‍රියාත්මක කරන්නේ නැහැ කියලායි දැන් තිබෙන ගැටුම. අපට ලැබී ඇති ආරංචි මාර්ග අනුව අද සිට නඩත්තු කටයුතුවලට -maintenance- සහ breakdownsවලට සේවකයන් මැදිහත් වෙන්නේ නැහැ. මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ මේ ප්‍රශ්නය විසඳන්න කියලායි. මොකද, හෙට අනිද්දා වෙනකොට වතුර නැතිවෙයි. ඒ වනතුරුද බලාගෙන ඉන්නේ?

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම කාර්මික ආරාවුලක් ඇති වුණු විගසම අපි මැදිහත් වෙලා එය නිරාකරණය කරන්නට කටයුතු කරනවා. මේ කාරණයේ පසුබිම මෙකයි. අවුරුදු තුනකට සැරයක් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වැටුප් වැඩි කිරීමේ ක්‍රමයක් තිබෙනවා. අපි ඒක සිදු කරනවා. අපි අමාත්‍යාංශය භාරගත් දා ඉඳලා මේ වන විට අවුරුදු තුනක් ගතවෙලා තිබෙනවා. 2015දී අපි සියයට 30කින් වැටුප් වැඩි කළා. මේ තුන්වෙනි අවුරුද්ද ඉවර වෙනකොට ව්‍යාත්තීය සංගම් සියයට 23ක වැටුප් වැඩිවීමක් ඉල්ලා සිටියා. අපි ඒ සම්බන්ධයෙන් භාණ්ඩාගාරයත් සමඟ දීර්ඝ සාකච්ඡාවක් කළා, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අරගෙන. ඒ අනුව, සියයට 20ක වැටුප් වැඩිවීමක් පමණයි ලබා දිය හැක්කේ කියලා භාණ්ඩාගාරය කිව්වා. දැන් මේ අය මේ අරගළය ගෙන යන්නේ ඉතිරි සියයට 3ක වැටුප් වැඩි වීම දුන්නේ නැහැයි කියන කාරණය උඩ.

ගරු කථානායකතුමනි, ඒ විතරක් නොවෙයි. මේ කාලය අතරතුරදී වැටුප් විෂමතා ඉවත් කිරීම හේතුවෙන් සෑම තලයකටම අවම වශයෙන් සියයට 10ක පමණ වැටුප් වැඩිවීමක් සිදුවෙලා තිබෙනවා. ඒ අනුව මේ වන විට සියයට 60ක පමණ විශාල වැටුප් වැඩිවීමක් සිදු කරලා තිබියදී, ලබා දීමට නොහැකි සියයට 3ක් වැනි සුළු ප්‍රතිශතයක් සඳහා තමයි මේ කාර්මික ආරාවුල ඇති කරගෙන තිබෙන්නේ. මේ කාර්මික ආරාවුල ඇති කළේ අපට දැනුම් දීලා, සාකච්ඡා කරලා නොවෙයි, එක පාරටමයි. ඊට පසුව අපට වෙන විකල්පයක් නැහැ. අපි මේ ගැන සාකච්ඡා කළා; අදත් සාකච්ඡා කරගෙන යනවා. දිරි දීමනාවක් හැටියට ඒ සියයට 3ක ප්‍රමාණය දිය හැකිද කියලා භාණ්ඩාගාරයත් සමඟ සාකච්ඡා කරලා පිළියමක් ලබා දෙන්නට අපි සූදානම්. [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දැන් ඇමතිතුමා පිළිගන්නවා, ලේකම්තුමා මේ වැටුප් වැඩිවීම කර දෙන බවට ලිපියක් නිකුත් කළ බව, මාස කිහිපයකට කලින්. දැන් ඒක ක්‍රියාත්මක කිරීම ආපස්සට යනවා. ඔබතුමා කිව්වා ඉල්ලා සිටි සියයට 23න් සියයට 20යි දෙන්නේ කියලා.

ගරු ඇමතිතුමනි, පානීය ජලය පාවිච්චි කරන ලක්ෂ ගණනක් මිනිසුන් ගැන හිතලා මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්. භාණ්ඩාගාරය හරහට තියාගෙන මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. හදිසියේවත් මේ සති අන්තයේ ජල සැපයුම නැවතුණොත් මොකද වෙන්නේ?

අද එක පැත්තකින් පළාත් ගණනාවක්ම උණ රෝගයට ගොදුරු වෙලා. ඇයි, ඔබතුමන්ලා මේ ප්‍රශ්නය විසඳන්නේ නැත්තේ?

විදුලිබල මණ්ඩලය, Petroleum Corporation එක, වරාය වැනි ආයතනවලට වඩා අඩුවෙන් තමයි ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වැටුප් ලබන්නේ. අපේ ආණ්ඩුවේ අන්තිම කාලයේ අපි එක පාරක් වැටුප් වැඩි කළා. ඔබතුමාට කියන්නේ මේ ගැටුම ඕනෑකමින් දුරදිග යන්න දෙන්න එපා කියලායි.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
ඒක සම්පූර්ණයෙන් වැරැදියි. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අයට උපරිම පඩිය ලැබෙනවා. ලැබෙන්නේ නැතුව නොවෙයි. වෙලා තිබෙන්නේ මේකයි. Electricity Board එකේ, Petroleum Corporation එක වාගේ ආයතනවල පඩි වැඩිවීමක් කළාම, ඒවාට සමානව මේ අයත් ඉල්ලනවා. ඒවාට සමානව දිය හැකිද, නැද්ද කියන එක පිළිබඳව අපේ මූල්‍ය තත්ත්වය සැලකිල්ලට අරගෙන තමයි පඩි වැඩි කිරීමක් කරන්න පුළුවන්කම තිබෙන්නේ. අපි අවුරුදු හයක් තිස්සේ ජල ගාස්තු සංශෝධනයක් තවම කරලා නැහැ. පාරිභෝගිකයන්ට දරා ගන්න බැහැයි කියලා අපි කිසිම ගාස්තු සංශෝධනයක් කරලාත් නැහැ.

ඒ විතරක් නොවෙයි. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා සියයට 10කින් ජල ගාස්තුව අඩු කළා. එසේ තිබියදී ගාස්තු සංශෝධනයකුත් නොකර, මූල්‍ය තත්ත්වය තවතවත් පිරිහීමට යන කාලයකදී සියයට 3ක් අඩු වුණාය කියලා මෙහෙම කරන එක වැරැදියි. අපි ලබා දුන්නු පොරොන්දු අනුව අපේ ආණ්ඩුව ආවාට පස්සේ වැටුප සියයට 60ක් වැනි ප්‍රතිශතයකින් වැඩි වෙලා තිබෙනවා. මම හිතන හැටියට අපේ රාජ්‍ය ක්ෂේත්‍රයේ මෙවැනි පඩි

වැඩිවීමක් කොහේවත් ලැබිලා නැහැ. එහෙම තිබියදීත් මේ අරගළය ඉතාම අසාධාරණයි. මේක ඉතාම අසාධාරණ ඉල්ලීමක්. මේක අහිංසක පාරිභෝගිකයන් බිල්ලට දෙමින් කරන කේවල් කිරීමක්.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු කථානායකතුමනි, මට පැහැදිලි කිරීමක් කර ගන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අතුරු ප්‍රශ්න දෙක නම් අහලා ඉවරයි. අපි මේ ගැන විවාදයකට නොගිහින් ඉදිමු.

ගරු ඇමතිතුමනි, ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමා පැහැදිලි කිරීමක් ඉල්ලනවා. ඔබතුමාට අවස්ථාව දෙන්න පුළුවන්ද?

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
මේක වැදගත් කාරණයක් නිසා අහන්න ඉඩ දෙන්න.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
ගරු ඇමතිතුමනි, විදුලිබල මණ්ඩලය, තෙල් සංස්ථාව, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය ගත්තාම එක සමාන වැටුප් නොවෙයි තිබෙන්නේ. ඒ, ඒ ශ්‍රේණි අනුව වෙනස්. නමුත් ප්‍රතිපත්තියක් හැටියට අවුරුදු ගණනාවක් තිස්සේ අවුරුදු තුනෙන් තුනට පඩි වැඩි කරන කොට, විදුලිබල මණ්ඩලයට දෙන සියයට ප්‍රමාණයම තෙල් සංස්ථාවට දුන්නා, තෙල් සංස්ථාවට දෙන සියයට ප්‍රමාණයම ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයටත් දුන්නා. එය අඩුවීම හේතුවෙන් තමයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. ප්‍රතිපත්තියක් වශයෙන් පසු ගිය අවුරුදු ගණනාවක ඉඳලා අවුරුදු තුනකට වරක් මේ පඩි වැඩිවීම කළා. තෙල් සංස්ථාවට පඩි වැඩි කළා; විදුලිබල මණ්ඩලයට පඩි වැඩි කළා; ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පඩි වැඩි කළා. ඒ ආයතන තුනම එකට අරගෙන තමයි ඒක ක්‍රියාත්මක කළේ. තමුන්නාන්සේට නිලධාරි මහත්වරුන් ඒක පැහැදිලි කරලා දීලා නැතුවා ඇති. නමුත් මේ අවස්ථාවේදී වුණේ, ඒ වැඩිවීමේ ප්‍රතිශතය ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අඩුවෙන් ලබා දීමයි.

ඒ අය ඉල්ලන්නේ, 'පැරණි ගිවිසුම අනුව එම මුදලම අපටත් දෙන්න' කියලායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, ඒ ගැන අවධානය යොමු කරන්න.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
අනෙක් කාරණය මේකයි ගරු අමාත්‍යතුමනි. මේ "ස්ට්‍රයික්" එක හින්දා මගේ ගෙවල් පාරේ -මගේ ගේ ඉස්සරහා- විශාල පයිප්පයක් කැඩිලා දැන් දවස් හතක් තිස්සේ වතුර ගලාගෙන යනවා; විශාල වශයෙන් වතුර ගලාගෙන යනවා. එය හරිගස්සන්න කිසිම කෙනෙක් නැහැ.

ගරු අමාත්‍යතුමනි, ප්‍රතිපත්තිමය තීන්දුව අනුව ඒ සේවකයන්ගේ පඩි වැඩි කරන්න.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
ප්‍රතිපත්තිමය තීන්දුවක් තමයි. නමුත් වෙලා තිබෙන්නේ මේකයි. ගරු මන්ත්‍රීතුමනි, වෘත්තිය සමිති ක්ෂේත්‍රයේ හොඳ ප්‍රවීණ නායකයකු හැටියට ඔබතුමා මේ කාරණා දන්නවා. ඕනෑම කාර්මික ආරාවුලක් වෙන්න කලින් ඒ පාලන තන්ත්‍රයත් එක්ක යම් සාකච්ඡාවක් කරන්න ඕනෑ. නමුත් සාකච්ඡා නොකර, හිටපු ගමන් ඒ අය එළියට බැස්සා.

ගරු ගාමිණී ලොකුගේ මහතා
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)
අවුරුදු තුනකට වතාවක්- [බාධා කිරීමක්]

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
முல்லைத்தீவு மாவட்டப் பொது வைத்தியசாலையை எடுத்தால், அங்கு 18 வைத்திய நிபுணர்கள் இருக்க வேண்டும். ஆனால், 7 பேர் மட்டுமே நிரந்தரமாக இருக்கிறார்கள்.

[ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා]

අවර්කළින් 5 පේර් Registrar ආක இරුක්කිරාර්කළ්; 2 පේර් acting surgeons ආක இරුක්කිරාර්කළ්. එනවේ, අංකු 11 වෛත්තිය නිපුණර්කළුක්කු වෙට්රිටමුළ්ළතු. අන්ත වෛත්තිය චාලෙකළිල් කට්ටිටංකළෛක් කට්ටි, මරුන්තුකළෛ වළංකික් කොණ්ටිරුප්පතාල් මාත්තිරම් සේවෛකළෛ අතිකරික්ක මුටියාතු. එනවේ, අංකු වෛත්තියර්කළ් නියමික්කප්පට වේණ්ටුම්. අංකුළ්ළ පෙණ්කළුක්කාන තේවෛකළ් නිරෛවේර්ට්රප්පට වේණ්ටුමානාල් මකප්පේර්රු විටයත්තුටන් චම්පන්තප්පට්ට අනෛත්තු ටාක්ටර්කළුම් නියමික්කප්පට වේණ්ටුම්. අතේනේරම් ඉන්ත නාට්ටිල් එත්තනෛ වෛත්තියචාලෙකළිල් තේවෛක්කු අතිකමාක වෛත්තිය නිපුණර්කළ් නියමික්කප් පට්ටිරුක්කිරාර්කළ් එන්පතෛප් පර්රිච් චුකාතාර අමෛච්චර් අවර්කළ් ආරාය්න්තු පාර්ක්ක වේණ්ටුම්.

කිළක්කු මාකාණත්තින් චිල වෛත්තියචාලෙකළිල් තේවෛක්කුම් අතිකමාක වෛත්තිය නිපුණර්කළ් නියමික්කප් පට්ටිරුක්කින්රාර්කළ්. කුරිත්ත අට්ටවණෛයෛප් පාර්ත්තාල් අන්ත විටයත්තෛක් කණ්ටුකොළ්ළලාම්. ඉන්ත ඉටත්තිල් නාන් අවර්කළින් විපරංකළෛ කූර අවර්කළෛ අකෛරවප්පටුත්ත විරුම්පවිල්ලෛ. අතාවතු නීංකළ් Registrar - වෙළිනාට්ටුප් පයිර්චික්කාක කාත්තුක් කොණ්ටිරුක්කුම් ටාක්ටර්කළ්මූලම් එමතු පිරතේච වෛත්තියචාලෙකළෛ නටත්තික්කොණ්ටු, නිරන්තර වෛත්තියර්කළෛ ඒනෙය පිරතේචංකළිල් නියමිත්තුක්කොණ් ටිරුක්කිරීර්කළ්. ඉන්ත නිලෛමෛ මාර වේණ්ටුම්; එමතු මාවට්ටත්තිලුළ්ළ වෛත්තියචාලෙකළුක්කුම් නිරන්තර වෛත්තියර්කළ් නියමික්කප්පට වේණ්ටුම්. Registrar එන්ර category ඉල් උළ්ළවර්කළ් මේලතික පයිර්චික්කාක එන්තනේරමුම් වෙළිනාටු චෙල්ලක් කාත්තුක්කොණ්ටිරුප් පවර්කළ්. ඉතනාල් කුරිත්ත වෛත්තියචාලෙකළිල් එන්ත නේරත්තිලුම් චේවෛක්කු ඉටෛයූරු ඒර්පටුම් එන්පතු එංකළුක්කුත් තෙරින්ත විටයම්. ආනාල්, අතු අන්ත වෛත්තියර්කළින් උරිමෛ. ඉන්ත වකෛයිල් අවර්කළ් තංකළතු පයිර්චික්කුච් චෙල්ලක්කූටාතු එන්රු නාංකළ් අවර්කළෛත් තටුක්කමුටියාතු. එනවේ, චම්පන්තප්පට්ට චුකාතාර අතිකාරිකළ් තංකළතු නිලෛප්පාට්ටෛ මාර්රාතවරෛ, වන්නිප් පිරතේච වෛත්තියචාලෙකළ් අපිවිරුත්තියිල් පාරිය පින්නටෛවෛයේ චන්තික්කුම්.

අතේපෝල්, වට මාකාණ චපෛයින්කීළ් වරුම් උළ්ළක අතිකාරිකළුම් චරියාන මුරෛයිල් චෙයල්පටුවතිල්ලෛ. උතාරණමාක, කුරිත්ත වෛත්තියචාලෛයිල් පතිලුක්කු ඔරු නිරන්තර වෛත්තියර් වරුම්වරෛ චම්පන්තප්පට්ට වෛත්තියරෛ විටුවික්කාමල් වෛත්තිරුක්කලාම් එන්රාල්කූට, පතිලුක්කු වරවේණ්ටියවර් වරාමලේයේ අවරෛ විටුවික්කිරාර්කළ්. අතේනේරම් චුකාතාර අමෛච්චිලිරුන්තු වරුකින්ර අළුත්තමේ ඉතර්කුක් කාරණම් එන්රු චොල්කිරාර්කළ්. ආනාල්, පතවිකළෛත් තක්කවෛත්තුක් කොළ්වතර්කාක ඉවර්කළ් ඉව්වාරු චෙයල්පටුකිරාර්කළෝ එන්රු එණ්ණත් තෝන්රුකින්රතු. එමතු වන්නිප් පිරතේචත්තිල් වෛත්තිය නිපුණර්කළ් පර්රිය විටයත්තිල් මට්ටුමල්ල, එන්තවොරු වෛත්තියචාලෛක්කාන නිර්වාකිකළුම් චුකාතාර අමෛච්චාල් මුරෛප්පටි තෙරිවු චෙය්යප්පටවිල්ලෛ. ඉප්පොළුතුම් කුරිත්ත වෙට්රිටංකළුක්කාන විණ්ණප්පංකළ් call පණ්ණප්පටාමල්, චම්පන්තප්පට්ට විටයම් මුටක්කප්පට්ටුක්කොණ්ටිරුක්කින්රතු. උරිය වෙට්රිටංකළ් චුකාතාර අමෛච්චාල් වෙළිප්පටුත්තප් පටුමාක ඉරුන්තාල්, අතර්කු විණ්ණප්පිත්තු අන්තප් පතවිකළෛප් පෙරුවතර්කුප් පල ටාක්ටර්කළ් තයාරාක ඉරුක්කින්රාර්කළ්.

ඉන්රු වට මාකාණත්තිලුළ්ළ වෛත්තියචාලෛකළිල් මිකවුම් තකුති කුරෛන්ත, අතාවතු junior doctors පොරුප් පතිකාරිකළාක ඉරුන්තුකොණ්ටිරුක්කිරාර්කළ්. ආනාල්, තකුතියුළ්ළවර්කළ් අවර්කළින්කීළ් චේවෛයාට්රි, කෂ්ටප් පට්ටුක් කොණ්ටිරුක්කින්රාර්කළ්. ඉන්ත විටයම් මිකවුම් පිරච්චිනෛක්කුරියතාකුම්. ඉවෛ එල්ලාවර්රුක්කුම් කාරණම් එන්නවෙන්රු ආරාය්න්තු පාර්ත්තාල්, DDG - Medical Services එන්ර පතවියිල් ඉරුක්කුම් ඔරු නපර් ඉන්තච් චුකාතාර අමෛච්චින් චකල චේවෛකළෛයුම් mess up පණ්ණික් කොණ්ටිරුක්කින්රාර් එන්පතු තෙරියවරුකින්රතු එන්පතෛ ඉන්ත ඉටත්තිල් නාන් පකිරංකමාකක් කූරිවෛක්කින්රේන්. එනවේ, කුරිත්ත පතවියිල් ඉරුප්පවර්කළ් තමතු චෙයර් පාටුකළෛච් චරියාතච් චෙය්ය වේණ්ටුම්. චුකාතාර අමෛච්චරුක්කුක් කළංකම් ඒර්පටුත්තක්කූටිය ඉව්වාරාන චෙයර්පාටුකළෛ ඉවර්කළ් නිරුත්තාතවරෛ, වටක්කින් වන්නිප් පිරතේච වෛත්තියචාලෛකළින් චේවෛකළිල් කුරෛපාටුකළ් ඉරුන්තුකොණ්ටිරුක්කුම්. කුරෛපාටුකළ් තොටරුමාක ඉරුන්තාල්, ඉන්ත මකප්පේර්රු නන්මෛකළ් චට්ටත්තින්මූලම් මකප්පේර්රුක්කාකක් කාත්තිරුක්කුම් අම්මාක් කළුක්කු වළංකප්පටුම් වරප්පිරචාතංකළ්කූට ඉල්ලාමල් පෝය්විටුම්.

ඉන්රු උයිරුටන් පිරක්කවේණ්ටිය ඔරු පිළ්ළෛයෛ උයිරිල්ලාමල් පිරචවික්කුම් චම්පවංකළ් අටික්කටි ඉටම් පෙර්රුක්කොණ්ටිරුක්කින්රන. ඔරු කර්ප්පිණිත් තාය් මන්නාරි ලිරුන්තු ඔරු ambulance මූලම් වවුනියා වෛත්තියචාලෛක්කු මාර්රප්පට්ටිරුන්තාර්. අන්තප් පිරචවම් ambulance ඉලේයේ නටන්තතු. ඕර් අම්මා තනතු කුළන්තෛයෛ ඔරු ambulance ඉල් පිරචවික්කින්රාර් එන්රාල්, නාම් එව්වළවුතූරම් චුකාතාර චේවෛයිල් පින්තංකි නිර්කින්රෝම් එන්පතෛච් චින්තිප්පතර්කු ඉන්ත ඔරු නිකළ්වු පෝතාතා? එනවේ, ඕර් අම්මා උයිරුළ්ළ ඔරු පිළ්ළෛයෛප් පෙර්රු, මූන්රු මාත ලීවිල් නින්රු පාලූට්ටප්පෝකින්රාරා? අල්ලතු උයිරර්ර පිළ්ළෛයෛප් පිරචවිත්තු, ආරු කිළමෛකළ් ලීවිල් නින්රු තන්නුටෛය වරප්පිරචාතත්තෛප් පෙර්රුක්කොළ්ළප් පෝකින්රාරා? එන්පතු තාන් ඉංකුළ්ළ කේල්වි. කුරිත්ත කුරෛපාටුකළෛ ඉන්තච් චට්ටමූලංකළ්මූලම් නීක්කිවිට මුටියාතු. එනවේ, එමතු මක්කළුක්කාන චේවෛකළෛ, උරිය අමෛච්චර්කළ් චම්පන්තප් පට්ට අතිකාරිකළෛ නේරටියාකක් කණ්කාණිත්තුච් චෙය්ය වේණ්ටුම්. ඉල්ලෛයේල්, ඉව්වාරාන අතිකාරිකළ් අමෛච්චර්කළින් නර්පෙයර්කළෛයුම් කෙටුත්තුවිටුවාර්කළ් එන්පතෛ ඉන්ත ඉටත්තිල් කූරි, විටෛපෙරුකින්රේන්. නන්රි. වණක්කම්.

[අ.භා. 3.19]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අද දින ඉදිරිපත් වී තිබෙන සූතිකාධාර (සංශෝධන) පනත් කෙටුම්පත බොහොම ප්‍රගතිශීලී පනත් කෙටුම්පතක් බව මුලින්ම කිව යුතුයි.

විශේෂයෙන් ප්‍රසූත නිවාඩු සඳහා දින 84ක් ලබා දීමේ කාරණයේදී පෞද්ගලික අංශයේ සේවකයන් මෙන්ම වතුකරයේ ජනතාවත් ආවරණය වනවා. මම දැනගෙන සිටියේ නැහැ, වතුකරයේ ජනතාවට මීට ප්‍රථම මේ සම අයිතිවාසිකම තිබුණේ නැහැයි කියන එක. නමුත්, අද මේ ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පත හරහා ඒ සම අයිතිය ඒ අයට ලැබෙනවා. ඉස්සර මේ නිවාඩුව ලැබුණේ දරුවන් දෙදෙනකු ලැබීම දක්වා පමණයි. නමුත්, දැන් ඒ සීමාවත් අහෝසි කර තිබෙනවා.

ඊළඟට, තවත් සංශෝධනයක් ගෙනැවිත් තිබෙනවා, යම් සාජ්ජුවක හෝ කාර්යාලයක සේවය කරන ස්ත්‍රියකට වයස අවුරුද්දකට අඩු දරුවකු සිටිනවා නම්, මව් කිරි දීම සඳහා ඇයට අවශ්‍ය පරිදි අවස්ථා දෙකක් සඳහා කාලය ලබා ගන්නට පුළුවන්

වන ආකාරයට. එහිදී, සේවා ස්ථානයේ දාරකාගාරයක් - creche - තිබෙනවා නම් එක වතාවකට පැය භාගයක් සහ creche එකක් නැත්නම් එක වතාවකට පැයක කාලයක් ලබා ගන්න පුළුවන්, තම දරුවාට මව් කිරි ලබා දීම වෙනුවෙන්. මෙවැනි සංශෝධන ගෙන එනවිට ඒක ව්‍යාපාරවලට අවාසිදායකයි කියලා සමහර විට හිතන්න පුළුවන්. නමුත්, ඇත්තටම එහෙම වෙන්නේ නැහැ. අද වන විට කාන්තා ශ්‍රම බලකායේ අඩු වීමක් තිබෙන නමුත්, මේ තුළින් කාන්තා ශ්‍රම බලකාය ඉහළ යයි කියා අපි හිතනවා. මා හිතන විධියට ඒක ආර්ථිකයට හොඳයි. ඒ වාගේම වැඩ කරන මවට මේ තුළින් මානසික සුවයක්, නිදහසක් ලැබෙනවා. දරුවා ගැන නිතර සොයා බලන්නත් ඇයට පුළුවන්.

අනෙක් රටවලත් මේ ක්‍රමය තිබෙනවා. ඒ රටවල අත්දැකීම් දිහා බැලුවොත්, ආසියාවේ, යුරෝපයේ මේ ක්‍රමය බොහොම ධනාත්මක දෙයක් විධියට දකිනවා, ඒ රටවල කාන්තාවන්ගේ සේවයේ ඵලදායිතාව හෝ කාර්යක්ෂමතාවයේ අඩු වීමක් නැති නිසා. ඒ නිසා ඒ රටවල පෞද්ගලික අංශවලට කාන්තා, පුරුෂ භේදයක් නොමැතිව සේවකයන් බඳවා ගන්නවා.

ලංකාවේ අපි වර්තමානයේ මුහුණ දෙන එක ගැටලුවක් තමයි, කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වයේ අඩුවීමක් තිබීම. 2006දී අපේ ශ්‍රම බලකායේ කාන්තාවන් සියයට 46ක් හිටියා. 2010 වනකොට ඒක සියයට 41ට අඩු වෙලා තිබෙනවා. 2016 වන කොට ඒක සියයට 36ට අඩු වෙලා තිබෙනවා. ඒ කියන්නේ, 2006 සිට 2016 දක්වා කාලය තුළ, කාන්තා ශ්‍රම බලකාය මුළු ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් හැටියට සියයට 10කින් අඩු වෙලා තිබෙනවා. දැන් ලංකාවේ කාන්තා ශ්‍රම බලකාය සියයට 36ක් වෙනවා. දකුණු ආසියාවේ සියයට 28යි. ඒ අනුව බලන විට අපේ රටේ ඊට වැඩියි. නමුත්, වෙනත් රටවල් එක්ක සසඳන කොට සෑහෙන අඩුවක් තිබෙනවා කියලා පෙනෙනවා.

අඩු ආදායම් ලබන ජනතාව සිටින දිස්ත්‍රික්කවල ශ්‍රම බලකාය වැඩි වේවි කියලා අදහසක් තිබෙනවා. නමුත්, එහෙම එකක් සිදු වෙලාත් නැහැ. ඒ දිස්ත්‍රික්කවලත් අඩු වීමක් තිබෙනවා. ඒ විතරක් නොවෙයි. විදේශ රටවලට යන ලාංකික කාන්තාවන්ගේ ප්‍රමාණයත් අඩු වෙමින් පවතිනවා. පසුගිය කාලයේ ඒ ප්‍රමාණය සියයට 50කට වැඩිය සිටියා. දැන් සියයට 50කට වඩා අඩුයි.

රජයේ උසස් රැකියාවල වැඩ කරන කාන්තාවන් ගත්තාම, භයට එකක අනුපාතයක අවස්ථාවක් තමයි ඒ අයට ලැබෙන්නේ. ඒ කියන්නේ, යම් තැනෙක පිරිමි අය භයදෙනකු ඉන්නවා නම් කාන්තාවන් ඉන්නේ එක්කෙනකු පමණයි. මධ්‍යම කළමනාකාරිත්වය ගත්තොත්, එය පහට එකක් වැනි අනුපාතයක්. කාන්තාවන් හුඟක් රජයේ සේවයේ වැඩ කරනවා. නමුත්, උසස්වීම්වලදී ඒ කාන්තාවන්ට නිසි තැන ලැබෙනවාය කියලා අපට තවම පෙනෙන්නේ නැහැ.

මේ සම්බන්ධයෙන් ලෝක බැංකුව අධ්‍යයනයක් කළා, 2017දී "Getting to Work : Unlocking Women's Potential in Sri Lanka's Labor Force - 2017" යනුවෙන්. විශේෂයෙන් එහි පෙන්නුම් කෙරෙනවා, කාන්තාවන් ශ්‍රම බලකායට එකතු වීම අඩු වෙලා තිබෙන්නේ, නිවසේ වගකීම් අසමාන ලෙස තිබෙන නිසාය කියලා.

දෙවනුව පෙන්නුම් කරනවා, මානව ප්‍රාග්ධනයේ නොගැළපීමක් තිබෙන බව. අධ්‍යාපනය පැත්තෙන් ගත්තොත්, සාමාන්‍ය පෙළ විභාගයේ ප්‍රතිඵල බැලුවත්, උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල බැලුවත්, විශ්වවිද්‍යාල අධ්‍යාපනයේදී ලබන ප්‍රතිඵල බැලුවත් අද කාන්තාවන් ඉදිරියෙන්ම සිටිනවා. නමුත්, මානව ප්‍රාග්ධනයේ නොගැළපීමක් තිබෙනවාය කියනවා. ඒ කියන්නේ සුදුසු හැකියා නැහැ කියනවා; ආර්ථිකයට ගැළපෙන, ව්‍යවසායකත්වයට ගැළපෙන හැකියා අඩුයි කියලා පෙනෙනවා.

ඊළඟ කාරණය තමයි, ස්ත්‍රී පුරුෂ සමාජභාවය. ඒ පදනම සලකා බැලීමේදී කාන්තාවන්ට නොසැලකීමක් තිබෙනවා. Gender discrimination එකක් තිබෙනවා කියලාත් එම අධ්‍යයනයෙන් පැහැදිලි වනවා. කාන්තා ශ්‍රම බලකායේ සහභාගිත්වය අඩු වීමට වැඩියෙන්ම බලපාන්නේ මේ කරුණු තුන කියලා අපට කියන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කාන්තාවන්ට විතරක් නොවෙයි, පියාටත් ප්‍රසූත නිවාඩු දෙන රටවල් තිබෙනවා. එම යෝජනාව මෙම පනත් කෙටුම්පතට ඇතුළත් වෙලා නැහැ. ඒ නිසා ඒ යෝජනාවත් ඇතුළත් කළොත් හොඳයි. ඩෙන්මාර්කය පියාටත් සති දෙකක ප්‍රසූත නිවාඩුවක් දෙනවා. ඩෙන්මාර්කය අවුරුදු 26ක දීර්ඝ කාලීන study එකක් කරලා තිබෙනවා. එයින් පෙන්වා තිබෙනවා කාන්තාවන්ගේ ආදායමත් ඉහළ යනවා කියලා, පීතෘ නිවාඩු දුන්නාම. ඒ වාගේම දරුවන්ගේ සන්නිවේදන හැකියාව, ගණිතමය හැකියාව ඉහළට යනවාය කියනවා. ඒ නිසා විශේෂයෙන්ම පියාට ප්‍රසූත නිවාඩු ලබා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ අනුව, අද ඉදිරිපත් කර තිබෙන්නේ බොහොම ප්‍රගතිශීලී සංශෝධන බව අපට කියන්න පුළුවන්.

Today, we have brought forward very progressive recommendations on maternity benefits which we are adopting. One is to increase maternity leave - 84 days of leave to the plantation sector as well as to the private sector and also it is not confined to two children. Now there is no limit to the number of confinements that a woman could have for her to get 84 days of leave; the limit of two has been lifted. If there is a stillbirth, there is also an entitlement for leave.

I was just reading an article, yesterday, published by the Sri Lanka Institute of Directors in their "The Director" magazine. I would like to read these points of view of a woman and this is an interview of a woman in that magazine. This is Shiromal Cooray, Managing Director of Jetwing Travels, which is a well-known company and a family-owned business that she inherited. But, she went into a small company and transformed the travel arm of that company. She was also the Chairperson of the Sri Lanka Institute of Directors and also the President of the Sri Lanka Association of Inbound Tour Operators. She is talking about her experiences as a woman and saying actually what are the chances of a woman succeeding. She states, I quote:

> "I believe a woman has to make an extra effort to get somewhere because it is difficult for a woman to be heard. For instance, the woman may say something in the boardroom, but I have my doubts whether the others would listen to her. Even if they hear a woman speak, the rest may not pay attention to what she's saying. I think most men doubt that a woman can add anything worthwhile. So, it takes a while for them to realise that yes indeed she has something useful to say….."

Therefore, she says that a woman has to be a little assertive when she speaks even in the boardroom.

Going on further she states, I quote:

> "Managing work and home for a woman is very difficult unless she has a good support system. In the absence of a support system, the woman upon having children is forced to decide on her future in the work place. I knew very intelligent and capable young women who decided to give up work at the height of their careers. They psychologically feel compelled to make such a decision."

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

So, she is saying that some women who are well qualified are sometimes psychologically compelled, when they have children, to leave their workplace. So, one of the problems that Sri Lanka is facing presently is, though we have very high achievement levels for women in this country, they are not getting into the work force in the country.

She states, I again quote:

"It's a choice that a woman must make. The good thing is that a woman has a choice, whereas a man has to go to work to support the family. Nevertheless, I strongly believe that a woman should be given the opportunity to work."

Finally, I would like to quote this from her, because she is answering this question:

"Do you think employers also feel that women may give up after marriage and motherhood?"

She states, I quote:

"It's possible. I feel women need to speak with their managers about their future plans and the fact that they still want to work. On the other hand, I think the management gets the idea about what you want to be by the way you work. We need to educate the men and the partners; to feel that it's alright for the daughter to work late and the husbands to feel that it's alright for a woman to work and support the family. There is a lot of change to be done from a very young age. When I was pregnant my mom said that she wished for a boy. When I asked her why, she said that it was very hard being a woman. At that time I was young and didn't really understand what she meant. But today I know that it's indeed hard being a woman. However, broadminded your parents and husband may be, out there it's different. Every task in the family is on the woman, from entertaining to organising a party, while doing the same job as man."

She really talks about what the study brings out that the household roles and responsibilities, where men should take on more responsibilities, and also the fact that there is gender discrimination basically in Sri Lanka and that there has to be an attitudinal change.

So, the law itself will not change everything. Therefore, I am supporting the changes and the Amendments very strongly. But ultimately, if we are to change, it has to be an attitudinal change where we support women more strongly, so that they will contribute in the workforce and in the economy and will become equal partners in Sri Lanka's development.

Thank you.

[අ.භා. 3.31]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සූතිකාධාර (සංශෝධන) පනත් කෙටුම්පත සහ කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව කථා කිරීමට කලින්, මේ කාරණය පිළිබඳව මා සඳහන් කරන්නට ඕනෑ. මේ සම්බන්ධයෙන් උත්තරයක් දෙන්න ගරු රවුෆ් හකීම් ඇමතිවරයා මේ අවස්ථාවේ සභාවේ සිටියා නම් හොඳයි. එතුමා සඳහන් කළා, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවකයන් විරෝධතා පා ගමනේ යෙදෙන්නට කලින්, එම කාරණාව පිළිබඳව දැනුම් දුන්නේ නැහැ; කිසි සාකච්ඡාවක් කළේ නැහැ කියලා. නමුත්, මීට කලින් හතර වතාවක් ඒ අය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සභාපතිවරයා සහ සාමාන්‍යාධිකාරිවරයාත් සමඟ සාකච්ඡා කරලා තිබුණා. එම සාකච්ඡා අසාර්ථකයි. ඒ වාගේම මීට මොහොතකට කලිනුත් ඔවුන් අමාත්‍යාංශය විසින් කැඳවන ලද සාකච්ඡාවකට ගියා. නමුත් අමාත්‍යවරයා නැහැ, සභාපතිවරයාත් එක්ක සාකච්ඡා කළා. ඒ සාකච්ඡාවත් අසාර්ථකයි. එම සේවකයන් සාකච්ඡා, ඉල්ලීම් රාශියක් කරලා තමයි අවසානයේ මේ තීරණය ගෙන තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින පැවැත්වෙන විවාදයට අදාළව මා කථා කරනවා නම්, 1939 අංක 32 දරන ප්‍රසූතිකාධාර ආඥා පනතත්, 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනතත් තමයි අපි අද සංශෝධනය කරන්න යන්නේ. එයට සෑහෙන කාලයක් ගත වෙලා තිබෙනවා. ලෝකයේ රටවල් කාන්තා සේවිකාවන්ට ප්‍රසූත නිවාඩු, ප්‍රසූත වැටුප් ලබා දීම සම්බන්ධයෙන් ඉදිරිගාමී, ප්‍රගතිශීලී පියවර රාශියක් අනුගමනය කරලා දශක ගණනාවක් ගත වෙලා තිබියදී, ප්‍රමාද වී හෝ මෙවැනි සංශෝධනයක් ගෙන ඒම පිළිබඳව අප සතුටු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මීට මාස 7කට කලින් එවකට කම්කරු අමාත්‍යවරයා වූ ජෝන් සෙනෙවිරත්න මැතිතුමාගේ අවධානයට මා යොමු කළ ප්‍රශ්නයක් පිළිබඳව මම කියන්නම්. පෞද්ගලික ආයතනයක සේවය කරපු ඉංජිනේරුවරියක් ඇයගේ තුන්වන දරු ප්‍රසූතිය සඳහා නිවාඩු ලබා ගන්න ගිය වෙලාවේ ඇය ප්‍රසූත නිවාඩු සම්බන්ධ දුෂ්කරතාවකට මුහුණ දුන්නා. ඇය ඒ පිළිබඳව මට දැනුම් දුන්නා. මා එවකට සිටි අදාළ ඇමතිවරයාගෙන් මේ පිළිබඳව විමසුවාට පසුව ඇමතිවරයා කිව්වා, "තුන්වන දරුවා සඳහා එහෙම නිවාඩු ලබා දෙන්නට අපේ නීතියේ ප්‍රතිපාදන නැහැ" කියලා. ඒ නිසා සිදු වෙච්ච දේ තමයි, රටේ ජනතාවගේ බදු මුදල්වලින් අධ්‍යාපනය ලබලා, විශ්වවිද්‍යාලයට ගිහිල්ලා උපාධියක් ලබා ගත් ඇයට තමන්ගේ තුන්වන දරුවා නිසා රැකියාව අතහැරලා ගෙදර යන්න සිදු වුණු එක. අපේ රටේ ආර්ථිකයටද බලපාන මෙවැනි අවාසනාවන්ත සිදුවීම් රාශියක් සිද්ධ වුණාට පස්සේ තමයි අද අපි මේ පියවර ගන්නට යන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කෙසේ වෙතත් මෙය අපේ රටේ ආර්ථිකය සහ මානෘත්වය සම්බන්ධ කාරණයක්. අපේ රටේ ආර්ථිකය ගොඩනැඟීමේ දී අපේ රටේ ආදායම් උපදවන ප්‍රධාන ක්ෂේත්‍රවල බහුතරයක් සිටින්නේ කාන්තාවන්. මැද පෙරදිග රැකියාවල නිරත වන ශ්‍රමිකයන් වාගේම, ඇඟලුම් ක්ෂේත්‍රයට හා තේ නිෂ්පාදනයට වැඩිම දායකත්වයක් සපයන්නේත් කාන්තාවන්.

එසේ තිබියදී, එම සේවිකාවන් සම්බන්ධයෙන් අපි ලබා දී තිබෙන ප්‍රතිපාදන, ඔවුන්ට සලසා තිබෙන පහසුකම් පිළිබඳව අප කාටවත් සතුටු වෙන්න පුළුවන්කමක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ සෞඛ්‍ය දර්ශක පිළිබඳව අපි අද අගය කිරීමට ලක් කරනවා. අපි කවුරුත් දන්නවා, ආසියානු කලාපයට සාපේක්ෂව අපේ සෞඛ්‍ය දර්ශක හොඳයි කියලා. නමුත් අපේ සංඛ්‍යා ලේඛන ගෙන බැලුවොත්, අපේ රට පුරා ව්‍යාප්ත වුණු සෞඛ්‍ය ජාලයක් තිබියදී, වෛද්‍යවරුන් ඇතුළු සෞඛ්‍ය කාර්ය මණ්ඩලයක් සිටියදී පවා බර අඩු දරු උපත් ප්‍රතිශතය සියයට 18ක් කියලා අදත් අපේ සෞඛ්‍ය දර්ශකවල වාර්තා වනවා. ඒ වාගේම දරුවන් අතර උසට සරිලන බර, වයසට සරිලන බර, වයසට සරිලන උස නැතිවීම වැනි සාධක ගත්තොත්, අපේ තිබෙන ප්‍රශස්ත සෞඛ්‍ය මට්ටමට නොගැළපෙන සෞඛ්‍ය දර්ශක තමයි පෙන්නුම් කරමින් තිබෙන්නේ. කාන්තාවන්ට වැටුප්

සහිත ප්‍රසූත නිවාඩු ලබා නොදීම සම්බන්ධ ප්‍රශ්නය එයට ඍජුවම ගැට ගැහිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හාවර්ඩ් විශ්වවිද්‍යාලය විසින් කරන ලද සමීක්ෂණයක තොරතුරු මා ඔබතුමන්ලාට ඉදිරිපත් කරන්නම්. එම සමීක්ෂණය තුළින් ඔවුන් සොයාගෙන තිබෙනවා; ඔවුන් වාර්තා කරනවා, වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබාදීම ඉහළ යනකොට ළදරු මරණ අනුපාතිකය සාපේක්ෂව පහළ දමන්නට පුළුවන් බව. උදාහරණයක් හැටියට, සති 10ක ප්‍රසූත නිවාඩු ලබා දෙනවා නම් ළදරු මරණ අනුපාතිකය සියයට එකත්, සියයට දෙකත් අතර ප්‍රමාණයකින් පහළ දමන්නට පුළුවන් බවත්, සති 20ක ප්‍රසූත නිවාඩු ලබා දෙනවා නම් ළදරු මරණ අනුපාතිකය සියයට දෙකත්, සියයට හතරත් අතර ප්‍රමාණයකින් පහළ දමන්නට පුළුවන් බවත්, සති 30ක ප්‍රසූත නිවාඩු ලබා දෙනවා නම් ළදරු මරණ අනුපාතිකය සියයට හතත්, සියයට නවයත් අතර ප්‍රමාණයකින් පහළ දමන්නට පුළුවන් බවත් ඔවුන් සමීක්ෂණ ඇසුරින් සොයාගෙන තිබෙනවා. මේ නිසා ළදරු මරණ අනුපාතිකය සහ වැටුප් සහිත ප්‍රසූත නිවාඩු අතර සම්බන්ධයක් තිබෙන බව සොයාගෙන තිබෙනවා.

ආර්ථික සංවර්ධනය අතින් ලෝකයේ ඉහළින්ම සිටින, දළ ජාතික නිෂ්පාදිතයෙන්, විද්‍යා තාක්ෂණයෙන්, මේ සියල්ලෙන්ම ඉහළින් සිටින ඇමෙරිකා එක්සත් ජනපදය වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබා දෙන්නේ නැහැ. ඒ නිසාම ආර්ථිකයේ ඉහළම දර්ශක පෙන්නුම් කරන ඇමෙරිකා එක්සත් ජනපදය 2014 දීත් ළදරු මරණ අනුපාතිකය අනුව සිටින්නේ ලෝකයේ 56වන ස්ථානයේයි. ඔවුන්ගේ සජීවී උපත් 1,000කට ළදරු මරණ සියයට 6.17ක් වාර්තා වනවා. එයින් පෙන්නුම් කරන්නේ අන් කිසිවක් නොවෙයි. ආර්ථික සංවර්ධනය කොපමණ ඉහළ ගියත්, වැටුප් සහිත ප්‍රසූත නිවාඩු මාතෘත්වයට ඍජුවම බලපාන බවයි. යම්කිසි කාලයක් සඳහා වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබා නොදුන්නොත්, එය ළදරු මරණ අනුපාතිකය වැඩි වීමට බලපානවා කියන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දින 84ක ප්‍රසූති නිවාඩු ලබා දීමේ දී, එයින් සති දෙකක් ප්‍රසූතියට පෙර ලබා දීම අතිශය වැදගත් වනවා. මොකද, ප්‍රසූතියට පෙර ලබාදෙන නිවාඩු සහ ළදරුවන්ගේ උපතේදී බර අතර සම්බන්ධයක් තිබෙනවා. ප්‍රසූතියට පෙර නිවාඩු ලබා නොදෙන රටවල අඩු බර දරු උපත් විශාල වශයෙන් වාර්තා වෙනවා. ඒ නිසාම, මෙය ප්‍රමාද වී හෝ ක්‍රියාත්මක කිරීම අපි රටක් හැටියට ලබාගත් ජයග්‍රහණයක් කියා මම හිතනවා. අපි දැන් සෑහෙන්න ප්‍රමාද වෙලා නිසා; ලෝකය අපට වඩා වේගයෙන් ඉදිරියට ගිහින් නිසා මෙම නිවාඩු සීමාවන් සහ වැටුප් ලබාදෙන සීමාවන් ඉහළ දැමිය යුතුයි කියාත් අපි යෝජනා කරනවා. ඒ සඳහා මම උදාහරණයක් කියන්නම්. මේ වන විට කියුබාව උපතට පෙර සති 6කුත්, උපතින් පසු සති 12කුත් වශයෙන් සති 18ක ප්‍රසූත නිවාඩු ලබාදෙනවා. කියුබාව කියන්නේ, සියයට 100ක් වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබාදෙන රටක්. එම නිසා ජනතාව ගැන හිතන, ජනතාවගේ සුබසාධනය ගැන අවධානය යොමු කරන රටවල්, රාජ්‍යයන්, ආණ්ඩු වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබාදීම පිළිබඳව විශේෂ අවධානයක් යොමු කර තිබෙන බව මා කියන්න කැමැතියි.

මම කලින් කිව්වා වාගේම, සූතිකාධාර (සංශෝධන) පනත් කෙටුම්පත ප්‍රමාද වී හෝ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව අපි අගය කරන අතරේ ඒ සඳහා යම් එකතු කිරීමකුත් කරන්න කැමතියි. ලෝකයේ බොහෝ ආණ්ඩු මව්වරුන්ට වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබාදීම ක්‍රියාත්මක කරගෙන යනවා. අපි එතැනින් එහාට ගිහිල්ලා බලනවා නම්, ලෝකයේ පවතින සංවාදය තමයි මානුෂිකව සහ ශාරීරිකව නිරෝගී දරුවෙක්, නිරෝගී පවුලක් බිහි කර ගන්න නම් මවට පමණක් නිවාඩු දීලා ප්‍රමාණවත් නැහැ කියන එක. ලෝකයේ ආණ්ඩු විසින් පීතෘ නිවාඩුත් අනුමත කරගෙන යනවා. අඩු තරමේ අපේ රටෙත් අත්හදා බැලීමක් හැටියට හෝ අපට කර ගන්නට පුළුවන් නම් -සති තුනක් හෝ හතරකට එවැනි වැටුප් සහිත පීතෘ නිවාඩුත් ලබා දෙන්න පුළුවන් නම්- මව සහ පියා අතරත්, ඒ පවුල අතරත් තිබෙන බන්ධනය ශක්තිමත් කරන්න පුළුවන්. ඒක අනාගතයේ ශක්තිමත් දරුවෙක් බිහි කර ගන්න, හොඳ පුරවැසියෙක් බිහි කර ගන්න දායක වේවි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙය කම්කරු අමාත්‍යාංශයට සම්බන්ධ විෂයයක් නිසා විශේෂයෙන්ම මේ වෙලාවේ මෙතැනින් එහාට ගිහින් මම තවත් කරුණක් අවධානයට යොමු කරන්න කැමැතියි. ආණ්ඩුව දැන් නැවත වතාවක් සේවක අර්ථසාධක අරමුදලට අත තියලා, එය කොල්ල කන්න වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. සේවක අර්ථසාධක අරමුදලේ රුපියල් බිලියන 2,000කට ආසන්න මුදලක් තිබෙනවා. එක එක දහම් ගැට ගහලා, ජනතාව මත බදු පිට බදු පටවලා, බදු ෆයිල් විවෘත කරලා සාමාන්‍යයෙන් ආණ්ඩුවට හොයාගන්න පුළුවන් වන්නේ අවුරුද්දකට රුපියල් බිලියන 2,500කට වඩා අඩු මුදලක්. හැබැයි, සේවක අර්ථසාධක අරමුදලේ රුපියල් බිලියන 2,000ක් තිබෙනවා. කොයි ආණ්ඩුවත් කෙළ හලමින් ඉන්නේ මෙන්න මේ EPF එකෙන් කොටසක් සූරාගන්නේ කොහොමද කියන එකටයි. EPF අරමුදල ආයෝජනය කරලා, එදිනෙදා තාක්ෂණික වියදම් අත හැරියාට පසු 2017 අවුරුද්දේ ආණ්ඩුව ලැබූ පොලී ආදායම විතරක් රුපියල් බිලියන 215ක් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමන්ලා වාඩිවෙන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
එහෙම තිබියදී, ආසියානු සංවර්ධන අරමුදලේ නියෝග සහ උපදෙස් අනුව EPF එකේ මුදල්වලින් වැඩි ප්‍රතිශතයක් කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කරන්න ආණ්ඩුව සාකච්ඡා කරනවා. ඒ සඳහා ADB එකෙන් ආණ්ඩුවට රුපියල් මිලියන 250ක් ලැබෙන්න නියමිතයි. 2016දී තමයි මෙම ව්‍යාපෘතිය ආරම්භ කළේ. ඒ අනුව, රාජ්‍ය ආයතන කොටස් වෙළෙඳ පොළට දමන්නත්, ඒ වාගේම EPF අරමුදල ප්‍රාග්ධන වෙළෙඳ පොළේ ආයෝජනය කරන්නත් ADB එකෙන් යෝජනා කරනවා. මීට කලිනුත් -පසු ගිය ආණ්ඩුවත්- මේ වැඩේ කළා. EPF අරමුදලින් සියයට 4ක් කොටස් වෙළෙඳ පොළට දැම්මා. 2008 සිට 2012 දක්වා වූ අවුරුදු හතරේ EPF මුදල්වලින් සියයට 4ක් කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කිරීම නිසා -ඒ කාලයේ සියයට 4යි ආයෝජනය කරන්න පුළුවන්.- රුපියල් කෝටි 2,800ක පාඩුවක් ලැබුවා. සියයට 4ක් කොටස් වෙළෙඳ පොළේ ආයෝජනය කරනකොට සියයට 96ක්ම ආයෝජනය කරන්නේ භාණ්ඩාගාර බැඳුම්කර සහ බිල්පත්වලයි. අද අපි සාකච්ඡා කරන ඇලෝසියස්ගේ මුදල් ගනු දෙනුවට -මහ බැංකුවේ මහා මුදල් වංචාවට- යෙදවුණෙත් EPF එකේ මුදල්. සේවකයන් තමන්ගේ සේවා කාලය තුළදී දායකත්වය ලබාදෙන EPF එකේ මුදල් සියයට 4න් එහාට ගිහින්, සියයට 8, සියයට 10 දක්වා කොටස් වෙළෙඳ පෙළේ ආයෝජනය කරන්න ආසියානු සංවර්ධන බැංකුවේ උපදෙස් මත ආණ්ඩුව කටයුතු කරමින් යනවා. එය වහාම නතර කළ යුතුයි. එහෙම නැත්නම් වෙන්නේ, බැඳුම්කර මගඩියේදී සිද්ධ වුණා වගේම නැවත වතාවක් මේ රටේ සේවක අර්ථසාධක අරමුදල් විනාශ වන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය මෙම රුපියල් බිලියන 2,000 කෙසේ හෝ ගන්න මෙතරම් පරිශ්‍රමයක් දරන්නේ ඇයි කියා අපට තේරුම් ගන්න පුළුවන්. මොකද, 2015දී EPF

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

එකේ මුදල් මහ බැංකුවේ ආයෝජනය කරලා ඒ හරහා බැදුම්කර වංචාව සිද්ධ වෙනකොට, 2015 පෙබරවාරි සිට 2016 මාර්තු 31 දක්වා EPF එකට වුණු පාඩුව විතරක් රුපියල් මිලියන 8,500ක් වෙනවා.

මේ සම්බන්ධයෙන් උත්තර දෙන්න පුළුවන් ඇමතිවරයකු මේ අවස්ථාවේදී මේ සභාවේ නැති එක ගැන මා කනගාටු වනවා. මේ අවස්ථාවේදී කම්කරු විෂයය භාර ඇමතිවරයාත් මේ සභාවේ නැහැ; ඒ විෂයය භාර ඇමතිවරයා නැහැ කියා වැඩ බලන්න දමපු ඇමතිවරයාත් මේ සභාවේ නැහැ; ආණ්ඩුව වෙනුවෙන් වග කිව යුතු වෙනත් කිසිවෙකුත් නැහැ.

2016 අප්‍රේල් සිට සැප්තැම්බර් වන තෙක් ඒ ලාභය ගිය Perpetual Treasuries Limited එක රුපියල් මිලියන 6,814ක ලාභයක් හෙව්වා. ඒ රුපියල් මිලියන 6,814, EPF එකේ අපේ සල්ලියි.

පසුගිය දිනවල ජනාධිපතිතුමා කිව්වා නේ, "ඡන්දය කාලයේ මම කඩුව අතට අරගෙන කඩුව වනනවා" කියලා. ඒ වාගේම සෝභිත හාමුදුරුවන්ගේ ගුණ සමරුවට ගිහිල්ලාත් ජනාධිපතිතුමා මහා ආන්දෝලනාත්මක ප්‍රකාශයක් කරමින් කිව්වා, "මේ සම්බන්ධයෙන් තොරතුරු මගේ ළඟ තිබෙනවා, ඒවා හෙළිදරව් කරන්න අපි ඕනෑම කෙනෙකුට සාකච්ඡා දෙන්න ලෑස්තියි" කියලා. ඒ අනුව, "EPF එකේ සල්ලිවලට මොකක්ද වුණේ කියලා පැහැදිලිව කියන්නම්, සාකච්ඡාවක් දෙන්න" කියා 'දූෂණ විරෝධී හඬ සංවිධානය' එතුමාගෙන් සාකච්ඡාවක් ඉල්ලා තිබෙනවා. එතුමා ඒ කියපු ආකාරයට සාකච්ඡාවක් ලබාදෙයි කියා අපි බලාපොරොත්තු වනවා. මේ රටට සේවය කරමින් සිටින ජනතාවට අයිති මුදල් හිතූ හිතූ විධියට නිස්කාරණේ වියදම් කරන්න ආණ්ඩුවට ඉඩ දෙන්න බැහැ. ආසියානු සංවර්ධන බැංකුවෙන් ලබාදෙන මේ ඩොලර් මිලියන 250ක් වෙනුවෙන් EPF එකේ මුදල් කොටස් වෙළෙඳ පොළට දමා ඒ අරමුදල විනාශ කරන්න මේ ආණ්ඩුව හදන සැලැස්ම, කුමන්ත්‍රණය පිළිබඳව මා අහන ප්‍රශ්නයට කවුරු හෝ ඇමතිවරයකු ඇවිත් උත්තරයක් දෙයි කියා මම බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ඊළඟට අහන්න යන ප්‍රශ්නය ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමාත් මතු කළා. බැදුම්කර මගඩියෙන් ඇලෝසියස් උපයා ගත් මුදල්වලින් කොටසක් ගත්තේ කවුද කියන එක පිළිබඳව දැන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට පාරේ බැහැලා යන්න බැරි විධියට මාධ්‍ය හරහාත්, ජනතාව තුළත් මහා සාකච්ඡාවක් පැන නැඟිලා තිබෙනවා. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා කිව්වා, 118ක කථාවක්. ඒ 118ත් පදනම් කර ගෙන, එම සංඛ්‍යාව තවත් වැඩි වෙලා දැන් මේ මුදල් කවුද ගත්තේ, කවුද නොගත්තේ කියන එක පිළිබඳව හාහූවක් ගිහින් තිබෙනවා. ඒ නිසාම තමයි, ඊයේත් පාර්ලිමේන්තුවේදී මන්ත්‍රීවරු කිහිපදෙනෙකුම නැඟිටලා ඉල්ලා සිටියේ ඒ නම් වහාම හෙළිදරව් කරන්න කියලා. මුදල් ගත් අයත්, නොගත් අයත් කලවම් වෙලා නොගත්ත මිනිසුන්ගේ ආත්ම ගරුත්වයත් නැතිවෙන ආකාරයට දැන් මේ හාහූව පැතිරී යන්න පටන්ගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේකේ තිබෙන වැඩේ තමයි, ඇලෝසියස්ගෙන් මේ මුදල් අරගෙන පසුගිය කාලයේ දේශපාලනය කරපු අය තමන්ට ඒ චෝදනා ආවාට පස්සේ ඒවා අනිත් අය පිටිනුත් යවන්න අලුත් ව්‍යාපාරයක් ආරම්භ කර තිබීම. සාමාන්‍යයෙන් අසූචි වළේ ලගින ඌරාගේ ස්වභාවය තමයි, තමන් ඇඟේ අසූචි ගා ගත්තාට පස්සේ වටේ තිබෙන තාප්පවලයි, බිත්තිවලයි උල-උලා යන එක. ඒ වාගේ ඒ මුදල් වියදම් කරලා websites පවත්වාගෙන යන සමහර හිටපු ඇමතිවරු, ඒ අයට මඩ ගහන්න ඕනෑ අයගේ -තමන්ගේ විරුද්ධවාදීන්ගේ- නාම ලේඛන ඒ websitesවල ප්‍රසිද්ධ කරනවා, "මෙන්න 118 කොටසක්, මෙන්න 166 කොටසක්" කියලා. මේ පාර්ලිමේන්තුවේ ගරුත්වය ආරක්ෂා කරන්න නම්, ජනතා පරමාධිපත්‍යය ආරක්ෂා කරන්න නම්, මේ චෝදනා ලබපු අය වහාම හෙළිදරව් කරලා ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කඩිනමින් ඉදිරිපත් කරන්න කියා අපි කියනවා. එහෙම නැත්නම්, මේ කාරණා සමාජයේ නිකම් ඔහේ කැරකි-කැරකී තිබෙන්න පටන් ගැනීම මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට, දේශපාලනයට සහ ජනතා පරමාධිපත්‍යයට බරපතළ හානියක් සිද්ධ කරනවා.

ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 6දෙනා වෙනුවෙන් මම බොහොම පැහැදිලිව මේ දේ කියන්න කැමැතියි. අපි ඇලෝසියස්ට calls අරගෙනත් නැහැ; අපට ආ call එකකුත් නැහැ; අපි ගත් මුදලකුත් නැහැ. පසුගිය කාලයේ ඉදිරිපත් වුණු CID reportsවලිනුත් එය පැහැදිලි වනවා. COPE එක නියෝජනය කළ අපේ මන්ත්‍රීවරුන්ට කිසිම ඇමතුමක් ලැබුණේත් නැහැ, අපි කිසිම කෙනෙකු, කිසිම ඇමතුමක් ගත්තේත් නැති බව ඒ වාර්තාවලින් හෙළිදරව් වෙලා තිබෙනවා; වාර්තා වෙලා තිබෙනවා. එම නිසා අපි ඇලෝසියස්ලාට චෝදනා එල්ල කරන්නේ අපේ දැත් පිරිසිදුව තබාගෙනයි. ඒ වාගේම අපට කොන්ද කෙළින් තියාගෙන මේ චෝදනා ඉදිරිපත් කරන්න පුළුවන්කම ලැබී තිබෙන්නේ අපි ඒ අයත් එක්ක කිසිම සම්බන්ධයක් නැති නිසායි. නමුත්, මේවාට චෝදනා ලැබ මඩ ගා ගත් අය සමහර websites පාවිච්චි කරලා මේ සම්බන්ධයෙන් මඩ ව්‍යාපාරයකුත් ගෙන යන බව ඔබතුමාට මතක් කරන්න කැමැතියි.

බැදුම්කර මගඩිය වාගේ දේවල් නැවත වතාවක් සිදු වෙලා මේ රටේ වැඩ කරන ජනතාවගේ සේවක අර්ථ සාධක අරමුදල් නැවත කොල්ල කන්න ආණ්ඩුව හදන සැලසුම් පරාජයට පත් කර ගන්න එක අපි කාගේත් වගකීමක් බවට පත් වෙනවා. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානයට යොමු කරමින් මම නතර වෙනවා. බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තූතියි. මීළඟට, ජෝන් සෙනෙවිරත්න මහතා.

[අ.භා.3.49]

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්තවශයෙන්ම කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත ගැන වචන කිහිපයක් කථා කරන්න ලැබීම ගැන මම සතුටු වනවා. මොකද, මෙම පනත් කෙටුම්පත සකස් කිරීමේදී -පසුගිය දවස්වල කම්කරු ඇමතිවරයා වශයෙන් කටයුතු කරද්දි- මම විශාල උනන්දුවක්, මහන්සියක් ගත්තා. එයට ප්‍රධාන හේතුව තමයි මේ විධියේ සංශෝධන අවශ්‍යයි කියලා දීර්ඝ කාලයක් වෘත්තීය සමිති සහ අනෙකුත් සංවිධාන ඉල්ලා සිටියා. එහෙම ඉල්ලන්න හේතුව වුණේ, මේ නීතිවල එහෙම නැත්නම් මේ පනත්වල යම් යම් වෙනස්කම් ඒ වාගේම පරස්පර විරෝධයන් තිබුණ නිසයි. සමහර අයට යම් කිසි ප්‍රමාණයකට සාධාරණයක් වෙනකොට තවත් කොටසකට සාධාරණයක් වුණේ නැහැ. ඒ අයට අසාධාරණයක් තුළ තමයි කටයුතු කරන්න සිදු වුණේ. දැන් මෙම ගරු සභාවේදී පනත් කෙටුම්පත් දෙකක් සංශෝධනය කරන්න බලාපොරොත්තු

වෙනවා. පළමුවෙනි එක තමයි, කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා චේතන විධිමත් කිරීමේ) පනත සංශෝධනය. දෙවැනි එක තමයි, සූතිකාධාර පනත සංශෝධනය.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පළමුව සූතිකාධාර පනත ගත්තොත් ඇත්තවශයෙන්ම මෙය පැරණි පනතක්. 1939 වසරේ සිට ක්‍රියාත්මක වෙන පනතක්. මෙම පනත යටතේ ආවරණය වුණේ වතුවල, කර්මාන්තශාලා වැනි ආයතනවල වැඩ කරන කම්කරුවනුයි. වැඩ කරන කම්කරුවන්ට එහෙම නැත්නම් සාප්පු සහ කාර්යාලවල වැඩ කරන කම්කරුවන්ට හිමි යම් යම් අයිතිවාසිකම් අහිමි වෙලා තිබුණා. ඒ අයට ලැබෙන නිවාඩු ප්‍රමාණය අඩු වෙලා තිබුණා. ඒ අයට ලැබුණේ ප්‍රසූතියට පෙරාතුව සති දෙකක නිවාඩුවක්. ඒ වාගේම ප්‍රසූතියෙන් පසුව සති හතරක නිවාඩුවක්. මේ විධියට ඒ අයට දවස් හතළිස් දෙකක නිවාඩුවක් පමණයි ලැබුණේ. නමුත් සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ -Shop and Office Employees Act- මේ ප්‍රමාණය මීට වඩා වැඩියි. එකක් තමයි ඒ අයට ප්‍රසූතියට පෙරාතුව සති දෙකක නිවාඩුවක් ලැබුණා. ඊළඟට දින 70ක්-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. Edward Gunasekara to the Chair?

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)
I propose that the Hon. Edward Gunasekara do now take the Chair.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. EDWARD GUNASEKARA *took the Chair.*

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පසුව ඒ ගොල්ලන්ට දින 70ක නිවාඩුවක් ලැබුණා. මේ අනුව දින 84ක නිවාඩුවක් සාප්පු හා කාර්යාල සේවක පනත යටතේ ආවරණය වන කාන්තා සේවිකාවන්ට ලැබුණා. පවතින විෂමතාව නැති කරන්න, ඒ වෙනස නැති කරන්න තමයි මේ සංශෝධන ගෙනාවේ. මේ සංශෝධන ගෙන ඒමේදී පමාවීමක් සිදු වුණාය කියලා මම කිව්වා. පමා වෙන්න සිද්ධ වුණේ, ඇත්ත වශයෙන්ම යම් යම් අත්‍යවශ්‍ය අංශයන් සම්බන්ධව විසඳුම් සොයන්නට අපට සිද්ධ වුණු නිසයි. කෙසේ නමුත්, මේක නීතිගත කරලා සියලුම අංශවල වැඩ කරන කාන්තා සේවිකාවන්ට එක හා සමානව ප්‍රසූත නිවාඩු ලබා දෙන්නත්, ඒ අයට චේතන ලබා දෙන්නත් අපි බලාපොරොත්තු වෙනවා. මෙතැනදී තවත් සංශෝධනයක් ඇතුළත් වෙලා තිබෙනවා. සමහර වතුවල, ඒ වාගේම කර්මාන්තශාලාවල crèche හදලා ඒ දරුවන්ට පැය 10කට විතර වරක් කිරි දෙන්න ඒ මව්වරුන්ට අවස්ථාව ලැබිලා තිබෙනවා. ඒ සඳහා crèche හදලා ඒ අයට අවශ්‍ය පහසුකම් සපයා දෙන්න වතුවල නැත්නම් කර්මාන්තශාලාවල හාමිපුතුන් බැඳිලා සිටිනවා. නමුත්, සාප්පු සහ කාර්යාලවල ඒ විධිවිධානය ඇත්තේ නැහැ. ඒ නිසා මේක සංශෝධනයක් මඟින් ගෙන එන්නට බලාපොරොත්තු වෙනවා. දරුවෙක් බිහි කිරීමෙන් පස්සේ දින 42ක් නිවාඩු ලබපු මව්වරුන්ට මේ අනුව දින 84ක නිවාඩුවක් ලැබෙනවා. ඒ වාගේම, තවත් වැදගත්ම කාරණයක් තිබෙනවා. Shop and Office Employees Act එක යටතේ ළමයි දෙදෙනෙකුට පමණයි දින 84ක නිවාඩුවක් ලැබුණේ. නමුත්, ඒකත් දැන් වෙනස් කරලා තිබෙනවා. ළමයි කී දෙනෙක් වුණත්, ඒ අයට දින 84ක නිවාඩුව ලැබෙනවා. සෑම කෙනෙකුටම ඒ නිවාඩුව වාගේම ඒ නිවාඩුව පදනම් කරගෙන චේතනත් ලැබෙනවා. ඒ නිසා මෙතෙක් කල් අපේ වැඩ කරන ජනතාව වෙනුවෙන් කටයුතු කරන ව්‍යක්තීය සමීති, අනෙකුත් සංවිධාන ගෙන ගිය ඉල්ලීම සාර්ථක කරගන්න අපට පුළුවන්කම ලැබුණා කියලා මම හිතනවා.

මම කම්කරු ඇමතිවරයා වශයෙන් සිටියදී මගේ නිලධාරීන් එක්ක එකතු වෙලා හුඟාක් මහන්සි වෙලයි මේ කටයුතු කළේ. යම් යම් අංශවලින් විරෝධතා ආවත් ඒ අයට කරුණු ඒත්තු ගන්වලා ඊට පසුව සියලු දෙනාගේම සහයෝගය ඇතිව අපට මේක කරන්න පුළුවන්කම ලැබුණා. මේ තුළින් අද අපි බලාපොරොත්තු වෙනවා, කාන්තා සේවිකාවන්ගේ ජීවන මට්ටම දියුණු කරන්න. මොකද, අද කාන්තාවෝ සේවයට යෑම හුඟාක් අඩු වෙලා තිබෙනවා. මම හිතන විධියට පසුගිය අවුරුදු කිහිපය තුළ සියයට 8ක, සියයට 10ක පමණ ප්‍රමාණයක කාන්තා ශ්‍රමිකයන් සේවයට යාම අඩු වෙලා තිබෙනවා. මේ තත්ත්වයන් මහ හරවා අපේ රටේ කාන්තාවන් රැකියා සඳහා යාමටත්, ඒ වාගේම තමුන්ගේ ජීවන මට්ටම නඟා සිටුවීමට අවශ්‍ය පහසුකම් සැලැස්වීමටත් මේ තුළින් අපි බලාපොරොත්තු වෙනවා. රජය හැමවිටම බලාපොරොත්තු වුණේ, මේ විධියට එක හා සමාන පහසුකම් සලස්වලා විශේෂයෙන්ම දරුවන් ලබන මව්වරුන්ගේත්, තමුන්ගේ දරුවන්ගේත් සෞඛ්‍ය, ඒ අයගේ පෝෂණය නඟා සිටුවන්නයි. අද අපට මේ සංශෝධන මඟින් එය කරන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මීට වඩා කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මගේ පරමාර්ථය වුණේ, මේ පනත් කෙටුම්පතේ තිබෙන විධිවිධාන පැහැදිලි කරලා දෙන්නයි. මොකද, ඉතාමත්ම ප්‍රයෝජනවත් ඒ වාගේම බොහෝ දෙනෙක් බලාපොරොත්තුවෙන් සිටි විධිවිධාන මෙයට ඇතුළත්ව තිබෙනවා. මේ පහසුකම් මව්වරුන්ට, කාන්තාවන්ට ලබා දෙනවා කියලා ජාත්‍යන්තර කම්කරු සම්මේලනය ප්‍රඥප්තියකින් පවා පිළිඅරගෙන තිබෙනවා. ඒ ප්‍රඥප්තිය ප්‍රකාරව අද අපට මේ සංශෝධනයන් ඉදිරිපත් කරලා නීතිගත කරන්න පුළුවන්වීම ගැන සතුට ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා.3.56]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉතාමත්ම කාලෝචිත මාතෘකාවක් පිළිබඳවයි අද කථා කරන්නේ. මේක පක්ෂ, විපක්ෂ සියලු දෙනාටම බොහොම සහයෝගයෙන් එකඟ වෙන්න පුළුවන් මාතෘකාවක්. ඒ නිසා අද මේ ගරු සභාවේ සියලු දෙනාම බොහොම සන්සුන්ව කථා කරන මාතෘකාවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාන්තාවන්ගේ සේවා නියුක්තිය ගැන කථා කරනකොට පිරිමින් හැටියට අපි හැමතිස්සේම හිතනවා, "අපි තමයි වැඩියෙන් වැඩ කරන්නේ. සමාජයේ සියලු කාර්යයන් තුළදී අපි තමයි වැඩියෙන් ශ්‍රමය වැය කරන්නේ." කියලා.

හැබැයි, සාමාන්‍යයෙන් වැඩපළක, කාර්යාලයක, ෆැක්ටරි එකක විතරක් නොවෙයි, ගෘහ ජීවිතය අරගෙන බැලුවොත්, එකම වෘත්තියේ යෙදෙන අඹු සැමී දෙපොළකගේ වුවත්, දවසේ පැය 24න් වැඩි පැය ගණනක්, අඩුම තරමින් පැයක් දෙකක් හෝ පිරිමියාට වඩා ශ්‍රමය වැය කරන්නේ කාන්තාවයි. පාන්දරින් එකට එකම වැඩපළකට, ෆැක්ටරියකට වැඩට ගියත්, පිරිමියාට කලින් කාන්තාව අවදි වෙන්න ඕනෑ. පාන්දර ගෙදර ළිප ගිනි මෙළවීමේ ඉඳලා රාත්‍රියට ළිප ගිනි නිවන කටයුත්ත දක්වා සියලුම කටයුතු කරන්නේ කාන්තාවයි. නිවසක කටයුතු ආරම්භ වන්නේ කාන්තාවගෙන්; නිවසක කටයුතු නිවී යන්නේත් කාන්තාවගෙන්. ඒ නිසා අපි දකින විධියට කාන්තාව තමයි වැඩියෙන් ශ්‍රමය වගුරුවන්නේ; වැඩියෙන් මහන්සි වන්නේ; වැඩියෙන් ශක්තිය වැය කරන්නේ. අපි හැම කෙනෙක්ම මවකගේ කුසින් ඉපදුණු දරුවෝ. ඒ නිසා කාන්තාවන් කෙරෙහි, මාතෘත්වය කෙරෙහි අපේ යහ පාලන රජය බොහොම සුබවාදීව, මානුෂිකව බලනවා. ගරු රංජිත් සොයිසා මන්ත්‍රීතුමා, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා, අපි බොහොම සද්භාවයෙන්, මෙම සංශෝධන පනත් කෙටුම්පත් ගෙන ඒම පිළිබඳව සන්තෝෂයට පත් වෙනවා.

අද කාන්තා විමුක්තිය ගැන කථා කරනවා; කාන්තා අයිතිවාසිකම් ගැන කථා කරනවා; මාතෘත්වය පිළිබඳව කථා කරනවා; ජාතියට වැඩියෙන් දරුවන් ප්‍රාර්ථනා කරනවා; හැම තිස්සේම වැඩි වැඩියෙන් දරුවන් ප්‍රාර්ථනා කරනවා. අපි ඒ වාගේ සංකල්ප තුළ සිටිනවා නම්, මෙවැනි කරුණු කාරණාවලදීත් අවශ්‍ය වන පසුතලයන් නිර්මාණය කර දීම, වගකීමක් තිබෙන රජයක් හැටියට ඉතාමත්ම වැදගත් වෙනවා. දරුවෙක් බිහි වුණාට පසුව අපි එම දරුවා ආරක්ෂා කර ගත යුතු වෙනවා. ඒක අපේ සම්පතක්. කාන්තාවක් ගර්භිණී කාලය තුළ වැඩි වැඩියෙන් මහන්සි වෙනවා; ශ්‍රමය වැය කරනවා කියන්නේ එය අඩු බරකින් යුක්ත දරුවන් බිහි වීමට හේතුවක් වෙනවා. අඩු බරකින් යුක්ත දරුවෙක් ඉපදෙනවා කියන්නේ එම දරුවා සෞඛ්‍ය සම්පන්න දරුවෙක් නොවෙයි; නිරෝගී දරුවෙක් නොවෙයි. ඒ දරුවා අධ්‍යාපනය ලබන්නට තරම් මොළයක්, ශක්තියක්, කුසලතාවක් නැති දරුවෙක් බවට පත් වෙනවා. අඩු උපත් බරක් සහිත දරුවන් අඩු කුසලතාවන් සහිත දරුවන් බවට පත් වෙනවා. ඒක වර්තමානයේ අපේ රටට විශාල පිරිවැයක් වාගේම ප්‍රජාවට හානියක්. ඒ නිසායි අපට සෞඛ්‍ය සම්පන්න දරුවෙක් බිහි කර ගැනීමේ අවශ්‍යතාව මතු වන්නේ. අඩු බර දරු උපත්, මළ දරු උපත් අවම කරමින් නිරෝගී දරුවකු බිහි කිරීමට ගර්භිණී කාල සීමාව තුළ, දරු ප්‍රසූතයට පෙරාතුව වැටුප් සහිතව සුරක්ෂිතභාවයක් ලබා දීම විශේෂයෙන්ම වැදගත් වෙනවා. දරුවෙක් බිහි වුණාට පසුව මව් කිරිවලින් දරුවාගේ පෝෂණය ලබා දීම වාගේම, මවගේ උණුසුම, රැකවරණයත් ලබා දිය යුතුයි. මවකගේ තුරුලේ තබා ගෙන දරුවෙක් ගොඩනඟන්න අවශ්‍ය පසුබිම රජයක් හැටියට නිර්මාණය කරන්න පුළුවන් නම් ඒකත් ප්‍රජාව වෙනුවෙන් ඉටු කරන විශාල සාධාරණයක්.

වතුකර ප්‍රදේශවල, පෞද්ගලික ආයතනවල භාම්පුතුන්ගේ උපරිම සූරාකෑම්වලට, පීඩනයන්ට ලක්වෙමින් වැඩ කරන අපේ අභිංසක කම්කරු සහ අනෙකුත් සේවිකාවන් වෙනුවෙන් මෙවැනි සහන ලබා දීම පිළිබඳව අපි වැඩියෙන් සන්තෝෂ වෙන්න ඕනෑ. දරුවයි මවයි කියන්නේ ඔරුවයි කොල්ලෑවයි වාගේ. දරුවකුට මවකගේ සෙනෙහස, රැකවරණය විතරක් තිබුණාට මදි. අපේ ගරු ජෝන් සෙනෙවිරත්න හිටපු ඇමතිතුමාත් මේ කටයුත්ත සඳහා විශේෂයෙන් දායක වුණා. මෙය තවදුරටත් සර්ව සම්පූර්ණ වෙන්න, මවට එවැනි අවස්ථාවක් ලබා දෙන ගමන් පවුල සුරක්ෂා කරන, පවුල ආරක්ෂා කරන, දරුවා සහ මව රකින තාත්තාටත් එවැනි අවස්ථාවක් ලබා දෙන්න අපට හැකියාවක් තිබෙනවා නම් ඒකත් විශේෂ කාරණයක් හැටියට මේ අවස්ථාවේ සඳහන් කරන්න ඕනෑ. මේක අපේ යහ පාලන රජය ලැබූ තවත් සුවිශාල ජයග්‍රහණයක්, යහ පාලන රජයෙන් සිද්ධ වුණු තවත් එක් ප්‍රගතිශීලී කාර්යයක් හැටියට සලකමින් රජය වෙනුවෙන් මේ කටයුත්තට මම සුබ පතනවා.

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
ඔබතුමාට කාන්තාවන් ගැන හැඟීමක් තිබෙනවා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ඒක තමයි. අපි ආදරෙයි, කාන්තාවන්ට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමෙක් සඳහන් කළා වාගේ දැන් අපට ලොකු ප්‍රශ්නයක් ඇති වෙලා තිබෙනවා. බැදුම්කරයේ සල්ලි ගැනීම, පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ කටයුත්ත මෙගා ටෙලි නාට්‍යයක් බවට පත් වෙලා තිබෙනවා. මෙය අවසන් වේගෙන යනවා. නැවත කවුරු හෝ බෝම්බයක් පත්තු කරනවා. ඉන් පසුව දෙවැනි කොටස, තුන්වැනි කොටස, හතරවැනි කොටස රඟ දක්වන්න පටන් ගන්නවා. අවසන් වේගෙන යනවා, නමුත් අවසන් වෙන්නේ නැහැ. ඉස්සර 'සිත්තර' පත්තරයේ තිබුණා, 'ඉතින් ඊට පස්සේ' කියලා චිත්‍ර කථාවක්. එහි දේදුනු සහ කැළුම් කසාද බඳින්න යනවා. ඔන්න, එක පාරටම දේදුනු නුවරඑළිය දිහාට යනවා; කැළුම් මහණ වෙන්න යනවා. ඒ වාගේ මේකත් මෙගා ටෙලි නාට්‍යයක් බවට පත් වෙලා තිබෙන්නේ. [බාධා කිරීමක්] මොකක්ද?

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
දැන් කැළුම් සිංගප්පූරුවේ ඉන්නවා. දේදුනු කොහේද?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
කැළුම් සිංගප්පූරුවේ ඉන්නේ තමුන්නාන්සේලාගේ උදයංග වීරතුංගත් එක්කයි. [බාධා කිරීම්] තමුන්නාන්සේලාගේ උදයංග එක්ක තමයි කැළුම් ඉන්නේ. ඒකයි මේ කියන්නේ. මේක මෙගා ටෙලි නාට්‍යයක් වාගේ. 'ඉතින් ඊට පස්සේ' චිත්‍ර කථාව වාගේ. දැන් මේක ආයේත් අලුත් පැත්තකින් මතු වෙලා. මේකත් හරියට

"පුහුල් හොරා කරෙන් දැනේ" වාගේ. දැන් 118ක ලැයිස්තුවක් ගැන කථා කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපට අපේ ආසනවලට යන්න බැහැ. මගේ පඬුවස්නුවර ආසනයට එහෙම මට යන්න බැහැ. මගේ කරේත් අළු තිබෙනවාද කියලා මිනිසුන් මගේ කර දිහාත් බලනවා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
බලන්න, අගමැතිතුමා කරපු වැඩේ ඔබතුමා කියනවා- [බාධා කිරීමක්]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
නැහැ, නැහැ. මම කියන්නේ ඒක නොවෙයි. මේක මෙගා ටෙලි නාට්‍යයක් වාගේ වවාගෙන කන්න හදනවා. දැන් මට මගේ ආසනයට යන්න බැහැ. මමත් පුහුල් හොරකම් කරලාද, මගේ කරේත් අළු තිබෙනවාද කියලා ජනතාව බලනවා. මෙහෙම 118ක් ඉන්නවාද? 118ක් ඉන්නවා නම් ඒ නම් හෙළි දක්වන්න පුළුවන්ද? "මේක එහෙම දෙන්න බැහැ. එහෙම අයිතියක් නැහැ. අවුරුදු 30ක් යනකම් දෙන්න බැහැ" කියලා ජනාධිපති ලේකම්තුමා කියනවා අපට ඇහෙනවා. ඊට පසුව ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමිය කියනවා, "ජනාධිපති ලේකම්වරයා කියනවා නම් අපට දෙන්න පුළුවන්" කියලා. ඊළඟට, ජනාධිපති ලේකම්තුමා කියනවා, "නීතිපතිතුමාගෙන් අවසරයක් තිබෙනවා නම් අපට මේක දෙන්න පුළුවන්" කියලා. මේවා නොකෙරෙන කතන්දර. අපි පුහුල් හොරකම් කරපු මිනිසුන් නොවන නිසා, අපි පුහුල් ගෙනිහිල්ලාත් නැහැ; කැකිරි ගෙනහිල්ලාත් නැහැ; වට්ටක්කා ගෙනිහිල්ලාත් නැහැ; කුණු පොහොර උර, කුණු බෑග් ගෙනිහිල්ලාත් නැහැ. මේ කටයුත්තේදී අපි සුපිරිසිදු මිනිසුන් වන නිසා මම මේ උත්තරීතර පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටින්නේ කවුද පුහුල් ගෙනිව්වේ, කවුද කැකිරි ගෙනිව්වේ, කවුද පුන්නක්කු ගෙනිව්වේ, කවුද වට්ටක්කා ගෙනිව්වේ, කවුද කුණු බාල්දි ගෙනිව්වේ- [බාධා කිරීමක්] මොකක්ද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට අවශ්‍ය දෙයක් තිබෙනවා නම් මූලාසනයෙන් ඉල්ලන්න. මොකක්ද?

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මෙතුමා කියන විධියට මෙතුමන්ලා සියඹලා ගෙනැල්ලාම නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මන්ත්‍රීතුමා කැමති නම් පිළිතුරු දෙන්න.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
සියඹලා ගෙනිහිල්ලාද, පුහුල් ගෙනිහිල්ලාද, කැකිරි ගෙනිහිල්ලාද කියලා බලන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ මේ ලේඛනය- [බාධා කිරීම්] ජනාධිපති ලේකම්තුමා නැවත කියනවා, අතුරුදහන් වුණු හෝ අස්ථානගත වුණු පිටු අතර මෙහෙම නම් ලැයිස්තුවක් නැහැ කියලා. එතකොට මෙහෙම නම් ලැයිස්තුවක් තිබෙනවාද, නැද්ද? කාපු මකුණායි, නොකාපු මකුණායි- [බාධා කිරීමක්]

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට එක ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මන්ත්‍රීතුමා කැමති නම් එතුමාට අවස්ථාව දෙන්න පුළුවන්.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මගේ කැමැත්තක් නැහැ. මගේ වේලාව මට අවශ්‍යයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
රීති ප්‍රශ්නයක් නොවෙයි නම්, කථික මහත්මයාගේ අවසරය ඇතිව ප්‍රශ්නය අහන්න පුළුවන්.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මගේ කාලය දෙන්නම්, ඔබතුමාට කාලය දීලා නැහැ නේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මට පොඩි වේලාවක් දෙන්න. මට එක ප්‍රශ්නයක් අහන්න තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
එතුමාගේ වේලාව යනවා. එහෙම නම් පොඩි වේලාවක් දෙන්න.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු මන්ත්‍රීතුමා, "අර්ජුන් අලෝසියස්ගෙන් සල්ලි අරගෙන නැහැ" කියලා ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා ඊයේ COPE එකට දිවුරුම් ප්‍රකාශයක් දුන්නා වාගේ, ඔබතුමා කියන විධියට ආණ්ඩු පක්ෂයේ සිටින සියලු මන්ත්‍රීවරුන්ට ගරු කථානායකතුමා වෙත අද දින දිවුරුම් ප්‍රකාශයක් ලබා දෙන්න පුළුවන්ද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, මේ විෂයයට ඒ කරුණු අදාළ නැහැ.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මම ආණ්ඩු පක්ෂ නායකයෙක් නොවෙයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමනි, මෙය මෙම විෂයයට අදාළ නැහැ. ඔබතුමාට වෙන් වුණු කාලය අවසන්.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක අර පොළේ ඉන්න පිනුම්කාරයාගේ විසිල් එක වගේ. විසිල් එක ගහනවා; නමුත් ගහන පිනුමක් නැහැ. එම නිසා 118ක් ඉන්නවාද, මෙහෙම ලැයිස්තුවක් හැබෑවටම තිබෙනවාද කියලා හෙළිදරව් කරලා අපව නිර්දෝෂී කරන්න කියලා මම විශේෂයෙන් ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 4.07]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ சபைக்குத் தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய தினம் கடை, அலுவலக ஊழியர் (ஊழியத்தையும் வேதனத்தையும் ஒழுங்குபடுத்தல்) (திருத்தம்) சட்டமூலம் தொடர்பில் எனது கருத்துக்களையும் பதிவு செய்வதற்கு வாய்ப்பு வழங்கியமைக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

எமது நாட்டைப் பொறுத்தவரையில் வேலையற்றோரது பிரச்சினையானது ஒரு தொடர் பிரச்சினையாகவே இருந்து வருகின்றது. இந்த நிலையில் பார்க்கின்றபோது கடந்த ஆண்டின் தரவுகளின் பிரகாரம் வேலையற்றோர் மிகக் கூடிய மாகாணமாக, அதாவது 7.7 வீதமாக வடக்கு மாகாணமும், இதற்கு அடுத்த நிலையில் 6.0 என்ற வீதத்தில் கிழக்கு மாகாணமும் காணப்படுகின்றது. மாவட்ட ரீதியில் எடுத்துக் கொண்டால், 10.7 வீதமான அதிகூடிய வேலையற்றோர் இருக்கின்ற மாவட்டமாக யாழ்ப்பாணம் மாவட்டமும், அதற்கடுத்தபடியாக 6.6 வீதமான நிலையில் மட்டக்களப்பு மாவட்டமும் 6.4 வீதமாக திருகோணமலை மாவட்டமும் இருப்பதாகத் தெரியவருகின்றது. ஏனைய மாகாணங்கள் வேலைவாய்ப்பற்றோரைக் குறைந்தளவில் கொண்டிருந்தாலும், அந்த மாகாணங்களில் வாழுகின்றவர்கள் வேலை வாய்ப்புக்கள் பெற்று, வேலை செய்வதற்காக வடக்கு, கிழக்கு மாகாணங்களுக்கு வருகின்ற நிலைமை காரணமாக வடக்கு, கிழக்கு மாகாணங்களில் வேலையற்றோர் தொகை குறைவடையக்கூடிய நிலைமைகள் இல்லாதிருப்பதும் இங்கு குறிப்பிடத்தக்கது. இந்த வகையில், அங்கு வேலை வாய்ப்புக்களற்றோர் தொகை அதிகரித்துள்ள நிலையில், ஆண்களைவிட மும்மடங்கு அதிகளவில் பெண்கள் வேலை வாய்ப்புக்களற்றிருப்பதாகத் தெரியவருகின்றது.

எமது பகுதிகளைப் பொறுத்தவரையில், கடந்த காலங்களில் எமது அணுகுமுறைகள் காரணமாக அரச தொழில் வாய்ப்புகள் உள்ளிட்ட சுய தொழில்முயற்சிகள் பலவற்றை எமது மக்களுக்குப் பெற்றுக் கொடுக்கக்கூடிய நிலையில் நாம் இருந்தோம். அந்த வகையில் மேலும் பல வேலைவாய்ப்புகளை எமது மக்களுக்கு ஏற்படுத்திக் கொடுக்கக்கூடிய வாய்ப்புகள் எமது பகுதிகளில் இப்போதும்கூட இல்லாமல் இல்லை. என்றாலும் அதற்குரிய அரசியல் அதிகாரங்கள் எம்மிடம் இப்பொழுது இல்லை. எமது மக்கள் தற்போது பொருளாதார வீழ்ச்சி நிலையில் இருக்கிறார்கள். எனவே, தற்போது அரசியல் அதிகாரங்களில் இருப்பவர்கள் அதற்கான முயற்சிகளில் ஈடுபடலாம். அவர்களிடம் அதற்கான வாய்ப்புகள் நிறையவே இருக்கின்றன. எனினும், அதற்கான விருப்பமின்மை, ஆற்றலின்மை, இயலாமை போன்ற மூன்று குணாம் சங்களையும் இவர்கள் கொண்டிருப்பதனால், எமது மக்கள் தொடர்ந்தும் பாதிக்கப்பட்ட நிலையிலேயே இருந்து வருகின்றனர். அதுமட்டுமல்லாது, எமது மக்களுக்குரிய வேலைவாய்ப்புக்கள் ஏனைய மாகாணங்களில் வாழுகின்றவர் களுக்கு வழங்கப்படுவதன்மூலம், அவர்கள் எமது பகுதிகளில் எதிர்நோக்கும் மொழிப் பிரச்சினை உள்ளிட்ட பல்வேறு சிரமங்களால், அவர்களின் பணிகளின் ஊடாக எமது மக்களுக்குக் கிடைக்க வேண்டிய பயன்களும் புறக்கணிக்கப் படுகின்ற நிலைமைகளே தொடர்கின்றன.

கடந்த கால யுத்தம் மற்றும் பல்வேறு இயற்கை அனர்த்தங்கள் காரணமாகப் பெரிதும் பாதிக்கப்பட்டுள்ள எமது மக்கள் சமூகத்தை, இந்த நாட்டின் ஏனைய மாகாண மக்களுக்குச் சமாந்தரமான வகையில், அடிப்படை உரிமைகள் முதற்கொண்டு அரசியல் உரிமைகள் வரையில் அனைத்து வாய்ப்புகளையும் ஏற்படுத்தி, இந்த நாட்டில் கௌரவமிக்க பிரஜைகளாகக் கட்டியெழுப்புகின்ற நோக்கிலேயே நாம் செயற்பட்டிருந்தோம். அந்த வகையில் எமது மக்களைப் பொருளாதார ரீதியில் வலுவுள்ள நிலைக்கு கொண்டுவர வேண்டியதன் அவசியத்தை உணர்ந்தே நாம் பல்வேறு ஏற்பாடுகளை மேற்கொண்டிருந்தோம். ஆனால், துரதிருஷ்ட வசமாக எமது மக்களுக்குப் பொய்யான வாக்குறுதிகளை வழங்கி, எமது மக்களின் வாக்குகளை அபகரித்தவர்கள், இந்த நாட்டில் இன்றும் பாரிய கேள்விக்குறியாகவே இருக்கின்ற அரசியல் தீர்வு கிடைக்கும் வரையில் எமது மக்களின் ஏனைய தேவைகள் எதுவும் தீர்க்கப்படமாட்டா எனக் கூறியே காலத்தை நகர்த்தி வருகின்றனர்.

எமது மக்களில் பெரும்பாலானவர்கள் அரசியல் தீர்வுக்கு மட்டும் வாக்களிக்கவில்லை. இந்த அரசியல்வாதிகள் "அரசியல் தீர்வுக்கு மாத்திரமே வாக்களியுங்கள்!" என அவர்களிடம் கோரியிருக்கவுமில்லை. அவர்கள் பல்வேறு வாக்குறுதிகளை வழங்கியிருந்தார்கள். அந்த வகையில், எமது மக்கள் சொந்தக் காணி நிலங்களை விடுவித்துத் தருமாறு வாக்களித்தனர்; தமிழ் அரசியற் கைதிகளை விடுவித்துத் தருமாறு வாக்களித்தனர்; காணாமற்போன உறவுகளைக் கண்டறிவதற்கு வழிகோரி வாக்களித்தனர். தங்களுக்கு வாழ்வாதார வசதிகளை ஏற்படுத்தித் தருமாறு கோரி, புனர்வாழ்வுபெற்ற முன்னாள் இயக்க உறுப்பினர்கள் வாக்களித்தனர்; குடும்பத் தலைமைகளை ஏற்றிருக்கின்ற பெண்கள் வாக்களித்தனர். வேலைவாய்ப்புகளற்றோர், தங்களுக்கு வேலைவாய்ப்புகள் கோரி வாக்களித்தனர். இந்த அரசியல்வாதிகள், இவ்வாறு வாக்களித்த எமது மக்கள் அனைவரையும் இன்று நடுத்தெருவில் போராட விட்டுவிட்டு, எமது மக்களால் வழங்கப்பட்ட அரசியல் பதவிகளில் இருந்து கொண்டு சுகபோகங்களை அனுபவித்துவருகின்றனர். எமது மக்களின் துன்பதுயரங்களைப் புலம்பெயர் உறவுகளுக்கு வெளிப்படுத்தி, புலம்பெயர் உறவுகளிடமிருந்து பாரியளவில் பணம் பெறுகின்ற ஒரு சிலர், அந்தப் பணத்தை எமது மக்களின் நலன்சார்ந்து பயன்படுத்தாமல், தங்களது சொகுசு வாழ்க்கைக்குப் பயன்படுத்தி, எமது மக்களின் கஷ்டங்களுக்காக நீலிக்கண்ணீர் மாத்திரம் வடித்துக் கொண்டிருக்கின்றனர். அந்த வகையில், எமது பகுதியில் எமது மக்களின் ஏற்கனவே இருந்து வருகின்ற பல்வேறு பிரச்சினைகள் தீர்க்கப்படாமலும், பல்வேறு பிரச்சினைகள் மேலும் மேலும் சேர்ந்தும் எமது மக்களின் எதிர்காலம் என்பது வெறுமனே பிரச்சினைகளால் மாத்திரம் நிறைந்துவிடுமோ? என்ற அச்சமே எமக்குள் எழுந்துள்ளது.

කඩන්ත කාලංකලිල් පුනර්වාල්වුපෙබ්ර පල්ලායිරක් කණක්කාන මුන්නාල් ඉයක්ක උරුප්පිනර්කල් එමදු පකුදිකලිල් ඉන්නමුම් පෝදිය වාල්වාදාරංකල් ඉන්රිය නිලෙයිලේයේ වාල්න්දු වරුකින්රනර්. ඉවර්කළුක්කුත් තොළිල් වාය්ප්පුකළෙ වළංකුකින්ර තනියාර් තොළිල්මුයර්සි කළුක්කු මානියංකල් වළංකප්පදුම් එනක් කඩන්ත වරවු සෙලවුත් තිට්ටත්තිල් අරිවික්කප්පට්ටදු. එනිනුම්, ඉදුවරෙයිල් අදර්කුරිය එර්පාදුකල් අරසිනාලෝ තනියාර් තොළිල්මුයර් සියාලර්කළාලෝ සෙය්යප්පට්ටදාකත් තෙරියවිල්ලෙ. අදේ නේරම්, එමදු පකුදිකලිල් තනියාර් තොළිල්මුයර්සිකළෙ මුන්නෙදුප්පදිල් ඉරුක්කින්ර තටෙකළෙයුම් නාම් අවදානත්දිල් කොළ්ළවේම්ඩියුළ්ළදු. පුලම්පෙයර් මක්කළින් මුදලීදුකළුක්කු එර්ර වකෙයිලාන එර්පාදුකල් උරිය මුරෙයිල් මුන්නෙදුක්කප්පදුවදාකවුම් තෙරියවිල්ලෙ.

එමදු උයර් කල්විත්දුරෙකූද ඉන්රෙය තොළිර් සන්තෙයින් කේල්විකළුක්කාන වකෙයිල් මුන්නෙදුක්කප්පදාද නිලෙමෙ කාරණමාකප් පල්කලෙක්කළකප් පට්ටංකළෙප් පෙර්ර පලරුම් ඉන්රෙය තොළිර්සන්තෙයින් කේල්විකළුක්කු මුන්පාක එදුපදාද නිලෙමෙකළේ කාණප්පදුකින්රන. ඉන්දු එමදු නාට්ටෙප් පොදුත්තවරෙයිල් ඔරු පක්කම් තොළිල් වාය්ප්පුකළර්දුප් පල්ලායිරක්කණක්කානෝර් ඉරුක්කින්ර නිලෙයිල්, ඉන්නොරු පක්කම් සීනා, ඉන්දියා පෝන්ර නාදුකළිලිරුන්දු තොළිලාළර්කළ් ඉරක්කුමදි සෙය්යප්පට්දු, තොළිල්කළිල් ඊදුපදුත්තප්පදුකින්ර නිලෙමෙ උරුවාකි වරුකින්රදු. ඉත්තකෙය නිලෙමෙක්කුක් කාරණම් යාදු? එන්පදු කණ්දරියප්පදාද නිලෙයිලේයේ ඉන්ද නාට්ටින් කොළ්කෙ වකුප්පාක්කම් නදන්දේරික් කොණ්දිරුක්කින්රදු.

ඉන්දු වේලෙ වාය්ප්පුක්කළුක්කේර්ර ආළණිකළ් ඉල්ලෙ; වේලෙවාය්ප්පුක්කළර්දු ඉරුප්පෝරුක්කු ඒර්ර වේලෙ වාය්ප්පුකළ් ඉල්ලෙ. මදුපක්කත්දිල් පාර්ක්කින්රපෝදු, එමදු පකුදිකලිල් අරස තොළිර්දුරෙකළ් අර්ර ඒනෙය තනියාර් දුරෙකළ් සාර්න්දු සෙයලිල් ඉරුක්කින්ර තොළිර්දුරෙකළිල් එව්විදමාන තොළිල්මුරෙච් චට්දංකළුම් පින්පර්රප්පදාද නිලෙයේ පෙරිදුම් කාණප්පදුකින්රදු. වේලෙ නේරම් දවිර්න්ද මේලදික නේරංකළිල් පෙරප්පදුකින්ර වේලෙකළුක්කෙන මේලදිකක් කොදුප්පනවුකළ් වළංකප්පදුවදිල්ලෙ. ඌළියර් සේමලාප නිදි, ඌළියර් නම්පික්කෙ නිදි එන්පන වළංකප් පදුවදිල්ලෙ. අදික ඌදියම් වළංකප්පද වේම්ඩිය කාරණංකළාල්, ආණ්කළෙ අමර්ත්ද වේම්ඩිය වේලෙකළිල්, කුරෙන්ද ඌදියංකළිල් පෙණ්කළ් අමර්ත්දප්පට්දු, අවර්කළදු උළෙප්පුච් සුරණ්දප්පදුකින්ර නිලෙමෙකළුම්, ඉත්තකෙය පෙණ් තොළිලාළරුක්කුරිය අත්තියාවසිය විදුමුරෙකළ්කූද වළංකප්පදාද නිලෙමෙකළුම් එරාළමාකුම්. කුරිප්පාකක් කූපප්පෝනාල්, එමදු පකුදිකලිල් තොළිලාළර්කළ් අදිමෙ කළෙප්පෝන්රු නදත්දප්පදුකින්ර නිලෙමෙකළෙයේ මික අදිකමාකක් කාණක්කූදියදාකවුළ්ළදු.

අදේනේරම්, කර්ප්පිණිත් දාය්මාරුක්කෙන ඉන්ද අරසු පෝෂාක්කුත් තිට්ටත්තෙ අරිවිත්දුළ්ළපෝදිලුම්, එමදු පකුදිකළෙප් පොදුත්තවරෙයිල් අත්තිට්ටමානදු වේණ්ටා වෙදුප්පුදන් මේර්කොළ්ළප්පට්දු වරුවදාකවේ දෙරිය වරුකින්රදු. ඒනෙනිල්, පාවනෙක්කුදවාද පොරුට්කළේ පෝෂාක්කු එන්ර පෝර්වෙයිල් වළංකප්පදුකින්රන. එනවේ, තොළිලාළර්කළ් තොදර්පිල් වකුක්කප්පදුකින්ර චට්දංකළෙ උරියමුරෙයිල් නදෙමුරෙප්පදුත්දුවදර්කුම්, අවෙ උරිය මුරෙයිල් නදෙමුරෙප්පදුත්දප්පදුකින්රනවා? එන්පදු තොදර්පිල් තොදර් කණ්කාණිප්පුකළෙ මේර්කොළ්වදර්කුම්, චට්දංකළ් මීරප්පදුකින්ර නිලෙයිල් අදර්කෙදිරාක උරිය නදවදික්කෙකළෙ මුන්නෙදුප්පදර්කුම් වලුවාන චට්ද ඒර්පාදුකළ් අවසියම් එන්පදෙ වලියුරුත්දි, විදෙපෙරුකින් රේන්. නන්රි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා.

[අ.භා. 4.18]

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දෙවැනිවර කියැවීමේ විවාදයට ලක් කොට තිබෙන පනත් කෙටුම්පත් දෙකකට අදාළව ඉදිරිපත් කරන සංශෝධන පිළිබඳව අපි ඉතාම සතුටු වෙනවා. "කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත" තුළින් හා සේවිකාවන්ට ලබා දෙන ප්‍රසූත නිවාඩු සම්බන්ධව පවතින "සූතිකාධාර (සංශෝධන) පනත් කෙටුම්පත" තුළින් ඉතාම යහපත් ප්‍රවණතා පෙන්නුම් කරන බව මට හැඟී යනවා. මේ වාගේ සුවිශේෂී පනත් දෙකකට සංශෝධන ගෙන එන මේ අවස්ථාවේ ආණ්ඩුව නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂයේ මැති-ඇමතිවරුන් කිසිවෙකු මෙතැන නොසිටීම බරපතළ කාරණයක්. එසේ වන්නේ කාන්තාවන් පිළිබඳව මේ ගරු සභාවේ ඉදිරි පෙළ සිටින අයගේ කිසිම උනන්දුවක් නැතිකම නිසාද දන්නේ නැහැ කියා මා හිතනවා. කොහොම වුණත් එක්සත් ජාතික පක්ෂය වාගේ රජයකින් මේ වාගේ පනතකට සංශෝධනයක් සිද්ධ වෙන්නේ නැහැ කියන එක අපි දන්නවා. අපේ ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මැතිතුමා මැදිහත් වෙලා එතුමාගේ කාල පරිච්ඡේදයේදී මෙම පනත්වලට අදාළ සංශෝධන ගෙනා නිසා තමයි ප්‍රගතිශීලී පියවරක් විධියට අද ඒවා ඉදිරිපත් වෙන්නේ. ඒක අපට සතුටක්.

සේවිකාවන්ට සහන, ප්‍රතිපාදන ලබා දීම ගැන කථා කරන මේ අවස්ථාවේ අපේ රටේ වතු ක්ෂේත්‍රයේ කාන්තාවන් විශාල ප්‍රමාණයක් සේවයේ නියැළෙන බව අපි දන්නවා. ඒ වාගේම මේ රටට විදේශ විනිමය ලබා දෙන ආයෝජන කලාපවල වැඩ කරන සේවිකාවන් ඇතුළු සියලුදෙනාගේම සුරක්ෂිතභාවයට මේ සංශෝධන හේතු වෙනවාය කියලා අපි ඉතා ඕනෑකමින් කියන්න ඕනෑ. හැබැයි, අපි එක දෙයක් පිළිගන්න ඕනෑ. මෙම පනත තුළින් විශේෂයෙන්ම පෞද්ගලික අංශයේ සේවයේ නියැළෙන අයට වැඩි ප්‍රමුඛතාවක් හිමි වෙනවා. නමුත් මේ රටේ පෞද්ගලික ක්ෂේත්‍රයේ සියලු කර්මාන්ත අද කඩා වැටෙනවා. ඒ නිසා අද ප්‍රසූත නිවාඩු අලුතින් ලබා දෙන්න දෙයක් නැහැ. අද කම්කරු ක්ෂේත්‍රයේ සේවයේ නියැළෙන, වැඩවල යෙදෙන කාන්තාවන්ගේ සේවය අහිමිවීමේ කාල පරිච්ඡේදයකට රට ගමන් කරමින් තිබෙනවා. කම්කරු දෙපාර්තමේන්තුවට, කම්කරු හා ව්‍යවස්ථිය සමිති සබඳතා අමාත්‍යාංශයට ඉදිරි කාලපරිච්ඡේදවලදී මුහුණ දෙන්න වෙන්නේ බරපතළ ප්‍රශ්නයකට. සියලු ආයතන කඩා වැටෙන, කර්මාන්ත කඩා වැටෙන, කාන්තා ශ්‍රමිකයන් පමණක් නොවෙයි කර්මාන්තවල සේවයේ නියැළෙන කම්කරුවන් පවා බුරුතු පිටින් එළියට දමන, ඒ නිසා පැන නඟින ප්‍රශ්න රාශියකට මුහුණ දෙන්න සිද්ධ වෙන කාලපරිච්ඡේදයක් එනවා. මේ රටේ කාර්මික ක්ෂේත්‍රයේ සෑම අංශයකම කඩා වැටීමක් තිබෙනවා. සුළු ව්‍යාපාරිකයන්ගේ ව්‍යාපාර හා සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ක්ෂේත්‍රවල විශාල කඩා වැටීමක් නිර්මාණය වෙලා තිබෙනවා. විශේෂයෙන්ම ඩොලර් එකේ වටිනාකම දවසින් දවස ඉහළ යනකොට, පිට රටින් ගෙන්වන අමු ද්‍රව්‍ය තුළින් කරන සියලු නිෂ්පාදනවල කඩා වැටීමක් සිද්ධ වෙන බව අප දන්නවා. ඒ නිසා අපේ රටේ කාර්මික ක්ෂේත්‍රයේ සිටින කම්කරුවන්ට ඉතාම අවාසනාවන්ත කාලපරිච්ඡේදයකට ඉදිරි මාස හය තුළ මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ නිසා ප්‍රසූත නිවාඩු අලුතින් ලබා දෙන්න දෙයක් නැහැ. ඔවුන්ට දරුවෙක් හදාගෙන ගෙවල්වලට වෙලා ඉන්න වෙන කාලපරිච්ඡේදයක් තමයි එන්නේ. රැකියා අහිමි වෙන කාලපරිච්ඡේදයක් තමයි මේ උදාවෙමින් පවතින්නේ.

[ගරු සිසිර ජයකොඩි මහතා]

කම්කරුවන් සම්බන්ධ වැදගත් පනත් කෙටුම්පතක් දෙවැනිවර කියවන මේ වේලාවේ තවත් කරුණක් මතක් කරන්න මා කැමැතියි. මේ රටේ සේවක අර්ථ සාධක අරමුදලට -EPF එකට- මහ බැංකු බැඳුම්කර ගනුදෙනුව හරහා කෝටි 950ක පාඩුවක් සිද්ධ වෙලා තිබෙනවා. මේ කෝටි 950 කාටද ගියේ? බැඳුම්කර කොමිසම ඉදිරියේ මේ ගැන සාකච්ඡාවට ලක් වුණා. බැඳුම්කර හොරකමට අදාළව මුදල් ලබා ගත් විවිධ අයගේ නාමලේඛන පිළිබඳව පාර්ලිමේන්තුවෙත්, ඉන් පිටතත් දැන් සඳහන් වෙනවා. එක්සත් ජාතික පක්ෂය පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේදී සංවිධායකවරුන්ට මුදල් ගෙවිවේ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ මුදල්වලින් නොවෙයිද කියන ප්‍රශ්නය අපි අහනවා.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට විතරක් නොවෙයි මේ ඇඟිල්ල දිගු වෙන්නේ. සාධාරණ සමාජයක් කියලා මහ ලොකුවට කථා කරපු, 2015 ජනවාරි 08 වෙනි දාට පස්සේ මිනිසුන්ට සාධාරණය කරනවාය කියපු ගාමිණී වියන්ගොඩලා, සමන් රත්නප්‍රියලා, දඹර අමිල හාමුදුරුවෝ පර්පචුවෙල් ට්‍රෙෂරීස් සමාගමේ මුදල් ගත්තාද නැද්ද? ඒ අය ඔය 118දෙනාගේ ලැයිස්තුවේ ඉන්නවාද නැද්ද කියලා අපි අහනවා. [බාධා කිරීමක්] පාර්ලිමේන්තුවේ ඉන්න ඕනෑ නැහැ. මන්ත්‍රීතුමා, අද කථා වෙන්නේ පාර්ලිමේන්තුවේ ඉන්න අයගේ නාම ලේඛනය ගැන විතරයි. පාර්ලිමේන්තුවෙන් පිටතත් පර්පචුවෙල් ට්‍රෙෂරීස් සමාගමේ මුදල් ගත්ත, ආණ්ඩුව නිර්මාණය කිරීමට සම්මාදම් වෙච්ච,-

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, point of Order එක මොකක්ද?

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමාගේ මේ ප්‍රකාශයෙන් පාර්ලිමේන්තුවේ නැති, මේ රටේ සම්භාවනීය පුද්ගලයන්ට විශාල අගෞරවයක් වෙනවා. මොකද, ඒ අයට මෙතැනට ඇවිල්ලා උත්තර දෙන්න බැරි නිසා. අද මේ සඳහන් කරපු එක පුද්ගලයෙකුගේවත් නම කොමිෂන් සභා වාර්තාවක හෝ වෙන කොහේ හෝ සඳහන් වෙලා නැහැ. කරුණාකරලා මේ කරන ප්‍රකාශ,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, එහෙම නොගැළපෙන දෙයක් තිබෙනවා නම් ඉවත් කරන්න කියා මා කියනවා.

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
මහජන මුදල් හොරකම් කළ, මහජනයාට අයිති දේපළ හොරකම් කරපු අයගෙන් අල්ලස් ලබා ගන්නේ සම්භාවනීය පුද්ගලයන් නම්, ඒ 'සම්භාවනීය පුද්ගලයන්' පිළිබඳ අර්ථ නිරූපණය මට ඕනෑ. ඒ අය සම්භාවනීය පුද්ගලයන් නොවෙයි. [බාධා කිරීම්] ඔබතුමා අගමැතිතුමාගෙන් ඉගෙන ගන්න. අගමැතිතුමා මේ පාර්ලිමේන්තුවේ නැති මාධ්‍යවේදීන්ගේ නම් කියලා බැන්නා. ඔබතුමාට එදා ඒ ගැන කථා කරන්න තිබුණා. මේ රටේ මිනිසුන්ට තොරතුරු වාර්තා කරන මාධ්‍යවේදීන්ගේ නම් කිව්වා, ගරු අගමැතිතුමා. මේ පාර්ලිමේන්තුවේ කිව්වා; චෝදනා කළා. ඉතින් මුදල් ගත්තාය කියන එක පිළිබඳවත් ප්‍රශ්නයක් තිබෙනවා කියලා අපි කියනවා. [බාධා කිරීම්] සාධාරණ සමාජයක් පිළිබඳව කථා කරපු ගාමිණී වියන්ගොඩ, දඹර අමිල හාමුදුරුවෝ- [බාධා කිරීම්] මේ කරුණු සහිතවයි කියන්නේ. අපට ප්‍රශ්නයක් තිබෙනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විතරක් නොවෙයි, සිවිල් සමාජයේත් බොරුවට බෙරිහන් දෙන පිරිස් ඉන්නවාය කියලා මම චෝදනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව අනුව රටේ මූල්‍ය පාලනයේ බලය තිබෙන්නේ පාර්ලිමේන්තුවට. ඒ මූල්‍ය කටයුතු පිළිබඳව හොයා බලන ප්‍රධාන කමිටුව තමයි කෝප් කමිටුව. ඒ කෝප් කමිටුව බැඳුම්කර සිද්ධිය පිළිබඳව පරීක්ෂණ කරනවා. පරීක්ෂණය කරන පරීක්ෂකවරුන්ට අදාළ වගඋත්තරකාරයන් දුරකථන ඇමතුම් දෙනවා නම්, එහෙමත් නැත්නම් ඒ පරීක්ෂකවරු මුදල් ලබාගත්තාය කියලා සාක්ෂි ඉදිරිපත් වෙනවා නම් මේ රටට මොකක්ද වෙන්නේ? අපි පුද්ගලයන්ට චෝදනා කරන්නේ නැහැ. මේ විධියට මේ රට ඉස්සරහට ගමන් කරන්නේ කොහොමද? කෝප් කමිටුවට නැවතත් පත් වෙන්නේ ඒ වාගේ අය ද? ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා සහ ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා මුදල් ගත්තේ නැහැ කියලා දිවුරුම් ප්‍රකාශ දුන්නා. කෝප් කමිටුවට පත් කරපු අලුත් සාමාජිකයන් පර්පචුවෙල් සමාගමෙන් මුදල් ගත්තේ නැහැ කියලා දිවුරුම් ප්‍රකාශ දෙනතුරු කෝප් කමිටුව නැවත රැස් කරන්න එපා කියලා අපි ගරු කථානායකතුමාගෙන් ඉල්ලනවා. මේ රට ගමන් කරන්නේ කොතැනටද? මේ රට ඉදිරියට යන්නේ කොහොමද? මේ රටේ මිනිසුන්ට ජීවත් වෙන්න විධියක් නැහැ. බඩු මිල වැඩියි; බදු බර වැඩියි; කර්මාන්ත කඩා වැටෙනවා; නිෂ්පාදනයක් වෙන්නේ නැහැ; ඩොලරයේ අගය වැඩි වෙනවා; ආනයන වියදම් වැඩි වෙනවා; අපේ රටේ අපනයන ආදායම් නැහැ; ජාතික ආර්ථිකය පිරිහිලා; සෑම ක්ෂේත්‍රයකම වැඩ වර්ජන තිබෙනවා; කම්කරුවන්ගේ උද්ඝෝෂණ ඇති වෙලා තිබෙනවා; ජීවත්වීමේ ප්‍රශ්න තිබෙනවා; උපාධිධාරීන් දහස් ගණනක් රැකියා නැතුව ඉන්නවා. මේ එකම ප්‍රශ්නයක්වත් විසඳෙන්නේ නැති රටක් ඉදිරියට යන්නේ කොහොමද? රට තුළ සමස්ත ක්ෂේත්‍රවලම සේවක සේවිකාවන්ගේ අර්බුදයක් නිර්මාණය වෙලායි තිබෙන්නේ. සෑම ක්ෂේත්‍රයකම මේ අර්බුදය නිර්මාණය වෙනවා. වතු සමාගම්වල සේවිකාවන්ට මේ සපයන සහනය හොඳයි. හැබැයි, අපි දන්නවා ඇත දුම්බර මිටියාවතේ, හන්තාන කඳු මුදුන ඇතුළු සියලු තැන්වල අද වතු ඉඩම් ටික කොටස්වලට කඩලා වෙනත් ව්‍යාපාරවලට විකිණීමේ ව්‍යාපාරය ක්‍රියාත්මක වෙනවා කියලා. දැන් ඒක ක්‍රියාත්මක වෙමින් යන්නේ. දුම්බර මිටියාවතත් එහෙමයි. හන්තානේ සිද්ධ වෙන්නේත් එහෙමයි. නකල්ස් කඳුවැටියට කරගෙන යන්නේත් ඒ දේ. ඒවායේ පදිංචි කිරීම් කරන්නේ; හෝටල් හදන්නේ; ජාතිවාදී පදනම මත තමයි රටේ ජාතික සම්පත් ටික බෙදාදීම් සිද්ධ කරන්නේ. වතු සමාගම්වල සේවකයන්ට මේ සහන දෙන්න ඕනෑ.

ඊට වඩා දැවැන්ත අර්බුදයකට අපේ රටේ සෑම ක්ෂේත්‍රයක්ම ගමන් කරනවා. අපේ රටේ සෑම ක්ෂේත්‍රයකම අර්බුද ඇති වෙලා තිබෙනවා. ඊයේ පෙරේදා ගුවන් තොටුපොළ ඇතුළු ආයතනවල ආගමන විගමන නිලධාරීන්ගේ වැඩ වර්ජනයක් සහ උද්ඝෝෂණයක් තිබුණු බව අපි දන්නවා. ඔවුන්ගේ උද්ඝෝෂණයට එක හේතුවක් වුණේ මොකක්ද? මේ රටට තාවකාලික වීසා බලපත්‍ර මත එන විදේශික ශ්‍රමිකයන් ලංකාවෙන් පිට වෙන්නේ නැහැ, මේ අය පිට වෙනවාද කියලා විමර්ශනය කිරීමේ බලය මෙම ආගමන විගමන නිලධාරීන්ට දීලා නැහැයි කියන එකයි. ඔවුන්ගේ පිටවීම විමර්ශනය කිරීමේ බලය මේ අයට දෙන්නේ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
රට සංවර්ධනය වෙලා. ඒකයි යන්නේ නැත්තේ.

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
සංවර්ධනය වෙනවා නම් හොඳයි. මේ අය එන්නේ පදිංචි වෙන්න. කොහේටද මේ රට ගමන් කරන්නේ? මේ අවුරුදු තුන තුළ මේ රට කොතැනටද ගෙනිහින් තිබෙන්නේ? මොන තරම් විනාශයක්ද මේ රටට කරලා තිබෙන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කර්මාන්ත ක්ෂේත්‍රයේ සේවිකාවන්ගේ ප්‍රසූත නිවාඩු, ඒ වාගේම අජීවී දරු උපතක් සිදු වුණාම ලබා දෙන නිවාඩු සම්බන්ධයෙන් වන සහන මෙතෙක් කල් ක්‍රියාත්මක වුණේ නැහැ. ඒවා දැන් මේ පනත් කෙටුම්පතට ඇතුළත් කරලා තිබෙනවා. මෙම පනත් කෙටුම්පත සම්පාදනය කළ නිලධාරීන් ඇතුළු සියලුදෙනාගේ මේ ප්‍රගතිශීලී පියවර අපි අගය කරනවා. එහෙත් ඊට වඩා ගැඹුරින් ගිය සමාජ ප්‍රශ්න ජාලාවකට, ජාතික ආර්ථික ප්‍රශ්න ජාලාවකට අපේ රට මැදිහත් වෙලා තිබෙනවා. එම විනාශය කරා ගමන් කිරීම නවත්වන්නට මේ තාවකාලික සංශෝධනවලින් පුළුවන්ද කියන ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා. ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා.4.29]

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සාකච්ඡා කරන මාතෘකාවට පරිබාහිරව සිදු කළ අදහස් දැක්වීම් කිහිපයක් අපි දැක්කා. මීට පෙර අදහස් දැක්වූ ගරු මන්ත්‍රීතුමා කියපු කථාවකින්ම මගේ කථාව ආරම්භ කරන්නම්. අද පාර්ලිමේන්තුවේත් ප්‍රධාන මාතෘකාව වෙලා තිබෙන්නේ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම, එහෙම නැත්නම් අර්ජුන ඇලෝසියස් කියන ව්‍යාපාරිකයාගේ ගනුදෙනු සම්බන්ධවයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා කියනවා දිවුරුම් පෙත්සම් දීලා නිර්දෝෂී වෙන්න ලු. මම මේ උත්තරීතර සභාවේ ඉඳගෙන කියනවා, දැන් මේ එක කරුණක් ගැන නේ කියන්නේ. ඔව්, පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමෙන්, එහෙම නැත්නම් අර්ජුන් ඇලෝසියස් කියන ව්‍යාපාරිකයාගෙන් මුදල් ගත්තේ නැහැයි කියලා දිවුරුම් පෙත්සම් දෙන්න සුදුසුයි කියලා අපි කියමු. හැබැයි, මේ වාගේම ව්‍යාපාරිකයන් මහ විශාල පිරිසකට මේ රටේ අහිංසක මිනිසුන්ගේ බදු මුදල් ටික සාක්කුවට දා ගන්නට පසු ගිය කාල සීමාවේ අවස්ථාව උදා කරලා දුන්නා. අන්න ඒ කණ්ඩායමත් මේකට එන්නට ඕනෑ. ඇලෝසියස් කියන ව්‍යාපාරිකයා ගැන කථා කරන මොහුත්, ඊයේ පෙරේදා බිහි වුණු ව්‍යාපාරිකයෙක්. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව එහෙම නැත්නම් යහ පාලන ආණ්ඩුව ආවාට පසුව තමයි මොහු ව්‍යාපාරිකයෙකු බවට පරිවර්තනය වෙලා Bonds මිලදී ගැනීමට සුදුසුකම් තිබෙන සමාගමක් නිර්මාණය කරන්නට අවස්ථාව උදා කර ගත්තේ. මේ රටේ ජනතාව ඒකේ ඇත්ත කථාව දන්නවා. කොළඹ නගරය වහලා බේබිලාගේ හිත සුව පිණිස night race පදින කොට ඒවාට මුදල් දීලා තිබෙන්නේත් මේ සමාගම. ඒ ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. ඊයේ අපේ සහෝදරයෙක් කිව්වා, "ඒ සමාගම හොඳට තිබුණු සමාගමක්, මේ Bond issue එකෙන් පසුව තමයි ඒ සමාගම නරක් වුණේ" කියලා. ඒ කියන්නේ මීට පෙර කරපු දේවල් ඔක්කොම හොඳයි. නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාත් 806 වතාවක් මේ පුද්ගලයාට දුරකථන ඇමතුම් අරගෙන තිබෙනවා කියලා සමාජ වෙබ් අඩවි හරහා අපි දැක්කා. 806 වතාවක් ඇමතුම් ගත්තේ මොනවාටද? මම නම් දන්නේ නැහැ, girlfriendටවත් එච්චර දුරකථන ඇමතුම් අරගෙන තිබෙනවාද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කවුරුත් දැන් සුදු හුණු ගා ගන්නටයි හදන්නේ. මේ පාර්ලිමේන්තුව ඇතුළේ මේ ගනුදෙනුවට සම්බන්ධ 118ක් ඉන්නවා කියන මහත්මයාත් දැන් සුදු පිරුවට අඳින්නයි හදන්නේ. මොකද, දැන් රෙදි ගැලවිලා තිබෙන්නේ. ඔහු මේ පාර්ලිමේන්තුවේ මහා ජවනිකාවක් රඟපාලා පෙන්වුවා, "මම විතරක් නොවෙයි, 118ක් ඉන්නවා" කියලා. එම නිසා, මේ උත්තරීතර පාර්ලිමේන්තුව හැල්ලුවට පත් කරන්නට එපා කියලා අපි කියනවා. දිනපතා මේ කරුණ ගැන කථා කරමින්, "මම පිරිසිදුයි" කියමින් තව කාටවත් ඇඟිල්ල දිගු කරන්නට එපා. කථානායකතුමාගේ සහ ඔබතුමන්ලාගේ වගකීම තමයි මේ ගනුදෙනුවලට සම්බන්ධ සියලුදෙනා එළියට දෙන එක. මොකද, දේශපාලන පරපුරවල්වලින් ආවේ නැති, ගමේ සාමාන්‍ය මිනිහාගේ හයිය අරගෙන පාර්ලිමේන්තුවට ආපු අහිංසක මන්ත්‍රීවරුන් මෙහි සිටිනවා.

ඔබතුමන්ලා වාගේ, කිසි කෙනෙකුගේ හයියක් නැතිව ආපු විශාල මන්ත්‍රීවරුන් පිරිසක් අද මේ ගරු සභාවේ සිටින බව අපි දන්නවා. අන්න ඒ අහිංසක මිනිසුන් නියෝජනය කරලා ආපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අසාධාරණයක් වෙන්නට තියන්න එපා. මේ සභාවේ ඩීල්කාරයෝ අඩු වැඩි වශයෙන් ඉන්නවා. ඒ මහත්වරුන්ට ලක්ෂ 10ක් සාමාන්‍යයයි. මම දන්නේ නැහැ, මට නම් ලක්ෂ 10ක් කියන්නේ මහ ලොකු ගාණක්. අපට පාර්ලිමේන්තු මැතිවරණයේදී ලක්ෂ 10ක් කාගෙන්වත් හම්බ වෙලා නැහැ. ලැබෙන සියල්ලම එකතු කළත් ලක්ෂ 10ක් හම්බ වෙලා නැහැ. ඔක්කොම එකතු කළත් එපමණ මුදලක් හම්බ වෙන්නේ නැහැ. ඔය රුපියල් ලක්ෂ 10ක් ලබා දුන් මිනිහා කවුද කියලා නම මතක නැති වෙන තරමට ඒ මහත්වරුන්ට සල්ලි හම්බ වෙනවා නම්, එම පෙළැන්තිය පිළිබඳව වෙනම කථා කරන්නට ඕනෑ. එම නිසා මේ රටේ ජනතාවට මේ කරුණු අමතක වෙන්නට දෙන්න බැහැ.

පසුගිය කාලයේ පැවැති යුද්ධය අවසන් වුණාට පසුව, "LTTE එක සහමුලින්ම නැති කළා. මේ LTTE කියන කෲර, මිලේච්ඡ සංවිධානය සතුව තිබුණු මහා විශාල මුදල් ප්‍රමාණයක්, රත්‍රන් ටොන් ගණනක් අපි කන්ටේනර් පෙට්ටි දෙකකි න්කොළඹට අරගෙන ආවා. භය වෙන්න එපා, රටේ තිබෙන ප්‍රශ්න ටික විසඳන්න මේ රත්‍රන් ටික ප්‍රයෝජනයට ගත්තාම ඇති. කේපී කියන LTTE එකේ මහ මොළකරු මේ රටට අරගෙන ආපු දවසට, අපි ඒ මුදල් ටික ගත්තාම මේ රටේ තිබෙන ප්‍රශ්න ඉවර කර ගන්න පුළුවන්" කියලා රූපවාහිනිය ඉතා සතුටින් ප්‍රකාශ කළා අපට මතකයි. හැබැයි, පැවැති ආණ්ඩුව ඔය කියන කාරණා දෙකම ඉෂ්ට කළා. රත්‍රන් ටිකත් කොළඹට අරගෙන ආවා. අපේ හිටපු යුද හමුදාපති ගරු සරත් ෆොන්සේකා මැතිතුමා දන්නවා ඇති, මොකද වුණේ කියලා. ඉන් පසුව, කේපී කියන අයවත් ලංකාවට අරගෙන ආවා. මම නම් දන්නේ නැහැ, ඔබතුමන්ලාගෙන් කවුරුන් හෝ දන්නවා නම් කියන්න, රත්‍රන් ගෙනාවා යයි කියන ඔය කන්ටේනර් දෙක කොහේද තිබෙන්නේ කියලා. ඔය සල්ලි ටික මහ බැංකුව ඇතුළට ගියාද, අපේ රටේ ජාතික ආදායමට කොහෙන් හෝ එකතු වුණාද, එහෙම නැත්නම් ඔය රත්‍රන් ටික අපි නියෝජනය කරන ඇඹිලිපිටියට එහා පැත්තේ තිබෙන වීරකැටිය ප්‍රදේශයට අරගෙන ගියාද? ඒකට මොකද වුණේ කියලා මේ පාර්ලිමේන්තුවට හෝ කියන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් සුදු පාට රෙදි ඇඳගෙන සිටින මේ කළු චරිත ටික හෙට අනිද්දාට එළියට ඒවි කියා අපි හිතනවා. මාළුවා දියෙන් ගොඩ දැම්මාට පසුව දහලනවා වාගේ ඒ

[ගරු ඡේෂාන් විතානගේ මහතා]

අය දැන් දහලනවා. ගමෙන් ආ මන්ත්‍රීවරු කාගේවත් කුණු හෝදන්න එපා, ඇත්ත දැනගෙන, ඒ ඇත්ත වහන්න එපාය කියා අපි කියනවා. සාධාරණීකරණය කරන්න පුළුවන් කීපදෙනකු පමණයි ඔතැන ඉන්නේ. ඒ කණ්ඩායම හරි තැන ඉන්න. එතුමන්ලාත් ගිහින් ඒ ලොකු මෝරුන්ගේ කුණු හේදුවොත්, එතුමන්ලාගෙන් ජනතාව බලාපොරොත්තු වූ සාධාරණය ඉටු වන්නේ නැහැ කියායි මම හිතන්නේ. ඇලෝසියස්ගෙන් මුදල් ගත්තත්, වෙන කාගෙන් මුදල් ගත්තත් මේ රටේ අභිංසක මිනිහාගේ ඡන්දයෙන් ඔබතුමන්ලා පාර්ලිමේන්තුවට ඇවිත් ඉන්නේ ජනතා අභිලාෂයන් ඉටු කරන්නයි. අන්න ඒ කාරණය මතක තියාගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා අද මෙතැනට ඇවිත් කථා කරන්නේ මොනවාද? ආර්ථිකය කඩා වැටිලාය කියනවා; ජනතාවට කන්න බොන්න විධියක් නැහැය කියනවා. පසු ගිය කාලයේ ඔය මහත්වරුන් රටේ ජනතාවට කන්න දීපු හැටි අපි දැක්කා. ඒ කාලයේ රටේ ජනතාව, "අපට කන්න බොන්න නැහැ, අපේ ජීවන වියදම වැඩියි" කියා මහ පාරේ දහලන කොට, උද්ඝෝෂණ කරනකොට අර ආර්ථික විශේෂඥයා රූපවාහිනිය ඉස්සරහට ඇවිත් ගණන් හදලා ප්‍රකාශයක් කළා, "මේ රටේ එහෙම ප්‍රශ්නයක් නැහැ. රුපියල් 2,500කින් රටේ ජනතාවට කන්න පුළුවන්" කියා. පෞද්ගලික සහ රාජ්‍ය කියන සියලු මාධ්‍යවලින් රට පුරා එසේ ප්‍රකාශ කළාම ජනතාව මෝඩයා වේවි කියා සිතුවා. ඒ වාගේ මහා ලොකු වීරත්වයකින් තමයි එතුමන්ලා 2015 ජනවාරි 8වන දා ඡන්දයට ආවේ. නමුත් රටේ ජනතාව පණිවුඩයක් දුන්නා. ඒ පණිවුඩය තුළින් ජනතාව මේ යහ පාලන ආණ්ඩුවට වගකීමක් දී තිබෙනවාය කියා අපි විශ්වාස කරනවා. ඔය කියන මුදලාලිලාගේ සල්ලි සාක්කුවට දමාගත් කණ්ඩායම් මේ ආණ්ඩුව ඇතුළේත් ඉන්නවා නම් අන්න ඒ කණ්ඩායම් ටික පිරිසිදු කිරීමේ වගකීම ඔබතුමාට තිබෙනවා, අතිගරු ජනාධිපතිතුමනි. මේ උත්තරීතර ආයතනයේ ඉඳන් අතිගරු ජනාධිපතිතුමාට අපි කියනවා, "මෙහි කවුරුවත් ආරක්ෂා කරන්න වුවමනාවක් නැහැ, හැකියාවකුත් නැහැ, ඔබතුමා විධායක බලතල තිබෙන කෙනෙක්, මේ උත්තරීතර ආයතනය තුළ ඩිල්කාරයෝ කවුරුන් හෝ ඉන්නවා නම්, මේ උත්තරීතර ආයතනය තුළ රටේ ව්‍යාපාරිකයන්ගේ අවශ්‍යතා ඉටු කරන අය කවුරුන් හෝ ඉන්නවා නම් අන්න ඒ අයට විරුද්ධව පෙනී සිටින්න, වෙනත් කාටවත් එය කරන්න බැහැ" කියා. ඒ කාරණාව වෙනුවෙන් ඔබතුමා පෙනී සිටීවි කියන ගෞරවනීය අපේක්ෂාව, බලාපොරොත්තුව මේ උත්තරීතර ආයතනයේ සිටින පසු පෙළ මන්ත්‍රීවරුන් වන අප තුළ තිබෙන බව ප්‍රකාශ කරමින්, මගේ වචන කීපය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ටී. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා. ***[සභා ගර්භය තුළ නැත.]***

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා.

[අ.භා.4.36]

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ සාකච්ඡාවට බඳුන් වන සූතිකාධාර (සංශෝධන) පනත් කෙටුම්පත හා කාර්යාලීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත අතිශය වැදගත් පනත් කෙටුම්පත් දෙකක්. මේ මොහොත වන විට මේ රටේ සීනි කර්මාන්තය තුළ ඇති ප්‍රධාන කර්මාන්තශාලාවලට සිදුවී ඇති දෙය අපි දන්නවා. මම පොඩි වෙලාවක් අරගෙන ඒ කෙරෙහි තමුන්නාන්සේලාගේ අවධානය යොමු කරවනවා. අපේ දිස්ත්‍රික්කය වන මොනරාගල දිස්ත්‍රික්කයේ තිබෙන පැල්වත්ත සීනි කර්මාන්ත ආයතනයත්, සෙවණගල සීනි කර්මාන්ත ආයතනයත් ප්‍රධාන කර්මාන්තශාලා දෙකක්. ලංකාවේ ප්‍රධාන සීනි කර්මාන්තශාලා අතරින් කන්තලේ සීනි කර්මාන්තශාලාව ඇද වැටෙද්දී; එය වැසී මියැදෙද්දී, නිහුරාණ සීනි කර්මාන්තශාලාව ඇද වැටී මර නින්දේ නැවත නැවත නැගිට්ටිද්දී, පැල්වත්ත සහ සෙවණගල කියන සීනි කර්මාන්ත ආයතන දෙක අද රටට, ලෝකයට ඉතිරි වෙලා තිබෙන, ජාතියේ ප්‍රධාන සම්පත් දෙකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සෙවණගල සීනි කම්හල ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමාට දෙනවාට විරුද්ධව මේ වනවිට -දින 10කට ආසන්න කාලයක් තිස්සේ- එම කර්මාන්ත ආයතනයේ වැඩ වර්ජනයක් පැවැත්වෙමින් තිබෙන බව අපි දන්නවා. ඒ වාගේම අපි දන්නවා, දයා ගමගේ මහත්මයා අතේ තිබ්ලා රජයට පවරාගෙන තිබූ සෙවණගල සීනි සමාගම පසු ගිය කාලයේ -විශේෂයෙන් 2015 කාලයේ- කඩා වැටුණු බව. ඒ වෘත්තීය සමිති සියල්ලම එකතු වෙලා, ඒ ආයතනය කඩා වැටීමට හේතුව ලෙස කියන්නේ මොකක්ද? විශේෂයෙන්ම ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිවරයා හිටපු කාලයේ -2015 කාලයේ- ඒ විශාලම පාඩුව සිදු වුණා, සෙවණගල ආයතනය ඇද වැටුණාය කියා තමයි ඒ අය කියන්නේ. ඔවුන් ඉදිරිපත් කරන කාරණාව ඒකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සෙවණගල සීනි කර්මාන්ත ආයතනයේ ප්‍රගතිශීලී සේවක සංගමය, ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය, අන්තර් සමාගම් සේවක සංගමය සහ ප්‍රදේශයේ ගොවි සංවිධාන ගණනාවක් මේ වනවිට ඒ වැඩ වර්ජනයේ යෙදී සිටිනවා.

ඒ වැඩ වර්ජනය හරහා ඔවුන් කියන්නේ මොකක්ද? සෙවණගල ලංකා සීනි සමාගම රාජ්‍ය ව්‍යාවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශයට පැවරීමට විරුද්ධව තමයි ඒ වැඩ වර්ජනය අද කරගෙන යන්නේ. අපි දන්නවා 2015 වර්ෂයේදී මේ ආණ්ඩුව දින 100 වැඩසටහන තොරොම්බල් කර ආ බව. පසු ගිය දාක නම් අතිගරු ජනාධිපතිවරයාගේ ප්‍රකාශයකින් කියනවා අපට ඇහුණා, "අනේ, දින 100 වැඩසටහන කාගේද කියා දන්නේත් නැහැ" කියා. අනුර කුමාර දිසානායක මහත්මයා නම් එක වෙලාවක රූපවාහිනී වැඩසටහනකදී කියනවා මම දැක්කා, දින 100 වැඩසටහන ඒ අයගේ වැඩ සටහනක්ය කියා කියනවා වාගේ අදහසක්. ඒ කියන්නේ, දින 100 වැඩසටහනට දැන් අයිතිකාරයකු නැහැ කියන එකයි. ඒ දින 100 වැඩසටහන තුළ එදා සෙවණගල සීනි ආයතනය භාර වෙලා තිබුණේ ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යවරයාටයි. රුපියල් මිලියන 732ක මුදලක් අස්ථානගත වී ඇති බවත්, 2014 ව්‍යාපාර ඵලදායිතා සම්මානයෙන් පිදුම් ලැබූ ඒ ආයතනය මිලියන 250කට වඩා අධික පාඩු ලබන ආයතනයක් බවට පත් වූ බවත් සඳහන් වනවා. ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යවරයා වැවිලි කර්මාන්ත අමාත්‍යවරයාව සිටි කාලයේ -2015 වර්ෂයේ- සෙවණගල සීනි සමාගම පාඩු ලැබුවා. අවසාන අරමුණ වුණේ මොකක්ද? නැවත දයා ගමගේ මහත්මයාට -අද මේ ආණ්ඩුවේ කැබිනට් අමාත්‍යවරයකුව සිටින දයා ගමගේ මහත්මයාට- ඒ ආයතනය පූජා කිරීමයි අරමුණ වුණේ. ඒ වුණත්, යම් ආකාරයකට කඩා වැටෙමින් තිබූ ඒ ආයතනය 2015 වසරේ අග භාගයෙන් පසුව කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය විසින් පවරා ගනු ලැබීමත් එක්ක, නිවැරැදි කළමනාකරණයක් එක්ක බැඳිලා, සමස්ත සේවකයන් මැදිහත් වෙලා, සමස්ත ගොවියාගේ කැපවීම මත, ඒ ආයතනයේ මැදිහත් වීම මත මිලියන 700කට වඩා ලාභ ලබන ආයතනයක් බවට පත් වෙලා තිබෙන වෙලාවක්, මේක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විද්‍යාත්මක ක්‍රමයට අමාත්‍ය මණ්ඩලය පත් කරනවාය කියා මේ ආණ්ඩුව කියා තිබෙනවා. අමාත්‍ය මණ්ඩලය විද්‍යාත්මකව පත් කිරීමේ තරම කොච්චරද කියනවා නම්, රාජ්‍ය ව්‍යවසාය සංවර්ධනය කියන විෂයයට අයිති කර තිබෙනවා, මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශයත්. ඒ විද්‍යාත්මක අමාත්‍යාංශයේ අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාට විරුද්ධව තමයි මේ උද්ඝෝෂණ කරගෙන යන්නේ. ඒ විද්‍යාත්මක අමාත්‍ය මණ්ඩලයට අනුව පත් කළ ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමාගේ කාලයේදීයි -2015දීයි- ඒ ආයතනය විනාශ කළේ. ඒ කාලයේදී එය මිලියන ගණනක පාඩුවක් ලැබුවා. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව කාලයේ -විශේෂයෙන් 2014 දී- ව්‍යාපාර ඵලදායිතා සම්මානයෙන් පවා පිදුම් ලැබූ සෙවණගල ආයතනයට 2015 වනකොට මොකද වුණේ? වැරැදි කළමනාකරණ ප්‍රතිපත්ති නිසා එය රුපියල් මිලියන 250කට අධික පාඩු ලබන ආයතනයක් බවට පත් වුණා.

ඒ විතරක් නොවෙයි, රුපියල් මිලියන 732කට වඩා මුදල් අස්ථානගත වෙලා තිබෙනවා. ඒ සිදු වුණු අයථා ගනුදෙනුව; මුදල් අක්‍රමිකතාව; ඒ සිදු වෙලා තිබෙන අස්ථානගතවීම කුමක්ද කියන එක වහාම රටට හෙළි කරන්න කියා අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. මේ වැඩ වර්ජනය කරන වෘත්තීය සමිති සියල්ලම ඒක කරන්නේ නිකම් නොවෙයි. ඒකේ පක්ෂ භේදයක් නැහැ. සෙවණගල සීනි කර්මාන්ත ආයතනයේ ප්‍රගතිශීලී සේවක සංගමය, ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය, අන්තර් සමාගම් සේවක සංගමය ආදී වශයෙන් සියලු වෘත්තීය සමිති මේකට සම්බන්ධයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල සභානායකතුමා point of Order එකක් මතු කරනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මගේ කාමරයේ මම හිටියේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙතුමා මගේ නම සඳහන් කළා. මෙතුමාට මම මතක් කරන්න කැමැතියි, සෙවණගල සමාගම පෞද්ගලික අංශයට දෙන්න කිසිම සැලසුමක් නැති බව. සෙවණගල කර්මාන්තශාලාව හෝ පැල්වත්ත කර්මාන්තශාලාව හෝ පෞද්ගලික අංශයට පැවරීමට කිසිම අදහසක් නැහැ. අද උදේ සෙවණගල, පැල්වත්ත කර්මාන්තශාලාවල වෘත්තීය සමිති නායකයන් මගේ කාමරයේදී මාව හම්බ වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහිදි වැඩ වර්ජනය අවසන් කරන්න තීරණය කළා. [බාධා කිරීමක්] ඔය කර්මාන්තශාලා පෞද්ගලික අංශයට දෙනවාය කියන කථාව ඇත්ත වශයෙන්ම ප්‍රශ්න ඇති කරන්න කියපු දේශපාලන සටන් පාඨයක් පමණයි.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
Sir, I rise to a point of Order.
ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා

(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ ප්‍රකාශය පිළිබඳව අපි සතුටු වෙනවා. සෙවණගල සහ පැල්වත්ත කර්මාන්තශාලා පෞද්ගලීකරණය කරන්නේ නැහැය කියන කාරණය වග කීමක් දරන ආණ්ඩුවේ ප්‍රබල ඇමතිවරයෙක් හැටියට ඔබතුමා පාර්ලිමේන්තුවට දෙන සහතිකයක්ද? ඒ පිළිබඳව නැවතත් මම ඔබතුමාගෙන් විමසුවේ ඒක හරියට දැනගන්නයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒක තමයි මම ශුද්ධ සිංහලෙන් කිව්වේ.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මට ශුද්ධ සිංහල තේරෙනවා. බොහොම හොඳයි. සිංහලෙන්ම කියපු එක හරි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
සෙවණගල, පැල්වත්ත කර්මාන්තශාලා පෞද්ගලීකරණය කරන්නේ නැහැ. එම කර්මාන්තශාලා පෞද්ගලික අංශයට පවරන්න අපේ කිසිම අදහසක් නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මෙන්න මේ කරුණු හත තමයි තමුන්නාන්සේලා සාකච්ඡා කළේ. අපි ඒක දන්නවා. ඒ සම්බන්ධයෙන් ස්තුතියි. දින 10ක් පුරා ඇදිලා ගියේ වෙන මොකක්වත් නොවෙයි. ඔවුන්ගේ ප්‍රධාන කාරණාව වුණේ මෙයයි. ඒ පාඩු ලැබූ කාලය ඔබතුමා අමාත්‍යාංශය දැරූ කාලයයි. ඒකට තමයි විරෝධතාව මතු වුණේ. ඒ විරෝධතාව මතු වුණු නිසා තමයි ඔබතුමාට සාකච්ඡාවක් දෙන්න වුණේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමනි, ඒ කාලයේ මිල සම්බන්ධයෙන් කඩා වැටීමක් තිබුණා. ඒකයි වුණේ. There was a problem regarding the price.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඒකට කාරණාව වුණේ මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රුපියල් මිලියන 732කට ආසන්න මුදලක් අස්ථානගත වී ඇති බව ඒ සියලු වෘත්තීය සමිති කියනවා. ගරු ඇමතිතුමනි, ඒ බව ඔබතුමාටත් ලිඛිතව දන්වලායි තිබෙන්නේ. ඒ 2015 වසරේ අග භාගයේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එහෙම සිදු වෙලා තිබෙනවා නම් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් පරීක්ෂණයක් කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඔබතුමා ඒ පරීක්ෂණය ඉල්ලන්න, ගරු ඇමතිතුමනි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අනිවාර්යයෙන්ම ඉල්ලනවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඔබතුමා අද ඉල්ලන්න, ඒ පරීක්ෂණය. එතකොට අයථා ගනුදෙනුව අහුවෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
2015දී එහෙම පාඩුවක් සිදුවෙලා නැහැ. ඔය ඔක්කෝම සටන් පාඨ විතරයි. දයා ගමගේට දෙන්න යනවාය කියා එක සටන් පාඨයක් පැතිරුණා. ඊළඟට, මිල කඩා වැටීම උපයෝගි කරගෙන තව සටන් පාඨයක් ගෙන ගියා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
නැහැ, නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ ඔක්කෝම සටන් පාඨ. දැන් ඔබතුමා පාර්ලිමේන්තුවට කිව්වා, strike එකක් යනවාය කියලා. නමුත් strike එක ඉවරයි කියා මම ඇවිත් කිව්වාම, ඔබතුමා ඒක පිළිගන්නවා. ඔබතුමා පාර්ලිමේන්තුවත් නොමහ යවා තිබෙනවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට - [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කථාව පටන් ගත්තේ වැඩ වර්ජනයක් ක්‍රියාත්මක වෙමින් පවතිනවා කියලායි.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මගේ කථාව කරගෙන යන්න ඉඩදෙන්න, ගරු ඇමතිතුමනි. ඔබතුමා කථා කරන කොට ඔය කාරණා කියන්න. මට මගේ අවස්ථාව ලබාදෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සභානායකතුමනි, ඔබතුමාගේ කරුණු පැහැදිලි කිරීම අවසන්ද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Member, you cannot mislead the Parliament.
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා අද කථාව පටන් ගත්තේම වැඩ වර්ජනයක් යනවා කියලායි. වැඩ වර්ජනය අවසන්ය කියා එතුමා කිව්වේ නැහැ. මම ඇවිත් කිව්වාම තමයි එතුමා කියන්නේ, එතුමා ඒක දන්නවාය කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ගරු සභානායකතුමාගේ නම මතක් කරලා ඒ කාරණා කියපු නිසා එතුමාට උත්තර දෙන්න ඉඩ දෙන්න වෙනවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මම මේ පෞද්ගලික කාරණාවක් නොවෙයි කියන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමනි, වැඩ වර්ජනයක් ක්‍රියාත්මක වෙනවාය කියා ඔබතුමා කිව්වා. නමුත් එම වැඩ වර්ජනය අවසන්ය කියා ඔබතුමා කිව්වේ නැහැ. එය අවසන් කියා මම දැන් මේ ගරු සභාවට ඇවිත් කිව්වාම තමයි ඔබතුමා කියන්නේ ඒක අවසන්ය කියලා. ඔබතුමා පාර්ලිමේන්තුව නොමඟ යැව්වා. වැඩ වර්ජනය අවසන් බව දැන දැනත් ඔබතුමා වැරැද්දක් කළා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මට ඔබතුමා එක්ක වාදයක් නැහැ. නමුත් මේ කියන කාරණාව සත්‍යයයි. මම ඒක පෙන්වන්නම්. වැඩ වර්ජනයක් තිබුණේ නැති ගණනට නේ, තමුන්නාන්සේ මේ කථා කරන්න හදන්නේ. මේ වැඩ වර්ජනය නැවතුණේ මොකක් නිසාද? මෙන්න, ඔවුන් ඉදිරිපත් කරන කරුණු හත. පළමුවැනි කාරණය, ඉදිරියේදී කිසිසේත්ම හා කුමන අයුරකින්වත් පෞද්ගලීකරණය නොකරන බවට එකඟ වීම. මෙතුමා අද සාකච්ඡාවේදී එයට එකඟ වුණා. ඒ නිසා තමයි වැඩ වර්ජනය නවතින්නේ. දෙවැනි කාරණය මොකක්ද? 2015 වසරේ සිට දින සියයේ ආණ්ඩුව සූක්ෂ්ම අයුරින් මිලියන 233ක පාඩු පෙන්වීම හරහා පෞද්ගලීකරණයට මහ පෑදූ අයුරින් ඉදිරියේදී කටයුතු නොකරන බවට එකඟ වීම. ගරු ඇමතිතුමනි, ඒ කියන්නේ 2015 වසරේ දින සියයේ ආණ්ඩුව තුළ සූක්ෂ්ම අයුරින් මිලියන 233ක පාඩු පෙන්වීම තුළින් පෞද්ගලීකරණයට මහ පෑදුවාය කියන කාරණය ඔබතුමා පිළිගන්නවා.

වැඩ වර්ජනය නවතින්නේ 'එහෙම කරන්නේ නැහැ.' කියලා එකඟ වුණු නිසයි. තුන්වන කාරණය, මෙම ආයතනය පෙර පරිදි මීලඟදී ගෙන සිටි දයා ගමගේ මහතා සමඟ රත්නපුර හා ඇඹිලිපිටිය යන අධිකරණවල පවතින නඩුවලදී ඔහුට නැවත ආයතනය නතු වන අයුරින් කටයුතු නොකිරීමට එකඟ වීම. අධිකරණ

තීන්දුවකින් ආයතනය පෞද්ගලීකරණයට පහසු වන අයුරින් කටයුතු නොකිරීම කියන කාරණයට එකඟ වුණු නිසා තමයි අද වැඩ වර්ජනය නවතින්නේ. ඒ විතරක් නොවෙයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මට පොඩි වෙලාවක් දෙන්න, මේ කරුණු හත ඉදිරිපත් කරන්න.

අනෙක, 2018.05.25 වන දින උදේ 8.30 සිට 2018.06.06 වන අද දින දක්වා කාලය තුළ කර්මාන්තශාලාවේ වැඩ අක්‍රිය වීම තුළින් යම් මූල්‍ය පාඩුවක් සිදු වී ඇත්ද, ඒ සඳහා අප වෘත්තීය සමිති තුනේ සාමාජිකයින් සම්බන්ධයෙන් කිසිදු අයුරකින් අධිකරණමය වශයෙන් හෝ ආයතනයේ විනය නීති සංග්‍රහය අනුව කටයුතු නොකරන බවට පාලන අධිකාරිය එකඟ වීම කියන කාරණාව. ඒ විතරක් නොවෙයි. සේවක වැඩ වර්ජනය පැවැති දින සිට සේවයට පැමිණි සියලු සේවක මහතුන්ට ඉරිදා, පොහොය දිනය සමඟ වැටුප් ගෙවීමට එකඟ වීම කියන කාරණාව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අවසන් කරුණු දෙක මෙසේයි. කර්මාන්තශාලාවෙන් පිටත ගොවි බිම්වල කපා ඇති උක්වලට වර්ග කිරීමකින් තොරව උපරිම මිල ලබා දීමට එකඟ වීම කියන කාරණාව; මෙම වැඩ වර්ජනයට දේශපාලන බලය ඇතුළු වීම තුළින් පක්ෂ-විපක්ෂ දෙකෙහිම ගොවීන්ගේ වගාවන්ට, ගිනි ගත් ඉඩම්වලට, අමු උක්වලට ගෙවනු ලබන මිල ගෙවීමට එකඟ වීම කියන කාරණාව මත තමයි වැඩ වර්ජනය නවතින්නේ. එහෙම නැතුව ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමාගේ පෞද්ගලික කාරණාවක් මත නොවෙයි. එතුමා ඉතා පැහැදිලිව පිළිගෙන තිබෙනවා, 2015 වසරේ දින 100 වැඩ පිළිවෙළ ඇතුළතදී ඔහුගේ අමාත්‍යාංශය යටතේ මේ ආයතනය පාඩු ලැබුවා කියල. අද සාකච්ඡාවේදී එකඟ වුණු නිසා තමයි ඒ වෘත්තීය සමිති සටන අද අත් හරින්නේ කියන කාරණාව මතක් කරමින්, පැල්වත්ත හා සෙවණගල ආයතන පිළිබඳවත් සොයා බලන්න, ඒ ආයතන දෙකේ ඇති වෙලා තිබෙන සමහර ප්‍රශ්න පිළිබඳව තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ වැඩිපුර අවධානය යොමු කරන්න කියලාත් ඉල්ලා සිටිමින් මා නවතිනවා. මට කාලය ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා.

[අ.භා. 4.49]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විවාද කරන කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත වාගේම සූතිකාධාර (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මා සන්තෝෂයට පත් වෙනවා. ගරු සභානායක ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා අද ප්‍රශ්නයක් වෙලා තිබුණු වැඩ වර්ජනය නවත්වන්න ක්‍රියාත්මක වීම ගැන අපි ස්තුතිවන්ත වෙනවා. මෙවැනි වැඩ වර්ජන නැවතුණාම රිදෙන දේශපාලන කණ්ඩායම් සිටිනවා. ඒ ගොල්ලන්ට රිදුණාම ඒ ගොල්ලන් නැවතුණු වැඩ වර්ජනය තවදුරටත් ඉදිරියට ක්‍රියාත්මක කර ගන්න තිබෙන ආශාවට තල් අත්තට බොරලු ගහනවා වාගේ කථා කරනවා. ඒ ගැන රටේ ජනතාව අවදියෙනුයි ඉන්නේ. එවැනි අහූත චෝදනාවලට විශේෂයෙන් කිරිඇල්ල ඇමතිතුමා වැනි ඇමතිවරු පිළිතුරු දෙනවා. ඒ පිළිතුරු දීම තුළ හැකියාවක් ලැබී තිබෙනවා, අවශ්‍ය ප්‍රතිපාදන සලසමින් එවැනි විෂමතා වළක්වා ගෙන, ඒ ප්‍රශ්න විසඳාගෙන, ඉදිරියට යන්න.

සූතිකාධාර (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳවත් අපි කථා කරන්නේ, දශක හයකට අධික කාලයක් තිස්සේ ක්‍රියාත්මක වෙලා තිබුණු නීති දෙකක් අතර පවතින විෂමතාවන් සංශෝධනයට ලක් කරන්නයි. ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මාතෘ ආරක්ෂණය පිළිබඳ ප්‍රඥප්තියේ ප්‍රමිතීන්ට පටහැනිව තමයි මේ පනතට යම් යම් විධි විධාන අන්තර්ගත වෙලා තිබුණේ. ඒ අනුව මේ නීති දෙක සංශෝධනය කිරීමේ මූලික අරමුණ වුණේ, ඒ නීති දෙකට අදාළ නෛතික විධි විධානවල පවතින අසමානතා ඉවත් කිරීම හා ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මාතෘ ආරක්ෂණය පිළිබඳ සී-103 ප්‍රඥප්තිය හා සැසඳීමේදී මේ රටේ ක්‍රියාත්මක වන නීති දෙකේ පවතින විෂමතා අවම කිරීම කියන කාරණා දෙකයි. ඒ කියන්නේ, සජීවී දරු උපත්වලදී වේතන හෝ වැටුප් ගෙවීම සම්බන්ධයෙන් සූතිකාධාර ආඥා පනතේ හා සාප්පු හා කාර්යාල සේවක පනතේ නෛතික විධි විධානවල තමයි මේ විෂමතාව තිබුණේ. මේ නීති දෙක යටතේ සලසා ඇති විධි විධානවලට අනුව කාන්තා සේවිකාවන්ගේ පළමු සහ දෙවන දරු උපත් සඳහා පමණක් දින 84ක සූතිකාධාර තමයි හිමි වුණේ.

නමුත්, තුන්වන සහ ඊට වැඩි දරු උපත් සංඛ්‍යාවක් සඳහා ඇයට හිමි වුණේ දින 42ක සූතිකාධාර පමණයි. මෙන්න මේ විෂමතාව ඉවත් කරලා, නීති දෙකටම හඳුන්වා දුන් අලුත් සංශෝධන මඟින් කාන්තා සේවිකාවන්ගේ සියලුම සජීවී දරු උපත් සඳහා නියමිත දින 84ක සූතිකාධාර හිමි කර තිබෙනවා. මේක අපේ කාන්තා පරපුරට -විශේෂයෙන් මව් පරපුරට- ලබා ගන්න පුළුවන් වුණු ජයග්‍රහණයක්. මව්වරුන්ට දරුවන් ඉපදීමේදී ඒ අයට සහන ලබා දිය යුතු ප්‍රධාන කාරණයක් හැටියට සලකා මේ කාරණය ඉක්මනින් සංශෝධනය කිරීම ගැන අදාළ අමාත්‍යතුමාට අපි විශේෂයෙන් ස්තුතිවන්ත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහිදී සාකච්ඡාවට ලක් කළ යුතු තවත් කාරණා කිහිපයක් තිබෙනවා. මේ සඳහා කාරක සභා අවස්ථාවේදී ගරු අමාත්‍යවරයා සංශෝධන ඉදිරිපත් කරනු ලබනවා. ඒ අතර, මව් කිරි ලබා දෙන කාන්තා සේවිකාවන්ට විවේක කාලය ලබා දීම සඳහාත්, සාප්පු හා කාර්යාල සේවක පනතටත් එවැනිම විධිවිධාන හඳුන්වා දී තිබෙනවා. මෙය ඉතාමත් හොඳ තත්ත්වයක්. මේ රටේ අනාගත දරුවන් ගැන හිතලා, දරුවන්ගේ සෞඛ්‍ය ආරක්ෂා කරන්න, සෞඛ්‍ය ප්‍රගතියට අදාළ කාරණා හැටියට අප මෙය දකිනවා.

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශයේ ගරු ඇමතිතුමාට මේ කාරණය මතක් කරන්න කැමැතියි. දරුවෙක් ඉපදුණු වෙලාවේ මව්වරුන්ට ප්‍රසූත නිවාඩු ලබා දෙනවා වාගේම, ලෝකයේ සමහර රටවල පියවරුන්ටත් නිවාඩු ලබා දෙනවා. ඒ නිසා, මේ රටේත් එවැනි සංශෝධන ඇතුළත් කරලා, දරු ප්‍රසූතියෙන් පසු අම්මාට වාගේම තාත්තාටත් දරුවන් එක්ක සුරතල් වෙන්න අවස්ථාවක් ලබා දෙන වැඩසටහනක් ඇති කළ යුතුයි. එහෙම කළොත්, දරුවෙක් කුඩා කාලයේ රැක බලා ගන්නේ කොතරම් අමාරුවෙන්ද කියන හැඟීම තාත්තලාටත් ඇති වෙයි කියා මම හිතනවා. බොහෝ රටවල් එවැනි අවස්ථා ලබා දී තිබෙනවා. ඒ නිසා, මේ ක්‍රමය අපිත් අත් හදා බලන්න ඕනෑ. අම්මාට වාගේම තාත්තාටත් මාස දෙක, තුනක් නිවාඩු දෙනවා

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

නම්, ඒ දරුවා නිවැරැදි ආකාරයෙන්, පෝෂණ ශක්තියෙන් වැඩි දියුණු කර හදා ගන්න අවස්ථාවක් ලැබෙයි කියා අප බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, යෝජනාවක් හැටියට ඉදිරිපත් කර ඒ කාරණය අපට අත් හදා බලන්නත් පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දවස්වල මව් කිරි දීමේ ක්‍රමවේදයන් ගැන විවිධ මාධ්‍යවලින් කථා කළා. එක්තරා කාලයක රුහුණු විශ්වවිද්‍යාලයේ මව් කිරි දීමේ පාඨමාලාවක් ආරම්භ කළ වෙලාවේ, ඒ පාඨමාලාවට විරුද්ධව වෛද්‍ය ශිෂ්‍යයන් ක්‍රියාත්මක වී ඒ පාඨමාලාවට සහභාගි වුණු හෙදියන්ට පහර දුන්නා. එවැනි තත්ත්වයකුත් මේ රටේ තිබුණා. නමුත්, අද ඇති වී තිබෙන තත්ත්වය ගැන අපි සන්තෝෂ වනවා. ලෝකයේ අනෙක් රටවල් වාගේම සුබවාදී විධියට හිතන තැනට අද රට පත් වෙලා තිබීම ගැන ආණ්ඩුව හැටියට අපට සන්තෝෂ වෙන්න පුළුවන්.

ජන මාධ්‍ය මේ සඳහා වැඩි උත්සාහයක් අරගෙන මව් කිරි ලබා දීමේ අවශ්‍යතාව, වටිනාකම, සෑහෙන කාලයක් මව් කිරි ලබා දිය යුත්තේ ඇයි කියන කාරණා සම්බන්ධයෙන් වැඩසටහන් ක්‍රියාත්මක කරන හැටි අපි දැක්කා. විශේෂයෙන්, "TNL නාලිකාව" වැනි නාලිකා මේ සම්බන්ධයෙන් ක්‍රියාත්මක වුණා; "ඉසිර" ගුවන් විදුලිය මේ ගැන කථා කළා. ඒ විධියට කථා කළ නාලිකාවලට සිදු වී තිබෙන දේ බැලුවාම, "මේ රටේ අපි ඇති කළ මාධ්‍ය නිදහසට අද මොකද වෙලා තිබෙන්නේ?" යනුවෙන් ප්‍රශ්න කරන්නට සිදුවී තිබෙනවා.

පසුගිය දවස්වල TNL නාලිකාවට TRC එක සිදු කර තිබෙන අකරතැබ්බය අපි දැක්කා. ආණ්ඩුව පැත්තේ ඉඳගෙනම අද මාධ්‍ය නිදහසට සිදු වී තිබෙන දේ ගැන සාකච්ඡා කිරීමට සිදුවීම ගැන අප කනගාටු වනවා. ඕනෑම මාධ්‍යයකට ආණ්ඩුව විවේචනය කරන්න අපි නිදහස ලබා දී තිබෙනවා. නමුත්, ඒක දරා ගැනීමේ හැකියාව ආණ්ඩුවට තිබෙන්න ඕනෑ. එය දරා ගැනීමේ හැකියාව රටේ නායකයාට නැත්නම්, ඒක විශාල ප්‍රශ්නයක්. රටේ නායකයාට දරා ගැනීමේ හැකියාව නැතිවීම තුළ, විවිධ හේතු ඉදිරිපත් කරමින්, කඩාකප්පල්කාරී විධියට ඒ නාලිකාවල ප්‍රචාරය කිරීමේ අයිතිය නවත්වන්න රටේ නායකයා වටේ ඉන්න වන්දිභටයින් ලැහැස්ති වනවා නම්, එය සියලුම මාධ්‍යවලට කරන තර්ජනයක්. මේ තර්ජනය ගැන,- [බාධා කිරීමක්]

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(මාණ්පුමිකු ඊ. රඤ්ජිත් ත සොය්සා)
(The Hon. T. Ranjith De Zoysa)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාඞ්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(මාණ්පුමිකු ඊ. රඤ්ජිත් ත සොය්සා)
(The Hon. T. Ranjith De Zoysa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහාචාර්ය ආශු මාරසිංහ මැතිතුමාගේ කථාවට සවන් දීමෙදී මට යම් ප්‍රශ්නයක් මතු වුණා. එය නිවැරැදි කර ගැනීම සඳහා එතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තුවෙනුයි මේ ප්‍රශ්නය අහන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාඞ්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
එය point of Order එකක් නොවෙයි. ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමා කරුණු ඉදිරිපත් කරන්න.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(මාණ්පුමිකු ඊ. රඤ්ජිත් ත සොය්සා)
(The Hon. T. Ranjith De Zoysa)
කරුණු පැහැදිලි කිරීමක්.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) ආශු මාරසිංහ)
(The Hon. (Prof.) Ashu Marasinghe)
කරුණු පැහැදිලි කිරීම ඔබතුමාගේ වේලාවේදී කරන්න. [බාධා කිරීමක්] අපි නොබියව කියනවා, රටේ නායකයා හෝ මේ සම්බන්ධයෙන් කටයුතු කරනවා නම් වැරැද්ද වැරැද්දමයි කියා. වැරැද්ද ගැන අපි කථා කරන්න ඕනෑ. අපි වැරැද්ද ගැන කථා කරන්නේ. මේ රටේ ජනමාධ්‍යවලට කථා කරන්න නිදහස තිබෙන්නට ඕනෑ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ආර්. එම්. පද්ම උදයසාන්ත ගුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාඞ්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා point of Order එකක්ද?

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ආර්. එම්. පද්ම උදයසාන්ත ගුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමාට ඇහෙනවා ඇති. මෙතුමා අර කියපු චෝදනාව-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාඞ්කුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Point of Order එකක් නොවෙයි නම් ඉඩ දෙන්නට බැහැ, එතුමාගේ අවසරය නැතිව. මට පෙනෙන විධියට point of Order එකක් නොවෙයි. ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) ආශු මාරසිංහ)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මේ රටේ ජනමාධ්‍යවේදීන්ගෙන් ඉල්ලා සිටින්නේ, ජනමාධ්‍යවලට ලබා දුන්න නිදහස ආරක්ෂා කර ගන්න පෙළ ගැහෙන්න ඕනෑ කියන එකයි. එහෙම නැති වුණොත් වෙන්නේ විවිධ දේවල්. දවල් හීන දැකලා එක පාරට නැඟිට්ටා වාගේ වෙන්නේ නැතුව, ජනමාධ්‍යවලට අඩන්තේට්ටම් කරන එකට අපි විරුද්ධ වෙන්නට ඕනෑ. ඒ එරෙහිවීම වෙනුවෙන් අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට කථා කරන්නේ. එයයි, මන්ත්‍රීවරුන් හැටියට අපි බලාපොරොත්තු විය යුත්තේ. එයයි, අපි මේ අවස්ථාවේ කරන්නේ. [බාධා කිරීම්] TRC එකට අයිතියක් නැහැ. එහෙම කොහොමද TRC එකට අයිතියක් තිබෙන්නේ? සමස්ත රටේ ජනතාවට අයිති වුණු මේ frequency එක අපි රැකගන්න ඕනෑ. ඒ frequency එක රැකගැනීම සඳහා අපි මන්ත්‍රීවරුන් හැටියට කථා කරන්නට ඕනෑ. මේ frequency එක කාගේවත් බූදලයක් නොවෙයි. දේශපාලනඥයෙක් වශයෙන් කථා කරන දේවල් කාට හෝ ඒ වෙලාවේ පහදා දුන්නාම, ඔහු අතීතයේ කරපු දේවල්, වර්තමානයේ කියන ඒවාත් එක්ක සංසන්දනය කළාම, කුපිත වෙලා මෙවැනි frequencies තහනම් කරනවා නම් වැරදියි. [බාධා කිරීම්] අපි කියන්නේ මේක වැරදියි කියන එකයි. ඒක තමයි මේ කථා කළේ. [බාධා කිරීම්] අපි කියන්නේ TNL නාලිකාවට කරපු දෙය වැරදියි කියන එක. අපිත්

හොයන්නේ කවුද කළේ කියා. අපිටත් ඒක සොයා ගන්න ඕනෑ. ඒකයි කෙළින්ම අපේ චෝදනාව. [බාධා කිරීම්] අපි මේ චෝදනාව එල්ල කරන්නේ TRC එකට. TRC එක ක්‍රියාත්මක වුණු එක ගැන වගකීමක් දැරිය යුතු වෙනවා. ඒ ගැන අපි ඉදිරියේදී සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා. TRC එකේ වගකීම පාර්ලිමේන්තුවටත් තිබෙනවා. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු හැටියට අපට ඒ වගකීම තිබෙනවා. මේ රටේ මහ ජනතාවගේ පැත්තෙන්, මේ රටේ ජනමාධ්‍ය පැත්තෙන් අපි ඒ ගැන කථා කළ යුතු වෙනවා.

අපි උදාහරණයක් ගනිමු. මේ ප්‍රශ්නය 2016 වසරේ ප්‍රශ්නයක් නම් අද එන්නේ ඇයි? 2016 වර්ෂයේ මෙය විසඳාගන්න බැරි වුණේ ඇයි? මේවා තමයි අපෙට තිබෙන ප්‍රශ්න. එම නිසා TRC එකට අපි කියනවා, නින්දෙන් නැඟිටලා වාගේ වැඩ කරන්න එපාය කියා. අර කථාවක් තිබෙනවා නේ, " රජ වාසලේ ඉන්න වඳුරාට කඩුව අහුවුණා වාගේ" කියා. වඳුරාට කඩුව අහුවුණාම මොකද කරන්නේ? [බාධා කිරීම්] අන්න ඒ වාගේ දෙයක් තමයි මේ වෙලා තිබෙන්නේ.

අපි මේ කථාව කියනවා. TRC එක පරිස්සම් වෙන්න ඕනෑ, මේ කඩුව ගන්න ලැහැස්ති වෙන්න එපා. ඔබතුමන්ලාත් අපත් එක්ක එන්න මේ ගැන කථා කරන්න. මේක තමයි සැබෑ තත්ත්වය.

මේ වැරැද්ද නිවැරදි කළ යුතුයි. මේ රටේ TRC එකට තිබෙන අයිතිය තමයි ජනතාවගේ සංඥා පද්ධතියට නැත්නම් communication networksවලට අයිති frequencies සාධාරණව ලබා දීම. මේ ගැන පාර්ලිමේන්තුවේ විවාදයක් ඉල්ලන්න අපි බලාපොරොත්තු වෙනවා. Frequencies ලබා දීම සම්බන්ධයෙන් විශාල ප්‍රශ්නයක් තිබෙනවා. Frequencies ලබා දීමේදී ජනතාවගේ අයිතිවාසිකම් උල්ලංඝනය කර තිබෙනවා. අපි මේ සම්බන්ධයෙන් ඉදිරියේදී කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. මට කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

ඊළඟට, ගරු රවුෆ් හකීම් ඇමතිතුමා.

[ප.ව. 5.01]

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
(මාණ්පුමිකු නවුප් හකීම් - නකරත් තිට්ටමිටල් මර්‍රුම් නීර් වළංගල් අමෛච්චර්)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரව තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළේ, இன்று தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சினால் முன்மொழியப்பட்டுள்ள பிரசவகால விடுமுறை குறித்த புதிய சில சட்டத் திருத்தங்களை நாங்கள் வரவேற்கின்றோம். பொதுவாக இந்தப் பிரசவகால விடுமுறை என்கின்ற விஷயம் கடந்த நூற்றாண்டின்போது பல நாடுகளிலே - சர்வதேசத்திலும் - ஏற்றுக்கொள்ளப்பட்ட ஒன்றாக இருக்கின்றது. நமது நாட்டில் ஏறத்தாழ 84 நாட்கள் பிரசவத்திற்கு முன்பும் பின்புமாக பெண் தொழிலாளர்களுக்கு லீவு கொடுக்கப்படவிருக்கின்ற இந்தச் சூழலில், ஆண்களுக்கும் - இந்தப் பெண்களின் கணவர் மாருக்கும் - பிறக்கின்ற சிசுக்களின் தந்தையர்களுக்கும் - குறைந்தபட்சம் இரண்டு கிழமைகளாவது பிரசவகால விடுமுறை வழங்கப்படவேண்டுமென்று சில நாடுகள் விரும்புகின்றன; அந்தப் புதிய நடைமுறையைப் பேணி வருகின்றன.

இந்தியாவின் ஒரு மாநிலத்தில் இந்த நடைமுறை பின்பற்றப்படுவதை நாங்கள் அவதானித்தோம். அதாவது ஹரியானா மாநில முதலமைச்சர் ஆண்களுக்கும் இரண்டு வார காலம் - 15 நாட்கள் மகப்பேற்று விடுமுறையை வழங்க முடிவுசெய்து, அங்கு அந்த விடயம் இப்போது சட்டமாக அமுல்படுத்தப்படுகின்றது. குறிப்பாக, குடும்பத்தின் சுக நலனைப் பேணுவதற்கான, பிறக்கின்ற குழந்தைகளின் ஆரோக்கியமான வளர்ச்சியை உறுதிப்படுத்துவதற்கான இந்த முயற்சி விரிவுபடுத்தப்பட்டுக்கொண்டிருக்கின்ற ஒரு சந்தர்ப்பத்தில், எங்களுடைய நாட்டிலும் சில முன்னேற்றகரமான நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு வருகின்றன. குறைந்த பட்சம் இதில் இருக்கின்ற குளறுபடிகளாவது இல்லாமல் செய்யப்பட்டு வருகின்றன. குறிப்பாக, Shop and Office Employees (Regulation of Employment and Remuneration) (Amendment) Bill, அதேபோல Maternity Benefits (Amendment) Bill ஆகிய இரண்டு சட்டமூலங்களின்மூலம் வேறுபாடுகள் நீக்கப்பட்டு, 84 நாட்கள் மகப்பேற்று விடுமுறை கிடைக்கத் தக்கதான செயற்பாடு முன்னெடுக்கப்படுவது வரவேற்கத் தக்கது.

மகப்பேற்றுக்கான மருத்துவத் தாதியர் மத்தியிலே இருக்கின்ற சில குறைபாடுகளைப் பற்றியும் இங்கு நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன். அதாவது, இன்று சில வைத்தியசாலைகளிலே தாதியினருக்கும் பொதுச் சுகாதார மருத்துவ மாது என்று சொல்லப்படுகின்றவர்களுக்கும் இடையிலே சில வேறுபாடுகள் இருப்பதை நாங்கள் காண்கின்றோம். ஆனால், மருத்துவ மாதுகளின் சேவை யென்பது மிகப் பிரதானமானது. இருந்தாலும் அவர்களில் முதலாம் வகுப்புக்குத் தரமுயர்த்தப்பட்டவர்களை அதிலிருந்து Supra Grade என்ற அதிவிசேட தரத்துக்குப் பதவியுயர்த்துவது சம்பந்தமாகச் சில பிரச்சினைகள் ஏற்பட்டிருக்கின்றன. அதற்கென ஒரு பரீட்சையை நடத்துவதற்குத் தீர்மானம் எடுக்கப்பட்டிருந்தாலும், 2015க்கு முன்னர் மருத்துவ மாது களாகச் சேர்த்துக் கொள்ளப்பட்டவர்களை Supra Gradeக்கு பதவியுயர்த்துகின்ற விடயம் இதுவரையும் சரிவர நிறைவேற் றப்படாததாக இருந்து வருகின்றதென்பதை இங்கு நான் சுட்டிக்காட்டியாக வேண்டும்.

அதேநேரம், சில வைத்தியசாலைகளில் தாதிமாருக்குக் கொடுக்கப்படுகின்ற overtime - மேலதிகநேரக் கொடுப் பனவுகள் இவர்களுக்குச் சரிவரக் கிடைக்காமல் போகின்ற நிலவரங்கள் இருக்கின்றன. இந்த விடயத்தைச் சீர்செய்ய வேண்டிய அவசியம் இருக்கின்றது. இந்தக் குழுவினரின் தொழிற்சங்கத் தலைவியான தேவிகா கொடித்துவக்கு என்பவர் இது சம்பந்தமாகப் போராடி வருகின்றார். அதிலும் குறிப்பாக, பல வைத்தியசாலைகளில் கடமைக்கான turns வழங்கப்படுகின்ற விடயத்தில் அதாவது, ஒரு நாளில் காலை, பிற்பகல், இரவு என்று சம்பந்தப்பட்டவர்கள் வேலைக்கு அமர்த்தப்படுவதில் மருத்துவ மாதுகளுக்கும் தாதியர்களுக்கு மிடையிலே வேண்டுமென்றே வேறுபாடுகள் காட்டப்படு கின்றன என்ற குற்றச்சாட்டும் மருத்துவ மாது சேவையில் இருப்பவர்களால் தெரிவிக்கப்படுகின்றது என்ற விடயத்தையும் சபையின் கவனத்துக்குக் கொண்டுவர விரும்புகின்றேன்.

What I am trying to say, Hon. Presiding Member, is that this country has had a long history of giving

[ගරු රවුෆ් හකීම් මහතා]

maternity benefits to our workers. But, with the declining trend of the women labour force participation, it is important for us to look at certain anomalies that are in both these legislations, which we are trying to amend today.

I must particularly point out about the anomalous situation that has arisen because of the practice of hiring casual workers. If you take most of these maternity benefits, casual workers are included among the beneficiaries under the Shop and Office Employees (Regulation of Employment and Remuneration) Act. But, when it comes to the Maternity Benefits Ordinance, the maternity benefits that should accrue to the casual workers have not been granted. Therefore, there has been a certain practice followed for a long time, particularly, in many of the garment factories, where our women labour force is largely employed. So, when it comes to the Maternity Benefits Ordinance, that does not, unfortunately, cover the causal workers. Therefore, unfortunately, most of these casual workers tend to be hired and fired at the whims and fancies of the factory owners and they are also in an unfortunate situation where their causal period is extended without making them permanent and denying them their rights. This has been happening and has also been overlooked even by the Labour Inspectors of the Labour Department and sometimes, for various other inducements, they accommodate the factory owners. So, this unfortunate plight of the casual workers has to be highlighted.

But, this does not happen in the shop and office sector because the legislation very clearly covers all the workers including the casual workers. Therefore, the maternity benefits accruing to them cannot be denied by any employer in the shop and office sector. But, when it comes to the factories and other industries covered by the Maternity Benefits Ordinance, the casual workers, unfortunately, do not get this benefit. This is a serious lacuna that needs to be addressed. I would like to bring that to the notice of the Hon. Minister so that that particular amendment to the Maternity Benefits Ordinance could also be brought.

Then, Sir, earlier I was talking about the issue pertaining to the benefits that need to be granted to some of the workers in hospitals, particularly those who work in the labour room and in wards which offer antenatal care and postnatal care, who are put into various shifts. Their shifts are arranged in such a way that there is a serious discrimination that arises when the nurses do not get the benefits that need to accrue to them. Therefore, these issues need to be addressed.

Then, there is another issue pertaining to nurses, which I would like to emphasize in the Tamil language.

இன்று முஸ்லிம் பெண் தாதியரைப் பொறுத்தமட்டிலே, அவர்களுக்கென்று ஒரு சீருடை வழங்கப்படுகின்றது. அதாவது அவர்களுக்கு மேலணியும் காற்சட்டையும் கொடுக்கிற ஒரு நடைமுறை பேணப்பட்டு வருகிறது. ஆனால், அவர்கள் தங்களது சமய, கலாசார அடிப்படையில் உடை அணிவதற்காகச் சீருடைக்கு மேலதிகமாக மேலங்கியொன்று அணிவதற்கு ஏற்பாடு சில இடங்களில் செய்யப் பட்டுள்ளது. எனினும், புதிய சீருடையில் இந்த விடயம் சரிவர உள்ளடக்கப்படவில்லை என்கிற குறைபாடு இருக்கிறது. எனவே, முஸ்லிம் பெண் தாதியர்களுக்கான சீருடையிலே குறித்த மாற்றங்களைச் செய்வதற்கு அரசாங்கம் ஒத்துழைக்க வேண்டும். குறிப்பாக, சுகாதார அமைச்சு இது சம்பந்தமாகக் கவனமெடுக்கவேண்டும் என்று நான் இங்கு வலியுறுத்திக் கூறி, விடைபெறுகின்றேன். வஸ்ஸலாம்.

[අ.භා. 5.12]

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ සාකච්ඡාවට ගැනෙන වැදගත් පනත් කෙටුම්පතක් වන කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අපේ අදහස් දක්වන්න ලැබීම පිළිබඳව අපි සතුටු වනවා. මේ පනත් කෙටුම්පත තුළින් විශේෂයෙන්ම වැඩ කරන කාන්තාවන්ට සහනදායී ආකාරයට නීති-රීති පැනවීමට කටයුතු කිරීම ඉතාම වැදගත් කරුණක් හැටියට අපි සලකනවා. මේ සම්බන්ධව එතරම් විවාදයක්, ගැටලුවක් ඇති වෙන්න හේතුවක් නැහැ. අද රටේ ජනගහනයෙන් අතිබහුතරයක් කාන්තාවන්. රාජ්‍ය සේවකයන් ලක්ෂ 14ක් හා පෞද්ගලික අංශයේ සේවකයන් ලක්ෂ 65කට ආසන්න ප්‍රමාණයක් අපේ රටේ සිටින අතර, ජනගහන ප්‍රතිශතය අනුව එයින් අතිබහුතරයක් කාන්තාවන්. ඒ අය අතරින් පෞද්ගලික අංශයේ සේවයේ යෙදී සිටින සේවිකාවන්ට කාලානුරූපව යම් යම් කාල වකවානුවලදී විවිධ ආකාරයේ සහන ලබා දීලා තිබෙනවා. කාන්තාවන්ට ඒ ආකාරයේ සහන ලබා දෙන්න සාකච්ඡා කරනකොට මේ පනත් කෙටුම්පත හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සති 14ක වාගේ කාලයකට දීමනා ගෙවීමට කටයුතු කිරීම ඉතාම හොඳ, ප්‍රගතිශීලී පියවරක්. නමුත් ඒ නිසා පෞද්ගලික අංශයේ සේවාවන් සඳහා කාන්තාවන් බඳවා ගැනීමේ ප්‍රතිශතය අඩු වීමේ යම්කිසි ප්‍රවණතාවක් අපට දකින්න පුළුවන්; එහෙම වෙන්න පුළුවන්. එහෙම වුණොත් මේ රටේ ඉගෙන ගත් -උගත්- තරුණියන්ට රැකියා අවස්ථා සඳහා යමේ යම් අවහිරතාවක් ඇති වනවා. ප්‍රතිශතයක් හැටියට ඒ ප්‍රමාණය අඩු කිරීමේ හැකියාවක් තිබෙනවා. විශේෂයෙන්ම පෞද්ගලික බැංකු, පෞද්ගලික සාප්පු වැනි ආයතනවලට සේවිකාවන් බඳවා ගැනීමේදී එලෙස බඳවා ගන්නා ප්‍රතිශතය අඩු වීමේ ප්‍රවණතාවක් අපිට දකින්න පුළුවන් කියලා අපි මෙහි අනතුරක් දකිනවා. මේ යෝජනා ඉදිරිපත් කරනවාත් එක්කම මා කලින් කිව්ව ආකාරයේ යම් ප්‍රවණතාවක් ඇති වෙන්න ඉඩ තිබෙනවා නම් එය වැළැක්වීමට කටයුතු කිරීමත් රජය සතු යුතුකමක් සහ වගකීමක් හැටියට අපි සඳහන් කළ යුතු වනවා.

අපේ රටේ වතුකරයේ ජීවත් වන වතු කම්කරු කාන්තාවන්ගේ තත්ත්වය නම් මේ හැම එකකටම වඩා බොහොම කනගාටුදායකයි. රබර් කිරි කපන, තේ දලු කඩන, වත්තේ නෙළන -මේ හැම කටයුත්තකටම මැදිහත් වන- වතු කම්කරු කාන්තාවන්ගේ තත්ත්වය ඉතාම බේදනීයයි. ඔවුන්ට ජීවත් වෙන්න තිබෙන සාම්ප්‍රදායික නිවාස මීට අවුරුදු සියයකට, එකසිය පණහකට කලින් බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් හදුන්වා දුන් නිවාස පද්ධතියක්. සනීපාරක්ෂක කටයුතු ඉතාම අඩු මට්ටමකයි තිබෙන්නේ. දැනට මේ අයට සෞඛ්‍ය පහසුකම් යම් ආකාරයකින් ලැබුණත්, ගමේ අනිකුත් පුරවැසියන්ට ඒ පහසුකම් ලැබෙන තරමට එහි සාර්ථක තත්ත්වයක් පෙනෙන්න නැහැ. පසු ගිය රජය මඟින් වතු කම්කරු කාන්තාවන් සඳහා වතු සෞඛ්‍ය සේවාවක් ඇති කරන්න වතු මට්ටමින් පවුල් සෞඛ්‍ය සේවිකාවන් පත්

කරලා, ඔවුන් රජයේ සේවකයන් බවට පත් කිරීමට ගත් තීරණයත් එක්ක ඔවුන්ගේ සෞඛ්‍ය මට්ටම යම්කිසි ආකාරයකින් යහපත් තත්ත්වයට පත්වෙලා තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් සතුටු වනවා. හැබැයි, වතු කම්කරු කාන්තාවන් අතර මන්ද පෝෂණය, නූගත්කම ඉතා ඉහළ අගයක් දරනවා. මෙන්න මේ තත්ත්වයන් තුළ උපදින දරුවන් නීරෝගී දරුවන් නොවෙයි. වතු කම්කරුවන්ගේ අඩු ආදායම්ලාභී තත්ත්වයත් එක්ක රෝගී, මන්ද පෝෂණයට ලක් වුණු දරුවන් තමයි ඔවුන් සමාජයට ප්‍රසූත කරන්නේ. ඒ නිසා මෙන්න මේ අය ගැනත් වැඩි සැලකිල්ලක් දක්වලා, මේ තිබෙන පහසුකම් ඒ අයටත් ලබා දීමට කටයුතු කළ යුතුයි. එමෙන්ම ඔවුන්ට තවතවත් පහසුකම් ලබා දීමේ අවශ්‍යතාවක් තිබෙනවා කියන කාරණයත් මා මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කළ යුතු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි මෙවැනි යෝජනා, අණ පනත් ගැන අද අපි විවාද කරමින් සිටිනවා. අද උදේ ඉඳලා මේ පාර්ලිමේන්තුවේ රැඳී සිටිමින් ඒ කථාවලට සවන් දීපු මන්ත්‍රීවරයකු හැටියට මට පෙනී ගියා, අද බරපතළ විවිකිච්ඡාවක්, ගැටලුවක් ගැන මේ ගරු සභාව තුළ වරින් වර සාකච්ඡා කෙරුණු බව. ගරු කථානායකතුමා එතුමාට හැකි ආකාරයට ඒ තත්ත්වය කළමනාකරණය කරන්න හැදුවා. ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු එම ගැටලුව මතු කළා. මීට කලින් කථා කළ රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු මන්ත්‍රීවරයාත් ඒ කරුණ ප්‍රකාශ කළා. මටත් ඒ ගැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ප්‍රශ්නය මේකයි. මේ රජයේ නායකයන්ගේ දැනුවත්භාවය මත සිද්ධ වෙච්ච මහා බැංකු හොරකමට, පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම කරපු ඒ හොරකමට පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225දෙනාගෙන් 118දෙනෙක් සම්බන්ධයි කියලා අද ජනමාධ්‍ය හරහා සාකච්ඡා වනවා. අද වන කොට ඒ ගණන ටැක්සි මීටර් එක ඉහළ යනවා වාගේ 166 දක්වා වැඩි වෙලාය කියලා ප්‍රකාශ කෙරෙනවා. ඒ විධියට වැඩි වන කොට මේ කථා කරන මාත්, දැන් මූලාසනයේ ඉන්න ඔබතුමාත්, ගරු කථානායකතුමාත්, අගමැතිතුමාත්, ජ්‍යෙෂ්ඨ ඇමතිවරු ඇතුළු කවුරු කවුරුත් ඒකට සම්බන්ධ ඇති කියලා රට විශ්වාස කරනවා. මේ ගැටලුව විසඳා මන්ත්‍රීවරු නිවැරදි කිරීමට වහාම පියවරක් ගත යුතුයි.

දැන් කියනවා, එම වාර්තාවේ පිටු 106ක් අස්ථානගත වෙලා කියලා. ඊයේ ගරු සභාවට ඉදිරිපත් කළා, සී 350 - 360 වන තෙක් පිටු 11ක්. එතකොට, 360වන පිටුවේ සිට තව පිටු 49ක් සභාගත කළ යුතු වනවා. අපි අහනවා, ජනාධිපති ලේකම් කාර්යාලය මේ තරම් හෙමින්, හෙමින් මේ ගැන කටයුතු කරන්නේ මොකද කියලා. ඊයේ පිටු 11ක් දෙන්න පුළුවන් නම්, ඉතුරු ටිකත් දෙන්න තිබුණා නේ! මීට කලින් කිව්වේ, "ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ ඒ සම්පූර්ණ වාර්තාවම දැන් අපි දීලා තිබෙනවා. එහෙන් මෙහෙන් කොළ කඩලා, හංගලා නැහැ." කියලායි. හැබැයි, දැන් කියනවා, "කොළ ටිකක් අඩුයි." කියලා. රටේ නායකයාගෙනුත් ප්‍රකාශ වුණා, "අපි ඒ කොළ කඩලා පාපිස්ස යට දැම්මේ නැහැ." කියලා. හැබැයි දැන් කියනවා, "ඊයේ ටිකක් දුන්නා" කියලා. ගරු කථානායකතුමා කිව්වේ, "ඉතුරු ටික ලැබුණොත් දෙන්නම්." කියලායි. ඒ දෙනකොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බබා හම්බ වෙලා ඉවරයි. දැන් මුළු රටම පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225දෙනාම හොරුන්ගේ ගණනට දමලා. මේ අය අතරේ අර්ජුන් ඇලෝසියස්ගෙන් සල්ලි ගත්ත කට්ටිය ඉන්න බව අපි පිළිගන්නවා; පැහැදිලිව ඉන්නවා. ඔය කිය 118දෙනා අතරේ ගෙවල් ගත්ත කට්ටිය, චෙක්වලින් සල්ලි ගත්ත කට්ටිය ඉන්නවා. අපි වගකීමක් ඇතිව මෙය කියනවා. පසුගිය මහ ඡන්දයට කලින් පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමෙන් ආණ්ඩුවේ ප්‍රබලයකුට රුපියල් මිලියන 800ක් දුන්නා. ඔහු විසින් එක්සත් ජාතික පක්ෂයේ අපේක්ෂකයන්ගෙන් දිනයි කියලා හිතෙන අයට රුපියල් ලක්ෂ 50 ගණනේ බෙදලා දුන්නා. මැතිවරණයෙන් දිනයි කියලා හිතපු අයට අර්ජුන් ඇලෝසියස්ගෙන් ලැබුණු සල්ලිවලින් රුපියල් ලක්ෂ 50 ගණනේ බෙදා දුන්නා. සල්ලි ගත්ත කෙනා දන්නේ නැද්ද මේවා අර්ජුන් ඇලෝසියස්ගේ සල්ලි කියලා? මිලියන 800ක් බෙදා දුන්නා. ඒ සල්ලි ගත්ත මිනිස්සු කවුද, නොගත්ත මිනිස්සු කවුද කියලා අනාවරණ කරලා නිවැරදි කළ යුතුව තිබෙනවා. ඒක කරන්නේ නැතුව අපි ප්‍රශ්නයක් අහන කොට, "රාජපක්ෂ, රාජපක්ෂ" කියලා මේ පැත්තට අත දික් කරන්නේ නැතුව ඒ කරුණු අනාවරණ කරන්න. එවැනි දෙයකට සම්බන්ධ නොවුණු එක්සත් ජාතික පක්ෂයේ අභිංසක මන්ත්‍රීවරු ඉන්නවා නම් ඒ අයට සහ අපට පිරිසිදු වීමේ අවශ්‍යතාවක් තිබෙනවා.

අර්ජුන් ඇලෝසියස්ගේ සල්ලි අරගෙන තිබෙන්නේ මන්ත්‍රීවරු විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපට දැන ගන්නට ලැබී තිබෙන විධියට යහ පාලනය ගෙනෙන්න දහලපු රටේ ප්‍රසිද්ධ හාමුදුරුවරුත් ඉන්නවා. ඒ හාමුදුරුවරුන්ගේ නම් කියැවෙනවා. කලාකරුවන්ගේ නම් කියැවෙනවා. සාධාරණ සමාජයක් සඳහා වූ ව්‍යාපාරයේ කට්ටියගේ නම් කියැවෙනවා. අපි හැම තිස්සේම රූපවාහිනියෙන් දකින දඹර අම්බල හාමුදුරුවන්ගේ නමත් තිබුණා. සමන් රත්නප්‍රියගේ නමත් තිබුණා. ගාමිණී වියන්ගොඩගේ නමත් තිබුණා. ධර්මසිරි බණ්ඩාරනායකගේ නමත් කියැවෙනවා. සමනලී ෆොන්සේකාගේ නමත් කියැවෙනවා. මේ හැම කෙනෙක්ම පිරිසිදු නම් අපරාධකරු කවුද, හොරු කවුද කියලා සමාජයට අනාවරණ කිරීමේ වගකීමක් මේ ගරු පාර්ලිමේන්තුවට තිබෙනවා. "ඒ කාලයේ මෙහෙමයි. උදයංග වීරතුංග මෙහෙමයි. අරයා මෙහෙමයි. මෙයා මෙහෙමයි" කිය කියා ඒ වගකීමෙන් බැහැර වෙන්න එපා. අර්ජුන මහේන්ද්‍රන් ගෙනැල්ලා රටට හඳුන්වා දුන්නේ කවුද? ඔහුට පත්වීම් දුන්නේ කවුද? අර්ජුන මහේන්ද්‍රන් සිංගප්පූරුවේ මහුල් ගෙදරක ගියා කියලා කිව්වේ කවුද? සිංගප්පූරුවට ගිහින් අර්ජුන මහේන්ද්‍රන් හම්බ වුණේ කවුද? අර්ජුන මහේන්ද්‍රන් සිංගප්පූරුවේදී හමු වෙලා, සිංගප්පූරු-ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම අත්සන් කරන කොට ඒකේ ප්‍රධාන උපදේශකයා හැටියට ඔහු පත් කළේ කවුද? මෙන්න මේ කරුණු රට දැන ගත යුතුව තිබෙනවා. රටට "රට බයිලා" කියන්නේ නැතුව, පාර්ලිමේන්තුවට ඇවිල්ලා ඇත්ත කියන්න ඕනෑ. මෙවැනි තත්ත්වයක් තුළ අද මහජන නියෝජිතයාගේ භූමිකාව බරපතළ අපහසුතාවකට ලක් වෙලා තිබෙනවා. එම නිසා අපි ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා මේ ප්‍රශ්නය හිහන්නාගේ තුවාලයක් බවට තවදුරටත් පත්කර ගන්න එපා කියලා.

තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා කිව්වා, දැන් මේ ප්‍රශ්නය අඩු වෙමින් එනවා, ආයෙත් වැඩි වනවා කියලා. මේ ප්‍රශ්නය අඩු වෙන්නේ කොහොමද මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ලංකා ඉතිහාසයේ විශාලම මුදල් හොරකම, මුදල් වංචාව කරලා තිබෙනවා. ඒ ප්‍රශ්නය සැරෙන්-සැරේ, සැරෙන්-සැරේ ඉස්මතු වෙනවා. දිය යට ගසා තිබෙන බැලුම් බෝලයක් උඩට එනවා වාගේ උඩට එනවා. ඒක නැති කරන්න බැහැ. ඒක නැති කරන්න පුළුවන් වන්නේ, කවදා හෝ දවසක ජනතාවාදී ආණ්ඩුවක් බලයට පැමිණ හොරු ටික හිරගෙදරට දක්කපු දවසයි. ඒත් හොරු හිරගෙදරට දක්කන්නේ නැහැ නේ. හොරු එළියේ. හොරු එහෙත් ඉන්නවා; මෙහෙත් ඉන්නවා. මෙවැනි තත්ත්වයක් තුළ මහජන නියෝජිතයාගේ භූමිකාව බරපතළ අපහසුතාවකට ලක්වෙලා තිබෙන කාලයක් මේක.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මා දැක්කා, අපේ ගරු රවුෆ් හකීම් ඇමතිතුමා මේ සභාවේ කථා කරනවා. එතුමා දැන් මේ ගරු සභාවෙන් නික්ම ගිහින් තිබෙනවා. මා හිතුවා, එතුමා මේ ගරු සභාවේ ඉඳියි කියලා. මේ වනවිට රට පුරාම ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ සේවක වෘත්තීය සමිති සියල්ලම -ඉංජිනේරුවන්ගේ සිට කම්කරු සමිති දක්වා සියලුදෙනා- එකට එකතුවෙලා විශාල වැඩ වර්ජනයක්

[ගරු ටී. රංජිත් ද සොයිසා මහතා]

දියත් කර තිබෙනවා. අපි අනතුරු ඇඟවීමක් කරනවා, හෙට අනිද්දා වනකොට මුළු රටේම, විශේෂයෙන්ම මහ නගර සභා බල ප්‍රදේශ සියල්ලේම පානීය ජලය පිළිබඳ බරපතළ ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන් කියලා. සියයට 25කින් වැටුප් වැඩි කරනවාය කියලා රජය වෘත්තීය සමිතිවලට පොරොන්දු වුණා නම්, අවුරුදු තුනෙන් තුනට වැටුප් වැඩි කරනවාය කියන සහතිකය තිබෙනවා නම්, ගරු ඇමතිතුමා සහ කැබිනට් මණ්ඩලය එය අනුමත කර තිබෙනවා නම් මොකක්ද තිබෙන ප්‍රශ්නය? අපට දැන ගන්න තිබෙන ආකාරයට ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නව සභාපතිවරයාගේ අවශ්‍යතාව මත වැටුප් වැඩිවීම් නොකර, සේවකයන් සටන් ක්‍රියාමාර්ගයට ඇද දැමීම තුළ රජය සහ ඇමතිතුමා අපහසුතාවට ලක්වෙලා තිබෙනවා. ඒ නිසා අපි ගරු ඇමතිතුමාගෙන්, ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, සභාපතිවරයාට "බැරි නම් ගෙදර යන්න" කියලා කනෙන් අල්ලා එළියට දමන්නය කියලා. සේවක අයිතිවාසිකම් වෙනුවෙන් සහ ආණ්ඩුවේ නම්බුව ආරක්ෂා කර ගන්න නම් මේ වැඩ වර්ජනය අවසාන වෙන්න විසඳුමක් ලබා දිය යුතුයි. සියයට 25ක වැටුප් වැඩිවීමක් ඉල්ලුවාට පස්සේ එය දෙනවාය කිව්වා. නමුත් අද එය සියයට 20 දක්වා අඩු කරන්න යෑම තුළ තමයි මේ බරපතළ අර්බුදය ඇතිවෙලා තිබෙන්නේ. වැඩ වර්ජනයකට සේවක සේවිකාවන් ඇද දැමීම තුළ, "දැන් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පාඩුයි. මෙය පෞද්ගලීකරණය කරන්න ඕනෑ"යි කියන පෞද්ගලීකරණය කිරීමේ අවශ්‍යතාවකුත් තිබෙනවාය කියලා අපි විශ්වාස කරනවා. මොකද, මේ ආණ්ඩුවේ එකම ප්‍රතිපත්තිය තමයි විකුණාගෙන කෑම. දැන් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පාඩුයි කියා විකුණන්න හදනවා. දැන් ටිකකට කලින් ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා කිව්වා, "සෙවණගල නම් අපි විකුණන්නේ නැහැ. අපි එය එහෙම ම තියා ගන්නවා"යි කියලා. සෙවණගල විකුණන්නේ නැහැයි කිව්ව එක ගැන අපි එතුමාට ස්තුතිවන්ත වනවා; ආණ්ඩුවටම ස්තුතිවන්ත වනවා. එහෙම කිව්වා වාගේම එහෙම කරයි කියලාත් අපි හිතනවා.

ඒ ආකාරයට දැන් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විනාශය කරා ඇදගෙන යන වෙලාවේ -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මට තව විනාඩියක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් මා කියන්න යන කාරණය පිළිබඳව ආණ්ඩුවේ වග කිව යුතු ඇමතිවරුන් ජාතිය හමුවේ ප්‍රකාශයක් කළ යුතු වෙනවා. "රජයේ ඉඩම් බැංකු" නමින් පනත් කෙටුම්පතක් දැන් පාර්ලිමේන්තුවට ගෙනෙන්න කටයුතු කරනවා. එවැනි පනත් කෙටුම්පතක් ගෙනැවිත් ජාතියේ හදවත වැනි නකල්ස් කඳුකරයේ අක්කර 21,000ක්, ආණ්ඩුවේ ප්‍රබල ඇමතිවරුන් දෙදෙනකුගේ මැදිහත්වීම මත සවුදි කුමාරයකුට දෙන්න හදනවා, ත්‍රාෂ්ටික අපද්‍රව්‍ය ලංකාවට ගෙනැල්ලා දමන්න. ඒ ඉඩම් ප්‍රමාණය සවුදි කුමාරයකුට දෙන්න හදන්නේ ආණ්ඩුවේ ප්‍රබල ඇමතිවරුන් දෙදෙනෙක්. ඒ ප්‍රබල ඇමතිවරුන් දෙදෙනා කවුද කියා ආණ්ඩුව පැත්තෙන් කවුරුන් හෝ ඇහුවොත් මා ඒ නම් දෙක කියන්නම්. සියල්ල විකුණාගෙන කන මේ ආණ්ඩුව අද ජාතියේ හදවත වැනි නකල්ස් රක්ෂිතය විනාශ කරන්න, අක්කර 21,000ක් විකුණන්න කටයුතු කරනවා. මෙන්න මෙවැනි දේවල්වලට එරෙහිව තමයි මේ රටේ 6,200,000ක් ඡන්ද දායකයෝ "මෛත්‍රී පාලනයක් .... ස්ථාවර රටක්" සඳහා 2015 ජනවාරි මාසයේ 08 වන දා මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාට ඡන්දය දුන්නේ. ජනාධිපතිතුමාට මේ සම්බන්ධව නිහඬව ඉන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා අපි රජයෙන් ඉල්ලීමක් කරනවා, ආණ්ඩුවේ ඇමතිවරුන්ට ඕනෑ ඕනෑ විධියට මේ රටේ ජාතික සම්පත්, ජාතික දේපොළ, ඉඩම් ටික විදේශිකයන් සතු කරන්න ඉඩ දෙන්න එපා කියලා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුවෙන් ගෙනාපු 1972 ඉඩම් ප්‍රතිසංස්කරණය පනත සංශෝධනය කරලා, "රජයේ ඉඩම් බැංකු" නමින් පනත් කෙටුම්පතක් ගෙනැවිත්, ඒ හරහා ඉඩම් අක්කර 21,000ක් ලංකාවේ ඇමතිවරුන් දෙදෙනකු සවුදියේ රජ කුමාරයකුට විකුණන්න හදනවා. ඒ පිළිබඳව අපට බරපතළ සැකයක් සහ අප්‍රසාදයක් ඇති වෙනවා. මෙවැනි කරුණු කාරණා සම්බන්ධව අවධානය යොමු කරලායි මහජන නියෝජිතයන් වශයෙන් අපි මේ පාර්ලිමේන්තුවේදී කටයුතු කළ යුතු වන්නේ. එහෙම නැතුව ඒ පැත්තෙන් මේ පැත්තට පනින, මේ පැත්තෙන් ඒ පැත්තට පනින, ඊට පස්සේ අපි ඔක්කොම ගෙදර යන දෙයක් නොවෙයි, මේ පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයන්ගෙන් රටේ ජනතාව බලාපොරොත්තු වන්නේ. පාලන බලය ගත් උදවිය හරියාකාරව පාලනය කරගෙන ගිහින්, ඊළඟට බලයට එන අයට රට භාර දිය යුතුයි. ඒ නිසා නකල්ස් රක්ෂිතය විකුණන්න හදනවා නම් මේ රටේ භූමියට, ගහට-කොළට, ඇළට-දොළට, සතා-සීපාවාට, මහ පොළොවට ආදරය කරන සියලුදෙනාත් එක්ක ආණ්ඩුවේ උත්සාහය පරාජය කරන්න අපි සූදානම්ය කියන එකත් මා කියන්න කැමැතියි. ඒ වාගේම මහ පොළොවට ආදරය කරන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙනුත් අපි ඉල්ලීමක් කරනවා, මේ සටනේදී අපි පක්ෂ භේදයක් නැතුව එකට එකතු වෙමු කියලා. මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මන්ත්‍රීතුමා.

[ප.ප. 5.26]

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
කෞරව තලෛමෙතාංකුම් උරුප්පිනර් අවර්කළේ, ඇන්රු ඉංකු විවාත්තුක්කු එටුත්තුක් කොණ්ටුප්පට්ටුළ්ළ කටෙ, අලුවලක ඌලියර්කළින් ඌලියත්තෙයුම් වේතනත්තෙයුම් ඔළුංකුපටුත්තල් මට්රුම් මකප්පේට්රු නන්මෙකළ් පට්රිය තිරුත්තච් චට්ටමූලංකළ් තොටර්පිල් නාන් චිල විටයංකළෛක් කූර විරුම්පුකින්රේන්.

එමතු මාවට්ටත්තිලේ පල්වේරු තොළිල්තුරෙචාර් තොළිල් නිරුවනංකළ් ඉරුන්තපෝතිලුම්, අංකු 'පිරිමා' පෝන්ර තනියාර් නිරුවනංකළිල් නිරන්තර ඌලියර්කළාකවුම් තර්කාලික ඌලියර්කළාකවුම් කටන්ත කාලංකළිලේ කටමෛ පුරින්තවර්කළින් EPF, ETF එන්පන ඔළුංකුපටුත්තප්පටාත චූළලිල්, අවර්කළුක්කාන EPF number කළ් ආරු මාතංකළුක්කු ඔරුමුරෛ මාර්රම්පෙර්රු, ඉන්රු අවර්කළ් අන්ත නන්මෙකළෛ නිරන්තරමාකවේ පෙර මුටියාත ඔරු චූළල් උරුවාක්කප්පට්ටුළ්ළතු. ඉන්තත් තොළිලාළර්කළින් නලනෛප් පේණුමුකමාක නාංකළ් පල්වේරුපට්ට චට්ට වල්ලුනර්කළෛ - චට්টත්තරණිකළෛ නියමික්කින්රපෝතිලුම් කුරිත්ත වේලෛ වළංකුනර්කළ් චම්පන්තප්පට්ටවර්කළුක්කු ඉලට්චක්කණක්කාන

பணத்தைக் கொடுத்துச் செயற்படுவதன்மூலம் அந்த ஊழியர்களின் நலனைப் பேணுவதில் அவர்கள் தடையாக இருக்கின்றார்கள். இந்த நிலைமை சீர்செய்யப்பட வேண்டும்.

இங்கு உறுப்பினர்கள் கடை, அலுவலக ஊழியர்களின் ஊழியத்தையும் வேதனத்தையும் ஒழுங்குபடுத்துதல் தொடர்பாகப் பேசுகின்றபோது பெண்கள் தொடர்பாகவும் குறிப்பிட்டார்கள். இன்று சில தனியார் துறையில் தொழில் புரிகின்ற பெண்களுக்கு அவர்கள் பணிபுரிகின்ற கம்பனிகள் மகப்பேற்று லீவு வழங்காதபோதிலும், மூன்றாவது பிள்ளைப் பிரசவம் குறித்தும் 84 நாள் விடுமுறை அங்கீகரிக்கப்படுவது இங்கு குறிப்பிடத்தக்கது. அதேநேரம் மட்டுப்படுத்தப்பட்ட அளவில் மகப்பேறுகள் இடம்பெற வேண்டும் என்று கூறிய சீனா போன்ற சில நாடுகள், இன்று அந்தக் கட்டுப்பாட்டைத் தளர்த்தி, கூடுதலான பிள்ளைகளைப் பெறுகின்றவர்களுக்கு அன்பளிப்பு வழங்குகின்ற நிலைமையைக்கூட நாங்கள் காண்கின்றோம். சில நிறுவனங்கள் பெண் ஊழியர்களுக்கு மகப்பேற்று லீவு வழங்காததன் காரணமாக, இன்று அவர்கள் தங்களது குழந்தைகளுக்குத் தாய்ப்பால் கொடுக்கமுடியாத சூழல் ஏற்பட்டிருக்கின்றது. இதனால், அந்தக் குழந்தைகள் பல்வேறுபட்ட அசௌகரியங்களை அனுபவிக்கின்றனர். குறித்த பிள்ளைகள் வளர்ச்சி குன்றியவர்களாக, மூளை வளர்ச்சி குன்றியவர்களாக மற்றும் செயற்பாடு குன்றியவர் களாகக் காணப்படுகின்றார்கள்.

இன்று தோட்டத் தொழிலாளர்களின் வேதனங்கள் குறுக்கப்பட்டிருக்கின்ற அதேநேரம் சம்பந்தப்பட்ட தொழில் வழங்குநர்கள் தொழிலாளர்களின் EPF, ETF போன்ற விடயங்களில் முறையாகப் பங்களிப்புச் செய்வதில்லை.

இந்த இடத்திலே இன்னுமொரு விடயத்தையும் கூற வேண்டும். அதாவது இங்கு பேசியவர்கள் பலரும் Perpetual Treasuries நிறுவனம் தொடர்பாகவும் குறிப்பிட்டார்கள். அர்ஜுன் மகேந்திரன் அல்லது அலோசியஸ் போன்றவர்கள் தொடர்பில் சம்பந்தப்பட்டவர்கள் கூறுகின்றபோது, "இது புதிதாக அறிமுகப்படுத்தப்பட்ட ஒரு நிறுவனம்; அதாவது, நாங்கள் ஆட்சிக்கு வந்த பிறகு வந்த ஒரு நிறுவனம்" என்ற வகையில் கருத்துத் தெரிவித்தார்கள். ஆனால், அன்று முன்னாள் ஜனாதிபதி அவர்களுடைய புதல்வர் ஆடம்பரமாக நிகழ்வை நடத்தி, குறித்த ஒரு நகரத்தை நரகமாகக் காட்சியளிக்கச் செய்த, அல்லது மின்னொளியைப் பாய்ச்சி இந்த நாட்டினுடைய சகல செயற்பாடுகளையும் முடக்கிவிட்ட குறித்த நிகழ்ச்சிக்கு அலோசியஸினுடைய Perpetual Treasuries நிறுவனம் sponsor ஆக இருந்தது என்பதை இங்கு யாரும் மறுக்க முடியாது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, COPE குழுவில் நானும் ஓர் உறுப்பினராக இருக்கின்றேன். அந்த COPE குழுவிற்குக் கௌரவ உறுப்பினர் சுனில் ஹந்துன்னெத்தி அவர்களைத் தலைவராக நியமிக்க வேண்டும் என்று கௌரவ பிரதம மந்திரி அவர்கள் அன்று கூறியது கௌரவ பிரதம மந்திரி அவர்களுடைய நேர்மையான போக்கினை எடுத்துக் காட்டுகின்றது. அந்தக் குழுவுக்கு 400க்கு மேற்பட்ட குற்றச் செயற்பாடுகள் தொடர்பான முறைப்பாடுகள் முன்வைக்கப்பட்டிருக்கின்றன. ஆகவே, பல கம்பனிகள் ஊழல் செய்திருக்கின்றன. இந்த நிலைமையிலே அவற்றை ஆராய வேண்டும் என்பதற்காகவே கௌரவ உறுப்பினர் சுனில் ஹந்துன்னெத்தி அவர்களைத் தலைவராக்குங்கள் என்று எங்களிடம் சொன்னார்கள். ஐக்கிய தேசியக் கட்சியை அல்லது ஐக்கிய தேசிய முன்னணியைச் சேர்ந்தவர்களை அல்லது அதிமேதகு ஜனாதிபதி அவர்களைச் சார்ந்தவர்களைத் தலைவராக்குங்கள் என்று அவர் கூறவில்லை. அந்த வகையில் ஜே.வி.பீ. கட்சியினுடைய உறுப்பினர் சுனில் ஹந்துன்னெத்தியை நாங்கள் அதன் தலைவராக்கினோம். ஆனால், அவர்கள் இந்த விடயத்தில் அரசியல் நடத்தினார்கள். தலைவர் தெரிவிற்குப் பின் அவர்கள் என்ன செய்தார்களென்றால், ஒரே இடத்தில் நின்று கொண்டார்கள். அதாவது, பல்லாயிரக்கணக்கான கோடி ரூபாய் ஊழல்கள் இடம்பெற்ற மற்றைய நிறுவனங்கள் பற்றிச் சிந்திக்கவில்லை.

இன்று அவர்கள் சாதாரண ஊழியர்களையும் வீதியிலே இறக்கிவிட்டு, ஒழுங்குபடுத்த முடியாத, நாட்டுக்கு நஷ்டத்தை எற்படுத்துகின்ற வேலை நிறுத்தங்களில் ஈடுபடுகின்றார்கள். ஆனால், ஜப்பான் போன்ற வளர்ந்த நாடுகளிலே பகலிலே வேலை நிறுத்தம் செய்வதில்லை என்பது உங்களுக்குத் தெரியும். அங்குள்ள ஊழியர்கள் குறித்த ஒரு கோரிக்கையை முன்வைத்து இரவிலேயே வேலைநிறுத்தத்தில் ஈடுபடுகின்றார்கள். நாட்டினுடைய வருமானம் இழக்கப்பட்டு விடக்கூடாது அல்லது நாட்டில் ஒழுங்குபடுத்தப்பட்டிருக்கின்ற பொருளாதார நிகழ்ச்சித்திட்டங்கள் மாறுபட்டுவிடக்கூடாது என்பதிலே அவர்கள் கவனமாக இருக்கின்றார்கள். ஆனால், நமது நாட்டில் ஒரு சமூகத்தைப் பற்றி அல்லது படித்தவர்களைப் பற்றி அல்லது university மாணவர்களைப் பற்றிச் சிந்திக்கின்றதாகக் கூறிக்கொள்கின்றவர்கள், சம்பந்தப் பட்டவர்களுடைய உணர்ச்சிகளைத் தூண்டி அவர்களை வீதிகளிலே போராட வைக்கின்றார்கள். இதன்மூலமாக இந்த நாட்டினுடைய பல்லாயிரக்கணக்கான கோடி ரூபாய் வருமானம் பாதிக்கப்பட்டிருக்கின்றது. அன்று நாங்கள் ஒன்பது இலட்சம் மில்லியனுக்கு மேற்பட்ட கடன் சுமையோடுதான் இந்த நாட்டினுடைய ஆட்சிப் பொறுப்பை ஏற்றோம். ஆனால், அந்தக் கடனை எப்படிச் செலுத்துவது அல்லது எப்படி நிவர்த்தி செய்வது என்பது பற்றி ஜே.வி.பீ. உறுப்பினர்களோ அல்லது பொதுஜன முன்னணியுடன் சார்ந்த உறுப்பினர்களோ கூறுவதில்லை. இந்த வேலைநிறுத்தங்கள் நாட்டினுடைய பொருளாதாரத்தை நாசமாக்கிவிடும்.

இன்று பெற்றோலியம் 157 டொலர்களாக இருக்கின்ற போது, அல்லது 42 டொலர்களாகக் குறைந்தபோது, அல்லது பிறகு 56 டொலர்களாக அதிகரித்தபோது, அதனுடைய விலை நிர்ணயம் எப்படியிருக்க வேண்டும் என்பதிலே தற்போதைய அரசாங்கம் கவனம் செலுத்தி ஒரு விலைச் சூத்திரத்தைக் கொண்டுவந்ததுபோன்று, இந்த நாட்டிலேயிருக்கின்ற தனியார் மற்றும் அரச ஊழியர்களுக்குரிய சம்பளம் எந்தளவிலே அதிகரிக்கப்பட வேண்டும் என்ற ஒரு சூத்திரம் நிர்ணயிக்கப்பட வேண்டும். இந்த நிலைமை இல்லாததன் காரணமாகத்தான் இன்று இந்த நாட்டினுடைய ஒவ்வொரு தொழிலாளருடைய வருமானங்களிலே அல்லது அவர்களுடைய உரிமைகளிலே பேதங்கள் காணப்படுகின்றன.

இன்று 'பிறிமா' நிறுவனத்தைப் பொறுத்தவரையில், அங்கு தற்காலிக ஊழியர்களுக்கு 500 ரூபாய் சம்பளம்தான் வழங்கப்படுகின்றது. இதனால் அவர்கள் மாதத்திலே 15,000 ரூபாயைக்கூடப் பெறமுடியாதவர்களாக இருக்கின்றார்கள். 1983ஆம் ஆண்டு அந்த நிறுவனம் உருவாக்கப்பட்டது. இன்று அங்கு வேலை செய்த பலர் இளைப்பாறி இருக்கின்றார்கள். ஆனால், அவர்களுடைய EPF, ETF ஆகியவற்றைப் பெறமுடியாத வகையில் அவற்றில் நிதி மோசடி செய்யப்பட்டுள்ளது. அது தற்பொழுது கண்டு பிடிக்கப்பட்டு, 3 தனியார் இது தொடர்பில் மாதாந்தம் பல இலட்சம் ரூபாயைச் செலுத்திக்கொண்டிருக்கின்றார்கள். ஆனால், இந்த நிதியை வலுக்கட்டாயமாக அறிவிட வேண்டிய அளவுக்கு நிலைமை இருக்கவேண்டியதில்லை. தொழில் கொடுத்த 'பிறிமா' நிறுவனம்தான் மாதாந்தம் அந்த ஊழியர்களுக்குரிய EPF and ETF இனைப் பொறுப்பேற்க வேண்டும்.

[ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා]

අතුමට්ටුමන්නි, අන්ත இடத்தில් உருவாகின்ற dust இன் காரணமாக இன்று பலர் புற்றுநோயாளர்களாக மாறியிருக் கின்றார்கள். இன்று chemicals பாவனையின்மூலமாகத்தான் kidney பாதிப்படைகின்றது என்பது உங்களுக்குத் தெரியும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹ்ரூப்)
(The Hon. Abdullah Mahrooff)
Sir, please give me one more minute.

අන්තச் சுற்றுச்சுழலில் இருக்கின்றவர்களுக்குக்கூடச் சுகாதாரக் கேடுகள் ஏற்பட்டிருக்கின்ற காரணத்தினால், இந்த ஊழியர்களுடைய சம்பளம் மற்றும் ஏனைய விடயங்களை ஒழுங்குபடுத்துகின்றபோது, அவர்களுடைய சுகாதாரம், போஷாக்கு, எதிர்கால வாழ்வு மற்றும் வைத்தியத் தேவை போன்றவற்றுக்குத் தேவையான நிதியையும் ஒழுங்குபடுத்திக் கொடுக்க வேண்டும். எனவே, தனியார் கம்பனிகளாக இருந்தாலும் சரி, கடைத்தொகுதிகளாக இருந்தாலும் சரி, அரசே இவற்றை ஒழுங்குபடுத்த வேண்டும் என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා.5.34]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා චේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත සහ සූතිකාධාර (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර කියවීම පිළිබඳව විවාද කරන මේ අවස්ථාවේ දී මටත් කථා කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා.

මීට පෙර දින 42කට සීමා වී තිබුණු ප්‍රසූත නිවාඩුව දින 84 දක්වා දීර්ඝ කිරීම වාගේම, තුන්වැනි දරුවාගේ සිට දින 42කට සීමා වෙලා තිබුණු ප්‍රසූත නිවාඩුව දින 84ක් දක්වා දීර්ඝ කිරීම, ඒ වාගේම අජීවී දරු උපතක් සිදු වූ අවස්ථාවකදී දින 42ක් දක්වා ප්‍රසූත නිවාඩු ලබා දීම, යම් කිසි හේතුවක් මත ප්‍රසූත කාල පරිච්ඡේදය තුළ සේවය කර තිබෙනවා නම්, ඊට අදාළ ගෙවීම් ලබාදීම අනිවාර්ය කිරීම, පැය 9ක සේවා කාල පරිච්ඡේදය තුළ ළදරුවන්ට මව් කිරි ලබා දීම සඳහා වාර දෙකක් -පැය හාගය බැගින් දෙවරක්- ලබා දීම, එහෙම නැත්නම් ඊට අදාළ සුදුසු ස්ථානයක් නොමැති නම් ඒ සඳහා පැය දෙකක කාලයක් ලබා දීම යන සංශෝධන පිළිබඳව කරනු ලබන විවාදයට සහභාගි වෙන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා.

අද දින විවාදය ආරම්භයේ සිටම විශේෂයෙන්ම විපක්ෂයේ මන්ත්‍රීවරුන් මේ සම්බන්ධයෙන් විවිධ අදහස් පළ කළා. අපි මතක් කර දෙන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. පැය 9ක සේවා කාලය තුළ දරුවාට මව් කිරි ලබා දෙන්නට අපි පැය 2ක් වෙන් කරනකොට, එදා රාජපක්ෂ රෙජීමයේ උදවිය කළේ, උත්සවවලට ගිහිල්ලා අම්මලාගේ අතේ සිටින දරුවන් හුරතල් කරලා, පහුවෙනිදාට ළදරු කිරි පිටිවල මිල වැඩි කිරීමයි. එදා ඒ විධියට කිරි පිටි මිල වැඩි කරපු කට්ටිය තමයි අද ඇවිල්ලා බොහොම වේදනාවෙන් මේ ගැන කථා කරන්නේ. එතුමන්ලා විවාදය පටන් ගත් වෙලාවේ ඉඳලාම බඩු මිල ගැන කථා කරනවා; ජීවන වියදම ගැන කථා කරනවා; ආර්ථික අපහසුතා ගැන කථා කරනවා; විවිධ දුෂ්කරතා ගැන කථා කරනවා අපි දැක්කා. ඒ කාලය ආර්ථික පරිහානිය විතරක් නොවෙයි, මාධ්‍ය නිදහස නොමැතිකම, මාධ්‍යකරුවන් මර්දනය කිරීම ආදී විශාල ව්‍යසනයන්ට මුහුණ දෙන්න සිදු වුණු කාලයක් බවට පත් වෙලා තිබුණා. අද ඒ සියලුම දේවල් අමතක කරලා එම උදවිය නැවත මැරිලා ඉපදිලා වගේ කථා කිරීම පිළිබඳව මම කනගාටු වෙනවා.

මේ කාරණය ගැනත් මා මතක් කරන්නට ඕනෑ. ඊයේ නියෝජ්‍ය කථානායකවරයකු පත්කර ගැනීම සිදු වුණා. ඒ සඳහා විපක්ෂයෙන් අපේක්ෂිකාවක් ඉදිරිපත් වුණා. අවසානයේ දී නියෝජ්‍ය කථානායකවරයා එක්සත් ජාතික පක්ෂයෙන් පත් වුණාට පසුව එම අපේක්ෂිකාව කියනවා, "තමන් පරාජය වීම නොවෙයි සිදු වුණේ, සමස්ත කාන්තා පරපුරම පරාජයට පත් වීමයි සිදු වුණේ" කියලා. තමන් පැරදුණාම කාන්තා පරපුරත් විකුණන්න උත්සාහ කිරීම පිළිබඳව මා කනගාටු වෙනවා.

මම මතක් කර දෙන්නට ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ ක්‍රියාකාරකම් ගැන කථා කරද්දී, නිසියාකාරව ඔවුන්ගේ සේවය ලැබෙන්නේ නැහැ, සාමාන්‍ය ජනතාවට හිරිහැර වෙනවා; ඒ වාගේම තර්ජන ගර්ජනවලට මුහුණ දෙන්න සිදු වෙනවා කියලා අපට නිතර දෙවේලේ අහන්නට ලැබෙනවා. විශේෂයෙන්ම ඉඩම් ගැටලු නිරාකරණය කර ගැනීමේදී ඒ සඳහා දීර්ඝ කාලයක් ගතවෙනවා, මිනිස්සුන්ට සාධාරණයක් ඉටු වෙන්නේ නැහැ කියලා කියනවා. මේ කරුණු කාරණා පිළිබඳව මන්ත්‍රීවරුන් විධියට අපට ජනතාව පැමිණිලි කළත්, අපි ඒ පිළිබඳව වැඩි සැලකිල්ලක් දැක්වූයේ නැහැ.

හැබැයි, පසුගිය දිනක මටත් එහි යථාර්ථය තේරුම් ගන්න හැකියාව ලැබුණා. 2016දී නිවාස ව්‍යාපෘතියකට ඉල්ලපු ඉඩමක් 2016 සිට 2018 වනතුරුම කල් ඇදලා, අවසානයේ ප්‍රාදේශීය ලේකම්වරියක් විසින් නීති විරෝධී ලියවිල්ලකින් එය නිවාස සංවර්ධන අධිකාරියට ලබාදී තිබෙනවා. ඒ ලියවිල්ලේ පිටපතක් මා **සභාගත* කරනවා.**

අදාළ ලියවිල්ලේ දිනය සඳහන් වන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එය අත්සන් කර තිබෙන්නේ ප්‍රාදේශීය ලේකම් වෙනුවට, පරිපාලන නිලධාරි (වැඩ බලන) විසිනුයි. ඒ විතරක් නොවෙයි, "අනුමත කිරීම" කියන වචන වෙනුවට යොදා තිබෙන්නේ "නිර්දේශ කිරීම" යන්නයි. මේ විධියට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අන්දවලා නිවාස ව්‍යාපෘති කරන්න ගිහින් අවසානයේ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිලධාරීන් දෙදෙනෙකුට රැකියාව අහිමි වෙලා ඔවුන් දැන් ගෙදර ගිහින් ඉන්නවා. මේකයි අද රාජ්‍ය සේවයේ තත්ත්වය. රාජ්‍ය ආයතනයකින් රාජ්‍ය ආයතනයකට සලකන්නේ මෙහෙම නම්, ජනතාව සම්බන්ධයෙන් දක්වන්නේ කෙබඳු සැලකිල්ලක්ද කියන ප්‍රශ්නය අපිට තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, 1980 - 1990 කාලයේ රජයේ ආයතනවල දොරටුවලදී ලබාගත් අල්ලස් අද වන විට ඉහළ පුටු දක්වා ගිහින් තිබෙනවා. මෙවැනි ආකාරයේ අල්ලස් චෝදනා ලැබීම නිසා මීට ටික කලකට ඉස්සෙල්ලා ජනාධිපති කාර්යාලයේ ඉහළම නිලධාරීන් තුන්දෙනකුට බන්ධනාගාරගත වෙන්න සිද්ධ වුණා. අද රණ විරුවන් ගැන කථා කරන ඇතැම් උදවිය පසුගිය කාලයේ රණ විරුවන් සැබෑ සතුරන් පසුපස හඹා යනකොට කටයුතු කළ ආකාරය අපට මතකයි. රාජ්‍ය දේපොළ දූෂිත ලෙස විකිණීමට, රාජ්‍ය මුදල් අවභාවිත කිරීමට කටයුතු කළ උදවිය,

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

තම පවුලේ ප්‍රතිරූපය ගොඩ නඟා ගැනීමට කටයුතු කළ උදවිය තමන්ගේ රෙජීමය විවේචනය කරන පුද්ගලයන් පසුපස හමුදාව යොදවා ඔවුන් ඝාතනය කිරීමට පසුගිය කාලයේ කටයුතු කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුද හමුදා මූලස්ථානය සතු ඉඩම සින්නක්කර අයිතියට ෂැන්ග්‍රි-ලා හෝටලයට විකුණපු අය අද ඒක ඇතුළේම ඉඳගෙන මාතෘ භූමිය ගැන කථා කරනවා; දේශීයත්වය ගැන කථා කරනවා; ස්වෛරීත්වය ගැන කථා කරනවා; බැති ධර්ම දේශනා පවත්වනවා. රට, ජාතිය, ආගම ගැන කථා කරමින් පසුවට තඩි බා ගන්නා උදවිය බලය ලබාගැනීමට සිහින මවමින්, ලංකා ඉතිහාසයේ කවදාවත් සිදු නොවුණු දේවල් කරලා, විදේශීය රටකට සින්නක්කර අයිතියට විකුණපු භූමියක් තුළ ඉඳගෙනම බැති ධර්ම දේශනා පවත්වනවා. මේක තමයි අද වනකොට ඒකාබද්ධ විපක්ෂයේ භූමිකාව වෙලා තිබෙන්නේ.

තමන්ගේ දෙමව්පියන්ගේ සොහොන් ස්මාරක බැඳීමට මහජන මුදල්, දේපොළ අවභාවිත කළ, මිග් යානා ගනු දෙනුව සඳහා වැඩිපුර ඩොලර් මිලියන 7ක් මහජන මුදලින් නාස්ති කළ පුද්ගලයන් 2020දී මහ පුටුවට පැමිණීමේ සිහිනයෙන් අද කියන කථා අපට ඇහෙනවා. අවුරුදු 10ක්ම තමන් සහ සහෝදර සමාගම මඟින් රට පාලනය කරලා, අල්ලස, දූෂණය, භීෂණය රට පුරා උපරිමයට ගෙනැවිත් බලයෙන් ඉවත් වුණු පුද්ගලයින් නැවතත් මහ පුටුවට ඒමේ අදහසින් ජනතාව ගොනාට අන්දවන්න උත්සාහ කරනවා. මේ බොරුව, වංචාව නැවතත් පරාජය කරන්න අපි හැමෝම එකතු විය යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඒකාබද්ධ විපක්ෂයේ උදවියට විවාදයකට එනකොට, කථාවක් පවත්වනකොට බැඳුම්කරය පිළිබඳ මාතෘකාව නැතිවම බැහැ. ඒක තමයි ඒ ගොල්ලන්ගේ ප්‍රධාන මාතෘකාව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබී තිබෙන වේලාව අවසන්.

ගරු චන්දිම ගමගේ මහතා
(මාණ්පුමිකු සන්දිම කමකේ)
(The Hon. Chandima Gamage)
හොඳයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2008 සිට 2015 වනතුරු ඒ අය බැඳුම්කර හරහා කොපමණ මුදලක් වංචා කළාද, කීයක් දූෂණ කළාද, කොයි තරම් මුදලක් හම්බ කළාද කියන එක අද ඒ උදවියට අමතක වෙලා තිබෙනවා.

අද වැඩ වර්ජන ගැන කථා කරනවා. එදා වැඩ වර්ජනය කළා නම් එක්කෝ වෙඩි තිබ්බා; නැත්නම් ගැහුවා; නැත්නම් මැරුවා. අද ඒ තත්ත්වය නැති නිසා හැමෝටම ප්‍රජාතන්ත්‍රවාදී රටක් තුළ වැඩ වර්ජන කිරීමේ හැකියාව තිබෙනවා. ඒ අවස්ථාව ලබාදීම තුළ අද වැඩ වර්ජන වැඩි වෙලා තිබෙනවා. ඔය පවත්වන බොහෝ වැඩ වර්ජනවලට හේතු සාධක සොයා බැලුවොත්, ඇත්ත වශයෙන්ම වැඩ වර්ජනවලට යොමු විය යුතු නැති කරුණුවලටත් වැඩ වර්ජන කරන්න ජනතාව වාගේම රාජ්‍ය සේවකයන්, පෞද්ගලික ආයතනවල සේවකයන් අද පෙළඹීලා තිබෙන බව පෙනී යනවා. අද වැඩ වර්ජන කරන්නේ තමන්ට සිදු වුණු අසාධාරණයක් වෙනුවෙන්ම නොවෙයි කියන එක පැහැදිලිව කියන්න ඕනෑ. වැඩ වර්ජන කියන එක අද මේ රටේ මෝස්තරයක් වෙලා වාගේම, මාධ්‍යවල අවධානය ලබා ගැනීමට කරන විජ්ජාවක් බවටත් පත් වෙලා තිබෙනවා. ඒ නිසා අද මේ රටේ සංවර්ධනය, නිදහස වාගේම මේ රටේ විරෝධතාවල ප්‍රවේශයත් වෙනස් වෙලා තිබෙනවාය කියන කාරණය මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
බොහොම ස්තූතියි.

මී ළඟට, ගරු අරවින්ද් කුමාර් මන්ත්‍රීතුමා.

ඊට පෙර්ම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු මලික් සමරවික්‍රම මහතා (සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා)
(මාණ්පුමිකු මලික් சமரவிக்ரம - அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்)
(The Hon. Malik Samarawickrama - Minister of Development Strategies and International Trade)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු එඩ්වඩ් ගුණසේකර මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு எட்வட் குணசேகர அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. EDWARD GUNASEKARA *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු අරවින්ද් කුමාර් මහතා.

[ප.ව. 5.44]

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(මාණ්පුමිකු அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)
கௌரவ அவைத் தலைவர் அவர்களே, நன்றி. இன்று நாங்கள் கடை, அலுவலக ஊழியர் (ஊழியத்தையும் வேதனத் தையும் ஒழுங்குபடுத்தல்) (திருத்தம்) சட்டமூலம் மற்றும் மகப்பேற்று நன்மைகள் (திருத்தம்) சட்டமூலம் பற்றிய விவாதத்தில் கலந்துகொண்டு எங்களுடைய கருத்துக்களை முன்வைத்துக் கொண்டிருக்கின்றோம். அதற்குத் தாங்கள் எனக்குத் தந்த வாய்ப்பை நன்றியோடு நினைவுகூருகின்றேன்.

கடை, அலுவலக ஊழியர் (ஊழியத்தையும் வேதனத்தையும் ஒழுங்குபடுத்தல்) (திருத்தம்) சட்டமூலம் ஆங்கிலத்தில் Shop and Office Employees (Regulation of Employment and Remuneration) (Amendment) Bill என்று சொல்லப்படுகின்றது. இந்த நாட்டிலே இது மிகவும் பிரல்யமான ஒரு சட்டமாக இருக்கின்றது. இலட்சக்கணக்கான ஊழியர்களின் விடயங்களைத் தன்னகத்தே கொண்டிருக்கும் ஒரு சட்டமாக நாங்கள் இதனைப் பார்க்கின்றோம். இந்தச் சட்டத்தினூடாக விசேடமாக தனியார்துறை மற்றும் தோட்டத் துறை, ஊழியர்களின் சேமநலன்கள் பாதுகாக்கப்படுகின்றன. இதன்கீழ் பல்வேறு நன்மைகள் இருக்கின்ற அதேநேரம் தவறுகளும் திருத்த வேண்டிய விடயங்களும் இருப்பதையும் இந்த உயரிய சபையிலே நாங்கள் சுட்டிக்காட்ட வேண்டியதாக இருக்கின்றது.

[ගරු අ. අරවින්ද් කුමාර් මහතා]

ஊழியர்களுக்கு ஏற்படும் பல்வேறு இன்னல்களைப் பற்றி, ஒரு தொழிற்சங்கவாதி என்ற வகையிலும் மலையகத்திலே மிகப் பிரபல்யம்வாய்ந்த தொழிற்சங்கங்களிலே ஒன்றான மலையகத் தொழிலாளர் முன்னணியின் இணைத் தலைவர் என்ற வகையிலும் நான் இங்கு சுட்டிக்காட்ட வேண்டி யிருக்கின்றது. நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற மலையக மக்களில் மிக அதிகளவானவர்கள் தோட்டத் தொழிலாளர் களாக இருக்கின்றார்கள். அந்தத் தொழிலாளர்களின் சம்பளம் இரண்டு வருடங்களுக்கு ஒருமுறை கூட்டு ஒப்பந்தத்தினூடாக நிர்ணயிக்கப்பட்டு வருகின்றது. இந்தக் கூட்டு ஒப்பந்தம் கடைசியாக மிகக் காலதாமதமாகியே செய்யப்பட்டது. எனவே, அதற்கான காரணம் என்ன? என்று அதில் சம்பந்தப் பட்டவர்களிடம் நாங்கள் கேட்க வேண்டியிருக்கின்றது. ஒவ்வோர் இரண்டு வருடங்களுக்கும் ஒருமுறை கூட்டு ஒப்பந்தம் புதுப்பிக்கப்படுகின்றபோது அது காலாவதி யாவதற்கு முன்பே புதுப்பிக்கப்படுகின்றது அல்லது காலாவதி யாகிய ஓரிரு மாதங்களுக்குள் புதுப்பிக்கப்படுவதை நாங்கள் கடந்த காலங்களில் பார்த்தோம். ஆனால், அந்தக் கூட்டு ஒப்பந்தம் காலாவதியாகிச் சுமார் ஒரு வருடத்திற்குப் பின்புதான் கடைசியாகப் புதுப்பிக்கப்பட்டது.

முன்பெல்லாம் கூட்டு ஒப்பந்தம் புதுப்பிக்கப்படுவதனால் உயர்வடையும் சம்பளத்தின் அடிப்படையில் கணக்கீடு செய்து தோட்டத் தொழிலாளர்களுக்கு நிலுவைச் சம்பளம் கொடுக்கப் பட்டு வந்ததை நாங்கள் அனுபவ ரீதியாகப் பார்த்திருக் கின்றோம். ஆனால், கடந்தமுறை ஒரு வருடம் கால தாதமாகியே இந்தக் கூட்டு ஒப்பந்தம் கைச்சாத்திடப் பட்டது. அதனால் ஒவ்வொரு தோட்டத் தொழிலாளிக்கும் மாத மொன்றுக்கு 3,500 ரூபாய் என்ற அளவிலே நிலுவை வழங்கப்படவேண்டியிருந்தது. அப்படியானால் ஒரு வருட காலப்பகுதிக்கு 42,000 ரூபாயை ஒரு தோட்டத் தொழிலாளிக்கு நிலுவையாக வழங்கவேண்டிய நிலைமை ஏற்பட்டது. அந்த நிலுவைப் பணம் அவர்களுக்கு வழங்கப்படும் என்று தொழிற் சங்கவாதிகளாகிய நாங்கள் எதிர்பார்ப்புடன் இருந்தோம். நாங்கள் மட்டுமல்ல, தோட்டத் தொழிலாளர்கள், தோட்டத் தொழிற்றுறையை நம்பியிருக்கும் குடும்பங்கள், தோட்டத் தொழிற்றுறையை நம்பி வியாபாரம் செய்யும் வர்த்தகர்கள் ஆகியோரும் எதிர்பார்ப்புடன் இருந்தார்கள். அத்துடன் வங்கிக் கடன்களைப் பெற்ற தோட்டத் தொழிலாளர்கள் இந்த நிலுவைப் பணத்தினூடாகத் தங்கள் கடன்களைச் செலுத்த முடியும் என்ற பெரும் எதிர்பார்ப்போடு இருந்தார்கள். ஆனால், ஈற்றிலே என்ன நடந்தது? வருடமொன்றுக்குத் தோட்டத் தொழிலாளி ஒருவருக்கு நிலுவைப் பணமாக 42,000 ரூபாய் என்ற அளவில் செலுத்த வேண்டும் என்ற வகையில் பார்க்கின்றபோது 2 இலட்சம் தோட்டத் தொழிலாளர்களுக்கும் 800 கோடிக்கும் அதிகமான நிலுவைத் தொகை வழங்கப்பட வேண்டியிருந்தது. ஆனால், கூட்டு ஒப்பந்தம் செய்யப்பட்டு 2 வருடங்கள் பூர்த்தியாகின்ற இந்தக் காலகட்டத்திலே துரதிருஷ்டவசமாக அந்த 800 கோடிக்கும் அதிகமான ரூபாயிலே ஒரு சதமேனும் நிலுவையாகத் தோட்டத் தொழிலாளர்களுக்கு வழங்கப்படவில்லை. இதனை ஒரு மாபெரும் அநியாயமாகவே பார்க்க வேண்டியிருக்கின்றது; பெரும் பகற்கொள்ளையாகவே பார்க்க வேண்டியிருக்கின்றது. அப்படியென்றால், கூட்டு ஒப்பந்தத்திலே சம்பந்தப்பட்டவர்கள் - முதலாளிமார்களாக இருக்கலாம் அல்லது தொழிற்சங்கத்தினராக இருக்கலாம் - எவராக இருந்தாலும் இந்த இரண்டு தரப்பினர்களுக்குமிடையிலே ஏதோவொரு deal இருக்கின்றது என்பதை இதிலிருந்து புரிந்துகொள்ளக் கூடியதாக இருக்கின்றது. அதாவது இந்த இரண்டு தரப்பினரும் ஒரு புரிந்துணர்வுடன் செயற்படுகின்றார்கள் என்றுதான் இதனைப் பார்க்க வேண்டியிருக்கின்றது. அந்த வகையில் ஆயிரம், இரண்டாயிரம் ரூபாய் அல்ல, ஓர் இலட்சம், இரண்டு இலட்சம் ரூபாய் அல்ல, ஒரு மில்லியன், இரண்டு மில்லியன் ரூபாய் அல்ல. 800 கோடி ரூபாய்க்கும் அதிகமான நிலுவைப் பணம் சூறையாடப்பட்டிருக்கின்றது. அப்படி என்றால் இந்த அநியாயத்தை யாரிடம் போய்ச் சொல்வது?

இதனையும் ஓர் ஊழல் என்றுதான் சொல்லவேண்டும். அதாவது 800 கோடி ரூபாய் - அப்பாவித் தோட்டத் தொழிலாளர்களுக்கு வழங்கப்பட வேண்டிய தொகை - இதுவரையிலும் வழங்கப்படாத நிலையில், அவ்வாறான ஒரு தொகையை வழங்குவதற்கான எந்தவொரு சமிக்ஞையும் இல்லாத நிலையில் அது சூறையாடப்பட்டிருக்கின்றது என்றவொரு நிலைப்பாட்டுக்கே நாங்கள் வரவேண்டியிருக் கின்றது. அப்படி என்றால் பல்வேறு ஊழல்களையும் விசாரிப்பதற்காக ஆணைக்குழுக்கள் நியமிக்கப்படுகின்ற இந்தச் சந்தர்ப்பத்தில் இது சம்பந்தமாகவும் விசாரிக்கப்பட வேண்டும். பல்வேறு ஊழல், மோசடிகளை விசாரணை செய்வதற்காக ஆணைக்குழுக்கள் நியமிக்கப்பட்டு வருகின்ற இந்த நாட்டிலே தோட்டத் தொழிலாளர்களிடமிருந்து சூறையாடப்பட்டதாகக் கருதப்படும் இந்த 800 கோடி ரூபாய்க்கு என்னவாயிற்று என்பதைப் பற்றி விசாரித்து, அதற்கான சரியானதொரு தீர்வைத் தோட்டத் தொழிலாளர் களுக்குப் பெற்றுக் கொடுக்க அதிமேதகு ஜனாதிபதி அவர்கள் ஓர் ஆணைக்குழுவை நியமிக்கவேண்டுமென்ற கோரிக்கை யைத் தோட்டத் தொழிலாளர்கள் சார்பிலும் இந்த உயரிய சபையைப் பிரதிநிதித்துவம் செய்கின்ற ஏனைய உறுப்பினர்கள் சார்பிலும் இவ்வுயரிய சபையில் நான் முன்வைக்க விரும்புகின்றேன். இதற்கொரு நல்ல தீர்வு கிடைக்குமென்ற நம்பிக்கை இருக்கின்றது.

தாய்மாரின் பிரசவம் தொடர்பான, தாய்ப்பால் ஊட்டு வதிலே தாய்மார் முகங்கொடுக்கும் பிரச்சினைகள் தொடர்பான திருத்தம் இந்த உயரிய சபையிலே முன்வைக்கப் பட்டிருக்கின்றது. நாங்கள் தாயைக் கடவுளுக்கும் மேலாக மதிக்கின்றோம்; "தாயிற் சிறந்ததொரு கோவில் இல்லை" என்று சொல்வார்கள். அப்படியென்றால், அந்தத் தாய் சரியான முறையில் அரவணைக்கப்படுகின்றாரா? பிரசவ காலத்திலே தாய்மாருக்குக் கிடைக்கவேண்டிய நன்மைகள் கிடைக் கின்றனவா? என்று பார்த்தால், இல்லை என்ற நிலைமையே இருக்கின்றது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)
Sir, please give me one more minute.

விசேடமாக தோட்டத் தொழிற்றுறையிலே தொழில் செய்யும் பெண்களைப் பொறுத்தளவிலே, அவர்கள் பிரசவ காலத்திலே மிக மிகக் கஷ்டமான நிலைமையிலே தங்களது தொழிலைச் செய்கின்றார்களென்ற உண்மையை இங்கே நான் கூற வேண்டும். வயிற்றிலே சிசுவின் பாரம்! தலையிலே அதைவிடப் பல கிலோ கிராம் அதிகமான - உச்சகட்டமான பாரம்! இந்நிலையில் ஒரு தாய் இவ்வாறான ஒரு துன்பகரமான நிலைமைக்கு எவ்வாறு முகங்கொடுப்பது என்பதைப் பற்றிச் சற்றுச் சிந்தித்துப் பாருங்கள்! வேறு எந்தவொரு தொழிற் றுறையிலும் இவ்வாறானதோர் அவலகரமான நிலைமை காணப்படுவதில்லை. அதுமாத்திரமல்ல, இன்று தோட்டத்

துறையில் தொழில்புரியும் கர்ப்பிணிப் பெண்மணிகள் பிரசவ தினம் வரையிலும் தொழில் செய்யும் ஓர் அவலகரமான நிலைமை இருக்கின்றது. அதாவது நாளை பிரசவம் என்றால் இன்றுவரை தொழில் செய்யும் நிலைமை காணப்படுகின்றது. அது குறித்து நான் இரண்டு பிரதான காரணங்களைப் பார்க்கின்றேன். ஒன்று, அறியாமையின் காரணமாகப் பிரசவ தினத்தை அவர்கள் மறந்து விடுவது! அடுத்தது, பொருளாதார நிலைமையினால் கடைசித்தினம்வரை தொழில் செய்ய வேண்டிய அவலகரமான நிலை! இவ்வாறான நிலைமை களுக்கு மத்தியில்தான் தோட்டங்களிலே பெண்கள் தொழில் செய்துகொண்டு வருகின்றார்கள்.

தாய்ப்பால் ஊட்டுவதற்கான நேர ஒதுக்கீடு பற்றி இங்கு திருத்தம் முன்வைக்கப்பட்டிருக்கின்றது. ஆனால், தோட்டத் துறையிலே தொழில் செய்யும் எந்தவொரு பெண்மணிக்கும் இந்த நேர ஒதுக்கீடு பொருந்தாதென்பதை நான் இந்த இடத்தில் சுட்டிக்காட்ட விரும்புகின்றேன். ஏனெனில், அவர்கள் வீட்டிலிருந்து மிகத் தொலை தூரத்தில் தொழிலுக்குச் செல்கின்றார்கள். அதாவது அங்குள்ள தாய்ப்பாலூட்டும் பெண்மணிகளும் மிகத் தொலைவிலிருக்கும் மலைகளுக்கே வேலைக்காகப் போக வேண்டும். அப்படியென்றால், அவர்கள் இந்த நிலைமையை எவ்வாறு சமாளிக்கப்போகின்றார்கள்? இது எவ்வாறு சாத்தியமாகுமென்பதை மிக ஆழமாக ஆராய்ந்து பார்க்க வேண்டியிருக்கின்றது. இன்னும் பல விடயங்களையும் மற்றும் குறைகளையும் இங்கே சுட்டிக்காட்டவேண்டிய அவசியம் இருந்தாலும்கூட நேரம் போதாமையின் காரணமாக இத்துடன் எனது பேச்சை முடித்துக் கொள்கின்றேன். நன்றி. வணக்கம்.

[பி.ப. 5.55]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

கௌரவ சபைக்குத் தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மிக முக்கியமான இரண்டு சட்டத் திருத்தங்கள் பற்றி விவாதிக்கப்படும் இந்நாளில் உரையாற்ற வாய்ப்பளித் தமைக்கு உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். அவற்றில் ஒன்று மகப்பேற்று நன்மைகள் (திருத்தம்) சட்டமூலம். நாட்டிலுள்ள ஏனைய தாய்மாருக்கு மூன்றாவது குழந்தைப் பிரசவத்தின்போதும் 84 நாட்கள் விடுமுறை வழங்கப்பட்டு வந்த நிலையில் இதுவரை காலமும் பெருந்தோட்டங்களிலே வேலை செய்கின்ற பெண் தொழிலாளர்களுக்கு மூன்றாவது குழந்தைக்கு 42 நாட்கள் மாத்திரமே விடுமுறை வழங்கப்பட்டு வந்தது. நான் இது குறித்துப் பல்வேறு சந்தர்ப்பங்களிலே பாராளுமன்ற விவாதங்களிலே எடுத்துக் கூறியிருக்கிறேன். அதனைச் செவிமடுத்து இந்தத் திருத்தத்தை முன்வைத்து, இந்த நாட்டில் வேலை செய்கின்ற எல்லாத் தாய்மாருக்கும்போல மலையகப் பெருந்தோட்டத் தொழிலாளிகளாக இருக்கக்கூடிய தாய்மாருக்கும் மூன்றாவது குழந்தைப் பிரசவத்துக்கும் 84 நாட்கள் விடுமுறையைப் பெற்றுக் கொடுக்க நடவடிக்கை எடுத்த தொழில் அமைச்சர் அவர்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். முன்னர் போயா தின விடுமுறைகள் மற்றும் ஏனைய அரச விடுமுறைகளையும் சேர்த்து அந்த 84 நாட்கள் கழிக்கப்பட்டு வந்த நிலையில், இன்று அதுவும் மாற்றப்பட்டு, வேலை நாட்களில் மாத்திரம் இந்த 84 நாட்கள் கணக்கிடப்படுவதும் வரவேற்கக்கூடிய ஒரு விடயம். .

இந்தச் சபையில் கடை, அலுவலக ஊழியர் (ஊழியத்தையும் வேதனத்தையும் ஒழுங்குபடுத்தல்) (திருத்தம்) சட்டமூலமும் முன்வைக்கப்பட்டிருக்கின்றது. இந்தச் சட்டத்துக்கும் மகப்பேற்று நன்மைகள் (திருத்தம்) சட்ட மூலத்துக்கும் இடையில் ஒரு தொடர்பு ஏற்படுகின்றது. அதாவது, கடை, அலுவலக ஊழியர் சம்பந்தப்பட்ட சட்டத்தின் பிரகாரம் பெண் தொழிலாளர்கள் தாய்ப்பால் ஊட்டுவதற்கான ஏற்பாடுகள் செய்யப்பட்டிருக்கவில்லை. எனவே, மகப்பேற்று நன்மைகள் பற்றிய சட்டத்தின்கீழ் பெண் தொழிலாளர்கள் தங்களது குழந்தைகளுக்குத் தாய்ப்பால் ஊட்டுவதற்கு ஏற்ற வகையிலுள்ள ஏற்பாடுகளை, கடை, அலுவலக ஊழியர் பற்றிய சட்டத்திலும் இணைத்துக் கொள்கின்ற திருத்தம்மூலம் அந்தத் தொடர்பு ஏற்படுகின்றது. அதுவும் தொழில் அமைச்சினால் இது முன்னெடுக்கப்பட்டிருக்கின்றது என்ற வகையில் தொழில் அமைச்சர் அவர்களுக்கு நன்றி தெரிவிக்கக் கடமைப்பட்டிருக்கின்றேன். அத்துடன் இங்கே தொழில் அமைச்சின் சார்பாக வருகைதந்திருக்கின்ற அனைத்து அதிகாரிகளுக்கும் மற்றும் சட்டவரைஞர் திணைக்கள அதிகாரிகளுக்கும் நன்றி தெரிவிக்கின்றேன். அதேநேரம் இந்த முக்கியமான சட்டத்திருத்தத்தை வரவேற்கின்றேன். சட்ட வரைஞர் திணைக்கள அதிகாரிகளுடன் நான் இது பற்றிக் கலந்துரையாடியிருக்கின்றேன். இருந்தபோதிலும் இந்த இரண்டு சட்டங்களுடனும் தொடர்புடையதாக மிக முக்கிய மான திருத்தம் ஒன்றைச் செய்ய வேண்டிய தேவைப்பாடும் புதிய திருத்தத்தின் ஊடாக ஏற்பட்டிருக்கின்றது. அதனால் தான் இந்தத் திருத்தச் சட்டத்தை யார் முன்வைத்தார்கள் என நான் கேள்வி எழுப்பினேன். பெருந்தோட்டத் தொழிலாளர் களின் மூன்றாவது குழந்தைக்காக 42 நாட்கள் வழங்கப்பட்ட்டு வந்த விடுமுறையை 84 நாட்களாக அதிகரித்து அவர்களுக்கான ஏற்பாடுகளைச் செய்து கொடுக்கின்ற அதேநேரம், இங்கு முன்வைக்கப்பட்டுள்ள குறித்த திருத்தத்தில் மிக முக்கியமான மாற்றம் ஒன்று செய்யப்பட வேண்டியுள்ளது. அந்தத் திருத்தத்தை வாசித்துவிட்டு, அது சம்பந்தமாக விபரிக்க விரும்புகின்றேன்.

இந்தத் திருத்தத்தில் சொல்லப்படுவதானது, "ஏதேனும் கடை அல்லது காரியாலயத்தில் பெண் ஊழியர் ஒருவரின் தொழில்தருநர் ஒரு வயதுக்குக் கீழ்பட்ட குழந்தை ஒன்றுக்கு அவள் தாய்ப்பால் ஊட்டுவதாயின், ஏதேனும் ஒன்பது மணித்தியால காலப்பகுதியில், அவை தேவைப்படுத்தக்கூடிய வாறான அத்தகைய நேரங்களில் இரண்டு தாய்ப்பால் ஊட்டும் கால இடைவெளிகளை அவளுக்கு அனுமதித்தல் வேண்டும். ஒவ்வொரு கால இடைவெளியும், ஒரு குழந்தைப் பராமரிப்பு நிலையம் அல்லது வேறு பொருத்தமான இடம் அத்தகைய குழந்தைக்கு தாய்ப்பால் ஊட்டுவதற்காக அத்தகைய பெண் ஊழியருக்கு அத்தகைய தொழில்தருநரால் வழங்கப்படு மிடத்து, 30 நிமிடங்களுக்குக் குறையாமல் இருத்தல் வேண்டும் என்பதுடன், குழந்தைப் பராமரிப்பு நிலையம் அல்லது வேறு பொருத்தமான இடம் எதுவும் அவ்வாறு வழங்கப்பட்டிருக்காத விடத்து, ஒரு மணித்தியாலயத்துக்குக் குறையாமல் இருத்தல் வேண்டும்..." என்தாகும். இந்த விடயத்தில்தான் பிரச்சினை இருக்கின்றது. I think the officers from the Legal Draftsman and the Ministry of Labour must take note of this point. அதாவது, ஏற்கனவே பிள்ளைப் பராமரிப்பு நிலையம் ஏற்படுத்தப்பட்டிருக்கும்பட்சத்தில் அவர்களுக்குத் தாய்ப் பால் ஊட்டுவதற்கான வாய்ப்பு 30 நிமிடங்களுக்குக் குறையாமல் ஒன்பது மணித்தியாலயங்களில் இரண்டு தடவைகள் வழங்கப் படவேண்டும் என்பதாகக் குறித்த திருத்தத்தில் சொல்லப் பட்டிருக்கின்றது. அதேநேரம் பிள்ளைப் பராமரிப்பு நிலைய ஏற்பாடுகள் இல்லாத வேலைத் தலங்களில் ஒரு மணித்தியாலத் திற்குக் குறையாமல் வழங்கப்பட வேண்டும் என்று அதில் மேலும் சொல்லப்படுகின்றது.

[ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා]

மலையகப் பெருந்தோட்டப் பகுதிகளைப் பொறுத்த வரையில், பிள்ளைப் பராமரிப்பு நிலையங்கள் இருக்கின்றன. எனவே, அவர்களுக்கு வழங்கப்படுகின்ற நேரம் என்பது 30 நிமிடங்களாகத்தான் இருக்கும். ஆனால், அவர்கள் வாழக் கூடிய வீடுகள் இருக்கின்ற பகுதிகளில்தான் பிள்ளைப் பராமரிப்பு நிலையங்கள் இருக்கின்றன. அவர்கள் அங்கேதான் அந்தக் குழந்தைகளை விட்டுச் செல்கின்றார்கள். அதாவது அவர்கள் வசிக்கின்ற ஊரிலிருந்து கிட்டத்தட்ட ஐந்து கிலோ மீற்றர் - மூன்று கிலோ மீற்றர் தூரத்திலுள்ள மலைப் பகுதி களுக்குத்தான் கொழுந்து பறிக்கின்ற பெண்கள் வேலைக்குச் செல்ல வேண்டியிருக்கின்றது.

The field where the female employees are working is three to five kilometres away from the crèche or the child development centre. But, the Amendment states that if a crèche is there, an employee will be given only 30 minutes for nursing her child. In this case, they have the crèche, but it is far from the field. So, I think this should be amended again because in the same day we are going to give them another opportunity. Previously, they have been deprived of the maternity leave for the third child. Then, 42 days became 84 days and we welcome that. We thank the Government and the Hon. Minister. Also, there is another amendment to be made especially for the female estate workers. Even though they have been given crèches for their children, according to the proposed Amendment they are allowed to take only 30 minutes. But, it should be amended as one hour. So, I think the Hon. Minister together with the officials will take this matter into account and amend this Act again.

அதற்கு மேலதிகமாக இன்னுமொரு விடயத்தையும் ஞாபகப்படுத்தவேண்டியிருக்கின்றது. Then, with regard to domestic workers -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, your time is over.

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
I have one more minute, Sir.

அதாவது, இன்று வீட்டு வேலையாட்கள் எனச் சொல்லப் படுபவர்கள் சாதாரண குறைந்தபட்ச வேதனச் சட்டத்திலிருந்து விலக்களிக்கப்பட்டிருக்கின்றார்கள். Sir, the domestic worker has been excluded from the National Minimum Wage of Workers Act. இது சம்பந்தமாக இந்தச் சபையிலே ஏற்கனவே நான் பேசியிருக்கின்றேன். கடந்த மேதினத்தன்று அதிமேதகு ஜனாதிபதி அவர்கள் தனது மேதினச் செய்தியிலே வீட்டு வேலையாட்களையும் குறைந்தபட்ச வேதனச் சட்டத்தின்கீழ்க் கொண்டுவர வேண்டும் என்கின்ற முன்மொழிவைச் செய்திருந்தார். அதிமேதகு ஜனாதிபதி அவர்களின் அனுசர ணையும் ஆலோசனையும் இந்த விடயத்தில் இருப்பதனால் இந்தக் கோரிக்கையை நிறைவேற்ற நடவடிக்கை எடுக்கப்பட வேண்டும். The domestic workers should also be included by amending the Act. That is our responsibility.

Thank you very much for the time given to me.

[பி.ப. 6.02]

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

சபைக்குத் தலைமைதாங்கும் கௌரவ உறுப்பினர் அவர்களே, இங்கு முன்வைக்கப்பட்டுள்ள மகப்பேற்று நன்மைகள் (திருத்தம்) சட்டமூலம், கடை, அலுவலக ஊழியர் (ஊழியத்தையும் வேதனத்தையும் ஒழுங்குபடுத்தல்) (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதத்தில் கலந்துகொண்டு உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்குத் தங்களுக்கு நன்றி தெரிவித்துக் கொள்கின்றேன்.

சக உறுப்பினர் திலகராஜா அவர்கள் கூறியதுபோல, நாங்கள் பிரதிநிதித்துவப்படுத்துகின்ற எங்களது சமூகத்தோடு தொடர்புடைய மிக முக்கியமான திருத்தங்கள் இந்தச் சட்ட மூலத்தில் உள்ளடக்கப்பட்டிருப்பது வரவேற்கத்தக்க விடய மாகும். அதேநேரம் அவர் இங்கு முன்வைத்த மாற்றங்கள் குறித்த கூற்றினை வரவேற்பதோடு, அந்த மாற்றங்கள் இடம்பெறவேண்டும் என்று வலியுறுத்திக் கேட்டுக்கொள் கின்றேன். மூன்றாவது பிள்ளைப் பிரசவத்தின்போது வழமையாக வழங்கப்படுகின்ற பிரசவகால விடுமுறையின் அரைப் பகுதியே தோட்டத் தொழிலாளர்களுக்கு இதுவரை காலமும் வழங்கப்பட்டு வந்தது. இந்த நிலைமை நீக்கப்பட்டு தோட்டத் தொழிலாளர்களும் ஏனைய ஊழியர்கள்போல குறித்த முழுக்காலப்பகுதிக்கான விடுமுறையைப் பெற விருப்பது மிகுந்த வரவேற்புக்குரியது. எங்களுடைய கால கட்டத்திலே இந்த மாற்றம் இடம்பெறுவது எங்களுக்குப் பெருமை சேர்க்கின்றது.

நாட்டின் பொருளாதாரத்திலே மிக முக்கியமாகப் பங்காற் றுகின்ற ஒரு பிரிவினராகப் பெருந்தோட்டத்துறையைச் சேர்ந்த மலையக சமூகப் பெண்கள் காணப்படுகிறார்கள் என்பதில் மாற்றுக் கருத்துக்கு இடமில்லை. ஆனால், அவர்களின் தொழிலோடு சம்பந்தப்பட்ட வாழ்க்கை முறையை எடுத்துப் பார்க்கின்றபோது, சில முக்கியமான விடயங்களை வெளிப்படுத்த வேண்டியிருக்கின்றது. அதாவது, தோட்டங் களில் தொழில் செய்கின்ற பெண்கள் வேலைக்குச் செல்கின்ற போது குழந்தைகளை விட்டுச் செல்கின்ற குழந்தைப் பராமரிப்பு நிலையங்கள் எவ்விதமான அடிப்படை வசதி களோ, நியமங்களோ அற்றவைகளாகக் காணப்படுகின்றன. இந்த நிலையங்களில் குழந்தைகளைப் பராமரிப்பதற்கு அல்லது குழந்தைகளைப் பொறுப்பேற்பதற்கு அமர்த்தப் பட்டிருக்கின்ற ஊழியர்கள் எந்தவிதமான தகைமைகளோ பயிற்சிகளோ அற்றவர்களாக இருக்கின்றார்கள். மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சு இது தொடர்பிலும் கவனம் செலுத்த வேண்டும்.

தோட்டத்துறையிலுள்ள குழந்தைகள் மற்றும் சிறுவர் களினுடைய பராமரிப்பு நிலையங்கள் தொடர்பாகச் சிறுவர் அலுவல்கள் அமைச்சினது கவனத்தை ஈர்ப்பதற்குரிய பல முன்மொழிவுகளை நாங்கள் செய்திருக்கின்றோம். இருந்தாலும் அமைச்சின் செயற்பாடுகள் இன்னும் பெருந் தோட்டத் துறைக்கு விஸ்தரிக்கப்பட்டதாகத் தெரியவில்லை. இன்னமும் அந்த நிலையங்களின் செயற்பாடுகள் அவ்வாறே இருக் கின்றன. ஆகவே, சட்டங்கள் இயற்றப்பட்டாலும், சட்டத் திருத்தங்கள் கொண்டுவரப்பட்டாலும் அவை எந்த மட்டத்தில் நடைமுறைப்படுத்தப்படுகின்றன என்பதில் மிக முக்கியமாகக் கவனம் செலுத்தப்பட வேண்டியிருக்கின்றது. சக உறுப்பினர் திலகராஜா அவர்கள் குறிப்பிட்டதுபோல, இந்தச் சட்டத் திருத்தத்தின்மூலம் மலையக சமூகத்திற்கு குறித்த விடயத்தில் வாய்ப்பு அளிக்கப்பட்டாலும், இன்னோர் விடயத்தில்

அவர்களின் தொழிலோடு சார்ந்த சிக்கல்கள் இருப்பதை அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. இது தொடர்பாகக் கவனம் செலுத்துதல் மிக முக்கியமானது.

கடை, அலுவலக ஊழியர் சம்பந்தப்பட்ட சட்டமானது மிகவும் பிரபல்யமானது. எனக்கு முன்பு உரையாற்றிய அரவிந்த் குமார் அவர்கள் குறிப்பிட்டதுபோல, இது பெருந் தொகையான ஊழியர்களை உள்வாங்கிய ஒரு சட்டமாகும். ஆனால், இந்த சட்டம் எந்த அளவிலே நடைமுறைப் படுத்தப்படுகின்றது என்பது பற்றிக் கவனிக்கப் பட வேண்டியிருக்கின்றது. இன்று கடை, காரியாலயங்களில் வேலை செய்கின்ற ஊழியர்களில் எத்தனை பேருக்கு நியமனக் கடிதம் வழங்கப்படுகின்றது? அவர்களின் வேலை நேரம் தொடர்பான கட்டளைச்சட்டம் எந்த அளவுக்கு நடைமுறையில் இருக்கின்றது? என்பதில் கவனம் செலுத்த வேண்டும். அதேபோல் அவர்களின் விடுமுறை சம்பந்தமான சட்ட ஏற்பாடுகள் எந்த அளவிலே நடைமுறையில் இருக்கின்றன என்பது தொடர்பிலும் கவனம் நாங்கள் செலுத்த வேண்டும். ஏனெனில் இந்த விடயங்கள் ஒவ்வொன்றும் சட்டமாக இருக்கின்றபோதிலும் நடைமுறையிலே இல்லாத நிலைமையே இருக்கின்றது. தொழில் அமைச்சு அதிகாரிகள் இந்த விடயத்தைத் தொழில் அமைச்சின் கவனத்துக்குக் கொண்டு வருவது முக்கியமானது. ஆகவே, இந்தத் திருத்தச் சட்டத்தை இனிவரும் நாட்களிலாவது உயிரோட்டம் கொண்டதாக்கி, ஊழியர்களினது உரிமை மற்றும் நல்களைப் பெற்றுக் கொடுப்பதில் இந்தச் சட்டத்தினுடைய அமுலாக்கலம் சரியான முறையிலே அமைய வேண்டும் என்று இந்த இடத்திலே கேட்டுக் கொள்ள விரும்புகின்றேன்.

கடந்த காலங்களில் தோட்டத் தொழிலாளர்களுக்கான பிரசவ வைத்தியசாலை வசதிகள் பெருந்தோட்டங்களுக்கு உள்ளேயே இருந்தன. இந்தத் தோட்டத் தொழிலாளர்களுக்குப் பிரசவ விடுமுறைக் காலத்திற்குரிய கொடுப்பனவுகள் செய்யப்படுகின்றபோது, அந்தப் பிரசவச் செயற்பாடுகளுக்காக அந்த வைத்தியசாலைகள் தொடர்பில் ஒரு கட்டணம் அறவிடுவது வழமையாக இருந்து வந்தது. இன்று அத்தகைய வைத்தியசாலைகள் பலதும் கைவிடப்பட்டு மூடப்பட்ட நிலையிலே இருக்கின்றன. ஆனால், அவை தொடர்பாகப் பெருந்தோட்டங்களோ, அமைச்சோ, அரசோ போதுமான கவனம் இல்லை; அரசினது போதுமான கவனம் செலுத்துவதில். நாங்கள் இது தொடர்பாகவும் பல தடவைகள் இந்த அவையிலே கவன ஈர்ப்புக்கான முன்மொழிவுகளைச் செய்திருக்கின்றோம். இன்று அந்த வைத்தியசாலை இல்லாத நிலையிலும் அவர்களுடைய மகப்பேற்றுக் காலத்துக்குக் கொடுக்கப்படுகின்ற கட்டணத்திலிருந்து வைத்திய சாலைக்குரிய அத்தகைய கட்டணத்தை அறவிடுகின்ற தோட்டங்களும் இன்னும் இருக்கின்றன என்பதை இந்த இடத்திலே உங்களது கவனத்திற்குக் கொண்டுவர வேண்டும். ஆகவே, இது தொடர்பாக ஒரு சரியான ஆராய்வை மேற்கொண்டு அப்பாவித் தோட்டத் தொழிலாளர்களுக்குக் கிடைக்க வேண்டிய சரியான கொடுப்பனவைப் பெற்றுக் கொடுப்பதற்குரிய நடவடிக்கை எடுக்க வேண்டும்.

இன்று தொழில் அமைச்சின்கீழ் பல்வேறு தொழிற் சட்டங்கள் இருக்கின்றபோதும் அந்தச் சட்டங்கள் மூடி மறைக்கப்படுகின்ற இடமாகப் பெருந்தோட்டத்துறை இருக்கின்றது என்பது எங்களுக்குத் தெரியும். அந்த வகையில் இந்தத் திருத்தங்களும் சிக்கிவிடக்கூடாது. ஆகவே, இதிலிருக்கக்கூடிய நன்மைகள், உரிமைகள் என்பன எங்களுடைய பெருந்தோட்டத் தொழிலாளர்களுக்கும் கிடைப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும் என்று வலியுறுத்தி விடை பெறுகின்றேன். நன்றி.

[අ.භා. 6.10]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දවසේ සාකච්ඡාවට ගැනෙන වැදගත් පනත් කෙටුම්පතක් වන කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා චේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අදහස් දක්වන්න ලැබීම පිළිබඳව මා සතුටු වනවා. සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍ය ගරු මලික් සමරවික්‍රම මැතිතුමා මේ පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම සඳහා සභාවට ඉදිරිපත් කළා. මීට කලින් කථා කළ අපේ ගරු අරවින්ද් කුමාර් මන්ත්‍රීතුමාත්, ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමාත්, ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමාත් ඉතාමත් පැහැදිලිව වතුකරයේ තිබෙන විශාලතම ප්‍රශ්න පිළිබඳව මේ සභාවේ අවධානය යොමු කළා. මේ පනත් කෙටුම්පත ඉතිහාසයේ ඉතා වැදගත් වන පනත් කෙටුම්පතක්. මේ රටේ රජයන් පත් වෙනවා; ජනාධිපතිවරු පත් වෙනවා. මේ යහ පාලන ආණ්ඩුව බලයට ඇවිත් අවුරුදු 4කට ආසන්න කාලය තුළ මෙවැනි අණ පනත් කොච්චරක් සශෝධනය කරලා තිබෙනවාද? අද බොහෝ අයට කථා කරලා මේවා විවේචනය කරන්න පුළුවන්. හැබැයි, මේ වාගේ පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරන්න සමහරුන්ට කොන්දක් තිබුණේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු කථානායකතුමා එදා විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් විධියට සිටියදී ගෙනාපු තොරතුරු දැනගැනීමේ පනත් කෙටුම්පත එවකට සිටි ආණ්ඩුව ප්‍රතික්ෂේප කළා. අපි අවුරුදු ගණනාවක් ආපස්සට ගියා. පසුගිය කාලයේ ලෝකයේ අනෙක් රටවල් එක්ක සසඳන විට මානව හිමිකම් ක්ෂේත්‍රය තුළ අපි ඉතාමත් ඉහළ මට්ටමක සිටියේ. 2006 වර්ෂය වෙනකොට අපේ රට මානව හිමිකම් අංශයෙන් තිබිච්ච තත්ත්වයෙන් පහළට -"B" ශ්‍රේණියට- වැටිලායි තිබුණේ. නමුත්, මේ සභාවේ කවුරු පට්ටපල් බොරු කිව්වත්, නොයෙක් චෝදනා කළත් මේ අවස්ථාව වන විට ලංකාව මානව හිමිකම් අංශයෙන් පළමු තැනට ඇවිල්ලා තිබීම පිළිබඳව අද අපි සතුටු වෙනවා. සමහර අය විවේචනය කරලා මේ සභාවෙන් පිට වෙලා යනවා. ඔවුන් කියපු දේවල්වලට පිළිතුරු අහන්න ඒ අය මේ සභාවේ ඉන්නේ නැහැ. අපි අද ඉදිරිපත් කර තිබෙන එක පනත් කෙටුම්පතක් තමයි, "කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා චේතන විධිමත් කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත." ඒ කියන්නේ, වර්තමාන රජය හැම ක්ෂේත්‍රයක් තුළම බලලා තිබෙනවා කියන එකයි. මොකද, සාජ්පු හා කාර්යාල සේවකයින් පිළිබඳව අද ඉතාමත් අවාසනාවන්ත තත්ත්වයක් තිබෙනවා. විශේෂයෙන්ම පෞද්ගලික අංශය තුළ ඉතාමත් දැඩි ලෙස මේ සම්බන්ධයෙන් අපි අවධානය යොමු කරන්න ඕනෑ. 1954 අංක 15 දරන මේ පනත සම්මත කළේ අපේ රටට නිදහස ලැබිලා අවුරුදු කිහිපයකින් පසුවයි. සේවය කරන පැය ගණනත්, ඒ එක්කම චේතන හා ආනුෂංගික කරුණු පිළිබඳවත් එම පනතේ විධිවිධාන සලස්වා තිබුණා. මේ පනත අවස්ථා ගණනාවකදී සංශෝධනය වෙලා තිබුණා.

ස්ත්‍රී සේවිකාවකට සජීවී දරු ප්‍රසූතියක් ඇති වුවහොත්, ඇයට එම දරු ප්‍රසූතියේ සිට දින 70ක් දක්වා සහ සජීවී දරුවෙකු බිහි නොවුණොත්, එම දරු ප්‍රසූතියේ සිට දින 28ක් දක්වා නිවාඩු ලබා ගැනීමට මේ සංශෝධන පනත් කෙටුම්පත මඟින් ඇයට හිමිකම් තිබෙනවා. නමුත්, ඇතැම් තැන්වල මේ ක්‍රමය ක්‍රියාත්මක වෙනවා දකින්න නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ඇඟලුම් ක්ෂේත්‍රයට අදාළ කර්මාන්තශාලා තුළ ඉතාමත්ම අවාසනාවන්ත තත්ත්වයක් ඇති වෙලා තිබෙන බව අපේ ගරු මලික් සමරවික්‍රම අමාත්‍යතුමාත් දන්නවා. සමහර අයගෙන් මාස 6ක්, 7ක් වැනි කෙටි කාලයක් සේවය අරගෙන ඔවුන්ව ඉවත්

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

කරලා ඒ තැන්වලට අලුත් සේවකයන් ගන්නවා. ඒ අය තුට්ටුවට, දෙකට වැඩට ගන්නේ. ඒ අය වැඩි කාලයක් සේවය කරද්දී වැඩිපුර දීමනාවක් ගෙවන්න සිද්ධ වෙන නිසා ඒ අය ඉවත් කරලා නැවත අලුත් කණ්ඩායමක් බඳවා ගන්නවා. මේ තත්ත්වය සම්පූර්ණයෙන්ම නතර කරන්න ඕනෑ. කම්කරු අණ පනත් තිබුණත් සමහර ආයතනවල ඒවා ක්‍රියාත්මක වෙන්නේ නැහැ. පසුගිය රජය කාලයේ තමයි මේ ආයෝජකයන් ගෙන්වූවේ. ඒ අය පැදුරටත් නොකියායි ගිහිල්ලා තිබෙන්නේ. ආයෝජනය කරනකොට ලංකාවේ partner කෙනෙක් ඉන්නවා. අපිට දැනගන්නට ලැබුණු ආකාරයට සමහර වෙලාවට ඒ කිසි කෙනෙක් නැහැ. අවසානයේ LRC එකේ ඉඩම පවා තමන්ට ඕනෑ විධියට පරිහරණය කරලා තිබුණා. නමුත්, අද අපි ඒවා වෙනස් කරලා තිබෙනවා. අද ඒ කර්මාන්තශාලාවල කෝටි 19ක මුදලක් වර්තමාන කළමනාකාරිත්වය බාරගෙන තිබුණා, තමුන්නාන්සේලාගේ හැකියාව නිසා. මේවා පිළිබඳව පසුගිය ආණ්ඩුව කාලයේ බැලුවේ නැහැ. EPF ගෙව්වා ද, ETF ගෙව්වා ද කියන එක පිළිබඳව එදා බැලුවේ නැහැ. එදා කම්කරු නීති අණ පනත් සම්පූර්ණයෙන්ම කඩලායි තිබුණේ.

වැඩිය ඕනෑ නැහැ, ETF, EPF ගැන කථා කරපු රොෂේන් චානක වැනි අයට වෙඩි තියලා මරපු කාලයක මේ උද්ඝෝෂණ, මේ පිකටින් කොහේද තිබුණේ කියලා මම අහනවා. ඒ කාලයේ එහෙම කිසි දෙයක් දකින්න තිබුණේ නැහැ.

ඒ විතරක් නොවෙයි. අපේ ගරු මන්ත්‍රීතුමන්ලා වතු ආශ්‍රිත කරුණු කථා කළා. වතු ආශ්‍රිතව ඉතා අවාසනාවන්ත තත්ත්වයක් තිබෙන බව අපි දන්නවා. පසුගිය රජය යටතේ සබරගමුව පළාතේ ප්‍රාදේශීය සභාවක හිටපු සභාපතිවරයකු පිළිබඳව මට මතකයි. මේ මන්ත්‍රීවරුන් ඒ පුද්ගලයා පිළිබඳව දන්නවා. නුරි වත්තේ වතු අධිකාරිවරයා මැරුණේ කොහොමද? ඒ ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයාට කියන්නේ "අතකොටා" කියලායි. ඒ ප්‍රදේශයේ ජීවත් වන දෙමළ පුද්ගලයකු කාන්තාවක් සරණ පාවා ගෙන ආවොත්, ඒ කාන්තාව සමඟ ගත කරන පළමුවෙනි අවස්ථාව ඒ සභාපතිවරයාට දෙන්න ඕනෑ. ඒ වාගේ අමානුෂික විධියටයි ඔහු ඒ පළාතේ කටයුතු කළේ. අවසානයේ නුරි වත්තේ වතු අධිකාරිවරයාට මැරෙන්නත් සිද්ධ වුණා. ඒ හිටපු සභාපතිවරයා පොලීසියට ගියාම පොලීසියේ ස්ථානාධිපතිවරයාගේ පුටුවේ තමයි වාඩි වුණේ. ඒවාට මහ ඇමතිවරු ඇතුළු සියලුදෙනා උදව් කරලා තිබුණා. මම මේ දේවල් කියන්නේ වග කීමෙන්. මේ සිද්ධිය සම්බන්ධයෙන් නඩුවක් ගිහිල්ලා අවසානයේ මේ අයට අව්වු කරලා තිබෙනවා. ඒ කාලයේ ඒ වාගේ අවාසනාවන්ත සිදුවීම් සිද්ධ වුණා. නමුත්, අද ඒ තැන්වල ඒ වාගේ දේවල් සිද්ධ වන්නේ නැහැ. අද ඒවාට රජය හැටියට අපි මැදිහත් වෙලා තිබෙනවා. ප්‍රාදේශීය වශයෙන්, දිස්ත්‍රික්ක වශයෙන් සිටින තරුණ මන්ත්‍රීවරු ඒ තැන්වලට ගිහිල්ලා ඒවා හොයා බලා ඒ සම්බන්ධයෙන් කටයුතු කරනවා. ඒ නිසා මේ වාගේ අණ පනත් අපි ඉදිරියේදීත් ගෙනෙනවා. මම හිතන හැටියට මේ සම්බන්ධයෙන් අද කවුරුවත් කථා කරන්නේ නැහැ. ඔවුන් අද නොයෙක් දේවල් අරගෙන බොරුවට බුරනවා විතරයි. ඔවුන් මේ ආණ්ඩුවේ අඩුපාඩුකම් එකක්, දෙකක් අල්ලා ගෙන ඒක මහ මෙරක් විධියට සලකා මහ හඬින් කථා කළාට, ඇත්ත වශයෙන්ම සාධාරණ සහ යුක්තිසහගත ලෙස මේ ආණ්ඩුව මේ කටයුතු කළේ පසුගිය අවුරුදු තුන හමාරක කෙටි කාලයක් තුළයි. අපට කරන්න විශාල වැඩ කොටසක් තිබෙනවා. කණපිට හරවා තිබුණු රට, උඩු යටි කුරු කරලා තිබුණු දේ නැවත උඩු කුරු කරන්න ආණ්ඩුවක් හැටියට අපට විශාල කාලයක් යනවා. සමහරු හිතනවා, මේවා නිකම් එහෙන් මෙහෙන් කරන්න පුළුවන් කියලා. ඒ අය කෑ ගහනවා, ව්‍යක්තීය අයිතිවාසිකම් ගැන. තෙල් මිල අඩු කරලා ඉතාම හොඳ සාධාරණයක් කරපු වෙලාවේ කිසි කෙනෙක් ඒ ගැන ප්‍රශස්ති ගී ගායනා කළේ නැහැ. හැබැයි, තෙල් මිලේ මේ වැඩි කිරීම සම්බන්ධයෙන් ධීවරයෝ එක්ක මේ අයත් පාරට බැහැලා සටන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් නියමිත කාලය අවසන්.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න. සභාවේ කටයුතු අවසාන වීමට ආසන්නව තමයි අපට කථා කරන්න අවස්ථාවක් ලැබෙන්නේ. අඩු ගණනේ එතකොටවත් අපට තව වැඩිපුර විනාඩියක් දෙන්න. ඔබතුමා බොහොම කාරුණිකයි. ඒ නිසා මා හිතනවා, ඔබතුමා ඒ සඳහා අවස්ථාව දෙයි කියලා.

අපි කථා කරන මේ කරුණු ජනතාව අතරට යන්නේ නැහැ. මාධ්‍ය තුළ මේ කරුණු ප්‍රචාරය වන්නේ නැහැ. අපි සවස හතරට, පහට මේ සභාවේ කථා කරන කිසි දෙයක් මාධ්‍යවලින් ප්‍රචාරය වන්නේ නැහැ. පාර්ලිමේන්තුවේ පළමුවෙනි පැය දෙකේ ඩෙබානටන දේවල් තමයි මාධ්‍යවලින් ප්‍රචාරය වන්නේ. විපක්ෂයේ සමහර අය ලෑස්ති වෙලාම ඉන්නේ ඒකටමයි. ආණ්ඩු පක්ෂයේ ගරු සංවිධායකතුමනි, ඒකටත් පිළියමක් කරන්න ඕනෑ. මුල් පැය දෙකෙන් පස්සේ ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරයකු බෙහෙතකටවත් හොයා ගන්න පාර්ලිමේන්තුව තුළ නැහැ. මේ වෙලාවේත් ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරන කී දෙනෙකු ඉන්නවාද කියලා බලන්න. මේවා රටේ මිනිසුන්ට පෙන්වන්න ඕනෑ. ඒ නිසා මේ සභාවේ ආරම්භක පැය දෙක වාගේම පුළුවන් නම් අවසාන පැය දෙක හෝ පැයක් රූපවාහිනියේ පෙන්වන්න කියලා මම කියනවා. එතකොට ජනතාවටත් බලාගන්න පුළුවන්, සභාවේ වැඩ කටයුතු අවසාන වන තෙක් පාර්ලිමේන්තුවේ රැඳී සිටින්නේ කවුද කියලා. ඒ සම්බන්ධයෙන් රටේ ජනතාව දැනගන්න ඕනෑ. මේ අය සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන කොට ඇවිල්ලා පැයක්, දෙකක් ඉඳලා කෑ ගහලා, ඊට පසුව භෝජන සංග්‍රහයත් භුක්ති විඳලා යනවා. ඒ ගිහිල්ලා කරන්නේත් වෙන වෙන දේවල්. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පුළුවන් නම් අවසාන පැයේ -සාමාන්‍යයෙන් සවස පහේ සිට හය වෙන තෙක්- මේ සභාවේ වැඩ කටයුතු රූපවාහිනියේ පෙන්වන්න කියලා ගරු කථානායකතුමාට මා යෝජනාවක් ඉදිරිපත් කරනවා. මහලේකම්තුමනි, හැම මන්ත්‍රීවරයෙකුටම මෙහිදී සාධාරණයක් තිබෙන්න ඕනෑ.

ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, සභානායකතුමා මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා. ඒ වාගේම අපේ බුද්ධ ශාසන ඇමතිතුමාත් මේ සභාවේ ඉන්නවා. අපි බුද්ධ ශාසන අමාත්‍යාංශයට අදාළ කල් තැබීමේ යෝජනාවක් තමයි අද සවස සාකච්ඡා කරන්නේ.

මම දීර්ඝව කථා කරන්නේ නැහැ. මොන ප්‍රශ්න තිබුණත්, මොන අභියෝග තිබුණත්, මොන උද්ඝෝෂණ තිබුණත්, මොන පිකටින් තිබුණත්, උපවාසයේ යෙදුණත්, ගරු අග්‍රාමාත්‍යතුමාත්, අපිත් එඩිතරව එකට එකතු වෙලා මේ රටේ අහිංසක මිනිස්සු වෙනුවෙන් යම් වැඩ කොටසක් කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ මේ ආණ්ඩුව යටතේ ක්‍රියාත්මක කරනවා. ඇත්ත වශයෙන්ම ඒ සම්බන්ධයෙන් මම සතුටුවනවා. ඒ සඳහා සහයෝගය දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා. අපි කියනවා, භය නැතිව මේ කම්කරු නීති රීති හරියට ක්‍රියාත්මක කරන්න කියලා. හිටපු

ජනාධිපතිතුමාත් කිව්වා, කම්කරු ප්‍රඥප්තියක් ගෙනෙනවා කියලා. නමුත්, එතුමාත් එය කිව්වා විතරයි. කම්කරු ඇමති හැටියට අවුරුදු කීයක් එතුමා සිටියාද? නමුත් ජනාධිපති වෙලාත් එතුමාට ඒ දේ කරන්න බැරි වුණා. අපේ ගරු ඇමතිතුමාට ඒ සඳහා ශක්තිය තිබෙන බව මා ප්‍රකාශ කරනවා.

මූලාසනයේ සිටින ගරු මන්ත්‍රීතුමාට බොහොම ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 6.20]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

ඒකාබද්ධ විපක්ෂය පිළිබඳව ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කියපු නිසා මම යමක් කියන්න කැමැතියි. මේ සංශෝධනවලට අපේ විරුද්ධත්වයක් නැහැ. විරුද්ධත්වයක් තිබෙනවා නම් තමයි අපි සභාවේ ඉඳගෙන දිගටම ඒ සඳහා විරුද්ධත්වය පළ කරන්නේ. මේ පනත් කෙටුම්පත් දෙකට අපේ සහයෝගය පළ කරලා තමයි ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු ගියේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තවත් එක කාරණාවක් විතරක් කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කම්කරු පන්තිය දීර්ඝ කාලයක් සටන් කරලා ලබා ගත්ත අයිතියක් මේක. මේවා කවුරුවත් බන්දේසියේ තියලා දීපුවා නොවෙයි. ඒ අය තවත් අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටිනවා. ස්වාමිපුරුෂයන්ටත් නිවාඩු අනුමත කරන්න කියන කාරණාවත් තිබෙනවා. අද මේවා හෑල්ලුවට අරගෙන තිබෙනවා. මේ පනත් මේ යුගයේ ආපු පනත් නොවෙයි. ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

ඛිනා විධුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப் பட்டது.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' -[ගරු මලික් සමරවික්‍රම මහතා]

තීර්මානික්කප්පට්ටදු.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" - [மாண்புமிகு மலிக் சமரவிக்ரம]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Malik Samarawickrama.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]

குழுவில் ஆராயப்பட்டது.
[மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் தலைமை வகித்தார்கள்.]

Considered in Committee.
*[*THE HON. PRESIDING MEMBER *in the Chair.]*

1 වන වගන්තිය.- (ලුහුඬු නාමය.)
வாசகம் 1.- (சுருக்கப் பெயர்)
CLAUSE 1.- (*Short title.*)

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
Sir, I move,

"In page 1, leave out all words in lines 3 to 5 (both inclusive) and insert:

'Short title 1. This Act may be cited as the Shop and Office Employees (Regulation of Employment and Remuneration) (Amendment) Act, No. of 2018.' ".

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

1 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

1ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Clause 1, as amended, ordered to stand part of the Bill.

2 වන සහ 3වන වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
2ஆம், 3ஆம் வாசகங்கள் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clauses 2 and 3 ordered to stand part of the Bill.

3 වන අලුත් වගන්තිය.- (මව්කිරි දෙන මව්වරුන් සඳහා මව්කිරි දීමේ විවේක කාල සැලසීම.)
3வது புதிய வாசகம்.- (தாய்ப்பால் ஊட்டும் தாய்மார்களுக்கான தாய்ப்பால் ஊட்டுவதற்கான கால இடைவெளிகளை ஏற்பாடு செய்தல்.)
NEW CLAUSE 3.- (*Provision of nursing intervals for nursing mothers.*)

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
Sir, I move,

"In page 2, immediately after line 1, add:

'Provision of nursing intervals 181. The employer of a female employee in any shop or office shall, if she is nursing a child under one year of age, allow her, in any period of nine hours, two nursing intervals at such times as she may require. Each interval shall, where a creche or other suitable place is provided by such employer to such female employee for nursing such child, be not less than thirty minutes, and where no creche or other suitable place is so provided, be not less than one hour, and for nursing mothers shall be in addition to any interval provided to such female employee for meals or rest under any written law and be regarded, for the purposes of her employment, as time during which she has worked in her employment.' "

ඉදිරිපත් කරන ලදින්, පළමු වන වර කියවන ලදී.
கொண்டுவரப்பட்டு முதன்முறை மதிப்பிடப்பட்டது.
Brought up, and read the First time.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
Sir, I move,

"That the Clause be read a Second time."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.
3 වන අලුත් වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

வாசகம் சட்டமூலத்திற் சேர்க்கப்பட வேண்டுமெனும் வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
3வது புதிய வாசகம் சட்டமூலத்தின் பகுதியாயிருக்கக் கட்டளை யிடப்பட்டது.

Question, that the Clause be added to the Bill, put and agreed to.
New Clause 3 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

சட்டமாகு வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Enacting Clause ordered to stand part of the Bill.

නාමය
தலைப்பு
TITLE

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
Sir, I move,

"This Act may be cited as the Shop and Office Employees (Regulation of Employment and Remuneration) (Amendment) Act."

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

නාමය සංශෝධිතාකාරයෙන් පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

தலைப்பு திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Title, as amended, ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
I move,

"That the Bill, as amended, be now read the Third time."

Sir, I also request to give permission to correct the language, typographical errors, grammatical errors, numerical errors and consequential Amendments to the Bill.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව එකඟ ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

සූතිකාධාර (සංශෝධන) පනත් කෙටුම්පත
மகப்பேற்று நன்மைகள் (திருத்தம்) சட்டமூலம்
MATERNITY BENEFITS (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் இரண்டாம் முறையாக மதிப்பிடப்பட்டது.

Question put, and agreed to.
Bill accordingly read a Second time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:
''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' -[ගරු මලික් සමරවික්‍රම මහතා]

தீர்மானிக்கப்பட்டது.
"சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்படுமாக" - [மாண்புமிகு மலிக் சமரவிக்ரம]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. Malik Samarawickrama.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා මූලාසනාරූඪ විය.]
කුමුවිල් ආරායප්පට්ටු.
[මාණ්ඩලික නියෝජිතයන් විසින් සභාපතිත්වය ගනු ලැබිණි.]
Considered in Committee.
[THE HON. PRESIDING MEMBER in the Chair.]

1 සිට 9 තෙක් එගන්නි පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
1ආම් වාසකත්තිලිරුන්දු 9 ආම් වාසකම් වරෙ සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ඩුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.
Clauses 1 to 9 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති එගන්නිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන රහිතව වාර්තා කරන ලදී.
සට්ටමාකු වාසකමුම් තලෛප්පුම් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ඩුමෙනක් කට්ටළෙයිටප්පට්ටදු.
සට්ටමූලම් තිරුත්තමින්රි අරික්කෛ සෙය්යප්පට්ටදු.
Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported without Amendment.

ගරු මලික් සමරවික්‍රම මහතා
(மாண்புமிகு மலிக் சமரவிக்ரம)
(The Hon. Malik Samarawickrama)
I move,

"That the Bill be now read the Third time."

Sir, I also request to give permission to correct the language and typographical errors, grammatical errors, numerical errors and consequential Amendments to the Bill.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව එකඟ ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව තුන් වන වර කියවා සම්මත කරන ලදී.
විනා විටුක්කප්පට්ටු, ඒත්‍රුක්කොළ්ළප්පට්ටදු.
අදන්පඩි, සට්ටමූලම් මූන්‍රාම්මුරෛයාක මදිප්පිටප්පට්ටු නිර්‍රවේර්‍රප්පට්ටදු.
Question put, and agreed to.
Bill accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
විනා එටුත්තියම්පප්පෙර්‍රදු.
Question proposed.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
සභාව කල් තැබීමේ යෝජනාව, ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මැතිතුමා.

දහම් පාසල් අධ්‍යාපනය ශක්තිමත් කිරීම
அறநெறிப் பாடசாலைக் கல்வியை மேம்படுத்தல்
STRENGTHENING OF DHAMMA SCHOOL EDUCATION

[අ.භා. 6.28]

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"සදාචාර සම්පන්න ගුණගරුක පිරිසක් බවට අනාගත දරු පරපුර පත් කිරීම උදෙසා මෙරට දහම් පාසල්වල සේවය කරනු ලබන ගුරු භවතුන් ඉටු කරනුයේ නිස්සරණධ්‍යාශ වූ අමිල මෙහෙවරකි. තම ජීවිත කාලය පුරාම දහම් පාසල් සේවයේ යෙදෙන ගුරු භවතුන්ට වයෝවෘද්ධ වූ පසු කිසිදු පිළිසරණක් නොමැත.

එබැවින් මෙරට දහම් පාසල් අධ්‍යාපනය ශක්තිමත් කිරීමේ අරමුණින් මතු සඳහන් ක්‍රියා මාර්ග ගන්නා මෙන් යෝජනා කරමි.

(1) දහම් පාසල්වල වසර 10ක් අඛණ්ඩව සේවය කරන ගුරු භවතුන් සඳහා සාම චිනිසුරු පදවියක් ලබා දීම.

(2) දහම් පාසල් ගුරු සේවයේ වසර පහක් ඉක්ම වූ සෑම ගුරු භවතකු සඳහාම නොමිලයේ ජීවිත රක්ෂණයක් ලබා දීම.

(3) රජයේ රැකියා සඳහා ඇතුළත් වීමේදී දහම් පාසල් අවසානය හා ධර්මාචාර්ය විභාගය සමත් වූ ගුරු භවතුන් සඳහා ලකුණු ප්‍රමාණයක් ලබා දීම.

(4) විශ්වවිද්‍යාලයට ඇතුළත්ව උපාධිය ලබා ගැනීමේ දී දහම් පාසල් අවසාන ශ්‍රේණිය හා ධර්මාචාර්ය විභාගය සඳහා යම් ලකුණු ප්‍රමාණයක් ලබා දීම."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද වන විට අපේ රටේ නීතිය හා සාමය වෙනුවෙන්, අධ්‍යාපනය වෙනුවෙන්, මේ රටේ මහජනතාවගේ - අනාගත පරපුරේ- සුබසිද්ධිය වෙනුවෙන් විශාල පිරිවැයක් දරන්න සිදුවෙලා තිබෙන බව අපි කවුරුත් දන්නවා. දවසින් දවස රටේ අපරාධ ඉහළ යමින් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වන විට දෙමවුපියන් මහ මහ දමා යන තත්ත්වය දවසින් දවස වැඩි වෙමින් පවතින බව අපි දකිනවා. ඒක කොච්චරද කිව්වොත්, දවස් පහකට වරක් එක වැඩිහිටියෙක් මහමඟ දමා යන තත්ත්වයට මේ රට පත්වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේ රටේ වැඩිහිටි නිවාස සංඛ්‍යාව විශාල වශයෙන් වැඩිවෙමින් පවතිනවා. ඒවාට ඇතුළත් වීමේ තරගයක් ඇතිවෙලා තිබෙනවා. ඒ වාගේම රටේ සෑම ක්ෂේත්‍රයකම විනය පිළිබඳ ප්‍රශ්නයකට අපි මුහුණ දී තිබෙනවා. මානුෂීය ගුණාංග, අධ්‍යාත්මික ගුණවගාවන්, විශේෂයෙන්ම කෙළෙහි ගුණ සැලකීම වාගේ දේවල් නැතිවෙලා තිබෙනවා. කවර තනතුරක හිටියත් - උගතකු වුණත්, මේ රටේ ඉහළම පරිපාලන නිලධාරියකු වුණත්, ඉහළම දේශපාලනඥයකු වුණත්, මැති ඇමතිවරයකු වුණත්, ඉහළම තනතුරක සිටින කෙනෙකු වුණත්, රජ පුටුවේ වාඩිවෙන කෙනෙකු වුණත්- ගුණගරුක නැත්නම්, කෙළෙහි ගුණ දන්නේ

[ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා]

නැත්නම්, ශීලාචාර නැත්නම්, සදාචාර සම්පන්න නැත්නම් ඒක අපේ අනාගතයට බරපතළ ලෙස බලපානවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ නිසා දහම් පාසල් අධ්‍යාපනයේ වටිනාකම ගැන අපි කාටවත් විවාද කරන්න දෙයක් නැහැ. මම මේකෙන් අදහස් කරන්නේ බෞද්ධ දහම් පාසල් පමණක් නොවෙයි. හින්දු වේවා, ඉස්ලාම් වේවා සෑම ආගමකම දහම් පාසල් ශක්තිමත් කිරීම තුළින් දරුවන් අධ්‍යාත්මික ගුණවගාවෙන් යුතු පිරිසක් බවට පත් කිරීම, දරුවන්ට මානවවාදී ගුණාංග ඉගැන්වීම, අපේ රටේ යහපත බලාපොරොත්තු වන, රටේ අනාගත පරපුරේ සුබසිද්ධිය බලාපොරොත්තු වන හැම කෙනකුගේම යුතුකම බවට පත් වෙන්න ඕනෑ කියලා මම හිතනවා.

අවාසනාවකට අද අපේ හුඟක් දෙමව්පියන් තමන්ගේ දරුවන් හුදු සහතික ලබා ගන්නා පිරිසක් බවට පත් කරන්න කටයුතු කරනවා. ශිෂ්‍යත්ව විභාගයේ සිට සාමාන්‍ය පෙළ විභාගය, උසස් පෙළ විභාගය දක්වා පෞද්ගලික පන්තිවලට රැගෙන යමින් තමන්ගේ දරුවෝ උගතුන් බවට පත් කර ගන්න මහා ලොකු තරගයක යෙදෙමින් සිටිනවා. තමන්ගේ දරුවන්ට මේ රටේ යන්න පුළුවන් ඉහළම තැනකට යන්න මාර්ගය සකස් කරන්න උදේ, දවල් රෑ නොබලා ඒ දෙමවුපියන් විශාල තරගයක යෙදී සිටිනවා. ඒ තරගයට උදව් උපකාර කරන දේවල් තමයි බොහෝ වෙලාවට අපි කරන්නේ. හැබැයි, මේ දෙමව්පියන්ගෙන් හරි අඩක්වත් කල්පනා කරන්නේ නැහැ, තමන්ගේ දරුවන් උගතුන් කරනවා වාගේම ගුණවතුන් බවට පත් කළොත් තමයි තමන්ගේත්, රටේත් අනාගතය රැකෙන්නේ කියන එක.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මේ දහම් පාසල් ක්ෂේත්‍රය ශක්තිමත් කිරීමේ බරපතළ අවශ්‍යතාවක් තිබෙනවා. හැබැයි, දහම් පාසල්වල උගන්වන්න ගුරු භවතුන් නොමැති නම්, දහම් පාසල් ක්ෂේත්‍රය ශක්තිමත් කරන්න කිසිසේත්ම නොහැකියි. අද ගුරු භවතුන් දහම් පාසල්වල සේවය කරන්නේ නිස්සරණාධ්‍යාශයෙන්; කිසිම වැටුපක් නොලබමින්. පසු ගිය කාලයේ දහම් පාසල් ගුරුවරයකුට රුපියල් 2,000ක වාර්ෂික දීමනාවක් දුන්නා. අද ඒ දීමනාව රුපියල් 5,000ක් කර තිබෙනවා. දහම් පාසල් ගුරු භවතුන්ට නිල ඇඳුමක් දෙනවා. නමුත් මේවා අද යුගයේ හැටියට ප්‍රමාණවත් නැහැයි කියලා අපි කවුරුත් දන්නවා. සමහර දහම් පාසල් ගුරු භවතුන් අවුරුදු 30, 40 දහම් පාසලේ සේවය කරනවා. මම දන්න එක ගුරුවරියක් හිටියා. එතුමිය අවුරුදු 52ක් දහම් පාසල් සේවය කරලා, වයෝවෘද්ධව අසරණ වුණු වෙලාවේ සබන් කැටයක්වත් මිල දී ගන්න පුළුවන් තත්ත්වයක් තිබුණේ නැහැ. විදුලිබිලවත් ගෙවා ගන්න මාසයකට කීයක්වත් නැති තැනට පත් වුණා. ඒ නිසා අපි මෙයට මැදිහත් විය යුතුව තිබෙනවා. අපේ බුද්ධශාසන ඇමතිතුමා ආගම දහම ගැන හොඳින් හිතන, මේ රටේ යම් ඉහළ පිළිගැනීමක් තිබෙන බෞද්ධ නායකයෙක්. ගරු ඇමතිතුමනි, අපේ දහම් පාසල් ගුරුවරුන්ට පඩියක් දෙන්න කියලා මම යෝජනා කරන්නේ නැහැ. හැබැයි, අඩුම තරමින් ඒ අයට රක්ෂණාවරණයක් හරි දීලා අවුරුදු 55 ඉක්මවුවාට පස්සේ මාසයකට කීයක් හරි අතට ලැබෙන වැඩ පිළිවෙළක් හදන්න ක්‍රියා කරන්න. ඒ වාගේම දහම් පාසල් ගුරුවරයකුට හදිසියේ අසනීපයක් හැදුණොත්, ඒ අය වෙනුවෙන් වෛද්‍යාධාරයක් ලබා ගන්න පුළුවන් පහසුකම් ලබා දෙන්න. ඒ විතරක් නොවෙයි, අද විවිධ ක්ෂේත්‍රවල අයට ඕනෑ තරම් සාම විනිසුරු පදවි ලබා දෙනවා. අවුරුදු 10ක් අඛණ්ඩව සේවය කරන දහම් පාසල් ගුරුවරයකුට අඩුම තරමින් ශාසනාරක්ෂක ප්‍රාදේශීය මණ්ඩල බල ප්‍රදේශයට බලපාන ආකාරයටවත් සාම විනිසුරු පදවියක් ලබා දෙන්න බැරි ඇයි? ඒ නිසා මෙවැනි වැඩ පිළිවෙළකට යන්න කියලායි මම යෝජනා කරන්නේ.

ඒ විතරක් නොවෙයි, යම් දරුවකු විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේදී දහම් පාසල් අවසාන ශ්‍රේණි සහතික පත්‍ර විභාගයේදී එම විෂයන්ට ඔහු ලබාගෙන ඇති විශිෂ්ඨ සහ සම්මාන සාමර්ථ අනුව ලකුණු කිහිපයක් ලබාදීමට කටයුතු කරන්න කියා මම යෝජනා කරනවා. ඒ වාගේම ධර්මාචාර්ය විභාගය සමත් නම්, ඒ අයටත් යම් ලකුණු ප්‍රමාණයක් ලබා දෙන්න. ධර්මාචාර්ය විභාගය හෝ දහම් පාසල් අවසාන ශ්‍රේණි විභාගය සමත් දහම් පාසල් ගුරු භවතෙක් රජයේ රැකියාවකට ඇතුළත් වීමේදී ඔහුට යම් ලකුණු ප්‍රමාණයක් ලබාදෙන්න. මේ ක්‍රමය හින්දු දහම් පාසල්වලටත්, ඉස්ලාමීය දහම් පාසල්වලටත් බලපාන විධියට සකස් කරන්න පුළුවන්. ඒ විධියට යම් ලකුණු ප්‍රමාණයක් ලබාදෙන්න.

ඊළඟට, දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගයට වාඩි වෙන්න නම්, දරුවකු අඩුම තරමින් හයවැනි ශ්‍රේණියේ සිට අඛණ්ඩව දහම් පාසල් යා යුතුයි කියා යම්කිසි නීතියක් පනවන්න අපට පුළුවන්. එතකොට ඒ දරුවා දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගයට කෙළින්ම ගිහින් වාඩි වෙන්නේ නැහැ. හයවැනි ශ්‍රේණියේ සිට හෝ දහම් පාසල් යන දරුවකුට තමයි දහම් පාසල් අවසාන ශ්‍රේණි විභාගයට වාඩිවීමට අවස්ථාව ලැබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තවත් යෝජනාවක් කරන්න කැමැතියි. දහම් පාසල් ගුරුවරුන් පුහුණු කිරීම සඳහා අධ්‍යාපන විද්‍යා පීඨයක් සකස් කරන්න. බෞද්ධ දහම් පාසල් ගුරුවරු පමණක් නොවෙයි, හින්දු, ඉස්ලාම් ආදී සෑම දහම් පාසල් ගුරුවරයෙක්ම පුහුණු කිරීම සඳහා අධ්‍යාපන විද්‍යා පීඨයක් සකස් කරන්න. එතැනදී සෑම ආගමක් පිළිබඳවම දහම් පාසල් ගුරුවරුන්ට යම්කිසි ආකාරයක දැනුමක් ලබා දෙන්න. උදාහරණයක් හැටියට ගත්තොත්, හින්දු දහම් පාසල් ගුරුවරුන්ට බෞද්ධ ආගම ගැන දැනුම ලබාදෙනවා නම්, දහම් පාසලට ගිහින් තමන්ගේ ආගම වාගේම බෞද්ධ ආගම ගැනත් ඒ දරුවන්ට යමක් කියා දෙන්න ඒ අයට පුළුවන්කම ලැබෙනවා. ඉස්ලාමීය ගුරුවරුන්ට බෞද්ධ ආගම ගැන දැනුම ලබාදෙනවා නම්, බෞද්ධ ආගමේ වැදගත් යම් යම් දේවල් ගැන ඉස්ලාම් දරුවන්ට කියා දෙන්න ඒ අයට පුළුවන්. මේ ආගම් දෙකම පිළිබඳව බෞද්ධ දරුවන්ටත් වැදගත් යමක් කියා දෙනවා නම් ආගමික සහජීවනය එතැනම ඇති වෙනවා. එතකොට කවුරුවත් පල්ලියකට ගහන්න අත උස්සන්නේ නැහැ; පන්සලකට ගහන්න අත උස්සන්නේ නැහැ; වෙනත් ආගමකට නිගරු කරන්නේත් නැහැ. හැම ආගමකටම ගරු කරන පුරවැසියන් ලෙස ලාංකීය මිනිසුන් ගොඩ නහන්න නම්, දහම් පාසල් ගුරු අධ්‍යාපන පීඨයක් සකස් කර හැම ආගමකම තිබෙන වැදගත් දේ දරුවන්ට උගන්වන වැඩ පිළිවෙළක් සකස් කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

අශෝක අධිරාජයාත් ඒක තමයි කළේ. අශෝක අධිරාජයා සෑම ආගමකම හරවත් දේ ගත්තා. බුදු හාමුදුරුවෝ හැම ආගමකම වැදගත් කොටස් බෞද්ධ ආගමට එකතු කර ගත්තා විතරක් නොවෙයි, භික්ෂූන් වහන්සේලාට විනය නීති පනවද්දී වෙනත් ආගම්වල වැදගත් දේවල්, මහජනයා කියපු හුඟක් දේවල් ඒ විනය නීතිවලට ඇතුළත් කළා. මම උදාහරණයක් කියන්නම්. බුදු හාමුදුරුවෝ පන්සිල් පද පහ ගත්තේ ජෛන ආගමෙන්. ඒත් අද මහා බෞද්ධයෝ කියලා බෝඩ් ගහගත්ත අපේ සමහර බෞද්ධයෝ කථා කරන්නේ අනික් ආගම්වලට අගෞරව කරන්න බලාගෙනයි; ඒ ආගම්වලට පහර දෙන්න බලාගෙනයි. බුදුරජාණන් වහන්සේ කවදාවත් එහෙම දෙයක් දේශනා කළේ නැහැ. එම නිසා මේ රටේ ආගමික අධ්‍යාපනය ශක්තිමත් කිරීම අද තිබෙන බොහෝ ප්‍රශ්නවලට විසඳුමක් කියා මම හිතනවා. අපි නීති පැනෙව්වත්, අපරාධ පරීක්ෂණ කොමිෂන් සභා පත් කළත්, හිර ගෙවල් හැදුවත්, විශේෂ අධිකරණ හැදුවත් වැඩක් වන්නේ නැහැ. දඬුවම් කිරීමෙන් පමණක් මේ දේවල් නවත්වන්න පුළුවන්කමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "වැරැදිකාරයා නොවෙයි, වැරැද්ද මරන්න" කියායි සෑම ආගමික ශාස්තෘවරයෙක්ම කියා තිබෙන්නේ. වැරැදිකාරයා මරන්න කියා කිසිම ආගමික ශාස්තෘවරයෙක් කියා නැහැ. වැරැද්ද මරන්න කියා තමයි ආගමික ශාස්තෘවරු කියා තිබෙන්නේ. වැරැද්ද මැරීමට නම් කළ යුතු වැදගත්ම දෙය වන්නේ, කුඩා දරුවාගේ සිට හැම කෙනකුම ආගමික අධ්‍යාපනයට යොමු කර ආගමේ තිබෙන හරයන් ඒ අයගේ ජීවිතයට එකතු කර, අධ්‍යාත්මික ගුණ වගාවෙන් යුතු පිරිසක් බවට ඒ අය පත් කිරීමයි. අපේ අනාගත පරපුර මේ ගමන් මාර්ගයේ රැගෙන ගියොත්, ඔවුන් යහපත් පිරිසක් බවට පත්වීම නොඅනුමානයි කියා මම හිතනවා.

අපේ දහම් පාසල් ගුරුවරුන්ට විවිධ ප්‍රශ්න තිබෙනවා. ධර්මාචාර්ය විභාගය සමත් උදවියට ගුරු පත්වීම් ලබාදෙන්න පසුගිය කාලයේ තීන්දුවක් ගත්තා. කොටසකට එම ගුරු පත්වීම් ලැබුණා. එම ගුරු පත්වීම් නොලැබුණු තව කොටසක් එය බලාපොරොත්තුවෙන් සිටිනවා. ඒ අය පිළිබඳ අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. ඒ අයට මේ ගුරු පත්වීම් ඉතාම සුදුසුයි. පාසලක දහම උගන්වන්න ධර්මාචාර්ය විභාගය සමත් වන අය ඉතාම සුදුසුයි කියන එකයි මගේ විශ්වාසය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කරන්නේ ඉතාම සතුටින්. දහම් පාසල් ගුරුවරයෙක් විධියට මමත් වසර 15ක් නිස්සරණාධ්‍යාශයෙන් සේවය කළා. ඒ නිසා අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව විධියට මෙවැනි යෝජනාවක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීමත් මගේ සතුටට හේතුවක්. අද මේ දේශපාලන ක්ෂේත්‍රය ගත්තත්, ඒ සමහර අය ආපසු දහම් පාසල්වලට අරගෙන ගිහින් උගන්වන්න වටිනවා කියලා මට හිතෙනවා. අද සිටින මේ සමහර උදවිය, සමහර තනතුරුවලට යන අය, තනතුරුවලට පත් වෙන අය, වැදගත් කියලා හිතන අය කෙළෙහි ගුණ අමතක කරන විධිය බැලුවාම; මුල අමතක කරන විධිය බැලුවාම; සෙවණට තිබුණු ගහේ අතු කපා දමන්න ලැහැස්ති වන විධිය බැලුවාම ඔවුන් -අපේ මේ දේශපාලන නායකයන්- දහම් පාසල් අධ්‍යාපනය ලබා තිබුණා නම් රටටත්, අපේ මේ දේශපාලන තලයටත් මෙහෙම වෙන්නේ නැහැය කියන එකයි මගේ විශ්වාසය. ඒ නිසා දහම් පාසල් අධ්‍යාපනය ශක්තිමත් කිරීම සඳහා මේ යෝජනා ටික ක්‍රියාත්මක කිරීමට අපේ ගරු බුද්ධ ශාසන අමාත්‍යතුමාගේත්, අපේ රජයේත් අවධානය යොමු වේවා කියා ප්‍රාර්ථනා කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට යෝජනාව ස්ථිර කිරීමට, ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා.

[අ.භා.6.41]

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගාලු දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී, අපේ සහෝදර ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ මේ ඉතාම වැදගත් යෝජනාව ස්ථිර කරමින්, මගේ අදහස් දැක්වීම ආරම්භ කරනවා. බුද්ධ ශාසන අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රීවරයෙක් විධියට අභිනවයෙන් පත් වූ එතුමා මේ රටේ ඇස නොගැටෙන, මේ රටේ අවධානයට යොමු නොවෙන ක්ෂේත්‍රයක් පිළිබඳව කථා කිරීම සඳහා එතුමාගේ පළමුවැනි යෝජනාව ලෙස මෙවන් යෝජනාවක් ගරු ඇමතිතුමාට ඉදිරිපත් කිරීම ගැන අපි ඉතා සතුටු වෙනවා.

අද අපි මේ රටේ මේ උත්තරීතර ආයතනය පාවිච්චි කරන්නේ කුමක් සඳහාද කියා කල්පනා කර බැලුවොත්, සියයට 50ක් පමණම එය පාවිච්චි කරන්නේ අනිකාගේ චරිත ඝාතනයට, නැත්නම් තමන්ගේ දේශපාලන ප්‍රතිරූපය ඉහළ නංවා ගැනීමටයි කියන එක අපට පෙනී යනවා. නමුත් මේ උත්තරීතර ආයතනය තුළින් මේ වාගේ සාධනීය යෝජනා, මේ වාගේ රටට වැදගත් යෝජනා ඉදිරිපත් වීම අතිශය වැදගත්ය කියා මම විශ්වාස කරනවා. ඒ නිසා ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාවට මමත් යම් අදහසක් එකතු කරනවා. සාමාන්‍යයෙන් මමත් පන්සල් ආශ්‍රය කරන කෙනෙක්. ඒ නිසා දහම් පාසල් පිළිබඳව මටත් අවබෝධයක් තිබෙනවා. මම නියෝජනය කරන රක්වාන මැතිවරණ කොට්ඨාසයේ සෑම ජාතියක්ම නියෝජනය කරන ජාතීන් සිටින නිසා, මේ රට තුළ දහම් අධ්‍යාපනය පුබුදුවන්න අපි කටයුතු කරන්න ඕනෑ මොන විධියටද කියා මම දන්නවා.

ගරු ඇමතිතුමනි, මීට අවුරුදු 15කට ඉහතදී දහම් අධ්‍යාපනය පිළිබඳව මේ රටේ මිනිසුන් තුළ ලොකු ඕනෑකමක් තිබුණා. නමුත් මේ අධ්‍යාපන ක්‍රමයේ වෙනස්කම් එක්ක; පාසල් අධ්‍යාපනය තුළ ඇති වුණු වෙනස්කම් එක්ක දහම් අධ්‍යාපනය පිළිබඳව තිබුණු ඒ ඕනෑකම ක්‍රම ක්‍රමයෙන් නැති වෙලා ගියා කියා අපි හිතනවා. අද පළාත් සභා වේවා, ප්‍රාදේශීය සභා වේවා ඒවා හරහා යම් යම් නීති, සංශෝධන ගෙනාවාට, මේ දේවල් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඒ නිසා අපේ ගරු මන්ත්‍රීතුමා යෝජනා කළා වාගේ, පළමුවෙන්ම දහම් අධ්‍යාපනය ලබාදෙන ගුරුවරුන් ගැන අපි හිතන්න ඕනෑ. ඒ ගුරුවරුන් දිරිමත් කරලා, ඒ ගුරුවරුන් මේ සඳහා උනන්දු කරවා දහම් අධ්‍යාපනය ලබා දෙන්න පුළුවන් හොඳ ආචාර්ය මණ්ඩලයක් රට තුළ පද්ධතියක් විධියට හදන්න ඕනෑ. එසේ හදනවා වාගේම, ඊට පසුව තමන්ගේ දරුවා දහම් පාසලට යැවීම සඳහාත් දෙමව්පියන් උනන්දු වෙන්න ඕනෑ. ඒ තුළින් හොඳ පුරවැසියෙක් රටට එකතු කරනවා වාගේම, මේ දහම් අධ්‍යාපනය ඔහුගේ අධ්‍යාපනයේ එක කොටසක් බවට පරිවර්තනය වෙන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, දහම් අධ්‍යාපනය ලැබූ දරුවා විශ්වවිද්‍යාලයට යනකොට එය අතිරේක සුදුසුකමක් වෙන්න, ඔහුට රැකියාවක් ලබා දෙනකොට එය අතිරේක සුදුසුකමක් වෙන්න, එහෙමත් නැත්නම් රැකියාවක් ලබාගැනීමේදී දහම් අධ්‍යාපනය ලබා තිබෙන දරුවා කෙරෙහි විශේෂ කොට බලන්න, රජයේ රැකියාවක් දෙනකොට අඩුම තරමින් ඒ සම්බන්ධව සලකා බලන්න පුළුවන් ආකාරයට මේ රට තුළ නීති පද්ධතිය සකස් කරන්න පුළුවන් නම් හොඳයි.

ධර්මාචාර්ය විභාගය සමත් වුණු අයට ගුරු පත්වීම් ලබා දෙනවාය කියා පසුගිය කාලයේ ප්‍රකාශයක් කළ ආකාරය අපි දැක්කා. අපේ ප්‍රදේශවල සිටින විශාල පිරිසකට මේ අවස්ථාව ලැබෙයි කියා අපිත් බලාපොරොත්තුවෙන් සිටියා. නමුත් එහෙම අවස්ථාවක් තවම අපට ලබා දෙන්න බැරිවෙලා තිබෙන බව අපි දන්නවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ විෂයය පිළිබඳව අවබෝධයෙන් කටයුතු කරන අමාත්‍යවරයෙක්. පන්සලේ තිබෙන ප්‍රශ්න ටික විසඳනවා වාගේම, පන්සලෙන් කෙරෙන සේවාවත් පුළුල් වෙන්න ඕනෑ. පන්සලෙන් ගමට වෙන්න ඕනෑ සේවාව මොකක්ද කියන එක පිළිබඳව සමහර පන්සල්වලට අවබෝධයක් නැහැ කියන එක අපි දන්නවා. අපේ ගරු ඇමතිතුමනි, සමහර පන්සල් වාණිජ මධ්‍යස්ථාන වෙලා තිබෙන බව අපි කනගාටුවෙන් කියනවා. එහෙම නොවෙයි, පන්සල, පල්ලිය, කෝවිල කියන මේ ආයතන ටික ගමේ මනුෂ්‍යයාට වැඩ කරන්න පුළුවන්, ගමේ මනුෂ්‍යයාගේ අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටින, ආගම දහම ප්‍රචාරය කරන ආයතන බවට පරිවර්තනය වෙන්න ඕනෑ.

[ගරු හේෂාන් විතානගේ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් කරීකයන් සිටින නිසා මම වැඩිදුර කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න ඕනෑ. ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන ලද මේ යෝජනාව නිකම්ම නිකම් යෝජනාවක් විධියට පැත්තකට යන එකක් නැහැ. අපේ ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයෙක්. මේ රටේ දේශපාලනය පිළිබඳව පුළුල් අවබෝධයක් තිබෙන ගරු අමාත්‍යවරයෙක් විධියට එතුමා මේ වෙනුවෙන් සාධාරණයක් ඉටු කරාවි. ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා පළමුවැනි යෝජනාව විධියට මේ යෝජනාව එතුමාට ඉදිරිපත් කර තිබෙනවා. ඒ යෝජනාවේ සඳහන් කාරණා ඉටු කරන්න එතුමා කුමන හෝ පියවර ගනීවි කියා අපි විශ්වාස කරනවා. ඒ සඳහා එතුමාට ශක්තිය, ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
The next speaker is the Hon. Velu Kumar. You have five minutes.

[පි.ප. 6.46]

ගරු වේලු කුමාර් මහතා
(මාණ්පුමිකු වේලු කුමාර්)
(The Hon. Velu Kumar)
කෞරව තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළේ, කාලි මාවට්ටප් පාරාළුමන්ර උරුප්පිනර් කෞරව පන්තුල ලාල් පණ්ඩාරිකොඩ අවර්කළාල් මුන්වෛක්කප්පට්ටිරුක්කින්ර අරසෙරිප් පාඩසාලෛකළිනුඩෙය කර්රල් වළිකාට්ටල් තොඩර්පාන සභෛ ඔත්තිවෛප්පුවේළෛප් පිරේරණෙයිල් උරෛයාර්රුවතර්කාන වාය්ප්පිනෛත් තන්තමෛක්කු නන්රි තෙරිවිත්තුක්කොළ්කින්රේන්. පුත්තසාසන අමෛච්සර් අවර්කළ් ඉතර්කු විඩෙයළිප්පතර්කුත් තයාරාක ඉරුන්තාලුම්, ඉංගු මුන්වෛක්කප්පට්ටිරුක්කින්ර පිරේරණෙයෛ ඉන්ත මත අලුවල්කළ් අමෛච්සු, මුස්ලිම් සමය අලුවල්කළ් අමෛච්සු, කිරිස්තව සමය අලුවල්කළ් අමෛච්සු ආකිය අමෛච්සුක්කළුඩන් තොඩර්පුපට්ට ඔන්රාකවේ නාන් පාර්ක්කින්රේන්. අන්ත වකෙයිලේ, ඉන්ත පිරේරණෛ තොඩර්පාක ඉන්ත මත අලුවල්කළ් අමෛච්සර් තනතු පංකුපර්රලෛච් චෙය්තිරුන්තාල් චිරප්පාක ඉරුන්තිරුක්කුමෙන නිනෛක්කින්රේන්.

එංකළුඩෙය නාට්ටිලේ පාඩසාලෛ චෙල්කින්ර පිළ්ළෛකළුක්කු වාර ඉරුති නාට්කළාන සනික්කිළමෛ, ඥායිර්රුක්කිළමෛ ආකිය ඉරණ්ටු තිනංකළ් විටුමුරෛ නාට්කළාක ඉරුක්කින්රන. තංකළුක්කිරුක්කින්ර පිරතාන ඔය්වු නාළාන ඥායිර්රුක්කිළමෛයෛප් පොතුවාක ඉන්ත අරසෙරිප් පාඩසාලෛක්කාක අවර්කළ් ඔතුක්කික්කොළ්කින්රනර්. කුරිප්පාක ඉන්තු අරසෙරිප් පාඩසාලෛකළ් නාටු මුළුවතුම් නඩෙපෙර්රාලුම් අන්ත අරසෙරිප් පාඩසාලෛකළ් ඉන්නුම් මුරෛයාක ඔළුංකුපටුත්තප්පටාත ඔරු නිලෛයේ කාණප් පටුකින්රතෙන්පතනෛ ඉංගු චුට්ටික්කාට්ට වේණ්ටුම්. ඉන්තු අරසෙරිප් පාඩසාලෛකළිනතු පතිවුකළ් මාකාණ ඉන්තු කලාචාර අමෛච්සින්කීළුම්, මත්තිය අරසිල් ඉරුක්කින්ර ඉන්තුමත අලුවල්කළ් අමෛච්සින් කීළුම් මේර්කොළ්ළප්පට්ටු අවෛ අංගීකරික්කප්පටුකින්රන. අරස නිරුවාකත්තිර්කුක්කීළ් අවෛ උරියවාරු අන්තන්තප් පිරතේස චෙයලකංකළුක්කූටාක පතිවු චෙය්යප්පට්ට අමෛප්පුක්කළාක කට්ටියෙළුප්පප්පටුවතු පොරුත්තමාක ඉරුක්කුමෙන්රු නාන් නිනෛක්කින්රේන්.

අතේනේරම්, ඉන්ත අරසෙරිප් පාඩසාලෛකළ් තොඩර්පාක ඉන්තුමත අලුවල්කළ් අමෛච්සිනූටාක අවර්කළ් මුන්නෙඩුක්කින්ර චෙයර්පාඩුකළ් පෝතුමානතාවෙන්ර කේල්වියුම් එළුකින්රතු. ඉංගේ පන්තුල ලාල් පණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද ඉතා කාලෝචිත යෝජනාව පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී මටත් අදහස් දැක්වීමට ඉඩ ලබාදීම පිළිබඳව ඔබතුමාට ප්‍රථමකොට ස්තුතිවන්ත වනවා. ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා කියන්නේ පාර්ලිමේන්තුවේ ඉතා දීප්තිමත් චරිතයක්. මේ රටේ සමස්ත දහම් පාසල් හා පෙර පාසල් ගුරුවරුන්ට ශක්තියක් දීම සඳහා එතුමා මේ ගරු සභාවට ගෙනෙන මේ යෝජනාවට අපි බොහොම කැමැත්තෙන් දායකත්වය දෙනවා. ඇත්තෙන්ම දහම් පාසල් අධ්‍යාපනය නොලබපු පිරිස් තමයි මේ රටේ වඩාත්ම අකටයුතුකම්වලට සම්බන්ධ වෙලා ඉන්නේ. ඒ කාරණය අපි දිගින් දිගට සාකච්ඡා කරන දෙයක්. මේ රටේ මත් ද්‍රව්‍ය ජාවාරම, දූෂණය, භීෂණය, ස්ත්‍රී දූෂණය, මිනී මැරුම් ආදී විශාල අපචාරයන් සිද්ධ වෙන්නේ මෙසේ දහම් අධ්‍යාපනය නොලබන පිරිස් තුළිනුයි. ඒ නිසා මේ රටට දහම් පාසල් අධ්‍යාපනය ඉතා වැදගත් වෙනවා. මේ රටට යහපත් පුරවැසියන් බිහි කිරීම සඳහා

අතේනේරම්, ඉන්ත අරසෙරිප් පාඩසාලෛකළ් තොඩර්පාක ඉන්තුමත අලුවල්කළ් අමෛච්සිනූටාක අවර්කළ් මුන්නෙඩුක්කින්ර චෙයර්පාඩුකළ් පෝතුමානතාවෙන්ර කේල්වියුම් එළුකින්රතු. ඉංගේ පන්තුල ලාල් පණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද ඉතා කාලෝචිත යෝජනාව පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී මටත් අදහස් දැක්වීමට ඉඩ ලබාදීම පිළිබඳව ඔබතුමාට ප්‍රථමකොට ස්තුතිවන්ත වනවා. ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා කියන්නේ පාර්ලිමේන්තුවේ ඉතා දීප්තිමත් චරිතයක්. මේ රටේ සමස්ත දහම් පාසල් හා පෙර පාසල් ගුරුවරුන්ට ශක්තියක් දීම සඳහා එතුමා මේ ගරු සභාවට ගෙනෙන මේ යෝජනාවට අපි බොහොම කැමැත්තෙන් දායකත්වය දෙනවා. ඇත්තෙන්ම දහම් පාසල් අධ්‍යාපනය නොලබපු පිරිස් තමයි මේ රටේ වඩාත්ම අකටයුතුකම්වලට සම්බන්ධ වෙලා ඉන්නේ. ඒ කාරණය අපි දිගින් දිගට සාකච්ඡා කරන දෙයක්. මේ රටේ මත් ද්‍රව්‍ය ජාවාරම, දූෂණය, භීෂණය, ස්ත්‍රී දූෂණය, මිනී මැරුම් ආදී විශාල අපචාරයන් සිද්ධ වෙන්නේ මෙසේ දහම් අධ්‍යාපනය නොලබන පිරිස් තුළිනුයි. ඒ නිසා මේ රටට දහම් පාසල් අධ්‍යාපනය ඉතා වැදගත් වෙනවා. මේ රටට යහපත් පුරවැසියන් බිහි කිරීම සඳහා

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා.6.50]

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු ආනන්ද අලුත්තකමකේ)
(The Hon. Ananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී දහම් පාසල් අධ්‍යාපනය පිළිබඳව ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද ඉතා කාලෝචිත යෝජනාව පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේදී මටත් අදහස් දැක්වීමට ඉඩ ලබාදීම පිළිබඳව ඔබතුමාට ප්‍රථමකොට ස්තුතිවන්ත වනවා. ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා කියන්නේ පාර්ලිමේන්තුවේ ඉතා දීප්තිමත් චරිතයක්. මේ රටේ සමස්ත දහම් පාසල් හා පෙර පාසල් ගුරුවරුන්ට ශක්තියක් දීම සඳහා එතුමා මේ ගරු සභාවට ගෙනෙන මේ යෝජනාවට අපි බොහොම කැමැත්තෙන් දායකත්වය දෙනවා. ඇත්තෙන්ම දහම් පාසල් අධ්‍යාපනය නොලබපු පිරිස් තමයි මේ රටේ වඩාත්ම අකටයුතුකම්වලට සම්බන්ධ වෙලා ඉන්නේ. ඒ කාරණය අපි දිගින් දිගට සාකච්ඡා කරන දෙයක්. මේ රටේ මත් ද්‍රව්‍ය ජාවාරම, දූෂණය, භීෂණය, ස්ත්‍රී දූෂණය, මිනී මැරුම් ආදී විශාල අපචාරයන් සිද්ධ වෙන්නේ මෙසේ දහම් අධ්‍යාපනය නොලබන පිරිස් තුළිනුයි. ඒ නිසා මේ රටට දහම් පාසල් අධ්‍යාපනය ඉතා වැදගත් වෙනවා. මේ රටට යහපත් පුරවැසියන් බිහි කිරීම සඳහා

දහම් අධ්‍යාපනය ඉතා වැදගත් වෙනවා. ඒ නිසා මේ යෝජනාව ඉතා වැදගත් වෙනවා. ඒ අධ්‍යාපනය ලබා දෙන ගුරුවරුන් සහ ඒ සඳහා දායකත්වය දෙන ඒ සියලු දෙනා රැක ගැනීම සහ ඔවුන්ට ධෛර්යයක්වීම මේ රටේ පුරවැසියන් හැටියට අපේ යුතුකමක් සහ වගකීමක් වනවා. ඒ අයට සහයෝගය දැක්වීම සහ උදව් උපකාර කිරීමද වැදගත් වනවා. මම දැක්කා, මේ රටේ ජනාධිපතිතුමා වේදිකාවේ තියාගෙන මේ රටේ පොලීසිය හසුරුවන පොලීසියේ ප්‍රධානියා වන පොලිස්පතිතුමා වේදිකාවක කරන කථාවක්. එතුමා කියනවා, ශ්‍රී ලංකාද්වීපය තමයි දූෂණයෙන්, භීෂණයෙන්, ස්ත්‍රී දූෂණයෙන්, මත් ද්‍රව්‍ය ජාවාරමෙන් දෙවෙනි, තුන්වැනි ස්ථානයට පත්වෙලා තිබෙන්නේ කියලා.

ඉතිහාසයේ "පෙරදිග මුතුඇටය" කිව්ව "පෙරදිග ධාන්‍යාගාරය" කිව්ව "පිරිසිදු බෞද්ධ ධර්මය තිබෙන රට" කිව්ව මේ රට ගැන පොලිස්පතිතුමා රටේ ජනාධිපතිවරයා මහපුටුවේ තියාගෙන මෙහෙම ප්‍රකාශයක් සිද්ධ කළා. ඒ නිසා අපි බොහොම කනගාටුවට පත් වෙනවා. පොලිස්පතිතුමා තමයි මේ දූෂණය, භීෂණය, ස්ත්‍රී දූෂණය, මිනීමැරුම්, මත් ද්‍රව්‍ය ජාවාරම් විනාශ කිරීම සඳහා, ඒවා සොයා බැලීම සඳහා සිටින බලධාරියා වන්නේ. එතුමා එවැනි ප්‍රකාශයක් කරනකොට අපට තමයි මේ සම්බන්ධව කටයුතු කරන්න සිද්ධ වෙන්නේ. ජනාධිපතිතුමාත් තියාගෙන පොලිස්පතිතුමා රටේ තත්ත්වය බොහොම පැහැදිලිව රටට කියලා දුන්නා. අපි බොහොම කනගාටු වෙනවා. අපි තමයි ජනාධිපතිතුමා ජනවාරි 08 වෙනිදා පත් කළේ. මේ රටේ ජනාධිපතිතුමා කොතැනද ඉන්නේ කියලා අපට වේදනාවක් තිබෙනවා. මගේ හෘදය සාක්ෂියට එකඟවයි මම කථා කරන්නේ. ජනාධිපතිතුමා එක තැනක කිව්ව කථාවක් තව තැනක එතුමාම කියනවා, "මම මෙහෙම දෙයක් කිව්වේ නැහැ." කියලා.

එතුමා පත් කරන්නට ආසන සංවිධායකවරු හැටියට අපි ඒ කළ පරිත්‍යාගයේ ප්‍රතිඵලය සාධාරණ විධියට භුක්ති විඳින්නට මේ අවුරුදු දෙකහමාර තුන තුළ අපට හම්බ වුණේ නැහැ. රටේ නායකයා ජනාධිපතිතුමා. එතුමා පත් කළ පොලීසියේ බලධාරියා - පොලිස්පතිතුමා- මෙවැනි ප්‍රකාශයක් කිරීම පිළිබඳව දැඩි කනගාටුවක් ඇති වෙනවා. මේ රටේ රජයක් තිබෙනවාද කියන කනගාටුදායක- [බාධා කිරීමක්] මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අද මේ රටට කනගාටුදායක ප්‍රතිඵලයක් හම්බ වෙලා තිබෙනවා. එම නිසා මම හිතන විධියට මේවා නිවැරදි විය යුතුයි. අපි මහා බලාපොරොත්තු තියාගෙනයි 2015 ජනවාරි 08වෙනි දා ජනාධිපතිතුමාව පත් කළේ. අගමැතිතුමාගේ පූර්ණ සහයෝගය ඇතිව තමයි එදා එතුමා ජනාධිපතිතුමා වුණේ. එම නිසා මේ දෙදෙනාගේ සුහදශීලී ගමනක් නැත්නම් මේ රටේ ජනතාවගේ-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ජනාධිපතිතුමාගේ ක්‍රියා කලාපය ගැන මේ ගරු සභාවේ කථා කරන්නට එපා.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු ආනන්ත අළුත්කමකේ)
(The Hon. Ananda Aluthgamage)
ඒක මම පෞද්ගලිකව, හෘදය සාක්ෂියට එකඟව කිව්ව කථාවක්. අපි තමයි ජනාධිපතිතුමා පත් කළේ. එහෙම නම් "ජනාධිපතිතුමා" නොකියා "රටේ නායකයා" කියලා කියන්නම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ස්ථාවර නියෝග අනුව මේ ගරු සභාවේදී මන්ත්‍රීවරුන්ට ජනාධිපතිවරයාගේ පැවැත්ම ගැන කථා කරන්නට බැහැ.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු ආනන්ත අළුත්කමකේ)
(The Hon. Ananda Aluthgamage)
එහෙම නම් ඒක අයින් කරලා, අපි පත් කරපු ජනාධිපති නොවෙයි, රටේ ප්‍රධානියා කියලා මම කියන්නම්. "ජනාධිපතිවරයා" කියන වචනය අයින් කරලා "ප්‍රධානියා" කියන වචනය අනුයුක්ත කරන්න. මොකද, මේ කටයුත්තට මහන්සි වුණු නිසා මට හෘදය සාක්ෂියට එකඟව එහෙම කියන්න පුළුවන් නිසයි මම ඒ කථාව කිව්වේ. අපි ලේ, දහඩිය, කඳුළු වගුරුවලායි එතුමා එතැනට ගෙනාවේ. එම නිසා ඒ කාරණා කියන්නට අයිතිය මට තිබෙනවා. කාලය සීමිත නිසා අවස්ථාව ලබා දීම පිළිබඳව තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමා.

ඊට පෙර, ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (බුද්ධ ශාසන අමාත්‍යතුමා)
(මාණ්පුමිකු කාමිණි ජයවික්‍රම පෙරේරා - පුත්තසාසන අමෛච්චර්)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Buddhasasana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලක්ී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු හේෂාන් විතානගේ මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹேசான் விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. HESHAN WITHANAGE *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා, කථාව ආරම්භ කරන්න.

[අ.භා.6.56]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(මාණ්පුමිකු (පේරාසිරියර්) ආශු මාරසිංහ)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ස්තුතියි. ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා මූලාසනයේ සිටින වෙලාවේ කථා කරන්නට ලැබීම ගැන ඉතාමත් සන්තෝෂයට පත් වෙනවා. ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් වශයෙන් දහම් පාසල් සම්බන්ධව ඉදිරිපත් කරන ලද ඉතා වටිනා යෝජනාව අනුමත කරමින්, මීනුවන්ගොඩ, මැදගමුව "සුමඟ" දහම් පාසලේ හිටපු දහම් පාසල් ගුරුවරයකු විධියටත්, දහම් පාසලක අවසාන විභාගය දක්වා අධ්‍යාපනය ලැබූ කෙනෙකු හැටියටත් දහම් පාසල් වෙනුවෙන් කථා කරන්නට ලැබීම ගැන මම ඉතාමත් සන්තෝෂයට පත් වෙනවා.

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

දහම් අධ්‍යාපනය ගැන කථා කරන කොට අපේ බුද්ධ ශාසන ඇමතිතුමා ගැනත් යමක් කියන්න ඕනෑ. එතුමා ලංකාවේ ප්‍රධාන බෞද්ධ පාසලක් වන කොළඹ නාලන්දා විද්‍යාලයේයි අධ්‍යාපනය හැදෑරුවේ. මම ආනන්ද විද්‍යාලයේයි අධ්‍යාපනය හැදෑරුවේ. එතුමා අපට බොහොම කාලයකට කලින් කොළඹ නාලන්දා විද්‍යාලයෙන් බෞද්ධ අධ්‍යාපනයත් එක්ක අධ්‍යාපනය හැදෑරුවා. මේ පාර්ලිමේන්තුවේ බුද්ධාගම ගැන වැඩියෙන්ම දන්න, බුද්ධාගමට වැඩියෙන්ම ආදරය කරන බුද්ධ ශාසන ඇමතිවරයා තමයි එතුමා. එතුමා අද පාර්ලිමේන්තුවේ මේ යෝජනාවට උත්තර දෙන්න පැමිණිලා ඉන්න වෙලාවේ හෘදය සාක්ෂියක් තිබෙන මන්ත්‍රීවරයෙක් හැටියට මම කියන්න කැමැතියි, එතුමාට බුද්ධ ශාසන අමාත්‍යාංශයේ ඉදිරි කටයුතු ක්‍රියාත්මක කරන්න විශේෂ දක්ෂතාවක් තිබෙන බව. ඒ ගැනත් මතක් කරමින් මගේ කථාව ආරම්භ කරන්න මම කැමැතියි.

කල් තැබීමේ යෝජනාවෙන් අපේ බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා යෝජනා කරන 01, 02, 03 සහ 04 කියන ඒ කාරණාවලට මන්ත්‍රීවරුන් සියලුදෙනාම එකඟයි. මොකද, දහම් අධ්‍යාපනය කියන එක ඉතාමත් වැදගත් නිසා.

සමහර අය පාර්ලිමේන්තුවේ හැසිරෙන විධිය ගැන දැක්කාම අපට හිතෙනවා, දහම් අධ්‍යාපනය තියා සමහර වෙලාවට පාසල් අධ්‍යාපනයවත් ලැබිලා තිබෙන අයද මෙතැන ඉන්නේ කියලා. මම මේ කියන්නේ සියලුම අය ගැන නොවෙයි. බොහොම ස්වල්ප දෙනෙක් ගැනයි මම මේ කියන්නේ. මේ පුද්ගලයන්ටත් අපේ බුද්ධ ශාසන ඇමතිවරයා හරහා අපට පුළුවන් නම් නැවත දහම් අධ්‍යාපනය සමඟ සාරධර්ම අධ්‍යාපනයත් හඳුන්වා දෙන්න, මම හිතනවා, ඒක ඉතාමත් වටිනා දෙයක් වෙයි කියලා.

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා යෝජනා කළා වාගේ දහම් පාසල් ගුරුවරුන් වෙනුවෙන් -විශේෂයෙන් ධර්ම අධ්‍යාපනය උගන්වන ගුරුවරුන් වෙනුවෙන්- විද්‍යා පීඨයක් ආරම්භ කිරීම ඉතාමත් කාලෝචිත යෝජනාවක්. බුද්ධ ශාසන අමාත්‍යාංශය හරහා එයත් කරන්න පුළුවන් නම් අපි ඉතාමත් අගය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ දිනවල සාරධර්ම ගැන කථා කරනවා. සාරධර්ම වාගේම අපේ සමහර අයට අවුරුදු තුනකට කලින් කියපු දේවල් අමතක වීම ගැනත් අපි කථා කරනවා. අවුරුදු තුනකට කලින් කියපු දේවල් අමතක වීම අර්ථ දක්වා ගෙන ගියාම අපට මේ කථාවත් මතක් වෙනවා. බුද්ධ ධර්මය තමන් හොඳට දන්නවා කියලා හිතාගෙන කටයුතු කරන සමහර අය කියන්නේම අසත්‍ය. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර වෙලාවට හිතෙනවා, මේ රටේ අපි දකින නායකයන්ටත් මොකක්ද මේ වෙලා තිබෙන්නේ කියලා. මේ සාරධර්ම සියල්ල අමතක වෙලා; ගිලිහිලා ගිහිල්ලා. පන්සිල් පද ගැන මතකයත් සම්පූර්ණයෙන් අමතක වෙලා, තමන් මොකක්ද මේ කරන්නේ කියලා දන්නේ නැහැ.

ඊයේ-පෙරේදා මාධ්‍යවලින් ප්‍රචාරය වෙන කොට අපි දැක්කා, සමහර අයට අවුරුදු තුනකට කලින් කියපු දේවල් අද අමතක වෙලා කියනවා, "නැහැ, මම එහෙම කිව්වේ නැහැ" කියලා. මෙවැනි නායකත්වයේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. සමහර වෙලාවට මේක රටේ නායකත්වයෙන් වෙනවා නම් අපට බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. අපි ඒ බරපතළ ප්‍රශ්නයට අද මුහුණ දෙමින් ඉන්නවා.

අපේ ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කියපු කාරණයත් එක්ක අපි එකඟයි. ඒ කාරණය තමයි මේ රටේ ප්‍රධාන ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙන්නේ. අපේ නායකයන් ආදර්ශවත් විය යුතුයි. රටේ නායකයෝ ආදර්ශවත් විධියට රට පාලනය කරන්නේ නැත්නම්, රජ වාසලේ ඉන්න කේවට්ටයන්ට අවශ්‍ය විධියට මේ රට පාලනය වෙනකොට මේ රටට මොකක්ද වෙන්නේ? අපි අතීතයේ දැකලා තිබෙනවා, කේවට්ටයන්ගේ කීමට රට පාලනය කරනවා. එවැනි අවස්ථාවන් වෙනවා නම්, මේ රට පරිහානියට පත් වෙනවා. ඒක නිසා නැවත නැවතත් ආවර්ජනය කළ යුතු වෙනවා, මේ ධර්ම අධ්‍යාපනය නිවැරැදි ආකාරයට ලබා දිය යුතුයි කියන එක. "මම තරම් සිල්වත් බෞද්ධයෙක් නැහැ, අපේ හාමුදුරුවනේ" කියලා එළියට පෙනෙන්න කිව්වාට වැඩක් නැහැ. තමාගේ සිල්වත්කම තමන්ගේ ක්‍රියාවෙන් ඔප්පු කරන්න ඕනෑ. අතීතයේ එකඟ වෙච්ච දේවල් ඒ එකඟතාවට අනුව දිගටම පවත්වාගෙන යන්න ඕනෑ. කිසියම් නායකයෙකුට බැරි නම් අතීතයේ එකඟ වෙච්ච දේවල් දිගටම පවත්වාගෙන යන්න, අතීතයේ එකඟ වෙච්ච ඒවා නැවත විවේචනය කරනවා නම්, ඒවා ගැන හෘදය සාක්ෂියට එකඟව කථා කරන්නේ නැත්නම්, ඒ සම්බන්ධයෙන් අපට ප්‍රශ්න තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, එවැනි ප්‍රශ්න ගැන සාකච්ඡා කරන්න.

එවැනි දේවල් කථා කරන ජනමාධ්‍යයට අඩන්තේට්ටම් කිරීම පිළිකුල් සහගතව අපි හෙළා දකිනවා. අපි දැක්කා, ටීඑන්එල් ආයතනයට ඒ දේවල් කෙරෙනවා. දහම් අධ්‍යාපනය ගැන කථා කරන කොට එවැනි දේවල් අපට නොකියා බැහැ. සමහර ජනමාධ්‍ය දහම් අධ්‍යාපනය ප්‍රචලිත කරන්න උත්සාහ කළා. ටීඑන්එල් ආයතනයත් ඒ වාගේ ආයතනයක් හැටියටයි අපි දකින්නේ. එවැනි ආයතනවලට දණ්ඩ නීති සංග්‍රහයේ තිබෙනවා වාගේ නීති පනවලා, මේ මාධ්‍ය නිදහසත් නැති කරන්න යනවා නම් ඒක සම්පූර්ණයෙන්ම අපි වැළැක්විය යුතු වෙනවා. අපේ බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා මේ මතු කරන සාරධර්ම සහිත සමාජයක් බිහි කිරීම සඳහා වූ මේ කාරණා ටික මම හිතන්නේ අපේ නායකයන්ටත් ඉගැන්විය යුතුයි.

එහෙම කළේ නැත්නම් මොකද වෙන්නේ? අවුරුදු තුනකට කලින් මේ රටේ ජනතාව ඡන්දය දුන්නේ මොකටද කියා ඡන්දය දුන් ජනතාවට ප්‍රශ්න කරන්න සිද්ධ වන තැනකට දැන් ඇවිත් තිබෙනවා. ඒ නිසා තමයි අප කියා සිටින්නේ දහම් අධ්‍යාපනය මීටත් වඩා දියුණු කරලා සාර ධර්මවලින් පිරි සමාජයක් බිහි කිරීමේ වගකීම විශේෂයෙන් දහම් පාසල්වලට තිබෙනවා කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දහම් පාසල් ගිය ශිෂ්‍ය ශිෂ්‍යාවන් කිසිම කෙනකු වැරැදි ක්‍රියා මාර්ගවලට යොමු වන්නේ නැති බව අපි දැක තිබෙනවා. තමන් ධර්ම අධ්‍යාපනය හරියාකාරව ලබා ගත්තා නම්, හෘදය සාක්ෂියට අනුව කටයුතු කරන නිසා වැරැදි දේවල් සිද්ධ වන්නේ නැහැ. අද මේ පාර්ලිමේන්තුවේ සිටින විවිධ දිස්ත්‍රික්ක නියෝජනය කරන සියලු මන්ත්‍රීවරු එයට සාක්ෂි දරනවා. මොකද, ඒ මන්ත්‍රීවරු දන්නවා, දහම් අධ්‍යාපනයේ වටිනාකම. එවැනි මන්ත්‍රීවරුන් එක්ක අප යන මේ ගමනේ දහම් අධ්‍යාපනය සඳහා ඉදිරි අඩිතාලම දමන්නට විශේෂයෙන් බුද්ධ ශාසන අමාත්‍යවරයාට අපි අපේ සම්පූර්ණ සහයෝගය දෙනවා කියන එකත් මම ප්‍රකාශ කරනවා. ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා යෝජනා කරන ආකාරයට කටයුතු කළ යුතුවා මෙන්ම කිව යුතු තවත් කරුණක් තිබෙනවා.

ගරු බුද්ධ ශාසන අමාත්‍යතුමාගේ අලුත් යෝජනාවක් තිබෙනවා, අපේ රටේ තිබුණු පැරණි සංකල්පයක් වන "වැවයි දාගැබයි - ගමයි පන්සලයි" නැවත ප්‍රතිෂ්ඨාපනය කළ යුතුය කියා. එය ඉතා වටිනා සංකල්පයක්. "වැවයි දාගැබයි - ගමයි පන්සලයි" කියන සංකල්පය තුළ දහම් අධ්‍යාපනය තිබෙනවා. අතීතයේ තිබූ විධියට එය relaunch කරන්න අපට පුළුවන් නම්, මේ බොහෝ ප්‍රශ්න විසඳාගන්න හැකියාවක් ලැබේවි කියා අපි හිතනවා. බොහොම ස්තුතියි.

[අ.භා.7.04]

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සහෝදර බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද මේ කාලීන යෝජනාව යහපත් එකක් කියා අපි විශ්වාස කරනවා. එතුමා ඒ යෝජනාව අරගෙන ඇවිල්ලා එය විග්‍රහ කළේ, අතීතයේ දහම් පාසල් ගිය නමුත් දහම් පාසල් තුළින් ලබාගත් අධ්‍යාපනය භාවිතාවේ යොදවන්නේ නැතිව, ඒක දඩමීමා කරගෙන තමන්ගේ ජීවිතය නරක පැත්තට ගෙන යන මිනිසුන් සම්බන්ධයෙන් නොවෙයි කියන එකයි මම විශ්වාස කරන්නේ. අපි ඉහත කී අර්ථයෙන් කතා කරනවා නම්, එයින් කරන්නේ එතුමා ගෙන ආ මේ යෝජනාවේ හරය එයින්ම සුන් කර දමන්න උත්සාහ කර දැමීමක්. ඒ පුද්ගලයන්ට බණ කියන්න අපට අවශ්‍ය නැහැ කියන එකයි මම විශ්වාස කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා ගෙන ආ මේ යෝජනාව තුළින් අපි දකින කාරණා කීපයක් තිබෙනවා. දහම් පාසල්වල ඉගැන්වීමේ කටයුතු කරන බොහෝ අය අ.පො.ස. (සාමාන්‍ය පෙළ), අ.පො.ස. (උසස් පෙළ) කළ අයයි; සමත් අයයි; GAQ කරන අයයි. ඒ වාගේම, ගුරු වෘත්තියෙන් විශ්‍රාම ගොස් දහම් පාසල්වල ඉගැන්වීමේ කටයුතුවල යෙදෙන සමහර අයත් ඉන්නවා.

එසේ කරන්නේ, ඒ අයගේ දැනුම දරුවන්ට බෙදා දීම සඳහා කියලායි අපි විශ්වාස කරන්නේ. නමුත්, මොන තරාතිරමේ අය දරුවන්ට දහම් පාසල් අධ්‍යාපනය ලබා දීමට කටයුතු කළත්, මේ රටේ පාලකයන් කිසි කෙනෙක් ඒ අයගේ කැප කිරීම, පරිත්‍යාගය ඇගයීමට ලක් කරනවා කියලා අපට දැනෙන්නේ නැහැ. එහෙම ඇගයීමට ලක් කරනවා නම්, දහම් අධ්‍යාපනය ලබා දෙන ගුරු භවතුන්ට සුරක්ෂිතභාවයක් ඇති කරන්න කියලා මේ විධියට පාලකයින්ට යෝජනා ගෙනෙන්න බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමාට අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ කටයුත්ත නොකෙරුණු නිසා තමයි ඒ සම්බන්ධයෙන් යළි යළිත් මතක් කරන්න එතුමාට සිද්ධ වෙලා තිබෙන්නේ. අපි කොයි තරම් කථා බහ කළත් වැඩක් නැහැ, ඒ කථා බහ කරන දේ භාවිතාවේ යොදන්න පාලකයන් ක්‍රියාමාර්ග ගන්නේ නැත්නම්. එහෙම වුණොත් ඒවා නිකම්ම නිකම් හමස් පෙට්ටියට යනවාය කියන එකයි මගේ විශ්වාසය. අපේ පැත්තෙන් අපි 1994 වසරේ ඉඳලා මේ දක්වාම පළාත් සභා සහ පාර්ලිමේන්තු ප්‍රතිපාදන බොහොමයක් අධ්‍යාපන ක්ෂේත්‍රයේ, දරුවන්ගේ ශුභ සිද්ධියට යොදවමින් එනවා. මුළු රටේම පාසල් දරුවන්ගේ, දහම් පාසල් දරුවන්ගේ අධ්‍යාපන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම සඳහා අපි මේ දක්වා හැම වසරකම අබණ්ඩව සියයට 15ක් විතර වෙන් කරලා තිබෙනවා; සිංහල වේවා, දෙමළ වේවා, මුස්ලිම් වේවා, සෑම දහම් පාසලකටම. ඒ අය ඇවිල්ලා අප හමු වෙනවා; කථා බහ කරනවා. අපේ පැත්තෙන් අපි ඒක නිර්ලෝභීව ලබා දීලා, ඒ දරුවන් යහ මහට ගන්න අවශ්‍ය සත්කාරය කරනවාය කියන එක මම පැහැදිලි කරන්න ඕනෑ. ඒ වාගේම අපි අපේ දහම් පාසල්වල ඉන්න ගුරු භවතුන් සහ ස්වාමීන් වහන්සේලා සම්බන්ධ කර ගෙන, ඒ අයට ද්‍රව්‍යමය ආධාර ලබා දෙන්න ඕනෑ. ඒ කියන්නේ, දහම් පාසලට අවශ්‍ය පුටු, දහම් පාසලට අවශ්‍ය ඩෙස්ක්, ඒ වාගේම බංකු, දැනුම සංවර්ධනය කරන්න දහම් පාසල්වල පුස්තකාලවලට අවශ්‍ය පොත්, ඒ වාගේම ඒ පොත් දමන්න අවශ්‍ය කබඩ් වාගේ දේවල් අපි අපේ පැත්තෙන් ලබා දීමට කටයුතු කරනවා. එපමණක් නෙවෙයි. ඒ දරුවන්ට අවශ්‍ය පානීය ජලය ලබා ගැනීම සඳහා ජල ෆිල්ටර් පවා ලබා දීලා තිබෙනවා; ලබා දෙමින් පවතිනවා. අන්න ඒ විධියට ඒ දරුවන්ගේ අධ්‍යාපනය ඉදිරියට පවත්වාගෙන යාම සඳහා අපේ පැත්තෙන් අපි මැදිහත් වෙනවා.

මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, දහම් පාසල් ගුරුවරුන් ගුරුවරියන්ගෙන් වැඩි දෙනෙක් තරුණ අය බව. ඒ ගොල්ලන්ට වසරකට වතාවක් රුපියල් 5,000ක දීමනාවක් ලැබෙනවා. ඒක කොහොමවත් ප්‍රමාණවත් නැහැ. ඒ නිසා ඒ ගොල්ලන් කරන කැප කිරීම වඩ වඩාත් අගය කරලා, ඒ අයට ප්‍රමාණවත් ආකාරයෙන් ඒ දීමනාව වැඩි කරලා, ඒ අය තෘප්තිමත් කරන්නය කියලා අපි විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා. ඒ වාගේම දහම් පාසල් ගුරුවරියන්ට ලබා දෙන නිල ඇඳුම ගැනත් කියන්න ඕනෑ. මම හිතන විධියට වසරකට එක සාරියක් අරගෙන දෙනවා. ඒ සාරිය මොනම ආකාරයකින්වත් ප්‍රමාණවත් වෙන්නේ නැහැ. ඒ නිසා ඒ අයගෙන් වැඩි වැඩ කොටසක් ගන්න, දරුවන්ගේ අධ්‍යාපන ක්‍රියාවලියට ඒ අය සම්බන්ධ කර ගන්න මීට වඩා සහයෝගයක් ඒ අයට ලබා දෙන්නය කියා අපි ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා.

[අ.භා. 7.09]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද දින ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා විසින් දහම් පාසල් ගුරුවරුන් සම්බන්ධයෙන් සභාව කල් තබන අවස්ථාවේදී ගෙනෙන ලද යෝජනාව පිළිබඳ විවාදයේදී අදහස් කිහිපයක් පළ කිරීමට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා. කවුරු මොනවා කිව්වත්, අද වන විට මේ රටේ දහම් පාසල් අධ්‍යාපනයට දරුවන් වැඩිපුර යැවීමේ ප්‍රවණතාවක් අපි දකිනවා. ඉරිදා ටියුෂන් පන්ති පැවැත්වෙන නිසා, විශ්ව විද්‍යාලයට යාම සඳහා උසස් පෙළ සමත් වෙන්න බලාපොරොත්තුවෙන් ඉන්න දරුවන් දහම් පාසල් යන්නේ නැතුව ටියුෂන් පන්ති යනවාය කියලා පසුගිය කාලයේ ලොකු ප්‍රශ්නයක් තිබුණා.

මෙතුමා ගෙනෙන ලද මෙම යෝජනාව අනුව, දහම් පාසල් අධ්‍යාපනයේ අවසාන අදියර සමත් වී තිබෙන දරුවන්ට විශ්වවිද්‍යාලයට ඇතුළත් වීමේදී යම් කිසි ලකුණු ප්‍රමාණයක් ලබා දෙනවා නම්, ටියුෂන් පන්ති පසුපස යෑම අඩු කර දරුවන් තවදුරටත් දහම් පාසල්වලට යොමු කර ගැනීමේ හැකියාව තිබෙනවාය කියන කාරණය මම විශේෂයෙන් කියන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම, දහම් පාසල්වල අඩුපාඩු එමටයි. අනුරාධපුර දිස්ත්‍රික්කය ඇතුළු උතුරු මැද පළාත ගත්තාම, සෑම පන්සලකම වාගේ දහම් පාසලක් තිබෙනවා. සමහර පන්සල්වල ලියා පදිංචි නොවුණු දහම් පාසල් තිබෙනවා. භාමුදුරුවරුන්ගේ කැපවීම සහ ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීම මත ක්‍රියාත්මක වන දහම් පාසල් තිබෙනවා. ඒ වාගේම, ඒ දහම් පාසල්වල ගුරු භවතුන්ගේ ලොකු හිඟයක් තිබෙනවා. මොකද, රුපියල් 2,000ක දීමනාවක් තමයි පසුගිය කාලයේ ඒ ගුරුවරුන්ට ලබා දුන්නේ. පසුගිය කාලයේ යටි මඩි ගහලා, හොරකම් කරපු උදවිය මහා ලොකුවට, "අපේ භාමුදුරුවනේ" කියා ගෙන පන්සල් ගානේ ගිහිල්ලා මල් වට්ටි පූජා කරලා, හැම අවස්ථාවේදීම ධර්මයට අනුකූලව හැසිරෙනවාය කියලා, පන්සල් එක්ක ඉන්නවා කියලා තමයි පෙන්නුවේ. නමුත්, ඒ අයට බැරි වුණා දහම් පාසල් ගුරුවරුන්ට ලබා දෙන රුපියල් 2,000 දීමනාව වැඩි කරන්නට. එදා රුපියල් 2,000 දීමනාව දුන්නේ කොහොමද? ඒ කාලයේ ඒ

[ගරු චන්දිම ගමගේ මහතා]

රෙජීමය පාර්ශ්වයේ ප්‍රදේශයේ මන්ත්‍රීවරයා, එහෙම නැත්නම් සංවිධායකවරයා එනවා. ගුරුවරුන්ට ලබා දෙන දීමනා පැකට් ටික ගොඩ ගහලා තිබෙනවා. දහම් පාසල් ගුරුවරුන්ගේ නම කියනවා. නම කියන කොට අර දේශපාලනඥයා තමයි ඒක දෙන්නේ. ඒක දෙනවා විතරක් නොවෙයි, එහෙම දීලා ඉතිරි වෙන මුදල් ටිකට සිද්ධ වෙන දෙයක් දන්නේත් නැහැ. ඒ විධියට තිබුණු තත්ත්වයක් අපි වෙනස් කරලා, දහම් පාසල් ගුරුවරයාගේ ගිණුමට රුපියල් 5,000ක දීමනාවක් බැර කරන ක්‍රමවේදයක් හදලා තිබෙනවා. නමුත්, මේ මුදල කිසිසේත්ම ප්‍රමාණවත් කියලා මම හිතන්නේ නැහැ. බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කරුණු-කාරණා හේතු කරගෙන තමයි දහම් පාසල් ගුරු සේවය වෘත්තියක් බවට පත් වෙලා නැත්තේ. වෘත්තියක් වුණා නම්, මෙයින් වැටුපක් ලැබෙනවා නම්, මෙයින් ජීවන මහක් හොයා ගන්න පුළුවන් නම්, මීට වඩා විශාල පිරිසක් මෙයට යොමු වනවා වාගේම, මීට වඩා හොඳ දහම් අධ්‍යාපනයක් දරුවන්ට දීමට අපට හැකි වෙයි කියාත් මම විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මම කථා කරන්නේ බෞද්ධ දහම් පාසල් ගැන පමණක් නොවෙයි; හින්දු, ඉස්ලාම් ආදී සියලුම දහම් පාසැල් ගැනයි. ඒ නිසා, සහජීවනය ගොඩනඟන්න මෙය හොඳ අත්වැලක් වන බව මම විශේෂයෙන් මතක් කරනවා. අපේ බුද්ධ ශාසන ඇමතිතුමාත් මේ ගරු සභාවේ සිටින අවස්ථාවේ මා මේ කාරණය මතක් කරන්න ඕනෑ. අපි දකුණේ ආණ්ඩුවක් විධියට උතුරු, නැගෙනහිර ප්‍රදේශවලට ගිහිල්ලා ඉස්ලාම්, හින්දු දහම් පාසල්වලට උදව් උපකාර කරලා ඒ ආයතන ශක්තිමත් කරනවා නම් එය ඔවුන්ට ලොකු අත්වැලක් වෙයි කියා මම විශ්වාස කරනවා. භෞතික සම්පත්වල හිඟය, දීමනාවල හිඟය මේ සියල්ලම කරපින්නාගෙන තමයි මේ ගුරුවරු දහම් අධ්‍යාපනය ලබා දෙන්නේ. ඒ නිසා මේ ගුරුවරුන්ට මීට වැඩිය හොඳ ජීවන මට්ටමක් ගොඩනඟන්න,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කරුණු-කාරණා සිද්ධ වනවා නම් හොඳයි කියා මම සඳහන් කරනවා.

බෞද්ධ, ඉස්ලාම්, හින්දු යන සියලුම ආගම්වල දහම් පාසල් ගැන කථා කරන මේ අවස්ථාවේ මම එක් කරුණක් නිසා කනගාටු වනවා. ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙකු හැරෙන්නට ඒකාබද්ධ විපක්ෂයේ කිසිදු මන්ත්‍රීවරයෙක් -රාජපක්ෂ උන්නැහැලා මහා ලොකුවට බෞද්ධ ධර්මය ගැන කථා කළාට ඒ උදවියගෙන් එක මන්ත්‍රීවරයෙක්, මන්ත්‍රී පුළුටක්- හෝ මේ අවස්ථාවට සහභාගි නොවීම ගැන මගේ කනගාටුව පළ කරමින් මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා.

[අ.භා.7.14]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මා හිත මිත්‍ර ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මැතිතුමා ඉදිරිපත් කළ, අපේ රත්නපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මා හිතවත් ගරු හේෂාන් විතානගේ මැතිතුමා ස්ථිර කළ සභාව කල් තැබීමේ යෝජනාව සම්බන්ධයෙන් වචන කිහිපයක් කථා කිරීමට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. මේ රටේ බෞද්ධයින් හැටියට ඉතාමත් වැදගත්, ඒ වාගේම මේ රටේ සදාචාරය පිළිබඳව; මේ රටේ සංස්කෘතික උරුමය ගැන කථා කරන අප සියලු දෙනාටම ඉතාමත් වැදගත් යෝජනාවක් තමයි එතුමා ඉදිරිපත් කළේ. මේ අවස්ථාවේ අපේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නායකතුමා, ඒ වාගේම බුද්ධ ශාසන අමාත්‍ය, ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා ජ්‍යෙෂ්ඨ ඇමතිතුමා මේ කරුණු පිළිබඳව ඉතාමත් සාවධානව අවධානය යොමු කරමින් සිටිනවා.

ඒ වාගේම, ඔබතුමාගේ අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රීවරයා හැටියට පත් වූ, දහම් පාසල් අධ්‍යාපන ක්ෂේත්‍රයේ කීර්තිමත් ආදි ශිෂ්‍යයකු හැටියට අපත් සමඟ අපේ දිස්ත්‍රික්කයේ කටයුතු කරන ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මැතිතුමාට මේ අවස්ථාවේදී මා සුබ පතනවා. මේ අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රී ධුරයට ඉතාම සුදුසුකු වූ එතුමාට ඒ තනතුර ලැබී තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ අවුරුදු දෙදහස් පන්සියයක ඈත අතීතය පිළිබඳව අපි කථා කරනවා. මුලින්ම මේ රටේ බෞද්ධ අධ්‍යාපනය ආරම්භ වුණේ අනුරාධපුර යුගයේ මහා විහාරය ආශ්‍රිතවයි. දහස් ගණන් භික්ෂූන් වහන්සේලා එදා මේ රටේ සිටි ජනතාව වෙනුවෙන් බෞද්ධ අධ්‍යාපනය ලබා දුන්නේ ඒ විහාරස්ථාන තුළදීයි. ඒ වාගේම ගමයි පන්සලයි - වැවයි දාගැබයි අපේ උරුමයක් හැටියට කථා කරනවා. එදා ගමේ දරුවෙකු පළමුවරට අත් අකුරු ලියනකොට නැත්නම් මුලින්ම නැකතට අකුරු කියනකොට ඒ අවස්ථාවට මූලිකත්වය දුන්නේ ගමේ පන්සලේ හාමුදුරුවෝ. ඒ නිසාම බෞද්ධ අධ්‍යාපනයත් එක්ක ගමත්, පන්සලත්, පවුලත් බද්ධ වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේදී අපට ඉතා වැදගත් කරුණු කාරණා රැසක් ඉටු කරන්නට පුළුවන්. මේ රටේ ඇතිවන හැම ව්‍යසන අවස්ථාවකදීම විශේෂයෙන් උපදෙස් ගත්තේ බෞද්ධ භික්ෂූන් වහන්සේලාගෙන්. වළගම්බා රජතුමා සොළින් එක්ක සටන් කර පැරදී ආපසු යනකොට රජතුමාට රැකවරණය දුන්නේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා. දුටුගැමුණු රජතුමා තමන්ගේ මලනුවන් සමඟ ඇති කර ගත්ත අරගලයේදී, කාවන්තිස්ස රජතුමාට උපදෙස් දීලා එතුමන්ලා ඉතා හොඳින් සමගි කළේ බෞද්ධ භික්ෂූන් වහන්සේලා. අපි වර්තමානයේත් ඒ බෞද්ධ උරුමය, බෞද්ධ සාහිත්‍යය තුළින් අපේ දරුවන්ට දැනුම ලබා දී තිබෙනවා. බුද්ධ ශාසනය, ශාසන ඉතිහාසය, අභිධර්මය ගැන දැනුම, අවබෝධය අපට ලබා දීලා තිබෙනවා. උදේට පන්සිල් සමාදන් වෙන එක, සවසට පිරිත් අහන එක දෛනිකව අපි කරනවා. මේ රටේ බෞද්ධ සිද්ධස්ථාන ආශ්‍රය කර ගෙනයි දහම් පාසල් අධ්‍යාපනය ඇති වුණේ. නමුත්, අවුරුදු දෙදහස් පන්සියයක කාලයක සිට එන උරුමය අපට අද දහම් පාසල් තුළින් ලැබෙනවාද කියන එක සොයා බැලීමට බුද්ධ ශාසන අමාත්‍යවරයා හැටියට ඔබතුමාට ලොකු වගකීමක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මොනතරම් බණ දේශනා කළත්, මොනතරම් පරිත්‍රාණ ධර්ම දේශනා ඇසුවත්, උදේ සවස

මොනතරම් පන්සිල් ගත්තත්, -උදයට නැඟිට්ටාම පන්සිල් ගන්නවා. රාත්‍රියට නිදා ගන්නකොට පිරිත් අහනවා.- ඒවා ගැන කියා දුන්නත් අද ඒ ප්‍රතිපත්තිය කොයිතරම් දුරට ක්‍රියාත්මක වෙනවාද කියන එක ප්‍රශ්නයක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා මේ සභාව කල්තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන්නේ, සදාතනික ධර්මයක් වන බෞද්ධ ධර්මය තුළින් බෞද්ධ අධ්‍යාපනය මේ රටේ නගා සිටුවන්නට හොඳම කාලය ඇවිත් තිබෙන අවස්ථාවකයි.

ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කිව්වා වාගේ, කුඩු සංස්කෘතිය, මත්ද්‍රව්‍ය, සොරකම, මිනීමැරුම්, පාතාලය අද මේ රටේ ව්‍යාප්ත වෙලා තිබෙනවා. ඒවාට මොන විධියට දඬුවම් කළත්, ඒවා වැළැක්වීම සඳහා විවිධ උපක්‍රම භාවිත කළත්, ඒවාට එරෙහිව නීතිය කොයි ආකාරයට ක්‍රියාත්මක වුණත්, ඒවාට විසඳුම් ලබා දීමට හොඳම ක්‍රමය තමයි දහම් පාසල් අධ්‍යාපනය නහා සිටුවීම. ඊට උදාහරණ තිබෙනවා. හැත්තෑ එකේ කැරැල්ල ගත්තත්, අසූඅට-අසූනවයේ කැරැල්ල ගත්තත් එහෙමයි. මෙතැන සිටින ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමාගෙන් අපි අහන්නේ නැහැ, දහම් පාසල් ගියාද නොගියාද කියලා. එදා ආයුධ අතට අරගෙන යම් දෙයක් කරන්න ගිය අය පසුව ඒවායින් වැළකී හොඳ තත්ත්වයට පත් වුණේ එතුමන්ලා ලැබූ දහම් අධ්‍යාපනය නිසාය, දහම් අවබෝධය නිසාය කියා මා හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උතුරු- නැහෙනහිර ප්‍රභාකරන් වෙන්න පුළුවන්, මුස්ලිම් ජනතාව වෙන්න පුළුවන්. මේ හැම කෙනෙකුටම තමතමන්ගේ ආගම ධර්මය අනුව ජීවිත හැඩ ගස්වා ගන්න අවශ්‍ය පසුබිම සකස් විය යුතුමයි. ඒ නිසා මේ දහම් අධ්‍යාපනය වැඩි දියුණු කරන්න කළයුතු කටයුතු තිබෙනවා. මේ ගුරුවරුන්ට වැටුපක් ගෙවන්න බැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසාන වෙනවා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
දහම් පාසල් හයසියයක් හත්සියයක් ගාල්ල දිස්ත්‍රික්කයේ තිබෙනවා. ඒවා ලියාපදිංචි කර, ඒවාට උදව් කරන්න ගියාම අපි ලොකු ප්‍රශ්නයකට මැදි වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දහම් ප්‍රතිපත්තිය හදවත් තුළට කැවෙන්නට කටයුතු කරන්න සිද්ධ වෙනවා. හැම ආණ්ඩුවක්ම මේ ගැන කියනවා, වෙදිකාවල මොර දෙනවා, "දහම් පාසල් ගුරුවරයාට අපි නිසි තැන දෙනවා, දහම් පාසල් සහතිකයට අපි තැන දෙනවා" කියලා. නමුත් ඒවා කථාවලට විතරයි සීමා වන්නේ. මාත් දහම් පාසල් ගුරුවරයකු හැටියට අපේ ගරු මන්ත්‍රීතුමා සමග සමකාලීනව කටයුතු කළා. මාත් දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය, ධර්මාචාර්ය විභාගය සමත් වුණු කෙනෙක්. ඒ නිසා අපට මෙහි උරුමයක් තිබෙනවා. දහම් විෂයය පිළිබඳ දැනුමක් තිබෙනවා. මේ තුළින් ආගමික සහජීවනය ඇති වෙනවා. ඒ ගැන හැඟීම් ඇති වෙනවා. මේ රටේ සහජීවනයට අවශ්‍ය වැඩිම වැඩ කොටස කරන්නට පුළුවන් දහම් අධ්‍යාපනය තුළින්.

එතුමා යෝජනා කළ කරුණු ගණනාව සත්‍ය බව මා නැවත වරක් සනාථ කරනවා. මා ගරු අධ්‍යාපන ඇමතිතුමා එක්ක මේ කාරණය සාකච්ඡා කළා. ඔබතුමාට ඒ කටයුත්තට ශක්තියක් ලබා දෙන්න පුළුවන්. දහම් පාසල් අවසාන විභාගය සහ ධර්මාචාර්ය විභාගය කියන විභාග දෙකම සමත් වෙච්ච අය ඕනෑ තරම් අපේ රටේ ඉන්නවා. ඒ අය ඉතාම දක්ෂ, ඉතාම විනය ගරුක අය. කරුණාකරලා ඒ අයට මේ රටේ ධර්ම අධ්‍යාපනය ලබා දෙන්න අවස්ථාව ලබා දෙන්න. අනේ! ගරු බුද්ධ ශාසන ඇමතිතුමනි, මේ යෝජනාවත් අනෙක් යෝජනා වාගේ හමස් පෙට්ටියට දාන්න එපා. මේ කරුණුවලින් එක යෝජනාවක් හෝ අපි ක්‍රියාත්මක කරමු. ඒ වෙනුවෙන් ඔබතුමාට දෙන්න පුළුවන් ඉහළම සහයෝගය අපි ලබා දෙන්න සූදානම්. ඒ කටයුත්ත කරන්න අවශ්‍ය ඕනෑම දෙයක් කරන්න අපි බලාපොරොත්තු වනවාය කියන කාරණයත් මා මේ අවස්ථාවේදී මතක් කරනවා.

අද දින සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කළ ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මැතිතුමාටත්, එම යෝජනාව ස්ථිර කළ ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව මා අවසන් කරනවා. මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[අ.භා.7.21]

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කළ අපේ බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා, බුද්ධශාසන අමාත්‍යාංශයට අලුතින් පත් වෙච්ච අධීක්ෂණ මන්ත්‍රීවරයා හැටියට ඒ වැඩ ආරම්භ කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ ඔබතුමා කරන වැඩ පිළිවෙළ ඉදිරියට ගෙනයන්න ශක්තිය තිබෙන මන්ත්‍රීවරයකු හැටියට එතුමා එම වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවාය කියා මා හිතනවා. ඒ තුළින් අධීක්ෂණ මන්ත්‍රීවරුන් වන අපටත් ලොකු ආදර්ශයක් ලබා ගන්න පුළුවන් කියා මා හිතනවා.

විශේෂයෙන්ම දහම් අධ්‍යාපනය සුරක්ෂිතව ඉදිරියට ගෙනයන්න පුළුවන් වැඩ පිළිවෙළක් සකස් කිරීම සඳහා එතුමා යෝජනා රාශියක් ගෙනෙනවා, ගරු ඇමතිතුමනි. දැනට දහම් අධ්‍යාපනය ලබාදෙන ස්වේච්ඡා ගුරුවරුන්ට ලැබෙන දීමනා සම්බන්ධයෙන් වාගේම, ඉදිරියේදී ඔවුන් සුරක්ෂිත කරන වැඩ පිළිවෙළක් පිළිබඳවත් එතුමා යෝජනා කරනවා. දහම් පාසල් අද රට තුළ පවත්වාගෙන යනවාද කියන කාරණය අපි බුද්ධිමත්ව හොයා බලන්න ඕනෑ, ගරු ඇමතිතුමනි. ඉරිදා දිනයේ පවත්වන දහම් පාසලට දරුවන් යවන්න අද අපේ බොහෝ ආදරණීය දෙමව්පියන් පෙළඹෙන්නේ නැහැ, ගරු අමාත්‍යතුමනි. ඒකට ප්‍රධානම හේතුව තමයි, මේ තරගකාරී අධ්‍යාපන ක්‍රමය තුළ දෙමව්පියන් තම දරුවන්ට උසස් අධ්‍යාපනයක් ලබා දෙන්න කටයුතු කිරීම. දරුවා ඉපදිලා, එම දරුවා "අ" යන්න "ආ" යන්න කියන දවසේ ඉඳලා ඒ දරුවා කොතැනද ඉන්න ඕනෑ කියන කාරණය අපේ දෙමව්පියන්ගේ මනස තුළ ගොඩ නැඟෙනවා. ගරු ඇමතිතුමනි, අම්මා, තාත්තා, වැඩිහිටියන් කියන දේ වාගේම සමාජ ආචාර ධර්ම සියල්ල තේරුම් ගන්න පුළුවන් ළමයකු මේ රටේ නිර්මාණය කරන්න පුළුවන් වෙන්න ඕනෑ. ඒ නිර්මාණය සිද්ධ වෙන්නේ මේ දහම් පාසල තුළින්. අපේ වැඩිහිටියන් විසින් අපට නිර්මාණය කරපු ඒ හොඳ සමාජය අද වනකොට ගිලිහී යනවා, අපේ ගරු ඇමතිතුමනි. ඒ නිසා අපි වැඩි දෙනා අවධානය යොමු කරන්න ඕනෑ එතැනටයි කියලා මා හිතනවා. අපේ වැඩිහිටියන් තුළ අද තිබෙන මානසිකත්වයෙන් එහාට ගිහිල්ලා, එය නිවැරැදි තැනට ගෙනැල්ලා, මේ රටේ සමස්ත දරු පරපුරට - සිංහල හෝ වේවා, හින්දු හෝ වේවා, මුස්ලිම් හෝ වේවා- දහම් අධ්‍යාපනය ලබා දීම අනිවාර්යය කරන්න ඕනෑ. මේ දහම්

[ගරු චමින්ද විජේසිරි මහතා]

අධ්‍යාපනය අනිවාර්යය නොවීම අද මේ සමාජයේ කථා කරන සියලු ප්‍රශ්නවලට හේතුවක් හැටියට මා දකිනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා තරුණ මන්ත්‍රීවරයකු හැටියට ඒ වෙනුවෙන් මහා වෙහෙසක් දරන බව අපි දන්නවා. ඔබේ පන්සලේ අවශ්‍යතාව වෙනුවෙන් අද දිනයේදීත් අමාත්‍යාංශයට ගිහිල්ලා, ඒ පන්සල ගොඩ නඟන්න පුළුවන් වැඩ පිළිවෙළක් නිර්මාණය කරන්න ඔබතුමා වෙහෙසෙනවා. ඔබතුමා ගමත් එක්ක රැඳුණා. බුද්ධාගම වාගේම දහම් අධ්‍යාපනයත් එක්ක ඔබතුමා කටයුතු කළ නිසා ඔබතුමාට අද මෙතැනට එන්න අවශ්‍ය ආශීර්වාදය සහ ශක්තිය ලැබුණා. අපේ දරු පරපුරටත් ඉදිරි අනාගතයේදී ඒ දේ ලබා දෙන්න තමයි බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා මේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මේ ගරු සභාවට ගෙනාවේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමා දැන් කථාව අවසන් කරන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)
ගරු අමාත්‍යතුමනි, ඉරිදා දිනයේ දහම් පාසල් පවත්වන එක අනිවාර්යය කළොත් තමයි ස්වේච්ඡාවෙන් උගන්වන ගුරු භවතුන්ගේ වැඩ පිළිවෙළ ශක්තිමත් කරලා ඉදිරියට ගෙනයන්න පුළුවන් වන්නේ. මා අවධානය යොමු කරන්නේ එතැනටයි. අපේ බාල පරපුර අද මොකක්ද කරන්නේ කියලා අපි දකිනවා. සෙනසුරාදා, ඉරිදා කියන දවස් දෙක තුළ දරුවන් බාහිර පන්තිවලට යොමු කරන්න අපේ වැඩි හරියක් දෙමව්පියන් පුරුදුවෙලා ඉන්නවා.

එසේ කිරීම තුළින් අවසානයේ දී එම දෙමවුපියන් අසරණ තත්ත්වයට පත්වනවා විතරක් නොවෙයි, මේ රටේ දුවා දරුවන්ගේ අනාගතයත් විනාශ මුඛයට ඇදිලා යනවා. මෙය වළක්වා ගැනීම සඳහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නට පියවර ගන්න කියා අපි යෝජනා කරනවා. සෙනසුරාදා සහ ඉරිදා බාහිර පන්තිවලට ළමුන් යන එක නැවැත්වීමේ වැඩ පිළිවෙළක් නිර්මාණය කරලා, අපේ ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව අනුව වැඩ පිළිවෙළක් සකස් කර, එය ශක්තිමත්ව මේ සමාජයට දායද කරන්න ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා ඇමතිවරයාට පුළුවන් කියන විශ්වාසය ඇතිව මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා අමාත්‍යතුමාගේ පිළිතුරු කථාව.

[අ.භා.7.26]

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (බුද්ධ ශාසන අමාත්‍යතුමා)
(මාණ්පුමිකු කාමිනි ජයවික්‍රම පෙරේරා - පුත්තසාසන අමෛච්සර්)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of Buddhasasana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථිකයෝ ගොඩක් අදහස් දැක්වුවා. ඒවාට පිළිතුරු දෙන්න මට විනාඩි 10ක් මදි.

අද ඉතාම වැදගත් කාරණයක් සම්බන්ධයෙන් සභාව කල් තැබීමේ යෝජනාව ගෙන ඒම ගැන ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමාට මගේ හදවතින්ම ස්තුතිය පුද කරනවා. මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් රාශියක් කථා කළා. අපේ චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා කථා කළා; චන්දිම ගමගේ මන්ත්‍රීතුමා කථා කළා; නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා කථා කළා. දැන් මුලසුනේ සිටින ගරු හේෂාන් විතාරන මන්ත්‍රීතුමාත් කථා කළා. ඒ වාගේම (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමා කථා කළා; ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කථා කළා; විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කථා කළා. ඒ සියලුදෙනාම ඉතා වැදගත් අදහස් ඉදිරිපත් කළා. මම සතුටු වනවා, ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා කියපු කාරණයක් ගැන. එතුමා සඳහන් කළා, මේ පාර්ලිමේන්තුවේ ඉන්න සමහර අයව තමයි ඉස්සෙල්ලාම දහම් පාසලකට යවන්න ඕනෑ කියලා. ඇත්ත වශයෙන්ම මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන අපි ආදර්ශවත් විය යුතුයි. මෙතැන තමයි උත්තරීතර තැන. තමන් කථා කරන දේ, කියන දේ, හැසිරෙන ආකාරය යන සෑම දෙයක්ම තීරණය වන්නේ තමන්ගේ ජීවන රටාව අනුව. එතුමා එම කථාව කිව්වේ නිකම් නොවෙයි, යම් අරමුණක් ඇතිවයි.

අද කාලය ඉතිරි වී තිබෙන ආකාරය අනුව මා සංඛ්‍යා ලේඛන කිහිපයක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. ඊට කලින් ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමාට මා කියන්න කැමැතියි, ඔබතුමා හෙට උදේ 9.30ට මගේ අමාත්‍යාංශයට එන්න. ලියුම එනතෙක් ඉන්න ඕනෑ නැහැ. ඔබතුමා හුහක් හොඳ බෞද්ධයෙක්; ප්‍රතිපත්ති ඇති කෙනෙක් බව මා දන්නවා. ඒ නිසා ඔබතුමා හෙට ඉඳලා මගේ අමාත්‍යාංශයට ඇවිල්ලා අපේ වැඩ කටයුතුවලට සම්බන්ධ වෙන්න. අපේ අරමුණුවලට ඔබතුමාගේ සහයෝගය දෙන්න. මා ඔබතුමාට එම ආරාධනය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා දැනටමත් ක්‍රිස්තියානි ආගමික කටයුතු, හින්දු ආගමික කටයුතු හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමන්ලාගේ ලේකම්වරු සමඟ සාකච්ඡා කර තිබෙනවා. අධ්‍යාපන අමාත්‍ය ගරු අකිල විරාජ් කාරියවසම් මහතා ඒ ගැන නිල වශයෙන් ප්‍රකාශ කරාවි. ඒ නිසා මා මේ වෙලාවේ ඒ ගැන ප්‍රකාශ කරන්නේ නැහැ. දහම් පාසල් යෑම හැම ආගමකටම අනිවාර්ය වේවි. ස්ථිරවම අනිවාර්ය වනවා. ගරු අකිල විරාජ් කාරියවසම් ඇමතිතුමාත් එක්ක තව ගරු ඇමතිවරු හතර දෙනෙක් ඉදිරියේ දී ඉතා වැදගත්, ඓතිහාසික කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කරන්නට බලාපොරොත්තු වෙනවා. පාසලට ඇතුළත් වීමේදී මෙන්න මෙච්චර ලකුණු ගණනක් කියලා, - ඒ ගැන එතුමාගේ අමාත්‍යාංශයෙන් කියයි. ඒක ඓතිහාසික අවස්ථාවක්. කොළඹ ආර්. බී. ඡොප්තුමා කීප වතාවක්ම කිව්වා, "අධ්‍යාත්මික ගුණවගාව නැත්නම් වැඩක් නැහැ, මේ සමාජය පිරිහෙනවා" කියලා. ඒක තමයි ඇත්ත. අපි දහම් පාසලට ප්‍රමුඛතාව දීලා, ඒ තුළින් තමයි අධ්‍යාත්මික ගුණවගාව ඇති කළ යුත්තේ.

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නවලට අදාළ සංඛ්‍යා ලේඛන මම ගෙනැවිත් තිබෙනවා. ඒවා කියවන්න ගියොත් කාලය ගත වනවා. එතුමාගේ යෝජනාවෙන් ඉල්ලීම් කීපයක් ඉදිරිපත් කර තිබෙනවා. පළමුවැනි ඉල්ලීම තමයි, දහම් පාසල්වල වසර 10ක් අඛණ්ඩව සේවය කරන ගුරු භවතුන් සඳහා සාම විනිසුරු පදවියක් ලබා දීම. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනටමත් JP පත්වීම් දෙනවා. අපි කොහොමද මේ ඉල්ලීම ඉටු කරන්නේ කියලා අධිකරණ ඇමතිතුමිය එක්ක සාකච්ඡා කරන්නම්. මොකද, අධිකරණ අමාත්‍යාංශයේ තිබෙනවා quota එකක්. මම මේ ගරු සභාවට ආඩම්බරයෙන් මේ කාරණය ගැනත් කියන්න කැමැතියි. අධිකරණ ඇමතිතුමිය එතුමියගේ අමාත්‍යාංශයේ ලේකම්තුමිය සමඟ මගේ අමාත්‍යාංශයට ඇවිල්ලා,

පන්සල් සහ විහාරවලට අදාළව තිබෙන යල් පැනපු විහාර දේවාලගම් පනත වෙනස් කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කළා. අපි නැවත වතාවක් හමු වනවා. අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවක් තිබෙනවා. එයට පැමිණෙන ලෙසට අපි එතුමියට ආරාධනා කළා. මම කිසිම තීරණයක් තනිව ගන්නේ නැහැ. මම තීරණ ගන්නේ රජ කාලයේ වාගේ. අපේ මහා නායක හාමුදුරුවරු ඉන්නවා. විවිධ නිකායන්වල තිස්දෙනෙමක් විතර ඉන්නවා. මෙම විෂයය ගැන විශාරද දැනුමක් ඇති ගිහි පිරිසත් ඉන්නවා. අපි සියලුදෙනා 13වැනිදා රැස් වෙලා තීරණ රාශියක් ගන්නවා. දහම් පාසල් සම්බන්ධව තීරණය ගැනීමට එදාට පැමිණෙන ලෙසට අධ්‍යාපන අමාත්‍ය ගරු අකිල විරාජ් කාරියවසම් මහතාටත් මම ආරාධනා කර තිබෙනවා. ඊළඟට, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමති විජයදාස රාජපක්ෂ මැතිතුමාටත් ආරාධනා කර තිබෙනවා. මේ විධියට අපේ ඇමතිවරු රාශියක් සහභාගි වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
කාලය ප්‍රශ්නයක්ද? ඔරලෝසුවේ කටු ආපසු කරකවමු. මේ ප්‍රශ්න සියල්ලටම මා උත්තර දෙන්නේ කොහොමද කියා මා දන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දහම් පාසල් ගුරු සේවයේ වසර පහක් ඉක්මවූ සෑම ගුරු භවතෙකු සඳහාම නොමිලේ ජීවිත රක්ෂණයක් ලබා දෙන ලෙස යෝජනා කර තිබෙනවා. ඒ පිළිබඳවත් කටයුතු කරන්නේ කොහොමද කියලා අපි බලමු. අපි ස්වාමීන් වහන්සේලාටත් රක්ෂණ ක්‍රමයක් ලබා දෙන්න කටයුතු කරනවා. ලංකාවේ අසරණවෙලා ඉන්න ස්වාමීන් වහන්සේලාට රක්ෂණ ක්‍රමයක් අපි දැනට සකස් කරනවා. ඒ නිසා මේ ගැනත් මා බලන්නම්. මගේ ලේකම්තුමා මේ සභාවේ ගැලරියේ තිබෙන රජයේ නිලධාරීන්ගේ කුටියේ ඉන්නවා.

රජයේ රැකියා සඳහා ඇතුළත් වීමේදී දහම් පාසල් අවසාන හා ධර්මාචාර්ය විභාගය සමත් වූ ගුරු භවතුන් සඳහා ලකුණු ප්‍රමාණයක් ලබා දෙන ලෙසත් යෝජනා කර තිබෙනවා. මේ ගැනත් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා, ළමයකු පාසලකට ඇතුළත් කිරීමේදී ලකුණු ගණනක් දෙනවා වාගේ ක්‍රමයක් ඇති කරන ආකාරය ගැනත් බලමු. මේ පිළිබඳව මට එක වර වචනයක් කියන්න අමාරුයි.

විශ්වවිද්‍යාලයට ඇතුළත්ව උපාධිය ලබා ගැනීමේදී දහම් පාසල් අවසාන ශ්‍රේණිය හා ධර්මාචාර්ය විභාගය සඳහා යම් ලකුණු ප්‍රමාණයක් ලබා දෙන ලෙසටත් යෝජනා කර තිබෙනවා. මා පිළිගන්නවා, ධර්මාචාර්ය විභාගය සමත්, කැපවන ගුරු භවතුන් ඉන්නවාය කියලා. මේ සියලු යෝජනාවන් සම්බන්ධයෙන් අපි කටයුතු කරනවා. අපි කටයුතු කරන්නේ "ගමයි-පන්සලයි", "පන්සලයි-ගමයි" කියන සංකල්පය මතයි. පන්සලත් එක්ක, පල්ලියත් එක්ක, කෝවිලත් එක්ක, ඉස්ලාම් භක්තිකයන් එක්ක, හින්දු භක්තිකයන් එක්ක සම්බන්ධවෙලා ආධ්‍යාත්මික වශයෙන් මනස හදන්න ඕනෑ. මනස හැදුවේ නැත්නම් සමාජය හැදෙන්නේ නැහැ. එය පාර්ලිමේන්තුවේත් වෙන්න පුළුවන්. මේ ඔක්කොම කටයුතු කෙරෙනවා. මේ කරුණු සියල්ලටම උත්තර දෙන්න මට කාලය නැහැ. දැන් කාලය අවසානයි කියලා මට මූලාසනයෙන් ඉඟි කරනවා. මගේ අධීක්ෂණ මන්ත්‍රීවරයා විධියට බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමාට හෙට මගේ අමාත්‍යාංශයට එන්න කියලා මා ආරාධනා කරනවා. අපි මේ සම්බන්ධයෙන් පැහැදිලි වැඩ පිළිවෙළවල් සකස් කරමු. 13වන දා අපේ ආංශික අධීක්ෂණ කාරක සභාව පැවැත්වෙනවා. එම කාරක සභාවටත් සහභාගි වන ලෙස මා එතුමාට ආරාධනා කරනවා. අපි මේ සම්බන්ධයෙන් කටයුතු කරමු. මෙම කල් තැබීමේ යෝජනාව ගෙන ඒම ගැන එතුමාට මගේ ස්තුතිය පුද කරමින් මගේ කථාව අවසන් කරනවා.

එකල්හී වේලාව අ. භා. 7.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2018 ජුනි 07 වන බ්‍රහස්පතින්දා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.

அப்பொழுது நேரம் பி.ப. 7.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி பாராளுமன்றம், 2018 யூன் 07, வியாழக்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.


It being 7.30 p.m., MR. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

Parliament adjourned accordingly until 9.30 a.m. on Thursday, 07th June, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

261 වන කාණ්ඩය - 2 වන කලාපය
தொகுதி 261 - இல. 2
Volume 261 - No. 2

2018 ජූනි 07වන බ්‍රහස්පතින්දා
2018 யூன் 07, வியாழக்கிழமை
Thursday, 07th June, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන :
බැඳුම්කර වාර්තාව පදනම් කර ගනිමින් අසත්‍ය තොරතුරු ප්‍රචාරය

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය :
උන්නිච්චයි වැවේ වාන් දොරටු විවෘත කිරීම නිසා පීඩාවට පත් ගොවීන්ට වන්දි ලබාදීම
ලංකා විදුලිබල මණ්ඩලයේ වෘත්තිය සමිති නායකයන් භයදෙනෙකුගේ සේවය අත්හිටුවීම

සුරාබදු ආඥාපනත:
නිවේදන

කල් තැබීමේ යෝජනාව:
බංකොලොත් මූල්‍ය ආයතනවල තැන්පතු ආපසු ලබා ගැනීමේ වැඩ පිළිවෙළ

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:
பிணைமுறி அறிக்கை அடிப்படையிலான தவறான பிரச்சாரம்

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:
உன்னிச்சைக் குளத்தின் வான்கதவுகள் திறக்கப்பட்டதனால் பாதிக்கப்பட்ட விவசாயிகளுக்கான நட்டஈடு
இலங்கை மின்சார சபைத் தொழிற்சங்கத் தலைவர்கள் அறுவரின் சேவை இடைநிறுத்தம்

மதுவரிக் கட்டளைச்சட்டம்:
அறிவித்தல்கள்

ஒத்திவைப்புப் பிரேரணை:
திவாலான நிதி நிறுவனங்களின் வைப்புகளை மீளப்பெறும் வேலைத்திட்டம்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
False Propaganda based on Bond Report

PUBLIC FINANCE COMMITTEE REPORT

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Compensation to Farmers Affected by Opening of Sluice Gates of Unnichchai Tank
Suspension of Six Trade Union Leaders of Ceylon Electricity Board

EXCISE ORDINANCE:
Notifications

ADJOURNMENT MOTION:
Arrangement to Recover Money Deposited in Bankrupt Financial Institutions

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 ජූනි 07වන බ්‍රහස්පතින්දා
2018 யூன் 07, வியாழக்கிழமை
Thursday, 07th June, 2018

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப.9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

බැඳුම්කර වාර්තාව පදනම් කර ගනිමින් අසත්‍ය තොරතුරු ප්‍රචාරය
பிணைமுறி அறிக்கை அடிப்படையிலான தவறான பிரச்சாரம்
FALSE PROPAGANDA BASED ON BOND REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බැඳුම්කර වාර්තා අරමුණු කර ගනිමින් පාර්ලිමේන්තුව තුළත්, පිටස්තරවත් ප්‍රකාශ වුණු ඇතැම් කරුණු හා වාර්තා ගැන කථානායකවරයා වශයෙන් පැහැදිලි කිරීමක් වහා කළ යුතු බව මගේ හැඟීමයි.

අසත්‍ය, ගොතන ලද, සමහර විට ද්වේශ සහගතව ප්‍රකාශ වුණු සහ ප්‍රකාශ වන විවිධ අදහස් නිසා සියලුම ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටත්, පාර්ලිමේන්තුවටත්, පොදුවේ ශ්‍රී ලංකාවේ කීර්ති නාමයටත් විශාල කැලලක් ඇති වී තිබෙන බව සඳහන් කරන්නේ බලවත් සංවේගයෙනි.

කවුරුන් හෝ ගොතන ලද්දක් වන අල්ලස් ගත් මන්ත්‍රීන් 118 වෙනුවට එය 166 දක්වා වැඩි කරමින්, ඉන් නොනැවතී සිවිල් සමාජයේ පිළිගත් චරිත කිහිපයකටද අසාධාරණ ලෙස පරිභව කරමින් සීමාවක් නොමැතිව කෙරෙන මෙම පදනම් විරහිත චෝදනා නවතන ලෙස පිළිගත් මාධ්‍යද ඇතුළු සියලුදෙනාගෙන් මම කාරුණිකව ඉල්ලා සිටිමි.

බැඳුම්කර වාර්තාවලට ඇතුළත් විය යුතු සියලු අදාළ ලිපි ලේඛන සියල්ල මා වෙත කඩිනමින් ලබාදෙන ලෙස ජනාධිපති ලේකම්වරයාගෙන් ඉල්ලා ඇති අතර, ඔහු දිවයිනට පැමිණි විගසම නීතිපතිවරයාගේ හා පොලිස්පතිගේ සහයෝගයෙන් අදාළ සියලු ලියකියවිලි පාර්ලිමේන්තුවට ලැබෙනු ඇත.

මුදල් ලබාගත් මන්ත්‍රීවරුන්ගේ හෝ වෙනත් අයගේ කිසිම ලැයිස්තුවක් නොපවතින බවට ඊට වගකිව යුතු සියලු අංශ විසින් මා දැනුවත් කර ඇත. එමෙන්ම, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂක නිලධාරීන් 25දෙනකුගෙන් ප්‍රශ්න කළ බවට පැතිරුණු ආරංචියද සම්පූර්ණයෙන්ම අසත්‍ය ප්‍රවෘත්තියක් බවට පොලීසිය මා වෙත දන්වා ඇත.

අම්පාරේදී වඳ බෙහෙත් මිශ්‍ර කළ අල හොද්දක් ගැන ඇති වූ බොරු ප්‍රචාරයෙන් රට ගිනිගත් ආකාරය අප සිහි කරන්නේ දැඩි කනගාටුවෙනි. දැන් ඇති වී තිබෙන තත්ත්වයද රටට ඉතා අහිතකර බව පෙන්වා දීමට කැමැත්තෙමි. ඊයේ සිට සමහර මන්ත්‍රීවරුන් දිවුරුම් පෙත්සම් දීමත්, සමහර මන්ත්‍රීවරුන් මාධ්‍ය හරහා ගොස් මුදල් ලබා නොගත් බවට සහතික කිරීමත් අනවශ්‍ය හා සාවද්‍ය ක්‍රියාවක් ලෙසට විශාල ජන මතයක් රටේ ගොඩ නැඟෙමින් පවතී.

කවුරුන් මොනවා කිව්වත් අප අවනත විය යුත්තේ අපේ හෘදය සාක්ෂියට පමණි.

බැඳුම්කර පිළිබඳ විමර්ශනවලදී මෙවැනි සිද්ධීන් වාර්තා වුවහොත්, අවශ්‍ය පියවර වහාම ගන්නා බවට පොලීසිය අපට දන්වා ඇත. එම නිසා මෙම අවස්ථාවේදී බුද්ධිමත්ව හා වගකීමෙන් ක්‍රියා කරන ලෙස සියලුම පාර්ශ්වයන්ටත්, මාධ්‍යයටත් මම ආයාචනා කරමි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මට කාරණයක් කියන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට පසුව අවස්ථාව දෙන්නම්.

II

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2018 ජූනි මස 07වන බ්‍රහස්පතින්දා, එනම් අද දින අපර භාග 3.00ට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස සියලුම මන්ත්‍රීවරුන්ට මෙයින් දැනුම් දෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයට ගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, බුද්ධ ශාසන අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂය සඳහා බුද්ධ ශාසන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2017 වර්ෂය සඳහා බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

එම වාර්තා තරුණ, ක්‍රීඩා, කලා සහ උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයට ගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා තොරතුරු තාක්ෂණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයට ගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයට ගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයට ගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මම 2015 වර්ෂය සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයට ගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂය සඳහා අධිකරණ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2017 වර්ෂය සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(iii) 2017 වර්ෂය සඳහා නීති කොමිෂන් සභා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

එම වාර්තා නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයට ගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයට ගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා ක්‍රීඩා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on,

(i) Excise Notifications under Excise Ordinance;

(ii) Notes on the Supplementary Allocations given from the Budgetary Support Services and Contingent Liabilities provision made under the Department of National Budget as per the Introduction Note of the Annual Estimates; and

(iii) Financial Performance of the fourth quarter of the year 2017 which were referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු මලිත් ජයතිලක මහතා
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)

ගරු කථානායකතුමනි, ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත;

(ii) 2013 සහ 2014 වර්ෂ සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තා සහ මූල්‍ය ප්‍රකාශන;

(iii) වර්ෂ 2001 සිට 2010 දක්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(iv) 2012, 2013 සහ 2014 වර්ෂ සඳහා රණවිරු සේවා අධිකාරියේ වාර්ෂික වාර්තා;

(v) 2001 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වර්ෂ සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තා;

(vi) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(vii) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව;

(viii) 2016 වර්ෂය සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(ix) 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(x) 2015 සහ 2016 වර්ෂ සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු හරින් ප්‍රනාන්දු මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු සුජීව සේනසිංහ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ටී.බී. ඒකනායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු අරවින්ද් කුමාර් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)

ගරු කථානායකතුමනි, බත්තරමුල්ල, උතුරු තලංගම, ගුරුගෙදර පාර, අංක 552 බී දරන ස්ථානයෙහි පදිංචි වී.ජී.එච්.එස්. පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, ගොතටුව, නව නගරය, ඇල්හේන පාර, අංක 697/2 දරන ස්ථානයෙහි පදිංචි බී.ඩබ්ලිව්.ජී. බුද්ධික උෂාන් ප්‍රේමරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, **නුගතලාව**, ලාහුවැව, අංක 14 දරන ස්ථානයෙහි පදිංචි ආර්.එම්.එම්.කේ. රන්දෙනිය මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

(1) ගාල්ල, ගෝනමුල්ල හන්දිය යන ස්ථානයෙහි පදිංචි එල්.ඒ. ගුණරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) මාතර, මැද්දවත්ත, තංගල්ල පාර, අංක 389/1 දරන ස්ථානයෙහි පදිංචි මිලාන් සුබෝධ ජයසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) බද්දේගම, ඉදිගස්කැටිය, ඉසුරුපුර, අංක 71 දරන ස්ථානයෙහි පදිංචි ආර්.ඒ.කේ. සමරනායක මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

"සූර්ය බල සංග්‍රාමය" ව්‍යාපෘතිය: විදුලිය උත්පාදනය
"சூரிய சக்தி போராட்டம்" கருத்திட்டம் : மின்வலுப் பிறப்பாக்கம்
"SURYA BALA SANGRAMAYA" PROJECT: ELECTRICITY GENERATION

2/'18

1. **ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2017.09.06 දින වන විට ජාතික විදුලි පද්ධතිය තුළ පවතින සූර්ය බලයෙන් උත්පාදනය කරනු ලැබූ සම්පූර්ණ විදුලිබල ප්‍රමාණය කොපමණද;

(ii) සූර්ය බලයෙන් විදුලිය උත්පාදනය කිරීම සඳහා සිදු කරනු ලබන සවිකිරීම් අධෛර්යවත් කිරීමට ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් කටයුතු කරන බව දන්නේද;

(iii) සූර්ය බල සංග්‍රාමය ව්‍යාපෘතිය පිළිබඳව ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයන් දැනුවත් කිරීම සඳහා අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2017.09.06 ஆம் திகதியளவில் தேசிய மின்சார முறைமையினுள் காணப்படும் சூரிய சக்தியின் மூலம் பிறப்பிக்கப்படும் மொத்த மின்வலுவின் அளவு எவ்வளவென்பதையும்;

(ii) சூரிய சக்தியின்மூலம் மின்சாரத்தை பிறப்பிக்க மேற்கொள்ளப்படுகின்ற பொருத்துதல்களை அதைரியப்படுத்த இலங்கை மின்சார சபையின் ஊழியர்கள் செயலாற்றுகின்றனரென்பதை அறிவாரா என்பதையும்;

(iii) சூரிய சக்திப் போராட்டக் கருத்திட்டம் தொடர்பாக இலங்கை மின்சார சபையின் ஊழியர்களை விழிப்புணர்வூட்ட அமைச்சு மேற் கொண்டுள்ள நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்குஅறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he inform this House-

(i) the total amount of electricity that was generated using solar power and was added to the national grid as at 06.09.2017;

(ii) whether he is aware that employees of Ceylon Electricity Board are discouraging fixing of installations for generating electricity using solar power; and

(iii) the nature of steps that have been taken by the Ministry to raise awareness among employees of Ceylon Electricity Board about "Surya Bala Sangramaya" project?

(b) If not, why?

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ප්‍රශ්නයෙන් අහන්නේ 2017.09.06 දින වන විට ජාතික විදුලි පද්ධතිය තුළ පවතින සූර්ය බලයෙන් උත්පාදනය කරනු ලැබූ සම්පූර්ණ විදුලිබල ප්‍රමාණය කොපමණද කියලායි.

2017.09.06 දින වන විට ජනනය කරන ලද, ජාලයට සම්බන්ධ - grid connected - සූර්ය ප්‍රකාශ වෝල්ටීය - solar PV - ධාරිතාව මෙගාවොට් 51.36යි. වාණිජමය වශයෙන් සවි කර තිබෙන මෙගාවොට් 10 බැගින් වූ පහක් සහ 1.36ක් වශයෙන් තිබෙන අපේ pilot project එක ගැනයි මේ කියන්නේ. පියසි මත සවි කළ සූර්ය ප්‍රකාශ වෝල්ටීය ධාරිතාව මෙගාවොට් 49.702යි. ඒ අනුව ප්‍රශ්නයේ සඳහන් දිනය වන විට මෙගාවොට් 101.062ක ප්‍රමාණයක් සූර්ය බලයෙන් උත්පාදනය කරලා ජාතික පද්ධතියට එකතු කරලා තිබුණා. ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය අහලා සැහෙන කාලයක් ගත වෙලා තිබෙනවා.

2018.05.01 දිනට පියසි මත සවි කළ සූර්ය ප්‍රකාශ වෝල්ටීය ධාරිතාව මෙගාවොට් 83.88ක් බවට පත් වෙලා තිබෙනවා. ඒ අනුව එදිනට සමස්ත විදුලි ධාරිතාවය (සූර්ය බල) මෙගාවොට් 135.24ක් වෙනවා.

ගරු කථානායකතුමනි, මීට අමතරව තවත් මෙගාවොට් 150ක් පමණ සම්බන්ධයෙන් සම්පූර්ණ කටයුතු අවසන් කරලා අනුමැතිය ලබා දී තිබෙනවා. ඒ පිළිබඳ දත්ත අපේ පද්ධතියට ලැබෙන්නේ යම් කාලයක් ගත වුණාට පසුවයි.

(ii) ප්‍රශ්නයෙන් අහන්නේ සූර්ය බලයෙන් විදුලිය උත්පාදනය කිරීම සඳහා සිදු කරනු ලබන සවි කිරීම් අධෛර්යවත් කිරීමට ලංකා විදුලිබල මණ්ඩලයේ සේවකයින් කටයුතු කරන බව දන්නේද කියලායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නය කියවන්න අවශ්‍ය නැහැ. ඔබතුමා පිළිතුර ලබා දෙන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නයත් සමඟ නොකිව්වොත් ජනතාවට තේරුම් යන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර "නොදනී" යන්නයි. නමුත් මුල් කාලයේ තාක්ෂණික ගැටලු තිබුණා. විදුලිබල මණ්ඩලය සහ ලෙකෝ ආයතනය තුළ තාක්ෂණය පිළිබඳ අවබෝධය අඩුකමක් තිබුණා.

අද වෙනකොට ඒ පිළිබඳව චක්‍රලේඛ නිකුත් කරලා පුහුණුවීම් ලබා දීලා තිබෙනවා. දැන් කිසිම ගැටලුවක් නොමැතිව මෙය සිදු වෙනවා. ඊට අමතරව වෙන ගැටලුවක් තිබුණා. මේ සඳහා විශේෂ මීටරයක් අවශ්‍යයි. එම මීටර්වල හිඟයක් තිබුණා. ඒ නිසා ප්‍රමාදයක් සිද්ධ වුණා. නමුත් අද වෙනකොට සෑහෙන දුරට මෙම ප්‍රශ්නය විසඳී තිබෙනවා කියලා මම විශ්වාස කරනවා.

(iii) විදුලි පාරිභෝගිකයන්ගේ පියසි මත සවි කළ සූර්ය පැනල හා සූර්ය උද්‍යාන මඟින් ජනනය කරනු ලබන විදුලිය, ලංකා විදුලිබල මණ්ඩලය විසින් මිලදී ගෙන ලංවිම බෙදා හැරීමේ ජාලය හරහා විදුලි පාරිභෝගිකයන් වෙත බෙදා හැරීම සූර්ය බල සංග්‍රාමය වැඩසටහන යටතේ ලංකා විදුලිබල මණ්ඩලය මඟින් සිදු කරන මූලික ක්‍රියාවලියයි.

ලංවිම ප්‍රාදේශීය විදුලි ඉංජිනේරුවන් ඇතුළු විදුලි බෙදා හැරීම් අංශයට සම්බන්ධ ඉංජිනේරුවරුන් සඳහා සූර්ය බල සංග්‍රාමය ව්‍යාපෘතියේ අරමුණු, ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය, ප්‍රතිලාභ ආදි කරුණු ඇතුළත් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා තිබෙනවා.

අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද චක්‍රලේඛ මඟින් සූර්ය බල සංග්‍රාමය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වන සියලු දැනුවත් කිරීම් ලංකා විදුලිබල මණ්ඩලය වෙත යොමු කරලා තිබෙනවා; ඒ වාගේම LECO එකට යොමු කරලා තිබෙනවා. ලංකා විදුලිබල මණ්ඩලය මඟින් සූර්ය බලයෙන් විදුලිය ජනනය කරන සූර්ය බල සංග්‍රාම වැඩසටහන සඳහා වෙනමම චක්‍රලේඛ විධිවිධාන නිකුත් කරලා නිලධාරීන් දැනුවත් කරලා තිබෙනවා; ඒ වාගේම රටේ ජනතාවත් දැනුවත් කරලා තිබෙනවා.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ප්‍රශ්නය සඳහන් කරන්න එපා කියලා මම මුලින් කිව්වේ, වේලාව වෙන් කරලා තිබෙන්නේ පිළිතුරු ලබා දීමට විතරක් නිසායි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
හොඳමයි. මම ඒක පිළිගන්නවා, ගරු කථානායකතුමනි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, පිළිතුර ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බොහොම ස්තුතියි. මම හිතන විධියට සුනිත්‍ය බල ශක්තිය මේ පද්ධතියට ඇතුළත් කිරීම සඳහා ඔබතුමන්ලා විශාල ධෛර්යයක් ගන්නවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන් rooftop solar panels ගැන කථා කරද්දී, සාමාන්‍යයෙන් මෙගාවොට් එකකට ආසන්න වපසරියකින් යුතු පියසි තිබෙන ව්‍යාපාරික ස්ථාන තිබෙනවා. එවැනි ව්‍යාපාරික ස්ථාන ගැන සොයා බලද්දී, බොහෝ අය මේ සම්බන්ධව අධෛර්යවත් වෙලා තිබෙන බව පෙනී යනවා.

මොකද, ඒ ගොල්ලන්ගේම විදුලිය නිෂ්පාදනය කිරීම ඒ ගොල්ලන්ට වාසි වුණත්, මේ තිබෙන මිලත් එක්ක සංසන්දනය කරද්දී ගැටලුවක් තිබෙනවා. විශේෂයෙන්ම මිලදී ගැනීම් කරලා මාස හතරක්, පහක් යනවා, ව්‍යාපෘතියක් commission කර ගන්න. එතකොට ගරු ඇමතිතුමා, ඒ කාලයේදී යන interest rate එකත් එක්ක ගළපනකොට ව්‍යාපාරිකයෝ කියන කාරණයක් තමයි, මේ ගෙවීම -tariff එක- ප්‍රමාණවත් නැහැ කියන එක. ඒ නිසා විශේෂයෙන් ව්‍යාපාරික ස්ථාන, කර්මාන්තකරුවන් සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කරලා විශේෂත්වයක් කරන්න පුළුවන් හැකියාවක් ඔබතුමාට තිබෙනවාද?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු මන්ත්‍රීතුමා, මම පිළිගන්නේ නැහැ, ඔබතුමා කියන කාරණය. සූර්ය බල සංග්‍රාමය යටතේ තිබෙන Net Accounting සහ Net Plus කියන ව්‍යාපෘති යටතේ ඒකකයකට නිශ්චිත මිලක් ලබා දෙනවා. ඒ නිසා ඔබතුමාට ගෞරව සහිතව මම ඔබතුමාගේ තර්කය ප්‍රතික්ෂේප කරනවා. මේ වන විට පළමුවෙනි අවුරුදු 7 ඇතුළත විදුලි ඒකකයක් සඳහා රුපියල් 22.00ක්, ඒ වාගේම ඊළඟ අවුරුදු 13 ඇතුළත විදුලි ඒකකයක් සඳහා රුපියල් 15.50ක් වශයෙන් වසර විස්සක කාලයකට අපි ගිවිසුම්වලට එළඹෙනවා. මේ මිල අපි ගණන් හැදුවේ මීට අවුරුදු දෙකකට කලින්. අද එදාට වඩා ලෝක වෙළඳපොළේ උපකරණ මිල අඩුවෙලා තිබෙනවා. මම පිළිගන්නවා, ඩොලරයේ අගය වැඩිවීම නිසා ආපසු අනික් අතට දෙයක් සිදුවෙලා තිබෙනවා කියලා. හැබැයි, අර සවි කිරීමයි, සබඳතාව ලබාදීමයි අතර තිබෙන පරතරය අඩු කර ගන්න අපි බොහෝ පියවර ගෙන තිබෙනවා. යම් ගැටලුවක් තිබෙනවා නම්, කෙළින්ම අපට කථා කරන්න. මොකද, මෙගාවොට් එකක් කියන්නේ ඩොලර් මිලියනයක විතර ලොකු ආයෝජනයක්. ඒ වාගේම කර්මාන්තකරුවන් සහ විශාල පියැසි තිබෙන ආයෝජකයන් ධෛර්යවත් කරන්න අපි කැමතියි. යම් ගැටලුවක් හෝ මාස හතරක් පහක් වන විශේෂ ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒ පිළිබඳව අපව දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිනවා. නමුත් මම කියනවා, අදටත් මේ මිල වලංගු බව.

ඒ වාගේම, මෙගාවොට් 100 ඉලක්කය සපුරා ගැනීමෙන් පසුව මිල පිළිබඳව පුනරීක්ෂණයක් කරන්නට කැබිනට් තීන්දුව අනුවම අපි එකඟ වෙලා තිබෙනවා; ඒ අනුව අපි ඒ කටයුතු පටන් ගන්නවා. ඒ අනුව මීලඟි වෙනසක් කළ යුතු නම් අපි ඒ වෙනස කරන්නට සූදානම් ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. දෙවෙනි අතුරු ප්‍රශ්නය අහනවාද?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම දන්නා හැටියට ඔබතුමන්ලා සූර්ය උද්‍යාන හදුනාගෙන තිබෙනවා, මන්නාරම, තලෙයිමන්නාරම සහ පුනරීන් කියන ප්‍රදේශවල. විදුලිබල මණ්ඩලය විසින් ඉදිරි වසර දෙක තුන ඇතුළත ඒ සූර්ය උද්‍යානවල මෙගාවොට් 100ක හෝ 200ක බලාගාර ඉදි කරන්නට සැලසුම් කරලා තිබෙනවා. මේ වන විට විදුලිබල මණ්ඩලය මඟින් ඉදි කරන ඒ සූර්ය උද්‍යානවල ප්‍රගතිය කොහොමද, මේ සඳහා ආයෝජනය කරන්නේ කවුද, විදුලිබල මණ්ඩලයට ඒ සඳහා ශක්තිය සහ හැකියාව තිබෙනවාද කියලා මම ඔබතුමාගෙන් විමසනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, විදුලිබල මණ්ඩලය සූර්ය උද්‍යාන සඳහා කිසිම ආයෝජනයක් කරන්නේ නැහැ. මන්නාරම ප්‍රදේශයේ මෙගාවොට් 100ක සුළං බල උද්‍යානයක් ආසියානු සංවර්ධන බැංකුවේ ආධාර මත අපි ක්‍රියාත්මක කරනවා. ඒ හැරෙන්නට සූර්ය බලය සහ සුළං බලය පිළිබඳ අනෙකුත් ආයෝජන සියල්ලම පෞද්ගලික අංශය මත රඳා පවතිනවා. හැබැයි, මිලදී ගන්නේ තරගකාරී මිල ගණන් අනුවයි.

ගරු කථානායකතුමනි, පුනරීන් ප්‍රදේශයේ ගිගාවොට් 01ක්, ඒ කියන්නේ මෙගාවොට් 1,000ක ධාරිතාවකින් යුත් සුළං සහ සූර්ය කියන මූලාශ්‍ර දෙකෙන්ම ක්‍රියාත්මක වන බලාගාරයක් සැලසුම් කරලා තිබෙනවා. ඉඩම් මැනීමේ කටයුතු දැන් අවසන් කරලා තිබෙනවා. අවසර ලබා ගැනීමේ කටයුතු අපි දැන් කරගෙන යනවා. ඒ සම්පූර්ණ උද්‍යානයම තරගකාරී මිල ගණන් මත ටෙන්ඩර් ක්‍රමවේදයකට තමයි ලබා දෙන්නේ. ඒ වාගේම, සියඹලාණ්ඩුව ප්‍රදේශයේ තවත් මෙගාවොට් 100ක බලාගාරයක් සැලසුම් කරලා තිබෙනවා; මැනීම් කටයුතු කරගෙන යනවා. ඒ වාගේම, සුළං සහ සූර්ය බලය පිළිබඳව තිබෙන සියලුම අවස්ථාවන් තරගකාරී ලෙසයි කරන්නේ. ඒ දෙකට අමතරව තවත් මෙගාවොට් 150ක සූර්ය බලය පිළිබඳ ටෙන්ඩරයක් තව මාස දෙකකින් එනවා.

තවත් මෙගාවොට් 150ක සුළං බලය පිළිබඳ ටෙන්ඩරයකුත් මාස දෙකකින් එනවා. ඒ කියන්නේ මෙගාවොට් 1, 2 හෝ 10 දක්වා වූ කොටස් මඟින් ඒ ටෙන්ඩර් කරන්න පුළුවන්. එතකොට දේශීය ව්‍යාපාරිකයන්ටත්, විදේශීය ආයෝජකයන්ටත් - දෙගොල්ලන්ටම- අවස්ථාව තිබෙනවා. බොහොම ස්තුතියි, ඔබතුමා ඒ ප්‍රශ්නය ඇහුවාට.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 - 17/'18 - (1), ගරු ආනන්ද අලුත්ගමගේ මහතා.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 - 36/'18 - (1), ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

විදුහල්පති පුරප්පාඩු හා ගුරු පුරප්පාඩු පිරවීම : මාතලේ දිස්ත්‍රික්කය

அதிபர் மற்றும் ஆசிரியர் வெற்றிடங்களை நிரப்புதல் : மாத்தளை மாவட்டம்

FILLING OF PRINCIPAL AND TEACHER VACANCIES : MATALE DISTRICT

130/'18

4. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ, මධ්‍යම පළාත් සභාව යටතේ පාලනයවන පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) දැනට එම පාසල් අතරින්, වැඩබලන විදුහල්පතිවරුන් සිටින පාසල් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) දැනට දිස්ත්‍රික්කයේ පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව, එක් එක් අධ්‍යාපන කොට්ඨාසය අනුව, වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) මාතලේ දිස්ත්‍රික්කයේ විදුහල්පති පුරප්පාඩු හා ගුරු පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

කල්වි අමைச්சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தளை மாவட்டத்தில் மத்திய மாகாண சபையின்கீழ் நிருவகிக்கப்படுகின்ற பாடசாலைகளின் எண்ணிக்கை யாது;

(ii) மேற்படி பாடசாலைகளின் பெயர்கள் யாவை;

(iii) தற்போது இப்பாடசாலைகளுக்கு மத்தியில் பதில் கடமையாற்றும் அதிபர்கள் உள்ள பாடசாலைகளின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் யாவை;

(iv) தற்போது மாவட்டத்தில் நிலவுகின்ற ஆசிரியர் வெற்றிடங்களின் எண்ணிக்கை, ஒவ்வொரு கல்விக் கோட்டத்தின் படி வெவ்வேறாக யாவை;

(v) மாத்தளை மாவட்டத்தில் அதிபர் வெற்றிடங்கள் மற்றும் ஆசிரியர் வெற்றிடங்களை நிரப்புவதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education :

(a) Will he inform this House-

(i) the total number of schools functioning in the Matale District under the Central Provincial Council;

(ii) the names of the aforesaid schools;

(iii) out of those schools, the number of those that are currently functioning under acting principals and of the names of such schools;

(iv) separately, on per education region basis, the total number of teacher vacancies currently existing in the district; and

(v) the steps that will be taken by the Ministry to fill the vacancies existing for principals and teachers in the Matale District?

(b) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 306කි.

(ii) ඇමුණුම 01 **සභාගත*** කරමි.

(iii) පාසල් සංඛ්‍යාව 129කි. ඇමුණුම 02 **සභාගත*** කරමි.

(iv) ඇමුණුම 03 **සභාගත*** කරමි.

ඒ කලාප දෙකේ ගුරු පුරප්පාඩු මම වෙන වෙනම කියන්නම්.

නාඋල කලාප අධ්‍යාපන කාර්යාලයේ ගුරු පුරප්පාඩු:

නාඋල අධ්‍යාපන කොට්ඨාසය:

ප්‍රාථමික ගුරු පුරප්පාඩු 2යි. විද්‍යා ගුරු පුරප්පාඩු 1යි. දෙමළ භාෂාව හා සාහිත්‍ය පුරප්පාඩු 1යි. භූගෝල විද්‍යාව පුරප්පාඩු 3යි. පුරවැසි අධ්‍යාපනය පුරප්පාඩු 5යි. දෙවන බස (දෙමළ) පුරප්පාඩු 2යි. චිත්‍ර පුරප්පාඩු 5යි. නැටුම් පුරප්පාඩු 1යි. දෙමළ සාහිත්‍ය රසාස්වාදය පුරප්පාඩු 1යි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදය පුරප්පාඩු 12යි. කෘෂි හා ආහාර තාක්ෂණවේදය පුරප්පාඩු 6යි. ගෘහ ආර්ථික විද්‍යාව පුරප්පාඩු 3යි. සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය පුරප්පාඩු 2යි. සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය පුරප්පාඩු 1යි. පුස්තකාල පුරප්පාඩු 16යි.

අඔන්ගහකෝරළේ අධ්‍යාපන කොට්ඨාසය:

ප්‍රාථමික පුරප්පාඩු 9යි. ගණිතය පුරප්පාඩු 2යි. ඉංග්‍රීසි පුරප්පාඩු 1යි.

දෙමළ භාෂාව හා සාහිත්‍යය - පුරප්පාඩු 3යි. භූගෝල විද්‍යාව - පුරප්පාඩු 1යි; පුරවැසි අධ්‍යාපනය - පුරප්පාඩු 1යි; දෙවන බස (සිංහල) - පුරප්පාඩු 1යි; චිත්‍ර - පුරප්පාඩු 2යි; තොරතුරු හා සන්නිවේදන තාක්ෂණවේදය - පුරප්පාඩු 6යි; කෘෂි හා ආහාර තාක්ෂණවේදය - පුරප්පාඩු 4යි; ගෘහ ආර්ථික විද්‍යාව - පුරප්පාඩු 3යි; සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය - පුරප්පාඩු 2යි; පුස්තකාල - පුරප්පාඩු 7යි. මේ වාගේ පොඩි පොඩි ගණන් තිබෙනවා.

(v) ඔව්.

විදුහල්පති සේවයේ පුරප්පාඩු:

ජාතික පාසල් සඳහා 2018 වර්ෂයේ සිදු කිරීමට නියමිතව පවතින ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ වාර්ෂික ස්ථාන මාරුවීම්, පත් කිරීම් හා උසස්වීම් මඟින් එම පුරප්පාඩු පිරවීමට කටයුතු කෙරේ.

රාජ්‍ය සේවා කොමිසම අනුමත කරලායි තිබෙන්නේ. ඊයේත් අනුමැතිය ලබා දුන්නා. සති දෙකක් ඇතුළත ඒ ටික ගැසට් කරනවා.

පළාත් සභා පාසල් සඳහා රේඛීය අමාත්‍යාංශයෙන් බඳවාගනු ලැබූ මධ්‍යම පළාත් සභාවට අනුයුක්ත කර ඇති විදුහල්පති ශ්‍රේණිධාරීන් පුරප්පාඩු පවතින පාසල් සඳහා අනුයුක්ත කර ඇත.

ගරු මන්ත්‍රීතුමිය, විදුහල්පතිවරුන් 4,000ක් බඳවා ගත්තා. අපි ඒ අය පළාත් සභාවලට දී තිබෙනවා. පළාත් සභාවලින් සමහර විදුහල්පතිවරුන්, විදුහල්පතිවරුන් වශයෙන්ම ස්ථානගත කරලා නැහැ. ඔවුන් වෙනත් වෙනත් පාසල්වල සහකාර, නියෝජ්‍ය විදුහල්පතිවරුන් වශයෙන් ඉන්නවා; වැඩ බලන විදුහල්පතිවරුන් ලෙස ඉන්නවා. ජාතික පාසල්වලත් වැඩ බලන විදුහල්පතිවරු ඉන්නවා. හැබැයි ඒ හැමෝම ශ්‍රේණිධාරීන්. පළාත් සභාවේ වැඩ බලන අයගෙන් බහුතරය ඉන්නේ ශ්‍රේණිධාරීන් නොවන අයයි. බඳවා ගත් ඒ විදුහල්පතිවරුන් ස්ථානගත කර නැහැ, බොහොමයක් පළාත් සභාවල.

ගුරු සේවයේ පුරප්පාඩු:

අවශ්‍යතාව අනුව වරින් වර ගැසට් නිවේදන නිකුත් කර ගුරුවරුන් බඳවා ගැනීමට කටයුතු කරන අතර, පුරප්පාඩු සඳහා අනුයුක්ත කරනු ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි, (අ) (iv) ප්‍රශ්නයෙන් මා අසා තිබෙන්නේ මගේ මැතිවරණ කොට්ඨාසයේ තිබෙන කලාප දෙක ගැන පමණක් නොවෙයි, මුළු මාතලේ දිස්ත්‍රික්කයේම පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳවයි. විශේෂයෙන්ම ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගුරු පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ඒවා බොහොම දුෂ්කර ප්‍රදේශ. ඒ නිසා මා නැවත වතාවක් ඔබතුමාට ඒ පිළිබඳව අවධාරණය කරමින්, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය අහනවා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා අධ්‍යාපන අමාත්‍යවරයා වශයෙන් පත් වූවාට පසුව ශ්‍රේණිධාරී විදුහල්පතිවරු පත් කරලා, ඔවුන් ස්ථානගත කළා. මා ඒ ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

වාගේම ඒ අය පත් කරන තුරු වැඩ බලන විදුහල්පතිවරු විශාල කාර්ය භාරයක් ඉටු කළා. අවුරුදු තුනකටත් වැඩි කාලයක් වැඩ බලන විදුහල්පතිවරු විධියට සේවය කළ අයත් ඉන්නවා. ඒ නිසා ඒ අය සම්බන්ධයෙන් අමාත්‍යාංශය ගන්නා යම් ක්‍රියාමාර්ගයක් තිබෙනවා නම්, ඒ ගැන දැන ගන්න කැමැතියි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ඇත්ත වශයෙන්ම මේ ප්‍රශ්නය පිළිබඳව මා එක පැත්තකින් කනගාටු වෙනවා. විදුහල්පතිවරු හාරදහසක් බඳවා ගැනීමට අදාළ ගැසට් නිවේදනය අනුව වැඩ බලන විදුහල්පතිවරුන්ටත් ඒ විභාගය සඳහා පෙනී සිටින්න පුළුවන්කම තිබුණා. එයින් කොටසක් ඒ විභාගය සඳහා පෙනී ඉඳලා විදුහල්පතිවරු වශයෙන් පත් වෙලාත් තිබෙනවා. ගැසට් නිවේදනය අනුව වයස අවුරුදු පනහට අඩු වැඩ බලන විදුහල්පතිවරුන්ට තමයි ඒ විභාගය සඳහා පෙනී සිටින්න පුළුවන්කම තිබුණේ. නමුත් වයස අවුරුදු පනහට වැඩි වැඩ බලන විදුහල්පතිවරු සඳහාත් ඒ අවස්ථාව ලබා දෙන්න අපි රාජ්‍ය සේවා කොමිසමෙන් වෙනම අනුමැතියක් ඉල්ලා තිබෙනවා. හැබැයි ඒ වැඩ බලන විදුහල්පති පත්වීම් ගොඩක් දේශපාලන පත්වීම්. පසු ගිය කාලය පුරා වැඩ බලන විදුහල්පතිවරු විශාල සංඛ්‍යාවක් පත් කරලා තිබෙනවා. දැන් අපි දේශපාලනය බින්දුවක්වත් සම්බන්ධ කරගන්නේ නැතුව විදුහල්පතිවරු හාරදහසක් බඳවා ගත්තා. ඒ ගොල්ලන්ගෙන් දහසකටත් අඩු ගණනක් තමයි විදුහල්පතිවරු වශයෙන් විදුහල්වල ස්ථානගත කරලා තිබෙන්නේ. ඉස්කෝල හම්බ වුණේ නැති, එහෙම නැත්නම් වැඩ බලන විදුහල්පතිවරු තමයි තුන්දහසකට වැඩි සංඛ්‍යාවක් තවමත් ඉන්නේ. ඒ නිසා, යහ පාලන ආණ්ඩුව විධියට අපි උත්සාහ කරන්න ඕනෑ, මොකක් හෝ ප්‍රතිතියක් අනුව විදුහල්පතිවරු පත් කරන්න. ඒ අනුව විභාග තිබ්බාම, වැඩ බලන විදුහල්පතිවරුන්ටත් සුදුසුකම් අනුව ඉල්ලන්න පුළුවන්කම තිබෙනවා.

ඔබතුමිය කිව්වා වාගේ, උතුර-නැඟෙනහිර ප්‍රදේශවල අයට අපි වෙනම වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. ඒ අයට දීමනා පවා ගෙවන්න අපි කටයුතු කරලා තිබෙනවා. අපේ ආණ්ඩුව ආවාට පසුව පළමු ශ්‍රේණියේ විදුහල්පතිවරුන්ට රුපියල් 6,500ක දීමනාවකුත් ලබා දුන්නා. ඒ දීමනාව උතුරු-නැඟෙනහිර වැඩ බලන විදුහල්පතිවරුන්ට දෙනවා. හැබැයි, ශ්‍රේණිධාරීන් සිටියදී වැඩ බලන විදුහල්පති තනතුරු දෙන්න අපට පුළුවන්කමක් නැහැ. එහෙම දීම සුදුසුත් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තවත් ප්‍රශ්නයක් තිබෙනවාද, ගරු මන්ත්‍රීතුමියනි?

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, මාතලේ දිස්ත්‍රික්කය බොහොම අතිදුෂ්කර දිස්ත්‍රික්කයක් බව ඔබතුමා දන්නවා. මාතලේ නගරය හැරුණු කොට, අනෙක් සියලු ප්‍රදේශ වල්අලි තර්ජනය, නාය යෑම් වැනි බොහෝ තර්ජනවලට ලක් වන දුෂ්කර ප්‍රදේශ. අනුරාධපුර දිස්ත්‍රික්කය වැනි දිස්ත්‍රික්ක දුෂ්කර දිස්ත්‍රික්ක විධියට නම් කරලා තිබෙනවා. ඒවාට සාපේක්ෂව බලනකොට මාතලේ දිස්ත්‍රික්කය ඊට වඩා දුෂ්කරයි. විශේෂයෙන්ම විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා විට සහ පහ වසර ශිෂ්‍යත්ව ප්‍රදානය කරන කොට, අපේ මාතලේ දිස්ත්‍රික්කයේ දරුවන්ට විශාල අසාධාරණයක් සිද්ධ වෙනවා. ඒ නිසා අපේ දිස්ත්‍රික්කයත් දුෂ්කර දිස්ත්‍රික්කයක් විධියට නම් කර දෙන්න කියලා අවුරුදු දෙකක, දෙකහමාරක කාලයක් තිස්සේ මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් පවතින වර්තමාන තත්ත්වය කුමක්ද කියා මම දැනගන්න කැමැතියි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, පහ වසර ශිෂ්‍යත්වය සඳහා සෑම දිස්ත්‍රික්කයකටම quota එකක් තිබෙනවා. ශිෂ්‍යත්ව ලබා දීම් කරනු ලබන්නේ ඒ quota එක අනුවයි. ඔබතුමිය කියන කාරණය ගැන මම දැනුවත්වෙලා තිබෙනවා.

ඔබතුමිය ඉල්ලන්නේ මාතලේ දිස්ත්‍රික්කයට වැඩිපුර ප්‍රමාණයක් දෙන්න කියලාද?

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

සමහර දිස්ත්‍රික්ක දුෂ්කර දිස්ත්‍රික්ක විධියට නම් කර තිබෙනවා. ඒ දිස්ත්‍රික්කවලින් විශ්වවිද්‍යාලවලට ළමයින් ඇතුළත් කර ගැනීමේදීත්, පහ වසර ශිෂ්‍යත්ව විභාගයේ කඩඉම් ලකුණු බැලීමේදීත් යම් සාධාරණයක් සිද්ධ වෙනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමියනි, අනිවාර්යයෙන් විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගැනීමේදී ඒ සාධාරණය ඉෂ්ට වෙනවා. දැනටත් දිස්ත්‍රික් පදනම මත සියයට ගණනක් ඇතුළත් කර ගන්නවා. මාතලේ දිස්ත්‍රික්කයෙනුත් එහෙම තමයි. ශිෂ්‍යත්ව විභාගයේදීත් ඒ දිස්ත්‍රික්කයට quota එකක් ලැබුණාම, ඒ දිස්ත්‍රික්කයට සාධාරණය ඉෂ්ට වෙනවා.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)/
නමුත් ගරු ඇමතිතුමනි, අපට පොඩි අසාධාරණයක් වුණා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඒ ගැන ටිකක් අවධානය යොමු කරමු.

ඊළඟ ප්‍රශ්නය, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, මටත් පැහැදිලි කර ගැනීමක් සඳහා අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අද අපට වාද විවාද ගොඩක් තිබෙන නිසා ඒ සඳහා සෑම දෙනාගේම සහයෝගය ඉල්ලා සිටිනවා. ගරු ඇමතිතුමා පිළිතුරු දෙන්න කැමැති නම් ප්‍රශ්නය අහන්න. හදිසියක් නැත්නම් ඊළඟ දිනයක අහන්න පුළුවන්. ගරු ඇමතිතුමා කැමැතිද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
අහන්න, කමක් නැහැ. මම පිළිතුරු දෙන්න කැමැතියි.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු ඇමතිතුමනි, විදුහල්පති විභාගය සමත් වුණු විදුහල්පතිවරු ඉන්නවා. ඒ විදුහල්පතිවරු විදුහලකට පත් කළාට පස්සේ ඒ අයට විදුහලේ වැඩ භාර ගන්න ඉඩ දෙන්නේ නැහැ. ඒ පාසල්වල ඉන්න වැඩ බලන විදුහල්පතිවරු දේශපාලන බලපෑම් මත අම්මලා, තාත්තලා සම්බන්ධ කර ගෙන උද්ඝෝෂණ කරලා අලුතින් එන විදුහල්පතිවරු එළවනවා. ඊට පස්සේ ඒ විදුහල්පතිවරයා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා හමුවෙන්න යනවා; පළාත් සභාවේ අධ්‍යාපන ලේකම්තුමා හමුවෙන්න යනවා. ඊට පස්සේ ඒ අය කරන්නේ මොකක්ද? ඒ විදුහල්පතිවරු ඒ පාසල්වල වැඩ බලන විදුහල්පතිවරු විධියට දමනවා. ඒ අය විභාගයක් සමත්වෙලා. විභාගය සමත් වුණාට විදුහල්පතිකම ලැබෙන්නේත් නැහැ, දීමනාව ලැබෙන්නේත් නැහැ. ඒ නිසා මේ සම්බන්ධයෙන් විශේෂයෙන් සොයලා බලන්න. මේ ක්‍රමය හම්බන්තොට දිස්ත්‍රික්කය තුළ ඉතාම නරක විධියට ක්‍රියාත්මක වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන අවධානය යොමු කරන්න, ගරු ඇමතිතුමනි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මේ ගැන ආණ්ඩුකාරතුමන්ලාත් දැනුවත් කරන්නත් කටයුතු කර තිබෙනවා. මේක අධ්‍යාපන පද්ධතිය තුළ තිබෙන ඉතාම බරපතළ බෙදවාචකයක්.

ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ "සෙට්" කරලාත් උද්ඝෝෂණය කරවනවා. ඒ වාගේම ගරු කථානායකතුමනි, ඒ බඳවාගෙන තිබෙන ශ්‍රේණිධාරීන්ට අපි මාස තුනක හොඳ නේවාසික පුහුණුවක් දීලා තිබෙනවා; වැඩිම ලකුණු ලබා ගත් අයට විදේශ පුහුණුවක් දීලා තිබෙනවා. අද පාසල් නැති නිසා ඒ දක්ෂ විදුහල්පතිවරුන් එක එක තැන්වලට පත් කරනවා. මා ඒ ගැන සොයා බැලුවාම දැන ගන්නට ලැබුණා, කවුරුවත් යන්නේ නැති දුෂ්කර ප්‍රදේශවල පාසල්වලට තමයි ඔවුන්ට පත්වීම් ලබා දීලා තිබෙන්නේ කියලා. අපේ රේඛීය අමාත්‍යාංශය යටතේ නම්, ජාතික පාසල්වල මෙහෙම දෙයක් වෙලා සුමානයක් උද්ඝෝෂණයක් කළත් වැඩ බලන විදුහල්පතිවරුන් පත් කරන්නේ නැහැ. දැන් පුරුදුවෙලා තිබෙනවා,දෙමවුපියන් ටිකක් එකතු කරලා උද්ඝෝෂණය කරලා භය කරලා පත්වීම් කර ගන්න. අපි නම් එහෙම පත් කරන්නේ නැහැ. ඒ විධියට කටයුතු කරන්නය කියලා පළාත් සභාවෙනුත් ඉල්ලා සිටිනවා. පළාත් සභාවෙනුත් ඒ කටයුත්ත වෙනවා නම් මෙයට උත්තරයක් ලැබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 -157/'18- (1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 -192/'18- (1), ගරු ඉම්රාන් මහරූෆ් මහතා. [සභා ගර්භය තුළ නැත.]

ප්‍රශ්න අංක 7 -194/'18- (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා. [සභා ගර්භය තුළ නැත.]

පූන්තෝට්ටම් සුබසාධන කඳවුරේ ජනතාව: නැවත පදිංචිය

பூந்தோட்ட நலன்புரி முகாம் மக்கள்: மீள்குடியேற்றம்
PEOPLE IN PUNTHOTTAM WELFARE CAMP: RESETTLEMENT
215/'18

8. ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පසුගිය කාලයේ පැවැති යුද්ධය තත්ත්වය හේතුවෙන් අවතැන් වූ පවුල් 150ක් අවුරුදු 25ක් පුරා වවුනියාව පූන්තෝට්ටම් සුබසාධන කඳවුරේ වාසය කරන බවත්;

(ii) මෙම පවුල් 150 නෙඩුන්කේනි, සින්න අඩම්පන් ප්‍රදේශයේ නැවත පදිංචි කරන බවට වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් දැනුම් දී තිබියදී, මෙම පවුල් සඳහා වූ නිවාස කොටස් දෙකකට බෙදා නෙඩුන්කේනි සින්න අඩම්පන් ප්‍රදේශයේ නිවාස 68ක් සහ පුලියන්කුලම් ප්‍රදේශයේ නිවාස 82ක් වශයෙන් ''ලයිකා ඥානම් පුණ්‍යායතනය'' විසින් ඉදිකරන ලද බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත සඳහන් නිවාස 150හි එකී ජනතාව නැවත පදිංචි වී සිටින්නේද;

(ii) එසේ නම්, ඒ කවර දිනයක සිටද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு அபிவிருத்தி மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த யுத்த சூழ்நிலை காரணமாக இடம் பெயர்ந்த 150 குடும்பங்கள் 25 வருடங்களாக வவுனியா பூந்தோட்டம் நலன்புரி முகாமில் வசித்து வருகின்றன என்பதையும்;

(ii) இந்த 150 குடும்பங்களை நெடுங்கேணி, சின்ன அடம்பன் பிரதேசத்தில் மீள்குடியமர்த்துவதாக வவுனியா மாவட்டச் செயலகம் அறிவித்திருந்த நிலையில், இக்குடும்பங்களுக்கான வீடுகள் இரண்டு பகுதிகளாக பிரிக்கப்பட்டு, நெடுங்கேணி சின்ன அடம்பன் பிரசேத்தில் 68 வீடுகளும் புளியங்குளம் பிரதேசத்தில் 82 வீடுகளும் "லயிகா ஞானம் அறக்கொடைத் தாபனத்தால்" நிர்மாணிக்கப்பட்டுள்ளது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேலே குறிப்பிடப்பட்ட 150 வீடுகளில் அந்த மக்கள் மீள்குடியேறி உள்ளனரா என்பதையும்;

(ii) ஆமெனின், அது எத்திகதியிலிருந்து என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

asked the Minister of Resettlement, Rehabilitation, Northern Development & Hindu Religious Affairs:

(a) Is he aware that -

(i) 150 families displaced due to the previous war situation have been living in Punthottam Welfare Camp in Vavuniya for 25 years; and

(ii) construction of houses for these families is done in two areas as 68 houses in Sinna Adampan, Nedunkerni and 82 houses in Puliyankulama by "Lyca Gnanam Charity" while it has been informed by the District Secretary's Division of Vavuniya that these 150 families would be resettled in Sinna Adampan, Nedunkerni?

(b) Will he inform this House -

(i) whether the said people have been resettled in the said 150 houses; and

(ii) if so, since when?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(ආ) (i) ඔව්.

(ii) 2017.04.10වන දා පූන්තෝට්ටම් සුබසාධන මධ්‍යස්ථානයේ සිටි පවුල් 150ක් වෙත මෙම නිවාස 150 භාර දී ඇති අතර ඔවුන් සියලුදෙනාම නැවත පදිංචි කර ඇත.

(ඇ) අදාළ නැත.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
නන්‍රි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 - 309/'18 - (1), ගරු බුද්ධික පතිරණ මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා මීට කලිනුත් යොමු කරලා, කලින් සැසි වාරයේ දී කල් ගත් ප්‍රශ්නයක්. ඊළඟ දිනයේ දී මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දෙන බව ගරු ඇමතුමා වෙනුවෙන් මා ප්‍රකාශ කර සිටිනවා. මෙම සමාගම පිළිබඳව නිශ්චිත තොරතුරු සොයා ගැනීමේ දුෂ්කරතාවක් තිබෙනවා. ඒ නිසාම තමයි මගේ උගත් මිත්‍රයා දීර්ඝව මෙම ප්‍රශ්නය අහන්නේ. ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වනවා, මේ ඉතාම වැදගත් ප්‍රශ්නය මතු කිරීම ගැන. මේ ප්‍රශ්නයටත්, මෙම සමාගම පිළිබඳ අනෙක් ප්‍රශ්නවලටත් ඊළඟ සති කිපය තුළදී අනිවාර්යයෙන්ම පිළිතුරු ලබා දෙන බව ගරු ඇමතිතුමා වෙනුවෙන් මා ප්‍රකාශ කර සිටිනවා. මේ වනකොට අපි ඒ සම්බන්ධව ගොඩක් තොරතුරු සොයාගෙන තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු ඇමතිතුමා, නව ස්ථාවර නියෝග අනුව ප්‍රශ්නයකට උත්තර දෙන්න තුන් වතාවකට වැඩිය කල් ගන්න අමාරුයි. ඒ නිසා ඔබතුමා ඊළඟ වතාවේ දී පිළිතුරු ලබා දෙන්න කටයුතු කරන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, ඊළඟ වතාවේදී අනිවාර්යයෙන්ම පිළිතුරු ලබා දෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මා විවාදයකට යනවා නොවෙයි. අපේ රජය බලයට පත් වුණු 2015 වකවානුවේ ඉඳලාම මේ ප්‍රශ්නය න්‍යාය පත්‍රයේ තිබුණා. නමුත් මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම පස්හය වතාවක් කල් ගියා. නව පාර්ලිමේන්තු සැසි වාරය ආරම්භ වුණාට පසුව නැවත වතාවක් ඉදිරිපත් කර තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමාට ඒකට හේතුව පැහැදිලි කරලා දුන්නා නේ. ඒ නිසා එතුමාට පිළිතුරු ලබා දෙන්න තව අවස්ථාවක් ලබා දෙන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ඊයේත් මේ හා සමානම ප්‍රශ්නයක් ඉදිරිපත් වුණා. පෙරේදාත් මේ වාගේ ප්‍රශ්නයක් ඉදිරිපත් වුණා. ඒ ප්‍රශ්න දෙකටම උත්තර දෙන්න එතුමා මේ ගරු සභාවේ සිටියේ නැහැ. නමුත් ගරු අජිත් පී. පෙරේරා ඇමතිතුමා මේ ප්‍රශ්නය පිළිබඳව දක්වන උනන්දුව ගැන මා එතුමාට ස්තුතිවන්ත වනවා. ඒ නිසා මා බලාපොරොත්තු වනවා, ඊළඟ වතාවට අමතරව තවත් වතාවක් මේ ප්‍රශ්නයට පිළිතුරු ලබා දීමට කල් ගන්න එකක් නැහැයි කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා පොරොන්දුව ඉෂ්ට කරයි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, මා එහෙම ප්‍රශ්න මහ හරින්නේ නැහැ. හැම දවසකම ප්‍රශ්න අහන තරමට මා කැමැතියි. ප්‍රශ්න අහනවා මදි

කියලායි මට හිතෙන්නේ. ඒ නිසා එතුමා අහන වැදගත් ප්‍රශ්නවලට මා බොහොම කැමැත්තෙන් උත්තර දෙනවා. ඒ වාගේම එම ප්‍රශ්නවලට හරියට උත්තර දෙන්න ඕනෑ නිසා මට ඒ සඳහා කාලයක් අවශ්‍යයි. ඒ අනුව විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමා කියන කාරණය අපි පිළිගත්තා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

රත්නපුර දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍ය පාසල්: විස්තර
இரத்தினபுரி மாவட்டத் தமிழ் மொழிமூலப் பாடசாலைகள்: விபரம்
TAMIL MEDIUM SCHOOLS IN RATNAPURA DISTRICT: DETAILS

391/'18

10. ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ තිබෙන දෙමළ මාධ්‍ය පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් අතරින් ප්‍රාථමික හා ද්විතීයික පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම පාසල්වලින් මධ්‍යම රජයට අයත් පාසල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පාසල්වල නම් කවරේද;

(v) දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය හදාරන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) රත්නපුර දිස්ත්‍රික්කයේ,

(i) 2010 වර්ෂයේ සිට මේ දක්වා 5 වසර ශිෂ්‍යත්ව විභාගය සමත් හා අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2010 වර්ෂයේ සිට මේ දක්වා අ.පොස. (සා.පෙළ) සහ අ.පොස. (උ.පෙළ) විභාගය සමත් හා අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඉංජිනේරු හා වෛද්‍ය විද්‍යාව හැදෑරීම සඳහා විශ්වවිද්‍යාල සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iv) සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය ශිෂ්‍යයන් අතර ඉහත විභාග සමත් සහ අසමත් ශිෂ්‍ය සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

කල්වි අමෙච්චරෙක් කේට්ට වින්නා:

(අ (i) இரத்தினபுரி மாவட்டத்தில் உள்ள தமிழ் மொழிமூல பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு;

(ii) மேற்படி பாடசாலைகளில் ஆரம்பநிலை மற்றும் இரண்டாம் நிலைப் பாடசாலைகளின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு;

(iii) மேற்படி பாடசாலைகளில் மத்திய அரசுக்குரிய பாடசாலைகளின் எண்ணிக்கை எவ்வளவு;

(iv) அந்த பாடசாலைகளின் பெயர்கள் யாவை;

(v) தமிழ் மொழிமூலம் கல்வி கற்கும் மொத்த மாணவர்களின் எண்ணிக்கை எவ்வளவு;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இரத்தினபுரி மாவட்டத்தில்,

(i) 2010ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை ஐந்தாம் ஆண்டு புலமைப்பரிசில் பரீட்சையில் சித்தியடைந்த மற்றும் சித்தியடையாத மாணவர்களின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு;

(ii) 2010ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை க.பொ.த.(சாதாரண தர) மற்றும் க.பொ.த (உயர் தர) பரீட்சையில் சித்தியடைந்த மற்றும் சித்தியடையாத மாணவர்களின் எண்ணிக்கை வெவ்வெறாக எவ்வளவு;

(iii) 2010ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை பொறியியல் மற்றும் மருத்துவ துறையில் கற்பதற்கு பல்கலைக்கழகங்களுக்கான தகைமைகளைப் பெற்ற மாணவர்களின் எண்ணிக்கை எவ்வளவு;

(iv) சிங்கள மொழிமூல மற்றும் தமிழ் மொழிமூல மாணவர்களுக்கிடையே மேற்காண் பரீட்சைகளில் சித்தியடைந்த மற்றும் சித்தியடையாத மாணவர்களின் எண்ணிக்கை சதவீதமாக எவ்வளவு;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the number of Tamil medium schools in the Ratnapura District;

(ii) separately, the number of primary and secondary schools out of those schools ;

(iii) out of those schools, the number of schools that belongs to the central government;

(iv) the names of those schools; and

(v) the number of students who study in Tamil medium?

(b) Will he also inform this House -

(i) separately, the number of students who passed the year 5 Scholarship Examination and the number of students who failed that examination from 2010 up to now;

(ii) separately, the number of students who passed the GCE (O/L) Examination and the GCE (A/L) Examination and the number of students who failed those examinations from 2010 up to now;

[ගරු ටී. රංජිත් ද සොයිසා මහතා]

(iii) the number of students who qualified to study engineering and medicine in universities from 2010 up to now; and

(iv) the percentage of the students who passed and the percentage of the students who failed the examinations in Sinhala and Tamil medium?

(c) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

(අ) (i) 104කි.

(ii) ප්‍රාථමික පාසල් සංඛ්‍යාව - 42කි.

ද්විතීයික පාසල් සංඛ්‍යාව - 62කි.

(iii) එකකි.

(iv) පෙයිලානි මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලය.

(v) ශිෂ්‍ය සංඛ්‍යාව 53,269කි.

(ආ) (i) ඇමුණුම 01 බලන්න.

(ii) ඇමුණුම 01 බලන්න.

(iii) මේ සඳහා පිළිතුරු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලබාගත යුතු බව විභාග දෙපාර්තමේන්තුවෙන් දන්වා ඇත.

ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නය අහන්න ඕනෑ අපෙන් නොවෙයි. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන් තමයි අහන්න ඕනෑ.

(iv) ඇමුණුම් 02, 03 හා 04 බලන්න. ඇමුණුම් **සභාගත*** කරමි.

(ඇ) අදාළ නොවේ.

**** සභාමේසය මත තබන ලද ඇමුණුම්:***
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :
Annex tabled:

රත්නපුර දිස්ත්‍රික්කය

	2010		2011		2012		2013		2014		2015		2016		2017	
	සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය	සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය	සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය	සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය	සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය	සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය	සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය	සිංහල මාධ්‍යය	දෙමළ මාධ්‍යය
5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටී මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	13486	1409	14170	1589	14342	1588	15398	1776	15221	2024	15256	1944	16050	2125	16626	2079
කඩඉම් ලකුණට ඉහළ ලකුණු ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	1687	48	1802	72	1831	72	2042	77	3177	145	1845	65	2068	75	2035	63
අ.පෙ.ස. (සා.පෙළ) විභාගය සඳහා පෙනී සිටී මුළු ශිෂ්‍ය සංඛ්‍යාව (විෂයයන් 5 හෝ වැඩි)	16686	1097	15389	1162	15096	1134	14066	1137	13659	1190	13880	1388	නව 12733 පැරණි 1194	නව 1267 පැරණි 209	නව 14423 පැරණි 163	නව 1466 පැරණි 39
අ.පෙ.ස. (උ.පෙළ) හැදෑරීම සඳහා සුදුසුකම් ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	9304	441	8665	391	9124	457	8892	499	8913	490	9315	621	නව 9157 පැරණි 671	නව 587 පැරණි 65	නව 10456 පැරණි 92	නව 861 පැරණි 11
අ.පෙ.ස. (උ.පෙළ) විභාගය සඳහා පෙනී සිටී මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	13552	367	13593	380	12420	349	13099	343	13257	370	13378	396	13280	408	13028	384
විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	8831	197	8650	195	8393	180	8105	192	8562	245	8672	217	9158	229	8893	280

ඩී. ඒ. චන්ද්‍රසිරි
විභාග කොමසාරිස් (තාක්ෂණ)
විභාග කොමසාරිස් ජනරාල් වෙනුවට

රත්නපුර දිස්ත්‍රික්කය - 05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය

	2010		2011		2012		2013		2014		2015		2016		2017	
	සිංහල	දෙමළ	සිංහල	දෙමළ	සිංහල	දෙමළ	සිංහල	දෙමළ	සිංහල	දෙමළ	සිංහල	දෙමළ	සිංහල	දෙමළ	සිංහල	දෙමළ
5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටී සංඛ්‍යාව	13,486	1,409	14170	1,589	14,342	1,588	15,398	1,776	15,221	2,024	15,256	1,944	16,050	2,125	16,626	2,079
කඩඉම් ලකුණට ඉහළ ලකුණු ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව1	1,687	48	1,802	72	1,831	72	2,042	77	3,177	145	1,845	65	2,068	75	2,035	63
5 ශ්‍රේණිය සමත් ප්‍රතිශතය (%)	12.6	3.4	12.71	4.5	12.7	4.5	13.26	4.3	20.87	7.1	12.09	3.34	12.88	3.5	12.2	3.03
අසමත් ප්‍රතිශතය (%)	87.4	96.6	87.29	95.5	87.3	95.5	86.74	95.7	79.13	92.9	87.91	96.66	87.12	96.5	87.8	96.97

ඇමුණුම 03

රත්නපුර දිස්ත්‍රික්කය - අ.පොෂ (සා.පෙළ) විභාගය

	2010		2011		2012		2013		2014		2015		2016		2017	
	සිංහල	දෙමළ	සිංහල	දෙමළ	සිංහල	දෙමළ	සිංහල	දෙමළ	සිංහල	දෙමළ	සිංහල	දෙමළ	සිංහල	දෙමළ	සිංහල	දෙමළ
අ.පොෂ (සා.පෙළ) පෙනී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	16,686	1,097	15,389	1,162	15,096	1,134	14,066	1,137	13,659	1,190	13,880	1,388	නව		නව	
													12,733	1,267	14,423	1,466
													පැරණි		පැරණි	
													1,194	209	163	39
අ.පොෂ.(උ.පෙළ සඳහා සුදුසුකම් ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	9,304	441	8,665	391	9,124	457	8,892	499	8,913	490	9,315	621	නව		නව	
													9,157	587	10,456	861
													පැරණි		පැරණි	
													671	65	92	11
අ.පොෂ.(සා.පෙළ) සමත් ප්‍රතිශතය (%)	55.75	40.20	56.30	33.64	60.43	40.29	63.21	43.88	65.25	41.17	67.11	44.74	නව		නව	
													71.91	46.32	72.49	58.73
													පැරණි		පැරණි	
													28.09	53.68	27.51	41.27
අසමත් ප්‍රතිශතය (%)	44.25	59.8	43.70	66.36	39.57	59.71	36.79	56.12	34.75	58.83	32.89	55.26	නව		නව	
													56.19	31.10	56.44	28.20
													පැරණි		පැරණි	
													43.81	68.9	43.56	71.8

ඇමුණුම 04

රත්නපුර දිස්ත්‍රික්කය - අ.පොෂ (උ.පෙළ) විභාගය

	2010		2011		2012		2013		2014		2015		2016		2017	
	සිංහල	දෙමළ	සිංහල	දෙමළ	සිංහල	දෙමළ	සිංහල	දෙමළ	සිංහල	දෙමළ	සිංහල	දෙමළ	සිංහල	දෙමළ	සිංහල	දෙමළ
අ.පොෂ (උ.පෙළ) විභාගය සඳහා පෙනී සිටි සංඛ්‍යාව	13,552	367	13,593	380	12,420	349	13,099	343	13257	370	13,378	396	13,280	408	13,028	384
විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ සංඛ්‍යාව	8,831	197	8,650	195	8,393	180	8,105	192	8,562	245	8,672	217	9,158	229	8,893	280
අ.පොෂ (උ.පෙළ) සමත් ප්‍රතිශතය	65.1	53.67	63.63	51.31	67.57	51.57	61.87	55.97	64.58	66.21	64.82	54.04	68.96	56.12	68.26	72.91
අසමත් ප්‍රතිශතය	34.9	46.33	31.37	48.69	32.43	48.43	38.13	44.03	35.42	33.79	35.18	45.96	31.04	31.74	31.74	27.09

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය විශේෂයෙන්ම අධ්‍යාපන ඇමතිතුමාට මා යොමු කළේ, වතුකර ජනතාව විශාල ප්‍රමාණයක් ජීවත් වන රත්නපුර දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍ය සහ සිංහල මාධ්‍ය පාසල් අතර අධ්‍යාපනයේ විශාල විෂමතාවක් තිබෙන නිසායි. එම විෂමතාව නිසාම 05 ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය, අ.පොෂ.(සාමාන්‍ය පෙළ) විභාගය සහ උසස් පෙළ විභාගය සමත් වන සිංහල සහ දෙමළ ශිෂ්‍යයන් අතර අනුපාතයක් තිබෙනවාද කියලා මා දැනගන්නට අවශ්‍යයි. ඒ වාගේම ගරු අධ්‍යාපන ඇමතිතුමාගේ අවධානයට මේ කාරණයත් යොමු කරවන්න මා කැමැතියි.

ගරු ඇමතිතුමනි, මා දන්නා තරමින් 1948 ඉඳලා 2018 දක්වා රත්නපුර දිස්ත්‍රික්කයෙන් වෛද්‍ය විද්‍යාලවලට, ඉංජිනේරු විද්‍යාලවලට කිසිදු දෙමළ ශිෂ්‍යයෙක් ඇතුළත් වෙලා නැහැ. ඒ නිසාම සිංහල සහ දෙමළ ශිෂ්‍යයන් අතර අධ්‍යාපනයේ විශාල විෂමතාවක් තිබෙනවා. මේ තත්ත්වය අවම කිරීම සඳහා ඔබතුමා අධ්‍යාපන ඇමතිවරයා හැටියට ගන්නා වූ පියවර කුමක්ද යන්න පිළිබඳව සහ කරන යෝජනාව කුමක්ද යන්න පිළිබඳව මා දැනගත යුතුව තිබෙනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, මෙම ප්‍රශ්නය ඇසීම පිළිබඳව මා ඇත්ත වශයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මට උත්තරයක් දෙන්න පුළුවන් වන්නේ ඔබතුමා මේ ප්‍රශ්න අහපු නිසායි. අපේ රාජ්‍ය අමාත්‍යතුමාත් මෙතැන ඉන්නවා.

අපි පසුගිය දවස්වල වතුකරය සඳහා 900කට වඩා වැඩි පිරිසකට ගුරු පත්වීම් ලබා දුන්නා. විශේෂයෙන්ම සුදුසුකම් මත, ගුරු ව්‍යවස්ථාව මත බඳවාගත නොහැකි නිසා, ඔවුන් ගුරු සහායකයන් වශයෙන් බඳවා ගත්තා. ඒ වාගේම ගුරුවරුන් 3,800ක් බඳවා ගන්න දැනට අපි සැලසුම් කර තිබෙනවා. ඒ අනුව ඉදිරි කාලය තුළ වතුකරයේ පාසල් සඳහා ගුරුවරු 3,800ක් බඳවා ගන්නවා. ඒ වාගේම, "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතියට අමතරව ගරු රාජ්‍ය ඇමතිතුමාගේ ඉල්ලීම මත වතුකරය සඳහා වෙනම පාසල් ඉදි කරන්න දැනට රුපියල් මිලියන 250ක මුදලක් වෙන්කර තිබෙනවා. ඊට අමතරව වතුකරයේ තිබෙන පාසල් දියුණු කරන්න ඊයේ පෙරේදා අපි කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. ඇත්ත වශයෙන්ම එම පාසල් තිබෙන ඉඩම්වල ඉඩ මදිකමක් තිබෙනවා; විශාල තේ වතු වගේ දේවල් තිබෙනවා. වතුකරයේ තිබෙන පාසල්වල ඉඩ කඩ මදිකම නිසා අඩුම ගණනේ ඒ සෑම පාසලකටම අක්කර 2ක්වත් තිබිය යුතු ආකාරයෙන් සකස් කිරීම සඳහා ඉඩම් -ආණ්ඩුවේ වතුවලින් වෙන්න පුළුවන්, පෞද්ගලික අංශයේ වතුවලින් වෙන්න පුළුවන්- ලබා ගැනීමට අපි කැබිනට් පත්‍රිකාවක් යොමු කළා. දැන් එම කැබිනට් පත්‍රිකාව අනුමත වෙලා මේ දවස්වල ඒ ක්‍රියාවලියත් සිද්ධ වෙමින් යනවා. එම නිසා "ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ වතුකරයට කවදාවත් නැති විධියට ගුරු පහසුකම්, ඒ වාගේම ප්‍රතිපාදන, ගොඩනැඟිලි, විද්‍යාගාර, වැසිකිළි පහසුකම් වැනි ගොඩක් දේවල් දීලා තිබෙනවා. ඒ විතරක්

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

නොවෙයි, රාජ්‍ය ඇමතිතුමා එම ප්‍රදේශයේ සිටින නිසා ඒ සඳහා එතුමාගේ විශේෂ අවධානය යොමු කර මේ දිනවල විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරමින් තිබෙනවා. පරණ තත්ත්වය නොවෙයි දැන් තිබෙන්නේ.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(*மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா*)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු කථානායකතුමනි, අලුත් තත්ත්වය, පරණ තත්ත්වය නොවෙයි මම ඇහුවේ. 1948 ඉඳලා මේ දක්වා දෙමළ ශිෂ්‍යයන්ට කරන සැලකිල්ල පිළිබඳවයි මට දැනගන්න ඕනෑකම තිබුණේ.

මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු ඇමතිතුමනි, වතුකරයේ දරුවන් සඳහා රුපියල් මිලියන 250ක් වෙන් කළාය කියා ඔබතුමා කිව්වා. ඒ මුළු ලංකාවටමද, රත්නපුර දිස්ත්‍රික්කයට පමණක්ද? ගරු ඇමතිතුමනි, ඉඩම් සම්බන්ධයෙන් වතුකරයේ කිසිම ප්‍රශ්නයක් නැහැ. මොකද, ඒ සෑම පාසලක්ම තිබෙන්නේ වතුයායවල්වලයි. වතුයායවලින් එම පාසල්වලට ඉඩම් අත් පත් කරගන්න පුළුවන්. මොකද, විශාල ඉඩම් ප්‍රමාණයක් තිබෙනවා.

ගරු ඇමතිතුමනි, මගේ ඊළඟ ප්‍රශ්නය හැටියට මම ඔබතුමාට යොමු කරන්නේ මේ කාරණයයි. ගරු ඇමතිතුමනි, මම ඔබතුමා සමඟ විවාදයකට එනවා නොවෙයි. මම යෝජනාවක් ඉදිරිපත් කරන්නේ. දැන් තිබෙන මෙම විෂමතාව ඉවත් කිරීම කළ යුතුයි. දෙමළ මාධ්‍ය පාසල්වල විද්‍යාගාර පහසුකම් ඉතාම අල්පයි. රත්නපුර දිස්ත්‍රික්කයේ එකම දෙමළ දරුවකුටවත් විද්‍යා අංශයෙන් අපොස උසස් පෙළ හැදෑරීම සඳහා රත්නපුර දිස්ත්‍රික්කයේ පාසල් නැහැ. ඒ අයට හැටන් හෝ නුවරඑළිය වැනි ප්‍රදේශවලට යන්න වෙනවා. නුවරඑළිය දිස්ත්‍රික්කය තීරණයක් අරගෙන තිබෙනවා, අධ්‍යාපනය සඳහා එම දිස්ත්‍රික්කයෙන් පිට අය ඇතුළත් කර ගන්නේ නැහැ කියලා. එම නිසා මේ තත්ත්වය වහාම වෙනස් නොකළොත්, රත්නපුර දිස්ත්‍රික්කයේ දෙමළ දරුවකුට කිසිම දවසක වෛද්‍යවරයෙක්, ඉංජිනේරුවරයෙක් වෙන්න හම්බ වෙන්නේ නැහැ. ඒ තත්ත්වය ඇහිරිලා තිබෙනවා. එම නිසා දැනට වෙන් කර තිබෙන රුපියල් මිලියන 250ක මුදල ප්‍රමාණවත් වෙන්නේ නැහැ කියා මම ඔබතුමාට නැවතත් කියනවා.

ඒ නිසා වහාම විද්‍යාගාර පහසුකම් වැනි දේවල් වැඩි කරන ලෙසත්, දෙමළ මාධ්‍ය දරුවන් කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කර, 2019 අය වැයෙන් හෝ ඒ අවශ්‍ය කටයුතු කර විද්‍යා අධ්‍යාපනය ඉහළ නැංවීමට කටයුතු කරන්න කියාත් මා ඉල්ලා සිටිනවා. එසේ කරනවාද කියාත් මම ඔබතුමාගෙන් අහනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(*மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்*)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, ඒකත් එතුමා මට එවපු උඩ පන්දුවක්. අනික, මම උත්තර දෙන්න ඕනෑ වර්තමානයට අනුවයි. ගරු මන්ත්‍රීතුමනි ඔබතුමා කිව්වේ අතීතයේ තිබුණු තත්ත්වයක් ගැනයි. වර්තමානයේ අපි ඒ පහසුකම් දීලා තිබෙනවා. ඒවායේ ප්‍රතිඵල ලැබෙන්න, ළමයින් විශ්වවිද්‍යාලවලට යන්න ටික කාලයක් යාවි. ඊළඟට, මා කලින් සඳහන් කළ රුපියල් මිලියන 250ට අමතරව, ඉන්දියානු රජයේ ආධාර වශයෙනුත් රුපියල් මිලියන 300ක් අපට ලැබී තිබෙනවා. ඒ රුපියල් මිලියන 300න් රත්නපුර දිස්ත්‍රික්කයේ පාසල් 3ක් හදන්න සල්ලි වෙන් කරලා දැන් ඒ වැඩ පිළිවෙළ කරගෙන යනවා. ඔබතුමා මගේ අමාත්‍යාංශයට ආවොත්, නිලධාරීන් සමඟ එකතු වෙලා රාජ්‍ය අමාත්‍යතුමාටත්, මටත් ඒ වැඩ පිළිවෙළ ගැන පැහැදිලි කරන්න පුළුවන්.

ඊළඟට, විද්‍යාගාර පිළිබඳවත් ඔබතුමා ඇහුවා. ඔබතුමා ඒ ගැන ඇසීම පිළිබඳව මා බොහොම සතුටට පත් වෙනවා. මේ රටේ පාසල් 10,000ක් තිබෙනවා. ඒ 10,000 අතර, විද්‍යාගාර පහසුකම් නැති පාසල් 3,000ක් තිබෙනවා. "ළහම පාසල - හොඳම පාසල" ජාතික වැඩසටහන යටතේ අපි ඒ පාසල් තුන්දහසෙන් කොටසක විද්‍යාගාර හැදුවා. අනික් සියල්ලටම අපි ජංගම විද්‍යාගාර දීලා තිබෙනවා. ඔබතුමා ඔය කියන පාසලටත් මාස කිහිපයකට ඉස්සෙල්ලා ජංගම විද්‍යාගාර පහසුකම් ලබා දීලා තිබෙනවා. ඔබතුමා ඒ ගැන පොඩ්ඩක් සොයා බලන්න. මාස කිහිපයකට ඉස්සෙල්ලායි අපි ලබා දුන්නේ. අපි ජංගම විද්‍යාගාර 3,000ක් ලබාදී තිබෙනවා. ඔබතුමා අමාත්‍යාංශයට එන්න. අපට පුළුවන්කම තිබෙනවා, ඒ පිළිබඳව කරුණු පෙන්වා දෙන්න.

ගිරිහඬු සෑය පූජා භූමියට අයත් ඉඩම් : මැනුම් කටයුතු

கிரிஹண்டுசேய புனித ஸ்தலத்துக்குரிய காணிகள்: அளவை செய்தல்

LANDS BELONGING TO GIRIHANDU SEYA SACRED AREA: SURVEYING

406/'18

11. ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(*மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன*)
(The Hon. Anura Sidney Jayarathne)

ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තිරියාය ප්‍රදේශයේ පිහිටි ගිරිහඬු සෑය පූජා භූමියට අයත් ඉඩම් මැන අවසන් කර තිබේද;

(ii) එසේ නම්, මැන හඳුනාගත් භූමිය මත සලකුණු යෙදීම සිදුකර තිබේද;

(iii) මැනීම් මඟින් හඳුනාගෙන ඇති පූජා භූමියට අයත්වන ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iv) අදාළ පිඹුරුපත් බුද්ධශාසන අමාත්‍යාංශයට ලබාදීම ප්‍රමාද වීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ (i) திருகோணமலை மாவட்டத்தில் திரியாய பிரதேசத்தில் அமைந்துள்ள கிரிஹண்டுசேய புனித ஸ்தலத்துக்குரிய காணிகள் நில அளவை செய்யப்பட்டு பூர்த்திசெய்யப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அளவைசெய்யப்பட்டு இனங்காணப் பட்டுள்ள நிலத்தின்மீது அடையாளம் இடப் பட்டுள்ளதா என்பதையும்;

(iii) அளவைசெய்யப்பட்டதன்மூலம் இனங்காணப் பட்டுள்ள புனித ஸ்தலத்திற்குரிய காணியின் அளவு எவ்வளவு என்பதையும்;

(iv) குறிப்பிட்ட வரைப்படங்களை புத்தசாசன அமைச்சுக்கு வழங்குவதில் தாமதம் ஏற்படக் காரணம் என்னவென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Lands and Parliamentary Reforms:

(a) Will he inform this House -

(i) whether surveying the lands that are coming under the Girihandu Seya sacred site in

Thiriyaya of Trincomalee District has been concluded;

(ii) if so, whether survey marks have been placed on the surveyed land;

(iii) the extent of land that is coming under the sacred site; and

(iv) the reasons led for the delay in handing over respective plans to the Ministry of Buddhasasana?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ඔව්.

(iii) හෙක්ටෙයාර 1242.2204 (අක්කර 3069 රූඩ් 2 පර්චස් 15)කි.

(iv) මෙම පිඹුරුපත් සකස් කිරීම කර ඇත්තේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ ඉල්ලීම මත පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත් කිරීම සඳහා වේ. එම භූමිය පූජා භූමියක් ලෙස ප්‍රකාශයට පත් කරන අවස්ථාවේදී මෙම පිඹුරුපත් ලබාදීමට අප විසින් කටයුතු කරනු ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න අහන්න තිබෙනවාද?

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
නැහැ, ගරු කථානායකතුමනි.

පානීය ජල සැපයුම : ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
குடிநீர் வழங்கல்: திருகோணமலை மாவட்டம்
SUPPLY OF DRINKING WATER: TRINCOMALEE DISTRICT

408/'18

12. **ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා**
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 1983 වර්ෂය වනවිට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් පිරිසිදු පානීය ජලය සපයනු ලැබ තිබූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට පිරිසිදු පානීය ජලය සපයනු ලබන නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) 1983 වර්ෂයෙන් පසුව යුද්මය තත්ත්වය නිමවන තුරු පානීය ජලය ලබාදීම වෙනුවෙන් එක් එක් වර්ෂය සඳහා රජය විසින් වෙන් කරන ලද මුළු මුදල කොපමණද;

(iv) යුද්මය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය වනතෙක් පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘති වෙනුවෙන් රජය වෙන් කරන ලද මුළු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1983 ஆம் ஆண்டளவில் திருகோணமலை மாவட்டத்தில் தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபையினால் சுத்திகரிக்கப்பட்ட குடிநீர் வழங்கப்பட்டிருந்த வீடுகளின் எண்ணிக்கை யாது;

(ii) இன்றளவில் சுத்திகரிக்கப்பட்ட குடிநீர் வழங்கப்படுகின்ற வீடுகளின் எண்ணிக்கை யாது;

(iii) 1983 ஆம் ஆண்டின் பின்னர் யுத்த நிலைமை முடிவடையும் வரை குடிநீர் வழங்குவதற்காக ஒவ்வோர் ஆண்டிற்கும் அரசாங்கம் ஒதுக்கிய மொத்தப் பணத்தொகை யாது;

(iv) யுத்த நிலைமை முடிவடைந்த பின்னர் 2015 ஆம் ஆண்டு வரை குடிநீர் வழங்கல் கருத்திட்டங் களுக்காக அரசாங்கம் ஒதுக்கிய மொத்த பணத்தொகை ஆண்டு வாரியாக தனித்தனியாக எவ்வளவு;

(v) மேற்படி அனைத்தினதும் முன்னேற்ற அறிக்கையைச் சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of City Planning and Water Supply:

(a) Will he inform this House -

(i) how many households within the Trincomalee District had been connected to the supply of clean drinking water by the National Water Supply and Drainage Board by 1983;

(ii) how many households are supplied with clean drinking water at present;

(iii) what amount was allocated by the Government in each year for the supply of drinking water until the end of the war situation after 1983;

(iv) what amounts had been allocated by the Government for projects implemented for the supply drinking water, separately in respect of each of the years following the war situation up until the year 2015; and

(v) whether he will table a progress report on all above?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 1983 වර්ෂයේ නිවාස ජල සම්බන්ධන ලබා දී නොතිබුණු අතර, ජල සම්බන්ධන ලබා දීම ආරම්භ කර ඇත්තේ 1984 වර්ෂයේදීය.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(ii) මේ වන විට පිරිසිදු පානීය ජලය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව: 66,359 (2018 මාර්තු මස අවසන් වන විට)

(iii)

කාල සීමාව	ව්‍යාපෘතිය	මූල්‍ය ආධාර	ප්‍රගතිය	වැය වූ මුදල (රු. මිලියන)
1980-1984	ත්‍රිකුණාමලය ජල සම්පාදන ව්‍යාපෘතිය	France	සම්පූර්ණ කර ඇත	520
2005-2013	විසල් ත්‍රිකුණාමලය ජල සම්පාදන ව්‍යාපෘතිය	AFD	සම්පූර්ණ කර ඇත	4,000
2007-2014	මුතූර් ජල සම්පාදන ව්‍යාපෘතිය	ADB	සම්පූර්ණ කර ඇත	3,500

එකතුව: මිලියන 8,020

(iv)

කාල සීමාව	ව්‍යාපෘතිය	මූල්‍ය ආධාර	ප්‍රගතිය	වැය වූ මුදල (රු.මිලියන)
2005-2013	විසල් ත්‍රිකුණාමලය ජල සම්පාදන ව්‍යාපෘතිය	AFD	සම්පූර්ණ කර ඇත	4,000
2007-2014	මුතූර් ජල සම්පාදන ව්‍යාපෘතිය	ADB	සම්පූර්ණ කර ඇත	3,500
2011-2015	ඊච්චලම්පත්තු ජල සම්පාදන ව්‍යාපෘතිය	ADB (Care Project)	සම්පූර්ණ කර ඇත	1,072

එකතුව : මිලියන 8,572

(v)

කාල සීමාව	ව්‍යාපෘතිය	මූල්‍ය ආධාර	ප්‍රගතිය	වැය වූ මුදල (රු. මිලියන)	ආවරණය වන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1980 - 1984	ත්‍රිකුණාමලය ජල සම්පාදන ව්‍යාපෘතිය	France	සම්පූර්ණ කර ඇත	520	කන්තලේ,තඹලගමුව,කින්නියා , නිලාවේලි, එරක්කණ්ඩි, ගුවන් හමුදා ප්‍රදේශය	රාජ්‍ය ආයතන මඟින් ලැබුණු ඉල්ලීම් වලට අනුව
2005 - 2013	විසල් ත්‍රිකුණාමලය ජල සම්පාදන ව්‍යාපෘතිය	AFD	සම්පූර්ණ කර ඇත	4000	කන්තලේ , තඹලගමුව, කින්නියා නගර හා කඩවත් , කුච්චවේලි	330000
2007 - 2014	මුතූර් ජල සම්පාදන ව්‍යාපෘතිය	ADB	සම්පූර්ණ කර ඇත	3500	මුතූර්	10000
2011 - 2015	ඊච්චලම්පත්තු ජල සම්පාදන ව්‍යාපෘතිය	ADB (Care Project)	සම්පූර්ණ කර ඇත	1072	ඊච්චලම්පත්තු	13000
2015 - 2017	බක්මීගම ජල සම්පාදන ව්‍යාපෘතිය (අදියර I , II,හා III (ග්‍රාමීය ජල යෝජනා ක්‍රමය)	CKD	සම්පූර්ණ කර ඇත	16	ගෝමරන්කඩවල කොටස	3000
2013 - 2017	කන්තලේ (අග්බෝපුර) ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර I , හා II, (උපයෝගිතාව)	Small & Medium	ක්‍රියාත්මක වෙමින් පවති	100	කන්තලේ කොටස	1200
2015 සිට මේ දක්වා	සේරු නුවර - නීලපොල ජල සම්පාදන ව්‍යාපෘතිය		ක්‍රියාත්මක වෙමින් පවති	500	සේරුවිල හා මුතූර් කොටස	14000
2016 සිට මේ දක්වා	වාන් ඇල ජල සම්පාදන ව්‍යාපෘතිය (දීර්ඝ කිරීම)	Small & Medium	ක්‍රියාත්මක වෙමින් පවති	808.5	කන්තලේ කොටස හා කින්නියා	3500

(ආ) අදාළ නොවේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, ඊයේ දිනයේදීත් මීට සමාන්තර ප්‍රශ්නයක් මම අසන අවස්ථාවේදී නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් මේ සම්බන්ධව විමසිමක් කළා. 1983ට පෙර ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ එල්ටීටීඊ ත්‍රස්තවාදී යුද්ධය ආරම්භ වීමට කලින් පිරිසිදු පානීය ජල ව්‍යාපෘති කිසිවක් නොතිබුණු බවයි ඔබතුමා දුන් පිළිතුරේ ඇති වාර්තාවේ සටහන් වන්නේ. ඔය සමස්ත වාර්තාව අනුව මේ මොහොත වන විට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ නිශ්චිත ලෙසම පානීය ජලය ලැබී තිබෙන පවුල් සංඛ්‍යාවේ එකතුව ඔබතුමාට කියන්න පුළුවන්ද? ඒ වාගේම, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් තවමත් ආවරණය නොවී තිබෙන පවුල් සංඛ්‍යාව දැක්වෙන වාර්තාවක් ඔබතුමා ළඟ තිබෙන ඔය ලේඛනවල තිබෙනවාද?

තවත් කරුණක් ගරු අමාත්‍යතුමාට මා යොමු කරන්න ඕනෑ. ලංකාවේ වියළි කලාපීය දිස්ත්‍රික්කවල විශාල දුෂ්කරතාවක්, ගැටලුවක් තිබෙනවා. හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේදීත්, ජනාධිපති ලේකම් කාර්යාලය හරහාම පිරිසිදු පානීය ජලය ලබාදීම වෙනුවෙන් ඇත දුෂ්කර දිස්ත්‍රික්කවල තිබෙන පාසල්වල -විශේෂයෙන්ම වියළි කලාපයේ දිස්ත්‍රික්කවල වකුගඩු රෝග ව්‍යාප්ත වන නිසා- ජල පිරිපහදු ඒකක නිර්මාණය කිරීමේ වැඩ පිළිවෙළක් ආරම්භ කළා.

තමුන්නාන්සේලා ඒ කාර්යය කරන්න දැන් නැවත වරක් පියවර අරගෙන තිබෙනවා. මට දැනගන්න ඕනෑ, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ එසේ ආවරණය වුණු ප්‍රදේශවල ඇති පාසල්වල එවැනි පිරිපහදු ඒකක කොයි තරම් සංඛ්‍යාවක් හැදුවාද කියන එකයි. ඒ පිළිබඳ සංඛ්‍යා ලේඛන දත්ත සහිත වාර්තාවකුත් ඔබතුමාට මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ හැකිද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු මන්ත්‍රීතුමනි, සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත් ඔබතුමා දැනට අහපු ප්‍රශ්නයට විතරයි උත්තර තිබෙන්නේ. දැනටත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ කන්තලේ, අග්බෝපුර ජල සම්පාදන ව්‍යාපෘතියේ පළමුවැනි හා දෙවැනි අදියර ක්‍රියාත්මක වෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 100ක මුදලක් වැය කරනවා. කන්තලේ එම කොටසේ ප්‍රතිලාභීන් 1,200ක් ඉන්නවා. ඒ වාගේම සේරු නුවර - නීලපොල ජල සම්පාදන ව්‍යාපෘතියත් දැන් ක්‍රියාත්මක වෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 500ක මුදලක් වැය කරනවා. ඒකෙන් ප්‍රතිලාභීන් 14,000ක් ප්‍රතිලාභ ලබනවා. ඒ වාගේම වාන්ඇල ජල සම්පාදන ව්‍යාපෘතිය දීර්ඝ කිරීමත් දැන් ක්‍රියාත්මක වෙනවා. ඒ සඳහා රුපියල් මිලියන 808.5ක් වෙන් කර තිබෙනවා. ඒකෙන් කන්තලේ හා කින්නියා කොටසේ ප්‍රතිලාභීන් 3,500ක් ප්‍රතිලාභ ලබන්න නියමිතව තිබෙනවා. අනික් ප්‍රශ්න අමාත්‍යතුමාට යොමු කරලා ඒ පිළිතුරු අපි ඔබතුමාට ලැබෙන්න සලස්වන්නම්.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු ඇමතිතුමනි, 1983න් පසුව තවමත් පානීය ජලය නොලැබුණු පවුල් කොපමණ සංඛ්‍යාවක් ඉන්නවාද කියා ඔබතුමාට කියන්න පුළුවන්ද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඒ සංඛ්‍යාව පිළිබඳව ඔබතුමා කලින් අහලා නොතිබුණු නිසා, මේකේ ඒකට උත්තරයක් නැහැ. ඒ ගැන අහලා අපි ඔබතුමාට පිළිතුරක් ලබාදෙන්නම්.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ඔබතුමා හිතලා උත්තරයක් දෙන්න, බලන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

හිතලා කියන්න බැහැ නේ. අහලා කියන්නම්. මම ඒ ප්‍රශ්නය යොමු කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 13 -422/'18- (1), ගරු ඉෂාක් රහුමාන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 14 -438/'18- (1), ගරු ජයන්ත සමරවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 15 -472/'18- (1), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය (පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama - State Minister of Provincial Councils and Local Government and Sports)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවා ඇති දීර්ඝ කාලයක් නිස්සේ මම මේ ප්‍රශ්නය යොමු කළ බව. ඇත්තටම මේ ප්‍රශ්නය කෙරෙහි ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කළ යුතු වනවා. මොකද, මෙය විශේෂ විමර්ශන වාර්තාවක්. මේ වාර්තාව විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් සෑම කෙනෙකුටම ඉදිරිපත් කර තිබෙනවා. එය මා ළඟත් තිබෙනවා. මම කියන්නේ, විශේෂ විමර්ශන වාර්තාව කියවන්න කියලා විතරයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය අමාත්‍යතුමියනි, පුළුවන් තරම් ඉක්මනින් එය ලබා දෙන්න. අපි ප්‍රශ්නයකට තුන් වතාවකට වඩා කල් ගන්න දෙන්නේ නැහැ.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු කථානායකතුමනි, ඒ සඳහා කාලයක් ලබා දෙන්න. ප්‍රශ්නයට පිළිතුර ලැබිලා නැති නිසා උත්තර ලබාදෙන්න විධියක් නැහැ.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
උත්තර ලබාදෙන්න නොහැකි හේතුව කියන්න, ගරු රාජ්‍ය අමාත්‍යතුමියනි. ඔබතුමිය ඊයේ කිව්වා, ජනාධිපතිවරයාට වඩා ඉහළ බලයක් තිබෙන මහ ඇමතිවරයෙක් තමයි ඉන්නේ කියලා. මේක ඇත්තටම ෆයිල්ගත වුණු එකක් වෙන්න ඇති.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අපි නව රාජ්‍ය අමාත්‍යතුමියට අවස්ථාවක් ලබාදෙමු.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ෆයිල්ගත වුණු නිසා තමයි කියන්න බැරි වෙන්නේ. මොකද, මේක විශාල හොරකමක්.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු මන්ත්‍රීතුමනි, මට තොරතුරු ලැබී තිබෙනවා නම් විතරයි උත්තර දෙන්න පුළුවන් වන්නේ. මට මේ වෙනකොට උත්තර ලැබී නැහැ. ඒ සඳහා කාලය ලබා දෙන්න. අපි උත්තර ලබා දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟ අවස්ථාවේදී පිළිතුරු ඉදිරිපත් කරන්න, ගරු රාජ්‍ය ඇමතිතුමියනි.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
හොඳයි, ගරු කථානායකතුමනි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ, "මෙම සභාවට එම වාර්තාව ඉදිරිපත් කරන්නේ ද?" කියලයි. අමාත්‍යාංශයක නිලධාරීන් ඉන්නවා. රාජ්‍ය ඇමතිතුමිය විධියට ඔබතුමිය ඉන්නවා. විෂය භාර ඇමතිවරයෙක් ඉන්නවා. ආයතන ගොඩක් තිබෙනවා. අවුරුදු ගණනාවක් ගිහිල්ලත් පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කරන්න බැරි නම්, ඒ අමාත්‍ය ධුරයෙන් ඇති වැඩේ මොකක්ද? ඉල්ලා තිබෙන්නේ වාර්තාවක් විතරයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමිය ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු කථානායකතුමනි, එම වාර්තාව ඉදිරි කාලයේදී සභාවට ඉදිරිපත් කරන්න මම කටයුතු කරන්නම්.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ඔබතුමා විශේෂ විමර්ශනයක් යවනවා. විශේෂ විමර්ශන වාර්තාව ඔබතුමාටත් ලැබිලා ඇති. මන්ත්‍රීවරයෙක් හැටියට ඒ වාර්තාව මටත් ලැබිලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ කමිටුවට ලැබිලා ඇති. ගරු රාජ්‍ය ඇමතිතුමිය පොරොන්දු වුණා නේ, ලබන වාරයේදී ඒ වාර්තාව ගරු සභාවට ඉදිරිපත් කරන්නම් කියලා.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු කථානායකතුමනි, එම වාර්තාව ඉදිරිපත් කරන්න මම කාලය ඉල්ලා සිටියා. තව එක වරක් අපට අවස්ථාව ලබා දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි, අපි ඒ අවස්ථාව රාජ්‍ය අමාත්‍යතුමියට ලබා දෙමු.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දෙවන වටය.

ප්‍රශ්න අංක 3 - 36/'18 - (1), ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා ඉන්න නිසා මම ඒ ප්‍රශ්නය අසනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා පිළිතුර සභාගත කරනවා ද?

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ඇමතිතුමා ඒ ප්‍රශ්නයට පිළිතුරක් දුන්නොත් හොඳයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් දෙවන වටයේදී පිළිතුර දෙන්නේ නැහැ. ගරු ඇමතිතුමාට ඒ පිළිතුර සභාගත කරන්න පුළුවන්.

කුරුඳු පර්යේෂණ සඳහා වෙන් කළ මුදල : වැය විස්තරය

කறுவா ஆராய்ச்சிகளுக்கு ஒதுக்கப்பட்ட நிதி: செலவின விபரம்

MONEY ALLOCATED FOR RESEARCH ON CINNAMON: EXPENDITURE RECORD

36/'18

3. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2016 අය වැයෙහි අංක 169 යෝජනාවට අනුව, කුරුඳු හා ඒ ආශ්‍රිත පර්යේෂණ සඳහා වෙන් කරන ලද රුපියල් මිලියන 5ක ප්‍රතිපාදනය වැය කළ ආකාරය පිළිබඳ වැය විස්තරයක් ඉදිරිපත් කරන්නේද;

(ii) උක්ත අය වැය යෝජනාවට අනුව, 2016 වර්ෂය තුළදී රාජ්‍ය මූල්‍ය ප්‍රතිපාදන භාවිත කර සිදු කරන ලද පර්යේෂණ සංඛ්‍යාව, එම පර්යේෂණ සිදු කළ පර්යේෂකයන්ගේ නම් සහ ඒවායේ කාර්ය සාධන වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) කුළුබඩු (ගම්මිරිස්, කරාබු නැටි සහ සාදික්කා) අපනයන සඳහා වූ සෙස් බදු ඉවත් කිරීම හේතුවෙන් 2016 වර්ෂයේදී සෙස් බදු ආදායම් අහිමිවීමේ ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சமூக நலன்புரி மற்றும் ஆரம்பக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016 வரவு செலவு திட்டத்தின் 169ஆம் இலக்க முன்மொழிவின் பிரகாரம், கறுவா மற்றும் அது சார்ந்த ஆராய்ச்சிகளுக்கு ஒதுக்கப்பட்ட ரூபா 5 மில்லியன் நிதி ஏற்பாடு செலவிடப்பட்ட விதம் பற்றிய செலவின விபரமொன்றை சமர்ப்பிப் பாரா என்பதையும்;

(ii) மேற்படி வரவு செலவுத்திட்ட முன்மொழிவின் பிரகாரம், 2016ஆம் ஆண்டில் அரசாங்க நிதி ஏற்பாட்டை பயன்படுத்தி மேற்கொள்ளப்பட்ட ஆராய்ச்சிகளின் எண்ணிக்கை, மேற்படி ஆராய்ச்சிகளை மேற்கொண்ட ஆராய்ச்சியாளர் களின் பெயர்கள் மற்றும் இவற்றின் பெறுபேறுகள் பற்றிய அறிக்கையைச் சமர்ப்பிப்பாரா என்பதையும்;

(iii) வாசனைத் திரவியங்கள் (மிளகு, கராம்பு மற்றும் சாதிக்காய்) ஏற்றுமதிக்கான செஸ் வரி நீக்கப் பட்டமையால் 2016ஆம் ஆண்டில் ஏற்பட்ட செஸ் வரி வருமான இழப்பின் அளவு எவ்வள வென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Social Welfare and Primary Industries:

(a) Will he inform this House-

(i) in terms of the Proposal No. 169 of the Budget 2016, whether an expenditure record will be submitted regarding the manner in which Rs. 5 million allocated for the researches on cinnamon and related researches, was spent;

(ii) the number of researches performed with State financial allocations in 2016, of the names of the researchers who conducted aforesaid researches and a performance report on the output; and

(iii) the amount of loss incurred in cess tax revenue in 2016, by reason of the cess tax removal on spice (Pepper, Clove and Nutmeg) exports?

(b) If not, why?

ගරු දයා ගමගේ මහතා (සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு தயா கமகே - சமூக நலன்புரி மற்றும் ஆரம்பக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Daya Gamage - Minister of Social Welfare and Primary Industries)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කුරුඳු හා ඒ ආශ්‍රිත පර්යේෂණ සිදු කිරීම ජාතික විද්‍යා පදනම සමඟ ඒකාබද්ධව වැඩසටහනක් ලෙස කරගෙන යනු ලබයි. ඒ අනුව පර්යේෂණ 5ක් සඳහා පළමු වසරට රුපියල් මිලියන 44ක් ද, දෙවන වසරට රුපියල් මිලියන 58.8ක් ද, තුන්වන වසර සඳහා රුපියල් මිලියන 24.8ක් වශයෙන් රුපියල් මිලියන 127.6ක් වැය වෙතැයි ඇස්තමේන්තුගත කර ඇත. ඒ අනුව රුපියල් මිලියන 40ක් සහ රුපියල් මිලියන 35ක් පිළිවෙළින් 2016 සහ 2017 වසරවලදී ප්‍රතිපාදන නිදහස් කර ඇත.

[ගරු දයා ගමගේ මහතා]

(ii) ඉදිරිපත් කරමි.

අනු අංකය	ව්‍යාපෘතියේ නම	පර්යේෂකයා ගේ නම සහ ආයතනය	වර්තමාන ප්‍රගතිය	මූල්‍ය ප්‍රතිපාදන වෙන් කිරීම් (රු.)	ලබා දුන් ප්‍රතිපාදන (රු.)
1.	ශ්‍රී ලංකාවේ කුරුඳු වගා දර්ශ හා කුරුඳු වල් දර්ශයන්හි ජාන අනුක ව්‍යූහය සහ ජෛව රසායනික ලක්ෂණ පරිසර සාධක අනුව වෙනස් වීම.	පේරාදෙණිය විශ්වවිද්‍යාලය	ශ්‍රී ලංකාවේ දැනට ඇති කුරුඳු වගා දර්ශනයන් ජාන ඇගයීම් කර ගොවීන් සතුව ඇති දර්ශ හඳුනා ගැනීමට කටයුතු යොදා ඇත. නව ප්‍රභේදවල විශ්ලේෂණ කටයුතු ආරම්භ කර ඇත.	44,251,073.60	16,233,851.30
2.	ශ්‍රී ලංකාවේ කුරුඳුවල ඇති ඖෂධීය විභවය සහ එමඟින් කළ හැකි ඖෂධීය නිෂ්පාදන පිළිබඳ අධ්‍යයනය.	ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	විවිධ දේශගුණික කලාපවලින් තෝරා ගත් කුරුඳු ප්‍රභේදයන්ගේ නිස්සාරණ කටයුතු ආරම්භ කර ඇත. රසායනික අත්හදා බැලීම් ආරම්භ කර ඇත.	27,755,294.00	8,223,986.96
3.	ශ්‍රී ලංකාවේ කුරුඳු නිස්සාරකවල ජෛව රසායන ඇගයීම හා එමඟින් දියවැඩියා රෝගය (Type two Diabetes) සඳහා පෝෂ්‍ය ප්‍රතිකාරකයන් (Nutraceuticals) නිෂ්පාදනය.	කැලණිය විශ්වවිද්‍යාලය	විවිධ කෘෂි දේශගුණික කලාපවල වැඩෙන කුරුඳු නියැදිවල සුගන්ධ තෙල් නිස්සාරණ ක්‍රම හා ඒවායේ දියවැඩියාව නැති කිරීමේ ගුණය සඳහා පර්යේෂණ ආරම්භ කර ඇත.	9,818,000.00	3,911,558.62
4.	ශ්‍රී ලංකා කුරුඳුවල ජෛව රසායන පැනිකඩ, ජෛව සක්‍රිය කාරක හා එහි ඖෂධීය ගුණ අධ්‍යයනය.	රුහුණ විශ්වවිද්‍යාලය	පැලොල්පිටිය කුරුඳු මධ්‍යස්ථානයේ ඇති නියැදිවල ආදර්ශක එකතු කර ඒවායේ රසායනික අත්හදා බැලීම් හා අගය එකතු කිරීම් පිළිබඳ මූලික අධ්‍යයන කටයුතු ආරම්භ කර ඇත.	15,890,000.00	6,776,683.03
5.	ශ්‍රී ලංකා කුරුඳුවල අගයදාම සංවර්ධනය, අගයදාම කාරකයන්ගේ ලෝක වෙළෙඳ පොළේ ඇති ඉඩකඩ.	සබරගමුව විශ්වවිද්‍යාලය	පාර්ශ්වකරුවන් හා සාකච්ඡා අවසන් කර පවත්නා කුරුඳු වගාවන් සිතියම් ගත කර ඇත. අගයදාම ඉහළ නැංවීමේ අවස්ථා අභ්‍යන්තර හා බාහිර බලපෑම් කුරුඳු ආශ්‍රිත සංචාරක ක්ෂේත්‍ර ගැන විශ්ලේෂණය කර ඇත.	29,916,800.00	8,300,183.40
				127,631,167.60	43,446,263.31

(iii) සෙස් බදු ආදායම් අතිමිවීමේ ප්‍රමාණය රුපියල් මිලියන 51.2කි.

(ආ) අදාළ නොවේ.

2015 වර්ෂයේදී වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ සිසුන්: වයඹ පළාත

2015 இல் மருத்துவ பீடத்திற்குத் தகைமை பெற்றுள்ள மாணவர்கள்: வட மேல் மாகாணம்

STUDENTS QUALIFIED FOR MEDICAL FACULTIES IN 2015: NORTH-WESTERN PROVINCE

157/'18

5. ගරු නිහාල් ගලප්පත්ති මහතා (ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා වෙනුවට)

(மாண்புமிகு நிஹால் கலப்பத்தி - மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ சார்பாக)

(The Hon. Nihal Galappaththi on behalf of the Hon. (Dr.) Nalinda Jayathissa)

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේදී අපොස (උසස් පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාවෙන් පුත්තලම සහ කුරුණෑගල දිස්ත්‍රික්කවලින් පෙනී සිටි ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iii) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනගත් පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

உயர்கல்வி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015இல் க.பொ.த. (உயர்தர) பரீட்சைக்கு உயிரியல் பாடத்துறையில் புத்தளம் மற்றும் குருணாகல் மாவட்டங்களிலிருந்து தோற்றிய மாணவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி எண்ணிக்கையில், பல்கலைக்கழக அனுமதிக்கான தகைமையைப் பெற்றுள்ள மாணவர்களின் எண்ணிக்கையும் சதவீதமும் எவ்வளவென்பதையும்;

(iii) மருத்துவ பீடத்திற்கான தகைமையைப் பெற்றுள்ள மாணவர்களின் எண்ணிக்கையும் சதவீதமும் எவ்வளவென்பதையும்;

(iv) மருத்துவ பீடத்திற்கான தகைமையைப் பெற்றுள்ள மாணவன் அல்லது மாணவியின் ஆகக்குறைந்த பெறுபேறு, Z பெறுமதி, கல்வி கற்ற பாடசாலை மற்றும் தெரிவுசெய்யப்பட்ட மருத்துவ பீடம் யாதென்பதையும்;

ஒவ்வொரு மாவட்டத்தின்படி தனித்தனியாக அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education & Cultural Affairs:

(a) Will he inform this House in respect of each district separately-

(i) the number of students who sat for the GCE (Advanced Level) examination in the Biology stream in 2015 from Puttalam and Kurunegala districts;

(ii) the number and the percentage of the students who were qualified for university entrance;

(iii) the number and the percentage of the students qualified for medical faculties; and

(iv) the minimum result of the students who were qualified for the Medical Faculty, Z-score, the school in which each student studied and the Medical Faculty to which they got selected?

(b) If not, why?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - (Minister of Higher Education and Cultural Affairs)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ජීව විද්‍යා විෂය ධාරාවෙන් 2015 වර්ෂයේ පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව,

- පුත්තලම දිස්ත්‍රික්කය - 1,192
- කුරුණෑගල දිස්ත්‍රික්කය - 4,280

(ii) විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව,

- පුත්තලම දිස්ත්‍රික්කය - 640
- කුරුණෑගල දිස්ත්‍රික්කය - 2,065

එම සංඛ්‍යාව අපොස (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස,

- පුත්තලම දිස්ත්‍රික්කය - 53.69%
- කුරුණෑගල දිස්ත්‍රික්කය - 48.25%

(iii) වෛද්‍ය පීඨ සඳහා තෝරා ගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව,

- පුත්තලම දිස්ත්‍රික්කය - 42
- කුරුණෑගල දිස්ත්‍රික්කය - 82

එම සංඛ්‍යාව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස

- පුත්තලම දිස්ත්‍රික්කය - 6.56%
- කුරුණෑගල දිස්ත්‍රික්කය - 3.97%

(iv) එක් එක් දිස්ත්‍රික්කය අනුව වෛද්‍ය පීඨ සඳහා අවම සුදුසුකම් ලත් සිසුන්ගේ තොරතුරු

විභාග අංකය	නම	දිස්ත්‍රික්කය	පාසල	විෂය හා සාමාර්ථය		Z අගය	තෝරා ගනු ලැබූ වෛද්‍ය
5826217	ඒ.එච්.එන්. සමිලතා	පුත්තලම	පෞද්ගලික අයදුම්කරුවෙකු ලෙස විභාගයට ඉදිරිපත්ව ඇත.	භෞතික විද්‍යාව	B	1.7419	යාපනය විශ්ව විද්‍යාලය
				රසායන විද්‍යාව	A		
				ජීව විද්‍යාව	B		
5726026	එම්.ආර්.එම්. ලුතුෆි	කුරුණෑගල	කුලි/ කැකුණගොල්ල මුස්ලිම් ම.ම. විද්‍යාලය	භෞතික විද්‍යාව	B	1.9068	රජරට විශ්ව විද්‍යාලය
				රසායන විද්‍යාව	A		
				ජීව විද්‍යාව	B		

(ආ) පැන නොනඟී.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ප්‍රශ්න අංක 6 - 192/'18 - (1), ගරු ඉම්රාන් මහරූෆ් මහතා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, ගරු ඉම්රාන් මහරූෆ් මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 7 - 194/'18 - (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු කථානායකතුමනි, උදය ප්‍රභාත් ගම්මන්පිල මැතිතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මෙම ප්‍රශ්නය රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යාංශයෙන් තමයි අහලා තිබෙන්නේ. එය අදාළ වන්නේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට බවත් දැනුම් දී තිබෙනවා. ඒ නිසා නැවත එම ප්‍රශ්නය අදාළ අමාත්‍යාංශයට යොමු කරන ලෙස දන්වා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒක අදාළ අමාත්‍යාංශයට යොමු කරන්න කියලා ගරු මන්ත්‍රීතුමාව දැනුවත් කරන්න.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 13 - 422/'18 - (1), ගරු ඉෂාක් රහුමාන් මහතා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

ගරු කථානායකතුමනි, ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

පුහුණු හා නුපුහුණු විදේශගත ශ්‍රමිකයන්: විස්තර
வெளிநாடுகளில் பணிபுரியும் பயிற்றுவிக்கப் பட்ட ,பயிற்றுவிக்கப்படாத ஊழியர்: விபரம்
SKILLED AND UNSKILLED MIGRANT WORKERS: DETAILS

438/'18

14.ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා (ගරු ජයන්ත සමරවීර මහතා වෙනුවට)
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர - மாண்புமிகு ஜயந்த சமரவீர சார்பாக)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera on behalf of the Hon. Jayantha Samaraweera)

විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2017.03.31 දිනට විදේශයන්හි සේවයේ නියුතුව සිටින ශ්‍රී ලාංකික පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයන් සංඛ්‍යාව, ඔවුන් සේවයේ යෙදී සිටින රට අනුව, රැකියා වර්ගීකරණය අනුව සහ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය අනුව;

(ii) එම පුහුණු හා නුපුහුණු ශ්‍රමිකයන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව සහ සිංහල, දෙමළ, මුස්ලිම් හා වෙනත් ජාතීන්ට අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

தொலைத்தொடர்புகள், டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் வெளிநாட்டுத் தொழில்வாய்ப்புக்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2017.03.31ஆம் திகதி உள்ளவாறு, வெளிநாடுகளில் பணிபுரிகின்ற இலங்கையைச் சேர்ந்த பயிற்றுவிக்கப்பட்ட மற்றும் பயிற்றுவிக்கப் படாத ஊழியர்களின் எண்ணிக்கை, இவர்கள் பணிபுரிகின்ற நாட்டுக்கமைய, தொழில் வகைப் படுத்தல்களுக்கமைய, மற்றும் ஆண் பெண் பால் நிலைக்கமைய வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(ii) மேற்படி பயிற்றுவிக்கப்பட்ட மற்றும் பயிற்றுவிக் கப்படாத ஊழியர்களின் எண்ணிக்கை, ஒவ்வொரு மாவட்டத்துக்கமையவும் சிங்கள, தமிழ், முஸ்லிம் மற்றும் இதர இனங்களுக் கமையவும் வெவ்வேறாக எவ்வளவென் பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Telecommunication, Digital Infrastructure and Foreign Employment:

(a) Will he inform this House -

(i) the number of trained and untrained Sri Lankans employed abroad as at 31.03.2017 on the basis of their country of employment, gender and on the classification of professions separately; and

(ii) the number of those trained and untrained employees in relation to each district and ethnicities such as Sinhala, Tamil, Muslim and others separately?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2010.01.01 දින සිට 2017.12.31 දක්වා කාලය තුළ විදේශ රැකියා සඳහා පිටත්වීම පිණිස ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියා පදිංචි වූ පුද්ගලයන් පිළිබඳ සංඛ්‍යා ලේඛන එක් එක් වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් සැකසූ වාර්තාවක් **ඇමුණුම 01*** යටතේ ඉදිරිපත් කර ඇත.

මීට අමතරව ඉහත කාලසීමාව සඳහා විදේශ රැකියා සඳහා පිටත් වූ පුද්ගලයන්ගේ සංඛ්‍යා ලේඛන, ඔවුන් සේවයේ නියුතු රට අනුව, රැකියා වර්ගීකරණය අනුව සහ ස්ත්‍රී/පුරුෂ සමාජභාවය අනුව සකස් කළ සංක්ෂිප්ත වාර්තාවක් **ඇමුණුම 02*** යටතේ ඉදිරිපත් කර ඇත.

2017.03.31 වන දිනට එක් එක් රට අනුව, විදේශයන්හි සේවයේ නියුතුව සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් පිළිබඳ සංඛ්‍යා ලේඛන ශ්‍රී ලංකා තානාපති කාර්යාල මාර්ගයෙන් ලබා ගෙන ඇති අතර, එම සංඛ්‍යා ලේඛන අනුව 649,440ක සංඛ්‍යාවක් විදේශයන්හි දැනට සේවයේ නියුතුව සිටියි. අදාළ ලේඛනය **ඇමුණුම 03*** යටතේ ඉදිරිපත් කර ඇත.

මෙම සංඛ්‍යා එක් එක් රටවලට නිකුත් කර ඇති දැනට වලංගු රැකියා වීසා බලපත්‍ර ප්‍රමාණය අනුව ගණනය කර ඇත.

(තොරතුරු ලබා ගැනීම - අදාළ රටෙහි තානාපති කාර්යාලය විසින් එම රටේ විදේශ කටයුතු අමාත්‍යාංශය මාර්ගයෙන් ලබා ගන්නා ලදී.)

(ii) 2010.01.11 දින සිට 2017.12.31 දක්වා කාලය තුළ විදේශ රැකියා සඳහා පිටත්වීම පිණිස ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියා පදිංචි වූ පුද්ගලයන්ගේ රැකියා වර්ගීකරණය අනුව පුහුණු සහ නුපුහුණු ශ්‍රමිකයන් පිළිබඳ සංඛ්‍යා ලේඛන ඔවුන් පදිංචි දිස්ත්‍රික්කය අනුව, එක් එක් වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් සැකසූ වාර්තාවක් **ඇමුණුම 04*** වශයෙන් ඉදිරිපත් කර ඇත.

මීට අමතරව ඉහත කාල සීමාව සඳහා සංක්ෂිප්ත වාර්තාවක් **ඇමුණුම 05*** යටතේ ඉදිරිපත් කර ඇත.

විදේශගත වන ශ්‍රමිකයින් කාර්යාංශයේ ලියා පදිංචි කරනුයේ ශ්‍රී ලාංකිකයින් වශයෙන් වන බැවින් එම වාර්තා ජන වර්ගය අනුව ලබා දිය නොහැකිය.

(ආ) පැන නොනඟී.

**** ප්‍රස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේ කටයුතු අවසන් කරලා මම ඔබතුමාට අවස්ථාව දෙන්නම්. සියලු දෙනාටම මම අවස්ථාව දෙන්නම්.

මීළඟට, ස්ථාවර නියෝග 27 (2) යටතේ ප්‍රශ්න. ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

I

උන්නිච්චයි වැවේ වාන් දොරටු විවෘත කිරීම නිසා පීඩාවට පත් ගොවීන්ට වන්දි ලබාදීම
உன்னிச்சைக் குளத்தின் வான்கதவுகள் திறக்கப்பட்டதனால் பாதிக்கப்பட்ட விவசாயிகளுக்கான நட்டஈடு
COMPENSATION TO FARMERS AFFECTED BY OPENING OF SLUICE GATES OF UNNICHCHAI TANK

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ சபாநாயகர் அவர்களே, நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சர் கௌரவ துமிந்த திசாநாயக்க அவர்களிடம் இந்தக் கேள்வியைக் கேட்பதற்கு அனுமதித்ததற்கு நன்றி!

மட்டக்களப்பு மாவட்டத்தில் அமைந்துள்ள உன்னிச்சைக் குளத்தின் அதிக நீர் காரணமாக அதன் வான் கதவுகள் கடந்த மாதம் 25ஆம் திகதி அதிகாலை திறந்துவிடப்பட்டதனால் இந்தப் போகத்தில் விவசாயச் செய்கையில் ஈடுபட்டிருந்த சுமார் 800 விவசாயிகள் பாதிக்கப்பட்டுள்ளனர் என்றும், இதன் காரணமாக சுமார் 6,000 ஏக்கர் நெற்செய்கை பாதிக்கப் பட்டுள்ளதால் சுமார் 10 கோடி ரூபாய் வரையில் நட்டமேற் பட்டுள்ளதாகவும் அப்பகுதி விவசாய மக்கள் தெரிவிக் கின்றனர்.

மேற்படி குளத்தின் நீர் மட்ட அதிகரிப்புத் தொடர்பில் கடந்த மாதம் 19, 20, 21ஆம் திகதிகளில் பொறுப்பு வாய்ந்தவர்களால் நீர்ப்பாசனத் திட்ட அதிகாரிகளிடம் எடுத்துக் கூறப்பட்டுள்ளபோதிலும், அவ்வதிகாரிகள் அதனை அவதானத்தில் கொள்ளாமல், 23ஆம் திகதி மேற்படி குளத்தின் ஆபத்தான நிலை உணர்த்தப்பட்ட நிலையில், 24ஆம் திகதி ஆறு அங்குல நீர் திறந்துவிடப்படுமென நீர்ப்பாசனத் திணைக்கள அதிகாரிகளினால் கூறப்பட்டது. ஆனால், 25ஆம் திகதி அதிகாலை 15 கன அடி நீர் திறந்துவிடப்பட்டதால்தான் மேற்படி பாதிப்பு ஏற்பட்டுள்ளதாகவும், மேற்படி வான் கதவுகள் திறக்கப்பட்டதன் பின்னர் அப்பகுதியில் நீர்ப்பாசன அதிகாரிகள் எவருமே இருக்கவில்லையென்றும், இந்தச் செயற்பாடானது அதிகாரிகளின் அசமந்தப் போக்குக் காரணமாக ஏற்பட்டுள்ளதாகவும் கூறப்படுகின்றது.

மேற்படி குளத்தில் நீர் மட்டம் உயருகின்றபோது அதன் நீரை வெளியேற்றுவதற்கு உரிய வடிச்சல் ஆறு இல்லாததன் காரணமாகவே இத்தகைய நிலைமை ஏற்படுவதாக அதிகாரிகள் தரப்பில் ஒரு முறைப்பாடு முன்வைக்கப் பட்டிருக்கின்றது.

எனவே, மேற்படி நிலைமையினை ஆராய்ந்து, எனது பின்வரும் கேள்விகளுக்கான பதில்களையும் எடுக்கப்படக் கூடிய நடவடிக்கைகள் தொடர்பான விளக்கங்களையும் கௌரவ அமைச்சர் துமிந்த திசாநாயக்க அவர்களிடமிருந்து எதிர்பார்க்கின்றேன்.

- **மேற்படி குளத்தின் வான்கதவுகள் திறக்கப்பட்டதால், குளம் உடைப்பெடுக்காமல், ஏற்படவிருந்த பாரிய ஆபத்து நிலை தவிர்க்கப்பட்டுள்ளது. எனினும், இதன் காரணமாகப் பாதிக்கப்பட்டுள்ள விவசாய மக்களுக்கு ஏற்பட்டுள்ள இழப்பினை ஈடுசெய்யும் வகையில் நட்ட ஈடுகளை வழங்க முடியுமா?**

- **மேற்படி வான்கதவுகள் திறக்கப்பட்டதன் காரணமாக ஏற்பட்டுள்ள விவசாய மக்களின் பாதிப்புகளுக்கு நீர்ப்பாசனத் திணைக்களத்தின் அதிகாரிகளது கவன யீனங்கள் காரணமாக இருப்பின், அவர்கள் தொடர்பில் உரிய நடவடிக்கைகள் மேற்கொள்ளப்படுமா?**

- **மேற்படி குளத்தில் உயர்வடையும் நீரைப் பாதுகாப்பான முறையில் வெளியேற்ற ஏதுவாக வடிச்சல் ஆற்றை அமைப்பதற்கு ஏதேனும் நடவடிக்கை எடுக்கப்படுமா?**

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
மெயட பிළිතුරු ලබාදීම සඳහා වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා සතියක කාලයක් ඉල්ලා තිබෙනවා.

II

ලංකා විදුලිබල මණ්ඩලයේ වෘත්තීය සමිති නායකයන් හයදෙනෙකුගේ සේවය අත්හිටුවීම
இலங்கை மின்சார சபைத் தொழிற்சங்கத் தலைவர்கள் அறுவரின் சேவை இடைநிறுத்தம்
SUSPENSION OF SIX TRADE UNION LEADERS OF CEYLON ELECTRICITY BOARD

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මෙම ප්‍රකාශය කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ලංකා විදුලිබල මණ්ඩලයේ සේවක සේවිකාවන් දසදහසකට වැඩි සංඛ්‍යාවක් නියෝජනය කරන වෘත්තීය සමිති නායකයන් හයදෙනෙකුගේ සේවය අත්හිටුවීම හේතුවෙන් මතුවී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම ගරු සභාවේ අවධානය යොමු කරමි.

ලංකා විදුලිබල මණ්ඩලයේ වෘත්තීය සමිති නායකයින් හයදෙනෙකුගේ වැඩ තහනම් කර මේ වන විට මාස හතරකට ආසන්න කාලයක් ගතවී තිබෙනවා. එහෙත් විනය පරීක්ෂණ අවසන් නොමැති බව පවසමින් ඔවුන් නැවත සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා කම්කරු කොමසාරිස්වරයා විසින් කරන ලද නියෝගය නොතකා හරිමින් පළිගැනීමේ අරමුණින් යුතුව

[ගරු අනුර දිසානායක මහතා]

පාලනාධිකාරිය අත්තනෝමතික ලෙස කටයුතු කරමින් සිටින බවට වෘත්තීය සමිති චෝදනා කරනවා. වෘත්තීය සමිති කාර්යාලවලට ඇතුල්වීම තහනම් කිරීම හේතුවෙන් මෙම නායකයින් විසින් නායකත්වය දෙනු ලබන වෘත්තීය සමිති කටයුතු අඩපණ කිරීමේ පාලකයින්ගේ වුවමනාව ප්‍රකාශයට පත්වී තිබෙන බව පැහැදිලියි.

විශේෂයෙන් මේ වැඩ තහනම් කිරීම සිදු වන්නේ හුදෙකලා සිදුවීමක් හේතුවෙන් නොවෙයි. 2015 ජනාධිපතිවරණය අභිමුව 2014 නොවැම්බර් මාසයේ නීති විරෝධී මැතිවරණ අල්ලසක් ලෙස පාලනයට සම්බන්ධ කණ්ඩායමක් විසින් සිදු කර ගන්නා ලද වැටුප් වැඩි කර ගැනීමක් මෙම වෘත්තීය සමිති නායකයින් විසින් හෙළිදරව් කර ගනු ලැබ තිබුණා. එමඟින් විදුලිබල මණ්ඩලයේ ඉහළ, පහළ සේවකයින් අතර බරපතළ වැටුප් විෂමතාවක්, භේදයක් නිර්මාණය වුණා. එසේම වැටුප් කොමිසමේ, මහා භාණ්ඩාගාරයේ සහ කැබිනට් මණ්ඩලයේ අනුමැතිය නොමැති මෙම වංචනික ක්‍රියාවට අදාළව නීතිමය පියවර ගන්නා ලෙස ඔවුන් විසින් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කරනු ලැබුවා.

2015 ජනවාරි මාසයේ බලයට පැමිණි ආණ්ඩුවේද, ඉන් අනතුරුව මහ මැතිවරණයෙන් පසුව පත් වූ ආණ්ඩුවේද අදාළ අමාත්‍යවරුන් විසින් වරදක් සිදුවී ඇති බව පිළිගනු ලැබ, එය විසඳීමට කල් ඉල්ලා තිබුණද ඒ පිළිබඳව කිසිදු පියවරක් ගෙන තිබුණේ නැහැ. වසරක නිහැඬියාවෙන් අනතුරුව 2016 සැප්තැම්බර් වන විට වෘත්තීය සමිතිවලට මේ පිළිබඳ ක්‍රියාමාර්ග ගැනීමට බල කෙරී තිබුණා. සරල වෘත්තීය ක්‍රියාමාර්ගවලින් පසු 2017 සැප්තැම්බර් 13 සිට විදුලිබල මණ්ඩල වෘත්තීය සමිති විසින් අඛණ්ඩ වැඩ වර්ජනයක් කැඳවනු ලැබුවා. එය අවසන් වූයේ කම්කරු අමාත්‍යාංශයේ සහ විදුලිබල අමාත්‍යාංශයේ මැදිහත්වීම මත විදුලිබල මණ්ඩල පාලනාධිකාරිය සහ වෘත්තීය සමිති නායකයින් අතර අත්සන් තැබුණු ගිවිසුමක් අනුවයි.

පාලනාධිකාරිය විසින් අවස්ථා කිහිපයකදී මෙම ගිවිසුම උල්ලංඝනය කිරීම හේතුවෙන් කම්කරු කොමසාරිස්වරයා ඉදිරිපිට විභාග කෙරෙණු පැමිණිල්ලකට අනුව ගෙවීමට නියමිත වූ වැටුප් හා දීමනා ගෙවීම යම් පිරිසකගේ බලපෑම මත අමාත්‍යාංශ ලේකම්ගේ නියෝගයකින් 2017 දෙසැම්බර් 21වැනි දින නතර කෙරෙනවා; ගත් ක්‍රියාමාර්ග අත්හිටුවෙනවා.

මෙම අසාධාරණය අවසන් කර ගැනීම සඳහා 2018 ජනවාරි මාසයේ 17 දක්වා දරන ලද උත්සාහ අසාර්ථක වීමෙන් පසු විදුලිබල වෘත්තිය සමිති විසින් ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට උද්ඝෝෂණයක් පවත්වනු ලබනවා. අමාත්‍යාංශ ලේකම්වරයා විසින් පෙර වරුවේ සිදු කරන ලද සාකච්ඡාවෙන් පසු වෘත්තිය සමිති නායකයින් පස් වරුවේ ලංකා විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයා සමඟ සාකච්ඡා කර තිබුණා. විසඳුමක් අපේක්ෂාවෙන් මෙම සාකච්ඡා රාත්‍රිය වනතෙක් ඉදිරියට යද්දී, සේවකයන් විදුලිබල මණ්ඩල පරිශ්‍රයේ සාමකාමීව රැඳී සිටියා.

එහෙත් රාත්‍රී අටට පමණ පොලීසිය මැදිහත් වී රැඳී සිටි සේවකයන්ට පහර දී ඉවත් කරනවා. මෙහිදී සේවකයන් ගණනාවක් තුවාල ලබන අතර, මණ්ඩලයේ දේපළවලට ද හානි වෙනවා. මෙසේ වූයේ කාගේ හෝ මුග්ධ තීරණයක් අනුව පොලීසිය මැදිහත් කිරීම නිසා බව පැහැදිලියි.

කෙසේ වුවද, මෙම සිදුවීමට අදාළ වෘත්තීය සමිති ක්‍රියාමාර්ගයට මුල සිටම විරෝධය පළ කළ පාලන අධිකාරියේ ප්‍රතිචාරය වූයේ වෘත්තීය සමිති නායකයන් 06 දෙනෙකුගේ වැඩ තහනම් කර, වැටුප් ගෙවීම නතර කිරීමයි.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත දක්වා ඇති අදාළ ප්‍රශ්නවලට ඇමතිතුමා පිළිතුරු ලබා දෙනවා ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

1. වෘත්තීය සමිති නායකයන්ගේ වැඩ තහනම් කිරීමේදී විදුලිබල මණ්ඩලය විසින් විදුලිබල අමාත්‍යාංශයෙන් අනුමැතියක් ගත්තාද?

   අමාත්‍යාංශයේ අනුමැතියක් සහිතව වැඩ තහනම් කරලා තිබෙන්නේ.

2. විදුලිබල මණ්ඩලයේ විනය නීතිරීතිවල, වැඩ තහනම් කළ සේවකයෙකුගේ විනය පරීක්ෂණ මාස තුනක් ඇතුළත අවසන් නොවේ නම්, ඔහු නැවත සේවයේ පිහිටුවා පරීක්ෂණ කළ යුතු යැයි සඳහන් වී තිබේද?

3. මාර්තු 07 වන දින කම්කරු ඇමති හා කම්කරු කොමසාරිස් සමඟ පැවති සාකච්ඡාවේදී මාස තුනක කාලයක් තුළ මෙම වෘත්තීය සමිති නායකයන් නැවත සේවයේ පිහිටුවන ලෙස නියෝගයක් කර ඇති බව දන්නේද?

4. මැයි මස 10 වන දින විදුලිබල අමාත්‍යවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා සහ ලේකම්වරයා වෘත්තීය සමිති නායකයන් සමඟ පැවැති සාකච්ඡාවේදී ජූනි මාසයේ 06 වැනි දිනට ඔවුන් පෙර සේවයේ පිහිටවනු ලබන බවට පොරොන්දු වූයේද?

ඒ කියන්නේ ඊයේ දින.

5. ඒ අනුව මැයි මස 16 වන දිනට නියමිතව තිබුණු වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය අත්හිටවූ බව පිළිගන්නේද?

6. වෘත්තීය සමිති නායකයන්ගේ වැඩ තහනම් කර මර්දනීය ක්‍රියාමාර්ග ගැනීමෙන් සේවක ගැටලු විසඳිය නොහැකි බව පිළිගන්නේද?

7. මෙම වෘත්තීය සමිති නායකයන් නැවත සේවයේ පිහිටුවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?

ගරු ඇමතිතුමනි, මේවාට පිළිතුරු මොනවාද කියලා මම දැන ගන්න කැමැතියි. බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)

ගරු කථානායකතුමනි, ගරු අනුර දිසානායක මහතා ස්ථාවර නියෝග 27(2) යටතේ ඇසූ ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි.

1. නැත.

ඒ කියන්නේ අමාත්‍යාංශයෙන් අවසරයක් ගත්තේ නැත. 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනතේ 12 වන වගන්තියේ (k) උපවගන්තිය යටතේ විනය පාලන විධිවිධාන පැවරී ඇත්තේ විදුලිබල මණ්ඩලය වෙතය. ඒ අනුව විදුලිබල මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එක් එක් සේවක කාණ්ඩ සඳහා විනය බලධාරීන් පත් කර විනය බලතල පවරා ඇත. ඒ නිසා අමාත්‍යාංශයේ අනුමැතියක් ලබා ගැනීම අවශ්‍ය නොවේ.

2. ඔව්. මණ්ඩලයේ විනය නීති සංග්‍රහයේ 9.1 හා 16.5හි සඳහන් විධිවිධාන අනුව විනිශ්චය සභාව පත් කළ දින සිට මාස

03ක කාලයක් ඇතුළත පරීක්ෂණ පවත්වා අවසන් කිරීමට උත්සාහ කළ යුතුය.

ගරු මන්ත්‍රීතුමනි, විනිශ්චය සභාව පත්කළ දින සිට මාස 3ක කාලයක් ඇතුළත පරීක්ෂණ පවත්වා අවසන් කිරීමට උත්සාහ කළ යුතුය. විනිශ්චය සභාව පත් කළ දින සිට. චෝදනාව භාරදීපු දිනය මම පසුව කියනවා.

එසේ වුව ද 9.2හි සඳහන් විධිවිධාන අනුව සාමාන්‍ය තත්ත්වයන් යටතේ මාස 03ක කාලයක් තුළ එකී විනය පරීක්ෂණය අවසන් කළ නොහැකි වුවහොත් වැඩ තහනම් කරනු ලැබූ නිලධාරීන් විනය පරීක්ෂණයට අගතියක් නොවන පරිදි නැවත සේවයේ පිහිටුවිය යුතුය.

එමෙන්ම 9.4හි සඳහන් විධිවිධාන යටතේ විනය පරීක්ෂණයට යම් බාධාවක් ඇති වේ නම් එම බාධාවල් නිසා විනය පරීක්ෂණය මාස 03ක කාලයක් ඇතුළත නිම කිරීමට නොහැකි වේ නම්, ඒ සම්බන්ධයෙන් විනය පරීක්ෂණ විනිශ්චය සභාව විසින් විනය බලධාරියා වෙත දැන්විය යුතුය. එම පැමිණිල්ල සම්බන්ධයෙන් විනය බලධාරියා සෑහීමකට පත් වන්නේ නම් වැඩ තහනම් කළ නිලධාරියා නැවත සේවයේ නොපිහිටු විය යුතු අතර, පරීක්ෂණය දිගටම පවත්වාගෙන යා යුතුය.

එවැනි තත්ත්වයක් තවම මතු වෙලා නැහැ.

3. නොදනී.

සාකච්ඡා කරන ලද නමුදු අවසන් එකඟතාවයකට නොපැමිණි බව වාර්තා වී ඇත.

මේ පිළිබඳව අපි ඊයේ දිනයේත් කම්කරු අමාත්‍යාංශයෙන් මෙම සාකච්ඡාවේ සාකච්ඡා සටහන් -Minutes- තිබෙනවාද කියා විමසා සිටියා. ඔවුන් කියා සිටියා Minutes නැහැ කියලා.

4. ඔව්.

එසේ එකඟතාවකට පැමිණියේ එදින වන විට විනය පරීක්ෂණ කටයුතු අවසන් කරගත හැකිවේය යන පදනම මතය. නමුත් පසුව පාර්ශ්වකරුවන් අතර ඇති කරගත් පහත සඳහන් එකඟතාවන් නිසා ජූනි 06 වැනි දිනට පෙර ඔවුන් සේවයේ පිහිටුවනු ලැබීමට වූ එකඟතාවය අනුව ක්‍රියාකිරීමට නොහැකි විය. එම නිසා ඒ පිළිබඳ වගකීමක් අමාත්‍යාංශයට නොමැත.

මණ්ඩලයේ විනය නීති සංග්‍රහයේ 9.1 වගන්තිය හා 16.5හි විධිවිධාන යටතේ පරීක්ෂණ විනිශ්චය සභාව පත් කළ දින සිට මාස 03ක් අවසන්වීමට පෙර විනය පරීක්ෂණය අවසන් කළ යුතු බව සඳහන්ව ඇති අතර, මෙම වූදිත නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණ විනිශ්චය සභාව පත් කර ඇත්තේ 2018 අප්‍රේල් 05 වන දින ය. ඒ අනුව පරීක්ෂණය නිම කළ යුතු වන්නේ 2018 ජූලි 05 වන දින ය.

එමෙන්ම විනය නීති සංග්‍රහයේ 16.5හි විධිවිධාන පරිදි රැකවරණ නිලධාරීගේ/පැමිණිල්ල මෙහෙයවන නිලධාරීගේ සාක්ෂි සම්පිණ්ඩනය කර භාරදීම සඳහා දින 14ක කාලයකුත්, පරීක්ෂණ නිලධාරීන්ගේ අවසන් වාර්තාව පිළියෙළ කිරීම සඳහා එක් මසක කාලයකුත් වෙන් කර ඇත.

එම විධිවිධාන පරිදි පරීක්ෂණ විනිශ්චය සභාවේ අවසන් වාර්තාව භාරදිය යුතු වන්නේ 2018 අගෝස්තු 19 වන දින ය.

එසේ වුවද, පරීක්ෂණ නිලධාරි හා වැඩ තහනම් කරන ලද නිලධාරීන්ගේ රැකවරණ නිලධාරීන් සමඟ 2018.05.09 දින එළඹී ඇති එකඟතාවන්ට අනුව රැකවරණ නිලධාරීන් හට සතියේ දිනවල පරීක්ෂණ කටයුතු සඳහා පැමිණීමට නොහැකි වීම සහ ජූනි මාසයේ අවසන් භාගයේ රැකවරණ නිලධාරියෙකු විදේශගත වීමට සූදානමින් සිටින නිසා පරීක්ෂණ කටයුතු සඳහා පැමිණීමට නොහැකි බව දන්වා ඇති බැවින් ඔවුන්ගේ එකඟතාවන් අනුව සමස්ත පරීක්ෂණය සඳහා දින සඳහන් schedule එකක් සකස් කර ගත්තා; එකඟතාවක් සකස් කර ගත්තා.

ඒ අනුව, 2018.05.20 - ඉරිදා, 2018.05.27 - ඉරිදා, 2018.06.03 - ඉරිදා, 2018.06.09 - සෙනසුරාදා, 2018.07.01- ඉරිදා, 2018.07.02 - සඳුදා, 2018.07.09 - සඳුදා, 2018.07.16 - සඳුදා, 2018.07.21 - සෙනසුරාදා, 2018.07.23 - සඳුදා, 2018.07.30 - සඳුදා, 2018.08.07 - අඟහරුවාදා, 2018.08.16 - බ්‍රහස්පතින්දා, 2018.08.23 - බ්‍රහස්පතින්දා සහ 2018.08.31 - සිකුරාදා යන දින වූදිත නිලධාරීන්ගේ රැකවරණ නිලධාරීන් සහ පරීක්ෂණ නිලධාරියාගේ එකඟතාව මත සකස් කරගෙන තිබෙනවා.

අපි මුලින් සිතුවත් චෝදනා පත්‍රය භාර දුන් දිනයේ සිට මාස 3ක් ඇතුළත මේ ප්‍රශ්නය විසඳා ගැනීමට හැකියි කියලා, -අපි සම්බන්ධ වුණා,- ඉන් පසුව පරීක්ෂණ නිලධාරි සහ රැකවරණ නිලධාරීන් ඔවුන්ට අදාළ ප්‍රායෝගික කාරණා මත සමස්ත පරීක්ෂණයට දින නියම කරගෙන තිබෙනවා. එම නිසා අනන්තය දක්වා මේ පරීක්ෂණය යන්නේ නැහැයි කියන එක ඔබතුමාට කියන්නට අවශ්‍යයි.

5. ඉහත පිළිතුර අනුව අදාළ නැත.

අපි පොරොන්දුව දුන්නා, නමුත් පසුව ඇති වුණු තත්ත්වයන් අනුව වෙනස් වෙලා තිබෙනවා.

6. ඔව්.

අපි කිසිසේත්ම මර්දනීය ක්‍රියාමාර්ගවලට යන්නේ නැහැ.

7. විනය පරීක්ෂණ නිම වීමෙන් පසු එහි නිර්දේශ මත ඉහත කී එකඟ වූ කාල සටහන අනුව පරීක්ෂණ කටයුතු නිම වේ යැයි අපි අපේක්ෂා කරනවා.

ගරු මන්ත්‍රීතුමනි, මෙහි ඉන්නේ පිළිගත් වෘත්තීය සමිති කිහිපයක වෘත්තීය සමිති නිලධාරීන්. එක් වෘත්තීය සමිතියක් එක්සත් ජාතික පක්ෂයට අනුබද්ධ ජාතික සේවක සංගමය. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වෘත්තීය සමිති නායකයාත්, ජනතා විමුක්ති පෙරමුණ හා සම්බන්ධ වූ වෘත්තීය සමිති නායකයා මෙතැන ඉන්නවා. අපිට කාටවත් විශේෂයෙන් නොසලකා සිටින්නවත්, පළිගැනීමක් කරන්නටවත් හේතුවක් නැහැ. ඔවුන්ගේ වෘත්තීය අයිතිවාසිකම් පිළිබඳ ගැටලුවක් විසඳා ගැනීමට යාමේදී තමයි මේ අර්බුදය මතු වෙලා තිබෙන්නේ.

ඒ අනුව අපි සාධාරණ පරීක්ෂණයක් සඳහා අවස්ථාව ලබාදෙනවා; සාධාරණ පරීක්ෂණයක් සඳහා වූ වාතාවරණය සකස් කරනවා. ඒ අදාළ කම්ටුවේ විනය බලධාරීන්ගේ තීන්දුව මත අපි කටයුතු කරනවා. අපට අවශ්‍ය වන්නේ මෙය සාමකාමීව සහ සාධාරණව විසඳා ගැනීමටයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා. ගරු සභානායකතුමා වෙනුවෙන් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
Sir, on behalf of the Leader of the House, I move,

"That notwithstanding the provisions of Standing Order No. 8 of the Parliament and the motion agreed to by Parliament on 06.06.2018, the hours of sittings of Parliament on this day shall be 9.30 a.m. to 7.00 p.m.. At 1.30 p.m. Standing Order No. 8(5) of the Parliament shall operate. At 7.00 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින න්‍යාය පත්‍රයේ කටයුතුවලට යන්නට ප්‍රථම, ගරු අනුර දිසානායක මැතිතුමාත්, ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමාත්, ගරු විමලවීර දිසානායක මැතිතුමාත් මගෙන් වෙලාව ඉල්ලා තිබුණා. ඒ තුන්දෙනාටම අවශ්‍ය නම් දැන් කාලය ලබා දෙන්න පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
අවශ්‍යතාව නම්, ටිකක් කල් ගිහිල්ලා. මොකද, ඔබතුමා ඉදිරිපත් කරපු ප්‍රකාශයත් එක්ක තමයි මගේ ප්‍රශ්නය පැන නැඟුණේ. ඔබතුමා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා, 118ක ලැයිස්තුවක් නොමැති බවට අදාළ ආයතන විසින් දැනුම් දීලා තිබෙනවා කියලා. නමුත් ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 118ක් ඇලෝසියස්ගේ මුදල් ගත්තා කියලා විශාල මාධ්‍ය ප්‍රචාරයක් යනවා වාගේම සමහර පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පවා එසේ ප්‍රකාශ කර තිබෙනවා. ඔබතුමා යම් සාධක මත ඒක එහෙම නොවෙයි කියලා තිබෙනවා. හැබැයි ගරු කථානායකතුමනි, තවත් සාකච්ඡාවක් තිබෙනවා, ඇලෝසියස්ගේ ගිණුමෙන් චෙක්පත් 166ක් භුවමාරු වී තිබෙනවා කියලා. එතකොට ඒ චෙක්පත් ලැබුණේ කාටද කියන එක පිළිබඳවත් පරීක්ෂණයක් සිදු කළ යුතුව තිබෙනවා. 118කගේ නම් ලැයිස්තුවක් නැත්නම්, ඒ චෙක්පත් 166 පිළිබඳව ඔබතුමාට වාර්තාවක් ලැබිලා තිබෙනවාද කියලා ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි. මොකද, ඒකත් දැන් සමාජයේ සාකච්ඡා වෙමින් තිබෙන නිසා.

ගරු කථානායකතුමනි, දෙවැනි කරුණ මෙයයි. අපි බැඳුම්කර නිකුත් කිරීම සම්බන්ධයෙන් වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පිළිබඳවත්, ඒ වාගේම බරපතළ වංචා, දූෂණ සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව පිළිබඳවත් එක දිනෙක විවාදයක් පැවැත්වූවා. ඒ වාගේම ඒක තව දිගටම පවත්වාගෙන යන විවාදයක්. නමුත් ගරු කථානායකතුමනි, දැන් ඒ විවාදය නතර වෙලා තිබෙනවා. දිනයක් නියම කරගෙනත් පාර්ලිමේන්තුවේදී ඒක නතර වුණා. 'බරපතළ මූල්‍ය අපරාධ පිළිබඳ විමර්ශන වාර්තාවේ සිංහල පිටපත පමණයි තිබෙන්නේ. අඩු තරමේ ඉංග්‍රීසි භාෂාවෙන් හෝ පිටපතක් ඉදිරිපත් කරන්න' කියන යෝජනාව මත ඒක නතර වුණා. ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි, ඒ පිටපත සම්බන්ධයෙන් දැන් තත්ත්වය කුමක්ද කියලා. ඒක මගේ දෙවැනි ප්‍රශ්නය.

ගරු කථානායකතුමනි, මගේ තුන්වැනි ප්‍රශ්නය මෙයයි. බැඳුම්කර කොමිෂන් සභාවේ වාර්තා ඉල්ලා සිටින අවස්ථාවේදී ඔබතුමා මේ පාර්ලිමේන්තුවට කිව්වේ, "ඔබතුමාට ලැබිලා තිබෙන්නේ සී. 350 සිට සී. 360 දක්වා කියන වාර්තා. සී.01 සිට සී. 349 දක්වා වාර්තා ලැබිලා නැහැ. ඒ වාර්තා සභාවට ඉදිරිපත් කරන්න ජනාධිපති ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා" කියලා. මම දැනගන්න කැමැතියි, එහි ප්‍රගතිය මොකක්ද කියලා. ගරු කථානායකතුමනි, දැන් කොමිෂන් සභාවෙන් යම් වාර්තාවක් ඇවිල්ලා තිබෙනවා.

ඒ පිළිබඳ විවාද තිබෙන්න පුළුවන්. හැබැයි සෑම පුරවැසියකුටම ඒ වාර්තාව පිළිබඳව තොරතුරු දැන ගැනීමේ අයිතිය තිබෙනවා. වාර්තාව සතු බලධාරින් තමන්ට කැමැති කැමැති පරිච්ඡේද සමාජගත කිරීම යුක්තිසහගත නැහැ. ගරු කථානායකතුමනි, දැන් එහි කොටසක් ඇවිත් තිබෙනවා. ඒකයි මෙහි තිබෙන ප්‍රශ්නය. ඒ කොටස පිළිබඳ විවිධ සාකච්ඡා තිබෙනවා. නමුත් ඉදිරිපත් නොවන වාර්තා විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඉදිරිපත් වන වාර්තාවල කුමක්ද තිබෙන්නේ? ඒ පිළිබඳව දැනගැනීමේ අයිතියක් අපට තිබෙනවා. ඒ නිසා ඔබතුමාගෙන් මා දැනගන්න කැමැතියි, සී-1 සිට සී-349 දක්වා වාර්තා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ කවදාද කියා. ගරු කථානායකතුමනි, ඔබතුමා දැන් අපේ පණිවුඩකරුවා බවටයි පත් වී සිටින්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඇත්ත.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔබතුමාට අපි කියනවා; ඔබතුමා ජනාධිපති ලේකම්ට කියනවා; ජනාධිපති ලේකම්තුමා කියන එක ඔබතුමා අපට කියනවා. මේකයි දැන් ඇති වී තිබෙන තත්ත්වය. ඒ නිසා මීට පෙරත් මම ඔබතුමාට යෝජනා කළා, ජනාධිපති ලේකම්වරයා මේ පාර්ලිමේන්තුවට කැඳවන්න කියා. කැඳවා, මේ වාර්තා මොනවාද, වාර්තා සම්බන්ධයෙන් ඇති වී තිබෙන තත්ත්වය මොකක්ද, යවා තිබෙන්නේ කුමක්ද, නීතිපතිවරයාගේ නිර්දේශ කවරේද කියන ඒවා පිළිබඳව එතුමා එක්ක සාකච්ඡා කරන්න මන්ත්‍රීවරුන්ට අවස්ථාවක් දෙන්න. අපට ජනාධිපති ලේකම්වරයාත් එක්ක ඒවා පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ඔබතුමා අදාළ නිලධාරීන් කැඳවන්න කියන යෝජනාවත් මම කරනවා. බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමාත් සඳහන් කරන්නේ මේ කාරණය ගැනද?

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
නැහැ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
එහෙම නම්, මා මෙතුමාගේ ප්‍රශ්නයට පිළිතුර දී ඉන්නම්.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
හොඳයි, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මා මේ සම්බන්ධයෙන් නීතිපතිතුමාගෙනුත්, පොලීසියෙනුත්, අදාළ සියලු අංශවලිනුත් විමසුවා. මොකද, රටේ මේ ගැන විශාල ආන්දෝලනයක් ඇති වෙලා තිබෙනවා. මා කලින් කියූ පරිදි මෙය පාර්ලිමේන්තුවටත් අගෞරවයක්; මන්ත්‍රීවරුන් 225දෙනාටත් අගෞරවයක්; රටටත් අගෞරවයක්. එතුමන්ලා මට සහතික කර කිව්වා, එසේ 118දෙනකු සිටින ලැයිස්තුවක් හෝ 166දෙනකු සිටින ලැයිස්තුවක් ඒ අය ළඟ නැහැ කියා. එවැනි දෙයක් පවතිනවා කියා කිව්වේත් නැහැ. ඒ නිසා මා ඉල්ලා තිබෙනවා, මීට අදාළ සම්පූර්ණ වාර්තාවල attachments. ප්‍රධාන වාර්තාවලට ඇතුළත් සියලු attachments මට වහාම ලබා ලබාදෙන්න කියා මම ජනාධිපති ලේකම්තුමාගෙන් ඉල්ලා තිබෙනවා. එතුමා මේ දවස්වල විදේශගත වෙලායි ඉන්නේ. මා විශ්වාස කරනවා, එතුමා පැමිණි හැටියේම Attorney-Generalගේ අනුමැතිය ඇතිව එය ලබා දේවි කියා. නමුත් මට මෙකට කෙළින්ම සම්බන්ධ වන්න බැහැ. මොකද, ඒ භරහායි යා යුතු වන්නේ. ඒ වාගේම මා කියන්න ඕනෑ, ජනාධිපති ලේකම්තුමා සෑම විටම අපට සහයෝගය දුන් බව. ඒ වාගේම මම පෞද්ගලිකව විශ්වාස කරන්නේ නැහැ, එතුමා කැමැත්තෙන් කුමක් හෝ හංගාගෙන ඉන්නවා කියා. මා උත්සාහ කර බලන්නම්, අවස්ථාවක් ගන්න පුළුවන් වේවිද කියා. මගේත් යුතුකමක් තිබෙනවා. ඒකයි මා උදේත් පැහැදිලි කළේ. මුළු රටේම මේ ගැන ආන්දෝලනයක් තිබෙන අවස්ථාවක රටට අහිතකර, විශේෂයෙන් මන්ත්‍රීවරුන්ගේ ආත්ම ගරුත්වයට හානි වන දෙයක් සිදු වනවා නම් ඒක හොඳ නැහැ. ඒ නිසා ඒ වගකීම මම භාර ගන්නවා. බොහොම ස්තුතියි.

මීළඟට, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර තිස්සානායක්ක)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, විමර්ශන වාර්තාවේ පිටපත්-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඉංග්‍රීසි පිටපත translatorට භාර දීලා තිබෙනවා කිව්වා.

ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, අර්ජුන් ඇලෝසියස් මහතා සහ අනෙක් සිද්ධි නිසා මේ රටේ ඉතා විශාල ජාතික වශයෙන් වැදගත්කමකින් යුත් බොහෝ දේ මේ ගරු සභාවේ අවධානයෙන් ගිලිහී යනවා. අද දින මේ ගරු සභාවට ඉදිරිපත් කරලා තිබෙනවා, නව වෙළෙඳ ප්‍රතිපත්තිය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක්. මේ ප්‍රතිපත්තිය යටතේ ඉතාම ආන්දෝලනාත්මක සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුම-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒ ගැන අද විවාදයේදී කථා කරන්න පුළුවන් නේද, ආචාර්යතුමනි?

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
නැහැ. ඒකාබද්ධ විපක්ෂය ලෙස අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, මේ රටට මෙවැනි ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් හැදෙන අවස්ථාවක එහි අන්තර්ගතය පිළිබඳව අඩු තරමේ දින දෙකකවත් විවාදයක් පැවැත්වීම සඳහා කරුණාකරලා ඉඩප්‍රස්තාව ලබා දෙන්න කියලායි. මොකද, මේක උපනුපන් පරම්පරාවලටත් බලපාන, මුළු රටටම බලපාන, ජාතික වැදගත්කමකින් යුතු සිද්ධියක්. ජාතික න්‍යාය පත්‍රයක් තිබියදී, සිල්ලර දේවල්වලට ගිහිල්ලා සැහවුණු එකක් ක්‍රියාත්මක වන තත්ත්වය මේ ගරු සභාව විසින් නැවැත්විය යුතු වෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මම ඒ ගැන පක්ෂ නායකයින්ගේ රැස්වීමේදී කරුණු ඉදිරිපත් කරන්නම්.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු සෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සපානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(මාණ්පුමිකු සෙහාන් සේමසිංහ)
(The Hon. Shehan Semasinghe)
ගරු කථානායකතුමනි, බොහොම ස්තුතියි. ඔබතුමා මතු කළ කාරණාවට අදාළවයි මම මේ කාරණය කියන්නේ. මේ සභාව තුළදීම ගරු මන්ත්‍රීතුමන්ලා දෙදෙනෙක් ප්‍රසිද්ධියේම පිළිගෙන තිබෙනවා, මේ ආකාරයට මුදල් ලබා ගැනීමක් කළා කියලා. හැබැයි ඒ අතරම ඒ කණ්ඩායම විසින්ම කියනවා, අභවල් සංඛ්‍යාවක් අරගෙන තිබෙනවා, තවත් සංඛ්‍යාවක් අරගෙන තිබෙනවා කියලා. ගරු කථානායකතුමනි, ඒ නිසා ඔබතුමා කිව්වා වාගේම රටේ ජනතාව තුළ සාධාරණ සැකයක් මතු වෙලා තිබෙනවා. මොකද, එක කණ්ඩායමක් "ගත්තා" කියනවා. ඔබතුමා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම ගැන අපි ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා කියනවා, "එහෙම වාර්තාවක් නැහැ" කියලා. ගරු කථානායකතුමනි, හැබැයි ජනතාවට තේරෙන්නේ නැහැ, කවුරු කියන එක පිළිගන්නද කියලා. ඔබතුමා කියන කාරණය ඇත්තද, එහෙම නැත්නම් අර මුදල් ලබා ගත්තාය කියන මන්ත්‍රීවරු කියන කාරණය ඇත්තද කියලා ජනතාවට තේරෙන්නේ නැහැ. ගරු කථානායකතුමනි, ඒ නිසා ඒක ඇත්ත කථාවක් නොවෙයි නම්, කරුණාකරලා මේ විධියට රට නොමඟ යවන්න එපා කියලා අදාළ මහජන නියෝජිතයින්ට අවවාද කරන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා එන්න ඉස්සර වෙලා මම ඒ ආයාචනය කළා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
මොකද, ඒක ඔබතුමා ඇතුළු අප සියලු දෙනාටම කරන අපහාසයක්; අවමානයක් සහ මේ උත්තරීතර සභාව කෙරෙහි ජනතාව තුළ තිබෙන විශ්වාසය බිඳ දැමීමක් ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මා එය පිළිගන්නවා. බොහොම ස්තුතියි.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු කථානායකතුමනි, දිගින් දිගටම මතු වුණු ප්‍රශ්නයක් තමයි මේ ශ්‍රී ලංකා ජනරජයේ ජාතික වෙළෙඳ ප්‍රතිපත්තියක් තිබෙනවාද, නැද්ද කියන ප්‍රශ්නය. ඒ ප්‍රතිපත්තිය සකස් කරන්න යම් කිසි කාලයක් ගත වුණත්, අපි මේ නව වෙළෙඳ ප්‍රතිපත්තිය -New Trade Policy - ඉදිරිපත් කරලා මේ සභාව දැනුවත් කරලා තිබෙනවා. ගරු කථානායකතුමනි, සභාගත කරන්නේ දැනුවත් කිරීමට. ඒ වාගේම විවාදයක් ලබා දීම ගැනත් කිසිම ගැටලුවක් නැහැ.

එය ඉතා වැදගත් වූ කාරණයක්. අපේ (ආචාර්ය) බන්දුල ගුණවර්ධන ශූරීන් විසින් ඉල්ලූ පරිදිම, මේ පිළිබඳ විධිමත් විවාදයක් ලබා දීමට රජය කටයුතු කරනවාය කියන කාරණය මම කියනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මැතිතුමා. වෙලාව ගැන අවධානය යොමු කරන්න.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි. පසුගිය දිනවල මේ සම්බන්ධයෙන් කියැවුණා. ඊයේ හෝ පෙරේදා අපේ මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා මේ පැත්තට ඇඟිල්ල දික් කරලා කිව්වා, මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂක නිලධාරීන් විසිහතරදෙනෙකුගෙන් ප්‍රශ්න කර තිබෙන බව. මෙවැනි සාවද්‍ය තොරතුරු සමාජගත කළා; මේ පාර්ලිමේන්තුව තුළ කිව්වා. ඒ වාගේම මාධ්‍ය තුළිනුත් ඒවා ප්‍රචාරය වුණා. ඒ නිසා ඔබතුමාගෙන් අපි ගෞරවයෙන් ඉල්ලනවා, මේ වාර්තාව සභාවට ගෙන්වා ගන්න කියලා. මොකද, පසුගිය දිනවල සිදු වුණු damage එක මන්ත්‍රීවරු සියලු දෙනාටම වුණා. අපට ලොකුම සැකය තිබෙන්නේ, මේ ප්‍රශ්නයේ වැඩිපුර ඉන්නේ ඒකාබද්ධයේ කට්ටිය කියලා. ඒකයි තිබෙන ප්‍රශ්නය. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ගරු විමලවීර දිසානායක මැතිතුමා.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු කථානායකතුමනි, ගරු මුදල් හා ජනමාධ්‍ය ඇමතිතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තුවෙන් මම ගිය අවුරුද්දේ හත්වැනි මාසයේ දොළහ දාතමින් ප්‍රශ්නයක් අසා තිබෙනවා. ලබන මාසයේ දොළොස්වෙනිදාට ඒකේ වර්ෂ පූර්ණ උත්සවය සමරන්නයි තිබෙන්නේ. මෙතෙක් මට ඒ ප්‍රශ්නයට පිළිතුරක් ලැබිලා නැහැ. මම දන්නේ නැහැ මේක,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ ගැන අවධානය යොමු කරන්නම්. [බාධා කිරීමක්]

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු මංගල සමරවීර මැතිතුමනි, ඔබතුමාගේ කාලයේ සිදුවුණු දෙයක් ගැන නොවෙයි මම ඇහුවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි ඒ ගැන සොයා බලන්නම්.

ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)
මම ඒ ගැන දන්නේ නැහැ. මම ඒ ගැන සොයා බලා උත්තරය ඉදිරිපත් කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
"ලංකාදීප" පුවත් පතේ බිහුන් මේනක කියන ලේඛකයා කෘෂිකර්ම අමාත්‍යාංශයේ අලුත් ගොඩනැඟිල්ලේ බදු ගිවිසුම පිළිබඳව තොරතුරු ඉල්ලා සිටියා, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ. ඒ වරප්‍රසාදය යටතේ ඉල්ලූ ඒ තොරතුර ඒ අමාත්‍යාංශයෙන් දෙන්නේ නැහැ. "බදු ගිවිසුම නැහැ" කියනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක රජෝර්තු කරන්න පුළුවන් නේ.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
අභියාචනා සියල්ලම ඉදිරිපත් කර ගිය අවුරුද්දේ ඉඳලායි ඉල්ලන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
රජෝර්තු කරන්න පුළුවන්.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

මේ පාර්ලිමේන්තුවේ බොහොම උත්කර්ෂයෙන් කථා කරලා සම්මත කළ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ තොරතුරුවත්, දැන් මට පෙනෙන හැටියට මේ රටේ ජනතාවට ගන්න විධියක් නැහැ. ජනතාව මේ පනත පිළිබඳවත් දැන් දන්නේ නැහැ වාගේයි. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි අද ප්‍රධාන කටයුතුවලට යන්න ඕනෑ.

ගරු රංජිත් ද සොයිසා මැතිතුමා සහයෝගය දෙන්න. ඔබතුමාට මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවාද? මොකක්ද ප්‍රශ්නය?

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු කථානායකතුමනි, අපි අදත් කථා කළ, ඊයේ, පෙරේදාත් කථා කරපු කරුණක් නැවතත් ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. බරපතළ ප්‍රශ්නයක් නිසායි මෙය කියන්නේ. අර්ජුන් ඇලෝසියස්ගේ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමෙන් මුදල් ගත්ත අය සම්බන්ධව-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා එන්න කලින් මම ඒ සම්බන්ධයෙන් පැහැදිලි කළා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

අපි සියලු දෙනාම කියන්නේ, මේ සම්බන්ධයෙන් නිවැරැදි මන්ත්‍රීවරු නිවැරැදි විය යුතුයි කියායි. එසේ කිරීම ඔබතුමාගේ කාර්ය භාරය. ඒ වාගේම, අර්ජුන් ඇලෝසියස්ගෙන් සල්ලි ගත්ත, මේ පාර්ලිමේන්තුවේ ඉන්න අයත් මේ තුළ සැඟවිලා දැන් මේ ගොඩට එන්න හදනවා. මෙන්න මේක වළක්වන්න කටයුතු කරන්න, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

අද න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 4 දක්වා. [බාධා කිරීමක්] මොකක්ද?

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මේ බැඳුම්කර සිද්ධිය ගත්තොත්, ඒ නම් හෙළිකිරීම් ආදී ප්‍රශ්න දිහා බැලුවාම, විපක්ෂයේ ඉන්න හොරකම් කළ මන්ත්‍රීවරු ටික ලොකු හොරකම් වහගන්න අද මේ සිද්ධිය පාවිච්චි කරන බව පෙනෙනවා. මේ බැඳුම්කර සිද්ධිය ගැන කථා කරලා, ඒකට 118 දෙනෙක් සම්බන්ධයි කියලා අසත්‍ය ප්‍රචාර යවලා තමන් කළ හොරකම් ගැන කෙරෙන පරීක්ෂණ ටික වහගන්න තමයි මේ හදන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මම ඒ කරුණ පැහැදිලි කළා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු කථානායකතුමනි, මට කියන්න තිබෙන්නේත් මේ අයට හප හපා ඉන්න හොඳ රස බුලත්විටක් හම්බවෙලා තිබෙන බවයි. හැම දාම මේ ගැන කියනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි, දැන් අවසාන කරන්න. මේ අවස්ථාව ලබා දීම අයුතු ලෙස ප්‍රයෝජනයට ගන්න එපා.

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මැතිතුමා, කියන්න ඔබතුමාගේ කාරණය මොකක්ද කියලා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, මේ මතු වී තිබෙන ප්‍රශ්නය සම්බන්ධයෙන් ඔබතුමාට විශාල වගකීමක් තිබෙනවා. ඊට මැදිහත් වෙන්න පුළුවන් ඔබතුමාටයි. අපේ ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමාත්, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාත් තමුන් නිවැරදියි කියලා කෝප් සභාවට දිවුරුම් ප්‍රකාශ දුන්නා නම්, මේ පාර්ලිමේන්තුවේ සිටින 225 දෙනාගෙන්ම ඒ විධියට දිවුරුම් ප්‍රකාශ ගන්න ඔබතුමාට පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම අවශ්‍යතාවක් නැහැ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

එහෙම මුදල් ගත්තාද නැද්ද කියලා දිවුරුම් ප්‍රකාශ ඉල්ලන්න ඔබතුමාට පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, එහෙම දිවුරුම් ප්‍රකාශ ලබා ගැනීමේ කිසිම අවශ්‍යතාවක් මට නැහැ. ඒක සාධාරණත් නැහැ. මට එහෙම අයිතියකුත් නැහැ.

ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමනි ඔබතුමා මොකක්ද කියන්නේ? ඉක්මනට කියන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත අපි තමයි, අපේ ආණ්ඩුව තමයි යථාර්ථයක් බවට පත් කළේ. පසු ගිය ඉතිහාසය තුළ තොරතුරු වසන් කළ විධිය සහ තොරතුරු දැනගැනීම වෙනුවෙන් කළ කටයුතුවලට සිදු වුණු දේ අපි දන්නවා. හැබැයි, දැන් BMICH එක තුළ ස්ථාපිත කර තිබෙන කාර්යාලය තුළ රැඳී සිටින නිලධාරියාගෙන් ඕනෑම තොරතුරක්

[ගරු චමින්ද විජේසිරි මහතා]

ගන්න පුළුවන්. ඒ තොරතුරු නොදෙනවාය කියන කාරණය අසත්‍යයක්, ගරු කථානායකතුමනි. අපි ගිහිල්ලා තොරතුරු අරගෙන තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින ප්‍රධාන කටයුතු දැන් ආරම්භ කරමු.

අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 4 දක්වා වූ, සුරාබදු ආඥාපනත යටතේ නිවේදන විවාද කොට අනුමත කිරීම.

ඒ සම්බන්ධයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. 2018 මැයි මස 20 වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද සුරාබදු නිවේදන අතරින් අද දින සලකා බලනු ලබන නිවේදන, 2018 ජූනි මස 05 වන දින රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ දී සලකා බලා, එකී කාරක සභාවේ වාර්තාව 2018 ජූනි මස 07 වන දින, එනම් අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා.

ගරු මංගල සමරවීර මැතිතුමා විවාදය ආරම්භ කිරීමට ප්‍රථම ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ වීය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] *took the Chair.*

සුරාබදු ආඥාපනත: නිවේදනය
மதுவரிக் கட்டளைச் சட்டம் : அறிவித்தல்
EXCISE ORDINANCE: NOTIFICATION

[ප.භා. 10.50]

ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32(1) වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 ජනවාරි 18 දිනැති අංක 2054/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.05.22 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 03/2018 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා නියෝජ්‍ය කථානායක ධුරයට පත් වූවාට පසු, ඔබතුමා ඉදිරියේ මා කථා කරන ප්‍රථම අවස්ථාවයි මේ. ඒ නිසා ප්‍රථමයෙන්ම ඔබතුමාට මාගේ සුභාශිංසන එකතු කරන්න කැමැතියි.

ඒ වාගේම, ඔබතුමාගේ ජයග්‍රහණය වෙනුවෙන් මා මිත්‍ර චමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා එදා පාර්ලිමේන්තුවට නොපැමිණීම ගැනත් මගේ ස්තුතිය මේ අවස්ථාවේදී පිරිනමන්න කැමැතියි.

ගරු චමල් රාජපක්ෂ මහතා
(மாண்புமிகு சமல் ராஜபக்ஷ)
(The Hon. Chamal Rajapaksaa)
ගමේ කමට.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගමේ කමට. හරියට හරි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින න්‍යාය පත්‍රයේ, සුරා බදු ආඥාපනත යටතේ ඉදිරිපත් කොට තිබෙන අංක 1, 3 සහ 4 යන නිවේදන මම ඉදිරිපත් කරනවා. මෙම විවාදය ආරම්භ කරන්නට ප්‍රථම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ගැන විපක්ෂයේ මන්ත්‍රීවරුන් කිහිපදෙනෙක් බොහොම වේදනාවෙන් කථා කරනවා මට ඇහුණා. එතකොට මට මතක් වුණේ, මෙතුමන්ලා ආණ්ඩු පක්ෂය පැත්තේ වාඩිවෙලා ඉන්නකොට, වර්තමාන කථානායකතුමා එදා තොරතුරු ලබා ගැනීමේ නිදහස පනත් කෙටුම්පත පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පතක් හැටියට ගෙනෙනකොට, එයට දැඩි ලෙස විරුද්ධවෙලා, ඒ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ විවාදයටවත් ගන්න ඉඩක් තැබුවේ නැත්තේ මෙතුමන්ලාම නේද කියලායි. අද තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක වනවා. ඕනෑම අලුත් පනතක්, විශේෂයෙන්ම මේ තරම් විප්ලවකාරී පනතක් ක්‍රියාත්මක වීමේදී මුල් කාලය තුළ යම් යම් අඩුපාඩු ඇති වේවි. ඒවාත් හරිගස්සාගෙන අපි ඉදිරියට යනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට අනුව නොවෙයි, ඔබතුමාගෙන් වෙනත් තොරතුරක් දැන ගන්න පුළුවන්ද?

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
පෞද්ගලිකද?

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ජනමාධ්‍ය අමාත්‍යතුමා හැටියට ඔබතුමා එදා පාර්ලිමේන්තුවේදී කිව්වා, TNL නාළිකාවේ පොල්ගහවෙල කුලුන ආශ්‍රිතව ඇති වුණු ගැටලුව පිළිබඳව සොයා බලා උත්තරයක් දෙන්නම් කියලා. ඒ පිළිබඳ වර්තමාන තත්ත්වය මොකක්ද කියලා ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් -TRC- පිළිතුරක් එවා තිබෙනවා, එහෙම කළේ ඇයි කියන එකට හේතුව ඉදිරිපත් කරලා. ඒ වාගේම, TNL ආයතනයේ ශාන් වික්‍රමසිංහ

මැතිතුමාගේ ලිපියක් ඇතුළු ඒ තොරතුරුත් තිබෙනවා. ඒ තොරතුරුවල පරස්පරතාවක් තිබෙනවා. ඒ නිසා අපි ඒ ගැන හරිහැටි සොයා බලා කටයුතු කරනවා. නමුත් මට ආරංචි වුණා, ඒ අයත් හෙට අනිද්දා වනකොටම ඒ සම්බන්ධයෙන් නීති ක්‍රියාමාර්ගයට යොමු වනවාය කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, ගොබෙල්සියන් න්‍යාය කියලා කියන්නේ මොකක්ද කියලා. ඇඩොල්ෆ් හිට්ලර්ගේ ප්‍රචාරක ඇමතිවරයා වන ගොබෙල්ස් විශ්වාස කළා, එකම බොරුව නැවත නැවතත්, නැවත නැවතත් කිව්වොත්, කාලයක් යනකොට ඒ බොරුව ඇත්ත බවට ජනතාව විශ්වාස කරනවාය කියලා.

ඇත්තෙන්ම අපේ කුරුණෑගල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී මහින්ද රාජපක්ෂ මැතිතුමාත් අද මේ ගොබෙල්සියන් න්‍යාය අනුව කටයුතු කරන්න තීන්දු කර තිබෙනවා. කොහොමත් එතුමාට වාගේම, එතුමා යටතේ තිබුණු රජයට විශාල ෆැසිස්ට්වාදී නැඹුරුවක් තිබුණා. ඒ නිසා ඒ ෆැසිස්ට්වාදී සංකල්පවලට බොහොම කැමැති ඇති. නමුත් මේවා එතුමා ලියන ඒවා නොවෙයි, කවුරු හෝ ලියලා දෙන අසත්‍ය දේවල්. එවැනි අසත්‍ය දේවල් නිතර නිතර කියනවා. නමුත් ඒවා සම්බන්ධයෙන් විවාදයකට එන්න කිව්වාමත් එයට උත්තරයක්වත් දෙන්න සූදානම් නැහැ. නමුත් ඊයේ - පෙරේදා "The Island" පුවත් පතේ සහ "දිවයින" පුවත් පතේ එතුමා මේ විධියට කියලා තිබෙනවා මා දැක්කා.

2018 ජූනි මස 06 වැනි දින "දිවයින" පුවත් පතේ මෙසේ සඳහන් වනවා:

"අපේ රජයක් යටතේ බදු 20%කින් අඩු කරනවා."

එමෙන්ම, 2018 ජූනි මස 05 වැනි දින "The Island" පුවත් පතේ මෙහෙම කියනවා:

“People are suffering due to extremely high taxes. They cannot even eat properly or save any money…”

ඒ වාගේම, ජීවන වියදම අහස උසට තිබෙන නිසා ඒ අයට කන්නවත් බැරිලු. ඇත්ත වශයෙන්ම මා සන්තෝෂ වනවා, දැන්වත් ජීවන වියදම ගැන එතුමාගේ අවධානය යොමු වී තිබීම ගැන. මොකද, එතුමා ජනාධිපති කාලයේ ඉඳලා කෑවේ බිව්වේ අපේ වියදමින්. ඒ නිසා එතුමා ඒ කාලයේ තිබුණු වියදම් සහ ගණන් පිළිබඳව දැනගෙන ඉන්න නැතිව ඇති. ඒ නිසා මා බොහොම කෙටියෙන් ජීවන වියදම ගැන කියන්නම්. ජීවන වියදම ගැන කියන විටත් එතුමා ගොබෙල්සියන් න්‍යාය අනුව කියනවා, "කවදාවත් නැති විධියට ජීවන වියදම වැඩි වෙලා"ය කියලා.

ඒකට උදාහරණයක් හැටියට මා අද ලබා ගත්ත සංඛ්‍යාලේඛන ටිකක් කියන්නම්. එම සංඛ්‍යාලේඛන අනුව, 2014 දෙසැම්බර් මාසයේ රාජපක්ෂලා අපට ආණ්ඩුව බාර දෙනකොට නිවුඩු රතු හාල් - raw red rice - කිලෝවක් රුපියල් 91.90යි. නමුත් 2018 අවුරුද්දේ අප්‍රේල්, මැයි මාසය වනකොට නිවුඩු රතු හාල් කිලෝවක් රුපියල් 85.86කට තිබුණේ. නිවුඩු සුදු හාල් කිලෝවක් 2014 අවුරුද්දේ රුපියල් 78.19යි. අවුරුදු හතරකට පස්සේ අද නිවුඩු සුදු හාල් කිලෝව රුපියල් පහකින් විතරයි වැඩිවෙලා තිබෙන්නේ. ඒ අනුව මේ වනකොට නිවුඩු සුදු හාල් කිලෝවක් රුපියල් 82.73යි.

සම්බා කිලෝවක් රුපියල් 92 සිට රුපියල් 110ට වැඩි වෙලා තිබෙනවා. එදා -අවුරුදු හතරකට ඉස්සෙල්ලා - පිටි කිලෝවක් රුපියල් 97යි, අද රුපියල් 90යි. අද සීනි කිලෝව රුපියල් 108යි, එදා රුපියල් 100යි. රුපියල් 8ක වෙනසක් තිබෙනවා. එදා අල කිලෝව රුපියල් 104යි, අද රුපියල් 89යි. අවුරුදු හතරකට පස්සේ ඒක අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම පරිප්පු කිලෝව රුපියල් 170යි. අද පරිප්පු කිලෝව රුපියල් 147යි. එතුමන්ලාගේ ආණ්ඩු කාලයට වඩා රුපියල් 30කටත් වඩා අඩුයි. ඇත්ත වශයෙන්ම විශාල වෙනසක් තිබෙන්නේ පොල්වල විතරයි. නමුත් පොල් මිලත් දැන් අඩු වෙනවා. 2014 දී පොල් ගෙඩියක මිල තිබුණේ රුපියල් 46.25යි. දැන් රුපියල් 75ක් වෙනවා. [බාධා කිරීමක්] එහෙම නම් ඔබතුමන්ලා "ජීවන වියදම වැඩියි" කියලා කෑ ගහන්නේ ඇයි? මේ රටේ සියයට අනුවක් ජනතාව ගොවීන් නොවෙයි. කොයිතරම් අඩු වුණත් ගොවීන්ට ආණ්ඩුවෙන් සහන දීලා තිබෙනවා. ඒ අයට පාඩු සිදුවෙනකොට මුදල් අමාත්‍යාංශයෙන් ඒ අයට අලාභයක් නොවෙන්න සහන දුන්නා. ගරු රවීන්ද්‍ර සමරවීර ඇමතිතුමාගෙන් අහන්න, වැලිමඩ පැත්තේ අපි මොනවා ද කරන්නේ කියලා.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
සියයට 70ක් ගොවීන්ට - [බාධා කිරීමක්]

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ආ, ඕක රටට කියන්න. [බාධා කිරීමක්] - "කලබල වෙන්න එපා ගණන් ගියාට -එස්.බී. දිසානායක -" අන්න හරි. බොහොම හොඳයි, අපි ඕක මතක තියා ගන්නම්. ඔබතුමාව quote කරලාම කියන්නම්. [බාධා කිරීමක්] ඒක නේ. අපි දෙන්නාට එක පැත්තේ, එක ළඟම වාඩිවෙලා ඉන්න එච්චර වාසනාවක් නැහැ. ටික කාලයක් වාඩි වෙලා ඉන්නවා, ආයෙත් දෙපැත්තට යනවා. මේ ළඟක් වෙනතුරු මෙතැන වාඩිවෙලා සිටියා. ඊට ඉස්සෙල්ලා ඒ පැත්තේ වාඩි වුණා. හැබැයි, මොකක් හරි -[බාධා කිරීමක්] හරි, ඔබතුමා ඒ පැත්තේ ඔබතුමාගේ ආසනයේ අයට කථා කරන්න. අපිට රටක්ම බලා ගන්න තිබෙනවා. හැබැයි, මම මේ කිව්වේ ඔබතුමාටයි, මටයි මොකක්දෝ පොඩි අපලයක් තිබෙනවාය කියන එකයි.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
2001න් පස්සේ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
2001න් පස්සේ මොකක්දෝ අපලයක් තිබෙනවා.

මම කියමින් සිටියේ, ජනතාව නොමග යවන සුළු කාරණා අපේ මහින්ද රාජපක්ෂ මැතිතුමා කියා තිබෙනවා කියලයි. ඒ වාගේම එතුමා දැන් කියනවා, "බදු සියයට විස්සකින් අඩු කරනවා" කියලා. ඔව්, කියන්න ලෙහෙසියි. හැබැයි, එතුමා සියයට විස්සකින් බදු අඩු කරන්නේ කොහොමද, අඩු කළොත් ඇති වෙන තත්ත්වය මොකක්ද කියන එක ගැන එම එක ලිපියකවත්, එක සම්මුඛ සාකච්ඡාවක දීවත් විග්‍රහ කරලා නැහැ; විග්‍රහ කරන්න උත්සාහ කරලාත් නැහැ. බදු අඩු කරන්න, අඩු කරන්න අනෙක් පැත්තෙන් වක්‍ර බදු වැඩි කරන්න ඕනෑ බව තමුන්නාන්සේලා, අපි දන්නවා. එස්.බී. දිසානායක මන්ත්‍රීතුමා හිතනවාද දන්නේ නැහැ, ඒකත් හොඳයි කියලා. මොකද, ලෝකයේ වක්‍ර බදු සහ සෘජු බදු

[ගරු මංගල සමරවීර මහතා]

අනුපාතය වැඩිම රට ලංකාවයි. අපේ ආදායමෙන් සියයට 82ක් VAT සහ වෙනත් වක්‍ර ආකාරයට ලබා ගන්නවා. 2015 වෙනකොට සෘජු බදුවලින් ආදායම් ලබාගෙන තිබෙන්නේ සියයට 18යි. මිලියන 21ක් සිටින රටක මේ අවුරුද්ද වෙනවිට සෘජු tax files තිබුණේ ලක්ෂ හතරයි. මිලියන 21කින්, මිලියන 12ක්, 14ක් විතර වැඩිහිටියන් සිටිනවා ඇති. වැඩිහිටියන් මිලියන14ක් සිටින රටක සෘජු tax files තිබෙන්නේ ලක්ෂ හතරයි.

ඒ කියන්නේ, කවුරු හෝ කඩයකට ගිහින් සීනි ටිකක් මිල දී ගන්නවා නම්, ඔහු වක්‍ර බදු ගෙවනවා. එම පුද්ගලයා සමහර විට කොළඹ හතේ මහ මන්දිරයක සිටින කෝටිපති ව්‍යාපාරිකයකු වන්නට පුළුවන්; එහෙම නැත්නම් පැල්පතක සිටින ඉතාම දුප්පත් මිනිහෙක් වෙන්නත් පුළුවන්. නමුත් ඔවුන් කඩේට ගිහින් සීනි ටිකක් මිල දී ගන්න ගෙවන්නේ එකම මිලක්. එතකොට, ධනපතියා සහ දුප්පතා කියන දෙදෙනාම වක්‍ර බදු ගෙවනවා. ඒ දෙදෙනාම එක හා සමානව වක්‍ර බදු ගෙවනවා. අපි වෙනස් කරන්න ඕනෑ, මේකයි. රටක් හැටියට අපි කොහොම හරි මේ අනුපාතය වෙනස් කර ගන්නට ඕනෑ. මේ අනුපාතය වෙනස් කරන්නට නම් tax net එක, ඒ කියන්නේ බදු අය කරන ප්‍රමාණය, බදු ගෙවන ප්‍රමාණය පුළුල් කර ගන්නට ඕනෑ. හැම දාම බදු ගෙවන මිනිහාව තලලා වැඩකුත් නැහැ. අවංකව ඉස්සරහාට ඇවිල්ලා බදු ගෙවන ව්‍යාපාරිකයින්ව තලලා වැඩකුත් නැහැ. ගෙවන ප්‍රමාණයට වඩා දහ දොළොස් ගුණයක් ඉන්නවා, අඩුම ගණනේ ශතයක්වත් ගෙවන්නේ නැති අය. ඔය channel කරන දොස්තර මහත්වරු, නීතිඥවරු, විශේෂයෙන්ම වෘත්තීයවේදීන් බොහෝ දෙනෙක් බදු ගෙවන්නේ නැහැ. සමහරු ගෙවනවා. හැබැයි, බොහෝ දෙනා ගෙවන්නේ නැහැ. සමහර tuition mastersලා දැන් වුවමනාවෙන්ම ඉදිරිපත් වනවා. දැන් ඒ අයට තේරෙනවා මේක කළ යුතු දෙයක් කියලා.

ඇත්ත වශයෙන්ම මම කියන්න සන්තෝෂයි, අපි නව ආදායම් බදු පනත අප්‍රේල් මාසයේ 01වැනි දා ආරම්භ කළාට පසුව, පළමු මාසයේ දී විතරක් අලුත් බදු ලිපි ගොනු 41,000ක් සති තුනක දී ඇරලා තිබුණා. ඒ කියන්නේ, දැනට තිබෙන මුළු ගණනින් සියයට 10කට ආසන්න ප්‍රමාණයක්. මාසයක් ඇතුළත දී තමන් වුවමනාවෙන්ම -ස්වේච්ඡාවෙන්ම- ඇවිල්ලා බදු ගෙවන්න කටයුතු කරලා තිබෙනවා. ඒක හොඳ දෙයක්. මොකද, අපිත් බලාපොරොත්තු වෙන්නේ 2020 වනකොට, -එන අවුරුද්ද අන්තිම හා ඊට පසු අවුරුද්ද වනකොට- සෘජු බදු ගෙවන ප්‍රමාණය වැඩි කරගෙන VAT එක සියයට 2.5කින් අඩු කිරීමටයි. ඒ කියන්නේ, සෘජු බදු වැඩි කරගෙන, සාමාන්‍ය මිනිස්සු ආහාර ද්‍රව්‍යවලට ගෙවන බද්ද, ඇඳුම් පැළඳුම්වලට ගෙවන බද්ද, බෙහෙත්වලට ගෙවන බද්ද සියයට 2.5කින්වත් අඩු කිරීමේ ඉලක්කය ඇතිවයි අපි කටයුතු කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1950 වර්ෂයේ සිට අපේ රාජ්‍ය ආදායම දෙස බැලුවොත්, සෑම වසරකදීම රාජ්‍ය ආදායමට වඩා රාජ්‍ය වියදම වැඩිවෙලා තිබෙනවා. 1950දී රාජ්‍ය ආදායම රුපියල් බිලියන 0.6යි; වියදම රුපියල් බිලියන 0.8යි. ඒ කියන්නේ, අය වැය හිඟය විධියට තිබුණේ රුපියල් බිලියන 0.2යි. 1960 වෙනකොට අය වැය හිඟය රුපියල් බිලියන 0.4 දක්වා වැඩි වුණා. දශම ගණන්වල තිබුණු අය වැය හිඟය 2005 වසර වෙනකොට රුපියල් බිලියන 172 දක්වා වැඩි වුණා. 1950දී රුපියල් බිලියන 0.2ක්ව තිබූ අය වැය හිඟය 2015 වසර මුලදී අපි ආණ්ඩුව භාරගන්න කොට රුපියල් බිලියන 829.5යි. මෙතැනදී මම එහි ප්‍රතිශතය ඉදිරිපත් කරන්නේ නැහැ. මම පසුව එය ඉදිරිපත් කරන්නම්. 2017දී අය වැය හිඟය රුපියල් බිලියන 688යි. අපි ඒක පොඩ්ඩක් අඩු කර ගත්තා. මේ අවුරුද්දේ එය රුපියල් බිලියන 675 දක්වා අඩු කරගන්න පුළුවන් වෙයි කියා අපි හිතනවා. ඇත්ත වශයෙන්ම ඒක මේ කාලය තුළදී අපි ලැබූ විශේෂ ජයග්‍රහණයක්. එපමණක් නොවෙයි, අවුරුදු 60කට පස්සේ; මම හිතන විධියට සර් ජෝන් කොතලාවල මැතිතුමාගේ ආණ්ඩුවට පස්සේ අපේ ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් ප්‍රථම වතාවට වාර්තා කළේ 2017 දෙසැම්බර් මාසයේයි. ඉතින්, මෙහෙම තිබියදී සියයට 20කින් බදු අඩු කරනවාය කියා මහින්ද රාජපක්ෂ මැතිතුමා කිව්වාම, ඇත්ත වශයෙන්ම මට නම් තේරෙන්නේ මේ වාගේ කාරණයක්. සෘජු බදු අඩු කරනවා නම්, එතුමාට අනිත් පැත්තෙන් වක්‍ර බදු විශාල වශයෙන් වැඩි කරන්න වෙනවා. මම උදාහරණයක් කියන්නම්. 2005 වෙනකොට අපේ මුළු ආදායමින් සියයට 41.2ක් ආවේ වැට් බද්දෙන්. 2016 වෙනකොට අපි ඒක සියයට 16.2 දක්වා අඩු කර තිබෙනවා. ඒ කියන්නේ, වැට් බද්ද මත යැපෙන එක අපි අඩු කර තිබෙනවා. හැබැයි, අපේ ආණ්ඩුව යටතේ 2016 වන විට Excise Tax එක - මත්පැන් සඳහා වන බද්ද - අපේ මුළු ආදායමෙන් සියයට 36කටම වඩා කියනවා. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කාලයේ එය සියයට 22යි. මොකද, ඒ ආණ්ඩුව බේබද්දන්ගෙන්, හොර අරක්කුකාරයන්ගෙන්, වල් අරක්කුකාරයන්ගෙන් පැවතුණු ආණ්ඩුවක්. අපි බියර්වල මිල අඩු කිරීම තුළින් මේ වන විටත් අරක්කු පානය කිරීම, අරක්කු sales විශාල වශයෙන් අඩු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව කොපමණ වෙලාවක් තිබෙනවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමා විනාඩි 8ක කාලයක් වැඩිපුර අරගෙන තිබෙනවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මට ඉතාම සුළු වෙලාවක් තමයි දීලා තිබුණේ.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
අරක්කු අඩු වෙනකොට කසිප්පු වැඩි වෙනවා, ගරු ඇමතිතුමනි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඔබතුමාගේ figuresම තමයි ඒ කාලයේ මම පාවිච්චි කළේ. ඔබතුමා මෙතැන; මගේ ආසනය ළඟින්ම ඉඳගෙන මට ගොඩක් උදව් කළා. කෙසේ වෙතත් එහි ඇත්තක් තිබෙනවා. හැබැයි අනිත් පැත්තෙන් අපි, විශේෂයෙන්ම Excise Department එකේ Commissioner General of Excise විශාල මෙහෙයුමක් කරලා, බේරුවල වගේ ප්‍රදේශවල තිබෙන වල් රා නිෂ්පාදනය විශාල වශයෙන් අඩු කර තිබෙනවා.

ඒක ඉතා අමාරු අභියෝගයක්. විශේෂයෙන් දුප්පත් මනුෂ්‍යයාගේ බීම වන ගල් අරක්කු බෝතලේ මිල නම් ඊට වඩා අඩු වෙන්න ඕනෑය කියා මමත් හිතනවා. ඔබතුමන්ලාගේ අවසරය දෙනවා නම් අපට ඒක කරන්නත් පුළුවන්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ජනාධිපතිතුමා කාගේද?

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
"ඔබතුමන්ලාගේ අවසරය" කියා මම කිව්වේ, මුළු ආණ්ඩුවේම අවසරයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ බදු සංශෝධනය කළා; කරනවා. එම පනතේත් අඩු පාඩු තිබෙන තැන් පෙන්නුවාම, ඉතා සංවේදී ආණ්ඩුවක් හැටියට අපි ඒවාත් සංශෝධනය කර තිබෙනවා. මේ වන විට අපි අවුරුදු 18න් පහළ දරුවන්ගේ ඉතුරුම්වලට අදාළ පොලිය සඳහා බදු අය කිරීම ඉවත් කර තිබෙනවා. පසු ගිය ආණ්ඩුව කාලයේ -රාජපක්ෂ යුගයේ- Withholding Tax එක සියයට දෙකහමාරක් තිබුණා. අපි ඒකත් ඉවත් කළා. ඒ සියල්ල ඉවත් කරලා පාර්ලිමේන්තුවට ඉදිරි සති කිහිපය තුළදී සංශෝධනයක් ගෙනෙනවා. ඒ විතරක් නොවෙයි, කර්තෘ භාග මත පනවා තිබූ බදු සම්බන්ධයෙනුත් අඩු පාඩුවක් තිබෙන බව අපි පිළිගත්තා. අවසානයේදී අපි එකඟ වුණා, මාසයකට රුපියල් 50,000කට වඩා royalties ලබනවා නම් පමණක් බදු අය කරන්න. ඒ කියන්නේ, අවුරුද්දකට රුපියල් ලක්ෂ 5කට වැඩියෙන් royalties ලැබෙනවා නම් යම් බද්දක් ගෙවන්න වෙනවා. ඊට අඩුවෙන් royalties ලැබෙන කාගෙන්වත් බදු අය කරන්නේ නැහැය කියන නිගමනයට ඇවිත්, ඊට අදාළ සංශෝධන කිහිපයක්ම අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා.

මට මේ වෙලාවේ කථා කරන්න තවත් කරුණු රාශියක් තිබුණත්, කාල වේලාව මදි නිසා වැඩිපුර කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මම මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමාට කියනවා, එතුමාට ඇත්ත වශයෙන්ම මේ බදු ගැන ප්‍රශ්නයක් තිබෙනවා නම්, සාධාරණ තර්ක විතර්ක තිබෙනවා නම් කරුණාකර, ජනතාව නොමඟ යවනසුළු අසත්‍ය ප්‍රකාශ කරන්නේ නැතිව, පුවත් පත්වලට අසත්‍ය දේවල් කිය කියා ඉන්නේ නැතිව, මාත් එක්ක සාකච්ඡාවකට එන්න කියලා. මේක අභියෝගයක් නොවෙයි. [බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඔබතුමන්ලා තමයි පුවත් පත්වලට අසත්‍ය දේවල් කියන්නේ. [බාධා කිරීම්]

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
අසත්‍ය නොවෙයි, සියයට සියයක් ඇත්ත. මම ආයෙත් දැක්කා - [බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
මම අභියෝග කරනවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මමත් අභියෝග කරනවා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
දැන් අභියෝගය භාර ගන්න.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
අපි භාර ගත්තා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඔබතුමන්ලා 2014දී, - [බාධා කිරීමක්]

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
2014දී අපි - [බාධා කිරීමක්] ඉන්න, ඉන්න. තව වේලාව ගන්න ඕනෑ නැහැ. ඔබතුමාගේ අභියෝගය භාර ගන්නවා. මා හිතන විධියට ඔබතුමා අපේ අමාත්‍යාංශයටත් ලිපියක් එවා තිබෙනවා, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ පිහිටෙන්. ඒ සම්පූර්ණ විස්තර ඔබතුමාට දෙන්නම්. නමුත්, ඔබතුමාම බාධා කරපු, ඉදිරිපත් කරන්න එපාය කියපු තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත අද ඔබතුමාගේම පිහිටට ඇවිත් තිබෙනවා. [බාධා කිරීම්] ඇයි? ඔබතුමන්ලා තමයි - [බාධා කිරීමක්] ගරු කරු ජයසූරිය මැතිතුමා එදා තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත පාර්ලිමේන්තුවට ගෙනෙන්න හදනකොට ඔබතුමන්ලා ආණ්ඩු පක්ෂයේ පූර්ණ බලය පාවිච්චි කරලා, ඒක ගැන සාකච්ඡා කරන්නවත් ඉඩ දුන්නේ නැහැ. [බාධා කිරීම්] එතකොට ඔබතුමා හිටියේ ආණ්ඩුවේ නොවෙයිද?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
එතුමා ආණ්ඩුවේ හිටියා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඔව්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවේ ඉඳගෙන, "පවුලකට මාසයක් ජීවත් වෙන්න රුපියල් 2,500ක් ඇති" කියන මෝඩ කථාව කිව්වේ එතුමායි.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ටී. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් ඇමතිතුමාගෙන් කරුණු පැහැදිලි කර ගැනීමක් කරගන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, - [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අභියෝගය භාර ගන්නවා. [බාධා කිරීම්] ඒ කරුණු සියයට සියයක්ම නිවැරදියි කියන කාරණය ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, - [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ටී. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා. ඒ අවස්ථාවේදී කථා කරන්න.

මීළඟට, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කාරණයක් කියන්න අවසර දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා මගේ නම සඳහන් කළ නිසා කාරණයක් පැහැදිලි කළ යුතුයි. මම කිසි දවසක, "පවුලකට රුපියල් 2,500කින් කන්න පුළුවන්" කියලා නැහැ. [බාධා කිරීම්] මම ඉදිරිපත් කළ කැබිනට් පත්‍රිකාවක්,- [බාධා කිරීමක්] මඩ ගැසීම සඳහා උපන් හපනකු වන එතුමා විසින් මේ කරන ප්‍රචාරයට මා උත්තර දෙන්නම්. සල්ලි වියදම් කරලා, මහජනයාගේ බදු මුදල් වියදම් කරලා පට්ටපල් අසත්‍ය කියන්න එපා. ලංකා ඉතිහාසයේ, - [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා.11.15]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම ඔබතුමා නියෝජ්‍ය කථානායක ධුරයට තේරී පත්වීම පිළිබඳව මාගේත්, අපේ කණ්ඩායමේත් සුබ පැතුම් අපේ පක්ෂය වෙනුවෙන් මේ අවස්ථාවේදී මා පිරිනමනවා. මොකද, ඔබතුමා ඉතාම නිහතමානියි. මම විශ්වාස කරනවා, මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ වාගේම විපක්ෂයේ හැමෝමත් එක්ක සාධාරණ විධියට කටයුතු කරන්න ඔබතුමාට හැකියාව ලැබෙයි කියලා.

මා හිතන්නේ අපේ බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කියපු දේ එක විධියකට හරි. එතුමා රුපියල් 2,500කින් පවුලකට ජීවත් වන්න පුළුවන්ය කියලා කිව්වේ ආණ්ඩු පක්ෂයේ සිටිනකොටයි. "එය කිව්වේ නැහැයි" කියලා එතුමා කියන්නේ විපක්ෂයේ සිටිනකොටයි. ඒක හරි. ඒ කියන්නේ එතුමා ඒක කිව්වේ කොයි පැත්තේ ඉඳගෙනද කියන එකයි මෙතැනදී වැදගත් වන්නේ. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, කරුණාකරලා ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා මගේ නම කිව්වා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමාගේ නම කියන්න සිද්ධවනවා, කෑ ගහන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
රුපියල් 2,500කින් පවුලකට ජීවත් වන්න පුළුවන්ය කියලා මම කවදාවත් කියලා නැහැ. මම කියලා තිබෙනවා, මීනිහෙකු රුපියල් 2,500කින් නොමැරී ජීවත්වනවා කියලා. මොකද, ඒ කාලයේ අධ්‍යාපන පීඨවල සිටි ළමයින්ට මාසයකට ගෙව්වේ රුපියල් 2,500යි. ඒ මුදල රුපියල් 3,000ට වැඩි කර ගන්න Cabinet Paper එකක් දාපු එකට තමයි මේ කථාව හදලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හරි, පැහැදිලියි. එතුමා කිව්වේ එම මුදලින් පවුලකට ජීවත් වන්න පුළුවන් කියලා නොවෙයි, මහපොළ ශිෂ්‍යත්වලාභියෙකුට ජීවත් වන්න පුළුවන්ය කියලායි. එතුමා කියලා තිබෙන්නේ මහපොළ ශිෂ්‍යත්වයේ වටිනාකමයි. එතුමා කියලා තිබෙන්නේ එම මුදලින් පවුලකට ජීවත් වන්න පුළුවන්ය කියලා නොවෙයි, විශ්වවිද්‍යාලයේ සිටින ළමයෙකුට මහපොළ ශිෂ්‍යත්වයෙන් ජීවත් වන්න පුළුවන්ද, බැරිද කියන එකයි. ඒ අනුව විශ්වවිද්‍යාලයේ සිටින ළමයෙකුට ලැබෙන මහපොළ ශිෂ්‍යත්වයේ වටිනාකමයි

එතුමා කියලා තිබෙන්නේ. එවකට එතුමා ආණ්ඩුව පැත්තේ සිටි නිසා මහින්ද රාජපක්ෂ මහත්තයා ඒ වෙලාවේ එතුමාට කිව්වා, "ඕක කිව්වේ පවුලකටම කියලා කියන්න." කියලා. ඒක තමයි වුණේ. මම මේ විවාදයේදී ඔය සම්බන්ධයෙන් තවත් පැටලෙන්න යන්නේ නැහැ. ඒකෙදි එතුමාගේ විෂය දැනුමට වුණු අසාධාරණය ගැන මා කනගාටු වනවා.

අද සාකච්ඡා කෙරෙන මාතෘකාව පිළිබඳව විෂය භාර අමාත්‍යතුමාටත් යම්කිසි පැහැදිලි කිරීමක් කරන්න පුළුවන් නම් හොඳයි. මොකද, අද ප්‍රධාන වශයෙන්ම කථා කරන්නේ ආනයනය කරන පානීය නොවන ස්ප්‍රිතුවලට අය කරන සුරා බදු පිළිබඳවත්, රට බීමහල් තැබෑරුම් විවෘත කරන වෙලාව පිළිබඳවත්, කාන්තාවන් තැබෑරුම් හා හෝටල්වල -අනුමත බලපතුලත් ස්ථානවල- සේවයේ යෙදවීම පිළිබඳවත්ය.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

අද දින සාකච්ඡාවට නියමිත වූ සුරාබදු ආඥාපනත යටතේ දෙවන නිවේදනය සාකච්ඡාවෙන් ඉවත් කළා. මොකද, ඒ සම්බන්ධයෙන් Supreme Court එකේ නඩුවක් විභාග වනවා. එම නඩුව මේ සතියේත් විභාගයට ගන්න නියමිතව තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

හරි. ඊ ළඟට, ස්ප්‍රිතුවල පල්පය පිළිබඳව තිබෙනවා. ඒක මොකක්ද කියලා මට තේරෙන්නේ නැහැ. පොදුවේ ගත්තොත් දැන් තිබෙන විශේෂ ප්‍රශ්නය මේකයි. ගරු ඇමතිතුමනි, මේ ස්ප්‍රිතු ආනයනයේදීත්, ඒ වාගේම රට බීමවලටත් -අරක්කු වර්ගවලට- වරින් වර ආණ්ඩුව බදු ගහනවා. දැන් මේ එක් නිවේදනයක් යටතේත් රුපියල් 6ක බද්දක්, රුපියල් 1.50ක බද්දක් ආදී වශයෙන් බදු කිහිපයක් යෝජනා කෙරෙනවා. වක්‍ර බදු සහ ඍජු බදු ක්‍රියාවලිය සම්බන්ධයෙන් ඉතාම හොඳ විග්‍රහයක් ඔබතුමා ඉදිරිපත් කළා. ඒ විග්‍රහයට අනුව ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වනවා නම්, යම් ප්‍රමාණයකට ජනතාවටත් සාධාරණයක් වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ, අවශ්‍ය අයගෙන් ඍජු බදු අරගෙන වක්‍ර බදු ප්‍රමාණය අඩු කරන ප්‍රතිපත්තිය. එතැනදි බදු ගෙවන ප්‍රමාණය සහ බදු ගෙවීමට අදාළ එහෙත් බදු නොගෙවන ප්‍රමාණය පිළිබඳව සොයා බැලිය යුතුවනවා. ගරු ඇමතිතුමනි, දැන් ඔබතුමා කියපු ආකාරයට සති තුනකදී files 41,000ක් විවෘත වුණේත්, මිලියන 21කින් දැනට files ලක්ෂ 4ක් තිබෙනවා කියන්නේත් කාගේද? එතකොට ඒකෙදි ඍජු බදුවලට අදාළව නිශ්චිත වූ, ඒ ඍජු බදුවලිනුත් ඇත්තටම ඍජු බදු ගෙවිය යුතු එහෙත් නොගෙවන අය -ගෙවීම පැහැර හරින අය, මහ හරින අය- හඳුනාගන්න ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ පවතින දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට තිබෙන යන්ත්‍රණය මොකක්ද? දැන් සුරා බදුම උදාහරණයකට ගන්න. ලංකාවේ සුරා බදු ක්‍රියාවලියට සම්බන්ධ ස්කාගාර පවත්වාගෙන යන හැබෑවටම බදු ගෙවිය යුතු අය එම බදු ගෙවනවාද? අද පනවනවා වාගේම බද්දක් පැනවූවාට පස්සේ මොකක්ද වන්නේ? ඒ විධියට පානීය නොවන ස්ප්‍රිතු ආනයනය කිරීමට බදු පැනෙව්වාට පස්සේ වෙන්නේ මොකක්ද? සමහර විට පානීය නොවන ස්ප්‍රිතු ගෙනැල්ලා ස්ප්‍රිතු හදනවා.

සුවඳ විලවුන් වර්ග, වෙනත් වර්ගවලට රසායනික ද්‍රව්‍ය හැටියට යොදවා ගන්න ස්ප්‍රිතු නේ මේ "පානීය නොවන ස්ප්‍රිතු" කියන්නේ. ඒ ස්ප්‍රිතු ස්කාගාර පවත්වා ගෙන යන අය අරගන්නවා. පානීය නොවන කියන category එක යටතේ ඔවුන්ට බදු සහනයක් තිබෙනවා. ඒ බදු සහනය ස්කාගාර අයිතිකරුවන් ගන්නවා. ගරු ඇමතිතුමනි, ලංකාවේ ස්කාගාර පවත්වාගෙන යන හුහක් අය නැහැ. කිහිප දෙනෙක් පාර්ලිමේන්තුවේ ඉන්නවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අයිති ස්කාගාර තිබෙනවා. ඒ ගැන ඔබතුමා දන්නවා. පාර්ලිමේන්තුවෙන් එළියේ ඇලෝසියස් මහත්තයා ඉන්නවා. ඇලෝසියස් කියන නම පාවිච්චි නොකළාට වැඩිපුරම ස්කාගාර පවත්වාගෙන යන එක්කෙනෙක් තමයි ඇලෝසියස් මහත්තයා. එහෙම කිහිප දෙනෙක් ඉන්නවා. ඔබතුමාට, ඔබතුමාගේ අමාත්‍යාංශයට දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට කියන්න පුළුවන් "ලංකාවේ ලියා පදිංචි වෙලා තිබෙන සහ ලියා පදිංචි නොකළ ස්කාගාර මොනවාද? ඒ ස්කාගාරවල නිෂ්පාදන කරන ප්‍රමාණයට බදු ගෙවනවාද? බදු කොච්චර අය කරන්න පුළුවන්ද? කළුතර මෙන්ඩිස් ස්කාගාරයේ නිෂ්පාදනය කොච්චරද" කියලා සොයා බලන්න කියලා. මෙන්ඩිස් ස්කාගාරය කියන්නෙත් ඇලෝසියස්ගේ ස්කාගාරයක්. ඒ මෙන්ඩිස් ස්කාගාරයේ නිෂ්පාදනය කරන මත්පැන් ප්‍රමාණයත්, වෙළෙඳ පොළේ අලෙවි වන ප්‍රමාණයත්, ඒ අවුරුදුවල සහ මාසවල, දිනවල ඊට අදාළව ගෙවලා තිබෙන බදු ප්‍රමාණයත් ගත්තොත් බලා ගන්න පුළුවන්. මෙන්ඩිස් ස්කාගාරයෙන් බදු ගෙවලා තිබෙන ප්‍රමාණයට වඩා මන්ත්‍රීවරුන්ට අල්ලස් ගෙවලා තිබෙනවා කියලා කථාවක් තිබෙනවා. ඇලෝසියස්ගේ ස්කාගාරවලින් තමයි මන්ත්‍රීවරුන්ට සල්ලි බෙදලා තිබෙන්නේ. ඇලෝසියස්ගේ ස්කාගාර සල්ලිවලින් මන්ත්‍රීවරු සල්ලිවලට ගන්න පුළුවන් හැකියාවක් ඔහුට තිබෙනවා නම්, ඇලෝසියස්ගේ ඒ සල්ලි ආදායම් බදු හැටියට, නිෂ්පාදන බදු හැටියට, ස්කාගාර බදු හැටියට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගන්න පුළුවන්. අන්න, ඍජු බදු අල්ලන එක ක්‍රමයක්. මේක ඇලෝසියස්ගෙන් මන්ත්‍රීවරුන්ට ආවාය කියලා මන්ත්‍රීවරු බදු ගෙවන්නේ නැත්නම් ඒත් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවට එන්නේ නැහැනේ. ස්කාගාර යටතේ, ස්ප්‍රිතු යටතේ, අරක්කු නිෂ්පාදනය යටතේ එන බදු -දෙයියන්ගේ දේ දෙයියන්ට, සීසර්ගේ දේ සීසර්ට වාගේ- යන්න ඕනෑ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට නේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යන්න ඕනෑ සල්ලි මන්ත්‍රීවරුන්ගේ අතට එනවා. අන්න ඒක නිසා මන්ත්‍රීවරුන්ගේ අතට එන්නේ නැතිව ඒක දේශීය ආදායම් දෙපාර්තමේන්තුවටම ඇලෝසියස් හරහා යවා ගන්න ක්‍රමවේදයක් ඔබතුමා දැන් හදන්න ඕනෑ. ඍජු බදු file ප්‍රමාණය වැඩි කරනවා කියලා, මොකක් හෝ බදු අනුපාතයක් යටතේ අහිංසක මිනිහෙක්ගේ ඍජු බදු ප්‍රමාණය වැඩි කළා කියලා වැඩක් වෙන්නේ නැහැ. මොකද, ඒ මනුස්සයා ඊට පසුව ගිහින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉන්න නිලධාරින් අල්ලා ගෙන "මට මේක ගෙවන්න බැහැ." කියා කන් කෙඳිරි ගානවා. දැන් ඔබතුමා හොයලා බලන්න, ඍජු බදු file ඇරපු අයගෙන් ව්‍යාපාර සාර්ථක වෙලා තිබෙන්නේ කී දෙනෙකුගේද කියලා? ගෙවා ගන්න පුළුවන්ද? පුළුවන්කමකට ද ගෙවන්නේ කියලා. එහෙම නැහැ. ඒ නිසා ඇත්තටම ඔබතුමාගේ අමාත්‍යාංශයත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවත් යන්ත්‍රණය හදන්න ඕනෑ ඍජු බදු file ප්‍රමාණය වැඩි කරන්න විතරක් නොවෙයි, ඒවාට අදාළ අය ඒ බදු ගෙවන්න. අපේ රටේ දුම්කොළ නිෂ්පාදන ආයතන තිබෙනවා. දුම්කොළ බද්ද ඔබතුමන්ලා වැඩි කරනවා. ඒ අනුව සිගරට් එකේ මිල ගණන වැඩි වෙනවා. සිගරට් එකේ මිල වැඩි වුණාම ඒක වක්‍ර බද්ද හැටියට අහිංසක මිනිහා තමයි ගෙවන්න ඕනෑ. සිගරට් බොන එක අඩු කරන්න ඕනෑ. ඒක වෙනම කථාවක්. නමුත් බොන මිනිහා බොනවා නේ. අරක්කු බොන මිනිහා බොනවා. එතකොට අවසානයේ වෙන්නේ මොකක්ද? සිගරට් බොන මිනිහා, අරක්කු බොන මිනිහා බදු ගෙවනවා. සිගරට් එකේ මිල වැඩි වුණාම, අරක්කු බෝතලේ මිල වැඩි වුණාම කැමැත්තෙන් නොවෙයි අකමැත්තෙන් ගෙවනවා. බදු ගෙවනවා කියලා නොවෙයි බොන්නේ. බොන්න පුරුදු වෙච්ච නිසා බොනවා. බොනකොට බදු අය වෙනවා. නමුත්, ඇත්තම දේ මොකක්ද? නිෂ්පාදකයාගෙන් බදු අය කරනවාද? ඇලෝසියස්ලාගෙන් නිවැරදිව බදු අය කර ගන්නවාද? නැත්නම් දුම්කොළ සමාගම්වලින්, ඇලෝසියස් වැනි

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ස්කාගාර අයිතිකරුවන්ගෙන් බදු අය කර ගන්නවාද කියන එකයි ප්‍රශ්නය වන්නේ. මම හිතන්නේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවත්, මුදල් අමාත්‍යාංශයත් ක්‍රියා කළ යුතු වන්නේ බදු ගෙවිය යුතු හැබෑ කෙනා කවුද කියලා හඳුනාගෙන ඔහුගෙන් බදු අය කර ගැනීමටයි. එහෙමනැතිව, සෘජු බදු file ප්‍රමාණය වැඩි වුණා කියලා මම හිතන්නේ නැහැ file ප්‍රමාණයෙන් මේක මනින එක සාධාරණයි කියලා. මගේ අදහස වන්නේ බදු ගෙවන්න අයිති, බදු ගෙවිය යුතු, එහෙත් නොගෙවා පැහැර හරින සැබෑ අයිතිකාරයන් ටික අල්ලා ගන්න එක තමයි වඩා වටින්නේ කියායි. ඒකට ඔබතුමන්ලාට මොනවා හෝ යම් කිසි යන්ත්‍රණයක් හදන්න පුළුවන් නම් හොඳයි. ඒ සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විතරක් නොවෙයි, CID එකත් සම්බන්ධ කර ගන්න වෙයි. දූෂණ වංචා විමර්ශන ඒකකය, හදිසි වැටලීම් විමර්ශන අංශය වැනි ආයතනවල නිලධාරීන් මේ තොරතුරු හොඳට දන්නවා.

නොගෙවා ඉන්න අය කවුද, ඒ තැන් කොහේද තිබෙන්නේ කියලා ඒ අය දන්නවා. ඒ සඳහා රහස් පොලීසියේ නිලධාරීන්ගේ සහයෝගයත් ලබා ගන්න. ඔබතුමාගේ නිලධාරීනුත් මේවා ගැන දන්නවා. හරියටම ගෙවන්න ඕනෑ තැන කොතැනද කියලා දන්න, එහෙත් අය කර ගන්නේ නැති බොහෝ දෙනෙක් සුරාබදු දෙපාර්තමේන්තුවේ ඉන්නවා. මෙන්න මේ අය තමයි ගෙවන්න ඕනෑ අය කියලා ඒ අය දන්නවා. නමුත් අය කර ගන්නේ නැහැ. ගෙවන්නේ නැහැ. මොකද, ඒවාට වෙන වෙන ක්‍රමවේද හදාගෙන තිබෙනවා. මම කියන්නේ නැහැ ඒකට පගාව කියලා. නමුත් යන්ත්‍රණයක් හදාගෙන ඉන්නවා. මොකද, බදු ගෙවන්න ඕනෑ කෙනා දන්නවා, "මම කොපමණ බදු ගෙවන්න ඕනෑද?" කියලා. ඒ නිසා බදු නොගෙවීමට ක්‍රමවේදයක් හදාගන්නවා නම් ඒකෙන් කොපමණද පාඩු වෙනවාද කියලාත් ඔහු දන්නවා. ඇත්තටම ගත්තොත් ඔය යන්ත්‍රණය ඇතුළේ සුරාබදු දෙපාර්තමේන්තුවේ අය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අය ඉන්නවා කියලා මම විශ්වාස කරනවා. රේගු දෙපාර්තමේන්තුවෙත් යම් ප්‍රමාණයක් ඉන්නවා. ඒ විධියට බදු ගෙවිය යුතු අයගෙන්, ජාවාරම්කරුවන්ගෙන් පඩි ලබන ලැයිස්තුවක් තිබෙනවා. රජයේ නිලධාරියෙක් හැටියට පඩිය ගන්නවා වාගේම ඒ වාගේ අයගෙන් පඩියක් ලබන ලැයිස්තුවක් තිබෙනවා. ඔබතුමා අන්න ඒ පඩි ලබන ලැයිස්තුව හරියටම හඳුනා ගෙන ඒ අයට රජයෙන් පඩිය පොඩ්ඩක් වැඩි කරලා දුන්නත් කමක් නැහැ කියලායි මම හිතන්නේ. එහෙම කළොත් ඊට වඩා ලොකු ආදායමක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගන්න පුළුවන්. මේ පඩි ලබන ලැයිස්තුව ඒ ගොල්ලන්ගෙන් පඩි ගන්නේ නැතිව හරියටම බදු අය කළොත් රජයට විශාල වශයෙන් ආදායම් බදු එකතු කිරීමක් කරන්න පුළුවන්කම තිබෙනවා. මට ඒ ගැන කියන්න තිබෙන්නේ එපමණයි.

දැනට රේගු දෙපාර්තමේන්තුවේ මැදිහත්වීමක් නිසා ඇති වී තිබෙන සැමන් සම්බන්ධ ප්‍රශ්නයට මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. අපි මැකරල් කියන සැමන් වර්ගය චීනයෙන් ගෙන්වනවා. කුඩා ප්‍රමාණයේ සතෙක් ඒ සැමන්වල ඉන්නවාය කියලා දැන් ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා. මීට කලින් ඒ සැමන් වර්ගය ලංකාවට ගෙනැත් තිබෙනවා. චීන රජයෙන් ගෙන්වන ඒ සැමන් වර්ගය අද ලංකාවට ගෙන්වන එක නතර වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමා, යම් උෂ්ණත්වයක් යටතේ එම සැමන් වර්ගය හදනකොට ඒ මැකරල් මාළුවාගේ ශරීරයෙන් කුඩා සතෙක් ස්වාභාවිකව ඇති වෙනවා කියලා තිබෙනවා. ඒක මීට කලිනුත් සිදු වෙලා තිබෙනවා. එම නිසා Food Control Administration Unit එකවත්, SLSI එකවත් මේ සැමන් වර්ගය ගෙන්වීම නතර කරලා නැහැ. ඒක මිනිසුන්ට අහිතකර එකක් හැටියට නොවෙයි තිබෙන්නේ. නමුත් ඒ පිළිබඳ හදිසි මැදිහත්වීමක් සිදු වෙලා මේ වන විට චීන රජයෙන් සැමන් ගෙන්වීම නවත්වලා තිබෙනවා. ඒක වෙළෙඳ මාෆියාවේ තිබෙන ගැටලුවක්ද කියලා මම දන්නේ නැහැ. නමුත් ඔබතුමා මේ ගැන සොයා බලන්න. මොකද, මේක ඔබතුමන්ලාට චීන රජයත් එක්ක රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් පැටලැවිල්ලක් ඇති වෙන්න පුළුවන් කටයුත්තක් කියලා මම හිතනවා. ලංකාවට වැඩියෙන්ම සැමන් මාළු ගෙන්වන රටවල් අතර චිලී රජය වාගේම චීනයත් සිටිනවා. එම සැමන් වර්ගය ඇත්තටම ශරීරයට අහිතකර එකක්ද, මිනිසුන්ට ඒකෙන් ගැටලුවක් ඇති වෙනවාද, එහෙම නැත්නම් වෙළෙඳ මාෆියාවේ තිබෙන තරගය නිසා ඇති වුණු එකක්ද කියා සොයා බලා ඔබතුමා Food Control Administration Unit එකත්, SLSI එකත් සමඟ සාකච්ඡා කර මේ ප්‍රශ්නය නිරාකරණය කරනවා නම් හොඳයි. මොකද, අපි සැමන් ගෙන්වන චීන රටේ ආයතන SLS සහතික ලබපු, ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අනුමත කරපු, මීට පෙර ආහාර පාලන පරිපාලන ඒකකය - Food Control Administration Unit එක - අනුමත කරපු ආයතන. මම ඒ ආයතන වෙනුවෙන් නොවෙයි කථා කරන්නේ. නමුත් ක්‍රියාවලියක් හැටියට මෙපමණ කාලයක් ලංකාවට මැකරල් සැමන් ගෙන්වපු අයට මේ තහනම පැනවී තිබෙන නිසා ඒ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන්න කියා මම ඉල්ලා සිටිනවා. රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් ගත්තොත් චීනය අපට දේශපාලන වශයෙන් ආධාර ලබා දෙනවා විතරක් නොවෙයි, ඔවුන්ගේ ආයෝජන ආරක්ෂා කිරීම පැත්තෙනුත් සැලකිය යුතු ප්‍රමාණයකින් මැදිහත් වෙනවා කියා මම විශ්වාස කරන නිසා ඔබතුමාගේ අවධානය ඒ පිළිබඳවත් යොමු කරවනවා.

විශේෂයෙන් කාන්තාවන් තැබෑරුම්වල සේවයේ යෙදවීම සම්බන්ධයෙන් රජය ප්‍රතිපත්තිමය තීන්දුවක් අරගෙන එය නතර කරනවා නම් මම ඒ පිළිබඳව ගරු කරනවා. ඒ ගැසට් නිවේදනය ඉවත් කරගෙන තිබෙන නිසා මේ විවාදයේදී ඒ ගැන කරුණු ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වන්නේ නැහැ. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු රවි කරුණානායක මැතිතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[ප.භා. 11.29]

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මූලාසනයේ සිටින අවස්ථාවේ සුරාබදු ආඥාපනත යටතේ වන නිවේදන ගැන වචන ස්වල්පයක් කථා කිරීමට අවස්ථාව ලැබීම මම බොහොම අගය කරනවා. මම මේ අවස්ථාවේදී කථාව පටන් ගන්නේ, "රටේ ආර්ථික ප්‍රතිපත්තිය අපි රටටම සීමා කරන්න අවශ්‍යතාවක් නැහැ" කියමිනුයි. මොකද, මේ රට විතරක් නොවෙයි, මුළු ලෝකයම ඉතා අමාරු ආර්ථික ප්‍රශ්නයක් තුළින් තමයි ගමන් කරන්නේ.

මේ අවස්ථාවේදී අපි මතක් කර ගන්න අවශ්‍යයි, 2015 ජනවාරි මාසයේ 08 වැනි දා අපි ආණ්ඩුව භාර ගන්නකොට පැවතුණේ වටිටපු ආර්ථිකයක්; දණ ගැස්වූ ආර්ථිකයක්; ණයෙන් පිරුණු ආර්ථිකයක් බව. එවැනි ආර්ථිකයක් තමයි අපි භාර ගත්තේ. එසේ භාර ගන්නා අවස්ථාවේදී ජනතාව ඉමහත් විශ්වාසයක් ඇතුව

මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ජනාධිපති ලෙසත්, අපේ රනිල් වික්‍රමසිංහ මැතිතුමා අගමැති ලෙසත් පත් කළා. එසේ පත් කළ නිසා තමයි මේ ආර්ථිකය මෙතෙක් දුර ගෙන එන්නට පුළුවන් වුණේ. එසේ ආර්ථිකය ඉදිරියට පවත්වා ගෙන යාමේදී වැටුණු, නැතිවුණු, ණයෙන් පෙළුණු ආර්ථිකය නිවැරදි කරන්න අපට අවශ්‍ය වුණා. එසේ නිවැරදි කිරීම තුළින් අපේ ප්‍රතිපත්ති හැඩ ගස්වා ගන්න අවශ්‍ය වුණා, පළමුව අපේ ජනතාව ආරක්ෂා කිරීමට; දෙවනුව, මූල්‍ය ප්‍රතිපත්තියක්, මූල්‍ය විනයක් අනුව කටයුතු කිරීමට. එසේ කටයුතු කරන විට අපට නොයෙක් නොයෙක් විෂමතා පෙනෙන්න තිබුණා.

එදා ආණ්ඩුව භාර ගන්නා විට, එවකට අවුරුදු දෙකකට-තුනකට පෙර ඒ කියන කොන්ත්‍රාත්කරුවන්ට බිලියන 188ක් ගෙවන්නේ නැතුව තිබුණු යුගයක් තමයි අපි භාර ගත්තේ. එසේ භාර අරගෙන මාස හයක් යන්න කලින් අපේ ආණ්ඩුව තුළින් අපි ඒවා නිවැරදි කරලා නැවතී තිබුණු ආර්ථිකය නැවතත් සක්‍රිය කරන්න පටන් ගත්තා. ඒ තුළින් තමයි අපි මේ ආර්ථිකය ඉදිරියට තල්ලු කරගෙන ආවේ. අපි රට භාර ගන්නා අවස්ථාවේදී, මුදල් ඇමති වශයෙන් මා පත් කළ අවස්ථාවේදී අපට තිබුණු ආදායම මේ රටට ගත් ණයවල පොලී ප්‍රමාණය ගෙවන්න මදි වුණු ආකාරය මට මතකයි. අන්න ඒ වාගේ ණය කන්දරාවක් තමයි අරගෙන තිබුණේ. නමුත් ශත පහක ණයක් නැති ආර්ථිකයක් අපට භාර දීලා ඒක කළමනාකරණය කර ගන්න බැරි වෙලා තිබෙනවා වාගේ අද කථා කරනවා.

ගරු මංගල සමරවීර මුදල් ඇමතිතුමා පෙන්වා දුන්නා, එදා වෙනස් වී තිබුණු ආර්ථිකය අද තල්ලු කරගෙන යන්නේ කොහොමද කියලා. අපිට ලැබුණු ආදායම වැඩි වුණු ආකාරය ගැන මම සිහි කැඳවීමක් කරන්න කැමැතියි. 2014දී ආදායම 1,220 වෙනකොට, අපි 2015දී ආණ්ඩුව භාර ගත්තා. අපිට ඒ අවුරුද්දේ අපේ ආදායම බිලියන 258කින් වැඩි කරන්න පුළුවන් වුණා. ඇයි? ඊට පෙර ගෙවන්න බැරි වුණු තැන් අපි සොයා ගෙන, ඊට පෙර භාණ්ඩාගාරයට ලැබෙන්න තිබුණු මුදල් අනෙක් අයගේ සාක්කුවලට යමින් තිබුණු ක්‍රමය නැවත නිවැරදි තැනට ගෙනාවා. ඒ නිසා බිලියන 250ක් වැඩි කරගන්න හැකියාව ලැබුණා. ඒකෙන් ආදායම බිලියන 1,470ට වැඩි වුණා. 2016 වර්ෂයේදී මේ වැඩිවීම ඊටත් වඩා වැඩි කරලා බිලියන 283ක් -කවදාවත් වුණේ නැති වර්ධනයක්- දක්වා ගෙන යන්න අපට පුළුවන් වුණා. ඒ අනුව 2016දී අපේ ආදායම 1,720කට වැඩි කරන්න අපට පුළුවන් වුණා. අපි 2016 වර්ෂයේදී 2017 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුව ඉදිරිපත් කළා. අපි බිලියන 2,010ක ආදායමක් උපයන්න ඇස්තමේන්තු කළා. මීට පෙර මේවා ලබා ගන්න තිබුණු තැන් block වෙලා තිබුණේ; වහලා තිබුණේ. යන්න තිබුණු තැන්වලට නොවෙයි, අනෙක් අයගේ සාක්කුවලට තමයි ඒවා ගියේ. දැන් ඒවා නිවැරදි කරගෙන එනකොට එතැනදී යම් යම් විධියේ වෙනස්කම් වෙනවා. නමුත් 2017 වර්ෂයේ අපේ ආදායම බිලියන 147ට අඩු වෙනවා. ඒ කියන්නේ ඊට පෙර අවුරුද්දට වඩා බිලියන 132ක් අඩු වෙලා තිබෙනවා. දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 14.4ක්ව පැවති ආදායම, සියයට 13.8කට අඩු වෙලා තිබෙනවා. ඒ නිසා මගේ මිත්‍ර මුදල් ඇමතිතුමාගෙන් මම කාරුණිකව ඉල්ලීමක් කරනවා. අපේ රටේ ආර්ථිකය නිවැරදි කරන්න අවශ්‍යයි. මේ රටේ දේශපාලනඥයින් මේ රටේ ආර්ථිකය දුවවන්න ඕනෑ; නැත්නම් රජයේ නිලධාරීන් මේ රටේ ආර්ථිකය දුවවන්න ඕනෑ. මේ දෙගොල්ලන්ම එකට දුවන්න හදන කොට, පරස්පරයක් ඇති වෙනවා.

අද මේ ප්‍රශ්න ඇති වන්නේ මුදල් අමාත්‍යාංශයේ නොවෙයි; මහ බැංකුවේ කුමන්ත්‍රණකාරී ස්වරූපයක් තිබෙන නිසායි. මේවා ගැන කථා කරන්න භයක් තිබෙනවා. මේවා තමයි නිවැරදි කළ යුත්තේ. අගමැතිතුමාගේ දර්ශනයක් තිබෙනවා. ඒවා ක්‍රියාත්මක කරන්න ගියාම මහ බැංකුවේ වෙනත් ඒවා කථා කරනවා. මේක තමයි තිබෙන පරස්පරය. වැඩිකල් යන්න ඉස්සෙල්ලා මම පෙන්වා දෙන්නම්, එවැනි තත්ත්වයක් ඇති වන්නේ ඇයි කියලා. මොකද, රටේ මූල්‍ය ප්‍රතිපත්තිය තිබෙනවා. මහ බැංකුව තමයි සාමාන්‍යයෙන් එය ක්‍රියාත්මක කරන්නේ. ඒ වාගේම fiscal policy එක තිබෙනවා. ඒක මුදල් අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක කරනවා. ආදායම සහ වියදම දරාගෙන සිටින්නේ මුදල් අමාත්‍යාංශය තුළින් මේ fiscal policy එකයි. ලේකම්තුමා ඇතුළු ඉතාම දක්ෂ නිලධාරීන් එම අමාත්‍යාංශයේ සිටිනවා. මේ අය නිවැරදි කරලා ගෙනයන මාර්ගය තමයි අපට අවශ්‍ය වන්නේ. අපේ රටේ ආදායම අඩු වුණොත්, එතැන තමයි ප්‍රශ්නයක් ඇති වන්නේ. මොකද, වියදමට කිසිම ප්‍රශ්නයක් නැහැ. දවසින් දවස ඒක වැඩි වෙනවා. අසීමිත ඉල්ලීම් සීමිත සම්පත් තුළින් ප්‍රමුඛත්වය අනුව වෙනස් කරන්න යනකොට ඇතිවෙන ප්‍රශ්න තමයි අපට තිබෙන්නේ. ඒ නිසා ආදායම වැඩි කරන මාර්ග තමයි අපි ඇති කළ යුත්තේ. අප මේ අවස්ථාවේදී මේ supply side එක පැත්තෙන් කටයුතු කරන්නේ කොහොමද? ඉල්ලුම සහ සැපයුම - demand and supply - අනුව කටයුතු කරන්න අවශ්‍යයි. Supply side එක කියන්නේ සැපයුම. Demand side එක තමයි අද මේ ප්‍රශ්න ඇති කරගෙන යන්නේ. නමුත් ඒවා නවත්වන්න බැහැ. ජනතාවගේ ඉල්ලීම් අපි ලබාදෙන්න අවශ්‍යයි. නමුත් ආදායම සපයා ගන්නා මාර්ග තමයි අවශ්‍ය වන්නේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අලුත් පනත තුළින් අද එයට පණ පොවා තිබෙනවා. නමුත් සුරා බදු පනවන විට එහි ලොකු අඩුවීමක් පෙනෙන්න තිබෙනවා. මොකද, අපේ ප්‍රතිපත්ති වෙනස් කරලා තිබෙනවා. දැන් බියර් සහ අරක්කු ගැන බොහෝදෙනා අතර විවාදයක් තිබෙනවා. අපි මේ අවස්ථාවේ බියර් මිල අඩු කරලා, අරක්කු මිල වැඩි කිරීමෙන් වන්නේ නිකරුණේ බියර් බොන අය වැඩිවීමයි. එයින් ආදායම වැඩි වෙන්නේත් නැහැ. නමුත් බොන ප්‍රමාණය වැඩි වෙනවා. මේවා තමයි අපි හිතන්න අවශ්‍ය වන්නේ. බියර් සහ අරක්කුවලින් අපි ආදායම් ලැබිය යුතු නැහැ කියන ප්‍රතිපත්තියක් අනුගමනය කරනවා නම්, ඒක වෙනම දෙයක්. නමුත් මේ වාගේ අවස්ථාවක අපට කරන්න තිබෙන්නේ බොන ප්‍රමාණය වැඩි කිරීම නොවෙයි; එයින් ලබන්න පුළුවන් ආදායම වැඩි කරලා ඒ මුදල් රටේ සංවර්ධනයට පාවිච්චි කිරීමයි. 2015දී අපි භාරගත්ත ආණ්ඩුව තුළ මාසයකට සුරාබදුවලින් රුපියල් බිලියන 4ක ආදායමක් ලැබුණා. මාස තුනක් යන්න ඉස්සෙල්ලා එය මාසයකට රුපියල් බිලියන 12කට වැඩි වුණා. කොහොමද එහෙම වැඩි වෙන්නේ? ඒ වැඩි වෙන්නේ, වෙනින් තැන්වලට ගෙවන්නේ නැති ඒවා එදා ගෙවන්න පටන් ගත්ත නිසායි. හැබැයි, දැන් මේ ආදායම අඩුවෙලා තිබෙන්නේ ප්‍රතිපත්ති වෙනස්වීම නිසා බව මා මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම මේ රටට විනයක් අවශ්‍යයි. අද හැම තැනම පෙළපාළි යනවා. හැමතැනම strike කරන්න පටන් අරගෙන තිබෙනවා. කේවල් කිරීම ප්‍රශ්නයක් නැහැ. අසාධාරණ කේවල් කිරීම තමයි ප්‍රශ්නය වන්නේ. හැම තැනම බෝඩ් ලෑලි අල්ලාගෙන ඉන්නකොට රටේ ආර්ථිකය හදන්නේ කොහොමද? මේ රටට ආයෝජකයන් අවශ්‍යයි. ඉතිරි කිරීම් සියයට 25ක්, 26ක් තිබෙන රටක ඒ වාගේම දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය සියයට 7ක්, 8ක් ඉලක්ක කරන අවස්ථාවක අඩු ගණනේ තව සියයට 25ක ආයෝජනයක් මේ රටට ගෙනෙන්න අවශ්‍යයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක දේශීය වශයෙන් වෙන්න පුළුවන්; එහෙම නැත්නම් විදේශීය වශයෙන් ගේන්න අවශ්‍යයි. විදේශ ආයෝජන ගෙනෙනවා කියන එක නරක නැහැ. නමුත් ගෙනෙන්න ඕනෑ රටට ඔබින මට්ටමටයි. ඒකයි අපි කරගෙන යන්නේ. හැමදාම පෙළපාළි යනවා, හැමදාම බෝඩ් ලෑලි අල්ලාගෙන ඉන්නවා මේ රටට එන ආයෝජකයන් දැක්කොත්, ඒ අය හිතයි මොකටද මේ රටට එන්නේ කියලා. ලාඕසය, කාම්බෝජය, ඉන්දුනීසියාව, මැලේසියාව වාගේ රටවලට

[ගරු රවි කරුණානායක මහතා]

ගිහින් කිසිම ප්‍රශ්නයක් නැතුව ආයෝජනය කරන්න පුළුවන් අවස්ථාවක මේ රටට ඇවිල්ලා හිසේරදයක් එක්ක ආයෝජනය කරන්නේ ඇයි කියලා ඒ අය හිතාවි. වැඩිකල් යන්න ඉස්සර වෙලා අපේ රටේ විනය පාලනය කළේ නැත්නම් සාමාන්‍ය පෙළ අසමත් වෙන කට්ටිය "අපට සාමාන්‍ය පෙළ නැතුව උසස් පෙළ ඉගෙන ගන්න අවස්ථාව ලබා දෙන්න" කියලා පෙළපාළි යයි. මේ වාගේ ප්‍රශ්න තමයි අද රටේ ඇති වන්නේ. ඒ නිසා රටේ විනය ඇති කරන්න අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට අවශ්‍ය වන්නේ මේ රටේ ආදායම වැඩි කරන්න පුළුවන් මාර්ගයක්. ඒක මුදල් ඇමතිතුමා පෙන්වා දී තිබෙනවා. ඍජු ආදායම -ඍජු බදු- වැඩි කරන්න ඕනෑ. ඒක හරි. නමුත් වක්‍ර බදු අඩු කිරීම ලෙහෙසි නැහැ. සියයට 1කින් වක්‍ර බදු අඩුවෙනකොට රුපියල් බිලියන 135ක් අඩු වෙනවා. ඍජු බදු සියයට 15ක් අඩු කළාම ඒකෙන් අඩු වෙන්නේ රුපියල් බිලියන 125යි. මෙතෙක් කල් මේක තමයි සිද්ධවෙලා තිබෙන වෙනස. සියයට 1ක් සහ සියයට 15ක් අතර ඒ වෙනස ආදායමෙන් පෙනෙන එකක්. තවම අපේ රටේ ඍජු බදු ගෙවන්න පුළුවන් ශක්තිය ඇති කරලා නැහැ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව මෙහේ ඇවිල්ලා, පණ්ඩිත සුද්දෝ මෙහේ ඇවිල්ලා කිව්වාට අපි තමයි දන්නේ මේක කොහොමද ලබා ගත යුත්තේ කියලා. මෙන්න මෙය නොදැනුවත්ව කරන එක තමයි තිබෙන ප්‍රශ්නය. ඍජු බදු ඇති කරලා වක්‍ර බදු අඩු කිරීමේ ප්‍රතිපත්තිය හොඳයි. නමුත් අපට මේ අවස්ථාවේදී ආදායම් අවශ්‍යයි; රට සංවර්ධනය කරන්නත් අවශ්‍යයි. අද රටට ආයෝජන අවශ්‍ය වෙලා තිබෙන අවස්ථාවක්. අපේ රට වාගේම ආයෝජන හොයන වෙනත් රටවල් සමඟ ලංකාව සංසන්දනය කරනකොට තිබෙන වෙනස ගැන මම සොයා බැලුවා. සිංගප්පූරුව වාගේ රටක ඍජු බදු සියයට 17ක් තිබෙනවා. හැබැයි, එතැන dividend tax එකක් නැහැ. සාමාන්‍යයෙන් ආදායම ඉපයුවාට පසුව, ඒක බෙදන්න පටන් ගත්තාට පසුව ආණ්ඩුවක හෝ රටක ප්‍රතිපත්තියක් අනුව ඍජු බදුවලින් නවත්වන්න පුළුවන්; නැත්නම් ඒ ලාභය එළියට දෙනකොට ඒක dividend tax එකෙන් ගන්න පුළුවන්.

සිංගප්පූරුවේ dividend tax එක බින්දුවයි. වියට්නාමයේ ඍජු බදු සියයට 20යි; dividend tax එක බින්දුවයි. මැලේසියාවේ ඍජු බදු සියයට 24ක් තිබෙනවා; dividend tax එක බින්දුවයි. මියන්මාරයේ ඍජු බදු සියයට 25යි; dividend tax එක බින්දුවයි. තායිලන්තයේ ඍජු බදු සියයට 20යි; dividend tax එක 100යි. ඒ අනුව effective tax rate එක සියයට 28යි. කාම්බෝජයේ ඍජු බදු සියයට 20යි; dividend tax එක සියයට 14යි; effective tax rate එක සියයට 31යි. හැබැයි, ලංකාවේ සියයට 39.8ක් වෙනවා.

එම නිසා මගේ මිත්‍ර ගරු මුදල් ඇමතිතුමාට මම කාරුණිකව කියා සිටින්නේ, මේ රටට ආයෝජන අවශ්‍ය නම් strike නැති, පෙළපාළි නැති, ප්‍රතිපත්ති වෙනස් නොවන අනෙක් රටවල් සමඟ තරග කරන විට අපිත් තරගකාරී ස්වරූපයක සිටින්නට අවශ්‍ය බවයි. අපට සියයට 15ක් 20ක් වක්‍ර බදු දාලා, සියයට 40කට වඩා වැඩියෙන් ඍජු බදු ගන්න පුළුවන් නම් එය සාර්ථකයි. සාර්ථකත්වය තිබෙන්නේ ඒ අකාරයට අඩු පිරිසකගෙන් වැඩි බදු ප්‍රමාණයක් ලබා ගැනීම තුළයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩි 3ක කාලයක් තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ අවස්ථාවේදී ඉතාමත්ම ඕනෑකමින් කියන්නේ අප සියලුදෙනාම අමාරුවෙන් හදපු මේ ආණ්ඩුව තව අවුරුදු 10ක් 15ක් ඉදිරියට ප්‍රතිපත්ති අනුව කටයුතු කිරීම අවශ්‍ය බවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතන විධියට මගේ කාලය සම්බන්ධව සංශෝධනයක් අවශ්‍යයි. මට ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මන්ත්‍රීතුමාගේ වේලාවෙන් විනාඩි 5ක කාලයක් මට ලැබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ කාලයත් එකතු කරලා තමයි ඔබතුමට වේලාව වෙන් කළේ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට ඊට පෙර විනාඩි 10කුත් තිබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට විනාඩි 10ක් තිබුණා. ඔබතුමා කථාව පටන් ගත්තේ 11.28ට. තව විනාඩි 5ක්-

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
හොඳයි. මම තර්ක කරන්නේ නැහැ. ඔබතුමාගේ තීන්දුව අනුව කටයුතු කරන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එහෙම අසාධාරණයක් වෙන්නට මම ඉඩ නියන්නේ නැහැ.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම මේ පෙන්වා දෙමින් සිටියේ අපේ effective tax rate එක තරගකාරී ස්වරූපයකට ගේන්නට අවශ්‍ය බවයි. ඒ තුළින් තමයි මේ ආර්ථිකය ඉදිරියට තල්ලු කරගෙන යන්න පුළුවන් වෙන්නේ. අද පෙන්වන්නට හදන්නේ, මේ රටේ එක තැනක දෙකක තිබෙන ප්‍රශ්නයක් මුල් කොටගෙන මුළු රටේම ආර්ථිකය කඩා වැටෙනවා කියලායි. නැහැ. මේ රටේ එක තැනක පාරවල් හැදෙනවා, තව තැනක ගොඩනැඟිලි හැදෙනවා, තව තැනක සෞඛ්‍ය සඳහා රෝහල් හැදෙනවා , ඒ වාගේම අධ්‍යාපන ක්ෂේත්‍රය ශක්තිමත්ව ඉදිරියට යනවා. නමුත් අපේ මාධ්‍යය, -තොරතුරු ගලා යාම- බින්දුවට වැටිලා තිබෙන්නේ. අපි රුපියල් 100ක් වියදම් කළාම මාධ්‍යයෙන් පෙන්වන්නේ අපි ශතයක් වියදම් කළා කියලායි. ගිය ආණ්ඩුව ශතයක් වියදම් කළොත් රුපියල් 100ක් වියදම් කළා කියලා පෙන්වන්නට පුළුවන් ශක්තිය ඒ අයට තිබුණා. අපිට ඒ ශක්තිය නැති වෙලා තිබෙනවා. අපි ඒ හැකියාව හදලා ගන්නට ඕනෑ. මේ හරහා තමයි ජනතාවට සංවර්ධනය ඇඟට දැනෙන්නේ. අද හැම කොනකම සංවර්ධනයක් සිදුවෙනවා. ජනාධිපති සහ අගමැති අතර තිබෙන සුසංයෝගය තුළින් කොළඹ සිට

මඩකළපුවටත්, යාපනයේ සිට දෙවුන්දරතුඩුවටත් ඇස්වලට පෙනෙන සංවර්ධනයක් තිබෙනවා. අපි ඒ සංවර්ධනය ජනතාවට පෙන්වන්නට අවශ්‍යයි.

මම මේ අවස්ථාවේදී රත්තරන් සම්බන්ධයෙන් කාරණයක් කියන්නට කැමැතියි. මහ බැංකුවේ බොරු ප්‍රතිපත්තියක් පෙන්වන්නට හදලා, නොමඟ යැවීමක් ඇති කරලා තිබෙනවා. අපේ රටේ සංචාරක කර්මාන්තය සංවර්ධනය කරන්නට අවශ්‍යයි. ඒ නිසා තමයි අද ඉන්දියාවේ සංචාරකයින් සිංගප්පූරුවට සහ ඩුබායිවලට යන්නේ. සිංගප්පූරුව එක පැත්තකින් රත්තරන් සඳහා සියයට 7.7ක් වක්‍ර බදු ගෙවනවා. ඩුබායිවල මෙතෙක් රත්තරන් සඳහා වක්‍ර බදු තිබුණේ නැහැ, නමුත් පසුගිය අප්‍රේල් මාසයේ සිට සියයට 5.5ක් බදු අය කරනවා. අපි මේක දැක්කා. මුදල් අමාත්‍යාංශයේ සිටි දක්ෂ නිලධාරීන් මේ කාරණය පෙන්වා දුන්නා. මහ බැංකුවේ ඉන්න රට ගැන හිතන්නට පුළුවන් නිලධාරීන් පාවිච්චි කරලා අපි මේ බදු ප්‍රතිපත්තිය සියයට 3.5කට ගෙන ඒම තුළ ඉන්දියාවේ සිටින සංචාරකයින් මේ රටට අද්දවා ගැනීමට අපට හැකි වුණා. මේකෙන් ආදායම වැඩි වුණා; සංචාරක කර්මාන්තය වැඩි දියුණු වුණා; ලංකාව ඉදිරියට තල්ලු කරගෙන යන්න මාර්ගයක් ඇති වුණා. මේක දැක්කාම එක පාරටම එක පැත්තකින් මුදල් යනවා කියලා පෙනුණත් අනෙක් පැත්තෙන් මුදල් එන ප්‍රමාණය පෙණුනේ නැහැ. ඒ දෙක අතර ප්‍රශ්නයක් ඇති කරලා එක පාරටම පැය 24ක් යන්නට ඉස්සෙල්ලා ප්‍රතිපත්තිය වෙනස් කරනවා. ඒ ප්‍රතිපත්තිය වෙනස් වීම නිසා ඉන්දියානු සංචාරකයෝ අපේ රටට පැමිණීම අඩු වෙලා තිබෙනවා. අපට තර්ක විතර්ක කරන්නට පුළුවන්, මේ යන සල්ලි එනවාද නැද්ද කියලා. අන්තිමට සල්ලි නැතිව කොහොමද සංවර්ධනයක් ඇති වෙන්නේ? මේ නිසා තමයි අපට අවශ්‍ය වන්නේ රට ගැන කැක්කුමක් තිබෙන පිරිස-

ගරු අනුර දිසානායක මහතා
(මාණ්පුමිකු අනුර දිසානායක්ක)
(The Hon. Anura Dissanayake)

ඔබතුමා කිව්ව කාරණය පැහැදිලි වුණේ නැහැ. [බාධා කිරීමක්] වැළැක්වුණු එකයි.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)

අපි සියයට 20ට තිබුණු බදු ප්‍රමාණය සියයට 3.5ට අඩු කළා. නීත්‍යානුකූලව වක්‍ර බදු ලෙස සියයට 3.5ක් එකතු කරලා අපි කිව්වා මේක තමයි gem and jewelleryවලට සහ රත්තරන්වලට පාවිච්චි කරන්නේ කියලා. ඒ නිසා අපට තරග කරන්න පුළුවන් වුණා. මොකද, සිංගප්පූරුවේ තිබුණු සියයට 7.7ක වක්‍ර බදු ප්‍රමාණයට වඩා අඩුවෙන් අපේ බදු ප්‍රමාණය තිබුණු නිසා. ඉන්දියාවට ගිහිල්ලා සියයට 7ක් ගෙවන්නේ නැතුව, මෙහාට එනවා සියයට 3.5ක වරප්‍රසාදයක් ලබා ගන්න. සියයට 3.5ක් කියන්නේ රත්රන්වලට ලොකු ගණනක්. ඩුබායිවල රත්රන්වලට බදු සියයට බින්දුවයි තිබුණේ. ඒකට දැන් සියයට 5.5ක වැට බද්දක් දාලා තිබෙනවා. අපි ඒකත් දැකපු නිසා අපට පුළුවන් වුණා, ඒ ඩුබායිවලට යන අයත් මෙහාට ඇදගන්න. ඩුබායිවලට ගිහිල්ලා තිබුණු ඉන්දියාවේ කොම්පැනි තුනක් වහලා, ඒවා අපේ රටට ඇවිල්ලා තිබෙනවා. "මලබාර්" කියන කොම්පැනිය වාගේ කොම්පැනි තුනක් අපේ රටට ආවා. ඒ අවස්ථාව වැඩි කරනකොට තමයි එක සැරේට නැවත සියයට 15ක බදු ප්‍රමාණයක් දැම්මේ. ලංකාවේ අයට පිට රට අයත් එක්ක තරග කරන්න බැරි නිසා අපි සියයට 15ක බද්දක් දානවා කියලා, හොර-වංචා කරන්න පුළුවන් මාර්ගයක් නැවත ඇති කළා. අද පත්තරය බැලුවොත් පෙනෙනවා, කොච්චර හොරකම් සහ වංචා සිදු වෙනවාද කියලා. සුද්දෙක් එනවා, කිලෝ 10ක් එක්ක. තව සුද්දෙක් එනවා, කිලෝ 60ක් එක්ක. මේවා ඔක්කෝම අල්ලන එක තමයි රේගුවට තිබෙන්නේ. ඒක තමයි මහ බැංකුවට අවශ්‍ය වන්නේ. මොකද ඒවා නීත්‍යානුකූලව එන්න පටන් ගත්තාට පස්සේ ඔවුන්ට ගන්න දෙයක් නැහැ නේ. මෙන්න මේ තත්ත්වය තමයි අනුර දිසානායක මන්ත්‍රීතුමනි, අපි වෙනස් කරන්න හැදුවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ කථාව දැන් අවසාන කරන්න ඕනෑ.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)

නැවත සාකච්ඡා කර ඒ වාගේ තත්ත්වයක් නැවත ඇති කරන්න අවශ්‍යයි. අපි එදා එවැනි දෙයක් ගෙනාවේ ආයෝජකයන් රටට ගෙන්වා ගන්නයි. ඒ නිසා අපි නැවත මේ රටේ අපට ඔබින ප්‍රතිපත්ති ඇති කරන්න අවශ්‍යයි. එදා චන්ද්‍රිකාගේ කාලයේ රටේ ආර්ථිකය ඍණ ආර්ථිකයට ගෙන යන්න හදපු අය සමඟ නැවත කටයුතු කරන්නේ නැතුව, රට ගැන කැක්කුමක් තිබෙන අය ආර්ථිකය දියුණු කරන්න පාවිච්චි කරලා, නැවත සියයට 6, 7 සංවර්ධන වේගයකට අපේ රට ගෙනයන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂය පිළිගත් ඒ ආර්ථික සංවර්ධන ගමන නැවත ඇති කරලා, අවුරුදු 20ක් බලාගෙන හිටපු එක්සත් ජාතික පාක්ෂිකයන්ට මේ රටේ සංවර්ධන ප්‍රතිලාභ ලබා දෙන්න පුළුවන් වන්නේ කොහොමද කියන එක ගැන අපි හිතන්න ඕනෑ. මේ ගැන පක්ෂපාතීව කටයුතු කරන්න ඕනෑ නැහැ. අපක්ෂපාතීව, කොහොමද අපේ රට දියුණු කරන්න ඕනෑ කියන එක ගැන හිතලා, ඒක අපේ රටේ ආර්ථිකය දියුණු කරන සූත්‍රයට එකතු කරන්න ඕනෑය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ඔබතුමා දැන් කථාව අවසන් කරන්න.

ගරු රවි කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක්ක)
(The Hon. Ravi Karunanayake)

පරණ එන්ජිමට අලුත් බොඩියක් දාලා හරි යන්නේ නැහැ. අපට අවශ්‍ය වන්නේ අදට ඔබින ප්‍රතිපත්ති එක්ක ප්‍රංචි ලංකාව ලෝකයට එකතු කිරීමයි. අපේ රටේ ආනයන නවත්වන්න ඕනෑ නම්, මේ රුපියල බාල්දු කිරීම නොවෙයි කළ යුතුව තිබෙන්නේ. මේ රටට සියයට 68ක් ආනයනය කරන කොට, සියයට 32ක් අපනයනය කරන කොට, රුපියල අවප්‍රමාණය කිරීමෙන් මේ රටට වාසියක් ලැබෙන්නේ මොන ක්‍රමයෙන්ද? මහ බැංකුවේ පණ්ඩිතයෝ ඉන්නවා, රුපියල අවප්‍රමාණ කිරීමෙන් කෝටි 1,680ක ලාභයක් ලැබුණාය කියන. මෙහෙම කට්ටිය එක්කද රටට ආදරයක් ඇතුව මේ ගමන යන්නේ? කොහොමද මේ රටේ ආනයනය කරන ප්‍රමාණය සියයට 68ක් හා අපනයනය කරන ප්‍රමාණය සියයට 32ක් වෙද්දී රුපියල අවප්‍රමාණ කිරීමෙන් අපට වාසි වෙන්නේ? රුපියල අවප්‍රමාණ කිරීම නිසා නැවත රජයේ සේවකයන් පඩි වැඩි කරන්න කියලා උද්ඝෝෂණ පටන් ගනීවි. මේ වාගේ දේවල් ඇති කරනකොට අපි බලන්න ඕනෑ කොහොමද අපි cost push එක අඩු කරන්න පුළුවන් වන්නේ කියලා. ඒ කියන්නේ, ඉල්ලුම අනුව උද්ධමනය වැඩිවෙන ඒ ස්වරූපය නැති කරන්නේ කොහොමද කියලා බලන්න ඕනෑ. ඒක තුළින් තමයි රටේ ආර්ථිකය ඉදිරියට තල්ලු කරගෙන යන්න පුළුවන් වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
දැන් අවසාන කරන්න.

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට කාලය බාධා වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා ඉතාම වැදගත් පුටුවක ඉඳගෙන ඉන්න නිසා ඔබතුමාට බාධා කරන්න අකැමැතියි. ඔබතුමාගේ නම්‍යශීලිභාවය හෑල්ලු කරන්නේ නැතුව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. අපේ රටේ ආර්ථිකය රටට ඔබින අන්දමට හදන්න ඕනෑය කියන එක මතක් කරමින්, මම මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වෙමින් නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 11.48]

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

පළමුවෙන්ම, නියෝජ්‍ය කථානායකවරයා හැටියට ඔබතුමා මූලාසනයේ සිටින පළමුවැනි අවස්ථාවේම අපි ඔබතුමාට සුබ පතනවා. ඉතාම ස්වාධීනව, අපක්ෂපාතීව සභාවේ මන්ත්‍රීවරුන්ගේ ගරුත්වය ආරක්ෂා කරමින් කටයුතු කරනු ඇතැයි කියා අපේ බරපතළ විශ්වාසයක් ඔබතුමා පිළිබඳව තිබෙනවා.

අද ගරු මුදල් ඇමතිතුමන් විසින් ගැසට් නිවේදන දෙකක් ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
කීපයක් ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ඔව්. මගේ ළඟ තිබෙන්නේ දෙකයි. ඒ සම්බන්ධව අදහස් දැක්වීමට ලැබීම පිළිබඳව මා පළමුවෙන්ම සතුටු වෙනවා. මේ ගැසට් නිවේදන මඟින් පොල් සහ තල් ගස් මැදීම, රා බෝතල් කිරීම වැනි දේවල්වලට බදු අය කිරීමට යෝජනා කරලා තිබෙනවා. මේ කර්මාන්තය විධිමත් කිරීමට සහ රජයට බදු ආදායම් ලබා ගැනීමේ අරමුණින් මේ ගැසට් නිවේදන ඉදිරිපත් කරලා තිබෙන බවයි පෙනී යන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ මත්පැන් තත්ත්වය පිළිබඳ පිළිගත් සංඛ්‍යාලේඛන අධීක්ෂණය කරලා බලන කොට පෙනෙනවා, විශේෂයෙන්ම 2006 අංක 27 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි පනත සහ 2015 අංක 3 දරන දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරි (සංශෝධන) පනත මඟින් මද්‍යසාර භාවිතය අවම කරන්න උත්සාහ කර ඇති බව.

මෙන්න මේ පනත් දෙක මඟින් පැවැති රජය සහ වර්තමාන රජය විශාල උත්සාහයක් -විශාල ප්‍රයත්නයක්- දරා තිබෙනවා, මත් පැන් භාවිතය, මද්‍යසාර භාවිතය අඩු කරලා ඒ තුළින් රටේ ජනතාවගේ සෞඛ්‍ය ආරක්ෂා කිරීමට. මේ වන විට මත්පැන් භාවිතය නිසා සිරෝසිස් රෝගයෙන් මිය යන ශ්‍රී ලංකාවේ පුරුෂයන්ගේ අනුපාතය ලක්ෂයකට 37.3ක් බවට වාර්තා වනවා, මහ බැංකු වාර්තා අනුව. ඒ වාගේම, ශ්‍රී ලංකාවේ සිදු වන මරණ 10ක් ගත්තොත්, ඒවායෙන් 7ක්ම සිදු වන්නේ බෝ නොවන රෝග හේතුවෙන්. බෝ නොවන රෝග ඇතිවීමට බලපාන ප්‍රධාන සාධක 4න් 1ක් බවට මද්‍යසාර භාවිතය පත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මද්‍යසාර භාවිත කරන අය අතර පුරුෂයන් සියයට 39.6ක් සිටිනවා; ස්ත්‍රීන් සියයට 2.4ක් සිටිනවා. ඒ වාගේම, දැනට වයස අවුරුදු 15ට වැඩි පිරිමි ජන ගහනයෙන් සියයට 35ක් මත් පැන් පානය කරනවා. වයස අවුරුදු 15ට වැඩි කාන්තා ජන ගහනයෙන් මත් පැන් පානය කරන්නේ සියයට 1යි. ඒ අනුව, රටේ සමස්ත ජන ගහනයෙන් සියයට 64ක් කිසිම ආකාරයක මත්පැන්, මත් ද්‍රව්‍ය භාවිත නොකරන අය බව මේ වාර්තාවලින් හෙළි වනවා. මත්පැන් භාවිත කරන අය ජන ගහනයෙන් සියයට 36ක් පමණයි මේ රටේ ඉන්නේ.

පසු ගිය දවසක මේ පාර්ලිමේන්තුවේදීම ගරු මුදල් අමාත්‍යතුමා ප්‍රකාශයක් කළා. ඒ හරියටම 2017 අවුරුද්දේ ජූනි මාසයේ 22වන දායි. ඒ හැන්සාඩ් වාර්තාව මා ළඟ තිබෙනවා. එහි තීරු අංක 1880 යටතේ එතුමාගේ ප්‍රකාශය සඳහන් වනවා. එහි සඳහන්, ගරු මුදල් අමාත්‍යතුමා කරපු ප්‍රකාශය පිළිබඳව මම කෙසේවත් එකඟ වන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහි එතුමා කියා තිබෙනවා ලංකාවේ මත්පැන් පානය කරන අයගෙන් සියයට 61ක් පානය කරන්නේ කසිප්පු කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙම නම්, ලංකාවේ පස්දෙනකු මත්පැන් බොනකොට එයින් තුන්දෙනකු බොන්නේ කසිප්පු. ඒ වාර්තා කොහෙන් ගත්තාද, එතුමාට ඒවා කවුරු දුන්නාද කියන එක පිළිබඳව අපට සැකයක් තිබෙනවා. ගරු මුදල් අමාත්‍යතුමනි, ඒ වාර්තා සාවද්‍යයි. මොකද, රජය මඟින් නිකුත් කරපු සියලු වාර්තා, ලේඛන මා සතුව තිබෙනවා. ගරු ජනාධිපතුමා විසින් පත් කළ මත් ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායේ වාර්තාව මා සතුව තිබෙනවා. ඒ වාගේම, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය මඟින් "මත් ද්‍රව්‍ය පාලනය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය" නමින් වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. එහි ඇති කරුණුවල මේ වාගේ සංඛ්‍යා ලේඛන අඩංගු වන්නේ නැහැ.

ඒ වාගේම, මා ඉතා වැදගත් කරුණක් පිළිබඳව ගරු මුදල් අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවනවා. ගරු මුදල් අමාත්‍යතුමනි, කළුතර නියෝජ්‍ය පොලිස්පති කාර්යාලයට නියෝගයක් නිකුත් කර තිබෙනවා, අධිකරණයේ පැවරූ නඩුවක් සම්බන්ධයෙන්. 03875 සහ 40875 අංක දරන නඩු දෙක කළුතර මහාධිකරණයේ විභාග කර තිබෙනවා. "සුරාබදු ආඥාපනත යටතේ නීති විරෝධී මත්පැන් වැටලීමට පොලීසියට අයිතියක් නැත" කියා මේ නඩුවලදී කළුතර මහාධිකරණ විනිසුරුතුමා 2016.07.11 දින නියෝගයක් නිකුත් කර තිබෙනවා. මේ ගැන හුහක් අය දන්නේ නැහැ. හැබැයි, දැනගත් සමහර තැන්වල - බලංගොඩ සහ රත්නපුර අධිකරණවල- මේ නිවේදනයට අභියෝගයක් කළා. අභියෝග කළාම, ගරු විනිශ්චයකාරතුමාටත් සිද්ධ වුණා, නීති විරෝධී මත්පැන් පෙරන්නන් නිදහස් කර දමන්න, පොලීසියට නඩු පවරන්න අයිතියක් නැහැ කියා. ඒ නිසා මම ඒ කෙරේ ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, ගරු මුදල් අමාත්‍යතුමනි. සුරාබදු ආඥාපනත වහාම සංශෝධනයට ලක් කරලා -සුරාබදු ආඥාපනතේ 52 (1) වගන්තිය සංශෝධනයට ලක් කරලා, මත් පැන් වැටලීම් කිරීමට පොලීසියට ඇති නීත්‍යානුකූල අයිතිය තහවුරු කරන්න කටයුතු කරන්න. අපි එයට සහයෝගය දෙනවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
එය කරමින් ඉන්නවා. ඊළඟ මාස කීපය තුළ ඒ සංශෝධනය පාර්ලිමේන්තුවට අපි ඉදිරිපත් කරනවා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(*மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா*)
(The Hon. T. Ranjith De Zoysa)

බොහොම ස්තුතියි, ගරු අමාත්‍යතුමනි. ඔබතුමාගේ අවධානයට මා මේ කාරණය යොමු කළේ, නීති විරෝධී මත් පැන් භාවිතය වැඩි වන්න මේ තත්ත්වය එක හේතුවක් වෙලා තිබෙන නිසායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පෙර අදහස් දැක්වූ ගරු රවි කරුණානායක හිටපු මුදල් අමාත්‍යතුමා එතුමාගේ අදහස් දැක්වීමේදී නිරන්තරයෙන්, දිගින් දිගටම කිව්වා, රජයේ බදු ආදායම් වැඩි කර ගැනීම පිළිබඳව, ඒ වාගේම පසු ගිය රජය මඟින් ආදායම් අඩු කර තිබීම පිළිබඳව සහ කාබාසිනියා කර තිබූ ආර්ථිකයක් නැවත නිවැරැදි මහට ගැනීම පිළිබඳව.

ඒ අනුව, සුරා -මත්පැන්- සඳහා බදු වැඩි කරලා, ඒ බදු මුදල් රටේ සංවර්ධනයට යෙදවිය යුතුයි කියන එක තමයි විනාඩි පහළොවක එතුමාගේ කථාවේ මුඛ්‍ය අර්ථය -අදහස- බවට පත් වෙලා තිබුණේ. හැබැයි, රවි කරුණානායක මැතිතුමා ඉදිරිපත් කළ අදහස්වලට අනුව, එතුමාගේ ප්‍රකාශවලට අනුව බැලුවාම, අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ ප්‍රතිපත්තියට සම්පූර්ණ පරස්පර අදහස් දැක්වීමක් තමයි හිටපු මුදල් ඇමතිතුමා කළේ. 2015.07.09 වනදා ජා-ඇල නගර සභා ක්‍රීඩාංගණයේ පැවැති ප්‍රසිද්ධ රැස්වීමකදී අතිගරු ජනාධිපතිතුමා -එතුමා ජනාධිපතිවරයා හැටියට පත් වුණාට පසුව- කියා තිබෙනවා, "2020 වසර වන විට සුරාබදු ආදායම් නොමැතිව ජාතික අය වැය සැකසීම රජයේ අපේක්ෂාවයි" කියලා. ජනාධිපතිතුමා එසේ ප්‍රකාශ කර තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක මම කියන එකක් නොවෙයි; මත්ද්‍රව්‍ය නිවාරණය පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකායෙන් නිකුත් කළ නිවේදනයක සඳහන් ප්‍රකාශයක්. ඒ අනුව මුදල් ඇමතිතුමාගෙන් මේ කාරණය ගැන මා දැන ගන්න සතුටුයි. ප්‍රශ්නයක් අහනවා නොවෙයි. ජනාධිපතිතුමාගේ මේ වැඩ පිළිවෙළ අනුව යනවා නම්, 2018 වසරේ ඉඳලා පොල් ගස්, තල් ගස්වල ඉඳලා හැම එකටම අදාළව සුරාබදු සහ බලපත්‍ර ගාස්තු වැඩි කරලා බදු අය කිරීම ජනාධිපතිතුමා කියා තිබෙන මේ වැඩ පිළිවෙළට කොයි තරම් දුරට එකඟද කියලා මා දැනගන්න සතුටුයි. විශේෂ කාර්ය සාධක බලකායක් පත් කරලා, ගරු අතුරලියේ රතන හාමුදුරුවන්ගේ නායකත්වය තුළ "මතින් නිදහස් රටක්", "මතින් වැළලෙමුද - මතින් වැළකෙමුද" ආදී වශයෙන් ප්‍රකාශන හඳලා, ඡන්දයට පෙර රටේ ජනතාව අතර ඒවා ප්‍රචාරය කරලා බලය අරගෙන, දිගින් දිගටම මත්පැන් සඳහා බදු අය කරනකොට, නූතන ගොබෙල්ස් ඉන්නේ ඔය පැත්තේද, මේ පැත්තේද කියලා දැන් මට හිතෙනවා. ගරු මුදල් ඇමතිතුමාගේ කථාව ආරම්භයේ ඉඳලාම මම අහගෙන හිටියා. ජනාධිපතිතුමා කියපු දේ නොවෙයි දැන් ක්‍රියාත්මක වෙන්නේ. ජනාධිපතිතුමා එහෙම කියලා ඡන්දය ගත්තා; අරගෙන ජනාධිපති බවට පත් වුණා. හැබැයි අද කෙරෙන්නේ ඒක නම්, නූතන ගොබෙල්ස් න්‍යාය අනුගමනය කරන්නේ ආණ්ඩුවේ කොයි පැත්තද කියන එක පිළිබඳව මට විශාල ගැටලුවක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේ බියර් මිල අඩු කළා. බියර් මිල අඩු කළේ, මිනිස්සු නීති විරෝධී මත්පැන් බොන එක වළක්වා බියර් පානයට හුරු කරවන්නය කියලා ගරු මුදල් ඇමතිතුමා ප්‍රකාශයක් කළා. ගරු රවි කරුණානායක හිටපු මුදල් ඇමතිතුමා ඒකට හාත්පසින්ම වෙනස් ප්‍රකාශයක් මේ ගරු සභාවේ කර තිබෙනවා. "බියර් මිල අඩු කළා කියලා රටට ලැබුණු ආදායමකුත් නැහැ; මත්පැන් බීමේ අඩුවකුත් නැහැ"යි කියලා එතුමා කිව්වා. දැන් සිටින මුදල් ඇමතිතුමා කියනවා, බියර් මිල අඩු කිරීම හොඳයි කියලා. ගරු මුදල් ඇමතිතුමා පසුගිය අය වැය ඉදිරිපත් කරලා බියර් සඳහා තිබුණු මිල අඩු කළා. මත්පැන්වල අඩංගු වෙලා තිබෙන ඇල්කොහොල් ප්‍රතිශතය මත බදු අය කිරීම හොඳයි. බියර්වල ඇල්කොහොල් ප්‍රතිශතය අඩු නම් මිල අඩු විය යුතුයි. හැබැයි අඩු වෙන්න ඕනෑ, තිබුණු මිලෙන් පහළට නොවෙයි, තිබෙන මිලේ ඉඳලායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(*மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(*மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா*)
(The Hon. T. Ranjith De Zoysa)

තිබෙන තැන ඉඳලායි මිල අඩු වෙන්න ඕනෑ. මේක එහෙම නොවෙයි. බියර් මිල විශාල වශයෙන් අඩු කළා. ඒ තුළින් පාසල් ශිෂ්‍යයෝ බොහෝ දෙනෙක් මත් පැන්වලට හුරු වෙලා තිබෙනවා. ගරු මුදල් ඇමතිතුමාට අපි යෝජනාවක් ඉදිරිපත් කරනවා. ගරු මුදල් ඇමතිතුමනි, මත්පැන්වල අඩංගු වෙලා තිබෙන ඇල්කොහොල් ප්‍රතිශතය මත බදු අය කිරීමේ වැඩ පිළිවෙළට අපිත් එකඟයි; ඒක හොඳයි. සැර වැඩි මැත්පැන්වලට සැර බද්දක්, සැර අඩු මත්පැන්වලට අඩු බද්දක් අය කිරීම හොඳයි. හැබැයි ඔබතුමාගේ අතින් සිදු වුණු වැරැද්ද තමයි තිබෙන ප්‍රතිශතයට වඩා පහළට බියර්වල මිල අඩු කිරීම. ගරු ඇමතිතුමනි, රුපියල් 150ට තිබුණු බියර් කෑන් එක රුපියල් 100ක් වුණා. ඒක එතැනින් ඉහළට නේ යන්න ඕනෑ. නමුත් දැන් මේ අඩු වීම තුළ එක පැත්තකින් රජයට ලැබෙන්න තිබුණු බද්ද අඩු වුණා; ඒ වාගේම ආදායමත් අඩු වුණා. ඒ වාගේම පාසල් ශිෂ්‍යයන් බොහෝ දෙනෙකු මත් පැන් සඳහා හුරු වීමේ ප්‍රවණතාවකුත් ඇති වී තිබෙනවා. මෙන්න මේ ප්‍රවණතාව පිළිබඳව රටට ආදරය කරන උදවිය හැටියට, විශේෂයෙන්ම ගරු මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළ මේ ආණ්ඩුව තුළ තිබෙනවා නම්, කළ යුත්තේ මේක නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මට වෙලාව ලබා දීම පිළිබඳව මා ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම අවසාන වශයෙන් මා තව ඉල්ලීමක් කරනවා. රජය විශාල බදු ආදායමක් බලාපොරොත්තු වුණත් අද මේ ආකාරයට කටයුතු කිරීම තුළ සමාජයීය වශයෙන් විශාල පරිහානියක් සිදුවෙලා තිබෙනවා. ගරු මුදල් ඇමතිතුමනි, 2019 අය වැයත් ඔබතුමාටම ඉදිරිපත් කරන්න ලැබේවා කියා අපි ප්‍රාර්ථනා කරනවා. අන්න ඒ අය වැය ඉදිරිපත් කරනකොට හරි, සුරාබදු පිළිබඳව රජයේ ප්‍රතිපත්තිය මීට වඩා දැඩි විය යුතුයි කියන යෝජනාව ඉදිරිපත් කරමින්, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ගරු නියෝජ්‍ය කථානායකතුමාට ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(*மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(*மாண்புமிகு துஷார இந்துனில் அமரசேன*)
(The Hon. Thushara Indunil Amarasena)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(*மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රංජිත් ද සොයිසා මැතිතුමා මත්පැන් හා සම්බන්ධව බොහොම විශාල, -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්]

මීළඟට, ගරු නිරෝෂන් පෙරේරා රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[මධ්‍යාහ්න 12.00]

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ප්‍රථමයෙන්ම ඔබතුමාට සුබ පතනවා. නියෝජ්‍ය කථානායකතුමා හැටියට ස්වාධීනව කටයුතු කරමින්, මේ පාර්ලිමේන්තුවේ ගරුත්වයත් ආරක්ෂා කරගනිමින් ඉදිරියේ දී කටයුතු කරගෙන යාමට ඔබතුමාට හැකි වේවා කියා මා ප්‍රාර්ථනා කරනවා.

අද දින මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාතුමා විසින් ඉදිරිපත් කර තිබෙන සුරාබදු ආඥාපනත යටතේ නිවේදන සම්බන්ධයෙන් වන විවාදයට සහභාගි වීමට මටත් අවස්ථාව ලැබීම ගැන සතුටු වනවා. අද දිනයේ දී විශේෂයෙන්ම සුරා බදු පිළිබඳව විවිධ මත ප්‍රකාශ වුණා. මේ රටේ මත්පැන් භාවිතය වැඩි වී, ඒ තුළින් මේ රටේ සිටින ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයට අහිතකර බලපෑමක් ඇති වී තිබෙන බව අප සියලු දෙනාම පිළිගන්නවා. මත්පැන් පානය තුළින් විශේෂයෙන්ම පුරුෂ පක්ෂයේ සෞඛ්‍යයට සිදුවන හානිය පමණක් නොවෙයි, ඒ තුළින් ඔවුන්ගේ පවුල්වල පැවැත්මට සිදු වන හානිය පිළිබඳවත් අපි මේ සභාවේ අවධානය යොමු කළ යුතුයි. රටක් හැටියට අපි මත්පැන්වලින් ආදායමක් ලැබුවත්, සෞඛ්‍ය වියදම් තුළින් ඒ හා සමානම විශාල අහිතකර බලපෑමක් අපේ ආර්ථිකයට සිදු වනවාය කියන එකත් අපි පිළිගන්නට ඕනෑ. ගරු මුදල් ඇමතිතුමාගේ ප්‍රතිපත්තියක් තිබෙනවා, මධ්‍යසාර ප්‍රතිශතය වැඩි සැර මත්පැන්වලට වැඩි වශයෙන් බදු අය කළ යුතුයි කියලා. අප එයට එකඟ වෙන්න ඕනෑ. මත්පැන් භාවිතය සම්බන්ධයෙන් නීතිරීති පනවා, අන්තගාමී රටක් හැටියට එකවරම මත්පැන් භාවිතය නවත්වන්න බැහැ. විශේෂයෙන්ම ලංකාව සංචාරක කර්මාන්තය හා බැඳුණු රටක්. සංචාරකයින් විශාල පිරිසක් මේ රටට එනවා. ඒ වාගේම අපි අනෙකුත් ආගම් සහ සංස්කෘතීන් පිළිබඳව බලන කොට මේ රටේ විවිධ ප්‍රදේශවල මත්පැන් පානය පිළිබඳව විවිධ අදහස් තිබෙනවා. ඒ නිසා විවිධ ජාතීන් සිටින, විවිධ ආගම් අදහන රටක් හැටියට ඒ පිළිබඳවත් අවධානය යොමු කරලා තමයි අපි ඉදිරියට යන්නට ඕනෑ. නමුත්, සමස්තයක් වශයෙන් මත්පැන් භාවිතය අවම කිරීම සඳහා පියවර ගත යුතු බව ලෝකයම පිළිගන්නවා. ඒ නිසා, ඒ පිළිබඳවත් අපි විශේෂ අවධානය යොමු කරවනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නීති විරෝධී මත්පැන් ගැනත් මෙහිදී සඳහන් කළ යුතුයි. විශේෂයෙන්ම ඒ සම්බන්ධයෙන් නඩු පැවරීමේ දී පොලිසිය අනුගමනය කළ යුතු නීතිරීති තිබෙනවා. ඒවා ඉතා ඉක්මනින් නීත්‍යානුකූලව වෙනස් කළ යුතුයි. මොකද, පොලීසිය තමයි අපේ රටේ තිබෙන සෑම ගමක්ම, සෑම ප්‍රදේශයක්ම ඉතා ඉක්මනින් ආවරණය කරන්න පුළුවන් ශක්තියක් තිබෙන ආයතනය. අනෙක් ආයතනවලට එවැනි ශක්තියක් නැහැ. ඒ නිසා පොලීසියට අවශ්‍ය කටයුතු අනිවාර්යයෙන්ම ඉටු කර දිය යුතුයි. අද වන විට මේ නීති විරෝධී මත්පැන් හා අනෙකුත් මත් ද්‍රව්‍ය වැනි දේවල් අපේ ගම් තුළට ඇවිල්ලා විශාල හානියක් සිද්ධ වෙනවා. ඒවා මැඩලීම සඳහා පොලීසියට අවශ්‍ය ශක්තිය ඉතාම ඉක්මනින් ලබා දිය යුතුයි. දීර්ඝ කාලයක් තිස්සේ මේ ප්‍රශ්නය තිබුණත්, දකුණු පළාතෙන් එය හෙළි වන තෙක් කිසිවෙක් ඒ ගැන අවධානය යොමු කළේ නැහැ. ඒ නිසා, ඉතාම කෙටි කාලයකින් මේ ප්‍රශ්නය විසඳන්න කටයුතු කරන්න කියා අපි ගරු මුදල් අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා.

අද වන කොට ලංකාවේ ලැබෙන ආදායම් ගැන කථා කළා. ඔබතුමන්ලා දන්නවා, අපේ රටේ ආර්ථික ක්‍රමය වෙනස් කිරීම සඳහා රජය ප්‍රතිපත්තියක් ඔස්සේ ඉදිරියට ගමන් කරමින් සිටින වෙලාවක් බව. අපේ රට එදා විවෘත ආර්ථිකය මත අපනයනයන් තුළින් ශක්තිමත් ආර්ථිකයක් පවත්වාගෙන ගිය රටක්. නමුත් අපි 2015 දී බලය ගන්න කොට අපනයනය කඩාගෙන වැටිලා, විදෙස් වෙළෙඳ පොළවල් නැති වෙලා, අපට තිබුණු ආදායම් මාර්ග ඇහිරිලා තිබුණා. අපේ රටේ තිබුණු කර්මාන්තශාලා බංගලිදේශය වැනි රටවලට ලබාගෙන, අපේ තරුණ තරුණියන්ට රැකියා උත්පාදනය කරන්න බැරි තත්ත්වයක් තිබුණා. ඒ නිසා තරුණ තරුණියන් රජයේ රැකියා ඉල්ලන තත්ත්වයකට පත් වෙලා තිබුණා. එවැනි රටක් හැටියට තමයි 2015දී අපි මේ රට භාර ගත්තේ. නමුත්, යුරෝපා සංගමයේ GSP Plus සහනය, යුරෝපා සංගමයේ මත්ස්‍ය අපනයනය වැනි වෙළෙඳ ගිවිසුම්වල ප්‍රතිලාභ තුළින් අද වන විට පැහැදිලි ලෙස ශක්තිමත් අපනයනයක් මේ රටේ ස්ථාපිත කර තිබෙනවා.

අද වන විට ඉතිහාසයේ වැඩිම අපනයන ශක්තිය ලංකාව ලබාගෙන තිබෙනවා. ඒ වාගේම අද වන විට විදෙස් ආයෝජන විශාල ලෙස වැඩිවෙලා තිබෙනවා. ඒ අපනයන ශක්තිය තුළිනුත්, විදෙස් ආයෝජන වැඩිවීම තුළිනුත් නැවතත් අපේ ආර්ථිකය සුබ දිශාවකට ගමන් කරනවාය කියන එක අපට පෙනෙනවා. සමහර වෙලාවට අප හිතන තරමට මේ ආර්ථිකයේ ප්‍රතිසංස්කරණ - වෙනස්කම්- කර ගන්නට අපට බැරි වන්නට ඇති. මොකද, අපි ඉන්නේ ජාතික ආණ්ඩුවක නිසා. එක්සත් ජාතික පක්ෂයේ ආර්ථික ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආර්ථික ප්‍රතිපත්ති සියයට සියයක් ගැළපෙන්නේ නැහැ. ඒ නිසා ලංකාවේ පළමුවැනි වතාවට ජාතික ආණ්ඩුවක් තුළ සිටිමින්, තර්ක විතර්ක කරමින් මේ රටේ ආර්ථිකය ගෝලීය ආර්ථිකයට සම්බන්ධ කරන්නේ කොහොමද, ගෝලීය ආර්ථිකය තුළින් අනෙක් දියුණු රටවල් අභිබවා යන්නේ කොහොමද, ඒ ලැබෙන සම්පත් අපේ තරුණ තරුණියන් අතර, ජනතාව අතර සාධාරණ ලෙස බෙදන්නේ කොහොමද කියන පුළුල් කථිකාව අපේ ආණ්ඩුව තුළ නිරන්තරයෙන්ම තිබෙනවා.

විශේෂයෙන්ම අපි මේ කාරණයත් මතක් කරන්නට ඕනෑ. මේ අවස්ථාවේ දී අපට විශාල ණය කන්දක් ගෙවන්නට සිද්ධවෙලා තිබෙනවා. අපේ ගරු මුදල් ඇමතිතුමා සඳහන් කළ පරිදි 2015ට පෙර ගත් ණයවලින් සියයට 77ක් ඉදිරි අවුරුදු කිහිපය තුළ අපට ගෙවන්න සිදු වෙලා තිබෙනවා. ඒ ණය ගෙවීමේ වගකීමත්, ඒ ණය ගෙවීමේ බරත් අප මත පැවරිලා තිබෙනවා. ඒ වාගේම ඒ ණය අරගෙන කළ ව්‍යාපෘති විධියට, විශේෂයෙන්ම හම්බන්තොට වරාය, මත්තල ගුවන් තොටුපොළ වැනි ආදායම් ලැබෙන්නේ නැති මාර්ග, නැවතත් ආදායම් ලැබෙන මාර්ග බවට හරවලා ඒ ආශ්‍රිතව කර්මාන්තශාලා, කර්මාන්තපුර ස්ථාපනය කරලා අපනයනය තුළින් ගෝලීය ආර්ථිකයට බද්ද වුණු, අප සියලු

දෙනාටම සාධාරණ ලෙස තමන්ගේ හැකියාවෙන්, දක්ෂතාවයෙන් ඉදිරියට යන්න පුළුවන් ආර්ථිකයක් අපි මේ රට තුළ ගොඩනඟනවාය කියමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගොඩොම ස්තුතියි.

The next speaker is the Hon. Douglas Devananda. You have ten minutes.

[பி.ப. 12.07]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! புதிதாகப் பதவி யேற்றிருக்கின்ற நீங்கள் இந்தச் சபையைச் சுதந்திரமாகவும் நடுநிலையாகவும் முன்னெடுப்பீர்கள் என்ற நம்பிக்கையோடு எனது வாழ்த்துக்களை உங்களுக்குத் தெரிவித்து, என்னுடைய உரையைத் தொடர்கின்றேன்.

இன்றைய தினம் நடைபெறுகின்ற மதுவரிக் கட்டளைச் சட்டத்தின்கீழான அறிவித்தல்கள்மீதான விவாதத்தில் கலந்து கொண்டு எனது கருத்துக்களையும் பதிவுசெய்வதற்கு வாய்ப்பு வழங்கியமைக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கிறேன்.

இந்த நாட்டில் ஏற்கனவே "போதைக்கு முற்றுப் புள்ளி" என்றும், தற்போது "போதையற்ற தேசம்" என்றும் போதைப் பொருள் பாவனைக்கு எதிரான செயல்திட்டங்கள் ஆரம்பிக்கப் பட்டு செயற்பாடுகள் முன்னெடுக்கப்பட்டுள்ளபோதிலும், போதைப்பொருள் பாவனை என்பது அதிகரித்துவருகின்ற நிலைமைகளே காணப்படுவதாக அன்றாடம் ஊடகங்களில் வெளிவருகின்ற செய்திகள் தெரிவிக்கின்றன.

ஆரம்பத்தில் நகரங்களிலும், பின்னர் நகரங்களை அண்டிய பகுதிகளிலும் வியாபித்திருந்த போதைப்பொருள் பாவனை யானது, இன்று கிராம மட்டங்கள் தோறும் ஆக்கிரமித்து, எமது மக்களை ஆட்டிப்படைக்கின்ற மாபெரும் அழிவாகவே உருவெடுத்துள்ளது. குறிப்பாக, எமது மாணவர் சமூகத்தை இலக்கு வைத்துள்ள ஆபத்தாகவே இது உருவெடுத்துள்ளது.

இந்த நாட்டில் வடக்கு மாகாணம் போதைப்பொருட்களின் கடத்தல் செயற்பாடுகளுக்கு முக்கிய கேந்திரமாக மாறியிருக் கின்ற சூழ்நிலையில், அதன் பாவனையும் எமது பகுதிகளில் அதிகரித்து, பல்வேறு சமூகச் சீர்கேடுகளை தோற்றுவித்து வருவதை இங்கு நான் சுட்டிக்காட்ட வேண்டியுள்ளது. இத்தகைய போதைப்பொருள் கடத்தல் செயற்பாடுகள் கடந்த காலத்தில் யுத்தம் நிலவிய காலகட்டங்களில் இல்லாதிருந்தன. அதாவது கடற்றொழில் களில் தடைகள், கடற்படையினரது தீவிர ரோந்து சேவைகள் மற்றும் வடக்கிலிருந்து தென் பகுதிக்கான தரைப் போக்குவரத்து வசதியின்மை போன்ற பல்வேறு காரணங்களால் இந்தப் பிரச்சினை அப்போது இருக்கவில்லை.

இப்போது இத்தகைய போதைப்பொருள் கடத்தல் செயற்பாடுகள் காரணமாக எமது பகுதிகளில் அதன் பாவனை அதிகரித்து, பல்வேறு சமூகப் பாதிப்புகள் ஏற்பட்டு வருகின்றமை மட்டுமல்லாது, எமது கடற்றொழிலாளர்களுக்குத் தங்களது தொழிற்றுறைகளைச் சுதந்திரமாக மேற்கொள்ள முடியாத நிலைமையும் ஏற்பட்டுள்ளது என்பதையும் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன். அந்த வகையில், கடற் றொழிலில் ஈடுபடுகின்றவர்கள் சந்தேகத்தின்பேரில் சோதனை களுக்கு உள்ளாக்கப்படுகின்றமை, கைதுசெய்யப்படு கின்றமை போன்ற செயற்பாடுகளும் இடம்பெறுகின்றன.

அதேநேரம், மேற்படி போதைப்பொருள் கடத்தல் செயற்பாடுகளைக் காரணங்காட்டி, அவற்றைத் தடுக்கின்ற நடவடிக்கைகளை மேற்கொள்வதாகக் கூறப்பட்டு, கடற் படையினர் எமது கடற்றொழிலாளர்களது வாழ்வாதார கேந்திர முக்கியத்துவம்வாய்ந்த இடங்களைத் தம்வசப்படுத்திக் கொண்டுள்ளமையும், எமது கடற்றொழிலாளர்கள் தங்களது தொழிற்றுறைகளை மேற்கொள்வதற்கு இயலாதுள்ளமைக்கு இன்னொரு காரணமாகும். இது போதைப்பொருள் கடத்தலைத் தடுப்பதற்கெனக் கூறப்பட்டாலும் வடக்கின் ஊடான போதைப்பொருள் கடத்தல் செயற்பாடுகள் எந்தளவிற்கு இதுவரையில் தடுக்கப்பட்டுள்ளன? என்ற கேள்வியே இன்று இந்த நாட்டில் எழுந்துள்ள பிரதான கேள்வியாக இருக்கின்றது.

இன்று இந்த நாட்டில் கிராம மட்டங்களிலிருந்து நகர மட்டங்கள் வரையில் போதைப்பொருள் பாவனை பெருமளவு அதிகரித்துள்ளதை நீங்கள் ஏற்றுக்கொள்கின்றீர்கள். நாளாந்தம் ஊடகங்களைப் பார்க்கின்றபோது, போதைப் பொருட்களுடன் கைதுசெய்யப்படுகின்ற சம்பவங்களைக் காணக்கூடியதாக இருக்கின்றது. அவற்றில் 99 சத வீதமான கைதுகள் நாட்டுக்குள்ளேயே இடம்பெற்றுள்ளதாகத் தெரிய வருகிறது. கடத்தப்படுகின்ற நிலையில் கடலில் வைத்துக் கைப்பற்றப்படுகின்ற சம்பவங்கள் இதுவரையில் எத்தனை நிகழ்ந்துள்ளனவென்ற கேள்வி இல்லாமல் இல்லை. கடந்த காலங்களில் கொள்கலன்களில் போதைப்பொருட்கள் இந்த நாட்டுக்குள் கொண்டு வரப்பட்டதாகவும், அவற்றைக் கைப்பற்றியதாகவும் செய்திகள் மிகவும் பரபரப்பாக வெளிவந்த தன. அதன் பின்னர் என்னவாயிற்று? இன்றுவரையில் கடத்தியவர்கள் யாரென்று எந்தத் தகவலுமே இல்லாது போய்விட்டது.

2020ஆம் ஆண்டில் போதைப் பொருளை ஒழிப்பதாகக் கூறிக்கொண்டு, புகையிலைச் செய்கையைத் தடை செய்வதற்கான நடவடிக்கைகள் எடுக்கப்பட்டு வருகின்ற நிலையில், கேரளக் கஞ்சா இந்த நாட்டுக்குள் நாளாந்தம் மிக அதிகளவில் கடத்தப்பட்டுக் கொண்டிருக்கின்றது. 'போதை அற்ற நாடு' என்பது வெறும் பிரச்சாரங்களில் மட்டுமல்லாது, அதனை ஒழிக்கக்கூடிய ஏற்பாடுகள் வலுவுள்ளதாக மேற்கொள்ளப்படுதல் குறித்தும் அதிக அவதானம் செலுத்தப்படல் வேண்டும். இன்று இந்த நாட்டில் இவற்றை ஒழிக்கின்ற - கட்டுப்படுத்துகின்ற நிறுவனங்களில் கடமையாற் றுகின்றவர்கள் எந்தளவிற்கு அர்ப்பணிப்புடன் அத்துறையில் ஈடுபட்டுள்ளனரென்பதும் எமது மக்கள் மத்தியில் கேள்விக்குறியாகவே இருந்து வருகின்றது.

இதைவிட, தற்போது போதை மாத்திரைகளும் இந்த நாட்டுக்குள் அதிகளவிலான பாதிப்பை உண்டு பண்ணுகின்ற அளவிற்கு வியாபித்து வருவதாகவே தெரிய வருகின்றது. இந்த வகையில் சுமார் 15 க்கும் மேற்பட்ட போதை மாத்திரைகள் நாட்டுக்குள் புழக்கத்தில் இருப்பதாகவே கூறப்படுகின்றது.

இந்த நாட்டில் மதுப் பாவனையும் அதிகரித்தே காணப்படுகின்றது. இதற்குப் பிரதான காரணமாக கடந்த வரவு - செலவுத் திட்டத்தில் பியருக்கான விலை குறைப்பு சுட்டிக்காட்டப்படுகின்றது. சட்டவிரோத மதுப் பாவனையை அல்லது உற்பத்தியைக் கட்டுப்படுத்துவது மற்றும் உல்லாசப் பிரயாணிகளின் வசதிகள் கருதி என மேற்படி பியர் விலைக் குறைப்பிற்கு பிரதான காரணங்களெனக் கூறப்பட்டன. இந்த

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

நாட்டில் சட்டவிரோத மதுபான பாவனை தொடர்பிலோ அல்லது உற்பத்தி தொடர்பிலோ தேசிய மட்டத்திலான புள்ளி விபரங்கள் இல்லை என்றாலும், தொழில்நுட்ப ரீதியிலான துணைத் தேசிய ஆய்வுகளைப் பொறுத்தமட்டில் சட்டவிரோத மதுபான பாவனையில் ஈடுபடுவோர் இந்த நாட்டில் 10 சதவீதத்திற்கும் குறைவானவர்களென்றே கூறப்படுகின்றது. இந்த நாட்டில் சுமார் 40 சதவீதமானோர் மதுப் பாவனைக்கு உட்பட்டுள்ள நிலையில், அதில் 10 சதவீதத்திற்கும் குறைவான அதாவது 6 - 7 சதவீதமானோர் மட்டுமே சட்டவிரோத மதுப்பாவனைக்கு உட்பட்டுள்ள நிலையில், பியர் விலைக் குறைப்பானது சட்டவிரோத மதுப் பாவனையாளர்களை அதிலிருந்து விடுபட எந்தளவிற்கு அழுத்தங்களைக் கொடுக்கும் என்பது கேள்விக்குறியாகும்.

அதேநேரம், உல்லாசப் பயணிகளின் வசதியினைக் கருதி பியர் விலைக்குறைப்பு ஏற்படுத்தப்பட்டதெனில், உல்லாசப் பிரயாணிகளுக்கான சுற்றுலா மையங்களை அமைத்து, அதற்குள் விசேட ஏற்பாடாக மேற்படி விலைக்குறைப்பு ஏற்பாடுகளை மேற்கொள்ள வேண்டும். அதைவிடுத்து, உல்லாசப் பிரயாணிகளுக்கென்று கூறிக்கொண்டு, நாடாளாவிய ரீதியில் அதற்கான விலையைக் குறைத்ததே இன்று நாட்டில் மதுபானப் பாவனை அதிகரிப்புக்குப் பிரதான காரணமாக இருக்கின்றதென்றே தெரியவருகின்றது.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have only two more minutes.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
பியருக்கு விதிக்கப்பட்டிருந்த வரியானது 50 சதவீதத்தினால் குறைக்கப்பட்டதன் காரணமாக 1995 ஆம் ஆண்டுக்குப் பின்னர் இந்த நாட்டில் மதுப் பாவனையானது அதிகரித்தே காணப்பட்டது. 2006ஆம் ஆண்டில் புகையிலை மற்றும் மதுசாரம் மீதான கொள்கை இந்த நாட்டில் நடைமுறைப்படுத்தப்பட்டதன் காரணமாக 2007ஆம் ஆண்டு முதல் இந்த நாட்டில் மதுபானப் பாவனையில் வீழ்ச்சி ஏற்பட்டிருந்தது. 2009ஆம் ஆண்டு யுத்தம் முடிவுக்குக் கொண்டுவரப்பட்டதன் பின்னர், மதுபான உற்பத்திகள் வடக்கு, கிழக்கு மாகாணங்களை நோக்கி மிக அதிகளவில் நகர்த்தப்பட்டதன் காரணமாக, 2010ஆம் ஆண்டு முதல் மீண்டும் இந்த நாட்டில் மதுபானப் பாவனையானது அதிகரிக்க ஆரம்பித்தது.

இன்று இந்த நாட்டில் பாடசாலை மாணவர்களை வெகுவாக இலக்கு வைத்துப் பல்வேறு வகையிலான போதைப்பொருட்கள் பாடசாலைகளை அண்டிய பகுதிகளிலேயே விற்பனை செய்யப்படும் செயற்பாடுகள் பெருகியுள்ளன. கடந்த வருடத்தில் போதைப் பொருள் கடத்தல் தொடர்பில் 29,790 பேர் கைது செய்யப்பட்டுள்ளனர் எனத் தெரிய வருகின்ற நிலையில், இவர்களில் 39 வீதமானவர்கள் 20 வயதினை அண்டியவர்களாகவே காணப்படுகின்றனர். 60 வீதமானவர்கள் 30 வயதினைத் தாண்டியவர்கள் எனத் தெரிய வருகின்றது.

பியரின் விலைக் குறைப்பானது இந்த நாட்டில் இளம் வயதினரிடையே குறிப்பாக, கல்வி கற்கின்ற தரப்பினரிடையே மதுப் பழக்கத்திற்கும் அதிகரித்த மதுபாவனைக்கும் வழிகாட்டியுள்ள நிலையில், இது செறிவு கூடிய மது வகைகளை நோக்கிய பயணத்திற்கும் உந்துசக்தியாக இருக்கின்றது. பியரின் விலையைக் குறைத்து, ஏனைய செறிவு கூடிய மது வகைகளின் விலை அதிகரிப்பானது, மதுப் பாவனையாளர்களைச் சட்டவிரோத மதுபானங்களை நோக்கி நகர்த்துவதாகவே இருக்கின்றது. இதனால், ஏற்கனவே 6 - 7 வீதமான அளவில் இருந்துள்ள சட்டவிரோத மதுப் பாவனையாளர்களது எண்ணிக்கை இன்னும் சில காலங்களில் அதிகரிக்கக்கூடிய வாய்ப்புகளும் இருக்கின்றன. தற்போதைய நிலையில், வடக்கு மாகாணத்தில் இத்தகைய சட்டவிரோத மது உற்பத்திகள் அதிகரித்து வருவதையும், இத்தகைய உற்பத்திச் செயற்பாடுகளில் பாடசாலைகளைவிட்டு இடைவிலகிய மாணவர்களை இணைத்துக்கொள்ளும் நடவடிக்கைகளையும் காணக்கூடியதாக இருக்கின்றது.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have to conclude your speech now.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Sir, please give me one more minute.

அதுமட்டுமல்லாது, கஞ்சா போன்ற போதைப் பொருட்களின் பாவனை அதிகரிப்பிற்கும் இது வழிவகுத்துள்ளது என்றே தெரிய வருகின்றது.

எனவே, இந்த நாட்டினைப் போதையற்ற நாடாக மாற்ற வேண்டுமெனில், இது தொடர்பிலான சட்டங்களை நடைமுறைப்படுத்துகின்ற நிறுவனங்கள் தொடர்பில் இறுக்கமான ஏற்பாடுகள் இருத்தல் அவசியமாகின்றது. வடக்கு மாகாணத்தில் கடந்த காலங்களில் போதைப்பொருள் கடத்தல் நடவடிக்கைகளைப் பெரும்பாலும் தடுப்பதற்கு எதுவாக இருந்த தமிழ்ப் பொலிஸ் அதிகாரிகள் உட்படப் பலர் இடமாற்றப்பட்டுள்ளதனால், இன்று வடக்கிலே போதைப்பொருள் கடத்தல் என்பது பாரியளவில் அதிகரித்துள்ளது.

இதேநேரம் பொலிஸ் துறையில் குற்றங்களுக்கு ஆட்படுகின்ற பொலிஸ் அதிகாரிகள் தண்டனைகள் என்ற பெயரில் வடக்கு மாகாணத்திற்கு மாற்றப்படுகின்ற நிலையில், அவர்களில் பெரும்பாலானவர்களும் மேற்படி குற்றங்களுக்குத் துணை போகின்ற நிலைமைகளும் இல்லாமல் இல்லை. எனவே, பொலிஸ் சேவைகள் ஆணைக்குழு, பொலிஸ் மா அதிபர் இது தொடர்பில் கூடிய அவதானமெடுத்து, பொலிஸ் சேவையில் இருக்கின்ற நேர்மையான அதிகாரிகளை வடக்கு மாகாணத்திற்கு நியமித்து, மேற்படி போதைப்பொருள் கடத்தல் மற்றும் விற்பனைச் செயற்பாடுகள் உள்ளிட்ட சமூகவிரோதச் செயற்பாடுகளைக் கட்டுப்படுத்துவதற்கு உடனடியாக நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன்.

அதேநேரம் எமது கடற்றொழிலாளர்களது தொழில்முயற் சிகளுக்குப் பாதிப்பினை, சிரமங்களை ஏற்படுத்தாத வகையில், தற்போது வடக்கில் நிலைகொண்டுள்ள கடற்படையினரைப் பயன்படுத்திக் கடுமையான நடவடிக்கைளை மேற்கொண்டு, இந்தப் போதைப்பொருள் கடத்தல்களை முறியடிக்க இந்த அரசு முன்வர வேண்டும் என்றும் வலியுறுத்தி விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.19]

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා නියෝජ්‍ය කථානායක ධුරයට පත් වීම සම්බන්ධයෙන් ප්‍රථමයෙන්ම මා ශුභ පතනවා. ඒ වාගේම අද දින සුරාබදු ආඥාපනත යටතේ ඉදිරිපත් කර තිබෙන නිවේදන තුනක් සම්බන්ධයෙන් අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්නට ලැබීම ගැනත් සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු නිරෝෂන් පෙරේරා රාජ්‍ය ඇමතිතුමාගේ කථාවෙන් කොටසක් උපුටා ගනිමින් මා මගේ කථාව ආරම්භ කරනවා. ඒක තමයි විශේෂයෙන්ම නීති විරෝධී මත්පැන් සම්බන්ධයෙන් තිබෙන ගැටලුව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමානයේ නීති විරෝධී මත්පැන් හැම තැනම, හැම අවස්ථාවකම ප්‍රචලිත වෙමින් පවතින බව අපි දකිනවා. දැන් මේවා සමාජය තුළ බරපතළ ප්‍රශ්නයක් බවට පත්වෙමින් තිබෙනවා. සමහර දේශපාලනඥයන්ගේ සහයෝගයත් නීති විරෝධී මත්පැන් ජාවාරමේ යෙදෙන කණ්ඩායම්වලට ලැබෙනවා. එහිදී පොලීසියටත් බලපෑම් ඇති වෙනවා. වැටලීම් කරලා, අත්අඩංගුවට ගැනීම් කරලා නීතිමය කටයුතු කරන්න යද්දී පොලීසියත් යම් යම් අපහසුතාවන්ට පත් වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේ ගරු මුදල් ඇමතිතුමා ඉන්නවා. විශේෂයෙන්ම ග්‍රාමීය ප්‍රදේශවල නීති විරෝධී මත්පැන් වර්ධනය වීම සම්බන්ධයෙන් වහාම ක්‍රියා මාර්ගයක් ගන්නා ලෙස අපි එතුමාගේ අවධානයට යොමු කරවනවා. මොකද, ඒ නීති විරෝධී මත්පැන් ජාවාරමේ යෙදෙන බහුතරයක් රජයේ දේශපාලනඥයන්ට සම්බන්ධ අයයි. මේක සමාජයට පිළිලයක්. ඒ නිසා වහාම අදාළ ආයතන දැනුවත් කරලා ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නය කියලා අපි ඉතාම ගෞරවයෙන් රජයෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුවත්පත් වාර්තාවල අපි දකිනවා, අද වන විට රුපියලේ අගය තවදුරටත් කඩා වැටෙමින් ඇමෙරිකානු ඩොලරය සඳහා ගෙවන මුදල රුපියල් 159.88 දක්වා වැඩිවෙලා තිබෙන බව. ඉතිහාසයේ වැඩිම අගය. එතකොට මේ රටේ ආනයනයන් වැඩි වන අවස්ථාවක වර්තමානයේ පවතින ජීවන වියදම ඉහළ යාමත් සමඟ කිසිම විධියකට මේ රටේ බඩු මිල අඩුවෙයි කියලා අපට විශ්වාස කරන්න බැහැ. බඩු මිල අඩුවෙලාත් නැහැ. දෛනිකව පරිභෝජනයට අවශ්‍ය සෑම භාණ්ඩයකම මිල වැඩිවෙලා තිබෙනවා.

තමන්ට ලැබෙන පඩිය, තමන්ට ලැබෙන ආදායම තමන්ගේ පවුලේ අයත් එක්ක ජීවත් වෙන්න පුළුවන් ආකාරයට වියදම් කර ගන්න බැරිවෙලා තිබෙන අවස්ථාවක්, මෙය. ඒ කියන්නේ, රුපියලේ අගය කඩා වැටීම හරහා ඉතාම සොච්චම් මුදලක් තමයි ලැබෙන්නේ. මේ තිබෙන වාතාවරණය මත අනාගතයේදී මේ රටේ ජීවන වියදම තවදුරටත් වැඩිවීම වර්තමාන රජයට කිසිසේත්ම පාලනය කර ගන්න බැරි වෙනවා. රටේ නිෂ්පාදනය අඩුවෙන්න එක පැත්තකින් නියඟය බලපෑවා.

ඊළඟට, පසුගිය දිනවල දිස්ත්‍රික්ක ගණනාවක ගං වතුර තත්ත්වයක් පැවතුණා. එතකොට නිෂ්පාදනය කඩා වැටෙනවා. "මෙවැනි තත්ත්වයකට මුහුණ දෙන්න සූදානම්ද?" කියන ප්‍රශ්නය අපට රජයෙන් අහන්න සිදුවනවා. මොකද, ජනතාව බලාපොරොත්තු වන ආකාරයේ සේවයක් වර්තමාන රජයෙන් ඉටුවෙලා නැහැ. හැබැයි අපි දකිනවා රජයේ මැති ඇමතිවරු විවිධ කථා කියනවා, විවිධ පුරසාරම් ප්‍රකාශයට පත් කරනවා. නමුත් මහ පොළොවේ යථාර්ථය තමයි, අද මේ රටේ ජනතාවට ජීවත් වෙන්න නොහැකි බව. අධික බදු බරක් තිබෙනවා. ගරු මුදල් ඇමතිතුමනි, මේ බදු සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමකුත් කරන්න වෙයි. මොකද, ඒ සම්බන්ධයෙන් යම් අපැහැදිලිතාවක් තිබෙනවා. බදු අය කිරීමේ ක්‍රමය සරල කරන්න රජය උත්සාහ කළාට, අද බදු අය කිරීමේ ක්‍රමවේදය සංකීර්ණ වෙලා තිබෙනවාය කියලායි අපි විශ්වාස කරන්නේ. බදු අය කිරීමේ ක්‍රමවේදය පිළිබඳව පුවත් පත්වල දැන්වීම් පළ කර තිබුණු බව අපි දැක්කා. බදු මුදල්වලින්ම එකතු කර ගත් මුදල්වලින් පුවත් පත් දැන්වීම් පළ කරනවා. හැබැයි, අද ජනතාවට ඒ කිසිම දෙයක පැහැදිලිතාවක් නැහැ. අවසානයේ ජනතාව කියන්නේ, "ජීවත් වෙන්න බැහැ. බඩු මිල වැඩියි." කියන එකයි.

මේ කාරණය කෙරෙහි මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්න මා කැමැතියි. පසුගිය දා ගාල්ලේ පැවති වැඩ මුළුවකදී මේ රටේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමේ සභාපතිවරයා හැටියට නෙවිල් ගුරුගේ මහත්මයා විසින් කරන ලද ප්‍රකාශයක් පුවත් පත්වල පළවෙලා තිබුණා. "අපේ රටේ දූෂණය ඉහළ ගිහින් තිබෙනවා. ඒ හේතුව මත ආයෝජකයන් මේ රටට පැමිණීම වැළැක්වෙනවා"යි කියලා ඔහු ප්‍රකාශ කර තිබුණා. මෙය බරපතළ ප්‍රකාශයක්. මොකද, ආණ්ඩුවේ දූෂණය වැඩි වෙනවාය කියන කාරණාව තමයි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපතිවරයා ගාල්ලේ වැඩ මුළුවකට ගිහින් කියන්නේ. එය එක්තරා පක්ෂයක් ඉලක්ක කරගෙනවත්, එක්තරා පුද්ගලයකු ඉලක්ක කරගෙනවත් කරපු ප්‍රකාශයක් නොවෙයි. හැබැයි සමස්තයක් වශයෙන් මේ රටේ වංචාව, දූෂණය, විශේෂයෙන්ම අල්ලස් ලබා ගැනීම ඉහළ යනවාය කියන කාරණය තමයි එතැනින් ලැබෙන පණිවුඩය වන්නේ. පසුගිය දවස් කිහිපය තුළ ජනාධිපතිතුමාගේ කාර්ය මණ්ඩල ප්‍රධානී, ඒ වාගේම හිටපු ජනාධිපතිතුමියගේ කාර්ය මණ්ඩල ප්‍රධානී අල්ලස් ලබා ගන්න ගිහින් අහුවෙලා, අද ඒ පිළිබඳව නීතිය ඉදිරියේ කටයුතු කරමින් පවතින බව අපි දැක්කා. අපේ රටට ආයෝජන පැමිණෙයි කියලා අපි විශ්වාස කළත්, මේ කාරණාව මත කිසිම අවස්ථාවක අපේ රටට ආයෝජන පැමිණෙන්නේ නැහැ. එයට හේතුව මෙකයි. අපේ රටේ අල්ලස හා දූෂණය වැඩිවෙලාය, ඒ නිසා ආයෝජකයන්ට හිතකර පරිසරයක් අපේ රටේ නැහැයි කියලා මේ රටේ රාජ්‍ය නිලධාරීන් ප්‍රකාශයට පත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමානයේ අපේ රටේ ණය සම්බන්ධයෙන් හිටපු මුදල් ඇමතිතුමා ප්‍රකාශයක් කළා. අපේ රටේ ණය වැඩිවෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි, ඒ සල්ලි අරගෙන මොනවාද කළේ කියන එක. වර්තමානයේ රුපියල් බිලියන 3,000කුත්, අය වැය ලේඛනයෙන් යෝජිත රුපියල් බිලියන 1,800කුත් අරගෙන වර්තමාන රජය, මේ ආණ්ඩුව අපේ රටට මොකක්ද කළේ? කිසිම දෙයක් කළේ නැහැ. මේ අවුරුදු තුනහමාරක කාලය තුළ කළේ, පැවති රජය විවේචනය කිරීම පමණයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් ඇමතිතුමා ගොබෙල්ස් න්‍යාය සම්බන්ධයෙන් කථා කළා. ජාත්‍යන්තර වශයෙන් සම්මානයක් ලබා දෙනවා නම්, අපේ රටේ ගොබෙල්ස් න්‍යාය සාර්ථකවම ක්‍රියාත්මක වුණු කාල වකවානුව සහ පුද්ගලයා හැටියට ඒ ගෞරවය හිමිවන්නේ මංගල සමරවීර මුදල් ඇමතිතුමාටයි. එතුමා තමයි, වර්තමාන අගමැතිතුමාට -රනිල්ට-

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

බැහැයි කියලා ඒ කාලයේ එතුමාට seal එකක් ගැහුවේ. රනිල් වික්‍රමසිංහ මහත්මයාට පුළුවන්වෙලා තිබුණු ඒවාත් ඊට පස්සේ බැරි වුණා. ඒ තරම් ශක්තිමත්ව අපේ රටේ ගොබෙල්ස් න්‍යාය ක්‍රියාත්මක කරන්න මංගල සමරවීර ඇමතිතුමා ඒ වගකීම භාර ගත්තා. ගොබෙල්ස් න්‍යාය හරහා වර්තමාන ආණ්ඩුව බලයට පත්වෙලා, ගොබෙල්ස් න්‍යාය හරහාම පවත්වාගෙන යෑමට උත්සාහ දැරීම තමයි, අපේ රටේ සියලු ආර්ථික දර්ශක කඩා වැටෙන්න හේතුව බවට පත්වෙලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ රටේ දූෂණය හා අල්ලස සම්බන්ධයෙන් කථා කළොත්, පළමුවන ස්ථානයට එන්නේ වර්තමාන අගමැතිතුමා විසින් කරපු, මෙහෙයවපු, එතුමාට චෝදනාව එල්ලවන පර්පෙචුවල් ට්‍රෙෂරීස් ආයතනය සමඟ කරපු ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර වංචාවයි.

මේ වංචාව කිසිසේත්ම අගමැතිතුමා ප්‍රමුඛ රජයට වහන්න බැහැ. අගමැතිතුමා ඊයේ පිළිතුර ලබාදීමකදී මේ ගරු සභාව තුළදී ප්‍රකාශයට පත් කරනවා අපි දැක්කා, අර්ජුන මහේන්ද්‍රන් හිටපු මහ බැංකු අධිපතිතුමාගේ දින චර්යාව සම්බන්ධයෙනුත්. "අර්ජුන මහේන්ද්‍රන් සිංගප්පූරුවේ එක තැනක වැඩි කාලයක් ඉන්නේ නැහැ. ගෙවල් තැනින් තැනට මාරු කරනවා" කියලා එතුමා කිව්වා. මේ තරම් සම්බන්ධයක් තිබෙන අර්ජුන මහේන්ද්‍රන් මේ වංචාවේ ප්‍රධාන චූදිතයා හැටියට අද අපේ රටට ගෙනෙන්න බැරි ඇයි කියන කාරණය අපි අගමැතිතුමාගෙන් අහන්න කැමැතියි. මොකද, එතුමා එක්ක තිබෙන සම්බන්ධය කොච්චර ශක්තිමත්ද කිව්වොත් එතුමාගේ දෛනික දින චර්යාව ගැන පවා වර්තමාන අගමැතිතුමා දන්නවා. මේක ඉතාම බරපතළ තත්ත්වයක්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, මේ චෝදනාව ප්‍රධාන වශයෙන් එල්ල වෙන්නේ අගමැතිතුමාට. අගමැතිතුමා ප්‍රමුඛ රජය තමයි මහ බැංකුවේ මේ මුදල් අවභාවිතාවට සම්බන්ධ වුණේ. ඒ චෝදනාව එතුමාට එල්ල වෙලා තිබෙනවා. ඒ චෝදනාවෙන් එතුමාට නිදහස් වෙන්න අවශ්‍ය නම් අනිවාර්යයෙන්ම අර්ජුන මහේන්ද්‍රන් හිටපු මහ බැංකු අධිපතිතුමා ලංකාවට ගෙනැල්ලා, පරීක්ෂණවලට යොමු කරලා, ජනතාවට සත්‍යය සැපයිය යුතුයි. එය අගමැතිතුමා ප්‍රමුඛ රජයේ වගකීමක් හැටියට අපි දකිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
කාදර් මස්තාන් මන්ත්‍රීතුමාගේ වේලාවෙන් අපට තව මිනිත්තු පහක් අමතරව ලබා දීලා තිබෙනවා කියලා දැනුම් දුන්නා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අපට දැනුම් දීලා නැහැ.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
එතුමාගෙන් විනාඩි පහක් අපට ලබා දුන්නා.

ගරු කථානායකතුමනි, මා කිව්වේ මේ වගකීමෙන් අගමැතිතුමාට මිදෙන්න බැහැ, මේ වගකීමෙන් රජයට මිදෙන්න බැහැ කියන කාරණයයි. තමන්ගේ හොරකම වහ ගන්න තවත් අයට ඇඟිල්ල දිගු කිරීම සාධාරණ නැහැ; එය සදාචාරාත්මකත් නැහැ. මේ ගනුදෙනුව සම්බන්ධයෙන් වන ප්‍රධාන කණ්ඩායම කොහේද ඉන්නේ කියලා අගමැතිතුමා දන්නවා. ඉඳලා හිටලා ගමන් බිමන් යද්දි එතුමා හමු වෙනවා ඇති කියලා අගමැතිතුමා කරන ප්‍රකාශ තුළින් අපිට හිතෙනවා. වහාම ඒ සම්බන්ධයෙන් රටට හෙළි කිරීමක් කරන්න ඕනෑ කියලා අපි දැඩිව විශ්වාස කරනවා. ඒ මුදල්වලින් දැන් කරන දේවල් බලන්නකෝ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද මන්ත්‍රීවරු හැටියට අපිට පාරේ බැහැලා යන්න බැහැ නේ. මහජන නියෝජිතයන්ට පාරේ බැහැලා යන්න බැහැ නේ. මොකද, අපි 225 දෙනාගෙන් ඕනෑම කෙනෙකු දැක්කාම ජනතාව කියන්නේ, "අහවලාත් අර කියන ලේබනයේ ඇති" කියලායි. ඒක ජනතාවගේ පැත්තෙන් සාධාරණයි. ජනතාවට දේශපාලනඥයන් එපා වීම සාධාරණයි. මොකද, මේ පාර්ලිමේන්තුවේම මන්ත්‍රීවරයෙකු කියනවා, "මෙපමණ මුදල් ලබා ගත්තා" කියලා. ඒ මුදල් ලබා ගත්තේ කාගෙන්ද? බරපතළම විධියට මේ රටේ ආර්ථිකය කඩා දැමීමේ මේ මහ බැංකු බැඳුම්කර ගනුදෙනුවයි. මේ මහ බැංකු බැඳුම්කරයේ වංචාව සිදු නොවෙන්න අපේ රටට මෙච්චර ආර්ථික අවපාතයක් එන්නේ නැහැ; මෙච්චර ආර්ථික ගැටලු එන්නේ නැහැ. මේ බැඳුම්කරයම තමයි මේ රටේ ආර්ථිකය කඩා දැමීමේ. මේ රටේ අයහපත් කළමනාකරණයම තමයි මේ රටේ ආර්ථිකය කඩා දැමීමේ. ඒ නිසා මේ අය දැන් මෙම මුදල් පාවිච්චි කරනවා, මහජන නියෝජිතයන්ගේ අතින් සිදු වෙච්ච හොරකම් ටික වහ ගන්න. කොයි වාගේ තැනකටද, අපේ රට මේ ගමන් කරන්නේ? කොයි වාගේ දිසාවකටද, අපේ රට මේ ගමන් කරන්නේ? මෑත කාලීන ඉතිහාසයේ ආසියාවේ සිදු වුණු බරපතළම වංචාව සම්බන්ධයෙන් අගමැතිතුමා ප්‍රමුඛ ආණ්ඩුව අදටත් නිහඬ පිළිවෙතක් අනුගමනය කිරීම ගැන අපට ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙච්චර අපරාධයක් මේ රටට කරලා තිබියදී, මේ චෝදනාව එල්ල වන අය FCID එකට කැඳවලා, කී දවසක් ඔවුන්ගෙන් ප්‍රශ්න කරලා තිබෙනවාද කියා මම අහන්න කැමතියි. නමුත් ඔවුන්ගෙන් ප්‍රශ්න කරලා නැහැ. පොලීසියට ඔවුන්ගෙන් ප්‍රශ්න කරන්නත් බැහැ. මොකද, FCID එකට ප්‍රශ්න කිරීමේ අයිතිය යන්නේ අගමැතිතුමා විසින් යවන පණිවුඩයක් මත පමණයි. ඒ නිසා ආණ්ඩුවට මේ අපරාධයෙන් ගැලවෙන්න බැහැ. මොන පුරසාරම් දෙඩුවත්, මොන තරම් මහින්ද රාජපක්ෂ ආණ්ඩුවට මඩ ගැහුවත් මේ කරපු අපරාධයෙන් කවදාවත් මේ ආණ්ඩුවට මිදෙන්න බැහැ කියන කාරණය අපි කියනවා.

රජයේ ආදායම වැඩි වෙලා කියලා ආණ්ඩුව ප්‍රකාශයට පත් කරනවා අපි දිගින් දිගටම දැක්කා. රජයේ ආදායම වැඩි වෙන්න ඕනෑ. එක පැත්තකින් රටේ ජාතික සම්පත් ටික විකුණනවා. අනික් පැත්තෙන් බදු බර වැඩි වෙනවා. 2014 අපේ ආණ්ඩුව බාර දුන්නා වාගේ දෙගුණයක් මේ රජය බදු අය කරනවා. ඒ නිසා වර්තමාන රජය විසින් වැඩියෙන් බදු අය කරන්නේ නැහැ කියන තර්කය කිසිම කෙනෙකුට කියන්න බැහැ. මේ ආණ්ඩුව දවසින් දවස තමන්ගේ අස්ථාවර ආණ්ඩුව රැක ගන්න සහ තමන්ගේ ආණ්ඩුවෙන් ගිලිහී යන මන්ත්‍රීවරුන් ටික රැක ගන්න අහිංසක ජනතාවට බදු ගහනවා. බදු ගහලා කරන්නේ රජය ස්ථාවරත්වයට පත් කිරීම පමණයි.

මේක රටකට ගැළපෙන ආණ්ඩුවක් නොවෙයි. අපේ ආණ්ඩුවට වඩා දැන් රුපියල් ට්‍රිලියනයක් වැඩිපුර බදු ගන්නවා. පසුගිය අවුරුද්ද වෙද්දී මේ ආණ්ඩුව රුපියල් බිලියන 1,650ක් බදු වශයෙන් ගෙන තිබෙනවා. ඒ තරම් අතිවිශාල බදු මුදල් කන්දරාවක් ජනතාවගෙන් අරගෙන ජනතාවට දුන්නේ මොනවාද කියලා අපට ආණ්ඩුවෙන් ප්‍රශ්න කරන්න වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ අවස්ථාවේ ඉල්ලීමකුත් කරනවා. ඊයේ ජනතා විමුක්ති පෙරමුණේ නායකතුමා ප්‍රශ්නයක් ඇහුවාම අගමැතිතුමා පිළිතුරු ලබා දුන් ආකාරය අපි දැක්කා. රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා ඉතාම විනයානුකූලව, ඉතාම පැහැදිලිව, කිසිම කලබලයක් නැතුව, ඉතාම සංවරව ජනතා විමුක්ති පෙරමුණේ නායකතුමාට පිළිතුරු ලබා දුන්නා. හැබැයි, ඒකාබද්ධ විපක්ෂයේ අපේ මන්ත්‍රීවරු ප්‍රශ්නයක් ඇහුවාම එහෙම කටයුතු කරන්නේ නැහැ. ඒකාබද්ධ විපක්ෂයෙන් ප්‍රශ්නයක් ඇහුවාම, එම ප්‍රශ්නය අහපු මන්ත්‍රීවරයාව සමච්චලයට ලක් කරනවා; අගමැතිවරයා හැටියට එතුමාගේ ඇති අභිමානය කෙලසා ගන්නා ආකාරයට හැසිරෙනවා. මම අහන්නේ, ජනතා විමුක්ති පෙරමුණට සලකන එක ක්‍රමයකුත්, ඒකාබද්ධ විපක්ෂයට සලකන තවත් ක්‍රමයකුත් මේ ආණ්ඩුවේ තිබෙන්නේ මොකද? විපක්ෂය නම් සියලුදෙනාටම එක හා සමානව පිළිතුරු ලබා දෙන්න ආණ්ඩුවට පුළුවන් වෙන්න ඕනෑ. මොකද, අපි මේ ඉදිරිපත් කරන්නේ ජනතාවගේ ප්‍රශ්න. ඒ නිසා මෙන්න මේ කාරණාව ගැන අපි හොඳ අවධානයෙන් ඉන්නවා. ජනතා විමුක්ති පෙරමුණට වැඩි සැලකිලි ඇයි කියලා අපි දන්නවා. අඩුම ගානේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ අයිතියවත් ඒකාබද්ධ විපක්ෂයට ලබා දෙන්නේ නැත්තේ ඇයි කියලා අපි දන්නවා. මොකද, මේ පාර්ලිමේන්තුව විකෘති පාර්ලිමේන්තුවක්. මේක ජනතාව විසින් පත් කරපු පාර්ලිමේන්තුව නොවෙයි. ජනතාව පත් කරපු පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු තමන්ට කැමැති කැමැති විධියට විකිණිච්ච පාර්ලිමේන්තුවක් බවට පත් වෙලා අස්ථාවර රජයක්, අස්ථාවර රටක් බිහි කරලා තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වාගේ අස්ථාවර පාර්ලිමේන්තුවක අපි මොන වාද විවාද කළත් ඵලක් වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසාන කරන්න.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව තත්පර 30ක් දෙන්න.

අස්ථාවර පාර්ලිමේන්තුවක මේ වාගේ වාද විවාද කරලා තේරුමක් නැහැ. මේක විසුරුවා හැරලා අලුත් පාර්ලිමේන්තුවක් නිර්මාණය කර ගැනීමේ අයිතිය අපි ජනතාවට ලබා දෙනවා.

අදත් ගරු මුදල් ඇමතිතුමා කිව්වා, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාත් එක්ක විවාදයකට දින බලාපොරොත්තුවෙන් ඉන්නවා කියලා. ගරු මංගල සමරවීර ඇමතිතුමනි, ඔබතුමා වෙනුවෙන් කවදාවත් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා දිනයක් ලබා දෙන්නේ නැහැ. දිනයක් ලබා දිය යුතුත් නැහැ. මහින්ද රාජපක්ෂයි, මංගල සමරවීරයි කියන්නේ, අහසට පොළොව වාගේ දෙදෙනෙක්! ඔබතුමා විවාද කරන්න දිනයක් බලාපොරොත්තු වනවා නම්, ඔබතුමාට කවදාවත් මහින්ද රාජපක්ෂ මහත්තයාත් එක්ක විවාද කරන්න ලැබෙන්නේ නැහැ. එහෙම විවාදයකට එන්න වටින පුද්ගලයෙක් නොවෙයි ඔබතුමා. මොකද, ඔබතුමා නොහිටපු පක්ෂයක් නැහැ; ඔබතුමා නොහිටපු කණ්ඩායමක් නැහැ; ඔබතුමා කුමන්ත්‍රණ නොගහපු කෙනෙක් නැහැ. හැම නායකයෙකුටම විරුද්ධව කුමන්ත්‍රණ ගහපු, ලංකාවට ගොබෙල්ස් න්‍යාය ගෙනා පුද්ගලයා තමයි ඔබතුමා. [බාධා කිරීම්] මංගල සමරවීර ඇමතිතුමනි, ඔබතුමා කේන්ති ගන්න එපා. ඔබතුමාට අවමානයක් නොවෙයි කළේ. ඔබතුමා කියූ දේට පිළිතුරක් පමණයි අප ලබා දුන්නේ. මෙය ඔබතුමාට කළ අවමානයක් නොවෙයි. ඔබතුමා සතුටු වෙන්න. ලංකාවට ගොබෙල්ස් න්‍යාය ගෙනාවාට ජාත්‍යන්තර සම්මානය මේ වනකොටත් ඔබතුමාට හිමි වෙලා ඉවරයි කියන කාරණාව ප්‍රකාශ කරමින්, මට කාලය ලබා දීම ගැන ගරු නියෝජ්‍ය කථානායකතුමාට ස්තූතිවන්ත වෙමින් මම නිහඬ වනවා. ස්තූතියි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මංගල සමරවීර ඇමතිතුමා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මම වර්තමාන මුදල් ඇමති හැටියට හිටපු මුදල් ඇමතිතුමාට අභියෝග කරනවා, ආර්ථිකය ගැන කථා කරන්න අපත් සමඟ සාකච්ඡාවකට එන්න කියලා. පැනලා යන්නට එපා. [බාධා කිරීම්] භයයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු ජේ.සී. අලවතුවල නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි පහයි.

[අ.භා.12.35]

ගරු ජේ. සී. අලවතුවල මහතා (ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல - உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. J.C. Alawathuwala - Deputy Minister of Home Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බොහොමත්ම ස්තූතියි. ඔබතුමා ඊයේ දිනයේ නියෝජ්‍ය කථානායකවරයා හැටියට වැඩ භාර ගත්තා. එම තනතුරට පත් වීම සම්බන්ධයෙන් ඔබතුමාට සුබ පතන අතර, ඒ කටයුත්ත සාර්ථකව ඉටු කරන්න ලැබේවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

සුරාබදු ආඥා පනත යටතේ අද ඉදිරිපත් කර ඇති නිවේදන සම්බන්ධයෙන් කථා කරන්නට පෙර අපේ ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා කථාව අවසන් කරපු තැනින් මගේ කථාව පටන් ගන්න මම කැමැතියි. එතුමා කිව්වා, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට විවාදයකට එන්න කියලා මංගල සමරවීර ඇමතිතුමා කිව්වාට එතුමා කවදාවත් එන්නේ නැහැ, දෙදෙනා අහසට පොළව වාගේ කියලා. ඒක ඇත්ත. මට මතකයි, 2005 ජනාධිපතිවරණය වෙලාවෙත් රනිල් වික්‍රමසිංහ මැතිතුමා මහින්ද රාජපක්ෂ මැතිතුමාට විවාදයකට එන්න කියපුවාම එතුමා ආවේ නැහැයි කියලා. ඒ "අහසට පොළව වාගේ" කියන කථාව ඇත්ත. මොකද, මංගල සමරවීර ඇමතිතුමා කවදාකවත් මේ රටේ ජනතා මුදල් මංකොල්ල කාපු පුද්ගලයෙක් නොවෙයි. ඒ නිසා අපි පැහැදිලිව කියනවා, ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රකාශ කළේ සත්‍යය බව.

සුරාබදු ආඥා පනත ගැන කථා කරද්දී විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, අපේ රටේ ජනතාව මත්පැන් භාවිතය අතින් ඉතාම ඉහළ තැනක සිටින බව.

[ගරු ජේ. සී. අලවතුවල මහතා]

විශේෂයෙන්ම බෞද්ධ රටක් හැටියට, මේ රටේ මත්පැන් භාවිතය වැඩිවීම සම්බන්ධයෙන් මහජන නියෝජිතයන් හැටියට අපි කවුරුත් සතුටු වෙන්නේ නැහැ. නමුත්, මම එක කාරණයක් මතක් කරන්න කැමැතියි. සුරාව පානය කරනවා වැඩියි කියලා ඒ සඳහා වන බදු වැඩි කිරීමෙන් පමණක් මේ සමාජය සුරාවෙන් තොර සමාජයක් කරන්න අපට හැකි වෙන්නේ නැහැ. ගරු මංගල සමරවීර අමාත්‍යතුමනි, එම නිසා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා. අපි විටින් විට කිහිප වතාවක් මත්පැන් සඳහා වන බදු වැඩි කරලා තිබෙනවා. ඒක අපේ සමාජයේ පහළ පන්තියේ, -එදිනෙදා වැඩ කරන කම්කරුවන්ගේ- ආර්ථිකයට බලපා තිබෙනවා. ගරු ඇමතිතුමනි, එම නිසා ඒ සම්බන්ධයෙන් අපි ඉතාම සාධාරණ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. මම මුලින් කිව්වා වාගේ මේ රටේ මත්පැන් පානය ඉහළ යනවාට අපි කැමැති වෙන්නේ නැහැ. නමුත්, අපි ඒ සඳහා වෙනත් ක්‍රියාමාර්ග ගන්න ඕනෑ. රජයක් හැටියට අපි ඒ සඳහා ක්‍රියාමාර්ග ගණනාවක් අරගෙන තිබෙනවා. සමාජයක් හැටියට ඒ සම්බන්ධයෙන්, ඒ වාගේම එහි තිබෙන ආදීනව සම්බන්ධයෙන් අපි දැනුවත් වෙන්න ඕනෑ. අපි විටින් විට, සෑම අය වැයකින්ම බදු ප්‍රමාණය ඉහළ දැමීම තුළින් අද සමාජය තුළ නීත්‍යානුකූල නොවන මත්පැන් භාවිතය වැඩිවෙලා තිබෙනවා; ඒ සඳහා ඉල්ලුමක් ඇතිවෙලා තිබෙනවා. එම නිසා විශේෂයෙන්ම නීත්‍යානුකූල මත්පැන් පාවිච්චි කරන උදව්යට අසාධාරණයක් නොවන ආකාරයෙන් කටයුතු කරන්න ඕනෑය කියන එක මම මේ වෙලාවේ මතක් කරනවා. ඒ වාගේම ඔබතුමා පසු ගිය අය වැය යෝජනා තුළ මත්පැන්වල සැර අනුව බදු අය කිරීමට ගත් තීන්දුව ඉතාමත් වැදගත්. මොකද, සැර වැඩි වෙන්න, වැඩි වෙන්න තමයි සෞඛ්‍යමය ප්‍රශ්න ඇති වෙන්නේ. එම නිසා සැර අනුව බදු අය කිරීම පිළිබඳව අපේ සතුට ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙනුත් මතක් කරන්න ඕනෑ. සංචාරක ව්‍යාපාරය සම්බන්ධයෙන් අපේ රට ඉදිරියට බලාපොරොත්තු ගණනාවක් තබාගෙන තිබෙන රටක්. එම නිසා අපි සංචාරකයන් සම්බන්ධයෙන් ක්‍රියා කරන ආයතනවලට, සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ හෝටල්වලට, ඒ වාගේම සමාජශාලා වැනි ආයතනවලට මත්පැන් සම්බන්ධයෙන් දමා තිබෙන නීති හා රෙගුලාසි ලිහිල් කිරීමක් කරලා අපේ සංචාරක ව්‍යාපාරයට මේ අංශයෙනුත් සහයෝගයක් ලබා දෙන්න ඕනෑය කියන කාරණයත් මතක් කරනවා.

සුරා බදු සම්බන්ධයෙන් කථා කිරීමේදී මම මතක් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා කිව්වා, -එතුමා දැන් සභාවෙන් එළියට ගිහිල්ලා -අපේ රජය බලයට පැමිණියාට පසු රජයේ බදු ආදායම වැඩි කරගෙන තිබෙනවා කියලා. ඇත්තටම අපි බදු ආදායම වැඩි කරගෙන තිබෙනවා. විශේෂයෙන්ම සුරා බදු සම්බන්ධයෙන් ගත්තොත්, 2014දී -අපි ආණ්ඩුව ගන්න ඉස්සෙල්ලා- සුරා බදු එකතු කිරීමේ වර්ධනය සියයට 11ක් විධියටයි තිබුණේ. නමුත්, 2015 වර්ෂයේදී අපි එය සියයට 50.3ක් දක්වා වර්ධනය කරගෙන තිබෙනවා. මහින්ද රාජපක්ෂ රජය කාලයේ රේගුව හරහා එතනෝල් ගෙන්වීමේදී විශාල බදු වංචාවක් සිදු වුණා. එතනෝල් ව්‍යාපාරය තුළින් කිහිපදෙනෙකුට පමණක් හරි හම්බ කරගන්න දෙන්නේ නැතුව රජයේ ආදායමක් හැටියට ඒවායින් බදු අය කර ගැනීම නිසා තමයි අපට මේ ප්‍රමාණය වැඩි කරගන්න පුළුවන් වෙලා තිබෙන්නේ. රුපියල් බිලියනවලින් ගත්තොත් එය විශාල ප්‍රමාණයක්. මෙවැනි කටයුතු ගණනාවක් ක්‍රියාත්මක කළ නිසා තමයි එදා මත්පැන් සම්බන්ධයෙන් කටයුතු කළ කිහිපදෙනෙක් අතරට ගිය මුදල් රජයට අය කර ගැනීමේ අවස්ථාව උදා කරගන්න රජයක් හැටියට අපට පුළුවන් වුණේ.

සුරා බදු සම්බන්ධයෙන් කතා කිරීමේදී නීති විරෝධී මත්පැන් සම්බන්ධයෙන් අපි විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. ගරු ඇමතිතුමාගේ අවධානය යොමු කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. නීති විරෝධී මත්පැන් සම්බන්ධයෙන් පොලීසිවලින් නඩු පැවරීමේදී සමහර ප්‍රදේශවල තිබෙන උසාවිවලින් යම් යම් බාධා ගණනාවක් ඇවිල්ලා තිබෙනවා. එය දිගින් දිගට සිදු වුණොත් ඉතාම අපහසු තත්ත්වයකට පත් වෙනවා. මොකද, පොලීසිය තමයි ආසන්නම ස්ථානය, ඒ වාගේම මේ සම්බන්ධයෙන් හොඳ අවබෝධයක් තිබෙන ආයතනය. යම් කෙනෙකුට නඩු පැවරීම සඳහා පොලීසියට තිබෙන තරම් පහසුකම් සුරාබදු දෙපර්තමේන්තුවට නැහැ. එම නිසා අපි පොලීසියට තිබෙන නීතිමය තත්ත්වය ඉවත් කරලා හෝ, පොලීසියට තිබෙන නඩු පැවරීමේ හැකියාව ලබා දෙන නීති සකස් කිරීමක් කරලා හෝ අපි ඒ කටයුත්ත කරන්න ඕනෑය කියන එක මම ඇමතිතුමාට මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කාන්තාවන් සම්බන්ධයෙන් නොයෙකුත් නීති රීති ඇති කරලා තිබෙනවා. අද ලෝකයේ තිබෙන නීති රීති අනුව, කාන්තාවන්ට අසාධාරණයක් වෙනවා නම්, කාන්තාවගේ රැකියාව අහිමි වෙනවා නම් ඒක අසාධාරණයි. මේ පිළිබඳවත් අපි කල්පනා කර බලන්න ඕනෑ. මොකද, අද කාන්තාවන් කියා විශේෂයක් නැහැ. පිරිමි සහ කාන්තා මේ සියලු දෙනාම ජීවත්වීම සඳහා අද රැකියා කරනවා. එසේ රැකියා කිරීමේදී යම් යම් ස්ථානවල, -විශේෂයෙන් හෝටල්වල රැකියා කිරීමේදී- අප ගෙනෙන නීති රීති අනුව ඒ අයට රැකියා අහිමි වනවා නම් ඒක විශාල අසාධාරණයක්. අපි එක පැත්තකින් කාන්තාවන්ගේ අයිතිවාසිකම් ගැන කථා කරනවා. අනෙක් පැත්තෙන් කාන්තාවන්ගේ රැකියා අහිමි වෙන විධියට අපි කටයුතු කරනවා නම් එය ඉතාමත් අහිතකර තත්ත්වයක්ය කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්නට ඕනෑ. කාන්තාවන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙනුත් අපි මේ අවස්ථාවේදී කථා කරනවා. එවැනි නීතිරීති තුළින් කාන්තාවන්ගේ රැකියාවලට බලපෑමක් ඇති වෙනවා නම් ඒ පිළිබඳවත් අපේ කනගාටුව ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු අගමැතිතුමා ප්‍රශ්නවලට පිළිතුරු දීම සම්බන්ධයෙන් ගරු සේමසිංහ මන්ත්‍රීතුමා කථා කළා. [බාධා කිරීමක්] අහගන්න. තනතුරු අවශ්‍ය නැහැ. අහගන්නකෝ. එතුමාගේ පිළිතුරු දීම සම්බන්ධයෙන් ඒ මන්ත්‍රීවරයා එක කාරණයක් විතරක් මතක් කළා. අගමැතිතුමා පැහැදිලිව පිළිතුරු දුන්නා. පසුගිය රජය කාලයේ උදයංග වීරතුංග මිග් ගනුදෙනු සම්බන්ධයෙන් විශාල වංචාවක් කර අද හැංගිලා ඉන්නවා. ඒ ගැනත් කථා කරන්න. මොකද, එකක් ගැන විතරක් කථා කරන්නේ? ඒ විතරක් නොවෙයි, ඇමෙරිකාවේ තානාපතිවරයාව සිටි ජාලිය වික්‍රමසූරිය - තමුන්නාන්සේලාගේ රජයේ, තමුන්නාන්සේලාගේ නායකයින්ගේ ඥාතීන්- අද විදේශ රටවල සැඟ වී සිටිනවා. මේ වාගේ ඒවා එකක් දෙකක් නොවෙයි තිබෙන්නේ. පසුගිය රජය කළත්, මේ රජය කළත් වැරැද්ද නම් වැරැද්ද මන්ත්‍රීතුමා. තරුණ මන්ත්‍රීවරයෙක් හැටියට ඔබතුමා එකක් ගැන විතරක් කථා කරන්නට එපා; මේ කාරණා සියල්ලම ගැන කථා කරන්නටය කියා මම කියනවා. පරණ හොරුද අලුත් හොරුද කියා නැහැ, අපේ රජය සියලුම හොරුන්ට අවශ්‍ය විධියට නීතිය ක්‍රියාත්මක කරන්න-

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! What is your point of Order?

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියපු කාරණාව විකෘති කරලායි දැන් මේ නියෝජ්‍ය අමාත්‍යතුමා කථා කළේ. අගමැතිතුමා මේ සභාවට ආව නිසා වෙන්නට ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක point of Order එකක් නොවෙයි.

ගරු ජේ. සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කිසිම විකෘති කිරීමක් කළේ නැහැ. එතුමා කියපු කාරණයයි කිව්වේ. මේ ගරු මන්ත්‍රීතුමා එක්කෙනෙක් ගැන විතරක් කථා කළා. අගමැතිතුමා ප්‍රශ්න තුනකට උත්තර දුන්නා. පසුගිය කාලයේ ඒ හොරුත් හොරු; මේ හොරුත් හොරු. අලුත් හොරු, පරණ හොරු කියා වෙන් කරන්නට බැහැ. එම නිසා මම මන්ත්‍රීතුමාට කියනවා, ඔබතුමා තරුණ මන්ත්‍රීවරයෙක් හැටියට, කථා කරනවා නම් සියලුම හොරු ගැන කථා කරන්න කියා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ඔබතුමාගේ point of Order එක මොකක්ද කියන්න.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම බාධා කිරීමක් නොවෙයි කරන්නේ. මම කියපු කාරණය විකෘති කරනවා නම් ඒ ගැන පැහැදිලි කිරීමේ අයිතියත් ඔබතුමා මට දෙන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක point of Order එකක් නොවෙයි. කථාව අවසාන කරන්න ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා.

ගරු ජේ. සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
එතුමා කියපු දෙයමයි මම කිව්වේ. විකෘති කිරීමක් කළේ නැහැ. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
නැහැ. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා එහෙම චෝදනා කරන්නට එපා. [බාධා කිරීමක්]

ගරු ජේ. සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු මන්ත්‍රීතුමනි, බොරු චෝදනා කරන්නට එපා. ළමයෙක් වාගේ හැසිරෙන්න එපා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, දැන් කථාව අවසාන කරන්න.

ගරු ජේ. සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විකෘති කිරීමක් කළේ නැහැ. එක දෙයක් ගැන විතරයි කිව්වේ. අගමැතිතුමා ප්‍රශ්න තුනකට උත්තර දුන්නා. [බාධා කිරීමක්]මන්ත්‍රීතුමාට පරණ හොරු, හොරු නොවෙයිද? ඒ හොරු, හොරු නොවෙයිද? [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් කථාව අවසාන කරන්න.

ගරු ජේ. සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
එතුමා එක්කෙනෙක් ගැන විතරයි කථා කළේ. අගමැතිතුමා ප්‍රශ්න තුනකට උත්තර දුන්නා. හොරු පරණ අයත් එකයි, අලුත් අයත් එකයි. හොරු නම් හොරු. මන්ත්‍රීතුමා එක්කෙනෙක් ගැන විතරයි කථා කළේ. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි. කරුණාකර කථාව අවසාන කරන්න.

ගරු ජේ. සී. අලවතුවල මහතා
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
ඔබතුමාට බොහොමත්ම ස්තුතියි. මම කිව්වේ, හොරු පරණ අයත් එකයි, අලුත් අයත් එකයි කියන එකයි. එතුමා තරුණ මන්ත්‍රීවරයෙක් හැටියට හොරු නම් හොරු හැටියට කථා කරන්න කියන එකයි මම මතක් කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඊළඟට, ගරු දිලිප් වෙදආරච්චි රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි පහක් තිබෙනවා.

[අ.භා.12.45]

ගරු දිලිප් වෙදආරච්චි මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு திலீப் வெதஆரச்சி - கடற்றொழில், நீரக வளமூல அபிவிருத்தி மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilip Wedaarachchi - State Minister of Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නියෝජ්‍ය කථානායක ධූරයේ වැඩ භාර ගත් ඔබතුමාට මම ප්‍රථමයෙන් සුබ පතනවා.

සුරාබදු ආඥාපනත යටතේ නිවේදන අනුමත කිරීමට ඉදිරිපත් කර ඇති අවස්ථාවේදී අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2017 වර්ෂයේ තංගල්ලේ seafood restaurant එකෙන් බියර් බෝතල් දෙකක් පිටට විකුණුවාය කියා සුරාබදු දෙපාර්තමේන්තුවෙන් ඇවිත් අත් අඩංගුවට අරගෙන රුපියල් දෙලක්ෂ පණස්තුන්දහස් පන්සියයක දඩයක් ගෙවන්න නියම කර තිබුණා. මෙවැනි දඩ මුදලක් නියම කිරීම ගැන මම ඒ අයත් එක්ක ඇවිත් ගරු ඇමතිතුමාට කරුණු ඉදිරිපත් කළාම, එතුමා කිව්වා, "මේක කමිටුවෙන් ගත් තීරණයක් "කියා.

ගරු ඇමතිතුමනි, සංචාරක ව්‍යාපාරය කියන්නේ අපේ රටට විශාල ආර්ථික උත්පාදනයක් ඇති කරන අංශයක්. දකුණේ සංචාරක ව්‍යාපාරයේ වර්ධනයක් තිබෙන මේ මොහොතේ අපේ ගරු අගමැතිතුමා දකුණේ සංචාරක ව්‍යාපාරයේ යෙදෙන කුඩා ව්‍යාපාරිකයා නැංවීම සඳහා "Homestay" වැඩසටහන යටතේ විශාල වැඩ පිළිවෙළක් කරගෙන යනවා. මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න නම්, විශාල වශයෙන් දඩ මුදල් අය කරන්න ගෙන ඇති තීරණ සංශෝධනය කරන්න ඕනෑ. ගරු ඇමතිතුමාගෙන් මම මීට පෙර ඉල්ලීමක් කළා, මේ නියම කර තිබෙන දඩ මුදල අඩු කරන්න කියලා. ඔබතුමා කිව්වා, ඒක කමිටුවේ තීරණයක්, නිලධාරීන් ගත්ත තීරණයක් කියලා. අපේ ඉල්ලීම කමිටුවට ඉදිරිපත් කළාට පස්සේ, යම් මුදලක් අඩු කරලා දඩ මුදල වාරික වශයෙන් ගෙවීමේ පහසුකම සලසා දුන්නා. ගරු ඇමතිතුමනි, නිලධාරීන් ගන්න තීරණ ගැන ඔබතුමා සොයා බලන්න. රටේ ජනතාවට, ඉහළ පෙළේ ව්‍යාපාරිකයන්ට, සාමාන්‍ය ව්‍යාපාරිකයන්ට මේක විශාල ප්‍රශ්නයක්. මේ ක්ෂේත්‍රයේ ඉන්න ව්‍යාපාරිකයෙක් බියර් බෝතල් දෙකක් පිටට විකිණුවා කියලා රුපියල් දෙලක්ෂ පණස්තුන්දහසකට වැඩි මුදලක් දඩ වශයෙන් අය කරගෙන තිබෙනවා. ඒ නිසා මේ නීති සංශෝධනය කරලා, සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න ඔබතුමාගේ අත හිත දෙන්න කියා මා ඉල්ලීමක් කරනවා.

පසු ගිය දවස්වල රැකව, රුක්මන් කියන පුද්ගලයාගේ restaurant එකට බියර් අල්ලන්න පැනලා තවත් ප්‍රශ්නයක් ඇති වුණා. කොහෙන්ද පැනලා තිබෙන්නේ? කොළඹ ජනාධිපති විමර්ශන ඒකකයෙන්. පෙත්සමක් ලැබුණු නිසා බියර් අල්ලන්න කියලා කොළඹින් උපදෙස් දීලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ තංගල්ල කියන්නේ සංචාරක කලාපයක්. මේ ප්‍රදේශවල මත්පැන් අල්ලන්න හිටපු ගමන් පොලීසියෙන් එනවා; සුරාබදු දෙපාර්තමේන්තුවෙන් එනවා; ගාල්ලේ කඩා පනින හමුදාවෙන් එනවා; තවත් වැටලීම් අංශවලින් එනවා. මේ විධියට මේ සංචාරක ව්‍යාපාරය දියුණු කරන්නේ කොහොමද? ගරු ඇමතිතුමනි, බන්දුල රත්නායක කියන restaurant අයිතිකාරයාත් අසරණ තත්ත්වයට පත් වෙලායි ඉන්නේ. ඔහුට නියම කළ රුපියල් දෙලක්ෂ පණස්තුන්දහසක දඩ මුදල වාරික වශයෙන් ගෙවන්න ඔබතුමා කටයුතු කරලා දුන්නා. දකුණේ සුරාබදු දෙපාර්තමේන්තුවෙන් කරන වැටලීම්වලට, කොළඹින් කරන වැටලීම්වලට, ගාල්ලෙන් කරන වැටලීම්වලට, හම්බන්තොටින් කරන වැටලීම්වලට, තංගල්ලෙන් කරන වැටලීම්වලට -මේ ඔක්කෝටම- දඩ මුදලක් ගෙවන්න වෙනවා. ඒ දඩ සඳහා විශාල මුදලක් ගෙවන්න වෙනවා. මේක හරි අසාධාරණයි. මේක සංචාරක ව්‍යාපාරයේ දියුණුවට රුකුලක් වන්නේ නැති නිසා ඔබතුමා මේ ගැන කථා කරලා තීරණයක් ගන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

ඊළඟට, ගරු ඇමතිතුමනි, මත්පැන් මිල වැඩි කිරීමේදී, රට බීමවල මිල වැඩි කළත් ඒවා බොන්නේ මේ රටේ ඉන්න සුපිරි පැළැන්තියේ ජනතාව පමණයි. මධ්‍යම පන්තියේ ජනතාවටත් ඒ හා සමාන බීම වර්ග තිබෙනවා. නමුත්, රට වටේ ධීවර කර්මාන්තයේ යෙදෙන, මුහුදේ රළ සමඟ බැට කන ධීවරයා, වතුකරයේ සීතලේ තේ දළු නෙළන කම්කරුවා, වැඩ කරන කම්කරුවා ඇතුළු සියලු ජනතාව තමන්ගේ වෙහෙස මහන්සිය නිවා ගන්න පාවිච්චි කරන්නේ ගල් අරක්කු. ඒ නිසා, රට බීමවල මිල වැඩි කරලා රටේ පහළ මට්ටමේ ජනතාව පරිහරණය කරන ගල් අරක්කු බෝතලයේ මිල අඩු කරලා ඒ ජනතාවට ඒ සහනය ලබා දෙන්න කියලා මා ඔබතුමාගෙන් කාරුණික ඉල්ලීමක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු දිලිප් වෙදආරච්චි මහතා
(மாண்புமிகு திலீப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සමස්ත ධීවර, ගොවි, කම්කරු ජනතාව වෙනුවෙන් මා ඒ ඉල්ලීම කරන අතරේ, මේ සංචාරක ව්‍යාපාරය දියුණු කරන්න ගරු ඇමතිතුමාට ශක්තිය, ධෛර්ය ලැබෙවායි ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා.12.50]

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කේ. කාදර් මස්තාන් මන්ත්‍රීතුමාගේ කාලයෙන්-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අද වැඩ කටයුතු පමා වෙලා පටන් ගත් නිසා අපට කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

එතුමාගේ විනාඩි 15න්, විනාඩි 07ක් ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමාට දුන්නා. විනාඩි 08ක් මට ගන්න කිව්වා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අපට අද කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ වේලාවෙන් විනාඩි තුනක්, හතරක් හෝ මට දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සුරාබදු ආඥාපනත යටතේ නිවේදන කිහිපයක් සභාවට ඉදිරිපත් වෙලා තිබෙන මේ අවස්ථාවේ ඒ පිළිබඳව අදහස් කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම ගැන සතුටු වෙනවා.

විශේෂයෙන් අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු මංගල සමරවීර මැතිතුමා මුදල් අමාත්‍යවරයා වශයෙන් කටයුතු කරන කාලයක මේ කරුණු කාරණා පිළිබඳව එතුමාගේ අවධානය යොමු කරලා ඒ පිළිබඳව කටයුතු කරයි කියලා මා හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සති කිහිපයකට පෙර මාතර දිස්ත්‍රික්කයේ මිරිස්ස වෙරළ කලාපය කේන්ද්‍ර කර ගනිමින් ප්‍රචාරය වූ ප්‍රවෘත්ති ගණනාවක් අපි මාධ්‍ය තුළින් දැක්කා.

අනවසර ඉදිකිරීම් ඉවත් කිරීම, ඒ වාගේම අනවසරයෙන් පවත්වාගෙන යන, සුරා බදු බලපත්‍ර නොමැති ආයතන ගණනාවක් ඉවත් කිරීම සඳහා රජය විසින් යම් කිසි ක්‍රියාමාර්ගයක් ගන්නා ආකාරය මාධ්‍ය තුළින් වාර්තා කරනවා අපි දැක්කා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට සති 3කට කලින් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව ගත් නියෝගයක් -තීන්දුවක්- අනුව, මිරිස්ස වෙරළේ තිබුණු අවුරුදු ගණනාවක් තිස්සේ කර ගෙන ගිය ආපනශාලා, අවුරුදු ගණනාවක් තිස්සේ සංචාරක කර්මාන්තයේ යෙදුණු බොහෝ ආයතන එක දවසින් ඉවත් කරලා තිබෙනවා. ඒ අනුව අද වනකොට මිරිස්ස වෙරළ කලාපයම සුනු විසුනු කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ සංචාරක කර්මාන්තයට දැවැන්ත ශක්තියක් වුණේ මිරිස්ස වැනි සංචාරක කලාපයි. යුද්ධය පැවැති සමයේ මේ රටේ ආදායම් මාර්ග අඩු වෙලා යන කාලයක මිරිස්ස, හික්කඩුව, උණවටුන, තංගල්ල, පාසිකුඩා, ආරුගම්බේ, කල්පිටිය වැනි වෙරළ කලාප තුළ ජීවත් වුණු දේශීය කර්මාන්තකරුවන් ඒ කර්මාන්ත ගොඩ නඟා ගෙන ඒ තුළින් විශාල ශක්තියක් මේ රටේ ජාතික ආදායමට ලබා දුන්නා. මේ බොහෝ ආයතනවලට ගැටලු පැන නැඟුණු විවිධ අවස්ථා තිබෙනවා. අපට මතකයි, අපේ රජය පැවැති කාලයේත් වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව මැදිහත් වෙලා, එම ඉදිකිරීම් නීති විරෝධය කියන මතය උඩ ඒවා ඉවත් කළ යුතුය කියලා, ගොඩනැගිලි ගණනාවක් ලකුණු කර තිබුණු බව. නමුත්, අපට එදා ඒ කටයුත්තට මැදිහත් වන්න පුළුවන් වුණා. එවකට හිටපු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාත් ඒ ගැන දැනුවත් කරලා, ඒ දේශීය කර්මාන්තකරුවන්ට අවශ්‍ය සහනත්, එම ගොඩනැගිලි ඉවත් කර ගැනීමට සහන කාලයකුත් ලබා දීලා, සංචාරක කර්මාන්තයට බලනොපාන විධියට නිසි ආකාරයකට ඒ කටයුත්ත කරන්න අපට පුළුවන්කම ලැබුණා. නමුත්, මීට සති තුනකට පෙර මිරිස්ස වෙරළ කලාපයේ ගොඩනැගිලි 23ක් පැය 6ක කාලයක් තුළ සුනු විසුනු කර දමා මිරිස්ස කලාපයෙන් සංචාරක කර්මාන්තය අවුරුදු 3කට ඇත් කර තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද මේ මුළු මිරිස්ස කලාපයම දිස්වන්නේ සුනාමියෙන් පසුව දිස් වූ ආකාරයට. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කලාපයේ තිබෙන බොහෝ ස්ථාන නීති විරෝධියි කියලා කඩා ඉවත් කිරීම සම්බන්ධයෙන් මාධ්‍යයෙනුත් වැරදි මතයක් දුන්නා, අනවසර ඉඩම්වල එහෙම නැත්නම් රජයේ ඉඩම්වල ඉදිකර තිබෙන ගොඩනැගිලි තමයි මේ ඉවත් කරන්නේ කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඉවත් කරපු ගොඩනැගිලි 23ම රජයේ ඉඩම්වල තිබෙන ගොඩනැගිලි නොවෙයි, ඒවා ඔප්පු තිබෙන පෞද්ගලික ඉඩම්වල තිබෙන ගොඩනැගිලි. ඒ වාගේම ඒ ගොඩනැගිලි 23න්, 20කට අවශ්‍ය ව්‍යාපාර ලියා පදිංචිය, ප්‍රාදේශීය සභාවෙන් අවශ්‍ය බලපත්‍රය ආදී මේ සියල්ල ලබා ගෙන තමයි පසුගිය අවුරුදු 20ක කාලය තුළ සංචාරක කර්මාන්තයේ යෙදෙමින් ඔවුන් මේ කටයුතු කරලා තිබුණේ. නමුත්, සුරා බදු බලපත්‍රයක් ලබා ගැනීම වෙනුවෙන් විවිධ අවශ්‍යතා සපුරන්න ඕනෑය කියලා අපි දන්නවා. මේ සියලු කාර්යයන් කරගන්න One Stop Shop එකට එන්න කියනවා. නමුත් One Stop Shop එකට ගියාට පස්සේ එතැනදී full stop එක තියන්න සිද්ධ වෙලා තිබෙනවා. One Stop Shop එකට යනවා නම්, ඒ සියලු කාරණා සපුරා ගන්න අවුරුදු 20ක්වත් බලාගෙන ඉන්න වෙනවා. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විරුද්ධ වනවා නම්, ප්‍රාදේශීය සභාවේ අනුමැතිය දුන්නත් ඒ කටයුතු කර ගන්න බැරි වෙනවා. අදාළ සංචාරක ආයතනවල අනුමැතිය ලබා දුන්නත්, සුරාබදු දෙපාර්තමේන්තුව අනුමැතිය ලබා දුන්නත් ඒ කටයුත්ත කර ගැනීමට නොහැකිවනවා. එක ආයතනයක තිබෙන ගැටලුවක් නිසා, එක ආයතනයක තිබෙන කඹ ඇදිල්ලක් නිසා සමහර වෙලාවට මුළු සංචාරක ව්‍යාපාරයම කඩා වැටෙන අවස්ථා තිබෙනවා. එම නිසා විශේෂයෙන්ම මාතර දිස්ත්‍රික්කය නියෝජනය කරන ඇමතිවරයකු හැටියට මුදල් ඇමතිතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා, මේ පිළිබඳව අවධානය යොමු කරලා ඒ සිදු වූ අසාධාරණය නිවැරදි කරන්නත්, ඒ අසාධාරණය සිද්ධ වන උණවටුන, තංගල්ල, ගල්කිස්ස වැනි වෙරළ තීරවලත් අයටත් අසාධාරණයක් නොවන අන්දමින් ඒ කටයුතු නිවැරදි ආකාරයෙන් කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න වැඩි වෙලාවක් නැහැ. මුදල් ඇමතිතුමා උදේ සිට අවස්ථා ගණනාවකදී අපේ රජයෙන් සිදු වූ අඩු පාඩුකම් පිළිබඳව කථා කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහින්ද රාජපක්ෂ රජය දුන් මුදලට වඩා අඩු මුදලකට තමයි මේ ආණ්ඩුව ජනතාවට ඉන්ධන ලබා දෙන්නේ කියලා වෙළෙඳ දැන්වීමක් දමා තිබෙනවා අපි දැක්කා. ඉන්ධන මිල සම්බන්ධයෙන් මා ළඟ ලේඛනයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තු පුස්තකාලයේ පර්යේෂණ අංශයෙන් ලබා ගත් ඉන්ධන මිල සම්බන්ධයෙන් දත්ත ඇතුළත් එම ලේඛනය මේ අවස්ථාවේදී මා **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2014 අවුරුද්දේ ජනවාරි මාසයේ බොර තෙල් බැරලයකට අපේ ආණ්ඩුව ඇමෙරිකානු ඩොලර් 94.62ක මුදලක් ගෙව්වා. පෙබරවාරි මාසයේ ඇමෙරිකානු ඩොලර් 100.82ක මුදලක් ගෙව්වා. මාර්තු මාසයේ ඇමෙරිකානු ඩොලර් 100.8ක මුදලක් ගෙව්වා. අපේ ආණ්ඩුවේ අවසාන කාලයේ ඔක්තෝබර් මාසය වනකොට ඇමෙරිකානු ඩොලර් 84.4ක මුදලක් අපි බොර තෙල් බැරලයක් වෙනුවෙන් ගෙව්වා. නමුත්, අද දවස වනකොටත් මේ ආණ්ඩුවට බොර තෙල් බැරයක් වෙනුවෙන් ගෙවන්න සිද්ධ වෙලා තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් 70කට අඩු මුදලක් බව අපි මේ වෙලාවේ මතක් කරනවා. 2014 ඔක්තෝබර් මාසයේ ඇමෙරිකානු ඩොලර්. 84.4ට තිබුණු බොර තෙල් බැරලයක මිල 2015 ජනවාරි මාසය වනකොට

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු කංචන විජේසේකර මහතා]

ඇමෙරිකානු ඩොලර් 47.22කට අඩු වුණේ, මේ ආණ්ඩුව පාලනය කරන කාලයේදීයි. එම නිසා මේ ආණ්ඩුවට වාසියක් ලැබුණා. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කාලයේ ඩොලර් 100ට එහා ගිහිල්ලා තිබුණු බොරතෙල් බැරල් එකක මිල ඇමෙරිකන් ඩොලර් 47ට අඩුවීම නිසා, මේ ආණ්ඩුවට අවුරුදු 3කදී ඩොලර් බිලියන 5ක ඉතිරියක් කරන්න පුළුවන්කම ලැබුණා. මේ වෙලාවේ මුදල් රාජ්‍ය ඇමතිතුමා සභාවේ ඉන්නවා. මහින්ද රාජපක්ෂගේ ආණ්ඩුව කාලයේ බොරතෙල් බැරලයක මිල, මේ ආණ්ඩුව කාලයේ බොරතෙල් බැරලයක මිල, මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ ඩීසල් මිල, පෙට්‍රල් මිල, මේ ආණ්ඩුවේ ඩීසල් මිල, පෙට්‍රල් මිල සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයෙන් දැන්වීමක් දාලා තිබෙනවා අපි දැක්කා. ගරු අමාත්‍යතුමනි, මෙහි නිවැරදි කිරීමක් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. 2014 දෙසැම්බර් මාසය මැතිවරණ මාසයක්. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව පැවැති එම දෙසැම්බර් මාසයෙත් බොරතෙල් බැරල් එකක මිල ඇමෙරිකන් ඩොලර් 59.29යි. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව පැවති එම වසරේ ඔක්තෝබර් ඔක්තෝබර් මාසයේ බොරතෙල් බැරල් එකක මිල ඇමෙරිකන් ඩොලර් 84.40ක් වුණා. ඔබතුමන්ලා ආණ්ඩුව භාර ගත්තාට පසුව ජනවාරි මාසයේ තමයි තෙල් බැරල් එකක මිල ඇමෙරිකන් ඩොලර් 47.22ට අඩු වුණේ. ඒ නිසා මුදල් අමාත්‍යාංශය විසින් එම නිවැරදි කිරීම කළ යුතුයි.

ගරු මංගල සමරවීර ඇමතිතුමා ගොබෙල්ස් න්‍යාය ගැන කථා කළා. ගොබෙල්ස් න්‍යායද මේ ක්‍රියාත්මක කරන්න හදන්නේ කියලා මට හිතෙනවා. මුදල් අමාත්‍යාංශය දැන්වීම්වලට විශාල මුදලක් යට කරලා, ජනතාවට වැරදි අවබෝධයක් ලබා දෙන්න උත්සාහ කරනවා. අද මතයක් නිර්මාණය කරන්න හදනවා, 2014 වසරේ පැවැති ආණ්ඩුව තිබුණේ මීටත් වඩා අවදානම් තත්ත්වයක කියලා

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2017 වසරේ මුදල් වාර්තාව අපට ලැබිලා තිබෙනවා. එම මුදල් වාර්තාවේ පැහැදිලිව තිබෙනවා, -

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
Sir, I rise to a point of Order.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මට බාධා කරන්න එපා. මගේ කථාව අවසන් වුණාට පසුව ඕනෑ තරම් කථා කරන්න. මම ඔබතුමාට මොනවත් කිව්වේ නැහැ නේ. ඔබතුමා වාඩිවෙලා කථාව අහගෙන ඉන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා මේ පාර්ලිමේන්තුවේ දී කියනවා -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ඒක point of Order එකක් නොවෙයි.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මහ බැංකු වාර්තාවේ සංඛ්‍යා ලේඛන බැලුවාම, 2014 අවුරුද්දේ තත්ත්වයත්, 2017 අවුරුද්දේ තත්ත්වයත් පිළිබඳව ඕනෑම කෙනෙකුට තේරෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ ඉතිහාසයේ නිදහසින් පසුව, 2005 අවුරුද්දේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රට භාර ගන්න අවස්ථාව වෙනකන් මේ රටේ ණය බර රුපියල් බිලියන 2,222යි. ඒ රුපියල් බිලියන 2,222 ඉඳලා මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රට භාර දෙනකොට මේ රටේ සමස්ත ණය බර තිබුණේ රුපියල් බිලියන 7,391යි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය අවුරුදු 3ක කාලය ගත්තාම, එම රුපියල් බිලියන 7,391ක ණය ප්‍රමාණය මේ වසරේ ජනවාරි මාසය වන විට රුපියල් බිලියන 10,400ක් දක්වා වැඩි වෙලා තිබෙනවා. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව අවුරුදු 9ක කාලයක් තුළ ලබා ගත් ණය මුදල මෙන් සියයට 35ක මුදලක් මේ අවුරුදු තුන තුළ මේ යහ පාලන ආණ්ඩුව අරගෙන තිබෙනවා. අපි නොවෙයි ඒක කියන්නේ, ඔබතුමන්ලාගේ මේ සංඛ්‍යා ලේඛන. ඔබතුමන්ලාගේම සංඛ්‍යා ලේඛනවලින් ඔබතුමන්ලාට එය බලා ගන්න පුළුවන්. මේක දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙසත් කියන්න පුළුවන්. ඔබතුමන්ලාට කියවලා බලන්න පුළුවන්. ඔබතුමන්ලාට අද කටක් ඇරලා කියන්න පුළුවන්කමක් නැහැ, මේ රටේ ණය බර අඩු වෙලා තිබෙනවා; බදු බර අඩු වෙලා තිබෙනවා කියලා. ඔබතුමන්ලා පුළුවන් නම් ගමේ ගිහිල්ලා ඒක කියන්න. එහෙම කරන්න පුළුවන්ද කියලා මා අභියෝග කරනවා. ඔබතුමන්ලාට අද ගමේ පාරක් ගානේ යන්න බැහැ. [බාධා කිරීමක්] ඔබතුමා එළියට ඇවිල්ලා අපට කියන දේවල් අපි දන්නවා. ඔබතුමා, නියෝජ්‍ය කථානායකවරයා තෝරන ඡන්දය වෙලාවෙත් මහහරිමින් සිටිය බව අපි දන්නවා. ඔබතුමා එළියට ඇවිල්ලා කිව්වා, - [බාධා කිරීමක්] මම දන්නවා, ඔබතුමාගේ ආර්ථිකය ශක්තිමත් වෙලා ඇති. මහා විශාල ගොඩනැඟිලි ගහලා ඇති. [බාධා කිරීමක්] මම දන්නවා, එහෙම වෙලා ඇති. නමුත්, ජනතාවගේ ජීවන මට්ටම ඉහළ නංවන ක්‍රියාදාමයක් ඔබතුමා කරලා නැතිව ඇති. ඔබතුමන්ලා මොන ආකාරයෙන් කිව්වත්, ඔබතුමන්ලා මොන සංඛ්‍යා ලේඛනවලින් කිව්වත්, අද මහ බැංකු වාර්තාවලින් ඔප්පු වෙනවා-

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු කථානායකතුමනි, මෙතුමා මගේ නම කිව්වා.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මම කාගේවත් නමක් කිව්වේ නැහැ, ගරු කථානායකතුමනි.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා ඉතාමත් පට්ටපල් බොරුවක් කිව්වා. මේ කියන සංඛ්‍යා ලේඛන පවා පට්ටපල් බොරු.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා, ඒක point of Order එකක් නොවෙයි. ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු කංචන විජේසේකර මහතා
(මාණ්පුමිකු කඤ්චන විජේසේකර)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ රටේ ආර්ථික දර්ශක ගත්තාම 2014 අවුරුද්දේ ආර්ථික වර්ධන වේගය සියයට 7.4ට තිබුණා. අද වන විට ආර්ථික වර්ධන වේගය සියයට 3.4ට අඩු වෙලා තිබෙනවා. උද්ධමනය සියයට 3.35 ඉඳලා සියයට 8න් එහාට වර්ධනය වෙලා තිබෙනවා. මොන සංඛ්‍යා ලේඛන ගත්තත් අද ඇමෙරිකානු ඩොලර් එක- මේ ආණ්ඩුව මොකක්ද කිව්වේ? මේ ආණ්ඩුව බලයට පත් වෙනකොට කිව්වා, "ජාත්‍යන්තර සම්බන්ධකම් තිබෙනවා, ඩොලර් එක මිල ස්ථාවර වෙනවා, රුපියල ස්ථාවර බවට පත් කරනවා" කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2015 ජනවාරි මාසයේ 8 වැනිදා වනකොට ඇමෙරිකානු ඩොලර් එකක මිල රුපියල් 133ටයි තිබුණේ. අද, ඇමෙරිකානු ඩොලර් එකක මිල රුපියල් 159.60යි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු කංචන විජේසේකර මහතා
(මාණ්පුමිකු කඤ්චන විජේසේකර)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩි දෙකක කාලයක් ලබා දෙන්න. ඔබතුමන්ලා මොන සංඛ්‍යා ලේඛන ඉදිරිපත් කරමින් කථා කළත්, ඔබතුමන්ලා අද උගුලකයි වැටිලා සිටින්නේ.

මේ ආණ්ඩුව බලයට පත් වෙන්න කලින් "මෛත්‍රී පාලනයක් - ස්ථාවර රටක්" කියලා ප්‍රතිපත්ති ප්‍රකාශනයක් ඉදිරිපත් කළා, අපි දැක්කා. මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ දින සියයේ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කළා. මේ කාලය තුළ ආර්ථික ලේඛන 13ක් ඉදිරිපත් කරලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හිටපු මුදල් ඇමතිතුමා කථා කරමින්, දැන් ඉන්න මුදල් ඇමතිතුමාගේ ප්‍රකාශයට හාත් පසින්ම විරුද්ධ දෙයක් කිව්වා. මුදල් ඇමතිතුමා කථා කරමින් කිව්වා, හිටපු මුදල් ඇමතිවරයකු වූ හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට විවාදයකට එන්න කියලා අභියෝග කරනවා කියලා. මම එතුමාට කියනවා, පළමුවෙන්ම මේ රජයේ හිටපු මුදල් අමාත්‍ය රවි කරුණානායක මැතිතුමාත් එක්ක විවාදයක් කරලා එන්න කියලා. එතුමන්ලා දෙදෙනා කියන සංඛ්‍යාලේඛනවල පරස්පරභාවයක් තිබෙනවා. අද විවිධ ආයතනවලින්, විවිධ රාජ්‍යවලින් ලබාදෙන කොන්දේසි නිසා IMF එකෙන් අපට කොන්දේසි දාලා තිබෙනවා. අර්ජුන් මහේන්ද්‍රන් හිටපු මහ බැංකු අධිපතිවරයා සහ හිටපු මුදල් අමාත්‍ය රවි කරුණානායක මැතිතුමා ඒ අත්සන් කරපු ලේඛන නිසා අද දවසේ විවිධ දේවල් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. රාජ්‍ය ආයතන විකුණමින් යනවා. අද පෞද්ගලිකරණයට ඉඩ කඩ සකසමින් තිබෙනවා. අද මේ රටේ සියලු ක්ෂේත්‍ර කඩා බිඳ දාලා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අද මේ මොන පනත් කෙටුම්පත් ඉදිරිපත් කළත් වැඩක් වෙන්නේ නැහැ; මොන දේ මේ පාර්ලිමේන්තුවට ගෙනාවත් වැඩක් වෙන්නේ නැහැ. මොකද, ඔබතුමන්ලාට ඒවා ක්‍රියාත්මක කිරීමේ හැකියාවක් නැහැ. පසුගිය කාලයේ අපේ රටට තෙල් ආනයනය කිරීමෙන් විතරක් ඩොලර් බිලියන 5ක මුදලක් ඉතිරි වුණා. හැබැයි, තෙල් ආනයනයෙන් අඩු වෙන්න ඕනෑ මුදල් ප්‍රමාණය ඩොලර් බිලියන 5ක් වුණාට, 2014 හා සන්සන්දනය කරද්දී අද අපේ ආනයනය ඊටත් වඩා එහාට ඩොලර් බිලියන 9කින් වැඩි වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න.

ගරු කංචන විජේසේකර මහතා
(මාණ්පුමිකු කඤ්චන විජේසේකර)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ බදු බර වැඩි වෙලා තිබෙනවා. 2014 අවුරුද්දේ තිබුණාට වඩා 2018 අවුරුද්දේ දී ඔබතුමන්ලා අපේක්ෂිත බදු ප්‍රමාණය තුන් ගුණයකින් වැඩි වෙලා තිබෙනවා. මම මීට වැඩිය කාලය ගන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ආණ්ඩුවේ ගත වූ අවුරුදු තුන තුළ මුදල් ඇමතිවරුන් දෙදෙනෙක් කටයුතු කළා. රාජ්‍ය ප්‍රතිපත්ති ගණනාවක් ක්‍රියාත්මක වෙනවා. විවිධ අමාත්‍යාංශ යටතේ ඒවා ක්‍රියාත්මක වෙමින් තිබෙනවා. එක පැත්තකින් මේ රටේ ආර්ථිකය කඩා වැටෙමින් තිබෙනවා. ඒ වාගේම අනෙක් පැත්තෙන් දූෂණයෙන් ඉහළ ගිය රටක් බවට මේ රට පත් වෙලා තිබෙනවා. අපේ රට දූෂණයෙන් ඉහළටම ගිය රටක් බවට පත් වෙලා තිබෙනවා කියලා පොලිස්පතිතුමාත් කියා තිබෙනවා, අපි දැක්කා. මහ බැංකු වංචාව ඇතුළු සියලු දූෂණ වංචා වෙනුවෙන් මේ සියලුදෙනාම වග කියන්න ඕනෑ. ඒ වෙනුවෙන් අපේ ආණ්ඩුවක් තුළ අපි ගන්න පුළුවන් ඉහළම ක්‍රියා මාර්ග ගන්නවාය කියන එකත් මතක් කරමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.05]

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(මාණ්පුමිකු අනුර සිද්නි ජයරත්න)
(The Hon. Anura Sidney Jayarathne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා නියෝජ්‍ය කථානායකතුමා හැටියට අද පළමු වතාවට මේ ගරු සභාවට ඇවිල්ලා මූලාසනය මෙහෙයවන මේ අවස්ථාවේ දී මා පළමුවෙන්ම ඔබතුමාට සුබ පතනවා. සුරාබදු ආඥාපනත යටතේ නිවේදන කිහිපයක් පිළිබඳවයි අද දින විවාද කරන්නේ.

සුරාබදු ගැන කථා කරනකොට නීති විරෝධී මත්පැන් ගැනත් කථා කරන්නට ඕනෑ. මොකද, අද වන විට නීති විරෝධී මත්පැන් නිෂ්පාදනය වැඩි වෙමින් පවතිනවා. ගරු මුදල් ඇමතිතුමාත් දන්නවා, අපි අවස්ථා කීපයකදීම මේ ගැන කථා කර තිබෙන බව.

[ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා]

අපේ කණ්ඩායම් රැස්වීම්වල පවා අපේ ප්‍රදේශයේ නීති විරෝධී මත්පැන් නිෂ්පාදනය වැඩිවීම ගැන අපි කථා කරලා තිබෙනවා. පසුගිය කාලයේ ලංකාවේ මහෙස්ත්‍රාත් අධිකරණ තුනක සිදු වූ අඩු පාඩුකම් නිසා අපේ රටේ නීති විරෝධී මත්පැන් වැඩි වුණා. විශේෂයෙන්ම පොලොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ මහෙස්ත්‍රාත් අධිකරණයට අයත් පොලිස් බල ප්‍රදේශ 5ක නීති විරෝධී මත්පැන් වැඩිවීමක් සිද්ධ වුණා. ඒකට හේතුව තමයි, පොලීසිය විසින් අත් අඩංගුවට ගන්නා ලද නීති විරෝධී මත්පැන් සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරන ලද නඩු කිහිපයක් නඩු ප්‍රතික්ෂේප වීම. නීති විරෝධී මත්පැන් අත් අඩංගුවට ගැනීමේ වගකීම පැවරී තිබෙන්නේ සුරාබදු දෙපාර්තමේන්තුවටයි. හැබැයි, සුරාබදු දෙපාර්තමේන්තුවෙන් මේ කටයුත්ත නිසියාකාරව සිද්ධ කළේ නැහැ. ඒ සම්බන්ධයෙන් අපි සොයා බලනකොට දැනගන්නට ලැබුණු දෙයක් තමයි, වැටලීම් කිරීමට ප්‍රමාණවත් තරම් සම්පත් හා නිලධාරීන් සුරාබදු දෙපාර්තමේන්තුවේ නොමැති බව. පොලොන්නරුව වගේ දිස්ත්‍රික්කයක් ගත්තාම, එම දිස්ත්‍රික්කයේ සිටින සුරාබදු නිලධාරීන් ප්‍රමාණය හා සම්පත් ප්‍රමාණය ඉතාමත්ම අඩුයි. එය හේතුකොටගෙන අපේ ගම්බද ප්‍රදේශවල හොර මත්පැන් නිෂ්පාදනය වැඩි වෙලා තිබෙනවා. ඒ නිසාම එම ප්‍රදේශවල දුප්පත්කමත් වැඩි වෙලා තිබෙනවා. මම අද විශේෂයෙන්ම මේ ගැන කථා කරන්නේ අපි ගම්බද පළාත්වල සිටින මන්ත්‍රීවරු හැටියට මේ ප්‍රශ්නය අපට හොඳින් දැනෙන නිසායි. හොර මත්පැන් නිසා දුප්පත්කම වැඩි වෙනවා; අපරාධ වැඩි වෙනවා. මොකද, නීත්‍යානුකූල මත්පැන්වලට වැඩිය නීති විරෝධී මත්පැන්වලට ජනතාව යොමු වෙනවා වැඩියි. ගරු ඇමතිතුමනි, සුරාබදු දෙපාර්තමේන්තුව ඔබතුමා යටතේ පවතින නිසා මේවා නැවැත්වීමට අවශ්‍ය කටයුතු යොදන්න කියලා මම විශේෂයෙන්ම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඊළඟට, පොලීසියේත් ප්‍රශ්න තිබෙනවා. ඒ ප්‍රදේශයේ සමහර පොලිස් නිලධාරීන් සම්බන්ධ වෙලා මේ කටයුත්ත කරනවා; ඒ සඳහා පොලිස් නිලධාරීන් උදව් කරන අවස්ථාත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
ඒ වාගේ දේවල් විශේෂයෙන් සිද්ධ වෙනවා. එම නිසා මේ ගැන අවධානය යොමු කරන්න කියා මම ඉල්ලා සිටිනවා.

ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා එතුමාගේ කථාවේදී ගරු මංගල සමරවීර ඇමතිතුමා ගැනත්, හිටපු ජනාධිපතිතුමා ගැනත් කිව්වා. හිටපු ජනාධිපතිතුමා මංගල සමරවීර ඇමතිතුමා සමඟ විවාදයකට එන්නේ නැති ලු. හැබැයි, මංගල සමරවීර ඇමතිතුමාත්, හිටපු ජනාධිපතිතුමාත් අහසයි පොළොවයි වාගේ කියා අපි දන්නවා. එතුමා කිව්ව ඒ කාරණය හරි.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

හැබැයි, මංගල සමරවීර ඇමතිතුමා, ඇමතිවරයෙක් හැටියට එතුමාගේ කීර්ති නාමය ආරක්ෂා කරගෙන කටයුතු කරන බව අපි දන්නවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Nanayakkara, what is your point of Order?

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්ථාවර නියෝග අනුව කිසිම කෙනකුට මේ ගරු සභාවේ ගරු මන්ත්‍රීවරයකුගේ චරිතයට කැලලක් වන ආකාරයට කථා කරන්න බැහැ. එසේ නම් ඒ සඳහා යෝජනාවක් ගෙන ආ යුතුයි. එහෙම නැතිව, මෙසේ සඳහන් කිරීම ස්ථාවර නියෝගවලට පටහැනියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඒ කාරණය දිගින් දිගටම සිදු වුණා. අපි ඒ ගැන කටයුතු කරන්නම්.

ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමා කථා කරන්න.

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කියන්නේ නැතිව මොකක්ද කියන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? [බාධා කිරීම්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

කියා තමයි කියන්නේ.

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

මංගල සමරවීර ඇමතිතුමා හොරෙක් නොවෙයි කියන එක මුළු රටම දන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමනි, කරුණාකර ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
ඒ නිසා ඒ දෙන්නා සම කරන්න බැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
තමුන්නාන්සේ මේ සභාවේ කථා කිරීමේ අයිතිය නැති කර ගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා. - [සභා ගර්භය තුළ නැත.]

ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.09]

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට නියෝජ්‍ය කථානායක ධුරය ලැබීම පිළිබඳව ප්‍රථමයෙන්ම මගේ සුබ පැතුම් පිරිනමනවා. මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳවත් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද දින ඉදිරිපත් කර තිබෙන සුරාබදු ආඥාපනත යටතේ නිවේදන සම්බන්ධයෙන් කථා කරනකොට අපිට පසුගිය වකවානුව ගැන; පසුගිය රජයේ ක්‍රියාදාමයන් ගැන පොඩ්ඩක් කථා කරන්න වෙනවා. ඒ මන්ද? එදා මත්පැන් විකුණපු ආකාරයත්, අවන්හල් පවත්වාගෙන ගිය ආකාරයත් අපි දැක්කා. එදා දේශපාලනඥයන්ගේ ගැත්තන් මොනවාද කළේ? කිසිම බලපත්‍රයක් නැතිව, නොයෙක් ප්‍රදේශවල අවන්හල් පවත්වාගෙන ගියා; සෑම තැනම මත්පැන් අළෙවි කළා. ඒ ප්‍රශ්නය නිසා තමයි මිරිස්ස වැනි ප්‍රදේශවල අක්‍රමිකතා සිදු වුණේ. එම නිසා මෙවැනි නියාමන, අණ පනත් මේ කර්තව්‍යයේදී ඉතා වැදගත් වෙනවා. සුරාබදු ආඥාපනත ඉතා වැදගත් කියා අපි කියන්නේ, මත්පැන් භාවිත වෙන්නේ කොහොමද, මත්පැන් භාවිතයෙන් ජනතාවට හානියක් වෙනවාද කියා ඒ තුළින් දැන ගැනීමට හැකි වන නිසායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපේ රටේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. අනවසරයෙන් මත්පැන් විකුණන ස්ථාන විශාල සංඛ්‍යාවක් අද අපේ රටේ තිබෙනවා; ඒවා රට පුරාම තිබෙනවා. මේ නිසා රට තුළ විශාල සමාජයීය ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. මේ සමාජ ප්‍රශ්නය නිසා අද ගෙවල්වල; පවුල්වල විශාල විනාශයක් සිදුවී තිබෙන ආකාරය අපි දකිනවා. මත්පැන් භාවිතය සෞඛ්‍යයට අහිතකරයි කියා අපි දන්නවා. හැබැයි, සාමාන්‍ය ජනතාවට පානය කළ හැකි මත්පැන්වල මිල විශාල ගණනකින් ඉහළ ගිහින් තිබෙනවා. එම නිසා ඒ අහිංසක ජනතාව; මත්පැන් භාවිත කරන ඒ පුද්ගලයන් කුලී වැඩක් හෝ කරලා කෙළින්ම අර හොරෙන් මත්පැන් විකුණන තැන්වලට ගිහින් කිසිප්පු වැනි දේවල් පාවිච්චි කරන නිසා සෞඛ්‍යමය වශයෙන් විශාල ප්‍රශ්නයකුත් ඇති වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කරුණු නිසා අහිංසක ජනතාවට ආර්ථිකමය ගැටලු ගණනාවකටත් මුහුණ දෙන්න සිදු වී තිබෙනවා.

මොකද, මත්පැන් නීතිමය වශයෙන් තැන් තැන්වල සුලභව නැති නිසා, බලපත්‍ර නැති අනික් තැන්වලින් ගන්නකොට විශාල මුදලක් ගෙවන්න වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපේ රටේ සංචාරක ව්‍යාපාරයට මේ නීතිරීති බලපාන්නේ කොහොමද කියා අපි බලමු. අවුරුදු ගණනාවකට පෙර සිටම ශ්‍රී ලංකාවේ සංචාරක කලාප බිහි කර තිබෙන බව අපි දන්නවා. ඒ සංචාරක කලාප තුළ මේ මත්පැන් භාවිතයේ සහ විකිණීමේ ක්‍රමවේද ලිහිල් කළ යුතුය කියා මම හිතනවා. මොකද, සංචාරකයන් මේ රටට ඇවිත් සංචාරය කරනකොට, ඒ තැන්වල ඒවා සුලභව පාවිච්චි කරන්න පුළුවන් නම්, ඒක එම ව්‍යාපාරයට වැදගත් වෙයි කියා මම හිතනවා. හැබැයි, එය කළ යුත්තේ නියාමන එක්කයි; නීතියත් එක්කයි.

ඊළඟට, අපි දන්නවා අද වනවිට කාන්තාවන් විශාල ප්‍රමාණයක් සංචාරක කර්මාන්තයට අනුයුක්තව -විශේෂයෙන්ම හෝටල් ව්‍යාපාරයේ- රැකියාවල නිරත වන බව. ඔවුන් තරු පහේ හෝටල්වල පවා රැකියාවල නිරත වෙන්න පුළුවන්. අද වනවිට ඒ අයගේ රැකියාවට ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. මොකද, පනත අනුව කාන්තාවන්ට මත්පැන් අළෙවි කරන්න බැහැ. ඒ නිසා එවැනි තැන්වල නීත්‍යානුකූලව වැඩ කරන කාන්තාවන්ට ඒ කාර්ය භාරය කිරීම සඳහා එම ක්‍රමවේදයේ යම්කිසි ලිහිල් කිරීමක් විය යුතුයි කියන එක මේ වේලාවේ මම ප්‍රකාශ කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නැත්නම් කාන්තා පක්ෂයට එය ඉතාම අසාධාරණයක් වෙනවා. රැකියාවක් කරන්න බැරි තත්ත්වයකට අද ඔවුන් පත් වෙලා තිබෙනවා. ගරු මුදල් අමාත්‍යතුමා ඒ සඳහා අවශ්‍ය ක්‍රියාවලිය සකස් කරයි කියා අපි හිතනවා. මොකද, රටක් ඉදිරියට යනකොට දියුණුව වෙනුවෙන් යම් යම් දේවල්වල වෙනස්කම් සිදුවිය යුතුයි. අපි සියලුදෙනාම සෑම විටම සමාජ සාධාරණය ගැන කථා කරනවා. එපමණක් නොවෙයි, සමානාත්මතාව ගැනත් අපි කථා කරනවා. කාන්තාවන් වේවා, එහෙම නැත්නම් පුරුෂයන් වේවා, ආගමික වශයෙන් හෝ සමාජයීය වශයෙන් ඒ සියලුදෙනාටම සාධාරණයක් වෙන්න ඕනෑය කියන එක ගැනයි අපි සියලුදෙනාම කථා කරන්නේ. රැකියාවක් කරනකොටත්, ඒ සමාජ සාධාරණය ඒ අයුරින්ම ඉෂ්ට විය යුතුයි. ඒ කාරණය සඳහන් කරමින්, මට කථා කරන්න කාලය ලබාදීම ගැන තමුන්නාන්සේටත් ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඊළඟට, ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.14]

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) கவிந்த ஹேஷான் ஜயவர்தன)
(The Hon. (Dr) Kavinda Heshan Jayawardana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නව තනතුරට පත් වූ ඔබතුමාට ප්‍රථමයෙන්ම මා සුබ පතනවා. මම හිතන විධියට සුදුස්සාට සුදුසු තැන ලැබී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ගරු මංගල සමරවීර මුදල් ඇමතිතුමා මේ රට වෙනුවෙන් දැවැන්ත සේවයක් ඉටු කරනවා. නමුත් මීට ප්‍රථමයෙන් කථා කළ ඒකාබද්ධ විපක්ෂයේ සිටින සහෘද මන්ත්‍රීවරුන්ට එදා තිබුණු දේශපාලන ක්‍රමවේදය අද අමතක වෙලා තිබෙනවා. එදා ඔවුන්ගේ හිතෛෂීන්ට, දේශපාලන හෙංචයියලාට, හිත මිත්‍රාදීන්ට, ඥාතීන්ට බාර් ලයිසන් දුන්නා; එතනෝල් ගෙනෙන්න ලයිසන් දුන්නා. ඒ හරහා මේ රටට දැවැන්ත එතනෝල් කන්දරාවක් ගලාගෙන ආවා. ඒ කාලයේ නීති විරෝධී මාර්ගයෙන් එතනෝල් ගෙනාවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒවායෙන් මේ රටේ සුවඳ විලවුන් හදනවා, එසේ හදන සුවඳ විලවුන් අපනයනය කරනවාය කියා තවත් මාර්ගයක් හදා ගත්තා. හැබැයි, එසේ ගෙනා එතනෝල්වලින් කළේ සුවඳ විලවුන් හදපු එක නොවෙයි. සුවඳ විලවුන් හදන මුවාවෙන් අරක්කු නිෂ්පාදනය කළා. මේ රටට ලැබෙන්න තිබුණු කෝටි ගණනාවක, බිලියන ගණනාවක ආදායමක් ඒ නිසා නැති වුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත් අද වනවිට මේ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. අද වනවිට ආණ්ඩුව එතනෝල් ගෙන්වීම තමන් අතට අරගෙන නිසි ක්‍රමවේදයකට, නිසි පටිපාටියකට අනුව එය ක්‍රියාත්මක කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපි පොලීසියට බලපෑම් කරන්නේ නැහැ. නමුත් එදා සිටි දේශපාලනඥයෝ තමන්ට ඕනෑ ආකාරයට පොලීසියේ නිලධාරීන් බය කරගෙන, කසිප්පු සහ නීති විරෝධී අනික් මත්පැන් අළෙවි කිරීමටත්, ඒවා නිෂ්පාදනය කිරීමටත් පරිසරයක් නිර්මාණය කරගෙන තිබුණා. අද මේ යහ පාලන ආණ්ඩුව තුළ එවැනි දේවල් සිද්ධ වන්නේ නැහැ. නිවාඩු දිනවල මත්පැන් අළෙවි කිරීම සම්බන්ධවත් අපේ ගරු මුදල් ඇමතිතුමා යම්කිසි උත්සාහයක් දැරුවා. ඒ සම්බන්ධයෙන් මේ රට තුළ කතිකාවක් පවා ඇති වුණා. නමුත් නිවාඩු දිනයක් කියලා මේ රටේ මිනිසුන් අරක්කු බොන එකේ අඩුවක් වෙන බවක් අපි දකින්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හෙට දිනයේ බාර් වහලා නම්, අද දිනයේ අරක්කු ගන්න මිනිසුන් පෝලිමේ ඉන්නා ආකාරය අපි දකිනවා. ඒ වාගේම නීති විරෝධී විධියට විකුණන කසිප්පුවල මිල ඉහළ යන ආකාරයත්, ඒවාට පවතින ඉල්ලුම වැඩි වන ආකාරයත් අපි දකිනවා.

ඒත් එක්කම මේ රටට දැවැන්ත ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා. ඒක ඉතිහාසයේ ඉඳන් තිබුණා. ඒ තමයි මත් ද්‍රව්‍ය, මත් උවදුර. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වනකොට මේ රටට අලුත් මත් ද්‍රව්‍යයක් හඳුන්වා දීලා තිබෙනවා. ඒක තනිකර chemical එකක්. ඒක තමයි "අයිස්"කියලා හඳුන්වන්නේ. මේක ඉන්දියාවෙන් එනවා, මන්නාරම ප්‍රදේශයෙන් එනවා කියලා අපට පොලීසියේ නිලධාරීන් කියලා තිබෙනවා. ඒ වාගේම ලංකාව තුළත් මෙය නිෂ්පාදනය කරන්නට පුළුවන් කියන කාරණය අපට අහන්න, දකින්න ලැබෙනවා. මේක යම්කිසි ආකාරයේ methamphetamine වාගේ ඉතාමත් භයානක මත් ද්‍රව්‍යයක් කියා තමයි අපට දැන ගන්න ලැබෙන්නේ. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ආරංචි වෙච්ච විධියට මෙය මත් ද්‍රව්‍යයක් හැටියට හඳුන්වන්න නීති අද ලංකාවේ සම්පාදනය කරලා නැහැ. අද මෙය ලොකු ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. අපේ රටේ සිටින අභිංසක තරුණ තරුණියෝ අද මේ මත් ද්‍රව්‍යයට ඇබ්බැහි වෙමින් පවතිනවා. එපමණක් නොවෙයි. අද පාසල් යන දරුවෝ පෙති කියයි එහෙම නැත්නම් වෙනත් කුඩු ජාති කියයි. ඔවුන් මේවාට ඇබ්බැහි වෙමින් පවතිනවා. ආණ්ඩුවක් හැටියට, දේශපාලනඥයන් හැටියට මේ ගැන අපේ අවධානය මීට වඩා යොමු කරන්නට ඕනෑ කියන කාරණය මම මේ අවස්ථාවේදී මතක් කර දෙනවා. ඒ වාගේම ඔබතුමා දන්නවා, මේ වනකොට හැම තැනම නීතිවිරෝධී ගංජා -ඉන්දියාවෙන් ගෙනෙන ගංජා- අල්ලන බව. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමෙරිකාව වාගේ රටවල් ගත්තාම, ඒ වාගේම ඇම්ස්ටර්ඩෑම් ගත්තාම අද "medical marijuana" කියන එක නීතිගත කරලා තිබෙනවා. අද cancer patientsලාට ඒ කියන්නේ පිළිකා රෝගීන්ට වේදනා නාශකයක් හැටියට මෙය ප්‍රමිතිගතව ලබාදීමට කටයුතු කරනවා. අපට පුළුවන් නම් අපේ රෝගීන්ට වාගේම පිටරටට අපනයනය කරන්න වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම ඉතාම වැදගත් කියන එක මම මේ අවස්ථාවේදී මේ ගරු සභාවට මතක් කර දෙනවා. මොකද, ඇමෙරිකාව අද මේ පිළිබඳව දැවැන්ත විධියට research කරලා මේ ගැන හොයලා බලලා කටයුතු කරනවා. මගේ මිත්‍ර අනුරාධපුර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා කිව්වා, "අපේ මුදල් ඇමතිතුමායි හිටපු ජනාධිපතිතුමායි අහසට පොළොව වාගෙයි." කියලා. අහසට පොළොව වාගේ තමයි. හොරකම් කරපු, වංචා කරපු, කප්පම් ගත්තු, ජඩ වැඩ කරපු අයගේ files හංගාගෙන අපේ මුදල් ඇමතිතුමා ඒ අයව ආරක්ෂා කළේ නැහැ. අපේ මුදල් ඇමතිතුමා මේ රටේ සංවර්ධනයට, පැවැත්මට අවශ්‍ය කරන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අහසට පොළොව වාගෙයි කියන එක ඉතාමත් පැහැදිලියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ කාලය ලබාදීම පිළිබඳව මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම නැවත වතාවක් ඔබතුමාට මම සුබ පතනවා, ඔය ප්‍රධාන පුටුවේ ඉඳගෙන මේ පාර්ලිමේන්තුව හසුරුවන්න ඔබතුමාට ශක්තිය ධෛර්ය ලැබේවා! කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි. Hon. Velu Kumar please. You have five minutes.

[අ.භා. 1.20]

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුලින්ම මම ඔබතුමාට සුබ පතනවා, ඔබතුමාට මේ කාර්යය කරන්නට ධෛර්ය ලැබේවා! කියා.

மதுவரிக் கட்டளைச் சட்டத்தின்கீழான அறிவித்தல்கள் தொடர்பான இந்த விவாதத்திலே உரையாற்றுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். மதுவரி அறவீடு தொடர்பான அறவீட்டுத்தொகை மாற்றங்கள் குறிப்பாக, கள்ளைப் போத்தலில் அடைப்பதற்குரிய உரிமம் அதேபோல தென்னை, பனை மரங்களிலிருந்து கள்ளுத் தயாரிப்பதற்கான அறவீடு தொடர்பான மாற்றங்கள் இங்கு குறிப்பிடப்பட்டிருக்கிறது. எங்களுடைய நாட்டினது தேசிய வளங்களைக் கொண்டு தயாராகின்ற மதுசாரங்களில் ஒன்றாகத் தென்னை, பனை சார்ந்த கள்ளு காணப்படுகின்றது.

இந்த நாட்டிலே கடந்த காலத்தில் இடம்பெற்ற சமூக, கலாசார சீரழிவுகளின் பின்னணியில் மதுபானப் பாவனை பிரதான இடத்தை வகித்திருக்கின்றது. நான் குறிப்பாக ஒரு விடயத்தைக் குறிப்பிடவேண்டும். அதாவது நான் பிரதிநிதித் துவம் செய்கின்ற மலையக சமூகத்தைப் பொறுத்தவரையிலே, அவர்களின் தலைமை நகரான நுவரெலியா, அதேபோன்று பதுளை, கண்டி ஆகிய மத்திய மாகாணப் பிரதேசங்களில், குறிப்பாகத் தோட்டப் பகுதிகளில் மதுபானப் பாவனையானது மிக அதிக மட்டத்தில் இருப்பதைக் கடந்தகாலப் புள்ளி விபரங்கள் எடுத்துக் காட்டுகின்றன. 1980 களிலிருந்து 1990 - 2000 வரையான 10 - 20 வருட காலப் பகுதியிலேதான் தோட்டப்புறங்களிலே இந்த மதுபானச்சாலைகள் முளைத்திருக் கின்றன. குறிப்பாக, தோட்டங்களை மையப்படுத்திச் சாராய விற்பனைக் கடைகளும் பியர் விற்பனைக் கடைகளும் கள்ளுத் தவறணைகளும் எனப் பல மதுபானசாலைகள் ஆரம்பிக்கப் பட்டிருக்கின்றன.

1980-1990 காலப்பகுதிகளில் இருந்த அரசியல் தலைவர்களும் பாராளுமன்றத்தில் அங்கத்துவம் வகித்த பிரதிநிதிகளும் இதன் பின்னணியில் இருந்திருக்கிறார்கள். அந்தக் காலப் பகுதியில் பாராளுமன்ற உறுப்பினருக்குத் தவறணைகளை அல்லது மதுபானசாலைகளைத் திறப்பதற் குரிய அனுமதிப்பத்திரங்கள் பெற்றுக் கொடுக்கப்பட்டிருக் கின்றது. அந்தப் பகுதியில் இருக்கக்கூடிய வியாபாரிகள் இந்தத் தோட்ட மக்களை இலக்கு வைத்து இத்தகைய மதுபானசாலைகளைத் திறந்திருக்கிறார்கள். ஆகவே, சம்பந்தப் பட்டவர்கள் தாங்களே இதற்குக் காரணமாக இருந்துவிட்டு, தூண்டுதலாக இருந்துவிட்டு, இன்று அந்த மக்களைப் பார்த்துக் கைநீட்டி, அங்கே மதுப்பாவனை அதிகரித்துள்ள தாகச் சொல்கின்றார்கள். ஆனால், குறித்த செயற்பாட்டை மேற்கொண்டவர்கள்தாம் அதற்குப் பொறுப்புக்கூற வேண்டும்; அவர்கள்தான் அது குறித்து வெட்கப்படவேண்டும் என்பதை நான் இந்த இடத்திலே பதிவுசெய்ய விரும்புகின்றேன்.

ஏனைய பகுதிகளைப்போல் கடை வீதிகளோ அல்லது மக்கள் நடமாட்டமோ இல்லாத இந்தத் தோட்டங்களுக்குச் செல்கின்ற பாதைகளின் ஆரம்பப் பகுதியிலேயே மதுபான சாலைகள் அதாவது சாராயக் கடைகள், பியர் கடைகள், கள்ளுத்தவறணைகள் திறக்கப்பட்டிருக்கின்றன. ஆனால், அங்கு பாடசாலை செல்கின்ற பிள்ளைகள் தமக்கான ஓர் எழுதுகருவியை - பேனா, பென்சிலை வாங்குவதற்கான ஒரு கடையில்லை; அவசரமாக மருந்துப்பொருளை வாங்குவதற் கான ஒரு கடையில்லை. அவசரமாக மருந்தெடுப்பதற்கான ஒரு dispensary இல்லை. ஆனால், அங்கு சாராயக் கடைகள் தானாக முளைத்திருக்கின்றன. அங்கு மக்கள் விடியற் காலையில் வருகின்றபோது சரி, மாலையிலே வேலையை விட்டுச் செல்லுகின்றபோதும் சரி மற்றும் மாணவர்கள் பாடசாலைக்குப் போய் வருகின்றபோது சரி, ஒவ்வொரு நாளும் இவ்வாறான கடைகளைத் தாண்டிச் செல்லவேண்டி யிருக்கின்றது. இவ்வாறான தோட்டங்கள்தான் அங்கு அதிகம் காணப்படுகின்றன. ஆகவே, கௌரவ அமைச்சர் அவர்கள் தோட்டப்பகுதியில் இருக்கின்ற மதுபான விற்பனை நிலையங்களின் அமைவிடங்கள் தொடர்பில் கவனம் எடுத்து நடவடிக்கை எடுக்கவேண்டுமென்று கேட்டுக்கொள்கின்றேன்.

அதேபோல, மலையகப் பிரதேசம் அதிகளவு கள்ளுப்பாவனை இடம்பெறுகின்ற இடமாகவும் இருக் கின்றது. கடந்த அரசாங்கமானது தென்னை மரத்திலிருந்து பெறுகின்ற அந்தத் தேசிய உற்பத்தியை பல்வேறு இரசாயனப் பதார்த்தங்களைக் கொண்டு தயாரிக்கின்ற செயற்கை உற்பத்தியாக மாற்றிவிட்டது. இந்த நிலையிலே இதனை அதிகமாகப் பயன்படுத்தக்கூடிய இந்தப் பகுதியிலே இருக்கின்ற மக்கள் பல்வேறு பாதிப்புக்களுக்கு உள்ளாகியிருக்கின்றார்கள். இதனை நன்னிலைப்படுத் துவதற்காக கடந்த காலத்தில் அமைச்சர் அவர்கள் முன்மொழிந்திருப்பது தொடர்பில் நான் அவருக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இதனது உற்பத்தி நியமம் தொடர்பாக - தரம் தொடர்பாக ஆக்கபூர்வமான வகையிலே அமைச்சர் அவர்கள் தொடர்ந்தும் கவனம் செலுத்த வேண்டும்.

இன்று சாராயம் போன்ற உற்பத்திகளது வரி அறவீடு, எண்ணிக்கை தொடர்பாக இருக்கின்ற நிலைமை, கள் உற்பத்தியில் காணப்படவில்லை. அதாவது அதனது பதிவுகள், எண்ணிக்கைகள் தொடர்பில் கவனம் செலுத்தப்படுவதில்லை. அதன் ஒரு சிறு அளவுக்கு மட்டுமே வரி செலுத்தப்படுகின்றது. எஞ்சியவை வரியற்றவையாகக் கடைகளில் விற்பனை யாகின்றன என்பதையும் இந்த இடத்தில் தெரியப்படுத்தி, அது தொடர்பிலும் அமைச்சர் அவர்கள் கவனம் செலுத்த வேண்டும் என்று கேட்டு, மலையகச் சமூகத்தினுடைய விடிவுக்காக, மாற்றத்திற்காக இந்த மதுபானசாலைகளினது செயற்பாடு தொடர்பில் கடுமையான நடவடிக்கை எடுக்க வேண்டும் என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Finance and Mass Media, I move,

"That the Notifications made by the Minister of Finance and Mass Media, under Sections 2 and 22 of the Excise Ordinance (Chapter 52) regarding on Excise duty and published in the Gazette Extraordinary No. 2055/9 of 23rd January 2018, which were presented on 22.05.2018, be approved.

(Excise Notifications Nos. 05/2018 and 06/2018)

(Cabinet approval signified.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

III

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

Sir, on behalf of the Minister of Finance and Mass Media, I move,

"That the Notification made by the Minister of Finance and Mass Media, under Sections 2, 12, 22 and 25 read with Section 32 of the Excise Ordinance (Chapter 52) regarding on Excise duty and published in the Gazette Extraordinary No. 2059/32 of 21st February, 2018, which was presented on 22.05.2018, be approved.

(Excise Notification No. 07/2018)

(Cabinet approval signified.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු අනුර දිසානායක මහතා.

ඊට පෙර, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

බංකොලොත් මූල්‍ය ආයතනවල තැන්පතු ආපසු ලබා ගැනීමේ වැඩ පිළිවෙළ
திவாலான நிதி நிறுவனங்களின் வைப்புகளை மீளப்பெறும் வேலைத்திட்டம்
ARRANGEMENT TO RECOVER MONEY DEPOSITED IN BANKRUPT FINANCIAL INSTITUTIONS

[අ.භා. 1.27]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී පහත සඳහන් යෝජනාව මම ඉදිරිපත් කරනවා:

"මෑත කාලීනව රටේ ආර්ථිකයේ දැඩි අර්බුදකාරී තත්ත්වයක් ඇති වෙමින් පවතින අතර, මූල්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන ගණනාවක කඩා වැටීම මඟින්ද මෙම තත්ත්වය නිරූපණය වෙමින් තිබේ.

විශේෂයෙන් 2002 වසරේදී ප්‍රමුඛ ඉතිරිකිරීම් සහ සංවර්ධන බැංකුව කඩා වැටීම මෑත කාලීන මෙවැනි ප්‍රධාන ආයතනයන්හි බිඳ වැටීමේ ආරම්භය සටහන් කළේය. 2008 වසරේ සක්විති පන්නයේ කූට මූල්‍ය ජවාරම් බිඳ වැටීමෙන් අනතුරුව 2009 වසරේදී ගෝල්ඩන් කී ආයතනයෙන් ආරම්භ වී රුපියල් බිලියන 25කට වැඩි තැන්පතු තිබූ සෙලින්කෝ සමූහ ව්‍යාපාරය බිඳ වැටිණි. සෙලින්කෝ සමූහ ව්‍යාපාරය කඩා වැටෙද්දී ඊට අයත් සෙලින්කෝ ශ්‍රීරාම් සමූහ සමාගමට අයත් සමාගම් හතරක්ද, 'ෆිනැන්ස් ඇන්ඩ් ගැරන්ටි' මූල්‍ය සමාගමද අක්‍රිය තත්ත්වයට පත් විය. ඒ හා සමකාලීනව එන්ට්‍රස්ට් සෙකියුරිටිස්, ස්ටැන්ඩඩ් ක්‍රෙඩිට් ෆිනැන්ස්, සිටි ෆිනැන්ස් කෝපරේෂන් සහ සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනැන්ස් වැනි සමාගම්ද බිඳ වැටුණේ ඍජු තැන්පත්කරුවන් දස දහස් ගණනකට තමන්ගේ තැන්පතු අහිමි කරමිනි.

ආසන්නතම සිදුවීම ඊ.ටී.අයි. ෆිනැන්ස් ආයතනයේ ඇති වී තිබෙන අර්බුදයයි. පසුගිය ජනවාරියේ ඊ.ටී.අයි. ෆිනැන්ස් සහ ස්වර්ණමහල් ෆිනැන්ෂියල් සර්විසස් යන සමාගම් මූල්‍යමය අර්බුදයකට ලක්විය. මෙම සමාගම් දෙකෙහි රුපියල් බිලියන 36ක මුදලක් තැන්පත් කළ තැන්පත්කරුවන් 35,300කට මෙම තත්ත්වය බලපායි.

මෙම මූල්‍ය සමාගම්වල ඍජු තැන්පත්කරුවන් මෙන්ම ග්‍රාමීය බැංකු වැනි වෙනත් මූල්‍ය ආයතන විසින් මෙම ආයතනවල කරන ලද තැන්පතුද පවතින බැවින් මෙම මූල්‍ය ආයතනයන්හි බිඳවැටීම හුදු රටේ ආර්ථිකයට ඍණාත්මක ලෙස බලපෑමට අමතරව ලක්ෂ ගණනක මහ ජනතාවට ඍජු ලෙසම බලපායි. ඔවුන්ගේ තැන්පතු මුදල් ආපසු ලබා ගැනීමට නොහැකි වීම ඔවුන්ගේ ජීවිතවලට විවිධාකාරයෙන් බලපා තිබේ. තමන්ගේ මුදල් අවශ්‍ය මොහොතේ ලබා ගැනීමට නොහැකි වීම නිසා දිවිනසා ගැනීමේ සිට විශ්‍රාම සුවය අහිමි වීම, දරුවන්ගේ වගකීම ඉටු කිරීමට නොහැකි වීම, දෛනික ජීවිතය කඩා වැටීම වැනි අසරණ හා දුක්ඛිත තත්ත්වයනට ඔවුහු ඇද වැටී සිටිති.

අසරණභාවයට පත් වූ මෙම තැන්පත්කරුවන්ට ඔවුන්ගේ මුදල් වහා ආපසු ලබාදීමේ කඩිනම් වැඩ පිළිවෙළක් සැකසිය යුතු යැයිද, මූල්‍ය අක්‍රමිකතා විශාල ලෙස සිදු වී ඇති මෙම මූල්‍ය ආයතනවල රුපියල් බිලියන ගණනින් අවභාවිත කර ඇති පාලන අධිකාරින්ට එරෙහිව නීතිය දැඩිව ක්‍රියාත්මක කළ යුතු යැයිද, එම මුදල් නැවත ඔවුන්ගෙන් අය කර ගැනීමට ක්‍රියා කළ යුතු යැයිද මෙම සභාවට යෝජනා කර සිටිමි."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටේ මහ බැංකුවේ ලියා පදිංචි වී තිබෙන මූල්‍ය ආයතනවල වාගේම මහ බැංකුවේ ලියා පදිංචි නොවූ මූල්‍ය ආයතන විශාල ප්‍රමාණයක මේ රටේ මහ ජනතාව මුදල් තැන්පත් කොට තිබෙනවා. පසුගිය කාලය පුරාවටම මෙම ආයතන ගණනාවක්ම පවත්වාගෙන යාමේ නොහැකියාව මතු වීම හේතු කොට ගෙන කඩා වැටීමකට භාජන වී තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ හේතුවෙන් 50කට අධික ප්‍රමාණයක් සියදිවි හානි කරගෙන තිබෙනවා. ඒකයි තත්ත්වය. ඒ වාගේම තවත් කොටසක් තැන්පත් කරන ලද මුදල් කිසිවක් තමන්ට ලබා ගන්නට බැරිව මීය ගොස් තිබෙනවා, වයසට යාම හේතුවෙන්. ඒ වාගේම තවත් පිරිසකට උන් හිටිතැන් අහිමි වෙලා තිබෙනවා; දරුවන්ගේ අධ්‍යාපනය කඩා වැටිලා තිබෙනවා; ජීවත් වීමේ ගැටලු මතු වෙලා තිබෙනවා; පවුල් ඇතුළත ආරාවුල් නිර්මාණය වෙලා තිබෙනවා. මේ අය මොකටද වග කියන්නට ඕනෑ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ තැන්පත් කරපු මුදල්වලින් විශාල ප්‍රමාණයක්, තමන්ගේ මාසයේ ආදායමෙන් ඉතුරු වූ මුදලක් තැන්පත් කිරීම නොවෙයි. විශාල ප්‍රමාණයක තැන්පතු දෙස අපි හැරිලා බැලුවොත් පෙනෙනවා, යම් විශේෂ මුදලක් ඔවුන් අතට ලැබුණාට පසුව කරන ලද තැන්පතු බව. ඒ, ඔවුන් වැඩ කරලා සේවක අර්ථසාධක අරමුදල තමන්ගේ අතට ලැබුණාට පසුව තමන්ගේ ඉදිරි ජීවිකාව පවත්වාගෙන යාම වෙනුවෙන් තැන්පත් කරන ලද මුදල්; සමහර අය තමන්ගේ නිවසක්, ඉඩමක් විකුණලා අතට යම් මුදල් ප්‍රමාණයක් ලැබුණාට පසුව තැන්පත් කරන ලද මුදල්; සමහර අය තමන් සතුව තිබෙන වාහනයක් විකුණුවාට පසුව අතට ලැබුණු තැන්පත් කරන ලද මුදල්; සමහර අය විදෙස් ගත වෙලා අවුරුදු ගණනාවක් තිස්සේ වැඩ කරලා ඇවිල්ලා තැන්පත් කරන ලද මුදල්; ආණ්ඩුවේ ඉදිකිරීමට පවරා ගන්නා ඉඩම්වලින් -highwaysවලට වාගේ ඉඩම් පවරා ගත්තාට පස්සේ- ලැබුණු මුදල්. මේ කිසිවෙක් දෛනිකව ගලාගෙන යන විශාල මුදල් සම්භාරයක් අතේ තිබිලා මේ තැන්පතුවලට ගියා නොවෙයි. යම් නිශ්චිත මොහොතකදී තමන්ට යම් මුදල් ප්‍රමාණයක් ලැබුණාට පසුව එය ඉතා ඉක්මනින් වෙනත්

කටයුත්තකට යොදා ගැනීම වෙනුවෙන් -එක්කෝ දරුවන්ගේ අධ්‍යාපනයට, එක්කෝ නිවසක් තනා ගැනීමට, එක්කෝ ඉඩමක් මිලදී ගැනීමට, එක්කෝ විවාහ කටයුත්තක් කර ගැනීමට, එක්කෝ දරුවන් විදෙස්ගත කිරීමට වැනි අත්‍යවශ්‍ය වුවමනාවක් වෙනුවෙන්,- කෙටි කාලීනව තැන්පත් කරන ලද මුදල්. මේ ආයතන ගණනාවකට දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ආයතන ගණනාවක් අද කඩා වැටිලා. ආසන්න වශයෙන් ගත්තොත් පවුල් 75,000කට අධික ප්‍රමාණයකට තමන් විසින් තැන්පත් කරන ලද මුදල් තමන්ට ලබා ගැනීමේ නොහැකියාවකට මුහුණ දී තිබෙනවා.

මම එකින් එක කියන්නම්. ද ස්ටැන්ඩඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය අනුමත නිරාකරණ සැලැස්මක් ක්‍රියාත්මක කර ඇවර කිරීමට කටයුතු කරන්න කියලා තමයි තැන්පත්කරුවන් ඉල්ලා හිටින්නේ. ඒ මොකද?

ඉහත ආයතනය සෙලින්කෝ සමූහ ව්‍යාපාරයට අයත්ව තිබූ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අනුමත මූල්‍ය ආයතනයකි. 2008 වසරේදී සෙලින්කෝ සමූහයේ ඇති වූ මූල්‍ය අර්බුදය හේතුකොටගෙන මෙම සමාගමේ තැන්පත්කරුවන් 4,000ක් පමණ අන්ත අසරණභාවයට පත් වූ අතර, මෙම ආයතනයේ මූල්‍ය ගැටලු විසඳීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව මැදිහත් වුණා. පළමුව, කළමනාකරණ නියෝජිත වශයෙන් ලංකා පුත්‍ර බැංකුව මේකට පත් කළා. දෙවනුව, 2010 - 2011 වසරවලදී මර්චන්ට් බැංකුව පත් කළා. ඔවුන්ට එය ඉටු කර ගැනීමට නොහැකි වූ බැවින් සමාගමෙන් ඉවත් වුණා. තෙවනුව, 2011 මාර්තු 22වැනි දින අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමක් මඟින් කළමනාකරණ ආයෝජන කොටස්කරුවෙකු වශයෙන් එන්ට්‍රස්ට් ආයතනය - ඔබතුමන්ලා දන්නවා, එන්ට්‍රස්ට් ආයතනය කවුද කියලා. කිරිඇල්ල ඇමතිතුමා හොඳට දන්නවා.- මහ බැංකුව විසින් පත් කළා. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධානයන් ඇතුළත් 2011.03.07 වැනි දිනැති ලිපියක් මම ඔබතුමාට පෙන්වන්නම්.

විශේෂයෙන්ම මොකක්ද මහ බැංකුවේ විධානය? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔවුන් පැහැදිලිව කියනවා, "රුපියල් බිලියන 2.9ක වටිනාකමක් ඇති තැන්පත් වගකීම්වලින් සියයට 68ක ප්‍රමාණයක් සමාගමේ කොටස් බවට පරිවර්තනය කරන්න" කියලා. මේ ගොල්ලන් කොටස් ගන්න දැම්මේ නැහැ. මේ ගොල්ලන් සල්ලි දැම්මා, තමන්ට පොලියක් ලබා ගන්න සහ අවසානයේදී ඒ මුදල අවශ්‍ය කටයුත්තක් වෙනුවෙන් ලබා ගැනීමේ අරමුණින්. හැබැයි, දැන් කඩා වැටුණාට පස්සේ මොකක්ද කළේ? තමන්ගේ තැන්පත් මුදලින් සියයට 68ක් කඩා වැටිච්ච ආයතනයේ කොටස් බවට පත් කළා. මේ මහ බැංකුවේ නිර්දේශ. රුපියල් මිලියන 570ක් තෝරා ගත් සමූහ ව්‍යාපාර ආයතන වෙත, ණය ප්‍රමාණවලින් සියයට 100ක ප්‍රමාණය මත සමාගමේ සාමාන්‍ය කොටස් බවට පරිවර්තනය කළා. එන්ට්‍රස්ට් ආයතනය මිලියන 100ක් අරගෙන එනවා කියලා කිව්වා. මේ ආයතනය සතුව තිබුණු දේපළ අළෙවි කරනවා කියලා කිව්වා. ඊට පස්සේ මේක නැවත යථා තත්ත්වයට පත් කරනවා කියලා කිව්වා. හැබැයි, කිසිසේත්ම යථා තත්ත්වයට පත් වුණේ නැහැ. අද එම තැන්පත්කරුවන්ට සියයට 68ක-100ක ප්‍රමාණයක මුදල් අහිමි වෙලා තිබෙනවා. තැන්පත්කරුවන් 4,000ක් පමණ 2008 වසරේ සිට කිසිදු පොලියක් නැතුව, තමන් තැන්පත් කළ මුදලක් ගන්න බැරුව ඒ ගනුදෙනුව අවසන් වෙලා තිබෙනවා.

මම අහනවා, මහ බැංකුවේ නිලධාරින්ගෙන් තමුන්නාන්සේලා මේ ආයතන විධිමත් ලෙස නිරීක්ෂණයට භාජන කළාද කියලා, තමුන්නාන්සේලාට පැවරී තිබෙන වගකීමට අනුව? මතක තබා ගන්න, වගකීම අනුව කටයුතු කළේ නැහැ, මේ ආයතනය. මේ ආයතනය කඩා වැටෙන්න අරිනවා. කඩා වැටෙන එක පිළිබඳව අවබෝධයක් තිබෙනවා. තැන්පත්කරුවන්ට නිසි දැනුවත් කිරීමක් කරන්නේ නැහැ. කඩා වැටීම නැවත නිරාකරණය කිරීමට සැලසුම් ඉදිරිපත් කරනවා. ඒ සලසුම් සියල්ල අසාර්ථක බවට පත් වෙලා, තැන්පත්කරුවන් අන්ත අසරණ බවට පත් වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අන්තිමේදී මහ බැංකුව කියනවා, "නිරීක්ෂණ ක්‍රියාවලියක මීසක් තැන්පත් පිළිබඳ වගකීමක් මහ බැංකුවට නැත" කියලා. ප්‍රසිද්ධියේ මහ බැංකුව කියන්නේ ඒකයි. පත්තර දැන්වීම් දාලා යටින් හීනි අකුරින් දානවා, "මෙසේ වුවද තැන්පත් පිළිබඳව අපේ වගකීමක් නැහැ" කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මහ බැංකුවට මේ කාරණය කියනවා.

මහ බැංකුවේ ලියා පදිංචි කරන ලද මූල්‍ය ආයතනවල මුදල් තැන්පත් කිරීම පිළිබඳව, ඒ තැන්පත්කරුවන්ගේ මුදල් පිළිබඳව මහ බැංකුව වග කියන්නේ නැහැ කියා ප්‍රසිද්ධියේ දැන්වීම් දමන්න කියලා මම කියනවා. අර නිකම් පත්තර පිටුවක දැන්වීමේ යටින් කුඹි අකුරින් දමන වැකිය ගැන නොවෙයි මා කියන්නේ. එහෙම ප්‍රසිද්ධියේ දැන්වීම් දැම්මොත් බලාගන්න පුළුවන්, ඒ මූල්‍ය ආයතනවලට සිද්ධ වන්නේ මොකක්ද කියා. ඒ මූල්‍ය ආයතනවල ජනතාව මුදල් තැන්පත් කරන්නේ මහ බැංකුව කෙරේ තිබෙන විශ්වාසය නිසායි. මහ බැංකුවේ ලියා පදිංචි වුණා යැයි කියන, මහ බැංකුවේ licence එකක් තිබෙනවා යැයි කියන සහතිකය මත තමයි විශාල ප්‍රමාණයක් තැන්පත්කරුවන් ඒවායෙහි මුදල් තැන්පත් කළේ. හැබැයි මහ බැංකුව තමන්ගේ වගකීම අත් හැර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟ එක තමයි, CIFL ආයතනය. එහි තැන්පත්කරුවන් 4,092ක් ඉන්නවා. තැන්පත් මුදල රුපියල් කෝටි 3,500යි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ අතරින් සියයට 90ක් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් හෙවත් අවුරුදු 70ට වඩා වැඩි අයයි. තමුන්නාන්සේලාගේම නිර්ණායක අනුව තමුන්නාන්සේලා කියන ජ්‍යෙෂ්ඨ පුරවැසියන්. ඒ අය අතරින් 60දෙනකු පමණ මිය ගිහින් තිබෙනවා. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? 1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පනතින් ද, 2007 අංක 7 දරන සමාගම් පනතින් ද නීතිමය ආවරණය ලබමින්, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියා පදිංචි වෙමින් CIFL මූල්‍ය සමාගම බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් ලෙස ක්‍රියාත්මක වුණා. කොළඹ 07, ධර්මපාල මාවතේ, අංක 181 "ඒ" යන ස්ථානයේ පිහිටි ප්‍රධාන කාර්යාලය කේන්ද්‍රගත කරමින් මහනුවර, ගාල්ල, අනුරාධපුරය, යාපනය නගරවල ශාඛා කාර්යාල වශයෙන් ද, තලවාකැලේ, මහියංගණය, පොළොන්නරුව, කුරුණෑගල හා ගම්පහ නගරවල සේවා මධ්‍යස්ථාන වශයෙන් ද දීප ව්‍යාප්ත පාලනයකින් යුතුව මෙම මූල්‍ය සමාගම විහිදුණා. මෙම මූල්‍ය සමාගම මඟින් ස්ථාවර තැන්පතු, ඉතුරුම් පහසුකම්, ළමා ඉතුරුම් පහසුකම්, කල් බදු කුලී සින්නක්කර පහසුකම්, ක්ෂුද්‍ර මූල්‍ය ණය, ඉඩම් හා නිවාස ණය, උකස් සේවා ආදී සේවා රැසක් ක්‍රියාත්මක වූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ පිළිගත් මූල්‍ය ආයතනයක් වීම නිසා හා රජයේ වග කිව යුතු බලධාරීන්ගෙන් ලැබෙන නොමද මැදිහත්වීම නිසා ශ්‍රී ලංකාව පුරා විසිරී සිටින 4,150ක් පමණ වන දෙනා මෙම ආයතනයේ තැන්පත්කරුවන් බවට පත් වුණා. ඒ ව්‍යාප්තිය කෙතරම්ද යත් 2012, 2013 ගිණුම් වාර්තා අනුව එහි වත්කම් ප්‍රමාණය රුපියල් බිලියන 3.5ක්ව පැවතුණා. දැවැන්ත සංවිධානයක් හැටියට එය පැවතුණා. හැබැයි දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? තැන්පත්කරුවන්ගේ තැන්පත්වල වටිනාකම දැන් බිලියන 3.5ක් පමණ වනවා. තැන්පත්කරුවන්ගේ සංඛ්‍යාව දැන් 4,059ක් බවට පත් වෙලා තිබෙනවා. මෙම සමාගම 2009 සිට බිඳ වැටීමට ලක් වී තිබෙන බව මුදල් අමාත්‍යාංශයේ

[ගරු අනුර දිසානායක මහතා]

24/3/006/0005/001/C2009 හා 5/11/2009 දරන මහ බැංකු රහස්‍ය වාර්තාව එළි කළා. මා ළඟ තිබෙනවා මහ බැංකු රහස්‍ය වාර්තාව. ඒ ආයතනය ද්‍රවශීලතා අර්බුදයකට මුහුණ දී තිබෙන බව සඳහන් කරමින් මහ බැංකුව 2009දී රහස්‍ය වාර්තාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඉන් පසුව සකස් කරන ලද 24/300/005001 2011 හා 2011.01.20 දරන රහස්‍ය වාර්තාවෙන් ද සමාගමේ මහජන තැන්පත් අවභාවිතාව පිළිබඳව මහා පරිමාණ බිඳ වැටීමක් පෙන්නුම් කළා. ඒ, 2011දී යි. මොකක්ද වුණේ? මේ සියල්ල රහස්‍ය වාර්තා බවට පමණක් සීමා වී ඇත. මහ බැංකුව මේ පිළිබඳව මහ ජනතාව දැනුවත් කර නොමැත. සාධනීය ක්‍රියා මාර්ග නොගෙන අසමත් CIFL සමාගමට දිගින් දිගටම මහජන තැන්පතු ලබා ගැනීමට ඉඩ කඩ සකස් කර දුන්නා. අර්බුදය බව දැනගෙන, අර්බුදය වෙමින් තිබෙන බව දැනගෙන මහ ජනතාවගේ තැන්පතු ගන්න ඒ ආයතනයට දිගින් දිගටම ඉඩ කඩ ලබා දුන්නා. තැන්පත්කරුවන්ගේ සංගමය කියනවා, "2013 සිට තැන්පත්කරුවන්ගෙන් මුදල් හෝ පොලිය නොගෙවීම නිසා තැන්පත්කරුවන් සංගමයක් ලෙස 2013දී ඒකරාශි වුණා. සටන් බිමට අවතීර්ණ වුණා." කියා. අමාරුවෙන් උපයා ගත් මුදල් ආපසු ලබා ගැනීමට ඔවුන් පාරේ වාඩි වී ඉන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තමන් ඉතාම අමාරුවෙන් උපයාගත් සල්ලි තැන්පත් කර, තමන්ගේ ඒ තැන්පතු ගන්න දවල් පාරේ ඉඳගෙන ඉන්න, උපවාස කරන්න මහ ජනයාට සිදු වෙලා තිබෙනවා. මොකක්ද මහ බැංකුව කළේ? ඒ අය අතරින් බහුතරයක් බෝ නොවන රෝගවලින් පෙළෙනවා.

විශේෂයෙන්ම පිළිකා, වකුගඩු, හෘද රෝග, අධිරුධිර පීඩනය ආදී විශාල රෝග ලක්ෂණවලින් ඒ තැන්පත්කරුවන් පෙළෙනවා. ඒ අය අතරින් සියයට 91ක්ම වයසක අයයි; ජ්‍යෙෂ්ඨ පුරවැසියෝයි. ව්‍යාපාරික පරමාර්ථයෙන් නොව ජීවිතය පවත්වාගෙන යෑමේ පරමාර්ථයෙන් තමයි ඔවුන් මුදල් තැන්පත් කළේ. ගේදොර ඉඩ කඩම් විකුණා තිබෙනවා. ජීවත් වන්න විධියක් නැතිව ඒ අය ගෙවල් දොරවල් විකුණා දමා තිබෙනවා. මහ බැංකුව සමඟ සාකච්ඡා 14ක් පවත්වා තිබෙනවා. ඒ සාකච්ඡා අසාර්ථක වෙලා තිබෙනවා. හැබැයි අදත් ඒ තැන්පත්කරුවන්ට කිසිදු සහනයක් ලබා දෙන්න CIFL ආයතනයට බැරි වෙලා තිබෙනවා. මහ බැංකුව රහස්‍ය වාර්තා පමණක් සකසා තිබෙනවා.

තැන්පත්කරුවන් ආරක්ෂා කිරීමට මහ බැංකුව පියවර ගත්තේ නැහැ. ආයෝජන ප්‍රවර්ධන කාර්යයන් නොකර, ආයෝජන දිරි ගන්වනවා වෙනුවට තැන්පත්කරුවන්ට අසාධාරණයක් සිද්ධ වන විධියට තමයි මහ බැංකුව කටයුතු කරලා තිබෙන්නේ. ප්‍රතිව්‍යුහගත කිරීමට කොපමණ යෝජනා ඉදිරිපත් කළත්, ඒ සියල්ල අසාර්ථක වෙලා තිබෙනවා. හිටපු අධ්‍යක්ෂවරයා යම් පියවර ගත්තත්, දැන් අවුරුදු දෙකක සිට මහ බැංකුව මැදිහත් වෙලා මේ ආයතනයට අධ්‍යක්ෂවරයෙක්වත් පත් කර ගන්න බැරි වෙලා තිබෙනවා. වැඩ බලන අධ්‍යක්ෂවරයා සියල්ල කණපිට හරවා තිබෙනවා. හිටපු අධ්‍යක්ෂවරයා විසින් ලබා ගන්නා ලද තැන්පතු, පොලිය සමඟ ආපසු ගෙවීමට මූල්‍ය මණ්ඩල අනුමැතිය ලබා දුන්නා. මූල්‍ය මණ්ඩලය මේ ආයතනයට ලබා දීපු අවසර ලිපිය, සැලැස්ම මගේ ළඟ තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තැන්පතු ගෙවීම පිළිබඳව මූල්‍ය මණ්ඩලය ඉතාමත් විධිමත් සැලැස්මක් ඉදිරිපත් කළා. හැබැයි, මූල්‍ය මණ්ඩලය ඉදිරිපත් කළ ඒ සැලැස්මට අනුව ඒක සිද්ධ වෙලා නැහැ. ඊට පස්සේ අධිකරණයට ගියා. අධිකරණයටත් බොරු වාර්තා ඉදිරිපත් කරමින් තිබෙනවා. තමුන්නාන්සේලාගෙන් දැන් මම අහන්නේ, මේ CIFL ආයතනයේ භාරදහස් එකසිය පනස්නවයක් වූ තැන්පත්කරුවන්ගේ රුපියල් බිලියන 3.5ක් වන තැන්පත් මුදල -මහජනයා ඉතාමත් අසීරුවෙන් උපයා ගන්නා ලද මුදල්- මූල්‍ය ජාවාරම්කරුවන් කිහිප දෙනෙක් අතට පත් වෙන්න රජයක් හැටියට තමුන්නාන්සේලා ඉඩකඩ සලසනවාද, ඒ තැන්පත්කරුවන්ගේ ආරක්ෂාව වෙනුවෙන් තමුන්නාන්සේලා ගන්නා ක්‍රියාමාර්ග කවරේද කියායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට වැදගත්ම ප්‍රශ්නය තමයි UB Finance සමාගම පිළිබඳ ප්‍රශ්නය. මේ පිළිබඳව මම අවස්ථා ගණනාවකදී මේ පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න ඇහුවා. මම පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න ඇහුවාට පස්සේ අග්‍රාමාත්‍යවරයා මේ පාර්ලිමේන්තුවට උත්තරයක් දුන්නා. අග්‍රාමාත්‍යවරයා උත්තරය දුන්නාට පස්සේ UB Finance ආයතනයේ කළමනාකරු, ප්‍රධාන විධායක නිලධාරියා මට ලියුමක් එවා තිබුණා. මම පාර්ලිමේන්තුවේ ප්‍රශ්නයක් අහනකොට එයා මගේ office එකට ලියුමක් එවලා. ඒ ලියුමේ සම්පූර්ණයෙන්ම වැරදි කරුණුයි තිබුණේ. 2016.09.07වන දින මා විසින් ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් ඉහත කාරණය පිළිබඳව පාර්ලිමේන්තුවේදී කරුණු විමසුවා. ශ්‍රී ලංකා මහ බැංකුවෙන් සම්පූර්ණ වාර්තාවක් ලබා ගෙන පාර්ලිමේන්තුවට කරුණු ඉදිරිපත් කරන බවට අග්‍රාමාත්‍යතුමා විසින් ප්‍රකාශ කළා. කොටස් වෙළෙඳ පොළ ලැයිස්තුගත කිරීමට UB Finance සමාගමේ මූලික අවශ්‍යතා සපුරා නොමැති බැවින් වසරක කාලයක් ලබා දෙන බව මහ බැංකුව දැන්වූ බව අගමැතිතුමා කිව්වා. එතුමා එතකොට මහ බැංකුව භාර කෙනා. අර රොබරිය යන කාලයේ. 2012 වසරේ සිට කොටස් වෙළෙඳ පොළ ලැයිස්තුගත කිරීම ආරම්භ කරන බව ශ්‍රී ලංකා මහ බැංකුව සහ UB Finance සමාගම ප්‍රකාශ කළද, පසුගිය වසර නවයක කාලය පුරාවටම මෙය ලැයිස්තුගත කළේ නැහැ. මෙම ප්‍රශ්නගත සිද්ධියට අදාළව UB Finance සමාගමේ සභාපති ඇලෙක්ස් ලොවෙල් මහතාද 2016.09.07 වන දින ගරු අග්‍රාමාත්‍යතුමාට, මුදල් අමාත්‍යතුමාට, මහ බැංකු අධිපතිතුමාට පිටපත් සහිතව මා වෙත ලිපියක් යොමු කරමින් පවසා ඇත්තේ, තැන්පත් මුදල්වලින් සියයට 40ක් පොලිය සමඟ තැන්පත්කරුවන්ට ගෙවා ඇති බවයි. මගේ ළඟ ඒ ලිපිය තිබෙනවා. මේ දක්වා මේ UB Finance ආයතනය කිසිදු පොලියක් ගෙවා නැහැ. 2016.09.30වන දින UB Finance ආයතනයේ සභාපති, තැන්පත්කරුවන්ට එවා ඇති ලිපියේ සති හතරක කාල සීමාවක් තුළ කොටස් වෙළෙඳ පොළේ ආයෝජන කළ හැකි බව දන්වා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ, The Finance and Guarantee - F&G - කියන සමාගම. ඒ සමාගම අර්බුදයට ලක් වුණාට පස්සේ යුනියන් බැංකුවෙන් ඒ සමාගම අරගෙන, යුනියන් බැංකුවේ අනුබද්ධ ආයතනයක් හැටියට UB Finance කියන ආයතනය පිහිටෙව්වා. ඒකට මැදිහත් වීම ගැන මා එතුමන්ලාට ස්තුතිවන්ත වෙනවා. UB Finance ආයතනය දැන් සැලකිය යුතු ප්‍රමාණයකින් ලාභ ලබන බව පුවත් පත්වල වාර්තා කර තිබෙනවා මා දැක්කා. පසුගිය වසරේ එතුමන්ලාගේ ලාභය රුපියල් මිලියන 970ක් කියලා පෙන්නුම් කර තිබෙනවා. ඒ ගැන මම ස්තුතිවන්ත වෙනවා. මොකද, UB Finance ආයතනය කඩා වැටුණු ආයතනයක්. යුනියන් බැංකුව මැදිහත් වෙලා එය ගොඩ නැඟීමට දරපු උත්සාහය පිළිබඳව අපි ස්තුතිවන්ත වෙනවා. UB Finance ආයතනයේ කඩා වැටීමේ අනතුරක් ගැන නොවෙයි, මා මේ කියන්නේ. ඒ ආයතනය නැවතත් වර්ධනය වෙමින් තිබෙන ආයතනයක් බව පිළිගනිමින් තමයි මම මේ කරුණු ඉදිරිපත් කරන්නේ. හැබැයි, ඒ ආයතනයේ තිබෙන සල්ලි කාගේද? ඉස්සර වෙලාම කරපු දේ තමයි ඒ ආයතනයේ මිලියන 1,200ක කොටස් -F&G සමාගමේ මිලියන 1,200ක කොටස්- කොටසක් ශත පනහ බැගින් රුපියල් මිලියන හයසියයකට යුනියන් බැංකුවට දුන්නා. කොටස් මිලියන එක්දහස් දෙසියයක්, කොටසක් ශත පනහ ගණනේ රුපියල් මිලියන හයසියයකට යුනියන් බැංකුවට දුන්නා. ඒ වාගේම කොටසක් රුපියල් දෙක බැගින් කොටස් මිලියන 275ක් රුපියල් මිලියන 550කට ShoreCap කියන ආයතනයට දුන්නා.

එතකොට තැන්පත්කරුවන්ට? යුනියන් බැංකුවට මේ F&G සමාගමේ කොටසක් දුන්නේ සත 50 ගණනේ. ShoreCap කියන සමාගමට කොටසක් රුපියල් දෙක ගණනේ දුන්නා. හැබැයි, තැන්පත්කරුවන්ගේ මුදල්වලින් සියයට 60ක් මෙහි කොටස් බවට පරිවර්තනය කළා. තැන්පත්කරුවන්ගේ කොටසක වටිනාකම කීයද? තැන්පත්කරුවෙකුට කොටසක් දුන්නේ රුපියල් 7ට. ඒ මොන කොටසක්ද? ඡන්ද බලය හිමි නොවන කොටසක්. ඡන්ද බලය හිමි කොටස්, කොටසක් සත 50 ගණනේ යුනියන් බැංකුව සතුව තිබෙනවා කොටස් මිලියන 1,200ක්. ShoreCap සමාගමට රුපියල් 2 ගණනේ කොටස් මිලියන 275ක් දෙනවා, මිලියන 550කට. ඒවා ඡන්ද බලය හිමි කොටස්. හැබැයි, ඡන්ද බලය හිමි නොවන කොටසක් තැන්පත්කරුවන්ට රුපියල් 7 ගණනේ දෙනවා. ඒක සාධාරණද? ඒක අසාධාරණයි. මේ නිර්දේශය දෙන්නේ කවුද? ඒ නිර්දේශය දෙන්නේ මහ බැංකුව! මා ළඟ තිබෙනවා මහ බැංකුව මේ කොටස් අළෙවි කිරීමට සකස් කළ සැලැස්ම. ඒ අය මේ කොටස් මිල ගණන් එක්ක ඉදිරිපත් කරනවා. යුනියන් බැංකුවට සත 50යි. ShoreCap එකට රුපියල් 2යි. තැන්පත්කරුවාට රුපියල් 7යි. මිනිසුන්ගේ තැන්පත් මුදලින් සියයට 60ක් කොටස් බවට පත් කරන්න කිව්වා. ඒ සමහර අය සියයට 60ක් කොටස් බවට පත් කළා. සමහර අය සියයට සියයම කොටස් බවට පත් කළා. ඇයි ඒ? ඒ ගොල්ලෝ කිව්වා, "අපි මේ ආයතනය ගොඩ ගන්න ඒ විධියට කටයුතු කළා" කියලා. මුලින්ම F&G සමාගමෙන් මේකට shares දුන්නා. මා ළඟ තිබෙනවා ඒ කොටස් සහතිකය.

ඊට පස්සේ යුනියන් බැංකුව තමන්ගේ වෙනම අනුබද්ධ ආයතනයක් ලෙස UB Finance කියලා මේ සමාගම ගොඩනැඟුවා. ඊට පස්සේ UB Finance ආයතනයෙන් F&G එකේ කොටස් වෙනුවට ඒ ගොල්ලන්ගේ කොටස් සහතික නිකුත් කළා. මා ළඟ තිබෙනවා UB Finance සමාගම විසින් තැන්පත්කරුවන්ට නිකුත් කරන ලද කොටස්වලට අදාළ සහතිකය. දැන් ඡන්ද බලය නැති කොටස් සහතිකයක් තැන්පත්කරු ළඟ තිබෙනවා. ඒ කවදා ඉඳලාද? 2013 ඉඳලා. දැන් 2018 වෙනතෙක් මොකද වෙලා තිබෙන්නේ? මේ සමාගම මහ බැංකුවේ ලැයිස්තුගත සමාගමක් බවට පත් කරන්නේ නැහැ. ඉතින්, තැන්පත්කරුවන් මේ කොටස් අතේ තියාගෙන මොනවා කරන්නද? නිකම් කඩදාසියක් මහ ජනතාව අතේ තිබෙනවා. මහ ජනතාව අතේ කඩදාසියක් තිබෙනවා. නමුත්, මේ කොටස් අයිති සමාගම කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තුගත සමාගමක් බවට පත් වෙලා නැහැ!

2013.10.28 දින දරන ලිපිය මා ළඟ තිබෙනවා. UB Finance එකේ management එකට අවස්ථා ගණනාවකදී මේ විධියට කියනවා. "ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් කලින් නිකුත් කර ඇති විධානයන්ට අනුව, 2013.12.31 දිනට පෙර කොළඹ කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තුගත වන මෙන් මෙම සමාගමට උපදෙස් දෙනු ලැබූ බවත්, ඒ අනුව කටයුතු කිරීමට සමාගම එකඟ වූ බව දන්වමි." මේ ලිපිය කවුද එවන්නේ? මේ ලිපිය එවන්නේ මහ බැංකුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ, 2013දී. UB Finance සමාගම ලැයිස්තුගත කිරීම සඳහා අවශ්‍ය වන කොන්දේසි සකස් කර නියෝග දීලා තිබෙනවා. නමුත් තවම ඒ සමාගම ලැයිස්තුගත කරලා නැහැ. ඉදිරියේදී කටයුතු කරන්න නියෝග ලබා දුන් බව සඳහන් කරලා එවනවා.

ඊ ළඟට, 2016දී මෙහෙම කියනවා. "කෙසේ වුවද, සමාගම කොළඹ කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තුගත කිරීම සම්බන්ධයෙන් පැවති සියලු නීතිමය ගැටලු නිරාකරණය කර ගැනීමට සමාගමට මේ වන විට හැකියාව ලැබී ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කරන ලද විධානය ප්‍රකාරව 2016.06.30 -දැනට අවුරුදු දෙකකට කලින්- දිනට පෙර සිය කොටස් කොළඹ කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තුගත කිරීමට කටයුතු කරන බව සමාගමේ කළමනාකාරිත්වය විසින් අප වෙත දැනුම් දී ඇති බව තවදුරටත් දන්වා සිටිමි."

මේ තැන්පත්කරුවන්ට UB Finance සමාගමෙන් කියනවා, මහ බැංකුව විසින් ලැයිස්තුගත කිරීම සඳහා තිබෙන බාධා සියල්ලම අයින් වෙලා තිබෙනවාය කියලා. 2016.06.30 වෙනි දා කියනවා, "මේ සමාගම අපි කොටස් වෙළෙඳ පොළට ඇතුළු කරනවා" කියලා. නමුත්, තවම ඇතුළු කරලා නැහැ. දැන් මොකද වෙලා තිබෙන්නේ? කොටසක් රුපියල් 7 ගණනේ මේ වාගේ කඩදාසියක් තැන්පත්කරුවන් අතේ තියාගෙන ඉන්නවා. ඒක කොටස් වෙළෙඳ පොළට ඇතුළත් වෙලාත් නැහැ; ඒකට පොලියක් ගන්න විධියකුත් නැහැ; ඒක අළෙවි කර ගන්න විධියකුත් නැහැ. මේ විධියට කොළයක් විතරක් තිබෙනවා. මේ අයගේ EPF අරමුදල කියන්නේ මේ කොළයද? මේ ගොල්ලන්ගේ නිවසක් විකුණා ගත්ත මුදල කියන්නේ මේ කොළයද? ඒ ගොල්ලන් මේ F&G සමාගමේ තැන්පත් කළ මුදල කියන්නේ මේ කොළයද? මේ කොළයකින් ඇති ඵලය මොකක්ද? මහ බැංකුව UB Finance ආයතන පිළිබඳව ලබා දුන් කිසිම නිර්දේශයක් අනුව කටයුතු කර නැහැ. අද UB Finance ආයතනයේ නිලධාරීන් මොකක්ද කියන්නේ? "මේ ආයතනයේ තමුන්නාන්සේලාගේ සල්ලි නැහැ. තමුන්නාන්සේලාගේ සල්ලි තිබෙන්නේ F&G ආයතනයේ. F&G ආයතනයට ගිහිල්ලා ගන්න" කියලායි කියන්නේ. හැබැයි, F&G ආයතනය තමයි UB Finance එකට ගත්තේ; ඒකේ කොටස් තමයි ගත්තේ. ඒක තමයි යුනියන් බැංකුවේ අනුබද්ධ ආයතනයක් හැටියට පිහිටෙව්වේ. ඒ පිහිටවපු එකේ කොටස් තමයි UB Finance එකට දුන්නේ. මේ තැන්පත්කරුවන්ට දැන් මොකක්ද වෙන්නේ?

දැන් අවුරුදු දහයකට වැඩි කාලයක් මිනිස්සු සල්ලි තැන්පත් කර තිබෙනවා, ඒ වෙනුවට නිකම් හිස් කොළයක් ඔවුන්ගේ අතේ තිබෙනවා. මංගල සමරවීර ඇමතිතුමා මේකට උත්තරයක් දේවි. මම එතුමාගෙන් අහන්න කැමැතියි යුනියන් බැංකුවට දෙන කොටසක් ශත 50ක් වෙන්නේ, ShoreCap සමාගමට දෙන කොටසක් රුපියල් 2ක් වෙන්නේ ඇයි කියලා. ඒවා ඡන්ද බලය තිබෙන කොටස්. එහෙම නම්, ඡන්ද බලය නැති තැන්පත්කරුවන්ගේ කොටසක් රුපියල් 7ක් බවට තීරණය කළේ කොහොමද? ඒ වෙලාවේ මේ කටයුතු භාරව කටයුතු කළ මහ බැංකුවේ නිලධාරියා අද වැඩ කරන්නේ කොහේද? අද ඔහු යුනියන් බැංකුවේ උප සභාපතිවරයා. ඒක මතක තබා ගන්න. ඔහුගේ නම ප්‍රියන්ත. මේ ආයතනයේ ඉඳගෙන ඔහු තමයි මේ වැඩ කටයුතු කළේ. මම අනෙක් අය ගැන සහතික දෙන්නේ නැහැ. විදේශ ආයෝජකයෝ දෙදෙනෙක් මේ කටයුත්තට මැදිහත් වෙන්න ආවා. ඒ දෙදෙනා පසෙකින් තියලා මේ කටයුත්තට යුනියන් බැංකුව තෝරා ගත්තා. ඒකට කමක් නැහැ. ඒ නිර්දේශ අපි දන්නේ නැහැ නේ. හැබැයි, යුනියන් බැංකුව තෝරා ගන්න නිර්දේශ කළ මහ බැංකුවේ හිටපු නිලධාරියා අද වැඩ කරන්නේ කොහේද? ඔහු අද යුනියන් බැංකුවේ උප සභාපතිවරයා හැටියට කටයුතු කරමින් සිටිනවා. දැන් මේ තැන්පත්කරුවන්ගේ ආරක්ෂාව මොකක්ද කියලා අපි තමුන්නාන්සේගෙන් දැන ගන්න කැමැතියි. මහ බැංකුව මොකක්ද මේ කරලා තිබෙන්නේ? කවදාද මේ සමාගම ලැයිස්තුගත කරන්නේ? තවදුරටත් මේ සමාගම ලැයිස්තුගත කිරීමෙන් වැඩක් නැහැ. අඩුම තරමින් ඒ මිනිසුන්ට එකඟ වුණු මුදලයි, ඊට සරිලන පොලියයි එක්ක මුදල් ටික දෙන්න ඒ ආයතනය බැඳී සිටිනවා. තමුන්නාන්සේලා පිළිගන්නවාද, මහජනයාගේ ධනය මේ විධියට එකතු කර ගන්නේ මූල්‍ය ජාවාරම්කාරයන් බව? මේගොල්ලන් තමයි අපේ රටේ අපරාධකාරයෝ. ඒක මතක තියාගන්න. මේගොල්ලන්ගේ ඉතිහාසය මම පසුව තවදුරටත් පෙන්වන්නම්. මූල්‍ය ජාවාරම්කාරයෝ කණ්ඩායමක් අපේ රටේ මහජනයාගේ ධනය එක්රැස් කරමින් විරාජමානව වැජඹෙන තත්ත්වයක

[ගරු අනුර දිසානායක මහතා]

සිටිනවා. ඒ නිසා විශේෂයෙන්ම මේ UB Finance ආයතනයේ තැන්පත්කරුවන්ගේ ප්‍රශ්නය පිළිබඳව තමුන්නාන්සේගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට මම ETI ආයතනය ගැන ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ETI ආයතනයේ තැන්පත්කරුවන් 36,000ක් පමණ ඉන්නවා. ඔවුන් තැන්පත් කර ඇති මුදල රුපියල් බිලියන 3.5යි. ආසන්න වශයෙන් ගත්තොත් ඒ තැන්පත් ප්‍රමාණය රුපියල් කෝටි 3350ක් පමණ වෙනවා. ප්‍රසිද්ධ කාරණයක් තමයි මේ ETI ආයතනය එදිරිසිංහ සමූහ ව්‍යාපාරයට යටත්ව තිබුණාය කියන එක. ඉස්සර ඒ ආයතනය වළලු බඳින දැන්වීම් පළ කළා; විශාල පුණ්‍ය කටයුතු කරන බව පෙන්වූවා. ඒ සමාගමට මාධ්‍ය ආයතන තිබුණා. ඒ අය මහා දැවැන්ත චිත්‍රපටි හදන බව පෙන්වූවා; විශාල හෝටල් ගොඩනඟන බව පෙන්වූවා. මේ ඊඑපී ව්‍යාපාරය මහා දැවැන්ත සමූහ ව්‍යාපාරයක් හැටියට ජනතාවට පෙන්වා තිබුණා. ඒකට දීර්ඝ ඉතිහාසයක් තිබෙනවා. ඔවුන්ගේ ව්‍යාපාරය මේ රටේ දීර්ඝ ඉතිහාසයක් තිබෙන ව්‍යාපාරයක්. අපට ඒ ගැන ගෞරවයක් තිබෙනවා. ඔවුන් අපේ රටේ ආර්ථිකයට දායකත්වයක් සපයන්න ඇති කියන විශ්වාසයක් අපට තිබෙනවා. හැබැයි, අපි දැන් අහන්නේ මේකයි. ඒ අය මේ ඔක්කොම සෙල්ලම් කරලා තිබෙන්නේ කාගේ සල්ලිවලින්ද? ඒ ආයතනය පිළිබඳව මම ඔබතුමාට එකින් එක කරුණු පෙන්වා දෙන්නම්.

ETI Finance Limited ආයතනයේ සභාපති ජීවක හේමාල් එදිරිසිංහ මහත්මයා 2013.10.01 දින තැන්පත්කරුවන්ට යවන ලද ලිපියක් තිබෙනවා.

"එකී වාර්තාව අනුව අප සමාගම සතු ශුද්ධ වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 1600 සිට රුපියල් මිලියන 4100 දක්වා වර්ධනය වූ අතර, මුළු වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 32,000 දක්වා වර්ධනය වී ඇත."

මිලියන 32,000ක් කියන්නේ බිලියන 32 දක්වා වර්ධනය වී ඇති බවයි.

"ඊට අමතරව ETI මූල්‍ය සමාගම ව්‍යාපාර කටයුතු විවිධාංගීකරණය කිරීමේත් මෙහෙයුම් කටයුතු නවීකරණය කිරීමේත් කාර්යන්හි අඛණ්ඩව යෙදී සිටී. මූල්‍ය සමාගම් පිළිබඳ වර්තමානයේ පවත්නා හානිකර ප්‍රචාර නිසාත්, වෙළෙඳපොළේ පැතිර යන සාවද්‍ය තොරතුරු නිසාත් අපේ සමාගමේ ප්‍රගතිය පිළිබඳව ඔබ දැනුවත් කිරීම කාලෝචිත යයි අපි විශ්වාස කරමු. එසේම, වසර 45ක් පුරාවට ETI මූල්‍ය සමාගම පවත්වාගෙන ආ විශ්වසනීයත්වය, අඛණ්ඩ බව ඔබ වෙනුවෙන් සැපයීමට අප ඇප කැප වී සිටින්නෙමු."

කවුද එහෙම කියන්නේ? එහෙම කියන්නේ ජීවක එදිරිසිංහ. කවදාද කියන්නේ? කියන්නේ, 2013.10.01 දා. මීට අවුරුදු හතරහමාරකට කලින් කියනවා, "මේක දැවැන්ත ව්‍යාපාරයක්, ඒ ගැන විශ්වාසවන්තභාවය තියන්න" කියලා. ඒ විතරක් නොවෙයි, ඒ ලියුමේ තවත් සහතික කරන්නේ මොකක්ද?

"තවද, ETI මූල්‍ය සමාගමේ මූල්‍ය ස්ථාවරත්වය පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමා 0112-477000 මඟින් විමසීම් කළ හැකි බව වැඩිදුරටත් දැනුම් දෙමි."

"පොඩි හරි සැකයක් තිබෙනවා නම් අහන්න, මෙන්න නම්බර් එක" කියලා තැන්පත්කරුවන්ට ලියුමක් එවනවා. ඒ වන විටත් මහ බැංකුවෙන් යම් නිර්දේශ ලබා දී තිබුණා, මේ මූල්‍ය සමාගම යම් අස්ථාවරභාවයට පත්වෙමින් තිබෙන බවට. ඒ නිසා ඔවුන් මේ තැන්පත්කරුවන් මුළුමනින්ම නොමඟ යැවීමක් කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මා ළඟ තිබෙනවා, සභාපතිතුමා යවපු තවත් ලිපියක්. ඒ ලිපියේත් ඉතා පැහැදිලිව කියනවා, "ඉහත කී කරුණු අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියා පදිංචි මූල්‍ය සමාගම් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ උපදෙස් පිළිපැදීමට බැඳී සිටින අතර විශේෂයෙන්ම සඳහන් කළ යුත්තේ ඔබගේ තැන්පතු මුදල ඉතාම සුරක්ෂිත බවත්, එහි ආපසු ගෙවීම ස්ථිර වශයෙන්ම ස්ථාපිත කිරීමට වග කිව යුතු මූල්‍ය සමාගමක් වශයෙන් අපි බැඳී සිටින බවත්ය" කියලා. මේ ලිපිය යවා තිබෙන්නේ වැඩි ඈත දිනයක නොවෙයි. මේ ලිපිය යවන්නේ කවදාද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තැන්පත්කරුවන්ට මේ ලිපිය යවන්නේ, 2018.01.04 දිනයි; මේ අවුරුද්දේ ජනවාරි මාසයේ 04වන දායි. ඒ ලිපියේ අන්තිමට මොකක්ද කියන්නේ? "අඩ සිය වසක් ඔබ සමඟ සිටි අපි තව සිය වසක් ඔබ සමඟ ඉදිරියට" කියලා. එහෙම තමයි මේ ලිපිය යැව්වේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? මේ ETI ආයතනයේ ප්‍රශ්නය පිළිබඳව ඉරාන් වික්‍රමරත්න මුදල් රාජ්‍ය ඇමතිතුමාගෙන් මා ඇහුවාට පස්සේ, එතුමා පාර්ලිමේන්තුවට දීපු උත්තරය මොකක්ද? මේ එදිරිසිංහ සමූහ ව්‍යාපාරයට අයත් සියලු ව්‍යාපාර විකුණුවාට පස්සේ අදියර දෙකකට ඩොලර් මිලියන 75ක් ලැබෙනවාය කිව්වා. පළමුවන අදියරට ඩොලර් මිලියන 32ක් ලැබෙනවාය කිව්වා, ඊළඟ අදියරට ඩොලර් මිලියන 43ක් ලැබෙනවාය කිව්වා. මේ සමූහ ව්‍යාපාරයට අයිති ව්‍යාපාර සියල්ලම විකුණුවාම ඩොලර් මිලියන 75ක් ලැබෙනවා. ඩොලර් මිලියන 75ක් කියන්නේ, ආසන්න වශයෙන් රුපියල් බිලියන එකොළහමාරයි. ETI ආයතනය සහ ස්වර්ණමහල් මූල්‍ය සේවා ආයතනය විසින් ණයට දීපු මුදල් ප්‍රමාණය රුපියල් බිලියන පහමාරයි. එතකොට සමූහ ව්‍යාපාරයේ දේපොළවලින් ලැබෙනවා, රුපියල් බිලියන එකොළහමාරක්. ණයට දීපු මුදල් ප්‍රමාණය රුපියල් බිලියන පහමාරයි. ආසන්න වශයෙන්, රුපියල් බිලියන එකොළහමාරයි, රුපියල් බිලියන පහමාරයි එකතු කළාම රුපියල් බිලියන 17යි. හැබැයි රුපියල් බිලියන තිස්තුනහමාරක තැන්පත්කරුවන් ඉන්නවා. එතකොට ඉතුරු රුපියල් බිලියන දහසයහමාර කෝ? අපි කියනවා, ශ්‍රී ලංකා මහ බැංකුව මේ පිළිබඳව විමර්ශනයක් කරන්න ඕනෑය කියලා. මේ මූල්‍ය සමාගමේ සල්ලි කොහේටද ගියේ? මේ සමූහ ව්‍යාපාරයට අයිති සියලු දේපොළ විකුණුවත් ලැබෙන්නේ රුපියල් බිලියන එකොළහමාරයි. ණය වශයෙන් දීලා තිබෙන්නේ රුපියල් බිලියන පහමාරයි. එතකොට රුපියල් බිලියන 17යි. හැබැයි තැන්පතුවල එකතුව රුපියල් බිලියන තිස්තුනහමාරයි. එහෙම නම් ඉතුරු රුපියල් බිලියන දහසයහමාර කෝ? අපට ඒ මුදල් ප්‍රමාණය පෙන්වන්න. එක්කෝ ගෙවා ගන්න බැරි වුණු බොල් ණය කියලා පෙන්වන්න. නැහැ. ඒවා ඒ ගොල්ලන්ගේ ආයතනවල තමයි තිබෙන්නේ. මේ රුපියල් බිලියන දහසයහමාරට මොකද වුණේ?

තමුන්නාන්සේලා අද තැන්පත්කරුවන්ට කියන්නේ මොකක්ද? 05වන දා තැන්පත්කරුවන් කැඳවා සියයට 10ක් දීලා තිබෙනවා. තවත් සියයට 10ක් පස්සේ දෙනවා ලු. ඉතිරි සියයට 80 අවුරුදු පහකින් දෙනවා ලු. ඒ දෙමවුපියන් -තැන්පත්කරුවන්- මට මුණ ගැහුණා. සමහර අය තමන්ගේ දරුවන් පිට රට යවන්න වීසා එක ලැබෙන කල් තමයි සල්ලි ටික තැන්පත් කරලා තිබුණේ. සමහර අය පිට රට ගිහින් ඇවිත්, ව්‍යාපාරයක් පටන් ගන්න තෙක් තමයි සල්ලි ටික තැන්පත් කරලා තිබුණේ. එක් කෙනෙක්

මීගමුවේ තිබුණු තමන්ගේ හෝටලය විකුණා දෙසැම්බර් මාසයේ රුපියල් ලක්ෂ 500ක් තැන්පත් කරලා තිබෙනවා. දෙසැම්බර් මාසයේත් සල්ලි ගන්නවා. හැබැයි දෙසැම්බර් මාසයේ රුපියල් ලක්ෂ 500ක් අරගෙන මැයි මාසයේ කියනවා, "ඔය ගොල්ලන්ට ජූනි මාසයේ 05වන දාට සියයට 10ක් දෙන්නම්. පස්සේ තව සියයට 10ක් දෙන්නම්. ඉතුරු සියයට 80 අවුරුදු 5කින් දෙන්නම්" කියලා. අපි අහනවා, මේ අය කවුද කියලා. මේ අය මහ ජනයාගේ දේපොළ හොරකම් කරන මහ දවල් මං කොල්ලකාරයෝ. මේ මූල්‍ය සමාගම් මහ දවල් මං කොල්ලකාරයෝ. දෙසැම්බර් මාසයේ රුපියල් ලක්ෂ 500ක් ගන්නවා. "ජූනි මාසයේ 05වන දා සියයට 10ක් දෙන්නම්, තව මාස තුනකින් තව සියයට 10ක් දෙන්නම්, ඉතුරු සියයට 80 අවුරුදු 5කින් දෙන්නම්" කියලා කියනවා. මූල්‍ය සමාගම් එහෙම කියන්නේ කොහොමද? ETI ආයතනයේ මුදල් කොහේටද ගියේ? මුතුකරුපන් චෙට්ටියාර් ආයතනයටයි. මුතුකරුපන් චෙට්ටියාර් ආයතනය කාගේද කියා සොයා බලන්න. සල්ලි ඇද්දේ කොහේටද කියා සොයා බලන්න. ඒක ඊඒපී සමූහ ව්‍යාපාරයට අයිති නැහැ. තමුන්නාන්සේ සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් කැඳවා, මුතුකරුපන් චෙට්ටියාර් ආයතනය අයිති කාටද කියලා බලන්න. Board of Directors මාරු වුණේ කවදාද? මේවා වෙනස් වුණේ කවදාද? ස්වර්ණමහල් ආයතනයේ රත්නු ටික ඇද්දේ කොහේටද? ETI ආයතනයේ සල්ලි ඇද්දේ කොහේටද කියා සොයා බලන්න. මූල්‍ය ජාවාරම්කාරයෝ මහ දවල් මහ ජනයාගේ ධනය මං කොල්ල කනවා. ආණ්ඩුවක් හැටියට තමුන්නාන්සේලා මේවා අනුමත කරනවාද? මේ රටේ පුරවැසියන් පිළිබඳව ආණ්ඩුවට වග කීමක් නැද්ද? මේ රටේ පුරවැසියන්ගේ මුදල් පිළිබඳව, තැන්පතු පිළිබඳව ආණ්ඩුවට වග කීමක් නැද්ද? තමුන්නාන්සේලා මේවාට වග කියන්න ඕනෑ.

ආයතන කඩා වැටුණාම නැවත ගොඩනැඟීමේ සැලසුම් ඉදිරිපත් කරන බව අපි ඕනෑ තරම් දැකලා තිබෙනවා. ඊට පස්සේ ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්ම ඉදිරිපත් කරනවා. දිගටම ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලසුම් ඉදිරිපත් කිරීමෙන් බලාපොරොත්තු වන්නේ මොකක්ද? ප්‍රශ්නය කල් අදින්නයි. ප්‍රතිව්‍යුහගත කරලා මොන ආයතනයද ඉහළට ආවේ?

F&G Company, UB Finance උඩට ආපු බව මම පිළිගන්නවා. හැබැයි, UB Finance එක උඩට ආවාට එහි තැන්පත්කරුවන්ට සල්ලි දීලා නැහැ. වෙන මොකක්ද උඩට ගත්තේ කියලා මට කියන්න. මේ නිකම් මූල්‍ය ජාවාරම්කාරයෝ දෙන්නෙක්, තුන්දෙනෙක් මේකට ඇවිල්ලා, මේකේ තිබෙන දේපළයි, මහ බැංකුවෙන් දී තිබෙන licence එකයි උපයෝගී කර ගෙන දාදු කෙළිනවා. මේක තමයි සිද්ධ වෙලා තිබෙන්නේ. Entrust Securities PLC එක පසුගිය කාලයේ ආවා මේ ආයතන ගොඩකට. පසුගිය කාලයේ මේ කඩා වැටුණු ආයතන ගොඩකට මැදහත් වුණේ Entrust Securities PLC ආයතනය. දැන් මොකක්ද වෙලා තිබෙන්නේ? අන්තිමේ දී ඒකත් වැටුණා. එම නිසා තමුන්නාන්සේලා මේ ගැනත් හිතන්න. මේ මූල්‍ය සමාගම්වල තැන්පත්කරුවන්ගේ සල්ලිවල ආරක්ෂාව ගැන, ඒ අයට ආපසු මුදල් ලබා දීම පිළිබඳව අත් හරින්නට බැරි වග කීමක් තමුන්නාන්සේලාට තිබෙනවාය කියා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට මේ කාරණය කෙරෙහිත් අවධානය යොමු කරවන්න මා කැමැතියි. තවත් ලියාපදිංචි නොකළ සමාගම් කිහිපයක් තිබෙනවා. සෙලින්කෝ සමූහ ව්‍යාපාරයට අයිති F & G, PDL and RECL වැනි සමාගම් තිබෙනවා. ඒවා ලියාපදිංචිවෙලා නැහැ. හැබැයි, ඒවා ලලිත් කොතලාවලට අයත් සෙලින්කෝ සමූහ ව්‍යාපාරය එක්ක තිබුණේ. ඇත්තටම ඒ මූල්‍ය සමාගම්වල අය වැඩියෙන් පින්දහම් කරනවා නම්, වැඩියෙන් සල්ලි සොයන්න ඕනෑ. පින් දහම් කරනවා නම්; මහජන සේවය තරනවා නම්, වැඩිපුර සල්ලි හොයන්න ඕනෑ. මම මේ ඇත්ත කියන්නේ. මොකද, මේ හැම දෙනාම හැංගිලා සිටියේ මේ පින් දහම්වල. මහ ජනයා හිතනවා, මහා පින් දහම් කරන නෝනා; මහා පින් දහම් කරන කොතලාවල මහත්මයා; මේ අයට සල්ලි තිබෙනවා කියලා. මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගනය හදන්න මිලියන සියයක් දුන්නා. පින් කඳන්. පත්තරවල ඒ ගැන පළ වෙනවා, මුල් ගල් තියනවා. ලංකාවේ ප්‍රධාන පුරවැසියාත් එක්ක ඡායාරූප ගන්නවා. ජනතාව හිතනවා, ජනාධිපතිතුමාගේ අගසවු. එකකට මිලියන සියයක් දෙනවා, නෝනා යනවා විවෘත කරන්න. මොකක්ද මේ වෙලා තිබෙන්නේ? මේවා තුළින් තමයි සැඟවෙන්නේ. එම නිසා ජනතාව මුළා කරමින් මේ ආයතන විශාල ප්‍රමාණයක් අද තැන්පත්කරුවන්ගේ ජීවන තත්ත්වය අකර්මණ්‍යතායට පත් කර තිබෙනවා. එතැනින් නතර වෙන්නේ නැහැ.

විශේෂයෙන්ම මේ කාරණය ගැනත් මම කියන්නට ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අපි දන්නවා, අපේ රටේ "සණසස" ගැන. "සණසස" අපේ රටේ ග්‍රාමීය වශයෙන් විශාල ලෙස පැතිරිලා තිබෙනවා. එහි තැන්පත්කරුවන්ට "සණසස" පිළිබඳව සැකයන් ඇති කර ගැනීම සඳහා නොවෙයි මම මේ කථාව කරන්නේ. මා නැවතත් එහි තැන්පත්කරුවන්ට කියනවා. ඔබට "සණසස" විශ්වාස නම්, ඔබ "සණසස" එක්ක ගනුදෙනු කරන්න. නමුත් මම කියන්නේ මෙයයි. දැන් "සණසස" කිව්වාම අපි හැමදෙනාගේම ඔළුවේ ඇදෙන්නේ මොකක්ද? "සණසස" කිව්වාම අපි හැමදෙනාගේම ඔළුවේ ඇදෙනවා, යම් මව් සමාගමක් පිළිබඳව. එම මව් සමාගමට මේ වටේම තිබෙන ශාඛා යටත්, එම මව් සමාගම විසින් මේ ශාඛා මෙහෙය වීමකට භාජනය කරනවා කියන එක අපේ ඔළුවේ ඇදෙනවා. මෙය මුළුමනින්ම මහ බැංකුවට අයත් නොවුණත්, සමුපකාර පනත යටතේ ලියාපදිංචි කර තිබෙනවා. සමහර ඒවා පළාත් සභා විෂය යටතට එනවා. හැබැයි දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? සණසේ එක් එක් ශාඛා වෙන වෙනමයි ක්‍රියාත්මක වෙන්නේ. "සණසස" කියා තිබුණාට, එක් මවු සමාගමක් විසින් කළමනාකරණය කරන, සියලුම තැන්පත්කරුවන්ට එකම සමාගමකින් වග කියන තැනක් නොවෙයි. සණසේ ස්වභාවය තමයි එම සණස ශාඛාව එතැනට වග කියන එක. එතකොට සමහර තැන් සාර්ථක වෙලා තිබෙනවා; සමහර තැන් අසාර්ථක වෙලා තිබෙනවා.

දැන් මම මේ කාරණය පිළිබඳව ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්නට කැමැතියි. තැන්පත්කරුවන්ටන්ට සිදු වූ මූල්‍ය වංචාව පිළිබඳව 2016 වසරේ දී මිරිහාන විශේෂ අපරාධ විමර්ශන කොට්ඨාසයට පැමිණිලි 235ක් සහ මහරගම පොලිසියට පැමිණිලි 137ක් ඉදිරිපත් කර තිබෙනවා. මෙම මූල්‍ය වංචාව පිළිබඳව පොදු දේපළ පනත යටතේ ක්‍රියාකාරී විමර්ශන කටයුතු කළා. ඊට පසුව මේ වත්තේගෙදර "සණසස" සමිතියේ කෝටි 60ක මුදලක් එහි සභාපතිලා අරගෙන පනිනවා; පුතාගේ නමට ඉඩම් ගන්නවා, එම විස්තර සියල්ල මා ළඟ තිබෙනවා. පොලිසියට පැමිණිලි කළත් පොලිසිය කිසි දෙයක් කළේ නැහැ. මේ "සණසස" ආයතනයේ මුදල් තැන්පත් කළ තැන්පත්කරුවන්ගේ තැන්පතු අද අහිමි වෙලා තිබෙනවා. මේ පිළිබඳව රවි කරුණානායක හිටපු මුදල් ඇමතිතුමාට තැන්පත්කරුවන් ලියුමක් යැව්වා. ඒ තැන්පත්කරුවන් යවපු ලියුමට හිටපු මුදල් අමාත්‍යතුමා යැවූ උත්තරයත් මම කියවන්නම්. එතුමා එම ලිපියේ කියා තිබෙනවා,

"වත්තේ ගෙදර "සණසස" සමිතියෙන් මුදල් ලබා ගැනීමට නොහැකි වීම සම්බන්ධයි. දිනය: 2016.10.27, ඉහත කරුණ සම්බන්ධයෙන් ගරු අධිකරණ අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම් විසින් මා වෙත ගොනු කරන ලද ලිපිය සම්බන්ධයෙනි." මේ විජයදාස රාජපක්ෂ මැතිතුමාගේ පෞද්ගලික ලේකම් විසින් එවන ලද ලිපියකට යවපු උත්තරය. "මෙහිදී සමුපකාර හා ඒ සම්බන්ධ ණය දෙන සමිති මාගේ විෂය පථයට අදාළ නොවන

[ගරු අනුර දිසානායක මහතා]

අතර, එම ඉල්ලීම ඉදිරිපත් කළ යුත්තේ කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයටය. "එතුමා එහෙම කියනවා. "දැනට ලංකාව පුරා සමුපකාර ග්‍රාමීය බැංකු 2,450ක් සහ "සණසස" බැංකු 5,217ක් පවතී. එම ආයතනවල මූල්‍ය සුරක්ෂිතභාවය ඉතා අවම මට්ටමක පවතින බව වත්තේ ගෙදර, "සණසස" මූල්‍ය වංචාව මගින් පෙනී යයි.

වර්තමානයේ එම ආයතනවල මුදල් ආරක්ෂාව පිළිබඳව වගකීම දරනුයේ අදාළ සමිතියේ සභාපති, ලේකම් හා සාමාන්‍යාධිකාරි වන අතර, ඔවුන් විසින් දේශපාලන පක්ෂයක රැකවරණය ලබමින් මහ ජනතාවගේ මුදල් වංචා කරමින් සිටියි. මේ සම්බන්ධව මුදල් අමාත්‍යවරයා ලෙස මාගේ දැඩි අවධානය යොමු වී ඇති අතර, දැනටමත් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ මෙම ගැටලු නිරාකරණය කිරීමට සුදුසු කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වමි."

"ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය යටතේ මෙම ගැටලු නිරාකරණය කිරීමට සුදුසු කටයුතු සිදු කරනවා" කියා 2016.10.27 දින එතුමා කියනවා. දැන් අවුරුදු එක හමාරකට වැඩි කාලයක් ගතවෙලා තිබෙනවා. මෙම ගැටලු නිරාකරණය කරන්න ගත් ක්‍රියාමාර්ග මොනවාද කියා මා දැනගන්න කැමතියි. හිටපු මුදල් ඇමතිතුමා මේක උතුරු කොළඹ සංවිධායකවරයා හැටියට එතුමාට යවපු ලියුමක් නොවෙයි. ඒවා නම් දේශපාලන ලියුම් නේ. මුදල් අමාත්‍යවරයා හැටියට එම letterhead එකෙන් යවපු ලිපියක් මේ. "සමුපකාර ග්‍රාමීය බැංකු 2,450ක සහ සණසස බැංකු 5,217ක මූල්‍ය සුරක්ෂිතභාවය ඉතා අවම මට්ටමක පවතින බව" මුදල් ඇමතිවරයා එම ලිපියෙන් කියනවා. මහ ජනයාගේ තැන්පතු කරන්න ග්‍රාමීය බැංකු තිබෙනවා; සණසස බැංකු තිබෙනවා. හැබැයි, මුදල් අමාත්‍යවරයා රටට කියන්නේ මොකක්ද? ඒවායේ තැන්පතු අනාරක්ෂිතයි කියා එතුමා කියනවා. හැබැයි, ඒ ගැන දැන් දන්නේ කවුද? මේ කේ.ඒ. සෙනෙවිරත්න කියන මහත්මයායි. මොකද, එතුමාට යවපු ලියුම නිසා තමයි එතුමා මේ ගැන දන්නේ. රටේ මිනිසුන් මේවා ගැන දන්නේ නැහැ. ඒ නිසා දැන් මොකක්ද වෙලා තිබෙන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වත්තේගෙදර සමිතිය වේගයෙන් ක්‍රියාත්මක වන හොඳ සමිතියක් කියලා තමයි සාමාන්‍යයෙන් ජනතාව තුළ මතයක් ගොඩනැඟිලා තිබුණේ. ඒ නිසා ඒ සමිතියට ගිහින් වැඩිපුර සල්ලි දමන්නය කිව්වා. ඒ ආසන්නයේ තිබෙන බැංකුත් කිව්වා, "වත්තේගෙදර සමිතියේ මුදල් දැම්මා නම් වැඩිපුර පොලිය ලැබෙනවා" කියලා. එහෙම තමයි රුපියල් මිලියන 600ක් එම සමිතියේ තැන්පත් කරලා තිබෙන්නේ.

502 සී, වත්තේගෙදර සණසස සමිතියේ රුපියල් මිලියන 600කට වැඩි මුදලක් තැන්පත් කළ තැන්පත්කරුවන් 1,000කට වැඩි පිරිසකට 2016 සිට මේ දක්වා තම තැන්පත් මුදල් ලබා ගැනීමට නොහැකිව දැඩි අසරණභාවයට පත්ව ඇත. බස්නාහිර පළාත් සභාවේ සමුපකාර දෙපාර්තමේන්තුවේ අංක 103 දරන අංකයෙන් ලියා පදිංචි කර ඇති මෙම සමිතියේ මූල්‍ය කටයුතු පිළිබඳව විගණනය කිරීම බස්නාහිර සමුපකාර දෙපාර්තමේන්තුවේ වගකීමකි. එම වගකීම පුරා වසර 10කට අධික කාලයක් තුළ සිදු කර නොමැති අතර, එම දෙපාර්තමේන්තුවේද අනුදැනුම ඇතිව තැන්පත්කරුවන්ගේ මුදල් එම සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වංචා කර ඇත. වර්ෂ 2015දී මෙම සමිතියේ සිදු වන මූල්‍ය වංචා පිළිබඳව විමර්ශනයක් සමුපකාර දෙපාර්තමේන්තුවෙන් සිදු කරමින් තිබියදී, සමිතියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අභියාචනාධිකරණය වෙත පෙත්සමක් ගොනු කොට විමර්ශනය අත් හිටුවීමේ නිරණයක් ලබා, එම නියෝගයේ ආශිර්වාදයෙන් බරපතළ ලෙස තැන්පත්කරුවන්ගේ රුපියල් කෝටි 60ක මුදල් මෙම වත්තේගෙදර සමිතියේ සභාපතිත්, ඔහුගේ පුතාත්, ඔහුගේ සාමාන්‍යාධිකාරිවරුනුත් අවභාවිතා -හොරකම්- කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ග්‍රාමීය බැංකුවට අදාළ කාරණයක් කෙරෙහිත් මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

"ගාල්ල දිස්ත්‍රික්කයේ සීමාසහිත හබරාදුව විවිධ සේවා සමුපකාර සමිතියට අයත් ග්‍රාමීය බැංකු ශාඛා මඟින් ප්‍රදේශයේ තැන්පත්කරුවන්ගෙන් ලබා ගත් රුපියල් කෝටි 59කට ආසන්න මුදලක් අවභාවිතාවට ලක් කිරීම හේතුවෙන් ජනතාව බලවත් පීඩාවකට පත්ව ඇත. එකී තැන්පත්කරුවන්ට ප්‍රතිලාභ හා මුදල් ආපසු ලබා ගැනීමට ඉල්ලුම් කර තිබියදී ග්‍රාමීය බැංකු නිලධාරීන් එය දිගින් දිගටම ප්‍රතික්ෂේප කරයි. "

මේ පිළිබඳව වගකිව යුතු අංශ දැනුවත් කළද, මේ ග්‍රාමීය බැංකුවේ මුදල් තැන්පත් කළ අයට කිසිදු සාධාරණයක් ඉෂ්ට වී නැහැ. මෙහි හිටපු සභාපතිවරයා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට එරෙහිව පොලිස් පැමිණිලි ගණනාවක් සහ අධිකරණයේ සම්මුති කීපයක් යොමු කර ඇති නමුත් ඒ සියල්ල පැත්තකින් තබා තිබෙනවා. "එකා සැමටත් - සැම එකාටත්" යන තේමාව යටතේ, - මේක තමයි තේමාව.- ඔක්කොම එකතුවෙලා එකාට තමයි දීලා තිබෙන්නේ! "එකා සැමටත් - සැම එකාටත්" කියන තේමාව යටතේ ආරම්භ කළ දීර්ඝ ඉතිහාසයක් සහිත සමුපකාර ව්‍යාපාරය, ග්‍රාමීය බැංකු අංශයේ සිදු කරන මෙම කටයුත්ත අතිශය බේදනීය වේ. තමන්ගේම කුඩා ව්‍යාපාරයක්, ස්වයං රැකියාවක්, ඉඩමක් ගැනීම වැනි දෙයකින් ලබාගන්නා ආදායමකට වඩා හොඳ තත්ත්වයක් කියා හිතලා තමයි ප්‍රදේශයේ ජනතාව මෙහි මුදල් තැන්පත් කර තිබෙන්නේ. හැබැයි, දැන් මොකද වෙලා තිබෙන්නේ? මේ මුදල් ඒ ජනතාවට ලබාගන්න බැරි වෙලා තිබෙනවා. එතැන 35,000ක පමණ තැන්පත්කරුවන් ඉන්නවා. අදාළ අමාත්‍යාංශය වෙත මේ සම්බන්ධයෙන් තොරතුරු වාර්තා වී තිබෙනවාද, මේ තැන්පත්කරුවන්ට සිදු වූ අසාධාරණය සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ගය මොකක්ද, ඒ සඳහා ගත වන කාලය කොපමණද කියා ගරු ඇමතිතුමන්ලාගෙන් මා දැනගන්න කැමැතියි. මා මේ කාරණය කිව්වේ මේ නිසායි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම අපේ රටේ මූල්‍ය ශාඛාවරුන් අතළොස්සක්, -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, යාපනයේත් "සබ්‍රා" කියලා මූල්‍ය ආයතනයක් තිබෙනවා නේද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
"සබ්‍රා".

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
"සබ්‍රා" ආයතනයට මොකද වෙලා තිබෙන්නේ? ඒකත් එහෙම තමයි. කඩා වැටිලා තිබෙනවා. මිනිසුන් එහි මුදල් තැන්පත් කර තිබෙනවා. අද යාපනයේ වැඩිම පිරිසක් සිය දිවි හානි කර ගන්නේ මේ ණය බර හේතු කොටගෙනයි.

2017 වර්ෂයේ වාර්තා අනුව මේ ණය හේතු කොටගෙන අපේ රටේ 195දෙනෙක් සිය දිවි හානි කරගෙන තිබෙනවා. එක පැත්තකින් තැන්පතු, අනික් පැත්තෙන් ණය. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ ණය ක්‍රමවේද මොන තරම් අසාධාරණද කියලා මම තමුන්නාන්සේට පෙන්වන්නම්. දැන් තිබෙනවා ග්‍රාමීය

කුඩා ණය යෝජනා ක්‍රම. ජනතාවට ජීවත් වෙන්න විධියක් නැහැ. අතට කීයක් හෝ ලැබෙනවා නම්, කෙසේ හෝ ගන්න අපේක්ෂා කරනවා. ඒ බැංකුවල අනික් මූල්‍ය කටයුතු පිළිබඳ ගෞරවය තිබෙනවා නම්, ඒ ගෞරවය දෙමින්ම තමයි මේ ගැන මා කියන්නේ.

මම මේ පෙන්නුම් කරන්නේ, "Commercial Credit" කියන කුඩා ණය යෝජනා ක්‍රමය ගැනයි. ඒ ණය යෝජනා ක්‍රමය යටතේ රුපියල් ලක්ෂයක loan එකක් දෙනවා. රුපියල් 2,500 ගණනේ මාස 50ක් ඒකට ගෙවීම් කරන්න ඕනෑ. ණය මුදල රුපියල් ලක්ෂයයි; අතට රුපියල් ලක්ෂයක් ලැබෙනවා; මාසයකට රුපියල් 2,500 ගණනේ මාස 50ක් ගෙවන්න ඕනෑ. සාමාන්‍යයෙන් ග්‍රාමීය ජනතාව හිතනවා, "රුපියල් ලක්ෂයක් එකවර හම්බ වුණොත් තමන්ට වගාවක් හෝ කර ගන්න පුළුවන්; මාසයකට රුපියල් 2,500 ගණනේ තමයි ගෙවන්න වෙන්නේ; දවස් දෙකක් කුලී වැඩ කළාම රුපියල් 2,500 හොයා ගන්න පුළුවන්" කියලා. බැලූ බැල්මට සහනයක් වාගේයි. හැබැයි, මොකක්ද වෙලා තිබෙන්නේ? රුපියල් ලක්ෂයකට එයා ගෙවන්නේ රුපියල් 125,000යි. බැලූ බැල්මට හිතෙනවා, පොලිය රුපියල් 25,000යි; සියයට 25යි කියලා. ඒ ඇත්තද? නැහැ. පොලිය සියයට 25ට වඩා වැඩියි. මොකද, හැම මාසයේම අර මුදලින් රුපියල් 2,500 ගණනේ අඩු වනවා. එතකොට හීන වන මුදලට පොලී අනුපාතය ගණනය කරන්නේ නැහැ. එහෙම හරියට ගණනය කළොත්, මේ පොලී අනුපාතය සියයට 47.47යි. එවැනි පොලියක් ගෙවන්න මොන පුරවැසියාටද පුළුවන්කම තිබෙන්නේ? සියයට 47.47ක පොලියට ණයක් ගත යුත්තේ අපේ රටේ මොන පුරවැසියාද? සියයට 48ක පොලී අනුපාතයකට ණයක් දෙන්න! මේක තමයි දැන් ණය යෝජනා ක්‍රමය.

අද ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය කියන්නේ මොකක්ද? ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය කියලා කරන්නේ, රුපියල් ලක්ෂයක් ණයට දෙනවා; මාසයකට රුපියල් 2,500 ගණනේ මාස 50ක් ගෙවන්න ඕනෑ; රුපියල් 2,500 ගණනේ වාරික 50ක් රුපියල් 125,000යි; හැබැයි දුන්නේ ලක්ෂයයි. 125,000ක් කිව්වාම හිතනවා, වාර්ෂික පොලිය සියයට 25යි කියලා. බැලූ බැල්මට පේන්නේ එහෙම තමයි. වාර්ෂික පොලිය සියයට 25 නොවෙයි. හීන වන ශේෂයට පොලී අනුපාතය හරියට ගණනය කරලා බැලුවොත්, මේකේ පොලී අනුපාතය සියයට 47.50යි. මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමයක්ද? තමුන්නාන්සේලා මේවා ගැන අනුගමනය කරන ප්‍රතිපත්තිය මොකක්ද? ලබා දිය යුතු පොලී අනුපාත පිළිබඳව, උච්චාවචන පිළිබඳව මහ බැංකුව නිරන්තරයෙන් නිර්දේශ ඉදිරිපත් කරනවා. හැබැයි, දැන් ග්‍රාමීය ජනතාව ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන ජාවාරම්කරුවන්ගේ උගුල්වලට විශාල ලෙස හසු වෙලා තිබෙනවා. මහ බැංකුව ඒ පිළිබඳව ගන්නා පියවර මොකක්ද?

තවත් ණය යෝජනා ක්‍රමයක් පිළිබඳව මම තමුන්නාන්සේගේ අවධානය යොමු කරවනවා. ඒ යෝජනා ක්‍රමය සකස් වෙලා තිබෙන්නේ මෙහෙමයි. රුපියල් 40,000ක් දෙනවා. ඒ සඳහා රුපියල් 2,202 ගණනේ මාස 24ක් ගෙවන්න ඕනෑ. එතකොට මාස 24ට රුපියල් 52,848ක් ගෙවන්න ඕනෑ. ගත්තේ රුපියල් 40,000යි. ඒකට රුපියල් 12,848ක් වැඩි වෙලා තිබෙනවා. හැබැයි, වාර්ෂික පොලී අනුපාතය කීයද? එහෙම තැනක වාර්ෂික පොලී අනුපාතය සියයට 28.50යි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රම යටතේ සියයට 28.50 පොලියට, සියයට 47.50 පොලියට, සියයට 60 පොලියට ණයක්? ගම්වලට යනවා; කාන්තාවන් පස්දෙනෙක් විතර එකතු කර ගන්නවා; "ඔයගොල්ලන්ට රුපියල් ලක්ෂය ගණනේ දෙන්නම්" කියනවා; මාසයකට රුපියල් 5,000 ගණනේ ගෙවන්න කියනවා. අද අපේ රටේ ජනතාව මෙවැනි විශාල ණය උගුලක හිර වෙලා තිබෙනවා. ඒ ප්‍රමාණය කොච්චරද කියනවා නම් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ළඟ තිබෙනවා ඒ වාර්තාව. අද අපේ රටේ වතු ක්ෂේත්‍රයේ පවුල්වලින් සියයට 73ක් නිල වශයෙන් ණයයි. මම මේ කියන්නේ, කඩේට තිබෙන ණය, පොලී මුදලාලිට තිබෙන ණය ගැන නොවෙයි. වතු ක්ෂේත්‍රයේ පවුල්වලින් සියයට 73ක් ලියා පදිංචි කරන ලද ආයතනවලින් නිල වශයෙන් ණය අරගෙන තිබෙනවා. එතකොට පුරවැසියන්ගෙන් 100ක් ගත්තොත්, වතුකරයේ 73ක් ණයකරුවන් බවට පත් වෙලා තිබෙනවා. ග්‍රාමීයව සියයට 61යි. නාගරිකව සියයට 49යි. ඒ නිසා අද අපේ රට විතරක් නොවෙයි, සාමාන්‍ය ජනතාවත් මේ ණය උගුලේ හිරකරුවන් බවට පත් වෙලා තිබෙනවා. හැබැයි, මේකේ වර දාන ලබමින් සිටින්නේ කවුද? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, නගරයකට ගිහින් බලන්න. ඒ නගරයේ ලොකුම බිල්ඩින් එක බැංකුවේ. වැඩිම පහසුකම් දෙන්නේ කාටද? ඉහළ කළමනාකරණයටයි; බැංකු නිලධාරින්ටයි. වැඩියෙන්ම රට සවාරි යන්නේ කවුද? බැංකු නිලධාරින්. Director Board එකට වාඩි වුණාම එක දවසකට වැඩියෙන්ම ගෙවන්නේ කාටද? බැංකුවේ අයටයි. මේ මොනවා උපයලාද? කර්මාන්ත කරලාද? නිෂ්පාදනයක් සිදු කරලාද? නැහැ. ජනතාවගේ සල්ලි තැන්පතු ලෙස ගන්නවා; ආපහු ජනතාවට වැඩි පොලියට දෙනවා. එතැන තිබෙන පරතරයෙන් තමයි බැංකු නඩත්තු වෙන්නේ. හැබැයි කාර්යයක් කරනවා. විසිරිලා තිබෙන සල්ලි ටික එක තැනකට එකතු කරලා ප්‍රාග්ධන අවශ්‍යතා සපයනවා.

අපි බැංකුවේ කාර්ය භාරය පිළිගන්නවා. හැබැයි, බැංකුවේ කාර්ය භාරය විසින් අද මොකක්ද කරලා තිබෙන්නේ? අපි බැංකු පද්ධතිය පිළිගන්නවා, බැංකුවට කාර්ය භාරයක් තිබෙනවා. ජනතාව සතු විසිරී තිබෙන කුඩා කුඩා මුදල්, තැන්පතු ලෙස අරගෙන -කෙනෙක් ගිහිල්ලා රුපියල් ලක්ෂයක් තැන්පත් කරයි. තව කෙනෙක් රුපියල් ලක්ෂ දෙකක් තැන්පත් කරයි. තවත් කෙනෙක් රුපියල් ලක්ෂ පහක් තැන්පත් කරයි. ගෙදර රුපියල් ලක්ෂයක් තිබුණා කියලා වෙනත් ආයෝජනයක් කරන්න බැහැ. රුපියල් ලක්ෂ දෙකක් තිබුණා කියලා ආයෝජනයක් කරන්නත් බැහැ.- ඒ සල්ලි ඔක්කෝම එකතු කරගෙන ව්‍යාපාරිකයෙකුගේ යම් ප්‍රාග්ධන අවශ්‍යතාවක් වෙනුවෙන් ලබා දෙනවා. ඒක නරක නැහැ. ඒ බැංකු ක්‍රියාවලිය අපි පිළිගන්නවා. ඒක හොඳයි. හැබැයි, සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? අද මේ බැංකුවල overhead එක, මේ බැංකුවල පිරිවැය පිළිබඳව තමුන්නාන්සේලා ලබා දී තිබෙන නිර්ණායකයන් මොනවාද? ඒ තමයි, ලොකුම ගොඩනැඟිල්ල, ලොකුම වාහනය, වැඩිම වැටුප්, වැඩිම අධ්‍යක්ෂ මණ්ඩල දීමනා. මේ සියල්ල විසින් කරන දේ තමයි ජනතාවගේ තැන්පතුත් නැති කරලා තිබෙනවා, ඒ වාගේම ජනතාවට ණය බරත් ඇති කරලා තිබෙනවා. එම නිසා අද අපේ රටේ ප්‍රධාන ප්‍රශ්නය තිබෙන්නේ මූල්‍ය ජාවාරම්කරුවන් කිහිපදෙනෙක් අතේයි. පොදුවේ ගත්තොත්, ධනපතීන් සමඟ ඒ ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳව අපට ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි, අපි කර්මාන්තකරුවන් පිළිගන්නවා, නිෂ්පාදනයට මැදිහත් වන කෙනා පිළිගන්නවා, දැවැන්ත සේවා ආයතන පිළිගන්නවා. හැබැයි, මේ මූල්‍ය ආයතන මොනවාද කරන්නේ? මහා ජාවාරමක්. එම නිසා අද අපේ රටේ ජනතාව වැටී තිබෙන ආර්ථිකය පතුලේම තිබෙන අර්බුදය, මූල්‍ය ජාවාරම්කරුවන්ගේ උගුල,- පවුල් ලක්ෂ 50යි තිබෙන්නේ. ආසන්න වශයෙන් ගත්තොත් එයින් පවුල් ලක්ෂයක් මා කලින් කියපු කඩා වැටුණු ආයතන ඇතුළේ කඩා වැටිලා තිබෙනවා. එවැනි ආයතන කීයද තිබෙන්නේ? ආයතන හතයි, අටයි. ආයතන හතක්, අටක් ඇතුළේ පවුල් ලක්ෂයක් විනාශයට පත්වෙලා තිබෙනවා. ඒ අයගේ දේපළවලට මොකුත් වෙලා නැහැ. සිංගප්පූරුවේ ගෙවල් අරගෙන තිබෙනවා. මල්ලී කැනඩාවේ, අයියා ඕස්ට්‍රේලියාවේ. මම දන්න නිසයි කියන්නේ. ඔවුන් දේපළ අරගෙන තිබෙනවා. ඒ ගොල්ලන්ගේ ජීවිත අබමල්

[ගරු අනුර දිසානායක මහතා]

රොනකින් හානියකට පත්වෙලා නැහැ. හැබැයි, සිද්ධ වෙලා තිබෙන්නේ මොකක්ද? තැන්පත්කරුවන් සිය දිවි හානිකර ගන්නවා. තැන්පත්කරුවන්ගේ පවුල්වල ආරවුල් ඇතිවෙලා තිබෙනවා. දරුවන්ගේ අධ්‍යාපනය කඩා වැටිලා තිබෙනවා. ඉන්න තැනක් නැති වී තිබෙනවා. තැන්පත්කරුවන්ට මේ සියලු අර්බුද ඇතිවෙලා තිබෙනවා. ඔවුන් මොකක්ද කරපු වරද? ඔවුන් හොරකම් කළාද? ඔවුන් වංචා කළාද? නැහැ. ඔවුන් විශ්වාසවන්ත තැනක තමන්ගේ මුදල් ටික දැම්මා. දැමූ මුදල් ටික සම්බන්ධයෙන් සහතිකයක් දෙන්න බැරි නම් මොකක්ද ඒකට කරන්නේ?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම නිසා මම කියන්නේ, මෙම මූල්‍ය ආයතන කඩා වැටීම තුළින් මේ රටේ තැන්පත්කරුවන් විශාල සංඛ්‍යාවක් අසීරුතාවට ලක්වෙලා තිබෙනවා. ඒ සඳහා ක්ෂණික සහ වේගවත් විසඳුමක් අවශ්‍යයි. අපට මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ කථා කරන්න පුළුවන්. අපට මේ පිළිබඳව පාර්ලිමේන්තුව තුළ හඬ නඟන්න පුළුවන්. හැබැයි, මේකට විසඳුමක් ලබා දීමේ ක්‍රියාදාමය තිබෙන්නේ පාර්ලිමේන්තුව ඇතුළේ නොවෙයි කියලා මම පෞද්ගලිකව විශ්වාස කරනවා. පාර්ලිමේන්තුවෙන් පිටත මහ බැංකුවත්, තැන්පත්කරුවනුත්, ඒ වාගේම එම මූල්‍ය ආයතනවල කළමනාකාරිත්වයත්, ඇමතිතුමනි, ඔබතුමාත්, අපිත්, සියලුදෙනා මැදිහත් වෙලා තැන්පත්කරුවන්ගේ මුදල් පිළිබඳ වග කීමක් ලබා දිය යුතුව තිබෙනවා. එම මුදල් සඳහා ආරක්ෂාවක්, එම මුදල් නැවත ලබා දීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ඇති කළ යුතුව තිබෙනවා. ඒ ජාවාරම්කරුවන්ට නිදැල්ලේ ඉන්න දෙන්න පුළුවන්ද? විශාල වශයෙන් මුදල් අරගෙන තමන්ගේ ජීවිත ඕනෑවටත් වඩා වැඩියෙන් අධි පරිභෝජන ජීවිතවලට තල්ලු වෙලා. වාහනය නම් ලොකුම වාහනය, security නම් ලොකුම security එක දමාගෙන තමයි ඒ අය ජීවිත ගත කරන්නේ. ඒ අයගෙන් සමහර අය මම පෞද්ගලිකව දන්නවා. පෞද්ගලික වශයෙන් අපිත් එක්ක කථා බහ කරලා තිබෙනවා. ඒ තත්ත්වය මම විශ්වාස කරනවා. ඒ අය ගැන දන්න නිසයි මම මේ කථා කරන්නේ. ගරු මංගල සමරවීර ඇමතිතුමනි, මම විතරක් නොවෙයි, ඔබතුමාත් ඒ අය ගැන දන්නවා. ඒ අය කවුද කියන්න අපි දන්නවානේ. ඒ ගොල්ලන්ගේ ජීවිත ගැන අපි දන්නවා. ඒ අයගේ ජීවිත ඒ විධියට සුඛ විහරණ සහිතව ගතවෙනවා. හැබැයි, තැන්පත්කරුවෝ මහ පාරේ බෝඩ් අල්ලාගෙන අව්වට වේලෙනවා, වැස්සට තෙමෙනවා, ඔවුන්ගේ ගෙවල්වල ආරවුල්. බිරිඳ එපා කියද්දී ස්වාමියා මුදල් තැන්පත් කරලා. එතකොට බිරිඳ ස්වාමියට බණිනවා. ස්වාමියා එපා කියද්දී බිරිඳ මුදල් තැන්පත් කරලා. ස්වාමියා බිරිඳට බණිනවා. මෙවැනි අරවුල් විශාල ප්‍රමාණයක් ඇතිවෙලා තිබෙනවා. මේ තත්ත්වය ඉක්මනින්ම විසඳිය යුතුව තිබෙනවා. එම නිසා මුදල් අමාත්‍යතුමාට මා අවසාන වශයෙන් කියන්නේ, මේ පිළිබඳව මහ බැංකුවට වග කීමක් තිබෙන බවයි.

මහ බැංකුව තමන්ගේ කාර්ය භාරය අත් හැරලා තිබෙන්නේ. මහ ජනතාවගේ තැන්පතු පිළිබඳව තමුන්නාන්සේලාට වග කීමක් තිබෙනවා. තමුන්නාන්සේලා ඒ වගකීම අත් හරිමින් තිබෙන්නේ. තමුන්නාන්සේලා ඉන්නේ තැන්පත්කරුවන්ගේ පැත්තේද, ඒ ජාවාරම්කරුවන්ගේ පැත්තේද කියලා මම දන්නේ නැහැ. මම පොදුවේ සියලුම දෙනාට කියන්නේ නැහැ. සමහර අය අනිවාර්යයෙන්ම ජාවාරම්කරුවන්ගේ පැත්තේ ඉන්නවා. එහෙම නැත්නම් මහ බැංකුවේ කෙනා, UB Finance Company Limited එකත් සමඟ ගනුදෙනු කරපු කෙනා යූනියන් බැංකුවේ උප සභාපති ධුරයට පත් වෙන්නේ කොහොමද? ඒ නිසා මෙම තැන්පත්කරුවන්ගේ රැකවරණය පිළිබඳව මහ බැංකුවට විශාල කාර්ය භාරයක් තිබෙනවා. එම නිසා මම ඔබතුමාට යෝජනාවක් කරනවා. අපි දැන් මේක මෙතැන කථා කරමු. හැබැයි, විධිමත් විසඳුමක් වෙනුවෙන් ඔබතුමා මුදල් අමාත්‍යාංශය සමඟ සාකච්ඡාවක් කැඳවන්න. ඔබතුමාත් එන්න. මහ බැංකුවේ අදාළ නිලධාරීන් කැඳවන්න. තැන්පත්කරුවන්ගේ යෝජනාත් ගනිමු, අපිත් මැදිහත් වෙමු, ඒ ආයතනත් කැඳවලා ඔවුන්ට සාධාරණ ගෙවීමක් කිරීම සඳහා විධිමත් සාකච්ඡාවක් කරමු.

විශේෂයෙන්ම මේ මොහොතේ මතුවෙලා තිබෙන ප්‍රශ්නය තමයි ඊටීඑයි ආයතනයේ ප්‍රශ්නය. ඒ සඳහා කරනු ලබන යෝජනාව මොකක්ද ඇමතිතුමා? ආයතනය අළෙවි කළොත්, ඒ කියන්නේ, එම ආයතනය ඇවර කළොත් ගන්නා පියවර මොකක්ද කියන යෝජනාව මම යෝජනාව ඇවිල්ලා තිබෙනවා. ඒ යෝජනාවේ තිබෙන්නේ මොකක්ද? ජූනි මාසයේ 5වැනිදා සියයට 10ක් දුන්නා. ඊට පස්සේ තව සියයට 10ක් දෙනවා. ඉතිරි සියයට 80 අවුරුදු 5කින් දෙනවා. අවුරුදු 5කින් ලබා දීම පිළිබඳ සාකච්ඡාව කොහොමද යන්නේ?

සාකච්ඡා මේසයට ගෙනැල්ලා තර්ජනය කරනවා, "මේ යෝජනාවට එකඟ වුණේ නැත්නම්, ඇවර කළොත් ඔයගොල්ලන්ට සියයට 50ක්වත් ලැබෙන්නේ නැහැ." කියලා. එහෙමයි කියන්නේ. තැන්පත්කරුවන් භය කරනවා, "මේ යෝජනාවට එකඟ වුණේ නැත්නම් ඔයගොල්ලන්ට ශතයක්වත් නැතිව යනවා. සියයට 50ක්වත් නැතිව යනවා. ඒ නිසා මේ යෝජනාවට එකඟ වෙන්න." කියලා. කවුද මෙහෙම කියන්නේ? මංකොල්ලකාරයින් මුලසුනේ ඉඳගෙන තැන්පත්කරුවන්ට තර්ජනය කරනවා. මේකයි ඇත්ත කථාව. ඒ නිසා මේ පිළිබඳව අපි අවධානය යොමු කරමු. ගරු මංගල සමරවීර ඇමතිතුමනි, මා මීට කලිනුත් ඔබතුමාට කිව්වා, "මේ ගැන අපි සාකච්ඡාවක් කරමු." කියලා. ඔබතුමා රාජ්‍ය ඇමතිතුමා එක්කත් සාකච්ඡා කරලා අපට වේලාවක් ලබා දෙන්න. අපි මේ ආයතන එකින් එක කැඳවමු. මේ කියන ආකාරයට කටයුතු කර තිබෙනවා නම්, ඒවායේ දේපොළ පවරා ගන්න ඕනෑ; හංගලා තිබෙන දේපොළ හොයන්න ඕනෑ. ඒ කටයුත්ත අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට භාර දෙන්න. අපි දන්නවා, සමහර දේපොළ තිබෙන බව. තැන්පත්කරුවන් දන්නවා, සමහර දේපොළ කොහෙද තිබෙන්නේ කියලා. ඒ නිසා මේ ඔක්කෝම පිළිබඳ හොඳ විමර්ශනයක් කරලා තැන්පත්කරුවන්ට සාධාරණය ඉටු කිරීම සඳහා ආණ්ඩුවක් හැටියට තමුන්නාන්සේලාගේ වගකීම ඉටු කරන්නය කියන යෝජනාව කරමින් මා නතර වෙනවා. මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. The Hon. Nihal Galappaththi to second the Adjournment Motion.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතාම කාලීන, ජාතික මට්ටමේ වටිනා කියන යෝජනාව මේ මොහොතේ මා ස්ථිර කරනවා.

මහජන මුදල් මංකොල්ල කන්න මැදිහත් වුණු අපරාධකාරයින් සම්බන්ධයෙන් වහාම ක්‍රියාත්මක වන පරිදි, ක්‍රියා මාර්ග අරගෙන පුරවැසියාට සාධාරණයක් ඉෂ්ට කරන්නය කියලා මා ආණ්ඩුවට බල කරලා කියනවා.

බොහොම ස්තුතියි.

[අ.භා. 2.22]

ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ඉතා කාලෝචිත යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන මා ඉතාම සතුටු වෙනවා. ඇත්ත වශයෙන්ම එතුමාගේ යෝජනාවටත්, එතුමා කළ කථාවටත් පිළිතුරක් දීම අදාළ ඇමතිවරයා හැටියට මට එක්තරා විධියකින් අපහසු වන්නේ, එතුමා කියාපු බොහෝ කාරණා එක්ක මමත් එකඟ නිසායි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Velu Kumar to the Chair?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

I propose that the Hon. Velu Kumar do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුදල් ඇමතිතුමා කථා කරන්න.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම finance companies සහ විශේෂයෙන් ග්‍රාමීය මට්ටමේ ඒ පුංචි ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් -microfinance companies- වෙනත් විධියකින් කියනවා නම්, "ණය කාක්කන්" එහෙමත් නැත්නම් "පොලී කාක්කන්" ඇති කළ තත්ත්වය ඇත්ත වශයෙන්ම භේදජනකයි. මෙතුමා -ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා- කිව්වා වාගේ විශේෂයෙන් උතුරේත්, උතුරුමැද පළාතේත් පසු ගිය කාලයේ නියඟය පැවැති දිස්ත්‍රික්කවල මේ ප්‍රශ්නය ඉතාම තදබලව තිබෙනවා. මීට පෙර කිව්වා වාගේ මෙහිදී බොහෝ ඉලක්ක බවට පත් වෙලා තිබෙන්නේ අහිංසක, අසරණ කාන්තාවනුයි. ඒ අය කිසිම තේරුමක් නැතිව සුළු ණය මුදල් ගන්නවා. නමුත්, ඒ අය මහා ණය උගුලකට හසු වෙලායි ඉන්නේ කියලා ඒ අයට තේරෙන්නේ පසුවයි. මෑතකදීත් මේ විධියට ගත්ත ණය ගෙවා ගන්න බැරිව යාපනයේ කාන්තාවන් දෙදෙනකු සිය දිවි නසා ගත්තා. ණය ගෙවා ගන්න බැරි වුණාම, තරුණ කාන්තාවන්ගෙන් නම් ගොඩක් වෙලාවට මේ කොම්පැනිවල නිලධාරීන්, නියෝජිතයින් ගිහිල්ලා ලිංගික අල්ලස් ලබා ගන්නා තත්ත්වයක් පවා ඇති වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් අපි දැනට අවධානය යොමු කරලා එයට විසඳුමක් සොයා ගෙන තිබෙනවා. ඒ ගැනත් මම කියන්නම්. නමුත්, අපේ අනුර දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කාරණා රාශියක් තිබෙනවා. මම ඒවාට වෙන වෙනම පිළිතුරු නොදුන්නත්, එතුමා කියපු ආකාරයට අපි ලබන සතියේම මේ සම්බන්ධයෙන් පක්ෂ පාට නැති කමිටුවක් හදනවා. අපි මහ බැංකුවේ නිලධාරීන් සමඟ, භාණ්ඩාගාරයේ නිලධාරීන් සමඟ මේ ප්‍රශ්න සඳහා ක්ෂණික සහ දීර්ඝ කාලීන විසඳුමක් සොයන්නට ඕනෑ. පසුගිය කාලය පුරාම මෙවැනි සිද්ධීන් රාශියක් සිදු වී තිබෙන බවත් මම කියන්න ඕනෑ. ඔබතුමා කිව්වා වාගේ මේ සිද්ධීන්වලට මහ බැංකුවේ විවිධ නිලධාරීන් සම්බන්ධ වෙන්න ඇති; ඔව්, සම්බන්ධ වුණා. නමුත්, මේ පාර්ලිමේන්තුවේදී පවා යම් යම් මන්ත්‍රීවරුන් විවිධ මත ප්‍රකාශ කළත්, වර්තමාන මහ බැංකුවේ අධිපති ආචාර්ය කුමාරස්වාමී මහතාත්, එහි නියෝජ්‍ය අධිපතිවරුන් ගැනත් මට පූර්ණ විශ්වාසයක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම අපි නිවැරදි දේ කරලා හැකි තාක් ඉක්මනට මේ ප්‍රශ්නවලට උත්තරයක් දෙන්න බලාපොරොත්තු වනවා.

අනුර දිසානායක මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාවේ දක්වා ඇති පරිදි ආර්ථිකයේ දැඩි අර්බුදයක් නැති වුණත්, ඇත්ත වශයෙන්ම මූල්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන කීපයක අස්ථාවරභාවය නිසා විශේෂයෙන්ම අපේ රටේ මූල්‍ය ක්ෂේත්‍රයේ අස්ථාවර තත්ත්වයක් ඇති වෙලා තිබෙන බව මම කියන්න කැමැතියි. නමුත්, ඔබතුමාත් පෙන්වූ ආකාරයට මේක අද ඊයේ සිද්ධ වුණු දෙයක් නොවෙයි. මේ තත්ත්වය 1980 දශකයේ සිටම වරින් වර ඇති වූ තත්ත්වයක්. ඒ වාගේම මූල්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන කඩා වැටීමට වෙනත් විවිධ හේතු බලපාන්න පුළුවන්. මූලික වශයෙන් මෙම ආයතනවල නිසි මූල්‍ය කළමනාකරණයක් නොමැති වීම, නිසි ඇගැයීමකින් තොරව අදූරදර්ශී ලෙස ණය නිකුත් කිරීම සහ අක්‍රමවත් ලෙස වෙනත් ආයෝජන කටයුතු සිදු කිරීම, දුර්වල කළමනාකරණය මෙන්ම ආයතන කළමනාකරුවන්ගේ සහ අධ්‍යක්ෂවරුන්ගේ වංචනික ක්‍රියා ද එම ආයතන කඩා වැටීමට බලපානවා. ස්වාභාවික ව්‍යසන හා වෙනත් හේතු නිසාද මූල්‍ය ආයතන කඩා වැටී තිබෙනවා. එම ආයතන විසින් ලබා දෙන ණය ආපසු ලබා ගැනීමේ දුර්වලතාද එම ආයතන කඩා වැටීමට යම් තරමකට බලපාන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැනට රට තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියා පදිංචි කර ක්‍රියාත්මක වන මුදල් සමාගම් 44ක් පමණ තිබෙනවා. 2018 මාර්තු 31 වනකොට මේ මූල්‍ය සමාගම්වල මුළු වත්කම් වටිනාකම රුපියල් බිලියන 1,395ක් - ට්‍රිලියන 1.3ක් පමණ- වනවා. ඒකෙන් රුපියල් බිලියන 692ක් පමණ මහ ජනතාවගේ තැන්පත් මුදල්. ඒ වාගේම රටේ සමස්ත මූල්‍ය පද්ධතියෙන් සියයට 7.9ක පමණ වත්කම් ප්‍රමාණයක් මේ මූල්‍ය සමාගම් සතුව තිබෙනවා. මේ සමාගම් ජනතාවගේ තැන්පත් ලබා ගන්නා අතර, ඊට අමතරව ගනුදෙනුකරුවන් වෙත ලීසිං සහ වෙනත් ණය පහසුකම් ලබා දීමේ කටයුතු සිදු කරනවා. 2018 මාර්තු මාසය අවසන් වනකොට මේ ආයතන තමන්ගේ වත්කම්වලින් සියයට 79ක පමණ ප්‍රමාණයක් එනම්, රුපියල් බිලියන 1,102ක් පමණ ණය හා ලීසිං ලෙස ලබා දීලා තිබෙනවා. ඇත්තෙන්ම මෙතරම් විශාල ප්‍රතිශතයක් ණයවලින් සමන්විත වෙලා තිබෙන කොට ආර්ථිකයේ යම් යම් විචල්‍යතා ඇතිවන

[ගරු මංගල සමරවීර මහතා]

අවස්ථාවක ණය ලබා ගත් ගනුදෙනුකරුවන්ට ඒවා නැවත ගෙවීමේ හැකියාව දුර්වල වෙලා මූල්‍ය ආයතනත් අර්බුදයන්ට ලක්වන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය දශක කීපය ගත්තොත් මෙවැනි මූල්‍ය ආයතන කඩා වැටීම හෝ අර්බුදයට ලක් වීම සිදු වෙලා රජය විසින් තැන්පත්කරුවන්ට මහජන මුදල් විශාල වශයෙන් ගෙවූ අවස්ථා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් රටේ සංවර්ධනය සහ ජනතා සුභසාධනය වෙනුවෙන් වෙන් කර තිබෙන රජයේ මූල්‍ය සම්පත් විවිධ වංචනික හෝ අයථා ක්‍රියා නිසා හෝ, අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ කළමනාකරණ දුර්වලතා නිසා හෝ අර්බුදයන්ට ලක් වූ ආයතන වෙනුවෙන් වන්දි විධියට ගෙවීම කෙතරම් සාධාරණද කියලාත් අපි නැවත සිතන්න ඕනෑ.

ඇත්ත වශයෙන්ම මෙවැනි ආයතන අර කියපු විධියට ඒ අයගේ මුදල්, ඒ අයගේ වත්කම් පිට රටවල හංගා, තැන්පත්කරුවන් විශාල අර්බුදයකට තල්ලු කිරීම නිසා රජය එයට මැදිහත් වෙලා ඔවුන්ට සිදු වුණාය කියන පාඩුව ගෙවීම කොයි තරම් සාධාරණද කියන එක ගැනත් අපි සිතන්න ඕනෑ.

මොකද, කලින් කල ඇති වෙන පෞද්ගලික අංශයේ මූල්‍ය ආයතනවල කඩාවැටීම්වලට මුහුණ දෙන්න වෙනත් නීතිමය සහ ආයතනික ව්‍යූහයක් අපි සකස් කර ගන්නට ඕනෑ වෙලා තිබෙනවා. ඇත්තෙන්ම මේ තත්ත්වය සලකා බලා ශ්‍රී ලංකා බැංකුව මේ වන විට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය - Sri Lanka Deposit Insurance and Liquidity Support Scheme - නමින් යෝජනා ක්‍රමයක් අපි පවත්වා ගෙන යනවා. ඒ යටතේ අර්බුදයට ලක් වූ මූල්‍ය ආයතනවල එක් තැන්පත්කරුවෙකුට රුපියල් ලක්ෂ 6ක් දක්වා මුදල් ලබා දෙන්නට පුළුවන්. එමඟින් කුඩා පරිමාණයේ තැන්පත්කරුවන් වැඩි පිරිසකට සහන සැලසීම සිදු වනවා. මෙවැනි ක්‍රමවේදයක් ලෝකයේ අනෙක් රටවල ද ක්‍රියාත්මක වෙනවා.

අනෙක් කරුණ තමයි, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා සඳහන් කරපු නීතිමය ක්‍රියාමාර්ගය සිදු වීම. මෙතැනදී මහජන මුදල් අවභාවිත කළ පුද්ගලයන්ට එරෙහිව 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ නීතිය ක්‍රියාත්මක කරනවා. එහිදී මහාධිකරණ නඩු විභාගයෙන් පසුව එම පනත යටතේ රුපියල් මිලියන 5ක දඩයක් හෝ වසර 5ක සිර දඬුවමක් හෝ නැතිනම් මේ දඬුවම් දෙකම ලබා දීමේ හැකියාව තිබෙනවා. අපේ අදහස නම් මේ පනත සංශෝධන කරලා මීට වඩා තදබල නීතිරීති පැනවීම කාලෝචිතයි කියන එකයි. මොකද, මේ මූල්‍ය ආයතන කරගෙන යන අයට, විශේෂයෙන්ම වංචාකරුවන්ට, රුපියල් මිලියන 5ක් ගෙවනවා කියන එක ඉතාමත්ම සුළු දෙයක්. ඒ අයට මේ දඩය ගෙවලා තමන්ගේ කටයුතු ඒ ආකාරයටම කරගෙන යන්න පුළුවන්. ඒ නිසා අපි මේ පනත සංශෝධනය කිරීම ගැනත් අපේ අවධානය යොමු වෙලා තිබෙනවා.

මේ වන විට මහ බැංකු මුදල් මණ්ඩලය, අනවසර මූල්‍ය ව්‍යාපාර සමඟ සමාගම් අධ්‍යක්ෂවරු 151 දෙනෙක් හඳුනා ගෙන තිබෙනවා. නැවත වෙනත් ආයතනයක අධ්‍යක්ෂවරයෙක් වශයෙන් හෝ ප්‍රධාන නිලධාරියෙකු ලෙස කටයුතු කිරීමට නොහැකි වන පරිදි ඔවුනට විරුද්ධව පියවර ගෙන තිබෙනවා. මේ වාගේ ජනතාවට වංචා කරපු සමාගම්වල හිටපු අධ්‍යක්ෂවරු 155දෙනෙක් අපි හඳුනා ගෙන තිබෙනවා. මූල්‍ය ආයතන වෙනුවෙන් ඒවායේ අයථා පාලනය සහ වංචනික කටයුතුවලට එරෙහිව නීතිමය කටයුතු කරන්න ශ්‍රී ලංකා බැංකුව නිරාකරණ හා බල ගැන්වීමේ දෙපාර්තමේන්තුවක් -Resolution and Enforcement Department- ස්ථාපිත කරලා තිබෙනවා. ඒ කියන්නේ මීට පෙර මේ වංචනික ක්‍රියාවල යෙදුණ 150 දෙනා ගැන මේ දෙපාර්තමේන්තුව හරහා අපි අවධානයෙන් ඉන්නවා. ඒ වාගේම ඉදිරියේ දී මෙවැනි වංචනික ක්‍රියා සිදු කරන අය ගැනත් මේ තුළින් හොයන්න පුළුවන්.

මා ඉහත කියපු තැන්පත් රක්ෂණ ක්‍රමය අනුව තැන්පත්කරුවන්ට වන්දි ලබාදීමෙන් පසුව අදාළ මූල්‍ය සමාගම් ඇවර කිරීමට නීතිමය ප්‍රතිපාදන තිබෙනවා. එවැනි අවස්ථාවක ඇවරකරුවෙක් පත් කිරීමෙන් පසුව වත්කම් විකුණා තමන්ට මෙතෙක් නොලැබුණ මුදල් ලබා ගැනීමේ අයිතිය තැන්පත්කරුවන්ට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තවශයෙන්ම මේ සියල්ල ඉදිරියේ අපේ මේ තැන්පත්කරුවන් ඉතාමත්ම අසරණ තත්ත්වයකට පත් වෙලායි සිටින්නේ. ඒ ගැන අපි සාකච්ඡා කරලා පියවර ගන්නවා. [බාධා කිරීමක්] බොහොම අසරණයි. වැඩි මුදලක් තැන්පත් කරපු අය ගැන ඔබතුමන්ලා සමහත් අපි සාකච්ඡා කරලා, ඒ අවශ්‍ය නීතිරීති අපි ඉක්මනට ප්‍රතිපාදනය කරන්න සූදානම්. නමුත්, අපි මේ මාසය ඇතුළත තවත් කාර්යයක් කිරීමට සූදානම් වෙනවා. අපි මුලින්ම කථා කළ ක්ෂුද්‍ර ණය එනම් microfinance companiesවලට හසු වුණු කාන්තාවන්ට මේ මාසය ඇතුළත අපි විශේෂ සහනයක් ලබා දෙනවා. අපි එය ජූනි මාසයේ 22වෙනිදා ප්‍රකාශයට පත් කරන්න බලාපොරොත්තු වනවා.

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා (විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன - விஞ்ஞான, தொழில்நுட்ப, ஆராய்ச்சி, திறன்கள் அபிவிருத்தி, தொழில் பயிற்சி மற்றும் கண்டி மரபுரிமைகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Lakshman Senewiratne - State Minister of Science, Technology and Research, Skills Development and Vocational Training and Kandyan Heritage)
බොහොම ප්‍රශංසනීයයි, ගරු ඇමතිතුමනි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සහනය අනුව මෙවැනි microfinance companiesවලින් රුපියල් එක්ලක්ෂ පනස්දහසකට වඩා අඩුවෙන් ණය ගත්ත අයගේ සියලුම පොලිය අපි කපා හැරලා රජය එය දරා ගන්නවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු මුදල් ඇමතිතුමනි, සමහර ආයතනවල පොලී අනුපාතය සියයට 60යි. මහ බැංකුව ඒ ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවලට දීලා තිබෙන අවසරය මොකක්ද? මහ බැංකුව යම් පොලී අනුපාතයක්,- [බාධා කිරීමක්]

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
නැහැ, එහෙම අවසරයක් දීලා නැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
නමුත් ඒවා ප්‍රධාන ආයතන; ලියා පදිංචි ආයතන. ඒවායේ පොලී අනුපාතය සියයට 40යි, සියයට 60යි.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මමත් ඒක කියන්නයි හැදුවේ. ගරු මන්ත්‍රීතුමනි, අපි මේ ණය පොලිය කපා හරිනවා. ඒ වාගේම, මහ බැංකුව මඟින් මේ අයට සියයට 30ක cap එකක් අපි දානවා. ඇත්ත වශයෙන්ම අපට ඒක නීතියෙන් ක්‍රියාත්මක කරන්න බැරි වුණත්, අපි ඒ අයට දන්වා සිටිනවා සියයට 30ට වඩා ගිහිල්ලා කටයුතු කළොත් මහ බැංකුවට මැදිහත්වීමට සිදු වෙනවා කියලා. මෙම යෝජනා ක්‍රමය අනුව රුපියල් 150,000ට වඩා අඩු මුදලක් ගත්ත ලංකාවේ ඕනෑම කාන්තාවක් මේ ණය ක්‍රමයට අහුවෙලා ඉන්නවා නම්, මෙම මස අන්තිම වෙනකොට අපි ඒ සියලු දෙනාටම මේ සහනය ලබාදෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කඩා වැටීමට ලක් වුණු මූල්‍ය ආයතනවල තැන්පත්කරුවන්ගේ ප්‍රශ්නය?

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඔබතුමා කිව්වා වාගේ මූල්‍ය ආයතන කඩා වැටීම නිසා ඇති වෙච්ච ප්‍රශ්න විශාල ප්‍රමාණයක් තිබෙනවා. දැනටමත් යම් ප්‍රමාණයකට උත්තරත් ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා මේවා ගැන කථා කරන්න මම ලබන සතිය ඇතුළත වේලාවක් ලබා දෙන්නම්. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. Next, the Hon. Dayasiri Jayasekara. You have 25 minutes.

[අ.භා.2.37]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාම වැදගත් කාලීන මාතෘකාවක් සාකච්ඡාවට බඳුන් කරන්න අපට අවස්ථාවක් සලසා දීම පිළිබඳව ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, අපේ ගරු මංගල සමරවීර ඇමතිතුමාත් මේ සභාවේ සිටීම ගැන එතුමාටත් ස්තුතිවන්ත වෙනවා. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා විනාඩි 55ක, 60ක පමණ කාලයක් පුරාවටම මේ රටේ තිබෙන තත්ත්වය පිළිබඳව විශාල කරුණු සංඛ්‍යාවක් හෙළිදරවු කළා. පළමුවෙන්ම මමත් එතැනට තමයි එන්න බලන්නේ. මොකද හේතුව, අද ග්‍රාමීය කාන්තාවන් අතිවිශාල ණය බරකින් පෙළෙනවා. එවැනි ණය බරකින් පෙළීමට මූලික හේතු කාරණාව වෙලා තිබෙන්නේ ග්‍රාමීය දුගීභාවයයි. දේශපාලනඥයන් විධියට අපිත්, විවිධ ආයතනත් බලන්නේ ස්වයං රැකියා ආදී විවිධ ක්‍රියා මාර්ග හරහා ග්‍රාමීය දුප්පත්කම තුරන් කිරීමේ වැඩ පිළිවෙළට අත ගහන්නයි. සමහර වෙලාවට පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඔවුන්ගේ පදනම් හරහා කාන්තාවන් ස්වයං රැකියාවලට යොමු කරනවා; ඔවුන්ට පුහුණුවීම් දෙනවා. පුහුණුවීම් දුන්නාට ඊළඟට ඔවුන්ව තල්ලු කරන්නේ කොයි පැත්තටද කියලා ඔවුන්ට ඉදිරි වැඩ පිළිවෙළක් නැහැ. ඒ වැඩ පිළිවෙළ තුළ හිරවෙන කාන්තාවන් තමන් ගත්ත දැනුම භාවිතයට ගන්න ප්‍රාග්ධනය නැතිව ඉන්නවා. පසුගිය කාලයේ ගරු රිසාඩ් බදියුදීන් මැතිතුමා කථා කරලා හැම ආසනයකම වාගේ මැෂින් 25ක් දාලා, කාන්තාවන් පුහුණු කිරීමේ වැඩ පිළිවෙළක් පටන් ගත්තා. අද මට එක කාන්තාවක් කථා කරලා කිව්වා, "දැන් මාස 6 ඉවරයි සර්, මේකට අවශ්‍ය කරන වැඩ පිළිවෙළ සකස් කරන්න දැන් අපට මැෂින් එකක් ඕනෑ." කියලා. ඇය කැමැතියි, මේ තුළින් වැඩ පිළිවෙළක් පටන් ගන්න. හැබැයි, ඇයට යොදවන්න ප්‍රාග්ධනයක් නැහැ. ඒ නිසා ඇය මොකක්ද කරන්නේ? අනුර දිසානායක මැතිතුමා කිව්වා වාගේ තමන්ට මැෂින් එකක් ගැනීම සඳහා හෝ වෙනත් කාරණයක් සඳහා රුපියල් 50,000ක් හෝ 100,000ක් ණයට අරගන්නවා. ඒ මුදල ඉතාම සාධාරණයි කියලා ඇයට හිතෙනවා. හැබැයි, ඇය ඒ මුදල ගෙවාගෙන යන්න බලනවා. ටිකක් කල් යනකොට සමහර වෙලාවට ඒ ව්‍යාපාරය කඩාගෙන වැටෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර ප්‍රදේශවල හතු නිෂ්පාදනය කරන කාන්තාවන් ඉන්නවා. ඔවුන් නිෂ්පාදනය කරන හතු වෙළෙඳ පොළට යවා ගන්න විධියක් නැහැ. ඒ නිසා ඇයගේ කර්මාන්තය සම්පූර්ණයෙන්ම කඩා වැටෙනවා. ඒ නිසා ඇය කරන්නේ, ඇය ලබාගත් ණය පියවීම සඳහා ආපහු තවත් තැනෙකින් ණය ගන්න එකයි. එක තැනෙකින් රුපියල් 100,000ක ණයක් ගත්තා නම්, ඒ 100,000 ණය මුදල ගෙවා ගන්න තව තැනෙකින් ලක්ෂ දෙකක් අරගෙන කලින් ගත්ත රුපියල් 100,000 ණය මුදල ගෙවලා, ඉතිරි 100,000 තමන්ගේ ව්‍යාපාරයට යොදා ගන්න පුළුවන් ද කියලා බලනවා. ඇය දැනට ලක්ෂ තුනක් ණය වෙලා තිබෙනවා. ඒ ව්‍යාපාරය සාර්ථක නොවුණොත්, ඒ ලක්ෂ තුනේ ණය ඊට පස්සේ ලක්ෂ පහ වෙනවා. මේ විධියට ගියාම ඊට පස්සේ ඇයට අනිවාර්යයෙන්ම පොලී මුදලාලි කෙනෙක් ළඟට යන්න සිද්ධ වෙනවා. එහෙම ගිහිල්ලා ඇයගේ ඉඩම උකසට තියලා මුදල් අරගෙන, ඒ මුදලින් තමන්ගේ ස්වයං රැකියාවේ දියුණුවට වැඩ පිළිවෙළක් සකස් කරන්න උත්සාහ කරනවා.

අවසාන වශයෙන්, ඇයට සිද්ධ වෙනවා තමන්ගේ නිවසින් එළියට යන්න. රුපියල් ලක්ෂයක, දෙකක ණයක් ගත්තාම, අවසානයේ පොලී මුදලාලි ඉඩමත් තියාගෙන පවුලේ සියලුදෙනා එළියට තල්ලු කරන තැන් අපි අනන්තවත් දැක තිබෙනවා. මේ ක්‍රියාදාමය එක පැත්තක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි කාරණය තමයි, ක්ෂුද්‍ර මූල්‍ය ණය දෙන ස්ථාන ස්ථාපිතවීම. අද ගමේ පොළ ඇතුළේ මීටරයට දෙනවාය කියලා දවසට ණය දෙනවා. රුපියල් දසදහසට පොලිය රුපියල් දහසයි. මේ විධියට කරගෙන යන වැඩ පිළිවෙළකුත් තිබෙනවා. ඊට අමතරව, ගම් ඇතුළේ සමහර අය මෝටර් බයිසිකල්වලින් ගිහින් දවසේ ලැබෙන මුදල් ටික එකතු කරගෙන එන ක්‍රමයකුත් අපි දන්නවා. මේ ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රමය තුළ අද පැහැදිලිව විශාල අර්බුදයක් ඇති වෙලා තිබෙනවා. මෙය පාලනය කරන්න කෙනෙක් අද ලංකාවේ නැහැ. මේක තමයි තිබෙන ප්‍රධානම ප්‍රශ්නය. මහ බැංකුව, එහෙම නැත්නම් වෙනත් ආයතනයක් හෝ මුදල් අමාත්‍යාංශය මේ සඳහා මැදිහත් වෙලා මේ ක්‍රියාදාමයට නිවැරදි වැඩ පිළිවෙළක් හදලා දුන්නේ නැත්නම් අපිට විශාල අර්බුදයකට, ගැටලුවකට මුහුණ දෙන්න සිද්ධ වනවා. දැනටත් අප ඒ ගැටලුවට මුහුණ දෙමින් ඉන්නේ. දැන් ලංකාවේ කාන්තාවන්ගේ ණයබරතාව වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම මෙවැනි ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවලින් මුදල් ගත්ත අය විශාල අමාරුවක වැටිලා තිබෙනවා.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

මෑතකදී මම අපේ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සමීක්ෂණයක් කළා. කොළඹින් එන මෙවැනි මූල්‍ය ආයතන විසින් ලබා දී තිබෙන ණය ප්‍රමාණය සියයට 42ක්, සියයට 43ක් බව ඒ සමීක්ෂණය තුළින් දැක්කා. ඒ විධියට ගත්ත ණය විශාල ප්‍රමාණයක් දැන් හිර වෙලා තිබෙනවා. එම නිසා අද ඔවුන්ට තමන්ගේ අර්බුදය ලිහා ගන්න විධියක් නැතිව සිය දිවි හානි කර ගන්න සිද්ධ වෙලා තිබෙනවා. අනුර දිසානායක මැතිතුමා කිව්වා වාගේ, ගෙදරක මහත්තයා නොවෙයි වැඩිම ණයකාරයා බවට පත් වෙලා තිබෙන්නේ නෝනා. මහත්තයාගෙන් අහන්නේ නැතිව නෝනා ගිහින් අර වාගේ මූල්‍ය ආයතනයක සල්ලි තැන්පත් කරනවා. මම මේ ළඟදී HNB Finance කියන ආයතනයට කථා කරලා බැලුවා. ඒකේ පුද්ගලයන් ගිහිල්ලා සමහර අයගෙන් මුදල් අරගෙන ඇවිල්ලා තිබෙනවා. මේ HNB සමාගම නොවෙයි කියලායි ඒ අය කල්පනා කරන්නේ. ඒ නිසා ඇය මුදල් දීලා. දැන් ඇයට හොයා ගන්න බැහැ, කාටද මේ මුදල් දුන්නේ කියලා. ඒ මුදල් ගත්ත අතරමැදියන් පැනලා ගිහිල්ලා. මෙවැනි විශාල අර්බුදයක් අද ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේ ප්‍රශ්නයට වහාම මැදිහත්වීම අද අත්‍යවශ්‍ය කාරණයක් බවට පත් වෙලා තිබෙනවා.

මම කැබිනට් මණ්ඩලයේ ඉන්න කොට, "කරුණාකරලා මේකට විසඳුමක් ලබලා දෙන්න" කියලා මම කාරණා ගණනාවක් කථා කළා. ඒ සඳහා අද ආණ්ඩුව ක්‍රියාත්මක වී තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මම ස්තුතිවන්ත වනවා.

අද විශාල අර්බුදයක් බවට පත්වී තිබෙන The Finance and Guarantee Co. Ltd. එක පිළිබඳව අනුර දිසානායක මැතිතුමා කථා කළා. එහි තැන්පත්කරුවන් 2,697කගේ රුපියල් මිලියන 1,863ක මුදලක් තැන්පත් කරලා තිබෙනවා. 2008දී UB Finance සමාගම The Finance and Guarantee Co. Ltd. හි සියලු වත්කම් පවරා ගත්තා. අද UB Finance සමාගම ලංකාවේ ශාඛා 20ක් සහිත සමාගමක් බවට පත් වෙලා තිබෙනවා. ඔවුන්ගේ ආදායම් මාර්ග අද වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම ඔවුන්ගේ ලාභාංශ පොත්වල සඳහන් වෙනවා. මේ ගෙනාපු මුදල් ටික ඊළඟට UB Finance එක අවසාන වශයෙන් ලංකා බැංකුවේ කොටස් නිකුත් කිරීම් සඳහා පාවිච්චි කිරීමට 2015දී වැඩ පිළිවෙළක් සකස් කළා. ඒක certificate එකක් විධියට තමයි නිකුත් කළේ. බැංකු නොවන මූල්‍ය සමාගම් අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා තමයි මේ කොටස් ටික නිකුත් කළේ. ඒ නිකුත් කරන කොට රුපියල් 2 බැගින් මිලියන 600ක් අලුතෙන් සොයා ගත් ShoCap කියන ආයතනයට, ඒ වාගේම සත 50 ගණනේ යුනියන් බැංකුවට, තැන්පත්කරුවන්ට බිලියන 1.36ක non-voting shares දුන්නා.

ගරු ඇමතිතුමනි, මෙතැනදී යම් වරදක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා, මේ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න ඕනෑ. බැංකු නොවන මූල්‍ය සමාගම් අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා, මේ කොටස් නිකුත් කිරීමේදී ලෝක කොටස් වෙළෙඳ පොළේ තත්ත්වයන් එක්ක ගත්තාම විශාල වැරැද්දක් කරලා තිබෙනවා. සාමාන්‍යයෙන් voting sharesවලට වඩා non-voting shares අඩු වෙන්න ඕනෑ. නමුත්, මෙතැනදී non-voting sharesවල මුදල රුපියල් 7ක් දක්වා දීලා තිබෙනවා. මෙතැනින් තමයි එක පැත්තකින් මේ අර්බුදය පැනනඟින්නේ. මේ බිලියන 1.36ට non-voting ordinary sharesවල මිල රුපියල් 7 බැගින් තමයි දීලා තිබෙන්නේ. වැරදි තීන්දුවක් විධියටයි අපි මෙය දකින්නේ. ඒවා කෙසේ නිකුත් කළාද, කොහොමද මේ ක්‍රියාදාමය ක්‍රියාත්මක වුණේ කියන එක ගැන බොහොම පැහැදිලි අදහසක් අපි ගන්න ඕනෑ. ඒ වාගේම අපි මේ සඳහා කැබිනට් අනුමැතියක් අරගෙන තිබෙනවා. ඒ වාගේම, මාස 18කින් මේ ප්‍රශ්නය විසඳන්න කියලා 2009දී කියලා තිබුණා. නමුත් අද දක්වා ප්‍රශ්නය විසඳීමට අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන නැහැ. ඒ නිසා අද 51 දෙනෙක් සියදිවි හානි කරගෙන. අද මේ ප්‍රශ්නයට ඒ තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, අද මේ රටේ සිටින වැඩිහිටි පුරවැසියන් අතිවිශාල පිරිසක් ඔවුන්ගේ එදිනෙදා කාර්යභාරය පැත්තකින් තියලා, ඔවුන් තැන්පත් කර තිබෙන මුදල් ටික ආපසු ගන්න, එහෙම නැත්නම් එයට ලැබෙන පොලිය ගන්න විශාල පරිශ්‍රමයක් දරන කාලයක් බවට මේ කාලය පත් වෙලා තිබෙනවා.

ඊළඟට, UB Finance සමාගමේ කොටස්, කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තුගත කරන්න වැඩ පිළිවෙළ සකස් කරලා තිබියදී, එය ක්‍රියාත්මක නොකර කොටස් සහතික මේ තැන්පත්කරුවන් සඳහා නිකුත් කළේ ඇයි කියලා මම අහන්න කැමැතියි. මේක තමයි තිබෙන ප්‍රධාන ප්‍රශ්නය. UB Finance සමාගම ගනුදෙනුකරුවන් තුළ විශාල විශ්වාසයක් ඇති කරලා තිබුණා, කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තුගත කරලා වැඩ පිළිවෙළක් සකස් කරනවාය කියලා. හැබැයි, අද වෙනතුරු ඒ කොටස් කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තුගත කිරීමට හැකියාවක් ලැබුණේ නැහැ, UB Finance සමාගමට. හැබැයි, කොටස් වෙළෙඳ පොළේ ලැයිස්තුගත කිරීමකින් තොරව සිටින මේ තැන්පත්කරුවන්ට UB Finance සමාගම කොටස් ලබා දෙනවා. ඒ නිසා 2015 කොටස් සහතික නිකුත් කිරීමේදී ලැයිස්තුගත කිරීම් නොකළේ ඇයි කියන එකත් මෙහිදී මතු වෙන කාරණයක්. UB Finance සමාගම යුනියන් බැංකුවේ අනුබද්ධ සමාගමක් නිසා, මේ බිලියන 1.36ක මුදල -මිලියන 1,863- මේ තැන්පත්කරුවන්ට ගෙවීමට අවශ්‍ය කටයුතු කරන්න කියලා අපි කියන්න කැමැතියි. ඒ සඳහා මහ බැංකුව පැහැදිලිව මැදිහත් විය යුතුයි. ඒ විතරක් නොවෙයි, ඔවුන් ඒ සඳහා ක්‍රියා කළ යුතුයි. අද මහ බැංකුව මේ කාර්යය කර ඇරලා තිබෙන්නේ. එසේ කර අරින්නේ නැතුව මේ වැඩ පිළිවෙළට අත ගසා කරගෙන යන්න බැරි ඇයි කියලා මම අහනවා.

ඒ විතරක් නොවෙයි, Finance and Guarantee Co. Ltd. එකේ තිබුණු වත්කම් කොපමණද? මුදල් විතරක් නොවෙයි, තවත් වත්කම් ප්‍රමාණයක් ඒ සමාගමට තිබුණා. ඔවුන්ට වාහන තිබුණා; දේපළ තිබුණා. මේ සියල්ලම එකට එකතු කරලා ගත්තාම, ඒ වත්කම් පිළිබඳව මහ බැංකුවට යම් වැටහීමක් තිබෙනවාද කියන කාරණයත් මම මතු කරන්න කැමැතියි. විශේෂයෙන්ම මේ බැංකුව මර්වන්ට් බැංකුව හා සම්බන්ධ කිරීමේදී කමිටුවක් පත් කළා. එම කමිටුවෙන් පැහැදිලිව කිව්වා, ඉතාම කෙටි කාලයක් ඇතුළත මේ ප්‍රශ්නය අවසන් කරන්න කියලා. හැබැයි, 2008දී පටන් ගත් මේ ක්‍රියාදාමය තවදුරටත් -අද වනතුරුත්- කරගෙන යන්න ඔවුන්ට සිද්ධ වෙලා තිබෙනවා. ඒ නිසා අවුරුදු ගණනාවක් පාරවල්වල රස්තියාදු වෙන්න මේ තැන්පත්කරුවන්ට සිද්ධ වෙලා තිබෙනවා. මේ ප්‍රශ්නයට ආණ්ඩුව විධියට වහාම මැදිහත් විය යුතුයි. එපමණක් නොවෙයි. මේ කටයුතුවලට අදාළව හිටපු නිලධාරීන් කවුද කියලා සොයා බලා, ඔවුන් මේ කොටස් නිකුතුව සිද්ධ වෙනකොට, නිසි පරිදි එම ක්‍රියාදාමයට අත ගැසුවේ නැත්තේ ඇයි කියා සොයා බලන්න කියලා මම මහ බැංකුවෙන් ඉල්ලා සිටිනවා. බැංකු නොවන මූල්‍ය සමාගම් අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විධියට මේ shares නිකුත් කරලා තිබෙන්නේ කිසිදු වගකීමකින් තොරවයි. ඒ නිසා මේ ක්‍රියාදාමය ගැන සොයා බලන්න කියලා මෙතැන සිටින ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමාගෙන් මම කරුණාවෙන් ඉල්ලන්න කැමැතියි.

අද වනවිට ඊටීඅයි ආයතනය තුළත් මේ වාගේම තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. මම එදා දිගින් දිගටම මේ පාර්ලිමේන්තුවේදී ඒ ගැන ප්‍රකාශ කළා. රත්තරන් ගෙන ඒමේදී සියයට සියයක් බදුවලින් නිදහස් කිරීම තුළ රත්තරන් මිල එකවර කඩා වැටෙනවා. බදුවලින් නිදහස් කිරීම තුළ ඇති වෙන මේ

තත්ත්වය ගැන මම එදා පැහැදිලිව කිව්වා. ඒ හරහා ලංකාවට රත්තරන් විශාල ප්‍රමාණයක් ආනයනය කර තිබෙනවා. හැබැයි, ලංකාව ඇතුළේ ඒවාට අවශ්‍ය කරන ව්‍යාපාර හැදුණේ නැහැ; මැණික් ව්‍යාපාර හැදුණේ නැහැ. රවි කරුණානායක මැතිතුමාට එදා අවශ්‍ය වෙලා තිබුණා රත්තරන් ලංකාවට ගෙනෙන්න පුළුවන් අය 50 දෙනෙක් පත් කරන්න. මට මතක හැටියට එතුමා එවැනි අය වැය යෝජනාවක් ගෙනාවා. හැබැයි, ඒක කරගන්න හම්බ වුණේ නැහැ. ඒකත් එක්ක මොකද වුණේ? රත්තරන් ගෙනෙන්න සුදුසු පුද්ගලයන් කවුද කියලා කල්පනා නොකිරීම නිසා, රත්තරන් ගෙනෙන පුද්ගලයන් කවුද කියලා සොයා ගන්න බැරි විධියට විශාල රත්තරන් තොගයක් ලංකාවට ඇවිල්ලා තිබුණා.

ඒ විතරක් නොවෙයි, ඒ වාගේම විශාල තොගයක් ලංකාවෙන් එළියට ගිහිල්ලාත් තිබුණා. මම සති කිහිපයකට කලින් මේ ගැන කථා කළාම, හර්ෂ ද සිල්වා මැතිතුමාත් මේ ගැන කථා කළා. ඒ අනුව තමයි අද සියයට 15කට මේ බද්ද අඩු කරලා තිබෙන්නේ. ඒ නිසා අද යම් ක්‍රමානුකූලභාවයක් රත්තරන් ආනයනයේදී ඇති වෙලා තිබුණත්, ඉන්දියාවෙන් ලංකාවට හොරෙන් රත්තරන් ගෙනෙන තත්ත්වයක් දැන් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධව නිවැරදි ස්ථාවර වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. නැත්නම් වෙන්නේ ලංකාවේ රත්තරන් වෙළෙඳ පොළ වැඩිවීම වාගේම, අනෙක් පැත්තෙන් ආපසු ඉන්දියාවෙන් ලංකාවට ජාවාරම්කරුවන් රත්තරන් ගෙනෙන එක වැඩිවීමයි.

අපි සියයට සියයක් බදු අඩු කරලා තිබෙන වෙලාවේ ලංකාවට ගෙනා රත්තරන්වලින් ලංකාවේ ආනයන බිල වැඩි වෙලා තිබුණා. හැබැයි, ඒ ආනයනය කරපු එකෙන් රටට ප්‍රයෝජනයක් අත්වෙලා තිබුණේ නැහැ. ඒ ගෙනාපු රත්තරන් ටික ජාවාරම්කරුවන් විසින් නැවත ඉන්දියාව ඇතුළු වෙනත් රටවලට පැටෙව්වා. ඒ නිසා මේ ගැන යම් ස්ථාවර වැඩ පිළිවෙළක් හැදුවේ නැත්නම්, මෙය මේ රටේ විශාල අර්බුදයක් බවට පත් වෙන්න ඉඩ තිබෙනවා. ඒ නිසා මම ඉරාන් වික්‍රමරත්න මැතිතුමාට කියන්න කැමතියි, කරුණාකරලා ලංකාවේ තිබෙන ක්ෂුද්‍ර මූල්‍ය ණය දෙන ආයතන පිළිබඳ පැහැදිලි වැඩපිළිවෙළක් මහ බැංකුවත් එක්ක එකතුවෙලා සකස් කරන්න කියලා.

ඒ විතරක් නොවෙයි, මට ඇහුණා අනුර දිසානායක මන්ත්‍රීතුමා සණස ගැන කථා කරනවා. මහ ඇමති කෙනෙකු විධියට වැඩ කරපු නිසා මාත් දන්නවා, සණස ව්‍යාපාරය අපේ පළාතේත් ඉතාම ශක්තිමත්ව යන ව්‍යාපාරයක් බව. නමුත් සමහර තැන්වල කඩා වැටිලා තිබෙනවා. ඒ කඩා වැටිලා තිබෙන්නේ සමහර පුද්ගලයන්ගේ ප්‍රශ්න නිසා; සණස තුළ ඇතිවෙච්ච, ඒ ප්‍රාදේශික තුළ ඇති වෙච්ච කාරණා නිසා. ඒ වාගේ දේවල් සිද්ධ වෙන්න පුළුවන්. සමුපකාර ග්‍රාමීය බැංකු තුළත් මේ දේ සිද්ධ වෙනවා. හැම සමුපකාර ග්‍රාමීය බැංකුවක්ම ඉතා හොඳින් දුවන්නේ නැහැ. සමහර ග්‍රාමීය බැංකු සමහර වෙලාවට කඩා වැටෙන්න පුළුවන්. එය සමස්ත ග්‍රාමීය බැංකු ක්ෂේත්‍රයේ ඇතිවන අර්බුදයක් විධියට හඳුන්වන එක සම්පූර්ණයෙන් වැරදියි. මේවාගේ ක්‍රියාදාම තුළ සණස ව්‍යාපාරයේ හොඳ කීර්තිනාමය කඩා වැටෙනවා. ඒවාට විසඳුම් ඕනෑ තරම් තිබෙනවා. බොහොම පැහැදිලිව පළාතේ සමුපකාර කොමසාරිස්ට පුළුවන් ඒ සණස කොට්ඨාසය මොකක්ද කියලා හොයලා බලන්න. ඒ අය කර තිබෙන වැරැද්ද මොකක්ද කියලා හොයලා බලලා ඔවුන්ට විරුද්ධව ක්‍රියාදාමයක් ගන්න පළාතේ සමුපකාර කොමසාරිස්තුමාට බලය දීලා තිබෙනවා. ඒ ක්‍රියාදාමය තුළ ඔවුන්ට විරුද්ධව දඬුවම් පැමිණවීමේ ක්‍රියාදාමයකුත් තිබෙනවා. ඒ නිසා මේ කුඩා ක්ෂුද්‍ර මූල්‍ය ආයතන පිළිබඳව මහ බැංකුව ඕට වඩා මැදිහත් වෙන්න ඕනෑ. මේවා පිළිබඳව වෙනම දෙපාර්තමේන්තුවක් විධියට ක්‍රියා කරමින් යම්කිසි ස්ථාවර වැඩපිළිවෙළක් හැදුවේ නැත්නම් ලංකාවේ තව තවත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විශාල ප්‍රමාණයක් ඇති වෙනවා විතරක් නොවෙයි, කිසිම ප්‍රමිතියකින් තොර ආයතන ඇති වෙනවා. ඒ තුළින් අපේ අහිංසක ජනතාවගේ මුදල් ගත්ත විශාල පිරිසක් ජාවාරම්කරුවන් විධියට ඒ මුදල් පිටරටට පටවනවා. එහෙම නැත්නම් ඔවුන් බංකොලොත් වෙනවා. මොකද, ඔවුන් දන්නේත් නැහැ ඔවුන්ට හම්බවෙන මේ සල්ලිවලින් මොකක්ද කරන්නේ කියලා. ඒ නිසා මෙන්න මේ ක්‍රියාදාමය පිළිබඳව ස්ථාවර වැඩපිළිවෙළක් මහ බැංකුව විධියට හදන්න පියවර ගැනීම අත්‍යවශ්‍ය කාරණයක් බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 2.53]

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතා විමුක්ති පෙරමුණ කාලෝචිත මානෘකාවක් තමයි අද දවසේ කල් තැබීමේ විවාදයට ඉදිරිපත් කරලා තිබෙන්නේ. දැන් සාමාන්‍යයෙන් ලංකාවේ ගම්බිම් මට්ටමින් පදුරකට ගැහුවත් microfinance companies හොයා ගන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ. පසුගිය දශක එකහමාරක කාලය තුළ finance companies විශාල ප්‍රමාණයක් ලංකාවේ බිහි වෙලා, ඒ හරහා රැකියා අවස්ථා විශාල ප්‍රමාණයක් බිහි වුණා. නමුත් ඒ finance companiesවල රැකියාවලට ආපු තරුණ තරුණියන් ටික කාලයක් යද්දී බලනවා, මේ සමාගමට වැඩ කරන්නේ නැතුව අපි යම්කිසි මුදල් ප්‍රමාණයක් එකතු කර ගත්තොත් ග්‍රාමීය ආර්ථිකයේ තිබෙන හිඩැස් තුළින් රිංගලා අපටම මේ වැඩේ කරන්න පුළුවන් කියලා. විශේෂයෙන් අද සිද්ධ වෙන්නේ මහ බැංකුවේ කිසිම නියාමනයක් හෝ පාලනයක් නොමැතිව මේ ආකාරයේ කටයුතු සිදුවීමයි. ඇත්ත වශයෙන්ම ඒ කාලයේ ගම්වල පොලී මුදලාලිලා කරපු වැඩේ ඊට වඩා දරුණු විධියට තමයි දැන් ගම් ඇතුළේ මේ සමාගම් හරහා සිද්ධ වෙන්නේ.

සාමාන්‍යයෙන් ව්‍යාපාර කටයුතුවලදී cheque issue කරනවා. නමුත් ඒ cheque issue කරද්දී කිසිම පාලනයක් නැහැ. අද එක තැනකට cheque එකක් දීලා ණයක් ගන්නවා. ඒ ණය ගෙවා ගන්න බැරි වුණාම තවත් තැනකට cheque එකක් දීලා තව ණයක් ගන්නවා. ඒකත් ගෙවන්න බැරි වුණාම තවත් තැනකට cheque එකක් දීලා තවත් ණයක් ගන්නවා. ඒකත් ගෙවන්න බැරි වුණාම තවත් තැනකට යනවා. මේ ආකාරයට අධික පොලියට මෙවැනි microfinance companies වලින් ණය ලබා ගැනීම නිසා ග්‍රාමීය වශයෙන් ව්‍යාපාර කටයුතු කරන කුඩා ව්‍යාපාරිකයන්ගේ ව්‍යාපාර කඩා වැටීමකට ලක් වෙලා තිබෙනවා. අනික් පැත්තෙන් මේ chequeවලට තිබෙන වටිනාකමත් දැන් නැති වෙලා තිබෙනවා. මුදල් රාජ්‍ය ඇමතිතුමා මෙතැන ඉන්නවා. අපි එතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ cheque නිකුත් කිරීම සම්බන්ධයෙන් නියාමනයක් ගෙනෙන්න ඕනෑ කියලා. ඕනෑ කෙනෙකුට, ඕනෑම ප්‍රමාණයක් cheque issue කරන්න පුළුවන්. හැබැයි, යම්කිසි cheque ප්‍රමාණයක් හෝ මුදල් ප්‍රමාණයකින් එහාට දිගින් දිගටම ඒ ව්‍යාපාරිකයාගේ cheque return වෙනවා නම්, ඔහුට cheque issue කරන්න බැරි ක්‍රමයක්, එහෙම වැඩ පිළිවෙළක් ගෙනැල්ලා නියාමනයක් ඇති කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

අද වෙනකොට National Identity Card Number එක හරහා තමයි මේ සියලු දේවල් සිද්ධ වෙන්නේ. ඒ තොරතුරු ඔක්කෝම පරිගණක ගත වෙලා තිබෙනවා. ඒ නිසා අවශ්‍ය කරුණු හොයා ගන්න පුළුවන්. මොකද, හේතුව? අද විශාල ප්‍රමාණයේ සමාගම්වලට ඒගොල්ලන්ගේ dealersලා හරහා බඩු මිලදී ගන්නා විට chequesවලට තමයි බඩු මිලදී ගන්නේ. අන්තිමට ඒ සමාගම්වලට ඒ ණය ගෙවන්නේ නැති වුණාම ඒ සමාගම් කඩා වැටීමේ අනතුරකට ලක් වෙනවා. අපට විශේෂයෙන්ම

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

පෙනෙනවා, Dealers' network එකක් තිබෙන පෞද්ගලික අංශයේ සමාගම් මේ ගැටලුව හරහා බරපතළ අර්බුදයකට මුහුණ දීලා තිබෙන බව. එම නිසා මේවා නියාමනයට ලක් කිරීම අත්‍යවශ්‍යයි කියලා අපි විශ්වාස කරනවා. සාමාන්‍යයෙන් රජයේ බැංකුවකින් ණයක් ගන්න ගියාම නීති රීති, නියාමන ඔක්කෝම තිබෙනවා. නමුත් මේ වාගේ ආර්ථිකයට ඍජු ලෙස බලපාන, රටේ ආර්ථිකයට ප්‍රධාන දායකත්වය ලබා දෙන සමාගම් කඩා වැටීම සහ ගම් මට්ටමේ, බිම් මට්ටමේ සිටින කුඩා ව්‍යාපාරිකයන්ගේ ව්‍යාපාර සහ ග්‍රාමීය ආර්ථිකය කඩා වැටීම පිළිබඳව කිසියම් නියාමනයකට ලක් නොවීම පිළිබඳව අපි කනගාටුවට පත් වෙනවා.

අපි විශේෂයෙන්ම කියන්නට ඕනෑ, මහ බැංකුව හරහා මේ පිළිබඳව එක පාර නීති රීති, රෙගුලාසි ගෙනෙන්නේ නැතිව ග්‍රාම නිලධාරී වසම් 14,000 සම්බන්ධයෙන් පරීක්ෂණයක් - research එකක් -කරලා, සවිස්තරාත්මක තොරතුරු සොයාගෙන, මේ තොරතුරුවලට ගැළපෙන ආකාරයේ නියාමනයක් ගෙනෙන්න කියලා. මොකද, එක පාරටම කිව්වොත් රුපියල් මිලියන 200ක් දීලා licence එකක් ගන්න ඕනෑ කියලා, එතැනින් පසුව විශාල ලෙස මුදල් තිබෙන අයට පමණයි එවැනි ව්‍යාපාරයක් පටන් ගන්නට පුළුවන් වෙන්නේ. එම නිසා ප්‍රධාන පෙළේ සමාගම් ටික කඩා නොවැටෙන තත්ත්වයේ පවත්වාගෙන යන ගමන්ම කුඩා පරිමාණයේ ව්‍යාපාරිකයන් ඉදිරියට ගෙනෙන්නට පුළුවන් ආකාරයට, ඒ පහසුකම් ලබා ගන්නට පුළුවන් ආකාරයේ නියමනයක් මේ සඳහා එකතු කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

අද මහ බැංකුව සම්බන්ධයෙන් වන මාතෘකා ගැන තමයි කථා කරන්නේ; නියාමනයන් සම්බන්ධයෙන් මාතෘකා ගැන තමයි කථා කරන්නේ. එම නිසා විශේෂ ඉල්ලීමක් කිරීම සඳහා මම මෙය අවස්ථාවක් කර ගන්නවා. මහ දවල් මහ බැංකුව මංකොල්ල කෑවා කියලා ප්‍රචාරයක් තිබෙනවා. ඒ හරහා රුපියල් බිලියන 12ක පාඩුවක් වුණාය කියලා කියනවා. මේ පරීක්ෂණ ඉවර කරලා තිබෙනවා නම්, ඒවා හංගාගෙන ඉන්නේ නැතිව ඒ අයට විරුද්ධව නඩු දමන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. මොකද, නඩු දාලා ඒ වැරදිකරුවන්ට දඬුවම් දෙන්නට ඕනෑ. ඒකට තමයි මේ ආණ්ඩුව ආවේ. පසු ගිය ආණ්ඩුව කාලයේ කරපු වැරදි සොයන ගමන්ම මේ ආණ්ඩුව කාලයේ ඉවර කරලා තිබෙන පරීක්ෂණ සම්බන්ධයෙනුත් නඩු පවරලා දඬුවම් දීම අත්‍යවශ්‍ය වෙනවා.

මේ අවස්ථාවේ දී ගරු කථානායකතුමා සභාවේ නැති වුණත් කියන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. මන්ත්‍රීවරුන්ගේ ගෞරවය සහ වරප්‍රසාද ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කථානායකවරයාට විශාල වගකීමක් තිබෙනවා. අද ප්‍රධාන පෙළේ මාධ්‍යවලත්, සමාජ මධ්‍ය, මේ හැම එකකම කථා කරන්නේ කවුද 118දෙනා කියලායි. මහ බැංකු බැඳුම්කරවලින් සල්ලි ගත්තු 118දෙනා කවුද? ඒ තුළ සමාජ මාධ්‍ය ජාල වගකීම් විරහිතව හැසිරෙන නිසා, මේ සිද්ධියට කිසිම සම්බන්ධයක් නැති මන්ත්‍රීවරුන් පිළිබඳව පවා ජනතාව සැකයෙන් බලන තත්ත්වයක් අද නිර්මාණය වෙලා තිබෙනවා. එම නිසා මේ 118 දෙනා හෝ, 18 දෙනා හෝ, 218 දෙනා හෝ, ඒ සල්ලි ගත්තු අයගේ නම් ටික එළියට දැමීම අතශවශ්‍යයි. ඒ පිළිබඳව අපි ගරු කථානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මොකද, මේවාට හවුල් නැති, මේවාට සම්බන්ධ නැති මන්ත්‍රීවරුන්ගේ ගෞරවය සහ වරප්‍රසාද ආරක්ෂා කිරීම මේ සභාවේත්, කථානායකතුමාගේත් වගකීමක් වෙනවා.

මැතිවරණ කාලයට විවිධ දේශපාලනඥයන්ට විවිධ ව්‍යාපාරිකයන් මුදල් දෙනවා. හැබැයි කවුරු හෝ දේශපාලනඥයකු කියනවා නම් දන්නේ නැතිව මුදල් ගත්තේ, ගත්තු ගණන මතක නැහැ කියලා, ඒක පට්ට පල් බොරුවක්. අනෙක් කාරණය තමයි මහ බැංකු බැඳුම්කර මංකොල්ලය සිද්ධ වෙලා තිබෙන්නේ 2015 මාර්තු මාසයේ. මහා මැතිවරණය පැවතුණේ අගෝස්තු මාසයේ. එතකොට එම කාලය ඇතුළත කවුරුන් හෝ දන්නේ නැතිව cheques අරගෙන තිබෙනවා කියලා කියනවා නම්, ඒක පට්ට පල් බොරුවක්. එම නිසා සල්ලි ගත්තු අයගේ නම් ටික එළියට දාලා, නොගත්තු අයගේ ගෞරවය ආරක්ෂා කරන්නට මේ පාර්ලිමේන්තුවට වගකීමක් තිබෙනවා. ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවෙන් මේක ගන්න අවුරුදු 30ක් ඉන්න ඕනෑ, එහෙම නැත්නම් ජනාධිපති කාර්යාලයෙන් එළියට දුන්නොත් තමයි අපිට මේක එළියට දමන්නට පුළුවන් වැනි කථා පැවසීම ජනතාවට විහිළු සැපයීමක් කියලායි මම නම් හිතන්නේ.

බැඳුම්කර කොමිසමට ලබා දුන් ප්‍රචාරය වාගේම, බැඳුම්කර වාර්තාවේ සංක්ෂිප්තය ජනාධිපතිතුමා කියන කොට, ජාතික ප්‍රපත්තියක් ප්‍රකාශයට පත් කරනවා වාගේ රටේ සියලු මාධ්‍ය ඒකට විශාල ප්‍රචාරයක් ලබා දුන්නා. ඒ නිසා මුදල් ගත්තාය කියන 118දෙනාගේ නම්වලට ලැබිලා තිබෙන ප්‍රචාරය වාගේම, නොගත්තු අය ගැනත් ප්‍රචාරයක් ලබාදීමේ වගකීම මාධ්‍යයටත්, පාර්ලිමේන්තුවටත් තිබෙනවාය කියන එක මම විශේෂයෙන්ම කියන්නට ඕනෑ. ඒ නිසා මේ විවිධ නීති රාමුවලට මුවා වෙලා, විවිධ යටි කුට්ටු වැඩවලට මුවා වෙලා අනෙකුත් මන්ත්‍රීවරුන්ගේ ගෞරවය බිල්ලට නොදී ඒ නම් ටික එළියට දැමීම වැදගත්.

මම මේ කාරණය ගැනත් කියන්නට ඕනෑ. මේ මහ බැංකු බැඳුම්කරය කියන්නේ මේ රටේ සිදු වෙච්ච සියලු දේ නොවෙයි, එකයි. මේ මහ බැංකු බැඳුම්කරයෙන් වැරදිකාරයන්ට දඬුවම් දෙනවා වාගේම, මේ අර්ජුන් ඇලෝසියස්ලා පසු ගිය ආණ්ඩු කාලයේ කරපු දේවල්වලටත් දඬුවම් දෙන්නට ඕනෑ. ඔවුන් night racesවලට sponsor කරලා තිබෙනවා. ඒවාත් එළියට දමන්න ඕනෑ. Night racesවලට sponsor කරපු ඒවාත් එළියට දමන්න ඕනෑ. හිටපු මහ බැංකු අධිපතිගේ සහෝදරිය පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉඳලා තිබෙනවා. දැන් ඒක ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ. ඒ එක්කම, මේ බැඳුම්කර මගඩිය 2008 ඉඳලා සිදු වෙලා තිබෙනවා. ඒවායේ කොමිස් ගිය ආකාරය ගැනත් එළියට දමන්න ඕනෑ. අපි විශේෂයෙන්ම ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කරලා තිබෙනවා, තවම ප්‍රතිචාරයක් නැහැ. මේ වාගේ තව කොමිසමක් දමන්න, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මට තව විනාඩියක් දෙන්න. 2008 ඉඳලා 2015 වෙන කල් හිටපු මහ බැංකු අධිපති නිවාඩ් කබ්‍රාල් මැතිතුමා ඒ වෙලාවේ නිබුණු නීතියේ හිඩැස්වලින් රිංගලා, ඒ වෙලාවේ බැඳුම්කරවලින් දාපු සෙල්ලම් ටිකත් එළියට දාන්න කොමිසමක් ගෙනෙන්න ඕනෑ. Greek Bondsවලින් ගහපු ටිකත් එළියට එන්න ඕනෑ. ඒ අයටත් දඬුවම් දෙන්න ඕනෑ. ඒ වාගේම හෙජින් සූදුව හරහා සිදු වෙච්ච පාඩුවටත් දඬුවම් දෙන්නට ඕනෑ. දැන් වැඩේ වෙලා තිබෙන්නේ, මේ අර්ජුන් ඇලෝසියස් මහත්මයාගෙන් සල්ලි ගත්තු කට්ටිය ගල් ගිල්ලා වාගේ ඉඳීම නිසා, මේක තමයි මෙතෙක් ලංකාවේ සිදු වෙච්ච එකම හොරකම, ඒකෙන් පමණයි පගා අරගෙන තිබෙන්නේ කියලා මතයක් නිර්මාණය වෙලා තිබෙන එකයි. ඒ නිසා, ඒකට දඬුවම් දුන්නොත් තමයි අර අනෙක් හොරු ටිකත් එළියට ගන්න පුළුවන්. එහෙම නොවුණොත් වෙන්නේ මොකක්ද? පරණ කට්ටිය ඔක්කෝම සුදනෝ වාගේ

ඉන්නවා. පරණ වෝදනා තිබෙන අය දැන් දිවුරුම් පෙත්සම් අත්සන් කරනවා. ඔවුන්ට උසාවියේ නඩු තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්ඩලික තලෛමතාඩකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසන්.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(මාණ්ඩලික එස්.එම්. මාරික්කාර්)
(The Hon. S.M. Marikkar)
දිවුරුම් පෙත්සම් අත්සන් කරලා, අනෙක් අයට හොරු කියනවා. ඒ නිසා අතිගරු ජනාධිපතිතුමාගෙන් අපි ඉල්ලීමක් කරනවා, මේ ආණ්ඩු කාලයේ සිදු වෙච්ච බැලුම්කර ගනුදෙනුවට කොමිසමක් දාලා සක්‍රීය වුණා වාගේම, ගිය ආණ්ඩු කාලයේ ඒවාත් හොයන්න කියලා. "මම දන්නේ නැහැ, මට තේරෙන්නේ නැහැ" කියලා තැන් තැන්වල කිය කියා ඉන්නේ නැතුව කොමිසම් දාලා හොයලා, ඒ ටිකත් එළියට අරගෙන ඒ අයටත් දඬුවම් දෙන්න. මහජන ඡන්දයෙන් පත් වෙලා ඇවිල්ලා, මන්ත්‍රී ධුරය ව්‍යාපාරයක් කර ගන්න සියලුම දෙනාට පක්ෂ-විපක්ෂ භේදයෙන් තොරව දඬුවම් දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්ඩලික තලෛමතාඩකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
අඩුත්තු, කෞරව එස්. ශ්‍රීතරන් අවර්කළ්! උංකළුක්කු 20 නිමිඩංකළ් ඔදුක්කප්පට්ටුළ්ළන.

[පි.ප. 3.03]

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(මාණ්ඩලික සි. ශ්‍රීදරන්)
(The Hon. S. Shritharan)
කෞරව තලෛමතාඩකුම් උරුප්පිනර් අවර්කළේ, இன்றைய தினம் மக்கள் விடுதலை முன்னணியினுடைய தலைவர் கௌரவ அநுரகுமார திசாநாயக்க அவர்களால் கொண්டුවරப்பட்டுள்ள நிதி நிறுவனங்கள் தொடர்பான விடயம் பற்றிய இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணையிலே கலந்து கொள்வதிலே மகிழ்ச்சியடைகின்றேன்.

இன்று இந்த நாட்டினுடைய பல்வேறுபட்ட இடங்களிலும் இந்த நிதி நிறுவனங்களுடைய தாக்கங்கள் இருந்தாலும், யுத்தத்துக்குப் பின்னரான காலப்பகுதியிலே குறிப்பாக, தமிழர்கள் வாழுகின்ற வடக்கு, கிழக்கு மாகாணங்களில் நுண்நிதிக் கடன்களுக்கூடாக மக்கள் பாரிய அளவிலே பாதிப்பைச் சந்தித்திருக்கிறார்கள். பல்வேறுபட்ட மக்களுடைய வாழ்க்கையிலே இது பெரிய தாக்கத்தைச் செலுத்தியிருக்கிறது. குறிப்பாக, குடும்பப் பெண்களை நோக்கியே இந்த நுண்நிதி நிறுவனங்கள் கடன்களை வழங்குகின்றபோதிலும், அக்கடன் களை அறவிடுவதில் மிகமோசமான நடவடிக்கைகளை மேற்கொள்கின்றன. குறிப்பாக, கடனை அறவிடுகின்றவர்கள் பயன்படுத்துகின்ற வார்த்தைகள், மக்களை அணுகுகின்ற முறைகள்கூட மிக மோசமானதாகக் காணப்படுகின்றன. இந்த நிலைமை வடக்கிலும் கிழக்கிலும் மிக மோசமானதாக இருந்த சூழலில், நுவரெலியா மற்றும் மலைநாட்டுப் பகுதிகளிலும் அம்பாந்தோட்டை போன்ற பகுதிகளில்கூட இதனுடன் சம்பந்தப்பட்ட பல மரணங்கள் சம்பவித்திருப்பதாக நாங்கள் செய்திகள்மூலம் அறிகின்றோம். இந்த நுண்நிதி நிறுவனங்களுடைய செயற்பாடுகள் நாடுபூராகவும் ஒரு பாரிய தாக்கத்தை ஏற்படுத்தியிருக்கிறது. நான் வாழுகின்ற கிளிநொச்சி மாவட்டத்தில் இதுவரை ஏறத்தாழ பெண்கள் 13 பேரும் மட்டக்களப்பு மாவட்டத்திலே 19 பேரும் இந்த நுண்நிதிக் கடன்களின் காரணமாகத் தற்கொலை செய்திருக்கிறார்கள். வடக்கு மாகாணத்தில் இதுவரை ஒட்டுமொத்தத்தில் 56 பெண்கள் இந்த நுண்நிதிக் கடன் காரணமாகத் தற்கொலை செய்திருக்கிறார்கள்.

கிளிநொச்சி மாவட்டத்திலே குறிப்பாக, மலையகத் திலிருந்து இடம்பெயர்ந்து வாழுகின்ற மக்களை நோக்கிய, குடும்பப் பெண்களை நோக்கிய இந்த நிதிப் பாய்ச்சல்கள், அவர்களுடைய பொருளாதார வல்லமையை இல்லாமல் செய்து, பல்வேறுபட்ட தாக்கங்களைக் குடும்பத்தில் ஏற்படுத்தக்கூடிய வகையிலே அமைந்திருக்கின்றன. இந்த நிதி நிறுவனங்களுடைய நடவடிக்கைகளை அடாவடித்தனங்கள் என்றுகூடக் கூறலாம். அவர்களுடைய மிலேச்சத்தனமான நடவடிக்கைகள் பல பெண்கள் கிணற்றிலே விழுந்து தற்கொலை செய்யக்கூடிய அளவுக்கு, தூக்குப் போட்டுத் தற்கொலை செய்யக்கூடிய அளவுக்கு அவர்களைத் தள்ளியிருக்கிறன. இந்தப் பணங்களை அறவிடச் செல்கின்றவர்களுக்கு ஒரு நேரகாலம் கிடையாது. காலை நான்கு மணிக்கே அங்கு சென்றுவிடுகிறார்கள் அல்லது இரவு பத்து மணி மட்டும் சம்பந்தப்பட்டவர்களுடைய வீட்டுக் "கேட்" களிலே நிற்கிறார்கள். இதனால், பிள்ளைகளோடு வாழ்ந்து கொண்டிருக்கின்ற இந்தப் பாதிக்கப்பட்ட மக்களுடைய வாழ்க்கை பெருமளவு பாதிப்பைச் சந்திக்கின்றது.

2009ஆம் ஆண்டு யுத்தம் மௌனிக்கப்பட்டதன் பிற்பாடு, கூடுதலாக மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய தலைமையிலான அரசாங்கம் ஒரு கையால் உட்கட்டுமானங்களுக்கான நிதிப் பாய்ச்சல்களை வடக்கிலும் கிழக்கிலும் வாழுகிற மக்களிடம் தள்ளியது. இன்னொரு கையால் வாழ்வாதாரம் என்ற பெயரிலே அந்த மக்களிடம் நிதியைப் பாயவிட்டது. "போரிலே பாதிக்கப்பட்ட மக்களுடைய மனநிலைகளை மாற்றி, அவர்களை இயல்பு வாழ்க்கைக்குக் கொண்டு வருகிறோம்; அவர்களுடைய வாழ்க்கையிலே மாற்றங்களைக் கொண்டு வருகிறோம்" என்ற அடிப்படையில்தான் உட்கட்டுமானம் என்ற வகையில் ஒரு கையாலும், வாழ்வாதாரம் என்ற வகையில் இன்னொரு கையாலும் மஹிந்த ராஜபக்ஷ அரசினால், வடக்கு, கிழக்கில் வாழுகிற மக்களிடம் இந்த நிதிகள் பாயவிடப்பட்டன. ஆனால், அவ்வாறான நிதிப் பாய்ச்சல் அந்த மக்களுடைய வாழ்க்கையிலே மாற்றங்களைக் கொடுக்கவில்லை. மாறாக, தோல்வியின் விளிம்பிலே இருந்த மக்கள், போரால் பாதிக்கப்பட்ட மக்கள் தங்களுடைய வாழ்க்கையைக் கொண்டு செல்ல முடியாது திணறினார்கள்.

ஏன், அவர்கள் இந்தக் கடன்களை வாங்குகிறார்கள்? அதற்கான காரணம் என்ன? யுத்தத்திலே முழுவதும் அழிந்ததன் பிற்பாடு, மீளக்குடியேறி வாழுகின்ற மக்களுக்கு வீடுதான் அத்தியாவசியமாகத் தேவைப்படும். அந்த வகையில் அங்கு ஒரு வீட்டைக் கட்டுவதற்காக அரசாங்கம் முதலிலே மூன்றேகால் இலட்சம் ரூபாய்களை வழங்கியது. பின்னர், ஐந்தேகால் இலட்சங்களை வழங்கியது. அதன் பின்னர் அது ஏழு இலட்சங்களாக மாறியது. இப்பொழுது எட்டு இலட்சங்களாக இருக்கின்றது. ஆனால், இன்னும் அந்த எட்டு இலட்சத்தைத் தாண்டவில்லை. ஆனால், சாதாரணமாக 500 அல்லது 600 சதுர அடிப் பரப்பளவுடைய வீடொன்றை அமைப்பதற்கு இந்தப் பணம் போதாது. மக்கள் இதற்கான கடன்களை பெறுகிறார்கள். இந்தக் கடன்களை மத்திய வங்கியினுடைய கட்டுப்பாட்டின்கீழ் இருக்கின்ற நிதி

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

நிறுவனங்களிடமிருந்தும் அதன் கட்டுப்பாட்டின்கீழ் இல்லாதவர்களிடம் இருந்தும் பெறுகிறார்கள். இந்நிலையில் குறிப்பாக, கம்பனிச் சட்டத்துக்குக்கீழ் பதிவு செய்யப்பட்ட இலங்கையிலுள்ள அரலிய, சில்வா போன்ற கம்பனிகள் நூற்றுக்கு நூறு வீதம் வட்டியைப் பெற்றுக் கொள்கின்றன.

சாதாரணமாக பெண் தலைமைத்துவக் குடும்பங்களைச் சேர்ந்த பெண்ணிகளிடம் 5,000 ரூபாய் பணத்தைக் கடனாக வழங்குகின்றார்கள். இரண்டு மாதத்திலே அந்தக் கடனை அவர்கள் திருப்பிச் செலுத்த வேண்டும். ஒரு நாளைக்கு 200 ரூபாய்ப்படி அவர்கள் செலுத்தவேண்டும். "இந்த 5,000 ரூபாய்மூலம் எங்களது உடனடித்தேவையை நாங்கள் பூர்த்தி செய்கின்றோம்தானே! அதற்காக ஒரு நாளைக்கு 200 ரூபாய்தானே செலுத்துகின்றோம்" என்று அந்தப் பெண்கள் நினைக்கின்றார்கள். ஆனால், இரண்டு மாதங்களிலே - 60 நாட்களிலே 200 ரூபாய் வீதம் 12,000 ரூபாய் பணத்தை அந்த நிதி நிறுவனம் பெற்றுக் கொள்கின்றது. ஆனால், எவ்வளவு மோசமான பகற்கொள்ளையை இந்த நிறுவனங்கள் செய்கின்றன? அதேநேரம் குறிப்பாக, மட்டக்களப்பிலோ, கிளிநொச்சியிலோ, யாழ்ப்பாணத்திலோ இந்த நிறுவனங்கள் இருக்கவேண்டும் என்பது அவசியமில்லை. அதாவது அவர்கள் வேறொரு மாவட்டத்திலே இருப்பார்கள். அங்கிருந்து இந்தக் கடனை வழங்குவார்கள்; இவர்களுக்கும் மத்திய வங்கிக்கும் எந்தச் சம்பந்தமும் இருக்காது. இந்த நுண்நிதி நிறுவனங்கள் கிராமத்துப் பெண்கள்மீது, போரால் பாதிக்கப்பட்டவர்கள்மீது மிகக் கொடுமையான முறையிலே நடவடிக்கை மேற்கொள் கின்றன. இன்றையதினம் இந்த ஒத்திவைப்புவேளைப் பிரேரணையை ஜே.வீ.பீ தலைவர் கௌரவ அநுர திசாநாயக்க அவர்களினால் கொண்டுவரப்பட்டதை நான் ஒரு நல்ல சகுனமாகப் பார்க்கின்றேன்.

குறிப்பாக, யாழ்ப்பாண மாவட்டத்திலே மக்களுடைய தொகை அண்ணளவாக 6 இலட்சம். இந்த 6 இலட்சம் மக்கள் வாழ்கின்ற இடத்திலே 136 வங்கிக் கிளைகள் உள்ளன. இது சாதாரண விடயமல்ல. அதேபோல் ஒன்றரை இலட்சம் மக்கள் வாழ்கின்ற கிளிநொச்சி மாவட்டத்திலே 24 வங்கிக் கிளைகளும் 1,65,000 மக்கள் வாழ்கின்ற மன்னார் மாவட்டத்தில் 23 வங்கிக் கிளைகளும் 1,35,000 மக்கள் வாழ்கின்ற முல்லைத்தீவு மாவட்டத்திலே 21 வங்கிக் கிளைகளும் 1,80,000 மக்கள் வாழ்கின்ற வவுனியா மாவட்டத்திலே 27 வங்கிக் கிளைகளும் அமைந்துள்ளன. இது வங்கி அடர்த்தி! பொருளியலிலே வங்கி அடர்த்தி என்பது முக்கியமான பங்கை வகிக்கின்றது. இலங்கை பூராகவும் இருக்கின்ற மக்களினது தொகையின் அடிப்படையில் வங்கியினுடைய அடர்த்தி 1 இலட்சம் மக்களுக்கு 17 ஆகக் காணப்படுகின்றது. ஆனால், வடக்கு மாகாணத்திலும் கிழக்கு மாகாணத்திலும் இருக்கின்ற மாவட்டங்களில் உள்ள மக்களில் 1 இலட்சம் மக்களுக்கு 23 வங்கிக் கிளைகள் காணப் படுகின்றன. அப்படியானால், அரசாங்கத்தின் நிகழ்ச்சிநிரலின்கீழ் இருக்கின்ற வங்கிகள் என்ன அடிப்படையில் இவ்வளவு கிளைகளை வைத்திருக்கின்றன. வடக்கையும் கிழக்கையும் தவிர்த்துத் தென்பகுதியைப் பார்த்தால், எத்தனையோ ஆடைத்தொழிற்சாலைகள், எத்தனையோ வகையான தொழிற்சாலைகள், வேலைவாய்ப் புக்கள், அரச வேலைவாய்ப்புக்கள் இருக்கக்கூடியதாக, 1 இலட்சம் மக்களுக்கு 17 வங்கிக் கிளைகள்தான் இருக்கின்றன. எந்தத் தொழிற்சாலைகளும் இல்லாத, அரச துறையிலும் அதிகுறைந்த உத்தியோகத்தர்களைக் கொண்ட, யுத்தத்தால் முழுமையாகப் பாதிக்கப்பட்ட கிழக்கிலும் வடக்கிலும் வாழ்கின்ற மக்களில் 1 இலட்சம் மக்களுக்கு 23 வங்கிக் கிளைகள் இருக்கின்றன என்றால், அது அரசாங்கத்தால் திட்டமிட்டுச் செய்யப்படுகின்ற அதாவது அவர்களுடைய பொருளாதாரத்தை உறிஞ்சுகின்ற ஒரு பயங்கரமான செயற்பாடாகவே பொருளியல் ஆய்வாளர்களால் பார்க்கப்படுகின்றது. இது மிக மிக அபாயகரமானது; இது இந்த நாட்டிலே இடம்பெறுகின்ற மிக மோசமான ஒரு காரியம்.

இவற்றைவிட leasing கம்பனிகள் இருக்கின்றன. வடக்கு மாகாணத்தில் மட்டும் 23 குத்தகைக் கம்பனிகளுடைய 70 கிளைகள் மத்திய வங்கியின் கட்டுப்பாட்டுக்குக்கீழ் இருக்கின்றன. அதாவது மத்திய வங்கியின் கட்டுப்பாட்டுக் குக்கீழ் இல்லாத அரலிய, சில்வா போன்ற நிறுவனங்களைத் தவிர்த்து 70 கிளைகள் உள்ளன. இந்த நிதி நிறுவனங்களின் முழுமையான கவனமும் மக்களிடம் இருக்கின்ற பணத்தை உறிஞ்சுவதிலே செலுத்தப்படுகின்றது. உதாரணமாக, இந்த மக்கள் ஒரு Android phone ஐ வாங்குவதற்காகக் கடன்படுகின்றார்கள், ஒரு மோட்டார் சைக்கிள் வாங்குவதற்காகக் கடன்படுகின்றார்கள், ஒரு வீட்டைக் கட்டுவதற்காகக் கடன்படுகின்றார்கள், வீட்டுக்கான சில தளபாடங்களை வாங்குவதற்காகக் கடன்படுகின்றார்கள். ஆனால், இவர்கள் வாங்குகின்ற இந்த Android phone அல்லது மோட்டார் சைக்கிள், வீடு, தளபாடங்கள் போன்றன எவையும் அவர்களுக்கு உழைத்துக் கொடுக்கின்ற - வருமானத்தை கொடுக்கின்ற பொருட்களல்ல. இதனால் இந்த மக்கள் தொடர்ந்தும் வட்டிக்கு மேல் வட்டியைக் கட்டி இந்த நிதி நிறுவனங்களுடைய - குத்தகைக் கம்பனிகளுடைய வலையிலே சிக்குண்டு சிதைந்துபோகின்ற ஒரு வாழ்க்கைப் பொருளாதாரத்தையே சந்திக்கின்றார்கள். இந்த வகையில் இந்த மக்கள் மிக அபாயகரமான - பயங்கரமான சூழலில் வாழ்கின்றார்கள்.

நீங்கள் மத்திய வங்கியினுடைய ஆண்டறிக்கையை பார்த்தால், 2009ஆம் ஆண்டுக்கு முதல் வடக்கு மாகாணத்தில் மொத்தமாகவே 70 வங்கிக் கிளைகள் மட்டுமே இருந்தன என்பது தெரிய வரும். கிழக்கு மாகாணத்தில் 52 வங்கிக் கிளைகள் மட்டுமேயிருந்தன. ஆனால், 2009க்கு பின்னர் வடக்கு மாகாணத்தில் 250 வங்கிக் கிளைகள் உருவாக்கப்பட்டிருக்கின்றன, கிழக்கு மாகாணத்தில் 212 வங்கிக் கிளைகள் உருவாக்கப்பட்டிருக்கின்றன. அப்படியானால் அதன் நோக்கம் என்ன? தொழில் இல்லாத, பொருளாதாரம் கிடைக்காத, யுத்தத்தால் அழிந்த மக்கள் வாழும் பிரதேசங்களில் இவ்வளவு வங்கிக் கிளைகளும் என்ன அடிப்படையிலே உருவாக்கப்பட்டிருக்கின்றன? இது இலங்கையிலே இருக்கின்ற மக்களிடம் மிக மோசமான ஒரு நிலைமையை உருவாக்கியிருக்கின்றது; பொருளாதாரத்திலே பாரிய தாக்கத்தைச் செலுத்தியிருக்கின்றது.

இலங்கையிலே ஒரு வங்கியோ அல்லது நிதி நிறுவனமோ கடன் வழங்குவதென்றால், விவசாயத்துக்காக அல்லது கைத்தொழிலுக்காக அல்லது ஒரு சேவைத்துறைக்காக அதாவது வியாபாரம், கடைகள் போன்றவற்றுக்கு வழங்கும். இவ்வாறு இலங்கையில் பிரதானமான 3 துறைகளுக்கு - விவசாயம், கைத்தொழில், சேவைத்துறை -கடன்கள் வழங்கப்படுகின்றன. அந்த உற்பத்திக்கான அறுவடையின் போது- அதன் பயன் பெறப்படுகின்றபோதுதான் அந்தப் பணத்தை recover- மீளப்பெற முடியும். ஆனால், இந்த நிதி நிறுவனங்கள் அவ்வாறு செய்வதில்லை. அதாவது இன்றைக்குக் கடனை வழங்கி, நாளைக்கே வட்டியோடு அதனுடைய முதலாவது கட்டுப்பணத்தை மீளப்பெறுகின்றன.

அப்படியென்றால் மக்களின் வாழ்க்கை எங்கே செல்லும்? கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இதுதான் இந்த நாட்டிலுள்ள ஏழை மக்கள் மட்டுமல்ல, பாதிக்கப்பட்ட மக்களின் வாழ்க்கையிலே பாரிய பாதிப்பை ஏற்படுத்திக் கொண்டிருக்கின்றது. அண்மையில்கூட யாழ்ப்பாணத்திலே mobile phone வாங்கித் தரவில்லையென்பதற்காக ஒரு மாணவன் தற்கொலை செய்திருக்கின்றான்; குழந்தையில்லை என்பதற்காக 35 வயதான இளம் தாய் தற்கொலை செய்திருக்கின்றார். அராய்ந்து பார்த்தால், இந்தத் தற்கொலைகளின் பின்னணியில் நிதி நிறுவனங்களின் தாக்கங்கள் இருப்பது தெரியவரும்; இதன் பின்னால் இருக்கின்ற விடயங்கள் புலப்படும்.

பொருளியல் ரீதியாக இந்த நிதிப் பாய்ச்சல்களில் இரண்டு விடயங்கள் மேலோங்கியிருக்கின்றன. ஒன்று நிதி நிரம்பல் பக்கம்; மற்றையது, நிதியின் கேள்விப் பக்கம். அரசாங்கமும் அரச வங்கிகளும் நிதியை நிரம்பல் செய்கின்றன. அதேநேரத்தில் கேள்வியின் பக்கம் உள்ள மக்கள் இதனால் திண்டாடிப் போகின்கிறார்கள்; திணறிப் போகின்றார்கள். ஆகவே, அரசாங்கம் தன்னுடைய நிரம்பலை அதிகரிக் கின்றபோதெல்லாம், பணரீதியாகத் தாள், சில்லறை நாணயங்களை அதிகரிக்கின்றபோதெல்லாம் கம்பனிகளை எல்லாம் பாயவிடுகின்றபோது, பணப் பாய்ச்சல் என்பது இந்த மக்களிடம் பாரியளவு தாக்கத்தைக் கொடுத்திருக்கின்றது. இதனால்தான் இந்த நிதியின் கேள்வியின் பக்கமுள்ள மக்கள் கடுமையாகப் பாதிக்கப்படுகின்றார்கள்.

குறிப்பாக அங்கு நடைபெற்ற யுத்தம் அந்த மக்களிடத்தில் பல்வேறு தாக்கங்களைச் செலுத்தியிருக்கின்றது. உதாரணமாக, யுத்த காலத்தில் ஒருவர் 4 இலட்சம் ரூபாய்க்கு ஒரு வீட்டை வாங்கியிருக்கின்றார் என்றால், இப்பொழுது அந்த வீட்டின் பெறுமதி 4 கோடி ரூபாய். அதேநேரத்தில் அந்த யுத்தத்தில் ஈடுபட்ட, 30 ஆண்டுகள் யுத்தத்திலே பங்குபற்றிய போராளி ஒருவர் 4 சதம்கூட இல்லாமல் வெளியிலே நிற்கிறார். அதாவது யுத்தம் இரண்டு பரிசுகளைக் கொடுத்திருக்கின்றது. முதலாவது யுத்தம் நடக்கின்றபோது 4 கோடி ரூபாய் பெறுமதியான வீட்டை 4 இலட்சத்திற்கு வாங்கிய ஒருவர் இன்று 4 கோடி ரூபாயோடு இருக்கிறார். இரண்டாவது, அதே யுத்தத்தில் ஈடுபட்ட, 30 வருடங்கள் போராடிய போராளி ஒருவர் 4 சதமில்லாமல் வெளியிலே நிற்கிறார். இந்த இரண்டுக்குமிடையே இருக்கின்ற பொருளாதார வீக்கம் - பொருளாதார வீச்சு வேறுபட்ட மனநிலையைக் கொடுக்கின்றது; பாரியளவு தாக்கங்களைச் செலுத்துகின்றது. இது அந்த மக்களுக்கிடையிலே சமூக வேறுபாடுகளில், பொருளாதார வேறுபாடுகளில் பயங்கரமாகத் தாக்கம் செலுத்தி வருகின்றது. ஆகவே, இந்தக் கடன் பிரச்சினையைத் தீர்ப்பதற்கு இரண்டு வகைகளிலே அரசாங்கம் முன்வர வேண்டும். அந்தக் கடன்களை இல்லாமற்செய்ய வேண்டும் அல்லது நீக்க வேண்டும். குறிப்பாக, கடன் மன்னிக்கப்பட வேண்டும். அந்த மக்களிடமிருந்து இந்தக் கடன்களை மீளப்பெறாமல், மன்னிக்கப்பட்டு அந்த மக்கள் விடுவிக்கப்பட வேண்டும் அல்லது இந்தக் கடனைச் செலுத்துவதற்கு ஏனைய வங்கிகளுடைய வட்டி வீதத்திற்கு ஏற்ற வகையிலே மிக அதிக அளவில் வட்டி குறைக்கப்பட்டுக் கால அவகாசமும் வழங்கப்பட வேண்டும்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நிதி நிறுவனங்களினுடைய தாக்கங்களால் நான்கு வகையான குடும்பங்கள் பாதகத்திற்கு உள்ளாகியிருக்கின்றன. முதலாவது, பெண்களைத் தலைமைத்துவமாகக் கொண்ட குடும்பங்கள். இரண்டாவது, முன்னாள் போராளிகளுடைய குடும்பங்கள். மூன்றாவது, மாற்று வலுவுடையோரது குடும்பங்கள். நான்காவது, வலிந்து காணாமலாக்கப்பட்டோரது குடும்பங்கள். நான்கு வகையான குடும்பங்களைச் சேர்ந்தவர்களும் நுண் நிதி நிறுவனங்களுடைய கடன்களால் அவர்களுடைய வருமானத்தில் பாரிய அளவிலான தாக்கங்கள் ஏற்பட்டிருக்கின்றன. யுத்தம் தந்த பரிசினூடாக இந்த மக்கள் தங்களுடைய பொருளாதாரங்களை இழந்தது மட்டுமல்லாமல், தங்களுடைய வாழ்க்கையில் பெருமளவான பாதிப்புக்களையும் கண்டிருக்கின்றார்கள். இது தொடர்பாக வடக்கிலும் கிழக்கிலும் பல அரச சார்பற்ற நிறுவனங்கள் போராட்டங் களை நடாத்தியிருக்கின்றன. சென்ற வாரம்கூட கிளிநொச்சி மாவட்ட அரச சார்பற்ற மற்றும் சிவில் சமூக அமைப்புக்களின் சம்மேளனம் கிளிநொச்சியிலிருக்கின்ற மத்திய வங்கியின் பிராந்திய அலுவலகத்திற்குச் சென்று தங்களுடைய கோரிக்கைகளை முன்வைத்திருக்கின்றது.

குறிப்பாக இரண்டு விடயங்களை அவர்கள் பிரதானமாகக் குறிப்பிட்டிருக்கின்றார்கள். முதலாவது, கடன்பொறிக்குள் சிக்கித் தவிக்கும் எம்மவர்களுக்குக் கடனைச் செலுத்துகின்ற காலத்தை இரண்டு வருடங்களுக்குப் பிற்போட்டு அதற்கான வட்டியை இரத்துச் செய்து, மீளச் செலுத்தும் வசதியினை ஏற்படுத்திக் கொடுத்தல். அத்துடன், கடனை மீளச் செலுத்துவதற்கான சரியான வருமான மூலத்தைப் பெற்றுக் கொள்வதற்கான வாழ்வாதார முயற்சிக்கான சரியான வசதியினை ஏற்படுத்திக் கொடுத்தல். இரண்டாவது, கடன்களை உரிய நேரத்தில் திருப்பிச் செலுத்த முடியாமல் வட்டிக்கு வட்டி கொடுத்து - எடுத்த கடன் தொகைகளுக்கு மேலாக வட்டி கட்டிக்கொண்டு அவதிப்படும் மக்களின் கடன்களை உடனடியாக இரத்துச் செய்து, அவர்களைக் கடன் சுமையிலிருந்து விடுவித்தல். மூன்றாவது, நுண் நிதிக் கடன் நிறுவனங்களின் அதிகூடிய வட்டி வீதத்தினை உடனடியாகக் குறைத்து 10 - 12 சதவீதத்திற்கு உட்பட்ட ஆண்டு வட்டிக்கு கடன்களை வழங்க நடவடிக்கை எடுத்தல். நான்காவது, அரச வங்கிகளுக்கூடாகக் குறைந்த வட்டி வீதத்திற்குக் கடன்களை வழங்கும் திட்டங்களைப் போதியளவு மேற்கொள்வதற்கான நிதியை ஆண்டுதோறும் ஒதுக்கீடு செய்வதன்மூலம் தனியார் நிதி நிறுவனங்களின் பிடியிலிருந்து மக்கள் விடுபட்டு, தமது கடன் தேவைகளை அரச வங்கிகளினூடாகப் பூர்த்தி செய்ய நடவடிக்கை எடுத்தல். ஐந்தாவது, சமூக மட்டத்தில் இயங்கும் நுண் நிதி அமைப்புக்களான மாதர் கிராம அபிவிருத்திச் சங்கம், சுய உதவிக் குழுக்கள் மற்றும் பெண்கள் கூட்டுறவு அபிவிருத்திச் சங்கங்களின் நுண் நிதிச் செயற்பாடுகளுக்கு நிதியுதவி அளிப்பதன்மூலம் குறைந்த வட்டி வீதத்தில் சமூகங்களுக்குள்ளேயே கடன் பெறும் வசதியினை ஊக்கப்படுத்தல். இவ்வாறு 73 இற்கும் மேற்பட்ட சமூகமட்ட அங்கத்தவர்களைக் கொண்ட இந்த அமைப்பு தன்னுடைய கோரிக்கையை மத்திய வங்கியினுடைய ஆளுநரிடம் முன்வைத்திருக்கின்றது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நான் ஏன் அவர்களுடைய கோரிக்கையை முன்வைக்கின்றேனென்றால், இன்று இந்த மக்கள் விழித்திருக்கின்றார்கள். அன்று பாரியளவான யுத்தம் தந்த தாக்கத்தினால் இந்த மக்களுடைய வாழ்க்கையில் ஏற்பட்ட பாதிப்பைவிட இன்று இந்த மக்கள் இயல்பான வாழ்க்கையிலே மீள முடியாத அளவுக்குப் பாதிக்கப்பட்டிருக்கின்றார்கள்.

கிளிநொச்சியைச் சேர்ந்த பல பெண்கள் என்னிடம் வந்து இது சம்பந்தமாகக் கூறிக் கண்ணீர் விட்டு அழுதிருக்கிறார்கள். அதாவது இந்தக் கடனை மீளப் பெற வருபவர்கள் மாலை 7 - 8 மணிக்கு வீட்டு வாயிலிலே நின்று வற்புறுத்துகிறார்கள்; அவர்கள் பேசுகின்ற வார்த்தைகள் மிகக் கேவலமானதாக

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

இருக்கின்றன. அவர்களில் ஒருவர் ஒரு தாயிடம், "உன்னிடம் கடன் கட்ட பணம் இல்லையென்றால் உன்னுடைய மகளை என்னோடு அனுப்பிவிடு" என்றுகூட கேட்டிருக்கிறார்! இந்த நுண் நிதி நிறுவனங்கள் இவ்வளவு மோசமான நிலையிலே காணப்படுகின்றன. அந்த நிறுவனங்கள் ஏழை மக்களுடைய வாழ்க்கையை, கௌரவத்தை, அந்தஸ்தைக்கூடக் கேள்விக் குள்ளாக்கியிருக்கிறது; அந்த மக்களை வாழவிடாமல் தடுத்திருக்கிறது. இதிலே அரசாங்கம் கூடிய கவனம் செலுத்த வேண்டும்; இவர்களின் பிரச்சினையைத் தீர்த்து வைப்பதில் கூடியளவான பங்களிப்புச் செய்ய வேண்டும். கௌரவ நிதி அமைச்சர் அவர்கள் இது பற்றி விசாரிக்கவென ஒரு குழுவை அமைத்து, அதற்கு நடவடிக்கை மேற்கொள்வதாகக் கூறியிருக்கின்றார். குழு அமைப்பது மட்டுமல்லாமல், அந்த மக்களுக்கு உடனடி நிவாரணம் வழங்கப்பட வேண்டும். அந்த மக்கள் உடனடியாக அதிலிருந்து விடுவிக்கப்படவேண்டும். அவர்களுடைய வாழ்க்கையிலே மாற்றம் வேண்டும். யுத்தத்தால் பாதிக்கப்பட்ட, வடக்கிலும் கிழக்கிலும் கண்ணீரோடு வாழ்கின்ற, எதிர்காலம் பற்றிய நம்பிக் கையில்லாத அந்த மக்களுடைய வாழ்க்கையிலே மாற்றம் வேண்டும் என்றால், இந்த நுண்நிதிக் கடன்களிலிருந்து உடனடியாக அவர்களை அரசாங்கம் விடுவிக்கவேண்டும். ஆகவே, இதில் அரசாங்கம் உடனடியாகத் தலையிட வேண்டும்.

ஏற்கனவே விடுதலைப் புலிகள் இருந்த காலத்தில் தமிழீழ வைப்பகத்தில் மக்கள் அடைவு வைத்த நகைகளை, வைப்புச் செய்த பணங்களை அரசாங்கம் அரசுடமையாக் கியிருக்கின்றது. பல மக்கள் இன்றும் அந்த ரசீதுகளோடு இருக்கின்றார்கள். அந்த நகைகள் மஹிந்த ராஜபக்ஷவின் காலத்தில் ஓர் ஒப்புக்குக் கொஞ்சப் பேருக்கு வழங்கப்பட்டன. ஆனால், இன்னும் முழுமையாக வழங்கப்படவில்லை.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
உங்களுக்கு இன்னும் ஒரு நிமிடம் இருக்கின்றது.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
இரண்டு நிமிடங்கள் தாருங்கள்!

அதேபோல் தமிழர் புனர்வாழ்வுக் கழகம் இலங்கையினுடைய பல வங்கிக் கிளைகளிலே தன்னுடைய நிதியை முதலீடு செய்திருந்தது. அவற்றையெல்லாம் அரசாங்கம் தன்னுடைய சொத்தாக மாற்றியிருக்கின்றது. வடக்கிலும் கிழக்கிலும் வாழ்ந்த தமிழ் மக்களுடைய பணமும் அவர்களுடைய சொத்துக்களும் அரசாங்கத்தினுடைய வைப்பிலேயிருக்கின்றது. ஆனால், இன்று அந்த மக்கள் வேலைவாய்ப்பின்றி - தொழிலின்றி, நுண்நிதி நிறுவனங்களுக் கூடாகவும் வீக்கம் பொருந்திய வங்கிகளுக்கூடாகவும் தங்களுடைய வாழ்க்கையைக் கொண்டுசெல்ல முடியாமல் திணறுகின்றார்கள். இது அபாயகரமானது. அரசாங்கம் இந்தச் செயற்பாடுகளைத் திட்டமிட்டுச் செய்கின்றதா? ஏன் வடக்கிலும் கிழக்கிலும் அரசாங்கம் இவ்வாறான செயற்பாடுகளை மேற்கொள்கின்றது? இதனால் அந்தப் பிரதேசம் பெருமளவிலே பாதிக்கப்பட்டிருக்கின்றது. இந்த விடயங்களுக்குப் பதில் கூறவேண்டிய கடமை அரசிற்கிருக்கின்றது. ஆகவே, இந்த வடக்கிலும் கிழக்கிலும் வாழ்கின்ற மக்களுடைய வாழ்க்கையில் விடிவு ஏற்படுவதற்கு உடனடித்தீர்வு கொண்டுவரப்பட வேண்டும் என்பதை வலியுறுத்தி, இன்றைய தினம் ஒத்திவைப்புவேளைப் பிரேரணையிலே பேச வாய்ப்புத் தந்தமைக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
நன்றி. ඊළඟට, ගරු වාසුදේව නානායක්කර මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම, ගරු ලකී ජයවර්ධන මහතාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මේ අවස්ථාවේ ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මම යෝජනා කරනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு வேலு குமார் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. VELU KUMAR *left the Chair, and* THE HON. LUCKY JAYAWARDANA *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථා කරන්න.

[අ.භා. 3.24]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සියදිවි නසා ගැනීම අපරාධයක්. නමුත් ඒ අපරාධයට දඬුවම් කරන්න බැහැ. සිය දිවි නසා ගැනීමට තැත් කිරීමත් අපරාධයක්. ඒ වාගේම එයට දඬුවම් කළ හැකියි. සිය දිවි නසා ගැනීමට පෙලඹවීම, ඒකත් අපරාධයක්. මේ සභාව කල්තැබීමේ විවාදයේදී අපට අහන්න ලැබුණා, කොම්පැනිවල තැන්පතු දාලා 50 ගණනක් දෙනා සිය දිවි නසා ගෙන තිබෙනවා කියලා. ඒ තැන්පතු හිරවෙලා. ඒ තැන්පතු ගන්නත් බැහැ. පොලී ගන්නත් බැහැ. තමන් අනාථ වෙලා. තමන්ට බෙහෙත් ටික ගන්න බැහැ. තමන්ගේ දරුවාගේ මඟුල කර ගන්න බැහැ. මේ විධියට හැම අතින්ම හිර වෙච්ච මිනිස්සු එක විසඳුමයි හොයා ගන්නේ. ඒ තමයි සිය දිවි නසා ගැනීම. සිය දිවි

නසා ගන්න මිනිසුන්ගේ අවතාර මේ කොම්පැනිකාරයින්ටත්, කොම්පැනිකාරයන්ට මෙහෙම අනුබල දීපු මහ බැංකුවටත්, මහ බැංකුවේ ප්‍රධාන උදවියටත් පෙනෙන්න පටන් ගනීවි. එහෙම නැත්නම් අපි කාටත්, 'ඒක දෙවියන්ගේ කැමැත්ත' කියලා අහක බලාගන්නත් පුළුවන් වේවි.

මේ රට ණය උගුලක හසු වෙලා තිබෙනවා කියා කිසිම මුදල් ඇමති කෙනෙක් සිය දිවි නසා ගන්නේ නැහැ. "අයියෝ, මේ ලංකාව ණය උගුලකට හසු වෙලා තිබෙනවා! ඒ මුදල් අය වැයෙන් පියවන්න මට බැහැ" කියා කිසිම මුදල් ඇමති කෙනෙක් සිය දිවි නසා ගන්නේ නැහැ. ඒ මොකද? ඒවා ඔහුගේ මුදල් නොවන නිසා. එහි බරක් ඔහුට නැහැ. ඒ වාගේ මේ මූල්‍ය සමාගම් ගැනත් මම කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Edirisinghe Trust Investments සහ ස්වර්ණමහල් මූල්‍ය සේවා සමාගම ආදි මූල්‍ය සමාගම්වල තැන්පත්කරුවන්, අනෙක් පැත්තෙන්, Central Investment and Finance - CIFL කියන කොම්පැනියේ තැන්පත්කරුවන් කියන දෙගොල්ලන්ට අදාළවයි මම මගේ කතාව කරන්නේ. ඒ තැන්පත්කරුවන්ගෙනුත් සැලකිය යුතු පිරිසක් සිය දිවි නසා ගත් අය අතරේ ඉන්නවා. මේ කාරණය නිසා අනාථ වූ අය, තමන්ට සමාජයට මුහුණ දෙන්න බැරිව ජීවිතය විනාශ කරගන්නේ නැති වුණත් ගෙවල් දොරවල් අත් හැර පැන ගිය අය ඉන්නවා. මේවා සමාජ ව්‍යසන බවට පත් වෙලා. උතුර සහ නැඟෙනහිර පළාත්වල, එහෙම නැත්නම් දකුණේ ඈත ගම්මානවල ක්ෂුද්‍ර මූල්‍ය ණය ක්‍රම යටතේ ණය අරගෙන ගෙවා ගන්න බැරිව, තමන්ගේ ගෙවල්වල බඩු මුට්ටු අල්ලන්නට නීතියේ වරෙන්තුවකුත් අරගෙන එන කොට එයට මුහුණ දෙන්න බැරිව සිය දිවි නසා ගත් අයත් ඉන්නවා. එවැනි අය උතුරු මැද පළාතේ විශාල වශයෙන් ඉන්නවා. මොකද, ඒ අයට කන්න දෙකක තුනක අස්වනු නැති වෙලා ගියා. එක් පැත්තකින්, කන්න දෙක තුනක අස්වනු නැති වෙලා යනවා; අනෙක් පැත්තෙන්, හැම කන්නයකම ණය ගන්නවා, "ඊළඟ කන්නයේ හරි යාවි" කියා. ඊළඟට ඒ කන්නයත් පාළු වෙලා ගිහින් ණය ගෙවා ගන්න බැරි වනවා. කෘෂිකර්ම නිලධාරි මහත්තුරු ඇවිල්ලා කියනවා, "මේ නියඟය කාලේ. දැන් වී වවන්න බැහැ, ඔයගොල්ලෝ වට්ටක්කා වවන්න" කියා. ඔන්න සියලුදෙනාටම බීජ දීලා වට්ටක්කා වවනවා. ඊළඟට වට්ටක්කා අස්වැන්න එනවා, ගොඩ ගොඩවල්. ඒවා විකුණාගන්න බැහැ. ආයෙමත් මොකක්ද, උත්තරය? කලින් ගත් ණය ගෙවා ගන්නත් බැහැ, වට්ටක්කා සිටුවන්න ගත් ණය ගෙවා ගන්නත් බැහැ, වට්ටක්කා විකුණාගන්නත් බැහැ. ඉතින් සිය දිවි නසා ගැනීම තමයි ඒ ප්‍රශ්නයෙන් මිදෙන්න ලේසිම මාර්ගයක් වෙලා තිබෙන්නේ. එහෙම නොවුණොත්, අන්තිමට ණයකාරයන් හැටියට තමන්ගේ ගෙවල් දොරවල් සින්න වීම, තමන්ට උන් හිටි තැන් නැති වීම, තම පළාත්වල තමන් අවමානයට ලක් වී යෑම තමයි ඒ මිනිසුන්ට අත් වන ඉරණම. එය විශාල සමාජ ව්‍යසනයක්; විශාල සමාජ ප්‍රශ්නයක්. මේ සමාජ ව්‍යසන ප්‍රශ්නය ගැන ආණ්ඩුව සිතා තිබෙනවාද; මේ සඳහා කුමන වැඩ පිළිවෙළක් සිතා තිබෙනවාද? "Enterprise Sri Lanka" කියා වැඩ පිළිවෙළක් ගැන අපට පසුගිය අය වැයේදී අහන්න ලැබුණා. ඒ මඟින් කිව්වා, "මේ ගිනි පොලීකාරයන්ට, මේ ණය කාක්කන්ට, මිනිසුන්ගෙන් තැන්පතු අරගෙන ඒ තැන්පතු වංචා කරන හොරු රැළට උත්තරයක් තිබෙනවා. ඒ තමයි, "Enterprise Sri Lanka" කියලා. ඒ ගැන කිව්වේ ගිය නොවැම්බරයේ සහ දෙසැම්බරයේ. "Enterprise Sri Lanka" එන්නේ දැන්. ඔන්න ඊයේ පෙරේදා පත්තරවල තිබුණා, "Enterprise Sri Lanka" එනවා කියා. "Enterprise Sri Lanka" ආවාම මොකද වෙන්නේ? එහි කියන්නේ ඇපයක් නැතිව ණය දෙනවා කියලායි. ඇපයක් නැතිව ණය දෙන එක ගැන නීතිපති කාර්යාලයේ දීර්ඝ සාකච්ඡාවක් යමින් තිබුණා. දැන් කොහොම හෝ ඇපයක් නැතිව, ඇපකරයක් නැතිව, ඇපකරුවකු නැතිව ණය දෙන තැනකට ඇවිත් තිබෙනවා නම් කරන්න යන කාර්ය කුමක්ද කියා සොයා බලා, එහි තිබෙන වටිනාකම තක්සේරු කරලා ඒ අනුව මේ ණය දෙන්න පුළුවන්. එහෙම හිතලා මේ ණය දෙනවා නම් එහි වටිනාකමක් තිබෙනවා. නමුත් අපි තවමත් එබඳු ණය දෙන තෙක් බලාගෙන ඉන්නවා.

මීට ඉස්සර වෙලා අය වැය ලේඛනයක කෘෂි කාර්මික ක්ෂේත්‍රය වෙනුවෙන් "රන් අස්වැන්න" ආදී වශයෙන් ණය ක්‍රම ගණනාවක් යෝජනා කළා; ඇපකරයක් හා ඇපකරුවෙක් නොමැතිව මින්සුන්ට ණය දෙන්න. නමුත් ඒවා එකක්වත් ක්‍රියාත්මක කරන්න බැරි වුණා. ඇයි? ඒවා සියල්ල නීති ප්‍රශ්නවල හිර වෙලා තිබුණා. දැන් අපි හිතමු, ETI එකේ තිබුණු මගේ තැන්පතුවලට ජනවාරි මාසයේ කල් පිරිලා, දැන් මම ගන්න යනවා කියලා. ගියාම කියනවා, "දෙන්න එපා කියලා මහ බැංකුවෙන් කියා තිබෙනවා"ය කියලා. මගේ කල් පිරුණු තැන්පතුවේ මුදල මගේ අතට ගන්න එක මහ බැංකුව තහනම් කරලා තිබෙනවා. හේතුව, මුළු ETI පද්ධතියම අර්බුදයකට ලක් වීම නිසා ඇති වී තිබෙන නරක තත්ත්වය යටතේ operations නවත්වා තිබීම. ETI එකේ operations නවත්වා තිබෙනවා, මේ ජනවාරි මාසයේදී. ඉතින් ඒ operations නැවත්වලා, කල් පිරුණු තැන්පතුවල හිමිකම් ඇති අයට දෙන විසඳුම මොකක්ද? අනෙක් තැන්පතුවලට තව කල් තිබෙනවා නේ. ඒ තැන්පතුවලට තවම කල් පිරිලා නැහැ නේ. ඒ තැන්පතු ආපසු ඉල්ලනවා නම් ඒක වෙනම කාරණයක් නේ. එහෙම නම් මහ බැංකුවේ අධීක්ෂණය යටතේ හෝ මේ කල් පිරුණු තැන්පතුවලට අදාළ මුදල් ගෙවලා හමාර කරන්න කොච්චර මුදලක් යනවාද? ඒකට මුදල්, ද්‍රවශීලතාව, නැද්ද?

මම මේ පාර්ලිමේන්තුවට ආපු කාලයේම සිදුවුණු සිද්ධියක් මට මතකයි. මහ බැංකුවෙන් Mercantile Credit Ltd එකට සල්ලි දුන්නා, "මෙන්න, තැන්පතුකරුවන්ට ගෙවලා දමන්න" කියලා. ඒ සල්ලි මහ බැංකුවට නැවතත් ලැබුණාද, නැද්ද කියලා මම දැන ගන්න කැමැතියි. මේ මෑතකදීත් ආණ්ඩුවේ මුදල්, මහ බැංකුවේ මුදල්, නැත්නම් භාණ්ඩාගාරයේ මුදල්වලින් සමහර සමාගම්වල සමහර තැන්පතුකරුවන්ට ගෙවා තිබෙනවා. අපි කියන්නේ, ඒ විධියට, මේ කල් පිරුණු තැන්පතුවල ගෙවීම් කිරීමට මහ බැංකුව ඉදිරිපත් විය යුතුයි කියලායි. මහ බැංකුව එක පැත්තකින් සිය දිවි නසා ගැනීමට ඒ මිනිස්සු පෙලඹෙව්වා, නිසි අධීක්ෂණයක්, නිසි නියාමනයක් නැති නිසා. බොහෝ කාලයකට පෙර සිට මේ අනතුරුදායක තත්ත්වය ගැන වාර්තා ලැබුණා; රහස්‍ය වාර්තා ලැබුණා. 2009 වසරේ ඉඳලා ලැබෙනවා. නමුත් 2017 වසරේත් ඒ ගැන කරපු දෙයක් නැහැ. දැන් අපට කියනවා, "අපි දැනුම්දීම් කළා, ETI එකට විශේෂ නිවේදන යැව්වා, රතු නිවේදන යැව්වා, අනතුරු ඇඟවීම් කළා, ඒ මොකක්වත් ඒ මිනිසුන් ඇහුවේ නැහැ" කියලා. ඉතින් මේ විධියට තම වගකීමෙන් ඇඟ බේරා ගන්න මහ බැංකුවකට පුළුවන්ද?

අධීක්ෂණය කරනවා කියන්නේ, නියාමනය කරනවා කියන්නේ මොකක්ද? මහ බැංකුවම ඒකට එක්තරා විධියක විග්‍රහයක් දීලා තිබෙනවා, "අධීක්ෂණය කරනවා, නියාමනය කරනවා කියන්නේ තමුන්නාන්සේලාගේ මුදල් ආරක්ෂා කරනවා කියන එක නොවෙයි" කියලා. ඒක තමයි කියා තිබෙන්නේ. අධීක්ෂණය කරනවා කියන්නේ, නියාමනය කරනවා කියන්නේ තමුන්නාන්සේලාගේ මුදල් ආරක්ෂා කරනවා කියන එක නොවෙයි කියලා තැන්පතුකරුවන්ට කියලායි තිබෙන්නේ. ඉතින් අධීක්ෂණය කරනවා, නියාමනය කරනවා කියන එක තුළ යම් කිසි ආකාරයකට මේ කොම්පැනි අකාලයේ බංකොලොත් වීම වැළැක්වීමට, වැරදි කළමනාකරණය වැළැක්වීමට, ඒ

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

කොම්පැනිවල තැන්පත්කරුවන්ගේ මුදල් අවභාවිත කිරීම වැළැක්වීමට අධීක්ෂණයක් නැත්නම්, ඒක මොන මළ ඉලව් අධීක්ෂණයක්ද? හිතූ හිතූ හැටියට මිනිසුන්ගේ මුදල් තැන්පතු අරගෙන, හිතූ හිතූ හැටියට ඒවා තමන්ගේ අයුතු ලාභයට හරවා ගන්නට කොම්පැනිකාරයන්ට ඉඩකඩක් දීලා තිබෙනවා නම්, ඒක මොන බම්බු නියාමනයක්ද? ඒ නිසා "මහ බැංකුවේ අධීක්ෂණය හා නියාමනය" කියන කාරණය ගැන අපි මීට වඩා පැහැදිලි තැනකට එන්න ඕනෑ කියලා මම කියනවා.

ඒ, මුදල් මූල්‍ය සමාගම්. ඒ පොලීකාරයෝ නේ. ඒ ගොල්ලන්ට එච්චර නම්බු නාමයක් දීලා කථා කරන්න ඕනෑ නැහැ. ඒ අය පොලීකාරයෝ; සල්ලි විකුණන අය. ඒක තමයි අද ලෝකයේ තිබෙන හොඳම රස්සාව; සල්ලි විකුණන එක. ඒකට තියෙනවා, ණය වෙළෙඳ පොළ - debt market - කියලාත් එකක්. සල්ලි විකුණනවා. සල්ලිවලට අය කරනවා. මේක මේ අද තිබෙන ආර්ථික ක්‍රමයේ මූලිකාංගයක්. ඒකම තමයි අර සක්විති කළේ. එක එක විධියේ තරාතිරම්වල අය, එක එක විධියේ ස්වරූපයෙන්, එතරම් ගොරහැඩි නැති ආකාරයට, සමහරු තරමක් ගොරහැඩි ආකාරයට කරන්නේ එකම සූදුව. ඒ තමයි, මිනිසුන්ගේ සල්ලි අරගෙන ඒවා තමන්ගේ සාක්කුවේ දමා ගැනීම. එහෙම නැත්නම් මට පැහැදිලි කරන්න, ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමා.

මේ කොම්පැනි බංකොලොත්; මේ කොම්පැනි අසාර්ථකයි. නමුත්, ඒ කොම්පැනිවල අයිතිකාරයෝ සාර්ථකයි. මේ කොම්පැනි අසාර්ථකයි. මේ කොම්පැනිවල දැන් වත්කම් නැති වෙලා ගිහින්. වැඩිපුර ඉතිරි වෙලා තිබෙන්නේ බැරකම් - liabilities-. නමුත්, මේ කොම්පැනිවල අයිතිකාර මහත්වරු කිසිම අඩු පාඩුවක් නැතිව තමන්ගේ වත් පොහොසත්කම් වෙනත් වෙනත් ආකාරයට, වෙනත් වෙනත් තැන්වල පවත්වා ගෙන යනවා. මේ තත්ත්වය අපි ඉස්සර හඳුන්වා දීලා තිබෙනවා -මෑත කාලයේ මේ පාර්ලිමේන්තුවට කියන්න බැරි වුණා- "කොම්පැනි කෑම" කියලා. ඒ කියන්නේ, කොම්පැනියක් හදනවා. ඒ කොම්පැනියට මිනිසුන්ගේ මුදල් ටික එකතු කර ගන්නවා. එකතු කරලා කොම්පැනියේ මුදල් තමන්ගේ ප්‍රයෝජනයට ගන්නවා; කොම්පැනිය යකාට යනවා. අන්න එහෙම වුණාට පස්සේ මහ බැංකුව ඇවිල්ලා වල්ගෙන් අල්ලා ගන්නවා. අල්ලා ගෙන, මේ තිරිසනා ආම්බාන් කර ගන්න පුළුවන්ද කියලා බලනවා. එහෙම කරන්න බැහැ. එතකොට ඒ තිරිසනාගේ ඔළුව, බඩ, තුනටියයි ඔක්කෝම යන්න ඕනෑ තරම් ගිහිල්ලා. මෙන්න මේ නිසා මහ බැංකුව ගැන මහ ජනයාගේ මතයක් තිබෙනවා, "මහ බැංකුවේ ඉන්න අය මේ කොම්පැනිකාරයොත් එක්ක එකතු වෙලා තමයි මේ ජාවාරම කරන්නේ" කියලා. මහ ජනයාගේ මුදල් මේ විධියට මං කොල්ලකන්නේ, පැහැර ගන්නේ මහ බැංකුවේ අයයි, කොම්පැනිකාරයොයි එකතු වෙලා. මේ කොම්පැනි, මිනිසුන්ගේ සල්ලි එකතු කරගෙන ව්‍යාපාර කරනවා. ඒ ව්‍යාපාර කරන්නේම තමන්ගේ අත යටින් ලාභය එන හැටියටයි. ඒ ගනුදෙනුවේ මතුපිටින් අලාභයි; අසාර්ථකයි. ඒ ගනුදෙනුව අරගෙන බැලුවාම වටිනාකම අඩුයි. නමුත්, අත යටින් ගණන වැඩියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මම එච්චර වෙලාවක් කථා කළාද? [බාධා කිරීමක්]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
The Hon. Eran Wickramaratne)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මහ බැංකුවේ හිටිය අය කියලා කථා කරන්නේ ඉස්සර මහ බැංකුවේ හිටිය අය ගැනයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මහ බැංකුව කියන එක හැම දාම එකක්; දෙකක් නොවෙයි. It is a continuing phenomenon. මහ බැංකුව කියන්නේ හැම දාම එකක්. ඒ කියන්නේ, ඒකට නිලධාරීන් අද එනවා, හෙට යනවා. තවත් කට්ටිය අලුතෙන් එනවා. ඒ අය ඊට පස්සෙන්දා යනවා. ඒ නිසා, there is no difference.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි අටක කාලයක් එකතු කර තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විනාඩි අට තුළ මම CIFL ගැනයි, ETI Finance Limited. එක ගැනයි කථා කරන්න යන්නේ. මේ CIFL Depositors' Association එක නොයෙකුත් විධියේ යෝජනා ඉදිරිපත් කළා. CIFL Depositors' Association එක මඟින් ඒ ගොල්ලන් කිව්වා, "මෙන්න ඉන්නවා මේකට දමන්න මිනිහෙක්; ආයෝජකයෙක්. ඒ මිනිහාව භාර ගන්න" කියලා. මේ සාකච්ඡාව ඒ ගොල්ලෝ කළා. එහෙම කරලා අන්තිමට ගිහිල්ලා භාර දුන්නා. අන්තිමට මොකක්ද වුණේ? CIFL එක බුන්වත්. ටිකක් දෙන්න එපායැ, නම්බුකාර නමක්. බුන්වත්- bankrupt.

ඒ කියන්නේ බංකොලොත්භාවයට පත් වූ බවට ප්‍රකාශ කරලා එය ඇවර කරන්න පටන් ගත්තා. ඇවර කළාම මේ මිනිස්සුන්ට මොකක්ද වෙන්නේ? ඒ අයට කියා තිබෙනවා, "අපි එක්කෙනකුට හයලක්ෂය බැගින් දෙනවා" කියලා. එතකොට තැන්පත්කරුවෝ සියයට 60ක් cover වෙනවා. ඒක වැරැදියි කියලා මේ සංගමයේ උදවිය ලියුම් ලියලා තිබෙනවා. 201801.02වන දින මේ සංගමයේ සභාපතිවරයා වන විජය ගුණවර්ධන මහතා විසින් ලියන ලද ලිපියක් මම **සභාගත*** කරනවා. කරුණාකරලා එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරන්න ඉඩ දෙන්නය කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මේ ලියුමේ දිනය 2018 ජනවාරි 02. මෑත කාලයේ ලියා තිබෙන්නේ. ඒ ලිපිය ලියා තිබෙන්නේ ඒ සංගමයේ සභාපතිවරයා වන විජය ගුණවර්ධන මහතායි. ETI ආයතනයේ කිසිම බලයක් නැතිව Swarna Mahal Jewellers (Pvt.) Ltd. ආයතනය තැන්පතු අරගෙන තිබෙනවා. ඒක නීති විරෝධියි. තමුන්නාන්සේලාගේ පත්තර දැන්වීම්වල තමුන්නාන්සේලා කියලා තිබෙනවා, "අපි උන්ට දඩුවම් කරනවා, අපි උන්ව බෙල්ලෙන් අල්ලලා ගේනවා" කියලා. දැන් බෙල්ලෙන් අල්ලලා ගෙනැල්ලා තිබෙන්නේ කවුද?

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කාටද දඬුවම් කරලා තිබෙන්නේ? මම අහන්නේ ETI එකේ අය ගැනයි. ස්වර්ණමහල් කට්ටිය නීති විරෝධීව තැන්පතු අරගෙන තිබෙනවා. තැන්පත් ගන්න බලයක් නැහැ. ඒගොල්ලන් අරගෙන ඇවිල්ලා කරපු දඬුවම් මොනවාද? ඒගොල්ලන්ට කළේ මොනවාද? Entrust Securities PLC එකෙන් නඩු දාපු එකක් ගැන කියනවා. ඒකෙන් ඔක්කොම වහගන්න බැහැ නේ. ඒවාට හොඳ දේශපාලන හේතුත් තිබුණු නිසා ඒවා සිදුවෙලා තිබෙනවා. දේශපාලනය ඇතිව වේවා, නැතිව වේවා ඒවා සිදු වන එක තමයි හොඳ. ඒ නිසා නියාමනය හා අධීක්ෂණය යටතේ ETI එකේත් CIFL එකේත් මේ සිදු වුණු විධි පිළිවෙත ඉතාමත්ම කනගාටුදායකයි. ඇත්තටම CIFL එක මේ විධියට ඇවර කිරීමෙන් පසුව විකුණන්න වත්කම් කෝ? තිබෙන වත්කම්වලින් කොටසක් ණය. ඔබතුමා දන්නවාද, CIFL එකෙන් එක කොටසක් දමලා තිබෙන්නේ නිවාස ව්‍යාපෘතියකට කියලා? ඒ නිවාස ව්‍යාපෘතිය හදලා තිබෙන්නේ UDA එකත් එක්ක. ඒවාට අය වෙන්න තිබෙන මුදල් තමයි මේකේ ප්‍රධාන වශයෙන්ම වත්කම් හැටියට තිබන්නේ. මේ මිනිස්සුන්ට ලැබෙන්නේ ඔය වත්කම්වලින් ලැබෙන්නා වූ පංගුව පමණක් නම් ඒ මිනිස්සුන්ගේ ශාපය මේ වගකීම් දැරිය යුතු සියලු පුද්ගලයින්ට එල්ල වෙනවාට කිසිම සැකයක් නැහැ. ඒ මිනිස්සු හූල්ලමින් යන්නේ. ඒ මිනිස්සුන්ගේ හදවත්වලින් පිටවන සුසුම්, ඒ මිනිස්සුන්ගේ සන්තානය තුළින් ගිනිගෙන ඇවිලෙන වේදනාවේ ශාපය මේ ගැන කටයුතු කළ, මේ ගැන වග කිව යුතු සියලු දෙනාටම ලැබෙනවා. මම ගුප්ත විද්‍යාව ගැන ඒ තරම් විශ්වාස කරන කෙනෙක් නොවෙයි. මම හිතන විධියට භෞතික වශයෙන් තමයි මේ ශාපය වදින්නේ. භෞතික වශයෙන්ම මේ අපරාධයට මුල් වූ පුද්ගලයින්ට මේවාට වගඋත්තර කියන්න දවසක් එයි.

හර්ෂ ද සිල්වා මහත්මයා -මා ළඟ ඒ පත්තරය තිබෙනවා.- ඇමතිවරයා වෙන්න ඉස්සරවෙලා, එතුමන්ලාගේ ආණ්ඩුව පිහිටුවන්න ඉස්සරවෙලා මේ CIFL එකේ කට්ටිය හමු වුණා. මගේ මිත්‍ර වජිර ඇමතිතුමා සභාවට ආපු නිසා මගේ පාළුව ගියා. බොහොම ස්තුතියි. හර්ෂ ද සිල්වා ඇමතිතුමා කිව්වා " අපි ආවාට පස්සේ බලන්න, කරන වැඩේ. තමුන්නාන්සේලා කාටවත් අඩුපාඩුවක් නොවෙන්න, ඔය මුදල් ඔක්කොම මම ලබා දෙනවා. මම අරයාත් එක්ක කථා කරලා තියෙනවා, මෙයාත් එක්ක කථා කරලා තියෙනවා, මම ඒ ඔක්කොම එක්ක කථා කරලායි තියෙන්නේ. මම මේ මුදල් ලබා දෙන්න ලැහැස්තියි" කියලා. ඡන්ද ටික ලැබුණා. නමුත් මුදල් නම් මිනිස්සුන්ට ලැබුණේ නැහැ. ඡන්ද ලැබුණාම මම හිතුවා, වාදයකටවත් එයි කියලා; එතකොට මේක කියන්න පුළුවන් කියලා. ඒ වාගේම අපේ වර්තමාන ජනාධිපතිතුමාගේ ප්‍රකාශයක් තිබුණා, ජනාධිපතිවරණයට ඉස්සරවෙලා. ඒ ප්‍රකාශයේ කියා තිබෙනවා Golden Key වාගේ ආයතනවල සිදු වුණු විශාල මුදල් පැහැර ගැනීම් සැලකිල්ලට ගෙන සියලුම මූල්‍ය සමාගම්වල සාපරාධී ක්‍රියා පිළිවෙත ගැන විමර්ශනයක් කරන්න මම කොමිසමක් පත් කරනවා කියලා.

ඒ කොමිසම තවමත් පත් කරලා නැහැ. මා ජනාධිපතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, ප්‍රමාදවෙලා හෝ ඒ කොමිසම වහාම පත් කරන්නය කියලා. බැඳුම්කර කොමිසම පත් කිරීම ඊට වඩා හදිසි වුණු බව ඇත්ත තමයි. ඒ ගැන සැකයක් නැහැ. දැන් මේ මිනිසුන් කියන්නේ මොකක්ද? "ගුරා හිටගෙන සුළඟිය බානකොට ගෝලයෝ දුව-දුවා සුළඟිය බානි" කියලායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කියන්නේ මොකක්ද කියලා ඔබතුමා දන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
කවුද ගුරා? ගුරා තමයි ශ්‍රී ලංකා මහ බැංකුව. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිම බැනාත් එක්ක එකතුවෙලා අගමැතිගේ උදව්වෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල්වලට කෙළියා නම් කොම්පැනි ගැන කවර කථාද? එසේ ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.46]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1940 වර්ෂයටත් පෙර සිට තමයි බැංකු නොවන මූල්‍ය ආයතන ශ්‍රී ලංකාවේ තිබුණේ. නමුත් දශක ගණනාවක් යන තුරුම මේ මූල්‍ය ආයතනවල නියාමනයක් සිදු වුණේ නැහැ. පවුල් ව්‍යාපාර විධියට තමයි ඉතිහාසයේ ඒ ආයතන තිබුණේ. ඊට පස්සේ, 1979 අංක 27 දරන පනතින් තමයි මේ ආයතන නියාමනය කිරීම පටන් ගත්තේ. එතකොට තමයි මේ පවුල් ව්‍යාපාර පොදු සමාගම් බවට පරිවර්තනය වුණේ. ඊට පස්සේ ඒ ආයතනවල තිබෙන ප්‍රශ්න දැකලා ඒ පනත නැවත වෙනස් වුණා. 1979 පනතේ තිබෙන අඩුපාඩු දැකලා, මේ ආයතනවල සිදුවන හොරකම්වල, වංචාවල අත්දැකීම් එකතු කරගෙන, 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත ඇති වුණා.

පසුගිය දවස්වල මූල්‍ය ආයතන කඩා වැටෙන හැටි අපි දැක්කා. මේවා ගැන හිතලා, මේවායේ තිබෙන අඩුපාඩු ගැන හිතලා, 2011 අංක 42 දරන පනත ගෙනාවා. ඒ අනුව තමයි වර්තමානයේ මූල්‍ය ආයතන ලියා පදිංචිය, නියාමනය හා අධීක්ෂණය කිරීම ඇතුළු හැම දෙයක්ම සිදුවෙලා තිබෙන්නේ. වර්තමානයේ රට මූල්‍ය අර්බුදයකට වැටිලා නැහැ. රට මූල්‍ය අර්බුදයකට වැටුණා නම් බැංකු ගණනාවක් එක වර වැහෙන්න ඕනෑ. නමුත් අද වෙලා තිබෙන්නේ, යම් යම් මූල්‍ය ආයතන අර්බුදයකට වැටී තිබෙන එකයි. එක් එක් ආයතන මූල්‍ය අර්බුදයකට වැටීමට විවිධ හේතු තිබෙනවා. එක ආයතනයක් මූල්‍ය අර්බුදයකට වැටුණාම, එයට ජාලගත වෙද්දී තවත් ආයතන මූල්‍ය අර්බුදයකට වැටෙන අවස්ථා අපි දැකලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ගරු මංගල සමරවීර මුදල් ඇමතිතුමා ප්‍රතිඥාවක් දුන්නා, වහාම මේ පනත අලුත් කරලා, මේ අත්දැකීම් තුළින් නැවත මෙහෙම නොවෙන විධියට ශක්තිමත් පනතක් නිර්මාණය කරනවාය කියලා. එය අපි හැමදෙනාටම සතුටු විය හැකි කරුණක්. ජනතාව අමාරුවෙන් එකතු කරගත් සල්ලි, සමහර විට සැඳෑ සමය හොඳින් ගෙවන්න තරුණ කාලයේ දුක් මහන්සිවෙලා එකතු කළ සල්ලි තමයි මේ මූල්‍ය ආයතනවලින් විනාශ කරන්නේ; තව කෙනකුගේ ගොඩකට එකතුවෙලා තිබෙන්නේ. ඒ නිසා ඒ සඳහා වැට බඳින එක අවශ්‍ය වනවා.

අද අපේ රටේ මහා මං කොල්ල සිදු කරන අපරාධකාරයෝ පවා අධිකරණය ඉදිරියට ගිහින් රට බේරාගත් වීරවරයන් වාගේ තමයි රහපාන්නේ. මේ නීතිය ඒ තරම් දුර්වලයි. ඒ නීතියේ දුර්වලකම ප්‍රයෝජනයට ගෙන, පසුගිය කාලයේ හිටපු මං

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

කොල්ලකාරයන්, රටේ සල්ලි, ජනතාවගේ සල්ලි හොරා කාපු දේශපාලනඥයන් අධිකරණය ඉදිරියේ කොහොමද හැසිරෙන්නේ කියලා අපි දකිනවා. මේ මූල්‍ය සමාගම්වල ඉන්න හොරකම් කරපු අයත්, මේ මූල්‍ය සමාගම්වල ඉන්න වංචාකාරයනුත් හැසිරෙන්නේ ඒ විධියට තමයි. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කිව්වා වාගේ ඒ ගොල්ලන් කඩා වැටිලා නැහැ. ඒ ගොල්ලන් ඉතා ශක්තිමත්. මේ රටේ හොරු ශක්තිමත්. මේ හොරු ශක්තිමත්වෙලා තිබෙන්නේ ඇයි? එහෙම වෙලා තිබෙන්නේ මේ රටේ නීතිය මකුළු දැලක් වෙලා තිබෙන නිසායි. අහිංසක, දුප්පත් මිනිසුන් විතරයි මේ නීතියේ රැහැනට අහුවෙන්නේ, ලොකු මිනිසුන් අහුවෙන්නේ නැහැ. ඒ නිසා මා ගරු මුදල් ඇමතිතුමාට විශේෂයෙන්ම - [බාධා කිරීමක්] මට වෙලාව මදියි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මා අහන්නේ, එක මන්ත්‍රීවරයකුවත් ඉන්නවාද, - [බාධා කිරීමක්]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

නැහැ. මේ නීතියේ ප්‍රශ්නයක් තිබෙන බව අපි දකිනවා. ගරු මංගල සමරවීර ඇමතිතුමා අද මේ සභාවට ප්‍රතිඥාවක් දුන්නා, ඉතා ඉක්මනින් ශක්තිමත් නීති නිර්මාණය කරනවාය කියලා. අඩු ගණනේ අහිංසක, දුප්පත් මිනිසුන්ගේ අදෝනා නිසාවත් ඒ නීතිය නිර්මාණය වෙන්න ඕනෑය කියන එක විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ.

මේ මාතෘකාවෙන් පොඩ්ඩක් ඔබ්බට ගිහින් බැලුවොත්, අද මේ රටේ තිබෙන්නේ මූල්‍ය ප්‍රශ්නයක් නොවෙයි, මේ ව්‍යාපාරවල තිබෙන වංචාවයි. නීතියේ තිබෙන දුර්වලතාව නිසා ඒ තුළින් රිංගනවා. මේ ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ගම්වලට ගිහින් අහිංසක කාන්තාවන් රවටනවා. අද උතුරේ විතරක් නොවෙයි, මුළු රටේම, රැකියාවක් නොකරන, ගෙදර තනියම සිටින, පවුලේ බර කරට ගෙන සිටින කාන්තාවන්, පවුලේ ක්‍රියාකාරිත්වය භදන කාන්තාවන් තමන්ගේ සැමියාටත් හොරෙන් ණය ගත් අවස්ථා තිබෙනවා. ඒ ගැන සැමියාට කියන්න විධියක් නැහැ. සිය දිවි නසා ගැනීම විතරයි ඇයට උත්තරය වශයෙන් තිබෙන්නේ. මේ ව්‍යසනයෙන් අපි රට බේරා ගන්න ඕනෑ.

කුඩු ජාවාරම් තුළින් රටේ ඉන්න තරුණයන් අද විනාශ වෙලා යනවා. ඒ ව්‍යසනයෙන් රට බේරා ගන්න හදනවා වාගේම, මේ ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් ගිහින්, ගමේ රැකියාවක් නොකර ගෙදර ඉන්න කාන්තාවන් රවටාගෙන ඔවුන්ගේ මුළු ජීවිතයම අවුල් කර විනාශ කරන ක්‍රියාදාමයත් නවත්වන්න අවශ්‍යයි. එය කාලීන අවශ්‍යතාවක් කියන එක අපි හැමෝම දන්නවා. ඒ සඳහා ශක්තිමත් නීති නිර්මාණය කරන්න ඕනෑ.

අද බලපත්‍රලාභී මූල්‍ය සමාගම් 44ක් තිබෙනවා. ඒවායේ තැන්පතු බිලියන හයසිය අනූදෙකක් තිබෙනවා. ඒ කියන්නේ කෝටි හැටනවදහස් දෙසියයක් ජනතාවගේ මුදල් තිබෙනවා, බලපත්‍ර ලබාගත් මූල්‍ය සමාගම්වල. ඒ ජනතාව ආරක්ෂා කරන්න ඕනෑ. මේ ජනතාව මේ සමාගම් වෙත ඇදී ගියේ ඇයි? ඇදී යන්නේ වැඩිපුර පොලියක් දෙනවා කියන නිසා. සියයට එකක් දෙකක් වැඩිපුර දෙනවා කියනවා. වැඩි පොලියක් ගැන කියනකොට ඒක හොයා ගෙන යනවා. ඒක අපේත් හැටි. වැඩිපුර දෙයක් ලැබෙනවා නම් අපි කවුරුත් එතැනට ඇදෙනවා. හැබැයි, මහ බැංකුවේ වගකීමක් තිබෙනවා, මේ ප්‍රකාශ කරන දේවල වගකීම ගන්න. මේ මූල්‍ය සමාගමක් කඩා වැටෙන්නේ එක අවුරුද්දක් තුළ නොවෙයි. මූල්‍ය සමාගමක් කඩා වැටෙන්න අවුරුදු ගණනක කාලයක් යනවා. මහ බැංකුව ඒ තත්ත්වය දකිනවා. ඒ කරුණු අධික්ෂණය කිරීම සඳහා මහ බැංකුව තුළ වෙනම ආයතනයක් පිහිටුවා තිබෙනවා. එහෙම නම් මේ ආයතන අධීක්ෂණය කරලා, යමක් දන්නේ නැති, වැඩියෙන් කියක් හෝ ගන්න හිතාගෙන ඉන්න, තමන්ගේ සැඳෑ සමය හොඳින් ගත කරන්න සිහින මැවූ මේ අහිංසක ජනතාව ආරක්ෂා කර ගැනීම මහ බැංකුවේ වගකීමක් කියන එක විශේෂයෙන් කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ මූල්‍ය සමාගම් කඩා වැටුණේ අද ඊයේ නොවෙයි. එක්දහස් නවසිය අසූවේ දශකයේ සිට මේවා කඩාගෙන වැටුණා. එක එක වෙලාවට එක එක ආයතන කඩාගෙන වැටුණු අවස්ථා තිබෙනවා. එක්දහස් නවසිය අසූඅට-අසූනවය කාලයේ පැවැති මූල්‍ය අර්බුදයෙන් සමාගම් 13ක් කඩාගෙන වැටී තිබෙනවා. එදා ඒ බලපෑම් අවම කිරීමට මහ බැංකුව ප්‍රතිමූල්‍ය පහසුකම් ලබා දුන්නා. එසේ ලබා දීලා ඒ ආයතන යම් මට්ටමකට ගන්න පුළුවන් වුණා. එදා එවැනි මූල්‍ය සමාගම් නවයක් ඇවර කළා. තව දෙකක් ඇවර කරමින් පවතිනවා. තව ආයතන දෙකක් අලුත් කොම්පැනි දෙකකට භාර දීලා අද හොඳ තත්ත්වයෙන් කරගෙන යනවා. The Finance and Guarantee Co. Ltd. එක, Panadura Finance and Enterprises Limited එක වාගේ සමාගම් කඩාගෙන වැටුණාම, ඒවා වෙන ආයෝජකයන්ට ලබා දීලා හොඳ තත්ත්වයෙන් කරගෙන යනවා. මහ බැංකුව ඒ වාගේ නියාමනයක් කරපු අවස්ථා ඕනෑතරම් තිබෙනවා.

2002 වර්ෂයේදී ප්‍රමුඛ බැංකුව මූල්‍ය අර්බුදයකට ලක් වුණා. ඒ තැන්පත්කරුවන්ට මුදල් ගෙවීම මහ බැංකුව මැදිහත් වීමෙන් සිදු වුණා. ඒ වාගේම ගෝල්ඩන් ක්‍රෙඩිට් සමාගම මොනවාවත් කළේ නැහැ කියලා ගරු හර්ෂ ද සිල්වා ඇමතිතුමා කිව්වා. නමුත් අපි යම් දෙයක් කළා. සියයට හතළිස් දෙකක් දක්වා කොටස් ගෙවන්න කටයුතු කළා. මා දන්නා තරමට කොටස් හතළිස් දෙකටම තවම ගෙවීම් කර නැහැ. ඉතිරි ටික ඒ වත්කම් විකුණා ලැබෙන මුදල්වලින් මහ බැංකුව වියදම් කරපු මුදල් ටිකත් කවර් කරගෙන, ඉතිරි ටික දෙන්න කටයුතු කරනවා. මේවා කඩිනමින් සිද්ධ වෙන්න ඕනෑ. ඒ විධියට මහ බැංකුව ගත් ක්‍රියාමාර්ග තිබෙනවා. හැබැයි, මහ බැංකුව ගත් ක්‍රියා මාර්ග කඩිනම් නොවීම පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ETI Finance Limited එකේ තැන්පත්කරුවන් තිස්හය දාහක් විතර ඉන්නවා. මේ තරම් විශාල පිරිසකගේ දුක් අදෝනාව මැද අපට රජයක් වශයෙන්, මහ බැංකුව වශයෙන් කටයුතු කරන්න තිබෙනවා. මේ තත්ත්වය මේ රජයෙන් ඇති වෙච්ච දෙයක් නොවෙයි. මේ තත්ත්වය පසුගිය රජය කාලයේදීත් සිද්ධ වුණා. ඊට ඉස්සෙල්ලාත් සිදු වුණා. හැබැයි, අපේ නීතිය ශක්තිමත් නැති නිසා තමයි අපට මේ තත්ත්වයට මුහුණ දෙන්නට සිද්ධ වී තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යහපාලන රජය හැටියට අපි මේ වනවිට විශාල වැඩ කොටසක් කර තිබෙනවා. අපි තොරතුරු දැන ගැනීමේ පනත් වැනි පනත් ගෙනැවිත් තිබෙනවා. දැන් ජනතාවට තොරතුරු දැන ගැනීමේ හැකියාව තිබෙනවා. ඒ වාගේම රාජ්‍ය නිලධාරීන්ට ශක්තිමත්ව වැඩ කරන්න පුළුවන් විධියට ස්වාධීන කොමිෂන් සභා හදලා තිබෙනවා. එදා නම් දේශපාලන බලපෑම් තිබුණා යැයි කියන්න පුළුවන්, යම් කොම්පැනියක් වැටී ගෙන යන කොට ඒ කටයුතු වහගෙන කරගෙන යන්න. අද එහෙම වහගෙන කටයුතු කරගෙන යන්න බැහැ. ඒ තරමට ජනතාවට හැම තොරතුරක්ම විවෘත කර තිබෙනවා. ඒ තුළ මහ බැංකුව මීට වඩා ශක්තිමත්ව වැඩ කිරීම

අවශ්‍ය වෙනවා.මේ ප්‍රශ්නය විසඳීම සඳහා ගරු මුදල් අමාත්‍යතුමා විශාල ව්‍යායාමයක් දරා තිබෙන බව අපි දන්නවා. පුළුවන් දේවල් කරලා තිබෙනවා.

2010 වාගේ වෙනකොට රක්ෂණ යෝජනා ක්‍රමයක් - ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය - ද්‍රවශීලතා ආධාර ක්‍රමයක් හදුන්වා දී තිබෙනවා. එක් තැන්පත්කරුවෙකුට ගෙවන්න තිබුණේ රුපියල් ලක්ෂ තුනයි. 2018දී මේ ප්‍රමාණය රුපියල් ලක්ෂ 6 දක්වා වැඩි කළා. මුදල් ඇමතිතුමා ඇවිල්ලා, මේ කරුණු ගැන හොයලා යම් ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මුදල් ඇමතිතුමා මැදිහත් වෙලා, මේ වාගේ කඩාගෙන වැටෙන ආයතන පිළිබඳව හොයන්න මහ බැංකුව තුළ විශේෂ ආයතනයක් හදලා තිබෙනවා. එතුමා මේ වාගේ වැඩ පිළිවෙළවල් කරලා තිබෙනවා. හැබැයි, මේක මදි. මේ කටයුතු මීට වඩා ශක්තිමත් වෙන්න ඕනෑ. අශ්වයා ගියාට පස්සේ ඉස්තාලය වහලා තේරුමක් නැහැ. අපිට මේවා කලින් දැනගන්න පුළුවන් දේවල්. මේ ආයතන එක පාරට කඩා වැටෙන්නේ නැහැ. ඒ සඳහා අපි කටයුතු කරන්න ඕනෑ. ඒ වාගේම අපි දැක්කා, අර්බුදයට ලක් වූ මූල්‍ය ආයතනවලට,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසානයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
විශේෂයෙන්ම අපිට මේක ලොකු ව්‍යසනයක් බව මා මේ අවස්ථාවේ දී කියනවා. විශාල මූල්‍ය ආයතන කඩා වැටෙනවා නොවෙයි, කඩා වටිටනවා. කලිනුත් කිව්වා වාගේ අයිතිකාරයා බොහොම සතුටින් ඉන්නවා. නමුත් තැන්පත්කරුවා තමයි අසරණ වෙලා තිබෙන්නේ. මෙතෙක් මේ කටයුත්ත සිදු වුණා. වර්තමාන යහ පාලන රජය තුළින් මේ සඳහා කඩිනම් ක්‍රියාමාර්ග අරගෙන, ඉදිරියටවත් මේ වාගේ දේවල් නොවෙන ආකාරයට නීති පද්ධතියක් නිර්මාණය කළ යුතුයි. ඉතාම කඩිනමින් මේ ප්‍රශ්නය තේරුම් අරගෙන, නව නීති සංග්‍රහයක් සහ නව අණ පනත් ගෙනැල්ලා, හොරකම් කරන්න හිතෙන්නේ නැති විධියට, වැරැදි කළ අයට දැඩි දඩුවම් පමුණුවන්න පුළුවන් -දැඩි ක්‍රියාමාර්ග ගන්න පුළුවන්- ආකාරයට නීති නිර්මාණය කිරීම සම්බන්ධයෙන් මා විශේෂයෙන්ම මුදල් ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා. එතුමා ඒ ආකාරයෙන්ම එමකටයුතු සිදු කරයි කියන බලාපොරොත්තුවෙන් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.58]

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ETI Finance Limited ආයතනය ඇතුළු මූල්‍ය සමාගම් පිළිබඳ අර්බුදයත්, වර්තමාන ආර්ථික ක්ෂේත්‍රය පිළිබඳවත් සාකච්ඡා වන මේ මොහොතේදී ඒ සම්බන්ධයෙන් වවන කීපයක් ප්‍රකාශ කරන්න ලැබීම පිළිබඳව මා සතුටු වනවා. ETI Finance Limited ආයතනය පිළිබඳවත්, අර්බුදයට ලක් වෙලා තිබෙන අනෙකුත් මූල්‍ය සමාගම් සියල්ල පිළිබඳවත් කථා කිරීමේදී සියලුම කථික මහත්වරු පෙන්වා දුන් ප්‍රධාන කාරණය තමයි, ලංකාවේ මූල්‍ය පරිපාලනය සහ ක්ෂුද්‍ර මූල්‍ය සමාගම් නියාමනය පිළිබඳව මහ බැංකුවෙන් මීට වඩා විශාල කාර්ය භාරයක් සිදු වෙන්න ඕනෑය කියන කාරණය. මේ කරුණු කාරණා මට පෙර කථා කළ කථික මන්ත්‍රීවරුන් සඳහන් කළා. එමෙන්ම අපේ ආණ්ඩුව තිබුණු කාලයේ දීත් යම් මූල්‍ය සමාගමක් අර්බුදයට පත් වුණු බව අපට මතකයි. හැබැයි, වර්තමානයේ දී මූල්‍ය සමාගම් කීපයක්ම අර්බුදයට ලක් වෙමින් තිබෙනවා. මේ හරහා ගනුදෙනුකරුවන් අතිවිශාල ප්‍රමාණයක් විශාල අපහසුතාවකට පත්වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් හැකිතාක් ඉක්මනින් නීති ප්‍රතිපාදන සම්පාදනය කරලා, මීන් ඉදිරියටවත් මෙවැනි කරුණු සිදු නොවන මට්ටමට මේ ගනුදෙනුකරුවන් ආරක්ෂා කර ගැනීමට රජයක් හැටියට වාගේම මහජන නියෝජිතයන් හැටියට අපිට යුතුකමක් තිබෙනවා.

මේ ETI Finance Limited ආයතනයේ ගනුදෙනුකරුවන් 35,000කට වඩා වැඩි ප්‍රමාණයක් මුදල් තැන්පත් කරලා තිබෙනවා. නමුත් අද ඔවුන් ඉතාම අසරණ භාවයට පත්වෙලා සිටිනවා. ඔවුන්ගේ දුක් අදෝනාවන් අපිට දිනපතා රූපවාහිනියෙන් දකින්නට ලැබෙනවා. තමුන්ගේ ජීවිත කාලය තුළදීම ඉතිරි කර ගත් මුදල් මෙවැනි මූල්‍ය ආයතනයක තැන්පත් කරලා, මාස තුනක් යනකොට එම මූල්‍ය ආයතනය අර්බුදයට ලක්වෙලා තිබෙනවාය කියන කරුණ ඇහුවාට පස්සේ කී දෙනෙකුට හදවත් රෝග වැළඳුණාද කියන කාරණය අපි පසු ගිය කාලයේ දැක්කා. ඒක ඉතාම කනගාටුදායක තත්ත්වයක්. පසු ගිය කාලයේ අර්බුදයට ලක් වෙච්ච 'ගෝල්ඩන් කී' ආයතනයේ රුපියල් බිලියන 25ක වත්කම් පිළිබඳව තමයි කථා කළේ. හැබැයි, මේ වනවිට ETI Finance Limited ආයතනය රුපියල් බිලියන 35කට වැඩි දැවැන්ත මුදල් ගැටලුවකට මැදිවෙලා සිටිනවා. මෙහිදී මතු වන කාරණය තමයි, මේ ආයතනය තැන්පත්කරුවන්ගෙන් රුපියල් බිලියන 35ක තැන්පත් ලබාගෙන තිබීම. එයින් ඔවුන් සතුව තිබෙන වත්කම් ප්‍රමාණය බිලියන 10ක් පමණ වන අතර තවත් බිලියන 5ක් පමණ ඔවුන් ණය දීලා තිබෙනවා. ඉතුරු රුපියල් බිලියන 20ක ප්‍රමාණය ලංකාවේ නැතිනම්, තැන්පත්වල නැතිනම්, දේපළවල නැතිනම් ඒ මුදල් කවරාකාරයෙන් රටින් බැහැර කළාද කියන කාරණය බොහොම පැහැදිලිව මතු වනවා. එහිදී මහ බැංකුව මේ සම්බන්ධව අධීක්ෂණය කළා නම්, මේ ආයතනය සතුව තිබිය යුතු තැන්පතු සහ වන්දි ප්‍රමාණය යම් පමණකට ආරක්ෂා කර ගැනීමේ වගකීමක් මහ බැංකුව සතුව තිබෙන්නට තිබුණා. හැබැයි, ඒ නියාමන කාර්ය භාරය මහ බැංකුව පැත්තෙන් සිදු වුණේ නැති බව තමයි බොහොම පැහැදිලිව පෙනෙන්නට තිබෙන්නේ. මේ තැන්පත්කරුවන්ට මේ වනාවේදී සියයට 10ක මූල්‍ය ප්‍රතිපාදන ප්‍රමාණයක් ලබා දී තිබුණා කියා මා විශ්වාස කරනවා. හැබැයි, ඒ ප්‍රමාණය කෙසේවත් සෑහීමකට පත් වෙන්න පුළුවන් ප්‍රමාණයක් නොවෙයි කියන එක බොහොම පැහැදිලියි. ඒ නිසා මේ තැන්පත්කරුවන්ගේ දුක්ඛ දෝමනස්සයන්ට ඇහුම් කන් දීලා, මීට වඩා සාධාරණ වන්දි ගෙවීමේ ක්‍රමයක් සකස් කිරීමේ යුතුකම සහ වගකීම මේ ආණ්ඩුවට පවතිනවා. මේ මූල්‍ය අර්බුදය ලංකාව පුරා පැතිරී යනකොට මේ සමාගම විතරක් නොවෙයි, ලංකාවේ විවිධ දිස්ත්‍රික්කවල තිබෙන ආයතන රාශියක් මේ වනවිට මේ අර්බුදයට මැදිවෙලා, කඩා වැටීමට ලක්වෙලා තිබෙන බව අපි දන්නවා. ලංකාවේ ආර්ථික අපගමනය, ව්‍යාපාර කර ගෙන යාමේ අපහසුව, ආයෝජන අඩුකම ඇතුළු කරුණු කාරණා නිසා මූල්‍ය ක්ෂේත්‍රයේ අර්බුදය උඩු දුවන තත්ත්වයට පත්වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කයේ හබරාදුව විවිධ සේවා සමුපකාර සමිතියට අයත් ග්‍රාමීය බැංකුවත් මේ වාගේම අර්බුදයකට ලක් වෙලා තිබෙන බව මීට කලින් මේ ගරු සභාවේ දී සඳහන් වුණා. කොළඹ තිබෙන ETI Finance Limited ආයතනයේ කඩා වැටීම පිළිබඳව, එහි තැන්පත්කරුවන්ගේ දුක්ගැනවිලි පිළිබඳව රූපවාහිනියෙන් පෙන්වලා විශාල ප්‍රචාරණ යාන්ත්‍රණයක් හරහා රටම දැන ගත්තාට, මෙලෙස අර්බුදයට ලක් වෙච්ච මූල්‍ය ආයතන රාශියක් ගම් මට්ටමේ, දිස්ත්‍රික්ක මට්ටමේ තිබෙනවා. හබරාදුව විවිධ සේවා

[ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා]

සමුපකාර සමිතියට අයත් ග්‍රාමීය බැංකුව එවැනි එක් ආයතනයක් විතරයි. එම මූල්‍ය ආයතනයේ විතරක් අවභාවිත වෙච්ච මුදල රුපියල් කෝටි 40කට ආසන්නයි. ETI Finance Limited ආයතනයේ තැන්පත්කරුවන් 35,000ක් ඉන්නවා. හබරාදුව ග්‍රාමීය බැංකුවේ තැන්පත්කරුවන් 35,000ක් ඉන්නවා. හබරාදුව ග්‍රාමීය බැංකුවේ රුපියල් ලක්ෂයට වඩා තැන්පත් කරපු තැන්පත්කරුවන් 5,000ක් ඉන්නවා. ඒ සියලු දෙනාම කිසිම වගවීමක් නැති මූල්‍ය ආයතනයක තමුන්ගේ තැන්පතුව තියලා අද ඉතාම අසරණභාවයට පත් වෙලා ඉන්නවා. එම තැන්පත්කරුවන්ට සාධාරණය ඉෂ්ට කර ගන්න පොලීසියට යන්න පුළුවන්කමක් නැහැ; මහ බැංකුවට යන්න පුළුවන්කමක් නැහැ. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට ගියාම ඔවුන් මේ පිළිබඳව නිහඬතාවක් දක්වනවා. ඔවුන්ට ගැටලුව විසඳන්න විධියක් නැහැ. ඒ නිසා මේ ග්‍රාමීය බැංකු පද්ධතිය පවා ලංකාවේ විශාල දෙදුරුම් කෑමකට දැන් ලක් වෙලා තිබෙනවා.

ගාල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාමීය බැංකු 18ක් තිබෙනවා. මේ ග්‍රාමීය බැංකු සමුපකාර ක්‍රමය හරහා මධ්‍යම රජයට හෝ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයට බද්ධ වෙලා තිබෙනවා කියා ජනතාව විශ්වාස කරනවා. ඒවායේ නියමිත පරිදි විගණනයක් සිදු වෙන්නේ නැහැ. අධ්‍යක්ෂ මණ්ඩලය තමන්ගේ හිතුමනාපයට අනුව මේ ග්‍රාමීය බැංකු පද්ධතිය පාලනය කරනවා. නියමිත විගණනයක් සිදු නොවන විට, සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් දැනුවුවොත් "මේක විගණනය වෙන්නේ නැහැ, හරියට විගණනය කරන්න" කියලා, ඔවුන් මහ සභාව රැස් කරලා කුමක් හෝ තීන්දුවක් අරගෙන එම මුදල් අවභාවිත කරන්න කිසියම් මාර්ගයක් හදා ගන්නවා. මේ නිසා අද ගනුදෙනුකරුවන් විශාල ප්‍රමාණයක් ඉතාම අපහසුතාවට පත් වෙලා ඉන්නවා. හබරාදුව විවිධ සේවා සමුපකාර සමිතියේ විතරක් තැන්පත්කරුවන් 35,000ක් අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා. ගාල්ල දිස්ත්‍රික්කයේ තිබෙන සමිති 18න් අඩු ගණනේ සමිති 06ක - 07ක දැවැන්ත මූල්‍ය අක්‍රමිකතා සිදු වනවා. මේක ලංකාව පුරාම මෙලෙසමයි. එහෙම නම් අපට යුතුකමක් තිබෙනවා, මේවා නියාමනය කරන්න. මේවා බැංකු හැටියට හඳුන්වාගෙන කටයුතු කරන ආයතන. ගරු ඇමතිතුමනි, මේ මූල්‍ය ආයතනය හරියට නියාමනය කරන්න මේ රටට නීතියක් අවශ්‍යයි. මේක විශාල අඩුවක්. ඒක කවුරු හෝ කරන්න අවශ්‍යයි. එලෙස කළේ නැත්නම් බැංකුව කියන නම යෙදුවාට පස්සේ, විවිධ සේවා සමුපකාර සමිතිය කියන නම යෙදුවාට පස්සේ, ජනතාව මේවාට රැවටෙනවා. එවැනි අක්‍රමිකතා සහිත මූල්‍ය ආයතනවල මුදල් තැන්පත් කිරීමෙන් අසරණ භාවයට පත්වන අයට පිළිසරණක් වෙන්න කිසිම ක්‍රමයක් මේ රටේ ආණ්ඩුවටවත්, මේ රටේ කිසිම දෙපාර්තමේන්තුවකටවත්, මහ බැංකුවටවත් හැකියාවක් නැත්නම් ඒක විශාල අඩුවක් හැටියට අපි දකිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි මූල්‍ය ආයතනවලට, මෙවැනි සමාගම්වලට ජනතාව නතු වෙන්නේ ඇයි, ගමන් කරන්නේ ඇයි කියන කාරණය බලන්න අවශ්‍යයි. තමුන්නාන්සේත් දන්නවා ඇති, මේ ආයතන රටේ සාමාන්‍යයෙන් ලබා දෙන්නට පුළුවන් පොලියට වඩා විශාල පොලියක් තැන්පතු සඳහා ලබා දෙන බව. යම් මූල්‍ය සමාගමක් රටට දැරිය හැකි, තමන්ට දැරිය හැකි පොලියට වඩා වැඩි පොලියක් ලබා දෙනවා නම්, මහ බැංකුවට ඊට මැදිහත් විය යුතු බව බොහොම පැහැදිලිව අපි විශ්වාස කරනවා. මහ බැංකුව අලුතෙන් කාර්යාංශයක් හෝ පිහිටුවා ඊට විරුද්ධ වෙන්නට අවශ්‍යයි. මොකද එහෙම කළේ නැත්නම්, මේ සමාගම් පාලනය කරන අය අධික පොලියක් ලබා දෙන බවට තැන්පත්කරුවන්ට පොරොන්දු වෙලා ඔවුන් ඒ මුදල් ලබාගෙන, ඒ තැන්පතුවලින් තමන්ගේ සේවක මණ්ඩලය ඇතුළු ඥාති හිතවතුන්ට අඩු පොලියට ණය ලබා දෙනවා. නැත්නම් ප්‍රදාන ලබා දෙනවා. ඒ හරහා මේ ක්‍රමයෙන් තැන්පතු ක්ෂය වෙලා යනවා. අලුත් තැන්පතුවලින් තමයි පොලී ගෙවීම් ඇතුළු කටයුතු කරන්නේ. මේක බොහොම පැහැදිලි විෂම චක්‍රයක්. ඒ නිසා මේ චක්‍රය යම්කිසි තැනකින් නතර කරන්න අවශ්‍යයි.

එක පැත්තකින් වැඩි පොලියක් බලාපොරොත්තුවෙන් තැන්පත්කරුවන් එතැනට ගිහින් අසරණ වනවා. අනෙක් පැත්තෙන් ජනතාව ණය ලබා ගන්න මූල්‍ය සමාගම්වලට යනවා. ඇයි ජනතාව ණය ලබා ගන්න යන්නේ? මේ රටේ බැංකු පද්ධතිය හරහා අධික පොලියකට ණය ගන්නත්, තමුන්ට ඇපයක් තියන්නට වනවා. දේපළක් නැත්නම් ණයක් ලබා ගන්න විධියක් නැහැ. එහෙම නැත්නම්, සාක්ෂි සඳහා රාජ්‍ය සේවකයෝ දෙදෙනෙක් ඉදිරිපත් වෙන්නට අවශ්‍යයි. දේපළක් නැත්නම්, සාක්ෂියට රජයේ සේවකයෝ නැත්නම්, මේ රටේ පිළිගත් බැංකුවකින් ණයක් ගන්න පුළුවන්කමක් නැහැ. මේ රටේ බැංකු පද්ධතිය ලෝකයේ දකුණු ආසියානු කලාපයේ හොඳම බැංකුව වුණා, එක වුණා; දෙක වුණා; තුන වුණා කියලා කියනවා. මේ රටේ රාජ්‍ය බැංකු සහ පෞද්ගලික බැංකු, "තමුන්ට මෙච්චර ස්ථාවර තැන්පතු තිබෙනවා; මෙච්චර වත්කම් තිබෙනවා; මෙච්චර ලාභ ලැබුවා" කියලා මහ උජාරුවට ජනතාවට කියනවා. හැබැයි, මේ බැංකු තිබෙන්නට ඕනෑ ලාභ ලබලා තමන්ගේ සාක්කු පුරවා ගන්නට නොවෙයි කියලා අපි කියනවා. රාජ්‍ය බැංකුත්, පෞද්ගලික බැංකුත් සාධාරණ ලාභයක් ලැබුවාට කමක් නැහැ. හැබැයි, මේ රටේ ජනතාවට ණයක් ගන්න, ආයෝජනය කරන්න පහසුකම් සලසන්නයි මේ බැංකු තිබෙන්නට ඕනෑ. එහෙම වුණොත් තමයි මේ රටේ ආර්ථිකය දුවන්නේ. අද මොකක්ද වෙලා තිබෙන්නේ? රාජ්‍ය බැංකුවකට ගියත්, පෞද්ගලික බැංකුවකට ගියත්, මේ රටේ පොඩි මිනිහාට ණයක් ගන්න පුළුවන්කමක් නැහැ. ණයක් ගන්න පුළුවන්කමක් නැහැ වාගේම, තමන්ගේ ව්‍යාපාර ආරම්භ කරන්න පුළුවන්කම් නැහැ. මොකද, ඇපයට තියන්න දේපළක් නැහැ. ඒ නිසා මේ ආර්ථිකය නතර වෙලා තිබෙනවා.

මේකට හොඳ උදාහරණයක් තිබෙනවා. ගාල්ල දිස්ත්‍රික්කය පසුගිය කාලයේ සංචාරක ව්‍යාපාරය අතින් හොඳ දියුණුවක් ලබලා, හොඳ ආදායම් ලැබූ පිරිසක් ජීවත් වුණු ප්‍රදේශයක් බවට පත් වෙලා තිබුණා. සංචාරක කර්මාන්තය, ධීවර කර්මාන්තය සහ තේ කර්මාන්තය ඇතුළු වැවිලි කර්මාන්තයෙන් ගාල්ල දිස්ත්‍රික්කයේ විශාල පිරිසක් ජීවත් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාම අවාසනාවකට පසුගිය වසරේදී සංචාරක ව්‍යාපාරයේ විශාල කඩා වැටීමක් සිදු වුණා. හෝටල් විශාල ප්‍රමාණයක් අලුතින් ඉදි වුණා. ඒකත් එක්ක දකුණේ ජනතාව සංචාරකයන් විශාල පිරිසකගේ පැමිණීම බලාපොරොත්තු වුණා. හැබැයි අද ගාලු දිස්ත්‍රික්කයේ සංචාරක ව්‍යාපාරය කඩා වැටිලා තිබෙනවා. සමස්ත ශ්‍රී ලංකාව ගත්තත් එහෙමයි.

පසුගිය වසර කිහිපය තුළ ණය ලබාගෙන සංචාරක ව්‍යාපාරය සඳහා ගොඩනැඟිලි ඉදිකරන්න පටන් ගත් ආයෝජකයන් අද විශාල අපහසුතාවකට පත්වෙලා තිබෙනවා. මොකද, ඔවුන්ට තමන්ගේ ණය වාරිකය ගෙවාගන්න විධියක් නැහැ. අනික් පැත්තෙන්, පොහොර නැතිකම නිසා තේ වගාවේ ඵලදායිතාව ශීඝ්‍ර ලෙස අඩු වුණා. ඒ වාගේම ධීවර කාර්මිකයා විශාල අපහසුතාවකට පත් වුණා. මුහුදු ගිහිල්ලා ඔවුන්ට තමන්ගේ රස්සාව කරගන්න විධියක් නැහැ. අවාසනාවට කාලගුණයත් මේ රටට විරුද්ධ වෙලා තිබෙනවා. මුහුදු යන්න නොහැකිව ධීවරයෝ අසරණ වෙලා ඉන්නවා; තේවල, රබර්වල හොඳ ඵලදාවක් නොමැතිව මේ රටේ කෘෂි කාර්මාන්තයෙන් ජීවත් වන දකුණේ ජනතාව අසරණ වෙලා ඉන්නවා; අනික් පැත්තෙන් සංචාරක කර්මාන්තය කඩා වැටිලා තිබෙනවා.

ඊටත් එහා ගිය කාරණයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පසුගිය කාලයේ රජයේ ගොඩනැඟිලි ඉදිකරන්න කොන්ත්‍රාත් ලබාගත් කොන්ත්‍රාත්කරුවන්ට රජයෙන් ලැබිය යුතු මුදල් ප්‍රමාද වෙලා තිබෙනවා, ඒවා නිසි වෙලාවට නොලැබීම නිසා ඔවුන් විසින් කළ යුතු ණය ගෙවීම් අතපසු වෙලා තිබෙනවා. මෙන්න මේ කරුණු හතර නිසා තමන් ලබාගත් ණය ගෙවාගන්න බැරිව අද එම ව්‍යවසායකයන්, කොන්ත්‍රාත්කරුවන්, සංචාරක ව්‍යාපාරයේ සිටින අය, වැවිලි කර්මාන්තකරුවන් ඉතාම අසරණභාවයට පත්වෙලා තිබෙනවා. එසේ අසරණ වුණු ව්‍යවසායකයන් තමන්ගේ ණය වාරිකය මාස තුනක් ගෙවිවේ නැත්නම්; තමන්ගේ bank account එකෙන් ගත් ණයට හෝ overdraft එකට ගෙවිවේ නැත්නම්, ණය තොරතුරු කාර්යාංශයට - CRIB එකට - දන්වලා ගනු දෙනුකරුවන්ව අසාධු ලේඛනගත කරනවා. ගරු ඇමතිතුමනි, සංචාරක ක්ෂේත්‍රයේ, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ මෙතෙක් කල් හොඳ ඉතිහාසයක් තිබුණු, හොඳින් ගනු දෙනු පවත්වාගෙන ගිය ව්‍යාපාරිකයන්, කොන්ත්‍රාත්කරුවන්, ව්‍යවසායකයන් ඉන්නවා නම්, කරුණාකරලා මාස තුනක් වගේ කෙටි කාලයක් ඇතුළත ඔවුන්ව අසාධු ලේඛනගත කරන්න එපාය කියා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඔවුන්ට මේ තත්ත්වයෙන් ගොඩ එන්න යම්කිසි කාලයක් අවශ්‍යයි. පරිසර තත්ත්වයන්, රටේ තිබෙන ආර්ථික තත්ත්වයන් සියල්ල එකට ගැට ගැසිලා තිබෙන්නේ. එහෙම වෙලා තිබෙන්නේ ඔවුන්ගේ වරදක් නිසා නොවෙයි. එම නිසා මාස 6ක් වැනි කාලයකින් ඔවුන්ව අසාධු ලේඛනගත - blacklist - කරනවා නම් ඒක ඉතාම අසාධාරණ තත්ත්වයක්. එහෙම කළොත් ඔවුන්ගේ ව්‍යාපාර කරගෙන යන්න, නැවත නැඟිටින්න ඔවුන්ට හැකියාවක්, ශක්තියක් ලැබෙන්නේ නැහැ. එම නිසා රජයක් හැටියට එක පැත්තකින් ක්ෂුද්‍ර මූල්‍ය ආයතන, ග්‍රාමීය බැංකුව ඇතුළු ආයතන වඩාත් හොඳ, ඉහළ මට්ටමේ කළමනාකාරිත්වයකට අරගෙන යනවා වාගේම, අපහසුතාවට පත්වෙලා සිටින ගනු දෙනුකරුවන්ට ශක්තිය සපයන්නත් අවශ්‍යයි. එහෙම නැත්නම් දණින් වැටුණු මේ රටේ ආර්ථිකයත් එක්ක පවුල් මට්ටමේදී -කුටුම්භ මට්ටමේදී- ගම් මට්ටමේදී ඔවුන්ව නැඟිට්ටවන්න ඉතාම අපහසුයි කියන කාරණය මම සඳහන් කරනවා. මේ කාරණා ඒ වගේ සංකූල තත්ත්වයට පත් වෙනතුරු මේ ආණ්ඩුව නිසි අවධානයක් යොමු කරන්නේ නැත්තේ ඇයි කියන ගැටලුව අපට මතුවෙලා තිබෙනවා.

අපේ foreign exchange reserves ඉහළ ගිහින් තිබෙනවාය කියා පසුගිය දවස්වල මහ බැංකුවේ අධිපතිතුමා කියා තිබෙනවා අපි දැක්කා. හොඳයි, අපි ඒ ගැන සතුටු වෙනවා. ලංකාවේ විදේශ සංචිත ඉහළ ගිහින් තිබෙනවා නම්, අපි ඒ පිළිබඳව සතුටට පත් වෙනවා. මේ රටේ ආර්ථිකය ශක්තිමත් වෙනවා නම් අපි කැමැතියි. අපි මොන දේශපාලන පක්ෂයේ සිටියත් - ආණ්ඩුවේ සිටියත්, විරුද්ධ පක්ෂයේ සිටියත් - මේ රට සංවර්ධනය වෙනවා දකින්න, මේ රටේ දළ ජාතික නිෂ්පාදනය ඉහළ යනවා දකින්න අපට අවශ්‍යයි. මේ රටේ ඒක පුද්ගල ආදායම ඉහළ ගිහින් රටේ ජනතාවගේ අත මිට සරු වෙනවා දකින්න අපි ආසයි. හැබැයි, ඒකට විදේශ සංචිත වැඩිවීම පමණක් සෑහෙන්නේ නැහැ, අපේ රුපියල අවප්‍රමාණය වෙනවා නම්, අපේ ආයෝජන පහළ යනවා නම්, මේ රටට ගෙන එන බඩු භාණ්ඩවල ප්‍රමාණය වැඩි වෙලා, මේ රටින් අපනයනය කරනු ලබන ප්‍රමාණය අඩුවෙලා නැවත වතාවක් වෙළෙඳ ශේෂය අඛණ්ඩව වැඩි වෙනවා නම් එය හොඳ තත්ත්වයක් නොවෙයි. පසුගිය වසරේත් එහෙම වුණා.

2016 වසරට සාපේක්ෂව 2017 වසරේදී අපේ ආර්ථිකය පිළිබඳ දැක්ම බොඳ වෙමින් තිබෙන බව බොහොම පැහැදිලිව පෙනෙනවා. මේ ආර්ථික අපගමනයත් එක්ක 2000 වර්ෂයෙන් පසුව වාර්තා වුණු අඩුම ආර්ථික වර්ධන වේගය වුණු සියයට 3.1 පසුගිය වසරේදී තමයි වාර්තා වෙලා තිබෙන්නේ. අපි දැක්කා, බොහෝ කාලයකට පසුව; 2016 වර්ෂයේදී තමයි මේ රටේ ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 40කින් අඩු වුණේ. ආර්ථික වර්ධනය අඩුම වේගයකට පත් වන, මේ රටේ ඒක පුද්ගල ආදායම ඉතාම අඩු මට්ටමකට පත් වන, රුපියලේ අගය ඉතාම නරක ලෙස බාල්දු වන මේ කාලය තුළ මේ රටේ ව්‍යවසායකයන්ට, මේ රටේ ස්වේච්ඡාවෙන් හා ස්වාධීනව නැඟී සිටින්න උත්සාහ කරන ව්‍යාපාරිකයන්ට තමන්ගේ ව්‍යාපාර කටයුතු සාර්ථකව කරගෙන යන්න නොහැකි වීම අරුමයක් නොවෙයි. එම නිසා ආණ්ඩුව රාජ්‍ය ආයෝජනය මීට වඩා වැඩි කළ යුතුයි කියා අපි විශ්වාස කරනවා. හැබැයි, අපේ කාලයේදී අපි දැකපු කාරණයක් තිබෙනවා. රටේ සංවර්ධන ගමනට රාජ්‍ය ආයෝජනය, රාජ්‍ය දායකත්වය ඉතා ඉහළ මට්ටමක තිබුණා. එක පැත්තකින් ණය ආධාර ආවා, දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වුණා.

අනික් පැත්තෙන් රාජ්‍ය ආයෝජන ඉතාම ඉහළ මට්ටමක තිබුණා. ඒ රාජ්‍ය ආයෝජන හරහා මේ රටේ යටිතල පහසුකම් සංවර්ධනය වනකොට ඒ මුදල් ටික තමයි ග්‍රාමීය කුඩා කොන්ත්‍රාත්කරුවා, ව්‍යවසායකයා, ව්‍යාපාරිකයා අතට ගියේ. ඒ නිසා තමයි මේ රටේ ආර්ථිකයට අඛණ්ඩව ඉදිරියට යන්න අවශ්‍ය මංපෙත් සැලසුණේ. ඒ නිසා තමයි 2013 වර්ෂය වනකොට මේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 7.1ක් දක්වා වැඩි වෙලා තිබුණේ. ඒ ආර්ථික වර්ධන වේගය මේ කලාපයේ චීනය, ඉන්දියාව වාර්තා කරනවා. චීනය සහ ඉන්දියාව ඒ දැවැන්ත සංවර්ධන ගමන යනකොට, ඉතා ඉහළ මට්ටමේ මානව සම්පතක් තිබෙන, අධ්‍යාපනය අතින් ඉහළ මට්ටමක සිටින, තාක්ෂණය පැත්තෙන් හොඳ දැනුමක් තිබෙන, විදුලිය, යටිතල පහසුකම් පැත්තෙන් ඉතා ඉහළ සංවර්ධනයක් ලබාගත්ත අසල්වාසී රට වන අපේ රටට ඒ ආර්ථික වර්ධන වේගය ලබා ගන්න බැරිද කියන එක අප සෑම කෙනකුටම තිබෙන ප්‍රශ්නයක්. ඒ නිසා මේ අවස්ථාවේදී ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමාටත්, මහ බැංකු අධිපතිතුමාටත් -එතුමා රාජ්‍ය නිලධාරීන්ගේ කුටිය තුළ සිටින ආකාරය අපට පෙනෙනවා. - බොහොම පැහැදිලිව කියන්න අවශ්‍යයි, මේ ගැටලුව ඉස්සරහට තව තවත් දරුණු වන බව. ගමේ කළු කඩකාරයා ළඟට ගිහින් සියයට 20, 25 පොලියට ණය ගන්න පිරිස දිනපතා වැඩි වන ආකාරය අපි දකිනවා. ඔවුන් අසරණ වෙලායි ඉන්නේ. ඔවුන්ට රාජ්‍ය බැංකුවකට යන්න විධියක් නැහැ. ඒ නිසා ඔවුන් යන්නේ ඉහළ මට්ටමේ පොලියක් අය කරන පොලීකාරයා ළඟටයි. එහෙම නැත්නම් ගමේ වෙනත් ක්ෂුද්‍ර මූල්‍ය ආයතනයක් වෙනයි. ඔවුන් එක පැත්තකින් තමන්ගේ අතේ තිබෙන සියලුම මුදල් මේ ආයතනවලට ලබාදෙනවා. අනික් පැත්තෙන්, ඒ ආයතන ඒ මුදල් ටික අරගෙන වැඩි පොලී අනුපාතයක් යටතේ කටයුතු කරන්න යාම තුළ ඒ ආයතන ටික දවසකින් කඩා වැටෙනවා. ග්‍රාමීය මට්ටමේදී මෙය දෙකොන පත්තු වන විලක්කුවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ ව්‍යවසායකයන්, අසරණ නැන්පත්කරුවන් ආරක්ෂා කරන්න රජයක් හැටියට තමුන්නාන්සේලා කටයුතු කරන්න. ඒ වගකීම පැහැර හරින්න එපාය කියා තමුන්නාන්සේලාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට, ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

ඊට පෙර, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
The Hon. Eran Wickramaratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜ்புர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு லக்கி ஜயவர்தன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA *took the Chair.*

[අ.භා. 4.13]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜ்புர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ යෝජනාව පිළිබඳව අදහස් දක්වන්න මට අවස්ථාව ලබාදීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම මැතකදී බංකොලොත් වුණු ETI ආයතනය පිළිබඳව අපේ බොහෝ මන්ත්‍රීතුමන්ලා කථා කළා. ඒ විතරක් නොවෙයි, තවත් එවැනි ආයතන කිහිපයක් ගැන අපි මේ විවාදයේදී කථා කළා. විශේෂයෙන් මේ මූල්‍ය ආයතන බංකොලොත් වීම, විනාශ වීම තුළ මේ රටේ පොදු ජනතාවගේ මුදල් විශාල වශයෙන් විනාශ වෙලා, ඒ මුදල් අහිමි වන තත්ත්වයක් අපි දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "Ceylinco Profit Sharing and Investment Corporation Limited" නමින් පසුගිය කාලය පුරාම මාධ්‍යවල අවධානයට ලක් නොවුණු, මාධ්‍ය තුළ කථා නොවුණු තවත් මෙවැනි මූල්‍ය ආයතනයක් තිබුණා. සෙලින්කෝ සමූහ ව්‍යාපාරයට අයත් මේ ආයතනය පටන් ගත්තේ 2002දියි. තැන්පත්කරුවන් අටදහසක පමණ ප්‍රමාණයක් මේ ආයතනය සමඟ කටයුතු කළා. හැම පැත්තේම වාගේ මේ ආයතනයේ ශාඛා ඇති කළා. කොළඹ, කාත්තන්කුඩි, ඕටමාවඩි, අක්කරෙයිපත්තුව, කල්මුණේ, සමන්තුරේ, අකුරණ, බේරුවල, පුත්තලම වැනි ප්‍රදේශවල ශාඛා විවෘත කරමින් මේ ආයතනය කටයුතු කළා. මේ රටේ සිටින අහිංසක ජනතාව එම ශාඛාවල මුදල් විශාල වශයෙන් තැන්පත් කළා. ඒ තැන්පත් කරන මුදල් නැවත ආයෝජනය කරලා ඒ ආයෝජන හරහා ලැබෙන ලාභ මත ඔවුන්ට මාසික ගෙවීම් කරනවා කියලායි මේ ආයතනය පටන් ගත්තේ. ස්ථාවර තැන්පතු පවත්වාගෙන යාම, වෙළෙඳාම් සඳහා ණය ලබාදීම සහ leasing පහසුකම් ලබාදීම තමයි මේ ආයතනය ලබා දුන් සේවාවන් වන්නේ. මේ මූලික කාරණා උඩ තමයි මේ ආයතනය පටන් ගත්තේ. මේක ඇත්තටම සෙලින්කෝ සමූහ ව්‍යාපාරයට අයත්ව තිබූ ආයතනයක්. 2002දී පටන් ගත් මේ ආයතනයේ ජනතාවගේ මුදල් මිලියන 600ක් පමණ තැන්පත් කළා.

මේකේ තිබෙන වැදගත් දේ මෙයයි. මේ රුපියල් මිලියන 600 මේ රටේ ජනතාවගේ මුදල්. යම් කිසි කෙනෙකු සේවයෙන් විශ්‍රාම යනකොට ලැබෙන EPF එක වෙන්න පුළුවන්, gratuity මුදල් වෙන්න පුළුවන්, ඒ ලැබෙන මුදල් අරගෙන ගිහිල්ලා ඔවුන් මේ ආයතනවල තැන්පත් කළා. තමන් නැති කාලයක තමන්ගේ දරුවන්ගේ අධ්‍යාපනය වෙනුවෙන්, තමන්ගේ පවුලේ ඉදිරි ගමන වෙනුවෙන්, ඒ පවුල්වල නඩත්තුව වෙනුවෙන් තැන්පත් කළ රුපියල් මිලියන 600ක මුදල 2009 වසර වෙනකොට අතුරුදහන් වෙලා සමාගම බංකොලොත් වනවා. 2009දී බංකොලොත් වුණු සමාගම, එම සමාගමේ මුදල් තැන්පත් කරන්න කියලා තැන්පත්කරුවන්ට ආරාධනා කරන්නේ පත්තරවල සම්පූර්ණ පිටුවක් පුරා දැන්වීම් දමා, ගුවන්විදුලි නාලිකාවල දැන්වීම් ප්‍රචාරය කරලා, ඒ වාගේම TV channelsවල දැන්වීම් දමා තමයි. එලෙස තමයි මේ තැන්පත්කරුවන් මේවාට ඒ ගොල්ලන් ඇද ගන්නේ. ඒ ඇද ගැනීම තුළ ඒ ආයතන කෙරෙහි ජනතාවට විශාල විශ්වාසයක් ගොඩ නැඟෙනවා.

විශේෂයෙන්ම සමාජයේ පහළ තලයේ සිටින ජනතාව තමයි මේ සඳහා යොමු වන්නේ. වෙළෙඳ ව්‍යාපාරිකයෝ කවුරුවත් මේ ආයතනවල මුදල් ආයෝජනය කළේ නැහැ. එහෙම නැත්නම් විශාල වශයෙන් මූල්‍ය ශක්තිය තිබෙන අය ගිහිල්ලා මේ ආයතනවල මුදල් ආයෝජනය කළේ නැහැ. බොහොම අමාරුවෙන් හම්බ කර ගත් මේ සමාජයේ පහළ තලයේ සිටින ජනතාව තමන්ගේ මුදල් ටික අරගෙන ගිහිල්ලා මේ ආයතන තුළ තැන්පත් කළා. නමුත්, 2009 වර්ෂය වනකොට මේ ආයතනය බංකොලොත් වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ආයතනය බංකොලොත් වනකොට මේ ආයතනයෙන් විශාල වශයෙන් ණය ලබා දී තිබුණා. මේ ආයතනයෙන් ණය ලබා ගත් එක් ආයතනයක්, The Finance and Guarantee Co. Ltd. එක. ඒ ආයතනය රුපියල් මිලියන 220ක් අරගෙන තිබෙනවා. ඊ ළඟට, සෙකේස් අධ්‍යාපන ආයතනය රුපියල් මිලියන 140ක ණය මුදලක් ලබා ගෙන තිබෙනවා. ඊ ළඟට, මේ ආයතනයෙන් මුදල් ලබා ගෙන තිබෙනවා, වෙළෙඳ ව්‍යාපාර සඳහාය කියලා රමීෂා සහාබ්ඩීන් කියලා කාන්තාවක්. එතුමිය රුපියල් මිලියන 90ක පමණ මුදලක් මෙම ආයතනයෙන් ණය වශයෙන් ලබා ගෙන තිබෙනවා. එතකොට මේ රමීෂා සහාබ්ඩීන් කියන කාන්තාවට ණය ලබා දීලා තිබෙන්නේ Ceylinco Profit Sharing Investment Corporation Limited එකට එතුමියගේ ස්වාමිපුරුෂයා එවන ලියුමක් මතයි. මේ රුපියල් මිලියන 90 ලබා දෙන්න කියලා එතුමා තමයි guarantee වෙන්නේ. මේ ණය මුදල දෙන්නේ ඒ ලිපියටයි. ඒ රුපියල් මිලියන 90 ලබා දෙන්න එතුමියගේ දේපළ හෝ එහෙම නැත්නම්, වෙනත් වත්කමක් හෝ ඇපයට තබා ගන්නේ නැහැ. ඒ ලියුමට තමයි මේ ණය මුදල දෙන්නේ. මේකේ තිබෙන විශේෂම දේ තමයි, මේ ලියුම යවන කෙනා පසුගිය ආණ්ඩු සමයේ Airport and Aviation Services (Sri Lanka) Limited එකේ සභාපතිවරයෙකු හැටියට වැඩ කිරීම. ඒ සභාපතිතුමා තමයි ලියුම යවන්නේ, "තමන්ගේ බිරිඳට ව්‍යාපාර කටයුතු කර ගෙන යන්න මුදල් ලබා දෙන්න." කියලා. ඒ ලිපියට රුපියල් මිලියන 90ක ණය මුදලක් ලබා දීලා තිබෙනවා. එතුමා අදත් අපේ ආණ්ඩුවේ රාජ්‍ය ඇමතිවරයෙකු හැටියට සිටිනවා. එතුමාගේ ආර්යාවට තමයි මේ මුදල් අරගෙන දීලා තිබෙන්නේ. මේ රුපියල් මිලියන 90න් අද වනකොට ගෙවා තිබෙන්නේ රුපියල් මිලියන 35යි. අනෙක් ආයතන ගත්ත මුදල් තවම ගෙවා නැහැ. මෙහි තිබෙන ප්‍රධානම ප්‍රශ්නය මෙයයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ආයතනය බංකොලොත් වුණාම තැන්පත්කරුවෝ මහ බැංකුවට දැනුම් දෙනවා. මහ බැංකුවට දැනුම් දීලා එතුමන්ලා ගිහිල්ලා CID එකේ

පැමිණිල්ලක් කරනවා, 'මේ ආයතනයට විරුද්ධව නඩු දමන්න.' කියලා. ඒ පැමිණිල්ල 2010දී කරන්නේ. කියන්න කනගාටුයි, ඒ දමපු පැමිණිල්ලට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඒ ආයතනයට විරුද්ධව තවම නඩුවක්වත් පවරා නැහැ. අපි දන්නේ නැහැ, මේ ආයතනවල සිටින අය අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරීන්වත් බිලී බා ගෙන ඉන්නවාද කියලා. පැමිණිලි කරලා අවුරුදු 9ක් වනවා, අද වන තෙක් නඩුවක් පවරා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ සම්බන්ධයෙන් මහ බැංකුවට පැමිණිලි කළාම ඒ තැන්පත්කරුවන්ට මහ බැංකුවෙන් ලියුමක් එවනවා, "Ceylinco Profit Sharing Investment Corporation Ltd is not an institution licensed by the Central Bank under either the Banking Act, No.30 0f 1988..." කියලා අදාල Acts වල numbers ටික දමා. ඒ ලියුමේ අන්තිම වාක්‍යයේ කියනවා, "I regret to Inform that the Central Bank cannot intervene to solve your problem or to give an appointment for a meeting at this juncture." කියලා. ගරු මුදල් ඇමතිතුමාගේ අවධානය අපි මේ කෙරෙහි යොමු කරන්න ඕනෑ. මේ ලියුම මහ බැංකුවෙන් යවා තිබෙන්නේ Additional Director. නමුත්, එතුමාගේ නමවත් මෙහි නැහැ. මහ බැංකුව ඒ ලිපියෙන් කියනවා, "මේ ආයතනය මහ බැංකුවේ register වෙලා නැහැ. ඒ හින්දා අපි මේ ගැන කිසිම දෙයක් දන්නේ නැහැ"යි කියලා. එතකොට අපට තිබෙන ප්‍රශ්නය තමයි, පත්තරවල සම්පූර්ණ පිටුවක් පුරාම දැන්වීම් දමා, ගුවන්විදුලි නාලිකාවල දැන්වීම් ප්‍රචාරය කර, රූපවාහිනී නාලිකාවල දැන්වීම් දමා මිනිසුන් ගිහින් මුදල් තැන්පත්කරනකොට ඒක මහ බැංකුව දැක්කේ නැද්ද කියන එක.

මේ ගැන මහ බැංකුව හෙව්වේ නැද්ද, "මේ ගොල්ලන්ට licence තිබෙනවාද, බුලත් කඩයක්ද කළේ, එහෙම නැත්නම් පෙට්ටි කඩයක්ද කළේ" කියලා. නැහැ. මේක සෙලින්කෝ සමූහ ව්‍යාපාරයේ තිබෙන Ceylinco Profit Sharing Investment Corporation Limited එකක්. ඒ වාගේ ආයතනයක් මහ බැංකුවේ ලියා පදිංචි වෙලා නැත්නම්, මහ බැංකුව ඒ වෙලාවේදීම ඒ සම්බන්ධව ක්‍රියාත්මක වෙන්න ඕනෑ. මහ බැංකුව එහෙම ක්‍රියාත්මක වුණේ නැහැ. මහ බැංකුව ක්‍රියාත්මක වෙන්නේ නැතිව, අභිංසක තැන්පත්කරුවන් මහ බැංකුවත් එක්ක කථා කරන්න appointment එකක් ඉල්ලුවාම ඒකට පිළිතුරු යවනවා, "මේ ආයතනය මහ බැංකුවේ ලියා පදිංචි වෙලා නැහැ. ඒ නිසා අපට මේ ගැන තමුන්නාන්සේලාත් එක්ක කථා කරන්න බැහැ." කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට විනාඩියක කාලයක් ලබා දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒක මහ බැංකුවේ තත්ත්වය නම් ඉතාම කනගාටුදායකයි. අපි මේක නොවෙයි මහ බැංකුවෙන් බලාපොරොත්තු වෙන්නේ. සමහර මන්ත්‍රීවරු මහ බැංකුවට එක එක චෝදනාවන් කළා. අපේ ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, "මේවාට මහ බැංකුවේ සමහර නිලධාරීන් හවුල් වෙලා තිබෙනවා." කියලා. මේ ලියුම බැලුවාම මහ බැංකුවේ නිලධාරිනුත් මේකට හවුල් වෙලා තිබෙනවා ද කියලා මටත් හිතෙනවා. මොකද, මේ එවැනි ලියුමක්. රුපියල් මිලියන 600ක මිනිසුන්ගේ සල්ලි බංකොලොත් කරපු ආයතනය ගැන කථා කරන්න මහ බැංකුවෙන් වෙලාවක් ඉල්ලුවාම මහ බැංකුවෙන් ලියුමක් යවනවා, "වෙලාවක් දෙන්න බැහැ." කියලා. එතකොට ඒ මිනිසුන් පත්තරවල advertisements දමා ගෙන, ගුවන් විදුලිවල advertisements දමා ගෙන, ටීවීවල advertisements දමා ගෙන සල්ලි එකතු කරනකොට සෙලින්කෝ සමූහ ව්‍යාපාරයේ තිබෙන Ceylinco Profit Sharing Investment Corporation Limited එක කොතලාවල මහත්තයාගේ අයිතිය යටතේ තිබුණු ආයතනයක්. එහෙම ආයතනයක් licence එකක් නැතිව සල්ලි එකතු කරද්දි මහ බැංකුව කොහේද හිටියේ. මහ බැංකුව නිදා ගෙන ද හිටියේ? මහ බැංකුව ඒක දැක්කේ නැද්ද? එහෙම නැත්නම්, කොතලාවල මහත්තයා නිසා මහ බැංකුව අහක බලා ගෙන හිටියාද? ඒක තමයි අපට තිබෙන ගැටලුව වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මුදල් ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරන්න කැමැතියි. මේ අහිංසක මිනිසුන් අවුරුදු ගණන් වැඩ කරලා, මහන්සි වෙලා බොහොම අමාරුවෙන් හම්බ කර ගත්ත සල්ලි තමයි මේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම එක උදාහරණයක් කියලා නවත්වන්නම්. මේ ආයතනයේ සල්ලි තැන්පත් කරපු මම පෞද්ගලිකව දන්නා කොම්පඤ්ඤවීදියේ එක් කාන්තාවක් ඉන්නවා. එතුමිය ගෙදර ඉදි ආජ්ප හදලා, ආජ්ප හදලා කඩවල්වලට දාලා ඒ හම්බවෙන සල්ලි ටික තමන්ගේ පුතාගේ අධ්‍යාපනය වෙනුවෙන් මේ ආයතනයේ තැන්පත් කළා. ඒ සල්ලි ටිකත් හම්බවුණේ නැහැ. අන්න ඒ වාගේ අහිංසක මිනිසුන්ගේ සල්ලි ගරා ගන්න දෙන්න එපා. මා මුදල් අමාත්‍යතුමාගෙන් ඉල්ලනවා, ඔබතුමාගේ මැදිහත් වීමෙන් මේ අහිංසක මිනිසුන්ට සහනයක් ලබා දෙන්න කියලා. බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තූතියි. Next Hon. Seeniththamby Yoheswaran. You have ten minutes.

[பி.ப. 4.23]

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று ஜே.வீ.பீ. உறுப்பினர் மாண்புமிகு அநுர திஸாநாயக்க அவர்களால் நிதி நிறுவனங்கள் சம்பந்தமாகக் கொண்டு வரப்பட்டிருக்கின்ற ஒத்திவைப்புவேளைப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு பேசுவதையிட்டு மிகுந்த மகிழ்ச்சியடைகின்றேன்.

உண்மையிலேயே வடக்கு, கிழக்கு மாகாணங்கள் யுத்தத்தால் பெரிதும் பாதிக்கப்பட்டவையாகும். அந்த மாகாணங்கள் பல துறைகளிலும் பாதிக்கப்பட்டுள்ள நிலையில், இன்று நுண்கடனாலும் பெரிதும் பாதிப்பை எதிர்கொண்டிருக்கின்றன. அந்த மக்களின் வாழ்வாதாரத்தைக் கட்டியெழுப்ப வேண்டிய இந்தக் காலகட்டத்திலே நுண்கடன் வழங்கும் திட்டம் அவர்களைச் சீரழிக்கின்றது என்பதை இன்று பலரும் அறிந்திருப்பார்கள்.

குறிப்பாக, 2009ஆம் ஆண்டு யுத்தம் முடிவடைந்ததன் பின்னர், பாதுகாப்புச் செயலாளரினால் வடக்கு, கிழக்கில் ஓர் ஆய்வு மேற்கொள்ளப்பட்டது. அந்த ஆய்வானது "1977ஆம் ஆண்டு தொடக்கம் 2009ஆம் ஆண்டு வரை 30 வருடங்களாகத் தொடர்ந்து தமிழர்களால் எப்படி யுத்தம் நடத்த

[ගරු සීතාම්බි යෝගේස්වරන් මහතා]

முடிந்தது?" என்பது பற்றியதாகும். ஆய்வின் முடிவில் கிடைத்த பதில், "தமிழ் மக்களது சுயசார்ப்புப் பொருளாதாரம் பலமாக இருக்கும்வரை அவர்களுக்குச் சிந்திக்க நேரமிருக்கும். அந்தச் சுயசார்புப் பொருளாதார வலு உடைந்துவிட்டால் சோறா, சுதந்திரமா? என்ற நிலை அவர்களுக்கு மத்தியில் உருவாகும்." என்பதாகும். உதாரணமாக, மலையகத் தமிழ் மக்கள்போல் அன்றாடம் காய்ச்சிகளாக அவர்களது பொருளாதார ஸ்திர நிலையை உடைத்துவிட்டால் அவர்களுடைய அரசியல் விடுதலைக் கோரிக்கை தானாகவே நீர்த்துப் போகும் என்பதாகும். அதுவே சம்பந்தப்பட்டவர்களது கணிப்பாகும். அப்படியானால் எங்களது நேரம் அனைத்தும் உழைப்பை நோக்கியதாகவே இருக்கும்; சிந்திக்க நேரமிருக்காது. தமிழ் மக்கள் விடயத்தில் இவ்வாறுதான் திட்டமிடப் பட்டிருக்கின்றது.

2009க்கு முன்னர் யுத்தம் நடந்தபோது தமிழர்கள் தங்களது அடிப்படைப் பொருளாதார இருப்பை உடையவிடவில்லை. கடந்த 30 வருடங்களாக யுத்தச் செலவோடு சுயசார்புப் பொருளாதார ஊக்குவிப்புக்கும் நிதி ஒதுக்கப்பட்டு தமிழ் மக்களது நிதிப் பொருளாதார நிலை ஓரளவு ஸ்திரத் தன்மையிலேயே இருந்தது. கடந்த 2009இல் யுத்தம் நிறைவுற்ற பின்னர் வடக்கு, கிழக்கில் 'லீசிங்' நிறுவனங்கள், 'பிரமிட்' வியாபாரம், விசேட நுண்கடன் நிதி நிறுவனங்கள் ஊடாக வடக்கு, கிழக்கு மக்களின் கணிசமான திரவப்பணம் தொக்கிச் சென்றுவிட்டது. அதாவது அந்தத் திரவப் பணத்தை மீண்டும் வடக்கு, கிழக்கிற்கு கொண்டுவரும் தமிழர்களின் அடிப்படைப் பொருளாதாரப் பொறிமுறையை முற்றாக அழித்துவிட்டார்கள்.

இன்று தமிழ் மக்கள் பலவிதத்திலும் பாதிக்கப்பட்டிருக்கிறார்கள். மட்டக்களப்பு மாவட்டத்தைப் பொறுத்தவரையில், நுண்கடன் என்பது அங்கு பாரிய தாக்கத்தை ஏற்படுத்தி வருகின்றது. இதனால் பல சீரழிவுகள் ஏற்பட்டுக் கொண்டிருக்கின்றன. நுண்கடன் வழங்கும் நிறுவனங்கள் 24 - 48 வீதம் வரை வட்டியை அறவிடுகின்றன. உண்மையிலே கடந்த சில காலங்களாக மட்டக்களப்பு மாவட்டத்திலே நுண்கடன் பெற்று, செலுத்த முடியாமல் இறப்பவர்களின் தொகை அதிகரித்துக் கொண்டு போகின்றது. கிட்டத்தட்ட 18 பேர் வரை இறந்திருப்பதாகத் தரவுகள் கூறுகின்றன. இந்த நுண்கடனைச் செலுத்த முடியாத சூழலினால் பல பெண்கள் வெளிநாடு செல்கின்றனர். இதனால் அவர்களுடைய பிள்ளைகள் பெரும் பாதிப்பை எதிர்கொள்கிறார்கள். அதன்மூலம் அவர்களின் கல்வி சீரழிக்கப்படுகின்றது. இந்த நுண்கடன் காலாசார ரீதியாகவும் பல பிரச்சினைகளை ஏற்படுத்திக் கொண்டிருக்கின்றது. மக்கள் இந்த நுண்கடனை எடுப்பதற்குக் காரணம் அந்த நிறுவனங்கள் கடன் வழங்கும் முறையை இலகுபடுத்தியிருப்பதாகும். அதாவது வங்கியின்மூலம் கடன் வழங்குகின்ற பல சட்டதிட்டங்கள் இறுக்கமாக இருக்கின்றன. ஆனால், நுண்கடன் வழங்குகின்ற நிறுவனங்களின் சட்டதிட்டங்கள் தளர்ந்த நிலையில் இருக்கின்றன.

வடக்கு, கிழக்கிலே கணவனை இழந்து குடும்பங்களுக்குத் தலைமைதாங்குகின்ற 80,000க்கும் அதிகமான பெண்கள் இருக்கின்றார்கள், பல பாதிக்கப்பட்ட முன்னாள் போராளிகள் இருக்கிறார்கள், புனர்வாழ்வளிக்கப்பட்ட முன்னாள் போராளிகள் இருக்கிறார்கள், காணாமலாக்கப்பட்டவர்களின் குடும்பத்தினர் இருக்கிறார்கள், மாற்றுத் திறனாளிகள் இருக்கிறார்கள். இவர்களின் வாழ்வாதாரம் கட்டியெழுப்பப் படுவது மிக அவசியமானதொன்றாக இருக்கின்ற நிலையில், அரசாங்கம் அதற்கான சரியான ஒரு திட்டமிடலை மேற்கொள்ளாதிருக்கின்றது. 2009க்கு முன் தமிழினம் யுத்தத்தால் அழிந்தது. அதற்குப் பின் இன்று எவ்வாறு தமிழினத்தை அழிக்கலாம் என்று மறைமுகமாக அரசாங்கமே திட்டமிட்டு செயற்பட்டுக் கொண்டிருக் கின்றதா? என்று எண்ணத் தோன்றுகின்ற வகையில், இன்று நுண்கடன் வழங்குகின்ற திட்டங்கள், மதுபானத் தொழிற்சாலைகள் அதிகரிக்கப்படுதல், மதுபான நிலையங்கள் அதிகரிக் கப்படுதல், வடக்கு, கிழக்கு போதைவஸ்த்திற்குரிய இடமாக மாற்றியமைக்கப்படுதல் முதலிய நிகழ்வுகள் அமைந்துள்ளன.

இந்தச் செயற்பாடுகள் பற்றி ஆராய்ந்து பார்க்கின்றபோது அவை தமிழ் மக்களை மறைமுகமாக அழித்துக் கொண்டிருப்பது தெரிகின்றது. இதுவரை தமிழர்கள் என்ன நோக்கத்திற்காக இந்த மண்ணிலே போராடினார்களோ, அந்தப் போராட்ட எண்ணங்களைச் சீரழிக்கும் செயற்பாடுகளாகத்தான் இன்று இந்தத் திட்டங்கள் அமுல் செய்யப்படுகின்றன. நுண்கடன் வழங்கும் நிறுவனங்கள் பற்றி ஆராய்வதற்காக பிரதேச அபிவிருத்திக் குழுக் கூட்டங்களுக்கு அந்த நிறுவனங்கள் சார்ந்தவர்களை அழைத்தால், "நாங்கள் மத்திய வங்கியின் கீழே செயற்படுகின்றோம். ஆகவே, நாங்கள் அவர்களுக்குத்தான் பதில் சொல்ல வேண்டும்" என்று அவர்கள் சொல்கின்றார்கள். அந்த வகையில்தான் அவர்களின் செய்பாடு இருக்கின்றது. ஆனால், இன்று இந்த நுண்கடன் நிறுவனங்களால் எமது மக்கள் பல்வேறு பாதிப்புக்களை எதிர்நோக்குகின்றார்கள்.

மட்டக்களப்பு மாவட்டத்தில் கிட்டத்தட்ட 26 நுண்கடன் வழங்கும் நிறுவனங்கள் பதியப்பட்டிருக்கின்றன. நுண்கடனை வழங்குகின்ற வங்கிகள் 16 இருக்கின்றன. தொண்டர் நிறுவனங்கள், கம்பனிகள்மூலம் கடன் வழங்கும் நிறுவனங்கள் 25 இருக்கின்றன. அதேநேரம் பல நுண்கடன் வழங்கும் நிறுவனங்கள் பதியப்படாமலும் இருக்கின்றன. இவையெல்லாம் முற்றாகத் தமிழர்களின் வாழ்வாதாரத்தையும் உயிரையும் பறித்துக் கொண்டிருப்பதை இந்தச் சபையிலே நான் கூறவேண்டும். யுத்தத்தால் பாதிக்கப்பட்ட மக்களுக்கு இழப்பீடுகளை வழங்குவது சிறந்த பரிகாரமாகும். மாறாக, நுண்கடன்மூலமாக அவர்களின் வாழ்க்கையினை அழிக்க முற்படுவது மிகவும் கொடுமையான செயலாகும் என்பதை நான் இந்தச் சபையிலே கூறிக்கொள்ள விரும்புகின்றேன். ஆகவே, நுண்கடனால் பாதிக்கப்பட்டுக் கொண்டிருக்கின்ற மக்கள் சார்பாக அரசாங்கம் கூடிய கவனம் செலுத் தவேண்டியயுள்ளது என்பதை நான் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

நுண்கடன் வழங்கும் நிதி நிறுவனங்களின் கடன் திட்டங்கள் தமிழ் மக்கள் மீதான ஒரு வகைப் பொருளாதார உளவியல் யுத்தமாகக் காணப்படுகின்றது. கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! வடக்கு, கிழக்கில் எத்தனை எத்தனை இளம் தாய்மார் இவ்வாறு பாதிக்கப்பட்டுத் தற்கொலை செய்துள்ளார்கள்? என்பதனை பெண் என்ற வகையில் நீங்கள் சிந்தித்துப் பாருங்கள்! இந்த நுண்கடன்களே இதற்கு காரணமாக இருக்கின்றன. அண்மையில் எனது ஊருக்கு அருகாமையில்கூட ஒரு மரணம் ஏற்பட்டது. அந்த மரண வீட்டின் ஓலம் என்னவென்றால், "நுண்கடன் படாதீர்கள்! நுண்கடனால்தான் இந்தத் தற்கொலை நடைபெற்றது" என்றவாறிருந்தது. ஏனென்றால், சம்பந்தப் பட்டவர்கள் அந்தக் குடும்பத்திலே பலருக்கு நுண்கடனைக் கொடுத்திருக்கின்றார்கள். அதாவது கணவனுக்கு வேறாகக் கொடுக்கின்றார்கள், மனைவிக்கு வேறாகக் கொடுக்

கின்றார்கள், பிள்ளைகளுக்கும் வோறாகக் கொடுக் கின்றார்கள். சம்பந்தப்பட்டவர்கள் கூடிய வட்டியைப் பெறுவதற்காகவே இந்தக் கடன்களை இலகுவாக வழங்கி ஊக்குவிக்கின்றார்கள். இதனால்தான் மக்கள் எல்லோரும் நுண்கடனைப் கடனைப் பெறுகின்றார்கள்.

ஒரு நிறுவனத்திடம் நுண்கடனைப் பெற்றுவிட்டு, அதைச் செலுத்த முடியாத நிலை ஏற்படும்போது, இன்னுமொரு நிறுவனத்தை நாடுகின்றார்கள். அங்கும் கடனைப் பெற்றுவிட்டு அதையும் செலுத்தமுடியாத நிலையில், இன்னுமொரு நுண்கடன் நிறுவனத்தை நாடுகின்றார்கள். ஆகவே, இந்த விடயத்தில் ஒரு சரியான நடைமுறையில்லை. அதாவது எத்தனை நுண்கடன் நிறுவனங்களிடமிருந்தும் கடன் பெறலாம் என்கின்ற நிலை அந்த மக்களுக்கு மத்தியில் ஏற்பட்டுவிட்டது. அதேநேரம் இந்தப் பாதிக்கப்பட்ட மக்கள் தமது வாழ்வாதாரத்தையும் பொருளாதார மேம்பாட்டினையும் கருத்திற்கொண்டு கடன்பெற முயல்கின்றார்கள். இருந் தபோதிலும் இந்த விடயத்தில் அரசாங்கத்தின்மீதும் குறை சொல்ல வேண்டியுள்ளது. ஏனென்றால், அரசாங்கம் சரியான முறையில் சமுர்த்தி வங்கிகளினூடாகத் திட்டமிட்டுக் கடன்களை வழங்கவில்லை. அடுத்தது, புனர்வாழ்வு அதிகாரசபையின் மூலமான கடன் வழங்கும் திட்டம் பாதிக்கப்பட்ட மக்களுக்கு மத்தியில் சரியாக அமுல்படுத் தப்படுவதில்லை. ஆனால், அதில் இறுக்கமான நடைமுறைகள் பின்பற்றப்படுவதன் காரணமாக மக்கள் அந்தக் கடனைப் பெற முயற்சிப்பதில்லை.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have only one more minute.

ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)
Madam, please give me two more minutes.

மட்டக்களப்பு மாவட்டத்திலே 2017 ஆம் ஆண்டு நடுப்பகுதியிலே 270 கோடி ரூபாய் சமுர்த்தி வங்கியில் வைப்பிடப்பட்டிருந்தது. ஆனால், அதைக் குறித்த வங்கியிலிட்டு வட்டியைப் பெறுவதில்தான் சம்பந்தப் பட்டவர்கள் ஆர்வம் காட்டினார்கள். ஆனால், பாதிக்கப்பட்ட மக்களுக்கு அவற்றைக் கொண்டு உதவியிருக்கலாம். புனர்வாழ்வு அதிகாரசபை யுத்தத்தால் பாதிக்கப்பட்ட மக்களுக்கு வழங்குகின்ற கொடுப்பனவுகளை மற்றும் கடனை கடுமையான நிபந்தனைகளை மேற்கொள்ளாது சரியான முறையில் மக்களுக்கு வழங்கியிருந்தால், அவர்கள் நுண்கடன் பெறுகின்ற வீதத்தைக் குறைத்திருக்கலாம். ஆகவே, அரசாங்கம் ஒரு தீர்மானத்திற்கு வந்து, நுண்கடன் காரணமாக உயிரை மாய்த்துக்கொள்ளச் சிந்திக்கின்ற குடும்பங்களின் நிலைவரங்களை ஆராய்ந்து அவர்களது கடன்களை நீக்குவதற்கு நடவடிக்கை எடுக்க வேண்டும். இது மிக முக்கியமானது.

இந்த நுண் கடனினால் வடக்கு, கிழக்கிலே பல உயிர்கள் பாதிக்கப்படும் நிலைமை இருக்கின்றது. இந்த விடயத்தில் அரசாங்கமும் நிதி அமைச்சும் கவனம் செலுத்த வேண்டும். அரசாங்கத்திற்கு வருமானம் வேண்டுமென்ற நோக்கத்திற்காக இன்று எமது மக்கள் அழிக்கப்படுவதை நாங்கள் ஒருபோதும் ஏற்றுக்கொள்ள முடியாது. ஆகவே, நுண்கடன் வழங்கும் நிறுவனங்கள்மீது பாரிய தடை விதிக்கப்பட ஏற்படுத்த வேண்டும். ஓர் ஆராய்வை மேற்கொண்டு அரச வங்கிகள்மூலம் அவர்களுக்கான கடன்களை வழங்குவதுடன், உரிய முறையில் அந்த நிதிகளை அவர்கள் மீளச் செலுத்துவதற்கான நடைமுறையும் வகுக்ககப்பட வேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன்.

ஒட்டு மொத்தமாகப் பார்த்தால் வடக்கு, கிழக்கில் வறுமை நிலை கூடுதலாக இருக்கின்றது. அங்கு முதலாவதாகக் கிளிநொச்சி மாவட்டமும், இரண்டாவதாக முல்லைத்தீவு மாவட்டமும், மூன்றவாதாக மட்டக்களப்பு மாவட்டமும், நான்காவதாக திருகோணமலை மாவட்டமும் காணப் படுகின்றது. அவர்கள் நுண் கடனைப் பெறுவதற்கு வறுமைதான் வழிவகுத்திருக்கின்றது. வீடமைப்பு அபிவிருத்தி அதிகாரசபையினால் வழங்கப்படுகின்ற வீடுகள் நடுத்தர வர்க்கத்திற்கு மாத்திரம் வழங்கப்படாமல் உண்மையிலே பாதிக்கப்பட்ட மக்களுக்கும் மானியமாக வழங்கப் படுவதற்கான ஒரு செயற்றிட்டம் அமுல் செய்யப்பட வேண்டும். அதன்மூலம்தான் அந்த மக்கள் வீடமைப்பதற்காகக் கடன் படுகின்ற நிலைமையை நீக்கலாமென்ற செய்தியைக் கூறி, இதிலே அரசாங்கம் கூடிய கவனம் செலுத்த வேண்டுமென்றும் வேண்டுகோள் விடுத்து, எனது உரையை நிறைவு செய்கின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you very much. මීළඟට, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.35]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට බොහොම ස්තුතියි. කඩා වැටුණු මූල්‍ය ආයතන සම්බන්ධයෙන් අද දින ඉදිරිපත් කර තිබෙන කල් තැබීමේ යෝජනාව විවාද කරන අවස්ථාවේදී කථා කරන්නට ලැබීම ගැන මම සතුටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙම මූල්‍ය සමාගම් ගැන කථා කරද්දී මෙවැනි තත්ත්වයක් ඇති වෙන්න හේතු වුණේ මොකක්ද කියන එක පිළිබඳව අපි විශේෂයෙන්ම සොයන්න ඕනෑ. සාමාන්‍යයෙන් අද කාලයේ නගරයක් දෙස බලනකොට හතු පිපෙනවා වාගේ මූල්‍ය සමාගම් ගණනාවක දැන්වීම්, බෝඩ් දකින්න පුළුවන්. 2005 වර්ෂය වන විට අපේ රටේ මූල්‍ය සමාගම් 28ක් පමණයි ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියා පදිංචි වෙලා තිබුණේ. නමුත්, 2005 සිට 2015 දක්වා වූ වසර 10 තුළ අලුතෙන් මූල්‍ය සමාගම් 16ක් ලියා පදිංචි වෙලා තිබෙනවා. මෙහි වැඩිවීම ආසන්න වශයෙන් සියයට 60ක්. සියයට 60ක් කියන්නේ ඉතා වැඩි ප්‍රමාණයක්. අපේ රටේ අවශ්‍යතා මත, රටේ ජනගහන වර්ධනයත් එක්ක, රටේ ආර්ථික වර්ධනයත් එක්ක මේ ප්‍රමාණය සියයට 5කින්, 10කින් වැඩි වුණා නම් ඒක ගළපාගන්න තිබුණා. නමුත්, සියයට 60කින් මූල්‍ය සමාගම් වර්ධනය වෙන්න මේ මූල්‍ය සමාගම්වලට අනුමැතිය ලබාදීම හරහා බරපතළ සැකයක් ඇති වෙනවා. මේ සම්බන්ධයෙන් අපි සොයා බැලුවාම අපි දැකපු දෙයක් තමයි, පසුගිය රජය කාලයේ විශාල මූල්‍ය සමාගම් ප්‍රමාණයක් රට තුළ හතු පිපෙනවා වාගේ ස්ථාපිත වෙලා තිබෙන්නේ තමුන්ගේ ගජමිතුරන්ව, තමුන්ගේ හිතවතුන්ව සතසන්න මූල්‍ය සමාගම් licence ලබාදීම නිසා බව. ඒක බරපතළ සැකයක්. ඒක අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා ගිය මූල්‍ය සමාගම් ප්‍රමාණයක් රට තුළ ස්ථාපිත කිරීමක් විධියට දකින්න පුළුවන්.

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

මේකත් එක්තරා ගැටලුවක් විධියට අපි හඳුනාගෙන තිබෙනවා. අපි සමාජය දෙස දකිද්දී, ගම දෙස දකිද්දී, නගරය දෙස දකිද්දී ඒක පේනවා.

2005, 2010 සහ 2015 කාලවලදී මූල්‍ය සමාගම් ගණනාවක් කඩා වැටුණා. ප්‍රමුඛ බැංකුව කඩා වැඩුණා. සෙලින්කෝ සමූහ ව්‍යාපාරය කියන්නේ ඉතා දැවැන්ත සමූහ ව්‍යාපාරයක්. ඒ ව්‍යාපාරයත් කඩා වැටුණා. මේ වාගේ මූල්‍ය ආයතන ගණනාවක කඩා වැටීම සිද්ධ වුණා. හැබැයි, ඒ කාලයේ ශ්‍රී ලංකා මහ බැංකුව, ඒ කාලයේ පැවති රජය අපි දන්නා දේවල්වලට අමතරව අපි නොදන්නා ගොඩාක් දේවල් සඟවාගෙන සිටියා. ඒ දවස්වල ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු කරපු ආකාරය පිළිබඳව අපට බරපතළ සැකයක් මතු වෙනවා. ඒ වාගේම, Entrust Limited කියන සමාගම බොහොම ප්‍රචලිත සමාගමක්. ඒකේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අපේ පාර්ලිමේන්තුවට ඥාතිකම් කියන, හිතවත්කම් කියන අයත් ඉන්නවා. Standard Credit Finance Limited කියන ආයතනය රුපියල් බිලියන 2.5ක වත්කම් අරගෙන, ඒ අය සියයට 65ක අයිතිය සහිතව Entrust Limited එකත් එක්ක එකතු වෙලා holdings සමාගමක් පිහිටෙව්වා. හැබැයි, මෙම holdings සමාගම විසින් ඒ රුපියල් බිලියන 2.5 පසුවදාම නැවත Entrust Securities PLC එකට ලබා ගත්තා. මෙතැනදී බරපතළ වංචාවක්, දූෂණයක්, හොරකමක්, මහ දවල් කොල්ලකෑමක් සිද්ධවෙලා තිබෙනවා. Standard Credit Finance Limited එකට නිකම්ම නිකම් කොළ කැල්ලක් විතරක් දීලා, මහ දවල් රුපියල් බිලියන 2.5ක් කොල්ලකාපු සිදුවීමක් ලෙස මෙය හඳුන්වන්න පුළුවන්. ඒ දවස්වල මහ බැංකු අධිපති විධියට සිටියේ අජිත් නිවාඩ් කබ්‌රාල් මහත්මයායි. එතුමා ඔය වාගේ වැඩවලට බොහොම සුප්‍රකටයි. ඒ දවස්වල ගම්වල තිබුණා, money ladder වාගේ මුදල් එකතු කරන පිරමීඩ ක්‍රම. අපි නම් දන්නා විධියට ඔය පිරමීඩ ක්‍රමවල godfather එයා තමයි. ඒවා අජිත් නිවාඩ් කබ්‌රාල් මහත්මයාලාගේ කාලයේ සිදුවූ දේවල්. දැන් මේවා බොහෝ අයට අමතක වෙලා. ඒ නිසා සමහරු ඉස්මතු කරන්න හදනවා, මේ රජයේ ආර්ථික වැඩ පිළිවෙළ, රටේ ආර්ථිකය ශක්තිමත් නැහැ කියලා. "ගොබෙල්ස්" න්‍යාය අනුව ආර්ථිකය හොඳ නැහැ, වැටිලා; වැටිලා; වැටිලා කියාගෙන යද්දී සමහරු එය විශ්වාස කරනවා නේ. මේක පට්ටපල් බොරුවක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඇත්තම කියනවා නම් අද අය වැය පරතරය සියයට 4.5 දක්වා පහළට ඇවිල්ලා තිබෙනවා. එය හොඳ තත්ත්වයක්. ඒ වාගේම, රටේ ආදායම් තත්ත්වය සියයට 12 සිට සියයට 15 දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. රටේ අපනයනය සියයට 11 දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේම, විදේශ විනිමය ශේෂය US Dollars 19 billion දක්වා ඉතිහාසයේ වැඩිම වැඩිවීම වාර්තා කරලා තිබෙනවා.

ජනවාරි මාසයේ සිට දිගින් දිගටම උද්ධමනය පහළට ගිහිල්ලා තිබෙනවා. ඍජු විදේශ ආයෝජන US Dollars 1.9 billion. මම හිතන විධියට මෙය වැඩිම, වාර්තාගතම ඍජු විදේශ ආයෝජන ප්‍රමාණයයි. ඒ ප්‍රමාණය අපට පසු ගිය වසරේ ලැබී තිබෙනවා. එහෙම නම් කොහොමද කියන්නේ, ආර්ථිකය කඩා වැටිලා කියලා? මේක පට්ටපල් බොරුවක්. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් ආවාම ආර්ථිකය ශක්තිමත් වෙනවා කියලා මතයක් තිබුණා. ඒක අනෙක් පැත්තට හරවන්න මාධ්‍යවලින්, එහෙම නැත්නම් කට මාධ්‍ය තුළින් මෙවැනි මතයක් ස්ථාපිත කරන්න හදනවා. හැමදාම ආර්ථිකය කඩා වැටිලා; ආර්ථිකය කඩා වැටිලා; ආර්ථිකය කඩා වැටිලා කියලා කියන්න උත්සාහ කරනවා. හැම තිස්සේම අපි ලෝක ආර්ථිකයත් එක්ක මේවා ගළපා ගන්න ඕනෑ. ලෝක ආර්ථිකයත් එක්ක බලන කොට අද දකුණු ආසියාවේ වේගයෙන් ඉදිරියට යන රටක් හැටියට මේ වසර දෙක ඇතුළත විශාල පිම්මකින්, විශාල ජවයකින් යුතුව මේ රජය කටයුතු කර තිබෙනවා. 2015දී අපි භාර ගත්තේ විශාල ණය කන්දක් තිබුණු රටක්. මහින්ද රාජපක්ෂ මහත්මයා මේ අර්බුදයට මුහුණ දෙන්න බැරිව, අර්බුදයෙන් ගොඩ යන්න බැරිව අවුරුදු දෙකකට කලින් ජනාධිපතිවරණය තියලා අර්බුදය මහහරින්න කටයුතු කළා. හැබැයි, අපේ රජය බලයට පත්වෙලා මේ අර්බුදයට මුහුණ දුන්නා. අපි ණය ටික ගෙව්වා. වෙලාවට අපි ඒ ණය ටික හරියට කළමනාකරණය කළා. ඒක කරන ගමන් සංවර්ධනය ඉස්සරහට අරගෙන ගියා. පසු ගිය කාලයේ ඇහුවා මොනවාද හැදුවේ කියලා. දැවැන්ත කර්මාන්තශාලා, දැවැන්ත ව්‍යාපෘති අවුරුදු එකහමාරකින් දෙකකින් හදන්න බැහැ. රාජපක්ෂ මහත්තයා 2005දී බලයට ඇවිල්ලා 2007දී highways හැදුවේ නැහැ. 2008දී highway එකක්වත් හැදුවේ නැහැ. ඔය ඔක්කොම හදන්න ගත්තේ 2009න්, 2010න් පස්සේ. ඒ වාගේ තමයි අපේ රජය යටතේත් පසු ගිය අවුරුදු දෙක, දෙකහමාර තුළ දැවැන්ත ව්‍යාපෘති ටික දැක්කේ නැහැ. හැබැයි, දැන් පෙනෙනවා. දැන් කුරුණෑගල දක්වා අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් ජනතාවට පෙනෙන්න තිබෙනවා. ඒ ව්‍යාපෘති වේගයෙන් ක්‍රියාත්මක වෙනවා. මම අද එන කොට දැක්කා, පැලියගොඩ සිට වරාය හරහා කුළුණු මතින් ඉදි වන කොටුවේ තිබෙන පෝට් සිටි එක දක්වා අධිවේගී මාර්ගයේ වැඩ පටන් ගෙන ඒ කටයුතු කරගෙන යනවා. තවත් දැවැන්ත ව්‍යාපෘති ගණනාවක වැඩ කරගෙන යනවා. මේවා දකින්නේ දැන්. හැබැයි, පසු ගිය අවුරුදු තුන තුළ කිසිදු අඩුවකින් තොරව ගමේ විශාල සංවර්ධනයක් කළා. රාජපක්ෂ යුගයේ මොනවාද වුණේ? රාජපක්ෂ යුගයේ සංවර්ධනය වුණේ හම්බන්තොට ගමේ; තමන්ගේ ගමේ විතරයි. එහෙම නොවෙයි, අද මුළු දිවයින පුරා සෑම ග්‍රාම නිලධාරී වසමකම විශාල සංවර්ධනයක් වෙලා තිබෙනවා. අපේ මුදල් ඇමතිතුමා සභාවේ ඉන්නවා ඇති. ගමේ සංවර්ධනය වේගවත් කරන්න "ගම්පෙරළිය" වැඩසටහන, මේ අවුරුද්දේ තව මාසයකින් දෙකකින් ගමට විශාල මුදල් ප්‍රමාණයක් එන -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ඔබතුමියට ස්තුතියි. මම කථාව අවසන් කරනවා.

"ගම්පෙරළිය" වැඩසටහන අපි ක්‍රියාත්මක කර තිබෙනවා. දැන් මේවා ජනතාවට දැනෙන්න පටන් ගන්නවා; ජනතාවට හැඟෙන්න පටන් ගන්නවා. මේවා සිදු වෙන කොට තමයි මේ කට්ටිය කලබලවෙලා ඉන්නේ. කලබලවෙලා හිටියාට මේගොල්ලන්ට තව අය එකතු කර ගන්න බැහැ. ඊයේ පෙරේදා නියෝජ්‍ය කථානායකතුමා පත් කරන කොට විපක්ෂය දෙකට බෙදිලා. එක කට්ටියක් යන්න ගියා. සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය ඡන්දයට ඉදිරිපත් වුණා. අන්තිමට එතුමියට ඡන්ද 53යි තිබුණේ. කලින් කිව්වා හැත්තෑ ගණනක් තිබෙනවා; අසූ ගණනක් තිබෙනවා කියලා. අන්තිමට තමන්ගේ හිටපු කට්ටියවත් එකතු කර ගන්න බැරි වුණා. බැසිල් මහත්මයාගේ කට්ටියේ නිශාන්ත රණතුංග මහත්මයාලා කැන්ටින් එකේ කුමන්ත්‍රණ කරමින් හිටියා. මෙතැන හිටියේ ගෝඨාභය මහත්මයාගේ කල්ලියේ ප්‍රසන්න රණතුංග මහත්මයා, වීරවංශ මහත්මයා, පද්ම උදයශාන්ත මහත්මයාලා විතරයි. ඒ නිසා මෙතැනත් විශාල බෙදීමක් තිබෙනවා. මම හිතන හැටියට බෙදීමට හේතුව මේ පැත්තේ හිටපු දහසයේ අපලය. දහසයේ අපලය ඒ පැත්තට ගියාට පස්සේ දැන් අපේ පැත්ත ශක්තිමත්වෙලා තිබෙනවා; ඒ පැත්තේ බෙදීමක්

තිබෙනවා. මේ දහසය මේ පැත්තේ ඉන්නකම් රටෙත් නියහයක් තිබුණා. ඒ දහසය ඒ පැත්තට ගියා විතරයි රටට වහින්න පටන් ගත්තා. මේ දහසය ඒ පැත්තට ගියාට පස්සේ ආණ්ඩු පක්ෂයට හොඳ කල දශාවක් ඇති වුණා. ඒ දහසය ඒ පැත්තට ගියාම විපක්ෂයට නරක කල දශාවක් එන්න පටන් ගත්තා. ඒ ගැන අපි සතුටු වෙනවා. අවුරුදු දෙකහමාරක් තුළ අඩුපාඩු ඇති වුණා. හැබැයි, දැන් රට ඉදිරියට ගෙන යන වේගවත් ගමනක් ආරම්භ කර තිබෙනවා. "ගම්පෙරළිය " වැඩසටහන ආරම්භ කර තිබෙනවා. මේ තුළින් ඉදිරි වසර එකහමාර ඇතුළත දැවැන්ත සංවර්ධනයක් ඇති කරලා, රටේ ආර්ථිකය ශක්තිමත් කරන්නත්, ගමේ ආර්ථිකය ශක්තිමත් කරන්නත් ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරන්නත් කටයුතු කරන බව මතක් කරමින්, මේ අර්බුද නිරාකරණය කරලා ජනතාවට වඩා ශුභදායක ආර්ථික වැඩ පිළිවෙළක් ඇති කරන්න, මූල්‍ය ක්ෂේත්‍රයේ තිබෙන ආයතනය නිසි ලෙස කළමනාකරණය කරන්න මුදල් ඇමතිතුමාටත්, මහ බැංකුවටත්, එහි අධිපතිතුමාටත් ශුභ පතමින්, කාලය ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.43]

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දවසේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන කඩා වැටීම සම්බන්ධයෙන් වූ අතිශය වැදගත් කාරණාව පිළිබඳව ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ මහජන නියෝජිතයන් කථා කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉස්සර අපේ ගමේ ජනවහරේ, ඇත ගම් දනව්වල මිනිස්සුන්ට ගමේ පොලී මුදලාලි ගැන කිව්වාම, අපේ හිතේ, ගැමි ජනතාවගේ හිතේ ඇඳෙන්නේ ඉතාම කළු චරිතයක් හැටියටයි.

බඩ මහත, කළු මිනිහෙක්, මුදලාලි කෙනෙක් තමයි මතක් වෙන්නේ. බඩට උඩින් සුදු ටී-ෂර්ට් එකක් ඇදගෙන, කෝට් බෑයක් දමාගෙන ඉන්නා ගොඩක් උස මනුස්සයෙක්, ගමේ මිනිසුන්ට මුදල් පොලියට දෙන ගිනි පොලිකාරයෙක් තමයි අපට එදා මතක් වුණේ. 1977න් පස්සේ නව ලිබරල්වාදී - neo-liberal - ආර්ථිකයේ වැරහැල්ල, එහි අනතුර අපේ ජීවිතවලට, අපේ රටේ ගම් දනවුවල මිනිසුන් වෙතට කඩාපහත් වුණු හැටි තමයි අද මේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන කඩා වැටීම හරහා අපට පෙන්වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉස්සර ගම්වල මිනිස්සු පැල් කවි කිව්වේ, පාරු කවි කිව්වේ, කරත්ත කවි කිව්වේ, ජන කවි කිව්වේ හිතේ දුකට, කාංසියට, තනියට. ගොවිතැන පාලු වුණාට පස්සේ, කනකර බඩු ටික උකස් වුණාට පස්සේ, සින්න වුණාට පස්සේ, අනෙක් බඩු ටික උකස් වුණාට පස්සේ තමයි කවි පද ලිව්වේ. ඒ කාලයේ කිව්වේ මේ වාගේ කවි.

"ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ
දුක්දෙන අලි ඇතුන් පන්නා හරින්නේ
රක්මෙන දෙවියනේ වෙලෙ බත් බුදින්නේ
දුප්පත්කම නිසයි මම පැල් රකින්නේ"

දැන් මේ මූල්‍ය සමාගම්වල මුදල් තැන්පත් කරපු අපේ රටේ ජනතාවට වෙන්නේ මොකක්ද? ඔවුන්ගේ හෙට දවස ඉතාම නරක අනතුරකට පත්වෙලා ඉවරයි. දැන් ජනතාව ළඟට එන්නේ එදා ආපු කළුකඩ මුදලාලි නොවෙයි. මේ නූතන නව ලිබරල්වාදී ආර්ථිකය තුළ දැන් ඒ කාර්යභාරයට සුදු ඇඳුම් ඇඳගත්ත, කළු කෝට් දමා ගත්ත, සුදු පටිකාරයෝ, කළු පටිකාරයෝ එනවා. අද ඔවුන් ගම් දනවුවල සැරිසරනවා. ඔලොක්කුවට හිනා වෙන, ලස්සනට කථා කරන, උජාරුවට කථා කරන, වර්ණවත්ව අදහස් දෙන ඔවුන් බොහොම ලස්සන අනාගතයක්, ලෝකයක් මවලා විචිත්‍රවත් ආලෝකයක් අපේ ගම් දනවුවල මිනිසුන්ට ලබා දෙනවා. මේ සුදු පටිකාර කොම්පැනිවලට එදා ගමේ පොලී මුදලාලිට තිබුණු ප්‍රතිරූපය නොවෙයි තිබෙන්නේ. ඒ අයට අද තිබෙන්නේ, "ඒ කොම්පැනිය කාර්යශූරයි; සුහදශීලීයි; ප්‍රියමනාපයි; බොහොම ජේත්තුකාරයි" කියන ප්‍රතිරූපයයි. මේවාට රටේ කියන්නේ ෆිනෑන්ස් කොම්පැනි කියලායි. අන්න ඕවාට තමයි ෆිනෑන්ස් කොම්පැනි කියන්නේ! එදා හිටපු ඒ කළුකඩ මුදලාලිට තමයි අද ෆිනෑන්ස් කොම්පැනි කියන්නේ. අනේ! අපේ රටේ ජනතාවට මොකද වුණේ? එදා කළුකඩ මුදලාලිට තිබුණු ඒ කළු පින්තූරය වෙනුවට මේ ෆිනෑන්ස් කොම්පැනි ඇවිල්ලා සුදු පින්තූරයක් හදා ගත්තා. හැබැයි, කොරන්නේ පරණ රස්සාවම තමයි; පරණ වැඩේම තමයි. තමන්ගේ වටිනා දේවල් ඒ කොම්පැනිවල උකසට තබා, ගිනි පොලියට ණය ගැනීමට තරම් විශ්වාසයක් මේ රටේ ජනතාවට ඇති වුණා.

පසුගිය කාලයේ ඒ කොම්පැනි රූපවාහිනී advertisements දැම්මා, පත්තරවල දැන්වීම් පළ කළා. ඒ විතරක් නොවෙයි, බණ කියෙව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සමහර ෆිනෑන්ස් සමාගම් පෝයට බණ කියවනවා. සමහරු වකුගඩු රෝගීන්ට උදව් කරනවා. සමහරු ලේ දන් දෙන ව්‍යාපාර කරනවා. ඒවා-මේවා ඔක්කෝම කරලා මිනිසුන්ගේ හිතේ ප්‍රතිරූපයක් හැදුවා, මේ කොම්පැනි හරහා තමන්ගේ ජීවිතය වෙනස් කර ගන්න පුළුවන් කියලා. මිනිස්සු මුදල් ඉතුරු කරන්නේ හදිස්සියට ගන්නයි. නමුත් අන්තිමට වෙන්නේ සබ්බසකලමනාවම මේ කොම්පැනිවලට සින්න වෙන එකයි.

මේ කොම්පැනිවලට ආකර්ෂණයක් ඇති වුණේ ඇයි? ලොකු පොලියක් ගෙවන බවට දුන් ප්‍රචාරය නිසායි එවැනි ආකර්ෂණයක් ඇති වුණේ. ETI Finance Limited එක කඩා වැටීමෙන් මිනිසුන් 36,000ක් පමණ අසරණ වුණා. එය, ස්වර්ණමහල් ආයතනයට අයිති, ඊඒපී එදිරිසිංහලාට අයිති කොම්පැනියක්. මේ රටේ මහ බැංකුව යටතේ මෙවැනි ක්ෂුද්‍ර මූල්‍ය ආයතන 46ක් තිබෙනවා. ලියාපදිංචි මූල්‍ය සමාගම්වල රූපියල් කෝටි 3,600ක් තැන්පත් කළ තැන්පත්කරුවන් රට පුරා සිටියාය කියලා වාර්තා වෙනවා. මේ මූල්‍ය සමාගම් තැන්පත්කරුවන් රවටා මිනිසුන්ගේ මුදල් තැන්පත් කර ගන්නවා. ඒක තමයි මේ වෙලා තිබෙන්නේ. මිනිස්සු තමන්ගේ ජීවිත කාලය තුළ දුක් මහන්සියෙන් හොයා ගන්නා දේ තමයි මේවායේ තැන්පත් කළේ. ඉන්පසු මොකද වෙන්නේ? ඉහළ පොලියකට ණය දීමට හා වාහන ෆිනෑන්ස්වලට ඒ මුදල පාවිච්චි කරනවා. අඩු පොලියට මුදල් තැන්පත් කරගෙන, ගිනි පොලියට ණය දෙන ක්‍රමය තමයි මේ ෆිනෑන්ස් ආයතන හරහා අපේ ගම් දනවුවල සිද්ධ වන්නේ.

අපි මේ ගැන අහන්නේ මහ බැංකුවෙන්. මහ බැංකුවේ නිලධාරී මහත්වරු අද ඇවිල්ලා ඉන්නවා. මේ ආයතන 46 මහ බැංකුවෙන් අධීක්ෂණය නොකරන්නේ ඇයි? මූල්‍ය ආයතන 51ක් තිබෙනවා. පසුගිය අවුරුදු කිහිපය තුළ මේ මහ බැංකුව අධීක්ෂණය කරලා තිබෙන්නේ එවැනි ආයතන 31ක් පමණයි. මේ රටේ මහා මූල්‍ය වංචාවක්, මුදල් කොල්ලයක්, මහා ජාවාරමක් වෙනකොට මහ බැංකුව නිදා ගෙන ඉන්නේ ඇයි?

[ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා]

අපි තමුන්නාන්සේලාගෙන් අහනවා, මේක නූතන වහල් වෙළඳාමක්ද කියලා. මේක නූතන වහල් වෙළඳාමක්. මේ ක්ෂුද්‍ර ණයලාභීන් විදින දුක හොයලා බලන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ සමහර ආයතන රටට ගුණ ධර්ම කියනවා. සමහර ආයතන ත්‍රිපිටකයත් කියලා දෙනවා; සූත්‍ර පිටකයත් කියලා දෙනවා; රතන සූත්‍රයත් කියලා දෙනවා. හැමදාම ඒවා කිය කියා තමයි මේ සුදු පටිකාරයෝ ගම් දනව්වලට ගිහිල්ලා අසරණ මිනිසුන්ගේ කෝටි ප්‍රකෝටි ගණන් මුදල් එකතු කර ගත්තේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ලෝකයේ මොන කොම්පැනිය ද, මොන ආයෝජකයා ද සියයට සියයක් ආයෝජනය කරලා සියයට සියයක ලාභයක් හොයන්නේ? ලෝකයේ තිබෙන මත්ද්‍රව්‍ය වෙළඳාමේවත්, ලෝකයේ තිබෙන කුඩු වෙළඳාමේවත්, ලෝකයේ තිබෙන ලොකුම වෙළඳාම වන අවි ආයුධ වෙළඳාමේවත් සියයක් ආයෝජනය කරලා සියයක් ලාභ හොයන කොම්පැනි නැහැ. මහ බැංකුව හොයලා බලන්න ලෝකයේ කොතැනද සියයක් ආයෝජනය කරලා, සියයට 56 සිට 60 දක්වා පොලී අය කරන ක්ෂුද්‍ර මූල්‍ය ආයතන තිබෙන්නේ කියලා. ඒ වාගේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන ලෝකයේ කොහේද තිබෙන්නේ? ඒවා තිබෙන්නේ ලංකාවේ. ඒවා තිබෙන්නේ එංගලන්තයේ නොවෙයි. ඒවා තිබෙන්නේ ඉතියෝපියාවේ නොවෙයි. ඒවා තිබෙන්නේ ලතින් ඇමෙරිකාවේ නොවෙයි. ඒවා තිබෙන්නේ අප්‍රිකාවේ නොවෙයි. ඒවා තිබෙන්නේ ආසියාවේ වෙනත් රටවල්වල නොවෙයි. ඒවා තිබෙන්නේ ලංකාවේ. ඒ නිසා අගමැතිතුමා ඇතුළු මේ ආණ්ඩුවේ වගකීම තමයි මේවා ගැන සොයා බැලීම. හැත්තෑ හතෙන් පස්සේ තමුන්නාන්සේලා පටවපු මේ ආර්ථික ක්‍රමය ඇතුළේ, නව ලිබරල්වාදී ආර්ථික ක්‍රමයේ ප්‍රගුප්සාජනක නිරුවත තමයි මේ පෙන්වන්නේ. ඒ නිරුවතින් බැටකන මේ රටේ ජනතාව බේරා ගන්න දැන්වත් ඉදිරිපත් වෙන්න කියලා අපි ඉල්ලනවා. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ ඕනෑම ආයතනයක්, ඕනෑම ව්‍යාපාරයක් සියයක් ආයෝජනය කරලා සියයට 56ක් ලාභ ලබන්න පුළුවන්කමක් නැහැ. රන්ජන් රාමනායක ඇමතිතුමනි, එහෙම පුළුවන් මත්ද්‍රව්‍ය වෙළඳාමට, අවිආයුධ වෙළඳාමට පමණයි. ඒ නිසා මහ බැංකුවට වගකීමක් තිබෙනවා මත්ද්‍රව්‍ය වෙළඳාමටත් වඩා, ආයුධ වෙළඳාමටත් වඩා මේ කරන ලෝකයේ තුප්පහිම වෙළඳාමට එරෙහිව මැදිහත් වෙන්න. අපේ රටේ ඇත මොණරාගල, ඇත වෙල්ලස්සේ, ඇත හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්පාරේ, ත්‍රිකුණාමලයේ, වවුනියාවේ ගම්දනව්වල ඉන්න කැත්ත උදැල්ල අරගෙන හේන, කුඹුර සරි කරන අහිංසක ගොවීන්ගේ සල්ලි ටික තමයි රීරිමාංශ විධියට මේ උරා බීලා තිබෙන්නේ. ඒ නිසා මේ වහල් වෙළඳාම නවත්වන්න කියලා අපි ඉල්ලනවා. මේවා වැඩ කරන මිනිසුන්ගේ සල්ලි. මේ මූල්‍ය ආයතනවලට මේ සල්ලි ටික එකතු කරලා දෙන්න සුදු පටි දාගෙන ඒ ආයතනවල සේවකයන් පැය 16ක්වත් වැඩ කරන්න ඕනෑ. ඒ වාගේ වහල් සේවයක් කරලා තමයි ඔවුන් මේ ආයතනවලට සල්ලි හොයලා ගෙනැත් දෙන්නේ. මේ ආයතන ණය ගෙවන්නේ කොහොමද? සාමාන්‍යයෙන් වැඩ කරන මිනිසුන් ගැන අපි අහලා තිබෙනවා. වහලා සහ වහල් හිමියා ගැන අපි අහලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලැබී ඇති කාලය අවසානයි.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව විනාඩියක් දෙන්න.

මහ බැංකුවේ මහත්වරුනි, විද්වත් මහත්වරුනි, මහා වියත් ආර්ථික විශේෂඥ මහත්වරු මහ බැංකුවේ ඇති; මේ රටේ මුදල් අමාත්‍යාංශයේ ඇති. ඒ අයටයි අපි මේ කියන්නේ.වහලා වහල් හිමියාට ගෙවීම කරන්නේ කොහොමද? වහලා මෙහෙය කරන්නේ ශ්‍රමයෙන්. වහල් හිමියා ඒ ශ්‍රමය කොල්ල කනවා. නමුත් මේක ඇතුළේ මොකද වෙන්නේ? එක මිනිහෙක් වෙනුවට මුළු පවුලම තම ජීවිතයේ තිබෙන සියලු දේවල්, මුළු ඥාති සංහාරයම හැදිගැවෙනකම් කැප වෙලා කළත් මේ මූල්‍ය අර්බුදයෙන් ගොඩ එන්න බැහැ. වහල් හිමියා වහලාගෙන් හොරා කෑවාට වඩා, වහල් හිමියා වහලාගෙන් සුරාකෑවාටත් වඩා සුරාකෑමක් මේ ක්ෂුද්‍ර මූල්‍ය ආයතන විසින් අපේ ගම් දනව්වල කරනවා. ඒ නිසායි මේක කොල්ලයක් කියලා කියන්නේ. ඒ නිසා වහාම මේ ක්‍රියාවලිය පිළිබඳ සොයා බලලා, මේ තැන්පත්කරුවන්ගේ පොලී ගෙවීම වෙනුවෙන්, මේ තැන්පත්කරුවන්ගේ මුදල් ගෙවීම වෙනුවෙන් මැදිහත් වෙන්න.

අපි දන්නවා, ඊ. ඒ. පී. එදිරිසිංහ මහත්තයාගේ ඊඒපී සමාගම් ජාලයේ ස්වර්ණවාහිනිය ගැන. ස්වර්ණවාහිනී මාධ්‍ය ආයතනය මිලදී ගත්ත ලයිකා මොබයිල් ආයතනයට ස්වර්ණවාහිනී මාධ්‍ය ජාලයෙන් රටේ නීතිය අනුව දෙන්න පුළුවන් සියයට 40ක් පමණයි. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ වෙනකොට මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ඉහළ පුටුවල ඉන්න සමහර නිලධාරීන්ට මිලියන 200ක මුදලක් ලබාදීලා ඉතිරි සියයට 60ත් ලයිකා මොබයිල් ආයතනයට පවරන්න කටයුතු කරනවාය කියලා අපට ආරංචියි. එහෙම නම් ඒ කටයුතු කරන්න යන්නේ, අයථා ලෙස හොයාගත් වත්කම් හෝ අය කරගෙන, එහෙම නැත්නම් රජයට පවරාගෙන හෝ මේ අසරණ දුප්පත් මිනිසුන්ගේ මුදල් ටික නැවත ගෙවන්න කටයුතු කරන්න කියලා මේ ආණ්ඩුවට අවධාරණය කරමින් ඔබතුමිය මට ලබා දුන් කාලය පිළිබඳවත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ලකී ජයවර්ධන මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.55]

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉතා වැදගත් කාලෝචිත යෝජනාවක් සම්බන්ධයෙන් මේ උත්තරීතර සභාවේ සාකච්ඡා වන වෙලාවේ අදහස් පළ කරන්නට අවස්ථාවක් ලබා දීම සම්බන්ධයෙන් මම ඔබතුමියට ස්තුතිය පළ කරනවා. සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් සඳහා සාමාන්‍යයෙන් ලබා දෙන කාලය පැයකට සීමා වුණත්, මේ කාරණයේ වැදගත් භාවය සලකා රජය මේ සාකච්ඡාව සඳහා පැය පහමාරක කාලයක් වෙන් කරලා මෙවන් ප්‍රශ්න විසඳන්නට යම් ක්‍රියාමාර්ගයක් ගැනීම ගැන මේ අවස්ථාවේදී මාගේ ප්‍රසාදය පළ කරනවා.

මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ, "මෑත කාලීනව රටේ ආර්ථිකයේ දැඩි අර්බුදකාරී තත්ත්වයක් ඇති වෙමින් පවතින අතර මූල්‍ය ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතන ගණනාවක කඩා වැටීම මහින්ද මෙම තත්ත්වය නිරූපණය වෙමින් තිබේ" කියලායි.

නමුත් මේක අලුත් දෙයක් නොවෙයි, මෙවන් ආයතන කඩා වැටීම දීර්ඝ කාලයක සිට පවතින බව අපි කවුරුත් දන්නවා. මෙවැනි ආයතන ආරම්භ වෙලා වසර 40ක පමණ කාලය තුළ මෙවන් අවස්ථා ගණනාවක් මේ රටේ ඇති වෙලා තිබෙනවාය කියන එක අපි කල්පනා කරන්නට ඕනෑ. ආර්ථික අහේනිය පිළිබඳව කථා කරනකොට, ආණ්ඩුවට ඒ පිළිබඳව චෝදනා කරන්නට විරුද්ධ පක්ෂයට අවස්ථාවක් නැහැ කියන එකයි මම දකින්නේ. ආර්ථිකයේ නියම කඩා වැටීම සිදු වුණේ එතුමන්ලාගේ කාලයේයි. 2015 ජනවාරි වන විට මේ රටේ තිබුණු ආර්ථික තත්ත්වයත්, අද රටේ තිබෙන ආර්ථික තත්ත්වයත් ගැන බලන විට අද වන විට යම් සැනසීමක් තිබෙනවා කියන එක අප පිළිගත යුතු වෙනවා. ඒ කෙසේ වෙතත් රටේ මෙවන් අවස්ථා නැති කිරීම රජයක වගකීමක් හැටියට මම දකිනවා. ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වන වැඩ පිළිවෙළ ගැන අපේ ගරු මුදල් ඇමතිතුමා කරුණු ඉදිරිපත් කළා. ඒ වාගේම අපේ ගරු මුදල් රාජ්‍ය ඇමතිතුමාත් මේ පිළිබඳව මැදිහත් වෙලා, මෙවන් තත්ත්වයන් අඩු කරන්නට, මර්දනය කරන්නට කටයුතු සලස්වයි කියලා අපි විශ්වාස කරනවා. අපේ මේ සාකච්ඡාව තුළ ඉදිරිපත් වුණු කරුණු කාරණා අනුව ඉදිරියේදී මෙවන් සිදුවීම් සීමා කරන්නට, නැති කරන්නට අවස්ථාව සැලසෙයි කියලා අපි විශ්වාස කරනවා.

මූල්‍ය කටයුතු පිළිබඳව කථා කරන මේ අවස්ථාවේ සඳහන් කළ යුතු තවත් කාරණයක් තිබෙනවා. අද වන විට පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ගණනාවකට අල්ලස් දුන් බවත්, ඒ සිද්ධියට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ගණනාවක් සම්බන්ධ බවත් කියමින් මාධ්‍ය තුළ විශාල ආන්දෝලනාත්මක ප්‍රචාරයක් ගෙන යනවා. 118 දෙනෙකු පිළිබඳව ගරු මන්ත්‍රීවරයකු දැක්වූ අදහසට අද මාධ්‍ය තුළින් විශාල ප්‍රචාරයක් ලබා දෙනවා. නිවැරදි මන්ත්‍රීවරුන් දෙදෙනෙකු හැරෙන්නට අනෙකුත් සියලුම මන්ත්‍රීවරුන් අල්ලස් ලබා ගත්ත බව තමයි සඳහන් වෙන්නේ. නමුත්, 1988 දේශපාලනයට පිවිසුණු මා පළාත් සභාවත්, ඒ වාගේම පාර්ලිමේන්තුවත් නියෝජනය කරමින් පැමිණි අවුරුදු 30ක දේශපාලන ගමන තුළ මෙවන් දෙයකට යොමු වෙලාවත්, අල්ලස් ලබාගෙනවත් නැහැයි කියන එක මතක් කරන්නට ඕනෑ. එම නිසා පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ නිමිකරු ඇලෝසියස් මහතාගෙන් කිසිදු මුදලක් හෝ උපකාරයක් ලබාගෙන නොමැති බව මම මේ අවස්ථාවේ දී සඳහන් කරනවා. විශේෂයෙන්ම මාධ්‍ය තුළින් කෙරෙන ප්‍රචාරය නිසායි මම මේ කාරණය ගැන සඳහන් කළේ. ඒ වාගේම අපි ආත්ම අභිමානයක් ඇතිව ජීවත් වෙනවා. රජයෙන් කියලා කිසිම දෙයක් ලබා නොගෙන, අල්ලස් නොගෙන දේශපාලන ගමනක නියැලෙනවා කියන එක මම සන්තෝෂයෙන් මේ අවස්ථාවේ දී සිහිපත් කරනවා.

මූල්‍ය ආයතන කඩා වැඩීම ගැන කථා කරනවා නම්, මේකට ප්‍රධාන හේතුව කළමනාකරණයේ අඩු පාඩු බවයි අපි දකින්නේ. ඒ වාගේම ජනතාවගේ අසීමිත ආශාවන් නිසා මේවාට ගොදුරු වෙන බව අපි විශ්වාස කරනවා. රජයේ බැංකු තිබියදී, විශ්වාස කරන්නට පුළුවන් ආයතන තිබියදී, එවන් ආයතනවල මුදල් තැන්පත් නොකර වැඩි පොලියක් ලබා ගැනීමේ අරමුණින් ජනතාව මේ ආයතනවලට යොමු වීම තුළින් අන්තිමට අමාරුවේ වැටෙන ආකාරය අපි දකිනවා. ජනතාව එවැනි ආයතනවල මුදල් තැන්පත් කිරීමට යොමු වීම තුළින් ඉතාමත් අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා, මාධ්‍ය තුළින් අපි දැක්කා. නමුත් මේ මූල්‍ය ආයතන කඩා වැටීම තුළ ජනතාවට සිදු වුණු අලාභයන්, පාඩුවන් මහ හරවන්නට රජය ක්‍රියාත්මක විය යුතුයි කියන එකත් අපි මතක් කරන්නට ඕනෑ.

අනවසර මුදල් ව්‍යාපාර, වංචනික තහනම් මූල්‍ය යෝජනා ක්‍රම මෙන්ම මූල්‍ය සමාගම් කඩා වැටීම තුළින්ද ඒ තැන්පත්කරුවන් අද වන විට දැඩි සේ අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා කියන එක අපි දකිනවා. ශ්‍රී ලංකාව තුළ මුදල් තැන්පත්කර ගැනීමට හා මුදල් ව්‍යාපාර පවත්වාගෙන යාමට 2011 මුදල් ව්‍යාපාර පනත බලපෑවත්, ඊට පරිබාහිරව මහජනතාවගේ මුදල් තැන්පතු භාර ගැනීම සිදුවන බවත් පෙනෙන්නට තිබෙනවා. විශේෂයෙන්ම සක්විති රණසිංහ මහතා කරපු එම ව්‍යාපාරය තුළ වුණත් විශාල පිරිසක් කරදරයට පත් වුණා. විශේෂයෙන්ම මහනුවර ප්‍රදේශයේ මේක මුලින්ම පටන් ගත්තේ 1990 ගණන්වල, මහනුවර මහින්ද මෝටර්ස් කියන ආයතනය. ඒ ආයතනය මහින් සියයට 25ක, සියයට 30ක පොලියක් ලබා දෙමින් මිනිසුන්ගෙන් මුදල් ලබාගෙන තැන්පත් කර ගත්තා. නමුත් අන්තිමට ඒ පොලී මුදලාලිත් නැති වෙලා යන තත්ත්වයට ඒ ව්‍යාපාරය කඩා වැටිලා විශාල පිරිසක් අසරණ තත්ත්වයට පත් වුණා. මෙවන් අවස්ථා මහ හරවන එක රජයේ වග කීමක්. විශේෂයෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ අවසරය ලබා තිබෙන -ශ්‍රී ලංකා මහ බැංකුවේ ලියා පදිංචි- මූල්‍ය සමාගම් කඩා වැටීම පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව වග කිව යුතුයි කියන එක අපි පිළිගත යුතු වෙනවා. ඒ අයට මෙවන් නිර්ණායකයන් මත ක්‍රියා කිරීමට කටයුතු සැලැස්වීම ඉතාම වැදගත් කියන එකත්, එවන් අඩු පාඩු ඇති කරන්නට කටයුතු කිරීම පිළිබඳව ඒ අය එම වැරැදිවලට වග කිව යුතුයි කියන එකත් අපි මතක් කරන්නට ඕනෑ.

මුදල් ව්‍යාපාර පනතේ ලියාපදිංචි මූල්‍ය සමාගම්වලට අමතරව විවිධ ව්‍යාපාර නාම ඔස්සේ තැන්පතු ලබා ගෙන ජනතාව නොමඟ යවා ඇති ආයතන තිබෙනවා. එම ආයතන පිළිබඳවත් විශේෂ අවධානයක් යොමු කරලා, වැරැදිකරුවන්ට දඬුවම් දීලා එවන් අවස්ථා සමාජයෙන් තුරන් කිරීමට, මේ සමාජයේ පවතින ව්‍යසනය නැති කරන්නට කටයුතු සැලසීම වැදගත් කියන එකත් සඳහන් කළ යුතු වෙනවා. ඒ වාගේම තමන්ගේ මුදල් ආයෝජනය කරන ආයතන සෑම විටම නීත්‍යානුකූල දැයි සොයා ගැනීම මහජනතාවට ඉතාම අසීරු කරුණක් වෙලා තිබෙනවා. ඒ වාගේම තමන්ගේ මුදලක් තැන්පත් කරනවා නම් ඒ ආයතනය කොයි ආකාරයේ ආයතනයක්ද, ඒ කෙරේ විශ්වාසයක් තබාගෙන කටයුතු කරන්න පුළුවන්ද කියා සොයා බලන එක ජනතාවගේත් වග කීමක් විය යුතුයි. එසේ කටයුතු කිරීම තුළින් ඒ අයට මේ වාගේ පාඩු ලැබීම් මහ හරවා ගන්න අවස්ථාවක් ලැබෙනවා කියන එකත් මා මතක් කරන්නට ඕනෑ.

බොහොමයක් තැන්පත්කරුවන් විශ්වාස කරනවා, ආයෝජන සහතිකය දුන් පසු ඒ කටයුතු නීත්‍යානුකූලයි කියලා. නමුත් ඒ ආයෝජන සහතිකය නීත්‍යානුකූල නැහැ. මුදල් ලබා ගැනීම පමණයි එවන් අවස්ථාවලදී කරන්න තිබෙන්නේ. නමුත් ආයෝජකයන් ගාව තමයි සියලුම බලතල තිබෙන්නේ. ඒක නිසා ඒ මුදල්වලට සුරක්ෂිතතාව නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. පසු ගිය කාලයේ අපි දැක්කා, ගෝල්ඩන් කී සමාගමේ කඩා වැටීම තුළ තැන්පත්කරුවන් 11දෙනෙක් ජීවිතක්ෂයට පත් වුණා. ලලිත් කොතලාවල මැතිතුමා එදා එම ව්‍යාපාරය සාර්ථකව කරගෙන ගියා. එතුමාගේ බංකොලොත්භාවය තුළ එවකට පැවති රජයේ සමහර දේශපාලනඥයන් එම දේපළ ලබා ගන්නට කටයුතු කිරීම තුළ එතුමාත් නැති වුණා, එතුමාගේ තැන්පත්කරුවනුත් ඉතාම අසරණ තත්ත්වයට පත් වුණා කියන එක අපි දකිනවා. ඒ ආකාරයට විශේෂයෙන්ම මෑතකදී -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ලකී ජයවර්ධන මහතා
(மாண்புமிகு லக்கி ஜயவர்தன)
(The Hon. Lucky Jayawardana)

ඒ වාගේම මෑතකදී ස්ටෑන්ඩඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ්, සිටි ෆිනෑන්ස් කෝපරේෂන් ලිමිටඩ්, සීඅයිඑෆ්එල් ආයතනය සහ එන්ට්‍රස්ට් සෙකියුරිටි ආයතනය තැන්පත්කරුවන්ට මුදල් ආපසු ගෙවීමට අපොහොසත් වෙලා තිබෙනවා. ඒක නිසා ඒ අයගේ සියලු දේපළ විකුණා හෝ මුදල් ලබා දීමට අවශ්‍ය කටයුතු සැලසීම වැදගත් කියන එක මම මතක් කරනවා. දැන් නවතම කඩා වැටීමට ලක් වී ඇති මූල්‍ය ආයතනය වන්නේ එදිරිසිංහ සමූහ ව්‍යාපාරයට අනුබද්ධ ඊටීඅයි ෆිනෑන්ස් ආයතනයයි. දිනපතා තැන්පත්කරුවන් විශාල පිරිසක් තමන්ගේ තැන්පතු ආපසු ලබා ගැනීම සඳහා එම ආයතනයට පැමිණෙන ආකාරය අපට පෙනෙන්න තිබෙනවා. නමුත් ඒ අයට පිළිතුරක් නැතිව ඒ අය ඉතා අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා කියන එක අපි දකිනවා. වසර ගණනාවක් තිස්සේ ඔවුන් උපයා ගත් ධනය මේ වන විට ඔවුන්ට යළි ලබා ගැනීමේ දුෂ්කරතාවන් මතු වී තිබෙනවා. තැන්පත්කරුවන් 25,000කට ආසන්න සංඛ්‍යාවක් මේ ගැටලුවට මුහුණ දී තිබෙනවා. ඒක නිසා එම තැන්පත්කරුවන් 25,000කගේ ගැටලු විසඳන්න කොයි ආකාරයෙන් හරි කටයුතු සැලසීම වැදගත් කියන එකත් මතක් කරන්නට ඕනෑ. විශේෂයෙන් මේ අවස්ථාව මහ හරවන්නට කටයුතු කර, මේ අඩු පාඩු සකස් කර, මේ රටේ යහ පාලනය ඇති කිරීම; යහපත් අන්දමින් පවත්වාගෙන යෑම, වග කීම් දරන සියලුදෙනාගේම වග කීමක් කොට සලකා ඒ කටයුතු ක්‍රියාත්මක කරන්නය කියා ඉල්ලා සිටිනවා. මේ අසරණභාවයට පත් වුණු ජනතාවට ඉතා ඉක්මනින්ම ඒ අයගේ සුවසෙත උදා කරගන්නට කටයුතු සලසවන්නය කියා ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

The next speaker is the Hon. Douglas Devananda. You have 15 minutes.

[பி.ப. 5.05]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபைக்குத் தலைமைதாங்குகின்ற உறுப்பினர் அவர்களே, நன்றி. இந்த நாட்டில் குறிப்பிட்ட தொகையிலான மக்கள் முகங்கொடுத்துள்ள, அதேநேரம் வடக்கு, கிழக்கு மாகாணங்களில் பெரும்பாலான மக்கள் குறிப்பாக, குடும்பங்களுக்குத் தலைமைதாங்குகின்ற பெண்கள் உள்ளிட்ட பொருளாதார வலிமை குன்றியவர்கள் மிக அதிகளவிலான பாதிப்புகளைத் தினமும் எதிர்நோக்குகின்ற ஒரு முக்கிய பிரச்சினை தொடர்பில் இந்தச் சபையிலே விவாதம் ஒன்றினை நடத்துவதற்கு வழிவகைகளை ஏற்படுத்தியுள்ள மக்கள் விடுதலை முன்னணிக்கு எனது நன்றியைத் தெரிவித்துக்கொள்ளும் அதேவேளை, இந்த விடயம் தொடர்பில் எனது கருத்துக்களையும் முன்வைப்பதற்கு வாய்ப்பு வழங்கியமை குறித்து உங்களுக்கும் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

யுத்தத்திற்குப் பின்னரான வடக்கு, கிழக்கு மாகாணங்களில் பல்வேறு இழப்புகளுக்கு மத்தியில் வாழ முற்பட்டு வருகின்ற, பொருளாதார வலுவில்லாத மக்களை இலக்காகக் கொண்டு இன்று அப்பகுதிகளில் 30க்கும் மேற்பட்ட நுண்கடன் நிறுவனங்கள் செயற்பட்டு வருவதாகவும், பொருளாதாரத்தின் மிக அதிக தேவைகளைக் கொண்ட எமது மக்களுக்கு மிகவும் இலகுவாக வழங்கப்படுகின்ற மேற்படி நிறுவனங்களின் மூலமான கடன்கள், 12 முதல் 25 வீதம் வரையிலான வட்டிகளுடன் மிகவும் வன்மையான முறைகளில் அறவிடப்படுவதாகவும் எமது மக்கள் தொடர்ந்து முறையிட்டு வருகின்றனர். மக்களுக்கு வழங்குகின்ற நுண் கடன்களின் தவணைப் பணங்களை அறவிடுவதற்கான அதிகாரிகளுக்கு இந்த நிறுவனங்கள் சலுகைக் கொடுப்பனவுகளை வழங்கி வருவதாலும், தவணைப் பணங்களை அறவிடாத அதிகாரிகளுக்கு மாத ஊதியங்கள்கூட வழங்கப்படுவதில்லை என்பதாலும், இந்த அதிகாரிகள் எமது மக்களைத் துன்புறுத்தியேனும் தவணைப் பணங்களை அறவிடவே முனைகின்றனர். இதற்காக இரவு வேளைகளில் வீடுகளுக்குச் செல்வது, பாலியல் அச்சுறுத்தல்களை மேற்கொள்வது, உயிர் அச்சுறுத்தல்களை மேற்கொள்வது, மோசமான வார்த்தைப் பிரயோகங்களைப் பிரயோகிப்பது போன்ற சம்பவங்கள் எமது பகுதிகளில் நாளாந்தம் நடந்தேறி வருகின்றன. அதேநேரம், மேற்படி தவணைப் பணங்களை அறவிடுவதற்கெனச் சில நிறுவனங்கள் சண்டியர்களையும் பணியில் அமர்த்தியுள்ள நிலைமைகளையும் காணக்கூடியதாக இருப்பதாக எமது மக்கள் தெரிவிக்கின்றனர். மேற்படி நுண் கடன் நிதி நிறுவனங்களின் செயற்பாடுகள் காரணமாக எமது பகுதிகளில் மக்கள் தற்கொலைக்குத் துணியும் நிலைமை நாளுக்கு நாள் அதிகரித்து வருவதையும் இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

நிதி நிறுவனங்களின் பெயரால் எமது மக்களைப் பாதிப்புக்களுக்கு உட்படுத்தி, அம்மக்களைத் தற்கொலைக்குத் தள்ளுகின்ற நிலைமையை எமது பகுதியில் 80களின் முற்பகுதியில் காணக்கூடியதாக இருந்தது. "சப்றா யுனிக்கோ பினான்ஸ் லிமிட்டெட்" என்ற தனியார் நிதி நிறுவனமே அன்று எமது மக்களின் பாரியளவிலான நிதியை மோசடி செய்திருந்தது. அந்த வகையில், எமது நாட்டு மக்களை மோசடி செய்கின்ற வழிமுறையை நிதி நிறுவனங்களுக்கு எடுத்துக் காட்டிய முன்னோடியாகவே இந்த சப்றா நிதி நிறுவனம் எமது வரலாற்றில் பதியப்பட்டிருப்பதை நான் இங்கு வேதனையுடன் எடுத்துக்கூற விரும்புகின்றேன். "54,018 ரூபா முதலீடு செய்தால் முதிர்ச்சியில் 1 இலட்சம் ரூபா கிடைக்கும்" எனக் கூறியும், மேலும் பல்வேறு கவர்ச்சிகரமான விளம்பரங்களை மேற்கொண்டும், 207 ஆம் இலக்கம், மின்சார நிலைய வீதி, யாழ்ப்பாணம், 61ம் இலக்கம், நியூ புல்லர்ஸ் வீதி, கொழும்பு 04 எனும் முகவரிகளைக் கொண்டு ஆரம்பிக்கப்பட்டிருந்த இந்த "சப்றா நிதி நிறுவனம்", எமது மக்கள் கஷ்டப்பட்டு உழைத்த பணத்தையும், தங்களது பெண் பிள்ளைகளின் திருமணத்திற்கென சிறுகச் சிறுக பெற்றோர்கள் சேமித்திருந்த பணத்தையும், ஓய்வூதியக்காரர்கள் தங்களது எதிர்காலம் கருதி சேமித்திருந்த பணத்தையும் அன்றே ஏப்பமிட்டு, இத்தகைய மோசடிகளுக்கு வடக்கில் பிள்ளையார் சுழி போட்டிருந்தது.

இந்த நிதி நிறுவனமானது கொழும்பில் தலைமையகத்தைக் கொண்டு ஆரம்பிக்கப்பட்டிருந்த நிலையில், இதனது முகவர் நிலையமானது யாழ்ப்பாணத்தில் "சப்றா உமா எக்ஸ்போர்ட் லிமிட்டெட்" என்றே ஆரம்பிக்கப்பட்டிருந்தபோதிலும், மேற்படி நிதி நிறுவனம் குறித்த விளம்பரங்கள் "சப்றா யுனிக்கோ பினான்ஸ் லிமிட்டெட்" என்றே மேற்கொள்ளப் பட்டிருந்தது. மேற்படி நிதி நிறுவனத்தால் யாழில் எமது மக்களிடமிருந்து கோடிக்கணக்கான பணம் சேகரிக்கப்பட்டு, பின்னர் அந்தப் பணம், இந்த நிதி நிறுவனத்தின்மூலமாக ஆரம்பிக்கப்பட்டு, இன்றும் யாழில் செயற்பட்டுக் கொண்டிருக்கின்ற ஓர் ஊடக நிறுவனத்திற்கு மாற்றப்பட்டு அபகரிப்புச் செய்யப்பட்டதென்றே தெரிய வருகின்றது.

அக்காலகட்டத்தில் எமது மக்களை ஆசை காட்டி சுருட்டப்பட்ட கிட்டத்தட்ட சுமார் 60 கோடி ரூபாவுடன் 1993ஆம் ஆண்டில் இந்த நிதி நிறுவனம் இழுத்து மூடப்பட்டபோது, யாழ்ப்பாணத்தில் அரச நிர்வாகம் செயலில் இருக்கவில்லை. இந்நிறுவனம் மூடப்பட்டு, அதன் நிர்வாக இயக்குநர் இந்தியாவுக்கும் தப்பியோடிவிட்டார். மேற்படி, மோசடிக்கு எதிராகச் சட்ட நடவடிக்கைகளுக்கான சில முயற்சிகள் மேற்கொள்ளப்பட்டிருந்தும், குற்றவாளிகள் இதுவரையில் தண்டனைக்கு உட்படுத்தப்படாத நிலையில், இதனை இன்றும் தமக்குச் சாதமாகப் பயன்படுத்திக் கொள்கின்ற சில நிதி நிறுவனங்கள் இன்றும் எமது மக்களை ஏமாற்றுகின்ற நிலைமைகளே தொடர்கின்றன.

இந்த சப்றா நிறுவனம் அன்று எமது மக்களிடையே மேற்கொண்டிருந்த நிதி மோசடி காரணமாக பலர் தற்கொலை செய்து கொண்டனர். இவர்களில் கோண்டாவில் கிழக்கு பகுதியைச் சேர்ந்த துரைரட்ணம் என்பவரது தற்கொலையானது அக்காலத்தில் மிகுந்த பரபரப்பை எற்படுத்தியிருந்தது. மேலும், பலர் மனநோயாளிகளாக ஆக்கப்பட்டிருந்தனர். எனவே, மோசடி நிதி நிறுவனங்கள் தொடர்பில் அவதானத்தைச் செலுத்துகின்றபோது, இந்த 'சப்றா யுனிக்கோ பினான்ஸ் லிமிட்டெட்' நிதி நிறுவனம் தொடர்பிலும் ஆராய்ந்து, உரிய சட்ட நடவடிக்கையினை எடுக்கும்படியும் கேட்டுக் கொள்வதுடன், தற்போது எமது பகுதிகளில் மேற்கொள்ளப்பட்டு வருகின்ற நிதி நிறுவங்களின் மோசடிகளைத் தடுத்து நிறுத்துவதற்கு, மேற்படி சப்றா நிதி நிறுவனத்தின் உரிமையாளர்களைச் சட்டத்தின் முன் நிறுத்துவதானது இன்றியமையாதது என்பதையும் இங்கு வலியுறுத்த விரும்புகின்றேன். குறிப்பாக, மேற்படி நிதி நிறுவனம் தொடர்பில் தனியானதொரு விசாரணைக் குழு அமைத்து, விசாரணைகளை மேற்கொண்டால் சப்றா நிதி நிறுவனத்திற்கும், மேற்படி ஊடக நிறுவனத்திற்குமுள்ள தொடர்புகள், பங்குகள் போன்ற விடயங்களை வெளிக்கொண்டு வரமுடியும் என்பதை இங்கு சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

'மலர்ந்தது தமிழர் ஆட்சி' என்று கூறிக் கொண்டு வந்த வடக்கு மாகாண சபையின் மூலமும் எவ்விதமான மக்கள் நலன்சார் திட்டங்களும் இல்லாத நிலையில், எமது மக்கள் இத்தகைய நுண்கடன் நிதி நிறுவனங்களின் சூழ்ச்சிகளில் சிக்குண்டு பல்வேறு பாதிப்புகளுக்கு உள்ளாகி வருகின்ற நிலை ஏற்பட்டிருக்கின்றது. இதே போன்றதொரு நிலைமையினைத்தான் அன்று 'தமிழனின் வங்கி' என்று கூறிக் கொண்டு வந்திருந்த சப்றா நிதி நிறுவனமும் எமது மக்களைப் பல்வேறு பாதிப்புகளுக்கு உட்படுத்தியிருந்தது.

வடக்கு, கிழக்கு மக்களுக்கான பொருளாதார உளவியல் யுத்தமாக மேற்கொள்ளப்பட்டு வருகின்ற இந்த நுண் கடன் நிதி நிறுவனங்களின் நடவடிக்கைகள் காரணமாக, வடக்கு, கிழக்கு மாகாணங்களில் நாளாந்தம் தற்கொலைக்கு முயற்சிப்போரின் எண்ணிக்கை அதிகரித்து வருகின்றது. இத்தகைய முயற்சிகளில் ஈடுபடுகின்ற பலர் சிகிச்சை பலனின்றி உயிரிழந்தும் வருகின்றனர். இத்தகைய நுண் கடன் நிதி நிறுவனங்கள் தொடர்பில் அரச தரப்பினருக்கு பல்வேறு முறைப்பாடுகள் முன்வைக்கப்பட்டுள்ள நிலையிலும், அரசு இது தொடர்பில் உரிய நடவடிக்கைகளை இதுவரையில் எடுத்துள்ளதாகத் தெரியவரவில்லை. ஏற்கெனவே, எமது மக்களின் பணத்தை மோசடி செய்துள்ள சப்றா நிதி நிறுவனத்தின் மோசடிக்காரர்கள் இத்தகைய நிதி நிறுவனங்களின் பின்னணியில் அல்லது வழிகாட்டிகளாகத் தற்போதும் இருக்கின்றார்களா? என்பது தெரியாது. சிலவேளை அப்படி இருந்தாலும் ஆச்சரியப்படுவதற்கு ஒன்றுமில்லை என்றே கூறவேண்டும்.

இத்தகைய நிலையில் இலங்கை மத்திய வங்கியின் 2017ஆம் ஆண்டுக்கான அறிக்கையின் இரண்டாவது பகுதியிலே, "வங்கிகளற்ற நிதி நிறுவனங்கள் மேற்பார்வை" எனும் தலைப்பின்கீழ் மொத்தமாக 51 நிதி நிறுவனங்கள் செயற்பாட்டில் இருப்பதாகவும், மேலும் 68 நிதி நிறுவனங்களை ஆரம்பிப்பதற்கு அனுமதி வழங்கப் பட்டிருப்பதாகவும் தெரிய வருகின்றது. இவ்வாறான அனுமதிகள் வழங்கப்படுகின்ற நிலையில், நுண் கடன் பிரிவுகளின் கட்டளைக்கும் மேற்பார்வைக்குமான திணைக்களம் ஒன்றும் செயற்பாட்டில் இருப்பதாகக் கூறப்படுகின்ற நிலையில், மேற்படி நுண் கடன் நிதி நிறுவனங்களால் எமது மக்கள் தற்கொலைக்குத் துணிகின்ற நிலைமைகள் ஏன் ஏற்படுகின்றன? என்ற கேள்வியே எமது மக்கள் முன்பாக எழுந்துள்ளது.

இன்று எமது மக்கள் பொருளாதார வலிமை இழந்தவர்களாக இருக்கின்ற நிலையில், அவர்களால் ஈட்டப்படுகின்ற சொற்பமான நிதிகூட பினான்ஸ், லீசிங், நுண்கடன் வட்டி, வீடமைப்புக் கடன் வட்டி போன்ற பல்வேறு பிரிவுகளால் தென் பகுதி நோக்கியே நகர்த்தப்பட்டு வருகின்றன. அது போதாமைக்குப் பிற மாவட்டங்களிலிருந்து சென்று வடக்கு, கிழக்கு மாகாணங்களின் வளங்கள் சூறையாடப்படுகின்ற நிலைமைகளும் இல்லாமல் இல்லை. பல்வேறு தொழில்சார் இடையூறுகள் ஏற்படுத்தப்படுகின்றன. எனவே, வடக்கு, கிழக்கு மாகாணங்களிலே எமது மக்களை வாட்டி வதைக்கின்ற மேற்படி நுண்கடன் நிதி நிறுவனங்கள் தொடர்பில் இந்த அரசு வலுவுள்ள, உரிய நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும் என நான் வலியுறுத்த விரும்புகின்றேன்.

மேற்படி நுண்கடன் சுமைகளிலிருந்து எமது மக்கள் விடுபடுவதற்கு அரச இலகு கடன் திட்டங்களை அறிமுகப்படுத்துவது என்பது அதற்கு ஒருபோதும் உரிய தீர்வாகாது. எமது மக்களைத் தற்போதுள்ள கடன் சுமைகளிலிருந்து மீட்க என இன்னுமொரு கடன் திட்டத்தினை அறிமுகம் செய்வதானது எமது மக்களை மீண்டும் படுகுழியில் தள்ளிவிடும் செயலாகும். எனவே, முதலில் மேற்படி நுண் கடன் நிதி நிறுவனங்கள் குறித்து உடனடி ஆய்வுகளை மேற்கொண்டு, நியாமற்ற வட்டி வீதங்களை ஒதுக்கிடவும், முறையற்ற வகையிலான கடன்கள் வழங்கப்பட்டிருப்பின் அவற்றை இரத்துச் செய்திடவும், அவரவர் பெற்ற கடன்களை அவரவர் வசதிக்கேற்ற தவணை முறையில் திருப்பிச் செலுத்துவதற்கு ஒரு கால அவகாசமும் வழங்கிட முன்வர வேண்டும். மேற்படி கடன்களில் பல வலுக்கட்டாயமாக எமது மக்கள் மத்தியில் திணிக்கப்பட்டிருப்பதால் இத்தகைய ஏற்பாடுகள் அவசியமாகும்.

அதேநேரம், எமது பகுதிகள் கடந்த காலங்களில் அடைந்துள்ள பாதிப்புகளையும், எமது மக்களின் பொருளாதார வீழ்ச்சி நிலைமைகளையும் கருத்திற் கொண்டு, அரசாங்கம் புனர்வாழ்வு அதிகாரசபையின் ஊடாக மேற்படி கடன் தொகையை மீளச் செலுத்துவதற்கு ஒரு விசேட ஏற்பாட்டினை மேற்கொள்ள வேண்டும். அந்த வகையில் எமது மக்கள் மீது வலியப் புகுத்தப்பட்டுள்ள மேற்படி கடன் சுமைகளிலிருந்து எமது மக்கள் மீளுகின்ற நிலையில், எமது மக்களது எதிர்கால வாழ்வு கருதிய வாழ்வாதாரங்களை மேற்கொள்வதற்கு அரசு குறிப்பிடுகின்ற ஓர் அரச இலகுக் கடன் முறைமைகளை

[ගරු ඩග්ලස් දේවානන්ද මහතා]

වழங்குவது ஆரோக்கியமாக அமையும் என்பதைத் தெரிவித்துக் கொள்கின்றேன். அந்தவகையில், இன்று நிதியமைச்சர் அவர்கள் ஒரு கருத்தினை முன்வைத் திருக்கின்றார். அதாவது, 1,50,000 ரூபாய்க்கு உட்பட்ட நுண்நிதிக் கடன்களைப் பெற்றுள்ள பெண்களின் கடன்களில் வட்டி வீதத்தை இல்லாதொழிப்பதற்கான கருத்தொன்றை முன்வைத்திருக்கின்றார். அந்த வகையில் நாங்கள் அதனை வரவேற்கின்றோம். அதனை மேலும் வலுப்படுத்தக்கூடிய வகையில் நடவடிக்கை எடுக்க வேண்டுமென கௌரவ அமைச்சர் அவர்களிடம் கேட்பதோடு, நான் இன்று முன்வைத்திருக்கின்ற இந்தக் கருத்துக்களையும் அமைச்சர் அவர்கள் கருத்திலெடுக்க வேண்டுமென்று கேட்டு, சந்தர்ப்பத்திற்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you. Next, the Hon. Abdullah Mahrooff. You have seven minutes.

[பி.ப. 5.17]

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று கௌரவ பாராளுமன்ற உறுப்பினர் அநுர திஸாநாயக்க அவர்களால் கொண்டுவரப்பட்ட ஒத்திவைப்புவேளைப் பிரேரணையின்மீது பேசுவதற்குச் சந்தர்ப்பம் தந்தமையை யிட்டுத் தங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். இன்று சம்பந்தப்பட்ட அரச அங்கீகாரம் பெற்ற நிதி நிறுவனங்கள் ஒழுங்காக இயங்காத நிலையில் மக்கள் பல்வேறு சோதனைகளுக்கு உள்ளாகியுள்ளார்கள்.

வடக்கு, கிழக்கிலே 30 வருட கால யுத்தத்திற்கு முகங்கொடுத்து தமது சொத்துக்களையும் மற்றும் பொருளாதாரத்தையும் இழந்திருக்கின்ற மக்களைக் கவருகின்ற வகையில் இந்த நுண்கடன் திட்டம் அமைந்திருக்கின்றது. அதாவது, நுண்கடன் கொடுக்கின்ற அரச அங்கீகாரம் பெற்ற, அங்கீகாரம் பெறாத பல மோசடி நிறுவனங்கள் யுத்தத்தால் பாதிக்கப்பட்டு முடங்கியுள்ள எமது பிரதேச மக்கள் மத்தியில் "உங்களுடைய பிள்ளைகளின் உயர் கல்விக்காக உதவி செய்கின்றோம்; 45 வயதுக்கு மேற்பட்டவர்களுக்கு 55 வயதாகின்றபோது கவர்ச்சியான ஓர் ஓய்வூதியத்தைத் தரப் போகிறோம்" என்றெல்லாம் கூறி தங்களுடைய கடன் திட்டத்திற்குள் அவர்களை உள்வாங்கிக் கொள்கின்றன.

ஆனால், இன்று இவ்வாறான நிதி நிறுவனங்களில் முதலீடு செய்தவர்களுடைய நிதியைப் பெறமுடியாத ஒரு சூழல் உருவாகியுள்ளது. அஜித் நிவாட் கப்ரால் போன்றவர்களுடைய - மத்திய வங்கியினுடைய அனுசரணையுடன் அங்கீகாரம் பெற்ற பல நிறுவனங்கள் மோசடியில் ஈடுபட்டதை 10 வருடங்களுக்குப் பிறகு நாங்கள் கண்டுகொண்டோம். குறித்த நிறுவனங்கள் கவர்ச்சிகரமான வட்டியை தருவதாகக் கூறியதால், அவற்றில் வைப்பிலிட்டு ஏமாந்தவர்கள் இன்று கூடுதலாக இருக்கிறார்கள். வடக்கு, கிழக்கிலே இவ்வாறான மோசடி நிறுவனங்கள் 60க்கும் அதிகமாக இருக்கின்றன. அதேநேரம் திருகோணமலை மாவட்டத்திலே 20க்கு மேற்பட்ட மோசடி நிறுவனங்களை மக்கள் இனங்கண்டுள்ளார்கள்.

இன்று மிக முக்கியமான நிதி நிறுவனங்கள் மோசடியில் ஈடுபட்டதன் காரணமாக 35,300 வாடிக்கையாளர்கள் பாதிக்கப்பட்டிருக்கின்றார்கள் என்பது உங்களுக்குத் தெரியும். இந்த நிலைமை ETI Finance Limited முதலிய நிதி நிறுவனங்களால் ஏற்பட்டுள்ளது. இவற்றில் 36 பில்லியனுக்கு மேல் வைப்பிடப்பட்டுள்ளது. ஆனால், அந்த வைப்பாளர்கள் குறித்த தொகையைப் பெறமுடியாத சூழல் ஏற்பட்டிருக்கின்றது. இன்று நாங்கள் முன்னர் இருந்த அரசாங்கம் செய்த மோசடிகளை சரிசெய்துகொண்டு போகின்றபோது பல சவால்களை எதிர்நோக்குகின்றோம்.

அண்மையிலே சர்வதேச விலைச்சூத்திரங்களுக்கமைவாக நாங்கள் பாவிக்கின்ற பெற்றோல், டீசல் போன்றவற் றினுடைய விலையை ஒரு சிறிய தொகையால் அதிகரித்தபோது எதிர்க்கட்சியில் இருந்து கூக்குரலிட்டார்கள். ஆனால், அன்று 157 ரூபாவாக இருந்த பெற்றோலின் விலையை 100 ரூபாவாகக் குறைக்க வேண்டுமென்றும், 80 ரூபாவாக டீசல் விற்கப்பட வேண்டுமென்றும், 50 ரூபாய்க்கு மண்ணெண்ணெய் விற்கப்பட வேண்டுமென்றும் சரத் என். சில்வா போன்ற உயர் நிதிமன்ற நீதியரசர்கள் தீர்ப்பு வழங்கியபோது, அன்றைய ஆட்சியாளராக இருந்த முன்னாள் ஜனாதிபதி அவர்கள் அந்தத் தீர்ப்பைக்கூட உதாசீனப்படுத்தினார். ஆனால், நாங்கள் இன்று இவ்வாறான விடயங்களையெல்லாம் நெறிப்படுத்தியிருக்கிறோம். இன்று சர்வதேச மட்டத்திலே அமெரிக்கா போன்ற நாடுகளுடைய செயற்றிட்டங்களினால் ஒரு ஸ்திரமான நிலையில்லாமல் விலைகள் அதிகரித்துக்கொண்டு போகின்றபோது, டொலரினுடைய விலையேற்றங்கள் வருகின்றபோது சாதாரண பாரம மக்கள் அதற்கு விலைகொடுக்க வேண்டியவர்களாக இருக்கின்றார்கள்.

இன்று எமது நாட்டிலே இனக்குரோதம் உள்ள அல்லது இனவாதம் பேசுகின்ற சில அமைப்புக்களும் மற்றும் இயங்கங்களும் செயற்படுவதன் காரணமாக சம்பந்தப்பட்ட மக்கள் பல்லாயிரக்கணக்கான கோடி ரூபாக்கள் பெறுமதியான சொத்துக்களை இழந்து அநாதரவாக இருக்கின்றார்கள். இதன் காரணமாக இன்று எமது நாட்டிலே முதலீடு செய்ய வருகின்றவர்கள் தயங்குகின்றார்கள். அதுமட்டுமல்ல அன்னியச் செலாவணியை இழக்கச் செய்கின்ற ஒரு நிலைமையையும் வெளிநாடுகளிலே இருந்து பெறப்படுகின்ற உதவித்திட்டங்கள்கூட இல்லாமற் போகின்ற சூழலையும் ஏற்படுகின்றது. இப்படிப்பட்ட நிலைமையிலே இனக் கலவரங்களை இனக் குரோதங்களை ஏற்படுத்துகின்ற அமைப்புக்களைச் சட்ட ரீதியாகத் தடை செய்ய வேண்டும். அதாவது அவர்களுக்கு இந்த நாட்டில் கிடைக்கின்ற அத்தனை உரிமைகளையும் இல்லாமற்செய்ய வேண்டும். சில கொந்தராத்துக்காரர்களை 'பிளக் லிஸ்ற்' செய்வதுபோன்று இவர்கள்மீதும் நடவடிக்கை எடுக்க வேண்டும். அவ்வாறான இனவாதிகள் நாட்டின் பிரஜைகளாக வாழ்கின்ற உரிமைகூட சட்டதிட்டத்தின் ஊடாகத் தடை செய்யப்பட வேண்டும். இப்படிச் செய்வதன்மூலம் எமது நாட்டினுடைய பொருளாதாரத்தை ஸ்திரப்படுத்த முடியும்.

நிதியமைச்சர் அவர்கள் போலியான நிதி நிறுவனங்களுக்குப் பல கட்டுப்பாடுகளை விதித்து நாட்டினுடைய நிதிச் சட்டத்தின் பிரகாரமே அவர்களுக்கான அங்கீகாரத்தை வழங்க வேண்டும். ஒரு ஒழுங்குபடுத்தப்பட்ட நிதி நிறுவனங்களை மட்டும் இந்த நாட்டு மக்களின்

தேவைகளுக்குப் பயன்படுத்த முடியும். இன்று அரசு சாதாரண மக்களுக்கு, பாதிக்கப்பட்ட மக்களுக்கு உரிய முறையிலே இலகு கடன்களைக் கொடுப்பதன்மூலம் இந்த நிதி நிறுவனங்களின் மோசடியை நிறுத்தலாம். அதேநேரத்தில் யுத்த சூழல் காரணமாக பாதிக்கப்பட்டு வட, கிழக்கு மாகாணத்திலே பெண்கள் தலைமைதாங்குகின்ற குடும்பங்களுக்கு எந்தவொரு கடன் திட்டமுமாக இல்லாமல் உதவித்திட்டங்களை அமுல்படுத்த வேண்டும். நிதி அமைச்சர் அவர்கள் கூறியதுபோன்று, அந்தத் தொகையை விதவைகள் பெறக்கூடிய சூழல் உருவாக்கப்பட வேண்டும்.

இந்த நிதி நிறுவனங்களுக்கு ஒழுங்குக் கட்டுப்பாட்டை விதித்து அவற்றைச் சரியான முறையிலே நடத்த வேண்டும். பெற்றோல், டீசல், மண்ணெண்ணெய் போன்ற பாவனைப் பொருட்களுக்கு எவ்வாறு விலைக் கட்டுப்பாட்டைக் கொண்டு வர வேண்டும் என்று நினைக்கின்றோமோ, அதேபோன்று குறித்த நிதி நிறுவனங்களை ஒழுங்குபடுத்தி, அவற்றைக் கட்டுக்கோப்புக்குள் வைத்துக்கொள்ளக்கூடிய ஒரு நிலைமையை அரசு உருவாக்க வேண்டும் என்று கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා 5.25]

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
බොහොම ස්තුතියි. මට විනාඩි පහක කාලයක් තිබුණා. ඊට පසුව විනාඩි 14ක් එකතු වුණාම මම හිතන විධියට විනාඩි 19ක කාලයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා කථා කරන්න, විනාඩි 19ක්.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ජනතා විමුක්ති පෙරමුණේ නායක ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා විසින් අද දින සභාව කල් තබන අවස්ථාවේදී ගෙනෙන ලද යෝජනාවට අදාළව ක්ෂුද්‍ර මූල්‍ය ආයතන මඟින් සිදු වන වැරදි, අඩුපාඩු ගැන කථා කරන මේ අවස්ථාවේදී මා විශේෂයෙන්ම ප්‍රකාශ කරන්න කැමැතියි, මේ වෙද්දී රට තුළ ගම්බදවත්, නගරබදවත් මේ මූල්‍ය ආයතන ක්‍රියාවලිය දිගින් දිගටම සිදු වන බව. මහ බැංකුව තුළ මෙවැනි ආයතන කීයක් ලියාපදිංචි වෙලා තිබෙනවාද කියලා අපි දන්නේ නැහැ. ඒ වාගේම මහ බැංකුව ඒ ආයතන කීයක් අධීක්ෂණය කරනවාද, නියාමනය කරනවාද කියන එක ගැනත් දේශපාලන අධිකාරිය විධියට අපි දන්නේ නැහැ; රාජ්‍යය පරිපාලනය කරන පුද්ගලයන් විධියට, රජය විධියට දන්නේත් නැතුව ඇති. නමුත් විශේෂ කාරණාව තමයි 2015 වසරට කලින් යම් කිසි පුද්ගලයෙක් ණයක් ගත්තා නම්,- උදාහරණයක් හැටියට කියනවා නම්, අපේ පළාත්වල රුපියල් 5,000ක මුදලක් ලබා දුන්නාම මාස දෙකකින් - දින 60කින්- රුපියල් 6,000ක් දෙන්න ඕනෑ. අන්න ඒ විධියට තමයි ගම් තුළ ඒ කණ්ඩායම් -පස් දෙනාගේ කණ්ඩායම කියනවා, විසි දෙනාගේ කණ්ඩායම කියනවා, එහෙම නැත්නම් තනි පුද්ගලයෙක් කියනවා,- මේ ණය ගත්තේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හැබැයි ඒ වකවානුව තුළ ඒ මුදලට ගෙවන්න ඕනෑ ගණන ගෙවන්න ඒ ජනතාවට හැකියාව තිබුණා. ඒ කියන්නේ, දවසට රුපියල් සියයයි. රුපියල් 5,000ක් සොයා ගන්නා මනුස්සයා වැල්ලට ගිහිල්ලා මාළු ටික අරගෙන ඒ මාළු ටික අළෙවි කළාම රුපියල් 7,500ක-8,000ක ආදායමක් ලැබුවා. එතකොට පලා ටික කඩන නැන්දා පලා ටික පොළට ගෙනැල්ලා විකිණුවාම රුපියල් හත් අටදහසක ආදායම ලැබුවා. දවසට රුපියල් සියයයි අයින් කරන්න ඕනෑ. මේ ක්‍රියාන්විතය දිගින් දිගට ගියා. දවස් පහක්-හයක් මේ වෙළෙන්දෝ, එහෙම නැත්නම් මේ ව්‍යාපාරිකයෝ ව්‍යාපාරික කටයුතු කළා. කිරි ගොවියාට ඒ මාර්ගයෙන් ආදායමක් ලැබුණා; කිරි ගොවියාගේ ආර්ථිකය ගොඩ නැඟුණා. පේශ කර්මාන්තය දියුණු වුණා, පේශ කර්මාන්තය වාගේ කර්මාන්ත කරන ස්වයං රැකියාලාභීන්ගේ අත මීට සරු වුණා. ඒ වාගේ විශාල විධියට ඒ ව්‍යාපාර තිබුණා.

අද වෙද්දී මේ මහ බැංකු වාර්තාවේම කියනවා, 2017 වසරේ කෘෂි කාර්මික නිෂ්පාදන දර්ශකය සියයට 10.9කින් අඩු වෙලා තිබෙනවා කියලා. මහ බැංකු වාර්තාවේ තිබෙන්නේ එහෙමයි. යල කන්නය පාළු වෙලා, යල කන්නයට අවශ්‍ය කරන පොහොර ටික හම්බ වෙන්නේ නැතුව, මහ කන්නයට අවශ්‍ය කරන වතුර ටික, පොහොර ටික හම්බ වෙන්නේ නැතුව කෘෂි කර්මාන්තය කඩා වැටුණාම ණය ගත්ත මිනිස්සු ඒ ණය ගෙවන්නේ කොහොමද? උතුරු පළාතේ, නැඟෙනහිර පළාතේ මන්ත්‍රීවරු, TNA එකේ මන්ත්‍රීවරු පැහැදිලිවම ප්‍රකාශ කළා, ඒ ගොල්ලන්ගේ ගම්වල 2015 වසරට කලින්, යුද්ධය ඉවර වුණාට පස්සේ, ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක වුණා; ඒ තුළින් ආධාර ලැබුණා; නිවාස ආධාර ලැබුණා; ස්වයං රැකියා ආධාර ලැබුණා කියලා. ඒවා තුළින් යමක් කර ගත්ත ජනතාව මේ ආණ්ඩුව ආවාට පසුව වහ බොන්න පටන් ගත්තාය කියලා කිව්වා. ඉතින් එහෙම තත්ත්වයට රට නිර්මාණය වුණේ ඇයි? කනකර උකස් තියන්න සිදු වුණේ ඇයි? කනකර සින්න වුණේ ඇයි? ජනතාව කබලෙන් ළිපට වැටුණේ ඇයි? ඒක ඒ පොලී මුදල ලබා ගන්න ඒ පොලී මුදලාලි සාධාරණීකරණය කිරීමක් නොවෙයි. බැංකුවෙන් එහෙම ණයක් ගන්න ක්‍රමයක් හදලා දුන්නේ නැහැ. ජාතික ආර්ථිකයේ එහෙම වැඩ පිළිවෙළක් නිර්මාණය වුණේ නැහැ. එහෙම වැඩ පිළිවෙළක් මේ බැංකු පද්ධතිය හරහා රජයේ බැංකුවලින් හෝ ජනතාවට ලබා දෙනවා නම්, ජනතාව යන්නේ අර කළුකඩ මුදලාලි ළඟට නොවෙයි; පොලී මුදලාලි ළඟට නොවෙයි. ඒ රාජ්‍ය බැංකු ගමට ගිහිල්ලා ගමේ ස්වයං රැකියාව හඳුනාගෙන කටයුතු කරනවා නම්, ඒකට මහ බැංකුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙනවා නම්, අද පොලිය නැතුව ජනතාවට මුදල් දීලා ජනතාවගෙන් මුදල් ගන්න පුළුවන් ක්‍රමවේදයක් හදන්න පුළුවන්. එහෙම නැත්නම් බොහොම සුළු පොලියකට ණය දීලා මේ ක්‍රමවේදය හදන්න පුළුවන්.

එහෙම නොකරන නිසා අපට පෙනෙන්නේ මොකක්ද? මහ බැංකුව කඩා මහ බැංකුවේ තිබෙන ධනය අර්ජුන මහේන්ද්‍රන් සිංගප්පූරුවට ගෙන ගියා. ඒ වාගේම, මහ බැංකුව කඩන කල් අදාළ නිලධාරීන් ඒ දිහා බලාගෙන සිටියා. අදත් ඒ නිලධාරීන් බලාගෙන ඉන්නවා, මේ මූල්‍ය සමාගම්වලින් රටට වන අහේනිය, රටට වන විනාශය දිහා. අප කොපමණ කථා කළත්, මේවා ගැන කොපමණ යෝජනා ඉදිරිපත් කළත්, රජයේ වැඩ පිළිවෙළක් නැත්නම්, රජයේ වැඩසටහනක් නැත්නම් මේ වැඩ පිළිවෙළ ඉදිරියට ගෙන යන්න පුළුවන්කමක් නැහැ. අපි දැක්කා, ඉස්සර finance companiesවලින් ඩිමෝ බට්ටා වාහන අරගෙන, ව්‍යාපාර කරගෙන විශාල විධියට දියුණු වූ ජනතාවක් සිටි බව. නමුත් අද මොකක්ද වෙලා තිබෙන්නේ? 2015 වර්ෂයෙන් පස්සේ, ඩිමෝ

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

බටිටා ගත් මිනිසුන් ඒවා ගෙන ගිහින් finance companiesවල ගොඩ ගහලා තිබෙනවා. අද ඒවා වෙන්දේසි කරගන්න බැහැ. වෙන්දේසි කරලා විකුණුවාට පසුව, එය ෆිනෑන්ස් කරලා ගත් මනුස්සයාට නඩුවක් වැටෙනවා. මොකද, වාහනයේ වටිනාකම ලක්ෂ 15යි, හැබැයි වෙන්දේසියෙන් ලැබෙන්නේ ලක්ෂ 7යි. ඒ ලක්ෂ 8 වෙනුවෙන් අර පුද්ගලයාට විරුද්ධව නඩුවක් දමනවා. ඒ පුද්ගලයාට සිය දිවි නසා ගන්නවා හැර වෙනත් විකල්පයක් නැහැ. රුපියල් 10,000ක් 12,000ක් ගෙවන්න බැරි මිනිහා රුපියල් ලක්ෂ 7ක්, 8ක් ගෙවන්නේ කොහොමද?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, හිරේ යනවා කියන එක අපේ රටේ මිනිසුන්ට ලජ්ජාවක්. මහ බැංකුව කඩපු අයට එරෙහිව අද නීතිය ක්‍රියාත්මක වන්නේ නැහැ. නමුත් ඉහතින් කිව්වා වාගේ පොලියට ගත්, ෆිනෑන්ස් කර විවිධ දේ ගත් මිනිස්සු අද අන්ත අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා. සුළු පරිමාණ ද, මධ්‍ය පරිමාණ ද, මහා පරිමාණ ද කියා භේදයක් එයට නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ ප්‍රදේශයේ සහල් නිෂ්පාදකයන් විඳින දුෂ්කරතා අපි දකිනවා. දැන් සහල් නිෂ්පාදකයන්ට වී ගන්න හැකියාවක් නැහැ. වී කලට වේලාවට ලැබෙන්නේ නැහැ. වී මාෆියාව පවත්වාගෙන යන්නේ කොම්පැනි දෙක තුනක්. අපි දන්නවා, රටේ ප්‍රධාන පුද්ගලයාගේ සහෝදරයා අද ඒ සහල් මාෆියාවේ ඉන්නවා කියා. ඒවා ගැන කවුරුවත් කතා කරන්නේ නැහැ. අද වී අස්වැන්න නෙළුවාම ඒ අස්වැන්න ගන්න යන අයට කුණු කොල්ලයට ඒ අස්වැන්න දෙන්න ගොවියාට සිද්ධ වනවා. වී තෙත ද, වේළිලා ද කියා කිසිවක් බලන්නේ නැහැ. ඒ වී ටික අරගෙන යනවා. ඒ සහල් මාෆියාව නිසා ජනතාව ලක්ෂ ගණනක් අවතැන් වෙලා ඉන්නවා. සුළු හා මධ්‍ය පරිමාණ මෝල් හිමියන් තුන්හාරසියයක් අද ඒ අයගේ කර්මාන්ත කර ගන්න බැරිව ඉන්නවා. අපි දන්නවා, ඒ මෝල් හිමියන් ඇවිත් රාජ්‍ය අමාත්‍යතුමා හමු වුණා; ඒ වාගේම, ඒ මෝල් හිමියන් ඇවිත් මුදල් අමාත්‍යතුමා හමු වුණා කියලා. නමුත් ආණ්ඩුව තුළ -රජය තුළ- වැඩ පිළිවෙළක් නැහැ. කන්න තුනක්, හතරක්, පහක් පාළු වෙලා. ඒ මෝල් හිමියන්ගේ මුදල ගෙවා ගැනීමේ වැඩසටහනක් නැහැ. අපි දැක්කා, 2015ට ඉස්සර වෙලා පැවැති රජයන් තුළින් ඒවා ක්‍රියාත්මක වුණු අන්දම. නමුත් දැන් ඒවා ක්‍රියාත්මක වන්නේ නැහැ. ඒ නිසා ගැටලු ගණනාවක් මතුව තිබෙනවා. ආණ්ඩුව දැන් හොඳ ක්‍රීඩාවක් පටන් ගෙන තිබෙනවා නේ. පාර්ශ්ව දෙකම ලැස්ති වෙලා ඉන්නවා, චෝදනා කරගන්න. දැන් මෝල්වලින් හම්බ කරන එක කරන්නේ ජනාධිපතිතුමාගේ පාර්ශ්වයෙන් කියා ලේසියෙන්ම බෝලය පාස් කරනවා, ආණ්ඩුව කරන එක්සත් ජාතික පක්ෂයේ අය. අපි දැක්කා ජනාධිපතිතුමා කෑ ගැහුවාම, ඊයේ පෙරේදා TNL ආයතනයේ පොල්ගහවෙල විකාශනාගාරයේ මොනවාද උපකරණ වගයක් ගලවාගෙන යනවා. එහෙම නම්, ඒ වාගේ දෙයක් අර මෝල් හිමියන් සම්බන්ධවත් කරන්න ඕනෑ. එසේ හෝ කරලා අර සාමාන්‍ය මිනිසුන් බේරාගන්න ඕනෑ. නමුත් එවැනි වැඩ පිළිවෙළක් නැහැ. ඒ නිසා අද රට තුළ මහා දරුණු තත්ත්වයක් නිර්මාණය වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මූල්‍ය ආයතනවල ලියා පදිංචිය දෙන වෙලාවට ඒ ආයතන ගැන මහ බැංකුව පරීක්ෂාවෙන් බලන්න ඕනෑ. අපි දැක්කා, පසුගිය කාලයේ සක්විතිලා සිටියා; දඬුවම් මුදලාලිලා සිටියා; තවත් එක එක විධියේ මුදලාලිලා සිටියා. පසුගිය දවස්වල ඒ අය ජනතාවට කිව්වා, තැන්පත් මුදල්වලට පොලිය සියයට 17ක්, 18ක් දෙනවා කියලා. ඉතින් ජනතාවත් පෙරේතකමට ගිහින් ඒ ආයතනවල සල්ලි තැන්පත් කරනවා. සමහර පුද්ගලයන් ගිහින් සමහර ආයතනවල මුදල් තැන්පත් කර තිබෙනවා, තමන්ගේ වකුගඩුව විකුණලා. තමන්ගේ වකුගඩුව රුපියල් ලක්ෂ පහට, හයට විකුණා ඒ මුදල් ටික ගෙන ගිහින් අර ආයතනවල විශාල පොලියකට තැන්පත් කළා. ඉදිරියේදී ජීවත් වෙන්න, ජීවනෝපාය ක්‍රමවේදයක් නොමැති නිසා ඔවුන් එසේ කර තිබෙනවා. තමන්ගේ වතු පිටි, හරකා බාන විකුණා ඒ මුදල් ටික ගෙන ගිහින් ඒ බැංකුවල දාලා තිබෙනවා. අද මොකක්ද වෙලා තිබෙන්නේ? අපේ ගරු වාසුදේව හිටපු අමාත්‍යතුමා කව්වා වාගේ මේ ආණ්ඩුව එන්න කලින් කිව්වේ, "අපි ආවාට පසුව මේවාට වැඩ පිළිවෙළක් හදනවා, මේ මුදල් ටික ගන්න ක්‍රමවේදයක් හදනවා" කියලායි. නමුත් අද ඒවා සිද්ධ වන්නේ නැහැ. දිගින් දිගටම ක්‍රමවේද ගැන කතා කරනවා විතරයි.

අපි දන්නේ නැහැ, මහ බැංකුවට හොයන්න බැරි ඇයි කියලා. ETI ආයතනය මුදලක් ගත්තා නම්, ඒ මුදල ආපසු දෙන්න ETI ආයතනයට කොපමණ ආදායමක් තිබෙනවාද; ඒ මුදල ඒ ගොල්ලෝ වර්ධනය කරන්නේ කොහොමද; සියයට 17ක ලාභයක් හොයන්නේ මොන වාගේ ව්‍යාපාරවලින්ද; ඒ ගොල්ලන් ඒ ව්‍යාපාරවල මුදල් වෙන වෙන දේවල්වලට යොදවනවාද යන මේවා ගැන හොයා බලන්න වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අමාත්‍යාංශවල කටයුතු සොයා බැලීමට දැන් අධීක්ෂණ මන්ත්‍රී තනතුරු ලබා දීලා තිබෙනවා. ඒ අධීක්ෂණ මන්ත්‍රීවරුන්ට රුපියල් ලක්ෂ හතර, පහ ආණ්ඩුවෙන් ගෙවනවා. මේ කාර්යයට ඒ අධීක්ෂණ මන්ත්‍රීවරුන් හෝ යොදවන්න ඕනෑ. තමන්ගේ අමාත්‍යාංශයේ වැඩ කටයුතු කරන්නේ නැති සමහර ඇමතිවරු මේ පාර්ලිමේන්තුවේ ඉන්න බව අපි දන්නවා. සමහර ඇමතිවරුන්ට අදාළ විෂයය නොවෙයි ඒ ඇමතිවරයා කරන්නේ. සමහර ඇමතිවරු ඒ විෂයයෙන් පිට ගිහිල්ලා ගෙවල් තිබෙන්නේ කාටද, හෝටල් තිබෙන්නේ කාටද, විදුලි බිල් තිබෙන්නේ කාටද, ඒවාට ගෙවන්නේ කවුද, ඒවාට සල්ලි එන්නේ කොහෙන්ද, ඒවා කරන්නේ කවුද කියන දේවල් හොයනවා. ඒ ආකාරයට රහස් පොලීසියෙන් කළ යුතු වැඩ කටයුත්ත භාර ගත්ත ඇමතිවරුත් මේ පාර්ලිමේන්තුවේ, මේ ආණ්ඩුව ඇතුළේ ඉන්නවා. ඒ ඇමතිවරුන්වත් ගිහිල්ලා, මේ ETI ආයතනය මොකක්ද කියලා කියන්න. හැබැයි, මම පැහැදිලිවම කියනවා, ඒ කියන ඇමතිවරු ETI ආයතනයට විතරක් යන්නේ නැහැ කියලා. මොකද, ETI ආයතනයෙන් වැඩිම මුදලක් අරගෙන තිබෙන්නේ ඒ කියන ඇමතිවරු නිසායි එහෙම යන්නේ නැත්තේ. මේ කියන ඇමතිවරු තමයි ETI ආයතනයෙන් වැඩිම මුදලක් අරගෙන තිබෙන්නේ.

රන්ජන් රාමනායක අපේ හිතවතා, දිවුලපිටිය ආසනයේ ඉඳලායි ගියේ. අපේ කංචන විජේසේකර මන්ත්‍රීතුමා එතුමාට පැහැදිලිවම අභියෝග කළා, "ඔබතුමා ETI ආයතනයත් එක්ක සම්බන්ධයි. ETI ආයතනයේ ගනුදෙනු ගැන මේ මිනිසුන්ට වග කියන්න; ඒ මිනිස්සු අතරට ගිහිල්ලා කථා කරන්න" කියලා. නමුත්, එතුමාට එහෙම යන්න බැහැ; යන්නේ නැහැ. "සමහර යාළුවෝ අමාරුවේ වැටුණාම, ඔවුන්ට උදව් කරන්න ධනවත් කාන්තාවෝ ඇසුරු කෙරුවා" කියලා 2017 වසරේ එතුමා "ලංකාදීප" පත්තරේට කියලා තිබෙනවා මම දැක්කා. ධනවත් කාන්තාවෝ ඇසුරු කරලා ඔවුන්ගෙන් මුදල් හොයලා දුන්නා කියලා රන්ජන් රාමනායක ඇමතිතුමා කියා තිබුණා. මේක තමයි තිත්ත ඇත්ත. ඒක තමයි එතුමා රහස් පොලීසිය ආකාරයට කරන කර්තව්‍යයේ තිත්ත ඇත්ත. වීදුරු ගෙවල්වල ඉඳලා ගල් ගහන්න එපාය කියලා තමයි අපට එතුමාට කියන්න තිබෙන්නේ. අද මේ වැදගත් විවාදය අපි කාටත් වැඩිය වැදගත් වෙන්නේ එතුමාටයි. එතුමාට තමයි අපේ කංචන විජේසේකර මන්ත්‍රීතුමා ETI ආයතනය ගැන කථා කරද්දී අභියෝග කරලා ඇඟිල්ල දිගු කරලා කිව්වේ, "ඔබතුමා ඇවිල්ලා මේවාට උත්තර දෙන්න" කියලා. අද පාර්ලිමේන්තුවේ ඒ වැඩ පිළිවෙළ නිර්මාණය වෙලා තිබෙනවා. නමුත්, එතුමා අද මේ පැත්තේවත් නැහැ; එතුමා අද පැත්තකවත්

නැහැ. එතුමා පුළුවන් නම් ඇවිල්ලා මේ අභියෝග භාර ගන්න ඕනෑ.

අතීතයේ නම් අපි අහලා තිබුණේ "ගණිකාව" කියන්නේ තමන්ගේ ශරීරය දීලා මුදල් හම්බ කරන තනතුරකට කියලා. ඒක කාන්තාවකට විතරයි අයිති. කාන්තාව විතරයි -අපේ රටේ නොවෙයි. ඒක අපේ රටේ නීතිගත වෙලා නැහැ. වෙනත් රටවල- ඒ ව්‍යාපාරයේ යෙදුණේ. මේ කියන විධියට සමහර යාළුවෝ අමාරුවේ වැටුණාම කාන්තාවන් ඇසුරු කරනවා කියන පිරිමි ඉන්න රටක් මේක; පිරිමි විතරක් නොවෙයි, පිරිමි ඇමතිවරු ඉන්න රටක් මේක; පිරිමි නළුවෝ ඉන්න රටක් මේක. ඒ ආකාරයට මේ ETI ආයතනයත් එක්ක සම්බන්ධ වෙලා මේ මුදල් කොහේට ගියාද, මොනවාට ගත්තාද, මොනවාද කළේ, ඒ වකවානුව තුළ ආශ්‍රය කළේ -ඇසුරු කළේ- මොන කාන්තාවද කියලාවත් අඩුම තරමින් කියන්න ඕනෑ. මම දන්නේ නැහැ එතුමා මොන ආගමේද කියලා. අපි දන්නවා රෝමානු කතෝලික ආගමේ මරිය මදලේනාට ගල් ගහලා මරන්න කියලා රටේ නීතිය තීරණය කළාම, ජේසු ස්වාමිදරුවෝ ඉදිරිපත් වෙලා කිව්වාලු, "ගල් ගහනවා නම් එවැනි වැරැද්දක් නොකළ කෙනෙක් පළමුවැනි ගල ගහන්න" කියලා. නමුත්, ඒ වැරැද්ද නොකළ කෙනෙක් එදා හොයා ගන්න පුළුවන්කමක් තිබුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද පාර්ලිමේන්තුවේ සිටින එකම ශුද්ධවන්තයා විධියට කටයුතු කරන්නේ කවුද? රන්ජන් රාමනායක මහත්මයායි. අද පාර්ලිමේන්තුවේ වෙන කවුරුවත් ශුද්ධවන්තයෝ නැහැ. කෝප් එකේ ඉඳගන්න ලජ්ජයි කියනවා. එතුමා සියලුදෙනාට දෝෂාරෝපණය කරනවා. හැබැයි, කාන්තාවක් රැවටීම සම්බන්ධයෙන් චෝදනාවකට අදාළව රුපියල් 50,000ක ඇප නියම වූ නඩුවක් එතුමාට ගංගොඩවිල උසාවියේ තිබෙනවා. ඒ වාගේම, ගුරුවරියක් කසාද බඳිනවාය කියා එය පැහැර හැරීම සම්බන්ධයෙන් මහනුවර අධිකරණයේ නඩුවක් එතුමාට තිබෙනවා. අපි මේ රෙදි හෝදන්න නොවෙයි කථා කළේ; අපි මේ කථා කළේ වීදුරු ගෙවල්වල ඉඳලා ගල් ගහන්න එපාය කියන්නයි.

රන්ජන් රාමනායක මහත්මයා ඊයේ-පෙරේදා ඉඳලා ගෝඨාභය මහත්මයා හදපු ගෙවල් ගැන කියනවා; එතුමාගේ විදුලි බිලක් ගැන කථා කරනවා; එතුමාගේ තව දේවල් ගැන කථා කරනවා. නමුත් තමන්ගේ ඇහේ වැදී තිබෙන අසූචි ටික ගැන එතුමාට මතකයක් නැහැ. එතුමා කරන්නේ ගඳ ගස්සන එක විතරයි. මේ අවස්ථාවේ මුදල් රාජ්‍ය ඇමතිතුමා ඉන්න නිසා මම කියනවා, මේ කටයුත්ත භාර දිය යුතු නියම සුදුස්සා රන්ජන් රාමනායක මැතිතුමාය කියන එක. මේ ETI ආයතනයේ සිද්ධ වුණු මූල්‍ය අපරාධය සම්බන්ධයෙන් සොයා බලන්න, ඒ අධීක්ෂණ කටයුතු කරන්න රට වටේ යවන්න එපා. මෙතැනින් එහා පැත්තට ගියාම ඒ ආයතනයේ මුදල් ගියේ කොහේටද, කාගේ චිත්‍රපටය හදන්නද ගියේ, කාගේ යහළුවන්ට උදව් කරන්නද, පාව්විච් කළේ කා වෙනුවෙන්ද කියලා සමාගමේ සිටින ඥාතීන්, හිත මිත්‍රාදීන් නැත්නම් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ උදවිය ප්‍රකාශ කරයි. හැබැයි, අර 118 වාගේ නොවෙයි, එදාට එළියට එන්නේ. චෙක් කොළ ලියැවුණේ කොහොමද, රාමනායක මහත්තයාද මාරු කළේ, රියැදුරාද මාරු කළේ, එහෙම නැත්නම් සිකියුරිටි එකෙන්ද මාරු කළේ කියන එක කිසිම ප්‍රශ්නයක් නැතිව එදාට එළියට එයි. ඒ නිසා තමයි එතුමා මේවාට උත්තර බඳින්න ඉදිරිපත් වන්නේ නැත්තේ. මේක තමයි එතුමා නිතරම කියන "නිත්ත ඇත්ත." දැන් 118 දෙනෙක් ගැන කථා කරද්දී අපට භය නැතිව කියන්න පුළුවන්, අපි කිසිම පුද්ගලයකුගෙන් එක රුපියලයක්වත් අරගෙන මැතිවරණ කටයුතු කරලා නැහැයි කියලා. එතුමාට මම අභියෝගයක් කරනවා. ඒ වෙලාවේ රන්ජන් රාමනායක මාත් එක්ක තමයි දිවුලපිටියේ මැතිවරණයට තරග කළේ. නමුත් ඒ වෙලාවේ එතුමා ගත්ත මනාප ප්‍රමාණයට වඩා මනාප ප්‍රමාණයක් මම ඒ ආසනයෙන් ගත්තා. එතුමා සියලු දෙනාගෙන්ම මුදල් එකතු කරගෙන තමයි මැතිවරණය කළේ. මම කිසි කෙනකුගෙන් එක රුපියලක්වත් ගත්තේ නැහැ. පුළුවන් නම් ඒ අභියෝගයත් භාර ගන්න. මම හිතන විධියට එතුමා කොහේ හරි ඉඳගෙන අද මගේ කථාව අහනවා. ඒක මම දන්නවා. ඒ නිසා ඒ අභියෝගයත් භාර ගන්න. එතුමා මුදල් ඉල්ලා ගෙන මැතිවරණය කරපු ආකාරය ගැන ලිඛිත සාක්ෂි මා ළඟ තිබෙනවා. ඒවා මට ඉදිරිපත් කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ශුද්ධවන්තයෝ කිසි නැනක නැහැ. යම් යම් අය අතින් යම් යම් වැරැදි අඩුපාඩු සිද්ධ වෙන්න පුළුවන්. ඒ වැරැදි හදාගෙන ඉදිරියට යන එක තමයි කළ යුත්තේ. දැන් කළ යුත්තේ මේ කබලෙන් ළිපට වැටුණු ජනතාවට පිහිට වෙන එකයි. ඒ නිසා තමයි අපි කිව්වේ මේ මූල්‍ය ආයතන මුදල් මංකොල්ලකමින් කරන කටයුතු ගැන සොයා බලන්න කියලා. මොකද, ETI ආයතනය ලබා ගත් රුපියල් කෝටි 3000ක්, 4000ක් පමණ වන මුදල ආයෝජනය කරපු තැනක් අපට පෙනෙන්නේ නැහැ. එහෙම තැනක් නැහැ. ආයෝජනය කරපු ව්‍යාපාරයක් නැහැ. තිබෙන ව්‍යාපාරවලින් එච්චර ලොකු ලාභයක් ලැබෙන්නේ නැහැ. එහෙම නම් ඒ මුදල ජනතාවට දෙන්නේ කොහොමද? අපි මුදලක් පොලියට ගත්තා නම්, ගමේ ඉන්න අභිංසක මනුස්සයා මුදලක් පොලියට ගත්තා නම් ඒ මනුස්සයා භයයි. කොහොම හරි ඇවිල්ලා පොලිය දෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
හොඳයි. බොහොම ස්තුතියි.

රුපියල් 5000ක් ගත්ත පුද්ගලයා භයයි. ඒ නිසා ඒ පොලිය ලබා දෙනවා. හැබැයි, ලක්ෂ ගණන් ගන්න පොලීකාරයා වාගේම තමයි අර ETI ආයතනයත්. ඒගොල්ලෝ ගන්නේත් පොලියට. ඒ මුදල ගෙනත් දෙන්නේ අභිංසක මිනිහායි. ඒකයි වෙනස. හැබැයි, ඒ පුද්ගලයා භය නැතිව, අර කිව්වා වාගේ සුදු කබාය දමලා, හරි ලස්සනට ටයි එක දාලා උජාරුවට යනවා. ඒ වාගේම අර වාගේ ඕනෑ සැප පහසුකමක් විඳින්න කැසිනෝ ශාලාද, එහෙම නැත්නම් රට සවාරියක්ද, රට සවාරි ගිහිල්ලා වෙන වෙන දේවල්ද, එහෙම නැත්නම් රන්ජන් රාමනායක මහත්තයලා වාගේ අයට වියදම් කරන්නද ඒ ඕනෑ දෙයකට වියදම් කරනවා. එහෙම වියදම් කරලා, කරන කටයුතු ගැන තමයි අධීක්ෂණයක් කළ යුත්තේ. ඒ නිසා මම නැවත නැවතත් කියනවා ඒ වැඩ පිළිවෙළ මින් ඉදිරියට කරන්නය කියලා.

මම මේ කාරණාව කියලා මගේ කථාව අවසන් කරන්නම්. අපේ නලින් බණ්ඩාර මන්ත්‍රීතුමා කිව්වා මෙවා 2015ට කලින් ලියා පදිංචි කළ ආයතන කියලා. රාජ්‍ය මුදල් ඇමතිතුමනි, ඒ ලියා පදිංචි කළ ආයතන ගැන සොයා බලන්න ඔබතුමන්ලාට අවුරුදු තුනහමාරක් හොඳටම ඇති. එහෙම සොයා බලලා අඩුපාඩුවක්, ප්‍රශ්නයක්, ගැටලුවක් තිබුණා නම් ලියා පදිංචිය අහෝසි කරන්න; අහෝසි කරලා ඒ ගොල්ලන්ගේ මූල්‍ය ආයතන විසුරුවා හරින්න පුළුවන්කම තිබුණා. ඒ කටයුත්ත කළා නම් ජනතාව මේ තත්ත්වයට වැටෙන්නේ නැහැ. මම හිතන විධියට දැන් එකක,

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

දෙකක කරලා ඇති. ඉදිරියට හෝ ඒක කරලා ජනතාව මුදවා ගෙන ජනතාවට මේ සහනය ලබා දෙන්න. ඒ මිනිස්සු වැස්සට තෙමෙනවා; අව්වට වේලෙනවා; සිය දිවි නසා ගන්නවා. ජනතාව ඒ තත්ත්වයට පත් කර තිබෙන්නේ වර්තමාන ආණ්ඩුව මිසක් පසු ගිය ආණ්ඩුව නොවෙයි කියමින් කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. මීළඟට ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.45]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ජනතා විමුක්ති පෙරමුණේ නායක, ඒ වාගේම විරුද්ධ පක්ෂයේ ප්‍රධාන සංවිධායක අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් ගෙනෙන ලද සභාව කල් තැබීමේ යෝජනාව ඉතාම වැදගත්, කාලෝචිත යෝජනාවක්. එතුමා මේ යෝජනාවට අදාළව සංඛ්‍යාලේඛන, දත්ත සහිතව කරුණු කාරණා ඉදිරිපත් කළා. ඒ වාගේම, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමාත් ඒ ඇතැම් කරුණු සම්බන්ධයෙන් ඉතා පැහැදිලිව -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

අතන් පිටකු, மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA *left the Chair, and* DEPUTY SPEAKER *took the Chair.*

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවෙන්ම ඔබතුමාට මා ශුභ පතනවා. ඔබතුමා නියෝජ්‍ය කථානායකතුමා හැටියට මූලාසනයේ ඉන්නකොට මට කථා කරන්න ලැබීමත් භාග්‍යයක් කොට සලකනවා.

මගේ මිත්‍ර ඉන්දික අනුරුද්ධ මන්ත්‍රීතුමාගේ කථාවේදී රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා ඉතාම දැඩි ලෙස විවේචනය කළා. මා හිතන හැටියට එතුමා මේ සභාවේ සිටින අවස්ථාවක ඒ විධියට කථා කළා නම් වඩාත් හොඳයි. ඒ නිසා පාළු ගෙයි වළං බිඳින්න එපාය කියලා මා එතුමාට යෝජනා කරනවා. එතුමා සභාවේ සිටින වෙලාවක එතුමා ගැන කථා කරන්න. අදත් එතුමා මේ සභාවට ඇවිල්ලා ගියා. මා ඒ ගැන වැඩි විස්තර කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමන්ලා ශාන්තුවරයන් වාගේ තමයි දැන් කථා කරන්නේ. කිසිම හොරකමකට, කිසිම වංචාවකට, කිසි දෙයකට අබ මල් රේණුවක තරමින්වත් සම්බන්ධ නැති, අඩු ගණනේ රහසින්වත් පව් නොකරපු විධියට තමයි කථා කරන්නේ. නමුත් මේ මූල්‍ය ආයතන සම්පූර්ණයෙන්ම කඩා වැටීම සිද්ධ වුණේ 2002 සිටයි. ඒ ගැන මා ඉතාම කනගාටු වනවා. එදා 2002දී ප්‍රමුඛ බැංකුව කඩා වැටෙනකොට, ශ්‍රී ලංකා මහ බැංකුව වෙන්න පුළුවන්, එවකට මුදල් ඇමතිවරයා වශයෙන් හිටපු කෙනා වෙන්න පුළුවන්, ඒ සඳහා අවශ්‍ය කටයුතු කරලා තිබුණා නම් ඒ කඩා වැටීම සිද්ධ වන්නේ නැහැ. 2002දී ප්‍රමුඛ බැංකුව කඩා වැටුණා. ඊට පස්සේ, 2008 වසරේදී 'සක්විති' පන්නයේ කූට ජාවාරම් බිඳ වැටුණා. මෙවැනි කූට ජාවාරම් ඇති වීමට හේතුව මොකක්ද? මේවා හරියාකාරව නියාමනයක් කළේ නැති නිසායි එහෙම වුණේ.

අද මේ අය මහ ලොකුවට කථා කරනවා. 2009 වසරේදී ගෝල්ඩන් කී ආයතනය ආරම්භ වෙලා, රුපියල් බිලියන 25කට වැඩි තැන්පත් තිබූ සෙලින්කෝ සමූහ ව්‍යාපාරය බිඳ වැටුණා. මේවාට වග කියන්න ඕනෑ කවුද කියලා මා අහනවා. අද අණ පනත් ගෙනැවිත්, මේ ආයතන නියාමනය කරන්න අපේ මුදල් අමාත්‍යවරයා, රාජ්‍ය අමාත්‍යවරයා කටයුතු කරද්දී එතුමා මේ විධියට කථා කරනවා. එතුමා ලජ්ජා නැතුව වීදුරු ගෙවල් ගැන කිව්වා. වීදුරු ගෙවල්වල ඉඳගෙන ගල් ගහන්න එපාය කියලා මා එතුමාටත් කියනවා. ඒ වාගේම, හැම කිල්ලෝටයකම හුනු තිබෙනවාය කියන එකත් මා විශේෂයෙන්ම මතක් කරනවා.

ETI Finance Limited ආයතනයේ, Swarnamahal Financial Services PLC (SFS) ආයතනයේ රුපියල් බිලියන 36ක් deposit කරලා තිබුණා. 35,300 දෙනෙකුට ඒ මුදල් ගෙවන්න තිබුණා. අපි දන්නවා, 2002 සිට ප්‍රමුඛ බැංකුවට ඇති වුණු තත්ත්වය. ප්‍රමුඛ බැංකුව සම්පූර්ණයෙන්ම කඩා වැටුණා. ඊට පස්සේ 2008දී සක්විති වාගේ අයත් ඒ තත්ත්වයට පත් වුණා. ඒ විතරක් නොවෙයි. 'දඬුවම් මුදලාලි' වාගේ අයත් බිහි වුණා. දඬුවම් මුදලාලි බිහි වුණේ කොහෙන්ද? කියන්න කනගාටුයි. දඬුවම් මුදලාලි බිහි වුණේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ නිජ භූමිය තුළින්. අද ඒ දඬුවම්ලා ආ ගිය අතක් නැහැ. දඬුවම් ළඟ සල්ලි තැබූ අයට මොකද වුණේ? ඒ ආණ්ඩුව ඒවාට උපක්‍රමයක් ක්‍රියාත්මක නොකළේ ඇයි? අද ඒවා ගැන කථා කරන්න බැරි කටේ පිට්ටුද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ අය විතරක් නොවෙයි, පාතාලයත් බිහි වුණා. ජූලම්පිටියේ අමරේ ගැන අද කවුරුත් කථා කරන්නේ නැහැ. තුවක්කුව අරගෙන, කමිසය නැතුව පාරේ යන රත්නවීරලා, වම්බොට්ටලා ගැන අද කථා කරන්නේ නැහැ. පාතාලය, 'දඬුවම්' වැනි අයගේ මූල්‍ය ආයතන සහ ගමේ හොර සල්ලිකාරයන් නිසා තමයි එදා රට ඒ තත්ත්වයට පත් වුණේ. මෙවැනි තත්ත්වයක් නිර්මාණය කරලා, අපට කුණු කන්ද දීලා, අපට ණය බර දීලා, නොයෙක් විධියේ ආපදා ඇතිවන්නට අවශ්‍ය කටයුතු කරලා, ඒ තුළින් සම්පූර්ණයෙන් මේ රට විනාශ කරලා, අද ඇවිල්ලා ලජ්ජා නැතුව කථා කරනවා; රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා ගැන කථා කරනවා.

මම අවසාන වශයෙන් මේ රටේ ග්‍රාමීය බැංකු ව්‍යාපාරය ගැන කියන්න ඕනෑ. මට කලින් ගාල්ල දිස්ත්‍රික්කයේ අපේ සහෝදර මන්ත්‍රී, ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමාත් ඒ ගැන ප්‍රකාශ කළා. විශේෂයෙන් දකුණේ තිබුණු ග්‍රාමීය බැංකු ව්‍යාපාරය තුළ ලොකුම කඩා වැටීම සිද්ධ වෙලා තිබෙන්නේ, හිටපු

අමාත්‍යවරයකු හැටියට කටයුතු කළ, හිටපු නියෝජ්‍ය කථානායකතුමාගේ හබරාදුව ආසනයේයි. හබරාදුව විවිධ සේවා සමුපකාර සමිතිය විසිපන්දාහක් වන ගනුදෙනු කරුවන්ට පොල්ල තිබ්බා. සිංහල වචනයෙන් කියනවා නම් එහෙමයි කියන්න වෙන්නේ. ඒවාට කිසිම ක්‍රියාමාර්ගයක් ගත්තේ නැහැ. ඒ පළාත් සභාව තිබුණේත් ඒ රජය යටතේ. ඒ අමාත්‍යවරු හිටියේත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. එහෙත් ඒවාට සාධාරණයක් කරන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ බරත් අද උසුලන්න වෙලා තිබෙන්නේ අපිටයි. ඒ නිසා තරාතිරම නොබලා, කවුද කියලා බලන්නේ නැතිව මේ රටේ තිබෙන ක්ෂුද්‍ර මූල්‍ය ආයතන තුළින් ඇතිවන මෙවැනි දේවල් නියාමනය කරන්න කියලා අපි කියනවා. මහ බැංකුවට ඒ පුළුවන්කම තිබෙනවා.

මේ ආයතන නොයෙක් වර්ගයේ ණය ලබා දෙනවා. සමහර වෙලාවට දුප්පත් අහිංසක මිනිසුන්ට විශේෂිත ණය ලබා දෙන්න පුළුවන්කම මේ ආයතනවලට තිබෙනවා. පොලී නැතිව මාස දෙක තුන ණය දෙනවා නම් මේ තත්ත්වයට පත්වෙන්නේ නැහැ. මේ මිනිසුන්ට ක්ෂුද්‍ර මූල්‍ය ආයතන බලෙන් ණය දෙන්නේ නැහැ. ඒ මිනිසුන්ගේ අහිංසකකමට, ස්වයං රැකියාවක් කර ගන්නට බැරිකමට, එදිනෙදා කීයක් හෝ හරි හම්බ කරගන්න කීයක් හෝ පොළී ගෙවලා මුදලක් අරගෙන එදා වේල සඳහා කටයුතු කරන අහිංසක පවුල් ලක්ෂ ගණනක් මේ තුළින් ප්‍රයෝජන ලබනවා.

අපි යමක් කරනකොට හැම පැත්තක් දෙසම බලන්නට ඕනෑ. විශේෂයෙන් රජයක් හැටියට අපට මේ කාරණාවලට මැදිහත් වෙන්න පුළුවන්. වර්තමාන රජය, මහ බැංකුව අද මේ සඳහා ප්‍රවේශ වෙනවා. ගරු මුදල් ඇමතිතුමා ප්‍රකාශ කළා වාගේ, ණය වර්ග හැටකට හැට පහකට වැඩි ප්‍රමාණයක් ක්‍රියාත්මක වෙනකොට -ලබන 22 වැනි දා වෙනකොට- ඒවා නියාමනය වෙනවා.

විශේෂයෙන් මේ ආයතන සඳහා තිබෙන නීති පද්ධතිය, පනත් සම්පූර්ණයෙන්ම වෙනස් කරන්න ඕනෑ. මේ රටේ දුෂණය වැඩියෙන්ම තිබෙන්නේ සමුපකාරවල. ඇතැම් සමුපකාරවල හොඳ අය ඉන්නවා. නමුත් අද වෙනකොට දුෂණයෙන්, වංචාවෙන් තොර ඒවා සොයා ගන්න බැහැ. ඒ නිසා මේ අණපනත් සම්පූර්ණයෙන්ම වෙනස් කරලා, අලුත් නීති පද්ධතියක් ඇති කරන්න ඕනෑ. ගරු රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා කිව්වා වාගේ පොලීසියට ගියාම පොලීසිය මේ ආයතනවලට අදාළ පැමිණිලි භාර ගන්නේ නැහැ. ඇයි ඒ? කෝටි ගණන්වල පැමිණිලි පොලීසිය භාර ගන්නවා ද? ලක්ෂයකට වැඩි මුදලක් සම්බන්ධයෙන් පැමිණිල්ලක් දාන්න වෙනකොට කාට පැමිණිලි කරනවාද කියලා මිනිස්සු දන්නේ නැහැ. අහිංසක මිනිස්සු මේ ආයතනවලට රැවටිලා. අද සමුපකාර ක්ෂේත්‍රය, ග්‍රාමීය බැංකු ක්ෂේත්‍රය සම්පූර්ණයෙන්ම කඩා වැටෙනවා. අද ගාල්ල දිස්ත්‍රික්කයේ තිබෙන සමුපකාර සමිති හැම එකකම ආයෝජනය කරන්න මිනිසුන්ට භයක් ඇති වෙලා තිබෙනවා. එක සමුපකාරයක සිද්ධ වුණ මේ හොරකම නිසා මේ රටේ සමුපකාර පද්ධතිය සම්පූර්ණයෙන්ම විනාශ වෙලා, මිනිසුන් අතර ඒ ගැන තිබෙන විශ්වාසය නැති වෙලා. මේ තත්ත්වය නිසා මිනිස්සු තවදුරටත් හිඟමනෙන් හිඟමනට පත් වෙනවා. මේ තත්ත්වය තුළ තමයි වැඩි පොලියක් ගෙවන්න වුණත් මිනිස්සු ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සොයාගෙන යන්නේ. අපි දෙයක් කරනකොට ඊට අවශ්‍ය පරිසරය නිර්මාණය කරන්න ඕනෑ.

ගරු මුදල් රාජ්‍ය අමාත්‍යතුමා අතින් ඉතා නිර්මාණශීලී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. ඒක ටිකක් හෙමින් තමයි කෙරෙන්නේ. මොකද, මේ කටයුතු ක්ෂණික නූඩ්ල්ස් වාගේ, අද පටන් අරගෙන හෙට ඉවර කරන්න පුළුවන් කමක් නැති නිසා. අපේ මේ අවුරුදු තුන තුළ රටේ තිබුණු සියලු අපරාධ, විනාශ නතර කරන්න බැහැ. යටිකුරු කර තිබුණු තත්ත්වය නැවත උඩුකුරු කරන්න කාලයක් යනවා. ඊට අවශ්‍ය සහයෝගය අපි දෙන්න ඕනෑ.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා කථා කළේ මේ අංශය ගැන නොවෙයි. එක එක අයගේ චරිත ඝාතනය කරන්නයි එතුමා කථා කළේ. එතුමා කාන්තාවන් ගැන නොයෙක් කථා කියනවා. ඔබතුමා නවක තරුණ මන්ත්‍රීවරයකු හැටියට මේ සභාවේ නැති මන්ත්‍රීවරුන්ගේ අයිතිය ආරක්ෂා වෙන විධියට ශිෂ්ට විධියට -අපි වාගේ- කථා කරන්න ඕනෑ. ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය අමාත්‍යතුමා ඉන්න වෙලාවක point of Order. එකක් නඟලා කියන්න, " ඔබතුමා මෙහෙම කළා නේද" කියලා. නමුත් එහෙම කථා කරන්න භයයි; කොන්දක් නැහැ. මොකද එතුමා කෙළින්ම පහර ගහන නිසා, පිළිතුරු දෙන නිසා. එතුමා දැන් දිවුලපිටිය ආසනයේ ඇත්තේත් නැහැ. ඒ නිසා ඔබතුමා භය වෙන්න ඕනෑ නැහැ. ගරු අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමනි, එතුමා දැන් දිවුලපිටිය ආසනයේ නැහැ. ඒ නිසා ඔබතුමා භය වෙන්න ඕනෑ නැහැ. නීති විරෝධීව පස් කපනකොට එතුමා ගිහින් නීත්‍යානුකූල කටයුතු කරද්දී ඒ තුළින් එතුමා යම් අපහසුතාවකට පත් වුණා. ඒවා සිද්ධ වුණේ කාගේ කුමන්ත්‍රණ නිසා ද කියලා අපි දන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඇත්තටම සතුටු වෙනවා, රජයක් හැටියට, යහපාලන ආණ්ඩුව හැටියට ඉතාම හොඳ මූල්‍ය විනිවිදභාවයක් ඇති කරන්න අද කටයුතු කරමින් යන එක ගැන. මූල්‍ය විනිවිදභාවය සම්පූර්ණයෙන් විනාශ වෙලායි තිබුණේ පසුගිය කාලයේ. ඒක අමුතුවෙන් කියන්න අවශ්‍ය නැහැ. ඒ සඳහා ඕනෑතරම් උදාහරණ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු පෙන්වා දුන්නා; අපේ මන්ත්‍රීවරුත් පෙන්වා දුන්නා. 2002 සිට මේ ආයතනවල මේ කඩා වැටීමට සම්පූර්ණයෙන්ම වග කියන්න ඕනෑ හිටපු ආණ්ඩුවයි; හිටපු මුදල් ඇමතිවරයායි. හිටපු ආණ්ඩුවේ මුදල් ඇමතිවරයා කවුද කියලා තමුන්නාන්සේලා දන්නවා. ඒ නිසා මා නම් වශයෙන් සඳහන් කරන්නට ඕනෑ නැහැ.

අවසාන වශයෙන් මේ කාරණය පිළිබඳවත් මා කියන්න කැමැතියි. කවුරු වැරැදි කළත් අවසානයේ මේ රටේ ජනතාව වෙනුවෙන් අපි ඒවා නිවැරැදි කරන්න ඕනෑ. අපිට මොන තරම් චෝදනා කළත්, අපි බොහෝ නිවැරැදි දේවල් කර තිබෙන බව අපි දන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. තවත් බොහෝ දේවල් අපට ඉදිරියේ දී කරන්නට තිබෙනවා. නමුත් මේ සියල්ල එකට ගත්තාම අපි සතුටු වනවා. කවුරු මොනවා කිව්වත්, මොන විධියට බෙරිහන් දුන්නත්, මොන විධියට ශෝකාලාපයන් මේ අවස්ථාවේ මතු කළත් මේ රටේ යම්කිසි වෙනසක් ඇති කිරීමට ආරම්භයක් පමණයි මෙයින් සිදු වුණේ. මේ රටේ යහ පාලනය ඇති කරලා, මූල්‍ය විනිවිද භාවය සහ සංහිඳියාව ඇති කරලා, පාතාලය වාගේ නොයෙක් විධියේ මත් ද්‍රව්‍ය නිවාරණය කරන්න අවශ්‍ය කටයුතු කරලා, මේ රටේ අලුත්ම නිර්මාණශීලී මිනිස් කොට්ඨාසයක් හදන්නට අපි රජයක් හැටියට ඉදිරියේ දී කටයුතු කරනවා. මිදි වැල වැටෙන තුරු නරියා බලාගෙන සිටියා වාගේ සමහරු කියනවා, ''හෙට අනිද්දා ආණ්ඩුව ගන්න ලෑස්ති වෙනවා'' කියලා. ඒකට තව ටික කාලයක් ගත වේවි කියලා මා හිතනවා. ඒ නිසා මා විශේෂයෙන්ම තමුන්නාන්සේලාට කියනවා, කරුණාකරලා ඒ අවස්ථාවේදී කථා කරන්න කියලා. රාජ්‍ය ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් හොඳ පිළිතුරු ටිකක් ලබා දෙයි කියා මා හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට ඉතාම වාසනාවන්ත දේශපාලන අනාගතයක් ප්‍රාර්ථනා කරනවා. සභාපති නාමාවලියේ හිටපු මන්ත්‍රීවරයෙකු වූ, ඉතාම අහිංසක, නිහතමානී, අවංක, ඒ වාගේම උගත - වෙල්ලස්ස පරපුරෙන් බිහි

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

වුණු හොඳ නායකයකු වශයෙනුත්, නියෝජ්‍ය කථානායකවරයා හැටියට මේ ගරු සභාවේ ගෞරවාන්විතභාවය ආරක්ෂා කරමින් ඉදිරියේ දී මහ ජනතාවට වැඩ කරන්න පුළුවන් ශක්තිය ඔබතුමාට ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. මීළඟට, ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි පහළොවක් තිබෙනවා.

[අ.භා.5.56]

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට පළමුවෙන්ම මා ස්තුතිවන්ත වනවා. විශේෂයෙන්ම අපේ ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුව කථා කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වනවා. ඒ වාගේම අද උදෑසන කාලයේ සිදු වූ යම් දෙයක් නිසා එතුමාට යම්කිසි ආකාරයකින් සිත් රිදීමක් සිදුවුණා නම් ඒ පිළිබඳවත් මගේ කනගාටුව පළ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව යටතේ පැහැදිලි විනිවිදභාවයකින් මූල්‍ය කටයුතු කරන්නට ලැබීම ගැන සතුටු වනවාය කියලා අපේ විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමා කිව්වා. ගරු විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමනි, අද ලැබුණු ප්‍රවෘත්තියක් තමයි, මේ රටේ ඇමෙරිකානු ඩොලරයකට රුපියලේ අගය 160 ඉක්ම වූවාය කියන පුවත. එය ඔබතුමන්ලා සතුටු වන පුවතක් නම්, ඔබතුමන්ලාගේ ආණ්ඩුවට දීර්ඝ ගමනක් තිබේවි කියලා මා හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මූල්‍ය ආයතන පිළිබඳව සංවාදයේ යෙදෙන අද දවසේ අධිකරණයෙන් අපට ලැබුණු පුවත් ගණනාවක් තිබෙනවා. විශේෂයෙන්ම මහ බැංකු වංචාවේ මහ මොළකරුවන් වන අර්ජුන මහේන්ද්‍රන් සහ අර්ජුන් අලෝසියස් -ඒ පර්පෙචුවල් ට්‍රෙෂරීස් ආයතනයේ ගනුදෙනු- පිළිබඳව දැන් කරුණු අනාවරණය වනවා. මේ පිළිබඳව අපි දිගින් දිගටම පාර්ලිමේන්තුව දැනුවත් කළා. 2015 පෙබරවාරි මාසයේ 26 වැනිදා සිදු වෙච්ච පළමුවැනි වංචාව පිළිබඳවත්, 2016 අවුරුද්දේ මාර්තු මාසයේ සිදු වෙච්ච දෙවැනි වංචාව පිළිබඳවත් අපි කරුණු අනාවරණය කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මන්ත්‍රීවරු 118ක් ගැන පසුගිය දවස්වල ලොකු කුතුහලයක් තිබුණා, "118 දෙනෙකු චෙක්පත් අරගෙන තිබෙනවා, ඒ ලිපි ලේඛන ඉදිරිපත් කරන්නම්" කියලා. අද අධිකරණයේ දී කරුණු අනාවරණය වෙනවා, අර්ජුන මහේන්ද්‍රන් හිටපු මහ බැංකුවේ අධිපතිවරයාගේ credit card බිල ගෙවන්න පර්පෙචුවල් ට්‍රෙෂරීස් ආයතනයෙන් රුපියල් මිලියන 3.2ක - රුපියල් ලක්ෂ 32ක - චෙක්පතක් පර්පෙචුවල් ට්‍රෙෂරීස් ආයතනයෙන් නිකුත් කරලා තිබෙනවාය කියලා. ඒ, පළමුවැනි අනාවරණය. දෙවනුව අනාවරණය වනවා, එක්තරා රාජ්‍ය අමාත්‍යවරයෙකුට මැතිවරණ ක්‍රියාවලිය ගෙන යන්න අවස්ථා දෙකකදී චෙක්පත් ලබා දුන්නාය කියලා. හැබැයි, රාජ්‍ය අමාත්‍යවරයාගේ නම අධිකරණයෙන් අනාවරණය කරන්නේ නැහැ. ඒ වාගේම තුන්වනුව අද කරුණු අනාවරණය කරනවා, මුදල් ලබා ගත්තාය කියලා අනාවරණය වෙච්ච තවත් මන්ත්‍රීවරයකු තවත් රුපියල් මිලියනයක චෙක් එකක් ගත්තා කියලා අධිකරණයට අනාවරණය වුණා කියලා. විජේපාල හෙට්ටිආරච්චි මැතිතුමා "රජයේ විනිවිදභාවය, රජය සතුටු වන ආර්ථික ප්‍රතිපත්ති" කියලා අද කිව්වේ මේවාද කියලා කියන්න මා දන්නේ නැහැ. ETI සමාගම ඇතුළු රාජ්‍ය ආයතන වෙන්න පුළුවන්, පෞද්ගලික ආයතන වෙන්න පුළුවන්, මූල්‍ය ආයතනවල කඩා වැටීම ආදී මේ රටේ සිදු වෙච්ච ආර්ථික කඩා වැටීම් සියලු දෙයටම වග කියන්න ඕනෑ, මහ දවල් මේ රටේ සිදු වෙච්ච මහ බැංකුවේ මහා වංචාව කියන එක අපි පැහැදිලිව කියන්නට ඕනෑ. මේ රටේ යම්කිසි ගමනක් නිර්මාණය වෙලා තිබුණා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

2009 මැයි මාසයේ 18වැනි දා මේ රටේ පැවැති යුද්ධය අවසාන කරලා, ඒ තිබුණු අභියෝග ජය ගන්න මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ රජයට එදා යම්කිසි වැඩ පිළිවෙළක් තිබුණා. මේ රටේ ආර්ථිකය නන්වන්න වැඩ පිළිවෙළක් තිබුණා. සියයට 3.1 මට්ටමේ තිබුණු ආර්ථික වර්ධන වේගය සියයට 7.4 දක්වා වර්ධනය වුණා. මේ රට ලබා ගත් ණයවලින් ව්‍යාපෘති සිදු කළා. මේ රටේ දළ දේශීය නිෂ්පාදිතය වැඩි වුණා. මේ රටේ විරැකියාව අඩු වුණා. මේ රටේ උද්ධමනය අඩු වුණා. මේ රටේ ඒක පුද්ගල ආදායම වැඩි වුණා. කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රය වෙන කවරදාකටත් වැඩියෙන් වර්ධනය වුණා. නමුත් 2015 ජනවාරි 08වැනි දා පත් වුණු රජයේ කළමනාකරණයේ තිබුණු දුර්වලතා නිසා මේ සියලු දේ වෙනස් වුණා.

මේ රජය පළමුවෙන්ම කරපු කාර්ය භාරය මොකක්ද? පළමු කාර්ය භාරය තමයි, මේ රටේ පුරවැසියෙකු නොවන පුද්ගලයෙකු -සිංගප්පූරු ජාතිකයෙකු - මහ බැංකුවේ අධිපති බවට පත් කිරීම. ඒ විතරක් නොවෙයි, ශ්‍රී ලංකා මහ බැංකුව පළමු වතාවට මුදල් අමාත්‍යාංශයෙන් ගලවා අගමැතිවරයා යටතේ තිබෙන ආයතනයක් බවට පත් කර ගත්තා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දවසේ මේ ඔප්පු වෙන්නේ එක කාරණයක් විතරයි. කරුණු අනාවරණය වෙන්නේ එක කාරණයක් පිළිබඳව විතරයි. හිටපු මහ බැංකු අධිපති අර්ජුන මහේන්ද්‍රන් මහතාගේ රුපියල් ලක්ෂ 32ක credit card බිල්පත ගෙවනවා පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමෙන්. ඇයි, එහෙම වෙන්නේ? අර්ජුන මහේන්ද්‍රන්ට පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම සමඟ කිසිම සම්බන්ධයක් නැත්නම් ඔහුගේ credit card බිල්පත පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමෙන් ගෙවන්න ඒ විධියට චෙක්පත් මාරු වෙන්නේ ඇයි? ඒ වෙන මොනවත් නිසා නොවෙයි. අපි ඒක තමයි පසුගිය කාලය පුරාම පැහැදිලිව කිව්වේ, මහ බැංකු වංචාව අර්ජුන මහේන්ද්‍රන්, අර්ජුන් ඇලෝසියස් ඇතුළු ආණ්ඩුවේ ඇතැම් කට්ටිය සැලසුම් සහගතව කරපු කටයුත්තක් කියලා. සැලසුම් සහගතව කරපු කටයුත්තෙන් තුටු පඬුරු හැටියට ලැබුණු දේ තමයි අර්ජුන මහේන්ද්‍රන්ගේ ලක්ෂ 32ක credit card බිල්පත ගෙවීම. මේ පොඩි දේවල් විතරයි. පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමෙන් මිලියන 1,180ක මෙවැනි චෙක්පත් මාරු කරලා තිබෙනවා කියලා අපට ආරංචි වෙලා තිබෙනවා. හෙට අනිද්දා වනකොට තව මන්ත්‍රීවරු කීදෙනෙකුගේ නම් හෙළිවෙයිද දන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මේ උත්තරීතර සභාවේ නියෝජ්‍ය කථානායකවරයා හැටියට පත් වෙලා ඉන්නවා. ඒ නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ සිද්ධියේදී ඔබතුමා ඇතුළු මේ පාර්ලිමේන්තුවේ සිටින අපි සියලුදෙනා පිළිබඳව අද රටේ ජනතාව ලොකු සැකයකින් බලාගෙන ඉන්නවා. ගරු කථානායකතුමා කිව්වා, නම් 118ක් නැහැ කියලා. හැබැයි අද

අධිකරණයෙන් වාර්තා වනවා, එක්තරා රාජ්‍ය ඇමතිවරයෙකුට අවස්ථා දෙකකදී චෙක්පත් දෙකක් ලබා දුන් බව. ඒ වාගේම තවත් එක්තරා මන්ත්‍රීවරයෙකුට මිලියනයක චෙක්පතක් ලබා දුන් බව. ඒ නිසා මේ 118 ලැයිස්තුව සමහර වෙලාවට ඊට වඩා වැඩි වෙන්න පුළුවන්; අඩු වෙන්න පුළුවන්. නමුත්, අපි ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ගරු කථානායකතුමාගේ මැදිහත් වීමෙන් මේ පිළිබඳව සවිස්තර වාර්තාවක් පාර්ලිමේන්තුවට ලබා දීලා, මේ පාර්ලිමේන්තුවේ ගෞරවයත්, මන්ත්‍රීවරුන්ගේ ගෞරවයත් ආරක්ෂා කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ETI සමාගම ඇතුළු EAP සමූහ ව්‍යාපාරයට අයත් සමාගම් ගණනාවක තැන්පත්කරුවන් අද ඉතාම අසරණභාවයකට පත් වෙලා ඉන්නවා. පසුගිය මාස හය තුළ ඔවුන් විවිධ තැන්වල උද්ඝෝෂණය කළ බව අපි දැක්කා. එම ආයතනවලට ගිහිල්ලා ඔවුන්ගේ මුදල් ලබා ගන්න උත්සාහයක යෙදුණා. දැන් මාස හයක් ගතවෙලා තිබෙනවා. තැන්පත් කරපු මුදල් ගන්න බැරිව බොහෝ පිරිසක් ඉන්නවා. "හිරු නාළිකාව", "දෙරණ නාළිකාව" ඇතුළු රූපවාහිනී මාධ්‍ය තුළින් අපි දැක්කා, ඔවුන් අසරණභාවයට පත් වෙලා සිටින ආකාරය. තමන්ගේ ජීවිත කාලය තුළ ඔවුන් හම්බ කර ගත්ත මුදල් යම් කිසි ලාභයක් ලබා ගැනීම සඳහා ආයෝජනය කළත්, අද ඒ මුදල් පවා අහිමි වන තත්ත්වයට පත් වීම නිසා බොහෝ දෙනෙක් සිය දිවි නසා ගත් බවත් පසුගිය දින කීපයේ අපිට අසන්නට ලබුණා. සමහර උදවිය රෝගී තත්ත්වයට පත් වෙලා තිබෙන බවත් අපි දැක්කා. මේ පිළිබඳව පසුගිය සතියේ පාර්ලිමේන්තුවේ විමසූ අවස්ථාවේ දී රාජ්‍ය අමාත්‍ය ඉරාන් වික්‍රමරත්න මැතිතුමා කිව්වා, ජූනි මාසයේ 05වැනිදා වනකොට මේ කණ්ඩායමට උපරිමය ලක්ෂ 06 දක්වාත්, නැත්නම් අඩුම තරමේ තැන්පතුවලින් සියයට 10ක මුදලක් ලබා දෙන්න කටයුතු කරනවා කියලා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, අද 07වැනි දා. ඊයේ දවසේත්, අද උදේ වනකොටත් දැන ගන්නට තිබුණේ තවමත් මේ මුදල් ලබා දෙන්නට කටයුතු කර නැති බවයි. මේ කටයුත්ත කරන්න කියලා ඔබතුමන්ලා මහ බැංකුවෙන් නියෝගයක් දුන්නා ලු. ඒ නියෝගය අද වනකොට කොයි ආකාරයට ක්‍රියාත්මක වනවාද කියලා මම දන්නේ නැහැ. අද 07වැනි දා. මේ වනකොටත් ඒ අසරණ තැන්පත්කරුවන්ගේ මුදල් ලබා දෙන්න පුළුවන්කමක් ලැබී නැහැ.

තැන්පත්කරුවන් 36,000ක් අද අසරණභාවයට පත් වෙලා ඉන්නවා. ඔවුන් පෙරේදා පාර්ලිමේන්තු වටරවුමට ආවා, අපි දැක්කා. පාර්ලිමේන්තු වටරවුමට ඇවිල්ලා උද්ඝෝෂණය කරනකොට පොලිස් බලය යොදවලා, රාජ්‍ය මර්දනය විවිධ අයුරින් යොදවලා ඔවුන්ව යටපත් කරන්නට බැලුවා. අඩුම තරමේ එක ඇමතිවරයෙක්, රජය නියෝජනය කරන එක නිලධාරියෙක් ඔවුන් ඉදිරියට ගිහින් ඔවුන්ගේ ප්‍රශ්න, ගැටලුවලට අවශ්‍ය විසඳුම ලබා දෙන්න ඉදිරිපත් නොවීම පිළිබඳව අපි කනගාටුවට පත් වනවා. ඔබතුමන්ලා විපක්ෂයේ ඉන්න කොට අපි දැක්කා, - [බාධා කිරීමක්]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ඒ මුදල් ජූනි 05වන දා සිට දෙනවා. ඒ ඕනෑම කෙනකුට ඕනෑම වේලාවක ගිහින් ඒ සියයට දහය ලබා ගන්න පුළුවන්.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ පිළිතුරට ස්තූතිවන්ත වෙනවා. නමුත්, මේ මුදල් ලබා ගැනීමට ඊයේ දවසේ ගියාමත් ඔවුන්ට ලැබුණු පිළිතුර තමයි, "ප්‍රමාණවත් මුදලක් ලැබී නැහැ" කියන එක. හිරු නාළිකාවේ ප්‍රවෘත්තිවලදී මේ පිළිබඳව සඳහන් කළා මා දැක්කා. නමුත් ඔබතුමා උත්තරයක් දෙනවා, ඒවා ලබාගන්න පුළුවන්කම තිබෙනවාය කියලා. ඒ නිසා ඒ පිළිබඳව නිවැරදි ක්‍රියා මාර්ගයක් ගන්න කියන ඉල්ලීම මා කරනවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
ප්‍රමාණවත් පරිදි ගෙවීමක් නැතත්, සියයට දහය ලැබෙනවා.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
හොඳයි, ගරු රාජ්‍ය ඇමතිතුමනි. හෙට දවසේ වුණත් ගිහින් ඒ තැන්පත්කරුවන්ට සියයට දහයක් දක්වා, එහෙම නැත්නම් ලක්ෂ භයක උපරිමයක් දක්වා ඒ මුදල ලබා ගන්න පුළුවන්කම තිබෙනවාය කියා ඔබතුමා මේ වෙලාවේ සහතිකයක් දෙනවා. ඒ මැදිහත්වීම පිළිබඳව ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ETI ආයතනය ඇතුළු EAP සමූහ ව්‍යාපාරය පිළිබඳව තවත් ගැටලු පැන නැඟී තිබෙනවා. මේ ආයතන සියල්ල විකුණන්න මේ ආණ්ඩුව, මහ බැංකුව පසුගිය දිනවල යෝජනා ඉදිරිපත් කළා. මට මතකයි, මීට අවුරුද්දකට පමණ පෙර අවුරුදු එකහමාරක පමණ කාලයක් EAP සමූහ ව්‍යාපාරයේ සභාපතිවරයා හැටියට කටයුතු කළේ, මනෝ තිත්තවැල්ල කියන පුද්ගලයායි. මනෝ තිත්තවැල්ල කියන්නේ, වර්තමාන මුදල් අමාත්‍යතුමාගේ උපදේශකවරයායි. එතුමාට තවත් ආයතන ගණනාවක පත්වීම් ලැබිලා තිබෙනවා. "ශ්‍රීලන්කන් එයාර්ලයින්ස්" ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයට එතුමා පත් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, එතුමා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ, රක්ෂණ නියාමන කොමිෂන් සභාවේ සභාපතිවරයා හැටියට පත් කර තිබෙනවා. කඩා වැටුණු සමූහ ව්‍යාපාරයක් කළමනාකරණය කළ සභාපතිවරයා දැන් ඔබතුමන්ලාගේ මුදල් ඇමතිවරයාගේ උපදේශකයා බවට පත් කරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි, එතුමා තවත් ආයතන ගණනාවක තනතුරුවලට පත් කර තිබෙනවා. කල්පනා කර බලන්න, ඒ දැනුම, ඥානය, බුද්ධිය තිබෙන, මේ පිළිබඳව යම් කිසි වගකීමක් දරන්න පුළුවන් වෙනත් පුද්ගලයන් මේ රටේ ඇත්තේම නැද්ද කියලා. මේ මනෝ තිත්තවැල්ල කියන පුද්ගලයා පසුගිය කාලයේ චන්ද්‍රිකා කුමාරතුංග රජයේ චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය එක්ක, මංගල සමරවීර මැතිතුමා එක්ක ළඟින් කටයුතු කළ කෙනෙක්. එදා දවසේත් ඒ අපේ ආණ්ඩුවට විශාල චෝදනා ප්‍රමාණයක් එල්ල වුණා. එල්ටිටීඊයට මුදල් ලබා දුන්නාය කියන චෝදනාව තිබෙන ලයිකා මොබයිල් ආයතනයට එතුමා ඒ සභාපතිත්වය දරපු සමාගම් විකිණීමේ ගනු දෙනුව පිටුපස ඉන්නේත් මනෝ තිත්තවැල්ල මහත්මයාත්, හිටපු ජනාධිපතිනි චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියත්, මංගල සමරවීර මැතිතුමාත්ය කියා දැන් අද දවසේ චෝදනාවක් ඇවිත් තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳවත් ඔබතුමන්ලා මේ සභාව දැනුවත් කරන්න ඕනෑ.

විශේෂයෙන් මේ රටේ නීතියක් තිබෙනවා, රූපවාහිනී නාළිකාවක හෝ රේඩියෝ නාළිකාවක කොටස් සියයට 40කට වඩා විදේශීය සමාගමකට ලබා ගන්න බැහැ කියලා. නමුත් අද විදේශීය සමාගමකට ලබාදීලා තිබෙන්නේ. මේ රටේ දේශීය ආයෝජකයන් මේ සඳහා ඉදිරිපත් පත් වුණා. මම දන්නවා, හිරු ආයතනයේ සභාපති, රෙනෝ ද සිල්වා මහත්මයා මේ වෙනුවෙන් ලංසුවක් තිබ්බා, මේ ආයෝජකයන්ගේ ලංසුවලට වැඩි ලංසුවක් එතුමා තිබ්බා; ඉහළම ලංසුව තිබ්බා. හැබැයි, දේශීය ආයෝජකයාට අවස්ථාව ලැබුණේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක කාලයක් පුරාවට කරගෙන ආපු දෙයක්.

[ගරු කංචන විජේසේකර මහතා]

එහෙම නැතිව වෙන මොනවත් නොවෙයි. අවුරුදු තුනක්, හතරක් තිස්සේ කරගෙන ආපු දෙයක්. තැන්පත්කරුවන්ගේ මුදල් එක පැත්තකින් සිංගප්පූරුවට ගෙන ගියා. සිංගප්පූරුවේ තව සමාගමක් ගෙනැත් ETI එකේ භාරකාරත්වයට දැම්මා. සභාපතිවරයා හැටියට කටයුතු කළ මනෝ තිත්තවැල්ලගේ හිතවත් කණ්ඩායමක් ගෙනැල්ලා ස්වර්ණවාහිනිය සහ ස්වර්ණමහල් ඇතුළු EAP සමූහ ව්‍යාපාරයේ ආයතනවල හිමිකාරිත්වය ඔවුන් අතට පත් කළා. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහ බැංකුවේ සිදු වුණු වංචාවට නොදෙවෙනි වංචාවක් මේ තුළ සිද්ධ වෙලා තිබෙනවා. රුපියල් බිලියන 36ක වංචාවට අද මේ රටේ මුදල් ඇමතිවරයාත්, මනෝ තිත්තවැල්ල ඇතුළු කණ්ඩායමත් වග කියන්න ඕනෑය කියන කාරණය අපි මේ ගරු සභාවට මතක් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(*மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු කංචන විජේසේකර මහතා
(*மாண்புமிகு கஞ்சன விஜேசேகர*)
(The Hon. Kanchana Wijesekera)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අද මේ මූල්‍ය ආයතන පිළිබඳ වගකීම තිබෙන්නේ මොන ආයතනයටද කියා මා දන්නේ නැහැ. මහ බැංකුව තිබෙනවා; මුදල් අමාත්‍යාංශය තිබෙනවා; ආර්ථික ප්‍රතිපත්ති කළමනාකරණය කරන අමාත්‍යාංශය තිබෙනවා; රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය තිබෙනවා. මේ ආදී විවිධ අමාත්‍යාංශ තිබෙනවා. බැංකු ටික එක තැනක තිබෙනවා. මහ බැංකුව තව තැනක තිබෙනවා. අපි දන්නේ නැහැ, අද මේක කළමනාකරණය වෙන්නේ කොහොමද කියලා. මේ සම්බන්ධයෙන් මේ රටේ නීතිය තව තවත් වර්ධනය වෙන්න ඕනෑ. අපි ඒක පිළි ගන්නවා. පසුගිය කාලයේ රාජ්‍ය බැංකු, පෞද්ගලික බැංකු කඩා වැටෙන්න කටයුතු සිද්ධ වෙද්දී එකම රාජ්‍ය බැංකුවක්වත්, සෙලාන් බැංකුව ඇතුළු එකම පෞද්ගලික බැංකුවක්වත් කඩා වැටෙන්න නොදී, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව -එම රජය- ඒ බැංකු පද්ධතිය ආරක්ෂා කර ගැනීමේ කටයුත්තට මුහුණ දුන් ආකාරය අපිට මතකයි.

අද මේ ආණ්ඩුවේ ක්‍රියාකාරිත්වය තුළින් අපට පෙනෙන්නේ මොකක්ද? ඒ තුළින් සිද්ධ වන්නේ පෞද්ගලික ආයතන කඩාගෙන වැටෙන එක පමණක් නොවෙයි. රජයේ බැංකු ගිණුම්වල තිබෙන මුදල් ටිකත් පෞද්ගලික බැංකු ආයතනවල තැන්පත් කරන්න කියා කැබිනට් පත්‍රිකාවක් ආවාය, අවස්ථා තුනකදී තමන්ට ඒක ප්‍රතික්ෂේප කරන්න සිද්ධ වුණාය කියා ජනාධිපතිවරයා එතුමාගේ කථාවකදී කියනවා අපි දැක්කා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම කැබිනට් පත්‍රිකාව ප්‍රතික්ෂේප කරන්න ජනාධිපතිතුමාට අවස්ථා තුනක් යනවා නම්, මේ රටේ ආර්ථිකය කළමනාකරණය කරන්නේ කොහොමද කියා අපට හිතාගන්න පුළුවන්. මේ වනකොට මේ රටේ අර්බුද ගණනාවක් ඇති වෙලා තිබෙනවා. "මහින්ද රාජපක්ෂ ආණ්ඩුව රට ණය උගුලක හිර කරලා තිබුණේ, අපි රට භාර ගන්නකොට ආර්ථිකය කඩාගෙන වැටිලායි තිබුණේ" කියලා මේ ආණ්ඩුව අද මොන විධියට කිව්වත්, සංඛ්‍යා ලේඛනවලින් බැලුවත්, අද රටේ සිදුවන දේ දිහා බැලුවත්, අද අධිකරණය තුළින් වාර්තා වන දේ දිහා බැලුවත් වෙන මොනවත් නොවෙයි පෙන්වන්නේ. මේ අවුරුදු තුනහමාර තුළ මේ රට දුෂණය, වංචාව ඉහළ ගිය රටක් බවට පත් වෙලා තිබෙන ආකාරය තමයි පෙන්වන්නේ.

අද මංගල සමරවීර ඇමතිතුමා ගොබෙල්ස් න්‍යාය ගැන කිව්වා. "හොරා", "හොරා" කියලා කියාගෙන යනවා කිව්වා. අනික් අයට හොරා, හොරා කියපු කට්ටියම අද හොරු බවට උසාවිය ඉදිරියේ අනාවරණය වෙමින් පවතිනවා. මේක තමයි යථාර්ථය. මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ වරප්‍රසාද භුක්ති විඳිමින් සිටි අපේම කණ්ඩායම් තමන්ගේ නිලතල ආරක්ෂා කර ගැනීම සඳහා, තනතුරුවලට තිබෙන කෑදරකම නිසා වර්තමාන ආණ්ඩුව පැත්තට ගිහින් පසුගිය ආණ්ඩුවට චෝදනා කළ අවස්ථා අපි දැක්කා. ඔවුන් මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ තිබුණු අඩු පාඩු ගැන කිව්වා; ප්‍රජාතන්ත්‍රවාදය නැහැය කිව්වා; වැඩ කරන්න හැකියාවක් තිබුණේ නැහැය කිව්වා. හැබැයි, අද ඔවුන්ට ඒ කටින්ම කියන්න සිද්ධ වෙලා තිබෙනවා, "නැහැ, මහින්ද රාජපක්ෂ ආණ්ඩුව මේ රටේ බිහි වුණු සුවිශේෂී ආණ්ඩුවක්" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මූල්‍ය ආයතන කඩා වැටීම නිසා ජනතාවට අද අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා. මේ තැන්පත්කරුවන් 36,000 පමණක් නොවෙයි අද අසරණ වෙලා ඉන්නේ. මෙවැනි ආයතන ගණනාවක් රට පුරා තිබෙනවා. මහ බැංකුව, ඒ වාගේම මුදල් අමාත්‍යාංශය මැදිහත් වෙලා මේ අසාධාරණය වළක්වලා, ජනතාවට සාධාරණය ඉෂ්ට කර දෙන්න කියන ඉල්ලීම කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(*மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 30ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.12]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(*மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்*)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)
ස්තුතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය කථානායකවරයා හැටියට පත්වීම අප සියලුදෙනාටම ගෞරවයක් බව පළමුවෙන්ම මා කියන්න කැමැතියි. ඔබතුමා පිරිසිදු චරිතයක් තිබෙන, පරිණත නුවණකින් යුත් කෙනෙක්. ඔබතුමා නියෝජ්‍ය කථානායක ධුරයට පත්වීම ඌව වෙල්ලස්සේ ජනතාවට පමණක් නොවෙයි, අප සියලුදෙනාටම ගෞරවයක්. ඒ වෙනුවෙන් අපි ඔබතුමාට සුබ ප්‍රාර්ථනා කරනවා.

මම මුලින්ම රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා ගැන වචනයක් කියන්න අත්‍යවශ්‍යයි. මොකද, අද එතුමා පාර්ලිමේන්තුවේ නැති වෙලාවකදී එතුමාගේ නම සඳහන් වුණා. මීට අවුරුදු තුනකට උඩදි එතුමා හිරු නාළිකාවේ වැඩසටහනකට ගිහින් මධ්‍යම රාත්‍රියේ එතැනින් එළියට එනකොට වාහනවලින් කට්ටියක් ඇවිත් එතුමාට තර්ජනය කළ බව මට මතකයි. මට ඒ සිද්ධිය දැනගන්න ලැබුණාම මම එතුමාව හොයාගෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුගේ නිල නිවාසවලට ගියා. රන්ජන් රාමනායක කියන මේ රටේ සුප්‍රසිද්ධම නළුවාට තමන්ට අයිති නිවසක්වත් නැහැය කියන එක එදා තමයි මට දැනගන්න ලැබුණේ. එතුමා ජීවත් වන ආකාරය ගැන අපි දන්නවා. එතුමාගේ චරිතය ගැන කථා කළ නිසා මේ කාරණය සඳහන් කළ යුතුය කියා මා හිතුවා. අපේම මුදල්වලින්, එක්කෝ අපේ පවුලෙන් ලැබෙන මුදල්වලින්, නැත්නම් අපි ව්‍යාපාරවලින් සොයා ගත් මුදල්වලින් අපට මැතිවරණ වැඩ පිළිවෙළ කරන්න පුළුවන්. නමුත්, වැඩි පාර්ශ්වයකට තමන්ගේ මැතිවරණ ව්‍යාපාරය එහෙම කරන්න බැහැ. මේ රටේ ඕනෑම කෙනකුට දේශපාලනය කරන්න

අයිතිය තිබෙන්න ඕනෑ. දේශපාලනය කරනකොට ඒ අයට වෙනත් අයගෙන් ඒ සඳහා මුදල් ලැබෙන්න පුළුවන්. එලෙස මුදල් ලැබෙන්නේ කාගෙන්ද කියන එක තමයි මෙතැන තිබෙන ගැටලුව. මම විශේෂයෙන්ම රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා ගැන කියන්න අවශ්‍යයි. මම හිතන විධියට එතුමා දේශපාලනය කරන්නේ මේ රටේ යම් කිසි වෙනසක් ඇති කිරීමේ බලාපොරොත්තුවෙනුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපේ මන්ත්‍රීතුමන්ලා කරුණු කාරණා රාශියක් කිව්වා. ඒ සමහර ඒවාට පිළිතුරු දෙන්න මම වෑයම් කරනවා. එක මන්ත්‍රීවරයකු කිව්වා, අද cheques වැඩි ප්‍රමාණයක් return වෙනවා, එම නිසා ඒකට යම්කිසි පිළියමක් යොදන්න ඕනෑය කියලා. නමුත්, cheque එකක් return වන එක බරපතළ වරදක් කියා දණ්ඩ නීති සංග්‍රහයේ සඳහන් වනවා. ඉතින් ඒකට විධිවිධාන තිබෙනවා. ඒ ගැන තවත් නීතිමය පියවර ගන්න අවශ්‍ය නැහැ. ප්‍රශ්නයක් තිබෙනවා නම්, ඒ එම නීති ක්‍රියාත්මක නොකිරීමේ ප්‍රශ්නයක් වෙන්න පුළුවන්.

ඊයේ බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කථා කරනකොට කිව්වා, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ යම්කිසි විස්තරයක් මුදල් අමාත්‍යාංශයෙන් ලිඛිතව ඉල්ලුවාය කියා. නමුත් මුදල් අමාත්‍යාංශයෙන් දින 14ක් ඇතුළත එය ලැබුණේ නැහැය කියාත් එතුමා කිව්වා. එතුමාට පිළිතුරක් එවන්නය කියා මුදල් අමාත්‍යාංශයේ ලේකම්ට කියන්නම් කියා මම කිව්වා. නමුත්, මම ඇත්තටම පුදුම වුණේ එතුමා මෙම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත යටතේ යම් විස්තරයක් ඉල්ලපු එක ගැනයි. මොකද, එදා කරු ජයසූරිය මන්ත්‍රීතුමා තොරතුරු දැන ගැනීමේ අයිතිය මේ රටේ පුරවැසියන්ට ලබාදිය යුතුය කියා එම පනත් කෙටුම්පත ඉදිරිපත් කරනකොට මේ පාර්ලිමේන්තුවේම වාඩි වෙලා ඉන්න මටත් වාසනාව තිබුණා. එදා, බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා ඇමතිතුමා වශයෙන් කටයුතු කරද්දි එයට විරුද්ධ වුණා. අපි ගෙන ආ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතේ වාසිය එතුමාටත් ලබාගන්න පුළුවන් වීම ගැන අපට සන්තෝෂයි. අද අපේ රජය 2015ට ප්‍රථමයෙන් තිබුණු රජයට වඩා බොහොම විවෘත රජයක්. තොරතුරු දැන ගන්න පුළුවන්; වාද විවාද කරන්න පුළුවන්. රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමාට තර්ජනය කරන්න වාහනවලින් කට්ටිය පැමිණීම, එක්නැලිගොඩලාට, තාජුදීන්ලාට, ලසන්තලාට ආපු සුදු වෑන් වැනි සිද්ධි අද කාටවත් වෙලා නැහැ. අපේ රජයට විරුද්ධව එවැනි එක් චෝදනාවක්වත් ඇවිත් නැහැ. අපේ රජය යටතේ එවැනි චෝදනාවකින් මරණයකට පත්වුණු එක්කෙනෙක්වත් නැහැ. පසුගිය පාලන තන්ත්‍රය සහ අද තිබෙන පාලන තන්ත්‍රය අතර අහසයි පොළොවයි වාගේ විශාල වෙනසක් තිබෙනවා.

I heard some of the Hon. Members from the Northern Province made many remarks today about borrowings taken by many people and how they have had to face many difficulties. Some were critical of the fact that financial institutions had gone to the North but, I could say with responsibility that there were financial institutions, particularly banks, who went to the North straight after the cessation of hostilities. They went there with the intention of actually rebuilding the North by providing finances for both consumers and for businesses. We could say that the banks in the Northern Province have acted with great responsibility. There have been allegations that some of the other financial institutions, finance companies and unregulated institutions, have been granting loans at exorbitant interest rates, particularly taking advantage of some of those - particularly of women - who were traumatized by the war. This is very unfortunate and we completely condemn such action and such behaviour.

I would also like to say that the Minister of Finance and Mass Media, the Hon. Mangala Samaraweera, who extensively toured the North and the East of the country and got a firsthand view of what exactly had happened, has recommended the Government that we take measures to ease the pressure, particularly of the women in the Northern Province, Eastern Provinces and in the North-Central Province who have had to face bankruptcy and stress and who have got into a debt trap because of these exorbitant interest rates. Therefore, Sir, they will be relieved of this for the measures that are to be shortly introduced by our Government.

අද අපි සාකච්ඡා කරන්නේ ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාගේ කල් තැබීමේ යෝජනාව පිළිබඳවයි. අපි බොහෝ මූල්‍ය ආයතන ගැන සාකච්ඡා කළා. නමුත්, අපි බොහොම ළඟින් මේක අධ්‍යයනය කළොත්, 2008, 2009 වර්ෂවලදී ආසියාවේ මූල්‍ය අර්බුදයක් ඇති වුණු බව අපට පැහැදිලි වෙනවා. ආසියාවේ මූල්‍ය අර්බුදය ඇති වූ අවස්ථාවේදී ලංකාවටත් බලපෑමක් තිබුණා. එදා රජය මූල්‍ය අර්බුදයේ තිබෙන ප්‍රශ්නය වසා දමලා කොහොම හරි මෙහි ගැටලුවක් නැති විධියට පෙන්වන්න අවශ්‍යයි කියන තීරණයට ආවා. නමුත් ඇත්තටම එදා ඒ ගත්ත තීරණය බොහොම වැරදි තීරණයක්. ඒ නිසා තමයි මේ අර්බුදය මීට වැඩිය උග්‍ර වෙලා තිබෙන්නේ. බැංකු නොවන ආයතනවල වැටීමට හේතුව මේකයි. නමුත්, මම මේ කාරණයත් සඳහන් කරන්නට ඕනෑ. අද බොහෝ අය මහ බැංකුව ගැන හුහාක් චෝදනා කළා. නමුත්, එදා මහ බැංකුවේ වෘත්තියවේදීන් -professionals within the Central Bank- මේ අර්බුදය ගැන කථා කරලා, ආයතන ගැන සඳහන් කරලා මුදල් මණ්ඩලයට රිපෝර්තු ඉදිරිපත් කළා. නමුත්, එදා මුදල් මණ්ඩලයට ඉදිරිපත් කරපු රිපෝර්තුවලින් පවා ඒ ගැන කිසිම තීරණයක් ගත්තේ නැහැ. එදා මහ බැංකුවේ අධිපති ලෙස කටයුතු කළ නිවාඩ් කබ්‌රාල් මැතිතුමාත්, මුදල් ඇමතිතුමා වශයෙන් කටයුතු කළ මහින්ද රාජපක්ෂ මහතාත් ඒකට වගකියන්න ඕනෑ කියන එක සඳහන් කළ යුතුයි. මේ ක්‍රියාවලිය නිසා තමයි බැංකු නොවන ආයතනවල -finance companiesවල- අර්බුදයක් තිබුණේ. එපමණක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2005දී මේ රටේ තිබුණ finance companies සංඛ්‍යාව 28යි. නමුත්, 2014 අවසානය වන විට 28ක්ව පැවැති finance companies සංඛ්‍යාව, 44ක් දක්වා වැඩි කරනු ලැබුවා. ඒ කියන්නේ ඒ finance companies වලට දුන්න licence ප්‍රමාණය සියයට 60කින් වැඩි කළා. ඒවා නොයෙකුත් ඥාති සම්බන්ධතාවන් තිබෙන, ඒ වාගේම දේශපාලන අරමුණුවලින් දුන්නා කියන එක සඳහන් කළ යුතුයි. අවුරුදු 10ක් තුළදී මේ finance companiesවලට දුන්න licence ප්‍රමාණය සියයට 60කින් වැඩි කළා. අවුරුදු 70කට දුන්නු ප්‍රමාණය අවුරුදු 10කින් -2005 ඉඳලා 2014 වනවිට- සියයට 60කින් වැඩි කළා. මේ නිසා තමයි මේ අර්බුදය මෙහෙම උග්‍ර වුණේ. එපමණක් නොවෙයි, ඒ කාල පරිච්ඡේදය තුළ leasing companies වලට licence 6ක් ලබා දුන්නා. ඒ නිසා අභිංසක තැන්පත්කරුවන්ට බොහොම ලොකු අසාධාරණයක් සිදු වෙලා තිබෙනවා. අද මේ ගරු සභාවේදී කළ හුහාක් කථා මම අහගෙන හිටියා. ඇත්ත, සමහර අය විශ්‍රාම යන්න තබා ගෙන තිබුණු මුදල් ප්‍රමාණය පවා ඔවුන්ට අහිමි වුණා. විශ්‍රාම සුවයෙන් ජීවත් වෙන්නට බැහැ. සමහර අය සියදිවි නසා ගත්තා කියලා කිව්වා.

සමහර මහලු අයට නැත්නම් රෝගී අයට අවශ්‍ය සෞඛ්‍ය සේවාවන් ලබා ගන්නට බැහැ. සමහර දෙමව්පියන් දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දෙන්න බලාගෙන හිටියා. ඒවා ඒ අයට

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

කරගන්නට බැරි වුණා. මෙවැනි දෙයක් සිදුවීම ගැන අපිත් ඒ අය එක්ක මේ අවස්ථාවේදී කනගාටු වෙනවා. මේ අභිංසක අය මේ තත්ත්වයට තල්ලු කළේ කවුද කියන ප්‍රශ්නය තමයි අපි අහන්නට ඕනෑ. ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා උදේ කථා කරනකොට යෝජනාවක් කළා. ඒ යෝජනාවේදී එතුමා කිව්වා, "මුදල් ඇමතිතුමාගේ මැදිහත්වීමෙන් මහ බැංකුවත්, තැන්පත්කරුවන්ගේ නියෝජිතයනුත් ඒ වාගේම විපක්ෂයේ මන්ත්‍රීවරුත් එකඟ වෙලා මේක සාකච්ඡා කරලා මේ ප්‍රශ්නයට යම්කිසි පිළියමක් දිය යුතුයි." කියලා. අපි ඒ යෝජනාව පිළිගන්නවා. අපි ඒක කළ යුතුයි. මොකද, අභිංසක පුද්ගලයන්ගේ ඒ වේදනාව අපට යම්කිසි විධියකින් තුනී කරන්න පුළුවන් නම් අපි ඒක කළ යුතුයි. ඒක අපේ වගකීමක්. මෙවැනි අර්බුදයක් කවුරු ඇති කළත්, අද අපට වගකීමක් තිබෙනවා ඔවුන්ගේ ඒ වේදනාව තුනී කරන්න. මහ බැංකුව ඒ සම්බන්ධයෙන් දැනට ක්‍රියාවලීන් කීපයක් අරගෙන තිබෙනවා. පළමුවැනි එක හැටියට ඒ අය නිරාකරණය හා බලගැන්වීමේ දෙපාර්තමේන්තුවක් - Resolution and Enforcement Department එක- ආරම්භ කරලා තිබෙනවා. ඒක ක්‍රියාකාරී ඒකකයක්. ඒ නිසා ද්‍රවශීලතාව අඩු වෙනකොට ඒ අයට යෝජනා ඉදිරිපත් කරන්නට පුළුවන්. ඒ වාගේම, මහ බැංකුවේ රක්ෂණ ක්‍රමය පුළුල් කරලා තිබෙනවා. ඉස්සර දුන්නු සීමාව රුපියල් ලක්ෂ 3යි. ඒ කියන්නේ, තැන්පතුව නැති වෙනවා නම් රක්ෂණ ක්‍රමය හරහා රුපියල් ලක්ෂ 3ක් ලබා දෙනවා. නමුත්, ඒ සහනාධාර ප්‍රමාණය රුපියල් ලක්ෂ 6 දක්වා අපි වැඩි කරලා තිබෙනවා. ඒ ආයතනය උග්‍ර ප්‍රශ්නයකට මුහුණ දෙනවා නම්, ඒ ආයතනය නැවත හදාගන්න බැරි නම්, ඒ මුදල් මූල්‍ය ක්‍රමය ඉදිරියට ගෙනියන්න ඒක ඈවර කිරීමේ තීරණයක් ගන්න බැංකුවට පුළුවන්. ඒ වාගේම, නීතිමය පියවර ගන්නට පුළුවන්. මහජනතාව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළකුත් මහ බැංකුව දිගටම කරගෙන යනවා කියලා සඳහන් කරන්නට ඕනෑ.

අපි අද හුඟාක් ආයතන ගැන කථා කළා. මම එයින් සමහර ආයතන ගැන යම්කිසි පිළිතුරක් දෙන්න වෑයම් කරනවා. අපි දන්නවා, CIFL සමාගම ගැන. ඒ සමාගම සම්බන්ධයෙන් පියවර අරගෙන තිබෙනවා. ඒක දැන් නීතිපති දෙපාර්තමේන්තුවට බාර දීලා තිබෙනවා. එතැන ප්‍රමාදයක් තිබෙනවා කියලා කියන්නට පුළුවන්. නමුත්, අපි ඒක ශීඝ්‍ර කරන්නට ඕනෑ. මොකද, එතැන විශාල ගැටලුවක්, ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, ඒ ආයතනයේ අයට යම්කිසි මුදලක් හෝ ලබා දිය යුතුයි කියන ගැටලුව තිබෙනවා. නමුත්, ඒක වසර 3කින් විතර දැන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් ක්‍රියාත්මක වෙලා නැහැ. එම නිසා ඒක නීතිපති දෙපාර්තමේන්තුව හරහා විසඳන්න අපි වෑයම් කරනවා. ඒ වාගේම, අද ETI ආයතනය ගැන හුඟාක් සාකච්ඡා වුණා. ETI ආයතනය ගැන මම මීට ප්‍රථමයෙන් සති දෙකකට උඩදී කථා කරපු නිසා ඒ ගැන මම දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ. නමුත්, අද මෙතැනදී ප්‍රශ්න කීපයක්ම ආපු නිසා, ඒ ප්‍රශ්නවලට පමණක් පිළිතුරක් දෙන්න බලාපොරොත්තු වෙනවා. ගරු මන්ත්‍රීවරයෙක් ඇහුවා, "මහ බැංකුව ඒ තැන්පත්කරුවන්ට කරන ගෙවීම් වළක්වලා තිබෙන්නේ ඇයි?" කියලා. ඒකට හේතුව විධියට ETI ආයතනයේ සාමාන්‍යාධිකාරී දැනුම් දුන්නා, "2017 අප්‍රේල් මාසයේදී එහි ද්‍රවශීලතාව අඩු නිසා ඒ අයට ගෙවීම් කරන්න බැහැ." කියලා. මෙතැනදී මූල්‍ය ව්‍යාපාරික පනත -Finance Business Act, No.42 of 2011- යටතේ මහ බැංකුව ක්‍රියා කරලා තිබෙනවා. එම නිසා ඒ බලතල අනුව තාවකාලිකව තමයි ඒ තැන්පතු ගෙවීම් නතර කරලා තිබෙන්නේ.

අනුර දිසානායක මන්ත්‍රීතුමා අද මේ ගැන කථා කළා. මා නැවතත් ඒ කරුණු කියන්න කැමැතියි. ආයෝජකයෙක් ගෙනැවිත් මේ ආයතනය නැවත පණ ගන්වන එක තමයි ගන්න තිබෙන මූලික පියවර. පළමුවන ආයෝජනය ඇවිල්ලා තිබෙනවා. ඒ නිසා තමයි, ජූනි 05වන දා සිට සියයට 10ක්, එහෙම නැත්නම් රුපියල් ලක්ෂ 6ට අඩු ප්‍රමාණයක් තැන්පතුකරුවන්ට ගෙවන්නේ. ඊළඟ ආයෝජනය ආවාම ජූනි මාසය අවසන් වනකොට තවත් සියයට 10ක් ගෙවන්න බලාපොරොත්තු වෙනවා. ඊට පස්සේ තුන්වන ආයෝජනය ආවාම මේ ආයතනය පණ ගන්වා ඒ ක්‍රියාවලිය දිගටම කරගෙන යන්න බලාපොරොත්තු වෙනවා. මෙහිදී සඳහන් කළා, සමහර විට අවුරුදු 5ක් යන කල් ඒ තැන්පත්කරුවන්ට ඒ මුදල් නොලැබෙයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහිදී තීරණ කිහිපයක් ගන්න වෙනවා. ඒ තීරණ මෙවායි. මේ ව්‍යාපාරය ප්‍රතිසංස්කරණය කරලා ඉදිරියට ගෙන යනවා නම් ඒ අයට බලාපොරොත්තුවක් ඇති වෙයි, සමහර විට ඒ අයගේ මුළු තැන්පතුවම ලබා ගැනීමටත්, ඒ වාගේම පොලී මුදලක් ලබා ගැනීමටත් පුළුවන් වෙයි කියලා. ඒ ගැන අසතුටු නම් මේ සමාගම ඈවර - liquidate - කරන්න සිදු වෙනවා. මේ සමාගම liquidate කළොත්, මෙහි වත්කම් විකිණීමෙන් ලැබෙන්නේ රුපියල් බිලියන 11.5ක් පමණ. ඒ වාගේම තැන්පතු රක්ෂණයෙන් - deposit insurance scheme එකෙන් - රුපියල් බිලියන 9ක් පමණ ලැබෙයි. ඊට පස්සේ ඈවර කිරීමෙන් ලැබෙන ප්‍රමාණය රුපියල් බිලියන 4ක් පමණ වෙයි. දැනට කරගෙන යන සාකච්ඡාවන් අනුව අධ්‍යක්ෂවරුන්ගෙන් රුපියල් බිලියනයක් පමණ ලැබෙයි. එතකොට ලැබෙන මුළු මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 25.5ක් පමණ වෙනවා. නමුත් අපි දන්නවා, මුළු තැන්පත්කරුවන්ගේ තැන්පතු රුපියල් බිලියන 33.5ක් වෙනවාය කියලා. එතකොට එතැන පරතරයක් තිබෙනවාය කියලා අපට පෙනෙනවා. වෙනත් විධියකට කිව්වොත්, මේ ආයතනය සම්පූර්ණයෙන් ඈවර කළොත්, තැන්පත් කරපු මුදලින් තැන්පතුකරුවකුට ලබා ගන්න පුළුවන් වෙන්නේ සියයට 65ක් හෝ සියයට 70ක් පමණයි. මේ ආයතනය සම්පූර්ණයෙන් ඈවර - liquidate - කළොත් එපමණ ප්‍රමාණයක් තමයි ලබා ගන්න පුළුවන් වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආයෝජකයා ගැනත් අද සාකච්ඡා කළා. මේ ආයෝජකයා ගැන නොයෙකුත් අය, නොයෙකුත් දේවල් කිව්වා. මේ ආයෝජක ආයතනය Blue Summit Capital Management Private Limited කොම්පැනියයි. මෙය සිංගප්පූරුවේ ලියා පදිංචි කොම්පැනියක්. මේ කොම්පැනිය තමයි, අතුරු සමාගම් ඇතුළුව ETI සමූහ ව්‍යාපාරය ගන්නට යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒ අය තමයි මූලින් මේ ආයෝජනය කරලා තිබෙන්නේ. ඒ නිසා තමයි, ජූනි 05වන දා සිට යම්කිසි මුදලක් තැන්පත්කරුවන්ට ගෙවන්න පුළුවන්වෙලා තිබෙන්නේ. මේ සමූහ ව්‍යාපාරය තුළ "ස්වර්ණවාහිනී" media company එකත් තිබෙනවා. මුදල් ඇමතිතුමාගේ අනුමැතිය නොමැතිව broadcasting ආයතනයක, එහෙම නැත්නම් රූපවාහිනී ආයතනයක කොටස් සියයට 40කට වැඩි ප්‍රමාණයක් විදේශිකයන්ට විකුණන්න බැහැ. මුදල් ඇමතිතුමා එයට තවමත් අනුමැතිය දීලා නැහැ.

Blue Summit Capital Management Private Limited කියන ව්‍යාපාරය ගැන නොයෙකුත් කතාන්දර කිව්වා. මට කියන්න තිබෙන්නේ මෙපමණයි. ශ්‍රී ලංකා මහ බැංකුව මේ ආයෝජකයා ගැන සොයා බලා තිබෙනවා. Central Bank එකේ මූල්‍ය සෝදිසි කිරීමේ ඒකකය - Financial Intelligence Unit, FIU - හරහා තමයි මේ ආයෝජකයා ගැන සොයා බලා තිබෙන්නේ. විදේශ රටවල FIUsවලින් ලැබුණු තොරතුරු අනුව මේ ආයෝජකයා ගැන අද වන තෙක් තවමත් කිසිම ඍණ වාර්තාවක් ලැබී නැහැයි කියන එක සඳහන් කරන්න පුළුවන්.

ඒ විතරක් නොවෙයි. සමහර මන්ත්‍රීවරුන් මේ සභාවේ කථා කරනකොට, මේ ආයෝජනය පිළිබඳව මුදල් ඇමතිතුමාටත් යම්කිසි පෞද්ගලික ගනුදෙනුවක් තිබෙනවාය කියන අදහසක් ඉදිරිපත් කරන්න වෑයම් කළ බව මම මෙහිදී සඳහන් කරන්නට ඕනෑ.

නමුත් මේ විධියට කිසිම හේතුවක් නොමැතිව, කිසිම විස්තරයක් නොමැතිව රටේ මුදල් ඇමතිතුමාට පහර ගැසීම, රටේ ආර්ථිකයට පහර ගැසීමක් කියලා මම හිතනවා. ඒ නිසා මන්ත්‍රීවරුන් එවැනි දෙයින් වැළැක්විය යුතුයි කියන එක තමයි මගේ මතය.

ඊට්ඒයි ආයතනයට අමතරව තවත් ආයතන ගණනාවක් ගැන කථා කළා. නමුත් මම ආයතන එකක්-දෙකක් ගැන කථා කරනවා. එයින් එකක් තමයි, Standard Credit Finance Limited ආයතනය. Standard Credit Finance Limited ආයතනයේ සිදු වුණු ක්‍රියාවලිය ගැන බලන්න. Standard Credit Finance Limited ආයතනයෙන් Entrust Holdings Limited ආයතනයට රුපියල් බිලියන 2.5ක් දුන්නා. එසේ දීලා සියයට 65ක කොටස් ලබා ගත්තා. Entrust Holdings Limited එකෙන් මේ මුදල ලබා ගෙන ඊට පසුව එම මුදල Entrust Limited කියන කොම්පැනි එකේ දැම්මා. එම කොම්පැනිය බැඳුම්කර පිළිබඳව ගනුදෙනු කරන කොම්පැනි එකක්. එම කොම්පැනිය එම මුදල අරගෙන, බැඳුම්කරවලට දැම්මේ නැහැ. අනෙක් කොම්පැනි එකට කොළ කැල්ලක් දීලා, ඒ අය ඒ මුදල ලබා ගෙන තිබෙනවා. මේ මුළු ක්‍රියාවලියම සමහර විට පැය 24කින්, පැය 48කින් සිදු වුණු ක්‍රියාවලියක් වෙන්න ඇති කියලා මම සැක කරනවා. දැන් ඒ ගැන සොයාගෙන යනවා. එසේ සොයා ගැනීමෙන් පසුව පොලීසියෙන් අපට ඒ ගැන දැන ගන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. මේ රුපියල් බිලියන 2.5ක මුදල අනිවාර්යයෙන්ම අරගෙන තිබෙනවා. Standard Credit Finance Limited කියන ආයතනය දුප්පත් තැන්පත්කරුවන්ගේ මුදල සොරා කාලා තිබෙනවා. Entrust Holdings Limited කියන ආයතනය මෙසේ සොරා කාලා තිබෙන්නේ රාජ්‍ය සුරැකුම් දෙනවාය, ඒවායේ ආයෝජනය කරනවාය කියලායි. නමුත් රාජ්‍ය සුරැකුම් ගන්නේ නැතුව මුදල අරගෙන කොල්ල කාලා, මුදල් සොරකම් කරලා මේකේ අයිතියත් ලබාගෙන තිබෙනවා. Entrust Holdings Limited ආයතනය ලබාගෙන තිබෙන්නේ මේ රුපියල් බිලියන 2.5 විතරක් නොවෙයි. එම ආයතනය රුපියල් බිලියන 10ක් ලබාගෙන තිබෙනවා. එසේ ලබාගත් Entrust Holdings Limited ආයතනයේ අධ්‍යක්ෂවරුන් අතර මේ සභාවේ සිටිනා මන්ත්‍රීවරුන්ගේ සහෝදරයන් පවා ඉඳලා තිබෙනවා. අද ඒ මන්ත්‍රීවරුන් ඉන්නේ විපක්ෂයේ. ඔය පොදු විපක්ෂයේ ඉන්නා කට්ටියගේ සහෝදරවරුත් එම ආයතනයේ අධ්‍යක්ෂවරුන් හැටියට සිටි බවට සඳහන් වෙනවා. කොපමණ පෙලඹෙව්වත් මම ඒ නම් කියන්නේ නැහැ. නමුත් මෙතැනට ඇවිල්ලා මේ ආයතන ගැන, ඒවායේ කඩා වැටීම් ගැන ඒ අය සුදනෝ වාගේ කථා කළ නිසායි මම ඒ ගැන කිව්වේ. මේ කඩා වැටීම් සිදු වුණේ පසුගිය රජය කාලයේදීයි. ඒ කාලයේ මේවා වසා ගෙන ගියා. කාලයකට මේවා වසා ගෙන ගියා. හොරකම් සිදුවී ගෙන ගියා. මේ අය බලයේ ඉන්නකොට තමයි "මුදල් දෙන්න, ඒවා රජයේ බැඳුම්කරවල දමනවා" කියලා එක එක ආයතනවලට ගිහිල්ලා කිව්වේ. ඊට පසුව එම මුදල් හොරකම් කළා.

අද පවතින වෙනස මේකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද පවතින වෙනස මොකක්ද? අද අපි කිසිවක් සඟවන්නේ නැහැ. තිබෙන විධියටම ඒවා ගැන කියනවා. ඒකයි තිබෙන වෙනස. අපි මේවා සඟවන්නේ නැහැ. තිබෙන විධියටම ඒවා ගැන කියනවා. ඇත්තටම සිදුවෙලා තිබෙන්නේ මොනවාද කියලා හැමෝම දැන ගත යුතුයි.

අද පැවැති මේ විවාදයේදී අනුර දිසානායක මන්ත්‍රීතුමාත්, තවත් මන්ත්‍රීවරුත් මේ ගැන සඳහන් කළා. මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ finance companiesවල විතරක් නොවෙයි, microfinance companiesවල විතරක් නොවෙයි. සමුපකාර ව්‍යාපාරවලත්, 'ග්‍රාමීය බැංකු' කියලා බැංකු හදාගෙන තිබෙනවා. ඒ බැංකුවලත් මේ ප්‍රශ්නය තිබෙනවා. අද කථා කළ සමහර කථිකයන් රට තුළ පවතින එවැනි බැංකු කිහිපයක්ම ගැන සඳහන් කළා. එසේ සඳහන් කරමින් ඔවුන් කියා සිටියා, මේ වාගේ හොරකම් ඒවායේත් සිදුවෙලා තිබෙනවා කියලා. මම එයින් එකක් ගැන සඳහන් කරන්න කැමැතියි. අවිස්සාවේල්ලේ, නැහෙනහිර හේවාගම කෝරළයේ විවිධ සේවා සමුපකාර සමිතියේ තිබෙන ග්‍රාමීය බැංකුවේ සිදු වී ඇති මූල්‍ය අක්‍රමිකතාව නිසා අහිංසක මිනිසුන් විවිධාකාර පීඩාවලට ගොදුරු වී සිටිනවා; වේදනාවෙන් සිටිනවා.

මේ ග්‍රාමීය බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ජනතාව අතරේ වෙන වෙන මත ඇති කරන්නට හදනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන ඇත්තටම සිදු වෙලා තිබෙන්නේ රුපියල් කෝටි 53.8ක මුදලක් මේ අය ඔය Entrust Securities PLC එකේ යොදවලා තිබෙනවා. එම Entrust Securities PLC එක ද්විතීක වෙළෙඳ පොළ නියෝජිත ආයතනයක් වෙනවා. Entrust Securities PLC එක හරහා කටයුතු කළා. මෙතැන අපට තිබෙන සැකය ග්‍රාමීය බැංකුවේ අධ්‍යක්ෂවරු සහ Entrust Securities PLC අධ්‍යක්ෂවරුයි අතරේ සමහර වෙලාවට ගනුදෙනුවක් අනිවාර්යයෙන්ම තිබෙන්නට ඇති බවයි. මේ ග්‍රාමීය බැංකුවේ සභාපතිවරයා, ලේකම්වරයා, සාමාන්‍යාධිකාරී මේකට වග කියන්න ඕනෑ. තනතුරු ගත්තා වාගේ නොවෙයි. මේවාට නීතිමය පියවර ගන්නවා. ඒ තැන්පත්කරුවන්ට මම කියනවා, ඒ අයත් ගිහිල්ලා නීතිමය පියවර ගන්න ක්‍රියාත්මක වෙන්න ඕනෑ කියලා. මහ බැංකුව දැනටම Entrust Securities PLC එක ගැන නීතිමය පියවර අරගෙන යනවා. තැන්පතුකරුවන්ටත් නීතිමය පියවර ගන්න පුළුවන්. මේක Entrust Securities PLC එකේ අධ්‍යක්ෂවරු එක්ක එකතුවෙලා කරපු වැඩක් වාගේ තමයි අපට නම් පෙනෙන්නේ.

අද (වෛද්‍ය) රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා කථාකරනකොට යෝජනාවක් කළා. එතුමා කිව්වා "බැංකුව" කියන වචනය දිගින් දිගටම පාවිච්චි වෙනවා කියලා. ඇත්තටම එතකොට ජනතාව හිතනවා, බැංකුවක් නම් ස්ථාවරයි; මුදල් දැම්මාට ගැටලුවක්, ප්‍රශ්නයක් නැහැයි කියලා. මේ "බැංකුව" කියන වචනය ගැන මගේ අදහසත් එතුමාගේ අදහස වාගේමයි. "බැංකුව" කියන වචනය පාවිච්චි කරනවා නම්, ඒක මහ බැංකුවේ අධීක්ෂණය යටතේ තිබිය යුතුයි. මගේ අදහසත් ඒකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමෘද්ධි සහනාධාරය බෙදනවා. නමුත් සමෘද්ධි බැංකු පනතක් කියලා පනතක් ගෙනැල්ලා, මහ බැංකු අධීක්ෂණයෙන් පිට තවත් බැංකුවක් පවත්වාගෙන යනවා. අද ඒක ගැන කථා කරලා ඒක මහ බැංකුවේ අධීක්ෂණයට ගන්න කියලා කියනකොට වෙන තර්කයක් ඉදිරිපත් කරලා කියනවා "නැහැ, ඒක සංවර්ධනයට අවශ්‍යයි; මහ බැංකුවේ අධීක්ෂණයට ගියොත් සංවර්ධනයට ඒක අපහසුතාවක් ඇති වෙන්න පුළුවන්" කියලා. වෙනත් ආයතනයක් තිබෙනවාට අපට ප්‍රශ්නයක් නැහැ. නමුත් "බැංකුව" කියන වචනය පාවිච්චි කරන්න එපා කියලායි මම කියන්නේ. ඒක වෙනම පනතක් යටතේ තිබෙන්න පුළුවන්. ඒක වෙනම ක්‍රියාවලියක යෙදෙන්නට පුළුවන්. නමුත් බැංකුවක් නම්, මහජනයාගෙන් තැන්පතු ගන්නවා නම්, මහ බැංකුවේ අධීක්ෂණය යටතේ ආ යුතුයි කියන එකයි මගේ මතය. ඒ නිසා මේ ග්‍රාමීය බැංකුව ගැනත් අපට කථා කරන්න සිදු වෙනවා. බැංකුව කියන නම භාවිත කරනවා නම්, අධීක්ෂණය කළ යුතුද නැද්ද කියන එක අපට නැවතත් හිතන්න වෙනවා. මම දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ. අවසාන වශයෙන් කරුණක් දෙකක් කියලා මගේ කථාව අවසාන කරනවා.

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

බැංකුවක තැන්පතුවක් ගන්නකොට, ණය මුදලක් දෙනකොට පොලියේ විශාල පරතරයක් තිබෙනවා කියලා අද තව මතයක් ඉදිරිපත් වුණා. ඒ කියන්නේ බැංකුවේ overhead එක. මම හිතන හැටියට ඒ කාරණයත් කිව්වේ අනුර දිසානායක මන්ත්‍රීතුමාමයි. එතුමා කිව්වා, overhead එක විශාලයි කියලා. ඒ overhead එක අඩු කර ගන්න පුළුවන් වුණොත් ණය දෙන පොලී ප්‍රතිශතය පහළට ගේන්න පුළුවන් කියලා එතුමා කිව්වා. ඒකේ ඇත්තක් තිබෙනවා. මොකද, දකුණු ආසියාවේ රටවල් එක්ක සසඳනකොට අපේ පොලී පරතරය වැඩියි. ඒ පරතරය අඩු කරන්නට ඕනෑ. ආසියාවේ අනික් රටවල් එක්ක සසඳනකොට ශ්‍රී ලංකාව භූගෝලීය වශයෙන් බොහොම කුඩා රටක්. අපි සාමාන්‍යයෙන් නගරයක් පසුකරගෙන යනකොට මේ රටේ ඕනෑම තැනක අපට පෙනෙනවා, එක දිගට බැංකු පහ හයක් සමහර විට එක පේළියටම තිබෙනවා. ඒ බැංකු සියල්ලෙන්ම පාහේ එකම සේවාවන් ලබාගන්නට පුළුවන්. නමුත් මේ බැංකු ඔක්කෝම ඒවායේ ශාඛාවන් විවෘත කරලා තිබෙනවා. ශාඛාවන් විවෘත කරලා ඒ අය හුඟක් මුදල් ආයෝජනය කරලා තිබෙනවා. ඇත්තටම මෙය අනවශ්‍ය ආයෝජනයක් කියලා කියන්නට පුළුවන්; irrational duplication එකක් කියලා කියන්නට පුළුවන්. මේක අඩු කරන්න අවශ්‍යයි. ඒ බැංකුවේ overhead එක පහළට ගේන්න නම් මේක අඩු කරන්නට ඕනෑ. මේ finance companies ප්‍රමාණය 28, 45 කරන්නවත්, මේ තිබෙන බැංකු ගණන දෙගුණ කරන්නවත් අවශ්‍යතාවක් නැහැ.

ඇත්තටම තිබෙන අවශ්‍යතාව මේකයි. අද මුදල් ගනු දෙනු කරන්නේ බැංකු හරහාවත්, ශාඛා හරහාවත් විතරක් නොවෙයි. මුදල් ගනු දෙනුව ATM එක හරහා කරනවා. ඒ වාගේම අද මුදල් ගනු දෙනුව mobile phone එක හරහා කරන්නට පුළුවන්. මුදල් ගනු දෙනුව mobile phone එක හරහා කරන නිසා අද මත් ද්‍රව්‍ය ගනු දෙනුවත් mobile phone එක හරහා සිදු වෙනවා. මොකද, තාක්ෂණය දියුණු වෙන විට හොරුත් තාක්ෂණය භාවිත කරනවා. ඒක නියාමනය කරන්නට ක්‍රම සහ විධි තිබෙනවා. ඒ ක්‍රම සහ විධි ක්‍රියාත්මක කළ යුතුයි. අද තාක්ෂණය දියුණු කරලා වැය වෙන මුදල අඩු කරලා බැංකු සේවාවන් රට වටේ හැම තැනම ගෙන යන්නට පුළුවන්. එම නිසා අපේ රජයට ප්‍රතිපත්තියක් හැටියට පිළිගන්නට සිද්ධ වෙනවා අපි මේ බැංකු එකතු කළ යුතුයි කියන එක - bank consolidation-. අපි බැංකු එකතු කළ යුතුයි කියන න්‍යායට එන්නට ඕනෑ. ඒ කියන්නේ බැංකු එකතු වෙනවා නම් අපි රජයක් හැටියට ඒකට සහයෝගය දෙන්නට ඕනෑ. මොකද, රජයක් හැටියට ඒ සඳහා සහයෝගය දුන්නොත් ඒකේ වාසිය තැන්පත්කරුවාටත්, ණය ගන්නා පුද්ගලයාටත් ලැබෙනවා. එම නිසා මේක ප්‍රතිපත්තියක් හැටියට අපි පිළිගත යුතුයි; අපි ඒ වාගේ ක්‍රියා කළ යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ සභාවේ කියැවුණා ආර්ථිකය දුර්වල වෙලා තිබෙනවා කියලා. ඇත්තටම macroeconomy එක අද ශක්තිමත් වෙලා තිබෙන්නේ. එදා විශාල අය වැය පරතරයක් තිබුණා; සියයට 7, සියයට 6 වැනි අය වැය පරතරයන් තිබුණා. අද ඒක සියයට 5 දක්වා අඩු වෙලා තිබෙනවා. නියහය තිබුණේ නැත්නම්, ජල ගැල්ම තිබුණේ නැත්නම් 2017දී ඒ ප්‍රතිශතය සියයට 4.6යි. මේ අවුරුද්දේදී ඒක සියයට 4.6ට ගේන්නට සහ 2020 වන විට එය සියයට 3.5ට ගේන්නට අපි බලාපොරොත්තු වෙනවා. අපි රජය භාර ගන්නා විට රජයේ මුළු ආදායම අඩු වෙලා තිබුණේ; ඒ ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 11.5ක්, සියයට 12ක වාගේ ප්‍රමාණයක තිබුණේ. අද ඒක සියයට 15කට කිට්ටු වෙන්නට යනවා.

අපි මේ මුදලින් කළේ මොනවාද? මේ මුදල්වලින් තමයි අධ්‍යාපනය දියුණු කරලා තිබෙන්නේ; ළඟම පාසල හොඳම පාසල කරන්නට අපි ආයෝජනය කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි මේ රටේ පාසල් යන හැම දරුවෙකුටම -දරුවන් ලක්ෂ 45කට- "සුරක්ෂා" නමින් රක්ෂණාවරණයක් ලබා දීලා තිබෙනවා. මෙතෙක් කිසිම රජයක් දීලා නැති රක්ෂණ ආවරණයක් අපි පාසල් දරුවන් වෙනුවෙන් ලබා දීලා තිබෙනවා. ඒ රක්ෂණාවරණය හරහා මව්වරුන්ට දරුවා රෝහලකට අරගෙන ගිහින් ඒ බිල ගෙවා ගන්නට රුපියල් ලක්ෂ දෙකක්, ලක්ෂ දෙකහමාරක් වෙනකම් මුදලක් ලබා ගන්නට පුළුවන් හැකියාව තිබෙනවා. ඒ විතරක් නොවෙයි පාසල් දරුවෙකුගේ දෙමව්පියන්ගෙන් කෙනෙකු අහිමි වුණොත් ඒ රක්ෂණාවරණය හරහා යම්කිසි මුදලක් දරුවාගේ වියදම සඳහා ලැබෙනවා.

අද අපි සෞඛ්‍ය සේවයට ආයෝජනය කරන ප්‍රමාණය, හදාගෙන යන රෝහල් ප්‍රමාණය ගැන මම විස්තර කරන්නට යන්නේ නැහැ. නමුත් අපි විශාල ආයෝජනයක් කරලා තිබෙනවා. දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට සෞඛ්‍යයට සහ අධ්‍යාපනයට වෙන් කරන ප්‍රමාණය අතින් අපි අද ඉදිරියට ගිහින් තිබෙනවා. පසුගිය වසර 10ම ක්‍රම ක්‍රමයෙන්, ක්‍රම ක්‍රමයෙන් ඒ ප්‍රමාණය අඩු වුණා. නමුත් පසුගිය වසර තුන තුළදී අපි මේක ක්‍රම ක්‍රමයෙන් වැඩි කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මුදල් අපි හරියට පාවිච්චි කරලා තිබෙනවා. අද මේ රටේ බොහෝ පුද්ගලයන් වයස්ගත තත්ත්වයට පත් වෙනවා; දීර්ඝ කාලයක් ජීවත් වෙනවා. ලෝකය ඒකට fastest ageing population කියලා කියනවා, වයස්ගත වන සමාජය කියලා කියනවා. ඊයේත් මම අවුරුදු 100 උපන් දිනය සමරපු කෙනෙකුගේ නිවසට ගියා. අද අපි පැනඩෝල් පෙත්තක මිල සියයට 50කින් අඩු කරලා තිබෙනවා. ඒ වාගේම ඕනෑම අත්‍යවශ්‍ය බෙහෙත් පෙත්තක මිල විශාල ප්‍රමාණයකින් අඩු කරලා තිබෙනවා. මම ඒ විස්තර සියල්ලම කියන්න යන්නේ නැහැ. ඒවා කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ කොහොමද? රජයේ රෝහලකට ගිහින් බෙහෙත් ගත්තොත් ඒක නොමිලයේ ලැබෙනවා. ඒ වාගේම ඇස් කාචවල මිල විශාල ප්‍රමාණයකින් - සියයට 45ත් සියයට 75ත් අතර ප්‍රමාණයකින්- අඩු කරලා තිබෙනවා. ඒ වාගේම stent එකක මිල අපි රුපියල් ලක්ෂයකින් අඩු කරලා තිබෙනවා. ඒ වාගේම අපි operationsවල ගාස්තු අඩු කරලා තිබෙනවා. ඒ අනුව අපි සෞඛ්‍යයට වියදම් කරලා තිබෙන මුදල අප්‍රමාණයි කියලා කියන්නට පුළුවන්. මේ කාලය තුළදී, 2017දී ආනයන සියයට 11කින් වැඩි වුණා; ධීවර ආනයනය සියයට 40කින් වැඩි වුණා. විදේශ විනිමය ශේෂය රුපියල් බිලියන 19යි. ඒ, විශාලම ශේෂය. පසුගිය දශක ගණනාව තුළම අපි දැකලා නැහැ මෙච්චර විශාල වැඩි වීමක්.

1956න් පස්සේ පළමුවැනි වතාවට තමයි මේ රටේ ප්‍රාථමික අතිරික්තයේ ධන අතිරික්තයක් ඇති වෙලා තිබෙන්නේ. පසු ගිය ජනවාරි මාසයේ ඉඳලාම උද්ධමනය ක්‍රමක්‍රමයෙන් අඩු වේ ගෙන, අඩු වේ ගෙන යනවා. අපේ සංඛ්‍යාලේඛනවලට අනුව නොවෙයි, ඒ මහ බැංකුවේ සංඛ්‍යා ලේඛනවලට අනුවයි. මම මේ සභාවට මේ කාරණය කියන්නට කැමැතියි. පසු ගිය කාලයේ වාගේ නොවෙයි, මහ බැංකුවයි, රජයයි එකක් අනෙකට ස්වාධීනව ක්‍රියාත්මක වේ ගෙන යනවා. ඒ අයගේ දත්තවලින් තමයි මම මේ කරුණු සඳහන් කරන්නේ. ඒ වාගේම විදේශ ආයෝජනය ඩොලර් බිලියන 1.9යි. ලංකා ඉතිහාසයේ වැඩිම ආයෝජන ලැබිලා තිබෙන්නේ 2017දී කියන එකත් සඳහන් කරන්නට ඕනෑ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
හම්බන්තොට වරාය විකුණලා?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
හම්බන්තොට වරායෙන් රුපියල් මිලියන 300යි ලැබුණේ. රුපියල් බිලියන 1.9න් දශම තුනයි හම්බන්තොට වරායෙන් ලැබුනේ. ඒකත් අයින් කරන්න. ඒත් රුපියල් බිලියන 1.6ක් ලැබිලා තිබෙනවා. හම්බන්තොට වරාය විකුණලා ලැබුණු මුදල ඉවත් කළත් විශාල මුදල් ප්‍රමාණයක් ලැබිලා තිබෙනවා.

හම්බන්තොට වරාය ගැන කථා කරපු නිසා මම මේ කාරණය කියන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, එදා මම හම්බන්තොටට ගියා; මත්තල ගුවන් තොටුපොළට ගියා; වරායට ගියා. එදා ගුවන් තොටුපොළට යනකොට එක මගියෙක්වත් ගුවන් තොටුපොළේ හිටියේ නැහැ. එතැනින් බැහැලා වරායට ගිහිල්ලා එන කොට තමයි තුවක්කුවක් එල්ල කරගෙන පුද්ගලයෙක් ආවේ. මම පස්සේ තමයි දැන ගත්තේ එදා එතුමා හම්බන්තොට නගරාධිපති කියලා. මම දේශපාලනයට අලුත් නිසා හඳුනා ගත්තේ නැහැ එයා කවුද කියලා. බස් එකෙන් පැනලා යන කොට තමයි දැන ගත්තේ එතුමා හම්බන්තොට නගරාධිපති කියලා. අද මම රාජ්‍ය ඇමති කෙනෙක්. අවුරුදු හතරකට පස්සේ තමයි ඒ නඩුව හම්බන්තොට උසාවියට ගිය මාසයේ ආවේ. මම හම්බන්තොට උසාවියට ගිහිල්ලා ඒ සිද්ධිය පිළිබඳ කරුණු කිව්වා. අවසානාවකට එතුමා අදත් එතැන නගරාධිපතිතුමා වෙලා සිටිනවා. නමුත් නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ. අපි ඒ ස්ථාවරය තුළ තමයි සිටින්නේ. [බාධා කිරීමක්] වෙන්න පුළුවන්. පසු ගිය කාලයේ හුඟක් අය එක එක දේවල් කළා. සමහර අය හොඳ පැත්තට මාරු වෙලා තිබෙනවා කියලාත් සඳහන් කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මා අවසන් කරනවා. හුඟක් අය කථා කරන කොට කිව්වේ මොකක්ද? ආර්ථිකය කඩා වැටිලාය කිව්වා. අද ශක්තිමත් තැනක ආර්ථිකය තිබෙනවා. ඒ නිසා අපට අද පුළුවන් මෙතැන ඉඳලා අපේ වර්ධන වේගය වැඩි කරන්න. එදා ආසියාවේ ඉහළ වර්ධන වේගයක් තිබුණා. චීනයේ ආර්ථික වර්ධන වේගය සියයට 10යි, 11යි. ඉන්දියාව සියයට 7ට, 8ට තිබුණේ. නමුත් අද ඒවා සියයට 6ට, 7ට බැහැලායි තිබෙන්නේ. එදා අපට සියයට 7ක වර්ධන වේගයක් තිබුණා. අද ඒක 4ට වැටිලා තිබෙනවා. නමුත් 2018දී දළ දේශීය නිෂ්පාදනයෙන් ආර්ථික වර්ධන වේගයේ වැඩි වීම සියයට 5ක් ඉක්මවා යනවා කියලාත් සඳහන් කරමින් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, මට ලබා දුන් කාලය පිළිබඳව.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ජයම්පති වික්‍රමරත්න මන්ත්‍රීතුමා.

[අ.භා. 6.51]

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නියෝජ්‍ය කථානායක ධුරයට තෝරා ගන්නා ලද ඔබතුමාට ශුභාශිංසනය පළ කර සිටීම මගේ යුතුකමක්. ඔබතුමා මේ පාර්ලිමේන්තුවේ ඉන්න ඉතාම ජනප්‍රිය මන්ත්‍රීවරයෙක්. ඒ වාගේම ඉතාම නිහතමානී හා අවංක කෙනකු හැටියට අපි කවුරුත් පිළිගන්නා කෙනෙක්. ඒ නිසා ඔබතුමා මෙම වැදගත් ධුරයට පත් වීම අපි කාටත් සතුටක්. ඔබතුමාගේ කටයුතු ඉතා සාර්ථක වේවා!යි කියා මම පළමුවෙන්ම ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මුළු භවස් වරුවේම ආණ්ඩු පක්ෂයේත්, විරුද්ධ පක්ෂයේත් මන්ත්‍රීවරු ඉදිරිපත් කරපු කරුණුවලට අනුව අපි කවුරුත් කනගාටු වෙන්නට ඕනෑ, මූල්‍ය ක්ෂේත්‍රයේ සිදු වෙලා තිබෙන මේ තත්ත්වය පිළිබඳව. නොයෙකුත් බැංකු, නොයෙකුත් මූල්‍ය ආයතන, නොයෙකුත් සමුපකාර සමිති පිළිබඳව දීර්ඝ වශයෙන් උදාහරණ ගෙනැල්ලා, නම් ගම් සහිතව සමහරු කථා කළා. සමහරු නම් ගම් කියන්නේ නැතුව ඒ විස්තර පමණක් කිව්වා. අපි කනගාටු වෙන්නට ඕනෑ තත්ත්වයක් තමයි අද මේ මතු වෙලා තිබෙන්නේ. ප්‍රතිපත්තිමය කරුණු ගැන දීර්ඝ වශයෙන් සඳහන් කළා.

මෙයට එක් හේතුවක් ලෙස අපට පෙනෙන දෙය තමයි, නියාමනයක් නොමැතිකම. අපේ නීතිවල දුර්වලකම් තිබෙනවා. ඒ වාගේම නියාමනයක් නොමැති වීම මේ ප්‍රශ්නවලට ප්‍රධාන හේතුවක් ලෙස අපට පෙනී යනවා. නමුත් නියාමනයක් නොමැති වීම පමණක් නොවෙයි එකම හේතුව. ඒ දූෂණ පිළිබඳව, සිදුවී තිබෙන ඒ මහා වංචා පිළිබඳව ප්‍රමාණවත් ලෙස පරීක්ෂණ කරලා නැහැ. ඒ පරීක්ෂණ ඇදී ගිහින් තිබෙනවා. ඒවා අවුරුදු ගණන් ඇදී යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මතක් වෙනවා දකුණු අප්‍රිකාවේ තිබුණු නඩුවක් පිළිබඳව. එය සුප්‍රසිද්ධ නඩුවක්. "මක්වන්යානේ" තමයි එම නඩුවේ නම. එම නඩුවේදී ප්‍රශ්නයක් මතු වුණා. මතු වුණු ප්‍රශ්නය තමයි, "මරණ දණ්ඩනය තිබ්ය යුතුද, නැද්ද?" කියන එක. දකුණු අප්‍රිකානු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය කිව්වා, ප්‍රශ්නය මරණ දණ්ඩනය තිබෙනවාද නැද්ද කියන එක නොවෙයි කියා. ඔවුන් කියා සිටියා, වරදක් කළාම ඒ වරද පිළිබඳව නිසි ලෙස පරීක්ෂණ පැවැත්වෙනවා, වරද කරපු මිනිහාට විරුද්ධව නඩු පැවරෙනවා සහ වරද කරපු මනුස්සයාට දඬුවමක් ලැබෙනවා කියා රටේ මිනිසුන්ට තේරෙනවා නම්, ප්‍රශ්නය දඬුවමේ ප්‍රමාණය නොවෙයි කියා. ප්‍රශ්නය තිබෙන්නේ මරණ දඬුවම ද, ජීවිතාන්තය දක්වා සිර දඬුවම ද කියන එක පිළිබඳව නොවෙයි. ඒ වරද පිළිබඳව හරියට පරීක්ෂණය වෙලා, නඩුව පැවරිලා, prosecute කරලා, වැරැදිකාරයා වෙලා දඬුවම් විඳිනවා නම් that is the best deterrent against crime. මේ කාරණය පිළිබඳව ද මට කියන්න තිබෙන්නේත් එයයි. අපි නීති තද කරන්න ඕනෑ; දඬුවම් නියම කරන්න ඕනෑ. ඒවා ඔක්කෝම ඇත්ත. නමුත් හරියට පරීක්ෂණ පැවැත්වෙන්නේ නැත්නම්, ඒවා දිගින් දිගට ඇදී යනවා නම්, වැරැදිකරුට දඬුවම් ලැබෙන්න අවුරුදු 10, 15 යනවා නම් අපි කොහේද ඉන්නේ කියලා අපට නිතාගන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි, එක සමුපකාර සමිතියක් පිළිබඳව.

[ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා]

ඒ තමයි මහරගම ප්‍රදේශයේ තිබෙන වත්තේගෙදර සකසුරුවම් සහ ණය ගනුදෙනු සමුපකාර සමිතිය. එහි බාහිර තැන්පත්කරුවන්ගේ තැන්පත් තිබෙනවා, රුපියල් කෝටි 66ක. රුපියල් කෝටි 66ක්! ඒ බොහෝ තැන්පත්කරුවන් බොහොම අමාරුවෙන් මුදල් සොයා ගත්ත අය. එක්කෝ, තමන්ගේ EPF එක තැන්පත් කරපු අය. එහෙම නැත්නම්, අවුරුදු ගණනක් තිස්සේ එකතු කරපු මුදල් තැන්පත් කරපු අය. එහි හිටපු සභාපති තමයි නන්දසිරි විනෝදහේවා. ඔහු කෝටි 6ක ණයක් දෙනවා, ඔහුගේ පුතාට! කොහොමද වැඩේ? ඒ පුතාගේ නම, සුමින්ද විනෝදහේවා. ප්‍රියංග නිශාන්ත කුමාර කියන තවත් කෙනකුටත් ණය දෙනවා. කෝටි 6ක ණයක් දෙනවා. පසු කාලයක ප්‍රියංග නිශාන්ත කුමාර එම සමිතියේම ලේකම් බවට පත් වෙනවා. නමුත් ඒ මුදල ගෙව්වේ නැහැ. ඉන් පස්සේ මේ නිශාන්ත කුමාර කියන පුද්ගලයා -ණය අරගෙන නොගෙවා, පසුව සමිතියේ ලේකම් වූ මිනිහා- ණය උකස් ඔප්පුවක් අවලංගු කිරීමේ ප්‍රකාශන ඔප්පුවක් දෙනවා. එයා ගත්ත සල්ලි ගෙවලා නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒවා තමයි, අංක 140992 සහ 140993 යන ප්‍රකාශන ඔප්පු. "වත්තේගෙදර අහවල් ස්ථානයේ පදිංචි සීමාසහිත වත්තේගෙදර සකසුරුවම් හා ණය ගනුදෙනු පිළිබඳ සමුපකාර සමිතියේ ලේකම් පදවිය දරන වර්තමාන නිලධාරි ප්‍රියංග නිශාන්ත කුමාර වන මම මෙසේ ප්‍රකාශ කර සිටිමි." ඔහු කියනවා, වත්තේගෙදර ඒ සමිතියෙන් සුමින්ද විනෝදහේවා -ඒ කියන්නේ, සමිතියේ හිටපු සභාපතිගේ පුතා- සහ අංක 34හි පදිංචි ප්‍රියංග නිශාන්ත කුමාර වන මම -ඒ කියන්නේ, ඔප්පුවෙන් ප්‍රකාශ කරන මිනිහා- ණය අරගෙන තිබෙනවා. එයා කියනවා, එයායි, සභාපතිගේ පුතායි තවත් කෙනෙකුයි -අපි තුන් දෙනා- එකතු වෙලා රුපියල් කෝටි 6ක් ගත්තා, දැන් අපි ඒ මුදල ගෙවලායි තිබෙන්නේ. හැබැයි, දැන් ඒ ඔප්පු සොයා ගන්න නැහැ කියලා. එයා මෙහෙම කියනවා. "අංක 400 දරන ණය ඔප්පුවේ මුල් පිටපත දැනට ඉහත කී සමිතිය වෙත හෝ මා වෙත නොමැති හෙයින් එම ඔප්පුව අවලංගු කිරීම සඳහා උකස් අවලංගු කිරීමේ ප්‍රකාශන ඔප්පුවක් සාදවා දීමට මම තීරණය කරමි." කියලා.

කොහොමද වැඩේ? එහෙම කරලා, ප්‍රකාශන ඔප්පු ලියනවා. ඒවා register කරනවා. මට ලැබී තිබෙන තොරතුරු අනුව ඊට පසුව එම ඉඩම් මුදා ගන්නවා. මුදා හැරලායි තිබෙන්නේ. බොහොම අමාරුවෙන් සභාපති නන්දසිරි විනෝදහේවා අත්අඩංගුවට ගත්තා. සුමින්ද විනෝදහේවාත් දැන් අත් අඩංගුවට අරගෙන තිබෙනවා. ප්‍රියංග නිශාන්ත තවම හොයා ගන්න නැහැ. බස්නාහිර පළාතේ සමුපකාර දෙපාර්තමේන්තුව ඉතාම මන්දගාමී ආකාරයටයි මේ කාරණය පිළිබඳව කටයුතු කර තිබෙන්නේ. දැන් අලුත් නිලධාරි මණ්ඩලයක් පත් වෙලා ඉන්නවා. 2005-2016 දක්වා විගණනයක් තිබුණේ නැහැ. දැන් නව නිලධාරි මණ්ඩලය යටතේ විගණනයක් කෙරෙනවා. නමුත් හිටපු අධ්‍යක්ෂවරු බලපෑම් කරනවා. ගංගොඩවිල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් පවරලා තිබෙනවා; 1058/16 දරන නඩුව. ඒකත් අනෙක් නඩු වාගේම ඇදි ඇදී යනවා. වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි තිබෙන වැදගත්කම නිසා මට තව විනාඩි දෙක-තුනක කාලයක් දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, අපි පස් වරු 7.00ට මෙම විවාදය අවසන් කරන්න ඕනෑ.

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)

හොඳයි. මේ පිළිබඳව 2017 ජූලි මාසයේ 26 වනදා මිරිහාන පොලීසියට පැමිණිලි කරලා තිබෙනවා. අංක 281/192 දරන පැමිණිල්ල ඉදිරිපත් කරලා තිබෙනවා. නමුත් ඒ සම්බන්ධයෙන් අද වනතුරු කිසිම දෙයක් කෙරිලා නැහැ. සමුපකාර දෙපාර්තමේන්තුවෙන් ප්‍රමාණවත් ලෙස පරීක්ෂණ කරලා නැහැ. අද සභාපති සහ කාරක සභාවේ නිලධාරීන් බයේ ඉන්නවා, ඔවුන්ගේ ජීවිතවලට හානි සිදුකරයි කියලා. සමිතියට යම් ආරක්ෂාවක් දීලා තිබෙනවා, ලේඛන ආරක්ෂා කරන්න ඕනෑ නිසා. මේකට දේශපාලන බලපෑමක් තිබෙනවා, එම දේශපාලන බලපෑම නිසා මේ පිළිබඳව නිසි විමර්ශනයක් කෙරෙන්නේ නැති වෙයි කියලා තැන්පත්කරුවන් බයේ සිටිනවා. ඒ නිසා බලධාරීන්ගෙන් මා ඉල්ලා සිටිනවා, මේ සඳහා මැදිහත් වෙලා, වහාම, නිසි පරිදි මේ පිළිබඳව පරීක්ෂණයක් කරලා, මෙහි වරදකරුවන් නීතිය හමුවට ඉදිරිපත් කරන්න කියලා. විශේෂයෙන්ම අමාරුවෙන් මුදල් හොයා ගෙන මුදල් තැන්පත් කළ අයට සාධාරණයක් වෙන විධියට මේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් වෙයි කියලා මා විශ්වාස කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු මන්ත්‍රීතුමනි, විෂයට අදාළ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ කාරක සභාවට නිලධාරීන් කැඳවලා, මෙම පරීක්ෂණ ඉක්මන් කිරීමට අවශ්‍ය - [බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ යෝජනාවට බොහොම ස්තුතියි. ඒ පිළිබඳවත් අපේ අවධානය යොමු කරනවා.

එකල්හි වේලාව අ. භා. 7.00 වූයෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවීමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2018 ජූනි 08වන සිකුරාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේ ය.

அப்பொழுது, பி.ப. 7.00 மணியாகிவிடவே மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.


அதன்படி பாராளுமன்றம், 2018 யூன் 08, வெள்ளிக்கிழமை மு. ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது

It being 7.00 p.m., MR. DEPUTY SPEAKER *adjourned Parliament without Question put.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

261 වන කාණ්ඩය - 3 වන කලාපය
தொகுதி 261 - இல. 3
Volume 261 - No. 3

2018 ජූනි 08වන සිකුරාදා
2018 யூன் 08, வெள்ளிக்கிழமை
Friday, 08th June, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

ප්‍රතිඥාව:
ගරු සීනි මොහමඩ් මොහමඩ් ඉස්මයිල් මහතා

විගණකාධිපතිවරයාගේ වාර්තාව

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
TNL රූපවාහිනියේ පොල්ගහවෙල විකාශනාගාරයේ විකාශන කටයුතු අත් හිටුවීම

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී

TNL රූපවාහිනියේ පොල්ගහවෙල විකාශනාගාරයේ විකාශන කටයුතු අත් හිටුවීම:
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත
දෙවන වර හා තුන් වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

කල්තැබීමේ යෝජනාව:
ග්‍රාමීය බැංකු පාලනය සඳහා නිසි ක්‍රමවේදයක් සැකසීම

பிரதான உள்ளடக்கம்

உறுதிப்பிரமாணம்:
மாண்புமிகு சீனி மொஹமட் மொஹமட் இஸ்மயில்

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:
TNL தொலைக்காட்சியின் பொல்கஹவல ஒளிபரப்பு நிலைய ஒளிபரப்பு இடைநிறுத்தம்

ஜெனரால் சேர் ஜோன் கொத்தலாவலை பாதுகாப்புப் பல்கலைக்கழகம் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது

TNL தொலைக்காட்சியின் பொல்கஹவல ஒளிபரப்பு நிலைய ஒளிபரப்பு இடைநிறுத்தம்:
நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சரினது கூற்று

தேசிய பாதுகாப்பு நிதியம் (திருத்தம்) சட்டமூலம்:
இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை:
கிராமிய வங்கிகளை ஒழுங்குறுத்துவதற்கான முறைமையை வகுத்தல்

PRINCIPAL CONTENTS

AFFIRMATION:
Hon. Seeni Mohamed Mohamed Ismail

AUDITOR-GENERAL'S REPORT

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Shutdown of TNL Transmission Centre at Polgahawela

GENERAL SIR JOHN KOTELAWALA DEFENCE UNIVERSITY (SPECIAL PROVISIONS) BILL:
Read the First time

SHUTDOWN OF TNL TRANSMISSION CENTRE AT POLGAHAWELA:
Statement by Minister of Finance and Mass Media

NATIONAL DEFENCE FUND (AMENDMENT) BILL:
Read a Second, and the Third time, and passed as amended

ADJOURNMENT MOTION:
Formulation of Methodology for Regulation of Rural Banks

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 ජුනි 08වන සිකුරාදා
2018 யூன் 08, வெள்ளிக்கிழமை
Friday, 08th June, 2018

පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

ප්‍රතිඥා : ගරු සීනි මොහමඩ් මොහමඩ් ඉස්මයිල් මහතා
உறுதிப்பிரமாணம்: மாண்புமிகு சீனி மொஹமட் மொஹமட் இஸ்மயில்
AFFIRMATION: HON. SEENI MOHAMED MOHAMED ISMAIL

ගරු සීනි මොහමඩ් මොහමඩ් ඉස්මයිල් මහතා නීති ප්‍රකාර ප්‍රතිඥාව දී මේසය මත තිබූ පොතෙහි අත්සන් කළේය.

மாண்புமிகு சீனி மொஹமட் மொஹமட் இஸ்மயில் சட்டத்தினால் வேண்டப்பட்டவாறு உறுதிப்பிரமாணம் செய்து, சபாபீடத்திலுள்ள புத்தகத்தில் கையொப்பமிட்டார்.

Hon. Seeni Mohamed Mohamed Ismail made and subscribed the Affirmation required by Law, and signed the Book at the Table.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර 2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XXVII කොටස, පස්වැනි කාණ්ඩයේ VIII කොටස සහ හයවැනි කාණ්ඩයේ XV, XVIII හා XXI කොටස්; සහ

2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XIX කොටස, සිව්වැනි කාණ්ඩයේ IV කොටස සහ හයවැනි කාණ්ඩයේ IV කොටස මම ඉදිරිපත් කරමි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ගරු සභානායකතුමා වෙනුවෙන් මම "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කරමි.

එම වාර්තාව ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 සහ 2015 වර්ෂ සඳහා ශ්‍රී ලංකා භදබිම අධිකාරියේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

එම වාර්තා කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව තරුණ, ක්‍රීඩා, කලා සහ උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, 2017 වර්ෂය සඳහා පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලි සංදේශ, ඩිජිටල් යටිතල පහසුකම් හා විදේශ රැකියා අමාත්‍යතුමා වෙනුවෙන්, 2017 වර්ෂය සඳහා විදේශ රැකියා අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන්, 2017 වර්ෂය සඳහා ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව තරුණ, ක්‍රීඩා, කලා සහ උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) දිවුලපිටිය, මීගමුව පාර, මහවත්ත, අංක 442/සී දරන ස්ථානයෙහි පදිංචි ඩී.එම්.ඒ. රණතුංග මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) මාකවිට, තම්මිට, අංක 94/සී/1 දරන ස්ථානයෙහි පදිංචි ජී.එල්.ආර්. මෙන්ඩිස් මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුජීබුර් රහුමාන් මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -37/'18- (1), ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්නය ඉතා ඉක්මනින් අගමැතිතුමාට යොමු කරවන්න ඕනෑ. මොකද, ඉතිහාසයේ පළමුවන වතාවට අද ඩොලරයේ අගය රුපියල් 160 ඉක්මවා තිබෙනවා. ඒ නිසා ඉක්මන් පිළිතුරක් අවශ්‍ය වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟ දිනයේදී පිළිතුර දෙන්න පුළුවන් නේද, ඇමතිතුමා?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
පුළුවන්.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 -158/'18- (1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 3 -195/'18- (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 - 216/'18 - (1), ගරු ඩග්ලස් දේවානන්දා මහතා.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ சபாநாயகர் அவர்களே, நான் அந்தக் கேள்வியைக் கேட்கின்றேன்.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 - 232/'18 - (1), ගරු එස්.එම්. මරික්කාර් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 - 240/'18 - (1), ගරු හේෂාන් විතානගේ මහතා.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

වර්ග කළ කසළ එකතු කිරීම : පහසුකම් සැලසීම
வகைப்படுத்தப்பட்ட குப்பை சேகரிப்பு: வழங்கப்பட்டுள்ள வசதிகள்
COLLECTION OF CLASSIFIED GARBAGE: FACILITIES PROVIDED

310/'18

7. ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වර්ග නොකළ කසළ එකතු නොකිරීමට පළාත් පාලන ආයතන ගත් තීරණය පිළිබඳව ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර තිබේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

(iii) කසළ වර්ගීකරණය කර එකතු කිරීමට අවශ්‍ය පහසුකම් ජනතාවට ලබා දී තිබේද;

(iv) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

(v) වර්ගීකරණය කරන ලද කසළ එකතු කිරීමට පළාත් පාලන ආයතන සඳහා පහසුකම් සලසා දී තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) කසළ වර්ගීකරණය කර නොදෙන පුද්ගලයන්ට එරෙහිව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) වර්ගීකරණය කරන ලද කසළ ප්‍රතිචක්‍රීකරණය කරන්නේද;

(iii) එසේ නම්, ඒ කවර ස්ථානයකදීද;

(iv) ඒ සඳහා ආයෝජනය කරන ලද මුදල කොපමණද;

(v) ප්‍රතිචක්‍රීකරණය කරන ලද කසළ කවර කටයුතු සඳහා භාවිත කළ හැකිද;

යන්නත් එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

මාකාණ සභාවල්, උළුෙරාට්ටි මත්රුම් විළෙයාට්ටුත් තුරෙ අමෙච්චරෙයි කේට්ට විනා:

(அ) (i) வகைப்படுத்தாத குப்பைகளைச் சேகரிக்காதிருப் பதற்கு உள்ளூராட்சி நிறுவனங்கள் எடுத்துள்ள முடிவைப் பற்றி மக்களை விழிப்புணர்வூட்டத் தேவையான நடவடிக்கைகள் மேற்கொள்ளப் பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், அது எவ்வாறென்பதையும்;

(iii) குப்பைகளை வகைப்படுத்திச் சேகரிக்கத் தேவை யான வசதிகள் மக்களுக்குப் பெற்றுக்கொடுக்கப் பட்டுள்ளனவா என்பதையும்;

(iv) ஆமெனில், அது எவ்வாறென்பதையும்;

(v) வகைப்படுத்தப்பட்ட குப்பைகளைச் சேகரிப் பதற்கு உள்ளூராட்சி நிறுவனங்களுக்கு வசதிகள் செய்துகொடுக்கப்பட்டுள்ளனவா என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) குப்பைகளை வகைப்படுத்தித் தராத ஆட்களுக் கெதிராக எடுக்கப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

(ii) வகைப்படுத்தப்பட்ட குப்பைகள் மீள்சுழற்சி செய்யப்படுகின்றனவா என்பதையும்;

(iii) ஆமெனில், அது எந்த இடத்தில் என்பதையும்;

(iv) அதற்காக முதலீடு செய்யப்படும் பணத்தொகை எவ்வளவென்பதையும்;

(v) மீள்சுழற்சி செய்யப்பட்ட குப்பைகளை எத்தகைய பணிகளுக்குப் பயன்படுத்தலாம் என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils, Local Government and Sports:

(a) Will he state-
(i) whether necessary action has been taken to educate people about the decision taken by local authorities not to collect unclassified garbage;
(ii) if so, the manner in which it was done;
(iii) whether people have been given the facilities which are required for collecting garbage after it is classified;
(iv) if so, the manner it has been done; and
(v) whether local authorities have been provided with the facilities required for collecting classified garbage?

(b) Will he also state-
(i) the action that has been taken against the persons who dispose garbage without classifying it;
(ii) whether the classified garbage is recycled;
(iii) if so, the place in which it is done;
(iv) the amount of money invested for it; and
(v) the purposes for which the recycled garbage can be used?

(c) If not, why?

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය (පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama - State Minister of Provincial Councils and Local Government and Sports)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ඔව්.

(ii) මෙම ප්‍රතිපත්ති තීරණය පිළිබඳව අප අමාත්‍යාංශය චක්‍රලේඛ හා උපදෙස් පත්‍රිකා මඟින් පළාත් සභා හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් දැනුවත් කළ අතර, එම පළාත් පාලන ආයතන ජනතාව දැනුවත් කිරීම සිදු කර ඇත. ඊට අමතරව විද්‍යුත් මාධ්‍ය හා මුද්‍රිත මාධ්‍ය මඟින් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් අප අමාත්‍යාංශය මඟින්ද සිදු කරන ලදී.

(iii) පළාත් පාලන ආයතන මඟින් සිදු කරයි.

(iv) ඒ සඳහා විවිධ ක්‍රමවේද භාවිත කරනු ලැබේ.

(v) වර්ගීකරණය කළ කසළ එකතු කිරීම කාල සටහනක් මඟින් සිදු කළ යුතු බවට ඉහත (අ) (ii) හි චක්‍රලේඛ මඟින් පළාත් පාලන ආයතනවලට උපදෙස් ලබා දී ඇත. මෙම අමාත්‍යාංශය මඟින් කසළ ප්‍රවාහන යන්ත්‍ර, අත් කරත්ත හා කොම්පෝස්ට් බඳුන් දිවයිනේ පළාත් පාලන ආයතන වෙත බෙදා දී ඇති අතර, ඉදිරි කාලයේදී කසළ ප්‍රවාහන යන්ත්‍ර සැලකිය යුතු ප්‍රමාණයක් පළාත් පාලන ආයතනවලට බෙදා දීමට සැලසුම් යොදා ඇත.

(ආ) (i) මේ සඳහා නෛතික විධිවිධාන සලසා ගැනීම පළාත් පාලන ආයතන සතු වග කීමකි. එයට සහායක් ලෙස සම්මත අතුරු ව්‍යවස්ථාවක් සකසා පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශ වෙබ් අඩවිය තුළ ප්‍රසිද්ධ කර ඇති අතර, අතුරු ව්‍යවස්ථා සැකසීම ගැන පළාත් පාලන ආයතන නිලධාරීන්ට පුහුණුව ද ලබා දී ඇත. ඒ අනුව දැනට පළාත් පාලන ආයතන තුළ අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක වෙමින් පවතී. අතුරු ව්‍යවස්ථා කඩ කරන පුද්ගලයන්ට එරෙහිව නෛතික පියවර ගැනීමට සහ උසාවිය හරහා දණ්ඩන පැනවීමට අදාළ ප්‍රධාන පනතේ විධිවිධාන තුළ ඒ ඒ පළාත් පාලන ආයතනවලට බලතල තිබේ.

(ii) වර්ගීකරණය කළ පසු දිරන කසළ සඳහා කොම්පෝස්ටිකරණ ක්‍රියාවලිය ද - කොම්පෝස්ටිකරණය- නොදිරන කසළ සඳහා ප්‍රතිචක්‍රීකරණ ක්‍රියා මාර්ග ද පෞද්ගලික අංශයේ ද මැදිහත් වීමෙන් සිදු කෙරේ.

(iii) ලංකාවේ බොහෝ පළාත් පාලන ආයතන බල ප්‍රදේශ තුළ සිදු වේ.

(iv) ප්‍රතිචක්‍රීකරණ කටයුතු සඳහා රේඛීය අමාත්‍යාංශය, පළාත් සභා, පළාත් පාලන ආයතන මෙන්ම පෞද්ගලික අංශ මඟින් ද සිදු කෙරෙන අතර ලංකාව පුරා ක්‍රියාත්මක වන වැඩසටහනකි.

(v) පෞද්ගලික අංශය විසින් විවිධ නිමි හා අන්තර් භාණ්ඩ සැකසීම මෙන්ම අපනයන කටයුතු සිදු කෙරේ.

(ඇ) අදාළ නොවේ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, එතුමිය සවිස්තරාත්මක පිළිතුරක් ලබාදීම ගැන මම ස්තුතිවන්ත වනවා. ගරු රාජ්‍ය ඇමතිතුමියනි, ඔබතුමියගෙන් පළමු අතුරු ප්‍රශ්නය අහන්න කැමැතියි.

මේ නිලධාරීන් ඔබතුමියට කොහොම පිළිතුරු ලියලා දුන්නත්, නියත වශයෙන්ම කසළ වෙන වෙනම වර්ග අනුව එකතු කිරීම ඉතා හොඳ තීන්දුවක්; ක්‍රියාත්මක විය යුතු තීන්දුවක්. මෙය ආරම්භ කරන්නට ප්‍රමාද වුණු එකයි කනගාටුව. මෙය මීට දශක ගණනාවකට කලින් ආරම්භ කළ යුතුව තිබුණු තීන්දුවක්. හැබැයි, මම කියන කාරණය ගැන ඔබතුමිය හොයලා බලන්න. නිලධාරීන් දෙන ඔය පඩංගුවල තිබෙන ඒවා නොවෙයි, මේ ගැන ඇත්ත හොයලා බලන්න. වෙන වෙනම කසළ එකතු කරගෙන ගියත් ඔය කියන ප්‍රතිචක්‍රීකරණය වෙන්නේ නැහැ. ඒක සුන්දර කථාවක් විතරයි. ගරු කථානායකතුමනි, නැවත ගිහිල්ලා දමන්නේ එකම තැනකට. මම මාතර දිස්ත්‍රික්කයෙන් උදාහරණ කියන්නම්. මාතර මහ නගර සභාව ගත්තත්, අකුරැස්ස ප්‍රාදේශීය සභාව ගත්තත්, අතුරලිය ප්‍රාදේශීය සභාව ගත්තත්, මාලිම්බඩ ප්‍රාදේශීය සභාව ගත්තත් මට මගේ දිස්ත්‍රික්කය ගැන කියන්න පුළුවන්. වෙන වෙනම ලස්සනට බෑග්වලට කසළ එකතු කරගෙන යනවා. එකතු කරගෙන ගියාට පස්සේ නැවත වරක් තෘණමූල මට්ටමින් - grassroots level එකෙන්- ප්‍රතිචක්‍රීකරණයක් වෙන්නේ නැහැ. බෑග් සියල්ලම එකට දානවා. ඊටපස්සේ බල්ලෝ, කපුටෝ වාගේ සත්තු ගිහිල්ලා මේ බෑග් ඉරනවා. ආපසු වතාවක් මේවා කලවම් වෙනවා. ඒ නිසා මේ තීන්දුව ගන්නවත් එක්කම ඒකට සමගාමීව කසළ ප්‍රතිචක්‍රීකරණය විය යුතුව තිබුණත් ඒක වෙන්නේ නැහැ. මේ කාරණය ඔබතුමිය පිළිගන්නවා ද? මේකට කඩිනමින් ගන්න පුළුවන් ක්‍රියාමාර්ගය මොකක්ද?

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු කථානායකතුමනි, එහෙම වෙන අවස්ථා, ආයතන තිබෙන්න පුළුවන්. පළාත් සභා, පළාත් පාලන අමාත්‍යාංශය විධියට අවශ්‍ය අනු නීති සකස් කරන්න පුහුණු කරලා, විශේෂයෙන්ම පුහුණු කිරීමේ ආයතනයක් ඇති කරලා තිබෙනවා. ඒ මඟින් විශේෂයෙන්ම පළාත් පාලන ආයතන විධිමත් කරන්න කටයුතු කරනවා. ඒ වාගේම මේ ආයතනවල ප්‍රධානීන්ට කසළ කළමනාකරණය පිළිබඳ විදේශීය පුහුණුව පවා ලබාදීලා තිබෙනවා. ඒ නිසා ඇත්තටම කසළ කළමනාකරණයේදී ඒ අය ස්වාධීනව කටයුතු කළ යුතු වෙනවා. මොකද, මධ්‍යම රජයට පළාත් සභාවේ හෝ එක් එක් ප්‍රාදේශීය සභාවේ කුණු කසළ ගැන වෙනම ගිහිල්ලා අධීක්ෂණය කිරීමේ හැකියාව අඩුයි. ඒ නිසා තමයි පළාත් පාලන ආයතනවලට අදාළව අනු නීති හදලා, ඒ අයට පුහුණුව දීලා, දැනුම දීලා ස්වාධීනව කටයුතු කරන්න අවස්ථාව දීලා තිබෙන්නේ. එහෙම කටයුතු නොකරන ආයතනයක් තිබෙනවා නම් ඒ සම්බන්ධයෙන් සොයා බලා, නැවතත් උපදෙස් දීලා කටයුතු කරන්න අමාත්‍යාංශයට පුළුවන්කමක් තිබෙනවා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, මම මේ කියන්න යන කාරණය ගැන ඔබතුමාත් හොඳටම දන්නවා. මොකද, මම ඒ නියෝජිත පිරිස් ඔබතුමාටත් මුණ ගස්වලා තිබෙනවා. ලෝකයේ බොහෝ රටවල පරිහරණය කරන ලද කුණු එකතු කරන යන්ත්‍ර -garbage compactors-, ගිලන් රථ, ගිනි නිවන රථ අපට නොමිලේ දෙන්න ඒ රටවල් ලැහැස්තියි. උදාහරණයක් හැටියට ජපානය ගත හැකියි. මම මෙහෙම කියන්නේ, මම එවැනි යන්ත්‍ර ලංකාවට ගෙන්වලා බෙදා දීලා තිබෙන නිසයි. ගරු කථානායකතුමනි, කුණු එකතු කරන යන්ත්‍රයක් සාමාන්‍යයෙන් රුපියල් මිලියන 40ක්-50ක් වෙනවා. ගරු කථානායකතුමනි, ඔබතුමාත් පුරපති වශයෙන් කොළඹ මහ නගර සභාවේ හිටපු නිසා දන්නවා ඇති, garbage compactor එකක් කොච්චර මුදලක් වෙනවාද කියලා. හැබැයි ජපානය වාගේ රටවලින්, යුරෝපා රටවලින් අපට පාවිච්චි කරපු, ඉතා හොඳ තත්ත්වයේ garbage compactors ගෙන්වා ගන්න පුළුවන්, අපේ තානාපති කාර්යාලවල නිලධාරීන් උනන්දු වෙනවා නම්. ඒ වාගේම ලංකාවට ගෙන්වනකොට තිබෙන ප්‍රශ්නය තමයි - ලංකාවේ පළාත් පාලන ආයතනවලට දෙන්නනේ මේවා ගෙන්වන්නේ,- වරාය බද්දේ සිට බොහෝ බදු අය කිරීම. ඒ නිසා අමාත්‍යාංශය මැදිහත් වෙලා මේ විධියට ගෙන්වන කුණු එකතු කරන යන්ත්‍ර වෙනුවෙන්, එහෙම නැත්නම් ගිනි නිවන රථ වෙනුවෙන් VAT එක ආදී සියලු තීරු බදු ඉවත් කරලා දෙන්න

[ගරු බුද්ධික පතිරණ මහතා]

පුළුවන් නම්, රුපියල් ලක්ෂ හාර පන්සියයක් වන කුණු එකතු කරන යන්ත්‍රයක් රුපියල් ලක්ෂ පහකට-දහයකට ලංකාවට ගෙන්වා ගන්න පුළුවන්.

සාමාන්‍යයෙන් ගත්තොත්, ලක්ෂ හාර පන්සියයක් වෙනවා. ඒ ගණනට පාවිච්චි කරපු, ඉතා හොඳ තත්ත්වයේ යන්ත්‍ර සිය ගණනක් ගෙන්වා ගන්න පුළුවන්. මේකට අවශ්‍ය මැදිහත්වීම කරන්න ගරු රාජ්‍ය ඇමතිතුමියත්, කැබිනට් අමාත්‍යතුමාත්, අමාත්‍යාංශයත් සූදානම්ද? ඒකට ක්‍රමවේදයක් හදනවාද?

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) ශ්‍රීයාණි විජේවික්කිරම)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු කථානායකතුමනි, මම මේ සම්බන්ධයෙන් අමාත්‍යාංශය දැනුවත් කළා. මේ පිළිබඳව ඉදිරි ක්‍රියා මාර්ග ගැනීම සඳහා ගරු ඇමතිතුමා සමඟත් සාකච්ඡා කරලා පියවරක් ගන්නම්. ඒක හොඳ පණිවිඩයක්. ඒ වාගේම කලින් අහපු අතුරු ප්‍රශ්නයත් එක්ක මට කල්පනා වුණු දෙයක් තමයි, උපකරණ ටික ලැබිලා තිබෙනවා නම්, කසළ කළමනාකරණය හරියාකාරව කිරීමේ වගකීමක් පාලන පාලන ආයතනවලට තිබෙනවාය කියන එක. ඔබතුමා කලින් කියූ විධියට එසේ කටයුතු කරන්නේ නැත්නම් මහ ජනතාවටත් අයිතියක් තිබෙනවා, පළාත් පාලන ආයතනයට විරුද්ධව නඩු දමන්න. ඒ නිසා කවුරුත් තමන්ගේ අයිතිවාසිකම් ගැන කල්පනාවෙන් ඉඳලා වැඩ කරන්න ඕනෑ, මේ හැම දේම විධිමත් වෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

හොඳයි. ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, ජපානයේ ඉඳලා භාණ්ඩ බොහොමයක් ලංකාවට එනවා වාගෙයි. ඔබතුමාත් සහය දෙන්න.

ප්‍රශ්න අංක 8 - 382/'18 - (1), ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 9 - 387/'18 - (1), ගරු කේ. කාදර් මස්තාන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10 - 409/'18 - (1), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 11 - 423/'18 - (1), ගරු ඉෂාක් රහුමාන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 12 - 439/'18 - (1), ගරු ජයන්ත සමරවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 13 - 451/'18 - (1), ගරු බිමල් රත්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 14 - 473/'18 - (1), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) ශ්‍රීයාණි විජේවික්කිරම)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක් කල් ඉල්ලා සිටිනවා.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, සමා වෙලා, පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවස්ථාවක් දෙන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

එතුමිය දැන් පෞද්ගලිකව මේ සම්බන්ධයෙන් බලයි. මම හිතන්නේ මීට පස්සේ එතුමිය මෙම ප්‍රශ්නයට පිළිතුර දෙන්න කල් ගන්න එකක් නැහැ.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)

ගරු කථානායකතුමනි, මේ හා සම්බන්ධම ප්‍රශ්නයක් මම පසුගිය බදාදා දිනයේදී ඇසුවා. එම ප්‍රශ්නයට ගරු රාජ්‍ය ඇමතිතුමිය පිළිතුර දුන්නා. මේ විමර්ශනය සම්බන්ධ තොරතුරු තිබෙන්නේ එක් ඇමුණුමකයි. එදා දිනයේදී ඔබතුමියට එවා තිබෙන්නේ මෙම විමර්ශන වාර්තාවෙන් භාගයයිද? මොකද, විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් එකම ලිපි ශීර්ෂය යටතේ, එකම දිනයේ එවා තිබෙන මේ වාර්තාව කොටස් වශයෙන්ද එවා තිබෙන්නේ කියන ප්‍රශ්නය අපට තිබෙනවා. මොකද, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ මම මේ ලේඛනය ගත්තා. ගරු රාජ්‍ය ඇමතිතුමියනි, 2017 අප්‍රේල් 20 දින විගණකාධිපති දෙපාර්තමේන්තුවේදී මේ විශේෂ විමර්ශනය කරන්නේ. එය සිදුවන්නේ ගරු කථානායකතුමාගේ විශේෂ ඉල්ලීම මතයි. පසුගිය බදාදා දිනයේදී ඔබතුමිය මීට අදාළ ගොනුවේ තිබුණු ලේඛනයක කොටසක් කියෙව්වා. හැබැයි, අද දිනයේදී සහ ඊයේ දිනයේදී ඒ ලේඛනය නැතිවනවා. ගරු කථානායකතුමනි, මෙක හරි බේදනීය තත්ත්වයක්.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

ඊ ළඟ අවස්ථාවේදී පිළිතුර දෙන්න පුළුවන් නේ, ගරු රාජ්‍ය ඇමතිතුමිය.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) ශ්‍රීයාණි විජේවික්කිරම)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

මට සකස් කර දෙන ලිපිගොනුව අනුව තමයි මම පිළිතුර දෙන්නේ. මම අමාත්‍යාංශයට කියන්නම්, ගරු මන්ත්‍රීතුමාගේ ප්‍රශ්න ටිකට ඉක්මනින් පිළිතුරු දෙන්න කියලා. මොකද, මේ ප්‍රශ්නයට පිළිතුර දෙන්න එපායැ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)

හොඳයි, මේ සඳහා පෞද්ගලික අවධානය යොමු කර ඒ ප්‍රශ්නයට පිළිතුර ලබා දෙන්න.

ගරු චමින්ද විජේසිරි මහතා
(මාණ්පුමිකු සමින්ද විජේසිරි)
(The Hon. Chaminda Wijesiri)

හොරු ආරක්ෂා කරන්න හදනවාද දන්නේත් නැහැ.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) ශ්‍රීයාණි විජේවික්කිරම)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

මට නම් කිසි වුවමනාවක් නැහැ, හොරු ආරක්ෂා කරන්න.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(මාණ්පුමිකු නිහාල් කලප්පත්ති)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා ළඟ මේ ප්‍රශ්නයට අදාළ පිළිතුර තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
පිළිතුර තිබෙනවා නම්, එවන්න. එතුමිය පෞද්ගලිකව ඒ සම්බන්ධයෙන් සොයා බලයි.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 15-476/'18-(1), ගරු විමලවීර දිසානායක මැතිතුමා.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(මාණ්පුමිකු டீ.ரீ.டபිள්யු. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අසනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය ඇමතිතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(මාණ්පුමිකු டீ.ரீ.டபිள්யු. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු කථානායකතුමනි, මම ඊයේත් මේ කාරණය කිව්වා. ලබන මාසේ 12වෙනි දාට මේ ප්‍රශ්නයට වර්ෂ පූර්ණ උත්සවය සමරන්න ඕනෑ. මේ හතරවන වතාවට කල් ඉල්ලන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
නැහැ. නැහැ. ගරු මන්ත්‍රීතුමා, මින් පසුව අලුත් ස්ථාවර නියෝග අනුව තුන්වතාවකට වැඩිය ඉඩ දෙන්නේ නැහැ. එතුමා අනිවාර්යයෙන්ම සහනික වෙනවා. අතීතය ගැන මම කථා කරන්නේ නැහැ.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(මාණ්පුමිකු டீ.ரீ.டபිள්යු. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ගරු කථානායකතුමනි, ඉතාම වැදගත් ප්‍රශ්නයක් මම ඇහුවේ. මතින් තොර රටක් සඳහා ප්‍රතිඥා දුන්න රටක අහෝ! දුකකි. ඛේදයකි; තිතකි; ඉරකි.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දෙවැනි වටය.

ප්‍රශ්න අංක 2-158/'18 -(1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(මාණ්පුමිකු නිහාල් කලප්පත්ති)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබාදීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3-195/'18-(1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

නාගරික නිවාස ව්‍යාපෘති : කොළඹ දිස්ත්‍රික්කය
நகர வீடமைப்புக் கருத்திட்டம்: கொழும்பு மாவட்டம்
URBAN HOUSING PROJECTS: COLOMBO DISTRICT

232/'18

5. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු එස්.එම්. මරික්කාර් මහතා වෙනුවට)
(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு எஸ்.எம். மரிக்கார் சார்பாக)
(The Hon. Buddhika Pathirana on behalf of the Hon. S.M. Marikkar.)
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) ඉදිරි වර්ෂ 03 ඇතුළත ආරම්භ කිරීමට නියමිත කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික නිවාස ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස ව්‍යාපෘතීන්හි ඉදිකිරීමට අපේක්ෂිත නිවාස ඒකක සංඛ්‍යාව කොපමණද;

[ගරු බුද්ධික පතිරණ මහතා]

(iii) මෙම නිවාස ව්‍යාපෘති සඳහා නිශ්චිත ඉඩම් හඳුනාගෙන තිබේද;

(iv) එසේ නම්, එම ඉඩම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) මෙම ව්‍යාපෘති සඳහා වැය කිරීමට අපේක්ෂිත මුළු මුදල කොපමණද;

(ii) මේ සඳහා පෞද්ගලික අංශයේ ආයෝජන පවතින්නේ නම්, ඒවා කවරේද;

(iii) රාජ්‍ය හා පෞද්ගලික ආයෝජනවලින් ඉදිකරනු ලබන නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම ව්‍යාපෘති අවසන් කිරීමට බලාපොරොත්තු වන දින වකවානු කවරේද;

(v) මෙම නිවාස ව්‍යාපෘතිවල නිවසක මුළු වටිනාකම කොපමණද;

(vi) එම නිවාස ජනතාවට ලබාදීමේ වැඩ පිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

මානකර මැටුම් හා මහාමාර්ග අමාත්‍යාංශය භාර රාජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) සුසන්ත පුංචිනිලමේ මහතා (මානකර මැටුම් හා මහාමාර්ග අමාත්‍ය ගරු (ආචාර්ය) සුසන්ත පුංචිනිලමේ මහතා) (The Hon. (Dr.) Susantha Punchinilame) (State Minister of Mahaweli Development and Environment)

ගරු කථානායකතුමනි, මහාවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය භාර රාජ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඉදිරි වර්ෂ 03 ඇතුළත ආරම්භ කිරීමට නියමිත නාගරික නිවාස ව්‍යාපෘති

නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය මඟින් - නිවාස ව්‍යාපෘති 30

මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘති මඟින් - නිවාස ව්‍යාපෘති 07

වැඩිමනත් ලෙස පසුගිය 2016 හා 2017 වසරවල පහත දැක්වෙන පරිදි නිවාස ව්‍යාපෘති විවෘත කරන ලදි.

2016 වර්ෂයේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය මඟින් නිමකරන ලද නිවාස 518ක් ජනතාවට භාර දී ඇත.

අනු අංකය	නිවාස ව්‍යාපෘතියේ නම	නිවාස ඒකක ගණන	විවෘත කළ දිනය
1	මුවදොර උයන, ෆර්ගියුෂන් පාර, කොළඹ 15 (A හා D ගොඩනැගිලි)	254	2016.01.12
2	සියසෙත සෙවණ, පංචිකාවත්ත, මරදාන	264	2016.08.05
		518	

asked the Minister of Megapolis and Western Development:

(a) Will he inform this House-

(i) the number of urban housing projects in the Colombo District scheduled to be initiated within the next three years;

(ii) the number of housing units expected to be constructed in these projects;

(iii) whether specific lands have been identified for these housing projects; and

(iv) if so, what those lands are?

(b) Will he also inform this House -

(i) the total amount of money expected to be spent for these projects;

(ii) what the private sector investments are, if there are any in this regard;

(iii) how many houses were constructed by the Government and private investments, separately;

(iv) the dates on which the projects are expected to be concluded;

(v) the total value of a house in these housing projects; and

(vi) the course of action for granting the houses to people?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඉදිරි වර්ෂ 03 ඇතුළත ආරම්භ කිරීමට නියමිත නාගරික නිවාස ව්‍යාපෘති

නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය මඟින් - නිවාස ව්‍යාපෘති 30

මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘති මඟින් - නිවාස ව්‍යාපෘති 07

වැඩිමනත් ලෙස පසුගිය 2016 හා 2017 වසරවල පහත දැක්වෙන පරිදි නිවාස ව්‍යාපෘති විවෘත කරන ලදි.

2016 වර්ෂයේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය මඟින් නිමකරන ලද නිවාස 518ක් ජනතාවට භාර දී ඇත.

අනු අංකය	නිවාස ව්‍යාපෘතියේ නම	නිවාස ඒකක ගණන	විවෘත කළ දිනය
1	මුවදොර උයන, ෆර්ගියුෂන් පාර, කොළඹ 15 (A හා D ගොඩනැගිලි)	254	2016.01.12
2	සියසෙත සෙවණ, පංචිකාවත්ත, මරදාන	264	2016.08.05
		518	

2017 වර්ෂයේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය මඟින් නිමකරන ලද නිවාස 1750ක් ජනතාවට භාර දී ඇත.

අනු අංකය	නිවාස ව්‍යාපෘතියේ නම	නිවාස ඒකක ගණන	විවෘත කළ දිනය
1	ලක්සඳ සෙවණ, B ගොඩනැගිල්ල	396	2017.03.02
2	ජයමහ සෙවණ, මහවත්ත	68	2017.03.18
3	ලක්හිරු සෙවණ, මාළිගාවත්ත	192	2017.06.28
4	මෙත්සඳ සෙවණ, හේනමුල්ල, A ගොඩනැගිල්ල	218	2017.10.30
5	ලක්සඳ සෙවණ, C ගොඩනැගිල්ල, කොලොන්නාව	396	2017.11.08
6	ලක්සෙත සෙවණ, මාළිගාවත්ත, ඇපල් වත්ත	480	2017.11.13
		1750	

ඉදිරි වර්ෂයන් තුළ වැඩ නිමවීමට නියමිත නිවාස ව්‍යාපෘති

2018 වර්ෂයේදී නිවාස 5953ක් හා 2019 වර්ෂයේදී නිවාස 1218ක් ජනතාවට භාර දීමට නියමිතය.

අනු අංකය	නිවාස ව්‍යාපෘතියේ නම	නිවාස ඒකක ගණන	වැඩ නිම කිරීමට යෝජිත කාලය
1	හේනමුල්ල නිවාස ව්‍යාපෘතිය, ගොඩනැගිල්ල 1	566	2018 මාර්තු
	ගොඩනැගිල්ල 2	670	2018 මාර්තු
	ගොඩනැගිල්ල 3	1647	2018 අප්‍රේල්
	ගොඩනැගිල්ල 4	1042	2018 මැයි
2	ආරාමය පෙදෙස නිවාස ව්‍යාපෘතිය, දෙමටගොඩ	717	2018 පෙබරවාරි
3	කොළඹගේ මාවත, HRL ගොඩනැගිල්ල	615	2018 දෙසැම්බර්
4	ටොරින්ටන් මාවත නිවාස ව්‍යාපෘතිය	115	2019
5	මාළිගාවත්ත නිවාස ව්‍යාපෘතිය B ගොඩනැගිල්ල	192	2018 අප්‍රේල්
	C ගොඩනැගිල්ල	192	2018 දෙසැම්බර්
	D ගොඩනැගිල්ල	192	2018 දෙසැම්බර්
6	කාලිංග මාවත නිවාස ව්‍යාපෘතිය	528	2019
7	කොලොන්නාව නිවාස ව්‍යාපෘතිය 1 ගොඩනැගිල්ල	240	2019 මාර්තු
	2 ගොඩනැගිල්ල	168	2019 අගෝස්තු
	3 ගොඩනැගිල්ල	167	2019 ජූලි
	4 ගොඩනැගිල්ල	120	2018 මාර්තු

(ii) නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය මඟින් - නිවාස ඒකක 18,152

මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘති මඟින් - නිවාස ඒකක 3,777

(iii) 2018 වසර තුළ ඉදිකිරීම් ආරම්භ කිරීමට නියමිත ඉඩම් හඳුනාගෙන ඇත. පුනස්ථාපන සැලැස්මට අනුව 2018 හා 2019 වර්ෂයන්හිදී මුදා ගන්නා ඉඩම්වල 2019 හා 2020 වර්ෂයන්හිදී ඉදිකිරීමට නියමිත නිවාස ව්‍යාපෘති ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

(iv) 2018 වසර සඳහා හඳුනාගත් ඉඩම් සහ යෝජිත නිවාස ව්‍යාපෘති

- කිඹුලාඇල වත්ත, මාදම්පිටිය
- බිලූමැන්ඩල්, 601 වත්ත
- 318 වත්ත, මාදම්පිටිය
- ඇපල්වත්ත
- එළුමඩුව වත්ත
- ස්ටේඩියම්ගම
- ෆර්ගියුෂන් පාර
- බැටරිවත්ත, මොරටුව
- ඔබේසේකරපුර
- පැලියගොඩ

මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘතිය මඟින් යෝජිත නිවාස ව්‍යාපෘති

- එලියට් පෙදෙස, බොරැල්ල
- තලවතුගොඩ, ජයවර්ධනපුර රෝහල පාර
- පලතුරුවත්ත, කොට්ටාව
- රත්මලාන (වාරිමාර්ග දෙපාර්තමේන්තු ඉඩම)
- තලගහකුඹුර, තලවතුගොඩ
- පැලියගොඩ
- වේලුපිල්ලේවත්ත, රාජගිරිය

(ආ) (i) නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය සඳහා - ආසන්න වශයෙන් රුපියල් මිලියන 85,341.40

මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘති සඳහා - ආසන්න වශයෙන් රුපියල් මිලියන 31,666.00

(ii) මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘති සඳහා පෞද්ගලික ආයෝජන 50%ක් වන අතර, ඉතිරි 50% නාගරික සංවර්ධන අධිකාරිය විසින් දරනු ලැබේ.

(iii) මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘතිය යටතේ ඉදිකරනු ලබන නිවාස ඒකක 3,777 පමණක් නාගරික සංවර්ධන අධිකාරිය හා පෞද්ගලික අංශයේ ආයෝජන මත ඉදි කරනු ලබයි. නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය යටතේ ඉදිකරනු ලබන නිවාස ඒකක රජයේ හා නාගරික සංවර්ධන අධිකාරියේ අරමුදල් මඟින් ඉදිකිරීමට යෝජිතය.

(iv) මෙම ව්‍යාපෘති 2018, 2019, 2020 යන වර්ෂයන්හිදී ආරම්භ කිරීමට නියමිත අතර, එක් ව්‍යාපෘතියක ඉදිකිරීම් කාලසීමාව මාස 30කි. ඒ අනුව 2020, 2021, 2022 වසර වන විට යෝජිත ව්‍යාපෘති අවසන් කිරීමට නියමිතය.

(v) නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියේ නිවසක වටිනාකම රුපියල් මිලියන 4.7 පමණ වන අතර මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් පිරිනැමීම අනුව නිවසක වටිනාකම තීරණය කරනු ලැබේ.

(vi) නාගරික පුනර්ජීවන ව්‍යාපෘතිය මඟින් ඉදිකිරීමට නියමිත නිවාස ව්‍යාපෘති ආසන්නයේ පවතින අඩු පහසුකම් සහිත වතු ජනාවාසයන්වල ජීවත්වන ජනතාවට ලබා දීමටත්, මධ්‍යම ආදායම් නිවාස ව්‍යාපෘතිය සඳහා නිවාස ලබාදීමේදී එම නිවාස ලබාගැනීමට කැමැත්ත දක්වන රජයේ සහ පෞද්ගලික ආයතන නිලධාරීන් තෝරා ගැනීමට නියමිතය.

(ඇ) අදාළ නොවේ.

වෙස්ට්හෝල් වත්තේ පිහිටි ග්‍රාමීය රෝහල : නැවත විවෘත කිරීම

வெஸ்ட்ஹோல் தோட்டக் கிராமிய வைத்தியசாலை: மீண்டும் திறத்தல்

RURAL HOSPITAL IN WESTHALL ESTATE : REOPENING

382/'18

8. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා වෙනුවට)

(மாண்புமிகு தினேஷ் குணவர்தன - மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே சார்பாக)

(The Hon. Dinesh Gunawardena on behalf of the Hon. Mahindananda Aluthgamage.)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, පස්බාගේ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වෙස්ට්හෝල් වත්තේ පිහිටි වෛද්‍ය මධ්‍යස්ථානය රජයට පවරාගෙන ග්‍රාමීය රෝහලක් බවට පත් කරන ලද බවත්;

(ii) මෙම ග්‍රාමීය රෝහල මඟින් එම ප්‍රදේශයේ පවුල් 3500 - 4000 ක් අතර ප්‍රමාණයකට සේවය සැලසූ බවත්;

(iii) දැනට වසරකට පෙර වෛද්‍යවරුන් හා උපකරණ හිඟය හේතුවෙන් මෙම රෝහල වසාදමා ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) එසේ නම්, මෙම රෝහල නැවත විවෘත කර වතුකරයේ ජනතාවගේ සෞඛ්‍ය අවශ්‍යතාවයන් විසඳීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கண்டி மாவட்டத்தின், பஸ்பாகே கோரளை பிரதேச செயலாளர் பிரிவின் வெஸ்ட்ஹோல் தோட்டத்தில் அமைந்துள்ள மருத்துவ நிலையம் அரசினால் பொறுப்பேற்கப்பட்டுக் கிராமிய வைத்தியசாலையாக மாற்றப்பட்டதென்பதையும்;

(ii) மேற்படி கிராமிய வைத்தியசாலையின் மூலம் இப்பிரதேசத்தின் 3500 - 4000 குடும்பங்களுக்குச் சேவை வழங்கப்பட்டதென்பதையும்;

(iii) தற்போது சுமார் ஒரு வருடத்திற்கு முன்னர் மருத்துவர்கள் மற்றும் உபகரணங்கள் பற்றாக் குறை காரணமாக இவ்வைத்தியசாலை மூடப் பட்டுள்ளதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், இவ்வைத்தியசாலையை மீண்டும் திறந்து பெருந்தோட்ட மக்களின் சுகாதாரத் தேவைகளை நிவர்த்தி செய்வதற்கு நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Is he aware that -

(i) the medical centre which is situated in Westhall Estate in Pasbage Korale Divisional Secretary's Division in Kandy District was acquired by the Government and converted into a rural hospital;

(ii) this rural hospital provided services to 3,500 to 4,000 families in the area; and

(iii) this hospital was closed down a year ago due to the shortage of doctors and equipment?

(b) If so, will he inform this House whether action will be taken to reopen this hospital and fulfill the health requirements of the estate people?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා

(மாண்புமிகு கயந்த கருணாதிலக்க)

(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) ඔව්

(iii) නැත. වෛද්‍ය නිලධාරියෙක් සහ ලියා පදිංචි වෛද්‍ය නිලධාරියෙක් මඟින් බාහිර රෝගී අංශයේ සේවාවන් හා සායන කටයුතු පවත්වාගෙන යනු ලබයි.

(ආ) පැන නොනඟී.

(ඇ) පැන නොනඟී.

ගරු කථානායකතුමා

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ප්‍රශ්න අංක 9 - 387/'18- (1), ගරු කේ. කාදර් මස්තාන් මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා

(மாண்புமிகு புத்திக பதிரண)

(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, ගරු කේ. කාදර් මස්තාන් මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා

(மாண்புமிகு கயந்த கருணாதிலக்க)

(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

Question ordered to stand down.

පානීය ජල ව්‍යාපෘති : පුත්තලම දිස්ත්‍රික්කය

குடிநீர் வழங்கல் கருத்திட்டங்கள்: புத்தளம் மாவட்டம்
DRINKING WATER PROJECTS: PUTTLAM DISTRICT

409/'18

10.ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Dinesh Gunawardena on behalf of the Hon. Padma Udhayashantha Gunasekera)

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 1983 වර්ෂය වනවිට පුත්තලම දිස්ත්‍රික්කය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් පිරිසිදු පානීය ජලය සපයනු ලැබ තිබූ නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට පිරිසිදු පානීය ජලය සපයනු ලබන නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) 1983 වර්ෂයෙන් පසුව යුද්ධය තත්ත්වය නිමවන තුරු පානීය ජලය ලබා දීම වෙනුවෙන් එක් එක් වර්ෂය සඳහා රජය විසින් වෙන් කරන ලද මුළු මුදල කොපමණද;

(iv) යුද්ධය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය වනතෙක් පානීය ජලය ලබාදීමේ ව්‍යාපෘති වෙනුවෙන් රජය වෙන් කරන ලද මුළු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1983ஆம் ஆண்டளவில் புத்தளம் மாவட்டத்தில் தேசிய நீர் வழங்கல் மற்றும் வடிகாலமைப்புச் சபையினால் சுத்திகரிக்கப்பட்ட குடிநீர் வழங்கப் பட்டிருந்த வீடுகளின் எண்ணிக்கை யாது;

(ii) இன்றளவில் சுத்திகரிக்கப்பட்ட குடிநீர் வழங்கப் படுகின்ற வீடுகளின் எண்ணிக்கை யாது;

(iii) 1983ஆம் ஆண்டின் பின்னர் யுத்த நிலைமை முடிவடையும்வரை குடிநீர் வழங்குவதற்காக ஒவ்வோர் ஆண்டிற்கும் அரசாங்கம் ஒதுக்கிய மொத்தப் பணத்தொகை யாது;

(iv) யுத்த நிலைமை முடிவடைந்த பின்னர் 2015 ஆம் ஆண்டுவரை குடிநீர் வழங்கல் கருத்திட்டங் களுக்காக அரசாங்கம் ஒதுக்கிய மொத்தப் பணத்தொகை ஆண்டு வாரியாகத் தனித் தனியாக எவ்வளவு;

(v) மேற்படி அனைத்தினதும் முன்னேற்ற அறிக்கையைச் சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of City Planning and Water Supply:

(a) Will he inform this House-

(i) how many households within the Puttalam District had been connected to the supply of clean drinking water by the National Water Supply and Drainage Board by 1983;

(ii) how many households are provided with clean drinking water at present;

(iii) what amount was allocated by the Government in each year for the supply of drinking water after 1983 until the end of the war situation;

(iv) what amounts had been allocated by the Government for projects implemented for the supply of drinking water, separately in respect of each of the years following the war situation up until the year 2015; and

(v) whether he will table a progress report on all above?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ජල සම්පාදන මණ්ඩලය මඟින් ලබා දී තිබූ ජල පහසුකම් සංඛ්‍යාව: 400කි.

(වැඩ භාර නිලධාරීන්ගේ දත්ත අනුව)

(ii) මේ වන විට ලබා දී ඇති ජල සැපයුම් සංඛ්‍යාව : 38,879 කි.

(iii) 1983 සිට එක් එක් වර්ෂය සඳහා පුත්තලම් දිස්ත්‍රික්කය සඳහා ජාතික ජල සම්පාදන මණ්ඩලය දැරූ වියදම්:

අංකය	වර්ෂය	වියදම (රුපියල්)
1	1983-2007	836,195,016.98
2	2008	254,342,717.94

(iv) යුද්ධය තත්ත්වය අවසානවීමෙන් පසු වසර 2015 තෙක් පුත්තලම දිස්ත්‍රික්ක ජාතික ජල සම්පාදන ව්‍යාපෘති වෙනුවෙන් වැය කළ මුදල් පහත වගුවේ පරිදි වේ.

වසර	වියදම (රුපියල්)
2009	7,965,000.00
2010	78,736,000.20
2011	117,360,000.27
2012	313,494,000.48
2013	665,782,000.34
2014	1,392,507,000.56
2015	1,373,552,000.10

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(v) ඔව්. (මේ සමඟ ඉදිරිපත් කර ඇත.)

අංකය	ව්‍යාපෘතියේ නම	ආවරණය වන ප්‍රදේශ	ප්‍රතිලාභීන්	වර්තමාන තත්ත්වය
1	ආසියානු සංවර්ධන බැංකු ආධාර (හලාවත) ජල සම්පාදන ව්‍යාපෘතිය	හලාවත, බිංගිරිය, ආරච්චිකට්ටුව	71,000	ව්‍යාපෘතියේ වැඩ අවසන් වී ඇත. ජල සම්බන්ධතා ලබා දීමට නියමිතව ඇත.
2	ආසියානු සංවර්ධන බැංකු ආධාර (පුත්තලම) පානීය ජල සම්පාදන ව්‍යාපෘතිය	පුත්තලම, වනාතවිල්ලුව, ආණමඩුව	71,000	.....එම.....
3	ආණමඩුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	ආණමඩුව, නවගත්තේගම, කොටවෙහෙර, මහකුඹුක්කඩවල, රස්නායකපුර	135,075	ව්‍යාපෘතියේ වැඩ ආරම්භ වී ඇත.

අංකය	ව්‍යාපෘතියේ නම	ආවර්ණය වන ප්‍රදේශ	ප්‍රතිලාභීන්	වර්තමාන තත්ත්වය
1	දන්කොටුව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතිය	දංකොටුව, වෙන්නප්පුව, නාත්තන්ඩිය	112,500	ටෙන්ඩර්පත් ඇගැයීම් සිදුවෙමින් පවතී.
2	හලාවත ජල සම්පාදන ව්‍යාපෘතිය (II අදියර)	බිංගිරිය, මහවැව, හලාවත	32,317	ආසියානු සංවර්ධන බැංකු ආධාර යටතේ ක්‍රියාත්මකවීමට නියමිතව ඇත.
3	කල්පිටිය ජල සම්පාදන ව්‍යාපෘතිය	කල්පිටිය	72,000	ආච්චිමලේ ජලාශයෙන් ජල ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා ගතයුතුව ඇත. එතෙක් කරදියෙන් (ලුණු රසය ඉවත් කිරීම) කල්පිටිය අන්තර්කාලීන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.
4	පුත්තලම දකුණු නගර ජල සම්පාදන ව්‍යාපෘතිය	පුත්තලම, මූන්දලම, ආරච්චිකට්ටුව, මහකුඹුක්කඩවල	155,552 (2038)	ජල මූලාශ්‍ර සඳහා අනුමැතිය ලබා ගත යුතුව ඇත. මූල්‍ය ප්‍රතිපාදන ලබා ගත යුතුය.
5	කල්පිටිය කරදියෙන් ලුණු රසය ඉවත් කරන ජල සම්පාදන ව්‍යාපෘතිය	කල්පිටිය	44,011	ව්‍යාපෘති ඇගැයීම් කමිටුවේ අනුමැතිය ලබා ගත යුතුව ඇත.
6	කරුවලගස්වැව වනාතවිල්ලුව ජල සම්පාදන ව්‍යාපෘතිය	කරුවලගස්වැව, වනාතවිල්ලුව	41,575	මූලික ශක්‍යතා අධ්‍යයන වාර්තාව සකසමින් පවතී.
7	පුත්තලම ජල සම්පාදන ව්‍යාපෘතිය (II අදියර)	පුත්තලම	125,240	
8	දන්කොටුව ජල සම්පාදන ව්‍යාපෘතිය (II අදියර) නාත්තණ්ඩිය/ මහවැව පානීය ජල සම්පාදන ව්‍යාපෘතිය	දන්කොටුව, නාත්තන්ඩිය, මහවැව		
9	කාක්කපල්ලිය ජල සම්පාදන ව්‍යාපෘතිය (II අදියර)	මහවැව, මාඳම්පේ, හලාවත		

(ආ) අදාළ නොවේ.

අතුරු මාර්ග හා කාන්තු පද්ධති සකස් කිරීම : කලාවැව ගම්මානය

கிளை வீதிகள் மற்றும் வடிகால் தொகுதிகளை அமைத்தல்: கலாவெவ கிராமம்

CONSTRUCTION OF BYROADS AND DRAINAGE SYSTEMS: KALAWEWA VILLAGE

423/'18

11. ගරු බුද්ධික පතිරණ මහතා (ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවට)

(மாண்புமிகு புத்திக பதிரண - மாண்புமிகு இஷாக் ரஹுமான் சார்பாக)

(The Hon. Buddhika Pathirana on behalf of the Hon. Ishak Rahuman)

පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කලාවැව ගම්මානයේ පවුල් 2500 ක් පමණ ජීවත් වන බවත්;

(ii) මෙම ගම්මානය, දිස්ත්‍රික්කයේ ජනාකීර්ණ සහ ඉතා ශීඝ්‍රයෙන් නාගරීකරණය වෙමින් පවතින ගම්මානයක් වීම හේතුවෙන් මෙහි අතුරු මාර්ග හා කාන්තු පද්ධති පිළිවෙළට සකස් කිරීම අත්‍යවශ්‍ය වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මෙම අඩුපාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

මාකාණ සපයකල්, උළුෙරාට්චි මත්‍රුම් විළෙයාට්ටුත් තුරෙ අමෙච්චරෙයිරෙක් කේට්ට විනා:

(அ) (i) இப்பலோகம பிரதேச செயலாளர் பிரிவில், கலாவெவ கிராமத்தில் சுமார் 2500 குடும்பங்கள் வசிக்கின்றார்கள் என்பதையும்;

(ii) இக்கிராமம், மாவட்டத்தில் சன நெரிசல் மிக்க துரிதமாக நகரமயமாகிக்கொண்டிருக்கும் ஒரு கிராமம் என்பதால் இதன் கிளை வீதிகள் மற்றும் வடிகால் தொகுதிகளை முறையாக அமைக்க வேண்டியது இன்றியமையாதது என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இக்குறைகளை நிவர்த்திசெய்வதற்குத் தேவையான நிதி ஏற்பாட்டை வழங்குவாரா என்பதையும்;

(ii) ஆமெனில், அத் திகதி யாதென்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils, Local Government and Sports:

(a) Is he aware that-

(i) approximately 2,500 families live in Kalawewa village in Ipalogama Divisional Secretary's Division; and

(ii) it has become essential to construct the byroads and the drainage systems of this village properly as it is a densely populated and rapidly urbanizing village in the district?

(b) Will he inform this House-

(i) whether the necessary provisions to fulfil these shortcomings will be provided; and

(ii) if so, by which date?

(c) If not, why?

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2017 ඡන්ද හිමි නාම ලේඛනය අනුව කලාවැව ගම්මානයේ පවුල් 343ක් ජීවත් වේ.

(ii) ඔව්.

(ආ) (i) පළාත් සභාව සතු සීමිත ප්‍රතිපාදන ප්‍රමාණය ප්‍රමුඛතා පදනම මත ලබාදීමට නියමිතයි.

(ii) නිශ්චිත දිනයක් ප්‍රකාශ කළ නොහැක.

(ඇ) අදාළ නොවේ.

ඩීසල් සඳහා අයකරන බදු : විස්තර
டீசலுக்கான வரி: விபரம்
TAXES ON DIESEL: DETAILS

439/'18

12.ගරු ශෙහාන් සේමසිංහ මහතා (ගරු ජයන්ත සමරවීර මහතා වෙනුවට)
(மாண்புமிகு செஹான் சேமசிங்க - மாண்புமிகு ஜயந்த சமரவீர சார்பாக)
(The Hon. Shehan Semasinghe on behalf of the Hon. Jayantha Samaraweera)

ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ඩීසල් ආනයනය කිරීමේදී ඩීසල් ලීටරයක් වෙනුවෙන් රජය විසින් අයකරනු ලබන ආනයන බද්ද කොපමණද;

(ii) ඩීසල් ලීටරයක් සඳහා රජය විසින් ආනයන බද්ද හැර වෙනත් බදු අයකරන්නේද;

(iii) එසේ නම්, එම බදු කවරේද;

(iv) එක් ලීටරයක් සඳහා අයකරනු ලබන බදු ප්‍රමාණය, එක් එක් බදු වර්ගය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ඩීසල් ලීටරයක් සඳහා රජය විසින් අයකරනු ලබන මුළු බදු ප්‍රමාණය, ඩීසල් ලීටරයක සිල්ලර මිලෙහි කවර ප්‍රතිශතයක්ද;

(ii) ඩීසල් සඳහා රජය අය කරනු ලබන සියලු බදු ඉවත් කළහොත්, පාරිභෝගිකයාට ඩීසල් ලීටරයක් ලබා දිය හැකි සිල්ලර මිල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) ඩීසල් සඳහා රජය විසින් විවිධ වර්ගයේ බදු අය කිරීම හාණ්ඩ හා සේවාවන්හි මිල ගණන් වැඩිවීමට බලපා ඇති බවත්;

(ii) ඩීසල් සඳහා රජය අයකරනු ලබන සියලු බදු ඉවත් කළහොත්, හාණ්ඩ හා සේවාවල මිල අඩුකිරීමට හැකි බවත්;

එතුමා පිළිගන්නේද?

(ඈ) නො එසේ නම්, ඒ මන්ද?

පෙට්‍රෝලිය වළංකල් අපිවිරුත්ති අමෙච්සරෙක් කේට්ට විනා:

(அ) (i) டீசல் இறக்குமதி செய்யும்போது ஒரு லீற்றர் டீசலுக்கு அரசாங்கம் அறவிடுகின்ற இறக்குமதி வரி எவ்வளவு என்பதையும்;

(ii) ஒரு லீற்றர் டீசலுக்கு அரசாங்கம் இறக்குமதி வரி தவிர வேறு வரிகளை அறவிடுகின்றதா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி வரிகள் யாவை என்பதையும்;

(iv) ஒரு லீற்றருக்கு அறவிடப்படுகின்ற வரித் தொகை, ஒவ்வொரு வரி வகைக்கும் அமைய எவ்வளவு என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) ஒரு லீற்றர் டீசலுக்கு அரசாங்கம் அறவிடுகின்ற மொத்த வரித் தொகையானது, ஒரு லீற்றர் டீசலின் சில்லறை விற்பனை விலையில் எத்தனை சதவீதமாகும் என்பதையும்;

(ii) டீசலுக்கு அரசாங்கம் அறவிடுகின்ற சகல வரிகளையும் நீக்கும்பட்சத்தில், வாடிக்கையாளருக்கு ஒரு லீற்றர் டீசலைப் பெற்றுக் கொடுக்கக்கூடிய சில்லறை விலை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) டீசலுக்கு அரசாங்கம் பல்வேறு வகையிலான வரிகளை அறவிடுவதானது பண்டங்கள் மற்றும் பணிகளின் விலைகள் அதிகரிப்பதற்கு ஏதுவாக அமைந்துள்ளது என்பதையும்;

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

(ii) ඩීසලුක්කු අරසාඞ්කම් අරවිටුකින්ර සකල වරිකළෙයුම් නීක්කුම්පට්සත්තිල්, පණ්ටඞ්කළ් මර්රුම් පණිකළින් විලෙකළෙක් කුරෙක්ක මුටියුම් එන්පතෙයුම්;

අවර් ඒර්රුක්කොළ්වාරා?

(ඊ) ඉන්රෙල්, ඒන්?

asked the Minister of Petroleum Resources Development:

(a) Will he inform this House-

(i) the Import Tax per litre of diesel charged by the Government in importing diesel;

(ii) whether the Government charges any taxes other than the Import Tax per litre of diesel;

(iii) if so, what those taxes are; and

(iv) the amount charged as taxes per litre, as per each type of tax?

(b) Will he also inform this House -

(i) the total amount of taxes charged on diesel by the Government as a percentage of the price of a litre of diesel; and

(ii) the retail price at which diesel could be provided to the customer if all taxes charged by the Government on diesel were lifted?

(c) Will he admit that-

(i) imposition of various taxes on diesel by the Government has caused increase of prices of goods and services; and

(ii) it is possible to bring down the prices of goods and services if all the taxes imposed on diesel by the Government are lifted?

(d) If not, why?

ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ මහත්මිය (ඛනිජ තෙල් සම්පත් සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමිය)

(மாண்புமிகு (டாக்டர்) (திருமதி) அனோமா கமகே - பெற்றோலிய வளங்கள் அபிவிருத்தி பிரதி அமைச்சர்)

(The Hon. (Dr.) (Mrs.) Anoma Gamage - Deputy Minister of Petroleum Resources Development)

ගරු කථානායකතුමනි, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***

** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*

** Answer tabled:*

(අ) (i) ලංකා ඔටෝ ඩීසල් ලීටරයක් සඳහා රුපියල් 3.85ක් සහ ලංකා සුපර් ඩීසල් ලීටරයක් සඳහා රුපියල් 10.55කි.

(ii) ඔව්.

(iii) වෙනත් බදු නම්,

- නිෂ්පාදන බද්ද
- වරාය හා ගුවන් සේවා සංවර්ධන බද්ද
- ජාතික ගොඩනැගීමේ බද්ද

(iv)

	(ලංකා ඔටෝ ඩීසල්)	(ලංකා සුපර් ඩීසල්)
ආනයන බදු (රේගු බදු) රුපියල්/ ලීටරයට	3.85	10.55
නිෂ්පාදන බද්ද රුපියල්/ ලීටරයට	13.00	13.00
වරාය හා ගුවන් සේවා සංවර්ධන බද්ද (පිරිවැය, රක්ෂණ හා නැව් ගාස්තු මත 7.5%) රුපියල් / ලීටරයට (සාමාන්‍ය)	5.86	6.07
ජාතික ගොඩනැගීමේ බද්ද රුපියල් /ලීටරයට	0.93	1.02
එකතුව	23.64	30.64

(ආ) (i) ලංකා ඔටෝ ඩීසල් 21.69%

ලංකා සුපර් ඩීසල් 25.75%

(ii) ලංකා ඔටෝ ඩීසල් රුපියල් 93.11

ලංකා සුපර් ඩීසල් රුපියල් 96.72

(ඇ) (i) සහ (ii) එකඟ නොවේ.

(ඈ) බදු පිරිවැයට බලපාන එක් සාධකයකි. පිරිවැයට අනුව මිල වෙනස් නොකරන බැවින්, පිරිවැය වැඩිවීම සංස්ථාව මඟින් දරනු ලැබේ.

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය : සපයා ඇති නිල වාහන

அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சரின் பிரத்தியேக பதவியணி: வழங்கப்பட்டுள்ள உத்தியோகபூர்வ வாகனங்கள்

PRIVATE STAFF OF MINISTER OF DEVELOPMENT STRATEGIES AND INTERNATIONAL TRADE: PROVISION OF OFFICIAL VEHICLES

451/'18

13. ගරු නිහාල් ගලප්පත්ති මහතා (ගරු බිමල් රත්නායක මහතා වෙනුවට)

(மாண்புமிகு நிஹால் கலப்பத்தி - மாண்புமிகு பிமல் ரத்நாயக்க சார்பாக)

(The Hon. Nihal Galappaththi on behalf of the Hon. Bimal Rathnayake)

සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියා පදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சரைக் கேட்ட வினா:

(அ) அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சரின் பிரத்தியேக பதவியணிக்கு இணைக்கப்பட்டுள்ள, உத்தியோகபூர்வ வாகனங்கள் வழங்கப்பட்டுள்ள ஒவ்வோர் உத்தியோகத்

தரதும் பெயர், பதவி, ஒதுக்கப்பட்டுள்ள வாகனத்தின் வகை, பதிவிலக்கம் மற்றும் அவ்விதம் ஒதுக்குவதற்கு அங்கீகாரம் வழங்கியது யார் என்பதை வெவ்வேறாக அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Development Strategies and International Trade:

(a) Will he inform this House separately the name and designation of each officer who is attached to the private staff of the Minister of Development Strategies and International Trade, who has been allocated a vehicle along with details of the type of vehicle allocated to them, registration number and the name of the officer who authorized such allocation of a vehicle?

(b) If not, why?

ගරු මලික් සමරවික්‍රම මහතා (සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு மலிக் சமரவிக்ரம - அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்)
(The Hon. Malik Samarawickrama - Minister of Development Strategies and International Trade)
Sir, I **table*** the Answer.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(a)

Assigned vehicle to Private staff of Hon. Minister of Development Strategies and International Trade. Up to Date - 2018.03.31

VEHICLE NUMBER	TYPE OF VEHICLE	NAME OF ASSIGNED OFFICER	DESIGNATION OF ASSIGNED OFFICER	POWER OF ASSIGNING
WP KY 7021	Defender	Mr. S. Vishwanadhan	Media Secretary	This vehicle was assigned by the Secretary to the Ministry in terms of the President's Office Circular No. C/A/1/17/1 dated 2010.05.14
WP CAK 4266	Montero	Mr. S.N.P. Rathwatte	Public Relations Officer	This vehicle was assigned by the Secretary to the Ministry in terms of the President's Office Circular No. C/A/1/17/1 dated 2010.05.14
WP KU 6279	Discovery 4	Ms. Shanthi Bandara	Coordinating Secretary	This vehicle was assigned by the Secretary to the Ministry in terms of the President's Office Circular No. C/A/1/17/1 dated 2010.05.14

(b) Not relevant.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, 27(2) ස්ථාවර නියෝගය යටතේ ප්‍රශ්න. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

TNL රූපවාහිනියේ පොල්ගහවෙල විකාශනාගාරයේ විකාශන කටයුතු අත් හිටුවීම
TNL தொலைக்காட்சியின் பொல்கஹவல ஒளிபரப்பு நிலைய ஒளிபரப்பு இடைநிறுத்தம்
SHUTDOWN OF TNL TRANSMISSION CENTRE AT POLGAHAWELA

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා.

මෙම කාරණාව පිළිබඳව පාර්ලිමේන්තුවට කලින් ප්‍රකාශයක් කිරීමට එකඟ වුව ද, මෙතෙක් එවැනි ප්‍රකාශයක් සිදුවී නොමැත. එනම්, TNL Television Network ආයතනයේ පොල්ගහවෙල සම්ප්‍රේෂණාගාරය සීල් තබා තහනම් කොට එහි විකාශනය නවතා දැමීමේ කාරණය සම්බන්ධවයි. ගරු කථානායකතුමනි, විදුලි සංදේශ කටයුතු අමාත්‍යතුමා වෙත පිළිතුරු බලාපොරොත්තුවෙන් ඉදිරිපත් කරන කාරණාව මෙයයි.

ශ්‍රී ලංකාවේ දීර්ඝ කාලීන හා පුරෝගාමී රූපවාහිනී විකාශනය වන TNL Television Network ආයතනයේ පොල්ගහවෙල ක්‍රියාත්මක වන අවසරලත්, අදාළ ගෙවීම් සියල්ල ඉටු කර ඇති සම්ප්‍රේෂණ කුලුනේ විකාශන කටයුතු 2018 ජුනි මස 05වැනි දින ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව - TRC- විසින් සීල් තබා විකාශනය නවතා බලපත්‍රය අවලංගු කිරීම, අත් හිටුවීම කිසිදු සාධාරණ හෝ නීත්‍යානුකූල කරුණක් නොව, ජනමාධ්‍ය නිදහසට හා මෙවැනි විකාශනයන් රාශියකට කර ඇති බලවත් තර්ජනයක් හා පහරකි.

එහෙයින්,

1. 1979දී මෙම ක්ෂේත්‍රයේ පුරෝගාමී මහ පෙන්වීම ඇති කළ, 1992දී බලපත්‍ර ලැබූ, මෙම ආයතනය 1994-1995 සිට මෙම සම්ප්‍රේෂණ කටයුතු කළ බවත් අමාත්‍යවරයා පිළිගන්නවාද?

   මෙම ආයතනයේ සම්ප්‍රේෂණ කටයුතු සිදු කරන පොල්ගහවෙල සම්ප්‍රේෂණ කුලුන තහනම් කොට නවතා දැමුවත්, සියලු ගෙවීම්, බලපත්‍ර ගාස්තු ආදිය නීත්‍යානුකූලව කර ඇති බව පිළිගන්නේද?

2. අපේ දේශපාලන මතය කුමක් වුවද, ශාන් වික්‍රමසිංහ මහතා කළමනාකාර අධ්‍යක්ෂ ධුරය දරන ටීඑන්එල් ටෙලිකොම් නෙට්වර්ක් ආයතනයට ජනමාධ්‍ය නිදහස උල්ලංඝනය කරමින් හිතුවක්කාර ලෙස නියෝග පනවමින් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිසම කර ඇති ක්‍රියාව අවලංගු කර එම විකාශන කරගෙන යෑමට පොල්ගහවෙල සම්ප්‍රේෂණාගාරයට වහා ඉඩ ලබා දෙනවාද?

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

එසේ නම්, ඒ කවදාද?

එසේ නැත්නම් හේතු පැහැදිලි කිරීමට කටයුතු කරනවාද?

ගරු කථානායකතුමනි, අපි පාර්ලිමේන්තු පනතකින් තමයි මෙම විකාශන නීතිගත කළේ.

අපි පාර්ලිමේන්තු පනත ගෙනෙන්නත් කලින් තමයි ශාන් වික්‍රමසිංහ මහතා මේ ක්ෂේත්‍රයේ පුරෝගාමියා වුණේ. මට මතකයි, ජේ.ආර්. ජයවර්ධන මහතාගේ රූපය දැම්මේ නැහැයි කියලා මහරගම ආසනයේ ආරම්භ කළ ඒ පළමුවෙනි විකාශනාගාරය ජනසතු කළ හැටි. ඉන් පසුව එතුමා අලුතෙන් ටීඑන්එල් එක පටන් ගත්තා. බොහෝ අය එයින් බිහි වුණා. අපගේ හිත මිත්‍ර ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා වාගේම, අද ජනමාධ්‍ය ක්ෂේත්‍රයේ සිටින බොහෝ අය බිහි වුණු කේන්ද්‍රස්ථානයක් ඒක. අප තුළ වෙනස් වූ දේශපාලන මත තිබෙන්නට පුළුවන්. ඒක වෙනම කාරණයක්. අපි "හිරු" නාළිකාව තහනම් කළ වෙලාවේදීත් පාර්ලිමේන්තුවේදී ඒ ගැන ඇහුවා. සී.එස්.එන්. නාළිකාව තහනම් කළ වෙලාවේදීත් අපි පාර්ලිමේන්තුවේදී ඒ ගැන ඇහුවා. විදුලි සංදේශ නියාමන පනත හිතුවක්කාර, අත්තනෝමතික ලෙස පාවිච්චි කරන්නට පාර්ලිමේන්තුව සම්මත කළ පනතක් නොවෙයි. මේ සම්ප්‍රේෂණ කුලුනෙන් සිදු කරන්නේ විකාශනයක්. දහස් ගණනක්, ලක්ෂ ගණනක් ජනතාව මේකට සවන් දෙනවා.

ගරු කථානායකතුමනි, එදා උදේ රහස් පොලිසියේ නිලධාරීන් ගිහිල්ලා ඒ ස්ථානයට බලහත්කාරයෙන් ඇතුළු වෙලා ක්‍රියා කළේ කොහොමද? සාමාන්‍යයෙන් එසේ ඇතුළුවීමට කලින් ආයතනයකට දැනුම් දෙන්න ඕනෑ. පනත අනුව, due notice has to be given. Are you going to treat this country in this manner? We are not under a dictatorship yet. We are still a Parliamentary democracy, my Friend, Hon. Malik Samarawickrama will agree with me. But, this is the way you all are treating the media today.

ඒ ආයතනය රජයට කරන්න තිබෙන සියලු ගෙවීම් 2016 අවසානය දක්වාත් ගෙවා තිබෙනවා. ඊට පස්සේ ගැටලුවක් ඇති වී තිබෙනවා. ඒ ගැටලුව විසඳා ගැනීම සඳහා සාකච්ඡා වාර ගණනාවක් පවත්වා, ලිපිලේඛන රාශියක් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමඟ ටීඑන්එල් ආයතනය හුවමාරු කළ බවට පැහැදිලි ලිපිලේඛන තිබෙද්දී ඇයි මෙහෙම හිතුවක්කාර ලෙස කටයුතු කර තිබෙන්නේ? මා හිතනවා, මෙය ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ -Sri Lanka Telecommunications Act - වගන්ති උල්ලංඝනය කිරීමක් කියලා. එසේ වගන්ති උල්ලංඝනය කිරීමෙන් එක ආයතනයකට නොවෙයි, ඒ මුළු ක්ෂේත්‍රයටම මේ හා සමාන තර්ජනයක් තමයි එන්නේ. මෙය ආරම්භයක්. මෙය භයානක ක්‍රියාවලියක් හැටියට අපි දකිනවා. මම කලින් කිව්වා වාගේ, due notice has not been given. "Due notice" is due notice, not sending the CID in the morning and shutting off and sealing off the transmission. The TRCSL allowed this institution to develop. They in fact gave permission and licence to import and upgrade the technical broadcasting system. This institution went to the People's Bank. They have taken loans and upgraded the broadcasting system. ගරු අගමැතිතුමනි, I do not want to ask you this question. I know that you are not going to answer this because of your beloved brother. But, we all know and we respect him as a pioneer of television network in our country. We might have political differences with some of the institutions, but media freedom is very important in this democratic world.

Lastly, ගරු කථානායකතුමනි, මම දන්නේ නැහැ, අග්‍රාමාත්‍යතුමා මේ ප්‍රශ්නයට උත්තර දෙයිද කියලා.

මා හිතන විධියට දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන්- [බාධා කිරීමක්] ජනාධිපතිවරයා යටතෙහි තිබෙන්නේ මහවැලිය, පරිසරය සහ Defence කියන විෂයයන් තුන පමණයි. අනෙක් පත්වීම් කිරීමේ බලය; Director-General ආදීන් පත් කිරීමේ බලය තිබෙනවාද? If someone is appointed violating the Constitution, that appointment itself can be questioned. I am only giving an indication to correct these things because people are acting without knowing the powers that we enjoy today under the Constitution. මා ඒ කෙරෙහිත් විශේෂයෙන්ම ආණ්ඩුවේ අවධානය යොමු කරවනවා. මේ ආයතනය ගැන නොවෙයි, තවත් ආයතන ගැන වුණත් ප්‍රශ්න කරන්න පුළුවන්. ඒක බරපතළ කාරණයක්. I am not promoting that the Prime Minister be given all the powers under the Nineteenth Amendment to the Constitution, but this is the situation, Hon. Prime Minister. The Ministry of Defence and two other Ministries come under the President.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි. මන්ත්‍රීවරුන් දෙදෙනෙක් අවස්ථාව ඉල්ලුවා. ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමා සහ ගරු මලික් සමරවික්‍රම අමාත්‍යතුමා. බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, ඔබතුමා තමයි ඉස්සර වෙලාම අවස්ථාව ඉල්ලුවේ. ගරු මන්ත්‍රීතුමා, පැහැදිලි කිරීමක් කරන්න තිබෙනවාද? මේ සම්බන්ධයෙන් විවාදයකට යන්න බැහැ.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු කථානායකතුමනි, පැහැදිලි කිරීමක් නොවෙයි. මේ කාරණයට මමත් යමක් එකතු කරන්නට ඕනෑ. ශාන් වික්‍රමසිංහ මැතිතුමා කියන්නේ, ජාතික සම්පතක්. ඒ, අගමැතිතුමාගේ සහෝදරයා නිසා නොවෙයි. 1969 ඩඩ්ලි සේනානායක ආණ්ඩුව කාලයේ තමයි එතුමා මුලින්ම රූපවාහිනී නාළිකාවක් පටන් ගන්න හැදුවේ. බණ්ඩාරනායක මැතිනියත් එය ප්‍රතික්ෂේප කළා; ඩඩ්ලි සේනානායක මැතිතුමාත් ප්‍රතික්ෂේප කළා. ජේ.ආර්. ජයවර්ධන යුගයේ තමන්ගේ ඥාතියකු වූ අනිල් විජේවර්ධන මැතිතුමාත් එක්ක එය පටන් ගත්තා. එය ලත් තැනම ලොප් කළා. ස්වාධීන රූපවාහිනිය පටන් ගත්තේ එතුමා. රාජකීය විද්‍යාලයේ ඉගෙන ගත් කාලයේ එතුමාගේ pocket money සහ රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ pocket money අරගෙන තමයි electronic වැඩ කළේ. එතුමාගේ ඉතිහාසය එහෙමයි. මේ පාර්ලිමේන්තුවේ 225දෙනා අතර සිටින, TNL එකේ සේවය කරපු එකම කෙනා මමයි. ගරු කථානායකතුමා, බන්දුල ගුණවර්ධන මැතිතුමා, දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ආදී සියලුදෙනාගේ පළමුවන රූපවාහිනී සංවාදය, පළමුවන රූපවාහිනී වැඩසටහන TNL එකේ "ජනඬ" වැඩසටහනයි. එදා එම වැඩසටහන මෙහෙයවපු කෙනකු විධියට මා ඇත්තටම ලජ්ජා වනවා; කනගාටු වෙනවා. ඒ, අගමැතිතුමාගේ සහෝදරයා නිසා නොවෙයි. අප ආවේ මේකට නොවෙයි, ගරු කථානායකතුමනි. LankaeNews වෙබ් අඩවියත් මේ විධියටම block කළා. මේවා block කරන කොට; මාධ්‍ය ආයතන block කරන කොට ඒ පිළිබඳව ජනමාධ්‍ය අමාත්‍යාංශය,

ජනමාධ්‍ය ඇමතිවරයා, රටේ අගමැතිවරයා ආදි අය අතර consent එකක් තිබෙනවා. ඒ අය දැනුවත් වෙන්න ඕනෑ. එහෙම block කරන්න හේතුවක් තිබෙනවාද? අපට රෙදි ඇදගෙන එළියට බැහැලා කතා කරන්න පුළුවන්ද? 2015 ජනවාරි 8වන දාත්, අගෝස්තු 17වන දාත් අපි ජයග්‍රහණ ලැබුවේ මේවා කියලාද? TNL රූපවාහිනී සේවයට පනවපු වාරණය සහ ඒ කරපු බලපෑම් කොන්දේසි විරහිතව වහාම ඉවත් වෙන්නට ඕනෑ. ඒ වාගේම LankaeNews ඇතුළු වෙබ් අඩවි මේ විධියට block කරන්න පුළුවන්ද? මේවා jokes. මේ නූතන යුගයේ පොලීසිය දාලා මේ විධියට බලපෑම් කරන්න පුළුවන්ද? අනෙක් කාරණය, පොලීසිය ටීඑන්එල් මාධ්‍ය ආයතනයට කඩා පැන්නේ පොලීසිය භාරව සිටින නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයා දැනුවත්වද? අපි ටීඑන්එල් එකේ වැඩ කරද්දී මේ වගේ යුගයක් භුක්ති වින්දා. ප්‍රවෘත්තියක් නිසා රහස් පොලීසිය කඩාගෙන පැන්නා. මට මතක විධියට 1998 තමයි ඒක වුණේ. අපි ප්‍රවෘත්ති ලියපු කොළ ටික උදුරාගෙන ගියා. අපි තැන් තැන්වල හැංගිලා ඉඳලා, three-wheelersවලින් ගියේ. මට මතකයි සමහර අවස්ථාවල වෙස් වලාගෙන ගිහිල්ලා තමයි රාත්‍රී ප්‍රවෘත්ති ටික දුන්නේ. මේ වගේ අඳුරු යුගයක් තමයි එදා තිබුණේ. ශාන් වික්‍රමසිංහ මැතිතුමාට මෙහෙම අත තැබුවා නම්, අනෙක් අයගේ ඉරණම මොකක්ද? ආපහු සැරයක් අපි රට ඇදගෙන යන්නේ කොතැනටද? මේක නතර වෙන්න ඕනෑ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට ගරු මලික් සමරවික්‍රම මැතිතුමා.

ගරු මලික් සමරවික්‍රම මහතා (සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා)
(මාණ්පුමිකු මලික් සමරවික්‍රම - අපිවිරුත්ති උපාය මුරෙකළ් මට්රුම් සර්වදේස වර්ත්තක අමైච්චර්)
(The Hon. Malik Samarawickrama - Minister of Development Strategies and International Trade)

Hon. Speaker, we are also for media freedom and we are totally against closing down of this tower, which we think is not reasonable. But, I would like to remind my good Friend, the Hon. Dinesh Gunawardena, that the dictatorship was during their regime and that was the time that Sirasa TV channel was burnt down. I think, the Hon. Member has forgotten that. Even though Sirasa TV channel is continuously attacking us, we believe in media freedom.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
None of us have gone to Sirasa.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්රම)
(The Hon. Malik Samarawickrama)
You may not have gone, but it was during your regime.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
We are not going to have a debate on that. I allowed the Hon. Members of Parliament to express their views.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්රම)
(The Hon. Malik Samarawickrama)
It was burnt during your time. That was a dictatorship.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
That incident took place during President Chandrika Bandaranaike Kumaratunga's regime.

ගරු මලික් සමරවික්‍රම මහතා
(මාණ්පුමිකු මලික් සමරවික්රම)
(The Hon. Malik Samarawickrama)
You were also in that Government. You were a Minister in that Cabinet. She was with you at that time. [*Interruption.*] Hon. Speaker, the Hon. Dinesh Gunawardena was a Minister in the Cabinet at that time.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Okay.

ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමා පිළිතුරු දෙනවාද?

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ප්‍රධාන සංවිධායකතුමනි, ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා යම් කාරණයක් ඉදිරිපත් කරනවා. ඔබතුමා ඊට පසුව පිළිතුරු දෙන්න.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත යටතේ ඔබතුමාටත් වග කීමක් තිබෙනවා, මේ රටේ ව්‍යවස්ථාදායකය විසින් සම්මත කරනු ලබන අණ පනත්වලට පටහැනිව රජයක් හෝ කුමන බලධරයෙක් හෝ ක්‍රියාත්මක වෙනවා නම් ඒ පිළිබඳව අවධානය යොමු කරන්න. අපේ "සීඑස්එන්" නාළිකාවටත් මේ ආකාරයෙන්ම - ත්‍රස්තවාදී ආකාරයෙන් - මැදිහත් වෙලා එය වසා දැම්මා. අද "ටීඑන්එල්" එකටත් ඒක වෙනවා. ඒ නිසා, දේශපාලන පක්ෂ, පාට භේදයෙන් තොරව මේ රටේ මාධ්‍යවලට නිදහසේ ක්‍රියාත්මක වෙන්න ඉඩ හරින්න ඕනෑය කියා අපි කියනවා. පොලිස් රාජ්‍ය සංකල්පය යටතේ කරන මෙවැනි හිතුවක්කාර සීල් තැබීම් වැනි දේවල් වැළැක්වීමට කටයුතු කරන්න ඔබතුමාටත් වග කීමක් තිබෙනවාය කියා අපි විශ්වාස කරනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. මම ඒ පිළිබඳව අවධානය යොමු කරන්නම්. [බාධා කිරීමක්]

[ගරු කථානායකතුමා]

ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කරන කාරණය මොකක්ද?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් පණ්ඩාර ජූයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මේ කාරණය ඉතාම වැදගත්. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා, "අපේ සීඑස්එන් නාළිකාව" කියා කිව්වා. මම දන්නා විධියට "සීඑස්එන්" නාළිකාව එතුමාගේ නම් නොවෙයි. හැබැයි, "සීඑස්එන්" නාළිකාවේ සිද්ධියත්, මේ සිද්ධියත් කාරණා දෙකක්. "සීඑස්එන්" නාළිකාවට මුදල් ආවේ කොහොමද, එම ආයතනය පිහිටෙව්වේ කොහොමද කියන එක පිළිබඳව බරපතළ ප්‍රශ්නයක් තිබුණා. ගරු කථානායකතුමනි, මෙතැන තිබෙන වැදගත්ම දේ තමයි, - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අපි මේ කාරණය ගැන කථා කළේ එය විවාදයක් කරගන්න නොවෙයි, "ටීඑන්එල්" එක සම්බන්ධයෙන් කරුණු පැහැදිලි කරගන්නයි.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් පණ්ඩාර ජූයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මෙතැන තිබෙන වැදගත්ම කාරණය තමයි, "ටීඑන්එල්" ආයතනයේ අධිපතිවරයා ගරු අගමැතිතුමාගේ සහෝදරයාය කියන කාරණය මේ රටේ සියයට 5ක්වත් දැනගෙන සිටියේ නැති එක. අඩුම ගණනේ "ටීඑන්එල්" එක මේ ආණ්ඩුවේ advertisement එකක්වත් ගත්තේ නැහැ, අගමැතිතුමාගේ බලතල පාවිච්චි කළේ නැහැ. අගමැතිතුමාගේ පවුලේ තව සහෝදරයෝ ඉන්නවා. ඒ අය මාධ්‍ය ආයතන පවත්වාගෙන යනවාය කියා ජනතාව දැනගත්ත එකත් ලොකු දෙයක් බව මම කියන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමනි, දැන් ඔබතුමාගේ පිළිතුර ඉදිරිපත් කරන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් අසන ලද ස්ථාවර නියෝග 27 (2) ප්‍රශ්නයට පිළිතුරු දෙන්න නියමිතව ඇත්තේ ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමාටයි. ඉදිරි පාර්ලිමේන්තු සතියේදී ඒ පිළිබඳව සවිස්තරාත්මක පිළිතුරක් දෙන බව එතුමා දැනුම් දී තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි.

අද දිනයේ ප්‍රධාන වැඩ කටයුතු,- [බාධා කිරීමක්] ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමනි, ඔබතුමා මට ලිපියක් දුන්නා. ඒ ගැන සම්පූර්ණ විස්තර ලබා දුන්නාම,- [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Hon. Member, what is your point of Order?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා පසුගිය දා මේ ගැන ඇහුවාම මංගල සමරවීර ඇමතිතුමාත්, මලික් සමරවික්‍රම ඇමතිතුමා වාගේම මේ ක්‍රියාව හෙළා දැකලා, ඒ පිළිබඳව විස්තරාත්මක ප්‍රකාශයක් කරනවාය කිව්වා. නමුත් අද වනතුරු පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කළේ නැහැ. ඒ නිසා තමයි 27(2) ස්ථාවර නියෝගය යටතේ මේ කාරණය මම අද ඉදිරිපත් කළේ. ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා දැන් මේ පාර්ලිමේන්තුවට කියවන ලද ලිපියේ විස්තරාත්මක ප්‍රකාශයක් නැහැ. ආයතනයක් තහනම් කරලා, රහස් පොලිසිය ඇතුළු වෙලා, දේපොළ තහනම් කරලා ඒ ආයතනයේ කටයුතු ඇනහිටලා, මුළු ජන මාධ්‍යයම තර්ජනයකට ලක් වෙලා තිබෙනවා. අද "ටීඑන්එල්" එකටයි මේ දේ වෙලා තිබෙන්නේ. හෙට වෙනත් ජන මාධ්‍ය ආයතනයකට මේ දෙය වෙන්න පුළුවන්. බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා කිව්ව විධියට, පනත උල්ලංඝනය කරමින් මේ විධියට හැසිරෙන්න පුළුවන් නම් ඕනෑම ආයතනයක් මෙවැනි සිද්ධියකට ගොදුරු වෙන්න පුළුවන්.

ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමනි, මේ ප්‍රශ්නයෙන් මම කාරණා දෙක, තුනක් අසා තිබෙනවා. ඒ නිසා ලිස්සලා යන උත්තර දෙන්න එපා. "සීඑස්එන්" එක පිළිබඳ ප්‍රශ්නය වෙලාවේදීත් ඔබතුමාගෙන් මම ප්‍රශ්නයක් ඇහුවාම, ඔබතුමා ලිපි ගොනුව ගෙන්වා ගෙන, බොහොම ගෞරවාන්විත ඇමතිවරයෙක් හැටියට ඒ පිළිබඳව කටයුතු කරලා බෝපගේ කියන තැනැත්තාට දඩුවම් කරන තත්ත්වයට පත් කළා. ඒ වාගේ ඔබතුමාට පුළුවන් මේ ප්‍රශ්නයේදී, - [බාධා කිරීමක්]

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්පුමිකු පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මටත් කාරණයක් කියන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්න, ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා විෂයය භාර ඇමතිතුමා නොවෙයි. නියෝජ්‍ය ඇමතිවරයෙක් ඉන්නේ. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව කොතැනද මේක තිබෙන්නේ කියා මම නම් දන්නේ නැහැ. ගරු කථානායකතුමනි, මෙයට අර්ථ නිරූපණයක් දෙන්න සිදු වෙයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අපි ඒක බලනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්ඩලික තිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
නමුත්, මම අහපු ප්‍රශ්නයට උත්තරයක් දෙන්න. ඔබතුමන්ලා අද හෝ හෙට "ටීඑන්එල්" නාළිකාවේ තහනම ඉවත් කරනවාද? [බාධා කිරීමක්]

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්ඩලික පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාට යෝජනාවක් ඉදිරිපත් කරන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු බුද්ධික පතිරණ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ යෝජනාව මොකක්ද? මේ ගැන දැන් විවාද කරන්න බැහැ. අවසාන කරන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(මාණ්ඩලික පුත්තික පතිරණ)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, විවාදයක් කරගෙන යනවා නොවෙයි. අද "ටීඑන්එල්" එකට මෙහෙම සිදු වුණා. පසුගිය කාලයේ සිරස ආයතනයට ගල් ගැහුවා. මේ සෙල්ලම නතර වෙන්න ඕනෑ.

ආයෙත් පාර්ලිමේන්තුව රැස් වෙනකොට ජුනි 19වැනි දා, 20වැනි දා වෙනවා නේ, ගරු කථානායකතුමනි. ඒ වෙන කොට "ටීඑන්එල්" එකට තව මොනවා කරලා තියෙයිද දන්නේ නැහැ. එහෙම නොවෙයි, අද දවස ඇතුළත මේකට උත්තරයක් ඕනෑ. මේක සෙල්ලම් කරන්න පුළුවන් වැඩක් නොවෙයි. මීට මාසයකට, දෙකකට කලින් සිරස ආයතනයට ගල් ගැහුවා. මොනවාද මේ වෙන්නේ? මෙහෙම වුණොත් අපි අයාලෙ, අවලමේ යන රටක් වෙනවා නේ. ඊට කලින් මොකක් හෝ පියවරක් ගන්න.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අද ඇමතිතුමා නැද්ද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්ඩලික කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මේ සඳහා පිළිතුරු දෙන්න අවශ්‍යයි කියා ඇමතිතුමා දැනුම් දීලාම තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඉතින් එතුමාට අද පිළිතුරු දෙන්න පුළුවන් නේ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්ඩලික කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
එතුමා අද අතිගරු ජනාධිපතිතුමා සමඟ බදුල්ලේ රැස්වීම් මාලාවකයි සිටින්නේ. ඒ නිසා තමයි එතුමා එහෙම කිව්වේ.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අද දවස ඇතුළත ඇවිත් එතුමාට මේ ගැන පැහැදිලි පිළිතුරක් දෙන්න බැරිද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්ඩලික කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
එතුමාව ගෙන්වා ගන්න අපි උත්සාහ කර බලන්නම්. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔව්, ඔබතුමාගේ කාරණය කියන්න, පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමනි.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්ඩලික ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
අදාළ අමාත්‍යතුමා නොමැති නම්, ගරු අග්‍රාමාත්‍යතුමාට පුළුවන් මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කරන්න. [බාධා කිරීම්]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්ඩලික කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
විදුලි සංදේශ ඇමතිවරයා ලෙස කටයුතු කරන්නෙත් ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමායි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්ඩලික තිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
විදුලි සංදේශ කථාවක් නොවෙයි, මම අහන්නේ. විදුලි සංදේශ නියාමන කොමිසම කවුරු යටතේද තිබෙන්නේ කියා ඔබතුමා කියනවාද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්ඩලික කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ඒක තිබෙන්නේ, ගරු ජනාධිපතිතුමා යටතේයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්ඩලික තිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
So, Hon. Prime Minister, under the 19th Amendment - [*Interruption.*]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්ඩලික රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
It should be answered by the Hon. Harin Fernando. ප්‍රශ්නය අහලා තිබෙන්නේ, ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමාගෙන්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්ඩලික තිනේෂ් ගුණවර්ධන)
(The Hon. Dinesh Gunawardena)
That is Okay. But does he have the powers to appoint the DG? Even the DG's appointment can be questioned. That is what I am saying. Please look into this because this is a serious matter.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්ඩලික රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
I will ask the Hon. Minister to look into this matter.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
So, if the Hon. Minister can give a reply today, it will be very useful. අද පුළුවන් නම් ඒක කරන්න කියන්න. ඇමතිතුමාට අවස්ථාව දෙන්න. එතුමා එය කරාවි. උපදෙස් වැඩි වුණාමත් වැඩේ කරගන්න අමාරු වෙනවා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order, එක මොකක්ද?

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, මේක වැදගත් රීති ප්‍රශ්නයක්. "සිරස" ආයතනයට ගිනි තියපු වෙලාවේ ඔබතුමන්ලා ඔය විධියට - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඒක හරි. ඒකේ ප්‍රශ්නයක් නැහැ, ඔබතුමා වාඩිවෙන්න. [බාධා කිරීම්] Order, please! කරුණාකර වාඩිවෙන්න. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා හරින් ප්‍රනාන්දු ඇමතිතුමාට දැනුම් දීලා අද පිළිතුරක් ලබාදෙන්න උත්සාහ කරනවා. ඒක දැන් ඉවරයි. [බාධා කිරීම්] එතුමාට අවස්ථාව දෙන්න; he will give a reply.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමන්ලා මෙතැන ඉන්නවා; අගමැතිතුමාත් ඉන්නවා. අද උදේ "ටීඑන්එල්" එකේ නිලධාරීන් උසාවියට අරගෙන ගිහින් තිබෙනවා. මේ අයව උසාවියට ගාල් කරලා තමුන්නාන්සේලා මොකක්ද මේ කරන්නේ කියා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් මම අහනවා. මම මේ ප්‍රශ්නය භාර දුන්නේ ඊයේ දහවල් 11.50ටයි. පාර්ලිමේන්තුව එක්ක මේ විධියට වැඩ කරන්නේ මොකද? වගකීමක් තියෙන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මමත් අද මේ ගැන ඇමතිතුමාට කථා කරන්නම්. [බාධා කිරීමක්] හරි, ඒක අපි කථා කරමු. ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ඉල්ලීම පිළිබඳ විස්තර මට ඉදිරිපත් කරන්න. ඊට පස්සේ මම අවශ්‍ය පියවර ගන්නම්. ඒ කාරණය ඉදිරිපත් කරන්න මම දැන් පොඩි අවස්ථාවක් දෙන්නම්.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් කරන ඉල්ලීම මේකයි.

අද උදේ 7.30ට ජාතික රූපවාහිනියේ "සුබ උදෑසනක්" වැඩසටහන යටතේ සහ තවත් රාජ්‍ය මාධ්‍යවල පැය භාගයක විතර විශේෂ ගුවන් කාලයක් වෙන් කරගෙන, වෙනත් පුද්ගලයන් ඒ වැඩසටහනට ගෙන්වාගෙන, මමත්, සිසිර ජයකොඩි මන්ත්‍රීතුමාත් පාර්ලිමේන්තුව තුළ කරන ලද ප්‍රකාශයක් පිළිබඳව දිගින්-දිගට, දිගින්-දිගට, "පාර්ලිමේන්තුවේ ඉන්න සිසිර ජයකොඩි සහ රංජිත් ද සොයිසා හොරු" කියා ප්‍රකාශ කරමින් එම වැඩසටහන මෙහෙයවීම පිළිබඳව වරප්‍රසාද ප්‍රශ්නයක් ඇසීමටයි මම ඔබතුමාගෙන් අවස්ථාව ඉල්ලා සිටින්නේ. ඔබතුමා ඉල්ලන විධියට විස්තර දෙන්න විධියක් නැහැ. මොකද, වැඩසටහනේ හඬ පටය අපට ලබා දෙන්නේ නැහැ. ඒක ලබා ගන්න පුළුවන් ඔබතුමාටයි. ඒ නිසායි මා ඔබතුමා ළඟට හදිසියේ ඇවිල්ලා, මට මේ සම්බන්ධයෙන් පැහැදිලි කරන්න අවස්ථාවක් දෙන්න කියලා ඉල්ලා සිටියේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, හොඳයි.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, මා එය පැහැදිලි කරන්නම්. පෙරේදා සිසිර ජයකොඩි මන්ත්‍රීතුමත්, මමත් දෙදෙනා මේ පාර්ලිමේන්තුවේදී බැඳුම්කර සිද්ධිය පිළිබඳව කථා කරනකොට, පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමෙන් මුදල් ගත් උදවිය පිළිබඳව සමාජ මාධ්‍ය ජාලා සහ පුවත් පත් ඇතුළු මාධ්‍යවල සාකච්ඡා වන කරුණු පිළිබඳව සභාවේ ප්‍රකාශ කළා. ඒ අනුව සාකච්ඡාවට බඳුන්වෙලා ඉන්න පුද්ගලයන්ගේ නම් ප්‍රකාශ කළා. අද ඒ පුද්ගලයන් ගෙන්වාගෙන ජාතික රූපවාහිනියේ වාඩි කරගෙන, "වාචාලයෝ, හොරු, ජඩයෝ, මැරයෝ" වැනි වචන භාවිත කරමින් මන්ත්‍රීවරුන්ට කථා කිරීම නිසා අපේ වරප්‍රසාද උල්ලංඝනය වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, මේ තත්ත්වය ඇති වෙන්න ප්‍රධාන හේතුව මෙයයි. රටේ විවාදයට භාජනවෙලා තිබෙන, අර්ජුන් ඇලෝසියස්ගෙන් සල්ලි ගත් මන්ත්‍රීවරුන් 118දෙනකු හෝ 166දෙනකු පිළිබඳව වාර්තාවක් සභාවේ පක්ෂ විපක්ෂ සියලු මන්ත්‍රීවරුන් ඔබතුමාගෙන් ඉල්ලා සිටියා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, එහෙම එකක් නැහැය කියා මා ඊයේ ප්‍රසිද්ධියේ සඳහන් කළා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මා ඔබතුමාට චෝදනා කරනවා නොවෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ ගැන සති ගණන්, මාස ගණන් අපට කථා කරන්න පුළුවන්.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ඔබතුමා නීතිපතිතුමාට යොමු කළා, ජනාධිපති ලේකම්තුමාට යොමු කළා. ඒ තැන්වලින් වාර්තා ලැබෙන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොලීසියෙන් කිව්වා, එහෙම එකක් නැහැය කියලා. එය මනඃකල්පිත එකක්.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ඒ තැන්වලින් වාර්තා ලැබෙන්නේ නැති නිසා තමයි සමාජයේ සියලුම පුද්ගලයන් මේ චෝදනාව එල්ල කරන්නේ. ඒ නිසා මේ තත්ත්වය තුළ කරන්න තිබෙන්නේ, මන්ත්‍රීවරයෙක් හැටියට මේ ගැන රට හමුවේ කරුණු ප්‍රකාශ කරන අපට එරෙහිව ද්වේශ සහගත සිද්ධි ප්‍රචාරය කරමින් කරුණු දක්වන එක නොවෙයි. ඇලෝසියස්ගෙන් සල්ලි ගත්තේ කවුද, ඇලෝසියස්ට ටෙලිෆෝන් කෝල් දුන්නේ කවුද කියන එක පිළිබඳව රට හමුවේ කරුණු දැක්වීම පමණයි කරන්න තිබෙන්නේ. රාජ්‍ය මාධ්‍ය උපයෝගි කරගෙන කරන නින්දිත ප්‍රකාශ තුළින් ඇලෝසියස්ගෙන් සල්ලි ගත්ත හොරු ටිකත් අද නිවැරැදිකරුවන් වෙනවා. ඒ නිසා අපි කරුණාවෙන් ඉල්ලීමක් කරනවා, අර්ජුන් ඇලෝසියස්ගෙන් සල්ලි ගත් අය පිළිබඳව වහාම රටට හෙළිදරව් කරන්න කියලා. අද දවසේත් ඉල්ලීමක් කරනවා, මේ 118දෙනා හෝ 166දෙනා හෝ 25දෙනා ගැන වහාම අපට කියන්න කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කොපමණ කිව්වත්, 118දෙනකු නැහැය කියනවා නම්, 166දෙනකු නැහැය කියනවා නම් මා කොහෙන් නම් දෙන්නද? [බාධා කිරීම්] පොලීසියත් නැහැය කියනවා නම්, නීතිපතිතුමාත් නැහැය කියනවා නම්, නැති දෙයක් ගැන කියන්නේ කොහොමද? අපට හැම දාම උදේට කථා කරලා යන්න පුළුවන්. මේ ගැන මාධ්‍යයෙන් කියයි. පොලීසිය ඒ ගැන සොයනවා. ඊයේ මා පැහැදිලි කරලා කිව්වා. [බාධා කිරීම්]

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා.

ගරු ශෙහාන් සේමසිංහ මහතා
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු කථානායකතුමනි, ඔබතුමා ඊයේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ අභිමානය ආරක්ෂා කරමින් ප්‍රකාශයක් සිදු කළා. ඒ ගැන අපි ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. COPE එක තමයි මහා බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් රටට වැදගත් තොරතුරු රාශියක් හෙළි කළේ. COPE එක නියෝජනය කරන මන්ත්‍රීවරුන් ඍජුවම බැඳුම්කර සිද්ධියට සම්බන්ධ වූදිතයා සමඟ මුදල් ගනුදෙනු කර තිබෙනවාය කියා මේ රටේ නීතිපතිවරයා දැනුම් දී තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ රටට කරන සාධාරණයක් හැටියට ඒ උදව්වට සදාචාරාත්මකව එතැනින් අයින් වෙන්න බැරි නම්, ඔබතුමා ඒ අය එතැනින් අයින් කර, වෙන මන්ත්‍රීවරුන් COPE එකට නම් කරන්නය කියා ඒ පක්ෂවලට දැනුම් දෙන්න. මොකද? මෙය, ආසියාවේ සිදුවුණු බරපතළම මුදල් වංචාව. ඔබතුමාගේ නායකත්වය යටතේ විමර්ශන කටයුතු සිදු වෙද්දී ඒ සල්ලි ගත්ත, හොරකම් කර වෙක් ගත්ත මුදල් ගනුදෙනු කරපු සහ දූරකථන පණිවුඩ ලබා දුන් මේ සියලු දෙනා COPE එකේ සාමාජිකත්වය දැරීම ඔබතුමාටත් අවමානයක් වෙනවා. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, your point is taken.

ඒ පත්වීම් කරන්නේ පක්ෂයෙන්. ඔබතුමා කියන කරුණ මම දැනටම පක්ෂ නායකට ඉදිරිපත් කර තිබෙනවා. පාර්ලිමේන්තුවේ මේ ප්‍රශ්නය පැන නැඟුණා. අපි පක්ෂ නායක රැස්වීමේදීත් මේ ගැන කථා කළා. එම නිසා අවශ්‍ය කටයුතු කරන්න පක්ෂ නායකත්වයට අවස්ථාව තිබෙනවා. [බාධා කිරීමක්] ගරු විජේසේකර මන්ත්‍රීතුමා.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු කථානායකතුමනි, මේ කාරණය දිගින් දිගටම ඇදගෙන යන්න නොවෙයි උත්සාහ කරන්නේ. ඔබතුමා ඊයේ දිනයේදී ප්‍රකාශයට පත් කළා, අපේ මන්ත්‍රීවරුන්ගේ පොලිස් නිලධාරීන් කැඳවා පරීක්ෂණයක් පැවැත්වූයේ නැහැ කියා; ප්‍රශ්න කිරීම්වලට ලක් කළේ නැහැ කියා පොලිස්පතිතුමාත් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවත් ඔබතුමා දැනුවත් කළ බව. නමුත් ඊයේ දවසේ අධිකරණයේදී අනාවරණය වුණා, අපේ රාජ්‍ය අමාත්‍යවරයෙකුගේත් තවත් එක්තරා මන්ත්‍රීවරයෙකුගේත් ආරක්ෂක නිලධාරීන් ගෙනැල්ලා ප්‍රශ්න කර, ඒ ප්‍රශ්න කිරීම් තුළින් තවත් වෙක්පත් පිළිබඳ කරුණු අනාවරණය වුණාය කියා. එම නිසා ඔබතුමාට කරුණු අනාවරණය කරද්දී පොලිස්පතිවරයාත්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවත් මේ කරුණු වහලා නම් ඔබතුමා දැනුවත් කරන්නේ -[බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, ගරු මන්ත්‍රීතුමා. එහෙම නැහැ. මම ඊයේ කිව්වේ, මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂකයෝ විසිපස් දෙනෙකුගෙන් ප්‍රශ්න කළාය කියා නොවෙයි. එහෙම එකක් නැහැ. නමුත් පරීක්ෂණ කර ගෙන යනවා. ඒ පරීක්ෂණ වෙනයි. මේ දෙක කලවම් කර ගන්න ඕනෑ නැහැ. මේකට අදාළව නොවෙයි. මම හොඳට පරීක්ෂා කර බලා තමයි කථා කළේ. ඒ පරීක්ෂණ වෙනම යනවා. පොලිස්පති කිව්වා, "ඒ පරීක්ෂණ කර ගෙන යන ගමන් යමක් තිබෙනවා නම් අපිව දැනුවත් කරනවා." කියා. [බාධා කිරීමක්] විජේසේකර මන්ත්‍රීතුමා.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු කථානායකතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම ගරු කථානායකතුමනි, අද සමාජ වෙබ් අඩවි හරහා ප්‍රවෘත්තියක් යනවා. ඊයේ දවසේ පොලිස්පතිතුමාත්, ඒ වාගේම අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ඝානී අබේසේකර කියන පුද්ගලයාත් පාර්ලිමේන්තුවට කැඳවා "B" වාර්තා ඉදිරිපත් කරන්නට එපාය කියා ආණ්ඩුවේ ප්‍රබල නායකයන් දැනුවත් කිරීමක් කළාය කියා. එහෙම එකක් වෙලා තිබෙනවා නම් ගරු කථානායකතුමනි, ඒ පිළිබඳවත් ඔබතුමාගේ අවධානය යොමු කරන්නටය කියා ඉල්ලා සිටිනවා.[බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාගේ කාරණයෙන් පසු අපි අද ප්‍රධාන කටයුතුවලට යමු. මේ ගැන හුඟක් කථා කළා. උදේ වරුවේ පළමුවන පැය එකහමාරේදී ලොකු උනන්දුවක් තිබෙනවා. මම දන්නේ නැහැ, මොකද කියා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මම කථා කරන්නේ ඒ ප්‍රශ්නය ගැන නොවෙයි. ගරු කථානායකතුමනි, ඔබතුමා පිළිගතයුතු වෙනවා, අපේ උත්තරීතර සභාවේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුට විවිධ දේ පිළිබඳව ඉතාම ගැඹුරින් අදහස් දක්වන්නට අයිතියක් තිබෙන බව. ඒ අයිතිය පාවිච්චි කර ආණ්ඩු පක්ෂයේ වුණත් විරුද්ධ පක්ෂයේ වුණත් මන්ත්‍රීවරයෙකුට තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව යම් කිසි කරුණක් සඳහන් කරන්න විශේෂ වරප්‍රසාදයක් හිමි කර දී තිබෙනවා. ඒ සඳහා විශේෂ ආරක්ෂාවක් ලබා දී තිබෙනවා. ඒ ආරක්ෂාව යටතේ මන්ත්‍රීවරු මෙතැන කටයුතු කරනවා. ඒවා පාර්ලිමේන්තුව තුළ කරන කටයුතු. මෙයින් පිටත ජන සන්නිවේදන මාධ්‍ය තිබෙනවා. විශේෂයෙන් රජයේ මාධ්‍ය තිබෙනවා. මුදල් හා ජනමාධ්‍ය භාර අමාත්‍යවරයා මංගල සමරවීර මැතිතුමා. එතුමාට මෙතැනදී පහර දුන්නොත්, එසේ නැත්නම් ඒ හා සම්බන්ධිත පාර්ශ්වයන්ට පහර දුන්නොත්, මුදල් සම්බන්ධ සිද්ධීන් කථා කළොත්, එතුමා විසින්ම මෙහෙය වන රූපවාහිනී සංස්ථාව මහින් ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට පෙරළා පහර දෙන්නට යනවා නම් ඒක ඉතාම නින්දිත පහත් පෙළේ ලෝක ප්‍රජාතන්ත්‍රවාදයට-[බාධා කිරීමක්]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් පණ්ඩාර ජූයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. ගරු මන්ත්‍රීතුමා, කරුණාකර ඉක්මනට අවසාන කරන්න.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(මාණ්පුමිකු නලින් පණ්ඩාර ජූයමහ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු කථානායකතුමනි, රජයේ පාර්ශ්වයෙන් මේ සම්බන්ධව වවන කිහිපයක් කථා කිරීමට අවස්ථාව උදා කිරීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. Bond ගනුදෙනුව සම්බන්ධව ජනාධිපති කොමිෂන් සභා වාර්තාව එළි දැක්වූවා. දැන් නඩු කටයුතු සිදු වෙනවා. මේ රජය යටතේ රජයේ කිසිදු අත පෙවීමකින් තොරව, බලපෑමකින් තොරව ස්වාධීනව මේ කටයුතු සිදු වෙනවා.

හැම දෙයක්ම ඒ නිසා තමයි හෙළිවෙලා තිබෙන්නේ. ගරු කථානායකතුමනි, මෙතැන වැදගත්ම දේ මෙයයි. මේගොල්ලන් මේ තුළින් පසුගිය කාලයේ කරපු හොරකම් සියල්ලම වළක්වා ගන්න,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අපි ප්‍රධාන වැඩ කටයුතුවලට යමු. මේ ගැන කථා කළා ඇති. [බාධා කිරීම්] මට මීට වැඩිය වේලාව දෙන්න බැහැ. [බාධා කිරීම්] ඔක්කොටම කථා කරන්න අවස්ථාව ලබා දුන්නා. දැන් මේ ගැන කථා කළා ඇති. [බාධා කිරීම්]

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(මාණ්පුමිකු නිහාල් කලප්පත්ති)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, මේ සිද්ධිය පාර්ලිමේන්තු ඉතිහාසයේ ඉතාම අපකීර්තිමත් සිද්ධියක් බවට පත්වෙලා තිබෙනවා. ඒ නිසා දෙබරයට ගල් ගැහුවා වාගේ මහ අවුලක් ඇතිවෙලා තිබෙනවා. ඒ නිසා ඔබතුමා අපේ ස්වාමියා විධියට විශේෂයෙන් මේ සම්බන්ධයෙන් මැදිහත්වෙලා,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මා සෑම මන්ත්‍රීවරයෙකුටම කථා කරන්න අවස්ථාව ලබා දුන්නා. එක වතාවක් අවස්ථාව දෙන්න පුළුවන්. දෙවතාවක් දෙන්න පුළුවන්. පාර්ලිමේන්තු වැඩ කටයුතු කරන්න තිබෙන නිසා තුන් වතාවක් හතර වතාවක් අවස්ථාව ලබා දෙන්න අමාරුයි.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(මාණ්පුමිකු නිහාල් කලප්පත්ති)
(The Hon. Nihal Galappaththi)
දෙවැනි කාරණය මෙයයි. ආණ්ඩුවේ ඉන්න රාජ්‍ය අමාත්‍යවරයෙකුගේ දරුවෙක් විසින් සිදු කරන ලද accident එකක් සම්බන්ධයෙන් මාධ්‍යවල දිගින් දිගටම news පළවනවා. ඒ නිසා මා ඔබතුමාගෙන් මේ කාරණය දැනගන්න කැමැතියි. ඔහු වතාවන් කීපයක්ම රාජ්‍ය වාහන අවභාවිත කරමින් මේ සිද්ධිය කරලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් අපේ රටේ පොලීසිය නීති ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවාද කියන කාරණයට අපිට ඉතාම පැහැදිලි උත්තරයක් ලබා දෙන්න කියන කාරණය මා ඔබතුමාගේ අවධානයට යොමු කරනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
පොලිස් ප්‍රකාශකතුමා ඒ ගැන කියලා තිබුණා මා දැක්කා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අපි මේ විවාදය අවසාන කරමු නේද, දිනේෂ් ගුණවර්ධන මැතිතුමා? අපි හුඟක් දුර ගියා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
මා යළිත් වරක් ඔබතුමාට නහන්නේ මේකයි. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමායි, සිසිර ජයකොඩි මන්ත්‍රීතුමායි -අපේ කණ්ඩායමින්- පාර්ලිමේන්තුවේ කරපු කථාවක් ජාතික රූපවාහිනියේ අද උදේ දරුණු ලෙස -අපහාසාත්මක ලෙස- විවේචනයට ලක් කිරීම පාර්ලිමේන්තු වරප්‍රසාද ප්‍රශ්නයක්, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. මා ඒ ගැන හොයා බලන්නම්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
මේ කටයුත්ත කරන්න ඉඩ තියන්න එපා. ඊළඟට, පාර්ලිමේන්තුව තව දවස් ගණනාවකින් තමයි රැස් වෙන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මම කිව්වානේ මේ කාරණය ගැන අවධානය යොමු කරනවා කියලා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
අපේ 70 මන්ත්‍රී කණ්ඩායම වෙනුවෙන් අද දිනයේම මා බොහොම ගෞරවයෙන් ඔබතුමාගෙන් ඉල්ලනවා, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද ආරක්ෂා කරන්න කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ප්‍රධාන කටයුතු ආරම්භයේදී පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත
ஜெனரால் சேர் ஜோன் கொத்தலாவலை பாதுகாப்புப் பல்கலைக்கழகம் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம்
GENERAL SIR JOHN KOTELAWALA DEFENCE UNIVERSITY (SPECIAL PROVISIONS) BILL

"දකුණු ආසියාතික තාක්ෂණික සහ වෛද්‍ය ආයතනයෙහි ලියාපදිංචි වී ඇති ශිෂ්‍යයන් 1981 අංක 68 දරන ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල පනත මඟින් පිහිටුවන ලද ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කිරීමට අදාළ ජාතික ප්‍රතිපත්තිය සකස් කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා විසිනි.

2018 ජුනි 19 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர் மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2018 யூன் 19, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon.(Dr.) Wijeyadasa Rajapakshe, Minister of Higher Education and Cultural Affairs; to be read a Second time upon Tuesday, 19th June, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දෙවැනි යෝජනාව.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, මේ කාරණය. ආණ්ඩුව සති දෙකකට කලින් පොරොන්දුවක් දුන්නා, මේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ නැහැ කියලා. මොකද, ඇමතිතුමා විෂයය භාර ගත්තාට පස්සේ යළිත් මේ පනත් කෙටුම්පත සලකා බැලීමේ අවශ්‍යතාව නිසා. මේ පනත් කෙටුම්පත ගැන බරපතළ ප්‍රශ්න මතු වී තිබෙනවා. අවශ්‍ය නිවැරදි කිරීම් නොකර ඔබතුමා ඇයි පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - (Minister of Higher Education and Cultural Affairs)
මා ඒගැන පැහැදිලි කිරීමක් කරන්නම්, ගරු කථානායකතුමනි.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය මුලදී, ශ්‍රීමත් ජෝන් කොතලාවල ඇකඩමිය විධියට තිබිලා ඒකට සංශෝධනයක් ගෙනැල්ලා තමයි විශ්වවිද්‍යාලයක් බවට පරිවර්තනය කර තිබෙන්නේ. ඒ පනතේ යම් යම් අඩු පාඩු තිබෙනවා කියලා, පනත අලුතෙන් සකස් කිරීමේ ක්‍රියාවලියක් අවුරුදු හයක්, හතක් තිස්සේ සිද්ධ වෙලා තිබෙනවා. ඒ අනුව, අලුතෙන් පනත් කෙටුම්පතක් හදලා තිබෙනවා, නව පනතක් විධියට. ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න අපි සූදානම් වෙලා සිටියත්, එය න්‍යාය පත්‍රයට ඇතුළත්ව තිබුණත්, අපි මීට සති කිපයකට කලින් එම පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ නැහැ කියලා පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කළා. ඒක නැවත සලකා බලන්නට ඕනෑ. මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ SAITM විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ සිසුන් අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා ඉතාම සුළු සංශෝධනයක් විතරයි; අලුත් පනත් කෙටුම්පත නොවෙයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු දිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ගරු ඇමතිතුමා, ප්‍රශ්නය SAITM එක නේ. වෛද්‍ය විද්‍යාල අර්බුදය රටේ හැම විශ්වවිද්‍යාලයකටම පැතිරී ගියේ, SAITM එක නිසා; ඒ ආයතනය නීති විරෝධී ලෙස ගත් ක්‍රියා මාර්ගය නිසා. තමුන්නාන්සේ ඒ ශිෂ්‍යයන් සහ මහාචාර්යවරුන් සමඟ විසඳුමක් ඇති කරගෙන සභාවට එන්නේ නැතුව, ආපහු අවුලකට පාර කපන්නේ ඇයි?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
කිසිම අවුලක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. අවුලක් තිබුණා. ඒ අවුල ලිහලා අදාළ සියලු පාර්ශ්වකරුවන් එක්ක සාකච්ඡා කරලා

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

එකඟ වුණු විසඳුම තමයි, SAITM එකේ ළමයින් නවසිය ගණනට සාධාරණයක් ඉෂ්ට කරන්න කියන එක. රජයේ වෛද්‍යවරුන්ගේ සංගමය, මේ සම්බන්ධව කථා කරපු විශ්වවිද්‍යාල අංශ කියන ඒ සියලුදෙනාගේ එකඟතාව ඇතිවයි මෙක කරන්නේ. අලුතෙන් පනත් කෙටුම්පතක් ගෙන ඒමේදී රජයේ ප්‍රතිපත්තිය කුමක් විය යුතුද කියලා අපි ඉදිරියේදී සාකච්ඡා කරමු.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
පාර්ශ්වකරුවන්, නිලධාරින් අභිභවා යන්න හොඳ නැහැ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
නැහැ, නැහැ ගරු මන්ත්‍රීතුමා. පාර්ශ්වයන් එකඟයි. නමුත් එක්තරා විශ්වවිද්‍යාල ශිෂ්‍ය කොටසක් විතරක් මේ පිළිබඳව තවම උද්ඝෝෂණය කරනවා. ඒ ඇරෙන්න අදාළ වගකිවයුතු පාර්ශ්ව සියල්ල එකඟ වෙලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මා දන්නා විධියට නම් පාර්ශ්වයන් එකඟ නැහැ. ඒ නිසා ඔබතුමා,-

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
එක කාරණයයි අහන්න තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමාගෙන් මම අහන්නේ දීර්ඝ කාලයක් තිස්සේ වෛද්‍ය විද්‍යාව හදාරපු ඒ ශිෂ්‍යයන් 980ට සාධාරණයක් ඉෂ්ට වෙනවාට ඔබතුමන්ලා විරුද්ධ ද, එහෙම නැත්නම් කැමැතිද?

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
අපි ඉතාම කැමැතියි. සාධාරණයක් වෙනවාට අපි විරුද්ධ නැහැ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
විරුද්ධයි ද?

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
අපි විරුද්ධ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලා එහෙම නම් විවාදයේදී කථා කරන්න පුළුවන් නේ. එදාට සාකච්ඡා කරන්න.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඔව්, එදාට සාකච්ඡා කරමු. ඒක තමයි ඉදිරිපත් කළේ. අවශ්‍ය සංශෝධන තිබෙනවා නම්, ඔබතුමන්ලාත් ඉදිරිපත් කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපට ඒ ගැන සාකච්ඡා කරන්න කල් තිබෙනවා නේ. එදාට සාකච්ඡා කරමු. අද විවාද කරන්න වේලාවක් නැහැ නේ.

මීළඟට, ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම්දීම. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා, අංක 02.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
Sir, on behalf of the Leader of the House of Parliament, I move,

"That the Government Business shall have precedence this day."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 33, ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත- දෙවැනිවර කියවීම.

ගරු මන්ත්‍රීවරුනි, 2018 අප්‍රේල් මස 05 බ්‍රහස්පතින්දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත 2018 මැයි 22 අහහරුවාදා දින ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2018 ජුනි මස 07 වන බ්‍රහස්පතින්දා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති බව ඔබතුමන්ලාගේ දැන ගැනීම පිණිස මෙසේ දැනුවත් කර සිටිමි.

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටකු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත් තිනින්රු අකලවේ, පිරතිච් සභානායකර් අවර්කළ් [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] *took the Chair.*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා.

ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත
தேசிய பாதுகாப்பு நிதியம் (திருத்தம்) சட்டமூலம்
NATIONAL DEFENCE FUND (AMENDMENT) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[පූ.භා. 10.31]

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - (Minister of Higher Education and Cultural Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම "ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතුය" යි යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ කථාව ආරම්භ කිරීමට ප්‍රථම මම ඔබතුමාට සුබ පතනවා. පසුගිය කාලසීමාවේ ඔබතුමා ඔය ආසනයේ ඉතාම ගෞරවනීය විධියට කටයුතු කරපු නිසා සභාව ඔබතුමාව නියෝජ්‍ය කථානායක ධුරයෙන් පිදුම් දෙන්න තීරණය කළා. අද මා මුලින්ම ඔබතුමා ඉදිරියේ කරන කථාව නිසා ඔබතුමාට පළමුකොට සුබ පතනවා.

අද දින 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතට සංශෝධනයක් අපි ඉදිරිපත් කරනවා. අපේ රටේ යුද්ධයක් පැවැති වෙලාවේ ත්‍රිවිධ හමුදාවල සේවයේ නියුතුව සිටි බොහෝ දෙනෙකුට බොහෝ කරදර කම්කටුලුවලට මුහුණ දෙන්න සිදු වුණා. සමහර අයගේ ජීවිත නැති වුණා, සමහර අයගේ අත පය නැති වුණා; අංග විකල තත්ත්වයට පත් වුණා. ඒ නිසා ඒ උදව්යගේ සුභසාධනය වෙනුවෙන් කටයුතු කිරීම පිණිස තමයි 1985 වසරේදී මේ ජාතික ආරක්ෂක අරමුදල් පනත ගෙනැල්ලා මෙවැනි අරමුදලක් හදලා තිබෙන්නේ. ඉතින් ඒ පනත ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී මතු වුණු ගැටලු කිහිපයක් හේතුවෙන් තමයි අද දිනයේදී අපි මේ සංශෝධනය ඉදිරිපත් කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනතේ කටයුතු සඳහා භාරකරුවන්, නැත්නම් අධ්‍යක්ෂවරු වශයෙන් කටයුතු කළ යුතු බවට මේ පනතේ දෙවන වගන්තියේ දක්වා තිබෙන්නේ, ජනාධිපතිතුමාත්, ඒ වාගේම ආරක්ෂක ඇමතිතුමාත්. ඔබතුමා දන්නවා, අපේ රටේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ශ්‍රේෂ්ඨාධිකරණය කළ අර්ථ නිරූපණය අනුව ආරක්ෂක ඇමති සහ ජනාධිපති යනුවෙන් දෙදෙනෙක් ඉන්න බැහැ. ආරක්ෂක අමාත්‍යාංශය දැරිය හැක්කේ ජනාධිපතිවරයාට විතරයි. ඒ නිසා ඒ තත්ත්වයත් අපි සැලකිල්ලට භාජන කළා. අනෙක් කාරණය, මෙය සාමාන්‍ය පරිපාලන කටයුත්තක්. ඒ නිසා මේ අරමුදල පාලනය කිරීම සඳහා ජනාධිපතිවරයා වෙනුවට අපි ආදේශ කරන්න යෝජනා කරනවා, ජනාධිපතිතුමාගේ ලේකම්වරයා, ඒ වාගේම ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයාගේ ලේකම්වරයා. ඒ අනුව, ජනාධිපතිතුමා වෙනුවට මේ අරමුදලේ කටයුතු ඉටු කිරීම සඳහා එම නිලධාරීන් දෙදෙනා පත් කිරීම තමයි මේ සංශෝධනයේ මූලික ලක්ෂණය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවනුව, මේ පිළිබඳව අදාළ විගණන වාර්තා යනාදී ගිණුම් භාර දීමේ කටයුත්ත ආරක්ෂක අමාත්‍යවරයා වෙත සිදු කළ යුතුයි කියන සංශෝධනයත් අපි ඉදිරිපත් කරනවා. ත්‍රිවිධ හමුදාවේ රණවිරුවන්ට -නිවාස නැති උදවියට,- නිවාස ඉදිකිරීම, ඒ වාගේම යුද්ධයෙන් පීඩාවට පත් වෙලා ජීවිත තර්ජනවලට ලක් වුණු උදවියට -අත පය අහිමි වුණු අය ඉන්නවා; ඇස් අහිමි වුණු අය ඉන්නවා; අංග විකල තත්ත්වයට පත් වුණු අය ඉන්නවා.- යම් යම් සහන සැලසීම යනාදී සුභසාධන කටයුතු සැලසීම තමයි මේ අරමුදලෙන් බොහෝ විට කරන්න අදහස් කරන්නේ. ඒ අනුව, 2014 සිට 2017 දක්වා වූ වර්ෂ ඇතුළත රණ විරුවන් සඳහා පූර්ණ වශයෙන් නිවාස 597ක් ඉදි කර තිබෙනවා; අර්ධ නිවාස 2,863ක් ඉදි කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඉදිරි වර්ෂ කිහිපය තුළ පූර්ණ නිවාස 623කුත්, අර්ධ නිවාස 4,875කුත් ඉදි කරන්න සැලසුම් කර තිබෙනවා. මෙවැනි සුභසාධන කටයුතු සාර්ථකව ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය සංශෝධන තමයි මේ මඟින් ඉදිරිපත් කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය ආරක්ෂක කටයුතුවලට සම්බන්ධ කාරණයක් නිසා මේ දිනවල සමාජයේ, ජනමාධ්‍යවල වැඩි වැඩියෙන් කථා වන කාරණයක් පිළිබඳව මේ සභාවේ අවධානය යොමු කරවන්න මම කැමැතියි. ඒ තමයි, පාතාල ක්‍රියාකාරකම්, මත් කුඩු සහ මත් ද්‍රව්‍ය ආශ්‍රිතව අපරාධ රැල්ලක් අපේ රටේ පැවතීම හේතුවෙන් රට ඉතාම බරපතළ තත්ත්වයකට මුහුණ පා තිබීම. මෙය අද ඊයේ සිදු වුණු දෙයක් නොවෙයි, දශක තුන හතරක ඉඳලා ක්‍රමානුකූලව වර්ධනය වෙමින් ඇවිත් තිබෙනවා.

විශේෂයෙන් දීර්ඝ කාලීන යුද්ධයක් තිබුණු රටක, ඒ යුද්ධය අවසානයේදී දකින්න ලැබෙන එක් ආනුෂංගික ප්‍රතිඵලයක් හැටියට, අවි ආයුධ එහාට මෙහාට වීම, මත් ද්‍රව්‍ය ප්‍රවාහනය සහ වෙළෙඳාම වැනි කාරණා ශීඝ්‍ර වශයෙන් සිද්ධ වෙන්න ඉඩ කඩ තිබෙනවා. අපටත් අද වන කොට ඒ අවාසනාවන්ත ඉරණමට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. විශේෂයෙන් මේ "මත් ද්‍රව්‍ය" සහ "පාතාලය" සම්බන්ධයෙන් ගත්තොත්, මෙය දෙකකට වෙන් කරන්න අපට බැහැ. කොතැනක ගත්තත් "පාතාලය" සහ "මත් ද්‍රව්‍ය" එකට ගමන් කරන සාපරාධී අපරාධ බවට පත් වෙලා තිබෙනවා.

ඇත්ත වශයෙන්ම අපි බලාපොරොත්තු වුණා, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් ස්වාධීන පොලිස් කොමිෂන් සභාවක් හදලා, පොලීසිය ස්වාධීන කළාම, පොලීසියට දේශපාලනඥයින්ගේ ඇඟිලි ගැසීම් අඩු කරගෙන අපට මේවා පාලනය කර ගන්නට පුළුවන්; දක්ෂ පොලීසියක් නිර්මාණය කර ගන්න පුළුවන් වේවි කියලා. නමුත්, මේ පිළිබඳව නැවත විශ්ලේෂණයක් කළ යුතු කාලය එළැඹිලා තිබෙනවා.

එක් පැත්තකින් පොලීසිය තමන්ගේ කටයුතු ස්වාධීනව කරනවා වාගේම, අනික් පැත්තෙන් පොලීසියෙන් කෙරෙන්න ඕනෑ වගකීම හරියටම ඉටු වනවාද කියන කාරණය අපට ප්‍රශ්නයක් විධියට මතු වෙලා තිබෙනවා. එම නිසා පොලීසිය ස්වාධීන වුණාට රටේ ජනතාවට එය ප්‍රමාණවත් මදි. පොලීසිය කාර්යක්ෂම වන්නත් ඕනෑ. අපරාධ මර්දනය කරන්න පොලීසියට හැකියාව තිබෙන්න ඕනෑ. ඒ වාගේම ඒවාට ක්‍රියාත්මක වන්නත් ඕනෑ. පසුගිය දශක තුන, හතරක තත්ත්වයත්, වර්තමානයේ තිබෙන තත්ත්වයත් අපි අරගෙන බැලුවොත් පෙනෙනවා, මත් ද්‍රව්‍යවලට සම්බන්ධ එහෙම නැත්නම්, පාතාල කල්ලි කියන ඒවා බිහි වෙලා තිබෙන්නේ දේශපාලනඥයින්ගේ සහ පොලීසියේ උසස් නිලධාරීන්ගේ අනුග්‍රහය ඇතිව බව. දේශපාලනඥයින්ගේ සහ පොලීසියේ රැකවරණය නැතිව කොතැනක හෝ පාතාල කල්ලියක්, කුඩු කල්ලියක් නිර්මාණය වුණා නම්, ඒක මාස දෙකෙන්, තුනෙන් පොලීසිය ඉවර කරනවා. එහෙම ඉවර කර

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

ගන්න බැරි පාතාල කල්ලි රටේ ක්‍රියාත්මක වනවා නම්, බොහොම පැහැදිලිවම කොහෙන් හරි දේශපාලනඥයෙකු -කොයි පැත්තේද මම දන්නේ නැහැ- සහ පොලීසියේ උසස් නිලධාරියෙකු ඒකට සම්බන්ධව ඉන්නවාම තමයි. එහෙම නැත්නම් ඔය පාතාල කල්ලි, ඔය මත් කුඩු වෙළෙඳාම්, මත් කුඩු ජාවාරම් මෙපමණ මහා පරිමාණ ලෙස කරන්න බැහැ. ඒ නිසා මෙම ගෞරවනීය සභාවේ සියලුම මැති ඇමතිවරුන්ගේ අවධානය මා මේ සම්බන්ධයෙන් යොමු කරවනවා. මේ පිළිබඳව අපට අලුතෙන් සිතා බලන්න වනවා; අලුත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න වනවා. මේ රටේ ව්‍යාප්ත වෙමින් පවතින මත් කුඩු උවදුර නිසා අපේ තරුණ පරම්පරාව ඉතාම වේගයෙන් ව්‍යසනයකට පත් වෙමින් යනවා.

පසුගිය කාලයේ මම උතුරු පළාතට ගිය අවස්ථාවක මට දැනගන්න ලැබුණු කරුණු අනුව ගත්තාම පෙනෙනවා, උතුරු පළාතේත් කවදාවත් නැති තරමටම මේ මත් කුඩු උවදුර වේගයෙන් ව්‍යාප්ත වෙමින් පවතින බව. උතුරු පළාතේ සිටින බොහෝ දේශපාලනඥයන් මේ සභාවේත්, වෙනත් තැන්වලත් වෙනත් බොහෝ මාතෘකා ගැන කථා කරනවා. හැබැයි, තමන් නියෝජනය කරන ප්‍රදේශයේ සිටින තරුණ පරම්පරාව ශීඝ්‍රයෙන් විනාශ වෙමින් යෑම පිළිබඳව කිසිවෙකුගේත් අවධානයක් යොමු කරපු බවක් නම් පෙනෙන්නට නැහැ. අපි රටේ ආරක්ෂාව ගැන කියන කොට අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් සහතික කර දීලා තිබෙන විධියට රටේ සියලුම ජනතාවට රටේ ඕනෑම තැනක නිදහසේ ජීවත් වීමේ අයිතිය ආරක්ෂා කර දීම රජයක -ආණ්ඩුවක- වග කීමක්. මහ ජනතාවගේ මුදලින් අපි ත්‍රිවිධ හමුදාවත්, පොලීසියත් නඩත්තු කර ගෙන යන්නේ ඒ වෙනුවෙනුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වන විට මේ වාගේ මත්ද්‍රව්‍ය, පාතාල කල්ලි රට තුළ ව්‍යාප්ත වීම අපි නොහිතපු පරාසයන් තුළට අතික්‍රමණය වෙලා තිබෙනවා. උදාහරණයක් විධියට අපේ සමහර විශ්වවිද්‍යාල පද්ධති තුළ බලපුවාම, දැන් විශ්වවිද්‍යාලවලටත් මත් කුඩු ගේන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගිය සතියේත් එක සිද්ධියක් ගැන මම පැමිණිලි කරලා තිබෙනවා. විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ සේවය කරපු සුළු සේවකයෙක් මත් කුඩු විශ්වවිද්‍යාලයට රැගෙන එන කොට, විශ්වවිද්‍යාලයේ ආචාර්යවරුන් පොලිසියට දීපු පණිවිඩයක් මත සුරාබදු දෙපාර්තමේන්තුවෙන් ඇවිල්ලා අල්ලලා තිබෙනවා. මේ මත් කුඩු ප්‍රමාණය අල්ලා ගැනීම පිළිබඳව සිද්ධිය දැකපු අය බොහෝ ඉන්නවා. ඒ ගොල්ලන් එළි පිට කථා කරන්න බය වුණාට විශ්වවිද්‍යාලයේ ගේට්ටුව ළඟදි -විශ්වවිද්‍යාල පරිශ්‍රයේ- සිදු වූ සිද්ධියක් නිසා මේක දැකපු අය ඉන්නවා. ඒ අල්ලා ගත් මත් කුඩුත් එක්ක නීතිය ක්‍රියාත්මක කරන්න මේ චූදිතයාව පොලීසියට ඉදිරිපත් කරයි කියලා ඔවුන් බලාපොරොත්තු වුණා.

අවසානයේදී වෙලා තිබෙන්නේ මොකක්ද? මේ මත් කුඩු ගෙනාපු මනුස්සයා හොර අරක්කු බෝතලයක් ළඟ තියාගෙන සිටියා කියලා සුරාබදු දෙපාර්තමේන්තුවෙන් මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරලා, මහෙස්ත්‍රාත් අධිකරණයෙන් ඇප අරගෙන ගිහිල්ලා තිබෙනවා. ඒ අල්ලපු මත් කුඩුවලට සිදු වුණු දෙයක් හොයා ගන්න නැහැ. මේක ඉතාමත්ම භයානක තත්ත්වයක්. මත් කුඩුත් එක්ක විශ්වවිද්‍යාලයේදී මිනිහෙක් ඇල්ලුවා කියන කාරණය එම විශ්වවිද්‍යාලයේ උප කුලපතිවරු දන්නවා; විශ්වවිද්‍යාලයේ ආචාර්යවරු දන්නවා; ශිෂ්‍යයන් දන්නවා. හැබැයි, නීතිය ක්‍රියාත්මකවීමේදී ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මම මේ පිළිබඳ මුදල් අමාත්‍යාංශයේ ලේකම්ට පැමිණිලි කරලා තිබෙනවා. එතුමා පරීක්ෂණයක් පවත්වන්න පොරොන්දු වුණා. අපි බලාපොරොත්තුවෙන් ඉන්නවා, ඉක්මනටම ඒ පිළිබඳ තීරණය කුමක්ද කියලා දැන ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහෝ විශ්වවිද්‍යාල ඇතුළට දැන් මත් කුඩු ගෙන යාමේ ව්‍යාපෘතියක් අලුතෙන් ආරම්භ වෙලා තිබෙනවා. අපි රටේ ආරක්ෂාව, විනය ගැන කථා කරනවා. දැන් මේ පාර්ලිමේන්තුවේ විනය ගැනත් අපට හරියට විවේචන තිබෙනවා. මේ ආයතනයේ විනය පවතින්නේ නැහැ, අපේ මන්ත්‍රීවරුන්ගේ විනය හොඳ මදියි කියලා ජනමාධ්‍යයෙන් කියනවා; රටේ ජනතාව කියනවා; අපිත් කියනවා; අපිත් අහගෙන ඉන්නවා; අපිත් මේවා පිළිගන්නවා. ඒ අතර හරි ඒවාත් තිබෙනවා; වැරදි ඒවාත් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විනය පිළිබඳ රටේ බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. රටේ ජාතික ආරක්ෂාව ක්‍රියාත්මක කිරීම යනාදී මේ සියල්ල සිද්ධ වෙන්නේ රටේ පවතින විනයත් එක්කයි. අපි දන්නවා පාසල් පද්ධතියේ ගුරුවරු බොහොම දුක්මහන්සි වෙලා තමන්ගේ විද්‍යාලවලින් හොඳ විනය ගරුක දූ දරුවන් ටිකක් නිර්මාණය කරලා, උසස් විභාගවලට ඉදිරිපත් කරලා, දක්ෂතා පෙන්වලා විශ්වවිද්‍යාලයට යවනවා. හැබැයි, මේ විනය ගරුක දරුවෝ ටික විශ්වවිද්‍යාල ගේට්ටුවෙන් ඇතුළට ගිය ගමන්ම වෙන වෙනස පිළිබඳ බරපතළ ප්‍රශ්න තිබෙනවා.

මම මේ වෙලාවේදී හිටපු ගරු අධ්‍යාපන අමාත්‍ය රිචර්ඩ් පතිරණ මැතිතුමාව ඉතා ගෞරවයෙන් සිහිපත් කරනවා. නවක වදය කියන ව්‍යසනය නතර කරන්න කාටවත් කරන්න බැරි වුණු දෙයක් එතුමා කළා. මේ දේ කරන්න ඒ වෙලාවේ කවුරුවත් ඉදිරිපත් නොවෙන වෙලාවක එතුමා ඒක කළා. ඒක තමයි, විශ්වවිද්‍යාලවල නවක වදය, හිංසනය නතර කරන්න එතුමා පනත් කෙටුම්පතක් ගෙනාපු එක. ඒ පනත් කෙටුම්පත සම්මත කර ක්‍රියාත්මක කරනකොට නවක වදය සෑහෙන්න වශයෙන් පාලනය වුණා. අද වන විට නවක වදය පිළිබඳව පැමිණිල්ලක් කරන්න කවුරුත් භයයි. එතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. පැමිණිල්ලක් කරලා ආවොත් විශ්වවිද්‍යාලය ඇතුළේදී අත පය කඩනවා; ඔළු පළනවා. පසුගිය අවුරුද්දේදී වාර්තාගත නොවුණු, විශේෂ ඒකකයකින් සොයා ගත හැකිවූ බරපතළ නවක වද සිද්ධීන් 280ක් පිළිබඳ තොරතුරු අපට දැනගන්න ලැබුණා. මේවාට ලිංගික වශයෙන් කරන අතවරත් ඇතුළත්. අද සමහර විශ්ව විද්‍යාල තුළ - හැම විශ්වවිද්‍යාලයක් තුළමත් නොවෙයි. හැම පීඨයක් තුළමත් නොවෙයි- කෙළින්ම තිබෙන්නේ වෙනම ලෝක. ඒවා පිළිබඳව පැමිණිල්ලක් කරන්න උපකුලපතිවරයෙකුට අද ශක්තියක් නැහැ. එවැනි පැමිණිල්ලක් කරන්න ඔහුට ආරක්ෂාවක් නැහැ. පීඨාධිපතිවරයෙකුට ඒක කරන්න බැහැ. ඔහුට ජීවිතය පිළිබඳව අනතුරක් තිබෙනවා. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට මේක කරන්න බැහැ. ඔවුන් එවැනි පැමිණිල්ලක් කළොත් ඊට පහුවෙනිදා ඉඳන් විශ්වවිද්‍යාලයට ඇවිල්ලා ඉගෙන ගන්න බැහැ. එවැනි පරිසරයක් නැහැ. ජීවිතය පිළිබඳව අනතුරක් තිබෙනවා. මේවා පිළිබඳව දරුවෝ සිය දහස් ගණන් මේ වන විට අපටත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවටත් පැමිණිලි කරලා තිබෙනවා; ඡායාරූප එවනවා; දෙමව්පියන් ඇවිල්ලා අඬනවා. ඔවුන් අහනවා, තමන්ගේ දරුවන්ට දෙන දස වද මොනවාද කියලා. මේ පිළිබඳව මේ ගරු සභාවේත් කාලෙකින් අවධානය යොමු වෙලා නැහැ. ඒක නිසා තමයි මම අද පොඩ්ඩක් දීර්ඝ වශයෙන් මේ කරුණු ඉදිරිපත් කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔලුවිල්වල පිහිටි අග්නිදිග ආසියානු විශ්වවිද්‍යාලයේ ළමයි වැඩ වර්ජනයක් ආරම්භ කරලා අදට දින 189ක් වෙනවා. ළමයි වැඩ වර්ජනය කරනවා. ඊයේ මුළු දවස පුරාම මම මහන්සි වුණේ ඒ වෙනුවෙන්. මම ඊයේ දිනයේදී එම විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමාත්, ආචාර්ය මණ්ඩලයත්, ශිෂ්‍යයනුත් කියන කණ්ඩායම් 3ම මේ පාර්ලිමේන්තුවට කැඳෙව්වා.

අපේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති, ගරු රාජ්‍ය ඇමතිතුමා ඇතුළු අපි මේ අය ගෙන්වලා කථා කරලා

බැලුවා, ඇත්තටම මොකක්ද මේ වෙලා තිබෙන්නේ කියලා. ඒ විශ්වවිද්‍යාලවල තිබෙන තත්ත්වය ඉතාම කනගාටුදායකයි. මේ හිංසනය දරන්න බැරි නිසා අද සමහර ශිෂ්‍යයෝ විශ්වවිද්‍යාලය අතහැර යනවා. හිංසනය දරා ගන්න බැරුව ශිෂ්‍ය-ශිෂ්‍යාවෝ විශ්වවිද්‍යාලය අතහැර ගිහින් තිබෙනවා.

ඒ විශ්වවිද්‍යාලය, කාලයක් තිස්සේ ප්‍රශ්න තිබුණු විශ්වවිද්‍යාලයක්. ඒ නිසා ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් භාෂා තුන පිළිබඳව ප්‍රවීණත්වය තිබෙන, ඉතාම ගෞරවයට පාත්‍ර වුණු, අවංක මහාචාර්යවරයෙක් උපකුලපති කර එතැනට යවා එම විශ්වවිද්‍යාලය පවත්වා ගෙන යනවා. එතුමාටත් ඒ කටයුතු කරගෙන යන්න හරි අමාරුයි. එවැනි අමාරු තත්ත්වයක් නිර්මාණය කරලා තිබෙනවා.

මම විශේෂයෙන්ම මේ විශ්වවිද්‍යාලය ගැන කථා කරන්න ගත්තේ, හැම ප්‍රජාවම නියෝජනය වෙන දරුවන් මෙම විශ්වවිද්‍යාලයේ ඉන්නා නිසායි. සිංහල, දෙමළ හා මුස්ලිම් කියන ජාතීන්ට අයත් දරුවන් එහි ඉන්නවා. ඒ වාගේම එම විශ්වවිද්‍යාලය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි කියන භාෂා තුනෙන්ම කටයුතු කරන විශ්වවිද්‍යාලයක්. මෙම විශ්වවිද්‍යාලයේ දිගින් දිගටම ප්‍රශ්න තිබුණු නිසා, ඒවා නිරාකරණය කරන්න අලුතින් උපකුලපතිවරයෙක් යැව්වා. ඒ උපකුලපතිවරයාටත් ඒක කරගෙන යන්න දෙන්නේ නැහැ. මොකද, ඒ විශ්වවිද්‍යාලය ඇතුළේ මහා මාෆියාවක් තිබෙනවා. සමහර දරුවෝ එවපු ලියුම් මම අවශ්‍ය ප්‍රමාණයට ඉදිරියේදී හෙළිදරව් කරනවා. සමහර සිසුවියන් සහ ඔවුන්ගේ දෙමව්පියන් අපට පැමිණිලි ඉදිරිපත් කරලා තිබෙනවා. සමහර ආචාර්යවරුන්ට ලිංගික අල්ලසක් දුන්නේ නැත්නම් විභාග පාස් කර ගන්න බැරි තත්ත්වයක් එහි තිබෙනවා. ඒ පිළිබඳව අපි පරීක්ෂණ කටයුතු ආරම්භ කර තිබෙනවා. එම විශ්වවිද්‍යාලයේ කටයුතු කරන එස්.එම්. ආලිෆ් කියන ආචාර්යවරයා සම්බන්ධව දිගින් දිගටම අපට පැමිණිලි එනවා. දරුවන්ට කෙළින්ම කියනවාලු, ලිංගික අල්ලසක් නැත්නම් විභාගය අසමත් කරනවාය කියලා. මේක තමයි අද ඒ විශ්වවිද්‍යාලයේ පවතින තත්ත්වය.

මීට පෙර එම විශ්වවිද්‍යාලයේ හිටපු උපකුලපතිතුමාට විරුද්ධව දීර්ඝ වශයෙන් චෝදනා ඉදිරිපත් වෙලා තිබෙනවා. COPE එකේ හිටපු සාමාජික ගරු මන්ත්‍රීතුමන්ලා මෙතැන ඉන්නවා නම්, එතුමන්ලා ඒ ගැන දන්නවා ඇති. පියවර ගන්න කියලා ඒ වාර්තා අපිට එවා තිබෙනවා. බොහෝ වැරදි දේවල් කරලා තිබෙනවා. විශ්වවිද්‍යාල මුදල්වලින් තමන්ගේ ගෙවල් නඩත්තු කරගෙන, ලයිට් බිල් ගෙවලා, වතුර බිල් ගෙවලා තිබෙනවා. අද මම මෙතැනට පැමිණියාම කවුරු හරි මට කිව්වා, ඒ චෝදනාව තිබෙන මැතිතුමා තමයි අද උදේ මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු විධියට දිවුරුම් දුන්නේ කියලා. මාත් පුදුමයට පත් වුණා.

එතුමාට තිබෙන චෝදනා පත්‍රය හරි දිගයි ගරු එස්.බී. දිසානායක මන්ත්‍රීතුමා දන්නවා ඇති, එතුමාට දිග චෝදනා පත්‍රයක් තිබෙනවා කියලා. COPE එකෙන් නියෝග කරලා තිබෙනවා, ඒ චෝදනා ගැන පරීක්ෂණ පවත්වලා නීතිය ක්‍රියාත්මක කරන්න කියලා. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඒ කටයුතු කරගෙන යනවා. ඒ අතරතුර අද එතුමා මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු ලෙස දිවුරුම් දුන්නා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කථා කරන්නේ දේශපාලන පක්ෂයක ප්‍රශ්නයක් නොවෙයි. මේ රටේ අපි මුහුණ දෙන යථාර්ථය මේකද?

මීට දවස් තුනකට කලින් අපේ ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමාට කියලා අපි අලුත් තාක්ෂණය පාවිච්චි කරලා, ICTA ආයතනය හරහා අලුත් app එකක් -තාක්ෂණික මෙවලමක්- හදා ගත්තා. ඒ තාක්ෂණික මෙවලම හරහා විශ්වවිද්‍යාල දරුවන්ට ඒ පහසුකම ලබා දුන්නාම ඔවුන්ගේ දුරකථනයේ තිබෙන app එකට ඇඟිල්ල තියන්න විතරයි ඕනෑ. ඇඟිල්ලෙන් touch කරනවාත් එක්කම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තුළ පවත්වාගෙන යන පැය 24 පුරාම වැඩ කරන operation room එකේ සිටින නිලධාරීන්ට පණිවුඩය ලැබෙනවා, ඒ දරුවාට කරදරයක් කියලා. ඒ telephone එක කාගේද කියලා එතැන සඳහන් වෙනවා. එතකොට, ඒ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යාව ඉන්නේ කොතැනද කියලා අපේ operation room එකේ පෙන්නුම් කරනවා. අපි ප්‍රාදේශීය පොලීසි දැනුවත් කරලා තිබෙනවා, ඒ පණිවුඩය ලැබුණු ගමන්ම වහාම ගිහින් පරීක්ෂා කරලා ඒ කටයුතුවල යෙදෙන ඕනෑම කෙනෙක් අල්ලලා නීතිය යටතේ දඬුවම් කරන්න කියලා. මම හිතනවා මේක ඉතාම දියුණු තාක්ෂණයක් කියලා.

ගරු එස්.බී. දිසානායක මහතා
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
බොහොම හොඳයි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
බොහොම ස්තුතියි. ඔබතුමන්ලාගේ කාලයේත් මේවා පිළිබඳව දිගින් දිගටම සාකච්ඡා කරලා තිබෙනවා. අද තාක්ෂණය දියුණු වෙලා තිබෙනවා. ඒ අනුව මේවා වෙනත් ක්ෂේත්‍රවලටත් ඉදිරියේදී යොදා ගන්න අපට පුළුවන්. කාන්තා හිංසනය, ළමා හිංසනය, බස් රථවලදී සිදු වන කාන්තා හිංසනය වාගේ ඕනෑම කාරණයක් සඳහා යොදා ගත හැකි ආකාරයට අපි මේ තාක්ෂණය අනෙක් අංශවලටත් පුළුල් කරන්න බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශ්වවිද්‍යාල සම්බන්ධව මම මේ කිව්වේ එක උදාහරණයක් විතරයි; ඔලුවිල් විශ්වවිද්‍යාලයේ එක උදාහරණයක් විතරයි. ඔලුවිල් විශ්වවිද්‍යාලයේ සිංහල, දෙමළ සහ මුස්ලිම් කියන දරු දැරියෝ තුන්ගොල්ලම ඉන්නවා. දෙමළ සහ මුස්ලිම් දරු දැරියෝ සාමකාමීව ඉගෙන ගන්නවා. ඒක බොහොම හොඳ ලක්ෂණයක්.

අපි ඒක අගය කරන්න ඕනෑ. හැබැයි, සිංහල ළමයි ඉන්නවා. අද වෙනකොට ඔවුන් දවස් 189ක් ස්ට්‍රයික්! පන්තිවලට යන්නේ නැහැ. අපි ඊයේ මේ ශිෂ්‍යයන් ගෙන්වාගෙන ඇහුවා, මොකක්ද කාරණය කියලා. එක ශිෂ්‍යයකුගේ ශිෂ්‍යාභාවය අහෝසි කරලා තිබෙන එක තමයි ඒකට හේතුව. ඒ ශිෂ්‍යාභාවය අහෝසි කිරීම පිළිබඳව අපි හොයලා බැලුවා. ඒ ශිෂ්‍යයා තියා ගත්තොත් ඒ විශ්වවිද්‍යාලයේ ළමයි 50ක්, 60ක් ඒ විශ්වවිද්‍යාලය අත්හැරලා යනවා. ඔහු ඒ තරම් ත්‍රාඩයෙක්; රස්තියාදුකාරයෙක්; මිනීමරු හැසිරීමක් තිබෙන ශිෂ්‍යයෙක්. ඒ උපකුලපතිවරයා ඒ වාගේ ශිෂ්‍යයෙකුට මොකද කරන්නේ? විශ්වවිද්‍යාලයේ තියා ගන්නද කියන්නේ? අම්පාර නගරයේ -අපේ දයා ගමගේ ඇමතිතුමාගේ ආසනයේ- පසුගිය කාලයේ දිගින් දිගටම මේ ළමයි ස්ට්‍රයික් කළා. අපේ අනෝමා ගමගේ නියෝජ්‍ය ඇමතිතුමිය හැම දාම කියනවා මේකට විසඳුමක් දෙන්න කියලා. ඒක නිසා තමයි මම ඒ ළමයින්ට එන්න කිව්වේ. ඒ ළමයින්ට තිබෙන ප්‍රශ්නය මොකක්ද? අර ඉවත් කරපු ශිෂ්‍යයා ආපහු ගන්න කියනවා. එහෙම අරගෙන විශ්වවිද්‍යාලයේ විනයක් ඇති කරන්න පුළුවන්ද? පාලනයක් ගෙන යන්න පුළුවන්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කරුණු රටට දැන ගන්න අපි කියන්න ඕනෑ.

මේ විශ්වවිද්‍යාල කඩාකප්පල් කරන කණ්ඩායම් ඉන්නවා. ඒවාට මුදල් වියදම් කරන කණ්ඩායම් ඉන්නවා. මේ ගොල්ලන්ට මේවා කරන්න මුදල් දෙන අය ඉන්නවා. පසුගිය දවස්වල විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ එක දිගට එනවා; උද්ඝෝෂණය

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

කරනවා; වෝඩ් ප්ලේස් එක වහනවා. හැම දාම ඒක හොඳ ප්‍රවෘත්තියක්. News alert එකත් යනවා, "විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම තිබෙන වෝඩ් ප්ලේස් එක close කළා, due to protest by the students." කියලා. හැබැයි, රටේ මිනිස්සු හිතාගෙන ඉන්නේ ඇත්තටම ප්‍රශ්නයක් තිබෙන නිසා තමයි වෝඩ් ප්ලේස් එක වහන්න දහස් ගණන් ශිෂ්‍යයෝ එන්නේ කියලා. මේ එන්නේ මොකටද කියලාත් අපි හොයලා බලන්න ඕනෑ. මම හොයලා බැලුවා.

මම වැඩ භාර ගත්තු පළමුවැනි දවසේම වෝඩ් ප්ලේස් එකේ තිබෙන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගේට්ටුව හිරවෙන -වැහෙන- විධියට ශිෂ්‍යයෝ උද්ඝෝෂණය කරන්න පටන් ගත්තා. මම කිව්වා, "ශිෂ්‍ය නායකයන් දෙන්නෙකුට එන්න, මේ ගැන කථා කරන්න" කියලා. පස් දෙනෙකුට එන්න ඕනෑ කිව්වා. මම කිව්වා, "පස්දෙනෙක් එන්න. ඇවිල්ලා කථා කරමු" කියලා. ඇවිල්ලා කථා කළා. සබරගමුවේ Faculty of Geomatics එකේ මිනින්දෝරුවරු වශයෙන් පුහුණුවන දරුවෝ තමයි මේ ඇවිල්ලා ඉන්නේ. පස්දෙනෙක් ආවා, ප්‍රශ්නය කිව්වා. මොකක්ද ප්‍රශ්නය? අපේ අමාත්‍යාංශයටත් අයිති නැති, ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමාගේ අමාත්‍යාංශයට අයිති Surveyorsලාගේ Council එකක් තිබෙනවා.

මේ කාරණය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ දොරකොඩ නටන්න ඕනෑ එකක් නොවෙයි. එහෙම එකක් තිබුණා නම් ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමාට කියන්න ඕනෑ, මෙන්න මේකේ ප්‍රශ්නයක් තිබෙනවා කියලා. මේ Council එකට ඉන්නවා 7දෙනෙක්. තුන්දෙනෙක් නිල බලයෙන්ම පත් වනවා. ඒ අය තමයි, මිනුම්පති - Surveyor General -, නියෝජ්‍ය මිනුම්පති සහ තවත් කෙනෙක්. මිනින්දෝරු ආයතනය කියා එකක් තිබෙනවා. තවත් සාමාජිකයන් තුන්දෙනකු පත් කරන්න ඕනෑ ඒ ආයතනයෙන්. එක්කෙනකු පත් කරන්න ඕනෑ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති. ඒ පනතේම කියා තිබෙනවා Academic, Engineering and Scientists ගැන. ඒකෙන් අදහස් කර තිබෙන්නේ, මිනින්දෝරු ක්ෂේත්‍රයේ නොවන වෙනත් කෙනකු පත් කරලා ඔහුගේ බුද්ධියත් මේකට දායක කරගන්න කියන එකයි. මෙය බොහොම පරණ -අවුරුදු 20ක් විතර පරණ- පනතක්. ඒ කවුන්සලයට අපේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති මහාචාර්ය මොහාන් ද සිල්වා මැතිතුමා නම් කර යවා තිබෙනවා, මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ පීඨාධිපති. දැන් ශිෂ්‍යයන්ගේ ඉල්ලීම මොකක්ද? මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයේ පීඨාධිපති අස් කරලා ඒ අයගේ faculty එකේ සිටින පීඨාධිපති පත් කරන්න කියන එකයි. මම ඒ ශිෂ්‍යයන්ගෙන් ඇහුවා, මොකක්ද, ඔයගොල්ලන්ට තිබෙන ප්‍රශ්නය කියලා. ඔවුන් කිව්වා, "අපේ අනාගතය තීන්දු කරන්නේ එයා" කියලා. මේ ගොල්ලන් විශ්වවිද්‍යාලයේද ඉන්නේ කියලා මට හිතුණා. ඕක දෙකේ පන්තියේ ළමයින්වත් කියන කතාවක්ද? මම කිව්වා, "ඕගොල්ලන්ගේ අනාගතය තීන්දු කරන්නේ ඕකෙන් නොවෙයි. ඕගොල්ලන්ගේ අනාගතය තීන්දු කරන්නේ ඔබට ලැබෙන සහතිකයෙන්. සහතිකයත් මදි. ඔබ සාර්ථක වෘත්තීයවේදියකුද, නැද්ද කියා තීන්දු කරන්නේ ඔබ මෙතැනදී ලබන අද්දැකීම් සහ පළපුරුද්ද, අධ්‍යයනය මඟින්" කියලා. "එහෙම නම් ඕගොල්ලෝ පෙළපාළි එන්නේ ඇයි? පීඨාධිපති නේද පෙළපාළි එන්න ඕනෑ?" කියලා මම ඇහුවා. ඔහුට නේ මෙහි ඕනෑකම තිබෙන්නේ. ඔහු තමයි මේ පෙලඹවීම කරලා එවන්නේ. චෝදනාවේ කියනවා, "අපි දැන් හත්අටවතාවක් මෙහෙම ආවා. අපට විසඳුමක් නැහැ" කියලා. මම ඇහුවා, "කීදෙනෙක් ආවාද?" කියලා. 300දෙනෙක් බස් හයකින් ආවා කියා ඒ අය කිව්වා. මම ඇහුවා, "වියදමකුත් යන්න ඇති නේද?" කියා. "අපට එක ගමනකට ලක්ෂ තුනක් වියදම් වුණා" කිව්වා. ඔය කියන විධියට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිගේ තීන්දුව වෙනස් කරන්න හත් වතාවක් ඔයගොල්ලන් ආවා කියා උපකල්පනය කළොත්, මාස තුනට රුපියල් ලක්ෂ 21ක් වියදම් කර තිබෙනවා, කියා මම කිව්වා. මම ඇහුවා, "ඔයගොල්ලෝ ඔක්කෝම මහපොළ ශිෂ්‍යාධාරය ගන්නවාද?" කියා. "ගන්නවා" කියා ඒ අය කිව්වා. ඒ ඔක්කෝම මහපොළ ශිෂ්‍යාධාරය ගන්නවා. ඒ මහපොළ ශිෂ්‍යාධාරයෙන් ජීවත් වන ළමයින්ට ලක්ෂ 21ක් දුන්නේ කවුද, කොහෙන්ද? මොන සංවිධානයෙන්ද දුන්නේ? මොන රටෙන්ද එය ආවේ? අපේ රටේ මේ අධ්‍යාපන ක්‍රමය, විශ්වවිද්‍යාල පද්ධතිය කඩාකප්පල් කරන්න බලවේග බොහොමයක් ක්‍රියාත්මක වනවා. SAITM එක සම්බන්ධව උද්ඝෝෂණ කරද්දීත් ඒවාට මුදල් යෙදෙව්වේ කවුද කියා අපි දන්නවා.

අද අපේ විශ්වවිද්‍යාල පද්ධතිය විනාශ කරන්න බොහෝ බලවේග ක්‍රියාත්මක වෙනවා. ගමේ ගොඩේ සිටින අහිංසක, අසරණ දෙමවුපියන්ගේ දරුවෝ විතරයි ඒවාට අහුවෙලා තිබෙන්නේ. ඊයේ ආපු ළමයින්ගෙන් මම ඇහුවා, ඒ අයගේ අම්මා තාත්තා මොනවාද කරන්නේ කියලා. කරන ඉහළම රැකියාව තමයි ගොවිතැන, නැත්නම් විදුලි කාර්මික. ඒ දෙමවුපියෝ එම රැකියා දෙකෙන් පිට වෙනත් රැකියා තිබෙන අය නොවෙයි; වෙනත් ආදායම් තිබෙන අය නොවෙයි. මම ඇහුවා, ඔබතුමන්ලාගේ සංවිධානයේ මධ්‍යම පන්තියේ ආදායම් තිබෙන කෙනෙක් ඉන්නවාද, කියලා. මාසයකට රුපියල් 50,000ක්, රුපියල් 60,000ක් ගන්න අම්මා කෙනෙකුගේ, තාත්තා කෙනෙකුගේ දරුවෙක් ඉන්නවාද කියලා. ගෑවිලාවත් නැහැ. ඉහළ මධ්‍යම පාන්තිකයෙකුගේ දරුවෙක් ඉන්නවාද? ගරු චමල් රාජපක්ෂ මන්ත්‍රීතුමනි, ගෑවිලාවත් නැහැ. ජනප්‍රිය ඉස්කෝලෙක, ලොකු ඉස්කෝලෙක ඉගෙන ගත්ත ළමයෙක්? ගෑවිලාවත් නැහැ. කවුද මේ පෙළපාළි යන්නේ? කවුද මේ උද්ඝෝෂණය කරන්නේ? මේ විධියට උද්ඝෝෂණය කරන්නේ, තුන් වේල නොවෙයි, එක වේලක්වත් කන්න නැති, බොහොම අමාරුවෙන් ජීවත් වන අම්මාගේ, තාත්තාගේ දරුවෝ. තමන්ගේ බඩට කෑමක් නැතුව, ඇඟට වස්ත්‍රයක් නැතුව, දුක් විඳලා, මහන්සි වෙලා, බොහොම අමාරුවෙන් උගන්වලා, විශ්වවිද්‍යාලයට යවන ධීවරයාගේ, කම්කරුවාගේ, ගොවියාගේ දුලා පුතාලා විතරයි මේ වැඩේට අහුවෙලා ඉන්නේ. වෙන කිසි කෙනෙක් අහුවෙලා නැහැ. කවුද ඔවුන් මේ තත්ත්වයට ගෙනැල්ලා තිබෙන්නේ? මේ රටේ නොයෙකුත් ව්‍යාපාර තිබෙනවා, ඒවාට සම්බන්ධ වුණු බංකොලොත් දේශපාලන ව්‍යාපාර තිබෙනවා, රට අස්ථාවර කරන්න බලාපොරොත්තු වන, කුමන්ත්‍රණ කරන ආයතන තිබෙනවා. ඒ අය තමයි මේවා කරන්නේ. අපේ රටේ වෛද්‍ය පීඨ එපා කියලා කෑ ගහනකොට; උද්ඝෝෂණය කරන කොට, කොළඹ ප්‍රදේශයේ විශාල වශයෙන් කාර්යාල ඇරෙනවා. ඒ මොකටද? වෛද්‍ය උපාධිය නේපාලයෙන් හෝ බංගලාදේශයෙන් හෝ ඉන්දියාවෙන් හෝ දෙන්න.

ගරු සී.බී. රත්නායක මන්ත්‍රීතුමනි, කීයක්ද ගෙවන්න තිබෙන්නේ කියලා ඔබතුමා දන්නවාද? අපේ local agentට අවම වශයෙන් රුපියල් ලක්ෂ 5ක් ගෙවන්න ඕනෑ. වෛද්‍ය විද්‍යාව ඉගෙන ගන්න අපේ ළමයි නේපාලයට, බංග්ලිදේශයට යැව්වා කියලා මීට අවුරුදු 20කට, 30කට කලින් කිව්වා නම් අපි හිතා වෙනවා. අද වෛද්‍ය විද්‍යාව ඉගෙන ගන්න යන අපේ දරුවකුගේ වියදම රුපියල් ලක්ෂ 120යි, 140යි, 160යි. වෛද්‍ය උපාධිය ගන්න නේපාලයට යනවා; බංගලිදේශයට යනවා; ඉන්දියාවට යනවා. එදා ඒ රටවල්වල ශිෂ්‍යයෝ ඔක්කෝම ඉගෙන ගන්න ආවේ ලංකාවට. වරද කාගේද කියන එක නොවෙයි ප්‍රශ්නය. කාට හරි, කොහේ හරි අපට වැරදිලා තිබෙනවා. අද මෙය බොහොම අවාසනාවන්ත තත්ත්වයක් බවට පත්වෙලා තිබෙනවා. දැන් අපේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයින්ගේ මානසික තත්ත්වය මොන තරම් පිරිහිලාද කියලා දැනගන්න මම එක උදාහරණයක් කියන්නම්.

පසුගිය කාලයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ගොඩනැඟිල්ලක "ශ්‍රීමත් ලලිත් ඇතුළත්මුදලි අනුස්මරණ ශාලාව" කියලා නාම පුවරුවක් සවිකර තිබුණා. එම නාම පුවරුව සවි කරපු දවසේ ඊ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයෝ කුළු ගෙඩි ගෙනැල්ලා එම පුවරුවට ගහලා කැඩුවා. එම බෝඩ් එක කඩපු හැම ළමයෙක්ම මහපොළ ශිෂ්‍යත්වය ගත්තවා. මහපොළ නැත්නම් ඒ අයට කන්නත් නැහැ, අඳින්නත් නැහැ. හැබැයි, ලලිත් ඇතුළත්මුදලි හදපු මහපොළෙන් ජීවත් වන ශිෂ්‍යයෝ තමයි ඇවිල්ලා ත්‍රාඩ විධියට "ශ්‍රීමත් ලලිත් ඇතුළත්මුදලි" නම සහිත බෝඩ් එකට කුළු ගෙඩිවලින් ගහලා කැඩුවේ. ඒ නම් ලැයිස්තුව මගේ ළඟ තිබෙනවා. මම ඒක එළියට දාන්නේ නැත්තේ, ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තිබෙන අනුකම්පාවක් නිසා නොවෙයි. ඒ ලැයිස්තුව එළියට දැම්මොත් ඒ උදවියගේ පවුල්වල දෙමවුපියන්ට, දරුවන්ට ගම්වල පාරවල්වලට බහින්න බැරිවන නිසයි. ඒ ගැන හිතලා දැනට ඒ ලැයිස්තුව එළියට දමන්නේ නැහැ.

අද අපේ විශ්වවිද්‍යාල පද්ධතියේ කුලපතිතුමන්ලා, ආචාර්යතුමන්ලා අතිබහුතරයක් ඉතාම වෙහෙසකර ලෙස මේවා ප්‍රශස්ත මට්ටමින් පවත්වාගෙන යන්න ඊ දවල් නොබලාම මහන්සි වෙනවා. නමුත් මේ සියල්ල කඩාකප්පල් කරන කුඩා කණ්ඩායම් ඉන්නවා. මේ උදවිය තමයි, මේ සියලු ව්‍යසනයන් සිදු කරමින් විශ්වවිද්‍යාල පද්ධතියම අද අවුල් කර ගෙන ඉන්නේ. අපි කියනවා, අපේ අනාගතය තමයි මේ විශ්වවිද්‍යාලවල ඉන්නේ කියා. ඇත්ත. හෙට දවසේ අනාගතය භාර ගන්න ඉන්න පරම්පරාව තමයි මේ. ශිෂ්‍යත්වයක් ලබාගෙන එයින් ජීවත් වෙන ළමයා, තමන්ට ඉගෙන ගන්න අත දුන්න; ශිෂ්‍යත්වයක් දුන් මිනිහාගේ නම තියෙන බෝඩ් එකට කුළුගෙඩියෙන් ගහලා පුපුරවනවා නම්, ඒ ළමයා හෙට දිනයේ සමාජයට අතුළු වෙන්නේ මොන විධියේ ආදර්ශවත් මිනිහෙක් විධියට ද කියා අපට හිතාගන්නට පුළුවන්. ඒකයි අද රටේ පවතින තත්ත්වය. මේ පිරිහීමෙන් මේ ශිෂ්‍ය පරම්පරාව බේරාගන්න ඕනෑ. අද ශිෂ්‍යයෝ විශ්ව විද්‍යාලයට ගියාම සිහින ලෝකවල ඉන්නේ. මේවාට ඇවිත් ඒ අයගේ ඔළුගෙඩි වෙනස් කරනවා. Brainwash කරනවා. Brainwash කරලා, එක එක ඒවාට මේ ළමයින් පොලඹවලා මේ ළමයින්ගේ ජීවිත සම්පූර්ණයෙන්ම විනාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද යථාර්ථය ගැන අකමැත්තෙන් වුවත් අපි කියන්නට ඕනෑ. අද අපේ රටේ විශ්ව විද්‍යාලයෙන් උපාධිය ලබා ගන්නා උපාධිධාරියා අද සමාජය තුළ "expired good" එකක් බවට පත් වෙලා තිබෙනවා. කල් ඉකුත් වූ භාණ්ඩයක් වෙලා තිබෙනවා. අද පෞද්ගලික බැංකුවකට, පෞද්ගලික සමාගමකට ඉල්ලුම් පත්‍රයක් දාලා රැකියාවක් ගන්න ගියාම, රජයේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයාට දෙන තැනට වඩා වැඩි තැනක් ජාත්‍යන්තර පාසලේ උසස් පෙළ සමත් ළමයාට දෙනවා. එහෙම දෙන්නේ නැද්ද? රාජකීය විද්‍යාලයෙන් ආපු කෙනෙක් වෙන්නට පුළුවන්, තෝමියන් කෙනෙක් වෙන්න පුළුවන්. එම උසස් විද්‍යාලවලින් ආපු උසස් පෙළ සමත් ළමයාට තිබෙන පිළිගැනීම අද රජයේ උපාධිධාරියාට ලැබෙන්නේ නැහැ, පෞද්ගලික අංශයේ රැකියාවක් සඳහා ඉදිරිපත් වීමේ දී. ඒ අයට රැකියාවක් ගන්න හරි අමාරුයි. එම නිසා තමයි අද රැකියා පෝළිමක් හැදිලා තිබෙන්නේ. අද අපේ දේශපාලන සංස්කෘතියක් හැදිලා තිබෙනවා, උපාධියක් ගත්තොත් රජයේ රැකියාවක් දිය යුතුය කියලා. [බාධා කිරීමක්]

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු ඇමතිතුමා, සභයෝගයට වචනයක් කියන්න ඉඩ දෙන්න පුළුවන් ද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

හොඳයි.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(மாண்புமிகு ஏ.டி. சுசில் பிரேமஜயந்த)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නව උසස් අධ්‍යාපන අමාත්‍යතුමාට මම ස්තුතිවන්ත වෙනවා. විෂය භාර අමාත්‍යවරයා හැටියට උසස් අධ්‍යාපන විෂය පිළිබඳව කරුණු වටහාගෙන, විශේෂයෙන්ම විශ්වවිද්‍යාලවල තත්ත්වය පිළිබඳව අදහස් ප්‍රකාශ කිරීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. මම මෙතැනට පොඩි දෙයක් එකතු කරනවා. ගරු අමාත්‍යතුමනි, මුළු ලෝකයම මීට අවුරුදු දහයකට කලින් - අවුරුදු 10ත් - 15ත් අතර කාලය තුළ - STEM education ආරම්භ කළා. ඒ කියන්නේ Science, Technology, Engineering, and Mathematics කියන එක. මෙයට ළඟදී එකතු වුණා, STEAM education - Science, Technology, Engineering, Art and Mathematics කියන එක. මේ රටවල් 76ක් වාර්ෂිකව competition එකක ඉන්නවා. පසුගිය 2017 අවුරුදේ PISA Test එකෙන් පළමුවෙනියාට ආවේ සිංගප්පූරුව. වියට්නාමය අට වැනියා. ලංකාව ඔය හැත්තෑ හයේවත් නැහැ. නමුත් අවාසනාවක මහත! පසුගිය කාලය තුළ මා උත්සාහ කළා තාක්ෂණ විද්‍යා හා පර්යේෂණ විෂය භාර අමාත්‍යවරයා හැටියට STEM education එක පිළිබඳව කතිකාවක් ඇති කර කොහෙන් හෝ මේක ආරම්භ කරන්න. කෙසේ හෝ මට ඒකට දැන් අවස්ථාවක් නැහැ. ඔබතුමාට උසස් අධ්‍යාපන අමාත්‍යවරයා හැටියට මම යෝජනා කරනවා, ඔබතුමා මෙහි initiative එක ගන්න කියලා. කාරක සභා අවස්ථාවකදී හෝ Sectoral Oversight Committee එකේදී අපේ දායකත්වය අපි ලබා දෙන්නම්. මගේ මතය මෙයයි. මේ අවුරුදු දහය තුළ සමාන්තර රටවල් හැත්තෑහයකට වැඩි ගණනක් ඉදිරියට ගිහින් තිබෙනවා නම්, ඒ දහය තුළ අපි පස්සට ගිහින් තිබෙනවා. ඔබතුමා මේක උසස් අධ්‍යාපනයෙන් පටන් ගන්න. නමුත් මේක පෙර පාසලෙන් පටන් ගන්න ඕනෑ දෙයක්. ඔබතුමා කියන කාරණය හරි. මේ අධ්‍යාපන ක්‍රමය තුළින් බිහි වෙන්නේ නිර්මාණකරුවන් නොවෙයි. Innovatorsලා නොවෙයි. Researchersලා බිහි වෙන්නේ නැහැ. ලංකාවේ ජනගහනයට, ලංකාවේ researchesලා ඉන්න ඕනෑ විසි දාහක්. අද ඉන්නේ පන්දහස් එකසියයි. පන්දහස් එකසියයෙන් දෙදාහකට අඩු ගණනක් විතරයි researchs වල engage වෙන්නේ. එදා මුනිදාස කුමාරතුංගයන් කිව්වා නේ "අලුත් අලුත් දෑ නොතනන ජාතිය ලොව නොනගී" කියලා. අන්න ඒකයි වෙන්න යන්නේ. ඔබතුමාට සුබ ප්‍රාර්ථනා කරනවා. ඔබතුමා ඔය ටික කියපු නිසා තමයි, මම ඔබතුමාට ධෛර්යයක් වෙන්න මේ වචන ටික කිව්වේ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු මන්ත්‍රීතුමාට බොහොම සතුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක ආණ්ඩුවක ප්‍රශ්නයක්වත්, පක්ෂයක ප්‍රශ්නයක්වත් නොවෙයි. එතුමා දැකපු විධියටම තමයි මාත් දකින්නේ. මේක රටේ ප්‍රශ්නයක්. මේ ගරු සභාවේ මහජන නියෝජිතයන් වන අපට පක්ෂ භේදයක් නැහැ.

මේක රටේ ප්‍රශ්නයක්. අපට පක්ෂ භේදයක් නැහැ. රටේ අනාගතය නිර්මාණය කිරීමේදී, විශ්වවිද්‍යාල පද්ධතිය නිර්මාණය කිරීමේදී මේ ගරු සභාවේ සිටින මහජන නියෝජිතයන් සියලුදෙනාම එකතු කරගෙන, ඒ අයගේ අදහස් අරගෙන හොඳ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න මම බලාපොරොත්තු වනවා.

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සඳහන් කරමින් සිටියේ විශ්වවිද්‍යාල පද්ධතිය ගැනයි. අපේ විශ්වවිද්‍යාල පද්ධතියේ ඉගෙන ගන්නා ශිෂ්‍යයන්ගෙන් සියයට 52ක්ම කලා සහ කළමනාකරණ පීඨවල අයයි. අපේ ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා දන්නවා, වෛද්‍ය සහ ඉංජිනේරු පීඨවල ඉගෙන ගන්නා ශිෂ්‍යයන්ට නාස්ති කරන්න තරම් කාලයක් නැති බව. මොකද, කාලය නාස්ති කළොත් ඒ අයට කවදාවත් වෛද්‍යවරයෙක් වෙන්න බැහැ. ඒ ගොල්ලන්ගේ වැඩ පිළිවෙළ සාර්ථක වෙලා තිබෙන්නේ එතැනිනුයි. ඉංජිනේරු පීඨවල අයටත් එහෙමයි. නමුත් අද කලා සහ කළමනාකරණ අංශයේ පාඨමාලාව අරගෙන බැලුවාම, මුළු අවුරුද්දටම උගන්වන්නේ මෙපමණද කියලා අපට ටිකක් පුදුමත් හිතෙනවා. ඒක කලා අංශයේ තිබෙන එක ප්‍රශ්නයක්. අපේ ගරු සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමාත් ඒක පිළිගනීවි. කලා අංශයේ පාඨමාලාව මාස දෙකකින් ඉගෙන ගන්න පුළුවන්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඉතින්, දරුවෝ මාස දහයක් පාරේ ඉන්නවා. ප්‍රශ්නයක් නැහැ නේ. මාස දහයක් පාරේ ඉඳලා ඉතිරි මාස දෙකේ "ක්‍රෑම්" දමලා විභාගය පාස් වෙනවා. එතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. කාගේ හෝ note එකක් අරගෙන ෆොටෝ කොපියක් ගහගෙන, ඒක පාඩම් කරලා විභාගය පාස් වෙනවා. මම ලංකාවේ සියලුම උපකුලපතිතුමන්ලා කැඳවලා මේ පිළිබඳව සාකච්ඡා කළා. මේ ගොල්ලන්ට භාෂා ප්‍රවීණතාවක් නැහැ. ඉංග්‍රීසි භාෂාව ඉගෙන ගන්නේ නැහැ. සිංහල භාෂාවේ ප්‍රවීණතාවක් නැහැ. "උපාධිධාරී පත්වීම්" කියා අපේ අමාත්‍යාංශවලට මේ සමහර අය එනවා. ඒ අයට ලියුමක් හදන්න දුන්නොත් හතර වතාවක් විතර correct කරන්න අපිට සිද්ධ වෙනවා. ඒ අයට සිංහලෙන් ලියුමක් draft කරගන්න බැහැ. ඒකෙන් අද මොකද වෙලා තිබෙන්නේ? බොහෝ අය ජාත්‍යන්තර පාසල් ක්‍රමය විවේචනයටත් ලක් කරනවා. හැබැයි ඒ සියල්ලම කරන අතරේ, අද එන්න එන්නම පුළුල් වෙන්නෙත් ජාත්‍යන්තර පාසල්. දැන් ජාත්‍යන්තර පාසල්වල ඉගෙන ගන්නා සංඛ්‍යාව 1 millionවලට ආසන්න වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමා තව කොපමණ වෙලාවක් කථා කරනවාද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
කාලය පිළිබඳව ප්‍රශ්නයක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි ඒක adjust කර ගන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව කොච්චර වෙලාවක් අවශ්‍යද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මට තව විනාඩි 20ක් විතර ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාත්‍යන්තර පාසල්වලට යන දරුවෝ හොඳට ඉංග්‍රීසි ඉගෙන ගන්නවා. ඒ වාගේම විෂයයනුත් ඉගෙන ගන්නවා. ඔවුන් අපොස සාමාන්‍ය පෙළ විභාගය සමත් වෙනවා. උසස් පෙළ විභාගයත් සමත් වෙනවා. ඒ විභාග සමත් වුණ ගමන්ම ඔවුන්ට රස්සාවකුත් හම්බ වෙනවා. ඒ පෞද්ගලික බැංකුවක වෙන්න පුළුවන්; කොම්පැනියක වෙන්න පුළුවන්. රස්සාව කරන ගමන් පුළුවන් නම් ඒ අය London LLB හෝ London BA කර ගන්නවා. එහෙම කරලා, මේ රටේ ව්‍යත්තියවේදියෙකුත් වෙනවා. ඔවුන් අවුරුදු 25, 26 වනකොට විවාහ වෙනවා. අවුරුදු 30 වනකොට ගෙයකුත් හදාගෙන, ළමයින් දෙදෙනෙකුත් හදාගෙන ඉන්නවා. අද අපේ වියදමින් -මහ ජනතාවගේ වියදමින්- විශ්වවිද්‍යාලවල ඉගෙන ගන්නා ශිෂ්‍යයන් අවුරුදු තුනේ course එකට අවුරුදු හයක් විතර ගත කරනවා. තව අවුරුදු හතරක් විතර, "රැකියා දියව්, දියව්" කියා ආණ්ඩුවට විරුද්ධව පෙළපාළි යනවා. එතකොට ඔවුන්ට අවුරුදු 30යි. ඊට පස්සේ ගෙවල් හදන්න වෙලාවකුත් නැහැ; ළමයි හදන්න වෙලාවකුත් නැහැ. යාන්තම් විවාහයක් විතරක් කර ගන්නවා. මේකද මේ රටේ උපාධිධාරියාගේ ඉරණම විය යුත්තේ? "අධ්‍යාපනයට සියයට 6ක් වෙන් කරන්න ඕනෑ" කියා එක පැත්තකින් පෙළපාළි යනවා; උද්ඝෝෂණ කරනවා. මේ රටේ ප්‍රාථමික පාසල් පද්ධතියේදී විනයක් ඇතිව අපූරුවට හැදුණු, ඉගෙන ගත්ත ළමයි ටික විශ්වවිද්‍යාල දොරකඩින් ඇතුළට ගිය ගමන්ම මොළය විකෘති කර ගන්නවා. සියල්ලෝම නොවෙයි, බහුතරයක්. හැබැයි වෛද්‍ය අංශයේ, ඉංජිනේරු අංශයේ ළමයින්ට එහෙම රෝග හැදෙන්නේ නැහැ. කලාතුරකින් ඒ අයටත් හැදෙනවා ඇති. මේ රෝගය හැදෙන්නේ අනෙක් පීඨවල අයටයි. මේ සියලුදෙනාම ඉගෙන ගන්නේ මේ රටේ මහ ජනතාවගේ සල්ලිවලින්. හෝඩියේ පන්තියේ සිට උපාධිය දක්වා ඉගෙන ගන්නා හැම දරුවෙක්ම මේ රටේ සිටින ධනපතියාට ණයයි. ධනපතියන් බදු ගෙවනවා. ඒ ලැබෙන බදු මුදල් රජය අධ්‍යාපනය වෙනුවෙනුත් යොදවනවා. නිදහස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයෝ ඔක්කෝම මේ රටේ ඉන්න මධ්‍යම පාන්තිකයන්ට ණයයි. විශ්වවිද්‍යාල දරුවොත් මේ රටේ ඉන්න හිඟන්නාටත් ණයයි.

මොකද, ඒ ගොල්ලන්ගේ අධ්‍යාපනයට මේ රටේ හිඟන්නාත් දායක වෙලා තිබෙනවා. හිඟන්නාත් කඩෙකට ගිහින් සීනි ටිකක්, පරිප්පු කාලක් ගන්නකොට ඒකේත් බද්දක් තිබෙනවා. මහජන මුදල්වලින් තමයි මේවා ඔක්කොම නඩත්තු කරන්නේ. ආණ්ඩුවේ ඇමතිවරු වන අපි කවුරුත් ගෙදරින් සල්ලි ගෙනැත් නොවෙයි මේ කටයුතු සිදු කරන්නේ. මේ ඔක්කොම කටයුතු සිදු කරන්නේ මහජන මුදල්වලින්. මහජන මුදල්වලින් ඉගෙන ගන්නා දරුවන් විශ්වවිද්‍යාලයට යන්නේ මේ රට ගොඩ ගන්නයි; රට සංවර්ධනය කරන්නයි; හොඳ බුද්ධිමත් දායකත්වයක් රටට ලබා දෙන්නයි. ඔවුන් විශ්වවිද්‍යාලයට යන්නේ මහ උගතුන්, වියතුන් වෙන්නයි. හැබැයි, එතැනට ගිය දවසේ ඉඳලා ඒ සියලුදෙනාම, "අරක දියව්, මේක දියව්, අරයා පලයව්" කිය කියා තමයි පාරවල්වල පෙළපාළි යන්නේ. මේ සංස්කෘතිය මෙහෙම ගියොත්, අධ්‍යාපන ක්ෂේත්‍රය කොතැනින්ද නතර වෙන්නේ? අනික් පැත්තෙන්, ඒ අයටත් සහෝදර, සහෝදරියන් ඉන්නවා. නමුත් කරන හිංසා, පහර දීම්, ලිංගික අතවරවල සීමාවක් නැහැ. මේ වාගේ පහත්, නීච වැඩ කරනකොට අඩු ගණනේ තමන්ට ඉන්න සහෝදරයා, සහෝදරිය ගැන මතක් වෙන්න එපා යැ. එහෙම මතක් වෙන්නෙත් නැහැ. අද අපේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය මොන තරම් කෲර, අමානුෂික තත්ත්වයට වැටිලා තිබෙනවාද? අද විශ්වවිද්‍යාලවල ඉන්න උපකුලපතිතුමන්ලාට, පීඨාධිපතිවරුන්ට මේ තත්ත්වයෙන් මේවා ගොඩ ගන්න ඕනෑකම තිබෙනවා. ඒ වෙනුවෙන් ඔවුන් මහන්සි වෙනවා. හැබැයි, ඊට වඩා බලවේග මේ ශිෂ්‍ය සංගම් නාමයෙන් එක එක අයගෙන් කප්පම් අරගෙන, මුදල් පොම්ප කරන ඒවා

යොදවලා, ගමින් ගොඩින් ආපු දුප්පත්ම පවුල්වල දු දරුවන්ගේ මොළය විකෘති කරලා, ඒ කට්ටිය පාරට දක්කලා, මුළු විශ්වවිද්‍යාල පද්ධතියම අකර්මණ්‍ය කරනවා. ඒවා හසුරුවා ගන්න බොහෝ විශ්වවිද්‍යාලවල ආචාර්ය මණ්ඩලයට අපහසුයි. මොකද, ඒ ගොල්ලන් අසරණයි. ඒ ගොල්ලන්ට ඒ කටයුත්ත කරන්න හුඟක් තැන්වලින් ශක්තියක් ලැබෙන්නේ නැහැ. මෙතැනදී පොලීසියටත් ප්‍රශ්නයක් තිබෙනවා. ගිය අවුරුද්දේ බරපතළ සිද්ධි 280ක් වෙලාත් ඉන් එකක්වත් පොලීසියට වාර්තා කර නැහැ. තමන්ට පැමිණිලි කළේ නැතිව පොලීසියට ඒ සම්බන්ධව පියවරක් ගන්නත් බැහැ. ඒ නිසා විශ්වවිද්‍යාල තුළ තිබෙන මේ අරාජික, අවාසනාවන්ත තත්ත්වය නැති කරගෙන, විශ්වවිද්‍යාල පරිපාලනය සහ විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩි කර ගන්න අපිට අනිවාර්යයෙන් සිදු වනවා. එහෙම නොවුණොත්, අපේ විශ්වවිද්‍යාල පද්ධතියෙන් මේ රටේ ජනතාවට සෙතක් වෙන්නේ නැහැ.

අනික් කාරණය මෙයයි. ගරු සුසිල් ප්‍රේමජයන්ත මන්ත්‍රීතුමනි, අපේ රටේ පාසල් පද්ධතියේ ජාත්‍යන්තර පාසල් තිබෙන බව ඔබතුමා දන්නවා. ඒ ගොල්ලන්ට අවශ්‍ය සුදුසුකම තමයි, සමාගම් රෙජිස්ට්‍රාර් ළඟ register වෙන එක. සමාගමක් විධියට ලියාපදිංචි කිරීමේ සුදුසුකම විතරයි ඕනෑ කරන්නේ. එතකොට ඒ ගොල්ලන් ජාත්‍යන්තර පාසලක් ඇති කරනවා. විශ්වවිද්‍යාලවල උපාධි පිරිනමනවා නේ. අපේ (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා මේ කාරණය දන්නවා. ඒකට අවශ්‍ය කරන්නේ එක සුදුසුකමයි. උපාධි ප්‍රදානය කරන ආයතනයක් විධියට අපේ අමාත්‍යාංශය විසින් එය පිළිගන්න ඕනෑ. එලෙස අපේ අමාත්‍යාංශය විසින් පිළිගත්තාට පස්සේ ඒකේ උපාධිය උගන්වනවාද, සහතිකය විකුණනවාද, උපාධියේ ප්‍රමිතියක් තිබෙනවාද කියා කවුරුවත් දන්නේ නැහැ. කාටවත් ඒක හොයන්නත් බැහැ. මේ විධියට අද අපේ අධ්‍යාපන ක්ෂේත්‍රය අරාජික තත්ත්වයකට ගමන් කර තිබෙනවා. ඒ නිසා මීට සති කීපයකට කලින් ගරු අග්‍රාමාත්‍යතුමා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා, පාසල් ලියාපදිංචි කිරීම සහ පවත්වාගෙන යාමට රාජ්‍ය ප්‍රතිපත්තියක් හදන්නය කියා. මේ වනකොට කැබිනට් අනුකමිටුවක් පත් කරලා, (ආචාර්ය) සරත් අමුණුගම මැතිතුමාගේ සභාපතිත්වයෙන් අපි ඒ කටයුතු කරගෙන යනවා. අද ලෝකයේ දියුණු හැම රටක්ම විශ්වවිද්‍යාල පද්ධතිය, ඒවායේ ප්‍රමිතිය සහ ගුණාත්මකභාවය පරීක්ෂා කරන්න, අධීක්ෂණය - monitor - කරන්න කටයුතු කරනවා. විශ්වවිද්‍යාලයක් ආරම්භ කරන්න සුදුසු යටිතල පහසුකම් තිබෙනවාද, එය විශ්වවිද්‍යාලයකට ගැළපෙන තැනක්ද, ඒකෙන් ශිෂ්‍යයන්ට ප්‍රමාණවත් පහසුකම් සපයනවාද කියා බලන්න ඕනෑ.

එතකොට ඒ උදවිය ඉදිරිපත් කරන විෂය මාලාවන් අපට පිළිගත හැකි ඒවාද, ඒ විෂයමාලා ගුණාත්මකව උගන්වන්න ගුරුවරු ඉන්නවා ද, ඒ ගොල්ලන්ගේ සුදුසුකම් මොනවා ද, අවසාන වශයෙන් දෙන උපාධියේ ප්‍රමිතියක් තිබෙනවා ද නැද්ද කියලා තීන්දු කරන්න අපි දැන් කෙටුම්පත් කරලා තිබෙනවා, Quality Assurance and Accreditation Bill එක.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත)
(The Hon. A.D. Susil Premajayantha)

ගරු ඇමතිතුමනි, ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, අවුරුදු තුනක් තිස්සේ සයිටම් ප්‍රශ්නය විසඳන්න ඔබතුමා විශාල වෙහෙසක් දරනවා. මට මතකයි, අමාත්‍ය මණ්ඩලයට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ආ බව. වෛද්‍ය ශිෂ්‍යයෙක් හැටියට ඇතුළත්වීම සඳහා - enrol කරන්න - තිබෙන අවම සුදුසුකම පිළිබඳව. ඒ අවම සුදුසුකම පිළිබඳව අමාත්‍ය මණ්ඩලයේ තීන්දුව පමණක් නොවෙයි, මා දන්නා හැටියට ඒක පාර්ලිමේන්තුවටත් ඇවිල්ලා අනුමත වෙන්න ඕනෑ. වෛද්‍ය උපාධිය පිළිබඳ පවතින අවම ප්‍රමිතිය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවාද කියලා දැන ගන්න කැමැතියි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මෙහි කාරණා කිහිපයක් තිබෙනවා. අද ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් කළා. ඉදිරියේදී අපට සාකච්ඡා කරන්න පුළුවන්. සමහර උදවිය වියවුල් තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. මොකද, ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අලුතෙන් පනත් කෙටුම්පතක් හදලා තිබෙනවා කියලා. ඒ පනත් කෙටුම්පත නොවෙයි, මේ ගෙනාවේ. ඉතාම සුළු සංශෝධනයක් විතරයි. ශිෂ්‍යයන්ගේ මානුෂීය පැත්ත ගැන හිතලා රජයේ වෛද්‍ය සංගමය ඇතුළු විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සියලු දෙනා සමඟ කථා කරලා ගත් තීරණයක් අනුව මේ උදවිය කොතලාවල විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය - absorb -කර ගන්න ඒ සංශෝධන පනත් කෙටුම්පතේ තිබෙන්නේ සුළු සංශෝධනයක්. එවකට වෛද්‍ය සභාවේ - SLMC එකේ - අවම සුදුසුකම Biology, Chemistry, Physics කියන විෂයයන්වලට "එස් 3" තමයි තිබුණේ. ඒක අවම සුදුසුකම් විධියටයි තිබුණේ. එතකොට ඒ සුදුසුකම පදනම් කරගෙන තමයි අන්තර්ග්‍රහණය කරන්නේ. නමුත් "එස් 3" තිබුණු හැමෝම ගන්නේ නැහැ. Z-score එක අනුව සුළු ප්‍රමාණයක් තමයි ගන්නේ. නමුත් "එස් 3" තමයි පිළිගැනීම හැටියට තිබුණේ. ඒ පදනම උඩ තමයි ගරු මන්ත්‍රීතුමා අපි ඒක සිද්ධ කරන්නේ.

ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
(මාණ්පුමිකු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත)
(The Hon. A.D. Susil Premajayantha)

මගේ මතකයේ හැටියට අමාත්‍ය මණ්ඩලයට දැනට මාස කිහිපයකට කලින් අත් පත්‍රිකාවක් ආවා, "සී 2යි; එස් 2" කියලා. නමුත් වෛද්‍ය ක්ෂේත්‍රයේ පීයාධිපතිවරුන් සහ අනික් අය කිව්වේ "බී 3" කියලා. නමුත් ඒක ඊට පස්සේ කොහොම හරි Medical Council එකෙන් refer කළා කියලා සෞඛ්‍ය ඇමතිතුමා ඉදිරිපත් කළා "සී 2 එස් 1." දැන් ඔබතුමා හදන්නේ මේ වෙච්ච යම්කිසි වරදක් නැත්නම් අසාධාරණයක් සාධාරණය කරන්න. හැබැයි, ප්‍රශ්නය තිබෙන්නේ ඔය එස් 3 අවම ප්‍රමිතිය හැටියට දිගටම පවත්වාගෙන යනවාද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

නැහැ. ඒක කෙරෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම ජාතික ප්‍රශ්නයක් දක්වා ඔඩු දුවපු ප්‍රශ්නයක් විසඳීම සඳහා වූ ප්‍රායෝගික විසඳුමකට තමයි අපි කවුරුත් එකඟතාවයකට ඇවිල්ලා තිබෙන්නේ. මේ ශිෂ්‍යයන් අන්තර්ග්‍රහණය කරන්නෙත් මූලික සුදුසුකම් පිළිබඳව පරීක්ෂා කරලා. හැබැයි, අප මින් ඉදිරියට පෞද්ගලික වෛද්‍ය පීඨවලට ඉඩ දෙනවාද, නැද්ද යන්න පිළිබඳව රාජ්‍ය ප්‍රතිපත්තිමය තීරණයක් ඉදිරියේදී ගන්න ඕනෑ. ඒ එක්කම අවම සුදුසුකම කුමක්ද කියලා අපි එකඟතාවයකට ඇවිල්ලා ඒක ගැසට් කරන්න ඕනෑ. ඒක නූතනයට ගැළපෙන පරිදි කරන්න ඕනෑ. එක පාරට හිතුමතේට අපි ඒක කරන්නේ නැහැ. ඔබතුමන්ලා සියලු දෙනා එක්ක සාකච්ඡා කරලා, ජාතික ප්‍රතිපත්තියක් විධියට අපි එකඟතාවයකට එමු. මේක සුවිශේෂී කාරණයක් නිසා ළමයින්ගේ අනාගතය ගැන කල්පනා කරලා සියලු දෙනාගේ එකඟතාවය අපි ලබා ගත්තා. [බාධා කිරීමක්] මේ ප්‍රශ්නය විසඳලා අනිකුත් කාරණා පිළිබඳව කටයුතු කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේකත් කියන්නම්. රටේ මත දෙකක් තිබෙනවා. එක මතයක් තමයි පෞද්ගලික විශ්වවිද්‍යාල ආරම්භ කරන්න ඕනෑ, හැබැයි, ප්‍රමිතිය රැකගෙන ඒවා පවත්වාගෙන යන්න ඕනෑ කියන මතය. දෙවැනි මතය තමයි රටක පෞද්ගලික විශ්වවිද්‍යාල ලාභ ලබන ආයතන විධියට පවත්වන එක හොඳ නැහැ, ලාභ ලබන ආයතනයකට පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ගෙන යන්න දෙන්න බැහැ, ඒකට වෙනත් ක්‍රමවේදයක් එක්කෝ රජයේ, එක්කෝ භාරකාර

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

මණ්ඩලයක් යටතේ කළ යුතුයි කියන මතය. අද මේ මත දෙක තිබෙනවා. විශ්වවිද්‍යාල ප්‍රජාව තුළත් මේ මත දෙක තිබෙනවා. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි,වෛද්‍යවරු අතරත් තිබෙනවා නේද? ඒ මතය පිළිබඳ අපි රජයක් විධියට තීරණයක් අරගෙන නැහැ. අපි තීරණයක් ගන්නේ නැහැ. මොකද, මේ ප්‍රශ්නය නිරාකරණය කරලා, අදාළ සියලු පාර්ශ්වයන් එක්ක සාකච්ඡා කරලා රටට හොඳ දේ මොකක්ද කියලා අපි තීරණය කරමු. ඒ පිළිබඳව මේ ගරු සභාවට තීරණය කරන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අවසාන වශයෙන් සඳහන් කරන්නේ විශ්වවිද්‍යාල පද්ධතියේ වින‍ය අපි ආරක්ෂා කර ගත්තේ නැත්නම් අපේ විශ්වවිද්‍යාල පද්ධතිය පිළිබඳව,- [*Interruption.*] Do you want to ask a question?

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(මාණ්පුමිකු இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ அமைச்சர் அவர்களே, பல்கலைக்கழகங்கள் தொடர்பில் நீண்ட ஒரு விளக்கத்தையளித்திருந்தீர்கள். அத்துடன், இந்த விடயத்தில் திருத்தப்பட வேண்டிய அம்சங்கள் பற்றியும் சர்வதேசப் பாடசாலைகள்மூலம் மாணவர்கள் பெறுகின்ற நன்மைகள் தொடர்பாகவும் விரிவாகக் கூறியிருந்தீர்கள். நன்றி!

இன்று சில மாவட்டங்களில் பல்கலைக்கழக அனுமதியின்போது பல்வேறு விடயங்கள் இடம்பெறுகின்றன. நான் வன்னித் தேர்தல் மாவட்டத்திலுள்ள மன்னார் மாவட்டத்தைச் சொந்த இடமாகக் கொண்டவன். எங்களுடைய மாவட்டத்தில் க.பொ.த. சாதாரண தரப் பரீட்சையில் தோற்றாத மாணவர்கள் சிலர் வேறு மாவட்டங்களிலிருந்து வந்து சில கிராமப்புறப் பாடசாலைகளில் க.பொ.த. உயர்தர கணித, விஞ்ஞானப் பிரிவுகளில் தங்களுடைய பெயர்களைப் பதிவுசெய்கிறார்கள். பின்னர் கண்டி, கொழும்பு போன்ற பிற மாவட்டங்களில் கல்வி கற்றுவிட்டு, க.பொ.த. உயர்தரப் பரீட்சை எழுதுவதற்கு மாத்திரம் அப்பாடசாலைகளுக்கு வருகிறார்கள். அங்கு அவர்கள் பரீட்சை எழுத வருகின்ற போதுதான் சம்பந்தப்பட்டவர்கள் தங்களுடைய பாடசாலையில் பதிந்திருக்கின்றார்கள் என்பது, குறித்த பாடசாலை மாணவர்களுக்குத் தெரியவருகின்றது.

கௌரவ அமைச்சர் அவர்களே, மாணவர்கள் க.பொ.த. சாதாரண தரம் கற்கும்போது எந்தப் பாடசாலையில் அனுமதிக்கப்பட்டுப் பரீட்சைக்குத் தோற்றுகின்றார்களோ அந்தப் பாடசாலைக்குரிய மாவட்டம்தான் அவர்கள் க.பொ.த. உயர்தரப் பரீட்சைக்குத் தோற்றும்போது பல்கலைக்கழக வெட்டுப் புள்ளிக்கான மாவட்டமாகக் கருதப்பட வேண்டும். உதாரணமாக, மன்னார் மாவட்டத்தில் மாணவன் ஒருவன் க.பொ.த. சாதாரண தரப் பரீட்சைக்குத் தோற்றியிருந்தால் அவன் க.பொ.த. உயர்தரப் பரீட்சைக்குத் தோற்றும் பட்சத்தில் மன்னார் மாவட்டத்திற்குரிய வெட்டுப்புள்ளிக்குள் உள்வாங்கப் பட முடியும். உதாரணமாக, க.பொ.த. சாதாரண தரப் பரீட்சைக்கு புத்தளம் மாவட்டத்தில் தோற்றிய மாணவன் ஒருவன் Advanced Level க்கு மன்னார் மாவட்டத்தில் பெரியமடு பாடசாலை போன்ற ஒரு பாடசாலையில் தன்னுடைய பெயரைப் பதிவுசெய்வது, சட்டப்படி செல்லுபடி யற்றதாக இருந்தாலும் அரசியல் பலம், பண பலம் என்பவற்றின்மூலம் அங்குள்ள அதிபர்கள் குறித்த மாணவனை அங்கு பதிவுசெய்கிறார்கள். அங்கு பதிவானதன் பின்பு புத்தளத்திலோ, கண்டியிலோ, கொழும்பிலோ சென்று அந்த மாணவன் கல்வி கற்றுக்கொண்டிருக்கின்றான். அதன் பின்னர் மன்னாரில் தான் பதிவுசெய்த பாடசாலையில் உயர்தரப் பரீட்சை எழுதுகின்றான். அதன் காரணமாக அவன் மன்னார் மாவட்டத்துக்குரிய வெட்டுப்புள்ளிக்குள் உள்வாங்கப் படுகின்ற ஒரு சூழ்நிலை காணப்படுகின்றது. ஆகவே, க.பொ.த. சாதாரண தரப் பரீட்சைக்குத் தோற்றிய மாவட்டத்திலேயே நிச்சயமாக உயர்தரப் பரீட்சைக்கும் தோற்ற வேண்டும். அவர்களுக்கான வெட்டுப்புள்ளியும் குறித்த மாவட்டத்தைச் சார்ந்ததாக வழங்கப்பட வேண்டும். அதாவது புத்தளத்தில் படிக்கின்ற ஒரு மாணவன் மன்னாரில் வந்து உயர்தரப் பரீட்சை எழுதினாலும் அவன் க.பொ.த. சாதாரண தரப் பரீட்சை புத்தளத்தில் எழுதியிருந்தால் அவனுக்கு புத்தளத்திற்குரிய வெட்டுப்புள்ளிதான் வழங்கப்பட வேண்டும். கௌரவ அமைச்சர் அவர்களே, இந்த நிலைமையினால் ஒரு வருடத்தில் 2-3 வெளிமாவட்ட மாணவர்கள் மன்னார் மாவட்டத்திலிருந்து பல்கலைக் கழகங்களுக்கு உள்வாங்கப்படுகின்ற சூழ்நிலை தொடர்ந்து காணப்படுகின்றது. எனவே, கௌரவ அமைச்சர் அவர்களே, இந்த விடயத்தை உங்களது கவனத்துக்குக் கொண்டு வருகிறேன். எனவே, இவ்வாறான நடைமுறைகள் இடம்பெறாத வகையில் சட்டங்கள் உருவாக்கப்பட வேண்டும் என்றும், அந்தந்த மாவட்டத்தின் வளங்களுக்கு ஏற்றவாறு மாணவர்கள் பல்கலைக்கழக அனுமதி பெறும் வகையில் ஒழுங்குவிதிகளில் திருத்தங்கள் கொண்டுவரப்பட வேண்டும் என்றும் கேட்டுக்கொள்கின்றேன்.

அடுத்ததாக, இன்னொரு விடயம். அதாவது கடந்த 2016ஆம் ஆண்டு உயர் தரப் பரீட்சைக்குத் தோற்றி, மன்னார் மாவட்டத்தில் rank 5 இல் வந்த ஒரு மாணவி, Z-Score அடிப்படையில் 7ஆவது rankக்குப் பின்தள்ளப்பட்டுள்ளார்.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Hon. Member, I got your point.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

எனவே, Z-score அடிப்படையில் மாணவர்களைத் தெரிவு செய்த பின்னர்தான் rank வழங்கப்பட வேண்டும். அவர் 5ஆவது இடம் என்று சட்டரீதியாக உங்களுடைய ஆணைக்குழுவால் அறிவித்ததன் பின்பு -மன்னார் மாவட்டத்தில் ஐந்து பேருக்குத்தான் மருத்துவ பீடத்துக்குச் செல்லமுடியும்- அந்த மாணவி தனக்கு மருத்துவ பீடம் கிடைத்துவிட்டது என்று சந்தோசத்தில் இருந்ததார். பின்னர் இரண்டு அல்லது மூன்று வாரங்களுக்குப் பிறகு, அந்த மாணவிக்கு வந்த மாணிய ஆணைக்குழுவின் கடிதத்தில் அவர் ஏழாவது இடம் என்று குறிப்பிடப்பட்டிருந்தது. இது தொடர்பில் தேடிப் பார்த்தபோது, கண்டி மாவட்டத்தில் பரீட்சை எழுதிய ஒருவர் மன்னார் மாவட்டத்தில் பதிவுசெய்திருந்த காரணத்தினால், அந்த மாவட்டத்திலிருந்து மருத்துவ பீடத்துக்கு உள்வாங்கப்பட்டிருக்கின்றார்.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Hon. Member, I know the issue. Anyway, thank you very much for raising it.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා මතු කළේ, ඉතාම වැදගත් කාරණයකි. Z-score එකේ ඉහළ ලකුණු මට්ටමකින්

වෛද්‍ය පීඨවලට සහ ඉංජිනේරු පීඨවලට තෝරා ගන්නා ළමයින් සම්බන්ධයෙන් තමයි ඔය ප්‍රශ්නය තිබෙන්නේ. කොළඹ, මහනුවර වාගේ දිස්ත්‍රික්කවල උදවිය විභාගය කිට්ටු වන විට මන්නාරම, සමහර වෙලාවට වවුනියාව, මොනරාගල වාගේ Z-score එකේ අඩු ලකුණු මට්ටමකින් වෛද්‍ය පීඨවලට සහ ඉංජිනේරු පීඨවලට ඇතුළු කර ගන්නා දිස්ත්‍රික්කවලට ගිහිල්ලා විභාගය ලියනවා. ඒ අය එහෙම ගිහිල්ලා විභාගය ලිව්වාම, ඒ දිස්ත්‍රික්කවල අඩු පහසුකම් යටතේ ඉගෙන ගෙන ලකුණු ගත්ත සිසු දරුවන්ට ඒ සඳහා තිබෙන අවස්ථාව නැතුව යනවා. දිගින් දිගටම එසේ සිදු වුණු නිසා මම මේ අමාත්‍ය ධුරය භාර ගන්න පෙර සිටම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඒ පිළිබඳව අවධානය යොමු කරලා, මේ වන විට අවශ්‍ය කටයුතු කරගෙන යනවා. මේ අවුරුද්දේත් ඔය ප්‍රශ්නය ආවා. මම ඇමතිවරයා වශයෙන් පත් වෙන්න සති කිහිපයකට කලින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙනුවෙන් මම නඩුවලටත් පෙනී සිටියා. එවැනි ශිෂ්‍යයින් කොමිසමට විරුද්ධව නඩු පවරා තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මහනුවර දිස්ත්‍රික්කයේ පදිංචිකරුවෝ ගිහිල්ලා සමහර වෙලාවට වවුනියාවේදී, මන්නාරමේදී විභාගයට පෙනී ඉඳලා තිබෙනවා. ඒ සමහර වංචාවලට විදුහල්පතිවරුනුත් සම්බන්ධයි. විදුහල්පතිවරු සහතිකය දෙනවා, සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාග දෙක සඳහාම එහේ ඉගෙන ගත්තාය කියලා. හැබැයි අපි හොයලා බලනකොට සාමාන්‍ය පෙළ කරලා තිබෙන්නේ වෙනත් දිස්ත්‍රික්කයක. අපි දැන් ඒ වාගේ වංචාවලට උදව් කරපු සමහර විදුහල්පතිවරුන්ගේ වැඩ තහනම් කරලාත් තිබෙනවා. ඒ නිසා අපි එහෙම ළමයි විශ්වවිද්‍යාලයට ඇතුළු කරනකොට -අවුරුදු තුනද, පහද කියලා මට හරියටම මතක නැහැ.- හරියටම ඒ දිස්ත්‍රික්කයේ අධ්‍යාපනය ලැබුවාද කියන එක පිළිබඳව කොමිසමෙන් තහවුරු කර ගන්නවා. එහෙම වංචාවක් කළා කියලා හෙළිදරව් වුණු ළමයින්ට මේ වතාවේ ඉල්ලන්න කොමිසමෙන් අවස්ථාව දීලා නැහැ. ඒ සමහර උදවිය දැන් මූලික අයිතිවාසිකම් නඩු පවරලාත් තිබෙනවා. ඒකේ ප්‍රශ්නයක් නැහැ. හැබැයි අපි ස්ථිර ක්‍රමවේදයක් අනුගමනය කරනවා. අවුරුදු තුනද, පහද කියන එක තමයි මට මතක නැත්තේ. අවම වශයෙන් ඒ කාල සීමාව තුළ ඒ දිස්ත්‍රික්කය තුළ ඉගෙන ගෙන නැත්නම්, university admission ලබා දීමේදී අපි ඒ දිස්ත්‍රික්කයේ අපේක්ෂකයෙක් විධියට සලකන්නේ නැහැ. අපි දැන් ඒ ක්‍රමය හඳුනාගෙන ඒකට ප්‍රතිකර්ම යොදලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් තවත් දැඩි පියවර ගන්න ඕනෑ වුණොත්, ඒකත් අපි ගන්නවා. මොකද, අඩු පහසුකම් සහිත දිස්ත්‍රික්කවල දරුවන්ට අසාධාරණයක් වෙන්න දෙන්න බැහැ. ඒක සාධාරණ නැහැ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු ඇමතිතුමනි, විශ්වවිද්‍යාල ප්‍රවේශයටම සම්බන්ධ පොඩි කාරණයක් ගැන ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. ඔබතුමාගේ ව්‍යක්තීමයභාවය සහිතව උසස් අධ්‍යාපනය වෙනුවෙන් වැදගත් සේවාවක් ඉටු කරන්න ඔබතුමාට හැකියාව ලැබෙයි කියලා මම හිතනවා.

ගරු ඇමතිතුමනි, අවුරුදු 75ක් විතර තිස්සේ අපේ රටේ අධ්‍යාපන ඉතිහාසය තුළ අපි උපයා ගත්ත දැවැන්ත කීර්තියක් තමයි විශ්වවිද්‍යාල ප්‍රවේශයට දේශපාලන බලපෑම් කරන්න බැහැ කියන එක. ජනාධිපතිගේ හෝ අගමැතිගේ ලියුමක් අරගෙන ආවත් විශ්වවිද්‍යාලයට ඇතුළත් කරන්න බැහැ. මේ පිළිබඳ සම්පූර්ණ වගකීම තිබෙන්නේ, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට. දැන් සාමාන්‍ය ක්‍රමවේදයෙන් විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගන්නවාට අමතරව පාලි, දර්ශනය, ඉංග්‍රීසි වාගේ සමහර පාඨමාලා තිබෙනවා, ඒවායේ ශිෂ්‍යයින් සංඛ්‍යාව අඩු වෙනකොට ඒ විශ්වවිද්‍යාලයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දැනුම් දෙනවා, අපට තව ශිෂ්‍යයින් සංඛ්‍යාවක් ගන්න පුළුවන් කියලා. ඒ අනුව අතිරේක ප්‍රවේශයකට ඉඩකඩ සැලසෙනවා. ඒ අතිරේක ප්‍රවේශයේ තිබෙන කොන්දේසිය තමයි කිසිම හේතුවක් මත පාඨමාලාව මාරු කරන්න බැහැ කියන එක. මොකද, පාඨමාලාව මාරු කළ ගමන් සාමාන්‍ය ශිෂ්‍යයෙකුට බරපතළ අසාධාරණයක් වෙනවා. මේ ගැන එතරම් රටේ අවධානයට ලක් නොවුණාට, අතිරේක ප්‍රවේශයෙන් ඇවිල්ලා, ඊට පසුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය අරගෙන පාඨමාලාව මාරු කරලා, විශ්වවිද්‍යාලයට දැනුම් දෙනවා. මගේ ළඟ මේ තිබෙන ලේඛනය ඔබතුමාට පෙන්වන්න පුළුවන්, ගරු ඇමතිතුමනි. පසුගිය වසර දෙකේදී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි පාඨමාලාව සඳහා ඒ විධියට ඇතුළත් වුණු ශිෂ්‍ය ශිෂ්‍යාවන් කිහිප දෙනෙක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභියාචනාධිකරණ කමිටුවෙන් අවසර අරගෙන -විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතුව නොවෙයි.- පාඨමාලාව මාරු කරගෙන තිබෙනවා. එතකොට එක පැත්තකින් සාමාන්‍ය ප්‍රවේශයෙන් විශ්වවිද්‍යාලයට ඇතුළු වන ශිෂ්‍යයින්ටත් අසාධාරණයක් වෙනවා. ඒ වාගේම පාඨමාලාවටත් අසාධාරණයක් වෙනවා.

මම හිතනවා, රටේ අවධානයට ලක් නොවුණාට, මේක යම්කිසි නිලධාරින් කිහිප දෙනකු එකතු වෙලා කරන යම් ආකාරයක ඇඟිලි ගැසීමක් කියලා. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. මම ඔබතුමාට ඒ අයගේ නම් සහිත මේ ලේඛනය භාර දෙන්නම්; මෙය පරීක්ෂා කරන්න කියලා ඉල්ලනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඔබතුමාට බොහොම ස්තුතියි. එවැනි දෙයක් තිබෙනවා නම් අනිවාර්යයෙන්ම එය නිවැරදි කරන්න අපි සූදානම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කියාපු කාරණය වාගේම ඒ මාතෘකාවට අදාළව රට දැන ගතයුතු තවත් වැදගත් කරුණු කිහිපයක්ම තිබෙනවා. පසුගිය දවස්වල භික්ෂූන් වහන්සේලා විශාල සංඛ්‍යාවක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට පෙළපාළියකින් ආවා, "බෞද්ධ දර්ශනය කප්පාදු කරලා"යි කියලා විරෝධතාවක් පළ කරමින්. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, ඔබතුමා කියාපු කාරණයෙන් තමයි මේකත් මතු වෙන්නේ. මේ සම්බන්ධයෙන් මුළු රටම කැලඹීමකට ලක් කළා. භික්ෂූන් වහන්සේලා තුන් හාරසියයක් කොළඹට එකතු වෙලා, කෑ ගහගෙන, "හූ" කියාගෙන, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ ගේට්ටු කඩාගෙන ඇවිල්ලා උද්ඝෝෂණයක නිරත වුණා, අපි විශ්වවිද්‍යාලවලින් බෞද්ධ දර්ශනය කපා හැරලායි කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කිසිම විශ්වවිද්‍යාලයක බෞද්ධ දර්ශනය කපා හැර නැහැ. මම මේක ජනමාධ්‍යයෙන් පුන පුනා කිව්වා. මොකක්ද, මෙතැන වෙලා තිබෙන්නේ? විශ්වවිද්‍යාලයට ඇතුළු වන භික්ෂූන් වහන්සේලා බෞද්ධ දර්ශනය ඉගෙන ගන්න කැමැති නැහැ; ඉගෙන ගැනීම ප්‍රතික්ෂේප කරනවා. මේ ප්‍රශ්නයයි තිබෙන්නේ. මේක කනගාටුදායක තත්ත්වයක්; කථා කරන්න ලජ්ජා කාරණයක්. ඒ නිසා මොකද වෙලා තිබෙන්නේ? අපට සිද්ධ වෙනවා, එක්කෝ විශ්වවිද්‍යාලවල බෞද්ධ දර්ශන දෙපාර්තමේන්තුව පවත්වා ගෙන යන්න තව ළමයින් ටිකක් ගන්න; එහෙම නැත්නම් ඒවා වහලා දමන්න. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, මේ කාරණා දෙකෙන් එකයි නේ, අපට කරන්න පුළුවන්. දැන් මේ වතාවේත් විද්‍යෝදයේත් මට මතක විධියට පේරාදෙනියේ හෝ කැලණියේත් එහෙම ප්‍රශ්නයක් ආවා. ප්‍රමාණවත් පරිදි ශිෂ්‍යයින් නැහැ. භික්ෂූන් වහන්සේලා

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

ඉන්නවා; බෞද්ධ දර්ශනය ඉගෙන ගන්න එන්නේ නැහැ. ඔබතුමා කිව්වා වාගේම ඔතැන ඊට වැඩිය ලොකු අසාධාරණයක් පසුගිය කාලවල සිද්ධ වෙලා තිබෙනවා. සංස්කෘත, පාලි, ග්‍රීක වැනි සමහර විෂයන්වලට - දැන් බෞද්ධ දර්ශනය කියලා අපොස (උසස් පෙළ) විෂයයක් නැහැ. තිබෙන්නේ බුද්ධාගම. - ශිෂ්‍යයන් මදි වුණාම අර අතිරේක ලැයිස්තුවෙන් ගන්න කොට සමහර අය අරගෙන තිබෙනවා, Z-score එකේ අන්තිම ළමයාට වැඩිය තුන්දහසක් පහළින් ඉන්න ළමයා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක අවධානයට යොමු විය යුතු කාරණයක්. ළමයකු කොච්චර තරග කරලාද, Z-score එකේ ඉහළට එන්නේ විශ්වවිද්‍යාලයට යන්න. හැබැයි, Z-score එකේ ඉහළින් 3,000ක් ඉන්දැද්දී 3001ට ඉන්න දරුවා ඇතුළට යනවා, මා දැන් කියූ පුරප්පාඩුව ඇති වන නිසා.

අනෙක් කාරණය තමයි, ඒ ආපු අය අතර minus අයත් එනවා. ඒ කියන්නේ, Z-score එකේ plus අය නොවෙයි minus අය. මේ අවුරුද්දේ අපි මේක දුර දිග යන්න දුන්නේ නැහැ. ඒ, භික්ෂූන් වහන්සේලා පෙළපාළි ගිය නිසා නොවෙයි. ක්‍රමවේදය නිවැරදි කරන්න ඕනෑ නිසයි මම එහෙම කළේ. නැතිව පෙළපාළි ගියා කියලා, පෙළපාළියේ ඔළු ගෙඩි සංඛ්‍යාව වැඩි වුණායි කියලා අපි තීන්දු වෙනස් කරන්නෙත් නැහැ; තීන්දු ගන්නෙත් නැහැ. ඒ ගොල්ලන්ට පෙළපාළි යන්න අයිතිය තිබෙනවා, අපට තීන්දු ගන්නත් අයිතිය තිබෙනවා. ඒ නිසා අප ක්ෂණිකව එක දවසක් ඇතුළත සාකච්ඡා කරලා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඒ ගොල්ලන්ගේ සම්පූර්ණ නිදහස යටතේ තීරණයක් ගන්න ඉඩ දුන්නා. ඒ අනුව තීරණය කළා, Z-score එකේ දහස් ගණන් පහළින් ඉන්න අය නොවෙයි, බුද්ධාගම විෂයය කරලා ඉහළින්ම ඉන්න ළමයින් ටික ගන්න. ඒ ගොල්ලන්ට ඒ පීඩනයෙන්, ඒ දෙපාර්තමේන්තුවෙන් පිට යන්න බැහැ; විෂය මාරු කරන්නත් බැහැ. ඒ අනුව, අපි එක විශ්වවිද්‍යාලයකට 20 බැගින් ගත්තා. රුහුණු විශ්වවිද්‍යාලයේත් 10 දෙනකුගේ හිඟයක් තිබෙනවා. මොකද, එහෙම කළේ නැත්නම් අපට මේ පීඨ වහන්න වෙනවා. ඒවා පවත්වා ගෙන යන්න බැරි වෙනවා. ඒ නිසා විශ්වවිද්‍යාල පද්ධතිය පවත්වා ගෙන යන්න මේ තීරණය ගත්තා. මම මේ පිළිබඳව අපේ රටේ අතිපූජනීය මහා නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා පවා දැනුවත් කළා. මොකද, මේ සම්බන්ධයෙන් රටේම ජනතාව නොමඟ ගියා.

විශේෂයෙන් බෞද්ධ ජනතාව කම්පනයට පත් වුණා, බෞද්ධ දර්ශනය අපේ රටේ විශ්වවිද්‍යාලවලින් කපා හැරලායි කියලා. එහෙම දෙයක් වුණේ නැහැ. විශ්වවිද්‍යාලයට ආපු භික්ෂූන් වහන්සේලාගේ බෞද්ධ දර්ශනය පිළිපදින්න, ඉගෙන ගන්න තිබෙන නො කැමැත්ත නිසා තමයි මේ රටේ මේ කලබැගෑනිය ඇති වුණේ කියන එක සම්බන්ධයෙන් රට දැනුවත් කරන එක අපේ යුතුකමක්; වගකීමක්. විශේෂයෙන්ම අතිපූජනීය මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේලා දැනුවත් කිරීමත්, ඒ හරහා ඒ උදවියට අවශ්‍ය නිසි උපදෙස් ලබා දීමත් අපේ යුතුකමක් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කථාව අවසන් කරන්නයි යන්නේ.

මම විශේෂයෙන්ම මතක් කරනවා, අපේ රටේ විශ්වවිද්‍යාලවල ඉගෙන ගන්නා-

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

නැඹී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ගරු ඇමතිතුමනි, මා එක් කාරණයක් ඔබතුමාගේ අවධානයට ලක් කරන්න කැමැතියි. විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ ළමයින්ගේ තිබෙන ගුණාත්මකභාවයේ පිරිහීම, ඒ වාගේම අපේ රටට අවශ්‍ය බුද්ධිමතුන් තනා ගන්න බැරි තත්ත්වයක් නිර්මාණය වීම පිළිබඳව දැන් ඔබතුමා ලොකු විග්‍රහයක් කළා. ඔබතුමා ඒ ගැන අවධානය යොමු කරලා ඉදිරි කාලයේදී ඒ තත්ත්වය වෙනස් කරන්න ක්‍රියා කරයි කියලා මම හිතනවා. මම ඔබතුමාට එකක් කියන්න ඕනෑ. ඔබතුමා කිව්වා වාගේ ඒ කාලයේ අපේ රටේ විශ්වවිද්‍යාල තුළ පාලි, සංස්කෘත, පෘතුගීසි වැනි භාෂා සඳහා පාඨමාලා තිබුණා. උදාහරණයක් හැටියට මම විද්‍යෝදයේ -ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ- ඉගෙන ගන්න කොට එහි පාඨමාලාවක් තිබුණා, පෙරදිග භාෂා හා සිංහල කියලා. මම හැදෑරුවේත් එයයි. මම ආර්ථික වටිනාකම් තිබෙන විෂයයන් හදාරන්න ගියේ නැහැ. සිංහල විෂයය ගැඹුරින් හදාරන කොට අර භාෂාවට සංකලනය අවශ්‍යයි. අද ඒ වටිනාකම සරසවි තුළ අහිමි වෙලා තිබෙනවා. උදාහරණයක් කිව්වොත් අද පංච තන්ත්‍රය, හිතෝපදේශය, සාහිත්‍ය දර්පණ යනාදී සංස්කෘත විෂයයන් ඉගෙන ගන්න තිබෙන අවස්ථාව අඩුයි. කලාව, සංස්කෘතිය, ඒ වාගේම භාරත සංස්කෘතිය වැනි දේවල්වල දැනුම අවශ්‍යයි සංවේදී මිනිසෙකු හැදෙන්න. ඇත්ත වශයෙන්ම අධ්‍යාපනය තුළින් ඒ සංවේදීත්වය අපි වෙනස් කරන්න ඕනෑ. ඒකට නීති රීති දමා හරියන්නේ නැහැ. අධ්‍යාපනය ගුණාත්මක වෙනසකට ලක් කරන්න ඕනෑ. ඒ වාගේම අධ්‍යාපනය සම්බන්ධයෙන් විධිමත්භාවයකින් සැලසුම් කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා.

බෞද්ධ දර්ශනය ඉගෙන ගන්න ස්වාමීන් වහන්සේලා කැමති නැහැ, එම නිසා ඒ පාඨමාලා වෙනස් කර ගෙන යනවාය කියලා දැන් ඔබතුමාම කියනවා නේ?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඔව්.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

ඊට හේතුව, මේ රටේ තිබෙන ආර්ථික ක්‍රමවේදයට අනුව ඒවාට වටිනාකමක් නොලැබීමයි. එම නිසා උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ එවැනි විෂයයන් -පුරා විද්‍යාව වැනි විෂයයන් -හදාරන අයටත්, රට ඇතුළේ වටිනාකමක් ලබා දෙන ක්‍රමවේදයක් සැකසෙන්න ඕනෑ. එහෙම නැත්නම් ඒ විෂයයන් හැදෑරීමෙන් කිසිදු ඵලක් වන්නේ නැහැ. ස්වාධීන බුද්ධිමතෙකු විධියට යමක් කියලා යමක් ලියලා මිනිසුන්ට දැනුම දෙන එක තමයි ඇත්ත වශයෙන්ම කළ යුතු වන්නේ. මහාචාර්ය බලගල්ල මෑතිතුමා පීඨාධිපති හැටියට සිටි වෙලාවේ තමයි මම විද්‍යෝදයේ -ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ- ඉගෙන ගත්තේ. එවැනි විද්වතුන් සම්බන්ධ කර ගෙන මිනිසෙකු සංවේදීත්වයට පත් කරන්නේ කොහොමද කියලා අපි සොයා බැලිය යුතු වනවා. ඒ සඳහා සාහිත්‍යමය වශයෙන් සහ විවිධ භාෂාවලින් උකහා ගත යුතු දේත්, විවිධ රටවල තිබෙන කලා මාධ්‍යයනුත් අපි ප්‍රයෝජනයට ගන්නේ කොහොමද කියන එක ගැන අපි සොයා බැලිය යුතුයි. විශේෂයෙන්ම සංස්කෘත භාෂාව, පාලි භාෂාව හා ඊට අදාළ

වෙනත් භාෂා සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් සකස් කර අංග සම්පූර්ණවම ඒ විෂයයන් පාසල් පද්ධතියටවත් මූලික වශයෙන් ඇතුළු කර ඒ දැනුම ලබා දෙන්න ක්‍රියා කළොත් අපට සංවේදී සමාජයක් හදන්න පුළුවන් වෙයි. එම නිසා ඔබතුමාගේ අවධානය ඒ වෙනුවෙන් යොමු කරන්න කියන ඉල්ලීම මා කරනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. එතුමා කිව්ව කාරණය පිළිබඳව අප සියලුදෙනාම අවධානය යොමු කළ යුතුයි. අද අපේ අධ්‍යාපන ක්‍රමය තුළ ගුණාත්මක පුද්ගලයෝ නිර්මාණය වනවා හරි අඩුයි. මීට අවුරුදු 30කට, 40කට පෙර විශ්වවිද්‍යාලයක් ගත්තාම හැම විශ්වවිද්‍යාලයක්ම වාගේ සෞන්දර්යය විශ්වවිද්‍යාලයක් වුණා. වෛද්‍ය පීඨයේ ඉගෙන ගත්තත්, ඉංජිනේරු පීඨයේ ඉගෙන ගත්තත් හැම දරුවෙකුගේම ඇහේ කලාව තිබුණා; සාහිත්‍ය තිබුණා. ඒ දරුවන් ඒ විෂයයන් ගැනත් උනන්දුවක් දැක්වූවා. අද ඒවා මොනවාවත් නැහැ. මා ළඟදීත් මගේ කථාවකදී කිව්වා, 'සෞන්දර්යය විශ්වවිද්‍යාලය' කියලා වෙනම විශ්වවිද්‍යාලයක් විවෘත කරන්න තරම් අපි අවාසනාවන්ත වෙලා තිබෙනවාය කියලා. අපේ රටේ තිබුණු අපි ඉගෙන ගත් පාසල් ඒ කාලයේ කලාගාර වශයෙන් අපට හඳුන්වන්න පුළුවන්. අපේ ගුරුවරුන්ට ඒ දැනුම තිබුණා. ඔවුන් කලාව අපේ ලේවලට ඇතුළු කළා. අද වාණිජ ක්‍රමය තුළ පාසල් පද්ධතිය තුළවත් ඒ දේ සිදුවෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට හොඳම උදාහරණයක් මා කියන්නම්. එදා විශ්වවිද්‍යාල තුළින් මොන තරම් වටිනා නිර්මාණ, කවි, විරහ ගී, ගායනා බිහි වුණාද? එදා තිබුණු සංස්කෘතිය තුළ ගැහැනු ළමයෙකුයි, පිරිමි ළමයෙකුයි යාළු වෙලා ඉඳලා තරහා වුණත්, එතැන හොඳ විරහ වේදනාවක් තිබුණා. ඒ ළමයා ගෙදර එන්නේ, "නුඹ පෙම් කරනා නුඹේ කුමාරිය මට ද ආදරෙයි කියා තිබේ..." කිය කියායි. ඒ කතාන්දරය එතැනින් ඉවරයි. හැබැයි, අද මොකද වෙන්නේ? අද පෙම් කරනා ගැනු ළමයා හෙට අයින් වුණොත් පිරිමි ළමයා පහුවෙනිදාට ගේන්නේ කිනිස්ස. හදවත දෙපළු වෙන්න ඇනලා තමයි තමන්ගේ ආදරය පෙන්වන්නේ. ඇයි ඒ?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

දැන් කියන්නේ, "රුවිරාණනී අහන්න - එකපාර මා මරන්න....." කියලායි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඔව්. "රුවිරාණනී අහන්න - එකපාර මා මරන්න....." කියලායි. මොකක්ද මේ රටට වෙලා තිබෙන්නේ? අපේ රටේ විශ්වවිද්‍යාල විකෘති වෙලා නැද්ද; උඩු යටිකුරු වෙලා නැද්ද? ඇයි මේකට හේතුව? මේකට හේතුත් මම ගරු මන්ත්‍රීතුමන්ලාට කියන්නම්. පළමුවැනි හේතුව තමයි, අපි ඉගෙන ගන්න කාලයේ සාමාන්‍ය පෙළට සාහිත්‍ය අත්‍යවශ්‍යයි; අනිවාර්යයි. අද සාහිත්‍යයක් නමට තිබෙන්නේ. අද සාහිත්‍ය ගැඹුරින් උගන්වන්නේ නැහැ. උසස් පෙළට යනකොට කවුරුවත් සාහිත්‍ය ඉගෙන ගන්න උනන්දුවක් නැහැ. අද විශ්වවිද්‍යාල පද්ධතියට අපට කරන්න ඕනෑ දේ මෙයයි. විශේෂයෙන්ම මම කියපු කලා සහ කළමනාකරණ දෙපාර්තමේන්තුවල ශිෂ්‍යයන්ට දැන් තිබෙන විෂය මාලාවේ විෂය පථය ප්‍රමාණවත් වන්නේ මාස 3කට, 4කටයි. මේ උදවියට සිංහල සාහිත්‍ය, කලාව, ඉංග්‍රීසි සාහිත්‍ය කියන තුනෙන්ම වාරයෙන් වාරයට විභාග තිබෙන්න ඕනෑ. විශ්වවිද්‍යාලවලදී ඇයි නිකම් කාලය -ජීවිතයේ වටිනාම කාලය- නාස්ති කරන්නේ? සාහිත්‍ය ඉගෙන ගන්න දවසකට පැය දෙකක්, තුනක් වැය කළොත් කොච්චර තෘප්තියක් ලැබෙනවාද? සමාජයට යනකොට මොන තරම් බුද්ධිමතෙක් විධියටද එළියට යන්නේ? නිකම්ම නිකම් උපාධිකාරයෙක් විධියට සහතිකය කිහිල්ලේ ගහගෙන යන එකේ ඵලක් තිබෙනවාද? ඒක නිසා මේවා සියල්ල ප්‍රතිසංවිධානය කරලා, අලුතින් සංශෝධනය කරලා විෂය මාලා හඳුන්වාදීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ පිළිබඳව මම උපකුලපතිතුමන්ලා එක්කත් දිගින් දිගටම සාකච්ඡා කළා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

අද සිංහලෙන් හරියට වැකියක් ලියන්න පුළුවන් පරම්පරාවක් ඇති වෙන්නේ නැහැ. අපේ භාෂාව මළ භාෂාවක් වේවි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඇත්ත. ඒ තත්ත්වය වළක්වා ගන්න,- [බාධා කිරීමක්] - ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට දීර්ඝ කථාවක් කරන්න කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මේ පනත් කෙටුම්පත සම්මත කරගැනීම සඳහා ගෞරවනීය මැති ඇමතිවරුන්ගේ සහයෝගය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ඇමතිතුමනි, ඔබතුමා කලේ බොහොම වැදගත්, ඒ වාගේම අත්‍යවශ්‍ය කථාවක්.

The next speaker is the Hon. I. Charles Nirmalanathan. You have got 20 minutes.

[மு.ப. 11.45]

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, வாய்ப்புக்கு நன்றி. தாங்கள் பிரதிச் சபாநாயகராகத் தெரிவுசெய்யப்பட்டதன் பின்பு கிடைத்த முதல் சந்தர்ப்பமாக இதனை நான் கருதுகின்றேன். இன்று தேசிய பாதுகாப்பு நிதியம் (திருத்தம்) சட்டமூலம் சபையில் சமர்ப்பிக்கப்பட்டிருக்கின்றது. இன்னொரு நாட்டின் பாதுகாப்பைவிட எங்களுடைய நாட்டின் பாதுகாப்பு முக்கியமானது. அதேநேரம் இலங்கை உள்நாட்டுப் பாதுகாப்பின் நிமித்தம் பல இழப்புக்களை, துன்பங்களைச் சந்தித்திருக்கின்றது. ஆனால், 2009 ஆம் ஆண்டு யுத்தம் முடிந்த பின்பும் பாதுகாப்புக்கு அதிக நிதி ஒதுக்கப்பட்டு வருகின்றது. அந்த நிதிகள் எந்த வகையில் பயன்படுத்தப்படுகிறதென்பது புரியாத புதிராகவே தொடர்கின்றது.

இந்த நாட்டினுடைய பாதுகாப்பு அமைச்சரான மேதகு ஜனாதிபதி அவர்கள் எங்களுடைய மக்களுக்குப் பல வாக்குறுதிகளைத் தந்திருக்கிறார். அவர் நாட்டின் ஜனாதிபதியாக, பாதுகாப்பு அமைச்சராக இருக்கின்ற போதிலும், அவருடைய பல வாக்குறுதிகள் இன்னும் நிறைவேற்றப்படாத சூழ்நிலை இருக்கின்றது. அதில் அரசியல் கைதிகள் தொடர்பான விடயத்தை ஜனாதிபதி அவர்களுடைய கவனத்திற்குக் கொண்டுவர விரும்புகின்றேன். நாட்டில் யுத்தம்

[ගරු ඉ. වාල්ස් නිර්මලනාදන් මහතා]

நடைபெற்றது. ஓர் இனத்தைச் சேர்ந்த மக்களின் உரிமைகள் மறுக்கப்பட்டபோது, அந்த உரிமைக்காகவே குறித்த இளைஞர்கள் ஆயுதமேந்திப் போராடினார்கள். ஆகவே, இந்தப் பிரச்சினை அரசியல் ரீதியாகத் தீர்த்துவைக்கப்பட வேண்டிய ஒரு விடயமாகும். புதிய அரசாங்கம் அமைக்கப்பட்டபோது அரசியல் கைதிகளுடைய விடுதலை தொடர்பாக ஜனாதிபதி அவர்கள் பலமுறை வாக்குறுதி அளித்திருக்கின்றார். ஆனால், குறித்த அரசியல் கைதிகள் இன்று வரை அரசியல் ரீதியான தீர்மானம் ஒன்றின்மூலம் விடுவிக்கப்படவில்லை. ஒரு சில கைதிகள் சட்டத்தரணிகள்மூலம் விடுவிக்கப்பட்டிருக் கிறார்கள். காரணம் குறித்த கைதிகளின் சார்பில் குற்ற ஒப்புதல் வாக்குமூலம் மட்டுந்தான் சாட்சியமாக இருந்தது. இந்த நிலையில், பணம் படைத்த, பணத்தைப் புரட்டக்கூடிய ஒரு சில அரசியல் கைதிகள் மட்டும் சட்டத்தரணிகளுக்குக் கட்டணம் செலுத்தி, குறித்த வழக்கிலிருந்து விடுவிக்கப்பட்டிருக்கின் றார்களேயொழிய வேறில்லை.

மேதகு ஜனாதிபதி அவர்களின் அரசியல் ரீதியான நகர்வின்மூலம் இன்றுவரை ஒரேயொரு கைதி மட்டுமே விடுதலை செய்யப்பட்டிருகிறார். அவரைக் கொல்ல வந்ததாக அந்தக் கைதி மீது குற்றஞ்சுமத்தப்பட்டிருந்தது. அண்மையில் கிளிநொச்சியைச் சேர்ந்த ஆனந்த சுதாகரனுடைய பிள்ளைகள் ஜனாதிபதியை நேரடியாகச் சந்தித்து, தங்களுடைய தந்தையை விடுதலை செய்யுமாறு கேட்டிருந்தார்கள். அதற்கு "புது வருடத்திற்கு முன்பு உங்களின் அப்பா உங்களுடன் இருப்பார்" என்று ஜனாதிபதி அவர்கள் உறுதியளித்திருந்தார். ஆனால், இன்று புதுவருடம் முடிந்துவிட்டபோதிலும் அவர் விடுதலை செய்யப்படவில்லை. ஆகவே, அவர் எந்தப் புதுவருடத்தைக் குறிப்பிட்டார் என்பது எனக்குத் தெரியவில்லை. எதிர்வரும் 18 ஆம் திகதி மேதகு ஜனாதிபதி அவர்கள் தேசிய சிறுவர் பாதுகாப்புத் தொடர்பில் கிளிநொச்சிக்கு விஜயம் செய்ய விருக்கிறார். நான் இச்சந்தர்ப்பத்தில் மாண்புமிகு ஜனாதிபதி அவர்களிடம் ஒரு கோரிக்கையை முன்வைக்கின்றேன். அதாவது, கிளிநொச்சி மாவட்டத்தைச் சேர்ந்த ஆனந்த சுதாகரனின் பிள்ளைகளுக்குக் கொடுத்த வாக்குறுதியை நிறைவேற்றும்முகமாக அவரை விடுதலை செய்ய வேண்டும். அதேபோன்று பல அரசியல் கைதிகள் இன்னும் சிறையிலிருக்கிறார்கள். அவர்களுடைய பிள்ளைகளும் சிறுவர்களாக இருக்கின்றார்கள். ஆகவே, அவர்களுடைய மன ஏக்கங்களைப் புரிந்து அவர்களுடைய கல்வியை, குடும்ப வாழ்க்கையை மேம்படுத்த வேண்டும். அப்பொழுதுதான் ஜனாதிபதியினுடைய கிளிநொச்சி வருகையை மக்கள் வரவேற்பார்கள் என்பதை இங்கு தெரிவித்துக் கொள்கின்றேன். மேதகு ஜனாதிபதி அவர்கள் வாக்குறுதி அளித்ததன் அடிப்படையில், ஆனந்த சுதாகரனையாவது 18ஆம் திகதிக்கு முதல் விடுதலை செய்ய வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று பாதுகாப்பு அமைச்சானது, தேசிய பாதுகாப்பு என்று கூறிக்கொண்டு, வடக்கு, கிழக்குப் பிரதேசத்தின் பல இடங்களில் இராணுவத்தினரைக் கொண்டு சுற்றுலா விடுதிகளையும் சுற்றுலா மையங்களையும் மற்றும் தேநீர்க் கடைகளையும் மரக்கறி விற்பனை நிலையங்களையும் அபிவிருத்தி செய்து வருகிறது. அதேநேரம் வடக்கில் இருக்கின்ற இராணுவத்தின் சுற்றுலா விடுதிபோல, வேறெங்கும் காணவில்லை. கடந்த வருடம் நான் முள்ளிக்குளம் கடற்படை முகாமுக்குச் சென்றிருந்தேன். அங்கும் சுற்றுலா விடுதி காணப்பட்டது. ஆகவே, இன்று பாதுகாப்புக்கு அதிக நிதி ஒதுக்கப்படுகிறது. ஆனால், வடக்கில் மிகப் பெரிய சுற்றுலா மையங்களை இராணுவம் அமைத்துக்கொண்டிருக்கிறது. அந்த வகையில் தேசிய பாதுகாப்புக்கு ஒதுக்கப்படுகின்ற நிதியில் சுற்றுலா மையங்கள் அமைக்கப்படுகின்றன. அதாவது அந்த மக்களுக் குரிய காணிகளைத் தேசிய பாதுகாப்புக்குத் தேவை என்று எடுத்து, அவற்றில் சுற்றுலா விடுதிகளை அமைக்கின்றார்கள்.

உதாரணமாக ஒன்றைக் கூறுகின்றேன். மன்னார் மாவட்டத்தில் தாழ்வுபாடு என்ற கிராமத்தில் யுத்தம் முடிவதற்கு முன்பு ஒரு கடற்படை முகாம் இருந்தது. அதேநேரம் அங்கு கடந்த வருடமும் புதிதாக ஒரு கடற்படை முகாம் அமைக்கப்பட்டிருக்கின்றது. இதனால் அந்தக் கடற்கரைப் பிரதேசத்தில் கரைவலைகளை இழுக்கின்ற இரண்டு பிரதேசங்களைக் கடற்படை அபகரித்து வைத்திருக் கின்றது. ஆனால், இந்த இடம் யுத்தம் முடிவடைய முன்பு அபகரிக்கப்படவில்லை. மாறாக, 2017ஆம் ஆண்டுதான் அபகரிக்கப்பட்டது. அதாவது 2009ஆம் ஆண்டு யுத்தம் முடிவடைந்தது. 2017ஆம் ஆண்டு கடற்படை அந்தப் பிரதேசத்தை அண்மித்துச் சுற்றுலா விடுதி மையத்தை அமைத்திருக்கின்றது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நான் மன்னார் மாவட்டக் கடற்படை அதிகாரியுடன் இது தொடர்பாகக் கதைத்தபோது, "இந்த முகாம் தேசிய பாதுகாப்புக்குத் தேவை" என்று அவர் கூறினார். கடற்படைக்கு 2009ஆம் ஆண்டுக்கு முன்னர் தேவைப்படாத அந்த இடம் எப்படி 2017ஆம் ஆண்டு தேவைப்பட்டது? அதேநேரம் 2009ஆம் ஆண்டு யுத்தம் முடிவதற்கு முன்பு அங்கு அமைந்திருந்த கடற்படை முகாமை அகற்றுமாறு நாங்கள் கேட்கவில்லை. ஆனால், 2017ஆம் ஆண்டு தேசிய பாதுகாப்பு என்ற வகையில் புதிதாக அங்கு ஏன் கடற்படை முகாமை அமைத்தீர்கள்? என்றுதான் கேட்கின்றோம். "கடற்படை முகாம் அமைப்பது தொடர்பில் விமர்சனம் இல்லை. ஆனால், மீனவர்கள் மீன்பிடிப்பதற்குரிய அனுமதியைக் கொடுங்கள்" என்று குறித்த கடற்படை அதிகாரியிடம் நான் கூறினேன். கடற்றொழில் திணைக்களம் அந்தப் இடத்தில் இரண்டு கரைவலைப்பாடுகளுக்கான அனுமதியை கடந்த 20 வருடங்களாக வழங்கிவருகின்றது; வருடா வருடம் புதுப்பித்துக் கொண்டிருக்கின்றது. அதேநேரம், மீனவர்கள் தொழில்புரிவதற்கு இடையூறில்லாத வகையில் கடற்கரையிலிருந்து 100 மீற்றர் தூரத்தில் முகாமை அமைக்குமாறும் நான் அண்மையில் கேட்டிருந்தேன். அதனை அனுமதிக்க முடியாதென்று அவர் கூறினார். ஆகவே, இராணுவத்தின் மற்றும் கடற்படையின் இவ்வாறான செயற்பாடுகள் தொடர்பாக யாரிடம் நாங்கள் முறையிடுவது என்று தெரியவில்லை. ஏனென்றால், குறித்த விடயம் தொடர்பில் அங்கிருக்கின்ற அதிகாரிகளிடம் கதைக்கின்ற போது -

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ආරක්ෂක අරමුදලට අදාළ වූ වැදගත් සාකච්ඡාවක් මේ පාර්ලිමේන්තුවේ දැන් දියත්

වෙමින් තිබෙනවා. මේ සම්බන්ධයෙන් මේ මන්ත්‍රීවරුන් අසන ප්‍රශ්නවලට උත්තර දෙන්නේ කවුද කියලා මම දැන ගන්න කැමැතියි.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
උත්තර දෙන්න කවුරුවත් නැහැ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
එක්කෝ ජනාධිපතිවරයා ඉන්න ඕනෑ, නැත්නම් ආරක්ෂක රාජ්‍ය ඇමතිවරයා ඉන්න ඕනෑ. මේ මන්ත්‍රීවරුන් රටේ ආරක්ෂාව, ජාතික ආරක්ෂාව, උතුරේ සහ රටේම ජනතාවගේ දෛනික ප්‍රශ්න පිළිබඳව අවධානය යොමු කරන මේ වේලාවේ, ආණ්ඩු පක්ෂයෙන් ඒ සම්බන්ධයෙන් උත්තර දෙන්න බැඳී සිටින්නේ කවුද කියලා මම දැන ගන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)
උත්තර දෙන්න අවශ්‍ය ප්‍රශ්නය මොකක්ද කියලා, ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමාගෙන් මම අහන්න කැමැතියි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු සභානායකතුමනි, මෙතුමා දැන් ප්‍රශ්න ගණනාවක් ඇසුවා. ඉදිරියේ දී තවත් කථිකයන් එවැනි ප්‍රශ්න අහන්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට මේ ගැන තේරෙනවා ඇති. මේ විෂයට අදාළ ප්‍රශ්න ගණනාවක් ඒ ඒ මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරනවා. ගරු සභානායකතුමනි, ඔබතුමා ඒවාට උත්තර දෙන්න භාර ගන්නවා නම් ප්‍රශ්නයක් නැහැ. නමුත් මෙය ඔබතුමාගේ විෂය නොවෙයි. ඔබතුමාට වඩා පිළිතුරු ලබා දිය හැකි ආරක්ෂක රාජ්‍ය ඇමතිවරයෙක් ඉන්නවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලි ප්‍රශ්නයක් තිබෙනවා නම් අපට උත්තර දෙන්න පුළුවන්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මෙතුමා දැන් මෙච්චර වෙලා ඉදිරිපත් කරපු ප්‍රශ්න ටික තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමනි, ඔබතුමා ප්‍රශ්නය අහන්න. මම උත්තර දෙන්නම්.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ගරු ඇමතිතුමනි, 2009දී Navy camp එකක් තාල්පාඩුවල තිබුණා. 2017දී -ගිය අවුරුද්දේ- ඒ ගමේ ආයෙත් Navy camp එකක් අලුතින් පටන් ගත්තා. එම ප්‍රදේශයේ සිටින, Commander, North Western Naval Areaගෙන් මම ඒ ගැන ඇහුවාම, ඒ ගොල්ලන් කිව්වා "தேசிய பாதுகாப்பு" කියලා. 2009දී ඒ ප්‍රදේශයට Navy camp එකක් ඕනෑ නැහැ. 2017දී මොකටද, අතනට Navy camp එකක්? මම කිව්වා, "ඔය ගොල්ලන් Navy camp එකක් දැම්මාට කමක් නැහැ. මුහුදු රක්ෂාව කරන කට්ටියට ඒ රක්ෂාව කරන්න පුළුවන් විධියට ඉඩ දෙන්න" කියලා. අවුරුදු දෙකකදී මාදැල් ධීවරයින්ට පාඩු වුණා. එක මාදැලකින් ධීවරයින් 40 දෙනෙකු පමණ ප්‍රයෝජන ගන්නවා, families 80ක් ඉන්නවා. ඒ ගොල්ලන්ගේ ඔක්කෝම නැති කරලා ඒ Navy camp එක දැනට හදනවා, මන්නාරම දිස්ත්‍රික්කයේ තාල්පාඩු ප්‍රදේශයේ. එතැනින් මීටර් 100ක් ඒ ගොල්ලන්ට මුහුදු රස්සාව කරන්න දීලා එයින් එහා පැත්තේ දමන්න කියලා කිව්වා. එතකොට ඒ ගොල්ලන් කිව්වා, "ඒක coastal area. ඔයගොල්ලන්ට සම්බන්ධ නැහැ" කියලා.

Member of Parliament කෙනෙක් Forest Department එකට කථා කළොත්, "ඔයගොල්ලන්ට සම්බන්ධ නැහැ" කියලා කියනවා. Coastal area සම්බන්ධව එහෙම කියනවා. Army එකේ තිබෙන ප්‍රශ්න ටික කථා කරන්න අපට කවුරුවත්, කොහේවත් නැහැ. Commander, North Western Naval Areaගෙන් මම මේ ගැන ඇසුවා. "මම එන්නම්. මට විනාඩි පහක් දෙන්න. මම මේ ගැන පැහැදිලිව කියන්නම්" කියලා මම කිව්වා. එතකොට ඒ ගොල්ලන් කිව්වා, මන්නාරමේ සිටින Commander, North Western Naval Area හමුවෙන්න ආරක්ෂක අමාත්‍යාංශයට ගිහිල්ලා permission අරගෙන එන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මා දන්නා තරමින් State Minister of Defence මේ වනවිට ආරක්ෂක සම්මන්ත්‍රණයක් සඳහා විදේශගත වෙලායි සිටින්නේ. ඔබතුමා දැන් මතු කළ කාරණා සම්බන්ධයෙන් අපේ සභානායකතුමා දැනුවත් කරන්න. ගරු සභානායකතුමනි, ඒ අනුව මෙතුමාට පිළිතුරක් ලබා දෙන්න වැඩ පිළිවෙළක් සකස් කරන්න පුළුවන්ද?

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
Commander of the Navy හමුවෙන්න වේලාවක් ලබා දුන්නොත් ඇති.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා Navy එකේ ප්‍රධානියෙක් හමුවෙන්න වේලාව ඉල්ලුවාම කිව්වාලු, ආරක්ෂක අමාත්‍යාංශයෙන් අවසර අරගෙන එන්න කියලා. එහෙම නම් කරන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මොකද, මන්ත්‍රීවරයෙකුට Commander of the Navy හෝ Commander of the Army හෝ පොලීසියේ ඉහළ නිලධාරියෙකු හමුවෙන්න අවශ්‍ය නම්, එතුමාට වේලාවක් ලබා දෙන්න ඕනෑ. කොහොම වුණත් මම ගරු නිර්මලනාදන් මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නය -

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
Commander, North Western Naval Area හමුවෙන්න අපට වේලාවක් ලබා දුන්නා නම් ඇති. ඒ ප්‍රදේශයට ගිහින්, ඇති වී තිබෙන ප්‍රශ්නය ගැන සොයා බලා, කථා කරලා අවසන් කර ගන්න ඕනෑ. අපි කථා කළාම කියනවා, "ඔයගොල්ලන් ආරක්ෂක අමාත්‍යාංශයෙන් අවසර ගන්න" කියලා. මේ ප්‍රදේශය සම්බන්ධව කථා කරන්න ඕනෑය කියලා මම ආරක්ෂක අමාත්‍යාංශයට ලියුමක් ලිව්වා. උත්තර ආවේ නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මන්ත්‍රීවරයෙක් වේලාව ඉල්ලුවාම, එතුමාට අවස්ථාව ලබා දෙන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඇත්ත වශයෙන්ම මන්ත්‍රීවරයෙකුට ආරක්ෂක අමාත්‍යාංශයෙන් අවසර අරගෙන එන්න කියලා නාවික හමුදාවටවත්, පොලීසියටවත් කියන්න බැහැ.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
පොලීසියේ අවුලක් නැහැ. පොලීසියෙන් කථා කරනවා. Army සහ Navy අයගේ තමයි ප්‍රශ්නය තිබෙන්නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මෙවැනි පන්නයේ උත්තර දෙන්න පුළුවන්. මම ගරු සභානායකතුමා අපහසුතාවට පත් කරනවා නොවෙයි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම පිළිගන්නවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
සාමාන්‍යයෙන් ඇමතිවරයෙකුට ඔහොම උත්තර දෙන්න පුළුවන්. නමුත් මේක වැදගත් විවාදයක්. අපි ජනතාවගේ මුදල් ලක්ෂ ගණනක් දවසකට වියදම් කරගෙන තමයි මෙවැනි වැදගත් මාතෘකා ගැන සාකච්ඡා පවත්වන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැයෙන් වැඩිම මුදල් ප්‍රතිපාදනයක් වෙන් වන්නේ ආරක්ෂක අමාත්‍යාංශයට. එසේ තිබියදීත්, මේ ප්‍රශ්නවලට උත්තර දෙන්න ඇමතිවරයෙක් නැහැ. සභානායකතුමා "මම වාර්තා කරන්නම්" කියලා කිව්වාට, ඇත්තටම ඒකට සභානායකතුමා ඕනෑ නැහැ. ඒක clerk කෙනෙකුට වුණත් කරන්න පුළුවන්. මේ විවාදය පවත්වාගෙන යෑමේ තේරුම මොකක්ද කියලායි මම අහන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම ඒක පිළිගන්නවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මන්ත්‍රීවරයෙක් සාකච්ඡාවක් සඳහා ආරක්ෂක අංශ ප්‍රධානියෙකුගෙන් ඉල්ලීමක් කළාම, ආරක්ෂක අමාත්‍යාංශය හරහා එන්න කියලා ඒක ප්‍රතික්ෂේප කරන්න බැහැ, ඒකට ඉඩ දෙන්න ඕනෑය කියලා අපේ සභානායකතුමා ඉතාම පැහැදිලිව කිව්වා. ඇත්ත වශයෙන් වහාම එම තත්ත්වය සම්බන්ධයෙන් ගත හැකි පියවරක් ඔබතුමාගේ මට්ටමෙන් තිබෙනවාද කියලා මම දැනගන්න කැමැතියි. ඒ පළමුවැනි කාරණය.

දෙවෙනි කාරණාව තමයි, මන්ත්‍රීවරයෙක් එවැනි සාකච්ඡාවක් ඉල්ලන්නේ හදිසි තත්ත්වයක් යටතේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මම ඒක පිළිගන්නවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ආරක්ෂක අමාත්‍යාංශය හරහා එන විට එම තත්ත්වය වෙනස් වෙනවා. එම නිසා දැන් ඒ සම්බන්ධයෙන් ගත හැකි ක්‍රියාමාර්ගයක් තිබෙනවා නම් ඔබතුමා ප්‍රකාශ කරන්න, එතකොට එතුමා හෙටම ගිහිල්ලා ඒ ගැන කරුණු පැහැදිලි කරයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. ගරු සභානායකතුමනි, ඔබතුමා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කාරණා කටයුතු සිදු කරන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒ වාගේම, මම කියන්නට ඕනෑ ඇමතිවරුන් සහ නියෝජ්‍ය ඇමතිවරුන් සභාවේ සිටිය යුතු බව. ගරු අගමැතිතුමාත් කියලා තිබෙනවා පාර්ලිමේන්තුවේ වැඩවලට ප්‍රමුඛතාව දෙන්න කියලා. ගරු අගමැතිතුමා ඒ බව පැහැදිලිව කියලා තිබෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ජනාධිපතිතුමා පොරොන්දු වුණා නේ පාර්ලිමේන්තුවට වග කියන්නම් කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
අපි ඒ පිළිබඳව දිගින් දිගටම සාකච්ඡා කිරීම අවශ්‍ය වෙන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමනි. අවශ්‍ය වැඩ පිළිවෙළ අපි ඉදිරියේ දී කරන්නම්. යම් කාරණයක් සාකච්ඡා කරන්නට තිබෙනවා නම්, ඒ සාකච්ඡාවට සම්බන්ධ වන්න ගරු ඇමතිවරයා හෝ නියෝජ්‍ය ඇමතිවරයා මේ ගරු සභාවේ රැඳී සිටින ආකාරයේ වැඩ පිළිවෙළක් අපි ඉදිරියේදී ක්‍රියාත්මක කරන්නම්.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මේ කාරණය සම්බන්ධවද ගරු මන්ත්‍රීතුමා? [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමා, මම ඒ පිළිබඳව ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කර, අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්නම්. [බාධා කිරීමක්] Hon. Nirmalanathan, you can continue with your speech.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நன்றி.

இந்த விடயங்கள் தொடர்பாக எமது பிரதேசங்களில் பல குழப்பங்கள் நிலவுகின்றன. அப்போதிருந்த கடற்படைத் தளபதி 2016ஆம் ஆண்டு முள்ளிக்குளம் கிராமத்திற்கு வந்து கடற்படை முகாம்கள் தொடர்பில் வாக்குறுதி ஒன்றை வழங்கினார். அதாவது, "இன்னும் ஆறு மாதங்களில் குறித்த பிரதேசங்களை விடுவிப்போம்" என்று வாக்குறுதியளித் திருந்தார்.

அப்போதிருந்த மன்னார் மறை மாவட்டக் குரு முதல்வர், சட்டத்தரணிகள், கடற்படைத் தளபதி, மற்றும் பாராளுமன்ற உறுப்பினர்கள், பாதுகாப்பு இராஜாங்க அமைச்சர் உட்படச் சம்பந்தப்பட்ட எல்லோருமே அந்தக் கூட்டத்தில் கலந்து கொண்டு, அவ்விடயங்கள் தொடர்பில் ஆராய்ந்து முடிவெடுக்கப்பட்டது. ஆனால், அந்த முடிவில் மூன்றில் ஒரு பங்குதான் இதுவரை நடைமுறைக்கு வ்நதுள்ளதே ஒழிய, இன்னும் இரண்டு பங்கு விடயங்கள் நடைமுறைக்கு வரவில்லை. நான் இது குறித்துச் சம்பந்தப்பட்ட கடற்படைத் தளபதியுடன் தொடர்புகொண்டபோது, "தற்போது, நான் கடற்படைத் தளபதியில்லை; எனக்குப் பிறகு பதவியில் வந்த கடற்படைத் தளபதியிடம் அது பற்றிக் கதையுங்கள்" என்று கூறினார். அவருக்குப் பிறகு இரண்டு தளபதிகள் இடமாற்றம் பெற்றுவிட்டார்கள். ஆனால், இன்னும் அது தொடர்பான எந்தவிதமான விளக்கங்களும் அளிக்கப்படவில்லை. இதனால் இதுகுறித்து மேலும் என்ன கதைப்பது என்பது எனக்குத் தெரியாமலிருக்கின்றது. நான் ஏற்கனவே கூறியதுபோன்று குறித்த விடயங்கள் தொடர்பில் நேரடியாக அதிமேதகு ஜனாதிபதி அவர்களை நாங்கள் சந்திக்க முடியாது. ஆனால், மாவட்டங்களிலிருக்கின்ற பிரச்சினைகள் தொடர்பில் அந்தத் தளபதிகளுடன் அல்லது மாவட்ட அதிகாரிகளுடன் கலந்தாலோசிப்பதற்குச் சந்தர்ப்பம் தருவதாகக் கூறப்பட்டது.

மன்னார் பிரதான வீதியில் முருங்கன் பிரதேசத்தில் ஓர் இராணுவ முகாம் இருக்கின்றது. அந்தக் காணி உரிமையாளர் ஒரு வயதான நபர். அந்தக் காணியின் முன் பகுதியில் ஒரு சிறிய ரயர் கடையை மட்டும் நடத்துவதற்கு அவருக்கு அனுமதி வழங்கப்பட்டிருக்கின்றது. ஆனால், அவரிடம் அந்தக் காணிக்குரிய உறுதி மற்றும் உரிமம் எல்லாம் இருக்கின்றன. அதேநேரம் அங்கு 5 - 6 இராணுவ வீரர்கள் மட்டும்தான் இருக்கின்றார்கள். அந்த நபர் எனது காரியாலயத்திற்குப் பலமுறை வந்து அந்தக் காணியை விடுவித்துத் தருமாறு கேட்டிருக்கின்றார் .

அந்த விடயம் தொடர்பாக நான் பாதுகாப்பு அமைச்சுக்குக் கடிதம் அனுப்பியிருந்தேன். ஆனால், இன்றுவரை பதில் வரவில்லை. அவருக்கு 2 - 3 பிள்ளைகள் இருக்கின்றார்கள். அவர்களுக்கு வாழ்வாதாரத்தை ஏற்படுத்திக் கொடுக்கக்கூடிய வகையில் அவர் அங்கு கடைகளைக் கட்டுவதற்கு முயற்சி செய்து கொண்டிருக்கின்றார். ஆனால், அது தொடர்பில் எந்தவிதமான அனுமதியும் வழங்கப்படவில்லை. ஆகவே, இந்த விடயத்தையும் பாதுகாப்பு அமைச்சின் கவனத்திற்குக் கொண்டு வருகின்றேன்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have only two more minutes.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
நன்றி. அதேநேரத்தில், எங்களுடைய பிரதேசத்திலிருக் கின்ற விவசாயப் பண்ணைகளை இன்றும் இராணுவம்தான் பொறுப்பில் வைத்திருக்கின்றது. அதேபோல் கடைகளையும் நடத்துகின்றது. அண்மையில் தள்ளாடி இராணுவ முகாமிற்கு அருகிலுள்ள புனித அந்தோனியார் ஆலயத்திற்குச் சொந்தமான ஓர் இடம் தொடர்பில் நானும் மன்னார் மாவட்டக் குரு முதல்வரும் நேரடியாகப் பாதுகாப்பு இராஜாங்க அமைச்சரிடம் சென்று முறையிட்டிருந்தோம். அதாவது "புனித அந்தோனியார் ஆலயத்திற்குச் சொந்தமான இடத்தில் அவர்கள் canteen அமைக்கின்றார்கள். அதனைத் தடுத்து நிறுத்துங்கள்" என்று கேட்டிருந்தோம். ஆனால், இன்று வரை எந்தப் பதிலுமில்லை. ஆனால், இன்று canteen கட்டித் திறக்கப்பட்டுள்ளது. கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இராணுவத்தினராலும் கடற்படையினராலும் மேற்கொள்ளப் படுகின்ற குறித்த செயற்பாடுகளை அமைச்சர்களால் அல்லது ஜனாதிபதி அவர்களால் கட்டுப்படுத்த முடியவில்லையா? அல்லது இந்த நாட்டில் தொடர்ந்தும் பயங்கரவாதத்தை ஏற்படுத்தக்கூடிய வகையில் தன்னிச்சையாக அவர்கள் முயற்சிக்கிறார்களா? இன்று நாங்கள் யுத்தம் முடிந்ததன் பின்பு நல்லிணக்கத்திற்காக உழைத்துக் கொண்டிருக்கின்றோம். ஆனால், அந்த நல்லிணக்கத்தை உடைக்கின்ற வகையில் இராணுவம் மற்றும் கடற்படையின் செயற்பாடுகள் அமைந்திருக்கின்றன. இராணுவத்தின் செயற்பாடுகள் பற்றி யாரிடமும் கேட்க முடியாத நிலை காணப்படுகின்றது. அரசாங்க அதிபரிடம் முறையிட்டால், "இராணுவ விடயத்தில் தலையிட முடியாது" என்று சொல்கின்றார். தொடர்ந்து இப்படியான சூழ்நிலை நிலவினால் இந்த நாட்டில் நல்லிணக்கம் ஏற்படாது.

முன்னர் பேசிய உயர்கல்வி அமைச்சர் மாண்புமிகு கலாநிதி விஜயதாஸ ராஜபக்ஷ அவர்கள், "முன்பு ஒரு காலத்தில் இலங்கையைத் தேடிவந்த பல்கலைக்கழக மாணவர்கள் தற்பொழுது பங்களாதேஷ், மலேசியா போன்ற நாடுகளுக்குச் செல்கிறார்கள்" என்று கூறியிருந்தார். உண்மையில் இந்த நாட்டில் ஓர் நல்லிணக்கம், ஓர் அரசியல் தீர்வு ஏற்படாவிட்டால், நாட்டின் பொருளாதாரம் எந்தக் காலத்திலும் முன்னேறாது. ஒவ்வொரு கட்சியும் மாறிமாறி ஆட்சிசெய்து கொண்டு போகலாம். ஆனால், நாடு அபிவிருத்தி யடைவதற்குத் தேசிய நல்லிணக்கம் ஏற்பட வேண்டும்; இராணுவமும் கடற்படையும் அதற்காக ஒத்துழைக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

இறுதியாக, மீண்டும் மேதகு ஜனாதிபதி அவர்கள் கிளிநொச்சிக்கு வரும்போது ஆனந்த சுதாகரனையும்

[ගරු ඉ. වාල්ස් නිර්මලනාදන් මහතා]

அவரைப்போன்ற ஏனைய அரசியல் கைதிகளையும் விடுதலை செய்துவிட்டு வர வேண்டும் என்று கேட்டு, விடைபெறு கின்றேன். நன்றி.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Thank you. මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! Yes, Hon. Lakshman Kiriella.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, there is a Statement that needs to be made by the Hon. Mangala Samaraweera. Will you please give him only ten minutes?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
All right. Do you want that before the Hon. Ajith Mannapperuma's speech?

ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)
එතුමා කථා කළාට පසුව මගේ ප්‍රකාශය ඉදිරිපත් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
After him.

[අ. භා. 12.06]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අභිනවයෙන් නියෝජ්‍ය කථානායක ධුරයට පත්වීම පිළිබඳව පළමුවෙන්ම මම ඔබතුමාට සුබ ප්‍රාර්ථනා කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඔබතුමා මන්ත්‍රීවරයකු ලෙස මූලාසනය භාරවන විටත් බොහොම ක්‍රමානුකූලව, ලස්සනට, ආදර්ශවත් විධියට මේ ගරු සභාව මෙහෙයවූවා. අද ඒ කර්තව්‍යය නිල වශයෙන්ම ඔබතුමාට ලැබී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සංශෝධනය කරන ජාතික ආරක්ෂක අරමුදල් පනත ප්‍රථමයෙන්ම ඉදිරිපත් කළේ 1985 මාර්තු 5වන දායි. එවකට ජාතික ආරක්ෂක ඇමති සහ නියෝජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයා වූ ලලිත් ඇතුලත්මුදලි ඇමතිතුමා තමයි මේ පනත ඉදිරිපත් කළේ. ඒ, ජේ.ආර්. ජයවර්ධන ආණ්ඩුව කාලයේයි. එතුමා එදා මෙම අරමුදල ආරම්භ කරන්න ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් කරමින් තමන්ගේ කථාව ආරම්භ කරද්දී කිව්වා, "ජීවිත පරිත්‍යාගයෙන් රට වෙනුවෙන්, රටේ ආරක්ෂාව වෙනුවෙන් සටන් කරන වීරෝදාර රණ විරුවන් ජීවිතක්ෂයට පත් වුණාම, ආබාධිත වුණාම ඒ අයගේ පවුලේ අයට, ඒ අයට යම් සුබසෙතක් -යහපතක්- සැලසීම සඳහා තමුන් පෞද්ගලිකව මේ අයට උදව් කරන්නේ කොහොමද කියලා රටේ දසදහසක් ජනතාව බලාගෙන ඉන්නවා" කියලා. ඒ සඳහා නීත්‍යානුකූල ක්‍රමයක් ඇති කරන්න තමයි මේ පනත එදා ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා ගෙනාවේ. ඒ දේ කිරීම රජයේ වගකීමක්. රජය යම් යුතුකමක් ඉෂ්ට කරනවා. නමුත් ඒ යුතුකමට වඩා එහාට ගිහින්, රටේ ජනතාවටත් තමන්ගේ යුතුකම ඉෂ්ට කිරීමට ඉඩ සලසන්න තමයි මේ දේ කළේ. මේ වෙනකොටත් මේ අරමුදලේ රුපියල් කෝටි 100කට -බිලියනයකට- ආසන්න මුදලක් තිබෙනවා. නමුත් පසුගිය කාලයේ මේ අරමුදල අකර්මණ්‍ය වුණා; ක්‍රියාත්මක වුණේ නැහැ. අවුරුදු ගණනාවකින් එය රැස්වෙලා නැහැ. අපේ රජයන් කළ මේ වාගේ හොඳ දේවල් රාශියක් පසුගිය කාලයේ අකර්මණ්‍ය වුණා.

"ජනසවිය" වැඩ පිළිවෙළ "සමෘද්ධිය" බවට පත් කරලා සමෘද්ධිමත් වුණු මිනිස්සු නැහැ. සමෘද්ධි ව්‍යාපාරය හරහා ජනතාව වහලුන් බවට පත් කළා. හිටපු ජනාධිපති ආර්. ප්‍රේමදාස මැතිතුමා ජනසවිය වැඩ පිළිවෙළ ආරම්භ කළේ අවුරුදු දෙකකින්, තුනකින් සමෘද්ධිමත් ජනතාවක් බිහි කරන්නයි. "නැති බැරි අය - ඇති හැකි අය" කිරීමට තමයි මේ ජනසවිය වැඩ පිළිවෙළ නිර්මාණය කළේ. නමුත් පසුගිය රජයවල් එම වැඩ පිළිවෙළ "සමෘද්ධිය" කියා වෙනස් කළා. වහල්භාවයකින් යුක්ත ජනතාවක් නිර්මාණය කරන්න තමයි ඒ ක්‍රියාදාමය කළේ. ඒ වාගේම, උදාගම් ව්‍යාපාරය දිහා බැලුවත් හදපු උදාගමක් නැහැ. අන්තිමට ඒකේ නම වෙනස් කරගෙන දැහලුවා. ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා මහපොළ ශිෂ්‍යත්ව ලබාදීම ආරම්භ කළා. මමත් මහපොළ ශිෂ්‍යත්ව වැඩ පිළිවෙළේ විශේෂ කුසලතා ශිෂ්‍යත්වධාරියෙක්. විශ්වවිද්‍යාලයේ ඉගෙන ගන්නත් විශේෂ කුසලතාවක් තිබුණු ශිෂ්‍යයෙක් විධියට මට ඒ සල්ලි ලබා දුන්නා. ඒක නම් වෙනස් කරන්න බැරි වුණා. අදත් ඒ වැඩ පිළිවෙළ ශක්තිමත්ව තිබෙනවා. නමුත් පසුගිය කාලයේ නොයෙකුත් දේවල් වෙනස් කළා.

අද සංශෝධනය සඳහා ඉදිරිපත් කර තිබෙන මේ පනත පවා අකර්මණ්‍ය වෙලා තිබුණා. රටේ සමෘද්ධිය ඇති කිරීමට, රටේ ජනතාවගේ යහපත සඳහා ඇති වුණු ව්‍යාපාර බොහොමයක් මේ අය කුහක චේතනාවෙන් අකර්මණ්‍ය කළා. නමුත් අද අපි මේ පනත සක්‍රිය වෙන්න පුළුවන් විධියට ඒකේ තිබෙන අඩු පාඩු හරිගස්සලා තිබෙනවා. මේ අරමුදල දැනටත් සක්‍රියයි. එය තවත් සක්‍රිය වෙන්න කටයුතු කරනවා. දැනටත් රණවිරු පවුල්වල දරුවන්ට ශිෂ්‍යත්ව ලබා දෙනවා. ඒ වාගේම නිවාස හදා දෙනවා. එවැනි දේවල් මෙම අරමුදල හරහා කෙරෙනවා. නමුත් මේ පනත අවුරුදු ගණනාවකින් වෙනස් වෙලා නැහැ. එදා වුණු දේ විතරයි තවම වෙන්නේ. එය ශක්තිමත් වෙලා නැහැ. මේ මණ්ඩලය අවුරුදු ගණනකින් රැස් වෙලා නැහැ. අද අපි එය ඉටු කරන්න උත්සාහ කරනවා.

"රණ විරුවන්" කියන වචනය බොහොම අගය කොට කෑ ගැහුවාට, පසුගිය කාලයේ එය වචනයට විතරක් සීමා වුණු ආකාරය අපි දැක්කා. රණ විරුවාට කියලා තමයි ගෙදර බල්ලන්ට කන්න දෙන්නේ; බල්ලා නාවන්නේ. අපේ රටේ පාලකයෝ රණ

විරුවාට කියලා තමයි ගෙදර වත්තේ වැඩ ටික කරගත්තේ. රණ විරුවෝ තමයි පාරවල කානු ශුද්ධ කළේ. ඒ තත්ත්වයට රණ විරුවන් හෑල්ලු කරන, ඔවුන්ගේ අභිමානය හෑල්ලු කරන ක්‍රියාදාමයන් කරලා, රණ විරුවන්ගේ අභිමානය ගැන කියමින් මාධ්‍ය ඔස්සේ කෑ ගහනවා; ජනතාවට වෙන චිත්‍රයක් පෙන්වනවා. නමුත් තිරය පිටුපස තිබෙන්නේ තව චිත්‍රයක්. එහෙම කාලයක් තමයි අපට වෙනස් කරන්න සිදු වුණේ. බලය ලබාගන්න ගියාමත් රණ විරුවෝ පාවිච්චි කළා. "රණ විරුවන් එල්ලුම් ගහට ගෙන යනවා. ඒක නිසා මට බලය දෙන්න" කියා කිව්වා; "රණ විරුවන් විදුලි පුටුවට ගෙනයනවා, ඒකෙන් රණ විරුවන් බේරා ගන්න මට බලය දෙන්න" කියා කිව්වා. බලය ගන්නත් ඔවුන්ව පාවිච්චි කළා. මේවා ජාතියේ සංවේදී අවස්ථා. මේ සංවේදී අවස්ථා පිළිබඳව පපුවට ගහ ගනිමින් ප්‍රකාශ කර කර, ජනතාවගෙන් බලය ගන්න ඒ රණ විරුවන්ව පාවිච්චි කළා.

රණ විරුවන්ගේ හපන්කම් පාවිච්චි කරලා බැලුවේ තමුන්ට බලය ගන්නේ කොහොමද කියායි. රණ විරුවන් විකුණුවා. රණ විරුවන් විකුණුවාට, බලය ගන්න ඔවුන් පාවිච්චි කළාට, යුද්ධය ජයග්‍රහණය කරපු සෙන්පතියා හිටේ දැම්මා. යුද්ධය ජයග්‍රහණය කරපු සෙන්පතියාට දස වද දුන්නා. එහෙම තමයි මේ අය කටයුතු කළේ. තිරය ඉස්සරහා එක කථාවක්; පිටුපස තව කථාවක් තිබුණේ. එදා එහෙමයි වුණේ. ඒ වාගේම, රණ විරුවන් පාවිච්චි කරලා සල්ලි හම්බ කළා. මිග් යානා ගනුදෙනුවලින් කෝටි ගණන් හොරකම් කළා. හමුදා මූලස්ථානය පිට රටට වික්කා. "රටේ ඉඩම් විකුණනවා" කියා මේ ආණ්ඩුවට සමහරු චෝදනා කරනවා. මේ ආණ්ඩුව කිසි දෙයක් විකුණලා නැහැ. හවුල් ව්‍යාපාර ආරම්භ කර තිබෙනවා. නමුත්, එදා රණ විරුවන්ගේ මූලස්ථානය; රටේ හමුදා මූලස්ථානය විදේශ රටකට සින්නක්කරව විකුණුවා. එහෙම කරපු ආණ්ඩුවක් ලෝකයේ තිබෙනවා නම්, ඒ ලංකාවේ තිබුණු පසුගිය ආණ්ඩුවයි. එහෙම කළ රටක් ලෝකයේ තිබෙනවා නම්, ඒ අපේ ශ්‍රී ලංකාවයි. අකුරේගොඩ Defence Headquarters Complex එක භදන්නය කියා රණ විරුවන් විකුණාගෙන කෝටි ප්‍රකෝටි ගණන් හොරකම් කළා. අන්න ඒ විධියට රණ විරුවන් විකුණාගෙන තමයි ඔවුන් පැවතුණේ. හොරකම් කරන්න රණ විරුවන් පාවිච්චි කළා; බලය ගන්න රණ විරුවන් පාවිච්චි කළා. බලය පවත්වා ගෙන යන්න රණ විරුවන් පාවිච්චි කරලා, අන්තිමට රණ විරුවන් හෑල්ලුවට ලක් කළ ව්‍යාපෘති තමයි ඒ ගොල්ලන් කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දශක 3ක යුද්ධයකින් අමිහිරි අත් දැකීම් විඳගත්ත රටක්. මේ යුද්ධය අවසානයේ අපි උරුම කරගත්තේ මොනවාද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්ලේටෝ නම් දාර්ශනිකයා කියනවා, "යුද්ධයක අවසානය දැක ඇත්තේ මළවුන් විතරයි" කියා. ජීවත් වෙන මිනිස්සු යුද්ධයේ අවසානය දැක නැහැ, මළවුන් විතරයි යුද්ධයේ අවසානය දැක තිබෙන්නේ කියලා ප්ලේටෝ කියා තිබෙනවා. ලෝක ඉතිහාසය පුරාම සිවිල් යුද්ධ, ලෝක සංග්‍රාම අපි අත් විඳ තිබෙනවා. මෙවැනි යුද්ධයකදී තමන්ගේ රට වෙනුවෙන්, රටේ පාලන තන්ත්‍රය වෙනුවෙන්, ජනතාව වෙනුවෙන් යුද්ධයට මැදි වන රටක නීත්‍යානුකූල හමුදාව ඉටු කරන්නේ වගකීමකට වඩා යුතුකමක්.

එලෙසයි මා කල්පනා කරන්නේ. යුද්ධයකට එකතු වන්නා මහා පරිත්‍යාගයකට සූදානම්. මොකක්ද ඒ පරිත්‍යාගය? ඒ, තමන්ගේ ජීවිතයයි. කෙනකුට පරිත්‍යාග කරන්න පුළුවන් ලොකුම දේ තමන්ගේ ජීවිතයයි. ඒ ජීවිතය පරිත්‍යාග කරන්න කැමැත්තෙන් තමයි නීත්‍යානුකූල හමුදාවට රටේ පුරවැසියන් එකතු වන්නේ. එවැනි පරිත්‍යාගයක් කිරීමට කෙනකුට නිර්භීතකමක්, එඩිතර සිතක් තිබිය යුතුයි. එහෙම නැති කෙනකුට මෙය කරන්න බැහැ. එවැන්නන් අගය කිරීම, ඔවුන්ට උපහාර දැක්වීම රටක ජනතාවගේ වගකීමකට වඩා කෘතගුණ සැලකීම පිළිබඳව වූ මහා ලක්ෂණයක් පිළිබිඹු කිරීමක්.

අවශ්‍ය නීති රීති ටික ගෙනැත් අද අප ජාතික ආරක්ෂක අරමුදල ශක්තිමත් කරන්නේ, ඒ සඳහා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කරන්නේ, රට වෙනුවෙන් ජීවිත පරිත්‍යාග කරන්න කැමැත්තෙන් ඇවිත් ජීවිත පරිත්‍යාග කළ, ආබාධිත වූ, රට වෙනුවෙන් ක්‍රියා කරන අයට කෘත ගුණ සැලකීමක් වශයෙනුයි. විශේෂයෙන් ඒ වෙනුවෙනුයි අප මෙය කරන්නේ. අප අද මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ ඉටු කරනුයේ ඒ උදාර මිනිස් ගුණය පිළිබිඹු කරන කාර්ය භාරයක් බවයි මා විශ්වාස කරන්නේ. අප මුහුණ දුන් යුද්ධයේ සැබෑ ස්වරූපය හඳුනා ගැනීම වැදගත් බවයි මා කල්පනා කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වොන් ෆෙල්ටර් කියන දාර්ශනිකයා කියනවා, නියම ත්‍රස්තවාදය කියන්නේ මොකක්ද කියා; නියම ත්‍රස්තවාදය කියන්නේ ජාතිවාදයයි කියනවා. අපේ දශක තුනක යුද්ධය ආරම්භ වන්නේත්, ක්‍රියාත්මක වුණේත් ජාතිවාදය කියන එක පදනම් කරගෙනයි. එහෙම නැතිව, වෙනත් දෙයක් නිසා නොවෙයි. පසුගිය දවස්වල අපි දැක්කා, මහනුවර රිය අනතුරක් වෙලා දෙදෙනකු ගහගන්නවා. එයත් පොඩි සිවිල් යුද්ධයක් බවට පත් කරගෙන රටේ ධනය විනාශ කරලා දැම්මේ ජාතිවාදය නිසා තමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, තවත් විනාඩියක කාලයකුයි ඔබතුමාට තිබෙන්නේ.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තවත් විනාඩි දෙකක් විතර දෙන්න. කාලය තිබෙනවා නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
තවත් විනාඩියයි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ජාතිවාදය තුළින් ඇති වූ යුද්ධය රට වෙනුවෙන් අවසන් කළ රණ විරුවන් කිසි දිනක ජාතිවාදීන් ලෙස කටයුතු කර නැහැ. ඔවුන් යුද්ධ කළේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී නිදහස වෙනුවෙනුයි; ත්‍රස්තවාදීන් විසින් සිර කරගෙන සිටි සාමාන්‍ය ජනතාව බේරා ගැනීම වෙනුවෙනුයි. ඒ ජනතාව සිංහල වෙන්න පුළුවන්, මුස්ලිම් වෙන්න පුළුවන්, ද්‍රවිඩ වෙන්න පුළුවන්, වෙනත් ජාතියක අය වෙන්න පුළුවන්. අන්න ඒ අය වෙනුවෙන් තමයි ජීවිත පරිත්‍යාගයෙන් මේ හමුදා නිලධාරීන් කටයුතු කළේ. එවැනි උදාර පරමාර්ථයෙන් සිදු කළ යුද්ධය, පටු වර්ගවාදී හැඟීමෙන් පෝෂණය කරමින් දේශපාලනය කිරීම තරම් වෙනත් අපරාධයක් මම දකින්නේ නැහැ. යුද්ධය විකුණාගෙන දේශපාලනය කිරීම තරම් අපරාධයක් තවත් නැහැ. මොකද, රටක රණ විරුවා කියන්නේ එක් දේශපාලන පක්ෂයකට අයත් කෙනෙක් නොවෙයි; එක් කණ්ඩායමකට අයත් කෙනෙක් නොවෙයි. රටක නීත්‍යානුකූල ආණ්ඩුව ආරක්ෂා කිරීමට, තමන්ගේ යුතුකම ඉටු කිරීමට තමයි ඔවුන් ඒ වගකීම භාරගෙන ඇවිත් ඉන්නේ. රටක සිවිල් යුද්ධය කියන දේ ආක්‍රමණකාරී යුද්ධයකට වඩා වෙනස් බව අප තේරුම් ගත යුතුයි. සිවිල් අරගළයකදී එකම රටේ පුරවැසියන් තමයි යුද්ධයකට පැටලෙන්නේ. එක්කෝ ඒ අය තුළ තිබෙන අතෘප්තිය නිසා, එහෙම නැත්නම් විවිධ සමාජයීය කාරණා නිසා

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

තමයි සිවිල් යුද්ධයක් රටේ ඇති වන්නේ. අප තේරුම් ගත යුත්තේ එයයි. දශක තුනක යුද්ධයක් නිමා කළ ත්‍රිවිධ හමුදාවට, පොලීසියට දැක්විය හැකි සැබෑ උපහාරය යළිත් යුද්ධයක් ඇති වීම වැළැක්වීමයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප රට බුදු දහම අනුව රාජ්‍ය කරන, බුදු දහමට ප්‍රමුඛස්ථානය පිරිනමා කටයුතු කරන රටක්. බෞද්ධ දර්ශනයේ ප්‍රධාන මඟ පෙන්වීම මොකක්ද? ඒ, හේතුඵලවාදයයි. එහෙම නම් යුද්ධය කියන්නේ ඵලය පමණයි. අප හේතුව විනාශ කළ යුතුයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ සඳහා යුද්ධයේදී හෙළු ලෙයට වඩා වැඩියෙන් දහඩිය හෙළිය යුතු වනවා. මේ රටේ සිටි කීර්තිමත් සෙන්පතියකු වූ වීර ඩෙන්සිල් කොඛ්බෑකඩුව මහතා වරෙක ප්‍රකාශ කළා, "යුද්ධය නිමා කළ හැකියි, එය සදාකාලිකව අවසන් කිරීමට නම් දේශපාලනය විසින් ඉතිරිය කළ යුතුයි" කියා. නමුත් අප මේ රටේ දකින්නේ මොකක්ද? දේශපාලනය විසින් නැවතත් යුද්ධය අවුළන්න බැලීමකුයි අප දකින්නේ. මොකද, යුද්ධයෙන් හම්බ කර ගත් මිනිස්සු, යුද්ධයෙන් බලය ගත් මිනිස්සු, යුද්ධය විකුණාගෙන කන මිනිස්සු බලන්නේ අවසන් කළ යුද්ධය නැවත අවුළා දේශපාලන බලය ගන්නයි. අප දැකපු ජරාම කටයුත්ත ඒකයි. මා විශේෂයෙන් කල්පනා කරන්නේ; අදහස් කරන්නේ රණ විරුවන්ට ලබා දිය හැකි ගෞරවය සහ පිළිගැනීම එතුමාගේ විග්‍රහය තුළ රැඳී තිබෙනවා කියායි. අපට මේ අවස්ථාවේදී පටු වන්න බැහැ. යුද්ධයක් අවසන් කරලා රට තුළ සාමය ගෙන යන මේ වෙලාවේ අවස්ථාවාදීන් වෙන්න බැහැ. අපි පටු කල්පනාවලින් බැහැර වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මේ කාරණය කියා මම කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අප පුළුල් දැක්මකින් යුතුව ක්‍රියා කළ යුතුයි. යුද්ධයේදී හරි දෙය මෙන්ම වැරදි දෙයද සිදු විය හැකියි. හරි දෙය කළ අය අගය කරන අතර, වැරැදි දෙය කළ අය පිළිබඳවද ක්‍රියා කළ යුතුයි. විනයගරුක විරුවන්ට සිදු වන අවමානයක් වෙයි නම්, වැරදි කළ අය පිළිබඳව ක්‍රියා කිරීම එම අවමානය මහ හරවා ගැනීම සඳහා කළ යුත්තක්. එවැනි දියුණු මානසික මට්ටමකට අපේ සමාජය ගෙන ඒම අපගේ කාර්ය භාරය වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. දැන් කථාව අවසන් කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
තවත් විනාඩියයි ගන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට දැන් වැඩිපුර විනාඩි තුනක් දී තිබෙනවා. කරුණාකර කථාව අවසන් කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අපගේ ත්‍රිවිධ හමුදාවට, පොලීසියට, සිවිල් ආරක්ෂක බල කායට, ස්වේච්ඡාවෙන් යුද්ධයට දායකවූවන්ගේ දරු පවුල්වලට සලසනු ලබන සහනයක් වෙනුවෙන් ඕනෑම අවස්ථාවක ක්‍රියා කිරීමට, උපකාර කිරීමට අප බැඳී සිටින බව මේ උත්තරීතර සභාවට කියනවා.

චීනය නිර්මාණය කළ මා ඕ සේතුංතුමා කියූ ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් මගේ කථාව අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

"අපි හරි දේ වැඩි දියුණු කළ යුතුයි. වැරදි දෙයට විරුද්ධ විය යුතුයි." මේ ප්‍රකාශයේ අරුත අප අවබෝධ කර ගනිමු. රණ විරුවන් ඉටු කළ මහා මෙහෙවර වර්ගවාදයෙන්, ආගම්වාදයෙන් හැල්ලුවට ලක් කිරීමට, ආපස්සට ගැනීමට අප ඉඩ නොදෙමු කියමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මංගල සමරවීර අමාත්‍යතුමා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා අද දින, ස්ථාවර නියෝග 27(2) යටතේ ඇසූ ප්‍රශ්නයට පිළිතුර,

පොල්ගහවෙල TNL සම්ප්‍රේෂණාගාරයේ කටයුතු අත්හිටුවීම : මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ ප්‍රකාශය

TNL தொலைக்காட்சியின் பொல்கஹவலை ஒளிபரப்பு நிலையத்தின் ஒளிபரப்பு நடவடிக்கைகள் இடைநிறுத்தம்: நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சரினது கூற்று

SHUTTING DOWN OF TNL TRANSMISSION CENTRE AT POLGAHAWELA: STATEMENT BY MINISTER OF FINANCE AND MASS MEDIA

ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, TNL රූපවාහිනී සේවයේ විකාශන කටයුතුවලට සිදුවී ඇති බාධාවන් පිළිබඳව ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා අද දින පාර්ලිමේන්තුවේ අවධානය යොමු කර තිබෙනවා. ඒ අවස්ථාවේ මම මේ සභාවේ සිටියේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙය ජාතික වශයෙන් ඉතා වැදගත් කාරණාවක් නිසා, මේ සම්බන්ධයෙන් පොඩි ප්‍රකාශයක් කිරීමට අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමාට ඉතාමත්ම ස්තුතිවන්ත වනවා.

2018 ජූනි මාසයේ 04 වෙනි දින පෙරවරුවේ TNL රූපවාහිනී ආයතනයේ පොල්ගහවෙල විකාශන මධ්‍යස්ථානය වටලා, එය මුද්‍රා තබා, එහි තිබූ විකාශන යන්ත්‍රද අත් අඩංගුවට ගනු ලැබීය. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව -TRC එක- පවසා සිටින්නේ, මෙම විකාශනාගාරය වෙනුවෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් ලබා ගත යුතු වාර්ෂික විකාශන බලපත්‍රය මෙතෙක් ලබා ගෙන නොතිබීම හේතුවෙන් අධිකරණයෙන් ලබාගත් අවසරයක් මත මෙම අත් අඩංගුවට ගැනීම සිදු කළ බවයි.

පොල්ගහවෙල උසාවියේදී අද දින නඩු විභාගය කැඳවීය. එහිදී, 2017/2018 වර්ෂය සඳහා පොල්ගහවෙල විකාශනාගාරයට අදාළ සංඛ්‍යාත TRC වෙතින් ලබා නොගැනීම නිසා මෙම තහනම් කළ බවත්, උපකරණ තොගයක් අත් අඩංගුවට ගත් බවත් ඔවුන් දන්වා ඇත. නමුත්, TNL රූපවාහිනී ආයතනයේ නියෝජිතයන් දීර්ඝ වශයෙන් කරුණු දක්වා ඇත්තේ, 2016 වර්ෂයේදී එකී සංඛ්‍යාත - frequencies - හරහා විකාශන කටයුතු සිදු කිරීමේදී වෙනත් විකාශන ආයතනයක සංඛ්‍යාතවලට බාධා පැමිණෙන බව TRC එක තමන් වෙත දන්වා ඇති බවත්, එකී දැනුම් දීමට අනුව ඒ සම්බන්ධයෙන් පැමිණිල්ල විභාග කරන ලෙසත්, ඒ සඳහා තම ආයතනයද කැඳවන ලෙසත් ලිඛිතව දන්වා තිබුණු බවටත්ය.

නමුත්, එවැනි පැමිණිලි විභාගයක් අද වනතුරුත් නොපැවැත්වුණු බවත්, තමන්ට කිසිදු දැනුම් දීමකින් තොරව මෙසේ කඩා පැන අත් අඩංගුවට ගත් බවත් අද උසාවියේදී වැඩිදුරටත් පෙන්වා දී තිබෙනවා. තවද, TRC එක සමඟ කළ ලිපි ගනුදෙනුවේ අවසාන ලිපියද TNL රූපවාහිනී ආයතනය විසින් යවා ඇති බවත් දැනුම් දී ඇත. මේ ආයතනය වැහුවේ මේ ප්‍රශ්නය නිසායි කියා මේ අය කිව්වාට, මේ සම්බන්ධයෙන් දිගින් දිගටම අවසාන ලියුමත් TNL ආයතනය යවලායි තිබෙන්නේ. -TNL රූපවාහිනී ආයතනයෙන් පොලීසිය විසින් අත් අඩංගුවට ගත් තාක්ෂණික උපකරණවල වටිනාකම මිලියන 20ක්, එහෙම නැත්නම් කෝටි 2කට වැඩි බවත්, ඒවා නිදහස් කරන ලෙසත් ඉල්ලා තිබෙනවා.

නමුත්, එසේ භාණ්ඩ නිදහස් කිරීමක් සිදු නොවූ අතර, TNL නියෝජිතයා දන්වා ඇත්තේ එම භාණ්ඩ තම ආයතනයට ඉතා වටිනා බැවින්, තෙත කාන්දු නොවන සුරක්ෂිත ස්ථානයක තබා ආරක්ෂා කරන ලෙසයි. ඒ අනුව නඩුකාරතුමා භාණ්ඩවල ආරක්ෂාව සලසන බවට අද උදේ භාරගෙන තිබෙනවා.

මේ සම්බන්ධයෙන් අද පවතින නීතිමය තත්ත්වය මෙයයි. අපේ රජය නිදහස්, වග කිවයුතු මාධ්‍ය වෙනුවෙන් සම්පූර්ණයෙන්ම ඇප කැපවී සිටින හෙයින්, මේ ඇති වුණු සිද්ධිය ගැන රජය හැටියට අපි ඉතාමත්ම කනගාටු වනවා.

අද තමුන්නාන්සේලා බැලුවොත්, මේ රටේ තිබෙන සෑම මාධ්‍යයක්ම පාහේ අපේ රජයට විරුද්ධව අදහස් ප්‍රකාශ කිරීමට වැඩි කාලයක් විපක්ෂයට ලබා දුන්නත්, ඒ ආයතනත් එක්ක අපි ඉතාමත්ම හොඳ ගනුදෙනුවක් තිබෙනවා. "සිරස" ආයතනය රජයට, අගමැතිතුමාට ඉතාමත් බරපතළ ලෙස පෞද්ගලික පහර ගැහුවත්, අපි කිසිම විධියකට සිරස ආයතනයට බාධා කර නැහැ.

සිරස ආයතනයේ සභාපතිතුමා -කිලී මහරාජා මහත්මයා- මගේ හොඳ මිත්‍රයෙක් විධියට අදත් මම සලකනවා. මම එදා කිව්වා වාගේම පසු ගිය කාලයේ මටත් ඉතාම දැඩි ලෙස ප්‍රහාර එල්ල කළා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
කොටළුවා කියලා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඔව්, කොටළුවා කියලා. පසුව, මම එක්සත් ජාතික පක්ෂයේ උප සභාපතිවරයා කියලා දැනගෙන ඊයේ පෙරේදා මට මල් පොකුරකුත් එවලා තිබුණා. මේවා අපි දැනගන්න ඕනෑ. අපි මෙතැන රණ්ඩු වෙන්න ඕනෑ. නමුත් අනිත් තැන්වලදී අපි ආශ්‍රය කරන්න ඕනෑ. ඒකයි ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ. දිලිත් ජයවීර මහත්මයාගේ "දෙරණ" මාධ්‍ය ජාලය ගන්න, නැත්නම් රේනෝ සිල්වා මහත්මයාගේ "හිරු" ආයතනය ගන්න. "හිරු", "දෙරණ" වැනි නාළිකා හැම එකක්ම අපට වඩා ඔබතුමන්ලාට කාලය දෙනවා. නමුත්, ඒ දෙගොල්ලන්ම මගේ මිත්‍රයෝ. ඒ විතරක් නොවෙයි, ඇත්ත වශයෙන්ම මේ සිද්ධිය වෙන්න සති කිහිපයකට ඉස්සෙල්ලා මම, ඉෂිනි වික්‍රමසිංහ මහත්මිය මගේ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මාධ්‍ය පෞද්ගලික ලේකම් හැටියට පත් කර ගන්න එකඟ කරගෙන තිබුණා. එතුමිය ජූලි මාසයේ 1වැනිදා ඒ කාර්ය භාරගන්නවා. එහෙමයි අපි කටයුතු කරන්නේ. අපට වෙනස් විධියේ අදහස් තිබෙන්නට පුළුවන්. අපි ඒවාට ගරු කරන්න ඕනෑ. ඇත්තෙන්ම කියනවා නම්, මම අද සන්තෝෂ වෙනවා. මොකද, පසුගිය යුගයේ ජනමාධ්‍යයට ප්‍රබල ප්‍රහාර එල්ල කරනකොට නිහඬව හිටපු අපේ මිත්‍රවරු දැන් මාධ්‍ය නිදහස ගැන විශාල උනන්දුවක් පෙන්වනවා. තරහා වෙන්න එපා, මොකක්ද වුණේ කියලා මම මතක් කරන්න ඕනෑ. අපට තවම මතකයි, "හිරු" ආයතනය වැරදි ප්‍රවෘත්තියක් පළ කළාය කියලා TRC එක ගිහිල්ලා හිරු ආයතනය සම්පූර්ණයෙන්ම වහලා දැම්ම බව. ඇත්තටම මම කියනවා, හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ තමයි TRC එක පවරා ගත්තේ. මොකද, 1997දී TRC පනත හැදුවේ මම. ඇත්තෙන්ම TRC එක තිබෙන්නට ඕනෑ විදුලි සංදේශ අමාත්‍යාංශය යටතේයි. ඒ පනතේ තිබෙනවා, "TRC එකේ සභාපතිවරයා විය යුත්තේ විදුලි සංදේශ අමාත්‍යාංශයේ ලේකම්වරයා." කියලා. නමුත්, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඒකේ තිබෙන සල්ලි දැකලා, ඒකට තිබෙන බලය දැකලා, TRC එක දේශපාලන ආයුධයක් බවට පත් කරගන්න තිබෙන වුවමනාවට 2010, 2012 වෙනකොට ගැසට් නොකර ඒක ජනාධිපතිවරයා යටතට පවරා ගත්තා. ඒ විධියට පවරා ගත්ත එක තමයි අදත් ඒ විධියටම එන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පවරා ගත්ත එක තියාගන්නේ නැතුව ආපහු දෙන්න තිබුණානේ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඔව්, ඇත්ත වශයෙන්ම දෙන්න තිබුණා.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
සාධාරණය ඉෂ්ට කරන්න ආවා නම්, සාධාරණත්වය වෙනුවෙන් කථා කරනවා නම් ඒක දෙන්න තිබුණා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
පොඩ්ඩක් ඉන්න, මම මේ කථාව ඉවර කරලා ඉන්නම්. මම කියාගෙන ආවේ මේකයි. එදා TRC එක අරගෙන, ඒක දේශපාලන ආයුධයක් හැටියට පාවිච්චි කරලා එතුමා මොකක්ද කළේ? යූඑන්පී එකේ දුමින්ද සිල්වා මන්ත්‍රීවරයා යූඑන්පී එකෙන් කඩලා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ගැනීම සඳහා මහා ආයුධයක් බවට පත්කර ගත්තා. රේනෝ සිල්වා මන්ත්‍රීවරයා ඔබතුමන්ලාගේ පැත්තට ආවා විතරයි නැවතත් licence ටික දුන්නා. හැබැයි, ඔක්කෝම ටික දුන්නේත් නැහැ. සී.බී. රත්නායක මන්ත්‍රීතුමනි, ඒවායේ සමහර frequencies,-

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
රේනෝ සිල්වා නෙමෙයි, දුමින්ද සිල්වා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
සී.බී. රත්නායක මන්ත්‍රීතුමනි, දිවා ආහාරය සඳහා 12.30ට විවාදය නවත්වන නිසයි මම ඉක්මනට කියන්නේ.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
දුමින්ද සිල්වා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
සමාවෙන්න, රේනෝ සිල්වා නෙමෙයි, දුමින්ද සිල්වා. දුමින්ද සිල්වා ඔය පැත්තට ගත්තා, අනිත් පැත්තෙන් දුමින්ද සිල්වා,-

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜ்புர் ரஹ்மான்)
(The Hon. Mujibur Rahuman)
උතුරු කොළඹ සංවිධායකවරයා වශයෙන් පත් කළා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
අනිත් පැත්තෙන් උතුරු කොළඹ සංවිධායකවරයා බවට පත් කළා. [බාධා කිරීමක්] ඒ වාගේම "සිරස" ආයතනයට ගිනි තිබ්බා, බෝම්බ ප්‍රහාර එල්ල කළා. මට තවම මතකයි, ඒ කාලයේත්,- [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා. හැබැයි, අපි දිවා විවේකය සඳහා 12.30ට විවාදය අවසන් කරන්න ඕනෑ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමතිතුමා කිව්වා,-

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඕක පස්සේ පැහැදිලි කරමු. මොකද, 12.30ට විවාදය ඉවරයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
We will give you another ten minutes. There is no hurry because this is important and we will not be meeting for another two weeks' time. I have just two questions. ගරු ඇමතිතුමා කිව්වා, "මේ ආයතනයට අලුතින් ගෙනාපු තාක්ෂණික, යාන්ත්‍රික උපකරණ කිසිම හේතුවක් නැතුව අත් අඩංගුවට අරගෙන තිබෙනවා." කියලා.

කලින් මගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන අවස්ථාවේ මම කිව්වා, මහජන බැංකුවෙන් විශාල ණයක් අරගෙන මේවා ආනයනය කර තිබෙන බව. ඒ අවශ්‍ය නැති දේවල් නිදහස් කරන්න Commission එකට පුළුවන්. ඒක උසාවියට අයිති දෙයක් නොවෙයි. අපි මේක කාරණයෙන් කාරණය විසඳා ගනිමු. They can intervene and release them. They do not have to wait till the next date of court. The second issue is, පොල්ගහවෙලට විතරයි නේ, මේ ප්‍රශ්නය තිබෙන්නේ. පොල්ගහවෙල සම්ප්‍රේෂණාගාරයේ කටයුතුවලදී පවා පනත යටතේ අනුගමනය කළ යුතු පිළිවෙළක්, "notice to be issued" ආදී පිළිවෙළක් තිබෙනවාය කියලා ඔබතුමාම කියනවා. ඒවා අනුගමනය කරන්නේ නැතිව හිතුවක්කාර විධියට තමයි CID එක යවලා මේක කළේ. ඒ නිසා දැන් ආණ්ඩුවට පුළුවන් Commission එකට කියන්න "කරුණාකරලා තහනම අයින් කරලා නඩුවක් දමලා ඒක කරගන්න" කියලා. ගාස්තු ගෙව්වාද, නැද්ද, නියමිත ප්‍රමාණයට වඩා වැඩියෙන් ගාස්තු ඉල්ලුවාද ආදී ප්‍රශ්න උසාවියත් එක්ක බේරා ගන්න. Commission එකට Order එක revoke කරන්න පුළුවන්. ඒකට නේ, ආණ්ඩුව මැදිහත් වෙන්න ඕනෑ.

ඔබතුමා නැති වෙලාවේ මම ඇහුව අන්තිම ප්‍රශ්නය, ගරු කථානායකතුමාට භාර කළ ප්‍රශ්නය මේකයි. ගිය ආණ්ඩුව කාලයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව ජනාධිපතිවරයාට ඕනෑම විෂයක් තමන්ගේ යටතට ගන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ පරිසරය, ආරක්ෂක සහ මහවැලි කියන විෂයයන් විතරයි ජනාධිපතිතුමා යටතට ගන්න පුළුවන්. ඒ අගමැතිතුමා විසින් නිර්දේශ කරන්නේ නැත්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please!

දිවා ආහාරය සඳහා නවත්වන්නේ නැතිව විනාඩි 05ක් ඉදිරියට සභාවේ කටයුතු පවත්වාගෙන යන්න සභාව එකඟද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
එකඟයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
I am trying to help although the TNL does not give us publicity. That is a different matter. We stand for media freedom.

ඒ අනුව දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පසුව මෙය අයිති විය යුත්තේ කොතැනටද? Ministry of Telecommunication and Digital Infrastructure එකේ ලේකම්ට ද? That is the issue now. Otherwise, Hon. Minister, this will become another legal issue where the appointments might fall vacant in so many other corporations also. Please give your attention to this.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Hon. Dinesh Gunawardena, I am not a lawyer nor a Constitutional expert but, I think what you said has some basis and we will certainly discuss how we can resolve this. As far as I can see, I feel that this is a case of bureaucratic bungling.

ඇත්ත වශයෙන්ම දේශපාලන තීන්දුවකට වඩා මට නම් පෙනෙන්නේ මෙතැන පරිපාලනමය අවුලක් තිබෙන බවයි. නමුත් මේ තත්ත්වය ගැන කථා කරන්න වර්තමාන TRC ආයතනයේ සභාපති, ජනාධිපති ලේකම් ඔස්ටින් ප්‍රනාන්දු මැතිතුමා සම්බන්ධ කර ගන්න කිහිප වතාවක් බැලුවා. නමුත් එතුමා විදේශගතවෙලායි ඉන්නේ. ඒ නිසා එතුමා ආපු විගස අපි මේ සම්බන්ධයෙන් කථා කරනවා.

අවසාන වශයෙන් ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඇතුළු ඔබතුමන්ලා සියලුදෙනාටම මට කියන්න තිබෙන්නේ මේ සිද්ධිය ගැන මම ඉතාමත්ම ප්‍රබල ලෙස කම්පනයට පත් වන බවයි; කනගාටු වන බවයි. ඊට වඩා කියන්න මට වචන නැහැ. මම ඉතාමත්ම කනගාටු වෙනවා.

මේ සිද්ධිය නිසා තවත් පැත්තකින් මම විශාල වශයෙන් සන්තෝෂ වෙනවා. ඒ වෙන මොකක්වත් නිසා නොවෙයි, එදා "සිරස" ආයතනයට ගිනි බෝම්බ ප්‍රහාර එල්ල කරන කොට, "සියත" ආයතනයට ගිනි තියන කොට, යාපනයේ උදයන් පුවත්පත් ආයතනයට 42 වතාවක් පහර දෙන කොට, ජාතික රූපවාහිනියට පැනලා පහර දෙන කොට, Lanka-e-news ආයතනයට ගිනි තියන කොට, "ලංකා" පුවත්පත සීල් තබන කොට, හිරු නාළිකාව තහනම් කරන කොට, මාධ්‍යවේදීන් මරන කොට නිහඬව හිටපු තමුන්නාන්සේලා සියලු දෙනා, නිහඬතාවයෙන්ම සහයෝගය පළ කළ අපේ මන්ත්‍රීතුමන්ලා අද මාධ්‍ය නිදහස වෙනුවෙන් ප්‍රබලව පෙනී සිටීම ගැන මගේ විශාල සතුටක් තිබෙනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

දිවා ආහාරය සඳහා අපරභාග 1.30 දක්වා සභාවේ කටයුතු අත්හිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා 1.30ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.30 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

දිවා විවේකයෙන් පසු ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනි වර කියැවීමේ විවාදය නැවතත්. ගරු ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ. භා. 1.31]

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත සාකච්ඡා කරන අද දිනයේදී අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් ලබා දීම ගැන මම ස්තුතිවන්ත වෙනවා. මෙම කාරණාව සඳහා ආරක්ෂක අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරන ලද පසුබිම් සටහන පිළිබඳව මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. මේ සටහනේ පැහැදිලිව කියන්නේ, ජාතික ආරක්ෂක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අනුමත කර ගැනීමේදී විගණන ගැටලු මතු වෙලා තිබෙන නිසා මේ තනතුරුවල සංශෝධනයක් කරන්නට කටයුතු කරනවා කියන කාරණාවයි. ඒ පිළිබඳව අපට විරුද්ධ වෙන්නට දෙයක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක පරිපාලන කටයුත්තක්. ඒ නිසා ඒක විය යුතු දෙයක්. ඒ වාගේම ඒ පසුබිම් වාර්තාවේ 2017.09.27 දින අමාත්‍ය මණ්ඩල සටහන් කියලා යෝජනා දෙකක් ඉදිරිපත් කරලා තිබෙනවා.

පළමුවෙනි යෝජනාව ලෙස සඳහන් වෙනවා, "1991 අංක 10 දරන ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනතේ 03වෙනි වගන්තිය මඟින් සංශෝධනය කරන ප්‍රධාන ප්‍රඥප්තියේ 13වෙනි වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තිය පෙර ලෙස සංශෝධනය කිරීමට" කියලා. ඒකේ දෙවෙනි යෝජනාව තමයි," රණ විරු සුබ සාධන කටයුතු වෙනුවෙන් ශ්‍රී ලංකා රජය විසින් ආරම්භ කරනු ලැබූ ජාතික ආරක්ෂක අරමුදල දේශීය ආදායම් පනත අනුව ගෙවිය යුතු ආදායම් බදුවලින් නිදහස් කිරීම." මෙහිදී, පළමුවෙනි යෝජනාවට අනුමැතිය දීලා, දෙවෙනි යෝජනාව කැබිනට් එකෙන් ප්‍රතික්ෂේප කරලා තිබෙනවා.

මම ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණාවක් සමඟ එකඟ වෙනවා. මේ අරමුදල පිහිටුවන්නේ මේ රට වෙනුවෙන් ජීවිත කැප කරමින් කටයුතු කළ රණ විරුවන්ගේ සුභ සාධන කටයුතු සඳහ ඔවුන්ගේ අවශ්‍යතා ලබාදීම සඳහායි. එතුමා කියන ආකාරයට මේ පනත සංශෝධනය කිරීමෙන් අරමුදල ශක්තිමත් වෙන්නේ නැහැ. ඒක පරිපාලනමය කාරණාවක්. හැබැයි අරමුදල ශක්තිමත් කරන්න නම් දෙවෙනි යෝජනාව වශයෙන් තිබුණු කාරණාව වන, ගෙවිය යුතු ආදායම් බදුවලින් නිදහස් කිරීම කළ යුතු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ රටේ මිනිසුන්ට ජීවත් වෙන්න බැහැ. අද බඩු මිල ඉහළ ගිහින් තිබෙනවා. රාජ්‍ය සේවකයන් අද ඉතාම අමාරුවෙන් ජීවත් වෙන්නේ. ඒ වාගේම පෞද්ගලික අංශය බරපතළ ලෙස හානියට පත් වෙලා තිබෙනවා. ආධාර ලබන පවුල්වල අය ඉතාමත්ම අමාරුවෙන් ජීවත් වෙන්නේ. එම නිසා ඒ අයට අද මේ අරමුදලට උපකාර කරන්නට බැහැ. නමුත් මේ අරමුදලට මුදල් දායකත්වයක් ලබා දෙන ව්‍යාපාරිකයන්ට යම්කිසි බදු සහනයක් ලබාදෙනවා නම්, මේ අරමුදල ශක්තිමත් කරන්නට පුළුවන්කම තිබෙනවා. ඒ පිළිබඳව ගරු මුදල් ඇමතිතුමාගේ අවධානය යොමු කරලා, යම් යම් කොන්දේසි යටතේ හෝ මේ අරමුදල ශක්තිමත් විය යුතුයි කියන විශ්වාසය අප තුළ තිබෙනවා. මොකද, රණ විරුවන් ආරක්ෂා කිරීම සෑම රජයකම වගකීමක්.

ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමාගේ කථාවේදී එතුමා ප්‍රකාශ කළේ, මෙය දේශපාලන වශයෙන් රණ විරුවන් මැදිහත් කරගෙන කරන පාප කර්මයක් හැටියටයි. මමත් කියන්නේ ඒ කාරණාවමයි. එතුමන්ලාම තමයි රණ විරුවන්ට මඩ ගහලා මේ විධියට කටයුතු කළේ. ඒ හරහා රණ විරුවන්ට තිබෙන ආත්ම විශ්වාසය නැති වනවා. අවුරුදු 30ක යුද්ධයක් තිබුණු කාල සීමාව තුළදී රණ විරුවන් කළ කැප කිරීම් ගැන අපි කල්පනා කරන්න ඕනෑ. ඒ රණ විරුවෝ තමන්ගේ ජීවිත කැප කළා; තමන්ගේ අත් පා කැප කළා. දරුවන්ට තමන්ගේ පියා නැති වුණා. බිරින්දෑවරුන්ට තමන්ගේ ස්වාමියා නැති වුණා. මේ කැප කිරීම් කරපු රණ විරුවන්ට අපේ ගෞරවය, සැලකිල්ල දක්වා ඒ අයට ශුභ සාධන පහසුකම් සැලසුවේ නැත්නම්, ඒ අයට වරප්‍රසාද ලබා දුන්නේ නැත්නම්, ඒ අය ආණ්ඩු කෙරෙහි, මිනිසුන් කෙරෙහි කලකිරෙනවා. අද ආබාධිත තත්ත්වයට පත්වෙලා ඉන්න රණ විරුවන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම අපේ ආණ්ඩුවේ වග කීමක් වෙනවා.

ඒ විතරක් නොවෙයි. 2001 - 2004 කාල සීමාවේදී රණ විරුවන්ට කළ අසාධාරණකම් පිළිබඳව ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමන්ට මා මතක් කරන්න ඕනෑ. මිලේනියම් සිටි සිද්ධියේදී, පාවාදීම් හරහා එහි සිටි බුද්ධි අංශයේ හොඳ නිලධාරීන් අපට අහිමි වුණා. ඒ අයට අවශ්‍ය තොරතුරු ලබා ගන්න පුළුවන්කම ලැබුණා. අපි නොවෙයි එදා කිව්වේ. එදා ජනාධිපතිනිය හැටියට කටයුතු කළේ චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියයි. එදා එල්ටීටීඊ් සංවිධානයට නැව් පිටින් ආයුධ ආපු හැටි

[ගරු ප්‍රසන්න රණතුංග මහතා]

එතුමිය කිව්වා. අවසානයේදී ආපු නැවට ප්‍රහාරයක් එල්ල කළාට පස්සේ තමයි ආණ්ඩුව පෙරළන්න කටයුතු කරනවාය කියන කාරණය එතුමිය කිව්වේ. ඒ වකවානුවේදී ප්‍රභාකරන් එක්ක ගිවිසුම් ගහගෙන, එදා රණ විරුවන්ට විරුද්ධව එල්ටීටීඊ සංවිධානයට ආයුධ ලබා දීලා, ඒ කටයුතු කළේ 2001 - 2004 කාලය තුළ පැවති ආණ්ඩුවයි කියන එක අමතක කරන්න පුළුවන්කමක් නැහැ. ඒ නිසා රණ විරුවන්ගේ ආත්ම විශ්වාසය නැති වුණා. හමුදාවට රණ විරුවන් බැඳෙන එක නැවතුණා. හමුදාවට පුද්ගලයන් බැඳෙන එක නැවතුණා විතරක් නොවෙයි, හමුදාවල හිටපු රණ විරුවන් සේවය අතහැරලා හොරෙන් එළියට ආවා. ඔවුන් හමුදාවෙන් පැනලා ඇවිල්ලා සැඟවිලා සිටියා. ඒ කාලයේ පැනලා ගිය රණ විරුවන් අල්ලන්න පොලීසිය යොදවා කටයුතු කළ ආකාරය ගැන මට මතකයි.

ඊට පස්සේ 2005දී මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බලයට ආවාට පස්සේ, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත් එක්ක මැදිහත්වෙලා මේ තත්ත්වය වෙනස් කරන්න විශාල වැඩ පිළිවෙළක් සකස් කළා. මුලින්ම කළේ, අලුතින් රණ විරුවන් නැවත හමුදාවට බඳවා ගන්නත්, හමුදාවෙන් පැනලා ගිය රණ විරුවන් නැවත බඳවා ගන්නත් වැඩ පිළිවෙළවල් සකස් කරන එකයි. කවුරු මොනවා විවේචනය කළත්, මේ රටේ ජනාධිපතිවරයාගේ පුත්‍රයා නාවික හමුදාවට බැඳිලා මේ රටේ තරුණයන්ට ආදර්ශයක් දුන්නා. මීනුවන්ගොඩ නගර සභාවේ මනමේණ කියලා නාගරික මන්ත්‍රීවරයෙක් සිටියා. එතුමා මන්ත්‍රී ධුරය අතහැරලා හමුදාවට බැඳුණා. අද එතුමා ජීවතුන් අතර නැහැ; යුද්ධයෙන් මිය ගියා. එවැනි කැප කිරීම් කරන්න මේ රටේ තරුණයෝ ඉදිරිපත් වුණා. මරණයක් සිදු වුණාම ජන සහභාගිත්වයක් ඇති කරලා එයට ගෞරවයක් දෙන වැඩ පිළිවෙළක් සකස් කළා. ඒ වාගේම රණ විරුවන්ගේ දරුවන්ට ලේඛනයක් තිබුණා, දරුවන් පාසල්වලට ඇතුළත් කර ගන්නකොට එක පන්ති කාමරයකට දරුවන් 5දෙනකු ඇතුළත් කර ගන්නා ක්‍රමයක් ඇති කළා. හැබැයි වර්තමාන රජය බලයට පත් වුණාට පස්සේ, "දැන් යුද්ධයක් නැහැ. ඒ නිසා ඒ චක්‍රලේඛය අවශ්‍ය නැහැ"යි කියලා ඒ චක්‍රලේඛය පවා ඉවත් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. නිවාස, රැකියා ලබාදෙන වැඩ පිළිවෙළක් තිබුණා. ශුභ සාධන කටයුතුවලට ප්‍රමුඛතාවක් ලබා දුන්නා. මට මතකයි, ඒ කාලයේ මේ ඉන්දික අනුරුද්ධ මන්ත්‍රීතුමාගේ දිවුලපිටිය ආසනයේ පවා රණ විරු ගම්මාන ඉදි කරන්න පටන් ගත්ත බව. මේ අරමුදලේ නිර්මාතෘ ලලිත් ඇතුලත්මුදලි හිටපු ඇමතිතුමායි. එතුමා කරපු හොඳ වැඩ අදටත් පවතිනවා. "ඒවා වෙනත් ඇමතිවරයෙක්, වෙනත් ආණ්ඩුවකින් කරපු දේවල්" කියලා අපේ ආණ්ඩුව ඒ කටයුතු නැවැත්වූයේ නැහැ. ඒවාට උපරිම දායකත්වය ලබා දුන්නා. රණ විරුවන් කැමැත්තෙන් ගිහින් සටන් කරලා, ඒ කැප කිරීම් කළ නිසා තමයි, අවුරුදු 30ක් තිස්සේ තිබුණු යුද්ධය අවසන් කරන්න පුළුවන්කම ලැබුණේ. හැබැයි අද වෙලා තිබෙන්නේ මොකක්ද? අද ඒ රණ විරුවන්ට නිසි ගෞරවය ලබා දෙන්න මේ රජය කටයුතු කරනවාද? විශ්‍රාම වැටුප ඉල්ලාගෙන ජනාධිපති මන්දිරය ළඟට ගිය ආබාධිත රණ විරුවන්ට පහර දුන් හැටි පසුගිය කාලයේදී අපි දැක්කා. ඒ පහර දීම හරහා යුද්ධයෙන් ඇහැක් අහිමි වුණු රණ විරුවාගේ ඉතුරු ඇහැ ගලවා දැම්මා. අද රණ විරුවන් හිරගෙවල්වල ඉන්නවා. රණ විරුවන්ට සලකන්නේ නැහැ. රණ විරුවන්ගේ ශුභ සාධන කටයුතු පිළිබඳව සොයා බලන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, ඔබතුමා හරහා මා මේ ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, කරුණාකරලා ආබාධිත වුණු රණ විරුවන්ට දරුවකු ඉන්නවා නම්, ඒ පවුල් අසරණවෙලා ඉන්නවා නම්, ඒ දරුවන්ට උගත්කම තිබෙනවා නම්, ඔවුන්ට ප්‍රමුඛතාව දීලා ඒ දරුවන්ට රැකියා ලබා දෙන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්නය කියලා. ඒක රජයේ වග කීමක්; ලබා දිය යුතු දෙයක්.

රණවිරුවන්ට හිංසා කරන්නේ නැතිව, අපහාස කරන්නේ නැතිව ඒ කටයුතු කරන්න ඕනෑ. ගරු සරත් ෆොන්සේකා මැතිතුමා එදා හමුදා නිලධාරියකු හැටියට කටයුතු කරනකොට අපි එතුමාට ඒ ගෞරවය ලබා දුන්නා. දේශපාලනයට ඇවිත්, ඒ කුණු ගොඩට වැටුණාට පස්සේ එතුමා අද අපහාස විඳිනවා. ඒක වෙනම කාරණාවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ සංකල්පය තුළින් ගෙන ගිය වැඩ පිළිවෙළ තුළ අද අපි හැමෝටම නිදහසේ ජීවත් වෙන්නට පුළුවන්කම ලැබී තිබෙනවා. ඒ සඳහා ත්‍රිවිධ හමුදාපතිවරු සහ රණවිරුවෝත් ලොකු දායකත්වයක් දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා, උතුරේ වෙනම රාජ්‍යයක් ස්ථාපිත කරන කුමන්ත්‍රණය දශක ගණනාවක් තිස්සේ ක්‍රියාත්මක වෙන බව. ඒ අයට ඕනෑ වුණේ වෙනම රාජ්‍යයක් බිහි කරන්න අවශ්‍ය කටයුතු කරන්නයි. පෘතුගාලය සහ ඕස්ට්‍රේලියාව විසින් ගොනු කරන ලද "East Timor" නඩු තීන්දුවේ සඳහන් කර ඇති පරිදි, වෙනම රටක් ප්‍රකාශයට පත් කරන්න කාරණා හතරක් ඉටු වෙන්න ඕනෑ. "සුවිශේෂී අනන්‍යතාවකින් යුත් ජනතාවක් වෙසෙන විට, එම ජනතාවගේ පරමාධිපත්‍යය බිඳී ගොස් ඇත්නම් ඒ පරමාධිපත්‍ය බලය ක්‍රියාත්මක කිරීම මධ්‍යම ආණ්ඩුව විසින් සිදු කරන විට, එවැනි ජනතාවක් සමූලඝාතනයට ලක්ව සිටින විට සහ එම ජනතාවට දීර්ඝ කාලයක් මුළුල්ලේ නිරතුරුව අවමන් සහගත ලෙස සලකන විට" යනාදී වශයෙන් වන කරුණු හතරක් සම්පූර්ණ වන්න ඕනෑ. අද ඒ කරුණු හතර ඉෂ්ට කරගන්න උතුරේ ප්‍රධාන ඇමතිවරයා කටයුතු කරන හැටි අපි දකිනවා. පසුගිය දවසක කියා තිබුණා දැන් උතුරේ සියයට 99ක් ඉන්නේ දෙමළ ජනතාවයි කියලා. එහි සිටි සිංහල, මුස්ලිම් ජනතාවට මොකද වුණේ කියලා අද සොයා බලන්න ඕනෑ. ඒ ජනතාව ජනවාර්ගික යුද්ධයකට පටලවා ඝාතනය කරමින් ඒ ප්‍රදේශවලින් පළවා හරින්න එදා කටයුතු කළා. වර්තමානයේ ඒ ප්‍රධාන අමාත්‍යවරයා ප්‍රසිද්ධියේ කියා සිටිනවා සිංහල සහ මුස්ලිම් ජනතාවට උතුරේ ජීවත්වීමට අයිතියක් නැති බව හා එය දෙමළ ජනතාවගේ නිජබිම බව. මේ කරුණු කියන්නේ මම කලින් කී ඒ කාරණා හතර ඔප්පු කරන්න නොවෙයිද? ඒ වාගේම, යුද්ධයක් පවතින කාලය තුළ සේම අනෙකුත් අවස්ථාවලදීද දෙමළ ජනතාව සමූලඝාතනයට ලක්ව ඇතැයි උතුරේ ප්‍රධාන අමාත්‍ය විග්නේෂ්වරන් පුන පුනා කියන්නේ, "එවන් වූ අනන්‍යතාවක් ඇති ජනතාවක් සමූලඝාතනයට ලක්ව සිටී නම්" යන කොන්දේසිය සම්පූර්ණ කරගන්න නොවෙයිද?

එසේ නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ අරමුදල් පිහිටුවා විතරක් හරියන්නේ නැහැ. රටේ ජාතික ආරක්ෂාව පිළිබඳව රජය අවධානය යොමු කරන්නට ඕනෑ. අද රටේ ජාතික ආරක්ෂාව බිංදුවට වැටිලා තිබෙන්නේ. පසුගිය කාලයේ අපි දැක්කා, උතුරු නැහෙනහිර පළාත්වල එල්ටීටීඊ සංවිධානයට සම්බන්ධ පුද්ගලයන් දේශපාලන අධිකාරිය සමඟ සම්බන්ධ වෙලා ත්‍රස්තවාදීන් සමරන හැටි. අද සමහර අය උත්සාහ කරනවා ත්‍රස්තවාදීන් දේශපාලන සිරකරුවන් ලෙසට හඳුන්වා දෙන්නට. අද රණවිරුවන්ට අපහාස කරමින්, මහ බැංකුවට ගහපු

අය දේශපාලන සිරකරුවන් කියලා නිදහස් කරනවා. ඒ වාගේ තත්ත්වයක් අද රටේ පවතිනවා. මේ තත්ත්වය රටේ ජාතික ආරක්ෂාවට බරපතළ ප්‍රශ්නයක්. අද අපි පිටරටවලට යන කොට - යුරෝපයේ රටවලට යනකොට- ප්‍රභාකරන්ගේ පින්තූර ගහගෙන සල්ලි එක්කාසු කරන හැටි පෙනෙනවා. ඒ නිසා අපේ තානාපති කාර්යාල හරහා මොනවාද සිද්ධ වෙන්නේ කියන එක අපි සොයා බැලිය යුතුයි. ඔවුන් අද ඒ සල්ලි එකතු කරන්නේ අපේ රටට ආධාර කරන්නද? නැහැ. අරමුණ ඉටු කරගැනීම සඳහා අද ඔවුන් ඒ කටයුතු කරගෙන යනවා. විශේෂයෙන් ආණ්ඩුව මේ ගැන අවධානය යොමු කරන්න ඕනෑ. අපි පිටරටවල ඉන්න එල්ටීටීඊ හිතවාදී දෙමළ කණ්ඩායම්වල අවශ්‍යතා ඉටු කරන්න හොඳ නැහැ. නමුත් අද මේ ආණ්ඩුවට එහෙම කරන්න බැරිකමක් තිබෙන්නේ මොකද? පසුගිය ජනාධිපතිවරණයේදී ඡන්ද ලබාගැනීම සඳහා එල්ටීටීඊ හිතවාදී දෙමළ ඩයස්පෝරාවට ලබා දුන් පොරොන්දු ඉටු කරන්න යන නිසා තමයි අද මේ ජාතික ආරක්ෂාව බිඳ වැටෙන තත්ත්වයට පත්ව තිබෙන්නේ. ඒ වාගේම අපි දකිනවා, අගමැතිතුමාට එරෙහිව විශ්වාස භංග යෝජනාව ගෙනා වෙලාවේ දෙමළ ජාතික සන්ධානය කළ ඉල්ලීම් ඉටු කරන්න අද ආණ්ඩුව කටයුතු කරන හැටි. කප්පම් ලබා දෙමින් ආණ්ඩු බලය රැක ගැනීම සඳහා ජාතික ආරක්ෂාව හැල්ලුවට ලක්කරන්න හොඳ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද රටේ ජාතික ආරක්ෂාවට ආර්ථිකයේ කඩා වැටීමත් බල පා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ඔබතුමා දැන් කථාව අවසන් කරන්න අවශ්‍යයි.

ගරු ප්‍රසන්න රණතුංග මහතා
(මාණ්පුමිකු පිරසන්න රණතුංග)
(The Hon. Prasanna Ranatunga)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කරුණු පිළිබඳව අවධානය යොමු කරන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. S. Shritharan. You have 20 minutes.

[ප.ව. 1.44]

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(මාණ්පුමිකු සි. සිරීදරන්)
(The Hon. S. Shritharan)
කෞරව ප්‍රතිච් සභානායකර් අවර්කළේ, තේසිය පාතුකාප්පු නිතියම් (තිරුත්තම්) සට්ටමූලත්තෙ අංගීකරිප්පතර්කාන ඉන්‍රෙය විවාතත්තිල් මික මුක්කියමාන සිල විටයංකළෙ මුන්වෙක්ක විළෛකින්‍රේන්. ඉලංකෙයිලේ පාතුකාප්පු අමෛච්චිර්කාක ඔදුක්කප්පටුකින්‍ර නිතියින් අළවු තොටර්න්තුම් අතිකරික්කප්පට්ටුක්කොණ්ටිරුක්කින්‍රතු. අතාවතු, ඉන්‍ර නාට්ටිලේ යුත්තම් මුටින්තු 9 ආණ්ටුකළ් නිර්වෙටෛන්තු විට්ටතාකච් චොල්ලප්පටුකින්‍රපෝතිලුම් අපිවිරුත්ති වේලෛත් තිට්ටංකළුක්කාක ඔදුක්කප්පටුකින්‍ර නිතියිනෛවිට, පාතුකාප්පුක්කාකප් පල කෝටි රූපාය් අතිකමාක ඔදුක්කප්පටුකින්‍රතු. අන්ත ඔදුක්කීටුකළ් එන්පතු ඒන් ඉව්වළවු තූරම් ඉන්‍ර නාට්ටිලේ නටෛපෙ‍රවේණ්ටුම්? එන්පතෛ මුතලිල් නාංකළ් චින්තික්ක වේණ්ටුම්. කුර්ප්පාක, ඉලංකෙයින් වටක්කු, කිළක්කු මාකාණංකළිල් ඔන්‍රරෛ ඉලට්චත්තිර්කුම් මේර්පට්ට ඉරාණුවත්තිනර් මුකාම්කළිල් වෛක්කප්පට්ටිරුක්කින්‍රාර්කළ්. ඉතනෛවිට, කටර්පටෛයිනර්, විමානප්පටෛයිනර්, පොලිසාර් එන්‍ර වකෛයිලුම් පාතුකාප්පුප් පටෛයිනර් ඉරුක්කින්‍රාර්කළ්. ඉවර්කළුක් කප්පාල් ඉලංකෙයිනුටෛය ඉරාණුවප් පිරිවින් කට්ටුප්පාට්ටින්කීළ් වරාත CSD එන්‍රු චොල්ලප්පටුකින්‍ර Civil Security Department - චිවිල් පාතුකාප්පුත් තිණෛක්කළ උත්තියෝකත්තර්කළුම් අංකේ කටමෛයිල් ඊටුපටුත්තප් පටුකින්‍රාර්කළ්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
Order, please! Will an Hon. Member propose the Hon. Mujibur Rahuman to the Chair?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
I propose that the Hon.Mujibur Rahuman do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විටුක්කප්පට්ටු ඒර්ර්ුක්කොළ්ළප්පට්ටතු.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මුජීබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය.
අතන්පිරකු, මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ් අක්කිරාසනත්තිනින්‍රු අකලවේ, මාණ්පුමිකු මුජිපුර් රහූමාන් අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.
Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. MUJIBUR RAHUMAN *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
කෞරව උරුප්පිනර් අවර්කළේ, උංකළතු උරෛයෛත් තොටරුංකළ්.

ගරු එස්. ශ්‍රීතරන් මහතා
(මාණ්පුමිකු සි. සිරීදරන්)
(The Hon. S. Shritharan)
කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, එනක්කු ඔදුක්කප්පට්ට 20 නිමිටංකළිල් 5 නිමිටංකළෛච් චක පාරාළුමන්‍ර උරුප්පිනර් වියාළේන්තිරන් අවර්කළුක්කු වළංකුකින්‍රේන්. ආකවේ, එනක්කු15 නිටංකළෛ ඔදුක්කිත් තාරුංකළ්.

මික මුක්කියමාක, ඉලංකෙයිනුටෛය පාතුකාප්පුච් චෙලවිනංකළුක්කාක ඔදුක්කප්පටුකින්‍ර නිති, ඉන්‍ර නාට්ටිනුටෛය මක්කළ් තොකෛයුටන් ඔප්පිටුකින්‍රපෝතු, වීක්කමානතාක උළ්ළතු එන්පතෛ ඉන්‍ර නාටු උණර්න්තු කොළ්ළ වේණ්ටුම්. ඉලංකෙයිලිරුක්කින්‍ර පටෛයිනරෛ 9 මාකාණංකළුක්කුම් පිරිත්තුප් පාර්ක්කින්‍රපෝතු ඔව්වොරු මාකාණත්තිර්කුම් ඉරුක්කවේණ්ටිය තොකෛයිනෛවිට අතිකමාන තොකෛයිනර් වටක්කිලුම් කිළක්කිලුම් ඉරුක්කින්‍රනර්. ඒන් ඉව්වළවු තොකෛයාන පටෛයිනර් අංකු කුවික්කප්පට්ටිරුක්කින්‍රනර්? අවර්කළුක්කාක වරුටා වරුටම් පෙරුමළවු නිති ඔදුක්කප්පටුවතන්මූලම් ඒනෛය අපිවිරුත්ති නටවටික්කෛකළ් මුටක්කප්පටුකින්‍රන.

වටක්කිලුම් කිළක්කිලුම් ඉරාණුවත්තිනර් චෙය්ත ඉනප් පටුකොලෛකළ් උලකම් අර්පින්තතු. ඉන්‍රු උලකත්තිලේ අන්ත ඉනප් පටුකොලෛක්කාන විචාරණෛකළ් මේර්කොළ්ළප්

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

பட்டுக்கொண்டிருக்கின்றன. பல இராணுவத் தளபதிகள் இந்த இனப் படுகொலையிலே நேரடியாக ஈடுபட்டார்கள். இன்று பாராளுமன்றத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற

[මුලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

உட்படச் சம்பந்தப்பட்ட எல்லாருமே ஈடுபட்டார்கள் என்பது நிதர்சனமான உண்மை. இவ்வாறான ஒரு சூழலில்தான் இந்த நாட்டிலே நடந்த பெருமளவான இனப் படுகொலைகளுக்குப் பின்னாலிருந்த இராணுவத்தினர் இன்று யாழ்ப்பாணத்திலே மரம் நடுவதற்கும் பாதைகளை அமைப்பதற்கும் மக்களுக்கு வீடு கட்டிக் கொடுப்பதற்கும் முன்னிற்கின்றார்கள் என்ற ஒரு மாயைத் தோற்றத்திற்குள்ளே அவர்கள் கொண்டுவரப்படு கின்றார்கள்.

இன்று கிளிநொச்சி மாவட்டத்திலேயிருக்கின்ற இரணைமடுக் குளத்தினுடைய பின் பகுதியிலே ஒரு பாரிய இராணுவக் குடியிருப்பொன்று உருவாக்கப்பட்டிருக்கின்றது. அதற்குள்ளே ஏனையவர்கள் யாருமே செல்ல முடியாது. பாரியளவான காடு அழிக்கப்பட்டு, இரும்புக் கூடுகள் என்று முதலிலே நாங்கள் அழைத்த அந்தப் பொருத்து வீடுகள் போன்ற வீடுகள் அமைக்கப்பட்டு, அந்தக் குடியிருப்புக்கள் உருவாக்கப்பட்டிருக்கின்றன. ஏன் இந்த நாட்டிலே இவ்வாறான செயற்பாடுகள் நடைபெற்றுக்கொண்டிருக் கின்றன? இதனைவிட, பல்வேறுபட்ட இடங்களிலே படையினருடைய உதவியோடு, சிங்கள மக்கள் அடாத்தாகக் குடியேறுதல், தொழிலில் ஈடுபடுதல் போன்ற செயல்கள் இடம்பெற்றுக் கொண்டிருக்கின்றன. இந்தச் சபையிலே குறித்த நிதி அந்த விடயத்திற்காகவா ஒதுக்கப்படுகின்றது?

இன்று வடமராட்சி கிழக்கிலே குறிப்பாக மருதங்கேணி, உடுத்துறை, தாளையடி, கட்டைக்காடு, புல்லாவெளி, வெற்றிலைக்கேணி வரையும் வாழ்கின்ற மக்கள் கொதித்துக் கொண்டிருக்கின்றார்கள். ஏனெனில், அங்கிருக்கின்ற சிலருக்குச் சில பணத்தாசை காட்டிவிட்டு, அவர்களுடைய பகுதிகளிலே அட்டை பிடிக்கின்ற தொழில்களிலே தென் பகுதியைச் சேர்ந்த சிங்கள சமூகத்தைச் சேர்ந்தவர்களும் முஸ்லிம் சமூகத்தைச் சேர்ந்தவர்களும் ஈடுபடுகின்றார்கள். இதனால், வழமையாகவே தங்களுடைய பாரம்பரியமான மீன்பிடித் தொழிலிலே ஈடுபடுகின்ற மக்கள் பாரியளவிலான பொருளாதாரச் சரிவுகளைச் சந்தித்திருக்கின்றார்கள். இது தொடர்பாக கௌரவ பிரதமர் அவர்களோடும் மீன்பிடித் துறை அமைச்சர் அவர்களோடும் எங்களுடைய கட்சி பேசியிருந்தது. ஆனால், அதுகுறித்த எந்த நடவடிக்கையும் இந்த நாட்டிலே மேற்கொள்ளப்படவில்லை.

நேற்றைய ஊடகச் செய்திகளைப் பார்க்கிறபொழுது, சனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்கள்கூட, தன்னை ஏற்றி வைத்த ஏணியைக் காலால் உதைக்கின்ற வேலையில் இறங்கியிருக்கிறார் என்பது வெளிப்படையாகத் தெரிகின்றது. மைத்திரிபால சிறிசேனவும் எங்களுக்கு எதிரி; மஹிந்த ராஜபக்ஷவும் எங்களுக்கு எதிரி. ஆனால், ஓர் எதிரி மாற்றம் - ஓர் ஆட்சி மாற்றத்திற்காக வாக்களியுங்கள் என்று நாங்கள் எங்களுடைய மக்களிடம் கேட்டு, மைத்திரிபால சிறிசேன அவர்கள் இந்த நாட்டின் ஜனாதிபதியாகக் கொண்டு வரப்பட்டார். அவ்வாறு எங்களால் கொண்டுவரப்பட்ட மைத்திரிபால சிறிசேன அவர்கள் நேற்றுத் தமிழ்த் தேசியக் கூட்டமைப்பின் முகத்திலே தன்னுடைய காலால் எட்டி உதைத்திருக்கிறார். அதாவது, எதிர்க்கட்சியினராக இருந்தாலும் வடக்கு, கிழக்கு அபிவிருத்தியிலே ஈடுபட வேண்டிய, அந்தப் பிரதேசத்தைப் பிரதிநிதித்துவப்படுத்து கின்ற 15 பாராளுமன்ற உறுப்பினர்களும் இன்று உருவாக்கப்பட்டிருக்கின்ற வடக்கு, கிழக்குச் செயலணியி லிருந்து ஒதுக்கப்பட்டிருக்கின்றார்கள்; கருத்தில் எடுத்துக் கொள்ளப்படாமல் விடப்பட்டிருக்கின்றார்கள். ஆகவே, நாட்டின் சனாதிபதி அவர்களுடைய இன்றைய நிலை என்ன? பாதுகாப்பு அமைச்சு சம்பந்தப்பட்ட விடயத்தில் இது மிக முக்கியமான கேள்வி. இதேபோல பல்வேறுபட்ட சம்பவங்கள் இந்த நாட்டிலே இடம்பெறுகின்றன. அதியுத்தம சனாதிபதியிலிருந்து அரசியல் தலைவர்கள் வரை, இந்த நாட்டிலே புரையோடிப்போயிருக்கின்ற தமிழர்களுக்கான இனப் பிரச்சினையை - அந்த மக்கள் 70 ஆண்டுகளுக்கு மேலாக பாதிப்புக்குள்ளாவதற்குக் காரணமான பிரச்சினையை - தீர்ப்பதற்கு இன்னும் சரியானதொரு வழியை கண்டுபிடிக்கவில்லை. ஆனால், வரவு செலவுத்திட்டத்தில் யுத்தத்துக்காக வருடா வருடம் பெருந்தொகைக் காசு ஒதுக்கப்படுகிறது.

இன்று தமிழர்களுடைய வளங்கள் சுரண்டி எடுக்கப்படுகிறன. தென்பகுதியை மையமாக இருக்கின் றவர்களை வைத்து வடமராட்சிக் கிழக்கிலே இருக்கின்ற மீன்வளம் சுரண்டி எடுக்கப்படுகிறது. அதேபோல, முல்லைத்தீவு மாவட்டத்தில் 26 கிலோமீற்றர் நீளமான கடற்கரைப் பிரதேசங்களில் தென்பகுதியைச் சேர்ந்தவர்களை வைத்து, கரைவலைப்பாடுகள் என்ற அடிப்படையிலே அந்த மக்களின் சொத்துக்கள் சூறையாடப்படுகின்றன. தமிழ் மக்கள் யுத்தத்தைச் சந்தித்து, தொழில் இல்லாமல் - வேலைவாய்ப்பு இல்லாமல், கடல் பொருளாதாரத்தையும் விவசாயப் பொருளாதாரத்தையும் நம்பியிருக்கின்ற சூழலில், இராணுவம் மற்றும் படையின் உதவியோடு அவர்களுடைய மீன்வளம் - கடல் வளம் அபகரித்துச் செல்லப்படுகின்றது.

அதேநேரம், இராணுவத்துக்குக் கீழே இல்லாமல், சனாதிபதி தனக்குக் கீழே வைத்திருக்கின்ற சிவில் பாதுகாப்புப் பிரிவினர், வடக்கிலும் கிழக்கிலும் தமிழ் மக்களுடைய 20க்கும் மேற்பட்ட விவசாயப் பண்ணைகளை நடத்துகிறார்கள்; அங்கிருந்து பெறப்படுகின்ற விளைச்சல்களை வெளிச்சந் தைக்குக் கொண்டு வந்து விற்கிறார்கள். அதாவது குறைந்த செலவோடு உற்பத்தி செய்கின்ற உற்பத்திப் பொருட்கள் சந்தைகளில் ஆகக்குறைந்த விலைகளிலே விற்கின்றார்கள். இதனால் அங்கே வாழுகின்ற தமிழர்கள் விவசாயம் செய்ய முடியாது. அத்துடன் அங்கு இராணுவம் மற்றும் கடற்படையின் உதவியோடு தென்பகுதியைச் சேர்ந்தவர்கள் கடற்றொழிலே ஈடுபடுகிறார்கள். இராணுவம் சலூன் நடத்துகின்றது. ஆகவே, அவர்கள்தான் தலைமயிர் வெட்டுகின்ற தொழிலிலும் ஈடுபடுகின்றார்கள். அங்குள்ள பொறியியல் வேலைகளையும் இராணுவம்தான் மேற்கொள்கின்றது.

அதைவிட அவர்கள் அங்கு ஒவ்வொரு பிரதேச சபைக்கும் சென்று, "நாங்கள் அந்த road ஐ அமைக்கப்போகின்றோம்; இந்த road ஐ அமைக்கப்போகின்றோம்; எங்களுக்கு 'மகநெகும' ஊடாகக் காசு ஒதுக்கப்பட்டிருக்கிறது; போக்குவரத்து அமைச்சினூடாக காசு ஒதுக்கப்பட்டிருக்கிறது" என்றெல்லாம் சொல்கின்றார்கள்; குறித்த தொழில்களில் ஈடுபடுகிறார்கள். உதாரணமாக, கிளிநொச்சியிலே இருக்கின்ற சர்வதேச விளையாட்டுத்தளத்தில் - மஹிந்த ராஜபக்ஷ காலத்திலே விளையாட்டு மைதானம் என்ற பெயரோடு உருவாக்கப்பட்ட ரொட்ரிகோ மைதானம் - இராணுவத் தினரின் கைகளில் ஒப்படைக்கப்பட்டு, அங்கு வேலைத்

திட்டங்கள் நடைபெறுகின்றன. அந்த வேலைகளைச் செய்ய இலங்கையில் வேறு ஓர் ஒப்பந்தக்காரர் இல்லையா? வடக்கு, கிழக்கில் இருக்கின்ற ஒப்பந்தக்காரர்கள் அதைச் செய்யமாட்டார்களா? இராணுவத்துக்குச் சம்பளம், pension முதலிய சகல கொடுப்பனவுகளும் வழங்கப்படுகின்றன. ஆனால், இந்த இராணுவத்தினரை வைத்து, கடலில் மீன்பிடித் தொழில் நடத்தப்படுகின்றது; தோட்டத் தொழில் செய்யப்படுகின்றது. அவர்களின் பொறியியல் பிரிவினூடாக பாதைகள் அமைக்கப்படுகின்றன. இதனைவிட, ஏனைய ஒப்பந்த வேலைகளையும் அவர்களே செய்கிறார்கள். ஆகவே, தமிழர்கள் எங்கே போவது? அவர்களுடைய தொழில் என்ன? யுத்தத்துக்குப் பிறகு, வடக்கிலும் கிழக்கிலும் ஒரு தொழிற்சாலை ஆரம்பிக்கப்பட்டதாக அரசாங்கத்தில் இருக்கின்ற யாராவது நெஞ்சை நிமிர்த்திச் சொல்லட்டும்! யுத்தத்துக்குப் பிறகு அந்த மக்களுடைய வாழ்க்கையிலே என்ன மாற்றங்கள் கொண்டு வரப்பட்டிருக்கின்றன?

2015ஆம் ஆண்டு எந்த அரசாங்கத்தை தமிழ் மக்கள் தெரிவு செய்தார்களோ, அந்த அரசாங்கத்தின் பல அமைச்சர்கள் வடக்கிலும் கிழக்கிலும் சிறந்த முறையில் செயற்படவில்லை. அமைச்சர் லக்ஷ்மன் கிரிஎல்ல அவர்களை நான் குறிப்பிடவில்லை. அவர் நீதியாகச் சில வேலைகளைச் செய்திருக்கிறார். ஏனைய பல அமைச்சர்கள் வடக்கிலும் கிழக்கிலும் இருக்கின்ற அரச செயலகங்களில் குறிப்பாக தொல்பொருள் திணைக்களம், இலங்கை மின்சார சபை, நில அளவைத் திணைக்களம், சூழலியல் திணைக்களம், மாவட்டச் செயலகங்கள் மற்றும் பிரதேசச் செயலகங்களில் காணப்படுகின்ற சாரதி, காவலாளி, peon - அலுவலக உதவியாளர் - போன்ற வெற்றிடங்களை எல்லாம் தென் பகுதியைச் சேர்ந்த சிங்கள இளைஞர், யுவதிகளைக் கொண்டு நிரப்புகின்றார்கள். ஆனால், அங்கே அந்த ஊழியர்கள் ஒரு வருடம் பணி புரிந்துவிட்டுத் திரும்பவும் இங்கே வந்துவிடுகிறார்கள்.

இன்று யாழ்ப்பாண மாவட்டத்திலே கிட்டத்தட்ட 40,000 பேர் சமூர்த்தி கோரி விண்ணப்பித்திருக்கின்றார்கள். ஆனால், அவர்களுக்கு இன்னம் சமூர்த்தி வழங்கப்படவில்லை. கிளிநொச்சியிலே இன்னும் 13,000 பேருக்கு சமூர்த்தி வழங்கப்பட வேண்டும். அதற்காக அவர்கள் விண்ணப்பித் திருக்கின்றார்கள். ஆனால், இன்னும் வழங்கவில்லை. அங்கு இளைஞர் யுவதிகள் தொழிலுக்குச் செல்வதற்கான வேலைத்தளங்கள், தொழிற்சாலைகள் இல்லை. இத்தகைய ஒரு சூழலிலேயே இலங்கையின் பாதுகாப்புப் படைகளுக்கு வருடா வருடம் நிதி ஒதுக்கப்படுகின்றது.

புரையோடிப்போயிருக்கின்ற இனப் பிரச்சினையைத் தீர்ப்பதில் அரசாங்கம் ஒரு சாண்கூட முன்னேறவில்லை. இதிலே அமெரிக்கா, இந்தியா மற்றும் ஐரோப்பிய நாடுகள் தலையிட்டிருக்கின்றன. இது சம்பந்தமாக எவ்வளவோ உறுதிமொழிகள் தரப்பட்டிருக்கின்றன. இவ்வளவு நடந்தும் எந்த முன்னேற்றமும் இடம்பெறவில்லை. ஆகவே, அமெரிக்காவும் இந்தியாவும் ஐரோப்பிய நாடுகளும் இதில் கூடுதல் கவனம் செலுத்த வேண்டுமென்று இந்தச் சபையினூடாகப் பகிரங்கமாகவே கேட்கின்றோம். இந்த இலங்கையில் புரையோடிப் போயிருக்கின்ற இனப் பிரச்சினையைத் தீர்த்துவைப்பதில் அரசாங்கத்தில் இருக்கின்றவர்கள் கரிசனையற்றவர்களாக அல்லது அக்கறையற்றவர்களாகவே இருக்கின்றார்கள் என்ற எண்ணம் தமிழர்கள் மத்தியில் வளர்ந்துகொண்டு செல்கின்றது. ஆனால், இந்த விடயத்தில் நாங்கள் யாருமே விரோதமாகப் பேசவில்லை.

எனக்கு முன்னர் பேசிய கௌரவ உறுப்பினர் அவர்கள், சம்பந்தப்பட்டவர்கள் பிரபாகரனுடைய படத்தை வைத்துச் அஞ்சலி செலுத்தியதாகச் சொன்னார். ஆனால், நடந்து முடிந்த முள்ளிவாய்க்கால் தின நிகழ்விலே சம்பந்தப்பட்ட மக்கள் வடக்கு, கிழக்கின் எந்தவோர் இடத்திலாவது தங்களுடைய தேசியத் தலைவர் பிரபாகரனுடைய படத்தை வைத்து அஞ்சலி செலுத்தவில்லை. ஆனால், அவர்கள் யுத்தத்திலே இறந்து போன, காணாமற்போன 1,46,000 க்கும் மேற்பட்ட மக்கள் குறித்து அஞ்சலி செலுத்தி, வணக்கம் செலுத்தி, தமது கடமைகளைச் செய்தார்கள். இது 2015க்கு முன்பு தடுக்கப்பட்டிருந்தது. ஆனால், இன்று நாங்கள் உங்களோடு இணைந்து ஓர் ஆட்சி மாற்றத்தைக் கொண்டுவந்து, நீங்கள் சொல்கின்ற நல்லாட்சியை உருவாக்கித் தந்தவர்கள் என்ற அடிப்படையில், துயிலும் இல்லங்களுக்குச் செல்ல உங்களிடம் அனுமதி கேட்டோம்; சில துயிலும் இல்லங்களுக்கு இதுவரையும் சென்று வருகின்றோம்; எங்களுடைய இறந்து போன மக்களுக்காக வணக்கம் செலுத்த முயற்சிக்கின்றோம். 2015ஆம் ஆண்டிலிருந்து அதனைத்தான் முள்ளிவாய்க்காலிலே செய்து வருகின்றோம். ஆனால், இந்தச் செயற்பாட்டை யாருடைய மனதையும் நோகடிக்க வேண்டுமென்று செய்யவில்லை.

யுத்தத்திலே மக்கள் கொல்லப்பட்டமை, காணமலாக்கப் பட்டமை உண்மை! கிளிநொச்சியிலும் முல்லைத்தீவிலும் திருகோணமலையிலும் வவுனியாவிலும் காணாமலாக்கப் பட்டவர்களின் உறவுகள் தொடர்ந்தும் போராடிக்கொண்டிருக் கின்றார்கள். அவர்களுடைய போராட்டம் இரண்டு வருடங்களை நெருங்கப்போகின்றது. ஆனால், அவர்களை அரசாங்கம் ஏன் மனிதர்களாகக் கவனிக்கவில்லை? ஏன் அவர்கள் பற்றிச் சிந்திக்கவில்லை? இவ்வாறான நிலைமைகளுக்கு மத்தியில்தான் பாதுகாப்புக்காக நிதி ஒதுக்கப்படுகின்றது.

குறிப்பாக வடக்கு, கிழக்கைச் சேர்ந்த அரசியல் கைதிகளான இளைஞர், யுவதிகள் விடுதலை செய்யப்படாமல் இன்றும் சிறையிலே செத்துக் கொண்டிருக்கின்றார்கள். கிளிநொச்சியைச் சேர்ந்த ஆனந்த சுதாகரனுடைய இரண்டு குழந்தைகளும் தமது தாய் இறந்த பின்னர் ஜனாதிபதிக்குக் கடிதம் எழுதினார்கள். அதாவது, நீங்கள் செய்த கொடுமைகளை, இன அழிப்புக்களையெல்லாம் மறந்து அந்தக் குழந்தைகள் "ஜனாதிபதி மாமா, எங்கள் அப்பாவை விடுவியுங்கள்" என்றுதான் கடிதம் எழுதியிருந்தார்கள். ஆனால், அரசாங்கத்தின் இதயப் பகுதிகள் இன்னும் திறக்கப்படவில்லை. எதிர்வரும் 18 ஆம் திகதி கிளிநொச்சிக்கு ஜனாதிபதி அவர்கள் வரவிருப்பதாக செய்திகள் அடிபடுகின்றன. ஆனால், ஆனந்த சுதாகரனுடைய குடும்பத்திற்கு அதாவது தாய் இல்லாமல், தந்தை சிறையிலே இருக்கின்ற சூழலில் வாழ்கின்ற அந்தக் குழந்தைகளுக்கு ஜனாதிபதி அவர்கள் என்ன பதில் சொல்லப்போகின்றார்? இந்த நிலையிலேயே ஜனாதிபதி அவர்கள் கிளிநொச்சியிலே நாலாயிரம் சிறுவர்களை அழைத்துக் கூட்டம் நடாத்த விருக்கிறார்.

இம்முறை ஜனாதிபதி அவர்கள் கிளிநொச்சி வருவது இரண்டாவது தடவை என்று நினைக்கின்றேன். அதேநேரம் பிரதமர் கிளிநொச்சி வருகிறார்; அமைச்சர்கள் வருகின்றார்கள். ஏதோ இந்த நாட்டில் சமாதானம் நிலவுவதுபோல, எல்லாமே நல்லதாக நடப்பதுபோல அவர்கள் எல்லோருமே காட்டிக்கொள்கிறார்களே தவிர - அவ்வாறான ஒரு படத்தை ஓட்டுகின்றார்களே தவிர, அந்த மக்களுடைய உண்மையான, ஆத்மார்த்தமான பிரச்சினையை யாரும் தெளிவாகக் கையாளுகின்ற நிலைமை ஏற்படவில்லை என்பது

[ගරු එස්. ශ්‍රීතරන් මහතා]

දුරදිරුෂ්ටවසමානයි. ඒ ඇයි මේ තත්ත්වය? ජනාධිපතිතුමාට ප්‍රශ්නයක් තියෙනවා, අගමැතිතුමාට ප්‍රශ්නයක් තියෙනවා කියලා තමන්ගේ ඇතුළේ ඒ දෙන්නා දෙවිදිහට කතා කරනවා. එකට එක්ව ගිය ආණ්ඩුව එකට එක්ව යන්න බැරි තත්ත්වයක් තියෙනවා කියලා කියනවා. ඒ වගේ තත්ත්වයක් තියෙනවා නම් ඒ ආණ්ඩුව ඉල්ලා අස්වෙලා අලුත් ආණ්ඩුවක් ගෙනෙන්න ඕනෑ

ගැන අපි කථා කළා. ගරු එම්.ඒ. සුමන්තිරන් මන්ත්‍රීතුමාත්, මමත් යෝජනා කළා, ජනාධිපතිතුමා හෝ අගමැතිතුමා හෝ ජනාධිපතිතුමා නම් කරන කැබිනට් ඇමතිවරයෙක් මේ අරමුදල භාරව කටයුතු කළ යුතුයි කියා. නිලධාරියකුට ඒ වගකීම පවරන්න එපාය කියා අපි යෝජනා කළා. අත්දැකීම් ඔස්සේ කථා කරනකොට අපිට සිල් රෙදි සිද්ධිය මතක් වෙනවා. අද ජනාධිපති ලේකම් හැටියට කටයුතු කරන්නේ ඔස්ටින් ප්‍රනාන්දු මැතිතුමායි. ආරක්ෂක ලේකම්වරයා හැටියට කටයුතු කරන්නේ කපිල වෛද්‍යරත්න මැතිතුමායි. මේ නිලධාරි දෙපළ මේ රටේ හොඳ කීර්ති නාමයක් තිබෙන, කිසිම කිලුටක් ඇඟේ ගාවා නොගත් නිලධාරීන් හැටියට අපට හඳුන්වන්න පුළුවන්. මේ වාගේ වගකීම් අපි නිලධාරීන්ට භාර දෙනකොට අනාගතයේදී යම්කිසි ගැටලු මතු වෙන්න පුළුවන්. ඒ නිසා අපි කියන්නේ, අප ආංශික අධීක්ෂණ කාරක සභාවේදී යෝජනා කළ පරිදි ජනාධිපතිතුමා හෝ අගමැතිතුමා හෝ ජනාධිපතිතුමා නම් කරන කැබිනට් ඇමතිවරයකුට මේ වගකීම පවරන්න කියායි. නිලධාරියකුට මේ වගකීම පවරන්න එපා. ඒ ඉල්ලීම තමයි අපි කරන්නේ.

ආණ්ඩු පක්ෂය එම යෝජනාවට ඇහුම් කන් දීලා, අද මේ පිළිබඳව ඡන්දය විමසන්න කලින් අවශ්‍ය කරන ඒ සංශෝධනය කරයි කියා අපි බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ කාරණයත් පැහැදිලි කරන්න ඕනෑ. මේ අරමුදලට විශාල මුදලක් දැන් එකතුවෙලා තිබෙනවා. මේ රටේ ජනතාව, විදේශ ජනතාව වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරු මේ අරමුදල වෙනුවෙන් මුදල් පරිත්‍යාග කර තිබෙනවා. අද වනකොට රුපියල් බිලියනයකට -රුපියල් කෝටි 100කට- වැඩි ප්‍රමාණයක් මේ අරමුදලට එකතුවෙලා තිබෙනවා. ඒ නිසා, රටේ ආබාධිත රණ විරුවන් සම්බන්ධයෙන් පවතින ප්‍රශ්නවලට විසඳුම් හොයන්න මේ මුදල් පාවිච්චි කරන්න පුළුවන්; ඒ අයගේ නිවාස හදන්න මේ මුදල් ප්‍රයෝජනයට ගන්න පුළුවන්. දේශපාලන කෝණයකින් බලන්නේ නැතිව; දේශපාලනයකට ලක් වන්නේ නැතිව මේ රටේ ජනතාව සහ රණ විරුවන් වෙනුවෙන් මේ රට නැවත වරක් එක් සේසත් කරන්න මේ මුදල් පාවිච්චි කරන්න පුළුවන් කියන කාරණය මා මේ අවස්ථාවේදී පාර්ලිමේන්තුවට ප්‍රකාශ කරන්න කැමැතියි.

අවුරුදු 30ක් තිස්සේ තිබුණු යුද්ධය අපි නිමා කළා. යුද්ධය ජයග්‍රහණය කළාට පස්සේ මේ රට සැබෑ වශයෙන් එක් සේසත් කරන්නත්, ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුම් හොයන්නත් කිසිම ආණ්ඩුවක් තවම ඉදිරිපත් වෙලා නැහැ. ඒ ගැන අපි කනගාටු වනවා. පාර්ලිමේන්තු සභා ගර්භය තුළ කථා කරන කොට දේශපාලනයෙන් තොරව, රටට අවශ්‍ය කරන දේ පිළිබඳව අපි කථා කළ යුතුයි. මෙවැනි පනත් ඉදිරිපත් කරනකොට පාර්ලිමේන්තුවේ කාරක සභා හරහා එන යෝජනාවනුත් මේ පනත්වලට ඇතුළත් කරන්න කියා තමයි අපි මේ අවස්ථාවේදී ආණ්ඩුවෙන් ඉල්ලා සිටින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. මෙය රටට අවශ්‍ය කරන හොඳ පනතක්. නමුත් ආණ්ඩු පක්ෂයේ සහ මේ පිළිබඳව ආංශික අධීක්ෂණ කාරක සභාවේ සිටින මන්ත්‍රීවරුන් හැටියට අපි ඉදිරිපත් කර තිබෙන යෝජනාත් මෙම පනතට ඇතුළත් කරන්න කියන ඉල්ලීම මා කරනවා.

අවසාන වශයෙන් මා මේ කාරණයත් කියන්න ඕනෑ. මේ පනත් කෙටුම්පත පිළිබඳව විගණකාධිපතිවරයාත් යම්කිසි අදහසක් දක්වලා තිබෙනවා. මා ඒ ගැන දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ. ආණ්ඩු පක්ෂය සහ අදාළ අංශවලින් ඒ දීලා තිබෙන යෝජනා පිළිබඳව, නීතිරීති සහ රෙගුලාසි පිළිබඳව, කළමනාකරණය පිළිබඳව ගැටලු ඇතිවෙලා තිබෙනවාය කියා විශේෂයෙන්ම එතුමා පෙන්වා දී තිබෙනවා. එමෙන්ම සැලසුම් පිළිබඳවත් ගැටලු ඇතිවෙලා තිබෙනවාය කියන කාරණය ගැනත් විගණකාධිපතිතුමා අදහස් දක්වා තිබෙනවා. ඒ පිළිබඳවත් රජයේ අවධානය යොමු කරයි කියා මා හිතනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබාදීම පිළිබඳව නැවත වරක් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ ඉතිරි කාලය මා හිතවත් ආශු මාරසිංහ මැතිතුමාගේ කථාවට එකතු කරන්න කියන ඉල්ලීමත් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 2.11]

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුවෙන්ම මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ඔබතුමා මේ දවස්වල නෝම්බි ඇල්ලීමේ කර්තව්‍යයේ යෙදෙනවා ඇති. ඒ නිසා ඔබතුමාට "අල්ලාහ් දෙවියන්ගේ පිහිට ලැබේවා"යි කියා මා ප්‍රාර්ථනා කරනවා.

විශේෂයෙන් මා ඔබතුමාට මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. යූඑන්පී එකේ දුමින්ද සිල්වා මන්ත්‍රීවරයා යූඑන්පී එකෙන් කඩලා අපේ පක්ෂයට ගත්තාය, එතුමා උතුරු කොළඹ සංවිධායක හැටියට පත් කළාය කියා මංගල සමරවීර ඇමතිතුමා කිව්වා. ඒ වෙලාවේදී ඔබතුමාත් එයට හූමිටි තැබුවා. මංගල සමරවීර මැතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් මාතර ආසනය සංවිධානය කරලා, එක්සත් ජාතික පක්ෂයට ගිහින්, එක්සත් ජාතික පක්ෂයේ මාතර සංවිධායක හැටියට පත් වුණා කියන කාරණයත් මා ඔබතුමාට මේ අවස්ථාවේදී මතක් කර දෙන්න ඕනෑ. ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව කථා කරන්නයි මා මේ අවස්ථාවේදී සූදානම් වෙන්නේ.

උසස් අධ්‍යාපන ඇමතිතුමා හැටියට වාගේම සංස්කෘතික කටයුතු ඇමතිවරයා හැටියට ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා කටයුතු කිරීම ගැන මා සතුටු වෙනවා. රටක් ඉදිරියට ගෙන යාමේදී, රටක් පාලනය කිරීමේදී පවතින මූලික වගකීම තමයි රාජ්‍ය ආරක්ෂාව. රාජ්‍ය ආරක්ෂාව සහ ඉදිරියේදී අපේ රට භාර දෙන්න ඉන්න දරුවන් නිර්මාණය කිරීමේ අවසන් අදියර තමයි විශ්වවිද්‍යාල අධ්‍යාපනය. මෙන්න මේ කර්තව්‍යයේදී පාටක්, පක්ෂයක්, දේශපාලනයක් ඈද ගෙන ඇඟිල්ල දිගු කරලා කථා කරනවාට වඩා රටක අනාගතය තීන්දු කරන තැනට එන්න කටයුතු කරන්න අවශ්‍යයි කියන එක අපේ විජයදාස රාජපක්ෂ ඇමතිතුමා විදහා පෑවා. යථාර්ථය සත්‍ය ලෙස ප්‍රකාශ කිරීම ගැන එතුමාට මා ස්තුතිවන්ත වෙනවා.

අද පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් දිවුරුම් දුන්නා. ඒ දිවුරුම් දුන් මන්ත්‍රීවරයා ආචාර්යවරයෙක්. කොමිෂන් සභාව මඟින් එතුමාට විරුද්ධව චෝදනා ඉදිරිපත් වෙලා තිබෙනවාය කිව්වා. ඒ චෝදනා පිළිබඳවත් පරීක්ෂණ කරන්න කියලා අපි ඉල්ලීමක් කරනවා. විරුද්ධ නැහැ. නමුත් එහෙම චෝදනාවක් තිබෙනවා නම්, ඒ ගැන බලන්න ඕනෑ.

අද අපට ඇඟිල්ල -ඇඟිලි දහයම- දිගු කරනවා. පක්ෂ විපක්ෂ භේදයක් නැතුව මහජන නියෝජිතයින් හැටියට තේරී පත් වූ අපට ඇඟිලි දිගු කරනවා. "බැදුම්කර සිද්ධියේදී පගා ගත්තාය, අල්ලස් ගත්තාය" ආදී දේවල් තමයි මේ මොහොත වන විටත් මාධ්‍ය ජාල තුළ සැරිසරන්නේ. මා කියන්න කැමැතියි, දෙකෝටි විසි ලක්ෂයකින් තෝරා ගත්ත එකසිය අනූහත්දෙනා -අනෙක් අය ජාතික ලැයිස්තුවෙන් පත් කරන උදවිය- මහජන ඡන්දයෙනුයි

[ගරු සී.බී. රත්නායක මහතා]

තෝරා පත් කර ගත්තේ. මහජන ඡන්දයෙන් තෝරා පත් කර ගත්ත මේ අය පාර්ලිමේන්තුවට එක වෙලාවකට මොන්ටිසෝරිය, එක වෙලාවකට බැදුම්කර ස්ථානය, තවත් වෙලාවකට වෙනත් වෙනත් නම් යොදමින් නින්දා අපහාස කරන්න සූදානම් වෙනවා. නමුත් ඊට වඩා වගකීමෙන් යුතුව කටයුතු කරන්න ඕනෑ. මේ සියලු දෙනාටම අභිමානයක් තිබෙනවා, ගෞරවයක් තිබෙනවා. සමහර මාධ්‍ය මේවා හුවා දක්වනවා. දෙරණ මාධ්‍ය ආයතනයේ සංඛ සහෝදරයා කිව්වා වාගේ මාධ්‍යයේ ගණිකා වෘත්තියේ යෙදෙන උදව්ය ඉන්නවා. ඒ අය ගත්ත ඒවා ගැනත් කථා කරන්න ඕනෑ. අනෙක් අයට ඇඟිලි දිගු කරනවා වාගේම බැදුම්කරයට සම්බන්ධ වූ ඇලෝසියස්ලා වාගේ උදවිය අලුත් පුවත්පත් හදන්න වාගේම අලුත් විද්‍යුත් මාධ්‍ය හදන්න මාධ්‍යවේදීන් මුදල් දීලා ගත්තාද, නැද්ද කියලා රටට හෙළි කරන්න. මම ඉස්සර වෙලා මේ පිළිබඳව පැහැදිලිව ප්‍රකාශයක් කරලා තිබුණා. මේ මුදල් ලබා ගත්ත උදවිය පිළිබඳව පැහැදිලි ප්‍රකාශයක් කරනකොට- අදත් ගල්කිස්ස උසාවියේ නඩු වාර තුනකට මම සම්බන්ධ වුණා. නමුත් ඊයේ වන විට මීලියන තුනක මුදලක් ගත්තාය කියලා සනාථ වෙලා තිබෙනවා. මම හිතනවා, ඉදිරියේදීත් ඒ කාර්යය වෙයි; අපේම සහෝදරයෙක් ඒ සඳහා දායකත්වය ලබා ගෙන තිබෙනවා කියන එක. ඒ නිසා මම ඒ ගැන වැඩි දුරට කථා කරන්නේ නැහැ.

විජයදාස රාජපක්ෂ මැතිතුමාට මේ කාරණය ගැන කියන්න ඕනෑ. නුවර එළිය දිස්ත්‍රික්කයේ විශ්වවිද්‍යාලයට බඳවා ගන්නේ Z-score එකේ ඉතාම අඩු ලකුණු මට්ටමකින්. මා එතුමාට ස්තුතිවන්ත වෙනවා, එතුමා දැඩි තීන්දුවක් ගන්නවාය කියා කිව්වා. ඒ වෙන මොකක්වත් නොවෙයි. මහනුවර දිස්ත්‍රික්කයේ වැඩිම ලකුණු මට්ටමකින් ගන්නවා වාගේම නුවර එළිය දිස්ත්‍රික්කයේ අඩු ලකුණු මට්ටමකින් ගන්නේ. එතකොට මහනුවර පදිංචි කෙනා, හම්බන්තොට පදිංචි කෙනා එහෙම නැත්නම් පොළොන්නරුවේ පදිංචි කෙනා, අනුරාධපුරයේ පදිංචි කෙනා නුවර එළියෙන් විභාගය දමලා, නුවර එළියේ ජනතාවගේ දරුවන්ට අසාධාරණයක් කරනවා. අන්න ඒ අසාධාරණය නතර කරන්න කටයුතු කරන්න කියලා මම විජයදාස රාජපක්ෂ මැතිතුමාට විශේෂයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ.

ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කථා කරනකොට මේ කාරණයත් මා කියන්න ඕනෑ. මේ රටේ දුක් විඳින ජනතාව, දහසක් මව්වරු දහසක් බලාපොරොත්තු තියාගෙන තමයි මේ ලෝකයට දරුවන් බිහි කරන්නේ. ඒ දරුවා ඔහුගේ පෞද්ගලික අපේක්ෂාවලට වඩා රට පෙරටු කරගෙන, රටේ පැවැතියා වූ ඒ රුදුරු ත්‍රස්තවාදය දුරු කරලා රටට සාමය උදා කිරීම සඳහා තමන්ගේ ඇස්, ඉස්, මස්, ලේ දන් දුන්නා. දන් දීලා රටට නිදහස ලබා දුන්නා. මහින්ද රාජපක්ෂ මැතිතුමා එදා සේනාධිනායකයා හැටියට කටයුතු කළා. අද එතුමාට අපහාස කරනවා. එතුමා කළ ක්‍රියාව අවතක්සේරු කරනවා. අද බුද්ධි අංශයේ සියලුදෙනා සිරගත කරලා තිබෙනවා. ඔවුන් චෝදනා ලබා තිබෙනවා. ඔවුන් දින වකවානු නැතුව දිනෙන් දිනට සිරගත කරලා තිබෙනවා. ඔවුන් නිදහස් කරන්නේ නැති තැනට ඇවිල්ලා තිබෙනවා. මෙහෙමද, ඒ රණවිරුවන්ට සලකන්නේ කියලා මා අහනවා.

අපේ ද්‍රවිඩ සහෝදර ගරු මන්ත්‍රීවරුන් උතුරු නැඟෙනහිර සිටින ජනතාවට සිදු වෙලා තිබෙන අසාධාරණකම් පිළිබඳව කථා කරනවා වාගේම දකුණේ සිටින අනෙක් ජනතාවට වන අසාධාරණකම් ගැනත් අපි කථා කරන්න ඕනෑ. ඒ අවස්ථාව සලසා දෙන්න ඕනෑ. ඒ අය වෙනුවෙනුත් විමසිලිමත්ව කටයුතු කරන්න සූදානම් වෙන්න ඕනෑ. ඒ කාරණය විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

මා නියෝජනය කරන මධ්‍යම පළාතේ මයිලපිටිය කියන ග්‍රාමයේ රණ විරු ස්මාරකයක් තිබෙනවා. අද ඒ ස්මාරකය යන්තමින් නඩත්තු වෙනවා විතරයි. එහි තිබෙන අඩු පාඩු ගැන කථා කරන්න කිසි කෙනෙකු නැහැ. රණ විරුවන් සමරන අවස්ථාවේදී උත්සවයක් පැවැත්වීමවත් දැන් සිදු වන්නේ නැහැ. පසුගිය වතාවේ ගරු දිළුම් අමුණුගම මන්ත්‍රීතුමා ගිහිල්ලා රණ විරු සැමරීමක් කළා. හැබැයි, දැන් එතැන තිබෙන toilet එකවත් පිරිසිදු තත්ත්වයේ නැහැ. ඒ පිළිබඳව අවධානය යොමු කරලා කටයුතු කරන්නය කියා ලේකම්තුමාට විශේෂයෙන් මතක් කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කථා කරන මේ අවස්ථාවේදී, තවත් නොකියාම බැරි කාරණා කිහිපයක් තිබෙනවා. අප රටේ සිටින කුඩා දරුවා උසස් මිනිසකු දක්වා නිර්මාණය කරන්නේ කුමන ආකාරයෙන්ද කියන කාරණාවේදී මෙය ඉතා වැදගත් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "විශ්වවිද්‍යාලයට මත්කුඩු රැගෙන ගිය එක්තරා සේවකයකු සුරාබදු දෙපාර්තමේන්තුවෙන් විශ්වවිද්‍යාල පරිශ්‍රයේදීම අල්ලා ගත්තාට පස්සේ ඒ පුද්ගලයා ළඟ මත් වතුර තිබුණායි කියලා සුරාබදු දෙපාර්තමේන්තුවෙන් ඉදිරිපත් කිරීම තුළ, උසාවියෙන් ඇප අරගෙන ගිහිල්ලා තිබෙනවා; දැන් ඒ ගැන පරීක්ෂණයක් කරගෙන යනවා." කියලා ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ ඇමතිතුමා කිව්වා. අද බොහෝ පාසල්වලට ගංජා, අබිං වැනි මත් ද්‍රව්‍ය රැගෙන යාම තුළ පාසල් දරුවන්ගේ ජීවිත විනාශ වෙනවා. ඒ ගැන කථා කරන්න, සොයා බලන්න කෙනෙකු නැහැ. ස්වාධීන කොමිෂන් සභා ගැන කථා කරනවා. "පොලීසිය ස්වාධීනයි." කියනවා. මත්කුඩුවලට, ගංජාවලට ඇබ්බැහි වූවන් අත්අඩංගුවට ගන්නවා, ඒවා විකුණන කෙනා අත්අඩංගුවට ගන්නේ නැති තත්ත්වයක් තිබෙනවා. වහාම මේ ගැන අවධානය යොමු කරන්න. මේ පිළිබඳව අවධානය යොමු කරලා මේ දරුවන්ගේ අනාගතය බේරා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු කරන්නය කියා පොලිස්පතිතුමාගෙන් මා විශේෂයෙන් ඉල්ලා සිටිනවා. ඒ විතරක් නොවෙයි.

මේ රටේ ස්ත්‍රී දූෂණය, ළමා අපචාර, කාන්තා හිංසනයන් මොන විධියට ප්‍රචලිත වෙලා තිබෙනවාද, මොන විධියට වැඩි වෙලා තිබෙනවාද කියන එක සංඛ්‍යා ලේඛන වශයෙන් ගෙනැල්ලා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. මේ අවුරුදු තුන ඇතුළත දරුවන් කී දෙනකු අපචාරවලට ලක් වෙලා තිබෙනවාද, ප්‍රවාහන සේවය තුළදී කාන්තාවක් කී දෙනකු හිංසනයට ලක් වෙලා තිබෙනවාද කියන එක පුවත් පත්වල සඳහන් වෙනවා. ප්‍රවාහන සේවාව තුළදී කාන්තාවන්ගෙන් සියයට 90ක්ම එවැනි තත්ත්වයන්වලට මුහුණ දෙනවා කියලා තොරතුරු දැනගන්න ලැබී තිබෙනවා. ඒ නිසා මේ පිළිබඳව සොයා බලා වාර්තාවක් දෙන්නය කියන එක විශේෂයෙන් මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාතාලය පිළිබඳව කථා කළොත් ඒත් එහෙමයි. මේ සම්බන්ධයෙන් නොයෙකුත් තීන්දු, තීරණ ගන්න බව අපට පෙනෙනවා. දැනට සති දෙකකට ඉස්සෙල්ලාත් දවස් හතරක්, පහක් ඇතුළත පාතාලය සම්බන්ධ මීනී මැරුම් පහක්, හයක් වෙලා තිබෙනවා කියලා වාර්තා වුණා ඔබතුමාත් දකින්න ඇති. මේ පිළිබඳව කථා කරනකොට මට්ටක්කුලිය පැත්තේ වුණු සිද්ධීන් පිළිබඳවත් නිරන්තරයෙන්ම කථා කළ යුතුයි. මේ තත්ත්වයන් සමනය කරන්න ඕනෑ. ඔබ ඔබගේ ජීවිතයට ආදරෙයි, මම මගේ ජීවිතයට ආදරෙයි වාගේම කිසිවෙකුටත් අනුන්ගේ ජීවිත නසන්න පුළුවන්කමක් නැහැ. "දිවයින" පුවත් පතේ කටයුතු කළ, අනුර හොරේෂස් මහතා "ගිනි අවි සහ ගිනි කෙළි" කියලා පොතක් ලිව්වේ එවැනි ඉතිහාසයක් එක්කයි. එදා තුම්මුල්ලේ පත්මේ, ලොක්කේ, රම්බෝ ගැන

ලියලා, දේශපාලනික වශයෙන් ඒ දේවල් කොයි විධියට ක්‍රියාත්මක වුණාද, ක්‍රියාත්මක කළාද කියලා රටට පෙන්වා දුන්නා. නැවත ඒ දේවල්වලට හිස ඔසවන්න දෙනවා නම්, රාජ්‍ය ආරක්ෂාවක් පිළිබඳව අප කථා කරන්නේ කොහොමද, රාජ්‍ය ආරක්ෂාවක් ගැන අපි හිතන්නේ කොහොමද කියන එකත් විශේෂයෙන් අහන්න ඕනෑ. අපි රණ විරුවන්ව අගය කරමින් කථා කරනවා. ඔවුන්ගේ උන්නතිය ගැන කථා කරනවා. රණ විරු ගම්මාන ගැන කථා කරනවා. මේ දේශය -මාතෘ භූමිය- ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් සටන් වැදී ආබාධිත තත්ත්වයට පත් වුණු, ජීවිතය පූජා කළ රණ විරුවන්ගේ ඒ අම්මලාට, දස මාසයක් කුස තුළ දරා මොලොවට බිහි කර, ලේ කිරි කර පෙවූ ඒ අම්මලාට දුන්නු දුක් කන්දරාව නැති කරන්න පුළුවන්කමක් නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
හොඳයි. ඒ නිසා මේ පිළිබඳව විශේෂ අවධානය යොමු කරන්න කියා ලේකම්තුමාගෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමා මේ පිළිබඳව අවධානය යොමු කරලා මේ රටේ පුරවැසියකු හැටියට ඒ ගන්නා වූ තීන්දුවලට පාටක්, පක්ෂයක්, දේශපාලනයක් නැතිව මේ රටේ ජනතාවට නිදහසේ ජීවත්වීමේ අයිතිය ලබා දෙන්නය කියා ඉල්ලා සිටිනවා. මේ අවස්ථාවේදී අපි සතුටු වෙනවා, ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත ගෙනැල්ලා ඔවුන් වෙනුවෙන් හඬක් නහන්න, ඔවුන් වෙනුවෙන් ක්‍රියාත්මක වෙන්න, ඔවුන් වෙනුවෙන් දායකත්වය ලබා දෙන්න සූදානම් වීම ගැන. ඉදිරියට ඒ කටයුතු නිවැරදි ආකාරයෙන් කරගෙන යන්න.

ඒක ජාත්‍යන්තරයට හෝ වෙන කාටවත් ඕනෑ ආකාරයට ක්‍රියාත්මක කරන්න සූදානම් වන්න එපාය කියන එක විශේෂයෙන් මම සඳහන් කරනවා. නිවැරදිව දේශීය අනන්‍යතාව, මාතෘ භූමියේ අනන්‍යතාව රැකෙන අයුරින් සිංහල, දෙමළ, මුස්ලිම් කියන සියලු ජන කොටස් අයත් ශ්‍රී ලාංකික ජාතිකයෙක් හැටියට කොන්ද කෙළින් තබාගෙන ඒ සඳහා තීන්දු තීරණ ගන්න පසුබට වෙන්න එපා. ඒ සඳහා අපි ඔබතුමාත් සමඟ නිරන්තරයෙන්ම අත්වැල් බැඳගෙන ඉන්නවාය කියන එක විශේෂයෙන් මම සඳහන් කරනවා. එම නිසා මේ අවස්ථාව සඳහා අපි දායකත්වය ලබා දෙන්න ඕනෑ. මේ සඳහා කටයුතු කිරීමේදී පාටක්, පක්ෂයක් වෙත ඇඟිල්ල දිගු කරනවාට වඩා, මාතෘ භූමිය වෙනුවෙන් මාතෘ භූමියේ ජීවත් වන ජනතාවට ආරක්ෂාව සපයන ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ නිල දරුවන්ට ඒ සඳහා ශක්තිය හා ධෛර්යය ලබා දීම අපේ යුතුකමක් හා වගකීමක් වෙනවාය කියලා මම හිතනවා. අසාධාරණය, අකටයුත්ත දුටු තැන අපි ඒ සඳහා එරෙහි වන්න සූදානම් වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කරුණ කියන්න කැමැතියි. දණ්ඩ නීති සංග්‍රහය සම්බන්ධයෙන් මා කියන වගන්තිවල අංක වරදින්න පුළුවන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

දණ්ඩ නීති සංග්‍රහයේ 314, 315, 316 වගන්තිවල සඳහන් වෙනවා, මොට ආයුධයකින් පහර දීලා සුළු තුවාල ඇති කිරීම, ඒ වාගේම මොට ආයුධයකින් පහර දීලා මරණීය තුවාල ඇති කිරීම, ඒ වාගේම තියුණු ආයුධයකින් පහර දීලා මරණීය තුවාල ඇති කිරීම සම්බන්ධ නඩු අධිකරණයට යන්නේ කොයි ආකාරයටද කියලා. ඒ සඳහා ක්‍රියා කරන්නේ JMOගේ report එක අනුවයි. හැබැයි, පොලීසියේ ස්ථානාධිපතිතුමා ළඟ රතු පැනයි, නිල් පැනයි තිබෙනවා. එතුමා මේ කාර්යය කොයි ආකාරයට කරනවාද කියන එක අපට කියන්න බැහැ. එම සිද්ධිය සමඟ මණ්ඩලයට දමන්න පුළුවන්; මහෙස්ත්‍රාත් අධිකරණයට දමන්න පුළුවන්; මහාධිකරණයට දමන්න පුළුවන්. එම නිසා පොලීසිය ස්වාධීන ආකාරයෙන් ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියන එක විශේෂයෙන් මම සඳහන් කරන්න ඕනෑ. ඒක තමයි පොලිස්පතිතුමා කිව්වේ, නීතිය නවන්න පුළුවන් කියලා. ඒ නවන නීතිය රටට ගැළපෙන්නේ නැහැ. අපි රටේ මිනිසුන්ට යුක්තිය හා සාධාරණය ඉෂ්ට කරන්න ඕනෑ. ඒ ඇදුම ඇඳගත්, පාටක්ද නැත්නම් වෙන ජරාවක් ද තැවරුණු ඒ අයට අසූචි වළක ඉඳගෙන ඇඟිල්ල දිගු කරනවා කියලා කිව්වා. මේ දෙදෙනාම අසූචි වළේ ඉඳලා තමයි කථා කරන්න සූදානම් වන්නේ.

රටට, ඒ වාගේම ජනතාවට නිවැරදි ආකාරයෙන් ක්‍රියාත්මක වන නීතිමය පසුබිමක් සකස් කරන්න කියන එක මම මේ අවස්ථාවේදී විශේෂයෙන් ඉල්ලා සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව සලසා දීම පිළිබඳව මාගේ ගෞරවනීය ස්තුතිය පුද කරමින් මා නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මැතිතුමා.

[අ.භා. 2.25]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයේ සිටින වෙලාවේ මට කථා කරන්න ලැබීම ගැන සන්තෝෂයට පත්වනවා. ඒ වාගේම අභිනවයෙන් පත් වූ අපේ ගරු නියෝජ්‍ය කථානායකවරයාට සුබ පතන්නටත් මම මේ මොහොත යොදා ගන්නවා. දීර්ඝ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කළ මන්ත්‍රීවරයෙකු වන එතුමා නියෝජ්‍ය කථානායකවරයා හැටියට පත් කර ගන්න ලැබීම ගැන, එතුමා පත් කරන්න යෝජනා ස්ථිර කරපු මන්ත්‍රීවරයෙකු හැටියට මම සන්තෝෂයට පත්වනවා.

අද ආරක්ෂක අමාත්‍යාංශය යටතේ කථා කරන ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳවත්, ඊට අදාළ අනෙකුත් ආයතන පිළිබඳවත් කථා කරන්න මම බලාපොරොත්තු වනවා. විශේෂයෙන් රණ විරු සේවා අධිකාරිය, ඊට අමතරව ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය ආදී කාරණා ගැන මේ අවස්ථාවේදී මම කථා කරන්න බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව කථා කරන කොට ජාතික ආරක්ෂක අරමුදල ස්ථාපිත කළ දිවංගත ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා අපි සිහිපත් කළ යුතුමයි. ආබාධිත සෙබළුන්, අතුරුදහන් වූ සෙබළුන් වෙනුවෙන් රට ජාතිය හැටියට තමන් කළ යුතු කාර්යය සඳහා අවශ්‍ය වන අරමුදල් රැස් කර ගැනීමට එතුමා තමයි ජාතික ආරක්ෂක අරමුදල ඇති කළේ.

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

ජාතික ආරක්ෂක අරමුදල ඇති කරපු අවස්ථාවේ නියමයන් වුණේ එවකට සිටි ඇමතිවරයා හෝ ජනාධිපතිවරයා හෝ ජනාධිපතිවරයා විසින් පත් කරන ඇමතිවරයෙකු විසින් මෙම අරමුදල පාලනය කළ යුතුය යන්නයි. නමුත්, ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අපි පාර්ලිමේන්තුවේ ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදීත් සාකච්ඡා කළා. වර්තමානයේ අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන ජනාධිපති ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් මෙම අරමුදලට නිලබලයෙන් පත්වන සාමාජිකයින් වශයෙන් නම් කර තිබෙනවා. මෙම නිලධාරීන් නිලබලයෙන් පත්වන සාමාජිකයින් ලෙස සිටීම වාගේම, ජාතික ආරක්ෂක අරමුදලේ වගකීම සම්පූර්ණයෙන් ආරක්ෂක ඇමතිවරයා හෝ ජනාධිපතිවරයා අතේ තිබිය යුතුයි කියන කාරණයත් මේ අවස්ථාවේදී අපි සිහිපත් කරනවා.

මේ ගැන නැවතත් සලකා බැලුවොත් හොඳයි කියලා අපි විශ්වාස කරනවා.

ඊළඟට, ජාතික ආරක්ෂක අරමුදලේ ප්‍රධාන කාර්යයක් තමයි රජය විසින් ආරම්භ කරන ලද රණවිරු සේවා අධිකාරිය හරහා රණවිරු සුභසාධන කටයුතු වෙනුවෙන් මුදල් යෙදවීම. රණවිරු සේවා අධිකාරියේ සභාපතිනිය අනෝමා ෆොන්සේකා මැතිනියයි. ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවත් එතුමියට විශේෂයෙන්ම ස්තුතිවන්ත වුණා. එහිදී, මයන්ත දිසානායක මන්ත්‍රීතුමා මේ ගැන විශේෂයෙන් සඳහන් කළා මට මතකයි. ඒ වාගේම රණවිරු සේවා අධිකාරියේ සභාපතිතුමිය හැටියට පත් වුණ එතුමිය මේ රටේ රණ විරුවන් වෙනුවෙන් කථා කළ හැකි, ඔවුන් ගැන දැනුවත්කමක් තිබෙන, වගකීමක් ගත හැකි කෙනෙක්. කිසිම කෙනෙකුට විරුද්ධ විය නොහැකි වන අයුරින් රණවිරු සේවා අධිකාරිය ක්‍රියාත්මක වීම ගැන අපි පැසසීමට ලක් කළ යුතුමයි. එතුමියගේ නායකත්වය ගැන කිව්වොත්, මේ රටේ රණවිරුවන් විඳපු දුක් ගැන වැඩියෙන්ම දන්නා තැනැත්තිය එතුමියයි. ඒ නිසා එතුමියට වගකීමක් තිබෙනවා, තමන්ගේ අත් දැකීමත් එක්ක රණවිරුවන්ට අවශ්‍ය සුභසාධන සම්පාදනය කරන්න.

මේ රණවිරු සේවා අධිකාරියේ කටයුතු ගැන සඳහන් කළොත් අපට සමහර වෙලාවට විවිධ අවලාද නැඟෙනවා, "වර්තමාන ආණ්ඩුව රණ විරුවන්ට සලකන්නේ නැහැ" කියලා. ඇත්තටම මේ රණවිරු සේවා අධිකාරිය කරලා තිබෙන වර්තමාන කාර්යය, 2015, 2016, 2017 වසර තුන තුළ කළ කාර්යය දෙස බැලුවාම, කලින් වසරවලට වඩා රණ විරුවන් වෙනුවෙන් අපි ක්‍රියාත්මක වෙලා තිබෙන බව පෙනෙනවා. 2016.01.25 දින "විරුසර වරප්‍රසාද" ව්‍යාපෘතිය ඇරඹුණා. ඒ යටතේ යුදමය කාලසීමාව තුළ, 2009 වසර වන තෙක්, සේවය කළ නිලධාරීන් සඳහා නියමිත වසර 20ක සේවා කාලය සඳහාත්, සෙසු නිලයන් සඳහා නියමිත වසර 22ක ආදී වශයෙනුත්, විශ්‍රාම ගොස් තිබෙන රණ විරුවන් වෙතත් මෙම විරුසර වරප්‍රසාද කාඩ්පත් ලබා දීලා තිබෙනවා. යුද හමුදාවේ 29,084ක්, නාවික හමුදාවේ 2,566ක්, ගුවන් හමුදාවේ 2,129ක්, පොලීසියේ 5,340ක්, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ 972ක් ආදී වශයෙන් 40,091ක් දෙනෙක් විරුසර වරප්‍රසාදලාභීන් හැටියට හඳුනාගෙන ඔවුන්ට ඒ වරප්‍රසාද ලබා දී තිබෙනවා.

"විරු සුමිතුරු" නිවාස යෝජනා ව්‍යාපෘතිය ගැනත් මම කිව යුතුයි. මේ ව්‍යාපෘතිය හරහා මේ වන විටත් නිවාස 3,650ක් ඉදි කරන්න ඉලක්කගත වෙලා තිබෙනවා. 2017 වසරේදී 913ක්, 2018 වසරේදී 912 ක් ආදී වශයෙන් නිවාස සාදා නිම කරන්නට මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

දැනට ක්‍රියාත්මක වෙලා තිබෙන කාර්යයන්වල වටිනාම කාර්යයක් හැටියට ගත හැකියි, රණවිරු දු දරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව ප්‍රමාණයක් ප්‍රදානය කිරීම. පසුගිය කාලයේ, 2012 වසරේදී, රණවිරු දු දරුවන් වෙනුවෙන් ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව 350ක් පමණ තමයි තිබුණේ. නමුත් 2015 වන විට එම ඉතුරුම් ආයෝජන ශිෂ්‍යත්ව 520ක් දක්වාත්, 2016 වන විට 821 ක් දක්වාත් ආදී වශයෙන් වැඩි වෙලා තිබෙනවා. ඊට අමතරව, අපොස (සාමාන්‍ය පෙළ) සහ අපොස (උසස් පෙළ) ශිෂ්‍යත්වලාභීන් දෙගුණයකින් වැඩි වෙලා තිබෙනවා. 2012 වසරේදී ශිෂ්‍යත්වලාභීන් 122ක් සහ 2014 වසරේදී 191ක් සිටියත්, 2015 වසරේදී එය 353 දක්වා වැඩි වෙලා තිබෙනවා.

රණවිරු මාපිය රැකවරණ දීමනාව 2012, 2013 වසරවල සඳහන් වෙලා තිබුණෙත් නැහැ. නමුත් මේ ආණ්ඩුවට 2015 වසර වනවිට 28,394ක්, 2017 වසර වනවිට 35,446ක රණවිරු මාපිය රැකවරණ ලබා දෙන්න හැකියාව ලැබිලා තිබෙනවා. රණවිරු සේවා අධිකාරියේ නියමිත කාර්යයන් ඉතාමත් කීර්තිමත් විධියට ඉටු කරන අනෝමා ෆොන්සේකා මැතිනියට සුබ පතන්නටත්, එතුමිය කරන කාර්ය භාරය පැසසුමට ලක් කරන්නටත් මම මේ අවස්ථාව යොදා ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විධියට, ජාතික ආරක්ෂාව සම්බන්ධව කාරණා සාකච්ඡා කරනකොට, අපි සාකච්ඡා කළ තව කාරණාවක් තමයි, "අකුරේගොඩ, ආරක්ෂක හමුදා මූලස්ථාන සංකීර්ණය ඉදි කිරීම" පිළිබඳ කටයුතු. අකුරේගොඩ, ආරක්ෂක හමුදා මූලස්ථාන සංකීර්ණය ඉදි වෙන්නේ කොළඹ කොටුවේ තිබුණ යුද හමුදාවට අයිති ඉඩම් ටික චීනයට විකිණීමෙන් පසුවයි.

ඇත්තටම මේ හමුදා මූලස්ථානය ඉදිකිරීම සම්බන්ධයෙන් ප්‍රශ්න රාශියක් තිබෙනවා. ප්‍රධාන වශයෙන්ම නෛතික ප්‍රශ්නයක් තිබුණා. අපි කාරක සභාවේදීත් ඒ පිළිබඳව සාකච්ඡා කළා. මොකද, 9/11 attack එක අපට මතකයි. නැත්නම්, ඇමෙරිකාවේ පෙන්ටගනයට වුණු attack එක අපට මතකයි. මේ attack එකත් එක්ක ලෝකයම පිළිගත් න්‍යායක් තිබුණා. ඒ තමයි, රටක හමුදා මූලස්ථාන සියල්ල එක තැනකට ගේන්නේ නැහැ කියන එක. නමුත්, ලංකාවේදී අපි ඒක ක්‍රියාත්මක කළේ නැහැ. අපි යුද හමුදාව, ගුවන් හමුදාව, නාවික හමුදාව යන සියලු හමුදා එක තැනකට ගේන්න තීරණය කළා. මේක ආරක්ෂාව සම්බන්ධයෙන් ගත්ත වැරදි තීරණයක් කියලා අපි හිතනවා. මේ කාරණයේදී අපට වාර්තාගත වන විධියට විවාදාත්මක කාරණා කිහිපයක් තිබෙනවා. එකක් තමයි, රුපියල් බිලියන 69ක් වන මේ විශාල ව්‍යාපෘතිය සඳහා consultancy service එක ලබා දෙන්න මුදිත ජයකොඩි කියන මහත්මයාව කෙළින්ම පත් කරලා තිබුණු එක. නමුත්, වර්තමාන ආරක්ෂක ලේකම් කපිල වෛද්‍යරත්න මැතිතුමාගේ මූලිකත්වයෙන් මේ තීරණය වෙනස් කරලා, එය රජයේ ආයතනයක් වන CECB ආයතනයට ලබා දෙන්න ගත්ත ක්‍රියා මාර්ගය මම මේ මොහොතේ අගය කරනවා. ඇත්තටම අපි එහි විනිවිදභාවය - transparency - ගැන කථා කළොත් ඒක ඉතා කාලෝචිත ක්‍රියාවක්. ඒ හරහා අපට අවස්ථාව ලැබිලා තිබෙනවා, මේ වරද නිවැරදි කර ගන්න. අකුරේගොඩ හමුදා මූලස්ථානය සෑදීම වැරදි තීරණයක් වුණත්, එය සෑදිය යුතු වෙනවා. ඉදිරියේදී විනිවිදභාවයකින් ඒ කාර්යය කරන්න අවස්ථාව ලැබෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ඊළඟට මම කථා කරන්න කැමතියි, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වර්තමාන තත්ත්වය ගැන. අද ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පනත් කෙටුම්පත අපට ඉදිරිපත් කරන්න පුළුවන් වුණා. ඒ සම්බන්ධයෙන් අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මේ හරහා රටේ තිබුණ විශාල ප්‍රශ්නයක්,- [බාධා කිරීමක්]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද න්‍යාය පත්‍රයේ අංක 33 යටතේ තිබෙන්නේ ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදයයි. අද දින ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ පනත් කෙටුම්පතත් ඉදිරිපත් කළා. නමුත්, ඒක අද විවාදයට සම්බන්ධ ද කියන එක ගැන මම මූලාසනයෙන් දැනගන්න කැමතියි. මොකද, න්‍යාය පත්‍රයේ අද දිනට එය නැහැ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමනි, අද එම පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම පමණයි කළේ. ඒ සම්බන්ධව අද විවාදයක් නැහැ. විවාදය වෙන දවසක ලබාදෙනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ඒ නිසා අපි ඊළඟ දවසේ ඒ ගැන කථා කරමු.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ජාතික ආරක්ෂක කටයුතු සඳහා ක්‍රියාත්මක වන විශ්වවිද්‍යාලයක් හැටියටත්, ඒ වාගේම, ත්‍රිවිධ හමුදාව වෙනුවෙන් ඇති කරන ලද විශ්වවිද්‍යාලයක් හැටියටත්, දූ දරුවන් වෙනුවෙන් ඇති කරන ලද විශ්වවිද්‍යාලයක් හැටියටත් මේ කාර්යයන් ගැන කථා කරන්න මා කැමැතියි. මේ මොහොත වන විටත් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයත් එක්ක සම්බන්ධ කරලා SAITM ප්‍රශ්නය විසඳන්න අවශ්‍ය පහසුකම් සලසමින් ඉන්න බව අපි දන්නවා. ඒ වාගේම, මේ විශ්වවිද්‍යාලයත් එක්ක දැනට ශික්ෂණ රෝහලක් තිබෙනවා. මේ ශික්ෂණ රෝහලේ වර්තමාන තත්ත්වය පැසසුමට ලක් කළ යුතුයි. මොකද, වර්තමානයේ දිනකට රෝගීන් 600ක් පමණ මෙම රෝහලෙන් තමුන්ට අවශ්‍ය ප්‍රතිකාර ලබා ගන්නවා. අපේ සෞඛ්‍ය ලේකම්තුමා ඉන්න නිසා මම මේ ගැනත් කියන්න ඕනෑ. ජනගහනය අධික ප්‍රදේශයක තිබෙන මෙම රෝහලට අවශ්‍ය කාරණා ටික සම්පාදනය කර ගන්න ලැබුණොත්, අපට හැකියාවක් ලැබෙනවා ජාතික අවශ්‍යතාවන් ඉටු කරන්න මෙම රෝහල හරහා තව තවත් පහසුකම් සලසා දෙන්න. මේ කාරණා ගැන පරීක්ෂා කරලා සෞඛ්‍ය අමාත්‍යාංශයත් එක්ක එකතු වෙලා ඒ නිවැරැදි කිරීම් ටික කරගෙන ඉදිරියට යන්න අපට හැකියාව ලැබුණොත් ඒක ඉතා වටිනවා. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ දැනට පීඨ රාශියක් තිබෙනවා. උදාහරණ හැටියට ආරක්ෂක හා උපක්‍රමික අධ්‍යයන පීඨය, පශ්චාත් උපාධි අධ්‍යයන පීඨය, වෛද්‍ය පීඨය, ඉංජිනේරු පීඨය, නීති පීඨය, කළමනාකරණ, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, සම සෞඛ්‍ය විද්‍යා පීඨය, පරිගණක පීඨ ආදී වශයෙන් පීඨ තිබෙනවා. අපට නැවත වාද කරන්න පුළුවන් කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨය ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණය ඉතාම වටිනා කාරණයක් නිසා මේ ගැන මම සඳහන් කළ යුතුමයි.

මේ වෛද්‍ය පීඨයේ දැනට ඉගෙන ගන්නා ශිෂ්‍යයින්ට අමතරව SAITM එකේ ශිෂ්‍යයින් 700 ගණනකටත් ඉගෙන ගැනීමට අවස්ථාව ලබා දීමට සැලසුම් හදලා තිබෙනවා. ඒ නිසා මේ වෛද්‍ය පීඨය හරහා වැඩිපුර ළමයින් 700 ගණනකට වෛද්‍ය විද්‍යාව හැදෑරීමට අවස්ථාව ලබා දෙන්න අපට අවස්ථාවක් ලැබෙනවා. අපි මේ කාරණා සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතු වෙනවා.

දැනට මේ වෛද්‍ය පීඨයට ප්‍රධාන වශයෙන්ම ඇතුළත් කරනු ලබන්නේ ත්‍රිවිධ හමුදාවට අවශ්‍ය වෛද්‍යවරුන් බිහි කර ගැනීමට අවශ්‍ය ශිෂ්‍ය ප්‍රමාණයයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් මෙම වෛද්‍ය පීඨයට ඇතුළත් කරනු ලබන දරුවන් යුද හමුදාවට, නාවික හමුදාවට, ගුවන් හමුදාවට සේවය සඳහා යොදවනවා වාගේම අනාගතයේදී වෙනත් ආකාරයේ ක්‍රමවේදයකින් -අලුත් පනතකින් හෝ- තවත් වැඩි වැඩියෙන් ශිෂ්‍යයන් බඳවා ගැනීමට හැකියාවක් ලැබුණොත්-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! I wish to announce that this House cordially welcomes the Hon. (Mrs.) Helen Conway-Mouret, Member of Senate of France, now present at the Speaker's Gallery. Thank you.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
සියලුම මන්ත්‍රීවරුන් මේ සඳහා සහයෝගය ලබා දිය යුතුයි කියලා මම හිතනවා. මම ඒ කාරණයත් මතක් කර දෙන්න කැමැතියි. ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම සිදු කරන මෙම විවාදයේදී විශ්වවිද්‍යාල ප්‍රශ්නය, කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨයේ ප්‍රශ්නය, අකුරේගොඩ හමුදා මූලස්ථාන සංකීර්ණයේ ප්‍රශ්නය ගැන වැඩි වැඩියෙන් අවධානය යොමු කරලා නියමිත ක්‍රියාමාර්ග ගත්තොත්, ජාතික ආරක්ෂක අරමුදල වාගේම ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබෙන කාරණාවලට වැඩි වැඩියෙන් අවධානය යොමු කරන්න අපට හැකියාවක් ලැබෙනවා. මේ සම්බන්ධව කථා කිරීමට මට කාලය ලබා දීම ගැන මූලාසනයේ සිටින ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසාන කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු මලිත් ජයතිලක මන්ත්‍රීතුමා.

[අ.භා. 2.39]

ගරු මලිත් ජයතිලක මහතා
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මට කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට බොහොමත්ම ස්තුතියි. ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක

[ගරු මලිත් ජයතිලක මහතා]

සභාවේ සභාපතිවරයා හැටියට කටයුතු කරන මට, ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත දෙවැනිවර කියවන අද දවසේ ඒ සම්බන්ධයෙන් අදහස් දැක්වීමට මේ ආකාරයෙන් අවස්ථාව ලබා දීම සම්බන්ධව නැවත මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ජාතික ආරක්ෂක අරමුදල සම්බන්ධයෙන් අපේ ආංශික අධීක්ෂණ කමිටුවේ සාමාජික මහත්වරුන් සියලු දෙනා සාකච්ඡා කළා. එහිදී අපි මූලික වශයෙන් සංශෝධන කිහිපයක් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම "ජනරජයේ ජනාධිපති ලේකම්වරයා සහ ආරක්ෂක විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා" හැටියට එහි නම් කරලා තිබුණා. අපේ කමිටු සාමාජික මහත්වරුන් වන ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමාත්, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමාත් කිව්වා වාගේ අපි යෝජනා කළා, මිලියන 1,067ක් වාගේ විශාල මුදල් ප්‍රමාණයක් තිබෙන අරමුදලක් භාර ජනාධිපතිවරයා හෝ විෂය භාර ආරක්ෂක අමාත්‍යවරයාත් එම කමිටුවේ -Board එකේ- සාමාජිකයෙක් විය යුතුයි කියලා. එම සංශෝධනය ඉදිරිපත් වීම වැදගත් කියලා අපි හිතනවා.

1985දී එවකට හිටපු ජාතික ආරක්ෂක ඇමතිවරයා වූ ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා මෙම අරමුදල ආරම්භ කිරීමෙන් බලාපොරොත්තු වුණේ, යුද්ධය නිසා ආබාධිත වෙන සහ විශ්‍රාම ගැන්වෙන, ඒ වාගේම ඒ යුද්ධයට මුහුණ දීලා යම්කිසි ප්‍රශ්නකාරී තත්ත්වයකට පත් වෙන ත්‍රිවිධ හමුදාවේ සෙබළුන් සහ නිලධාරීන් වෙනුවෙන් යම්කිසි ආකාරයක සුභසාධන කර්තව්‍යයක් ඉටු කිරීමයි. ඒ අවස්ථාව වෙනකොට යුද්ධය පටන් ගෙන අවුරුදු දෙකක් වාගේ සුළු කාලයක් ගත වෙලා තිබුණේ. අපිට පෙනෙන විධියට එම අවුරුදු දෙක ඇතුළතත් ත්‍රිවිධ හමුදාවේම අවශ්‍යතාවක් ඇතිවී තිබුණා. එම සුභසාධන කර්තව්‍යය මූලික කරගෙන තමයි මේ ජාතික ආරක්ෂක අරමුදල පිහිටුවා තිබෙන්නේ. මම හිතන විධියට ජාතික ආරක්ෂක අරමුදලේ මූලික -මුඛ්‍ය- පරමාර්ථය වී තිබෙන්නේ ත්‍රිවිධ හමුදාවේ මියගිය, ආබාධිත සහ වෙනත් ප්‍රශ්නකාරී තත්ත්වයන්ට ලක් වුණු ආරක්ෂක හමුදා සෙබළුන්ට සහ නිලධාරීන්ට යම්කිසි සුභසාධන ක්‍රියාවලියක් ආරම්භ කිරීමයි.

කොහොම වුණත් පසුගිය කාලය පුරා මේ අරමුදලේ ක්‍රියාකාරිත්වය දිහා බැලුවාම අපට පෙනී ගිය දෙයක් තමයි, ඒ ක්‍රියාකාරිත්වය සුළු පරාසයක තමයි ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ කියන එක. යුද්ධයෙන් අබාධිත වූ, අතුරුදහන් වූ රණ විරුවන්ගේ එහෙම නැත්නම් ත්‍රිවිධ හමුදා සාමාජිකයන්ගේ නිවාස ප්‍රශ්නයට විසඳුම් ලබා දීම, ඒ හමුදා සාමාජිකයන්ගේ දරුවන් පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්වය සමත් වුණාම ශිෂ්‍යත්ව මුදලක් ලබා දීම වාගේ සුළු පරාසයක විතරයි මේ අරමුදල ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. රුපියල් මිලියන 1,067ක් වාගේ විශාල මුදලක් මේ අරමුදල සතුව තිබුණත් අර වාගේ සුළු පරාසයක විතරයි ක්‍රියාත්මක වෙලා තිබෙන්නේ. ඒ නිසා මා යෝජනා කරන්න කැමැතියි මේ අරමුදලේ විෂය පථය, කාර්යභාරය මේ වාගේ සුළු පරාසයක ක්‍රියාත්මක වීමෙන් ඔබ්බට ගිහිල්ලා මීට වඩා පුළුල් විය යුතුයි කියලා.

විශේෂයෙන්ම 2009 මැයි මාසයේ 18 හෝ 19වෙනි දායින් පස්සේ අපි දැන් සිටින්නේ පශ්චාත් යුදමය තත්ත්වයක, පශ්චාත් යුදමය ශ්‍රී ලංකාවක. දැන් යුද්ධය අවසන් වෙලා අවුරුදු 9ක් ගත වෙලා තිබෙනවා. ලෝක ඉතිහාසයේ දෙවන ලෝක යුද්ධය අවසන් වුණාට පස්සේ, යුද්ධයක් ආශ්‍රිතව වැඩිපුරම කටුක අත්දැකීම් සහිත සිද්ධිය තමයි වියට්නාම යුද්ධය. වියට්නාම යුද්ධයේ අවසානය 1975දී සිදු වුණා. එයට මුහුණ දුන්නු ඇමෙරිකානු හමුදාවත්, වියට්නාම හමුදාවත් කියන දෙපාර්ශ්වයම යුදමය වශයෙන් විශාල හානියකට පත් වුණා. ඒ යුද්ධය අවසන් වීමත් සමඟ තමයි මේ සුබසාධන ක්‍රියාවලිය ආරම්භ වුණේ. පශ්චාත් යුදමය තත්ත්වයකදී යුද්ධයට මුහුණ දුන් රටේ හමුදාවේ සාමාජිකයන්ගේ සුබසාධන කටයුතු පිළිබඳව ලෝකයේ වැඩිම අවධානය යොමු වුණු අවස්ථාව තමයි 1975දී වියට්නාම යුද්ධය අවසන් වූ අවස්ථාව. වියට්නාම යුද බිමට ගිය ඇමෙරිකානු යුද විරුවන් වෙනුවෙන් ඇමෙරිකාවේ අදටත් සුබසාධන ක්‍රියාවලියක් සිදු කරනවා. අවුරුදු 40කට පසුවත් ඇමෙරිකානු රාජ්‍ය ඒ වගකීම ඉටු කරනවා. අපේ රටේ යුද්ධය අවසන් වෙලා අවුරුදු 09යි ගිහින් තිබෙන්නේ. එම නිසා අපට ජාතික වගකීමක් තිබෙනවා, ජාතික කාර්යභාරයක් තිබෙනවා විශේෂයෙන්ම යුද්ධය නිසා ජීවිත අහිමි වූ, ආබාධිත තත්ත්වයට පත් වූ සහ අතුරුදහන් වූ ආදී වශයෙන් තිබෙන categories කිහිපය යටතේ සුබසාධන ක්‍රියාවලිය මීට වඩා පුළුල් පරාසයක සිද්ධ කිරීමට. මම මුලින්ම කිව්වා වාගේ අපි සුබසාධනය කියලා කරන්නේ පොඩි පොඩි වැඩ ටිකක් පමණයි. අපට ලැබෙන ප්‍රශ්න අනුව පෙනෙනවා, පඩි ගෙවීම පිළිබඳ ප්‍රශ්න, ගෙවල් ප්‍රශ්න, දරුවාට ශිෂ්‍යත්වයක් ලබා ගැනීම, දරුවා පාසලකට ඇතුළත් කර ගැනීම වාගේ කාරණාවලට පමණක් ඒ ප්‍රශ්න සීමා වෙලා තිබෙන බව. පශ්චාත් යුදමය තත්ත්වයක් තුළ රටක් කොහොමද තමන්ගේ හමුදාව වෙනුවෙන් කටයුතු කරන්නේ කියලා පරමාදර්ශී විධියට ඇමෙරිකාව සහ වියට්නාමය ගත්තොත්, අපේ ආරක්ෂක අමාත්‍යාංශයටත්, අපේ ත්‍රිවිධ හමුදාවේ ප්‍රධානීන්ටත් ඒ රටවල් දෙකෙන් අවශ්‍ය ප්‍රමාණයට උදාහරණ අදටත් ලබා ගන්න පුළුවන්.

එහිදී වැදගත්ම කටයුත්ත මෙයයි. ලෝක ඉතිහාසයේ රටක රාජ්‍ය හමුදාවක් අවුරුදු 26ක් -සමස්ත හමුදාවම- එක දිගට සටන් කළ රටකට තිබෙන්නේ අපේ රට පමණයි. ශ්‍රී ලංකාවේ හමුදාව සම්බන්ධයෙන් කථා කරන විට ලෝක ඉතිහාසයේ වැදගත්ම සිද්ධියක් තමයි, අපේ සමස්ත හමුදාවම අවුරුදු 26ක් අඛණ්ඩව යුද්ධ කරලා තිබීම. මගේ මිත්‍රයෙක් ශ්‍රී ලංකා හමුදාවේ මනෝ වෛද්‍යවරයකු හැටියට කටයුතු කළා. දැන් නම් ඔහු විදේශගතව ජීවත් වෙන්නේ. රුවන් ජයතුංග කියන ඒ වෛද්‍යවරයා යුද්ධ කාලයේ ශ්‍රී ලංකා හමුදාවේ මනෝ වෛද්‍යවරයකු විධියට කටයුතු කළා. ඔහු තමයි, ලංකාවේ හමුදාව අවුරුදු 26ක් එක දිගටම යුද්ධ කිරීම තුළ ඇති වුණු ඒ යුද විඩාව - war fatigue - තුළ ගොඩ නැඟුණු Post-traumatic Stress Disorder කියන තත්ත්වය පිළිබඳව ලංකාවේ මුලින්ම අධ්‍යයනය කළේ.

මට කියන්න අවශ්‍ය මේ කාරණයයි. යුද්ධය ඉවර වෙලා අවුරුදු 40කට පස්සේත් වියට්නාම් යුද බිමට ගිය ලෝකයේ සුපිරිම හමුදාවට තවම ඇමෙරිකාව සලකනවා. අපේ රටේ නම් ඒ අය පිළිබඳ පරීක්ෂණ ක්‍රියාවලියක්වත් නැහැ. ඒ නිසා මම යෝජනා කරනවා, මේ අරමුදලේ තිබෙන මිලියන 1,067න් සුළු පරාසයක ක්‍රියාත්මක වෙන්නේ නැතුව මේ වාගේ පුළුල් මනෝ විද්‍යාත්මක කටයුතු වෙනුවෙනුත් යොදවන්න කියලා. විශේෂයෙන්ම අපේ ශ්‍රී ලංකා හමුදාවේ සියයට 12ත්, 15ත් අතර සාමාජිකයන් පිරිසක් අදටත් මොනම හෝ මානසික ආතති, PTSD කියලා අපි හඳුන්වන තත්ත්වයෙන් පෙළෙනවා. ඒ අයට කිසිම රැකවරණයක් හෝ ඔවුන් පිළිබඳ අවධානයක් නැහැ. ඔවුන් අපි වාගේම සමාජයේ ඉන්නවා. ඔවුන්ට වෙන ප්‍රශ්නයක් නැහැ. නමුත් ඔවුන් මානසික චිත්තවේගත් එක්ක දුක් විඳිනවා. ඒ අයට කිසිම පිළිසරණක් නැහැ. මම යෝජනා කරනවා, අර Post-traumatic Stress Disorder වාගේ තත්ත්වයට මුහුණ දීලා ඉන්න අපේ හමුදා සාමාජිකයන්ට යම් කිසි ආකාරයක සහනයක්, ප්‍රතිකාරයක්, උදව්වක් ලබා දීම සඳහා මේ අරමුදල යොදවන්න කැප වෙන්න කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යුද්ධය අවසානයත් එක්ක යුද්ධයට මුහුණ දුන්නු, යුද්ධයේ කටුක අත්දැකීම් විඳපු අපේ ත්‍රිවිධ

හමුදාවේ විශාල පිරිසක් විශ්‍රාම ගියා. අවුරුදු 12න් වෙන්න පුළුවන්, අවුරුදු 22න් වෙන්න පුළුවන්, ඔවුන් විශ්‍රාම ගියා. මුලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, "රණ විරුවා", "රණ විරුවා", "රණ විරුවා" කියලා අපි ඔවුන් අගය කරලා කථා කළාට, ඔවුන් අවුරුදු 12න් හරි, 22න් හරි විශ්‍රාම ගියාම එතැනින් පස්සේ කිසිම ඇගැයීමක් නැහැ. ඔහුට හිමි විශ්‍රාම වැටුපක් හෝ මොනවා හරි දීමනාවක් තිබෙනවා නම් එපමණයි ලැබෙන්නේ. අපි මේ කියන මහා රණ විරුවා අන්තිමට කොහේ හරි ආයතනයක ගේට්ටුවක් ළඟ security job එකක් තමයි කරන්නේ. එහෙමත් නැත්නම් ත්‍රී-වීලර් එකක් ෆිනෑන්ස් කරලා අරගෙන ඒ ත්‍රී-වීලර් එකේ වැඩ කරනවා.

අපි විශාල වශයෙන් රණවිරු උපහාර උත්සව පැවැත්වුවත් වැඩක් නැහැ, ඒ රණ විරුවා ත්‍රී-වීලර් එකක් ඔහුගේ සල්ලිවලින් අරගෙන වැඩ කරනවා නම් හෝ මම කලින් කිව්වා වාගේ කොහේ හරි security job එකක් කරනවා නම්. අපි ඊට වැඩිය දෙයක් ඔවුන් වෙනුවෙන් කරන්න ඕනෑ. ලෝකයේ වැදගත්ම විනයගරුක පුද්ගලයන් ඉන්න තැන තමයි හමුදාවක් කියන්නේ. ඒක ලෝකයේ ඕනෑම තැනකට පොදු තත්ත්වයක්. අපට මේ මානව සම්පත ඉතාම වැදගත්. මානව සම්පත් කළමනාකරණය පිළිබඳව දැන් ලෝකය වැඩියෙන්ම කථා කරනවා. අපේ ශ්‍රී ලංකා ත්‍රිවිධ හමුදාවේ විශ්‍රාම යන ඒ විවිධ මට්ටම්වල නිලවල නියුතු වෙලා හිටපු ඒ පිරිස අපේ රටේ සංවර්ධන කාර්යය සඳහා යොදා ගන්න පුළුවන්.

අවුරුදු 20න් ත්‍රිවිධ හමුදාවේ මොනම තනතුරකට හරි යන කෙනෙක්, ඉහළ තනතුරක් නොදරනවා නම් අවුරුදු 42න් අනිවාර්යයෙන් විශ්‍රාම ගත යුතුමයි. සමහර විට අවුරුදු 45 වෙනකොට ඔවුන් විශ්‍රාම අරගෙන තිබෙනවා. ඔවුන්ගේ විනය සහ පුහුණුව, ඔවුන්ගේ ඒ ශක්තිය හා දැනුම අපේ රටේ සංවර්ධන කාර්යය සඳහා යොදා ගන්න පුළුවන් කියලා මම විශ්වාස කරනවා. මම මුලින්ම කිව්වා වාගේ පොඩි කටයුතු දෙක, තුනකට සීමා වෙන්නේ නැතුව මේ අරමුදල ඊට වඩා ඉහළ කටයුතු සඳහා යොදවන්න ඕනෑ. ඒ වාගේම, ඔවුන්ට යම් කිසි ව්‍යවසායකත්ව පුහුණුවක් ලබාදීමේ වැදගත්කමක් තිබෙනවා. මම දන්නවා, ශ්‍රී ලංකා හමුදාව යම්කිසි උත්සාහයක් කළා, විශ්‍රාම ගැන්වෙන අවදියේ ඉන්න හමුදා සෙබළුන්ට, නිලධාරින්ට ඔවුන් කැමැති ආකාරයක ව්‍යවසාය සංවර්ධන පුහුණුවීම් ලබා දීමට. නමුත් ඒවා සාර්ථක වුණේ නැහැ.

මම ආරක්ෂක අමාත්‍යාංශයට යෝජනා කරනවා, විශ්‍රාම ගැන්වෙන වයසේ සිටින සියලු හමුදා සාමාජිකයන් විශ්‍රාම යෑමෙන් පස්සේ, සමාජයේ එතරම් පිළිගැනීමක් නැති security job එකකට යනවාට වඩා, ඔවුන්ගේ කැමැත්ත පරිදි දෙපයින් නැඟී සිටින්නට හැකි ආකාරයේ ව්‍යවසායකත්ව පුහුණු වැඩසටහන්වලට යොමු කරන්න කියලා. මම කියන්නේ නැහැ ඒ අය පපඩම් හදන, හඳුන්කූරු හදන වාගේ වැඩවලට යොදවන්න කියලා. ඔවුන්ට හැකි, ඊට වඩා ඉහළ ස්වයං රැකියා හෝ ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණුවලට ඔවුන් යොමු කරන්න මේ අරමුදල යොදා ගන්න කියලා මම යෝජනා කරන්න කැමැතියි.

රට පුරාම හැම තැනම තිබෙනවා, රණවිරු ගම්මාන. ඒක බොහොම හොඳ සංකල්පයක්. රණ විරුවාගේ නිවාස ප්‍රශ්නයට විසඳුම් ලබා දීම සඳහා රණවිරු නිවාස ලංකාවේ ඕනෑම තැනක තිබෙන්න පුළුවන්.

வரலாற்றில் இன்று ஒரு மகிழ்ச்சிகரமான நாள்! வட பகுதிக் கல்விச் சமூகத்தின் கனவுகளில் ஒன்று நிறைவேறிய நாள்! யாழ். பல்கலைக்கழகத்தின் 33வது பொதுப்பட்டமளிப்பில் யாழ்ப்பாணப் பல்கலைக்கழகப் பொறியியல் பீடத்தில் இருந்து வரலாற்றில் முதல் தடவையாக 33 பேர் பொறியியல் விஞ்ஞானமாணிப் பட்டம் பெற்றுப் பொறியியலாளர்களாக இன்று வெளியேறுகிறார்கள். கடந்த ஆட்சியின்போது தேசிய பாதுகாப்பின் காரணமாக படையினரிடம் இருந்த பல்லாயிரக்கணக்கான ஏக்கர் நிலங்களை நான் விடுவித்து மக்களிடம் கையளித்திருந்தேன். அதில் 650 ஏக்கர் பரப்பளவைக் கொண்ட கிளிநொச்சி அறிவியல் நகரும் ஒன்றாகும். யாழ். பல்கலைக்கழகத்தின் பொறியியல் மற்றும் விவசாய பீடங்களை அமைப்பதற்கு அந்த அறிவியல் நகரை படையினரிடமிருந்து விடுவிக்க வேண்டுமென்று நான் பல்வேறு பிரயத்தனங்களை எடுத்து, அதற்கான அமைச்சரவைப் பத்திரத்தைச் சமர்ப்பித்திருந்தேன். அதற்கான அங்கீகாரத்தைப் பெறுவதற்கு அன்று அமைச்சராக இருந்து ஆதரவு வழங்கிய இன்றைய ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களுக்கும், உயர் கல்வி அமைச்சராக இருந்த எஸ்.பி. திசாநாயக்க அவர்களுக்கும், விசேடமாக முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களுக்கும் மற்றும் எனது முயற்சிகளுக்கு ஆதரவு நல்கிய ஏனையவர்களுக்கும் வட பகுதி கல்விச் சமூகத்தின் சார்பில் நான் நன்றிகூறக் கடமைப்பட்டிருக்கிறேன். பொறியியல் துறையை விரும்பும் வட பகுதி மாணவர்கள் தென்னிலங்கையில் தங்கியிருந்து பல்வேறு சிரமங்களுக்கு மத்தியில் தங்களது பட்டப்படிப்பைத் தொடரவேண்டிய நிலையிலிருந்து அவர்களை விடுவிக்கும் வகையில் தமது சொந்த மண்ணிலேயே அவர்களுக்கான வளாகங்களை அமைக்க வேண்டுமென்ற யாழ். கல்விச் சமூகத்தின் நீண்ட காலக் கனவை இன்று நிறைவேற்றிக் கொடுத்ததுபோல், தமிழ் பேசும் மக்களின் ஒட்டுமொத்தக் கனவுகளையும் நிறைவேற்றிக்கொடுக்கும் இலக்கு நோக்கி நான் தொடர்ந்தும் நடப்பதற்கு, அனைத்துத் தரப்பினரின் ஆதரவையும் சகோதர வாஞ்சையோடு கோரிநிற்கிறேன். யாழ். பல்கலைக்கழகத்திலிருந்து இளம் பொறியியலாளர்களாக வெளியேறிவரும் எம் தேசத்துக் கல்விக் கண்மணிகளுக்கு வாழ்த்துக்களையும் கூறிக்கொள்கின்றேன்.

தேசிய பாதுகாப்பு நிதியம் (திருத்தம்) சட்டமூலம் தொடர்பான இன்றைய இந்த விவாதம் தொடர்பாகவும் ஒரு கருத்தைக் கூற விரும்புகின்றேன். இங்கு பேசிய பாராளுமன்ற உறுப்பினர் ஒருவர் வியட்நாம் - அமெரிக்க யுத்தத்தைப் பற்றிக் குறிப்பிட்டிருந்தார். அந்த வியட்நாம் யுத்தத்தில் பாதிக்கப்பட்ட அமெரிக்கப் படையினருக்கு விசேடமான நிதி ஏற்படுத்தப்பட்டதுபோல, இலங்கை இராணுவத்திற்கும் அவ்வாறு விசேடமான நிதி ஏற்படுத்தப்பட்டிருப்பதாகவும் குறிப்பிட்டிருந்தார். அந்த வகையில், புனர்வாழ்வு பெற்றவர்கள் மற்றும் நேரடியாக யுத்தத்தில் பாதிக்கப்பட்ட மக்களுடைய வாழ்க்கையை விரைவாக முன்னேற்றுவதற்கெனவும் ஒரு விசேட நிதியினை ஒதுக்குமாறு கேட்டுக்கொண்டு, நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

[අ.භා 3.53]

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ආරක්ෂක අරමුදල් පනතට සංශෝධන ඉදිරිපත් කරන මේ වෙලාවේ ඒ පිළිබඳව අදහස් කිහිපයක් එකතු කරන්නට අවස්ථාව ලැබීම ගැන මා පළමුවෙන්ම සතුටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික ආරක්ෂක අරමුදල් පනත හැදුවේ 1985 මාර්තු මාසයේ 05 වැනිදා. බෙදුම්වාදී කොටි ත්‍රස්තවාදය කම්මුතු කරන්න; පරාජය කරන්න කැපවුණු රණවිරුවන්ටත්, රණවිරුවන්ගේ පවුල්වලටත් සුබසාධනය සලසන්නයි; ඉදිරි ආරක්ෂක වළල්ලේ කොටියාත් එක්ක මරණය සමඟ පොර බඳමින් සිටි රණවිරුවාගේ පවුලට අවශ්‍ය සුබසාධනය සලසා රණවිරුවාට මානසික ඒකාග්‍රතාවයකින් යුක්තව මව් පොළොව වෙනුවෙන් සටන් වදින්න ඕනෑ කරන මානුෂික ශක්තිය සපයන්නයි; ඔහුට ඕනෑ කරන ධෛර්යය සපයන්නයි. ඔහුට ඕනෑ කරන ආත්ම විශ්වාසය සපයන්න තමයි ජාතික ආරක්ෂක අරමුදල හැදුවේ. ඒක බොහොම ප්‍රගතිශීලි යෝජනාවක්. දිවංගත ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා ඒක කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි රණවිරුවන් රකිනවා කියන්නේ රණවිරු ජයග්‍රහණත් රකින එක. රණවිරුවන් රකිනවා කියන්නේ, රණවිරුවන්ව ආරක්ෂා කරන එක. ජාතික ආරක්ෂාවට රණවිරුවා වැදගත් වාගේම රණවිරුවාටත් ආරක්ෂාව වැදගත්.

අද මේ ගරු සභාවේ යහ පාලන ආණ්ඩුවේ මන්ත්‍රීවරු රණවිරුවන් ගැන කථා කර කර පපුවට ගහ ගන්නවා; කිඹුල් කඳුළු හෙළනවා. යහ පාලන ආණ්ඩුව ආපු හැටියේ මොකක්ද කළේ? සහීඩ් අල් හුසේන් කුමාරයා හැදුවා, යෝජනාව. "ශ්‍රී ලංකාවේ හමුදා සමූල ඝාතකයි" "ශ්‍රී ලංකාවේ හමුදාව ස්ත්‍රී දූෂකයි" "ශ්‍රී ලංකාවේ හමුදාව සුබ සාධන මධ්‍යස්ථානවලටත් ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල කළා" කියලා අභූත චෝදනා නඟලා, රණවිරුවන් දංගෙඩියට දක්කන යෝජනාවලියක් හැදුවා, සහීඩ් අල් හුසේන් කුමාරයා. මංගල සමරවීර, හිටපු විදේශ අමාත්‍යවරයා මේ අවස්ථාවේ ගරු සභාවේ නැති වුණත් උන්නැහේගේ නම නොකියා බැහැ. මංගල සමරවීර හිටපු විදේශ අමාත්‍යවරයා ගිහිල්ලා මොකද කිව්වේ? සහීඩ් අල් හුසේන් කුමාරයා හදපු වාර්තාවේ ඇලපිල්ලක්, ඉස්පිල්ලක්, පාපිල්ලක්, කොමාවක්, තිතක් පවා වෙනස් කළේ නැහැ. ඒ පිළිබඳව කිසිම මැසිවිල්ලක්වත් නැගුවේ නැහැ. අපේ හමුදා එහෙම කළේ නැහැ කියලා කිව්වේ නැහැ. එම වාර්තාව දොහොත් මුදුන් දීලා, දණ ගහලා පිළිගත්තා ඔබතුමාට මතක ඇති, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 30.1 යෝජනාව ආවේ එහෙමයි. අද 30.1 යෝජනාව අනුව මේ මන්ත්‍රීවරුන් කිඹුල් කඳුළු හෙළනවා. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය (පිහිටුවීම, පරිපාලනය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම) නැමැති පනතෙන් අපේ රටේ රණවිරුවන් දංගෙඩියට දක්කන්න ලැහැස්ති කරන චෝදනා පැක්ටරිය හැදුවේ, 30.1 යෝජනාව අනුව නොවෙයි ද? එම චෝදනා ෆැක්ටරිය අනුව නොවෙයිද, නිමල්කා ප්‍රනාන්දු කියන කොටි ධෙනුව සහිත කොමසාරිස්වරු අද මුලතිව්, වන්නිය, කිලිනොච්චිය, යාපනය, මන්නාරම ප්‍රදේශවලට ගිහිල්ලා රණවිරුවන්ව දං ගෙඩියට දක්කන්න ඕනෑ කරන අභූත චෝදනා නිර්මාණය කරන්නේ. ස්කයිප්වලින් පැමිණිල්ලක් ආවත් ඒකත් විභාග කරනවා; චෝදනාව හදනවා. ඊමේල් එකකින් පැමිණිල්ලක් ආවත් ඒකත් විභාග කරනවා; චෝදනාවක් හදනවා. ආං ආවා, බඩු. අද නිමල්කා ප්‍රනාන්දු කියන කොටි ධෙනුව මේ ආණ්ඩුවේ පිහිටෙන් කොටින්ට ඕනෑ වැඩේ, දෙමළ ඊයස්පෝරාවට ඕනෑ වැඩේ, බෙදුම්වාදීන්ට ඕනෑ වැඩේ අපේ බදු මුදලින්ම සම්පූර්ණ කරමින් ඉන්නවා. රණවිරු දඩයමට ඒ පනත විතරක් නොවෙයි 30.1 යෝජනාව අනුව ආවේ. 30.1 යෝජනාව අනුව ආපු දෙවෙනි පනත බලන්න. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය පනත. කොහොමද වැඩේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ ගරු සභාවේ එක්සත් ජාතික පක්ෂයේ එක වගකිව යුතු මන්ත්‍රීවරයකුවත් නැහැ; කවුරුවත් නැහැ; බලු කපුටෙක්වත් නැහැ. මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඉන්නවා. එතුමා උත්තර දෙයි. ඒ බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම සඳහා වූ ජාත්‍යන්තර සම්මුතියට අඩු ගණනේ ඉන්දියාව අත්සන් තැබුවාද, චීනය අත්සන් තැබුවාද, රුසියාව අත්සන් තැබුවාද, එක්සත් ජාතික පක්ෂයේ පරමාදර්ශී රාජ්‍ය වන ඇමෙරිකා එක්සත් ජනපදය අත්සන් තැබුවාද? නැහැ. ලෝකයේ කිසි බලගතු රටක් අත්සන් තැබුවේ නැහැ. තමන්ගේ රටේ හමුදාව රකින්න කල්පනා කරන කිසිම රටක් ඒ ප්‍රඥප්තියට අත්සන් කළේ නැහැ.

මේ රටේ මොකක්ද කළේ? මංගල සමරවීර අමාත්‍යවරයා මොකක්ද කළේ? මේ යහ පාලන නඩය මොකක්ද කළේ? ඒ පනත් කෙටුම්පතට අත්සන් කළා විතරක් නොවෙයි, ඒ පනත් කෙටුම්පත තුළින් දීන, තුච්ඡ, අපේ රටේ රණ විරුවන් අමු-අමුවේ ජාත්‍යන්තර අධිකරණවලට පාවා දෙන ඒ ප්‍රඥප්තිය මේ නීතියටත් ඇතුළු කළා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් ඒකෙන් යන්ත්‍රණ දෙකක් හැදෙනවා. එක් යන්ත්‍රණයක් තුළින් සම්මුති රාජ්‍යයන්වලට අපේ රටේ රණ විරුවන් පිටුවහල් කිරීමේ හැකියාව එනවා. අනෙක් පැත්තෙන් අණ දීමේ වගකීම නිරණය කොට දඬුවම් ලබා දීමේ මහාධිකරණයක් ලංකාවේ නිර්මාණය කරන්න පුළුවන්කම ලැබෙනවා. යන්ත්‍රණ දෙකයි. රණවිරු දඩයමට පනත් දෙකයි. මෙන්න එනවා, තව එකක්. හැබැයි, මේක 30.1 යෝජනාවේ තිබුණේත් නැහැ. 30.1 යෝජනාවේ තිබුණා, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවන්න ඕනෑය කියන යෝජනාව. 30.1 යෝජනාවේ තිබුණා, ජාත්‍යන්තර ප්‍රඥප්තිය බලාත්මක කිරීමේ යෝජනාව තිබුණා. හැබැයි, සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනත සංශෝධනය කරන්න කියලා 30.1 යෝජනාවේ තිබුණේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ පනත තමයි, රනිල් වික්‍රමසිංහ අග්‍රාමාත්‍යවරයා එදාත් -2002දී- පොදු රාජ්‍ය මණ්ඩලයීය රටවල් සමඟ හැදුවේ. එදත් කළේ, රට පාවා දීමේ පනත් කෙටුම්පත් ගෙනෙන එකයි. ඒකට තමයි 2002දී මේ පනත ගෙනාවේ. අද මොකද කරන්නේ? මේකට ගෙනෙනවා, බරපතළ සංශෝධන 22ක්. මේකෙන් මොකක්ද වෙන්නේ? අපට පෙනෙන විධියට මංගල සමරවීර මහත්තයා මේ කරන්න හදන්නේ මේකයි. මේ කරන අපරාධවලට, ඊළඟ පාර්ලිමේන්තු මහ මැතිවරණයේ දී මංගල සමරවීරට ආපසු දියවන්නාව පැත්ත පළාතේ එන්න ලැබෙන්නේ නැහැ. ඒ නිසා සෙයිඩ් අල් හුසේන් කුමාරයා විශ්‍රාම යනකොට; මෙහෙන් කුජීතවෙලා යනකොට, එතුමා පුටුව හදා

[ගරු ජයන්ත සමරවීර මහතා]

ගන්නයි මේ හදන්නේ. සෙයිඩ් අල් හුසේන් කුමාරයා සිටින තැනින් විශ්‍රාම යනකොට, ජාත්‍යන්තර මානව හිමිකම් කොමසාරිස් වෙන්න තමයි මෙතුමා මේ හදන්නේ. ඒක නිසා තමයි කියන්නේ නැති දේවලුත් මේ කරන්නේ. සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත සංශෝධනය කරන්න කියලා 30.1 යෝජනාවෙවත් නැහැ. නමුත් ඒකත් කරනවා. මේකෙන් මොකක්ද වෙන්නේ? ජාත්‍යන්තර ප්‍රඥප්ති පනතින් සම්මුති රාජ්‍යයන්වලට විතරයි පිටුවහල් කරන්න පුළුවන් වෙන්නේ. හැබැයි, මේක එහෙම නොවෙයි. යුද අපරාධයක් සිදු වී තිබෙනවාය කියලා ඉල්ලුවොත් සම්මුති රාජ්‍යයන් නොවන රාජ්‍යයන්ටත් පිටුවහල් කිරීමට සිදු වනවා. ජාත්‍යන්තර ප්‍රඥප්ති පනත යටතේ සම්මුති රාජ්‍යයන්වලට විතරයි පිටුවහල් කරන්න පුළුවන් වන්නේ. හැබැයි, මෙයින් එහෙම නොවෙයි වෙන්නේ. යුද අපරාධයක් සිදු වී තිබෙනවා කියා ඉල්ලීමක් කළොත්, සම්මුති රාජ්‍යයන් නොවන රාජ්‍යයන්ටත් ඒ අවස්ථාව ලැබෙනවා. අතුරුදහන් වූවන්ගේ කාර්යාලය හදන යුද අපරාධ චෝදනා ෆැක්ටරියේ චෝදනාවකට අදාළ ඥාතියෙකු වෙනත් ඕනෑම රටක සිටියොත්, "අපේ ඥාතියා අතුරුදහන් කරලා ඝාතනය කිරීමේ වරදට මෙන්න මෙයා ඕනෑ කරනවා" කියා ඒ රටෙන් කවුරු හෝ කිව්වොත්, සාක්ෂිකරුවකු හැටියට ඒ රණවිරුවා ඕනෑම රටකට පිටුවහල් කිරීමට බැඳී සිටින සංශෝධන තමයි සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගය ලබා දීමේ පනතේ සංශෝධන හැටියට මේ එන්නේ. මංගල සමරවීර මේ නින්දිත උත්සාහය කරන්නේ අන්න ඒකටයි. මේ දින පනත ගෙනෙන්න යන්නේ ඒකට. මේ රටේ රණ විරුවන් රකින්න කල්පනා කරන හැම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගෙන්ම අපි ඉල්ලනවා, "තමුන්නාන්සේලා මේ පනතට අත උස්සන්න එපා. මේ පනතට අත ඉස්සුවොත් මේ රටේ ජනතාවට ඒ අයගේ අත් කපන්න සිදු වෙනවා" කියලා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබටත්, මටත්, මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමාටත්, -අපි හැමෝටමත්- බයක් සැකක් නැතිව, මේ පොළොවේ හුස්ම ගන්න; උතුරේත්, දකුණේත් නිදහසේ සැරිසරන්න හැකියාව ලබා දීම සඳහා ජීවිත දානය දීපු රණ විරුවන් තමයි මේ තුච්ඡ, නින්දිත, අපකීර්තිමත් විධියට අද දං ගෙඩියට දක්කන්නට සැරසෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම කරනවා නම් අපි කවුද? එහෙම කරනවා නම් අපි මොක්කුද? අපිට ඒ වෙනුවෙන් නැඟී සිටීමට යුතුකමක් නැද්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? තමන්ගේ ජීවිතය පරදුවට තබලා අපට ජීවිතය දීපු මේ රණවිරුවන්ව මෙහෙම පිටුවහල් කරලා, දං ගෙඩියට දක්වන්න නීති හදනවා නම් මේ පාර්ලිමේන්තුව තිබිලා වැඩක් තිබෙනවාද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? එවැනි අවස්ථාවක "මේ පාර්ලිමේන්තුවට හෙණ වදීවා" කියලා කවුරු හෝ ප්‍රාර්ථනා කළොත් ඒකේ වරදක් තිබෙනවාද කියලා මා තමුන්නාන්සේගෙන් අහනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ද්‍රවිඩ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරු, ඒ උන්නැහේලා අලුතින් ඉපදුණාද කියලා මා අහනවා. ජන සංහාරය කළේ කවුද කියලා අපි අහනවා. අද විග්නේස්වරන් ඇතුළු කණ්ඩායම ජන සංහාරක සති පවත්වනවා. මේ ආණ්ඩුව අද සංහිඳියාව ගැන කථා කරනවා. විග්නේස්වරන් මහත්මයා ජන සංහාරක සති පවත්වනවා. ආණ්ඩුවේ බදු මුදලින් ජන සංහාරක සති පවත්ව පවත්වා ලෝකයට කියනවා, "ජන සංහාරය කළා" කියලා. ඒ විතරක් නොවෙයි, බැංකු මංකොල්ලයකට ගිහිල්ලා පළමුවැනි චෝදනාවට සයිනයිඩ් කරල කාපු ශිවකුමාරන්වත් සමරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මංකොල්ල කන එවුන්ව සමරන්න කියලා තමයි මේ කියන්නේ. ඒ කියන්නේ, උතුරේ පාසල් ශිෂ්‍යයන්ට කියන්නේ මොකක්ද? "මංකොල්ල කන්න ලැහැස්ති වෙයල්ලා, සයනයිඩ් කරල් බැඳ ගන්න ලැහැස්ති වෙයල්ලා, එහෙම වුණොත් තමයි වීරත්වයේ විශ්ව අල්තාරය මත; පූජාසනය මත අනාගත පරම්පරාවන් ඔබ පුදන්නේ, බැංකු මංකොල්ල කාලා පොලීසියට අහු වුණොත් සයනයිඩ් කාපල්ලා" කියා තමයි මේ කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙමළ ජාතික සන්ධානයේ ගරු කටයුතු මන්ත්‍රීවරුන්ගෙන් අපි අහනවා, ජන සංහාර කළේ කවුද කියලා. ශ්‍රී ලංකා හමුදාවද? නැහැ. කාත්තන්කුඩි පල්ලියට බෝම්බ ගැහුවේ කවුද? යාච්ඤා කරමින් සිටි මුස්ලිම් බැතිමතුන් අමු අමුවේ ඝාතනය කළේ කවුද? සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ යන සියලු ජනකොටස්වල මිනිසුන් හිටපු පිටකොටුව නගරයේ බෝම්බ පුපුරවලා, එම නගරය සුසානයක් බවට පත් කළේ කවුද? දෙහිවල කෝච්චියේ හැමෝම යනවා. දෙමළ ජනතාව යනවා; මුස්ලිම් ජනතාව යනවා; සිංහල ජනතාව යනවා; සිංහල-කතෝලික ජනතාව යනවා; සිංහල-බෞද්ධ ජනතාව යනවා; දෙමළ-හින්දු ජනතාව යනවා. ඒ හැමදෙනාම යන දෙහිවල කෝච්චියට බෝම්බය තියලා, එම කෝච්චිය කුඩු කරලා, මහා සමූලඝාතනයක් කළේ කවුද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩොලර් ෆාම්වල, කෙන්ට් ෆාම්වල අභිංසක දරුවන් පවා පොල් ගස්වල ගහලා, කැති ගාලා නැති හංග කළේ කවුද? කෝ, ඒවාට genocide යෝජනා? එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස්වරයා වන සෙයිඩ් රාඩ් අල් හුසේන් කුමාරයා කියනවා, ශ්‍රී ලංකාවේ හමුදා හතළිස්දහසක් ඝාතනය කළාය කියලා. මංගල සමරවීර මහත්මයා දොහොත් මුදුන් දීලා ඒක පිළිගන්නවා. දැන් දෙමළ ජාතික සන්ධානය සමූලඝාතන චෝදනා කරනවා. අද විග්නේෂ්වරන්ලා ජන සංහාරක සති සමරනවා. තකට තක! මෙහෙන් "ටීඑන්ඒ" එක කියනවා, ජන සංහාර කළාය කියලා. එහෙම කියමින් ඔවුන් ජන සංහාරක සති සමරනවා. නොදකින්! මේ විදේශ ඇමතිවරයා ඒක පිළිගන්නවා. තකට තක! බලන්න කෝ, මේ විදේශ ඇමතිවරයා එහෙම පිළිගත්තාට, ශ්‍රී ලංකාව පිළිබඳව දන්නා, ශ්‍රී ලංකාවේ ජනයා පිළිබඳව දන්නා, ශ්‍රී ලංකාවේ සභ්‍යත්වය පිළිබඳව දන්නා නෙස්බි සාමිවරයා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේදී මොකක්ද කියන්නේ කියලා. මංගල සමරවීර කිව්වේ නැති වුණාට නෙස්බි සාමිවරයා කියනවා, "ශ්‍රී ලංකාවේ හමුදා කියන්නේ, විශිෂ්ට, විනයානුකූල හමුදාවක්; ජාත්‍යන්තර මානුෂික නීතියයි, ජාත්‍යන්තර මානව හිමිකම් නීතියයි උපරිමයෙන් රැකපු හමුදාවක් ඒක, එහෙම රැකපු හමුදාවක් මම දැකලා නැහැ, මැරුණේ භයදහසයි" කියලා. කොහොමද වැඩේ? නෙස්බි සාමිවරයාට ශ්‍රී ලංකාව ගැන නිබුණු අවබෝධය මේ විදේශ අමාත්‍යවරයාට නිබුණේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මේ වාගේ විදේශ අමාත්‍යවරු පොල්පිතිවලින් කපන්න පුළුවන්. ඒ නිසා අපි තමුන්නාන්සේලාට මෙන්න මේ කාරණය කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ එන්න හදන්නේ මොකටද? විග්නේෂ්වරන් මහත්මයා genocide සමූලඝාතක චෝදනා සම්මත කරනවා; ජන සංහාරක සති සමරනවා. පාසල් දරුවන් බලහත්කාරයෙන් දක්කලා, විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝත් බලහත්කාරයෙන් දක්කලා, ජනතාවගේ බදු මුදල්වලින් genocide සති, සමූලඝාතක සති, ජන සංහාරක සති සමරනවා. පාර්ලිමේන්තුවේ දෙමළ ජාතික සන්ධානයේ මන්ත්‍රීවරුත් ඒවාට තකට තක; "දී කිරට බළල්ලුත් සාක්කියි" කියන්නා වාගේ, එතුමන්ලාත් ඒ දේවල්ම කියනවා. අරහෙත් මංගල සමරවීර හිටපු

විදේශ අමාත්‍යවරයා සෙයිඩ් රාඩ් අල් හුසේන් කුමාරයාගේ යෝජනාව දොහොත් මුදුන් දීලා පිළිගන්නවා; සම අනුග්‍රහය දක්වනවා. ඒ අතරතුර අතුරුදහන් වූවන්ගේ කාර්යාල පිහිටුවනවා. නිමල්කා ප්‍රනාන්දු වැනි කොටි ධේනුවෝ; NGO කාක්කියෝ ලංකාවේ හතර කොනට ගිහිල්ලා - මුලතිව්, කිලිනොච්චි, වන්නි ගිහිල්ලා - චෝදනා ගොනු කරනවා; ෆැක්ටරිය ක්‍රියාත්මක වෙනවා. අර පැත්තෙන්, බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුතිය පනත බලාත්මක වෙනවා. මේ පැත්තෙන්, සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත මේ රටේ සම්මත කරන්න හදනවා. අවසානයේ, "අපේ රටේ රණ විරුවෝ" කියලා පපුවට ගහ ගන්නවා. අපේ රටේ රණ විරුවෝ දංගෙඩියට දක්කන්න යහපාලන ආණ්ඩුව සැරසෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ උත්තරීතර සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ගෙන්; හෘදය සාක්ෂියක් තිබෙන මන්ත්‍රීවරුන්ගෙන් අපි ඉල්ලා සිටිනවා, මේ පනත් කෙටුම්පතට අත ඔසවන්න එපාය කියා. ඒ වාගේම අපේ රටේ ජනතාවගෙන් ඉල්ලනවා, මේ මහා අපරාධකාරී පනත් කෙටුම්පත් මේ පාර්ලිමේන්තුවේ සම්මත කරන්න ඉඩ දෙන්න එපාය කියා. මේ පාර්ලිමේන්තුව අද අසමත් කියලා පෙනෙනවා.

මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු; අපි දන්නේ නැහැ, අද 118කට නොවෙයි, 168කට හොරකමේ චෝදනාව එල්ල වෙලා තිබෙනවා. මේක දූෂිත පාර්ලිමේන්තුවක් කියලා මිනිස්සු කියනවා. ඒ නිසා මේ පාර්ලිමේන්තුවට අයිතියක් නැහැ, රණ විරුවන් දංගෙඩියට දක්ක දක්කා, තව තවත් මේ රට කුණු කර කර, මේ රට පල් කර කර, මේ රට නැති කර කර, මේ රට වනස වනසා ඉන්න. වනසන්නේ නැතුව යන්න; මව් පොළොවට වද දෙන්නේ නැතුව යන්න; රණ විරුවන්ට වද දෙන්නේ නැතුව යන්න; රණ විරුවන් ජාත්‍යන්තර අධිකරණවලට දක්කන්නේ නැතුව යන්න කියන ඉල්ලීම කරමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීවරු 168දෙනකුට හොරකමේ චෝදනාව එල්ල වී තිබෙනවාය කියා එතුමා ප්‍රකාශ කළා. පට්ටපල් අසත්‍ය කියන්න එපා කියලා මා එතුමාට කියනවා. 168දෙනකුට හොරකමේ චෝදනාව එල්ල වී තිබෙනවා නම්, ඒකාබද්ධ විපක්ෂයේ අයත් ඒ අතර ඉන්න ඕනෑ. ඒ නිසා මේ අසත්‍ය කථා හැන්සාඩ් වාර්තාවෙන් අයින් කරන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා.

[අ.භා.4.08]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්න අවස්ථාව ලබාදීම ගැන ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ කථාවේදී අසත්‍ය කාරණා රාශියක් කියැවුණාය කියන එක මුලින්ම කියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ගොල්ලන් ප්‍රාර්ථනා කරන දේවල් තමයි මේ කියන්නේ. එතුමන්ලාගේ ප්‍රාර්ථනා තිබෙනවා නේ. "මේ රටේ ආයෙමත් කොටි ඉපදෙන්න ඕනෑ; මේ රටට කොටි එන්න ඕනෑ; ප්‍රභාකරන් එන්න ඕනෑ; ඒ අයත් එක්ක අපි ගහ ගන්න ඕනෑ; දකුණේ තරුණයෝ මැරෙන්න ඕනෑ; ඊට පස්සේ ඒ අයට අපි 'රණ විරුවන් ' කියලා කියනවා; ඒ විධියට ජනතාව අන්දවලා ආයෙත් බලයට එන්න ඕනෑ" කියලා ඒ ගොල්ලන්ගේ ප්‍රාර්ථනාවක් තිබෙනවා. මේක තමයි මේ ගොල්ලන්ගේ දේශපාලන න්‍යාය පත්‍රය. ඒ න්‍යාය පත්‍රය තමයි මෙතැනට ඇවිත් කියවන්නේ. [බාධා කිරීමක්] ඔව්, විග්නේෂ්වරන් කියන්නේ ඔබතුමන්ලාගේම කට්ටිය තමයි. ඔබතුමන්ලාගේ බාප්පා තමයි විග්නේෂ්වරන් කියන්නේ. ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමනි, ඔබතුමා දකුණේ ඉඳගෙන කියන දේ තමයි එතුමා උතුරේ ඉඳගෙන කියන්නේ. එතුමාටත් ඕනෑ මේ රට බෙදන්නයි. ඔබතුමාටත් ඕනෑ රට බෙදන්නයි. [බාධා කිරීමක්]

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මංගල සමරවීර ඇමතිතුමා තමයි, - [බාධා කිරීමක්]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මේ රටේ යුද අපරාධ වුණාය කියා මංගල සමරවීර ඇමතිතුමා කොහේවත් ගිහින් කියා නැහැ. මේ රටේ යුද අපරාධ සිදු වුණාය කියා ආණ්ඩුව කිසි විටෙකත් පිළිගෙන නැහැ. ආණ්ඩුවක් හැටියට අපි එය ප්‍රතික්ෂේප කරනවා. පසුගිය කාලයේ මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා මොකක්ද කිව්වේ? මැතිවරණයක්, මැතිවරණයක් ගණනේ පපුවට ගහ ගනිමින් කිව්වා, "විදුලි පුටුවට මාව හෙට ගෙනියනවා; අනිද්දා ගෙනියනවා" කියලා. අන්තිමේදී ගිය පළාත් පාලන මැතිවරණයේදී විතරයි පපුවට ගහ ගත්තේ නැත්තේ. ඇයි ඒ? අපි එතුමා බේරා ගත්තා. විදුලි පුටුවේ කථාව දැන් නැහැ. දැන් ඒ ගැන මහින්ද රාජපක්ෂ මහත්මයා කථා කරන්නෙත් නැහැ; එතුමාගේ ගෝල බාලයන් කථා කරන්නෙත් නැහැ. ඇයි ඒ? ජාත්‍යන්තරයත් එක්ක තිබුණු ඒ මත භේද, ගැටුම් අපට නිරාකරණය කර ගන්න පුළුවන් වුණා. අද ජාත්‍යන්තරය අපි කියන දෙයට ඇහුම්කන් දෙනවා; අපි කියන දේ අහනවා. ඒ ගොල්ලන් ලැහැස්තියි, අපිත් එක්ක එකට වැඩ කරන්න. තමුන්නාන්සේලාගේ කාලයේ ජාත්‍යන්තරය තමුන්නාන්සේලා

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

කියන එක දෙයක්වත් පිළිගත්තේ නැහැ. ඇයි ඒ? කියපු හැමදේම පට්ටපල් අසත්‍ය. ඔක්කෝම කළේ බොරුවයි. ලෝකයේ එදා තිබුණු තත්ත්වය අද වෙනස් වෙලා තිබෙනවා. අද ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා කියනවා, "දැන් ආයෙමත් කොටි නැඟිටිනවා" කියලා. මේ ගොල්ලන් හරි කැමැතියි, කොටි නැඟිටිනවා නම්. මේ ගොල්ලන්ටත් ඕනෑ ඒක කර ගන්න තමයි. කොටි නැඟිටිනකම් තමයි මෙතුමන්ලා බලාගෙන ඉන්නේ. මොකද, කොටියා විකුණාගෙනයි මේ ගොල්ලන් ජීවිතය ගෙවන්නේ. "කොටියා", "කොටියා" කිය කියා තමයි මේ ගොල්ලන්ගේ කාලය ගත වෙන්නේ. මේ අය ඉපදුණු දවසේ ඉඳන් මැරෙන තුරුම කටේ තිබෙන්නේ "කොටියා" කියන වචනයයි. එතුමන්ලා මේ පාර්ලිමේන්තුවේ වෙන වචනයක් කියනවාද? මොකක්ද නිතරම කියන වචනය? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන් මතක තියා ගන්න, මේ බලවේගය තමයි එදා බණ්ඩාරනායක මැතිතුමාවත් ඝාතනය කළේ කියන එක. ඒ බලවේගයේ නියෝජිතයන් තමයි මේ මන්ත්‍රීවරු. ඒ ගොල්ලන්ගේ බාප්පලා තමයි එදා බණ්ඩාරනායක මහත්තයාට වෙඩි තියලා මැරුවේ. ඒවායේ පුරුක් තමයි මේ එන්නේ. ඒ පුරුක් ඇවිල්ලායි මේ බෙරිහන් දෙන්නේ.

මෙතුමන්ලා රට ජාතිය ගැන කියමින් කෑ ගහනවා. හමුදා මූලස්ථානය විකුණපු එක ගැන කියන්නේ නැහැ. 1988 - 1989 කාලයේත් අපේ රටේ දකුණේ ත්‍රස්තවාදයක් තිබුණා. ත්‍රස්තවාදය කිව්වාම, උතුරේ ත්‍රස්තවාදයත් එකයි, දකුණේ ත්‍රස්තවාදයත් එකයි. ඒකේ වෙනස්කම් නැහැ. මෙතුමන්ලා දැන් රණ විරුවන් ගැන කියමින් මෙතැන කෑ ගැහුවා නේ. එදා දකුණේ ත්‍රස්තවාදය වෙලාවේ රණ විරුවන් එය මැඩලන්න ලොකු මෙහෙයුමක් කළා. ඒ මෙහෙයුමට විරුද්ධව එදා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මහින්ද රාජපක්ෂ මැතිතුමා ජිනීවාවලට ගියා. එතුමා ගියේ photos අරගෙනයි. අරගෙන ගිහින් පෙන්නුවා, "මෙන්න, මේ රටේ හමුදාව දකුණේ කොල්ලන්ව මරනවා" කියලා. අද මේ ගොල්ලන් මේ කථා කරන රණ විරුවන්ට විරුද්ධවයි, එදා මහින්ද රාජපක්ෂ මහත්තයා ජිනීවාවලට ගියේ. Airport එකේදී photos ටික හසු වුණා. අන්තිමට photos ටික තියලා එතුමා ගියා. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාත් එක්කයි ගියේ. එතකොට එදා දකුණේ ත්‍රස්තවාදය මැඩලන්න කටයුතු කළේ රණ විරුවන් නොවෙයිද? එතකොට ඉස්සර වෙලාම රණ විරුවන්ට විරුද්ධව ජිනීවා මානව හිමිකම් කවුන්සලයට ගිහින් complain කළේ කවුද? මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමායි. වෙන කවුරුවත් නොවෙයි. එතුමා ජිනීවා ගියේ 1988 - 1989 කාලයේයි. දැන් මෙතුමන්ලාට ඒ සියල්ලම අමතක වෙලා තිබෙනවා. මැරිලා ඉපදිලා වාගෙයි දැන් මෙතුමන්ලා කථා කරන්නේ; නින්දෙන් අවදි වෙලා වාගෙයි කථා කරන්නේ. 1988 - 1989 කාලයේ ජිනීවා ගියේ කවුද කියා මෙතුමන්ලා දන්නේ නැහැ.

මහින්ද රාජපක්ෂ මැතිතුමා ජිනීවා යන්න ආසන්න කාලයකදී පාර්ලිමේන්තුවේදී කළ කථාවකදී මොකක්ද කියන්නේ කියලා ඒ හැන්සාඩ් වාර්තාව අරගෙන බලන්න. එතුමා එදා කථා කරලා කියනවා, "මම යක්කුත් එක්ක හෝ කාත් එක්ක හෝ එකතු වෙලා මේ රටේ මානව හිමිකම් ආරක්ෂා කරන්න වැඩ කරනවා." කියලා. එහෙම කියලා තමයි එතුමා ජිනීවා ගියේ. එදාත් දකුණේ මෙහෙයුම් කළේ මේ රණ විරුවෝමයි. වෙන කවුරුවත් නොවෙයි. එදා දකුණේ පැවැති ත්‍රස්තවාදය මැඩලන්න වැඩ කළේ තමිල්නාඩුවෙන් ආ අය නොවෙයි; තමිල්නාඩුවෙන් ආ හමුදාව නොවෙයි. ලංකාවේ තිබෙන ගැමුණු, විජය, ගජබා, සිංහ කියන රෙජිමේන්තුම තමයි එදාත් ගිහිල්ලා මෙහෙයුම් කළේ. එදා හිටපු රණ විරුවන්ට විරුද්ධව තමයි තමුන්නාන්සේලාගේ පොහොට්ටුවේ නායකතුමා ජිනීවා ගියේ. ඒ සම්බන්ධයෙන් කියනකොට තමුන්නාන්සේලා අද නිශ්ශබ්දව ඉන්නේ ඇයි? එදා එතුමා ජිනීවා යනකොට හොඳයි. අද පොඩ්ඩක් එහෙන් මෙහෙන් මොනවා හෝ කථා බහක් එනකොට භූමිතෙල් ගෑවුණු ගැරඩියෝ වාගේ නලියන්න පටන් ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තවත් කරුණක් කියන්න ඕනෑ. උදය ගම්මන්පිල මැතිතුමා මේ දිනවල හැම දාම වාගේ රූපවාහිනී නාලිකාවලට ඇවිල්ලා දිවුරුම් ප්‍රකාශ ඉල්ලනවා. කාගෙන්ද? Perpetual Treasuries එකෙන් සල්ලි ගත්තේ නැති අය ඉන්නවා නම්, දිවුරුම් ප්‍රකාශ දෙන්න කියනවා. අපි නම් Perpetual Treasuries එකෙන් සල්ලි අරගෙන නැහැ. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අපට ප්‍රශ්නයකුත් නැහැ. නමුත්, මම එතුමාගෙන් දිවුරුම් ප්‍රකාශයක් ඉල්ලනවා. එතුමා 2014දී පළාත් සභා මැතිවරණයට ඉදිරිපත් වුණා. ඒ කාලයේ එතුමා ගෙවල් ගණනේ ගිහිල්ලා රුපියල් 100 ගණනේ එකතු කළා. එවකට හිටපු ආරක්ෂක ලේකම්තුමා වූ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඇවන්ට් ගාර්ඩ් එකේ සභාපති වූ නිශ්ශංක සේනාධිපතිතුමාට කියලා එතුමාට ඡන්ද ව්‍යාපාරය කරන්න වාහන අරගෙන දුන්නා. ඇවන්ට් ගාර්ඩ් එකෙන් අපි වාහන ගත්තේ නැහැයි කියලා පුළුවන් නම්, ඒකට එතුමාට දිවුරුම් ප්‍රකාශයක් දෙන්න කියන්න කෝ. දැන් එතුමා අනික් අයගෙන් දිවුරුම් ප්‍රකාශ ඉල්ලනවා නේ? අනික් අයගෙන් දිවුරුම් ප්‍රකාශ ඉල්ලන ගම්මන්පිල මැතිතුමනි, ගෝඨාභය රාජපක්ෂ මහත්තයා කියලා ඇවන්ට් ගාර්ඩ් එකේ නිශ්ශංක සේනාධිපති ඔබතුමාගේ මැතිවරණ ව්‍යාපාරය කරන්න ඔබතුමාට වාහන දුන්නේ නැද්ද කියලා ඔබතුමා කියන්න කෝ. ඔබතුමා ඒකට දිවුරුම් ප්‍රකාශයක් දෙන්න කෝ. ඒ නිසා අපි එතුමාට කියන්න ඕනෑ, වීදුරු ගෙවල්වල ඉඳගෙන නිකම් බොරුවට ගල් ගහන්න එපා කියලා. එම සිද්ධිය සම්බන්ධයෙන් නඩුවකුත් විභාග වන නිසා මම වැඩිය ඒක ගැන කථා කරන්නත් කැමැති නැහැ. ඒ නඩුවේ විස්තරත් මා ළඟ තිබෙනවා. ඒ නිසා එතුමාට අපි කියන්න ඕනෑ, වීදුරු ගෙවල්වල ඉඳගෙන ගල් ගහන්න එපා, ඔබතුමා එහෙම ගල් ගහන්න ගියොත් ඉස්සරහට තව තව ඒවා එළියට එන්න පුළුවන් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත හා සම්බන්ධ විවාදයට සහභාගිවීමට මටත් අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දවස්වල මුස්ලිම් ජනතාවගේ රාමසාන් කාලය. රාමසාන් කාලයට අපි කියනවා, "නෝම්බි" කියලා. මේ දිනවල බොහෝ දේශපාලනඥයන් මුස්ලිම් ජනතාව එකතු කරලා නෝම්බි අත් හරින්න ඉෆ්තාර් උත්සව සංවිධානය කරනවා. දැන් ජනාධිපති පුටුව බලාපොරොත්තුවෙන් සිටින ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත් හැම තැනම ඉෆ්තාර් උත්සවවලට යනවා. අදත් මට ආරංචි වුණා, Galle Face Hotel එකේ එවැනි උත්සවයක් පැවැත්වෙන බව.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමාත් යනවාද?

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
නැහැ. මට ඒකට එන්න බැහැ. මට එන්න අමාරුයි. ඊයේ-පෙරේදා බේරුවල ප්‍රදේශයේ පැවැති ඉෆ්තාර් උත්සවයකට එතුමා ගිහිල්ලා කථාවක් කළා. එතුමා ඒ උත්සවයේදී කියා තිබෙනවා, "අපේ ආණ්ඩුවක් ආවාම මුස්ලිම් ජනතාවට ආරක්ෂාව ඇතුව

ජීවත් වන්න මම අවස්ථාව සලසා දෙනවා." කියලා. ඒක හොඳ දෙයක්. එතුමාගේ එම කථාව මම අගයනවා. එතුමා මේ ඉන්තාර් උත්සවවලට යන එක ගැනත් මගේ විරුද්ධත්වයක් නැහැ. මොකද, ඒක හොඳයි. මුස්ලිම් ජනතාවත් එක්ක එතුමා යම් සම්බන්ධයක්, යම් මිත්‍රත්වයක් හදා ගන්න උත්සාහ කරනවා නම්, ඒක හොඳ දෙයක්. ඒකට අපි විරුද්ධ නැහැ. නමුත්, අපට පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. මොකද, මෙහෙම කියන එතුමාත් ආරක්ෂක ලේකම්වරයා වශයෙන් සිටි කාලයේ වුණු දේවල් අපට මතකයි. ඒ කාලයේදී තමයි ඉස්සෙල්ලාම මේ එක එක සංවිධාන මේ රටේ ජාතිවාදය අවුස්සමින් මේ රටේ මුස්ලිම් විරෝධයක් සිංහල ජනතාව තුළ ඇති කරන්න පාරට බැහැලා එළිපිට වැඩ කර ගෙන ගියේ. ඒ සඳහා එම සංවිධාන රැස්වීම් පැවැත්වුවා. ඒ රැස්වීම් පවත්වන්න, ඒ වාගේම පෙළපාළි යන්න එතුමා අවසරත් දුන්නා. ඒ කාලයේ එක එක කඩ ඉස්සරහට ගිහිල්ලා ඒ කඩවල් වහන්න කියලා උද්ඝෝෂණ කරන්නත් එතුමා අවසර දුන්නා. ඒ කාලයේ මේ හැම එකක්ම කරන්න එතුමා අවසර දුන්නා. එදා අපි ඒ දේවල්වලට විරුද්ධ වෙලා ඒවා නවත්වන්න කියලාත් එතුමාට කිව්වා.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සභාවේ නැති පුද්ගලයෙකු පිළිබඳව ඉතාම අසත්‍ය චෝදනා මෙතුමා ඉදිරිපත් කරනවා. එතුමා එල්ල කරන එම චෝදනා අපි සම්පූර්ණයෙන් බැහැර කරනවා. මොකද, ඔය බොදුබල සේනා සංවිධානය පසුගිය කාලයේ මේ ආණ්ඩුව යටතේත් එවැනි ජාතිවාදී ක්‍රියා ඕනෑ තරම් කරනවා අපි දැක්කා. මේ ආණ්ඩුව ඒ සම්බන්ධයෙන් කිසිම ක්‍රියාමාර්ගයක් ගත්තේ නැහැ. නමුත්, ඒකට හිටපු ආරක්ෂක ලේකම්තුමාගේ කිසිම සම්බන්ධයක් නැහැ. මේ ගරු සභාවේ උත්තර දෙන්න බැරි මනුෂ්‍යයෙකුට අස්ථාන චෝදනා කරන්න එපා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මෙම අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනය ගන්නවා ඇති.

අනතුරුව ගරු ලකී ජයවර්ධන මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

අතන්පිටකු, මාණ්පුමිකු ලක්කි ජූයවර්තන අවර්කළ් අක්කිරාසනත් තිණින්රු අකලවේ, මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ් තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. LUCKY JAYAWARDANA *left the Chair, and* THE HON. DEPUTY SPEAKER *took the Chair.*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කිසිම සංවිධානය නමක් සඳහන් කළේ නැහැ. මම "බොදු බල සේනා" සංවිධානයේ නම සඳහන් කළේ නැහැ. ඒ මන්ත්‍රීතුමා තොප්පිය දා ගත්තාට මට කරන්න දෙයක් නැහැ. හිටපු ආරක්ෂක ලේකම්තුමා මේ රටේ ජනාධිපති වුණොත් එතුමාට උත්තර දෙන්න පුළුවන්. එහෙම නැත්නම් පාර්ලිමේන්තුවට ආපු දවසක උත්තර දෙන්න පුළුවන්. එතුමාගේ කාලයේ විශාල සිදුවීම් සිදු වුණා. එතුමා ඒවා නවත්වන්න කිසිම උත්සාහයක් දැරුවේ නැහැ. මට මතකයි, එදා රනිල් වික්‍රමසිංහ මහත්තයා විපක්ෂ නායකතුමා හැටියට කටයුතු කරද්දි මෙම ගරු සභාවේ කථාවක් කරලා කිව්වා, "වහාම මේවා නවත්වන්න. මේවා දුරදිග යන්න දෙන්න එපා." කියලා. මට මතකයි, මේවා නවත්වන්න කියා මම පළාත් සභාවෙත් මේකට විරුද්ධව කථා කළ බව. එතුමාට කිසිම වුවමනාවක් තිබුණේ නැහැ. අවසානයේ දී මෙහෙම ගිහිල්ලා මේක අලුත්ගමදී පිපිරුණා. විශාල විනාශයක් වුණා. අලුත්ගම සිද්ධියේදිත් ඒ සංවිධානයට රැස්වීම් තියන්න පොලීසිය අවසර දුන්නේ නැහැ. පොලීසියේ OIC මහත්තයා ඒ අවසරය නැවැත්තුවා. පොලීසියේ OIC මහත්තයා නැවැත්වූ අවසරය, ගෝඨාභය රාජපක්ෂ හිටපු ලේකම්තුමාගේ බලපෑම උඩ පොලීසියට දෙන්න වුණා. ඒ රැස්වීමෙන් පසුව විශාල කෝලාහලයක් ඇති වෙලා අවසානයේ දී ජීවිත පවා අහිමි වුණා; කෝටි ගණන් දේපළ විනාශ වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීමක්] මම උත්තර දෙන්නම්. ගිංතොට ඇති වූ සිද්ධිය සම්බන්ධවත් මම කියන්නම්. මේ විනාශය වන විට එතුමා ආරක්ෂක ලේකම්තුමා වශයෙන් කටයුතු කළා. ඊළඟට, දඹුල්ලේ මුස්ලිම් පල්ලියට කඩා පැනලා පොලීසිය ඉදිරිපිට විශාල ප්‍රහාරයක් එල්ල කළා. ඊළඟට අනුරාධපුරයේ- ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු 400කට වඩා පැරණි ඉතා සංස්කෘතික වටිනාකමින් යුත් සොහොන් කොතක් තිබුණා. නමුත්, ඒ සොහොන් කොතට මේ සංවිධානය ඇවිල්ලා බලහත්කාරයෙන් පොලීසිය බලා ඉදිද්දී ප්‍රහාරයක් එල්ල කළා, නැවැත්තුවේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහින්ද රාජපක්ෂ මහත්තයාගේ පාලන කාලය යටතේ සිද්ධීන් 410කට වඩා වැඩි ප්‍රමාණයක් වුණා. අඩුම ගණනේ ඒ එකකදීවත් නීතිය ක්‍රියාත්මක වුණේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා බේරුවල සිද්ධියේ දී 25 දෙනෙක් පමණ අත් අඩංගුවට අරගෙන ඒ 25 දෙනාම අවසානයේ දී බේරුවල පොලීසියේදී පොලිස් ඇපමත නිදහස් කළා. ඒ විධියටයි එදා ගෝඨාභය රාජපක්ෂ මහත්තයා ආරක්ෂක ලේකම් කාලයේ දී සිදු වුණේ. දැන් එතුමා ඇවිල්ලා එක පාරටම නින්දෙන් අවදිවෙලා වාගේ කියනවා, "අපි ආවොත් මේක කරන්න දෙන්නේ නැහැ." කියලා. ඒක හොඳයි. මම කියනවා, එතුමා ඉස්සෙල්ලාම කරන්න ඕනෑ ඒක නොවෙයි. එතුමා ඉස්සෙල්ලාම කරන්න ඕනෑ "මගේ කාලයේ මේක වුණා. මට මේක නවත්ත ගන්න බැරි වුණා. ඒ නිසා මම ඉස්සෙල්ලාම සමස්ත මුස්ලිම් ජනතාවගෙන්ම සමාව ඉල්ලනවා." කියලා ප්‍රසිද්ධියේ සමාව ඉල්ලන්න ඕනෑ. ඒකයි කළ යුතු දේ. ඒක කරන්නේ නැතිව, "අපි ආවාට පසුව මේක කරන්න දෙන්නේ නැහැ" යි කියන එක බයිලා කථාවක්. ආවාට පසුව හැම කෙනාම කරන්න දෙන්නේ නැහැ කියලා වෙලා තිබෙන දේ අපි දන්නවා නේ. පැමිණි පසුව තමයි සියලු දෙනාම කියන්නේ කරන්න දෙන්නේ නැහැයි කියලා. පැමිණි පසුව නොකරන වැඩේ නේ කරන්නේ. ඒක දැන් අපටත් තේරෙනවා. එතුමාව

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

ගෙනෙන්න යන්නේ කවුද? මට කියන්න. ඊළඟට තව කාරණයක් කියන්න ඕනෑ. මුස්ලිම් ජනතාවගේ "වියතුන්ගේ සංගමය" කියන සමස්ත ලංකා ජමිඉයියතුල් උලමා කියන සංගමය තිබෙනවා. ඊයේ-පෙරේදා ඒ සංගමයේ උදවිය ගිහිල්ලා එතුමා හම්බ වුණා. ඒක බොහොම හොඳයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පසුගිය කාලයේ හලාල් ප්‍රශ්නයක් මේ රටේ ආවා නේ. හලාල් ප්‍රශ්නය ආවාම ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මුස්ලිම් වියතුන්ගේ "සමස්ත ලංකා ජමිඉයියතුල් උලමා" කියන සංවිධානය ගෙන්වලා තර්ජනය කළා, "වහාම හලාල් සහතික දෙන එක නවත්වන්න ඕනෑ." කියලා. එදා සැලකුවේ එහෙමයි. දැන් අද ජනාධිපතිකම ගන්න ඕනෑ නිසා එක එක තැන්වල රස්තියාදුවේ යනවා. මොකද, ඡන්ද ටික ගන්න ඕනෑ නිසයි. නමුත්, එදා එහෙමයි කථා කළේ. අද එතුමා හැදිලා ඉන්නවා නම් හොඳයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කියනවා නේ "බලයට ආවාම මේක කරන්න දෙන්නේ නැහැ"යි කියලා. ඒක හොඳයි. දැන් එතුමා සමඟ එකතු වෙලා සිටින පිරිස මම කියන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මතක තියා ගන්න. එතුමාත් සමඟ වියත් මඟ සංවිධානය ඉන්නවා. වියත් මඟ සංවිධානයේ ඉන්නේ කවුද? එතුමාත් එක්ක පසුගිය කාලයේ වැඩ කරපු උදවිය. එළිය සංවිධානයේ ඉන්නේ කවුද? එළිය සංවිධානයේ ඉන්නේ මේ රටේ සිංහල, මුස්ලිම්, දෙමළ, මිනිසුන් අතර වෛරය, ක්‍රෝධය, අවිශ්වාසය, සැකය ඉස්මතු කරන; මේ රටේ දෙමළ, සිංහල, මුස්ලිම් ජනතාව බෙදන්න කථා කරන; මේ රටේ සුළු ජාතින්ට කිසිම ඉඩක් දෙන්න හොඳ නැහැ කියන සංවිධාන තමයි එතුමත් එක්ක ඉන්නේ. ඒ, සිංහල රාවය සංවිධානය.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක් තිබෙනවා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜ்புர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඊළඟට, රාවණා බලය සංවිධානය. මේවා තමයි දැන් එතුමාත් එක්ක ඉන්න සංවිධාන. ඒ සංවිධානත් එක්ක ගිහිල්ලා එතුමා කොහොමද, මේ රටේ සුළු ජන කොටස් ආරක්ෂා කරන්නේ? ආරක්ෂා කරන්න පුළුවන්ද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එතුමන්ලාට මතක් කරන්න අවශ්‍ය තව කාරණයක් තිබෙනවා. එතුමන්ලාගේ පොහොට්ටුව බලයේ තිබෙන ඇඹිලිපිටිය සහ මතුගම ප්‍රාදේශීය සභා දෙකම යෝජනා සම්මත කරලා තිබෙනවා, ඒ ප්‍රදේශවල තිබෙන ගව මස් කඩ කාමර වසා දමන්න ඕනෑ කියලා. ඇයි ඒ? බෞද්ධාගම අනුව හරක් මස් කන එක විතරක් නොවෙයි නේ හොඳ නැත්තේ. එහෙම නම්, එළු මස් කන්නත් හොඳ නැහැ; ඌරු මස් කන්නත් හොඳ නැහැ; මාළු කන්නත් හොඳ නැහැ. එහෙම නම්, ඒ කඩවල් සියල්ලත් වහලා දාන්න ඕනෑ; බාර් ටිකත් වහලා දාන්න ඕනෑ. ඒවා ගැන මුකුත් කථා නොකර පොදුජන පෙරමුණ බලය තිබෙන ඇඹිලිපිටිය සහ මතුගම ප්‍රාදේශීය සභා දෙකම යෝජනා ගෙනැල්ලා සම්මත කරලා තිබෙනවා, ඒ ප්‍රදේශවලින් ගව මස් කඩ කාමර අයින් කරන්න ඕනෑ කියලා. ඇයි ඒ? ඒ, මේ ව්‍යාපාර මුස්ලිම් ජනතාවත් එක්ක සම්බන්ධ වුණු ව්‍යාපාර නිසා. එහෙම නම්, මේක පිටුපස තිබෙනවා, මුස්ලිම් විරෝධය. තමුන්නාන්සේලාගේ ගෝඨාභය රාජපක්ෂ මොනවා කථා කළත්, පහළ මට්ටමේ තිබෙන ඒ මුස්ලිම් විරෝධය නැවතිලා නැහැ. ඒකයි මම කියන්නේ, තමුන්නාන්සේලාට මුස්ලිම් ජනතාවත් සමඟ යන්න පුළුවන් ගමනක් නැහැ කියලා. බලයට ආවාට පස්සේ මුස්ලිම් ජනතාව ආරක්ෂා කරනවා කියන කථා බොරු. ඒවා වෙන්නේ නැහැ. ඒවා සියල්ලම සිහින ලෝකවල තිබෙන කථා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කියන මේ දේත් මතක තියාගන්න. අපේ මුස්ලිම් ජනතාවට ගෝඨාභයත් එක්ක යන්න පුළුවන් එක ගමනයි. ඊයේ-පෙරේදා මියන්මාරයේ සිදුවුණු දේවල් අපි ඇස් දෙකින් දැක්කා. ගෝඨාභයත් එක්ක ගිහිල්ලා අපට අන්න ඒ වාගේ රටක් හදන්න පුළුවන්. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. ඊළඟට, ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.24]

ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කාලය ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ජාතික ආරක්ෂක අරමුදල පසුගිය කාලයේ ආරක්ෂක අරමුදල වශයෙන් සංවර්ධනය වුණා. මේ අරමුදල ආරම්භ කළේ ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා. එදා මේ අරමුදල ආරම්භ කරන අවස්ථාවේ අපි සියලුදෙනාම මේකට දායක වුණා; අපේ මාසික වැටුප පරිත්‍යාග කළා; රටේ සාමාන්‍ය ජනතාවත් නොයෙක් අවස්ථාවලදී විවිධ අංශවලින් මේකට පරිත්‍යාග කළා. මේ පරිත්‍යාග කළේ බලාපොරොත්තු රාශියක් ඇතිවයි. මේ රටේ රණවිරුවන්ගේ අනාගතය වෙනුවෙන් ඒ පවුල්වල දරුවන්ට යම්කිසි සාධනීය වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරාවිය කියලා හිතලයි ඒ පරිත්‍යාග කළේ. අද ඒ වැඩ පිළිවෙළ ඉතාමත්ම හොඳින් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම, මේ අරමුදල හරහා බොහෝ තැන්වල රණවිරුවන් රැක බලා ගැනීමේ කටයුත්ත ඉතාමත්ම සාර්ථකව ඉෂ්ට වෙනවා. ඒ පිළිබඳව අපි කවුරුත් සතුටු වෙනවා. මේ අරමුදල එදා ආරම්භ කළේ රටේ ජාතික අවශ්‍යතාවක් හැටියටයි. මොකද, ඒ වෙලාවේ අපි බලාපොරොත්තු නොවුණු මේ අවසානාවන්ත යුද්ධය ඉතාමත්ම දරුණු විධියට ක්‍රියාත්මක වෙලා තිබෙන නිසා දැවැන්ත සමාජ ප්‍රශ්නයක් රටේ මතු වුණා. ඒ වෙලාවේදී රජයට තනිවම මුහුණ දෙන්න බැරි තරමට මේ ප්‍රශ්න උග්‍ර වෙලා තිබුණු නිසා ජනතාවගේ සහයෝගය ඒ වෙලාවේ අවශ්‍ය වුණා. ඒ නිසා තමයි මේ අරමුදල ඇති කරලා, අද ඒ යුතුකම් කොටස ඉතාමත්ම හොඳින් ඉෂ්ට කරගෙන යන්නේ. විශේෂයෙන්ම අපේ ගම් පළාත්වල රණවිරු ගම්මාන පිහිටුවලා, රණවිරු සෙවණ පිහිටුවලා මේ කාර්යයට දායක වෙලා තිබෙනවා. ඒ ස්ථානවලට ගියාම තමුන්නාන්සේලාට තේරෙනවා, මොන තරම් දැවැන්ත සේවාවක් මේ අරමුදලින් ඉෂ්ට වෙනවා ද කියලා.

අද මේ විවාදය දිහා බැලුවාම මට පෙනුණේ, දේශපාලන වුවමනාවට යුද්ධය විකුණාගෙන කෑම තවමත් අපේ රටේ සිද්ධ වන බවයි. ඒක ඉතාමත්ම අවාසනාවන්ත තත්ත්වයක්. අපේ රටේ යථාර්ථයට මුහුණ දෙන්නේ නැතිව, අපේ රටේ වුණු දේවල් ගැන අපි කථා කරන්නේ නැතිව මේකෙන් දේශපාලන වාසි ගන්න හැම වෙලාවේම බලනවා. පසුගිය කාලවකවානුවේ අපේ රණ විරුවෝ ඉතාමත්ම නිර්දය විධියට ගෙනැල්ලා සිරගත කළා. ඔවුන්ට විරුද්ධව කිසිම චෝදනාවක් නැහැ. දැන් මේ වෙන තෙක් චෝදනා නැහැ. දැන් අවුරුද්දකට ආසන්න කාලයක් තිස්සේ මේ රණ

විරුවන් සිරගත කරලා තිබෙනවා; කිසිම චෝදනාවක් නැහැ; නඩු විභාගයක් නැහැ; පැමිණිල්ලක් නැහැ. කාලයකට පස්සේ පොලීසියෙන් උසාවියට ඇවිල්ලා කියනවා, "තවමත් පරීක්ෂණ අවසන් නැහැ" කියලා. ඒ නිසා නැවතත් ඔවුන් සිරගත කරනවා. රණවිරු අරමුදල වගේ ආයතනවලින් බලාපොරොත්තු වුණු වැදගත් සේවාව නොවෙයි මේ සිද්ධ වෙන්නේ. මේ අරමුදල් හැදුවේ රණ විරුවන් පාවා දෙන්න නොවෙයි.

රණ විරුවන්ට අනාගත ආරක්ෂාව දෙන්න, රණ විරුවන්ගේ ගෞරවය රකින්න, රණ විරුවන්ගේ දරු පවුල්වල අනාගතය සාක්ෂාත් කරන්නයි මේ වාගේ අරමුදලක් හැදුවේ. නමුත් අද මේ ආණ්ඩුව කරගෙන යන්නේ, රණ විරුවන් පාවා දීමේ වැඩ පිළිවෙළක්. ඒක තමයි අද අපේ රටේ අපි සියලුදෙනාටම තිබෙන කනගාටුව. ඒ උදව්යට නිරපරාදේ චෝදනා එල්ල කරනවා විතරක් නොවෙයි, මිනීමැරුම් චෝදනා එල්ල කරනවා විතරක් නොවෙයි, ඔවුන් සිරගත කරලා අවාසනාවන්ත විධියට ඒ උදව්යගේ අනාගතය කඩාකප්පල් කරනවා. ඒ විතරක් නොවෙයි, බොරු චෝදනා එල්ල කරලා, බොරු චෝදනා ගොනු කරලා, බොරු චෝදනා නඟලා ඒ තුළින් රණ විරුවන් තවත් අපහසුතාවකට පත් කරලා තවත් කවදාවත් මේ රටේ මේ වාගේ වැඩ පිළිවෙළකට අපේ රණ විරුවන් ඉදිරිපත් නොවෙන තැනට කටයුතු සකසන්න තමයි මේ ආණ්ඩුව කටයුතු කරගෙන යන්නේ. මේ නිසා තමයි අපි මේ අවස්ථාවේ රජයට විරෝධය දක්වන්නේ. මේ වැඩ පිළිවෙළ වහාම නවත්වන්න. මේ රණ විරුවන් පාවාදීම වහාම නවත්වන්න. රණ විරුවන් වෙනුවෙන් කරගෙන යන මේ හොඳ වැඩ පිළිවෙළ තවත් පුළුල් ආකාරයෙන් කරගෙන යන්න.

අපේ ගම් පළාත්වල තවම කිසිම හවිහරණක් නැතුව රණ විරුවන් රාශියක් ජීවත් වෙනවා. මේ රණ විරු අරමුදලට එම අවශ්‍යතා සම්පූර්ණයෙන්ම ඉෂ්ට කිරීමේ හැකියාව නැහැ. මේ අරමුදලේ තිබෙන මුදල් ප්‍රමාණය හෝ වැඩ පිළිවෙළ හෝ සංයුතිය එහෙම නැත්නම් මේ වපසරිය ප්‍රමාණවත් නැහැ, මේ රට වෙනුවෙන් කැප වුණු ඒ වාගේම තවත් කෙනෙකුගේ උදවු බලාපොරොත්තුවෙන් අද යම්තම් ජීවිතය ගැට ගසා ගෙන ඉන්නා රණ විරුවන් වෙනුවෙන් කටයුතු කරන්න. ඒ සඳහා මේ වැඩ පිළිවෙළ ප්‍රමාණවත් නැහැ කියන එක තමයි මට කියන්න තිබෙන්නේ.

අපේ ගම්වල බොහෝ රණ විරුවන් ඉන්නවා, තවම ඒ අයට ඉන්න ගෙයක් නැති; යන්න එන්න තැනක් නැති. ඒ මිනිසුන්ගේ දරුවන්ගේ අනාගතය ගැන සොයන්න කෙනෙක් නැහැ. රණ විරුවන් මිය යාම නිසා වැන්දඹුභාවයට පත් වුණු සමහර කාන්තාවන් ඉන්නවා. ඔවුන් ගැනත් සොයන්න බලන්න කෙනෙක් නැහැ; ජීවත් වෙන්න තැනක් නැහැ. එසේ තිබියදීත් අපි මේ රණ විරුවන් මේ රටට කරපු සේවාව, මේ රටට කරපු කැපවීම කුමක්ද කියන එක ගැන හැම දාම මෙතැනදී කථා කරනවා; බොහෝ දෙනෙක් පාර තොටේදී පවා කථා කරනවා. නමුත් ඔවුන් වෙනුවෙන් කැප වෙන වැඩ පිළිවෙළක් අපේ රටේ තවම ඇති වෙලා නැහැ කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ.

පසුගිය අවුරුදු 30ක් තිස්සේ පැවති යුද්ධයෙන් අපි මොන තරම් දුකක් විඳ්දාද; මොන තරම් වේදනාවක් විඳ්දාද? අද අපි ඒ සියල්ලම වාගේ අමතක කරගෙන යනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේගේ දිස්ත්‍රික්කයේ තමුන්නාන්සේගේ ගම් පළාත වන ඇතිමලේ ගම්මානයේ මනුෂ්‍යයන් කපා දමා තිබුණේ කොහොමද කියන එක තමුන්නාන්සේට මතකද මම දන්නේ නැහැ. නමුත් මම ඒ සිදුවීම ඇහැට දැක්ක නිසා මට නම් මතකයි. එම ගම්මානයේ මිනිසුන් කපා දමා, මරා දමා තිබුණා. බඩදරු අම්මා කෙනෙකුගේ බෙල්ල කපා මරා, ඇයගේ කුස කපා, කුස තුළ සිටි දරුවා එළියට අරගෙන ඒ දරුවාගේත් බෙල්ල කපා තිබුණා. මෙක තමයි එල්ටීටීඊ සංවිධානයේ තිබුණු කුරිරු මිලේච්ඡත්වය. අපි ඒවා දැක්කා. ඒවා දැකලා අපි කනාගටු වුණා. අපි කරකියා ගන්න දෙයක් නැතුව අසරණ වෙලා සිටියා. අද කියනවා, මේ රණ විරුවන් යුද අපරාධ කළා කියලා. එල්ටීටීඊ සංවිධානයෙන් කරපු අපරාධ ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ.

අරන්තලාවේ සිදුකළ භික්ෂු ඝාතනය සිහි කිරීමට පසුගිය දවස්වල කිහිප පොළක් කටයුතු කළා. ඒවා ගැන ජිනීවා හෝ අන්තර් ජාතික සම්මේලනවලදී කවුරුවත් මතක් කරන්නේ නැහැ. පොඩි ළමයින් හැටියට හිටපු ඒ අහිංසක සාමණේර ස්වාමීන් වහන්සේලා සම්පූර්ණයෙන් කපා කොටා, මරා දමා තිබුණු හැටි තමුන්නාන්සේට මතක ඇති කියලා මම විශ්වාස කරනවා. නමුත් මේවා ගැන කොහේදිවත් -අන්තර් ජාතික සම්මේලනවලදීවත්- අපේ නියෝජිතයෝ කථා කරන්නේ නැහැ. ඒක එහෙම පිටින්ම පාවා දීලා. අපේ විදේශ කටයුතු අමාත්‍යාංශයත් කිසිම තැනකදී මේ රටේ රණ විරුවන් ආරක්ෂා කරන්න ඉදිරිපත් වුණු බවට ආරංචියක් නැහැ. එහෙම කරපු බවක් පෙනෙන්න නැහැ. ඇත්තටම ඒක අපට කනගාටුවකට කාරණයක්. රට වෙනුවෙන් මේ තරම් කැපවීමක් කරපු රණ විරුවන් ගැනවත්, මිනිසුන් මරා දමා එල්ටීටීඊ සංවිධානය ඒ කරපු අපරාධ ගැනවත් අන්තර් ජාතික සම්මේලනවලදී අපේ මිනිසුන් කථා කරන්නේ නැත්තේ ඇයි කියන එක ගැන අපට ලොකු සැකයක් තිබෙනවා. මේ රටේ හමුදාව පාවා දීලා, යුද අධිකරණ ඇති කරලා මේ මිනිසුන් කුදලා ගෙන යන්න දැන් කටයුතු සූදානම් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රණ විරුවන්ට කරන ලොකුම අගෞරවය ඒකයි කියන එකයි මම කියන්නේ. ඒ නිසා මේ අරමුදලින් මීට වඩා පුළුල්, මීට වඩා අර්ථවත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක විය යුතුයි කියලා මම විශ්වාස කරනවා. මේ අරමුදල හරහා අද කරන ක්‍රියාවලියත් දැවැන්ත ක්‍රියාවලියක්. මම එය අගය කරනවා. විශාල වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙනවා. නමුත් අපේ ගම්වල ඉන්නා ඒ මියගිය රණ විරුවන්ගේ අහිංසක භාර්යාවන්, දරුවන්, ඒ උදව්යගේ පරම්පරාවේ ඉතුරු අය, ඒ අයගේ දෙමව්පියන් රැක බලා ගැනීම සඳහා මේ ව්‍යාපාරය මීටත් වඩා තවත් පුළුල් විය යුතුයි.

ඒකයි අපි කියන්නේ මේ වැඩ පිළිවෙළ මේ රජයේ අනුග්‍රහය ලැබිය යුතු වැඩ පිළිවෙළක් බව. නමුත්, රජය මෙකට අනුග්‍රයක් දක්වන්නේ නැහැ. රජය අනුග්‍රහය දක්වන්නේ මේ රට පාවා දීමේ වැඩ පිළිවෙළට. හමුදාව පාවා දීමේ වැඩ පිළිවෙළට තමයි අද මේ රජයේ අනුග්‍රහය ලැබිලා තිබෙන්නේ. අන්තර් ජාතිකව අපට එල්ල කරලා තිබෙන බොරු චෝදනා ගැන, විශාල මිනිස් සංහාරයක් - genocide - සිද්ධ කළා කියන අවස්ථාවල රජය වැදගත් විධියට ඉදිරිපත් වෙලා රට ආරක්ෂා කර ගන්නට, රටේ ගෞරවය රකින්නට, හමුදාවේ ගෞරවය රකින්නට තවමත් ඉදිරිපත් නොවීම ගැන අපි කනගාටු වෙනවා. මෙහේ ඉඳන් කථා කළාට, මේ සභාවේ ඉඳගෙන කථා කළාට වැඩක් නැහැ. අපට කථා කරන්නට තිබෙන්නේ මෙතැන නොවෙයි; ජිනීවා සම්මේලනය ඇතුළු අන්තර් ජාතික ආයතනවලයි. අපි අද ගරු කරනවා අපේ සරත් වීරසේකර රණ විරුවාට, එතුමා තනියම ගිහින් මේ ගැන සටන් කිරීම ගැන. ආණ්ඩුව සටන් කරන්නේ නැති නිසා එතුමා තනියම ගිහින් මේ රටේ රණ විරුවන් වෙනුවෙන් කටයුතු කළා. ඒක ලොකු ජයග්‍රහණයක්. එවැනි කෙනෙකු හෝ ඉදිරිපත් වෙලා මේ කටයුත්ත කිරීම අපි කවුරුත් අගය කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ක්ෂේත්‍රය තුළ අපේ රටේ ජනතාවට විශාල වැඩ කොටසක් කරන්නට තිබෙනවා. අපේ රට දියුණු කරන්න නම්, අපේ රටේ සමඟියෙන් ඉන්න නම්, අපේ රටේ වෛරය නැති කරන්න නම් සියලුදෙනා තුළම අන්‍යෝන්‍ය විශ්වාසය ගොඩ නැඟීමේ වැඩ පිළිවෙළක අපි ඉන්නට ඕනෑ. අද

[ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා]

ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණේ සමහර මන්ත්‍රීවරුන් කථා කරන්නේ, මේ විශ්වාසය නැති කරන්නයි. මේ රටේ දෙමළ ජනතාවත්, මුස්ලිම් ජනතාවත්, සිංහල ජනතාවත් කාලාන්තරයක් තිස්සේ සමඟියෙන් ජීවත් වුණා. මේ ජනතාව අතර අන්‍යෝන්‍ය විශ්වාසයක් තිබුණා. අපි හැමදෙනා තුළම එකිනෙකාට ගෞරව කිරීමක් තිබුණා. අද ඒ ගෞරවය නැති වන විධියට එකිනෙකාට අපහාස, උපහාස කිරීම ඉතාමත්ම අවාසනාවන්ත තත්ත්වයක් කියලායි මම කියන්නේ. මේ තත්ත්වය මේ විධියට ගියොත් අපේ රටේ සමඟිය ගොඩ නහන්නට ලැබෙන්නේ නැහැ. මේ රට සාමකාමීව ඉදිරියට යන්න නම් එකිනෙකාට වෛර කිරීමෙන් තොරව, එකිනෙකා අවිශ්වාස කිරීමෙන් තොරව අපේ සිත් තුළ යම්කිසි ගෞරවාන්විත හැඟීමක් ඇති කරගෙන කටයුතු කළ යුතු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ලබා දුන් අවස්ථාව ගැන මම තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙනවා. මේ වැඩ පිළිවෙළ තවත් පුළුල් කරගෙන යාමට ආශීර්වාද කරමින්, මේ වැඩ පිළිවෙළ සඳහා ශක්තිය, ගෞරවය සහ විශ්වාසය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මම විනාඩියක් ඉල්ලා සිටිනවා ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණයක් පිළිබඳව පැහැදිලි කිරීමක් කළ යුතුයි. ජාත්‍යන්තරයට රණ විරුවන් පාවා දීම ගැන එතුමා ආණ්ඩුවට ලොකු චෝදනාවක් කළා. ජාත්‍යන්තරය මේ ප්‍රශ්නයට පැටලුණු හැටි ගැන සමහර වෙලාවට මේ සභාවේදී විකෘති විධියට අදහස් දක්වන අවස්ථාත් අපි දැකලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රණ විරුවන් සම්බන්ධව, යුද්ධය පැවති සමයේ සිද්ධ වුණු දේවල් සම්බන්ධව ජාත්‍යන්තරය අපි පටලවා ගත්තේ නැහැ; අපි සම්බන්ධ කර ගත්තේ නැහැ. එදා 2009 මැයි මාසයේ 18වෙනි දා යුද්ධය ඉවර වුණා; මැයි මාසයේ 21වෙනි දා වෙන කොට එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බැන් කි මූන් මහත්තයා ලංකාවට ආවා. යුද්ධය ඉවර වෙලා පැය 48ක් යන කොට එක්සත් ජාතීන්ගේ මහ ලේකම්තුමා ලංකාවට ආවා. ඇවිල්ලා උතුරට ගිහිල්ලා, නැවත දකුණට ඇවිල්ලා එවකට සිටි අතිගරු ජනාධිපතිතුමා සමඟ සාකච්ඡා කරලා, එවකට සිටි විදේශ කටයුතු ඇමති ගරු රෝහිත බෝගොල්ලාගම මැතිතුමා සමඟත් සාකච්ඡා කරලා ගිවිසුමක් අත්සන් කළා. ඒ ගිවිසුම යටතේ තමයි යුද අපරාධ චෝදනා සම්බන්ධව මේ රට යටත් කරන්න පුළුවන් කියලා ලංකාව එකඟතාව දුන්නේ. 2003දී ගරු අග්‍රාමාත්‍යතුමා රෝම ගිවිසුමට ගිය වෙලාවේ ජාත්‍යන්තර අපරාධ අධිකරණයේ බලයට රටක් විධියට යටත් වෙන්න අපි සූදානම් නැහැයි කියලා ආපහු ආවා; එතුමා අත්සන් කළේ නැහැ. හැබැයි, පසුගිය රජය යුද්ධය ඉවර වෙලා දවස් 4ක් ඇතුළත චෝදනා ලද අය ජාත්‍යන්තර අධිකරණයට ගෙන යන්න ඕනෑයි කියලා, ඒ හැකියාව ලැබෙන පරිදි ගිවිසුමක් අත්සන් කළා. ඒ ගිවිසුමේ ප්‍රතිඵලයක් හැටියට තමයි බැන් කි මූන් මහත්මයා දරුස්මාන් කමිටුව පත් කළේ.

ඒ දරුස්මාන් කොමිටියෙන් තමයි කියන්නේ civiliansලා 40,000ක් මැරුණා; සුදු කොඩි ගෙනෙන අයට වෙඩි තිබ්බා කියලා. ඒ චෝදනා ටික අපේ හමුදාවට විරුද්ධව පෙළ ගැස්වූයේ පසුගිය ආණ්ඩුව බැන් කී මූන් මහත්මයාත් එක්ක අත්සන් කර ගත්තු ගිවිසුමේ බලය මත පිහිටුවා ගත් දරුස්මාන් කමිටුවේ වාර්තාව මතයි. ඒ දරුස්මාන් කමිටුවේ වාර්තාව පදනම් කරගෙන තමයි අපේ ආණ්ඩුව ආවාට පස්සේත් ඇමෙරිකා එක්සත් ජනපදය ජිනීවාහි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුවට යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඒක නිසා කවුරු හරි කියනවා නම් අපේ ආණ්ඩුව රණවිරුවෝ පාවා දුන්නා කියලා, ඒ පාවා දීම සිද්ධ වෙලා තිබෙන්නේ පසු ගිය ආණ්ඩුව කාලයේය කියලා ඔප්පු කරන්න අපි ලැහැස්තියි. අපේ ආණ්ඩුව බලයට ආවාට පස්සේ එක්සත් ජාතීන්ගේ විශේෂ නියෝජිතයෙක් ආවා, රාජ නීතිඥ බෙන් එමර්සන් කියලා. මම අධිකරණ ඇමතිවරයා හැටියට ඉන්න වෙලාවේ ඔහු මගෙන් ඔය ප්‍රශ්න ඇහුවා. ඔහු ඇහුවා, අපේ විශේෂ අධිකරණය - hybrid court - දාන්නේ නැත්තේ මොකද කියලා. මෙහෙම චෝදනා තිබෙන රණවිරුවන්ට එරෙහිව දඬුවම් දීමේ ක්‍රමවේදය මොකක්ද කියලා මගෙන් ඇහුවා. මම කිව්වා, අපි අනුගමනය කරන්නේ ඔබගේ රටේ අගමැතිතුමිය වන තෙරේසා මේ මැතිනිය අනුගමනය කරන ක්‍රමයමයි කියලා. එතුමිය මොකක්ද කිව්වේ? ඒ රටේ සොල්දාදුවන්ට විරුද්ධව යුද අපරාධ චෝදනා තිබෙනවා, අනුන්ගේ රටකට ගිහිල්ලා එහේ යුද අපරාධ සිද්ධ කළා කියලා. හැබැයි, තෙරේසා මේ මැතිනිය කිව්වේ මගේ එක සොල්දාදුවෙක්වත් කිසිම අධිකරණයකට ගෙන යන්න දෙන්නේ නැහැ කියලා. අපි කිව්වේත් ඒක තමයි. අපේ ආණ්ඩුවේ මතය, අපේ ස්ථාවරය වශයෙන් අපි එහෙම කිව්වා. හැබැයි, යුදමය සිද්ධීන් නොමැතිව කවුරු හරි තමන්ගේ රාජකාරිය පාවිච්චි කරලා ඉන් පිටත ගිහිල්ලා අපරාධයක් කරලා තිබෙනවා නම් ඒකට රටේ නීතිය ක්‍රියාත්මක වෙන්න ඕනෑ. නමුත් රජයක් විධියට අපි ඔය රණවිරුවෝ පාවා දුන්නාය කියන චෝදනාව සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

The next speaker is the Hon. S. Viyalanderan. You have 30 minutes.

[பி.ப. 4.40]

ගරු එස්. වියාලේන්දිරන් මහතා
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று நடைபெறுகின்ற தேசிய பாதுகாப்பு நிதியம் திருத்தச் சட்டமூலம் தொடர்பான விவாதத்தில் எனக்குப் பேசுவதற்கு வாய்ப்பளித்தமைக்கு முதற்கண் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இங்கு தெரிவிக்கப்பட்ட கருத்துக்களை வைத்துப் பார்க்கும்பொழுது, இந்த நாட்டிலே மக்களுக்குத் தலைமைதாங்குகின்ற தலைவர்களிடம் இன்னும் இனவாதக் கண்ணோட்டங்கள், பக்கச்சார்பான நியாயப் பாடுகள் இருப்பதை உணரக்கூடியதாக இருக்கின்றது.

எனக்கு முன் பேசிய கௌரவ பாராளுமன்ற உறுப்பினர் சிசிர ஜயகொடி அவர்கள் பேசும்பொழுது, தமிழ்த் தேசியக் கூட்டமைப்பு வடக்கு, கிழக்கிலே நடந்த யுத்தம் பற்றிய விடயத்திலே, பொதுமக்கள் கொன்றொழிக்கப்பட்ட விடயத்திலே, பொய்யான தகவல்களைப் புனைந்து கூறுவதாகக் கூறியிருந்தார். உண்மையிலே, கடைசி யுத்தம் வரை பார்க்கும்பொழுது, எத்தனையோ அப்பாவிச் சிறார்கள், பாடசாலை மாணவர்கள், கர்ப்பிணித் தாய்மார்கள் என்று பலர் கொல்லப்பட்டதை நாம் அறிவோம். ஆகவே, இறுதிவரை - 2009ஆம் ஆண்டு மே மாதம் 18ஆம் திகதி வரை நடந்ததான இந்த யுத்தத்திலே, இந்த நாட்டில் யுத்தத்தோடு சம்பந்தப்பட்டவர்கள் பாதிக்கப்படுவது என்பது ஒருபுறமிருக்க,

யுத்தத்தோடு சம்பந்தப்படாத அப்பாவி மக்கள் பாதிக்கப் பட்டிருக்கிறார்கள் என்பதை, அவர்கள் கொல்லப் பட்டிருக்கிறார்கள் என்பதை, அவர்கள் காணாமலாக்கப் பட்டிருக்கிறார்கள் என்பதை யாரும் மறக்கவோ, மறுக்கவோ முடியாது. அவ்வாறு செய்வதாக இருந்தால், அது சோற்றுக்குள் முழுப் பூசணிக்காயைப் புதைப்பது போன்ற செயற்பாடாகத்தான் அமையும். ஆகவே, இங்கு எந்தவிதமான புனைதல்களும் இல்லை. உண்மையாக நடந்த விடயங்களை, யதார்த்தமாக நாங்கள் அறிந்த விடயங்களைப் பேசுகிறோம். இவ்வாறானவர்களின் கருத்துகளைக் கேட்கின்றபொழுது, காலப்போக்கில் இவ்வாறானதொரு யுத்தம் நடக்கவில்லை என்ற கருத்துக்கூட வந்துவிடுமோ என்ற ஐயப்பாடு இருக்கின்றது. ஆகவே, இந்த நாட்டிலுள்ள மக்களுக்குத் தலைமைதாங்குகின்ற தலைவர்களாகிய நாங்கள் சரியான கருத்துக்களைப் பேச வேண்டும் என்பதுடன், அந்தக் கருத்துக்கள் இந்த நாட்டிலே இருக்கின்ற இனங்களுக்கிடையே பரஸ்பரம், புரிந்துணர்வு, தாராள மனப்பாங்கு, அதற்கூடான ஓர் இன நல்லிணக்கம் மற்றும் ஐக்கியத்தைக் கட்டியெழுப்புவதாக இருக்கவேண்டும். அதுதான் இந்த நாட்டை ஓர் அபிவிருத்தி சார்ந்த பாதையிலே, ஒரு முன்னேற்றகரமான பாதையிலே கொண்டு செல்வதற்கும் மற்றைய நாடுகளுக்கு ஒரு முன்னுதாரணமான நாடாக விளங்கச் செய்வதற்கும் வழிவகுக்கும்.

உண்மையிலே 3 தசாப்த காலத்தைத் தாண்டி நடந்த கடந்தகால யுத்தத்திலே வடக்கு, கிழக்கிலே பல்வேறு அழிவுகளை எங்கள் மக்கள் சந்தித்திருக்கின்றார்கள். ஆனால், கடந்த அரசு "வடக்கின் வசந்தம்" என்று வடக்கிலும், "கிழக்கின் உதயம்" என்று கிழக்கிலும் மேற்கொண்ட கருத்திட்டங்களின்மூலம் அபிவிருத்தித் திட்டங்களை மேற்கொண்டு, கட்டிடங்களைக் கட்டியிருக்கலாம்; வீதிகளை அமைத்திருக்கலாம். "வடக்கின் வசந்தம்", "கிழக்கின் உதயம்" போன்ற திட்டங்கள் கடந்த காலங்களிலே பல்வேறு அமைச்சர்கள், பல்லாயிரக்கணக்கான கோடி ரூபாயைச் சுருட்டுவதற்கு ஏதுவாக இருந்த திட்டங்களாகவும் இருந்தன. ஆனால், இந்த "வடக்கின் வசந்தம்" ஊடாகவோ, "கிழக்கின் உதயம்" ஊடாகவோ அந்த மாகாணங்களில் வாழ்கின்ற மக்களின் வாழ்க்கையிலே எந்த வகையிலான அல்லது எவ்வாறான ஒரு முன்னேற்றத்தை ஏற்படுத்தியிருக்கின்றது? என்ற விடயத்தைப் பற்றி நாங்கள் சிந்திக்க வேண்டும். அந்தக் கருத்திட்டங்களின் ஊடாக வடக்கு, கிழக்கிலே போடப்பட்ட வீதிகளின் நிலைமை இன்று என்ன? அதிகளவான வீதிகள் இன்று வீதிகளாக இல்லை. சில இடங்களிலே பாலம் போடப்பட்டதாக விளம்பரப் பலகைகள் இருக்கின்றன. அதற்கான estimate எவ்வளவு என்றும் போடப்பட்டிருக்கின்றது. ஆனால், அந்த வேலைத்திட்டம் அங்கில்லை. ஆகவே, கடந்த அரசு மேற்கொண்ட திட்டங்கள் 3 தசாப்த காலமாக யுத்தத்தினுடைய கோரப்பிடிக்குள் சிக்கிக் கொண்டிருந்த அந்த மக்களுடைய வாழ்வாதாரத்திலே எத்தகைய மாற்றத்தை உண்டுபண்ணியிருக்கின்றது? எவ்வாறான மாறுதல்களைக் கொண்டுவந்திருக்கின்றது? என்பது தொடர்பில் சிந்திக்க வேண்டும்.

இந்த நாட்டிலிருக்கின்ற இனவாதத்தை, மதவாதத்தை விரும்பாத பெரும்பான்மையான சிங்கள மக்களோடு, இந்த நாட்டின் முஸ்லிம் மக்களும் தமிழ் மக்களும் இணைந்துதான் இந்த ஆட்சிமாற்றத்தைக் கொண்டுவந்தார்கள். அதாவது, இந்த நாட்டின் சிறுபான்மையின தமிழ் மக்களும் முஸ்லிம் மக்களும் இனவாதத்தையும் மதவாதத்தையும் விரும்பாத பெரும் பான்மையினச் சிங்கள மக்களும் இணைந்துதான் 2015ஆம் ஆண்டு ஜனவரி மாதம் 8ஆம் திகதி இந்த நாட்டிலே ஓர் ஆட்சி மாற்றத்தைக் கொண்டுவந்தார்கள். இந்த ஆட்சி மாற்றத்தின் பின்னர் பல்வேறுபட்ட எதிர்பார்ப்புகளோடும் நம்பிக்கை யோடும் எமது மக்கள் இருந்தார்கள். ஆனால் இந்த ஆட்சி மாற்றத்தினாலும் சொல்லக்கூடிய அளவுக்கு எந்த மாற்றமும் அவர்களுக்கு ஏற்பட்டதாக இல்லை. கடந்த அரசினுடைய செயற்பாடுகள் போன்றே இந்த அரசின் செயற்பாடுகளும் தொடர்வதையே காண முடிகின்றது. காணாமலாக்கப்பட்டவர் களின் உறவுகள் இன்று 2 வருடங்களைத் தாண்டியும் தங்களுடைய உறவுகளைத் தேடி அலைகின்றனர், வீதிகளில் இருந்து போராட்டங்களை மேற்கொள்கின்றனர். இவ்வாறான நிலைமை தொடர்ந்துகொண்டேயிருக்கின்றது.

இன்று தேசிய பாதுகாப்பு நிதியம் (திருத்தம்) சட்டமூலம் தொடர்பான விவாதம் நடைபெற்றுக்கொண்டிருக்கின்றது. வருடாந்தம் பாதுகாப்புக்கான நிதி அதிகரித்துக்கொண்டுதான் செல்கின்றது. அதில் எந்த மாற்றமும் இல்லை. 2007ஆம் ஆண்டு 1,49,651 மில்லியன், 2008ஆம் ஆண்டு 2,04,827 மில்லியன் என்று பாதுகாப்புக்காக ஒதுக்கப்படுகின்ற நிதி யுத்தம் நடந்த காலத்தில் அதிகரித்துக்கொண்டு சென்றது. ஆனால், யுத்தம் நடந்த காலத்தில் இருந்ததைவிட, 2009 மே 18இலே இந்த யுத்தம் மௌனிக்கப்பட்ட - முடிவுக்குக் கொண்டுவரப்பட்ட பின்னரும் பாதுகாப்புக்கான செலவினம் குறையாமல், அது வருடாந்தம் அதிகரித்துக்கொண்டு செல்வதை நாங்கள் பார்க்க முடிந்தது. அந்த அடிப்படையிலே 2011 முதல் 2018 வரையிலே பார்க்கின்றபோது, அது வருடாந்தம் அதிகரித்து, 2018இல் கிட்டத்தட்ட 2,90,711 மில்லியன் என்றளவில் அதிகரித்திருப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது. அந்த வகையில், யுத்தம் நடந்த காலத்தை விட, யுத்தம் நடைபெறாத ஒரு சுமுகமான நல்ல சூழ்நிலை நிலவுகின்ற காலகட்டத்தில்தான் பாதுகாப்புக்கு ஒதுக்கப்படுகின்ற நிதி ஒதுக்கீடு அதிகமாகக் காணப்படுகின்றது.

அவ்வாறே, யுத்தம் நடைபெற்ற காலப்பகுதியிலே 7.8 என்ற வீதத்திலிருந்த இலங்கையினுடைய பொருளாதார வளர்ச்சி வீதத்தை யுத்தம் முடிவுக்கு வந்த பின்னரான காலப்பகுதியுடன் ஒப்பிட்டுப் பார்க்கும்போது, அது 2015இலே 5.0 வீதமாகவும், 2016இலே 4.5 வீதமாகவும், 2017இலே 3.1 வீதமாகவும் குறைவடைந்து செல்கின்ற வீதத்தில் இருப்தைக் காணமுடிகின்றது. ஆகவே, நாங்கள் பொருளாதார ரீதியாக எங்களது நாட்டை வளர்ச்சிப் பாதைக்குக் கொண்டுசெல்ல வேண்டுமானால், அதிகளவான நிதிகளை உற்பத்தித்துறை சார்ந்த விடயங்களுக்கு ஒதுக்கீடு செய்ய வேண்டும். அவ்வாறு செய்யும்பொழுது யுத்தமில்லாத சுமுகமான ஒரு சூழ்நிலை நிலவுகின்ற இந்தக் காலகட்டத்திலே எங்களுடைய நாட்டின் பொருளாதார வளர்ச்சி வீதத்தை அதிகரித்துக்கொள்ளலாம். இது நடைமுறைச் சாத்தியமானதாக இருக்கும். ஆகவே, இந்த விடயத்திலே அரசு கூடுதலான கவனத்தைச் செலுத்த வேண்டும்.

2015.09.01ஆம் திகதி எட்டாவது பாராளுமன்றத்தின் புதிய கூட்டத்தொடர் ஆரம்பிக்கப்பட்டதிலிருந்து நாங்கள் எங்களது வடக்கு, கிழக்கிலே அழிக்கப்பட்ட, யுத்தத்தினால் பாதிக்கப்பட்டிருக்கின்ற பல்வேறு தொழிற்சாலைகளை மீளப் புனரமைத்துத் திறக்குமாறு கோரிப் பல்வேறு திட்ட முன்மொழிவுகளை வைத்துப் பேசிக்கொண்டிருக்கின்றோம். ஆயினும், கிழக்கிலே, குறிப்பாக நான் பிரதிநிதித்துவப்படுத்து கின்ற மட்டக்களப்பு மாவட்டத்திலே அவ்வாறான ஒரு தொழிற்சாலையாவது இந்த நல்லாட்சி அரசினால் மீளப் புனரமைக்கப்பட்டுத் திறக்கப்பட்டதாக இல்லை. ஆனால், வருடாந்தம் பாதுகாப்புக்கான நிதி அதிகரிக்கப்பட்டுக்

[ගරු එස්. වියාලේන්දිරන් මහතා]

கொண்டேயிருக்கின்றது. சனாதிபதியின் ஆட்சிக் காலத்தில் மூன்று வருடங்கள் நிறைவடைந்து செல்கிறது. இந்தப் பாராளுமன்றத்தின் ஆயுட் காலத்திலே அரைவாசிக் காலத்தை நாங்கள் கடந்திருக்கிறோம். நாங்கள் பல்வேறு திட்டங்கள் குறித்து சனாதிபதியுடன் பேசியிருக்கிறோம்; பிரதமருடன் பேசியிருக்கிறோம்; சம்பந்தப்பட்ட அமைச்சர்களுடன் பேசியிருக்கிறோம். இன்று அங்கு செயலிழந்திருக்கின்ற வாழைச்சேனை காகித ஆலையாக இருக்கலாம், அல்லது பாதிக்கப்பட்டிருக்கின்ற ஓட்டுத் தொழிற்சாலையாக இருக்கலாம், அல்லது மட்டக்களப்பு மாவட்டத்தில் இருக்கின்ற எந்தவொரு தொழிற்சாலையையும் திறப்பதற்குரிய எந்தவொரு நடவடிக்கையும்கூட 0.1 வீத அளவில்கூட - இந்த நல்லாட்சி அரசிலே முன்னெடுக்கப்படவில்லை. வாழைச்சேனை காகித ஆலையானது, கிட்டத்தட்ட 3,500 தொடக்கம் 4,000 பேர் வேலைசெய்த ஒரு மிகப் பெரிய தொழிற்சாலை. அந்தத் தொழிற்சாலையைத் திறந்து தாருங்கள் என்று கேட்டு, நாங்கள் இந்த அரசினது ஒவ்வொரு வரவு செலவுத் திட்டத்துக்கும் ஆதரவாக வாக்களித்ததுதான் மிச்சம். ஆனால், அங்கு எந்தவொரு வேலையும் நடந்ததாக இல்லை.

இன்று அந்தப் பகுதியிலே படித்த இளைஞர், யுவதிகள் வேலையற்றிருக்கின்ற நிலைமையை நாங்கள் பார்க்கக் கூடியதாக இருக்கின்றது. இவ்வாறு தொழிற்சாலை கள் திறக்கப்படாதது ஒரு பக்கம் இருக்க, படித்த எத்தனையோ இளைஞர், யுவதிகள் வேலையற்றிருக்கின்ற இந்தச் சூழலிலே, சாதாரண அரச தொழிலாக இருக்கின்ற சிற்றூழியர் நியமனத்தில்கூட, அந்தப் பகுதியிலிருக்கின்ற இளைஞர், யுவதிகளுக்கு முன்னுரிமை அளிக்கப்படாமல், தென்னிலங்கை யிலிருந்தும் பொலன்னறுவையிலிருந்தும் காலியிலிருந்தும் அதிகளவானவர்கள் நியமிக்கப்படுகின்ற நிலைமையைத்தான் நாங்கள் கிழக்கிலே, மட்டக்களப்பு மாவட்டத்திலே பார்க்கிறோம். இலங்கை மின்சார சபையாக இருக்கலாம், சுகாதாரத்துறையாக இருக்கலாம், அனைத்துத் துறைகளிலும் இவ்வாறு அதிகமானவர்கள் நியமிக்கப்பட்டிருக்கின்றார்கள். சிற்றூழியர் நியமனங்களில்கூட அந்தப் பகுதியைச் சார்ந்த படித்த இளைஞர், யுவதிகளுக்கு முன்னுரிமை வழங்கப்படாத நிலைமை இருக்கின்றது. இந்த நல்லாட்சியை ஏற்படுத்தியவர் களென்ற அடிப்படையிலே அது எங்களுக்குப் பாரிய பாதிப்பை ஏற்படுத்தியிருக்கிறது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, வடக்கு, கிழக்கு மாகாணங்கள் இரண்டுமே யுத்தத்தினால் முழுமையான பாதிப்புக்களுக்குள்ளாக்கப்பட்ட மாகாணங்களாகும். அண்மையில் வட மாகாண அபிவிருத்திக்கென்று ஓர் அமைச்சு உருவாக்கப்பட்டது பற்றி உங்களுக்குத் தெரியும். ஆனால், யுத்தத்தினால் திட்டமிட்டு அழிக்கப்பட்ட கிழக்கு மாகாணத்தைச் சிறந்த முறையிலே மீள் கட்டுமானம் செய்து, அதனை நல்ல நிலைக்குக் கொண்டுவர வேண்டுமென்ற அடிப்படையிலே இந்த நல்லாட்சி அரசிலே கிழக்கு மாகாண அபிவிருத்திக்கென்று ஓர் அமைச்சு உருவாக்கப்படவில்லை. அதாவது, இன்று மேல் மாகாண அபிவிருத்தி அமைச்சு, வடமேல் மாகாண அபிவிருத்தி அமைச்சு, வட மாகாண அபிவிருத்தி அமைச்சு என்று அமைச்சுக்கள் இருந்தும் கிழக்கு மாகாணத்திற்கென்று அவ்வாறான ஓர் அமைச்சு உருவாக்கப்படவில்லை. வடக்கு, கிழக்கு மாகாணங்களின் அபிவிருத்தி மற்றும் வளர்ச்சிக்காக ஜனாதிபதி அவர்களுடைய தலைமையிலே அண்மையில் ஒரு செயலணி உருவாக்கப்பட்டதை நீங்கள் அறிந்திருப்பீர்கள். அந்தச் செயலணியில்கூட தமிழ்த் தேசியக் கூட்டமைப்பிலிருக்கின்ற 15 பாராளுமன்ற உறுப்பினர்களிலே ஒருவராவது உள்வாங்கப் படவில்லை. ஆனால், இந்த அரசினுடைய செயற்பாடுகளுக்கு நாங்கள் பல வகைகளிலே ஆதரவு வழங்கி வருகின்றோம்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, வடக்கு மகாணத்திற்கென்றும் கிழக்கு மாகாணத்திற்கென்றும் ஓர் அதிகாரசபையை உருவாக்கி, அதிலே எங்களையும் உள்வாங்கிக்கொண்டு பல்வேறு வேலைத்திட்டங்களை முன்னெடுப்பதாகக் கடந்த காலங்களிலே பிரதமர் -

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

Hon. Deputy Speaker, my good Friend said that we have not given priority to the Northern and the Eastern Provinces. But, in fact, if you look at the courthouses we have built in Trincomalee, Batticaloa and also in the Northern Province, they are the best courthouses available in Sri Lanka. The Hon. Member also talked about recruitment. With regard to recruitment to the Judiciary - also when I was in charge of Prison Reforms - we have not recruited anybody from outside. All were from your area; all were from the respective Provinces.

Recently, I went and opened very important cultural centres in three places. There may be some weaknesses and defects in certain segments, but we have never ignored these Provinces, because we always give priority to them when it comes to infrastructure and also recruitment. Maybe, that is not being implemented by a couple of ministries.

Hon. Member, when it comes to recruitment, although applications are called in those areas, sometimes we cannot find persons with required qualifications because, education had been disrupted for over three decades there. Maybe, it is due to that fact that sometimes we cannot find qualified persons for the respective fields. Except for that, of course, I hope the Hon. Member would appreciate our efforts made with regard to recruitment without any discrimination. We are not concerned about race, creed or language. When it comes to recruitment and development, we extend our fullest cooperation, especially to the Northern and Eastern Provinces, considering the fact that they have suffered much more than the people in any other province during the war period.

Thank you.

ගරු එස්. වියාලේන්දිරන් මහතා
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)

கௌரவ அமைச்சர் அவர்களே, தங்களுடைய கௌரவமான பதிலுக்கு நான் நன்றி கூறுகின்றேன். தங்களுடைய அமைச்சைப் பொறுத்தளவில், தங்களுடைய முன்னைய அமைச்சில் அவ்வாறான பாரபட்சங்கள் இருந்ததாக நான் கூறவில்லை. தற்போது புதிதாக நீங்கள் அமைச்சுப் பொறுப்பினை ஏற்றிருக்கின்றீர்கள். தாங்கள் முன்பு வகித்த அமைச்சிலும் சரி, தற்போதும் சரி அதை நீங்கள் சரியாகச் செய்திருக்கின்றீர்கள். சில அமைச்சுக்களிலே வேலைவாய்ப்புத் தொடர்பான விடயத்திலே உண்மையிலே

பாரபட்சம் நடந்திருக்கிறது. நீங்கள் கூறியதுபோல தகைமை - qualification - என்ற அடிப்படையில் பார்க்கும்போது, இலங்கையிலே கோரப்படுகின்ற விண்ணப்பங்களுக்கேற்ற தகைமைகளை அந்தப் பகுதியில் இருக்கின்ற இளைஞர், யுவதிகளும் கொண்டிருக்கின்றார்கள். ஆனால், பொலன்னறுவையிலிருந்து இன்று இரண்டு பஸ் வண்டிகளில் மட்டக்களப்புப் போதனா வைத்தியசாலைக்குச் சுகாதார சிற்றூழியர்கள் வருகின்றார்கள். அங்கு உண்மையிலே மொழி சார்ந்த பிரச்சினை பாரியதொரு பிரச்சினையாக இருக்கின்றது. நோயாளிகளோடு அவர்களது மொழியில் பேசுவது அந்த ஊழியர்களுக்குக் கஷ்டமாக இருக்கின்றது. ஏனென்றால், அவர்கள் தமிழ் மொழி பேசுவார்கள்; இவர்கள் சிங்கள மொழி பேசுவார்கள். இதேபோன்று, மட்டக்களப்பிலிருக்கின்ற தமிழ் மொழி பேசக்கூடிய தமிழர்களையோ, முஸ்லிம்களையோ சிங்கள மக்கள் வாழ்கின்ற பகுதிக்கு வெற்றிடங்களுக்கு நியமிக்கின்றபொழுது, அங்கு மொழி சார்ந்த பிரச்சினை பாரிய பிரச்சினையாக இருக்கும். இது சுகாதாரத்தோடு சம்பந்தபட்ட தொழில். அந்த வகையில், அந்தச் சிற்றூழியர் நியமனங்களில்கூட அந்தப் பகுதி இளைஞர், யுவதிகள் புறக்கணிக்கப்பட்டிருக்கின்றார்கள்.

அவ்வாறே கல்வி அமைச்சின் நியமனங்களில்கூட இந்த நிலை காணப்படுகின்றது. தேசியப் பாடசாலைகளிலே இரவு நேரக் காவலாளிகளாக, சிற்றூழியர்களாக குருநாகல் மாவட்டத்திலிருந்து நியமிக்கப்பட்டிருக்கின்றார்கள். எமது பகுதியிலிருக்கின்ற மக்கள் இந்த ஆட்சியை ஏற்படுத்தியதிலே முக்கிய பங்குதாரிகளாக இருப்பதனால் அவர்கள் இந்த ஆட்சிமீது விரக்தியடையும் அல்லது வெறுப்படையும் நிலைக்குத் தள்ளப்படுகின்றார்கள். இந்த விடயத்தில் சில அமைச்சுக்கள் கௌரவமான முறையிலே நடந்துகொண்டாலும், பல அமைச்சுக்கள் அவ்வாறு நடந்துகொள்வதில்லை. இது தொடர்பாக நாட்டின் ஜனாதிபதி மற்றும் பிரதமரிடம் நாங்கள் சுட்டிக்காட்டியிருக்கிறோம். இந்தமாதிரியான விடயங்களிலே எங்களுடைய கருத்துக்களையும் உள்வாங்கிக் கொண்டு நீங்கள் பயணிக்க வேண்டுமென்று நாங்கள் எதிர்பார்க்கின்றோம். ஆனால், அவ்வாறான முன்னெடுப்புக்களைக் காணக்கூடியதாக இல்லை.

தொழிற்சாலைகள் என்று நாங்கள் பேசும்பொழுது, ஏற்கெனவே இருந்த தொழிற்சாலைகள் எதுவும் திறக்கப்படாததனால் வேலைவாய்ப்பற்றிருக்கின்ற பலர் நுண்கடன் நிதியை நாடுகின்றனர். கிழக்கிலே, மட்டக்களப்பு மாவட்த்திலே நுண்கடன் நிதியானது - microcredit - பாரிய உயிர்கொல்லியாக இன்று மாறியிருக்கின்றது. சிந்தித்துப் பாருங்கள்! மத்திய வங்கியிலே கோடிக்கணக்கான ரூபாயைக் கொள்ளையடித்தவர்கள் இன்று வெளிநாடுகளிலே, உள்நாட்டிலே உல்லாசமாக வாழுகின்றபோது, இன்று நுண்கடன் நிதி என்ற பெயரிலே சாதாரண அப்பாவி மக்களிடம் 25 - 30 சதவீத வட்டி அறவிடப்படுகின்றது. அந்தக் கடனைக் கட்ட முடியாமல் மட்டக்களப்பு மாவட்டத்திலே ஏழு மாதங்களுக்குள் 17 பேர் தற்கொலை செய்துகொண்டிருக்கிறார்கள். அந்தப் பணம் அதிகளவான வட்டி விகிதத்திலே மீள அறவிடப்படுகிறது. கோடிக்கணக்கான ரூபாயை இலஞ்சமாகப் பெற்றவர்கள் வெளிநாடுகளிலும், உள்நாட்டிலும் இன்று உல்லாசமாக வாழ்கின்ற நிலையிலே, வங்கிகளிலே கடன் பெற்ற ஓர் அரச உத்தியோகத்தரின் நிலைமையை எடுத்துப்பாருங்கள்! வங்கிகளிலே பெற்ற அந்தக் கடனை அவர்கள் அடைக்கும்பொழுது எடுத்த கடனுக்குச் சமனாக வட்டியைச் செலுத்தவேண்டியிருக்கிறது. அரச ஊழியர்கள் தொடக்கம் சாதாரண மக்கள்வரை இன்று அதிகளவான வட்டி விகிதத்தை வங்கிகளுக்கு, நுண்கடன் நிதி நிறுவனங்களுக்கு, financial கம்பனிகளுக்குச் செலுத்திக் கொண்டிருக்கின்றார்கள். கடனைச் செலுத்த முடியாதவர்கள் இன்னோரிடத்திலிருந்து கடன் பெற்று முன்னைய கடனை அடைத்துவிட்டு, அந்தக் கடனை அடைப்பதற்கு இன்னுமோர் இடத்திலிருந்து கடன் பெறுகிறார்கள். இறுதியில் கடனை அடைக்க முடியாத பட்சத்திலே அவர்கள் தங்களுடைய உயிரை மாய்த்துக்கொள்கின்ற துர்ப்பாக்கிய நிலைக்குத் தள்ளப்படுகிறார்கள். இந்த நிலை மாற்றப்பட வேண்டும். நாட்டிலே நாங்கள் வருமானத்தை ஈட்டக்கூடியதான புதிய தொழில் முயற்சிகளை உருவாக்க வேண்டும். இந்தப் பகுதிகளில் அத்தகைய தொழில் முயற்சிகளை ஆரம்பியுங்கள். அதற்கான அதிக நிதி ஒதுக்கீடுகளை ஒதுக்குங்கள் என நாங்கள் கேட்கின்றோம்.

இன்று இந்த நல்லாட்சியிலே நாங்கள் புதிய தொழிற்சாலைகளை எதிர்பார்த்தோம். இல்லை! ஏற்கனவே இருந்த தொழிற்சாலைகளைத் திறவுங்களென்று சொன்னோம். இல்லை! ஆனால், இந்த நல்லாட்சி அரசாங்கம் இந்த 3 வருடங்களில் இரண்டு தொழிற்சாலைகளை ஏற்படுத்தியிருக்கின்றது. அதிலொன்று, கல்குடாவிலே அமைக்கப்பட்டு, மக்களுடைய, மக்கள் பிரதிநிதிகளுடைய ஜனநாயக மயப்படுத்தப்பட்ட கண்டன ஆர்ப்பாட்டங்களினால் இடை நிறுத்தப்பட்டிருக்கின்ற மதுபானத் தொழிற்சாலை - மதுபான உற்பத்தித் தொழிற்சாலை. 450 கோடி செலவிலே அர்ஜுன் மகேந்திரனுடைய மருமகன் அலோசியஸ் அவர்களுடைய தலைமையில் அங்கே உருவாக்கப்பட்டதான ethanol plant. சற்றுச் சிந்தித்துப் பாருங்கள்! அது இன்று மக்களுடைய கண்டன ஆர்ப்பாட்டங்களினால், நாங்கள் வீதிகளில் இறங்கிப் போராடியதனால் இடைநிறுத்தப்பட்டிருக்கின்றது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த உயரிய சபையிலே நான் இன்னுமொரு முக்கியமான விடயத்தைக் கூற விரும்புகின்றேன். இன்று மட்டக்களப்பு மாவட்டத்திலே படுவான்கரை என்று சொல்லப்படுகின்ற பகுதி கிட்டத்தட்ட மாவட்டத்தின் 80 வீதமான நிலப்பரப்பைக் கொண்ட ஒரு பகுதியாகும். அது 30 வருடங்களாகத் தொடர்ச்சியாக யுத்த சூழ்நிலையிலிருந்த ஒரு பகுதி; முழுமையாக அழிக்கப்பட்ட ஒரு பகுதி. அந்தப் பகுதியிலே இருக்கின்ற மிகப் பெரிய பிரச்சினை, குடிநீர்ப் பிரச்சினை. குடிநீர்த் தட்டுப்பாடு என்பது காலாகாலமாக இருக்கின்ற ஒரு பிரச்சினை. குடிப்பதற்கான நீரைக்கூட அங்கு மக்களால் பெறமுடியாத சூழல் இருக்கின்றது. இந்த நிலையிலே தற்போது படுவான்கரைப் பகுதியிலே, மட்டக்களப்பின் ஏறாவூர்ப்பற்றுப் பிரதேச செயலாளர் பிரிவுக்குட்பட்ட புல்லுமலை என்கின்ற கிராம சேவகர் பிரிவிலே ஒரு mineral water கம்பனிக்கு - போத்தலிலே நீரை அடைத்து விற்கக்கூடிய தொழிற்சாலையொன்றுக்கு - 'மாறா' என்று சொல்லப்படுகின்ற ஒரு கம்பனிக்கு அங்கே தொழிற்சாலையை அமைத்து, அங்கிருக்கின்ற நிலத்தடித் தண்ணீரை உறிஞ்சி, அதனைப் போத்தலிலே அடைத்து, விற்பனை செய்வதற்குரிய அங்கீகாரத்தை அரச திணைக்களங்கள் வழங்கியிருக்கின்றன. ஆனால், குறைந்தது வருடத்திலே 7 மாதங்கள் குடிப்பதற்கு நீரில்லாமல் அல்லற்படுகின்ற அந்தக் கிராமங்களிலே பிரதேச சபை plastic tanks வைத்துத்தான் குடிநீரை வழங்குகின்றது. அவ்வாறு குடிப்பதற்கு நீரில்லாமல் அல்லற்படுகின்ற நிலைமையிருக்கின்ற பகுதியிலே, மத்திய சுற்றாடல் அதிகாரசபை, பிரதேச சபை போன்றனவும் வன ஜீவராசிகள், வன இலாகா போன்ற பல திணைக்களங்களும் இன்று நிலத்தடி நீரை உறிஞ்சி, அந்த நீரை எடுத்துப் போத்தலில் அடைத்து விற்கின்ற தொழிற்சாலைக்கு அனுமதி வழங்கியிருக்கின்றன. மத்திய சுற்றாடல் அதிகாரசபை

[ගරු එස්. වියාලේන්දිරන් මහතා]

மாகாணத்திலிருந்துகொண்டு, மத்தியிலிருந்துகொண்டு, அந்த மாவட்டத்திலே ஏறாவூர்ப்பற்றுப் பிரதேச செயலாளர் பிரிவிற்குள்ளே குடிநீருக்கே அல்லற்படுகின்ற அந்தப் பகுதியிலே நிலத்தடித் தண்ணீரை உறிஞ்சிப் போத்தலில் அடைத்து விற்பனை செய்ய அனுமதி வழங்கியிருக்கின்றது.

அந்தப் பகுதியில் நிலத்தடித் தண்ணீரை உறிஞ்சுவது அந்தப் பகுதியிலிருக்கின்ற கிட்டத்தட்ட 70க்கும் மேற்பட்ட கிராமங்களில் உள்ள 8,000க்கும் அதிகமான மக்களுடைய இரத்தத்தை உறிஞ்சுவதற்குச் சமனாகும். இந்தத் திணைக்களங்கள் அந்தத் தொழிற்சாலைக்கு எந்தவிதமான கள விஜயத்தையும் மேற்கொள்ளாமல், அந்தப் பகுதியிலிருக்கின்ற மக்களுடைய கருத்துக்களையும் கேட்டறியாமல் அனுமதி வழங்கியமையினால், இன்று மிகப் பெரிய factory ஒன்றை 100 ஏக்கர் காணியில் அமைப்பதற்கான ஆரம்ப வேலைகள் நடந்துகொண்டிருக்கின்றன. கடந்த திங்கட்கிழமை பெரிய புல்லுமலை, கித்துள், உறுகாமம், கோப்பாவெளி, வெலிக்காக்கண்டி, மங்களகம போன்ற கிராமங்களிலே இருக்கின்ற கிட்டத்தட்ட 200க்கும் மேற்பட்ட மக்கள் அந்தத் தொழிற்சாலைக்கு முன்பாக நின்று ஒரு ஜனநாயக மயப்படுத்தப்பட்ட போராட்டத்தை முன்னெடுத்திருந்தார்கள். "நிலத்தடி நீரை உறிஞ்சுகின்ற அந்தத் தொழிற்சாலையை மூடுங்கள்!" என்றுதான் அவர்கள் அந்தப் போராட்டத்தை முன்னெடுத்திருந்தார்கள். அந்த மக்களுடைய ஜனநாயக மயப்படுத்தப்பட்ட அந்தக் கண்டன ஆர்ப்பாட்டத்தையும் மீறி, பிரதேச சபையினுடைய கட்டிட அனுமதியையும் சம்பந்தப்பட்ட அரச திணைக்களங்களின் அனுமதிகளையும் பெற்று இன்று அந்தத் தொழிற்சாலையினுடைய கட்டுமானப் பணிகள் நடந்துகொண்டிருக்கின்றன.

மக்கள் பிரதிநிதிகளாகிய நாங்கள் மேதகு ஜனாதிபதி அவர்களுக்கு இதுபற்றி அறிவித்திருக்கின்றோம். குடிப்பதற்கே நீரில்லாமல் அல்லற்படுகின்ற, குடிநீர்ப் பஞ்சத்திற்குள்ளாகியிருக்கின்ற பகுதியிலே இவ்வாறான ஒரு தொழிற்சாலை அமைக்கப்படுவதானது மிகப்பெரிய ஒரு பின்புலத்திலேதான் மேற்கொள்ளப்படுவதாக நாங்கள் யோசிக்கின்றோம். அங்குள்ள மக்களும் அவ்வாறுதான் யோசிக்கின்றார்கள். ஏனென்றால், ஏறாவூர்ப்பற்று பிரதேச சபை 2018ஆம் ஆண்டு ஏப்பிரல் மாதம் 25ஆம் திகதி கூடியபோது, ஐக்கிய தேசியக் கட்சியின் விகிதாசாரப் பட்டியலிலே புல்லுமலைப் பகுதியிலிருந்து தெரிவு செய்யப்பட்ட ஓர் உறுப்பினர் - திருமதி நல்லரட்ணம் அமுதினி என்பவர் உரையாற்றும்போது, குடிநீர் சம்பந்தமான அந்தத் தொழிற்சாலை பற்றியதான கருத்தை முன்வைத்திருந்தார். அதாவது, இராஜாங்க அமைச்சர் எம்.எல்.ஏ.எம். ஹிஸ்புல்லாஹ் அவர்கள், பண்ணையை அமைத்துக் குடிநீர் வழங்குவதாகவும் அதன்படி பிரதேசம் முழுக்க வழங்கலாம் என்றும் கோப்பாவெளி மாரியம்மன் கோவில் வீதி, கொச்சித்தோட்ட வீதிகள், வெலிக்காக்கண்டி வீதிகளைப் புனரமைத்துத் தருவதாகவும் கூறினார். அதற்குப் பின்பு நடந்த அமர்விலே தொழிற்சாலையையும் அமைத்துத் தருவதாக அவர் கூறியிருக்கிறார். அதன் அடிப்படையில் கௌரவ இராஜாங்க அமைச்சர் ஹிஸ்புல்லாஹ் அவர்களுடைய பின்னணியில்தான் இது நடைபெறுகிறதா? என்று அப்பகுதியிலுள்ள மக்கள் இவருடைய பெயரைக் கூறியிருந்தார்கள். நாங்கள் இராஜாங்க அமைச்சரைக் குற்றஞ்சாட்டவில்லை. ஐக்கிய தேசியக் கட்சியின் உறுப்பினர் பிரதேச சபையிலே பேசியதால்தான் இந்த இராஜாங்க அமைச்சருடைய பெயரை மக்கள் உச்சரித்தார்கள். ஆனால் கௌரவ இராஜாங்க அமைச்சர் அவர்கள், அவரைக் குறித்து நான் போலித்தனமாக, விசமத்தனமாகப் பிரச்சாரம் செய்வதாகப் பத்திரிகை அறிக்கைமூலம் குற்றஞ் சாட்டியிருந்தார். இதனை நாங்கள் நிச்சயமாக ஏற்றுக்கொள்ள முடியாது. அந்த மக்களின் உண்மையான நிலைவரத்தை, களநிலைவரத்தை அறியாமல், நான் 20 பேரை எங்கிருந்தோ அழைத்துக் கொண்டுவந்து ஆர்ப்பாட்டத்தை நடத்தியதாகக் கூறியிருந்தார். உண்மை அதுவல்ல!

இன்று அங்கு காணப்படுவது குடிநீர்ப் பிரச்சினை! ஒரு நாளைக்கு கிட்டத்தட்ட 20,000 லீற்றர் வீதம் ஒரு கிழமைக்கு 1,40,000 லீற்றர் நீரை நிலத்தடியிலிருந்து உறிஞ்சினால் அதனால் நிச்சயமாகப் பாதிக்கப்படுவது அந்த மாவட்டத்திலிருக்கின்ற மக்கள்தான். அங்கு தமிழ் மக்கள் மட்டுமல்ல, மங்களகம என்ற பகுதியிலே சிங்கள மக்கள் இருக்கிறார்கள், அதற்கும் அப்பால் உறுகாமத்திலே முஸ்லிம்கள் இருக்கின்றார்கள். இது அனைவரையும் பாதிக்கின்ற செயற்பாடு. ஆகவே மேதகு ஜனாதிபதி அவர்கள் இந்த நிலத்தடி நீரை உறிஞ்சிப் போத்தலில் அடைக்கின்ற தொழிற்சாலை அமைப்பை உடனடியாகத் தடுத்து நிறுத்த வேண்டும். இந்தக் கள நிலைவரத்தை அறிந்துகொள்ளாமல், அந்த மக்களுடைய நிலைமையை அறிந்துகொள்ளாமல், அவர்களின் கருத்துக்களைக் கேட்டறியாமல், அதற்கு அனுமதி வழங்கிய அரச அதிகாரிகளை, அவர்கள் எந்தத் திணைக்களத்தைச் சேர்ந்தவர்களாக இருந்தாலும், உடனடியாக விசாரணைக்குட்படுத்தவேண்டுமென்று கேட்டுக் கொள்ள விரும்புகின்றேன்.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

Hon. Deputy Speaker, can I get some clarification from the Hon. Member? Can I know what is the Pradeshiya Sabha area that Hon. Member is referring to?

ගරු එස්. වියාලේන්දිරන් මහතා
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)

மட்டக்களப்பு மாவட்டத்தில் உள்ள ஏறாவூர்ப்பற்று பிரதேச சபை.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

Hon. Member, did you check whether they have already got an environmental certificate for the commencement of that factory? Do you know whether they have got it or not?

ගරු එස්. වියාලේන්දිරන් මහතා
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)

கௌரவ அமைச்சர் அவர்களே, உண்மையிலே இவர்கள் ஏறாவூர் பற்றுப் பிரதேச செயலகத்திடமோ அல்லது ஏறாவூர் பற்று பிரதேச செயலகப் பிரிவு உட்படுகின்ற பிரதேச அபிவிருத்தி ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்திலோ, அல்லது மாவட்ட அரசாங்க அதிபரிடமோ அனுமதியைப் பெறாமல், பிரதேச சபையிடம் மட்டும் கட்டிட அனுமதியைப் பெற்றிருக்கிறார்கள். இதன் பின்னர், இவர்கள் மற்றைய திணைக்களங்களிடம் அனுமதியைப் பெற்று தொழிற்சாலையை ஆரம்பித்துக் கொண்டுபோகும்பொழுது,

குறித்த உறுப்பினர் அச்சபையில் உரையாற்றியதை வைத்துத்தான் இது நிலத்தடி நீரை உறிஞ்சிப் போத்தலில் அடைத்து விற்பனை செய்கின்ற ஒரு தொழிற்சாலை என்பது தெரியவந்தது. ஆகவே, எங்களுடைய -

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

Hon. Deputy Speaker, what I want to tell is that His Excellency the President is the Minister in charge of Environment. If the Hon. Member gives me all the details about this so called illegal construction of the factory or what they are going to do, certainly we will look into that matter. I hope the Hon. Member will furnish me with all the details.

ගරු එස්. වියාලේන්දිරන් මහතා
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)

நிச்சயமாகத் தருகிறேன். கௌரவ அமைச்சர் அவர்களே! உண்மையிலே நீங்கள் எங்களதும் எங்களுடைய மக்களதும் ஆதங்கத்தை அறிந்து, ஒரு கௌரவமான பதிலை இந்தச் சபையிலே தந்தமைக்காக நான் உங்களுக்கு எங்களுடைய மக்கள் சார்பாக மனப்பூர்வமான நன்றியைக் கூறுகிறேன். அது முழுக்க முழுக்க விவசாயம் சார்ந்த பகுதி. அந்த இடத்திலே கிழமைக்கு 1,40,000 லீற்றர் வீதம் நிலத்தடி நீரை உறிஞ்சினால், விவசாயம் பாதிக்கப்படும்; மீன்பிடி பாதிக்கப்படும்; கால்நடை வளர்ப்புப் பாதிக்கப்படும். இவ்வாறு பல்வேறு பாரிய விளைவுகளைச் சந்திக்கநேரிடும். ஏனென்றால், இந்தியாவிலே நிலத்தடி நீரை உறிஞ்சியதால், பல கிராமங்கள் அழிந்திருக்கின்றன; பஞ்சத்துக்கு உள்ளாக்கப்பட்டிருக்கின்றன; வரண்ட பூமியாக மாறியிருக்கின்றன. ஆகவே, அந்தப் பகுதியிலே இந்தத் தொழிற்சாலையை அமைப்பதற்கான அனுமதியை, இந்தத் திணைக்களங்கள் எந்தப் பின்னணியில், எந்தச் செல்வாக்கின் அடிப்படையில் வழங்கின என்று தெரியவில்லை. ஆகவே, தயவுசெய்து மேன்மைதங்கிய சனாதிபதி அவர்கள் உடனடியாக இந்த விடயத்திலே தலையிட்டு, அந்தத் தொழிற்சாலை அமைப்பு நடவடிக்கைகளை நிறுத்தவேண்டும்.

இன்று சாதாரண ஒரு குடிமகன் சுற்றாடல் அதிகார சபையிலே ஒரு தொழில்சார்ந்த அனுமதியை எடுக்கப்போனால், அதற்காக அவர் பல மாதங்கள் அலைய வேண்டும். ஆனால், இதற்கான அனுமதிகள் உடனடியாக வழங்கப்பட்டிருக்கின்றன. அங்குள்ள வன இலாகா - Forest Department அதிகாரிகள் எதைப் பார்த்துக்கொண்டு இருக்கிறார்களோ தெரியாது. அங்கு பல ஆயிரக்கணக்கான தேக்கு மரங்கள் வெட்டப்பட்டிருக்கின்றன. ஆகவே, கௌரவ அமைச்சர் அவர்களே நீங்கள் இதனை உடனடியாக சனாதிபதியின் கவனத்துக்குக் கொண்டுசெல்ல வேண்டும். நாங்களும் இதை சனாதிபதியின் கவனத்துக்குக் கொண்டு செல்கின்றோம். நீங்கள் நேரில் வந்து இதனுடைய கள நிலவரத்தை பார்த்தால் உங்களுக்கு விளங்கும். நான் நினைக்கின்றேன், சில திணைக்களங்கள் முழுக்க முழுக்க ஏதோ ஓர் அதிகாரத்துக்கு, செல்வாக்குக்கு உட்பட்டுத்தான் அனுமதிகளை வழங்கியிருக்கின்றன என்று. ஆகவே, இந்த விடயத்திலே மக்கள் சார்பாக சிறந்த முடிவெடுக்க வேண்டுமெனத் தாழ்மையாகக் கேட்டுக்கொண்டு, வாய்ப்புக்கு நன்றிகூறி, விடைபெறுகின்றேன்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Thank you. මීළඟට, ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දොළහක කාලයක් තිබෙනවා.

[අ.භා.5.13]

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

මේ අවස්ථාවේදී අදහස් දක්වන්න මට ඉඩ ලබා දුන්නාට ඔබතුමාට බොහොමත්ම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ජාතික ආරක්ෂක අරමුදල් පනතට සංශෝධන ඉදිරිපත් කරන මේ අවස්ථාවේදී, ජාතික ආරක්ෂක අරමුදලේ ඇති වටිනාකම, ඒ වාගේම ජාතික ආරක්ෂක අරමුදල් තුළින් ජාතික ආරක්ෂාවේ නියැලෙන සාමාජිකයින්ට අත් වුණු ප්‍රතිලාභ, ප්‍රතිපාදන වැනි දේවල් ගැන අද කථා ගොඩක් අහන්න ලැබුණා. හැබැයි, මේ කථා අස්සේ බෙදහීයම කථා ටික අපට ඇහුණේ TNA මන්ත්‍රීතුමන්ලාගෙන්. එක වෙලාවක මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා යක්ෂයෙක් විධියට තමයි එතුමන්ලාට පෙනුණේ. "අපි එතුමාට කැමැති නැහැ." කිව්වා. ඒ වාගේම, අද උදේ වරුවේ කථා කළ සමහර මන්ත්‍රීවරු කිව්වා, "උතුරු, නැගෙනහිරින් සම්පූර්ණයෙන්ම යුද හමුදාව ඉවත් කරන්න ඕනෑ." කියලා. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු ප්‍රකාශ කළා, "ඒ ජනතාවට යම් දෙයක් ලැබුණා නම් එහෙම ලැබුණේ අපේ ආණ්ඩුව කාලයේයි." කියලා. ඔව්, ඒ කථාව ඇත්ත.

හිටපු අධිකරණ ඇමතිතුමා මේ සභාවේ ඉන්නවා. දැන් උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු ඇමතිතුමා. ගරු ඇමතිතුමනි, දැනට අවුරුදු 30කට උඩදි යූඑන්පී ආණ්ඩුව කාලයේ තමයි මේ දෑවැද්ද මේ රටට ලැබුණේ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව 1979 මේ රටේ ආණ්ඩු කරන කාලයේ දැනට අවුරුදු නවයකට උඩදි නවත්වපු යුද්ධය දෑවැද්දක් විධියට අවුරුදු 30කට මේ රටට උරුම කර දුන්නා. ඒ දෑවැද්ද තමයි ආණ්ඩු ගණනාවක් වසරෙන් වසර, දශකයෙන් දශකය ඉදිරියට ගෙනාවේ.

අපේ ඇමතිතුමා කළ ප්‍රකාශයක් ගැන මම කනගාටු වනවා. දැන් යුද්ධය ඉවරයි. හැබැයි, 2003දී රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා, රෝම නීතියට අපි අත්සන් කරලා නැහැ කියලා මානව හිමිකම් සංවිධානවලට, එහෙම නැත්නම් බ්‍රිතාන්‍යයට ප්‍රකාශ කළා කිව්වා. ඒ වාගේම, "අපි මේ යුද අධිකරණවලට අවනත වෙන්නේ නැහැ." කියලා වීර ප්‍රකාශයක් කළා කිව්වා. එහෙම වීර ප්‍රකාශයක් කරපු අගමැතිවරයා තමයි 2003, 2004, චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය කියන "ප්‍රභාකරන් මහත්තයා" කිලිනොච්චියෙයි, රනිල් වික්‍රමසිංහ මහත්තයා කොළඹයි ගිවිසුම් දෙක අත්සන් කළේ. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, උතුරු නැගෙනහිර උසාවි හදා ගන්න කියලා කිව්වා; පොලීසි හදා ගන්න කියලා කිව්වා; එහේ නඩු අහන්න කියලා කිව්වා; එහේ LTTE බැංකු හදාගන්න කියලා කිව්වා; එහේ සියලු වැඩ කටයුතු ටික කර ගන්න කිව්වා. පුත්තලමෙන් එහාට ඕනෑ දෙයක්; මොනරාගලින් එහාට ඕනෑ දෙයක්; කිසි ප්‍රශ්නයක් නැහැ. එහෙම දන් දීපු අගමැතිවරයෙක් තමයි අද අගමැති පුටුවේ ඉන්නේ. එහෙම දන් දුන් අගමැතිවරයා තමයි අද මේ එක්සත් ජාතික පක්ෂයේ සමහර අය ඇවිල්ලා ශුද්ධ කරන්නේ. හැබැයි, රටේ ජනතාවට ජීවන හුස්ම ලබා දුන්නු මහින්ද රාජපක්ෂ මහත්මයා යුද්ධය අවසන් කරලා, 2009 මැයි මාසයේ 18 වැනිදා කටුනායක ගුවන් තොටුපොළට ඇවිල්ලා පොළොව සිපගත්තාම ඒක මහා විජ්ජාවක්, මහා විකාරයක් විධියට දැක්කා.

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

මම දෙමළ සහෝදරවරුන්ට කියන්න ඕනෑ සහෝදරවරුනි, ඒ සිපගත්තේ සමස්ත ලංකාවේ භූමිය කියලා. එහෙම නැතිව දකුණේ පොළොව නොවෙයි සිපගත්තේ. උතුරේ කඳුළු හල හලා හිටිය අම්මාට සැනසීම දුන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයා. අද මේ පාර්ලිමේන්තු ගැලරියේ සිටින කුඩා දරුවෝ වාගේ දරුවන් අරගෙන ගිහිල්ලා ඒ දරුවන්ගේ බෙල්ලේ මල් මාලා නොවෙයි උතුරේ LTTE එකේ ප්‍රභාකරන් දැම්මේ, සයනයිඩ් කරලයි දැම්මේ. බෙල්ලේ සයනයිඩ් කරල එල්ලලා, බිම දිගේ ඇදෙන ටී 56 කරේ එල්ලලා යුද්ධයට තල්ලු කරලා දැම්මා.

අධිකරණ ඇමතිතුමනි, එදා -එක්දහස්නවසිය අසූ ගණන්වල- ජේ.ආර්. මහත්තයා හට කණ්ඩායම් යවලා යාපනයේ පුස්තකාලයට ගිනි තියලා අළු දුවිලි කරලා දැම්මා. "යාපනයෙන් දෙමළ වෛද්‍යවරු බිහි වෙනවා. යාපනයෙන් උගතුන්, බුද්ධිමතුන් බිහි වෙනවා. එහෙම බිහි වෙන එක නවත්වන්න පුස්තකාලයට ගිනි තියපන්." කිව්වා. ඒක තමයි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව මේ රටට දුන්නු දෑවැද්ද.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මඩකලපුවේ අපේ වියාලේන්දිරන් මන්ත්‍රීතුමා අද කියනවා, "2015න් පස්සේ මේ ආණ්ඩුවෙන් ඒ ප්‍රදේශයට සංවර්ධනය බින්දුවක් ලැබුණේ නැහැ." කියලා. නමුත්, උතුරේ ගිනි තැබූ පුස්තකාලය අපි හදලා දුන්නා. බෝම්බ ගහපු රජයේ ආයතන, ඉස්පිරිතාල හදලා දුන්නා. කුඩු කරපු ඉස්කෝල ටික, පුස්තකාල ටික හදලා දුන්නා. බස් එක යන්න පුළුවන් විධියට පාර නිර්මාණය කළා. කෝච්චිය යන්න පුළුවන් විධියට රේල් පාර නිර්මාණය කළා. හැබැයි, මේ රජය නැඟෙනහිරට නැවතත් දෑවැද්ද දුන්නා.

අර්ජුන ඇලෝසියස් මහත්තයා ගිහිල්ලා නැඟෙනහිරට අරක්කු ස්කාගාරයක් 2016 හදලා දුන්නා. ඔන්න, ආණ්ඩු දෙකේ වෙනස. මේක තමයි ආණ්ඩු දෙකේ වෙනස. දැන් මේ අර අඳින්නේ මොකටද? අපි කැත නැතුව කියනවා, යුද්ධය ජයග්‍රහණය කරන්න ෆොන්සේකා මහත්මයා යුද හමුදාවට ඒ නායකත්වය දුන්නා කියලා. හැබැයි, ෆොන්සේකා මහත්තයාට නායකත්වය දුන්නා, ගෝඨාභය රාජපක්ෂ මහත්තයා. හැබැයි, ගෝඨාභය රාජපක්ෂ මහත්තයාට නායකත්වය දුන්නා, මහින්ද රාජපක්ෂ මහත්තයා. අන්න එහෙම තමයි යුද්ධය අවසන් වුණේ. සොල්දාදුවෝ ජීවිත 20,000කට වැඩිය පූජා කෙරුවා. 40,000ක් විතර අබ්බාගාත වුණා. අද රණවිරු සෙවණවල අත පය හතරම නැති සොල්දාදුවෝ ඉන්නවා. ඇස් දෙක පෙනෙන්නේ නැති, කන්න කටට හැන්ද ළං කළාම කට ඇරෙන සොල්දාදුවෝ ඉන්නවා. ඇයි, මේ රටට ස්වාභාවික විපත් එන්නේ? අපේ ජාතියට අමතක වෙමින් යනවා. අද රණවිරුවා සමව්වලයකට පත් වෙලා තිබෙනවා. අද රණවිරුවාගේ ඇස් ගැලවෙන්න බෝම්බ ගහනවා; කඳුළු ගෑස් ගහනවා. රණවිරුවා ඉල්ලන දීමනාව වෙලාවට දෙන්නේ නැහැ. රණවිරුවාගේ ඒ වරදාන ටික දෙන්නේ නැහැ. මේ ආණ්ඩුව රණවිරුවාගේ කරපිටින් තමයි ආවේ. විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, හිතලා බලන්න. ජනාධිපතිවරණ වේදිකාව උඩ කෑ ගහලා කිව්වා, "ඒ උත්තරීතර රණවිරුවා කානු පල්ලට දමා තිබෙනවා." කියලා. අද ගිහිල්ලා බලන්න, බේරේ වැවේ තිබෙන කානු හැම එකකම කුණු ටික අයින් කරන්නේ සිවිල් ආරක්ෂක බලකායේ අපේ සහෝදර රණවිරුවෝ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාගේ ගම් ප්‍රදේශයේ මායිම් ගම්මාන ගණනාවක් තිබුණා. අනුරාධපුරයෙන් එහාට යන්න බැහැ. පුත්තලමෙන් එහාට යන්න බැහැ. අපට ජීවත් වෙන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. දැන් සමහරු මැරිලා ඉපදිලා වාගේ. අපි මේ යුද්ධයේ වේදනාව දැක්කා. ඒක නිසා සමහරු හඳනවා, "උතුරේ කෙරුවේ අරගළයක්. එහෙම නම් දකුණේ කළේත් අරගළයක්." කියලා කියන්න. ඒ ගොල්ලන්ට මේක මතකද දන්නේ නැහැ. දකුණේ තරුණයා ඉල්ලුවේ නැහැ, මාතරින් කොටසක්; දකුණෙන් කොටසක්; කොළඹින් කොටසක්; අනුරාධපුරයෙන් කොටසක්. රටේ අධ්‍යාපන ප්‍රතිපත්තියක් හදන්න, සෞඛ්‍ය ප්‍රතිපත්තියක් හදන්න ඒ වාගේම රටට හොඳ නායකත්වයක් ගෙනෙන්න කියලා තමයි දකුණේ තරුණයා ඒ වෙලාවේ ඉල්ලුවේ. හැබැයි, උතුරේ තරුණයාට එල්ටීටීඊ ප්‍රභාකරන් පෙව්වේ විස සයනයිඩ්. ඒ වාගේම මරාගෙන මැරෙන බෝම්බ. ඒ ගොල්ලන් ඉල්ලුවේ රටේ උතුරු-නැඟෙනහිරින් උඩ කොටසයි. ඒ හින්දා මේ ඉතිහාසය වළලන්න දෙන්න එපා.

හිටපු අධිකරණ අමාත්‍යතුමා - වර්තමාන උසස් අධ්‍යාපන අමාත්‍යතුමා - කිව්වා, "මහින්ද රාජපක්ෂ මහත්මයා හවුල් ගිවිසුමකට එහෙම නැත්නම් එකඟතාවකට ආවා" කියා 22වන දා ආ වෙලාවේ බැන් කි මූන් මහත්මයා කිව්වා කියා. යම්කිසි ගිවිසුමකින් ගිවිසුම්ගත වෙලා තිබෙනවා නම්, එය ඉදිරිපත් කරන්න.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

නැඹී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු අමාත්‍යතුමනි, මට තවත් පොඩි වෙලාවයි තිබෙන්නේ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මගේ වෙලාවෙන් ගන්න. ගරු මන්ත්‍රීතුමනි, ඔය වාර්තාව -ඔය අත්සන් කරපු ගිවිසුම- මම මේ පාර්ලිමේන්තුවේ වාර්තාගත කළා. එය මේ පාර්ලිමේන්තුවේ වාර්තාගත කළාම එදා ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ හිටපු සභානායක ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාත්, මේ පාර්ලිමේන්තුවේ එවකට ඔබතුමන්ලාගේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත් කියන දෙදෙනාම කිව්වේ, ඒ අයවත් මේ ගැන දැනගෙන සිටියේ නැහැ; දැනුම් දීමක් කර තිබුණේ නැහැ; එය දැනගෙන සිටියේ හිටපු ජනාධිපතිතුමා සහ හිටපු විදේශ කටයුතු අමාත්‍යතුමාය කියලායි. මේ පාර්ලිමේන්තුවේ හැන්සාඩ් වාර්තාවේ සඳහන්ව තිබෙනවා, - [බාධා කිරීමක්]

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
බොහොම ස්තුතියි. මෙය අලුත් පාර්ලිමේන්තුවක්; අපි අලුත් සාමාජිකයෝ. අපි කාරුණිකව ඉල්ලා සිටිනවා, ඒ වාර්තාව නැවත වතාවක් ඉදිරිපත් කරන්න කියා. මොකද, එතකොට මේ සීඅයිඩීකාරයන්ට සොයන්න දේවල් නැහැ. දැන් සීඅයිඩීකාරයෝ ඉන්නවා, ලැම්බෝගිනි ගැන සොයන, රත්තරන් අශ්වයන් ගැන සොයන, මාලිගා ගැන සොයන, ලොකු ලොකු ගේම් ගැන සොයන. ඒවා සොයන්න දෙයක් යැ? මහින්ද රාජපක්ෂ මහත්මයාට ගහන්න පුළුවන් නම් තිබෙන හොඳම ගැහිල්ල තමයි ඔය වාර්තාව මොකක්ද කියා පෙන්වීම. එය ඉදිරිපත් කරලා පෙන්වන්න. එය සමාජගත වෙලා නැහැ. ඒ බොරුව සමාජගත වන්නේ නැහැ. මේ රටට ජීවන හුස්ම පිම්බේ ඒ නායකයා කියන එක කවුරුත් දන්නවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මම වගකීමක් ඇතිවයි කියන්නේ.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
හරි, ඔබතුමා ඒ වාර්තාව අපට කඩිනමින් ලැබෙන්න සලස්වන්න. පෞද්ගලිකව හෝ එය ලැබෙන්න සලස්වන්න. අපි එතකොට එය පරීක්ෂා කරලා ඔබතුමාට ඒ කෘතඥතාව පිරිනමන්නම්. අපට ඇහුණා, ඔබතුමා පසුගිය දවස්වල කියපු දේවල්. අපට විශ්වාස කරන්න බැරි ඒකයි. වතාවක් ඔබතුමා රූපවාහිනී නාළිකාවකට ඇවිත් කිව්වා, ආයෙත් ජීවිතේටවත් හවුල් ආණ්ඩුවල ඇමතිකම් ගන්නේ නැහැ කියා. ඔබතුමා පැහැදිලිවම එය කිව්වා. හැබැයි, ඔබතුමා අද වාඩි වෙලා ඉන්නේ හවුල් ආණ්ඩුවේ. ඒ නිසා තමයි ඔබතුමා කියන දේ අපට පිළිගන්න බැහැ කිව්වේ. එදා ඔබතුමා හම්බන්තොට වරාය ගැන කතා කරද්දී අපි ඔබතුමාට මහා ඉහළින් ගරු කළා. එදා ඔබතුමා රණ විරුවන් පාවා දෙන එක ගැන කථා කරද්දී අපි ඔබතුමාට ඉහළින් ගරු කළා. එදා ඔබතුමාට එක්සත් ජාතික පක්ෂය එළුව එළුවා ගැහුවා. ඒ සියලුදෙනා එළුවා එළුවා ගහපු වෙලාවේ අපි තනිකර ඔබතුමා වෙනුවෙන් කථා කරලා කිව්වා, "අපි මොන පදනමේ සිටියත්, ඒ පුද්ගලයා හරි දේ කියනවා" කියා. හැබැයි, ඔබතුමා වරද්දා ගත්තා. ඔබතුමා ප්‍රකාශ කළා, "ආයේ හවුල් ආණ්ඩුවල නැහැ. තනි එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබෙනවා නම් මම එහි ඉඳගන්නවා. එහෙම නැත්නම් නැහැ" කියා. නමුත් දැන් අමාත්‍යාංශයක් භාර ගෙන ඉන්නවා.

SAITM ප්‍රශ්නය ගැනත් අද උදේ කතා කළා. [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් විනාඩියක කාලයකුයි තිබෙන්නේ.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
බොහොම ස්තුතියි. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට ඒ දරුවන් 900 දෙනා අරගෙන හොඳ විධියට කටයුතු කරනවා නම් හොඳයි. මෙහි බොහෝ දේවල් කතා කරන්න ආවත් දැන් අවස්ථාවක් නැහැ. අද අධ්‍යාපන ක්ෂේත්‍රය යන ක්‍රමවේදය දිහා බලන්න. උසස් අධ්‍යාපනය කෙසේ වෙතත්, අධ්‍යාපන අමාත්‍යතුමා සමඟ සම්බන්ධ වෙලා මේ අධ්‍යාපන ක්ෂේත්‍රය වෙනුවෙන් වැඩ පිළිවෙළක් ගෙන එන්න ආණ්ඩුවට පුළුවන් නම්, එය බොහොම වටිනවා. අද පෞද්ගලික පන්ති මාෆියාවක් රට තුළ නිර්මාණය වෙලා තිබෙනවා. ඒ තුළින් ජාවාරම්වලට, හෙරොයින් ආදී මත් ද්‍රව්‍යවලට දරුවෝ ඇබ්බැහි වෙලා ඉන්නවා. අද සමාජ විෂමාචාර ගණනාවක් රට තුළ සිද්ධ වනවා. දරුවන් සිටින පියවරුන් විධියට අපට දැනෙනවා, මේ සමාජය යන්නේ බොහොම නරක තැනකටයි කියලා. අද ගුරුවරුන් පෞද්ගලික පන්තියට මූලිකත්වය දෙන තත්ත්වයට පත් වෙලා ඉන්නවා. අද ගුරුවරුන්ට දෙන වැටුප කීයද? මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට දෙනවාට වඩා දහදොළොස් ගුණයකින් වැඩි කරලා ගුරුවරුන්ට වැටුප් දෙන්න. හැබැයි පෞද්ගලික අධ්‍යාපනය පැත්තට ඒ ගුරුවරුන් යොමු වන්න ඉඩ තබන්න එපා. ඊට අදාළ නීති හදන්න. නීති හදන්න තමයි පාර්ලිමේන්තුව තිබෙන්නේ. වැටුප වැඩි කරන්න, දෙතුන්ගුණයකින්. දැන් රුපියල් 60,000ක් දෙනවා නම්, රුපියල් 180,000ක්, රුපියල් 200,000ක් පමණ පඩියක් ගුරුවරයකුට දෙන්න. හැබැයි, "පෞද්ගලික පන්ති කරන්න එපා" කියා කියන්න. ඒ වාගේ ජාතික ප්‍රතිපත්තියක් හදන්න. මේ තිබෙන්නේ ජාතික ආණ්ඩුවක්. සියලුදෙනා එකතු වෙලායි ආණ්ඩුව කරන්නේ. TNA එක විපක්ෂය නමට හදාගෙන සිටියාට TNA එකත් ඉන්නේ ආණ්ඩුව ඇතුළේ. ඒක තමයි කියන්නේ "අහවල් දේ දෙන්න" කියා. විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙන එන එක, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කරන එක නොවෙයි කරන්න තිබෙන්නේ. රටට ඊට වඩා වැදගත් වන ජාතික ප්‍රතිපත්ති ටික හදන්න. එහෙම නොකර, නායකයන් හැම තිස්සේම හදන්නේ පක්ෂ වර්ධනය කරන්නයි. JVP එක පක්ෂය වර්ධනය කරනවා. අනෙක් පක්ෂ හදනවා, බලයේ රැඳී ඉන්න. නායකයෝ හදනවා, කොහොම හෝ බලයේ රැඳී ඉන්න. ඒවා නතර කරලා අනාගත දරුවාට රට ගෙන යන්න පුළුවන් ආර්ථික දැක්මක් ඇතිව ගමන් කරන්න පුළුවන් අධ්‍යාපන ප්‍රතිපත්තියක්, අධ්‍යාපන වැඩසටහනක්, අධ්‍යාපන ක්‍රමවේදයක් හදන්න. SAITM දරුවන් පාරේ තබන්න බැහැ. "SAITM" නම අයින් කරන්න. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට ඒ දරුවන් බඳවා ගෙන ඒ වැඩ පිළිවෙළට යොමු කරන්න. ඔවුන්ට සායනික පුහුණුව ලබා දෙන්න. ඒ ගැටලුව අවසන් කරන්න. අපි විශ්වාස කරනවා, ඔබතුමාට ඒ ශක්තිය, හයිය, ධෛර්යය තිබේවි කියා; ඔය සෞඛ්‍ය අමාත්‍යතුමා මොන විධියට දෙසා බැවත් ඔබතුමා කොන්ද කෙළින් තියාගෙන ඒ කටයුත්ත කරාවි කියා. ඒ වාගේම ඔබතුමා ඉදිරිපත් කරන්න හදන අර ලේඛනය කඩිනමින් අප අතට ලැබිලා ඒ ගැන සංවාදයක් ඇති කරගන්නත් අවස්ථාව ලැබේවි කියා බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් කරුණු ගණනාවක් කියන්න තිබුණත් කාලය සීමිත වෙලා තිබෙන නිසා අවසාන වශයෙන් මේ කාරණය පමණක් කියන්නම්. මෙහිදී ජල ප්‍රශ්නයක් ගැනත් කථා කළා. මෙය උතුරට, නැඟෙනහිරට පමණක් සීමා වූ ප්‍රශ්නයක් නොවෙයි. මෙය මුළු රටටම පොදු ප්‍රශ්නයක්. අද කිසිම පළාතක සම්බන්ධීකරණ කමිටු හරියාකාරව ක්‍රියාත්මක වන්නේ නැහැ. සම්බන්ධීකරණ කමිටුවලට ඒ බලය තිබෙනවා. තමන්ගේ ප්‍රදේශයේ වැඩ පිළිවෙළ, වැඩසටහන, පරිසරය ආදි සියල්ල තීන්දු කරන්නේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවයි. ඒ තුළ වැඩ පිළිවෙළක් නැති නිසා තමයි නැඟෙනහිර පළාතේ මඩකලපුවට ඔය දේ සිද්ධ වෙලා තිබෙන්නේ. ආණ්ඩුවක් විධියට ඒවා සම්බන්ධයෙන් නියම ප්‍රතිපත්ති, වැඩසටහන් ගෙනාවොත් ඒවා හරියාකාරව කරගෙන යන්න පුළුවන් වේවි. ජලය කියන්නේ විශාල අවශ්‍යතාවක් තිබෙන, ඉදිරියේදී විශාල වටිනාකමක් ලැබෙන දෙයක්ය කියමින්, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා

[අ.භා.5.27]

ගරු රන්ජන් රාමනායක මහතා (සමාජ සවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க - சமூக வலுவூட்டல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Ranjan Ramanayake -Deputy Minister of Social Empowerment)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නියෝජ්‍ය කථානායක ධුරය ලැබුණාට පසු ඔබතුමාට සුබ

[ගරු රන්ජන් රාමනායක මහතා]

පතන්නත් මට බැරි වුණා. ඔබතුමා පක්ෂග්‍රාහී නොවී සියලුදෙනාටම හොඳ සේවයක් ඉටු කරයි කියා මම බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත ගැන කථා කිරීමේදී විවිධ අදහස් ප්‍රකාශ වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යුද්ධය අවසන් වුණාට පසු රණ විරුවන්ට වැඩිම සේවයක් ඉටු වුණේ, ඔවුන්ගේ විශ්‍රාම වැටුප්, දීමනා ගැන සාකච්ඡා කරද්දී වැඩිම සේවයක් වුණේ යහ පාලන ආණ්ඩුවෙන් කියන එක මම බොහොම පැහැදිලිව කියනවා. ඒ සඳහා ඕනෑ තරම් උදාහරණ තිබෙනවා. පසුගිය කාලයේ ආබාධිත රණ විරුවන් ජනාධිපති ලේකම් කාර්යාලය ළඟට ඇවිල්ලා උද්ඝෝෂණ කරනවා අපි දැක්කා. ඒ අයට අවශ්‍ය සියලුම දේවල් ලැබුණා; දීමනාත් ලැබුණා. ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ කාලයේ ඒවා අත හැර දැමුවත්, අපේ ආණ්ඩුවෙන් ඒ සියලුම දේවල් ලැබුණාය කියන එක මම මේ අවස්ථාවේ බොහොම පැහැදිලිව කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විෂය සාකච්ඡා කරන අතරේ අද උදේ වරුවේ මේ සභාවේ කථා කරපු විෂය ගැනත් කථා කරන්න මම බලාපොරොත්තු වෙනවා. ඒ තමයි උසස් අධ්‍යාපනය. ගරු උසස් අධ්‍යාපන අමාත්‍ය (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහත්මයා උදේ කරපු මුළු කථාවම ගෙදර සිට PEO TV හරහා නරඹන්න අවස්ථාව මට ලැබුණා. එතුමා මේ ගෞරවනීය සභාවේ සිටියදීම යම් යම් පාර්ශ්වයන් විසින් මට පැමිණිලි කරපු දේවල් ගැන එතුමාගෙන් අහන්නට මම මේ අවස්ථාව යොදා ගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විෂය ගැන කථා කරද්දී ඇත්තෙන්ම මට මනාප අඩුවෙනවා; මිනිසුන් මා කෙරෙහි තිබෙන ප්‍රසන්නතාව, ආදරය, ප්‍රියතාව අඩුවෙනවා. දේශපාලනයේදී කරන්න තිබෙන හොඳම දේ තමයි දෙන දෙයක් කාලා වෙන දෙයක් බලාගෙන ඉන්න එක. මම මේ කරන්න යන්නේ සියතින් ගෙල සිඳ ගැනීමක්; විශ්වවිද්‍යාල සිසුන්ගෙන් බහුතරයකගේ මනාප නැතිකර ගැනීමක්. නමුත්, අගතියට පත් පාර්ශ්වය වෙනුවෙන් තමයි මම හැම විටම පෙනී ඉන්නේ. ඒ කියන්නේ, ආධාරයක්, උපකාරයක්, හඬක් නැති helpless ජනතාව වෙනුවෙන් පෙනී ඉන්න එක තමයි මගේ දේශපාලන ප්‍රතිපත්තිය. මගේ පසුගිය දේශපාලන ගමන විමර්ශනය කළොත් තමුන්නාන්සේලාට ඒක දැනගන්නට පුළුවන්.

මම අද කථා කරන්නේ නවක වදයට පාත්‍ර වන ගමෙන් ආ අභිංසක කම්කරුවන්ගේ, ගොවීන්ගේ, ඒ වගේ වෘත්තීන් කරන අභිංසකම මව්පියන්ගේ දරුවන් ගැනයි. මම පසුගිය කාලයේ Facebook එක හරහා සොයා ගත් එම වීඩියෝ දර්ශන මගේ ළඟ තිබෙනවා. මම ඒවා සභාගත කරන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අවස්ථාවේ ගැලරියේ පාසල් ළමුන් ඉන්නවා. ඒ නිසා මට ඒවා ගැන විස්තරාත්මකව කියන්නට බැහැ. නමුත්, අවබෝධ කර ගනීවි. ඒක කියන්නේ කොහොමද කියලා මට තේරෙන්නේත් නැහැ. නවක වදයට පාත්‍ර වුණු ගම්වලින් ආපු අභිංසක යුවතියන්, තරුණයන් නිරුවත් කරලා ඔවුන්ට විවිධ දේවල් කරන්නට කියලා පොල්ලකින් ගසමින් බල කරනවා. ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමාගෙන් අහනවා, එතුමාගේ දරුවෙකුට මේ හිරිහැරය කළා නම් ඔබතුමා මොකද කරන්නේ කියලා. මෙතැන දරුවන් ඉන්න නිසා මට කියන්න බැහැ, සමහර අයට සමහර දේවල් තේ කෝප්පවලට දාලා බලෙන් බොන්න දෙනවා. ඒ යුවතියන්, ඒ අභිංසක විශ්වවිද්‍යාල ශිෂ්‍යාවන් අඬමින් ජරාව දමපු ඒ තේ බොනවා. බිව්වේ නැත්නම් ගහනවා. ඊට පස්සේ යම් යම් අතවරවලට ලක් කරනවා. Mobile phone එක on කරගෙන, සජීවීව, ඒවා YouTube එකේ upload කරගෙන, Facebook එකේ upload කරගෙන ඒ අය මේ දේ කරනවා. මෙවැනි ත්‍රස්තවාදී විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් ගැන කවුද කථා කරන්නේ? ඔවුන් අවුරුදු 7ක්, 8ක් එක දිගට විශ්වවිද්‍යාලවල ඉන්නවා. හැමදාම පාරේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා කියන විධියට -මම උදේ මෙතුමාගේ කථාව ඇහුවා, - එක උද්ඝෝෂණයකට රුපියල් ලක්ෂ 3ක් වැය වෙනවාලු. උද්ඝෝෂණ 7ක් කරලා තිබෙනවාලු. ඒ උද්ඝෝෂණ 7ට රුපියල් ලක්ෂ 21ක් වැයවෙලා තිබෙනවා. ඒවාට ප්‍රතිපාදන වෙන් කරන්නේ කවුද? ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමනි, මම අහන්න කැමැතියි, ඔබතුමාගේ දරුවෙකුට මේක වුණා නම් ඔබතුමා මොකද කරන්නේ කියලා. අද මේ නවක වදය නිසා සමහර අය මානසික ආබාධවලට ලක්වෙලා තිබෙනවා.

සමහර අය සදාකල් ආබාධිත - disabled - තත්ත්වයට පත්වෙලා තිබෙනවා. මේක ඉතාම දරුණු තත්ත්වයක්. එතුමා කියන විධියට මේ දේ නිසාම, උසස් පෙළ ඉතාම ඉහළින් සමත් වුණු බොහෝ අය ලංකාවේ විශ්වවිද්‍යාලවලට එන්නේ නැහැ. මොකද, ඔවුන්ව ගොදුරු කර ගන්න, ඔවුන්ව පළිහක් කර ගන්න විවිධ කූට දේශපාලනඥයන් සහ දේශපාලන පක්ෂ සැදී පැහැදී බලාගෙන ඉන්නවා. ඒ උද්ඝෝෂණවලට ආවේ නැත්නම්, ඒ පිකටින්වලට ආවේ නැත්නම් නොයෙකුත් ලිංගික හිරිහැර කරනවා; ගහනවා; බණිනවා; ප්‍රේම සම්බන්ධතා ඇති කර ගන්න බල කරනවා. මේවා ගැන කවුද කථා කරන්නේ? මේවා කිව්වාට පස්සේ හෙට ඉඳලා මට එක දිගට මඩ ප්‍රහාර එල්ල වෙයි. දැනට මට නඩු 21ක් තිබෙනවා. නීතිඥ මහත්වරු බහුතරයක් මා එක්ක තරහයි. විනිසුරුවරුන් බහුතරයක් තරහයි. දොස්තරවරු බහුතරයක් තරහයි. ඒ වාගේ ප්‍රශ්න තිබෙනවා. නමුත් ජනතාව ඡන්දය දීලා අපිව පාර්ලිමේන්තුවට එවා තිබෙන්නේ අගතියට පත් වන පාර්ශ්වයන් ගැන කථා කරන්න මිසක්, තමන්ගේ වාසියට මනාප වැඩි කර ගැනීමට නොවෙයි.

මේ අවස්ථාවේ මම එතුමා කිව්ව තවත් කථාවක් quote කරන්න; මාතෘකාව කර ගන්න කැමැතියි. මහපොළ ශිෂ්‍යත්වයෙන් අද විශ්වවිද්‍යාල දරුවන් ලක්ෂ ගණනක් අධ්‍යාපනය ලබනවා; ඒ ශිෂ්‍යත්ව මුදල ලබා ගන්නවා. නමුත් අපි පසුගිය දවස්වල රූපවාහිනියේ සහ අනෙකුත් මාධ්‍ය නාළිකාවල දැක්කා ඒ දේ ලබා දුන්න ඇතුලත්මුදලි මහත්මයාගේ නාම පුවරුව කුළුගෙඩිවලින් ගහලා කුඩු කරනවා. ඒ නාම පුවරුව කුළුගෙඩිවලින් ගහලා කුඩු කරන දරුවන්ට ඇත්තෙන්ම මම අනුකම්පා කරනවා. කරුණාකරලා මේ මානසිකත්වය වෙනස් කර ගන්න. ඔවුන් කුළුගෙඩිවලින් ගහලා නාම පුවරුව කුඩු කරලා, කුණුහරුප කියමින් එතැන කැගහනවා. නමුත් මේ මුදල ලබා ගන්නවා. ඒ නම් ටික ප්‍රසිද්ධ කරන්නේ නැහැයි කියලා ගරු ඇමතිතුමා කියනවා මම අහගෙන හිටියා. මොකද, ඒ දරුවන්ගේ දෙමව්පියන්ට ගමේ ඇවිදින්න බැරි වෙනවා, පාරේ බැහැලා යන්න බැරි වෙනවා කියලා. ගරු ඇමතිතුමනි, කරුණාකරලා ඒ නම් ටික ප්‍රසිද්ධ කරන්න. මොකද, මේ දරුවන්ට තමුන්නාන්සේ කියන විධියටම ඉගෙන ගන්න ඒ නිදහස් අධ්‍යාපනය - free education - ලබා ගන්න අපේ රටේ සියලුම දෙනා උදව් වෙනවා. තමුන්නාන්සේලා කියන විධියට කඩෙට ගිහිල්ලා ගන්න පරිප්පු ටිකට, සීනි ටිකට ගහන බදුවලින් තමයි මේ අය ඉගෙන ගන්නේ. ඒ නිසා මේ අයට කිසිම අයිතියක් නැහැ, ඒ විධියට නාම පුවරු කුඩු කරන්න. අපි බැලුවොත් අද ලංකාවේ හැමදාම මහ පාරේ උද්ඝෝෂණ. මේ අය කවදාද සරසවියට ගිහිල්ලා ඉගෙන ගන්නේ? මෙතුමා කියන විධියට කලා විෂයයන් - Arts - කරන අය අනුන්ගෙන් බලාගෙන අන්තිමට examination එකට ලියනවා. වැඩිපුර ඉන්නේ පාරේ. පාරේ ඉඳගෙන කැගහනවා. පදිකයන්ට, රැකියාව කරලා යන ජනතාවට ගෙදර යන්න බැහැ, traffic එක. කාටවත් වැඩ කර ගන්න බැහැ. මේ ශිෂ්‍ය

ශිෂ්‍යාවන්ගෙන් මම ඉල්ලා සිටිනවා මේ වාගේ දේවල් කරන්නේ නැතිව, දේශපාලන අතකොළු නොවී කරුණාකරලා තමන්ගේ අධ්‍යාපනයට සිත යොමු කරන්නය කියලා. ඒකයි මගේ ඉල්ලීම. මම මේ අවස්ථාවේ ගරු ඇමතිතුමාගෙන් උත්තරයක් බලාපොරොත්තු වෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ දරුවකුට මේ වාගේ දෙයක් වුණා නම් ඒකට පිළිතුරු දෙන්න විතරද ඔබතුමා බලාගෙන ඉන්නේ? මේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගැන ඔබතුමාට කිසිම සෙනෙහසක් නැද්ද? ඔබතුමා මේ ගැන පෙනී ඉන්නේ නැත්තේ ඇයි කියන එකට දැන් මම ඔබතුමාගෙන් උත්තරයක් බලාපොරොත්තු වෙනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමනි, ඔබතුමාත් කථා කිරීමට බලාගෙන සිටින නිසා මම විනාඩි දෙකෙන් පිළිතුර කියන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ ගැන කථා කරන්න උදේ වරුවේ ඔබතුමාගෙන් ප්‍රමාණවත් කාලයක් ගත්තා. නමුත් අපේ ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමාගේ ප්‍රශ්නයට එතුමා දැන් උත්තරයක් බලාපොරොත්තු වන නිසා විශේෂයෙන්ම එයට උත්තරයක් දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි හිතනවා අද මේ රටේ තිබෙන ලොකුම ප්‍රශ්නය මත්කුඩුකාරයෝ සහ මිනී මරන පාතාලය කියලා. ඊට වඩා බරපතළ ප්‍රශ්නය තිබෙන්නේ විශ්වවිද්‍යාල පාතාලයේයි. මොකද, අපේ රටේ අනාගතය භාර ගන්න ඉන්න උගතුන්, බුද්ධිමතුන් හැදෙන්න යන තැන වන විශ්වවිද්‍යාලයට ගියාම ඒ දරුවන්ට සිදු වන අකරතැබ්බය ගැන තමයි අපිත් අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් කථා කළේ. මේ පිළිබඳව මම උදේත් පැහැදිලි කළා. අපි telephone එකට සවි කරන app එකක් හදලා ඒ පිළිබඳව තොරතුරු අරගෙන ක්‍රියාත්මක කරන්න යනවා.

මේ පිළිබඳව පොලීසිය දැනුවත් කරනවා. මේ සම්බන්ධයෙන් 1998 පනතක් තිබෙනවා. මා ඒ ගැන ගෞරව පූර්වකව උදේත් සඳහන් කළා. ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මන්ත්‍රීතුමාගේ පියතුමා වන රිචර්ඩ් පතිරණ හිටපු අධ්‍යාපන ඇමතිතුමා තමයි ඒ පනත ඉදිරිපත් කළේ. එදා කාටවත් කරන්න බැරි වුණු දෙයක් එතුමා කළාය කියලා මා උදේත් සඳහන් කළා. මේ පිළිබඳව තීරණයක් ගෙන පාර්ලිමේන්තුවට නීතියක් ගෙනෙන්න එතුමාට විතරයි ආත්ම ශක්තිය තිබුණේ. ඒ පිළිබඳව දැනට හොඳ නීතියක් තිබෙනවා; දැඩි නීතියක් තිබෙනවා. මේ රටේම ජනතාවට දැන ගන්න මා එකම ඉල්ලීමක් කරනවා. විශ්වවිද්‍යාලවලට දරුවන් යවපු දෙමවුපියන්ගෙන් මා කාරුණිකව ඉල්ලා සිටිනවා, විශ්වවිද්‍යාලයට ගිය තමන්ගේ දරුවන් මොනවාද කරන්නේ කියලා කරුණාකරලා සොයා බලන්නය කියලා. ඒ අය ඉගෙන ගන්නවාද, එහෙම නැත්නම් එක් එක් අයගේ අතකොළු බවට පත්වෙලා තිබෙනවාද, එහෙමත් නැත්නම් විශ්වවිද්‍යාලවල කුලියට පාතාල මෙහෙයවන තරුණයන්ගේ බිල්ලක් බවට පත්වෙලා තිබෙනවාද කියලා සොයා බලන්න. මොකද, අපි ඉදිරියේදී අනිවාර්යයෙන්ම මේ පිළිබඳව නීතිය දැඩිව ක්‍රියාත්මක කරනවා. මා කරන එකම ඉල්ලීම මෙයයි. "මේ අපේ එකම දරුවා. අපට අනුකම්පා කරලා මේ ප්‍රශ්නය විසඳා දෙන්න"යි කියලා, ඒවාට සම්බන්ධවන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අම්මලා, තාත්තලා, සහෝදර සහෝදරියෝ කවදාවත් අතිගරු ජනාධිපතිතුමා ළඟටවත්, ගරු අගමැතිතුමා ළඟටවත්, මේ ඇමතිවරු ළඟටවත් එන්න එපා. ඒ සම්බන්ධයෙන් අපෙන් කවදාවත් සමාවක්, අනුකම්පාවක් ලැබෙන්නේ නැහැයි කියන පණිවුඩය විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ සියලු දෙමවුපියන්ට දෙනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

ගරු ඇමතිතුමනි, ඔබතුමා දැන් ප්‍රකාශ කරන්නේ, ඉදිරියේදී කැමරා සවි කරලා, මේ ක්‍රියාවල යෙදෙන අයට, ශිෂ්‍යයන්ට අඩන්තේට්ටම් කරන අයට දඩුවම් කරනවාය කියලායි. අතීතයේදී සිදු කළ එවැනි ක්‍රියා සම්බන්ධයෙන් වීඩියෝ දර්ශන කිහිපයක් මා ළඟ තිබෙනවා. මා අද ඒවා සභාගත කරන්නම්. ඒ ළමයින් නිරුවත්කරලා ඔවුන්ට පොලුවලින් ගහනවා. ඒ ළමයින් කිසිම දෙයක් කරලා නැහැ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඔබතුමා ඒ සාක්ෂි දැන් ඉදිරිපත් කළොත්, ඒවා සම්බන්ධයෙන් දැන් නීතිය ක්‍රියාත්මක කරනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

මා ඒවා අද සභාගත කරන්නම්. ඒ ළමයින් නිරුවත් කරලා පොලුවලින් ගහනවා, ඔවුන්ට පිටි කවනවා, නොයෙකුත් අපවිත්‍ර ජලයෙන් ඔවුන් නාවනවා, ඔවුන්ගේ ඇඟට මූත්‍රා කරනවා. ලෝකයේ කිසිම විශ්වවිද්‍යාලයක මෙවැනි දේවල් කරනවාය කියලා මා හිතන්නේ නැහැ. ඉදිරියේදී සියලුම විශ්වවිද්‍යාලවල ත්‍රස්තවාදී ශිෂ්‍යයන් විසින් මට අපහාස කරනු බැවින්, ඒ මඩ ප්‍රහාර මා බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)

හොඳයි. ඒ වුණත් මා මේ කාරණය කිව යුතුයි. මොකද, ගම්වලින් එන අහිංසක දරු දැරියන්ට කිසිම පිහිටක් නැහැ; හඬක් නැහැ. ඒ අය නොයෙකුත් පිකටින්වලට බලෙන් දක්කාගෙන යනවා. ඒ සම්බන්ධයෙන් ඇමතිතුමා නිසි පිළිතුරක් දෙයි කියලා මා හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ මේ සභාවේ කළ කථාවක් ගැන පොඩ්ඩක් කියන්න ඕනෑ. එතුමන්ලාගේ නම් කියන්න මා බලාපොරොත්තු වන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුවට මෙවර අලුතින් පත් වී ආපු මන්ත්‍රීවරු කිහිපදෙනෙක් ඊයේ මගේ නම සඳහන් කරමින් විවිධ චෝදනා කළා. ඒවා බොහොම ප්‍රාථමික චෝදනා. එතුමන්ලාගේ නම් කියන්නවත් මා කැමැති වෙන්නේ නැහැ. එතුමන්ලා ප්‍රචාරය ලබා ගන්න කළ උගුලට, ඒ කොහොල්ලෑ ගුලියට මා අහුවෙන්නේ නැහැ. මා කැන්ටීමේ සිටියදී සභානායක කාර්යාලයෙන් කථා කරලා මට කිව්වා, "ගරු රන්ජන් ඇමතිතුමා, අන්න ඔබතුමාට දෙදෙනකු බණිනවා"යි කියලා. මා ඇහුවා, "කවුද බණින්නේ?" කියලා. එතකොට කිව්වා, "අනේ! නම මතක නැහැ. බණිනවා"යි කියලා. මා කිව්වා, "නම මතක නැත්නම් මා කොහොමද ගිහින් නම කියන්නේ? මෙය ප්‍රචාරක උගුලක්. මා මේකට අහුවෙන්නේ නැහැ"යි කියලා. අකුරක් නෑර ඒ සම්පූර්ණ කථාවම මා ඇහුවා. ඒ ගෞරවනීය මිතුරන් සියලුදෙනාගෙන්ම මා ඉල්ලා සිටිනවා, එතුමන්ලාට මා අභියෝග කරනවා, මේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට මුවාවෙලා අභියෝග කරන්නේ නැතුව, එළියේදී ඒ

[ගරු රන්ජන් රාමනායක මහතා]

ගැන කියන්න කියලා. මා ව්‍යාපාරිකයන්ගෙන් ගත් මුදල් ගැන කිව්වා. ඒ ව්‍යාපාරිකයන්ගේ නම් මොනවාද? පසුගිය දවස්වල කළුගල් ව්‍යාපාරිකයකුගෙන් මා රුපියල් ලක්ෂ 120ක් ගත්තාය කියලා කිව්වා. මා අභියෝග කළා. ඒ නම කිව්වේ නැහැ.

අනික් කාරණය තමයි, මාගේ ප්‍රේම සම්බන්ධතා ගැන චෝදනා කිරීම. මා හිතන හැටියට මගේ ප්‍රේම සම්බන්ධතා උද්ධමනයට හෝ රුපියලේ අවප්‍රමාණය වීමට හෝ ඩොලරයේ අගය ඉහළ යෑමට බලපාන්නේ නැහැ.

මගේ ප්‍රේම සම්බන්ධතා මම ප්‍රසිද්ධියේ පිළිගෙන තිබෙනවා. ඒවා මේ ගරු සභාවට උචිත නැහැ. ඒ වාගේ වල්පල් කථා කරන්න නොවෙයි මම පාර්ලිමේන්තුවට පත් වුණේ. අපි මේ පාර්ලිමේන්තුවට පත්වෙලා එන්නේ අගතියට පත් පාර්ශ්ව වෙනුවෙන් කථා කරන්නයි. ඒ නිසා මම නැවත නැවතත් කියනවා, අපි ඒ තත්ත්වයට යන එක හොඳ නැහැ කියලා. ඒ සියලු මන්ත්‍රීවරුන්ට මම උත්තර දෙන්න ලෑස්තියි. උසාවියේදී හෝ මා එතුමන්ලා හමුවන්න ලෑස්තියි. හැබැයි, එතුමන්ලා ස්ථාවර නියෝගවලට මුවාවෙලා පාර්ලිමේන්තුව ඇතුළේ ඒ කථා කියන්නේ නැතිව, මා මේ සභාවේ නැති අවස්ථාවේ ඒ කථා කියන්නේ නැතිව, පාර්ලිමේන්තුවෙන් පිටතදී එක වචනයක්වත් අඩු නොකර ඒ මුළු කථාවම කියනවා නම් හොඳයි. එතුමන්ලා එක්ක මගේ කිසි තරහක් නැහැ. අපි මිතුරෝ. අපි දුරකථනයෙනුත් කථා කරනවා. ඒ නිසා ඒ සියලු චෝදනා පාර්ලිමේන්තුවෙන් පිටදී කියන්න ඕනෑ. එතකොට මට ඒවාට උත්තර දෙන්න පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් කථාව අවසාන කරන්න.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ පහර දෙන දර්ශන, මුත්‍ර පෙවීම්, පිටිවලින් ගැසීම් සහ අතපය කැඩීම් වාගේ දේවල්වල වීඩියෝ දර්ශන මම ගරු උසස් අධ්‍යාපන අමාත්‍යවරයාට ලබා දෙනවා. ඉදිරියේදී මේ කටයුතු නවත්වනවා සේම, ඒවාට ගොදුරු වෙලා අද ආබාධිත තත්ත්වයේ ඉන්න, සිය දිවි නසා ගත්ත සහ අධ්‍යාපනය හැර දා පිටරට ගිය අයටත් වන්දියක් ලබා දෙන්න කියා ඉල්ලා සිටිනවා. මොකද, නොකළ වරදකට මේ අය ලොකු හිංසනයකට ලක් වී තිබෙන නිසා. ඒ ගැන සොයා බලන්න කියලා ගරු ඇමතිතුමාගෙන් ඉල්ලමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඊළඟට, ගරු චන්ද්‍රසිරි ගජදීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 12ක් තිබෙනවා.

[අ.භා.5.43]

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අද කථා කරන්න සූදානම් වුණු, ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පතට අමතරව අපේ ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය අමාත්‍යතුමා මතු කළ කරුණකට අදාළව යමක් කියන්න කැමතියි. ඇත්ත වශයෙන්ම ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය අමාත්‍යතුමා කියපු විධියේ -එවැනි ස්වභාවයේ- නවක වධයක් තිබෙනවා නම් හොඳ නැහැ. මාත් විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලබනකොට නවක වධයට මුහුණ දුන් කෙනෙක්. මම ලොක් කරපු කබඩ් එකක් ඇතුළේ ඉඳගෙන බණ කිව්වා. ඇත්ත වශයෙන්ම සමහර නවක වධ විනෝදාත්මකයි. බිමට වතුර දාලා අපට කිව්වා මේ කොනේ ඉඳලා එහා කොනට බඩගාලා පිහිනන්න කියලා. ඉතින් එහෙම පිහිනලා ඉවර වෙලා, අයෙත් යහළු මිත්‍රයෝ වුණාට පස්සේ ඒකේ පොඩි 'ආතල්' එකකුත් තිබෙනවා. ඒ නිසා මේ නවක වධය කියන කාරණයේදී සමස්ත ශිෂ්‍ය ප්‍රජාවටම චෝදනා කරන්න හොඳ නැහැ. ඒ වෙනුවට 'නවක ත්‍රස්ත වදයක්' තිබෙනවා නම් අපි ඒ ගැන බලන්න ඕනෑ. එහෙම දේවල් කරන මානසික ලෙඩ්ඩු ඉන්නවා. ඒ අයගේ සමාජ ප්‍රශ්න ගැන බලන්න ඕනෑ. මෙහිදී පළමුවෙන්ම වැදගත් වෙන්නේ රටට ගැළපෙන, ලෝකය දකින්න පුළුවන් උගත් පරපුරක් බිහි කිරීමට අවශ්‍ය නව අධ්‍යාපන ප්‍රතිපත්තියක් සැලසුම් කිරීමයි. ඒක ප්‍රාථමික අධ්‍යාපනයේ සිට එන්නට ඕනෑ. එතකොට වෙනස් වූ මනසක් ඇති තරුණයෙක්- [බාධා කිරීමක්]

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Sir, I rise to a point of Order.

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා විශ්වවිද්‍යාලයේ සිටි ඉතාම බුද්ධිමත් පුද්ගලයකු නිසා මා ඔබතුමාගෙන් අහන්න කැමතියි, යුරෝපයේ වෙන රටවල; ජර්මනියේ,- [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක point of Order. එකක් නොවෙයි ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පැහැදිලි කර ගැනීමක්. ඒ වාගේ රටවල මේවා වෙනවාද කියලා එතුමාගෙන් දැනගන්න කැමැතියි. වෙන රටවල මේ නවක වධය තිබෙනවාද මන්ත්‍රීතුමා?

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
යම් රටවල යම්කිසි අඩුවැඩි ප්‍රමාණයකින් තිබෙනවා. කළු ජාතික ළමයින් ආවාම සුදු ජාතිකයන් නවක වධය දීපු අවස්ථා තිබෙනවා. ඒක වෙනම ස්වභාවයක්. ඒ වාගේ දේවල් බොහෝ වෙලාවට පිරිමි හොස්ටල්වල තමයි වෙන්නේ. ඒ ගැන ඒ අය ඒ තරම් ගැඹුරු විධියට කල්පනා කරන්නේත් නැහැ. ඒක සම්ප්‍රදායයක් විධියට තිබෙනවා. මම කියන්නේ, ඒකත් නැති විය යුතුයි කියායි. ඒ ගැන කිසි තර්කයක් නැහැ. මම කිව්වේ නවක වධය සිදුවෙන ස්වභාවය ගැන. අපට මේවා ඔක්කොම නැති කරන්න පුළුවන්කමකුත් නැහැ. අපි මේ පාර්ලිමේන්තුවේදී නීති පැනෙව්වා; නවක වධයට දඬුවම් දෙන නීති පැනෙව්වා. ඒවා බරපතළ දඬුවම්. ඇත්ත වශයෙන්ම ඒක කළත් අපට මේ තත්ත්වය වෙනස් කරන්න අමාරුයි. ඒ නිසා උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන් තුළ තිබෙන ඒ මානසිකත්වයේ වෙනස හදන්න නම්, ජාතික තලයේ අධ්‍යාපන සැලසුමකින් මිනිසා වෙනස් කිරීමේ වැඩ පිළිවෙළක් ප්‍රායෝගිකව ගෙන යන්න ඕනෑ එහෙම නැත්නම් අපට ඒ තත්ත්වය වෙනස් කරන්න බැහැ.

දැන් සමහර රටවල "මානව ගුණය" කියලා විෂයයක් තිබෙනවා. මානව ගුණය -සංවේදීත්වය- එක විෂයයක්. එහෙම තත්ත්වයක් නිර්මාණය කිරීමට ගැළපෙන අධ්‍යාපන ප්‍රතිපත්තියක් අපි සකස් කළ යුතුයි. මේ සමහර සිද්ධි සමහරුන්ට විනෝදාංශ. නවක වදයට මුහුණ දීපු අය වඩාත් මිතුයි, ඊට පස්සේ. නමුත් පොලුවලින් ගහලා, අත් කඩලා, ශිෂ්‍යයන්ට මුහුණ දෙන්න බැරි විධියේ බරපතළ හිංසාකාරී ක්‍රියා කරනවා නම් අපි ඒවා වළක්වන්න ඕනෑ. එහි කිසිම සැකයක් නැහැ.

ගරු රන්ජන් රාමනායක මහතා
(*மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க*)
(The Hon. Ranjan Ramanayake)
ලිංගික අතවර.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(*மாண்புமிகு சந்திரசிறி கஜதீர*)
(The Hon. Chandrasiri Gajadeera)
ඔව්, ලිංගික අතවර. 'සමහර අයට සමහර දේවල් කෝප්පවලට දාලා බලෙන් බොන්න දෙනවා' කියලා ඔබතුමා කියන කොටම මට හැඟුණා, ඒ බොන්න දෙන්නේ මොනවාද කියලා. එවැනි දේවල් නම් ඉතාම අමානුෂිකයි. හැබැයි, ඇත්ත වශයෙන්ම එහෙම දේවල් සිදු වනවා නම් සිදු වෙන්නේ, මොළයේ විකෘතියක් තිබෙන මිනිසුන් අතින්. හැම මිනිහෙකුගෙන්ම ඒ තත්ත්වය ඇති වෙන්නේ නැහැ. මා කියන්නේ මේකයි. අපි මේ කරුණු සංවාදයට ලක් කරලා, ඒවා ගැන සොයා බලලා, අධ්‍යයනය කරලා විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ මනස හැදිය යුතුයි. විශ්වවිද්‍යාලයට ශිෂ්‍යයන් ඇතුළත් වන ආරම්භක අවස්ථාවේ ඔවුන් දැනුවත් කරන්න විවිධ පාඨමාලා පටන් ගන්නවා. ඒවා තුළ වුණත් මනස වෙනස් කිරීමේ වැඩසටහන් තිබිය යුතුයි. ඇත්ත වශයෙන්ම ඔවුන් උසස් අධ්‍යාපනය හදාරන්න විශ්වවිද්‍යාලයට ඇතුළත් වුණු අවස්ථාවේ සිට ක්‍රමානුකූලව එම වැඩසටහන් ආරම්භ කරන්න පුළුවන් නම්, මේ වාගේ හුහක් සිද්ධි වළක්වා ගන්න අපට පුළුවන් වෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනෙක් කාරණය තමයි, සමාජමය ප්‍රශ්න සහ ඔවුන් මුහුණ දෙන කටුකත්වය මේ ක්‍රියාවලට තදින් බලපෑම. අධ්‍යාපනය හදාරන්න උසස් අධ්‍යාපන ආයතනවලට එනකොට ඔවුන් අසීරුකම්වලට මුහුණ දෙනවා වාගේම, ඒ තුළින් වෛරය ඇති වනවා. ශිෂ්‍යයන් බාහිර පන්තිවලට යනවා කියලා දැන් මෙතැනදී කිව්වා. දැන් ඉස්කෝලේ උගන්වන්නේ නැහැ. ඒ නිසා දරුවන් සෑහෙන වියදම් කරගෙන තමයි බාහිර පන්තිවලට යන්නේ. මේවාත් එක්ක ඇති වන සමාජ ක්‍රෝධය සහ ආතතිය විශ්වවිද්‍යාලය තුළදී ඔහු කාගෙන් හෝ පිරිමහ ගන්න බලනවා. එහෙම ඒවාත් තිබෙනවා. ඒ නිසා සමස්ත සමාජයම උඩු යටිකුරු කරන වෙනසකට පරිවර්තනය කිරීමත් මේ සිද්ධි වළක්වා ගැනීමට වැදගත් වනවා. ඇමතිතුමාගේ අදහසට විරුද්ධ අදහසක් නොවෙයි මා කිව්වේ. මේ තත්ත්වය වළක්වන්න ඔබතුමා මේ ගන්න උත්සාහය පිළිබඳවත්, සමහර කාරණා සෘජුව මතු කිරීම ගැනත් මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත ගැන විවාද කරනකොට අපේ සමහර මන්ත්‍රීතුමන්ලා කිව්වා, ඇත්ත වශයෙන්ම රණ විරුවන් වෙනුවෙන් සුබසාධනයක් තමයි මේ පනත් කෙටුම්පතින් අරගෙන එන්නේ කියලා. මේ සංශෝධනය ගැන ඒ අර්ථයෙන් කථා කළා. නමුත් මේ සංශෝධනයෙන් එක කාරණයයි වැදගත්වෙලා තිබෙන්නේ. ඒක තමයි, මේ අරමුදල කළමනාකරණය. මුල් පනතේ නවවැනි වගන්තියේ මේ සුබසාධනය අන්තර්ගතයි.

1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 9වැනි වගන්තියේ මෙසේ සඳහන් වනවා;

> "තම රාජකාරි කටයුතු ඉටු කරන අතරතුර දී තුවාල ලද හෝ මියගිය, පොලිස් බලකායේ හෝ සන්නද්ධ හමුදාවල හෝ යම් සාමාජිකයකුගේ පවුල්වලට යම් ප්‍රතිලාභ ගෙවීම ඇතුළුව, ..."

තවත් කාරණයක් එහි සඳහන්ව තිබෙනවා. මේ කාරණයත් අමතක කරන්න එපා. ඒ කාරණය ගැන අපි කවුරුවත් හිතුවේ නැහැ.

1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ තවදුරටත් මෙසේ සඳහන් වනවා:

> "...., ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීමට සහ සහතික කිරීමට වඩාත්ම හේතු වන්නේ යයි මණ්ඩලය අදහස් කරන ආකාරයට සහ කාර්යයන්ට, අරමුදලට අයත් මුදල් ජනාධිපතිවරයාගේ විධානවලට යටත්ව යොදා ගැනීම මණ්ඩලයේ කාර්යය විය යුතු ය."

මේ ආකාරයට මුල් පනතේ නවවැනි වගන්තියේ කරුණු දෙකක් ඇතුළත් වෙනවා. රණවිරු සුබසාධනය එක කරුණක්. නමුත් අද මේ ගැන කථා කරනකොට සමහර අය කිව්වා, "රණවිරු සුබසාධනය වෙනුවෙන් තමයි මේ පනත් කෙටුම්පත ගෙනාවේ" කියලා. නැහැ ඒක වැරැදියි. අපි මේ කාරණා දිහා මධ්‍යස්ථව බැලුවේ නැත්නම් අපට වරදිනවා.

යුද්ධයෙන් පස්සේ ආබාධිත වූ මෙන්ම මිය ගිය රණවිරුවන්ගේ පවුල් වෙනුවෙන් වාගේම, නොයෙක් ආකාරයෙන් අතවරවලට පත් වෙච්ච රණ විරුවන් වෙනුවෙන් ජාතික සුබසාධන වැඩ පිළිවෙළක් ගෙන ගියා.

රණවිරු සේවා අධිකාරිය සක්‍රීය කෙරුවා. ඒ වාගේම ඉතිහාසයේ කවදාවත් නැති විධියට - ලෝකයේ වෙන රටවල තිබුණාද දන්නේ නැහැ.- ජාතික පාසල්වල උසස් අධ්‍යාපනය ලබන්න අවස්ථාව නැති රණවිරුවන්ගේ දරුවන්ට අධ්‍යාපනය ලැබීම සඳහා වෙනම පාසල් නිර්මාණය කෙරුවා. ජාතික වශයෙන් මේ වාගේ වැඩ පිළිවෙළක් පසුගිය යුගයේ අරගෙන ගියා. ඒ නිසා මේක අද පටන් ගත් එකක් නොවෙයි. ඉතිහාසය පුරාම රණවිරු සුබසාධනය වෙනුවෙන් ගෙනාපු වැඩපිළිවෙළ පසුගිය රජය ඉතාම සාර්ථකව ඉස්සරහට ගෙන ගියා. ඒ නිසා මේ කාරණයේ දී අපි ගෞරව ගන්න එක නොවෙයි, යථාර්ථවාදීව ප්‍රවේශ වීමයි වෙන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රණවිරුවෝ යුද්ධයට යවලා ඒ මියගිය රණවිරු පවුල්වල සුබසාධනය සැලසීම, මියගිය රණවිරුවා වෙනුවෙන්, ආබාධිත රණවිරුවා වෙනුවෙන් සලකා බැලීමට වඩා රට ඇතුළේ යුද්ධයක් ඇති වීම වැළැක්වීමයි අපට වැදගත් වෙන්නේ. ඒක තමයි අපේ මූලික පදනම විය යුත්තේ. යුද්ධය කොහොමද ආරම්භ වුණේ කියලා අපි දැක්කා. යුද්ධය පටන් ගත්තේ කවුද? ඒ ඉතිහාසයට යන්න දැන් වෙලාවක් නැහැ. ඒ ගැන වෙන වෙලාවක අපට කථා කරන්න පුළුවන්. අද යුද්ධය පාවිච්චි කරලා, උතුර - දකුණ දෙපැත්තට බෙදිලා ජාතිවාදී සංකල්පනා උඩ අපට මේකට විසඳුම් හොයන්න බැහැ. ඇත්ත වශයෙන්ම රණවිරුවෝ ගියේ ත්‍රස්තවාදය පරාජය කරන්නයි; බෙදුම්වාදය පරාජය කරන්නයි. රට බෙදීම වළක්වන්නයි ගියේ. රට බෙදීමේ අරගළයේ ප්‍රධානම ආයුධය වුණේ ත්‍රස්තවාදය. අපි කවුරුත් ත්‍රස්තවාදයට විරුද්ධයි. උතුරේ තිබුණත්, දකුණේ තිබුණත් විරුද්ධයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දකුණෙන් ත්‍රස්තවාදය ආපු අවස්ථා තිබුණු බව මා ඔබතුමාට කියන්න කැමතියි. ඒ තමයි දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාපු අවස්ථාව. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් තමයි පළාත් සභා ආවේ. පළාත් සභා ගෙනෙන වෙලාවේ එය මේ ජාතික ගැටලුවට යම් ප්‍රමාණයක හෝ විසඳුමක් වෙයි කියලා, එදා අපි ඒකට පක්ෂව හිටියා. ඒ වෙනකොට දකුණේ ප්‍රචණ්ඩත්වය, ඊනියා දේශප්‍රේමීත්වය මතු වුණා. විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ - අපේ මිත්‍රවරු මේ අවස්ථාවේ ගරු සභාවේ නැහැ. - එම නායකත්වය යටතේ තමයි දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය හැදුණේ. ඝාතන රැල්ලක් කරගෙන ගියා. මම දෙසැරයක් බෝම්බවලට මුහුණ දීපු කෙනෙක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ විනාඩි පහළොවක් තිබුණු එක-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, අපට කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
හොඳයි. මූලික වශයෙන් අද අපි මේ දෙපිරිස අතර සංවේදීතාව නිර්මාණය වෙන ජාතික වැඩ පිළිවෙළකට, සංහිඳියාවකට යෑම අවශ්‍යයි කියන එක මා ඔබතුමාට කියන්න කැමතියි. දෙපැත්තට බෙදී සටන් කිරීම නොවෙයි කළ යුත්තේ. පසුගිය කාලයේ මේ වෙනුවෙන් අපි ප්‍රධාන වගකීමක් ඉසිලූ බව මම කියන්නට ඕනෑ. ඇත්ත වශයෙන්ම යුද්ධයට සම්බන්ධ වූ උතුරේ තරුණයන් 12,000ක් පුනරුත්ථාපනය කිරීමේ වැඩ පිළිවෙළක් ගෙන ගියා. ඒක කාටවත් අමතක කරන්නට පුළුවන් එකක් නොවෙයි. අපේ රටේ එය අගය නොකළත්, ලෝකය එය අගය කළා. උතුරේ සියලු ප්‍රශ්න විසඳන්න බැරි වුණු බව ඇත්ත. තවමත් ගැටලු තිබෙන බව ඇත්ත. උතුරට සංවර්ධනය දිය යුතු බවත් ඇත්ත. ඒ තිබෙන විෂමතාව වෙනස් කිරීම කළ යුතු බවත් ඇත්ත. එම විෂමතාව නිසා තමයි යුද්ධය පටන් ගත්තේ. ඒ නිසා අපි දෙගොල්ලන්ම මේකට වගකියන්න ඕනෑ. එම 12,000ක් වූ තරුණයන්ට නිසි පුනරුත්ථාපනය ලබා දීලා, ඔවුන්ගේ ආර්ථික ශක්තිය ගොඩ නහන්න අවම පොලියක් යටතේ ණය මුදලක් ලබා දෙන්න පසුගිය රජයට පුළුවන්කම ලැබුණා. එක පැත්තකින් උතුරේ සහෝදරවරු ඒ ක්‍රියාවලිය අගය කරන්න ඕනෑ. අනෙක් පැත්තෙන් අපි අතර සංහිඳියාව ඇති කිරීම සඳහා වූ මානසික තත්ත්වයන් නිර්මාණය කිරීමත්, විවිධ බලපෑම් මත උතුරේ තිබෙන ආර්ථික ශක්තිය හූරාගන්න හදන වෙනත් බලවේග තිබෙනවා නම් ඒවා පරාජය කිරීමටත්, ඒවාට බලපෑම් කිරීමටත්, ඔවුන්ගේ පරිසරය ආරක්ෂා කිරීමටත්, ඔවුන්ගේ ජාතික සම්පත් ආරක්ෂා කිරීමටත්, ඔවුන්ගේ ජීවන තත්ත්වය දියුණු කිරීමටත්, ඔවුන්ගේ අධ්‍යාපන වැඩසටහන් ශක්තිමත් කිරීමටත් අවශ්‍යයි. ඒ සඳහා වූ ජාතික ක්‍රියාවලියක අවශ්‍යතාව තිබෙනවා. ඒ නිසා තමයි අපි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගැන බලාගෙන හිටියේ. උතුරේ ප්‍රශ්නයට දිය හැකි දේශපාලන විසඳුම එයයි.

එම දේශපාලන විසඳුම අද යටපත් කරලා තිබෙනවා. බලය ගන්නකොට උතුරට දේශපාලන විසඳුම් ලබා දීම ගැන කථා කරනවා. බලය ගත්තාට පසුව උතුර අමතක කරනවා. ඡන්දයේ දී විතරයි අපි විසඳුම් ගැන කථා කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
(மாண்புமிகு சந்திரசிறி கஜதீர)
(The Hon. Chandrasiri Gajadeera)
අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි කිසිම ජන කොට්ඨාසයක් රවටන්න හොඳ නැහැ. ඔවුන් සියලුදෙනාම එකම රටේ ජීවත් වන අපේම සහෝදරවරු. එක රටක්, එක ජාතියක් විධියට කල්පනා කරලා, සියලුම ජනවාර්ගික කොටස්වල අයිතීන් ආරක්ෂා කරන දේශපාලන විසඳුමක් ඉදිරියට ගෙන යාමයි අප කළ යුත්තේ. ඒක යුද්ධයට මුහුණ දුන් රණවිරුවන්ටත් කරන ගෞරවයක්. උතුරේ මිය ගිය අයගේ ඥාතීන්ගේ දුක් අදෝනා පහ වෙන්නත්, ඉදිරියේ දී එවැනි තත්ත්වයක් ඇති නොවෙන්නත් ඒ තුළින් හැකියාව ලැබෙනවා වාගේම මිත්‍රශීලී ප්‍රවේශයකින් රටේ ජාතික සංවර්ධනය ඉස්සරහට ගෙන යන්න පුළුවන් බවත් ප්‍රකාශ කරමින්, ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

The next speaker is Hon. Gnanamuthu Srineshan. You have 15 minutes.

[பி.ப. 5.57]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, முதலில் உங்களுக்கு எனது வணக்கத்தைத் தெரிவித்துக் கொள்கின்றேன். இன்று தேசியப் பாதுகாப்பு நிதியம் பற்றிய விவாதம் நடைபெற்றுக்கொண்டிருக்கின்றது. உண்மையில், தேசியப் பாதுகாப்பு நிதியம் அவசியமானது. அது இருக்கத்தான் வேண்டும். தேசியப் பாதுகாப்பு நிதியத்தின் அதிகரிப்பை யுத்தத்திற்கு முற்பட்ட காலம், யுத்தத்திற்குப் பிற்பட்ட காலம் என்று பார்க்கின்றபோது, யுத்த காலத்தில் தேசியப் பாதுகாப்பிற்கான நிதியம் அதிகரித்திருப்பதையிட்டு நாங்கள் குறைசொல்ல வரவில்லை. ஆனால், யுத்தம் முடிந்ததன் பின்னர் இந்தத் தேசியப் பாதுகாப்பு நிதியம் உயர்ந்துகொண்டு செல்வதும், பொருளாதார வளர்ச்சி வீதம் குறைந்துகொண்டு செல்வதும் வித்தியாசமான ஒரு போக்காகவே காணப்படுகின்றது. குறிப்பாக, 2010ஆம் ஆண்டில் 202.2 பில்லியன்களாகக் காணப்பட்ட தேசியப் பாதுகாப்பு நிதியம் 2018இல் 290.7 பில்லியன்களாக அதிகரிக்கப்பட்டிருக்கின்றது. புள்ளிவிபர ரீதியாகப் பார்க்கின்றபோது, தேசியப் பாதுகாப்பு நிதியம் யுத்த காலத்தில் உயர்ந்திருப்பது என்பது நாங்கள் சாதாரணமாக ஏற்றுக்கொள்ளக்கூடிய ஒரு விடயம். ஆனால், யுத்தம் முடிந்ததன் பின்னர் இந்தத் தேசியப் பாதுகாப்பு நிதியம் உயர்ந்துகொண்டு செல்வதென்பது ஏற்றுக்கொள்ள முடியாத ஒரு விடயமாக இருக்கின்றது.

உலக நாடுகளின் தேசியப் பாதுகாப்பு நிதியத்தை அட்டவணை ரீதியாகப் பார்க்கின்றபோது, உலகத்தில் பெரும் வல்லரசாகக் கருதப்படுகின்ற சீனாவை எடுத்துக்கொண்டால், அதன் தேசியப் பாதுகாப்பு நிதியம் ஏறத்தாழ மாறாத ஒரு கணியமாக இருக்கின்றது. 2013ஆம் ஆண்டிலிருந்து 2018ஆம் ஆண்டுவரையும் மொத்தத் தேசிய உற்பத்தியில் 1.9 வீதமாகக் காணப்படுகின்றது. ஆனால், எங்களுடைய தேசியப் பாதுகாப்பு நிதியம் என்பது மொத்தத் தேசிய உற்பத்தியில் 2.2 வீதமாக இருக்கின்றதென்றால், சீனாவின் விகிதாசாரத்தை விட, எமது பாதுகாப்பு நிதியத்தின் விகிதாசாரம் உயர்ந்திருப்பதைப் பார்க்கக்கூடியதாக இருக்கின்றது. ஜப்பான் நாட்டின் தேசியப் பாதுகாப்பு நிதியத்தை எடுத்துப் பார்க்கின்றபோது, அது மொத்தத் தேசிய உற்பத்தியில் 0.9 வீதமாகக் காணப்படு

கின்றது. இந்த நிலையில் எங்களுக்கு முன்மாதிரியான நாடுகள் வழிகாட்டுகின்ற போக்கைப் நாங்கள் பின்பற்றுவதா? இல்லையா? என்று பார்க்க வேண்டும். அடுத்து. மியன்மாரை எடுத்துப்பார்க்கின்றபோது, அங்கு 2007ஆம் ஆண்டுக்கான தேசியப் பாதுகாப்பு நிதியம் மொத்தத் தேசிய உற்பத்தியில் 2.5 வீதமாக இருக்கின்றது. அதேபோன்று பாகிஸ்தானை எடுத்துக்கொண்டால், 2017ஆம் ஆண்டில் அதன் தேசிய பாதுகாப்புச் நிதியம், மொத்தத் தேசிய உற்பத்தியில் 3.5 வீதமாகக் காணப்படுகின்றது. ஆகவே, பாகிஸ்தான், மியன்மார் போன்ற நாடுகளின் இந்த -

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජපානය ආරක්ෂාවට වෙන් කරන මුදල ඔවුන්ගේ අය වැයෙන් සියයට 0.9ක් වාගේ අඩු ප්‍රමාණයක්ය කියා ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා. ජපානය වැනි රටක් ආරක්ෂාවට වෙන් කරන මුදල අපේ රට ආරක්ෂාවට වෙන් කරන මුදල සමඟ සංසන්දනය කරන්න බැහැ. මොකද, ජපානය ඇමෙරිකාවත් එක්ක ආරක්ෂක ගිවිසුමක් තිබෙනවා. ඒ නිසා ජපානය ආරක්ෂාවට වියදම් කරන්නේ නැහැ. ජපානයට ආරක්ෂාව ලබාදීම සම්බන්ධ වගකීම ඇමෙරිකාව භාරගෙන තිබෙනවා. ඒක අන්තර්ජාතික ගිවිසුමක්. නමුත් ශ්‍රී ලංකාව ආරක්ෂා කරන්න කවුරුවත් ජාත්‍යන්තරව ඉදිරිපත් වෙලා නැහැ. ඒ නිසා ස්වාධීනව කටයුතු කරන රාජ්‍යයක් විධියට කොහොමටත් ඒ රටේ සහ මේ රටේ ආරක්ෂක වියදමේ වෙනසක් ස්වාභාවිකවම තිබෙන්න ඕනෑ.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

கௌரவ அமைச்சர் அவர்களே, நான் உங்களுடைய கருத்தினை ஏற்றுக்கொள்கின்றேன். ஆனால், சீனாவை எடுத்துப் பார்க்கின்றபோது, அதன் பாதுகாப்பு நிதியம் மொத்தத் தேசிய உற்பத்தியில் 1.9 வீதமாக, ஒரு மாறாக் கணியமாகத் தொடர்ந்து ஐந்து ஆண்டுகளாகப் பேணப்பட்டு வருகின்றது. இந்த இடத்தில் நான் என்ன சொல்ல வருகின்றேன் என்றால், இதில் நாட்டின் இறைமை என்ற ஒரு பகுதியும் மக்களின் உரிமை என்ற ஒரு பகுதியும் என இரண்டு பகுதிகள் இருக்கின்றன. அதிகாரத்தோடு சம்பந்தப்பட்ட, நாட்டைப் பாதுகாப்பதோடு சம்பந்தப்பட்ட ஒரு விடயமாக இறைமை காணப்படுகின்றது. இறைமை பற்றி ஜோன் ஒஸ்ரின் குறிப்பிடுகின்றபோது, நினைப்பதைச் செய்வதற்கான அதிகாரம், அல்லது நினைத்த விடயங்களை நிறைவேற்றக் கூடிய அதிகாரம் என்று எல்லாம் குறிப்பிடுகின்றார். ஒரு விதத்தில் பார்த்தால் ஒஸ்ரின் போன்றவர்களின் கருத் தாடல்கள் ஜனநாயகத்துக்கு முரணானதாகத்தான் அமைந்திருக்கின்றன. ஆனால், ஜனநாயகத் தன்மையோடு ஒப்பிட்டு உரிமையா, இறைமையா என்று பார்க்கின்றபோது, உரிமை என்பதற்கு ஜனநாயக நாடுகளில் மிகவும் முக்கித்துவம் கொடுக்கின்றார்கள்.

யுத்தத்திற்குப் பிற்பட்ட காலத்தில் தேசிய பாதுகாப்பு நிதியம் அதிகரித்துக்கொண்டு செல்வதையும், பொருளாதார வளர்ச்சி வீதம் வீழ்ச்சியை நோக்கிச் செல்வதையும் புள்ளிவிபர ரீதியாகக் காணலாம். ஆனால், உண்மையில் மக்களிடம் ஓர் எதிர்பார்ப்பு இருக்கின்றது. அதாவது, யுத்தம் முடிந்ததன் பின்னர் பாதுகாப்பு நிதியம் குறைந்துகொண்டு செல்கின்ற ஒரு போக்குக் காணப்படுமென்றும், பொருளாதார அபிவிருத்தியில் அதிகரித்த தன்மை காணப்படுமென்றும் அவர்கள் எதிர்பார்க்கின்றார்கள். ஆனால், அதில் ஒரு மாறுபட்ட போக்கையே அவதானிக்கக்கூடியதாக இருக்கின்றது.

இடதுசாரிச் சிந்தனையுடைய சிரேஷ்ட அரசியல்வாதி யென்ற வகையில் கௌரவ பாராளுமன்ற உறுப்பினர் கஜதீர அவர்கள் நல்லதொரு விடயத்தைக் குறிப்பிட்டார். அவர் மிகவும் அறிவியல்பூர்வமாக ஆக்கபூர்வமான கருத்துக்களை வெளியிடுகின்ற ஒரு நடுநிலைச் சிந்தனையாளரென்ற அடிப்படையில் அவருடைய கருத்துக்களை மிகவும் விருப்பமாகப் நான் பார்ப்பதுண்டு. உண்மையில் அடிப்படை வாதத்திற்கு அப்பாற்பட்டு அறிவியல் ரீதியாக நாங்கள் பார்க்க வேண்டும். ஒரு நாட்டில் யுத்தம் முடிவடைந்ததன் பின்னர் இரண்டு பக்கங்களைப் பார்க்கலாம். அந்த வகையில் யுத்தத்தில் பாதிக்கப்பட்ட மக்கள் என்ற ஒரு பக்கம் இருக்கின்றது; யுத்தத்தினால் பாதிப்பினை ஏற்படுத்தியவர்கள் என்ற ஒரு பக்கம் இருக்கின்றது. மீள் குடியேற்றம், மீள் கட்டுமானம் போன்ற விடயங்களைப் பார்க்கின்றபோது இராணுவ முகாமொன்றை ஓரிடத்திலிருந்து இன்னோர் இடத்திற்குக் கொண்டு செல்வதற்குப் பாதுகாப்பு நிதியத்தைப் பயன்படுத்துவதை விட, மீள் குடியேற்றத்திற்கான நிதியினைப் பயன்படுத்துகின்ற போக்கே காணப்படுகின்றது.

உண்மையில் வடக்கு, கிழக்கு மக்களைப் பொறுத்த மட்டில், யுத்தத்தில் வென்றதைவிட, வென்றதன் பின்னர் மக்களின் மனங்களை வெல்வதென்பதுதான் மிக முக்கியமான விடயம். இந்த நாட்டில் மக்களின் மனங்கள் வெல்லப் படுகின்றபோதுதான் நிரந்தரமானதொரு சமாதானத்தைக் கட்டியெழுப்ப முடியும். கடந்த காலத்தில் யுத்தம் ஏற்பட்டதற்கான காரணங்களைக் கண்டறிய வேண்டும். அந்தக் காரணங்கள் தொடர்ந்தும் இருக்குமானால் நாட்டில் நிரந்தரமான சமாதானத்தை ஏற்படுத்திக்கொள்வதென்பது கடினமானதொரு காரியமாக இருக்கும். எனவேதான் கௌரவ பாராளுமன்ற உறுப்பினர் கஜதீர அவர்கள் ஒரு விடயத்தைக் குறிப்பிட்டார். அதாவது, ஓர் இனத்தை ஏமாற்றிவிட்டோ மென்றோ அல்லது வென்றுவிட்டோமென்றோ எண்ணுவது இன்னுமொரு முறுகல் நிலையையும் முரண்பாட்டையும் ஏற்படுத்துவதற்கு வழிகோலும்.

உண்மையில் யுத்தத்திற்குப் பிற்பட்ட காலத்தில் நாட்டின் பாதுகாப்பு என்பது நிகழ்ச்சி நிரலில் முன்னிலைப்படுத்தப் படவேண்டிய ஒரு விடயமாக இருந்தாலும்கூட, பாதிக்கப்பட்ட மக்கள் சார்பான செயற்பாடுகள் எப்படி இருக்கின்றதென்ற விடயத்திலும் முக்கிய கவனம் செலுத்தவேண்டியவர்களாக நாங்கள் இருக்கின்றோம். அந்த அடிப்படையில், எனக்கு முன்பு பேசிய கௌரவ பாராளுமன்ற உறுப்பினர் வியாழேந்திரன் அவர்கள் பல விடயங்களைக் குறிப்பிட் டிருந்தார்; உரிய பதில்களை கௌரவ அமைச்சர் அவர்கள் வழங்கிக்கொண்டிருந்தார். யுத்தத்தில் பாதிக்கப்பட்ட கிழக்குப் பிராந்தியத்தை எடுத்துப் பார்க்கின்றபோது, அங்கு தமிழ் மக்கள் வாழுகின்ற பிராந்தியம், முஸ்லிம் மக்கள் வாழுகின்ற பிராந்தியம் என்று இருக்கின்றன. தமிழ் மக்கள் வாழுகின்ற பிரதேசங்களில் அபிவிருத்தியைக் கட்டியெழுப்புகின்ற விடயத்தில் மிகவும் மந்தமான செயற்பாடுகள் காணப்படு கின்றன. குறிப்பாக, அரசியல்வாதிகள் தங்களுடைய வாக்கு வங்கியைத் தக்கவைத்துக் கொள்வதில் அக்கறை காட்டு கின்றார்கள். தேசிய அமைச்சர்களாக இருப்பவர்களும்கூட குறிப்பிட்ட பிரதேசங்களை அபிவிருத்தி செய்துகொண்டால் அந்த வாக்கு வங்கியைக் கொண்டு தாங்கள் அடுத்தமுறையும் வென்று விடலாம் என்ற எண்ணம் கொண்டிருக்கின்றார்கள்.

எனவே, கிழக்குப் பிராந்தியத்தில் காணப்படுகின்ற குடிநீர்ப் பிரச்சினை, போக்குவரத்துப் பிரச்சினை, மீள்கட்டு மானப் பிரச்சினை, குடியேற்றம் சம்பந்தமான பிரச்சினை போன்ற பல்வேறுபட்ட பிரச்சினைகள் தீர்க்கப்படாத

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

நிலையில் அங்கு அபிவிருத்தி என்கின்ற விடயம் எட்டப்படாத நிலைமை காணப்படுகின்றது. குறிப்பாக, 5 - 6 தொழிற் சாலைகள் இயங்கிய மட்டக்களப்பு மாவட்டத்தை எடுத்துக்கொண்டால், இன்று எல்லாத் தொழிற்சாலைகளும் ஒரு பூச்சிய நிலையில் கிடப்பில் போடப்பட்டிருக்கின்றன. இந்த விடயங்களில் மாற்றம் ஏற்படாதுவிட்டால் இந்த ஆட்சியை நல்லாட்சி என்று சொல்லிக்கொண்டிருப்பதில் அர்த்தம் இல்லாமல் போய்விடும். "தொழிற்சாலைகளை இயங்கச் செய்யுங்கள்; தொழில் வாய்ப்புக்களைக் கொடுங்கள்; மக்களின் வாழ்வாதாரத்தைக் கட்டியெழுப்புங்கள்; அவர்களுக்கு மாற்றத்தை ஏற்படுத்தி, மக்களின் மனங்களில் ஏற்பட்டிருக்கும் வடுக்களை, காயங்களை ஆற்றுங்கள்" என்று நாங்கள் இந்தப் பாராளுமன்றத்தில் பிரவேசித்ததிலிருந்து குரல் கொடுத்துக் கொண்டிருக்கின்றோம். ஆனால், இதுவரைக்கும் அந்தத் தொழிற்சாலைகள் திறக்கப்படவில்லை. அவற்றில் 5 தொழிற்சாலைகளைக் கூறிப்பிடலாம். அதாவது மூவாயிரத் துக்கும் மேற்பட்ட தொழிலாளர்கள் வேலைசெய்த வாழைச்சேனை paper factory மூடப்பட்டுக் கிடக்கின்றது, ஓட்டுத் தொழிற்சாலைகள், அரிசி ஆலைகள் மூடப்பட்டுக் கிடக்கின்றன. இதையும்விட, ஓர் அரச அச்சகம் மூடப்பட்டுக் கிடக்கின்றன; பண்ணைகள் மூடப்பட்டுக்கிடக்கின்றன. யுத்தம் முடிவடைந்ததன் பின்னரும் அபிவிருத்தி என்கின்ற விடயத்தை நோக்கிச் செல்லாவிட்டால், அடிப்படைத் தேவையான குடிநீரைக்கூட அந்த மக்களுக்குப் போதியளவு வழங்காது விட்டால், இந்த யுத்தத்தினால் பாதிக்கப்பட்ட மக்களுக்கு யுத்த வெற்றியினால் நல்ல செய்திகள் கொண்டு செல்லப்படவில்லை என்றுதான் பொருள்படும்.

கௌரவ அமைச்சர் அவர்களே, நான் ஒரு விடயத்தைக் குறிப்பாகச் சொல்ல விரும்புகின்றேன். அதாவது எமது மாவட்டத்திலே உன்னிச்சைக் குளம் என்ற ஒரு பெரிய குளம் காணப்படுகின்றது. அந்தக் குளத்திலிருந்து நீர் எடுக்கப்பட்டு, அந்த நீர் தொலைதூரங்களிலுள்ள நகரப் பகுதிகளுக்கு, ஏறத்தாழ 50 - 60 கிலோ மீற்றர்களுக்கப்பால் கொண்டு செல்லப்படுகின்றது. ஆனால், உன்னிச்சைக் கிராமம் என்று சொல்லப்படுகின்ற கிராமத்திற்குக் குடிநீர் கொடுக்கப் படவில்லை. கௌரவ நீர் வழங்கல் அமைச்சர் அவர்களிடம் பல தடவைகள் இந்த விடயத்தைச் நான் சுட்டிக் காட்டியிருக்கின்றேன். அதேநேரம் உன்னிச்சைக் குளத்திலிருக் கின்ற நீர் அந்தக் குளத்திற்குப் பக்கத்திலிருக்கின்ற கிராமங்களான உன்னிச்சை, ஆயித்தியமலை, மணிபுரம், நெல்லிக்காடு, மகிழவெட்டுவான், பாவற்கொடிச்சேனை, பன்சேனை எனப் பல்வேறுபட்ட பக்கத்துக் கிராமங்களை விடுத்து, அந்தக் கிராமங்களைக் கடந்து தொலை தூரங்களுக்குக் கொண்டுசெல்லப்படுகின்றது. ஆனால், பக்கத்திலிருக்கின்ற அதாவது அங்கிருந்து சில மீற்றர் களுக்கப்பாலிருக்கின்ற கிராமங்களுக்கு வழங்கப்படவில்லை. இந்த விடயம் சம்பந்தமாக நீர் வழங்கல் அமைச்சர் கௌரவ றவுப் ஹக்கீம் அவர்களிடம் அடிக்கடி நான் பிரஸ்தாபித்துக் கொண்டிருக்கின்றேன். ஆனால், இன்னும் கூட, அந்த நீர் அந்த மக்களுக்குக் கிடைக்காத நிலைமை காணப்படுகின்றது.

எனவே, யுத்தத்தின் பின்னர் எல்லா மக்களுக்கும் குடிநீராவது கொடுக்கப்பட்டிருக்கின்றதா? என்று பார்க்கின்ற போது, உன்னிச்சைக் குளத்திலிருக்கின்ற நீர் உன்னிச்சைக் கிராமத்திற்கே கிடைக்கவில்லை என்றால், நாங்கள் என்ன செய்து கொண்டிருக்கின்றோம் என்பதைப் பரிசீலனை செய்யவேண்டியவர்களாக இருக்கின்றோம். ஏனென்றால், எங்களுடைய மக்கள் இந்த நல்லாட்சியை ஏற்படுத்த வேண்டும் என்பதற்காக அதிகமான வாக்குகளை அளித்தவர்கள். இந்த நல்லாட்சி ஏற்பட்டு - இந்தப் பாராளுமன்றம் ஆரம்பிக்கப்பட்டு ஏறத்தாழ இரண்டரை - மூன்று வருடங்களாகின்றன. இந்த நேரத்தில் எங்களுடைய மக்களுக்கு என்ன மாற்றம் ஏற்படுத்திக் கொடுக்கப்பட்டிருக்கின்றது? குடிநீர் வழங்கப் பட்டிருக்கின்றதா? இந்த நிலையில் அந்தப் பிரதேசத்தில் வாழ்கின்ற மக்களில் 80 வீதமானவர்கள் சுத்திகரிக்கப்பட்ட நீரைப் பருகவில்லையென மருத்துவ அறிக்கையொன்று தெரிவிக்கின்றது. இதனால் kidney பாதிப்பு, cancer நோய் போன்றவை ஏற்படுவதாகக்கூடச் சொல்லப்பட்டிருக்கின்றது. எனவே, இந்த நல்லாட்சியின்மூலமாக அடிப்படை வாழ்வாதாரப் பிரச்சினைகளைத் தீர்க்கவேண்டிய ஒரு நிலைமையிருக்கின்றது.

கௌரவ பாராளுமன்ற உறுப்பினர் வியாழேந்திரன் அவர்கள், பதுளை வீதியில் நீர் சுத்திகரிப்பு ஆலையொன்று தொடங்கவிருப்பதாகக் குறிப்பிட்டிருந்தார். ஆனால், உண்மையில் அவை வரட்சிக்குட்பட்ட பிரதேசங்களாகும். அங்கு குடிநீரைப் பெறுவதில் மக்கள் மிகவும் அல்லோல கல்லோலப்படுகின்ற நிலைமை காணப்படுகின்றது. அந்த மக்களின் ஓர் அடிப்படைத் தேவையான குடிநீரை வழங்குவதற்கு முன்பு வியாபார அடிப்படையில் ஒரு தொழிற்சாலையை அங்கு ஏற்படுத்துவது என்பது அந்த மக்களை இன்னும் வஞ்சிக்கின்ற ஒரு செயற்பாடாகத்தான் அமைய முடியும்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have only two more minutes.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

இந்த இடத்தில் நான் ஒரு விடயத்தைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். அதாவது, இந்தப் பாராளுமன்றத்தில் அடிக்கடி எனது கருத்துக்களைப் பதிவுசெய்திருக்கின்றேன். கௌரவ பிரதமர் அவர்களிடமும் பிரஸ்தாபித்திருக்கின்றேன். இந்த நல்லாட்சி இரண்டரை - மூன்று வருடங்களை நெருங்குகின்றது. இந்தக் காலகட்டத்தில் எங்களுடைய பிரதேசத்தில் என்ன அபிவிருத்திகள் ஏற்படுத்தப்பட்டிருக் கின்றன? வாழ்வாதாரங்களில் என்ன மாற்றங்கள் ஏற்பட்டிருக் கின்றன? என்று நாங்கள் பார்க்கின்றோம்.

நாங்கள் இந்த இடத்தில் கௌரவ அமைச்சர் சஜித் பிரேமதாஸ அவர்களுக்கு நன்றி சொல்ல வேண்டும். ஏனென்றால் அவருடைய அமைச்சின்கீழான வீட்டுத் திட்டங்கள் மக்களுக்கு ஓரளவு கொடுக்கப்பட்டுக் கொண்டிருப்பதை அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. ஆனால், குடிநீர் வழங்கலுக்குப் பொறுப்பான அமைச்சு மூலமான செயற்பாடுகளில் இன்னும் நியாயமான, சமநிலையான, சமத்துவமான, பாரபட்சமற்ற செயற்பாடுகள் மேற்கொள்ளப்படவில்லை. சமூக அடிப்படையில், இன அடிப்படையில் சிந்திப்பதை பிழையென்று நான் சொல்லவில்லை. ஆனால், ஓர் இனத்திற்கான, சமூகத்திற்கான ஓர் உரிமையைச் சிறப்புரிமை யாக அதிகம் கொடுத்துக் கொண்டிருக்கின்றபோது இன்னுமோர் இனத்தின் அடிப்படைத் தேவைகளைக்கூடப் பூர்த்திசெய்ய முடியாத நிலைமை காணப்படுமாகவிருந்தால், அது அந்த மக்கள் இந்த நல்லாட்சியின்மீது நம்பிக்கையிழப்பதற்கு ஓர் அடிப்படையாக அமைந்துவிடும்.

இந்தப் பாராளுமன்ற விவாதங்களின்போது இந்தக் குடிநீர் விடயத்தைப் பற்றி 3 தடவைகள் நான் பிரஸ்தாபித்திருக் கின்றேன். இவ்வாறு பிரஸ்தாபித்தும் உன்னிச்சைக் குளத்தி லிருந்து வருகின்ற நீர் அந்த உன்னிச்சை கிராமத்திலுள்ள மக்களுக்கு இன்னும் கிடைக்கவில்லையென்றால் இதையொரு வஞ்சனையாக - வஞ்சிப்பாகத்தான் சொல்லக்கூடியதாக இருக்கும். எனவே, நடுநிலையாகவும் பாரபட்சமில்லாமலும் பக்கச்சார்பில்லாமலும் சிந்திக்கின்றவர்கள் இந்த விடயங் களில் சரியான பதில்களைத் தரவேண்டும். அந்த வகையில் இனிவரும் இரண்டு ஆண்டுகளிலாவது மாற்றங்கள் ஏற்பட வேண்டும். அந்த மாற்றங்கள் நல்லாட்சியின் நல்ல சகுனங்களாக, நல்ல சாட்சியங்களாக அமையவேண்டுமெனக் கூறி, எனது உரையை நிறைவு செய்கின்றேன்.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමනි, මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. ඔබතුමා සඳහන් කළ උන්නිච්චෙයි ජලාශය-Is that Unnichchai?

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
ඔව්, මට්ටක්කළප්පු මාවට්ටත්තිලුන්ල උන්නිච්චෙයි කුලම්.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Can you kindly give me all those details. We will look into that with the Hon. Prime Minister and the President.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
I will give the details. Please consider this matter as it is very important.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
You had better give all those details. I will certainly attend to that with His Excellency the President.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
Okay. Thank you.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු කංචන විජේසේකර මහතා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා.6.13]

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද දවසේ පැවැත්වෙන ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට එකතු වෙන්න ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. අද දවසේ මේ විවාදයට එකතු වුණු බොහෝ දෙනෙක් ජාතික ආරක්ෂක අරමුදල් පනත පිළිබඳව කථා කරනවාට වඩා උතුරු-නැඟෙනහිර ප්‍රදේශවල අවුරුදු තිහක් තිස්සේ පැවැති යුද්ධය ගැනත්, ආරක්ෂක අමාත්‍යාංශය වෙනුවෙන් වෙන් කරන මුදල් පිළිබඳවත්, තවත් විවිධ කාරණා පිළිබඳවත් කරුණු මතු කළා කියා මා හිතනවා. ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙන මේ වෙලාවේ මා මේ ගරු සභාවේ අවධානය යොමු කරවන්න කැමැතියි, මේ ආණ්ඩුව බලයට පත් වෙනකොට ලබා දීපු පොරොන්දුවල තිබුණු කරුණු කාරණා ගණනාවක් අද දවසේ ආරක්ෂක අමාත්‍යාංශය, ඒ වාගේම මේ අරමුදල් තුළින් කප්පාදුවට ලක් වෙලා තිබෙනවා කියන කාරණය සම්බන්ධයෙන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ද්‍රවිඩ ජාතික සන්ධානය නියෝජනය කරන මන්ත්‍රීවරු මොන විධියට කිව්වත්, අපට ලැබෙන තොරතුරු අනුව අද වන විට යුද හමුදාව ඇතුළු ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබෙන සියලු ආයතනවල දීමනා -ඉන්ධන දීමනාව, ප්‍රවාහන දීමනාව- සියල්ල සියයට 45කින් පමණ කප්පාදුවට ලක් කරලා තිබෙනවා. ඒ වාගේම පුහුණු වෙනුවෙන්, විදේශ ගමන් වෙනුවෙන් පසුගිය කාලය පුරාවට ලබා දීපු සහන සියයට 90කින් පමණ කප්පාදුවට ලක් කරලා තිබෙනවා. ඒ වාගේම අපේ යුද හමුදාවලට තවත් තහංචි ගණනාවකුත් පැනවිලා තිබෙනවා. අවුරුදු තිහක් තිස්සේ යුද්ධ කරලා ත්‍රස්තවාදය පරාජය කිරීමේ වරදට, එක්සත් ජාතීන්ගේ සාම සාධක හමුදාවට එකතු වෙන ශ්‍රී ලාංකීය යුද හමුදාවට දැන් නීති පැනවිලා තිබෙනවා, ඒ සාම සාධක කටයුතුවලට සහභාගි වෙන්න පුළුවන් 2009 වසරෙන් පසුව බඳවා ගත්ත නිලධාරින්ට පමණයි කියලා. ඒ නිසා අපි විශේෂයෙන්ම ඒ පිළිබඳව මේ ගරු සභාවේ අවධානය යොමු කරවනවා. පසුගිය කාලය පුරාම රණවිරුවන් ගණනාවක් තමන්ගේ ජීවිතය පරිත්‍යාග කරලා, තමන්ගේ ජීවිතයේ කොටස් පරිත්‍යාග කරලා කරපු කැප කිරීම වෙනුවෙන් ඔවුන්ට අවශ්‍ය සහන, ශක්තිය ඉදිරියටත් ලබා දෙන්න, මේ අරමුදල් තව තවත් ශක්තිමත් කරගෙන යන්න අවශ්‍ය වටපිටාව සූදානම් කරලා දෙන්න කියලා ඉල්ලීමක් කරනවා.

මන්ත්‍රීවරු කිහිප දෙනෙකු මේ පිළිබඳව අදහස් දැක්වුවා. මඩකලපුව දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු එස්. වියාලේන්දිරන් මන්ත්‍රීතුමා -විශේෂයෙන් යහ පාලන ආණ්ඩුව බලයට ගෙනෙන්න කටයුතු කළ කණ්ඩායමක් හැටියට- කිව්වා, උතුරු නැඟෙනහිර ප්‍රදේශවල ආර්ථිකය කඩාගෙන වැටිලා තිබෙනවා; සංවර්ධනය අඩාළ වෙලා තිබෙනවා කියලා. ඒ විතරක් නොව රුකියා ප්‍රශ්න ගණනාවක් ගැනත් එතුමා කිව්වා. නමුත්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව බලයට පත් කරන්න කටයුතු කරපු කණ්ඩායම හැටියට දෙමළ ජාතික සන්ධානය විපක්ෂයේ වාඩි වෙලා අවුරුදු තුන හමාරක් තුළ කටයුතු කරපු ආකාරය සම්බන්ධයෙන් අපට ගැටලුවක් තිබෙනවා. ආණ්ඩුවෙන් ගෙන එන පනතකට සහයෝගය ලබා දෙන්න දෙමළ ජාතික සන්ධානය සූදානම් වෙලා ඉන්නවා. නමුත්, ඔවුන් එක පැත්තකින් විවේචනය කරන ගමන් ආණ්ඩුව ගෙන එන ඕනෑම පනත් කෙටුම්පතකට අත උස්සා සහයෝගය දෙන්න පසුගිය අවුරුදු තුනේම කටයුතු කළා. එම නිසා පාර්ලිමේන්තුවේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා වෙන්න නම්, එතුමන්ලාගේ ප්‍රදේශවලටත් යම් කිසි සංවර්ධනයක් -එතුමන්ලා කියනවා නම් ඒක ලැබිලා නැහැ, ලැබෙන්න ඕනෑයි කියලා- අවශ්‍ය නම්, එතුමන්ලාට වැඩ කරන්නත් පුළුවන් හයිය තිබෙනවා නම්, ඒ 16දෙනාත් මේ ආණ්ඩුවේම පාර්ශ්වකරුවන් බවට පත් වෙලා, ඇමතිකම් කිහිපයක් අරගෙන -මොකද, එතුමන්ලා මේ ආණ්ඩුව ශක්තිමත් කිරීමේ කොටස්කරුවන් හැටියට කටයුතු කරන නිසා- කටයුතු

[ගරු කංචන විජේසේකර මහතා]

කළා නම් ඔවුන්ට උතුරට, නැහෙනහිරට අවශ්‍ය සංවර්ධනය ගෙන යන්න පුළුවන් වෙයි කියලා මා හිතනවා. මොකද? අපි දැක්කා පසුගිය ඉතිහාසය පුරාම සිදු වුණු දේවල්. ඕනෑම කෙනෙකුට චෝදනා ඉදිරිපත් කරන්න ලේසියි. නමුත්, චෝදනා ඉදිරිපත් කරනවා වාගේම ඔවුන්ට එකට වැඩ කරන්න අවස්ථාවක් තිබෙන්න ඕනෑ. විශේෂයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කණ්ඩායමක් එකතු කර ගෙන ජාතික ආණ්ඩුවක් හැටියට ගැට ගහගෙන යන මේ ආණ්ඩුව පසුගිය කාලය පුරාවට පිරිහීමට ලක් වෙලා තිබෙනවා. විපක්ෂයේ කණ්ඩායම වැඩි වෙලා තිබෙනවා. විපක්ෂයේ කණ්ඩායම් ප්‍රමාණයත් වැඩි වෙලා තිබෙනවා. ඒ නිසා මේ අවස්ථාවේදී, ආණ්ඩුවට එකතු වෙලා මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා යන දෙපළත් එක්ක එහෙම නැත්නම් ඔවුන් පත් කරපු නායකයන් දෙපළත් එක්ක කටයුතු කිරීමේ හැකියාව ඔවුන්ට තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2009 මැයි මාසයේ 18 වෙනි දා ඒ යුද්ධය අවසන් වුණාට පසුව මහින්ද රාජපක්ෂ රජයෙන් විශාල සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් උතුරු නැහෙනහිර පළාත්වල ආරම්භ කළා. අපට මතකයි, එදා දවසේ සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කරනකොට තිබුණු විශාලම ගැටලුව තමයි, උතුරු පළාත් සභාව. උතුරු පළාත් සභා මැතිවරණයක් පවත්වන්න ඒ වෙලාවේ වාතාවරණයක් තිබුණේ නැහැ. නමුත්, උතුරු පළාත් සභා මැතිවරණයක් ලබා දීලා උතුරු නැහෙනහිර ජනතාවට ඒ පළාත් සභා දෙකට අවශ්‍ය තමන්ගේ නියෝජිතයන් පත් කර ගන්න අවස්ථාව දුන්නා. ඒ නියෝජිතයන් පත් කර ගැනීම තුළ අද උතුරු පළාත් සභාවේ ඉන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ, එක්සත් ජාතික පක්ෂයේ, පොදුජන එක්සත් පෙරමුණේ, එහෙම නැත්නම් ඒකාබද්ධ විපක්ෂය නියෝජනය කරන, නැත්නම් ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරන මහ ඇමතිවරයෙකු; ඇමති මණ්ඩලයක් නොවෙයි. අද දවසේ උතුරු පළාත් සභාව නියෝජනය කරන්නේ දෙමළ ජාතික සන්ධානය නියෝජනය කරන කණ්ඩායමක්. ඒ නිසා උතුරු පළාතේ ඒ සංවර්ධන කටයුතු කරගෙන යන්න, උතුරු පළාතේ සිටින තරුණයින්ගේ තිබෙන ගැටලු පිළිබඳව අවධානය යොමු කරලා ඒ වෙනුවෙන් කටයුතු කරන්න ඔවුන්ට නොහැකියාවක් තිබෙනවා නම් ඒ වරද පැටවෙන්නේ දකුණේ ඉන්න දේශපාලන නායකයින්ට නොවෙයි. ඒක ඔවුන් වෙතම පැවරෙන වගකීමක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා චෝදනා කරනවාට වැඩිය ඔවුන්ට ලැබී තිබෙන පහසුකම් තුළින් තමන්ගේ කොට්ඨාසවල ජනතාවට, උතුරු නැහෙනහිර ජනතාවට යම්කිසි සේවයක් කරන්න උත්සාහ කරනවා නම් එයින් ප්‍රතිඵලයක් ලැබෙවි කියලා මා හිතනවා.

ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා පසුගිය රජයට චෝදනා ගණනාවක් එල්ල කළා. හිටපු ආරක්ෂක ලේකම්තුමාට දැන් චෝදනා ගණනාවක් එල්ල වෙනවා. ගෝඨාභය භීතිකාවක් ඇති වෙලා තිබෙනවා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරණයට ඉදිරිපත් වනවාද, නැද්ද කියලා තීන්දුවක් අරගෙන නැහැ. පොදුජන එක්සත් පෙරමුණ හැටියට අපි එහෙම තීන්දුවක් අරගෙන නැහැ. ඒකාබද්ධ විපක්ෂය හැටියට අපි එහෙම තීන්දුවක් අරගෙන නැහැ. හැබැයි, දැන් භීතිකාවක් ඇති වෙලා තිබෙනවා. එතුමා මුස්ලිම් ජනතාව අතරට යනකොට, මුස්ලිම් ජනතාව එතුමාව වැලඳ ගන්නකොට, එදා සිදු වුණු වැරදි සිදුවීම්, වැරදි මත නිවැරදි වනකොට අද භීතිකාවක් ඇති වෙලා තිබෙනවා. ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමාට මා කියනවා, -දැන් එතුමන්ලා නියෝජනය කරන්නේ ආණ්ඩු පක්ෂය- අලුත්ගම සිද්ධියක් ගැන අවුරුදු ගණනාවක් කියන්නේ නැතිව, අපේ ආණ්ඩුවෙන් වැරැද්දක් වුණා නම් ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්න කියලා. මොකද, දැන් ඔබතුමන්ලාගේ ආණ්ඩුවක් තිබෙන්නේ. අසාධාරණයට ලක් වුණු යම් කිසි පුද්ගලයකු ඉන්නවා නම්, සාතනයට ලක් වුණු පුද්ගලයකු ඉන්නවා නම් ඔවුන් වෙනුවෙන් ඒ පරීක්ෂණය කරන්න ඒකාබද්ධ විපක්ෂය හැටියට අපි සම්පූර්ණ සහයෝගය දෙනවා. අපටත් බලා ගන්න ඕනෑ එදා දවසේ අලුත්ගම සිද්ධියේ නිර්මාතෘවරුන් කවුද කියලා.

පසුගිය දවසක වුණු දිගන සිදුවීම ගැනත් කථා කළා අපි දැක්කා. ඒ ගැන කථා කරනකොට කියනවා, "පොදුජන එක්සත් පෙරමුණේ මන්ත්‍රීවරුන් කිහිප දෙනෙකු රක්ෂිත බන්ධනාගාර ගත කරලා ඉන්නවා, ඒ නිසා මේක පොදුජන එක්සත් පෙරමුණේ වැඩක්" කියලා. ඊට පෙර ගිංතොට සිද්ධියක් වුණා. ඒ සිද්ධිය වනකොට අත්අඩංගුවට ගත්තේ කවුද? අපේ ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාත් දන්නා කියන, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක්. දැන් දිගන සිද්ධියට පොදුජන එක්සත් පෙරමුණ සම්බන්ධයි කියලා, ආණ්ඩුව අපට චෝදනාව එල්ල කරනවා නම්, ගිංතොට සිද්ධියට අත්අඩංගුවට ගත්තේ එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයකු නම්, එහෙනම් ඒ වරද පැටවෙන්න ඕනෑ එක්සත් ජාතික පක්ෂයටයි.

අපි කියන්නේ නැහැ, ඒක එක්සත් ජාතික පක්ෂය මෙහෙයවා කරපු දෙයක් කියලා. ඒ වාගේම අපි කියන්නේ නැහැ, දිගන සිද්ධියත් දේශපාලන හස්තයක් මෙහෙයවා කරපු කටයුත්තක් කියලා. ඒ පිළිබඳව පරීක්ෂණ පවත්වන්න, ඒකට අපෙන් බාධාවක් නැහැ. දිගන සිද්ධිය සම්බන්ධයෙන් දිළුම් අමුණුගම මන්ත්‍රීතුමා පසුගිය දිනවල තුස්ත විමර්ශන ඒකකයට කැඳවා ප්‍රශ්න කළා. එහිදී එතුමාගේ ජංගම දුරකථනය භාර දීලා, ඒ සියලු ප්‍රශ්නවලට මුහුණ දුන්නා. එම නිසා මේ දේවල් සම්බන්ධයෙන් සාධාරණ පරීක්ෂණයක් පැවැත්වෙනවා නම්, අපේ කිසිම විරෝධතාවක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම මෙම කරුණ කියනවා. රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා අද මේ ගරු සභාවට ඇවිල්ලා කථාවක් කළා. එතුමා මන්ත්‍රීවරුන් ගණනාවකට චෝදනා කළා. එතුමාට විරුද්ධව යම් කිසි චෝදනාවක් තිබෙනවා නම්, එළියට ඇවිල්ලා ඉදිරිපත් කරන්න කියලා එතුමා කිව්වා. පාර්ලිමේන්තුවේදී නොවෙයි, පාර්ලිමේන්තුවෙන් පිටතදී ඊඒපී සමූහ ව්‍යාපාරය පිළිබඳව මමත් එතුමාට අභියෝගයක් කළා. හැබැයි, ඒකට නම් එතුමා උත්තර දුන්නේ නැහැ. එතුමාගේ කථාවේදී එතුමා කිව්වා, අසරණ වුණු මිනිසුන්ට උදව් කිරීම එතුමාගේ ගතියක් කියලා. එතුමා ඒ කාර්යය කරන ආකාරය අපි දැක්කා. අසරණ වෙලා හිටපු අගමැතිතුමා විශ්වාස භංගයෙන් බේරා ගන්න එතුමා විශාල කාර්ය භාරයක් කරනවා අපි දැක්කා. අසරණ වෙලා හිටපු අර්ජුන මහේන්ද්‍රන්ට, අර්ජුන් ඇලෝසියස්ට, COPE එක ඇතුළේ අසරණ වුණු පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමට එතුමා උදව් කරනවා අපි දැක්කා. අවසාන මොහොතේ footnotes ගහපු කණ්ඩායමක් හිටියා. පස්සේ footnotes ගහපු කට්ටියත් නැහැ, මේකට විරුද්ධව කටයුතු කරපු කට්ටියත් නැහැ. ඒ අය විදේශගත වුණා කිව්වා. අසරණ වුණු ඒ කණ්ඩායම් දෙකට නම්, එතුමා උදව් කරන ආකාරය අපි දැක්කා.

අද කල් තැබීමේ විවාදය තිබෙන්නේ ග්‍රාමීය සංවර්ධන බැංකු කඩා වැටීම පිළිබඳවයි. මම එතුමාගෙන් නැවත වතාවක් ඉල්ලීමක් කරනවා. පාර්ලිමේන්තුව තුළ නොවෙයි, මම පාර්ලිමේන්තුවෙන් පිටතදී කරපු ඒ අභියෝගය භාරගෙන පුළුවන් නම්, අද සවස තිබෙන කල් තැබීමේ විවාදයට හෝ ඇවිල්ලා ඒ පිළිබඳව උත්තර ලබා දෙන්න කියලා. අසරණ ජනතාව වෙනුවෙන් පෙනී සිටීමින් එතුමා කරන ඒ කාර්ය භාරය අපි අගය කරනවා. හැබැයි, අසරණ වුණු අගමැතිතුමා නිදහස් කරගන්න ගිහිල්ලා එතුමා විශාල අමාරුවක වැටුණාය කියන එකත් අපි එතුමාට කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යුද්ධයක් අවසාන වුණු පමණින් ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය කපා දැමීමේ හැකියාවක් නැහැ. යුද්ධය අවසාන වුණු විගස තුනෙන් එකක භූමි ප්‍රදේශයක් නැවත මේ රටට එකතු වුණා; උතුරු නැහෙනහිර ජනතාව විශාල සංඛ්‍යාවක් එකතු වුණා. ඒ දවස අපට මතකයි, එවකට පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ ඇමතිතුමා හැටියට චන්ද්‍රසිරි ගජදීර මැතිතුමා ඩලස් අලහප්පෙරුම හිටපු ඇමතිතුමාත් එක්ක එකතු වෙලා තරුණ සේවා සභාව යටතේ එල්ටීටීඊ් ත්‍රස්තවාදීන් විශාල පිරිසක් පුනරුත්ථාපනය කරන්න විවිධ මෙහෙයුම් කළා. එදා ඒ පිරිස පුනරුත්ථාපනය කරලා "තල් රුප්පාවෙන් - පොල් රුප්පාවට" කියලා වැඩසටහනක් ක්‍රියාත්මක කරලා, උතුරෙන් දකුණට එන ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරලා, සංහිඳියාව ඇති කරන්න කටයුතු කළ ආකාරය අපට මතකයි. ඒ සඳහා එතුමන්ලා විශාල කාර්ය භාරයක් කළා.

ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය වැඩි වුණේත් වෙන මොනවත් නිසා නොවෙයි. එදා දවසේ පුනරුත්ථාපන කටයුතු කිරීමේ වගකීම පැවරුණේ යුද හමුදාවටයි. ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයන්න හමුදාවේ විශාල නිලධාරින් ප්‍රමාණයක් යොදවා තිබුණා. යුද්ධයක් අවසාන වුණු පමණින් අපේ ආරක්ෂාව පිළිබඳව අවතක්සේරුවක් කරන්න පුළුවන්කමක් නැහැ. අපේ ආරක්ෂාව ශක්තිමත් කළ යුතුයි. එම නිසා ආරක්ෂක අමාත්‍යාංශයේ අරමුදල් තව තවත් ශක්තිමත් කරලා, ජීවිත පරිත්‍යාග කරපු රණ විරුවන්ගේ පවුල්වලට, ආබාධිත වුණු රණ විරුවන් ඇතුළු ඒ සියලුදෙනා වෙනුවෙන් උපරිම සහන සලසන්න කටයුතු කරන්න කියන ඉල්ලීම ආණ්ඩුවට කරමින්, අද ඉදිරිපත් කරන පනත් කෙටුම්පතට පක්ෂව මම නිහඬවනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.

විනා විවාදයකින් තොරව, ඒකමතිකව ඒ ආකාරයෙන්ම ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් නියම කරන ලදී.
[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]
ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා විසින් ඉදිරිපත් කරන ලද පනත් කෙටුම්පත ඒ ආකාරයෙන්ම ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් නියම කරන ලදී.

Without debate, that is to say, on the motion of the Hon. Deputy Speaker.
[THE HON. DEPUTY SPEAKER in the Chair.]
The Bill presented by the Hon. (Dr.) Wijeyadasa Rajapakshe, was accordingly read the First time.

මතු පළවන යෝජනාව සභා සම්මත විය.:

''පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතු ය.'' - [ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

තීරණය කරන ලදී.
"සිවිල් නීතිය පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවට" - [ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

Resolved:
"That the Bill be referred to a Committee of the whole Parliament." - [The Hon. (Dr.) Wijeyadasa Rajapakshe.]

කාරක සභාවෙහිදී සලකා බලන ලදී.
[ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.]
කුලුගැන්වීම් සිදු නොවිය.
[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]
Considered in Committee.
[THE HON. DEPUTY SPEAKER in the Chair.]
No Riots.
[The Hon. (Dr.) Wijeyadasa Rajapakshe]

1 සිට 3 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

1 ඉලිරුන්දු 3 වරෙයාන වාසකංකල් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්කවේණ්ඩුමෙනක් කට්ටළෙයිඩප්පට්ටදු.

Clauses 1 to 3 ordered to stand part of the Bill.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
4 වන වගන්තියට සංශෝධන ඉදිරිපත් කිරීම, ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති ගරු මලිත් ජයතිලක මහතා.

4 වන වගන්තිය.- ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

வாசகம் 4. - (முதன்மைச் சட்டவாக்கத்தின் 13ஆம் பிரிவைத் திருத்துதல்.)

CLAUSE 4. - (*Amendment of Section 13 of the principal enactment.*)

ගරු මලිත් ජයතිලක මහතා
(மாண்புமிகு மலித் ஜயதிலக)
(The Hon. Malith Jayathilake)
ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"2 වන පිටුවේ, ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ:

'4 වන වගන්තියේ "ජාතික ආරක්ෂාව" යන වචන වෙනුවට "ජාතික ආරක්ෂක" යන වචන ආදේශ කිරීම.' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
තීරණය කරන ලදී.
Amendment put, and agreed to.

ගරු සභාපතිතුමා
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමා එම සංශෝධනයට එකඟද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
එකඟයි.

අපි එම සංශෝධනය අනුමත කරනවා.

4 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
4ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 4, as amended, ordered to stand part of the Bill.

5 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
5ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 5 ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.
சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.
Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සෝදුපත්වල භාෂා සහ මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ඉල්ලා සිටිමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වන වර කිය විය යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.
Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කල් තැබීමේ යෝජනාව, ගරු රමේෂ් පතිරණ මහතා.

ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "මේ අවස්ථාවේ ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා මූලාසනය ගත යුතුය"යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. INDIKA ANURUDDHA HERATH *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රමේෂ් පතිරණ මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ග්‍රාමීය බැංකු පාලනය සඳහා නිසි ක්‍රමවේදයක් සැකසීම
கிராமிய வங்கிகளை ஒழுங்குறுத்துவதற்கான முறைமையை வகுத்தல்
FORMULATION OF METHODOLOGY FOR REGULATION OF RURAL BANKS

[අ.භා. 6.27]

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේදී මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා.

"දැනටමත් අර්බුදකාරී තත්ත්වයට පත් වී ඇති ශ්‍රී ලාංකේය මූල්‍ය ක්ෂේත්‍රය සහ මූල්‍ය සමාගම් අතරට ග්‍රාමීය බැංකු පද්ධතිය ද ගොදුරු වන බව ඉතා පැහැදිලිව පෙන්නුම් කෙරේ.

හබරාදුව විවිධ සේවා සමුපකාර සමිතිය මඟින් පාලනය වන හබරාදුව ග්‍රාමීය බැංකුව සිය තැන්පත්කරුවන්ගේ මුදල් රුපියල් කෝටි 40ක් පමණ අවභාවිත කොට ගනුදෙනුකරුවන් 35,000ක් පමණ ඉතා අසරණ තත්ත්වයට පත් කර ඇත.

මෙම ගනුදෙනුකරුවන්ට නිශ්චිත විසඳුම් ඉදිරිපත් කිරීමට හෝ තැන්පතු මුදලින් කොටසක් හෝ ලබා දීමට ද පාලනාධිකාරිය සහ දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව අපොහොසත් වී ඇත.

නිසි නියාමන ක්‍රමවේදයක් නොමැති, වගවීමක් නොමැති මූල්‍ය සමාගම් ලෙස කටයුතු කෙරෙන ලාංකේය ග්‍රාමීය බැංකු පද්ධතියේ සැලකිය යුතු ග්‍රාමීය බැංකු ප්‍රමාණයක් ඉදිරියේදී කඩා වැටීමේ පැහැදිලි අනතුරක් මතු වී ඇත.

එම නිසා මෙම බැංකු පද්ධතිය ක්‍රමවත්ව පවත්වා ගෙන යාමට නිසි ක්‍රමවේද සකසන ලෙසත්, එම බැංකු මහ බැංකුවේ නියාමනයට යටත් කරන ලෙසත් මුදල් අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිමි. එමෙන්ම දැනට ඉතා අසරණභාවයට පත් වී ඇති හබරාදුව ග්‍රාමීය බැංකු තැන්පත්කරුවන්ට සාධාරණ ඉටු කර දෙන ලෙස ද යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හබරාදුව ග්‍රාමීය බැංකුව වාගේම ශ්‍රී ලාංකීය ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රය මුහුණ දෙන ගැටලු පිළිබඳ මෙම ගරු සභාවේ දී විවාදයක් ඊයේ දිනයේදී පැවතුණා. එම විවාදයේ දී මේ මූල්‍ය ක්ෂේත්‍රයේ ඇති වෙලා තිබෙන අර්බුදය ග්‍රාමීය මට්ටමේ බැංකු පද්ධතිය හරහාත් ඔඩුදුවන තත්ත්වයක් අද වන විට ඇති වෙලා තිබෙන බව බොහොම පැහැදිලිව පෙනෙනවා. හබරාදුව විවිධ සේවා සමුපකාර සමිතිය යටතේ මෙම ග්‍රාමීය බැංකුව තැන්පතුකරුවන් 35,000කගෙන් පමණ තැන්පතු ලබා ගෙන තිබෙනවා. ශ්‍රී ලාංකීය මුදලින් රුපියල් කෝටි 40කට ආසන්න ප්‍රමාණයක් තැන්පතු වශයෙන් ලබා ගෙන ලක්ෂයකට වඩා මුදල් තැන්පත් කරපු තැන්පතුකරුවන් 5,000ක් ඉන්න මේ සමිතිය හදිසියේම තම මූල්‍ය තත්ත්වය අයහපත් තත්ත්වයට පත් වෙලා කඩා වැටීම නිසා මේ පළාතේ ජීවත් වෙන පවුල් රැසක පිරිසක් ඉතාම අසරණභාවයකට පත් වෙලා තිබෙනවා. ETI සමාගමේ රුපියල් කෝටි 3,500කට ආසන්න මුදලක් තැන්පත් කරපු 35000ක පිරිසක් ඉන්නවා. හැබැයි, තැන්පත්කරුවන්ගේ සංඛ්‍යාව ගත්තාම, හබරාදුව ග්‍රාමීය බැංකුවේත් ඒ හා සමානව තැන්පත්කරුවන් පිරිසක් මුදල් තැන්පත් කරලා තිබෙනවා, තැන්පත් මුදල ප්‍රමාණාත්මකව ඊට අඩු ප්‍රමාණයක් වුණාට.

අද ජනතාව අතර මතයක් තිබෙනවා, මේ සමුපකාර ග්‍රාමීය බැංකු රජය සතුව, රජයේ නියාමනය යටතේ පාලනය වන ආයතනයක්ය කියන කාරණය. අද පළාත් සමුපකාර විෂය පළාත් පාලන විමධ්‍යගත විෂයක් හැටියට පළාත් සභාවට භාර වෙලා තිබෙනවා. පළාත්වල තිබෙන සමුපකාර අමාත්‍යාංශය මඟින් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු හරහා යම් නියාමනයකට මේවා යටත් වෙලා තිබෙනවා. අපට දැන ගන්නට ලැබී තිබෙන තොරතුරු අනුව, හබරාදුව ග්‍රාමීය බැංකුව විතරක් නොවෙයි ලංකාව පුරා ක්‍රියාත්මක වන ග්‍රාමීය බැංකු රාශියක් නියමිත නියාමනය සිදු නොවී, විගණනය සිදු නොවී අබණ්ඩව පවත්වා ගෙන යන බව දැන ගන්නට තිබෙනවා. ඒ අර්ථයෙන් ගත් කළ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවලින් ලබා දෙන නියෝගවලින් පරිබාහිරව නියමිත විගණනයක් නොමැතිව ක්‍රියාත්මක වන ග්‍රාමීය බැංකු මේ රටේ විශාල ප්‍රමාණයක් තිබෙනවා.

රාජ්‍ය ආරක්ෂාව පිළිබඳව ඡායාවක් තිබෙන නිසා ජනතාව ඉතාම අපහසුවෙන් තමුන් හරිහම්බ කරපු ධනය ගෙනිහිල්ලා මේ බැංකුවල තැන්පත් කරනවා. ඒ විධියට විශාල මුදලක් තැන්පත් කරලා තිබෙනවා. ඒ පළාතේ විශාල පිරිසක් එක්ක කොරියාවේ සේවය කරපු තරුණ මහත්මයෙක් ඇවිත් මේ සම්බන්ධයෙන් අපට කිව්වා. ඒ මහත්මයා වසර 5ක් කොරියාවේ සේවය කරලා ඉතාම දුක් මහන්සියෙන් හම්බ කරගත්ත රුපියල් ලක්ෂ 90ක මුදලක් මේ බැංකුවේ මාස 3ක කාලයකට තැන්පත් කරලා තිබෙනවා. අද එම බැංකුව කඩා වැටීම නිසා එකම සතයක්වත් ගන්නට බැරිව ඔහු ඉතා අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්නවා. අනෙක් තැන්පත්කරුවන්ගේ තත්ත්වයත් ඊට දෙවැනි නැහැ.

අද රජය ETI සමාගමේ කාරණයට මැදිහත් වෙලා සියයට 10ක මුදලක් හරි තැන්පත්කරුවන්ට ලබා දෙන්නට යෝජනා කරලා, ඒ කටයුතු සිද්ධ වෙමින් පවතිනවා. ඒක හොඳ කාරණයක්. වසර 5ක් ඇතුළතදී ඉතිරි මුදල් ටික ETI තැන්පත්කරුවන්ට ලබා දෙනවා කියලා රජය අඩු ගණනේ පොරොන්දුවක් හරි වෙලා තිබෙනවා. ඒ සඳහා මහ බැංකුව යම් පමණකට මැදිහත් වෙලා තිබෙනවා. නමුත්, අද හබරාදුව ග්‍රාමීය බැංකුවට විකුණන්නට දේපොළක් නැහැ. හරියට තක්සේරු කරලා වටිනාකමක් ගන්න පුළුවන් දේපොළක් ඔවුන්ට නැහැ. මේ සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට මැදිහත් වෙන්නට බැහැ. අධ්‍යක්ෂ මණ්ඩලවල සිටින පිරිස් ඒ මුදල් අවභාවිත කරනවා නම්, පරිපාලනය හරියට කරන්නේ නැත්නම් සමුපකාර දෙපාර්තමේන්තුව මඟින් අධ්‍යක්ෂ මණ්ඩලයට තුන්දෙනෙක් පත් කරලා මේක යම් පමණකට නියාමනය කිරීමේ ක්‍රමවේදයක් මීට පෙර තිබුණා. හැබැයි, දැන් තිබෙන තත්ත්වය යටතේ සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරුනුත් මේ ක්‍රමවේදය යටතේ තනතුරු ලබා ගන්න අකමැතියි. මොකද, ඊට පස්සේ තැන්පත්කරුවන්ට හැකියාවක් ලැබෙනවා, නීතිය පැත්තෙන් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට විරුද්ධවත් නීතිය ක්‍රියාත්මක කරන්න. ඒ නිසා නිලධාරින්ගේ පැත්තෙනුත් බොහොම පැහැදිලි හිරවීමක් තිබෙනවා. ඔවුන්ට කරන්න පුළුවන් දේ අදාළ උපදෙස් ලබාදීම පමණයි. හැබැයි, අධ්‍යක්ෂ මණ්ඩලවල ක්‍රියා කරන සමහර වංචාකාරී පුද්ගලයින් නිසා අදාළ උපදෙසුත් මහා සභාවේ සම්මත කරගෙන ක්‍රියාත්මක කරන්න බැරි තත්ත්වයක් තිබෙනවා. සමුපකාර ව්‍යාපාරය එක පැත්තකින් යම්කිසි කාල වකවානුවකදීත්, වර්තමානයේදීත් හොඳින් ක්‍රියාත්මක වන සමිති හරහා විශාල පිරිසකට සෙත සලසන ආයතන පද්ධතියක් බවට පත් වෙලා තිබුණා. හැබැයි, අද මේ ග්‍රාමීය බැංකු පද්ධතියට රජයේ නිසි නියාමනයක් නොමැති නිසා, මධ්‍යම රජයෙන් හෝ පළාත් සභාවෙන් මේකට විගණනය වෙනුවෙන් සහ නීතිය පැත්තෙන් නිසි පරිදි ක්‍රියාත්මක වෙන්න පුළුවන් නීති පද්ධතියක් නැති නිසා ගනුදෙනුකරුවන් ඉතාම අපහසුතාවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපට අද පොලිසියකට ගිහිල්ලා පැමිණිල්ලක් කරලා මේ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරවා ගන්න හැකියාවක් නැහැ. නීති පද්ධතිය ඉතාම ලිහිල්. ඒ නිසා රජය පැත්තෙන් වගකීමක් තිබෙනවා, පළාත් සභා සමඟ සම්බන්ධ වෙලා සමුපකාර ග්‍රාමීය බැංකු නියාමනය සඳහා කිසියම් ක්‍රමවේදයක් සකස් කරන්න. අපේ පළමුවැනි ඉල්ලීම ඒකයි. මේක අද හබරාදුවට බලපාන කාරණයක් වුණාට, ගාල්ල දිස්ත්‍රික්කයේ තවත් සමිතියකට, දෙකකට බලපාන කාරණයක් වුණාට, අනාගතයේදී ලංකාවේ ස්ථාන රාශියක මේ වාගේ සිද්ධීන් ඇති වෙන්නට පුළුවන් පසුතලයක් සකස් වෙමින් තිබෙනවා. ඒ නිසා මේ ග්‍රාමීය බැංකු රජයේ මහ බැංකුව යටතේ යම්කිසි අධීක්ෂණයකට පත් කරන්න කටයුතු සලස්වන්න කියන යෝජනාව අපි කරනවා. ඒ සම්බන්ධ යෝජනාව විමධ්‍යගත විෂයක් නිසා පළාත් සභා සමඟ සාකච්ඡා කරන්න අවශ්‍යයි. ඒ යෝජනා පළාත් සභාවලට යවලා ඒ වෙනුවෙන් කටයුතු කරන්නය කියන ඉල්ලීම අපි කරනවා.

අද අසරණ තත්ත්වයට පත් වෙලා ඉන්න හබරාදුව ග්‍රාමීය බැංකුවේ තැන්පත්කරුවන් ඒ පළාතේ විශාල උද්ඝෝෂණවල නිරත වෙනවා. ඒ පළාතේ ජනතාව ගිහිල්ලා මේ බැංකුව වට කරනවා. හැබැයි, උත්තර දෙන්න කවුරුවත් නැති නිසා ඔවුන් අසරණ වෙලා ගෙදර එනවා. මේ වංචා කරපු අධ්‍යක්ෂ මහත්වරු අද කාටවත් උත්තර දෙන්නේ නැතිව, කිසිම සිද්ධියක් සිදු නොවුණා වාගේ තමුන්ගේ පාඩුවේ ජනතාවගේ සල්ලි හොරකම් කරලා ගෙවල්වලට වෙලා ඉන්නවා. ඔවුන්ට කාගේවත් චෝදනාවක් නැහැ. පොලීසියට ගිහිල්ලා පැමිණිල්ලක් දාලා යුක්තිය ඉෂ්ට කරගන්න ක්‍රමවේදයක් නැහැ. මේ තත්ත්වය ඉදිරියට තවත් වැඩි වර්ධනය වෙන්න ඉඩ තිබෙනවා. මොකද, තැන්පත්කරුවන්ට අද රාජ්‍ය බැංකුවකට ගිහිල්ලා ණයක් ගන්න පුළුවන්කමක් නැහැ. ජනතාවට තැන්පතුව හැටියට තියන්න, ආරක්ෂණ හැටියට තියන්න දේපොළක් නැහැ. රාජ්‍ය සේවක ඇප ලබා ගන්න බැහැ. ඒ නිසා ඔවුන් ග්‍රාමීය බැංකුවට යනවා.

මේ ග්‍රාමීය බැංකු එක පැත්තකින් ජනතාවට යම්කිසි ණයක් දෙන ගමන්, අනෙක් පැත්තෙන් රාජ්‍ය බැංකුවකින් ලබාදෙන පොලියට වඩා වැඩි පොලියක් දෙන්න ජනතාවට පොරොන්දු වෙනවා. ඒ පොලිය ලබා දෙනවා. හැබැයි, ඔවුන්ට ඒ මුදල් ප්‍රතිආයෝජනය කරලා තැන්පත්කරුවාට ලබා දෙන පොලියට වඩා වැඩි පොලියක් බැංකුවට ලබා ගන්න ක්‍රමවේදයක් නැහැ. ඔවුන් මුදල ලබා ගන්නවා. තැන්පත්කරුවන්ට රජයේ පොලී මුදලට වඩා වැඩි ප්‍රතිලාභ ලබා දෙනවා. ඔවුන්ට ඒ මුදල් ප්‍රතිආයෝජනය කරන්න තැනක් නැහැ. ඔවුන් තමුන්ගේ අධ්‍යක්ෂ මණ්ඩලවලට සියයට 3ට, 4ට ණය පහසුකම් ලබා දෙනවා. ඒ නිසා ක්‍රමානුකූලව මේ අයගේ තැන්පත් ක්ෂය වෙලා යනවා. ඒ ආකාරයෙන් තැන්පත්කරුවන්ගෙන් ලබා ගත්ත කෝටි ගණන් මුදල් අද ක්ෂය වෙලා ගිහිල්ලා මේ බැංකු කඩා වැටිලා තිබෙනවා. ඒක ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. තමුන්ගේ දුක හෙළි කරන්නේ නැතිව අසරණව ගෙවල්වලට වෙලා කාටවත් කියාගන්න විධියක් නැතිව ජීවත් වෙන දහස් ගණන් පිරිස් ඉන්න බව හබරාදුව ග්‍රාමීය බැංකු ණය ක්‍රමය කඩා වැටුණාට පස්සේ අපි දැක්කා. ඒ ජනතාවට යන්න එන්න තැනක් නැහැ. තමුන් ජීවිත කාලයම අරපරිස්සමට තියපු රුපියල් 50,000, රුපියල් 75,000 ග්‍රාමීය බැංකුවට දාලා බැංකුව කඩා වැටුණාට පස්සේ ඒ මිනිස්සුන්ට යන්න එන්න තැනක් නැහැ; කියන්න කරන්න දෙයක් නැහැ. ඔවුන් ඉතාම අසරණ තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මහජන නියෝජිතයින් හැටියට, රජය හැටියට, මේ කාරණයට මීට වඩා මැදිහත් වෙන්න අවශ්‍යයි කියලා අපි විශ්වාස කරනවා. එහෙම කළේ නැත්නම්, අපි සෑම කෙනෙකුටම ප්‍රබල ගැටලුවක් බවට මේ කාරණය පත් වනවා. ඒ නිසා අපි ගරු මුදල් අමාත්‍යතුමාට යෝජනා කරනවා, මේ මූල්‍ය ආයතන යම්කිසි ක්‍රමවේදයක් අනුව නියාමනය කරන්න කියලා.

[ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා]

ජනතාවගෙන් මුදල් ලබා ගැනීමට ඒ ගොල්ලන්ට බොහොම පැහැදිලි අයිතියක් තිබෙන බව ඔවුන් කියනවා. ඔවුන් ජනතාවට කියන්නේ, "මේවා රජයට සම්බන්ධ ආයතන. සමුපකාර දෙපාර්තමේන්තුව රජයේ ආයතනයක්" කියලායි. ඒ වාගේම ඔවුන් ජනතාවට කියනවා, "ගාල්ල සමුපකාර රෝහලත් මේකට සම්බන්ධයි." කියලා. නමුත්, කිසිම සම්බන්ධයක් නැහැ. ජනතාව මේ කථා විශ්වාස කරලා, මුදල් ලබා දෙනවා. අපි දැක්කා, පසුගිය කාලයේ පිරමීඩ ගනුදෙනුවලට සම්බන්ධ වෙන්න එපා, ඒවායේ මුදල් තැන්පත් කරන්න එපා කියලා මහ බැංකුව පුවත් පත්වල වරින් වර නිවේදන පළ කළා. ඒක හොඳ පියවරක්. ජනතාව දැනුවත් වනවා. මෙවැනි කරුණු පිළිබඳවත්, මූල්‍ය සමාගම් පිළිබඳවත්, අවිධිමත් ලෙස පාලනය වන ග්‍රාමීය බැංකු පිළිබඳවත් ජනතාව දැනුවත් කරන්න අවශ්‍යයි. එහෙම නැත්නම් අපේ රටේ විශාල පිරිසක් මේවායේ ගොදුරු බවට පත් වෙලා අසරණ වනවායි සිහිපත් කරමින්, මා නිහඬ වනවා. ඔබතුමාට බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
යෝජනාව ස්ථිර කිරීම, ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමා.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හබරාදුව විවිධ සේවා සමුපකාර සමිතියට අනුබද්ධ ග්‍රාමීය බැංකුවල සිදු වෙච්ච මුදල් අවභාවිතය පිළිබඳව ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරපු යෝජනාව මා ස්ථිර කරනවා. මේ යෝජනාව ඉදිරිපත් කරපු වෙලාවේ ඇත්තටම ශ්‍රී ලංකා නිදහස් පක්ෂ හබරාදුව ආසන සංවිධායකතුමාත් හිටියා නම් හොඳ බව විශේෂයෙන්ම සඳහන් කළ යුතුයි. සියලු ග්‍රාමීය බැංකු පසුගිය කාලය පුරා පළාත් සභාවේ, ඒ වාගේම මධ්‍යම රජයේ නියාමනය යටතේ තිබුණාට, අපි දන්නවා ගාල්ල දිස්ත්‍රික්කයේ පමණක් නොවෙයි, මාතර දිස්ත්‍රික්කයේත් විවිධ ස්ථානවල තිබෙන ග්‍රාමීය බැංකුවල කඩා වැටීම් අද ඇති වෙලා තිබෙන බව. ඒ කඩා වැටීම්වලට ප්‍රධානම හේතුව බවට පත් වෙලා තිබෙන්නේ, ඒ කඩා වැටෙන බැංකු පිටුපස තිබෙන විශාල දේශපාලන හයිය. මේක දැන් මාතර දිස්ත්‍රික්කයේත් මේ ආකාරයටම ක්‍රියාත්මක වනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සමහර ස්ථානවල මේක මාෆියාවක් හැටියටයි ක්‍රියාත්මක වෙන්නේ. මේ ග්‍රාමීය බැංකු තුළ වත්කම් වැඩි ප්‍රමාණයක් නැහැ. නමුත්, ග්‍රාමීය බැංකුවල නිලවරණයට ඉදිරිපත්ව තරග කරන පිරිස ඒ සඳහා වියදම් කරන මුදල දිහා බැලුවාම, මේ සඳහා සංවිධානය වන ආකාරය දිහා බැලුවාම ඉතාමත් පුදුමයි. ඔවුන් මේ සඳහා වියදම් කරන මුදල අභිංසක ජනතාවගේ තැන්පතුවලින්, නැත්නම් අභිංසක ජනතාවගේ වත්කම්වලින් උපයා ගැනීමේ ක්‍රමවේදයන්ටත් ඇතුළත් වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට හිතෙන හැටියට මේ රටේ මහ දවාලේ සිදු වෙච්ච මහ බැංකු වංචාවෙන් පසුව දැන් ඒක රෝගයක් හැටියට ග්‍රාමීය බැංකුවලටත් බෝ වෙලා තිබෙනවා. අද දවසේ මේ ග්‍රාමීය බැංකුවල සිදු වෙමින් තිබෙන අක්‍රමිකතා වැළැක්වීම සඳහා විශේෂයෙන්ම පළාත් සභාව පැත්තෙන් සිදුවන මැදිහත් වීමේත් අඩු පාඩු තිබෙනවා. පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයාට හැකියාව තිබෙනවා, අධ්‍යක්ෂ මණ්ඩලවලට සුදුසු නිලධාරීන් පත් කරලා, අවශ්‍ය නියාමන කටයුතු කිරීමට. නමුත්, අපි දකිනවා සමහර තැන්වල -හැම තැනම නොවෙයි.- ග්‍රාමීය සමුපකාර අධ්‍යක්ෂ මණ්ඩල පත් කරද්දී දේශපාලන බලපුළුවන්කාරකම්වලට හා ඔවුන්ගේ නිර්දේශ තුළින් ඒ කටයුතු සිද්ධ වන බව. ඒ නිසා විශේෂයෙන්ම මේ ගරු සභාවේ අවධානය මා ඒ කෙරෙහි යොමු කරවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ETI ආයතනය වැනි මූල්‍ය ආයතන කඩා වැටීමේදී අපි දැක්කා විශාල පිරිසක් අසරණභාවයට පත් වනවා. මහ බැංකු වංචාව නිසා මේ රටේ ආයෝජකයන් අසරණ වුණු අවස්ථා අපි දැක්කා. ඒ නිසා අද ජනතාවගේ විශ්වාසය බිඳීගෙන යමින් පවතිනවා. පසුගිය කාලයේ ග්‍රාමීය බැංකුවල මුදල් තැන්පත් කරපු, ආයෝජනය කරපු බොහෝ දෙනෙකුගේ ඒ විශ්වාසය අද බිඳීගෙන යමින් පවතින මොහොතක අපි ගරු සභාවේ අවධානය යොමු කරවනවා, මේ වෙනුවෙන් මැදිහත් වීමක් සිදු කරන්න කියලා. විශේෂයෙන්ම පළාත් සභාව, මධ්‍යම ආණ්ඩුව ඒ වෙනුවෙන් යම්කිසි නියාමන වැඩ පිළිවෙළක් සකස් කරලා මේ ග්‍රාමීය බැංකු පද්ධතිය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් අවශ්‍ය කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින්, ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව නැවත වතාවක් ස්ථිර කරමින්, මා නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා.

[අ.භා.6.40]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දූෂණයට, අක්‍රමිකතාවට එරෙහිව සටන් වදින ඔබතුමා මූලාසනයේ ඉන්න වෙලාවක මෙවැනි යෝජනාවක් ගැන සාකච්ඡා කිරීමට ලැබීම ගැන මා සතුටු වනවා.

ගාල්ල දිස්ත්‍රික්කයේ හබරාදුව විවිධ සේවා සමුපකාර සමිතියේ පසුගිය කාල පරිච්ඡේදය තුළ කෝටි 60කට ආසන්න මුදලක් වංචා කිරීම සම්බන්ධයෙන් මා හිතවත් ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව, දකුණු පළාත නියෝජනය කරන අපේ මිත්‍ර කංචන විජේසේකර මන්ත්‍රීතුමා ස්ථිර කළා, එම කාරණාව දකුණු පළාත් සභාවේ සමුපකාර දෙපාර්තමේන්තුවට අයත්වන්නක් නිසා.

ඇත්ත වශයෙන්ම මේ වෙලාවේ අපි දේශපාලන භේදයක් නැතිව මේ දූෂණයට විරුද්ධව එකට කටයුතු කරනවා. මේ තුළින් පෙනෙනවා දූෂණ විරෝධී කටයුතු සඳහා එක්සත් ජාතික පක්ෂයද, පොදුජන එක්සත් පෙරමුණද, එහෙම නැත්නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයද කියලා භේදයක් නැතිව කටයුතු කරන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව මා ඉතා හොඳින්ම දන්නා කාරණා කිහිපයක්ම තිබෙනවා. ගාල්ල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සම සභාපතිවරයා හැටියට මා මේ ප්‍රශ්න ගැන පසුගිය වර පැවැත්වූ කමිටු සාකච්ඡාවේදී පොලිසියට, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට සහ අදාළ අනෙකුත් ආයතනවලට දැනුම් දුන්නා, වහාම මේවා පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියලා. දකුණු පළාතේ පළාත් සමුපකාර අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා හැටියට කටයුතු කරන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන නීතිඥ යූ.ජී.ඩී. ආරියතිලක මැතිතුමා. එතුමා මේ සම්බන්ධව මා සමඟ සාකච්ඡා කළ කාරණාත්, ඒ වෙනුවෙන් ගත හැකි ක්‍රියාමාර්ග මොනවාද කියන එක පිළිබඳවත් ඉතාම කෙටියෙන් සඳහන් කරන්නට කැමැතියි. මම හිතන විධියට ඒ බැංකුව රුපියල් කෝටි 60ක මුදලක් වංචා කරලා තිබෙනවා. දැනට තැන්පත්කරුවන්ට ලක්ෂ 7ක මුදලක් පමණයි ගෙවලා තිබෙන්නේ. තව කෝටි 53ක මුදලක් අභිංසක ගනුදෙනුකාර ජනතාවට ගෙවන්නට තිබෙනවා.

පසුගිය කාල පරිච්ඡේදය තුළ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සම්බන්ධ එක්සත් ජනතා නිදහස් සන්ධානයට උදව් කළ සභාපතිවරයෙක් තමයි මේ සමුපකාරයේ හිටියේ. ගරු වෛද්‍ය රමේෂ් පතිරණ මැතිතුමන්ලා මේවාට සම්බන්ධ නැහැ. පැවැත්වූ පරීක්ෂණයෙන් පස්සේ, සමුපකාර පනතේ 62 වගන්තියට අනුව ඒ සභාපතිවරයා ඉවත් කළා. ඉන් පසු ඔහු ගාල්ල මහාධිකරණයේ නඩුවක් දාලා ඒ රැකියා තහනම ඉවත් කර ගැනීම සඳහා තහනම් නියෝගයක් ගත්තා. ඒ නියෝගයෙන් පස්සේ ඉතාම අවාසනාවන්ත දෙයක් සිද්ධ වුණා. සමුපකාර කොමසාරිස්වරයා කැඳවන්නේ නැතිව, ඒ පිළිබඳව විමසන්නේ නැතිව ඒක පාර්ශ්විකව තමයි මහාධිකරණයේදී තහනම් නියෝගයක් ලබා දුන්නේ. සාමාන්‍යයෙන් එහෙම සිද්ධ වෙනවා. ඔහු අධිකරණයෙන් ලබාගත්ත තහනම් නියෝගය ක්‍රියාත්මක වුණු නිසා සමුපකාර කොමසාරිස් දෙපාර්තමේන්තුවටවත්, බලය තිබෙන අමාත්‍යාවරයාටවත් ඒ පිළිබඳව කටයුතු කරන්නට නොහැකි වුණා. ඒ නිසා සිද්ධ වුණේ, ඊළඟ සමුපකාර ඡන්දය වෙලාවේත් ඒ පුද්ගලයාගේ කණ්ඩායම ජයග්‍රහණය කරලා ඒ පුද්ගලයාම නැවත සභාපති බවට පත් වීමයි. නමුත්, පසුව නැවත පරීක්ෂණයක් කරලා ඔහු ඉවත් කරලා තිබෙනවා. වෙනම පරීක්ෂණයක් කරලා සමුපකාරයේ සභාපතිකමෙන් ඉවත් කළත්, ඒ කාලය තුළ සිදු වුණු දේවල් පිළිබඳව උත්තර දෙන්න ඕනෑ.

ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ 25,000කට වැඩි පිරිසක් මේ සමුපකාරය සමඟ ගනුදෙනු කළා. ඒ ගනුදෙනු කරලා තිබෙන්නේත් අපූරු විධියට. මහජන බැංකුව වාගේ රාජ්‍ය බැංකුවලත්, වාණිජ බැංකුවලත් සාමාන්‍යයෙන් ස්ථිර තැන්පතු සඳහා දෙන්නේ සියයට 12ක 13ක වාගේ පොලියක්. හැබැයි, ඒ කිසිම බැංකුවක නැති තරමේ ඉහළ පොලී අනුපාතයක්, සියයට 16ක් වැනි පොලී අනුපාතයක් දෙනවා කියලා ප්‍රචාරය කරලා තමයි මේ ග්‍රාමීය බැංකුව තැන්පතු ලබාගෙන තිබෙන්නේ. මහජන බැංකුව, ලංකා බැංකුව වාගේ බැංකුවල තිබුණු මුදල් ගෙනැල්ලා මිනිස්සු මේ සමුපකාර බැංකුවේ තැන්පත් කළා. කවුද අකමැති ඉහළ පොලියකට? රජයෙන් පිළිගත් ග්‍රාමීය බැංකු ව්‍යාපාරය ගැන මිනිසුන්ට විශ්වාසයක් තිබුණා. ඒ නිසා ග්‍රාමීය බැංකුව ස්ථිර තැන්පතුවකට සියයට 16ක් පොලිය ලබා දෙන විට, සියයට 12ට, 11ට වෙනත් බැංකුවල ස්ථිර තැන්පත් දාලා තිබුණු බොහෝ අය ඒ මුදල් ග්‍රාමීය බැංකුවේ තැන්පත් කළා. මේක තමයි අපේ ගරු රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා කිව්වේ. ඉමදුව ප්‍රදේශයේ තරුණ මහත්මයෙක් කොරියාවේ ගිහිල්ලා උපයපු ලක්ෂ 90ක් ගෙනැල්ලා මේ බැංකුවේ දැම්මා. මේ බැංකුව මේ සල්ලි තමන්ට ඕනෑ ඕනෑ අයට ඕනෑ ඕනෑ විධියට දුන්නා. සමහරුන්ට සාමාන්‍ය ඇප දෙකක් මත සමුපකාර කළමනාකරුගේ වුවමනාවට ණය දීලා තිබෙනවා. මම හිතන විධියට මිනිස්සු වැඩි ලාභයක් ලබන්නට මේ කරා යොමු වුණා.

මෙහි විශේෂත්වය වන්නේ, සමහර බැංකු කළමනාකරුවන් සල්ලි තිබෙන කොල්ලන්ගේ, සල්ලි තිබෙන ව්‍යාපාරිකයන්ගේ ගෙවල්වලට ගිහිල්ලා ඒ අයගේ සල්ලි අරගෙන මේ බැංකුවේ තැන්පත් කිරීමයි. එහිදී හරිම අපූරු සිදුවීමක් වුණා. ඉමදුව ප්‍රාදේශිකයේ හිටපු කළමනාකාරතුමියට ලක්ෂ පහක ණයක් ගන්න ඕනෑය කියන කොට, චෝදනාවට ලක් වෙච්ච ඒ සභාපතිවරයා කිව්වා, "එහෙම නම් ගිහිල්ලා මුදලක් අරගෙන එන්න. ඔයාට ඒ එක්කම ණය දෙන්නම්." කියලා. මම මේ කියන කාරණය රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා දන්නවා. ඊට පස්සේ තරුණයෙක් ළඟට ගිහිල්ලා කියනවා, "අපේ බැංකුව මෙන්න මේ වාගේ පොලියක් ලබා දෙනවා. ඒ නිසා කරුණාකරලා මේ බැංකුවේ තැන්පත් කරන්න. ඔබට ඉතාම වාසිදායකයි" කියලා. ඒ මුදල තැන්පත් කළාට පස්සේ ඒ සමුපකාරකයේ කළමනාකාරතුමිය රුපියල් ලක්ෂ පහක ණය මුදල ගත්තා.

මේ වාගේ මුදල් දීපු විශාල පිරිසක් අද ඉතා අසීරුතාවට පත් වෙලා ඉන්නවා. මෙහිදී මුදල් තැන්පත් කිරීමේ රෙගුලාසි සම්පූර්ණයෙන්ම උල්ලංඝනය කරලා තිබෙනවා. දකුණු පළාත් සමුපකාර කොමසාරිස්වරයා චක්‍රලේඛයක් මඟින් කියලා තිබෙනවා, රජයේ පිළිගත් වාණිජ බැංකුවල පොලී අනුපාතයට වඩා වැඩි වෙන විධියට කටයුතු කරන්න එපා කියලා. නමුත් ඒ සියල්ල උල්ලංඝනය කරලායි කටයුතු කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් ජාවාරමක් කරලා තිබෙනවා. සමහර වෙලාවට සියයට 16ක පොලියක් දෙනවා කියලා මුදල් ගන්නවා. සියයට 16යි කිව්වාම තැන්පත්කරුවන් මුදල් තැන්පත් කරනවා. ඒ නිසා ඒ සමුපකාරකයේ ඕනෑ තරම් මුදල් තිබෙනවා. ඊට පස්සේ ඒ මුදල මහජන බැංකුව වාගේ වෙනත් බැංකුවක තැන්පත් කරනවා. එවැනි බැංකුවක අඩු පොලී ප්‍රමාණයකට තැන්පත් කරලා, ඒක සුරැකුමක් විධියට තියලා සමුපකාර සමිතිය නැවතත් ණයක් ගන්නවා. ඒ විධියට අඩු පොලී ප්‍රමාණයක් ලැබෙන විධියට බැංකුවල තැන්පත් කළාම කෝටි 30කට ආසන්න මුදලක් මොන විධියටවත් තැන්පත්කරුවන්ට නැවත ගෙවන්න බැහැ. මොකද බැංකුවෙන් ලැබෙන පොලියට වඩා වැඩි පොලියක් තැන්පත්කරුවන්ට ගෙවන්න තිබෙන නිසා. මේ හේතුව නිසා මොකක්ද වෙලා තිබෙන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා කෝටි 30ක මුදලක් සම්පූර්ණයෙන්ම අවභාවිත වෙලා තිබෙනවා. තවත් කෝටි 10ක මුදලක් යම් යම් අයට සුළු සුළු ඇප මත ලබා දීලා තිබෙනවා. අඩු තක්සේරු සුරැකුම් ප්‍රමාණයක් අරගෙන තමයි ඒ ණය දීලා තිබෙන්නේ. ඒ නිසා මොනවා කළත් මේ මුදල ගෙවන්න පුළුවන්කමක් නැහැ. මේක ඉතාම අවාසනාවන්ත සිද්ධියක්. සියයට 16ක පොලියට ගම්වල තැන්පත්කරුවන්ගෙන් මුදල් ලබාගෙන ඒ මුදල් සියයට 4, 8 වාගේ සුළු පොලියකට හිතවත් අයට දෙනවා. සමුපකාරයේ මැනේජර් කෙනෙක් හදිසියේ ණයක් ඉල්ලුවොත්, කිසිම බයක් නැතුව සියයට 4ක, සියයට 8ක පොලියට ඒ ණය මුදල දෙනවා. මේ වාගේ ඉතාම අවාසනාවන්ත, අකාරුණික පාලන තන්ත්‍රයක් තමයි ඒ සමුපකාරවල තිබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ කියන කාරණය ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමා දන්නවා. මේ තත්ත්වය මාතර සමුපකාර සමිතියේත් තිබෙනවා. පසුගිය කාලයේ මාතර සමුපකාර ආරෝග්‍ය ශාලවේ අමුතු දේවල් සිදු වුණා. ඒ සභාපතිවරයා ක්‍රියා කරන්නේ අත්තනෝමතිකව. ඒ දේවල් සම්පූර්ණයෙන් වහගෙනයි ඉන්නේ. ඒ සභාපතිවරයා ඉවත් කරන්න පළාත් සභාවේ ඇමතිවරයාටවත් බැහැ. ඒක මතක තියා ගන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ සමුපකාර සමිතියේ ඉතාම අවාසනාවන්ත සිද්ධි වෙනවා. පොලිසියට සම්බන්ධ ඇතැම් අය මේ දූෂිතයන් ආරක්ෂා කරනවා. මේ දූෂිත සභාපති ආරක්ෂා කරන්නේ මොන ආකාරයටද කිව්වොත්, ඒකට මෙන්න හොඳ උදාහරණයක්. මාතර සමුපකාර රෝහලේ දරු උපතක් ගැන කථාවක් තිබෙනවා. පෙරඅම්මා කියන කාන්තාවකට දරුවෙක් ලැබෙන්න හිටියා. ඒ කාන්තාව, පොලීසියේ සාජන්වරයෙකුගේ බිරිඳක වන රේඛාගේ නමින් ඒ සමුපකාර රෝහලට ඇතුළත් කරනවා. ඒ පොලිස් සාජන්වරයාටයි, බිරිඳටයි -ඒ දෙපළට- දරුවෝ නැහැ. ඒ නිසා දරු ජාවාරම කර ගන්න දරුවෙකු හම්බ වෙන්න ඉන්න පෙරඅම්මා ඇතුළු කරනවා, සමුපකාර රෝහලට. රේඛා කියන නමින් ඇතුළු කරලා, ඒ දරුවා ලැබුණාට පස්සේ අර දෙන්නා ඒ දරුවා අරගෙන යනවා. පෙරඅම්මාටයි දරුවා ලැබෙන්න ඉන්නේ. හැබැයි, රේඛා නමින් තමයි පෙරඅම්මා රෝහලට ඇතුළත් කරන්නේ. මොකද, දරුවා ලැබුණාට පසුව රේඛාට දරුවා ගන්න ඕනෑ නිසා. මේ පිළිබඳව පොලිස්පතිවරයාට පැමිණිලි කරලා තිබෙනවා. පොලිස්පතිවරයාට පැමිණිලි කළාට

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

පස්සේ, ඒ පිළිබඳව පරීක්ෂණය කරන්න ඉන්නේත් පොලීසියේ ඒ සාජන් මහත්තයායි. ඔහු පරීක්ෂණවලට යනවා. පරීක්ෂණ කළාට සිද්ධිය අහුවෙන්නේ නැහැ, ඒක යට ගැහුවා. ඒ නිසා නැවත මේ පිළිබඳව පොලිස්පතිට දන්වලා තිබෙනවා. නමුත් අද වෙනතෙක් ඒ ගැන පරීක්ෂණයක් නැහැ. ඒ නම්-ගම් තිබෙනවා. ඒවා අවශ්‍ය සාක්ෂිවලට දෙන්න පුළුවන්. දකුණු පළාතේ සමුපකාර අමාත්‍යවරයා ඉතාම පැහැදිලිව මේවාට විරුද්ධ වෙනවා. මේ පිටුපස එක්තරා දේශපාලන හස්තයක් ක්‍රියාත්මක වෙනවා. ඒ කවුද කියලා රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා දන්නවා; මාත් දන්නවා.

හැබැයි, මේ සම්බන්ධයෙන් යටින් ක්‍රියාත්මක වෙලා ඒ, හොරු ආරක්ෂා කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අද මේ පිළිබඳව පරීක්ෂණ කරන්න පොලීසියට බැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මාතර පොලීසියේ පැමිණිල්ල දැම්මාට වැඩක් නැහැ. මේ හොරු ආරක්ෂා කරන ඇතැම් පොලිස් නිලධාරීන් ඉන්නවා. මම එය බය නැතිව කියනවා. අර "රේබා" කියන කාන්තාවගේ නමින් පෙරියම්මා රෝහලට ඇතුළත් කරලා ලැබුණු දරුවා ගැන පරීක්ෂණයක් කරන්න කියලා මම පොලිස්පතිවරයාට කියනවා. සාමාන්‍යයෙන් පොලිස්පතිතුමාට පැමිණිල්ලක් කළාම එය කාටද යවන්නේ? පොලිස්පතිතුමා අදාළ කටයුතු කිරීම සඳහා එය යවනවා, පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිට. ඊට පසුව ඔහු එය පොලිස් අධිකාරිවරයා වෙත යවනවා. පොලිස් අධිකාරිවරයා එය සහකාර පොලිස් අධිකාරිවරයාට යවනවා. අවසානයේ එය යන්නේ, සිදුවීම වූ ප්‍රදේශයේ HQI වෙත හෝ එතැන සිටින කවුරුන් හෝ නිලධාරියකු වෙතයි. අවසානයේ සිදු වන්නේ "නඩුත් භාමුදුරුවන්ගේ - බඩුත් භාමුදුරුවන්ගේ" වාගේ, නීතිය හරියාකාරව ක්‍රියාත්මක නොවීමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා ඔබතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා. හබරාදුව විවිධ සේවා සමුපකාර සමිතියට අදාළ සිද්ධිය සම්බන්ධයෙන් කටයුතු කරන්න මුදල් අමාත්‍යාංශයට සිද්ධ වනවා. ගාල්ල දිස්ත්‍රික්කයේ අක්මීමන සමුපකාරය ඇතුළුව සමුපකාර 11කට ආසන්න ප්‍රමාණයක් තිබෙනවා. දකුණු පළාතේ සමුපකාර 33ක් තිබෙනවා. ගාල්ල, මාතර, හම්බන්තොට කියන දිස්ත්‍රික්කවල සමුපකාර ක්ෂේත්‍රය කෙරෙහි පැවැති ජනතාවගේ විශ්වාසය සම්පූර්ණයෙන්ම භංගත්වයට පත් වෙලා තිබෙනවා. ගම්බද ප්‍රදේශවල දුක් විඳින අහිංසක මිනිස්සු එදා විශ්වාසය මත ඉඩමක් හෝ කුමක් හෝ දෙයක් ඇපයට තියලා අඩු පොලියකට කීයක් හෝ ණයක් ලබා ගත්තා. අද ඒ අය එසේ ණය මුදලක් ලබා ගන්න බැරි ඉතාම අසීරු තත්ත්වයට පත් වෙලා ඉන්නවා. මේ ව්‍යාපාරය සම්පූර්ණයෙන්ම කඩා දමන්න කටයුතු කරපු, ඉතාම අවාසනාවන්ත තත්ත්වයකට පත් කරපු අයට විරුද්ධව අනිවාර්යයෙන්ම කටයුතු කරන්න ඕනෑ.

විශේෂයෙන්ම අපි ඊයේ නොයෙකුත් මූල්‍ය ආයතන පිළිබඳව කතා කළා. ස්වර්ණවාහිනී නාළිකාව ඇතුළු ඊළඟ සමූහ ව්‍යාපාරය ගැන කථා කළා. එම මූල්‍ය ආයතනයේ මුදල් තැන්පත් කළ ගනුදෙනුකරුවන් සංඛ්‍යාව 35,000යි. කලින් කථා කළ මන්ත්‍රීවරයකුත් කිව්වා වාගේ, ඒ පිළිබඳව ලොකු ප්‍රසිද්ධියක් තිබෙනවා. කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු ඒ ගැනත් කිව්වා. මෙම ග්‍රාමීය බැංකුවේ ගනුදෙනුකරුවන් සංඛ්‍යාව 25,000යි. ඒ පිළිබඳව ප්‍රසිද්ධියක් තිබුණත්, මේ ග්‍රාමීය බැංකු ගැන කවුරුවත් දන්නේ නැහැ. මම වගකීමෙන් කියනවා, මේ වැරැද්ද අපි නිවැරැදි කරන්න ඕනෑ. අපි ජනතාවට වග කියන්න ඕනෑ. මේ සිද්ධිය නිසා අද ග්‍රාමීය බැංකු ව්‍යාපාරය සම්පූර්ණයෙන් කඩා වැටී තිබෙනවා. ගමේ මිනිහා තුළ මේ කෙරෙහි විශ්වාසය නැති වන කොට, ඉතාම අවාසනාවන්ත තත්ත්වයට පත් වෙනවා. ඒ පිළිබඳව පරීක්ෂණ පැවැත්වුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම යෝජනාවක් කරන්න කැමැතියි. කරුණාකර අපේ ආංශික අධීක්ෂණ කාරක සභාවට - Sectoral Oversight Committee එකට- මේ සම්බන්ධයෙන් අදාළ පුද්ගලයන් ගෙන්වන්න. අදාළ පළාත් සභාවේ අමාත්‍යවරයා සාක්ෂි දෙන්න ලෑස්තියි; කොමසාරිස්වරයා සාක්ෂි දෙන්න ලෑස්තියි; දිස්ත්‍රික් කොමසාරිස්වරුන් සාක්ෂි දෙන්න ලෑස්තියි. ඒ සඳහා සම්බන්ධ වුණු සියලු වගකිව යුතු නිලධාරීන් ගෙන්වා, ආංශික අධීක්ෂණ කාරක සභාව මඟින් ඒ පිළිබඳව විසඳුමක් ලබා දීලා, රජය හෝ මැදිහත් වෙලා, ඒ වැරැද්ද කරපු අයගෙන් - වැරදිකාරයන්ගෙන්- මුදල් අය කර ගන්න. ගරු රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා කිව්වා වාගේ, ඔවුන්ගේ දේපළ විධියට දැන් තිබෙන්නේ තෙල් පිරවුම්හල විතරයි. ඒකත් උකස් තියලාද කියන එක ප්‍රශ්නයක්. මා හිතන්නේ ඒකත් උකස් තියලා. ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමාට, ගරු වජිර අබේවර්ධන අමාත්‍යතුමාට, අපට - සියලු මහජන නියෝජිතයන්ට- පාරිභෝගිකයන් මේ පිළිබඳව පැමිණිලි කර තිබෙනවා. ඒ නිසා සමස්ත මහජන නියෝජිතයන් වෙනුවෙන් මම ඉල්ලීමක් කරනවා. අපි පක්ෂ භේදයක් නැතිවයි මේ පිළිබඳව කටයුතු කරන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයේ සිටින වෙලාවේ මා ඔබතුමා මඟින් ගරු කථානායකතුමාගෙන් ඉල්ලීමක් කරනවා, අදාළ අය ආංශික අධීක්ෂණ කාරක සභාවට ගෙන්වා ඒ කාරණය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න කියා. අද අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට මේ වාගේ දෙයක්, හොරකමක් අල්ලන්න බැරි නම් ජාත්‍යන්තරයට ගිය හොරු අල්ලන්නේ කොහොමද කියා මම අහනවා. වැරැදි කරපු අය අද ඒ ගම් ප්‍රදේශවල නිදුකින් ඉන්නවා. අද ඒ මුදල් පිළිබඳව කතා කරනවා. අපට සැකයක් තිබෙනවා, ඒ මුදල් කුමන ආකාරයෙන් පාවිච්චි කළාද කියන එක සම්බන්ධයෙන්. ඉතාම අකාරුණික විධියට ඒ මුදල් පාවිච්චි කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න කියා මා ඉල්ලා සිටිනවා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවටත් අපි වගකීමෙන් කියනවා, මේ සම්බන්ධයෙන් වාර්තා කරන්න ඕනෑ, පොලිස්පතිතුමා මේ පිළිබඳව නැවත පරීක්ෂණයක් කරන්න ඕනෑ කියා. මාතර සිද්ධිය ආදි සිදුවීම්වලට අදාළ සියලු පාර්ශ්වයන් අපි දෙන්නම්. මේ රටේ නිබුණු "සම උපකාරය" යන අරුතින් කටයුතු කරගෙන ගිය පිරිසිදු පාලන තන්ත්‍රයක්, දරුවන් ජාවාරම් කරන තක්කඩින් බවට පත් වෙලා තිබෙනවා; සම්පූර්ණයෙන්ම දහ ජරා වෑහෙන තත්ත්වයට පත් කර තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න කියා මා ඉල්ලීමක් කරනවා. මෙය අපේ දිස්ත්‍රික්කයේ සිද්ධ වෙච්ච කාරණයක් වන නිසා, මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන් ගරු රමේෂ් පතිරණ මන්ත්‍රීතුමාටත්, එය ස්ථිර කළ ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමාත් ඇතුළු සියලුදෙනාටම අපි ස්තුතිවන්ත වෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක අමාත්‍යතුමා ඇතුළු අප සියලුදෙනාගේ ඉල්ලීම වන්නේ මේ සිද්ධිය සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න කියන එකයි. ඒ කෙරෙහි අවධානය යොමු කරලා, කෙටි කාලයක් තුළ අවශ්‍ය කටයුතු කරන්න කියලා මා ඉල්ලීමක් කරනවා. මොකද, නඩුවක් දැම්මාට පසුව තීන්දුවක් දෙන්න සාමාන්‍යයෙන් අවුරුදු 5ක්, 6ක් පමණ ගත වනවා. එතකොට සමහරවිට පාලන තන්ත්‍ර වෙනස් වෙනවා; නොයෙක් දේවල් වෙනස් වෙනවා. අධිකරණ නියෝගයක් ගත්තාම, එය වෙනස් කරන්න අවුරුදු ගණන් ගත වන තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මෙම සිද්ධිය සම්බන්ධයෙන් ඉක්මනින් අවශ්‍ය කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින්, මට කාලය ලබා දීම සම්බන්ධයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කතාව අවසන් කරනවා.

[අ.භා. 6.56]

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ යෝජනාව මෙතරම් පහු වෙලා ගෙන ඒම පිළිබඳව, විශේෂයෙන්ම අපේ ගරු රමේෂ් පතිරණ මන්ත්‍රීතුමාටත්, එතුමාගේ දිස්ත්‍රික්කය නියෝජනය කරන එක්සත් ජාතික පක්ෂයේ අනෙකුත් මන්ත්‍රීවරුන්ටත් මා කනගාටුව ප්‍රකාශ කරනවා.

මොකද, මේක තමුන්නාන්සේලාගේ දිස්ත්‍රික්කයේ ජනතාවගේ දුක් ගැනවිල්ලක්. රමේෂ් පතිරණ මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු කාරණා ඉතාමත්ම සත්‍යයයි. ගරු ඇමතිතුමනි, ග්‍රාමීය බැංකු ගනුදෙනුකරුවන් 35,000ක් ඉන්නවා. හබරාදුව විවිධ සේවා සමුපකාර සමිතිය යටතේ ග්‍රාමීය බැංකු 11ක් තිබෙනවා. එම ග්‍රාමීය බැංකු ශාඛා 11 තුළ තමයි 35,000ක් වන ගනුදෙනුකරුවන් නියෝජනය වෙන්නේ. කලින් කිව්වා වාගේම, මහ ජනතාව දහඩිය මහන්සියෙන් හම්බ කරගත් රුපියල් කෝටි 60ක තැන්පතු මුදල් තිබෙනවා. අද එම තැන්පතු මුදල් ගන්න ගියාම ඒ සඳහා වග කියන්න, එම මුදල් ලබා දෙන්න කිසිම කෙනෙක් නැහැ, මහහැරලා පැත්තකට වෙලා ඉන්නවා. ගරු රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා කිව්වා වාගේම, තැන්පතුකරුවන්ගෙන් තැන්පතු ලබා ගැනීමේදී සියයට 15, සියයට 16, සියයට 17 වැනි ආකර්ෂණීය පොලී අනුපාත පෙන්වා කරුණු ඉදිරිපත් කරලා, සුරංගනා කථා කියලා තමයි ඒ මිනිසුන්ගේ සල්ලි තැන්පත් කරවාගෙන තිබෙන්නේ. කථාවක් තිබෙනවා නේ, "ගන්නකොට රචනය - දෙනකොට ව්‍යසනය" කියලා. ඒකයි මේ වෙලා තිබෙන්නේ. ගන්න කොට රචනය දාලා, පොත දාලා ගන්නවා. නමුත් ගරු ඇමතිතුමනි, ඒ විධියට තැන්පත් කරන මුදල් ඒ ග්‍රාමීය බැංකුවේම සිටින විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය ඇතුළු ග්‍රාමීය බැංකු නිලධාරීන් ආපසු ණයට ගන්නවා. ගන්නේ කීයටද? සියයට තුනේ, හතරේ, පහේ පොලියට. ඊට පස්සේ මොකක්ද වෙන්නේ? කඩා වැටෙන එක අහන්න දෙයක් නැහැ. මෙන්න මෙහෙම තමයි මේ නස්පැත්තියට ඒ ගොල්ලන් දායක වුණේ.

මම කියන්න ඕනෑ තවත් කාරණයක් තිබෙනවා. මෙන්න මේ විධියට තැන්පත් කරලා තිබෙන මුදල් පිළිබඳව ඒ ජනතාව ලොකු බලාපොරොත්තුවකින් හිටියත්, ජනතාවට එම මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් ගැටලුවක් ඇති වෙලා තිබෙනවා. මම උදාහරණ කිහිපයක් කියන්නම්. එකක් තමයි මෙතුමන්ලා කිව්වා වාගේම, දික්කුඹුරේ ප්‍රදීප් කියන මහත්මයා අවුරුදු පහළොවක් කොරියාවේ හිටියා. ඔහු බොහොම අමාරුවෙන්, මහන්සියෙන්, සීතල විදගෙන සල්ලි හම්බ කරගෙන ඇවිල්ලා ඉඩමක් ගත්තා. ඒ ඉඩමත් විකුණුවා. ගෙනාපු සල්ලි තව රුපියල් ලක්ෂ 70ක් තිබුණා. ඉඩම විකුණුවේ ලක්ෂ 20කට. ඔක්කෝම ලක්ෂ 90යි. ඒ මනුස්සයාගේ රුපියල් ලක්ෂ 90 සමුපකාර ග්‍රාමීය බැංකුවේ නිලධාරීන් **ගෙදරටම** ගිහිල්ලා අරගෙන ඇවිල්ලා තමයි තැන්පත් කළේ. ඒ තරම්ම හදිස්සියි. අද ඒ මනුස්සයාට අල්ලපු අත්තත් නැහැ; පය ගහපු අත්තත් නැහැ. මොකක්වත් නැහැ, අසරණ වෙලා ඉන්නවා.

ගරු අමැතිතුමනි, අහංගම ප්‍රදේශයේ පදිංචි තැන්පත්කරුවෙක් තමන් තැන්පත් කළ මුදල් ගන්න ගියා. මොකටද? ගෙදර මරණයක් වෙලා. රුපියල් 7,000යි ගන්න ගියේ. රුපියල් 7,000 ගන්න ගියාම ඔහුගේ බැංකු ගිණුමේ සත පහක්වත් සඳහන් වෙන්නේ නැහැ. එම නිසා ඒ මනුස්සයා අකුළාගෙන ආපසු ආවා. මෙන්න මේ වාගේ තමයි අද ඒ මිනිස්සු අසරණ වෙලා තිබෙන්නේ. එම මුදල් කාගේවත් දේවල් නොවෙයි. දේශපාලනඥයන්ගේ හෝ සමුපකාර සමිතියේ සභාපතිතුමාගේ හෝ උප සභාපතිතුමාගේ හෝ අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ එම සමුපකාර ග්‍රාමීය බැංකුවල ඉන්න මැනේජර් නෝනලාගේ, මහත්වරුන්ගේ හෝ වෙන කාගේවත් මුදල් නොවෙයි. ඒවා අසරණ මිනිසුන්ගේ දහඩිය මහන්සියෙන්, ලේ කදුළු වැය කරලා හොයපු මුදල්. අද ඒ මහත්වරු එම මුදල් ඕනෑ ඕනෑ විධියට, ලාභදායක විධියට, අඩු පොලියට අරගෙන, ඒවායින් වංචල, නිශ්චල දේපොළ අරගෙන ඉතාමත්ම යහතින් වැජඹෙනවා. නමුත්, අර මිනිස්සු අද හූල්ලමින් ඉන්නවා. මේක තමයි ඇති වෙලා තිබෙන තත්ත්වය.

විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කිව්වා වාගේම, ඔබතුමාට කිව යුතු තව කාරණයක් තිබෙනවා, ගරු ඇමතිතුමනි. එම විවිධ සේවා සමුපකාර සමිතියේ වැලිගමගේ කියලා සභාපතිවරයෙක් හිටියා. වැලිගමගේ කියන එම සභාපතිවරයා තමයි 2010 ඉඳලා එම විවිධ සේවා සමුපකාර සමිතියේ සභාපති වශයෙන් හිටියේ. ඒ මනුස්සයා තමයි සමුපකාර ග්‍රාමීය බැංකුවේ තිබුණු මුදල් විනාශ කිරීමට මුළුමනින්ම දායක වුණේ; මැදිහත් වුණේ. ඊට පස්සේ කලින් කිව්වා වාගේම ඔහුට නඩුවක් වැටුණා. ප්‍රදේශයේ සිටින නමගිය දේශපාලනඥයා එම නඩුවට ඉදිරිපත් වුණා.

එහෙම මැදිහත් වෙලා, එතුමාගේ ආනිසංසයෙන්, ආනුභාවයෙන් මේ පුද්ගලයා මුදා ගත්තා; බේරාගත්තා. ඒ නිසා ඒ පුද්ගලයා අද නිරුපද්‍රිතව ඉන්නවා. එම දේශපාලනඥයාගේ ඡන්ද ව්‍යාපාරයේදී බත් පැකට් බෙදන්න, වතුර බෝතල් බෙදන්න රුපියල් ලක්ෂ ගණන් මේ සභාපතිවරයා සහ ග්‍රාමීය බැංකුවේ මහත්වරු, නෝනලා විසින් පරිත්‍යාග කර තිබෙනවා. ඒ නිසා මේ හොරකම කළ පුද්ගලයා ඒ දේශපාලනඥයාගේ ආනිසංසයෙන්, ආනුභාවයෙන් අදත් ඉතාම යහතින් වැජඹෙනවා. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ හිටපු කෙනෙක්. එතුමා ඒ පැත්තෙන් මේ පැත්තට ඇවිත්; පොහොට්ටුවේ සාමාජිකයෙක් වෙලා, නැවත වතාවක් මේ කටයුත්ත කරන්න අද මැදිහත් වෙලා ඉන්නවා. ගරු රමේෂ් පතිරණ මන්ත්‍රීතුමනි, මේ භ්‍රෂ්ටයාගෙන්, ද්‍රෝහියාගෙන් බොහොම ප්‍රවේශම් වෙන්නය කියා මම තමුන්නාන්සේලාගෙන් විශේෂයෙන් ඉල්ලා සිටිනවා.

තමුන්නාන්සේලා දෙගොල්ලෝම සමුපකාර ව්‍යාපාරය මුළුමනින්ම විනාශ කළා. රට පුරා සමුපකාර ප්‍රාදේශික විශාල ප්‍රමාණයක් තිබෙනවා. මේ ප්‍රාදේශික අද මුළුමනින්ම විනාශ කරලා, "සම උපකාරය" අනික් පැත්ත ගහලා, අද ඒවා නිකම්ම නිකම් මැස්සෝ ඇඟිරෙන තැන් බවට පත් වෙලා තිබෙනවා. සමුපකාර ප්‍රාදේශික ටික කාලා, දැන් ග්‍රාමීය බැංකු ටික සුද්ද කරන්න පටන්ගෙන තිබෙනවා. මම දැන් කියූ ප්‍රාදේශීය දේශපාලනඥයාගේ දේශපාලන වැඩවලදී එයාගේ වාහනවලට තෙල් ගහන්නත් මේ මුදල් යොදවා තිබෙනවා. අන්න ඒ කාරණය මම විශේෂයෙන්ම තමුන්නාන්සේලාගේ අවධානයට යොමු කරනවා.

මේ සමුපකාරයේ හිටපු සභාපතිවරයා -වැලිගමගේ කියන පුද්ගලයා- රුපියල් ලක්ෂ 20ක cheque එකක් බලහත්කාරයෙන් අරගෙන ගියාය කියා ඔහුට විරුද්ධව සමුපකාර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයා පොලීසියේ පැමිණිල්ලක් දමා තිබෙනවා. නමුත් අද වනතුරු පොලීසිය මේ පුද්ගලයා අත් අඩංගුවට ගෙන නැහැ. ඒ ප්‍රදේශයේ සිටින දේශපාලනඥයාගේ ආනුභාවයෙන්, ආනිසංසයෙන් ඔහු නිරුපද්‍රිතව සිටිනවා; ඒ දේශපාලනඥයා මේ හොර දෙටුවා ආරක්ෂා කරනවා. එවැනි රැකවරණයක් තමයි අද ඔහුට ලැබී තිබෙන්නේ. ගරු ඇමතිතුමනි, ජනතාව මේ සම්බන්ධයෙන් පැමිණිලි ඉදිරිපත් කළත්, මේ මුදල්වලට යට වෙලා ඒ කිසිම පැමිණිල්ලක් පොලීසිය භාර ගන්නේ නැහැ, මහහරිනවා.

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, ජනතා විමුක්ති පෙරමුණේ ගාල්ල දිස්ත්‍රික් පළාත් සභා මන්ත්‍රී, එම කණ්ඩායමේ නායක නලින් හේවගේ සහෝදරයා මේ සම්බන්ධයෙන් විශේෂයෙන් මැදිහත් වෙලා මේ වන විට ඒ සඳහා කටයුතු කිහිපයක් කර තිබෙන බව මම ඔබතුමාට කියන්න කැමැතියි. ඒ ජනතාව මැදිහත් කර ගෙන, "හබරාදුව ග්‍රාමීය බැංකුව හා තැන්පත්කරුවන් සුරැකීමේ සංගමය" පිහිටුවා එහි අනුශාසක විධියට ඔහු මේ සියලුම ගනුදෙනුකරුවන් වෙනුවෙන් සක්‍රිය මට්ටමෙන් කටයුතු කරනවා. ඒ වාගේම, හබරාදුව සමුපකාර බල ප්‍රදේශය පුරාම පෝස්ටර් ව්‍යාපාරයක් දියත් කර, අභිංසක තැන්පත්කරුවන්ගේ මුදල් මේ හොර දෙටුවන්ගෙන් මුදා ගන්න ඔහුගේ පැත්තෙන් කටයුතු කර තිබෙනවා. මාධ්‍ය සාකච්ඡාවක් කැඳවා මාධ්‍ය දැනුවත් කිරීම මඟින් මුළු රටම මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ කටයුත්තටත් ඔහු මැදිහත් වී තිබෙනවා. ඒ විතරක් නොවෙයි, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට මේ ප්‍රශ්නය ඉදිරිපත් කර එය විසඳා දෙන ලෙසත්, ඒ ගැන සාකච්ඡාවට ගන්නා ලෙසත් ඔහු ඉල්ලා තිබෙනවා. ඒ වාගේම, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව පැවැත්වෙන අවස්ථාවක ඒ ජනතාව ගෙන්වාගෙන, ඒ අයට සිදුවූ නස්පැත්තියට විරුද්ධව විශාල උද්ඝෝෂණයක් ඔහු එදා ඒ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව ඉදිරියේ කර තිබෙනවා. මේ ජනතාවගේ ප්‍රශ්නයට විසඳුමක් ලබාදීමට මෙවැනි කාර්යයන් රාශියක් එතුමාගේ පැත්තෙන් දියත් කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දකුණු පළාත් සභාවේ හිටපු සමුපකාර ඇමතිවරයා අපේ හම්බන්තොට පැත්තේ ඉන්න ප්‍රසිද්ධ පුද්ගලයෙක්. "පැතුම" කියා සමිති විශේෂයක් එතුමාගේ තිබෙනවා. මෙන්න මේ "පැතුම" සමිතිවලටත් මේ ග්‍රාමීය බැංකුවල මුදල් පරිත්‍යාග කරවාගෙන, තමන්ගේ දේශපාලන කටයුතුවලට ඒවා යොදවා ගෙන තිබෙනවා. ඒ කාරණය ගැනත් තමුන්නාන්සේගේ අවධානය යොමු කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

කවුරු කවුරුත් මේවාට සම්බන්ධවෙලා තිබෙනවා. ඒ නිසා කාගේ කාගේත් මලුවල මොන මොනවා හෝ තිබෙනවාය කියන එක එයින් පැහැදිලි වෙනවා. ඒ වාගේම, පළාත් සභාවේ අවිධි කාරක සභාවට මේ සියලුම නිලධාරීන් කැඳවා ඒ අය ගැන පරීක්ෂණයක් පැවැත්වීමටත් පළාත් සභා මන්ත්‍රී නලින් හේවගේ මහතා විසින් කටයුතු යොදා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මේ සම්බන්ධයෙන් සමුපකාර සමිති පනතේ 46 (1) යටතේ 2016 වසරේ සිටම පරීක්ෂණයක් කරගෙන යනවා. නමුත් එහි ප්‍රතිඵල ලබාදීමට තවමත් කටයුතු කර නැහැ. ඒ නිසා මේ තත්ත්වය ගැන නලින් සහෝදරයා විසින් "සිරස" රූපවාහිනියේ සංවාදයකදී කථා කර තිබෙනවා. ඒ කථා කිරීමේදී හබරාදුවේ ඉන්න ඒ දේශපාලනඥයාට ඒක වැදිලා; දැනිලා ඔහුගේ ඉහ මොළ රත්වෙලා ඔහු අපේ නලින් සහෝදරයාට විරුද්ධව රුපියල් මිලියන 10ක වන්දියක් ඉල්ලා එන්තරවාසියක් යවා තිබෙනවා. නමුත් ඒවාට අද මොන ක්‍රියා මාර්ගයක්වත් අරගෙන නැහැ. මෙන්න මේ වාගේ කටයුතුත් සිද්ධවෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඒ නිසා මේ ගැන මෙන්න මේ ආකාරයට කටයුතු කළ යුතුය කියා අපි යෝජනා කරනවා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා කිව්වා වාගේ, පළමුවැනිව කළ යුතු වන්නේ, මීට අදාළ බලධාරීන් සියලුදෙනාම පාර්ලිමේන්තුවට කැඳවලා ඒ අය සම්බන්ධයෙන් පරීක්ෂණයක් වහාම දියත් කිරීමයි. ඒ වාගේම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට මේ සම්බන්ධයෙන් පැමිණිල්ලක් කරලා එය අනිවාර්යයෙන්ම විමර්ශනයට ලක් කළ යුතුයි. සමුපකාර සමිතියේ හිටපු සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය, බැංකු කළමනාකරුවන් සහ අනිකුත් නිලධාරීන් සියලුදෙනාගේම වත්කම් බැරකම් පිළිබඳව සොයා බලලා, ඒවා තහනමට ලක් කරලා ඒ සියලු දේවල් අත්පත් කරගෙන මේ අභිංසක මිනිසුන්ගේ ප්‍රාර්ථනා ඉෂ්ට කරන්න, අනිවාර්යයෙන්ම මැදිහත් වන්නය කියන ඉල්ලීම මම මේ මොහොතේ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් අද නිශ්චිත, පැහැදිලි, විධිමත් වගකීමක් සහිත උත්තරයක් දෙන්න අදාළ ඇමතිවරු සභාගී නොවීම පිළිබඳව මා ඉතාම කනගාටු වෙනවා. ඒ නිසා මට කියන්න තිබෙන්නේ, " වැටත් නියරත් ගොයම් කා නම්, කාට පවසම් ඒ අමාරුව" කියන කියමන විතරයි.

ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමා.

[අ.භා.7.08]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරු හතරදෙනකු විසින් ඉතාම වැදගත් කරුණු කාරණා රාශියක් ඉදිරිපත් කළා. අද ඉදිරිපත් කළ ඒ සියලුම කාරණා විෂයය භාර අමාත්‍යවරයාගේ අවධානයට යොමු කරවනවා. අද දින එතුමාට මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න පැමිණෙන්න නොහැකි වුණේ, මේ දිනවල මේ වෙලාව මුස්ලිම් භක්තිකයන් නෝම්බි අරින වෙලාව නිසායි. එතුමා මේ සියලුම කරුණු සම්පිණ්ඩනය කරලා, ඉදිරි දිනයකදී ඒ පිළිබඳව තමුන්නාන්සේලාට එතුමාගේ අදහස් ප්‍රකාශ කරාවි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව රීට අනුකූලව අ.භා. 7.09ට, 2018 ජූනි 19වන අඟහරුවාදා අ.භා. 1.00 වන තෙක් කල් තියේය.

அதன்படி பி. ப. 7.09 மணிக்கு பாராளுமன்றம், 2018 யூன் 19, செவ்வாய்க்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 7.09 p.m. until 1.00 p.m. on Tuesday, 19th June, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

261 වන කාණ්ඩය - 4 වන කලාපය
2018 ජූනි 19වන අඟහරුවාදා
தொகுதி 261- இல. 4
2018 யூன் 19, செவ்வாய்க்கிழமை
Volume 261 - No. 4
Tuesday, 19th June, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන :
භාණ්ඩාගාර බැඳුම්කර විමර්ශන කොමිෂන් සභා වාර්තාවේ මුද්‍රා නොහළ කොටස්ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන) පනත් කෙටුම්පත : ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
කථානායකතුමාගේ සහතිකය

විගණකාධිපතිවරයාගේ වාර්තාව

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

ජාතිය ගොඩනැඟීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත :
පළමු වන වර කියවන ලදී

කල් තැබීමේ යෝජනාව:
රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ඉදිරිපත් කළ වාර්තාවල නිර්දේශ

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:
திறைசேரி பிணைமுறி விசாரணை ஆணைக்குழு அறிக்கையின் வெளியிடப்படாத பகுதிகள்
காணி பராதீனப்படுத்தல் மீதான மட்டுப்பாடுகள் (திருத்தம்) சட்டமூலம்: உயர்நீதிமன்றத் தீர்ப்பு
சபாநாயகரது சான்றுரை

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கை

வினாக்களுக்கு வாய்மூல விடைகள்

நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை:
அரசாங்கக் கணக்குகள் பற்றிய குழு சமர்ப்பித்த அறிக்கைகளின் சிபாரிசுகள்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Unreleased Sections of the Bond Commission Report
Land (Restrictions on Alienation) (Amendment) Bill: Determination of the Supreme Court
Speaker's Certificate

AUDDITOR-GENERAL'S REPORT

REPORT OF COMMITTEE ON PUBLIC ACCOUNTS

ORAL ANSWERS TO QUESTIONS

NATION BUILDING TAX (AMENDMENT) BILL:
Read the First time

ADJOURNMENT MOTION:
Recommendations Made in Reports Presented by Committee on Public Accounts

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 ජූනි 19වන අඟහරුවාදා
2018 யூன் 19, செவ்வாய்க்கிழமை
Tuesday, 19th June, 2018

අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA]
in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

භාණ්ඩාගාර බැඳුම්කර විමර්ශන කොමිෂන් සභා වාර්තාවේ මුදා නොහළ කොටස්
திறைசேரி பிணைமுறி விசாரணை ஆணைக்குழு அறிக்கையின் வெளியிடப்படாத பகுதிகள்
UNRELEASED SECTIONS OF THE BOND COMMISSION REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම පිළිබඳ පරීක්ෂා කිරීම සහ විමර්ශනය කිරීම සඳහා වූ ජනාධිපති විමර්ශන කොමිෂන් සභා වාර්තාවේ C-350 - C-360 ලෙස 'සලකුණු කර ඇති වෙළුම් තුනකින් සමන්විත ලේඛන' පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිළිබඳව 2018 ජූනි මස 05වන දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී සාකච්ඡා කර තීරණය කළ පරිදි, එකී ලේඛන වාර්තාවේ කොටසක් පමණක් වන හෙයින් එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර C-1 - C-349 දක්වා වූ 'සලකුණු කර ඇති ලේඛන' ද, 'සලකුණු කර ඇති වෙනත් ලේඛන' වෙතොත් ඒවාද ඇතුළුව කොටස් වශයෙන් නොවන සම්පූර්ණ 'සලකුණු කර ඇති ලේඛන' සියල්ලම පාර්ලිමේන්තුවට නොපමාව ඉදිරිපත් කළ යුතු බව දන්වමින් 2018 ජූනි මස 12වන දින ජනාධිපති ලේකම්වරයාට ලිපියක් යවන ලදී.

ඊට පිළිතුරු වශයෙන්, එකී භාණ්ඩාගාර බැඳුම්කර විමර්ශන කොමිෂන් සභා වාර්තාවට අදාළ සියලු ලේඛන පාර්ලිමේන්තුවට මුදා හැරීම සම්බන්ධයෙන් මේ වන විට නීතිපතිවරයාගේ උපදෙස් පතා ඇති බවත්, නීතිපතිවරයාගේ උපදෙස් සහ එකඟතාව ලද වහාම ඒ උපදෙස් අනුව ක්‍රියා කරන බවත් ජනාධිපති ලේකම්වරයා විසින් 2018 ජූනි මස18වන සඳුදා, එනම් ඊයේ දින පාර්ලිමේන්තුවට ලිඛිතව දන්වා ඇති බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

මෙම බැඳුම්කර සිද්ධියට අදාළ සියලුම ලිපිලේඛන නීත්‍යානුකූලව ජනාධිපති කාර්යාලයෙන් මා වෙත ලැබෙන තෙක්, මාධ්‍ය හරහා එකිනෙකාට චෝදනා කරමින් පාර්ලිමේන්තුවේ කීර්ති නාමයටත්, ගරු මන්ත්‍රීවරුන් හා සිවිල් පුරවැසියන්ගේ අභිමානයටත්, අප දේශයේ ගෞරවයටත් හානි වන ආකාරයේ චෝදනා හා ප්‍රකාශ නිකුත් කිරීමෙන් වළකින ලෙස සියලු ගරු මන්ත්‍රීවරුන්ගෙන් හා මාධ්‍යයෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

II

ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන) පනත්
කෙටුම්පත : ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
காணி (பராதீனப்படுத்தல் மீதான மட்டுப்பாடுகள்) (திருத்தம்) சட்டமூலம்: உயர்நீதிமன்றத் தீர்ப்பு
LAND (RESTRICTIONS ON ALIENATION) (AMENDMENT) BILL: DETERMINATION OF THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව "ඉඩම් (සන්තකය පැවරීම සීමා කිරීමේ) (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ඉදිරිපත් කරන ලද පෙත්සම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය දැනුම් දීමට කැමැත්තෙමි.

මෙම පනත් කෙටුම්පතෙහි විධිවිධාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනනුකූල නොවන බවට ශ්‍රේෂ්ඨාධිකරණය තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතුයැයි මම නියෝග කරමි.

ශ්‍රේෂ්ඨාධිකරණ තීරණය:
உயர் நீதிமன்றத் தீர்ப்பு:
Determination of the Supreme Court

IN THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

In the matter of the ordinary exercise of jurisdiction of the Supreme Court under Article 121 of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka read with Rule 63 of the Supreme Court Rules of 1978 against the Bill titled "Land (Restriction on Alienation) (Amendment)"

SC SD 15/2018

Polpagoda Gamage Salochana Vincent
No.35, Kohilakotuwa Road,
Maharagama.

Vs

Hon. Attorney General
Attorney General's Department,
Colombo 12.

Before:

Sisira J de Abrew	Judge of the Supreme Court
Prasanna Jayawardena PC	Judge of the Supreme Court
Murdu N.B.Fernando PC	Judge of the Supreme Court

Counsel:
Kanishka Witharana for the Petitioner.
Dr. Avanthi Perera SSC with Suren Gnanaraj SC for the Attorney General

The Court assembled for the hearing at 10.00 a.m. on 4.6.2018.

[ගරු කථානායකතුමා]

Determination

A Bill titled "Land (Restrictions on Alienation) (Amendment)" was published in the Gazette of the Democratic Socialist Republic of Sri Lanka on 12th April 2018 and placed on the Order Paper of Parliament on 22nd May 2018.

The long title of the Bill reads as 'An Act to amend the 'Land (Restrictions on Alienation) Act No.38 of 2014.'

The jurisdiction of this Court to determine the constitutionality of the said Bill has been invoked in terms of Article 121(1) of the Constitution by a petition presented to the Court by the Petitioner.

The Petition to this Court was filed on 28.5.2018, within one week of the Bill being placed on the Order Paper of Parliament as required by Article 121(1).

When the said Petition was taken up for consideration, learned Counsel appearing for the Petitioner and the learned Senior State Counsel made submissions. The Petitioner, in his Petition has stated that Clauses 2 and 3 of the Bill are inconsistent with Articles 3,4,12(1),12(2),75 and 154G of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka. But learned Counsel did not make submissions as to how the Bill would violate Articles 3,4,12(1),12(2) and 75 of the Constitution.

Clause 2 of the Bill reads as follows.

"Section 3 of the Land (Restrictions on Alienation) Act No.38 of 2014(hereinafter referred to as the Principal enactment) is hereby amended in subsection (1):-

(a) by the repeal of paragraph (b) of that subsection and the substitution therefor of the following paragraph:-

"(b) a condominium parcel specified under the Apartment Ownership Law:

Provided that, the entire value shall be paid upfront through an inward foreign remittance prior to execution of the relevant deed of transfer."

(b) in paragraph (h) of that subsection by the substitution for the words "transfer of such land" of the words "transfer of such lands; and";

(c) immediately after paragraph (h) of that subsection by the addition of the following new paragraph:-

"(i) any land, the title of which is transferred on or after April 1, 2018 to a company referred to in paragraph (b) of subsection (1) of section 2, listed in the Colombo Stock Exchange."

Clause 3 of the Bill reads as follows.

"Section 5A of the Principal enactment is hereby amended:-

(a) by the substitution for the words and figures 'January 8, 2017' of the words and figures 'January 1, 2016.';

(b) in the marginal note thereof, by the substitution for the words and figures 'January 8, 2017' of the words and figures 'January 1, 2016.'

Learned counsel for the Petitioner contended that the Bill deals with the subject of land; that the subject of land is in Provincial Council List of the Constitution; and that it should be referred to every Provincial Council by His Excellency the President in terms of Article 154G(3) of the Constitution before the Bill is enacted by the Parliament.

Article 154 G(3) of the Constitution reads as follows.

"(3) No Bill in respect of any matter set out in the Provincial Council List shall become law unless such Bill has been referred by the President, after its publication in the Gazette and before it is placed on the Order Paper of Parliament, to every Provincial Council for the expression of its views thereon within such period as may be specified in the reference, and-

(a) where every such Council agrees to the passing of the Bill, such Bill is passed by a majority of the Members of Parliament present and voting ; or

(b) where one or more Councils do not agree to the passing of the Bill, such Bill is passed by the special majority required by Article 82 :

Provided that where on such reference, some but not all the Provincial Councils agree to passing of a Bill, such Bill shall become law applicable only to the Provinces for which the Provincial Councils agreeing to the Bill have been established, upon such Bill being passed by a majority of the Members of Parliament present and voting."

The Bill seeks to amend section 3 and 5 of the 'Land (Restrictions on Alienation)'Act No.38 of 2014. The preamble of Act No.38 of 2014 reads as follows.

"WHEREAS in furtherance of the development policies being promoted by the Government in the backdrop of a globally integrated environment, it is deemed expedient and necessary to ensure the prudent use of land which is a limited resource, in a manner that preserves the national interest:

AND WHEREAS it is the National Policy to regulate the use of lands, in a sustainable manner, having imposed restrictions on the alienation of lands to foreigners, foreign companies and certain institutions with foreign shareholding and having granted concessions to citizens of Sri Lanka for certain development projects, as specified in this Act:"

Therefore it appears that the subject of Act No.38 of 2014 is with regard to 'National Policy and not 'land'. Thus the subject of the Bill is also 'National Policy' and not 'land'. The subject of National Policy is not a subject in the Provincial Council List. It is a subject in the Reserved List.

Article 154G(7) reads as follows.

"A Provincial Council shall have no power to make statutes on any matter set out in List II of the Ninth Schedule (hereinafter referred to as "the Reserved List")."

Therefore it is seen that a Provincial Council shall have no power to make statutes in respect of the subjects set out in the Reserved List.

When we consider the above matters we hold the view that compliance under Article 154G(3) of the Constitution is not required before placing the Bill in the order paper of the Parliament. For the above reasons, we hold that the contention of learned counsel for the Petitioner that the subject of the Bill being the subject of land and therefore Article 154G(3) of the Constitution should be complied with cannot be accepted is hereby rejected. We have examined the provisions of the Bill and in our opinion they do not violate the Constitution. For the above reasons, we make determination that the Bill titled "Land (Restrictions on Alienation) (Amendment)" is not inconsistent with the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

Sisira J de Abrew
Judge of the Supreme Court

Prasanna Jayawardena PC
Judge of the Supreme Court

Murdu N.B.Fernando PC
Judge of the Supreme Court

[මෙම ලේඛනය පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த ஆவணம் நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This document is also placed in the Library.]

III

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2018 ජුනි 18වන දින මවිසින් පහත සඳහන් පනත් කෙටුම්පත්වල සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

සාජ්පු හා කාර්යාලයීය සේවකයන් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) (සංශෝධන)

සූතිකාධාර (සංශෝධන)

IV

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම සහ තේරීම් කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம் மற்றும் தெரிவுக்குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS AND MEETING OF COMMITTEE OF SELECTION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2018 ජුනි මස 19වන අඟහරුවාදා, එනම් අද දින අපර භාග 2.00ට මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සභාගී වන ලෙස ගරු සභික මන්ත්‍රීවරුන් සියලුදෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීම අවසන් වූ වහාම තේරීම් කාරක සභාවේ රැස්වීමක් පැවැත්වෙන බවත් දන්වනු කැමැත්තෙමි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව
கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව, 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XVI සහ XVII කොටස් සහ තෙවැනි කාණ්ඩයේ VIII කොටස මම ඉදිරිපත් කරමි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා, පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන සහ නියමයන් ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂය සඳහා ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2017 වර්ෂය සඳහා මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාව;

(iii) 2017 අංක 30 දරන විසර්ජන පනතේ 6 (1) වගන්තිය යටතේ 2018.04.01 සිට 2018.05.31 දක්වා ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ වැය ශීර්ෂ අංක 240 යටතේ පරිපූරක සභාය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් ව්‍යාපෘතිය මඟින් සිදු කරන ලද පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන;

(iv) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන්

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 පෙබරවාරි 15 දිනැති අංක 2058/33 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(v) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 පෙබරවාරි 15 දිනැති අංක 2058/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.

එම වාර්තා, පරිපූරක වෙන්කිරීම් පිළිබඳ සටහන සහ නියමයන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2014 වර්ෂය සඳහා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂය සඳහා කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්; සහ

(ii) 2017 වර්ෂය සඳහා වවුනියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම්.

එම වාර්තා අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2015 වර්ෂය සඳහා සීමාසහිත මිල්කෝ (පුද්ගලික) සමාගමේ වාර්ෂික වාර්තාව; සහ

(ii) 2015 වර්ෂය සඳහා ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව.

එම වාර්තා තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂය සඳහා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2015 වර්ෂය සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

එම වාර්තා තරුණ, ක්‍රීඩා, කලා හා උරුමයන් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් නියමයන් ඉදිරිපත් කරමි.

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ "හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්" ආයතනය උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 11 දිනැති අංක 2053/38 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ කලම්බු ඉන්ටනැෂනල් නෝට්කල් ඇන්ඩ් ඉංජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 11 දිනැති අංක 2053/39 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ ශ්‍රී ලංකා ඉන්ස්ටිට්යුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජනවාරි 24 දිනැති අංක 2055/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ කලම්බු ඉන්ටනැෂනල් නෝට්කල් ඇන්ඩ් ඉංජිනියරින් කොලේජ් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අප්‍රේල් 19 දිනැති අංක 2067/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ ශ්‍රී ලංකා ඉන්ස්ටිට්යුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ගැරන්ටි) ලිමිටඩ් ආයතනය උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අප්‍රේල් 19 දිනැති අංක 2067/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(vi) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ නැෂනල් ස්කූල් ඔෆ් බිස්නස් මැනේජ්මන්ට් ලිමිටඩ් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගනිමින් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අප්‍රේල් 19 දිනැති අංක 2067/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.

එම නියමයන් අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් තොරව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් 2017 වර්ෂය සඳහා තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් තොරව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කාරක සභා වාර්තාව පිළිගැන්වීම. අටවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව, එම කාරක සභාවේ සභාපති ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා විසින් පිළිගැන්වීම.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கை
REPORT OF COMMITTEE ON PUBLIC ACCOUNTS

ගරු ලසන්ත අලගියවන්න මහතා (මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிதி மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர்)
The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Finance and Mass Media)

ගරු කථානායකතුමනි, රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මූල්‍ය පාලනය සහ කාර්ය සාධනය පිළිබඳ පරිගණක තොරතුරු කළමනාකරණ පද්ධතිය මඟින් ඇගයීම - 2016 මුදල් වර්ෂය සම්බන්ධයෙන් අටවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව මම ඉදිරිපත් කරමි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, "එම වාර්තාව මුද්‍රණය කළ යුතුය"යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් තොරව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
අවශ්‍ය කටයුතු සිදු කරන ලදී.
Ordered that the Report be printed.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු විජයකලා මහේස්වරන් මහත්මිය (ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) விஜயகலா மகேஸ்வரன் - சிறுவர் அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Vijayakala Maheswaran - State Minister of Child Affairs)

කෞරව සභාපතිතුමනි, අංක 38, මාර්කට් වීදිය, නීර්කොලම්බු යන ලිපිනයේ පදිංචි ටී.ඒ. තිරුනාවුක්කරසු යන පුද්ගලයාගෙන් මා විසින් ලබා ගන්නා ලද මනුවක් ඉදිරිපත් කිරීමට මම කැමැත්තෙමි.

ගරු සුජීව සේනසිංහ මහතා (ජාත්‍යන්තර වෙළෙඳ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - சர்வதேச வர்த்தக இராஜாங்க அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - State Minister of International Trade)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) නුගේගොඩ, උඩහමුල්ල, පරණ කොට්ටාව පාර, අංක 510/ඒ දරන ස්ථානයෙහි පදිංචි සී.ඩී.ආටිගල මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) අතුරුගිරිය, පෝරෙ, ධම්මදීප ද්විභාෂා මූලික පිරිවෙණෙහි වාසය කරන පූජ්‍ය රුක්මලේ ධම්මකිත්ති නායක ස්වාමීන් වහන්සේගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ටී.බී. ඒකනායක මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

ගරු සුසන්ත පුංචිනිලමේ මහතා
(மாண்புமிகு சுசந்த புஞ்சிநிலமே)
(The Hon. Susantha Punchinilame)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) කැලණිය, ගෝනවල, උදය මාවත, අංක 735/5 දරන ස්ථානයෙහි පදිංචි එච්.කේ.සී. අසේල කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) කොළඹගෙ ආර, 94 කණුව යන ස්ථානයෙහි පදිංචි කේ. එම්. ශාන්ත නිමල්සිරි මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) ත්‍රිකුණාමලය, ජමාලියාපුර, අංක 66/17 දරන ස්ථානයෙහි පදිංචි එස්.ඩී. රපායිදීන් මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, වලපනේ, වතුමුල්ල, අංක 98/D දරන ස්ථානයෙහි පදිංචි උපාලි දයානන්ද අපෝන්සු මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුජිබුර් රහුමාන් මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 -18/'18 - (1), ගරු ආනන්ද අලුත්ගමගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 2 - 38/'18 - (1), ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ලග්ගල මැතිවරණ කොට්ඨාසයේ අවතැන් වූ පවුල්: ඉඩම් ගැටලු
லக்கல தேர்தல் தொகுதியில் இடம்பெயர்ந்த குடும்பங்கள்: காணிப் பிரச்சினை
DISPLACED FAMILIES IN LAGGALA ELECTORATE : LAND ISSUES

132/'18

3. ගරු රෝහිණි කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කළු ගහ, මොරගහකන්ද ව්‍යාපෘතිය හේතුවෙන් මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල මැතිවරණ කොට්ඨාසයේ අවතැන් වූ පවුල්, ලග්ගල මැතිවරණ කොට්ඨාසය තුළම පදිංචි කිරීමට පියවර ගෙන තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, අවතැන් වූ පවුල් සංඛ්‍යාව සහ ලබාදුන් ඉඩම් ප්‍රමාණය කොපමණද;

(iii) එසේ ලබාදුන් ඉඩම් ප්‍රමාණය වත්මන් පරපුරට ප්‍රමාණවත් වුවද, ඊළඟ පරම්පරා සඳහා ප්‍රමාණවත් නොවන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, මොරගහකන්ද ව්‍යාපෘතිය හේතුවෙන් නැවත පදිංචි කරන ලද පවුල් මුහුණ දෙන ඉඩම් ගැටලු හා ඔවුන්ගේ ඊළඟ පරම්පරාවට මුහුණ දීමට සිදුවන ඉඩම් ගැටලු විසඳීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) களுகங்கை, மொரகஹகந்த கருத்திட்டம் காரணமாக மாத்தளை மாவட்டத்தில், லக்கல தேர்தல் தொகுதியில் இடம்பெயர்ந்த குடும்பங் களை, லக்கல தேர்தல் தொகுதியிலேயே குடியமர்த்துவதற்கு நடவடிக்கை மேற்கெள்ளப் பட்டுள்ளது என்பதை அறிவாரா;

(ii) ஆமெனில், இடம்பெயர்ந்த குடும்பங்களின் எண்ணிக்கை மற்றும் வழங்கப்பட்ட காணிகளின் பரப்பளவு எவ்வளவு;

(iii) அவ்வாறு வழங்கப்பட்ட காணிகள், தற்போதைய சந்ததியினருக்கு போதியதாக இருப்பினும், அடுத்த சந்ததியினருக்கு போதியதாக இல்லை என்பதை ஏற்றுக்கொள்வாரா;

(iv) ஆமெனில், மொரகஹகந்த கருத்திட்டம் காரணமாக மீள குடியமர்த்தப்பட்ட குடும்பங்கள் எதிர்கொள்ளும் காணிப் பிரச்சினைகள் மற்றும் அவர்களின் அடுத்த சந்ததியினர் எதிர்கொள்வ தற்கு நேரிடுகின்ற காணிப் பிரச்சினைகளை தீர்ப்பதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக் கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) whether he is aware that steps have been taken to resettle the families of the Laggala Electorate of the Matale District who got displaced owing to the Moragahakanda Project of the Kalu Ganga, within the Laggala Electorate itself;

(ii) if so, the number of families that got displaced and the extent of lands provided;

(iii) whether it is admitted that although the lands thus provided are adequate for the present generation, but those would not suffice for the next generations; and

(iv) if so, the steps that will be taken by the Ministry to solve the land issues faced by the families resettled as a result of the Moragahakanda Project and the land issues that will be encountered by their future generation?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ලග්ගල මැතිවරණ කොට්ඨාසයේ අවතැන් වූ සියලුම පවුල් එම කොට්ඨාසය තුළම පදිංචි කර නොමැත. මොරගහකන්ද-කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් නැවත පදිංචි කිරීමට සිදු වූ පවුල් සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත පරිදි වේ.

ව්‍යාපෘති ප්‍රදේශය	පවුල් සංඛ්‍යාව
මොරගහකන්ද	1,703
කළුගඟ	1,051
එකතුව	2,754

මෙම පවුල් 2,754න් පවුල් 1,973ක් සඳහා ගොඩ හා වාරි ඉඩම් ලබා දී ඇති අතර, ඉන් පවුල් 1,965ක් මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල මැතිවරණ කොට්ඨාසය තුළ පදිංචි කර තිබේ. අනෙක් පවුල් 08 ඔවුන්ගේ කැමැත්ත පරිදි පොළොන්නරුව දිස්ත්‍රික්කයේ මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පදිංචි කර ඇත. මුළු පවුල් 2,754න් ඉඩම් ලබා දුන් පවුල් 1,965 හැර අනෙක් පවුල් 781 තම කැමැත්ත පරිදි ව්‍යාපෘතිය මඟින් ලබා දෙන ගොඩ හා වාරි ඉඩම් වෙනුවට රුපියල් ලක්ෂ 16ක මුදල ලබාගෙන තම අභිමතය පරිදි තෝරාගත් ස්ථානවල පදිංචි වී ඇත.

(ii)

නැවත පදිංචි කළ යුතු පවුල් ගණන	2,754
ඉඩම් ලබා දුන් පවුල් ගණන	1,973
ඉඩම් වෙනුවට රුපියල් ලක්ෂ 16ක මුදල ලබා දුන් පවුල් ගණන	781

ඉඩම් ලබා දීමේදී සෑම පවුලක් සඳහාම නේවාසික ඉඩම් අක්කර 1/2ක් සහ වාරි පහසුකම් සහිතව වගා ඉඩම් අක්කර 1 1/2ක් බැගින් ලබා දී ඇත.

(iii) මොරගහකන්ද-කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රජාව නැවත පදිංචි කිරීමේදී ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අවස්ථාවේදී පදිංචියට බලපෑම් සිදු වන පවුල් පිළිබඳ සලකා බලන අතර, ඊළඟ පරම්පරා සඳහා ඉඩම් ලබා දීම පිළිබඳ සලකා බැලීමේ හැකියාවක් නොමැත.

(මාණ්පුමිකු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මැතිතුමනි, දෙවන වටය නිසා පිළිතුර සභාගත කරන්න වෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ඇමතිතුමා ඇවිල්ලා ඉන්නවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - (Minister of Higher Education and Cultural Affairs)
ගරු කථානායකතුමනි, පිළිතුර ලබාදෙන්න විනාඩි දෙකකට වඩා ගත වන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, නැහැ, ගරු ඇමතිතුමා. දෙවන වටයේදී අනුගමනය කරන ප්‍රතිපත්තියක් තිබෙනවා. ප්‍රතිපත්තිය කැඩුවොත් ඒක දිගටම යනවා. ඒ නිසා සභාගත කරමු.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, එතුමා පැමිණියහොත් උත්තර දෙන්න අවස්ථාව දෙනවා කියා ඔබතුමා පොරොන්දු වුණා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පිළිතුර වාර්තා වෙනවා නේ. එම නිසා ගරු මන්ත්‍රීතුමනි, අමනාප වෙන්න එපා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඔබතුමා පොරොන්දු වුණා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මට පිළිතුරු දෙන්න පුළුවන්. නමුත් කාල වේලාවේ ප්‍රශ්නය තමයි තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාලවේලාව සම්බන්ධ ප්‍රශ්නයක් තමයි තිබෙන්නේ. ගරු ඇමතිතුමා පිළිතුර සභාගත කරන්න.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, එහෙම නම් මම පිළිතුර සභාගත කරන්නම්.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමා ඉස්සෙල්ලා පිළිතුරු දෙන්න හැදුවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි. හරි. මෙතැන වැරදීමක් වෙලා තිබෙනවා. ගරු ඇමතිතුමා ප්‍රමාද වූ නිසා මෙතුමාගේ ප්‍රශ්නය ගත්තේ නැහැ.

ඇමතිතුමා පැමිණියාට පසුව ගන්නම් කියලා මම කිව්වා. You are correct. මම අවස්ථාව දෙන්නම් කියලා කිව්වා. ගරු ඇමතිතුමා පිළිතුරු දෙන්න.

උපාධි ප්‍රදානය කරනු ලබන ආයතන: විස්තර
பட்டமளிப்பு நிறுவனங்கள்: விபரம்
DEGREE AWARDING INSTITUTIONS : DETAILS

159/'18

4. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන උපාධි ප්‍රදානය කරනු ලබන ආයතන සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) එම එක් එක් ආයතනයේ,

(i) ලිපිනය;

(ii) උපාධි ප්‍රදානය කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමතිය ලබාගෙන ඇති දිනය;

(iii) පිරිනමනු ලබන උපාධි;

(iv) ඉගෙනුම ලබන සිසුන් සංඛ්‍යාව;

(v) එක් එක් උපාධි පාඨමාලාව සඳහා අයකරනු ලබන මුදල්;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා (ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා) වෙනුවට

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා (ගරු (ආචාර්ය) සුදර්ශනී ප්‍රනාන්දු-ජයරත්න මහත්මිය) විසින් පිළිතුරු දෙන ලදී.

உயர்கல்வி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) தற்போது இலங்கையில் இயங்கிவருகின்ற பட்ட மளிக்கும் நிறுவனங்களின் எண்ணிக்கை யாது என்பதை அவர் இச்சபைக்குத் தெரிவிப்பாரா?

(ஆ) மேற்படி ஒவ்வொரு நிறுவனத்தினதும்,

(i) முகவரி;

(ii) பட்டமளிப்பதற்காக பல்கலைக்கழக மானிய ஆணைக்குழுவின் அங்கீகாரம் பெற்றுக் கொள்ளப்பட்ட திகதி;

(iii) அளிக்கப்படுகின்ற பட்டங்கள்;

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(iv) கல்வி பயிலும் மாணவர்களின் எண்ணிக்கை;

(v) ஒவ்வொரு பட்டப் பாடநெறிக்கும் அறவிடப்படுகின்ற பணத் தொகை;

தனித்தனியாக யாது என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Higher Education & Cultural Affairs:

(a) Will he inform this House of the number of degree awarding institutions in Sri Lanka at present?

(b) Will he also inform this House separately of -

(i) the address;

(ii) the date on which approval has been obtained from the University Grants Commission to award degrees;

(iii) the degrees awarded;

(iv) the number of undergraduates in them; and

(v) the fee charged for each degree course;

with respect to each of the said institutions?

(c) If not, why?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) ආයතන සංඛ්‍යාව 19කි.

(ආ) (i) ඇමුණුම මඟින් ඉදිරිපත් කර ඇත.

ඇමුණුම **සභාගත*** කරමි.

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් උපාධි ප්‍රදානය කරනු ලබන ආයතන සඳහා උපාධි ප්‍රදාන තත්ත්වය ලබා දීමේ ක්‍රියාවලිය 2012.02.21 දින දක්වා සිදු කරන ලදී.

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25 අ සහ 70 ආ වගන්තිවල විධිවිධාන පරිදි සහ 2012.02.22 දිනැති අංක 1746/11 දරන ගැසට් නිවේදනය ප්‍රකාරව උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා නිසි බලධාරියා ලෙස පත් කරන ලද අතර එතැන් සිට රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන උපාධි ප්‍රදාන ආයතන ලෙස පිළිගැනීම සහ ප්‍රතීතනය උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය මඟින් සිදු කරන ලදී. ආයතන හා උපාධි ප්‍රදානය අනුමත කරනු ලැබූ දිනයන් ඇමුණුම මඟින් ඉදිරිපත් කර ඇත.

(iii) ඇමුණුම මඟින් ඉදිරිපත් කර ඇත.

(iv) 2017.12.31 දිනට අදාළ ආයතන මඟින් සපයා ඇති තොරතුරු අනුව පිළිගත් උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි අධ්‍යාපනය හදාරන මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 21,500කි. මෙය දැනට අධ්‍යාපනය ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ එකතුව වේ.

(v) රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන මඟින් උපාධි පාඨමාලා සඳහා අයකරනු ලබන ගාස්තු පිළිබඳ සංඛ්‍යා ලේඛන අමාත්‍යාංශය විසින් රැස් කරනු නොලැබේ.

(ඇ) පැන නොනඟී.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු කථානායකතුමනි, මගේ පළමු අතුරු ප්‍රශ්නය මෙසේයි.

බොහෝ උපාධි ලබාදීමේදී අනුකූලතා සහතිකයක් - compliance certificate එකක්- ආයතනයෙන් ඉල්ලා සිටිනවා. මේ උපාධි ප්‍රදානය කරන ආයතන සියල්ල එම සහතිකය ලබාගෙන තිබෙනවා කියා ඔබතුමාට සහතික කර කියන්න පුළුවන් ද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒ ගැන තොරතුරු ලබාගෙන තමයි මට උත්තරයක් දෙන්න වෙන්නේ. එහෙම නැතුව මේ අවස්ථාවේදී ඒ ගැන කියන්න අපහසුයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එය පළමු වටයේ අහපු ප්‍රශ්නයක් විධියටයි record වෙන්න ඕනෑ; දෙවන වටයේ අහපු ප්‍රශ්නයක් විධියට නොවෙයි. නැත්නම් precedence එකක් වෙනවා.

දෙවන වටය, ප්‍රශ්න අංක 12.

මන්නාරම දිස්ත්‍රික්කය තුළ විදුලි සැපයුම: විස්තර
மன்னார் மாவட்ட மின்சாரம் விநியோகம்: விபரம்
PROVISION OF ELECTRICITY IN MANNAR DISTRICT : DETAILS

410/'18

12. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Dinesh Gunawardena on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera)
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) 1983 වර්ෂය වනවිට මන්නාරම දිස්ත්‍රික්කය තුළ ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට විදුලිය ලබා දී ඇති මුළු නිවාස සංඛ්‍යාව කොපමණද;

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(iii) වර්ෂ 1984 සිට 2009 දක්වා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

(iv) 2009 වර්ෂයේදී යුද්ධය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා විදුලිය ලබා දී ඇති නිවාස සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව කොපමණද;

(v) ඉහත (iv) හි සඳහන් කාල පරිච්ඡේදය සඳහා විදුලිය ලබා දීම වෙනුවෙන් වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

මින්වලු මට්‍රුම් පුතුප්පික්කත්තක්ක සක්ති අමෛච්චරෙක් කේට්ට විනා:

(அ) (i) 1983 ஆம் ஆண்டளவில் மன்னார் மாவட்டத்தில் இலங்கை மின்சார சபையினால் மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் மொத்த எண்ணிக்கை யாதென்பதையும்;

(ii) தற்போதைக்கு மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் மொத்த எண்ணிக்கை யாதென் பதையும்;

(iii) 1984 முதல் 2009 ஆம் ஆண்டு வரை மின்சாரம் வழங்குவதற்காக ஒதுக்கப்பட்டுள்ள பணத் தொகை ஆண்டு வாரியாக எவ்வளவென் பதையும்;

(iv) 2009 ஆம் ஆண்டில் யுத்த நிலவரம் முடிவடைந்த பின்னர் 2015 ஆம் ஆண்டு வரை மின்சாரம் வழங்கப்பட்டுள்ள வீடுகளின் எண்ணிக்கை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;

(v) மேற்படி (iv) இல் குறிப்பிடப்பட்டுள்ள கால கட்டத்தில் மின்சாரம் வழங்குவதற்காக ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he inform this House -

(i) of the number of houses in the Mannar District that had been provided with electricity supply by the Ceylon Electricity Board by year 1983;

(ii) of the total number of houses which have been provided with electricity supply by now;

(iii) of the amount allocated annually from year 1984 to 2009 for the supply of electricity on per year basis;

(iv) of the number of houses that have been provided with electricity supply up to year 2015 after the end of war situation in year 2009 on per year basis; and

(v) of the amount of money allocated for the supply of electricity during the period mentioned in (iv) above on per year basis?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කිසිවක් නැත. බෙදාහැරීම සිදු කරනු ලැබුවේ පළාත් පාලන ආයතනයෙනි.

(ii) මේ වන විට විදුලි සම්බන්ධතා 36,649ක් සපයා ඇත.

2015 වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා ග්‍රාම නිලධාරිවරුන් මඟින් සිදු කරන ලද සංගණනය අනුව මන්නාරම දිස්ත්‍රික්කය තුළ විදුලි සේවාව ලබාගෙන නොමැති නිවාස ඒකක ගණන 4,331ක් බව වාර්තා වූ අතර, ඔවුනට විදුලි සේවාව ලබා ගැනීමට තිබූ ප්‍රධානතම බාධාව වූයේ විදුලි සේවාව ලබා ගැනීමට හා නිවාස තනැඳුම් කිරීමට අවශ්‍ය මූලික පිරිවැය දැරීමට තිබූ නොහැකියාවයි.

ඒ අනුව 2015 වර්ෂයේ නොවැම්බර් මස සිට ක්‍රියාත්මක කරන ලද "රටම එළියයි අඳුර දුරලයි - ජාතික විදුලි සත්කාරය" ණය යෝජනා ක්‍රමය යටතේ මෙම පවුල් සඳහා විදුලි සේවාව ලබා ගැනීමට හා නිවාස තනැඳුම් කිරීමට රු.45,000ක උපරිමයක් දක්වා ණය මුදලක් ලබා දුන් අතර, එම වැඩසටහන 2016 වර්ෂය අවසානය දක්වා ජාතික මට්ටමෙන් ක්‍රියාත්මක වූ අතර, එම වැඩසටහන යටතේ 2016 වර්ෂයේදී නිවාස ඒකක 3,269ක් සඳහා විදුලි සේවාව ලබා දී ඇත.

2017 වර්ෂය තුළ මන්නාරම දිස්ත්‍රික්කයේ හඳුනාගත් නිවාස ඒකක අතරින් නිවාස ඒකක 1,049ක් සඳහා විදුලි සේවාව ලබා දී ඇත.

2018 වර්ෂයේ අප්‍රේල් මස අවසන් වන විට මන්නාරම දිස්ත්‍රික්කයේ හඳුනාගත් නිවාස ඒකක අතරින් නිවාස ඒකක 707ක් සඳහා විදුලි සේවාව ලබා දී ඇත.

(iii) 1984 වර්ෂයේ සිට 2009 දක්වා මන්නාරම දිස්ත්‍රික්කයේ විදුලි සැපයුම් සඳහා වෙන් කරන ලද මුදල් පහත සඳහන් වේ.

වර්ෂය	වෙන් කරන ලද මුදල (රු.මිලියන)
1984	-
1985	-
1986	-
1987	-
1988	-
1989	11.5
1990	0.25
1991	-
1992	4.97

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

1993	0.57
1994	-
1995	-
1996	-
1997	-
1998	8.48
1999	-
2000	-
2001	-
2002	2.17
2003	14.24
2004	18.68
2005	42.43
2006	21.78
2007	41.01
2008	90.58
2009	198.42

(iv) 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා විදුලි සැපයුම් ලබාදුන් නිවාස සංඛ්‍යාව පහත පරිදි වේ.

වර්ෂය	අදාළ වර්ෂය තුළදී ලබාදුන් නව සබඳතා සංඛ්‍යාව	වර්ෂය අවසාන වන විට විදුලිය පරිභෝජනය කරනු ලබන සම්පූර්ණ නිවාස සංඛ්‍යාව
2009.01.01 - 2009.12.31	198	8,331
2010.01.01 - 2010.12.31	876	9,207
2011.01.01 - 2011.12.31	3,299	12,506
2012.01.01 - 2012.12.31	3,504	16,010
2013.01.01 - 2013.12.31	5,577	21,587
2014.01.01 - 2014.12.31	3,079	24,666
2015.01.01 - 2015.12.31	2,971	27,637

(v) 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා විදුලි සැපයුම් සඳහා වෙන් කරන ලද මුදල පහත පරිදි වේ.

වර්ෂය	වෙන් කරන ලද මුදල (රු.මිලියන)
2009	134
2010	93
2011	112
2012	22
2013	55
2014	156
2015	254

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 13 - 424/'18 - (1), ගරු ඉෂාක් රහුමාන් මහතා.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු කථානායකතුමනි, ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන කටයුතු ආරම්භයේ දී පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම, ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත් කෙටුම්පත
நாட்டைக் கட்டியெழுப்புதல் வரி (திருத்தம்) சட்டமூலம்
NATION BUILDING TAX (AMENDMENT) BILL

"2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

***2018 ජූලි 03** වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.*

නිති මත්‍රුම් වෙලුසන ඌටක අමෙච්චර් චාර්පිල් මාණ්පුමිකු කයත්ත කරුණාතිලක්ක අවර්කළාල් චමර්ප්පික්කප්පට්ටතු.

2018 යූලෙ 03, චෙව්වාය්ක්කිළමෙ ඉරණ්ටාම් මුරෙ මතිප්පිටප්පට වේණ්ටුමෙනවුම් අච්චිටප්පට වේණ්ටුමෙනවුම් උරිය තුරෙචාර් මේර්පාර්වෛක් කුලුවුක්කු ආර්රුප්පටුත්තප්පට වේණ්ටුමෙනවුම් කට්ටළෛයිටප්පට්ටතු.

Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Minister of Finance and Mass Media; to be read a Second time upon Tuesday, 03rd July, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That notwithstanding the provisions of Standing Order No. 8 of the Parliament, the hours of sittings of Parliament on this day shall be 1.00 p.m. to 6.30 p.m.. At 2.00 p.m. Standing Order No. 8(5) of the Parliament shall operate. At 6.30 p.m. Mr. Speaker shall adjourn the Parliament without question put."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමනි, ඔබතුමා යම් කාරණයක් ඉදිරිපත් කිරීම සඳහා විනාඩි කිහිපයක් ඉල්ලුවා. දැන් ඒ සඳහා අවස්ථාව තිබෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අද මුළු රටේම තැපැල් සේවය අඩපණ වී තිබෙනවා. තැපැල් සේවකයින් 26,000කට අධික සංඛ්‍යාවක් වැඩ වර්ජනයක යෙදී ඉන්නවා. ඊට අදාළව, ස්ථාවර නියෝග 19 යටතේයි මා මේ ප්‍රශ්නය අහන්නේ. තැපැල් සේවකයින්ගේ ඉල්ලීමට විසඳුමක් ලබා දීම සඳහා දීර්ඝ කාලයක් කටයුතු නොකර කල් දමන ලද සේවා ව්‍යවස්ථාව අලුතෙන් ඇති කිරීමට, එමඟින් 2006 ව්‍යවස්ථා සංශෝධනය කිරීමට ආණ්ඩුව එකඟ වුවද, එසේ කටයුතු කර නැති හෙයින් එය ඉටු කර ගැනීමට යළිත් අරඹා ඇති තැපැල් සේවක වැඩ වර්ජනය විසඳීමට රජයට පියවර ගත හැකිව තිබියදීත් එසේ කටයුතු නොකොට තැපැල් සේවාව අඩපණ වීමට ඉඩ දී ඇති බව පිළිගන්නේද?

26,000කට අධික තැපැල් සේවක වර්ජනය නිසා තැපැල් ලිපි බෙදීම රට පුරා නැවතී, එමඟින් සේවාවන් අඩපණ වී ඇත. මේ වන විට කටුනායක ගුවන් තොටුපොළේ විදේශ තැපැල් ලිපි දහස් ගණන් හිර වී තිබෙනවා. හැම තැපැල් කාර්යාලයකම ලිපි හිර වී තිබෙනවා. මේ බරපතළ ප්‍රශ්නය විසඳන්නට පුළුවන්කම තිබෙනවා. ගරු ඇමතිතුමා කරපු ප්‍රකාශය 2018 ජූනි 17 දින "ද සන්ඩේ ටයිම්ස්" පුවත් පතෙහි සඳහන් වනවා. මා එය කියවන්නම්:

"Minister of Posts & Postal Services, Abdul Haleem told “the Sunday Times”, the long term plan to settle the matter is by making the Postal Services a ‘Closed Department’,.."

- which had been agreed many months ago, but it has not been implemented -

"..wherein, salaries and matters regarding to recruitment can be decided independently. Hence, the Cabinet has appointed a Committee to resolve matters."

නමුත්, ප්‍රශ්නය තිබෙන්නේ වුවමනාවෙන්ම මේ ප්‍රශ්නය විසඳන්නට ක්‍රියා මාර්ග නොගෙන සිටීමයි. විසිහයදහසකට අධික තැපැල් සේවක වර්ජනය නිසා, තැපැල් බෙදීම රට පුරා නැවතී එමඟින් සේවාවන් අඩපණ වී තිබෙනවා. එම සාධාරණ සේවක ඉල්ලීමට එකඟ වී එය ක්‍රියාත්මක නොකර, වර්ජනයේ සිටින සේවකයන් සේවයෙන් ඉවත් කරන බවට තැපැල්පති කළ ප්‍රකාශය අපි හෙළා දකිනවා. තැපැල්පතිගේ එම ප්‍රකාශය ඉල්ලා අස්කර ගෙන, වහා ඉටු කළ හැකිව තිබෙන තැපැල් සේවක ඉල්ලීම් ඉටු කරන්නේ කවදා ද කියලයි අපි මේ අවස්ථාවේ රජයෙන් අහන්නේ. තැපැල් ලිපි ලක්ෂ දෙකහමාරක් හිරවී තිබෙනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් අද කැබිනට් මණ්ඩලයේ සාකච්ඡා වුණා. ගරු තැපැල් ඇමතිතුමා ඒ අවස්ථාවේ පොරොන්දු වුණා, අද දවස ඇතුළත මේ ප්‍රශ්නය විසඳනවා කියලා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කොහොම හරි විසඳනවා කියලා- [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අද කැබිනට් මණ්ඩලයේදී මේ කාරණය සාකච්ඡා වුණා. අද මේක විසඳනවා කියලා පොරොන්දු වුණා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
කිසිවකු අස් කරන්නේ නැහැ කියලා-[බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඒවා එහෙම කියන්න බැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද හැන්දෑ වනතුරු බලන්න.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමනි, මේ කාරණාව සම්බන්ධයෙන්ද?

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
නැහැ, ගරු කථානායකතුමනි. අපි මැයි 22 වැනිදා -එනම්, හරියටම මීට දින 27කට පෙර- ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන් පිරිසක් අත්සන් කරලා ඔබතුමාගෙන් ඉල්ලීමක් කළා, දින නියමයක් නැතිව කල් යන පළාත් සභා මැතිවරණය පිළිබඳව මේ ගරු සභාවේ විවාදයක් අවශ්‍යයි කියලා. ගරු කථානායකතුමනි, පළාත් සභා මැතිවරණය කල් දමා මාස නවයක් වනවා, තව දවස් තුනකින්. දැන් මේ මොහොතේ මේ රටේ අතිගරු ජනාධිපතිතුමාට, ගරු අගමැතිතුමාට, ඔබතුමාට, විෂයභාර ඇමතිතුමාට කියන මේ කිසි කෙනකුට මේ මැතිවරණය පවත්වන දිනයක්, මාසයක් කියන්න බැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මම දැනටමත් බ්‍රහස්පතින්දා දිනයේ අපේ පක්ෂ නායක රැස්වීමට විෂය භාර අමාත්‍යතුමා කැඳවා තිබෙනවා. එදින මේ සම්බන්ධයෙන් සාකච්ඡා කර පක්ෂ නායකයන් දැනුවත් කරනවා. ඊට පස්සේ මම ඔබතුමන්ලාට අවස්ථාව දෙන්නම්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් විවාදයට දිනයක් දීමට එය බාධාවක් වන්නේ කෙසේද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එදාට අපි මේ සම්බන්ධයෙන් තීරණය කරනවා. මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න බ්‍රහස්පතින්දා අපි හම්බ වෙනවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ඊළඟ සභා වාරයේදී අපට ඒ සඳහා දිනයක් ලැබෙනවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම වෙන්න ඇති. බ්‍රහස්පතින්දාට ඇමතිතුමා කැඳවා තිබෙනවා. එතුමා ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් හම්බ වෙලා මේ සම්බන්ධයෙන් කථා කර ස්ථිර තීරණයක් අපට දෙන්න ඕනෑ. මොකද, එහෙම වුණේ නැත්නම් මටත් පත් කිරීමට සිදු වෙලා තිබෙනවා. එම නිසා ඔබතුමන්ලා තව දවස් තුනක් ඉන්න.

සභාව කල් තැබීම, ගරු සභානායකතුමා.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා.

ඊට ප්‍රථම, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති. තව සුළු මොහොතකින් පක්ෂ නායකයින්ගේ රැස්වීම පැවැත්වෙන බවත් මේ අවස්ථාවේදී මා මතක් කරන්න කැමැතියි.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ඉදිරිපත් කළ වාර්තාවල නිර්දේශ
அரசாங்கக் கணக்குகள் பற்றிய குழு சமர்ப்பித்த அறிக்கைகளின் சிபாரிசுகள்
RECOMMENDATIONS MADE IN REPORTS PRESENTED BY COMMITTEE ON PUBLIC ACCOUNTS

[අ.භා. 2.03]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සභාව කල් තබන අවස්ථාවේදී පහත සඳහන් යෝජනාව මා ඉදිරිපත් කරනවා:

"රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් අටවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි සැසිවාරය තුළ ඉදිරිපත් කරන ලද සියලුම වාර්තා පාර්ලිමේන්තුවේ අවධානයට ලක් විය යුතු නිසාත්, ඉදිරි ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී මෙම වාර්තාවලින් නිර්දේශිත කරුණු පිළිබඳව නිසි

අවධානය යොමු කළ යුතු නිසාත්, මෙම වාර්තාවල අන්තර්ගතයන් පිළිබඳව පුළුල්ව සලකා බැලීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි."

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අටවන පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් විමර්ශනය කරන ලද අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා පළාත් පාලන ආයතන ඇතුළු ආයතන ගණනාවක් පිළිබඳව වන වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. එක් පැත්තකින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙකු හැටියටත්, මේ ගරු පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙකු හැටියටත් මම කල්පනා කළා, ජනතාවට දැන ගැනීම සඳහා මේ වාර්තාවේ අන්තර්ගතය පිළිබඳව අවධානය යොමු කරවන්න.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 ව්‍යවස්ථාව මඟින් රටේ මූල්‍ය පාලනය පිළිබඳ වගකීම පැවරෙන්නේ පාර්ලිමේන්තුවට. ඒ අනුව මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරු 225දෙනාම මේ රටේ ජනතාවගේ බදු මුදල් පාලනය පිළිබඳව වග විය යුතු වනවා. ඒ වගවීම සමස්ත පාර්ලිමේන්තුවටම යම් වගකීමක් සහිතව ඉටු කිරීම සඳහා ඓතිහාසිකවම මෙම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා ඇති කරලා තිබෙනවා. එම කාරක සභා අපේ රටේ ඉතිහාසයක් පුරා තිබිලා 1972 ඔක්තෝබර් 26 වෙනිදා ජාතික රාජ්‍ය සභාව තුළින් මෙම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා පැන නැඟුණා. ඒ වාගේම ඊට පසු කාලයක පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා වෙනම පැන නැඟුණා. මෙම අටවන පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙත්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවෙත් සාමාජිකයෙක් හැටියට මම කටයුතු කරනකොට, වෙනදාට වඩා මේ කාරක සභා දෙකම තමන්ට පැවරුණු කාර්යභාරය ඉටු කිරීම සඳහා විශාල මැදිහත්වීමක් කරනවා අපි දැක්කා. එක පැත්තකින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තමන්ට පැවරිලා තිබෙන ආයතන 837ක තිබෙන මූල්‍ය පාලනය පිළිබඳ විමර්ශන කටයුතු වේගවත් කිරීම සඳහා සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් මැදිහත් වුණා. ඒ වාගේම එතුමාගේ විශේෂ උනන්දුව යටතේම මෙම ආයතන සඳහා යම් කිසි ආකාරයක දියුණු තාක්ෂණය මුල් කරගෙන තොරතුරු තාක්ෂණ පද්ධති යනාදිය ජාලගත කිරීම සඳහා සැලැස්මක් දියත් වුණා. මේ කාරක සභාවේ මන්ත්‍රීවරු හැටියට ඉදිරි පියවර කිහිපයක් තියන්න පුළුවන්කම ලැබීම පිළිබඳ අපි සතුටු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ දී ආයතන එකින් එක ගෙන විමර්ශනය කරනවාට අමතරව, රටේ පැන නැඟුණු ප්‍රශ්න -මහ බැංකු බැඳුම්කර ගනුදෙනුව, ඒ වාගේම පසුගිය පාර්ලිමේන්තු සමයෙත් මේ පාර්ලිමේන්තු සමය දක්වා දික් වුණු සහල් ගනුදෙනුව, සමුපකාර අමාත්‍යාංශයේ මුදල් ගනුදෙනු, SAITM ආයතනය- සම්බන්ධව විශේෂ උනන්දුවක් ඇති කරන්නත්, එවැනි විශේෂ කාරණා වෙනම අරගෙන විමර්ශනය කරන්නත් අපට හැකි වුණා. ඒ සම්බන්ධයෙන් අනු වාර්තා අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ නිසා මූල්‍ය පාලනය පිළිබඳව මෙම කාරක සභාවලට පැවරිලා තිබෙන වගකීම තවත් ඉස්සරහට අරගෙන යන්න ඕනෑ කියලා මම හිතනවා.

මම දැක්කා, මෙම කාරක සභා වාර්තා සම්බන්ධයෙන්ම පැවතුණු වැඩමුළුවකදී අපේ විගණකාධිපතිතුමා ප්‍රකාශ කරලා තිබෙනවා, "අපේ රටේ සමහර නිලධාරීන් හැසිරෙන විධිය අනුව ගත්තාම ලලිත් වීරතුංග මහත්මයා වාගේම මේ රටේ නිලධාරීන්ගෙන් සියයට 50ක්ම ඉන්න ඕනෑ නිරේ"ය කියලා. ඒකෙන් එතුමා කියන්න අදහස් කරන්න ඇත්තේ මේ රටේ ජනතාවගෙන් බදු මුදල් වියදම් කිරීමේදී තවමත් අපට ඒ ආකාරයටම ජනතාවට වග වෙන්නට හැකියාවක් ලැබිලා නැහැ කියන එකයි. ඒ නිසා තමයි විගණකාධිපතිවරයා කියා තිබෙන්නේ, ඒ ඒ අමාත්‍යාංශවල ප්‍රධාන ගණන්දීම් නිලධාරීන් හැටියට කටයුතු කරන රාජ්‍ය නිලධාරීන්ගෙන් සියයට 50කට වඩා වැඩි ප්‍රමාණයක් හිරේ යන විධියට තමයි කටයුතු කරලා තිබෙන්නේ කියලා. එයින් අදහස් වෙන්නේ, රාජ්‍ය මූල්‍ය පාලනයේ වගකීම අපි එතරම් ශිෂ්ටසම්පන්න ආකාරයට සිද්ධ කරලා නැහැ කියන එකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම මෙතැන තවත් ගැටලුවක් තිබෙනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ COPE එක වෙනුවෙන් අපි බොහෝ කාල වේලාවක් මිඩංගු කරලා මෙවැනි වාර්තා සකස් කළාට, මේ වාර්තාවලින් කරන්න පුළුවන් දේවල් මොනවාද? ඒක පාර්ලිමේන්තුවක් හැටියට අපි බරපතළ වශයෙන් සාකච්ඡාවට ගත යුතුයි. රාජ්‍ය මූල්‍ය පාලනයේ වගකීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පාර්ලිමේන්තුවට පැවරිලා තිබෙනවා. ඒ වගකීම ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවෙන් කාරක සභා දෙකක් පත් කළාටම, එයින් සියල්ල සිද්ධ වුණාය කියලා අත පිසදාගන්න අපට අයිතියක් ලැබෙන්නේ නැහැ; අවස්ථාවක් ලැබෙන්නේ නැහැ; හැකියාවක් ලැබෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වාර්තා පරිශීලනය කරනකොට මතු වුණු ප්‍රධාන ප්‍රශ්න කීපයක් සම්බන්ධයෙන් මම මේ පාර්ලිමේන්තුවේ අවධානයට යොමු කරවන්න කැමැතියි. එකක් තමයි, අපි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාකච්ඡා කරලා ජනතාවගේ බදු මුදල් වග වීමකින් තොරව වියදම් කිරීම සම්බන්ධයෙන් යම් අනතුරු ඇඟවීමක් කළාට පස්සේ එයට ඇහුම්කන් දෙන්නට ඒ අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු එකඟතාවක් පළ කරනවා ද කියන එක. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සිටින විවිධ පක්ෂවලට අයිති මන්ත්‍රීවරු ඒ කාරණය සම්බන්ධයෙන් තමන්ගේ පක්ෂයේ තිබෙන ප්‍රතිපත්තියට වඩා, ජනතාවගේ මුදල් සම්බන්ධ වගකීම කරට අරගෙන කටයුතු කරපු නිසා අපට පුළුවන්කම ලැබුණා එවැනි අවස්ථා කීපයක් පෙන්වා දෙන්න. උදාහරණයක් හැටියට අපි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාවේ 98වැනි පිටුවේ දක්වා තිබෙනවා, ආන්දෝලනයකට තුඩු දීපු කෘෂිකර්ම අමාත්‍යාංශයේ ගොඩනැඟිල්ල සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අදහස මොකක්ද කියන එක. පාර්ලිමේන්තුවේත් අපි විටින් විට මේ කාරණය සම්බන්ධයෙන් අවධානය යොමු කරලා තිබෙනවා. 2016 ජනවාරි පළමුවැනි දා සිට අප්‍රේල් 07වැනි දා දක්වා කාලය තුළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව කැඳවන ලද ආයතන අතර, 2016 අප්‍රේල් මස 07වැනි දා කෘෂිකර්ම අමාත්‍යාංශයත් කැඳවා තිබෙනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාවේ 98වැනි පිටුවේ මෙන්න මෙහෙම සඳහන්ව තිබෙනවා:

"කෘෂිකර්ම අමාත්‍යාංශයේ දැනට පවත්වාගෙන යන ගොවිජන මන්දිර ගොඩනැඟිල්ල පාර්ලිමේන්තුවට පවරා ගැනීම හේතුවෙන් එම අමාත්‍යාංශය පවත්වාගෙන යාම සඳහා කුලී පදනම මත නව ගොඩනැඟිල්ලක් තෝරා ගැනීමේදී එහි මිල, මිල කමිටුවකින් තීරණය කිරීම හෝ තරගකාරී මිල ගණන් කැඳවීමකින් තොරව වර්ෂ 5ක් සඳහා රුපියල් මිලියන 958ක පමණ කුලියක් ගෙවීමට ගනු ලැබූ තීරණය සහ කෘෂිකර්ම අමාත්‍යාංශය සතුව ඇති බත්තරමුල්ලේ හෙක්ටෙයාරයක පමණ ඉඩම මේ සඳහා සුදුසු ගොඩනැඟිල්ල ඉදි කිරීමට අවධානය යොමු නොකිරීම."

මෙතැන කාරණා දෙකක් තිබෙනවා. තරගකාරී මිල ගණන් කැඳවීමකින් තොරව අවුරුදු 5කට රුපියල් මිලියන 958ක් කුලී ගෙවන්නට ගත්ත තීරණය සහ කෘෂිකර්ම අමාත්‍යාංශයටම අයිති බත්තරමුල්ලේ තිබෙන හෙක්ටෙයාරයක පමණ ඉඩම ගොඩනැඟිල්ලක් හදන්නට යොදා නොගැනීම කියන කාරණා

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

දෙක කාරක සභාවේ අවධානයට අරගෙන තිබෙනවා. ඒ විතරක් නොවෙයි. කාරක සභාව බොහොම පැහැදිලිව නිර්දේශ කරලා තිබෙනවා, "මෙම ගිවිසුම අත්සන් කිරීම සිදු නොකරන ලෙස රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව නියෝග නොකරන නමුත්, -මොකද, අපට අයිතියක් නැහැ ආණ්ඩුව ප්‍රතිපත්තිමය තීරණයක් ගත්තාට පසුව ඒකට අභියෝග කරන්නට.- ගිවිසුමට කාරක සභාවේ අනුමැතිය හිමි නොවන බව කාරක සභාව විසින් අවධාරණය කරන ලදී." කියලා. එසේම තිබෙනවා, "විගණකාධිපතිවරයා විසින් මේ සම්බන්ධයෙන් ඉදිරියේදී ඉදිරිපත් කරනු ලබන විගණන විමසුම්වලදී කාරක සභාවේ බලතල ප්‍රකාරව කටයුතු කිරීමට සිදු වන බව කාරක සභාව විසින් අවධාරණය කරන ලදී" කියලා.

අපේ රටේ මෑත කාලයේ ජනතාවගේ බදු මුදල් නිකරුණේ වියදම් කිරීම සම්බන්ධයෙන් තිබුණු හොඳම උදාහරණය වුණු කෘෂිකර්ම අමාත්‍යාංශයට ගොඩනැඟිල්ලක් කුලියට ගැනීම සම්බන්ධයෙන් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව අවධානය යොමු කරලා තිබෙනවා. ගිණුම් කාරක සභාවට තමන්ගේ සීමාව තුළ ඉදිමින්, -අපට දේශපාලන විවේචනයක් තිබෙනවා අගමැතිවරයා කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරලා කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සම්බන්ධයෙන්. ඒ, දේශපලන ප්‍රතිපත්තිමය විවේචනයක්.- රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වපසරිය තුළ ඒ ප්‍රතිපත්තිමය තීන්දුව අභියෝගයට ලක් කරන්නට බැරි වුණත්, ගිණුම් කාරක සභාව බොහොම පැහැදිලිව කියලා තිබෙනවා එම ගිවිසුමට කාරක සභාවේ අනුමැතිය හිමි නොවනවා කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දැන් තිබෙන ප්‍රශ්නය තමයි, මෙවැනි බරපතළ ගනුදෙනුවක් පිළිබඳව කාරක සභාව හැටියට අපි පාර්ලිමේන්තුවේ අවධානය යොමු කරලා තිබියදී අදාළ අමාත්‍යාංශයේ කෘෂිකර්ම අමාත්‍යවරයා හෝ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කරන ලද අගමැතිවරයා ඒ පිළිබඳව දක්වන ලද අවධානය කුමක්ද කියන එක. එතකොට මේ කාරක සභාව වාර්තාවක් ඉදිරිපත් කරලා ඇති ඵලය මොකක්ද? අපි සාකච්ඡා කරලා, ඉදිරිපත් කරන නිර්දේශයන් පිළිබඳව ආණ්ඩුව සැලකිල්ලට ගන්නේ නැත්නම්, ජනතාවගේ බදු මුදල් පිළිබඳව ව්‍යවස්ථාවෙන් අපට බලය පවරලා තිබුණාට ආණ්ඩුවේ අගමැතිවරයා සහ ඊට අදාළ ඇමතිවරු ඒ තීන්දු ගන්නේ හිතුමතේ නම්, "මොකක්ද කාරක සභාවට තිබෙන වග වීම" කියන ප්‍රශ්නය අපට තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පළමුවැනි කාරණය වන්නේ, ජනතාවගේ බදු මුදල් කිසිදු වග වීමකින් තොරව නිස්කාරණයේ වියදම් කරන එක වළක්වා ගන්න අපේ කාරක සභා සමත් වෙලා තිබෙනවාද කියන එකයි. දැන් මේ උදාහරණයෙන් පෙනෙනවා, අපි ඒකෙන් අසමත් වෙලා තිබෙනවා කියන එක. දෙවැනි කාරණය වන්නේ, ජනතාවගේ බදු මුදල් කිසිදු හිරිකිතයකින් තොරව මෙහෙම අවභාවිතයේ යොදවන කොට යම් කිසි හෝ නීතිමය ක්‍රියාමාර්ගයක් ගන්නට මේ කාරක සභාවන්ට පුළුවන්ද කියන එකයි. ඒකයි තිබෙන ඊළඟ ප්‍රශ්නය. යම් කිසි හෝ අවම වශයෙන් හෝ නීතිමය ක්‍රියාමාර්ග ගන්න පුළුවන්ද? බැහැ.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවත්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවත් දත් නැති කටක් වාගේ තමයි. විලිස්ස - විලිස්සා ඉන්න පුළුවන්. ඒකෙන් මොකුත් හපන්න බැහැ. ඒ නිසා වෙලා තිබෙන්නේ මොකක්ද? රටේ සිදුවන මහා බරපතළ වංචා හෙළිදරව් කළාට එතැනින් එහාට අපට ගන්න පුළුවන් ක්‍රියාමාර්ගයක් නැහැ. මම මේ කියන්නේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ 2017 ජනවාරි 24 සිට මැයි 24 දක්වා ඉදිරිපත් කරන ලද සිව්වන වාර්තාව ගැනයි. එහි 86වැනි පිටුවේ 2014 මාර්තු 24වැනි දා සේවක අර්ථසාධක අරමුදල පිළිබඳව අපි කරපු විමර්ශනය පිළිබඳව විස්තරය තිබෙනවා. එහි ඉදිරිපත් වෙච්ච ප්‍රධාන කරුණක් වන්නේ මෙයයි:

> "2010 ජූලි මාසයේ ගුවන් සමාගමක කරන ලද රු. 500,000,000/- ආයෝජනයක් වෙනුවෙන් ද, 2010 මැයි මස 31 දින වන විට හෝටල් සමාගමක කොටස් මිලදී ගැනීමට සිදු කළ රු. 810,321,610/-ක ආයෝජනයක් වෙනුවෙන් සහ නව හෝටල් සංකීර්ණයකට 2013 වර්ෂ අවසානයේ සිදු කළ රු. 5,000,000,000/- ආයෝජන සඳහා අරමුදලට කිසිදු ප්‍රතිලාභයක් ලැබී නොතිබීම හා එම මුදල් මූල්‍ය ප්‍රකාශනවල හානිකරන අලාභයන් ලෙස කපා හැර තිබීම."

ප්‍රශ්නය තිබෙන්නේ මෙතැනයි. රුපියල් මිලියන 6,310ක සේවක අර්ථසාධක අරමුදලේ මුදල් ව්‍යාපෘති තුනක ආයෝජනය කරලා තිබෙනවා. අරමුදලට කිසිදු ප්‍රතිලාභයක් ලැබිලා නැහැ. මේක පැහැදිලිවම රටේ ජනතාවගේ බදු මුදල් අවභාවිතා කිරීමක්. හැබැයි, මෙහෙම බරපතළ අවභාවිතාවක් වෙලා තිබියදීත් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට ගන්න පුළුවන් නීතිමය ක්‍රියාමාර්ගයක් නැහැ. ඒ පිළිබඳව අපි සාකච්ඡා කරන්න ඕනෑ.

ස්ථාවර නියෝගවලින් හෝ පාර්ලිමේන්තුවේ වෙනත් අණපනත්වලින් හෝ අඩු තරමින් මෙතැනින් එක දශමයක් හෝ එහාට යන්නේ කොහොමද, මේවාට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගැනීම සඳහා යම් උත්තේජනයක් සපයන්නේ කොහොමද කියන එක ගැන සාකච්ඡා කරන්න ඕනෑ. මොකද, අපි හොඳටම දන්නවා මේ සිද්ධ වන දේ. අපි සෑහෙන කාලයක් මීඩංගු කරලා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේදී මහ බැංකුවේ බැඳුම්කර වංචාව විමර්ශනයට ලක් කළාට, ඒ සම්බන්ධයෙන් footnotes ඇතිව හෝ නැතිව යම්කිසි ආකාරයක සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කළාට, "ඒක මම නීතිපති දෙපාර්තමේන්තුවට යවනවා" කියලා අගමැතිතුමා නැඟිටලා ගරු කථානායකතුමා කියන්නත් කලින් කිව්වාට අවුරුද්දක් යන කල් මොකුත් කළේ නැහැ. ඊට පසුව ජනාධිපති විමර්ශන කොමිෂන් සභාව හරහා තමයි එය නීතිපති දෙපාර්තමේන්තුවට ගියේ. මේ විධියට, සේවක අර්ථසාධක අරමුදලේ රුපියල් මිලියන හයදහස් ගණනක මුදලක් -රුපියල් බිලියන 6ක්- කිසිදු ප්‍රතිලාභයක් නොමැතිව ආයෝජනය කර අවභාවිත කර තිබෙන විටත් අපට ගන්න පුළුවන් ක්‍රියා මාර්ගයක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා තුන්වනුව අවධානය යොමු කරවනවා, මේ වාර්තා විසින් අදාළ අමාත්‍යවරුන් යම් සදාචාරමය බැඳීමකට හෝ ලක් කරනු ලබනවාද කියන ප්‍රශ්නයට. ඒකයි ඊළඟ ප්‍රශ්නය. නීතිමය ක්‍රියා මාර්ග ගන්න බැරි නම්, ජනතාවගේ බදු මුදල් පිළිබඳව වග වීමට සහතික වෙලා ඉන්න අපට -පාර්ලිමේන්තුවට- පුළුවන්කමක් තිබෙනවාද, ඒ අදාළ අමාත්‍යවරුන් අඩු තරමින් යම් සදාචාරමය බැඳීමකටවත් ලක් කරන්න?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා ඔබතුමාගේ අවධානය යොමු කරවනවා, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ හතරවන වාර්තාවේ 120වන පිටුවට. ඒ පිටුවේ වාර්තා වෙනවා, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සම්බන්ධයෙන්. මේ තමයි අපි 2017 මැයි 24වන දා නිකුත් කරපු වාර්තාව. මේ වාර්තාවේ 120 පිටුවේ සඳහන් වෙනවා, 2014 වර්ෂයේදී එවකට හිටපු උසස් අධ්‍යාපන අමාත්‍යවරයාට වාර්ෂිකව හිමි ගෙවල් කුලී දීමනා වෙනුවට එම සීමාව ඉක්මවා විදුලි හා ජල බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම කර තිබූ නමුත් ඒ සඳහා වැඩිපුර ගෙවූ රුපියල් 833,460ක මුදල ආපසු අය කර ගන්න කටයුතු කරගෙන නැහැ කියලා. රුපියල් 833,460ක් වැඩිපුර ගෙවා තිබෙනවා. ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා -උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා- රජයේ ගිණුම් පිළිබඳ

කාරක සභාවට මේ ප්‍රශ්නයට උත්තර බදින්නේ කොහොමද? ඒ මෙහෙමයි. ඔහු මේ විධියට උත්තර දෙනවා.

"2009 මාර්තු 05 දිනැති 10/2007(1) දරන චක්‍රලේඛයට අනුව අමාත්‍යවරයෙකුට හිමි රු. 50,000/- ගෙවල් කුලී දීමනාව ගෙවමින් සිටියදී, එකල විශ්වවිද්‍යාලවල මතු වූ ගැටලු නිරාකරණය කිරීම සඳහා නීතිපතා විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සමඟ රැස්වීම් පැවැත්වීමට සිදු වූ බවත්, වියදම අඩුකර ගනු වස් ඒවා පැවැත්වූයේ අමාත්‍යවරයාගේ නිල නිවසේ බැවින්, ගෙවල් කුලී දීමනාව අනවශ්‍ය බව පැවසූ අමාත්‍යවරයා අදාල කාලයේ විදුලි හා ජල බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම ප්‍රමාණවත් බව දැන්වූ බවත්..."

යනාදි වශයෙන්.

ඒ කරුණු පෙන්වලා අමාත්‍යාංශය ජල, විදුලි බිල්පත් සඳහා රුපියල් 8,33,460ක් වැඩිපුර ගෙවා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඇත්තටම මේ ගැන සොයා බලන්න ඕනෑ. රුපියල් 50,000 බැගින් ගෙවල් කුලී ගෙව්වා නම් වැය වන්නේ රුපියල් ලක්ෂ 6යි. නමුත් "ගෙවල් කුලී එපා ඒ වැඩ කර ගන්නම්" කියලා, ඒ ගෙදර ලයිට් බිල්, වතුර බිල් සඳහා රුපියල් ලක්ෂ 8 1/2කට ආසන්න මුදලක් ගෙවාගෙන තිබෙනවා. ඒ කාරණය පැත්තකින් තියමු කෝ. හැබැයි, "විශ්වවිද්‍යාල උප කුලපතිවරු ඇතුළු ආචාර්ය මණ්ඩලය සමඟ ඇමතිවරයාගේ ගෙදරදී දිගින් දිගට සාකච්ඡා කරන්න සිද්ධ වුණා, ඒ නිසා තමයි මේ ලයිට් බිල් වතුර බිල් ගියේ" කියලා තමන්ගේ අමාත්‍යවරයා වෙනුවෙන් උත්තර දෙන්න ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයාට සිද්ධ වෙනවා. මේ කරුණු රාජ්‍ය ගිණුම් කාරක සභාවේ විමර්ශනයට ලක් කරන බව දන්නා ඇමතිවරයා අඩු තරමින් සදාචාරමය බැඳීමකට යටත් කර ගන්නවත් අපේ කාරක සභාවේ විමර්ශන සමත් වෙලා නැහැ.

ඒ විතරක් නොවෙයි, මෙම වාර්තාවේ ඒ අමාත්‍යාංශයටම අදාළව මේ චෝදනාවත් තිබෙනවා.

"2010 මැයි 14 දිනැති රාජ්‍ය වියදම් කළමනාකරණ චක්‍රලේඛයේ 3(1) හා 4(1) ඡේදය අනුව අමාත්‍යවරුන්, නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් උපරිම නිල වාහන සංඛ්‍යාව 3ක් වුවද, 2014 වසරේදී එම සීමාව ඉක්මවා වාහන 7ක් අමාත්‍යවරයා වෙත ලබා දී තිබුණු අතර, මාසිකව හිමි ඉන්ධන ප්‍රමාණය ඉක්මවා රුපියල් 1,029,380/- ක ඉන්ධන ප්‍රතිපූරණය කර තිබුණු අතර එම මුදල අදාළ පාර්ශ්වවලින් අය කර නොතිබීම."

ඒකට අමාත්‍යාංශයේ ලේකම්වරයා ලබා දෙන පිළිතුර මේකයි.

"මෙම කාල වකවානුවේ ඇති වූ ගැටලුකාරී වාතාවරණය හමුවේ අදාළ අමාත්‍යවරයාගේ ආරක්ෂාව තර කිරීමට සිදු වූ බවද, පාර්ලිමේන්තුව විසින් අසනු ලබන නොයෙකුත් ව්‍යාපෘතිවලට අදාළ ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා අදාළ කාර්ය මණ්ඩලවලට අනුයුක්ත නිලධාරීන්ගේ රාජකාරී කටයුතු සඳහා නිල රථ ලබා දීම සිදු වූ බවද...."

ඒ හේතුව නිසා මේ විධියට වැඩිපුර වාහන සංඛ්‍යාවක් ගත් බව කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි -කවුරු හරි මන්ත්‍රීවරයෙක්- පාර්ලිමේන්තුවේ ප්‍රශ්න අහන එකත් දඩමීමා කරගෙන තමන්ට හිමි වාහන ප්‍රමාණයට වඩා වැඩිපුර වාහන පාවිච්චි කර තිබෙනවා; ඒවාට වැඩිපුර ඉන්ධන ලබාගෙන තිබෙනවා. මෙවැනි පිළිතුරක් රාජ්‍ය ගිණුම් කාරක සභාවට එවීමේදී ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා අසරණ වෙන්න ඇති කියලා මම දන්නවා. කාලයක් මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ මන්ත්‍රීවරු තමයි මේ අමාත්‍යාංශ භාරගෙන තිබෙන්නේ. ඒ කාලයේ හිටපු උසස් අධ්‍යාපන අමාත්‍යවරයාත් එහෙමයි. නමුත් මෙවැනි ආකාරයේ පිළිතුරු එවලා පාර්ලිමේන්තුව හැල්ලු කර තිබෙනවා. ඒ නිසා අඩු ගණනේ අමාත්‍යවරුන්ට තිබෙන වග කීමට ඒ අමාත්‍යවරුන් සදාචාරමය වශයෙන්වත් බැඳ ගන්න රාජ්‍ය ගිණුම් කාරක සභාවට -අපට- බැරිවෙලා තිබෙනවා.

ඒ වාගේම තමයි ගිණුම් කාරක සභාව හමුවේ අපි විටින් විට හෙළිදරව් කරන කරුණු තිබෙනවා. ඒ කරුණු මේ රටේ මතු ආරක්ෂාව වෙනුවෙන් හෝ එහෙම නැත්නම් අනාගතයේදී අකටයුතු දේවල් සිද්ධ නොවීම සඳහා භාවිත කර තිබෙනවාද කියන බරපතළ ප්‍රශ්නයක් පැන නඟිනවා. මොකද, ඒ කරුණු පිළිබඳව කොච්චර සාකච්ඡා කළත් වැඩක් වෙලා නැති නිසා. අතීත වැරදි වෙනුවෙන් දඬුවම් කරන්නත් බැරි නම්, නීතිමය වශයෙන් වැරදිකරුවන්ට යම් දඬුවමක් කරන්නත් බැරි නම්, ඒ පුද්ගලයන් සදාචාරමය වශයෙන් බන්ධනය කරන්නත් බැරි නම් අනාගතය වෙනුවෙන් හෝ යමක් කරන තැනකට රාජ්‍ය ගිණුම් කාරක සභා වාර්තා පත්වෙන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ 4වැනි වාර්තාවේම 10වැනි පිටුවට මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව විසින් කළ විමර්ශනයක් ගැන එහි සඳහන් වෙනවා. ඔබතුමා දන්නවා, 2012 අවුරුද්දේ ජාතික කෞතුකාගාරයේ,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමාට වෙන් වී තිබෙන කාලයෙන් කොටසක් මම ගන්නවා.

2012 අවුරුද්දේ ජාතික කෞතුකාගාරයේ බරපතළ වංචාවක් සිද්ධ වුණා. ජාතික කෞතුකාගාරයේ තිබෙන භාණ්ඩ නැති වුණොත්, ඒවා ප්‍රතිනිෂ්පාදනය කරන්න බැහැ. රටකට ඓතිහාසිකව උරුම වුණු කෞතුක වටිනාකමක් තිබෙන භාණ්ඩ ආරක්ෂා කරගන්න රටක් හැටියට අපි එදා අසමත් වුණා. ඒ සොරකම පිළිබඳව 2017දී විමර්ශනය කරන අවස්ථාවේ, මේ කරුණු අනාවරණ වුණා.

"සොරකමෙන් පසු වසර 5ක් ගත වී තිබුණද නිසි පරිදි ආරක්ෂක කැමරා පද්ධතියන් ස්ථාපිත කිරීමට මේ දක්වා කටයුතු කර නොමැත. රාත්‍රී කාලයේ දර්ශන ලබා ගැනීමට නොහැකි වීම වැනි දුර්වලතා රාශියක් දැනට පවත්නා කැමරා පද්ධතියේ පවත්නා බවත්, සොරකම සිදු වන අවස්ථාව වන විට පවතින සීසීටීවී කැමරා පද්ධතිය අක්‍රිය වී පැවතුණු බවත් අනාවරණය විය. මේ වන තුරු පද්ධතිය නිසි ලෙස ස්ථාපිත කර නොමැත."

මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. 2012දී හොරකම සිද්ධ වුණා හා සමානවම බරපතළයි, අවුරුදු 5ක් ගත වෙලාත් "සීසීටීවී කැමරා පද්ධතිය තවමත් හරියට ස්ථාපිත කරලා නැහැ කියලා" රාජ්‍ය ගිණුම් කාරක සභා වාර්තාවෙන් අපට කියන්න සිද්ධ වෙනවා නම්. ඒ කියන්නේ මේ සොරකමින් පස්සේ අපි පාඩමක් ඉගෙනගෙන නැහැ කියන එකයි.

ඒ වාගේම, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව පිළිබඳව අපි තවත් කරුණක් දක්වනවා.

16වැනි සාක් සමුළුවේ කොළඹ ප්‍රඥප්තියට අනුව සහ 2008 වර්ෂයේ අමාත්‍ය මණ්ඩල තීරණයක් අරගෙන තිබෙනවා, සහල්

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

මෙට්‍රික්ටොන් ලක්ෂයක ආහාර සංචිතයක් පවත්වාගෙන යන්න. රටක නියහයක්, ගංවතුරක්, ඕනෑම ස්වාභාවික ආපදාවක් ඇති වුණොත්, මෙට්‍රික්ටොන් ලක්ෂයක ආහාර සංචිතයක් පවත්වාගෙන යන එක ජනතාවගේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම සඳහා වැදගත් වෙනවා. හැබැයි, ඒ විධියේ අමාත්‍ය මණ්ඩල තීරණයක් අරගෙන තිබියදීත් එවැනි ආහාර සංචිතයක් පවත්වාගෙන ගියේ නැති බව කාරක සභාව හඳුනාගෙන තිබෙනවා. එතකොට, අනාගතය සඳහා අනතුරු අවම කිරීමේ අරමුණින් අපි ඉදිරිපත් කර තිබෙන යෝජනා ක්‍රියාත්මක කරන්නටවත්, අදාළ ආයතන කටයුතු කරලා නැහැ. ඒක තමයි තිබෙන ප්‍රශ්නය. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ වාර්තා පාර්ලිමේන්තුවේ පුස්තකාලයට ගියාට පමණක් ප්‍රමාණවත් නැහැ. ඒ සම්බන්ධයෙන් වග වෙන; වග වීම පරීක්ෂා වන යන්ත්‍රණයක් අවශ්‍යයි. මේ නිර්දේශ, නියෝග ඉදිරිපත් කළාට පසුව, අඩුම තරමින් යම් නිශ්චිත කාල සීමාවක් තුළ ඒවා ඉටු කළාය කියලා මේ නිලධාරින් සියලුදෙනා පාර්ලිමේන්තුවට සහතික වෙන්නට ඕනෑ. එහෙම නැති වුණොත්, මේ කාරක සභා අපි කොතරම් ඉහළින් වර්ණනා කළත්, එහි ප්‍රතිඵලය ජනතාවට අත් පත් වන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මෙම කරුණ පිළිබඳව මා ඔබතුමාගේ අවධානයට යොමු කරවනවා. පාර්ලිමේන්තුවෙන් යම් කිසි මුදල් ප්‍රතිපාදනයක් ඒ, ඒ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට වෙන් කර දුන් පසුව එම මුදලට වඩා වැඩිපුර වියදම් කරන එකත් වැරැදියි, අඩුවෙන් වියදම් කරන එකත් වැරැදියි කියා විගණකාධිපතිතුමා කියා තිබෙනවා මා දැක්කා. අපි සෑහෙන වාර ප්‍රමාණයක් පාර්ලිමේන්තුවේ දී සාකච්ඡා කරලා තමයි ජනතාවගේ අවශ්‍යතාවන් වෙනුවෙන් එවැනි මුදල් ප්‍රතිපාදනයන් වෙන් කරන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2015-2016 වර්ෂවල වකුගඩු රෝගීන් වෙනුවෙන් වෙන් කළ මුදල් කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. 2015 වර්ෂයේ රුපියල් මිලියන 353ක්, 2016 වර්ෂයේ රුපියල් මිලියන 667ක් වකුගඩු රෝගීන් සඳහා ආධාර ලෙස බෙදන්න කියා වෙන් කළා. ඒ විධියට වෙන් කළාට, 2015 වකුගඩු ආධාර ලෙස බෙදා තිබුණේ එයින් සියයට 62යි. 2016 බෙදා තිබුණේ සියයට 70යි. අපේ රටේ මේ ආධාර ලබන්න ඕනෑ, ඒ ආධාර නොලැබීම නිසාම තමන්ගේ පවුල් ජීවිත පවත්වා ගෙන යන්න බැරි වෙන; ඒ නිසාම තමන්ගේ දරුවන් පාසල් යවා ගන්න බැරි වෙන රෝගී ජනතාවක් රජරට ප්‍රදේශ ආශ්‍රිතව ජීවත් වෙනවා. ඒ අවශ්‍යතාව සලකා බලා තමයි පාර්ලිමේන්තුව එවැනි මුදල් ප්‍රමාණයක් වෙන් කළේ. තාක්ෂණික ප්‍රශ්න පසෙක තබා, අඩු ගණනේ ඒ මුදලින් සියයට 90ක්, 95ක් වෙන් කරන්න බැරි වෙනවා නම්, ඒක බරපතළ ප්‍රශ්නයක්. මේක ජනතාවගේ ජීවිත පිළිබඳ ප්‍රශ්නයක්. ඒ නිසා මේ පිළිබඳවත් කාරක සභාවේ අවධානය යොමු කර තිබෙනවා.

ඊළඟට, පසුගිය කාලයේ යම් ආන්දෝලනයකට තුඩු දුන් වැඩිහිටි දීමනාව සම්බන්ධයෙනුත් සඳහන් කළ යුතුයි. රුපියල් 2,000ක් වැඩිහිටියන්ට ලබා දෙන්නට 2015දී අය වැය යෝජනාවක් තිබුණා. එයින් රුපියල් 100ක් ජාතික වැඩිහිටි මහ ලේකම් කාර්යාලයෙන් කපා ගත්තා. ඒ අනුව 2016 අවුරුද්දේ රුපියල් මිලියන 389ක් එකතු වුණා. රුපියල් මිලියන 443ක් ඒ ගිණුමේ තිබෙනවා. වැඩිහිටියන්ට දෙන ආධාරයෙනුත් රුපියල් 100ක් කපා ගැනීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ කරුණ මතු කරන්න උත්සාහ කරන්නේ මේ හේතුව නිසායි. අපි විශාල සංවාදයක් මේ වෙනුවෙන් කළා. ජනතාවගේ බදු මුදල් වෙන් කරන්නට යම් තීන්දුවක් ගත්තාට පසුව ඒක ක්‍රියාත්මක වෙන්නේ නැත්නම්, ඒ සම්බන්ධයෙන් විමර්ශනය කිරීමේ බලයක් අපට නැහැ. ඒ නිසා, ගිණුම් කාරක සභාවේ මන්ත්‍රීවරුන් වන අප මැදිහත් වෙලා කරන මේ ව්‍යායාමය සාර්ථක වෙන්න නම්, එක්කෝ අදාළ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් පාලන ආයතන මේකට නීතිමය වශයෙන් බැඳෙන්නට ඕනෑ. නීතිමය බැඳීමට එහා ගිය සදාචාරාත්මක බැඳීමකුත් වුවමනා කරනවා. මේ දෙකම නැත්නම් අපි කොතරම් තදින් උත්සාහ කළත්, ඒක ප්‍රතිඵල විරහිත වෙනවා. අපට ජනතාවට කියන්න පුළුවන්. නමුත් පාර්ලිමේන්තුවට ව්‍යවස්ථාවෙන් හිමි මූල්‍ය පාලනයේ වගකීම නිසියාකාරව ක්‍රියාත්මක වීමට නම්, එවැනි වගකීමකට බැඳීමට අවශ්‍ය කරන විධියේ නීතිමය ප්‍රතිපාදන ප්‍රමාණයක්, යන්ත්‍රණයක් මේ කාරක සභාවලට වුවමනායි කියන අදහස යෝජනා කරමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
යෝජනාව ස්ථිර කිරීම, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මා ස්ථිර කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is Hon. Niroshan Perera. Before he starts, will an Hon. Member propose the Hon. Shehan Semasinghe to the Chair?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)
I propose that the Hon. Shehan Semasinghe do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு செஹான் சேமசிங்க அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. SHEHAN SEMASINGHE *took the Chair.*

[අ.භා.2.30]

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කර තිබෙන යෝජනාවට අදාළව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාවල අන්තර්ගතයන් පිළිබඳව සාකච්ඡා කරන මෙම විවාදයට සහභාගී වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මෙම පාර්ලිමේන්තුවට පැවරී තිබෙන රටේ මූල්‍ය පාලනය පිළිබඳ වගකීම ඉටු කිරීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මඟින් දායකත්වය සැපයූ එහි සභාපති, නියෝජ්‍ය අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා ඇතුළු සියලු මන්ත්‍රීතුමන්ලාට මා ස්තුතිවන්ත වෙනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවත්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවත් වෙනදාට වඩා සක්‍රිය මට්ටමින් අදාළ ආයතන පිළිබඳව විමර්ශනය කරලා, එම වාර්තා නිසි කලට, නිසි ලෙසට මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබෙනවා. ඒ බව විපක්ෂය වුණත් පිළිගන්නවා ඇති. මේ රටේ දේශපාලන ඉතිහාසය ගත්තාම මේකත් ලොකු ජයග්‍රහණයක් වෙනවා. මොකද, සමහර වේලාවට අපි මේ කාරක සභාවල වැඩ කටයුතු ආරම්භ කළාම අවුරුදු ගණනාවක් ප්‍රමාද වුණු වාර්තා තමයි ඉස්සෙල්ලාම ලැබෙන්නේ. එම නිසා මේ කාරක සභාව තුළින් වර්තමානයේ සිදු වෙන දේවල් වර්තමානයේම පරීක්ෂා කර නිසි ලෙස පාර්ලිමේන්තුවට වාර්තා කිරීම දේශපාලන ඉතිහාසයේ ඉතා විශේෂ ජයග්‍රහණයක් ලෙස තමයි අපි සලකන්නේ. ඇත්තටම මේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට මදි. මේ වාර්තා තුළින් පැන නැඟෙන කරුණු තව දුරටත් විමර්ශනයට ලක් වෙලා අධිකරණ කටයුතු දක්වා යන පැහැදිලි ගමන් මඟක් තිබිය යුතුයි කියන කරුණ ඔබ සියලු දෙනාම පිළිගන්නවා ඇති. එවැනි පැහැදිලි ගමන් මඟක් තිබුණොත්, මේ රටේ සිදු වන වංචා හා දූෂණ විශාල ප්‍රමාණයක් අපට වළක්වා ගැනීමට හැකියාව තිබෙන බව මේ සභාව පිළිගනී කියා මා විශ්වාස කරනවා.

2016 වර්ෂය වන විට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විවිධ ආයතන 837ක් විමර්ශනයට ලක් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වාගේ කාරක සභාවකින් අමාත්‍යාංශ ඇතුළු ආයතන 837ක් පරීක්ෂා කරන එක එතරම් ලෙහෙසි පහසු කටයුත්තක් නොවෙයි කියන එක ඔබතුමාත් දන්නවා ඇති. අපට තිබෙන්නේ ඉතාම සීමිත කාලයක්. සමහර වේලාවට මේ ආයතන තුළ පරීක්ෂණයට ලක් කළ යුතු කාරණා එකකට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. එම නිසා අපේ කාරක සභාවේ සභාපති, ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා සහ අප සියලු දෙනාම කාරක සභාවට අදාළ සියලු දේවල් පරිගණකගත කරලා, අමාත්‍යාංශ සහ ඒ යටතේ ඇති ආයතන ඇගයීමකට ලක් කරන්නට විශේෂයෙන්ම කටයුතු කළා. 2015 සහ 2016 ඇගයීම් වාර්තා මා ළඟ තිබෙනවා. එහිදී අනාවරණය වුණු සුවිශේෂී ලක්ෂණයක් සඳහන් කරන්න මට අවසර දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පරීක්ෂණයට ලක් කරපු ආයතනවල ඇගයීම් ලකුණු 2015ට වඩා 2016 වන කොට විශාල ලෙස වැඩි වෙලා තිබෙනවා. 2015 ඇගයීම් ප්‍රතිඵල අනුව ලකුණු 90ට වැඩි ආයතන 60ක් තිබුණා. එම ප්‍රමාණය 2016 වනකොට 73 දක්වා වැඩි කරන්නට විශේෂයෙන්ම අපේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවත්, ඒ ආයතනත් විශේෂයෙන්ම කටයුතු කර තිබෙනවා කියලා මම මේ අවස්ථාවේදී කියනවා. ඒ වාගේම 2015දී ලකුණු 70 - 90 අතර ආයතන 282ක් තිබුණා. එම ප්‍රමාණය 2016 වන කොට 447 දක්වා වැඩි කරන්නට කටයුතු කර තිබෙනවා. 2015දී ලකුණු 50 - 70 අතර ආයතන 386ක් තිබුණා. එම ප්‍රමාණය 295 දක්වා අඩු කරන්නට කටයුතු කර තිබෙනවා. 2015දී ආයතන 104ක් ලකුණු 50ට අඩුවෙන් තිබුණා. එම ආයතන ප්‍රමාණය 2016 වනකොට 22 දක්වා අඩු කරන්නට අපි කටයුතු කර තිබෙනවා. මම හිතන හැටියට මේක ඉතාම සුවිශේෂී කාරණයක්. ආයතනවලින් නිසි වෙලාවට ගිණුම් ඉදිරිපත් වීමෙන්, විගණකාධිපතිතුමාගේ නිරීක්ෂණ, අපේ කාරක සභාවේ නිරීක්ෂණ තුළින් කලට වේලාවට වාර්තා සැපයීමට හැකි වීමෙන් මේ අවුරුදු තුන තුළ අපි ඉතාම හොඳ ප්‍රගතියක් ලබා තිබෙනවා කියලා මම මේ අවස්ථාවේදී සඳහන් කරන්න කැමැතියි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, what is your point of Order?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අද අරලියගහ මන්දිරයේ ඉඳලා පාර්ලිමේන්තුවට එන්න පැයකුත් මිනිත්තු 20ක් විතර කාලයක් ගතවුණා. මොකද, පාර්ලිමේන්තුවට එන මාර්ගය වහලා. මොන වාගේ ප්‍රජාතන්ත්‍රවාදයක්ද මේ තිබෙන්නේ? පාර්ලිමේන්තුවට එන්න තිබෙන මාර්ගයේ බාධාවක් තිබෙනවා; පාර වහන්නට කටයුතු සිදු වෙලා තිබෙනවා; පොලීසිය බලාගෙන සිටිනවා. කරුණාකරලා පොලීසිය මේ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු ආකාරය ගැන ගරු කථානායකතුමා විධිමත් උපදෙසක් ලබා දෙන්න. මෙවැනි ක්‍රියාවක් සිදු වුණු පළමුවැනි වතාව මෙය නොවෙයි. පාර්ලිමේන්තුව රැස් නොවන දවස්වලත් barricades තිබෙනවා. මේ වාගේ දෙයක් නිසා පාර්ලිමේන්තු මාර්ගය අවහිර කරලා තිබෙනවා. මේ අවහිරය හැම දෙනාටම බලපාන්නට ඇති කියලා මා හිතනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්නේ පාර්ලිමේන්තු පිවිසුම් මාර්ගයේ අවහිරතාවක් පිළිබඳවද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

කොළඹ පැත්තේ සිට පාර්ලිමේන්තුවට එන මාර්ගය වහලා. පොලීසිය බලාගෙන ඉන්නවා. එතැන meeting එකක් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, එම කාරණය අපි ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කරවන්නම්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මේක ප්‍රජාතන්ත්‍රවාදයද? අපට වරමක් දීලා තිබෙන්නේ රට භදන්න මිසක් බෝඩ් ලෑලිවලට භය වෙලා යටපත් වෙන්න නොවෙයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට පාර්ලිමේන්තුවට ඇතුළුවීමේ දී බාධාවක් ඇති වුණාද?

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මට එන්න බැරි වුණා. මම අරලියගහ මන්දිරයෙන් පිටත් වුණේ පස් වරු 1.10ට. මම කෘෂිකර්ම අමාත්‍යාංශය පිහිටි ස්ථානය හරහා මෙතැනට ආවේ පස් වරු 2.10ට. දැන් කවුරු හෝ එතැනට යැව්වොත් බලාගන්න පුළුවන්. පාර්ලිමේන්තු පොලීසියත් සිටිනවා නේ. බලන්න, පාර්ලිමේන්තුවට එන්න පුළුවන්ද, බැරිද කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මේ පිළිබඳව ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කරලා, ඒ සම්බන්ධයෙන් පොලිස්පතිතුමාට දැනුම් දෙන්න කටයුතු කරන්නම්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ විතරක් මදි. කොතරම් වෙලාවක් පාර වසා අවහිර කර තිබුණාද කියලා පොලීසියට වාර්තා කරන්න කියන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අපි ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්නම්. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට බාධාවකින් තොරව, නිදහසේ සහා ගර්භයට පැමිණීමේ අයිතිය තිබෙනවා. ඒ සම්බන්ධයෙන් කටයුතු කරලා නැහැ කියලා අපි කථානායකතුමාට දැනුම් දෙන්නම්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම අහන්නේ, ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න තිබෙන පාර්ලිමේන්තුවට පැමිණෙන මාර්ගයත් අවහිර වෙලා තිබෙනවා නම් මොකක්ද කරන්නේ? කාගේ ප්‍රජාතන්ත්‍රවාදයද අපි ආරක්ෂා කරන්න හදන්නේ?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, මම ඒ සම්බන්ධව ගරු කථානායකතුමා දැනුවත් කරන්නම්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
එතුමා දැනුවත් කරලා විතරක් මදි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
පොලිස්පතිතුමාගෙන් ඒ සම්බන්ධයෙන් විමසීමකුත් කරන්නම්. උද්ඝෝෂණ හෝ යම් කටයුත්තක් එතැන සිදුවෙනවාය කියා වාර්තා වෙනවා. අපි ඒ සම්බන්ධයෙනුත් කටයුතු කරන්නම්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තරුණ තරුණියන්ගේ ජීවිත ආරක්ෂා කිරීමේ වගකීම අපටත් තිබෙනවා. නමුත් මෙහෙම එනකොට, ඒක වල්බූරු නිදහසක් වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, ගරු මන්ත්‍රීතුමනි. අපි ඒ ගැන කටයුතු කරන්නම්.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මටත් කාරණයක් කියන්න තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, කියන්න ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ යම් කරුණක් ඔබතුමාගේ අවධානයට යොමු කරන්න මා කැමැතියි. වරක් මේ පාර්ලිමේන්තුවට එන්න බැරිවන විධියට හමුදාවත්, පොලීසියත් යොදවා පාර්ලිමේන්තුවම වට කරලා තිබුණා. මම ඒ වෙලාවේ ඇවිත්, අපේ ගරු කථානායකතුමාගෙන් ඇසුවා, "ඔබතුමාගේ අනුදැනුම නැතුව පොලීසියට හෝ හමුදාවට මේ පාර්ලිමේන්තුව වට කරන්න පුළුවන්ද, පාර්ලිමේන්තුවට එන මාර්ග අවහිර කරන්න පුළුවන්ද?" කියා. එතුමා ඒ වේලාවේ මට උත්තරයක් දුන්නා. ඒ උත්තරය මොකක්ද කියා මේ වෙලාවේ කියන්න මම කැමැති නැහැ. නමුත් මෙහෙම වෙලා තිබෙන පළමුවැනි වතාව මෙය නොවෙයි. උද්ඝෝෂකයන් නිසා සිදුවන බාධා කිරීම් වැළැක්වීමේදී වේවා, උද්ඝෝෂකයන් මර්දනය කිරීම උදෙසා ගනු ලබන ක්‍රියා මාර්ගවලදී වේවා, මන්ත්‍රීවරුන්ට නිදහසේ එන්න යන්න තිබෙන අයිතිය ආරක්ෂා වන ආකාරයෙන් කටයුතු කළ යුතුයි. එම කාරණයේදී ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමාත්, මමත් එකම අදහසේ ඉන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඒ සම්බන්ධයෙන් සොයා බලා ඔබතුමන්ලාට පිළිතුරක් ලබා දීමට කටයුතු කරන්නම්. ඒ වාගේම ජනතාවටත් කරදරයකින්, හිරිහැරයකින් තොරව ගමන් බිමන් යෑමේ පහසුව පොලීසිය සපයා දිය යුතුයි. එම කාරණය මම ගරු කථානායකතුමාට දැනුම් දෙන්නම්.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පාර වසා තිබෙන්නේ ඇයි කියා පොලීසිය විශේෂයෙන්ම අපට කියන්න අවශ්‍යයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, එම කාරණය ගරු කථානායකතුමාගේ අවධානයට යොමු කරලා, ඔබතුමාට පිළිතුරක් ලබා දෙන්නම්.

ගරු රවී කරුණානායක මහතා
(මාණ්පුමිකු රවි කරුණානායක)
(The Hon. Ravi Karunanayake)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු නිරෝෂන් පෙරේරා රාජ්‍ය ඇමතිතුමනි, දැන් ඔබතුමාගේ කථාව කරගෙන යන්න.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(මාණ්පුමිකු නිරෝෂන් පෙරේරා)
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මටත් කරදරයක් නොවෙන්න මට ලබා දී තිබෙන වෙලාව අඩු කරන්න එපාය කියා මා ඉල්ලා සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
හොඳයි, ඔබතුමා කථා කරන්න.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(මාණ්පුමිකු නිරෝෂන් පෙරේරා)
(The Hon. Niroshan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මුලින් සඳහන් කළ පරිදි විශේෂයෙන්ම අපි මේ ඇගයීම් තුළින් ඒ ආයතන 837ටම විවිධ ලකුණු දීලා, වසරින් වසර ඒවායේ ප්‍රගතිය බලා, එම ප්‍රගතිය සාධාරණ ලෙස සුබදායක මට්ටමකට ගෙනෙන්න කටයුතු කළා. එසේ කටයුතු කරන්න හැකිවීම ගැන විශේෂයෙන්ම අපි සතුටු වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, තව විනාඩි දෙකකින් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(මාණ්පුමිකු නිරෝෂන් පෙරේරා)
(The Hon. Niroshan Perera)\
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ජනතාවට මුහුණ දෙන්න සිදුවන අපහසුතා වළක්වන්න වාගේම, සිදුවන වංචා හා දූෂණ අවම කිරීමට මේ තොරතුරු තාක්ෂණය භාවිත කරලා කටයුතු කරන්න කියා වංචා හා දූෂණ වැඩිපුරම සිදුවන අපේ සමහර ප්‍රසිද්ධ ආයතනවලට -මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, රේගුව වැනි ඒවාට- අපි නියම කර තිබෙනවා. මේ වනවිට මේ රටේ ප්‍රසිද්ධ කාරණය මහ බැංකු බැඳුම්කර සිද්ධිය බව මා දන්නවා. මහ බැංකුවේ මේ බැඳුම්කර සිද්ධිය තුළින් පසුගිය කාලයේ සිදුවුණු සියලුම වංචා හා දූෂණ සියලුදෙනාටම අමතක කරවා තිබෙනවා. JVP එකේ අපේ ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාත් උදාහරණයකට ගත්තේ මහ බැංකු බැඳුම්කරයේ සිදුවුණු දූෂණ හා වංචාව පිළිබඳ සිද්ධියයි. නමුත් එතුමාට අනික් ඒවා හරියට කියා ගන්නත් බැරුව ගියා. මේ රටේ සිදුවෙලා තිබෙන වංචාව හා දූෂණය ඒක විතරයි කියා මාධ්‍ය විසින් එච්චරටම එය ජනතාවට කා වද්දා තිබෙනවා.

අපි දැනට "කෝප්" එකෙන් නිර්දේශ ලබා දීලා තිබෙනවා. ජනාධිපති කමිටුවකින් එය විමර්ශනය කර තිබෙනවා. ඒ පිළිබඳව අධිකරණ ක්‍රියා මාර්ගයකට ගිහිල්ලාත් තිබෙනවා. නමුත් අනික් වංචා හා දූෂණ මේ නිසා යටපත් කරන්න, ඒවා අමතක කරන්න ඉඩ දෙන්න පුළුවන්කමක් නැහැ. පසුගිය කාලයේ සිද්ධ වුණු සියලුම වංචා හා දූෂණ සම්බන්ධව මේ වාර්තා තුළින් පැන නැඟුණු කරුණු කුණු බක්කියට දමන්නේ නැතුව, ඒ තොරතුරු මේ පාර්ලිමේන්තුවේ කොහේ හෝ කොනක මකුළු දැල් බැඳිලා විනාශ වෙන්න දෙන්නේ නැතුව, ඒ සම්බන්ධව ක්‍රියා මාර්ගයක් ගැනීම සඳහා අපි විශේෂයෙන්ම අවධානය යොමු කළ යුතුයි කියන කාරණය මම මතක් කරනවා. ඒ සඳහා පාර්ලිමේන්තුවට තිබෙන වගකීම නිසි ලෙස තේරුම් ගෙන, පාර්ලිමේන්තුවට ඒ සඳහා තිබෙන බලතල මේ රටේ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කිරීම සඳහා ඒවා නිසි ලෙස ශක්තිමත් කරලා, අපි ඉදිරියට යන්න ඕනෑය කියන කාරණය මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.43]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කර)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මමත් සාමාජිකයකු වශයෙන් සිටින රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව සම්බන්ධයෙන් සභාව කල් තබන අවස්ථාවේ යෝජනාවක් ලෙස කෙරෙන මෙම විවාදයට මටත් සම්බන්ධ වෙන්න අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව නිලධාරීන් සමඟ කරන සංවාද තුළින් බොහෝ දේවල් නිරාකරණය කර ගන්නවා. නිලධාරීන් කැඳවා, ඔවුන්ගෙන් විමසා, ඔවුන් ඒවාට දෙන පිළිතුරු අනුව තවදුරටත් කළ යුතු කාර්යයන්ට ඔවුන් යොමු කරලා, අවසානයේ සමහර විට අපි කියනවා, මාසයකින් හෝ ඔවුන්ට එකඟ විය හැකි කාල සීමාවක් දීලා වාර්තාවක් ඉදිරිපත් කරන්නය කියලා. ඊට පස්සේ පසු විපරමක් කරනවා, ඒ කාල සීමාව තුළ ඒ වාර්තාව ලැබුණාද කියලා. ඊළඟට ඒ වාර්තාව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සියලුම සාමාජිකයන් අතර බෙදා හැරීමක් සිද්ධ වෙනවා. මේ අතින් බැලුවාම අපේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සාර්ථකව ඉදිරියට යමින් තිබෙන බව මම සතුටින් කියන්න ඕනෑ.

ඊළඟට, යම් කරුණු නිරාකරණය නොවූ විටක එය පාර්ලිමේන්තුවට වාර්තා කිරීම තමයි ස්ථාවර නියෝග අනුවත් අපට කරන්න තිබෙන කාර්යය වන්නේ. අලුත් ස්ථාවර නියෝග අනුව අපි පාර්ලිමේන්තුවට වාර්තා කරන කරුණු අදාළ වන ඇමතිවරයා ඒ කරුණු සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු වෙනවා. එය සැක නැතුවම ලේඛනයක් විය යුතු බව කීමත් අනවශ්‍යයි. එසේ ඉදිරිපත් කරනු ලබන ලේඛනය මේ පාර්ලිමේන්තු සභාව තුළ සභාගත කිරීමට ඒ අදාළ ඇමතිවරුන්ට න්‍යාය පත්‍රයේ එක් අවස්ථාවක් ලබාදිය යුතුයි. එම අවස්ථාවේදී එම ලේඛනවල ඇමතිතුමා සඳහන් කරන පිළිතුරු ගැන යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වූ විටක, ආණ්ඩු පක්ෂයේද, විපක්ෂයේද කියන භේදයකින් තොරව මන්ත්‍රීවරුන්ට ඒ ඇමතිතුමාගෙන් කරුණු විමසා දැන ගැනීමටත්, ඇමතිවරයාගේ වැඩිදුර අවධානය යොමු කරවීමටත් අපේ මන්ත්‍රීවරුන්ට අවස්ථාවක් ලබාදිය යුතුයි කියා මා විශ්වාස කරනවා.

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහෝ ආයතනවල ප්‍රාග්ධන වියදම් ඌන වියදමක් හැටියට සඳහන් වන බව අපි නිරීක්ෂණය කර තිබෙනවා. එක් අවස්ථාවක, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට JICA එකෙන් ලබා දුන් අරමුදලකින් නිලධාරීන් පුහුණු කිරීමේ ව්‍යාපෘතියක් සූදානම් කර තිබුණා. ඒ මුළු මුදලම වැය කරලා තිබුණේ නැහැ. ඒ ව්‍යාපෘතිය ආරම්භවෙලා තිබුණේත් නැහැ. ඒ නිසා ඒ වර්ෂයේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට වෙන් කළ මුදල මුළුමනින්ම වියදම් නොවූ මුදලක් හැටියට ඉතිරිවෙලා තිබෙනවා. ප්‍රාග්ධන මුළු ඉතිරිවීම් රුපියල් විසිපන් මිලියනයක්. මෙය සියයට 100ක ප්‍රාග්ධන ඉතිරි වීමක් බවට පත් වී තිබුණු බවටත් අපි නිරීක්ෂණය කර තිබෙනවා. මෙය මේ අමාත්‍යාංශයට පමණක් සීමා වුණු දෙයක් නොවෙයි. බොහෝ අමාත්‍යාංශවල වියදම්වල ඌන වියදමක් විගණකාධිපති පරීක්ෂණ තුළින් වාර්තා වෙනවා. විගණකාධිපතිතුමා ඉතා විශිෂ්ට මෙහෙවරක් කරමින් සිටිනවා. නොයෙකුත් නොයෙකුත් පස්සට ඇදීම් නිසාත්, බලපෑම් නිසාත් ජාතික විගණන පනත් කෙටුම්පත තවමත් මේ පාර්ලිමේන්තුවට ගෙනෙන්න මේ ආණ්ඩුවට නොහැකි වීම ගැන මට කනගාටුයි. ජාතික විගණන පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ගෙනැවිත්, වුවමනා කරන පහසුකම් හා කාර්ය මණ්ඩලවලින් මේ විගණන බලය තවත් ජව ගැන්වෙන්නට පුළුවන් වෙනවා නම්, විගණකාධිපති දෙපාර්තමේන්තුවට මීටත් වඩා විශාල මෙහෙවරක් කරන්න පුළුවන් වෙනවාය කියා මා විශ්වාස කරනවා.

විගණකාධිපතිතුමා කියපු එක කාරණයක් අද පුවත් පතක සඳහන් වෙලා තිබෙනවා මා දැක්කා. එතුමා කියා තිබුණා, "රජයේ නිලධාරීන්ගෙන් භාගයක් ඉන්න ඕනෑ හිරේ. රජයේ නිලධාරීන්ගෙන් භාගයකට සිරගත වෙන්නට වෙනවා." කියා. කුමක් වුණොත් ද? ලලිත් වීරතුංග මහතාට තිබුණු චෝදනාව අනුව දඬුවම් කරලා එතුමාව සිරගත කරනු ලැබුවා. ඒ අවභාවිතාව හේතුව හැටියට ගත්තොත් ඒ වාගේ සිදුවීම් රජයේ නිලධාරීන් භාගයකට වඩා වැඩි දෙනෙකු අතින් සිදු වෙනවා. එහෙම නම් රජයේ නිලධාරීන් භාගයකට වඩා ඉන්න ඕනෑ සිරගෙවල් ඇතුළේය කියා විගණකාධිපතිතුමා පෙන්නුම් කර තිබුණා. මෙයින් අපි අධිකරණයේ නඩු තීන්දුව කිසිසේත් අගෞරවයට ලක් කරනවා නොවෙයි. අපි එතැනදී පෙන්නුම් කරන්නේ රජයේ මුදල් අවභාවිතාව කියන එක බොහොම බහුලව වෙනවා කියන එකයි. ඒකයි මේ කියන්නේ. එය විගණකාධිපතිතුමාගේ කාර්යාලයෙන් කරන විමර්ශනවලින් හා එතුමාගේ විමර්ශන පදනම් කර ගෙන අපේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව කරන විමර්ශනවලදී අපට හෙළිදරව් වන ආකාරයට පරීක්ෂණ කර ගන්නට බැරිව බොහෝ සිදු වීම් තිබෙනවා. දැන් මේ ඉදිරිපත් කරපු වාර්තාවලත් තිබෙනවා. මා ඒ වාර්තා වෙන වෙනම උපුටා දක්වන්නට යන්නේ නැහැ. "ෆයිල්ස්" නැති වෙලා. ලිපිගොනුව නැති වුණාම පරීක්ෂණ කල් යනවා. එම නිසා පරීක්ෂණ බොහෝ සෙයින් කල් ගිහින් තිබෙනවා. නැත්නම් පරීක්ෂණ කරන්නට බැරි වී තිබෙනවා. මෙවැනි තත්ත්වයකට පත් වුණාම ඒ ලිපිගොනු අස්ථානගත වීමට වග කිවයුතු කවුරු හෝ කෙනෙක් ඉන්න එපායැ. අවසාන වශයෙන් වග කීම දැරිය යුතු පුද්ගලයා පිළිබඳවත් ක්‍රියා මාර්ගයක් ගැනෙන්නට ඕනෑ. එසේ නැත්නම් අපි මේ කරන ව්‍යායාමයේ කිසිම තේරුමක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ කටයුතු අමාත්‍යාංශය ගැනත් විගණකාධිපතිතුමා පෙන්නුම් කර තිබුණා, විශාල වැරදි වියදම් වෙලා තිබෙන බව. ඒ වියදම් ගැන ඒ කාලයේ සිටි නිලධාරියා ඒවා කළාය කියා එතැනින් ඉවර කරන්නට බැහැ. ඒ කාලයේ සිටි තානාපතිවරයාත් ඒ ගැන වග කිව යුතුය කියා විගණකාධිපතිවරයා කියනවා. ඒ ආකාරයට මේක මුදුනටම ගෙන ගිහින් වග කීම් දාමය- දැන් ඔය විධානයක වග කීම් දාමය ගැන අලුතෙන් ගෙනෙන නීතිවල තිබෙනවා.- අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පනත, බලහත්කාර අතුරුදහන් කිරීම් පිළිබඳ සම්මුතිය අනුව අපි ගෙනා පනතට අනුව වරද කරන කෙනා විතරක් නොවෙයි, ඒ වරද කිරීම පිළිබඳව සොයා බැලිය යුතු අවසාන බලධාරියා දක්වා ඒ වග කීමට හසු කර තිබෙනවා. මෙන්න මේ වග වීම අපේ රෙගුලාසිවල තිබෙනවා ප්‍රමාණවත් මදි. අපේ මුදල් රෙගුලාසිවල මේ කියන වග වීම ප්‍රමාණවත් ලෙස අපි නිර්ණය කර ගෙන, ප්‍රසාරණය කර ගෙන සියලුම දෙනා වගවීමට අයිති වෙන විධියට හසුකර ගන්නට අපට පුළුවන් වෙලා නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අවසාන වශයෙන් මට කියන්නට තිබෙනවා, රාජ්‍ය සේවය ඵලදායිව තබා ගැනීම සඳහාත් රජයේ රැකියා අවස්ථා පිරවීම සඳහාත් පුරෝකථනයක් කරන්න අවශ්‍ය බව. මෙපමණ සංඛ්‍යාවක් විශ්‍රාම යනවා. මේ මේ ශ්‍රේණිවල නිලධාරීන් මේ කාලය වෙනකොට විශ්‍රාම යනවා. මේ ශ්‍රේණීන්වල ඇබෑර්තු එනවා. මේ පුරෝකථනය අනුව බඳවා ගැනීම් සැලසුම් කරන්නට පුළුවන්. එසේ නැත්නම් උසස් කිරීමේ සැලසුම. මේ අනුව අපේ රාජ්‍ය සේවයේ හිස් තැන් නැතිව රාජ්‍ය සේවය කර ගෙන යන්නට පුළුවන්කමක් ලැබෙනවා.

අවසාන වශයෙන් කියනවා නම්, මහා බැංකු හොරකම දැන් ලෝක ප්‍රසිද්ධයි. අපේ ගරු මන්ත්‍රීතුමෙක් කිව්වා, " හැම කාලයේම හොරකම් වෙලා තිබෙනවා. මේ හොරකම ගැනම විතරක් ඇයි කථා කරන්නේ" කියා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මා මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. I think, my Hon. Friend, this robbery is the mother of all robberies. මේ කාරණය ඉංග්‍රීසි භාෂාවෙන් කිව්වාම තමයි එය අර්ථවත් වෙන්නේ. මේ හොරකම සියලුම හොරකම්වල මාතෘත්වය දරන බවයි අපි කියන්නේ. මෙවාට සම්බන්ධකම් තිබෙන බවට සැකයට භාජනය වෙච්ච මන්ත්‍රීවරු ඉන්නවා නම් ඒ මන්ත්‍රීවරු සිය කැමැත්තෙන් මේ කාරක සභාවලින් ඉවත් වෙන්නට ඕනෑ. එසේ ඉවත් වුණේ නැත්නම් ඒ මන්ත්‍රීවරු කැඳවලා, එම උපදේශය ලබා දෙන්න අපේ කථානායකතුමාට පුළුවන්. කථානායකතුමා ඒ කටයුත්ත කරයි කියන බලාපොරොත්තුවෙන් මා නිහඬ වනවා. විගණකාධිපතිතුමාටත්, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු ලසන්ත අලගියවන්න මැතිතුමාටත් මා ස්තුතිවන්ත වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා නියෝජ්‍ය ඇමතිතුමා.

[பி.ப. 2.55]

ගරු සෙයිඩ් අලී සාහීර් මවුලානා මහතා (ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா - தேசிய ஒருமைப்பாடு, நல்லிணக்கம் மற்றும் அரச கருமமொழிகள் பிரதி அமைச்சர்)
(The Hon. Seyed Ali Zahir Moulana - Deputy Minister of National Integration, Reconciliation and Official Languages)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கௌரவ லசந்த அலகியவன்ன அவர்களைத் தவிசாளராகக் கொண்டுள்ள அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கைகள் குறித்து கௌரவ நளிந்த ஜயதிஸ்ஸ அவர்களால் கொண்டுவரப்பட்ட ஒத்திவைப்புவேளைப் பிரேரணைமீதான விவாதத்தில் கலந்துகொள்வதில் நான் மட்டற்ற மகிழ்ச்சி யடைகின்றேன்.

"அரசாங்க கணக்குகள் பற்றிய குழுவினால் எட்டாவது பாராளுமன்றத்தின் முதலாவது கூட்டத்தொடரின்போது சமர்ப்பிக்கப்பட்டுள்ள சகல அறிக்கைகள்மீது பாராளு மன்றத்தின் கவனம் செலுத்தப்பட வேண்டுமென்பதாலும், எதிர்காலத்தில் கொள்கை ரீதியான தீர்மானங்களை மேற்கொள்கையில் இந்த அறிக்கைகளில் விதப்புரை செய்யப் பட்டுள்ள விடயங்கள்மீது கவனம் செலுத்தப்பட வேண்டுமென்பதாலும், இந்த அறிக்கைகளின் உள்ளடக்கம் குறித்துப் பரந்தளவில் ஆராய்ந்து பார்த்தல் உகந்தது" எனக் குறித்த பிரேரணையில் குறிப்பிடப்பட்டுள்ளது. இந்தக் குழுவின் ஓர் உறுப்பினராக இருந்து பல முக்கியமான விஷயங்கள் குறித்து நானும் ஆராய்ந்திருக்கின்றேன். அதேநேரம் கணக்குகள் சம்பந்தமாக எங்களால் கொடுக்கப் படுகின்ற அறிக்கைகள் சரியான முறையில் வழிநடாத்தப்பட வேண்டும் என்பதில் நாங்கள் பல முயற்சிகளை மேற்கொண்டிருக்கின்றோம்.

பொதுக் கணக்குகள் பற்றி குழு அதன் வரலாற்றில் முதல் தடவையாக, அந்தக் குழுவின் மேற்பார்வையின்கீழ் வருகின்ற மொத்தம் 842 எண்ணிக்கையான நிறுவனங்களை உள்ளடக் கிய 2015ஆம் ஆண்டின் கணக்குகளை அடிப்படையாகக் கொண்டு, கணனி வலையமைப்பு மதிப்பீடு ஒன்றின்மூலம் பெற்றுக் கொள்ளப்பட்ட பெறுபேறுகள் தொடர்பில் குழுவின் கருத்துக்கள் அறிக்கையிடப்பட்டுள்ளன. கணனி வலைய மைப்பு முறைமையொன்றின்மூலம் தொடர்புறச் செய்து, உரிய சகல வகைகூறும் உத்தியோகத்தர்களினதும் பிரதான வகைகூறும் உத்தியோகத்தர்களினதும் மேற்பார்வையுடன், கணக்காய்வாளர் அதிபதியினதும் மற்றும் அவரது பதவியணியினரினதும் முழுமையான கண்காணிப்பு மற்றும் சான்றுபடுத்தல் ஆகியவற்றின் அடிப்படையில், 2016ஆம் ஆண்டின் கணக்குகளை அடிப்படையாகக் கொண்டு, கண்காணிப்புக்கு உட்படுத்தப்பட வேண்டிய சகல நிறுவனங்களும் உள்ளடங்கும் வகையில், மேற்கொள்ளப்பட்ட மதிப்பீட்டு நிகழ்ச்சித்திட்டங்களின் அவதானிப்புகள் மற்றும் சிபாரிசுகள் என்பவற்றைக் குறிப்பிடுகின்ற அறிக்கையைச் சமர்ப்பித்துள்ளதையிட்டு எமது தவிசாளர் அவர்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, கடந்த சில மாதங்களுக்கு முன் சில உள்ளூராட்சிச் சபைகளில், குறிப்பாக, "கிழக்கு மாகாணத்திலுள்ள காத்தான்குடி நகர சபை, ஏறாவூர் நகர சபை போன்ற உள்ளூராட்சிச் சபைகளின் அறிக்கைகளில் பல முரண்பாடுகள் காணப்படுவது பற்றி நாங்கள் ஆராய்ந்தபோது - அது தொடர்பில் விசாரணை செய்யுமாறு எமது தவிசாளர் அவர்கள் என்னிடம் சொன்னார் - நாங்கள் Auditor-General அவர்களது observation அடிப் படையிலே கொண்டுவரப்பட்ட பல விஷயங்களை விசாரித்த பொழுது, பாராளுமன்றத்தினால் ஒதுக்கப்பட்ட பணம் ஒட்டுமொத்தமாகக் கையாடப்பட்டிருப்பது தெரியவந்தது. அப்போதிருந்த முதலமைச்சரது வழிநடத்தலால் இவ்வாறான விளைவுகள் ஏற்பட்டுவிட்டதாகக் கிழக்கு மாகாண சபையின் பிரதம செயலாளர், கிழக்கு மாகாண உள்ளூராட்சி அமைச்சின் செயலாளர் உட்படப் பலர் சொன்னார்கள். கௌரவ உறுப்பினர் வாசுதேவ நாணாயக்கார அவர்கள் சொல்லியபடி, இன்று முதலமைச்சர் அங்கு இல்லாவிட்டாலும் அதுபற்றி விசாரிக்கப்படல் வேண்டும். ஏனெனில், அவற்றுக்கு வழங்கப்பட்ட நிதிகள் அரசியல் தலையீட்டால்தான் முறையாகச் செலவழிக்கப்படவில்லை என்பதை அந்த நேரத்திலிருந்த அதிகாரிகளே ஏற்றுக் கொண்டார்கள். ஏறாவூர் நகர சபையை எடுத்துக்கொண்டால், அங்கு அன்றாட வேலைகளைச் செய்வதற்குக்கூடப் பணமில்லாமல் இருக்கின்ற நிலையில், இந்த உள்ளூராட்சிச் சபையின் பணம் முதலமைச்சரின் அரசியல் சார்பான தமாஷாக்களுக்காக மிகவும் மோசமான முறையில் வீண் விரயம் செய்யப்பட்டிருப்பதை நாங்கள் காணக்கூடியதாக இருந்தது. எனவே, எங்களுடைய குழு அதன் அன்றைய செயலாளரிடம் இதுபற்றிய அவருடைய அறிக்கையை ஒரு மாதத்திற்குள் சமர்ப்பிக்குமாறு கேட்டுக் கொண்டபோதிலும், அந்த அறிக்கை எமது COPA க்கு இன்று வரை அனுப்பிவைக்கப்படவில்லை. எனவே, இந்த விடயத்திலே கவனம் செலுத்தப்பட வேண்டும்.

அதுமாத்திரமல்ல, Engineer ஒருவராலும் அங்கு கையாடல்கள் இடம்பெற்றிருக்கின்றன. இது சம்பந்தமாக Auditor-General அவர்களால் விரிவாகச் சொல்லப்பட்டுள்ளது. The observation of the Auditor-General has very clearly said, that the engineer who was assigned by the former Chief Minister has already mishandled the funds being given for certain projects. Even now they are retaining the same engineer, protected by certain officials, who are encouraging this kind of activities. So this is totally unacceptable. எனவே, இந்தக் கணக்குகள் சம்பந்தமான விசாரணைகள் தொடர்பில் உரியவர்கள் வகைசொல்லக்கூடிய வகையில் பாராளுமன்றம் சிபாரிசு செய்ய வேண்டும் என்பதையும் இந்த நேரத்தில் தெரிவித்து, சந்தர்ப்பத்திற்கு நன்றி கூறி, விடைபெறு கின்றேன். நன்றி.

[අ.භා.3.01]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින අටවැනි පාර්ලිමේන්තුවේ දෙවැනි සභාවාරය සඳහා වූ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ පළමුවැනි වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පසුව, අටවන පාර්ලිමේන්තුවේ පළමුවෙනි සැසිවාරය තුළ ඉදිරිපත් කරන ලද සියලුම වාර්තා පිළිබඳව පැවතෙන මේ විවාදයේදී ඒ සම්බන්ධයෙන් අදහස් කීපයක් ප්‍රකාශ කරන්න මම බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාවගේ මුදල්වලට වග කියන ආයතනය පාර්ලිමේන්තුව බව අපි කවුරුත් දන්නා කාරණයක්. මේ රටේ ජනතාව මේ රටට ගෙවන බදු, රාජ්‍ය ආදායම් සහ වියදම්, රාජ්‍ය ආයතනවල කරන ක්‍රියාකාරකම් ආදී

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

වශයෙන් මුදල් හා සම්බන්ධ සියලු දෙයට වග කියන ආයතනය තමයි පාර්ලිමේන්තුව. මේ පාර්ලිමේන්තුවේ මුදල් පිළිබඳව නිරීක්ෂණය කරන ආයතන දෙකක් තිබෙනවා. ඒ ආයතන දෙක තමයි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සංස්ථා සහ මණ්ඩල නිරීක්ෂණය කරන අතර, මගේ මිත්‍ර -සමාවෙන්න, මගේ මිත්‍ර නොවෙයි. ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමාගේ මිත්‍ර - ලසන්ත අලගියවන්න මැතිතුමා සභාපති ධුරය දරන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව රාජ්‍ය දෙපාර්තමේන්තු නිරීක්ෂණය කරනවා. මේ රටේ කරපු ඕනෑම ගනුදෙනුවක් පිළිබඳව අධීක්ෂණය කරලා, ඒ නිලධාරීන් කැඳවලා, ඒ පිළිබඳව හොයා බලන්න මේ ආයතන දෙකට පුළුවන්. එමෙන්ම ඒවායේ තිබෙන අඩුපාඩුකම් සියල්ල මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න පුළුවන්. ඒ අඩුපාඩු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළාට පස්සේ, මේ පාර්ලිමේන්තුව විසින් මුදල් අමාත්‍යාංශයටත්, අදාළ අමාත්‍යාංශයටත් ඒ අඩුපාඩුකම් පිළිබඳව දන්වලා යවනවා. ඒ අනුව ඔවුන්ගේ නිර්දේශ ඉදිරිපත් කරලා, ඉදිරි කටයුතු කරගෙන යනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආයතන දෙක තමයි, මේ රටේ ජනතාවගේ මුදල් සම්බන්ධයෙන් වග කිව යුතු ආයතන දෙක. ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමනි, මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියටත් කටයුතු කළා. ඒ නිසා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයෙකු හැටියට මොන තරම් කාර්ය භාරයක් කරන්න පුළුවන්ද කියලා මම දන්නවා.

නියෝජ්‍ය ඇමතිතුමනි, අපි ඒ දවස්වල රාජ්‍ය ආයතනවලට ගිහිල්ලා පැන්නා. අපි රාජ්‍ය ආයතනවලට පැනලා, ඒවා නිරීක්ෂණය කළා; ඒවායේ තිබෙන වැරැදි හොයලා බැලුවා; වැරැදිකරුවන් ඇල්ලුවා; ඒ අයට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු කළා. ඒ නිසා මේ ආයතනය විශාල බලයක් සහිත, පුළුල් ආයතනයක් කියන එක අපි කවුරුත් දන්නා දෙයක්. මම කියාගෙන ආවේ මේකයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රටේ මුදල්වලට වග කිව යුතු ආයතනය පාර්ලිමේන්තුව නම්, ඒ මුදල් ගැන සොයා බලන ආයතනය "කෝප්" කමිටුව නම්, මේ "කෝප්" කමිටුව කෙරෙහි රටේ ජනතාව තුළ විශ්වාසයක් තිබෙන්න ඕනෑ. වර්තමාන "කෝප්" කමිටුව පිළිබඳව මේ රටේ ජනතාවගේ තිබෙන අවිශ්වාසය තමයි මට තිබෙන ප්‍රශ්නය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජනවාරි මාසයේ 08 වැනිදායින් පස්සේ හොරකම නවත්වනවා කියලා බලයට පත් වෙච්ච මේ ආණ්ඩුව යටතේ මහා බැඳුම්කර මංකොල්ලය පිළිබඳව ඩිව් ගුණසේකර මැතිතුමා විසින් පරීක්ෂණයක් කළා. කෝප් කමිටුව විසින් පරීක්ෂණය කරලා, මේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කලින්, හොරකම හෙළි වෙයි කියලා වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් නොකර පාර්ලිමේන්තුව විසුරුවා හැරියා. 2015 අගෝස්තු මාසයෙන් පස්සේ "කෝප්" කමිටුව නැවත පත් කළා. "කෝප්" කමිටුව නැවත පත් කරනකොට කලින් හිටපු වේලු කුමාර් මන්ත්‍රීතුමා ඉවත් කරලා, සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා පත් කළා. එතුමා තමයි "බැඳුම්කරයේ ඇත්ත නැත්ත" කියන පොත ලිව්වේ. පසුගිය දා ජනාධිපතිතුමා විසින් මේ පාර්ලිමේන්තුවේ සභාවාරය නැවත ආරම්භ කළාට පසුව "කෝප්" කමිටුවට නැවත සාමාජිකයන් පිරිසක් පත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ රටේ හැම කෙනෙක්ම කථා කරන දෙයක් තමයි, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු පිළිබඳව; පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තිබුණු ගෞරවය පිළිබඳව. වර්තමාන පාර්ලිමේන්තුව තරම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා අපහසුතාවකට පත් කරපු තැනක් තවත් නැහැ. මන්ත්‍රීවරයාට තිබුණු ගරුත්වය මේ තරම් නැති වුණු අවස්ථාවක් ලංකා ඉතිහාසයේ කවදාවත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෝප් කමිටුවට පසුගිය දා සාමාජිකයන් පිරිසක් පත් කළා. මේ පත් කරපු සාමාජිකයන්ගෙන් දෙන්නෙක් බැඳුම්කර වංචාවට සම්බන්ධ අර්ජුන් ඇලෝසියස් මහතාගෙන් මුදල් ගත්ත බව මේ වෙනකොට ඔප්පු වෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාවගේ මුදල්වලට වග කියන ආයතනය පාර්ලිමේන්තුවයි. ඒ මුදල් අධීක්ෂණය කරන්නේ "කෝප්" කමිටුව. "කෝප්" කමිටුවට පත් කරලා ඉන්න සමහර සාමාජිකයන් ඒ කමිටුව විසින් පරීක්ෂා කරන ලද ගනු දෙනුවකට සම්බන්ධ චූදිතයෙකුගෙන් මුදල් අරගෙන තිබෙනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ හිටපු සභාපති ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමාට මතක ඇති, බැඳුම්කර වංචාව පිළිබඳව "කෝප්" කමිටුවේ සාකච්ඡා කරපු වෙලාවේ "කෝප්" කමිටුවේ හිටපු ඔය සල්ලි ගත්ත මිනිස්සු විගණකාධිපතිතුමාට ඇඟිල්ල දිගු කරලා තර්ජනය කළ හැටි. ඔවුන් විගණකාධිපතිතුමාට ප්‍රශ්න කරන්න දුන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "කෝප්" කමිටුව තීරණය කළා, මහ බැංකු අධිපතිවරයා පාර්ලිමේන්තුවට කැඳවන්න ඕනෑ කියලා. මහ බැංකු අධිපතිවරයා පාර්ලිමේන්තුවට කැඳවන්න ඕනෑ කියනකොට "කෝප්" කමිටුවේ සභාපතිවරයාව කථානායකතුමාගේ කාමරයට ගෙනැල්ලා ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාත් එක්ක කිව්වා, පුළුවන් නම් මේක නවත්වන්න කියලා. සුනිල් හඳුන්නෙත්ති සභාපතිතුමා "නැහැ, මම එතුමා ගෙන්වනවා" කියපු නිසා තමයි මේ බැඳුම්කර වංචාව එළියට ආවේ. ඒ වනතුරු මහ බැංකුව කිසිම තොරතුරක් දුන්නේ නැහැ. එදා මහ බැංකු අධිපතිවරයා කෝප් කමිටුවට ගෙන්වන එක නවත්වන්න මේ පාර්ලිමේන්තුව කටයුතු කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ ජනතාවගේ මුදල්වලට වග කියන ආයතනය හොරකමක් ගැන හොයනකොට ආණ්ඩුව මැදිහත්වෙලා ඒ චූදිතයන් කෝප් කමිටුවට කැඳවන එක නවත්වනවා නම්, තව මොනවාද කථා කරන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙනකොට පාර්ලිමේන්තු මන්ත්‍රීවරු දෙදෙනෙක් කෝප් කමිටුව පරීක්ෂා කළ ගනු දෙනුවකට සම්බන්ධ ඒ චූදිතයාගෙන් මුදල් ගත්තා කියා ඔප්පු වෙලා තිබෙනවා. ඒ වාගේම තව සාමාජිකයන් තුන්දෙනෙක් මුදල් ගත්තා කියා ඔප්පු වෙලා තිබෙනවා. මම නම් කියලා ඒ අය අපහසුතාවට පත් කරන්න කැමැති නැහැ. කළුතර දිස්ත්‍රික්කයේ ඇමතිවරයෙක්, ගම්පහ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් සහ පුත්තලම දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයෙක් මුදල් අරගෙන තිබෙනවා කියලා මේ වෙනකොට ඔප්පු වෙලා ඉවරයි. හෙට අනිද්දා වෙනකොට ඒ නම් ටික එළියට එනවා. කොළඹ වර්තමාන නගරාධිපතිතුමිය රෝසි සේනානායක මහත්මියයි. බැඳුම්කර කොමිසමේ සාක්ෂි විභාග කරනකොට ඒ තොරතුරු එළියට ගියා කියලා පසුගිය දවස්වල පත්තර වල පළ වුණා. ඒ තොරතුරු එළියට ගියේ එතුමිය මඟින් කියලා කිව්වා. දැන් හෙළිවෙලා තිබෙනවා එතුමියගේ පුතාත් මුදල් ගත්තා කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ සහ කෝප් කමිටුවේ සාමාජිකයන් පස් දෙනෙක් මුදල් අරගෙන තිබෙනවා කියා මේ වෙනකොට ඔප්පු වෙලා ඉවරයි. තව දෙන්නෙක් හෙට අනිද්දා වෙනකොට එළියට එනවා. මේ ප්‍රශ්නය නිසාම මමත්, අපේ කළුතර දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ජයන්ත සමරවීර මැතිතුමාත් දිවුරුම් ප්‍රකාශ දුන්නා. කෝප් කමිටුවට තිබෙන ගෞරවය නැති කරන්න එපා, කෝප් කමිටුවේ සාමාජිකයන් අර්ජුන් ඇලෝසියස්ගෙන් සල්ලි අරගෙන නැත්නම් වහාම දිවුරුම් ප්‍රකාශයක් දීලා "අපි මුදල් අරගෙන නැහැ" කියලා කියන්න කියලා අපි කිව්වා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තමයි තිබෙන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මට විනාඩි කීයක්ද තිබුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තිබුණේ විනාඩි 10යි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අපේ පැත්තෙන් කථා කරන වෙන මන්ත්‍රීවරයෙකුගේ කාලය ලබා දෙන්න.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමාගේ කාලය තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි, ඔබතුමා කථා කරන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියාගෙන ආවේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු පස්දෙනෙක් ඒ චූදිතයාගෙන් මුදල් අරගෙන තිබෙන බව මේ වෙනකොට ඔප්පු වෙලා තිබෙන බවයි. අපි ගරු කථානායකතුමාට කිව්වා, මුදල් අරගෙන නැත්නම් "කෝප්" කමිටුවේ සියලු සාමාජිකයන්ගෙන් දිවුරුම් ප්‍රකාශ ලබාගන්න කියලා. පාර්ලිමේන්තුවේ කළුතර දිස්ත්‍රික් මන්ත්‍රී ජයන්ත සමරවීර මැතිතුමා සහ මම විතරයි කෝප් කමිටුවේ සාමාජිකයන් හැටියට තවම දිවුරුම් ප්‍රකාශ දීලා තිබෙන්නේ. අනික් කවුරුවත් දිවුරුම් ප්‍රකාශ දුන්නේ නැහැ. ඔක්කෝම දැන් ඇටි කෙහෙල් කාපු රිලව් වාගෙයි. දැන් කවුරුවත් කතා කරන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කෝප් කමිටු සාමාජිකයන්ට සල්ලි දීලා විතරක් නොවෙයි, මේ වෙනකොට මෙන්ඩිස් අරක්කු සමාගමේ දිස්ත්‍රික් නියෝජිත තනතුරු ගත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු පස්දෙනෙක් ඉන්නවා. වයඹ පළාතේ මන්ත්‍රීවරයෙක් ඉන්නවා; සබරගමුව පළාතේ මන්ත්‍රීවරයෙක් ඉන්නවා; මධ්‍යම පළාතේ මන්ත්‍රීවරයෙක් ඉන්නවා. ලජ්ජා නැතුව ඊයේ-පෙරේදා නියෝජ්‍ය ඇමතිකම් ගත්තා. ඇලෝසියස්ගේ අරක්කු විකුණනවා; බෙදනවා. ඒජන්සි අරගෙන, අර්ජුන් ඇලෝසියස්ගේ අරක්කු බෙදනවා. දැන් ලජ්ජා නැතුව කථා කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකක්ද මේ පාර්ලිමේන්තුවට වෙලා තිබෙන්නේ?

අපි ඊයේ පත්තරේ දැක්කා, හාරදහස් පන්සියයකට මුදල් බෙදලා කියලා. හාරදහස් පන්සියයකට මුදල් බෙදලා; සිරිකොතේ වැඩ කරන මිනිස්සුන්ට සල්ලි ගෙවලා; මහ බැංකුවේ නිලධාරින්ට සල්ලි ගෙවලා; පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට සල්ලි ගෙවලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොකක්ද මේ වෙලා තිබෙන්නේ? මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ, ජනතාවගේ මුදල්වලට වග කියන ආයතනයේ සාමාජිකයන් පරීක්ෂණයට ලක්වන ප්‍රධාන චූදිතයාගෙන් මුදල් අරගෙන තිබෙනවා නම්, අද වෙනකල් මේ ආණ්ඩුවේ නීති කෝ? ලක්ෂ දහයට-පහළොවට අපිට නඩු පවරලා හිරේ දමනවා. රවි කරුණානායක හිටපු මුදල් ඇමතිතුමා බැඳුම්කර කොමිසමට ආවා. එහිදී එතුමා අර්ජුන් ඇලෝසියස් මහත්මයාගෙන් නිවසක් ගත්තාය කියලා ඔප්පු වුණා. ඒ චෝදනා පත්‍රය නීතිපතිතුමාට යවලා මාස හතරක් වෙනවා. අද වෙනකල් කිසි ප්‍රතිචාරයක් නැහැ. මහින්දානන්ද අලුත්ගමගේලාට විරුද්ධව මාස තුනෙන් අධි චෝදනා හාර දෙනවා. මහෙස්ත්‍රාත් අධිකරණයේ 2012 වසරේ කථා කළ නඩුවල අධි චෝදනා තවම හාර දීලා නැහැ. අවුරුදු හතක් පරක්කුයි, මහෙස්ත්‍රාත් අධිකරණවල කථා කරන නඩුවලට අදාළව මහාධිකරණවලට අධි චෝදනා හාර දීම. හැබැයි මේ ආණ්ඩුවට විරුද්ධව කථා කරනවාට ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට විරුද්ධව අධි චෝදනා හාර දීලා නඩු අහනවා.

රවි කරුණානායක මහත්මයාට විරුද්ධව අද වෙනකල් අධි චෝදනා හාර දුන්නාද? FCID එකට කැඳවලා කටඋත්තරයක් ගත්තාද? දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා ගෙන්වලා කටඋත්තරයක් ගත්තා. සුජීව සේනසිංහ මන්ත්‍රීතුමා FCID එකට ගෙන්වලා කටඋත්තරයක් ගත්තා. අනෙකුත් මන්ත්‍රීවරුන්ගෙන් කටඋත්තර ගන්නවාද? කළුතර දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ඇමතිවරයෙක්ගේ මස්සිනා ගිහිල්ලා තමයි cheque එක මාරු කළේ. දූෂණය නැවැත්වීම ගැන කථා කරනවා. විගණකාධිපතිට ඇහිල්ල දික් කරලා තර්ජනය කළා. විගණකාධිපතිවරයා හරි කලකිරීමෙනුයි එදා කථා කළේ. රටේ මුදල්වලට වග කියන විගණකාධිපති බැඳුම්කර කොමිසම ගැන කථා කරනකොට, එක එක්කෙනාගේ කොන්ත්‍රාත් කරන්න එපාය කියලා විගණකාධිපතිට කිව්වා; විගණකාධිපතිවරයාට තර්ජනය කළා. විගණකාධිපතිවරයා මහ බැංකුවට ගිහිල්ලා අදාළ තොරතුරු ඉල්ලනකොට විගණකාධිපතිවරයාට තොරතුරු නොදී හිටියා. පාර්ලිමේන්තුවේ footnotes දැමූ සියලු දෙනාගේ වත්කම් හෙළි කරන්න කියලා ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු විධියට අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ගිහිල්ලා පැමිණිලි කළා. අද වෙනකල් එක මන්ත්‍රීවරයෙක් ගෙන්වලා තිබෙනවාද?

රුපියල් බිලියන 131ක් හොරකම් කළාය කියලා මේ මන්ත්‍රීතුමන්ලා ගිහිල්ලා මේ ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ට විරුද්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිලි කළා. පැමිණිලි කරලා දැන් අවුරුදු එකහමාරයි. අද වෙනකල් අල්ලස් කොමිසමට එක මන්ත්‍රීවරයෙක් කැඳවා තිබෙනවාද? එක මන්ත්‍රීවරයෙක්වත් අල්ලස් කොමිසමට කැඳවා නැහැ. ඒ නිසා ඒ පැමිණිල්ල ඉදිරිපත් කළ මන්ත්‍රීතුමන්ලා දසදෙනා අල්ලස් කොමිසමේ සභාපතිතුමාට ලිපියක් ඉදිරිපත් කරලා තිබෙනවා. රජයේ අමාත්‍යවරු සහ නිලධාරින් ඇතුළු දොළොස්දෙනෙකුට එරෙහිව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිලි ඉදිරිපත් කළා. ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා, ගරු රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා, ගරු සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා, ගරු නිරෝෂන් ප්‍රේමරත්න මන්ත්‍රීතුමා, ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා, ගරු කනක හේරත් මන්ත්‍රීතුමා, ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා, ගරු උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා, ගරු රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා, ගරු විදුර වික්‍රමනායක මන්ත්‍රීතුමා යන මන්ත්‍රීවරු දසදෙනා මේ ආණ්ඩුවේ ඇමතිවරු රුපියල් බිලියන 131ක් -මිලියන 131,000ක් - මහ දවල් හොරකම් කළා කියලා පැමිණිලි ඉදිරිපත් කරලා තිබෙනවා. කෝ, ඒවාට විභාග? මොකක්ද, මේ රටේ නීතිය? මේ

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

රටේ නීතිය තිබෙන්නේ ඒකාබද්ධ විපක්ෂයට විතරද? එක දිගට දින දමලා ප්‍රසන්න රණතුංගගේ නඩු අහනවා. බැසිල් රාජපක්ෂ මහත්මයාගේ නඩු එක දිගට දින දමලා අහනවා. මහින්දානන්ද අලුත්ගමගේගේ නඩු අහනවා. දවසෙන් දවස ඒ නඩු අහනවා. හැබැයි මහ දවල් මංකොල්ල කාපු කට්ටියගේ නඩු පිළිබඳව විභාගයකුත් නැහැ; මොකක්වත් නැහැ. එහෙම නේද, ගරු විජිත හේරත් මන්ත්‍රීතුමනි? මොකක්වත් නැහැ. මේවා ගැන කවුරුවත් කථා කරන්නේ නැහැ.

අපි දැක්කා, අපේ නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා ඊයේ-පෙරේදා පොලීසිය භාර නියෝජ්‍ය ඇමතිකම භාර ගත්තා. අද නියෝජ්‍ය ඇමතිකම භාර ගත්තා, හෙට උදේ FCID එකට ගියා; හිටපු ආරක්ෂක ලේකම්තුමාට විරුද්ධව කටඋත්තරයක් දෙන්න. මාර ඇමතිකම්! ඇමතිකම දුන්න ගමන් ගිහිල්ලා කටඋත්තර දෙනවා. ඊට කලින් කටඋත්තර දෙන්න බැහැ. ඇමතිකම දීලා තිබෙන්නේ, කටඋත්තරයක් දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ගරු කථානායකතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, මේ පාර්ලිමේන්තුවේ කෝප් එකේ ඉන්න, මුදල් ගත්ත සාමාජිකයින් ටික වහාම ඉවත් කරන්න කියලා. මේ වන කොට ඒ පස්දෙනකුගේ නම් ඔප්පු වෙලා තිබෙනවා. ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමනි,

'ෆුටනෝට් කල්ලිය' කෝප් කමිටුවේ හැසිරුණු ආකාරය ඔබතුමාට මතකද? ඔබතුමාට මතක ඇති, ෆුටනෝට් කල්ලිය හැසිරුණු ආකාරය. බුදු අම්මේ! කෝප් කමිටුවේ සාකච්ඡාව යන ගමනුත් සමහරු "Okay, okay" කිය කියා කථා කරනවා. අපි හිතුවා, මළ ගෙයක් ගැන කියලා ගෙදරින් කථා කරනවා කියලා. පස්සේ බැලුවාම අර්ජුන් ඇලෝසියස් එක්කයි කථා කරලා තිබෙන්නේ! මේ රටේ ලොකුම මූල්‍ය වංචාව සිදුවීම පිළිබඳව පාර්ලිමේන්තුවේ කෝප් කමිටුවේ පරීක්ෂණය පැවැත්වෙන අතරේ, එක්සත් ජාතික පක්ෂයේ ඇමතිවරු අර්ජුන් ඇලෝසියස් එක්ක දුරකථනයෙන් කථා කර ගන්නවා, මේ ප්‍රශ්නවලට දෙන උත්තර මොනවාද කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොනවාද මේ වෙන්නේ? කොහේටද මේ අය මේ රට ගෙන යන්නේ? ජනවාරි මාසයේ 08වැනි දා මේ රටේ ජනතාව මේ ගොල්ලන්ට ඡන්දය දුන්නේ මොනවාටද? බැංකු කඩන්නද? ජනාධිපතිතුමා අහලා තිබුණානේ, "ජන වරම දුන්නේ මහ බැංකුව කඩන්නද" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බැදුම්කර වංචාව සම්බන්ධයෙන් වන කෝප් කමිටු වාර්තාව අපි පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. හරි විධියට නම් ඒක එදාම අදාළ ආයතනවලට යවන්න ඕනෑ. නමුත්, අද වනතුරු ඒක යවලා තිබෙනවාද? අද වනතුරු ඒක පාර්ලිමේන්තුවෙන් මුදල් අමාත්‍යාංශයට එහෙම නැත්නම් අදාළ ආයතනවලට යවලා නැහැ. ඒ නිසා පාර්ලිමේන්තුවත් වරදක් කරලා තිබෙනවා. ඒ මොකක්ද? මේ කරුණු වහන එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. " දිවිරුම් ප්‍රකාශයක් දුන්නා" කියලා එදා මම කිව්වාම, කළුතර දිස්ත්‍රික්කයේ නියෝජ්‍ය ඇමතිවරයෙක් කිව්වා, "අපට විරුද්ධවත් නඩු තිබෙනවා" කියලා. අපට විරුද්ධව තිබෙන නඩු දැන් විභාග කරනවා නේ. දැන් දිගින් දිගට ඒවා අහනවානේ. ඒ නඩු තීන්දු ආවාම චෝදනා එන්නේ කාටද, මොනවාද වෙන්නේ කියලා බලා ගන්න පුළුවන්. අපි අත්අඩංගුවට ගත්තා; ඒ ඔක්කෝම කළා නේ. අධිකරණයේ නඩු තීන්දුව ආවාම බලා ගන්න පුළුවන්, කවුද හොරු, කවුද නිවැරදිකාරයන් කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේගොල්ලන් හොරකම නවත්වන්න කියලා බලයට පත් වෙලා මාසයක් යන කොට මේ රටේ මහ බැංකුවේ මුදල් හොරකම් කර තිබෙනවා. ඒ හොරකමට සම්බන්ධ මහ එකාගේ ඉඳලා සියලුදෙනා අද අහු වෙලා තිබෙනවා. පසුගිය පාර්ලිමේන්තු මැතිවරණය වෙලාවේ එක්සත් ජාතික පක්ෂයේ සියලු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සල්ලි දුන්නා, එක්සත් ජාතික පක්ෂයේ මහලේකම්තුමා. අපේක්ෂකයෙකුට ලක්ෂ 50, 100, 150 දුන්නා. ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමනි, සල්ලි දුන්නා නේද?

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(මාණ්පුමිකු හර්ෂන රාජකරුණා)
(The Hon. Harshana Rajakaruna)
නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
එහෙම නම් "දුන්නේ නැහැ" කියලා දිවුරුම් ප්‍රකාශයක් දෙන්න. සිරිකොතේ ලයිට් බිල් ගෙවා ගන්න බැරිව හිටපු තමුන්නාන්සේලා එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට මැතිවරණයට ලක්ෂ 50, 100 බෙදුවා. මම ඒ අයගේ නම් කියන්න කැමැති නැහැ.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(මාණ්පුමිකු හර්ෂන රාජකරුණා)
(The Hon. Harshana Rajakaruna)
බැසිල් රාජපක්ෂ මහත්මයා බෙදුවේ?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
බැසිල් රාජපක්ෂ මහත්මයා බෙදුවා නම් තමුන්නාන්සේ ඒක ඔප්පු කරන්නකෝ. බැසිල් රාජපක්ෂ මහත්මයාට චෝදනාවක් නැහැ. තමුන්නාන්සේලාටයි චෝදනාව තිබෙන්නේ, මහ බැංකුව කොල්ල කෑවායි කියලා. [බාධා කිරීම්] හරි, පොඩ්ඩක් ඉන්නකෝ. ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමනි, ඔබතුමා බොහොම ගෞරවනීය මන්ත්‍රීතුමෙක්නේ. ඔබතුමා කමිටුවේ සාමාජිකයෙක් නේද?

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(මාණ්පුමිකු හර්ෂන රාජකරුණා)
(The Hon. Harshana Rajakaruna)
ඔව්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා අර්ජුන් ඇලෝසියස්ගෙන් සල්ලි ගත්තා ද?

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(මාණ්පුමිකු හර්ෂන රාජකරුණා)
(The Hon. Harshana Rajakaruna)
නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
හොඳයි, එහෙම නම් ඔබතුමා කෝප් කමිටුවට දිවුරුම් ප්‍රකාශයක් දෙන්න. හැබැයි ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට චෝදනාවක් තිබෙනවා සල්ලි ගත්තා කියලා. ඔබතුමා ගත්තේ නැත්නම් දිවුරුම් ප්‍රකාශයක් දෙන්න. [බාධා කිරීම්] මූලාසනාරූඪ

ගරු මන්ත්‍රීතුමනි, පෙනෙනවා නේද මොකද වෙන්නේ කියලා? [බාධා කිරීම්] ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමනි, ඔබතුමා එක්ක තිබෙන පෞද්ගලික ප්‍රශ්නයක් නිසා නොවෙයි මම මෙහෙම කියන්නේ. ඒ විධියට රටේ මතයක් හැදිලා තිබෙනවා. ඔබතුමාට මතකද, සමහර අය කෝප් කමිටුවේ හැසිරුණු හැටි? විගණකාධිපතිතුමාට තර්ජනය කරපු හැටි මතකද? තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ කණ්ඩායම අර්ජුන් ඇලෝසියස් වෙනුවෙන් කඩේ ගිය හැටි මතකද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හොඳයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අර්ජුන් ඇලෝසියස්ගෙන් මුදල් ගත්ත සියලුදෙනා විතරක් නොවෙයි, මෙන්ඩිස් සමාගමේ ඒජන්සි ගත්ත පාර්ලිමේන්තුවේ ඉන්න පස්දෙනා කවුද කියලාත් කියන්න. තමුන්නාන්සේලාගේ පස්දෙනකු ඉන්නවා. මේ සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ඉදිරිපත් කරපු පැමිණිල්ල මම **සභාගත*** කරනවා.

මෙයට සම්බන්ධ උෆව පළාතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ඉන්නවා; මධ්‍යම පළාතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ඉන්නවා; සබරගමුව පළාත නියෝජනය කරන තමුන්නාන්සේලාගේ පසුපෙළ මන්ත්‍රීවරයකුත් ඉන්නවා; වයඹ පළාතේ මන්ත්‍රීවරයකුත් ඉන්නවා. ඒ අය තමයි අර්ජුන් ඇලෝසියස්ගේ අරක්කු බෙදන කට්ටිය. පාර්ලිමේන්තුවේ දැන් අරක්කු බෙදන මන්ත්‍රීවරුත් ඉන්නවා.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)
ඒ නම් ටික කියන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
පොඩ්ඩක් ඉන්නකෝ. ඒ නම් ටික හෙට අනිද්දා එළියට එනවා. කලබල වෙන්න එපා. මම දැන් කිව්වානේ. ගම්පහ දිස්ත්‍රික්කයේ එක්කෙනකුගේ නමක් තිබෙනවා; කළුතර එක්කෙනකුගේ නමක් තිබෙනවා; හලාවත එක් කෙනකුගේ නමකුත් තිබෙනවා. දැන් ඒවා හසු වෙලා තිබෙනවා. ඒ නම් ටික එළියට එනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ උත්තරීතර පාර්ලිමේන්තුව තමයි මේ රටේ ජනතාවගේ මුදල්වලට වග කියන ආයතනය. ඒ කටයුතු නිරීක්ෂණය කරන ආයතනය කෝප් කමිටුව නම්, ඒ කමිටුවේ සාමාජිකයන් මේ රටේ මහා මං කොල්ලය කළ මං කොල්ලකරුවාගෙන් සල්ලි අරගෙන තිබෙනවා නම්, කරුණාකර ඒ සාමාජිකයන් ඉවත් කර වෙනත් සාමාජිකයන් පත් කරලා, ඒ ගෞරවනීය අවස්ථාව එතුමන්ලාට ලබා දෙන්න කියන ඉල්ලීම පමණයි මා ඔබතුමාගෙන් කරන්නේ. බොහොම ස්තුතියි.

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.
Document not tendered.

[අ.භා.3.20]

ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පිළිබඳව කථා කරන මේ මොහොතේ ඒ සම්බන්ධයෙන් අදහස් දක්වන්න මට ලැබී තිබෙන්නේ ඉතාම කෙටි කාලයක් නිසා, අවශ්‍යම කාරණා පමණක් කථා කරන්න මා බලාපොරොත්තු වනවා.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයකු වශයෙන් දෙවෙනි වතාවටත් මා තෝරා ගැනීම පිළිබඳව විශේෂයෙන්ම මා සතුටු වනවා. මීට කලින් තිබුණු රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සහ වර්තමාන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා වන ලසන්ත අලගියවන්න මැතිතුමාටත් මා ස්තුතිවන්ත වන්න ඕනෑ. එතුමාත් එක්ක, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සිටින මන්ත්‍රීතුමන්ලාත් එක්ක, ඒ නිලධාරීන් එක්ක වැඩ කර ගෙන යනකොට ඇත්තටම නවක මන්ත්‍රීවරියක විධියට මටත් ගොඩක් දේවල් ඉගෙන ගන්න පුළුවන් වුණා. නවක මන්ත්‍රීවරියක විධියට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ තිබෙන වටිනාකම පිළිබඳව මට කොපමණ දේවල් ඉගෙන ගන්න තිබෙනවාද කියලා එහිදී මට තේරුම් ගියා. රාජ්‍ය දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ ඇතුළේ ගනුදෙනු සිද්ධ වන්නේ කොහොමද, ඒවායේ අය වැය සකස් කරන්නේ කොහොමද, ඒ මුදල් පරිහරණය වන්නේ කොහොමද, ඒ මුදල් යම් යම් කටයුතුවලට යොදවන්නේ කොහොමද කියන ඒ සෑම දෙයක් පිළිබඳවම යමක් ඉගෙන ගන්න තිබෙන හොඳම ස්ථානය රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තමයි කියලා මට උපදෙස් දුන්නේ අපේ ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමායි. ඒ නිසා මේ වෙලාවේ මම කෘතඥතාපූර්වකව එතුමාත් මතක් කරන්න ඕනෑ. එතුමාගේ බල කිරීම මත, පුළුවන් සෑම අවස්ථාවකම වාගේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට මම ගියා. ඒ ගිය සෑම අවස්ථාවකදීම මට ඉගෙන ගන්න දෙයක් තිබුණා. එහිදී අපේ දැනුමට යමක් එකතු වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට නිතරම සහභාගි වුණු කෙනකු විධියට මම අධ්‍යයනය කරපු පළමුවෙනි කාරණාව තමයි, 2015 වසරට කලින් අවුරුදු ගණනාවක් තිස්සේ පැවැති ආණ්ඩු යටතේත් ඇහැ ගැටුණේ නැති අමාත්‍යාංශ, රාජ්‍ය ආයතන තිබෙන බව. ඒ ආයතන ඇතුළේ සිදු වුණු මුදල් පිළිබඳ යම් යම් අකටයුතුකම් අවුරුදු ගණනාවක් තිස්සේ ඇදී ගෙන ඇවිත් තිබෙනවා, මෙතෙක් කථා නොකර. 2015දී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ධුරය ලසන්ත අලගියවන්න මැතිතුමාට ලැබුණාට පස්සේ එතුමා කිසිම විධියකින් කිසිම පැත්තකට ගැනී වන්නේ නැතිව ඉතාම අපක්ෂපාතීව, සෑම නිලධාරියෙකුම කාරක සභාව ඉස්සරහට ගෙන්වාගෙන ඒ හැම කාරණාවක්ම මුල සිට අග දක්වා අපේ අවධානයට යොමු කළා. ඒ විධියට එතුමා කටයුතු කළ නිසා අපි දැන ගත් කරුණු තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට ටික වෙලාවකට කලින් මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා කිව්වා, පසුගිය ආණ්ඩු කාලයේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව හරි ප්‍රබල ආයතනයක්, ප්‍රබල තැනක්, ප්‍රබල කොමිටියක් කියලා. මේ කාරක සභාවෙන් එක පාරටම ගිහින් රාජ්‍ය ආයතනවලට පනිනවා කියලාත් එතුමා කිව්වා. එතුමා කියන විධියට ඒ තරම් තදබල ලෙස ඒ වැඩ කටයුතු කළා නම්, මේ ආණ්ඩු බලය ගත් අපට 2015 වසරේ සිට අද වන තෙක් පසුගිය ආණ්ඩු කාලයේ සිදු වූ මූල්‍ය අකටයුතුකම් ගැන සොයා බලන්න වුණේ මොකද? අද සමහර රජයේ ආයතනවලට සිදු වෙලා තිබෙන දේවල් ගැන බලන කොට

[ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය]

-දේශපාලනය පැත්තක තියන්න කෝ- රටේ පුරවැසියකු විධියට ඇත්තටම මට පුදුමාකාර කලකිරීමක් ඇති වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කීප වතාවක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ උදවිය මේ කාරක සභාවට ගෙන්වූවා. අපි හිතමු, ලංකාවේ දූෂිත රාජ්‍ය ආයතන 10ක් තිබෙනවා කියලා. මේ ආයතන 10න් ප්‍රමුඛ ස්ථානය ලැබෙන්නේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට. මේ ආයතනය තරම් සල්ලි හම්බ කරන්න පුළුවන්, අත යට කොමිස් ගහන්න පුළුවන් ආයතනයක් මේ රටේ කොහේවත් නැහැ. මේ ආයතනයේ නිලධාරීන්ගෙන් අපේ සභාපතිතුමා ප්‍රශ්න අහන කොට, පිටුපස ආසනයක හිටපු රාජ්‍ය නිලධාරිනියක් නිදි කිරනවා. මම එතුමියගෙන් ඇහුවා, මෙම ආයතනයේ නිලධාරීන් පාර්ලිමේන්තුවට ගෙන්වා සභාපතිතුමා ප්‍රශ්න කරන කොට ඔබතුමිය නිදාගෙන ඉන්නවා නම්, ආයතනය ඇතුළේත් මේකම නේද වෙනවා ඇත්තේ කියලා. මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලිපි අවුරුදු ගණනාවක් තිස්සේ -අද වනකොටත්- අස්ථානගතයි. මේ පිළිබඳව අපි දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. අපි ඔවුන්ට දන්වා තිබෙනවා, ඊළඟ වතාවේ පැමිණෙනකොට අස්ථානගත වුණු ලිපිගොනු සියල්ලක්ම අප අතට පත් කරන්න කියලා. රාජ්‍ය ආයතනයක ලිපි අස්ථාන ගත වෙනවා කියලා කියන්නේ දඩුවම් ලැබිය යුතු වරදක්. අපේ මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා කිව්වා, එතුමන්ලාගේ කාලයේ මේ ආයතන පිළිබඳව සොයා බැලුවා, එම ආයතන ශක්තිමත්ව වැඩ කටයුතු කළා කියලා. ඒ විධියට වැඩ කටයුතු කළා නම් අද මේ වාගේ තත්ත්වයක් ඇති වෙන්න විධියක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රත්මලාන මගේ ආසනය නිසා තවත් විශේෂ දෙයක් කියන්න තිබෙනවා. පසුගිය ආණ්ඩු කාලයේ මේ මුළු ලංකාවේම මහනගර සභා, නගර සභා, ප්‍රාදේශීය සභා අතරින් තිබුණු දූෂිතම මහ නගර සභාව තමයි දෙහිවල-ගල්කිස්ස මහනගර සභාව. එවකට නගරාධිපති විධියට හිටියේ ධනසිරි කියලා මහත්මයෙක්. දැන් එතුමා නැහැ. ධනසිරි මහත්මයා නගරාධිපති විධියට කටයුතු කරගෙන යනකොට 2012 වසරේ හිඟ වරිපනම් ආදායමෙන් රුපියල් මිලියන 31ක් කපා හැරලා තිබෙනවා. එතුමා පෞද්ගලිකවම හඳුනන "නගින්දාස්" කියන ආයතනයකින් වරිපනම් මුදල් රුපියල් ලක්ෂ 29ක් අය විය යුතුව තිබෙනවා. අපි මේ වෙනකොට ඔවුන්ට දැනුම් දීලා තිබෙනවා, මේ හිඟ ආදායම් අය කර ගත යුතුයි කියලා. මේ වන විට හිඟ වරිපනම්වලින් රුපියල් මිලියන 100ක් අය කරගෙන තිබෙනවා කියලා ගණන්දීමේ නිලධාරියා කියලා තිබෙනවා. මෙවර නගරාධිපති වෙලා තිබෙන්නේ, පොහොට්ටුව පක්ෂය නියෝජනය කරන ස්ටැන්ලි ඩයස් මහත්මයායි. බොරු කියන්න ඕනෑ නැහැ, හිටපු නගරාධිපතිතුමාත් එක්ක බලද්දි එතුමා ඇත්තටම යූඑන්පී අය ද, ශ්‍රී ලංකා අය ද කියලා බලන්නේ නැතිව, පක්ෂ, පාට භේදයකින් තොරව හැම කෙනා එක්කම ඉතාමත් සුහදව වැඩ කටයුතු කරනවා. හැබැයි, ඉතාමත් වග කීමෙන් යුතුව මෙය කියන්න ඕනෑ. ඒ දවස්වල ධනසිරි කියන මහත්මයාත් එක්ක හිටපු හොරු ටික ඉන්නවා නේ. දැන් ටික ටික ස්ටැන්ලි ඩයස් නගරාධිපති මහත්මයා ළඟට ඒ අය ළං වෙනවා. එහෙම ළං වෙලා ඒ පුද්ගලයාවත් සවුත්තු කරන්න, හොරකම් කරන්න පුරුදු කරන්න ටික ටික ලැහැස්ති වෙනවා. ස්ටැන්ලි ඩයස් කියන නගරාධිපතිතුමා "හොරෙක්" විධියට නම කැත කර ගත්ත කෙනෙක් නොවෙයි කියලා මට විශ්වාසයක් තිබෙනවා. ඒ නිසා මම විශේෂයෙන්ම පාර්ලිමේන්තුව ඇතුළේ දී එතුමාට මේ ටික කියනවා. එතුමාට මේ කථාව කොහෙන් හරි තැනකින් ආරංචි වෙයි නේ. "හොරුන්ගෙන් ආරක්ෂා වෙලා ඉන්න, නැත්නම් හිටපු නගරාධිපතිතුමා වාගේ නිකම් නම කැත කර ගන්නයි වෙන්නේ" කියලා, මා එතුමාට කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කාලයකට පසුව අද තමයි කථාවක් කරන්න අවස්ථාව ලබා ගත්තේ. මේ පාර්ලිමේන්තුවේ තිබෙන ප්‍රධානතම කොමිටියක් වන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සිටින ලාබාලතම සාමාජිකාව; මේ පාර්ලිමේන්තුවේම සිටින ලාබාලතම මන්ත්‍රීවරිය මම. මාව එම කොමිටියට පත් කරපු ගරු අගමැතිතුමාට, ගරු කථානායකතුමාට මේ වෙලාවේ මා ස්තුතිවන්ත වෙනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ හිටපු ගරු සභාපතිතුමාටත් ස්තුතිවන්ත වෙනවා. අවසාන වශයෙන් මේ කාරණාව පිළිබඳවත් මා සඳහන් කරන්නට ඕනෑ. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිලධාරිනියක් මට පැවසුවා, "මෙතෙක් කාලයක් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ හිටපු එක සභාපතිවරයකුටවත් අවස්ථාවක් ලැබුණේ නැහැ; අවස්ථාවක් කර ගත්තේ නැහැ, බිම් මට්ටමේ තිබෙන ප්‍රාදේශීය සභා, නගර සභා, මහ නගර සභා මේ රාජ්‍ය ගිණුම් කාරක සභාවට ගෙන්වා ප්‍රශ්න කරන්න. මේ තමයි ප්‍රථම වතාව" කියලා. ඒ අවස්ථාව සලසා ගත්තේ අපේ ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා විතරයි. මම එතුමාට ස්තුතිවන්ත වනවා. අද ඩෙංගු මදුරුවන්ට දුම ගැසීමේ ඉඳන්, කැළි කසළ අයින් කරන එක දක්වා, පොඩි තැනක ඉඳලා ඉහළම රාජ්‍ය ආයතනය දක්වා, මම හිතන විධියට මේ වෙනකොට රාජ්‍ය නිලධාරීන් 813ක්, - නේද ගරු සභාපතිතුමනි?

ගරු ලසන්ත අලගියවන්න මහතා (මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிதி மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர்)
The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Finance and Mass Media)
820ක්.

ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
- රාජ්‍ය නිලධාරීන් 820ක් මේ පාර්ලිමේන්තුවේ පැවැත්වෙන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ හිටපු සභාපති ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා ඉදිරියට; අප ඉදිරියට ප්‍රශ්න කරන්නට ගෙන්වා තිබෙනවා. ඒ පිළිබඳව මම එතුමාට ස්තුතිවන්ත වනවා, ඒ වාගේම මා ඒ ගැන සතුටු වනවා. මේ රටේ ප්‍රධානම මූල්‍ය කළමනාකරණය සිදු වන තැන තමයි පාර්ලිමේන්තුව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට තවත් මිනිත්තු දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஹிருணிகா பிரேமச்சந்திர)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
විනාඩි දෙකක කාලයක් යන එකක් නැහැ. මට එච්චර දෙයක් කියන්න නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රටේ මූල්‍ය කළමනාකරණය කරන තැන තමයි පාර්ලිමේන්තුව. මේ සෑම ආයතනයක්ම පාර්ලිමේන්තුවට ගෙන්වලා, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ දී ඔවුන්ගෙන් ප්‍රශ්න කරලා, ඉදිරියේ දී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳව ඔවුන් දැනුවත් කිරීම පිළිබඳව එම කාරක සභාවේ සාමාජිකාවක් හැටියට මා අද ඇත්තටම සතුටු වනවා. මේ ආයතනවල සමහර දූෂිත නිලධාරීන් සිටිනවා තමයි. හැබැයි, ඒ හැම කෙනාම දූෂිතයි කියලා මම කියන්නේ නැහැ. රාජ්‍ය සේවය කියලා කියන්නේ ඕනෑම රටක කෂේරුකාව. එය බිඳ වැටුණොත් රටේ ගමන් මඟ සම්පූර්ණයෙන්ම අඩාල වෙන බව රාජ්‍ය සේවකයන්ට විශේෂයෙන්ම කිව යුතුයි. ඒ කාලයේ

දූෂිත වැඩ කරන්න හරි ලේසියි. මොකද, උඩ සිට පහළ දක්වාම සිටියේ දූෂිතයන් නිසා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) හිරුණිකා පිරේමච්චන්දිර)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
මේ කාලයේ දූෂණයට අත පොවන්න එච්චර හැකියාවක් නැහැ. මොකද, කවුරු කොහොම කිව්වත් අඩු තරමින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා හරි කෙළින් ඉන්නවා. ඒ වාගේම, මට තවත් දෙයක් ගැන කියන්න තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට නියමිත කාලය දැන් අවසානයි.

ගරු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය
(මාණ්පුමිකු (තිරුමති) හිරුණිකා පිරේමච්චන්දිර)
(The Hon. (Mrs.) Hirunika Premachandra)
COPE එකේ සාමාජිකයින් විධියට හිටපු කීප දෙනෙක් මුදල් ලබා ගැනීම සම්බන්ධයෙන් අද දින මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා කථා කළා. එම සල්ලි ගත්තාය කියන 118 දෙනාගේ ලැයිස්තුවට මම ඇතුළත් නැහැ කියන එක මම ඉතාමත් ආඩම්බරයෙන්, ඉතාමත් සංතෝෂයෙන් ප්‍රකාශ කරනවා. ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. The next speaker is the Hon. Douglas Devananda. You have ten minutes.

[පි.ප. 3.30]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(මාණ්පුමිකු ටක්ලස් තේවානන්තා)
(The Hon. Douglas Devananda)
කෞරව සභාපතිතුමා, ගරු මන්ත්‍රීවරුනි, අද දින අරසාංගික කණ්කුකළ් පත්‍රිය කුළුවිනුඩෙය අරික්කෛ තොටර්පිලාන ඔත්තිවෛප්පුවේළෛ විවාතත්තිල් කලන්තුකොණ්ටු, එනතු කරුත්තුක්කළෛයුම් පතිවු සෙය්වතර්කු වාය්ප්පු වළංකියමෛ කුරිත්තු එනතු නන්රියෛත් තෙරිවිත්තුක්කොළ්කින්රේන්.

ඉන්ත නාට්ටින් වරවු සෙලවුත්තිට්ටත්තිර්කු ඔරු පාරිය සුමෛයිනෛක් කොටුත්තුක් කොණ්ටිරුක්කින්ර අරස නිරුවනඞ්කළින් නට්ටඞ්කළ් එන්පතු, ඉන්ත නාට්ටින් පොරුළාතාරත් තුරෛයිල් මික අතීතමාන අමුත්තඞ්කළෛප් පිරයෝකිත්තු වරුවතාකවේ තොටර්න්තුම් කාණප්පටුකින්රන. කුරිප්පාක, අරසුක්කුම් වර්ත්තක සෙයර්පාටුකළුක්කුම් ඔත්තුවරාතු එන්ර නිලෛයිනෛ උරුවාක්කි වරුකින්ර මේර්පටි නිරුවනඞ්කළ් කාරණමාක පල්වේරු වරිච් සුමෛකළාල් පොතුමක්කළ් පාතික්කප්පටුකින්ර නිලෛමෛකළේ කාණප්පටුකින්රන. ඔරු පක්කත්තිල් මේර්පටි අරස නිරුවනඞ්කළිල් පණියාට්රුකින්ර පණියාළර්කළුටෙය වාළ්වාතාරඞ්කළ් කුරිත්තුම් යෝසික්ක වේණ්ටියුළ්ළ අතේනේරම්, මේර්පටි අරස නිරුවනඞ්කළ් තොටර්න්තුම් නට්ටත්තිල් සෙයර්පට්ටු වරුකින්ර නිලෛයිල්, අන්ත නට්ටත්තිනෛ ඊටුසෙය්කින්ර වකෛයිල් පෙරප්පටුකින්ර පොතුමක්කළින් නිති කාරණමාක පොතුමක්කළ් අටෛකින්ර පාතිප්පුකළ් කුරිත්තුම් යෝසික්ක වේණ්ටුම්.

අරස නිරුවනඞ්කළ් තොටර්පිලාන පල්වේරු මුරෛප්පාටු කළෛයේ නාම් කටන්ත පල කාලඞ්කළාකක් කේල්වියුට්රු වරුකින්රෝම්. ඔරු නිරුවනත්තෛච් සිරන්ත මුරෛයිල් ඉයක්කි, අතන් මූලමාන පෝතිය පයන්කළෛ ඊට්ටුවතර්කුප් පතිලාක, අන්නිරුවනත්තින් මූලමාකත් තත්තමතු තනිප්පට්ට අපිලාෂෛකළෛප් පූර්ත්তි සෙය්තු කොළ්වතර්කු මුනෛකින්ර නපර්කළ් අත්තකෛය නිරුවනඞ්කළින් පිරතානිකළාක නියමනම් පෙරුකින්ර නිලෛකළිලේයේ ඉත්තකෛය තවරුකළ්, මුරෛකේටුකළ්, ඌළල් මෝසටිකළ් ඉටම්පෙරුවතාකත් තෙරිය වරුකින්රතු. එනවේ, අරස නිරුවනඞ්කළ් උයරිය පයනෛ, අතාවතු අවර්රින් උරිය ඉලක්කුකළෛ එට්ට වේණ්ටු මෙනිල් අවර්රුක්කෙන නියමික්කප්පටුකින්ර පිරතානිකළිල් අතික කවනම් සෙලුත්තුවතු අවසියමාකින්රතු.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී කවුරු හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු වේලු කුමාර් මහතාගේ නම යෝජනා කරන්න.

ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය (කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය)
(මාණ්පුමිකු (තිරුමති) *சந்திராணி பண்டார - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்*)
(The Hon. (Mrs.) Chandrani Bandara - Minister of Women and Child Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு செஹான் சேமசிங்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. SHEHAN SEMASINGHE *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
කෞරව ටක්ලස් තේවානන්තා අවර්කළේ, උංකළතු උරෛයෛත් තොටරලාම්.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(මාණ්පුමිකු ටක්ලස් තේවානන්තා)
(The Hon. Douglas Devananda)
අන්තන්ත නිරුවනඞ්කළින් ඒනෛය පතවිකළුක්කෙනක් කල්වි, තිරමෛ මර්රුම් තකුති අටිප්පටෛයිල් නපර්කළ් තෙරිවු සෙය්යප්පටුකින්ර නිලෛයිල්, අවර්රින් පිරතානිකළ් අරසියල් නියමනඞ්කළාක ඉරුක්කින්ර නිලෛයිල්, අන්ත අරසියල් නියමනඞ්කළුම් අන්තන්තත් තුරෛකළ් සාර්න්ත අනුපවඞ්කළුටන්

[ගරු ඩග්ලස් දේවානන්ද මහතා]

කූඩිය ඒනෙය තකුතිකළෙයුම් අඩිප්පටෙයාකක් කොණ්ට වෛකළාක ඉරුත්තලේ අවසිමාකින්රතු.

නට්ටමේර්පටුකින්ර අරස නිරුවනංකළෛක් කට්ටියෙළුප්පු වතර්කාකවෙනක් කූරප්පට්ටු, අරස තොළිල්මුයර්සිකළ් අමෛච්සු උරුවාක්කප්පට්ටතු. එනිනුම්, අන්ත අමෛච්සු අරස නිරුවනංකළෛ විර්කින්ර අමෛච්සාකක් කාණප්පටුකින්රතේ අන්රි, අරස නිරුවනංකළෛක් කට්ටියෙළුප්පුවතාකත් තෙරිය වරවිල්ලෛ. ඔරු සිල අරස මර්රුම් තනිප්පට්ට ආය්වු රීතියිලාන අරික්ක෈කළෛප් පාර්ක්කින්රපොළුතු, ඇන්ත නාට්টෛප් පොරුත්තවරෙයිල් අරසාංකමානතු වර්ත්තක මුයර්සිකළිල් ඈടුපටුවතු සාත්තියමානතාක ඇල්ලෛයෙන්ර විටයම් වලියුරුත්තප්පට්ටු වරුවතෛ නාම් කාණක්කූටියතාක ඉරුක්කින්රතු. ඇන්ත ඇටත්තිල් අරසියල් තලෛයීටුකළ්, අටිප්පටෛ චෙයර්රිරන් ඇන්මෛ, ඇයලාමෛ - මුයලාමෛ පෝන්ර කාරණිකළෛ නාම් මුතන්මෛප් පටුත්ත වේණ්ටියුළ්ළතු.

එනවේ, ඇන්ත නිලෛයිලිරුන්තු නාංකළ් මේර්පටි අරස නිරුවනංකළ් තොටර්පිල් අවතානම් චෙලුත්ත වේණ්ටුමේයන්රි, අවර්රිනෛ උටනටියාක විර්රුවිට මුයර්සිප්පතෛ මාත්තිරමේ කුරියාකක් කොළ්ළල් නල්ලතල්ල. ඒනෙනිල්, ඇංකු අරස නිරුවනංකළිල් වේලෛවාය්ප්පු පෙර්රිරුප්පোරතු වාළ්වාතාරම් තොටර්පිලුම් සින්තික්ක වේණ්ටියුළ්ළතු. අතේනේරම්, එමතු පකුතිකළිල් ඒර්කෙනවේ චෙයර්පට්ටිරුන්ත අරස නිරුවනංකළෛයුම් තර්පෝතෛය තේවෛකළුක්කේර්ප මරුචීරමෛක්කප්පටවේණ්ටිය තේවෛකළුම් ඉරුප්පතෝටු, ඒනෙය වළංකළෛප් පයන්පටුත්තියතාන පුතිය තොළිල්මුයර්සිකළින් උරුවාක්කංකළුම් තේවෛප්පටුකින්රන. අන්ත වකෛයිල් මේර්පටි අරස නිරුවනංකළෛ මුන්නෙටුප් පතු තොටර්පිල් නීණ්ට කාලත්තිර්කුරිය චෙයර්රිරන් කොණ්ට කොළ්කෛ වකුප්පුක්කළ් අවසියමාකින්රන.

පොතුප් පටුකටන් පෙරුතලානතු කට්টුප්පාට්টුක්කුළ් කොණ්ටු වරප්පට වේණ්ටුම් එනුම් කොළ්කෛ උරුතියිලි, ඇන්ත අරසු තොටර්ന්තු චෙයර්පටුකින්ර නිලෛයිලි, අරස චොත්තුක්කළෛ විර්කින්ර ඔරු නිලෛක්කුම් තළ්ළප්පටලාම්. ආනාල්, විර්පනෛ මූලමාකප් පෙරප්පටුකින්ර වරුමාන මානතු වාරි වරුමානත්තිනෛප් පোලන්රි, ඔරු මුරෛ මාත්තිරමේ කිටෛක්කප් පෙරක්කූටිය වරුමානමාකුම් එන්පතෛ ඇංකු චුට්ටික්කාට්ට විරුම්පුකින්රේන්. අත්තුටන්, විර්පනෛ එන වරුමිටත්තු, නට්ටමේර්පට්ටුළ්ළ අරස නිරුවනංකළෛ යන්රි, ඉലാപම් ඈට්ටක්කූටිය අරස නිරුවනංකළുක්කේ චන්තෛයිල් කේළ්විකළ් ඉരുක්කුම් එන්පතුතාන් යතার්ත්තමාකුම්. අන්ත වකෛයිල්, අරചින් ඉലാപම් ඈට്ടുകින්ර නිරുവനങ്കളിന് പങ്കുകളൈ വിറ്പതന് മൂലമാക ഇതനൈച് ചാത്തിയമാക്കലാ മെന മുയര്ചിത്താലുമ്, നാളടൈവില് അരചിന് പങ്കുകളിന് വീതമ് കുറൈന്തു, അരചിന് ചെലവിനങ്കളൈ ഈടുചെയ്തു കൊള്വതര്കുപ് പയന്പട്ട ചൊത്തുക്കള് അനൈത്തുമ് ഇറുതിയില് തനിയാര്വ ചമാകിവിടുമ് നിലൈ ഏറ്പട്ടു വിടുമ്.

അതേനേരമ്, പങ്കുച് ചന്തൈ ഊടാന വിറ്പനൈയിന്പോതു, പങ്കുകളിന് മതിപ്പാനതു അവറ്റിന് ഉണ്മൈയാന മതിപ്പില് നിര്ണയമ് പെറാമല്, ചന്തൈ നിലൈയില് കാണപ്പടുക്കിന്റ പല്വേറു ചക്തികളിന് താക്കങ്കളിന് അടിപ്പടൈയിലേയേ അവൈ നിര്ണയിക്കപ്പടുകിന്റ നിലൈമൈകളേ കാണപ്പടു കിന്റന. എനവേ, അരച നിരുവനങ്കള് - അരച തനിയാര് മയപ്പടുത്തലുക്കു ഉട്പടുത്തപ്പടുമാനാല്, അവറ്റിന് ചെയറ്റിറനൈയുമ് പാതുകാപ്പിനൈയുമ് ഉറുതി ചെയ്തുകൊള്ള ഇയലുമാക ഇരുക്കുമെന എണ്ണുകിന്റേന്. എനവേ, ഇവ്വിടയമ് തൊടര്പില് ചമ്പന്തപ്പട്ടവര്കള് അവതാന മെടുക്ക വേണ്ടുമ് എനക് കേട്ടുക് കൊള്കിന്റേന്.

മേലുമ് അമൈച്ചുക്കള്, മാകാണ ചപൈകള്, അരച തിണൈക്കളങ്കള്, ആണൈക്കുഴുക്കള്, ഉള്ളൂരാട്ചി മന്റങ്കള്, മാവട്ട ചെയലകങ്കള് തൊടര്പിലാന നിതി നിര്വാകമ് മറ്റുമ് ചെയലാറ്റുകൈ തൊടര്പിലുമ് അരചാങ്ക കണക്കുകള് തൊടര്പിലാന കുഴുവിന് മൂന്റാവതു അറിക്കൈ എടുത്തുരൈക്കിന്റതു. പൊതുവാകവേ മേറ്പടി അനൈത്തുത് തുറൈകള് ചാര്ന്തുമ് പാര്ക്കിന്റപോതു, നിതി വിതികള് മറ്റുമ് ചെയറ്റിറന് വിതികള് പിന്പറ്റലാന വികിതാചാര നിലൈമൈകളൈ ഇങ്കേ കാണക്കൂടിയതാക ഇരുക്കിന്റതു. ഉള്ളൂരാട്ചി മന്റങ്കളുക്കാന തേര്തലൈ ഇലകുപടുത്തുമ് വകൈയില് എനക് കൂറപ്പട്ടു, കൊണ്ടു വരപ്പട്ട പുതിയ തേര്തല് മുറൈമൈയിന് പിരതിപലന്കളൈ നാമ് ഇപ്പോതു അനുപവിത്തുക് കൊണ്ടിരുപ്പതൈ ഇങ്കേ ചുട്ടിക്കാട്ട വേണ്ടുമ്.

വേട്പാളര്കളുക്കു അതിക ചെലവുകളൈ ഏറ്പടുത്തുകിന്റ വിരുപ്പു വാക്കു മുറൈമൈ ഒഴിക്കപ്പട്ടു, ഇന്റു വേട്പാളര് കളുക്കുച് ചെലവിനൈക് കുറൈത്തു, അരചുക്കുപ് പാരിയ ചെലവിനൈ ഏറ്പടുത്തുമ് വകൈയില് അതികരിത്ത ഉറുപ്പിനര് കളൈക് കൊണ്ടതാകവേ ഇന്ത ഉള്ളൂരാട്ചി മന്റങ്കള് ഉരുവാകിയിരുക്കിന്റന. അതേനേരമ്, പണമുള്ളവര്കള് വട്ടാരങ്കളില് വെറ്റി പെറക്കൂടിയ നിലൈമൈയിനൈയുമ് ഇതു എറ്പടുത്തിയിരുക്കിന്റതു. 60 വീതമ് വട്ടാര മുറൈമൈയിലുമ് 40 വീതമ് വികിതാചാര മുറൈമൈയിലുമ് എനക് കൂറപ്പട്ടാലുമ്, ഇന്റു നടൈമുറൈയില് 100 വീതമ് വികിതാചാര മുറൈയിലേയേ ഇന്തത് തേര്തല് മുറൈമൈ ചെയറ്പടുത്തപ്പട്ടു വരുകിന്റതാകവേ ഉണര മുടികിന്റതു. അന്ത വകൈയില്, വട്ടാരങ്കളില് വെറ്റി പെറ്റ കട്ചികളിന് വെറ്റിയാനതു മുടങ്കിപ് പോയ്, തോല്വികണ്ട കട്ചികളിന് പലമാന എതിര്ക്കട്ചികള് ഉരുവാക്കമ് പെറ്റുള്ള നിലൈയില്, വെറ്റിയാളര്കളാല് മക്കളുക്കു ആറ്റ വേണ്ടിയ പൊറുപ്പുകള് തൊടര്പിലാന തീര്മാനങ്കള് പോതിയ പെരുമ് പാന്മൈ ഇന്റിയ നിലൈയില് പലമ്വായ്ന്ത എതിര്ക്കട്ചികളിന് എതിര്പ്പുകളുക്കു മുകങ്കൊടുക്ക വേണ്ടിയ ചിക്കലാന നിലൈമൈകള് തോറ്റുവിക്കപ്പട്ടുള്ളന.

മാകാണ ചപൈകളൈപ് പൊറുത്തവരൈയില്, നിതി വിതികള് തൊടര്പിലാന മുറൈമൈകള് പിന്പറ്റപ്പടാത നിലൈ പൊതുവാകവേ അവതാനിപ്പുപ് പെറുകിന്റ നിലൈയില്, ഇതു പല്വേറു ഊഴല്, മോചടികളുക്കു വഴിയേറ്പടുത്തുമ് നിലൈയാകവേ തെന്പടുകിന്റതു. ഇന്തച് ചപൈയില് നാന് എറ്കനവേ പല തടവൈകള് ചുട്ടിക്കാട്ടിയുള്ള വകൈയില് വടക്കു മാകാണ ചപൈയില് എറ്കനവേ നിയമനമ് പെറ്റിരുന്ത അമൈച്ചര്കളുക്കു എതിരാക ഊഴല്, മോചടിക് കുറ്റച്ചാട്ടുകള് വടക്കു മാകാണ ചപൈയിന് ആളുന്തരപ്പിനരാലേയേ മുന്വൈക്കപ്പട്ടു, അതു തൊടര്പില് വടക്കു മാകാണ മുതലമൈച്ചരാല് ഒരു വിചാരണൈക് കുഴുവുമ് നിയമിക്കപ്പട്ടു, വിചാരണൈകള് മേറ്കൊള്ളപ്പട്ടു വരുവതാകക് കൂറപ്പട്ടു, അന്ത നാന്കു അമൈച്ചര്കളുമ് പതവി നീക്കഞ് ചെയ്യപ്പട്ടനര്.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ உறுப்பினர் அவர்களே, இன்னும் ஒரு நிமிடம் இருக்கின்றது.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

ஆனால், அவர்கள் தொடர்பில் வேறு சட்ட நடவடிக்கைகள் எதுவும் இதுவரையில் மேற்கொள்ளப்படவில்லை. அதே நேரம், மேற்படி நான்கு அமைச்சர்களினதும் அமைச்சுக்கள் போக, வடக்கு மாகாண முதலமைச்சரின் கீழிருக்கின்ற அமைச்சுக்கள் தொடர்பிலும் ஊழல், மோசடிக் குற்றச் சாட்டுக்கள் முன்வைக்கப்பட்டன. எனினும், அவை தொடர்பில் எவ்விதமான விசாரணைகளும் மேற்கொள்ளப்படவில்லை. இத்தகைய நிலைமையின் மத்தியில் தற்போது வடக்கு மாகாணத்தில் நியமனம் பெற்றிருக்கின்ற கல்வி அமைச்சர் உள்ளிட்ட அமைச்சர்களுக்கு எதிராகவும் ஊழல், மோசடிக் குற்றச்சாட்டுகள் முன்வைக்கப்பட்டு வருகின்றன.

அதேபோன்று கடந்த காலத்தில் 'நெல்சிப்' உதவித் திட்டத்தில் யாழ். மாவட்ட உள்ளூராட்சி மன்றங்களில் இடம்பெற்றிருந்த மோசடிகள் தொடர்பில் இதுவரையில் உரிய விசாரணைகள் மேற்கொள்ளப்படவில்லை. இது தொடர்பில் வடக்கு மாகாண சபை விசாரணைகளை மேற்கொண்டதாகக் கூறப்பட்டிருந்த நிலையிலும், அது குறித்து எவ்விதமான தகவல்களும் இல்லாத நிலையில், அது குற்றவாளிகளைக் காப்பாற்றுகின்ற ஒரு தந்திரோபாயம் என்றே கருதப்பட வேண்டியுள்ளது. எனவே, எமது மக்களுக்கான நிதி - எமது மக்களின் நிதி - இவ்வாறு முறைகேடுகளுக்கு ஒரு சில நபர்களால் உட்படுத்தப்படுகின்ற நிலையில், அவை தொடர்பில் உரிய சட்ட நடவடிக்கைகள் மேற்கொள்ளப்பட்டு, குற்றவாளிகள் இனங்காணப்பட்டு, தண்டிக்கப்பட வேண்டும் என்பதை மீண்டும் வலியுறுத்த விரும்புகின்றேன். நடந்து முடிந்தவை தொடர்பில் முறையான சட்ட நடவடிக்கைகள் மேற்கொள்ளப்படுவதுடன், அத்தகைய தவறுகள் நடக்காதிருப்பதற்கும் வழிவகைகளை மேற்கொள்ள வேண்டும்.

அத்துடன், செயற்றிறன் என்பது பொதுவாகவே எமது பகுதிகளில் மக்கள் பயன்பெற வேண்டிய அரச நிறுவனங்களில் குறைவாகவே காணப்படுகின்றது. இதற்குப் போதிய ஆளணிகள் இன்றிய குறைபாடுகளும் ஒரு காரணமாக இருக் கின்றது. மேலும், நிரப்பப்பட வேண்டிய ஆளணி வெற்றிடங் களுக்குத் தென் பகுதிகளைச் சார்ந்தவர்கள் நிரப்பப்பட்டு வருகின்ற நிலையில், மொழி மற்றும் சூழல் குறிப்பாக, பிரதேச பரிச்சயமற்ற காரணங்களாலும் அரச நிறுவனங்களின் பயன்பாடுகளைப் பெறுவதில் எமது மக்கள் பாரிய சிரமங் களுக்கு முகங்கொடுத்து வருகின்றனர். எனவே, இத்தகைய பாதகங்கள் இனங்காணப்பட்டு, அவற்றை அகற்றுவதன் ஊடாகவே எமது பகுதிகளில் அரச துறை சார்ந்த நிறுவனங் களால் போதிய பயன்களை எமது மக்களுக்கு வழங்க முடியும்.

மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி நிறுவனங்களைப் பொறுத்தவரையில் ஏனைய மாகாண சபைகள் மற்றும் ஏனைய மாகாணங்களின் உள்ளூராட்சி மன்றங்களுடன் எமது பகுதி - குறிப்பாக வடக்கு மாகாணத்தின் மாகாண சபையையோ, அல்லது வடக்கு மாகாணத்தின் உள்ளூராட்சி சபைகளையோ அடைவு மட்டத்தில் ஒப்பிட்டுப் பார்க்க முடியாது. ஏனைய மாகாணங்களைப் பொறுத்தவரையில் மாகாண சபைகளும் உள்ளூராட்சி சபைகளும் மக்கள் நலன்சார்ந்து செயற்பட்டு வருகின்றபோதிலும், எமது பகுதியில் அது தொடர்ந்தும் மக்கள் நலன் சாராத செயற்பாடுகளிலேயே ஈடுபட்டு வருகின்றன. அதாவது, மக்களின் உணர்வுகளை அறிந்து செயற்பட்டு, மக்களின் பிரச்சினைகளைத் தீர்ப்பதற்குப் பதிலாக மக்களை மேலும், மேலும் உணர்வுபூர்வமாகத் தூண்டியும் சீண்டியுமே வருகின்றன. மறுபக்கத்தில் ஏனைய மாகாணங்களுக்கு மத்திய அரசின் நேரடிப் பங்களிப்புகள் கிடைக்கப் பெறுகின்றபோதும், வடக்கில் அந்த நிலை அரிதென்றே கூறவேண்டும். ஒன்று மத்திய அரசின் நேரடிப் பங்களிப்புகள் போதியளவு வருவ தில்லை. வந்தாலும், அங்கு அவற்றை மேற்கொள்ள விடுவ தில்லை என்ற நிலையே காணப்படுகின்றது.

எனவே, மக்களது நலன் சார்ந்த பணிகளை மேற் கொள்வதைப் புறக்கணித்து வருகின்ற விருப்பமின்மை, முயலாமை, இயலாமை கொண்டவர்களிடம் எமது பகுதியின் அரச நிறுவனங்கள் மாட்டிக்கொண்டு, செய்வதறியாத நிலைமை தொடர்கின்றபோது, எமது மக்களே மீள முடியாத வாழ்க்கைச் சுமைகளை அரவணைத்துக் கொண்டு வாழவேண்டிய நிலை ஏற்பட்டுள்ளதால், வடக்கு மாகாண சபையின் உத்தியோகபூர்வ காலம் முடிவடைந்தவுடன், எமது மக்களின் விடிவு கருதி வடக்கு மாகாண சபைக்கான தேர்தலை இந்த அரசு உடன் நடாத்த முன்வரவேண்டுமெனக் கேட்டுக் கொண்டு, சந்தர்ப்பத்துக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

நன்றி! அடுத்து, கௌரவ பந்துல லால் பண்டாரிகொட அவர்கள்!

[අ.භා.3.44]

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් සභාව කල්තබන අවස්ථාවේ ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධව කරුණු කීපයක් ඉදිරිපත් කරන්න මටත් අවස්ථාව ලැබීම ගැන සතුටට පත්වන අතර, ඒ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ වන විට මමත් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයකු ලෙස ක්‍රියා කරනවා. නවක මන්ත්‍රීවරයකු හැටියට මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අසුන් ගත්තාම, එහි සභාපති ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමා එම කාරක සභාව මෙහෙයවන ආකාරය පිළිබඳව ඇත්ත වශයෙන්ම මම එක්තරා විධියකින් පුදුමයට පත් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආකාරයෙන් පසුගිය කාල පරිච්ඡේදය තුළ අපේ රටේ රජයේ ආයතනවල ගිණුම් පරීක්ෂාවට ලක් වුණා නම්; විමර්ශනයකට ලක් වුණා නම්, අද අපි දකින බොහෝ දුර්වලතා, රාජ්‍ය සේවයේ ඇති බොහෝ දූෂණ, අක්‍රමිකතා අපට අවම කරගන්න නොවෙයි, අද තිබෙන තත්ත්වයෙන් සියයට 90කට වැඩි ප්‍රමාණයක් නැති කරගන්න තිබුණාය කියා මා විශ්වාස කරනවා.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු ලසන්ත අලගියවන්න මැතිතුමාගේ මෙහෙයවීමෙන් නිකුත් කරන ලද පොදු නිරීක්ෂණ, නිගමන සහ නිර්දේශ පිළිබඳව 2017 දෙසැම්බර් 08වන දා ඉදිරිපත් කළ වාර්තාවක් තිබෙනවා. මේ වාර්තාව කියවා බැලුවාම අපට පෙනෙනවා, රජයේ එක් එක් ආයතන පිළිබඳව යම් යම් නිගමන, නිරීක්ෂණ සහ නිර්දේශ එහි ඉදිරිපත් කර තිබෙන බව. ඒ බොහෝ නිරීක්ෂණ සහ නිර්දේශ දෙස බැලුවාම අපට පෙනී ගියා, ඇතැම් ආයතනවල අභ්‍යන්තර විගණනය සඳහා ප්‍රමාණවත් නිලධාරීන් පිරිසක් නොමැතිකමින් සමහර විගණනයන් ප්‍රමාදවී ඇති බව. මම ඒ පිළිබඳව උදාහරණයක් කියන්නම්. මේ වන විට තැපැල් දෙපාර්තමේන්තුවේ වැඩ වර්ජනයකුත් තිබෙන නිසා මේ කාරණය ඉස්මතු කරන එක හොඳයි කියා මා කල්පනා කළා.

[ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2017 දෙසැම්බර් 08වන දා ඉදිරිපත් කළ වාර්තාවේ 11වැනි පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

"2013 වසරේ දී අනාවරණය වූ, කැපැල් කාර්යාල 04ක සිදුව තිබූ රුපියල් 8,613,000/-ක වංචාවක් සම්බන්ධයෙන් සිදු කරන ලද විමර්ශන කටයුතු සඳහා වසර 03 සිට වසර 13 දක්වා කාලයක ප්‍රමාදයක් සිදුවී තිබිණි.

කැපැල් කාර්යාල හා ඒ හා සම්බන්ධිත අංශවල සිදුව ඇති දූෂණ, වංචා හා අක්‍රමිකතා සම්බන්ධයෙන් සිදුවන විමර්ශන කාර්යාවලිය ඉතා මන්දගාමී බව අවධාරණය කළ කාරක සභාව, එම විමර්ශන හා පරීක්ෂණ කටයුතු කඩිනම් කරන ලෙස ප්‍ර.ග.නි./ග.නි. හට උපදෙස් දෙන ලදී. මෙම ප්‍රමාදයන්ට හේතුව විමර්ශන අංශයේ පවතින නිලධාරි හිඟය බවත්, දැනට එම අංශයේ සේවයේ යෙදී සිටිනුයේ නිලධාරීන් 16දෙනෙකු පමණක් බවත් අනාවරණය විය. 2016.12.31 දින වන විට විමර්ශන 2,711ක ප්‍රමාණයක් පවතින බව හෙළිදරව් වූ හෙයින්, ඒවා නිරාකරණය සඳහා රේඛීය අමාත්‍යාංශය මැදිහත්වී කටයුතු කළ යුතු බව කාරක සභාව විසින් අවධාරණය කරන ලදී."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසර 3 සිට වසර 13ක් දක්වා කාලයක් මේ ප්‍රමාදය සිදු වෙන්න හේතු වී තිබෙන්නේ අභ්‍යන්තර විගණන නිලධාරීන්ගේ හිඟකමයි. මම හිතන හැටියට අද අපේ රටේ සංවර්ධන නිලධාරීන් හැටියට බඳවා ගත් උපාධිධාරීන් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. මම ඒ අයට අගෞරව කරන්නට නොවෙයි මේවා කියන්නේ. ඒ අය සමහර වෙලාවට පාරට ඇවිල්ලා උද්ඝෝෂණය කරනවා, "අපට duty එකක් දෙන්න. රාජකාරියක් දෙන්න. අපට රාජකාරියක් නැහැ." කියලා. ඇයි, මේ රටේ සිටින බඳවා ගත් උපාධිධාරීන්ගෙන් හෝ ඉදිරියේදී බඳවා ගන්නා පිරිසෙන් මේ සඳහා පුහුණු කරලා නිලධාරීන් පත් කළ නොහැක්කේ?

මම අවුරුදු 23ක් පළාත් සභාව නියෝජනය කරලායි පාර්ලිමේන්තුවට ආවේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ පළාත් සභාවල ගිණුම් කාරක සභාවල මීට අවුරුදු 10කට 15කට කලින් ගිණුම් වාර්තා තමයි තවම පරීක්ෂා කරන්නේ. මේවා පරීක්ෂා කරලා යම් යම් නිරීක්ෂණ සහ නිර්දේශවලට යන විට ඒ ආයතනවල සිදු වන්නට ඕනෑ විනාශය, රටට සහ ජනතාවට සිදු විය යුතු අවාසිය සිදු වී හමාරයි. සමහර වෙලාවට මේවාට වග කිව යුතු නිලධාරීන් ඒ ස්ථානවල නැහැ. සමහර කාරණා විභාග කරන විට වග කිව යුතු නිලධාරීන් විශ්‍රාම ගිහිල්ලා, තවත් සමහර අය විශ්‍රාම ගිහින් මිය ගිහින්. ඒ වාගේම මේවාට වග කිව යුතු සමහර දේශපාලනඥයිනුත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපට නිගණ්ඨයන්ගෙන් බණ අහන්නට සිද්ධ වෙලා තිබෙනවා. බුදු රජාණන් වහන්සේගේ කාලයේ ශ්වේතාම්බර සහ දිගම්බර කියලා නිගණ්ඨ නාථ පුත්‍රයන්ගේ ගෝලයෝ වර්ග දෙකක් හිටියා. කට්ටියක් සුදු රෙදි කඩක් පමණක් ඇඳගෙන හිටියා. ඒ අයට කිව්වා ශ්වේතාම්බර කියලා. තව කට්ටියක් නිර්වස්ත්‍රව, -ඇහේ නූල් පොටක්වත් නැතිව- හිටියා. ඒ අයට කිව්වා දිගම්බර කියලා. ඒකාබද්ධ කල්ලියේ කට්ටියත් ඔය වාගේ කණ්ඩායම් දෙකකයි ඉන්නේ. එක කට්ටියක් ශ්වේතාම්බර, අනෙක් කට්ටිය දිගම්බර. ඒ අයගේ දූෂණ, වංචා, හොරකම් විභාගයට නොගැනීමේ, පරීක්ෂණයට භාජනය නොකිරීමේ, මේවාට නිසි දඬුවම් නොදීමේ හේතුව නිසායි අද අපට දිගම්බරයන්ගෙන් බණ අහන්නට වෙලා තිබෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ වගකීම මමත් නියෝජනය කරන රජය සහමුලින්ම භාර ගන්නවා. ඒක තමයි වුණු බරපතළ ප්‍රශ්නය වන්නේ. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව අද ක්‍රියාත්මක වන විධියට මීට පෙර ක්‍රියාත්මක වෙලා මේ නිරීක්ෂණ සහ නිර්දේශවලට යම්කිසි ක්‍රියාමාර්ගයක් ගත්තා නම්, අපේ ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා යෝජනා කරන්නා වාගේ අදාළ ආයතනවලින් මේවාට අවශ්‍ය කරන යම් පරීක්ෂණ සිදු කරලා දඬුවම් දිය යුතු අයට දඬුවම් දුන්නා නම් අද අපට සිද්ධ වෙලා තිබෙනවා වාගේ දිගම්බරයන්ගෙන් -නිර්වස්ත්‍රව ඉන්න අයගෙන්- බණ අහන්නට වුවමනාත් නැහැ. ඒ විතරක් නොවෙයි. මේ රටේ එදා හිටපු දේශපාලනඥයන්ටත්, නිලධාරීන්ටත්, අද පත් වුණු අයටත්, අනාගතයේ පත් වන අයටත් ඒක හොඳ පූර්වාදර්ශයක් බවට පත් වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිර්දේශ, නිරීක්ෂණ ක්‍රියාත්මක කළ යුතු යැයි හැඟවෙන කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් වන වෙලාවේ මම යෝජනාවක් විධියට අදහසක් ඉදිරිපත් කරන්නට කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ දේශපාලනඥයින්, මහජන නියෝජිතයින් පුහුණු කිරීමේ කුමන හෝ ආයතනයක් ආරම්භ කරන්නට අවශ්‍යයි. එවැනි යම් යම් ආයතන තිබෙනවා, ශ්‍රී ලංකා පදනම් ආයතනය වැනි ඒවා. නමුත්, ඒවා ප්‍රමාණවත් නැහැ. ප්‍රාදේශීය මට්ටමේ ඉඳලා එන දේපාලනඥයින්ට විද්‍යාත්මකව දැනුමක්, අවබෝධයක් දෙන්නට පුළුවන් නිසි ආයතනයක් අපේ රටේ නැහැ. මේ රටේ මහජන මුදල් හුඟාක් විනාශ වෙන්නට ඒක ප්‍රධාන හේතුවක් වෙනවා. සමහර අය ප්‍රාදේශීය සභාවලට පත් වෙනවා. ඒ අය මහ ජන නියෝජිතයෝ. හැබැයි, ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට ප්‍රාදේශීය සභා පනත අනුව විශාල බලයක් තිබෙනවා. අලුතෙන් පිහිටු වූ ප්‍රාදේශීය සභා පත් වෙන්නට කලින් මීට පෙර තිබුණු ප්‍රාදේශීය සභා සභාපතිවරයා තමයි චෙක් පත්වලට අත්සන් කළේ. දකුණු පළාතේ ප්‍රාදේශීය සභා සභාපතිවරයෙකුට එක අවස්ථාවක විමර්ශනයක් ආවා, ඔහුගේ නමටම චෙක් පතක් ලියාගෙන ලාච්චුවේ දාගෙන ඉඳලා. හරි දැනුමක් තිබුණා නම්, හරි අවබෝධයක් තිබුණා නම් මේ වාගේ දේවල් කරන්නේ නැහැනේ. මහ ජනයා ඡන්දය දීලා පත් වෙලා එන බව හැබෑව. මේ රටේ මේ සා විශාල මුදල් කන්දරාවක් කාබාසිනියා වුණු එකේ තීන්දු - තීරණ ගන්නා මහජන නියෝජිතයෝ පුහුණු කරන්නට යම්කිසි පිරිවැයක් දැරුවාට පාඩුවක් නැහැ. අඩුම තරමින් ඒ අයට මේක පාඨමාලාවක් හැටියට ලබා දුන්නත් ඇති වරදක් නැහැ. ප්‍රාදේශීය සභාවලින් පටන් අරගෙන, පළාත් සභා, පාර්ලිමේන්තුව දක්වා වන සියලුම මන්ත්‍රීවරුන්ට යම්කිසි අවබෝධයක් දෙන්නට ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගෙන් තවත් තත්පර කිහිපයක් ඉල්ලනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
පළාත් සභාවේ ඉඳලා යම් යම් කාරණා දන්න කෙනෙකු හැටියට මට කියන්න ගොඩක් කාරණා තිබෙනවා. කාලය කෙටි නිසා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙන් එළියට එන සමහර කාරණා ගැන මට දැන් ප්‍රකාශ කරන්න අපහසුයි. දැන් බලන්න,

ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව ගැන. අපි දන්නවා, 2012 වසරේ එහි සොරකමක් සිදු වුණු බව. සොරකම සිදු වුණාම ජාතික කෞතුකාගාරය භාණ්ඩවල ආරක්ෂාව සම්බන්ධයෙන් යම් කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න ඕනෑ. හැබැයි, මොකක්ද වුණේ? අපේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිරීක්ෂණ හා නිර්දේශවල තිබෙනවා, "හොරකමෙන් වසර පහක් ගත වෙලා තිබුණත් නිසි පරිදි ආරක්ෂිත කැමරා පද්ධතියක් ස්ථාපිත කිරීමට මේ දක්වා කටයුතු කර නොමැත." කියලා. මේ කොතැනද? ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුවේ. ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව කියලා කියන්නේ අපි කවුරුත් හදවත වාගේ ආරක්ෂා කළ යුතු තැනක්, අපේ ඉතිහාසය පිළිබඳව සඳහන් තැනක්, අපේ මතු පරම්පරාවට අපේ ඉතිහාසය පිළිබඳව යම් පාඩමක් කියලා දෙන්න පුළුවන් තැනක්. අපි දන්නවා, 2012 වසරේ මෙතැන හොරකමක් වුණු බව. දැන් තත්ත්වය මම දන්නේ නැහැ. මේක, 2017 දෙසැම්බර් වාර්තාව. CCTV camera ටික සවි කර ගන්න අවුරුදු පහක් ගිහිල්ලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක නිසා මේ යෝජනාව වැදගත් කියලා මම කල්පනා කරනවා. මොකක් නිසාද? රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ඉදිරිපත් කරන නිරීක්ෂණ, නිර්දේශ ක්‍රියාත්මක කරන්න යාන්ත්‍රණයකුත් තිබිය යුතුයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් අවසන් කරන්න.

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(මාණ්පුමිකු පන්තුල ලාල් පණ්ඩාරිකොඩ)
(The Hon. Bandula Lal Bandarigoda)
ඒ සඳහා වහාම කටයුතු කළ යුතුයි කියලා මමත් මේ අදහසට එකඟ වෙනවා. මම මීට වඩා කාලය ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව අද යන මේ ගමන ඉස්සරහට ගිහිල්ලා මේ රටේ ජනතාවගේ මහජන මුදල්-දේපළ ආරක්ෂා කිරීම සඳහා හොඳ පවුරක් හැටියට ක්‍රියා කිරීමට ශක්තිය ලැබේවා! කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ස්තුතියි. Next, the Hon. Gnanamuthu Srineshan.

[පි.ප. 3.55]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(මාණ්පුමිකු ඥානමුත්තු ශ්‍රීනේසන්)
(The Hon. Gnanamuthu Srineshan)
කෞරව තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළේ, இன்று இங்கு அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கை தொடர்பான විවාදம் நடைபெற்றுக் கொண்டிருக்கின்றது. அரச நிறுவனங்களின் கணக்குகளை மேற்பார்வை செய்தல் தொடர்பான அறிக்கையில் பிரதான நிறுவனங்களும் துணை நிறுவனங்களும் இடம்பெற்றிருக்கின்றன. அமைச்சுக்கள், திணைக்களங்கள், மாவட்டச் செயலகங்கள், உள்ளூராட்சி நிறுவனங்களென்று மொத்தமாக 519 பிரதான நிறுவனங்கள் தொடர்பாகவும், மாகாண சபைகள், பிரதேசச் செயலகங்கள் மற்றும் அமைப்புக்களென்று 842 துணை நிறுவனங்கள் தொடர்பாகவும் குறித்த அறிக்கையில் குறிப்பிடப்பட்டிருக் கின்றது. அந்த வகையில், அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் விடயப் பரப்புக்குட்பட்டிருக்கின்ற நிறுவனங்களின் கணக்குகள் ஆய்வு செய்யப்பட்டு அறிக்கைப் படுத்தப்பட்டிருக்கின்றமை பற்றிய ஒரு முக்கியமான விடயம் இன்றைய விவாதத்தின் கருப்பொருளாக இருக்கின்றது.

காலைவேளைப் பத்திரிகைக் கண்ணோட்டத்தின்போது நான் ஒரு செய்தியைப் பார்த்தேன். அதாவது அரச நிதியில் நாற்பது சதவீதமானவை வீண் விரயம் செய்யப்படுகின்ற தென்ற ஒரு கருத்து அங்கே கூறப்பட்டிருந்தது. அப்படி யென்றால் அறுபது சதவீதமான நிதிதான் செலவு செய்யப்படுகின்றதென்று எங்களால் மறுதலையாக ஊகித்துக் கொள்ள முடியும். ஒரு ஜனநாயக நாட்டில் மக்களுக்காகப் பணியாற்றக்கூடிய திணைக்களங்களாக இருக்கலாம்; அமைச்சுக்களாக இருக்கலாம்; மாவட்டச் செயலகங்களாக இருக்கலாம்; பிரதேச செயலகங்களாக இருக்கலாம்; உள்ளூராட்சி நிறுவனங்களாக இருக்கலாம், இவை மக்களுக்காகச் சேவையாற்றுவதற்காக, நிதியினைக் கையாளுகின்ற அதிகாரங்களும் அவற்றுக்கு வழங்கப் பட்டிருக்கின்றன. இந்த நிலையில் நாற்பது சதவீதமான நிதி வீண் விரயம் செய்யப்படுகின்றது என்றால், இதை ஐம்பதுக்கு ஐம்பது என்று மட்டந்தட்டிப் பார்க்கின்றபோது மக்களுக்காகச் செலவுசெய்யவேண்டிய நிதியின் ஐம்பது சதவீதமான நிதி வீண் விரயம் செய்யப்படுகின்றதென்று குறிப்பிட முடியும். அழுத்தமாகச் சொல்வதாக இருந்தால் நாற்பது சதவீதமான நிதி வீண் விரயம் செய்யப்படுகின்றது.

இன்று சட்டபூர்வமான செயற்பாடுகளுக்கப்பால் சாதாரண நிகழ்வுகளாகப் பல விடயங்கள் நடைபெற்றுக் கொண்டிருக் கின்றன. அந்த வகையில் பொருட்களைக் கொள்வனவு செய்கின்றபோது தரகுப் பணம் பெற்றுக்கொள்ளல் என்ற விடயமானது சாதாரணதொரு கைங்கரியமாகக் கருதப் படுகின்றது. பொதுவாக சந்தையில் குறைந்த விலையில் கேள்வி மனுக்களைக் கோரி, குறைந்த விலையில் தரமான பொருட்களைக் கொள்வனவு செய்ய முடியுமென்கின்ற ஒரு நிலைப்பாடு காணப்பட்டாலும், அநேகமாக தரமற்ற பொருட்கள் கொள்வனவு செய்யப்படுவதும் உயர்ந்த விலையில் அதற்குரிய பற்றுச்சீட்டுக்கள் பெறப்படுவதுமான நிலைமையில், மொத்தத்தில் எங்களுடைய மக்களுக்காகச் செலவு செய்யப்படுகின்ற பணம் வீண் விரயம் செய்யப்படுகின்றது.

அரச நிறுவனங்களில் நேர்மையாகப் பணியாற்றுகின்ற அதிகாரிகள் மற்றும் அலுவலர்களை நாங்கள் என்றும் பாராட்டுகின்றோம். மனச்சாட்சிப்படியும், கடவுளுக்குப் பயந்தும் பணியாற்றுகின்ற அதிகாரிகள் மற்றும் அலுவலர்களை ஒருபோதும் குறைகூறுவதற்கில்லை. ஆனால், எமது நாட்டில் நிதி மோசடிகள், ஊழல்கள் அல்லது ஒழுங்கீனங்கள் அல்லது வீண் விரயங்கள் வாழையடி வாழையாக, சர்வசாதாரணமாக நிகழ்ந்து கொண்டிருக்கின்ற படியால் எமது நாடு அபிவிருத்தியடைந்து வருகின்ற நாடுகள் பட்டியலிலிருந்து விடுபட்டு அபிவிருத்தியடைந்த நாடுகள் பட்டியலுக்குள் முன்னேறிச் செல்ல முடியாத ஒரு துர்ப்பாக்கிய நிலைமையே காணப்படுகின்றது. அரச நிறுவனங்கள் நிதியினைச் சரியான முறையில் கையாண்டு அந்த நிதியினை மக்களின் வாழ்வாதாரத்துக்காக, அபிவிருத்திக்காகச் செலவு செய்ய வேண்டும். அதாவது, அந்த நிதி நூற்றுக்கு நூறு சதவீதம் முறையாகச் செலவு செய்யப்படுமாக இருந்தால் எமது நாட்டில் வறுமை ஏற்படுகின்ற நிலைமையோ அல்லது எமது நாடு அபிவிருத்தி அடைந்து வருகின்ற நாடுகள் என்ற பட்டியலுக்குள் தொடர்ந்து இடம்பெற்றுக் கொண்டிருக்கின்ற துர்ப்பாக்கியமான நிலைமையோ ஏற்படக்கூடிய வாய்ப்பு இல்லை. ஆனால், இன்று பொதுவாக அமைச்சு மட்டத்தில் இடம்பெறக்கூடிய வீண் விரயங்கள் அல்லது நிதித்

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

துஷ்பிரயோகங்கள் உயர்ந்த மட்டத்தில் இருப்பதையும், மாவட்டச் செயலகங்கள், பிரதேசச் செலயகங்கள், உள்ளூராட்சி நிறுவனங்கள் என்று இறங்கு வரிசைப் படுத்திக்கொண்டு செல்கின்றபோது அவை அதற்கு அடுத்த கட்டத்தில் இருப்பதையும் காணக்கூடியதாக இருக்கின்றது. அந்த வகையில் இன்று "விரலுக்குத் தக்க வீக்கம்" என்று கூறுவதுபோன்று அந்தந்த நிறுவனங்களின் அதிகார வீச்சுக்களுக்கு - எல்லைகளுக்கு ஏற்ற விதத்தில் நிதி மோசடி அல்லது துஷ்பிரயோகம் அல்லது வீண் விரயம் அதிகரித்துக்கொண்டு செல்கின்றது.

மட்டக்களப்பு மாவட்டத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற ஒரு பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில், எனது மாவட்டத்தில் ஊழல், மோசடி, இலஞ்சம் முதலிய விடயங்கள் இடம்பெறக்கூடாது என்ற விடயத்தில் முன்மாதிரியாக நடந்து கொள்ள வேண்டுமென்ற அடிப்படையில் நான் மிகவும் கவனமாகச் செயற்பட்டு வருகின்றேன். கடந்த காலத்தில் எமது மாவட்டச் செயலகத்தில் சில தில்லுமுல்லுகள் இடம்பெற்றமை பற்றி எங்களால் அறியக்கூடியதாக இருந்தது. அதன் காரணமாக, அங்கிருக்கின்ற சில அதிகாரிகளை இடமாற்றம் செய்து, நேர்மையாக, உண்மையாகப் பணியாற்றக்கூடிய அதிகாரிகளை நியமிக்க வேண்டும் என்ற ஒரு கோரிக்கையை விடுத்திருந்தோம். பலத்த போராட்டத்தின் மத்தியில் அந்தக் கோரிக்கை நிறைவேற்றப்பட்டிருக்கின்றது.

மட்டக்களப்பிலுள்ள பிரதான பாலம் கல்லடிப் பாலமாகும். அதற்கு அண்மித்ததாகச் சிறுவர் பூங்காவொன்று அமைக்கப்பட்டிருக்கின்றது. அதற்குப் பக்கத்தில் மீனுருவச் சிற்பங்கள் அமைக்கப்பட்டிருக்கின்றன. சாதாரணமாக அதற்கு எவ்வளவு செலவு செய்யப்பட்டிருக்குமென அறிவதற்காக ஒரு மதிப்பீட்டினைச் செய்யுமாறு பொறியியலாளர் ஒருவரிடம் கேட்டிருந்தேன். அவரது கணிப்பின்படி அதற்குரிய செலவு 1 - 1.5 மில்லியனுக்கு உட்பட்டதாக இருக்கும் என்று குறிப்பிட்டார். ஆனால், அதற்கு 9.3 மில்லியன் - 93 இலட்சங்கள் செலவு ஏற்பட்டிருக்கின்றது. ஆகவே, அந்த மீனுருவச் சிற்பத்தினை வடித்தெடுக்கச் சாதாரண மதிப்பீட்டை விட 6 மடங்கு செலவு செய்யப்பட்டிருப்பதை அறியக் கூடியதாக இருந்தது. இவ்வாறு நிதி மோசடி செய்கின்றவர்கள், நிதித் துஷ்பிரயோகம் செய்கின்றவர்கள், பொதுமக்களுக்காகச் செலவு செய்ய வேண்டிய நிதியைத் தங்கள் சட்டைப் பைக்குள் போட்டுக்கொண்டு செல்கின்றவர்கள் இருக்கின்றார்கள். இப்படிப்பட்டவர்களில் சிலர் சில தந்திரோபாயங்களைக் கடைப்பிடிக்கிறார்கள். அதாவது, அநேகமாக அமைச்சர்கள் மற்றும் அதிகாரிகளோடு நல்லுறவைப் பேணுகின்றார்கள், அல்லது அவர்களின் மனம் குளிரக்கூடிய விதத்தில் மாலைகள் அணிவிக்கின்றமை போன்ற சில வரவேற்புச் செயற்பாடுகளில் ஈடுபடுகின்றார்கள். இவ்வாறு செய்து கொண்டுதான் இவர்கள் தங்களது தில்லுமுல்லுகளையும் மோசடித்தனமான செயல்களையும் மிகவும் சாதுரியமான முறையில் செய்து கொண்டிருக்கின்றார்கள். இப்படிப்பட்ட ஊழல்தாரிகள் யார்?

ஊழல், மோசடிகள் விடயத்தில் ஒரு வலைப்பின்னல் காணப்படுகின்றது. அந்த வலைப்பின்னலில், அரசியல் வாதிகளும் இருக்கின்றார்கள், நிர்வாகிகளும் இருக்கின் றார்கள். அவ்வாறே இப்படிப்பட்டவர்களைக் காப்பாற்றக் கூடிய ஊடகவியலாளர்களும் இருக்கிறார்கள். நான் எல்லா ஊடகவியலாளர்களையும் சொல்லவில்லை. நேர்மையாகவும் நடுநிலையாகவும் செயற்படக்கூடிய ஊடகவியலாளர்கள் இருக்கின்ற அதேவேளை, இந்தத் தவறானவர்களின், தில்லுமுல்லு செய்கின்றவர்களின் புகழ்பாடிக்கொண்டு, அவர்களுக்குச் சான்றிதழ் கொடுத்துக் கொண்டு அவர்களைப் பாதுகாக்கின்ற விதத்தில் செயற்படுகின்றவர்களும் இருக்கின் றார்கள். நமது நாடு ஒரு ஜனநாயக நாடு என்ற வகையில் ஊடகச் சுதந்திரம் இருக்க வேண்டும். ஊடகங்கள் பிழையானவர்களைச் சுட்டிக்காட்ட வேண்டும், மோசடிக்காரர் களைச் சுட்டிக்காட்ட வேண்டும், ஊழல்தாரிகளைச் சுட்டிக்காட்ட வேண்டும், மக்களை ஏமாற்றுகின்றவர்களைச் சுட்டிக்காட்ட வேண்டும். மாறாக, அவை அவ்வாறான செயற்பாடுகளில் ஈடுபடுகின்றவர்களுக்குப் பக்கபலமாக இருக்கின்றபோது ஊழல்தாரிகள் அல்லது நிதி மோசடி செய்கின்றவர்கள் மேலும் மேலும் வளர்ந்துகொண்டு வருவதற்குத்தான் வாய்ப்பிருக்கின்றது.

நாங்கள் நல்லாட்சி அரசினை ஏற்படுத்துவதில் பங்குதாரி களாக இருந்திருக்கின்றோம். ஆனால் இந்த நல்லாட்சியிலும் கூட அரச திணைக்களங்கள் அல்லது அமைச்சுகள் மற்றும் நிறுவனங்களில் இப்படியான தில்லுமுல்லுகள் நடைபெறுகின்றபோது அவற்றை எங்களால் ஜீரணிக்க முடியாதுள்ளது. அந்த அடிப்படையில், உண்மையில் இந்த அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவின் அறிக்கையில் நிதி விடயத்தில் வெளிப்படைத் தன்மை என்பது மிக முக்கியமான ஒன்றாகும். பொறுப்புக் கூறுதல், வெளிப்படைத் தன்மை என்பன ஜனநாயகத்தின் பக்க வேர்களாக இருக்கவேண்டும். அந்த அடிப்படையில் இந்த நிதி விடயத்தில் சரியான வெளிப்படைத் தன்மை காட்டப்பட வேண்டும். அதாவது, மக்களிடமிருந்து வரிப்பணங்கள் அறவிடப்படுகின்றன. இந்த அறவிடப்படுகின்ற வரிப்பணங்களுக்குப் பதிலாக அரசு மக்களுக்குச் சேவை செய்ய வேண்டும் என்று மக்கள் எதிர்பார்த்துக் கொண்டிருக்கின்றார்கள். மக்கள் இவ்வாறு எதிர்பார்த்துக் கொண்டிருக்கின்றபோது, மக்களுக்குச் சேரவேண்டிய அந்த நிதி, ஒரு கட்டுமானம் மூலமாகவோ, வீதிகளை அமைப்பதன் மூலமாகவோ அல்லது வடிகால்களைத் திருத்துவதன் மூலமாகவோ நூற்றுக்கு நூறு வீதம் செலவு செய்யப்படுமாக இருந்தால், உண்மையில் மக்களை அபிவிருத்தி என்கின்ற விடயத்தில் தங்குதடை யில்லாமல் முன்னோக்கிக் கொண்டு செல்வதற்குரிய வாய்ப்பிருக்கின்றது.

1948ஆம் ஆண்டில் நாங்கள் சுதந்திரம் பெற்றோம்; இப்போது 70 ஆண்டுகளைக் கடந்திருக்கின்றோம். இந்த வேளையில் எங்களுடைய உற்பத்தித் திறனைப்பற்றி நாங்கள் ஒரு தடவை அவதானிக்க வேண்டும். அதாவது, வெளியீடு களை உள்ளீடுகளால் பிரித்துப் பார்ப்பதன் மூலமாக இந்த உற்பத்தித் திறனைக் கணக்கிட முடியும். ஜப்பானின் உற்பத்தித் திறனைப் பார்க்கின்றபோது அது 60 ஆக இருக்கின்றது. ஆனால், இலங்கையைப் பொறுத்தமட்டில் உற்பத்தித் திறன் வீதம் 1.6 ஆகத்தான் காணப்படுகின்றது. அப்படியென்றால், ஜப்பானோடு ஒப்பிட்டுப் பார்க்கின்ற போது, எங்களுடைய உற்பத்தித் திறனின் அளவு மிக மிகக் குறைவான மட்டத்தில் காணப்படுகின்றது. உள்ளீடுகளுக்கு அதிக செலவு செய்து பெறப்படுகின்ற வெளியீடுகளினால் எங்களது உற்பத்தித் திறன் என்பது 1.6 ஆக இருக்க, இந்தியாவில் அது 14 ஆக இருக்க, ஜப்பானில் அது 60 ஆக இருக்கின்றது. எனவே, எங்களுடைய நிலைப்பாடு மிக மோசமான நிலையிலிருக்கின்றது. இந்தப் புள்ளிவிபரம் ஐந்து வருடங்களுக்கு முற்பட்டதாக இருக்கும் என நான் நினைக்கின்றேன். அண்மைய புள்ளிவிபரத்தைப் பார்க்க முடியவில்லை. அதனால் எமது உற்பத்தித்திறன் தற்போது அதிலிருந்து வளர்ந்திருக்கின்றதோ அல்லது அதே நிலையிலிருக்கின்றதோ என்பது எனக்குத் தெரியவில்லை;

අතනෙ இற்றைப்படுத்திக் கொள்ள முடியவில்லை. எனவே, இந்த அரசாங்கக் கணக்குகள் பற்றிய குழு மிகவும் வினைத் திறனாகச் செயற்பட வேண்டும். இது வினைத்திறனாகச் செயற்படுவதன் மூலமாக, சரியான முறையில் அந்தக் கணக்குகளைப் பரிசீலனை செய்வதற்கும் மதிப்பீடுகள் செய்வதற்கும் அறிக்கையிடுவதற்கும் உரிய நடவடிக்கை களைச் செய்வதன் மூலமாக முக்கியமாக இந்த ஊழல், மோசடிகளில் ஈடுபடுகின்றவர்கள், நிதியினைப் பிழையான முறையில் கையாள்கின்றவர்கள் போன்றவர்களுக்கு எதிராகக் கடுமையான நடவடிக்கைகளை எடுக்கவேண்டும். பொது நிதியினை மோசடிக்கு உட்படுத்துவதோ அல்லது தங்களு டைய இஷ்டப்படி பயன்படுத்துவதோ மிகப் பாரதூரமான ஒரு குற்றச் செயலாகும். எனவே, கடந்த காலமாக இருக்கலாம், தற்காலமாக இருக்கலாம், எக்காலமாக இருந்தாலும் யார் இந்த அரச நிதியினை, மக்களுக்குச் சேரவேண்டிய நிதியினை ஒரு மோசடித் தன்மையான முறையிலே கையாண்டார்களோ அல்லது கையாள்கின்றார்களோ, அவர்களுக்கெதிராகச் சரியான நடவடிக்கைகளை எடுக்கவேண்டும். அதற்கு இந்த அரசாங்கக் கணக்குகள் பற்றிய குறித்த பாராளுமன்றக் குழு மிகவும் பக்கபலமாக இருந்து செயற்பட வேண்டும் என்பது எங்களுடைய வேண்டுகோளாக அமைகின்றது.

குறிப்பாக, நாங்கள் அரச நிதி தொடர்பில் பார்க்கின்ற போது மேற்பார்வை, கணக்காய்வு, மதிப்பீடு, அவற்றை முறையாக அறிக்கையிடல் என்பன முக்கியமாக இருக்கின்ற அதேவேளையில், இந்த அறிக்கைகள் இடப்பட்டதன் பின்னர் யார் பக்கமாக விரல் நீட்டப்படுகின்றதோ, அவர்களுக் கெதிராக ஒரு சரியான, நியாயமான நடவடிக்கை எடுக்க வேண்டும். சிலவேளைகளில் ஆயிரம் ஆய்வுகள் செய்யப் பட்டாலும் அல்லது அறிக்கையிடப்பட்டாலும், அறிக்கையிடப் பட்டதன் பின்னர் அதனை அமுல்படுத்தல் அல்லது நடவடிக்கை எடுத்தல் என்பது மிக முக்கியமாக இருக்கின்றது என்று சொல்வார்கள்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, இன்னும் ஒரு நிமிடம் இருக்கின்றது.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
எனவே, இவ்வாறான செயற்பாடுகளைச் சரியாகச் செய்கின்றபோது, உண்மையில் எமது நாட்டில் ஒரு நல்லாட்சி நடைபெறுகின்றது, நல்ல நிர்வாகம் நடைபெறுகின்றது அல்லது நல்ல விதத்தில் மக்கள் பரிகரிக்கப்படுகின்றார்கள் என்ற உண்மையை நாங்கள் விளங்கிக் கொள்ளக்கூடியதாக இருக்கும்.

குறிப்பாக, இன்னுமொரு விடயத்தை நான் சொல்லியாக வேண்டும். அதாவது, எங்களுடைய நாட்டில் அன்றிலிருந்து இன்றுவரை மக்கள் எதிர்பார்க்கின்ற விடயங்கள், வறுமை யைத் தணிக்கவேண்டும், வாழ்வாதாரத்தைக் கட்டியெழுப்ப வேண்டும், அபிவிருத்தியைக் காணவேண்டும், ஒட்டு மொத்தத்தில் எமது நாடு ஓர் அபிவிருத்தியடைந்த நாடாகத் தலைநிமிர்ந்து நிற்கவேண்டும் என்பதாகும். ஆனால், அந்த எதிர்பார்ப்புக்களை சுதந்திரம் பெற்று 70 ஆண்டுகள் கழிந்தபோதும் எங்களால் அடையமுடியாமல் இருக்கின்றது. இதற்குக் குறுகிய அரசியல் இலாபம் தேடுகின்ற செயற் பாடுகள் அல்லது நிதியினைக் கையாள்கின்ற விடயத்தில் காணப்படுகின்ற மறைகணியமான செயற்பாடுகள் என்பன காரணமாக அமைகின்றன. எனவேதான் இந்த அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவானது விரல் நீட்டிக் காட்டுகின்ற அல்லது தொட்டுக் காட்டுகின்ற இந்த மோசடித்தனமான செயற்பாடுகள் இடம்பெறுகின்ற திணைக்களங்கள், அமைச் சுக்கள், உள்ளூராட்சி அதிகாரசபைகள், பிரதேச செயலகங்கள் எவையாக இருந்தாலும் அவற்றின்மீது உரிய நடவடிக்கை எடுத்து, இந்த மறைகணியமான செயற்பாடுகளைக் கட்டுப் படுத்த வேண்டுமென்று கூறி, எனது உரையினை நிறைவு செய்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
நன்றி. The next speaker is the Hon. Eran Wickramaratne. You have ten minutes.

[අ.භා.4.10]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සභාව කල් තැබීමේ යෝජනාව යටතේ රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වාර්තා පහක් පිළිබඳව වාද විවාද කරන අවස්ථාව. මේ පාර්ලිමේන්තුවේ පැරණිම කාරක සභාව තමයි රාජ්‍ය ගිණුම් කාරක සභාව. මම හිතන විධියට රාජ්‍ය ගිණුම් කාරක සභාව ආරම්භ කරලා දැනට අවුරුදු 95ක් පමණ වෙනවා. නමුත් මේ අටවැනි පාර්ලිමේන්තුව තුළ තමයි, කෙටි කාලයක් තුළදී රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වාර්තාවන් හතරකුත්, අතුරු වාර්තාවකුත් ඉදිරිපත් කරන්න පුළුවන්වෙලා තිබෙන්නේ. මේ අවස්ථාවේ මා පළමුවෙන්ම අපේ රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සභාපති ගරු ලසන්ත අලගියවන්න ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මම හිතන විධියට එතුමාගේ මහ පෙන්වීම හේතුවෙන් පමණයි අපට මෙවැනි වාර්තා ගණනාවක් ශීඝ්‍රයෙන් ඉදිරිපත් කරන්න පුළුවන්වෙලා තිබෙන්නේ. එතුමාට සහාය දුන් පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමාට, නියෝජ්‍ය මහලේකම්තුමාට සහ සහකාර මහ ලේකම්වරුන්ට වාගේම රාජ්‍ය ගිණුම් කාරක සභා කාර්යාංශයේ කාර්ය මණ්ඩලයටත් අපේ ස්තුතිය ප්‍රකාශ කරනවා. එතුමන්ලාගේත්, විගණකාධිපතිතුමා ඇතුළු කාර්ය මණ්ඩලය සහ මහා භාණ්ඩාගාරයේ නිලධාරින්ගේත් සහාය නිසා තමයි අපට මේ දේ කරන්න පුළුවන්වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේ හැන්සාඩ් සංස්කාරකවරිය වන අපේ රංජනී ජයමාන්න මෙනවිය අවුරුදු 35ක සේවයකින් පසුව අද දින විශ්‍රාම ලබනවා. ඇය ගැන සඳහනක් කරන්න අද මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

හුඟාක් වෙලාවට පාර්ලිමේන්තුවේ පෙනෙන්නේ අප වැනි මැති ඇමතිවරුන්. මොකද, වාද විවාද කරන නිසා. නමුත් අපේ කාර්ය භාරය හරිහැටි කරන්න අප පිටුපස සිට නිහඬව සේවය කරන විශාල සේවක පිරිසක් සිටිනවා. රංජනී ජයමාන්න මෙනවිය විශ්‍රාම ලබා ඉදිරි කටයුතු සාර්ථකව කර ගෙන යාම සඳහා අපි ඇයට ශාරීරික, මානසික, අධ්‍යාත්මික සුවය පතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ වාර්තාවන් අතරින් මම අතිරේක වාර්තාව ගැන පමණක් වචනයක් කියන්න කැමැතියි. අපේ රටේ රාජ්‍ය ආදායමෙන් සියයට 85ක්ම

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

ලැබෙන්නේ රේගුව හරහා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හරහා සහ සුරාබදු දෙපාර්තමේන්තුව හරහායි. ඒ නිසා රජයේ මුළු ආදායමෙන් සියයට 85කට වැඩි ප්‍රමාණයක් ලැබෙන මේ ආයතන තුන තොරතුරු තාක්ෂණය භාවිතය තුළින් කාර්යක්ෂම කරන්නේ; ඵලදායී කරන්නේ; දූෂණය අවම කරන්නේ කොහොමද කියන අරමුණින් තමයි මේ දෙපාර්තමේන්තු තුනට සම්බන්ධ ආයතනත් ගෙන්වලා රාජ්‍ය ගිණුම් කාරක සභාව විමර්ශනය කළේ. මෙහි නිර්දේශ කිහිපයක්ම තිබෙනවා. සමහර නිර්දේශ ක්‍රියාත්මක වෙලා තිබෙනවා. ඒ ගැන අපි අපේ සතුට ප්‍රකාශ කරන්න ඕනෑ. විශේෂයෙන්ම රේගුව විසින් ක්‍රියාත්මක කරන යම් කරුණු පද්ධති සැලකිල්ලට ගෙන තිබෙනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේත් සිදු කරන යම් කිසි ක්‍රියාවලින් තිබෙනවා. ඒවා ගැන මතක් කරන අතර මම මේ ගරු සභාවට විශේෂයෙන්ම කිව යුත්තේ අඩු පාඩුව ගැනයි. අඩු පාඩුව මම කියන්නම්. මේ සියලුම ආයතන තොරතුරු සන්නිවේදන තාක්ෂණය මඟින් සම්බන්ධ කරලා, ඒ එක් එක් මෘදුකාංග භාවිතා වෙනවා. නමුත් ඒවා හරහා - RAMIS එක හරහා- ඒ සියල්ලක්ම එකමුතු කරන්න, එකතු කරන්න හැකි ක්‍රමවේදයකට යා යුතුයි. ඒක තවම අපි හිතපු විධියට සිදුවෙලා නැහැ.

මේ වාර්තාවේ සඳහන් වෙනවා, වසරක් තුළදී -2017 ඔක්තෝබර් මාසයේ 1වැනි දා වෙන කොට- නැවතත් ගිණුම් කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතුයි කියලා. ඒ ප්‍රගතිය පිළිබඳව වාර්තාව ඉදිරිපත් වෙලා නැහැ. ඒ වාර්තාව වහාම ඉදිරිපත් කරන්න අවශ්‍යයි කියලා මම මේ අවස්ථාවේදී මතක් කරනවා. අපි දන්නවා, තොරතුරු තාක්ෂණය පාවිච්චි කළොත්, අපට ආදායම වැඩි කර ගන්න; දූෂණය අවම කරන්න පුළුවන් කියලා. ඒ තුළින් ගෞරවයෙන් වැඩ කරන රජයේ නිලධාරීන්ගේ ගෞරවය අපට ආරක්ෂා කරන්න පුළුවන් වෙනවා. හොරකමට, වංචාවට ඉන්න ඒ සුළු පිරිස තමයි මේ දේවල් හුහක් වෙලාවට ප්‍රමාද කරන්නේ. නමුත් වැඩි පිරිසගේ ගෞරවය අපට රැක ගන්නට පුළුවන් වෙනවා.

ඊළඟට මුදල් අමාත්‍යාංශය පිළිබඳව විගණකාධිපතිතුමා ළඟදී කරපු ප්‍රකාශයක් ගැන මම වචනයක් කියන්න කැමැතියි. පළමුවෙන්ම මම කියන්න ඕනෑ, විගණකාධිපතිතුමා කරපු ප්‍රකාශය නිවැරැදි ප්‍රකාශයක් කියලා. නමුත් ඒ විගණකාධිපතිතුමාගේ නිවැරැදි ප්‍රකාශය අරගෙන මහ බැංකුවේ හිටපු අධිපතිතුමා මුදල් අමාත්‍යාංශය රජයේ මේ ණය ප්‍රමාණය සහවනවා වාගේ අදහසක් මාධ්‍යයට ප්‍රකාශ කළා. ඇත්තටම මුදල් අමාත්‍යාංශයත් ඒ වාගේම මහ බැංකුවත් සඳහන් කරලා තිබෙනවා, "2017 අවසන් වෙන කොට ශ්‍රී ලංකා රජයේ මුළු ණය ප්‍රමාණය රුපියල් බිලියන 10,313යි; නැත්නම් දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 77.6යි" කියලා. නමුත් විගණකාධිපති සඳහන් කර තිබෙනවා, "නැහැ, ඒ ප්‍රමාණය ඇත්තටම රුපියල් බිලියන දහඅහස් හත්සියදෙකයි. දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතය සියයට අසූවයි දශම පහයි" කියලා. තව විධියකට කිව්වොත්, විගණකාධිපති සඳහන් කර තිබෙන්නේ රජයේ මුළු ණය ප්‍රමාණය රුපියල් බිලියන තුන්සිය අසූනවයකින් විතර අඩු බවයි. ඇත්තටම මෙතැන සිදුවෙලා තිබෙන්නේ මේකයි. පසුගිය වකවානුවේ -එදා රජය- හම්බන්තොට වරාය හදනකොට ශ්‍රී ලංකා වරාය අධිකාරිය එක්ක ගිවිසුම් හතරක් අත්සන් කළා. අත්සක් කරලා, කැබිනට් මණ්ඩලයට දැන්වුවා, මේවා රජයේ ණය නොවෙයි, මේවා රජයේ ණයෙන් අයින් කරලා කෙළින්ම වරාය අධිකාරියට දාන්න කියලා. ඇත්තටම මේ ඉල්ලීම කළේ එදා හිටපු මුදල් ඇමතිතුමායි. එදා හිටපු මුදල් ඇමතිතුමා 2013 ජනවාරි මාසයේ 9 වැනි දා කැබිනට් මණ්ඩලයට සන්දේශයක් ඉදිරිපත් කළා. ඊට පස්සේ 2013 ජනවාරි මාසයේ 11 වැනි දා කැබිනට් තීරණයක් ආවා. ඒ කැබිනට් තීරණය ආවේ මුදල් අමාත්‍යාංශයේ හිටපු ලේකම් පී.බී.ජයසුන්දර මැතිතුමාටයි. ඒ කැබිනට් සන්දේශය ඉදිරිපත් කළේ කවුද? ඉදිරිපත් කළේ එදා හිටපු මුදල් ඇමතිතුමායි. එදා හිටපු මුදල් ඇමතිතුමා තමයි මහින්ද රාජපක්ෂ මැතිතුමා.

"හම්බන්තොට වරායේ සංවර්ධන ව්‍යාපෘතියේ පළමුවන හා දෙවන අදියර සඳහා චීන ආනයන අපනයන බැංකුවෙන් ලබා ගනු ලැබූ ණය අරමුදල් එම කොන්දේසි මත ණය සේවාකරණය කිරීමට ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට වගකීම පැවරීමටත් අමාත්‍ය මණ්ඩල අනුමතිය අපේක්ෂා කෙරේ" කියලා එතුමා කැබිනට් සන්දේශය ඉදිරිපත් කළා. ඒ සියලු විස්තර මා ළඟ තිබෙනවා. එදා කැබිනට් මණ්ඩලයෙන් ඒ තීරණය ගත්තාය කියලාත් තිබෙනවා. හම්බන්තොට වරාය ගොඩනැඟීමේදී වාගේම, නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය හදන්න යනකොටත් තවත් ගිවිසුම් තුනක් හැදුවා. ඒ ගිවිසුම් හරහා රජයට තිබෙන ණය අයින් කරලා, ඒ ණය ලංකා විදුලිබල මණ්ඩලයටත් ඒ වාගේම Lanka Coal Company (Pvt) Limited එකටත් පවරා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමා ඔබතුමාට නියමිත කාලය අවසානයි. කථාව කෙටි කළොත් හොඳයි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)
මා කතාව ඉක්මනින් අවසන් කරන්නම්.

එම සමාගමේ නම තමයි, Lanka Coal Company (Pvt) Limited. ඒ සමාගමට ඒ ණය පවරා තිබෙනවා. "මේක රජයේ ණයක් නොවෙයි. ඒ නිසා මේ ණය ඒ ආයතනයට පැවරිය යුතුයි" කිව්වා. ඒ වාගේම මත්තල ගුවන් තොටුපොළ හදනකොටත් 2010 ඔක්තෝබර් මාසයේ 11වන දා ඒ අය නැවතත් කැබිනට් මණ්ඩලයට යෝජනා කළා, මේ ණය රජයේ ණයෙන් අයින් කරලා ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමට පවරන්න කියලා. ඔක්තෝබර් මාසයේ 24වන දා ඒ සඳහා කැබිනට් මණ්ඩලය අනුමැතිය ලබා ගත්තා. මා මෙහිදී කෙටියෙන් කියන්න හැදුවේ මේකයි. විගණකාධිපතිතුමා කියපු දේ හරි. නමුත් ඇත්තටම මේ දේ සිදු වුණේ 2010 සහ 2013දීයි. පසු ගිය රජය කාලයේ 2010 සහ 2013දී තමයි -මහින්ද රාජපක්ෂ මහතා මේ රටේ මුදල් අමාත්‍යතුමා වෙලා සිටින විට තමයි- කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබා ගත්තේ, මේ ණය රජයේ ණයෙන් අයින් කරලා ඒ සමාගම්වලට පවරන්න. එදා ඉඳලා අද වන තෙක් මුදල් අමාත්‍යාංශය ඒ ආකාරයෙන්ම තමයි -ඒ අනුවම තමයි- ක්‍රියා කරලා තිබෙන්නේ. නමුත් ඒ ණය සහවන්න මුදල් අමාත්‍යාංශය කිසිම ක්‍රියාවක යෙදුණේ නැහැ. එදා ඒ රජය ඒ ණය සහවන්න තමයි ඒ ක්‍රියාව කළේ. එදා ඒ ණය සැහෙව්වේ නැත්නම් රජය ගත් ණය ප්‍රකාශිත ණයට වඩා විශාලයි කියලා එදා හිටපු මුදල් ඇමතිතුමාට විතරක් නොවෙයි, මහ බැංකුවේ අධිපතිතුමාටත් මා මතක් කරන්න ඕනෑ. මොකද, අද සමහර අයට අමතක වීමේ රෝගයක් තිබෙන නිසා. මහ බැංකුවේ එදා හිටපු අධිපතිතුමා - අජිත් නිවාඩ් කබ්‍රාල් මහතා- මාධ්‍ය කැඳවා කියනවා, මේ ණය අද සැහෙව්වා වාගේ කතාවක්. ඒ නිසා තමයි මා මේ විස්තර කැබිනට් එකේ notes සමඟ මේ සභාවට ඉදිරිපත් කළේ. මේ වාගේ හොර බොරු කරලා, වංචා කරලා, විශ්‍රාම ගිහිල්ලාත් තවත් වංචා කරන්න හදන අය ගැන රට දැන ගත යුතුය කියන එක මේ අවස්ථාවේදී කිව යුතුයි.

මට කාලය ලබා දීම ගැන ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය අමාත්‍යතුමා.

ඊට පෙර මූලාසනය සඳහා ගරු තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு வேலு குமார் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. VELU KUMAR *left the Chair, and* THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA) *took the Chair.*

[අ.භා. 4.22]

ගරු ලසන්ත අලගියවන්න මහතා (මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிதி மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர்)
The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Finance and Mass Media)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විධියට මා අද ඉතාම සතුටු වෙනවා, මේ පාර්ලිමේන්තුවට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා පහක් ඉදිරිපත් කිරීමට හැකි වීම පිළිබඳව සහ ඒ වාර්තා ගැන දවසක් පුරා පැවැත්වෙන මේ විවාදයේදී කතා කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳව මේ විවාදයේදී මේ දක්වා පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු දේශපාලන පක්ෂවල නියෝජිතයන් කතා කළා. මා ප්‍රථමයෙන්ම ඒ සෑම කෙනකුටම ස්තුතිවන්ත වනවා, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සිය අදහස්, යෝජනා ඉතාම ඵලදායී ලෙස ඉදිරිපත් කිරීම පිළිබඳව.

ඒ වාගේම, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ ක්‍රියාවලිය මේ ආකාරයෙන් සාර්ථකව කරගෙන යන්න අපට සහයෝගය ලබා දෙන, දුන් අය පිළිබඳව මා මුලින්ම සිහිපත් කළ යුතුව තිබෙනවා. විශේෂයෙන්ම, මේ පාර්ලිමේන්තුවට නායකත්වය ලබා දෙන ගරු කථානායකතුමාව මුලින්ම සිහිපත් කළයුතු වෙනවා. එතුමා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කටයුතු පිළිබඳව සෑම අවස්ථාවකම මහපෙන්වමින් අවශ්‍ය ශක්තිය අපට ලබා දෙන අතර, අපේ කාරක සභාවේ මන්ත්‍රීවරුන්ට, නිලධාරීන්ට, දේශීය හා විදේශීය පුහුණුවීම් සඳහා අවස්ථාව ලබා දෙමින්, විවිධ වැඩ මුළු සඳහාද අවස්ථාව ලබා දුන්නා. පක්ෂ නායක රැස්වීම් තුළ අවස්ථා ගණනාවකදීම කථා කර, මෙවැනි විවාදයක් ලබා ගැනීමට පවා නායකත්වයක් ලබා දුන්නේ ගරු කථානායකතුමායි. ඒ නිසා මේ අවස්ථාවේ දී අප එතුමාව කෘතවේදීව සිහිපත් කරන්නට ඕනෑ.

ඒ වාගේම මහ ලේකම්තුමා, අපේ කාරක සභා ලේකම් කාර්යාලයේ ලේකම්තුමා ඇතුළු සියලු දෙනාම මේ ගිණුම් කාරක සභාවේ ක්‍රියාවලීන් වෙනුවෙන් අපට දැවැන්ත ශක්තියක් ලබා දුන්නා. රාජ්‍ය ආයතන 837ක් සම්බන්ධයෙන් කටයුතු කිරීම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට ලෙහෙසි පහසු කාර්යක් නොවෙයි. ඒක සෑමදෙනාටම අවබෝධ වෙනවා ඇති. රාජ්‍ය ආයතන 837ක ගිණුම් ක්‍රියාවලිය පිළිබඳව කොපමණ වැඩ ප්‍රමාණයක් තිබෙනවාද යන්න අමුතුවෙන් සඳහන් කිරීමේ අවශ්‍යතාවක් නැහැ. ඒ වෙනුවෙන් විශාල කාර්ය මණ්ඩලයක් අපේ පාර්ලිමේන්තුවේ ලේකම් කාර්යාලය තුළ නැහැ. ලේකම්තුමියක්, සහකාර ප්‍රධාන නිලධාරිතුමෙක් සහ නිලධාරිතුමියක් සිටිනවා; පාර්ලිමේන්තු නිලධාරීන් හතරදෙනෙක් සිටිනවා; ලඝුලේඛිකාවන් දෙදෙනෙක් සිටිනවා; පාර්ලිමේන්තුවේ සේවා සහායකයින් තුන්දෙනෙක් සිටිනවා. මේ දොළොස්දෙනා, පාර්ලිමේන්තුවේ සිටින භාෂා පරිවර්තක, හැන්සාඩ් යන අනෙකුත් අංශවල සහයෝගය; දායකත්වය අරගෙන තමයි මෙවැනි දැවැන්ත කාර්ය භාරයක් මේ කාරක සභා ක්‍රියාවලිය තුළ ඉටු කරනු ලබන්නේ. මෙවැනි කාර්ය භාරයක් ඉටු කිරීමට අවශ්‍ය දායකත්වය, කැපවීම ලබා දීම පිළිබඳව එහි ලේකම්තුමිය ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයට මම ස්තුතිය පළ කරන්නට ඕනෑ. ඒ වාගේම, අපේ මේ කටයුතු කර ගෙන යෑම සඳහා, අදාළ වැඩසටහන් සකස් කිරීම තුළින් පාර්ලිමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශයේ අධ්‍යක්ෂතුමා ඇතුළු එම කාර්ය මණ්ඩලය අපට විශාල ශක්තියක් ලබා දී තිබෙන අතර, ඒ සකස් කළ වැඩසටහන් අපේ වැඩ කටයුතුවලට විශාල රුකුලක් වෙලා තිබෙනවා.

මෙම කාරක සභාවේ උපදේශකයෙක් විධියට කටයුතු කළ, හිටපු අමාත්‍යාංශ ලේකම්වරයෙක් වන ලලිත් ආර් ද සිල්වා මහත්මයා ලබා දුන් ශක්තියත් මේ මොහොතේ අප කෘතවේදීව සිහිපත් කරන්නට ඕනෑ.

මේ ක්‍රියාවලියේ දී විගණකාධිපතිවරයා ඇතුළු විගණකාධිපති දෙපාර්තමේන්තුව අපට විශාල ශක්තියක් ලබා දෙනවා. අප විසින් කැඳවනු ලබන රැස්වීම්වලට වාර්තා ඉදිරිපත් කරමින්, විශාල කැපවීමකින් යුතුව විගණකාධිපතිතුමාගේ නායකත්වයෙන් ඒ ශක්තිය අපට ලබා දෙනවා. ඒ වාගේම, මා ඇතුළු අපේ කාරක සභාවේ මන්ත්‍රීවරුන් 25දෙනාට මේ කටයුතු නිදහසේ කර ගෙන යෑම සඳහා අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, කිසිදු අත පෙවීමකින්, කිසිදු බලපෑමකින් තොරව රජය විධියට ඒ අවශ්‍ය පූර්ණ නිදහස අපට ලබා දෙනවා. ඒ වාගේම කාරක සභාව කියන්නේ සභාපතිවරයා නොවෙයි. සභාපතිවරයාට තිබෙන කාර්ය භාරය හා වගකීම වන්නේ සෙසු සාමාජිකයන්ගේ අදහස් හා යෝජනා මත කටයුතු කිරීම. ඒ අනුව පාර්ලිමේන්තුව

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

නියෝජනය කරන සියලුම දේශපාලන පක්ෂවල නියෝජිතයන් 26දෙනෙකු අපේ කාරක සභාව නියෝජනය කරනවා. සියලුම දේශපාලන පක්ෂවල නියෝජිතයන් තමන්ගේ දේශපාලන ප්‍රතිපත්ති, පක්ෂය එළියෙන් තියලා කාරක සභාවට ඇවිල්ලා සැබෑ මහජන නියෝජිතයකුගේ වගකීම කුමක්ද කියන එක අවබෝධ කරගෙන කණ්ඩායමක් විධියට කාරක සභාව තුළ කටයුතු කරන නිසා තමයි, ඒ අයගේ කැපවීම නිසා තමයි අපට මේ කටයුත්ත සාර්ථකව ඉටු කරගන්න පුළුවන්කම ලැබී තිබෙන්නේ කියන කාරණය මම ඉතාමත් සතුටින් සඳහන් කරනවා. එම නිසා ඒ සියලුදෙනාවම මේ අවස්ථාවේ දී සිහිපත් කළ යුතුයි. තනිවම වැඩක් කරන්න පුළුවන්කමක් නැහැ. බාහිර ආයතන ඇතුළු සෑම කෙනෙකුම ලබා දෙන වගකීම හා සහයෝගය තුළින් තමයි අපි මේ කාර්ය භාරයන් සියල්ලක්ම සාර්ථකව ඉටු කරනු ලබන්නේ. එම නිසා මේ කටයුතු වෙනුවෙන් අපට ලබා දෙන සහයෝගය පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විධියට මම ඒ සියලු දෙනාටම ස්තුතිය පළ කරන්නට ඕනෑ.

විශේෂයෙන්ම අපි මෙම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තුළින් කරන්නේ මොකක්ද? ඒ වාගේම කළ යුතු වන්නේ මොකක්ද? අපේ රටේ දෙකෝටියක් ජනතාව නියෝජනය කරන්න පාර්ලිමේන්තුවට 225දෙනෙක් තෝරා පත්කර එවනවා. අපව තෝරා පත්කර එවන්නේ ඇයි? ජනතාව තුළ විවිධ අරමුණු විශාල වශයෙන් තිබෙන්නට පුළුවන්. නමුත්, අපට පැවරී තිබෙන ප්‍රධාන වගකීම් කිහිපයක් තිබෙනවා. ඉන් පළමුවැනි වගකීම තමයි මේ රටේ නීති ප්‍රතිපත්ති සකස් කිරීම. ඊළඟ වගකීම තමයි අය වැය මඟින් ජනතාවගේ බදු මුදල්; රටේ මුදල් වෙන් කිරීම සහ අනුමත කිරීම. ඊළඟ කාර්ය භාරය තමයි, එසේ අනුමත කරනු ලබන මුදල් ජනතාවගේ මුදල් නිසා ඒවා හරි හැටි, ඵලදායී ලෙස සහ වග කීමකින් යුතුව වියදම් කරනවාද කියා සොයා බැලීම. එය පාර්ලිමේන්තුවේ එක් වගකීමක් බවට පත් වෙනවා. මෙම ප්‍රධාන අරමුණු තුන සඳහා තමයි ජනතාව අපව පාර්ලිමේන්තුවට එවන්නේ.

රටේ විවිධ මත තිබෙනවා. පාර්ලිමේන්තුව පවත්වාගෙන යන්න දවසකට මෙච්චර මුදලක් වියදම් කරනවා; අවුරුද්දකට මෙච්චර මුදලක් වියදම් කරනවා කියලා කියනවා. ඒ සෑම දෙයක්ම කරන්නේ මෙන්න මේ අරමුණු තුන, එම වගකීම් තුන අපෙන් ඉටුකර ගැනීම සඳහායි. ඒ අනුව පාර්ලිමේන්තුව අය වැය මඟින් වෙන් කරනු ලබන මුදල් නිසි පරිදි වියදම් කිරීමේ කාර්ය භාරය සිදු වුණාද කියන කාරණය පිළිබඳ සොය බැලීමට පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරු 225ටම බැරි නිසා තමයි මේ මන්ත්‍රීවරු 225 නියෝජනය කරමින් 26දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් සකස් කරලා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පිහිටුවලා තිබෙන්නේ. තවත් මන්ත්‍රීවරු 26දෙනෙක් පත් කරලා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව පිහිටුවලා තිබෙනවා. මෑතකදී රජයේ මුදල් පිළිබඳ කාරක සභාවත් පිහිටුවලා තිබෙනවා. එතකොට අපි පාර්ලිමේන්තුවට පැමිණෙන්නේ ඇයි, අපි මේ කමිටුවලට පත් කරන්නේ ඇයි? අය වැයෙන් වෙන් කරන මුදල් නිසි පරිදි වියදම් කරනවාද කියන කාරණය පිළිබඳ සොයා බැලීමේ කාර්ය භාරය තමයි අපට පැවරී තිබෙන යුතුකම, වගකීම බවට පත් වෙලා තිබෙන්නේ. ඒ අනුව වර්තමානයේ අපේ රටේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට රාජ්‍ය ආයතන 837ක් අයත් වෙනවා. අපේ රටේ විශේෂිත වූ වියදම් ඒකක 19ක්, අමාත්‍යාංශ 51ක්, දෙපාර්තමේන්තු 92ක්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල 25ක්, පළාත් අරමුදල් 9ක්, පළාත් අමාත්‍යාංශ 45ක්, පළාත් සභා විශේෂ වියදම් ඒකක, දෙපාර්තමේන්තු 215ක්, පළාත් සභා අධිකාරි 46ක්, මහනගර සභා 23ක්, නගර සභා 41ක් සහ ප්‍රාදේශීය සභා 271ක් ආදී වශයෙන් එය සමන්විත වෙනවා. ඊට අමතරව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව සඳහා ව්‍යවස්ථාපිත මණ්ඩල ආයතන 427ක් අයත් වෙනවා. පාර්ලිමේන්තුව අය වැයෙන් වෙන් කරනු ලබන මුදල් මේ දෙපාර්තමේන්තු, ආයතන 837 වියදම් කරන ආකාරය පිළිබඳව සහ එම ආයතනවල කාර්ය සාධනය පිළිබඳව තමයි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විධියට අපි සොයා බැලිය යුතු වන්නේ. මෙය සොයා බැලිය යුත්තේ කෙසේද? මෙය සෑම වර්ෂයකම සොයා බැලිය යුතුයි.

පාර්ලිමේන්තුව සෑම වර්ෂයකම ඉදිරි වර්ෂය සඳහා අය වැය සම්මත කරනවා. අය වැය සම්මත කරලා මේ ආයතනවලට මුදල් ලබා දුන්නාට පසුව එම ආයතන අපේ රටේ තිබෙන නීති-රීති අනුව මුදල් වියදම් කළ යුතුයි. ඒ අනුව විගණකාධිපති දෙපාර්තමේන්තුව මේ පිළිබඳ සොයා බලා පාර්ලිමේන්තුවට වාර්තා කරනවා. පාර්ලිමේන්තුවට වාර්තා කරන දේ පිළිබඳව වැඩි දුරටත් සොයා බැලීම අප විසින් සිදුකළ යුතුයි. මේක වර්තමානයේ තිබෙන නීතියක් නොවෙයි. සෑම අවුරුද්දකම අය වැයෙන් සල්ලි වෙන් කරනවා. සෑම අවුරුද්දකම රජයෙන් මේ ආයතනවලට සල්ලි ලබා දෙනවා. එම ආයතන සල්ලි වියදම් කරනවා. විගණකාධිපතිවරයා සෑම අවුරුද්දකම ඊට පෙර අවුරුදුවල එම ආයතන සල්ලි වියදම් කළේ කොහොමද කියන එක පිළිබඳ වාර්තාවක් පාර්ලිමේන්තුවට ලබා දෙනවා. ඒ අනුව අපි කාරක සභාව විධියට විගණකාධිපතිවරයා සහ අදාළ ආයතන කැඳවලා, ඉදිරිපත් කර තිබෙන කරුණු පිළිබඳ නැවත නිර්දේශයක් පාර්ලිමේන්තුවට ලබා දෙනවා. මෙම ක්‍රියාවලිය තමයි සිදු විය යුතුව තිබුණේ.

විශේෂයෙන්ම පළමුවැනි පාර්ලිමේන්තුවේ සිට රජයේ ගිණුම් පිළිබඳ කාරක සභා පැවතුණා. එම පැවැති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවලිනුත් විශාල කාර්ය භාරයක් ඉටු වී තිබෙනවා. 1978 වර්ෂයේ සිට 1988 වර්ෂය තෙක් පාර්ලිමේන්තුවට වාර්තා 15ක් ඉදිරිපත් කරලා තිබෙනවා; ආයතන 198යි. 1988 සිට 1993 දක්වා වූ කාලය තුළ වාර්තා 11ක් ඉදිරිපත් කර තිබෙනවා; ආයතන 50යි. 1994 සිට 2010 වනතෙක් පාර්ලිමේන්තුවට කැඳවා තිබෙන්නේ ආයතන 3ක් වැනි සුළු ප්‍රමාණයක්. ඊළඟට, 2010 සිට 2015 වනතෙක් නැවත ආයතන 160ක් කැඳවා තිබෙනවා. මේ අනුව 1978 සිට මේ වනතෙක්ම ආයතන 425ක් පමණ තමයි පාර්ලිමේන්තුවට කැඳවන්න පුළුවන් වෙලා තිබෙන්නේ. වර්තමානයේදී රජයේ මුදල් පිළිබඳ කාරක සභාව සෑම වර්ෂයකම මේ ආයතන පිළිබඳව සොයා බැලිය යුතුයි; මේ සියලුම ආයතන පිළිබඳව සෑම වර්ෂයකම පාර්ලිමේන්තුවට වාර්තා ඉදිරිපත් කළ යුතුයි. ඉතිහාසයේ තිබූ රජයේ මුදල් පිළිබඳ කාරක සභා තුළින් මෙම කාර්ය භාරය නිසි පරිදි ඉටු වෙලා තිබෙනවාද කියන කාරණය අපි සාකච්ඡා කර බැලුවා. ඒ ක්‍රියාවලිය නිසි පරිදි ඉටු වෙලා නැති බව කනගාටුවෙන් වුවත් අපි සඳහන් කරන්න ඕනෑ. එය පැවතුණු රජයේ මුදල් පිළිබඳ කාරක සභාවල අඩු පාඩුවක් නොවෙයි. අපි ඒ අයට දෝෂාරෝපණය කළ යුතු වන්නේ නැහැ. නමුත් සමස්ත පාර්ලිමේන්තුවම එම වගකීම ඉටු කර තිබුණේ නැහැය කියන කාරණය අපි නිහතමානීව පිළිගත යුතුව තිබෙනවා. වර්තමානයේ තිබෙන රජයේ මුදල් පිළිබඳ කාරක සභාව මේ අඩු පාඩුව පිළිගත්තා; අවබෝධ කර ගත්තා. එය අවබෝධ කරගෙන, ඒ සිදු වුණු ක්‍රියාවලිය පිළිබඳව අපි සොයා බැලුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එදා ඒ කැඳවන ලද ආයතනවල අවුරුදු 10කට 15කට පෙර වර්ෂවල ගිණුම් වාර්තා තමයි සලකා බලා තිබෙන්නේ. එහෙම කළාය කියා නිසි ප්‍රයෝජනයක් ලබා ගන්න පුළුවන් වෙලා නැහැ. ඒ නිලධාරීන් නැහැ; විශ්‍රාම ගිහින්. එම නිසා ඒ කැඳවන ලද ආයතන සම්බන්ධයෙනුත් විශේෂයෙන්ම නිසි ඵලදායකත්වයක් ලබාගැනීමට පුළුවන්කමක් ලැබී තිබුණේ නැහැ. ඒ වාර්තා පරිශීලනය කිරීමේදී අපට එය ඉතාම හොඳින් අවබෝධ වුණා. එම

නිසා එය නිවැරැදි කිරීමට අපි උත්සාහ කළා. 2016 සිට 2018 දක්වා අපි වාර්තා 6ක් ඉදිරිපත් කළා. අපි මේ වනවිට මෙම කාරක සභාවට ආයතන 125ක් කැඳවා තිබෙනවා. අපි 2016.09.22වන දා වාර්තාවක් ඉදිරිපත් කළා. 2017.06.23වන දා තවත් වාර්තාවක් ඉදිරිපත් කළා. ඒ වාගේම, තොරතුරු තාක්ෂණ පද්ධතිය හරහා ජාලගත වැඩසටහනක් අපි මේ වෙනුවෙන් ක්‍රියාත්මක කළා. මම ඒ පිළිබඳවත් පැහැදිලි කරන්නම්.

මේ ආයතන 832ම ආවරණය වන පරිදි ජාලගත වැඩසටහනක් ක්‍රියාත්මක කරලා, එම ආයතනවල තොරතුරු ලබාගෙන 2017.11.13වන දින අපි පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළා. ඉන් පසුව, 2017.12.08වන දා තවත් වාර්තාවක් ඉදිරිපත් කළා. ඊට අමතරව, ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය අමාත්‍යතුමාගේ සභාපතිත්වයෙන් යුතුව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අනුකාරක සභාවක් පිහිටෙව්වා. එම අනුකාරක සභාවට රජයේ ආයතන කැඳවලා, ආදායම් ලබන ආයතනවල එම ආදායම් වැඩිකර ගැනීමට කටයුතු කළ හැක්කේ කෙසේද කියා සාකච්ඡා කළා. ඒ අනුව එම ආයතන කලින් පාවිච්චි කර තිබෙන ක්‍රමවේද මොනවාද, තොරතුරු තාක්ෂණය භාවිත කර එම ආයතනවල ආදායම වැඩි කර ගන්නේ කොහොමද යනාදී කරුණු පිළිබඳව අධ්‍යයනයක් කරලා, මේ පාර්ලිමේන්තුවට පැහැදිලි වාර්තාවක් ඉදිරිපත් කරන්න අපේ කාරක සභාව කටයුතු කළා. ඒ වාගේම, මේ ආයතන 837ම පිළිබඳව -ඒවා එකින් එකට අරගෙන- 2016 වර්ෂයට අදාළ තවත් වාර්තාවක් අද දිනයේදී අපි මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. ඒ අනුව මේ ආයතන අටසියනිස්භතේම 2015 වර්ෂයට අදාළ ගිණුම් පිළිබඳව වාර්තාවකුත්, 2016 වර්ෂයට අදාළ ගිණුම් පිළිබඳ වාර්තාවකුත් මේ වනවිට මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න අපි කටයුතු කර තිබෙනවා. මේක අනිවාර්යයෙන්ම සිදුවිය යුතු කරුණක්. මෙම කාරක සභාවට මේ ආයතන කැඳවා අපි කථා කරන්නේ අවුරුදු 10ක් 15ක් පැරණි දේවල් පිළිබඳව නොවෙයි. මෑත වර්ෂවල සිදුවුණු අඩු පාඩුකම් පිළිබඳව අපි ඔවුන් සමඟ කථා කළා. මේ ආයතන අටසිය ගණනම පාර්ලිමේන්තුවට කැඳවන්න අපිට පුළුවන්කමක් නැති නමුත් පාර්ලිමේන්තුවත්, මේ ආයතන 837ත්, විගණකාධිපතිවරයාත් සම්බන්ධ කර ගනිමින් ජාලගත තොරතුරු තාක්ෂණ පද්ධතියක් අපි හඳුන්වා දී තිබෙනවා. ඒ අනුව අපි වර්තමාන කාරක සභාවට මේ ආයතන වෙන් වෙන් වශයෙන් කැඳවනවා වාගේම, ජාලගත වැඩසටහන මඟින් පාර්ලිමේන්තුවත්, මේ ආයතන 837ත් අතර අද වනවිට ඍජු සම්බන්ධතාවකුත් ඇති කරගෙන තිබෙනවා. අද අපි බොහෝවිට මේ ආයතන සමඟ ගනුදෙනු කරන්නේ ලිපිවලින් නොවෙයි. අද අපි නවීන තාක්ෂණික වැඩසටහන් පාවිච්චි කරලා මේ ආයතන 837ත්, පාර්ලිමේන්තුවත් අතර ඉතාම සමීපව සම්බන්ධතාවක් ඇති කර ගැනීමම අපේ ඉදිරි කටයුතු සඳහා ඉතාම සුබවාදී ප්‍රවණතාවක් බව මම විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ.

මේ ආයතනවල විගණනය සහ කාර්ය සාධනය පිළිබඳ තොරතුරු ලබාගැනීම සඳහා අපි ප්‍රශ්නාවලියක් සකස් කර තිබෙනවා. අපි මෙම ක්‍රියාවලිය තුළින් කරන්න බලාපොරොත්තු වුණේ මේකයි. විශේෂයෙන්ම අපිට ආයතන විශාල ප්‍රමාණයක් කැඳවන්න පුළුවන්කමක් නැති නිසා, අපි ප්‍රශ්නාවලි පහක් සකස් කළා. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලට එක ප්‍රශ්නාවලියකුත්, සියලුම පළාත් සභා සහ පළාත් සභා අරමුදල්වලට එක ප්‍රශ්නාවලියකුත්, පළාත් සභා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, විශේෂ ගිණුම් ඒකක සඳහා එක ප්‍රශ්නාවලියකුත්, පළාත් සභා ප්‍රඥප්ති සඳහා එක ප්‍රශ්නාවලියකුත්, සියලුම පළාත් පාලන ආයතන සඳහා එක ප්‍රශ්නාවලියකුත් යනාදී වශයෙන් ප්‍රශ්නාවලි පහක් අප සකස් කර තිබෙනවා. ඒ මඟින් අප එම ආයතනවල තොරතුරු ලබා ගන්නවා. විශේෂයෙන්ම එම ආයතනවල සැලසුම්කරණය, අභ්‍යන්තර පාලනය, මානව සම්පත් කළමනාකරණය, රාජ්‍ය සම්පත් කළමනාකරණය, රාජ්‍ය ආදායම් කළමනාකරණය, ව්‍යයම් කළමනාකරණය, අනික් රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම්, ගිණුම් ඉදිරිපත් කිරීම, විගණනයට ප්‍රතිචාර දැක්වීම් හා කාර්ය සාධනය පිළිබඳව එම ප්‍රශ්නාවලිය හරහා තොරතුරු ඇතුළත් කර ගනු ලබනවා. ඒ අනුව මේ ප්‍රශ්නාවලියට ඒ අදාළ ආයතනවලින් ලබාදෙන තොරතුරු, තොරතුරු පද්ධතිය හරහා අමාත්‍යාංශ ලේකම් විසින් නිර්දේශ කරලා, විගණකාධිපතිවරයාට එව්වාට පසුව විගණකාධිපතිතුමාගේ නිලධාරියෙක් ඒ අදාළ අමාත්‍යාංශවලට ගිහින්, ආයතනවලට ගිහින් ඒ ලබා දී තිබෙන තොරතුරු නිවැරැදිද කියා බලා, විගණකාධිපතිවරයාගේ නිර්දේශ සමඟ තොරතුරු පද්ධතිය හරහාම එම තොරතුරු පාර්ලිමේන්තුවට එවනවා. එම තොරතුරු පාර්ලිමේන්තුවට ලැබුණාට පසුව තොරතුරු පද්ධතිය හරහාම මේ ආයතනවලට ලකුණු ලබා දෙනවා.

ආයතනවල වැරැදි, අඩු පාඩුකම් සිදුවුණාට පසුව කොපමණ පරීක්ෂණ පැවැත්වුවත්; පශ්චාත් පරීක්ෂණ පැවැත්වුවත් රටට අහිමි වුණු මුදල් නැවත ලබා ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැය කියන කාරණය කාරක සභාව තුළ කටයුතු කරන විට අප දකින දෙයක්. කොපමණ පරීක්ෂණ පැවැත්වුවත් ඒ සිදුවුණු පාඩුව මකා ගන්න නැවත පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. එම නිසා කාරක සභාව විධියට අපි උත්සාහ කරන්නේ, මේ ආයතනවල සිදුවන අඩු පාඩුකම් නැති කර ගන්නයි; අවම කර ගන්නයි. ඒ නිසා පාර්ලිමේන්තුවත්, විගණකාධිපති දෙපාර්තමේන්තුවත්, ඒ ආයතනත් අතර දැඩි සම්බන්ධතාවක් තිබෙනවා නම්; අධීක්ෂණයක් තිබෙනවා නම්; සම්බන්ධීකරණයක් තිබෙනවා නම් එම ආයතනවල සිදුවන අඩු පාඩුකම් අවම වෙනවාය කියන විශ්වාසය අප තුළ තිබෙනවා.

කාරක සභාවට ආයතනයක් කැඳෙව්වාම ඒ ආයතනය කොපමණ උනන්දු වෙනවාද කියලා අපි දන්නවා. හැබැයි, බොහෝ ආයතනවලට ඒ උනන්දුව තිබෙන්නේ කාරක සභාවට ඇවිල්ලා පිළිතුරු දීලා යන්න විතරයි. කාරක සභාවට කැඳෙව්වාට පස්සේ ආයතන සූදානම් වෙනවා. එම නිසා අපි දැක්කා, මේ ආයතනයත්, පාර්ලිමේන්තුවත් අතර ඍජු සම්බන්ධතාවක අවශ්‍යතාවක් තිබෙන බව. එම නිසා තමයි මේ තොරතුරු පද්ධති වැඩසටහන අපි හඳුන්වා දීලා තිබෙන්නේ. 2015 අවුරුද්දේ අපි ඒ ආයතන ඇගැයීමකට ලක් කළා. හොඳම කාර්ය සාධනයක් තිබෙන, විගණනයක් ඉදිරිපත් කළ ආයතන ඇගැයීමකට ලක් කළා. ඒ අයට අපි පාර්ලිමේන්තුවේ ඇගැයීම් වැඩසටහනක් පැවැත්වුවා. ඒ තුළින් ඒ ආයතනවලට සහතික පත් ලබා දුන්නා. ඒ වාගේම 2015 අවුරුද්දේ හඳුන්වා දුන් තොරතුරු පද්ධති වැඩසටහනත් එක්ක සංසන්දනය කළාම, 2016 අවුරුද්දේම එම ආයතන කාර්ය සාධනය සහ ගිණුම් කටයුතු පැත්තෙන් විශාල ප්‍රගතියක් ලබාගෙන තිබෙනවාය කියන කාරණය රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විධියට අපි ඉතාමත් සතුටින් සඳහන් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම 2015 අවුරුද්දේ මේ ආයතන 837න් ආයතන 122ක්ම ලකුණු 50ටත් වඩා අඩුවෙන් තමයි ලබාගෙන තිබුණේ. නමුත් 2016 ගිණුම් අනුව බැලුවාම ආයතන 100ක්ම ලකුණු 50කට වඩා වැඩියෙන් ලබා ගන්නා ආයතන බවට පත්වෙලා තිබෙන බව පෙනෙනවා. ඒ වාගේම 2016 අවුරුද්දේ ලකුණු 90ට වඩා වැඩියෙන් ලබාගත් ආයතන තිබුණේ ඉතාමත් සුළු ප්‍රමාණයක්. නමුත් 2016 වර්ෂය වන විට ඒ ආයතන විශාල ප්‍රගතියක් අත්පත් කරගෙන තිබෙනවා; වැඩි ආයතන ප්‍රමාණයක් වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගෙන තිබෙනවා.

අද ඒ ආයතනවල විගණන කමිටු කැඳවනවා. ඒ වාගේම එම ආයතනවල අනිකුත් කටයුතු සම්බන්ධයෙන් අද යම් ප්‍රවණතාවක්

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

ඇති කරගෙන තිබෙනවා. ඒ වාගේම විගණනයට පිළිතුරු ලබාදීමේදී අද ඒ ආයතන ශුභවාදී තත්ත්වයකට පත්වෙලා තිබෙනවා. 2016 වර්ෂයට අදාළ සියලුම ආයතන ඇගැයීමකට ලක් කිරීමේ වැඩසටහනක් අපි මේ වර්ෂයේදීත් අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කරනවා. මේ වැඩසටහන තුළින් අපේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කටයුතු ඉතාමත් කාර්යක්ෂම කර ගැනීමට අපට හැකියාව ලැබී තිබෙනවා. මෙය සමස්ත පාර්ලිමේන්තුවම ලද ජයග්‍රහණයක් විධියටයි අපි දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෑතකදී පාර්ලිමේන්තුවට හඳුන්වා දුන් ස්ථාවර නියෝග අනුව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මේ ආයතන සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන වාර්තාව මුදල් අමාත්‍යාංශයටත්, අදාළ ආයතනවලටත් නොපමාව යැවිය යුතුව තිබෙනවා. මේ ඉදිරිපත් කරපු වාර්තා පාර්ලිමේන්තුව අදාළ ආයතනවලට යවන්න ඕනෑ. අදාළ ආයතනවලට මේ වාර්තාව යවනවාය කියන්නේ, මේ කාරක සභාවේදී අනාවරණය වුණු කරුණු ඇතුළත් වාර්තාව, නිර්දේශයන් යවන එකයි. ඊට පස්සේ මුදල් අමාත්‍යාංශයත්, අදාළ ආයතනයත් ඒ නිර්දේශ පිළිබඳව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන මාස දෙකක් ඇතුළත, එනම් සති 8ක් ගතවීමට පෙර පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයි. එතකොට කාරක සභාවට බලන්න පුළුවන්, මේ කාරක සභාවෙන් සොයාගත් කරුණු, අනාවරණය කරගත් කරුණු මේ ආයතන ක්‍රියාත්මක කරලාද, නැද්ද කියලා.

අපේ මන්ත්‍රීතුමන්ලාගේ අදහස් හා යෝජනාවලින් කියවුණා, මේ කාරක සභාව නිර්දේශ ඉදිරිපත් කරනවා පමණයි, පසු විපරමක් සිද්ධ වන්නේ නැහැයි කියලා; මේ තීන්දු තීරණ ක්‍රියාත්මක කරනවාද කියා සොයා බැලීමක් සිද්ධ වෙන්නේ නැහැ කියා. අපි අද පාර්ලිමේන්තු ස්ථාවර නියෝග මඟින් මේ වැඩසටහන තවත් ශක්තිමත් කර තිබෙනවා. මේ ගිණුම් ක්‍රියාවලිය- මුදල් නිසි පරිදි වියදම් කළාද කියා සොයා බැලීමේ ක්‍රියාවලිය- තවත් පියවරක් ඉදිරියට තබා මාස දෙකක් ඇතුළත නැවතත් ඒ ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු පාර්ලිමේන්තුවට වාර්තා කරන මට්ටමකට අද ඇවිත් තිබෙනවා. එම නිසා කාරක සභාව විධියට අපි නව ස්ථාවර නියෝගවලට අනුව ඒ කටයුතු ක්‍රියාත්මක කරන්න සූදානම් වෙලා තිබෙනවා. මේ වාර්තා සියල්ලක්ම අපි ඒ ආයතනවලට යොමු කරනවා. මේ සෑම ආයතනයක්ම මාස දෙකක් ඇතුළත ඒ ආයතන වෙත ලබා දුන් වග කීම ඉටු කිරීම පිළිබඳව මෙම පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුව තිබෙනවා. ඒ අනුව මේ වැඩසටහන තව තවත් ශක්තිමත් කරන්න අපි අනිවාර්යයෙන්ම කටයුතු කරනවා. එසේ කටයුතු කළ යුතුයි. මේ සෑම දෙයකම අවසානය කුමක්ද? මේ රටේ ජනතාව අපව පාර්ලිමේන්තුවට එවන්නේ මෙන්න මේ කටයුතු ටික කරන්නයි. මේ රටේ නීති ටික හදලා, මුදල් ටික වෙන් කර, හරිහැටි ඒ මුදල් ටික වියදම් කළා ද කියා සොයා බලන්නයි. ඒ වග කීම අප මනාව අවබෝධ කර ගෙන තිබෙන නිසා තමයි අපේ කාලයෙන් වැඩි ප්‍රමාණයක් මේ වෙනුවෙන් මිඩංගු කරන්නේ. අපේ කාලය මිඩංගු කර, මා ඇතුළු අපේ කාරක සභාවේ මන්ත්‍රීවරුන් විසි හය දෙනා මේ පිළිබඳ ඉතාමත් හොඳ අවබෝධයකින් යුතුව මේ කටයුතු නිවැරදි කරන්න ක්‍රියා කරනවා. එම නිසා ඒ කාර්ය භාරය අප බොහොම පැහැදිලිව ඉටු කරනවාය කියන එක ඉතාමත් වගකීමකින් යුතුව කියන්නට ඕනෑ.

පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවත්, රජයේ ගිණුම් කාරක සභාවත් ඉතාමත් සුහද සම්බන්ධතාවයකින් යුතුව සමස්ත පාර්ලිමේන්තුවේ මූල්‍ය වග කීම් නිසි ලෙස අවබෝධ කර ගෙන කටයුතු කරනවා. එය එසේ අනිවාර්යයෙන්ම සිදු කළ යුතු කාර්යයක් හැටියටයි පෞද්ගලිකව මා ඇතුළු කාරක සභාවේ මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාම දකින්නේ. ඒ වාගේම මේ ඉදිරිපත් කරපු වාර්තාවල ඒ ඒ ආයතන සම්බන්ධව වෙන වෙනම නිරීක්ෂණ ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම ඒ ඉදිරිපත් කළ වාර්තාවල විශේෂ නිර්දේශයන් ඉදිරිපත් කර තිබෙනවා. එසේම පොදු නිරීක්ෂණයන් ද අපි ඉදිරිපත් කර තිබෙනවා. මේ පොදු නිරීක්ෂණයන් හා විශේෂ නිරීක්ෂණයන් අපි වෙනමම අරගෙන ඒ ආයතනවලට ලබා දුන් නියෝගවලට අමතරව පොදු නිරීක්ෂණයන් හා විශේෂ නිරීක්ෂණයන් පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුව තිබෙනවා.

අද විගණකාධිපති දෙපාර්තමේන්තුවත් මේ කටයුතු ශක්තිමත් කිරීම සඳහා දැවැන්ත කාර්ය භාරයක් ලබා දෙනවා. ඒ වාගේම පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ කටයුතුවලට විගණන පනතකින් විශාල සහයෝගයක් ලැබෙනවා යයි කියන්නට ඕනෑ. එම නිසා අපි සියලු දෙනාම ඒකරාශී වී විගණන පනත් කෙටුම්පත කඩිනමින් සම්මත කර ගත යුතුයි. විගණන පනත් කෙටුම්පතට අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබුණා. එය මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. මේ සම්බන්ධයෙන් විවිධ ආයතනවල අදහස් හා යෝජනා ආවා. අද ඒ අදහස් හා යෝජනා අධ්‍යයනය කරමින් තිබෙනවා. එම නිසා මේ පාර්ලිමේන්තුව ගෙන යන මේ ක්‍රියාවලියට විගණකාධිපතිවරයා - විගණන කොමිෂන් සභාව ශක්තිමත් වීම විශාල රුකුලක්ය කියන එකත් අපි මේ අවස්ථාවේදී සඳහන් කරන්නට ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමා, ඔබතුමාට තව විනාඩි හතරක කාලයක් තිබෙනවා.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

විශේෂයෙන්ම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරනු ලබන වාර්තා පිළිබඳව විවාද කරනු ලබන මේ අවස්ථාව, මා මේ කාරණයත් කියන්න උපයෝගි කර ගන්නවා. ජාතික විගණන පනත් කෙටුම්පතේ තිබෙන අඩුපාඩුකම් නිවැරදි කරලා, කඩිනමින් එය සම්මත කර දීම අපේ යුතුකමක් හා වගකීමක් බව අපි අවබෝධ කර ගන්න ඕනෑ. අපි ඒ කාරණය කෙරෙහිත් අනිවාර්යයෙන්ම අපේ අවධානය යොමු කරන්න ඕනෑ. මේ ක්‍රියාවලිය තවත් ශක්තිමත් වීම සඳහා මේ කාරක සභාව විසින් ලබා දෙන නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳව පසු විපරමක් කළ යුතුයි. එමෙන්ම මේවා සෑබෑ ලෙස ක්‍රියාවට නැංවීම පිළිබඳව අපි දැනට වඩා, තවදුරටත් ශක්තිමත් විය යුතුයි. ස්ථාවර නියෝග හරහා යම් දින වකවානු, යම් සීමාවන් දාලා, මේ පාර්ලිමේන්තුවේ කටයුතු තවත් ශක්තිමත් කරන්න ක්‍රියා කරලා තිබෙනවා. හැබැයි, අපි මීටත් වඩා ඉදිරියට යා යුතුයි. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට නිලධාරීන් කැඳවලා, ඔවුන්ට දඬුවම් ලබා දිය යුතුයි කියන තැන මම පෞද්ගලිකව නැහැ. දඬුවම් ලබා දීලා පමණක් මේ සෑම දෙයක්ම නිවැරදි කර ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. නමුත් අපි සෑම කෙනෙකුටම හිමිවෙලා තිබෙන වගකීම් හරිහැටි ඉටු කරනවා නම්, මේ සිදු වන අඩුපාඩුකම් අපට නිවැරදි කර ගන්න පුළුවන්කමක් ලැබෙනවා කියන එකයි පෞද්ගලිකව මගේ විශ්වාසය. එම නිසා දඬුවම් ලබා දීමට අපට ඒ බලතල අවශ්‍ය වන්නේ නැහැ. හැබැයි, මේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ඒ ආයතන දක්වන ප්‍රතිචාර පිළිබඳව සොයා බලා, දැනට තිබෙනවාට වඩා දඬුවම් ලබා දීමටත් යන්නේ නැතිව, අතරමැදි තැනකට ඒමේ අවශ්‍යතාව අනිවාර්යයෙන්ම අපට තිබෙනවා. වර්තමානයේදී පමණක් නොවෙයි, නිදහසින් පස්සේ සෑම යුගයකදීම මේ රටේ රාජ්‍ය දේපළ, රාජ්‍ය මුදල් වංචාවන් සහ

අක්‍රමිකතාවන් සිදු වුණා කියන එක අපි පිළිගත යුතුයි. අද මේ තත්ත්වය නිසාම රටේ සමස්ත ජනතාව තුළ දේශපාලනඥයන් කෙරෙහි විශ්වාසයක් නැහැ. පිළිකුල් සහගත විධියට තමයි රටේ ජනතාව දේශපාලනඥයන් දිහා බලන්නේ; ඔවුන්ව දකින්නේ. ජනතාව එසේ බැලුවාය කියලා අපි ජනතාවට දෝෂාරෝපණය කළ යුතු වන්නේ නැහැ. ජනතාව සාධාරණයි. මේ තත්ත්වය නිවැරැදි වීමට නම් අපට පැවරී තිබෙන වගකීම අපි නිසි පරිදි ඉටු කරලා, මේ රටේ ජනතාව තුළ දේශපාලනඥයන් කෙරෙහි ඇති වැරැදි ආකල්ප නිවැරැදි කළ යුතුයි. එලෙස කටයුතු කිරීම තමයි අද රටක් විධියට අවශ්‍ය වන්නේ කියා මම පෞද්ගලිකව හිතනවා.

අද දිනය පුරා පාර්ලිමේන්තුවේ පැවැත්වෙන විවාදයේදී විවිධාකාරයෙන් අදහස් සහ යෝජනා ඉදිරිපත් කරපු, ඉදිරියේදී තවදුරටත් අදහස් ලබා දීමට සිටින සියලුම මැති-ඇමතිවරුන්ට, මන්ත්‍රීතුමියන්ලාට අපි මේ අවස්ථාවේදී ස්තුතිය පුද කරන අතර, මා ඇතුළු රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ අපේ සියලුම සාමාජිකයන්ගේ ස්තුතියත් සමස්ත පාර්ලිමේන්තුව වෙනුවෙන් මම මේ අවස්ථාවේදී පුද කරනවා. මේ රටේ ජනතාවගේ මුදල් උපරිම ආකාරයෙන් රටේ ඉදිරි අනාගතය සඳහා යොදා ගැනීමට අපි සියලුදෙනාම ඒක රාශී වෙලා, එකතුවෙලා කටයුතු කරමු කියන ආරාධනයත් කරමින් මම නිහඬ වනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා.5.03]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜ்புர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා පිළිබඳ විවාදයට සම්බන්ධ වීමට අවස්ථාව ලබා දීම ගැන මම පළමුවෙන්ම ඔබතුමියට ස්තුතිවන්ත වනවා. ඒ වාගේම අපේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා කථා කළාට පසුව මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැනත් මම ඔබතුමියට ස්තුතිවන්ත වනවා.

විශේෂයෙන්ම එතුමාගේ කථාවේදී සඳහන් කළා, දේශපාලනඥයන් ගැනත්, දඬුවම් දීම පිළිබඳවත් එතුමාගේ මතය. එතුමා කිව්ව විධියට අපිත් දන්නවා, දේශපාලනඥයන් ගැන සමාජයේ තිබෙන බැල්ම මොකක්ද කියන වගත්, දේශපාලනඥයන් පිළිබඳව සමාජයේ එහෙම හොඳ මතයක් නැහැයි කියලාත්. දේශපාලනඥයන් ගැන සමාජයේ තිබෙන්නේ ඉතා භයානක වැරදි මතයක්. දේශපාලනඥයාගේ හැම දෙයක් පිළිබඳවම ජනතාව බලන්න පුරුදු වෙලා තිබෙන්නේ වපර ඇසින් කිව්වොත් එය ඉතාම නිවැරදියි. මම හිතනවා, ඒක මේ සමාජ අර්බුදය තුළ ඇති වෙච්ච දෙයක් කියලා. පසුගිය කාලය තුළ සිදු වුණු යම් යම් දේශපාලන සිද්ධීන් නිසා පොදුවේ හැම දේශපාලනඥයා ගැනම ජනතාවට තිබෙන විශ්වාසය අද ඉතා අඩු මට්ටමකයි තිබෙන්නේ. අපි දන්නවා, දේශපාලනඥයන් වංචා හා දූෂණවලට සම්බන්ධ වුණාම ඒවා ඉතා ඉක්මනින් ප්‍රසිද්ධ වෙනවා; මාධ්‍ය ඒ ගැන කථා කරනවා; මාධ්‍ය තුළ ඒවා පළ වෙනවා; විරුද්ධ පක්ෂයේ ඉන්න උදවිය ඒවා ගැන කථා කරනවා කියලා. දේශපාලන නායකයන් විසින් මුදල් සම්බන්ධ වංචා හෝ එහෙමත් නැත්නම් නොයෙකුත් වංචාවලට, දූෂණවලට සම්බන්ධ වුණාම ඒවා හෙළිදරව් වීමේ ක්‍රම තිබෙනවා. එක්කෝ විරුද්ධ පක්ෂයේ සිටින මන්ත්‍රීවරු ඒවා හොයාගෙන ඇවිල්ලා මේ සභාවට ඉදිරිපත් කරනවා.

අපි දන්නවා, මේ රටේ රාජ්‍ය යන්ත්‍රණය ගැන. රාජ්‍ය නිලධාරීන් යම් යම් දූෂණවලට සම්බන්ධ වුණාම, යම් යම් දේවල් සඳහා රජයේ මුදල් අවභාවිත කළාම, එහෙම නැත්නම් නොයෙකුත් වංචාවලට සම්බන්ධ වුණාම ඒවා හෙළිදරව් වීමේ සම්භාවිතාව ඉතාම අඩු මට්ටමකයි තිබෙන්නේ. අපි සියලුදෙනාම විශ්වාස කරනවා, පොදුවේ හැම රාජ්‍ය නිලධාරියෙක්ම එහෙම නොවෙයි කියා. නමුත් රාජ්‍ය නිලධාරීන් විශාල පිරිසක් සහ සමහර ආයතන ප්‍රධානීන් යම් යම් දේවල් අයුතු ලෙස උපයා ගැනීම්, වංචා දූෂණවලට සම්බන්ධවීම් අපි සියලුදෙනාම දැකලා තිබෙනවා. මොන ආණ්ඩුව තිබුණත්, කොයි ආණ්ඩු කාලයෙත් ඒවා තිබිලා තිබෙනවා. ආණ්ඩු මාරු වුණා කියලා ඒවා වෙනස් වෙන්නේ නැහැ. සමහර රාජ්‍ය නිලධාරීන් ඒ අයගේ වංචා, දූෂණ එක්කෝ ඒ එන ඇමතිතුමාව අල්ලා ගෙන යටපත් කර ගන්නවා; එහෙම නැත්නම් ඊළඟ ආණ්ඩුව ආවාම ඒ ආණ්ඩුවේ ඉන්න ඇමතිතුමා අල්ලාගෙන ඒවා යටපත් කර ගන්නවා. ඒ වාගේ සිද්ධීන් රාශියක් අපි දැකලා තිබෙනවා. නමුත් දැන් තියෙන දේ තමයි එහෙම සම්බන්ධ වෙන රාජ්‍ය නිලධාරීන්ව පරීක්ෂාවට ලක් කිරීම හා ඔවුන් පිළිබඳව තීන්දු ගන්නා වූ යන්ත්‍රණය කුමක්ද කියන එක. පාර්ලිමේන්තුව තුළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවත්, ඒ වාගේම කෝප් කමිටුවත් කියන කාරක සභාවන් දෙකක් තිබෙනවා. රාජ්‍ය නිලධාරීන්ගේ ක්‍රියාදාමය පිළිබඳව පරීක්ෂාවට ලක් කරන්න පුළුවන් ආයතන දෙකක් හැටියට මේ ආයතන අපට හඳුන්වන්න පුළුවන්. මේ ආයතන දෙක තුළින් විශාල සේවයක් වෙන බව අපි දන්නවා.

රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව රාජ්‍ය ආයතනවල, දෙපාර්තමේන්තුවල ගනුදෙනු හා සියලු දේවල් පරීක්ෂාවට ලක්කරන්න පුළුවන් ආයතනයක් හැටියට තිබෙනවා. ඒ වාගේම තමයි විගණකාධිපතිතුමාගේ වාර්තාවත්. විගණකාධිපතිතුමාගේ වාර්තාව තුළින් විගණකාධිපතිතුමා ඉදිරිපත් කරන දේවල් ගැන බැලුවොත්, ඒ වාර්තාවත් මේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව කරන කාර්යන් හා සමාන කාර්යයක් තමයි කරන්නේ. නමුත් අපි දකින දේ තමයි බොහෝ දුරට අපේ රටේ දැන් මේ දේවල් වාර්තාවලට පමණයි සීමා වෙන්නේ කියන කාරණය. විගණකාධිපතිතුමාගේ වාර්තාව අරගෙන බැලුවොත්, ඒ වාර්තාව තුළ එතුමා හඳුනාගත් දේවල්, නිර්දේශ කරපු දේවල් විශාල වශයෙන් තිබෙනවා. මම දැක්කා, ඊයේත් එතුමාගේ කථාවකදී විශාල වංචාවක් ගැන එතුමා සඳහන් කළා. නමුත් අවාසනාවකට, වෙලා තිබෙන දේ තමයි මේවා වාර්තාවන්වලට පමණක් සීමාවීමේ හැකියාවක් සහ ඒවාට සවන්දීමේ හැකියාවක් විතරක් තිබීම. ඊට එහා මේ කටයුත්ත යන්නේ නැහැ. ඒක තමයි තිබෙන ප්‍රශ්නය. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව ගත්තත්, ඒක හරියට දත් නැති කටක් වාගේයි. මොකද, හපන්න බැහැ; හැපුවාට අහුවෙන්නේ නැහැ. මෙහිදී අපට කථා කරන්න පුළුවන්; රාජ්‍ය නිලධාරීන් ගෙනැල්ලා ප්‍රශ්න කරන්න පුළුවන්; නිර්දේශ දෙන්න පුළුවන්. ඒ නිසා අපට හොඳයි. ඒ දේවල් ගැන සාකච්ඡා කර කර අපට ඉන්න පුළුවන්. නමුත් එහි දෙන අවසාන තීන්දුව, ඒ දෙන නිර්දේශ ක්‍රියාත්මක කරන පුද්ගලයා ඒක ක්‍රියාත්මක නො කළාම අපි ගන්නා තීන්දුව මොකක්ද කියන එක ගැන ගැටලුවක් තිබෙනවා. ඒ අනුව බලනකොට, රජයේ නිලධාරීන් සම්බන්ධ වංචා, දූෂණ සම්බන්ධයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීම පැත්තෙන් අපි ඉතාම අවම මට්ටමකයි ඉන්නේ; අපි ඉතාම ප්‍රාථමික මට්ටමකයි ඉන්නේ. යහපාලන ආණ්ඩුව බලයට පත් වුණාම අපි රටක් හැටියට මේ වංචා, දූෂණවලට විරුද්ධව විශාල හඬක් නැඟුවා. ඒ හඬ නැඟුවේ, දේශපාලනඥයින්ට විරුද්ධව විතරක් නොවෙයි. වංචා, දූෂණ නැති කරනවාය කියලා අපි කිව්වේ, දේශපාලනඥයින් විසින් කරන ලද වංචා, දූෂණ පිළිබඳව විතරක්

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

නොවෙයි. මේ රටේ රාජ්‍ය තන්ත්‍රය තුළ ඉන්න යම් යම් ප්‍රබල නිලධාරීන් හවුල් වුණු වංචා, දූෂණ නැවැත්වීමේ ක්‍රියාදාමයත් අපේ ඒ සටන් පාඨය තුළ තිබෙනවා. නමුත් ඒ ගැන දක්වන අවධානය, ඒ සම්බන්ධයෙන් ගන්නා වූ තීන්දු-තීරණ, ඒ සම්බන්ධයෙන් ගන්නා වූ නීතිමය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් බැලුවාම ඉතාම අවම, ප්‍රාථමික මට්ටමකයි අපි ඉන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, යහපාලන රජය හැටියට අපි මේ වංචා, දූෂණ අවම කර ගැනීම සඳහා යම් යම් තීන්දු-තීරණ අරගෙන තිබෙනවා. ස්වාධීන කොමිෂන් සභා ඇති කිරීම, කෝප් වාර්තාව හරහා යම් යම් නීතිමය ක්‍රියාමාර්ගවලට යාම වාගේ සාධනීය තීන්දු අරගෙන තිබෙනවා. නමුත් සමස්තයක් වශයෙන් ගත්තාම මේ රටේ සිදු වන වංචා, දූෂණ අවම කර ගැනීමට ඒ සාධනීය තීන්දු විතරක් ප්‍රමාණවත් වෙනවා කියලා මා හිතන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ නිසා දේශපාලනඥයින්ගේ වංචා, දූෂණ අවම කරන්න, නැති කරන්න කථා කරනවා වාගේම, ඒවාට විරුද්ධව පෙනී සිටිනවා වාගේම- රාජ්‍ය යන්ත්‍රණය තුළත් විශාල ලෙස මේ රටේ ජනතාවගේ මුදල් අවභාවිතා කරනවා; දූෂණයට ලක් වෙනවා.- ඒවා නැති කිරීම සඳහා නීතිමය පැත්තෙන් මීට වඩා යම් විශාල යන්ත්‍රණයක් අපට අවශ්‍ය වෙනවා. ඒක මේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව තුළ අපට පෙනෙනවා. අපට තව හුඟක් ඉස්සරහට යන්න තිබෙනවා. අපි තවම ප්‍රාථමික අවධියේ ඉන්නේ. ඒ ප්‍රාථමික අවධියේ ඉඳන් ඉස්සරහට යන්න නම්, පාර්ලිමේන්තුව හැටියට අපි මීට වඩා නීති-රීති ගෙනැල්ලා, රාජ්‍ය යන්ත්‍රණය තුළත් සිදු වන වංචා දූෂණ අවම කර ගන්න පුළුවන් තීන්දු-තීරණ ගත යුතුයි කියන එක තමයි මාගේ අදහස. බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තූතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා.5.11]

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමියනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව පිළිබඳ විවාදය පැවැත්වෙන මේ මොහොතේ ඒ පිළිබඳව අදහස් කිහිපයක් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව මා ස්තුතිවන්ත වෙනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා විධියට ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා එම කාරක සභාවේ ව්‍යුහය, ඉලක්ක සහ ක්‍රියාවලිය පිළිබඳව පැහැදිලි විස්තර කිරීම් ගණනාවක් සිද්ධ කළා. කොහොම වුණත්, පාර්ලිමේන්තුව විමර්ශනය කරන ලද වාර්තාවල අන්තර්ගතය පිළිබඳව තමයි අද දවසේ කථා කරන්නේ.

රටේ මූල්‍ය පාලනය පිළිබඳව වගකීම තිබෙන්නේ පාර්ලිමේන්තුවටයි. ඒ නිසා තමයි රටේ ඉදිරි සංවර්ධන සැලැස්ම පිළිබඳව ඉදිරිපත් කරන යෝජනා සහ ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අය වැය ලේඛනය මඟින් මුදල් ප්‍රතිපාදන වෙන් කරන්නේ. විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු යටතේ ඒ මුදල් ප්‍රතිපාදන වෙන් කළාට පසු ඒ අවුරුද්ද තුළ රටේ සංවර්ධනය වෙනුවෙන් විශාල කාර්ය භාරයක් කළ යුතුව තිබෙනවා. ඒ අනුව රාජ්‍ය දෙපාර්තමේන්තු, ආයතන සියල්ල සූදානම් වෙනවා, අය වැයෙන් වෙන් කළ මුදල්වලින් රජය බලාපොරොත්තු වුණු ඉලක්ක කරා යන්න. එහිදී සිද්ධ වන යම් යම් අක්‍රමිකතා, මූල්‍ය අවභාවිත වීම්, මූල්‍ය විනය පිළිබඳව විමර්ශනය කරන්නේ පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවයි. එක පැත්තකින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවත්, අනෙක් පැත්තෙන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවත් මූල්‍ය සහ රාජ්‍ය ආයතන පිළිබඳව විමර්ශනය කරනවා. අද රටේ හැම අංශයකම ලොකු කඩා වැටීමක් තිබෙනවා අපි දකිනවා. සමාජමය වශයෙන්, සංස්කෘතිකමය වශයෙන්, ආර්ථිකමය වශයෙන් වාගේම රාජ්‍ය ආයතන වශයෙනුත් ලොකු කඩා වැටීමක් දකින්න ලැබෙනවා. ඒ නිසා රටක් විධියට අපි කොහේටද යන්නේ කියන කාරණය පිළිබඳව කල්පනා කරලා මේවා සියල්ලම විධිමත් කරගත යුතු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රාජ්‍ය ආදායම සමන්විත වන්නේ බදු ආදායමින් සහ බදු නොවන ආදායම්වලිනුයි. මේ වන කොට ජනතාවගෙන් එකතු කරන බදු ආදායම වැඩි වෙලා තිබෙනවා. 2015දී ඇමෙරිකානු ඩොලර් බිලියන 9,973ක් වූ බදු ආදායම 2017 වන කොට 10,955 දක්වා වැඩි වෙලා තිබෙනවා. මේ බදු ආදායම වැඩි වෙන්නේ ජනතාවගේ ආදායම වැඩි වෙලා නොවෙයි. රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා බදු එකතු කරනවා. අද වන විට මිනිසුන්ට දරන්න සිද්ධ වෙලා තිබෙන බදු ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා. මේ බදු ආදායම තමයි රාජ්‍ය ආදායමේ කොටසක් විධියට පොදු සංවර්ධන කටයුතු සඳහා රාජ්‍ය ආයතනවලට, දෙපාර්තමේන්තුවලට වෙන් කරන්නේ රජයේ ඉලක්ක කරා යන්න. එහිදී මෙවැනි අක්‍රමිකතා, දූෂණ සිද්ධ වනවා නම් ජනතාවගේ දහඩිය, මහන්සිය, කඳුළු තමයි මේ අක්‍රමිකතාවලට, දූෂණවලට, වංචාවලට ගොදුරු වන්නේ. ඒ නිසා රජයේ ගිණුම් කාරක සභාවට මෙවා පිළිබඳව විමර්ශනය කිරීමේ බලය පමණක් දීලා මදි. මෙවා පිළිබඳව සොයා බලා මේවා නිවැරදි කර ගන්නටත්, ඒ පිළිබඳව යම් දඬුවම් ලබා දීමටත් අවකාශයක් සැලසෙන්න ඕනෑයි කියලා අපි විශ්වාස කරනවා.

පසුගිය අවුරුද්දේ විතරක් රාජ්‍ය ආයතනවලින් ලැබූ පාඩුව රුපියල් බිලියන 50ක් කියලා අපේ ගරු කථානායකතුමා පසුගිය දවස්වල "වෝටර්ස් ඒජ්" හි පැවැති රැස්වීමකදී ප්‍රකාශ කර තිබෙනවා. මේ රටේ සංවර්ධන කටයුතුවලට, රජය පවත්වා ගෙන යන්න විදේශ ණය ගන්න අවශ්‍ය නැහැ. මේ විනාශ වන එහෙම නැත්නම් පාඩු ලබන රුපියල් බිලියන 50 කළමනාකරණය කර ගත්තොත්, ණය නොවී මේ සංවර්ධන කටයුතු කරගෙන යන්න, ජනතාවගේ සුභසාධන කටයුතු කරගෙන යන්න, මේ රජය පවත්වා ගෙන යන්න පුළුවන්කම ලැබෙනවා. ඊළඟට, රාජ්‍ය ආයතනවලින් මේ විධියට පාඩු ලබනවා නම්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කාර්ය භාරය තිබෙන්නේ කොතැනද කියන එක ගැනත් අපට සිතා බලන්න වෙනවා. මොකද, සම්මුති ආණ්ඩුවක් විධියට මේ ආණ්ඩුව බලයට පත් වුණෙත්, යහ පාලනය ඇති කරනවා කියලායි. "යහ පාලනය" කියන්නේ යහපත් පාලනයක් කියන එකයි. රටේ විනයක් වාගේම මූල්‍ය විනයක් තිබෙන්නට ඕනෑ. හොරකම, දූෂණය, වංචාව රාජ්‍ය ආයතනවලින් විතරක් නොවෙයි, සමාජයෙනුත් තුරන් කරන්න ඕනෑ. හැබැයි, අද වන විට මේ හැම දෙයක්ම වැඩි වන පැත්තටයි කටයුතු සිද්ධවෙලා තිබෙන්නේ. එක පැත්තකින් රජයේ ණය වැඩි වෙනවා; ජනතාවට ගහන බදු ප්‍රමාණය වැඩි වෙලා තිබෙනවා; ජීවන වියදම වැඩි වෙලා තිබෙනවා; වංචාව, දූෂණය, අක්‍රමිකතා -මේ සියල්ලත්- වැඩි වෙලා තිබෙනවා.

දූෂිත බැඳුම්කර ගනු දෙනුව පිළිබඳව අද දවසේත් කථා වුණා. මේ ගැන කථා වීම පිළිබඳව ප්‍රශ්නයක් නැහැ. මේ මහ බැංකු

බැඳුම්කර ගනු දෙනුව මේ රටේ සිදු වුණු භයානකම, දැවැන්තම, බරපතළම මූල්‍ය අපරාධයක් විධියට සලකන්න පුළුවන්. ශ්‍රී ලංකා මහ බැංකුව අයිති ආර්ථික කටයුතු අමාත්‍යාංශය එවකට තිබුණේත් අගමැතිතුමා යටතේයි. ඒ නිසා අගමැතිතුමාටත් ඒ චෝදනාවෙන් ගැලවෙන්න බැහැ. එතුමා චෝදනාවෙන් නිදහස් වෙලාත් නැහැ. පසුගිය දවස්වල එතුමාට විරුද්ධව විශ්වාසභංග යෝජනාවක් ඉදිරිපත් වුණාම එතුමා ඒක ජයග්‍රහණය කළා. නමුත්, මහ බැංකු බැඳුම්කර වංචාවෙන් විශාල මූල්‍ය පාඩුවක්, විශාල හානියක් සිදු වුණා, රටේ පොලී අනුපාතය වැඩි වුණා, ඒ වංචාව අවුරුදු 30ක් වාගේ කාලයක් ආර්ථිකයට බලපානවා, එම නිසා මේ වංචාව ආර්ථිකයට දරා ගන්න බැරි තත්ත්වයක්ය කියන එක මේ වනකොට සමාජගත වෙලා තිබෙනවා. එම නිසා අද දින ඉදිරිපත් කර තිබෙන සභාව කල් තැබීමේ යෝජනාව සමඟ සම්බන්ධ කරලා හෝ ඒ ගැන කථා කිරීම වැදගත් වනවා. මොකද, මේ කාරණය ජනතාවට අමතක නැති නිසා.

රාජ්‍ය ආයතනයක මූල්‍ය වංචාවක් සිද්ධ වුණොත්, ව්‍යවස්ථාපිත ආයතනයක ඒ වාගේ අක්‍රමිකතාවක් සිද්ධ වුණොත් COPE එක තුළ හෝ, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තුළ හෝ ඒ කරුණ සාකච්ඡාවට ගත්තාම එය හෙළිදරව් වෙනවා. හැබැයි, දූෂිත බැඳුම්කර ගනුදෙනුවෙන් දේශපාලනඥයන් මුදල් ලබා ගත්තාය කියන කාරණය අද මාධ්‍යයට හොඳ මාතෘකාවක් වෙලා තිබෙනවා. අද මාධ්‍ය තලු මර මරා ඒ කාරණය ගැන ප්‍රවෘත්ති සපයනවා. ඒ නිසා අද ඒ කාරණය ජනමාධ්‍ය තුළ විශේෂ අවධානයට යොමු වෙලා තිබෙනවා. මෙහිදී මුදල් ගත්තේ කවුද, නොගත්තේ කවුද කියන එක ජනතාවටත් ප්‍රශ්නයක්. මුදල් ගත්තාය කියලා හතරදෙනෙක්, පස්දෙනෙක් පිළිගෙනත් තිබෙනවා. හැබැයි, මේ කාරණය විගණනය වෙන්නේ නැහැයි කිව්වාට, ජනතා අධිකරණයේදී විගණනය වෙන්න පුළුවන්. ඒක ඊළඟ මැතිවරණයේදීත් වෙන්න පුළුවන්. කොයි මොහොතක හරි මේ කාරණය විගණනය වනවා. නමුත්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා සඳහන් කළේ රජයේ මේ ආයතනවලින් රජයට සිද්ධ වුණු පාඩු, ඒ විනාශය නැවත අය කර ගන්න බැහැයි කියලායි. ඒ අක්‍රමිකතාවලින් පාඩුවක් සිද්ධ වුණා නම්, ඒක දරා ගන්න වනවා කියලා කිව්වා. නමුත් ඒක එහෙම වෙන්න බැහැ. මේ විධියට ගියොත් රජයක් පවත්වාගෙන යන්න හම්බ වන්නේ නැහැ. අනාගතයේ බලයට එන රජයකටවත් ඒ රජය පවත්වා ගෙන යන්න බැරිවනවා. එම නිසා මේ මුදල් අය කර ගන්න ක්‍රමයක් සකස් කරන්න ඕනෑ. ඉදිරියේදී මේ ප්‍රශ්නවලට තිරසාර කල් පවත්නා විසඳුම් ලබා දෙන්න ඕනෑ නම්, මේ මුදල් අය කර ගන්න ක්‍රමයක්, මේ අලාභ අය කර ගන්න ක්‍රමයක් සහ මේ වැරදිවලට දඬුවම් ලබා දෙන ක්‍රමයක් ක්‍රියාත්මක කළ යුතුයි. අපි ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

"තානාපති කාර්යාල නඩත්තුවට 2017දී රුපියල් බිලියන 8.3ක් වැය වෙලා තිබෙනවා. හැබැයි, ඒකෙන් කාර්යක්ෂම ප්‍රතිඵල ලැබිලා නැහැ" යි කියලා විගණකාධිපතිතුමා සඳහන් කළ කාරණයක් "අද" පත්තරයේ සිරස්තලය විධියට අද පළ කර තිබෙනවා. එහෙම කියන්නේ අපි නොවෙයි, රජයේ විගණකාධිපතිතුමා. ඒ කියන්නේ අපේ තානාපති සේවය අකාර්යක්ෂම වෙලා තිබෙනවාය කියන එකයි. ඒ සඳහා වෙන් කරන මුදල්වලින් කිසි ප්‍රයෝජනයක් ලැබිලා නැහැ. ලංකාවේ අය විදේශ රටවල පදිංචි වෙලා ඉන්නවා. එක්කෝ ඒ අයට සේවයක් වන්න ඕනෑ. එහෙම නැත්නම් රටේ කීර්තිය වෙනුවෙන්, සංචාරක ව්‍යාපාරය වෙනුවෙන් ඒ තානාපති සේවයෙන් ඵලදායී යමක් වෙලා නැහැයි කියලා විගණකාධිපතිතුමා කියනවා. රුපියල් බිලියන 8.3ක් කියන්නේ විශාල මුදලක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අය වැයෙන් රාජ්‍ය ආයතනවලට වෙන් කරන සියලු මුදල් වර්ෂය අවසාන වනකොට වියදම් කරන්නේ නැහැ. ඒකත් විගණනයට ලක් වෙන්න ඕනෑ දෙයක්. අය වැයකින් මුදල් වෙන් කරන්නේ රටේ සංවර්ධනය වෙනුවෙන්, ඒ ආයතනවල දියුණුව වෙනුවෙන්. අවසානයේ ඒ මුදල් ටික වැය වන්න ඕනෑ මහ ජනතාවගේ දියුණුවට. ඒ මුදල අවුරුද්ද අවසන් වනකොට වියදම් වුණේ නැත්නම් එතැනත් ගැටලුවක් තිබෙනවා. එහෙම කියන්නේ අපි නොවෙයි, විගණකාධිපතිතුමා. මම දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාවේදී මා තවත් කාරණයක් සඳහන් කරමින් මගේ කථාව අවසන් කරන්න කැමැතියි.

පාර්ලිමේන්තුවේ හැන්සාඩ් දෙපාර්තමේන්තුවේ සංස්කාරකතුමිය හැටියට කටයුතු කළ රංජනී ජයමාන්න මෙනෙවිය අවුරුදු 35ක සේවයකින් පසු අද දවසේ විශ්‍රාම යනවා. එතුමිය මේ පාර්ලිමේන්තුව වෙනුවෙන්, ඒ වාගේම හැන්සාඩ් සංස්කරණය වෙනුවෙන් විශාල කාර්යභාරයක් කළා. අද දින විශ්‍රාම යන එතුමියගේ විශ්‍රාම ජීවිතය නිරෝගිමත්, සැපවත් ජීවිතයක් බවට පත් වන්නට අපි සුබ පතනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු වන අප සියලුදෙනාම මේ කාලය තුළ එතුමිය කරපු සේවය ඇගැයීමකට ලක් කරනවාය කියන කාරණයත් ඇයට ගෞරවයක් වශයෙන් මා මේ මොහොතේ සිහිපත් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මී ළඟට, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි, 15ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.22]

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රටක මූල්‍ය බලය සහ මූල්‍ය වගකීම පැවරෙන්නේ පාර්ලිමේන්තුවට. ඒ කාරණය වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම තේරුම් ගත් ජනතා විමුක්ති පෙරමුණේ ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කළ විගණන වාර්තා විවාදයට ගන්න කටයුතු කිරීම සඳහා ගෙන එන ලද සභාව කල් තැබීමේ යෝජනාව ඉතාම ප්‍රශංසනීයයි කියන එක මා මේ මොහොතේ සඳහන් කරන්න ඕනෑ. ආයතන 837ක් සම්බන්ධයෙන් විගණන වාර්තා 4ක් සහ අතුරු වාර්තාවක් ඉදිරිපත් කිරීමට සමත් වීම ප්‍රශංසනීය කටයුත්තක්ය කියලා අපි විශ්වාස කරනවා. මෙන්න මේ කාරණයේදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වර්තමාන සභාපතිවරයා සුවිශේෂී වග කීමක් ඉෂ්ට කරනු ලැබුවා. මෙහිදී එතුමාගේ මැදිහත්වීම ඉතාම ප්‍රශංසනීයයි.

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

ඒ වාගේම, විගණකාධිපතිතුමා, නියෝජ්‍ය විගණකාධිපතිවරුන් සහ මුදල් අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ මැදිහත්වීමත්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලයේත්, හැන්සාඩ් දෙපාර්තමේන්තුවේ සොයුරු සොයුරියන්ගේත් මැදිහත්වීමත් ඉතාම ප්‍රශංසනීයයි. මේ අයගේ සාමූහික වගකීමේ ප්‍රතිඵලයක් විධියට තමයි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිතුමා ඇතුළු අපි කාටත් පුළුවන් වුණේ මේ වාගේ විධිමත් වාර්තාවක් ඉදිරිපත් කරන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒ වාගේම මම මේ මොහොතේ විශේෂ කරුණක් සඳහන් කරන්න කැමතියි. පාර්ලිමේන්තුවේ හැන්සාඩ් දෙපාර්තමේන්තුවට වසර 35ක් තිස්සේ ඉතාම විශිෂ්ට සේවයක් කරපු, හැන්සාඩ් සංස්කාරක රංජනී ජයමාන්න සොයුරිය අද විශ්‍රාම යනවා. මා ඇයගේ විශ්‍රාම දිවියට සුබ පතනවා. ඒ වාගේම, ඇයට සියවසක් ජීවත්වීමට හැකියාව ලැබේවායි කියලා ආශීර්වාද කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ වාර්තා සම්බන්ධයෙන් මුද්‍රිත මාධ්‍යවලට සහ විද්‍යුත් මාධ්‍යවලට විගණකාධිපතිතුමා විවෘත ප්‍රකාශයක් කරනු ලැබුවා, හිටපු ජනාධිපතිවරයාගේ ලේකම්වරයා විසින් මහජන මුදල් අවභාවිත කළ සිද්ධියක් සම්බන්ධයෙන්. ඔහු කිව්වා, ඒ වාගේ කටයුතුවලට මැදිහත් වූ අයට මේ විධියට දඬුවම් දුන්නොත් නිලධාරීන් බහුතරයකට දඬුවම් විඳින්න සිද්ධ වෙනවා කියලා. එතුමා කොන්ද කෙළින් තියාගෙන, කිසිම බලපෑමකින් තොරව, සෘජුව මැදිහත්වෙලා ඒ ප්‍රකාශය කරනු ලැබුවා. මට මතකයි, ඒ ප්‍රකාශය කළාට පස්සේ මේ ඊනියා යහ පාලන ආණ්ඩුවේ ඇතැම් මැති ඇමතිවරු සහ සභානායකවරයා ඒ ප්‍රකාශය අභියෝගයට ලක් කළා, "එවැනි ප්‍රකාශයක් කරන්න ඔහුට කිසිම අයිතියක් නැහැ" කියලා. නමුත් විගණකාධිපතිවරයා මහජනතාවගෙන් පඩි ලබන කෙනකු විධියට කොන්ද කෙළින් තියාගෙන සෘජුව සිටියා මිස, මොනම ආකාරයකින්වත් එම අදහස -ප්‍රකාශය- ඉවත් කර ගැනීමට කටයුතු කළේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවෙන් නිරීක්ෂණය කරපු අවස්ථාවලදී අපි දැක්කා, රජයේ දෙපාර්තමේන්තුවල පුරප්පාඩු රාශියක් තිබෙන බව. ඒ නිසා අපි ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගෙන්, අමාත්‍යාංශ ලේකම්වරුන්ගෙන් නිරන්තරයෙන්ම අසනු ලැබුවා, "මෙවැනි විගණන වාර්තා හැදීමේදී යම් යම් අක්‍රමිකතා සිදු වෙන්නේ කාර්ය මණ්ඩලයේ - මානව සම්පතේ - යම් ආකාරයක අඩුවක් නිසා ද" කියලා. ඔවුන් කිව්වා, "ඒකත් යම් කිසි ආකාරයක ගැටලුවක් තමයි" කියලා. දළ වශයෙන් ගත්තාම අද වන විට උපාධිධාරීන් 60,000කට වැඩි පිරිසක් විශ්ව විද්‍යාලවලින් පිටවෙලා ඉන්නවා. මේ ඊනියා යහ පාලන ආණ්ඩුවේ අගමැතිවරයා කිව්වා, රැකියා ලක්ෂ 10ක් සපයනවා කියලා. ඒ රැකියා ලක්ෂ 10 මෙම උපාධිධාරීන්ට ලබා දීලා ඒ අයගෙන් අවශ්‍ය වැඩ කටයුතු කර ගන්නවා නම්, මේ දෙපාර්තමේන්තුවල තිබෙන විගණන ගැටලු යම්තාක් දුරකට අවම කර ගන්න පුළුවන්කම තිබෙනවාය කියලා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සිව්වන වාර්තාවේ සඳහන් කරුණු කෙරෙහි මම ඔබතුමියගේ අවධානය යොමු කරවනවා. අපි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට 2014 මැයි 04 වන දා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය කැඳෙව්වා. විගණකාධිපතිතුමා නිරීක්ෂණය 107වන පිටුවේ මෙසේ සඳහන් වනවා:

> මව් යාත්‍රා 02ක් මිලදී ගැනීම සඳහා 2007 වර්ෂයේ සිංගප්පූරු සමාගමක් සමඟ එළඹ තිබූ ගිවිසුමකට අනුව අත්තිකාරම් ගෙවා දින 280ක් තුළ කොන්ත්‍රාත්කරු විසින් යාත්‍රා නිෂ්පාදනය කර භාර දිය යුතු වූ අතර මේ සඳහා රු.148,8000,000/-ක මුදල් ප්‍රතිපාදන වෙන් කර 2015 දෙසැම්බර් වන විට රු.113,556,801/-ක් වැය කර තිබුණද, මව් යාත්‍රා මිලට ගෙන නොතිබීම.
>
> මව් යාත්‍රා මිලදී ගැනීම "මහින්ද චින්තන" වැඩ සටහන යටතේ ඇතුළත් කර තිබූ වැඩ සටහනක් වන අතර, ඒ සඳහා කැබිනට් අනුමැතිය 2007 වසරේදී ලැබී තිබූ බවත්, ඒ අනුව මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ද ලැබී තිබුණු බවත්, ඒ සඳහා වූ ඇස්තමේන්තුගත වියදම රුපියල් මිලියන 326ක් බවත්, එම ප්‍රතිපාදනවලින් මිලියන 113ක් වැය කර ඇතත්, මව් යාත්‍රා දෙක ලැබී නොමැති බව ප්‍ර.ග.නි./ග.නි. පැවසීය. බැංකු ඇපකරයක් නොමැතිව අත්තිකාරම් මුදලක් ලෙස රුපියල් මිලියන 65ක් ගෙවා ඇති බව හෙළිදරව් වන බවත්, මෙම ගනුදෙනුවට අදාළ ටෙන්ඩර් පරිපාටිය වැනි තොරතුරු ඇතුළත් ලිපි ගොනු අස්ථානගත වී ඇති බවත් ප්‍ර.ග.නි පැවසීය."

චින්තන සභාපතිතුමන්ලාගේ කාලයේ ඉතාමත්ම ප්‍රශංසනීය ආකාරයෙන් ඒ විගණන කටයුතු සිද්ධ වෙලා තිබෙන බව අද අපට පෙනෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 109වැනි පිටුවේ මෙන්න මේ ආකාරයට සඳහන්ව තිබෙනවා:

> "දික්ඔවිට ධීවර වරාය ඉදිකිරීම සඳහා වෙන් කළ මුදලින් ඊට අයත් නොවූ සී/ස සීනෝර් පදනමට අයත් මට්ටක්කුලිය බෝට්ටු යාත්‍රාංගණය අලුත්වැඩියා කිරීමට වැය කළ රුපියල් මිලියන 106ක මුදල ආපසු අය කර ගැනීමට හෝ එහි ප්‍රතිලාභ ධීවරයන්ට ලැබෙන පරිදි යෝජනා ක්‍රමයක් සැකසීමටත්, ඒ පිළිබඳව කාරක සභාවට වාර්තා කිරීමටත් පූර්ව කාරක සභාවේ දී ප්‍ර.ග.නි වෙත උපදෙස් ලබා දී තිබූ අතර, ධීවරයන්ට ප්‍රතිලාභ ලැබෙන අන්දමේ සහනදායී මිලකට යාත්‍රා අලුත්වැඩියා කර ගැනීමේ යෝජනා ක්‍රමයක් සකස් කර නොතිබීම හා 2016 දෙසැම්බර් මස 31 දිනට එම බෝට්ටු අංගණය වෙනුවෙන් වැය කළ මුදල රුපියල් 225,000,000/-ක් වීම."

කල්පනා කරලා බලන්න. මෙන්න මෙහෙම තමයි චින්තන සභාපතිතුමන්ලාගේ කාලයේ විගණන කටයුතු සිද්ධ වුණේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 110වැනි පිටුවේ මෙන්න මේ ආකාරයට සඳහන්ව තිබෙනවා:

> "දික්ඔවිට ධීවර වරාය විවෘත කිරීමේ උත්සවයේ මුළු වියදම රුපියල් 26,889,165/-ක් වූ අතර, උත්සව ශාලාව ඉදිකිරීම් හා සැරසිලි කිරීම පෞද්ගලික ආයතනයකට පවරා තිබුණි. ඒ සඳහා අනුමත මුදල හා එකඟ වූ මුදල ඉක්මවා රුපියල් 1,898,950/-ක් ගෙවා තිබුණි. සමරු ඵලකය ඉදිකිරීම සඳහා සැපයුම්කරු රුපියල් 650,000/-ක වියදමක් දක්වා තිබූ අතර, ප්‍රසම්පාදන කමිටුව විසින් ඊට අමතර ගාස්තු ලෙස රුපියල් 350,000/-ක් එකතු කර රුපියල් ලක්ෂ 1,000,000/-ක් අනුමත කර ගෙවීම් කර තිබීම."

මෙන්න මේ ආකාරයෙන් තමයි පසුගිය කාලයේ කටයුතු සිද්ධ වෙලා තිබෙන්නේ. මේ මහජන මුදල්. මේ මහජන මුදල්වලට ආගිය අතක් නැහැ; අදටත් ඒ මුදල්වලට වෙච්ච දෙයක් නැහැ. මේවාට වග කිවයුතු නිලධාරීන් සියලු දෙනාම නිව්හැනහිල්ලේ සුවසේ කාලය ගත කරනවා. ඒවාට එදා හිටපු දේශපාලනඥයන් වග කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 110වැනි පිටුවේ තවදුරටත් මෙන්න මේ ආකාරයට සඳහන්ව තිබෙනවා:

> "2015 වර්ෂය අවසාන වන විට නිම කළ යුතුව තිබූ කයිකාවල නැංගුරමිපළ ඉදිකිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා රුපියල් මිලියන 84.84ක් වැය කර තිබුණි. වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතිය නතර කර දමා තිබූ බව ද, ව්‍යාපෘතිය නතර කර තිබුණ ද, උපදේශන ගාස්තුවෙන් සියයට 62ක් එනම්, රුපියල් 4,379,531/-ක් උපදේශක ආයතනයකට ගෙවා තිබීම."

නමුත්, තවමත් දික්ඔවිට ධීවර වරාය කුමන ආකාරයකින්වත් ගල් කැල්ලක්වත් තියලා හදලා නැහැ. ඒ නිසා මේ වාගේ දැවැන්ත

මුදල් අවභාවිතාවන් තමයි පසුගිය කාලයේ සිද්ධ වෙලා තිබෙන්නේ. අපට ඒක නිරීක්ෂණය වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. 110වැනි පිටුවේ තවදුරටත් මේ ආකාරයට සඳහන්ව තිබෙනවා:

"පානදුර ධීවර වරායේ මෝයකට වැලි ඉවත් කිරීම සඳහා ධීවර වරාය නීතිගත සංස්ථාවට ලබා දී තිබූ රුපියල් මිලියන 20ක අත්තිකාරම වර්ෂ 10ක් තුළ අදාළ වැලි අලෙවියෙන් පියවිය යුතු වුවද, ජනල් සටහන් මඟින් වැය ශීර්ෂයට හර කර පියවා තිබීම. මහා භාණ්ඩාගාර උපදෙස් මත එසේ කළ බව ප්‍ර.ග.නි./ග.නි. පැවසූ නමුත්, මහා භාණ්ඩාගාරයට කරුණු වැරැදි ලෙස දැක්වීම නිසා මෙම තත්ත්වය උද්ගත වී ඇති බව කාරක සභාව නිරීක්ෂණය කළේය."

කල්පනා කරලා බලන්න. රුපියල් කෝටි ගණනක් මුදල් වියදම් කරලා මෝය කට වැලි ඉවත් කරන්න සූදානම් වුණා. නමුත්, එක වැලි කැටයක්වත් ඉවත් කළේ නැහැ. වැලි ඉවත් කරන්න ගත්ත මුදල්වලට මොනවා වුණා ද කියලා අදටත් සොයා ගන්න නැහැ. වැලි ඉවත් කරන්න භාණ්ඩාගාරයෙන් ආපු මුදල් වියදම් කළා, වැලි විකුණලා ගත්තු සල්ලිවලට වුණු දෙයක් අද වෙනතුරුත් දැනගන්නට ලැබිලා නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සිව්වන වාර්තාවේ - 2017.01.24 සිට 2017.05.24 දක්වා - සමාජ සවිබලගැන්වීම් හා සමාජ සුභසාධන අමාත්‍යාංශය 2017 මාර්තු 07 වෙනි දා පරීක්ෂණයට කැඳවූ අවස්ථාවේ දී නිරීක්ෂණය වූ කරුණු මම ඔබතුමියගේ අවධානයට යොමු කරන්නම්. එම වාර්තාවේ 40වෙනි පිටුවේ 5වෙනි කාරණය ලෙස මෙසේ සඳහන් වෙනවා:

"2015 අයවැය යෝජනා යටතේ අඩු ආදායම්ලාභී ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ලබා දෙන රු. 2000/= ක මාසික දීමනාවෙන් රු. 100 ක් ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ ගිණුමකට බැර කර තිබුණද මෙම මුදල කිසිදු සුබසාධන කටයුත්තක් සඳහා යොදවා නොතිබුණි. 2016 දෙසැම්බර් 31 දින දක්වා ලැබුනු රු. 389,000,000 ක්ද ඉන් පසුව ලැබුණු රු. 54,445,900 ක්ද ලෙස මුළු එකතුව වූ රු. 443,445,900ක් නිශ්කාර්යව පැවතීම."

කල්පනා කරලා බලන්න. තවදුරටත් එහි මෙසේ සඳහන් වෙනවා:

"අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන මෙම අරමුදල පිහිටුවා ඇති බවත් වැටිහිටි සුබසාධනය සඳහා භාර අරමුදලක් ලෙස ලියාපදිංචි කිරීමට අවශ්‍ය කෙටුම්පත් සකස් කර ඇති බවත් එමඟින් එම අරමුණු වලට අනුව වියදම් කිරීමට බලාපොරොත්තු වන බවත් ප්‍ර.ග.නි. පැවසීය"

පල් පට්ට බොරු. තවමත් මේ සම්බන්ධයෙන් කිසිමාකාරයක සිදු වීමක් වෙලා නැහැ. මේ වැඩිහිටි ජනතාව මේ රටට සේවය කළ, ඉතාමත්ම විශිෂ්ට පුරවැසියන් කොටසක්. මේ මුදල කපා ගන්නේ නැතිව ඒ අයට ලබා දුන්නොත් ඒ මිනිසුන්ට මහත් සහනයක් ඇති වෙනවා. ඒ දේවත් එවකට සිටි ඇමතිවරයා විසින් කළේ නැහැ. එම නිසා මේවාට අනිවාර්යයෙන්ම දඬුවම් ලබා දිය යුතුයි කියන එකයි අපි විශ්වාස කරන්නේ. අපේ සභාපතිතුමා කිව්වා, දඬුවම් ලබා දීම සම්බන්ධයෙන් එතුමාගේ කැමැත්තක් නැහැයි කියලා. මම කියනවා ඒක වැරැදියි, ඒක එතුමාගේ අදහස වෙන්නට පුළුවන්. අඩුම තරමින් මේ අපරාධවලට යම්කිසි ආකාරයක හෝ දඬුවමක් ලබා දුන්නොත් මේ අපරාධ සියයට 100ක් නැති වුණත් අවම වශයෙන් යම් ප්‍රමාණයකින් අඩු වෙනවා කියන එක අපි විශ්වාස කරනවා. එම නිසා මේ සම්බන්ධයෙන් අනිවාර්යයෙන්ම දඬුවම් ලබා දිය යුතුයි කියලා අප විශ්වාස කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
අවසාන වශයෙන් ඔබතුමියගේ අවධානයට මා තව එක කාරණයක් යොමු කරවනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සිව්වන වාර්තාවේ 69වෙනි පිටුවේ මෙසේ සඳහන් වෙනවා:

" නීත්‍යානුකූල බලතල නොමැතිව පළාත් ආණ්ඩුකාරවරයා විසින් උපදේශකවරුන් 7 දෙනෙකු පත්කර තිබීම.

ප්‍රධාන අමාත්‍යවරයාගේ ඉල්ලීම මත ආණ්ඩුකාරවරයා විසින් අදාළ පත්වීම් සිදුකර පරිශ්‍රමික හා දීමනා තීරණය කර ඇති අතර පළාත් සභාවලට උපදේශකවරුන් පත්කිරීම සඳහා

අමාත්‍යාය මණ්ඩල අනුමැතියක් ලැබී නොමැති බැවින් මෙම පත් කිරීම් නීත්‍යානුකූල නොවන බව ආණ්ඩුකාරවරයා සහ මහ ඇමතිවරයා වෙත ලිඛිතව දැන්වීමෙන් පසු 2016.12.08 දිනැති ලිපියක් මඟින් උක්ත පත්වීම් අවලංගු කිරීමට කටයුතු කර ඇතත් 2016.12.18 දිනැති ලිපිය මඟින් එම තනතුරු යළි බලාත්මක කිරීමට කටයුතු කර ඇති බව ප්‍ර.ග.නි./ග.නි. ප්‍රකාශ කළේය....."

ඒ වාගේම තවදුරටත් මෙහෙම කියනවා;

"ආණ්ඩුකාරවරයා සමග සාකච්ඡා කර මේ සම්බන්ධයෙන් ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව 2017 අප්‍රේල් 10 දිනට පෙර කාරක සභාවට වාර්තා කරන ලෙස නියෝග කළේය."

නමුත් අද වෙනතුරුත් මේකට උත්තර ලැබිලා නැහැ. මේ මහ ඇමතිවරයා මහජන මුදල් මේ විධියට කොල්ල කෑවේ, පිල්ළි ගැහුවේ වරක් දෙවරක් නොවෙයි. ජනාධිපතිවරයාගේ පවා නියෝගවලට පටහැනිව කථා කරන මෙවැනි ජාති භ්‍රෂ්ටයන් අනිවාර්යයෙන්ම දඬුවමට ලක් කළ යුතුයි කියන එක අපි විශ්වාස කරනවා. එම නිසා මේ සම්බන්ධයෙන් ඉදිරියේ දී කටයුතු කිරීමට අපි වැඩි වැඩියෙන් මැදිහත් වෙන බව ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු රන්ජන් රාමනායක මහතා (සමාජ සවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க - சமூக வலுவூட்டல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Ranjan Ramanayake -Deputy Minister of Social Empowerment)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා

ගරු ඒ. ඒ. විජේතුංග මහතා
(මාණ්පුමිකු ඒ.ඒ. විජේතුංග)
(The Hon. A. A. Wijethunga)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මුජීබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය.

அதன்படி, மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA *left the Chair, and* THE HON. MUJIBUR RAHUMAN *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාങ്കුම් உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කථා කරන්න.

[අ.භා.5.36]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතාමත්ම වැදගත් කාරණාවක් පිළිබඳවයි අද සාකච්ඡා වෙන්නේ. මේ කාරණය ගැන අද දින සාකච්ඡා කිරීමට අවස්ථාවක් ලබා දීම පිළිබඳව අපි ස්තුතිවන්ත වෙනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වසර 94ක ඉතිහාසයක් තුළ වඩාත්ම සක්‍රිය සේවයක් කළ අපේ ලසන්ත අලගියවන්න සභාපතිතුමා ප්‍රමුඛ ඒ කාරක සභාවේ සියලුම නිලධාරීන්ට, සභික මන්ත්‍රීවරුන්ට අපි විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. මේ හැම දෙයක් ගැනම විශේෂ අවධානයක් යොමු කරලා, පළමු වරට මේ විධියට වාර්තා ගණනාවක් ඉදිරිපත් කිරීම පිළිබඳව අපි ඒ සියලුදෙනාටම බෙහෙවින් ස්තුතිවන්ත විය යුතුයි. පසුගිය කාලපරිච්ඡේදය තුළ අපි මේ රටේ නීති, ප්‍රතිපත්ති රාශියක් සකස් කළා. මේ රටේ විනිවිදභාවය ඇති වෙන්න අවශ්‍ය කරන සියලුම කටයුතු කළා. මේ ආණ්ඩුව ආවාට පසුව අන්ධකාරයෙන් ආලෝකයට පැමිණෙන්නට අවශ්‍ය සියලුම කටයුතු අපි කළා. අන්ධකාරයේදී නොදැකපු බොහෝ භයානක දේවල්, අන්ධකාරයේ සිදුවුණු බොහෝ භයානක දේවල් ආලෝකය මතු වුණාට පස්සේ පෙනෙන්න පටන් ගත්තා. මේ අලුත් පරිවර්තනය නිසා ආලෝකයේදී පුංචි දෙයක් වුණත් දකින්න පටන් ගන්නකොට මේ සමාජය තුළ විශාල ආන්දෝලනයක් ඇති වුණා. මහා අන්ධකාරයේ කළ දැවැන්ත තක්කඩිකම්, හොරකම්, දූෂණ, මැරකම් ආදී සියල්ල අලෝකය ලැබුණාට පසුව කරන්න හදනකොට පුංචි දෙයක් හෝ දැක්කත් මහා ආන්දෝලනයක් ඇති වෙන්න පටන් ගත්තා. ඒ නිසා තමයි, අන්ධකාරයේ සිටි මහා චෞරයන් - හොරුන් - තක්කඩින් අද හරිම සුද්ධවන්තයන් වාගේ මේ විධියට චෝදනා කරන්නේ. අද කරීකයන් රාශියක් සුද්ධවන්තයෝ, සුද්ධෝදනලා වාගේ කථා කළ හැටි අපි දැක්කා.

මේ මාතෘකාව පිළිබඳව කථා කරනකොට මට මේ කාරණය කියන්න වෙනවා. ආයතනවලට ප්‍රශ්නාවලියක් යවන එකක් ගැන ලසන්ත අලගියවන්න මැතිතුමා ප්‍රකාශ කළා. ඒ පිළිබඳව මට පුංචි ගැටලුවක් මතු වුණා. ආයතනයක කාර්යක්ෂමතාව පිළිබඳව විමසලා ප්‍රශ්නාවලියක් යවනකොට, ඒ ප්‍රශ්නාවලියට උත්තර සපයන්නේත් ඒ ආයතනය විසිනුයි. ස්ථානීය පරීක්ෂණයක් කරන්න ගියාම, ඒ ස්ථානීය පරීක්ෂණයට සහාය දෙන්නේත් ඒ ආයතනය විසිනුයි. එතකොට, නඩුත් භාමුදුරුවන්ගේ; බඩුත් භාමුදුරුවන්ගේ; උත්තර දෙන්නේත් භාමුදුරුවෝ. හොරාගේ අම්මාගෙන් තමයි පේනය අහන්නේ. එම නිසා තොරතුරු ලබා ගැනීමේ මේ ක්‍රමවේදය සියයට 100ක්ම සාර්ථකද කියන ගැටලුව මට මතු වුණා. මේ හැම කටයුත්තක්ම කඩිනමින් කිරීම ඉතාම හොඳයි; මාස දෙකක්, තුනක් ඇතුළත කරනවා නම් හොඳයි. පසුගිය කාලයේ වාගේ අවුරුදු 10ක්, 15ක් කල් ගිය පරීක්ෂණ නැවත කරන්න යනකොට, ඒවායේ තිබෙන කාලීන වැදගත්කම කියන එක නැතිව යනවා. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට හපන්න පුළුවන් වුණාට, දත් නැහැය කියා ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරයෙක් බොහොම උජාරුවෙන් කියනවා මම අහගෙන හිටියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තමුන්නාන්සේට දැන ගන්නයි මේ කාරණය කියන්නේ. මේ කාලයේ නම්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට දත් නැහැ. හැබැයි, පසුගිය කාලයේ දත් නොවෙයි, තොල් තිබුණේත් නැහැ. සමහර වෙලාවට දිවක් තිබුණේත් නැහැ. එහෙම තිබුණු කාලයක් පසු කරගෙන තමයි අද මේ තත්ත්වයට ඇවිත් තිබෙන්නේ. අපි ඒ ගැන සන්තෝෂ වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් හපන්න හෝ පුළුවන්කමක් තිබෙනවා. දත් ටික එන කල් ඉවසන්න. දැන් දත් එන්න පුපුරාගෙනයි එන්නේ. දත් ටික එනතුරු ඉවසන්න කියන එක මම මේ අවස්ථාවේදී කියනවා.

මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා අර හැම දාම පට්ටා ගහන බැඳුම්කරය පිළිබඳව පුදුමාකාර සුද්ධවන්තයෙක් විධියට බොහොම උජාරුවෙන් කථා කළ ආකාරය අපි දැක්කා. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා ක්‍රීඩා ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ -2011 වසරේ- රුපියල් මිලියන 112ක් වැය කර සුගතදාස ක්‍රීඩාංගණයේ ඉදිකළ ධාවන පථය මාස දෙකක් ඇතුළත විනාශ වීම පිළිබඳව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සිවිවන වාර්තාවේ 114වැනි පිටුවේ සඳහන් වී තිබෙනවා. රුපියල් මිලියන 112ක් වැය කරලා ක්‍රීඩාංගණයේ ඉදිකළ ධාවන පථය මාස දෙකක් ඇතුළත ධාවනයට නුසුදුසු එකක් බවට පත් වුණු එක පිළිබඳව විමර්ශනය කළ වාර්තාව තිබෙනවා. "සීමාසහිත ගහකොළ එන්ටප්‍රයිසස්" කියන ආයතනයෙන් තමයි මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාගේ කාලයේ ඒ ඉදිකිරීම් කර තිබෙන්නේ. මේ "ගහකොළ එන්ටප්‍රයිසස්" කියන නම හදිසියේ හදා ගත් නමක්ද, පාරේ එන ගමන් හදිසියේ මතක් වූ නමක්ද කියා අපි දන්නේ නැහැ. රුපියල් මිලියන 112ක් වැය කරලා තමයි ඒ ඉදිකිරීම් කටයුත්ත කළේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාങ്കුම් உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් කියන්න ඕනෑ කරුණක් තිබෙනවා. අද දවසේ පාර්ලිමේන්තුවට එනකොට පැය එකහමාරක්, දෙකක් පමණ අපට මහ පාරේ රස්තියාදු වෙන්න සිද්ධ වුණා. සරසවි ශිෂ්‍යයන් මහ සොහොන් බලකාය වාගේ කටයුතු කරමින්, තමන්ට ලැබී තිබෙන අයිතීන් උල්ලංඝනය කරමින් සාමාන්‍ය ජනතාවට, පාසල් ශිෂ්‍යයන්ට, අසරණ රෝගීන්ට සාමාන්‍ය පාරවල, මහා මාර්ගවල යන්න තිබෙන අවස්ථාව අද උල්ලංඝනය කරනවා. ඒ ගැන කියන්න ඔබතුමා මට විනාඩියක කාලයක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට මෙය කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක එදා

කළා නම් මොකද වෙන්නේ? මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ආණ්ඩුව තිබෙන කොට අධ්‍යාපනය වෙනුවෙන් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 6ක් වෙන් කරන්නය කියා සරසවි ශිෂ්‍යයන් උද්ඝෝෂණය කරද්දී, ගම්පහ ප්‍රදේශයේදී සරසවි ශිෂ්‍යයන් දෙදෙනකු මැරුණා. මේ උද්ඝෝෂණය එදා කළා නම් එහෙම තත්ත්වයක් තමයි ඇති වන්න ඉඩ තිබුණේ. ඒ එක්කම, මම තවත් කාරණයක් කියන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න. ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මම අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගලගොඩඅත්තේ ඥානසාර හාමුදුරුවන්ගේ සිද්ධිය සම්බන්ධයෙනුත් අපි මේ දවස්වල බැණුම් අහනවා. ගලගොඩඅත්තේ ඥානසාර ස්වාමීන් වහන්සේ පිළිබඳ නඩුව ඇහුවේ සිරිකොත පක්ෂ මූලස්ථානයේද කියා මා අහන්න කැමැතියි. එහේ නොවෙයි ඒ නඩුව ඇහුවේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ රටේ අධිකරණ ක්‍රියාදාමය තුළ, අධිකරණයක් ඉදිරියේ තමයි නඩුව ඇහුවේ. හැබැයි එක්තරා අවස්ථාවක "දෙරණ" නාලිකාවේ අංශක 360 දේශපාලන වැඩසටහනේදී ගලගොඩඅත්තේ හාමුදුරුවන් වහන්සේම පිළිගත්තා, බීමත්ව රිය පැදවීමද ඇතුළුව වැරදි 11ක් සමඟ පොලීසියට හසු වූ බව. උන් වහන්සේ බොහොම බය පක්ෂපාතව තමන්ගේ වැරැද්ද පිළිගත්තා මට මතකයි.

පසුගිය ආණ්ඩුව කාලයේ මොරටුවේ හිටපු නියෝජ්‍ය නගරාධිපති ස්වාමීන් වහන්සේලා දෙදෙනකු සාතනය කළා. සරත් ෆොන්සේකා මැතිතුමා අත් අඩංගුවට ගත් වෙලාවේ එතුමා නිදහස් කරන්නය කියා මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ කියද්දී මොකද වුණේ? මාදුළුවාවේ සෝභිත ස්වාමීන් වහන්සේ එළියට බහිද්දිම ආපු ලොරියකින් උන් වහන්සේ හප්පා දැම්මා. ඒ කාලයේ සිටි පාලකයෝ ඊට පසුව තර්ජනය කළා, "අධිෂ්ඨාන පූජාව පැවැත්වුවොත් මල්වතු පාර්ශ්වය දෙකට කඩනවා" කියා. ඒ වාගේම, ඒ කාලයේ දළදා මාලිගාව ඉස්සරහා race පැවැත්වුවා. මා මේ අවස්ථාවේදී කියන්න ඕනෑ, ගලගොඩඅත්තේ ඥානසාර හාමුදුරුවන්ගේ නඩුව ඇහුවේ සිරිකොත පක්ෂ මූලස්ථානයේ නොවන බව. උත්තරීතර අධිකරණය තුළ තමයි ඒ නඩුව ඇහුවේ. එය පක්ෂයකින් කළ දෙයක් නොවෙයි. එය මහා සංඝ රත්නයට එරෙහිව අප කරන දෙයකුත් නොවෙයි. මාදුළුවාවේ සෝභිත හාමුදුරුවෝ වාහනය එළියට දමනකොට ලොරිවලින් හප්පපු ආණ්ඩු තමයි පසුගිය කාලයේ තිබුණේ. මොරටුවේ හිටපු නියෝජ්‍ය නගරාධිපති හාමුදුරුවරුන් දෙදෙනකු මරපු අවස්ථාවක් තිබුණා; කැපූ කෙටූ අවස්ථා, කඩුවලින් කෙටූ අවස්ථා තිබුණා. දැන් දෙබිඩි ප්‍රතිපත්තියකුයි ඒ අය අනුගමනය කරන්නේ. පසුගිය කාලයේ මිනිසුන් අමු අමුවේ මරා දැමුවා. මේ වෙලාවේ පැත්තක සිටින පක්ෂයකට මේ විධියට චෝදනා කරන දෙබිඩි ප්‍රතිපත්තිය ගැනත් අපේ විරෝධතාව පළ කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු රන්ජන් රාමනායක නියෝජ්‍ය අමාත්‍යතුමා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට විනාඩි 16ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.46]

ගරු රන්ජන් රාමනායක මහතා (සමාජ සවිබලගැන්වීම් නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க - சமூக வலுவூட்டல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Ranjan Ramanayake -Deputy Minister of Social Empowerment)
ඔබතුමාට බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තා ගැන කථා කරන අවස්ථාවේදී වචන කීපයක් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. කාලය බොහොම අඩුවෙන් තිබෙන නිසා මා කෙලින්ම point එකට එන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු විගණකාධිපති ගාමිණී විජේසිංහ මහත්මයාගේ ප්‍රකාශය ළඟදී මාධ්‍ය හරහා ඉතාම ප්‍රසිද්ධියට පත් වුණා. ඒ වාගේම එය ආන්දෝලනාත්මක විධියට ජනතාව අතර හුවමාරු වෙමින් පවතිනවා. ගරු විගණකාධිපතිතුමාගේ ප්‍රකාශයේ සඳහන්ව තිබෙන්නේ කොහොමද? එතුමාගේ ප්‍රකාශයේ සඳහන්ව තිබෙන්නේ, "බැදුම්කර සිද්ධිය වාගේ ඕනෑ තරම් වංචා පසුගිය යුගයේ වෙලා තිබෙනවා. උදාහරණයක් වශයෙන්, ගල් අහුරු වංචාව, හාල් ගෙනාපු case එක...." ආදි වශයෙනුයි. එහෙමයි එතුමා කියන්නේ. එතැන ගණන බිලියන 15ක්. තවත් තිබෙනවා පසුගිය කාලයේ වූ දේවල්. ඒවායින් එකක් තමයි, hedging ගිවිසුම හරහා වූ අලාභය. Entrust ගනුදෙනුව හරහා රත්වත්තේ සොහොයුරෙක් රුපියල් බිලියන 10ක පමණ වංචාවකට හසු වෙලා තිබෙනවා. ෂැන්ග්‍රි-ලා ගිවිසුම, වෙනත් නොයෙකුත් කුමන්ත්‍රණ, අපේ රට විකිණීම හරහා කොමිස් මුදල් ගැනීම, ක්‍රිෂ් වංචාව ආදි දේවල් ද සිදුව තිබෙනවා.

මේවා සියල්ලම හැංගිලා පවතින තත්ත්වයක් තමයි තිබෙන්නේ. පසු ගිය කාලයේ මේවා සියල්ලම හැංගිලා තිබෙද්දී, යහපාලන ආණ්ඩුව පත් වුණාට පස්සේ මේ හොරු එක දිගට අහුවෙන්න පටන් ගත්තා. "හොරු ඇල්ලුවාද? හොරු ඇල්ලුවාද?" කියලා සියලු දෙනා සමච්චල් කරද්දී මේ තරම්වත් - මෙපමණකින්වත් - හොරු අල්ලපු ආණ්ඩුවක් ඉතිහාසයේ තිබුණාද කියලා, "හොරු ඇල්ලුවාද?" කියලා සමච්චල් කරන පාර්ශ්වයෙන් මම අහන්න කැමැතියි. මේ සම්බන්ධයෙන් මම අභියෝග කරනවා. මම ඕනෑම විවාදයකට එන්නම්. ඒ කාලයේ එහෙම හොරු ඇල්ලුවේ නැහැ. එහෙම හොරු ඇල්ලුවා නම්, ඇල්ලුවේ එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මහත්මයා විතරයි. එතුමා තමයි වෝල්ටර් තල්ගොඩපිටිය කියන වාර්තාව හරහා කැබිනට් ඇමතිවරු අට දෙනෙක් ගෙදර යැව්වේ. මොන්නැකුලම, වී.සී. පෙරේරා, මරික්කාර් වැනි අය ගෙදර යැව්වේ එතුමායි. හොරු අල්ලන එක කොච්චර බෙල්ල ගහලා යන වැඩක් ද කිව්වොත් තමන්ගේම ආණ්ඩුවේ හොරු අල්ලන්න ගිහිල්ලා ඇත්තටම එතුමාගේ ජීවිතයෙන් පවා වන්දි ගෙවන්න සිද්ධ වුණා. ඒ වාගේම ආණ්ඩුවක් තමයි මේ ආණ්ඩුවත්. මම එක්සත් ජාතික පාක්ෂිකයකු වුණත් කියන්න ඕනෑ, ඊට පසුව ආපු ප්‍රේමදාස මහත්මයාගේ යුගයේ හොරු ඇල්ලුවා කියලා අපට ආරංචියක් ආවේ නැහැ. ඊට පසුව ආපු ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක ජනාධිපතිනියගේ යුගයේ හොරු ඇල්ලුවා කියලා ආරංචියක් අපට ආවේ නැහැ. මට මතකයි එක හොරෙක් අල්ලපු සිද්ධිය. ඒ අනුලා විද්‍යාලයේ විදුහල්පතිනිය. ඒ කියන්නේ හාල්මැස්සෙක් ඇල්ලුවේ. තෝරු, මෝරු ඇල්ලුවේ නැහැ. අනුලා විද්‍යාලයේ විදුහල්පතිනිය කළ වංචාව මොකක්ද? දරුවන් දෙදෙනකු පාසලට ඇතුළත් කරවා

[ගරු රන්ජන් රාමනායක මහතා]

ගැනීම සඳහා ඒ මව්පියන්ගෙන් පීරිසි කුට්ටමක් අල්ලසක් වශයෙන් ගැනීම. අන්න එහෙමයි වුණේ. ඊට පස්සේ මහින්ද රාජපක්ෂ මහත්තයාගේ කාලයේ හොරු අල්ලනවා කියලා අපි අහලාවත්, දැකලාවත් තිබුණේ නැහැ. එතුමා කිව්වා, "අපේ හාමුදුරුවනේ, මා ළඟ "ෆයිල්" තිබෙනවා. මම කවදාවත් අපේ ආණ්ඩුවේ ජඩකම්, බලුකම්, කුපාඩිකම් කරපු අයගේ ෆයිල් එළියට දමන්නේ නැහැ. ඒක විශාල වරදක්." කියලා. එතුමාගේ හඬින්ම කියපු, එතුමාගේ රූපයත් ඇතුළත් වීඩියෝ එකක් තිබෙනවා. මම ඒක සභාගත කරන්නම්.

මෙන්න මෙහෙමයි, පසු ගිය ආණ්ඩු හොරුන් ආරක්ෂා කළේ. ඒක තමයි සිද්ධ වුණේ. එතුමා එසේ කිව්වා වාගේම හිටපු අග විනිසුරුවරයෙක් වන සරත් එන්. සිල්වා මහත්තයා කිව්වා, "මම හිරගෙදර යවන්න ඕනෑ කෙනාව රජ ගෙදර යැව්වා. මට සමාවෙන්න." කියලා. ඒ වාගේම එතුමා කිව්වා, "ඒ කාලයේ මහින්ද රාජපක්ෂ මහත්මයාව හිරගෙදර යැව්වා නම්, මේ රට විශාල අගාධයකින් බේරා ගන්න තිබුණා." කියලා. එහෙම කිව්වේ සරත් එන්. සිල්වා හිටපු අග විනිසුරුවරයා. හොරුන් ආරක්ෂා කළ යුග ගණනාවක් තමයි අපි පසු කරගෙන ආවේ.

ඊට පස්සේ 2015 ජනවාරි 08 වැනිදා යහපාලන ආණ්ඩුව බලයට ආවා. අමුතුම සංස්කෘතියක්, අමුතුම දේශපාලනයක්. ගරු ජනාධිපතිතුමා තමන්ගේ ලේකම්වරු දෙදෙනෙක් ඇල්ලුවා. කවුද, මහානාම සහ දිසානායක. අල්ලස ගත්තේ කොහේදිද, ටාජ් හෝටලයේ car park එකේදී. රුපියල් කෝටි දෙකක් ගැන ගැන ඉන්නකොට අහු වුණා. අන්න හොරු අල්ලපු විධිය. මේකම තමයි විගණකාධිපතිතුමාත් කියන්නේ. විගණකාධිපති ගාමිණී විජේසිංහ මහත්තයා කියන කථාව මොකක්ද? සිල් රෙදි බෙදීම හරහා රුපියල් කෝටි 60ක වංචාවකට ලලිත් වීරතුංග වාගේ ලේකම්තුමන්ලා අහුවෙලා තිබෙනවා. එතුමන්ලා කියනවා, ඒක වංචාවක් නොවෙයි කියලා. නමුත් අපේ මැතිවරණ කොමසාරිස්තුමා කියනවා, "ඒ සිල් රෙදි ආවරණය කළ කවරයේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ රූපය ගහලා තිබුණා. ඒක පැහැදිලිවම මැතිවරණ අල්ලසක්." කියලා. රුපියල් කෝටි 60ක්. මෙහෙම හොරු ඇල්ලුවාම මොකද වෙන්නේ? එහෙම හොරු ඇල්ලුවාම අපේ සමහර ස්වාමීන් වහන්සේලා පිණ්ඩපාතයේ යනවා, හොරුන් වෙනුවෙන් වන්දිය ගෙවන්න. ඉතින් කොහොමද අපි හොරු අල්ලන්නේ? හොරු උසාවියෙන් එළියට එනකොට පිරිත් නූල් බඳිනවා, ඒ අයට ශක්තියක් දෙනවා, වන්දි ගෙවන්න පිණ්ඩපාතේ යනවා. මේ වාගේ දේවල් තමයි අද අපට අහන්න ලැබෙන්නේ.

විගණකාධිපති ගාමිණී විජේසිංහ මහත්තයා තවත් කථාවක් කියනවා. බැරි වෙලාවත් රජයේ සේවකයන් මෙවැනි දූෂණවලට සහයෝගය දීලා, ඒ අය අධිකරණයට ගෙනැල්ලා දඬුවම් නොදුන්නොත්, මේ විධියට උසාවි එන්න, නීතිය ඉදිරියට එන්න, හිරේ යන්න ඉන්න තවත් බොහෝ රජයේ සේවකයන්ට සැනසීමක් ලැබෙනවා. ඒ කියන්නේ ඒ ගොල්ලන්ව අල්ලන්නේ නැහැ. මේ දෙදෙනා බේරුණොත් ඒ ගොල්ලෝ අහනවා, "ඇයි, ඒ ගොල්ලෝ විතරක් බේරන්නේ, අපිව බේරන්නේ නැද්ද" කියලා. ඉතින්, මේ වගේ තත්ත්වයක් තමයි අද තිබෙන්නේ. ඒ නිසා පොදු විපක්ෂයේ, ඔය කියන පොහොට්ටුවේ හෝ ඕනෑම පාර්ශ්වයකට මම අභියෝග කරනවා. පුළුවන් නම් තමුන්නාන්සේලා හිතට එකඟව කියන්න. මම කියන්නේ නැහැ, මේක සර්ව සම්පූර්ණයෙන්ම හොරු අල්ලපු ආණ්ඩුවක් කියලා. නමුත්, මේ තරමින්වත් හොරු අල්ලන ආණ්ඩුවක් ඉතිහාසයේ තිබුණා නම් එය නමින් කියන්න කියලා මම ඔබතුමන්ලාට අභියෝග කරනවා.

පසු ගිය දිනවල බැඳුම්කර වංචාව ගැන ලොකුවට කථා වුණා. ගාමිණී විජේසිංහ මහත්මයා කියනවා, බැඳුම්කර වංචාව වගේ දෙගුණයක්, තුන්ගුණයක් විශාල බැඳුම්කර වංචා මීට ඉස්සර සිදුවී තිබෙනවා කියලා. නමුත්, අපි හොරකම් අල්ලන්න පටන් ගත්තේ අපේම බැඳුම්කර වංචාවෙන්. මෙම බැඳුම්කර වංචාවට COPE එකේ අයගේ නම් කියැවුණා. ඒ වාගේම තවත් අයගේ නම් කියැවුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මම අද මගේ දිවුරුම් ප්‍රකාශය ගෙනාවා. ඒ දිවුරුම් ප්‍රකාශය මම **සභාගත*** කරනවා.

මෙම දිවුරුම් ප්‍රකාශය මම කථානායකතුමාටත් යවලා තිබෙනවා. මෙම දිවුරුම් ප්‍රකාශයේ සඳහන් වී තිබෙන කරුණු මම බොහොම පැහැදිලිව කියන්නම්:

> "වර්තමානයේ සාකච්ඡාවට බඳුන් වී ඇති ශ්‍රී ලංකා මහබැංකු බැඳුම්කර වංචාව සම්බන්ධයෙන් චෝදනා ලැබ සිටින පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමෙන් හෝ ඊට අනුබද්ධ වෙනත් ආයතනයකින් හෝ එහි කොටස්කාර වෙනත් ආයතනයකින් හෝ එහි හිමිකාර අර්ජුන ඇලෝසියස් යන අයගෙන් හෝ ඔහුගේ නියෝජිතයෙකුගෙන් හෝ කිසිදු මුදලක්, දේපළක් හෝ වෙනත් ප්‍රතිලාභයක් ..."

සෘජුව හෝ වක්‍රාකාරව,- ඒ කියන්නේ, සමහර අය driversලා මාර්ගයෙන් ගන්නවානේ. තවත් සමහර අය චෙක්පත පිටුපස තමන්ගේ security officerට කියලා අත්සන් කරලා ඔහු මාර්ගයෙන් මාරු කරගන්නවා. තවත් අය තමන්ගේ ඥාතීන් මාර්ගයෙන් අරගෙන තිබෙනවා. තවත් අය යම් පදනමක් හරහා අරගෙන තිබෙනවා. තවත් අය වාහන හරහා අරගෙන තිබෙනවා. සමහර අය හෝටල් හරහා අරගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් සමහර අය රුසියානු පෙම්වතියන් හරහා අරගෙන තිබෙනවා. ඒ වගේ එක එක විධියට අල්ලස් ලබාගෙන තිබෙනවා. මම ඒවා සියල්ලම ප්‍රතික්ෂේප කළා. මම රුසියානු පෙම්වතියන් හරහා අරගෙනත් නැහැ, මම ඒ පුද්ගලයාගෙන් කිසිම විධියකට මුදල් අරගෙන නැහැ කියලා දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කරනවා. මේක පොදු විපක්ෂයේ අය පටන් ගත්ත හොඳ point එකක්, හොඳ රැල්ලක්, හොඳ trend එකක්. ඒ අයත් දිවුරුම් ප්‍රකාශ ලබා දෙන්න ඕනෑ කියලා මම පෙරළා ඔවුන්ට අභියෝග කරනවා. මේක යෝජනා කරපු ගම්මන්පිල මහත්මයා බ්‍රයන් ෂෙඩික්ගෙන් මුදල් ගත්තේ නැහැ, රුපියල් කෝටි 7ක් හොරකම් කළේ නැහැ කියලා දිවුරුම් ප්‍රකාශයක් දෙනවා නම් මම ගරු කරනවා. ඒ වාගේම ක්‍රිෂ් ගනුදෙනුව සම්බන්ධ චංචාවෙන්,- අද නාමල් මහත්මයාගේ නඩුව කථා කරද්දී මම දැක්කා, නාමල් මහත්මයාගේ පෙම්වතියගේ දරුවාට ඩෙංගු හැදිලා - පෙම්වතියටත් නොවෙයි, පෙම්වතියගේ දරුවාට ඩෙංගු හැදිලා.- කියලා නඩුව මාස ගණනක් කල් ගිහිල්ලා තිබෙනවා.

ගරු ඒ. ඒ. විජේතුංග මහතා
(මාණ්පුමිකු ඒ.ඒ. විජේතුංග)
(The Hon. A. A. Wijethunga)
පෙම්වතියට දරුවෙක් ඉන්නවාද?

ගරු රන්ජන් රාමනායක මහතා
(මාණ්පුමිකු රන්ජන් රාමනායක්ක)
(The Hon. Ranjan Ramanayake)
දරුවෝ ඉන්න පෙම්වතියන් ඉන්න පුළුවන්නේ, නේද? පෙම්වතියට දරුවෙක් හම්බවෙලා නඩුව කල් ගියා. පසු ගිය දින ටිකේ අපි ඒ හොරු අල්ලාගෙන නීතිය ඉදිරියට ගියා. අනේ!

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

4දෙනෙක් ගෝඨාභය මහත්මයා දැක්කාම දුවනවා. දුවනවා කියලා පාර්ලිමේන්තුව ඇතුළේදී කියන්න පුළුවන්. නැත්නම් මට මේ

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

කථාවටත් නඩුවක් වැටෙනවා. මම මේ කරන්නේ ජනතාවගේ ප්‍රකාශ. මේවා මගේ ප්‍රකාශ නොවෙයි. ජනතාව වෙනුවෙන් කථා කරලා තමයි අද මට Supreme Court එකේ නඩුවක් වැටිලා තිබෙන්නේ. ඒ අය කියනවා, "රන්ජන් රාමනායක බැලූ බැල්මට උසාවියට අපහාසයක් කරලා තිබෙනවා." කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් නීතිඥයෙක්. බැලූ බැල්මටනේ ඒ විධියට පෙනිලා තිබෙන්නේ. හරියට බලන්නේ නැත්තේ ඇයි කියලා දන්නේ නැහැ නේද? ඒ කියන්නේ, බැලූ බැල්මට තමයි මාව වරදකරුවෙක් විධියට පෙනිලා තිබෙන්නේ. හරියට බැලුවා නම් හොඳ නැද්ද? හොඳට බැලුවා නම් තේරෙයි, රන්ජන් රාමනායක කියන දේවල් සියයට 100ක්ම ඇත්තයි කියලා.

ලංකාවේ අහිංසක, දුප්පත්, පීඩිත පන්තියේ මිනිහාව හිර කරන්න තමයි නීතිය සහ එම ආයතන තිබෙන්නේ. අඹ ගෙඩි 6ක් ගත් අහිංසක අම්මා කෙනෙක් රිමාන්ඩ් කරනවා. උසාවියේදී ඇනුමක් ඇරියොත් මාස 8ක් හිරේට දමනවා. පොල් ගෙඩි 6ක් හොරකම් කළාම, ඒකට ලොකු දඬුවමක් දෙනවා. කොස් ගෙඩියක් බාගත්තොත් ලොකු දඬුවමක් දෙනවා. නමුත්, මහා පරිමාණයේ ලෝක හොරු අහු වුණාම, පූර්වාපේක්ෂී ඇප -anticipatory bail- ලැබෙනවා. ඒ කියන්නේ . අත් අඩංගුවට ගැනීමට නොහැකි වන ලෙස තාප්පයක්, වාරණයක් දමා ගන්නවා. ඊටපසුව එහි සිටින විනිසුරුවරු එක එක්කෙනා ඉල්ලා අස් වෙනවා. නිකම්ම නොවෙයි අස් වෙන්නේ. ගෝඨාභය රාජපක්ෂ මහත්මයාව කිසිම හේතුවකින් අත් අඩංගුවට නොගන්නා ලෙස ලිඛිතව විධානයක් දෙමිනුයි අස් වෙන්නේ. ජනතාව අපට කියනවා, "හොරු අල්ලන්න" කියලා. මෙවැනි තත්ත්වයක් යටතේ කොහොමද හොරු අල්ලන්නේ? මේක ආණ්ඩුවේ වරදක්ද? මේ යහ පාලනය - Good Governance- තමන්ගේ ලේකම්ලාත් ඇල්ලුව ආණ්ඩුවක් කියලා මම කියනවා. කොටින්ම කිව්වොත්, තමන්ව ජනාධිපති ධුරයට පත් කළ අගමැතිතුමාව පවා මේ ජනාධිපතිතුමා කොමිසමට ගෙන්නුවා. අපේ හිටපු මුදල් ඇමතිවරයා වන රවි කරුණානායක මහත්මයා -පසුව විදේශ කටයුතු ඇමතිතුමා- තනතුර නැති වෙලා, අද සාමාන්‍ය මන්ත්‍රීවරයෙක් හැටියට පිටුපස ආසනයක සිටිනවා. තව බොහෝ අයට මෙවැනි දේවල් අහිමි වුණා. ලංකාවේ ජනතාවට "යහ පාලනය" - "Good Governance"- කියන එක ඔරොත්තු දෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඩෙස්මන්ඩ් මොරිස්ගේ "මනුසත් උයන" - "The Human Zoo"- සහ "නිරුවත් වානරයා" වැනි නවකතාවල කියනවා වාගේ, civilize වුණු ජනතාවක් නොවෙයි, අපට පාලනය කරන්න සිදු වෙලා තිබෙන්නේ. මේ uncivilized society එකක්. තවම නිවැරැදි විධියට පරිණාමය නොවුණු ජනතාවකුයි අපට පාලනය කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒ පරිණාමය නොවූ ජනතාව හොරුන්ට කැමැතියි. අපේ ජානවලමයි හොරකම තිබෙන්නේ. පන්සලකට ගියාම, පන්සලේ තිබෙන සෙරෙප්පු කුට්ටම පවා උස්සන ජනතාවක් ලංකාවේ ඉන්නේ. පන්සලට ගිහිල්ලා එන කොට, එතැන තිබෙන සෙරෙප්පු කුට්ටමකට වැඩේ දීලා. ඒ වාගේම උදේට පිං කැටේට සල්ලි දමනවා; රෑට බීලා ඇවිල්ලා පිං පෙට්ටිය කඩනවා. මෙවැනි ජනතාවක් තමයි මේ රජයට පාලනය කරන්න සිදු වෙලා තිබෙන්නේ.

මංකොල්ලකරුවන් පිරිසක් මංකොල්ලයක් කරන්න ඉස්සරවෙලා කතරගම ගිහිල්ලා, "කතරගම දෙවියනේ, මංකොල්ලය හොඳට කරගන්න අපට පිහිට වෙන්න" කියලා භාරයක් වුණු අවස්ථාවක් පසුගිය කාලයේ මම දැක්කා. කොහොමද වැඩේ? මංකොල්ලකාරයෝ කට්ටිය යනවා. දේවාලයට ගිහිල්ලා පූජාවක් පවත්වා භාරයක් වෙනවා, "අපි කරන්න යන මේ robbery එක hundred per cent successful වෙන්න" කියලා. Robbery එක කරලා ඉවර වෙලා නැවත කතරගම යනවා. ගිහිල්ලා, "කතරගම දෙවියනේ, ස්තුතියි. මංකොල්ලය ඉතාම හොඳට වුණා. අපි අහු වුණේ නැහැ. මෙන්න ඔබතුමාගේ ගතමන්ටි එක; මෙන්න ඔබතුමාගේ share එක" කියලා භාරයෙන් නිදහස් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුල සිටම හොරකම් කරන මෙවැනි ජනතාවක් තමයි අපට පාලනය කරන්න සිදු වෙලා තිබෙන්නේ.

මම පාසල් ගිය කාලයේ සිට සෑම දිනකම මා අතින් වුණු වැරදි පවා ස්වයං විවේචනය කළා. තමන්ගේ වත්තේ කොපමණ පොල් ගස් තිබුණත්, කුරුම්බා තිබුණත්, එහා ගෙදර වත්තේ කුරුම්බා කඩලා ඒ අයිතිකාරයා දුවගෙන එන කොට, ඒ පුද්ගලයාට කුණුහරුපයක් කියලා දුවන්න ඉස්කෝලේ ළමයින් කැමැතියි. ඒක මේ ගරු සභාවේ සිටින සැමදෙනාම පිළිගන්නා දෙයක්. ඒක නේ තත්ත්වය. ඒ නිසා මම හිතනවා, මේ ජනතාව එදා ඉඳලාම හොරකමට ජානගතව සිටින කණ්ඩායමක් කියලා. මම කියන මේ කාරණය නිසා ඡන්ද නැති වෙයි. නමුත්, ඇත්ත කථාව මේක තමයි. එහෙම නැත්නම්, ලංකාවේ හොරු මෙච්චර ඉහළ තැනට යන්නේ නැහැ.

බැසිල් රාජපක්ෂ මහත්මයා නොම්මර එකේ සොර දෙටුවෙක් කියලා මේ මුළු ලංකාවම දන්නවා; එතුමාත් දන්නවා; සියලුදෙනාම දන්නවා. එතුමාගේ මල්වානේ මාළිගාව ඉස්සරහින් ජනතාව ගිහිල්ලා අනික් පැත්තට ඡන්දය දමනවා. නිකම් හිතන්න, මේ ජනතාව කොහොමද වෙනස් කරන්නේ කියලා.

ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමනි, පසුගිය කාලයේ ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ සහ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ order එක හරහා කටයුතු කර වැලිවේරියේ තුන්දෙනෙකුට වෙඩි තබා මැරුවා. ඒ කියන්නේ, චතුර ඉල්ලපු අයට මේ අය වෙඩි තියලා මැරුවා. ඒ bulletsවලින් හැදුණු හිල් පල්ලිවල තවම තිබෙනවා. ඒ සිද්ධිය වැලිවේරියේ ජනතාව ඇස් දෙකට දැක්කා. ඒ අය ඒක හොඳටම දන්නවා. නමුත්, ඡන්ද ප්‍රතිඵල කොහොමද? වෙඩි තියපු එකා දිනුම්. වෙඩි තියපු එකාට චෝදනා කරපු අය පැරදුම්. ඉතින්, මේ ජනතාව කොහොමද හදන්නේ? අපේ රටේ ජනතාව තරම් ඉක්මනින් අතීතය අමතක වෙන ජනතාවක් ලෝකයේ කොහේවත් නැහැ කියා මම හිතනවා. "මොනවා හෝ වුණාම සුමාන දෙකයි ඒක මතකයේ තිබෙන්නේ" කියලා ප්‍රභාකරන් පවා කියලා තිබුණා. ඒක තමයි ඇත්ත තත්ත්වය. මෙපමණ හොරු අල්ලාගෙන එද්දීත් ජනතාව කටයුතු කරන ආකාරය බැලුවාම ඒක පෙනෙනවා.

අද FCID, CID, Bribery Commission එක බලන්න; අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ දැන් සිටින අධ්‍යක්ෂ ජනරාල්වරයා වැඩ කරන විධිය බලන්න. පසුගිය කාලයේ බාලපටබැඳි මහත්මයා එතුමා වාගේ චෝදනා ඉදිරිපත් කරන්න උත්සුක වුණාද, උනන්දු වුණාද? නැහැ නේ. බාලපටබැඳි මහත්මයා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සිටිද්දී රෝහිත අබේගුණවර්ධන මහත්මයාට case එකක් ආවා. ඒ මොකක්ද? අයුතු වත්කම් උපයාගැනීම ගැන ඒ මහත්මයාට statement එකක් දෙන්න බැරි වුණා කියලා. මට මතක විධියට ගණන භාරකෝටි හැටපන්ලක්ෂයක්. එතුමා දුන්න excuse එක මොකක්ද? නඩුවට එද්දී නයෙක් ගැහුවාලු. ඔන්න ඔහොමයි බේරුණේ. ඒ නිසා මම මේ කථාව අහගෙන ඉන්න ජනතාවගෙන් නැවත ඉල්ලීමක් කරනවා. වැරදි, අඩු පාඩු ඇති. ලෝකයේ කවදාවත් හොරු නැතිව යන්නේ නැහැ. අපට ඕනෑ හොරු අල්ලන ආණ්ඩුවක්. හොරු අදත් ඉන්නවා; හෙටත් ඉන්නවා; අනිද්දාත් ඉන්නවා; ඉන්අනිද්දාත් ඉන්නවා. කවදාවත් හොරකම නවතින්නේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු රිසාඩ් බදියුදීන් ඇමතිතුමා එන්නේ නැහැ කියලා එතුමාගේ වේලාවත් කියලා එවලා තිබුණා. එතුමා එන්නේ නැහැ කියලා තිබුණා. හොරු ගැන කථා කරද්දී ඔබතුමන්ලාත් විරුද්ධයි වාගේ. කාලය අඩුවෙන් දෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, එම කාලය ගරු රිසාඩ් බදියුදීන් ඇමතිතුමා විසින් නවක මන්ත්‍රී ගරු (ආචාර්ය) එස් එම්. මොහමඩ් ඉස්මයිල් මැතිතුමාට ලබා දී තිබෙනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු (ආචාර්ය) එස් එම්. මොහමඩ් ඉස්මයිල් මැතිතුමා මට කථා කරලා කිව්වා -

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
මම විනාඩි 2ක් දෙන්නම්.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමාගේ විනාඩි 20ක්-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට එතුමාගෙන් දෙන්නේ විනාඩි දෙකයි. එතුමාට තිබෙන්නේ විනාඩි 7යි.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
අනේ මැතිතුමා, ඔබතුමාගේ -

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මම මගේ වේලාවෙන් විනාඩි 5ක් දෙන්නම්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාගේ කාලයෙන් විනාඩි 5ක් දෙන්නලු. එතකොට මට තව විනාඩි 7ක් තිබෙනවා.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
බොහොම ස්තුතියි. මම ඔබ දෙපලටම ගරු කරනවා. හොරු අල්ලන්නට කරන සටනට ඔබතුමන්ලා ලබා දෙන ආශීර්වාදයට සහ encouragement එකට බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා දුන් දිවුරුම් ප්‍රකාශයෙන් රන්ජන් රාමනායක කෙළින්ම කියනවා, "මම සෘජුව හෝ වක්‍රාකාර මේ මුදල් ලබා ගත්තේ නැහැ" කියලා. හිටපු ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මහත්මයා "සුනාමි ආධාරවලින් මිලියන 82ක් තමන්ගේ සොහොයුරියගේ ගිණුමට දමා ගත්තේ නැහැ " කියලා දිවුරුම් ප්‍රකාශයක් මා වාගේම නිර්භීතව ලබා දෙයි කියලා මම බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම එතුමා චීන ව්‍යාපෘති හරහා මුදල් ලබා ගත්තේ නැහැ කියලා, එතුමාට තිබෙන තවත් චෝදනා හරහා සල්ලි ලබා ගත්තේ නැහැ කියලා එතුමාගෙන් දිවුරුම් ප්‍රකාශයක් බලාපොරොත්තු වෙනවා. මොකද, එතුමා වරක් ප්‍රකාශ කළා, "එතුමා ඩොලර් එකක් හරි හොරකම් කරලා තිබෙනවා කියලා ඔප්පු වුණොත් ප්‍රසිද්ධියේ බෙල්ල කපා ගන්නවා" කියලා. එතුමා එහෙම කියලා තිබුණා. නමුත් එතුමාගේ පුත්තු ටිකගෙන් මේ සේරම අහු වෙලා ඉවරයි. කොටින්ම කිව්වොත් යෝෂිත කියන පුත්‍ර රත්නය තමන්ට සහ තමන්ගේ ආච්චිට -ඩෙසි ආච්චිට- තිබෙන ඉඩම් 15 ගැන කියන්න අද අපොහොසත් වෙලා තිබෙනවා. ච්චී බේබි, ඒ කියන්නේ පොඩිම දරුවා, පොඩිම තරුණයා, චීනය හරහා රොකට්ටුවක් අභ්‍යාවකාශගත කරන්නට කීයක් ලබා ගත්තාද කියන එක පිළිබඳව තවම ලංකාවේ ජනතාවට උත්තර දීලා නැහැ. CSN එක හරහා ඩොලර් මිලියන 159ක් අපට අල්ලා ගන්නට පුළුවන් වුණා. එහෙම අල්ලා ගන්නට පුළුවන් වුණත් ඒ අය කිව්වා, "මේ බඩු තිබෙනවා, මේවා කාගේද කියලා දන්නේ නැහැ." කියලා. CSN එකේ Working Director කෙනෙක් නැහැ; අයිතිකරුවෙක් නැහැ. නමුත් සන්නාම තානාපති -Brand Ambassador- හැටියට යෝෂිත මහත්මයා අත්සන් කරලා තිබෙනවා. ඉතින්, ලංකාවේ බහුතර ජනතාව මේවා ගැන දැන දැන තව තවත් මේ හොරුන්ට ආවඩන එක, 'ජයවේවා!' කියමින් හොරුන් පස්සේ කැගහගෙන යන එක ගැන විශාල දුකක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දෙයම ඇන්ගෝලාවටත් වුණා. ඇන්ගෝලාව කියලා රටක් තිබෙනවා. ඒ රටේ ජනාධිපති වශයෙන් හිටියේ සැන්ටොස් කියලා කෙනෙක්. ඇන්ගෝලාවේත් ලංකාවේ වාගේම අවුරුදු 30ක යුද්ධයක් තිබුණා. මේ යුද්ධය අවසන් වෙලා ඇන්ගෝලාව නට්ටම් වෙලා සතයක්වත් නැතිව ඉද්දී, චීන ආයෝජකයෝ සල්ලි අරගෙන ඇන්ගෝලාවට ආවා, ලංකාවට ආවා වාගේම. චීන ආයෝජකයෝ සල්ලි අරගෙන එද්දී සැන්ටොස් මහත්මයා කිව්වා, " අවුරුදු 30ක් යුද්ධ කරලා අපි නට්ටම් වෙලා ඉන්නේ. අපේ අතේ සත පහක්වත් නැහැ. අපට මෙහෙම වියදම් කරන්න සල්ලි නැහැ" කියලා. මම චීනයට විරුද්ධම නැහැ. නමුත් මැරෙන්න ඉස්සෙල්ලා මම මේ කථාව කියන්නම ඕනෑ. මේක තමයි තිත්ත ඇත්ත. කවුරුත් කථා නොකරන චීන ආක්‍රමණය. චීන ආයෝජකයෝ ඇන්ගෝලාවේ ජනාධිපති සැන්ටොස් මහතාට කිව්වා, "අපි අධිවේගී මාර්ග - highways - ටික හදලා දෙන්නම්" කියලා. එතකොට සැන්ටොස් මහත්මයා කිව්වා, "අනේ එහෙම කළොත් අපි කොහොමද ගෙවන්නේ?" කියලා. එවිට චීන ආයෝජකයෝ කිව්වා, "අපි ඔයාට මේකෙන් කොමිස් දෙනවා." කියලා. වැඩේ okay වුණා. සැන්ටොස් මහත්මයාගේ පුත්තු ඇතුළු පවුලේ අය රජපක්ෂ පවුල වාගේම ඉතා පොහොසත් වුණා. මම අසත්‍යක් නොවෙයි කියන්නේ. මේ ගැන පසුගිය ටිකේ මාධ්‍ය හරහා ප්‍රචාරය වුණා. මැලේසියාවේ හිටපු ජනාධිපතිතුමා "සිරස" රූපවාහිනී නාළිකාවට ඇවිල්ලා live කිව්වා, චීනය එක උණ්ඩයක් පාවිච්චි කරන්නේ නැතුව රටවල් ආක්‍රමණය කරන්නේ කොහොමද කියලා. එක උණ්ඩයක් පාවිච්චි නොකර රටවල් ආක්‍රමණය කරන විධිය අද චීනය සේද මාවත දිගේ ලස්සනට කරගෙන යනවා. ඉන්දියන් සාගරයේ තිබෙන හොඳම තැන වන අපේ හම්බන්තොට වරාය සතු කර ගන්න චීනයට ලොකු වුවමනාවක් තිබුණා. මහින්ද මහත්තයා ඒකට අහු වුණා. මහින්ද මහත්මයා ගැන මගේ වෛරයක් නැහැ. මේ රටේ පැවැති යුද්ධය අවසන් කරන්නට

එතුමා විශාල දායකත්වයක් ලබා දුන්නා. එතුමාට වාගේම ආරක්ෂක ලේකම්තුමාට, අපේ ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහත්මයාට සහ දිවි පූජා කළ රණ විරුවන් 26,000ට අපේ ගෞරවය තිබෙනවා. නමුත්, ඊට වඩා ලොකුයි අපේ රට. සමාව දෙන්න බැරි වරද තමයි, චීනයට අපේ රට විකුණපු එක. පළමුවත් මව්බිම,දෙවනුවත් මව්බිම, තුන්වෙනුවත් මව්බිම කියලා පපුවට අතින් ගහ ගත්ත, පොළව ඉඹපු ඒ දේශ ප්‍රේමියා තරම් ලංකාව චීනයට වික්ක දේශ ප්‍රේමියෙක් නැහැ කියන එක මම පැහැදිලිව කියනවා. ෂැන්ග්‍රි-ලා හෝටලය හදන්න එම ඉඩම දුන්නේ කියටද? අනේ, අක්කර ගානක් සින්නක්කර දුන්නා. විදෙස් ආයෝජකයන්ට සින්නක්කරව ඉඩම් දීලා, ආරක්ෂක අමාත්‍යාංශයේ ගොඩනැඟිලි සංකීර්ණය අන්න පැලවත්තේ හදනවා. ඒකේ වැඩ තවම ඉවර නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කාලය අවසානයි.

ගරු රන්ජන් රාමනායක මහතා
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න තව පොඩි වෙලාවක් දෙන්න.

මෙවැනි තත්ත්වයන් නිසා මම නැවත නැවත ඉල්ලා සිටිනවා, විගණකාධිපතිතුමා වැනි නිර්භීත රජයේ නිලධාරීන් එම තනතුරුවලට පත් කරන්න කියලා. එවැනි නිලධාරීන් පත් වුණොත් රටේ දූෂණ අවම කර ගන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නම් කියන්න එපාය කියලාත් මට කියා තිබෙනවා. නමුත්, මම මේ අවස්ථාවේ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අපේ කොමසාරිස්තුමා ඇතුළු දප්පුල ද ලිවේරා, කෝදාගොඩ, ශානි අබේසේකර, රවී සෙනෙවිරත්න, රවී විද්‍යාලංකාර, ධම්මික ප්‍රියන්ත වැනි නිලධාරීන්ට ස්තුතිවන්ත වනවා. මේ සියලු දෙනා පරිණාමය නොවූ ජනතාවක් ඉන්න රටේ එල්ල වන සියලු දුක් ගැහැට විඳගෙන, සමව්වලයට ලක් වෙමින්, නින්දා අපහාස විඳ ගනිමින් investigations හරියට කරගෙන යනවා. මම මේ අවස්ථාවේ ගරු ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු මේ රජයෙන් ඉල්ලා සිටිනවා, එතුමන්ලා පසුගිය ටිකේ හැසිරුණා වාගේ මේ කිසිම පරීක්ෂණයකට - investigation එකකට - ඇඟිලි නොගහ ඉන්න කියලා. තමුන්ගේ ලේකම් වුණත් කමක් නැහැ, සල්ලි අරගෙන තිබෙනවා නම් ඒ අයව හිරේ දාන්න අද පෙලඹිලා ඉන්න එක ගැන මම සන්තෝෂ වනවා. ගාමිණී විජේසිංහ මහත්මයා කිව්වා වාගේ, ඇති වෙන්න දූෂණ සහ වංචා තිබෙද්දී මේක විතරක් අල්ලාගෙන දහලන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, COPE එකට භාර දෙන්න මම ලිපියක් ගෙනාවා. මම එම ලිපිය **සභාගත*** කරනවා.

COPE එකේ සාමාජිකයින් හැටියට පත් කරන්නන්ගේ පැටිකිරිය බලලා පත් කරන්න කියා මා කියන්න ඕනෑ. උසාවිය කියනවා වාගේ බැලූ බැල්මට, දූෂණ සම්බන්ධයෙන් චෝදනා තිබෙන අයව කරුණාකරලා COPE ඒකේ සාමාජිකයින් හැටියට වාඩි කරන්න එපා. මොකද, COPE එකට එන කණ්ඩායම් හිනා වෙනවා, "හොරු අල්ලන්න පත් කරලා තිබෙන්නේ ඊටත් වඩා හොරු කණ්ඩායමක්" කියලා. එම නිසා මම ගරු කථානායකතුමාගෙනුත්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගෙනුත්, ඒ වාගේම පක්ෂවල නායකයින්ගෙනුත් ඉල්ලා සිටිනවා, කවදාකවත් හොරුන්ව COPE එකේ සාමාජිකයෝ හැටියට පත් කර එවන්න එපා කියලා. කාලය ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5යි.

[අ.භා. 6.12]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ශ්‍රී ලංකා සිනමාවේ වාගේම අපේ පාර්ලිමේන්තුවෙත් අපට හීරෝ කෙනෙක් ඉන්නවා. ඒ තමයි, අපේ රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා. එතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්න අවස්ථාව ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිය පළ කරනවා. එතුමාගේ වැදගත් කථාවට මට වෙන් වූ කාලයෙනුත් විනාඩි දෙකක් ලබා දුන්නා. මම මේ අවස්ථාවේදී මතක් කරන්නට කැමැතියි, එතුමාගේ කථාවේ ගොඩාක් දුරට සඳහන් වුණේ මේ පාර්ලිමේන්තුවේ තිබෙන COPE එක හා COPA එක ගැනයි කියන කාරණයත්. මම හොඳටම දන්නවා අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව හැටියට ජනතා විමුක්ති පෙරමුණෙන් ඉදිරිපත් කළ මෙම යෝජනාවේ සඳහන් වන්නේ Committee on Public Accounts - COPA - එකේ වාර්තාව ගැනයි කියන කාරණය. ඒ ගැන අදහස් දක්වන විවාදයක් තමයි මේ සිදු කරන්නේ. මේ විවාදයේදී ගොඩාක් මන්ත්‍රීවරුන් COPE එක ගැනත් කථා කළා.

අපි පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට මේ පාර්ලිමේන්තුවේ ගොඩාක් කමිටුවලට සභාභාගි වෙනවා. Sectoral Oversight Committees තිබෙනවා, Standing Committees තිබෙනවා, Select Committees තිබෙනවා. නමුත් ඒ විවිධ කමිටුවලින් ගොඩාක් ප්‍රසිද්ධ වෙලා තිබෙන්නේ COPE එක සහ COPA එකයි. ඒකට හේතුව මොකක්ද? ගරු රන්ජන් රාමනායක මැතිතුමා කළ කථාවෙන්ම ඒ ගැන විමසා බලමුකෝ. එතුමා සිදු කළ කථාවේ අන්තර්ගතය තුළ ගොඩාක් වෙලාවට සඳහන් වුණේ postmortems ගැනයි. අපි කරන්නේ කළ වැරදි සොයාගෙන postmortems කරන එක විතරයි. ඒ ගැන තමයි අපි ගොඩාක් දුරට බලන්නේ. නමුත් එතැනින් ඉහළට ගිහිල්ලා COPA එක තවදුරටත් ශක්තිමත් කරන්න පුළුවන් කොහොමද කියන කාරණය ගැන COPA එකේ සභාපතිතුමා ලෙස කටයුතු කළ ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා කළ කථාවෙන් එතුමා නිවැරදිව පැහැදිලි කළා. මම ඒක අගය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලිපියක් සභාගත කරමින් මම මගේ වේලාව ඉතුරු කර ගන්නවා. අද දින "Daily News" පුවත්පතේ මගේ interview එකක් පළ කරලා තිබෙනවා. ඒකත් එක්කම අපේ ගරු කබීර් හෂීම් ඇමතිතුමාගේ ලිපියකුත් මේකට එකතු කරලා, එකම ලිපියක් හැටියට මෙහි වාර්තා කරලා තිබෙනවා. මම මේ අවස්ථාවේදී මේ ගැනත් සඳහන් කරමින් කියන්නේ අපේ වගකීම වෙලා තිබෙන්නේ මේ postmortems විතරක් කරමින්, වැරදි සොයා දඬුවම් දෙන එක විතරක් නොවෙයි

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා]

කියන එකයි. මේ රටට වග කියන, අපිට ඡන්දය දුන් ජනතාවට වග කියන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපි කොහොමද මෙවැනි වැරදි නැති කරන්නේ? අපි කොහොමද, සැලැස්මක් හදන්නේ? මම අද දින "Daily News" පුවත් පතේ සඳහන් කර තිබෙන වාර්තාවෙන් සුළු ප්‍රමාණයක් පමණක් උපුටා දක්වන්නම්.

" 'This is the issue that we have now: all the development proposals are political proposals',..... "

Then, it goes on to report further what I said, I quote:

" 'The government's needs become the State's needs, which means the party's needs, which means political needs',..... "

" 'That's how it gets deviated from the State to the party. So all the people's money goes to political purposes.' "

අපේ ගරු රන්ජන් රාමනායක මැතිතුමා එතුමාගේ කථාවේදී හොඳින්ම සඳහන් කළා වාගේ, එක එක රජය ඒ ගොල්ලන්ගේ කාලයේ ඉදිරිපත් කළ proposals ඒ ගොල්ලන්ගේ පක්ෂයේ, නැත්නම් පවුලේ, එහෙමත් නැත්නම් ඒ ගොල්ලන්ගේ ප්‍රදේශයේ දියුණුව සඳහා හදා ගත්තා මිසක්, State එකට, අපේ රටට හරි යන විධියට හදලා නැහැ. ඒ නිසා පාර්ලිමේන්තුවේ ස්වේච්ඡා කණ්ඩායමක් හැටියට ඇගයීම් පිළිබඳව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංසදයක් හදා ගන්න අපි යෝජනා කරලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(මාණ්පුමිකු මයිල්වාකනම් තිලකරාජා)
(The Hon. Mylvaganam Thilakarajah)

හොඳමයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ ගරු නියෝජ්‍ය කථානායකතුමා වන ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මැතිතුමාගේ නායකත්වයෙන්, ඇගයීම් පිළිබඳව ගෝලීය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංසදයේ සභාපතිතුමා වන අපේ ගරු කබීර් හෂීම් ඇමතිතුමාගේ නායකත්වයෙන් ඇගයීම් සම්බන්ධව ප්‍රතිපත්තියක් මේ රටට හඳුන්වා දීමට අපි ඉදිරිපත් වෙලා ඉන්නවා. ළඟදීම මේ පාර්ලිමේන්තුවට එම යෝජනාව ගෙනෙනවා. ඒ ගැන තමයි මෙම ලිපියේ සඳහන් වෙලා තිබෙන්නේ. අපි global conference එකක් ලබන සැප්තැම්බර් මාසය තුළදී ලංකාවේ පවත්වන්නටත් සූදානම්. "මන්ත්‍රීවරුන්ගෙන් වන වැරදි අඩු කරන්න ඕනෑ, මේ වාගේ දේවල් සිද්ධ නොවෙන්න ඕනෑ" කියන බලාපොරොත්තුව තිබෙන අපේ ගරු රන්ජන් රාමනායක වැනි මැතිතුමන්ලා ඇතුළු සියලුම මන්ත්‍රීවරුන්ගෙන් මේ අවස්ථාවේදී මම ඉල්ලීමක් කරනවා, ඇගයීම් සම්බන්ධව අපි ගෙනෙන්න බලාපොරොත්තු වෙන එම ප්‍රතිපත්තියට සහයෝගය දෙන්න කියලා. විය යුත්තේ ඇස්තමේන්තුවේ සිට ඇගයීමට -estimation to evaluation - මතිප්පීට්ටිලිරුන්දු මතිප්පාය්විර්කුච් චෙන්රු එංකළතු වේලෛත් තිට්ටංකළෛ මුන්නෙටුක්ක වේණ්ඩුම්. මම 2018.06.19වන දින "Daily News" පුවත් පතේ සඳහන් වාර්තාව **සභාගත*** කරනවා. බොහොම ස්තුතියි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[பி.ப. 6.17]

ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා
(மாண்புமிகு (கலாநிதி) சீ.மு. முகம்மட் இஸ்மாயில்)
(The Hon. (Dr.) S. M.Mohamed Ismail)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

அமர்வுக்குத் தலைமைதாங்கிக் கொண்டிருக்கும் கௌரவ பாராளுமன்ற உறுப்பினர் அவர்களே, அரசாங்கக் கணக்குகள் பற்றிய பாராளுமன்றக் குழுவின் அறிக்கைகள் தொடர்பான இந்த விவாத நேரத்தில் எனது கன்னி உரையை ஆற்றுவ தற்கும், நான் சத்தியப் பிரமாணம் செய்த நாளில் என்மீது இங்கு முன்வைக்கப்பட்ட சில குற்றச்சாட்டுக்களுக்கு எனது பதில்களை வழங்குமுகமாகவும் எனக்கு நேரம் ஒதுக்கித் தந்தமைக்கு கௌரவ சபாநாயகர் அவர்களுக்கு முதலில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

என்னுடைய அரசியல் பிரவேசத்தின் ஊடாக, தேசியப் பட்டியலின்மூலம் இந்தப் பாராளுமன்றக் கதிரையை அலங்கரிப்பதற்காக வேண்டி, என்னுடைய கட்சியின் தலைவர் கௌரவ றிஸாட் பதியுதீன் அவர்களின் பரிந்துரையில், அதேபோன்று ஐக்கிய தேசியக் கட்சியின் தலைவர் கௌரவ பிரதம மந்திரி அவர்களின் சிபாரிசின்பேரில் இந்தப் பாராளுமன்ற அங்கத்துவம் எனக்குக் கிடைக்கப் பெற்றுள்ளது. அதற்காக அவர்களுக்கும் அதேபோன்று எனக்காக வாக்களித்த அம்பாறை மாவட்ட மக்களுக்கும் என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இன்று எமது நாட்டில் யுத்தம் முடிவடைந்து, அபிவிருத்தியை நோக்கிப் பல்வேறுபட்ட திட்டங்கள் முன்னெடுக்கப்பட்டு வருகின்ற இவ்வேளையில், பொருளா தாரம், அதேபோன்று உரிமைகள் சார்ந்த பல்வேறு வகைப்பட்ட பிரச்சினைகளுக்கு மக்கள் முகங்கொடுக்க வேண்டியிருப்பது என்னைப் பொறுத்தவரையில் வேதனை யளிக்கின்றது. 1960களில் ஆசியாவில் அதியுச்ச இடத்தி லிருந்த ஒரு நாடாக இலங்கையைப் பார்த்தார்கள். ஆனால், இன்று இந்த நாடு பொருளாதார ரீதியாக மிகவும் பின்தங்கியதன் காரணமாகவும் அதேபோன்று, இனங்களுக் கிடையேயான விரிசல்களின் காரணமாகவும் இந்த நாட்டின் அபிவிருத்தியும் எதிர்காலமும் கேள்விக்குறியாக இருந்து கொண்டிருக்கின்றது. ஆகவே, இன்று நாங்கள் எங்களிடையே இருக்கின்ற சில வேற்றுமைகளைக் களைந்து, இந்த நாட்டின் வளர்ச்சிக்காக வேண்டியும் இந்த நாட்டின் எதிர்காலச் சந்ததியினருக்காக வேண்டியும் பல்வேறுபட்ட முன்னெடுப் புக்களைச் செய்யவேண்டிய ஒரு காலகட்டத்தில் வாழ்ந்து கொண்டிருக்கின்றோம். ஆகவே, இந்த நாட்டில் இருக்கின்ற பிரச்சினைகளுக்குச் சரியான தீர்வுகளைக் கண்டு, இந்த நாட்டைப் பொருளாதார ரீதியாகப் பலமிக்க ஒரு நாடாக மாற்றுவதற்கு இந்த நாட்டு மக்கள் அனைவரும் ஒரு தாய் மக்கள் போன்று வாழவேண்டிய ஒரு சூழ்நிலை ஏற்படுத்தப்பட வேண்டும். அதற்காகப் பங்களிப்புச் செய்வதற்கும் இந்தச் சபையின்மூலம் குரல்கொடுப்பதற்கும் வாய்ப்புத் தந்தமைக்கு மீண்டுமொரு முறை சம்பந்தப்பட்டவர்களுக்கு எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

அரசியல் உரிமை பற்றியும் ஏனைய உரிமைகள் பற்றியும் பேசப்படுகின்ற இந்தக் காலகட்டத்தில், உரிமைகள் பகிர்ந் தளிக்கப்படவேண்டும், அதேபோன்று மக்கள் அனைவரும் ஒற்றுமையோடு வாழ்கின்ற சூழ்நிலை ஏற்படுத்தப்பட வேண்டும் என்ற எதிர்பார்ப்பு மக்களிடம் இருந்துகொண்டிருக் கின்றது. அந்த அடிப்படையில் அவர்களுடைய எதிர்பார்ப்பை

நாங்கள் இந்த உயர் சபையினூடாக முடியுமான வரை நிறைவேற்றுவோமேயானால், அது இன்று இந்த நாட்டிலுள்ள மக்களுக்கு மாத்திரமல்லாமல், இந்த நாட்டை வளப் படுத்தக்கூடிய எதிர்காலச் சந்ததியினருக்கும் ஒரு வாய்ப்பாக அமையும் என்ற ஒரு நம்பிக்கை எனக்கிருக்கின்றது. எனவே, இந்தப் பாராளுமன்றத்தில் பல்வேறுபட்ட பேதங்களைப் பற்றி பேசிக்கொண்டு காலத்தை வீணடிக்காமல், எவ்வாறு இந்த நாட்டை எதிர்காலத்தில் அபிவிருத்தியடையச் செய்யலாம் என்று சிந்தித்துச் செயற்பட வேண்டிய கடமைப்பாடு இச் சபையிலுள்ள அனைவருக்கும் இருக்கின்றது.

எமது நாட்டிலுள்ள 80 வீதத்துக்கும் அதிகமான சனத் தொகையினர், இந்த நாட்டின் முதுகெலும்பான விவசாயத் துறையிலும் மீன்பிடித் துறையிலும் பங்களிப்புச் செய்து கொண்டிருக்கிறார்கள். ஆனால், இந்த நாட்டில் அவர்களு டைய வாழ்வை வளப்படுத்தக்கூடிய சரியானதொரு திட்டம் இல்லாத நிலைமையை நாங்கள் காண்கின்றோம். அன்று பொருளாதார ரீதியாக எங்களைவிட மிகவும் பின்தங்கிய நிலையில் இருந்த எமது அயல் நாடுகள், குறிப்பாக ஆசியாவிலுள்ள பங்களாதேஷ், நேபாளம், பூட்டான், ஆப்கானிஸ்தான், பாகிஸ்தான், இந்தியா போன்ற 'சார்க்' நாடுகளும் அதேபோன்று தூரகிழக்கு நாடுகளான வியட்நாம், லாவோஸ், தாய்லாந்து போன்ற நாடுகளும் இன்று பொருளாதார ரீதியாக விருத்தியடைந்து வருகின்றன. ஆகவே, நாங்களும் இந்த நாடுகளைப்போன்று எங்களுக்குள் இருக்கின்ற பேதங்களை மறந்து, எங்களுடைய எதிர்கால வேலைத் திட்டங்களைச் சரியான முறையில் வகுத்து, எமது நாட்டின் பொருளாதார முன்னேற்றத்தில் கவனம் செலுத்தி னால், எமது நாடும் சுபிட்சமுள்ள ஒரு நாடாக மாறும்.

இன்று அநேகமான நாடுகளில் அரசாங்கம் சில கைத்தொழில்களுக்கு முன்னுரிமை கொடுத்து, "கிராமத்துக்கு ஒரு கைத்தொழில் அல்லது கிராமத்துக்கு ஒரு வேலைத்திட்டம்" என்ற அடிப்படையில் முடியுமான அளவு பங்களிப்புச் செய்து, மக்களது பொருளாதாரத்தை வளப்படுத்தி வருகின்றது. தாய்லாந்தைப் பொறுத்தவரையில், அங்கு அரசாங்கம் ஒரு கிராமத்துக்கு அல்லது ஒரு பிரதேசத்துக்கு ஒரு பொருளாதார வேலைத்திட்டம் அல்லது ஒரு கைத்தொழில் திட்டம் என்ற அடிப்படையில், அங்கிருக்கின்ற மக்கள் அனைவருக்கும் முடியுமான உதவிகளைச் செய்து வருகின்றது. அதேநேரம் அங்கு என்னென்ன விடயங்களில் பிரச்சினைகள் இருக் கின்றதோ - கம்பனிகளைப் பதிவுசெய்வதாக இருந்தாலும் சரி அல்லது ஏனைய தொழில் துறைகளை ஒருங்கிணைப்பதாக இருந்தாலும் சரி - அவை அனைத்தையும் அரச பொறிமுறை யினூடாக இலகுபடுத்திக் கொடுத்து, உள்நாட்டு முதலீட்டாளர் களை மாத்திரமல்லாமல், வெளிநாட்டு முதலீட்டாளர்களையும் அங்கு வரவழைத்து, நாட்டினை அபிவிருத்தி செய்துகொண்டு போவதை எங்களால் பார்க்கக்கூடியதாக இருக்கின்றது. நாங்களும் அந்த அடிப்படையில் எங்களுடைய பொருளா தாரத்தை வளர்ச்சியடையச் செய்ய வேண்டும்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் ஒரு நிமிடம் இருக்கிறது.

ගරු (ආචාර්ය) එස්. එම්. මොහමඩ් ඉස්මායිල් මහතා
(மாண்புமிகு (கலாநிதி) சீ.மு. முகம்மட் இஸ்மாயில்)
(The Hon. (Dr.) S. M.Mohamed Ismail)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்னு மொரு விடயத்தையும் இவ்விடத்தில் நான் குறிப்பிடவேண்டும். அதாவது, நான் பாராளுமன்ற உறுப்பினராகச் உறுதிப் பிரமாணம் செய்த நாளன்று உரையாற்றிய உயர் கல்வி அமைச்சர் கௌரவ விஜயதாச ராஜபக்ஷ அவர்கள், நான் பல்கலைக்கழகத்தில் உபவேந்தராக இருந்த காலத்தில் எனது வீட்டின் தண்ணீர்க் கட்டணம், மற்றும் மின்சாரக் கட்டணம் செலுத்தப்பட்ட விடயம் சம்பந்தமாகக் குறிப்பிட்டிருந்தார். அரசாங்கத்தினால் உபவேந்தருக்குப் பல்வேறுபட்ட சலுகைகள் சட்டரீதியாக வழங்கப்பட்டு வருகின்றன. அதுமாத்திரமல்லாமல், பல்கலைக்கழக மூதவையினூடாகவும் சலுகைகள் வழங்கப்படுகின்றன. ஆகவே, பல்கலைக்கழகத்தி லிருக்கின்ற எல்லா மட்டத்தினரின் அனுமதியோடுதான் எனக்குக் குறித்த சலுகைகள் வழங்கப்பட்டன. அதற்கான ஆவணங்கள் என்னிடம் இருக்கின்றன. தேவையேற்படின் அவற்றை கௌரவ சபாநாயகர் அவர்களிடம் சமர்ப்பிப் பதற்கும் நான் தயாராக இருக்கின்றேன்.

அதேநேரம் நான் கடமைபுரிந்த தென்கிழக்குப் பல்கலைக் கழகத்தில் பாலியல் இலஞ்சம் பெறப்படுவதாகவும் கூறப் பட்டிருக்கின்றது. இதனால் இன்று அங்கிருக்கின்ற பெண்கள், ஆண்கள் அனைவரும் பல்வேறுபட்ட மன உளைச்சலுக்கு உட்பட்டிருக்கின்றார்கள். பல்கலைக்கழகம் என்பது ஒரு நாட்டின் சொத்து; அது கல்வியின் முதுசமாகப் பார்க்கப் படுகின்றது. எது என்னவாக இருந்தாலும், இவ்வாறான ஒரு சபையில், அது பற்றிய உண்மையை நிரூபித்ததன் பின்னர் அது சம்பந்தமாகப் பேசுவதுதான் சிறப்பானதாக இருக்கும் என்பது என்னுடைய தாழ்மையான வேண்டுகோள் என்பதைத் தெரிவித்து, எனக்குப் பேச வாய்ப்பளித்தமைக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා.

[අ.භා.6.27]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අටවන පාර්ලිමේන්තුවේ පළමුවන සැසි වාරය තුළ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද සියලුම වාර්තාවලින් සමන්විත වුණු රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කළ අවස්ථාවක, ඒ සම්බන්ධයෙන් වන කල් තැබීමේ විවාදයට සියලුදෙනාම සහභාගි වුණු වෙලාවක, මටත් ඒ පිළිබඳව වවන ස්වල්පයක් මේ ගරු සභාව හමුවේ ඉදිරිපත් කරන්න ලැබීම ගැන මා සතුටු වනවා. ඒ එක්කම ඉතාමත් පළපුරුදු, දක්ෂ අමාත්‍යවරයකු වන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති හැටියට කටයුතු කළ ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා ඇතුළු එහි සාමාජික මන්ත්‍රීවරුන් සියලුදෙනාටම මගේ ස්තුතිය පුද කරන්නට ඕනෑ.

අපි දන්නවා, විශේෂයෙන්ම රාජ්‍යයක් හැටියට මූල්‍ය විනිවිදභාවය පිළිබඳව ඉතා පැහැදිලි චිත්‍රයක් අපට ලබා ගන්නට පුළුවන් වන්නේ, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තුළින් කියලා. මොකද, මේ රටේ විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා, මණ්ඩල, ඒ වාගේම හැම ආයතනයක්ම විවිධාකාරයෙන් මුදල් වැය කිරීම් පිළිබඳව, ප්‍රධාන ගණන් දීමේ නිලධාරි හැටියට විගණකාධිපතිවරයාට වාර්ෂිකව ගිණුම් ලබා දීමට එම ආයතන බැඳී සිටිනවා. නමුත් මා පළාත් සභාවේ රාජ්‍ය

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

ගිණුම් කාරක සභාවේ සභාපති හැටියට කටයුතු කළ කාලයේදී මා දැක්කා, මා කලින් සඳහන් කළ ආයතනවල රාජ්‍ය සේවාව තුළින් අපි බලාපොරොත්තු වන විනිවිදභාවය බොහෝ විට දකින්න පුළුවන්කමක් නැහැයි කියලා. බොහෝ අවස්ථාවලදී ඒ සියල්ල අපෙන් ගිලිහී ගිහින් තිබෙනවා. ඒ නිසා ඕනෑම කෙනකුට, අමාත්‍යවරයකුට, ලේකම්වරයකුට, ඒ වාගේම විවිධ රාජ්‍ය ආයතනවල නිලධාරීන්ට මුදල් පරිපාලනය පිළිබඳව, එහෙම නැත්නම් මුදල් පිළිබඳව විනිවිදභාවය දකින්නට පුළුවන්කමක් ලැබුණේ නැහැ. ඒ නිසා රාජ්‍ය ආයතන, කලින් කථා කළ මා මිත්‍ර ගරු රන්ජන් රාමනායක -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)
හැරෙන්නවත් බැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඒක තමයි. ඔබතුමාට යම් අසාධාරණයක් වුණා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)
ඒක ඉතා අසාධාරණයක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
රන්ජන් රාමනායක නියෝජ්‍ය අමාත්‍යතුමා තමයි වග කියන්න ඕනෑ.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා දන්නවා, මට හැම දාම අන්තිම කථාවයි දෙන්නේ කියලා. හැබැයි ඒ කථාව කරනකොට මට ලබා දී තිබෙන විනාඩි ගණනත් නැති වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
අනිවාර්යයෙන්ම.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)
මට තව විනාඩියක කාලයක් දෙන්න. අවසර ගන්නකොටම කාලය අවසන් වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
තව විනාඩියක් කථා කරන්න පුළුවන්.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු ලසන්ත අලගියවන්න මැතිතුමනි, මට මුලින්ම කැමැත්තක් තිබුණා, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට එන්න. නමුත් පළාත් සභාවේ රාජ්‍ය ගිණුම් කරක සභාවේ සභාපතිවරයා වශයෙන් මා අවුරුදු 5ක් කටයුතු කර තිබුණත් මට ඒ අවස්ථාව ලැබුණේ නැහැ. නමුත් ඒ අවස්ථාවන් තුළින් මේ රටේ යම් වෙනසක් ඇති කරන්න පුළුවන් දෙයක් අපි දැක්කා. ඕනෑම ආයතනයක විගණන වාර්තාව බැලුවාට පස්සේ, ඒ ආයතනයේ සේවාව පිළිබඳව චිත්‍රයක් මවා ගන්නට පුළුවන්. ආයතන ප්‍රධානියකු වැඩ භාර ගන්නකොට ඔහුගේ මේසයට ඉස්සෙල්ලාම එන්න ඕනෑ, විගණන වාර්තාවයි. අද මේ රටේ එවැනි තත්ත්වයක් දකින්නට නැහැ. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තුළින් යම් යම් නිර්දේශයන් කරනවා නම්, ඒවා පිළිබඳව අමාත්‍යවරුන් වාගේම ඒ ආයතන ක්‍රියාත්මක වෙන්නට ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(මාණ්පුමිකු විජේපාල හෙට්ටිආරච්චි)
(The Hon. Wijepala Hettiarachchi)
හිටපු ජනාධිපති ලේකම් ලලිත් වීරතුංග මැතිතුමාගේ නඩු තීන්දුව පිළිබඳව අපේ විගණකාධිපති ගාමිණී විජේසිංහ මහතා කියා තිබුණු ප්‍රකාශයක් අද පුවත් පත්වල තිබෙනවා මා දැක්කා. මේ කරපු දේවල්වලට ලැබුණු දඩුවම එක්ක බැලුවොත්, මේ රටේ රාජ්‍ය සේවයේ සියයට 50ක් හිරේ දමන්න ඕනෑය කියලා ඔහු ප්‍රකාශ කර තිබුණා. විගණකාධිපතිතුමාගේ පිළිතුර තුළින්ම පෙනෙනවා, රටේ තත්ත්වය මොකක්ද කියලා. මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

එකල්හි වේලාව අ. භා. 6.30 වූයෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2018 ජූනි මස 20 වන බදාදා දා, භා. 1.00 වන තෙක් කල් ගියේ ය.

අප්පොழුතු, பி.ப. 6.30 மணியாகிவிடவே மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளு மன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி பாராளுமன்றம், 2018 யூன் 20, புதன்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

It being 6.30 p.m., MR. PRESIDING MEMBER *adjourned Parliament without Question put.*

Parliament adjourned accordingly until 1.00 p.m. on Wednesday, 20th June, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

261 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 261 - இல. 5
Volume 261 - No. 5

2018 ජූනි 20 වන බදාදා
2018 யூன் 20, புதன்கிழமை
Wednesday, 20th June, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන :

සම්බන්ධීකරණ කාරක සභාව: සාමාජිකයන් පත් කිරීම

ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම

ගෘහ්‍ය කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම

නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව : සාමාජිකයකු පත් කිරීම

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත:
පළමුවන වර කියවන ලදී

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත :
දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

කල් තැබීමේ යෝජනාව:
මඩකලපුව දිස්ත්‍රික්කයේ රජයේ ගොඩනැගිලිවලින් ආරක්ෂක හමුදා ඉවත් කිරීම

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:

இணைப்புக் குழு: உறுப்பினர்கள் நியமனம்

ஒழுக்கவியல் மற்றும் சிறப்புரிமைகள் பற்றிய குழு: உறுப்பினர்கள் நியமனம்

சபைக் குழு :உறுப்பினர் நியமனம்

சட்ட விவகாரம் (ஊழலுக்கெதிரான) மற்றும் ஊடகத் துறை பற்றிய துறைசார் மேற்பார்வைக் குழு : உறுப்பினர்கள் நியமனம்

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கைகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

இருப்பிடக்கூறு சொத்தாண்மை (விசேட ஏற்பாடுகள்) சட்டமூலம்:
முதன்முறை மதிப்பிடப்பட்டது

அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்

ஜெனரால் சேர் ஜோன் கொத்தலாவலை பாதுகாப்புப் பல்கலைக்கழகம் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம்:
இரண்டாம் ,மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை:
மட்டக்களப்பு மாவட்டத்தில் அரச கட்டிடங்களிலிருந்து படையினரை வெளியேற்றல்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Liaison Committee: Appointment of Members

Committee on Ethics and Privileges: Nomination of Members

House Committee: Nomination of Members

Sectoral Oversight Committee on Legal Affairs (Anti-Corruption) and Media: Nomination of a Member

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

PUBLIC FINANCE COMMITTEE REPORT

ORAL ANSWERS TO QUESTIONS

APARTMENT OWNERSHIP (SPECIAL PROVISIONS) BILL:
Read the First time

MINISTERIAL CONSULTATIVE COMMITTEES

GENERAL SIR JOHN KOTELAWALA DEFENCE UNIVERSITY (SPECIAL PROVISIONS) BILL:
Read a Second and the Third Time, and passed as amended

ADJOURNMENT MOTION:
Withdrawal of Security Forces from Government Buildings in Batticaloa District

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 ජූනි 20 වන බදාදා
2018 யூன் 20, புதன்கிழமை
Wednesday, 20th June, 2018

අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස්වීය.
නියෝජ්‍ය කථානායකතුමා
[ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.
MR. DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

සම්බන්ධීකරණ කාරක සභාව : සාමාජිකයන් පත් කිරීම
இணைப்புக் குழு: உறுப்பினர்கள் நியமனம்
LIAISON COMMITTEE : APPOINTMENT OF MEMBERS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පාර්ලිමේන්තුවේ 125 වැනි ස්ථාවර නියෝගයෙහි විධිවිධාන ප්‍රකාරව සම්බන්ධීකරණ කාරක සභාව : -

කථානායකවරයාගේ සභාපතිත්වය ඇතිව;
නියෝජ්‍ය කථානායකවරයා;
නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා;
පාර්ලිමේන්තුවේ සභානායකවරයා;
පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා;
ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා;
විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා; සහ

ආචාර ධර්ම හා වරප්‍රසාද පිළිබඳ කාරක සභාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව, ව්‍යවස්ථාදායක ස්ථාවර කාරක සභාව, ආංශික අධීක්ෂණ කාරක සභා, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාව, උසස් නිලතල පිළිබඳ කාරක සභාව සහ පසුපෙළ මන්ත්‍රීවරයන්ගේ කාරක සභාව යන කාරක සභාවල සභාපතිවරයන්ගෙන් සමන්විතව ගරු කථානායකතුමා විසින් පත්කරනු ලැබේ.

II

ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව : සාමාජිකයන් නම් කිරීම
ஒழுக்கவியல் மற்றும் சிறப்புரிமைகள் பற்றிய குழு: உறுப்பினர்கள் நியமனம்
COMMITTEE ON ETHICS AND PRIVILEGES : NOMINATION OF MEMBERS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පාර්ලිමේන්තුවේ 118 වැනි ස්ථාවර නියෝගයෙහි විධිවිධානවල සහ 2018 මැයි 22 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාව ප්‍රකාරව, 2018 ජූනි 19 වැනි දින තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් මන්ත්‍රීවරයන් ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේ කටයුතු කිරීම සඳහා නම් කරන ලදී.

ගරු නිලක් මාරපන මහතා
ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා
ගරු ගයන්ත කරුණාතිලක මහතා
ගරු මනෝ ගනේසන් මහතා
ගරු ෆයිසර් මුස්තාපා මහතා
ගරු ඒ.ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා
ගරු ඩග්ලස් දේවානන්දා මහතා
ගරු අනුර දිසානායක මහතා
ගරු ඊ. සරවනපවන් මහතා
ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය

III

ගෘහ්‍ය කාරක සභාව : සාමාජිකයන් නම් කිරීම
சபைக் குழு : உறுப்பினர்கள் நியமனம்
HOUSE COMMITTEE : NOMINATION OF MEMBERS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පාර්ලිමේන්තුවේ 117 වැනි ස්ථාවර නියෝගයෙහි විධිවිධානවල සහ 2018 මැයි 22 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරගත් යෝජනාව ප්‍රකාරව, කථානායකවරයාගේ සභාපතිත්වය ඇතිව 2018 ජූනි 19 වැනි දින තේරීම් කාරක සභාව විසින් මතු සඳහන් මන්ත්‍රීවරයන් ගෘහ්‍ය කාරක සභාවේ කටයුතු කිරීම සඳහා නම් කරන ලදී.

ගරු මහින්ද අමරවීර මහතා
ගරු පලනි දිගම්බරම් මහතා
ගරු ඩග්ලස් දේවානන්දා මහතා
ගරු නිහාල් ගලප්පත්ති මහතා
ගරු රංජිත් අලුවිහාරේ මහතා
ගරු කේ.කේ. පියදාස මහතා
ගරු සීනිතම්බි යෝගේස්වරන් මහතා
ගරු ඊ. සරවනපවන් මහතා
ගරු කංචන විජේසේකර මහතා

IV

නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව : සාමාජිකයෙකු පත් කිරීම

சட்ட விவகாரம் (ஊழலுக்கெதிரான) மற்றும் ஊடகத்துறை பற்றிய துறைசார் மேற்பார்வைக் குழு: உறுப்பினர் நியமனம்

SECTORAL OVERSIGHT COMMITTEE ON LEGAL AFFAIRS (ANTI-CORRUPTION) AND MEDIA: NOMINATION OF A MEMBER

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පාර්ලිමේන්තුවේ 111 වැනි ස්ථාවර නියෝගයෙහි (22) (අ) ඡේදයෙහි විධිවිධාන අනුව සහ 2018 ජූනි 19 වැනි දින තේරීම් කාරක සභාව විසින් නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සේවය පිණිස ගරු කරුණාරත්න පරණවිතාන මහතා පත් කර ඇති බව දන්වනු කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව හා වාර්ෂික ගිණුම්; සහ

(ii) 2017 වර්ෂය සඳහා මැතිවරණ කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව.

එම වාර්තා අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන හා ගිණුම් වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 වර්ෂය සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥාපනතේ 9, 12, 19, 21, 25, 27, 49, 59, 62, 64, 67, 68, 72, 95, 96 සහ 97 වගන්ති යටතේ තැපැල් ගාස්තු සම්බන්ධයෙන් මුද්‍රල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයාගේ එකඟතාව ඇතිව තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලද්දව, 2018 ජූනි 07 දිනැති අංක 2074/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද ව්‍යවස්ථාව ඉදිරිපත් කරමි.

එම ව්‍යවස්ථාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම, අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, "ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත" සහ "1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වගන්තිය සහ 24අ(1) වගන්තිය යටතේ නියමයන්" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Deputy Speaker, I present the Report of the Committee on Public Finance on, "Excise Notification under Excise Ordinance" and "Order under Ports and Airports Development Levy Act" which were referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අජිත් පී. පෙරේරා මහතා - [සභා ගර්භය තුළ නැත.]
ගරු ජේ.සී. අලවතුවල මහතා - [සභා ගර්භය තුළ නැත.]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, பின்வரும் மனுக்களை நான் சமர்ப்பிக்கின்றேன்:

(1) சாவகச்சேரி, கல்வயல், ஸ்ரீ சண்முகநாத பாடசாலை எனும் முகவரியில் வதியும் திரு. கே. இராஜேந்திரம் அவர்களிடமிருந்து கிடைத்த மனு;

(2) இல. 75, அம்மன் வீதி, யாழ்ப்பாணம் எனும் முகவரியில் வதியும் கலாநிதி திரு. ஸ்ரீரங்க நாதன் தர்ஷனன் அவர்களிடமிருந்து கிடைத்த மனு.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොන්නැකුලම, "චන්දි" යන ලිපිනයෙහි පදිංචි එච්.එම්. සෝමාවතී බණ්ඩාර මැණිකේ මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු එස්.සී. මුතුකුමාරණ මහතා - [සභා ගර්භය තුළ නැත.]

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පදියතලාව, වැලිකුඹුර, නව ගම්මානය, අංක 262/ඩී දරන ස්ථානයෙහි පදිංචි කේ.එච්.එම්. අබේරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் மான்னப்பெரும - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Ajith Mannapperuma - Deputy Minister of Environment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වේයන්ගොඩ, බණ්ඩාරනායක පාර, අංක 536/2 දරන ස්ථානයෙහි පදිංචි එම්.පී. ලලිත් පද්මසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පහත සඳහන් පෙත්සම් නවය මම පිළිගන්වමි.

(1) කිබිස්ස, ලේනව, "මිහිර" යන ලිපිනයෙහි පදිංචි එච්.එම්.යූ.බී. ලේනව මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) කුලියාපිටිය, මූණමල්දෙනිය, කරඔවත්ත යන ලිපිනයෙහි පදිංචි එච්.එම්. තිලකරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(3) අහුනකොළපැලැස්ස, මුලනගොඩ පාර, තලාවේ ගෙදර, අංක 43 දරන ස්ථානයෙහි පදිංචි අයි.කේ. මිල්ටන් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(4) මාදම්පේ, දන්සැලවත්ත, කුරුණෑගල පාර, "ශ්‍රී කෙත" යන ලිපිනයෙහි පදිංචි කේ.එච්.ද එස්. විජයරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම;

(5) මහනුවර, මූලස්ථාන පොලීසියේ ප්‍රධාන පොලිස් පරීක්ෂක එල්.ඒ. සිරිවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම;

(6) මහරගම, මහමේසාරාම පාර, අංක 58 දරන ස්ථානයෙහි පදිංචි එම්.කේ.ඩී. දේශප්‍රිය මහතාගෙන් ලැබුණු පෙත්සම;

(7) දර්ගා නගරය, ජෙයිලානි පාර, අංක 48/1 දරන ස්ථානයෙහි පදිංචි එම්.එම්.තාසිම් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(8) වලස්මුල්ල, බෝවල, ගොඩැල්ලවත්ත, අංක 211/1 දරන ස්ථානයෙහි පදිංචි සීතා සිරිවර්ධන මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(9) නාඋල, කණුමුලයාය, ජනඋදානගම, අංක 36 දරන ස්ථානයෙහි පදිංචි යූ.ජී. කුසුමාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහනුවර, ජෝර්ජ් ඊ.ද සිල්වා මාවත, අංක 309/2 දරන ස්ථානයෙහි පදිංචි ජෙරම් වනිගසේකර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, மட்டக்களப்பு, கல்லடி, இராமகிருஷ்ணபுரம் எனும் முகவரியில் வதியும் திருமதி கே. மல்லிகா அவர்களிடமிருந்து கிடைத்த மனுவை நான் சமர்ப்பிக்கின்றேன்.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 1-39/'18 - (1), ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කුරුවිට කර්මාන්තපුරය: විස්තර
குருவிட்ட கைத்தொழில் பேட்டை: விபரம்
INDUSTRIAL ZONE AT KURUWITA : DETAILS

242/'18

2. ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, කුරුවිට කර්මාන්තපුරයක් පිහිටා තිබෙන බව දන්නේද;

(ii) එසේ නම්, එම කර්මාන්තපුරය ආරම්භ කළ දිනය හා එහි ආරම්භක අරමුණු කවරේද;

(iii) අද වනවිට මෙම කර්මාන්තපුරය තුළ ක්‍රියාත්මක වන කර්මාන්තශාලා සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(iv) එම එක් එක් කර්මාන්ත ශාලාවේ රැකියාවල නියුක්ත සේවක සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නේද;

(v) එම කාලසීමාව තුළ වැසීගිය කර්මාන්තශාලා තිබේ නම්, ඒවායේ නම් කවරේද;

(vi) මෙම කර්මාන්ත පුරය තවදුරටත් සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

කෛත්තොළිල් මත්‍රුම් වාණිප අලුවල්කළ් අමෛච්චරෛක් කේට්ට විනා:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்தில் குருவிட்டவில் கைத்தொழில் பேட்டையொன்று உள்ளதென் பதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி கைத்தொழில் பேட்டை ஆரம்பிக்கப்பட்ட திகதி மற்றும் அதன் ஆரம்ப நோக்கம் யாதென்பதையும்;

(iii) தற்போது இக்கைத்தொழில் பேட்டையில் இயங்கும் தொழிற்சாலைகளின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் யாவையென் பதையும்;

(iv) மேற்படி ஒவ்வொரு தொழிற்சாலையிலும் தொழிலில் ஈடுபட்டுள்ளவர்களின் எண்ணிக் கையை வெவ்வேறாகக் குறிப்பிடுவாரா என்பதையும்;

(v) மேற்படி காலகட்டத்தில் மூடப்பட்ட தொழிற் சாலைகள் உள்ளதாயின் அவற்றின் பெயர்கள் யாவையென்பதையும்;

(vi) இந்தக் கைத்தொழில் பேட்டையை மேலும் விருத்தி செய்வதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Commerce:

(a) Will he inform this House-

(i) whether he is aware that an industrial zone is established at Kuruwita in Ratnapura District;

(ii) if so, the date of commencement of the aforesaid industrial zone and its primary objectives;

(iii) the factories that function in this industrial zone as at today and their names;

(iv) whether the number of the employees serving in each of these factories would be separately stated;

(v) the names of the factories which were closed down during the aforesaid period, if any;

(vi) the steps taken by the Ministry to further develop this industrial zone?

(b) If not, why?

ගරු බුද්ධික පතිරණ මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு புத்திக பதிரண - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் பிரதி அமைச்சர்
(The Hon. Buddhika Pathirana - Deputy Minister of Industry and Commerce)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කවදා කාපු ටකරන් ද කියලා කිව්ව ලු. පාර්ලිමේන්තුවේ ඊයේ වනතුරු ප්‍රශ්න අහපු මට අද ආපු ගමන් ප්‍රශ්නවලට උත්තර දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. නියෝජ්‍ය අමාත්‍ය ධුරයේ දිවුරුම් දීලා කටේ කෙළ පිසදා ගන්න වුණේ නැහැ, ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න සිද්ධ වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ප්‍රශ්නයට පිළිතුර දෙන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
එතුමාගේ ප්‍රශ්නයට පිළිතුර දෙන්න අද හරි වාසනාවන්ත දවසක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද පාර්ලිමේන්තුවේ ඔප්පුවත් නියමානුකූල විධියට සකස් වෙනවා. මොකද, මෙච්චර කාලයක් ඔප්පු තිරප්පු නැතිව පාර්ලිමේන්තුව අනවසර ඉදිකිරීමක් හැටියට නේ තිබිලා තිබෙන්නේ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඒක ප්‍රශ්නයට අදාළ නැහැ. ඔබතුමා අසා තිබෙන ප්‍රශ්නයට පිළිතුර දෙන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු ඉඩම් අමාත්‍යතුමාට ගෞරවයක් වශයෙන් ඒ ගැන කියන්න ඕනෑ නේ. මේ ගැන කියන්න කියලා ඉඩම් ඇමතිතුමා මටයි පැවරුවේ. නැත්නම් එතුමාට මේ ගැන කියන්න තිබුණා. [බාධා කිරීමක්] අසා තිබෙන ප්‍රශ්නයට මේක අදාළයි. මොකද, ඉඩම් ඇමතිතුමා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කරුණාකරලා ඔබතුමා ප්‍රශ්නයට පිළිතුර දෙන්න.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ඔව්.

(ii) නාලන්ද එල්ලාවල කර්මාන්තපුරය
අදියර I - 1992
නාලන්ද එල්ලාවල කර්මාන්තපුරය
අදියර II - 1997

අරමුණු

1. දළ දේශීය නිෂ්පාදනයට කර්මාන්ත අංශයේ වන දායකත්වය ඉහළ නැංවීම.
2. විදේශ ආයෝජන දිරිමත් කිරීම.
3. අපනයන වර්ධනය කිරීම තුළින් විදේශ විනිමය උත්පාදනය වැඩි කිරීම.
4. කර්මාන්තකරුවන් සඳහා යටිතල පහසුකම් සැපයීම.
5. කර්මාන්තශාලා ජනාකීර්ණ ප්‍රදේශවල ස්ථාපනය කිරීම මඟින් සිදු වන පාරිසරික හා සමාජීය ගැටලු අවම කිරීම.
6. ස්වාරක්ෂිත කලාප හා විධිමත් අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යුහයක් සහිත වෙන් කරන ලද ප්‍රදේශ තුළ කර්මාන්තශාලා ස්ථාපනය මඟින් පාරිසරික හානි අවම කර ගනිමින් කාර්මික ප්‍රවර්ධනය සිදු කිරීම.

(iii) අදියර I - කර්මාන්තශාලා සංඛ්‍යාව 23
අදියර II - කර්මාන්තශාලා සංඛ්‍යාව 18
එකතුව 41

අදියර I ට අදාළ කර්මාන්තශාලා ලැයිස්තුව ඇමුණුම I ලෙස මම **සභාගත*** කරනවා. ඔබතුමාට අවශ්‍ය නම් කියන්න, මම එය කියවන්නම්.

ඒ වාගේම අදියර II ට අදාළ කර්මාන්තශාලා 18ක ලැයිස්තුව තිබෙනවා. මම එය ඇමුණුම II ලෙස **සභාගත*** කරනවා.

(iv) I වෙනි අදියරට අදාළ කර්මාන්තශාලා 23හි සේවක සංඛ්‍යාව ඇතුළත් ලැයිස්තුව සහ II වෙනි අදියරේ ආයතන 18ට අදාළ සේවක සංඛ්‍යාව ඇතුළත් ලැයිස්තුව ඇමුණුම III ලෙස මම **සභාගත*** කරනවා.

අදියර I සහ II හි මුළු රැකියා එකතුව - 654යි.

(v) අදියර Iහි කර්මාන්තශාලා 10ක් වැහිලා ගිහින් තිබෙනවා, අදියර IIහි කර්මාන්තශාලා 11ක් වැහිලා ගිහින් තිබෙනවා. මම එම ලැයිස්තු දෙක ඇමුණුම IV ලෙස **සභාගත*** කරනවා.

(vi) නාලන්ද එල්ලාවල කර්මාන්ත පුරයේ අදියර Iහි අභ්‍යන්තර මාර්ග පද්ධතිය සංවර්ධනය කිරීමට රු. 9,125,000ක මුදලක් 2018 වසර සඳහා වෙන් කර ඇත.

නාලන්ද එල්ලාවල කර්මාන්ත පුරයේ අදියර IIහි මීටර් 100ක් වන අභ්‍යන්තර මාර්ගයක් කොන්ක්‍රීට් කිරීමට රු. 602,000ක මුදලක්, මීටර් 205ක් වන අභ්‍යන්තර මාර්ග කොටසක් අලුතින්ම සකස් කර කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමට රු. 3,923,000ක මුදලක්ද 2018 වසර සඳහා වෙන් කර ඇත.

(ආ) පැන නොනඟී.

** සභාමේසය මත තබන ලද ඇමුණුම්:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்புகள் :*
**Annexes tabled:*

ඇමුණුම I

අනු අංකය	නාලන්ද එල්ලාවල කර්මාන්තපුරය අදියර - I
1	රෝහිත ජෙම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ
2	ප්‍රාර්ථනා ෂීට් සෙන්ටර්
3	නිව් සම්පත් ඉන්ජිනියර්ස්
4	මොහානා ඉන්ඩස්ට්‍රිස්
5	සිඟිරි පර්නිචර් (ප්‍රයිවට්) ලිමිටඩ
6	ඉසුරු ග්‍රීන් එනර්ජි ඉන්ජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ
7	නිව් මිඩලේ ලංකා මිල්ක් ප්‍රඩක්ට්
8	බීහයිව් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ
9	යසස ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ
10	ඔගස්ටින් මෝටර්ස් ලිමිටඩ
11	හිරුෂි ගාමන්ට්
12	බීහයිව් මල්ලිකා බේකරි
13	බුද්ධි එන්ටර්ප්‍රයිසස්
14	සී/ස ලන්කන් පියුටර් (පුද්.) සමාගම
15	මයික්ලීවස් ෆැබ්‍රිකේ (ප්‍රයිවට්) ලිමිටඩ
16	ජේ.කේ. එන්ටර්ප්‍රයිසස්
17	ගෝල් මාකටිං සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ
18	එස්.එස්.පී. ඉංජිනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ
19	ඩොන් ඔරෙස්තේ බෑග් සෙන්ටර්
20	ඩී.ඩී.කේ. ටෙක්නිකල් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට් ලිමිටඩ
21	ස්ටාවුඩ් (ප්‍රයිවට්) ලිමිටඩ
22	හයිබ්‍රාමනී ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ
23	සිලොන් ජෙම් ඇන්ඩ් සිලිකා ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට් ලිමිටඩ

[ගරු බුද්ධික පතිරණ මහතා]

ඇමුණුම II

අනු අංකය	නාලන්ද එල්ලාවල කර්මාන්තපුරය අදියර - II
1	ලලන්ස් ස්පෝර්ට් ගුඩ්ස්
2	පැරමවුන්ට් එක්ස්පොර්ට් ඉන්ඩස්ට්‍රීස්
3	එන්.එස්.සී. ලේටෙක්ස් ප්‍රයිවට් ලිමිටඩ්
4	තරිදු ඉන්ඩස්ට්‍රීස්
5	සන්ජීව විවින්ග්
6	සබරගමුව ෆර්ටිලයිසර්(ප්‍රයිවට්) ලිමිටඩ්
7	ගම්පොල ඉන්ඩස්ට්‍රීස්
8	නිව් රෙඩියන්ට් ස්ටීල් ෆර්නිචර්ස්
9	ලලිතා නිෂ්පාදන ආයතනය
10	බී.වී.එස්. ඉන්ජිනියරින්
11	සිල්වා ඇක්සසරීස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
12	සේනානි විවින්ස්
13	හෙයිල්කෝ රබර් ඉන්ඩස්ට්‍රීස්
14	කේ.සී.පී. බුෂස්
15	මිනිපුර කෙමිකල් (ප්‍රයිවට්) ලිමිටඩ්
16	පැරඩයිස් ටෙක්ස්ටයිල්ස්
17	එවර්ග්‍රිප් ඔටෝ මෝටිව් (ප්‍රයිවට්) ලිමිටඩ්
18	එස්.ජේ. ප්ලයිවුඩ්

ඇමුණුම III

අනු අංකය	නාලන්ද එල්ලාවල කර්මාන්තපුරය අදියර - I	සේවක සංඛ්‍යාව
1	රෝහිත ජෙම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	10
2	ප්‍රාර්ථනා ෂීට් සෙන්ටර්	24
3	නිව් සම්පත් ඉන්ජිනියර්ස්	09
4	මොහාතා ඉන්ඩස්ට්‍රිස්	15
5	සිගිරි පර්නිචර් (ප්‍රයිවට්) ලිමිටඩ්	42
6	ඉසුරු ග්‍රීන් එනර්ජි ඉන්ජිනියරින් (ප්‍රයිවට්) ලිමිටඩ්	21
7	නිව් මිඩ්ලේ ලංකා මිල්ක් ප්‍රඩක්ට්	21
8	බිහයිව් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්	130
9	යසස ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්	05
10	ඔගස්ටින් මෝටර්ස් ලිමිටඩ්	06
11	හිරුෂි ගාමන්ට්	10
12	බිහයිව් මල්ලිකා බේකරි	30
13	බුද්ධි එන්ටර්ප්‍රයිසස්	22
14	සී/ස ලන්කන් පියුටර් (පුද්.) සමාගම	08
15	මයික්ලිටස් ෆැබ්‍රිකේ (ප්‍රයිවට්) ලිමිටඩ්	05
16	ජේ.කේ. එන්ටර්ප්‍රයිසස්	14
17	ගෝල් මාකටිං සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්	21
18	එස්.එස්.පී. ඉංජිනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්	25
19	ඩොන් ඔරෙස්තේ බෑග් සෙන්ටර්	10
20	ඩී.ඩී.කේ. ටෙක්නිකල් ඉන්ඩස්ට්‍රීස් ප්‍රයිවට් ලිමිටඩ්	13
21	ස්ටාවුඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්	03
22	හයිඩ්‍රාමනී ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්	20
23	සිලොන් ජෙම් ඇන්ඩ් සිලිකා ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට් ලිමිටඩ්	03
එකතුව		467

අනු අංකය	නාලන්ද එල්ලාවල කර්මාන්තපුරය අදියර - II	සේවක සංඛ්‍යාව
1	ලලන්ස් ස්පෝර්ට් ගුඩ්ස්	18
2	පැරමවුන්ට් එක්ස්පොර්ට් ඉන්ඩස්ට්‍රීස්	15
3	එන්.එස්.සී. ලේටෙක්ස් ප්‍රයිවට් ලිමිටඩ්	07
4	තරිදු ඉන්ඩස්ට්‍රීස්	03
5	සන්ජීව විවින්ග්	03
6	සබරගමුව ෆර්ටිලයිසර්(ප්‍රයිවට්) ලිමිටඩ්	06
7	ගම්පොල ඉන්ඩස්ට්‍රීස්	12
8	නිව් රෙඩියන්ට් ස්ටීල් ෆර්නිචර්ස්	28
9	ලලිතා නිෂ්පාදන ආයතනය	15
10	බී.වී.එස්. ඉන්ජිනියරින්	06
11	සිල්වා ඇක්සසරීස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්	15
12	සේනානි විවින්ස්	02
13	හෙයිල්කෝ රබර් ඉන්ඩස්ට්‍රීස්	06
14	කේ.සී.පී. බුෂස්	08
15	මිනිපුර කෙමිකල් (ප්‍රයිවට්) ලිමිටඩ්	05
16	පැරඩයිස් ටෙක්ස්ටයිල්ස්	10
17	එවර්ග්‍රිප් ඔටෝ මෝටිව් (ප්‍රයිවට්) ලිමිටඩ්	03
18	එස්.ජේ. ප්ලයිවුඩ්	25
එකතුව		187

ඇමුණුම IV

අනු අංකය	නාලන්ද එල්ලාවල කර්මාන්තපුරය අදියර - I
1	පැසිපික් ඕවර්සීස් ආයතනය
2	එස්.ඩබ්ලිව්. ඉංජිනියර්ස්
3	ට්‍රොපිකල් රිසෝර්සස් (ප්‍රයිවට්) ලිමිටඩ්
4	රංගිකා ගාමන්ට්
5	කොබෝ මිනරල් ප්‍රොසෙසින් (ප්‍රයිවට්) ලිමිටඩ්
6	සී මෙටල්/පැල්කොම් ඉන්ඩස්ට්‍රීස්
7	දිලුම් ඇපරල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
8	සෙන්ට්‍රල් ලැපිඩරි (ප්‍රයිවට්) ලිමිටඩ්
9	ඩොන් ඔරෙස්තේ බෑග් සෙන්ටර්
10	නෙක්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්

අනු අංකය	නාලන්ද එල්ලාවල කර්මාන්තපුරය අදියර - II
1	සිලෝන් ඔක්ෂිජන් (ප්‍රයිවට්) ලිමිටඩ්
2	ලක්රුවන් එන්ටර්ප්‍රයිසස්
3	සූසාල් ඉංජිනියරින්
4	ජේ.එන්.ඩී.වුඩ් ප්‍රඩක්ට්
5	මිණිපුර මිනරල් (ප්‍රයිවට්) ලිමිටඩ්
6	පැන්ඩා නූඩ්ල්ස් මැනුෆැක්චරින් කම්පැනි
7	සිලොන් වෝටර්
8	එක්ස්පෝ ලංකා
9	රේයස් හෝල්ඩින්ග්
10	පී ඇන්ඩ පී බුෂස්
11	මාස් වෙයින් හවුස්

ඔබතුමාගේ ප්‍රශ්නයට පිළිතුර එයයි. ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමාට අවශ්‍ය නම් මම එන්නම්, අපි දවසක් දාගෙන ගිහින් මේ කර්මාන්තකරුවන් සියලුදෙනාම එක තැනකට එකතු කරලා ඔවුන්ගේ ප්‍රශ්න ගැන කථා කරමු.

ඒ අයගේ තිබෙන ගැටලුවලට අපි ඒ වෙලාවේ දෙන්න පුළුවන් විසඳුම් ඒ වෙලාවේම දෙමු, කෙටි කාලීනව. මැදි කාලීන සහ දීර්ඝ කාලීන විසඳුම්වලට අපි යමු. ඔබතුමා සතුටු නම් අපි මේ ජූලි මාසයේම දවසක් යොදා ගනිමු. මේ ප්‍රශ්න අහලා ඉවර වුණාට පස්සේ අපි හමුවෙලා දවසක් යොදා ගෙන යමු.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුලින්ම අපේ අලුත් නියෝජ්‍ය ඇමතිතුමාට මා සුබ පතන්න කැමැතියි. මේ

පාර්ලිමේන්තුවේ වැඩියෙන්ම ප්‍රශ්න අහපු මන්ත්‍රීවරයා අද නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට ඉන්න වෙලාවේ පළමුවෙන්ම මේ ප්‍රශ්නය අහන්න ලැබීම ලොකු වාසනාවක් කියලා මා හිතනවා. එතුමා සාර්ථක පිළිතුරක් ලබා දුන්නා. එතුමා මේ පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න ගොඩක් අහලා තිබෙනවා. ඒ අතරින් පිළිතුරු නොලැබී විශාල ප්‍රශ්න ප්‍රමාණයක් යට යන්න ඇති. ඔබතුමා දරන අමාත්‍යාංශයෙන් එවැනි අසාධාරණයකට ලක් නොවෙන්න, වැඩ කරන්න පුළුවන් විධියට පිළිතුරු ලබා දෙන්න හැකියාව ලැබේවා! කියා මා ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. කුරුවිට කර්මාන්තපුරය කියන්නේ රත්නපුර දිස්ත්‍රික්කය ආශ්‍රිතව තිබෙන විශාලම කර්මාන්තපුරය. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ කර්මාන්තපුරය තුළ වාණිජමය වටිනාකම් තිබෙන විශාල භූමි ප්‍රදේශයක් තුළ කර්මාන්ත කරන්නේ නැති, නමුත් කර්මාන්ත කරන විධියට proposals දාලා දේශපාලන හයිය-හිතවත්කම් මත ඉඩම් වෙන් කර ගත්තු කණ්ඩායම් ඉන්නවා. මේ තුළ ලොකු අසාධාරණයක් වෙනවා. අද නව කර්මාන්ත ආරම්භ කරන්න යන අයට ඒ ඉඩ-කඩම් දෙන්න විධියක් නැහැ. මොකද මේවා වෙන් කරගෙන තිබෙන නිසා. ඒ නිසා මම ඔබතුමාගෙන් මේ කාරණය දැන ගන්න කැමැතියි. මේ ක්‍රමවේදය පසුගිය කාල සීමාව පුරාවට සිදු වුණා. ඒ තුළින් ප්‍රදේශයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන්ට අවස්ථාවක් ලබා ගන්න තිබෙන අයිතිය අහිමි වෙලා තිබෙනවා. මේකට ගන්නා වූ කඩිනම් පියවර මොකක්ද කියලා පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට ඔබතුමාගෙන් අහන අතර, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න ගරු දයාසිරි ජයසේකර මහතාට අවස්ථාව දෙනවා. ඒ වාගේම, ඔබතුමාගේ ආරාධනාව පරිදි මම දිනයක් අදම වෙන් කර ගන්නවා. මොකද, එතැන බලන්න ඕනෑ තැනක්. මා හිතන්නේ ගරු ඇමතිතුමාට කාලයක් නැති වන්න ඇති, එය බලන්න. එතැන තිබෙනවා, ලොකු මාෆියාවක්. ඒ පිළිබඳව සොයා බලා එය හරි තැනට - හරි track එකට - ගත්තොත් ඒ ප්‍රදේශයටම රැකියා ලබා දෙන්න පුළුවන්. ඒ වාගේම අපේ ජාතික ධනය, රාජ්‍ය මුදල් ශක්තිය වැඩි කරන්න පුළුවන් හොඳ ආයෝජන ටිකක් ගෙන්වා ගන්න පුළුවන් තැනක්, එය. ඒ වෙනුවෙන් ඔබතුමා කටයුතු කරන්නේ කෙසේද කියා දැන ගන්න කැමැතියි, මා අර කලින් අහපු ප්‍රශ්නයට උත්තරයකුත් බලාපොරොත්තු වන ගමන්.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු මන්ත්‍රීතුමනි, පළමුවන කාරණය මෙකයි.

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු බුද්ධික පතිරණ මහතා
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
ගරු අමාත්‍යතුමා මා දෙනවාටත් වඩා හොඳ, ප්‍රබුද්ධ උත්තරයක් එයට දෙනවා ඇති.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රිසාඩ් බදියුදීන් අමාත්‍යතුමා.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සමඟ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාත්, අපේ නිලධාරිනුත් මා එතැනට යවන්නම්. ඔබතුමා කියන එක ඇත්ත. යම් යම් කර්මාන්ත පටන් ගන්න ඕනෑ කියා ඉල්ලීමක් කරලා risk committeesවල අවසර ලබාගෙන තමයි ඔවුන් ඒවා බාර ගන්නේ. එහෙම භාර ගත්තාට පසුව අපට දුන් proposal අනුව නොවෙයි සමහර අය කර්මාන්ත පටන් ගන්නේ. වෙනත් වෙනත් දේවල් එතැන සිදු වන බව මම දන්නවා. කැබිනට් අවසරය ආදි සියල්ල අරගෙන දුන්නාට පසුව ඒ අය එක පාරටම එළවන්නේ කොහොමද යන්න ගැන ප්‍රශ්නයකුත් අපට තිබෙනවා. නමුත් අපි පොදු තීන්දුවක් ගන්නයි යන්නේ. ඒ අවස්ථාව අරගෙන මෙච්චර කාලයක් වෙනත් විධියකට ඒවා පාවිච්චි කරන අයගේ, එහෙම නැති නම් හරියාකාර පිළිවෙළක් ඇතිව කර්මාන්ත කළේ නැති අයගේ ඉඩම් ආපසු අරගෙන වෙනත් අයට ලබා දීමට කටයුතු කරන්න අවශ්‍ය වැඩ කටයුතු අපි කරගෙන යනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන වෙලාවට අපේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා කුරුවිට කර්මාන්තපුරයට යනවා ඇති. එහෙම ගිහින් බලා ඔබතුමන්ලා යෝජනාවක් කරන්න. ඊට පසුව අපට කරන්න පුළුවන් දේවල් අපි කරන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. ගරු මන්ත්‍රීතුමාගේ දෙවන අතුරු ප්‍රශ්නය.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට දෙවන ප්‍රශ්නය ඇසීමේ අවස්ථාව මම ලබා දෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමාට මා ස්තුතිවන්ත වෙනවා. අවුරුදු ගණනාවක් තුළ කැපිලිවලට ලක්වෙමින්, බොහොම අමාරුවෙන් ඒ කැපිල්ල දරාගෙන හිටපු ගරු බුද්ධික පතිරණ මැතිතුමා නියෝජ්‍ය අමාත්‍ය ධුරයකට පත් වීම පිළිබඳව අපි සන්තෝෂ වෙනවා. [බාධා කිරීමක්] ඔව්, ඔව්. තියෙනවා. ඒක ඔබතුමාටත් තියෙනවා; මටත් තියෙනවා. ප්‍රශ්නයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අපේ ගරු ඇමතිතුමාගෙන් අතුරු ප්‍රශ්නයක් අහන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, මේ ගැන මම ඔබතුමා එක්ක කථා කළා. තවම අපට හමුවෙන්න අවස්ථාව ලැබුණේ නැහැ. අද වන විට කුරුණෑගල සතොස ආයතනයේ බෙදා හැරීම් මධ්‍යස්ථාන සම්පූර්ණයෙන්ම වහලා දමලා තිබෙනවා. බෙදා හැරීමේ මධ්‍යස්ථාන ගණනාවක් තිබුණා. ඒවා ඉතාම හොඳට ක්‍රියාත්මක වුණා. පසු ගිය කාල වකවානුවේ ඔබතුමන්ලා බෙදාහැරීම් කුරුණෑගල භේමාස් කියලා කොම්පැනියකට දීලා තිබෙනවා. ඒගොල්ලන්ට බෙදා හැරීම් කරගෙන යන්න කිසිම capacity එකක් නැහැ. හැම තැනකම

[ගරු දයාසිරි ජයසේකර මහතා]

බෙදා හැරීම පිළිබඳව විශාල ප්‍රශ්න ගණනාවක් ඇතිවෙලා තිබෙනවා. මම ඔබතුමාට කියන්න කැමැතියි, ඔබතුමන්ලා හේමාස් ආයතනයට දීලා, ගිය අවුරුද්දේ අප්‍රේල් මාසයේ හේමාස් ආයතනයෙන් බෙදා ගන්න බැරිව ගලෙන්බිඳුනුවැවට පවා බඩු ටික අරගෙන ගියේ කුරුණෑගලින් කියන එක. අද එතැන ඉන්න තුන් හාරසියයක් පාරට බැහැලා උද්ඝෝෂණයක් කරනවා. මේ ස්ථාන වසා දැමීම තුළින් සිද්ධ වන්නේ ලක් සතොස සම්පූර්ණයෙන්ම කඩා වැටෙන එකයි. ඒ කියන්නේ සතොස සමාගමේ සියලුම ගබඩා පහසුකම් තිබෙද්දී, ඔබතුමන්ලා ඒක වහලා මේ සියල්ලම එක තැනකින් කරන්න දැන් වැලිසරට දීලා තිබෙනවා. මම දන්නා විධියට මේ සියල්ලම එක තැනකින් කරන්න බැහැ, ඇමතිතුමනි. මොකද, රත්නපුරයට ගංවතුර ආපු වෙලාවේ, ඒ බඩු ටික බෙදුවේ රත්නපුරයේ සතොස ශාඛාවක් තිබුණු නිසායි. මේ සියලුම මන්ත්‍රීවරුන් ඒකට උදාහරණ කියාවි. හැබැයි, අද වැලිසරින් - එක තැනකින්- මේ බඩු බෙදන්න යාම තුළ විශාල අර්බුදයක් ඇතිවෙලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි ඒ ස්ථානවල මිනිස්සු විශාල සංඛ්‍යාවක් වැඩ කළා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ එලුගල වාගේ දුප්පත් ප්‍රදේශවල සිටින අහිංසක, දුප්පත් මිනිස්සු තුන්හාරසියක් විතර එතැන වැඩ කළා. ඒ වාගේම ඒ අයගේ වාහන විශාල සංඛ්‍යාවක් එතැනට දාලා තිබෙනවා. දැන් ඒ අය යන එන මං නැති තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ඒ නිසා කරුණාකර මේකට විසඳුමක් දෙන්න කියලා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා. එක තැනකින් බඩු ටික බෙදීම නිසා ලක් සතොස ආයතනය විශාල අර්බුදයකට ලක් වෙනවාය කියන එක මම බොහොම කනගාටුවෙන් තමුන්නාන්සේට කියන්න කැමැතියි. කරුණාකර ඔබතුමාත් එක්ක සාකච්ඡා කරලා මේ ප්‍රශ්නය විසඳාගන්න අපට වෙලාවක් දෙන්න.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

අපි වෙලාවක් දෙන්න සූදානම්. මම ඔබතුමාට කියන්න කැමැතියි, සතොස නැති කරලා, විනාශ කරන සමහර කාලකණ්ණි හොරු ඉන්න බව. ඔවුන් තමයි සතොස වහලා දමන්න කටයුතු කරන්නේ. තමන්ට හම්බ කරගන්න තමයි සතොස පාවිච්චි කරලා තිබෙන්නේ. ඇත්තටම ඔබතුමාගේ question එක මේකට අදාළ එකක් නොවෙයි. දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා මට කථා කළා. මේ සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න අද සවස තුනහමාරට ඔබතුමාට වෙලාව ලබාදී තිබෙනවා. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඔබතුමා ඊයේ නේ එව්වේ. මේ පිළිබඳව සාකච්ඡා කරන්න ඔබතුමාට අද සවස තුනහමාරට වෙලාව වෙන්කරලා තිබෙනවා. ඇත්තටම සතොස වංචා සිදු වෙන්නේ කොතැනද කියලා බලනකොට, storesවලයි, transport එකෙයි තමයි එම වංචා සිදු වෙන්නේ. ලොරි රියැදුරන් monitor කරන system එකක් තිබුණේ නැහැ. සමහර ලොරිවල අයිතිකරුවන්ම තමයි සේවකයින් විධියට ඇතුළේ වැඩ කළේ. එම නිසා ඒ ගොල්ලෝ කිලෝමීටර ගණන් වැඩියෙන් දානවා. ඒවා නිසි පිළිවෙළක් නොමැතිව තමයි සිදු වුණේ. හිටපු අමාත්‍යතුමනි, ඒ නිසා අපි මේක පිළිවෙළක් ඇතුව කරන්න තමයි බලන්නේ. නමුත්, ඔබතුමා කියන කථාවේ ඇත්තක් තිබෙනවා නම්, අපි අද සාකච්ඡා කරමු. ඒ වෙලාවේදී ඔබතුමාගේ ගැටලු සම්බන්ධයෙන් අපේ නිලධාරීන් ඔබතුමාට පැහැදිලි කිරීමක් කරයි. කුරුණෑගල සතොස ආයතනය පවත්වාගෙන යන එකයි, ඒ හොරු ටික එතැන තියාගෙන වැඩ කරගෙන යනවාද කියන එකයි පිළිබඳව අපි දෙදෙනා සාකච්ඡා කරලා තීරණය කරමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

මට තව විනාඩියක් දෙන්න ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉක්මනට කාරණය කියන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

හොරු ඉන්න තැන මම වෙනම පෙන්වා දෙන්නම්. දැන් වෙලා තිබෙන්නේ මේකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. රත්නපුරයට යන්නත්, රත්නපුරේ ඉඳලා බඩු අරගෙන එන්නත් දෙකටම රුපියල් 80යි ගත්තේ. හැබැයි, හේමාස් ආයතනය අද එක පැත්තකට විතරක් යන්න රුපියල් එකසිය ගණනක් ගන්නවා. හොරු මතු වෙලා තිබෙන්නේ එතැනයි. ඒ කාරණය මම ගරු ඇමතිතුමාට පෙන්වා දෙන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

දැන් ඒ කාරණය ගැන ගරු ඇමතිතුමා ඔබතුමා එක්ක සාකච්ඡා කරන බව කිව්වා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

අපි ඒක හදාගන්න ලැහැස්ති කර ගනිමු. මම ඒකයි මේ පෙන්වා දෙන්නේ.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඒක ඔබතුමා කියන කථාව නේ. ඔබතුමා අපෙන් අහන්න ඕනෑ නේ. මේ හොරුන්ගේ කථාව අහලා නේ ඔබතුමා කථා කරන්නේ. ඔබතුමා දේශපාලනයක් විධියට මේ සතොස ගැන කථා කරන්න එපා. සතොස කියන්නේ කාගිල්ස් එක්ක, ඒ වාගේම පෞද්ගලික අංශයත් එක්ක competitively වැඩ කරන්න පුළුවන් ආයතනයක්. ඒ තත්ත්වයට අපි දැන් ගෙනැල්ලා තිබෙනවා; පිළිවෙළක් අනුව ගෙනැල්ලා තිබෙනවා; ඉහළ නිලධාරීන් පත් කරලා තිබෙනවා. [බාධා කිරීමක්] ඔබතුමා බලන්න, මේ වංචාව කුරුණෑගල තමයි සිද්ධ වෙන්නේ. කුරුණෑගල අංශයේ ඉන්න, -[බාධා කිරීමක්] පොඩ්ඩක් කථා කරන්න දෙන්න කෝ. [බාධා කිරීමක්] ඒක KPMG කියලා ආයතනයක්,- [බාධා කිරීමක්] අහන එකට උත්තර දෙන්න නේ ඕනෑ. KPMG කියලා ආයතනයක්,-

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ සාකච්ඡාව සවස තිබෙනවා. එතැනදී කථා කරන්න.

හොඳයි, බොහොම ස්තුතියි.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පොඩ්ඩක් මේ ගැන පැහැදිලි කරන්න ඕනෑ. KPMG ආයතනයට භාර දුන්නා අවුරුද්දක් මේ ගැන study කරලා පිළිවෙළක් අනුව මේ ආයතනය පවත්වා ගෙනයන්න, වැරැද්ද තිබෙන්නේ කොතැනද කියලා සොයා බලලා වාර්තාවක් දෙන්න කියලා. ඒ ගොල්ලන් දුන්නු වාර්තාව අනුව අවුරුදු තුනක plan එකක් අනුව තමයි මේ ආයතනය අපි පවත්වා ගෙනයන්නේ. ඇත්තටම කලින් ඉහළ නිලධාරින් කවුරුවත් හිටියේ නැහැ. පත්තරේ දැන්වීම් දාලා සුදුසු නිලධාරින් තමයි ඉහළ තනතුරුවලට -DGM ඉඳලා CEO දක්වා- පත් කරලා තිබෙන්නේ. ඒ ගොල්ලන් පාලනය කරන එකට ඇමතිවරයා හැටියට මම අත ගහන්නේ නැහැ. Board එකක් පත් කරලා තිබෙනවා. මේ ආයතනය කොහොමද පවත්වා ගෙනයන්න ඕනෑ කියලා KPMG ආයතනය ලබා දුන් plan එක අනුව තමයි ඒ Board එක ඒක කර ගෙන යන්නේ. ඒ අනුවයි බෙදා හැරීමේ මධ්‍යස්ථාන වහලා එක එක තැන්වල වෙච්ච අලාභ නැති කරන්න කටයුතු කරලා තිබෙන්නේ. එතුමාගේ ප්‍රදේශයේ ඉන්න ලොරි අයිතිකරුවන්, එහෙම නැත්නම් සේවකයන් ඉල්ලීමක් කරන නිසා එතුමා නිතරම මේ ගැන කථා කරනවා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 225දෙනෙක් සිටියාට එතුමා විතරයි මේ සම්බන්ධයෙන් මා සමඟ එදා ඉඳලා කථා කරන්නේ. ඒ වාගේම එතුමා කියන කාරණයේ සාධාරණයක් තිබෙනවා නම්, අනිවාර්යයෙන්ම එය ඉටු කරන්න මම සූදානම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 3 - 411/'18 - (1), ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 - 440/'18 - (1), ගරු ජයන්ත සමරවීර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 - 447/'18 - (1), ගරු බිමල් රත්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 - 474/'18 - (1), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විගණන විමසුමක් සම්බන්ධ ප්‍රශ්නයක් තමයි මේ අහන්නේ. එදා මුලසුනේ හිටපු ගරු කථානායකතුමා ගරු රාජ්‍ය ඇමතිතුමියට පැහැදිලිව කිව්වා, මේ පිළිතුරු කඩිනම් කරන්න කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ දිනයේදී සිදු කළ විවාදයේදීත් මේ හොරකම් සියල්ල පිළිබඳව කථා කළා. අද දිනයේත් මේ අහන්නේ, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තුළ කථා වුණු ප්‍රශ්නයක්. රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තුළදීත් ඉතා භාෂ්‍යජනක විධියට තමයි මේ ප්‍රශ්නයට පිළිතුරු ලැබුණේ. මේ මිලදී ගැනීම් සියල්ල කරන්න කියලා, විෂය භාර ඇමතිවරයාගේ අනුදැනුමකින් තොරව තමයි ඌව පළාත් සභාව කටයුතු කළේ. දැන දැන, දිගින් දිගටම ගරු කථානායකතුමා කියන දේත් නොසලකා හරින්නේ මේ ප්‍රශ්නයේ විශේෂත්වයක් තිබෙන නිසායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය දිනයේත් ගරු කථානායකතුමා පැහැදිලිව කිව්වා, මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න කියලා. ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් ඒක දන්නවා. රාජ්‍ය ඇමතිතුමිය පොරොන්දු වුණා පිළිතුරු දෙන්න. නමුත් දැන් එතුමිය එන්නේත් නැහැ; ඇමතිතුමා එන්නේත් නැහැ. මේ ප්‍රශ්නය දිගින් දිගටම මහ හරින්න හේතුව මම කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කරපු වැරදි වසන් කිරීම සඳහා තමයි මේ කටයුතු කරන්නේ.

පසුගිය සතියේත් "අහවලා" ඇවිත් ඒ "අහවලාගේ" හෝටලෙන් කාලා යනවා අපි දැක්කා. මේ මුදල් කොල්ලය මේ රටේ සියලුදෙනා දැන ගත යුතු ප්‍රශ්නයක් කියලායි මම හිතන්නේ. [බාධා කිරීමක්] අපේ නායකයාට "අහවලා" කියපු "අහවලා" තමයි. තමුන්නාන්සේලාගේ "අහවලා" තමයි. අපේ නායකයාට අහවලා කියපු ඒ අහවලා තමයි එහේට ගිහින් කාලා බීලා ආවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු කථානායකතුමා දැනුවත් කර කඩිනමින් පිළිතුරු ලබා දීමට කටයුතු කරන්නම්.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 7 -480/ '18 - (1) ගරු ඩී.වී. චානක මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

වට්ටුවාකල් පාලම: ප්‍රතිසංස්කරණය
வட்டுவாகல் பாலம்: புனரமைப்பு
VATTUWAKAL BRIDGE : RENOVATION

486/'18

8. ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාර්ග සංවර්ධන අධිකාරියට අයත් කිලිනොච්චි - මුලතිව් A-50 ප්‍රධාන මාර්ගයේ පිහිටා ඇති ප්‍රධාන පාලම වන මීටර් 402ක් දිගැති වට්ටුවාකල් පාලම එක් වාහනයක් පමණක් ගමන් කළ හැකි තරම් පටු වීම සහ කිසිදු ප්‍රතිසංස්කරණයක් නොකිරීම හේතුවෙන් ගමනාගමනයට අවහිරයක් වී ඇති බවත්;

(ii) මෙම වට්ටුවාකල් පාලම ප්‍රතිසංස්කරණය කිරීමට අදාළව, මවිසින් 2017.07.31 දිනැති ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) එසේ නම්, වට්ටුවාකල් පාලම, නිශ්චිත කාලයක් තුළ වාහන දෙකක් ගමන් කළ හැකි වන පරිදි පුළුල් කර ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வீதி அபிவிருத்தி அதிகாரசபைக்குச் சொந்தமான கிளிநொச்சி - முல்லைத்தீவு A-50 பிரதான வீதியில் அமைந்துள்ள பிரதான பாலமான 402 மீற்றர் நீளமுடைய வட்டுவாகல் பாலம் ஒரு வாகனம் மாத்திரம் செல்லக்கூடிய அளவுக்கு ஒடுங்கியதாக அமைதல் மற்றும் எவ்விதமான புனரமைப்பும் செய்யாமை காரணமாக போக்குவரத்துக்கு இடையூறாக அமைந்துள்ள தென்பதையும்;

(ii) இந்த வட்டுவாகல் பாலத்தை புனரமைத்தல் தொடர்பாக என்னால் 2017.07.31 ஆம் திகதி யிடப்பட்டு எழுத்துமூலமான ஒரு வேண்டுகோள் விடுக்கப்பட்டுள்ளதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், வட்டுவாகல் பாலத்தை திட்டவட்டமான ஒரு காலப்பகுதிக்குள் இரண்டு வாகனங்கள் செல்லத்தக்கதாக விஸ்தரித்து புனரமைக்க நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Highways and Road Development:

(a) Is he aware that-

(i) transportation has been disrupted because 402 - metre long Vattuwakal Bridge, the main bridge situated in Kilinochchi-Mullaitivu A-50 main road that belongs to the Road Development Authority, is very narrow and can accommodate only single-lane traffic and has not undergone any repair; and

(ii) I have submitted a written request dated 31.07.2017 with regard to the repairing of this Vattuwakal Bridge?

(b) Will he inform this House whether steps will be taken to repair and widen the Vattuwakal Bridge to have two lanes of traffic within a specific period of time?

(c) If not, why?

ගරු කබීර් හෂීම් මහතා (මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு கபீர் ஹாஷீம் - நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Highways and Road Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කිලිනොච්චි සිට මුලතිව් දක්වා ඇති A-50 මාර්ගය පුළුල් කළද පාලම අලුතින් ඉදි නොකිරීම නිසා මෙම තත්ත්වය ඇතිවී ඇත.

(ii) ඔව්.

(ආ) ජාතික ඒකාබද්ධතා හා ප්‍රතිසන්ධාන අමාත්‍යාංශ යටතේ පවතින Rehabilitation of Reconciliation Focused High Priority Roads and Bridges ව්‍යාපෘතිය මඟින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා මේ වන විට ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) අදාළ නොවේ.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, என்னுடைய முதலாவது மேலதிகக் கேள்வி என்னவெனில், வடக்கு மாகாணத்தில் iRoad Project மூலம் 1050 கிலோமீற்றர் பாதை அமைக்கின்ற பணி 2018ஆம் ஆண்டு நடைமுறைக்கு வருவதாக இருந்தது. ஆனால், அது தொடர்பான ஆரம்பகட்ட நடவடிக்கைகள்கூட இன்னும் ஆரம்பிக்கப்படவில்லை. அங்கு 2018ஆம் ஆண்டு iRoad Project ஏன் ஆரம்பிக்கப்படவில்லை என்பதையும், அது எப்போது ஆரம்பிக்கப்படும் என்பதையும் கௌரவ அமைச்சர் அவர்கள் தெளிவுபடுத்துவது நல்லது.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
கௌரவ உறுப்பினர் அவர்களே, இதற்குரிய replyஐ English இல் கூறுவது தெளிவாக இருக்கும். பரவாயில்லையா?

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
பரவாயில்லை!

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
நன்றி!

An iRoad Project for the Northern and the Eastern Provinces has already been planned and ready to go. We are ready to call for tenders and bids and to select the contractors. We have done all the negotiations with the ADB. There is a timeline and we are trying to fast-track it. Hopefully, before the end of this year, we would have iRoads set up for the Northern and the Eastern Provinces. But, we are not relying only on that. The Hon. Prime Minister was concerned about the road development in the Northern Province. After discussions with the Government of India, there was a team that came from India last week and we have discussed developing certain priority roads in the Northern Province. There will be a team sent by the Indian Government and they will look at the roads. We will also discuss with the TNA and other political parties of the North to identify the priority roads. In addition, we will have a Cabinet Paper introduced next week to develop the Kokilai Bridge which connects two districts namely, Mullaitivu and Trincomalee. We are also looking at developing a few other rural roads and I will attend to developing the bridge you have mentioned. Next week, hopefully, I will be visiting the Northern Province to open some of the bridges. There are three bridges that have been completed. We will be coming there to open those bridges.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
නන්‍රි. இரண்டாவது மேலதிகக் கேள்வி -

மன்னார் மாவட்டத்தில் எனக்குத் தெரிந்தவரையில் RDAக்குச் சொந்தமான சிறிய சிறிய வீதிகள், அதாவது பள்ளிமுனை, station, எருக்கலம்பிட்டி, நடுக்குடா இவை எல்லாம் இணைந்த 06 கிலோமீற்றர் நீளமுடைய வீதிகள் நீண்ட காலமாகப் புனரமைக்கப்படாமல் இருக்கின்றன. இது தொடர்பில் RDA தவிசாளருடன் தொடர்புகொண்டு கேட்ட போது, இதற்குப் பணம் இல்லை என்று சொன்னார். ஆனால், இலங்கையில் பெரிய பெரிய projectகள் எல்லாம் மேற்கொள்ளப்பட்டு வருகின்றன. அதேநேரம் நீங்கள் Cabinet Paper சமர்ப்பித்து கொக்கிளாய் bridgeஐ அமைப்பதற்குக் காரணம் அந்தப் பிரதேசத்தில் அவசரமாகத் தென்பகுதி ஆட்களை குடியமர்த்துவதாகும். ஆனால், அங்கு RDAக்குச் சொந்தமான ஆறே ஆறு கிலோ மீற்றர் நீளமுடைய, நீண்ட காலமாகப் புனரமைக்கப்படாமல் இருக்கின்ற வீதிகளைப் புனரமைத்துத் தருமாறு கேட்டால், அதற்கு அரசாங்கத்திடம் காசு இல்லை என்று சொல்லப்படுகின்றது.

ගරු කබීර් හාෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඇසූ එම අතුරු ප්‍රශ්නයට මා සිංහලෙන් පිළිතුරු දෙන්නම්. ඔබතුමා කියනවා, මන්නාරමේ කිලෝමීටර් හයක පමණ පාරවල් කාලයක් තිස්සේ හැදිලා නැහැයි කියලා.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
ඇමතිතුමා දන්නවා.

ගරු කබීර් හාෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
හරි. ඇමතිතුමාත් සිටියදී තමයි මා ඒ ගැන කියන්නේ. 2008 වසරේ පමණ ඉඳලා මේ රටේ මහාමාර්ග අමාත්‍යාංශය තිබුණේ හිටපු ජනාධිපතිතුමා යටතේයි. එතුමාගේ කාලයේ දී රුපියල් කෝටි ගණනක ණයත් අරගෙන, එතුමා අමාත්‍යවරයා හැටියට උතුරේ මෙපමණ වැඩ කළාය කියලා පම්පෝරි ගහනකොට මා හිතුවා, ඒ ගොල්ලන් මෙවැනි කුඩා පාරවල් හදලා ඇතියි කියලා. මෙය කිලෝමීටර් 6ක ප්‍රශ්නයක් තමයි. මේවා RDA එකට අයිති අතුරු පාරවල්. [බාධා කිරීමක්] ඔබතුමා එය මට ලිඛිතව ඉදිරිපත් කරන්න. එය ඇස්තමේන්තු කරලා එයට අවශ්‍ය ප්‍රතිපාදන සොයා දීමේ කටයුත්ත මා භාර ගන්නම්. [බාධා කිරීමක්] සල්ලි ගැන ප්‍රශ්නයක් නැහැ. අපි කෙසේ හෝ සල්ලි හොයලා ව්‍යාපෘතියක් යටතේ ඒක කරලා දෙන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 9 -488/'18- (1), ගරු හෙක්ටර් අප්පුහාමි මහතා.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සතියක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 10 -512/'18- (1), ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

රත්නපුර, නිවිතිගල මැතිවරණ කොට්ඨාසයේ "අයි - රෝඩ්" ව්‍යාපෘතිය: වැඩ අත්හිටුවීම
இரத்தினபுரி, நிவித்திகல தேர்தல் தொகுதி "ஐ-ரோட்" கருத்திட்டம்: வேலை இடைநிறுத்தம்
"iROAD" PROJECT IN RATNAPURA, NIVITHIGALA ELECTORATE: SUSPENSION OF WORK

513/'18

11. ගරු එච්.එල්. ප්‍රේමලාල් ජයසේකර මහතා
(மாண்புமிகு எச்.எல். பிரேமலால் ஜயசேகர)
(The Hon. H.L. Premalal Jayasekara)
මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, නිවිතිගල මැතිවරණ කොට්ඨාසයේ, "අයි-රෝඩ්" ව්‍යාපෘතිය යටතේ මාර්ග ව්‍යාපෘති 05 ක වැඩ 2015 දෙසැම්බර් මස ආරම්භ කළ බවත්;

(ii) ඉන් ව්‍යාපෘති 02 ක වැඩ අවසන් අදියරේ පවතින අතර ව්‍යාපෘති 03 ක වැඩ අතරමග නතර කර ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) නතර කර ඇති ව්‍යාපෘති නැවත ආරම්භ කරනු ලබන දිනය කවරේද;

(ii) 2017 වර්ෂය තුළදී වැඩ අවසන් කිරීමට නියමිතව තිබූ මෙම ව්‍යාපෘතිවල වැඩ අවසන් කරන කාල සීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்தின், நிவித்திகல தேர்தல் தொகுதியில், "ஐ-ரோட்" கருத்திட்டதின்கீழ் 05 வீதிக் கருத்திட்டங்களுக்குரிய வேலைகள் 2015 திசெம்பர் மாதத்தில் ஆரம்பிக்கப்பட்டதென்பதையும்;

(ii) இதில் 02 கருத்திட்டங்களின் வேலைகள் இறுதிக் கட்டத்தில் உள்ளதென்பதுடன் 03 கருத்திட்டங்களின் வேலைகள் இடைநடுவே நிறுத்தப்பட்டுள்ளதென்பதையும்;

அவர் அறிவாரா?

[ගරු එච්.එල්. ප්‍රේමලාල් ජයසේකර මහතා]

(ஆ) (i) நிறுத்தப்பட்டுள்ள கருத்திட்டங்கள் மீண்டும் ஆரம்பிக்கப்படும் திகதி யாதென்பதையும்;

(ii) 2017ஆம் ஆண்டில் வேலைகள் நிறைவுசெய்யப் படவிருந்த இக்கருத்திட்டங்களின் வேலைகள் நிறைவுசெய்யப்படும் சரியான காலகட்டம் யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Highways and Road Development:

(a) Is he aware that-

(i) work on 05 road projects in the Nivithigala electorate of the Ratnapura District commenced in December 2015 under the "iRoad" project;

(ii) work in 02 of the aforesaid projects has reached its final stage while work has been suspended in 03 of the projects;

(b) Will he inform this House-

(i) the date on which the suspended projects will re-commence;

(ii) the deadlines set for these projects which are expected to be completed within year 2017?

(c) If not, why?

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නිවිතිගල මැතිවරණ කොට්ඨාසයේ මාර්ග ව්‍යාපෘති 5ක වැඩ 2015 වර්ෂයේදී ආරම්භ කර ඇත.

(ii) කිලෝමීටර් 5.2ක් පමණ වන මාරපන මඩ හන්දිය සිට දෑල මාර්ගයේ කිලෝමීටර 5.05ක් කාපට් අතුරා සම්පූර්ණ කර ඇත. මාර්ග උරහිස් සැකසීමට ඇත.

සිදුරුපිටිය හන්දිය වත්තහේන පිටකැලය මාර්ගයද, ඇලපාත දම්මේ හන්දිය සිට දම්මේ ප්‍රජා ශාලාව දක්වා මාර්ගයද, ලබුවත්ත හන්දිය සිට පින්නගල හරහා හපුගහවෙල හන්දිය දක්වා මාර්ගයේද වැඩ දැනට නවතා ඇත. පලාවෙල අයගම මාර්ගයේද වැඩ ආරම්භ කර, දරුණු නාය යෑම් නිසා NBRO (ජාතික ගොඩනැඟිලි පර්යේෂණ ආයතනයේ) උපදෙස් ලැබෙන තුරු වැඩ නවතා ඇත.

(ආ) (i) සිදුරුපිටිය හන්දිය වත්තහේන පිටකැලය මාර්ගයේ වැඩ 2018.05.15 දින සිට නැවත ආරම්භ කර ඇත.

මාරපන මඩ හන්දිය සිට දෑල මාර්ගය, ඇලපාත දම්මේ හන්දිය සිට දම්මේ ප්‍රජා ශාලාව මාර්ගය හා ලබුවත්ත හන්දිය සිට පින්නගල හරහා හපුගහවෙල හන්දිය යන මාර්ගවල වැඩ 2018 ජූලි/ අගෝස්තු මාසවලදී ආරම්භ කිරීමට කටයුතු සූදානම් කර ඇත.

පලාවෙල අයගම මාර්ගයේ වැඩ NBRO උපදෙස් ලැබුණු පසු ආරම්භ කරනු ලැබේ.

(ii) කොන්ත්‍රාත් කොන්දේසි අනුව 2018 ඔක්තෝබර් 31 දින දක්වා කොන්ත්‍රාත් සමාගමට කාල දිගුවක් ලබා දී ඇත. ඊට අමතර සමාගමේ ප්‍රමාදයන් සම්බන්ධයෙන් කොන්ත්‍රාත් ගිවිසුම ප්‍රකාර කටයුතු කරන අතර, NBRO නිර්දේශය ලබා ගත යුතු මාර්ගය හැර අනෙකුත් මාර්ගවල වැඩ 2018 වර්ෂය ඇතුළත නිම කිරීමට අපේක්ෂිතය.

(ඇ) අදාළ නොවේ.

ගරු එච්.එල්. ප්‍රේමලාල් ජයසේකර මහතා
(மாண்புமிகு எச்.எல். பிரேமலால் ஜயசேகர)
(The Hon. H.L. Premalal Jayasekara)

ගරු ඇමතිතුමනි, සිදුරුපිටිය වත්තහේන මාර්ගය තවම අබලන් තත්ත්වයේයි තිබෙන්නේ. එහි දොළොස්වල කන්ද, වත්තහේන වැනි දුෂ්කර ගම්මාන රාශියක් තිබෙනවා. පාසල් යන දරුවන් වාගේම රැකියාවලට යන පිරිස් එම පෙදෙස්වල ඉන්නවා. නගරයට පිවිසෙන්න ගියාම ඒ අයට දැඩි අපහසුතාවලට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ඒ මාර්ගයේ වැඩ මේ මාසයේ 5වන දා ආරම්භ කළා. ඒ කටයුතු කඩිනමින් නිම කරන්න කියා මේ අවස්ථාවේදී මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ලබුවත්ත හන්දියේ සිට පින්නගල මාර්ගයේ වැඩ කටයුතුත් තවම ආරම්භ කර නැහැ. ඒකත් පුළුවන් තරම් ඉක්මනින් ආරම්භ කරන්න කියා මා ඔබතුමාගෙන් ඉල්ලනවා. අතුරු ප්‍රශ්න හැටියට අහන්න වෙනත් ප්‍රශ්න නැහැ. කෙසේ හෝ ඉතා ඉක්මනින් මේ කටයුතු ආරම්භ කරන්න කියා මා ඉල්ලා සිටිනවා. "අයි-රෝඩ්" ව්‍යාපෘතිය යටතේ ආරම්භ වුණු තවත් මාර්ග කීපයක් තිබෙනවා. ඒවායෙන් කොටසක වැඩ අවසන් කර තිබෙනවා. එහි තව කොටස් කීපයක වැඩ අවසන් කරන්න තිබෙනවා. ඒ වැඩ කොටසත් අවසන් කිරීම කෙරෙහි ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන්න කියා මා මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එම කාරණා මතක් කළ එක ඉතා හොඳයි. මම මේ ගැන හොයා බැලුවාම දැන ගන්න ලැබුණා, මේ "අයි-රෝඩ්" ව්‍යාපෘතිය යටතේ කොන්ත්‍රාත් භාර ගත්ත කිහිපදෙනකුම ඒ ව්‍යාපෘති නියමිත වෙලාවට සම්පූර්ණ කර නැති බව. සමහර අය දිගටම වැඩ කරගෙන යන්නේ නැතිව කොටස් වශයෙන් අතරමඟ නතර කර තිබෙනවා. ඒ නිසා අපි මේ සම්බන්ධයෙන් නිසි ක්‍රියා මාර්ගයක් ගන්න තීරණය කර තිබෙනවා. විශේෂයෙන් සබරගමුව පළාතේ රත්නපුරය සහ කෑගල්ලටත් මේක අදාළයි. සමහර තැන්වල කොන්ත්‍රාත්කරුවන් සියයට 20ක් විතර වැඩ අවසන් කරලා ඉතිරි ටික නතර කර තිබෙනවා. ඒ ඉතිරි වැඩ කටයුතු වහාම අවසන් කරන්න කියා මම කියලා තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නවා.

ගරු එච්.එල්. ප්‍රේමලාල් ජයසේකර මහතා
(மாண்புமிகு எச்.எல். பிரேமலால் ஜயசேகர)
(The Hon. H.L. Premalal Jayasekara)

නාය යෑමේ තර්ජනය නිසා ඒ අය වැඩ නවත්වා තිබෙනවා, ගරු ඇමතිතුමනි.

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

සමහර තැන්වල නාය යෑමේ තර්ජනය තිබෙන බව ඇත්තයි. නමුත්, සමහර තැන්වල නාය යාම නිසා නොවෙයි, ඒ අය වෙනත්

වැඩ භාරගෙන තිබෙන නිසා මේ වැඩ කරන්නෙත් නැහැ. ඒ නිසා මේ ව්‍යාපෘති නියමිත වෙලාවට සම්පූර්ණ කරන්න අපි දැන් ඒ අයව යොදවනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩලික පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 12 -515/'18- (1), ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

පානීය ජල ව්‍යාපෘති : මුලතිව් දිස්ත්‍රික්කය
குடிநீர் வழங்கல் கருத்திட்டம்: முல்லைத்தீவு மாவட்டம்
DRINKING WATER PROJECTS: MULLAITIVU DISTRICT

411/'18

3. ගරු ඩලස් අලහප්පෙරුම මහතා (ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවට)
(மாண்புமிகு டலஸ் அழகப்பெரும - மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர சார்பாக)
(The Hon. Dullas Alahapperuma on behalf of the Hon. R.M. Padma Udhayashantha Gunasekera)

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 1983 වර්ෂය වනවිට මුලතිව් දිස්ත්‍රික්කය තුළ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් පිරිසිදු පානීය ජලය සපයන ලද නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වන විට පිරිසිදු පානීය ජලය සපයනු ලබන නිවාස සංඛ්‍යාව කොපමණද;

(iii) 1983 වර්ෂයෙන් පසුව යුද්ධය තත්ත්වය නිම වනතුරු පානීය ජලය ලබා දීම වෙනුවෙන් එක් එක් වර්ෂය සඳහා රජය විසින් වෙන් කරන ලද මුළු මුදල කොපමණද;

(iv) යුද්ධය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය වන තෙක් පානීය ජලය ලබා දීමේ ව්‍යාපෘති වෙනුවෙන් රජය වෙන් කරන ලද මුළු මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉහත සියල්ලෙහිම ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல் மற்றும் நீர்வழங்கல் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1983ஆம் ஆண்டளவில் முல்லைத்தீவு மாவட்டத்தில் தேசிய நீர் வழங்கல் மற்றும் வடிகால மைப்புச் சபையினால் சுத்திகரிக்கப்பட்ட குடிநீர் வழங்கப்பட்டிருந்த வீடுகளின் எண்ணிக்கை யாது;

(ii) இன்றளவில் சுத்திகரிக்கப்பட்ட குடிநீர் வழங்கப் படுகின்ற வீடுகளின் எண்ணிக்கை யாது;

(iii) 1983ஆம் ஆண்டின் பின்னர் யுத்த நிலைமை முடிவடையும்வரை குடிநீர் வழங்குவதற்காக ஒவ்வோர் ஆண்டிற்கும் அரசாங்கம் ஒதுக்கிய மொத்தப் பணத்தொகை யாது;

(iv) யுத்த நிலைமை முடிவடைந்த பின்னர், 2015 ஆம் ஆண்டுவரை குடிநீர் வழங்கல் கருத்திட்டங் களுக்காக அரசாங்கம் ஒதுக்கிய மொத்த பணத் தொகை ஆண்டுவாரியாக தனித்தனியாக எவ்வளவு;

(v) மேற்படி அனைத்தினதும் முன்னேற்ற அறிக் கையைச் சமர்ப்பிப்பாரா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of City Planning and Water Supply:

(a) Will he inform this House-

(i) how many households within the Mullaitivu District had been connected to the supply of clean drinking water by the National Water Supply and Drainage Board by 1983;

(ii) how many households are provided with clean drinking water at present;

(iii) what amount in full was allocated by the Government in each year for providing drinking water until the end of the war situation after 1983;

(iv) what amounts in full was allocated by the Government for projects implemented for the supply of drinking water, separately in respect of each of the years following the war situation until the year 2015; and

(v) whether he will table a progress report on all above?

(b) If not, why?

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) යුද්ධය වාතාවරණය පැවැති කාලය තුළ සියලු ලියකියවිලි විනාශ වී ඇති හෙයින් මේ සම්බන්ධයෙන් කිසිදු දත්තයක් නොමැත.

(ii) 2018.03.31 දිනට ගෘහස්ථ ජල සම්බන්ධන සංඛ්‍යාව 968කි.

(iii) යුද්ධය වාතාවරණය පැවැති කාලය තුළ සියලු ලියකියවිලි විනාශ වී ඇති හෙයින් මේ සම්බන්ධයෙන් කිසිදු දත්තයක් නොමැත.

[ගරු රවුෆ් හකීම් මහතා]

(iv)

අංකය	ජල සම්පාදන ව්‍යාපෘති	රුපියල් මිලියන					සටහන
		2011	2012	2013	2014	එකතුව	
1	ඔඩ්ඩුසුඩාන්	15.2	30.5	63.6	44.8	154.1	උතුරු
2	නෙඩුන්කර්නි	24.54	23.63	22.4	33.93	104.5	නදිසි
3	පාන්ඩියන් කුලම	14.3	44.1	12.3	30.5	101.2	ප්‍රතිසාධන
4	මල්ලාවි	17.09	31.3	42.1	25.2	116.5	ව්‍යාපෘතිය
සම්පූර්ණ එකතුව		71.94	129.53	140.4	134.43	476.3	

2009 සිට 2014 දක්වා වෙන් කරන ලද මුදල : රු.මි 476.3කි.

(v) ඔව්.

අංකය	ජල සම්පාදන ව්‍යාපෘතිය	වෙන් කරන ලද මුදල (රුපියල්)	ජල සම්බන්ධන ගණන	සටහන
1	ඔඩ්ඩුසුඩාන්	154,085,614.51	282	
2	නෙඩුන්කර්නි	104,531,701.22	183	උතුරු
3	පාන්ඩියන් කුලම	101,161,300.12	262	නදිසි
4	මල්ලාවි	116,493,739.15	420	ප්‍රතිසාධන
මුළු මුදල රුපියල්		476,272,355.00		ව්‍යාපෘතිය

(ආ) අදාළ නොවේ.

වාද්දුව - මොරොන්තුඩුව මාර්ගය සංවර්ධනය: විස්තර
வாத்துவ - மொறன்துடுவ வீதி விஸ்தரிப்பு: விபரம்
DEVELOPMENT OF WADDUWA-MORONTHUDUWA ROAD : DETAILS

440/'18

4. ගරු ඩලස් අලහප්පෙරුම මහතා (ගරු ජයන්ත සමරවීර මහතා වෙනුවට)

(மாண்புமிகு டலஸ் அழஹப்பெரும - மாண்புமிகு ஜயந்த சமரவீர சார்பாக)

(The Hon. Dullas Alahapperuma on behalf of the Hon. Jayantha Samaraweera)

මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වාද්දුව හන්දියේ සිට, මොරොන්තුඩුව හන්දිය දක්වා දිවෙන වාද්දුව - මොරොන්තුඩුව මාර්ගය පුළුල් කර සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සහ අවසන් කිරීමට යෝජිත දින කවරේද;

(ii) එම මාර්ගයේ දිග, දැනට තාර යොදා ඇති ප්‍රමාණයේ පළල හා මුළු පළල කොපමණද;

(iii) කාපට් ඇතිරීමට බලාපොරොත්තු වන පළල සහ සංවර්ධනයෙන් අනතුරුව, පාරේ මුළු පළල කොපමණද;

(iv) සංවර්ධනය කරනු ලබන පාලම් සංඛ්‍යාව සහ බෝක්කු සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එම මාර්ග ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කර ඇති මුළු මුදල කොපමණද;

(ii) එම මුදලින් ඉඩම් හා දේපළ වන්දි ලෙස වෙන්කර ඇති මුදල කොපමණද;

(iii) ඉදිකිරීම් කාර්යය සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(iv) ඉදිකිරීම් කාර්යය සිදු කරන්නේ කවුරුන් විසින්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ, නම් ඒ මන්ද?

நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வாத்துவ சந்தியில் இருந்து மொறன்துடுவ சந்தி வரை செல்கின்ற வாத்துவ - மொறன்துடுவ வீதியை விஸ்தரித்து அபிவிருத்திசெய்யும் கருத்திட்டத்தை ஆரம்பிக்க மற்றும் நிறைவுசெய்ய உத்தேசித்துள்ள திகதிகள் யாவை;

(ii) அந்த வீதியின் நீளம், தற்போது தார் இடப் பட்டுள்ள அளவின் அகலம் மற்றும் மொத்த அகலம் எவ்வளவு;

(iii) காபற் இடுவதற்கு எதிர்பார்த்துள்ள அகலம் மற்றும் அபிவிருத்திக்குப் பின்னரான வீதியின் மொத்த அகலம் எவ்வளவு;

(iv) அபிவிருத்தி செய்யப்படுகின்ற பாலங்களின் எண்ணிக்கை மற்றும் மதகுகளின் எண்ணிக்கை எவ்வளவு;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி வீதிக் கருத்திட்டத்திற்காக மதிப்பீடு செய்யப்பட்டுள்ள மொத்தப் பணத்தொகை எவ்வளவு;

(ii) மேற்படி பணத்தொகையில் காணிகள் மற்றும் ஆதனங்களின் இழப்பீட்டுக்காக ஒதுக்கப் பட்டுள்ள பணத்தொகை எவ்வளவு;

(iii) நிர்மாணப் பணிகளுக்காக ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை எவ்வளவு;

(iv) நிர்மாணப் பணிகள் யாரால் மேற்கொள்ளப் படும்;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Highways & Road Development:

(a) Will he inform this House-

(i) the dates on which the project for the expansion and development of Wadduwa-Moronthuduwa Road from Wadduwa Junction to Moronthuduwa Junction is proposed to be commenced and completed;

(ii) the total area of the said road and the width of the extent which has been tarred;

(iii) the width of the extent which is expected to be carpeted and the total width of the road after completing the development; and

(iv) the number of bridges and culverts that are developed?

(b) Will he also inform this House-

(i) the total estimate for the said road project ;

(ii) the amount that has been allocated as compensation for lands and property, out of the above estimate;

(iii) the amount of money allocated for the construction purpose; and

(iv) as to who has undertaken the construction activity?

(c) If not, why

ගරු කබීර් හාෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ආරම්භ දිනය - 2015.10.05
අවසන් කිරීමට යෝජිත දිනය - 2019.07.05
(ii) මාර්ගයේ දිග - කිලෝමීටර් 5.3
දැනට තාර දමා ඇති ප්‍රමාණයේ පළල - මීටර් 4.5
මුළු පළල (දළ වශයෙන්) - මීටර් 10
(iii) කාපට් ඇතිරීමට බලාපොරොත්තු වන පළල - මීටර් 7.6
සංවර්ධනයෙන් අනතුරුව පාරේ මුළු පළල - මීටර් 12.2
(iv) සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන පාලම් සංඛ්‍යාව - නැත.
සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වන බෝක්කු සංඛ්‍යාව - 17

(ආ) (i) රුපියල් මිලියන 799.2කි.
(ii) රුපියල් මිලියන 420කි.
(iii) රුපියල් මිලියන 379.2කි.
(iv) මාගා ඉංජිනේරු (පුද්.) සමාගම

(ඇ) අදාළ නොවේ.

කර්මාන්ත හා වාණිජ කටයුතු ඇමතිවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය: නිල වාහන
கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சரது பிரத்தியேகப் பதவியணி: உத்தியோகபூர்வ வாகனங்கள்
PERSONAL STAFF OF MINISTER OF INDUSTRY AND COMMERCE: OFFICIAL VEHICLES

447/'18

5. ගරු ඩලස් අලහප්පෙරුම මහතා (ගරු බිමල් රත්නායක මහතා වෙනුවට)
(மாண்புமிகு டலஸ் அழகப்பெரும - மாண்புமிகு பிமல் ரத்நாயக்க சார்பாக)
(The Hon. Dullas Alahapperuma on behalf of the Hon. Bimal Rathnayake)

කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சரின் பிரத்தியேக பதவியணிக்கு இணைக்கப் பட்டுள்ள உத்தியோகபூர்வ வாகனங்கள் வழங்கப் பட்டுள்ள ஒவ்வோர் உத்தியோகத்தரதும் பெயர், பதவி, ஒதுக்கப்பட்டுள்ள வாகனத்தின் வகை, பதிவிலக்கம் மற்றும் அவ்விதம் ஒதுக்குவதற்கு அங்கீகாரம் வழங்கியது யார் என்பதை வெவ்வேறாக அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Industry and Commerce:

(a) Will he inform this House separately the name and designation of each officer who is attached to the personal staff of the Minister of Industry and Commerce and those who have been allocated with official vehicles, along with details on the type of vehicle allocated to them, registration number and the name of the officer who authorized such allocation of a vehicle?

(b) If not, why?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ)

අනු අංකය	නිලධාරියාගේ නම	තනතුර	වෙන් කර ඇති වාහනයේ වර්ගය	ලියාපදිංචි අංකය	වෙන් කිරීම සඳහා අනුමැතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද
1	එම්. රිෆ්ඛාන් බදියුදීන් මයා	පෞද්ගලික ලේකම්	කාර්	KL - 4080	අතිරේක ලේකම් (පාලන)
2	ජේ.එම්. නලීම් මයා	සම්බන්ධීකරණ ලේකම්	ඩබල් කැබ්	PH - 1235	අමාත්‍යාංශ ලේකම්
3	එස්.ආර්.එම්.එම්. ඉර්ෂාඩ් මයා	සම්බන්ධීකරණ ලේකම්	ඩබල් කැබ්	PH - 1243	අමාත්‍යාංශ ලේකම්

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

අනු අංකය	නිලධාරියාගේ නම	තනතුර	වෙන් කර ඇති වාහනයේ වර්ගය	ලියා පදිංචි අංකය	වෙන් කිරීම සඳහා අනුමැතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද
4	ජෝශප් තවරාජා මයා	මාධ්‍ය ලේකම්	ඩබල් කැබ්	PF - 6283	අමාත්‍යාංශ ලේකම්
5	අයි.එස්.එම්. මොහිදීන් මයා	මහජන සම්බන්ධතා නිලධාරි	ඩබල් කැබ්	PF - 8051	අමාත්‍යාංශ ලේකම්
6	ජේ.එම්.සී. රෝයි ජයසිංහ මයා	උපදේශක	කාර්	KH - 6369	අමාත්‍යාංශ ලේකම්

(ආ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 7 -480/'18- (1), ගරු ඩී.වී. චානක මහතා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක් කල් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කොළඹ මහාධිකරණයේ නඩු අංක එච්. සී./4648/2009: විස්තර
கொழும்பு மேல் நீதிமன்ற வழக்கு இலக்கம் H.C/4648/2009: விபரம்
COLOMBO HIGH COURT CASE NO. H.C./4648/2009: DETAILS

512/'18

10. **ගරු ඩලස් අලහප්පෙරුම මහතා (ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා වෙනුවට)**
(மாண்புமிகு டலஸ் அழகப்பெரும - மாண்புமிகு மொஹான் பிரியதர்ஷன த சில்வா சார்பாக)
(The Hon. Dullas Alahapperuma on behalf of the Hon. Mohan Priyadarshana De Silva)
අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළඹ මහාධිකරණයේ විභාග වූ අංක - එච්. සී./4648/2009 (නීතිපතිගේ අංක - සී. ආර්. - 2/26/2009) නඩුවේ චිත්තිකරුවන් කවුරුන්ද;

(ii) එම අධි චෝදනා පත්‍රයේ නහා තිබූ අධි චෝදනා කවරේද;

(iii) එකී අධි චෝදනාවලින් සියලුම චිත්තිකරුවන් නිදොස් කිරීමක් කර තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) එසේ නිදහස් කළද, නීතිපතිවරයාට නැවතත් චෝදනා නිසි ලෙස සංස්ථාපනය කිරීමට හැකි බව තීන්දුවේ දන්වා තිබේද;

(ii) ඒ අනුව, නීතිපතිවරයා විසින් චෝදනා නිසි ලෙස සංස්ථාපනය කර චිත්තිකරුවන්ට එරෙහිව නැවත නඩු පැවරීමක් කරනු ලබන්නේද;

(iii) එසේ නම්, නැවත නඩු පවරනු ලබන්නේ කවර කාලයක් තුළද;

(iv) එසේ නඩු නොපවරන්නේ නම්, එකී තීරණයට අදාළ හේතු පිළිබඳව දැනුවත් කරන්නේද;

යන්න එතුමිය සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

நீதி மற்றும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு கேட்ட வினா:

(அ) (i) கொழும்பு மேல் நீதிமன்றத்தில் விசாரிக்கப்பட்ட H.C/4648/2009 ஆம் இலக்க (சட்டத்துறைத் தலைமையதிபதியின் இலக்கம் சீ.ஆர். 2/26/2009) வழக்கின் பிரதிவாதிகள் யாவர் என்பதையும்;

(ii) அந்தக் குற்றப்பகர்வுப் பத்திரத்தில் முன்வைக்கப் பட்டிருந்த குற்றப் பகர்வுகள் யாவை என்பதையும்;

(iii) அந்த குற்றப்பகர்வுகளிலிருந்து சகல பிரதிவாதி களதும் குற்றம் மற்றவர்கள் என விடுதலை செய்யப்பட்டுள்ளனரா என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) அவ்வாறு விடுவிக்கப்பட்டபோதிலும் சட்டமா அதிபரால் மீண்டும் குற்றச் சாட்டுக்களை உரியவாறு மீள ஸ்தாபிக்க முடியுமென தீர்ப்பில் குறிப்பிடப்பட்டுள்ளதா என்பதையும்;

(ii) அதன்படி, சட்டத்துறைத் தலைமையதிபதி குற்றச்சாட்டுக்களை உரியவாறு மீள ஸ்தாபித்து பிரதிவாதிகளுக்கு எதிராக மீண்டும் வழக்குத் தாக்கல் செய்வாரா என்பதையும்;

(iii) அவ்வாறெனில், மீண்டும் எக்காலத்துக்குள் வழக்கு தாக்கல் செய்யப்படும் என்பதையும்;

(iv) அவ்வாறு வழக்கு தாக்கல் செய்யப்படாவிடின், அந்தத் தீர்மானத்துக்கு ஏதுவான காரணங்கள் தொடர்பாக அறிவூட்டப்படுமா என்பதையும்

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Justice andPrison Reforms:

(a) Will she inform this House-

(i) the defendants of case number H.C./4648/ 2009 (Attorney General's Number C.R.- 2/26/2009) which was heard in the High Court, Colombo;

(ii) the charges raised in the Indictment Paper; and

(iii) whether all the defendants have been acquitted from the aforesaid indictments?

(b) Will she State-

(i) whether it is stated in the Determination that there is a possibility for the Attorney General to amend the accusations for a second time;

(ii) accordingly, whether the defendants are re-filed by the Attorney General having properly amended the accusations;

(iii) if so, the period within which re-filing is done; and

(iv) whether the reasons for the particular decision would be unveiled, if not re-filed thus?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කොළඹ මහාධිකරණ එච්.සී./4648/2009 (නීතිපති යොමු අංකය CR2/26/2009) දරන නඩුවේ චූදිතයන් :

1. සීමාසහිත නෙක්සියා කෝපරේටි කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම;
2. ලින්කන් පියසේන; සහ,
3. රවී සන්දෙෂ් කරුණානායක.

(ii) එම නඩුවේ නඟා තිබූ අධිචෝදනාවන් වූයේ:

01. වර්ෂ 2006 ක්වූ දෙසැම්බර් මස 22 වන දින හෝ ඊට ආසන්න දිනයකදී මෙම අධිකරණයේ බල සීමාව තුල පිහිටි කොළඹ දී 1 වන චූදිත වශයෙන් නම් කර ඇති සමාගම අනේවාසික පදිංචිකරුවෙකු වන ගැලියන් ඉන්ටර්නැෂනල් මාස්ටර් ෆන්ඩ් යන ආයතනය විසින් මෙරටට එවන ලද ඇමරිකානු ඩොලර් මිලියන 01 ක මුදලක සාපේක්ෂ රුපියල් වටිනාකම වන රුපියල් එකසිය හත් මිලියන, හතලිස් නමදහස් හාරසිය හැට හතරක (107,049,464/-) ප්‍රමාණය ශ්‍රී ලංකා මහ බැංකුවේ අවසරයක් නොමැතිව එකී අනේවාසික පදිංචිකරු වෙනුවෙන් හෝ ඒ වෙනුවට සීමාසහිත ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ කිරුළපන ශාඛාවේ ගිණුම අංක 02 -1122258 -02 දරණ ගිණුමේ රඳවා තබා ගැනීමෙන්, 1973 අංක 39 දරණ පනතින් සංශෝධිත 1953 අංක 24 දරණ විනිමය පාලන ආඥා පනත යටතේ 7(ඇ) වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 51(4)(ආ) වගන්තිය යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් සිදු කිරීම.

02. ඉහත සඳහන් වේලාවේදී ස්ථානයේදී හා එකී ක්‍රියාකලාපයේදීම ඉහත නම් සඳහන් 2 වන චූදිත වන යුෂ්මතා ඉහත 1 වන චෝදනාවේ සඳහන් වරද සිදු කිරීමට ආධාර හා අනුබල දුන් බවද, ,එකී අනුබල දීමේ හේතුවෙන් 1 වන චූදිත සමාගම ඉහත 1 වන චෝදනාවේ සඳහන් වරද සිදු කළ බැවින් 2 වන චූදිත වන යුෂ්මතා දණ්ඩ නීති සංග්‍රහයේ 102 වන වගන්තිය සමග කියවිය යුතු 1973 අංක 39 දරණ පනතින් සංශෝධිත 1953 අංක 24 දරණ විනිමය පාලන ආඥා පනත යටතේ 7(ඇ) වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 51(4)(ආ) වගන්තිය යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් සිදු කිරීම.

03. ඉහත සඳහන් වේලාවේදී ස්ථානයේදී හා එකී ක්‍රියාකලාපයේදීම ඉහත නම් සඳහන් 3 වන චූදිත යුෂ්මතා ඉහත 1 වන චෝදනාවේ සඳහන් වරද සිදු කිරීමට ආධාර හා අනුබල දුන් බවද, එකී අනුබල දීමේ හේතුවෙන් 1 වන චූදිත සමාගම ඉහත 1 වන චෝදනාවේ සඳහන් වරද සිදු කළ බැවින්, 3 වන චූදිත වන යුෂ්මතා දණ්ඩ නීති සංග්‍රහයේ 102 වන වගන්තිය සමග කියවිය යුතු 1973 අංක 39 දරණ පනතින් සංශෝධිත 1953 අංක 24 දරණ විනිමය පාලන ආඥා පනත යටතේ 7(ඇ) වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 51 (4) (ආ) වගන්තිය යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් සිදු කිරීම.

04. වර්ෂ 2007 ක් වූ ජනවාරි මස 03 වන දින හෝ ඊට ආසන්න දිනයකදී මෙම අධිකරණයේ බල සීමාව තුල පිහිටි කොළඹ දී 1 වන චූදිත සමාගම අනේවාසික පදිංචිකරුවෙකු වන රාජ් රාජරත්නම් යන අයෙකු විසින් මෙරටට එවන ලද ඇමරිකානු ඩොලර් මිලියන 02 ක මුදලක සාපේක්ෂ රුපියල් වටිනාකම වන රුපියල් දෙසිය දාහතර මිලියන එක්ලක්ෂයක (214,100,000/-) ප්‍රමාණය ශ්‍රී ලංකා මහ බැංකුවේ අවසරයක් නොමැතිව එකී අනේවාසික පදිංචිකරු වෙනුවෙන් හෝ ඒ වෙනුවට සීමාසහිත ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ කිරුළපන ශාඛාවේ ගිණුම අංක 02 – 1122258-02 දරණ ගිණුමේ රඳවා තබා ගැනීමෙන්, 1973 අංක 39 දරණ පනතින් සංශෝධිත 1953 අංක 24 දරණ විනිමය පාලන ආඥා පනත යටතේ 7 (ඇ) වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 51(4)(ආ) වගන්තිය යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් සිදු කිරීම.

05. ඉහත සඳහන් වේලාවේදී ස්ථානයේදී හා එකී ක්‍රියාකලාපයේදීම ඉහත නම් සඳහන් 2 වන චූදිත වන යුෂ්මතා ඉහත 4 වන චෝදනාවේ සඳහන් වරද සිදු කිරීමට ආධාර හා අනුබල දුන් බවද, එකී අනුබල දීමේ හේතුවෙන් 1 වන චූදිත සමාගම ඉහත 4 වන චෝදනාවේ සඳහන් වරද සිදු කළ බැවින් දණ්ඩ නීති සංග්‍රහයේ 102 වන වගන්තිය සමග කියවිය යුතු 1973 අංක 39 දරණ පනතින් සංශෝධිත 1953 අංක 24 දරණ විනිමය පාලන ආඥා පනත යටතේ 7(ඇ) වන වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 51(4)(ආ) වගන්තිය යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් සිදු කිරීම.

06. ඉහත සඳහන් වේලාවේදී ස්ථානයේදී හා එකී ක්‍රියාකලාපයේදීම ඉහත නම් සඳහන් 3 වන චූදිත වන යුෂ්මතා ඉහත 4 වන චෝදනාවේ සඳහන් වරද සිදු කිරීමට අධාර හා අනුබල දුන් බවද, එකී අන්බල දීමේ හේතුවෙන් 1 වන චූදිත සමාගම ඉහත 4 වන චෝදනාවේ සඳහන් වරද සිදු කළ බැවින් , දණ්ඩ නීති සංග්‍රහයේ 102 වන වගන්තිය සමග කියවිය යුතු 1973 අංක 39 දරණ පනතින් සංශෝධිත 1953 අංක 24 දරන විනිමය පාලන ආඥා පනත යටතේ 7(ඇ) වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 51 (4) (ආ) වගන්තිය යටතේ දඩුවම් ලැබිය යුතු වරදක් සිදු කිරීම.

07. ඉහත පළවන චෝදනාවේ සඳහන් ස්ථානයේදී වේලාවේදී හා එකී ක්‍රියා කලාපය තුල පිහිටි කොළඹ දී 2 වන චූදිත වන යුෂ්මතා වරදක් සිදු කිරීම සඳහා එනම්, විනිමය පාලක විසින් 2002 අප්‍රේල් මස 19 වන දිනැති අංක: 1232/14 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමේ 4(ඇ) ඡේදයේ විස්තර කර ඇති කොන්දේසිය උල්ලංඝනය කරමින්, සීමාසහිත යුනියන් බැංකුවේ සමාගම් කොටස් මිලට ගැනීම සඳහා අනේවාසික පදිංචිකරුවකු විසින් එනම්, රාජ් රාජරත්නම් විසින් හෝ ඔහු වෙනුවෙන් එවන ලද ඇමරිකානු ඩොලර් මිලියන 1 ක ප්‍රමාණයක් ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ කිරුළපන ශාඛාවේ සීමාසහිත නෙක්සියා (පුද්ගලික) සමාගම නමින්, කොටස් ආයෝජන බාහිර රුපියල් ගිණුමක් නොවන අංක : 021122258 – 02 දරණ ගිනුම විවෘත කරවා ඕනෑකමින් බැර කරවීමෙන් 1973 අංක 39 දරණ පනතින් සංශෝධිත 1953 අංක 24 දරණ විනිමය පාලන ආඥා පනතේ 7(ආ) හා 48 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 51 (4) (ආ) වගන්තිය යටතේ වරදක් සිදු කිරීම.

08. ඉහත සඳහන් වේලාවේදී ස්ථානයේදී හා එකී ක්‍රියාකලාපයේදීම ඉහත නම සඳහන් 3 වන චූදිත වන යුෂ්මතා ඉහත 7 වන චෝදනාවේ සඳහන් වරද සිදු කිරීමට අධාර හා අනුබල දුන් බවද, එකී අනුබල දීමේ හේතුවෙන් 3 වන චූදිත යුෂ්මතා ඉහත 7 වන චෝදනාවේ සඳහන්

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

වරද සිදු කළ බැවින්, 3 වන චූදිත වන යුෂ්මතා දණ්ඩ නීති සංග්‍රහයේ 102 වන වගන්තිය සමඟ කියවිය යුතු 1973 අංක 39 දරණ පනතින් සංශෝධිත 1953 අංක 24 දරණ විනිමය පාලන ආඥා පනත යටතේ 7 (ඇ) හා 48 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 51 (4) (අ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කිරීම.

09. ඉහත 4 වන චෝදනාවෙහි සඳහන් වේලාවේදී ස්ථානයේදී හා එම ක්‍රියා කලාපයේදීම හා එකී ක්‍රියා කලාපය තුල පිහිටි කොළඹ දී 2 වන චූදිත වන යුෂ්මතා වරදක් සිදු කිරීම සඳහා එනම්, විනිමය පාලක විසින් 2002 අප්‍රේල් මස 19 වන දිනැති අංක: 1232/14 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද දැන්වීමේ 4(ඇ) ඡේදයේ විස්තර කර ඇති කොන්දේසිය උල්ලංඝණය කරමින් සීමාසහිත යුනියන් බැංකුවේ සමාගම් කොටස් මිලට ගැනීම සඳහා අනේවාසික පදිංචිකරුවකු විසින් හෝ ඔහු වෙනුවෙන් එවන ලද ඇමරිකානු ඩොලර් මිලියන 2 ක ප්‍රමාණයක් ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවේ කිරුළපන ශාඛාවේ සීමාසහිත නෙක්සියා (පුද්ගලික) සමාගම නමින්, කොටස් ආයෝජන බාහිර රුපියල් ගිණුමක් නොවන, අංක : 021122258-02 දරන ගිණුම විවෘත කරවා ඕනෑකමින් බැර කරවීමෙන් 1973 අංක : 39 දරන පනතින් සංශෝධිත 1953 අංක : 24 දරණ විනිමය පාලන ආඥා පනතේ 7 (ආ) හා 48 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 51 (4) වගන්තිය යටතේ වරදක් සිදු කිරීම.

10. ඉහත 9 වන චෝදනාවේ සඳහන් කාල සීමාව තුලදී ස්ථානයේදී හා එකී ක්‍රියාකලාපයේදීම ඉහත නම් සඳහන් 3 වන චූදිත වන යුෂ්මතා ඉහත 9 වන චෝදනාවේ සඳහන් වරද සිදු කිරීමට අධාර හා අනුබල දුන් බවද, එකී අනුබල දීමේ හේතුවෙන් 2 වන චූදිත වන යුෂ්මතා ඉහත 9 වන චෝදනාවේ සඳහන් වරද සිදු කළ බැවින් 3 වන චූදිත වන යුෂ්මතා දණ්ඩ නීති සංග්‍රහයේ 102 වන වගන්තිය සමඟ කියවිය යුතු 1973 අංක : 39 දරණ පනතින් සංශෝධිත 1953 අංක 24 දරන විනිමය පාලන ආඥා පනත යටතේ 7(ඇ) හා 48 වන වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 51 (4) (ආ) වගන්තිය යටතේ දඬුවම් ලැබිය යුතු වරදක් සිදු කිරීම.

(iii) නැත. නිදහස් කිරීමක් පමණි.

(අ) (i) ඔව්

(ii) එම කරුණ සලකා බලමින් පවතී

(iii) එවැනි තීරණයක් ගන්නේ නම් එම තීරණයෙන් අනතුරුව නොපමාව.

(iv) ඔව්

(ඇ) අදාළ නැත.

[මෙම පිළිතුර පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த விடை நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது.]
[This answer is also placed in the Library.]

කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව: 2017 සඳහා වෙන් කළ මුදල

மகளிர் தொடர்பான தேசிய குழு: 2017க்கு ஒதுக்கிய பணம்

NATIONAL COMMITTEE ON WOMEN : MONEY ALLOCATED FOR 2017

515/'18

12. ගරු ඩලස් අලහප්පෙරුම මහතා (ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා වෙනුවට)
(மாண்புமிகு டலஸ் அழகப்பெரும - (மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத் சார்பாக)
(The Hon. Dullas Alahapperuma on behalf of the Hon. Indika Anuruddha Herath)

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දිවයිනේ සිටින ස්ත්‍රී, ළමා, තරුණ, සහ වැඩිහිටි ජනගහනය අනුපිළිවෙලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) කාන්තාවන් පිළිබඳ ජාතික කමිටුව පවත්වාගෙන යෑම සඳහා 2017 වර්ෂයට අය වැයෙන් වෙන් වූ මුදල කොපමණද;

(iii) එහි වර්තමාන ක්‍රියාකාරීත්වය කවරේද;

(iv) ප්‍රචණ්ඩත්වය හේතුවෙන් අසරණ වී දිවි ගෙවන කාන්තාවන්ට නිවාස හා වෙනත් සහන ලබා දීමට 2017 වර්ෂය සඳහා අය වැයෙන් වෙන් වූ මුදල කොපමණද;

(v) එම සහන ලබා දීම ක්‍රියාත්මක වන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நாட்டிலுள்ள பெண்கள், சிறுவர்கள், இளைஞர்கள் மற்றும் முதியோரின் சனத் தொகை முறையே தனித்தனியாக யாது என்பதையும்;

(ii) மகளிர் தொடர்பான தேசிய குழுவை பேணி வருவதற்கு 2017ஆம் ஆண்டுக்காக வரவு செலவுத் திட்டத்தின் மூலம் ஒதுக்கப்பட்ட பணத் தொகை யாது என்பதையும்;

(iii) அதன் தற்போதைய செயற்படுநிலை யாது என்பதையும்;

(iv) வன்முறைகள் காரணமாக நிர்க்கதிக்குள்ளாகி வாழ்ந்துகொண்டிருக்கும் பெண்களுக்கு வீடுகள் மற்றும் ஏனைய நிவாரணங்களை வழங்க 2017ஆம் ஆண்டிற்காக வரவு செலவுத் திட்டத்தின்மூலம் ஒதுக்கப்பட்ட பணத்தொகை யாது என்பதையும்;

(v) குறித்த நிவாரணங்களை வழங்குதல் நடை முறைப்படுத்தப்படும் திகதி யாது என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Women and Child Affairs:

(a) Will she inform this House-

(i) separately, the population of women, children, youths and the elderly living in this country respectively;

(ii) the amount of money that was allocated from the Budget for the year 2017 for the functioning of the National Committee on Women;

(iii) the present state of the functioning of that Committee;

(iv) the amount of money that was allocated from the Budget for the year 2017 for providing houses and other relief measures to women who are rendered destitute due to violence; and

(v) the date from which provision of such relief measures would be commenced?

(b) If not, why?

ගරු චන්ද්‍රානි බණ්ඩාර මහත්මිය (කාන්තා හා ළමා කටයුතු අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) சந்திராணி பண்டார - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Mrs.) Chandrani Bandara - Minister of Women and Child Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ස්ත්‍රී - 10.5 මිලියන

ළමා - 3.19 මිලියන (වයස අවුරුදු 0- 18)

තරුණ - 1.76 මිලියන (වයස අවුරුදු 18 - 29)

වැඩිහිටි - 5.55 මිලියන (වයස අවුරුදු 29ට වැඩි)

(ජන හා නිවාස සංගණනය 2012)

(ii) රු. මිලියන 8කි.

(iii)

1. කාන්තාවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ප්‍රතිපත්තිමය ක්‍රියාකාරකම් සිදු කිරීම.
2. කාන්තාවන්ට එරෙහි වන නීති සංශෝධනය හා නව නීති සංශෝධනය පිළිබඳව ක්‍රියා කිරීම.
3. කාන්තා ගැටලු පිළිබඳ පර්යේෂණ දියත් කිරීම හා එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා අදාළ ආයතන වෙත නිර්දේශ යොමු කිරීම.
4. ස්ත්‍රී, පුරුෂ සමාජභාවය මත ඇති වන වෙනස්කම් පිළිබඳ වූ පැමිණිලි පිළිගැනීම, සංනිරීක්ෂණය හා ඒවා අදාළ පාලක, බලධාරීන්, සම්බන්ධිත තැනැත්තන් හෝ මණ්ඩල වෙත අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා යොමු කිරීම.
5. ස්ත්‍රී, පුරුෂ සමාජභාවීය පැමිණිලි මධ්‍යස්ථානයේ කාර්ය භාරයේ ප්‍රසාරණය වීමක් වශයෙන් 2014 වර්ෂයේ ආරම්භ කරන ලද 1938 කාන්තා උපකාරක දුරකථන සේවය දැක්විය හැකි අතර, ලැබෙන පැමිණිලි පිළිබඳව පොලිසිය වෙත යොමු කිරීම, නෛතික ආධාර හෝ සමථ සේවා සඳහා රජයේ හෝ රජයේ නොවන සංවිධාන වෙත යොමු කිරීම.
6. කාන්තාවන්ට එරෙහි හිංසන වැළැක්වීම උදෙසා නීති හා උපදේශන සහන සැලසීම.
7. ස්ත්‍රී, පුරුෂ සමාජභාවීය හිංසන වැළැක්වීම උදෙසා උද්දේශනය කිරීම.
8. දේශපාලනයේ කාන්තා නියෝජනය ඉහළ නැංවීම උදෙසා උද්දේශනය, සුහුණු වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

(iv) "ප්‍රචණ්ඩත්වය හේතුවෙන් අසරණ වී දිවි ගෙවන කාන්තාවන්ට නිවාස හා වෙනත් සහන" ලබා දීමට සෘජු ලෙසම අමාත්‍යාංශයේ සංවර්ධන අංශය සඳහා ප්‍රතිපාදන වෙන් වී නොමැත. එහෙත් 2017 වර්ෂයේ අමාත්‍යාංශය සඳහා භාණ්ඩාගාරය විසින් වෙන් කරන ලද මුළු ඇස්තමේන්තු මුදලින් රු.මි. 50කට ආසන්න ප්‍රමාණයක් ප්‍රචණ්ඩත්වය හේතුවෙන් පීඩාවට පත් කාන්තාවන්ට හා දරුවන්ට සේවා සැපයීමට අවශ්‍ය කටයුතු සඳහා වෙන් කරන ලදී. ඒ අනුව එම ප්‍රතිපාදන යටතේ පහත සඳහන් ක්‍රියාකාරකම් අමාත්‍යාංශයේ සංවර්ධන අංශය විසින් ක්‍රියාත්මක කරන ලදී.

- ප්‍රචණ්ඩත්වයෙන් පීඩාවට පත් කාන්තාවන් හා ඔවුන්ගේ දරුවන් වෙනුවෙන් කාන්තා රැකවරණ නිවාස පවත්වා ගෙන යාම හා නඩත්තු කිරීම.
- පොලිස් ස්ථානයන්හි නව පොලිස් ළමා හා කාන්තා කාර්යාංශ ඉදි කිරීම.
- මොනරාගල දිස්ත්‍රික් රෝහලේ කාන්තා හා ළමා ආරක්ෂිත රැඳවුම් මධ්‍යස්ථානයක් ඉදි කිරීම.
- කාන්තා ගෘහ මූලික පවුල් සඳහා ජාතික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.
- විදේශ ආධාර මත ක්‍රියාත්මක වූ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන යටතේ සකස් කරන ලද ස්ත්‍රී, පුරුෂ සමාජභාවීය හිංසනය අවම කිරීම සඳහා වූ ජාතික ක්‍රියාකාරී සැලැස්මේ ක්‍රියාකාරකම් ඇගයීම හා පසුවිපරම.
- එක්සත් ජාතීන්ගේ ජනගහන අරමුදලේ ආධාර මත ප්‍රචණ්ඩත්වයට පත් කාන්තාවන් හා දරුවන් සඳහා සේවා සපයන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන ජාලගත කිරීම සඳහා වූ දිස්ත්‍රික් වැඩසටහන්, වැඩමුළු පැවැත්වීම.
- ජාතික කාන්තා කමිටුවට, ප්‍රචණ්ඩත්වය හේතුවෙන් අසරණ වී දිවි ගෙවන කාන්තාවන්ට නිවාස හා වෙනත් සහන ලබා දීමට 2017 වර්ෂයේ අය වැයෙන් ප්‍රතිපාදන වෙන් වී නැත.

(v) දැනටමත් මෙම වැඩසටහන් ක්‍රියාත්මක වෙමින් පවතී.

(ආ) අදාළ නොවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රධාන කටයුතු ආරම්භයේදී, පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම් දීම.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெருமa)
(The Hon. Dullas Alahapperuma)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊට ප්‍රථම වැදගත් කාරණයක් කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවන්නට මට අවස්ථාව දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, මේ වැඩකටයුතු ටික අවසන් කරලා ඔබතුමාට අවස්ථාවක් දෙන්නම්.

පනත් කෙටුම්පත් පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
BILLS PRESENTED

බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත
இருப்பிடக்கூறு சொத்தாண்மை (விசேட ஏற்பாடுகள்) சட்டமூலம்
APARTMENT OWNERSHIP (SPECIAL PROVISIONS) BILL

"රජයට හෝ රජයේ නියෝජ්‍යායතනයකට අයිති ඇතැම් සභාධිපත්‍ය දේපළ ලියාපදිංචි කිරීම සහ බැහැර කිරීම සඳහා පහසුකම් සැලැස්වීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

පිළිගන්වන ලද්දේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා වෙනුවට ගරු ගයන්ත කරුණාතිලක මහතා විසිනි.

2018 ජූලි 03 වන අඟහරුවාදා දෙ වන වර කියවිය යුතුයයි ද, එය මුද්‍රණය කළ යුතුයයි ද, අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවට යොමු කළ යුතුයයි ද නියෝග කරන ලදී.

வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை அமைச்சர்.சார்பில் மாண்புமிகு கயந்த கருணாதிலக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.

2018 யூலை 03, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் உரிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட வேண்டு மெனவும் கட்டளையிடப்பட்டது.

Presented by the Hon. Gayantha Karunatileka on behalf of the Minister of Housing and Construction; to be read a Second time upon Tuesday, 03rd July, 2018 and to be printed; and to be referred to the relevant Sectoral Oversight Committee.

අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා
அமைச்சுசார் ஆலோசனைக் குழுக்கள்
MINISTERIAL CONSULTATIVE COMMITTEES

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

I move,

"Forty Three (43) Ministerial Consultative Committees be appointed to be designated as follows:-

Ministerial Consultative Committee on Defence
Ministerial Consultative Committee on Mahaweli Development and Environment
Ministerial Consultative Committee on National Policies and Economic Affairs
Ministerial Consultative Committee on Tourism Development and Christian Religious Affairs
Ministerial Consultative Committee on Buddhasasana
Ministerial Consultative Committee on Transport and Civil Aviation
Ministerial Consultative Committee on Finance and Mass Media
Ministerial Consultative Committee on Science, Technology, Research, Skills Development and Vocational Training and Kandyan Heritage
Ministerial Consultative Committee on City Planning and Water Supply
Ministerial Consultative Committee on Public Enterprise and Kandy City Development
Ministerial Consultative Committee on Foreign Affairs
Ministerial Consultative Committee on Ports and Shipping
Ministerial Consultative Committee on Home Affairs
Ministerial Consultative Committee on Health, Nutrition and Indigenous Medicine
Ministerial Consultative Committee on Internal Affairs and Wayamba Development
Ministerial Consultative Committee on Industry and Commerce
Ministerial Consultative Committee on Megapolis and Western Development
Ministerial Consultative Committee on Agriculture
Ministerial Consultative Committee on Plantation Industries
Ministerial Consultative Committee on Power and Renewable Energy
Ministerial Consultative Committee on Irrigation and Water Resources and Disaster Management
Ministerial Consultative Committee on Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs
Ministerial Consultative Committee on Social Empowerment
Ministerial Consultative Committee on Highways and Road Development
Ministerial Consultative Committee on Public Administration and Management and Law and Order
Ministerial Consultative Committee on Higher Education and Cultural Affairs
Ministerial Consultative Committee on Housing and Construction
Ministerial Consultative Committee on Petroleum Resources Development
Ministerial Consultative Committee on Hill Country New Villages, Infrastructure and Community Development
Ministerial Consultative Committee on Lands and Parliamentary Reforms
Ministerial Consultative Committee on Women and Child Affairs
Ministerial Consultative Committee on Justice and Prison Reforms
Ministerial Consultative Committee on Education
Ministerial Consultative Committee on Resettlement, Rehabilitation, Northern Development and Hindu Religious Affairs
Ministerial Consultative Committee on Post, Postal Services and Muslim Religious Affairs
Ministerial Consultative Committee on Youth Affairs, Project Management and Southern Development
Ministerial Consultative Committee on National Integration, Reconciliation and Official Languages
Ministerial Consultative Committee on Telecommunication, Digital Infrastructure and Foreign Employment
Ministerial Consultative Committee on Social Welfare and Primary Industries
Ministerial Consultative Committee on Provincial Councils, Local Government and Sports
Ministerial Consultative Committee on Development Strategies and International Trade
Ministerial Consultative Committee on Sustainable Development, Wildlife and Regional Development
Ministerial Consultative Committee on Labour and Trade Union Relations

Each Committee shall consist of eight (8) members to inquire into and report upon such matters as are referred to it in terms of Standing Order 112;

The quorum of each Committee shall be three (3) members."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුවේ කටයුතු
பாராளுமன்ற அலுவல்
BUSINESS OF THE PARLIAMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
I move,

"That notwithstanding the motion agreed to by Parliament on 06.06.2018, for the purpose of the proceedings of the current session, Standing Order No. 8(2) of the Parliament shall operate with substitution of the words "10.00 a.m." for the words "10.30 a.m." ".

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, යෝජනා පිළිබඳ දැනුම් දීම සහ දිනට නියමිත කටයුතු.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මහතා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මෙම අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා. බැලුම්කර සිද්ධියට අදාළව, මුදල් අල්ලස් ලෙස ලබාගැනීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 118දෙනකු පිළිබඳව පසුගිය සති දෙක තුනක කාලය පුරාම විශාල සංවාදයක් තිබුණා. නමුත් ගරු කථානායකතුමා පැහැදිලි කළා, "අපට එහෙම ලේඛනයක් ලැබිලා නැහැ" කියා. මේ සභාවේ සිටින වග කිවයුතු නියෝජ්‍ය ඇමතිවරයෙක් විධියට ගරු රන්ජන් රාමනායක මැතිතුමා ඊයේ සභාව අමතා ප්‍රකාශයක් කළා. "මුදල් ගත්ත මන්ත්‍රීවරුන්ට අමතරව, ගෙවල් ගත්ත මන්ත්‍රීවරු ඉන්නවා; රූමතියන් ගත්ත මන්ත්‍රීවරු ඉන්නවා; නිවාස ගත්ත මන්ත්‍රීවරු ඉන්නවා" කියා එතුමා කිව්වා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හෘදය සාක්ෂියට එකඟව කටයුතු කරන මේ පාර්ලිමේන්තුවේ සිටින මොන පක්ෂයකට අයිති මන්ත්‍රීවරයකුට හෝ චෞරයන්ට අවනත නොවන හැම මන්ත්‍රීවරයකුටම මේ මොහොත වන විට සමාජය ඉස්සරහා බරපතළ ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේ කාරණය මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්න කැමැතියි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් කොයි තරම් ගර්හාවට, කොයි තරම් අපකීර්තියට ලක් වෙලා තිබෙනවාද කියා මම කියන්න යන මේ කාරණයෙන් පැහැදිලි වෙනවා. මේ දවස්වල පාර්ලිමේන්තුව ගැන පළ වෙලා තිබෙන, මිලියන ගණනාවක් අතරේ සංසරණය වන කාටුන් එකක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා එය දැක්කේ නැත්නම් සභාගත වෙන්නත් එක්කම එම කාටුන් එකේ සඳහන් කර තිබෙන දෙය මම කියන්නම්. පාර්ලිමේන්තුවට එන පාරේ එක්තරා පුරවැසියෙක් බයිසිකලයක් නතර කරනවා. එතකොට පාර්ලිමේන්තුවේ ඉන්න පොලිස් රාළහාමි කෙනෙක් ඇවිත් කියනවා, "හා, හා ඔය කරන්නේ වැරැදි වැඩක් බව දන්නේ නැද්ද? මේක පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, ඇමතිවරු යන පාරක්" කියලා. මේ පුරවැසියා රාළහාමිට උත්තර දෙනවා, "රාළහාමි, අවුලක් නැහැ, මම මේ බයිසිකලය ලොක් කරලා තිබෙන්නේ" කියා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පිළිබඳව සමාජයේ පවතින කතිකාවත කොයි තරම් ප්‍රබල තැනකට ඇවිත් තිබෙනවාද කියා තේරුම් ගන්න මේ කාටුන් එක ප්‍රමාණවත්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ නිසා මෙහි අවසානයක් තිබෙන්න ඕනෑ. බැලුම්කර වංචනිකයන්ගෙන් රූමතියන් ගත්ත, ගෙවල් ගත්ත, සල්ලි ගත්ත ජනතා නියෝජිතයන් මේ පාර්ලිමේන්තුවේ සිටින 225දෙනා අතර ඉන්නවාය කියා මේ ආණ්ඩුව නියෝජනය කරන ගරු නියෝජ්‍ය ඇමතිවරයෙක්; එක්සත් ජාතික පක්ෂයේ දෙවන පෙළ නායකයෙක් නැවත තහවුරු කරනවා. ඒ නිසා මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්නේ මේ කාරණයයි. එක්කෝ ඒ චෞරයන් කවුද කියා හෙළිදරව් කරන්න ඕනෑ; ඒ මුදල්වලට යට වුණු පුද්ගලයන් කවුද කියා හෙළිදරව් කරන්න ඕනෑ. එහෙම නැත්නම් මන්ත්‍රීවරයකුට, "තාත්තා" කියන්න තමන්ගේ ගෙදර දරුවෙක් අකමැති වෙන කාලයක් උදා වෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එම නිසා මේ සම්බන්ධයෙන් ගරු කථානායකතුමාගේත්, ඔබතුමාගේත් අවධානය නැවත නැවත යොමු කරවනවා. මේක දේශපාලන වාසියක් ගන්න කරන දෙයක් නොවෙයි. තක්කඩියාට වර්ණයක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. "කොළ පාට චෞරයා", "නිල් පාට චෞරයා", "රතු පාට චෞරයා" කියා චෞරයන්ට විවිධත්වයක් නැහැ; වර්ණයක් නැහැ. එම නිසා මේ 225දෙනාගේ ආත්ම ගරුත්වය රැක ගැනීම වෙනුවෙන් මූලාසනයේ ඔය පුටුව රටට නායකත්වයක් දෙන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක තමයි අපේ ඉල්ලීම වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව මම දන්නා තරමින්,- [බාධා කිරීමක්] ඔව්, ගරු සභානායකතුමනි කියන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 118දෙනාගේ කථාව ගැන ඇත්තටම පැහැදිලි හෙළිදරව්වක් නැහැ. 118දෙනාගේ කථාව මුලින්ම ඉදිරිපත් කළේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමායි. එතුමාට චෝදනාවක් ආවාම, "මම විතරක් නොවෙයි, තව 118දෙනෙක් ඉන්නවා" කියා එතුමා කිව්වා. ගරු කථානායකතුමා කීප සැරයක්ම කිව්වා, මේ 118දෙනාගේ කථාව ගැන ඇත්ත වශයෙන්ම මෙතෙක් කල් හෙළිදරව්වක් නැහැය කියා. අපිම කථා කරනවා, 118දෙනෙක් ගැන. මේ 118දෙනා කොහේද ඉන්නේ?

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ ඉන්න නියෝජ්‍ය අමාත්‍යවරයෙක් ඊයේ කිව්වා,- [බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
118දෙනාගේ කථාව ගැන අද මුලින්ම කථා කරන්න පටන් ගත්තේ ඔබතුමායි. අපිම මන්ත්‍රීවරු ගැන මෙහෙම කථා කළාම මොකක්ද වෙන්නේ? මේවා මාධ්‍යවල පළ වුණාම,- [බාධා කිරීමක්]-

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
අද දවසේ මාධ්‍යවල පළවුණු දෙය තමයි මම මේ කියන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඇයි, මේ ගැන තව තවත් කථා කරන්නේ? දිනපතාම මේ ගැන කථා කරලා අපිම අපේ පාර්ලිමේන්තුවේ වටිනාකම නැති කර ගන්නවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද සියලුම පුවත් පත්වල මුල් පිටුව සරසා තිබෙන්නේ මේ ප්‍රවෘත්තියෙන්. මේක හංගන එක නොවෙයි අපි කරන්න ඕනෑ. මෙවැනි දෙයක් වෙලා තිබෙනවාද කියලා සොයා බැලීමයි කළ යුත්තේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
හංගන්න ඕනෑය කියා අපි කියන්නේ නැහැ. 118දෙනෙක් ඉන්නවාය කියන කථාව මුලින්ම ඇදලා ගත්තේ දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමායි. එතුමාට චෝදනාවක් ආවාම, "මම විතරක් නොවෙයි, තව 118දෙනෙක් ඉන්නවා" කියා එතුමා කිව්වා. 118දෙනාගේ කථාව ගැන කොහේවත් හෙළිදරව් වෙලා නැහැය කියා ගරු කථානායකතුමාත් කියා තිබෙනවා. ඒ නිසා අපිම අපේ වටිනාකම නැති කරගන්නවා. එව්වරයි මට කියන්න තිබෙන්නේ. ඊයේ රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා මේ ගැන කථා කළාය කියා ඔබතුමා අද මේ ගැන කථා කරන්නේ ඇයි? අපිම අපව හෑල්ලු කරගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමනි, මට මතක හැටියට ඊයේ දවසේ ගරු කථානායකතුමා මේ සම්බන්ධයෙන් ප්‍රකාශයක් කළා. ඔබතුමා මේ කාරණාව අද ඉදිරිපත් කළාය කියා නැවත වතාවක් මම එතුමාව දැනුවත් කරන්නම්. ඊට පසුව අපි මේ ගැන බලමු. ඔබතුමාට බොහොම ස්තුතියි.

මීළඟට, ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත - දෙවැනි වර කියවීම.

අද දින විවාදයට ගැනෙන මෙම පනත් කෙටුම්පත 2018.06.08වන දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදුව, 2018.06.19වන දින අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී සලකා බලා, එකී කාරක සභාවේ වාර්තාව 2018.06.20වන දින, එනම් අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති බව දැනුම් දීමට කැමැත්තෙමි.

ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමා.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත
ஜெனரால் சேர் ஜோன் கொத்தலாவலை பாதுகாப்புப் பல்கலைக்கழகம் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம்
GENERAL SIR JOHN KOTELAWALA DEFENCE UNIVERSITY (SPECIAL PROVISIONS) BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[අ.භා. 1.48]

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - (Minister of Higher Education and Cultural Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දෙවන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත මම ගරු සභාවට ඉදිරිපත් කර සිටිනවා. මෙවැනි පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට බලපෑ පසුබිම පිළිබඳව මේ ගරු සභාවේත්, මේ රටේත් සියලු දෙනාටම පාහේ යම් අවබෝධයක් තිබෙනවා. අපේ රටේ විශ්වවිද්‍යාල පද්ධතිය ආසියානු කලාපයේ රටවල් සමඟ බැලුවාම ඉතා ඉහළ මට්ටමේ ප්‍රමිතියක අධ්‍යාපන ක්‍රමයක් පවතින්නේ. අපේ රටේ උසස් අධ්‍යාපනය මුල් කාලයේදී රජයේ විශ්වවිද්‍යාලවලින් පමණක් සිද්ධ වුණා. නමුත් පසු කාලයේදී පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලට සහ විශ්වවිද්‍යාලවලට උපාධි ප්‍රදානය කිරීමේ බලය පැවරීමක් සිද්ධ වෙලා තිබෙනවා. ලෝකයේ බොහෝ රටවල අධ්‍යාපන ක්‍රමය ආණ්ඩුවක් විසින් තනිවම කරන්නේ නැහැ; බොහෝ අවස්ථාවලදී පෞද්ගලික අංශය සහ රජය තරගකාරී ලෙසයි ප්‍රජාතන්ත්‍රවාදී රටවල අධ්‍යාපන ක්‍රමය පවත්වාගෙන යන්නේ. ඒ අනුව අපේ රටේ රජයේ විශ්වවිද්‍යාල 15ක් ක්‍රියාත්මක වන අතර, මේ වන විට උපාධි ප්‍රදානය කළ හැකි පෞද්ගලික අංශයේ උසස් අධ්‍යාපන ආයතන 19ක් පිළිඅරගෙන තිබෙනවා. ඒ 19න් එක ආයතනයක් සම්බන්ධව තමයි ප්‍රශ්නයක් මතු වුණේ. ඒ ප්‍රශ්නය මතු වුණේ දකුණු ආසියානික තාක්ෂණික සහ වෛද්‍ය ආයතනයේ වෛද්‍ය පීඨය සම්බන්ධවයි. අපේ රටේ අනෙකුත් උපාධි; කලා උපාධි, නීති උපාධි, ඉංජිනේරු උපාධි, තාක්ෂණික කටයුතු පිළිබඳ උපාධි ලබා දෙන ආයතන පෞද්ගලික අංශයේ ක්‍රියාත්මක වුණත්, ඒවා සම්බන්ධව මෙවැනි ගැටලුවක් මතු වුණේ නැහැ. නමුත් පෞද්ගලික වෛද්‍ය පීඨය සම්බන්ධයෙන් අද මේ ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා.

මීට පෙරත් 1980 දශකයේ මුල භාගයේදී එවකට පැවති ආණ්ඩුව රාගම පෞද්ගලික විශ්වවිද්‍යාලය ආරම්භ කරලා කාලයක් ගත වුණාට පස්සේ ඊට එරෙහිව පැන නැඟුණු උද්ඝෝෂණ සහ විරෝධතා හේතුවෙන් එවකට පැවති රජය එය රජයට පවරා ගන්න කටයුතු කළා. ඊට කාලයකට පස්සේ -අවුරුදු 30කට විතර පස්සේ- තමයි අද මේ ප්‍රශ්නය මතු වුණේ. 2012දී

පමණ තමයි දකුණු ආසියාතික තාක්ෂණික සහ වෛද්‍ය ආයතනය හෙවත් රටේ ජනතාව SAITM වශයෙන් හඳුන්වනු ලබන මේ ආයතනය ආරම්භ කළේ. එහි පීඨ කිහිපයක් තිබෙනවා. එහි එක පීඨයක් තමයි, වෛද්‍ය පීඨය. 2012 ආරම්භ කරපු මේ වෛද්‍ය පීඨය පිළිබඳව රටේ විරෝධතාවක් අපි දැක්කේ නැහැ. අවුරුදු තුනකට වැඩි කාලයක් එය ක්‍රියාත්මක වෙමින් පැවතුණා. නමුත් අවුරුදු තුනකට පස්සේ, මේ පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රජාව විශේෂයෙන් ගුරුවරු, ශිෂ්‍යයන්, ඒ වාගේ තවත් සමහර ආයතන සහ පුරවැසියෝ යම් යම් විරෝධතාවන් ඉදිරිපත් කරනු ලැබුවා.

අපේ රටේ විශ්වවිද්‍යාලවල අධ්‍යාපන කටයුතු පසු ගිය අවුරුදු තුනක වාගේ කාලයක් තිස්සේ දැඩි ලෙස අඩපණවීමට මෙම කාරණය බලපෑවා. විශේෂයෙන්ම වසරක වාගේ කාලයක් දීර්ඝ ලෙස මේ ප්‍රශ්නය දිගින් දිගටම පැවතීම නිසා විශ්වවිද්‍යාල බොහොම අකර්මණ්‍ය තත්ත්වයට පත් වුණා. වෛද්‍ය පීඨය වාගේ ආයතනවල මාස 10කට වැඩි කාලයක් ශිෂ්‍යයන්ට අධ්‍යාපනය ලබන්න තිබුණු කාලය ඔවුන් අහිමි කරගෙන තිබෙනවා. මේ වාගේ පෞද්ගලික විශ්වවිද්‍යාල ආරම්භ කරන්නට පෙර ලෝකයේ දියුණු රටවල් අනුගමනය කරන ක්‍රමවේදයක් තිබෙනවා. අපේ රටේ ඒක අනුගමනය කිරීමක් සිදු නොවීම නිසා තමයි මේ වාගේ බරපතළ ප්‍රශ්නයක් ඇති වුණේ. විශේෂයෙන්ම රජය මෙන්ම පෞද්ගලික විශ්වවිද්‍යාල පවතින ලෝකයේ දියුණු රටවල ඒ ආයතන අධීක්ෂණය කරන්න, ඒවායේ කටයුතු නිරීක්ෂණය කරන්න, විශේෂයෙන්ම ඒවායේ ප්‍රමිතිය ආරක්ෂා කර ගන්න යන්ත්‍රණයක් සකස් කරලා තිබෙනවා.

අපේ රටේ එවැනි යන්ත්‍රණයක් නොමැති අවස්ථාවක අවිධිමත් ලෙස උසස් අධ්‍යාපන ආයතන ආරම්භ කරන්න දීමේ ප්‍රතිඵලයක් විධියට තමයි මේ ප්‍රශ්නය ඇති වෙලා තිබෙන්නේ. මේ ප්‍රශ්නය උසස් අධ්‍යාපනයට සීමා වෙලා නැහැ. රටේ සාමාන්‍ය අධ්‍යාපනයටත් මේ ප්‍රශ්නය මතු වෙලා තිබෙනවා. අපේ රටේ රජයේ පාසල් පද්ධතියක් තිබෙනවා. රජයේ පාසල් පද්ධතියට අමතරව පෞද්ගලික අංශයෙන් ක්‍රියාත්මක වන පාසල් තිබෙනවා. මේ පාසල් ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කරන එකම දේ තමයි සමාගම් රෙජිස්ට්‍රාර් ළඟ එය සමාගමක් විධියට ලියා පදිංචි කිරීම.

දැනට තිබෙන උසස් අධ්‍යාපන ආයතනයක් උපාධිය ප්‍රදානය කිරීමට බලය ඇති ආයතනයක් විධියට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය පිළිගැනීමක් කරනු ලැබුවහොත්, ඒ ආයතනයට උපාධිය ලබා දීම සඳහා බලයක් ලැබෙනවා. ඒ හැරෙන්න පෞද්ගලික පාසල් පද්ධතියවත්, උසස් අධ්‍යාපනය ලබා දෙන ආයතන පද්ධතියවත් පාලනය කරන්න, නිරීක්ෂණය කරන්න, අධීක්ෂණය කරන්න අපේ රටේ නීති රාමුව තුළ ක්‍රමවේදයක් සකස් වෙලා නැහැ. අපි මේ වන විට ඒ සඳහා අවශ්‍ය පනත් කෙටුම්පතක වැඩ කටයුතු බොහෝ දුරට අවසන්කොට තිබෙනවා. මේ පිළිබඳව ක්‍රියාත්මක වන දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් විධියට උසස් අධ්‍යාපන ආයතනයක් පටන් ගන්නවා නම්, එය පටන් ගන්නා අවස්ථාවේ සිට උපාධිය පිරිනැමීම දක්වා කාලය තුළ සියලු කාරණා අධීක්ෂණය කරන්න මේ තුළින් හැකිවනවා. පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනයක් ආරම්භ කිරීමට ඔවුන්ට තිබෙන හැකියාව, තිබෙන පුහුණුව, ව්‍යත්තීයමය වශයෙන් තිබෙන නිපුණතාව, ඒ වාගේම යටිතල පහසුකම් සැපයීමට තිබෙන ආර්ථික ශක්තිය, ඒ විශ්වවිද්‍යාලවල ගුරුවරු විධියට කටයුතු කරන්න බලාපොරොත්තු වන ගුරුවරුන්ගේ සුදුසුකම්, පළපුරුද්ද, ඒ වාගේම පාඨමාලාව, පාඨමාලාවේ තිබෙන ගුණාත්මකභාවය, අවසාන වශයෙන් උපාධිය ප්‍රදානය කරනකොට ඒ උපාධියේ තිබෙන ප්‍රමිතිය සහ පිළිගැනීම ආරක්ෂා වන ක්‍රමවේදයක්, යාන්ත්‍රණයක් ඇති කරන්න සකස් කරලා තිබෙන පනත් කෙටුම්පත තමයි, තත්ත්ව සහතික සහ ප්‍රතිනතය පිළිබඳ පනත් කෙටුම්පත; Quality Assurance and Accreditation Bil. ඒ පනත් කෙටුම්පත සම්මත වුණාට පස්සේ අනාගතයේදී මේ වාගේ ගැටලුදායක තත්ත්වයන් ඇති වීම වළක්වා ගන්න කටයුතු කරන්න අපට පුළුවන්ය කියලා මම හිතනවා. මේ සම්බන්ධව දැන් ඇති වී තිබෙන ප්‍රශ්නය පිළිබඳව අපි කනගාටු වනවා. මේ ප්‍රශ්නය, මේ තරම් දුර දිග නොගොස් කෙටි කාලයක් තුළ අපට විසඳා ගැනීමට හැකියාව තිබුණු ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය දුර දිග යෑම නිසා විශ්වවිද්‍යාල පද්ධතියේ තිබුණු පසුබෑම, ඒ වාගේම විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ විශාල වශයෙන් මහ පාරේ උද්ඝෝෂණය කරමින් ඔවුන්ගේ කාලය මිඩංගු කිරීම, ඒ වාගේම මහ පාරේ නිරන්තරයෙන් පැවැති උද්ඝෝෂණ හේතුවෙන් රටේ ගමනාගමනයට, ජනතාවට වුණු හිරිහැර කරදර දිහා බැලුවාම ඒ පිළිබඳව අපටත් දැඩි කනගාටුවක් තිබෙනවා, සාකච්ඡා මාර්ගයෙන් විසඳා ගත හැකි ප්‍රශ්නයක් මේ තරම් දුර දිග අරගෙන ගියේ ඇයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පනත් කෙටුම්පතේ අරමුණු සහ අපි ඉදිරිපත් කරපු විසඳුම මෙම පනත් කෙටුම්පත තුළින් ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කරන්න මම බලාපොරොත්තු වනවා. විශේෂයෙන්ම මම සඳහන් කරනවා, මෙම පනත් කෙටුම්පත අදාළ වෙන්නේ, දකුණු ආසියාතික තාක්ෂණික සහ වෛද්‍ය ආයතනය නැතහොත් SAITM විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට 2009 සැප්තැම්බර් 15 වැනි දින සිට 2017 මැයි මාසයේ 15 වැනි දින දක්වා කාලය තුළ ඇතුළත් වුණු වෛද්‍ය ශිෂ්‍යයන්ට පමණයි කියා. ඒ හැර වෙනත් කිසිදු ශිෂ්‍යයෙකුට මේ පනත යටතේ බලපෑමක් හෝ කිසිම වරප්‍රසාදයක්, අයිතියක් ඉල්ලා සිටීමක් සිද්ධ වෙන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දෙවනුව අපි මේ පනත් කෙටුම්පතෙන් යෝජනා කරන්නේ, ඒ කාලසීමාව තුළ එම වෛද්‍ය පීඨයේ අධ්‍යාපනය ලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කර ගන්නයි. ඒ අන්තර්ග්‍රහණය කර ගැනීම SAITM විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ශිෂ්‍යයකු වූ පමණින් ම සිද්ධ වෙන දෙයක් නොවෙයි. ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට තිබෙන සුදුසුකම් පිළිබඳව අපි තහවුරුවක් ලබාගත්තාට පස්සේ තමයි මේ අන්තර්ග්‍රහණය සිද්ධ වෙන්නේ. ඒ අවශ්‍ය මූලික සුදුසුකම් කුමක්ද යන්න පිළිබඳව මේ පනතෙන් අපි අර්ථ නිරූපණය කර තිබෙනවා. දේශීය වශයෙන් නම් අධ්‍යාපනය ලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට උසස් පෙළ රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, ජීව විද්‍යාව යන විෂයන්ගෙන් සමත්වීම තමයි වෛද්‍ය විද්‍යාලයකට ඇතුළත් වීමට තිබෙන සුදුසුකම. මෙම අදාළ කාල සීමාව තුළ පැවැති මූලික සුදුසුකම විධියට අපි සලකා තිබෙන්නේ, මේ විෂයන් තුනට "එස්" සාමර්ථයක් ලබා තිබීමයි. ඒ එක්කම මේ විශ්වවිද්‍යාලයට ඇතුළත් වී තිබෙනවා, විදේශීය රටවල උසස් පෙළ අධ්‍යාපනය ලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවෝත්. ඔවුන්ගේ සුදුසුකම විධියට සමහර උදවියට තිබෙන්නේ රසායන විද්‍යාව, ජීව විද්‍යාව සහ ගණිතයයි. භෞතික විද්‍යාව විෂය වෙනුවට ලෝකයේ දියුණු රටවල් පිළිගෙන තිබෙනවා, ගණිතය විෂයට සාමර්ථ ලබා ගෙන තිබීම මේ වෛද්‍ය විද්‍යාව ඉගෙන ගැනීම සඳහා සුදුසුකමක් විධියට. එය බුද්ධි මට්ටම මණින ඉහළ සාධකයක් විධියට ඒ රටවල් සලකා තිබෙනවා. එවැනි ගණයේ ශිෂ්‍යයින් ප්‍රමාණයකුත් මේ අතර ඉන්නවා. එම නිසා මේ පනත් කෙටුම්පතේ සඳහන් මූලික සුදුසුකම් සපුරා ඇත්දැයි යන්න පිළිබඳව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් තහවුරුවක් ලබා ගෙන තමයි මේ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ අන්තර්ග්‍රහණය කර ගැනීම සිද්ධ වෙන්නේ.

තුන්වන කාරණය මෙයයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. SAITM විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ අධ්‍යාපනය ලැබූ ශිෂ්‍යයකු, ශිෂ්‍යාවක කුමන වසරක අධ්‍යාපනය ලැබුවේ වී නමුත් අන්තර්ග්‍රහණය කිරීමේදී ඔහු ඒ වසරේ ශිෂ්‍යයකු විධියටම අන්තර්ග්‍රහණය කරන්න කොතලාවල විශ්වවිද්‍යාලය බැඳිලා

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

නැහැ. ඒ විශ්වවිද්‍යාලයේ විශේෂඥ කණ්ඩායමක් විසින් මේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ලැබූ අධ්‍යාපනය සහ සායනික පුහුණුව පිළිබඳව තක්සේරුවක් අරගෙන ඒ තක්සේරුවට ගැළපෙන මට්ටමට තමයි කුමන වසරේ ශිෂ්‍යයකුද කියා තීන්දු කරලා එකී අන්තර්ග්‍රහණය කිරීම කරනු ලබන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හතරවනුව කිව යුතු කාරණය මේකයි. එය බොහොම සැක සංකා තිබෙන දෙයක් ලෙස ගෙන සමහර මාධ්‍යවල උදව්ය කතා කරනවා අපි දැක්කා. SAITM විශ්වවිද්‍යාලය උපාධිය පිරිනැමූ ශිෂ්‍යයන් කණ්ඩායමකුත් එතැන සිටිනවා. ඒ උදව්ය වෛද්‍ය උපාධිය අවසන් කරලායි ඉන්නේ. කොතලාවල විශ්වවිද්‍යාලයට ඒ උදව්ය අන්තර්ග්‍රහණය කිරීම තුළින් - SAITM විශ්වවිද්‍යාලයේ වෛද්‍ය උපාධිය අවසන් කිරීමේ හේතුව මතම- ඒ උදව්යට ස්වයංක්‍රියව උපාධියක් ලැබෙන්නේ නැහැ. කොතලාවල විශ්වවිද්‍යාලයට ඇතුළත් කරන, ඒ උපාධිය අවසන් කරපු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සායනික පුහුණුව සහ අධ්‍යාපනික මට්ටම පිළිබඳව තක්සේරුවක් ඒ විශ්වවිද්‍යාලයේ විශේෂඥ කණ්ඩායමක් මඟින් ලබා ගැනීමට කටයුතු කරනවා. අධ්‍යාපන මට්ටම සපුරා නැති නම් එය සපුරාලීමට කටයුතු කිරීමටත්, මීට වඩා පුළුල් ලෙස ඒ උදව්යට වැඩි අද්දැකීම් ලබා ගන්න පුළුවන් සායනික පුහුණුවක් අනිවාර්ය වශයෙන් ලබා දීමටත් කටයුතු කරනවා. ඒ සායනික පුහුණුව සහ අධ්‍යාපන කටයුතු සාර්ථක ලෙස අවසන් කරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පමණයි KDU එකෙන් MBBS උපාධිය ලැබෙන්නේ. ඒ ආකාරයට තමයි මේ පනත් කෙටුම්පතේ ප්‍රතිපාදන සකසා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙත් තවත් සමහර උදව්යගේ සැක සංකාවක් පවතිනවා. ඒ, අතීතයේ සිද්ධි පිළිබඳව එතුමන්ලාට තිබෙන අද්දැකීම් නිසා වන්නට ඇති. මේ පනත් කෙටුම්පත සම්මත කරගෙන ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන් කොතලාවල විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කිරීමෙන් පසුවත් SAITM වෛද්‍ය පීඨය තවදුරටත් ක්‍රියාත්මක වේදෝ කියන භයක් තිබෙනවා. ඒ පිළිබඳව අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවේදීත් සාකච්ඡා පවත්වා තිබෙනවා. ඊයේ දිනයේ මමත් ඊට සහභාගි වුණා. ඒ නිසා කාරක සභා අවස්ථාවේදීත් මේ පනත් කෙටුම්පතට තව සංශෝධනයක් අපි ඇතුළු කරනවා. ඒ තමයි මේ පනත් කෙටුම්පතේ සඳහන් SAITM වෛද්‍ය ශිෂ්‍ය ශිෂ්‍යාවන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කර ගැනීම අවසන් වූ වහාම SAITM විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය මඟින් උපාධි ප්‍රදානය කිරීමේ බලයක් ඔවුන්ට නොමැති බවට සහ ඒ සමඟම ඒ වෛද්‍ය පීඨය නීතියෙන් අහෝසි තත්ත්වයකට පත් වෙනවා කියන කාරණය. ඒ අනුව ඒ සංශෝධනය මේ පනත් කෙටුම්පතට ඇතුළු කළාට පස්සේ කාටවත් සැක සංකාවක් තියා ගන්න කිසි අවශ්‍යතාවක් නැහැ. මේ පනත මඟින්ම ඒ ශිෂ්‍ය ශිෂ්‍යාවන් අන්තර්ග්‍රහණය කරලා හමාර වෙනවාත් සමඟම එම වෛද්‍ය පීඨය අහෝසි වෙනවා. ඔබතුමන්ලා ඒකට කැමැතියි නේද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

නමුත් ඇමතිතුමා, ඒ හා සමඟම 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ ඒ පිළිගැනීමත් අහෝසි වෙන්න ඕනෑ. මොකද, මේ පනත් කෙටුම්පත ගෙනෙන්නේ KDU එකට විතරයි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඔව්, KDU එකට විතරයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

KDU එකට මේ පනත ගෙනැල්ලා SAITM එකේ වෛද්‍ය පීඨය ඉවත් කරනවා කියා වගන්තියක් දැම්මාට විශ්වවිද්‍යාල පනතින් පිළිගෙන තිබෙන වගන්තිය ඉවත් වෙන්නේ නැහැ. ඒ නිසා ඔබතුමා ඒකත් ගැසට් කරලා,-

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු මන්ත්‍රීතුමා ඒ කාරණය මතු කරපු එක හොඳයි. ස්තුතියි.

ගරු මන්ත්‍රීතුමනි, එය විශ්වවිද්‍යාල පනතෙන් ඇමතිවරයාට දීලා තිබෙන බලතලයක්. ඇමතිවරයා තමයි ඒ බලතල ක්‍රියාත්මක කරන්නේ. එතකොට මේ වගන්තිය ඇතුළත් කිරීම තුළ ඒ ඇමතිවරයා බලතල ක්‍රියාත්මක කිරීම පාර්ලිමේන්තුවේ පනතක් මඟින් වළක්වාලීමක් සිද්ධ වෙනවා. එතකොට SAITM කියන ආයතනය සම්බන්ධව බලතලයක් ක්‍රියාත්මක කරන්නට උසස් අධ්‍යාපන ඇමතිවරයාට කොහොමටවත් බලයක් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මේ වගන්තිය ඉදිරිපත් නොකළත් අපි බොහොම පැහැදිලිව කිව්වා, මේ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ අන්තර්ග්‍රහණය කරපු වහාම එය අවලංගු කිරීමේ ගැසට් පත්‍රය නිකුත් කරනවා කියලා. නමුත් යම් යම් පාර්ශ්ව මේ පිළිබඳව සැක ඇති කළ නිසා තමයි අපි මේ වාගේ ප්‍රතිපාදනයක් හඳුන්වා දුන්නේ. මොකද, මීන් ඉදිරියට සාමකාමීව අපේ විශ්වවිද්‍යාල පද්ධතිය පවත්වාගෙන යන්න මුළු රටේම ජනතාවට අවශ්‍යතාව තිබෙන නිසා. අද මම විශ්වාස කරනවා, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත අපි සකස් කළේ මීට අදාළ සියලුම පාර්ශ්වයන් සමඟ සාකච්ඡා කරලා බොහොම සුහද මට්ටමින් මේ ප්‍රශ්නය නිරාකරණය කිරීම සඳහා සියලු පාර්ශ්ව වලට තිබුණු අවශ්‍යතා උනන්දුව නිසා බව. ඇත්ත වශයෙන්ම කියනවා නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට දවස් දෙකක් වගේ කෙටි කාලයක් තුළ මේ ප්‍රශ්නයට සම්පූර්ණ විසඳුමක් ගෙනැල්ලා එකඟතාවයට එන්න පුළුවන්කම ලැබුණා. ඒ අනුව මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළා. මේ පනත් කෙටුම්පත පිළිබඳව යම්කිසි බරපතළ ගැටලුවක් තිබෙනවා නම්, මේ පනත් කෙටුම්පතේ නීතිවිරෝධී බවක් තිබෙනවා නම් මෙය අභියෝගයට ලක් කරන්නත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ඕනෑම පාර්ශ්වකරුවෙකුට අයිතියක් තිබුණා. දවස් හතක කාලයක් තුළ ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක් ඉදිරිපත් කරන්න අවස්ථාව තිබුණා. නමුත් කිසිදු පාර්ශ්වයක් මේ පනත් කෙටුම්පත අභියෝගයට ලක් කළේ නැහැ. ඒ නිසා තමයි අපට ඉතා ඉක්මනට අද දිනයේදී විවාදයට ගැනීමට හැකියාව ලැබුණේ. ඉතින් මෙවැනි තත්ත්වයක් තිබෙද්දීත් ඊයේ දිනයේදීත්, අද දිනයේදීත් සමහර ශිෂ්‍ය ශිෂ්‍යාවන් පාර්ලිමේන්තු පාරට ඇවිල්ලා උද්ඝෝෂණය කරමින්, තමන්ගේ කාලය නාස්ති කරමින්, මහ ජනතාවට ගමන් බිමන් යන්න තිබෙන අවස්ථාවන් අවහිර කරමින් මේ පවතින තත්ත්වය පිළිබඳව ඇත්ත වශයෙන්ම අපි කනගාටු විය යුතුයි. මොකද, මේ පිළිබඳව විවේචන එල්ල කරපු සියලුම පාර්ශ්වයන් පිළිගත්තා, SAITM ආයතනය ආරම්භ කරපු විධිය, එහි නීති පදනම කුමක් වුවත් මෙය SAITM විශ්වවිද්‍යාලයේ ඉගෙන ගත්ත ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ වරදින් වෙච්ච දෙයක් නොවෙයි කියන කාරණය. මොකද, ඒවා ආරම්භ කරපු රජයේ ආයතනවල අඩුපාඩුකම් තිබෙන්න ඇති; තීන්දුවල වැරදි තිබෙන්න ඇති; ඒ ආරම්භ කරපු ආයතනයේ වැරදි තිබෙන්න ඇති. නමුත් රජයේ පිළිගත් උසස් අධ්‍යාපන ආයතනයකට සුදුසුකම් ලබලා, විශාල මුදලක් වියදම් කරලා -දෙමව්පියෝ ඉපයූ මුදල් වියදම් කරලා,- ඇතුළු වුණු මේ දු දරුවන්ගෙන් සමහර අය අවුරුදු 7, 8 අධ්‍යාපනය ලබා හමාර කරපු අය. ඒ දු දරුවන්ගේ වරදක් නිසා

නොවෙයි, ඒ අයට මේ අකරතැබ්බයට මුහුණ දෙන්න සිද්ධ වුණේ. ඒ නිසා මේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට සාධාරණයක් ඉෂ්ට වෙන්න ඕනෑ කියලා සියලු පාර්ශ්වවල එකඟතාවක් තිබුණා. එතැන ගැටලුව තිබුණේ සාධාරණය ඉෂ්ට කරන ක්‍රමවේදය කුමක්ද කියන එක ගැනයි. ඒ නිසා තමයි අපි මේකට අදාළ සියලුම පාර්ශ්ව එක්ක සාකච්ඡා කරලා එකඟතාවකට ආවේ. ඒ සියලු දෙනාගේ එකඟතාව මත තමයි අපි මේ ක්‍රමවේදය හඳුන්වා දුන්නේ. මම සතුටු වෙනවා, මේකෙන් පස්සේ විශ්වවිද්‍යාල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට, ඒ වාගේම විශ්වවිද්‍යාල ගුරු භවතුන්ට තම තමන්ගේ කටයුතු සාමකාමීව පවත්වාගෙන යාමට හැකියාව ලැබෙවිය කියලා.

පෞද්ගලික විශ්වවිද්‍යාල පවත්වාගෙන යාම පිළිබඳව කාගේවත් තර්කයක් නැහැ; හබයක් නැහැ. ප්‍රශ්නය තිබෙන්නේ මේ වෛද්‍ය විද්‍යාලයෙන් ලබා දෙන වෛද්‍ය උපාධිය පිළිබඳව පමණයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහෝ දෙනෙක් මතු කරන කාරණයක් තමයි, මේ පිළිබඳව රජයේ ප්‍රතිපත්තිය කුමක්ද කියන එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුලින්ම මම කියන්න ඕනෑ, මේ පිළිබඳව මේ ක්ෂේත්‍රයේ උගතුන්ගේ වියතුන්ගේ මත දෙකක් තිබෙන බව. එක මතයක් තමයි, අපේ රටේ පෞද්ගලික විශ්වවිද්‍යාල ඇති කරන්න ඕනෑ කියන එක. හැබැයි, එය සියයට සියයක්ම ප්‍රමිතියකට අනුකූලව සිද්ධ විය යුතුය කියන කාරණය තමයි පළමුවැනි මතය. අපේ රටේ තිබෙන දෙවැනි මතය තමයි පෞද්ගලික විශ්වවිද්‍යාල පැවැත්වුවාට කමක් නැහැ, හැබැයි, ඒවා ලාභ ලබන ආයතන නොවිය යුතුය කියන එක. Non-profitable organizations should get involved in the operation of private medical faculties, either as a trust or some other formation. But, if it is a profitable organization, we should not permit it to start and operate medical faculties. That is the second opinion expressed by most of the intellects who discussed this subject.

දැන් අපට තිබෙන ප්‍රශ්නය තමයි මේ දෙකෙන් හොඳ කොයි එකද කියන එක රජයක් විධියට තීන්දුවක් අරගෙන නැතිවීම. අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා, ආංශික අධීක්ෂණ කාරක සභාව හරහා වෙන්න පුළුවන්, එහෙම නැත්නම් මේ පාර්ලිමේන්තුවේ වෙනම කාරක සභාවක් පත් කරලා වෙන්න පුළුවන් මේ පිළිබඳව දීර්ඝ කථිකාවතක් ඇති කරගෙන අපේ රටට ගැළපෙන ප්‍රතිපත්තිය කුමක්ද කියලා මේ සභාව තුළදී තීරණයක් ගන්න. ඒ අනුව-

ගරු කබීර් හාෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ඇමතිතුමාගෙන් පැහැදිලි කර ගැනීමක් කර ගන්න මම කැමැතියි. අපේ රටේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාල පිහිටුවීමේ ප්‍රතිපත්තියක් රජයකට තිබුණේ නැහැ. ඒ අනුව SAITM එක මේකට ඇතුළත් වෙන්නේ කොහොමද? SAITM එක ආරම්භ කරන්න එවැනි ප්‍රතිපත්තියක් නැති කාලයක, පසු ගිය රජයේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පාලනය යටතේ එවකට හිටපු උසස් අධ්‍යාපන ඇමතිවරයා අදාළ පනත් වෙනස් කරලා, ඒ පනත්වලට පටහැනිව තමයි SAITM එක ආරම්භ කළේ. ඒක තමයි මේ අවුල. ඒ ගොල්ලෝ ආරම්භ කරපු අවුල ඔබතුමා පැහැදිලි කරනවා නම් හොඳයි. රජයක් හැටියට අපි අද හිරවෙලා ඉන්නේ ඒ නිසායි. අපි මේ ප්‍රතිපත්ති කැඩුවේ නැහැ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇත්තටම ඒ ගැන කථා කිරීම මම හිතා මතාම අඩු කළේ, ඒ ගැන කථා කරන්න ගියොත් බොහෝ දේවල් කියන්න සිද්ධ වන නිසායි. මීට පෙර තිබුණු රජයන් අපේ රටේ පෞද්ගලික අධ්‍යාපන ප්‍රතිපත්තිය 1980 ගණන්වල ඉඳලා පිළිඅරගෙන තිබෙනවා; පෞද්ගලික උසස් අධ්‍යාපන ප්‍රතිපත්තිය පිළිඅරගෙන තිබෙනවා. හැබැයි, වෛද්‍ය උපාධිය සම්බන්ධව එහෙම දෙයක් ක්‍රියාත්මක වුණේ නැහැ. 2012දී හිටපු උසස් අධ්‍යාපන ඇමතිතුමා තමයි අදාළ නීතියේ වෙනස් කිරීමක් කර, නමුත් ක්‍රමවේදය පිළිබඳව නීති රාමුවක් ඇති කරගන්නේ නැතිව අවිධිමත් විධියට මේ ආයතනය ආරම්භ කරලා තිබෙන්නේ. මම හිතන විධියට, එක පැත්තකින් එසේ ඉදිරිපත් කරපු කාරණා උඩ වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු මහත්මයාත් නොමඟ ගිහින් තිබෙනවා. එතුමා සද්භාවයෙන් විශ්වාස කරලා තිබෙනවා, තමන්ට අවශ්‍ය නීති ප්‍රතිපත්තිය හදලා තිබෙන්නේ කියලා. එම නිසා මෙතැනදී එතුමාත් අසරණ වෙලා තිබෙනවා. ආණ්ඩුව කෙරෙහි විශ්වාසය තබලා යම් සහතිකයක් එතුමාට තිබෙනවාය කියන විශ්වාසය පදනම් කරගෙන බිලියන ගණනක ණයක් අරගෙන තමයි SAITM විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ආරම්භ කරලා තිබෙන්නේ. ඒ නිසා මේ සංසිද්ධිය තුළ එතුමාත් විඳිනයෙක් බවට පත්වෙලා තිබෙනවා. SAITM ශිෂ්‍ය ශිෂ්‍යාවනුත් විඳිනයන් බවට පත්වෙලා තිබෙනවා; ඒ අයගේ දෙමව්පියනුත් විඳිනයන් බවට පත්වෙලා තිබෙනවා. ඒකට විරුද්ධව උද්ඝෝෂණය කරපු - protest කරපු - මුළු විශ්වවිද්‍යාල ප්‍රජාවම අද විඳිනයන්ගේ තත්ත්වයට පත්වෙලා තිබෙනවා. මුළු රටම විඳිනයන් බවට පත්වෙලා තිබෙනවා. මහ ජනතාවට පාරේ යන්න තිබෙන අයිතිය පවා අහිමි වෙලා තිබෙනවා. ඇත්තටම මේ කාරණය මේ තරම් දුර දිග ගෙනයන්නේ නැතිව විශ්වවිද්‍යාල ප්‍රජාවත් මීට වඩා නම්‍යශීලිව, සාකච්ඡා කරලා කටයුතු කළා නම් මේ ප්‍රශ්නය මතු වෙන්නේ නැහැ. අපි මෙම කාරණය පිළිබඳව සියලුදෙනාගේ කැමැත්ත ඇතිව මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබියදී අදත්, ඊයේත් පාර්ලිමේන්තු පාරේ උද්ඝෝෂණය කරනවා. එම උද්ඝෝෂණවල අවසන් ප්‍රතිඵලය මොකක්ද? මම ඊයේ ඉතා වටිනා වැඩ සටහනක් බලාගෙන සිටියා. විශ්වවිද්‍යාල ප්‍රජාව තුළ අද සිද්ධ වෙන්නේ මොකක්ද කියලා, සිරස නාලිකාවේ "මායිම" කියන වැඩසටහනේ ජන මාධ්‍යවේදීන් කිහිපදෙනෙක් හොඳ විග්‍රහයක් කරනවා මම දැක්කා. එහිදී, මෙයින් රටට වන හානිය කුමක්ද කියන කාරණය පිළිබඳව හොඳ විග්‍රහයක් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණය තුළ අපේ විශ්වවිද්‍යාල පද්ධතියට; විශ්වවිද්‍යාල උපාධියට තිබෙන පිළිගැනීම දැන් එන්න එන්නම අඩු වෙන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ අතරතුර, තරගකාරී පෞද්ගලික විශ්වවිද්‍යාල පද්ධතිය තුළින් ලැබෙන උපාධියට, රජයේ උපාධියට වඩා ඉහළ පිළිගැනීමක් තිබෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ කාරණය නිසා ඉදිරියේදී අපට ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.

දැනට රජයේ විශ්වවිද්‍යාල පද්ධතියේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 91,488ක් අධ්‍යාපනය ලබන කොට, පෞද්ගලික විශ්වවිද්‍යාලවල 21,500ක් අධ්‍යාපනය ලබනවා. අද රජයේ විශ්වවිද්‍යාල ඇතුළේ තිබෙන හිරිහැර, වධ හිංසා, නවක වධය යන මෙවැනි දේවල් නිසා, යමක් කමක් තිබෙන සමහර දෙමව්පියෝ බොහෝවිට තමන්ගේ දරුවන් රජයේ විශ්වවිද්‍යාලවලට යවන්නේ නැතිව පෞද්ගලික විශ්වවිද්‍යාලවලට යවනවා. එහෙම නැත්නම් විදේශ රටවල විශ්වවිද්‍යාලවලට යවනවා. ඒ හේතුව නිසා අපට විදේශ විනිමය විශාල වශයෙන් අහිමි වෙලා තිබෙනවා.

ගරු කබීර් හාෂිම් ඇමතිතුමනි, අනික් පැත්තෙන් "බොර දියේ මාළු බානවා" වැනි දෙයකුත් මේ අතරේ සිද්ධ වෙනවා. අපි මේ විශ්වවිද්‍යාල පද්ධතිය අකර්මණ්‍ය කර ගෙන යෑම තුළ, මැද පෙරදිග රටවල සේවයට අපේ උදවිය යවන ආකාරයට විදේශ රටවලට යැවීම සඳහා ශිෂ්‍යයින් එකතු කිරීමට මේ රටේ ඒජන්සි හැදිලා තිබෙනවා. ඒ ඒජන්සි අද ශිෂ්‍යයන් එකතු කර වෛද්‍ය

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

උපාධිය ලබා ගැනීමට නේපාලයට යවනවා; බංග්ලාදේශයට යවනවා. අපේ රටේ ළමයින්ට වෛද්‍ය උපාධිය ලබා ගන්න සංසාරයේදීවත් ඒ රටවලට යන්න වෙයි කියලා අපි ඉතිහාසයේදී හිතුවේ නැහැ. මම ඒ රටවල අධ්‍යාපනය අවතක්සේරු කරනවා නොවෙයි. ඒ රටවලට වඩා ඉහළ අධ්‍යාපන මට්ටමක් තිබුණු රටක් විධියට, එවැනි රටවලට යාමට සිදුවීම ගැන අද අපි රටක් විධියට, ජාතියක් විධියට ලජ්ජා වෙන්න ඕනෑ. මේ වෛද්‍ය උපාධිය ගන්න ඉන්දියාවට, බංග්ලාදේශයට, නේපාලයට යෑම සඳහා එක් ශිෂ්‍යයෙකුට දැරීමට සිදුවන වියදම රුපියල් ලක්ෂ 120ක්, රුපියල් ලක්ෂ 140ක් පමණ වනවා. බංග්ලාදේශයට, නේපාලයට, ඉන්දියාවට එක ශිෂ්‍යයෙක් යැවීම වෙනුවෙන් එක ඒජන්සියක commission එක හැටියට රුපියල් ලක්ෂ පහක් ලැබෙනවා. යුරෝපීය විශ්වවිද්‍යාලයකට යවනවා නම් රුපියල් ලක්ෂ දහයක් ලැබෙනවා. පසුගිය කාලයේ පැවති උද්ඝෝෂණ වැඩි කරන්න; උද්ඝෝෂණවලට උත්තේජනය දෙන්න; ඔක්සිජන් සපයන්න ඒ ආයතනත් මුදල් පොම්ප කළා. ඒක අපි නොදන්නවා නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ සිටින සියලුදෙනාම ඒක දන්නවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අපි දන්නේ නැහැ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
දන්නේ නැහැ නේ! මේ උද්ඝෝෂණ උග්‍ර කිරීමට බලපෑ කාරණා තමයි මම මේ කිව්වේ. මේ තුළ අපේ රටේ වෛද්‍ය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මාස දහයකට වැඩි කාලයක් අහිමි වුණා. උපාධියක් හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මාස දහයක්, අවුරුද්දක් කියන්නේ මොන තරම් වටින කාල සීමාවක්ද? විශ්වවිද්‍යාලවල අනෙක් පීඨවල පවා අධ්‍යාපන කටයුතු මේ මහින් කඩාකප්පල් වුණා. එහි ප්‍රතිඵලයක් විධියට ඊළඟට වෙන්නේ මොකක්ද? ඊළඟ කණ්ඩායම විශ්වවිද්‍යාලයට ඇතුළත් කර ගැනීමත් අවුරුද්දකින් ප්‍රමාද වෙනවා. ඒ අනුව මේ ක්‍රියාදාමය තුළ අපේ රටේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවයට වුණු හානිය අපට මුදලින් තක්සේරු කරන්න බැහැ. ඒක මහා බරපතළ හානියක්. විශේෂයෙන්ම අධ්‍යාපන ක්ෂේත්‍රයම බිඳ වැටෙන්න සෑහෙන ප්‍රමාණයකට බලපාපු කාරණයක්. ඒ නිසා මේ සංශෝධනය මහින් මේ දැවෙන ප්‍රශ්නය විසඳෙනවා වාගේම, වසර තුනක් තිස්සේ නොවිසඳී තිබුණු ප්‍රශ්නය විසඳෙනවා වාගේම, ඕන් ඉදිරියට මෙවැනි තත්ත්වයක් ඇති නොවන විධියට කටයුතු කිරීමේ වගකීමත් මේ පාර්ලිමේන්තුවේ සියලුදෙනා වෙත පැවරී තිබෙනවා. ඒ නිසා තමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි මම මීට පෙරත් සඳහන් කළේ, අපි මේ සභාවේ ගරු මන්ත්‍රීතුමන්ලාත්, ගරු ඇමතිතුමන්ලාත් එක්ක සාකච්ඡා කරලා, Quality Assurance and Accreditation Bill එක නුදුරේදීම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ඉදිරිපත් කර තිබෙන මේ පනත් කෙටුම්පත, හරි සුවිශේෂී පනත් කෙටුම්පතක්. දීර්ඝ අරගළයක් කරලා, අවුරුදු ගණනක් තිස්සේ ඔඩු දුවලා, කැකෑරෙමින් පැවති ප්‍රශ්නයකට අවසානයේදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා විසඳුමක් ලබා ගත්ත පළමුවන අවස්ථාව මෙය වෙන්න පුළුවන්. දීර්ඝ ව්‍යායාමයක ප්‍රතිඵලයක් විධියට, සියලු පාර්ශ්වයන්ගේ ආශීර්වාද ඇතුව අපි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදී ඒ සියලු පාර්ශ්වයන්ට ස්තුති කිරීම මාගේ යුතුකමක් වනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විශේෂයෙන්ම මේ කර්තව්‍යය සාර්ථක කරගන්න අතිගරු ජනාධිපතිතුමාගේ මහ පෙන්වීම අපට ලැබුණා. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු නිලධාරීන්ගේ සහයෝගයත් පූර්ණ වශයෙන් ලැබුණා. ඒ වාගේම ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් අවශ්‍ය උපදෙස් ලැබුණා. ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා ඇතුළු නිලධාරීන් සියලුදෙනා අපේ මේ යෝජනාවට එකඟ වුණා. එහෙම එකඟ නොවුණා නම්, ශිෂ්‍යයන්ට මේ සහනය ලබා දීමේ හැකියාවක් අපට ලැබෙන්නේ නැහැ. ඉතින්, ඒ සියලුදෙනාටම ආණ්ඩුවේ ගෞරවය, ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා.

මේ පනත් කෙටුම්පත මේ ආකාරයට සකස් කරගෙන, සාකච්ඡාවලට ඉදිරිපත් වෙලා, සම්මුතියකට පැමිණීමට විශේෂයෙන් ගරු නීතිපතිතුමා ඇතුළු එතුමන්ගේ නිලධාරීන්, නීති කෙටුම්පත් සම්පාදකතුමිය ඇතුළු එතුමියගේ නිලධාරීන්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිතුමා, ඒ සාමාජිකයන් ඇතුළු සියලුදෙනා අපට සහයෝගය ලබා දුන්නා.

ඒ වාගේම, රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය මේ පිළිබඳව දැඩි අවධානයෙන් කටයුතු කරපු සංවිධානයක්. ඒ ආයතනය රටේ ජනතාවගේ සෞඛ්‍ය අයිතිවාසිකම් පිළිබඳව බරපතළ වගකීමක් දරන ආයතනයක්. රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය අපට මෙම ප්‍රශ්නය නිරාකරණය කර ගැනීම සඳහා ලබා දුන් සහයෝගය අගය කර සලකමින් එතුමන්ලාටත් අපේ ස්තුතිය පුද කරනවා. ඊට අමතරව, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ සංගම් මේ පිළිබඳව අපට දක්වපු සහයෝගය පිළිබඳවත් අපේ ස්තුතිය ප්‍රකාශ කරනවා.

මේ පනත් කෙටුම්පත සම්මත කර ගැනීම සඳහා ඔබ සියලුදෙනාගේ සහයෝගය අපට ලබා දෙන්න කියා මම මේ පාර්ලිමේන්තුවේ ගරු මැති ඇමතිතුමන්ලාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. Kaveendiran Kodeeswaran. You have fifteen minutes. - *[Not in the Chamber.]*

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ නමින් මේ පනත් කෙටුම්පතට සංශෝධන තුනක් ඉදිරිපත් කර තිබෙනවා. මම හිතුවා එම සංශෝධන තුන සම්බන්ධයෙන් ඇමතිතුමාගේ කථාවේදී සඳහනක් කරයි කියලා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ ගැන පැහැදිලි කරන්නම්. අපි ඊයේ ආංශික අධීක්ෂණ කාරක සභාවේදී ඒ පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාත් ප්‍රධාන වශයෙන් ඉදිරිපත් කරපු කාරණය තමයි SAITM වෛද්‍ය පීඨය අහෝසි කිරීමේ කාරණය. අපේ මේ පනත් කෙටුම්පතට සංශෝධනයක් විධියට එම වගන්තිය ඇතුළත් කරනවා. ඔබතුමන්ලාට ඒක ලැබෙන්න සලස්වනවා.

අනෙක් කාරණය තමයි, වෛද්‍ය සභාවේ අනුමැතිය ලබා ගැනීම පිළිබඳ කාරණය. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ආයතනය වෙනම ස්වාධීන ආයතනයක්. වෛද්‍ය විද්‍යාලය කියන්නේ උපාධි ලබා දෙන ආයතනයක්. ඒ උපාධිය පිළිගන්නවාද, නැද්ද කියන කාරණය පිළිබඳ පූර්ණ බලය, අනන්‍ය බලය තිබෙන්නේ වෛද්‍ය සභාවටයි. අපි නීතිඥවරුන් විධියට නීති උපාධිය -LLB- සමත් වුණාට, Council of Legal Education තමයි තීන්දු කරන්නේ අපේ උපාධි සහතිකය පිළිගන්නවාද නැද්ද කියන කාරණය. ඒ වාගේම මේකත් academic qualification එකක්; අධ්‍යයන සුදුසුකමක්. ඒක වෘත්තීය සුදුසුකමක් බවට පරිවර්තනය වෙන්නේ වෛද්‍ය සංගමය ඒ සහතිකය පිළිගත් විටයි. ඒ නිසා වෛද්‍ය සභාවට තිබෙන අයිතියට, ස්වාධීනභාවයට කිසිම බාධාවක් නැතිව මේ පනත් කෙටුම්පත ක්‍රියාත්මක කරන්න පුළුවන්. අවසානයේදී වෛද්‍ය සභාව තමයි තීරණය කරන්නේ, ඔහු එම වෘත්තියට ඇතුළු කර ගන්නවාද, නැද්ද කියන කාරණය. ඒ පිළිබඳව අපි මැදිහත් වීමක් කරන්නේ නැහැ. අපේ වගකීම තිබෙන්නේ විශ්වවිද්‍යාල පද්ධතිය තුළ උපාධිය ලබා ගැනීම දක්වා ඒ දූ දරුවන්ට සාධාරණය ඉෂ්ට කරන්නයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
දැනට වෙන්නේ කොහොමද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒ උපාධිය හැදෑරීම සඳහා අවශ්‍ය වූ මූලික සුදුසුකම කුමක්ද, මොන විශ්වවිද්‍යාලවල උපාධියද භාර ගන්නේ, මොන විශ්වවිද්‍යාලවල උපාධිද ප්‍රතික්ෂේප කරන්නේ කියන ඒ සියලු කරුණු දැනටත් තීරණය කරන්නේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙන්. ඒ නිසා මේ පනත් කෙටුම්පත මඟින් එතුමන්ලාගේ බලතල කිසි ලෙසකින් සීමා කිරීමට හෝ බාධා කිරීමට ඉඩ කඩක් නැහැ. ඒ පූර්ණ අයිතිය එතුමන්ලාට තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ ක්‍රියාවලිය එලෙසම පවත්වාගෙන යන්න පුළුවන්ද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඔව්. මා හිතන හැටියට ඒ කාරණය ඔබතුමාට පැහැදිලි ඇති.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 25ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.24]

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේ අපි මේ පාර්ලිමේන්තුවේ කාලය විශාල ලෙස යෙදෙව්වා SAITM අර්බුදය පිළිබඳව සාකච්ඡා කරන්නට. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාළ ඕනෑම කරුණක් සම්බන්ධයෙන් විවාදයක් පැවැති වෙලාවකදී, අදාළ මාතෘකාව පසෙක තිබියදී ප්‍රධාන මාතෘකාව බවට පත් වුණේ මේ SAITM ප්‍රශ්නය තමයි. ඒ වාගේම, රටේ මාධ්‍යවලත් ඉතා විශාල ඉඩකඩක් ඒ ප්‍රශ්නය විසින් අරගෙන තිබුණා.

ගරු ඇමතිතුමාගේ කථාවේදී කිව්වා, විශේෂයෙන් පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ආරම්භ කිරීම සම්බන්ධයෙන් රජයේ තවමත් ප්‍රතිපත්තිමය තීන්දුවක් නැහැ කියලා. නමුත්, 1977න් පස්සේ පත් වෙච්ච හැම ආණ්ඩුවක්ම අපේ රටේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ආරම්භ කරන්න උත්සාහ කළා; ආරම්භ කළා. 1982දී උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ආරම්භ කළා. ඊළඟට, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ කාලයේදී පෞද්ගලික වෛද්‍ය විද්‍යාල මේ රටේ පිහිටුවන්න අවස්ථා ගණනාවකදී උත්සාහ කළා. එහෙම වසර ගණනක් උත්සාහ කරලා, කොහොම හරි අවුරුදු අටකට පෙර තමයි මේ SAITM කියන ආයතනය ආරම්භ කරන්න පුළුවන්කම ලැබුණේ. ඒ කෙසේ වෙතත්, අපේ රටේ ශිෂ්‍ය ව්‍යාපාරය රටේ ජනතාවත් එක්ක මැදිහත් වෙලා කරපු අරගළවල ප්‍රතිඵලයක් හැටියට අපේ රටේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ආරම්භ කරන්න නොහැකි වෙලා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, පෞද්ගලික වෛද්‍ය විද්‍යාල හෝ පෞද්ගලික විශ්වවිද්‍යාල සම්බන්ධයෙන් රටේ මත දෙකක් පවතින බව ඔබතුමාත් දන්නවා. ඒක ඇත්ත. නමුත්, පෞද්ගලික වෛද්‍ය විද්‍යාලවලට පක්ෂ අය පවා SAITM ආයතනය සම්බන්ධයෙන් දරන්නේ ඊට වඩා වෙනස් ආකල්පයක්. SAITM ආයතනය ආරම්භ කරපු ආකාරය, එයට අවසර ගත්තු ආකාරය, සෞඛ්‍ය අමාත්‍යාංශයට විවිධ අසත්‍ය, ව්‍යාජ ලියුම් පෙන්වලා එයට අනුමැතිය ලබා ගත්තු ආකාරය හා කඩුවෙල උසාවියට ඉදිරිපත් කළ බොරු දිවුරුම් ප්‍රකාශ යන ඒ සියල්ලෙන් පෙන්නුම් කරනවා, රටේ සාමාන්‍ය නීතිය, සාමාන්‍ය පරිපාලන ව්‍යුහයත් කඩලා තමයි ඒ ආයතනය පවත්වාගෙන ගියේ කියලා. සාමාන්‍යයෙන් අපේ රටේ උපාධි ප්‍රදානය කරන ආයතනයක් ආරම්භ කිරීමේදී අවසර ගත්තේ, - විශේෂයෙන්ම වෛද්‍ය උපාධි ප්‍රදානය කරන ආයතනයක් - ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා ශ්‍රී ලංකා වෛද්‍ය සභාව කියන ආයතන හතරෙන්. මේ කියන ආයතන හතරම නොමඟ යවා හෝ ඒවා bypass කරලා, හිටපු ඇමතිවරයාගේ බලයත් පාවිච්චි කරලා තමයි ඔවුන් ඒ කටයුතු සිද්ධ කළේ. ඒ නිසා පෞද්ගලික විශ්වවිද්‍යාලවලට, පෞද්ගලික වෛද්‍ය විද්‍යාලවලට යම් කැමැත්තක් තිබෙන අය වුණත් SAITM එක විසින් කරපු ඒ ක්‍රියාවලිය අනුමත කරන්නේ නැහැ. ඒ නිසා මා කියන්න කැමැතියි ගරු ඇමතිතුමනි, මෙහි හිමිකරුවා වන වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු මේ කාරණයේදී විත්දිතයෙක් නොවන බව. ඔහු මේ පාර්ලිමේන්තුව නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක්. එක්සත් ජාතික පක්ෂය ඔහුගේ පක්ෂ සාමාජිකත්වය අහෝසි කිරීම නිසා මන්ත්‍රීකම නැති වුණා. ඔහු වෛද්‍යවරයෙක්; ඔහු ව්‍යාපාරිකයෙක්. ඔහු ආරම්භ කරපු පළමුවැනි ව්‍යාපාරය මේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය නොවෙයි. ඔහුට වෙනත් ව්‍යාපාර තිබෙනවා. ඒ නිසා ඔහු රටේ නීතිය දන්න කෙනෙක්ය කියලා අපි හිතනවා. එහෙම කෙනෙක් අවුරුදු අටක් තිස්සේ අපේ රටේ දරුවන් 800කට වැඩි ප්‍රමාණයක් රවටලා, ඒ දරුවන්ගේ අනාගතය අවිනිශ්චිතතාවකට පත් කරලා කරපු ඒ ක්‍රියාදාමයේදී ඔහු අභිංසකයෙක්, විත්දිතයෙක් හැටියට නම් කරලා පැත්තකින් තියන්න බැහැ. මොකද, ඔහු බරපතළ වැරදි ගණනාවක් සිද්ධ කරලා තිබුණ නිසා. ඇත්තටම අපේ රටේ යම් දරුවෙකුට උපාධියක් ගන්නට, වෛද්‍යවරයෙක් වන්නට තිබෙන අවශ්‍යතාව හා කැමැත්ත පාවිච්චි කරලා, ඒ කැමැත්ත ව්‍යාපාරික අරමුණකින් ප්‍රයෝජනයට ගෙන ලාභ ලැබීම සහ එම දරුවන්ගේ අනාගතය අඳුරු කිරීම සම්බන්ධයෙන් පවතින නීතියකින් ඔහුට දඬුවම් කරන්න ඕනෑ. එම දරුවන්ගේ අනාගතයට

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

සිදුවුණු හානිය සම්බන්ධයෙන් ඔහුගෙන් මුදලක් අය කර ගන්න ඕනෑ. ඇලෝසියස් වාගේම ඇලෝසියස් පන්නයේ වෙනත් වැඩක් තමයි ඔහු කරලා තිබෙන්නේ. එම නිසා ඔහු චින්දිතයෙක් හැටියට පැත්තකට කරලා තබන්න බැහැ.

අපි මේ පිටු දෙක-තුනක පනත් කෙටුම්පතකින් මෙය යම් ආකාරයකින් විසඳන්න උත්සාහ ගත්තාට, ටිකක් දික් ගැස්සුණු අරගළයක් රටේ තිබුණු බව ඇමතිතුමාත් පිළිගත්තා. විශේෂයෙන්ම අපේ රටේ වෛද්‍ය ශිෂ්‍යයින් තමන්ට ලැබෙන උපාධිය පිළිබඳ ප්‍රශ්නයකට නොවෙයි, අනාගතයේ දී එම වෛද්‍ය පීඨවලින් උපාධිය ලබා ගැනීමට නියමිත අනාගත පරම්පරාව වෙනුවෙන් විශාල කැප කිරීමක් කරපු නිසා, මේ අරගළය සම්බන්ධයෙන් යම් ජයග්‍රහණයක් ලබා ගන්න හැකියාව ලැබී තිබෙනවා. ඔවුන් තමන්ගේ දේශන අතරමඟ නතර කරගෙන, තමන්ගේ සායනික පුහුණුවලට යන්නේ නැතුව, විභාගවලට ඉදිරිපත් වෙන්නේ නැතුව, අර අට්ටාලවල ඉඳිමින් අඛණ්ඩව කරපු අරගළයක ප්‍රතිඵලයක් මේකට හේතු වුණා. ඒ වාගේම එම වෛද්‍ය ශිෂ්‍යයින් තනි කරන්නේ නැතුව අපේ රටේ විශ්වවිද්‍යාලවල සිටින අනෙක් ශිෂ්‍යයින් කඳුළු ගෑස් ප්‍රහාරවලට, ජල ප්‍රහාරවලට, පොලිස් බැටන් ප්‍රහාරවලට විටින් විට ලක් වෙමින්, සිරගතවීම, පොලීසියේ, හමුදාවේ ඔත්තු සේවා තමන්ගේ ගෙවල්වලට රිංගීම, තර්ජනය කිරීම ආදී ඒ සියල්ලට මුහුණ දෙමින් අඛණ්ඩව කරපු අරගළයක් තිබුණා.

ඒ වාගේම අපේ රටේ රජයේ වෛද්‍ය පීඨවල සිටින වෛද්‍ය ශිෂ්‍යයින්ගේ දෙමවුපියන් වෙන කවදාවත් නැති විධියට දිස්ත්‍රික්කවල දෙමවුපිය සංගම් හදාගෙන මේ අරගළයට විශාල සහායක් ලබා දුන්නා. ඔවුන් නොසිටින්නට සමහර විට මෙය අතරමඟ කෙළවර වෙන්න ඉඩ කඩ තිබුණා. හැබැයි, මේ රටේ වෛද්‍ය අධ්‍යාපනයත්, සෞඛ්‍යයත් ආරක්ෂා කිරීමේ අරමුණින් ඔවුන් ඒ අරගළයේ සිටියා. ඒ වාගේම මේ සටන අතරමඟ නතර වෙන්න නොදී ඇදගෙන යෑම සඳහා රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය සහ වෘත්තිය සමිති ඉතා විශාල කාර්ය භාරයක් කළා, ඇමතිවරයා අගය කළා වාගේම. ඒ වාගේම මම මේ වේලාවේදී අපේ රටේ වෛද්‍ය පීඨ ආචාර්ය සංගම් පිළිබඳව විශේෂයෙන් මතක් කරන්න කැමැතියි. ඔවුන් සාමාන්‍යයෙන් වෙනත් ප්‍රශ්නවලට මැදිහත් වෙන්නේ නැහැ. නමුත් මෙම ප්‍රශ්නයේ දී තමන්ගෙන් ඉගෙන ගන්නා ශිෂ්‍යයින් විසින් කරන අරගළය සාධාරණයි කියන පදනම මත, "අපේ රටේ වෛද්‍ය අධ්‍යාපනය සහ සෞඛ්‍යය සුරක්ෂිත වෙන්නට නම්, මේ සයිටම් ආයතනය අහෝසි විය යුතුයි" කියන දැඩි ස්ථාවරයේ ඉඳිමින් රටේ තිබෙන වෛද්‍ය පීඨ අටෙම ආචාර්ය සංගම් ඉතාම සාධනීය මැදිහත්වීමක් කළා. අපේ ආචාර්ය හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමාත් දන්නවා, ඔවුන්ගේ මැදිහත්වීම කොතරම් සාධනීයද කියලා. ඔවුන් මෙම ප්‍රශ්නය වවා ගන්න, මෙම ප්‍රශ්නයෙන් ගසා කන්න නොවෙයි කටයුතු කළේ. මෙම ප්‍රශ්නය සාර්ථකව විසඳා ගෙන එම දරුවන්ගේ අධ්‍යාපනය ඉස්සරහට ගෙන යන පැත්තට තමයි කටයුතු කරමින් සිටියේ. ඒ වාගේම ඊට සමාන්තරව සමහර සිවිල් සංවිධාන, දේශපාලන පක්ෂ මෙහිදී කළ කාර්ය භාරයක් තිබුණා. ඒ නිසා මේ හැම දෙනාම යම් කිසි ආකාරයකට ආපු එකඟතාවයේ ප්‍රතිඵලයක් හැටියට අද අපට යම් තීන්දුවකට එළඹෙන්නට පුළුවන්කම ලැබී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම පනත් කෙටුම්පතට යම් යම් සංශෝධන එකතු විය යුතුයි කියලා අපි හිතනවා. ඇමතිතුමාත් සමහර සංශෝධන විය යුතුයි කියලා පිළිගත්තා. ගරු ඇමතිතුමනි, මෙම පනත් කෙටුම්පතෙහි ඔබතුමා දක්වා තිබෙන විධියට 2009 සැප්තැම්බර් 15 ඉඳලා 2017 මැයි 15 දක්වා, සයිටම් ආයතනයේ ලියා පදිංචි වුණු ශිෂ්‍යයින් අතරින් මූලික සුදුසුකම් ලබා ඇති ශිෂ්‍යයින්ට තමයි මේ කේඩීයූ උපාධිය ලබා දෙන්නේ. මෙහි මූලික සුදුසුකම් විධියට ඔබතුමාම විග්‍රහ කරලා තිබෙනවා, අ.පොස.ස (උසස් පෙළ) විභාගයේදී රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ ජීව විද්‍යාව යන විෂයයන්ට "එස්" සාමර්ථ තුනක් ගත යුතුයි, එසේ ගත්තොත් අවම සුදුසුකම් සම්පූර්ණ වෙනවා කියලා. එහෙම නැත්නම් ඊට සමාන්තර විභාගවල රසායන විද්‍යාව, ගණිතය සහ ජීව විද්‍යාව කියන විෂයයන් සමත් වෙන්න ඕනෑය කියලාත් දක්වා තිබෙනවා.

ගරු ඇමතිතුමනි, දැන් තිබෙන ප්‍රශ්නය මෙයයි. පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ඇති කිරීමේදී ඕනෑම ආණ්ඩුවක් පැත්තෙන් එන ප්‍රධාන තර්කය තමයි, අපොස උසස් පෙළ විභාගය වැනි ඉතාම තරගකාරී විභාගයකදී ලකුණක් හෝ ලකුණු දෙකක් අහිමිවන, Z-score එකේ දශමයක් හෝ දශම දෙකක් අහිමිවන දරුවන්ට මුදල් වියදම් කරගෙන වෛද්‍යවරයකු වෙන්න අවස්ථාව තිබිය යුතුයි කියන එක. අපේ මොහාන් ලාල් ග්‍රේරු රාජ්‍ය ඇමතිතුමාත්, අධ්‍යාපනය භාර ඇමතිවරු ගණනාවකුත් මේ කාරණයම මේ පාර්ලිමේන්තුවේදී කියලා තිබෙනවා. හැබැයි මා තමුන්නාන්සේලාට පෙන්නුම් කරන්න කැමැතියි, රජයේ වෛද්‍ය පීඨවලට ඇතුළත්වීම සඳහා 2015 අවුරුද්දේ තරගකාරී උසස් පෙළ විභාගයේ ජීව විද්‍යා විෂය ධාරාවේ ප්‍රතිඵල අනුව අවශ්‍ය අවම සුදුසුකම මොකක්ද කියලා. "A" සාමාර්ථ 2ක් හා "B" සාමාර්ථ 1ක් තමයි අපේ රටේ වෛද්‍ය පීඨවලට ඇතුළත් වීම සඳහා දිස්ත්‍රික්ක හයක අවම සුදුසුකම වුණේ. ඒ දිස්ත්‍රික්ක මොනවාද? කොළඹ, කළුතර, මාතර, හම්බන්තොට, මඩකළපුව හා වවුනියාව යන දිස්ත්‍රික්කයි. ඒ කියන්නේ, වෛද්‍ය පීඨ ප්‍රවේශය සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ අවම සුදුසුකම වුණේ "A" සාමර්ථ 2ක් හා "B" සාමර්ථ 1ක්. එම අවුරුද්දේ වෛද්‍ය පීඨ ප්‍රවේශය සඳහා මඩකළපුව දිස්ත්‍රික්කයේත් අවම සුදුසුකම වුණේ "A" සාමර්ථ 2ක් හා "B" සාමර්ථ 1ක්. එතකොට ඔබතුමාට හිතාගන්න පුළුවන්, අපේ රටේ දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධයෙන් තිබෙන උනන්දුව, තරගකාරිත්වය සහ දක්ෂතාව. ඊළඟ අවම සුදුසුකම වන "A" සාමර්ථ 1ක් සහ "B" සාමර්ථ 2ක් අවශ්‍යවන දිස්ත්‍රික්ක තමයි, ගම්පහ, ගාල්ල, රත්නපුරය, කෑගල්ල, අනුරාධපුරය, පොලොන්නරුව, අම්පාර, යාපනය, මන්නාරම හා බදුල්ල යන දිස්ත්‍රික්ක. මන්නාරම දිස්ත්‍රික්කයේත්, ගම්පහ දිස්ත්‍රික්කයේත් 2015 අවුරුද්දේ අවම සුදුසුකම වුණේ "A" සාමර්ථ 1ක් සහ "B" සාමර්ථ 2ක්. ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අවම සුදුසුකම "A" සාමර්ථ 2යි, "C" සාමර්ථ 1යි. කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ අවම සුදුසුකම "A" සාමර්ථ 1යි, "B" සාමර්ථ 1යි, "C" සාමර්ථ 1යි. මුලතිවු දිස්ත්‍රික්කයේ අවම සුදුසුකම "A" සාමර්ථ 1යි, "B" සාමර්ථ 1යි, "C" සාමර්ථ 1යි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රජයේ වෛද්‍ය පීඨවලට ඇතුළත් වීම සඳහා 2015 අවුරුද්දේ මුලතිවු සහ කිලිනොච්චිය දිස්ත්‍රික්කවල අවම සුදුසුකම බවට පත්වෙලා තිබෙන්නේ "A" සාමර්ථ 1යි, "B" සාමර්ථ 1යි, "C" සාමර්ථ 1යි. ඒ අවුරුද්දේ මොනරාගල දිස්ත්‍රික්කයේ අවම සුදුසුකම වුණේ "B" සාමර්ථ 3යි. ඒ කියන්නේ, "B" සාමර්ථ 3ට වඩා ඉහළ, එනම් "A" සාමර්ථ 2ක් හා "B" සාමර්ථ 1ක් දක්වා වුණු අවම සුදුසුකමක් තමයි අපේ වෛද්‍ය පීඨවලට ඇතුළත් වෙන්න අවශ්‍යවෙලා තිබුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ වෛද්‍ය පීඨවලට ඇතුළත් වීම සඳහා එවැනි සුදුසුකමක් අවශ්‍යවෙලා තිබෙන අපේ රටේ, "S" සාමර්ථ 3ක් අවම සුදුසුකම වීමේ සාධාරණය මොකක්ද? එහි මොකක් හෝ සාධාරණයක් තිබෙනවාද කියලා මා සොයා බැලුවා. පසුගිය අවුරුදුවල ඔබතුමන්ලාගේම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රවේශ සුදුසුකම් යටතේ මේ සුදුසුකම කොහේද තිබෙන්නේ?

2005/ 2006 අධ්‍යයන වර්ෂයේ සිට 2015 /2016 අධ්‍යයන වර්ෂ දක්වා ගත්තාම, "S" සාමර්ථ තුනෙන් විශ්වවිද්‍යාලවල වෛද්‍ය පීඨවලට ප්‍රවේශවෙලා තිබෙන්නේ 2009 /2010 අවුරුද්දේ විතරයි. ඒ, කිලිනොච්චියේ දරුවෙක්. ඒ දරුවාට "S" සාමර්ථ තුනක් තිබෙනවා. 2015/2016 වර්ෂය ගත්තොත් ප්‍රවේශය "B" සාමර්ථ 2යි, "C" සාමර්ථ 1යි. ඒ නුවරඑළියේ දරුවෙක්. මූලික සුදුසුකම **"S"** සාමර්ථ තුන කියන එකේ තර්කයක් නැහැ. මේ සංඛ්‍යා ලේඛන අනුව රජයේ වෛද්‍ය පීඨවලට ඇතුළත් වෙන්න බැරි වෙලා තිබෙන්නේ දශම එකක දෙකක අඩුවක් නිසා නම් ඒක "S" සාමර්ථ තුන නොවෙයි, ඊට වඩා බොහෝ ඉහළයි.

ගණිතය සම්බන්ධ ප්‍රශ්නයත් ඒ වාගෙයි. මා මේ වෙලාවේදී ලිපියක් කියවන්න කැමතියි. රජයේ වෛද්‍ය පීඨ අටේම ආචාර්ය සංගම් විසින් ඉල්ලීමක් කර තිබෙනවා. ඔබතුමාටත් මේ ලිපිය නිකුත් කරලා ඇති, ගරු ඇමතිතුමනි. ඒ ලිපියේ බොහොම පැහැදිලිව කියනවා, මේ දරුවන් ඇතුළත් කර ගැනීමේ සුදුසුකම අඩු තරමින් "C" සාමර්ථ 2ක් සහ "S" සාමර්ථ එකක්වත් වෙන්න ඕනෑය කියා. වෛද්‍ය පීඨ අටේම ආචාර්යවරුන්ගේ ඉල්ලීම මෙකයි. එම ලිපියේ මෙසේ සඳහන් වනවා:

> " 'Basic qualifications' mean, minimum of two Cs and one S grade (as in Chemistry, Physics and Biology at the G.C.E. (Advanced Level) Examination conducted by the Examinations Department of the Ministry of Education of Sri Lanka or an equivalent foreign qualification including equivalent qualifications of students who have offered the subjects Chemistry, Physics and Biology;"

වෛද්‍යවරු වෙන්න, වෛද්‍ය උපාධිධාරීන් වෙන්න ශිෂ්‍යයන්ට උගන්වන ආචාර්යවරුන්ගේ ඉල්ලීම තමයි ගරු ඇමතිතුමනි, ගණිතය සමත් අය නොව, ගණිතය සමත් අය වෙනුවට භෞතික විද්‍යාව සමත් දරුවන්ට මේ සුදුසුකම ලබා දෙන්නය කියන එක. මෙන්න මේ "මූලික සුදුසුකම" කියන එක පිළිබඳව නැවත සලකා බලන්න කියා මා යෝජනා කරන්න කැමතියි. මේ සම්බන්ධයෙන් අපි අතරේ කාලයක් තිස්සේ ඉඳලා ලොකු විවාදයක් තිබෙනවා. නමුත් මේ "S" සාමර්ථ 3 කියන එක කිසිම ආකාරයකින් සාධාරණ හෝ තර්කානුකූල කාරණයක් නොවෙයි කියා මා කියන්න කැමතියි.

ඊළඟට, SAITM එකට සිසුන් බඳවා ගැනීමේදී ඒ ආයතනය විසින් පළ කළ දැන්වීම්වල ඉල්ලා තිබුණු සුදුසුකම මොකක්ද? නෙවිල් ප්‍රනාන්දු මහත්මයා මුදල් ගෙවා පුවත් පත්වල පළ කළ advertisementsවල තිබෙන්නේ, "C" සාමර්ථ 2ක් සහ "S" සාමර්ථ 1ක් ඕනෑය කියායි. මේ ප්‍රශ්න මතු වනකොට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව දැන්වීමක් පළ කරලා කියනවා, "ශ්‍රී ලංකා වෛද්‍ය සභාව මඟින් නිර්දේශිත අවම අධ්‍යාපන සුදුසුකම් ඔබ සපුරා තිබේද? අවම සුදුසුකම ජීව විද්‍යාව, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව යන විෂයයන් සඳහා සම්මාන සාමර්ථ දෙකක් සහ සාමාන්‍ය සාමර්ථයක් එකවර එක විභාගයකදී ලබා තිබීමයි" කියලා. දැන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවත් කියනවා, "වෙන දේවලට යන්න එපා, අපි පිළිගන්නේ නැහැ, අපි පිළිගන්නේ "C" සාමර්ථ 2 සහ "S" සාමර්ථ 1යි" කියා. SAITM එකත් advertisement එකක් පළ කරලා කියනවා, ඔවුන් ඉල්ලන්නේත් "C" සාමර්ථ 2 සහ "S" සාමර්ථ 1යි කියලා. එහෙම තිබියදී, "S" සාමර්ථ 3ක් තිබෙන සිසුන් ගැනීමේ තේරුම මොකක්ද? SAITM එක ඇතුළේ "S" සාමර්ථ 3ක් ගත් ළමයි ඉන්න බව මා දන්නවා. මට ඕනෑ නම් එය පෙන්නුම් කරන්න පුළුවන්, ගරු ඇමතිතුමනි. ඒ ළමයින්ගේ අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ තොරතුරු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් COPE එකට එව්වා. ඒ තොරතුරුවලට අනුව පළමුවැනි කණ්ඩායමේ දේශීය ශිෂ්‍යයන් 16දෙනකු අතරින් "C" සාමර්ථ 2, "S" සාමර්ථ 1ට වඩා අඩුවෙන් ගත් තුන්දෙනකු ඉන්නවා. දෙවැනි කණ්ඩායමේ දේශීය ශිෂ්‍යයන් 37දෙනකු අතුරින් "C" සාමර්ථ 2, "S" සාමර්ථ 1ට වඩා අඩුවෙන් ගත් 13දෙනකු ඉන්නවා. තුන්වැනි කණ්ඩායමේ දේශීය ශිෂ්‍යයන් 14දෙනාගෙන් "C" සාමර්ථ 2, "S" සාමර්ථ 1ට වඩා අඩුවෙන් ගත් 3දෙනකු ඉන්නවා. හතරවැනි කණ්ඩායමේ දේශීය ශිෂ්‍යයන් 55න් "C" සාමර්ථ 2, "S" සාමර්ථ 1ට වඩා අඩුවෙන් ගත් 14දෙනකු ඉන්නවා.

ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා උසස් අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ, "SAITM එකට ඇතුළත් වෙලා සිටින ශිෂ්‍යයන්ගේ උසස් පෙළ හෝ ඊට සමාන්තර විභාගවල සුදුසුකම් මොනවාද?" කියා මා පාර්ලිමේන්තුවේදී ප්‍රශ්නයක් ඇහුවා. මට මතක විධියට මම ඒක ඇහුවේ 2016 අප්‍රේල් මාසයේ වාගෙයි. එතකොට ඇමතිතුමා පාර්ලිමේන්තුවට කිව්වා, ඒ උත්තර SAITM එකෙන් අපිට ලබා දෙන්නේ නැහැය කියා. හොඳයි. අපි ඒ පිළිතුර තාවකාලිකව පිළිගනිමු. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට දැන් අනුයුක්ත -අන්තර්ග්‍රහණය- කරන SAITM එකේ ළමයින්ගේ සියලු අධ්‍යාපන සුදුසුකම් -ඒ කියන්නේ, index numbers, විභාගය කළේ කවදාද, එක් වතාවක විභාග ප්‍රතිඵල මොනවාද යනාදී කරුණු- අනික් අයට පරීක්ෂා කරන්න පුළුවන් වන විධියට ඒ තොරතුරු සියල්ල පාර්ලිමේන්තුවේ සභාගත කරන්න කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, මේක අමුතු අත්දැකීමක් නොවෙයි.

මම දන්නවා, උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් වෙලා තිබුණු ශිෂ්‍යයන්ගේ සමස්ත ප්‍රතිඵල පාර්ලිමේන්තුවේ සභාගත කළ බව. ඒ වාගේම මේ ප්‍රතිඵලත් සභාගත කරන්න, ගරු ඇමතිතුමනි. එතකොට මේ අයගේ සුදුසුකම් මොනවාද කියා බලාගන්න පුළුවන්. ගරු ඇමතිතුමනි, මෙහි කිසිම සාධාරණයක් නැහැ කියා මම කියන්නේ මේ නිසායි. මට UGC එකෙන් එවපු සංඛ්‍යා ලේඛන අනුව, මේක ඇතුළේ 0.058ක Z අගයක් තිබෙන දරුවෙකුත් ඉන්නවා. Z අගය 0.058යි. 1.8ක, 1.9ක Z අගයක් අරගෙනත් වෛද්‍ය පීඨයට යන්න බැරි අය ඉන්න අතරේ, 0.058ක Z අගය තිබෙන අය "සයිටම්" එකේ ඉන්නවා. ඒ වාගේම 0.0744ක Z අගය තිබෙන අයත් ඉන්නවා. ඒ කියන්නේ, Z අගය 1ටත් වඩා අඩුයි. අපි සලකා බලන්න ඕනෑ ලක්ෂ 80ක් හෝ ලක්ෂ 100ක් හෝ ගෙවලා අවුරුදු 5ක්, 6ක් වෛද්‍ය උපාධියක් ලබාගන්න බලාගෙන ඉන්න කෙනෙක් ඒ වෛද්‍ය උපාධිය ලබාගන්න බැරිවීම නිසා ලබන පශ්චාත්තාපය ගැන පමණක්ද? මෙවැනි කෙනකුට උපාධියක් ලබාදීලා සමාජයට යොමු කළාට පස්සේ ඔහු හෝ ඇය වෛද්‍යවරයෙක් හැටියට සේවය කරනකොට ඒකෙන් සෞඛ්‍ය සේවාවට සහ සාමාන්‍ය ජනතාවට වන දෙය ගැන අපි සලකා බලන්නේ නැද්ද? ඇත්තටම ගත්තොත්, "සයිටම්" එකේ ඉගෙන ගන්නා දරුවන් ගැන අපි කාට කාටත් තිබෙන අනුකම්පාව අද මේ තීන්දුවට ඒම සඳහා විශාල බලපෑමක් වුණා. ඇමතිතුමා කිව්වා වාගේම හැම පාර්ශ්වයක්ම හිතුවා, "මේ අය මේ රටේ දරුවෝ; ඔවුන්ටත් යම් සාධාරණයක් වෙන්න ඕනෑ" කියා. හැබැයි, සාධාරණයක් වුණු පමණින්ම, ඒ කෙනකුට වන සාධාරණය රටේ බහුතර ජනතාවකට අසාධාරණයක් වෙන්න බැහැ. ඒ නිසා තමයි, උසස් පෙළ විභාගයේ අවම සුදුසුකමක් දමලා, ඒ ප්‍රතිඵල තිබෙන අය වෛද්‍ය පීඨයට අරගෙන වෛද්‍ය උපාධි ලබාදෙන්න කටයුතු කරන්නේ. ඒ නිසාම තමයි වෛද්‍ය පීඨ ආචාර්යවරුන් පවා කියන්නේ ඔවුන්ගේ අවම සුදුසුකම මීට වඩා වැඩි වෙන්න ඕනෑ බව.

ඊළඟට, මේ අයගේ පුහුණුව සම්බන්ධවත් ප්‍රශ්නයක් තිබෙනවා. මම හිතන විධියට ඔබතුමාත් ඒක පිළිගන්නවා, ගරු ඇමතිතුමනි. ශ්‍රී ලංකා වෛද්‍ය සභාව 2015 සැප්තැම්බර් මාසයේ 4වන දා කළ නිරීක්ෂණයෙන් පසුව, "The inspection team recommended that the SLMC does not recognize graduates who have completed the study programme currently provided by the Faculty of Medicine, SAITM" යනුවෙන්

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

බොහොම පැහැදිලි වාර්තාවක් ඉදිරිපත් කළා. ඒ කියන්නේ, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සලකා බලන්නේ ඔවුන්ගේ සමස්ත පුහුණුව පිළිබඳවයි. ඒකට සායනික පුහුණුවත් අයිතියි; දේශනගාරයේ සිද්ධ වුණු දේශනත් අයිතියි. ඒ නිසා මේ අයට උපාධියක් ප්‍රදානය කරන්න කලින්; උපාධිය ප්‍රදානය කරලා ඔවුන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියා පදිංචි වෙන්න කලින් මෙන්න මේ කාරණය කළ යුතුය කියා අපි හිතනවා. අපි විතරක් නොවෙයි, වෛද්‍ය පීඨ ආචාර්යවරුනුත් ඒ කාරණය යෝජනා කර තිබෙනවා. රජයේ වෛද්‍ය පීඨ ශිෂ්‍යයෙක් ඉගෙන ගන්නා Medicine, Surgery, Paediatrics, Gynecology and Obstetrics කියන ප්‍රධාන විෂයයන් හතර පිළිබඳව අවුරුද්දක පුහුණුවක් මේ අයට ලබා දෙන්න ඕනෑ. ඊට අමතරව, අඩු තරමින් මාසයක්වත් Community Medicine පුහුණුව ලබා දෙන්න ඕනෑ. මොකද, මේවා අත්‍යවශ්‍යයි. ඒ නිසා මේ පුහුණුවත් නැතුව නිකම් විභාගයට ඉදිරිපත් කරලා, ඊට පස්සේ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව තමයි ඒක තීන්දු කරන්නේ කියලා කිව්වාට හරි යන්නේ නැහැ. වෛද්‍ය සභාව යම් කිසි ආයතනයක් පිළිගන්නේ එහි තිබෙන සායනික පුහුණුවත් සලකා බලලායි. ඒ නිසා මේ වෛද්‍ය පීඨ ආචාර්ය සංගමය ඉල්ලා තිබෙන විධියටම මේ අයට ප්‍රමාණවත් පුහුණුවක් ලබාදීමත් මේ කාරණාවලට ඇතුළත් කරන්න කියා මම කියනවා.

සයිටම් ආයතනයේ පළමුවැනි කණ්ඩායම් තුන ගැන බලන්න. ඔවුන්ට දැන් සයිටම් ආයතනය මඟින් විභාගයක් පවත්වා තිබෙනවා. ඔවුන් කියනවා, තැන් තැන්වල සිටින ආචාර්යවරුන් ඇවිත් තමයි අපේ විභාගය තීබ්බේ කියලා. හැබැයි ඒක ඔවුන් විසින්ම ප්‍රශ්න පත්‍ර හදලා, ඔවුන් විසින්ම පුනරීක්ෂණ පත්ති තියලා, ඔවුන් විසින්ම විභාගය පවත්වලා, ඔවුන් විසින්ම පරීක්ෂා කරපු විභාගයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක හරි අපූරුයි. සාමාන්‍යයෙන් මේ විභාගයේ ප්‍රතිඵල ගත්තොත්, ඒ ළමයින්ගෙන් සියයට 64කට, සියයට 65කට පන්ති සාමර්ථ තිබෙනවා. නමුත් අපේ රජයේ වෛද්‍ය පීඨවලත් A/Levelවලින් ඉහළම ලකුණු අරගෙන එන තැන්වලත් සාමාන්‍යයෙන් පන්ති සාමර්ථ තිබෙන්නේ සියයට 25ක්, 30ක් විතර වාගෙයි. මේකේ සියයට 65ක් පන්ති සාමර්ථ තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඒ එක කණ්ඩායමක ළමා රෝග - Paediatrics - විෂයයට විශිෂ්ඨ සාමර්ථ - Distinctions - 8ක් තිබෙනවාය කියා එක විශේෂඥ වෛද්‍යවරයෙක් මට කිව්වා. කොහොමවත් එහෙම තිබෙන්න විධියක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. සාමාන්‍යයෙන් කොළඹ වෛද්‍ය පීඨයේවත් එක විභාගයකදී Distinctions 8ක් එක විෂයකට එන්නේ නැහැ. මේක ඔවුන් පවත්වපු විභාගයක්. ඒ නිසා මේ විභාගයේ ප්‍රතිඵල සලකා KDU එකට අන්තර්ග්‍රහණය කරන්න බැහැ. ඒ විභාගය පිළි ගත්තොත්, ලොකු ප්‍රශ්නයක් වෙනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් කරන්නම්. ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, "A" සාමර්ථවලින්, "B" සාමර්ථවලින් ඇතුළත් වෙලා තිබෙනවාය කියා ඔබතුමා කිව්වාට, පසුගිය වසර ගණනාවක් තිස්සේ විශ්වවිද්‍යාලවලට පහළම සුදුසුකම්වලින් ඇතුළත් වූ ශිෂ්‍යයන් සිටින බවට ඒ සුදුසුකම් මා පෙන්වන්නම්. 2005 / 2006 අධ්‍යයන වර්ෂයේදී "B" සාමර්ථ දෙකයි, "C" සාමර්ථ එකයි. 2006 / 2007 වසරේදී "B" සාමර්ථ එකයි, "C" සාමර්ථ දෙකයි. 2007/2008 වසරේදී "C" සාමර්ථ දෙකයි, "S" සාමර්ථ එකයි. 2008/2009 වසරේදී "C" සාමර්ථ දෙකයි, "S" සාමර්ථ එකයි. 2009/ 2010 වසරේදී "S" සාමර්ථ තුනයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) නලින්ද ජූයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
හරි. ඒක මම කිව්වා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඊළඟට, 2010/2011 වසරේ "C" සාමර්ථ දෙකයි, "S" සාමර්ථ එකයි. 2011/2012 වසරේ "C" සාමර්ථ තුනයි. 2011/2012 "S" සාමර්ථ එකයි, "C" සාමර්ථ දෙකයි. 2012/2013 -ඒ අවුරුද්දේ දෙකක් තිබිලා තිබෙනවා.- "C" සාමර්ථ දෙකයි, "S" සාමර්ථ එකයි. 2012 /2013 "C" සාමර්ථ තුනයි. 2013/2014 "C" සාමර්ථ එකයි, "S" සාමර්ථ දෙකයි. 2014/2015 "A" සාමර්ථ එකයි, "B" සාමර්ථ එකයි, "C" සාමර්ථ එකයි. 2015/2016 "B" දෙකයි, "C" එකයි. මේ කාලය ඇතුළත "S" තුන තිබෙන අය ඇතුළත් වෙලා තිබෙනවා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) නලින්ද ජූයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඔව්. ඔබතුමා හරි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

අනෙක් කාරණය තමයි, මම ඔබතුමාගේ කරුණු පිළිබඳ හඬයක් කරනවා නොවෙයි. මේ ප්‍රශ්නය දිගින් දිගටම සාකච්ඡා කරද්දි ඔබතුමන්ලා මේ ගරු සභාවට පැහැදිලිව කිව්වා, මේකේ යම් යම් අඩුපාඩුකම්, දුර්වලකම් තිබෙනවා කියන එක. ඒක අපිත් පිළිගන්නවා නේ. හැබැයි, මේ ශිෂ්‍යයන්ට සාධාරණයක් කළ යුතුයි කියන මතය තමයි ඔබතුමන්ලා හැමදාම කිව්වේ. ඒ අනුව මීට වැඩිය අපට කරන්න පුළුවන් සාධාරණය මොකක්ද? ඒ කියපු සාධාරණය තමයි අපි මේ කරන්නේ.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) නලින්ද ජූයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
හොඳයි. දැන් ඔබතුමා කියපු කරුණු අනුව ඒ අවම සුදුසුකම තිබෙන දිස්ත්‍රික්ක මම කියන්නම්.

2005/2006 නුවරඑළිය, 2006/2007 නුවරඑළිය, 2007/2008 මුලතිව්, 2008/2009 කිලිනොච්චි, 2009/2010 කිලිනොච්චි, 2010/2011 මුලතිව්, 2011/2012 old syllabus එකෙන් මුලතිව්, 2011/2012 මාතලේ, 2012/2013 මුලතිව්, 2013/2014 මන්නාරම, 2014/2015 මොනරාගල, 2015/2016 නුවරඑළිය. මේවා තමයි ඒ දිස්ත්‍රික්ක.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

SAITM එක කොළඹ ළමයින්ට සීමා වෙච්ච එකක් නොවෙයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) නලින්ද ජූයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු ඇමතිතුමනි, "S" තුන කියන එකම ප්‍රතිඵලය ඇවිල්ලා තිබෙන්නේ කිලිනොච්චි දිස්ත්‍රික්කයේ 2009/2010 අධ්‍යයන වර්ෂයේදියි. ඒ ගැන ඔබතුමාත් කරුණු ඉදිරිපත් කළා. යුද්ධය පවතිනකොට, විදුලිය නැති කාලයේ බෝම්බ පත්තු වෙනවා,

ගෙදර ඉන්න බැහැ. එහෙම පාඩම් කරපු දරුවෙක්ගේ ප්‍රතිඵලය අරගෙන -"S" තුන අරගෙන- මේ හිටපු අයට සාධාරණීකරණය කරනවා කියලා ද ඔබතුමා කියන්නේ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
වෛද්‍ය අධ්‍යාපනයට උසස් ප්‍රමිතියක් ඕනෑ නැහැ කියලා මම කියන්නේ නැහැ. උසස් ප්‍රමිතියක් ඕනෑ. කවුරු හෝ නිර්මාණය කරපු මෙම අර්බුදය නිම කරන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධයෙන් තමයි අපේ අවධානය යොමු කරන්න ඕනෑ. ඔබතුමාගෙත් මගෙත් තර්කය එකයි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) නළින්ත ජූයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඒකට අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තත්පරයක කාලයක් ලබා දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
හොඳයි. ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමා, ඔබතුමාගේ තර්කය SAITM සිසුන්ට සාධාරණය ඉටු කිරීම නේ. SAITM සිසුන් බඳවා ගැනීමේදී වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමිතිය රැකගන්න ඕනෑ නිසා නෙවිල් ප්‍රනාන්දු මැතිතුමා දුන්නු සහනවලට වඩා වැඩි සහන ඔබතුමා දෙන්න අවශ්‍යතාවක් නැහැ නේ. මම ඔබතුමාට කියන්නේ -දැන් ඔබතුමාගේ computer එකෙන් ගන්න පුළුවන්.- SAITM website එකේ Medical Faculty Entry Requirements යටතේ දැන් තිබෙන එක බලන්න.

"Admission is done according to U.G.C. criteria in the Biology Stream. Qualifying subjects are Biology, Chemistry and Physics / Mathematics from Local G.C.E. Advanced Level or London Advanced Level / International Advanced Level. Minimum result requirement is 2 Credits and 1 Simple Pass from the abovementioned qualifying subjects."

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒක ඇත්ත. ඒක අපි පිළිගන්නවා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමා, SAITM එක -මේ ළමයි බැඳිලා තිබෙන නීති විරෝධී SAITM එක- කියනවා, ඔබ බැඳෙනවා නම් two "C"s and one "S" තිබෙන්න ඕනෑ කියලා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒක තමයි මම ඔබතුමාගෙන් මුලින්ම ඇහුවේ-

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ඔබතුමා ඇයි SAITM ප්‍රශ්නයට උත්තරයක් දෙන අවස්ථාවේදී ඒක "S" තුනට බස්සන්නේ? මොකද, සමහර අය ලොකු building හදනවා පෞද්ගලික විශ්වවිද්‍යාල පටන් ගන්න.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මම බස්සපු කතන්දරයක් මෙතැන නැහැ.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමා, ඔබතුමා දන්නවා සමහර අය නුගේගොඩ ප්‍රදේශයේ විශාල building හදනවා පෞද්ගලික විශ්වවිද්‍යාල පටන් ගන්න. මේ ගොල්ලන්ගේ businessවලට ඔබතුමා උදව් කරන්න අවශ්‍යතාවක් නැහැ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම හිතනවා එතුමා හරියට තේරුම් ගනීවි කියලා. මේ සුදුසුකම් මම තීරණය කරපු එකක් නොවෙයි. SAITM එකට අවශ්‍ය සුදුසුකම් ඒ ආයතනය තමයි තීරණය කරලා තිබෙන්නේ. දැන් ඒ ආයතනය යම් පදනමක් මත ශිෂ්‍යයන් අරගෙන තිබෙනවා නම්, යම් හේතුවක් නිසා ඒක ගෙන යන්න අපි අවස්ථාව නොදෙනවා නම් ඒ ශිෂ්‍යයන්ට සාධාරණයක් කරන්න කියන එක මේ හැමෝම ඉල්ලුවා. ඒ ශිෂ්‍යයන් ගැන තමයි අපි මේ කථා කරන්නේ. ඔක්කෝම කියනවා මේ ශිෂ්‍යයන්ට සාධාරණයක් කරන්න කියලා. සාධාරණය මේකයි කියලා දුන්නා. ඒක ඉදිරිපත් කළාට පසු කියනවා, "ඒක එහෙම නොවෙයි. මෙහෙමයි වෙන්න ඕනෑ." කියලා. එහෙමනම් SAITM එකේ ශිෂ්‍යයන් භාගයක් කපා හරින්නද අපට කියන්නේ? ඒක අපි කළ යුතු දෙයක්ද? එදා රජය පිළිගත්ත සුදුසුකම තමයි "S" තුන. ඒ "S" තුන තමයි අපි දමා තිබෙන්නේ. අපි හදපු නිර්ණායකයක් නොවෙයි, රටේ පැවතුණු නිර්ණායකය.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් චපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය දැන් අවසානයි. එක විනාඩියක කාලයක් පමණක් දෙන්නම්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) නළින්ත ජූයතිස්ස)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම විනාඩියකින් අවසන් කරන්නම්. මම බොහොම පැහැදිලිව කිව්වේ, SAITM එක ඉල්ලා

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

තිබෙන අවශ්‍යතාව, ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිළිගත්ත අවශ්‍යතාව, ඒ දෙකටම පරිබාහිරව ඊට වඩා අඩු අගයක් තමයි, අඩු ඉල්ලීමක් තමයි මේකේ ඇතුළත් කරලා තිබෙන්නේ කියන එකයි. 900ක් පමණ සිටින මේ ශිෂ්‍යයන් අතරින් මම දන්න හැටියට 160ක්, 170ක් විතර තමයි ඒ අවම සුදුසුකමත් නැති අය ඉන්නේ. එතකොට අපට ඒ සියලුදෙනා ගැන සලකා බලන්න බැහැ. මොකද, එක ළමයෙක් ගැන බලනවාට වඩා අපි බලන්න ඕනෑ වෛද්‍ය උපාධිය අරගෙන වෛද්‍යවරයෙක් හැටියට එළියට ගිහිල්ලා සමස්ත ජනතාවකට සලකන්නේ කොහොමද කියන එක ගැනයි. එතකොට ඒකට කවුද වග කියන්නේ කියන ප්‍රශ්නය තිබෙනවා. අපි ඉදිරිපත් කරපු ඊළඟ සංශෝධනය ඔබතුමා පිළිගත්තා. ඒ කියන්නේ, මේක අහෝසි කරන්න අවශ්‍ය වගන්තියක් ඇතුළත් කරන්න ඕනෑ කියන එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන කාරණය හැටියට මට තව එක දෙයක් ගැන කියන්න තිබෙනවා. මේකේ තිබෙන ආකාරයට දැන් උපාධි ප්‍රදානය කිරීම තීරණය කරන්නේ විශ්වවිද්‍යාල කළමනාකරණ මණ්ඩලයක් මඟිනුයි. KDU එක ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිළිඅරගෙන තිබෙන නිසා ඔබතුමාගේ තර්කයකුත් තිබෙනවා, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ අනුමැතියක් අවශ්‍ය නැහැ කියලා. නමුත් මෙය විශේෂ තත්ත්වයක් නිසාම මේ ප්‍රතිඵල සම්බන්ධ ප්‍රශ්නය, පුහුණුව සම්බන්ධ ප්‍රශ්නය ආදී ප්‍රශ්න ගණනාවක් තිබෙන නිසා මේ පනත් කෙටුම්පතට ඇතුළත් වෙනවා නම්, "විශ්වවිද්‍යාලයේ කළමනාකාරිත්ව මණ්ඩලය සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ අනුමැතියට යටත්ව" මේ උපාධිය පිරිනමනවා කියලා, ඒක තවත් ශක්තිමත් වෙනවා. ඒ යෝජනා ටිකත් කරමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි. මීළඟට, ගරු රමේෂ් පතිරණ මන්ත්‍රීතුමා කථා කරන්න. ඊට පෙර, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටකු, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

[අ.භා.2.53]

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, දීර්ඝ කාලයක් තිස්සේ අපි අත් විඳපු, මේ රටේ ශිෂ්‍ය ප්‍රජාව, වෛද්‍යවරුන්, ආචාර්ය මණ්ඩලවල මහත්ම මහත්මීන්, දෙමව්පියන් ඇතුළු විශාල පිරිසක් පීඩනයට පත් කරපු ගැටලුවක අවසානයේ ආරම්භයට අද අපි ඇවිල්ලා ඉන්නවා. ඒ අවසානයේ ආරම්භය අදින් ආරම්භ වෙලා මේ රටේ ශිෂ්‍ය ප්‍රජාවට, වෛද්‍ය ශිෂ්‍යයන්ට, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට, දුක් විඳපු ඒ දෙමව්පියන්ට, ඒ වාගේම මේ වෙනුවෙන් කැපකිරීම් කරපු ආචාර්ය මණ්ඩලවල මහත්ම මහත්මීන් ඇතුළු සෑම කෙනෙකුම සතුටු වෙන විධියට අවසන් කරන්නත් පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා. ඒ වෙනුවෙන් දීර්ඝ කාලීන ප්‍රශ්නය සාධනීය මට්ටමකට අරගෙන ඇවිල්ලා අවසන් කරන්න කටයුතු කරපු උසස් අධ්‍යාපන ඇමතිවරයාගේ ප්‍රවේශය පිළිබඳව අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම, මේ අරගළයට දීර්ඝ කාලීන කැපකිරීමක් කරලා ලංකාවේ වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමිතිය ආරක්ෂා කර ගන්නට පාරට ඇවිල්ලා සටන් කරපු විවිධ පීඨවල ශිෂ්‍යයන්ට, අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ කලා අංශයේ, වාණිජ අංශයේ, විද්‍යා ධාරාවේ අධ්‍යාපනය ලබන දරුවෝ පාරට ඇවිල්ලා වෛද්‍ය ශිෂ්‍යයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන්, වෛද්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වෙනුවෙන් සටන් කරපු ඒ සෑම කෙනෙකුටම අපේ ගරුත්වය පුද කරනවා. මේ රටේ වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමිතිය ආරක්ෂා වෙන විධියට, මේ රටේ නිදහස් අධ්‍යාපනයේ ප්‍රමිතිය ආරක්ෂා වෙන විධියට මේ ගැටලුව අවසන් නොවෙයිද කියන සැකය නිසා තමයි, විශ්වාසයක් නැතිකම නිසා තමයි අදත් ඔවුන් පාරට ඇවිල්ලා ඉන්නේ. අපි ගරු ඇමතිතුමාට ඊයේ කාරක සභා අවස්ථාවේදී සංශෝධන 3ක් ඉදිරිපත් කළා.

ගරු ඇමතිතුමා සද්භාවයෙන් මේ කටයුත්ත අවසන් කරන්න කටයුතු කරනවා කියන විශ්වාසය අපට තිබෙනවා. හැබැයි, පසුගිය වසර කිහිපය තුළ මේ සභාවේ අත් දැකපු කරුණුත් එක්ක, SAITM එක කවදාවත් වහන්නේ නැහැ කියලා පාරම්බාපු උසස් අධ්‍යාපන ඇමතිවරු හිටපු සභාවක, ගරු ඇමතිතුමා ඉන්නතුරු මේක සිද්ධ වෙයි, ඊට පස්සේ හෙට මොකක් වෙයි ද කියලා නිශ්චිත තීන්දුවක්, තීරණයක් නැති නිසා අපි එතුමාගෙන් බොහොම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, අපි ඉදිරිපත් කරපු සංශෝධන, යෝජනා පිළිගන්න කියලා. එතුමා සඳහන් කළා, පළමුවැනි සංශෝධනය එතුමාගේ පනත් කෙටුම්පතට එකතු කරනවා කියලා. ඒ කාරණය තමයි, SAITM එකේ අධ්‍යාපනය ලබන දරුවන් ක්‍රමානුකූලව ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට අන්තර්ග්‍රහණය කිරීමෙන් පසුව SAITM එක අවසන් වෙනවා කියන කාරණය එතුමා පිළිඅරගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාට බොහොම ස්තුතියි. දෙවැනි සහ තුන්වැනි කාරණා පිළිබඳවත් මේ ගරු සභාවේ අදහස් ප්‍රකාශ වුණා. වෛද්‍ය අධ්‍යාපනයේ මූලික සුදුසුකම් විධියට "S" 3න් දරුවෝ ඇතුළත් වෙලා තිබුණාට, නෙවිල් ප්‍රනාන්දු වෛද්‍ය පීඨයට සිසුන් බඳවා ගැනීමේදීම "C" 2 යි "S" 1 කියන සම්මාන සාමර්ථ දෙක සහ සාමාන්‍ය සාමර්ථය කියන මූලික සුදුසුකම් පිළිබඳව ඒ පීඨයෙන් කථා කරලා තිබුණා. ඒ නිසා ඒක ආපසු හරවාගෙන ගිහිල්ලා සාමාන්‍ය සාමාර්ථ 3කට ඒ කියන්නේ "three simple passes" කියන තැනට මේක නැවත අරගෙන යාම ගැටලුවක්ව තිබෙනවා කියන කාරණය සඳහන් වෙලා තිබෙනවා. ඒ නිසා ඒ සංශෝධනයත් පිළිඅරගෙන, කලිනුත් මේ ගරු සභාවේ සඳහන් වුණා වාගේ විශේෂිත කාරණයක් හැටියට එක් අවස්ථාවකදී පමණක් සිදු වන මේ අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රියාවලිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ කළමනාකාරිත්ව මණ්ඩලයෙන් සිදු වෙනවා වාගේම ඒක ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ අධීක්ෂණය යටතේ සිදු කරන්න කියන ඉල්ලීමත් අපි මේ අවස්ථාවේදී කරනවා. ඒ කරුණු තුන පරිපූර්ණය වෙනවා නම් මේ කරුණ පිළිබඳව කිසිම සැකයක් තියා ගන්නට හේතුවක් නැහැ. පාරේ ඉන්න ඒ ඔනෑම ශිෂ්‍යයකුට සහතිකයක් දෙන්නට පුළුවන්, "මේ SAITM වෛද්‍ය විද්‍යා උපාධි ආයතනය අහෝසි වෙනවා, වෛද්‍ය සභාවේ අධීක්ෂණයකින් බඳවා ගැනෙනවා, වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමිතිය ආරක්ෂා වෙනවා සහ මූලික සුදුසුකම පිළිබඳ කාරණය ආරක්ෂා වෙනවා" කියලා. ඒ කරුණු තුනම සාධනීය ලෙස අවසන් වෙනවා, ඒ කරුණු තුනට පිළිතුරු සැපයුවොත්. එම නිසා ඒ කරුණු තුන ඉෂ්ට වුණොත්, පසුගිය කාලය පුරාම සටන් කළ, පාරට බැහැලා ඒ වෙනුවෙන් විශාල කැප කිරීමක් කළ ඒ

සෑම දෙනාටම සාධාරණත්වය ඉෂ්ට වෙනවා කියලා අපි විශ්වාස කරනවා.

වෛද්‍ය පීඨ ආචාර්ය මණ්ඩල මේ කාරණය පිළිබඳව විශාල අවධානයක් යොමු කරලා තිබෙනවා. ඔවුන් සෑම කෙනෙකුම මේ ප්‍රශ්නය සාධනීය විධියට අවසන් කරන්නට, සාධනීය විසඳුම් දෙන්නට ඉදිරිපත් වෙලා කටයුතු කළා. එම නිසා මේ අවස්ථාවේදී ඔවුන් සෑම කෙනෙකුටම අපේ ගරුත්වය පුද කරන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කරුණ පිළිබඳව සඳහන් කිරීමේදී අපි සෑම කෙනෙකුම මූලිකව කියපු කාරණය තමයි, වෛද්‍ය අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ආරක්ෂා වෙන්නට ඕනෑ, ඒ වාගේම මේ රටේ නිදහස් අධ්‍යාපනයේ, නිදහස් සෞඛ්‍යයේ ප්‍රතිඵල ලබපු ලක්ෂ සංඛ්‍යාත පිරිස් අතරින් මේ රට සෞඛ්‍ය අංශයෙන් ඉදිරියට අරගෙන ගිය වෛද්‍යවරු ඇතුළු අනෙක් වෘත්තිකයින් විශාල කැප කිරීමකින් ලබා ගත්ත ජයග්‍රහණ ආරක්ෂා කරලා දෙන්නටයි ඒ ප්‍රමිතිය ආරක්ෂා කරලා දෙන්නට අවශ්‍ය වෙන්නේ කියන එක. එහිදී, මේ ආයතනය ආරම්භ කිරීම නිසා තමුන් නොදැනුවත්ව ඒකට ඇතුළු වෙලා අධ්‍යාපනය වෙනුවෙන් තමන්ගේ දෙමව්පියන් හරි හම්බ කළ විශාල මුදලක් වියදම් කරගෙන අමාරුවේ වැටුණු ශිෂ්‍යයින් පිළිබඳවත් අපි සාධනීය ලෙස කල්පනා කරන්නට ඕනෑයි කියන කාරණයත් මේ සභාවේ අපි සෑම කෙනෙක්ම බොහොම පැහැදිලිව පිළිගත්තා.

මම පෞද්ගලිකව පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයකට විරුද්ධ නැහැ. හැබැයි, මේ රටේ වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමිතිය ආරක්ෂා වෙන්නට ඕනෑයි කියන ස්ථානයේ ඉන්නවා. එම නිසා අද විශාල ප්‍රශ්නාර්ථයක් මේ රටේ ඉතිරි වෙලා තිබෙනවා. අපේ රටේ දරුවන් වෛද්‍ය අධ්‍යාපනය වෙනුවෙන් ලක්ෂ සංඛ්‍යාත මුදලක් ගෙවලා, කෝටි සංඛ්‍යාත මුදලක් ගෙවලා පිට රට යනවා නම් ඒක නතර කරන්නේ කොහොමද, ගුණාත්මක බවෙන් ඉහළ සහ ලාභ නොලබන වෛද්‍ය විද්‍යාලයක් මේ රටට අවශ්‍යද කියන කථිකාවත මේ රටේ මතු වෙලා තිබෙනවා. එම නිසා උසස් අධ්‍යාපන ඇමතිතුමා සඳහන් කළ විධියට ඉදිරි කාල වකවානුව තුළ ඒ පිළිබඳව නිර්ණායක සකස් කරලා, -වෛද්‍ය සභාවේ අනුමැතියත් සමඟ- එවැනි අවශ්‍යතාවක් මේ රටේ තිබෙනවා නම් ඒ අවශ්‍යතාව වෙනුවෙන් අපි කටයුතු කළ යුත්තේ කෙසේද කියන සාකච්ඡාව මේ රටේ ඇති කරන්නට අවශ්‍යවෙලා තිබෙනවා. මේ අද්දැකීම අපි සෑම කෙනෙකුටම අමිහිරි අද්දැකීමක්. 1989 වකවානුවේ උතුරු කොළඹ වෛද්‍ය විද්‍යාලයේ ඇති වුණු-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தலைசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)
Okay, thank you very much, Sir.

1989 පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ඇති වුණු වෙලාවේදීත් සිසු දරුවෝ පාරට බැහැලා, මේ වාගේම අරගළ ඇති වෙලා මහා ලේ වැගිරීමක් වුණු අතීතයක් අපේ රටේ අතීතයේ තිබුණා. ඒ අවස්ථාවේදීත් ආණ්ඩුවට ඒ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය රජය සතු කරලා ඒ ගැටලුව අවසන් කරන්නට වන තැනට මේ රටේ මහා උද්ඝෝෂණයක් මතු වුණා. History repeats itself. ඉතිහාසය පුනරාවර්තනය වෙලා ඒ විධියටම නැවත එවැනි තත්ත්වයක්, මේ SAITM පිළිබඳ කාරණය මත සමාජගත වුණා. මේ සමාජගත වුණු SAITM අර්බුදය පිළිබඳ කාරණයේදීත්, අපේ ආණ්ඩුවේත් ඊට පසු හිටපු ආණ්ඩුවලත් උසස් අධ්‍යාපන ඇමතිවරු කථා කළේ ඉතාම දරදඬු විලාසයෙන්. මේ ආයතනය කෙසේවත් වහලා දාන්නේ නැහැයි කියලා මේ සභාව තුළ ඉඳගෙන ඉතා ඉහළ හඬින් උච්චාරණය කළ ඇමතිවරු හිටියා. හැබැයි, අද ඒ සියල්ල වෙනස් වෙලා මේ ආයතනය වසා දමන්නට අවශ්‍යයි කියන මතවාදයට දේශපාලන පක්ෂ භේදයක් නැතිව, මැති ඇමතිවරුන්ගේ කිසිම භේදයක් නැතිව එන්නට වෙලා තිබෙනවා, යම් කිසි හේතුවක් නිසා. එම නිසා ඒ ජයග්‍රහණය ලැබුණේ මේ රටේ නිදහස් අධ්‍යාපනයටයි කියලා අපි විශ්වාස කරනවා, ඒ ජයග්‍රහණය ලැබුණේ මේ රටේ නිදහස් සෞඛ්‍ය සේවයටයි කියලා අපි විශ්වාස කරනවා. එම නිසා තමයි අපි නැවත නැවත කියන්නේ නැවත වතාවක් මේ අර්බුදය ඉහළට යන්න, වෙනත් ස්ථානයකට යන්න ඉඩ තියන්න එපා, මේ ඉදිරිපත් කරන පනත් කෙටුම්පතේ කිසිම ස්ථානයක හිඩැසක් තියන්නට එපා කියලා. අපි දන්නවා, ශිෂ්‍ය ප්‍රජාව අතරේත් සමහර විට අන්තවාදී පිරිස් ඉන්නවා, තමන්ගේ අධ්‍යාපන කටයුතු පැත්තක තියලා විවිධ කරුණු අරබයා වීථි සටන් කරන්නට පෙලඹෙන පිරිසක් ඉන්නවා. ඔවුන් කිසි කෙනෙකුට නැවත වතාවක් මේ පනත් කෙටුම්පතේ තිබෙන අඩු පාඩුවක් හරහා ශිෂ්‍ය ප්‍රජාව පාරට ගන්න ඉඩ තියන්න හොඳ නැහැ. එම නිසා අපි සෑම කෙනෙකුටම වග වීමක් තිබෙනවා, අපි සෑම කෙනෙකුටම යුතුකමක් තිබෙනවා මේ රටේ දරුවන්ගේ අධ්‍යාපන අයිතිය ආරක්ෂා කරන්නට වාගේම ඔවුන් විශ්වවිද්‍යාල තුළ තමන්ගේ අධ්‍යාපන කටයුතුවල නිරත වන බවට වග බලා ගන්නට. අන්න ඒ නිසා ඒ වගකීම පිළිබඳ කාරණය වර්තමාන උසස් අධ්‍යාපන ඇමතිතුමා බොහොම පැහැදිලිව හිතේ දරාගෙන කටයුතු කරනවා ඇති කියලා අපි විශ්වාස කරනවා. මොකද, පසුගිය වසර තුනක කාලය තුළත් බොහොම පැහැදිලි ඉඩ කඩක් තිබුණා, අවස්ථා ගණනාවකදීම හැකියාව තිබුණා මේ ප්‍රශ්නය මේ ස්ථානයට ගේන්නේ නැතිව, මෙතරම් දුර දිග යන්නේ නැතිව අවසන් කරන්නට.

හැබැයි, ඒ සියලුම අවස්ථාවන් මෙතෙක් කල් පැහැර හැරපු බව අපි ඉතාම කනගාටුවෙන් සඳහන් කරනවා. ඒ පැහැර හැරීම හරහා මේ රටේ වෛද්‍ය පීඨවල අධ්‍යාපනය ලබන වෛද්‍ය සිසුන්ගේ අධ්‍යාපන කටයුතු වසරකින් ප්‍රමාද වුණා. ඒ වසර නිසා ඒ වෛද්‍ය පීඨවල ශිෂ්‍යයන්ට සීමා වාසික වෛද්‍යවරුන් විධියට වෛද්‍ය සේවයට යන්නට අවස්ථාව නැති වෙලා සෞඛ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රබල ගැටලුවක් මතු වුණා. එසේ ප්‍රමාද වීම නිසා ඔවුන්ගේ පශ්චාත් අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ගත කරන්න වෙන කාලය වැඩි වුණා. ඒ නිසා ඉතාම අවාසනාවන්ත කාලයක් පසුගිය කාලයේ දිගටම තිබුණා. අද ඇති වෙලා තිබෙන තත්ත්වය ඉතාම හොඳයි. හැබැයි, ඒක සාධනීය අවසානයක් කරා අරගෙන යන්න නම් කළ යුතු දෙයක් තිබෙනවා. අපි නැවත වතාවක් මතු කරන කාරණය මෙයයි. මේ අන්තර්ග්‍රහණය කිරීමෙන් පසුව ආයතනය වසා දැමෙනවා වාගේම ඉදිරි කාලයේදී නැවත වතාවක් යම් විධියකින් ප්‍රමිතියකින් තොර වෛද්‍ය අධ්‍යාපනය සපයන -වෛද්‍ය උපාධිය මුදලට විකුණන- ආයතන බිහි වුණොත් මේ පූර්වාදර්ශය හරහා කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨය වැනි ස්ථානයකට නැවත වතාවක් අවශෝෂණය කරන්න -ළමයින් අන්තර්ග්‍රහණය කරන්න,- හැකියාවක් මතු වෙනවාද කියන සැකයක් සමහර වෙලාවට මතු වෙලා තිබෙනවා. උතුරු කොළඹ වෛද්‍ය විද්‍යාලය, උතුරු කොළඹ රජයේ වෛද්‍ය විද්‍යාලයක් බවට පරිවර්තනය වෙද්දී වෛද්‍යවරුන් 700ක් පමණ පිරිසක් බිහි වුණා. ඒ වාගේම තමයි SAITM එක හරහා 980කට ආසන්න ශිෂ්‍යයන් පිරිසක් නැවත රජයේ වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් වෙනවා. මේක පූර්වාදර්ශයක් හැටියට අරගෙන කටයුතු සිදු නොවෙන්න අවශ්‍යයි. ඒ නිසා අපි විශ්වාස කරනවා, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා සම්මත කරනවා වාගේම ඉදිරියේදී නැවත වතාවක් මේ පනතේ තිබෙන අඩු-ලුහුඬුකම් හරහා නැවත වතාවක් මෙවැනි තත්ත්වයක් ඇති වෙලා ඒ ළමයින් නැවත

[ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා]

කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට ඇතුළත් කිරීමේ අවස්ථා නවත්වන්න අවශ්‍යයි කියලා. මේ ශිෂ්‍යයන්ට සාධාරණය ඉෂ්ට කරන්න.

ඉදිරි කාලයේදී කොටස් වශයෙන් මේ ළමයින් කොතලාවල ආරක්ෂක විද්‍යා පීඨයට අන්තර්ග්‍රහණය කිරීම සිදු වෙනවා නම් අපට කියන්න අවශ්‍ය කාරණය වන්නේ, ඒ අන්තර්ග්‍රහණය සිදු වෙන කාල වකවානුව වන තෙක් අධ්‍යාපනය සපයන ආයතනයේ ප්‍රමිතිය ආරක්ෂා වෙලා තිබෙන්නට අවශ්‍යයි කියන එකයි. ගරු ඇමතිතුමනි, මම දන්නේ නැහැ, ඔබතුමාට ක්‍රමවේදයක් තිබෙනවාද කියලා. මොකද, එක වතාවේ මේ ළමයින් 980ම ගන්න බැරි නිසා. විවිධ කාණ්ඩ හරහා, විවිධ වර්ෂයන්වලටයි මේ ළමයි අන්තර්ග්‍රහණය කරන්න සිදු වෙන්නේ. ඒ අන්තර්ග්‍රහණය කරන අන්තර් කාල සීමාව තුළ ඒ ළමයින්ගේ අධ්‍යාපන කටයුතු පිළිබඳව දැනට අධ්‍යාපනය ලබන ස්ථානයේ ගැටලුවක් මතු වෙනවා. ඒ පිළිබඳව යම් කිසි වග වීමක් තිබෙන්නට අවශ්‍යයි. ඒ ක්‍රමවේදය සකස් කරන්නේ කෙසේද කියන ප්‍රශ්නය අපි ඉදිරිපිට තිබෙනවා. කෙසේ වුවත් අපේ බලවත් ඉල්ලීම තමයි, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ අනුකූලතාව, ඔවුන්ගේ අධීක්ෂණය යටතේ මේ අන්තර්ග්‍රහණය කිරීමේ කටයුතු සිදු කරන්න කියන එක. එහෙම වුණොත් පමණයි අපට ප්‍රමිතියකින් හා විනිවිදභාවයෙන් යුතුව මේ කරුණ සිදුවෙනවා කියන සහතිකය ලැබෙන්නේ. අපි විශ්වාස කරනවා, මේ ගැටලුව අවසන් කරන්න එක් හොඳ පියවරක් ගෙන තිබෙනවා කියලා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
ගරු ඇමතිතුමා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට තිබෙන බලය තමයි, යම් කිසි වෛද්‍ය උපාධියක් ඉදිරිපත් කරපුවාම ඒක ඒ වෛද්‍ය සභාවට පිළිගත හැකි එකක්ද, නැද්ද කියලා තීරණ කර ඒ පිළිගැනීම ලබා දීම. නමුත් උපාධි අධ්‍යාපන කටයුතු අධීක්ෂණය කිරීමේ බලයක් එම ආයතනයට නීතියෙන් ලැබිලා නැහැ. සාමාන්‍ය විධියට ඒවාට මැදිහත් වීමක් වෛද්‍ය සභාව කරන්නේත් නැහැ.

ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) රමේෂ් පතිරණ)
(The Hon. (Dr.) Ramesh Pathirana)
ගරු ඇමතිතුමනි, මේක විශේෂ අවස්ථාවක් හැටියට සලකන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලනවා. නැත්නම් මේ මූලික සුදුසුකම් නැති සමහර දරුවන්ට පවා වෛද්‍ය අධ්‍යාපනය සහ උපාධිය සම්පූර්ණ කළත් වෛද්‍ය සභාවේ අනුමැතිය නොලැබී යන්නට ඉඩ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වෛද්‍යවරුන්ගෙන්, වෛද්‍ය පීඨ ආචාර්යවරුන්ගෙන් දීර්ඝ කාලීන ඉල්ලීමක් තිබෙනවා. වෛද්‍ය අධ්‍යාපනයේ මූලික ප්‍රමිතීන් ගැසට් කරන්න කියන ඉල්ලීම මේ රටේ අඛණ්ඩව පවතින ඉල්ලීමක්. වෛද්‍ය අධ්‍යාපනයේ මූලික ප්‍රමිතීන් ගැසට් නිවේදනයක් මඟින් නිකුත් කරන්න කියන ඉල්ලීමත් අපි මේ සභාවෙන් කරනවා. එහෙම කළොත් අනාගතවාදීව බලලා මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ලබා ගත්තු ජයග්‍රහණ ආරක්ෂා කරගෙන, වැදගත් ඉහළ ප්‍රමිතියකින් යුතු වෛද්‍ය අධ්‍යාපනයක් මේ රටට හඳුන්වා දෙන්නට පුළුවන් කියන කාරණයත් සිහිපත් කරමින්, මට කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. ඊළඟට, ගරු එච්.එම්.එම්. හරීස් මහතා.

[පි.ප. 3.06]

ගරු එච්.එම්.එම්. හරීස් මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්පුමිකු එච්.එම්.එම්. හාරීස් - අරස තොළිල් මුයර්සි මර්රුම් කණ්ඩි නකර අපිවිරුත්ති පිරති අමైච්සර්)
(The Hon. H.M.M. Harees - Deputy Minister of Public Enterprise and Kandy City Development)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று ஜெனரல் சேர் ஜோன் கொத்தலாவலை பாதுகாப்புப் பல்கலைக்கழகம் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம் தொடர்பாக நடைபெறுகின்ற விவாதத்தில் கலந்துகொண்டு பேசுவதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். இந்த நாட்டில் மிக நீண்ட நாட்களாக பெரும் பிரச்சினையாக இருந்த SAITM மாணவர்களின் பிரச்சினையைத் தீர்ப்பதற்காக இந்தப் புதிய சட்ட ஏற்பாடுகள் இன்று பாராளுமன்றத்தில் கொண்டு வரப்பட்டுள்ளது. SAITM சம்பந்தமாக எழுந்த சர்ச்சையானது, இந்த நாட்டில் பலரது கல்வி நடவடிக்கைகளைப் பாதிப்படையச் செய்ததை நாங்கள் மறக்க முடியாது. இதனால், பல்லாயிரக்கணக்கான மாணவர்கள் குறிப்பாக, மருத்துவ பீட மாணவர்கள் தங்களுடைய கல்வி நடவடிக்கைகளை நிறுத்திவிட்டுப் பாதையில் இறங்கிப் போராடினார்கள்.

அதேபோன்று, தங்களது எதிர்காலம் சூனியமாகும் என்று SAITM இல் கல்வி கற்ற மாணவர்களினதும், அவர்களது பெற்றோர்களினதும் கவலை வேறு! இவ்வாறு பல சர்ச்சைகளை ஏற்படுத்திய SAITM பிரச்சினையானது, இன்று சனாதிபதி, பிரதமர் மற்றும் உயர் கல்வி அமைச்சர் ஆகியோரின் துரித நடவடிக்கை காரணமாகத் தீர்க்கப் பட்டிருக்கிறது. இவ்வாறு SAITM மாணவர்களின் பிரச்சினைக்கு நியாயமான ஒரு தீர்வைப் பெற்றுக் கொடுத்தமைக்காக நான் இந்த இடத்தில் சம்பந்தப் பட்டவர்களைப் பாராட்டியே ஆகவேண்டும்.

அதேநேரம், இந்த நாட்டில் தனியார் பல்கலைக்கழகக் கல்வி நடவடிக்கைகளை அடியோடு நிறுத்துவது என்பது ஆரோக்கியமான ஒரு விடயமல்ல. ஒவ்வொரு வருடமும் பல இலட்சக்கணக்கான மாணவர்கள் கல்விப் பொதுத் தராதர உயர்தரப் பரீட்சை எழுதினாலும், குறிப்பிட்ட ஒரு தொகையினர் மட்டும்தான் அரச பல்கலைக் கழகங்களுக்குத் தகுதிபெற்று உள்நுழைகின்றனர். எனவே, தரமான கல்வி நடவடிக்கைகள் என்ற நிபந்தனையுடன் அரசாங்கத்தின் அனுமதியோடு, இந்த நாட்டில் புதிய

தனியார் பல்கலைக்கழகங்கள் உருவாகின்றபொழுதுதான், இந்த நாட்டில் இருக்கின்ற ஏனைய மாணவர்களின் எதிர்காலம் பிரகாசமாகும் என்று நாங்கள் நம்புகின்றோம்.

இன்று எமது அண்டைய நாடான இந்தியாவில் தாராளமாகத் தனியார் பல்கலைக்கழகக் கல்வி நடவடிக்கைகள் சிறப்பாக இடம்பெற்று வருகின்றன. எங்களுடைய நாட்டில் இவ்வாறான கல்வி நடவடிக்கைகள் மறுக்கப்படுகின்றபொழுது, பல்லாயிரக்கணக்கான மாணவர்கள் மேற்கத்தேய மற்றும் ஆசியப் பல்கலைக் கழகங்களுக்குச் செல்வதனால், இந்த நாட்டின் அந்நியச் செலாவணி வெளிநாடுகளுக்குச் செல்கின்றது. இதனால், எமது நாடு பொருளாதார ரீதியாகப் பின்னடைவைச் சந்திக்கின்றது என்பதை நான் இந்த இடத்தில் குறிப்பிட்டே ஆகவேண்டும்.

அடுத்து, கடந்த வாரத்துக்கு முதல் வாரம் நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற கிழக்கு மாகாணத்தின் அம்பாறை மாவட்டத்தில் அமைந்துள்ள தென்கிழக்குப் பல்கலைக்கழகம் சம்பந்தமாகச் சில கவலையான விடயங்கள் இச்சபையில் சொல்லப்பட்டன. நான் அந்த மாவட்டத்தின் மக்கள் பிரதிநிதி என்ற அடிப்படையில், இது சம்பந்தமாக இந்தச் சபையில் சில வார்த்தைகளைப் பேசவேண்டும். குறிப்பாக, அதனுடன் தொடர்புடைய உயர் கல்வி அமைச்சர் அவர்கள் தற்பொழுது இந்தச் சபையில் இருக்கின்றபொழுது, அதுதொடர்பில் பேசுவது நல்லது என்று நினைக்கின்றேன்.

මේ අවස්ථාවේදී අග්නිදිග විශ්වවිද්‍යාලය ගැන කතා කරන්න මා කැමැතියි. ළඟදී අපේ උසස් අධ්‍යාපන සහ සංස්කෘතික කටයුතු ඇමති ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා ඒ විශ්වවිද්‍යාලය ගැන, ඒ විශ්වවිද්‍යාලයේ සිටින කථිකාචාර්යවරුන් සහ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ කතා කර තිබුණා. ඒ විශ්වවිද්‍යාලයේ සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන්, කථිකාචාර්යවරුන්ට ලිංගික අල්ලස් දීලා විභාගය සමත් වන බව ගරු ඇමතිතුමා කිව්වා කියා මේ රටේ සියලු ජාතික මාධ්‍ය නාලිකාවල ප්‍රචාරය වුණා. ඒ නිසා ඒ විශ්වවිද්‍යාලයේ ඉගෙන ගත්, ඉගෙන ගන්නා ශිෂ්‍ය ශිෂ්‍යාවන්, එම දෙමව්පියන් ආදි හැමෝම වේදනාවට පත් වුණා. ඒ වාගේම නැඟෙනහිර සිටින ජනතාව, බුද්ධිමතුන් වේදනාවට පත් වුණා. ගරු අමාත්‍යතුමනි, ලංකාවේ විශ්වවිද්‍යාල ගණනාවක් තියෙද්දී අග්නිදිග විශ්වවිද්‍යාලය ගැන පමණක් කතා කිරීම සුදුසු නැහැ කියා මා සඳහන් කරන්න කැමැතියි. ඔබතුමාගේ අමාත්‍යාංශය යටතේ තිබෙන්නා වූ ආයතන ගැන විවේචනය කිරීම සදාචාරයට පටහැනි කරුණක් බව මා මේ සභාවේ කියන්න කැමැතියි. ගරු ඇමතිතුමනි, ඒ පළාතේ ඉඳලා කණ්ඩායමක් ඇවිල්ලා මේ ප්‍රශ්නය ගැන ඔබතුමාට වැරදි තොරතුරු දුන්නා කියා මට ආරංචියි. ඇත්තටම ඒ විශ්වවිද්‍යාලයේ සිටින ශිෂ්‍ය ශිෂ්‍යාවන් - විශේෂයෙන්ම girlsලා- දැන් වේදනාවට පත් වෙලා ඉන්නවා. ඒ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සහ වේදනාවට පත් වූ සියලු දෙනාගේ යහපත වෙනුවෙන් හා විශ්වවිද්‍යාලයේ සංවර්ධනය වෙනුවෙන් කටයුතු කරගෙන යන අතර ඒ විශ්වවිද්‍යාලයේ කීර්ති නාමය ගොඩ නැඟීමට අවශ්‍ය කටයුතුත් කරන්න කියා මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලා සිටිනවා.

நான் இங்கு குறிப்பிட்ட விடயம் கௌரவ அமைச்சர் அவர்களுக்குத் தெளிவாகப் புரிந்திருக்கும் என்று நினைக்கின்றேன். தென் கிழக்குப் பல்கலைக்கழகம் என்பது இந்த நாட்டில் இருக்கின்ற ஒரு தேசிய பல்கலைக்கழகம். இந்தப் பல்கலைக்கழகம் பல சிரமங்களுக்கு மத்தியில் கட்டியெழுப்பப்பட்ட ஒரு பல்கலைக்கழகம். இப்பொழுதுதான் அது வளர்ந்து வருகின்றது. அங்குள்ள சில நபர்களுக்கிடையிலான போட்டா போட்டி காரணமாகச் சில குழுவினர் உங்களைச் சந்தித்து, அங்கு நடைபெறாத விடயங்களை, பொய்யான கதைகளை, பொய்யான தகவல்களை உங்களிடம் சொல்லியிருக்கின்றனர். ஆனால், உண்மை அதுவல்ல. அங்கு கல்வி நடவடிக்கைகள் மிகச் சிறப்பான முறையில் இடம்பெறுகின்றன. அதேபோன்று அங்கிருக்கின்ற விரிவுரையாளர்கள் மிகுந்த தியாக மனப்பான்மையுடன் சேவையாற்றுகின்றார்கள். அங்கு பல சமூகங்களைச் சேர்ந்த மாணவ, மாணவிகள் கல்வி கற்றுக்கொண்டிருக்கிறார்கள். சிங்கள, தமிழ், முஸ்லிம் என பல்லினங்களைச் சேர்ந்த மாணவ, மாணவர்கள் இந்தத் தேசத்தின் பல பகுதிகளிலிருந்தும் வந்து அங்கு கல்வி கற்கின்றார்கள். அங்கு கல்வி கற்றுவெளியேறிய பல மாணவ, மாணவிகள் இன்று தேசத்தின் பல பகுதிகளிலும் உயர் பதவிகளில் இருந்துகொண்டிருக்கிறார்கள். அங்கு பாலியல் இலஞ்சம் கோரியதற்கான அல்லது அது சம்பந்தமான விடயங்கள் நடந்தேறியதற்கான சான்றுகள் எதுவும் இதுவரை உறுதிப்படுத்தப்படவில்லை. நான் கொழும்புப் பல்கலைக் கழகத்தில் சட்டபீட மாணவனாக இருந்தவன். இந்த நாட்டின் பல்கலைக்கழகம் என்கின்றபொழுது, சில -

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Hon. Deputy Minister, can I make a clarification?

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
Okay.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Mr. Deputy Chairman of Committees, the Hon. Deputy Minister is referring to an issue that I raised in Parliament. I would not raise any issue in Parliament without taking responsibility for its facts. Hon. Deputy Minister, as you quite correctly said, I met a group of lecturers, students and the Vice Chancellor of that University. I met all of them.

The fact that there had been some incident of sexual harassment of a girl was not made as a sweeping statement; I did not make a general statement. One girl, together with her parents, had come to the University Grants Commission and handed over an affidavit on the incident. In addition to that, that girl has all the audio recordings as to how she had been threatened by the lecturer, whose name I mentioned here. She had been threatened that he will break her bones unless she agrees to his demands of sexual pleasure. Now, an inquiry into that incident is pending. In addition to that, I have already directed that matter to be referred to the Commission to Investigate Allegations of Bribery or Corruption. It has already been referred to that Commission.

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)

ගරු ඇමතිතුමනි, ඇත්තටම ඔබතුමා ඒ විධියට කථා කළා කිව්වත්, ඊළඟ දවසේ අපේ රටේ ජාතික මාධ්‍ය නාළිකාවල ආවේ ඒ ඉන්න කථිකාචාර්යවරුන්ට ලිංගික අල්ලස් දීලා කියලායි. ඒගොල්ලෝ interpret කළේ -

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
එහෙම කිව්වේ නැහැ. ඔබතුමා වරද්දාගෙන.

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
ඔබතුමා එහෙම කිව්වේ නැත්නම් හරි. හැබැයි,-

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මම එක පුද්ගලයකුගේ - ඒ lecturer ගේ- නම කිව්වා. එහෙම නම් ඔබතුමා කියන්නේ, ඒ විශ්වවිද්‍යාලයේ ගැහැණු ළමයින්ට සිදුවන ලිංගික අතවර ගැන අමතක කරලා, ඒ ගැන කථා නොකර තවදුරටත් ඒ ළමයින්ට ඒක වෙන්න ඉඩ දෙන්න කියලාද?

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
නැහැ, නැහැ. එහෙම කියන්නේ නැහැ. මම කිව්වේ-

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
එහෙම නම් මොකක්ද ඒකට ඔබතුමාගේ තිබෙන විරෝධය?

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
ඊළඟ දවසේ "Ceylon Today", "Daily Mirror", "The Island" පත්‍රවල ඒවා පළ වුණා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඉතින් ඒවා පළවෙන්න එපායැ. පාර්ලිමේන්තුවේදී නේ, කියන්නේ.

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
ඒ විශ්වවිද්‍යාලයේ ඉන්න ශිෂ්‍යාවෝ ඔක්කෝටම ඒක apply කළා. ඒ ගැන මම කනගාටු වුණා-

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
නැහැ, නැහැ. ඒක සම්පූර්ණයෙන්ම වැරැදියි. මම ඒ ගුරුවරයාගේ නම පැහැදිලිව කිව්වා. ඇයි, ඒක අනෙක් අය භාර ගන්නේ?

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
එහෙම නම් ඔබතුමාගේ අමාත්‍යාංශයේ media unit එක හරි ඊළඟ දවසේ ඒකට -

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔලුවිල් විශ්වවිද්‍යාලය ගැන අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ගැන හංගන්න දෙයක් නැහැ. ඒ විශ්වවිද්‍යාලය පාලනයකින් තොරව, කිසිම විනයක් නැතිව පවත්වාගෙන ගිහිල්ලා තිබෙන විශ්වවිද්‍යාලයක්. ඒ විශ්වවිද්‍යාලය නිවැරදිව උසස් තත්ත්වයකට ගෙන එන්න ඕනෑ නිසා මීට අවුරුදු තුනකට කලින් මහාචාර්යතුමෙක් පත් කර තිබෙනවා. ඒ මහාචාර්ය නජීම් මැතිතුමා. මම නොවෙයි එතුමා පත් කළේ. එතුමා බොහොම උනන්දුවෙන් මේ විශ්වවිද්‍යාලයේ කටයුතු දියුණු කරගෙන එනවා. නමුත් එතැන ඊට විරුද්ධ කණ්ඩායමක් ඉන්නවා. මම ඒක පැහැදිලිව කියනවා. රෙජිස්ට්‍රාර්වරයායි තවත් දේශකයන් කිහිප දෙනකුයි එකතු වෙලා එතුමාට ඒ කටයුතු කරන්න දෙන්නේ නැතිව, ඒ විශ්වවිද්‍යාලයේ වැඩ සියල්ල කඩාකප්පල් කරගෙන යනවා. ඒ ප්‍රශ්න නිසා තමයි මම ඒ නිලධාරීන් කැඳෙව්වේ. ඒ ප්‍රශ්න නිසා තමයි ඒ lecturersලා ඇවිල්ලා මට මේ කරුණු කිව්වේ. ඒ ශිෂ්‍යයන් ඇවිල්ලා මට කරුණු කිව්වේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Deputy Minister, உங்களது நேரம் முடிவடைந்து விட்டது.

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
තව විනාඩියක් දෙන්න.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට තව විනාඩියක් දෙන්න. ඒ වාගේ බරපතළ පැමිණිල්ලක් විශ්වවිද්‍යාල ශිෂ්‍යයකුගෙන් ලැබුණේ. අම්මලා තාත්තලා එක්ක ඇවිල්ලා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට දිවුරුම් ප්‍රකාශ දුන්නාම, අපි ඒවා ගැන නොතකා ඒ දේවල් එහෙමම සිද්ධ වෙන්න දෙන්න කියලාද ඔබතුමා කියන්නේ?

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
ගරු ඇමතිතුමනි, ඔබතුමා කිව්වේ එහෙම නම්, mediaවල ආව ඒ reports වැරැදියි කියලා ඔබතුමාගේ අමාත්‍යාංශයේ කවුරු හරි හෝ වෙන කවුරුවත් කිව්වේ නැහැ. ඒ නිසා තමයි-

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒ කරුණු පාර්ලිමේන්තුවෙන් පිටතදී කියපු දෙයක් නොවෙයි. පාර්ලිමේන්තුවේදී කියපු දේ තමයි මාධ්‍ය වාර්තා කළේ. ඒ දේ හරිද වරැදිද කියලා මුළු රටටම පෙනෙනවා.

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
ඔබතුමා එක්කෙනකුට නේ, චෝදනා කළේ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මම එයාගේ නමත් කිව්වා. අනෙක් අයට ප්‍රශ්නය වන්නේ, "lecturersලා මෙහෙම කරනවා" කියලා මම කිව්වොත් නේ. මම කිව්වේ අහවල් එක්කෙනා, "X" නැමති lecturer කියලා. එයාගේ නම සඳහන් කරලායි කිව්වේ.

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
හැබැයි, ඊළඟ දවසේ ඒක mediaවල ආවේ කොහොමද කියලා ඔබතුමාට බලන්න පුළුවන්. ඒගොල්ලෝ වැරදි ප්‍රචාර කරනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඔබතුමාත් මේ ගරු සභාවේ හිටියා නේ.

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
ඇත්තටම ගරු ඇමතිතුමනි, ඒ ළමයි ඔක්කොම ඇවිල්ලා ඇඩුවා. දෙමව්පියෝත් ඇඩුවා.

இது சம்பந்தமாக கௌரவ அமைச்சர் அவர்கள் சில விளக்கங்களைத் தந்தாலும் இந்த விடயத்தில் நான் மிகவும் வேதனையடைகின்றேன். இது சம்பந்தமாக நாட்டிலுள்ள ஊடகங்களும் பொறுப்பற்ற முறையில் நடந்திருக்கின்றன. எனவே, அமைச்சர் அவர்கள் இது சம்பந்தமான தெளிவான விளக்கத்தை அந்த ஊடகங்களுக்கு வழங்க வேண்டும். அதேநேரம், அந்தப் பல்லைக்கழகத்தைச் சிறந்த முறையில் கட்டியெழுப்புவதற்கும் அமைச்சர் உதவ வேண்டுமென்று கூறி, விடைபெறுகின்றேன். நன்றி.

[பி.ப. 3.19]

ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා
(மாண்புமிகு கவீந்திரன் கோடீஸ்வரன்)
(The Hon. Kaveendiran Kodeeswaran)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, ஜெனரல் சேர் ஜோன் கொத்தலாவலை பாதுகாப்புப் பல்கலைக்கழகச் சட்டமூலம் சம்பந்தமான இந்த விவாதத்திலே கலந்துகொள்ளச் சந்தர்ப்பம் தந்ததையிட்டுத் தங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன். இந்த நாட்டிலே யுள்ள மருத்துவ பீடங்கள் சம்பந்தமாகவும், அவற்றுக்குத் தெரிவாகின்ற மாணவர்கள் சம்பந்தமாகவும் சில வார்த்தை களைக் கூறலாமென்று நினைக்கின்றேன். தரவுகளின் அடிப்படையில், குறித்த ஒரு வருடத்தில் பல்கலைக்கழக விஞ்ஞான பீடங்களுக்குத் தெரிவுசெய்யப்படுவதற்கு 24,877 பேர் தகுதியுள்ளவர்களாக இருந்தும்கூட 6,288 பேரே அந்த அனுமதியைப் பெற்றுக்கொள்கின்றார்கள் என்பது தெரிய வருகின்றது. அப்படிப் பார்க்கின்றபொழுது, தெரிவு செய்யப்பட்ட மாணவர்கள் தங்களது கல்வியைத் தொடர்கின்ற அதே சந்தர்ப்பத்தில், தெரிவுசெய்யப்படாத ஏனைய மாணவர்கள் அந்தச் சந்தர்ப்பத்தை இழக்கின்றார்கள். அதாவது, அதற்குத் தகுதியற்றவர்களாகின்றார்கள். ஆகவே, மேலும் கூடுதலான மாணவர்களைப் பல்கலைக்கழகங்களுக்கு, குறிப்பாக மருத்துவ பீடங்களுக்கு உள்வாங்கச் செய்வது சிறந்த செயற்பாடாக இருக்குமென்று நான் நினைக்கின்றேன்.

SAITM நிறுவனத்தில் கற்கின்ற 982 பேர் ஜெனரல் சேர் ஜோன் கொத்தலாவலை பாதுகாப்புப் பல்கலைக்கழகத்திற்கு மாற்றப்படுவது சிறந்ததொரு செயற்பாடாகும். நிர்க்கதியாக விருந்த SAITM வைத்தியத்துறை மாணவர்கள் இவ்வாறு மாற்றப்படுவதையிட்டு நாங்கள் மகிழ்ச்சியடைகின்றோம். அதேபோல், அந்த மாணவர்களை அங்கு அனுப்பிய பெற்றோரும் இதற்காக அமைச்சர் அவர்களுக்கு நன்றியைத் தெரிவிப்பார்களென்று நான் நினைக்கின்றேன். வருடமொன்றுக்கு 1,288 - 1,300 மாணவர்கள் வரையில் பல்கலைக்கழக மருத்துவ பீடங்களுக்குத் தெரிவுசெய்யப் படுகின்றார்கள். இந்தத் தொகையை இன்னும் கூட்டுகின் றபொழுது இந்த நாட்டிலே பிரச்சினைகளைக் குறைக்கலாம். அதாவது, குறைந்த தகுதியாக 3-S சித்தி உள்ளவர்கள்கூட இந்த SAITM க்குத் தெரிவுசெய்யப்பட்டு அதன்மூலம் மருத்துவர்களாக வெளிவருகின்ற சந்தர்ப்பம் காணப்பட்டது. ஆனால், 3-A தரத்தில் சித்தியடைந்தவர்கள்கூட சில மாவட்டங்களில் மருத்துவத்துறைக்குத் தெரிவு செய்யப்படாத துர்ப்பாக்கிய நிலைக்குத் தள்ளப்பட்டிருக்கின்றார்கள். அந்த வகையிலே, கூடுதலான மாணவர்களை மருத்துவத்துறைக்கு உள்வாங்கினால் இந்த நாடு அதிகளவான மருத்துவர்களை - மருத்துவத்துறை நிபுணர்களைப் பெற்றுக்கொள்ளக்கூடியதாக இருக்கும். அதேபோல், 3-S சித்தியுடன் தகுதி குறைந் தவர்கள்கூட வெளிநாடுகளிலே போய்ப் படித்துவிட்டு மருத்துவர்களாகத் திரும்பவும் இங்கு வருகின்ற ஒரு நிலையும் காணப்படுகின்றது. ஆகவே, இந்த நாட்டிலே மருத்துவத் துறைக்குத் தெரிவுசெய்யப்படுகின்ற மாணவர்களின் தொகையை அதிகரிக்க வேண்டுமென்று இந்த உயரிய சபையிலே கேட்டுக்கொள்கின்றோன்.

அத்துடன், அம்பாறை மாவட்டத்திலே உள்ள தென்கிழக்குப் பல்கலைக்கழகத்துடன் இணைந்ததாக நீரியல் வளத் துறையை மையப்படுத்தியதான ஒரு பல்கலைக் கழகத்தை உருவாக்குவது சிறந்ததென நான் நினைக் கின்றேன். அப்படியான ஒரு பல்கலைக்கழகத்தை உருவாக் குகின்றபோது அந்தப் பகுதியிலேயிருக்கின்ற நீரியல் வளம் சம்பந்தமான விடயங்களை நல்ல முறையில் முன்னெடுக் கக்கூடியதாக இருக்கும். இதனுடன் தொடர்புடையதாக நான் ஒரு விடயத்தைக் குறிப்பிட வேண்டும். அதாவது, 1972ஆம் ஆண்டு 36 சதுர கிலோமீற்றர் பரப்பைக் கொண்டிருந்த பெரியகளப்பு என்ற பிரதேசம் இன்று 18 சதுர கிலோமீற்றர் பரப்பாக மாற்றப்பட்டிருக்கின்றது. இதற்குப் பல காரணங்கள் இருக்கின்றன. அதாவது, அந்தக் களப்பை ஆக்கிரமித்து மண் நிரப்பப்பட்டு, அந்தக் களப்பின் பெரும்பகுதி மூடப் பட்டுள்ளது. அதனால் அந்தப் பகுதியில் இருக்கின்ற மீனவர்கள் பாரிய விபரீதத்தை எதிர்நோக்குகின்ற நிலை காணப்படுகின்றது. கிட்டத்தட்ட 5,600 மீனவக் குடும்பங்கள் அந்தப் பெரிய களப்பைப் பாவித்துத் தங்களது வாழ்வாதாரத்தை மேற்கொண்டு வருகின்றனர். அண்மையில்கூட தமிழர்கள், முஸ்லிம்கள், சிங்களவர்கள் என்று பலரும் அந்தக் களப்பை நிரப்புகின்ற ஓர் அசாதாரண சூழ்நிலை ஏற்பட்டிருந்தது. இதனைத் தடுத்து நிறுத்துவதற்காக மீனவர் சங்கங்களைச் சேர்ந்தவர்கள் அந்த இடத்திலே போராட்டத்தை நடத்தி, அதற்கு எதிராகக் குரல் கொடுத்தார்கள். அதுமட்டுமல்ல, அங்கிருந்த, அரசாங்கப் பணத்திலே கட்டப்பட்ட, அரசாங்கத்தினாலே நிர்வகிக்கப்பட்ட மீனவர் பயன்பாட்டுக்கான ஒரு கட்டிடம்கூடத் தனியார் ஒருவரின் தேவைக்காக உடைக்கப்பட்டது. இதனை எதிர்த்து மக்கள் ஆர்ப்பாட்டங்களை நடத்தினார்கள். ஆனால், இன்றுவரை அந்தக் கட்டிடத்தை உடைத்தவர்களுக்கு எதிராகப் பொலிஸார் எந்தவித நடவடிக்கையும் எடுக்கவில்லையென்பது மிகவும் கவலைக்கும் வேதனைக்கும் உரிய விடயமாக இருக்கின்றது.

அதேபோல், அந்தக் களப்பிலே வேறொரு சகோதர இனத்தவர்கள் வேலியடைத்து, அந்த இடத்தைப் பிடிப்பதற்கான முயற்சிகளை மேற்கொண்டார்கள். இந்த முயற்சியினால் அந்தப் பிரதேசத்திலே இரண்டு இனங்களுக்கிடையே ஒரு கலவரநிலை தோன்றக்கூடிய வாய்ப்பிருந்தது. ஆயினும், அந்த இடத்தில் தனிப்பட்ட சொந்த

[ගරු කවීන්දිරන් කෝඩීස්වරන් මහතා]

නලනුක්කාකක් කාණියෙ අටෙක්කින්ර අන්තච් චෙයර්පාට්ටෙ මක්කළ් තටුත්තු නිරුත්තිනාර්කළ්. ආනාල්, අංකිරුක්කින්ර මක්කළාල් නිරාකරික්කප්පට්ටු, මක්කළාල් ඒර්රුක්කොළ්ළප්පටාත, අරසියල් වංකුරෝත්තිල් ඉරුක්කින්ර සිලර් අතනෙ ඉනප්පිරච්චිනෙයාක, ඉනවාතමාකත් තිරිපුපටුත්ති ඉරණ්ටු ඉනංකළුක්කිටෙයිලේ අන්තප් පිරච්චිනෙයෙ ඒර්රුප්පටුත්තුකින්ර නපර්කළාකච් චෙයර්පටුවතෙ නාංකළ් කාණ්කින්රෝම්. අතිල් කුරිප්පිට්ට ඕර් අරසියල්වාති තනතු මුකනූලිල්කූට ඉනවාතක් කරුත්තුක්කළෙ වෙළියිට්ටු අන්ත ඉටත්තිලේ ඉරණ්ටු ඉනංකළුක්කිටෙයිලේ පිරච්චිනෙයෙ ඒර්රුප්පටුත්තුකින්ර චෙයර්පාට්ටෙ මුන්නෙටුත්තාර්. ඉන්රු අන්ත ඉටත්තිල් ඉරුක්කින්ර තමිළර්, මුස්ලිම්කළුක්කිටෙයිලුළ්ළ නල්ලුරවෙ මේම්පටුත්ත වේණ්ටිය කටප්පාටු ඉරුක්කින්රතු. ඉන්නිලෙයිල් තනිප්පට්ට නෝක්කත්තුක්කාක අන්තක් කාණියෙ අටෙක්කින්ර චෙයර්පාට්ටෙ මුන්නෙටුක්කින්ර තනිප්පට්ට අන්ත නපරෙත් තටුත්තුනිරුත්තුකින්ර චෙයර්පාට්ටෙ මේර්කොළ්ළුකින්රපෝතු, අතනෙ අවර් සාතකමාකප් පයන් පටුත්ති අතනෙ ඕර් ඉනවාතක් කරුත්තාක වෙළියිටුවතෙ යිට්ටු, තමිළ්, මුස්ලිම් මක්කළ් මිකවුම් කවනමාකවුම් විළිප්පාකවුම් ඉරුන්තු චෙයර්පට වේණ්ටුම්. ඉප්පටියාන පෝලිප් පිරචාරංකළෙ, පෝලියාන කරුත්තුක්කළෙ, පෝලියාන වතන්තිකළෙ වෙළියිටුකින්ර අරසියල්වාතිකළෙ මක්කළ් චරියාක අටෙයාළම් කාණවේණ්ටුමෙන්රු නාන් ඉන්ත ඉටත්තිලේ කූරික්කොළ්ළ විරුම්පුකින්රේන්.

විචේටමාක, "කළප්පෙ මූටක්කූටාතු. අතිල් මණ්ණෙ නිරප්පක්කූටාතු, ඉතනාල් පාරිය විපරීතංකළ් ඒර්රුප්පටුම්, වෙළ්ළ අනර්ත්තංකළ් ඒර්රුප්පටුකින්රපෝතු මක්කළ් කූටුතලාකප් පාතික්කප්පටුවාර්කළ්" එන්ර කරුත්තෙ මේතකු ජනාතිපති අවර්කළ්කූට වෙළියිට්ටිරුන්තාර්. අප්පටිප්පට්ට නිලෙයිලුම් කූට අන්තක් කළප්පිලේ මණ්ණෙ නිරප්පි, වේලි පෝට්ටු අන්ත ඉටංකළෙ අපකරික්කින්ර - පිටික්කින්ර චෙයර්පාටුකළ් මුන්නෙටුක්කප්පට්ටිරුක්කින්රන. ආකවේ, ඉතනෙක් කරුත්තිර් කොණ්ටු අතර්කුරිය නටවටික්කෙයෙ අරසු මුන්නෙටුක්ක වේණ්ටුම්; අතර්කුරිය එල්ලෙකළෙ වලුප්පටුත්ත වේණ්ටුම්. අන්ත මීනවර්කළින් වාළ්වාතාරත් තෙප් පාතුකාක්ක වේණ්ටිය කටප්පාටු ඉන්ත අරසුක්කු ඉරුක්කින්රතු. අතර්කුරිය එල්ලෙකළ් චරියාන මුරෙයිලේ පෝටප්පටුවතර්කාන චෙයර්පාටුකළෙ මුන්නෙටුක් කින්රපෝතුතාන් අන්ත ඉටත්තිලේ ඉරුක්කින්ර පිරච්චිනෙයෙක් කුරෙත්තුක්කොළ්ළ මුටියුම්. අතාවතු, ඉනංකළුක්කිටෙයිල් ඒර්රුප්පටුකින්ර මුරුකල් නිලෙයෙත් තටුත්තු නිරුත්තක් කූටියතාක ඉරුක්කුම්. ආකවේ, ඉනංකළුක්කිටෙයිලාන පිරච්චිනෙකළෙත් තටුත්තු නිරුත්ති මක්කළෙච් චරියාන පාතෙයිලේ නාංකළ් කොණ්ටුචෙල්ල වේණ්ටුමෙන්රාල්, අන්ත ඉටත්තිලේ එල්ලෙකළ් චරියාකප් පෝටප්පට වේණ්ටුම්. අරසු අතර්කාන කණ්ටිප්පාන නටවටික්කෙකළෙ එටුක්කවේණ්ටුම්. අතාවතු, අත්තුමීරි අන්තක් කළප්පිලේ එල්ලෙකළ් පෝටප්පටුකින්ර චෙයර්පාටුකළෙ, මණ් නිරප්පප්පටුකින්ර චෙයර්පාටුකළෙ උටනටියාකත් තටුත්තු නිරුත්තවේණ්ටුම්. අප්පටිත් තටුත්තු නිරුත්තප්පටාමල් විටප්පට්ටාල්, 36 චතුර කිලෝ මීර්තර් පරප්පළවාන කළප්පු එතිර්කාලත්තිලේ ඉන්නුම් කුරෙවටෙන්තු, පාරියතොරු විළෙවෙ ඒර්රුප්පටුත්තුකින්ර ඔරු නිලෙමෙ ඒර්රුප්පටුම්.

ඉන්ත නල්ලාට්චි අරසුක්කු අන්ත මක්කළෙප් පාතුකාක්ක වේණ්ටිය කටමෙප්පාටිරුක්කින්රතු. අන්තක් කළප්පිලේ තමිழ්ච් චමූකත්තෙච් චේර්න්ත මීනවර්කළ් කූටුතලාන නන්මෙයෙයුම් පෙරුකින්රවර්කළාක ඉරුක්කින්රාර්කළ්. අවර්කළ් අතනාලේ තංකළතු වාළ්වෙක් කොණ්ටු නටත්තුකින්රවර්කළාක ඉරුක්කින්රාර්කළ්. ඉප්පටිප්පට්ට චෙයර්පාටුකළ් මීණ්ටුම් මීණ්ටුම් අංකු නටෙපෙරුම් එන්රාල්, ඉතු ඔරු පාරිය විළෙවෙ ඒර්රුප්පටුත්තුම්. අත්තුටන් අතර්කුප් පොරුප්පුක් කූරවේණ්ටිය නිලෙයිල් ඉන්ත අරසු ඉරුක්කුම් එන්පතෙයුම් ඉන්ත ඉටත්තිල් නාන් කූරික්කොළ්ළ විරුම්පුකින්රේන්. එනවේ, ඉන්ත උයරිය සපෙයිලේ නාන් කේට්ටුක්කොළ්ළ විරුම්පුවතු එන්නවෙන්රාල්, තයවුචෙය්තු අන්තක් කළප්පිර්කුරිය එල්ලෙකළ් උටනටියාකප් පෝටප්පට්ටු, අන්ත මක්කළින් වාළ්ක්කෙයිල් පාතුකාප්පාන ඔරු චූළ්නිලෙයෙ ඒර්රුප්පටුත්ත වේණ්ටුම්. අතේපෝල් ඉරණ්ටු ඉනංකළුක් කිටෙයේ ඉනවාතක් කරුත්තුක්කළෙත් තූණ්ටිප් පිරච්චිනෙයෙ ඒර්රුප්පටුත්තුකින්ර අන්ත අරසියල්වාතියින් කරුත්තෙත් තමිළ්, මුස්ලිම් මක්කළ් නිරාකරික්ක වේණ්ටුම් එන්ර කරුත්තෙයුම් නාන් ඉටත්තිල් චොල්ලික්කොණ්ටු, ඉරණ්ටු ඉන මක්කළුම් ඔන්රු චේර්න්තු අන්තක් කළප්පෙප් පාතුකාක්ක වේණ්ටුම් එන්රුම් කූරි, එනතු උරෙයෙයෙ මුටිත්තුක්කොළ්කින්රේන්. නන්රි.

[අ.භා. 3.30]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කර තිබෙන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විවාද කරන මේ අවස්ථාවේදී, ඇති වී තිබුණු එම අසාධාරණ තත්ත්වය වෙනස් කිරීමට දීර්ඝ කාලයක් දැවැන්ත අරගළයක් කළ ශිෂ්‍ය ව්‍යාපාරය, මහාචාර්යවරුන්, ඒ වාගේම ඒ සම්බන්ධව සහයෝගය දුන් සැම අපි යළිත් ගෞරවයෙන් සිහිපත් කරන්නට ඕනෑ. ඒ අයගේ අරගළය නොවන්නට රජය මේ පියවර ගන්නේ නැහැ. මේ පියවර සම්පූර්ණ විසඳුම් පියවරක් වෙය කියන විශ්වාසය තවම සැකයට භාජනය වන්නේත් ඒ නිසායි.

මම ගරු ඇමතිතුමාගේ කථාවට සවන් දුන්නා. ඒ වාගේම, මේ සංශෝධනය සම්බන්ධවත් අපි සාකච්ඡා කළා. SAITM කියන ආයතනය මුලින් තිබුණේ, South Asian Institute of Technology and Management වශයෙන් බව පළමුවෙන් මම කියන්න කැමැතියි. මේක තමයි උපත ලැබුවේ; මේක තමයි නීත්‍යානුකූලභාවය ලැබුවේ; මේක තමයි ආයෝජන අවසරය ලැබුවේ. මේ ආයතනය එහෙම ආරම්භ කරලා, මෙයට වෛද්‍ය අංශයක් එන්නත් කිරීමේ ක්‍රියා මාර්ගය නිසායි මේ මුළු මහත් අර්බුදය පටන් ගත්තේ. අපි ඒ ගැන දීර්ඝව කරුණු කියන්න ඕනෑ නැහැ. එහෙම වුණේ අපේ ආණ්ඩුව කාලයේ වෙන්න පුළුවන්. නමුත්, වෛද්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ආරක්ෂා කර ගත යුතුයි. ඒ සඳහා විශ්වවිද්‍යාල ක්ෂේත්‍රයේ අනෙක් වෛද්‍ය පීඨවල මහාචාර්යවරු සමඟ, ඒ වාගේම ශ්‍රී ලංකා වෛද්‍ය සභාව සමඟ කටයුතු කරමින් යම් යම් විෂයමාලා, විභාග, පුහුණු කිරීම්, දේශණ ආදිය පිළිබඳව අනුගමනය කළ යුතු ක්‍රියා මාර්ග අනුගමනය නොකිරීමේ ගැටුම තමයි SAITM ආයතනය සමඟ දීර්ඝව ඇති වුණු අර්බුදය. වෛද්‍ය ක්ෂේත්‍රයේ හිතුවක්කාරකමින් වෛද්‍ය උපාධි දෙන්නට පුළුවන්ය කියන ප්‍රශ්නය අවසන් විය යුතුයි. එය අවසන් කිරීමේ අවස්ථාව ඉතා වැදගත් ජයග්‍රහණයක් බවට අපි පත් කර ගත යුතුයි. එය නව ඇමතිතුමාගේ කර මත වැටී තිබෙන ප්‍රශ්නයක්.

North Colombo Medical Collegeහි සිදුවූ මේ හා සමාන ප්‍රශ්නයක් සම්බන්ධයෙන් ඒ.සී.එස්. හමීඩ් හිටපු ඇමතිතුමා 1989

ජූනි මාසයේ 8 වැනිදා කළ කථාවක් මම කියෙව්වා. එම ආයතනය මේ විධියටම වැරදි කටයුතුවල නිරත වී, වැරදි ආකාරයට ශිෂ්‍යයින් බඳවා ගෙන තිබුණා. ගුණාත්මකභාවයක් නොමැති අධ්‍යාපන කටයුතු නිසා වෛද්‍ය අධ්‍යාපනය අවුලක් බවට පත් වුණා. එදා ශිෂ්‍යයින් විශාල ප්‍රමාණයක් මිය ගියා. එය රජයට පවරා ගැනීමේ යෝජනාව එදා පාර්ලිමේන්තුවට ගෙනාවා. මම හිතන විධියට එදා පාර්ලිමේන්තුවේ කථා කළ මන්ත්‍රීවරුන් අතරින් අද පාර්ලිමේන්තුවේ ඉන්නේ මා පමණයි. එක්තරා විධියකට එදා අපි කියපු කතන්දර අතර අද කිසි වෙනසක් නැහැ.

අපි නිදහස් වෛද්‍ය සේවය ආරක්ෂා කර ගත යුතුයි. නිදහස් වෛද්‍ය සේවයට දැවැන්ත බලපෑමක් බවට පත් විය හැකි, ගාස්තු ගෙවා ලබා ගත යුතු පෞද්ගලික වෛද්‍ය විද්‍යාල අධ්‍යාපනය පිළිබඳව අපි ඉතාම ප්‍රවේශම් විය යුතු අතර, තර්ජන හා අනතුරු සහිත මාර්ගයකයි අප ගමන් කර තිබෙන්නේ. මේ නිසා අද තිබෙන මේ තත්ත්වය තුළ, දැනට SAITM ආයතනයේ වෛද්‍ය පීඨයේ සිටින ශිෂ්‍යයන් මෙයට ඇතුළත් කර ගැනීමෙන් අනතුරුව එම ආයතනය අහෝසිවීම සිදු කළ යුතුයි. මේ පිළිබඳ අවිනිශ්චිතභාවයක් තිබුණා. ගරු ඇමතිතුමා දැන් සංශෝධනයක් ලබා දීලා තිබෙනවා. රමේෂ් පතිරණ මන්ත්‍රීතුමාත්, සිසිර ජයකොඩි මන්ත්‍රීතුමාත්, වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමාත් කාරක සභාවේ දී අපේ යෝජනා ඉදිරිපත් කළා. එය පිළිගෙන, අද එම සංශෝධනය ඉදිරිපත් කර තිබෙනවා.

ඉන්පසුව තව සංශෝධන දෙකක් පිළිබඳව තමයි අපි අතර සාකච්ඡාව තිබුණේ. එම සංශෝධන දෙක, මෙහි මූලික සුදුසුකම් ලෙස සඳහන් විෂයන් පිළිබඳව තිබෙන ගැටලු සම්බන්ධයි. ගරු අමාත්‍යතුමනි, ඒ ප්‍රශ්නය විසඳා ගත යුතු වන්නේ ඇයි? SAITM එකෙන් ඇතුළත් වන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පමණක් අදාළ වනවා කියන වචන මුලින් සඳහන් කළත්, ඒ සුදුසුකම පොදු සුදුසුකමක් බවට පරිවර්තනය වීමේ භයානකකමක් තිබෙනවා. ඒක තමයි අද තිබෙන අනතුර. එය එසේ වීමට හැකි මාර්ගයක් තිබෙනවා. මොකද, ගරු ඇමතිතුමා මේ පනත් කෙටුම්පත ඉවත් කරගෙන නැහැ. "ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය" කියන පනත් කෙටුම්පත අයින් කරගෙන නැහැ. You have not withdrawn what was presented two months ago. මා දන්නේ නැහැ, ඔබතුමා අද එය අයින් කරගන්න බලාපොරොත්තු වනවාද කියා. ගරු අමාත්‍යතුමනි, මා නම් ඔබතුමාගෙන් කරන ඉල්ලීම, එක්කෝ ඒ පනත් කෙටුම්පත අයින් කරගෙන යළිත් ඉදිරිපත් කරන්න, එසේත් නැතිනම් ඒ පනත් කෙටුම්පත යළිත් සාකච්ඡාවට ලක් කරන්න කියන එකයි. එය සමඟ තමයි අද ගෙනෙන මේ සංශෝධනය ගැන යම් යම් සැක මතු වන්නේ. මොකද, මේ පනත් කෙටුම්පතින් විවෘත කරන දොරටු කොතැනින් නවතීද කියන අවිනිශ්චිතභාවය තිබෙනවා. ඒ නිසා එම පනත් කෙටුම්පතට අපේ එකඟතාවක් නැහැ. ඒ ගැන සාකච්ඡා කොට හෝ එය අලුතින් සකස් කිරීම ඉතාම වැදගත් වනවා. ඒ නිසාම තමයි ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ පිළිගැනීම අනුව දෙවන සංශෝධනය හැටියට අපේ පාර්ශ්වයන් ඔබතුමාගෙන් ඉල්ලීමක් කළේ, "ඇ" වගන්තියේ තිබෙන විශ්වවිද්‍යාලයේ කළමනාකාරිත්ව මණ්ඩලය විසින් උපාධිය පිරිනැමීම ගැන.

ඇමතිතුමා පැහැදිලි කිරීමක් කළා. ඒ අතර විශාල ගැටලුවක් මතු කරගත යුතු නැහැ. නමුත් ගරු ඇමතිතුමනි, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නිර්දේශ මත උපාධිය දෙන්න කියන එක නොවෙයි අපි කියන්නේ. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ නිර්දේශ මත වෛද්‍ය අධ්‍යාපනයට අදාළ විෂයයන් හදාරා හමාර වීමෙන් පසු එය කරන්න. මේ හේතුව නිසා තමයි ශ්‍රී ලංකා වෛද්‍ය සභාවත්, ඒ වාගේම රජයේ වෛද්‍ය සංගමයත්, මහාචාර්යවරුත්, SAITM එකත් ඔබතුමාගේ අමාත්‍යාංශය සමඟ අවුරුදු දෙකහමාරක් තිස්සේ නිරන්තර ගැටුමක යෙදී සිටියේ. අදාළ විෂයයන් හා වෛද්‍ය අධ්‍යාපනය පිළිබඳව කරන නිර්දේශ කියන එකයි එතැන අදහස් කරන්නේ. ඒක ඔබතුමා සැලකිල්ලට ගතයුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

I will conclude, Sir.

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා උපාධි පිරිනැමීම සිදුවෙන කොට ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට එය නිවැරැදි කරන්න හැකි වන මාර්ගය තමයි, මේ ගැන දක්වන පිළිගැනීම හා සැලකිල්ල. මම මගේ කථාව අවසන් කරමින් ඇමතිතුමාට යළිත් යෝජනා කරන්නේ, අපේ වෛද්‍ය අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිකර ගැනීම සඳහා වූ මීටත් වඩා බලයක් ඇති කාරක සභාවක් පත්කොට සාකච්ඡාවක් කිරීම ඉදිරි අනාගතය සඳහා වැදගත් කියන එකයි. ඒ වාගේම ඔබතුමා කලින් කිව්වා වාගේ, ඊට සමගාමීව SAITM එකේ වෛද්‍ය පීඨය ගැන අපි කියන්නේ එය ඉවත් කිරීමේ ගැසට් නිවේදනයද අමාත්‍යාංශය මඟින් ප්‍රකාශයට පත් කළ යුතු බවයි. එය එසේ නිවේදනය කරනු ඇතැයි මම විශ්වාස කරනවා. මේ කාරණය බොහොම සුභද තත්ත්වයකට පත් කරගන්න විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් වින්ද දුකට විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ටත්, මහාචාර්යවරුන්ටත්, දෙමව්පියන්ටත් ඒකාබද්ධ විපක්ෂයේ ගෞරවය පිරිනමනවා.

[பி.ப. 3.40]

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, உயர் கல்வி அமைச்சர் அவர்கள் SAITM மாணவர்கள் பாதிக்கப் படாத வகையில் ஜெனரல் சேர் ஜோன் கொத்தலாவலை பாதுகாப்புப் பல்கலைக்கழகம் (விசேட ஏற்பாடுகள்) சட்டமூலத்தினை முன்மொழிந்திருக்கிறார். இந்தச் சட்ட மூலமானது நீண்டகாலமாக வீதியில் இறங்கிப் போராடி வருகின்ற பல்கலைக்கழக மாணவர்களது போராட்டங்களுக்கு, அவர்களுடைய கோரிக்கைகளுக்கு, ஒரு தீர்வாக அமையுமென நம்புகின்றேன். அதற்காக உயர் கல்வி அமைச்சருக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

அமைச்சர் அவர்கள் தன்னுடைய உரையின்பொழுது, அந்த மாணவர்கள் எந்தவிதமான குற்றமும் செய்யவில்லையென்றும், 2012ஆம் ஆண்டு SAITM எனப்படும் இந்தத் தனியார் பல்கலைக்கழகம் ஆரம்பிக்கப்படும்போது முறையான அனுமதி பெறப்பட்டிருக்கவில்லை எனவும் குறிப்பிட்டிருந்தார். அந்தக் காலப்பகுதியில் குறிப்பாக முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷ அவர்களுடைய காலப்பகுதியில், அதற்கெதிராக எந்தவிதமான ஆர்ப்பாட்டமும் நடைபெறவில்லை. முன்னாள் உயர் கல்வி அமைச்சர் எஸ்.பி. திஸாநாயக்க அவர்களுடைய காலப்பகுதியில் அந்த அரசாங்கத்தினுடைய துணையுடன்தான் இந்த SAITM நிறுவனம் ஆரம்பிக்கப்பட்டது. ஆனால், அது பிழையான விடயமென்று கூறித் தற்பொழுது ஆர்ப்பாட்டம் செய்கின்றார்கள். இன்று பத்து நாட்களுக்கும் மேலாகத் தபால் திணைக்கள ஊழியர்கள் போராட்டம் நடத்துகிறார்கள்.

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

ஆனால், அந்தக் காலப்பகுதியில் மக்களாக இருக்கலாம், பல்கலைக்கழக மாணவர்களாக இருக்கலாம், தொழிற் சங்கங்களாக இருக்கலாம், எவரும் போராட்டம் செய்ய முடியாது; போராட்டம் செய்வதற்குரிய சூழ்நிலையும் அப்போது இருக்கவில்லை. ஆகவேதான் அந்தக் காலத்தில் அவர்கள் போராட்டம் செய்யவில்லை.

இந்த SAITM நிறுவனம் தொடர்பாக நீண்டகாலமாகப் பல்கலைக்கழக மாணவர்கள் போராட்டம் செய்கின்றார்கள். நேற்றுக்கூடப் பல்கலைக்கழக மாணவர்கள் இராஜகிரியவில் இருந்து பாராளுமன்ற வீதியூடாக வந்து பாராளுமன்றத்துக்கு முன்பு போராட்டம் செய்தார்கள். அவர்களது போராட்டத் திற்குத் தீர்வாக இது அமையுமென்று நான் நினைக்கின்றேன். தாங்கள் அமைச்சராக வந்து இரண்டு மாத காலத்திற்குள் இது தொடர்பான ஒரு சட்டத்தை உருவாக்கி, அதற்கு முற்றுப்புள்ளி வைக்கவேண்டும் என்று நீங்கள் முயற்சி செய்தமைக்கு நான் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

தனியார் பல்கலைக்கழகங்கள் வேண்டும்; அதில் எந்தவிதமான மாற்றுக் கருத்தும் இல்லை. ஆனால், தனியார் பல்கலைக்கழகங்களை உயர் கல்வி அமைச்சு கண்காணிக்க வேண்டும். அவை தகுதியான மாணவர்களை உள்வாங்குகின்றனவா என்பது மிக மிக முக்கியமான விடயமாகும். ஏனென்றால், ஒவ்வொரு மாவட்டத்திலுமிருந்தும் வெட்டுப்புள்ளியின் அடிப்படையிலேயே மருத்துவப் பிரிவுக்கு மாணவர்கள் தெரிவுசெய்யப்படுகின்றார்கள். அந்த வகையில் ஒவ்வொரு மாவட்டத்திலிருந்தும் ஆகக்கூடியது 5 - 10 மாணவர்கள் மாத்திரம் உள்வாங்கப்படுகின்றபோது, வெறுமனே 3 "S" சித்தி பெற்றவர்கள் தனியார் பல்கலைக் கழகத்தில் அனுமதிக்கப்படுகின்றார்கள். அதன்மூலம் அவர்கள் மருத்துவராக வெளிவருகின்றபோது அவர்களுடைய தரம், அவர்களுடைய மருத்துவம் எந்தளவில் இருக்குமென்பது மக்கள் மத்தியில் கேள்விக்குறியாக இருக்கின்றது. அந்த வகையில், தனியார் பல்கலைக்கழகங்கள் மூலம் மருத்துவப் பிரிவில் உள்வாங்கப்படுகின்ற மாணவர்கள் அதற்குரிய தகுதியுடையவர்களாக இருக்கின்றார்களா என்பது போன்ற விடயங்களைத் தங்களுடைய அமைச்சு கண்காணிக்கின்ற வகையில் சட்டங்கள் உருவாக்கப்பட்டு, அதனடிப்படையில் தனியார் பல்கலைக்கழகங்கள் இயங்கினால் உண்மையில் அது வரவேற்கத்தக்கது.

கௌரவ அமைச்சர் அவர்களே, தங்களுடைய அமைச்சுக்குக் கீழ்தான் தொல்பொருள் திணைக்களமும் இருக்கின்றது: அண்மையில்தான் தங்களுக்கு அது வழங்கப்பட்டிருக்கின்றது. குறிப்பாக, நான் இன்றைக்குத் தங்களுடைய அமைச்சு தொடர்பான இந்த விவாதத்தில் உரையாற்றுவதன் நோக்கம் இந்தத் திணைக்களம் தொடர்பில் தெரிவிப்பதுதான். இந்தத் தொல்பொருள் திணைக்களம் என்பது எமது பகுதிகளில் தற்பொழுது சில வேலைத்திட்டங்களுக்கு மிகப் பெரியதொரு தடையாக அமைகின்றது. அதற்குக் காரணம், எமது பிரதேசத்திலுள்ள அதிகாரிகளுக்கு அனுமதியளிக்கக்கூடிய அதிகாரமிக்க உயரதிகாரிகள் அங்கு இல்லை. இது மிக முக்கியமான ஒரு விடயம். அதாவது, 2011ஆம் ஆண்டிலிருந்து, மன்னார் மாவட்ட விளையாட்டு மைதானம் "அந்தப் பிரதேசத்தில் அமைக்கப்படவேண்டும், இந்தப் பிரதேசத்தில் அமைக்கப் படவேண்டும்" என்று அரசியல் ரீதியான பல இழுபறிகளுக்கு மத்தியில் நீண்டகாலமாக ஆரம்பிக்கப்படாமலிருந்து, தற்போது ஒரு வருடத்திற்குள்தான் அதன் அமைப்புப் பணிகள் ஆரம்பிக்கப்பட்டது. மன்னார் மாவட்ட நானாட்டான் பிரதேச செயலகத்திற்குட்பட்ட அரச காணியில் கிட்டத்தட்ட 350 மில்லியன் ரூபாய் செலவில் ஆரம்பிக்கப்பட்ட இந்த மாவட்ட விளையாட்டு மைதான அமைப்புப் பணியில் தற்போது கிட்டத்தட்ட அரைவாசி வேலைகள் முடிந்திருக்கின்றன. ஆனால், அங்கு வேலை செய்தவர்கள் அந்த வேலைத் திட்டத்திற்காக அந்த நிலத்தில் கிடங்கு கிண்டும்போது, அங்கு ஒரு சில தொல்பொருட்கள் இருந்ததாகத் தொல்பொருள் திணைக்களத்திற்குத் தெரியப்படுத்தியதன் நிமித்தம், அவர்கள் வந்து அந்த வேலையை நிறுத்தியிருக்கின்றார்கள். ஆனால், கௌரவ அமைச்சர் அவர்களே, இது தொடர்பாக மாவட்ட அபிவிருத்திக் குழுக் கூட்டத்தில் தீர்மானம் எடுக்கப்பட்டு, குறிப்பிட்ட அந்தப் பிரதேசத்தை மட்டும் விட்டுவிட்டு, மற்ற இடத்தில் அபிவிருத்தி வேலைகளைச் செய்வதற்கு அனுமதிக்கும்படி தொல்பொருள் திணைக்களத்திடம் நாங்கள் கேட்டிருந்தோம். ஆனால், தொல்பொருள் திணைக்களம் அது தொடர்பான பதிலைச் சரியான முறையில் வழங்கவில்லை. மன்னாரில் இருக்கின்ற அதிகாரிகள், "தங்களுக்கு அந்த அதிகாரம் இல்லை" என்று கூறுகிறார்கள். நீங்கள் வட மாகாணத்தில் இருக்கின்ற -

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
Is it in Mannar town itself?

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
Mannar town එකේ ඉඳලා කිලෝමීටර් 10ක් විතර තිබෙනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
If you can give me the details, I will attend to that matter.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
Okay. நன்றி! அமைச்சர் அவர்களே, நீண்ட காலமாகவே இந்தப் பிரச்சினை இருக்கிறது. ஆகவே, இந்த விடயத்தில் கவனமெடுத்து நடவடிக்கை எடுப்பதாகக் கூறியமைக்கு உங்களுக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கிறேன்.

கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் கடந்த வாரத்துக்கு முதல் வாரம் பல்கலைக்கழகச் சட்டம் தொடர்பாகப் பாராளுமன்றத்தில் விரிவாகக் கூறியிருந்தீர்கள். அதில் என்னென்ன குறைபாடுகள் இருக்கின்றது என்றும் அக் குறைபாடுகளை நிவர்த்தி செய்யவேண்டும் என்றும் கூறியிருந்தீர்கள். அதன்போது, பல்கலைக்கழக அனுமதிக் கான வெட்டுப்புள்ளி தொடர்பாக நான் தங்களுக்குச் சுட்டிக் காட்டியிருந்தேன். அதாவது, தற்பொழுது நடைமுறையில் இருக்கின்ற சட்டத்தின்படி, ஒரு மாணவன் தனது இறுதி மூன்று வருடக் கல்வியைக் குறித்த மாவட்டத்தில் கற்றிருந்தால் மட்டும்தான், அம்மாணவன் அந்த மாவட்டத் துக்குரிய வெட்டுப் புள்ளியினூடாகப் பல்கலைக்கழகம் செல்லமுடியும். உதாரணமாக, ஒரு மாணவன் GCE O/L எடுத்த பின்பு, மன்னார் மாவட்டத்தில் பதிவுசெய்துவிட்டு, வெளிமாவட்டத்தில் படிக்கின்ற விடயம் உங்களுக்கும் தெரியும். இங்கு குறிப்பிடப்படுகின்ற 03 வருடங்கள் என்பதன்

අඩිප්පඩයිල් පාර්ක්කින්‍රපෝදු, අම්මාණවන් first shyඉන්පෝදු, මන්නාර් මාවට්ට වෙට්ටුප් පුළ්ළියිනූඩාකප් පල්කලෙක්කළකම් සෙල්ල මුඩියාදු. ආනාල්, second shy එටුක්කුම්පෝදු, අම්මාණවනුක්කු මන්නාර් මාවට්ට වෙට්ටුප් පුළ්ළියිනූඩාකප් පල්කලෙක්කළකම් සෙල්වදර්කුරිය වාය්ප්පු ඉරුක්කින්‍රදු. කෞරව අමෙච්චර් අවර්කළේ, ඒර්කෙනවේ 5 වරුඩංකළ් -

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිදි) විජයතාස රාජපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

Hon. Member, that situation has changed now. Before students are enrolled to the Medical Faculty and the Engineering Faculty, the University Grants Commission always ascertain whether they had in fact been studying in a remote district or not. If they had not been there during the minimum period required, they will not be admitted to the university from the Z-score recognized or accepted from that district. It has been regularized now.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(මාණ්පුමිකු இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

කෞරව අමෙච්චර් අවර්කළේ, නීංකළ් කුරිප්පිටුවදු චරි. ආනාල් චිල වරුඩංකළුක්කු මුන්පු 5 වරුඩංකළ් කුරිත්ත මාවට්ටත්තිල් කල්වි කර්රිරුක්ක වේණ්ඩුම් එන්‍රුතාන් ඉරුන්තදු. ආනාල් එන්න කාරණත්තිර්කාක එන්‍රු තෙරියාදු, තර්පෝදු 3 වරුඩංකළ් එන්‍ර ඉන්ත මාර්‍රම් නටෙපෙර්‍රිරුක්කින්‍රදු එන්‍රු නාන් නිනෛක්කිරේන්. මීණ්ටුම් ඒර්කෙනවේ ඉරුන්තතෛප්පෝල ආකක් කුරෛන්තදු 5 වරුඩංකළ් කට්ටායම් කුරිත්ත මාවට්ටත්තිල් කල්වි කර්රාල් මට්ටුම්තාන් අන්ත මාවට්ට වෙට්ටුප්පුළ්ළි ඌඩාකප් පල්කලෙක්කළක අනුමතියෛප් පෙරමුඩියුම් එන්‍ර චට්ටත් තිරුත්තත්තෛත් තාංකළ් කොණ්ටුවන්තාල්, උණ්මෛයිල් පින්තංකිය මාවට්ටත්තිල් කල්වි කර්රුප් පල්කලෙක්කළක අනුමතියෛප් පෙරුකින්‍ර මාණවර්කළෛප් පාතික්කාත වකෛයිල් අදු අමෛයුම්. අතර්කුරිය චට්ට තිරුත්තංකළෛ මේර්කොළ්ළුම් පෝදු, නීංකළ් චොන්න කාරණංකළෝටු ඉන්තක් කරුත්තෛයුම් චට්ටමාකක් කොණ්ටුවන්තාල් නිච්චයමාක මාණවර්කළුක්කු අදු ඔරු වරප්පිරචාතමාක අමෛයුමෙන්පතාල්, ඉතනෛ නාන් ඔරු යෝචනෛයාකක් කුරිප්පිට විරුම්පුකින්‍රේන්.

කෞරව අමෙච්චර් අවර්කළේ, මන්නාර් මාවට්ටත්තිල් කණිතප් පිරිවිල් කල්වි කර්ර මාණවන් ඔරුවන් මුතල් තටවෛ ක.පොස.ත. උයර්තරප් පරීට්චෛක්කුත් තෝර්ර්‍රියපෝදු, අවන් පල්කලෙක්කළක් අනුමතික්කාකප් පල්කලෙක්කළක මානියංකළ් ආණෛක්කුළුවුක්කු විණ්ණප්පික්කවිල්ලෛ. අම්මාණවන් ඉරණ්ටාම් තටවෛ මන්නාර් මාවට්ටත්තිල් උයර්තරප් පරීට්චෛක්කු තෝර්‍රි, කණිතප් පිරිවිල් meritඉල් චිත්තියටෛන්තු, පල්කලෙක්කළක මානියංකළ් ආණෛක් කුළුවුක්කු අම්මුර්‍රෛයේ මුතල් තටවෛයාක විණ්ණප්පිත්තිරුන්තාන්. ආනාල්, “කටන්ත වරුටම් නීංකළ් පතිවු චෙය්තුවිට්ටීර්කළ්, ආකෛයාල් ඉන්ත වරුටම් පතිවු චෙය්ය මුටියාදු” එන්‍රු අන්ත ආණෛක්කුළුවිලිරුක්කින්‍ර අතිකාරිකළ් අවනදු විණ්ණප්පත්තෛ නිරාකරිත්තිරුක් කිරාර්කළ්. ආනාල් මුතල් තටවෛ අවන් නිච්චයමාකප් පතිවු චෙය්යවිල්ලෛ. මුතල් තටවෛ පතිවුචෙය්වතර්කු අවනුක්කු අනුප්පප්පට්ට පටිවම් මර්‍රුම් චකල ආවණංකළුම් අන්ත මාණවනින් කෛයිල් ඉරුක්කින්‍රන. අව්වාරෙනිල්, එප්පටි පල්කලෙක්කළකත්තිල් අන්ත මාණවනාල් පතිවුචෙය්ය මුටියුම්? ඉතුතොටර්පාක නාන් පල්කලෙක්කළක මානියංකළ් ආණෛක්කුළුවින් තලෛවර් පේරාචියර් මොහාන් ටි සිල්වා අවර්කළුටන් තොලෛපේචියිල් කතෛත්තේන්. අප්පෝදු අවර්, ඉතේපෝන්‍ර පල විටයංකළ් ඉරුක්කින්‍රතෙන්‍රු කූර්‍රිනාර්.

කෞරව අමෙච්චර් අවර්කළේ, උණ්මෛයිල් ඉන්ත මාණවන් පතිවෛ මේර්කොළ්ළවිල්ලෛ. අන්ත මාණවනුටෛය විණ්ණප්පප් පටිවංකළ් අවරුටෛය කෛයිලිරුක්කින්‍රපෝදු, එප්පටි අවරුටෛය පතිවු මේර්කොළ්ළප්පට්ටතු? පල්කලෙක්කළක මානිය ආණෛක් කුළුවිල් යාර් ඉතනෛ මේර්කොණ්ටතු? එන්න කාරණත්තිර්කාක ඉප්පටියාන පතිවුකළෛ මේර්කොල් කින්‍රාර්කළ්? එන්‍රු තාංකළ් විචාරණෛයෛ මේර්කොළ්ළ වේණ්ටුම්. පල්කලෙක්කළක මානියංකළ් ආණෛක්කුළුවිල් ඉරුක්කින්‍ර අතිකාරිකළ් චිලර් මාණවර්කළින් පතිවුකළෛ අවර්කළාකවේ චෙය්කිරාර්කළ්; පින්නර් අවර්කළුටෛය අටුත්ත වරුටත්තිර්කාන අනුමතියෛ මර්‍රුක්කිරාර්කළ්. නාන් ඉතු චම්පන්තමාකප් පල්කලෙක්කළක මානියංකළ් ආණෛක්කුළුත් තලෛවරිටම් එළුත්තුමූලමාකවුම් කෝරියිරුක් කින්‍රේන්. කුරිත්ත මාණවනිටම්, "නීංකළ් නීතිමන්‍රම් චෙල්ලුංකළ්!" එන්‍රු චොල්ලියිරුක්කින්‍රේන්. ආනාල් ඉප්පෝදු නීංකළ් උයර් කල්වි අමෙච්චරාක ඉරුක්කින්‍ර කාරණත්තිනාල්, ඉන්ත විටයත්තෛක් කරුත්තිලෙටුත්තු, උණ්මෛයිල් එන්න නටන්තතු එන්‍රු විචාරික්ක වේණ් ටුමෙන්‍රු තයවුටන් කේට්ටුක් කොළ්ළුකින්‍රේන්.

කෞරව අමෙච්චර් අවර්කළේ, අන්ත මාණවන් තර්පෝදු merit ඉල් pass ආකියිරුන්තුම් පතිවු චෙය්ය මුටියාමලිරුක් කින්‍රදු. පල්කලෙක්කළක මානිය ආණෙක් කුළුවින් ඉන්ත නටවටික්කෛ තොටර්පාකත් තංකළෛච් චන්තිප්පතර්කු නීංකළ් නේරම් ඔතුක්කිත් තරවේණ්ටුම්. අන්ත මාණවන් උංකළෛච් චන්තිප්පතර්කුරිය ඔර් අනුමතියෛත් තරවේණ්ටුම්. තාංකළ් අනුමතිත්තාල් අන්ත මාණවන්, අවරුටෛය තාය්, තකප්පන් ආකියෝරෛයුම් නාන් අෙමෛත්තුවරුකින්‍රේන්. උණ්මෛයිල් එන්න නටන්තතු එන්පතෛත් තාංකළ් විචාරණෛ චෙය්ය වේණ්ටුම්. අත්තුටන් අවරුටෛය විණ්ණප්පත්තෛප් පතිවු චෙය්වතර්කුරිය නටවටික්කෛයෛත් තාංකළ් එටුක්කවේණ් ටුමෙන්‍රු ඉන්ත නේරත්තිල් උංකළිටම් කෝරික්කෛයාකවුම් - වේණ් ටුකෝළාකවුම් විටුක්කින්‍රේන්. වාය්ප්පුක්කු නන්‍රි.

[අ.භා. 3.56]

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ - அரச நிருவாக முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் பிரதி அமைச்சர்)
(The Hon. Nalin Bandara Jayamaha - Deputy Minister of Public Administration and Management and Minister of Law and Order)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉතා වැදගත් පනත් කෙටුම්පතක් ගැන සාකච්ඡා කරන මේ අවස්ථාවේදී ඒ පිළිබඳව අදහස් දක්වන්නට අවස්ථාව ලැබීම ගැන මා සතුටු වනවා. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය පිහිටුවීමෙන් පසුව ඉතාම තීරණාත්මක අවස්ථාවකට ඒ විශ්වවිද්‍යාලය පැමිණ තිබෙනවා. පසුගිය කාලය පුරා සාකච්ඡා කළ, ශිෂ්‍යයන් වීථි බැස්ස, ශිෂ්‍යයන් සටන් කළ, දෙමව්පියන් සටන් කළ කාරණයක් සම්බන්ධයෙන්, මේ රජය ආරම්භ නොකළ සයිටම් එක සම්බන්ධයෙන් වන ප්‍රශ්නවලට මේ රජය විසඳුම් සොයා දෙන අවස්ථාවක ඒ පිළිබඳව අදහස් දැක්වීමට ලැබීම ගැන මම සතුටු වනවා.

සයිටම් ශිෂ්‍යයන්ට වාගේම වෛද්‍ය ශිෂ්‍යයන්ටත් - දෙගොල්ලන්ටම- උපරිම සාධාරණයක් වන අවස්ථාවක් විධියට

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

මම මේ අවස්ථාව දකිනවා. ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමා මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා තිබෙන්නේ, සයිටම් සිසුන්ට කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය උපාධිය ලබාදීමේ අරමුණ වෙනුවෙනුයි. සයිටම් ආයතනය පිහිටවුවේ, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ යුගයේ. අපි දන්නා විධියට ඒ යුගයේදී රාජපක්ෂ මහත්මයාගේ සෘජු මැදිහත්වීම යටතේ ශිෂ්‍යයන් දසදෙනෙකුට රුපියල් මිලියන 10 බැගින් රුපියල් මිලියන 100ක ශිෂ්‍යත්ව ලබා දීලා තිබෙනවා. ඒ ශිෂ්‍යත්වලාභී දරුවෝත් මේ ශිෂ්‍ය කණ්ඩායමේ ඉන්නවා. හැබැයි අද රාජපක්ෂ මහත්මයලා මේකට විරුද්ධව කථා කරනවා. එදා සයිටම් එක හදද්දී -GMOA එක වෙන්න පුළුවන්, අනෙකුත් සංවිධාන වෙන්න පුළුවන්,- රාජපක්ෂ හස්තයට හයේ කටවල් වහගෙන හිටියා. හැබැයි යහ පාලන ආණ්ඩුව බලයට පත් වුණාට පසුව මේ ගැන කතිකාවතක් ඇති වුණා. ඒක හොඳයි. ඒක තමයි වෙන්න ඕනෑ. අද ඒ කතිකාවතට අවසන් විසඳුමක් ලැබී තිබෙනවා. එය සියලුදෙනාටම සාධාරණය ඉෂ්ට වන විසඳුමක්. හැබැයි ඒ විසඳුම ලබා දෙද්දී රාජපක්ෂවරු විරුද්ධයි. හැබැයි එදා රාජපක්ෂවරු රුපියල් මිලියන දහය ගණනේ ශිෂ්‍යත්ව දීපු ශිෂ්‍යත්වලාභීනුත් ඒ කණ්ඩායමේ ඉන්නවා. ඉතින් එහෙම නම් මෙතැන තිබෙන්නේ පටු දේශපාලන බඩගෝස්තරවාදය කියලායි අපට හිතන්න වෙන්නේ. මේ අවස්ථාවේ ඇමතිවරයා මැදිහත් වෙලා, අතිගරු ජනාධිපතිතුමාගේ, ගරු අගමැතිතුමාගේ මැදිහත් වීම යටතේ මේ සාධාරණය ඉෂ්ට කරන්න කටයුතු කිරීම ගැන අපි සතුටු වනවා. විශේෂයෙන්ම අපි GMOA එකෙන් ඉතාම ආදරයෙන් ඉල්ලීමක් කරනවා. අපේ ශිෂ්‍යයින්ගෙන් ඉතාම ආදරයෙන් ඉල්ලීමක් කරනවා. අපි මේ ප්‍රශ්නය අවසන් කරන්න ඕනෑ. අපට හැමදාම සයිටම් එකත් එක්ක ඔට්ටු වෙවී ඉන්න බැහැ. මෙහිදී සියල්ලන්ටම සාධාරණ විසඳුමක් නොලැබෙන්න පුළුවන්. විශ්වවිද්‍යාල සිසුන් සියයට 100ක් මේ මතයට එකඟ නොවන්න පුළුවන්. ඒ වාගේම සයිටම් එකේ ඉගෙන ගත්ත සිසුන් සියයට 100ක් එකඟ නොවන්න පුළුවන්. නමුත් බහුතරයකට එකඟ වන්න පුළුවන් මතයකට ඇවිල්ලා තිබෙනවා.

විශ්වවිද්‍යාල සිසුන් ඊයේත් පාර්ලිමේන්තු මාර්ගය අවහිර කරලා, විශාල කලබලයක් ඇති කර ගත්තා. හැබැයි පටු දේශපාලන අරමුණු තිබෙන අය බහුතරයක් තමයි එතැන ඉන්නේ. එක්කෝ අන්තරය වෙන්න පුළුවන්, වෙනත් දේශපාලන කල්ලි -කණ්ඩායම්- වෙන්න පුළුවන්, මේ ශිෂ්‍යයන් දෙකොටියාසයේම අවශ්‍යතා ඉක්මවා ගිය දේශපාලන අරමුණු තිබෙන කණ්ඩායමක් තමයි මේවා පිටුපස ඉන්නේ කියන එක තමයි අපි දකින්නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ඊයේ පොලීසිය අවම වශයෙන් මැදිහත් වෙලා, ඒ උද්ඝෝෂණයට මුහුණ දුන්නා. කිසි කෙනෙකුට හානියක් වෙලා නැහැ; කාටවත් කඩු පොලුවලින් ගහලා නැහැ; තුවාල කරලා නැහැ. උද්ඝෝෂණ කිරීමේ නිදහස දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order, please! Will an Hon. Member propose the Hon. Shehan Semasinghe to the Chair?

ගරු රුවන් විජයවර්ධන මහතා (ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ருவன் விஜயவர்தன - பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Ruwan Wijayawardene - State Minister of Defence)

I propose that the Hon. Shehan Semasinghe do now take the Chair.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය.
அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு செஹான் சேமசிங்க அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. SHEHAN SEMASINGHE *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

කථා කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

පොලීසිය ඒ විධියට ඒ උද්ඝෝෂණය විසුරුවන්නට කටයුතු කර තිබෙනවා. එම නිසා යම් කිසි අපහසුතාවකට පත් වුණා නම්, පොලීසිය භාර නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට මම විශේෂයෙන් මාර්ගයේ ගමන් කරන ජනතාවගෙන් සමාව අයැද සිටිනවා. "මේක හැම දාම ඇදගෙන යන්නට එපා" කියන ඉල්ලීමයි මම ශිෂ්‍යයින්ගෙන් කරන්නේ. මේ තුළින් ඔබතුමන්ලා නොදකින විශාල පිරිසක් අපහසුතාවට පත් වෙනවා. විශේෂයෙන් මාර්ගයේ ගමන් කරන රජයේ සේවකයන් වෙන්නට පුළුවන්; එදිනෙදා මාර්ගයේ ගමන් කරන ජනතාව වෙන්නට පුළුවන්; වෘත්තිකයන් වෙන්නට පුළුවන්, ඔවුන්ගේ කාලය නාස්තිවීම හරහා රටට විශාල පාඩුවක් සිද්ධ වෙනවා. මම ඒ සම්බන්ධවත් මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය සතියක සති එකහමාරක කාලය ඇතුළත අවස්ථා තුනකදී පොලිස් දෙපාර්තමේන්තුවට පුළුවන් වුණා, මත් ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් අත් අඩංගුවට ගන්න. රුපියල් කෝටි දෙකහමාරකට ආසන්න මුදලක් වටිනා කේරළ ගංජා කිලෝ දෙකහමාරක් නාකොටික් අංශය විසින් අත් අඩංගුවට ගත්තා. ඒ වාගේම STF එකෙන් කෝටි දෙකහමාරකට ආසන්න මුදලක් වටිනා, හෙරොයින් කිලෝ දෙකහමාරක් අත් අඩංගුවට ගත්තා. ඒ වාගේම දවස් දෙකකට කලින් පැලියගොඩ ප්‍රදේශයේදී තවත් හෙරොයින් ප්‍රමාණයක් අත් අඩංගුවට ගත්තා. මේ විධියට අද විශාල වශයෙන් වැටලීම් කර අන්තරායක මත් ද්‍රව්‍ය අත් අඩංගුවට ගන්නට පුළුවන් වුණා. අපේ රටේ තරුණයන්, අපේ රටේ දූ දරුවන් විනාශ කරන මේ මත් ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් කෙටි කාලයකදී අත් අඩංගුවට ගන්නට ලැබීම ගැන අපි සතුටු වෙනවා.

මත් ද්‍රව්‍ය මර්දනය කර පමණක් ප්‍රමාණවත් නැහැ. මේවා මුලිනුපුටා දමන්නට ඕනෑ. අධිකරණ ඇමතිතුමියත් එක්ක ඉදිරියේදී සාකච්ඡා කර මේ සම්බන්ධ නීති රීති දැඩි කරන්නට ඕනෑ. අපි එදා කණ්ඩායම් රැස්වීමේදීත් මේ ගැන සාකච්ඡා කළා. මත් ද්‍රව්‍ය ජාවාරමේ යෙදෙන ප්‍රධාන ජාවාරම්කරුවන් අධිකරණයට ගෙනැවිත් දඬුවම් දීම පමණක් මදි. පුළුවන් නම්

මරණ දඬුවම ගෙනැල්ලා හෝ මේ කටයුතු නිම කරන්නට ඕනෑ. එදා මංගල සමරවීර ඇමතිතුමා කිව්වා, මරණ දඬුවමට විරුද්ධ වුණත් - මත් ද්‍රව්‍ය කියන කාරණයේදී මහා පරිමාණ ජාවාරම්කරුවන්ට මරණ දඬුවම දෙන්නට වුණත් එතුමා එකඟතාව පළ කරනවා කියා. ඒ විධියට අපි දැඩි තීන්දු ගන්නට ඕනෑ. එසේ නැත්නම් අපේ අනාගත පරපුර විනාශයෙන් විනාශයට පත් වෙලා යනවා.

පොලීසිය ගැන කථා කරද්දී කියන්නට ඕනෑ, කිරිවෙහෙර නායක ස්වාමීන් වහන්සේට වෙඩි තැබීම සම්බන්ධයෙන් සියලු තොරතුරු සොයා ගෙන සැකකරුවන් අත් අඩංගුවට ගන්නට පුළුවන් වුණාය කියන එක. ඊට අදාළ ආයුධ අත් අඩංගුවට ගන්න පුළුවන් වුණා. හැබැයි සමහරු කිය කියා යනවා, "අද ස්වාමීන්වහන්සේ කෙනෙකුටත් ආරක්ෂාව නැහැ "කියා. ඒක තනිකර පෞද්ගලික කෝන්තරයක්; එසේ නැත්නම් කිරිවෙහෙර පූජා භූමියේ තිබෙන මහසෙන් දේවාලය බෙදා ගැනීම පිළිබඳ කෝන්තරයක්. ඒ කෝන්තරය නිසා තමයි ඒ හිටපු කපු මහත්තයා ස්වාමීන් වහන්සේට වෙඩි තියන්න සැලසුම් කරන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසාන කරන්න.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

හැබැයි අපට මතකයි, කෝට්ටේ රජමහා විහාරයේ ස්වාමීන් වහන්සේලා දෙනමක් කපා කොටා ඝාතනය කිරීමක් සිදු වුණා, 2012 වර්ෂයේදී. ඒ අතීතය අමතක වුණ අය අද කියනවා, "අද ස්වාමීන් වහන්සේ නමකටවත් ආරක්ෂාව නැහැ" කියා. ඒක වැරදි කතන්දරයක්. එම නිසා අතීතය අමතක වුණ අයට ඒ කාලයේ සිද්ධ වුණ දේවල් අපි මතක් කර දෙනවා. ඒ සැකකරුවා අත් අඩංගුවට ගත්තා. ඒ සැකකරුවා වැලිකඩ බන්ධනාගාරයේදී ඝාතනය වුණා, වැලිකඩ බන්ධනාගාර සිද්ධියේදී. ඒ වාගේ සිදුවීම් වෙලා තිබෙනවා, 2015 වර්ෂයට පෙර. අද පොලිස් දෙපාර්තමේන්තුව ඉතා කෙටි කාලයකින් මේ සැකකරුවන් අත් අඩංගුවට අරගෙන නීතිය හමුවට පමුණුවා තිබෙනවා.

විශේෂයෙන් මේ පනත් කෙටුම්පත ගෙන ඒම සම්බන්ධයෙන් ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙන අතර, මට කාලය ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.
ඊළඟට, ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

[අ.භා. 4.05]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් සයිටම් අර්බුදය සම්බන්ධව යම් විසඳුම් ක්‍රියාවලියක් ගෙන ඒමට ආණ්ඩුව අවශ්‍ය කටයුතු කිරීම ගැන මම අද දවසේ සන්තෝෂ වෙනවා. මම මේ සම්බන්ධව පාර්ලිමේන්තුව තුළත්, පාර්ලිමේන්තුවෙන් පිටතත් කථා කළා. ඒ විතරක් නොවෙයි. මේ ප්‍රශ්නය අවසන් කරන්න කියලා කැබිනට් මණ්ඩලයේත් අපි දිගින් දිගටම කථා කළා ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමාට මතක ඇති. මොකද, මේ ආණ්ඩුව අවුරුදු දෙකක් මේ ප්‍රශ්නයත් එක්ක හිටියා. මිනිසුන් පාරට බැහැලා, විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් 2016 වසරේ දෙසැම්බර් මාසයේ සිට මාස 5 1/2ක් අධ්‍යයන කටයුතුවලින් ඉවත් වෙලා, ලංකාවේ තිබෙන සියලුම විශ්වවිද්‍යාල වසා දැමූ වාගේ තත්ත්වයකට පත් වෙලා තිබුණා. අපි දිගින් දිගටම කිව්වා, "කරුණාකර මේ ප්‍රශ්නයට විසඳුමක් ගෙනෙන්න." කියලා. හැබැයි, කියන්න කනගාටුයි, අපේ හිටපු උසස් අධ්‍යාපන ඇමතිතුමාත්, අපේ වර්තමාන සෞඛ්‍ය ඇමතිතුමාත් ඉතාම දැඩි ලෙස මේ සම්බන්ධව මැදිහත් වීමේ ප්‍රතිඵලය වශයෙන් තමයි මේ ප්‍රශ්නයට විසඳුමක් සොයා ගැනීමට බැරි තත්ත්වයට පත් වුණේ. ඉතාම නරක විධියට, කල්පනා නොකර මේවාට අතගැසීම නිසා තමයි මේ ප්‍රශ්නය ඇති වුණේ. ඔබතුමා ඉගෙන ගත්ත කෙනෙක්; ඒ වාගේම උසස් අධ්‍යාපන අමාත්‍යාංශය පිළිබඳ ඉතාම හොඳින් වැඩ කරන්න පුළුවන් කෙනෙක්; නීතිඥයෙක්. ඒ විතරක් නොවෙයි. යම් කාරණයක් තේරුම් කර දිය හැකි, මහන්තත්ත්වකම් කියවන්නේ නැතිව අඩු තරමේ අහගෙන ඉඳලා ඒකට උත්තරයක් දෙන්න පුළුවන් කෙනෙක් නිසා මම හිතනවා ඔබතුමාට මේ විශ්වවිද්‍යාල පිළිබඳව යම් අවබෝධයක් ඇතිව කටයුතු කරන්න පුළුවන් වෙයි කියලා. මේ ක්‍රියාදාමය තුළ මම ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. එතුමා අතිගරු ජනාධිපතිතුමා පත් කළ කමිටුවේ සාමාජිකයෙක් විධියට, නැත්නම් ප්‍රධානියා විධියට වැඩ කරලා මේ සම්බන්ධව යම් විසඳුම් ක්‍රියාවලියක් ගෙනාවා. ඒ ක්‍රියාවලියේ තව පියවර ගණනාවක් ක්‍රියාත්මක කිරීමට තිබෙනවා. ඒකයි මම ඒ සම්බන්ධයෙන් මෙතැනදී ඔබතුමාට විශේෂයෙන් මතක් කරන්නේ. ඔබතුමාට කලින් හිටපු අමාත්‍යතුමා -අපේ ලක්ෂ්මන් කිරිඇල්ල අමාත්‍යතුමා- 2018.05.25වැනි දින ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ගෙනාවා. මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්නේ නැතිව තවම මේ පාර්ලිමේන්තුවේ තියාගෙන ඉන්නවා.

අපිත් 1988 විශ්වවිද්‍යාල අරගලවලට සම්බන්ධ වෙලා හිටපු අය. අපේ පරණවිතාන මැතිතුමාත් දන්නවා. 1981 වර්ෂයේ ධවල පත්‍රිකාව ගෙනැත්, ඒකට විරුද්ධව උද්ඝෝෂණය කරනවා අපට මතකයි. එතකොට අපි හයේ පන්තියේ, හතේ පන්තියේ විතර හිටියේ. ඒ කාල වකවානුව තුළත් මේ විධියටම පනත් කෙටුම්පතක් ගෙනැත් තියාගෙන ඉඳලා ඒකෙන් කොටස්, කොටස් පාර්ලිමේන්තුව ඇතුළට ගෙනෙන්න පටන් ගත්තා. ඒක ලංකාවේ විශ්වවිද්‍යාල තුළ විතරක් නොවෙයි, ලංකාවේ අධ්‍යාපන ක්‍රමවේදය තුළත් ස්ථාපිත කරන වැඩ පිළිවෙළක් සකස් කෙරුවා. එම නිසා මම ඔබතුමාගෙන් පළමුවෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා, මේ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ඉවත් කරගෙන, ඉන් පසුව පාර්ලිමේන්තුව ඇතුළේ ඒ සම්බන්ධව විශේෂ සාකච්ඡා වට කිහිපයක් පවත්වමු කියලා. එතකොට අපට මේ සම්බන්ධව යම් අදහසක් දීලා සමස්ත ක්‍රමවේදය ගැන යම් අවබෝධයකට එන්න පුළුවන් වෙයි. ඒ නිසා පළමුවෙන් කළ යුත්තේ මේ ක්‍රියාදාමයයි. 1981 ධවල පත්‍රිකාව ගෙනැත්, ඒ නිසා ඇති වුණු උද්ඝෝෂණ, විරෝධතා නිසා ධවල පත්‍රිකාව අකුලා ගත්තා. හැබැයි, ක්‍රමානුකූලව ඉතිහාස විෂය අපේ විෂය ධාරාවෙන් ඉවත් වුණා. අර ධවල පත්‍රිකාවේ තිබුණ කාරණා එකින් එක හෙමිහිට ක්‍රමානුකූලව නැවත මේ රට ඇතුළේ ස්ථාපිත කළා. එම නිසා මේ පනත් කෙටුම්පත ඉවත් කරගෙන අපි සාකච්ඡා කරමු කියලා මම ඔබතුමාට පළමුවෙන්ම කියන්න කැමැතියි.

මේ විශේෂ විධිවිධාන පනත් කෙටුම්පත හදන්න මහන්සි වුණු අයට, -ඔබතුමා නොවෙයි- මූලික කාරණාවක් අමතක වෙලා

[ගරු දයාසිරි ජයසේකර මහතා]

තිබුණා. එම මූලික කාරණාව මේ පනත් කෙටුම්පතට ඇතුළත් කර තිබුණේ නැහැ. පැවැති සාකච්ඡාවල ප්‍රතිඵලයක් විධියට අද දෙවැනි පිටුවේ දොලොස්වැනි ජේළියට ඉක්බිතිව පහත දැක්වෙන කොටස ආදේශ කරන්න කියලා "සයිටම් වෛද්‍ය පීඨය ක්‍රියාත්මක වීම අවසන් වීම" ඇතුළත් කර තිබෙනවා. මම මේ පිළිබඳ ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ කොටස ඇතුළත් කරන්න සංශෝධනයක් ගෙනෙන තෙක්ම ඉන්න වුණා. මම දන්නේ නැහැ කවුද මේවා හදන්නේ කියලා. ආණ්ඩුවකට එන කළු ලපයක් විධියට තමයි මම මේක දකින්නේ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(*මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ*)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවසර දෙන්න. මෙම පනත් කෙටුම්පත හැදීමේ වගකීම අපි ගන්නවා. අපි සියලු පාර්ශ්ව එක්ක සාකච්ඡා කරලා එම ශිෂ්‍යයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කිරීමට එකඟ වුණා. මේ SAITM කියන ආයතනයේ වෛද්‍ය පීඨය අහෝසි කළොත් අන්තර්ග්‍රහණයක් කරන්න බැහැ. ඒක තමයි නීතිය. නොපවතින ආයතනයකින් ශිෂ්‍යයන් අන්තර්ග්‍රහණය කරන්නේ කොහොමද? ඒක නිසා ශිෂ්‍යයන් අන්තර්ග්‍රහණය කරනතෙක් මෙම ආයතනය තිබෙන්න ඕනෑ. ඒක අහෝසි කිරීම පාර්ලිමේන්තුවට ගෙනැල්ලා නීතියක් මඟින් සම්මත කරන්න ඕනෑ බරපතළ දෙයක් නොවෙයි. ඒක ඇමතිවරයාට ගැසට් නිවේදනයකින් කරන්න පුළුවන් දෙයක්. විශ්වවිද්‍යාල ප්‍රජාව සහ යම් යම් පාර්ශ්ව මේ පිළිබඳව තවදුරටත් යම් බියක් දක්වන නිසා, සැකයක් දක්වන නිසා තමයි බොහොම පැහැදිලිව මේ නීතිය කෙටුම්පත් කළේ. මේ සංශෝධන ගෙන එන්නේ වෙන දේකට නොවෙයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සැක දුරු කරන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*මාණ්පුමිකු තයාසිරි ජුයසේකර*)
(The Hon. Dayasiri Jayasekara)

ඔබතුමා කරපු දේ හොඳයි. මේ පනත් කෙටුම්පතටම SAITM එක අහෝසි කිරීම ඇතුළත් කරන්න තිබුණා. ප්‍රශ්නයක් නැහැ. ඔබතුමා කියන විධියට ගැසට් නිවේදනයක් මඟින් අහෝසි කරන්න පුළුවන්. හැබැයි, ඒ තරම් විශ්වාසයක් නැතුව ගියා. මොකද හේතුව, SAITM එකට විරුද්ධව විතරක් මේ රටේ වෛද්‍ය විද්‍යාල ශිෂ්‍යයන් සහ අනෙකුත් ශිෂ්‍ය ව්‍යාපාර දින 410ක් පාරේ ඉඳලා තිබෙනවා. ඒකෙන්ම පෙනෙනවා මේ ආණ්ඩුවට එම ප්‍රශ්නය විසඳා ගන්න බැරි තරමට එය කොයි තරම් බරපතළ කාරණයක්ද කියලා. මේ ගැන අපි කැබිනට් මණ්ඩලයේදී පුළුවන් තරම් කථා කළා. මේකට රණ්ඩු කළා. හැබැයි, අපි කියපු දේවල් සත පහකට ගණන් ගත්තේ නැහැ. අද ඔබතුමා ඒවාට කන් දීලා තිබෙනවා. මේ ක්‍රියාදාමය පිළිබඳව ශිෂ්‍ය ප්‍රජාවට තිබෙන අවිශ්වාසය නිසාම තමයි අඩුම තරමේ මේවා ඇතුළත් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. මොකද, විශ්වාසයක් නැහැ. මේ කියනවා, "හෙට SAITM එක අහෝසියි" කියලා. පසුවදා උදේ SAITM එකේ ප්‍රශ්නයට වෙනත් විසඳුමක් ගෙනැල්ලා දානවා. ඒක තමයි සිද්ධ වුණේ. ඒ බිය දුරු කිරීම සඳහා ඔබතුමා මේ ගෙනා ක්‍රියාදාමයට මම ස්තුතිවන්ත වනවා.

ගරු ඇමතිතුමනි, අනෙක් කාරණය තමයි අවම ප්‍රමිතීන්. වෛද්‍ය අධ්‍යාපනයේ අවම ප්‍රමිතීන් පිළිබඳව කථා කරපුවාම, රෝගීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ ක්‍රියාදාමය ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ අධීක්ෂණය හරහා සිද්ධ විය යුතුයි කියන කාරණය පනත් කෙටුම්පතට ඇතුළත් විය යුතුයි කියලා මා විශ්වාස කරනවා. මොකද, මේ බලය සම්පූර්ණයෙන්ම ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට දුන්න ගමන් මොකද වෙන්නේ? ඒ සම්බන්ධව පනත් කෙටුම්පතේ 2. (ඇ) උප වගන්තිය යටතේ මෙසේ සඳහන් වනවා:

> "මූලික සුදුසුකම් සහිත හා නියමිත දින හෝ ඊට පෙර සයිටම් හි එම්බීබීඑස් උපාධිය ප්‍රදානය කිරීම සඳහා වන අධ්‍යයන වැඩසටහන සම්පූර්ණ කර ඇති ශිෂ්‍යයන්ට ඒ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ කළමනාකාරීත්ව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි නියමයන්....."

ගරු ඇමතිතුමනි, වෛද්‍ය අධ්‍යාපනයේ අවම ප්‍රමිතීන් තීරණය කරන ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ අධීක්ෂණය යටතේ මෙය සිද්ධ වුණා නම් හොඳයි කියලා මම විශ්වාස කරනවා. එය මා යෝජනා කරනවා. එමඟින් මේකට යම් ශක්තියක් වෙයි. මොකද, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට මේ බලය ලැබීම තුළ ඕනෑම දෙයක් කරන්න පුළුවන් වාතාවරණයක් සකස් වෙයි කියන බියක් සියලුම ප්‍රජාව තුළ තිබෙනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(*මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ*)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව මම පැහැදිලි කිරීමක් කළා. මම හිතන විධියට ඒ වෙලාවේ ඔබතුමා සභාවේ හිටියේ නැහැ. දැන් මේ ප්‍රතිපාදනය තිබෙන්නේ, SAITM එකෙන් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කරනු ලබන ශිෂ්‍යයින්ට. එම ශිෂ්‍යයින් විශ්වවිද්‍යාලයේ අධ්‍යාපනය ලැබූ මට්ටමට, ඒ ආකාරයට කොතලාවල විශ්වවිද්‍යාලයට ගන්න බැඳීමක් නැහැ. ඒක නිසා එම අධ්‍යයන අංශයේ විශේෂඥ කණ්ඩායමක් විසින් එම ශිෂ්‍යයින් ලැබූ අධ්‍යාපනය සහ සායනික පුහුණුවේ ප්‍රමාණය තක්සේරුවක් කරලා, ඒ තක්සේරුව මත තමයි පළමුවැනි වසරද, දෙවැනි වසරද, තුන්වැනි වසරද, හතරවැනි වසරද යනාදී වශයෙන් මොන වසරද කියලා තීරණය කරන්නේ.

ඊළඟට, SAITM එකෙන් උපාධිය සම්පූර්ණ කරපු උදවියට ස්වයංක්‍රියව අන්තර්ග්‍රහණය කිරීම තුළ උපාධි සහතිකයක් දෙන්නේ නැහැ. ඒ උදවියගේත් අධ්‍යාපන මට්ටම සහ සායනික පුහුණුව බලලා, තව කොපමණ ප්‍රමාණයක් ඒ අය අධ්‍යයනය සහ පුහුණුව ලබන්න ඕනෑද කියලා තීරණය කරලා, ඒ පුහුණුව සහ අධ්‍යයනය ලබා දීමෙන් අනතුරුව පමණයි ඒ උපාධියට හිමිකම් ලබන්නේ. ඒ පිළිබඳව එම වෛද්‍ය පීඨයේ විශේෂඥ මණ්ඩලයට තමයි දැනීම තිබෙන්නේ. එම මණ්ඩලයට තමයි ඒ බලය අපි මෙමඟින් පවරා තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*මාණ්පුමිකු තයාසිරි ජුයසේකර*)
(The Hon. Dayasiri Jayasekara)

ගරු ඇමතිතුමනි, දැන් තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. මේ issue එක පිළිබඳව පමණක් ඔබතුමා ඔය කියන කාරණය සාර්ථක වෙන්න පුළුවන්. මෙතැනින් එහාට ගිහිල්ලා-

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(*මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ*)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මේ පනත් කෙටුම්පතේ පැහැදිලිව කියා තිබෙනවා, මෙම (විශේෂ විධිවිධාන) පනත අදාළ වන්නේ මේ සිසුන් 900 ගණනට පමණයි කියලා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(*මාණ්පුමිකු තයාසිරි ජුයසේකර*)
(The Hon. Dayasiri Jayasekara)

එහෙම නම් ප්‍රශ්නයක් නැහැ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මෙම පනත් කෙටුම්පතේ ඒ බව පැහැදිලිවම කියනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම නැත්නම් අපි නොදැනුවත්වම වෛද්‍ය සභාවේ අධීක්ෂණයකින් තොරව වෛද්‍ය පීඨයක් බිහි වෙනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
නැහැ, එහෙම වෙන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමනි, දැනටත් එහි වෛද්‍ය පීඨයක් තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔව්, තිබෙනවා. මම දන්නවා. නමුත් වෛද්‍ය සභාවේ අධීක්ෂණයකින් තොරව කටයුතු කිරීම තුළ, General Sir John Kotelawala Defence University එකට අනාගතයේදී වෙනම ඉස්සරහට යන්න පුළුවන් වාතාවරණයක් ඇති වෙන්න පුළුවන් කියන කාරණයයි මම සඳහන් කරන්නේ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමනි, මම කලින් ඒ ගැන පැහැදිලි කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පනතින් ලැබී තිබෙන බලතල අනුව, ශ්‍රී ලංකා වෛද්‍ය සභාවට තිබෙන්නේ යම් විශ්වවිද්‍යාලයකින් වෛද්‍ය උපාධියක් ලැබූ ශිෂ්‍යයෙක් වෛද්‍ය වෘත්තියට ඇතුළත් කර ගැනීමට සුදුසු ද, නැද්ද කියා තීන්දු කරලා, ලියා පදිංචි කරන බලතල තමයි. වෛද්‍ය සභාවට අයිතියක් තිබෙනවා, මොන විශ්වවිද්‍යාලයේ මොන ප්‍රමිතිය තිබෙන උපාධියක්ද භාර ගන්නේ, මොන උපාධියක්ද ප්‍රතික්ෂේප කරන්නේ කියලා ස්වාධීනව තීන්දුවක් ගැනීමට. එම ස්වාධීන අයිතියට මෙයින් කිසි බාධාවක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම, අපි නීති උපාධිය සමත්වෙලා නීති විද්‍යාලයට ගියාම, Council of Legal Education එකෙන් තමයි තීරණය කරන්නේ අපේ උපාධිය භාර ගන්න එකක්ද, නැද්ද කියලා. ඒ ගැන ඔබතුමාත් දන්නවා. ඒකට සමාන ක්‍රමයක් තමයි වෛද්‍ය සභාවේත් තිබෙන්නේ. විශ්වවිද්‍යාල අධ්‍යාපනය academic. අනෙක් එක professional, වෘත්තීයමය. ඒ අනුව, විශ්වවිද්‍යාල අධ්‍යාපනය ලබා දීමේ ක්‍රමවේද පිළිබඳව අධීක්ෂණය කිරීමේ කිසිම බලයක් වෛද්‍ය සභාවට නැහැ. හැබැයි, ඒකට ස්වාධීන බලයක් තිබෙනවා, ඒ උපාධිය පිළිගන්නවාද නැද්ද කියලා තීන්දු කරන්න. මෙහිදීත්, මේ උපාධිය අරගෙන ගියාම, එහි තිබෙන සුදුසුකම් සහ මොන සුදුසුකම් ඇතුවද උපාධියට ඇතුළත් වෙලා තිබෙන්නේ කියලා ස්වාධීනව තීරණයක් අරගෙන ඒ ගොල්ලන් කටයුතු කරනවා. ඒ ගොල්ලන්ගේ බලයට කිසිම හානියක් වන දෙයක් මේ පනත් කෙටුම්පත තුළ නැහැ. ඒ අයට අධීක්ෂණය කිරීමේ බලයකුත් නැහැ. ඒක තමයි ලෝකයේ හැම රටෙම තිබෙන ක්‍රමවේදය.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හොඳයි. ඒ පිළිගැනීම තුළ -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය දැන් අවසාන වෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට ලබා දී තිබෙන කාලයෙන් නොවෙයි, ඇමතිතුමාට ලබා දී තිබෙන කාලයෙන් -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලයෙන් ගරු දයාසිරි ජයසේකර මැතිතුමාට කථා කිරීමට කාලය දෙනවාද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මට ලබා දී තිබෙන කාලයෙන් නොවෙයි, අපේ පැත්තට ලබා දී තිබෙන කාලයෙන් එතුමාට විනාඩි දෙකක් දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, මේ පිළිබඳව සැක සංකා දුරු කිරීම දැන් ඔබතුමාට තමයි කරන්න වෙලා තිබෙන්නේ. මීට සම්බන්ධව ඉතිහාසය තුළ වූ රැවටීම් ටික දැන් ඔබතුමාට හඳුන්නයි වෙලා තිබෙන්නේ. ඒකයි මේ සැක සංකා මතු වෙන්නේ.

ඒ වාගේම, තවත් කාරණයක් මම ඔබතුමාට කියන්න කැමැතියි. විශේෂයෙන්ම අද රටේ තත්ත්ව සහතිකකරණය පිළිබඳව විශාල අර්බුදයක් තිබෙනවා. මේ උපාධි ගත්තාම, ඒ උපාධි නියම තත්ත්වයේ තිබෙනවාද? MBBS උපාධිය අරගෙන බලන්න. අපේ රටේ දොස්තරවරුන් බිහි වෙනවා, ඒ වාගේම තවත් විවිධ උපාධි අරගෙන විවිධ අය බිහි වෙනවා. හැබැයි, ඒ මිනිස්සු රක්ෂා ඉල්ලාගෙන පාර දිගේ ඇවිදිනවා. එක පැත්තකින් කියනවා, අධ්‍යාපනය හොඳයි කියලා. ඒ සඳහා විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් වෙනවා. හැබැයි, විශ්වවිද්‍යාලවලට ඇතුළත් වුණු සිසුන් එළියට එනකොට, ඒ අයට රක්ෂා නැහැ. ඒ අය පාර දිගේ "රක්ෂා දියව්" කියලා ආණ්ඩුවෙන් රක්ෂා ඉල්ලන තැනට දැන් පත් වෙලා තිබෙනවා. මම ඒ ටික කිව්වේ මේ පනත් කෙටුම්පතේ කරුණුවලට අදාළව නොවෙයි. ගරු ඇමතිතුමනි, ඒ නිසා මම ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලන්නේ තත්ත්ව සහතිකකරණය පිළිබඳව යම් විධිවිධාන ඇතුළත් වැඩ පිළිවෙළක් වහාම ස්ථාපිත කරන්න කියලායි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මුලින් කරුණු දක්වන අවස්ථාවේදීම ඒ ගැන පැහැදිලි කිරීමක් කළා. මේ වනවිටත් -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට කථා කිරීමට අමතර කාලයක් ලබා දෙන්නද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විනාඩියකට වඩා ගන්නේ නැහැ.

මම ඒ ගැන පැහැදිලි කළා. දැනටමත් අපි තත්ත්ව සහතිකය සහ ප්‍රතිතනය -quality assurance and accreditation- පිළිබඳව කෙටුම්පතක් හදලා තිබෙන්නේ. එහෙම පනතක්, එහෙම නීතියක් ක්‍රියාත්මක වුණා නම්, මේ වාගේ ප්‍රශ්නයක් මේ රටේ ඇති වෙන්නේ නැහැ. ඉදිරි සති කිහිපය ඇතුළත ඔබතුමන්ලාට අධ්‍යයනය කිරීම සඳහා අපි එම පනත් කෙටුම්පතේ පිටපත් ලබා දෙන්න කටයුතු කරන්නම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විනාඩියකින් මගේ කථාව අවසන් කරන්නම්.

ගරු ඇමතිතුමනි, මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා ගෙනෙන්න හදන ඒ වැඩ පිළිවෙළ ඇත්තවශයෙන්ම මීට අවුරුදු ගණනකට කලින් ගෙනෙන්න තිබුණු දෙයක්. මොකද, ලංකාවේ විශ්වවිද්‍යාලවල ප්‍රමිතිය පිළිබඳව විශාල අර්බුදයක් තිබෙනවා; පිළිගත් පාඨමාලා පිළිබඳ අර්බුදයක් තිබෙනවා. ඒ නිසා, එහෙම ක්‍රියාදාමයක් හැදුවොත් පමණයි අනාගතයේදී විශ්වවිද්‍යාලයෙන් එළියට එන දරුවා රටට වැදගත් වන පුද්ගලයකු විධියට පාවිච්චි කරන්න පුළුවන් වෙන්නේ. නැත්නම් වෙන්නේ ඔහු පාරේ උද්ඝෝෂණ කරන්නකු බවට පත්වීම පමණයි. ඒ නිසා මම ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා, එම ක්‍රියාදාමය ඉස්සරහට ගෙනයෑම පිළිබඳව. මේ පිළිබඳ අවශ්‍ය කටයුතු කිරීම ගැන ගරු ඇමතිතුමාට ස්තුතිය සහ ගෞරවය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මිනිත්තු හතක කාලයක් වෙන්ව තිබෙනවා.

[අ.භා.4.19]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සයිටම් ප්‍රශ්නය ගැන අපි දන්නවා. එය, මේ රටේ විශාල ආන්දෝලනයකට තුඩු දුන් ප්‍රශ්නයක්. ශිෂ්‍යයන් අතර වාගේම මේ රටේ -සමාජයේ- හැම තැනම කථාබහ කරපු ගැටලුවක් හැටියට පසුගිය කාලයේ අපි එය දැක්කා. විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ මහත්මයාගේ පාලන කාලයේදී තමයි සයිටම් කියන පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය පටන් ගත්තේ. කොහොම වුණත්, මහින්ද රාජපක්ෂ මහත්මයා පටන් ගත්ත ඒ දෙයට අන්තිමට අපට තමයි විසඳුමක් දෙන්න සිද්ධ වුණේ. මහින්ද රාජපක්ෂ මහත්මයා මේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය පටන්ගෙන, ඒ ප්‍රශ්නය විසඳන්නේ නැතුව ප්‍රශ්නය එහෙමම තියලා ගියා. අද ඒකාබද්ධ විපක්ෂයේ ඉන්න උදවිය කවුරුත් එදා මෙයට විරුද්ධව කථා කළේ නැහැ. එදා මේ සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලය තුළ අරගළ කළේත් නැහැ; පාර්ලිමේන්තුවේ කථා කළේත් නැහැ; පළාත් සභාවල කථා කළේත් නැහැ; මහ ඇමතිවරු කථා කළේත් නැහැ. එදා ඒ සියලුදෙනාම නිශ්ශබ්දව සිටියා, ගෝඨාභය රාජපක්ෂ මහත්මයාටත්, මහින්ද රාජපක්ෂ මහත්මයාටත් බයේ. අද අපේ ආණ්ඩුවට ඒ ප්‍රශ්නය දමලා, හරියට අපි හදපු ළමයකු හැටියට අප අල්ලාගෙන හංවඩු ගහන්න හදනවා. මේ ප්‍රශ්නය අපේ ඇහේ තියලා තළන්න හදනවා. එදා සයිටම් ගෙනාපු එස්.බී. දිසානායක හිටපු උසස් අධ්‍යාපන ඇමතිතුමා අද පාර්ලිමේන්තුවට ඇවිල්ලාත් නැහැ. එතුමා තමයි සයිටම් ගෙනාවේ. එතුමා අද ඒකාබද්ධ විපක්ෂයට ගිහින් ඉන්නවා. මාස දෙකකට කලින් එතුමා අපේ පැත්තේ ඉන්නකොට සයිටම් එකට පක්ෂව කථා කළා. අද එතුමා ඇවිල්ලා සිටියා නම් අපට අහගන්න තිබුණා, - [බාධා කිරීමක්] පක්ෂව? [බාධා කිරීමක්] ඔව්, ඒක තමයි. එතුමා අද මේ සභාවට ඇවිල්ලා මෙයට පක්ෂව එතුමාගේ අදහස කිව්වා නම් හුඟක් හොඳයි. ඒත් එතුමා අද ආවේ නැහැ. - [බාධා කිරීමක්] ඒක තමයි. එතුමා අද මේ සභාවට ආවා නම් -

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමා ලංකාවේ නැහැ.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
එතුමා අද මේ සභාවට ආවා නම් ඔබතුමන්ලාට එතුමාගෙන්ම මේ ගැන lecture එකක් ගන්න තිබුණා. මේ අහපු ප්‍රශ්න ඔක්කොම එතුමාගෙන්ම අහගන්න තිබුණා. මොකද, එතුමා නේ මේ සයිටම් එක ගෙනාවේ. අපි නොවෙයි නේ සයිටම් ගෙනාවේ. ඒක ගෙනාවේ එතුමා. එතුමා හිටියා නම් දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමාට එස්.බී. දිසානායක මන්ත්‍රීතුමාගෙන් අහගන්න පුළුවන්, ඇයි සයිටම් ගෙනාවේ, මේ ප්‍රශ්න කොහොමද මතු වෙන්නේ කියලා. දැන් විජයදාස රාජපක්ෂ මහත්මයාගෙන් ප්‍රශ්න ඇහුවා වාගේ ඒ හැම කාරණයක් ගැනම එස්.බී. දිසානායක මහත්මයාගෙන් අහගන්න තිබුණා. නමුත් අද එහෙම එකක් සිද්ධ වුණේ නැහැ. සයිටම් එක ගෙනාපු එස්.බී. දිසානායක මහත්මයා අද -

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මගේ නම සඳහන් කළ නිසායි මා මේ කාරණය කියන්නේ. මෙය වරදවා තේරුම් ගන්න එපා. එස්.බී. දිසානායක මැතිතුමා තවමත් ඒ මතයේමයි ඉන්නේ. එතුමා අද ලංකාවේ නැහැ. එතුමා සිටියත් එතුමාගේ ඒ අදහසට මා විරුද්ධයි. මා එදාත් විරුද්ධයි; අදත් විරුද්ධයි. සයිටම් එකට මා එදාත් විරුද්ධයි; අදත් විරුද්ධයි. එස්.බී. දිසානායක ඇමතිතුමා ගැන නොවෙයි, ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා ගැන ඔබතුමා මීට වඩා කථා කරන්න.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

ඔබතුමා අද ඒ අදහසට විරුද්ධ වන එක ගැන නම් මා දන්නවා. ඔබතුමා එදා විරුද්ධ වුණු එක ගැන නම් අපි දැනගෙන සිටියේ නැහැ. ඔබතුමා අද විරුද්ධ වන එක අපි දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා කිව්වා වාගේ එතුමා අද විරුද්ධ වන එක ගැන අපි දන්නවා. අපට ඇහුණා, අද විරුද්ධ වන එක. හැබැයි, එදා විරුද්ධ වන එක නම් අපට ඇහුණේ නැහැ. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා, සයිටම් එකට පාර්ශ්ව කිහිපයක් විරුද්ධයි කියලා. ඒකාබද්ධ විපක්ෂයේ ප්‍රධාන පෙළේ මන්ත්‍රීතුමන්ලා හැම කෙනෙක්ම සයිටම් එකට විරුද්ධව කථා කළා. බොහෝදෙනෙක් සයිටම් එකට විරුද්ධයි. ඒ වාගේම අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය ඇතුළු සමහර දේශපාලන පක්ෂ මෙයට විරුද්ධයි කියලා අපි දන්නවා. පසුගිය කාලයේ උද්ඝෝෂණ, අරගළ ගෙන ගියේ සයිටම් එකේ ඉන්න ළමයින් රජයේ විශ්වවිද්‍යාලයකට අනුයුක්ත කරන්න කියලායි. දැන් ඒ කටයුත්ත සිද්ධවෙලා තිබෙනවා. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය කියන්නේ රජයේ පාලනය යටතේ තිබෙන විශ්වවිද්‍යාලයක්. ඒ ළමයින් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට ඇතුළත් කරන්න හැදුවාමත් දැන් ඒකටත් විරුද්ධව කෑ ගහනවා. ඒකට විරුද්ධවත් දැන් කථා කරනවා. ඒකට විරුද්ධවත් පෙළපාළි යනවා. පසුගිය කාලයේම උද්ඝෝෂණය කළේ සයිටම් එකේ ඉන්න ළමයින් රජයේ විශ්වවිද්‍යාලයකට අනුයුක්ත කරන්න කියලායි. ඒකට තමයි උද්ඝෝෂණය කළේ. ආණ්ඩුව දැන් ඒ කටයුත්ත කරන්න ගියාමත් පාර්ලිමේන්තුව වට කරනවා; පාර්ලිමේන්තුවට ඇවිල්ලා උද්ඝෝෂණය කරනවා. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයටත් ඒ ළමයින් අනුයුක්ත කරගන්න එපා කියනවා. එහෙම නම් මේ සයිටම් එකේ ඉන්න ළමයින් පාරට දමන්න කියලාද කියන්නේ? මේ ළමයින්ට යන කල දසාවක් නැද්ද? මේ ළමයින් පාරවල් ගානේ රස්තියාදු කරන්නද කියන්නේ? මේ ළමයින් අනාථ කරන්නද කියන්නේ?

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි කථා නොකරන දෙයක් තිබෙනවා. ඒ තමයි, මේ සයිටම් විරෝධී අරගළය තුළ හිටපු ලංකාවේ විශ්වවිද්‍යාලවල ඉගෙන ගන්න ළමයින් 1,000කගේ අධ්‍යාපනය අවුරුදු තුනක් කඩාකප්පල්වෙලා තිබෙනවාය කියන කාරණය. අපි ඒ ළමයින්ට මොකක්ද කරන්නේ? මේ අරගළය පිටි පස්සේ දේශපාලන අරගළයකුත් තිබෙනවා. මෙය යම් කිසි දේශපාලන කටයුත්තක් මත කරන අරගළයක්. අපි දන්නවා, අපි මොන විසඳුම් දුන්නත්, ඒ විසඳුම්වලට ඔවුන් එකඟ නැහැයි කියලා.

අද මේ රටේ පෞද්ගලික විශ්වවිද්‍යාල තිබෙනවා. නීතිය පෞද්ගලික ආයතනවලින් ඉගෙන ගන්න පුළුවන්. කළමනාකරණය පෞද්ගලික ආයතනවලින් ඉගෙන ගන්න පුළුවන්. මේ රටේ ඕනෑම අධ්‍යාපනයක් අපට පෞද්ගලික ආයතනයකින් ලබන්න පුළුවන් නිදහස තිබෙන අපි දන්නවා. ඒ නිදහස නැත්තේ වෛද්‍ය විද්‍යාව ඉගෙන ගන්න විතරයි. අනිකුත් හැම අධ්‍යාපනයක්ම පෞද්ගලිකව පටන් ගන්න පුළුවන් නම්, ඇයි වෛද්‍ය අධ්‍යාපනය පෞද්ගලිකව දෙනවාට විතරක් විරුද්ධ වෙන්නේ?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව මිනිත්තු දෙකක් තිබෙනවා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

බොහොම ස්තුතියි. වෛද්‍ය අධ්‍යාපනය විතරක් පෞද්ගලිකව දෙනවාට විරුද්ධයි. නීතිය දුන්නාට ප්‍රශ්නයක් නැහැ. කළමනාකරණය - management - දුන්නාට කමක් නැහැ. ඉංජිනේරු අධ්‍යාපනය පෞද්ගලිකව දුන්නාට කමක් නැහැ. ඒ හැම එකක්ම පෞද්ගලිකව දුන්නාට කමක් නැහැ. හැබැයි, වෛද්‍ය අධ්‍යාපනය විතරක් පෞද්ගලිකව දෙන්න බැහැ. මේක තුළ දේශපාලන ප්‍රශ්නයක් තිබෙන බව අපට පෙනෙනවා. ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු පසු ගිය කාලය පුරාම මේ සටනට පක්ෂව කථා කළ බව අපි දන්නවා. තමුන්නාන්සේලාගේ කාලයේ මේක පටන් ගත්තේ. නෙවිල් ප්‍රනාන්දු කියලා කියන්නේ, තමුන්නාන්සේලාගේ ජනාධිපති හැටියට හිටපු මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ජනාධිපතිවරණ මැතිවරණවලට අරමුදල් දීපු මනුස්සයෙක්. මහින්ද රාජපක්ෂ මහත්මයා ළමයින් 10 දෙනෙකුට SAITM එකෙන් රුපියල් මිලියන 100ක ශිෂ්‍යත්ව අරගෙන තිබෙනවා. එක් ළමයෙකුට රුපියල් මිලියන 10 ගණනේ ළමුන් 10 දෙනෙකුට ශිෂ්‍යත්ව ලබාගෙන තිබෙනවා. කවුද, දුන්නේ? නෙවිල් ප්‍රනාන්දු මහත්මයා. නෙවිල් ප්‍රනාන්දු මහත්මයා මහින්ද රාජපක්ෂ මහත්මයාගේ රජය කාලයේ SAITM එකෙන් ළමුන් 10දෙනෙකුට ශිෂ්‍යත්ව ලබා දීලා තිබෙනවා. එහෙනම් එතුමන්ලා ඒවාට විරුද්ධ වෙන්නේ ඇයි? අපිට තේරෙන්නේ නැත්තේ ඒකයි. [බාධා කිරීමක්]

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පක්ෂ වෙන්න පුළුවන්. සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා විරුද්ධයි; බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා මරාගෙන මැරෙන්න හදනවා; අජේ දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා මරාගෙන මැරෙන්න හදනවා. ඔබතුමන්ලාගේ කණ්ඩායම් දෙකක් තිබෙන බව අපි දන්නවා. ඔබතුමන්ලාගේ සමහර හිටපු ඇමතිවරුන්ගේ ළමයි SAITM එකට ගිහිල්ලා ඉගෙන ගන්න නිසා සමහර අය එයට පක්ෂ බව අපි දන්නවා. නමුත් සමහර අය විරුද්ධයි. ඔවුන් SAITM එකට විරුද්ධ වන්නේ වෙන මොකක්වත් නිසා නොවෙයි, ඔවුන්ගේ කුහකකම නිසයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසාන කරන්න.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේකට විසඳුමක් ලැබුණත් නුදුරු අනාගතයේ දී අපට විසඳා ගන්න ප්‍රශ්නයක් තිබෙනවා. නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කර ගන්නවා වාගේම මේ රටේ සියලු දෙනාටම අධ්‍යාපනය ලබන්න තිබෙන අයිතියත් අපි පිළිගන්න ඕනෑ. එම පිළිගැනීම උඩ තමයි අපට මේ රටේ ඉස්සරහට යන්න පුළුවන් වන්නේ කියලා මා කියන්න කැමතියි. මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට ගරු කනක හේරත් මන්ත්‍රීතුමා, ඔබතුමාට මිනිත්තු හතක් තිබෙනවා.

[අ.භා.4.27]

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රටේ ව්‍යාකූල තත්ත්වයක් ඇති කරපු ප්‍රශ්නයක් විසඳීම සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම සඳහා අද මේ පාර්ලිමේන්තුවට ගෙන ඒමට කටයුතු කිරීම පිළිබඳව අපි සතුටට පත් වනවා. අපි පසුගිය වසර කීපය තුළදී මේ ප්‍රශ්නය ගැන කථා කළත්, හිටපු උසස් අධ්‍යාපන ඇමතිවරුන් සමඟ අපිට මේ කාරණය සම්බන්ධයෙන් කථා කරන්න බැරි වුණා. හිතුවක්කාර ලෙස තමයි සෞඛ්‍ය ඇමතිතුමා, උසස් අධ්‍යාපන ඇමතිවරු අපේ ප්‍රශ්නවලට උත්තර ලබා දුන්නේ. නියපොත්තෙන් කඩන්න තිබුණු ප්‍රශ්නය විසඳුවේ නැති නිසා තමයි එය වසර ගණනාවක් දුර දිග ගියේ. නමුත් අවසාන වශයෙන් මේ ප්‍රශ්නය නිරාකරණය කරලා, ඒ සඳහා විසඳුමක් ලබා දෙන්න කටයුතු කිරීම අපි මේ අවස්ථාවේ අගය කළ යුතුයි. මේ ප්‍රශ්නය ආපු හැම වෙලාවකදීම ඔවුන් කිව්වා, "ඒකාබද්ධ විපක්ෂය තමයි ආරම්භ කළේ. මහින්ද රාජපක්ෂ මැතිතුමා තමයි ආරම්භ කළේ" කියලා. නමුත් ඇත්ත තත්ත්වය මෙකයි. මේ රටේ සියලුම පුරවැසියන්ට නිදහස් අධ්‍යාපනය ලබා දෙන්න ඕනෑ කියන තැන අපි ඉන්නවා. පෞද්ගලික විශ්වවිද්‍යාල ආරම්භ කරනවාට අපි විරුද්ධ නැහැ. විශ්වවිද්‍යාල ආරම්භ කරලා, එම විශ්වවිද්‍යාල ප්‍රමිතියකට අනුව කටයුතු කරනවා නම් අපි ඒකට එකඟයි. ඒක තමයි අද වනතුරු ආණ්ඩුවේ ඉන්න සමහර මන්ත්‍රීවරුන්ට තේරුම් ගන්න බැරි වුණු කාරණය.

අපි උද්ඝෝෂණය කරන්න කියා සහයෝගය ලබා දුන්නා නම්, අපි එලෙස සහයෝගය ලබා දුන්නේ ප්‍රමිතියකට අනුව කටයුතු කරලා, මේ ප්‍රශ්නය විසඳන්න කියලායි. මේ ප්‍රශ්නය නිසා වසර ගණනාවක් තිස්සේ ශිෂ්‍යයන්ගේ, වෛද්‍යවරුන්ගේ, ආචාර්ය මණ්ඩලයේ, වෘත්තීයවේදීන්ගේ -මේ රටේ සෑම සියලු දෙනාගේම- කාලය, ශ්‍රමය නැති වුණා. මේකට හේතුව හෙව්වේ නැහැ. මේකට පිළිතුර හොයා ගත්තේ නැහැ. නමුත් අද වනකොට ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම පිළිබඳව අපි සතුටට පත් වනවා. නමුත් මේ වැඩ පිළිවෙළ හරියාකාරව අවසන් කළේ නැත්නම් ඉදිරියේ දීත් මේ ක්‍රියාවලිය අවසන් වෙන්නේ නැහැ. ඒ නිසා ඒ තැනට අපේ රට ගෙන එන්න කියලා අපි ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ ප්‍රශ්නය පැන නඟින්න හේතු වුණු මූලික කාරණය මොකක්ද කියලා අපි බලන්න ඕනෑ.

අපේ අධ්‍යාපන ක්‍රමවේදයේ තිබෙන වැරැදි හරියාකාරව අපි සකස් කර ගත්තොත්, ඉදිරි අනාගතයේ දී මේවාගේ ප්‍රශ්නවලට මුහුණ දෙන්න අපට සිද්ධ වෙන එකක් නැහැ කියලා මම හිතනවා. මේ රටේ නිදහස් අධ්‍යාපනය ලබා දෙනවා වාගේම, සියලු දෙනාටම උසස් අධ්‍යාපනය ලබා දෙන්නත් රජයක් වශයෙන් කටයුතු කරන්න අවශ්‍යයි. ඒ සඳහා පෞද්ගලික අංශයත් අපි දිරිගන්වන්න ඕනෑ. ඒක, ආණ්ඩුව වාගේම විපක්ෂයේ සිටින අප සියලු දෙනාත් එකඟ වන කාරණයක්. 2017දී උසස් පෙළ කරපු ශිෂ්‍යයන් සංඛ්‍යාව ලක්ෂ දෙකහමාර, තුන අතර ශිෂ්‍ය පිරිසක් වුණාට ඒ ශිෂ්‍ය පිරිසෙන් 26,000ක් පමණ තමයි විශ්වවිද්‍යාලයට යන්නේ. අන්න ඒ කාරණයට පිළිතුරක් හොයන එක තමයි වැදගත් වෙන්නේ. පක්ෂ භේදයකින් තොරව එම කාරණයට විසඳුමක් සෙවිය යුතුයි. ඒ සඳහා අපේ අධ්‍යාපනයේ වෙනසක් කරන්න, ක්‍රමවේදයේ වෙනසක් කරන්න කටයුතු කිරීම තමයි වැදගත් වෙන්නේ. එහෙම වුණා නම්, වැඩි පිරිසකට රජයේ විශ්වවිද්‍යාලවල උසස් අධ්‍යාපනය ලබාගන්න අවස්ථාව ලැබෙනවා. ඒ වාගේම පෞද්ගලික විශ්වවිද්‍යාලවලටත් අපි ඒ අවස්ථාව ලබා දුන්නොත්, -උපාධි කඩවලට නොවෙයි- ප්‍රමිතියකට අනුව එම විශ්වවිද්‍යාල දියුණු කරන්න අපේ සහයෝගය ලබා දුන්නොත් මේ රටේ සිටින වැඩි ශිෂ්‍ය පිරිසකට උසස් අධ්‍යාපනය ලබාගෙන උපාධිධාරීන් බවට පත්වීමේ හැකියාව තිබෙනවා. අනෙක් පැත්තෙන් මේ උගන්වන විෂය පථය නිසා උපාධි ලබා ගන්නා බොහෝ පිරිසකට අද පාරට වෙලා ඉන්න සිදු වෙලා තිබෙනවා. ඒ නිසා අපේ රටේ, ලෝකයේ රැකියා වෙළෙඳ පොළට සරිලන විෂය පථයක් අපේ විශ්වවිද්‍යාල තුළට ගෙන එන්න ඕනෑ කියන එකත් අපි මේ අවස්ථාවේ දී සඳහන් කරන්නට ඕනෑ. අපි පෞද්ගලික විශ්වවිද්‍යාලවලට විරුද්ධ නැහැ. පෞද්ගලික විශ්වවිද්‍යාල ප්‍රමිතියකට අනුව ක්‍රියාත්මක කරනවා නම්, ඒ සඳහා අපේ සහයෝගය ලබා දෙනවා. ඒක මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ යුගයේ ආරම්භ කරපු එකක්ද, මේ රජය ආරම්භ කරපු එකක්ද කියන එක නොවෙයි ප්‍රශ්නය. මේ ආණ්ඩුවට මේ ප්‍රශ්නය වසර තුනක් විසඳන්න බැරි වුණා. ඒක විසඳන්න හිටපු අමාත්‍යවරුන්ට අවශ්‍යතාවක් තිබුණේ නැහැ. හිතුවක්කාර ලෙස කටයුතු ක්‍රියාත්මක කිරීම තමයි සිදුවුණේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

හොඳයි.

අපි මේ පනත් කෙටුම්පතට සංශෝධන තුනක් ඉදිරිපත් කළා. ඊයේ තිබුණු කමිටුවේ දී අපේ සිසිර ජයකොඩි මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු එම සංශෝධන තුනෙන් එකකට විසඳුමක් ලබා දීලා තිබෙනවා. ඒ තමයි සයිටම් ආයතනය අහෝසි කරන කාරණය. නමුත් අපි ඇමතිතුමාට කියන්න කැමැතියි, අපට ඒ සම්බන්ධයෙන් දිනයක් ලබා දෙන්න කියලා. එහෙම දිනයක් ලබා දුන්නොත් මේ ප්‍රශ්නය තවත් දුරදිග යන්නේ නැහැ. මම හිතන්නේ අද දිනයේ දී කරන මේ උද්ඝෝෂණත් එතකොට නවතීවි. ඒ නිසා සයිටම් ආයතනය අහෝසි කරන දිනයක් ලබා දෙන්න කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා. ඒ වාගේම එතුමා කිව්වා, පළමු වසරේ සිට අවසාන වසර දක්වා මෙයට බඳවා ගන්නා සියලුම ශිෂ්‍යයන් සම්බන්ධයෙන් වෙනම ඇගයීමක් සිදු කරලා, ඒ අනුව තමයි අවශ්‍ය වසර ලබා දෙන්නේ කියලා.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மொஹான் லால் கிரேரு - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Mohan Lal Grero - State Minister of Higher Education and Cultural Affairs)

මේ සංශෝධනයේ තිබෙනවා, "ශිෂ්‍යයන් අන්තර්ග්‍රහණය කිරීම සම්පූර්ණ කරනු ලැබූ වහාම" කියලා. ඒ කියන්නේ මේ ළමයි ටික කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට අන්තර්ග්‍රහණය කිරීම අවසන් වූ වහාම සයිටම් ආයතනයේ වෛද්‍ය පීඨය අහෝසි වෙනවා. [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු කනක හේරත් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු කනක හේරත් මහතා
(මාණ්පුමිකු කනක හේරත්)
(The Hon. Kanaka Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවසාන කරන්න විනාඩියක් දෙන්න. මොකද, මගේ වේලාවේ මෙතුමා උත්තරය දුන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔබතුමා කථා කරන්න.

ගරු කනක හේරත් මහතා
(මාණ්පුමිකු කනක හේරත්)
(The Hon. Kanaka Herath)
එහෙම නම්, ඔබතුමා කියන ආකාරයට ලබන මාසය වෙද්දී අන්තර්ග්‍රහණය කරලා අවසන් වුණු ගමන් සයිටම් ආයතනයේ වෛද්‍ය ආයතනය වහන්න අවස්ථාව ලැබෙනවා. [බාධා කිරීමක්] ඔය සංශෝධනය ඉදිරිපත් කළේ අපේ ඒකාබද්ධ විපක්ෂයේ ගරු සිසිර ජයකොඩි මැතිතුමා. එතුමා ඉදිරිපත් කරනතුරු එහෙම අහෝසි කරන දිනයක් හෝ අහෝසි කරනවා කියන එක කියලා තිබුණේ නැහැ. ඉතින් ඒ පිළිබඳවත් අපේ ඇමතිතුමාට සහ නියෝජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ඊළඟ, කාරණය තමයි ,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසාන කරන්න.

ගරු කනක හේරත් මහතා
(මාණ්පුමිකු කනක හේරත්)
(The Hon. Kanaka Herath)
මම අවසාන කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉදිරි අනාගතයේ දී නැවත මේ වාගේ කරුණක් පිළිබඳව ගැටලුවක් සිදුනොවෙන ආකාරයට අද ඔබ තමුන්නාන්සේලා මැදිහත් වෙලා කටයුතු කරයි කියලා මා හිතනවා. විශේෂයෙන්ම ගරු ඇමතිතුමා මේ කටයුත්තට මැදිහත් වුණා. ඉදිරියේදී නැවතත් මෙවැනි ගැටලුවක් ඇති නොවන ආකාරයට සියලු කටයුතු ඉටු කිරීම සඳහා අපේ සංශෝධනවලට සහයෝගය ලබා දෙන්නය කියන ඉල්ලීම කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු හතක කාලයක් තිබෙනවා.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(මාණ්පුමිකු මොහාන් ලාල් කිරේරු)
(The Hon. Mohan Lal Grero)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පැහැදිලි කිරීමක් කරන්න මට අවස්ථාවක් දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනාගතයේදී මේ ප්‍රශ්නය ඇති නොවෙන්න උසස් අධ්‍යාපන අමාත්‍යාංශය තිරසාර වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. අපි තත්ත්ව සහතික කිරීමේ හා ප්‍රතීතනය කිරීමේ ස්වාධීන කොමිසමක් පිහිටුවනවා. ඒ අනුව, මූලික සැලසුම් නිරාකරණය කර, සම්පූර්ණ වැඩ පිළිවෙළ ඉදිරිපත් කර, සමස්ත කටයුතු හරියාකාරව සම්පූර්ණ කරනතුරු අනාගතයේ මෙවැනි ආයතන පටන් ගන්න බැහැ. එතකොට ඉදිරියේදී අතරමගදී ගැටලු ඇති වන ආකාරයට මේ පාඨමාලා පටන් ගන්න බැරි වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමා කථා කරන්න.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(මාණ්පුමිකු අසෝක පිරියන්ත)
(The Hon. Ashoka Priyantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තිබෙන්නේ විනාඩි 7යි නේද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඔව්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(මාණ්පුමිකු අසෝක පිරියන්ත)
(The Hon. Ashoka Priyantha)
මට මගේ වේලාව දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
හොඳයි, ඔබතුමා කථා කරන්න.

[අ.භා.4.35]

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(මාණ්පුමිකු අසෝක පිරියන්ත)
(The Hon. Ashoka Priyantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත දෙවැනිවර කියැවීම සඳහා ඉදිරිපත් කිරීම පිළිබඳව මම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. අපේ රටේ විශ්වවිද්‍යාල දරුවන්ගේත්, SAITM එකේ ඉගෙන ගත්ත දරුවන්ගේ සහ ඒ දරුවන්ගේ දෙමව්පියන්ගේත් ප්‍රශ්නය දීර්ඝ කාලයක් තිස්සේ පවතින එකක්. ඒ පිළිබඳව බොහොම ගැඹුරින් සිතා එයට විසඳුමක් ලබා දෙන්න පියවරක් ගැනීම පිළිබඳව අපේ නව උසස් අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමාට මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරයකු ලෙස මගේ ගෞරවය, ස්තුතිය පිරිනමනවා.

මේ විවාදයට එක් වුණු බොහෝ මැති ඇමතිවරුන්ගේ කථාවලදී අපට අහන්න ලැබුණා, මේ SAITM ආයතනය ස්ථාපිත කරලා ඒ ආයතනයෙන් මිලියන ගණන්වල ශිෂ්‍යත්ව ලබා ගත්තාය කියා. මම දකින විධියට නම් මේක පගාවක්. මගේ අදහස ඒකයි. දැන් මේ ආයතනයේ ගුණාත්මකභාවය පිළිබඳව කථා කරනවා; ගුණාත්මකභාවයක් තිබුණේ නැහැය කියනවා; ගුණාත්මකභාවයෙන් යුතු පෞද්ගලික වෛද්‍ය අධ්‍යාපනයක් ලබා දෙනවා නම් හොඳයි කියනවා. නමුත්, ගුණාත්මකභාවයක් නැති වෛද්‍ය පීඨයක් ඇති කළේ කවුද? ගුණාත්මකභාවයක් නැති වෛද්‍ය පීඨයකින් ශිෂ්‍යත්ව ලබා ගත්තේ මොකටද? ගරු ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා විතරක් නොවෙයි, ඔබතුමාට යෝජනා කරනවා, නෙවිල් ප්‍රනාන්දු මැතිතුමාගෙන් අහලා, නැත්නම් ලිඛිතව අරගෙන, එහෙමත් නැත්නම් ඔබතුමාගේ බලය පාවිච්චි කරලා හෝ මේ ශිෂ්‍යත්ව අරගෙන තිබෙන අයගේ නම් ටික මේ පාර්ලිමේන්තුවට දෙන්නය කියා. එහෙම නැති වුණොත් පාර්ලිමේන්තුව දවසින් දවස හැල්ලුවට ලක් වෙනවා. ඒ විතරක් නොවෙයි, අනාගතයේ දවසක

[ගරු අශෝක ප්‍රියන්ත මහතා]

මේ පාර්ලිමේන්තුවේ මැති ඇමතිවරු ගණනාවකට මේ පගාව ගැනීම, එහෙම නැත්නම් මේ අයථා කටයුත්ත පිළිබඳව වග කියන්න වෙනවා. දිනෙන් දින මේ පාර්ලිමේන්තුව හෑල්ලු වෙද්දී, පාර්ලිමේන්තුවට නොගැළපෙන ක්‍රමවේද ක්‍රියාත්මක කරන්න බලය පාවිච්චි කරන්න කිසිම කෙනෙකුට අවස්ථාව දිය යුතු නැහැ.

දින 410ක් තිස්සේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් පාරේය කියා අද බොහෝ අය කියනවා. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් දින 410ක් පාරේ ඉන්න හේතුව මොකක්ද? ප්‍රධාන හේතුව තමයි උසස් අධ්‍යාපනයේ ප්‍රමිතීන් පිළිබඳව දීර්ඝ කාලයක් තුළ ඇති වුණු යම් යම් ප්‍රශ්න. විශ්වවිද්‍යාලයකින් උපාධියක් ලබාගත් අයකුට -උපාධිධාරියකුට- වටිනාකමක් නොමැති තැනකට අද මේ රට පත්ව තිබෙන්නේ, විශ්වවිද්‍යාලයක් තුළ ලබා දිය යුතු අධ්‍යාපනය කුමන ක්‍රමවේදයකට, ප්‍රමිතියකට අනුව ලබා දෙන්න ඕනෑද, රටට අවශ්‍ය කරන විශ්වවිද්‍යාල පාඨමාලා මොනවාද, ඒ පාඨමාලා තුළින් රටට ලබාගත හැකි ප්‍රයෝජන මොනවාද කියා රට හඳුනා නොගත් නිසායි. මෙතැනින් පසුව හෝ, "හතු පිපෙනවා" වාගේ විශ්වවිද්‍යාලවල උපාධිධාරීන් නිර්මාණය කරනවාට වඩා, රටට ගැළපෙන, වැඩි අළෙවියක් තිබෙන, වැඩි ඉල්ලුමක් තිබෙන පාඨමාලා හඳුන්වා දී ඒ පාඨමාලාවලට දරුවන් ඇතුළත් කරන්න කටයුතු කරන්නය කියා මා ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විතරක් නොවෙයි, අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන ඔබතුමා මෙන්ම මේ ගරු සභාවේ ඉන්න බොහෝදෙනා දකින්න ඇති, ඊයේ සහ අද තිබුණු උද්ඝෝෂණවලට පැමිණ සිටි අහිංසක, අසරණ දරුවන් සියයක් ගත්තොත් එයින් අනූඅටක්, අනූනවයක්ම සෙරෙප්පු පැළඳගත් දරුවන් බව. ඒ උද්ඝෝෂණ අතරතුරයි මම මෙහාට ආවේ. ඒ එනකොටයි ඒ දර්ශනය මම දැක්කේ. එදා වේල කන්න බැරි අහිංසක, අසරණ දෙමාපියන්ගේ දරුවන්ට තමයි විශ්වවිද්‍යාලවලට ගිහිල්ලා අද මේ උද්ඝෝෂණවලට පවා එන්න වෙලා තිබෙන්නේ. මධ්‍යම පාන්තිකයන් හෝ උසස් ජීවන තත්ත්වයක සිටින එක දරුවෙක්වත් ඔය උද්ඝෝෂණයක නැහැ. ඒ නිසා අහිංසක දරුවන්ව බිල්ලට ගන්න කඹ ඇද ඇද මේ වැඩේ කරන්න එපා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(මාණ්පුමිකු අසෝක පිරියන්ත)
(The Hon. Ashoka Priyantha)
අපේ උසස් අධ්‍යාපන ඇමතිතුමාට මේ ප්‍රශ්නය විසඳන්න පාර්ලිමේන්තුවේ අපි 225දෙනාම සහයෝගය දෙන්න ඕනෑ. මොකද, මේක අද විපක්ෂයේ ඉන්න; එදා ආණ්ඩු පක්ෂයේ සිටි, එදා විපක්ෂය විරුද්ධ වෙද්දී ආණ්ඩු පක්ෂයේ අය කැමැති වෙලා කළ වැඩක්. ඒ අය ශිෂ්‍යත්ව අරගෙන, ඒ අයගේ දරුවන් SAITM එකට දමලා අද මේ සභාවටවත් එන්නේ නැතිව ඉන්නවා. මම බොහොම පැහැදිලිව කියන්න ඕනෑ, ඒකාබද්ධ විපක්ෂයේ විශාල කණ්ඩායමක් තමන්ගේ දරුවන්ව SAITM එකට දමලා මේ සභාවට එන්නේ නැතිව ඉන්න බව. අහිංසක, අසරණ විශ්වවිද්‍යාල දරුවෝ පාරට බැහැලා, "විසඳුමක් දියව්! දියව්!" කියා මේ ආණ්ඩුවට බලපෑම් කරනවා. මේ ආණ්ඩුවේ අපි අදින්නේ අනුන්ගේ පවක්. ඒ නිසා ඒකාබද්ධ විපක්ෂයත්, විපක්ෂයේ ඉන්න සියලුදෙනාත්, ආණ්ඩු පක්ෂයේ ඉන්න සියලුදෙනාත් එකතු වෙලා, අද දවසේවත් උසස් අධ්‍යාපන ඇමතිතුමාට ශක්තිය, පන්නරය දීලා මේ ප්‍රශ්නය විසඳන්න කටයුතු කරන්න ඕනෑ. ගරු ඇමතිතුමනි, මම මුලදී මතක් කළා වාගේ, උපාධිධාරීන් නිර්මාණය කරද්දී රටට අවශ්‍ය, රට හොයන, අනාගතයේදී ලෝකයට විකුණන්න පුළුවන් දැනුම සහ ශක්තිය තිබෙන උපාධිධාරීන් නිර්මාණය කරන්න ඕනෑ. අපි කලා උපාධි වාගේ ලෙහෙසියෙන් ගන්න පුළුවන් උපාධි ටික හදනවා. එහෙම හදලා රැකියා විරහිත උපාධිධාරීන්ගේ ගොඩ වැඩි කරනවා. අවසානයේදී මේ රට භාරගන්නා ඕනෑම රජයකට මේ රටේ උද්ඝෝෂණ විතරයි ඉතිරි වෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(මාණ්පුමිකු අසෝක පිරියන්ත)
(The Hon. Ashoka Priyantha)
මම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි මාස ගණනක් තිස්සේ දකිනවා, පාරේ උද්ඝෝෂණය කරන, රැකියා ස්ථානයේ උද්ඝෝෂණය කරන අයට සමහර පිරිස් දේශපාලන වශයෙන් නායකත්වය දෙන ආකාරය. උපාධිය සම්පූර්ණ කරන්නේ නැතිව විශ්වවිද්‍යාල ඇතුළට රිංගාගෙන, තමන්ගේ දේශපාලන බලමුළු තර කරමින් මේ අහිංසක, අසරණ දරුවන්ව ඩැහැ ගන්න ක්‍රමවේදයක් තිබෙනවා. ගරු උසස් අධ්‍යාපන ඇමතිතුමනි, මේ ක්‍රමවේදය අයින් කරන්න ඔබතුමාට මේ ලැබී තිබෙන අවස්ථාවෙන් ප්‍රයෝජනය ගන්න කියා ඉල්ලා සිටිමින්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

Next, the Hon. (Mrs.) Shanthi Sriskandarasa. You have 11 minutes.

[ප.ව. 4.42]

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(මාණ්පුමිකු (තිරුමතී) චාන්දි ශ්‍රීස්කන්දරාජා)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)
කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, இந்த நாட்டிலே குறிப்பாகக் கடந்த 10 மாதங்களாகத் தலைதூக்கி யிருக்கின்ற ஆர்ப்பாட்டங்களுக்குக் காரணமாக இருக்கின்ற, கொள்கைகள் இல்லாமல், உரிய அனுமதிகள் இல்லாமல் குறுக்கு வழியில் மருத்துவராவதற்கு முன்னாள் ஜனாதிபதி மஹிந்த ராஜபக்ஷவின் காலத்திலே ஆரம்பிக்கப்பட்ட SAITM நிறுவனம் தொடர்பான பிரச்சினைக்கு ஒரு தீர்வு கொண்டுவருமுகமாகச் சமர்ப்பிக்கப்பட்ட ஜெனரல் சேர் ஜோன் கொத்தலாவலை பாதுகாப்புப் பல்கலைக்கழக விசேட ஏற்பாடுகள் சட்டமூலம் தொடர்பான விவாதத்திலே பங்குபற்றுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு முதலில் நன்றியைத் தெரிவித்துகொள்கின்றேன். இந்த விவாதத்திலே இதுபற்றிய பல்வேறு கருத்துக்கள் முன்வைக்கப்பட்டுக் கொண்டிருக்கின்றன. இந்த SAITM நிறுவனத்தினை எதிர்த்துப் பல்கலைக்கழக மாணவர்கள் கடந்த 10 மாதங்களாகத் தங்களது கல்வியையும் இடைநிறுத்தித் தெருவோரங்களில் ஆர்ப்பாட்டங்களில் ஈடுபடுகின்றார்கள் என்றால், இந்த நிறுவனத்தால் கல்விக்கு எவ்வளவுதூரம் பாதிப்பு

ஏற்பட்டிருக்கின்றது, மாணவர்களை அது எவ்வளவுதூரம் பாதித்திருக்கின்றது என்பதனை வெளிப்படுத்துகின்ற ஒரு நிகழ்வாகவே நாம் அனைவரும் அதை நோக்க வேண்டும்.

கல்வியை அரசியலாகவோ, அரசியல் அதில் ஆதிக்கம் செலுத்துவதாகவோ, கல்வியை விலை பேசுவதாகவோ அமையத்தக்கவாறு திட்டங்களை முன்னெடுப்பதென்பது எவராலும் ஏற்றுக்கொள்ளப்பட முடியாத ஒரு விடயமாகும். அந்த வகையிலே, இந்த மருத்துவக் கல்வி என்பது பாதுகாக்கப்பட வேண்டும். அதிலும் சிறப்பாக இலங்கையின் மருத்துவர்களுக்குச் சர்வதேச ரீதியாக ஒரு மதிப்பிருக்கின்றது. அவர்கள் தரமானவர்கள், சிறந்த பயிற்சி பெற்றவர்கள், சிறந்த முறையிலே கற்பிக்கப்பட்டவர்கள், சிறப்பான கல்வியைக் கற்றவர்கள் என்ற ரீதியிலே சர்வதேசத் தரம் வாய்ந்தவர்களாக எமது நாட்டு மருத்துவர்கள் காணப்படுகின்றார்கள். ஆனால், இந்த SAITM நிறுவனத்தினூடாக மருத்துவக் கல்வி ஒரு வியாபாரமாக ஆக்கப்பட்டிருப்பது மிகவும் வேதனைக்குரிய ஒரு விடயமாகும்.

இங்கு மருத்துவக் கல்வியைத் தொடர்வதற்கான தகைமை என்பது மிகவும் குறைந்த நிலையிலே காணப்படுகின்றது. மருத்துவத் துறைக்குச் சாதாரண ஒரு குடும்பத்திலிருந்து, பின்தங்கிய கிராமங்களிலிருந்து, வருமானமற்ற வறுமையான குடும்பங்களிலிருந்து வருகின்ற பிள்ளைகளைப் பாதிக்கின்ற வகையில், அவர்களது தரம், அவர்களது திறமை, அவர்கள் கல்வியைக் கற்பதற்குப் படுகின்ற கஷ்டங்கள் என்பவற்றைக் கருத்திற்கொள்ளாது, உயர் வர்க்கத்திலுள்ளவர்கள் எந்தவொரு பட்டத்தையும் விலைக்கு வாங்க முடியும் என்ற ஒரு தத்துவம் இங்கு அடிப்படையாகக் காணப்படுகின்றது.

கல்வியில் தரப்படுத்தல் என்ற விடயம்தான் இனப் பிரச்சினைக்கு அத்திவாரமிட்டது. மீண்டும் எமது எதிர்கால இளைஞர்கள் அரசியலிலே, அரசாங்கத்திலே, அரசியல்வாதிகளிலே ஓர் அதிருப்தியை ஏற்படுத்துகின்ற வகையில் தெருவோர ஆர்ப்பாட்டங்கள் போன்ற அநாகரிகமான வேலைகளில் ஈடுபட நிர்ப்பந்திக்கப்படுவது மிகவும் வருந்தத் தக்க ஒரு விடயமாகும். இது எமது நாட்டுக்கு ஓர் அபகீர்த்தியை ஏற்படுத்தகின்ற விடயமாகவும் இருக்கின்றது. இந்த நாட்டுக்கு வருமானம் தேவை அல்லது பணம் தேவை என்றால், கல்வியை விற்பதை விடுத்து, கல்விக்கு விலை பேசுவதை விடுத்து, கைத்தொழிற்சாலைகளை உருவாக்குங்கள்! யுத்த காலத்தில் அழிக்கப்பட்ட கைத்தொழிற்சாலைகளை மீள உருவாக்குவதோடு, வருமானம் தரக்கூடிய விதத்தில் தொழில்நுட்ப ரீதியான கைத்தொழிற்சாலைகளைப் புதிதாக உருவாக்கி, அதில் புத்திஜீவிகளை அமர்த்தி, அதனூடாக இங்கிருக்கின்ற மூலப்பொருள்களை முடிவுப் பொருள்களாக மாற்றி வருமானத்தை ஈட்டிக்கொள்ளுங்கள்! அதைவிடுத்து, உயர் வர்க்கத்தினர் மட்டும் மருத்துவராகலாம், அவர்கள் எவ்வாறேனும் கல்வியை விலையை பேசி மருத்துவராகிக் கொள்ளலாம் என்ற நிலை மாறவேண்டும்.

அடுத்து, சேர் ஜோன் கொத்தலாவலை பாதுகாப்புப் பல்கலைக்கழகத்திலே கல்வி பயில்கின்றவர்களுக்கு இராணுவப் பயிற்சி கட்டாயம் என்ற ஒரு பாட நிருபம் காணப்படுகின்றது. இது மருத்துவக் கல்விக்குத் தேவையா? மருத்துவர்களுக்குரிய பயிற்சி என்ன? மருத்துவம் என்பது உயிரைக் காப்பாற்றுகின்ற ஓர் உன்னதமான பணி! இந்தப் பணியை அரசியலுக்காகவோ அல்லது அரசின் நன்மதிப்பைப் பெறவேண்டும் என்பதற்காகவோ கொண்டு நடாத்துவது பொருத்தமற்ற ஒரு நிகழ்வாகவே காணப்படுகின்றது.

இங்கு உயர் கல்விப் பிரதியமைச்சர் அவர்கள் அமர்ந்திருக்கின்ற வேளையில், உயர் கல்வியோடு தொடர்புபட்ட, வன்னிப் பிரதேசத்தைச் சார்ந்த ஒரு நிகழ்வு தொடர்பான கோரிக்கையொன்றை நான் முன்வைக்க விரும்புகின்றேன். யாழ். பல்கலைக்கழகத்தோடு இணைந்ததான மீன்பிடித் துறையியல் வளாகத்தினை முல்லைத்தீவு மாவட்டத்தில் நிறுவுவதற்கான ஆக்கபூர்வமான அடிப்படை வேலைகள் அனைத்தும் ஆரம்பிக்கப்பட்டு, வருடக்கணக்காக அவை எதுவித முடிவுமற்றுத் தொடர்ந்து இழுபறி நிலையில் காணப்படுகின்றது. இவ்வாறான ஒரு மீன்பிடித்துறை வளாகத்தினை ஆரம்பிப்பதற்காக ஏற்கெனவே, 150 ஏக்கர் காணி சம்பந்தப்பட்ட பிரதேச செயலாளரினால் ஒதுக்கீடு செய்யப்பட்டு, அதற்குரிய அறிக்கைகள் யாவும் சம்பந்தப்பட்ட அதிகாரிகளுக்கு அனுப்பிவைக்கப்பட்டும் அந்த வளாகத்தை ஆரம்பிப்பதற்கான முன்னெடுப்புக்கள் எதுவும் நடைபெறவில்லை. முல்லைத்தீவு மாவட்டம் யுத்தத்தில் மிகவும் பாதிக்கப்பட்ட ஒரு மாவட்டம் என்பது உங்களுக்குத் தெரியும். இன்று சர்வதேசரீதியாகப் பிரசித்திபெற்றிருக்கின்ற முள்ளிவாய்க்கால் அமைந்திருப்பதும் இந்த மாவட்டத்தில் தான். யுத்தத்திலே அனைத்தையும் இழந்து, இன்று மீண்டெழுந்து கொண்டிருக்கின்ற எமது மக்களுக்கு - இளைஞர், யுவதிகளுக்கு அந்தப் பிரதேசத்தோடு சார்ந்ததாக ஒரு பல்கலைக்கழக வளாகத்தை ஆரம்பிப்பதற்கு நீங்கள் ஆக்கபூர்வமாகச் செயற்படவேண்டும். இதனைவிடுத்து, அங்கு அன்றாடம் தொழில் செய்கின்றவர்களைப் பாதிக்கின்ற வகையிலே, பல்வேறு விதமான நிகழ்வுகள் நடைபெற்றுக் கொண்டிருப்பதையே காண்கின்றோம். இதுபற்றி நாங்கள் தொடர்ந்தும் எங்களது பாராளுமன்ற உரைகளிலே எடுத்துக் கூறி வருகின்றோம். இதற்கு ஒரு முடிவு காணும்வகையில், விசேடமாக எதிர்காலச் சந்ததிகளை நல்லவர்களாக உருவாக்குகின்ற வகையில், முல்லைத்தீவு மாவட்டத்திலே ஆரம்பிக்கவிருக்கின்ற இந்த மீன்பிடித் துறையியல் வளாகத்தை உடனடியாக ஆரம்பித்து, அங்கிருக்கின்ற சூழ்நிலைகளுக்கு அமைவாக அந்த இளைஞர், யுவதிகள் அங்கு கல்வி கற்பதற்குரிய சந்தர்ப்பத்தை நீங்கள் உருவாக்கிக் கொடுக்கவேண்டுமென்று நான் இந்த வேளையிலே கேட்டுக் கொள்ளுகின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, you have two more minutes.

ගරු ශාන්ති ශ්‍රීස්කන්දරාසා මහත්මිය
(மாண்புமிகு (திருமதி) சாந்தி ஸ்ரீஸ்கந்தராசா)
(The Hon. (Mrs.) Shanthi Sriskandarasa)
Okay.

இறுதியாக நடைபெற்ற உள்ளூராட்சிமன்றத் தேர்தலிலே வாக்களிக்கின்றபொழுது பல பட்டதாரிகள் 'நாங்கள் வேலையற்ற பட்டதாரிகள்' என்று தங்களுடைய வாக்களிப்பு அட்டையிலே எழுதியதை நாங்கள் அறிவோம். இந்த நிலைமையை வளர விடாதீர்கள்! இது இளைஞர்களிடையே மனக்கசப்பையும் வக்கிரத்தையும்தான் ஏற்படுத்தும். இந்த நிலையை மாற்றி, கல்வி முறையிலும் சரி, வேலைவாப்ப்பு வழங்குகின்ற முறையிலும் சரி, ஏனைய அபிவிருத்தித் திட்டங்களிலும் சரி, நேர் சிந்தனையோடு இந்த இளைஞர்களை உள்வாங்கி, அவர்கள் இந்த ஒருமித்த நாட்டினுடைய முன்னேற்றத்திற்காகவும் அபிவிருத்திக்காகவும் அர்ப்பணிப்போடு செயற்படக்கூடிய வகையிலான ஆக்கபூர்வமான செயற்பாடுகளை இந்த அரசு முன்னெடுக்க வேண்டுமென்று கேட்டு, நன்றி கூறி, அமர்கின்றேன்.

[අ.භා. 4.51]

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම SAITM ප්‍රශ්නයට ප්‍රමාද වී හෝ යම් විසඳුමක් ලබා දෙන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදයේදී ඇත්ත වශයෙන්ම පුළුල් කාරණා කිහිපයක් පිළිබඳවයි මම වැඩියෙන්ම කථා කිරීමට බලාපොරොත්තු වන්නේ. කෙසේ වෙතත් SAITM ප්‍රශ්නය කලින් ආණ්ඩුවේ බබෙක්; එය මේ ආණ්ඩුව භාර ගත්තා. නමුත් ඒ ප්‍රශ්නය විසඳීමද ඇදි ඇදී ගියා. මෙය නොවිසඳන්නටත් උනන්දුවක් සහිත බලවේග තිබුණා. සමහර දේශපාලන කණ්ඩායම් මෙය හිහන්නාගේ තුවාලය වාගේ දීර්ඝ කාලයක් ඇදගෙන ගියා. ඒ වාගේම විදේශ විශ්වවිද්‍යාලවලට ගිහින් වෛද්‍ය උපාධිය අරගෙන ඇවිල්ලා මෙහි ලියා පදිංචි වීමට පෙර පෙනී සිටිය යුතු අපි කවුරුත් දන්නා Act 16 විභාගයට සිසුන්ව සූදානම් කරන අය, වඩා කෙළින් කියනවා නම් ට්‍යුෂන් දෙන වෘත්තීය වේදීන්ද මේ ප්‍රශ්නයට විසඳුමක් දකින්නට කැමැති වුණේ නැහැ. ඔවුනුත් මෙය ඇවිස්සුවා. මොකද, පිට රට ගිහින් ඉගෙන ගෙන Act 16 විභාගයට ලංකාවට එන ශිෂ්‍යයන් ප්‍රමාණය අඩු වෙනවා නම් ඔවුන්ට පාඩු වෙනවා.

කෙසේ වෙතත් අපි අද රාජ්‍ය අධ්‍යාපනය සහ පෞද්ගලික විශ්වවිද්‍යාල අධ්‍යාපනය පිළිබඳ ප්‍රශ්නයට මුහුණ දී තිබෙනවා. මම හිතන්නේ මේ ගරු සභාවේ අතිවිශාල බහුතරය රාජ්‍ය අධ්‍යාපනයෙන් ප්‍රයෝජන ගත්ත අය. මම රාජ්‍ය අධ්‍යාපනයට සම්පූර්ණයෙන්ම පක්ෂ කෙනෙක්. අධ්‍යාපනය පිළිබඳ ප්‍රාථමික වගකීම - primary responsibility එක - තිබෙන්නේ රාජ්‍යයට කියා විශ්වාස කරන කෙනෙක් මම. නමුත් මම පෞද්ගලික අධ්‍යාපනයට විරුද්ධ නැහැ, එය අද තිබෙන සත්‍යයක්. පෞද්ගලික විශ්වවිද්‍යාලවලට ආණ්ඩුව ඉඩ දිය යුත්තේ රාජ්‍ය අධ්‍යාපනය පිළිබඳ තමන්ගේ වගකීම ඉෂ්ට කරන අතර, එයට අවාසියක් නොවන පරිදියි. රාජ්‍ය විශ්වවිද්‍යාල ක්‍රමය ආරක්ෂා කරගෙන, රාජ්‍ය තෘතීයික අධ්‍යාපන ක්‍රමය ආරක්ෂා කරගෙනයි පෞද්ගලික විශ්වවිද්‍යාලවලට ඉඩ දිය යුත්තේ. එය ඉතාමත්ම වැදගත්.

අධ්‍යාපනයට දළ ජාතික ආදායමෙන් සියයට 6ක් වෙන් කිරීම පිළිබඳව අපි පසුගිය කාලයේ කථා කළා. ඒක අපි හදා ගත්ත දර්ශකයක් නොවෙයි, ඒක මුළු ලෝකයම පිළිගත් දර්ශකයක්. විශේෂයෙන්ම ශ්‍රී ලංකාව වැනි දියුණු වන රටවලට තිබෙන ඉලක්කයක්. එම නිසා එය ඉෂ්ට කිරීමේ වගකීමට හානියක් නොවන පරිදි තමයි අපි මේ පිළිබඳව බලන්නට ඕනෑ. ඒ වාගේම අධ්‍යාපනය රටේ මූලික අයිතිවාසිකමක් බවට පත් කළ යුතුයි. ඒක අපේ රටේ මූලික අයිතිවාසිකමක් නොවෙයි. ආර්ථික හා සමාජීය අයිතිවාසිකම් මූලික අයිතිවාසිකම් ලෙස පිළිගන්නා බොහෝ රටවල අධ්‍යාපනයට තිබෙන අයිතියද මූලික අයිතිවාසිකමක් ලෙස පිළිගන්නවා. අපිද ඒ අනුව අනාගතයේදී එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කළ යුතුය කියන එකයි මගේ මතය වන්නේ. ප්‍රාථමික අධ්‍යාපනය අනිවාර්යයෙන්ම නොමිලයේ දෙන අතර, ද්විතීයික අධ්‍යාපනයද අනිවාර්යයෙන්ම නොමිලයේ දෙන අතර තෘතීයික අධ්‍යාපනය හැකි තරම් දුරට තිබෙන සම්පත් ප්‍රමාණය අනුව රාජ්‍යයේ වගකීම ලෙස ඉටු කළ යුතුයි කියායි මා විශ්වාස කරන්නේ.

අද පෞද්ගලික විශ්වවිද්‍යාලවල තෘතීයික අධ්‍යාපනය ඉංජිනේරු විද්‍යාව වැනි විෂයන්වල පවා සිදු වෙනවා. නමුත් ප්‍රශ්නය තිබෙන්නේ වෛද්‍ය විද්‍යාව පිළිබඳවයි. ඒක sensitive issue එකක්, sensitive area එකක්, වඩා සංවේදී ක්ෂේත්‍රයක්. එම නිසා විශේෂයෙන්ම ඒ ප්‍රශ්නයට මුහුණ දිය යුත්තේ, එම අධ්‍යාපනය ලබා දිය යුත්තේ ගුණාත්මක භාවය ආරක්ෂා කරමින් සහ රාජ්‍ය අධ්‍යාපනයට කිසිම අගතියක් නොවන පරිදියි. මම මීට කලිනුත් මේ ගරු සභාවේ සඳහන් කරලා තිබෙන ආකාරයට not-for-profit universitiesවලට අපි පුළුවන් තරම් උනන්දු කළ යුතුයි. ලාභ ලබා ගන්නේ නැති, කොටින්ම කියනවා නම් විශ්වවිද්‍යාල කඩවලට නොව, ලාභ ලබා ගැනීම තම ප්‍රධාන අරමුණ කර නොගත් විශ්වවිද්‍යාල අපි පුළුවන් තරම් උනන්දු කළ යුතුයි. හාවර්ඩ් විශ්වවිද්‍යාලය, යේල් විශ්වවිද්‍යාලය කියන්නේ ලෝකයේ ඉහළම විශ්වවිද්‍යාල. ඒ හැම විශ්වවිද්‍යාලයක්ම පෞද්ගලික විශ්වවිද්‍යාල. නමුත්, ඒවා ලාභය එකම අරමුණ කරගත් විශ්වවිද්‍යාල නොවෙයි, not-for-profit universities. එම නිසා ලංකාවේ එවැනි විශ්වවිද්‍යාල බිහි කිරීමට අපි පුළුවන් තරම් උනන්දු කළ යුතුයි. ඒ වාගේම මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පෞද්ගලික විශ්වවිද්‍යාලවලට ඉඩ දෙනවා නම්, අඩුම ගණනේ intake එකෙන් ඇතුළත් කරන ශිෂ්‍යයන්ගෙන් සියයට 10කට scholarships දෙන්න සියලුම පෞද්ගලික විශ්වවිද්‍යාලවලට අනිවාර්ය කළ යුතුයි. එම ශිෂ්‍යත්ව -scholarships- තමන්ට ඕනෑ විධියට නොව විශ්වවිද්‍යාල ප්‍රවේශයට පාදක කරගන්නා Z-score එක අනුව ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුළත් වෙන්නට බැරි වුණු ශිෂ්‍යයන්ගෙන් සියයට 10කට දෙන්නට ඕනෑ. එතකොට රාජ්‍ය විශ්වවිද්‍යාලයට ඇතුළත් වෙන්නට බැරි වුණු ශිෂ්‍යයන්ගෙන් ඊළඟ සියයට 10, ශිෂ්‍යත්ව පදනමක් මත පෞද්ගලික විශ්වවිද්‍යාලවලට යනවා. ඊළඟට මම එතැනින් නවතින්නේ නැහැ. මම යෝජනා කරන්නේ, එවැනි විශ්වවිද්‍යාලවල තවත් සියයට 10කගේ ශිෂ්‍ය ගාස්තු ගෙවන්න ආණ්ඩුවට පුළුවන්. ශිෂ්‍යයන්ට බරක් වෙන්නේ නැතුව intake එකෙන් ඊළඟ සියයට 10 ශිෂ්‍යත්ව පදනම යටතේ බඳවා ගන්න පුළුවන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)

එම ශිෂ්‍යත්ව මුදල ආණ්ඩුවෙන් ගෙවන ආකාරයට, ඒ පදනම මත කළ යුතුයි කියා මම යෝජනා කරනවා. මම මීට වඩා දීර්ඝ වශයෙන් කථා කරන්නේ නැහැ. රාජ්‍ය විශ්වවිද්‍යාලවලට හානියක් නොවන පරිදි පෞද්ගලික අධ්‍යාපනයට ඉඩ දෙන අතර, රාජ්‍ය අධ්‍යාපනය පිළිබඳ රජයේ වගකීම අත නොහැර කටයුතු කළ යුතුයි කියන එක මම අවධාරණය කරන්න කැමැතියි. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට, ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා කථා කරන්න.

ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු රුවන් විජයවර්ධන මහතා
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijayawardene)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා
(மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்ன)
(The Hon. (Dr.) Jayampathy Wickramaratne)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මුජීබුර් රහුමාන් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு செஹான் சேமசிங்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SHEHAN SEMASINGHE *left the Chair, and* THE HON. MUJIBUR RAHUMAN *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 4.59]

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක පැත්තකින් කාලාන්තරයක් තිස්සේ මේ රටේ වෛද්‍ය අධ්‍යාපනය විකුණා දැමීම සඳහා කටයුතු කරමින් ඒ හරහා මේ රටේ නිදහස් අධ්‍යාපන අයිතිය උදුරා ගැනීම සඳහා දරන ලද ප්‍රයත්නයත්, ඊට එරෙහිව එක පැත්තකින් ශිෂ්‍ය ව්‍යාපාරයත්, අනෙක් පැත්තෙන් මේ රටේ නිදහස් අධ්‍යාපනයේ උරුමය වෙනුවෙන් කැප වෙච්ච දේශපාලන පක්ෂ, බහුජන සංවිධාන දියත් කළ අනවරත අරගළයක ප්‍රතිඵලයක් හැටියට තමයි අදත් නිදහස් අධ්‍යාපන අයිතිය අපට ඉතිරි වී තිබෙන්නේ කියලයි අපි විශ්වාස කරන්නේ. මේ නිදහස් අධ්‍යාපනය උදුරා ගැනීමේ නැත්නම්, ජනයාට අහිමි කිරීමේ ව්‍යාපාරය එක එක වෙලාවට විවිධ වෙස් අරගෙන වරින් වරට නැවත නැවතත් මතු වෙමින් ආපු ඉතිහාසයක් තමයි අපට අත් විඳින්න වෙලා තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ රටේ වෛද්‍ය අධ්‍යාපනය මුදලට විකිණීම එක යුගයක නතර වුණේ මේ රටේ ශිෂ්‍ය ව්‍යාපාරයේ දරුවන්ගේ මළකඳන්වලින්; මහා ලේ පූජාවන්ගෙන්. මහා ජීවිත පූජාවන්ගෙන් තමයි මේ රටේ හොර උපාධි කඩ, වෛද්‍ය උපාධි කඩ නතර කරන්න පුළුවන් වුණේ. එදා ත්‍රිමා විතාන වැනි ශිෂ්‍ය නායකයන්ට මේ භූමියට ස්වකීය ජීවිතය පූජා කරලා ඒවා නතර කරන්න පුළුවන් වුණා. එදා ත්‍රිමා විතාන සහෝදරයා තමන්ගේ ජීවිතය පූජා නොකරන්න, එදා ශිෂ්‍ය ව්‍යාපාරය උතුරු කොළඹ ඒ හොර උපාධි කඩය අරගෙන එන කොට ඒකට එරෙහි නොවන්න අද මේ රටේ දුප්පත් අම්මා-තාත්තාගේ දරුවෙකුට වෛද්‍යවරයෙක් වෙන්න බැහැ. උතුරේ වෙන්න පුළුවන්, නැඟෙනහිර වෙන්න පුළුවන්, බටහිර වෙන්න පුළුවන්, යාපනය වෙන්න පුළුවන්, හම්බන්තොට වෙන්න පුළුවන්, මඩකලපුවේ වෙන්න පුළුවන්, කොළඹ වෙන්න පුළුවන් දුප්පත් අම්මා-තාත්තාගේ දරුවෙකුට වෛද්‍යවරයෙක් වෙන්න පුළුවන්කම ලැබෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එදා ත්‍රිමා විතාන වාගේ ශිෂ්‍යයන් ජීවිත පූජාවෙන් රැකගත්තු වෛද්‍ය අධ්‍යාපනය නැවත වතාවක් විකුණා දැමීමේ, මේ රටේ දුප්පත් අම්මා-තාත්තාගේ දරුවන් වෛද්‍ය විද්‍යාලයෙන් පිටමං කිරීමේ වෑයමක් තමයි අදත් දියත් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, SAITM හොර උපාධි කඩය අහෝසි කරනවා නම් ඒ අහෝසි කිරීමේ පනත් කෙටුම්පත එන්න තිබුණේ "සයිටම් අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත" නමින්. එහෙම තමයි මේ පනතේ නාමකරණය පවා සකස් වෙන්න තිබුණේ. නමුත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නොවෙයි තිබෙන්නේ. මේ පනතේ නාමකරණය තිබෙන්නේ ඊට වඩා වෙනස් විධියට. ඒ, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත යනුවෙනුයි. එහෙම නොවෙයි එන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොහොම වුණත් අපි මේ ආණ්ඩුවේ භාවිතය සම්බන්ධයෙන් පොඩ්ඩක් බලමු. පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතට සංශෝධන ගෙනාවා. ඒක කෙළවර වුණේ කොහොමද? මේ පාර්ලිමේන්තු ඉතිහාසයේ කළු පැල්ලමක් තියලා තමයි පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත අවසානයේ සම්මත වුණේ.

පළාත් සභා ඡන්ද විමසීම් පනතේ කාන්තා නියෝජනය ගෙනෙන්න ඇවිල්ලා ඒ පනත කෙළවර වුණේ මේ පාර්ලිමේන්තුවේ ඉතාම අඳුරු අත්දැකීමක් පාර්ලිමේන්තු ඉතිහාසයට එකතු කරලා. ඒක නිසා අද මේ ගෙනෙන පනත් කෙටුම්පත පිළිබඳවත් අපට තිබෙන්නේ මහා බලගතු සැකයක්. බලගතු සැකයක් තිබෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. SAITM පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය කියන්නේ එක පැත්තකින් ශිෂ්‍යයන් 980ක් විතරක් නොවෙයි; ඒකේ මහා දේපළක් තිබෙනවා. එක ශිෂ්‍යයෙක්ගෙන් (වෛද්‍ය) නෙවිල් ප්‍රනාන්දු - SAITM මුදලාලි- රුපියල් මිලියන ගණනින් ගත්තා. ඒ සල්ලි ටිකට දැන් මොකද වෙන්නේ? උසස් අධ්‍යාපන නියෝජ්‍ය ඇමතිතුමා මේ ගරු සභාවේ ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශිෂ්‍යයන් 980කගෙන් ගත්තු සල්ලි -(වෛද්‍ය) නෙවිල් ප්‍රනාන්දු මුදලාලි මහත්තයා ගත්තු සල්ලි- ඒ ළමයින්ට ගෙවනවාද, නැද්ද? මේ පනත් කෙටුම්පතේ විශේෂ විධිවිධානවලට ඒක අහු වුණේ නැත්තේ ඇයි?

ඒ මහා සම්පත් කන්දරාවට -මේ රටේ බදු ගෙවන අම්මා-තාත්තාගෙන් ගත්තු සල්ලිවලට, ඒ සම්පත්වලට- මොකද වෙන්නේ? ශිෂ්‍යයන් 980ක් විතරක් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට ඇතුළු කරගෙන හරි යන්නේ නැහැ. ඒකේ සල්ලි ටික, මේ සම්පත්වලට වෙන දේ ගැන තමුන්නාන්සේලා කියන්න ඕනෑ. ඒක නෙවිල් ප්‍රනාන්දුට අරගෙන යන්න දෙනවාද? ඒ SAITM එකේ ඉගෙන ගත්තු මේ රටේ බදු ගෙවන අම්මා-තාත්තාගේ ඒ අභිංසක දරුවාගේ සල්ලිවලට ආණ්ඩුව විධියට තමුන්නාන්සේලා මොකද කරන්නේ කියලා මේ පනත් කෙටුම්පත හරියට ගෙනාවා නම් කියන්න ඕනෑ. හරියට ගෙනාවා නම් ඒ සල්ලිවලට මොකද වෙන්නේ කියලා තමුන්නාන්සේලා කියන්න ඕනෑ. එක ළමයෙකුගෙන් ලක්ෂ 100 බැගින් -මිලියන 10 බැගින්- 980කගෙන් ගත්තු සල්ලිවලට මොකද වෙන්නේ කියලා තමුන්නාන්සේලා කියන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර ගෙනා මීට අදාළ අනෙක් පනත් කෙටුම්පත අහෝසි කරන්නේ නැතුව තමයි තමුන්නාන්සේලා මේ පනත් කෙටුම්පත අද අරගෙන ඇවිල්ලා තිබෙන්නේ. ඒ පනත් කෙටුම්පත තවම තිබෙනවා. ඒ පනත් කෙටුම්පත ගෙනෙනවාද නැද්ද කියලා

[ගරු ජයන්ත සමරවීර මහතා]

තමුන්නාන්සේලා කියන්න ඕනෑ. ඒක ගෙනාවොත් තමුන්නාන්සේලා මේ ගෙනෙන පනත් කෙටුම්පතෙන් වැඩක් නැහැ. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය (සංශෝධන) පනත් කෙටුම්පත තවම තිබෙනවා. ඒක තමුන්නාන්සේලා ඉවත් කරගන්නවාද, නැද්ද කියලා කිව්වේ නැහැ. ඒක ඉවත් කර ගන්නේ නැතිව ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සම්මත වුණොත් මොකද වෙන්නේ? නැවත අර පනත් කෙටුම්පත සම්මත වුණොත්, එක පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයක් නොව පෞද්ගලික වෛද්‍ය විද්‍යාල හැටහුටහමාරක් විතර මේ රටේ නැවත ඇති වෙලා වෛද්‍ය අධ්‍යාපනය මුළුමනින්ම මුදලාලිකරණයට ලක් වන, වෙළෙඳ පොළට දමන තත්ත්වය මේ රටේ නිර්මාණය වන්න පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)
මම සතුටු වනවා උසස් අධ්‍යාපන අමාත්‍යතුමා මේ වෙලාවේ මේ සභාවේ සිටීම ගැන. ගරු අමාත්‍යතුමනි, මා ඔබතුමාගෙනුයි මේ ප්‍රශ්නය අහන්නේ. ගරු උසස් අධ්‍යාපන අමාත්‍යතුමනි, ඊට පිළිතුර මා දැනගන්න කැමැතියි. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත හරහා තමුන්නාන්සේලා කියන්නේ නැහැ, SAITM හොර උපාධි කඩයේ තිබෙන සම්පත්වලට මොකද වෙන්නේ කියා. වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු මුදලාලි මහත්මයා මේ රටේ අහිංසක දරුවන්ගෙන් මිලියන ගණනින් ගත් ධනයට, භූරාගෙන කෑ ධනයට, ඒ දරුවන් රවටා ගත් ධනයට මොකද වෙන්නේ කියා මෙයින් කියන්නේ නැහැ. ඒ සල්ලි ටිකට මොකද වෙන්නේ? ඒ සල්ලි ටික පිළිබඳ උත්තරයක් ලැබෙන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එයට පැහැදිලිව උත්තරයක් දෙන්නම්. SAITM ආයතනයේ තිබෙන දේපළවලට, භාණ්ඩවලට මොනවා වනවාද කියන එක සොයන එක අපට අයිති කාරණයක් නොවෙයි. ඒක පෞද්ගලික ආයතනයක්. ඒ ගොල්ලන්ට ඕනෑ දෙයක් ඒවාට කර ගත්තාවේ. හැබැයි ඔය SAITM එක, KDU එකේ Medical Faculty එක කියන ඔක්කෝම ආරම්භ කරපු කාලයේ තමුන්නාන්සේලා බොහොම නිදාගිලිව -නිදාගෙන-සිටියා නේද? ඇයි, දැන් ඇවිත් අපෙන් ඒ ගැන අහන්නේ? ඇයි, එදා ආණ්ඩුවෙන් ඇහුවේ නැත්තේ? බොරුවට ගිරිය කඩාගෙන කෑ ගහන්න එපා.

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)
ගරු අමාත්‍යතුමනි, එක වරදක් තවත් වරදකින් නිවැරැදි කරන්න බැහැ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
තමුන්නාන්සේලා දැමූ ඒ අමාරුවෙන් මේ රටේ ජනතාව බේරාගන්නයි අප මේ හදන්නේ.

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)
එක වරදක් තවත් වරදකින් නිවැරැදි කරන්න බැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කතාව කරගෙන යන්න.

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔන්න බළලා මල්ලෙන් එළියට පනින හැටි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කතාව අවසන් කරන්න.

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් මිනිත්තුවක කාලයක් දෙන්න. එක වරදක් තවත් වරදකින් නිවැරැදි කරන්න බැහැ. ගරු අමාත්‍යතුමනි, තමුන්නාන්සේලා SAITM එක අහෝසි කරනවා නම් ඒ අහිංසක දරුවන්ගෙන් ගත් මුදල් ගැනත් සඳහන් කරමින් එය අහෝසි කිරීමේ පනත ගෙන එන්න ඕනෑ. නෙවිල් ප්‍රනාන්දු මහත්මයා SAITM හොර වෛද්‍ය උපාධි කඩය මඟින් ගත් සල්ලි ටිකට මොකද වෙන්නේ කියන ප්‍රශ්නයටත් තමුන්නාන්සේලා උත්තරයක් දෙන්න ඕනෑ. ඒ දරුවන් ටික දෙනා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට පටවා විතරක් හරි යන්නේ නැහැ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(මාණ්පුමිකු (කලානිති) විජයතාස රාජුපක්ෂ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමා, පොඩ්ඩක් ඉන්න. SAITM එක ආරම්භ කළාට පසුව එවකට පැවැති ආණ්ඩුවේ බලධාරීන්ගේ, දේශපාලනඥයන්ගේ, ඥාති මිත්‍රාදීන්ගේ ඉල්ලීම්වලට ඔය නෙවිල් ප්‍රනාන්දු වෛද්‍යතුමා රුපියල් ලක්ෂ 2,000කට වඩා වටිනාකමක scholarships දී තිබෙනවා. ඉස්සර වෙලා ඒක ගෙවන්න කියන්න. ඉස්සර වෙලා ඒක දෙන්න කියන්න.

ගරු ජයන්ත සමරවීර මහතා
(මාණ්පුමිකු ජයන්ත සමරවීර,)
(The Hon. Jayantha Samaraweera)
ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමනි, තමුන්නාන්සේ ඒ ගැන සොයන්න. ඒවා ගත් අයට ඒවා ගෙවන්න කියන්න. මේ, අහිංසක දරුවන්ගේ සල්ලි. මේ සල්ලිවලට වෙන්නේ මොකක්ද කියා කියන්න ඕනෑ. නෙවිල් ප්‍රනාන්දුට ඒ සල්ලි අරගෙන යන්න දෙනවා නම් මේ ආණ්ඩුව ගෙනාවේ ඒකට තමයි. ලැහැස්ති

වෙන්නේ ඒ සල්ලි ටික අරගෙන යන්නයි. ඒ සම්පත්වලට වෙන්නේ මොකක්ද කියන එක ගැන එක වගන්තියක්වත්, එක වචනයක්වත් මේ පනත් කෙටුම්පතේ නැහැ. ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමා.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මේ පනත් කෙටුම්පත මඟින් අවම සුදුසුකම ලෙස "S" සාමාර්ථ තුන නීතියක් බවට පත් කරන්න ලක ලැහැස්ති වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තවත් තත්පර 10ක කාලයක් දෙන්න. මා අවසාන වශයෙන් කියන්නේ මෙකයි. මෙහි සඳහන් පරිදි "S" සාමර්ථ තුනට විතරක් මේ අවස්ථාව දුන්නොත් මොකද වෙන්නේ? තමුන්නාන්සේලා මේ හදන්නේ සල්ලිකාරයන්ගේ දරුවන්ට ඕනෑම තැනකට ගිහින් ඒ සුදුසුකමට උපාධිය ලැබීමේ අවස්ථාව ඉදිරියේදී පුදන්නයි. එයටත් අපේ විරෝධතාව ප්‍රකාශ කරමින්, ඒ ආයතනයේ තිබෙන මහා සම්පත්වලට වන දේත් වගකීමෙන් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කියමින් මම නවතිනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 5.08]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මූලාසනයේ සිටින වෙලාවේ කතා කරන්න ලැබීම ගැන සන්තෝෂයට පත් වනවා. අද කතා කරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත සම්බන්ධයෙන් මේ දක්වා කතා කරපු කාරණාවලට පරිබාහිරව යමින්, එතැන් සිට කරන්නේ මොකක්ද කියන කාරණය ගැන අවධානය යොමු කරවන්න මා කැමැතියි. ඒකාබද්ධ විපක්ෂය සහ SAITM එක ආරම්භ කළ කාලයේ සිටි මන්ත්‍රීවරුන් මේ දක්වා කතා කරපු කාරණාවලින් පෙනෙන්නේ, එතුමන්ලා දැන් කිඹුල් කඳුළු හෙළනවා වාගේ ස්වභාවයක්. අපේ තවත් කතාවක් තිබෙනවා නේ, "නරියා මිදි තිත්තයි කීවා ලු" කියා. ඒ කාලයේ කට වහගෙන ඉඳලා, ඒ කාලයේ සද්ද නැතිව ඉඳලා මේ අය දැන් කතා කරනවා; දැන් කිඹුල් කඳුළු හෙළනවා. සදාචාරාත්මකව කල්පනා කළොත්, මේ අයට මේ ගැන කතා කරන්න කිසිම සදාචාරාත්මක අයිතියක් නැහැ. එදායි විරුද්ධ වෙන්න තිබුණේ. අප මේ කළේ එදා වූ වැරැද්ද නිවැරැදි කිරීමයි. එදා තිබුණේ ප්‍රමිතිය පිළිබඳ ප්‍රශ්නයයි. ප්‍රමිතිගත උසස් අධ්‍යාපනයක් මේ රටට අවශ්‍යයි. අප එදා සිට කතා කළේ ප්‍රමිතිගත උසස් අධ්‍යාපනයක් අවශ්‍යයි කියන එකයි. එය පෞද්ගලික ද, රජයේ ද කියන ප්‍රශ්නය වෙනත් ප්‍රශ්නයක්. පෞද්ගලික වෛද්‍ය විද්‍යාලවලට වාගේම රජයේ වෛද්‍ය විද්‍යාලවලටත් ප්‍රමිතිගත උසස් අධ්‍යාපන ක්‍රමයක් අවශ්‍යයි. ඒ නිසා තමයි අපි කියන්නේ මේ යෝජනා කර තිබෙන ආකාරයට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය ඒකාබද්ධව ඇති කරන අවම ප්‍රතිපාදන, අවම සුදුසුකම් මේ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලට වාගේම රජයේ විශ්වවිද්‍යාලවලටත් අවශ්‍යයි කියලා. අපි ඒක පිළිගන්නවා. ඒ ගැන කථාවක් නැහැ.

ඒක නොවෙයි, තිබෙන ප්‍රශ්නය. මේ රටේ මෙතැනින් එහාට පෞද්ගලික උසස් අධ්‍යාපනය; විශේෂයෙන්ම වෛද්‍ය අධ්‍යාපනය ඉවරද, මේ අවසානයද? මිනී පෙට්ටියට ඇණ ගහනවා වාගේ ඒක අවසන් කරනවාද? ඒකයි අද අපි කථා කරන්න ඕනෑ. මෙතැනින් පස්සේ අපි හදන්නේ මොකක්ද? අපි පිළිගන්නා කාරණයක් තමයි, මේ රටේ උසස් අධ්‍යාපනය සඳහා තිබෙන අයිතීන් ආරක්ෂා කළ යුතුය කියන එක. ඒ අයිතීන් පෞද්ගලිකද, රජයේද කියන ප්‍රශ්නය නොවෙයි තිබෙන්නේ. පෞද්ගලික පාසල්වලට යන දරුවන් මේ රටේ ඉන්නවා. එතකොට ඒ පෞද්ගලික පාසල්වලට යන දරුවන් විශ්වවිද්‍යාලවලට යන්නේ කොහොමද? මොකද, පෞද්ගලික පාසල්වලට යන දරුවන්ට රජයේ විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන්න ක්‍රමයක් නැහැ. ඒක ගරු ඇමතිතුමන්ලා දන්නවා. ඒ නිසා ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන, ඒ සඳහා අවශ්‍ය විද්‍යානුකූල ක්‍රමයක්, ප්‍රමිතියක් අපි ඇති කළ යුතුයි. ඒ කාලයේ ගත්ත තීරණ අනුව පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන වාගේම පෞද්ගලික පාසල් තිබෙනවා. දැන් මේ පෞද්ගලික පාසල් පද්ධතිය වහලා දමන්න කියනවාද? නැහැ. මේක තමයි ලෝකයේම පිළිගත් ක්‍රමය. මේ රටේ ප්‍රමිතිගත අධ්‍යාපනයක් හරහා සියලුම අවස්ථා ඇති කළ යුතුයි. මේ කාරණය එන කොට, SAITM ප්‍රශ්නය මුලින්ම කථා කරන කොට මම කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උප කුලපතිතුමාගෙන් ඇහුවේ "කවදා හරි දවසක ඔබතුමාට SAITM ආයතනය ගන්න වෙයි, ඒක කරන්න ඔබතුමාට පුළුවන්ද?" කියලා. පසු කාලයක මේ ගැන එතුමා අපිත් එක්ක සාකච්ඡා කළා. ඒක තමයි ඇත්ත කථාව. මෙතැන වුණු වැරැද්ද හදා ගන්න තිබෙන හොඳම ක්‍රමය ඒකයි.

විශේෂයෙන්ම අපේ උසස් අධ්‍යාපන අමාත්‍ය ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා. ඔබතුමා ඉතාමත් කාර්යශූරව, ඉක්මනින් මේ කටයුත්ත කළා. ඒ ගෞරවය ඔබතුමාට හිමි වෙනවා. අවම වශයෙන් ළමයින් නවසිය ගණනක් එළියට ඇදලා දමන්න තිබුණ කූට උපක්‍රම ඔක්කොම නවත්වලා, අවසානයේ අපට ප්‍රතිඵලය ලබා ගන්න හැකියාවක් ලැබුණා. ගරු ඇමතිතුමනි, දැන් මෙතැනින් එහාට අපි කල්පනා කළ යුතුයි. මෙතැනින් එහාට තමයි ප්‍රශ්නය තිබෙන්නේ. මොකද, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ළමයින් නවසිය ගණනකට අලුතින් උගන්වන්න අපට පුළුවන් නම්, ඒ ළමයින් නවසිය ගණනට උගන්වලා ඉවර වුණාට පස්සේ ඒක නවත්වන්න එපා. ඊට පස්සේ තවත් ළමයි නවසිය ගණනකට උගන්වන්න පටන් ගන්න ඉඩ තිබෙනවා. මේ විශ්වවිද්‍යාලය ඇතුළේ ඒ අත්දැකීම තිබෙනවා; ඒ අත්දැකීම හැදෙනවා. වෛද්‍ය පීඨයක් හැටියට වැඩියෙන් ළමයින්ට උගන්වන්න අවස්ථාව හැදෙනවා. අපි මේ අවස්ථාව ප්‍රයෝජනයට ගත යුතුයි. මේක වහන්න එපා. තව තවත් අවස්ථා ඇති කරන්න ඕනෑ. ඒ වාගේම රජයේ විශ්වවිද්‍යාලවල; සබරගමුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ආරම්භ වෙනවා; වයඹ වෛද්‍ය පීඨය ආරම්භ වෙනවා. මේ රටේ සියලු විශ්වවිද්‍යාලවල වැඩිපුර වෛද්‍ය පීඨ ආරම්භ කළ යුතුයි. රටේ පිළිගත්, රජයේ අනුමත උසස් අධ්‍යාපන ආයතන 19ක් දැනට තිබෙනවා. මේ 19 ඇතුළේ තවත් වෛද්‍ය පීඨ ආරම්භ කරන්න අපි අවස්ථාව හදලා දෙන්න ඕනෑ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

තව මාස දෙකක් ඇතුළත රත්නපුරයේ සබරගමුව වෛද්‍ය පීඨය ආරම්භ කරනවා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

බොහොම හොඳයි. බොහොම සන්තෝෂයි. මේවා තමයි රටට අවශ්‍ය. ඔබතුමා දන්නවා; අපි හැමෝම දන්නවා සමාජවාදය කරපින්නාගෙන ඉන්න හැමෝගේම නායකයෝ ඉන්න කියුබාවේ අද කොච්චර වෛද්‍යවරු හැදෙනවාද, කොච්චර වෛද්‍යවරු පුහුණුවෙලා අලුතින් එළියට එනවාද කියලා. ඒ, කියුබාවට විතරක් අවශ්‍ය වෛද්‍යවරු නොවෙයි. ලෝකය පුරා විහිදෙන වෛද්‍යවරු කණ්ඩායමක් කියුබාව හදනවා. ඇයි, අපට මේක කරන්න බැරි?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා දකින විධියට මේ රට සංවර්ධනය කරා ගෙන යන්න පුළුවන් එකම, හොඳම ක්‍රමය knowledge economy එක විතරයි. දැනුම සමඟ සම්බන්ධ වුණු economy එකක් තුළින් විතරයි රට ඉදිරියට ගෙන යන්න පුළුවන් වන්නේ. අපේ නිෂ්පාදන ආර්ථිකය ඇතුළු අනෙක් ආර්ථිකයන් කඩා වැටිලායි තිබෙන්නේ. අපට ඒවා කර ගන්න බැහැ. මොකද, අපට ඉන්දියාව වාගේ වෙළෙඳ පොළවල් එක්ක තරග කරන්න බැහැ. චීනයත් එක්ක තරග කරන්න බැහැ. නමුත් අපේ දරුවන්ගේ මොළ හොඳම මොළ හැටියට, ලෝකය සමඟ තරග කරවන්න අපට පුළුවන්. අපි ඒකට අවස්ථා ඇති කළ යුතුයි. විශ්වවිද්‍යාල වරම් ලබන එක්ලක්ෂ පණස්දහසක දරුවන්ගෙන් තිස්දහසකට අඩු ප්‍රමාණයකට පමණයි අපට තවම රජයේ විශ්වවිද්‍යාල ඇතුළේ ඉඩ දෙන්න පුළුවන්කම තිබෙන්නේ. අපි ඒක දෙගුණයක් කළ යුතුයි. ඒ වාගේම ප්‍රමිතිගත පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල ඉඩ කඩ තව වැඩි කළ යුතුයි. ඒ හරහා හැකිතාක් දුරට විශ්වවිද්‍යාල වැඩියෙන් ඇති කරලා, උසස් අධ්‍යාපනය සඳහා පහසුකම් ඇති කර දුන්නොත් knowledge economy එකක් විධියට ඉදිරියට යන්න අපට පුළුවන් වෙනවා. අද අපට IT engineersලා 18,000ක් ඕනෑ. නමුත් හැදෙන්නේ 16,000ක් පමණයි. අපි මේ ගැන කල්පනා කරන්න ඕනෑ. ඒ වාගේම තමයි අද ලෝකය IT engineersලා අලුතින් ඉල්ලනවා. 2020 වන විට ජපානය IT engineersලා ලක්ෂ 3ක් පිට රටවලින් ඉල්ලනවා. අපට අන්න ඒ market එක හදාගෙන knowledge economy එක ලබා දෙන්න පුළුවන් නම්, අපේ අම්මලා, නංගිලා, අක්කලා වහල් සේවයට පිට රට යවන එක නවත්වලා, skilled labour, දැනුමක් තිබෙන professionalsලා පිට රට යවන්න පුළුවන්. එහෙම ආදායම් ලබා ගන්නා ක්‍රමවේදයකට මේ රට යා යුතුයි. ඒක තමයි මේ රට දියුණු කරන්න අපට තිබෙන අවසාන ක්‍රමවේදය. ඒ නිසා උසස් අධ්‍යාපන ඇමතිතුමනි, ඒ ගැන කල්පනා කරන්න ඔබතුමාට හැකියාව තිබෙනවා. උදාහරණයක් හැටියට අපි නිතරම ආංශික අධීක්ෂණ කාරක සභාවේ - Sectoral Oversight Committee එකේ- මේ ගැන කථා කළා. පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අයත් අක්කර එක්දහස් ගණනක් තිබෙනවා. දැනට ළමයින් 25,000ක්, 30,000ක් විතර ඒ විශ්වවිද්‍යාලයේ ඉන්නේ. මේ ගණන double කරන්න පුළුවන්. ඒක ළමයින් 50,000කට විතර ඉගෙන ගන්න පුළුවන් විශ්වවිද්‍යාලයක්. රාත්‍රී පාඨමාලා පටන් ගන්න ඉතාමත් හොඳ තැනක්. සමහර විද්‍යාගාර, සමහර දේශනාගාර, සමහර departments සතියකට එක පැයයි පාවිච්චි කරන්නේ. මේක තමයි ඇත්ත තත්ත්වය. නමුත් හරි ක්‍රමවේදයක් තුළ නිසි කළමනාකාරිත්වයකින් කරන්න හැකියාව ලැබුණොත් ඒක ළමයි 50,000ක් ඉගෙන ගන්නා විශ්වවිද්‍යාලයක් බවට පරිවර්තනය කරන්න පුළුවන්. ඒක අපට අවශ්‍යයි. විශ්වවිද්‍යාලවලට රාත්‍රී පාඨමාලා අවශ්‍යයි. ඒ වාගේම පර්යේෂණ මට්ටමේ විශ්වවිද්‍යාල අවශ්‍යයි. මෙන්න මේවා තමයි අපි මෙතැනින් එහාට කථා කළ යුත්තේ. එහෙම නැතිව, SAITM මිනී පෙට්ටියට ඇණය ගහලා මෙතැනින් මේ කටයුතු නවත්වනවාද? නැහැ එහෙම කරන්න බැහැ. උසස් අධ්‍යාපනය හදාරන්න අයිතිවාසිකම් තිබෙන එක්ලක්ෂ පනස්දහසක් වන මේ සියලු දරුවන්ට අපි මේ රටේ ඉගැන්විය යුතුයි. එහෙම නැත්නම් මොකද වෙන්නේ?

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් බලන්නකෝ GMOA එක කරන ලස්සන සෙල්ලම. Act 16 විභාගයට ටියුෂන් දෙනවා! දරුවන් මේ රටින් නේපාලයට යවනවා; බංග්ලාදේශයට යවනවා වෛද්‍ය විද්‍යාව හදාරන්න. ඒවායේ උගන්වන ක්‍රමයවත් අපි දන්නේ නැහැ; අපට හොයන්න ක්‍රමයකුත් නැහැ. GMOA එක මොකද කරන්නේ? ටියුෂන් දීලා ඒ දරුවන් පාස් කරන ක්‍රමය හදනවා. ලංකාව ඇතුළේ ප්‍රමිතිගත උසස් අධ්‍යාපන ආයතන හදලා, ඒවාට ගිහිල්ලා, ඒවායේ උගන්වන ක්‍රමය බලන්න තිබෙන අවස්ථාව නැති කරලා, පෞද්ගලිකව මුදල් හොයා ගන්න ක්‍රමවේදයක් ඒ අය හදා ගන්නවා. ඒක තමයි මෙතැන තිබෙන කුහකකම. ඒ හැර වෙනත් දෙයක් නැහැ. මේ රටේ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවල ඉංජිනේරු පීඨ ආරම්භ කරන්න පුළුවන් නම්, ඇයි වෛද්‍ය පීඨ ආරම්භ කරන්න බැරි?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේක තමයි අරුම පුදුම ප්‍රශ්නය. මේ ප්‍රශ්නයට අපි පිළිතුරු සෙවිය යුතුයි. මේ ප්‍රශ්නය කරට අරගෙන විසඳන්නට උදව් කිරීම ගැන කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට මගේ විශේෂ ස්තුතිය ප්‍රකාශ කරනවා. මෙතැනින් පස්සේ ඔබතුමන්ලාට තිබෙන්නේ, මේ විශ්වවිද්‍යාලයට ලැබුණු මේ කීර්තියත් එක්ක ඔබතුමන්ලාගේ කටයුතු තව දෙගුණ තෙගුණ කරලා, හැකිනම් ඊළඟ අවුරුද්දේ ඉඳලා ළමයින් දහසකට ඉගෙන ගන්න පුළුවන් වෛද්‍ය පීඨයක් හදන එකයි. එහෙම නොවුණොත්, මේ රටේ උසස් අධ්‍යාපනය සඳහා ඇති ඉඩ කඩ නැති කර දැමීමක් වනවා. බංකොලොත් දේශපාලන පක්ෂවල සිටින කිහිප දෙනෙකුට මේ රටේ උසස් අධ්‍යාපන අයිතිය නැති කරන්න බැහැ. මේ බංකොලොත් දේශපාලන න්‍යාය පත්‍රවලට අනුව වැඩ කරන අය මේ ප්‍රශ්නයේදී පාරවල්වල හිටපු හැටි අපි දැක්කා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ කියන කට්ටිය කිසිම දවසක කථා කරලා තිබෙනවාද,"අපට උගන්වන දේවල් වැරදියි, අපේ ශාස්ත්‍ර පීඨයේ උගන්වන දේවල් වැරදියි. අපට වෛද්‍ය පීඨයේ පාඨමාලා හදාරන්නත් අවස්ථාව දෙන්න" කියලා? ඒ ගොල්ලෝ ඒවා කථා කරන්නේ නැහැ. ලෝකයේ දියුණු වුණු විශ්වවිද්‍යාලවල ශාස්ත්‍ර පීඨයේ ඉගෙන ගන්නා අයට වෛද්‍ය පීඨයේ පාඨමාලා ඉගෙන ගන්න පුළුවන්; ශාස්ත්‍ර පීඨයේ ඉගෙන ගන්නා අයට ඉංජිනේරු පීඨයේ පාඨමාලා ඉගෙන ගන්න පුළුවන්. එහෙම තමයි ලෝකය වෙනස් වෙලා තිබෙන්නේ. නවීන තාක්ෂණයත් එක්ක ලෝකය ඉස්සරහට යන්නේ එහෙමයි. අන්න එහෙම කල්පනා කරන ළමයි පිරිසක් අපි මේ රටේ හදා ගන්න ඕනෑ. එහෙම හදා ගත්තේ නැත්නම් අපට හැම දාම වෙන්නේ, අරාබියේ වහල් සේවයට යන අපේ අම්මලා, අපේ අක්කලා, අපේ නංගිලා ඒ වහල් සේවයෙන් එවන සල්ලිවලින් යැපෙන කාලකණ්ණි ජාතියක් බවට පත් වෙන්නයි. ඒක අපි නැවැත්විය යුතුයි කියලායි මම හිතන්නේ. ඒකට හොඳම අවස්ථාව දැන් අපට උදා වෙලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මා උසස් අධ්‍යාපන ඇමතිතුමාගෙන් මේ ඉල්ලීම කරනවා. මේ ගැන පුළුල් සාකච්ඡාවක් කරලා, වර්තමානයේ විශ්වවිද්‍යාලවලට තිස්දහසක් බඳවා ගැනීම දෙගුණයක් කරන ක්‍රමයක් අපි හදාගන්න ඕනෑ. ඊට අමතරව, ප්‍රමිතිගත උසස් අධ්‍යාපන ආයතන ඇති කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

ගරු ඇමතිතුමනි, අනුමත කළ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන ඇතුළේත් දැනට අක්‍රමිකතා සිද්ධ වෙනවා. "S" 3 කියන අවම සුදුසුකමවත් නැති අයට උපාධි ලබා දෙන ක්‍රම ඒ ආයතන හදා ගෙන තිබුණු හැටි අපි දැක්කා. මේ පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලට අවම ප්‍රමිතියක් තිබිය යුතුයි. අඩුම තරමින් ඒ ස්ථානවල වර්ග අඩි 50,000කවත් space එකක් තිබෙන්න ඕනෑය කියලා අපි කිව්වා. එහෙම ඉඩක් තිබෙන ස්ථානයක උගන්වන්නයි අපි අවස්ථාව දෙන්න ඕනෑ. නමුත්, මේ ගොල්ලෝ බෝඩ් ලෑලි දමාගෙන වෙන වෙන තැන්වල උගන්වනවා. මේ ගැනත් සොයා බලන්න ඕනෑය කියා මම ගරු ඇමතිතුමාගෙන් විශේෂයෙන් ඉල්ලනවා. ඒ අවසර දෙන තැන ඉගැන්විය යුතුයි. එහෙම නැති වුණොත්, ඒ ප්‍රමිතිය බාල්දු වෙන එකයි වන්නේ. ප්‍රමිතිගත පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනත් එක්ක රජයේ විශ්වවිද්‍යාල තරගකාරී level එකට ගෙනාවොත් විතරයි ජාත්‍යන්තරය පිළිගන්නා උසස් අධ්‍යාපන ආයතන, විශ්වවිද්‍යාල ඇති වන්නේ.

අවසන් වශයෙන් මම තව ඉල්ලීමක් කරනවා,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Membe
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. කාලය අවසානයි.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
දැනට පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතනවලට යොදා ගන්නා "Institute" කියන වචනය ඉවත් කරලා, ඒ ගොල්ලන්ටත් "විශ්වවිද්‍යාල" කියන නම දෙන්න ඕනෑ. එහෙම දුන්නොත් තමයි ලෝකයත් එක්ක තරගකාරීව කටයුතු කරන්න හැකි වන්නේ. හැබැයි, ඒ විශ්වවිද්‍යාල තත්ත්වය ලබා දීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ගත යුතු වෙනවා. අන්න ඒ ප්‍රමිතියත් හදන්න කියා ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 5.19]

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් ගැන සාකච්ඡා කරන අවස්ථාවක්. 2009දී ආරම්භ වුණු මේ SAITM ප්‍රශ්නය අවසානයක් දක්වා ගෙනැල්ලා අද යම් කිසි විසඳුමක් ලබාදීමට කටයුතු කිරීම පිළිබඳව විශේෂයෙන්ම අපි වර්තමාන උසස් අධ්‍යාපන ඇමතිතුමාට ස්තුතිවන්ත වනවා.

SAITM ආයතනය -වෛද්‍ය පීඨය- අහෝසි කරන්න අද යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒ පිළිබඳව අපගේ ස්තුතිය පුද කරනවා. South Asian Institute of Technology and Management කියන එකේ "Management" කියන කොටස තමයි පසුව "Medicine" බවට පත් වුණේ. මේ ආයතනයට සිසුන් ඇතුළත් කර ගැනීමේ අවම ප්‍රමිතිය පිළිබඳ ගැටලු මතු වුණා. මෙහි පාඨමාලා ආරම්භ වුණේ ලංකාවේ අවුරුදු දෙකක් ඉගෙන ගෙන, ඉන්දීය අවුරුදු තුන හෝ අවුරුදු තුනහමාර රුසියන් වෛද්‍ය විද්‍යාලයක අධ්‍යාපනය ලබා දෙනවා කියලායි. නමුත්, වෛද්‍ය සංගමය ඒක පිළිගන්නේ නැහැ. දරුවන් තැන් දෙකක අධ්‍යාපනය ලැබුවාම, SLMC එක ඒක පිළිගන්නේ නැහැ. මේ ආයතනයට එවැනි ගැටලු රාශියක් තිබුණා. මේ ආයතනයේ ප්‍රමිතිය පිළිබඳ ගැටලුත් තිබුණා. සායනික පුහුණුව පිළිබඳවත් ගැටලු තිබුණා. මේ ගැටලු අවසන් කරන්න යම් කිසි ක්‍රමවේදයක් ඔබතුමාගේ මැදිහත්වීමෙන් ඉදිරිපත් කිරීම පිළිබඳ ඔබතුමාටත්, අපේ රාජ්‍ය ඇමතිතුමාටත් ස්තුතිවන්ත වනවා.

හැබැයි, ගරු ඇමතිතුමනි, මෙතැන අවම සුදුසුකම පිළිබඳව ගැටලුවක් තිබෙනවා. වෛද්‍ය විද්‍යාව හදාරන්න අවශ්‍ය අවම සුදුසුකම වන්නේ උසස් පෙළ විභාගයේ සාමාන්‍ය සාමර්ථ 3යි. ඒ විධියට අවම සුදුසුකම "S" තුනක් හැටියට සැලකුවොත් වෛද්‍ය අධ්‍යාපනය සහ වෛද්‍ය වෘත්තිය කනත්තට යන දවස ඉක්මන් වෙයි කියලායි මට හිතෙන්නේ. අද අපේ රටේ ඉහළම Z-score අගයෙන් සියයට 40ක් දරුවන් merit ක්‍රමයට වෛද්‍ය විද්‍යාව හදාරන්න විශ්වවිද්‍යාලවලට තේරෙනකොට, සියයට 60ක් තේරෙන්නේ දිස්ත්‍රික් පදනම යටතේ. "S" තුනෙන් වෛද්‍ය විද්‍යාව හදාරන්න විශ්වවිද්‍යාලයට ශිෂ්‍යයන් ඇතුළත් කර ගන්නවාට අද ශිෂ්‍යයනුත් විරුද්ධයි, ආචාර්ය සංගමයත් විරුද්ධයි. මේ දෙගොල්ලන්ම මේ "S" තුන කියන අවම සුදුසුකම අයින් කරන්න කියලා එක මතයක ඉන්නවා. මම හිතන හැටියට "S" තුනක් තිබුණාට, කිසිම විෂය ධාරාවකින් රජයේ විශ්වවිද්‍යාලයක ඉගෙනුම ලබන්න සුදුස්සෙක් වෙන්න බැහැ. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා, මේ "S" තුන කියන අවම සුදුසුකම වෙනස් කරන්න කියලා. ඒ වෙනුවට, රාජ්‍ය වෛද්‍ය විද්‍යාලයකට ඇතුළත් වෙන්න නම්, අවම Z-score එක අවම සුදුසුකම කරන්න කියන එකත් මම යෝජනා කරනවා. "S" තුනෙන් වෛද්‍ය විද්‍යාලයකට ඇතුළත් කරගත් කාලයක් තිබෙන්න ඇති. නමුත්, කාලයත් සමඟ තත්ත්වය වෙනස් වෙන නිසා රජයේ වෛද්‍ය විද්‍යාලයකට ඇතුළත් වෙන්න නම්, අවම Z Score එක අවම සුදුසුකම හැටියට ගත්තොත් මම හිතන හැටියට ඒක ඉතාම වැදගත්. මේ තත්ත්වය වසරින් වසර වෙනස් වෙයි. මේ SAITM ආයතනයට බඳවා ගැනීමේදීත් අවම සුදුසුකම හැටියට බැලුවේ උසස් පෙළ "C" දෙකයි, "S" එක මිස "S" තුන නොවෙයි. එම නිසා "S" තුන කියන අවම සුදුසුකම නීතිගත වුණොත් නරක පූර්වාදර්ශයක් වෙයි කියලා මා හිතනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමියනි, මේ පිළිබඳව මා මීට පෙර පැහැදිලි කළා. ඒ වෙලාවේ ඔබතුමිය මේ සභාවේ හිටියේ නැහැ. 2005 වසරේ ඉඳලාම ඒ සුදුසුකම් පිළිබඳ ලැයිස්තුව මා ඉදිරිපත් කළා. ඒ අනුව මම උදාහරණයක් ගත්තොත්, 2009-2010 වසරේ රාජ්‍ය විශ්වවිද්‍යාලයට "S" තුනේ ළමයිනුත් අරගෙන තිබෙනවා. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව ඒ කියන වසරවලදී මූලික සුදුසුකම විධියට සලකා තිබෙන්නේ, "S" තුන. ඒක තමයි අපි පදනම් කළේ. නමුත් අපි දන්නවා, පහු වෙනකොට "S" තුනක් තිබෙන ළමයි විශ්වවිද්‍යාලයට ගත්තේ නැහැ කියලා. මොකද, Z-score අගය ඉහළ තිබෙන ළමයි ගොඩාක් හිටිය නිසා. මෙය රාජ්‍ය ප්‍රතිපත්තියක් විධියට ඉදිරියට ගෙන යන්න ගෙනාපු තීරණයක් නොවෙයි. මේ සුවිශේෂ ගැටලුවට වෙන විකල්පයක් නැති නිසාත්, මේ සුවිශේෂ ගැටලුවට ප්‍රතිකර්මයක් ලබා දීම සඳහාත් තමයි අපි මේ ක්‍රමය අනුගමනය කළේ.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

මේ අවස්ථාවට පමණක් සීමා වන විධියට මේ අවම සුදුසුකම සලකන එක හොඳයි. එහෙම නැති වුණොත්, මෙය නීතියක් බවට පත් වුණොත්-

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මේ පනතට අනුව ඒ සියලු දේවල් අදාළ මේ ළමයි 900 ගණනට විතරමයි.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

මේ ළමයි අතරවත් "S" තුන පමණක් ගත්ත අය ඉන්නවා කියලා මම හිතන්නේ නැහැ. මූලිකව දිස්ත්‍රික්කයෙන් තමයි "S" තුන තිබුණු දරුවන් අරගෙන තිබෙන්නේ. ඒක හරිම සාධාරණයි. මොකද, ඒ අය අවුරුදු 30ක යුද්ධයකට කොටුවෙලා හිටපු දරුවන් නිසා. හැබැයි, අද අනෙක් දිස්ත්‍රික්කවල "A" තුන ගත්ත දරුවන්ටත් වෛද්‍ය විද්‍යාලයකට යන්න බැරිව ඉන්නවා. මොකද, Z-score එක මදි නිසා. අපි "S" තුන ගත්ත දරුවන්ට-

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

එවැනි කීප දෙනයි ඉන්නේ. වැඩි පිරිසක් නැහැ.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

ඒ කාලයේ රජයේ විශ්වවිද්‍යාලවලටත් ශිෂ්‍යයන් ඇතුළත් කළේ "S" තුනෙන්. [බාධා කිරීමක්] 2010 වසරේදී ගත්තේ "C" දෙකෙන් සහ "S" එකෙන්. [බාධා කිරීමක්]

ඒක නිවැරදි වෙනවා නම් ඉතාම වැදගත්. එහෙම නැත්නම්, "S" තුන තිබෙන, සල්ලි තිබෙන දෙමව්පියන්ගේ දරුවන්ට වෛද්‍යවරු වීමේ ඉඩ කඩ තමයි අපි සපයන්නේ. එම නිසා ඇමතිතුමා කළ පැහැදිලි කිරීම මම පිළිගන්නවා. ඒ පැහැදිලි කිරීම ඉතාම වැදගත්. විදේශීය රටවල Advanced Level විභාගයෙන් ඉහළම ලකුණු ගත්තත් සම්මුඛ පරීක්ෂණයක් කරලා තමයි වෛද්‍ය අධ්‍යාපනයට තෝරා ගන්නේ. ඉහළ ලකුණු ගැනීම පමණක් නොවෙයි එතැනදී බලන්නේ. මොකද, මේ course එක හරිම අමාරු එකක් නිසා. ඒ වාගේම, මේ වෘත්තිය දරා ගන්න පුළුවන් අය තමයි තෝරා ගන්නේ. එම නිසා මේ වෘත්තියේ ගුණාත්මකභාවය ආරක්ෂා කර ගැනීම ඉතා වැදගත් කියන එක අපි මතක් කරන්න ඕනෑ.

ඒ වාගේම තවත් ගැටලුවක් මතු වුණා. SAITM ආයතනයේ වෛද්‍ය විද්‍යාව හදාරපු දරුවන්ට සායනික පුහුණුව ලබා ගැනීම පිළිබඳව ගැටලුවක් තිබුණා, ප්‍රමිතියක් නැහැ කියන එක ගැන. විශේෂයෙන්ම පුහුණුව ලබා ගැනීමට මහාචාර්ය ඒකකයක් තිබුණේ නැහැ. එම නිසා KDU එකට අන්තර්ග්‍රහණය කළා වාගේම, ඔවුන්ට සායනික පුහුණුව ලබාදීමත් ඉතාම වැදගත් වෙනවා. ඒ ක්‍රමවේදය මෙම සංශෝධනයට ඇතුළත් කරන්න බැහැ. නමුත්, ඉතාමත්ම වැදගත් වෙනවා,-

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම ක්‍රමවේදය ඇතුළත් කරලා තිබෙනවා. මම මුලිනුත් පැහැදිලි කළා, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට ශිෂ්‍යයන් අන්තර්ග්‍රහණය කරන්නේ ඒ ප්‍රතිඵල මතම නොවෙයි. උපාධිය සමත් වුණු අයත් ඉන්නවා. විශේෂඥ මණ්ඩලය විසින් ඒ පිළිබඳ තක්සේරුවක් කරලා ඒ අයට අවශ්‍ය අධ්‍යාපන කටයුතු වාගේම මහාචාර්ය අංශවල සායනික පුහුණුව තවදුරටත් අවශ්‍ය ප්‍රමාණයට ලබා දුන්නාට පස්සේ තමයි; එය සාර්ථව ඉටු කළොත් විතරයි උපාධිය ලැබෙන්නේ.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

ඒක ඉතාමත්ම හොඳයි, ගරු ඇමතිතුමනි. මොකද, දරුවෝ, ආචාර්ය මණ්ඩලය අද පාරේ ඉන්නේ ඔය ගැටලු දෙක වන අවම ප්‍රමිතිය සහ සායනික පුහුණුව කරන ක්‍රමවේදය පිළිබඳව විනිවිදභාවයක් නැති නිසායි. ඒ පිළිබඳව ඔවුන්ව දැනුවත් කරනවා නම් මේ විරෝධය නවතියි කියලා මම විශ්වාස කරනවා. මොකද, එම කාරණා දෙක තමයි අද ආචාර්ය මණ්ඩලය සහ දරුවෝ පාරට බහින්න හේතු වෙලා තිබෙන ප්‍රධානම කාරණා. ඒ පිළිබඳව ඔබතුමාගේ වැඩ පිළිවෙළක් තිබෙනවා නම් ඒක ඉතාමත්ම හොඳයි. මොකද, වෛද්‍යවරු කියලා කියන්නේ ජීවිතත් එක්ක ගනුදෙනු කරන උදවිය. එම නිසා ගුණාත්මකභාවයකින් යුත් වෛද්‍යවරුන් බිහි වුණොත් තමයි ඔවුන්ට අපේ රටේ ජනතාවට සේවය කරන්න පුළුවන් වෙන්නේ. සාමාන්‍ය කථාවට කියනවා, "නීතිඥ මහත්මයෙකුට වැරදුණොත් අඩි 6ක් උඩට යනවා, වෛද්‍යවරයෙකුට වැරදුණොත් අඩි 6ක් පහළට යනවා" කියලා. අඩි 6ක් උඩට යන කෙනාට නම් appeal කරන්න හෝ අවස්ථාවක් ලැබෙනවා. හැබැයි, අඩි 6ක් පහළට ගියොත් නම් ගියාම තමයි. එම නිසා වෛද්‍ය අධ්‍යාපනයේ ප්‍රමිතිය ආරක්ෂා කිරීම ඉතාමත්ම වැදගත් වෙනවා. මම පෞද්ගලිකව හිතනවා, මේ රටේ පෞද්ගලික අධ්‍යාපනය අපි පිළිගෙන තිබෙනවා කියලා. එම නිසා අවශ්‍ය කරන මූලික ප්‍රමිතීන්වලට අනුගත වුණු දරුවන්ට, විශේෂයෙන්ම අපොස(උසස් පෙළ) විභාගයෙන් "A" 3ක් ලබාගෙන රජයේ වෛද්‍ය විද්‍යාලවලට යන්න නොලැබෙන දරුවන්ටත් වෛද්‍ය අධ්‍යාපනය හදාරන්න යම් කිසි ක්‍රමවේදයක් තිබෙනවා නම් ඉතාමත්ම හොඳයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමියට වෙන් වුණු කාලය දැන් අවසන්.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

එම නිසා ප්‍රතිපත්තියක් හැටියට පෞද්ගලික වෛද්‍ය අධ්‍යාපනය සඳහා ළමයින්ට අවස්ථාව දෙන්න වෙනවා. ඒ වාගේම තමයි අපේ රට තුළ වෘත්තීය අධ්‍යාපනය හරහා ආර්ථිකය දියුණු කරගන්න පුළුවන්; ආදායමක් ලබාගන්න පුළුවන්. විශේෂයෙන්ම අපේ රටේ අධ්‍යාපනයේ ගුණාත්මකභාවය පිළිබඳව හොඳ පැහැදීමක් තිබෙනවා. එම නිසා තත්ත්ව පාලනය සහිත හොඳ වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කරලා, සියයට 50ක් දකුණු ආසියානු කලාපයේ දරුවොත් -විදේශීය දරුවොත්- මෙහි ගෙනැල්ලා අධ්‍යාපනය ලබා දෙන්න පුළුවන් බව මතක් කරමින්, මට කථා කරන්න කාලය වෙන් කර දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි.

මීළඟට, ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා.

[අ.භා. 5.29]

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. වසර ගණනාවක් තිස්සේ, මේ රජය බලයට පත් වුණු දවසේ ඉඳලා මේ රටේ තිබෙන දැවැන්ත ප්‍රශ්නයකට අවසන් විසඳුමක් ගෙනෙන්න, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත දෙවන වර කියැවීම සඳහා අද දින ඉදිරිපත් කර තිබෙනවා. ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයට SAITM සිසු දරුවන් ඇතුළත් කර ගැනීම කියන කාරණාව දක්වා රටේ දැවැන්ත ප්‍රශ්න රාශියක් ඒ හරහා නිර්මාණය වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙහි ඉතිහාසය ගත්තොත්, මේ යහ පාලන රජය අනවශ්‍ය, විසඳිය හැකි ප්‍රශ්නයක් කර තබාගෙන අවුරුදු තුනක්, තුනහමාරක් ආවා කියලා මම විශ්වාස කරනවා. මොකද, අද ගන්නා වූ මේ විසඳුම මීට වසර ගණනාවකට ඉස්සෙල්ලා ගත යුතුව තිබූ විසඳුමක්. නමුත් මෙවැනි පැත්තකට යන සාකච්ඡාවක්වත් ඉතිහාසය පුරා අපි දැක්කේ නැහැ. මීට පෙර හැම වෙලාවේම උත්සාහ කළේ; සෑම කථිකාවතකම තිබුණේ, SAITM ආයතනය, එහෙම නැත්නම් වෛද්‍ය නෙවිල් ප්‍රනාන්දු මහතාගේ ආයතනය කෙසේ හෝ එතැනම ස්ථාපිත කරන්නයි. එවැනි යෝජනා තමයි තිබුණේ. නෙවිල් ප්‍රනාන්දු මහත්මයාට ඒක කරගෙන යන්න සහයෝගය දෙන්න කියලා, අපිත් පසුගිය කාල සීමාව තුළ, අවුරුදු ගණනාවක් තිස්සේම රූපවාහිනී නාළිකාවල, වෙනත් මාධ්‍යවල, එළියේ, හැම තැනකම කථා කළා. නමුත්, අද මේ අරගෙන තිබෙන විසඳුම මීට පෙර නොගත්තේ මොකද කියන කාරණාව ගැනත් මා විපරම් කර බැලුවා. මේක සැකයට තුඩු දෙන කාරණයක් වෙන්න පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රටේ නීතිය, ඔය කියන ප්‍රමිතිකරණය කියන මොකක්වත් නැතුව අයාලේ ගිය යුගයක, තමන්ගේ ඇහේ හයියට වැඩ කළ යුගයක තමයි නෙවිල් ප්‍රනාන්දු මහත්මයා මේ සයිටම් ආයතනය ආරම්භ කරන්නේ. රජය වෙනස් නොවුණා නම් එතුමාට මෙහෙම ප්‍රශ්නයක් එන්නේ නැහැ. සයිටම් විශ්වවිද්‍යාලය - වෛද්‍ය උපාධි ආයතනය- අහෝසි කරන්න වෙන්නේ නැහැ. මම ඒක කිසි බයක් නැතුව කියනවා. රජයන් වෙනස් වීම තුළ ඒ ආයතනයේ ප්‍රමිතිය ගැන හොයන්න ගිහිල්ලා, වෙන වෙන ගැටලු නිර්මාණය වෙලා, අන්තිමේ දී මේ රටට මහා දැවැන්ත පාඩුවක් සිදු වුණා.

අපි දන්නවා, විශ්වවිද්‍යාල දරුවෝ පාරට බැහැලා මේ සම්බන්ධයෙන් කෑ ගහනකොට, සමහර වෙලාවට අපේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් ඔවුන් කෙරෙහි වෛරයෙන් කථා කරන බව; ඔවුන් කෙරෙහි වෛරයෙන් බලන බව. නැහැ. එතැන ලොකු සාධාරණයක් තිබෙනවා. අපි දන්නවා, විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ පාරට බහින්නේ අසාධාරණය වෙනුවෙන් බව. තමන්ගේ දේශපාලන අරමුණු වෙනුවෙන් ඉස්සරහට ගිහිල්ලා රූපවාහිනියට මුහුණ පෙන්නාගෙන, ගිරිය පුප්පාගෙන කෑ ගහන එක්කෙනෙක්-දෙන්නෙක් ඉන්න පුළුවන්. හැබැයි සත්‍ය වශයෙන්ම මේ පිටුපස සිටින්නේ අසාධාරණය වෙනුවෙන්, මේ රටේ අහිංසක දරුවන්ගේ අධ්‍යාපනයට හානියක් වෙනවා කියන මතයේ ඉඳගෙන පාරට බහින අය. ඒ හඬට කන් දෙන එකත් පැත්තකින් තියලා, පසුගිය කාල සීමාව තුළදී යම් යම් අමාත්‍යවරු නෙවිල් ප්‍රනාන්දු මහත්මයාට කොටු වෙලා මේ ප්‍රශ්නයට උත්තර හොයන්න ගියේ නැහැ; ඒ රාමුවෙන් එළියට ගියේ නැහැ. ඒ නිසා අද මේ පනත් කෙටුම්පත ගෙන ඒම පිළිබඳව ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමාට අපි අපේ හදපිරි ස්තුතිය පුද කරනවා.

මේ ප්‍රශ්නය පිළිබඳව හරි අවබෝධයකින් කටයුතු නොකිරීම තුළින් සහ එක් එක් අයගේ අවශ්‍යතා වෙනුවෙන් මේ ප්‍රශ්නය ලඝුකොට තැබීම තුළින් රජයක් විධියට අපි ලොකු කළු පැල්ලමක් තියාගත්තා කියලා මා විශ්වාස කරනවා. මේ රටේ සමස්ත විශ්වවිද්‍යාල දරුවන් එළියට බහින්න, ආචාර්ය ප්‍රජාව එළියට බහින්න, ඒ වාගේම වසරක කාල සීමාවක් වෛද්‍ය සිසුන්ට තමන්ගේ අධ්‍යයන කටයුතු අහිමි වීමට, ඒ දැවැන්ත පරිහානියට, පිටුපස්සට යාමට හේතු වුණේ, කිහිප දෙනෙක් ගත් තීන්දු නිසා බව මා මතක් කරන්න කැමැතියි. පසුගිය රජයත් මේකට හවුල් වුණා. අපේ රජය තුළත් පසු පෙළ මන්ත්‍රීවරු විධියට මෙය පිටුපස්සට අදින්න කටයුතු කළා කියන එක අවබෝධ කර ගන්නකොට අපිත් ප්‍රමාද වැඩියි. ගරු ඇමතිතුමනි, මේ විසඳුම ලබා දීම තුළින් අහිංසක ළමයි 980කට සාධාරණය ඉටු කළා වාගේම, මේ රටේ සමස්ත විශ්වවිද්‍යාල තුළ ඉන්න අපේ දරුවන්ට, අවුරුදු ගණනක් මේ වෙනුවෙන් දුක් විඳපු දරුවන්ට සාධාරණ විසඳුම් ලබා දෙන්න පුළුවන් අවස්ථාවක් නිර්මාණය වෙලා තිබෙනවා කියලා අපි හිතනවා. මේකෙන් පසුවත් කෑ ගහන කිහිප දෙනෙක් ඉඳියි. මේකෙන් පසුවත් මේ ප්‍රශ්න වෙන තැනකට අරගෙන යන්න උත්සාහ කරයි. නමුත් මීට වඩා දෙන්න පුළුවන් විසඳුමක් නැහැ කියලා අපි හිතනවා. මේ රටේ ප්‍රශ්න හරි විධියට විසඳන්න නම්, හරි නිර්මාණකරුවන් අතට යන්න අවශ්‍යයි කියා අපි විශ්වාස කරනවා. මේ ප්‍රශ්නය අතේ තියාගෙන වෙන වෙන විධියට උත්තර හොයන්න ගියා නම්, අපේ ආණ්ඩුව කාලයේ දීත් විසඳන්න බැරි ප්‍රශ්නයක් වෙන්න තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා එක දෙයක් කියනවා. මේ විශ්වවිද්‍යාල ගැටලුවට උත්තර හෙව්වා වාගේම අපට මෙතැනින් ඔබ්බටත් හිතන්න වෙනවා. පෞද්ගලික විශ්වවිද්‍යාල මේ රටේ ආරම්භ කරන්නේ නැහැ කියන මතය සමස්ත රට තුළට යන්න දෙන්න බැහැ. මේ රට අපි ඉස්සරහට ගෙන යනවා නම්, ඒ සඳහා නිර්මාණශීලී වැඩසටහනක් තිබෙන්න ඕනෑ. අපි දන්නවා, ගරු ඇමතිතුමා ළඟ එය තිබෙන බව. මේ රටේ පෞද්ගලික විශ්වවිද්‍යාල ඇති වෙන්න ඕනෑ; ඒවාට ප්‍රමිතියක් තිබෙන්න ඕනෑ. ඒ වාගේම මුදල් තිබෙන හෝ නැති ඕනෑම කෙනෙකුට ජාතික විශ්වවිද්‍යාලයකට යන්න බැරි නම්, අවම සුදුසුකම සපුරලා, පෞද්ගලික විශ්වවිද්‍යාලයකට ගිහිල්ලා අධ්‍යාපනය ලැබීමේ නිදහස තිබෙන්න ඕනෑ. එහෙම නැත්නම් තමයි මේ රටේ දරුවන්ට පාඩු වෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කර තිබෙන කාලය අවසානයි.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

එම මාර්ග අවහිර නොවන විධියට ප්‍රතිපත්තිමය කරුණු කාරණා එකතු කරගෙන, මේවා නියාමනය කරන්න පුළුවන් ආයතනයක් ඇති කරන්න ඕනෑ. මේ රටේ වෛද්‍ය ශිෂ්‍යයා විතරක් නොවෙයි, සෑම උපාධි පාඨමාලාවක්ම හදාරණ දරුවාට සාධාරණයක් ඉටු කරන්න පුළුවන් නියාමනයක් සහිත ආයතනයක් නිර්මාණය කිරීමේ වගකීම අරගෙන අපේ ගරු ඇමතිතුමා කටයුතු කරයි කියා අපි විශ්වාස කරනවා. මේ කරුණු සම්බන්ධයෙන් අපේ ගරු ඇමතිතුමා උපරිමයෙන් කටයුතු කරයි කියලා අපි විශ්වාස කරනවා. ගරු ඇමතිතුමනි, පළපුරුද්ද තිබෙන ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයකු විධියට මේ රටේ මේ ප්‍රශ්නය විසඳුවාට ඔබතුමාට අපේ ගෞරවනීය ස්තුතිය පුද කරනවා. ඒ වාගේම මෙතැනින් එහාට අපේ දරුවන්ට ඉගෙනීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කර දීමේ වගකීම ඔබතුමාට තිබෙනවා. ඒ සම්බන්ධයෙනුත් ඔබතුමා කටයුතු කරයි කියලා අපි විශ්වස කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

ඊට ප්‍රථම ගරු තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමියගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු මුජීබුර් රහුමාන් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය.

අතන්පිරකු, மாண்புமிகு முஜிபுர் ரஹுமான் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. MUJIBUR RAHUMAN *left the Chair, and* THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA *took the Chair.*

[අ.භා. 5.36]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය අසුන් ගන්නා මොහොතේ සිට වෙලාව බලන්න කියා මා ඉල්ලා සිටිනවා. මෙම විවාදයේදී මට කථා කරන්න ලැබී තිබෙන්නේ කෙටි කාලයක් නිසා මා මුලින්ම ඇමතිතුමාගෙන් යම් කරුණක් දැන ගැනීමට කැමැතියි. ඔබතුමා, "සයිටම් හි වෛද්‍ය පීඨය ක්‍රියාත්මක වීම අවසන් වීම" කියන සංශෝධනය ඉදිරිපත් කර තිබෙනවා.

එහි මෙසේ සඳහන් වෙනවා:

"....නිශ්චිතව සඳහන් පරිදි ශිෂ්‍යයන් අන්තර්ග්‍රහණය කිරීම සම්පූර්ණ කරනු ලැබූ ඉක්බිතිවම සයිටම් හි වෛද්‍ය පීඨය එම්.බී.බී.එස්. උපාධිය ප්‍රදානය කිරීම සඳහා වූ සුදුසුකම අවසන් විය යුතු අතර, එහි වෛද්‍ය පීඨය ක්‍රියාත්මක වීම ද අවසන් විය යුතු ය"

ගරු ඇමතිතුමනි, SAITM එකේ ළමයි 900ක් පමණ සිටින බවත්, batches 15ක් පමණ තිබෙන බවත් ඔබතුමා දන්නවා. එතකොට මේ batches 15 KDU එකට ගන්නේ කවදාද? [බාධා කිරීමක්]

ඔබතුමාගේ අවස්ථාවේදී පිළිතුරු දෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ වෙලාව මගෙන් ගන්න එපා, ගරු ඇමතිතුමාගෙන් ගන්න. ඇමතිතුමා දැන් පිළිතුරු දෙනවා නම් මම කැමැතියි. වෙලාව නැති ප්‍රශ්නය තමයි තිබෙන්නේ. මගේ පළමුවැනි ප්‍රශ්නය ඒකයි. KDU එක කුඩා වෛද්‍ය පීඨයක්. මේ batches 15 ඒකට ගන්න අවුරුදු 10ක්වත් ගතවෙයි කියා අපි හිතනවා. එම නිසා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, "අද සිට කිසිම ආකාරයක නව බඳවා ගැනීමක් සිදු කරන්න බැහැ" කියන කොටස පුළුවන් නම් ඔබතුමාගේ සංශෝධනයටම එකතු කරන්න කියා. නමුත් ඒකේ එහෙම නැහැ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
දින වකවානු පැහැදිලිව තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. 2009 වර්ෂයේ අදාළ දිනයයි, 2017 වර්ෂයේ දිනයයි අතර ලියා පදිංචි අය පමණයි ගන්නේ කියා මෙහි සඳහන් වෙලා තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මොකද, මේ සඳහා අවුරුදු 10ක් හෝ ඊට වැඩි කාලයක් ගත වෙනවා. SAITM එක ප්‍රායෝගික වශයෙන් අහෝසි වන්නේ කවදාද කියා ඔබතුමාගේ කථාවේදී කියන්න. එහෙම නැති වුණොත් මේක වංචනික ක්‍රියාවක් බවට පත් වෙන්න පුළුවන්. ඇමතිවරු වෙනස් වෙනවා. ඔබතුමාත් වෙනස් වුණා. එම නිසා මේ කාරණාත් වෙනස් වෙන්න පුළුවන්. ඒ මම ඉදිරිපත් කරන පළමුවැනි කාරණයයි. එය විග්‍රහ කිරීමට මට කාලය නැහැ.

දෙවැනි කාරණය මේකයි. මේ "S" සාමර්ථ තුනේ තර්කය ගැන මැති ඇමතිවරු දිගටම කිව්වා. මම හිතන විධියට ඔබතුමාට ඒ ගැන ලොකු තර්කයක් නැහැ. ඔබතුමා තර්ක කරනවා අපි දැක තිබෙනවා. ඔබතුමාට "C" සාමර්ථ 2යි, "S" සාමර්ථ 1යි කියන එක පිළිගන්න බැරි නම්, "රජයේ වෛද්‍ය පීඨවලට බඳවා ගන්නා අවම සුදුසුකම" කියන එක ඇතුළත් කරන්න කියා අපි යෝජනා කරනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමනි, ඒකම තමයි මේ දමලා තිබෙන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ නේ, ගරු ඇමතිතුමනි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒ අදාළ කාල සීමාවේත් "S" සාමර්ථ 3 තමයි තිබුණේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
නැහැ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඇයි නැත්තේ? පසුගිය අවුරුද්ද වනතෙක් මූලික සුදුසුකම වුණේ "S" සාමර්ථ 3 තමයි. මේ අවුරුද්දේ තමයි වෙනස් වෙලා තිබෙන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, මම කියන්නේ මේකයි. මේ "S" සාමර්ථ 3 කියන එක ප්‍රතිපත්තියක් වෙනවා. මෙය ප්‍රතිපත්තියක් වුණාට පසුව වෛද්‍ය පීඨවලට මොකද වන්නේ? ඔබතුමන්ලාගේ ආණ්ඩුව. අවුරුදු දෙකක් තිස්සේ මේ ප්‍රශ්නයට දැහලුවේ පෞද්ගලික විශ්වවිද්‍යාල ආරම්භ කිරීම වෙනුවෙන් ඔබතුමන්ලා කැප වී සිටින නිසායි. ඔබතුමා එයට කැප වී සිටිනවාද, නැද්ද කියා මම දන්නේ නැහැ. මම ඇත්තටම කනගාටු වෙනවා මෙතැන පැහැදිලි, - [බාධා කිරීමක්]

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේක පොදුවේ රටට බලපාන නීතියක් නොවෙයි කියා මම බොහොම පැහැදිලිව කිව්වා. මේක මේ ළමයි 980ට පමණක් සීමා වුණු එකක්. එහෙම නැතිව රජයේ තීරණයක් නොවෙයි. රජයේ වෛද්‍ය විද්‍යාලවලට ගන්න ප්‍රමිතිය මේක නොවෙයි. මෙම කාරණය මේ ළමයි 980ට පමණයි සීමා වන්නේ කියා මේ පනත් කෙටුම්පතේ පැහැදිලිවම සඳහන් කර තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, ඔබතුමාගේ කථාවේදී හෝ මේ ගැන පැහැදිලි කරන්න කියා. [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම නිසි ගෞරවය ඇතිව කියන්නේ. ගරු මොහාන් ලාල් ග්‍රේරු මැතිතුමනි, ඔබතුමා මගේ ගුරුවරයායි. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ රාජ්‍ය ඇමතිවරයා වශයෙන් ඔබතුමා මේ ප්‍රශ්නයට මැදිහත්වීම ඇත්තටම සදාචාර විරෝධීයි කියා මම ඔබතුමාට කියනවා. ඔබතුමා ජාත්‍යන්තර පාසල් ව්‍යාපාරයක් කරන පුද්ගලයෙක්. ඔබතුමාගේ කටයුත්ත සමාන වෙන්නේ අර්ජුන මහේන්ද්‍රන්ගේ සහ අර්ජුන් ඇලෝසියස්ගේ ගනුදෙනුවටයි. ඔබතුමා කරුණාකර මේ විවාදයට සම්බන්ධ වෙන්න එපා. ඒක ලජ්ජයි. ග්‍රේරු රාජ්‍ය ඇමතිතුමනි, ලජ්ජයි! ලජ්ජයි! [බාධා කිරීමක්] ඔබතුමාගේ business එක වෙනුවෙන් ඔබතුමාගේ තනතුර පාවිච්චි කරන්න එපා. ඒක කැතයි. කරුණාකර වාඩි වෙන්න.[බාධා කිරීමක්] ඇමතිවරයා ඉන්නවා. මට ඇමතිවරයා පිළිතුරු දුන්නාම ඇති. [බාධා කිරීමක්] සල්ලිවලට අධ්‍යාපනය විකුණාගෙන කන අය ගැන මට කිසිදු විශ්වාසයක් නැහැ. තමන්ගේ තනතුර තමන්ගේ business එකට පාවිච්චි කිරීම කැතයි. මේ ඇලෝසියස් කෙනෙක්; අර්ජුන මහේන්ද්‍රන් කෙනෙක්. කැතයි. හරි නම් ඔබතුමා අද මේ ගරු සභාවට එන්න අවශ්‍ය නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය දන්නවා, අපි COPE එකේ නම් යම් තීන්දුවක් අරගෙන තිබෙන බව. COPE එකේදි යම් ඇමතිවරයකුගේ විෂයයක් පිළිබඳව සාකච්ඡා කරනවා නම් එම ඇමතිවරයා සභාවෙන් නැඟිටලා යනවා. අඩු ගණනේ හිටපු නියෝජ්‍ය කථානායක ගරු තිලංග සුමතිපාල මැතිතුමාගේ- [බාධා කිරීමක්] කැතයි! ලජ්ජයි! [බාධා කිරීමක්] වාඩි වෙන්න. මගේ කාලය කන්න එපා. රට කෑවාට කමක් නැහැ; මගේ කාලය කන්න එපා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අවසාන වශයෙන් මට කියන්න තිබෙන්නේ, - [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ගරු මන්ත්‍රීතුමාගේ කාලය එතුමාට දෙමු. ඔබතුමාගේ කථාවේදී පිළිතුරු දෙන්න.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)

Madam, I rise to a point of Order.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ කාලය මගේ වෙලාවෙන් අඩු කරන්න එපා. එතුමාගේ වෙලාවෙන් අඩු කරන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)

මම රාජ්‍ය අමාත්‍යවරයා විධියට ප්‍රශ්නයකට උත්තරයක් දෙන්න සූදානම් වුණාම, පදනමක් නැතුව තමුන්නාන්සේ ඔය වාගේ අපහාස කරනවා නම්, කරුණාකර එය ඉල්ලා අස් කර ගන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මා එය ඉල්ලා අස් කර ගන්නේ නැහැ. මීට පෙර මා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්ව ඉන්නකොට ඔබතුමාගේ Lyceum International School එකේ ප්‍රශ්නවලට ඔබතුමා මාව හම්බ වෙන්නත් ආවා. ඒ නිසා ඔබතුමා කවුද කියා මා දන්නවා. ඔබතුමා මගේ ගුරුතුමායි. මට Physics උගන්වලා තිබෙනවා. ඔබතුමා ජනතා විමුක්ති පෙරමුණේ පක්ෂ කාර්යාලයට ආවා, Lyceum International School එක ගොඩදමා ගන්න. [බාධා කිරීමක්] මගෙන් අහගන්න එපා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මා පෞද්ගලික ප්‍රශ්නයක් නොවෙයි කියන්නේ. ඔබතුමා හිතලා බලන්න. ඔබතුමා මේ රටේ ප්‍රධාන පෙළේ අධ්‍යාපන වෙළෙන්දෙක්. ඔබතුමා SAITM එක වෙනුවෙන් පෙනී ඉන්න එක කැතයි. ඔබතුමා කර්මාන්ත විෂයය භාර රාජ්‍ය ඇමතිවරයා නම් මට ප්‍රශ්නයක් නැහැ. [බාධා කිරීමක්] කැතයි! කැතයි! ලජ්ජයි! නින්දිතයි! ඔයිට වඩා හොඳයි වෙන රස්සාවක් හොයා ගන්න එක. [බාධා කිරීමක්] ලජ්ජයි!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ගරු මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, දැන් මගේ අවස්ථාව දෙන්න.

ගරු ඇමතිතුමනි, SAITM එකේ දැනට ඉන්න සිසුන්ගේ සම්පූර්ණ අධ්‍යාපන සුදුසුකම් මොනවාද කියා ඔබතුමා වග කීමෙන් කිව්වේ නැහැ. SAITM එකේ දැනට සිටින සිසුන්ගේ සම්පූර්ණ අධ්‍යාපන සුදුසුකම් -ලංකාවේ උසස් පෙළ හෝ නැත්නම් ඊට සමාන වෙනත් විභාග ප්‍රතිඵල ලේඛන- පාර්ලිමේන්තුවට ලබා දෙනවාද කියා ඔබතුමාට සහතිකයක් දෙන්න පුළුවන්ද? මොකද, ඒක මේ ප්‍රශ්නයේදී අතිශයින් වැදගත් වනවා.

ගරු ඇමතිතුමනි, Federation of Faculty of Medicine Teachers' Associations of Sri Lanka ආයතනයෙන් අද දින ඔබතුමාට යොමු කළ ලිපිය මේ අවස්ථාවේදී මම **සභාගත*** කරනවා.

** කථාව අවසානයේ පළ කර ඇත.*
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

[ගරු බිමල් රත්නායක මහතා]

ඒ ලිපිය ඔබතුමාට ලැබිලා ඇති. අපටත් එම ලිපියේ පිටපතක් එවා තිබුණා. ඔවුන් ඒ ලිපියෙන් ඉතා වැදගත් ප්‍රශ්න 4ක් අසා තිබෙනවා. ඔබතුමා ඇමතිවරයා වශයෙන් එයට පිළිතුරක් ලබාදෙයි කියා මා හිතනවා. මොකද, ඔබතුමා අනාගතයේත් -හැම දාම- උසස් අධ්‍යාපන විෂයය භාර ඇමතිවරයාව සිටින එකක් නැහැ නේ. ඉහළට යයි; ධුරය වෙනස් වෙයි. ඒ නිසා ඔබතුමා ඇමතිවරයා වශයෙන් මෙන්න මේ ප්‍රශ්න හතරට දෙන පිළිතුරු අඩු ගණනේ හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කරලා තිබුණොත්, අනාගතයේදී අධ්‍යාපන වෙළෙන්දෝ සහ කඩකාරයෝ වෙන වෙන වංගු දාලා නිදහස් අධ්‍යාපනය මංකොල්ල කන්න හදන අවස්ථාවකදී එය වෙනස් කරන්න පුළුවන් වෙයි කියා අපි හිතනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, මට අවස්ථාව ලබාදීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

Federation of Faculty of Medicine Teachers'

Associations of Sri Lanka (FFMTA)

President-FMTA
Faculty of Medicine
University of Colombo

President-FMTA
Faculty of Medicine
University of Jaffna

President-FMTA
Faculty of Medicine
University of Peradeniya

President-FMTA
Faculty of Medicine
University of Ruhuna

President-FMTA
Faculty of Medicine
University of Kelaniya

President-FMTA
Faculty of Medical Sciences
University of Sri Jayewardenepura

President-FMTA
Faculty of Medicine
Rajarata University of Sri Lanka

20th June 2018
Hon. Wijedasa Rajapaksha
Minister of Higher Education

Dear Sir,

FFMTA concerns on the Kotalawala Defence University (special provisions bill)

We the FFMTA appreciate your efforts to resolve the issue of the SAITM medical degree programme. We understand the above said special provisions Bill is presented to the parliament as a solution to the crisis. The FFMTA would be grateful if you would clarify the following concerns we have on the said Bill to be presented.

1. SAITM in its website and on their promotional materials since 2010 clearly states that the minimum entry criteria to the medical degree programme is "2Cs and an S in the GCE A/L examination or an equivalent from a foreign exam. Hence, if the student selection was done under the said criteria there cannot be any student below the stipulated criteria of 2Cs and one S. The University Grants Commission repeatedly announced that UGC was involved in the student selection process. Hence, we would like to know how students with lower grades was enrolled in the SAITM medical programme? Who is responsible?

2. As the Minster of Higher Education, we earnestly request you to table the A/L or equivalent examination results of all those students enrolled to SAITM in the parliament for this process to be transparent.

3. As you are aware the Sri Lanka Medical Council is the supreme body on Standard of Medical Education and registration of medical professionals in the country. SLMC require all those enrolled in medical degree programmes to possess results above 2Cs and one S to be eligible for registration. We would like to know your stand on those students transferred from SAITM to KDU without minimum requirement.

4. FFMTA would like to know when will the Ministry of Higher Education take action to delist SAITM through a gazette notification?

We would be grateful if you could clarify our concerns during the second reading of the Bill in the parliament today (20th June 2018).

Thank you

Yours Faithfully

Dr. Manuj C Weerasinghe
Convener/ FFMTA

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමීය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට, ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා.

[අ.භා.5.44]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, මට කථා කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ඉතා වටිනා සම්මුතියක්; ඉතා අගනා විසඳුමක්; ඉතා වටිනා නිරාකරණයක් හැටියට කරුණු ඉදිරිපත් කළ ආකාරය අපි දැක්කා. නමුත්, මේ ප්‍රශ්නය වෙනුවෙන් කොච්චර මිලක් ගෙව්වාද? ඒ කාරණයත් මේ වෙලාවේ සිහිපත් කරන්න ඕනෑ. මේ අගනා විසඳුම ඉබේම පහළ වුණේ නැහැ. මේ වෙනුවෙන් විශ්වවිද්‍යාල දරුවන්ගේ ශිෂ්‍ය දින කීයක් විනාශ වුණාද, ආචාර්යවරුන්ගේ ඉගැන්විය යුතු දින කීයක් විනාශ වුණාද, ලෙඩුන්ට ප්‍රතිකාර නොලැබී කොපමණ කාලයක් ගත වුණාද, මේවා නිසා නොයෙකුත් අපහසුතාවන්ට හා විශාල හානිවලට කීදෙනෙක් ගොදුරු වුණාද කියන කාරණා ගැනත් අපි හිතන්න ඕනෑ. මෙන්න මේ අයගේ දුක් වේදනා මැද, මේ අයගේ විඳ දරා ගැනීම් මැද, මේ අයගේ පරිත්‍යාග මැද තමයි මේ විසඳුම කරා ඇවිත් තිබෙන්නේ කියන කාරණය මේ සියලුදෙනාම සිහිපත් කළ යුතුයි. ඒක මම ඉදිරිපත් කරන පළමුවැනි කාරණයයි.

දෙවැනි කාරණය, ආණ්ඩු. මම හිටපු ආණ්ඩුත් වෙන්න පුළුවන්. මම ආණ්ඩු කියන්නේ බහු වචනයෙන්. මේ ආණ්ඩු ව්‍යාපාරික දොස්තරලා සමඟ එකතු වෙලා නිදහස් අධ්‍යාපනය බිලි ගන්න ගෙනාපු කුමන්ත්‍රණය තාවකාලිකව හෝ අද පරාජය කර තිබෙනවා. එය තාවකාලිකව හෝ පරාජය කර තිබීම සතුටක්. මෙය සතුටක් බවත්, යම් ජයග්‍රහණයක් බවත් පිළිගන්න මම මැළි වන්නේ නැහැ. නමුත්, මේ ප්‍රශ්නය නිසා සිදුවූ හානියට රාජ්‍ය පාලකයනුත්, ව්‍යාපාරිකයනුත් වග කිවයුතුයි. දීර්ඝ කාලයක් පැවැති මේ අරගළය නිසා දරුවන්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වීම සම්බන්ධවත්, රෝගීන්ගේ ප්‍රතිකාර සම්බන්ධවත් රජය වන්දි ගෙවිය යුතුයි; ඒ ව්‍යාපාරිකයන් වන්දි ගෙවිය යුතුයි. අවම වශයෙන් ඔවුන්ට තමන්ගේ කනගාටුව පළ කිරීම සදාචාර වශයෙන් යුතුකමක්. එදා, උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය පිළිබඳ ප්‍රශ්නය පැන නැඟුණු ආකාරය මට මතකයි. එදාත්, අපි එම සටනේ උදවුකාරයෝ හැටියට සිටියා. හැබැයි, එදා එම සටන වෙනුවෙන් බෙල්ල දී ගෙන වැඩ කරපු දොස්තර සංගම්වල නායකයෝ අද නම් කණපිට ගහලා. ඒ ගොල්ලන් අද පදය මාරු කරලා, ඒ ගොල්ලන්ගේ එදා සටන අද වෙනකොට පාවා දීලා තිබෙනවා. මේක ඉතිහාසයේ පළමුවැනි වතාවට සිදුවෙන දෙයක් නොවෙයි. උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ ඉඳලා SAITM දක්වා ආපු ගමන, ජේ.ආර්. ජයවර්ධනගේ කාලයේ ඉඳලා රනිල්ගේ කාලය දක්වා ආපු ගමනක් හැටියටයි මට පෙනී යන්නේ. නිදහස් අධ්‍යාපනය පෞද්ගලීකරණය කරලා ඊට අවශ්‍ය දේශපාලනය අනුගමනය කරන ආණ්ඩු බලයක් තිබෙනතුරු, මේ අරගළය ඉවර වෙන්නේ නැහැ. මේ රටේ නිදහස් අධ්‍යාපනය නැවත පෞද්ගලීකරණයකට හරවන්න යනවා නම්, එතැන අරගළයක් මතු වේවි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමීයනි, SAITM එකේ ප්‍රමිතියෙයි ප්‍රශ්නය තිබුණේ, නිසි ප්‍රමිතිය ඇති කිරීමයි ආණ්ඩුවේ අපේක්ෂාව වී තිබෙන්නේ කියලා දැන් අපිට කිව්වා. නමුත් අපි කල්පනා කරනවා, ඊට වඩා දෙයක් මේ රටේ ශිෂ්‍ය අරගළය තුළින් ප්‍රකාශ වෙනවා කියලා. කරුණාකරලා Z-score අනුව හැමෝම ඒ ඒ විද්‍යාපීඨවලට බඳවා ගන්න, ඒ ඒ විශ්වවිද්‍යාලවලට බඳවා ගන්න. ඒවා පෞද්ගලික විශ්වවිද්‍යාල වුණත් කමක් නැහැ, ඒවා රජයේ විශ්වවිද්‍යාල වුණත් කමක් නැහැ. ඒවාට Z-score අනුව ළමයින්

බඳවා ගන්න. එසේ බඳවා ගැනීමේදී යම් යම් අයට පෞද්ගලික විශ්වවිද්‍යාලවලට මුදල් ගෙවන්න පුළුවන් නම්, ඒ අය ගෙවපුදෙන්. නමුත් මේ බඳවා ගැනීමේදී අඩු ලකුණු ලබන අයට මිල මුදල්වල ශක්තිය උඩ ඒ ඒ උපාධි ලබා ගැනීමට පෞද්ගලික නමින් තිබෙන විශ්වවිද්‍යාලවල ඉඩ පහසුකම් සලසා තිබීම මේ රටේ මහා බරපතළ ප්‍රශ්නයක් බවට පත් වෙනවා. මොකද, මේ රටේ සිටින විශාල ශිෂ්‍ය සංඛ්‍යාව අතරින් වැඩි ලකුණු ලබන නමුත් මිල මුදල් අතින් ශක්තිය අඩු අය කියනවා, "අපටත් මේ අධ්‍යාපනය ලබන්න ඕනෑ." කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක පමණ කාලයක් තිබෙන්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
"එසේ අධ්‍යාපනය ලබන්න අපිට තිබෙන අයිතිය අපේ අතේ මුදල් නැහැ කියලා අපට නැති වෙනවා නම්, මේ සමාජය කඩා ඉරා දමන්නට ඕනෑ." කියලා ඔවුන් කියනවා. ඒක තමයි ඉබේම මතු වෙන කාරණය. "අපිට ඉගෙන ගන්න ඕනෑ. ඉගෙන ගන්න අපට හැකියාව තිබෙනවා. මෙන්න අපේ Z-score එක. නමුත් අපට සල්ලි නැහැ. ඒ නිසා අපි බැහැර විය යුතුයි කියලා මේ සමාජය කියනවා නම්, මේ සමාජය කීතු කීතුවලට ඉරා දමන්න ඕනෑ." කියලා විරෝධයක් හා වෛරයක් මේ නිසා මතු වෙනවා. මම මේ කියන්නේ මේ රටේ තිබෙන සම්ප්‍රදායය අනුවයි. [බාධා කිරීමක්]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම තව සුළු මොහොතකින් මගේ කථාව අවසාන කරන්නම්. හැම පැත්තෙන්ම ඉන්නේ, වින්දිතයන්ය කිව්වා. නැහැ. එක පැත්තකින් වින්දිතයන් -victims- ඉන්නවා. තවත් පැත්තකින් දුෂ්ටයන් -villains- ඉන්නවා. මේ කාරණය අපි හරියාකාරව බේරා ගත යුතුයි.

ඊළඟට, රජයේ විශ්වවිද්‍යාලවල තත්ත්වය පහළ වැටිලාය කිව්වා. පෞද්ගලික විශ්වවිද්‍යාලවල තත්ත්වය දැන් ඉහළ නැඟ තිබෙනවාය කිව්වා. අනේ, කාගේද මේකේ වරද? පාලකයෝ හැර මේකට වගකිව යුත්තේ කවුද? මොන ආණ්ඩු කාලයේත් මේවා පාලනය කරපු පාලකයෝ හැර, මේ ගැන වගකිව යුත්තේ කවුද? එහෙම නම් මේවා කියන්නේ කාටද? ඒ නිසා අපි අපටම කියා ගන්නා එකත් වරදක් නොවෙයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මගේ කථාව අවසන් කරන්නම්.

අවසාන වශයෙන් මම ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය ගැන කථා කරන්න කැමැතියි. දැන් මෙම විශ්වවිද්‍යාලයට ළමයි ඇතුළත් කර ගන්නේ මේ විශේෂ විධිවිධාන පනත් කෙටුම්පත සම්මත වුණාට පසුව මේ විධියටයි කියලා පැහැදිලි කළා. ඒක අපිට තේරෙනවා. නමුත් "S" සාමර්ථ තුනේ ප්‍රශ්නය තිබෙනවා. ඒ වාගේම වෛද්‍ය සභාවේ අධීක්ෂණය තිබෙනවාද කියන ප්‍රශ්නය ගම්‍ය වනවාය කියලා අපේ ඇමතිතුමා කියා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කරුණු එසේ තිබියදී, මේ ශිෂ්‍යයින් නොවෙයි, සාමාන්‍ය ශිෂ්‍යයන් ඇතුළත් කර ගන්නේ කොහොමද කියලා අපි අහමු. සාමාන්‍ය ශිෂ්‍යයන් ඇතුළත් කර ගන්නේ මොන Z-score එකක් අනුවද, මොන නිර්ණායකයක් මතද, අපි ඒක විනිවිද දකින්නේ කොහොමද? Online කැඳවා online තේරා ගන්නවා. තිබිය යුතුව තිබුණු සුදුසුකම මොකක්ද, ඒ සුදුසුකම් අපට තිබුණාද, නැද්ද? ඒ සුදුසුකම් තිබියදීත් අපි ඇතුළත් කර ගත්තේ නැද්ද කියලා අපි දන්නේ කොහොමද? මේවා ගැන දැන ගන්න විධියක් නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු ඇමතිතුමනි, තමුන්නාන්සේලා ගෙනෙන්න ලෑස්ති කරන ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය පනත කරුණාකරලා අකුළා ගන්න. මොකද, ඒ පනත ගෙනාවොත් තමුන්නාන්සේලා තවත් ගිනි මැලයක් පත්තු කරන බව මතක තබා ගන්නය කියමින් මගේ කථාව අවසන් කරනවා. මේ වෙනුවෙන් සටන් කරපු සියලුදෙනාට මේ අවස්ථාවේදී අපගේ උපහාරය දක්වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. ඊළඟට, ගරු වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[ප.ව. 5.52]

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(මාණ්පුමිකු වඩිවේල් සුරේෂ්)
(The Hon. Vadivel Suresh)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று ஜெனரால் சேர் ஜோன் கொத்தலாவலை பாதுகாப்புப் பல்கலைக்கழகம் (விசேட ஏற்பாடுகள்) சட்டமூலம் சம்பந்தமான விவாதத்தில் மலையக மக்களுடைய பிரதிநிதி என்ற வகையிலே எனக்கும் ஒருசில வார்த்தைகள் இங்கு பேசக்கிடைத்ததையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். விசேடமாக, கௌரவ விஜயதாச ராஜபக்ஷ அவர்கள் உயர் கல்வி அமைச்சராகப் பதவியேற்ற பிறகு தன்னுடைய காலகட்டத்திலே இந்த SAITM பிரச்சினைக்கு ஒரு தீர்வு காண்பதற்கு அவர் எடுத்திருக்கின்ற முயற்சியை நான் வரவேற்கின்றேன். அத்தோடு கல்வி மற்றும் மனிதவள அபிவிருத்தி பற்றிய Sectoral Oversight Committee தலைவர் என்ற வகையிலே என்னுடைய பாராட்டுக்களையும் அவருக்குத் தெரிவித்துக் கொள்கின்றேன். இந்த SAITM பிரச்சினை சம்பந்தமாக இந்த நாட்டிலே பாரியதொரு பூகம்பம் ஏற்பட்டுக்கொண்டிருந்தது. இதன் காரணத்தினால் ஏனைய சுமுகமான கல்வி நடவடிக்கைகள் பாதிக்கப்பட்டதையும் நான் இங்கு குறிப்பிட விரும்புகின்றேன். அதற்கொரு முடிவாக எடுக்கப்பட்டிருக்கின்ற தீர்மானங்கள் உண்மையிலேயே வரவேற்கத்தக்கதாக இருக்கின்றன.

[ගරු වඩිවේල් සුරේෂ් මහතා]

කල්වි සම්බන්ධප්පට්ට විඩයම් ඉංකු විවාදික්කප් පඩුවතාල් ඉන්දච් චන්දර්ප්පත්තිලේ මේලුම් චිල විඩයංකළෙ ඉංකු නාන් කූරිවෛක්ක විරුම්පුකින්රේන්. විසේඩමාක, ඌවා මාකාණත්තිලේ නිලවුම් කල්විප් පොදුත් තරාතර උයර්තර විඥ්ඤාන, කණිත පාඩංකළුක්කුරිය ආසිරියර් පර්රාක්කුරෙ චම්බන්දමාක ඉන්දප් පාරාළුමන්රත්තිලේ පලමුරෙ නාන් පේසියිරුක්කිරේන්. චම්බන්දප්පට්ට අමෙච්චරුඩනුම් පේසියිරුක්කිරේන්; කෞරව පිරදම මන්දිරි අවර්කළුඩෙය කවනත්තිර්කුම් කොණ්ඩුවන්දිරුක්කිරේන්. ඉන්රු තනියාර් පල්කලෛක්කළකත්තිනුඩෙය පිරච්චිනෙයෛත් දීර්ප්පතර්කු ඉන්දප් පාරාළුමන්රම් එව්වාරු නඩවඩික්කෛ එඩුක්කිරතෝ, අදේපෝන්රු මලෙයක මක්කළුඩෙය, මලෙයක තමිල් පේසුම් මාණවර්කළුඩෙය උයර් කල්වියෛ මේම්පඩුත්තුවතර්කු කල්විප් පොදුත් තරාතර උයර්තර විඥ්ඤාන, කණිත පාඩංකළුක්කුරිය ආසිරියර් පර්රාක්කුරෙයෛ නිවර්ත්දි චෙය්වතර්කුම් ඉන්දප් පාරාළුමන්රමුම් චම්බන්දප්පට්ට අමෙච්චර්කළුම් නඩවඩික්කෛ එඩුක්ක වේණ්ඩුම්. ඉල්ලෛයේල් විරෛවිල් ඌවා මාකාණත්තෛච් චාර්න්ත මලෙයකක් කල්විප් පොදුත් තරාතර උයර්තර විඥ්ඤාන මර්රුම් කණිතප් පිරිවු මාණවර්කළුම් වීතික්කු ඉරංක වේණ්ඩිය ඔරු නිලෛමෛ ඒර්පඩුමෙන්පතෛයුම් ඉන්දච් චපෛයිලේ නාන් කූරිවෛක්ක විරුම්පුකින්රේන්.

අදුමට්ටුමල්ල, පල වරුඩ කාලමාක පාඩචාලෛයෛක් කොණ්ඩුනඩාත්තිය අදිපර්කළුම් - performing principals එන්රු කූරප්පඩුකින්ර අදිපර් දරම් වළංකප්පඩාද අදිපර්කළුම් - වීතික්කු ඉරංකවේණ්ඩිය ඔරු නිලෛමෛ ඉන්රු ඒර්පට්ටිරුක්කින්රදු. පදුළෛ මාවට්ටත්තිල්, විසේඩමාක පසරෛ පෝන්ර පිරදේසත්තිලේ performing principals තංකළුක්කුරිය අදිපර් දරම් වළංකප්පඩාද කාරණත්තිනාල් අන්දච් චේවෛයිලිරුන්දු විලකි නිර්කින්රාර්කළ්. එනක්කු ඥාපකම් ඉරුක්කින්රදු, ඒර්කෙනවේ මුන්නාළ් ජනාදිපදි කෞරව ටි.පි. විජේදුංක අවර්කළ් අමෙච්චරවෛප් පත්දිරම් මූලමාක අවර්කළුක්කු අදිපර් පදවි වළංකි, පල වරුඩ කාලමාක නීඩිත්දු වන්ද පිරච්චිනෙයෛත් දීර්ත්දු වෛත්දිරුන්දාර්. අන්රු අදිපර් දරම් ඉල්ලාදු, එන්දවිදමාන වළංකළුම් ඉල්ලාදු පාඩචාලෛයෛක් කොණ්ඩුනඩාත්තිය මලෙයකප් පෙරුන්තෝට්ටත්තෛච් චාර්න්ත අන්ද ආසිරියර්කළ් පදිල් අදිපර්කළාකච් චෙයර්පට්ටු වන්දාර්කළ්. අව්වාරු ඉන්ද අදිපර්කළුක්කුරිය නියමනංකළෛයුම් අමෙච්චරවෛ අංකීකාරම් මූලමාකප් පෙර්රුක්කොඩුක්ක වේණ්ඩුමෙන්ර එන්නුඩෙය කරුත්තෛ ඉන්ද උයරිය චපෛයිලේ නාන් කූරික්කොළ්ළ විරුම්පුකින්රේන්.

මලෙයකත්තිලේ තිරමෛයාන මාණවර්කළ් ඉරුන්දුම් පල්කලෛක්කළකත්තිර්කුත් තෙරිවු චෙය්යප්පඩක්කූඩිය වාය්ප්පුකළ් අවර්කළුක්කු ඉරුන්දුම්, මාරි මාරි වන්ද අරචාංකංකළ් අංකුළ්ළ ආසිරියර් පර්රාක්කුරෙයිනෛ උරිය මුරෛයිලේ නිවර්ත්දි චෙය්යාද කාරණත්තිනාල් මලෙයක මාණවර්කළ් පාරිය පාදිප්පුළ්ළාකියිරුක්කිරාර්කළ්. ඉන්රු ඉන්ද performing principals උම් අංකු පාදිප්පුක්කුළ්ළාකියිරුක්කිරාර්කළ්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛදාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. Member, you have only one minute.

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(මාණ්පුමිකු වඩිවේල් සුරේෂ්)
(The Hon. Vadivel Suresh)
All right.

ආසිරියර්කළ්, අදිපර්කළ්, මාණවර්කළ් එන්රු මුළුමෛයාක මලෙයකක් කල්විච් චමූකමේ අංකු පාදිප්පඩෛන්දිරුක්කින්රදු. ආකවේ අදනෛ නිවර්ත්දි චෙය්ය වේණ්ඩුම්. අමෙච්චර්කළ් පඩිත්දිරුක්කිරාර්කළෝ, පඩික්කවිල්ලෛයෝ එනක්කුත් තෙරියාදු. චිල විෂයංකළෛප් පාර්ක්කුම්පෝදු අමෙච්චර්කළ් චිලර් කණිත පාඩත්දිල් fail පෝල එනක්කු විළංකුකිරදු. ආනාල්, ඉන්රෛක්කු මලෙයකප් පෙරුන්තෝට්ටත්තෛච් චේර්න්ත තෝට්ටත්තොළිලාළර්කළින් පිළ්ළෛකළ් පඩිත්දිරුක්කිරාර්කළ්; චිරන්ත පෙරුපේරුකළෛප් පෙර්රිරුක්කිරාර්කළ්. ආකවේ අවර්කළුඩෙය කල්වියෛ මේම්පඩුත්ත ඉන්ද අරචාංකම් - මේදකු ජනාදිපදි අවර්කළුම් කෞරව පිරදමරර් අවර්කළුම් උරිය අමෙච්චර්කළුම් - උරිය නඩවඩිවක්කෛයෙඩුක්ක වේණ්ඩුමෙන්රු අන්ද මක්කළින් ඔරු පාරාළුමන්රප් පිරදිනිදි එන්ර වකෛයිලේ නාන් මිකවුම් ආණිත්දරමාකක් කූරිවෛක්ක විරුම්පුකින්රේන්.

මලෙයකත්තිර්කෙනත් තනියාන පල්කලෛක්කළකම් උරුවාක්කප්පඩ වේණ්ඩුම් එන්පදු එමදු නීණ්ඩකාලක් කෝරික්කෛ. මලෙයකත්තිලේ පල්කලෛක්කළකම් අමෛප්පදර්කෙන නාවලප්පිට්ටි, කොත්මලෛ, කට්ටුපුලා තෝට්ටත්තිලේ කාණි ඔදුක්කප්පට්ටදු. ආනාල්, අන්දප් පල්කලෛක්කළකම් එංකේ? එන්රු කේට්ක විරුම්පුකින්රේන්. පල වරුඩ කාලමාක අදු චම්බන්දමාක එන්ද නඩවඩික්කෛයුම් එඩුක්කප්පඩාදු අන්දක් කාණි ඉන්රු කාඩාක ඉරුක්කින්රදු. නාන් ඉංකු කුරිප්පිට්ටවාරු මලෙයකත්තිලේ උයර් කල්වික්කාන ආසිරියර් පර්රාක්කුරෙයිරුක්කින්රදු; මලෙයකත්තිර්කාන තනියාන පල්කලෛක්කළකම් ඉල්ලෛ; මාණවර්කළ් අංකු පාදික්කප් පට්ටිරුක්කිරාර්කළ්. එනවේ, මලෙයකත්තිර්කාන තනියාන පල්කලෛක්කළකත්තෛ උරුවාක්කුවතර්කු පුදිදාක නියමික්කප් පට්ට උයර් කල්වි අමෙච්චර් අවර්කළ් මුනෛවාන පංකළිප්පෛ වළංකුවාරෙන නාංකළ් එදිර්පාර්ක්කින්රෝම්. එමක්කු කෞරව අමෙච්චර් විජයතාස රාජපක්ෂ අවර්කළ්මීදු නම්පික්කෛයිරුක්කින්රදු. ඉන්දප් පාරාළුමන්රක් කාලම් මුදිවදෛවතර්කු ඉන්නුම් 1½ වරුඩ කාලමේයිරුක්කින්රදු. එනවේ, තොඩර්න්දුම් ඒමාර්රාදු ඉන්දප් පාරාළුමන්රක් කාලත්තිර්කුළ් මලෙයක මක්කළින් උයර් කල්වික්කු විත්දිඩවේණ්ඩුම්. අදර්කු අනෛවරුම් ඔත්දුමෛක්ක වේණ්ඩුමෙනක් කේට්ටුක්කොණ්ඩු, එන්නුඩෙය උරෛයෛ මුදිත්දුක්කොළ්කින්රේන්. නන්රි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛදාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Thank you. ඊළඟට ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[ප.ව. 5.58]

ගරු වේලු කුමාර් මහතා
(මාණ්පුමිකු වේලු කුමාර්)
(The Hon. Velu Kumar)
කෞරව තලෛමෛදාංකුම් උරුප්පිනර් අවර්කළේ, ඉන්රෛය මුක්කියමාන ඉන්ද විවාදත්තිලේ උරෛයාර්රුවතර්කු වාය්ප්පෛත් තන්දමෛක්කු මුදලිලේ නන්රියෛත් තෙරිවිත්තුක්කොළ්කින්රේන්. ඉන්ද නාට්ටින් උයර් කල්විත් තුරෛයෛක් කඩන්ද 2 - 3 වරුඩංකළාකප් පර්රියිරුන්ද, ඔරු තොර්රුනෝය් එන්රුකූඩච් චොල්ලක්කූඩිය වකෛයිලිරුන්ද ඔරු පිරච්චිනෙයෛ මුදිවුක්කුක් කොණ්ඩුවරුවතර්කුරිය නඩවඩික්කෛයෛ ඉන්රෛය උයර් කල්වි අමෙච්චරාන

கௌரவ விஜயதாஸ ராஜபக்ஷ அவர்கள் எடுத்திருக்கின்றார். உண்மையிலேயே அதற்கு நாங்கள் முதலில் அவருக்குப் பாராட்டுக்களைத் தெரிவிக்க வேண்டும். ஏனென்றால், கடந்த 2 - 3 வருடங்களாக இலங்கையின் பல்கலைக்கழகங்களிலுள்ள மாணவர்கள் தங்களுடைய பல்கலைக்கழகக் கல்வியைச் சரியான முறையில் தொடர முடியாத வகையில் இந்தப் பிரச்சினை அவர்களுக்குள் சுமத்தப்பட்டு, இன்றுவரை அந்த மாணவர்கள் வீதியிலிறங்கிப் போராட்டங்களை நடத்திக் கொண்டிருந்தார்கள். இதற்கான காரணம், கடந்த காலங்களில் இருந்த அரசாங்கம் இந்தப் பிரச்சினை தொடர்பாக சரியான திட்டவட்டமான ஒரு தீர்வினை இந்தச் சமூகத்திற்குப் பெற்றுக் கொடுக்காமையாகும்.

இன்று இந்த SAITM கல்லூரியிலே கல்வி பயில்கின்ற 900க்கும் அதிகமான அந்த மாணவர்களுடைய பிரச்சினையைத் தீர்க்கின்ற அதேநேரத்தில், இலங்கையில் வைத்தியத்துறை சார்ந்த கல்விக்கு இனிவரும் நாட்களிலே எவ்வித பாதிப்பும் ஏற்படாத வகையில், அதனுடைய நியமத்தைச் சரியான முறையிலே பாதுகாக்கக்கூடிய வகையிலான ஒரு தீர்வு இன்று முன்வைக்கப்பட்டிருப்பது வரவேற்கத்தக்கதாக இருக்கின்றது. SAITM கல்லூரியிலே இருக்கின்ற வைத்தியப் பிரிவுக்குரிய கற்றல் நடவடிக்கைகளை ஜெனரால் சேர் ஜோன் கொத்தலாவலை பாதுகாப்புப் பல்கலைக்கழகத்திற்கு மாற்றீடு செய்து, அந்த மாணவர்களுக்கு ஒரு தீர்வு முன்வைக்கப்பட்டிருக்கின்றது. இந்தச் சமூகத்தின் அடுத்த தலைமைகளாக விளங்கக்கூடிய, இந்த நாட்டின் பிரஜைகளான பல்கலைக்கழக மாணவர்கள் கடந்த காலம் முழுவதும் ஒரு பக்கம் பாதையிலே இறங்கிப் போராடினார்கள்; மறுபக்கமாக இந்த SAITM கல்லூரியினுள் இறுகியிருந்த மாணவர்கள் தங்களுடைய எதிர்காலம் என்னவென்று தெரியாமல் தடுமாற்றமடைந்திருந்தார்கள். இன்னொருபுறம் SAITM கல்லூரியிலே தங்களுடைய பிள்ளைகளை அனுமதித்த பெற்றோர்கள் அவர்களுடைய காலத்தையும் வீணாக்கித் பணத்தையும் இழந்து என்னசெய்வதென்று அறியாத நிலைமைக்குத் தள்ளப்பட்டிருந்தார்கள். இவையனைத்திற்கும் காரணம், இந்த நாட்டிலே சட்டத்தை நடைமுறைப் படுத்துகின்ற நிறுவனங்கள் தமது அதிகாரங்களைக் கையிலெடுத்துச் சட்டத்தைச் சரியாக நடைமுறைப் படுத்தாமையே என இந்த இடத்தில் நாங்கள் புரிந்துகொள்ள வேண்டியிருக்கின்றது. வைத்தியக் கல்வியைப் பெற்றுக் கொடுப்பதற்குரிய அனுமதி, அதற்குரிய தகைமைகள், அதற்கான நியமங்கள் என்பவற்றைக் கொண்டிராத ஒரு தனியார் நிறுவனமானது அக்கல்விக்காக மாணவர்களை உள்வாங்குகின்றபோது, அதற்கான ஒரு தீர்வை, அதற்கான ஒரு முடிவை எடுக்கக்கூடிய அதுசார்ந்த நிறுவனங்கள் என்ன செய்துகொண்டிருந்தன? என்ற கேள்வி எழுகின்றது. எவ்வாறாயினும் இன்று எல்லாத் தரப்புக்களும் நிம்மதியடையக்கூடிய, திருப்தியடையக்கூடிய ஒரு தீர்வு இதன்மூலம் கிட்டுமென நாம் நம்புகின்றோம்.

அதேநேரத்திலே, இந்தத் தனியார் பல்கலைக் கழகங்களுக்கான உள்வாங்கல் தொடர்பான குறைந்தபட்சத் தகைமை பற்றியும் இங்கே பேசப்படுகின்றது. ஒருபுறமாக இந்தத் தனியார் பல்கலைக்கழகங்களின், கல்லூரிகளின் கற்றல், கற்பித்தல், பாடநெறி வழிமுறை தொடர்பான நியமங்கள் என்பன ஏற்படுத்தப்பட வேண்டியிருக்கின்றன. மறுபுறமாக, அந்தக் கல்லூரிகளில் அந்தப் பாடநெறிகளுக்கு உள்வாங்கப்படுகின்ற மாணவர்களது தகைமை தொடர்பாகவும் நாங்கள் கவனத்திற்கொள்ள வேண்டியிருக்கின்றது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු (වෛද්‍ය) තුසිතා වීජේමාන්න මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் அக்கிராசனத்திலின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA *left the Chair, and* THE HON. DEPUTY SPEAKER *took the Chair.*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
அந்த வகையிலே, SAITM நிறுவனத்திலே கல்வியைத் தொடர்ந்த அந்த மாணவர்களுக்கு வாய்ப்பளிப்பதற்காக, குறைந்தபட்ச தகைமை 3-'S' சித்திகள் என இந்தச் சட்டத்திலே குறிப்பிடப்பட்டிருக்கின்றது. அதனைத் தொடர்ந்து, இனிவருங் காலங்களிலே ஏனைய பல்கலைக்கழகங்களுக்கு உள்வாங்கப் படுகின்ற மாணவர்கள் கொண்டிருக்கவேண்டிய தகைமையின் அடிப்படையிலேயே இதற்கான உள்வாங்கல் நடைபெறவேண்டுமென்றும் குறிப்பிடப்பட்டிருக்கின்றது. எனவே, நான் ஏற்கனவே குறிப்பிட்டதுபோல, இங்கு கொண்டுவரப்பட்டிருக்கின்ற குறைந்தபட்ச தகைமைகள், நியமங்கள் மற்றும் அதுசார்ந்த சட்டங்களானவை சரியான முறையிலே நடைமுறைப்படுத்தப்படுவதற்குரிய செயற்பாடுகள் முன்னெடுக்கப் படவேண்டும் என்பதனை இந்த இடத்திலே ஞாபகப்படுத்த விரும்புகின்றேன்.

அதேநேரத்திலே, ஒரு நாட்டில் மாணவர்கள் தங்களுடைய உயர் கல்வியை அரச பல்கலைக்கழங்களாக இருக்கலாம், தனியார் பல்கலைக்கழகங்களாக, அல்லது பல்கலைக்கழகக் கல்லூரிகளாக இருக்கலாம், அவற்றிலே சுதந்திரமாகத் தொடர்வதற்குரிய வாய்ப்புக்கள் வழங்கப்பட வேண்டும். நாங்கள் இங்கே எந்த வேலியை அமைத்தாலும்கூட, எவ்வாறு வேலியிட்டாலும்கூட, பல மாணவர்கள் பல மில்லியன் ரூபாயை வெளிநாடுகளிலே -

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have one more minute.

ගරු වේලු කුමාර් මහතා
(மாண்புமிகு வேலு குமார்)
(The Hon. Velu Kumar)
பல மில்லியன் ரூபாயை வெளிநாடுகளிலே செலவழித்துத் தங்களுடைய கல்வி நடவடிக்கைகளைத் தொடர்வது எங்களுக்குத் தெரியும். அதேநேரத்திலே, தங்களுக்குத் தகைமை இருந்தும்கூட, அதாவது தாங்கள் ஒரு வைத்தியராக, சட்டத்தரணியாக, பொறியியலாளராக வருவதற்குத் தகைமை இருந்தும்கூட, அதற்கான அவகாசம் இல்லாததனால் சாதாரண தொழில்களில் ஈடுபட்டிருக்கின்றவர்களும் இருக்கின்றார்கள். ஆகவே, இனிவருங் காலங்களில் இந்த நாட்டிலிருக்கின்ற உயர் கல்வி நிறுவனங்களினது உள்வாங்கல் தொடர்பான செயற்பாடுகள், கொண்டுநடத்துகின்ற நியமங்கள் என்பவற்றில் ஒரு சமநிலையைச் சட்டத் திருத்தங்களின்மூலம் ஏற்படுத்தி, இந்த இரண்டு நிலைப்பாடுகளுக்குமிடையிலே ஒரு சமநிலையான தீர்வு கிடைக்கப்பெற ஆவன செய்ய வேண்டும்.

[ගරු වේලු කුමාර් මහතා]

இங்கே விஞ்ஞானத் துறையில் அனுமதிக்கான குறைந்த பட்சத் தகைமை பற்றிப் பேசுகின்றோம். ஆனால், மலையகத்தின் வைத்தியத் துறையைப் பொறுத்தவரையிலே, குறிப்பாகத் தோட்டத்துறையிலிருக்கின்ற வைத்திய சாலைகளை - medical centre என்ற நிலையங்களைப் பார்த்தால், அங்கே வைத்தியர்களாகக் கடமையாற்றுபவர்கள் எவ்வித வைத்தியத் தகைமையுமற்ற சாதாரணமானவர்களாக இருப்பதைக் காணமுடிகின்றது. சிலவேளைகளிலே அவர்கள் வர்த்தகம் அல்லது கலைத்துறையிலே கல்வி பயின்றவர்களாகக்கூட இருக்கின்றார்கள். இவ்வாறான மிகுந்த பின்னடைவுகள், இடைவெளிகள், தொழில்சார்ந்த பற்றாக் குறைகள் வைத்தியத்துறையிலே இருக்கின்றன. இவை அனைத்தையும் கருத்திற்கொண்டு, தற்போது எடுக்கப்பட்டிருக்கின்ற இந்த முடிவினூடாக இனிவருங் காலங்களில் அந்தக் கல்வியைத் தொடர்வதற்கான அவகாசங்கள் அதிகரிக்கப்பட வேண்டுமெனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඊළඟට, ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමිය, ඔබතුමියට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.06]

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. SAITM පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය, කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට අනුබද්ධ කිරීම සම්බන්ධයෙන් බොහොම හොඳ, ධනාත්මක උත්තරයක් ලැබෙන මේ මොහොතේ උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍ය අපේ විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමාට මා විශේෂයෙන්ම ස්තුතිවන්ත වනවා. මා වෛද්‍ය සිසුවියක් හැටියට 1985දී වෛද්‍ය විද්‍යාලයට ඇතුළත් වෙලා, රාගම පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට විරුද්ධව අරගළ කරන කොට, අද සරසවි සිසුන් හා සමානවම අපි එදා ඊට විරුද්ධව පාරට බැස්සා. මේ හා සමානවම එදා අපි උද්ඝෝෂණ කරගෙන යන විට අපි දැකපු දෙයක් තිබෙනවා. මා විජයදාස රාජපක්ෂ ඇමතිතුමාට ඊයේ ආංශික උපදේශක කාරක සභාවේදීත් මේ කාරණය සම්බන්ධයෙන් කිව්වා. අද දරුවන් පාරට බැහැලා උද්ඝෝෂණය කරනවා. ඔවුන්ව ඒ සඳහා පොළඹවන යම් පිරිසක් ඉන්නවාද කියලා මට සැකයක් තිබෙනවා. මොකද, මා මේ අත්දැකීම ලබපු වෛද්‍ය සිසුවියක්. 1987, 1988 සහ 1989 කියන වර්ෂවල විශ්වවිද්‍යාල වහලා තිබුණු බව මට මතකයි. සමහර වෙලාවට අපි මේ උද්ඝෝෂණවලට සහභාගී වුණේ බොහොම අකැමැත්තෙන්. බල කිරීම් සහ පෙළඹවීම් මැද තමයි අපි උද්ඝෝෂණවලට සහභාගී වුණේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මා මේ කථා කරන්නේ වෛද්‍ය සිසුවියන්ගේ සහ සරසවි සිසුවියන්ගේ ආදරණීය දෙමව්පියන් වෙනුවෙනුයි. මොකද, මා හා සමකාලීනව අද වෛද්‍ය වෘත්තියේ යෙදිලා ඉන්න අය වාගේම මගේ සමකාලීන මිතුරු මිතුරියන් කියන දෙයක් තමයි, මේ සරසවි සිසුන්ව පාරට දමන්නේ නැතිව කෙසේ හෝ මේ ප්‍රශ්නයට විසඳුම් ලබා දෙන්න කියන කාරණය. අද ඒ සඳහා හොඳ, ධනාත්මක උත්තරයක් ලැබිලා තිබෙනවා. ඒ අනුව වෛද්‍ය ශිෂ්‍ය ශිෂ්‍යාවන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට අන්තර්ග්‍රහණය කර ගන්න අවස්ථාව ලැබිලා තිබෙනවා. අපි ඒ කටයුත්ත සඳහා අවුරුදු දෙකක කාලයක් ගත්තා වැඩියි කියා මට දැනෙනවා. මොකද, වෛද්‍ය සිසුවියක් විධියට විශ්වවිද්‍යාල ජීවිතය තුළ මගේ ගෙවුණු වයස කිසිසේත්ම ආපසු මට එකතු කර ගන්න බැරි වුණා. අවුරුදු පහකින් නිමා කරන්න තිබුණු වෛද්‍ය උපාධිය අපිට අවුරුදු හතකින් තමයි නිමා කරන්න ලැබුණේ. වර්තමානයේ සරසවිවල අධ්‍යාපනය ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ටත් මේ කාලය කිසිසේත්ම ඔවුන්ගේ ජීවිතයට එකතු කර ගන්න බැහැ. මේ අත්දැකීම ලබපු වෛද්‍ය ශිෂ්‍යාවක් විධියට මට දෙන්න තිබෙන පණිවුඩය මේකයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ආදරණීය දරුවන්ට අද හොඳ උත්තරයක් ලැබිලා තිබෙනවා. උසස් අධ්‍යාපන අමාත්‍යතුමා දීලා තිබෙන උත්තරයත් එක්ක අද සිට මේ දරුවන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට අන්තර්ග්‍රහණය කරලා, සයිටම් පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය අහෝසි වනකොට නියම ප්‍රමිතියකට ඔවුන්ට උසස් අධ්‍යාපනය හදාරන්න අවස්ථාව ලැබිලා තිබෙනවා. මේ දරුවන් නැවත නොයෙකුත් පෙලඹවීම්වලට මුළා වෙන්නේ නැතිව අධ්‍යාපන කටයුතු කරගෙන ගිහිල්ලා, දෙමව්පියන් බලාපොරොත්තු වන ඒ අපේක්ෂාව ඉෂ්ට කරන්න කියන පණිවුඩය මේ දරුවන්ට දෙන්න තමයි අද මා මෙය අවස්ථාවක් කර ගත්තේ. මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

ඊළඟට, ගරු මොහාන් ලාල් ග්‍රේරු රාජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.09]

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மொஹான் லால் கிரேரு - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Mohan Lal Grero - State Minister of Higher Education and Cultural Affairs)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනය දීර්ඝ කාලීන ප්‍රශ්නයක් සමථයකට පත් කරන දිනයක්. මේ විසඳුම කරා අප ගෙන යාම පිළිබඳව මේ අවස්ථාවේදී මා විශේෂයෙන් අතිගරු ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වනවා. ඒ වාගේම අලුතින් අපේ අමාත්‍යාංශයේ වැඩ බාර ගත් කැබිනට් ඇමතිතුමාට, ආරක්ෂක අමාත්‍යාංශයේ හා කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ උපකුලපතිතුමා ඇතුළු ආචාර්ය මණ්ඩලයටත් මා ස්තුතිවන්ත වනවා. ඊට අමතරව මට විශේෂයෙන් කාරණයක් කියන්න තිබෙනවා. "S" සාමර්ථ 3ක් තිබෙන දරුවන් වෛද්‍ය අධ්‍යාපනය ලැබීම පිළිබඳ ප්‍රශ්නය තමයි අද මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ලොකුවටම විවාදයට බඳුන් වුණේ.

මේ ප්‍රශ්නයේදී ඉතා පැහැදිලිව කියන්න තිබෙන්නේ, ලංකාවේ තිබෙන අදාළ නීතියට අනුව අද දක්වා විශ්වවිද්‍යාලවලට ඇතුළත් වීමේ අවම සුදුසුකම වන්නේ "S" සාමර්ථ 3යි කියන එකයි. එය වෛද්‍ය විද්‍යාලවලටත් සාධාරණයි. අද දක්වා මේ නීතිය වෙනස්වෙලා නැහැ. බිමල් රත්නායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට නිවැරැදි උත්තරය දෙන බව දැන ගත්ත නිසාත්, මේ යථාර්ථය, නිවැරැදි කථාව අහන්න බැරි නිසාත් තමයි මා උත්තර දෙන්න නැඟිට්ටාම බිමල් රත්නායක මන්ත්‍රීතුමා නොයෙක් අපවාද කියලා එයට විරුද්ධව කෑ ගැහුවේ. මෙය තමයි යථාර්ථය. ඒ විතරක්

නොවෙයි. ඒ නීතිය අනුව වෛද්‍ය අධ්‍යාපනය සඳහා අදත් අවම සුදුසුකම වන්නේ "S" සාමර්ථ 3යි කියලා මා ඉතා පැහැදිලිව කියනවා. වෛද්‍ය අධ්‍යාපනය සඳහා පමණක් අවම සුදුසුකම "C" සාමර්ථ 2ක් හා "S" සාමර්ථ 1ක් විය යුතුයි කියා යෝජනාවක් තිබෙනවා. එයට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබෙනවා. ඒ ගැසට් පත්‍රය තවම පාර්ලිමේන්තුවෙන් අනුමත වෙලා නැහැ. බිමල් රත්නායක මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයෙන් ඇත්තටම ඇහුවේ, "වෛද්‍ය අධ්‍යාපනය අවම ප්‍රමිතියට යටත් කියන එකට ඔබතුමා උත්තර දෙනවාද?" කියලායි. ඒ ප්‍රශ්නයට ඉතා පැහැදිලිව කියන්න තිබෙන්නේ, එතුමා කියන විධියට වෛද්‍ය අධ්‍යාපනය සඳහා තවමත් නීත්‍යානුකූලව අවම ප්‍රමිතියක් නැහැයි කියන එකයි. එතුමා බලාපොරොත්තු වන අවම ප්‍රමිතිය මොකක්ද?

ඊළඟට, මා ඉතා පැහැදිලිව කියන්න ඕනෑ, SAITM ආයතනය පටන් ගත්තේ 2009 - 2010 වර්ෂවලයි කියලා. 2009 - 2010 වසරවලම රජයේ විශ්වවිද්‍යාලවලට බඳවාගෙන තිබෙන දරුවන්ගේ අවම සුදුසුකම "S" සාමර්ථ 3යි. එහෙම නම් අද ඒවාත් අවලංගු කරන්න ඕනෑ. ඒ අය අද වෛද්‍යවරුන් හැටියට එළියට ඇවිල්ලා ඇති. එහෙම නම් ඒ අයගේ වෛද්‍ය උපාධිය අවලංගු කරනවාද කියලා මා ප්‍රශ්න කරන්න කැමැතියි. එහෙම නම් ඒ ගොල්ලන් වෛද්‍ය වෘත්තියෙන් අයින් කරන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. මා තව එක කාරණයක් පැහැදිලි කරන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් ගැසට් පත්‍රය තවම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නැති වුණාට, 2009 නිකුත් කරන ලද ගැසට් පත්‍රයක් තිබෙනවා. මේ ගැසට් පත්‍රය, 2009 වෛද්‍ය සභාව විසින් ඉදිරිපත් කරන ලද, පාර්ලිමේන්තුව විසින් අනුමත නොකරන ලද ගැසට් පත්‍රයක්. වෛද්‍ය අධ්‍යාපනයට ඇතුළත් වීමේ අවම සුදුසුකම - entry qualification - වශයෙන් මේ ගැසට් පත්‍රයේ තිබෙන්නේ මේ විධියටයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මා මේ ගැසට් පත්‍රය කියවන්නම්.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඔබතුමාට මඩ ගහපු එක කියන්න.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
ඒ මඩ ගැහුවේ ඇත්ත අහගන්න බැරි නිසා නේ. නිවැරදි උත්තරය දෙනකොට ඒ උත්තරය අහගෙන ඉන්න බැරි බව දැනගෙන, ඒ උත්තරයට මුහුණ දෙන්න බැරි වුණාම වෙන මොකක් හෝ කියලා පැනලා ගියා; නැඟිටලා ගියා. එතුමා කිව්වා, එතුමා මගෙන් ඉගෙන ගත්තාය කියලා. එය ඇත්තයි. එතුමා මගේ පෞද්ගලික අධ්‍යාපන පන්තියේ ඉගෙනගෙන, එතුමා මට ඒ විධියට චෝදනා කරන්නේ මා මිනී මරන්න ඉගැන්වූයේ නැති නිසා වෙන්න ඇති.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ලජ්ජයි.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
ඔව්. ලජ්ජයි. එතුමාට ලජ්ජා නැද්ද මා දන්නේ නැහැ. ඇත්තටම මට ලජ්ජයි. ඇත්ත කථාව එයයි. දැන් මට ලජ්ජයි. ඒ තමයි එතුමා ඒ ඇත්ත දේට, නිවැරදි උත්තරයට මුහුණ දෙන්න බැරි නිසා ඇකිළිච්ච විධිය; ඒ කථා කරපු විධිය. [බාධා කිරීමක්] මගේ ගෝලයෝ ගණනාවක් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා; මේ රට පුරා ඉන්නවා. ඒක වෙනම එකක්. මට මෙතැන කථා කරන්න සදාචාරාත්මක අයිතිය දුන්නේ මට ඡන්දය දුන් මේ රටේ දහස් ගණනක් ජනතාව. එතුමා මට ඒ අයිතිය දෙන්න ආපසු ඇවිල්ලා. එතුමා ප්‍රජාතන්ත්‍රවාදය ගැන දන්නේ නැද්ද? අපේ කාලයේ ඒ පන්තිවලටත් කොළ කැලි එව්වා, "පන්ති වහාම නවත්වනු" කියලා. අන්න එහෙම තමයි කළේ. බුලත් කඩයක්වත් කරන්න දුන්නාද?

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ඉවරවෙලා දැන් ඇවිල්ලා අපට මෙතැන කථා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2009.02.25වැනි දින ගැසට් පත්‍රයේ සඳහන් වන අවම සුදුසුකම් මම කියන්නම්.

"විශ්වවිද්‍යාලය, වෛද්‍ය විද්‍යාලය හෝ වෙනත් ආයතනයට ඇතුළත් වනු ලබන ශිෂ්‍යයන්ට අවුරුදු දහතුනකට නොඅඩු විධිමත් අධ්‍යාපනයක් ද ජීව විද්‍යා විෂය මාලාවෙන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) හෝ සමාන විභාගයකින් සාමාර්ථයක් තිබිය යුතුය."

On the issue of the army camp, we have spoken, I think, with the Hon. Member of Parliament as well. I have spoken with the Army Commander and he has assured me of the move-out and requested to give him a one-year time period, because the issue for them has been that they have to find an alternative land. The land that they had already found was not accepted; they were not given the green light to go ahead and acquire that land. But now, they have found another plot of land, for which they have been given the green light to go ahead and acquire. So, they are going ahead with its acquisition at the moment. Anyway, they need to shift the whole camp from where it is at present.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, අර army camp එක ඉවත් කරන්න අවුරුද්දක් කල් දීලා තිබුණා. දැන් ඒ කාලය ඉවරයි. Army Commander දැන් ආයෙත් තවත් අවුරුද්දක් ඉල්ලනවා. Army Commander පොරොන්දු වුණාලු, "අපට තව අවුරුද්දක් දෙන්න. අපි ඒ තැන බාරදීලා වෙනත් place එකකට යන්නම්." කියලා. ඇමතිතුමාත් කියනවා තව අවුරුද්දක් විතර ඕනෑ කියලා. ඒක තමයි තිබෙන ප්‍රශ්නය.

ගරු රුවන් විජයවර්ධන මහතා
(மாண்புமிகு ருவன் விஜயவர்தன)
(The Hon. Ruwan Wijayawardene)

ඔබතුමා කියන කථාව හරි, ගරු මන්ත්‍රීතුමා. අපි යුද හමුදාපතිතුමා සමඟ මේ ගැන කථා කළාම එතුමා අපට ප්‍රකාශ කළා, ඒ ගොල්ලන් මෙතැනින් යන්න ඉස්සෙල්ලා ඉඩමක් පවරා ගන්න බලන් ඉඳලා තිබෙන බව. නමුත්, ඒකට ඒ ගොල්ලන්ට අනුමැතිය ලැබුණේ නැහැ. ඒ නිසා දැන් වෙනත් ඉඩමක් පවරා ගන්න ඒ ගොල්ලන්ට මුදල් ඔක්කෝම අනුමත වෙලා තිබෙන්නේ. ඉඩමත් අනුමත වෙලා තිබෙන්නේ. දැන් යුද හමුදාවෙන් කියන්නේ ඔවුන්ට එතැනට යන්න ඒ භූමියේ යටිතල

[ගරු රුවන් විජයවර්ධන මහතා]

පහසුකම් ටික ඔක්කෝම හදා ගන්නට ඕනෑ කියලායි. නමුත්, ඒ භූමිය නිදහස් කිරීම අපි අනිවාර්යයෙන්ම කරනවා. මේ ක්‍රියාවලිය ගොඩක් පරක්කු වෙලා තිබෙන්නේ, ප්‍රමාද වෙලා තිබෙන්නේ ඒ අය ඉඩම්වලින් ඉවත් වෙලා යනකොට තවත් ඉඩමක් ඒ ගොල්ලන්ට හොයා ගන්න වෙලා තිබෙන නිසායි. නමුත්, ඒක අනිවාර්යයෙන්ම වෙනවා. අපි නිකම් කල් අරගෙන හමුදාව එතැනම තියාගන්නේ නැහැ. ඔබතුමන්ලාට අපි පොරොන්දුවක් දුන්නා එතැනින් අපි හමුදා කඳවුර ගලවනවා කියලා. දැන් ඒවා ඔක්කෝම සකස් කරලා තිබෙන්නේ; සූදානම් කරලා තිබෙන්නේ. යම් කිසි කාලයක් යනවා ඒ ටික ඔක්කෝම කරගන්න. මට කිව්වේ නම් මේ සඳහා තව අවුරුද්දක් විතර අවශ්‍ය වෙයි කියලායි. මම නැවත හමුදාපතිතුමාගෙන් අහන්නම්, පුළුවන් තරම් ඉක්මන් කරන්න පුළුවන් ද කියලා, ඒ භූමිය පුළුවන් තරම් ඉක්මනින් ඔබතුමන්ලාට ලබා දෙන්න. මොකද, මම දන්නා තරමින් යාබද ගොඩනැඟිලි දෙකක පාසලේ වැඩ කටයුතු කරගෙන යනවා. නමුත්, ඒ පාසලට ගොඩනැඟිලි ටික අවශ්‍ය වෙලා තිබෙන නිසා පුළුවන් තරම් ඉක්මනින් ඒ වැඩකටයුතු කරලා ඒ ප්‍රදේශයේ ජනතාවට ඒ පහසුකම් ලබා දෙන්න අපි වැඩ කටයුතු කරනවා කියලා මේ අවස්ථාවේදී කියන්නට ඕනෑ. තව අවුරුද්දක් දෙන්න කියලා තමයි හමුදාපතිතුමා අපෙන් ඉල්ලීමක් කරලා තිබෙන්නේ. ඒක පුළුවන් තරම් ඉක්මන් කරන්න අපි වැඩ කටයුතු කරන්නම්.

2009 වසරේ සිට මේ වන විට උතුරු-නැඟෙනහිර ප්‍රදේශවල ත්‍රිවිධ හමුදා කඳවුරු පවත්වාගෙන ගිය ඉඩම් අක්කර 83,000ක් ආපසු ඒ ප්‍රදේශවල ජනතාවට ලබා දීලා තිබෙනවා. ඒ ප්‍රදේශවල ජනතාවට ලබා දෙන්න තවත් ඉඩම් ගණනාවක් තිබෙනවා. ඒ සැලසුම් ටිකත් අපට තිබෙනවා. අපි ඒවා අනිවාර්යයෙන්ම කරනවා. එම ප්‍රදේශයේ ජනතාවට මේ ඉඩම් ලබා දෙන බවට අපි පොරොන්දු වෙලා තිබෙනවා. අපේ ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත්, අපේ මුළු රජයම මේ සංහිඳියාව ඇති කිරීමටත්, ඒ ප්‍රදේශවල ජනතාවගේ අවශ්‍යතාවලට අවශ්‍ය ඉඩම් ටික ලබා දෙන්න අවශ්‍ය වැඩ කටයුතු අනිවාර්යයෙන්ම කෙරෙනවා. මම දන්නවා, යම් කිසි ප්‍රමාදයක් වෙලා තිබෙන බව. ඒ ප්‍රමාදය වෙලා තිබෙන්නේ ඔවුන් කඳවුරු අත් හැර යනකොට වෙනත් ඉඩමකට ඒ කඳවුරු ටික ගෙනියන්නට ඕනෑ වෙලා තිබෙන නිසායි. ඒ නිසා වෙනත් ඉඩම් ටිකක් හොයා ගන්න වෙලා තිබෙනවා. ඒ ඉඩම්වලට අවශ්‍ය යටිතල පහසුකම් ටිකත් සකස් කරගන්න වුවමනා වෙලා තිබෙනවා. ඒ නිසා තමයි මේ ප්‍රමාදය ඇති වෙලා තිබෙන්නේ. වෙන මොකක්වත් නිසා නොවෙයි. අනෙක් ප්‍රශ්න ගැනත් මම සලකා බලා පුළුවන් තරම් ඉක්මනින් ඒවාට අවශ්‍ය විසඳුම් ටික ලබා දෙන්න කටයුතු කරන්නම්. ඒ වාගේම, අපේ ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා මගෙන් ඉල්ලීමක් කළා එතුමා නියෝජනය කරන මන්නාරම ප්‍රදේශයට එන්න කියලා. තව සුමානයකින්, දෙකකින් විතර මම ඔබතුමාට දිනයක් දීලා ඒ ප්‍රදේශයට ඇවිල්ලා ඔබතුමන්ලාට තිබෙන ගැටලු සම්බන්ධයෙන් සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් ඒකමතිකව පිළිගනු ලැබිණි.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.13 ට, 2018 ජූනි මස 21 වන බ්‍රහස්පතින්දා පූ. භා. 10.00 වන තෙක් කල් ගියේය.


அதன்படி பி. ப. 7.13 மணிக்கு பாராளுமன்றம், 2018 யூன் 21, வியாழக்கிழமை மு. ப. 10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 7.13 p.m. until 10.00 a.m. on Thursday, 21st June, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

261 වන කාණ්ඩය - 6 වන කලාපය
தொகுதி 261 - இல. 6
Volume 261 - No. 6

2018 ජූනි 21වන බ්‍රහස්පතින්දා
2018 யூன் 21, வியாழக்கிழமை
Thursday, 21st June, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන :

සභාපති නාමාවලිය : සාමාජිකයන් ආදේශ කිරීම

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය :

සහන පදනම යටතේ ලබාදුන් ට්‍රැක්ටර් රථ සඳහා වූ ගෙවීම්වලින් කිලිනොච්චි ගොවීන් නිදහස් කිරීම

1990 සුවසැරිය පදනම පනත් කෙටුම්පත :

දෙවන වර සහ තුන්වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

සුරාබදු ආඥාපනත:

නිවේදන

ආනයන හා අපනයන (පාලන) පනත :

නියෝග

කල් තැබීමේ යෝජනාව:

වන වගාව සඳහා කාබන් අරමුදලෙන් දීමනාවක් ලබා ගැනීම

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:

தவிசாளர் குழாம் : உறுப்பினர்களைப் பதிலீடு செய்தல்

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா :

மானிய அடிப்படையில் வழங்கப்பட்ட இருசக்கர உழவு இயந்திரத்துக்கான கொடுப்பனவிலிருந்து கிளிநொச்சி விவசாயிகளை விடுவித்தல்

1990 சுவசெரிய மன்றம் சட்டமூலம்:

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப்பட்டவாறு நிறைவேற்றப்பட்டது

மதுவரிக் கட்டளைச் சட்டம்:

அறிவித்தல்

இறக்குமதிகள் மற்றும் ஏற்றுமதிகள் (கட்டுப்பாட்டுச்) சட்டம்:

ஒழுங்குவிதிகள்

ஒத்திவைப்புப் பிரேரணை:

காபன் நிதியத்தின்மூலம் வனச் செய்கைக்கான கொடுப் பனவொன்றைப் பெற்றுக்கொள்ளல்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Chairman's Panel: Substitution of Members

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Payment Waive Off to Kilinochchi Farmers for Tractors Given at Concessionary Rate

1990 SUWASERIYA FOUNDATION BILL:

Read a Second and the Third Time, and passed as amended

EXCISE ORDINANCE:

Notifications

IMPORTS AND EXPORTS (CONTROL) ACT:

Regulations

ADJOURNMENT MOTION:

Grant from Carbon Fund for Forestation

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 ජූනි 21වන බ්‍රහස්පතින්දා
2018 யூன் 21, வியாழக்கிழமை
Thursday, 21st June, 2018

පූ.භා. 10.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய) தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2018 ජූනි මස 21වන බ්‍රහස්පතින්දා, එනම් අද අපර භාග 2.00ට මාගේ නිල කාමරයේදී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලුදෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

II

සභාපති නාමාවලිය : සාමාජිකයන් ආදේශ කිරීම
தவிசாளர் குழாம் : உறுப்பினர்களைப் பதிலீடு செய்தல்
CHAIRMAN'S PANEL : SUBSTITUTION OF MEMBERS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාපති නාමාවලියේ සේවය පිණිස මා විසින් පත් කරන ලද ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා නියෝජ්‍ය කථානායක වශයෙන්ද, ගරු ලකී ජයවර්ධන මහතා රාජ්‍ය අමාත්‍යවරයකු වශයෙන්ද, ගරු එඩ්වඩ් ගුණසේකර මහතා නියෝජ්‍ය අමාත්‍යවරයකු වශයෙන්ද පත්වීම නිසා පාර්ලිමේන්තුවේ අංක 140 වැනි ස්ථාවර නියෝගය ප්‍රකාරව ගරු මයන්ත දිසානායක මහතා, ගරු හේෂාන් විතානගේ මහතා සහ ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා අටවන පාර්ලිමේන්තුවේ දෙවන සභා වාරයේ සභාපති නාමාවලියේ සේවය පිණිස පත් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් යෝජනා සහ නියම ඉදිරිපත් කරමි.

(i) (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් වූ යෝජනාව

(2018 මාර්තු 16 දිනැති අංක 2062/45 දරන අති විශේෂ ගැසට් පත්‍රය);

(ii) (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් වූ යෝජනාව

(2018 අප්‍රේල් 17 දිනැති අංක 2067/2 දරන අති විශේෂ ගැසට් පත්‍රය);

(iii) (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් වූ යෝජනාව

(2018 මැයි 01 දිනැති අංක 2069/2 දරන අති විශේෂ ගැසට් පත්‍රය);

(iv) (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් වූ යෝජනාව

(2018 මැයි 02 දිනැති අංක 2069/19 දරන අති විශේෂ ගැසට් පත්‍රය);

(v) (235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන් වූ යෝජනාව

(2018 මැයි 15 දිනැති අංක 2071/15 දරන අති විශේෂ ගැසට් පත්‍රය);

(vi) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 පෙබරවාරි 23 දිනැති අංක 2059/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මාර්තු 07 දිනැති අංක 2061/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(viii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මාර්තු 19 දිනැති අංක 2063/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ix) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අප්‍රේල් 01 දිනැති අංක 2064/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

(x) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මැයි 01 දිනැති අංක 2069/18 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(xi) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මැයි 08 දිනැති අංක 2070/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(xii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මැයි 09 දිනැති අංක 2070/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(xiii) 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මැයි 20 දිනැති අංක 2071/85 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය.

එම යෝජනා සහ නියමයන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් පසු ඒකමතිකව එකඟ විය.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ කාර්ය සාධන වාර්තාව හා ගිණුම් ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් පසු ඒකමතිකව එකඟ විය.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 සහ 2017 වර්ෂ සඳහා ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කරමි.

එම වාර්තා ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් පසු ඒකමතිකව එකඟ විය.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016/2017 වර්ෂය සඳහා සී/ස ලංකා පොස්පේට් සමාගමේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් පසු ඒකමතිකව එකඟ විය.
Question put, and agreed to.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවෙන්, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂය සඳහා ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව;

(ii) 2017 වර්ෂය සඳහා ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා; සහ

(iii) 2017 වර්ෂය සඳහා ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

එම වාර්තා කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
විනා විවාදයකින් පසු ඒකමතිකව එකඟ විය.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

Hon. Speaker, on behalf of the Chairman of the Sectoral Oversight Committee on Economic Development, I present the Report of the Sectoral Oversight Committee on Economic Development on, "1990 Suwaseriya Foundation Bill" which was referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු රංජිත් සියඹලාපිටිය මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා)
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி அமைச்சர்)
(The Hon. Ranjith Siyambalapitiya - Minister of Power and Renewable Energy)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) අරණායක, කීරපනය, "ගුරුගලේ" යන ලිපිනයෙහි පදිංචි උදුලාවතී මැණිකේ මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කෑගල්ල, දිඹුල්ගමුව, බෙලිවත්ත යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.පී. සුභසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு வசந்த அலுவிஹாரே - கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon.Wasantha Aluvihare - State Minister of Agriculture)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) මාතලේ, කලුදෑවල, පාරාවත්ත, අංක 4/C දරන ස්ථානයෙහි පදිංචි කේ.ජී. ප්‍රේමසිරි මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) මාතලේ, මල්වත්ත පාර, අංක 200/5 දරන ස්ථානයෙහි පදිංචි ප්‍රදීප් මද්දුම කුළගේ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) මාතලේ, කටුදෙණිය, අංක 145/2/B දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්.එම්.ජී. ඉන්දික කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු කථානායකතුමනි, කොළඹ 05, කිරුළපන මාවත, අංක 73/47B දරන ස්ථානයෙහි පදිංචි කේ.ඒ. පාලිත රමාසිරි පෙරේරා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - State Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, ඇතුල්කෝට්ටේ, මාළිගාව පාර, 16/25 බී දරන ස්ථානයෙහි පදිංචි ධම්මික පරණ යාපා මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් හතර පිළිගන්වමි.

(1) දෙයියන්දර, කළුගලදෙණිය, අංක 2/17 දරන ස්ථානයෙහි පදිංචි ජේ.එල්. සුනිල් නන්ද මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) දෙහිවල, අනගාරික ධර්මපාල මාවත, අංක 81/7සී දරන ස්ථානයෙහි පදිංචි කේ.සී.ජේ. බැසිල් ප්‍රනාන්දු මහත්මියගෙන් ලැබුණු පෙත්සම;

(3) පිළියන්දල, මාවිත්තර, කනත්ත පාර, අංක 98/6 දරන ස්ථානයෙහි පදිංචි එම්.කේ. සේන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(4) අතුරලිය, යහමුල්ල, ඉඹුල්ගහවත්ත, "විස්මී" යන ලිපිනයෙහි පදිංචි මහවත්තගේ විජේරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු බිමල් රත්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු අරුන්දික ප්‍රනාන්දු මහතා
(மாண்புமிகு அருந்திக்க பர்னாந்து)
(The Hon. Arundika Fernando)

ගරු කථානායකතුමනි, පනිරෙන්ඩාව, කුඩා බිංගිරිය යන ලිපිනයෙහි පදිංචි ආර්.පී. දුලීකා දිල්හානි මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිඵම් අමුණුගම මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

ගරු කථානායකතුමනි, ඉපලෝගම, කුංචිකුලම, අංක 28 දරන ස්ථානයෙහි පදිංචි ජේ.කේ. සේනාධීර මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු කථානායකතුමනි, යක්කල, පොල්හේන, අංක 31/1 දරන ස්ථානයෙහි පදිංචි ජේ.ඒ.පී. පද්මලතා මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ගරු කථානායකතුමනි, ඇඹිලිපිටිය, මොරකැටිය, නුගේ හරස් පාර, අංක 3993/5 දරන ස්ථානයෙහි පදිංචි ඒ. එදිරිසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

ගරු කථානායකතුමනි, අක්මීමන, කපුහෙම්පල, ගොඩදුව පාර, අංක 106/4 දරන ස්ථානයෙහි පදිංචි එස්.ඒ. අතපත්තු මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)

ගරු කථානායකතුමනි, ඇහැලියගොඩ, පනාවල, රංගේගම, අංක ඒ/12/4 දරන ස්ථානයෙහි පදිංචි පී.එච්. පියවංශ මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

තේ කර්මාන්තය මුහුණ පා ඇති ගැටලු : විසඳුම්
தேயிலைக் கைத்தொழில் எதிர்நோக்கியுள்ள பிரச்சினைகள்: தீர்வு
PROBLEMS FACED BY TEA INDUSTRY: SOLUTIONS

40/'18

1. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 157ට අනුව, තේ කර්මාන්තය මුහුණ පා ඇති ගැටලු විසඳීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශවලින් සමන්විත ක්‍රියාකාරී කමිටුවක් පිහිටවනු ලැබුවේද;

(ii) එසේ නම්, එහි සාමාජිකයන්ගේ නම් කවරේද;

(iii) 2016 වර්ෂය තුළදී එම කමිටුව විසින් හඳුනා ගනු ලැබූ තේ කර්මාන්තය මුහුණ පා සිටි ප්‍රධාන ගැටලු කවරේද;

(iv) 2016 වර්ෂය තුළදී තේ කර්මාන්තයේ ගැටලු විසඳීම සඳහා රජය විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

පෙරුන්තෝට්ටක් කෛත්තොෆිල් අමෛච්චරෛක් කේට්ට විනා:

(அ) (i) 2016ஆம் ஆண்டுக்கான வரவுசெலவுத்திட்ட முன்மொழிவு இலக்கம் 157இன் பிரகாரம், தேயிலைக் கைத்தொழில் எதிர்நோக்கியுள்ள பிரச்சினைகளைத் தீர்ப்பதற்காக அரச மற்றும் தனியார்துறையை உள்ளடக்கிய செயற்பாட்டுக் குழுவொன்று நியமிக்கப்பட்டதா;

(ii) ஆமெனில், அதன் அங்கத்தவர்களின் பெயர்கள் யாவை;

(iii) 2016ஆம் ஆண்டில் அக்குழுவினால் இனங் காணப்பட்ட தேயிலைக் கைத்தொழில் எதிர் நோக்கியுள்ள பிரதான பிரச்சினைகள் யாவை;

(iv) 2016ஆம் ஆண்டில் தேயிலைக் கைத்தொழிலின் பிரச்சினைகளைத் தீர்ப்பதற்காக அரசாங்கத் தினால் கடைப்பிடிக்கப்பட்ட வழிமுறைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked Minister of Plantation Industries :

(a) Will he inform this House-

(i) whether a state-private Joint Action Committee was formed in order to solve the problems faced by the tea industry according to Proposal No. 157 of Budget 2016;

(ii) if so, the names of its members;

(iii) the main problems identified by the said Committee in 2016 as those faced by the tea industry; and

(iv) the measures adopted by the government in order to solve the problems in the tea industry in 2016?

(b) If not, why?

ගරු ඒ.ඩී. ප්‍රේමදාස මහතා (වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.டி. பிரேமதாச - பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. A.D. Premadasa - State Minister of Plantation Industries)

ගරු කථානායකතුමනි, ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා අසන ලද එම ප්‍රශ්නයට වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම පිළිතුර දෙනවා.

(අ) (i) ප්‍රාදේශීය වැවිලි සමාගම් කොළඹ කොටස් වෙළෙඳ පොළෙහි ලේඛනගත සමාගම් බවට පත් කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුකූලව ප්‍රතිපත්ති හා සැලසුම් කටයුතු අමාත්‍යාංශය යටතේ වැවිලි ප්‍රතිව්‍යුහකරණ කමිටුව පිහිටුවීම සිදු කර ඇත. ඒ යටතේ උප කමිටු පත් කිරීම සිදු කර නිර්දේශ ලබා දී ඇති අතර, ප්‍රධාන කමිටුව මඟින් පත් කළ ජාත්‍යන්තර ගිණුම්කරණ ආයතන 03ක් විසින් ප්‍රාදේශීය වැවිලි සමාගම්වල මූල්‍යමය හා කෘෂි කාර්මික ඇගයීමක් සිදු කර ඇත. ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

(ii) ඇමුණුම 01 මඟින් ඉදිරිපත් කර ඇත.

(iii) ඇමුණුම 02 මඟින් ඉදිරිපත් කර ඇත.

(iv) පෞද්ගලීකරණය කරන ලද ප්‍රාදේශීය වැවිලි සමාගම් 20 යටතේ පාලනය වන ඉඩම් ප්‍රමාණයන් ඇමුණුම 03 මඟින් ඉදිරිපත් කර ඇත. ඇමුණුම් **සභාගත*** කරමි.

ප්‍රාදේශීය වැවිලි සමාගම් 20ට අදාළව වතු යායන් 400කට ආසන්න ප්‍රමාණයක තේ, පොල්, රබර් යන ප්‍රධාන භෝගයන්ට අමතරව විවිධ භෝග වගා කර ඇත. වතුවල ඵලදායීතාව වතු යායෙන් වතු යායට, වැවිලි සමාගමෙන් සමාගමට මෙන්ම විවිධ කාල පරාසයන් තුළදී ද වෙනස්වීම්වලට භාජන වේ.

මෙහිදී ඵලදායීතාව යන්නෙන් අදහස් කරන සංඛ්‍යා දත්තයන් මොනවාද යන්න නිශ්චිතව සඳහන් කරන්නේ නම් ඒ පිළිබඳ අදාළ දත්ත ලබා දිය හැකිය.

(ආ) අදාළ නොවේ.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මෙම පිළිතුර සැපයීම සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, අධි සංවේදී පරිසර කලාපයක් වන නකල්ස් කඳුවැටිය ආශ්‍රිත ප්‍රදේශය තුළ වැවිලි කර්මාන්ත සමාගම් සතු වතුවල ඉඩම් ඉතා විශාල වශයෙන් පෞද්ගලීකරණය සඳහා සමහර විට දැනටමත් වැවී යනාදිය පෞද්ගලික අංශයට පවරා දී තිබෙන නිසාත්, මේ පිළිබඳව එම ප්‍රදේශයේ ජනතාව ඇතුළු පරිසරවේදීන්ගේ විශාල විරෝධයක් මතු වී තිබෙන නිසාත්, පළමුවැනි දා සිට ගරු අග්‍රාමාත්‍යතුමා එම ප්‍රදේශයට කැඳවාගෙන යන්න බලාපොරොත්තු වෙන නිසාත් නකල්ස් කඳුවැටිය ආශ්‍රිතව පවතින රාජ්‍ය වැවිලි සංස්ථාව සතු ඉඩම් පෞද්ගලික අංශයට ලබා දීමේ ප්‍රතිපත්තිය රජය ක්‍රියාත්මක කරනවාද, නැද්ද කියන එක පිළිබඳව ඔබතුමා මේ ගරු සභාවට දැනුම් දෙනවාද?

ගරු ඒ.ඩී. ප්‍රේමදාස මහතා
(மாண்புமிகு ஏ.டி. பிரேமதாச)
(The Hon. A.D. Premadasa)
ගරු කථානායකතුමනි, -[බාධා කිරීමක්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, නකල්ස් රක්ෂිතයට අයත් කිසිම ඉඩමක් අපි දීලා නැහැ. ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට ඉතිහාසය ගැන කියන්න කැමැතියි. චන්ද්‍රිකා මැතිනිය 1995දී ඉඩම් අක්කර ලක්ෂ පහක් පෞද්ගලික අංශයට දුන්නා. [බාධා කිරීම්] කවුද, විරුද්ධ වුණේ? [බාධා කිරීම්] හරි, හරි. මම කියන්නේ චන්ද්‍රිකා මැතිනිය 1995දී -

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
අපි විරුද්ධ වුණා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

පොඩ්ඩක් අහගෙන ඉන්න. කලබල වෙන්න එපා. චන්ද්‍රිකා මැතිනිය ඉඩම් අක්කර ලක්ෂ පහක් සමාගම් නවයකට දුන්නා. කවුද, දුන්නේ ඒක? [බාධා කිරීමක්]

හරි, හරි. පොඩ්ඩක් ඉන්න. Let me reply. උත්තරය ඕනෑ නැත්නම් මම වාඩිවෙනවා. [බාධා කිරීමක්] මට උත්තරය දෙන්න ඉඩ හරින්න. ගරු කථානායකතුමනි, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය ඉඩම් අක්කර ලක්ෂ පහක් පෞද්ගලික අංශයට දෙනකොට මහනුවර දිස්ත්‍රික්කයේ සහ මාතලේ දිස්ත්‍රික්කයේ තිබෙන වතු කිසි කෙනෙක් ගත්තේ නැහැ. No one wanted those estates because those were so badly maintained. වතු සමාගම් කිව්වා, මහනුවර දිස්ත්‍රික්කයේ තිබෙන වතු සහ මාතලේ දිස්ත්‍රික්කයේ තිබෙන වතු එපා කියලා. ඒ වතු එතරම් දුර්වල මට්ටමකයි තිබුණේ. මේ වතු නඩත්තු කරන්න එදා සිට අද දක්වා භාණ්ඩාගාරයට අවුරුද්දකට රුපියල් මිලියන 1,500ක් වැය වෙනවා. හැම අවුරුද්දේම භාණ්ඩාගාරයට ගිහින් කෙඳිරිගාන්න ඕනෑ. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ කාලයේ සිට 2001 දී මම වැවිලි කර්මාන්ත ඇමති වශයෙන් පත්වන තෙක් අවුරුදු 20ක් EPF සඳහා රුපියල් මිලියන 1,800ක් තමුන්නාන්සේලා ගෙව්වේ නැහැ. ජනවසම හා රාජ්‍ය වැවිලි සංස්ථාවේ වතුවල සේවකයන්ගේ EPF රුපියල් මිලියන 1,800ක් තමුන්නාන්සේලා ගෙව්වේ නැහැ. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. මේක දිග කථාවක්. මේක ටිකක් - [බාධා කිරීමක්] නකල්ස් විතරක් නොවෙයි, - [බාධා කිරීමක්] දෙන්නම්, දෙන්නම්. දෙනවා. තමුන්නාන්සේලා 2015 දී අපට ආණ්ඩුව භාර දෙනකොට - [බාධා කිරීමක්] පොඩ්ඩක් වාඩිවෙලා අහගෙන ඉන්න. [බාධා කිරීමක්] ගරු කථානායකතුමනි, 2015 දී යහ පාලන ආණ්ඩුව පත්වන කොට EPF සඳහා රුපියල් මිලියන 1,800ක් ගෙවන්න තිබුණා. ඒ අවස්ථාවේදී වැවිලි කර්මාන්ත ඇමතිවරයා හැටියට මම ඒ සම්බන්ධයෙන් කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා. ඊට පස්සේ රවි කරුණානායක හිටපු ඇමතිතුමා රුපියල් මිලියන 1,800ක් මුදා හැරියා, EPF ගෙවන්න. ඒකෙන් රුපියල් මිලියන 1,000ක් දුන්නා, යහ පාලන ආණ්ඩුව කාලයේ. අද මේ වතු නඩත්තු කර ගන්න බැහැ.

මම මාස දෙකකට කලින් තෙල්දෙණියේ හෙයාර්පාර්ක් වත්තට ගියා. සුමානයකට දවස් දෙකයි කම්කරුවන්ට වැඩ තිබෙන්නේ. ඒ කම්කරුවන් කියනවා, "මේ වතු කරන්න පුළුවන් කාට හෝ දෙන්න" කියලා. මේවා කාටත් එපා කියපු වතු. අවුරුද්දකට රුපියල් මිලියන 1,500ක් පාඩු වන වතුවල -වගා කරපු ඉඩම් නොවෙයි- වගා නොකරපු ඉඩම් තෝරා ගෙන, private sector එකෙන් ඉල්ලන ඕනෑ කෙනෙකුට දෙන්න පුළුවන් වන විධියට කබීර් හාෂිම් ඇමතිතුමා යෝජනා 250ක් හැදුවා. මේ ඉඩම් කබීර් හාෂිම් ඇමතිතුමාගේ අයටයි, මගේ අයටයි දුන්නා කියන එක අමූලික අසත්‍යයක්. කබීර් හාෂිම් ඇමතිතුමා මේ යෝජනා 250 හැදුවේ උපදේශකවරු - consultantsලා - පස් දෙනෙකු සමඟ අවුරුදු එක හමාරක් තිස්සේ මේ යෝජනා සියල්ලම අධ්‍යයනය කරලා, භාණ්ඩාගාරයේ කැමැත්ත අනුවයි. එතුමා අමාත්‍යාංශය මට බාර දෙනකොට මේ යෝජනා කැබිනට් මණ්ඩලයෙන් අනුමත වෙලා තිබුණා. හැබැයි, නකල්ස් රක්ෂිතයේ එක් බිම් අඟලක්වත් දීලා නැති බව මා තමුන්නාන්සේලාට කියන්න ඕනෑ. [බාධා කිරීමක්] I have not finished. මා පුවත් පත් සාකච්ඡාවක් පවත්වලා කිව්වා, නකල්ස් රක්ෂිතයේ කොහේද ඉඩම් දීලා තිබෙන්නේ කියලා මට පෙන්වන්න කියලා. නකල්ස් රක්ෂිතයේ පොළොව ලකුණු කරලා තිබෙන බව ඔබතුමා දන්නවාද, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි? ඒ ලකුණුවලින් පිට ඉඩම් තමයි අපි දීලා තිබෙන්නේ. දැන් තමුන්නාන්සේලා මේ නකල්ස් රක්ෂිතය කියලා,-

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

දැනටත් ඕවා පෞද්ගලික සමාගමිනේ. දැනටත් ඕවා පෞද්ගලිකව දීලානේ තිබෙන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக්ෂ්මන් கිරිஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ජනවසමේ වතු තවම පාලනය වෙන්නේ රජයෙන්. මාතලේ ඇල්කඩුව වතු පාලනය වෙන්නේත් රජයෙන්. මේ වතු නඩත්තු කරන්න බැහැ. මේ වතු කවුරුත් එපා කියපු වතු. දැන් රාජ්‍ය ව්‍යවසාය අමාත්‍යාංශය මේ කාරණය සම්බන්ධව කියන්නේ මොකක්ද? මේ ලාභ ලබන ආයතන එක්තරා දියුණු මට්ටමකට ගෙනෙන්න කියායි අමාත්‍යාංශය කියන්නේ. රාජ්‍ය ආයතන නඩත්තු කරන්න අවුරුද්දකට ආණ්ඩුවට රුපියල් බිලියන 450ක් වැය වනවාය කියා බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා දන්නවාද?

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

රාජ්‍ය ආයතන නඩත්තු කරන්න ආණ්ඩුවට අවුරුද්දකට රුපියල් බිලියන 450ක් යනවා. ඒකයි සැබෑ තත්ත්වය. කබීර් හාෂිම් ඇමතිතුමා යෝජනා 250 ගණනක් හැදුවා. ඒ එක යෝජනාවක්වත් ක්‍රියාත්මක වෙලා නැහැ. ඒ හැම යෝජනාවක්ම රක්ෂිතයෙන් පිට කියලා මම තමුන්නාන්සේලාට කියනවා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්දුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, එතුමාගේ පිළිතුර ගැන ස්තුතිවන්ත වෙනවා. පාර්ලිමේන්තුවේ මෙවැනි පැහැදිලි කර ගැනීමක් කර ගන්න එක වැදගත්. මොකද, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ රජයේ මෙතුමා වැවිලි කර්මාන්ත නියෝජ්‍ය ඇමතිතුමා. අපි ඒ රජයේ පෞද්ගලීකරණය පිළිබඳ ප්‍රතිපත්තියට -[බාධා කිරීමක්] ඔබතුමා ඒ කාලයේ මොන නියෝජ්‍ය ඇමතිද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
චන්ද්‍රිකා මැතිනිය මට දුන්නේ ස්වදේශ කටයුතු නියෝජ්‍ය ඇමතිකම.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්දුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඔබතුමා කන්ද උඩරට ප්‍රදේශය නියෝජනය කරන, ඓතිහාසික උරුමයන් නියෝජනය කරන ඇමතිවරයෙක් විධියට අපි තමුන්නාන්සේලා කවුරුත් පිළිගන්නවා, ඓතිහාසික අසාධාරණයක් කන්ද උඩරට ජනතාවට සිද්ධ වෙලා තිබෙන බව. ඒ තමයි බ්‍රිතාන්‍ය පාලන යුගයේදී මුඩු බිම් පනත යටතේ ඉඩම් අහිමි කිරීම. එහෙම ඉඩම් අහිමි වුණු, මහත් අසාධාරණයක් වෙච්ච ජනතාවක් සිටිනවා. රාජ්‍ය වැවිලි සංස්ථාව සතු ඉඩම් දැනට පෞද්ගලීකරණය කරලා නැහැ. මහින්ද රාජපක්ෂ රජයේ ප්‍රතිපත්තිය වුණේ පෞද්ගලීකරණයෙන් බැහැරව උපාය මාර්ගික ක්‍රමවේද මඟින් ඒවා වඩා ඵලදායී තත්ත්වයට ගෙන ඒමයි. එහිදී රක්ෂිතය අවට ප්‍රදේශයේ තිබෙන ඉඩ කඩම් වැවිලි නොවන කාර්යය සඳහා -වන වගාව සහ වෙනත් බෝග වගාවන් නොවන කාර්යය සඳහා- දීමටත් යෝජනා කැඳවලා තිබෙනවා. උදාහරණයක් වශයෙන් එළදෙනුන් තුන්දහසක් එක වත්තකට දැමීම පිළිබඳ යෝජනාවකුත් ඇවිල්ලා තිබෙනවා.

මේ වන විට එක වැවක්, -දැනට වැවිලි සංස්ථාව සතුව තිබෙන, ගෞරවනීය ස්වාමීන් වහන්සේලා විසින් ගොඩ නහපු වැවක්, ජනතාවගේ වැවක්- පෞද්ගලීකරණය කර තිබෙනවා. මම ඒ පිළිබඳව ඔබතුමාට කරුණු ඉදිරිපත් කරන්නම්. අපි කියන්නේ මේකයි. වැවිලි කර්මාන්තය සඳහා ඵලදායී නොවන මහ පොළොවේ හැම බිම් අඟලක්ම, විනිවිද පෙනෙන ආකාරයට රටේ ඵලදායීතාව ඉහළ නැංවීමට යොදා ගැනීම ගැන අපේ කිසි විරුද්ධත්වයක් නැහැ. නමුත්, එය ඒ පරිසරයට හානියක් නොවන ආකාරයටත්, ඒ සංවේදී පරිසර කලාපය රැකෙන ආකාරයටත්, ඒ ප්‍රදේශයේ මහජනයාගේ හඬට කන් දීලා, සාකච්ඡා කරලා, ඔවුන් සමඟ එකතු වෙලා ගන්නා තීන්දුවක් මීස, දේශපාලන ජාවාරම්කරුවන් සඳහා මේ ඉඩම් ටික බෙදා නොදිය යුතුයි කියන ස්ථාවරයේයි අපි ඉන්නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මම මේ පාර්ලිමේන්තුවට වගකීමෙන් කියන්නේ. ගරු කබීර් හාෂිම් ඇමතිතුමා යෝජනා 250ක් හදලා තිබුණා. ඒවා යෝජනා විතරයි. කැබිනට් එකෙන් අනුමත වුණා. නමුත්, එක බිම් අඟලක්වත් තවම දීලා නැහැ. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, එදා චන්ද්‍රිකා මැතිනිය ඉඩම් අක්කර ලක්ෂ 5ක් දෙන කොට ඇති වුණු තත්ත්වය මොකක්ද? තමුන්නාන්සේලා කාගෙන්ද ඇහුවේ? කාගෙන්ද උපදෙස් ගත්තේ? ඉඩම් අක්කර ලක්ෂ 5ක් දුන්නා, සමාගම්වලට. ඒක වරදක් කියලා පිළිගන්නවාද? [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අපි වර්තමානය ගැන කථා කරමු. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ඉඩම් අක්කර ලක්ෂ 5ක් දුන්නා. ඒ ගැන මොකද කියන්නේ? එදා පරිසරවේදීන්ගෙන් ඇහුවාද? වාර්තා ගත්තාද?

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්දුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
වෝටර්ස් ඒජ්වල තිබුණු -[බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, මේ ගැන පැහැදිලි කරන්න. [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මේ ගොල්ලන්ගේ බලාපොරොත්තුව ආයෝජන කඩාකප්පල් කිරීමයි. Sir, there is one more important thing. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මේ පළාත්වල සම්පත් කොච්චර තිබෙනවාද කියා ඔබතුමා දන්නවාද? "සෙම්බුවත්ත" කියලා වත්තක් තිබෙනවා; මේ වත්ත cone එකක් හැඩයට තිබෙන්නේ.

ඒක උඩ වැවක් තිබෙනවා. මේ වැව බලන්න විදේශ සංචාරකයන් එනවා කියලා ඔබතුමා දන්නවාද? ගිය අවුරුද්දේ මේ සෙම්බුවත්ත බලන්න කොච්චර ආවාද කිව්වොත් ඒ ticket sales වලින් විතරක් ආදායම Rs. 10 million. ඒක කඩාකප්පල් කරන්නයි මේ හදන්නේ. [බාධා කිරීමක්] ඔබතුමා වැවක් ගැන කිව්වේ. ආයෝජන කඩාකප්පල් කරන්න තමයි මේ වැඩ කරන්නේ. වෙන කිසිම දෙයක් නොවෙයි, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා.

හම්බන්තොට ප්‍රදේශයෙන් ආයෝජකයන්ට ඉඩම් දෙන්න හදනකොට එතැන විරෝධතා පවත්වනවා. ඒ වැඩ ඔක්කෝම කඩාකප්පල් කරනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්දුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග ආණ්ඩුවේ ඉඩම් පෞද්ගලිකකරණය කිරීමේ වැඩේට අපි අබමල් රේණුවක

තරම්වත් සම්බන්ධ වෙලා නැහැ. අපි ඒ ආණ්ඩුවේ හිටියේත් නැහැ. ඒ ඉඩම් ගජ මිතුරන්ට පවරා දීම නිසා, ඒ වංචා, හොරකම්, දූෂණ නිසා උසාවියෙන් දඩුවම් ලැබූ ජනාධිපති කෙනෙක් තමයි චන්ද්‍රිකා කුමාරතුංග මැතිනිය. අපි කියන්නේ ඔබතුමන්ලාත් ඒ තත්ත්වයට යන්න එපා කියලායි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි දැන් ඊළඟ ප්‍රශ්නයට යමු.

දෑල දෙමළ මහා විද්‍යාලය: ගුරු හිඟය
தேல தமிழ் மகா வித்தியாலயம்: ஆசிரியர் பற்றாக்குறை
DELA TAMIL MAHA VIDYALAYA: TEACHER SHORTAGE

243/'18

2. ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ, නිවිතිගල අධ්‍යාපන කොට්ඨාසයේ, දෑල දෙමළ මහා විද්‍යාලය නමින් පාසලක් තිබෙන බව දන්නේද;

(ii) එම පාසලේ දැනට ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iii) දැනට එම විදුහලේ උග්‍ර ගුරු හිඟයක් පවතින බව දන්නේද;

(iv) එම ගුරු හිඟය පියවීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்தில் நிவித்திகல கல்விக் கோட்டத்தில் தேல தமிழ் மகா வித்தியாலயம் என்ற பெயரில் பாடசாலையொன்று உள்ள தென்பதை அறிவாரா என்பதையும்;

(ii) அப்பாடசாலையில் தற்போது கல்வி பயிலும் மாணவர்களின் எண்ணிக்கை எத்தனை என்பதையும்;

(iii) தற்போது அப்பாடசாலையில் தீவிர ஆசிரியர் பற்றாக்குறை நிலவுகின்றதென்பதை அறிவாரா என்பதையும்;

(iv) அந்த ஆசிரியர் பற்றாக்குறையை நிவர்த்தி செய்வதற்கு அமைச்சினால் மேற்கொள்ளப்படும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) whether he is aware that there is a school named Dela Tamil Maha Vidyalaya in the Nivithigala Education Zone in the Ratnapura District;

(ii) the number of students studying in it at present;

(iii) whether he is aware that there is a severe shortage of teachers in that school at present; and

(iv) the steps the Ministry intends to take to address that shortage of teachers?

(b) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) 506කි.

(iii) ද්විතියික අංශයේ (6-11 ශ්‍රේණි) ගුරු පුරප්පාඩු 09ක් හා අ.පො.ස. (උසස් පෙළ) ගුරු පුරප්පාඩු 07ක් ඇත. ඇමුණුමෙහි දක්වා ඇත.

ඇමුණුම **සභාගත*** කරමි.

(iv) ඔව්.

2015 වර්ෂයේදී මෙම විද්‍යාලයට ගුරු සහායකවරුන් 06 දෙනෙකු පත් කර ඇති අතර, සබරගමු පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝගයෙන් එම ගුරු සහායකවරුන් 06 දෙනාම එකවර ගුරු පුහුණුව සඳහා නිදහස් කර ඇත. මෙම වර්ෂයේ ජූලි මස අවසානයේ ඔවුන් ගුරු පුහුණුව අවසන් කර පැමිණීමට නියමිත අතර, ඉන්පසු එම විද්‍යාලයේ ස්ථානගත කිරීමට නියමිතය.

එලෙසම ඉදිරියේදී බඳවා ගනු ලබන නවක දෙමළ මාධ්‍ය ගුරුවරුන්ගෙන් ද මෙම පාසලේ ගුරු හිඟය පියවීමට කටයුතු කරන බව සබරගමුව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් දන්වා ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, සාර්ථක පිළිතුරක් ලබා දීම පිළිබඳව අපේ ගරු ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. මෙතැන ගැටලුවක් තිබෙන බව ගරු ඇමතිතුමා පිළිගන්නවා. ගරු ඇමතිතුමනි, රත්නපුර දිස්ත්‍රික්කයේ තිබෙන අධ්‍යාපන කලාපවලින් නිවිතිගල අධ්‍යාපන කලාපය තමයි පසුගාමීම අධ්‍යාපන කලාපය.

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේ පාසලේ තිබෙන ප්‍රශ්න සම්බන්ධයෙන් වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න මේ ගරු සභාවට ඉදිරිපත් කරලා දැනට

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු හේෂාන් විතානගේ මහතා]

අවුරුද්දක් විතර වෙනවා. ඇමතිතුමාත් ඒවාට යම් යම් පියවර අරගෙන තිබෙනවා. ගරු අධ්‍යාපන ඇමතිතුමනි, මේ ගැටලුවට ප්‍රධාන හේතුව තමයි, සබරගමුව පළාත් සභාවේ මහ ඇමතිතුමා අධ්‍යාපන අමාත්‍යවරයා විධියට කටයුතු කිරීම. මේක ලොකු ගැටලුවක්. තරග විභාග තියලා ගුරුවරු බඳවා ගත්තත්, එතුමා ඉන්න කෑගල්ලෙන් තමයි වැඩිපුර ගුරුවරු එන්නේ. අද වන විට සබරගමුව පළාතේ ගුරු හිඟයක් නැහැ. සබරගමුව පළාතේ ගුරුවරු අතිරික්තයක් තිබෙනවා. මේ ගුරුවරු හරියට තුලනය කරගන්න බැරි ප්‍රශ්නයක් තිබෙනවා. තරග විභාග තියලා ගුරුවරු බඳවා ගන්න කටයුතු කළත් ගුරුවරු ගන්නේ කෑගල්ලෙන් විතරයි. ඒකට හේතුව තමයි, අධ්‍යාපන ඇමතිතුමා විධියට කටයුතු කරන මහ ඇමතිතුමා කෑගල්ලේ කෙනෙකුවීම. ඒ ගැටලුව නිසා මේ වාගේ දුෂ්කර කලාපවල ගුරු හිඟයට උත්තරයක් හොයන්න බැහැ. මේ ගැටලුව විසඳීමට ඔබතුමා ගන්නා වූ පියවර කුමක්ද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු තිබෙන්න හේතුව තමයි බඳවා ගන්න නිසි සුදුසුකම් තිබෙන අය නොමැතිවීම. ඒ නිසා අපි දැන් පළාත් සභාවට දැනුම්දීලා තිබෙනවා, දෙමළ මාධ්‍යයෙන් උගන්වා විශ්‍රාම ගිය ගුරුවරු ඉන්නවා නම්, ඒ ගොල්ලන්ගෙන් බඳවා ගෙන මේ ගුරු හිඟය පියවා ගන්න කටයුතු කරන්න කියලා.

මොකද, සමහරු බඳවා ගත්තත්, ඒ ප්‍රදේශවල ඉන්නේ නැහැ. දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩුවලට බඳවා ගත්තාම උතුරු - නැඟෙනහිර ප්‍රදේශවල අය තමයි පත් වෙන්නේ. එතකොට ඒ අය මේ පළාත්වල සේවය කරන්නේ නැහැ. සමහරු බඳවා ගත් සැනින් අතහැරලා යනවා. මේ ප්‍රශ්නය තිබෙනවා. ඒකට විකල්පයක් වශයෙන් තමයි දෙමළ මාධ්‍යයෙන් උගන්වලා විශ්‍රාම ගිය අයවත් තාවකාලික පදනම මත බඳවා ගන්න කියලා උපදෙස් දීලා තිබෙන්නේ. මම හිතන විධියට මේ දිනවල ඒ සඳහා අවශ්‍ය පියවර ගනිමින් යනවා.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ගරු කථානායකතුමනි, මාගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මම සබරගමු පළාත් සභාවේ මන්ත්‍රීවරයකු හැටියට හිටපු කාලයේ පළාත් සභාව තීන්දුවක් ගත්තා, -ගරු ඇමතිතුමා දන්නවා ඇති- උසස් පෙළ සමත් දෙමළ දරුවන් දෙමළ මාධ්‍ය ගුරු සහායකයන් විධියට බඳවා ගන්න. මේ සඳහා අයදුම් පත් කැඳෙව්වාම, මම දන්නා තරමින් කෑගල්ල දිස්ත්‍රික්කයෙන් අයදුම් පත් ආවේ 36ක් හෝ 40ක්. රත්නපුර දිස්ත්‍රික්කයෙන් අයදුම් පත් නවසිය ගණනක් ආවා. ඒ හේතුව නිසා මහ ඇමතිතුමා ඒ බඳවා ගැනීම් පස්සට දැම්මා. ගැටලුව තිබෙන්නේ මෙතැනයි ගරු ඇමතිතුමනි. ප්‍රධාන අමාත්‍යවරයාගේ අවශ්‍යතාව පිරිමහන්නට ගිය නිසා තමයි මේ ගැටලුව නිර්මාණය වෙලා තිබෙන්නේ. අපේ පළාතේ දැන් අලුත් ආණ්ඩුකාරතුමියක් ඉන්නේ. උසස් පෙළ සමත් දෙමළ ශිෂ්‍යයන් ගුරු සහායකයන් විධියට බඳවාගෙන පුහුණු කරනවා නම් මේ ගැටලුව විසඳා ගන්න පුළුවන්.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ රටේ ජාතික පාසල් සම්බන්ධයෙන් ඉතා උනන්දුවෙන් වැඩ කරනවා වාගේම උනන්දු වෙලා පළාත් පාසල් සම්බන්ධ කටයුතු කළත්, මේ ගැටලුවට උත්තරය එන්නේ නැහැ.

මම හිතන විධියට රත්නපුරයේ පළාත් අධ්‍යාපනය තවම තිබෙන්නේ ප්‍රාථමික අවධියේ. ඒ තත්ත්වයෙන් උඩට නොඑන්න දේශපාලන හේතු බලපානවා. අද ඒ පළාත් සභාව විසුරුවලා තිබුණත්, ඒ අයගේ බළල් අත්වලින් ඒ කටයුතුවලට බලපෑම් සිදු වනවා. අධ්‍යාපන අමාත්‍යවරයා වන ඔබතුමාට මේ වෙනුවෙන් කඩිනමින් ගන්න පුළුවන් පියවර මොකක්ද කියලා මම අහනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ අපට පළාත් සභාවල කටයුතුවලට මැදිහත් වීමේ සීමාවක් තිබෙනවා. ඔබතුමා කිව්වා වාගේ ප්‍රශ්න තිබෙනවා. එවැනි ප්‍රශ්න නැතුවාම නොවෙයි. මේ පාර්ලිමේන්තු සභා ගර්භයේ දී මම ඒ ගැන කථා කරලාත් තිබෙනවා. අපි පළමු වසරට ඇතුළත් කර ගන්නා ළමුන් අඩු කරගෙන යන කොට, දෙවැනි වසරේ දී පළාත් සභාව විසින් තොග පිටින් ළමයින් ඇතුළත් කර ගන්නවා. මේ වාගේ ප්‍රශ්න තිබෙනවා. මේ ප්‍රශ්නයත් ඒ වාගේම එකක් තමයි. කොහොම වුණත්, ඔබතුමා කිව්වා වාගේ උසස් පෙළ දෙමළ ගුරු සහායකයන් නැත්නම් එම ගුරුවරුන් බඳවා ගන්න අපි අවශ්‍ය පියවර ගන්නම්. දැනටත් ඒ බොහෝ කටයුතු සිදු වෙනවා. ඊයේ, ගුරු අධ්‍යාපනඥ සේවයේ පුරප්පාඩු 356ක් සඳහා පත්වීම් දුන්නා. ඒ වාගේම විදුහල්පති ධුරයේත් පත් වීම් ලබා දුන්නා. ඒ වාගේ විවිධ පුරප්පාඩු දැන් පුරවමින් පවතිනවා. ඔබතුමා සඳහන් කරන මේ ප්‍රශ්නවලටත් ඉදිරි කාලයේ දී විසඳුමක් ලබා දෙන්න පුළුවන් වෙයි කියලා විශ්වාස කරනවා. මෙතැන වෙලා තිබෙන්නේ මේ කාරණයයි. පළාත් සභාව සහ අපි ආණ්ඩු දෙකක්. පළාත් සභාවේ බලය දරන්නේ වෙනත් පක්ෂයක්. ගොඩක් වෙලාවට සමහර ඒවා අපට ඕනෑ විධියටම කර ගන්න බැහැ. හේතුව, එම නියෝග, චක්‍රලේඛ උල්ලංඝනය කරමින් සමහර වෙලාවට වෙනම ආණ්ඩුවක් වාගේ සමහර පළාත් සභා වැඩ කරන නිසා. මට ඒක නොකියා බැහැ. ඒ තත්ත්වය නිසා තමයි සමහර ගැටලු ඇති වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, මට ප්‍රශ්නයක් අහන්න විනාඩියක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමනි, පැහැදිලි කර ගැනීමක් කරන්න ඉල්ලනවා. ඔබතුමාට පුළුවන් නම් අවසර දෙන්න.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, ප්‍රශ්න ඕනෑ තරම් අහන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අහන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

2006 වසරේ සුසිල් ප්‍රේමජයන්ත මැතිතුමා අධ්‍යාපන ඇමතිවරයා වශයෙන් කටයුතු කළ කාලයේ මේ රටේ තිබෙන දෙමළ මාධ්‍ය පාසල්වල උසස් පෙළ Science and Mathematics පන්ති සඳහා ගුරුවරු ලබා දෙන්න කියලා අපි ඉල්ලුවා. ඒක යම් ප්‍රමාණයකින් ස්ථාපිත වුණාට, සාර්ථක වුණේ නැහැ. හම්බන්තොට දිස්ත්‍රික්කයේ දෙමළ මාධ්‍යයෙන් තිබෙන එකම ජාතික පාසල සහිරා විද්‍යාලයයි. එම සහිරා විද්‍යාලයටත් බොහොම අමාරුවෙන් ගුරුවරුන් දෙදෙනෙකු දැම්මා. නමුත් තවත් දෙදෙනෙක් මදි.

ඊට පසුව සුමානයකින් දෙකකින් ඒ දෙදෙනාත් ගියා. හම්බන්තොට එම ජාතික පාසලේ අ.පො.ස. (උසස් පෙළ) දෙමළ මාධ්‍ය දරුවන්ට Science and Mathematics ඉගෙන ගන්න අද වනතුරුත් අවස්ථාවක් නැහැ. ඒක හරිම අපරාධයක්. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාගේ අවධානය යොමු කර ඉතාම ඉක්මනින් මේ ප්‍රශ්නය විසඳන්න කියා මම කාරුණිකව ඉල්ලා සිටිනවා.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය දෙමළ මාධ්‍ය පාසල්වලට විතරක් නොවෙයි බලපාන්නේ. Science and Mathematics කියන විෂයයන්වලට සිංහල මාධ්‍ය ගුරුවරුවත් නැහැ. අපි පසු ගිය දවස්වල විද්‍යාව සහ ගණිතය ගුරු හිඟය පියවීම සඳහා ගෑසට් කරලා බඳවා ගැනීම් කරන්න ගියාම ඇත්ත වශයෙන්ම අවශ්‍ය පුරප්පාඩු සංඛ්‍යාවට සරිලන ප්‍රමාණයටවත් ඉල්ලුම් කළේ නැහැ. ඒකට හේතුව, විද්‍යාව සහ ගණිතය උපාධිධාරීන් බොහෝ වේලාවට වෙනත් වෙනත් වැටුප්තලවලට අදාළව වෙනත් රැකියාවල නිරත වීමයි. එයට විසඳුමක් වශයෙන් ගුරු සේවය සඳහා ඉල්ලුම් පත් කැඳවූවත් ඉල්ලුම් කරන්නේ නැති විෂයන් වන විද්‍යාව සහ ගණිතය විෂයන් ඉගැන්වීම සඳහා බඳවා ගන්නා ගුරුවරුන් වෙනුවෙන් කැබිනට් පත්‍රිකාවක් දාලා දීමනාවක් ලබා දෙන්න කටයුතු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. එහෙම නොවුණොත්, විශේෂයෙන්ම විද්‍යා උපාධිධාරීන් සහ ගණිතය උපාධිධාරීන් ගුරු සේවයට එන්නේ නැහැ. මේක තමයි ප්‍රශ්නය. දෙමළ මාධ්‍ය පාසල්වලට පමණක් නොවෙයි, සිංහල මාධ්‍ය පාසල්වලටත් මේ ප්‍රශ්නය තිබෙනවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු කථානායකතුමනි, නිදැල්ලේ පැහැදිලි කර ගැනීම් සඳහා අවස්ථාවක් ලබා දීම පිළිබඳව මා ගරු අමාත්‍යතුමාට ස්තූතිවන්ත වනවා. ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා කිව්වා වාගේම දෙමළ මාධ්‍ය ගුරු හිඟය සම්බන්ධයෙන් බලපාන, පළාත් සභාවල තිබෙන උදාසීන, අකර්මණ්‍ය පිළිවෙත පිළිබඳවත් අපි තේරුම් ගන්න ඕනෑ, ගරු අමාත්‍යතුමනි. නමුත් මෙහි ඉතාම තීරණාත්මක ලක්ෂ්‍යකට අපි මේ මොහොතේ පැමිණ සිටිනවා. උදාහරණයක් විධියට මාතර දිස්ත්‍රික්කය ගත්තොත්, එහි ප්‍රධාන ජාතික පාසල් වන සුජාතා බාලිකා පාසල, ශාන්ත තෝමස් පිරිමි පාසල ආදි පාසල්වල අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා විෂයක් වශයෙන් දෙමළ භාෂාව අයදුම් කිරීම දැන් ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා, මේ ගුරු හිඟය නිසා. ඒ නිසා එම සෑම පාසලකින්ම මෙවර නිල නොවන විධියට දරුවන්ගෙන් ඉල්ලීමක් කර තිබෙනවා, දෙමළ භාෂාව විෂයක් විධියට අයදුම් කරන්න එපා කියලා. ඒක විදුහල්පතිවරුන්ගේ වරදක්වත්, අනෙකුත් ගුරුවරුන්ගේ වරදක්වත් නොවෙයි, ගරු අමාත්‍යතුමනි. එය, එම විෂය ඉගැන්වීමේ කටයුතු සඳහා අවශ්‍ය ගුරුවරුන්ගේ හිඟකම පිළිබඳ ප්‍රශ්නයක්. ජාතික සංහිඳියාව ගැන වැඩියෙන්ම කතා කරන ආණ්ඩුවක් යටතේ සහෝදර ජනතාවගේ භාෂාව අධ්‍යයනය කරන්න ඉඩ නොලැබීම බරපතළ ගැටලුවක් වන්න පුළුවන්. ඒ නිසා මෙයට කඩිනම් විසඳුමක්, මැදිහත් වීමක් අපි ඔබතුමාගෙන් බලාපොරොත්තු වනවා, ගරු අමාත්‍යතුමනි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම එකී විෂයන් සම්බන්ධයෙන් බරපතළ ගුරු හිඟයක් තිබෙනවා. ඊට හේතුව, දකුණේ ප්‍රදේශවල පාසල්වලට දෙමළ මාධ්‍ය ගුරුවරුන් නොයෑම සහ එම ප්‍රදේශවල දෙමළ මාධ්‍යයෙන් විභාගයක් පැවැත්වූවත් එයට ඉල්ලුම් කරන ප්‍රමාණය ඉතා සීමිත වීමයි.

මේ ප්‍රශ්න ටික බලපානවා. නමුත් අපි ඒ ගැන බලනවා. ඒ සඳහා කාලයක් ගත වෙනවා. අපි දැන් සැලසුම් කරගෙන යන්නේ පුළුවන් තරම් ගුරුවරු අරගෙන, පුහුණුවක් දීලා, මේ පාසල්වලට මුදා හරින්නයි. ඒ සඳහා ටික කාලයක් ගත වෙනවා. අපි පසු ගිය කාලයේ ගුරු සහායක පත්වීම් විශාල සංඛ්‍යාවක් ලබාදුන්නා. උතුර, නැඟෙනහිර ප්‍රදේශවලට ඒ පත්වීම් දුන්නා. ඒ වාගේම වතුකරයට දුන්නා. අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, සිටින සංඛ්‍යාව අනුව සමහර ප්‍රදේශවලට සපයා තිබෙනවා. නමුත් මේ හිඟය අවසන් කරන්න පුළුවන් වෙලා නැහැ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ, ඉදිරි කාලයේ තවදුරටත් ක්‍රමවේද හදාගෙන මේ ගුරු හිඟය අවම කරන්න අපි පියවර ගන්නවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තූතියි, ගරු ඇමතිතුමනි.

ප්‍රශ්න අංක 3 - 412/'18- (1), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of City Planning and Water Supply, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -448/'18- (1), ගරු බිමල් රත්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 -481/'18- (1), ගරු ඩී.වී. චානක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

මුලතිව් තැපැල් අධිකාරි කාර්යාලය: නැවත විවෘත කිරීම
முல்லைத்தீவு தபால் அத்தியட்சகர் அலுவலகம்: மீண்டும் திறந்துவைத்தல்
OFFICE OF SUPERINTENDENT OF POSTS IN MULLAITIVU: REOPENING

487/'18

6. ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වූ දිස්ත්‍රික් තැපැල් අධිකාරි කාර්යාලය යුද සමයේදී වසා දැමූ බවත්;

(ii) නැවත පදිංචි කිරීම් කටයුතු ආරම්භ වීමෙන් පසු අනෙකුත් සියලු කාර්යාල නැවත ආරම්භ කළද,මෙම කාර්යාලය පමණක් මේ දක්වා ආරම්භ කර නොමැති බවත්;

(iii) එබැවින්, කිලෝ මීටර් 100ක් පමණ ඈතින් පිහිටි වවුනියාව දිස්ත්‍රික් තැපැල් කාර්යාලයට ගොස් තමන්ගේ තැපෑලට අදාළ ගැටලු ඉදිරිපත් කිරීමේ ඉතා අසීරු තත්ත්වයට මුලතිව් දිස්ත්‍රික් ජනතාව මුහුණ දී සිටින බවත්;

(iv) මෙම කාර්යාලය නැවත ආරම්භ කිරීම සම්බන්ධයෙන් මා විසින් 2017.07.07 දිනැතිව ලිඛිත ඉල්ලීමක් යොමුකළ බවත්;

එතුමා දන්නේද?

(ආ) එසේ නම්, මුලතිව් දිස්ත්‍රික් තැපැල් අධිකාරි කාර්යාලය ඉතා කඩිනමින් නැවත විවෘත කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

තැපැල්, තැපැල් සේවාවන් සහ මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා වෙත ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) முல்லைத்தீவு மாவட்டத்தில் இயங்கிவந்த மாவட்ட தபால் அத்தியட்சகர் அலுவலகம் யுத்த சமயத்தில் மூடப்பட்டதென்பதையும்;

(ii) மீளக் குடியமர்த்தும் பணிகள் ஆரம்பிக்கப்பட்ட பின்னர் ஏனைய அனைத்து அலுவலகங்களும் மீண்டும் ஆரம்பிக்கப்பட்டபோதிலும் இவ் வலுவலகம் மாத்திரம் இற்றைவரை ஆரம்பிக்கப் படவில்லை என்பதையும்;

(iii) எனவே, ஏறக்குறைய 100 கிலோமீற்றர் தொலைவில் அமைந்துள்ள வவுனியா மாவட்ட தபால் அலுவலகத்திற்குச் சென்று தமது தபால் சம்பந்தமான பிரச்சினைகளை முன்வைக்கின்ற மிகவும் சிரமமான நிலைமையை முல்லைத்தீவு மக்கள் எதிர்நோக்கி உள்ளனரென்பதையும்;

(iv) இந்த அலுவலகத்தை மீண்டும் ஆரம்பித்தல் சம்பந்தமாக என்னால் 2017.07.07ஆம் திகதி எழுத்திலான கோரிக்கையொன்று முன்வைக்கப் பட்டதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், முல்லைத்தீவு மாவட்ட தபால் அத்தியட்சகர் அலுவலகத்தை மிகவும் துரிதமாக மீண்டும் திறந்துவைக்க நடவடிக்கை எடுப்பாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Post, Postal Services and Muslim Religious Affairs:

(a) Is he aware that-

(i) the district office of the Superintendent of Posts in the Mullaitivu District was closed during the period of war;

(ii) though all the other offices have been recommenced after the resettlement was started, this office has not been recommenced up to date;

(iii) this has caused great inconvenience to the people in the Mullaitivu District since they have to get the service of the district post office in Vavuniya, which was about 100 km away, to present their problems related to the post; and

(iv) a written request dated 07.07.2017 was made by me to re-open this office?

(b) If so, will he inform this House whether action will be taken forthwith to recommence the district office of the Superintendent of Posts?

(c) If not, why?

ගරු අබ්දුල් හලීම් මහතා (තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு அப்துல் ஹலீம் - தபால், தபால் சேவைகள் மற்றும் முஸ்லிம் சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. Abdul Haleem - Minister of Post, Postal Services and Muslim Affairs)

ගරු කථානායකතුමනි, இந்த வினாக்களுக்கு தமிழ் பாஷையில் விடையளிக்கின்றேன். முதலில் இந்த வினா குறித்த பின்னணி அறிக்கையைக் குறிப்பிட விரும்புகின்றேன்.

யுத்த சூழல் நிலவிய காலத்தில் முல்லைத்தீவு தபால் அலுவலகக் கட்டிடம் சேதமடைந்துள்ளதுடன், முல்லைத்தீவு அலுவலகத்தின் சேவைகளை தொடர்ச்சியாகப் பேணி வருவதற்காக முல்லைத்தீவு பிராந்திய தபால் அத்தியட்சகர் கட்டிடத்திற்கு முல்லைத்தீவு தபால் அலுவலகம் கொண்டு செல்லப்பட்டது. முல்லைத்தீவு பிராந்திய தபால் அலுவலகத் திற்கு உரித்தான பதவியணியினர், மாவட்ட கணக்காளர் அலுவலகத்திற்கும் முல்லைத்தீவு தபால் அலுவலகத்திற்கும் இணைப்புச் செய்யப்பட்டுள்ளனர் என்பதுடன், உத்தியோக பூர்வக் கடமை நடவடிக்கைகள் வவுனியா பிராந்திய தபால் அத்தியட்சகர் அலுவலகத்திற்குப் பொறுப்பளிக்கப்பட்டுள்ளது.

யுத்தம் நிறைவடைந்துள்ளபோதிலும் முல்லைத்தீவு பிராந்திய தபால் அத்தியட்சகர் அலுவலகத்திற்கு தகுந்த கட்டிடமொன்றைத் தேடிப் பெற்றுக்கொள்வதிலுள்ள அசௌகரியங்கள் காரணமாக முல்லைத்தீவு பிராந்திய தபால் அத்தியட்சகர் அலுவலகத்தை மீளத் தாபிக்கமுடியாது போயுள்ளது.

2018ஆம் ஆண்டுக்கு, புதிய கட்டிடங்களை நிர்மாணிப் பதற்குத் தபால் திணைக்களத்திற்கு நிதியொதுக்கீடுகள் வழங்கப்படவில்லையென்பதுடன், தபால் தலைமையகம், மத்திய தபால் பரிமாற்று நிலையம், அனைத்து நிருவாக அலுவலகங்கள், தபால் பயிற்சி நிறுவனங்கள் மற்றும் தபால் அலுவலகங்கள் 653 உள்ளிட்ட சகல கட்டிடங்களையும் புதுப்பிப்பதற்காக 2018ஆம் ஆண்டுக்கு வழங்கப்பட்டுள்ள நிதி ஒதுக்கீடு ரூபா 160 மில்லியன்களாகும்.

இதன்மூலம் வடமாகாணத்திற்கு ஒதுக்கப்பட்டுள்ள நிதியைப் பயன்படுத்தி புதுப்பிக்க உத்தேசிக்கப்பட்டுள்ள அலுவலகங்களிலிருந்து முல்லைத்தீவு தபால் அலுவலகக் கட்டிடத்தைப் புதுப்பிக்க முன்னுரிமை வழங்க நடவடிக்கை மேற்கொள்ளப்படும். சேதமடைந்துள்ள முல்லைத்தீவு தபால் அலுவலகக் கட்டிடத்தைப் புனரமைத்துக்கொள்ள முடியும் பட்சத்தில் அதில் மீண்டும் தபால் அலுவலகத்தை ஆரம்பித்து வைப்பதற்கும், தற்போது தபால் அலுவலகம் பேணி வரப்படுகின்ற கட்டிடத்தில் முல்லைத்தீவு பிராந்திய தபால் அத்தியட்சகர் அலுவலகத்தை மீளத் தாபிப்பதற்கும் இயலுமாகும்.

கௌரவ உறுப்பினர் அவர்களின் கேள்விகளுக்கான பதில் பின்வருமாறு:

(அ) (i) ஆம்.

(ii) முல்லைத்தீவு மாவட்ட தபால் அத்தியட்சகர் அலுவலகம் மற்றும் உப தபால் அலுவலகங்கள் 02 ஐத் தவிர இந்தத் திணைக்களத்திற்கு உரித்தான ஏனைய அலுவலகங்கள் திறந்து வைக்கப்பட்டுள்ளன.

(iii) ஆம்.

(iv) ஆம். தெரியும் என்றாலும் பின்வரும் காரணத்தினால் அதைச் செயற்படுத்தச் சாத்தியமற்றதாக உள்ளது.

(ஆ) முல்லைத்தீவு தபால் அலுவலகக் கட்டிடம் யுத்தத்தினால் சேதமடைந்துள்ளதுடன், முல்லைத்தீவு மாவட்டத் தபால் அத்தியட்சகர் அலுவலகத்திற்கு உரித்தான கட்டிடத்தில் முல்லைத்தீவு தபால் அலுவலகம் பேணிவரப்படுகின்றது. முல்லைத்தீவு தபால் அலுவலகத்திற்குப் புதிய கட்டிடமொன்றைப் பெற்றுக்கொண்ட பின்னர் முல்லைத்தீவு மாவட்டத் தபால் அத்தியட்சகர் அலுவலகத்தை மீண்டும் திறந்து வைக்கும் வாய்ப்பு உள்ளது என்பதை அறியத் தருகின்றேன்.

(இ) ஏற்புடையதன்று.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ சபாநாயகர் அவர்களே, எனது முதலாவது மேலதிக வினாவைக் கேட்கின்றேன். கௌரவ அமைச்சர் அவர்களே, நீங்கள் அத்தியட்சகர் அலுவலகம் மீள ஆரம்பிக்கப்படுமென்று கூறியிருக்கிறீர்கள். அது புதிய கட்டிடம் அமைக்கப்பட்டு அதில் ஆரம்பிக்கப்படுமா? அல்லது தற்காலிகமாக ஏதாவது கட்டிடத்தை வாடகைக்கு எடுத்து ஆரம்பிக்கப்படுமா?

ගරු අබ්දුල් හලීම් මහතා
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)

பொருத்தமான ஏதும் கட்டிடமிருப்பின் உடனடியாக ஆரம்பிக்க முடியும். இல்லாவிட்டால் அதற்கெனப் புதிதாக ஒரு கட்டிடம் அமைத்து அதனை ஆரம்பித்து வைக்க வேண்டும்.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

எனது இரண்டாவது மேலதிக வினா, ஏற்கெனவே அதற்குரிய நிலம் இருக்கின்றது. அதாவது, யுத்தத்திற்கு முன்பு அத்தியட்சகர் அலுவலகம் இருந்த காணி இருக்கிறது. நீங்கள் கூறியதுபோல அடுத்த ஆண்டிலாவது புதிய கட்டிடம் அமைத்து அங்கு அதனை ஆரம்பிக்க வேண்டும். அதேநேரம் தற்போது தற்காலிகமான கட்டிடம் எடுக்கக்கூடிய வாய்ப்புகள் அந்தப் பிரதேசத்தில் இருக்கின்றபடியால் தற்காலிகமான கட்டிடமொன்றில் அதனை ஆரம்பிப்பதற்குத் தபால் மா அதிபருக்கு ஆணை பிறப்பித்து, விரைவில் அதனை அங்கு திறந்து வைக்குமாறு தங்களைக் கேட்டுக்கொள்கின்றேன்.

ගරු අබ්දුල් හලීම් මහතා
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)

தற்காலிகமாக ஒரு கட்டிடத்தைப் பெற்றுக்கொள்ள முடியுமாயின் தபால் மாஅதிபருடன் கதைத்து அதற்குரிய நடவடிக்கைகளை மேற்கொள்ள நடவடிக்கையெடுப்பேன்.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු කථානායකතුමනි, මට පැහැදිලි කර ගැනීමක් කර ගන්න පුළුවන්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මේ ප්‍රශ්නයට අදාළ පැහැදිලි කර ගැනීමක්ද, ගරු මන්ත්‍රීතුමනි?

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ඔව්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමනි, ඔබතුමා පැහැදිලි කිරීමක් කරන්න කැමැතිද?

ගරු අබ්දුල් හලීම් මහතා
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)
කැමැතියි.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු කථානායකතුමනි, මේ මොහොත වන විටත් පැවැත්වෙන, තැපැල් දෙපාර්තමේන්තුවේ 26,000ක් පමණ වන සේවකයන්ගේ වර්ජනයට දින 10ක් ගතවෙලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, සේවයට වාර්තා කරන්නේ නැති සේවකයන් සේවයෙන් පහ කරන බව ආණ්ඩුව කිව්වත්, මම දන්නා තරමින් ඊයේ වන විටත් සියයට 99ක් සේවකයෝ සේවයට වාර්තා කර නැහැ. ඒ වාගේම ඊයේ ඔවුන් උපවාසයක් ආරම්භ කළා. එය මාරාන්තික උපවාසයක් දක්වා වර්ධනය වන බව ඔවුන් මාධ්‍යවලට පවසා සිටියා. "මේ සඳහා වූ විසඳුම් යෝජනාවලිය අපි ඇමතිතුමාට ඉදිරිපත් කර තිබෙනවා, කැබිනට් මණ්ඩලය ඊට අනුමැතිය ලබා දුන්නොත් මේ වර්ජනය මෙතැනින් ඉවරයි" කියා තැපැල්පතිතුමා මාධ්‍යයට ඉතා පැහැදිලිව කිව්වා. නමුත් එය එසේ නිමාවන බවක් පෙනෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි. තැපැල් ලිපි ලක්ෂ දෙකහමාරක් ගොඩ ගැහිලා තිබෙනවා. සියලුම රාජ්‍ය කටයුතු අකර්මණ්‍ය වෙලා තිබෙනවා. මේක බරපතළ තත්ත්වයක්, ගරු කථානායකතුමනි. උසාවි පවා අඩපණ වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, would you like to respond?

ගරු අබ්දුල් හලීම් මහතා
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)
මෙම ප්‍රශ්නය මතු කිරීම සම්බන්ධයෙන් එතුමාට මම ස්තුතිවන්ත වෙනවා. මොකද, මමත් මේ සම්බන්ධයෙන් මේ ගරු සභාව දැනුවත් කරන්නයි අදහස් කළේ. ඇත්තටම ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ, තැපැල් වර්ජනය දවස් 10ක් පසුවෙලාත් තවමත් පවත්වාගෙන යනවා. හැබැයි, මේක මේ ආණ්ඩුවෙන් වුණු වැරැදීමක් නොවෙයි. පරණ ආණ්ඩුවේ පව් ගෙවීමක් තමයි අපි කරන්නේ. ඒ කියන්නේ, 06/2006 කියන චක්‍රලේඛයේ තිබෙන ගැටලුකාරී තත්ත්වය මතයි, මේ ප්‍රශ්නය උද්ගතවෙලා තිබෙන්නේ. අමාත්‍යවරයා හැටියට මම පසුගිය කාලයේ මේ සම්බන්ධයෙන් වෘත්තීය සමිති සමඟ දිගින් දිගටම සාකච්ඡා කරලා, මේ ප්‍රශ්නය විසඳීම සඳහා වූ යම් යෝජනාත් එක්ක අමාත්‍ය මණ්ඩලයට සන්දේශයක් ඉදිරිපත් කළා.

අමාත්‍ය මණ්ඩලය විසින් එය ගරු සරත් අමුණුගම අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වන අනු කමිටුවට යොමු කළා. මෙය තැපෑලට අදාළ වූ ප්‍රශ්නයක් වුවත්, එය විසඳීමේදී පාර්ශ්ව ගණනාවක නිරීක්ෂණ අපට අවශ්‍ය වෙලා තිබෙනවා. ඒ නිසා එතැනදීත් ප්‍රමාදයක් සිදු වුණා. ඒ අතරතුර නිලධාරී මණ්ඩලයකින් සමන්විත තවත් සභාවක් රැස් වුණා. එහිදී නිර්දේශයක් ආවා, වෘත්තීය සමිති සමඟ සාකච්ඡා කරලා තැපෑලටම ආවේණික වූ යම් වැඩ පිළිවෙළක් යොදන්නය කියා. ඒ සම්බන්ධයෙන් අපි දැන් වෘත්තීය සමිති සමඟත් සාකච්ඡා කරමින් පවතිනවා. මෙතැන තිබෙන ගැටලුව මේකයි, ගරු මන්ත්‍රීතුමනි. මෙම චක්‍රලේඛය එන්න පෙර I සහ II ශ්‍රේණි පමණයි තිබුණේ. 2006 චක්‍රලේඛය ආවාට පසුව එයට තවත් ශ්‍රේණියක් එකතු වෙලා තිබෙනවා. ඒක තමයි III වන ශ්‍රේණිය. එම III වන ශ්‍රේණිය ඉවත් කිරීමටත් ඔවුන්ගේ ඉල්ලීමක් තිබෙනවා. හැබැයි, මේ සම්බන්ධයෙන් අපි පසුගිය කාලයේ ගරු අග්‍රාමාත්‍යතුමාගේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් රැස්වෙලා වෘත්තීය සමිතිත් සමඟ තවත් සාකච්ඡාවක් පැවැත්වුවා. වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමේ කොමසාරිස්තුමාත් එයට සහභාගි වුණා. එතැනදී මමත් පුදුම වුණා, බොහෝ කාලයක් තිස්සේ එය කරන්න බැහැ කියපු වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමේ සභාපතිවරයා එයටත් එකඟත්වය පළ කිරීම පිළිබඳව. එම නිසා වෘත්තීය සමිති විසින් ගෙන යන මෙම විරෝධතා ව්‍යාපාරයේ ප්‍රධාන ඉල්ලීම් දෙකට ආණ්ඩුව පැත්තෙන් ඉතා සාර්ථක ප්‍රතිචාරයක් දක්වා තිබෙනවා. ඒක තමයි, තැපෑලට ආවේණික වූ අලුත් සේවා ව්‍යවස්ථාවක් සැදීම සහ III ශ්‍රේණිය ඉවත් කිරීම. එම නිසා ඔවුන් විසින් ගෙන යනු ලබන මෙම විරෝධතා ව්‍යාපාරය කිසිම තේරුමක් නැති වැඩ පිළිවෙළක් විධියටයි මම දකින්නේ. ඒක පිටුපස තවත් අරමුණක් තිබෙන බවයි මට පෙනෙන්නේ. මන්ද, පසුගිය කාලයේ තැපැල් වර්ජනයේ යෙදී සිටින අපේ සහෝදරවරු පෙළපාළියක් ගිහින් රැස්වීමක් පැවැත්වුවා. එම රැස්වීමේදී -අපේ වෘත්තීය සමිතිවල අය නොවෙයි- වෙනත් සමිති සමාගම්වල අය කථා කිරීමේදී මට දැනුණා, මෙම විරෝධතාව ගෙන යන්නේ ආණ්ඩුව පෙරළීමේ කුමන්ත්‍රණයක් හැටියට බව. ඒ අයගේ ඉල්ලීම්වලට රජය විසින් සාර්ථකව ප්‍රතිචාර දක්වා තිබෙන නිසා කරුණාකර සේවයට වාර්තා කරන ලෙස මම සියලුම තැපැල් සේවකයන්ගෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 -489/'18- (1), ගරු හෙක්ටර් අප්පුහාමි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 8 -492/'18- (1), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Petroleum Resources Development, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 9 -516/'18- (1), ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 10 -526/'18- (1), ගරු වාසුදේව නානායක්කාර මහතා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Irrigation and Water Resources and Disaster Management, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11 -551/'18- (1), ගරු අශෝක ප්‍රියන්ත මහතා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, මම එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of City Planning and Water Supply, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 12 -571/'18 - (1), ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

ප්‍රශ්න අංක 4 - 448/'18 - (1), ගරු බිමල් රත්නායක මහතා.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(මාණ්ඩලික නිහාල් කලප්පත්ති)
(The Hon. Nihal Galappaththi)
ගරු කථානායකතුමනි, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්ඩලික ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාස තුනක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
වෙනත් දිනයක් සඳහා කාර්යභාර කමිටුවට යොමු කරන ලදී.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික කතානායකතුමා)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 5 - 481/'18 - (1), ගරු ඩී.වී. චානක මහතා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(මාණ්ඩලික ඩලස් අලහප්පෙරුම)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්ඩලික ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, වරාය හා නාවික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
වෙනත් දිනයක් සඳහා කාර්යභාර කමිටුවට යොමු කරන ලදී.
Question ordered to stand down.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික කතානායකතුමා)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 7 -489/'18 - (1), ගරු හෙක්ටර් අප්පුහාමි මහතා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(මාණ්ඩලික අශෝක ප්‍රියන්ත)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්ඩලික ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
Sir, on behalf of the Minister of Power and Renewable Energy, I ask for two weeks' time to answer that Question.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
වෙනත් දිනයක් සඳහා කාර්යභාර කමිටුවට යොමු කරන ලදී.
Question ordered to stand down.

කෘෂි කර්මාන්තය, කර්මාන්ත හා සේවා සැපයීම: දළ දේශීය නිෂ්පාදනයට දායකත්වය
கமத்தொழில், கைத்தொழில் துறை மற்றும் சேவை வழங்கல்: மொத்த உள்நாட்டு உற்பத்திக்கு பங்களிப்பு
AGRICULTURE, INDUSTRY AND SERVICE SECTORS: CONTRIBUTION TO GROSS DOMESTIC PRODUCTION

516/'18

9. ගරු ඩලස් අලහප්පෙරුම මහතා (ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා වෙනුවට)
(மாண்புமிகு டலஸ் அழகப்பெரும - மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத் சார்பாக)
(The Hon. Dullas Alahapperuma on behalf of the Hon. Indika Anuruddha Herath)

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන සංරචක වන කෘෂි කර්මාන්තය, කර්මාන්ත අංශය හා සේවා සැපයීම 2016 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදනයට දායකවීමේ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රමාණ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iii) 2016 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදනයට සේවා අංශයේ දායකත්වය රුපියල් මිලියන කොපමණද;

(iv) එම සේවා ගණයට අයත් වී ඇති නව සංරචක කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ආ) (i) 2013 සිට 2016 වර්ෂය දක්වා කොටස් වෙළඳපොළ මිල දර්ශකය වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඉහත දර්ශකය තවදුරටත් පහළ යෑම වළක්වා ගැනීම සඳහා 2017 වර්ෂයේ දී කර ඇති යෝජනා කවරේද;

(iii) 2016 ජනවාරි, ජූනි සහ සැප්තැම්බර් යන මාසවල ජාතික පාරිභෝගික මිල දර්ශකයෙහි අගය කවරේද;

(iv) 2015 සහ 2016 වර්ෂවල පළමු භාගය තුළ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය කවරේද;

(v) කෘෂි කාර්මික අංශයේ සේවා නියුක්තිය කොපමණද;

(vi) 2015 සහ 2016 වර්ෂවල රාජ්‍ය අංශයේ හා ස්වයං රැකියාවල නියුක්තවූවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

නිති මත්‍රීතුමා වෙකුසන ඌඩක අමෙච්චරෙක් කේට්ට විනා:

(අ) (i) ඉලංගෙ පොරුළාතාරත්තින් පිරතාන ආක්කක් කූරුකළාන කමත්තොළිල්, කෛත්තොළිල් තුරෙ මත්‍රුම් සේවෙ වළංකල් ආකියවෙ 2016ආම් ආණ්ඩින් මොත්ත උළ්නාට්ටු උට්පත්තික්කුප් පංකළිප්පු සෙය්තුළ්ළ අළවු වෙව්වේරාක එව්වළවෙන්පතෙයුම්;

(ii) මේට්පඩි අළවුකළ් සතවීත අඩිප්පඩෙයිල් එව්වළවෙන්පතෙයුම්;

(iii) 2016ආම් ආණ්ඩින් මොත්ත උළ්නාට්ටු උට්පත්තික්කු සේවෛත් තුරෙයින් පංකළිප්පු එත්තනෛ මිල්ලියන් රූපා එන්පතෙයුම්;

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

(iv) மேற்படி சேவை வகுதிக்குரித்தான புதிய ஆக்கக் கூறுகள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) 2013 தொடக்கம் 2016 ஆம் ஆண்டு வரை பங்குச் சந்தை விலைச் சுட்டெண் ஒவ்வொரு வருடத்துக் கமைய வெவ்வேறாக யாதென்பதையும்;

(ii) மேற்படி சுட்டெண் தொடர்ந்தும் வீழ்ச்சி அடை வதைத் தடுப்பதற்கு 2017ஆம் ஆண்டில் செய்யப் பட்டுள்ள முன்மொழிவுகள் யாவை என்பதையும்;

(iii) 2016 ஆம் ஆண்டு சனவரி, யூன், செப்தெம்பர் ஆகிய மாதங்களில் தேசிய நுகர்வோர் விலைச் சுட்டெண்ணின் பெறுமதி யாதென்பதையும்;

(iv) 2015 மற்றும் 2016ஆம் ஆண்டுகளின் முதல் பகுதியில் தொழிற்படை பங்களிப்பு வீதம் யாதென்பதையும்;

(v) கமத்தொழில் துறையில் தொழில்புரிவோர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(vi) 2015 மற்றும் 2016ஆம் ஆண்டுகளில் அரச துறை மற்றும் சுய தொழில்களில் ஈடுபட்டுள்ளவர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Mass Media:

(a) Will he state-

(i) separately the contributions of the sectors of agriculture, industries and services, which are the key components of Sri Lanka's economy, to the gross domestic production of year 2016;

(ii) the contributions of the aforesaid sectors as percentages;

(iii) the contribution of the services sector to the gross domestic production in year 2016 in millions; and

(iv) the new components that have been added to the services sector?

(b) Will he inform this House -

(i) separately the price index of the share market in each year from 2013 to 2016;

(ii) the proposals that have been made for year 2017 to prevent the aforesaid index from dropping further;

(iii) the value of the national consumer price index in the months of January, June and September in year 2016;

(iv) the ratio of the labour force participation in the first half of the years 2015 and 2016;

(v) the employment level in the agriculture sector; and

(vi) the number of those who were employed in the state sector and in the self-employment sector in years 2015 and 2016?

(b) If not, why?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
The Hon. Eran Wickramaratne)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ශ්‍රී ලංකා ආර්ථිකයේ ප්‍රධාන සංරචක වන කෘෂි කර්මාන්තය, කර්මාන්ත අංශය සහ සේවා සැපයීම 2016 සහ 2017 වසරවලදී දළ දේශීය නිෂ්පාදිතයට දායක වීමේ ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් පහත දක්වා ඇත.

ආර්ථික කටයුතු	2016 වෙළෙඳපොළ මිල අනුව (රු.මිලියන)	මිල අනුව (රු. මිලියන)	2017 වෙළෙඳපොළ මිල අනුව (රු.මිලියන)	මිල අනුව (රු. මිලියන)
කෘෂි කර්මාන්තය	890,602	644,262	1,024,117	639,273
කර්මාන්ත	3,248,987	2,399,285	3,614,916	2,492,286
සේවා	6,770,667	5,124,016	7,412,033	5,289,227
භාණ්ඩ හා සේවා මත පනවන ලද සහනාධාර අඩු කරන ලද බදු	996,495	866,727	1,238,401	894,702
දළ දේශීය නිෂ්පාදිතය	11,906,752	9,034,290	13,289,466	9,315,488

මූලය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

(ii)

ආර්ථික කටයුතු	2016		2017	
	දායකත්වය (%) පවත්නා වෙළෙඳපොළ මිල යටතේ	දායකත්වය (%) 2010 ස්ථාවර මිල යටතේ	දායකත්වය (%) පවත්නා වෙළෙඳපොළ මිල යටතේ	දායකත්වය (%) 2010 ස්ථාවර මිල යටතේ
කෘෂිකර්මාන්තය	7.48	7.13	7.71	6.86
කර්මාන්ත	27.29	26.56	27.20	26.75
සේවා	56.86	56.72	55.77	56.78
භාණ්ඩ හා සේවා මත පනවන ලද සහනාධාර අඩුකරන ලද බදු	8.37	9.59	9.32	9.60
දළ දේශීය නිෂ්පාදිතය	100.00	100.00	100.00	100.00

මූලය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

(iii) (i) 2016 සහ 2017 වසරවලදී දළ දේශීය නිෂ්පාදිතයට සේවා අංශයේ දායකත්වය පහත දක්වා ඇත.

ආර්ථික කටයුතු	2016		2017	
	පවත්නා වෙළෙඳපොළ මිල අනුව (රු.මිලියන)	2010 ස්ථාවර මිල අනුව (රු.මිලියන)	පවත්නා වෙළෙඳපොළ මිල අනුව (රු.මිලියන)	2010 ස්ථාවර මිල අනුව (රු.මිලියන)
සේවා	6,770,667	5,124,016	7,412,033	5,289,227

මූලය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

ආර්ථික විශ්ලේෂණයේදී, ස්ථාවර මිල යටතේ ගණනය කළ ද.දේ.නි. දත්ත භාවිත කිරීම වඩාත් උචිත වේ.

(iv) පහත දැක්වෙන නව සේවා කටයුතු, ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේදී සිදු කරන ලද පාද වර්ෂය සංශෝධනයේදී සේවා කටයුතුවල වර්ගීකරණය සඳහා එක් කරන ලදී.

- පරිගණක වැඩසටහන් හා මෘදුකාංග නිෂ්පාදනය සහ තොරතුරු තාක්ෂණ සේවාවන්
- ව්‍යාත්තියමය සේවාවන්
- ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු

(ආ) (i) 2013 සිට 2017 දක්වා එක් එක් වර්ෂයේදී කොටස් වෙළෙඳපොළ මිල දර්ශකය වෙන් වෙන් වශයෙන්

වසර	සියලු කොටස් මිල දර්ශකය
2013	5,912.7
2014	7,298.9
2015	6,894.5
2016	6,228.2
2017	6,369.2

මූලය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

(ii) 2017-2018 කාල පරිච්ඡේදය තුළ ප්‍රාග්ධන වෙළෙඳ පොළ සංවර්ධනය කිරීම සඳහා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් පහත පියවරයන් ගෙන තිබේ.

- **නව සුරුකුම්පත් හා විනිමය පනත**

  කෙටුම්පත් කරන ලද නව සුරුකුම්පත් හා විනිමය පනත සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ බලපැවැත්වෙන නීති පද්ධතියට පෘථුල සංශෝධනයක් සපයමින්, සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නියාමන නියෝග පුළුල් කරනු ඇත. මෙම බලතල පුළුල් කිරීමේ යෝජනා, සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව සිය වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය උපක්‍රමවලින් ප්‍රමාණවත් ලෙස බලගන්වනු ඇත.

- **කොළඹ කොටස් හුවමාරුව අසාමූහිකරණය සඳහා පහසුකම් සැලසීම**

  කොළඹ කොටස් හුවමාරුව අසාමූහිකරණය මඟින් තරගකාරිත්වය හේතුවෙන් ඇතිවන පීඩනය කෙරෙහි ක්‍රියාකාරී ප්‍රතිචාරයක් දැක්වීම සඳහාත් වඩාත් නව්‍යකරණය වූ සහ වෙළෙඳ පොළ කේන්ද්‍ර කරගත් හුවමාරුවක් නිර්මාණය කිරීමටත් ඉඩ ලබා දෙනු ඇත. මෙම කෙටුම්පත, අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත්කොට අනුමැතිය ලබාගෙන ඇත. මෙය 2018 පෙබරවාරි 01 දින ගැසට් කරන ලද අතර, 2018 පෙබරවාරි 19 වන දින න්‍යාය පත්‍රිකාවෙහි ප්‍රකාශයට පත් කර ඇත.

- **සාමූහික ආයෝජන යෝජනා සංග්‍රහය** - Collective Investment Scheme (CIS) Code

  ආයෝජකයින් හට කොටස් වෙළෙඳ පොළ හා ප්‍රාග්ධන වෙළෙඳ පොළ වෙත පිවිසීමට ප්‍රමුඛ ආධාරකරු ලෙස ක්‍රියාකරමින් සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව ඒකක භාර අංශයට අඛණ්ඩව සහාය ලබා දෙන ලදී. ආයෝජකයින්ගේ ආයෝජන කලඹ සඳහා ඇති තෝරා ගැනීම් ඉහළ නැංවීම සඳහා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් වර්තමානයේ පවතින ඒකක භාර සංග්‍රහයෙහි පවතින පරතරයන් හඳුනාගත් අතර, එය අවම කිරීමට සාමූහික ආයෝජන යෝජනා සංග්‍රහය හරහා දේපළ වෙළෙඳාම් ආයෝජන භාර - Real Estate Investment Trusts - සහ හුවමාරු වෙළෙඳාම් අරමුදල් - Exchange Traded Funds - වැනි නව හඳුන්වාදීම් මඟින් සිදු කරනු ලබයි.

- **සියලුම වෙළෙඳ පොළ අතරමැදිකරුවන් සඳහා අදාළ වන නීති සහ රෙගුලාසි සංශෝධනය කිරීම**

  ශක්තිමත් නියාමන පරිසරයක් නිර්මාණය කිරීමෙන් වෙළෙඳ පොළ මට්ටමේ පුළුල් විනයක් ඇති කිරීමේ අදහස ඇතිව ජාත්‍යන්තර සම්මුතීන්ට යටත්ව සියලුම වෙළෙඳ පොළ අතරමැදිකරුවන් හට අදාළ නීති හා රෙගුලාසි දැනට විමර්ශනය කරමින් පවතී.

- **දේශීය හා විදේශීය ආයෝජකයන් ආකර්ෂණය කිරීම**

  මහජනතාවගේ මූල්‍ය හැකියාව වැඩිදියුණු කිරීම සඳහාත්, දැනුම්වත් මූල්‍යමය තීරණ ගැනීමට අවශ්‍ය මෙවලම්වලින් ආයෝජකයින් බලගැන්වීමත් අරමුණු කරගනිමින් සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් දිවයින පුරා දේශීය ආයෝජක සමුළු පවත්වන ලදී.

  මීට අමතරව, 2017 වසරේදී සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, කොළඹ කොටස් හුවමාරුව හා එක්ව සිංගප්පූරුව, නවසීලන්තය, ඕස්ට්‍රේලියාව සහ ඇමෙරිකා එක්සත් ජනපදය යන රටවල ආයෝජක සමුළු පවත්වා ඇති අතර, එමඟින් සැලකිය යුතු විදේශ ප්‍රාග්ධන ගලා ඒම් සිදු වී ඇත.

  තවද, සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව විසින් සතිපතා පුවත් පත්වල භාෂා තුනෙන් අධ්‍යාපනික ලිපි ප්‍රකාශයට පත් කරන අතර, ප්‍රාග්ධන වෙළෙඳ පොළෙහි පවත්නා විවිධ ආයෝජන ක්‍රියා මාර්ග සහ වෙළෙඳ පොළ තුළ පවතින අවස්ථා පිළිබඳ අත්‍යවශ්‍ය තොරතුරු සැපයීම සඳහා රූපවාහිනී වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

(iii)

කාලපරිච්ඡේදය	දර්ශක අගය	
	2016	**2017**
ජනවාරි	112.0	119.3
ජූනි	116.1	123.4
සැප්තැම්බර්	113.5	123.3

මූලය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

(iv)

කාලපරිච්ඡේදය	**ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය (%)**
2015 - පළමු භාගය	53.9
2016 - පළමු භාගය	53.7
2017 - පළමු භාගය	54.3

මූලය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

(v)

කාලපරිච්ඡේදය	සේවා නියුක්ත සංඛ්‍යාව	මුළු සේවා නියුක්තියේ ප්‍රතිශතයක් ලෙස
2015	2,244,547	28.7
2016	2,153,874	27.1
2017	2,140,185	26.1

මූලය: ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

(vi)

කාලපරිච්ඡේදය	රාජ්‍ය අංශය	ස්වයං රැකියා අංශය
2015	1,182,914	2,531,081
2016	1,157,658	2,511,750
2017	1,178,708	2,571,023

මූලය: ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

* ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව මඟින් පවත්වන ලද කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණවල දත්ත අනුව රාජ්‍ය අංශයේ සේවා නියුක්ත පුද්ගලයන් සංඛ්‍යාව

(ඇ) පැන නොනඟී.

ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් වෙත මිහින් ලංකා පවරා ගැනීම: සේවකයන් අන්තර්ග්‍රහණය

ஸ்ரீ லங்கன் விமானக் கம்பனி மிஹின் லங்கா விமானக் கம்பனியைப் பொறுப்பேற்றல்: ஊழியர் உள்ளீர்ப்பு

ACQUISITION OF MIHIN LANKA BY SRI LANKAN AIRLINES: ABSORPTION OF EMPLOYEES

571/'18

12. ගරු ඩලස් අලහප්පෙරුම මහතා (ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා වෙනුවට)

(මාණ්පුමිකු டலஸ் அழகப்பெரும - மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன சார்பாக)

(The Hon. Dullas Alahapperuma on behalf of the Hon. Mahinda Yapa Abeywardena)

රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) සී/ස මිහින් ලංකා (පෞද්ගලික) සමාගම පවත්වාගෙන යනු ලැබූ ගුවන් ගමන් වැඩසටහන්, 2016.10.30 දින සිට සී/ස ශ්‍රීලන්කන් එයාර් ලයින්ස් වෙත පවරා ගත් බව දන්නේද;

(ii) ඊට සමගාමීව සී/ස ශ්‍රීලන්කන් එයාර් ලයින්ස් වෙත බඳවා ගත් මිහින් ලංකා සේවකයන් සංඛ්‍යාව කොපමණද, ඔවුන්ගේ නම් හා තනතුරු කවරේද;

(iii) එසේ බඳවා නොගෙන සේවය අවසන් කළ මිහින් ලංකා සේවකයන් සංඛ්‍යාව කොපමණද, ඔවුන්ගේ නම් හා තනතුරු කවරේද;

(iv) සේවය අවසන් කළ එක් එක් සේවකයාට ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) 2016.12.31 දිනෙන් පසුව සේවයේ යොදවා සිටින අයගේ නම් හා තනතුරු කවරේද;

(vi) 2016.12.31 දින තෙක් උපදේශක තනතුරු දරමින් සේවය කළ පිරිස කොපමණද;

(vii) ඉහත (vi) හි සඳහන් පිරිස අතරින් ඉදිරි මාස සඳහා වැටුප් ගෙවා ඇති සංඛ්‍යාව කොපමණද, ඔවුන්ට ගෙවන ලද වන්දි මුදල් සහ වැටුප් හෝ දීමනා කොපමණද;

(viii) ප්‍රමාණවත් වන්දි නොලැබීම නිසා අභියාචනා ඉදිරිපත් කර ඇති සංඛ්‍යාව කොපමණද;

(ix) ඔවුන්ට හිඟ වන්දි මුදල් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வ/ப மிஹின் லங்கா விமானக் கம்பனியினால் நடாத்தப்பட்டுவந்த விமானப் பயண நிகழ்ச்சித் திட்டங்களை, 2016.10.30ஆம் திகதி தொடக்கம் ஸ்ரீ லங்கன் விமானக் கம்பனி பொறுப்பேற்றுக் கொண்டது என்பதை அறிவாரா;

(ii) அதற்குச் சமாந்தரமாக ஸ்ரீ லங்கன் விமானக் கம்பனிக்குச் சேர்த்துக்கொள்ளப்பட்ட மிஹின் லங்கா ஊழியர்களின் எண்ணிக்கை யாது, இவர்களின் பெயர் மற்றும் பதவிகள் யாவை;

(iii) இவ்வாறு சேர்த்துக்கொள்ளப்படாது சேவை முடிவுறுத்தப்பட்ட மிஹின் லங்கா ஊழியர்களின் எண்ணிக்கை யாது, இவர்களின் பெயர் மற்றும் பதவிகள் யாவை;

(iv) சேவை முடிவுறுத்தப்பட்ட ஊழியர் ஒவ்வொரு வருக்கும் செலுத்தப்பட்ட நட்ட ஈட்டுத் தொகை வெவ்வேறாக யாது;

(v) 2016.12.31ஆம் திகதியின் பின்னர் சேவையில் ஈடுபடுத்தப்பட்டுள்ளவர்களின் பெயர் மற்றும் பதவிகள் யாவை;

(vi) 2016.12.31ஆம் திகதிவரை ஆலோசகர் பதவி வகித்துக்கொண்டிருந்தவர்களின் எண்ணிக்கை யாது;

(vii) மேலே (vi) இல் குறிப்பிடப்பட்டவர்களில் எதிர் வரும் மாதங்களுக்காக சம்பளம் வழங்கப்பட்டுள் ளோரின் எண்ணிக்கை யாது, இவர்களுக்குச் செலுத்தப்பட்ட நட்டஈட்டுத்தொகை, சம்பளம் அல்லது கொடுப்பனவு எவ்வளவு;

(viii) போதியளவு நட்டஈடு கிடைக்காமையால் மேன் முறையீடு செய்துள்ளவர்களின் எண்ணிக்கை யாது;

(ix) இவர்களுக்கு நிலுவை நட்டஈட்டுத் தொகை வழங்கப்படுமா;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Enterprise and Kandy City Development:

(a) Will he inform this House-

(i) whether he is aware that the aviation services carried out under Mihin Lanka (Pvt.) Limited have been acquired by the Sri Lankan Airlines Limited since 30.10.2016;

(ii) the number of Mihin Lanka employees enrolled to Sri Lankan Airlines Limited in parallel to it and their names and positions;

(iii) the number of Mihin Lanka employees whose service was terminated and their names and positions;

(iv) the amount paid as compensation to each employee separately, whose service was terminated;

(v) the names and positions of the persons who have been employed after 31.12.2016;

(vi) the number of persons who served as consultants till 31.12.2016;

(vii) the group of persons mentioned in (vi) above, how many have been paid with salaries for the upcoming months, the compensations, wages or allowances paid to them;

(viii) the number of employees who have appealed due to not receiving adequate compensation; and

(ix) whether they will be provided with the outstanding compensation?

(b) If not, why?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඔව්.

(ii) 125කි. (නම් සහ තනතුරු ඇමුණුම් A* යටතේ දක්වා ඇත.)

(iii) 168කි. ඔවුන් ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමේ ක්‍රමය යටතේ සේවයෙන් ඉවත් විය. (නම් සහ තනතුරු ඇමුණුම් B* යටතේ දක්වා ඇත.)

(iv) ඇමුණුම C* යටතේ දක්වා ඇත.

(v) 13කි. (ඇමුණුම D* යටතේ දක්වා ඇත)

(vi) 08කි. (ඇමුණුම E* යටතේ දක්වා ඇත)

(vii) ඉහත (VI) හි සඳහන් පිරිසගේ සේවය අවසන් කර ඇති බැවින්, ඉදිරි මාස සඳහා වැටුප් ගෙවා නොමැත.

(viii) අභියාචනා ඉදිරිපත් වී නැත.

(ix) අදාළ නැත.

(ආ) අදාළ නැත.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න. ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

සහන පදනම යටතේ ලබා දුන් ට්‍රැක්ටර් රථ සඳහා වූ ගෙවීම්වලින් කිලිනොච්චි ගොවීන් නිදහස් කිරීම
மானிய அடிப்படையில் வழங்கப்பட்ட இருசக்கர உழவு இயந்திரத்துக்கான கொடுப்பனவிலிருந்து கிளிநொச்சி விவசாயிகளை விடுவித்தல்
PAYMENT WAIVE OFF TO KILINOCHCHI FARMERS FOR TRACTORS GIVEN AT CONCESSIONARY RATE

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ கமத்தொழில் அமைச்சர் மஹிந்த அமரவீர அவர்களிடம் கேள்வி கேட்க அனுமதித்ததற்கு முதலில் நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

2010 - 2012ஆம் ஆண்டு காலப்பகுதியில் கிளிநொச்சி மாவட்டத்தில் மீள்குடியேறிய விவசாய மக்களில் 127 பேருக்குப் பொருளாதார அபிவிருத்தி அமைச்சு ஜப்பான் நிறுவன நிதி உதவியில் இருசக்கர உழவு இயந்திரங்களை 50 வீத மானியத்தில் வழங்கியிருந்தது. 5,25,000 ரூபாய் பெறுமதியான மேற்படி உழவு இயந்திரங்களைப் பெற்றவர்கள் 2,50,000 ரூபாய் தவணை அடிப்படையில் செலுத்த வேண்டிய நிலையில், கிளிநொச்சி மாவட்டத்தில் தொடரும் காலநிலை சீர்கேடுகள் காரணமாகக் குறித்த விவசாய மக்களால் தவணைப் பணங்கள் செலுத்தமுடியாதுள்ளது. இதன் காரண மாக மேற்படி உழவு இயந்திரங்கள் பறிமுதல் செய்யப்படக் கூடிய நிலைமை ஏற்பட்டுள்ளதாகவும் தெரியவருகின்றது.

எனவே, இந்த விவசாய மக்களின் நலன்களை அவதானத்தில் கொண்டு, மேற்படி உழவு இயந்திரங்களை அம்மக்களுக்கு இலவசமாக வழங்கக்கூடிய ஏற்பாடுகளை மேற்கொள்ள முடியுமா? அல்லது நீண்டகால கடன் வசதியை ஏற்படுத்திக்கொடுக்க முடியுமா?

மேற்படி எனது கேள்விக்கு கௌரவ அமைச்சர் அவர்கள் பதிலளிப்பாரென எதிர்பார்க்கின்றேன்.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Leader of the House, who will reply?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, we will answer that Question tomorrow.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අමාත්‍යාංශ නිවේදන. වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍ය ගරු දුමින්ද දිසානායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රධාන කටයුතු. අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 4 දක්වා; 1990 සුවසැරිය පදනම් පනත් කෙටුම්පත දෙවන වර කියවීම, සුරාබදු ආඥා පනත යටතේ නිවේදන දෙකක් අනුමත කිරීම සහ ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග අනුමත කිරීම.

[ගරු කථානායකතුමා]

අද දින විවාදයට ගැනීමට නියමිත න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 4 දක්වා වූ විෂයයන් අදාළ ආංශික අධීක්ෂණ කාරක සභාවල සලකා බලා, එකී කාරක සභාවල වාර්තා පිළිවෙළින් 2018 ජූනි මස 21, 2018 ජූනි මස 07, 2018 ජූනි මස 20 සහ 2018 මැයි මස 25 යන දිනවලදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති බව මම මේ ගරු සභාව දැනුම් දීමට කැමැත්තෙමි.

1990 සුවසැරිය පදනම පනත් කෙටුම්පත
1990 சுவசெரிய மன்றம் சட்டமூலம்
1990 SUWASERIYA FOUNDATION BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I move,

"That the Bill be now read a Second time."

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා.

[ප.භා.10.52]

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
The Hon. (Dr.) Harsha De Silva - State Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, අද දවස, මගේ පාර්ලිමේන්තු ජීවිතයේ සතුටටම පත් වෙන්න පුළුවන් දවසක්. ඒකට හේතුව තමයි අපේ අමාත්‍යාංශය යටතේ අපි 1990 සුවසැරිය පදනම පනත් කෙටුම්පත අද මේ ගරු සභාවට ඉදිරිපත් කිරීම. මේ පනත් කෙටුම්පතේ පරමාර්ථය තමයි "1990 සුවසැරිය" කියලා පදනමක් ස්ථාපනය කිරීම. ඒකෙන් අපි බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? ගරු කථානායකතුමනි, ඒකෙන් අපි බලාපොරොත්තු වෙන්නේ, මේ රටේ ඕනෑම තැනැත්තෙකුට පූර්ව රෝහල් ප්‍රතිකාර, ගිලන් රථ සේවා සහ හදිසි ප්‍රතිකාර සේවා නොමිලේ සැපයීමයි. අවුරුදු ගණනක් තිස්සේ අපේ රටේ නොතිබුණු ඉතාම වැදගත් සේවාවක් ජනතාවට ලබා දීම සඳහා අද අපේ ආණ්ඩුව මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ඊට අමතරව ආසන්නම සෞඛ්‍ය සේවා සපයන්නා වෙත තැනැත්තෙකු ළඟා වන තුරු ආරක්ෂිත හා සායනිකව ක්‍රියාකාරී පරිසරයක් තුළ හදිසි සහ කාර්යක්ෂම පූර්ව රෝහල් ප්‍රතිකාර නොමිලේ සැපයීමටත් බලාපොරොත්තු වෙනවා.

අද බොහෝ වෙලාවට අපි දකිනවා, රිය අනතුරු සිදු වනවා; ඒ වාගේම ගස්වලින්, උස ස්ථානවලින් මිනිස්සු වැටිලා අනතුරු සිදු වනවා. නමුත් ඔවුන් ඉස්පිරිතාලයකට ගෙන යාමට අපට හරියාකාර සේවාවක් නැහැ. බොහෝ වෙලාවට ත්‍රිරෝද රථ පදවන පුද්ගලයින් තමයි ඒ සඳහා උදවු වෙන්නේ. ලොකු කාර්වල යන උදවිය accident එකක් දැක්කාම සමහර වෙලාවට අනෙක් පැත්ත බලාගෙන යන තත්ත්වයක් තිබෙනවා. අපි හිතමු accident එකක් වුණා, මෝටර් බයිසිකලෙන් වැටුණා කියලා. කොදු ඇට පේළියට යම්කිසි හානියක් සිදු නොවන ලෙස එම රෝගියාව රෝහලට රැගෙන යාමට අපට හැකියාවක් තිබෙන්න ඕනෑ. ඒ සඳහා මෙතෙක් කල් අපට සහයෝගය ලබා දුන් සියලු දෙනාට ස්තුතිවන්ත වෙන ගමන්, ඔවුන්ගේ සහයෝගය ඉදිරියටත් බලාපොරොත්තු වෙන අතර මේ අවස්ථාවේ රජය විසින් 1990 සුවසැරිය පදනම පනත් කෙටුම්පත ඉදිරිපත් කරනවා. අපේ සෞඛ්‍ය සේවයේ විප්ලවීය වෙනසක් කරන්න අද අපට අවස්ථාවක් ලැබෙනවා, ගරු කථානායකතුමනි. මේ පනත හරහා මේ රටේ ජීවත් වන මිලියන 21ක් වූ ජනතාවටත්, අපේ රටට සංචාරය පිණිස පැමිණෙන ආගන්තුක අමුත්තන්ටත් ඒ වාගේම විදේශවලින් මෙහි පැමිණ සිටින සියලු දෙනාටත් අපි මේ සේවාව ලබා දෙනවා. මෙම සේවාව නොමිලේ ලබා දීමට අපේ රජය තීරණය කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, හදිසි අවස්ථාවක් ඇතිවී දුරකථන ඇමතුමක් ලබා දුන් විට විනාඩි 13ක් වැනි කාලයක් ඇතුළත එම ස්ථානයට සියලුම පහසුකම් හා උපකරණ සහිත ගිලන් රථයක් සහ හදිසි වෛද්‍ය තාක්ෂණවේදීයෙක් පැමිණෙන ක්‍රමවේදයක් සකස් කරනවා. Hon. Speaker, this is not just an ambulance. It is fully equipped. The Prime Minister said the other day that it is like a microhospital. මෙය ක්ෂුද්‍ර රෝහලක් වාගෙයි. In addition to that, we have Emergency Medical Technicians who will come along to take the patient to the hospital. ගරු කථානායකතුමනි, 1990 සුවසැරිය හරහා අපි පූර්ව රෝහල් ප්‍රතිකාර අතින් සංවර්ධිත රටක් බවට අද පත් වෙනවා. අපි තුන්වැනි ලෝකයේ රටක්, අපි සංවර්ධනය වන රටක් කියලා බොහෝ පුද්ගලයන් කිව්වාට, මේ parameter එක හරහා අපි සංවර්ධිත රටක් බවට පරිවර්තනය වන බව මම කියන්න කැමතියි. මම ඉතා සතුටින් තමයි අද මේ කථාව කරන්නේ. In the Western countries - in America, Europe, Japan and in all other countries, when they call 911 or whatever, they will immediately have a prehospital care ambulance. In this country, we never had it. Actually, we have been having it for some time in certain provinces. I will talk about it later. නමුත් අපි අද ඉඳලා පූර්ව රෝහල් සේවය පැත්තෙන් සංවර්ධිත රටක තත්ත්වයට පත් වෙනවා. ඇත්ත වශයෙන්ම දැනටමත් අපේ 1990 සුවසැරිය සේවාව සමහර අංශවලින් ඇමෙරිකාවේ 911 ambulance service එකටත් වඩා ඉහළ තත්ත්වයක තිබෙනවා කියලා ඔවුන් සහරාවල සඳහන් කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි මේ සේවාව පටන් ගත්තේ නොයෙකුත් බාධක හා කම් කටුලු මැද බව බොහෝදෙනා දන්නවා. සමහරු අපට නොයෙකුත් චෝදනා ඉදිරිපත් කළා; උද්ඝෝෂණ කළා; මාධ්‍ය සාකච්ඡා පවත්වලා කිව්වා, "1990 සුවසැරියට ගොඩ වෙන්න එපා" කියලා. ඔවුන් ද්වේෂ සහගත කථා කිව්වා. ගරු කථානායකතුමනි, ඔබතුමා දන්නවාද, මේ ambulances ඉස්පිරිතාලවල නවතා තබන්නයි අපි ඉස්සෙල්ලාම තීරණය කළේ කියලා? ඒ අවස්ථාවේදී සමහරු උද්ඝෝෂණය කරලා කිව්වා, "1990 සුවසැරිය ඉස්පිරිතාල පැත්ත පළාතේ ගෙනෙන්න එපා" කියලා. මේ රටේ බහුතරයක් ජනතාව එදා අපත් සමඟ හිටියා. අපි පසුබට වුණේ නැහැ, ගරු කථානායකතුමනි. අපි තීරණය කළා, 1990 සුවසැරිය නවත්වන්නේ පොලිස් ස්ථානවල කියලා. ඒ, අපි ගත්ත හොඳම තීරණය. "පොලිස් ස්ථානවල නවත්තමු" කියලා ගත්ත තීරණය තමයි ඇත්තටම නිවැරදි තීරණය. මොකද, ඉස්සෙල්ලාම ඒ පණිවුඩ ලැබෙන්නේ පොලීසියටයි. එවිට අපට පුළුවන් වනවා, පොලීසිය හරහා ඒ ගිලන්රථ අවශ්‍ය ස්ථානවලට ගෙන යන්න.

අපි 2016 ජූලි මාසයේ 29වන දා තමයි පළාත් දෙකකින් මේ වැඩ පිළිවෙළ ආරම්භ කළේ. අපේ ගරු චමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා මේ අවස්ථාවේදී ගරු සභා ගර්භයට එනවා. එතුමා නියෝජනය කරන හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් තමයි අපි මේ වැඩ පිළිවෙළ ඉස්සෙල්ලාම පටන් ගත්තේ. ඊට පස්සේ අපි මාතරට ගියා; ගාල්ලට ගියා; කළුතරට ගියා; ගම්පහට ගියා. අවසාන වශයෙන් කොළඹට ආවා.

Hon. Speaker, I would like to give you some statistics of this service thus far. අපි 1990 සුවසැරිය සේවාව පටන් ගත්ත දවසේ ඉඳලා අද වනකොට දුරකථන ඇමතුම් 5,84,520ක් ලැබී තිබෙනවා. ඒ ලැබුණු දුරකථන ඇමතුම් 5,84,520ටම ඒ දුරකථන ඇමතුම අපේ Board එකට ලැබිලා තත්පර දෙකක් ඇතුළතදී අපි answer කර තිබෙනවා. ලැබුණු telephone callsවලින් සියයට 98.9කට අපි තත්පර 2ක් ඇතුළත answer කර තිබෙනවා. මේ වනකොට අපේ ambulances හදිසි අවස්ථාවලට 88,599 වතාවක් යවා තිබෙනවා.

එයින් 79,944 අවස්ථාවකදී, එසේ හදිසි අවස්ථාවලට භාජන වුණු රෝගීන් ඇම්බියුලන්ස්වලින් ඉස්පිරිතාලවලට අරගෙන ගිහින් තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ සියලු දෙයට - telephone call එක ආපු වේලාවේ ඉඳලා ඒ රෝගියා ගන්න තැනට යනකම් - අපට ගතවෙලා තිබෙන්නේ, විනාඩි 12යි, තත්පර 58යි. දත්ත අනුව වැඩිපුරම තිබෙන්නේ වාහන අනතුරු - vehicular trauma. වාහන අනතුරු සියයට 17ක් තිබෙනවා. අනෙක් ඒවා, non-vehicular trauma. ඒ කියන්නේ හදිසි අවස්ථාවල injure වුණු ඒවා. ඊළඟට, පපුවේ අමාරුවලට -cardiovascular diseasesවලට- සම්බන්ධ ඒවා සියයට 10ක් යනාදී වශයෙන් නොයෙක් හදිසි අවස්ථාවලදී අපි ජනතාවට ඒ අවශ්‍ය ප්‍රතිකාර ලබා දීලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, අපි මෙම කටයුත්ත පටන් ගත්ත දවසේ ඉඳලා බැලුවාම, අද වනවිට තත්ත්වය සම්පූර්ණයෙන්ම වෙනස් වී තිබෙනවා. අපිට ගරහපු කට්ටිය වෙනුවට අද සාමාන්‍ය ජනතාව "1990 සුවසැරිය"ට වන්දනාමාන කරන තත්ත්වයට පත් වී තිබෙනවා. මම ළඟ photo එකක් තිබෙනවා, ගරු කථානායකතුමනි. ගාල්ලේ පොඩි වෙළෙඳාමක් කරන මනුෂ්‍යයෙක්ව යට කරගෙන බස් එකක් ගිහිල්ලා ඒ අහිංසක මනුෂ්‍යයාගේ කකුල් දෙක කැඩී තිබුණා. ඒ මනුෂ්‍යයා ඉස්පිරිතාලයට ගෙනිහින් තිබෙන්නේ සුවසැරිය ambulance එකක. ඒ මනුෂ්‍යයාට සුව වුණාට පසුව ඔහු ambulance එක ඉස්සරහට ඇවිල්ලා වැඳලා තිබෙනවා. කවුරු හෝ ඒ අවස්ථාවේ photograph එකක් අරගෙන මට එවා තිබුණා. එවැනි තත්ත්වයකට අද පත් වෙලා තිබෙනවා. දරුවන් 27 දෙනෙක් මේ ambulance ඇතුළේ බිහි වී තිබෙනවා. 27 දෙනෙක්! සමහර අවස්ථාවලදී මිනිසුන් ඇවිත් අඬනවා. ඔවුන් ඒ ගැන කියනවා. ඔවුන් ඉතාම දුෂ්කර ප්‍රදේශවල අය.

ගරු කථානායකතුමනි, මම එක අවස්ථාවකදී එවැනි සිදුවීමක් කියන්නම්. එතැනට වාහනයක් ගෙන යන්න බැහැ. අපේ emergency medical technician සහ pilot - අපි driver කියලා කියන්නේ නැහැ. අපි කියන්නේ pilot කියලා -, ඔවුන් දෙදෙනා බැහැලා torch එකත් අරගෙන ඒ ගෙදරට ගිහින් ඒ මව අරගෙන එනකොට, අතරමඟදී මව දරුවා ප්‍රසූත කර තිබෙනවා. පත්තරවලත් බොහෝ අවස්ථාවල ඔවුන් මෙවැනි සිදුවීම් ගැන වාර්තා කර තිබෙන ආකාරය මම දැකලා තිබෙනවා.

මම හිතන විධියට 1990 සුවසැරිය ගිලන්රථ සේවාව මඟින් ජනතාවට ඉතාම විශිෂ්ට සේවාවක් ලැබෙනවා. මෙම සේවාව අපේ ආණ්ඩුව අලුතින් හිතලා, plan කරලා, මුදල් සොයාගෙන, මුලින් pilot කරලා හදපු එකක්. එම සේවාව මුළු ශ්‍රී ලංකාවටම ලබා දෙන්න තමයි අද මේ උත්තරීතර සභාවට මෙම පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම සඳහා ඉදිරිපත් කරන්නේ. ඒ නිසා අපේ රජය විවේචනය කරන සමහරුන්ට මම කියන්න කැමැතියි, හොඳ දෙයට හොඳයි කියන්න උත්සාහ කරන්න කියලා. හැම දෙයක්ම විවේචනවලට සීමා කරන්න එපා.

මෙහි ආරම්භය ගැන වචන කිහිපයක් ප්‍රකාශ කළ යුතුයි කියලා මම හිතනවා. මොකද, නොයෙක් කට්ටිය නොයෙක් කථා රටේ පතුරුවන්න හදනවා. ඇත්තවශයෙන්ම මට මේ අදහස ඇති වුණේ මම මතක විධියට 2013 අගෝස්තු මාසයේදී. අපි ත්‍රිකුණාමලයේ, කුච්චවේලි ගිහිල්ලා එනකොට තද වැස්සකට හසු වුණා.

Sir, I will now speak in English because I want to mention a couple of names. I would like to refer to one particular incident. There was heavy rain and, perhaps, we were driving a little too fast. One of the vehicles spun out of control and this lady, Ms. Amina Ali, who had just come to this country, was thrown away 40 feet and she was like a lump on the road. There was no way in which we could find an ambulance. She was critically injured. We had to take her to Kantalai Hospital. But, there was no way. I recall that there was an army camp nearby and the soldiers there jumped into a minivan and came to help us. By that time several others got together and it was a struggle to save her life. Sir, I want to mention these two names: a good friend of mine, Mr. Geethaka Gunawardena, a lawyer during the day, was a makeshift ambulance driver and his wife, Dr. Ruwani Gunawardena, currently a Consultant at Nawaloka Hospital, was an EMT for that day. It was a many hours journey. We brought her to Colombo, which took about seven hours, and there was another 14 hour of surgery done by Dr. Sunil Perera to fix her injured spinal cord and Amina is today doing perfectly well.

ගරු කථානායකතුමනි, එදා තමයි මම මේ තීරණය ගත්තේ. එවකට සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා වශයෙන් සිටි ගරු ලලිත් දිසානායක මැතිතුමාට ස්තුතිවන්ත වන්න ඕනෑ. මම එතුමාට කථා කළාම එතුමා කිව්වා, "හර්ෂ කලබල වෙන්න එපා. මම දඹුල්ලේ රෝහලේ ambulance එකක් ලෑස්ති කරලා තියන්නම්" කියලා. නමුත් ඒකේ condition එක අනුව එතැන හිටපු doctor කිව්වා, "මෙකට මාරු කරන්න එපා"යි කියලා. ඒක නිකම්ම නිකම් වැන් එකක්. බෙල්ල කැඩෙන්න යන පුද්ගලයකු නිකම්ම නිකම් වැන් එකක දමාගෙන ගියොත් ඊට වඩා ප්‍රශ්නයකට පැටලෙයි කියලා ඔහු කිව්වා. එදා මම හිතුවා, අපට කවදා හෝ රජයක් ලැබුණොත්, පළමුවෙන්ම කරන්නේ ambulance service එකක් පටන් ගන්න එකයි කියලා. ඒ සම්බන්ධයෙන් මූලික සාකච්ඡා ඇරඹුණේ 2015 පෙබරවාරි මාසයේදියි. එතකොට ජනාධිපතිවරණය අවසන්වෙලා අපේ ආණ්ඩුව පත්වෙලා මාසයක් පමණයි ගත වුණේ. 2015 මාර්තු මාසයේ ඉන්දියාවේ අගමැති නරේන්ද්‍ර මෝදි මැතිතුමා ලංකාවට ආවා. The Indian PM wished to provide a grant to Sri Lanka as a token of friendship between the people of India and Sri Lanka. මේ සම්බන්ධයෙන් තමයි මිනිස්සු ඉන්දියාව ගැන කියලා නොයෙකුත් විවේචනය කළේ.

At that time, Sir, they requested the Government to provide some possible options, as to what they could do to support us and that was when I asked our Prime Minister whether we could request their support to set up an ambulance service. Our Prime Minister agreed and told me, “You had better speak to him and if you can get him to agree, then you can set it up.” The rest is history,Sir.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

The first phase of the ambulance service we started in Hambantota and extended it to six other districts through a grant. මෙය ඉන්දියානු රජය විසින් ලබා දුන්නු ඇමෙරිකානු ඩොලර් මිලියන 7.6ක ප්‍රදානයක්. ඒ මුදලින් ශතයක්වත් නැවත ගෙවන්න අවශ්‍ය නැහැ. ඒ මුදලින් තමයි අපි මේ 1990 සුවසැරිය හදිසි ගිලන් රථ සේවය පටන් ගත්තේ. ඊට පස්සේ, දෙවන අදියරට - for the second phase - the Government of India gave us another grant. එය ණය මුදලක් නොවෙයි. ඒ මුදල නැවත ගෙවන්න ඕනෑ නැහැ. ප්‍රදානයක්, තෑග්ගක් හැටියට තමයි, තවත් ඩොලර් මිලියන 15.2ක් දීලා තිබෙන්නේ. ඒ අනුව ඉන්දියානු රජය විසින් තෑග්ගක් හැටියට දෙන ලද ඩොලර් මිලියන 22කට අධික මුදලින් තමයි අපි 1990 සුවසැරිය හදිසි ගිලන් රථ සේවය පටන් ගත්තේ. Along with that grant, we got technical support from THE GVK EMRI, which is running an ambulance service in India, to get this service started.

Sir, I wish to place on record my deepest appreciation to Prime Minister Narendra Modi and the people of India for this wonderful gift that they have given us. The people of Sri Lanka will ever be grateful to you and all those who are at the Ministry of External Affairs, India for having helped us to do this. The former Foreign Secretary of India, Mr. Subrahmanyam Jaishankar, particularly the former Indian High Commissioner to Sri Lanka, Mr Y. K. Sinha, the current Indian High Commissioner to Sri Lanka, Mr. Taranjit Singh Sandhu, the Deputy High Commissioner, Mr. Arindam Bagchi and the Counsellor, Mrs. Suja K. Menon need special mention as those who really supported us to make this happen.

Sir, I found out that this is one of the largest grants that India has given us outside the support for housing - the 50,000 houses in the North for tsunami affected areas. So, this is something that the people of India and the people of Sri Lanka have really used to build friendship among our nations. Also my deepest gratitude goes to Dr. G. V. K. Reddy, Mr. G V Sanjay Reddy, Mr. Karthi Gajendran, Mr. K. Krishnam Raju and Mr. Subodh Satyawadi for their assistance in making this happen.

ඒ සමඟම මේ කර්තව්‍ය සාර්ථක කර ගැනීමට කටයුතු කළ External Resources Department එකේ සියලුම නිලධාරීන්ට - particularly, to Mr. Priyantha Rathnayake, Mr. Samantha Bandara and also the lady who handled legal work for us - මගේ ස්තුතිය පිරිනමන්න කැමතියි. සෞඛ්‍ය ඇමති ගරු රාජිත සේනාරත්න මැතිතුමාට මගේ හෘදයංගම ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරන්න කැමතියි. එතුමා සියලු අවස්ථාවන්හිදී අපට මේ සඳහා සහයෝගය ලබා දුන්නා. මොකද, මේක පූර්ව රෝහල් ප්‍රතිකාර සේවයක්. සමහරු මේ ගැන දන්නේ නැහැ. Ambulances මේ රටේ තිබෙනවා. ඒ ambulances තිබෙන්නේ ඉස්පිරිතාලයක ඉඳලා තව ඉස්පිරිතාලයකට රෝගියෙකුව අරගෙන යන්නයි. ඒවාට තමයි රජය සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා ambulance ලබා දීලා තිබෙන්නේ. මේක එහෙම ambulance සේවාවක් නොවෙයි. ඉස්පිරිතාලයක ඉඳලා තව ඉස්පිරිතාලයකට රෝගියෙකුව අරගෙන යන්න අපට හැකියාවක් නැහැ. කළුබෝවිල ඉස්පිරිතාලයේ ඉඳලා මහ රෝහලට රෝගියෙකු අරගෙන යාම වෙනම කාර්යයක්. මේක පූර්ව රෝහල් ප්‍රතිකාර ඇම්බියුලන්ස් සේවාවක්. ඒ කියන්නේ, මෙය accident එක වෙච්ච තැන ඉඳලා, පපුවේ අමාරුව හැදුණු තැන ඉඳලා, මොළයේ නහරයක් පිපිරුණු වෙලාවේ ඉඳලා රෝගියා නිවැරදි ඉස්පිරිතාලයකට ගෙනි යන සේවාවක් පමණයි. මේක සෞඛ්‍ය සේවාවත් එක්ක බලන විට ඇත්ත වශයෙන්ම වෙනස් සේවාවක්. ඉස්පිරිතාලයට ගියාට පස්සේ තමයි අදාළ සෞඛ්‍ය සේවාව ලැබෙන්නේ. රෝගියා ත්‍රීවීලර් එකක දාගෙන යනවාද නැත්නම් කාගේ හෝ යාළුවෙකුගේ වාහනයක දාගෙන යනවාද වශයෙන් එදා තිබුණු තත්ත්වයට වඩා ඉතාම යෝග්‍ය අවස්ථාවක් තමයි අපට මේ 1990 සේවාව හරහා ලැබෙන්නේ.

ඊට අමතරව එවකට හිටපු පාලිත මහීපාල මැතිතුමාට, එවකට හිටපු ලේකම්තුමාට, දැන් ඉන්න ලේකම්තුමාට වාගේම දැන් ඉන්න අධ්‍යක්ෂ ජනරාල්තුමාට අපේ හෘදයංගම ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරන්න කැමතියි. ස්තුතිය පළ කරන්න ගියොත් එහෙම මා සිය ගණනකට ස්තුති කරන්න ඕනෑ. මට එහෙම ස්තුති කරන්න වේලාවක් නැහැ. මා ස්තුති කළ යුතු සුවිශේෂී පුද්ගලයෙකු ඉන්නවා. එතුමා වෙනුවෙන් මා ඒ ස්තුතිය කළ යුතුමයි. එතුමා තමයි, දුම්න්ද රත්නායක මහතා. මහාචාර්ය අසිත ද සිල්වා සමඟ මුලින්ම මේ අදහස සම්බන්ධයෙන් සාකච්ඡා කළේ අපි තුන් දෙනායි. එදා පටන් අද වනතුරු, අද සිට ඉදිරියටත් මෙම බාරදූර වගකීම අතට අරගෙන, සියයට සියයක් සාර්ථකත්වයෙන් මේ කටයුතු සිදු කරන්න මුල් වූ ප්‍රමුඛතම පුද්ගලයා හැටියට මා ඔහුට මගේ කෘතඥතාව පුද කරන්න කැමැතියි, ගරු කථානායකතුමනි. එතුමා ඒ සියලු දායකත්වය එදා ඉඳලා අදටත්, අද ඉඳලා හෙටටත් ලබා දෙන්නේ සම්පූර්ණයෙන්ම ස්වේච්ඡාවෙන් කියන කාරණයත් මා මේ අවස්ථාවේදී මතක් කරන්න කැමතියි.

ඔහුට සියලු ලක්වාසී ජනතාවගේ ගෞරවය හිමි වෙනවා. ඊට අමතරව, අපේ කාර්ය මණ්ඩලය දැනට පන්සියයක් විතර ඉන්නවා. ඒ කාර්ය මණ්ඩලය මෙහෙයවන අපේ ගයාන් චතුරංග මැතිතුමා, ඩී.වී.ඩී. ප්‍රසාද් මැතිතුමා, සොහාන් ද සිල්වා මැතිතුමා ඇතුළු අපේ කාර්ය මණ්ඩලයට -අවුරුද්ද දවසේ, වෙසක් පොහොය දවසේ, උදේ, රෑ, පැය 24 පුරාම වැඩ කරන- මම හිස නමා ආචාර කරන්න කැමතියි. මම දැක්කා, පසුගිය සිංහල අවුරුද්ද දවසේ තරුණ EMT කාන්තාවක් වැඩ ඉවර වෙලා ගෙදර යන අවස්ථාව ගැන පත්තරේ පළ වී තිබුණු ලිපියක්. ළිප ගිනි මෙළවීමේ අවුරුදු චාරිත්‍ර ඉෂ්ට කිරීමට යන්න ඇයට ඕනෑ වුණා. නමුත් දුරකථන ඇමතුමක් ලැබිලා, ඒ සියලු අවුරුදු චාරිත්‍ර නවත්වලා ඇය අර දරුවා ප්‍රසූත කරන්න ගිය කාන්තාව බේරා ගන්න ගිය කථාවක් ගැන පත්තරේ තිබුණා. ඒ වාගේ කථා හැමදාම තිබෙනවා. මේ ගොල්ලන් මේ ජීවිත බේරාගන්න shifts මාර්ගයෙන් පැය 24ම වැඩ කරනවා. මගේ මිත්‍ර සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, මුල් දවසේ මම කිව්වේ, මේක රස්සාවක් කියලා හිතන්න එපා; තමන් අදහන ආගම මොකක් වුණත් පිනක් හැටියට සලකන්න කියලායි. අද වෙනකොට 1990ට ගමේ ලොකු ප්‍රතිචාරයක් තිබෙනවා. Hon. Speaker, I want to tell you something in a lighter vein. මට මේ ළඟදී "ලංකාදීප" පුවත් පතේ පළ වුණු මංගල යෝජනා දැන්වීමක පින්තූරයක් කවුද එවලා තිබුණා. [බාධා කිරීමක්] අහගන්න, මන්ත්‍රීතුමා. ඒ මංගල යෝජනාවේ තිබෙනවා මෙහෙම මෙහෙමයි; අරහෙමයි මෙහෙමයි; වැඩ කරන්නේ 1990 කියලා. බලන්න, කොච්චර ලොකු පිළිගැනීමක්ද 1990ට ගමේ තිබෙන්නේ කියලා. මංගල යෝජනාවල දමනවා 1990 වැඩ කරන EMT කෙනෙක් කියලා. [බාධා කිරීමක්] මටත් දාන්න පුළුවන්. මට නම් තව මඟුල් අවශ්‍ය නැහැ. මම කියන්නේ එවැනි තත්ත්වයකට අද ඒ සේවාව පිළිගැනීම ගැනයි. කසාද බන්දලා දෙන්න යනකොට කොහේද වැඩ කරන්නේ, මොකක්ද කරන්නේ කියන එක වැදගත් නේ. ඒ අන්දමට මේ සේවය පිළිගන්න තත්ත්වයකට අද සමාජය ඇවිල්ලා තිබෙනවා. ඔවුන්ගේ සේවය අනර්ඝයි; උපරිමයි; it is an extremely excellent service that these people are providing.

ගරු කථානායකතුමනි, මගේ කාලය අවසන් වෙන නිසා මගේ කථාව අවසන් කරන්න ඕනෑ. අද මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්න පක්ෂ විපක්ෂ භේදයකින් තොරව සහයෝගය ලබාදෙන්න කියලා මම සියලු දෙනාගෙන් ඉල්ලා සිටිනවා.

මින් ඉදිරියට මේ රටේ සියලු පුරවැසියන්ටත්, මා කලින් කිව්වා වාගේ අපේ රටට එන සියලුම ආගන්තුකයින්ටත් මේ සේවාව අපි නොමිලේ ලබා දෙනවා. ඒ විතරක් නොවෙයි. උගත් තරුණ තරුණියන් 1,800කට මේ හරහා අලුතින් රැකියා අවස්ථා බිහි වන බවත් මතක් කරන්න කැමැතියි.

ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ අවස්ථාවේදී පුද්ගලයින් බොහෝ දෙනකුට ස්තුති කරන්න අමතක වුණා. අපේ කාර්යාලයේ අවශ්‍ය වැඩ කටයුතුවලට නිතරම Attorney-General's Department එකට, Legal Draftsman's Department එකට, වෙනත් ආයතනවලට ගිහිල්ලා කටයුතු කළ අනිතා වරුසවිතාන මහත්මියටත් මේ අවස්ථාවේ මා ස්තුතිවන්ත වෙනවා.

අවසාන වශයෙන් රජයේ ගිලන් රථ රියැදුරන්ගේ සංගමයටත් අපේ ස්තුතිය පළ කරනවා. ඔවුන් විරුද්ධ නොවී සම්පූර්ණ සහයෝගය ලබා දීලා තිබෙනවා. මේකට කවුරුවත් ගාව ගන්න අවශ්‍ය නැහැ. රජයේ ගිලන් රථ සේවාව එක පැත්තකින් තිබෙනවා. මේ "සුවසැරිය" ගිලන් රථ සේවාවත් රජයේ සේවාවක් විධියට අනෙක් පැත්තෙන් තිබෙනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. සුරාබදු ආඥා පනත යටතේ නිවේදන දෙකක් තිබෙනවා. මීළඟට, ගරු මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා.

[පූ.භා.11.16]

ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)
Hon. Speaker, I move Item Nos. 2 and 3 - two Notifications under the Excise Ordinance.

ඒ අනුව, සුරාබදු ආඥාපනතේ 32වන වගන්තිය ප්‍රකාරව රා බෝතල් ගත කිරීමේ වාර්ෂික බලපත්‍ර ගාස්තුව සංශෝධනය කිරීම සඳහා 2018 අප්‍රේල් මාසයේ 6වැනි දින අංක 2065/57 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 09/2018 දරන සුරාබදු නිවේදනය පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා මේ සමඟ ඉදිරිපත් කරනවා.

සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කිරීම සඳහා පැවැති පාර්ලිමේන්තු විවාදයට අනතුරුව, රා බෝතල් ගත කිරීමේ වාර්ෂික බලපත්‍ර ගාස්තුව අඩු කිරීමට අප අමාත්‍යාංශය එකඟ වුණා. බලපත්‍ර ක්‍රමවේදයක අවශ්‍යතාවට එකඟ වීමත් සමඟ අදාළ ඒකක ධෛර්යවත් වීම වාගේම රා බෝතල් ගත කිරීමේ බලපත්‍ර ගාස්තු අඩු කිරීම මත බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියාවලිය හරහා රා බෝතල් ගත කිරීමේ කර්මාන්තය නියාමනය කිරීම සඳහාත් පහසුකම් සැලසෙනවා.

ගරු කථානායකතුමනි, අපි රජයක් හැටියට මේ රටේ දේශීය ආදායම් විධිමත් කරන්නට, වැඩි කරන්නට පසු ගිය කාලය තුළ විවිධ ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. ආසියාවේ රටවලින් අපේ රට, වක්‍ර බදු සහ ඍජු බදු අතර අනුපාතය විශාල වශයෙන් තිබෙන රටක්. ඒ නිසා හැකිතාක් දුරට වක්‍ර බදු බර සාමාන්‍ය ජනතාවගෙන් අවම කිරීම අපේ ප්‍රධාන ඉලක්කය වෙලා තිබෙනවා. මම මීට පෙරත් මේ සභාවේදී කියලා තිබෙන ආකාරයට, අපේ සම්පූර්ණ ආදායමින් සියයට 82ක්ම ලැබෙන්නේ වක්‍ර බදුවලින්. එහෙම නැත්නම් සාමාන්‍ය ජනතාව ගෙවන බදුවලින්. අද කොළඹ සුවිසල් මන්දිරයක ඉන්න ඉතාම පොහොසත් මනුස්සයාත්, ඒ වාගේම, තවත් ප්‍රදේශයක කම්කරු රස්සාවක් කරන ඉතාම අසරණ දුප්පත් මනුස්සයාත් කඩයකට ගිහින් VAT එක හරහා සහ අනෙකුත් බදු හරහා ඒ ගෙවන මුදල්වලින් තමයි අපේ ආදායමින් සියයට 82ක්ම ලැබෙන්නේ. අපි ඍජු ආදායම් බදු හැටියට ලබා ගන්නේ සියයට 18ක් විතරයි. මේක ඉතාම අවාසනාවන්ත පිළිගත නොහැකි තත්ත්වයක්. ඒ නිසා තමයි ක්‍රමක්‍රමයෙන් වක්‍රබද්ද අඩු කිරීම සඳහා, ක්‍රමක්‍රමයෙන් VAT එක අඩු කිරීම සඳහා අපි ලබා ගන්නා වූ ඍජු බදු ප්‍රමාණය වැඩි කර ගන්න ඕනෑ වන්නේ; පුළුල් කර ගන්න ඕනෑ වන්නේ. ඍජු බදු වැඩි කර ගන්නත් ඕනෑ හැම දාම බදු ගෙවන මිනිසුන්ට තලන්නේ නැතිවයි. බදු ගෙවිය යුතු පුද්ගලයන්ට ඉතාම සාධාරණ නිවැරදි ක්‍රමයක් අපි පසුගිය වසරේ මේ පාර්ලිමේන්තුවේදීම සම්මත කළා. එම නීතිය අප්‍රේල් මාසයේ 01 වන දා ඉඳලා ක්‍රියාත්මක වෙලා තිබෙනවා. මේ රට නිදහසින් පසුව මේ දක්වාම -අද මිලියන 21ක් විතර ජනගහනයක් ඉන්න රටේ- මුළු ඍජු බදු ගොනු සංඛ්‍යාව -tax files- තිබුණේ ලක්ෂ 4ක් විතර. නමුත්, අපි පසුගිය අප්‍රේල් මාසයේ පළමුවෙනි දා නව දේශීය ආදායම් පනත ඉදිරිපත් කිරීමත් සමඟ බදු ගෙවිය යුතු ජනතාව විශාල වශයෙන් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙලා ඔවුන් ගෙවන්න තිබෙන සුළු බද්ද හෝ ගෙවන්න අවශ්‍ය ලිපි ගොනු ආරම්භ කරලා තිබෙනවා.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අප්‍රේල් පළමුවැනි දා සිට පසුගිය බදාදා වනතුරු මාස දෙකහමාරක කාලයක් තුළදී නව බදු ලිපි ගොනු 69,000ක් විවෘත කරලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මාස දෙකහමාරක් තුළ මේ ලබා ගත් ප්‍රගතිය අපි ඉදිරියට ගෙනිච්චොත්, ඒ momentum එක තියා ගත්තොත් අපට 2020 වර්ෂය වන විට පළමුවැනි පියවර හැටියට VAT එක සියයට 2.5කින්වත් අඩු කරන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා. දැන් VAT එක තිබෙන්නේ සියයට 15යි. මම පිළිගන්නවා ඒක වැඩියි කියලා. නමුත්, අපි බාර ගත් රටේ තිබුණු මහා ණයබර නිසා මේවා එකපාරට අඩු කරන්න බැහැ. ලංකා ඉතිහාසයේ මේ දක්වා වැඩිම ණය ගෙවන්නේ මේ අවුරුද්දේයි. බිලියන නොවෙයි, ට්‍රිලියන 1.9ක් මේ අවුරුද්දේ අපි ණය ගෙවනවා. ඒ ණයවලින් සියයට 83ක්ම තිබෙන්නේ 2015ට කලින් ලබා ගත්ත ණය බව අපි මෙතැනදී කියන්න ඕනෑ. ඒ වාගේම, එන අවුරුදු දෙකේදී -2019/2020- තමයි මේ රටේ ණය ගෙවීමට අමාරුම කාලය එන්නේ. ඒ කාලය වන විට මෙම මුදල mature වෙනවා; ණය mature වෙනවා. ඒ තුළින් ණය මුදල bunch වෙනවා. 2014දී, 2013දී, 2012දී ගත්ත ණයවල maturity එක, එක සැරේට එනවා. ඒ නිසා රුපියල් ට්‍රිලියන 4කට වැඩි ප්‍රමාණයක් 2019දී සහ 2020දී අපට ගෙවන්න වෙනවා. එසේ තිබියදීත් අද අපි ණය කළමනාකරණය කරලා, ඒ ණයට කරගහලා, "මේක රාජපක්ෂ රජයේ ණය, මේක අපේ ණයක් නොවෙයි" කියලා මඟ හරින්නේ නැතිව, මේ රටේ ජනතාව වෙනුවෙන් ඒ ණයත් ගෙවාගෙන ජනතාවට සහන ලබාදීමේ කටයුත්තත් දිගින් දිගටම කරගෙන ආවා. මේ තරම් ණය තියෙද්දීත් අපි 2015 පළමුවැනි දින 100දීම රජයේ සේවකයන්ගේ වැටුප වසර 10කට විතර පස්සේ විශාල වශයෙන් වැඩි කළ බව තමුන්නාන්සේලාට මතකයි. එදා අපි අත්‍යවශ්‍ය ආහාරවල මිල අඩු කළා. ගරු කථානායකතුමනි, අද වන විට -අවුරුදු 3ක් ගිහිල්ලාත්- පෙට්‍රල්, ඩීසල්, ගෑස් මිල අපි වැඩි කළත්, තවම එදා තිබුණු මිලට වඩා අඩුයි. ඒ වාගේම, අවුරුදු 3ක් ගිහිල්ලාත් අත්‍යවශ්‍ය ආහාර භාණ්ඩවල මිලේ තිබෙන්නේ සුළු වෙනසයි.

[ගරු මංගල සමරවීර මහතා]

මම සොයා බැලුවා. 2014 දෙසැම්බර් මාසයේ පරිප්පු මිලට වඩා අද පරිප්පු මිල අඩුයි. සමහර දේවල මිල වැඩි වුණත් වැඩි වෙලා තිබෙන්නේ, රුපියල් 5කින් හෝ 6කින්. අපි පිළිගන්නවා ඇත්ත වශයෙන්ම ප්‍රශ්නයක් හැටියට තිබෙන්නේ, පාලනය කර ගන්නට බැරි වුණේ පොල් මිල තමයි. නමුත්, මේ සියලු ප්‍රශ්නත් එක්ක අපි විවිධ පැතිවලින් වෙනත් සහන ලබා දීලා තිබෙනවා. ඒකයි මම සන්තෝෂ වෙන්නේ.

අපේ ගරු හර්ෂ ද සිල්වා මැතිතුමාගේ අදහසක් අනුව ලංකාවට හදුන්වා දුන් ඒ ambulance සේවය අද නීතිගත වෙනවා. ඒ තුළින් මේ රටට විශාල සේවාවක් වුණා. ඒ විතරක් නොවෙයි, පසුගිය කාලයේ මොකක්ද මේ ආණ්ඩුව කළේ කියලා අහන අයට මම කියන්නට කැමැතියි, කවදාවත් කිසිම රජයක් නොදීපු සහන අපි විශේෂයෙන්ම සෞඛ්‍ය සේවය තුළින් ලබා දීලා තිබෙන බව. උදාහරණයක් හැටියට කිව්වොත්, 2015න් පසුව හෘදය රෝගීන්ගේ ශල්‍ය කර්ම සඳහා "ස්ටෙන්ට්" සම්පූර්ණයෙන්ම නොමිලයේයි දෙන්නේ; ශතයක්වත් අය කරන්නේ නැහැ. මම හිතන්නේ ඒ කාලයේ ලක්ෂ ගණනක් වැය කරන්න සිද්ධ වුණා මේ "ස්ටෙන්ට්" ලබා ගන්නට. ඒ වාගේම අද වෙළෙඳ පොළේ තිබෙන හොඳම අක්ෂි කාච පවා නොමිලේ ලබා දෙනවා. මේවා ජනතාව නොදන්නවා නොවෙයි. නමුත් බොහෝ දෙනා මේවා ගැන කථා කරන්නේ නැහැ. ඊට අමතරව තවත් අක්ෂි කාච වර්ග 38ක මිල නියාමනය කරලා තිබෙනවා. රුපියල් 30,000කට අළෙවි වුණු අක්ෂි කාචයක උපරිම මිල අද රුපියල් 8,000යි. අද ඒ සඳහා රුපියල් 8,000කට වඩා අය කරන්න බැහැ. එදා රුපියල් ලක්ෂ 15ක් දක්වා පිළිකා රෝගීන්ගේ ප්‍රතිකාර සීමා කරලා තිබුණා. ලක්ෂ 15ක ප්‍රතිකාර ලැබුණාට පසුවත් පිළිකා රෝගියා සුව වෙලා නැත්නම්, සුව වන්නට තවත් කල් යනවා නම්, තවත් දීර්ඝ වශයෙන් ප්‍රතිකාර කිරීම අවශ්‍ය නම්, ඒ සඳහා එදා ඒ අහිංසක මිනිසුන්ට සල්ලි හිඟා කන්න සිද්ධ වුණා, බැංකුවට ණය වෙන්න සිද්ධ වුණා එහෙම නැත්නම් පොලී මුදලාලිගෙන් ණය ගන්න සිද්ධ වුණා. නමුත් අද සියලු පිළිකා රෝගීන්ට ජීවිතාන්තය දක්වා cancer treatment ලබා දෙන්න අපි පියවර අරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා ඉදිරිපත් කළ "1990 සුවසැරිය ව්‍යාපෘතිය" පිළිබඳව අදහසක් ඉදිරිපත් කරන්නට කැමැතියි. මේ ව්‍යාපෘතිය දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයෙන් ආරම්භ වුණු අතර, දැනට ඒ පළාතේ මේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වෙනවා. ඒ සම්බන්ධයෙන් ගරු රාජ්‍ය ඇමතිතුමාට මම ස්තුතිවන්ත වනවා. ඒක හොඳ ව්‍යාපෘතියක්.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කිව්ව ආකාරයටම රෝගියෙක් රෝහලට ගෙන යන පූර්ව අවශ්‍යතාවක් සම්පූර්ණ කරන සෞඛ්‍ය සේවයක් හැටියට එය සලකන්න පුළුවන්. අපේ රටේ එවැනි අත් දැකීම් අඩුයි; අපේ රටේ එවැනි අත් දැකීම් නැහැ වාගේයි. එවැනි ව්‍යාපෘතියක් ඇත්තටම හොඳ එකක්. මම නියෝජනය කරන මාතර දිස්ත්‍රික්කයේ දෙනියාය වැනි ඈත කඳුකර ප්‍රදේශවලත්, වෙනත් දුෂ්කර ප්‍රදේශවලත් මේ සේවාව ක්‍රියාත්මක වනවා. ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ ඒ ගිලන් රථය නවතා තිබීම නිසා ජනතාවට ඒ කෙරෙහි යම් විශ්වාසයක් ඇති වෙලා තිබෙනවා.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

ඒ පහසුකම ජනතාවට ලැබීම ඉතාම හොඳ දෙයක්. ඒක අගය කරන්න ඕනෑ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියපු ආකාරයටම ඒක අතිවිශිෂ්ට සේවයක්. හැබැයි, ඒ අතිවිශිෂ්ට සේවය පිළිබඳව ඔබතුමාගේ අවධානයට යොමු කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඔබතුමා කිව්වා වාගේම ඒ සේවය සපයන කාර්ය මණ්ඩලය කැප කිරීමක් කරනවා. ඒ වාගේම, ඔවුන්ට ගැටලුත් තිබෙනවා. ඔබතුමා ඒ ගැන හොයලා බලනවා නම් හොඳයි. ඔවුන්ගේ වැටුප් පිළිබඳ ප්‍රශ්න තිබෙනවා; දීමනා පිළිබඳ ප්‍රශ්න තිබෙනවා. ඒ වාගේම, අනෙකුත් අයට තිබෙන වෘත්තිමය අයිතිවාසිකම් ඔවුන්ටත් ලබා දෙනවා නම්, දැනට තිබෙනවාට වඩා යම් ප්‍රමාණයකින් හෝ ඒවා වැඩි කරන්න පුළුවන් නම් හොඳයි. ඒ සම්බන්ධයෙන් ඔවුන්ගේ යම් ප්‍රමාණයක දුක්ගැනවිල්ලකුත් තිබෙනවාය කියලා මා දන්නවා. ඒ නිසා ඒ අය කැඳවලා, ඒ අයගේ නියෝජිතයන් කැඳවලා ඔවුන්ගෙන් විමසීමක් කරන්න ඔබතුමාට පුළුවන් නම්, මේ සේවය සපයද්දී ඔවුන් මුහුණ දෙන ප්‍රායෝගික දුෂ්කරතා මොනවාද කියලා සොයා බලන්න පුළුවන් නම්, මේ සේවය මීට වඩා තවත් පුළුල් කරන්න පුළුවන්කම තිබෙනවාය කියා මා හිතනවා. ඔබතුමා කියපු ආකාරයට ලංකාව පුරාම මේ ගිලන් රථ සේවය ව්‍යාප්ත කිරීම ඉතාම හොඳ දෙයක්. දකුණු පළාතේ මා නියෝජනය කරන දිස්ත්‍රික්කයේත් මේ සේවය ක්‍රියාත්මක වෙනවා. එහි තිබෙන වැදගත්කම තමයි රෝගීන්ට, හදිසි අනතුරුවලට ලක් වන අයට, හදිසි රෝගාබාධවලට ලක් වන අයට, පපුවේ අමාරුවක් හැදුණු කෙනෙකුට ඉක්මනින් රෝහලකට යන්න පුළුවන් වීම. ඒ අයට විශ්වාසයක් තිබෙනවා, මෙවැනි වාහනයක් ළඟ පාතක තිබෙනවාය කියලා. ඒක තමයි වැදගත් වෙන්නේ. ඇත ගම් පළාත් ගත්තොත්, කොළඹ නගරයටත් වඩා ඒ පළාත්වල වාහන අඩුයි. රාත්‍රියට හදිසියකට වාහනයක් හොයා ගන්න බැහැ. උදව්වක් ඉල්ලා ගන්න හිතවතෙකුට වුණත් කථා කරන්න අමාරු අවස්ථා තිබෙනවා. එවැනි වෙලාවට කොහොම හරි පොලීසියට කෝල් එකක් දුන්නොත්, නැත්නම් මේ නොම්මරයට කථා කළොත්, පොලීසියේ මේ වාහනය තිබෙනවාය කියන විශ්වාසය වුණත් ගමක ඕනිසුන්ට වැදගත්. දකුණු පළාත තුළ ඉන්න කෙනෙකු විධියට මට ඒ අත්දැකීම පෞද්ගලිකව තිබෙනවා. ඒ නිසා මෙය වැදගත් සේවයක්. ඒ නිසා ඒ පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ සේවය ලංකාව පුරාම ක්‍රියාත්මක වීම ඉතාම හොඳයි. කාර්ය මණ්ඩලය හැටියට මේ සේවය සඳහා තව පිරිසක් එකතු වෙනවා නම් හොඳයි. ඒ වාගේම ඒ සේවකයන්ගේ ප්‍රශ්නවලට යම් විසඳුමක් ලබා දෙන ක්‍රමවේදයකට යන එකත් වඩා හොඳයි කියා මා හිතනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට විනාඩියක කාලයක් දෙන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ යෝජනාව අපි ක්‍රියාත්මක කරන්නම්. නොයෙකුත් ගැටලු එක්ක තමයි අපි මේ කටයුත්ත පටන් ගත්තේ. ඔබතුමා ඒක දන්නවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)
මම දන්නවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)

ඇත්ත වශයෙන්ම මූලික ප්‍රශ්නය තමයි ඒ පොලිස් ස්ථානවල ඔවුන්ට කාර්යාල පහසුකම් නොමැති වීම. කාර්යාල පහසුකම් ලබා දීම සම්බන්ධයෙන් මම ජනාධිපතිතුමා සමඟත් කථා කළා. මේ අවුරුද්ද අවසන් වෙන්න කලින් අපි පොලිස් ස්ථාන තුන්සිය ගණනක මේ සුවසැරිය ගිලන් රථ නවත්වනවා. රජයේ මුදල් වෙන් කරලා, ඔවුන්ට අවශ්‍ය කාර්යාල පහසුකම්, toilet පහසුකම් ආදිය ලබා දෙන්න අපි උත්සාහ කරනවා. මම තව දෙයක් කියන්න ඕනෑ. බොහෝ පොලීසිවලින් දැනට අපට ඒ උදව් ලබා දෙනවා. ඒ සේවකයන්ට පොලීසියේ විවේකාගාරවල ඉන්න, ඔවුන්ගේ නවාතැන්වල නවතින්න පවා අවස්ථාව ලබා දීලා තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)

ගරු ඇමතිතුමනි, නමුත් ඒ සේවකයන් පොලීසියේත් නොවෙයි, සෞඛ්‍ය සේවයේත් නොවෙයි. ඔවුන් අතරමැද තැනකයි ඉන්නේ. ඒ නිසා තමයි ඔවුන්ට වෘත්තීයමය සුරක්ෂිතභාවය පිළිබඳව යම් කිසි වැඩ පිළිවෙළක අවශ්‍යතාව තිබෙන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)

ඒක වැදගත්. ඒක තමයි අපි අද මේ කළේ. 1990 සුවසැරිය පදනම පනත් කෙටුම්පත හරහා අපි ඒ සේවය කවදාවත් නැති නොවන තත්ත්වයකට ගෙන යන්නයි හදන්නේ. රජය මාරු වුණත් මේ සේවය ඉදිරියට යන්න පුළුවන් විධියට.

මට එක දෙයක් කියන්න අමතක වුණා. මට විනාඩියක කාලයක දෙන්න. මේ සේවයේ පාලක මණ්ඩලය පත් කරන්නේ, ගරු ජනාධිපතිවරයා. ඒ මණ්ඩලයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්වරයා, මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා, IGP සහ තවත් හතර දෙනෙක් ඉන්නවා. එතකොට, මොන ජනාධිපතිවරයා බලයේ හිටියත්, මොන ආණ්ඩුව බලයේ හිටියත් මේ වැඩ පිළිවෙළ නොකඩවාම ඉස්සරහට ගෙන යන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු සුනිල් හන්දුන්නෙත්ති)
(The Hon. Sunil Handunnetti)

විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙනුත් "1990 සුවසැරිය පදනම" ජනාධිපතිවරයා යටතේ තියා ගන්න පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. [බාධා කිරීමක්] හොඳයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ආර්ථිකය පිළිබඳව තමයි අද අනෙකුත් ගැසට් නිවේදන ඉදිරිපත් කර තිබෙන්නේ. මම මුලින්ම කිව්වා, මේ සුරාබදු ආඥා පනත 1912 ආඥා පනතක් කියලා. හැබැයි, දැන් සුරාබදු ආඥා පනත පාවිච්චි කෙරෙන්නේ, 1912 වසරට ගැළපෙන්නවත්, වර්තමානයට ගළපා ගන්නවත් නොවෙයි, ආණ්ඩුවට ආදායමක් ඕනෑ වුණාම බද්දක් අයකර ගන්නයි. රා මදින මනුස්සයාගෙනුත් ලියාපදිංචි වීමේ බද්ද වශයෙන් රුපියල් ලක්ෂ පහක් අයකර ගන්නවාය කියන්නේ ගැටලුවක්. මේකට රා බෝතල් කිරීමේ ව්‍යාපෘතිය කියලා කිව්වාට, නීත්‍යානුකූලව, අරක්කු මට්ටමෙන් රා බෝතල් කෙරෙන්නේ නැහැ. අරක්කු, එහෙම නැත්නම් විස්කි, බ්‍රැන්ඩි මට්ටමෙන් රා බෝතල් කිරීමක් වෙන්නේ නැහැ. එහෙම කරන මහා පරිමාණ රා රේන්දකරුවන් කිහිප දෙනෙක් ඉන්න පුළුවන්. නමුත්, අපේ රා කර්මාන්තය ග්‍රාමීය, දුප්පත් ජීවිත ගත කරන ජනතාවගේ රැකියාව එක්ක බැඳුණු එකක් බව අපි දන්නවා.

මා දන්නා තරමට රා කර්මාන්තය කළුතර දිස්ත්‍රික්කයේ යම් ප්‍රමාණයක තිබෙනවා; පුත්තලම දිස්ත්‍රික්කයේ තිබෙනවා; උතුරු

පළාතේ තිබෙනවා; නැහෙනහිර පළාතේ තිබෙනවා. ඒක සාමාන්‍ය ජනතාවගේ ජීවිතත් සමඟ බැඳුණු එකක්. ඒ කර්මාන්තය තව දුරටත් ඔබතුමන්ලාගේ බදු ලැයිස්තුවේ තියා ගන්නවාද, නැද්ද කියන එක ගැන හිතන්න ඕනෑ. බදු අයකර ගැනීමට ඕනෑ තරම් දේවල් තිබියදී, බිලියන, මිලියන ගණන්වලින් බදු අය කර ගන්නේ නැතිව බදු දැලෙන් හොරු පැනලා යද්දී අපි තවම රා මදින කෙනා පස්සේ යනවා.

අනෙක් එක තමයි ගස් මැදීමේ බලපත්‍රය. ඒ කියන්නේ පොල් රා, කිතුල් රා, තල් රා මදින අයගේ බලපත්‍රය. ගස් මදින අය කියන්නේ කවුද? ගස් 100ක්, 200ක් තිබෙන මහා පරිමාණ ව්‍යාපාරිකයාද? නැහැ. උතුරු පළාතේ තල් රා කර්මාන්තය කරන මිනිසුන් කියන්නේ කවුද? ඒ අය අතිංසක සාමාන්‍ය ජනතාව. 1912දී ගෙනාපු සුරාබදු ආඥා පනතේ රා සඳහන් වෙලා තිබෙනවා; ගස් මැදීම තිබෙනවා. ආණ්ඩුවට බදු මුදලක් අය කර ගන්න වුවමනා වුණාම ඒ ආඥා පනත තවමත් පාවිච්චි කරනවා. ආණ්ඩුව දැන් කරන්නේ රා මැදීම නොවෙයි, "බදු මැදීම." ආණ්ඩුව ගස් මැදීමෙන් කරන්නේ බදු මැදීම; බදු උරච්චි කරනවා; බදු උරගා බලනවා. මොනවා හරි කරලා මේකෙන් තව පොඩ්ඩක් ගන්න පුළුවන්ද කියලා බලනවා. ඒ මිනිසුන්ට මේ කර්මාන්තය අතහරින්න බැහැ නේ. රා බලපත්‍රයේ ගාස්තුව වැඩි කළා කියලා හෝ ගස් මැදීමේ බලපත්‍රයේ ගාස්තුව වැඩි කළා කියලා ඒ ජීවිතය ගත කරන මිනිසුන්ට -තල් රා, පොල් රා, කිතුල් රා පෙරන අයට- මේ රස්සාව අතහරින්න පුළුවන්ද? ඒ රස්සාව අතහැරලා ඒ අයගේ දරුවන්ට කන්න දෙන්න වෙන්නේ වහ! මොකද, අද තිබෙන ජීවන වියදමත් එක්ක ඒ අයට ජීවත් වෙන්න බැහැ. ඒ නිසා තමයි මම කියන්නේ එක්කෝ මේ සුරාබදු ආඥා පනත වෙනස් වෙන්න ඕනෑ, එහෙම නැත්නම් ආණ්ඩුවේ මේ ප්‍රතිපත්ති වෙනස් වෙන්න ඕනෑ කියලා. මේ අතිංසක මිනිසුන්ගෙන් බදු අය නොකර ඉන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට ලැබී තිබෙන වේලාව සීමිත නිසා අවසාන වශයෙන් එක කරුණක් කියන්න ඕනෑ. ආණ්ඩුව දැන් කියනවා බදු නිදහස තිබෙනවා; බදු සහන තිබෙනවා; අලුත් බදු ආදායම් ගොනු ඇරලා තිබෙනවා; අපි ගොඩක් වැඩ කරලා තිබෙනවා කියලා. ඒ ආණ්ඩුව හිතන විධිය. නමුත් බිම් මට්ටමට බැහැලා බලන්න ඕනෑ ඇත්තටම ජනතාව කන බොන විධිය කොහොමද කියලා. අපේ මුදල් ඇමතිතුමා දැන් පොල් මිල ගැන කිව්වා. 2017.12.06වැනි දින සිට පොල්වලට රුපියල් 75ක උපරිම මිලක් පැනෙව්වා මට මතකයි. මම ඊයේ නාරාහේන්පිට ආර්ථික මධ්‍යස්ථානයට ගිහින් බැලුවා. ආර්ථික මධ්‍යස්ථානය කියන්නේ සාමාන්‍යයෙන් ටිකක් අඩුවට භාණ්ඩ මිල තිබෙන තැනක් නේ. එතැනත් පොල් ගෙඩියක අවම මිල රුපියල් 75යි. ඒ පොල් ගෙඩිය හිරමනයට දමන්න පුළුවන් එකක් නොවෙයි. හිරමනය අයිනෙන් තියාගෙන උරච්චි කරන්න පුළුවන් එකක්. එතැන පොල් ගෙඩියක් රුපියල් 100යි. රුපියල් 75ට පොල් නැහැ. මේ තමයි ඇත්ත තත්ත්වය. අද එළවලු මිල ගණන් බලන්නකෝ. අද එළවලු ග්‍රෑම් 250ක් රුපියල් 60යි, 70යි, 80යි. වම්බටු ග්‍රෑම් 250කුත් ඒ ගණන. මේකට හේතුව වැස්ස කියලා කියන්න පුළුවන්. ඒ විධියට එක එක හේතු කියන්න පුළුවන්. නමුත් අද ජනතාවට කන්න බැහැ. සාමාන්‍ය ජනතාවගේ ජීවන තත්ත්වය ගත්තොත්, මේ ආණ්ඩුව ඉදිරිපත් කරන තර්කවලින් ජීවත්වෙන්න පුළුවන්ද කියලා මම දන්නේ නැහැ. ඒක තමයි ඇත්ත යථාර්ථය. 2017 වර්ෂයේ මුල් කාලයේ සීනි, හාල්මැස්සන්, පරිප්පු, අර්තාපල්වලට උපරිම මිලක් නියම කළා. නමුත් ඇත්ත යථාර්ථය ගත්තොත් අද එළවලු මිල, සහල් මිල කීයද? අද හාල් කිලෝවක මිල රුපියල් සියයට එහා. පොල් ගෙඩියක් රුපියල් 100ට එහා. එළවලු ග්‍රෑම් 250 රුපියල් 60යි, 70යි. මේක තමයි ඇත්ත යථාර්ථය. දරුවෙක් දෙදෙනෙක් ඉන්න, සාමාන්‍ය ස්ථාවර මාසික වැටුපක් ලබන රජයේ සේවකයාට, පෞද්ගලික අංශයේ සේවකයාට, ගොවි ජනතාවට, සාමාන්‍ය මිනිසුන්ට මේ තත්ත්වය යටතේ ජීවත් වෙන්න පුළුවන්ද බැරිද කියන එක තමයි දැන් ආණ්ඩුව හිතන්න ඕනෑ. ආණ්ඩුවට පාර්ලිමේන්තුව රැස්වෙලා බද්දක් පනවා ගන්න එක ලේසියි. ආණ්ඩුවේ සිටින මන්ත්‍රීවරු ගණන වැඩි නිසා, ඔළු ගෙඩි ගණන වැඩි නිසා ඒ යෝජනාව අනුමත කරයි. නමුත් යථාර්ථය ගත්තොත් අද ජීවන බර, ජීවන වියදම උහුලන්නම බැහැ. ඒක 2017 මහ බැංකු වාර්තාවේත් ඒ විධියටම කියලා තිබෙනවා. ගිය අවුරුද්ද පුරා මිල ගණන් ඉහළ ගියේ කොහොමද, පාරිභෝගික මිල දර්ශකය වැඩි වුණේ කොහොමද, ජීවන වියදම වැඩි වුණේ කොහොමද කියලා ඒ සංඛ්‍යාලේඛනවලින්ම, ඒ ඉලක්කම්වලින්ම මහ බැංකු වාර්තාවේ කියලා තිබෙනවා. ජීවන බර වැඩි වෙලා තිබෙන මේ ආර්ථිකය ඇතුළේම අද ඩොලර් එකක වටිනාකම ඓතිහාසික වශයෙන් රුපියල් 161යි.

අද ඩොලරයේ වටිනාකම රුපියල් 161යි. ඩොලරයේ අගය තිබුණේ රුපියල් කීයටද කියලා අපි කල්පනා කර බලමු. 1950දී ඩොලරයේ වටිනාකම රුපියල් 4.56යි. 1994දී ඩොලරයේ වටිනාකම රුපියල් 54යි. 2017 ජනවාරි 01වන දා වනකොට ඩොලරයේ වටිනාකම රුපියල් 149යි. 2018 ඊයේ-පෙරේදා වනකොට ඩොලරයේ වටිනාකම රුපියල් 162යි. මහ බැංකු වාර්තාවේ මේ ගැන කියන්නේ කොහොමද? 2017 වර්ෂය ගැන මහ බැංකු වාර්තාවේ 221 පිටුවේ කියනවා, "ප්‍රධාන විදේශ ව්‍යවහාර මුදල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය අවප්‍රමාණය වීම හේතුවෙන් 2017 වසර අවසාන වනවිට සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 225.2කින් වැඩි විය." කියලා. ණය අරගත්ත නිසා නොවෙයි; ණය පොලී ගෙවපු නිසාත් නොවෙයි; රුපියල අවප්‍රමාණය වීම නිසා විතරක් සමස්ත ණය ප්‍රමාණය වැඩි වෙලා.

දැන් අපේ මුදල් ඇමතිතුමා කිව්වා, "අපි ණය පොලී ගෙව්වා. ණය වාරික ගෙව්වා" කියලා. මම හිතන විධියට රුපියල අවප්‍රමාණය වීම නිසා ලංකාවේ සමස්ත ණය ප්‍රමාණය වැඩිම වුණු අවුරුද්ද තමයි, 2018. සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 225කින් වැඩි වුණා. ඒ කියන්නේ, විදේශ ණය ගෙවීමේ දී රුපියල අවප්‍රමාණය වීමේ බාධාව; ගෙවපු ප්‍රමාණය. රුපියල අවප්‍රමාණය වුණත් ඩොලර් ගෙවන්නේ ඩොලර්වලින්මයි, ඩොලර්වලට බාධාවක් නැහැ කියලා ඔබතුමන්ලා තර්ක කරයි. මහ බැංකු වාර්තාවේත් ඒක තිබෙනවා. නමුත්, අපේ රටේ ජනතාව ඩොලරය රුපියල්වලින් උපයන්න ඕනෑ. ඒ නිසා රුපියල්වල බලපෑම, රුපියල අවප්‍රමාණය වීම නිසා සමස්ත ණය ප්‍රමාණයට වන බලපෑම මහ බැංකුව කියනවා, විදේශ ණයවලට විතරක් රුපියල් බිලියන 211ක් කියලා. රුපියල අවප්‍රමාණය වීම හේතුවෙන් විදේශ ණය ප්‍රමාණය රුපියල් බිලියන 211යි. සමස්ත ණය ප්‍රමාණය රුපියල් බිලියන 225යි. මේක තමයි ඇත්ත; යථාර්ථය.

ඊළඟට, ඩොලරයට ගෙවිය යුතු මිල වැඩි වීම විසින් ආනයනය කරන භාණ්ඩවලට ගෙවිය යුතු රුපියල් ප්‍රමාණය වැඩි වෙනවා. ඩොලර්වලින් භාණ්ඩ ආනයනය කරනකොට වෙළෙඳ පොළේ හුවමාරු වන රුපියලේ වටිනාකම වෙනස් වුණාට පස්සේ අපේ සාමාන්‍ය ජනතාවට විදේශවලින් ආනයනය කරන භාණ්ඩ මිලදී ගන්න විශාල රුපියල් ප්‍රමාණයක් ගෙවන්න වනවා. මොකද, අපි කැමැති වුණත්, අකැමැති වුණත් අපේ රට ඒ අධි පාරිභෝජනයේ, ඒ දුෂ්ට පරිභෝජන සංස්කෘතියේ ගොදුරු බවට පත් වෙලා නේ තිබෙන්නේ. දැන් මම සරල උදාහරණයක් කියන්නම්. පිට රටින් ගෙන්වන දත් බෙහෙතකට හුරු වුණු කෙනෙකුට "දැන් ඩොලරය අවප්‍රමාණය වෙලා තිබෙන්නේ. දන්තමුක්තවලින් දත් මැදපන්" කියලා අපි කිව්වොත්, දන්තමුක්තවලින් මදිවිද? දැහැටියකින් මදින්න කිව්වොත්, මදිවිද? නැහැ නේ. මම මේ සරලව කියන්නේ. ඒ කියන්නේ, කුරුඳු කෝටුවෙන් දැන් දත් මදින්න බැහැ.

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

දන්තමුක්තවලින් දත් මදින්න බැහැ. අපි දැන් ඒ පාරිභෝජන සංස්කෘතියේ ගොදුරු වෙලා ඉවරයි. මම ඒකෙන් කියන්නේ නැහැ, දැන් තිබෙන දත් බෙහෙත්වලට වඩා දන්තමුක්ත හොඳයි කියලා. මම ඒක නොවෙයි කියන්නේ. රුපියල අවප්‍රමාණය වීම නිසා ආනයනික භාණ්ඩවල මිල වැඩි වනකොට රටේ මිනිස්සු තව බංකොලොත් වනවා. එතකොට වෙන්නේ මොකක්ද? එළවලු ග්‍රෑම් 250ක් ගන්න රුපියල් 60ක් වියදම් කරනකොට, රුපියල අවප්‍රමාණය වීම නිසා තව මුදලක් හොයන්න ඕනෑ. ඉතින් ඔබතුමන්ලා කියනවා, අපරාධ වැඩි වෙලා; මංකොල්ල කෑම් වැඩි වෙලා කියලා. මිනිස්සු වෙන මොනවා කරන්නද? මංකොල්ල කන්නම වෙනවා තමයි. අපරාධ වැඩි වෙනවා තමයි. මොනවා කරන්නද? මිනිස්සු ජීවත් වෙන්න එපායෑ. පාර්ලිමේන්තුව රැස් වුණා කියලා මිනිසුන්ගේ බඩ පිරෙන්නේ නැහැ නේ. මිනිස්සුන්ට ජීවත් වෙන්න ක්‍රමයක්ම නැත්නම් මංකොල්ල කන එක තමයි කරන්න වෙන්නේ. ඒ තත්ත්වයට මේ ආර්ථිකය පත් වෙලා තිබෙන එක ගැන කනගාටු වෙමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

බොහොම ස්තුතියි. The Sitting is suspended for lunch till 1.30 p.m.

රැස්වීම රීට අනුකූලව නාවකාලිකව අත් නිටුවන ලදින්, අ.භා. 1.30ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, பி.ப. 1.30 மணிக்கு மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 1.30 p.m. and then resumed.

[අ.භා. 1.30]

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා (වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பாலித ரங்கே பண்டார - நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ இராஜாங்க அமைச்சர்)
(The Hon. Palitha Range Bandara - State Minister of Irrigation and Water Resources and Disaster Management)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, වැදගත් වූ පනත් කෙටුම්පතක්, නිවේදන කිහිපයක් හා නියෝග පිළිබඳව සාකච්ඡා කරන මේ මොහොතේ, මෙම විවාදයට සම්බන්ධවීමට ලැබීම පිළිබඳව මම අතිශයින්ම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම සුවසැරිය වැඩසටහන මේ රට තුළ කවදාවත් ක්‍රියාත්මක වෙයි කියා කවුරුවත් හිතුවේ නැහැ. සුවසැරිය වැඩසටහන තුළින් අද මේ රටේ ජනතාවට මහත් වූ සේවාවක් සිද්ධ වෙලා තිබෙනවා. තමන්ගේ ජීවිතය අනතුරකට ලක් වුණු අවස්ථාවක ලබාදෙන එක දුරකථන පණිවුඩයක් තුළින් තමන්ට අවශ්‍ය වෛද්‍ය පහසුකම් සපයා ගැනීමට, ගිලන් රථ සේවාවේ පහසුකම සපයා ගැනීමට මෙම වැඩසටහන තුළින් ජනතාවට අවස්ථාව උදා වෙලා තිබෙනවා. යහ පාලන රජය තුළ මොනවාද කළේ කියා සමහර උදවිය ප්‍රශ්න කරනවා. මේවාත් යහ පාලනය තුළ කළ දේවල්. ජනතාව යහපත් විධියට ජීවත් කරවීම සඳහා, ඔවුන්ගේ ජීවිත ආරක්ෂා කර දීම සඳහා ගන්නා ලද මහඟු ක්‍රියාදාමයක් තමයි සුවසැරිය වැඩසටහන කියන්නේ. මෙම සුවසැරිය වැඩසටහන තුළ කිසිවකුට ගිලන් රථයට මුදල් ගෙවීමට, වෙනත් ගාස්තු ගෙවීමට සිදු වන්නේ නැහැ. මෙම වැඩසටහන හඳුන්වා දුන් මුල් අවස්ථාවේදී, වෛද්‍ය නිලධාරී මහත්වරුන් පවා එය විවේචනය කළා; දෝෂාරෝපණයට ලක් කළා. "මේ සුවසැරිය ගිලන් රථයෙන් රැගෙන එන රෝගියාට ප්‍රතිකාර කරන්නේ නැහැ" කියන අන්දමේ ප්‍රකාශත් සිදු කළා. හැබැයි, අද ජනතාව ජීවත් කරවීමේ මහඟු ව්‍යාපාරයක් බවට මෙය පරිවර්තනය වෙලා තිබෙනවා. මේ සේවාව රට පුරා ව්‍යාප්ත කිරීම අපේ ආණ්ඩුවේ පරමාර්ථය වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සුරාබදු ආඥාපනතේ යම් යම් කරුණුත් අද මෙතැනදී සාකච්ඡාවට භාජන කරනවා. විශේෂයෙන්ම සුරාබදු ආඥාපනතට වඩා මහත් භයානකම වරදවල් පැටවෙන එකක් තමයි මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් තිබෙන ආඥාපනත. සුරාව, එහෙම නැත්නම් මත් වතුර භාවිතය වැඩි වෙලා තිබෙනවා, රට තුළ ඒවා මිලදී ගන්නා ප්‍රමාණයත් වෙනදාට වඩා වැඩි වෙලා තිබෙනවාය කියා මීට කලින් කථා කළ කථික මහත්ම-මහත්මීන් කිව්වා. මේ පිළිබඳව සංඛ්‍යාත්මකව බලනකොට, රට පුරා තිබෙන මත්පැන්හල් ප්‍රමාණයත් වැඩි වෙලා ඇති. ඊටත් වඩා, රටේ ඉන්නා ජනගහනය වැඩි වෙලා තිබෙනවා. ඒ වාගේම සංචාරක ව්‍යාපාරය දියුණු වෙලා තිබෙනවා. මේ රටට එන සංචාරකයන් මත්පැන් පාවිච්චි කරනවා. ඒ වාගේම රටේ ජනතාවත් මත්පැන් පාවිච්චි කරනවා. හැබැයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ මත්පැන්වලට වඩා භයානකම අංශය තමයි මත් ද්‍රව්‍ය. මත්පැන් සහ මත් ද්‍රව්‍ය කියලා තමයි අපි ඒවා හඳුනාගෙන තිබෙන්නේ. යම් කෙනෙක් මත්පැන් පාවිච්චි කළත් ඔහුව පාලනය කර ගැනීමට, හික්මවා ගැනීමට පුළුවන්කමක් තිබෙනවා. හැබැයි, ඊටත් වඩා භයානකම අංශය තමයි කුඩා ඉඩකඩකදී පාවිච්චි කරන මත් ද්‍රව්‍ය. මේ මත් ද්‍රව්‍ය එක්ක තමයි සමස්ත සමාජයටම මහා අභාග්‍යසම්පන්න තත්ත්වයකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පවා මේ මත් කුඩු ජාවාරමේ යෙදී තිබෙනවා. අතීතයේ අපිට ඒ ගැන අහන්න ලැබුණා. ඒ උදවිය විවිධ රූපවාහිනී නාළිකා ආරම්භ කළා; ගුවන් විදුලි නාළිකා ආරම්භ කළා. මත් ද්‍රව්‍ය ජාවාරම තුළ ඉදිමින් ඔවුන් රටේ ජනතාව මිලදී ගත්තා; විවිධ අපරාධ සිදු කළා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. බොහොම ඇතක නොවෙයි, මෑතකදී එවැනි ඉතිහාසයක් ගැන අපට අහන්න, දකින්න ලැබුණා. ඔවුන් නීතියට උඩින් ගියේ; නීතිය තඹයකට මායිම් කළේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අරුමාදුර ලෝරන්ස් රොමෙලෝ දුමින්ද සිල්වා කියලා පාර්ලිමේන්තුව නියෝජනය කළ මන්ත්‍රීවරයෙක් සිටියා. ඔහු අද නම් ඉන්නේ වැලිකඩ හිරගෙදරයි. ඔහු මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ කාල පරිච්ඡේදය තුළ ඔහුට විරුද්ධව මත් කුඩු ජාවාරම් පිළිබඳව විවිධ චෝදනා තිබුණා; විවිධ කතන්දර තිබුණා. සමස්ත සමාජයම ඔහුව හැඳින්වූයේ ඔහුගේ නියම නමවලින් නොවෙයි. "කුඩු සිල්වා", "කුඩු දුමින්ද" ආදී නමවලින් ඔහුව හඳුන්වන තත්ත්වයට පත් වෙලා තිබුණා. ඒ අනුව මේ උත්තරීතර පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන් -සාමාජිකයන්- මත් ද්‍රව්‍ය ජාවාරම්වල, මත්පැන් ජාවාරම්වල යෙදීම නිසා පාර්ලිමේන්තුවේ තත්ත්වයත් දවසින් දවස හැල්ලුවට ලක් වුණා. එදා මත් ද්‍රව්‍ය ජාවාරමේ යෙදී මුදල් ඉපැයුවා කියන දුමින්ද සිල්වා ඇතුළු සාමාජිකයන් මේ රටට කළේත්, මේ සමාජයට කළේත්, මේ පාර්ලිමේන්තුවට කළේත් මහාම කාලකණ්ණි ක්‍රියාවලියක්ය කියන එක කනගාටුවෙන් වුණත් සිහිපත් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අරුමාදුර ලෝරන්ස් රොමෙලෝ දුමින්ද සිල්වා කියන තැනැත්තා ගම්පොළ විදානෙලාගේ සමන්ත කුමාර නොහොත් "වෙලේ සුදා" කියන කුඩු ජාවාරම්කරුගෙන් මසකට රුපියල් ලක්ෂ 25ක් මාසික වැටුපක්, එහෙම නැත්නම් දීමනාවක් ලබා ගත්තාය කියලා අපට ඒ

දවස්වල අහන්න ලැබුණා. එදා, ගුවන් විදුලියේ සහ සමහර රූපවාහිනී නාළිකාවල මේ ක්‍රියාව පිළිබඳව ප්‍රචාරය වුණා. එදා පොලිස් මාධ්‍ය ප්‍රකාශක විධියට කටයුතු කළේ අජිත් රෝහණ මහත්මයායි. මේ පිළිබඳව අධිකරණය ඉදිරියට වාර්තා කළ කාරණා සහ පොලීසියට වාර්තා වුණු කාරණා ගැන පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා විධියට එතුමා වගකීමක් ඇතුව මාධ්‍ය ඉදිරියට ඇවිත් සඳහන් කළා.

ඔහු කිව්වා, ගම්පොල විදානෙලාගේ සමන්ත කුමාර නොහොත් වෙලේ සුදා කියන තැනැත්තා අරුමාදුර ලෝරන්ස් රොමෙලෝ දුමින්ද සිල්වා කියන තැනැත්තාට මාසිකව රුපියල් ලක්ෂ 25 බැගින් ගෙවා තිබෙනවාය කියා. ගම්පොල විදානෙලාගේ සමන්ත කුමාර නොහොත් වෙලේ සුදා කියන තැනැත්තා නම් තුනකින් පෙනී සිට තිබෙනවා. මාපාගොඩ කංකානම්ලාගේ සමන්ත ප්‍රදීප් යන නමින්ද, විජේසිංහ ආරච්චිලාගේ සුනිමල් ප්‍රදීප් යන නමින්ද ඔහු පෙනී සිට තිබෙනවා. ඔහුගේ බිරිඳ ගයනි ප්‍රියදර්ශනීයි. "වෙලේ සුදා කියන අයට නම් තුනකින්ම ගිණුම් තිබුණා, ඔහුගේ භාර්යාව වන ගයනි ප්‍රියදර්ශනීටත් ගිණුම් තිබුණා, එදා මේ ගිණුම් හරහා අරුමාදුර ලෝරන්ස් රොමෙලෝ දුමින්ද සිල්වාට මුදල් හුවමාරු කර තිබෙනවා, ඒ පිළිබඳව විමර්ශනය කරගෙන යනවා" කියා එදා පොලිස් මාධ්‍ය ප්‍රකාශක අජිත් රෝහණ මහත්මයා රටට හෙළිදරව් කළා. මත් ද්‍රව්‍ය ජාවාරම තුළින් උපයා ගත් මුදල්, මුදල් විශුද්ධිකරණය යටතේ නැවත රජයට අත්පත් කර ගැනීමටත්, ඒ සඳහා ඔවුන්ට විරුද්ධව නඩු පැවරීමටත් පියවර ගන්නවාය කියන එකත් එදා අපට අහන්න ලැබුණා. මේ සම්බන්ධව කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේ බී. 21138/15 යටතේ අධිකරණයට කරුණු වාර්තා කර වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනවාය කියලා එදා අපට අහන්නට, දකින්නට ලැබුණා. එදා ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයකු වශයෙන් සිටි අජිත් රෝහණ මහතා අද නියෝජ්‍ය පොලිස්පතිවරයෙක්. පොලිස් මාධ්‍ය ප්‍රකාශක විධියට ඔහු මේ කරුණු හෙළිදරව් කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවාසනාවක මහිම බලන්න. මේ සියල්ල සිදු වුණේ 2015 වර්ෂයට පෙරයි. 2015 වර්ෂයට ප්‍රථම සිදු වූ මේ අපරාධ සම්බන්ධයෙන් විමර්ශනය වුණේ නැහැ. මේ අපරාධ සියල්ලම යටපත් වුණා. කුඩු ජාවාරමෙන් උපයාගත් මුදල්වලින් රූපවාහිනී නාළිකා පටන් ගත්තා; ගුවන් විදුලි නාළිකා පටන් ගත්තා. මේ ජාවාරමෙන් උපයාගත් මුදල්වලින් මොනවාද කළේ කියන එක පිළිබඳව අදටත් හෙළිදරව් වෙලා නැහැ. මේ අපරාධ පිළිබඳව ගත් ක්‍රියාමාර්ග මොනවාද, මෙපමණ කාලයක් -2007 සිට 2015 දක්වා කාල පරිච්ඡේදය තුළ- කුඩු ජාවාරමෙන් උපයාගත් මුදල්වලට මොකද කළේ, මෙයට සම්බන්ධ වුණේ කවුද, කුමන අන්දමින්ද මෙය සිද්ධ වුණේ, පාකිස්තානයේ සිට වෙලේ සුදා ගෙන්වූ කුඩුවලට මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ මන්ත්‍රීවරුන් සම්බන්ධ වුණේ කොහොමද, මේ පිළිබඳව සිදු කළ විමර්ශනයට මොකද වුණේ, එතැනින් එහාට විමර්ශන කටයුතු නොකරන්නේ ඇයි, මේ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ගය මොකක්ද කියන එක සම්බන්ධව පොලිස්පතිවරයාගෙන් මා විමසීමක් කර තිබෙනවා. පොලිස්පතිතුමා තවම පිළිතුරක් එවා නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කෙසේ වෙතත්, ඒ සම්බන්ධව මා ඔබතුමා වෙතත් කරුණු ඉදිරිපත් කරනවා. මෙය පාර්ලිමේන්තුවේ කථානායකතුමා හරහාත් පොලිස්පතිවරයා වෙත යොමු කරන්න. මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ පුද්ගලයන් මේ රටට මහා විනාශයක් කරන කුඩු ජාවාරමේ යෙදුණා නම්, මේවා පිළිබඳව සෘජුවම විමර්ශනය කළ යුතුයි. සියලුම මහජන නියෝජිතයන් වෙනුවෙන් පෙනී සිටින, මහජන නියෝජිතයන් ආරක්ෂා කිරීම සඳහා පෙනී සිටින චරිතය තමයි පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මන්ත්‍රීවරුන්, මහජන නියෝජිතයන් සියලුදෙනා පෙනී සිටින්නේ කුඩුකාරයන් වෙනුවෙන් නොවෙයි; මහ ජනයා වෙනුවෙනුයි. එහෙම නම් ඒ මහ ජනයාට සිද්ධ වුණු හානිය පිළිබඳව පවත්වාගෙන ගිය විමර්ශනවලට කුමක්ද වුණේ කියා සොයා බලන එක මේ පාර්ලිමේන්තුවේ වගකීමක් කියා මා විශ්වාස කරනවා. ඒ නිසා තමයි අද මේ කරුණු ඔබතුමා වෙත ඉදිරිපත් කරන්නේ.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. අතුරුගිරිය ප්‍රදේශයේ හිටපු "කුඩු ලලිත්" නොහොත් ලලිත කෞශල්‍යය කියන තැනැත්තා මේ වනවිට මිය ගිහින් තිබෙනවා. මේ තැනැත්තාත් කුඩු ජාවාරමෙන් උපයාගත් මුදල් අරුමාදුර ලෝරන්ස් රොමෙලෝ දුමින්ද සිල්වා කියන තැනැත්තාට ලබා දී තිබෙනවාය කියන එක අජිත් රෝහණ නියෝජ්‍ය පොලිස්පතිතුමා එදා පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා විධියට ප්‍රකාශ කළා. පොලීසියට අසත්‍යය ප්‍රකාශ කරන්න අවශ්‍යතාවක් නැහැ. පොලීසිය අධිකරණයට සත්‍යය වාර්තා කරලා ඇති. මේවා සම්බන්ධයෙන් විමර්ශනය කළ යුතුයි. මේ රට විනාශ කරන්නේ කවුද? සියල්ලට ඉහළින්, සියල්ල දකිමින්, පැත්ත ගියත් ඇත්ත කියනවාය කියන අය තමන්ගේ පවුලේ සිද්ධවන දේවල්, තමන්ගේ සහෝදරයා කරන මිනී මැරුම් දකින්නේ නැහැ; තමන්ගේ සහෝදරයා කරන කුඩු ජාවාරම දකින්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

තමන්ගේ භාර්යාව කරන දේවල් දන්නේ නැහැ. තුන් ඉරියව්වෙන් කැපී පෙනෙන මේ රටේ ක්‍රිකට් ක්‍රීඩකයෙක් තමන්ගේ භාර්යාව ගෙන ගිහින් හැම ඉරියව්වකින්ම කැපී පෙනෙන අන්දමින්

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

-යෙදෙනකොට, සියල්ලට ඉහළින්, සියල්ල දකිමින් ඉන්න, පැත්ත ගියත් ඇත්ත කියන අයට ඒවා පෙනෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ සමාජයට ව්‍යසනයක් කළ උදවිය මේ සමාජය විවේචනය කරන්න, මේ සමාජයට පහර ගහන්න වැඩ කටයුතු කරන කණ්ඩායමක් බවට පත්වෙලා තිබෙනවා. මත් ද්‍රව්‍ය තුළින්, මිනිස් ජාවාරම තුළින් උපයන මුදල් රාජ සන්තක කිරීමට මේ රටේ නීතිය අනුව බලයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ සඳහා මෙම පාර්ලිමේන්තුව මැදිහත් වෙන්නට ඕනෑ. මේ පාර්ලිමේන්තුව නිවැරැදිව කටයුතු කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බොදුබල සේනා සංවිධානයේ මහ ලේකම් ගෞරවනීය ගලගොඩඇත්තේ ඥානසාර හාමුදුරුවන් වහන්සේ පිළිබඳව මා ඉතුරු විනාඩියේදී කථා කරන්න කැමතියි. අධිකරණ ක්‍රියාවලියකට ගිය කාන්තාවක් සම්බන්ධව උන් වහන්සේ යමක් කථා කළා කියන කාරණය මත අධිකරණයට අපහාස කළා කියා අධිකරණය උන් වහන්සේට නියෝගයක් ලබා දුන්නා. මා ඒ නියෝගය පිළිබඳව කථා කරන්නේ නැහැ. අධිකරණයට අපහාස කිරීම කියන එක පිළිබඳව

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

නීතිය අර්ථ කථනය කරලා නැහැ. කෙසේ නමුත් අධිකරණ ක්‍රියාවලියට කුමන අන්දමකින් හෝ බලපෑමක් වනවා නම්, එය විවේචනය කරනවා නම්, ඒක අධිකරණ ක්‍රියාවලියට කරන බාධාවක් -හානියක්- විධියටයි අපි දකින්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(මාණ්පුමිකු කුලුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ්)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමා දැන් කථාව අවසන් කරන්න.

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(මාණ්පුමිකු පාලිත රංකේ පණ්ඩාර)
(The Hon. Palitha Range Bandara)
මට තව විනාඩියක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මා මේ කාරණයත් කියා මගේ කථාව අවසන් කරන්නම්. ඔබතුමාගේ යාන්ඔය ව්‍යාපෘතිය ගැනත් කථා කරන්න තිබෙනවා.

මේ රටේ අනර්කලී ආකර්ශා කියලා අනගිභවනීය නිළියක් හිටියා. මේ නිළියට 2008 ජූනි මාසයේ 18 වැනිදා චිත්‍රපටයක් සඳහා ගිවිසුම අත්සන් කරන්න වැල්ලවත්තේ ස්ථානයකට එන්න කිව්වා.

මේ නිළිය ඇයගේ මවත් එක්ක එම ස්ථානයට ගියා. අරුම්දුර රොමේලෝ දුමින්ද සිල්වා කියන තැනැත්තා 25ක පමණ නඩයක් එක්ක අවි ආයුධ සහිතව එතැනට ගියා. ඔවුන් මේ මවට සහ දුවට තර්ජනය කළා. ගිනි අවි කටට දැම්මා. මේ දෙපළම නුගේගොඩට පැහැර ගෙන ගියා. නුගේගොඩට පැහැර ගෙන ගිහිල්ලා, නුගේගොඩ ගෙදරදී මේ දුමින්ද සිල්වා කියන තැනැත්තාත්, ඔහුගේ වැඩිමහල් සහෝදරයා වන රෙනෝ සිල්වා කියන තැනැත්තාත් ඊට පෙර දවසේ අධිකරණයෙන් දුන්නු නියෝගය වෙනස් කිරීමට කටයුතු කරන්න කියලා ඔවුන්ට දැඩි ලෙස බලපෑම් කළා. එහෙනම් මේ කාරණයත් අධිකරණයට කරන ලද බලපෑමක්. එක පැත්තකින් පැහැර ගෙන යාම තිබෙනවා; අධිකරණයට අපහාස කිරීම තිබෙනවා; අයුතු සිර කර ගැනීම තිබෙනවා. ඒ විධියට මෙතැන බරපතළ විධියේ අපරාධ රාශියක් තිබෙනවා. 2008දී මේ කාරණය සම්බන්ධව කොල්ලුපිටිය පොලීසියේ රාත්‍රී 10.30ට - පැය 22.30ට- සුළු පැමිණිලි සටහන් පොතේ පිටු අංක 137, ඡේද අංක 20 වශයෙන් සටහන්වෙලා තිබෙනවා. මේ ආකාරයට අධිකරණයට අපහාස කිරීම බරපතළ කාරණයක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගෞරවනීය සංඝ රත්නයට එරෙහිව අධිකරණය කටයුතු කළා වාගේම පොලීසිය නියත වශයෙන්ම මේ කාරණය සම්බන්ධවත් කටයුතු කරන්න ඕනෑ. මේ පිළිබඳවත් මා පොලිස්පතිවරයාගෙන් කරුණු විමසලා ලිපියක් යවා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ අවස්ථාවේදී මේ ලිපි දෙකම **සභාගත*** කරනවා. පාර්ලිමේන්තුව හරහා මේ ලිපි පොලිස්පතිවරයාට යොමු කර මේ සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කරන ලෙස මා ගෞරවයෙන් ඉල්ලනවා. බොහොම ස්තුතියි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[பி.ப. 1.43]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, மதுவரிக் கட்டளைச் சட்டத்தின்கீழான அறிவித்தல்கள் மற்றும் நோயாளர் வண்டிச் சேவை அல்லது சுப பயணம் தொடர்பான 1990 சுவசெரிய மன்றம் சட்டமூலம் சம்பந்தமான இந்த விவாதத்தில் கலந்துகொண்டு எனது கருத்துக்களையும் பதிவு செய்ய விரும்புகின்றேன்.

இலங்கை மக்களின் வாழ்க்கைத் தரத்தை மேம்படுத்துவதில் சுகாதார, வைத்திய சேவைகள் அத்தியாவசியமானதாக உள்ளன. 22 மில்லியன் மக்களைக் கொண்ட நமது நாட்டில் 70 சதவீதமான மக்கள் கிராமப் புறங்களிலேயே வாழ்கின்றார்கள்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. Heshan Withanage to the Chair?

ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
I propose that the Hon. Heshan Withanage do now take the Chair.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ගරු හේෂාන් විතානගේ මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹேசான் விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. HESHAN WITHANAGE *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
நன்றி.

அவர்களுடைய சுகாதாரத் தேவைகளை உரிய காலத்திலும் உயரிய தரத்திலும் வழங்குவதற்குத் தேவையான நடவடிக்கைகளை முன்னெடுப்பது அரசாங்கத்தின் கடமையாகும்.

இலங்கை மக்கள் அவர்களுடைய நாளாந்த வாழ்க்கையில் எதிர்பாராத விதமாக நோய்வாய்ப்படும்போதும் ஆபத்துக் களின்போதும் விபத்துக்களின்போதும் அவர்களுக்கு உடனடி முதலுதவிச் சேவையும் வைத்திய வசதியும் அவசரத் தேவைகளாக இருக்கின்றன. நோயாளர்களுக்கு உடனடி முதலுதவிகளைச் செய்வதற்கும் பாதிக்கப்பட்ட இடத்திலிருந்து மிகத்துரிதமாக அண்மையிலுள்ள வைத்தியசாலைக்குக் கொண்டுசெல்லவும் போதுமான வசதிகளை ஏற்படுத்துவது எமது கடமையாகும்.

அனர்த்தங்கள் அல்லது விபத்துக்கள் நடைபெற்ற இடத்திலிருந்து நோயாளியை வைத்தியசாலைக்கு எடுத்துச் செல்வதில் சாதாரணப் போக்குவரத்து ஏற்பாடுகள் கால தாமதமாக அமைவதுடன், பல சிரமங்களையும் எதிர்கொள்ள வேண்டியுள்ளது. அந்தக் குறைபாட்டை நிவர்த்திக்கும் பொருட்டு பாதிக்கப்பட்ட நோயாளியை உடனடியாக எடுத்துச் செல்வதற்குத் துரிதமான போக்குவரத்து ஏற்பாடுகளை ஏற்படுத்தப்படுவது அவசியமாகும். எனவே, அவசர மருத்துவ உதவி தேவையாக இருப்பவர்களையும் எதிர்பாராத அனர்த்தம் அல்லது விபத்தில் காயப்பட்டவர்களையும் துரித கதியில் வைத்தியசாலைக்குக் கொண்டு செல்வதற்கு நம்பத்தகுந்த நோயாளர் காவுவண்டிச் சேவையொன்று அத்தியாவசிய மாகும்.

நமது நாட்டில் ஏறத்தாழ 15,000 கிராமங்கள் உள்ளன. அப்பிரதேசங்களிலிருந்து நோயாளிகளை சிகிச்சைக்காக அல்லது மேலதிக சிகிச்சைக்காக ஆதார வைத்தியசாலைக்கோ அல்லது மாவட்ட வைத்தியசாலைக்கோ அல்லது போதனா வைத்தியசாலைக்கோ கொண்டுசெல்லுவதற்குப் போதுமான அளவு நோயாளர் காவுவண்டிகள் நமது நாட்டில் இல்லை என்பதை நாம் அனைவரும் அறிவோம்.

இக்குறைபாட்டை நிவர்த்தி செய்வதற்கு அரசாங்கம் முன்னுரிமையளித்து நடவடிக்கை எடுத்திருப்பது காலத்தின் கட்டாயத் தேவையாகும். இந்த முயற்சியை நாம் வரவேற்கின்றோம்.

இந்தியாவில், குறிப்பாக சென்னை மாநகரத்தின் முக்கிய வீதிச் சந்திகளில், அம்பியுலன்ஸ் வண்டிகள், வைத்தியர், தாதிச் சேவையினர், முதலுதவியாளர்களுடன் நிறுத்திவைக்கப் பட்டிருக்கும். இந்த அம்பியுலன்ஸ் வண்டிகள் ஒரு விபத்து மற்றும் ஆபத்து நடந்தவுடன், அதனால் பாதிக்கப் பட்டவர்களை உடனடியாக வைத்தியசாலைக்கு எடுத்துச் செல்கின்றன. இதனால் விபத்தில் காயமடைந்தவர் அல்லது தனது உயிருக்காகப் போராடிக் கொண்டிருப்பவர் உடனடியாக வைத்திய வசதிகளைப் பெற்றுக் காப்பாற்றப் படுகின்றார்.

இதனை முன்மாதிரியாகக்கொண்டு கௌரவ பிரதம மந்திரி ரணில் விக்கிரமசிங்க அவர்கள் இந்திய அரசாங்கத்துடன் பேச்சுவார்த்தைகளை நடாத்தி இத்திட்டத்தை நமது நாட்டில் நடைமுறைப்படுத்த எடுத்துள்ள நடவடிக்கை வரவேற்கத் தக்கதாகும். இதேபோன்று கிராமப்புறங்களில் மகப்பேற்றை எதிர்பார்த்திருக்கும் தாய்மாருக்கும் தொற்று நோயால் பாதிக்கப்பட்டிருப்பவர்களுக்கும் உரிய நேரத்தில் சிகிச்சை அளிக்கப்படுவதற்கு இந்தத் துரித நோயாளர் வண்டிச் சேவை உதவும் வகையில் ஏற்பாடுகள் செய்யப்பட வேண்டும்.

அண்மையில் தாமரைக் கோபுரத்தில் மின்னுயர்த்தியில் பொருத்தும் வேலைகளைச் செய்து கொண்டிருந்த கிளிநொச்சியைச் சேர்ந்த 19 வயதுக் கட்டிடத் தொழிலாளி தவறிவிழுந்து அகால மரணமடைந்தார். அவரின் சடலத்தைக் கிளிநொச்சியிலுள்ள அவரது வீட்டிலுள்ள பெற்றோரிடம் கையளிப்பதற்கு, அரச சார்பற்ற நிறுவனமொன்றிலிருந்து பெறப்பட்ட பிரேதக் காவு வண்டி ஒன்று ஏற்பாடு செய்யப்படுவதாக அந்தக் குடும்பத்திற்குக் கூறப்பட்டபோதும், பின்னர் மரணித்தவரின் சடலத்தைக் கொழும்பிலிருந்து கிளிநொச்சிக்குக் கொண்டு செல்வதற்காக 30,000 ரூபாய் வாகனச் செலவாகக் கோரப்பட்டதாக இறந்தவரின் குடும்பத்தினர் தெரிவித்திருந்தனர். வறுமையில் வாழும் அந்தக் குடும்பத்தினரை அவ்வாறு ஏமாற்றியது வடக்கு மாகாண சபையின் உறுப்பினர் ஒருவர் என்று பாதிக்கப்பட்டவர்கள் குற்றஞ்சாட்டியுள்ளனர்.

கௌரவ பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களால் பரிந்துரைக்கப்பட்டிருக்கும் இந்தத் துரித நோயாளர் காவும் வாகனச் சேவையானது நகர்ப்புறங்களில் முடங்கிவிடாமல், கிராமப் புறங்களில் வாழும் மக்களுக்கும் உதவக்கூடியவாறு செயற்படுத்தப்பட வேண்டும். நகர்ப் புறங்களில் வாழும் தமிழ் மக்களில் கணிசமானவர்கள் வாகன வசதிகளோடு வாழ்வதால், அவர்கள் ஏதோ ஒரு வாகன ஏற்பாட்டுடன் வைத்தியசாலைக்கு வந்து சேர்ந்துவிடக்கூடும். ஆனால், கிராமங்களில் வாழும் மக்கள், இவ்வாறான சேவைகளை எவ்வாறு பெற்றுக் கொள்வது என்பது தெரியாமலும், இவ்விதமான சேவைகள் எவ்வாறு ஒழுங்குபடுத்தப்படுகின்றன என்பது புரியாமலும் பெரும் சிரமங்களுக்கு முகங்கொடுத்து வாழ்கின்றனர்.

எனவே, எமது நாட்டு மக்களுக்கு நல்ல திட்டங்களை அரசாங்கம் நடைமுறைப்படுத்த முயற்சிக்கின்றபோதும், இந்தத் திட்டங்களுக்கு அரசாங்கம் சூட்டும் திட்டப்பெயர்களும் அந்தத் திட்டங்களின் அறிவுறுத்தல், வழிகாட்டல்கள் மற்றும் வசதிகள் என்பன நாட்டிலுள்ள அனைத்து மக்களும் புரிந்து கொள்ளும்படியானதாக இருப்பதில்லை என்பதைப் பல தடவை நான் இந்த உயரிய சபையில் சுட்டிக்காட்டியுள்ளேன். நான் சுட்டிக்காட்டிய பல புரியாத திட்டப் பெயர்கள் பின்னர் புரியும்படியாகத் தமிழில் திருத்தப்பட்டுள்ளன. அதற்காக அதிமேதகு ஜனாதிபதி மைத்திபால சிறிசேன அவர்களுக்கும் கௌரவ பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களுக்கும் எனது நன்றிகளைத் தெரிவித்துக் கொள்கின்றேன்.

அதுபோலவே இன்று நாம் விவாதிக்கும் 'சுவசெரிய' என்ற திட்டமும் சாதாரண மக்களுக்கு, குறிப்பாகத் தமிழ் மொழி பேசும் மக்களுக்குப் புரியும்படியாக இல்லை. அதாவது இந்தத் திட்டம் என்ன? என்பதையோ, இந்தச் சொல் என்ன அர்த்தத்தைக் குறிக்கின்றது என்பதையோ இலகுவாகப் புரிந்து கொள்ள முடியவில்லை. எனவே 'சுவசெரிய' எனும் சொல்லின் அர்த்தத்தைத் தமிழ் பேசும் மக்களும் இலகுவாகப் புரிந்து கொள்ளும்வகையில் குறிப்பிடுமாறு கேட்டுக் கொள்கின்றேன். அதாவது, இச்சேவைக்கு 'நோயாளர் வண்டிச் சேவை' அல்லது 'சுக பயணச் சேவை' எனப் பெயரிடுவதற்குக் கௌரவ அமைச்சர் அவர்கள் உரிய தரப்பினருடன் கதைத்து நடவடிக்கை எடுக்குமாறு கேட்டுக்கொள்கின்றேன்.

அதுபோலவே இந்தத் துரித நோயாளர் காவு வண்டிச் சேவையை மலையகம் மற்றும் வடக்கு, கிழக்கில் செயற் படுத்தும்போது, சாரதிகளாகவும் நோயாளர் உதவியாளர் களாகவும் கடமையாற்றுவோர் அந்தந்த மாவட்டங்களைப் பிரதிநிதித்துவம் செய்கின்ற வகையில் பணியில் அமர்த்தப்பட வேண்டும். ஏனென்றால், அந்த மக்கள் இலகுவாகத் தொடர்பு கொள்ளக்கூடிய வகையிலும், அவர்களின் பிரச்சினைகள், தேவைகளைப் புரிந்து கொள்ளக்கூடிய வகையிலும் இந்தச் சேவையில் ஈடுபடுவோர் இருக்கவேண்டும். அப்போதுதான்

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

இந்தத் துரித சேவையூடாக இந்த நாட்டு மக்கள் பயன் பெறுவார்கள் என்று கருதும் பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களின் எண்ணம் நிறைவேறும். ஏன் இவ்விடயத்தைக் குறிப்பிடுகின்றேனென்றால், வடக்கு மாகாணத்தில் குறிப்பாக அந்தந்த மாவட்டங்களில் நோயாளர் காவுவண்டிச் சாரதி அனுமதிப்பத்திரம் பெற்றவர்களும், முதலுதவிச் சிகிச்சை அளிப்பதற்கான சான்றிதழ் தகைமைபெற்ற தாதியர்களும் ஏராளமாக இருக்கின்றபோதும் இருக்கின்றபோதும் வெளி மாகாணங்களைச் சேர்ந்தவர்கள் அங்கே சாரதிகளாகவும் சௌக்கிய ஊழியர்களாகவும் நியமிக்கப்படுவதால் அங்குள்ள தகுதியானவர்கள் பாதிக்கப் படுவதாக முறையிடுகின்றனர்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ කථාව දැන් අවසාන කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Sir, it is my time.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Hon. Member, the first thing is we are not hiring from various other places and bringing them to the Northern Province. We are hiring from the Northern Province. In the Northern Province, we will start the service before the end of next month in Jaffna, Kilinochchi, Mannar, Mullaitivu and Vavuniya. We have hired 60 Emergency Medical Technicians and 60 pilots.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Are all from that area?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Yes. We have hired 120 people from that area and if I am correct, they have already been trained. All the EMTs are trained in Hyderabad for a number of weeks and then, they come back. As I was telling earlier, we are going to be serving over a million people in the Northern Province before the end of next month.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
What about the Eastern Province, Hon. State Minister?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
We have still not hired from the Eastern Province. But let me assure you that the Eastern Province will also be completed before the end of this year.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Okay. Thank you.

ஊழியர் நியமனங்களில் இவ்வாறு நடைபெறும் குறைபாடுகளுக்கும், சேவைகளை மக்கள் பெற்றுக் கொள்வதில் ஏற்படும் கவனயீனங்களுக்கும், அதிகாரத் துஷ்பிரயோகங்களுக்கும் வடக்கு மாகாணத்தில் நேர்த்தியான அரசியல் வழிகாட்டல் இல்லாமையும், வடக்கு மாகாண சபையின் செயற்றிறன் இன்மையும் பிரதான காரணங்களாக இருப்பதை நாம் மறுப்பதற்கில்லை. வடக்கு மாகாண சபையைப் பொறுப்பேற்று நிர்வகிப்போர் அந்த மாகாணத்தின் கல்வி வீழ்ச்சிக்கும், சட்டம் ஒழுங்கு சீர்கெட்டுப் போயிருப்பதற்கும் காரணமாக இருப்பதைப்போன்று, சுகாதார வசதிகள் உரியவாறு மக்களுக்குக் கிடைக்காமல் அந்த மக்கள் தொடர்ந்து துயரங்களை அனுபவிப்பதற்கும் காரணமாக இருக்கின்றார்கள்.

30 வருடங்களுக்கு மேலான யுத்தத்திற்கு முகம்கொடுத்த மக்கள் வட மாகாணத்தில் விசேஷமான மருத்துவ உதவிகளை நாடி நிற்பவர்களாக வாழ்ந்து வருகின்றார்கள். அவர்களுக்குத் தேவையான மருத்துவ உதவிகளைப் பெற்றுக்கொடுக்கவோ, அவர்களுக்கு இவ்வாறான துரித நோயாளர் வண்டிச் சேவைகளை ஏற்படுத்திக்கொடுக்கவோ மாகாண சபையைப் பொறுப்பேற்றவர்கள் இதுவரை எதனையும் செய்யவில்லை. முதலமைச்சர் விக்கினேஸ்வரன், தானே சுகாதார அமைச்சராக நியமித்தவர் அதிகாரத் துஷ்பிரயோகத்தைச் செய்திருப்ப தாகவும், சுகாதார அமைச்சு செயற்றிறனோடு செயலாற்ற வில்லை என்றும், வைத்திய உபகரணங்கள் கொள்வனவு மற்றும் ஆளணி உள்வாங்கல் நடைமுறையிலும் மோசடிகள் இடம்பெற்றிருப்பதாகவும் குற்றச்சாட்டை முன்வைத்துள்ளார்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Please give me two more minutes because the Hon. State Minister replied during my time. Anyway, I thank him for that clarification.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
Hon. Member, one other thing I want to clarify is that "1990" is common to every language.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
I understand that.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
"Suwaseriya" may not be the word in Tamil translation. But the main thing is “1990”.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Yes, I appreciate that. Shall I continue with my speech now, Sir?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Yes. Wind up your speech within one minute.

ගරු ඩග්ලස් දේවානන්ද මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
அக்குற்றச்சாட்டுக்கள் மீதான விசாரணைகளை நடத்துவ தாகவும் கூறியிருந்தார். அந்த விசாரணைகளின் முடிவாக வடக்கு மாகாண சுகாதார அமைச்சரைப் பதவிநீக்கம் செய்வதாகவும் கூறியிருந்தார். ஆனால், நடைபெற்றதாக கூறப்பட்ட அதிகாரத் துஷ்பிரயோகங்களுக்கும் மோசடி களுக்கும் முதலமைச்சர் விக்கினேஸ்வரனால் பரிகாரம் காணப்பட்டதாகவோ, தவறுக்கு உரியவாறான சட்ட நடவடிக்கைகள் எடுக்கப்பட்டதாகவோ இதுவரை வடக்கு மக்கள் எதையும் அறியவில்லை. இவ்வாறு முதலமைச்சரும் மாகாண அமைச்சர்களும் பொறுப்பற்றுச் செயற்படுவதால் அதை ஒரு வாய்ப்பாக எடுத்துக்கொண்டு சில சுகாதாரத் துறைசார் அதிகாரிகள் மக்களுக்குச் சுகாதார வசதிகளை வழங்குவதில் அசமந்தமாகச் செயற்படுவதால் பலர் பாதிக்கப்படுவதாகவும் கூறுகின்றனர்.

கடந்த ஐந்து வருட காலமாக, வடக்கு மாகாண சபையைப் பொறுப்பேற்று மக்கள் நலன் சார்ந்து ஆக்கபூர்வமாகச் செயற்படாத முதலமைச்சர் விக்கினேஸ்வரன், எதிர்வரும் ஒக்ரோபர் மாதத்துடன் நிறைவடையும் வடக்கு மாகாண சபையின் பதவிக்காலத்தை மேலும் நீடித்துத் தமது ஆளுமைக்குக்கீழ் தரவேண்டுமென்று கோரிக்கை விடுத்திருப்பது வேடிக்கையானதாகும். அவர் ஒரு முன்னாள் நீதியரசர் என்றபோதும் 13 ஆவது திருத்தச் சட்டத்தை முழுமையாக அறிந்துகொள்ளாமல், பதவிக்காலம் முடிந்த பின்னரும் கால நீடிப்புச் செய்து தமக்கு முதலமைச்சராகப் பதவி நீடிப்புச் செய்யுமாறு கோரிக்கை விடுத்திருப்பது வடக்கு மக்களிடையே எரிச்சலை ஏற்படுத்தியுள்ளது. மாகாண சபைகளில் மக்களால் தெரிவு செய்யப்படும் உறுப்பினர்களின் பதவிக்காலம் நிறைவடைந்ததும், அடுத்த தேர்தல் நடத்தப்பட்டு மக்கள் பிரதிநிதிகள் பொறுப்பேற்கும்வரை அது மாகாண ஆளுநரின் கட்டுப்பாட்டின்கீழ் நிர்வகிக்கப்படும் என்பது நியதியாகும். இந்நிலையில் பதவி ஆசையினாலும், அந்தப் பதவியின் சுகபோகங்களுக்குள் இருந்துகொண்டு சுயநல அரசியலில் ஈடுபடுவதற்கு வசதியாகவும் தனது பதவிக் கால நிறைவுக்குப் பிறகும் தனக்கு பதவி நீடிப்புத் தேவையென்று அவர் கேட்கின்றாரே தவிர வேறில்லை. யுத்த வடுக்களோடும் பொருளாதார வறுமையோடும் வட மாகாணத்தில் வாழ்ந்து கொண்டிருக்கும் எமது மக்களுக்குக் கடந்த ஐந்து வருடங்களில் அர்த்தபூர்வமாக எதையும் செய்யாத முதலமைச்சரும் அவரது சகாக்களும் எதிர்காலத்தில் எதையும் செய்வார்களென்று வட மாகாண மக்கள் நம்பவில்லை.

இந்தச் சந்தர்ப்பத்தில் ஜனாதிபதி மைத்திரிபால சிறிசேன அவர்களுக்கும் பிரதமர் ரணில் விக்ரமசிங்க அவர்களுக்கும் வடக்கு மாகாண மக்கள் சார்பாக நான் விடுக்கும் வேண்டுகோளானது, வடக்கு மாகாண சபைக்கான பதவிக் காலம் நிறைவடைந்ததும், காலதாமதமின்றி உடனடியாக வடக்கு மாகாண சபைக்குத் தேர்தலை நடத்தவேண்டும் என்பதாகும். புதிய தேர்தல் முறையில் மாகாண சபைத் தேர்தலை நடத்துவதற்குக் காலதாமதம் எடுக்குமாக இருந்தால், பழைய தேர்தல் முறையில் தேவையான சிறு திருத்தங்களைச் செய்து கொண்டு உரிய காலத்தில் தேர்தலை நடத்த வேண்டும். கடந்த ஐந்து வருடங்களாக வடக்கு மாகாண சபையினால் பெற்றுக்கொள்ள வேண்டிய பலாபலன்களை வடக்கு மக்கள் பெற்றுக்கொள்ளவில்லை. அந்தக் குறைபாட்டை நிவர்த்தி செய்து மக்களுக்குச் சேவை செய்யக்கூடியவர்களைத் தெரிவு செய்வதற்கு மக்களுக்கு இருக்கும் ஜனநாயக விருப்பத்தை நிறைவேற்ற உதவி செய்ய வேண்டுமென்றும் கேட்டுக் கொண்டு, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

Hon. State Minister, please look into that matter.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

ඊට පෙර කවුරු හෝ ගරු මන්ත්‍රීවරයෙක්, මූලාසනය සඳහා ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, " ගරු ශෙහාන් සේමසිංහ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

චිසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු හේෂාන් විතානගේ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு ஹேசான் விதானகே அவர்கள் அக்கிரா சனத்தினின்று அகலவே, மாண்புமிகு செஹான் சேமசிங்க அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. HESHAN WITHANAGE *left the Chair and* THE HON. SHEHAN SEMASINGHE *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 2.01]

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

අද දවසේ අනුමත කිරීමට නියමිතව තිබෙන 1990 සුවසැරිය පදනම පනත් කෙටුම්පත පිළිබඳව කථාබහ කරන මේ විවාදයේදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ගේ කථාබහ ඇහුවාට පස්සේ මට හිතෙන දේ, දැනෙන දේ මෙතැන කියන්න අවසර මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මෙතුමන්ලා මවන ආකාරයට බස්නාහිර ඇතුළු මේ රටේ තදාසන්න ප්‍රදේශවල සේවාවක් හැටියට පවතින මේ ඉන්දියානු ගිලන් රථ සේවාව - ambulance service එක-ලංකාවේ සතර වටේ ඇති කරන්න යනවා කියන එක තමයි මේ පදනම හරහා තමුන්නාන්සේලා බලාපොරොත්තු වෙලා තිබෙන්නේ. අපට මේ කාරණාව පැහැදිලි කරද්දී, අපේ රටේ රෝගීන් රෝහල් කරා රැගෙන ඒමේ පහසුකමක් හැටියට රට පුරාම මේ ව්‍යාපෘතිය රැගෙන යාම අවශ්‍යයි කියන කාරණය ඔබතුමන්ලා පෙන්වනවා. සුවසැරිය දෙවෙනි අදියර යටතේ මුළු දිවයිනම ආවරණය වන පරිදි මේ සේවාව පුළුල් කරන බවත්, ඇමෙරිකානු ඩොලර් මිලියන 15.2ක ඉන්දියානු ආධාර යටතේ මේ වැඩසටහන ක්‍රියාත්මක වෙන බවත් මෙතුමන්ලා කියනවා. ඒ සඳහා තමුන්නාන්සේලා ගිලන් රථ සංඛ්‍යාව 209 දක්වා වැඩි කරන බවත්, සේවකයන් 1782ක් යෙදවීමට අපේක්ෂා කරන බවත්, මෙය ස්වායත්ත ආයතනයක් බවත්, 1990 සුවසැරිය පදනම පනත් කෙටුම්පත ඉදිරිපත් කරන මේ මොහොතේ පාර්ලිමේන්තුවට කරුණු දක්වා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය සේවාව ගැන හොයලා බැලුවාම එක් කාරණාවක් හරි වැදගත් වෙනවා. අපේ රට වර්ග කිලෝමීටර 65,110ක විශාලත්වයකින් යුක්ත වනවා. ඒ වර්ග කිලෝමීටර ප්‍රමාණයේ අපේ රටේ සෞඛ්‍ය සේවාව පිළිබඳව අපට යම් මැනීමක් තිබෙනවාද කියන එක පිළිබඳව හොයලා බලන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ කිලෝමීටර 5ක් ඇතුළත රජයේ සෞඛ්‍ය සේවාව සපයන ආයතනයක් අනිවාර්යයෙන් තිබෙනවා. මේ තත්ත්වය ලෝකයේ වෙනත් රටක දකින්න පුළුවන්කමක් නැහැ. ඉන්දියාව ගැන බැලුවොත්, මිනිහෙකුට අසනීපයක් වුණොත්, රෝගාතුර වුණොත් ළඟම තිබෙන රජයේ වෛද්‍ය මධ්‍යස්ථානය, රජයේ මධ්‍යම රෝහල, එක්කෝ ප්‍රධාන රෝහලකට - general hospital එකකට-යන්න සැතපුම් 200ක දුර ගෙවා ගෙන යන්න ඕනෑකම තිබෙනවා. ලෝකයේ සෞඛ්‍ය සේවාව ගත්තොත්, කිලෝමීටර 5ක දුරකින් වෛද්‍ය මධ්‍යස්ථානයක් තිබෙන ප්‍රධාන රටක් බවට අපේ රට පත් වෙලා තිබෙනවා. ඒ තරමට රෝහලත් එක්ක සම්බන්ධයක්, රෝගියෙකුට වෛද්‍ය මධ්‍යස්ථානයත් එක්ක සම්බන්ධයක් ඇති කරගත හැකි මට්ටමට කිලෝමීටර 5ක් වැනි දුරක අපේ රටේ අනිවාර්යයෙන් සෞඛ්‍ය මධ්‍යස්ථානයක් තිබෙනවා.

ගියාට පස්සේ ඒවායේ පහසුකම් නැද්ද, ගැටලු තිබෙනවාද, ඇස්ප්‍රීන් පෙත්තවත් නැද්ද, කාර්ය මණ්ඩලය නැද්ද කියන මේ මොන කාරණා තිබුණත් අනිවාර්යයෙන්ම කිලෝමීටර් 5ක් වැනි දුරක සෞඛ්‍ය මධ්‍යස්ථානයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේලා සෞඛ්‍ය සේවාව දියුණු කරනවා නම් කළ යුතුව තිබුණු කරුණු මොනවාද? කල්පනා කරලා බලන්න. හත් දෙයියනේ! 1950 වන කොට අපේ රටේ සෞඛ්‍ය සේවයේ තිබුණේ රෝහල් 263යි. මහ බැංකු වාර්ෂික වාර්තාවේ සඳහන් වන විධියට 2017 වන කොටත් අපේ රටේ තිබෙන්නේ රෝහල් 612යි. 1950දී තිබුණු රෝහල් 263 තුළ තිබුණු ඇඳන් සංඛ්‍යාව 19,959යි කියලා වාර්තා වෙනවා. නමුත්, දැන් 21වන සියවසේ එළිපත්තේ ඉන්න අපේ රටේ, රෝගියකුට සේවාවක් සපයා ගන්න පුළුවන් රජයේ වෛද්‍ය මධ්‍යස්ථානයක් - එවැනි සම්පතක්- වර්ග කිලෝමීටර් 5ක දුරකින් තිබෙන අපේ රටේ ඒ ඇඳන් සංඛ්‍යාව වැඩි වෙලා තිබෙන්නේ, 19,959 සිට 76,774යි දක්වායි. තමුන්නාන්සේලා මධ්‍යම නගරයේ සිට ඈත ගම් දනව් කරා -මොනරාගල වෙන්න පුළුවන්; කිලිනොච්චිය, යාපනය වෙන්න පුළුවන්; ත්‍රිකුණාමලය වෙන්න පුළුවන්; මඩකලපුව වෙන්න පුළුවන්; හම්බන්තොට වෙන්න පුළුවන්; ඈත ගිරුවාපත්තුවේ වෙන්න පුළුවන්- ඒ දුක් විඳින මිනිසුන්ගේ සෞඛ්‍යය පැත්තෙන් තිබෙන අනේකවිධ ගැටලු, දහස් ගණන් ගැටලු, කෝටි-ප්‍රකෝටි ගණන් ගැටලුවලට විසඳුම් හොයනවා වෙනුවට, මෙවැනි service එකක් ඇති කිරීම විතරයි කරලා තිබෙන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

මට කථා කරන්න දෙන්න, ගරු රාජ්‍ය ඇමතිතුමනි. මගේ වේලාවෙන් ඔබතුමාට අවස්ථාව දෙන්න පුළුවන්කමක් නැහැ. මට තිබෙන්නේ විනාඩි 15ක කාලයක්. ඒ නිසා ඔබතුමාගේ වෙලාවේදී කියන්න පුළුවන් නම් හොඳයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අවසරය මත අවස්ථාව දෙනවා නම් මගේ වේලාවෙන් ගන්නේ නැතිව දෙන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Hon. Presiding Member, I have to have time, because I am the one who presented this Bill. මට අවස්ථාව ලැබිය යුතුමයි. මොකද, මමයි මේකේ-

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

මගේ වේලාවෙන් දෙන්න බැහැ. ඔබතුමා කථා කරන්න. මගේ වේලාව මට දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Hon. State Minister, are you trying to make a clarification? How long do you want?

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

Just give me one minute and let me make a clarification.

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ තර්කයේ ගැටලුවක් තිබෙනවා. අපි මේ සේවාව ගිරුවාපත්තුවෙන් තමයි පටන් ගත්තේ. ඔබතුමා කිව්වා, මේ සේවාව බස්නාහිර පළාතේ නගරබද තිබෙන දෙයක් කියලා. එහෙම නොවෙයි.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
නැහැ, නැහැ. මගේ තර්කය ඒක නොවෙයි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මම කියන දේ පොඩ්ඩක් අහන්නකෝ. මේ සේවාව ගිරුවාපත්තුවෙන් පටන් ගත්තේ. මුලින් පටන් ගත්තේ හම්බන්තොට, මාතර, ගාල්ල දිස්ත්‍රික්කවල. ඊට පස්සේ තමයි කළුතර, ගම්පහ, කොළඹ යන දිස්ත්‍රික්කවල පටන් ගත්තේ. අද වන කොට 79,944දෙනකුගේ අවශ්‍යතාවන් ඉටු කර තිබෙනවා. ඈත පිටිසර ගම්වල ඉඳලා පවා රෝගීන් ගෙන ගොස් තිබෙනවා. ඒක පළමුවැනි කාරණය.

ඊළඟට, ඔබතුමාගේ logic එක පිළිබඳ මතු වුණු අනෙක් ගැටලු සහගත කාරණාවත් මා කියන්නම්. ගරු මන්ත්‍රීතුමනි, මේකට රෝහල් සම්බන්ධ නැහැ. මේක පූර්ව රෝහල් ගිලන් රථ සේවයක්. මේක රෝහලත් එක්ක සම්බන්ධ වුණු සේවාවක් නොවෙයි. Three-wheeler එකේ ගෙන යනවා වෙනුවට, කාගේ හෝ වාහනයක් හොයනවා වෙනුවට, මේ 79,944 දෙනාට විනාඩි 12කුත් තප්පර 58ක් ඇතුළත ඒ සේවාව ලබා දෙන්න අපට පුළුවන් වෙලා තිබෙනවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
හොඳයි. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කළ පැහැදිලි කිරීමෙන්ම මගේ තර්ක ටික ඉදිරිපත් කරන්න පහසු කරලායි තිබෙන්නේ. ඔබතුමා විසින්ම මේ පාර්ලිමේන්තුවට වග කීමෙන් යුතුව දෙන උත්තර මත සහ මේ රටේ සෞඛ්‍ය බලධාරීන් දෙන උත්තර මත මගේ තර්ක ඉදිරිපත් කරන්න තමුන්නාන්සේ මට බොහොම හොඳ අවස්ථාවක් ලබාදුන්නා. ඇත්තටම මම මේ වන තෙක් batting කළේ. තමුන්නාන්සේ දැන් මට බෝලය දාලයි තිබෙන්නේ. මම දැන් මගේ ප්‍රශ්න ටික අහනවා. ඔබතුමා වග කීමෙන් යුතුව උත්තර ලබා දෙන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඕනෑම ප්‍රශ්නයක් අහන්න. [බාධා කිරීමක්]

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
පැහැදිලියි, පැහැදිලියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියාවේ bike ambulances තිබෙනවා. ඊළඟට, සැතපුම් 200ක් දුර ගිහිල්ලා වත් සෞඛ්‍ය මධ්‍යස්ථානයක සේවයක් ලබා ගන්න ඒ රටේ බැහැ. ඉතින් bike ambulances තිබෙන, සැතපුම් 200ක් දුර ගිහිල්ලා වත් සෞඛ්‍ය මධ්‍යස්ථානයක සේවයක් ලබා ගන්න බැරි ඉන්දියාව වැනි රටක් තමයි - තමුන්නාන්සේලා කියන විධියට මේ දෙවැනි අදියරේ ඇමෙරිකානු ඩොලර් මිලියන 15.2ක ආධාර දෙනවා. සමස්තය ගත්තාම ඇමෙරිකානු ඩොලර් මිලියන 22යි - අපට මේ service එක සඳහා ආධාර ලබා දෙන්නේ.

ඒක පැත්තකින් තියමු. මම අහන ප්‍රශ්නය මේකයි ගරු ඇමතිතුමනි. මේ සේවාව හරහා අපේ රටේ රෝගීන්ට සේවයක් ලැබෙනවා තමයි. ඔබතුමා කියන විධියට මේක හොඳ සේවාවක්. ඔබතුමා කියන විධියට මේ සේවාව ලංකාවේ සෞඛ්‍ය පද්ධතියත් එක්ක සම්බන්ධවන දෙයක් නොවෙයි, පූර්ව රෝහල් ක්‍රමවේදයක්. ඒ අනුව, ලෙඩා රෝහලේ දොර ළඟට රැගෙන යෑම තමයි තමුන්නාන්සේලා මේ කරන්නේ. රෝගියා ගෙදර සිට -රෝගි වෙන තැන සිට- රෝහලේ දොර ළඟට රැගෙන යෑම තමයි තමුන්නාන්සේලා මේ සේවය හරහා කරන්නේ. එදා අපේ රටේ මොකද වුණේ? අපේ රටේ මෙච්චර කාලයක් -1948 සිට- මිනිසුන් රෝහලට ගියේ බයිසිකලයෙන්, බස් එකෙන්, ත්‍රිරෝද රථවලින් හෝ කරත්තයෙන්. ඒ ක්‍රම වෙනුවට පූර්ව රෝහල් ක්‍රමවේදයක් කියලා තමුන්නාන්සේලා ambulance service එකක් ගෙනෙනවා. තමුන්නාන්සේලා ඒකෙන් කරන්නේ රෝගියා ගෙදර සිට රෝහලේ දොර ළඟට අරගෙන යන එකයි. ලෝකයේ මෙම ambulance service එක අදටත් තිබෙන්නේ රෝගියා රෝහල කරා ආවාට පසුව, ඒ රෝහලේදී කරන රෝග නිශ්චයකින් පසුව තවත් කිසියම් ප්‍රධාන රෝහලකට ඒ රෝගියා රැගෙන යෑම සඳහායි. ඒ විධියටයි අපේ රටෙත් මෙච්චර කාලයක් ambulance service එකක් තිබුණේ. හර්ෂ ද සිල්වා ඇමතිතුමනි, ලෝකයේ දියුණු රටවල මිනිසුන්ගේ අවශ්‍යතාව මෙවැනි ක්‍රමයකින් ඉටු කරමින් තිබෙන්නේ, පළාත් පාලන හෝ නගර සභා -town council- විසින් කරන සේවාවක් හැටියටයි. තමුන්නාන්සේලාත් එවැනි දෙයක් තමයි මේ කරලා තිබෙන්නේ. මම තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි, හර්ෂ ද සිල්වා අමාත්‍යතුමනි. දිගු කාලීනව මේ සේවාව දෙන්න තමුන්නාන්සේලාට පුළුවන් නම් හොඳයි. ඇතිමලේ, කොටියාගල, සියඹලාන්ඩුව, මහකළුගල්ල, ලාහුගල, කන්දකැටිය, කිලිනොච්චිය, මැදවච්චිය, ගිරුවාපත්තුව යනාදී වශයෙන් මේ රටේ හතර වටේ ඉන්නා මිනිසුන්ට මෙම සේවාව දිගු කාලීනව නොමිලේ දෙන්න පුළුවන් නම්, ඒක මේ රටට වැදගත් වන ලොකු සෞඛ්‍යමය පියවරක් වෙයි. ඒක අනිවාර්යයයි. මම අහන ප්‍රශ්නය ඒක නොවෙයි. සිරිපාදෙන් පටන් ගන්නා ගංගා ස්වාභාවිකව මුහුදට වැටෙනවා වාගේ මේ සේවාව කෙරෙනවාය කියා අපි විශ්වාස කරන්නේ නැහැ. තමුන්නාන්සේලා මෙය කරන්නේ නිදහස් සෞඛ්‍ය සේවාවට බලපාන, දීර්ඝ කාලීනව කපන පාරක් හැටියටද කියන ප්‍රශ්නය අපට තිබෙනවා. මම අහන ප්‍රශ්නයට ඊළඟට තමුන්නාන්සේ උත්තර දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අහන ප්‍රශ්නයට ගරු හර්ෂ ද සිල්වා මැතිතුමාට උත්තරයක් දෙන්න පුළුවන්. මම නහන පළමුවන ප්‍රශ්නය මේකයි. මේ සේවාව සඳහා අනාගතයේ කවදා හෝ දවසක රෝගියෙකුගෙන් මුදල් අය කිරීමක් කෙරෙනවාද? දෙවැනි ප්‍රශ්නය මේකයි. තමුන්නාන්සේ කිව්වා වාගේ මේ සේවාව පූර්ව රෝහල් සේවයක්. මේ පූර්ව රෝහල් සේවය මේ රටේ රෝහල් සේවාවත් එක්ක ඒකාබද්ධ කෙරෙනවාද? එහෙම ඒකාබද්ධ කළොත් ඊට පස්සේ, ඒ රෝගියා වෙනුවෙන් අනාගතයේ දී බිලක් නිර්මාණය වෙනවාද, නැද්ද? අනාගතයේ දී මේ වියදම් දරන්නේ ඉන්දියාවම ද? අනාගතයේ දී හෝ කවදා හෝ දවසක තමුන්නාන්සේලාගේ අය වැය පද්ධතියෙන් මේ සේවාව සඳහා වියදමක් දරලා, මේ රටේ කෝටි ගණන් වන ජනතාව ලබන නිදහස් සෞඛ්‍ය සේවයට බාධාවක් නොවන, ඒක රකින ආකාරයට මේ සේවාව ලබා දෙනවාද කියන ප්‍රශ්නයට තමුන්නාන්සේ උත්තරයක් දෙන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
එතුමා වැදගත් ප්‍රශ්න කිහිපයක් මතු කළා. මා ඒ ප්‍රශ්න හතරට උත්තර දෙන්නම්. පළමුවෙනි ප්‍රශ්නය-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඉතා කෙටියෙන් උත්තර දෙන්න.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ආර්. එම්. පද්ම උදයසාන්ත කුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කාලය එතුමාට දෙන්න බැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලයෙන් තමයි යන්නේ. ඔබතුමාට තව මිනිත්තු දෙකක කාලයක් පමණයි ඉතිරි වෙලා තිබෙන්නේත්.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ආර්. එම්. පද්ම උදයසාන්ත කුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කාලය එතුමාට දෙන්න බැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් ගරු රාජ්‍ය ඇමතිතුමාට උත්තර ලබා දීමට අවස්ථාව දීලා තිබෙනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
මෙතුමා ඉදිරිපත් කළ විවේචනවලට උත්තර දෙන්න ඕනෑ නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ විවේචනවලට පිළිතුරු දෙන්න එතුමාගේ කාලයෙන් ඔබතුමාට වේලාව දෙන්න බැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
නැහැ, මම ඒ විවේචනවලට පිළිතුරු දෙන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමා, එතුමාගේ කථාව අවසාන වුණාට පසුව ඔබතුමා පිළිතුරු දෙන්න.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ආර්. එම්. පද්ම උදයසාන්ත කුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
රාජ්‍ය ඇමතිතුමනි, මගේ කථාව අවසන් වුණාට පසුව ඔබතුමා පිළිතුරු දෙන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දෙන්න. මම එතුමාගේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්නම ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ කථාවේදී පිළිතුරු දෙන්න. ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා කථා කරන්න.

ඔබතුමාට මිනිත්තු දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ආර්. එම්. පද්ම උදයසාන්ත කුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නඟන ප්‍රශ්නය මේකයි. මේ පෙනෙන්නේ අනාගතයේ පෞද්ගලිකකරණය එන දිශාවයි. ඒකයි මගේ තර්කය. මේ එන්නේ අනාගත පෞද්ගලීකරණයයි. මේ රටේ නිදහස් සෞඛ්‍ය සේවය විනාශ කිරීමේ මාර්ගයද මේ හරහා එන්නේ කියන එකයි අපට නැඟෙන තර්කය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියාවත් එක්ක අත්සන් කිරීමට නියමිතව තිබෙන ETCA ගිවිසුම හරහා මේ රටේ නිදහස් සෞඛ්‍ය සේවයට විශාල තර්ජනයක් ඇති වෙමින් තිබෙනවාය කියන කාරණාවත් මම මේ වෙලාවේ අවධාරණය කරනවා. ඒ විතරක් නොවෙයි, රාජීත සේනාරත්න සෞඛ්‍ය මැතිතුමා මේ වන විටත් අපේ රටේ දේශීය වෛද්‍ය ක්‍රම ඉන්දියාවට බිලිදෙන්න ඉන්දියාව සමඟ දේශීය වෛද්‍ය ක්‍රමය සම්බන්ධයෙන් විශේෂ ගිවිසුමක් අත්සන් කරන්න යනවා.

ඒ හරහා මොකක්ද කරන්න හදන්නේ? ඉන්දියානු අනුගත බෙහෙත්, ඉන්දියානු වෛද්‍ය ක්‍රම, ඉන්දියානු වෛද්‍යවරු ලංකාවේ පිළිගැනීමට ලක්වන ලෙස මේ ගිවිසුම අත්සන් කළොත් අපේ රටේ පාරම්පරික ආයුර්වේද වෛද්‍ය විද්‍යාවට මොකක්ද වෙන්නේ? ආයුර්වේද වෛද්‍ය විද්‍යාවේ වැදගත් කියමනක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තුවක කාලයක් තිබෙන්නේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ආර්. එම්. පද්ම උදයසාන්ත කුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මේ ඉන්දියානු ගිවිසුම අත්සන් කළොත් අපේ රටේ දේශීය වෛද්‍ය ක්‍රමයේ අනාගතය ඉවරයි. සාමාන්‍යයෙන් දේශීය වෙදකම සම්බන්ධයෙන් අපේ පාරම්පරික වෛද්‍යවරු කිව්වේ මෙහෙමයි, අපේ හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමනි.

"අපේ සිරුර මනහර නුවරක් නම් ක්ෂුද්‍ර ජීවීන් එම නුවරට කඩා වදින ආක්‍රමණික හමුදාවක් වැන්න. එම හමුදාව නුවරට ඇතුළුවීමෙන් පසුව ප්‍රතිපෛව ඖෂධ නැමැති බෝම්බවලින් දැඩි ප්‍රහාරයක් එල්ලකොට සුනු විසුනු කිරීම පහසුය. එහෙත් එයින් සිරුර නමැති නුවරටද බරපතළ හානි සිදු වන බව අමතක නොකළ යුතුයි."

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ආර්. එම්. පද්ම උදයසාන්ත කුණසේකර)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මට මේ කියමන කියවා අවසන් කරන්න දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා.

"පෙරදිග වෙදකමේ ක්ෂුද්‍ර ජීවී හමුදා මැඩීමට බෝම්බ භාවිතා නොකරයි. සිරුර නැමැති නුවරට කිසිදු සතුරෙකුට ඇතුළු විය නොහැකි සේ සිරුර සියලු අතින් සවිමත් කිරීම පෙරදිග වෙදකමෙන් සිදු වේ. ශක්තිය සහ බලය තමයි අපේ පෙරදිග වෙදකමේ නීරෝගිභාවය කියා සලකන්නේ."

අපේ රටට නොවටිනා දේවලුත් මේගොල්ලන් ගෙනැල්ලා අවසානයි. ඒ නිසා නිදහස් සෞඛ්‍ය සේවය විනාශ කිරීමට යන මේ ක්‍රමවේදය පරාජය කරන්න මේ රටේ ජනතාව පෙළ ගැහෙනවාය කියන කාරණය සහතික කරමින්, මට කථා කරන්න කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දෙන්න එතුමාට respond කරන්න.

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු ප්‍රශ්න හතරට මා පිළිතුරු දෙන්න කැමතියි. මේක පූර්ව රෝහල් ප්‍රතිකාර ක්‍රමයක්. ඒක තමයි මූලිකම දේ.

දැනට සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වන ambulance තිබෙන්නේ එක ඉස්පිරිතාලෙක ඉඳලා තව ඉස්පිරිතාලයකට ලෙඩෙක් අරගෙන යන්නයි. ඔබතුමා කියන විධියට ඒ සේවයයි, මේ සේවයයි ඒකාබද්ධ වීමක් සිද්ධ වෙන්නේ නැහැ, ගරු මන්ත්‍රීතුමා. ඒ සේවා දෙකක්. [බාධා කිරීමක්]- ඔබතුමා පොඩ්ඩක් ඉන්න, මම ඉවර කරන්නම්. යම් රෝගියෙක් three-wheeler එකෙන්, කරත්තයෙන්, බයිසිකලෙන් රෝහලකට ගෙනෙවාට වඩා -කොදු නාරටියේ ප්‍රශ්නයක් හෝ වෙන මොකක් හරි ප්‍රශ්නයක් තිබෙනවා නම්- හරි ක්‍රමයට රෝහලකට ගෙන ඒම තමයි කරන්න ඕනෑ. ඒ විධියට ආරක්ෂාකාරීව තමයි මේ සේවය දිස්ත්‍රික්ක 6ක ක්‍රියාත්මක වෙන්නේ. මම කලින් කිව්වා වාගේ දකුණු පළාතේ සහ බස්නාහිර පළාතේ පමණක් මේ ආකාරයට රෝගීන් හැත්තෑනවදහස් ගණනක් රෝහල්වලට ගෙනිහිල්ලා තිබෙනවා. දෙවැනි කාරණාව විධියට ඔබතුමා ඇහුවා, මේ සේවාව කිලිනොච්චියට ගෙනියනවා ද, ඌරුබොක්කට ගෙනියනවා ද, ගිරුවාපත්තුවට ගෙනියනවා ද කියලා. ඔව්. අපි මේ උත්සාහ කරන්නේ මේ රටේ මිලියන 21ක් වන සියලු ජනතාවට මේ සේවාව ලබා දෙන්නයි. අද වන විට හම්බන්තොට ඇතුළු ඇත පිටිසර ගම්මානවලටත් අපි ඒ සේවාව ලබා දීලා තිබෙනවා. ඒ සේවාවේදි සාමාන්‍ය response time එක විනාඩි දොළහමාරයි.

තුන්වැනි කාරණාව විධියට ඔබතුමා ඇහුවා, මේක ඉන්දියන් ආධාරයක් යටතේ ද ලබා ගත්තේ කියලා. ඔව්, ඩොලර් මිලියන 22ක් ලැබිලා තිබෙනවා. ඒක ණයක් නොවෙයි. ඒක තෑග්ගක්, gift එකක්. ඉන්දියන් ජනතාව ශ්‍රී ලංකාවේ ජනතාවට දීපු තෑග්ගක්. මේ වෙනුවෙන් නැවත ශත පහක් වත් අපි ගෙවන්න ඕනෑ නැහැ. ඒ පළමුවැනි ඩොලර් මිලියන 7.6න් තමයි අපි දකුණු පළාතේයි, බස්නාහිර පළාතේයි මේ සේවාව පටන් ගත්තේ. අවුරුද්දක් සඳහා තමයි අපට ඒ සහනය ලැබුණේ. ඒ හරහා අපි ambulances 88ක් ගෙනාවා. මේ සේවාවේ ඉන්නේ ශ්‍රී ලංකාවේ සේවකයන් පමණයි; 500ක් විතර වැඩ කරනවා. ඒ සියලුදෙනා ශ්‍රී ලාංකික සේවකයෝ. අපට තාක්ෂණික උපදෙස් ලබා දෙන්න ඉන්දියන් පුද්ගලයෙක් ඇවිල්ලා ඉන්නවා. එච්චරයි, වෙන කවුරුවත් නැහැ. මේ සේවයේ වැඩ කරන සියලුදෙනා ශ්‍රී ලාංකික සේවකයෝ. ඔවුන් ඒ සේවාව හොඳින් ලබා දීලා තිබෙනවා. අවුරුද්දක් ඉවර වුණාට පස්සේ ශ්‍රී ලංකාවේ රජය මේ වියදම සම්පූර්ණයෙන් අරගෙන තිබෙනවා. 2017 අගෝස්තු මාසයේ තමයි ඒ පළමුවැනි අවුරුද්ද ඉවර වුණේ. 2017 අගෝස්තු මස සිට 2018 අගෝස්තු මස වෙනතෙක් මේ සේවය සඳහා රුපියල් මිලියන 680ක් වෙන් කරලා තිබෙනවා. ඒ වාගේම තමයි, දෙවැනි අදියරේ ලැබෙන ඩොලර් මිලියන 15.2 වියදම් කරලා අපි ambulances 209ක් ගෙනෙනවා. එතකොට ඔක්කෝම ambulances තුන්සිය ගණනක් තිබෙනවා. ඒ ඩොලර් මිලියන 15 ඉවර වුණාට පස්සේ ශ්‍රී ලංකාවේ රජය විසින්, අපේ Budget එක හරහා අපි ආණ්ඩුවේ හිටියත්, ඔබතුමන්ලා ආණ්ඩුවේ හිටියත් ඒ දේ කරගෙන යා යුතුයි. ඒ සේවය නොමිලේ ලබා දීම තමයි සිද්ධ වෙන්නේ. මේ පදනමට ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරයා තමයි සාමාජිකයන් පත් කරන්නේ. මම මුලින්ම ඒ කරුණ පැහැදිලි කළාට ඔබතුමා ඒක අහගෙන හිටියේ නැහැ. සෞඛ්‍ය ලේකම්තුමා, මුදල් ලේකම්තුමා, Inspector General of Police ඇතුළු 4දෙනෙක් තමයි මේ පදනමට පත් කරලා තිබෙන්නේ. අපි අද මේ සේවය සඳහා පනතක් ගෙනෙනවා. අනාගතයේදී අපි ආණ්ඩුවේ හිටියේ නැති වුණත්, ඔබතුමන්ලාත් මේ විධියටම මේ සේවය ඉදිරියට කරගෙන යන්න කියලා ඉල්ලනවා.

හතරවැනි කාරණය හැටියට ඔබතුමා පෞද්ගලිකරණයක් ගැන සඳහන් කළා. අපේ නිදහස් සෞඛ්‍ය සේවාව පෞද්ගලිකරණය කරන්න කිසිම අදහසක් මෙතැන නැහැ. මේ සේවාවට කොහොමත් මුදල් අය කරන්නේ නැහැ. මේක රජයේ සේවාවක්. "1990 සුවසැරිය" සේවාව සම්පූර්ණයෙන්ම ශ්‍රී ලංකා රජයට අයිති වැඩ කටයුත්තක්. අපි මේ කරගෙන යන්නේ නිදහස් සෞඛ්‍ය රැකදීම පමණක් නොවෙයි, අපේ රටේ එදා තිබිච්ච නැති, දියුණු රටවල්වල තිබෙන සේවාවක් අපේ රටටත් ලබා දීමයි. බොහොම ස්තුතියි.

[பி.ப. 2.20] (13th Start)

ගරු එච්.එම්.එම්. හරීස් මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ் - அரச தொழில் முயற்சி மற்றும் கண்டி நகர அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. H.M.M. Harees - Deputy Minister of Public Enterprise and Kandy City Development)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ சபைக்குத் தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இந்தச் சபையில் நடைபெறும் கௌரவ பிரதமர் அவர்களின் பொறுப்பிலுள்ள அமைச்சின் கீழ்வரும் சுவசெரிய மன்றம் சட்டமூலம் தொடர்பான விவாதத்தில் கலந்து கொள்வதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன்.

இந்த மன்றத்தின்கீழ் இந்த நாட்டில் நோயாளிகளுக்கு ambulance சேவையினை வழங்குவதற்கான ஏற்பாடுகள் செய்யப்படவிருக்கின்றன. கௌரவ இராஜாங்க அமைச்சர் ஹர்ஷ த சில்வா அவர்கள் குறிப்பிட்டதுபோன்று ஆரம்பத்தில் இந்திய நாட்டின் நிதியுதவியுடன் தென் மாகாணத்திலும் மேல் மாகாணத்திலும் இந்த ambulance சேவை செயற்பட்டிருந்தாலும், இன்று நாடு பூராகவும் உள்ள நோயாளிகளுடைய நலன் கருதி இந்தச் சேவை அவசியம் தேவைப்படுகின்றது.

நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற கிழக்கு மாகாணத்தின் அம்பாறை மாவட்டத்தில் இந்தச் சேவை எப்பொழுது ஆரம்பிக்கப்படும்? என்று நான் சற்று நேரத்திற்கு முன்பு கௌரவ இராஜாங்க அமைச்சர் ஹர்ஷ த சில்வா அவர்களிடம் கேட்டபோது, இந்தச் சேவை அம்பாறை மாவட்டம் மற்றும் கிழக்கு மாகாணத்தின் ஏனைய பகுதிகளில் எதிர்வரும் செப்டம்பர் மாத இறுதியில் ஆரம்பிக்கப்படும் என்ற செய்தியைத் தெரிவித்தார். அதற்காக அவருக்கு நான் நன்றி கூறக் கடமைப்பட்டிருக்கின்றேன்.

[ගරු එච්.එම්.එම්. හරීස් මහතා]

நோயாளிகள் தங்களுடைய வீடுகளிலிருந்து வைத்தியசாலைக்கு அவசரமாகச் செல்வதற்கான இந்தச் சேவை குறிப்பாக அபிவிருத்தியடைந்த மேற்கத்தைய நாடுகளில் தாராளமாக மேற்கொள்ளப்படுகின்றது. அதே அடிப்படையில் இந்தச் சேவையை எமது நாட்டிலும் அறிமுகப்படுத்த எமது அரசாங்கம் நடவடிக்கை எடுத்திருப்பது மிகவும் வரவேற்கத்தக்க விடயம். இது நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற மாவட்டத்திலும் மேற்கொள்ளப் படவிருப்பதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன்.

கௌரவ அமைச்சர் அவர்களே, உண்மையில் இந்தச் சேவை இந்தியாவில் வெற்றிகரமாக நடைமுறைப் படுத்தப்படுகின்றது. அந்த வகையில் நோயாளிகளை மட்டுமல்ல, நோயாளர்கள் இறக்கின்றபோது அவர்களின் இறந்த உடல்களை ஆஸ்பத்திரியிலிருந்து வீட்டுக்குக் கொண்டு செல்வதற்குக்கூட இந்த வாகன வசதிகள் ஒழுங்கு செய்யப்படுகின்றன. ஆனால், இலங்கையை எடுத்துக் கொண்டால், இறந்த உடல்களை ஆஸ்பத்திரியிலிருந்து வீட்டுக்குக் கொண்டு செல்ல பெருந்தொகைப் பணத்தைச் செலவிட நேரிடுகின்றது. உதாரணமாக கொழும்பிலிருந்து அம்பாறைக்கோ அல்லது யாழ்ப்பாணத்துக்கோ இறந்த உடல்களை எடுத்துச் செல்வது என்பது மிகவும் பாரிய செலவுடனான விடயமாக மாறியிருக்கின்றது. நமது நாட்டில் ஒரு வசதி குறைந்த நபர் ஆஸ்பத்தியில் இறந்தால், அந்த இறந்த உடலை அவரது வீட்டுக்குக் கொண்டு செல்வதில் பெரும் கஷ்டம் எதிர்நோக்கப்படுகின்றது. ஆகவே, 'ஜனாஸா' என்று எனது மதத்தில் சொல்லப்படுகின்ற இறந்த உடலைக் கொண்டு செல்வதற்குரிய போக்குவரத்து வசதியை இந்தியா போன்று இலங்கையிலும் கௌரவ அமைச்சர் அவர்கள் இந்தச் சபையின் ஊடாக ஏற்படுத்தித்தர வேண்டும் என்று நான் இவ்விடத்தில் கேட்டுக் கொள்ள விரும்புகின்றேன்.

இன்று அரசாங்கம் ஒருபுறத்தில் சுகாதார வசதிகளுக்காக ஆயிரக் கணக்கான மில்லியன் ரூபாய்களைச் செலவிடுகின்றபோதிலும், மறுபுறத்தில் இளஞ் சந்ததியினர் சுகாதார ரீதியாக முழுமையாகப் பலவீனத்துக்குள்ளாகின்ற போதைவஸ்துப் பாவனை அதிகரித்துக் கொண்டு செல்கின்றது. குறிப்பாக நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற அம்பாறை மாவட்டத்தில் போதைவஸ்துடனான பொருட்கள் குளிசைகளாகவும் ஏனைய திரவியங்களாகவும் இன்று பாடசாலை மாணவர்களுக்குப் விற்கப்படுகின்றன; அவர்களுக்குத் தாராளமாகக் கிடைக்கப் பெறுகின்றன என்பதைக் கவலையுடன் தெரிவிக்கின்றேன். இது சம்பந்தமாகப் பாரிய ஒரு network இயங்கிக் கொண்டிருக் கின்றது. இதற்கு அதிகாரிகள் பலர் உடந்தையாக இருப்பதாகவும் கூறப்படுகின்றது. எனவே, இந்தப் போதைவஸ்தை ஒழிப்பதற்கான, கட்டுப்படுத்துவதற்கான நடவடிக்கைகளை உயர் மட்டத்திலிருந்து கௌரவ பிரதமரின் நேரடிக் கண்காணிப்பின்கீழ் மேற்கொள்ள வேண்டுமென்று பொறுப்புள்ள ஒரு பாராளுமன்ற உறுப்பினர் என்ற வகையில் நான் இந்த இடத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

இன்று நாங்கள் இந்த நாட்டைக் குறிப்பாகப் பொருளாதார ரீதியாக முன்னோக்கிக் கொண்டு செல்ல வேண்டும் என்று முற்படுகின்றபோதிலும், சில கட்டங்களில் ஏற்படுகின்ற இயற்கை ரீதியான அழிவுகளினாலும் நாடு பாதிப்புக்குள் ளாகின்றது. அண்மையில் பெய்த பெரும் மழை காரணமாக மட்டக்களப்பு மாவட்டத்திலுள்ள உன்னிச்சைக் குளம் நிரம்பியதனால், அதன் வான் கதவுகள் திறக்கப்பட்டதன் ஊடாகப் பெரும் வெள்ளப்பெருக்கு ஏற்பட்டு, அந்த வெள்ள நீர் மட்டக்களப்பு மாவட்ட உன்னிச்சையிலிருந்து அம்பாறை மாவட்டத்திலுள்ள குறிப்பாக, எனது தொகுதியிலுள்ள கல்முனைக் கண்டம் அதேபோல் நாணல் போன்ற வயல் நிலங்களுக்கு வந்து, கிட்டத்தட்ட 1,400 ஏக்கர் காணிகளில் வெள்ள நீர் தேங்கி நின்றதனால் அங்கு விவசாயம் செய்த விவசாயிகளின் பயிர்கள் முற்றாக நாசமாக்கப்பட்டுள்ளன.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Deputy Minister, you have only two more minutes.

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
Okay.

இதனால் இப்பொழுது அந்த விவசாயிகள் பெரும் நஷ்டத்திற்குள்ளாகியுள்ளார்கள். எனவே, பொருளாதார அபிவிருத்திக்குப் பொறுப்பான அமைச்சு அவர்களுக்குரிய நஷ்டஈட்டை வழங்க வேண்டுமென்று இந்த இடத்தில் கேட்டுக் கொள்ள விரும்புகின்றேன்.

அதேநேரம் எங்களுடைய மாவட்டத்தில் பொத்துவில் பிரதேச மக்களுடைய கல்வி நடவடிக்கைகளை மேம்படுத்துவதற்குப் பெரிதும் தேவையாகவுள்ள ஒரு கல்வி வலயத்தை நீண்ட நாட்களாக அவர்கள் கோரி நிற்கிறார்கள். அதனைக் கிழக்கு மாகாணக் கல்வி அமைச்சும் கடந்த காலத்தில் அங்கீகரித்திருக்கின்றது. எனவே, இந்த விடயத்தில் கௌரவ பிரதமர் அவர்கள் தலையிட்டு அந்தக் கல்வி வலயத்தை உருவாக்க வேண்டும் என்று கேட்டுக் கொள்ள விரும்புகின்றேன்.

இன்று இந்த நாடு பூராகவும் பொருளாதார வலயங்கள் உருவாக்கப்பட்டு வருகின்றன. ஆனால், எங்களுடைய ஒலுவில் பிரதேசத்தில் வர்த்தகத் துறைமுகம் - மீன்பிடித் துறைமுகம் திறக்கப்பட்டு 4 - 5 வருடங்கள் ஆகிவிட்ட போதிலும், அந்தத் துறைமுகங்களை மையமாக வைத்து எந்தவொரு தொழிற்பேட்டையோ அல்லது பொருளாதார வலயமோ இன்னும் உருவாக்கப்படவில்லை. ஆனால், அம்பாறை மாவட்ட இளைஞர்கள் இன்று வேலை வாய்ப்பின்றிப் பெரும் விரக்தி நிலையில் இருக்கின்றார்கள்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Deputy Minister, please, wind up now.

ගරු එච්.එම්.එම්. හරීස් මහතා
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
Please, give me one more minute.

எனவே, அந்த ஒலுவில் துறைமுகத்தை மையமாக வைத்துத் தொழிற்பேட்டைகளை ஆரம்பித்து வைப்பதில் பொருளாதார அலுவல்களுக்குப் பொறுப்பான அமைச்சு கவனம் செலுத்தவேண்டுமென்று இந்த இடத்தில் கேட்டுக்கொண்டு, விடைபெறுகின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.28]

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මේ සුවිශේෂ විවාදයට සම්බන්ධ වෙන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව මුලින්ම ස්තුතිවන්ත වෙනවා. 1990 සුවසැරිය පදනම පිහිටුවීම සඳහාද, ඊට සම්බන්ධ සහ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනත් කෙටුම්පත විවාදයට ගැනෙන වෙලාවේ අදහස් දැක්වීමට ලැබීම සුවිශේෂී අවස්ථාවක්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ විවාදය ආරම්භ වුණු වෙලාවේ ඉඳලාම මම අහගෙන හිටියා. මේ 1990 යෝජනාව සමාජගත වුණු වෙලාවේ දී මේ රටේ මහා විශාල කථාවක් ගියා. මේ රටේ දේශපාලනඥයන් මේක දඩමීමා කරගෙන ආණ්ඩුවට එළව එළවා පහර දුන්නා. ඉන්දියාවේ "රෝ" ඔත්තු සේවය එනවා; ඉන්දියාවේ වෛද්‍යවරු ලංකාවට එනවා; ඉන්දියාවේ හෙද, හෙදි නිලධාරීන් ලංකාවට එනවා; ඉන්දියාවේ කම්කරුවෝ එනවා; රියදුරන් එනවා කිව්වා. අපේ රටේ අහිංසක මිනිසුන්ට රැකියාවක් කරන්න තිබෙන අවස්ථාව අහිමි වෙන මේ දැවැන්ත අවස්ථාව මහ හරින්න කියලා පසුගිය කාලයේ මහ විශාල ශබ්ද දාපු උදවිය හිටියා. මේ වැඩේ පටන් ගත්තාට පසුව මේ උදවියගේ කට වැහුණා. මොකද, කියන්න දෙයක් නැහැ. "රෝ" ඔත්තු සේවය එනකම් බලාගෙන හිටියා. කාලකණ්ණිකමෙන් බලාගෙන හිටියා, මේකෙන් හෝ ආණ්ඩුවට පහර දෙන්න පුළුවන්ද කියලා. නමුත් වැඩේ වැරදුනා. මේ වැඩසටහන නිවැරදිව යන දිහා බලලා තමන්ගේ මතය නිවැරදි කර ගත්ත යම් පිරිසකුත් ඉන්නවා. මේක නිවැරදි වැඩසටහනක්, මේ රටේ අහිංසක දුප්පත් මිනිහා කේන්ද්‍ර කොට ගත්, ඒ අහිංසක දුප්පත් මිනිහාට ඵලදායී වෙන මේ රට පුරා ව්‍යාප්ත විය යුතු වැඩසටහනක් කියන අවබෝධය තිබෙන මන්ත්‍රීවරුන් විපක්ෂයේ සිටියදී, මේකත් කුහක විධියට දකින, මේකත් නින්දිත, කාලකණ්ණි විධියට දකින මන්ත්‍රීවරුන් මේ පාර්ලිමේන්තුවේ සිටීම ගැන ලජ්ජයි.

මීට පෙර කථා කළේ තනිකරම කුහකකමින්. මේකේ හොඳක් පෙනෙන්නේම නැහැ. අහිංසක මිනිසුන්ට මේ තුළින් වුණේ මොකක්ද කියන එක ගැන කථා කළේ නැහැ. යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට; ජනතා නියෝජිතයකුට පුළුවන් නම් මේක විවේචනය කරලා කථා කරන්න, දේශපාලන භේදයකින් තොරව ඔහු තනිකරම කුහකකම පපුවේ පිරුණු කෙනෙකු විතරයි. මේකට දේශපාලනයක් නැහැ. මේ රටේ අහිංසක මිනිසුන් වෙනුවෙන්, මේ රටේ දුප්පත් මිනිසුන් වෙනුවෙන් ලැබෙන සහනයක්. ප්‍රභූ පන්තියට කොහොමත් මේ පහසුකම් තිබෙනවා. පෞද්ගලික වාහන තිබෙනවා, පෞද්ගලික ambulance එකක් ගෙදරට ගෙන්වා ගන්නට පුළුවන්කම තිබෙනවා. මේ රටේ සාමාන්‍ය ජනතාවට, මධ්‍යම පාන්තික ජනතාවට ලබාදෙන සහනයක් විධියට මෙය අගය කළ යුතුයි. මේකේ වාසිය එන්නේ කාටද කියලා සොයා බලන එක නොවෙයි, මේ තුළින් අහිංසක මිනිසුන්ට වන සේවාව ගැන කථා කළ යුතුයි.

මේ ගැන තවත් කරුණු කිහිපයක් සඳහන් කරන්නට මා කැමැතියි. මේ සේවාව ආරම්භ කරනේ අපේ ගරු හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා. එතුමා මේ ව්‍යාපෘතිය සමාජගත කරන්නට දැඩි වෙහෙසක් දැරුවා. මට මතකයි ඒ දවස්වල මහ විශාල කණ්ඩායම් මේකට විරුද්ධ වෙද්දී, එතුමා මාධ්‍ය සාකච්ඡා තිය තියා ජනතාවට මේ වැඩසටහන ගැන පැහැදිලි කළා. 2016 ජූලි මාසයේ 28වෙනි දා මේක ආරම්භ කරන්නේ ගිලන් රථ 88කින්. මේක දකුණු පළාතේ සහ බස්නාහිර පළාතේ ඉතා සාර්ථකව, කාටවත් වචනයක් කියන්නට බැරි විධියට ක්‍රියාත්මක වෙගෙන එන විට අද ජාතික වශයෙන් මුළු රටටම මේ සේවාව ලබා දීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ඉන්දියාවෙන් හම්බවෙලා තිබෙනවා. මේක පසුගිය කාලයේ ගත්තා වාගේ ණය මුදලක් නොවෙයි, පසුගිය කාලයේ කළා වාගේ deal එකක් දාලා සාක්කුවේ කීයක් හෝ දාගෙන ඉතිරි ටිකෙන් ගිලන් රථ ගත්තා නොවෙයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා පැමිණෙන්නේ නැහැයි කියලා එතුමාගේ කාලයත් මට ලබා ගන්නා ලෙස දැනුම් දුන්නා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇමෙරිකානු ඩොලර් 7.55ක පරිත්‍යාගයකින් 2016 ජූලි 28වෙනිදා ගිලන් රථ 88කින් මේ සේවාව ආරම්භ කළා.

මෙය LIBOR විවල්‍ය ණයක්වත්, වෙන බැංකුවකින් ගත්ත ණයක්වත්, අපි සතුටු කරන්න දුන්නු භාගයක ණයක්වත් නොවෙයි. මේක ආධාරයක්. ආධාරයකින් පටන්ගෙන මේ සේවාව හොඳට ක්‍රියාත්මක වෙනවා. එය මුළු රට පුරා ව්‍යාප්ත කරන්න, ගරු රාජ්‍ය ඇමතිතුමාගේ මැදිහත් වීමෙන් ඇමෙරිකානු ඩොලර් 5.02ක් නැවත අරගෙන ඇවිත් තිබෙනවා. ඒ නිසා මෙම සේවාවේ වටිනාකම වැඩි කරගන්න, මෙයින් රටේ අහිංසක මනුෂ්‍යයාට දෙන සේවාව තවදුරටත් පුළුල් කර ගන්න කටයුතු කරන්න ඕනෑ. අපේ පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා කිව්වා වාගේ, එතුමා නියෝජනය කරන ප්‍රදේශ වන කොටියාගලට, මොනරාගලට මේ සේවාව රැගෙන යෑමේ වටිනාකම ගැන අපි කථා කරන්න ඕනෑ. එහෙම නැතිව, මේ සේවාවේ තිබෙන දුර්වලකම් හොයලා, අඩු පාඩුකම් හොයලා, බොරු බේගල් ඇදබාලා මේ ව්‍යාපෘතියට විරුද්ධව කථා කරනවා නම්, රටේ ජනතාව ඒක තේරුම් ගනීවි. වෙන ඕනෑ දෙයකට විරුද්ධව කථා කළාට අපි විවේචන ඉදිරිපත් කරන්නේ නැහැ. නමුත් මේ කටයුත්තේදී එහෙම කරන්න බැහැ.

මේ සුවසැරිය වැඩසටහන තුළින් කිසිදු භේදයකින් තොරව රටේ ජනතාවට සිදුවන සේවාව අපි කවුරුත් අගය කළ යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන්ම මේ කාරණය කියන්න ඕනෑ. මේක තමයි රටේ ස්වභාවය. හරි දේට හරියි කියන්න කට ඇරෙන්නේ නැහැ. වැරැදි දේට වැරැදියි කියන්න කට ඇරෙන්නෙත් නැහැ. තමන්ට වාසියක් වන දේවල්වලට හරියි කියන්න; ඒවා නිවැරැදියි කියලා හිට ගන්න කණ්ඩායම් එක්ක ඉන්නකොට අපට ඒක තේරෙනවා. නිවැරැදි දේ මොකක්ද කියා රටේ ජනතාව තේරුම් ගනීවි. මම හොඳ උදාහරණයක් කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අනුනායක හිමිනමක් ප්‍රකාශයක් කරනවා අපි ඊයේ මාධ්‍ය තුළින් දැක්කා. ඒ ගැන අද මේ රටම කථා වෙනවා. "හිට්ලර් විධියට හරි කමක් නැහැ, අපේ හිටපු ආරක්ෂක ලේකම්තුමා මේ රට පාලනය කිරීම සුදුසුයි" කියා උන්වහන්සේ ප්‍රකාශයක් කරනවා. මමත් බෞද්ධයෙක්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. හාමුදුරුවන්ගේ උතුම් චීවරයට අපේ ලොකු ගරුත්වයක් තිබෙනවා. ඒ ගරුත්වය හිස මුදුනේ තියා

[ගරු හේෂාන් විතානගේ මහතා]

අපි පිළිගන්නවා. අපේ ඥානසාර හාමුදුරුවෝ අධිකරණයට ගෙන යාම, සිරගත වීම පිළිබඳවත් අපට ලොකු වේදනාවක් තිබෙනවා. ඒ, එම සිද්ධිය නින්දා නොවෙයි, අපි වඳින චීවරය ඇද ගත්ත අපේ හිමිනමක් නේද කියලායි අපට ඒ වේදනාව දැනෙන්නේ. හැබැයි අපි අද දකිනවා, මේ දේශපාලනඥයන්ගේ බලලෝභිත්වය; ඔවුන් බලය හොයාගෙන යාමේ ප්‍රතිඵලයක් විධියට, ඒ සඳහා අද මහා සංඝ රත්නයත් පාවිච්චි වෙන ආකාරය. නැත්නම් ඊයේ අපේ අනුනායක හාමුදුරුවන්ගේ කටින් කියැවෙන්න ඕනෑ, ගෝඨාභය රාජපක්ෂ මහත්තයා මේ රටේ ජනාධිපති වෙනවා නම්, එතුමා ඇමෙරිකාවේ ඔබාමා වාගේ, ඉන්දියාවේ නරේන්ද්‍ර සිං මෝදි වාගේ වෙන්න ඕනෑය කියායි. මට තිබෙන ප්‍රශ්නය, හිට්ලර්ගේ නම කියවුණේ ඇයිද කියන එකයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හිට්ලර් වාගේ මිලිටරිකරණය වෙන්න කියා බණ පදයක් බුද්ධාගමේ කොතැනද තිබෙන්නේ? මම නම් අහලා තිබෙන්නේ, දසරාජ ධර්මය අනුව රාජ්‍ය පාලනය කරන්න පුළුවන් නායකයන් බලයට පැමිණිය යුතුයි කියායි. අපට ගැටලුවක් තිබෙන්නේ මේ අනුනායක හිමියන් නොමඟ යවන එක ගැනයි. අපේ ස්වාමීන් වහන්සේලා නොමඟ යවනවා. හැබැයි, උන්වහන්සේලා නොමඟ යවන්නේ කවුද? මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී කොළොන්නාවේ සුමංගල හාමුදුරුවන්ගේ සිවුර බලෙන් ගලවන්න හදපු කණ්ඩායම තමයි සුදු රෙදි ඇදගෙන ඇවිල්ලා නැවතත් මේ ව්‍යාපෘතිය තුළ ඉන්නේ. ඉතින් රටේ හොඳ වැඩක් වෙනකොට එය හොඳයි කියන්න මේ කට්ටියගේ කට ඇරෙන්නේ කොහොමද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? අද මේ රටේ තිබෙන එකම ව්‍යාපෘතිය බලය ලබා ගැනීමේ ව්‍යාපෘතිය විතරයි. රට හදන්න; රටේ දුප්පත් අහිංසක මිනිසුන්ට සේවාවක් කරන්න; දුගී දුප්පත් අහිංසක මිනිසුන් වෙනුවෙන් යම්කිසි සුබසාධන වැඩසටහනක් ගේන්න; මේ රටේ මිනිස්සු ජීවත් වන විධිය ගැන මේ උත්තරීතර ආයතනයේදී ප්‍රශ්න කරලා, ඒ ගැන අමාත්‍යවරුන්ගේ අවධානය යොමු කරවන්න නොවෙයි ඒ අය කටයුතු කරන්නේ. බලය ලබාගැනීම සඳහා කුමන හෝ ක්‍රියාදාමයකට තමයි ඒ අය යන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ජීවත් වෙන්නේ අන්න දුගී දුප්පත් ජනතාවක් සිටින රත්නපුර දිස්ත්‍රික්කයේයි. ඇඹිලිපිටිය, හම්බන්තොට වැනි ප්‍රදේශවල ජීවත් වන මිනිසුන් මේ සේවාව ලැබෙනතුරු බලාගෙන ඉන්නවා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ සුවසැරිය ගිලන් රථ සේවාව රත්නපුර දිස්ත්‍රික්කයේ ඉහළ කැලෑබද ගම්වල සිටින මිනිසුන්ට ඉක්මනින් ලබාදෙන්න කටයුතු කරන්න. අපේ ගම්වල මිනිසුන්ට මේ සේවාව විශාල භයියක් වන බව අපි දන්නවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ ගිලන් රථය ඇතුළේ උපත් 27ක් සිදු වෙලා තිබෙනවා. මෙවැනි සේවාවක් රටේ තිබුණේ නැත්නම් මේ දරුවන් 27දෙනාගෙන් කී දෙනෙක් මැරෙන්න තිබුණාද? මේ ගිලන් රථය තුළ උපත් 27ක් සිදු වෙනවා කියන්නේ, ඒ අයට වෙන විකල්පයක් තිබුණේ නැහැය කියන එකයි. ගමක තිබෙන කුබෝටා ට්‍රැක්ටරයක, නැත්නම් ත්‍රීවීලර් එකක ඒ අම්මාවරු අරගෙන ගියා නම් මේ පහසුකම දෙන්න බැහැ. ඒ නිසා ඔබතුමන්ලා මේ සේවාව අගය කරන්න. මේ වෙනුවෙන් පෙනී සිටින්න පුළුවන් හැම කෙනෙක්ම රටේ දේශපාලන අධිකාරියේ පාට, පක්ෂ භේදවලින් තොරව ඒ සඳහා භයියක් වෙන්න ඕනෑය කියන කාරණය මම මතක් කරනවා.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මේ රටේ අහිංසක, දුප්පත් මිනිසුන් වෙනුවෙන් සමාජ භේදයකින්, දේශපාලන භේදයකින් තොරව ඔබතුමා කරගෙන යන මේ වැඩසටහන රට පුරා ස්ථාපිත කිරීමේ කාර්යය සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවායි කියා අපි පතනවා. 'රෝහල් තිබෙන විට මේවා මොකටද?' කියන අදහස මීට කලින් කථාවකදී කියැවුණා. දියුණු ඕස්ට්‍රේලියාව, ඇමෙරිකාව ආදි රටවලත් මේ වාගේ ගිලන් රථ සේවා තිබෙනවා. ඒවායේ රෝහල් මෙහේට වඩා දියුණුයි. අපේ සමහර රෝහල්වල වෛද්‍යවරු නැහැ. අපිට වඩා දියුණු රටවලත් මේ සේවාව ක්‍රියාත්මක කරන්නේ මෙහි අවශ්‍යතාව දන්නා නිසායි. ළිං මැඩි මානසිකත්වයේ සිටින ගොබ්බයන්ට මෙහි වටිනාකම දකින්න බැහැ. ඔවුන් දකින්නේ මෙහි අඩු පාඩු විතරයි කියන කාරණය මතක් කරමින්, මේ රටට අවශ්‍ය ඉතාම වැදගත් වැඩසටහනක් ගෙන එන ගරු රාජ්‍ය අමාත්‍යතුමාට සහ කාර්ය මණ්ඩලයට සුබ පතමින්, මගේ වචන කීපය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. I. Charles Nirmalanathan. You have 12 minutes.

[பி.ப. 2.38]

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, நன்றி. தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சினால் முன்வைக்கப்பட்டுள்ள 1990 சுவசெரிய மன்றம் சட்டமூலம் தொடர்பான இன்றைய விவாதத்தில் கலந்து கொண்டு பேசுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்கு முதலில் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இன்று நோயாளர்களை வைத்தியசாலைக்குக் கொண்டு செல்வதில் பல சிரமங்கள் எதிர்நோக்கப்படுகின்றது. ஆகவே, இன்று நோயாளர்களை ambulance வண்டிமூலம் வைத்தியசாலைக்குக் கொண்டு செல்வதற்கு ஏற்ற வசதிகளைச் செய்யும் முகமாக கௌரவ பிரதம அமைச்சர் அவர்களின் பொறுப்பிலுள்ள தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சு இந்தச் சட்டமூலத்தை இந்தச் சபையில் முன்வைத்துள்ளது. இது உண்மையில் வரவேற்கத்தக்க விடயமாகும். இதன்மூலம் நோயாளர்கள் மிக விரைவாக வைத்தியசாலைக்குச் செல்வதற்கான வாய்ப்புக்கள் ஏற்படுத்தப்படும்.

கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, இன்று பல சட்டங்கள் சாதாரண மக்கள் பயன்பெற முடியாத வகையில் இருக்கின்றன. ஆகவே, சாதாரண மக்களும் நோயாளர் காவு வண்டிச் சேவையைப் பெற்றுக் கொள்ளக்கூடிய வகையில் குறித்த நடைமுறையை இலகுபடுத்த வேண்டும் என்று உங்களிடம் நான் கேட்டுக்கொள்கின்றேன். அவ்வாறு செய்தால் மட்டும்தான், உண்மையிலே இந்தச் சேவை சாதாரண மக்களைச் சென்றடையும். அதேநேரம் இதன் உச்சப் பயனை நோயாளர்கள் அனுபவிக்கவேண்டுமென்றால், மக்கள் இந்தச் சேவை குறித்துத் தெளிவுபடுத்தப்படல் வேண்டும்.

உதாரணமாக ஒரு வைத்தியசாலையிலிருந்து 50 கிலோமீற்றருக்கு அப்பால் உள்ள ஒரு கிராமத்தில் ஒருவர் திடீரென நோய்க்குள்ளானால் அல்லது பாம்புக் கடிக்குள்ளானால் சம்பந்தப்பட்டவர்கள் யாரை அணுகி, அந்த ambulance வண்டிச் சேவையைப் பெற்றுக்கொள்ள முடியும் என்பது பற்றி மக்கள் மத்தியில் தெளிவுபடுத்தப்படல் வேண்டும்; அந்தச் சேவையை இலகுவாகப் பெற்றுக் கொள்ளக்கூடிய வகையில் விதிமுறைகள் உருவாக்கப்படல் வேண்டும். இந்தத் திட்டத்தைத் தாங்கள் வட மாகாணத்திற்கும்

කොණ්ඩු වරුවත නල්ලතු. ආනාල්, අතු උණ්මෙයිලේයේ මක්කළුක්කුප් පයනුළ්ළතාක අමෙවතර්කු නටවටික්කෙ එටුක්ක වේණ්ටුම් එන්රු තංකළිටම් කේට්ටුක් කොළ්කින්රේන්.

ඉන්තච් සේවෙයිල් පණියාළර්කළ් එප්පටි උළ්වාංකප් පටුවාර්කළ් එන්පතු පර්රියුම් කෙළරව ඉරාජාංක අමෙච්චර් අවර්කළ් තෙළිවුපටුත්තුවතු නල්ලතු. ඒර්කනවේ පණියිල් අමර්ත්තප්පට්ටුළ්ළවර්කළෙ නියමිප්පතා? අල්ලතු පුතිතාකප් පණියාළර්කළෙ උළ්වාංකුවතා? එන්පතු පර්රිත් තෙළිවුපටුත්ත වේණ්ටුම්.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු හර්ෂ ද සිල්වා රාජ්‍ය අමාත්‍යතුමා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු මන්ත්‍රීතුමා, මා ඒ ගැන පැහැදිලි කරන්නම්. ඒ දැනුවත් කිරීම කරන්න ඔබතුමන්ලා අපට සහය වන්න. මොකද, අප ඒ සේවාව මුලින්ම බස්නාහිර පළාතේත්, දකුණු පළාතේත් පටන් ගත්තාම ඒ ගැන දැනුවත් වන්න යම්කිසි කාලයක් ගියා. නමුත් දැන් වනකොට බොහෝ දෙනා ඒ සම්බන්ධයෙන් දන්නවා. ඒ සේවාව රටේම ව්‍යාප්ත වෙලා නැති නිසා අප තවම advertising campaign එකක් කරලා නැහැ. ලබන මාසය අවසන් වන්න කලින් අපි යාපනයට එනවා. ලබන මාසය අවසන් වන්න කලින් අපි යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව්, වව්නියාව කියන දිස්ත්‍රික්ක පහේම ඒ සේවාව ආරම්භ කරනවා. අපි දැනට බඳවා ගෙන තිබෙනවා 120ක කණ්ඩායමක්. පූර්ව පුතිකාර තාක්ෂණික නිලධාරීන් 60දෙනෙකුත්, රියැදුරන් 60දෙනෙකුත් බඳවාගෙන තිබෙනවා.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(මාණ්පුමිකු இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

ගරු ඇමතිතුමා, driversලා 60දෙනෙකු බඳවා ගත්තා කියා කිව්වා නේ. ඒ පුදේශයේ සිටින driversලා ගත්තා ද, එහෙම නැතිනම් පිටින් ගත්තා ද කියන එක තමයි මා අහන පුශ්නය වන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු මන්ත්‍රීතුමා, යාපනයේ තමයි සියලු interviews පැවැත්වූයේ. කොළඹ interview කරලා එහේ ගෙන ගියේ නැහැ. ඒ දිස්ත්‍රික්ක 5 පිරිස තමයි යාපනයේ පැවැත්වූ interviewsවලට ආවේ. ඒ ආ අයගෙන් තමයි අපි ඒ 60දෙනා තෝරා ගෙන තිබෙන්නේ. සමහර විට ඉදිරියේදී තවත් බඳවා ගැනීම් සිද්ධ වේවි. වෙනත් පුදේශවලින් නොවෙයි ඒ අය බඳවාගෙන තිබෙන්නේ. මොකද, ඒ බඳවා ගන්නා අයට ඒ පැත්තේ භාෂාව කතා කරන්න පුළුවන් වන්න ඕනෑ; ඒ පුදේශය ගැන දැනුමක් තිබෙන්න ඕනෑ. මේ සියලු කාරණා සලකා තමයි ඒ පුදේශවලින් ඒ පිරිස බඳවා ගත්තේ. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා ඇහුවා කෙනෙකුට නයෙකු දෂ්ට කළොත් ඒ කෙනා සිටින තැනට කිලෝමීටර 50ක දුරක් තිබෙනවා නම් ambulance එකට එතැනට යන්න කොච්චර වෙලාවක් යාවිද කියා. අප ඒ ambulance ස්ථාපිත කරන්නේ විනාඩි දොළහමාරක විතර කාලයකින් අපට respond කරන්න පුළුවන් වන විධියටයි. එහිදී අපි බලනවා distance එක කොතෙක්ද, population එක කොපමණද කියා. ඒ අනුව computer simulate කරලා අපි හිතනවා, 'අපි මෙන්න මෙතන තමයි ambulance එක park කළ යුත්තේ.' කියා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා දැනට ඒ සියලු ambulance park කරන්නේ පොලිස් ස්ථානවල බව. උතුර පුදේශයේත් ඒ ambulance park කරන්නේ පොලිස් ස්ථානවලමයි. උතුර පළාතේ ඕනෑම පුද්ගලයකු වෙත විනාඩි දොළහමාරක විතර කාලයකින් ළඟා වන්න තමයි අප උත්සාහ කරන්නේ.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(මාණ්පුමිකු இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

කෙළරව ඉරාජාංක අමෙච්චර් අවර්කළේ, නන්රි. නෝයාළර්කළෙ වෛත්තියචාලෛක්කු එටුත්තුච් චෙල්වතෙ ඉලකුවාක්කුම් වකෙයිල් ඉන්තත් තිට්ටත්තෛ නීංකළ් ඉලවචමාක ආරම්පික්ක ඉරුක්කින්රීර්කළ්. අතේනේරම් ඉන්රු පොරුළාතාරත්තිල් මිකවුම් කෂ්ටප්පටුකින්ර ඔරු නපර් වෛත්තියචාලෛයිල් ඉරන්තුවිට්ටාල්, අවරුටෙය උටලෛච් චම්පන්තප්පට්ට උරවිනර්කළ් වීට්ටුක්කු එටුත්තුච් චෙල්වතිල් මිකප් පෙරිය චිරමත්තෛ එතිර්නෝක්කුකිරාර්කළ්. ඒනෙනිල් කුරිත්ත වාකනච් චොන්තක්කාරර්කළ් කුරුකිය තූරමාක ඉරුන්තාලුම් 8,000 - 10,000 රූපා කට්ටණම් අරවිටුවතු ඉන්රු එල්ලා මාවට්ටංකළිලුම් වළමෙයාක ඉරුක්කින්රතු. අතේනේරම් ඉරන්ත උටලෛ එල්ලා වාකනත්තිලුම් ඒර්රිච් චෙල්වතුමිල්ලෛ. ආකවේ, කෙළරව ඉරාජාංක අමෙච්චර් අවර්කළේ, වෛත්තියචාලෛකළිල් ඉරක්කින්රවර්කළින් උටල්කළෛ අවර්කළින් වීටුකළුක්කු උරවිනර්කළ් එටුත්තුච් චෙල්වතර්කාන ඔරු නිකළ්ච්චිත්තිට්ටත්තෛ එතිර්කාලත්තිල් ආරම්පික්ක වේණ්ටුම් එන්ර යෝචනෛයෛ මුන්වෛක් කින්රේන්. එනක්කු මුන්පු පේචිය පිරති අමෙච්චර් අවර්කළුම් ඉතු චම්පන්තමාකක් කුරිප්පිට්ටිරුන්තාර්. ඉන්ත විටයම් උටනටියාකච් චෙයර්පටුත්තප්පට වේණ්ටුම් එන්පතිල්ලෛ. ඉතනෛ එතිර්කාලත්තිලාවතු නටෛමුරෛප්පටුත්ත නටවටික්කෛ එටුක්ක වේණ්ටුම්.

ඉන්රු චාතාරණ වාළ්වුක්කේ මක්කළ් කෂ්ටප්පටුකින්ර නිලෛයිල් අවර්කළ් උරවිනර්කළින් ඉරන්ත උටලෛක් කොණ්ටු චෙල්වතිල් මිකවුම් තුන්පකරමාන චූළ්නිලෛයෛ එතිර්නෝක්කුකින්රාර්කළ්. නෝයාළර් අම්පියුලන්ස් වණ්ටිච් චේවෛයෛ ඉන්තිය අරචාංකත්තින් උතවියුටන් මේර්කොළ් වතුපෝල ඒතෝ ඔරු නාට්ටින් උතවියුටන් අල්ලතු ඉලංකෛ අරචාංකත්තින් පංකළිප්පුටන් කුරිත්ත නිකළ්ච්චිත් තිට්ටත්තෛයුම් නිච්චයම් අමුල් චෙය්ය වේණ්ටුම්. අතන්මූලම් මක්කළ් පෙරිතුම් නන්මෛයටෛවාර්කළ්. කෙළරව අමෙච්චර් අවර්කළ් ඉන්ත විටයත්තිලුම් කවනම් චෙලුත්ත වේණ්ටුම්.

අටුත්තතාක, ඉරුපතායිරම් පට්ටතාරිකළුක්කු වේලෛ වාය්ප්පු වළංකුම්මුකමාකත් තංකළුටෙය අමෙච්චර්ච් චේර්මුකත්තේර්වු නටත්තප්පට්ටුළ්ළතු. අන්ත නේර්මුකත්තේර්වු පුළ්ළි අටිප්පටෛයිල් ඉටම්පෙට්රුළ්ළතු. ඉන්ත වකෛයිල් මුතර්කට්ටමාක ඉයායිරම් පට්ටතාරිකළුක්කු නියමනම් වළංකුවතර්කුම් මිකුති පතිනෛයායිරම් පේරුක්කුම් ආරු මාතංකළ් කළිත්තු නියමනම් වළංකුවතර්කුම් අමෙච්චු තීර්මානිත්තිරුප්පතාක නාන් අරින්තේන්. ආනාල්, ඉව්වළවු

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

කාලමුත් පට්ටම් පෙට්ට ආණ්ඩු අඩිප්පඩෙයිල්තාන් පට්ටතාරිකළුක්කු නියමනංකළ් වළංකප්පට්ටන. ඉන්ත විඩයම් කෙළරව ඉරාජාංක අමෙච්චර් අවර්කළුක්කු නන්රාකත් තෙරියුම්. ඒර්කනවේ ඉන්ත නියමනම් ආණ්ඩු අඩිප්පඩෙයිල් වළංකප්පට්ටපෝතිලුම් තර්පෝතු පුළ්ළි අඩිප්පඩෙයිල් වළංකප්පඩුවතන් කාරණම් එන්න? කුරිත්ත නියමනම් පුළ්ළි අඩිප්පඩෙයිල් වළංකප්පඩුමානාල් සම්පන්තප්පට්ටවර්කළ් ඉව්වළවු කාලමුම් කර්ර කල්වියිනාල්, පල්ලෙක්කළකප් පට්ටත්තිනාල් -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. Member, you have two more minutes.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(මාණ්පුමිකු ඉ. චාර්ල්ස් නිර්මලනාතන්)
(The Hon. I. Charles Nirmalanathan)

ඉන්තත් තේර්වින්පෝතු සම්පන්තප්පට්ටවර්කළ් පල්කලෙක් කළකත්තිල් පෙට්ර පට්ටත්තෙ කුරෙත්තු මතිප්පිට්ටු වේරු පලවිතමාන විටයංකළුක්කුප් පුළ්ළිකළ් ඉටප්පට්ටිරුක් කින්රන. ඉන්ත නියමනංකළෙ අරසියල් ර්තියාක වළංකුවතර්කාකත්තාන් ඉව්වාරු පුළ්ළිකළ් ඉටප්පඩුකින්රන එන්රු කුරිත්ත ඉළෙඥර්කළිටෙයේ සන්තේකම් එළුන්තුළ්ළතු. ඉතු සම්පන්තමාක තංකළුටෙය අමෙච්චින් චෙයලාළරිටම් චෙන්රු නාන් කතෙත්තපෝතු, "ඉන්ත නියමනංකළ් අරසියල් ර්තියානතල්ල" එන්රු කූරිනාර්. උණ්මෙයිල් අතෙ නාන් ඒර්රුක්කොළ්ළ මරුක්කින්රේන්. අතේනේරම් චට්ටත්තිර්කු මුරණාන චෙයර්පාටුකළෙච් චෙය්කින්රවර්කළ් පලර් ඉන්රු අමෙච්චරවෙයිල් ඉරුක්කින්රපෝතු ඉන්තත් තෙරිවු එව්වාරු සුයාතීනමාක අමෙයුම් එන්ර මිකප් පෙරිය සන්තේකම් පට්ටතාරිකළ් මත්තියිල් ඒර්පට්ටුළ්ළතු. ඉන්රු එනක්කුම් අන්තච් සන්තේකම් ඒර්පට්ටුළ්ළතු. ඒනෙන්රාල්, ඉන්තෝනේෂියාවිලිරුක්කින්ර කොට්ටෙප් පාක්කෙ අංකිරුන්තු ඉලංකෙක්කුක් කොණ්ටුවන්තු, ඉලංකෙක් කොට්ටෙප් පාක්කු එන්රු චොල්ලි ඉන්තියාවුක්කු අතනෙ අනුප්පුකින්ර අමෙච්චර්කළුම් උංකළුටෙය අරසාංකත්තිල් ඉරුක්කිරාර්කළ්. අප්පටියාන අමෙච්චර්කළ් ඉරුක්කින්ර පෝතු, එප්පටි අරසියල් කලක්කාමල් ඉන්ත නියමනංකළෙ උංකළාල් වළංක මුටියුම්? එන්රු ඉන්රු ඉළෙඥර්කළ් මත්තියිල් සන්තේකම් එළුන්තුළ්ළතු. ඉන්රු මන්නාර් මාවට්ටත්තිල් පට්ටතාරිකළ් මාවට්ටච් චෙයලකම් මුන්පු ආර්ප්පාට්ටම් චෙය්කින්රාර්කළ්. වටක්කින් ඒනෙය මාවට්ටංකළිලුම් අතේපෝන්රු ආර්ප්පාට්ටම් චෙය්වාර්කළ් එන්රු නාන් එතිර්පාර්ක්කින්රේන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(මාණ්පුමිකු ඉ. චාර්ල්ස් නිර්මලනාතන්)
(The Hon. I. Charles Nirmalanathan)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක කාලයක් දෙන්න.

කෙළරව අමෙච්චර් අවර්කළේ, ඉන්ත නියමනංකළිල් අරසියල් කලක්කාමල් ඉරුප්පතර්කාක පට්ටම් පෙට්ර ආණ්ඩු අඩිප්පඩෙයිල් නීංකළ් ඉන්ත නියමනංකළෙ වළංක වේණ්ටුම්. ඒර්කෙනවේ 2012ආම් ආණ්ඩු මාර්ච් 31ආම් තිකති කුරිත්ත නියමනම් වළංකප්පට්ටිරුක්කින්රතු. ඉන්රු 5,000 පේරෙ උළ්වාංකුවතාකවිරුන්තාල්, 2013, 2014ආම් ආණ්ඩුකළිල් පට්ටම් පෙට්රවර්කළෙ නේරඩියාක උළ්වාංකුංකළ්. අප්පටියානාල් අන්ත නියමනංකළිල් අරසියල් චම්පන්තප්පඩාතු. ආකවේ, කෙළරව අමෙච්චර් අවර්කළේ, ඉන්ත විඩයත්තෙ මිකවුම් කරුත්තිල් එටුත්තුච් චෙයර්පඩ වේණ්ටුම්. ඉන්ත නියමනංකළිල් අරසියල් චම්පන්තප්පට්ටාල් අරසාංකම් මිකප් පෙරිය පාතිප්පෙච් චන්තික්කුම් එන්රු කූරි, විටෙපෙරුකින්රේන්. නන්රි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. මීළඟට ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.51]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්තුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඉතාමත්ම කාලෝචිත, රටට වැදගත් මාතෘකාවක් වන "1990 සුවසැරිය පදනම පනත් කෙටුම්පත" පිළිබඳ විවාදයේදී අපි හඳවතින්, ඉතාම සද්භාවයෙන් තමයි ඒ සම්බන්ධයෙන් වචනයක් හෝ කථා කරන්න සූදානම් වන්නේ. හැබැයි, මෙම විවාදයේදී පද්ම උදයශාන්ත මන්ත්‍රීවරයා ඇතුළු විශාල පිරිසක් මොකක්දෝ, කියන්න බැරි තරම් පුදුමාකාර කුහකකමකින් තමයි කථා කළේ. මෙයින් අපේ රටට මේ ඉෂ්ට වන්නේ විශාල ප්‍රජා සේවයක් බව විශේෂයෙන් කියන්න ඕනෑ. මෙච්චර විශාල සේවයක් සිද්ධ වෙද්දී ඒක වළක්වන්න, විනාශයම ප්‍රාර්ථනා කරන, පුදුමාකාර කුහකම් පිරිච්ච මර ලතෝනියක්, මර අඳෝනාවක් කරනවා අපි දැක්කා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේකට තමයි කියන්නේ "දෙයියෝ දෙනවා, භූතයෝ වළක්වනවා" කියලා. ඉන්දියාවෙන් අපට මේ වාගේ විශාල සහනයක් ලැබෙද්දී භූතයෝ ටිකක් මේකට කලබලවෙලා, විවිධ මතිමතාන්තර හදාගෙන මේ ගැන ලොකු අවලාදයක්, මේ පිළිබඳව ද්වේශ සහගත බවක් තමයි පෙන්නුම් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දවස්වල රූපවාහිනියේ යනවා "මහරජ කංසා" කියලා ටෙලිනාට්‍යයක්. මහරජ කංසා කියන කථාව පුරාම කියැවෙන්නේ සුරයින්ගේ සහ අසුරයින්ගේ කථාවයි. ලෝකය විනාශ කරන්න ප්‍රාර්ථනා කරන්නේ අසුරයෝ. මහරජ කංසා කියන නාට්‍ය තුළ විනාශය, දුක, කඳුළු, වේදනාව, මරණය, ලේ මේ සියල්ලම ප්‍රාර්ථනා කරන අසුරයන් එක්ක තමයි මේ සුරයින්ට ගැටෙන්න සිද්ධවෙලා තිබෙන්නේ.

මේ රටේ විනාශය ප්‍රාර්ථනා කරන, මේ රටේ සුවහසක් දුක් විඳින ජනතාවගේ සුබසිද්ධියට විඝ්න කරන ඒ මර ලතෝනි තියන අසුරයින්ගේ, ඒ භූතයින්ගේ ශබ්දය අද අපි ඇහුවා. දෙයියෝ දෙන කොට භූතයෝ වළක්වනවා. හැම තිස්සේම හොඳ දේවලට හිත යන කොට භූතයෝ ඇවිල්ලා ඒක වළක්වනවා. එහෙම භූතයෝ ටිකක් තමයි ඉතාමත්ම හොඳ සත්කාරයකට මේ විධියට අවලාද නහන්නේ කියන එක එක මම විශේෂයෙන් කියනවා. මේක පිටි පස්සේ "රෝ" ඔත්තු සේවය එනවා, අරක එනවා කියනවා. ඉතිහාසයෙන් පටන් ගන්නවා නම්, බුදුහාමුදුරුවන්ගේ ධර්මය අපේ රටට ගෙනාපු එක ගැනත් අපි කථා කරන්න ඕනෑ. අපේ රටේ මහා සංස්කෘතිය, අපේ ජන ජීවිතය, ඉතිහාසය, අපි වැළඳගෙන තිබෙන ආගම මේ සියල්ලම අපට ඉන්දියාවෙන්

ආවේ. විජය රජ්ජුරුවන්ගෙන් පටන් ගත්තාම, මේ ආර්ය වර්ගයා ඉන්දියාවෙන් ආවේ. ඉන්දියාවෙන් අපට ඒ මහා සංස්කෘතිය ලැබෙන කොට, බුදුරජාණන් වහන්සේගේ ධර්මය ලංකාවට ගෙන එන කොට, දන්ත ධාතූන් වහන්සේ ඉන්දියාවෙන් මේ රටට වැඩම කරන කොට එහෙම නම් මේවාත් "රෝ" ඔන්තු සේවයේ හෝ, ඉන්දියන් කුමන්ත්‍රණවල හෝ ප්‍රතිඵල හැටියට තමයි අපට දකින්න සිද්ධ වන්නේ. ඒක තමයි කියන්නේ "දෙයියෝ දෙනවා, භූතයෝ වළක්වනවා "කියලා. ඒක තමයි මට මේ පිළිබඳව විශේෂයෙන් කථා කරන්න තිබෙන්නේ. කිසිම දෙයක් සුබවාදීව දකින්නේ නැති මේ භූතයෝ මේ විධියට කථා කරන එක වැරැදියි. මේකට ගමේ ගොඩේ කියමනක් තිබෙනවා, "මොකක්ද කහගන්න නියපොත්තක් නැති වුණාට ලොකු ටෝක් දෙනවා" කියලා. අපට මේකෙන් විශාල සේවයක් සිද්ධවෙලා තිබෙනවා. මේ වන විට මහමහදී ඉපදෙන්න ඉඩ තිබුණු දරුවෝ 27ක් මේ ඇම්බියුලන්ස් තුළ ඉපදිලා තිබෙනවා. එහෙම තිබුණේ නැත්නම් මේ කැගහන භූතයින්ගේ ගෙවල්වල ගිහිල්ලාද මේ දරුවෝ ප්‍රසූත කරන්නේ? තවමත් අපේ රටේ සෞඛ්‍ය සේවය යම් ආකාරයකින් දියුණු නැත්නම්, ඒකට වෙනත් ආකාරයකින් විකල්ප ගන්න එකේ තිබෙන වැරැද්ද මොකක්ද කියන එක මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම අහනවා.

ඉන්දියාවෙන් ගෙන්වන ව්‍යාඝ්‍රා ඔය භූතයෝ පාවිච්චි කළ අවස්ථා අපි දැක්කා; සමහර ගෙවල්වල තිබුණා. ගෙවල්වල පාවිච්චි කරලා ඒවා හම්බ වුණා. ඉන්දියාවෙන් ගෙනෙන "ව්‍යාඝ්‍රා" පාවිච්චි කරන්න පුළුවන්, ඒ ගෙවල්වල අයට, ඒ අයගේ ඥාතීන්ට සහ මිත්‍රයන්ට. ඉන්දියාවේ ඉන්න නළු නිළියන් ගෙන්වා තමන්ගේ ඡන්දය දිනා ගන්න campaign කරන්න පුළුවන්, ඔය කෑ ගහන භූතයන්ට සහ ඒ කොම්පැනියට. හැබැයි අපේ රටේ අභිංසක රෝගීන් සුවපත් කරන්න ඉන්දියාවෙන් ගෙන ආ මේ සුවසැරිය ඇම්බියුලන්ස් සේවාව ගැන ඔරොප්පු වෙනවා. මම හිතන්නේ ඒවා ඉතාම කුහක කතා කියලායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා ගොන් කතාවක් කිව්වා. තප්පුලාගෙන තප්පුලාගෙන යන කොට වරදිනවා. එතුමා කිව්වා, අපේ රටේ තිබෙන ආයුර්වේදය විනාශ කරන්න ඉන්දියාවෙන් මහා විශාල කුමන්ත්‍රණයක් දියත් වනවා කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අහන්න කැමැතියි, අපේ රටට ආයුර්වේදය කොහෙන්ද ආවේ කියා. ඉන්දියාවේ තිබුණු වේද ශාස්ත්‍රවලින් එක් වේදයක් තමයි ආයුර්වේදය. ඉන්දියාවෙන් තමයි ආයුර්වේදය ආවේ. ඒක තමයි අද අපේ රටේ පවත්වාගෙන යන්නේ. අපේ රටේ සිටින මේ හැමී‍ම් තිබෙන භූතයන්ට පින් සිද්ධ වන්න අදටත් අපේ රටට අවශ්‍ය වන සියලු දේශීය ඖෂධ බහුතරයක් -නෙල්ලි ගෙඩියේ, ඉරමුසු ටිකේ, කෝමාරිකා ටිකේ ඉඳලා සියල්ල- අප ගෙනෙන්නේ ඉන්දියාවෙනුයි. ඉන්දියාවෙන් තමයි ආයුර්වේදය ගෙන ආවේ. ඉන්දියාවෙන් ගෙනැල්ලා තමයි ආයුර්වේදය අපේ රටේ ස්ථාපිත වූයේ. ඒවා ගැන මොකවත් නොදන්නා භූතයෝ දැන් කෑ ගහනවා, අපේ රටේ දේශීය වෛද්‍ය කර්මාන්තයට විෂ කරන්න ඉන්දියාව මහා කුමන්ත්‍රණයක් දියත් කරනවා කියා. මේවා පහළ වුණේ කොහෙන්ද, මේවා හැදුණේ කොහෙන්ද ආදිය මොකවත් නොදන්නා මේ කුහක භූතයන් පිළිබඳව මගේ කනගාටුව පළ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 2.57]

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(මාණ්පුමිකු இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1990 සුවසැරිය පදනම පනත් කෙටුම්පත දෙවැනිවර කියවීම සහ සුරාබදු ආඥාපනත යටතේ නිවේදන සහ ජාත්‍යන්තර වෙළෙඳ කටයුතු සම්බන්ධයෙන්, ආනයන හා අපනයන (පාලන) පනත යටතේ නියෝග ඉදිරිපත් කරන මෙම මොහොතේ මෙම පනත් කෙටුම්පතට සංශෝධන ඉදිරිපත් කරනවාද කියලා මම ගරු රාජ්‍ය ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි. මේ යෝජනාවට අදාළ සංශෝධන අපට මේ වන තෙක් ලැබී නැහැ. සංශෝධනයක් ඉදිරිපත් කරන්න සූදානමක් තිබෙනවාද කියලා මම අහනවා. මොකද, මේ වන තෙක් අපට කිසිදු සංශෝධනයක් ලැබී නැහැ. මේ පනත් කෙටුම්පත මේ විධියටම සම්මත වෙනවාද කියන එකයි මම අහන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු මන්ත්‍රීතුමනි, මෙම පනත් කෙටුම්පතට අදාළ සංශෝධන අපි ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

ඒ සංශෝධන අපට ලැබිලා නැහැ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

සංශෝධන දැන් table කරයි.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

එහෙම බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට කියනවා,-

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

සංශෝධන පිළිබඳව මම පොඩ්ඩක් කියන්නම්. ඉදිරිපත් වෙලා තිබෙන්නේ සිංහල හා දෙමළ පරිවර්තනයේ වචන දෙක තුනක වෙනසක් පමණයි. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා මට මේ දැන් කිව්වා, ඒක ඉදිරිපත් කරනවා කියලා.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

බොහොම ස්තුතියි. ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමාට චෝදනා කරනවා, තවත් මන්ත්‍රීවරුන්ට චෝදනා කරනවා. නමුත් ගරු රාජ්‍ය ඇමතිතුමනි, මේ සේවය ගැන අපි, පෞද්ගලිකව මම, කිසිම වෙලාවක කිසිම චෝදනාවක් කරන්නේ නැහැ. මේ සේවය රටට වුවමනා කරන සේවයක්. ඇතැමුන් කිව්වා වගේ මේ සේවාව ඉන්දියාවේවත් නැති සේවයක්. අපි දකිනවා, බටහිර රටවල ස්වභාවික ආපදාවක් වුණාම, හදිසි අනතුරුක් වුණාම, රිය අනතුරක් වුණාම, විනාඩි ගණනකින්, තත්ත්පර ගණනකින් ගිලන් රථ එනවා. ලංකාව අනිත් අතින් දියුණු නැති වුණත්,- මම දන්නේ නැහැ, ඒ තරමටම ජනතාව ගිලන් වෙලා ඉන්නවාද කියලා. ජනතාව ගිලන් වෙලා ඉන්න තරමටම දැන් ඇම්බියුලන්ස් තිබෙනවා. හැබැයි, අපට භයක් තිබෙනවා; අපට සැකයක් තිබෙනවා. ඔබතුමාට වොක්ස්වැගන් කර්මාන්තශාලාව විතරයි කරගන්න බැරි වුණේ. හැබැයි, ඔබතුමාට ඒක කරගන්න බැරි වුණත්, ඔබතුමාගේ මහන්සිය පැත්තකටවත් දාන්නේ නැතුව මහන්සි වෙලා ඔබතුමා මේ කටයුත්ත කළා. හැබැයි, පොඩ් අඩු පාඩුවක් තිබෙනවා. මේ සංශෝධනය තුළ මේකට මොනවා ඇතුළත් වෙයිද කියලා අපි දන්නේ නැහැ. පළාත් සභා පනතේ

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

සංශෝධන පිළිබඳව අපි දන්නවා නේ. පළාත් සභා පනතේ සංශෝධනය තුළින් නංගි පෙන්නලා අක්ක දුන්න ක්‍රියාවලිය කරලා අදත් හොට පටලවාගෙන නේ ඉන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(මාණ්පුමිකු (කලානිති) හර්ෂ ත සිල්වා)
(The Hon. (Dr.) Harsha De Silva)
මේකට අදාළ සංශෝධනය තමයි ඔබතුමා ඉන්න පැත්තේ බෙදන්නේ. කරුණාකරලා ඉස්සෙල්ලාම ගරු ඉන්දික අනුරුද්ධ මන්ත්‍රීතුමාට ඒ සංශෝධනය දෙන්න.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(මාණ්පුමිකු ඉන්දික අනුරුත්ත හේරත්)
(The Hon. Indika Anuruddha Herath)
බොහොමත්ම ස්තුතියි. සංශෝධනය ඇවිල්ලා තිබෙන්නේ.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(මාණ්පුමිකු ඉන්දික අනුරුත්ත හේරත්)
(The Hon. Indika Anuruddha Herath)
ඔබතුමා ගැන මට වෙනම විවාදයක් තිබෙනවා. ඔබතුමා ගැන විවාදය පස්සේ කරමු.

මම කියමින් සිටියේ, මෙන්න මේ කටයුත්ත රටටම ව්‍යාප්ත වීගෙන එනවා. ඒ ඇම්බියුලන්ස් රථ ගිහිල්ලා පොලිස් ස්ථානවල ස්ථානගත කරන බව අපි දන්නවා. අද මම ඒ ඇම්බියුලන්ස් සේවයේ සේවය කරන රියැදුරු මහත්මයෙකුට සහ උපස්ථායිකාවකට කථා කළා. කථා කළාම, ඒ ගොල්ලෝ කරන කටයුතු ගණනාවක් තිබෙන බව මම දැන ගත්තා. ඒ කටයුතු මොනවාද? ඒ ගොල්ලෝ කියන්නේ, ඒ අයට,- මම ඔබතුමාගේ කථාව අතර තුරත් ඇහුවා, ඒ ගොල්ලන්ට ඉන්න ස්ථිර තැනක් - නිවහනක්- නැහැ. රාත්‍රී කාලයේ රාජකාරි කරන කාන්තා උපස්ථායිකාවක් සිටියොත්, ඒ උපස්ථායිකාවට සුදුසු තැනක් පොලීසිය තුළ හදලා දීලා නැහැ. හැබැයි, සමහර පොලිස් ස්ථානවල ස්ථානාධිපතිවරු ඒ අයට ඉන්න යම් යම් විධියේ ඉඩ පහසුකම් හදලා දීලා තිබෙනවා. මේ පදනම ඇති වුණාම ඒ සඳහා යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙයි.

ඊළඟට කාරණය තමයි, TATA වාහනවල සහ ඉන්දියානු භාණ්ඩවල ආයු කාලය පිළිබඳව තිබෙන ප්‍රශ්නය. මේක අපට නිකම් දුන්න එක හරි. හැබැයි, අපට දුන්න දෙයක්, ඔබතුමන්ලා කියනවා නම්,- අපි දන්නවා, රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා, ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමා, එස්.ඩබ්ලිව්.ආර්.ඩී. බණ්ඩාරනායක මැතිතුමා ලබා දුන් ප්‍රතිපත්තිමය වැඩ පිළිවෙළවල් අදටත් ක්‍රියාත්මක වන ක්‍රමවේදයක් තිබෙනවා. හැබැයි, මේක නිකම් දුන්න පළියට අවුරුදු තුනක්, අවුරුදු හතරක් යනකොට ඒ වාහන නොකැඩී තිබෙන්නේ නැහැ. අද සමහර රෝහල්වල තිබෙන ඇම්බියුලන්ස්වලට ටයර් එකක් දමන්න පුළුවන් වත්කමක්, හැකියාවක් සෞඛ්‍ය අමාත්‍යාංශයට නැති බව අපි දකිනවා. මීගමුව රෝහලේ එක්ස්රේ යන්ත්‍රයක් තිබෙනවා. මේ වෙද්දී එම එක්ස්රේ යන්ත්‍රය කැඩිලා අවුරුද්දක් වෙනවා. රෝගීන්ගේ එක්ස්රේ ගන්න පෞද්ගලික අංශය වෙත යවනවා. මේ වෙද්දී පෞද්ගලික අංශයට රුපියල් ලක්ෂ 40ක් විතර ගෙවලා තිබෙනවා. එක්ස්රේ යන්ත්‍රයක් අලුතින් ගන්නවත් ඒ තරම් මුදලක් වැය වෙන්නේ නැහැ. මෙන්න අපේ රටේ සෞඛ්‍යය.

මේ ගිලන් රථ ලබා දීම තුළින්, ජනතාව සංවේදීව හදිසි රෝගීන් රෝහල්වලට යවන බව අප දන්නවා. සමහර වෙලාවට හදිසි අනතුරක් දැක්කොත් 1990ට කථා කරලා ඒ ස්ථානයට යන්න කියලා කියන්න මටත් සිදු වෙයි. ඒ නිසා ඒ ක්‍රමවේදය ගැන අපි විවේචනය කරන්නේ නැහැ. ඒ ක්‍රමවේදය හොඳයි. හැබැයි, මේවා දෙන්නේ මොකටද කියන ප්‍රශ්නාර්ථය අපි ළඟ තිබෙනවා. අපි දන්නවා, මේ වෙන කොට කෝටි 150ක විතර ජනතාවක් සිටින ඉන්දියාවට අපි මොනවාද යවන්නේ, ඉන්දියාවෙන් අපට මොනවාද එන්නේ කියලා. ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා කිව්වා, ඉරමුසු, නෙල්ලි වැනි දේශීය දේ පවා එනවාය කියලා. ඒ විධියට ඉන්දියානු වෙළෙඳ පොළ අද ශ්‍රී ලංකාව කියන මේ පොඩි රට වෙළා ගෙන සිටින බව අපි දන්නවා. මේ "සුවසැරිය" ගන්න එක හොඳයි. මේවා ගන්නවා වාගේම, ඉන්දියානු වෙළෙඳ පොළ ආක්‍රමණය කර ගන්න අපට පුළුවන් නම් හොඳයි. මා ළඟ තිබෙනවා, සංඛ්‍යා ලේඛන. [බාධා කිරීමක්]

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(මාණ්පුමිකු තුෂාර ඉන්දුනිල් අමරසේන)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා මම කියපු දෙයක් ගැන සඳහන් කළා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංගුම් උறුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්] ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා, කථා කරන්න.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(මාණ්පුමිකු ඉන්දික අනුරුත්ත හේරත්)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කිසිම වෙලාවක මම මේ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් චෝදනා කළේ නැහැ.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, 2015 වර්ෂයේ ඉන්දියාවට කළ අපනයන වෙනුවෙන් අපනයන ආදායම වශයෙන් අපට ලබා ගන්න පුළුවන් වුණේ ඩොලර් 643ක් පමණයි. හැබැයි, ඉන්දියාව ආනයනය තුළින් ඩොලර් 4,268ක් අපෙන් උදුරා ගත්තා; 2016 වර්ෂයේදී ඩොලර් 5,318ක් අපෙන් උදුරා ගත්තා. ඕනෑම පොඩි ළමයෙකුගෙන් ඇහුවාම කියයි, ඉන්දියාව කොයි වාගේද, ලංකාව කොයි වාගේද කියලා. එතකොට ඉන්දියාවේ අවශ්‍යතාවන් මොනවාද, ලංකාවේ අවශ්‍යතාවන් මොනවාද?

අපි යන්න ඕනෑ එතැනටයි. සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශය යටතේත් අද කථා කරන නිසා සහ ඔබතුමාත් ඒ සම්බන්ධයෙන් වැදගත්කමක් දකින නිසායි මම මේ කියන්නේ. අපි පැටලිලා ඉන්න නූල් බෝලය මේකයි. අපි දන්නවා, ඕනෑම කෙනෙක් ගිහිල්ලා මොනවා හරි දෙයක් පෙන්වලා තමයි ලොකු දෙයක් ගන්නේ කියලා. උදාහරණයක් හැටියට ගත්තොත් කවුරුන් හෝ ළඟට මොකක් හරි යෝජනාවක් කරන්න යනවා නම්, තෑග්ගක්, පඩුරක් අරගෙන යනවා. නිධානයක් ගන්නත් බිල්ලක් දෙන්න ඕනෑ කියලා කියනවා වාගේ මොනවා හරි දීලා තමයි ගන්නේ. ඒ නිසා ඉන්දියාව යම් කිසි උපක්‍රමයකට සැරසෙනවා කියන එක අපි දන්නවා. ඒ නිසා අපි පාර්ලිමේන්තුව තුළ මේ වෙනුවෙන් සටන් කරමු. මේ ව්‍යාපෘතිය ගැන කිසිම චෝදනාවක් නැහැ. නමුත් රෝහල් පද්ධතිය ශීඝ්‍රයෙන් කඩා වැටිලා තිබෙනවා. ඒක ගැන ආයෙත් කථා කරන්න දෙයක් නැහැ. රෝගියා රෝහලේ දොරකඩට ගෙන ගියාට රෝහලෙන් රෝගියා ප්‍රතික්ෂේප කරන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මගේ පළාතේ එක සිද්ධියක් වුණා. "1990" ගිලන් රථ සේවයට කථා කරලා රෝගියාව ගෙනිහිල්ලා රෝහලට ඇතුළත් කළාට රෝහලේ අවශ්‍ය පහසුකම් තිබුණේ නැහැ; ප්‍රාථමික පහසුකම් ටික තිබුණේ නැහැ. රෝගියාව ආපහු ගෙන යන්න කිව්වා. එතකොට ගිලන් රථය පොලිස් ස්ථානයට ගිහිල්ලා ඉවරයි. නැවත වතාවක් රෝගියා අරගෙන පොලිස් ස්ථානයට ගියා. පොලිස් ස්ථානයට අරගෙන ගිහිල්ලා ගිලන් රථයට පටවලා ඊළඟ රෝහලට ගෙන යන්න කිව්වාට, ගිලන් රථයට එහෙම වැඩ පිළිවෙළක් නැහැ. ඔබතුමන්ලා කියනවා වාගේ ඒකට කියලා තිබෙන්නේ ළඟම රෝහලට ගෙන යන්න කියලා විතරයි. පසුව ඒ රෝගියා ගිලන් රථය තුළ මිය ගියා. ගිලන් රථවල සේවය කරන උදවිය කියන්නේ, ඒ ගිලන් රථ තුළ යම් කිසි රෝගියෙක් මිය ගියාම, එහෙම නැත්නම් හදිසි අනතුරක් වෙලා තුවාල වුණු රෝගියෙක් ගෙන ගියාම ඒවා පිරිසිදු කරන්නවත් ඒ ගොල්ලන්ට කාර්ය මණ්ඩලයක් නැහැ කියලායි. ඒකට ඉන්නේත් රියැදුරා සහ උපස්ථායිකාව විතරයි. ඉතින් මෙන්න මේ වාගේ සංශෝධන වෙන්න ඕනෑ. මේ 1990 සුවසැරිය පදනම හැදුණාට පසුව හරි යම් කිසි වෙලාවක ඒ කටයුතු සිදු වෙනවා නම් හොඳයි කියලා අපි යෝජනා කරනවා. ඒ වාගේම මම මුලින් කිව්වා වාගේ රෝහල් පද්ධතියත් සකස් වෙන්න ඕනෑ. උදාහරණයක් හැටියට කියනවා නම්, අවුරුදු තුනක් තිස්සේ -මේ වෙනකල්- රුපියල් මිලියන 500ක් වියදම් කරමින් මීගමුව රෝහල අලුත්වැඩියා කරනවා. මීගමුව රෝහලේ එක්ස්රේ යන්ත්‍රය ගැනත් මම කිව්වා. අපේ තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමාත් පාර්ලිමේන්තුවට එද්දී දකිනවා ඇති, අපේ අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමාත් දකිනවා ඇති, ඔය මීගමුව රෝහල තමයි කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේදී ගුවන් මඟියෙකුට, විදේශ රටක සිට එන ගුවන් මඟියෙකුට හදිසි හෘදයාබාධයක් හැදුණාම ගෙන යන්න තිබෙන ළඟම රෝහල; මිය ගියොත් ගෙන යන්න තිබෙන ළඟම රෝහල. ඒ රෝහලේ මෝචරිය කැඩිලා. Freezer truck එකක තමයි මළ මිනී දමන්නේ. ඔන්න, අපේ රටේ සෞඛ්‍ය සේවය! අද මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේදී ඔබතුමා වාගේම සෞඛ්‍ය ඇමතිතුමා, පොලිසිය භාර ඇමතිතුමා, ඒ වාගේම ජනාධිපතිතුමාත් මේ සභාවේ හිටියා නම් හරි වටිනවා. අද සෞඛ්‍ය ඇමතිතුමා මේ සභාවේ නැහැ. නමුත් රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ශීඝ්‍රයෙන් කඩාගෙන වැටිලා තිබෙනවා. අපි දන්නවා, දකුණේ ව්‍යාප්ත වෙලා තිබුණු වෛරස් රෝගය අද සබරගමුවට ව්‍යාප්ත වෙලා තිබෙන බව.

මෙතුමන්ලා කියනවා, අද බෙහෙත් වර්ග හතළිස් ගණනක මිල අඩු කරලා තිබෙනවාය කියලා. ගරු මන්ත්‍රීතුමනි, බෙහෙත් වර්ග හතළිස් ගණනක මිල අඩු කළාට, බෙහෙත් වර්ග අරගෙන බලන්න, බංග්ලාදේශයේ, ඉන්දියාවේ බෙහෙත් අපේ රටට එනවා. ඒ බෙහෙත්වල ගුණාත්මකභාවයක් නැහැ. [බාධා කිරීමක්] ඔබතුමා **තප්පුලලා, තප්පුලලා** මෙතැන වළං කඩේ බිඳින්න හදන්න එපා. පොඩ්ඩක් අහගෙන ඉන්න. මේ වාහන, මේ යන්ත්‍ර සූත්‍ර හම්බ වෙද්දී අනෙක් වැඩ කටයුතුත් සිද්ධ වෙන්න ඕනෑ. හැම පැත්තකින්ම ඒ කටයුතු සිද්ධ වෙන්න ඕනෑ. මීගමුව රෝහල එහෙම දැන් බොහොම සෝචනීය තත්ත්වයකයි තිබෙන්නේ. රුපියල් මිලියන 500ක් වියදම් කරලාත් අවුරුදු තුනක් පුරාවට ඒ ඉදිකිරීම් කටයුතු කරලාත් තවම අවසන් කර නැහැ. ඒක භාර දීලා තිබෙන්නේ, සජිත් ප්‍රේමදාස ඇමතිතුමාගේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයට. ඒ නිලධාරීන් කියනවා, ඒ මුදල් ටික වෙනත් වැඩවලට ගෙනිහිල්ලාය කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී මූලාසනය සඳහා ගරු ඡෂාන් විතානගේ මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "මේ අවස්ථාවේදී ගරු ඡෂාන් විතානගේ මහතා මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු ශෙහාන් සේමසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ඡෂාන් විතානගේ මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு செஹான் சேமசிங்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹேசான் விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. SHEHAN SEMASINGHE *left the Chair, and* THE HON. HESHAN WITHANAGE *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කියාගෙන ආවේ, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තත්ත්වය පිරිහිලා තිබෙන බවයි. සෞඛ්‍ය අමාත්‍යාංශය, රෝහල් පද්ධතිය බොහොම දරුණු ලෙස කඩා වැටිලායි තිබෙන්නේ.

ඒ නිසා, රෝගියාට ඔබතුමන්ලාගේ මේ ගිලන් රථයටම වෙලා ඉන්න සිදු වෙන තත්ත්වයක් තව ටික දවසකින් උදාවෙයිද දන්නේ නැහැ. නිදහස් සෞඛ්‍ය වෙනුවෙන් රජය විශාල මුදලක් වෙන් කරනවාය කියනවා. නමුත් අපේ ඇස් පනාපිට අපට දකින්න තිබෙන්නේ මොනවාද? විශේෂයෙන්ම අද ස්ටෙන්ට් දමන එක ගැන කියනවා; හෘදය සැත්කම් සම්බන්ධයෙන් කියනවා. මම හිතන විධියට ඒවා කර ගැනීමට මාස හතරක්, පහක් ඉන්න ඕනෑ, පෝලිමේ. ඒවාට අවශ්‍ය කරන වැඩ පිළිවෙළක් හදලා දීලා නැහැ. ඊයේ පෙරේදා පෞද්ගලික රෝහල්වලින් අය කරන VAT බද්ද අඩු කළා. එසේ අඩු කිරීමෙන් බලාපොරොත්තු වුණේ රජයේ රෝහල්වලට එන අය තව ටිකක් පෞද්ගලික රෝහලවලට යවන්නයි. ඒ බදු අඩු කිරීම හොඳයි. නමුත් රජයේ රෝහල් පද්ධතිය හරියාකාරව නඩත්තු කිරීමට එම රෝහල්වලට අවශ්‍ය පහසුකම්ද සැපයිය යුතුයි. පැය 24ම ඩිස්පෙන්සරිය ඇරලා කරලා

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

තියෙනවා කියලා තමයි දින සියයේ වැඩ පිළිවෙළ පටන් ගත්තේ. නමුත් අද එහෙම වැඩ පිළිවෙළක් නැහැ. මේ කඩා වැටීම සෞඛ්‍ය ක්ෂේත්‍රයට බොහොම බරපතළ විධියට බලපානවා. මේ වෙද්දී දකුණු පළාතේ කුඩා දරුවන් 25කට වැඩිය මිය ගිහින් තිබෙනවා. අපට ලැබී තිබෙන්නේ රජයේ රෝහල්වල සංඛ්‍යාලේඛන විතරයි. පෞද්ගලික රෝහල්වල ඒ සංඛ්‍යාලේඛන අපි ළඟ නැහැ. කරාපිටිය රෝහලේ සහ අනෙකුත් රෝහල්වල දරුවෝ මිය යනවා; රිජ්වේ ආර්යා ළමා රෝහලේ දරුවෝ මිය යනවා. ඒ දෙමව්පියෝ අද නඩු මහට යන තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. මේ වෛරසය කොහෙන් ආවාද, කොහොම ඉවර වෙයිද, මේකට අවශ්‍ය කරන බෙහෙත් වර්ග මොනවාද කියලා රජයේ ඇමතිවරුන්ට තවම ලොකු වගකීමක් නැහැ. එතුමන්ලා වෙන වෙන දේවල් කර කර, වෙන වෙන චෝදනා කර කර ඉන්නවා. අපේ සෞඛ්‍ය ඇමතිතුමාගේ පුතාත් ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී. නමුත් මීගමුව රෝහලේ කඩා වැටීම ගැන එතුමන්ලා එක වචනයක් කථා කරන්නේ නැහැ.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒක පළාත් සභාවටයි අයිති.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
පළාත් සභාවේ නොවෙයි, මධ්‍යම රජයෙන් තමයි මැදිහත් වෙන්නේ. ඒක පළාත් සභා රෝහලක් වුණාට සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් තමයි ඒ කටයුතු සියල්ල කරන්නේ. ඒක පළාත් සභාවෙන් කරන පරිපාලනයට එහා ගිය කටයුත්තක්. සෞඛ්‍ය ඇමතිවරයා මුල් වෙලා තමයි රුපියල් මිලියන 500ක් වෙන් කරලා මීගමුව රෝහලේ අලුත්වැඩියාව පටන් ගත්තේ. අද වෙද්දී ඒකට අවුරුදු තුනක් වෙනවා. ඒ වැඩවල කිසිම ප්‍රගතියක් නැහැ. ඒ කොන්ත්‍රාත්තුව කරන්නේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ නම්, අනෙක් අමාත්‍යාංශ එක්ක සාකච්ඡා කරලා ඒ සඳහා අවශ්‍ය මුදල් කඩිනමින් එවලා ඒ කටයුත්ත අවසන් කරන්න කියලායි අපි කියන්නේ. අවුරුදු දෙකක්, තුනක් තිස්සේ මෝචරියේ වැඩ කෙරෙන්නේ නැහැ කියන්නේ ඉතාම ශෝචනීය තත්ත්වයක්. ජාත්‍යන්තරයේ ලංකාවට තිබෙන තැන ගැන අපි හිතලා බලන්න ඕනෑ; කල්පනා කරන්න ඕනෑ. මොකක්ද ජාත්‍යන්තරය ශ්‍රී ලංකාව ගැන හිතන්නේ? ඔබතුමන්ලා ක්‍රියාත්මක කරන සාර්ථක වැඩ පිළිවෙළට වඩා, රට අපකීර්තියට පත් වෙන, ජනතාව කරදරයට, හිංසනයට පත්වෙන ක්‍රියා වැඩියි. ඒකාබද්ධ විපක්ෂයේ අපි කවදාවත් හොඳ දෙයට නරකයි කියන්නේ නැහැ.

සිදුවේ විජය කුමාරතුංග ඇස් රෝහල තිබෙනවා. එම රෝහල අක්ෂි ආබාධ සම්බන්ධයෙන් විශේෂත්වයක් උසුලනවා. අද වෙද්දී ඒ රෝහල ශල්‍යකර්ම කරන්නේ නැති තත්ත්වයට පත් වෙලා තිබෙනවා. මාසයකට ශල්‍යකර්ම 100ක්, 150ක් කළොත්, ඒ අතරින් මුදල් ගෙවා සිදු කරන ශල්‍යකර්ම ගණන 70ක්, 80ක් විතර. නොමිලේ කරලා දෙන්නේ ශල්‍ය කර්ම 20යි, 25යි. එහි අවශ්‍ය කරන පහසුකම්, උපකරණ නැහැ. හැබැයි, සෞඛ්‍ය ඇමතිතුමා කථා කරන්නේ එහෙම නොවෙයි. එතුමා සෞඛ්‍ය ක්ෂේත්‍රයට විශාල වැඩ කොටසක් කරපු කෙනකු විධියට තමයි කියන්නේ. එතුමාට ඊයේ පෙරේදා මොකක්ද තනතුරකුත් ලැබුණා. ලෝක සෞඛ්‍ය සංවිධානයේ උපසභාපති තනතුරක් ලැබුණා. ලෝක සෞඛ්‍ය සංවිධානයේ නියෝජිතයන් මීගමුව රෝහලේ මෝචරියට ගිහින් බලන්න ඕනෑ මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. රටේ සෞඛ්‍ය පිරිහිලා තිබෙන්නේ අන්න ඒ ආකාරයට. පාර්ලිමේන්තුවේ මෙවැනි විවාද, මෙවැනි යෝජනා සාකච්ඡා කරන වේලාවේ අදාළ අමාත්‍යවරු පාර්ලිමේන්තුවට ඇවිත් ඉන්න ඕනෑ. ඒ අමාත්‍යවරු දැන ගන්න ඕනෑ ගිලන් රථ සේවය ගැන විතරක් නොවෙයි. ගිලන් රථයෙන් රෝහලට ගෙනැත් දෙන රෝගියා ජීවත් කරන්න එම රෝහලේ තිබෙන පහසුකම් ගැන ඒ ප්‍රදේශයේ, ඒ පළාතේ, ඒ දිස්ත්‍රික්කයේ මැති ඇමතිවරු මොනවාද කියන්නේ කියලා බලන්න ඇමතිවරු ඉන්න ඕනෑ. අද මේ කරුණු අහන්න කෙනෙක් නැහැ. අපට මේ කරුණු උඩු හුළඟට තමයි කියන්න වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි ආණ්ඩුවට, රජයට විශේෂයෙන් කියනවා මේ කටයුතු ගැන මැදිහත් වෙන්න ඕනෑ කියලා.

SAITM එකේ ප්‍රශ්නය ගැන පසුගිය දවස්වල කථා කළා. SAITM එකේ ප්‍රශ්නයට ඊයේ දුන්න විසඳුමට අපි එකඟ වනවා. එම විසඳුමින් යම්තාක් දුරට ඒ ගැටලුව විසඳුණා.

මීට පෙර පැවැති ආණ්ඩුවෙන් යම් යම් සාධනීය දේවල් කරද්දී එක්සත් ජාතික පක්ෂය ඒවා විවේචනය කරපු විධිය අපි දැක්කා. යුද්ධය පැවැති කාලයේ කිලිනොච්චි යනවා කියලා, මැදවච්චි යනවා; අලිමංකඩ යනවා කියලා, පාමංකඩ යනවා කියපු මන්ත්‍රීවරු තමයි එක්සත් ජාතික පක්ෂයේ ඉන්නේ. හැබැයි ගරු හර්ෂ ද සිල්වා ඇමතිතුමනි, ඔබතුමන්ලා කරන හොඳ දේ අපි විවේචනය කරන්නේ නැහැ. ඔබතුමාගේ මේ ක්‍රියාවලිය, මේ වැඩ පිළිවෙළ අපි හොඳයි කියනවා. නමුත්, අපි පෙරළා ගහනවා. ඉන්දියානුවෝ මේ තුළින් බලාපොරොත්තු වෙන්නේ මොකක්ද? දැන් කියනවා, මේ හරහා ඉන්දියානු "රෝ" ඔත්තු සේවය එනවා කියලා එදා අපි චෝදනා කළා කියලා. ඉන්දියානු "රෝ" ඔත්තු සේවයක් එනවාද, නැද්ද කියන්න අපි දන්න නැහැ. කවුරු එනවාද, නැද්ද කියන්න අපි දන්නේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව තිබෙන්නේ විනාඩි දෙකක කාලයක් පමණයි.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
1990 සුවසැරියේ ලාංකිකයන් තමයි වැඩ කරන්නේ. ඉන්දියානු විශේෂඥයෙක් ඉන්නවා. අපි ඒක දන්නවා. ඒ ගොල්ලෝ වසරක නඩත්තු කාලයක් දෙනවා. අපි ඒක දන්නවා. සමහර වාහනවල වසරක නඩත්තු කාල සීමාව ඉවරයි. දැන් අපි ඒවා නඩත්තු කර ගන්න ඕනෑ. මෙතැනින් එහාට "1990 සුවසැරිය" පවත්වාගෙන යන්න ලංකාවට වැඩ පිළිවෙළක් තිබෙන්න ඕනෑ. නැත්නම් මේ ambulance කැඩිලා, හන්දි - හන්දි ගානේ, පොලිසි - පොලිසි ගානේ, රෝහල් - රෝහල් ගානේ කොට උඩ තිබෙයි; තැන් තැන්වල නවතා දමා තිබෙයි. එහෙම වුණොත් මේ ව්‍යාපාරය බොහොම භයානක තැනකට යනවා. ගරු ඇමතිතුමනි, මගේ කථාවෙන් පස්සේ ඔබතුමා මෙයට පිළිතුරක් දෙයි කියලා මා බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපට මොකක් හෝ දොළපිදේනියක් දීලා, අපට එවන බර, අපට එවන විෂබීජ, අපට එවන ආක්‍රමණ සියල්ලටම ඔළුව පහත් කරගෙන ඉන්න බැහැ. මේවායේ වරදක් වුණ දාට ඒ වෙනුවෙන් සටන් කරන්න ඔබතුමන්ලාටත් එකතු වෙන්න වෙයි. මේ ambulanceවලට පිටුපසින් එන ගිවිසුම් ගණනාවකට ඉදිරියේදී යන්න සූදානම් වෙලා සිටින බව අපි දන්නවා. දැන් සිංගප්පූරු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම හරහා ඉටු කර ගන්න වැඩ පිළිවෙළක් යනවා

කියලාත් අපි දන්නවා. සිංගප්පූරුවේ ඉවත් කරන කැළි කසළ, ඒ සියලු අපද්‍රව්‍ය ලංකාවට ගෙනැල්ලා ඒ ආයතන පිහිටුවන්න පුළුවන් කියලාත් ඒ ගිවිසුම් ඇතුළේ තිබෙනවා. ඒ වාගේම, manpower ආයතන පටන් අරගෙන ඒ රටවල සේවකයන් යොදා ගන්න පුළුවන් කියලාත් ඒ ගිවිසුම් ඇතුළේ තිබෙන බව අපි දන්නවා. ඕනෑ රටකින් ශ්‍රමිකයන් ගෙන්න ගන්න පුළුවන් කියන එකත් ඒ ගිවිසුම් ඇතුළේ තිබෙනවා. අපි ඒවා අධ්‍යයනය කරලා තිබෙනවා; සොයා බලා තිබෙනවා. ඒක නොවෙයි අද අපට තිබෙන ගැටලුව. ඉන්දියාව මේ ගෙනත් දුන්න දේ ගැනයි අපට ගැටලුව තිබෙන්නේ. ඉන්දියාව ලේසියෙන් නිකම් දෙයක් දෙන්නේ නැති බව අපි දන්නවා. අපි ඉතිහාසයේ අහලා තිබෙන විධියට, ඉන්දියාව ලංකාවට පරිප්පු දාපු තැන ඉඳලා කිසිම දෙයක් නිකම් දීලා නැහැ. අපෙන් මොනයම් හෝ දෙයක් ගන්න බලාගෙන තමයි ඒවා දෙන්නේ. ඒ නිසා මේ තුළින් රට පාවා දෙන තැනට ගෙනයන්න ඉඩ තබන්න එපා කියලා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ඇමතිතුමනි, ඔබතුමා ගෙනාවේ හොඳ ව්‍යාපෘතියක්. ඒක රටට හොඳයි. ඒක ජනතාවට හොඳයි. ජනතාවට වැදගත්. ඒක ගැන අපේ කිසිම විවාදයක් නැහැ. නමුත්, ඒකෙන් පසුව එන ඒවා ගැන අපට ඉදිරියේදී කථා කරන්න වෙයි. එදාට ඔබතුමා ඒ වෙනුවෙන් පෙනී සිටින්න කියන ඉල්ලීම කරමින්, මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමා මගෙන් පිළිතුරක් බලාපොරොත්තු වුණා. මා ඒ පිළිතුර ඉක්මනින් ලබා දෙන්නම්.

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා පැවසූ දේ හරි. ඉන්දියාවෙන් අවුරුද්දකට තමයි මුදල් ලැබුණේ. ඊට පස්සේ දකුණ සහ බස්නාහිර පළාතේ සේවය කරගෙන යන්න මේ අවුරුද්දේ ආණ්ඩුවෙන් රුපියල් මිලියන 680ක් වෙන් කර තිබෙනවා. ඉදිරියේදී මෙම කටයුතු කරගෙන යන්නේ රජයේ වියදමින්. මේ මිලියන 15.2 ඉවර වුණාම, එන අවුරුද්දේ අලුතින් එන ambulanceවලත් කාර්යභාරය ඉෂ්ට කරන්න රජයෙන් මුදල් යොදවනවා. මේ කටයුත්ත දිගටම කරගෙන යන්න තමයි අපි 1990 සුවසැරිය පදනම පනත් කෙටුම්පතට අද පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 06ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.18]

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1990 සුවසැරිය පදනම පනත් කෙටුම්පත ඉතා කාලෝචිත පනත් කෙටුම්පතක්. න්‍යායික නොවන, ප්‍රායෝගික දේශපාලනඥයකු වන ගරු හර්ෂ ද සිල්වා රාජ්‍ය අමාත්‍යතුමා ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට නව ජීවයක් ලබා දීම සඳහා මේ ගෙනා පනත් කෙටුම්පත අපේ රටේ විවිධ වූ ප්‍රදේශවල වෙසෙන අහිංසක ජනතාවගේ හිතසුව පිණිස සහ ඔවුන්ගේ ජන ජීවිතය නැංවීම සඳහා උපකාරයක් වෙයි.

අපි දන්නා හැටියට ලෝක සෞඛ්‍ය දර්ශකයට අනුව මේ රටේ ඉහළ සහ ඉතා දියුණු සෞඛ්‍ය සේවාවක් පවත්වා ගෙන යනවා. මම හිතන විධියට ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා රාජ්‍ය අමාත්‍යතුමා ප්‍රායෝගිකව මේ පිළිබඳව කල්පනා කරලා ඉන්දියානු රජයත් එක්ක සාකච්ඡා කරලා මෙම කටයුත්තට උරදී තිබෙනවා. අද උදේ සිට මේ දක්වා මේ විවාදයට සහභාගි වුණු ගරු මන්ත්‍රීවරුන් දැක්වූ විවිධ අදහස් අපි අසා සිටියා. මම හිතන විධියට මේ ගන්නා පියවර තුළ යම්කිසි ගැටලුසහගත තත්ත්වයන් ඇති වෙන්නට පුළුවන්. නමුත් මේ ගරු සභාවට මෙම යෝජනාව ගෙනැල්ලා, මෙතුමා ගන්නා වූ උත්සාහයට මන්ත්‍රීවරුන් හැටියට අපි ගරු කරන්න ඕනෑ. ඒ වාගේම මෙතුමා ගන්නා මේ උත්සාහය ඉතා වැදගත් එකක් බවත් මම මේ අවස්ථාවේ දී සඳහන් කර සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රයත් ඉතා ඉහළ මට්ටමක පවතිනවා. රජය මඟින් ඒ සඳහා විවිධ වූ සහන ලබා දෙනවා. අපේ රටේ ජනතාව කවදාවත් නොඉල්ලපු සහන පවා ලබා දී තිබෙනවා. ළමයින්ට සෞඛ්‍ය රක්ෂණයක් දෙන්න කියලා ජනතාව කවදාවත් ඉල්ලුවේ නැහැ. නමුත් අද ඒ පහසුකම් සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ ඇති කර තිබෙනවා. ඒ අනුව පාසල් දරුවෙකුට අසනීපයක් හැදුණා නම්, ඊට අවශ්‍ය සියලු ප්‍රතිකාර කටයුතු රජය මඟින් කිරීම සඳහා මේ රජය එවැනි යෝජනාවක් ගෙනැවිත් තිබෙනවා. එම නිසා අපි පැසසුම්සහගතව ඒ පිළිබඳව සාකච්ඡා කළ යුතුයි; ඒ පිළිබඳව කථා කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදේ සිට පැවැත්වෙන මේ සංවාදය තුළ විශේෂයෙන්ම සුරාබදු ආඥාපනත යටතේ නිවේදන දෙකක් පිළිබඳවත් සාකච්ඡා වුණා. අපි ග්‍රාමීය පරිසරයක ජීවත් වෙන, ග්‍රාමීය ජනතාව නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්. මම දීර්ඝ කාලයක් ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයකු හැටියට කටයුතු කර තිබෙනවා. ඊළඟට, පළාත් සභාවේ මන්ත්‍රීවරයකු හැටියට කාලයක් කටයුතු කළා. දැන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මෙතැනට පැමිණ සිටිනවා. මෙතැනදී අපි දැකපු එක් දෙයක් තමයි, මේ පාර්ලිමේන්තුව තුළ වැඩි කාලයක් ගත වෙන්නේ ජනතා නියෝජිතයන් විධියට අපි 225 දෙනාව මේ පාර්ලිමේන්තුවට එවපු ජනතාව ගැන සාකච්ඡා කරන්න නොවෙයි කියන කාරණය. පාර්ලිමේන්තුව තුළ වැඩි කාලයක් ගත කරලා තිබෙන්නේ මේ 225 දෙනාගේ ප්‍රශ්න විසඳන්නත්, ඒ අයගේ ඕනෑ එපාකම් සහ ඒ අය සිදු කර තිබෙන දූෂණ වංචා පිළිබඳව එකිනෙකාට දොස් පවරා ගැනීමත් සඳහායි. අපි ඒක මේ පාර්ලිමේන්තුව තුළදී දැකපු කාරණයක්. නමුත් අද තරුණ ඇමතිවරයකු හැටියට ගරු හර්ෂ ද සිල්වා රාජ්‍ය අමාත්‍යතුමා ජනතාව වෙනුවෙන් යමක් කළ යුතු යයි කල්පනා කරලා, මේ කරන කටයුත්ත අපි අගය කරනවා. අපේ මධ්‍යම පළාතේත් මේ කටයුත්ත ආරම්භ කිරීම සඳහා එතුමාගේ සහයෝගය ලබා දෙන්න කියලා අපේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් මේ අවස්ථාවේ දී එතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

ඊළඟට, සුරාබදු ආඥාපනත යටතේ නිවේදන පිළිබඳවත් සාකච්ඡා කරන අද දවසේ, දේශීය කර්මාන්තයක් වන කිතුල් කර්මාන්තය ගැනත් යමක් සඳහන් කරන්නට මා අවස්ථාව ලබා ගන්නවා. පිටරටින් ගෙනෙන මත් ද්‍රව්‍ය පිළිබඳව මේ පාර්ලිමේන්තුවේ සාකච්ඡාවට ලක් වෙලා තිබෙනවා; ඒ වාගේම මේ සමාජය තුළ සාකච්ඡාවට ලක් වෙලා තිබෙනවා. රට බීම ගෙන්වීම අඩු කරන්න කියලා මේ කවුරුවත් උද්ඝෝෂණය කරන්නේ නැහැ. හැබැයි, දේශීය නිෂ්පාදනයක් හැටියට අවුරුදු 2,500කටත් එහා කාලයක සිට පැවතෙන මේ කිතුල් කර්මාන්තය පිළිබඳවත් අපි කථා කළ යුතුයි. බුදුරජාණන් වහන්සේ වැඩ සිටි කාලයේ දී නාලාගිරි ඇතාටත් රා පොවා එවපු ආකාරය අපට බුදු දහමේ ඉගැන්වෙනවා. කිතුල් කර්මාන්තයේ යෙදෙන කෙනෙකුට

[ගරු ආනන්ද අලුත්ගමගේ මහතා]

කවදාවත් රට බීම බොන්න තරම් ආදායමක් ලැබෙන්නේ නැහැ. කිතුල් කර්මාන්තය වැනි අන්තරාදායක කර්මාන්තයක් කරන ඒ අහිංසක ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහාත්, ඒ වාගේම ඒ අය වෙනුවෙන් රක්ෂණයක් ලබා දීම සඳහාත් කටයුතු කරන ලෙස මම මේ ගරු සභාවට යෝජනා කරනවා. කිතුල් කර්මාන්තය තුළ රා නිෂ්පාදනය කරන්නත් පුළුවන්. අද පොල් රා මැදීම සඳහා අවස්ථාව ලබා දී තිබෙනවා. ඒ වාගේම කිතුල් කර්මාන්තයත් -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි ඉතුරු වී තිබෙන්නේ.

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කිතුල් කර්මාන්තය ආරක්ෂා කිරීම සඳහා රජය කටයුතු කරයි කියන විශ්වාසයෙන් අපි එම ඉල්ලීම කරනවා.

අවසාන වශයෙන් සඳහන් කළ යුතු තව දෙයක් තිබෙනවා. ජනමාධ්‍ය අපෙන් ප්‍රශ්න කරනවා, "මේ රටේ යහ පාලන ආණ්ඩුව ශක්තිමත් කිරීම සඳහා රටේ අගමැතිතුමා, ජනාධිපතිතුමා සහ ඔබතුමන්ලා හමු වුණු අවසාන අවස්ථාව කවදාද?" කියලා.

මා කිව්වා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපි මතක තිබෙන කාලයක ජනාධිපතිතුමාවත්, අගමැතිතුමාවත් මුණ ගැහිලා නැහැයි කියලා. මා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා; රටේ ජනතාව වෙනුවෙන් ඉල්ලා සිටිනවා; දෙවියන්ගේ නාමයෙන් ඉල්ලා සිටිනවා; ඉදිරි කාලය තුළ ජනතාවට වැඩක් කරන්න නම්, අපි පටන් ගත් යහ පාලනය ඉදිරියට ගෙන යන්න නම්, මේ නායකයින් අපිත් එක්ක එකතුවෙලා කටයුතු කරමු කියලා. මට වෙන් කර තිබෙන කාලය අවසාන බැවින්, කෙටි කාලයක් හෝ ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු මහින්ද අමරවීර ඇමතිතුමා.

[අ.භා. 3.25]

ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Agriculture and State Minister of Mahaweli Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින සුවසැරිය ගිලන් රථ සේවය පිළිබඳවත්, ඒ වාගේම වැදගත් නිවේදන දෙකක් හා නියෝග පිළිබඳවත් සාකච්ඡා වන මේ මොහොතේ, මා ප්‍රථමයෙන්ම හර්ෂ ද සිල්වා මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා, එතුමා මූලිකවෙලා මේ කටයුත්ත සිදු කිරීම ගැන. ඒ වාගේම මේ සඳහා ආධාර උපකාර කළ ඉන්දියානු රජයට අපේ කෘතවේදීභාවය හිමි කරන්න ඕනෑ. බොහෝදෙනෙක් විශ්වාස කළේ, සැක හිතුවේ ඉන්දියාව මේ ආධාරය, උපකාරය කරන්නේ තව බොහෝ දේවල් බලාපොරොත්තුවෙන් කියලායි. දැන් මේ සභාවේ කළ කථාවලිනුත් අපට අහන්න ලැබුණේ, ඉන්දියාව නිකම් යමක් දෙන්නේ නැහැයි කියන එකයි. ඉන්දියාව විතරක් නොවෙයි, මොන රටක් වුණත් අපට නිකම් යමක් දෙනවාය කියලා උපකල්පනය කරන්න හොඳ නැහැ.

අතීතයේ සිට විවිධ රටවල් අපට කරපු පරිත්‍යාග බොහොමයක් තිබෙනවා; උදව් උපකාර බොහොමයක් තිබෙනවා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව -BMICH එක- ඉදි කිරීම සඳහා චීනයෙන් ආධාර උපකාර ලැබුණා. ඒ වාගේම මේ පාර්ලිමේන්තුව ඉදි කරන්න ජපානයෙන් උදව් උපකාර ලැබුණා. සමහර ඒවා සහන ණය වෙන්න පුළුවන්. පරිත්‍යාග විශාල ප්‍රමාණයක් වෙනම ලැබී තිබෙනවා. ඒ වාගේම අවස්ථා ගණනාවකදී ඉන්දියානු රජයෙනුත් අපට ආධාර උපකාර විශාල ප්‍රමාණයක් ලැබී තිබෙනවා. ඉන්දියානු මධ්‍යම රජයේ පරිත්‍යාගයෙන් දැනටමත් පොලොන්නරුවේ අංග සම්පූර්ණ පාසලක් ඉදි වෙනවා. ඒ වාගේම හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාවට අවශ්‍ය උපකරණ ලබා දීම සඳහා විශාල මුදලක් ලබා දීලා තිබෙනවා. එයත් සම්පූර්ණයෙන් පරිත්‍යාගයක්. ඒ වාගේම නිවාස ඉදි කර ගැනීම සඳහා උතුරු නැඟෙනහිර ප්‍රදේශයේ ජනතාවටත්, දකුණේ ජනතාවටත් ඉන්දියානු රජයෙන් මුදල් ලැබී තිබෙනවා. ඒවා පරිත්‍යාග වශයෙන් ලැබී තිබෙනවා. ඒ වාගේම මේ ගිලන් රථ සේවයත් ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර තිබෙන සුහදතාව වර්ධනය කර ගන්න ලැබුණු උදව්වක් විධියට තමයි අපි සලකන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ අපි හිටපු ආණ්ඩුවට වැරැදුණු තැනක් තිබුණා. ඒ තමයි අපි ඉන්දියාව තරහ කරගත්ත එක. අපේ අසල්වැසි රට තරහ කරගෙන යන්න ගිය ගමනේ ප්‍රතිඵලය අපට එම කාලය තුළදීම දැනෙන්න පටන් ගත්තා. අපට ජීනීවා ගැටලුව ඇති වුණු මුල් අවස්ථාවේ දී ඉන්දියාව අපට උදව් කළා. යුද්ධය තිබුණු වෙලාවේ ඉන්දියාව අපට උදව් කළා. අනෙක් රටවල් අපට අවි ආයුධ දෙන්නේ නැති වෙලාවේ ඉන්දියාව අපට උදව් කළා; ණයට දුන්නා; විශේෂඥ දැනුම දුන්නා. ඒ වාගේම ඉන්දියාවේ තමිල්නාඩු ප්‍රදේශයේ ඇති වන උද්ඝෝෂණ වළක්වා, යුද්ධය අවසාන කරන්න සම්පූර්ණ ශක්තිය ඉන්දියාවෙන් අපට ලබා දුන්නා. ඉන්දියාවෙන් එම ශක්තිය ලබා දුන්නත්, මානව හිමිකම් පිළිබඳ ගැටලුවේ පළමුවන අවස්ථාවේ දී ඉන්දියාව අපට උදව් කළත්, පසුව ඉන්දියාවත් සමඟ ඇති කර ගත් විරසකය නිසා ඉන්දියාව අපට උදව් කිරීමෙක් වැළකුණා. එහි ප්‍රතිඵලය වුණේ, අපි වරින් වර පැරදිලා, අන්ත අසරණ තත්ත්වයට පත් වීමයි. ඒවායේ ප්‍රතිඵල විධියට යුරෝපා මත්ස්‍ය තහනම, ඇඟලුම් තහනම ඇති වුණා. ඒ වාගේම අපේ එළවලු, පලතුරු අපනයනයට තහනමක් එන්න තිබුණා. ඒ විතරක් නොවෙයි. කසළ තේ තිබෙනවාය කියා ප්‍රචාරය කරමින්, අපේ තේ මිලදී ගැනීම නවත්වන්න සියලු කටයුතු සූදානම් කරලා තිබුණා. ඒ තත්ත්වය දිගටම පැවතුණා නම්, අපේ අපනයන සීමා වුණා නම්, අපට විදේශ වෙළෙඳ පොළ අහිමි වුණා නම්, සම්බාධකවලට ලක් වුණා නම් අපේ රටේ මිනිස්සු කන්න නැතුව මැරෙන තත්ත්වයට පත් වෙනවා. බලවත් රටවල් එක්ක ගැටුම් ඇතිකර ගත්තොත් අද ඒවා යුද්ධ බවට පරිවර්තනය වෙන්නේ නැහැ.

ඒ රටවල් යුද්ධ කරන්නේ නැහැ; අපට බෝම්බ දමන්නේ නැහැ. හැබැයි, වෙන විධියකින් බලපෑම් ඇති කරලා, රටේ ජනතාව පාරට බස්සන තත්ත්වයට ඒ අය වැඩ කටයුතු කරනවා. අපි ඉන්දියාව තරහ කර ගත්ත එකේ වැරැද්ද තමයි අපට ඒ කාලය තුළදී විඳින්න ලැබුණේ. දැන් අපි ඉන්දියාව එක්ක හොඳ හිතින්, සුහදව කටයුතු කරනවා. එහි ප්‍රතිඵලයක් විධියට තමයි අපට මේ

ගිලන් රථ සංඛ්‍යාව ලබා දෙන්නේ. මේ ගිලන් රථ සේවාව සම්බන්ධයෙන් ඒ වෙලාවේ මොන තරම් දේවල් කිව්වාද කියා මට මතකයි. මේ ගිලන් රථ සේවය හරහා 'රෝ' ඔත්තු සේවය ක්‍රියාත්මක වනවාය කිව්වා. අපිත් බය වෙලා හිටියා; තිගැස්සුණා. මොකද, දවස ගණනේ පුවත් පත් සාකච්ඡා පවත්වලා, පාර්ලිමේන්තුවේ කථා කරමින් කිව්වා, 'රෝ' ඔත්තු සේවය තමයි මේ ගිලන් රථ හරහා එන්නේ කියා. අපිත් ඒ සම්බන්ධයෙන් නැවත විමර්ශනය කළා. නමුත් ගිලන් රථ සේවය හරහා පැමිණි 'රෝ' ඔත්තු සේවයක් නැහැ. ඒ ගිලන් රථවල සේවය කරන රියැදුරන්, සහායකයන් කියන සියලුදෙනාම ලංකාවේ අය බව අද පැහැදිලිව පෙනෙන්න තිබෙනවා. ඒ වාගේම, මේ ගිලන් රථ සේවය එක්කම හනුමා පාලමක් එනවාය කියා කිව්වා. ඒ හනුමා පාලම හරහා ලංකාව ඉන්දියාවට යටත් කර ගන්න -ඉන්දියාව අපව ආක්‍රමණය කර ගන්න- මට්ටමට ගෙනෙන බව මේ පාර්ලිමේන්තුවේදී අනන්තවත් කිව්වා. ඒ සම්බන්ධයෙන් පුවත් පත් සාකච්ඡා පැවැත්වුවා. ඒ පුවත් පත් සාකච්ඡා අහගෙන හිටපු අභිංසක මිනිසුන් හිතුවා, "අනේ! මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මේ රට ඉන්දියාවට පාවා දීලා, මේ ජාතික ආණ්ඩුව ඉන්දියාවට පාවා දීලා, දැන් 'රෝ' ඔත්තු සේවය ambulances හරහා අපේ රටට එනවා, හනුමා පාලම හරහා ඉන්දියාව මේ රට ආක්‍රමණය කරනවා, මේ හරහා ETCA ගිවිසුමත් අත්සන් කරලා අපේ රට සම්පූර්ණයෙන් ඉන්දියාවට යටත් වනවා" කියා. මේ ආදී වශයෙන් විවිධ දේවල් කිව්වා. "ඔන්න, ETCA ගිවිසුම අත්සන් කරන දිනය" කියා මේ පාර්ලිමේන්තුවේ ඉන්න සමහර මන්ත්‍රීවරු දින නියම කරලත් තිබුණා. නමුත් අද වනතුරු එහෙම ගිවිසුමක් අත්සන් කර නැහැ.

දැන් සිංගප්පූරු ගිවිසුම ගැනත් ඒ විධියටම කථා කරනවා. පසුගිය දවස්වල ඒ පිළිබඳව මමත් ටිකක් සොයා බැලුවා. මාධ්‍යවල තිබෙන ප්‍රචාර ඒ ආකාරයෙන්ම සත්‍ය නැති බව මට පැහැදිලිව කියන්න පුළුවන්. ඒ පිළිබඳව උනන්දුවක් දක්වන කීපදෙනකුම මට කථා කළා. "අපි ඒ නිලධාරීන් ගෙන්වලා, අදාළ අමාත්‍යවරයාත් සමඟ, මේ තුළින් අපේ රටට අවාසියක් සිදු වෙනවාද කියන එක පිළිබඳව සාකච්ඡාවක් පවත්වන්නම්" කියා මා ඔවුන්ට කිව්වා. මොකද, අපට අවශ්‍ය පලතුරු ටික අපේ රටේ හදා ගන්න, අපට අවශ්‍ය ආහාර ටික අපේ රටේ හදා ගන්න පුළුවන් වන විධියට "අපි වවලයි - අපි කන්නේ " කියන වැඩ පිළිවෙළ මම කෘෂිකර්ම අමාත්‍යාංශයේ දියත් කළා. ඒ වැඩ පිළිවෙළ තුළින් අපි අපනයනය ක්ෂේත්‍රය පිළිබඳවත් අවධානය යොමු කළා. නමුත් විවිධ සංවිධානවල කීපදෙනකුම මට කථා කරලා කිව්වා, "ඔබතුමා පලතුරු වවන්න හැදුවාට වැඩක් නැහැ. සිංගප්පූරුවෙන් පලතුරු ටික එන්න ගන්නවා, තුට්ටු දෙකට මෙහේ ඒවා විකිණෙනවා, මේ වෙළෙඳ පොළ සම්පූර්ණයෙන් ඉවරයි" කියලා. "මාළු ටික සිංගප්පූරුව හරහා එන්න පටන් ගන්නවා, එතකොට අපේ මේ කර්මාන්ත සම්පූර්ණයෙන්ම ඉවරයි" කියාත් කිව්වා. මා ඒ ගැනත් සොයා බැලුවා. නමුත් මට එහෙම තත්ත්වයක් වාර්තා වුණේ නැහැ. මම ඒ මහත්වරුන්ට නැවත කථා කරලා කිව්වා, "කමක් නැහැ, වැරැද්දක් තිබෙනවා නම් අපි හදමු" කියා. අපි කරන සියල්ලම හරි යන්නේ නැහැ. අපේ නිලධාරීන්, දේශපාලන අධිකාරියේ ඉන්න අය විසින් කළ සියලු දේවල් හරි ගියා නම් අද රට මේ තත්ත්වයේ තිබෙන්නේ නැහැ නේ. අපේ රටේ සංවර්ධනය උදෙසා ගත් ණයවලින් මේ රට සංවර්ධනය වෙලා, එහි ප්‍රතිඵල ජනතාවට ලැබුණා නම් අද අපේ රට හොඳ සුඛිත මුදිත රටක් බවට පත් වෙන්න ඕනෑ. නමුත් ආපසු හැරිලා බැලුවාම අපිට පෙනෙනවා, අපි රුපියල් කෝටි දහදාහකට වැඩි ප්‍රමාණයක ණයකාරයන් බවට පත්වී තිබෙන බව. අපේ රටේ ඉපදෙන හැම ළමයකුම රුපියල් ලක්ෂ හතරකට වැඩි ප්‍රමාණයක ණයකාරයන් බවට පත්වෙලා තිබෙනවා. ඒ අපි ගත් වැරැදි තීන්දුවල ප්‍රතිඵල බව අපි වටහා ගන්න ඕනෑ. අපේ අතින් වැරැදි වෙන්න පුළුවන්; අඩුපාඩු වෙන්න පුළුවන්. නමුත් අපි ඒවා හදා ගන්න ඕනෑ.

ඒ ගිවිසුමට සම්බන්ධ වුණු කණ්ඩායමත් එක්ක සාකච්ඡාවකට එන්නය කියා මම ඒ අයට ආරාධනා කළා. නමුත් කනගාටුවට කාරණය මේකයි. අද වනතුරුත් ඔවුන් මට කථා කළේ නැහැ. ඔවුන් ඒ පිළිබඳව අදහසක් ඉදිරිපත් කළේත් නැහැ. එහි තිබෙන අවාසි ටික අඩු ගණනේ ලිඛිතව හෝ ගෙනැත් දෙන්න කියා මම කිව්වා. සමහර සංවිධාන ඒ තොරතුරු ලිඛිතව එවා තිබුණා. ඒ කරුණු පිළිබඳව මා සොයා බැලුවා. නමුත් ඒ තොරතුරු කියපු ආකාරයෙන්ම සත්‍ය දේවල් නොවෙයි. අපි මීට වඩා රට ගැන හිතලා කටයුතු කරන්න ඕනෑ. දේශපාලන වශයෙන් ලැබෙන වාසි අවාසිවලට වඩා අපි රටක් විධියට එකතු වෙලා කටයුතු කරන්නේ කොහොමද කියන කාරණය පිළිබඳවයි අවධානය යොමු කරන්න ඕනෑ. මෙච්චර කාලයක් අපට වැරැදුණු බව අපි කිව්වා. ඉදිරියේදී ඒ වැරැද්ද සිදු නොවන ආකාරයට කටයුතු කිරීමේ වගකීම අපට තිබෙනවා.

මේ සුවසැරිය ගිලන් රථ සේවය සම්බන්ධව කථා කරද්දී, අපේ ගරු මන්ත්‍රීතුමන්ලා බෙහෙත් හිඟය සහ රෝහල්වල තත්ත්වය පිළිබඳවත් කිව්වා. ඒ වාගේ අදහස් ඉදිරිපත් කිරීම සාධාරණයි. මහජන නියෝජිතයෝ විධියට අපේ යුතුකම තමයි, අඩු පාඩු පෙන්වා දෙන එක. මම අද තිස්සමහාරාම රෝහලට කථා කළා. මොකද, එම රෝහල අසළ වර්ජනයක් තිබෙනවා; ජනතාවගේ පෙළ ගැස්මක් තිබෙනවා. ඒකට හේතුව, වෛද්‍යවරුන්ගේ අඩුවක්. ගිය සතියේත්, ඊට සති දෙකකට පෙරත් ඒ තත්ත්වය තිබුණා. මම ඒ ගැන සොයා බැලුවා. එතැන සිද්ධියක් වෙලා තිබෙනවා. හම්බන්තොට රෝහලේ වෛද්‍යවරු දෙන්නෙක් තිස්සමහාරාමයට මාරු කර තිබෙනවා. නමුත් ඒ දෙන්නා එහාට ගිහින් වැඩ භාර ගන්නේ නැහැ. ඒ දෙදෙනාම පදිංචි වී සිටින්නේ තිස්සමහාරාමයේයි. ඔවුන් තිස්සමහාරාම රෝහල පසුකරගෙනයි යන්නේ. නමුත් තිස්සමහාරාම රෝහලේ වැඩ වැඩියි කියා ඔවුන් හම්බන්තොට රෝහලට ගිහින් ඉන්නවා. අනික් අතට මම හිතන විධියට ඒ ගොල්ලන්ට පෞද්ගලිකව බෙහෙත් දීමේ කටයුත්තට ඇති පහසුවත් බලාගෙනයි මේ විධියට කටයුතු කරන්නේ. මම මේ කාරණය ගැන සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ට කථා කළා; අදාළ සියලුදෙනාට කථා කළා. නමුත් විසඳුමක් නැහැ. දැන් ඒ මාරුවීම්වලට විරුද්ධව වෘත්තීය සමිති කටයුතු කරනවා. මේ කවුරුත් කටයුතු කරන්නේ රෝගීන් දිහා බලලා නොවෙයි. වෛද්‍යවරුන්ගේ අයිතිවාසිකම් විතරක් දිහා බලලා කටයුතු කිරීම පිළිබඳව අපේ කනගාටුව ප්‍රකාශ කරනවා. මේවා සැලසුම් සහගතවයි සිද්ධ වෙන්නේ. මේ අය පාරට බැස්සාම, පාරවල් වහනවා. එතකොට බණින්නේ ආණ්ඩුවටයි; විරෝධය පළ කරන්නේ ආණ්ඩුවටයි. වෙන කාටවත් නොවෙයි. හැබැයි ආණ්ඩුව දෙන නියෝගය පිළිපදින්නේ නැති වෛද්‍යවරු ඉන්නවා නම්, ඒ අය පිළිබඳව කටයුතු කරන්න හැකියාවක් නැහැ. මොකද, ඊළඟට වෛද්‍ය සංගම් වැඩ වර්ජනයකට යනවා. මේ නිසා අපි මේ පිළිබඳවත් අවධානය යොමු කරන්න ඕනෑ.

මේ කථා කළ බොහෝ රෝහල් පළාත් සභාවලට අයිති ඒවායි. පළාත් සභාවලට අයත් රෝහල්වල අඩු පාඩු රාශියක් තිබෙනවා; ගැටලු රාශියක් තිබෙනවා. මධ්‍යම රජයට කියාත් දැන් නිකම් ඉන්න පුළුවන්කමක් නැහැ. පළාත් සභාවල තිබෙන ප්‍රතිපාදන අඩු නිසා වෙන්න ඕනෑ එහෙම වෙලා තිබෙන්නේ. ඒ පිළිබඳව සොයා බලා කටයුතු කරන්න ඕනෑ. මේ අද ඇතිවුණු තත්ත්වයක් නොවෙයි. අවුරුදු ගණනාවක සිට තිබෙන ප්‍රශ්නයක්. මමත් සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට කටයුතු කළා. එදාත් මේ ප්‍රශ්න තිබුණා. හැබැයි, අද බෙහෙත් වර්ග තිබෙන එක ගැන මම සතුටු වෙනවා. බෙහෙත් නැති නිසා වෙනදා පෝලිම් විශාල වශයෙන් තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි ඔබතුමා දැක ඇති, ඒ කාලයේ බෙහෙත් නැතුව, එක එක බෙහෙත් වර්ග නිහ වෙලා දවස ගණනේ ජනමාධ්‍යවල ප්‍රචාරත්ති මැවුණු ආකාරය. "අත්‍යවශ්‍ය බෙහෙත් ටික ලැබෙන්නේ නැහැ; බෙහෙත් ටික

[ගරු මහින්ද අමරවීර මහතා]

දෙන්නේ නැහැ; බෙහෙත් තිබුණේ නැහැ; හොඳ බෙහෙත් වර්ග නැහැ" කියා රෝහල්වලින් විවිධ මැසිවිලි නැඟුණා. නමුත් අද මම සතුටු වෙනවා; ආඩම්බර වෙනවා. එදා තිබුණු තත්ත්වය සමඟ සංසන්දනය කර බැලුවාම රෝගීන්ට බෙහෙත් දීම දැන් ඉතාම හොඳ මට්ටමකින් රජය විසින් ක්‍රියාත්මක කරගෙන යන බව අපට පෙනෙනවා.

සෞඛ්‍ය ක්ෂේත්‍රයට මේ රජය අතිවිශාල මුදලක් වියදම් කළා. අනික් අංශවලට දෙන මුදල් අඩු කරන්නෙත් නැතුව රජය ඒ වියදමත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ අවුරුදු දෙකක කාලයක් නියඟයක් තිබුණා. රුපියල් මිලියන 38,000ක් නියං ආධාර වශයෙන් දීලා, ගංවතුර ඇති වුණාම ඒවාටත් ආධාර දීලා, පොහොර සහනාධාරය වශයෙන් රුපියල් මිලියන 33,000ක් දීලා, ගොවීන් සියලුදෙනා රක්ෂණය කරන්න මිලියන 5,228ක් වියදම් කරලා, පාසල් දරුවන් රක්ෂණය කරන්නත් විශාල මුදලක් වියදම් කරලා, මේ බෙහෙත් ටික දෙන එකත් අඩු කරන්නේ නැතිව; සෞඛ්‍ය සේවාවට දෙන මුදලත් අඩු කරන්නේ නැතුව, අධ්‍යාපනයට දෙන මුදල අඩු කරන්නේත් නැතුව කටයුතු කරගෙන යන එක ගැන අපි සතුටු වෙන්න ඕනෑ.

අද මෙතුමන්ලා මොනවා කිව්වත්, අත්‍යවශ්‍ය බෙහෙත් ගණනාවක මිල අඩු වෙලා තිබෙනවා. සමහර ඒවායේ ප්‍රශ්න තිබෙන්න පුළුවන්. හැබැයි, මේවායේ මිල අඩු වුණේ නැහැ කියා කියන්න හොඳ නැහැ. අද පැනඩෝල් පෙත්තක මිල කීයකින් අඩු වෙලාද බලන්න. ඒ වාගේම තමයි, නිතර පාවිච්චියට ගන්නා බෙහෙත්වලත් මිල අඩුවෙලා තිබෙනවා. රුපියල් එකසිය ගණන්වලට ගත් බෙහෙතම දැන් රුපියල් 40ට ඇවිත් තිබෙනවා. Nexium කියන බෙහෙත ගැන මේ පාර්ලිමේන්තුවේම කථා කළා. ඒ බෙහෙත් පෙත්තක් රුපියල් 130ට වාගේ තිබුණේ. දැන් ඒ බෙහෙත් පෙත්ත රුපියල් තිස් ගණනට තිබෙනවා. මම මේ කියන්නේ ඒක මේ පාර්ලිමේන්තුවේ කථා වුණු මාතෘකාවක් නිසායි. ඒ බෙහෙත හිහයි කිව්වා; ඒ බෙහෙත එන්නේ නැහැ කිව්වා; එන්නේ බාල බෙහෙතක් කිව්වා. නමුත් ඒ බෙහෙතම අද එනවා. සැත්කම්වලදී වුණත් ලෙඩාට දරන්න තිබුණු බරින් සැලකිය යුතු කොටසක් මේ රජය භාරගෙන තිබෙනවා. ඒ නිසා රජය මොකුත්ම කළේ නැහැය කියනවා නම්, ඒක ඉතාම වැරැදියි කියන එකත් අපි පැහැදිලිව කියන්න ඕනෑ. මේ රජය සැලකිය යුතු වැඩ කොටසක් කර තිබෙනවා. තවත් වැඩ කොටසක් කළ යුතුව තිබෙන බවත් අපි පිළිගන්න සූදානම්. ඒ ටිකත් අපි නිවැරැදි කර ගන්න ඕනෑ.

ඊළඟට තවත් අදහසක් ඉදිරිපත් වුණා, ඉන්දියාව නිකම්ම දීලා ඉන්නේ නැහැය කියා. අපි රට පාවා දෙන වැඩ පිළිවෙළකට මේ හරහා යනවායි කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කිසිම විදේශීය රජයකට යටත් වෙන්නේ නැහැ කියන එක මම පැහැදිලිව කියන්න කැමැතියි. විදේශයකට ඕනෑ විධියට අපි ආණ්ඩු කරන්න සූදානම් වන්නේත් නැහැ. ඒක ඉතාමත්ම පැහැදිලියි. ඒ වාගේම මේ රට පාවා දෙන, රට කොටියාට යන එහෙම නැත්නම් රට වෙන කාටවත් යන, යුද්ධයකට යන වැඩ පිළිවෙළකටත් අපි ඉඩ තියන්නේ නැහැයි කියන එක ඉතා වගකීමෙන් කියනවා. සමහර අයට විවිධ දේවල් කියන්න පුළුවන්. දවස ගණනේ ප්‍රවෘත්ති මවන්න පුළුවන්. සමහර වෙලාවට අද දවසේ මාධ්‍යවල පළ කරන ප්‍රවෘත්ති ටික ඊළඟ දවසේ නිවැරදි කරන්න වෙනවා. හැබැයි, පත්තරේ මුල් පිටුවේ වැරදි ප්‍රවෘත්තියක් දමා අග පිටුවක පොඩියට නිවැරදි කිරීමක් කරනවා. නමුත්, මුල් පිටුවේ පළ කළ ප්‍රවෘත්තිය අරගෙන ඒ ගැන දවස පුරාම මාධ්‍යවල කථා කරනවා. ඒක අරගෙන අන්තර්ජාල, සමාජ ජාල වෙබ් අඩවි ඔස්සේ ආණ්ඩුවට නිරන්තරයෙන්ම ප්‍රහාර එල්ල කරනවා. හැබැයි, රටේ සැබෑ තත්ත්වය එය නොවෙයි කියන එක අපි සඳහන් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රජයක් විධියට අපෙන් වුණු අඩු පාඩුකම් තිබෙනවා. පසුගිය ඡන්දයේදී වුණත් SAITM ගැටලුව වැනි ලොකු ප්‍රශ්න ඇති වුණා. එහි දෙපැත්තම කළමනාකරණය කර ගන්න ආණ්ඩුවට බැරි වුණා. දෙපැත්තම අපට නැති වුණා. දැන් ඒක සැලකිය යුතු මට්ටමට විසඳා ගෙන තිබීම ගැන මම සතුටු වෙනවා. එතකොට ඒ ප්‍රශ්නය ඉවරයි. පසුගිය ඡන්දය වෙලාවේ අපට පොහොර පිළිබඳ ගැටලුවකුත් තිබුණා. ඒ සම්බන්ධයෙන් විශාල අර්බුදයක් තිබුණා. දැන් ඒ ගැටලුවත් සියයට 99ක් විසඳා තිබෙනවා. එවැනි ගැටලු ඉදිරියටත් ඇති වෙන්න අපි ඉඩ තියන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ තිබෙන අනෙකුත් වැඩ වර්ජන ගැන බැලුවොත්, සමහර ඒවා ඉතා සාධාරණ වැඩ වර්ජන කියලා කියන්න පුළුවන්. වැඩ වර්ජනයට පෙර ඒ අවශ්‍ය සාකච්ඡා නොදුන්නොත්, ඒ අයගේ ප්‍රශ්නය පිළිබඳව සැලකිලිමත් වෙලා නැත්නම් ඒකට වැඩ වර්ජනයක් කිරීම අසාධාරණයි කියලා අපට කියන්න බැහැ. ආණ්ඩුවේ අමාත්‍යවරුන් විධියට අපට වගකීමක් තිබෙනවා, ව්‍යක්තිය සමීති යම් ඉල්ලීමක් කළොත් සාකච්ඡාවක් දෙන්න. ඒක විසඳන්න පුළුවන් ගැටලුවක් නම් විසඳන්න ඕනෑ. ඒ වෙලාවේ විසඳන්න බැරි නම් වැඩ වර්ජනය කළත් විසඳන්න බැරි වෙන්න ඕනෑ. ප්‍රශ්නයක් විසඳන්න වැඩ වර්ජනය කරනතුරු ඉන්න අවශ්‍ය නැහැ. හැබැයි, දේශපාලන වුවමනාවන් මත ක්‍රියාත්මක වන වැඩ වර්ජන තිබෙනවා. ඒවාට විසඳුම් දෙන්න අපට අමාරුයි. නිදා ගෙන සිටින මනුෂ්‍යයකු ඇහැරවන්න පුළුවන්. බොරුවට නිදා ගෙන සිටින මනුෂ්‍යයකු ඇහැරවන්න අමාරුයි කියන එකයි මෙතැනදී පැහැදිලිව කියන්න තිබෙන්නේ. ඒ නිසා අපි ඒවාටත් මුහුණ දෙන්න ඕනෑ. අද රටේ ඇති වී තිබෙන ප්‍රජාතන්ත්‍රවාදය නිසා භය නැතිව වැඩ වර්ජනය කරන්න පුළුවන්, විරෝධතා ව්‍යාපාර පවත්වන්න පුළුවන්. අතීතයේ එහෙම තත්ත්වයක් තිබුණේ නැහැ. ඒ කාලයේ රුපියල් 10ක පඩි වැඩිවීම ඉල්ලා වැඩ වර්ජනය කළ රජයේ සේවකයාට රුපියල් 10 දෙන්නේ නැතිව රක්ෂාවෙන් දොට්ට දැම්මා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු මහින්ද අමරවීර මහතා
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ඒක, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාල පරිච්ඡේදයක්. ඊළඟට, රාජ්‍ය සේවයේ ආයතන වහලා සේවකයින් නිකම්ම සේවයෙන් ඉවත් කරපු යුගයකුත් තිබුණා. විශේෂයෙන් සතොස වැනි ආයතනවල. ඒත් ඒ කාලයේමයි. කලින් අපි ආණ්ඩු කරපු කාලයේත් වැඩ වර්ජන නැවැත්තුවේ කොහොමද කියලා අපි දන්නවා. සමහර ඒවා සාකච්ඡා කරලා හොඳින් නැවැත්තුවා. සමහර ඒවා නරක විධියට නැවැත්තුවා. ඒ වාගේම විරෝධතා පාලනය කළ විධියත් අපි දන්නවා, ඒවා මර්දනය කළ විධියත් දන්නවා. හැබැයි, මේ ආණ්ඩුවට කිසිම ආකාරයකින් මිනිසුන් මරන්නවත්, ඒ තිබෙන අයිතීන් පැහැර ගන්නවත් අපි ඉඩ තියලා නැහැයි කියන එක මම කියන්න කැමැතියි. ඒ ප්‍රජාතන්ත්‍රවාදය දීලා තිබෙනවා, ඒ නිදහස දීලා තිබෙනවා. තොරතුරු වාර්තා කරන්න නිදහස ලබා දී තිබෙනවා. ඒ නිසා මෙවැනි දේවල් ඇති වෙනවා. හැබැයි, අපේ රටේ වැඩ වර්ජන කරන අයගෙනුත් අපි

ඉල්ලා සිටින්නේ, ඒවායින් අහිංසක මිනිසුන් පීඩාවට පත් නොවෙන ආකාරයට තමන්ගේ වෘත්තීය ක්‍රියාමාර්ග ගන්නය කියලයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මීට වැඩිය කථා කරන්නේ නැහැ. මේ සම්බන්ධයෙන් වවන කිහිපයක් කථා කරන්න මට අවස්ථාව ලබා දීම පිළිබඳව මම ඉතාම සතුටු වෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[ප.ව. 3.44]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි. මීළඟට, ගරු සීනිතම්බි යෝහේස්වරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

ගරු සීනිතම්බි යෝහේස්වරන් මහතා
(மாண்புமிகு சீனித்தம்பி யோகேஸ்வரன்)
(The Hon. Seeniththamby Yoheswaran)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று இரண்டு முக்கிய விடயங்கள் இந்தச் சபையில் ஆராயப்படுகின்றன. ஒன்று, பிணியாளர் அம்புலன்ஸ் சேவை சம்பந்தமான விடயம். அடுத்தது, மதுவரிக் கட்டளைச் சட்டத்தின் கீழான அறிவித்தல்கள் பற்றிய விடயம். இவற்றில் நான் கூடுதலாக மது வரி சம்பந்தமாகப் பேச விரும்புகின்றேன்.

எமது நாட்டைப் பொறுத்தவரையில், எமது நாட்டின் வருமானம் கூடுதலாக மதுபானத்தில் தங்கியிருப்பதுபோன்று தெரிகின்றது. ஏனென்றால் அரசாங்கம் மதுபான நிலையங்களை ஆரம்பிப்பதிலும் ஊக்கமளிப்பதிலும் மிகக் கூடுதலாகச் செயற்பட்டுக் கொண்டிருக்கின்றது. ஆகவே, இது ஒரு வேதனைக்குரிய விடயமாகும். ஒரு நாட்டின் அபிவிருத்தியில் மக்கள் ஆரோக்கியமானவர்களாக இருப்பது அவசியமானதாக இருக்கின்றது. ஆனால், இன்று மதுபான ரீதியாக வடக்கு, கிழக்கிலே பெரும்பாலும் தமிழ் மக்கள் பாதிக்கப்பட்டுக் கொண்டிருக்கின்றார்கள். குறிப்பாக கடந்த கால யுத்தத்தால் பாதிக்கப்பட்ட எங்கள் சமூகம், இன்று மதுபான ரீதியில் பெரும் பாதிப்பை எதிர்கொண்டிருக்கின்றது. வறுமை ரீதியாகப் பார்க்கின்றபோது வடக்கு, கிழக்குத்தான் கூடிய வறுமை நிலையில் இருக்கின்றது. முதலாவதாக வட மாகாணமும், இரண்டாவது கிழக்கு மாகாணமும் இருக்கின்றது. அதேநேரத்தில் மாவட்ட ரீதியாகப் பார்க்கின்றபோது, முதலாவதாகக் கிளிநொச்சியும் இரண்டாவதாக முல்லைத்தீவும் மூன்றாவதாக மட்டக்களப்பும் நான்காவதாக திருகோணமலையும் இருக்கின்றது. மட்டக்களப்பு மாவட்டம் மிக வறுமையான நிலையிலே இருக்கின்றபோதிலும், இன்று அங்கு அதிகளவான மதுபானசாலைகள் உருவாகியிருப்பது மக்களின் வாழ்வாதாரத்தில் மிகக் கூடுதலாக பாதிப்பை ஏற்படுத்திக் கொண்டிருக்கின்றது.

குறிப்பாக மாவட்டத்திலே கிட்டத்தட்ட 20 மதுபான சாலைகள் இருக்கலாம். ஆனால், இப்போது 67 மதுபான சாலைகள் இருக்கின்றன. ஒரு மாதத்திலே கிட்டத்தட்ட 400 மில்லியன் ரூபாய் மதுபானத்துக்காக மட்டக்களப்பு மாவட்டத்திலே செலவிடப்படுகின்றது. அதாவது மதுபானத்தால் 400 மில்லியன் மாவட்டத்துக்கு வெளியில் செல்கின்றது. ஆனால், மட்டக்களப்பு மாவட்ட அபிவிருத்திக் காக வருகின்ற நிதி 360 மில்லியன் ரூபாய். அங்கு வீடுகள் தோறும் வறுமை நிலை! அந்த நிலையிலே மதுபான ரீதியாக மக்கள் பாதிக்கின்ற தன்மையே மிகக் கூடுதலாக இருந்து கொண்டிருக்கின்றது. குறிப்பாக பாடசாலை மாணவர்கள்கூட இன்று மதுபானம் மற்றும் போதைவஸ்துக்களுக்கு அடிமையாகின்ற நிலை கூடுதலாகக் காணப்படுகின்றது. இது குறித்து பல தடவைகள் இந்த உயரிய சபையிலே நாங்கள் குரல் கொடுத்திருக்கின்றோம். ஆனால், அது சார்பாகத் தீர்க்கமான நடவடிக்கைகள் இடம்பெறவில்லை.

மட்டக்களப்பு மாவட்டத்திலே சுற்றுலாத் துறைக்கான அபிவிருத்தி நடைபெறுகின்றது. அந்த வகையில் பல சுற்றுலா விடுதிகள் உருவாக்கப்பட்டிருக்கின்றன. அந்த விடுதிகளிலும் கூட மதுபான விற்பனைகள் இடம்பெறுகின்றன. அவை தவிர, 67 மதுபான நிலையங்கள் இருக்கின்றன. எவ்வளவோ தூரம் வறுமையில் பாதிக்கப்பட்டிருகின்ற எங்கள் மக்கள் மதுபானப் பாவனைக்கும் ஆளானால் அவர்களின் நிலை என்ன? என்று சிந்தித்துப் பாருங்கள்! எனவே, எங்களது மட்டக்களப்பு மாவட்டத்திலிருக்கின்ற மதுபான நிலையங்களைக் குறைப்பதற்கு அரசாங்கம் நடவடிக்கை எடுக்கவேண்டும் என மீண்டும் மீண்டும் வலியுறுத்துகின்றோம்.

அதுதவிர, நான் இப்பொழுது கூறப்போகும் விடயம் தொடர்பில் முன்பு நாங்கள் பல தடவைகள் இந்தப் பாராளுமன்றத்தில் குரலெழுப்பியிருக்கின்றோம். அதாவது, எனது கல்குடாத் தொகுதியிலே கும்புறுமுலை என்கின்ற பகுதியிலே ஒரு மதுபான உற்பத்தித் தொழிற்சாலை கட்டப்பட்டுக் கொண்டிருந்தது. தற்போது அதன் இயக்கம் நிறுத்தப்பட்டிருக்கின்றது. ஆனால், சம்பந்தப்பட்டவர்கள் பூரணமாக அதனைக் கட்டி முடித்துவிட்டார்கள். அந்த மதுபானத் தொழிற்சாலையைக் கொண்டுவந்தவர் யார்? இந்தப் பாராளுமன்றத்திலே அடிக்கடி பேசப்படுகின்றவரான அர்ஜுன் அலோசியஸ் அவர்கள். அவர் இந்திய நாட்டுக் கம்பனியுடன் சேர்ந்து அதனைச் செயற்படுத்துகின்றார். அவர் கிட்டத்தட்ட 230 மில்லியன் அங்கு பெற்றிருக்கின்றார்; 220 மில்லியன் அவர் முதலிட்டிருக்கின்றார். கிட்டத்தட்ட 450 மில்லியன் செலவில் கும்புறுமுலையில் எதனோல் தொழிற்சாலை என்கின்ற மதுபானத் தொழிற்சாலை உருவாக் கப்பட்டிருக்கின்றது. அது தற்காலிகமாக நிறுத்தப்பட்டாலும், தொடர்ந்தும் அது இயங்கலாம் என்ற சந்தேகம் மக்களிடம் இருக்கின்றது. இதற்கெதிராக முஸ்லிம் மக்கள், தமிழ் மக்கள் என்று மக்கள் போராட்டங்கள் நடத்தப்பட்டிருக்கின்றன. "அந்தத் தொழிற்சாலையை உடனடியாக மூடி, அந்த இடத்திலிருந்து அப்புறப்படுத்துங்கள்" என்று கோரி மக்கள் பிரதிநிதிகளாகிய நாங்கள் கையொப்பமிட்டு, அதிமேதகு ஜனாதிபதி அவர்களுக்கு மகஜர் சமர்ப்பித்திருக்கின்றோம். ஏனென்றால், அது இரகசியமாகக் கட்டியெழுப்பப்பட்டது. இங்கு மத்திய வங்கியின் பிணைமுறி விவகாரத்தில் அர்ஜுன் அலோசியஸ் பற்றி அழகாகப் பேசுகின்ற உறுப்பினர்கள், அலோசியஸின் கும்புறுமூலை எதனோல் தொழிற்சாலை செயற்றிட்டம் பற்றி ஏன் பேசத் தவறுகின்றார்கள்? இது கேள்விக்குறியாக இருக்கின்றது.

இன்று இந்திய அரசாங்கத்தின் அனுசரணையோடு பிணியாளர் அம்பியுலன்ஸ் வசதி ஏற்படுத்தப்படவிருக்கின்றது. அது சார்பாக இன்று இந்தப் பாராளுமன்றத்திலே விவாதம் இடம்பெற்றுக் கொண்டிருக்கின்றது. ஆனால், மட்டக்களப்பு மாவட்டத்திலிருக்கின்ற சில வைத்தியர்கள், அர்ஜுன் அலோசியஸின் ஆதரவைப் பெற்றுக்கொண்டு, அவர் கட்டுகின்ற எதனோல் தொழிற்சாலைக்கு ஆதரவாக விளம்பரங்களை ஏற்படுத்தி, மக்களுக்கு மத்தியில் பிரச்சாரம் செய்கின்ற நிலைமையைக்கூட நாங்கள் கண்டோம்.

[ගරු සීතාතම්බි යෝගේස්වරන් මහතා]

වෛද්‍යසාලෙකලිලේ තංකල් කඩමෙකලෙ ඔලුංකාකච් චෙය්වතිල්ලෙ. ආනාල්, අලෝසියස්ට්කුප් පක්කප් පාට්ටුප් පාදුවතර්කුච් චිල වෛද්‍යියර්කල් පුරප්පට්ටිරුක්කින්රාර්කල්. ආකවේ, ඉතිලේ නාංකල් මිකක් කවනමාක ඉරුක්කවේන්ටුම්.

කෞරව තලෛමෙතාංකුම් උරුප්පිනර් අවර්කලේ, මාවට්ටම් කූටුතලාන වරුමෙයිලිරුක්කින්රතු. ආකවේ, අන්ත මක්කළින් වාළ්වාතාරම් කට්ටියෙළුප්පප්පට වේන්ටුම්. ආනාල්, අන්ත මක්කල් මතුපානත්තිර්කු අටිමෙයාකින්ර නිලෛමෙයුම් කුටුම්පංකල් සීරළින්තු පෝකින්ර නිලෛමෙයුම් කූටුතලාකක් කාණප්පටුකින්රතු. අතනාල්, මිකත් තීවිරමාක නටවටික්කෙයෙටුත්තු, අංකිරුක්කින්ර මතුපානසාලෙකළෙක් කුරෙක්ක වේන්ටුම්. අත්තෝටු අලෝසියස්සාල් ස්තාපික්කප් පට්ටිරුක්කින්ර එතනෝල් තොළිර්සාලෙ - මතුපානත් තොළිර් සාලෙයෙ උටනටියාක මූටුවතෝටු අප්පුරප්පටුත්තවුම් වේන්ටුම්. ඒනෙනිල් අතු අන්ත මක්කළුක්කුත් තේවෛයිල්ලෙ. ආනාල්, අතෛවිට විසේටමාන විටයංකල් අන්ත මක්කළුක්කුත් තේවෛයාක ඉරුක්කින්රන. අන්ත වකෛයිල් පල මක්කළුක්කුම් වරුමානත්තෙ ඒර්පටුත්තක්කූටිය පල තොළිර් සාලෙකළෙ අංකු නාංකල් කොණ්ටුවරලාම්.

ඉන්රු අංකු සිල තොළිර්සාලෙකල් මූටප්පට්ටිරුක් කින්රන. වාළෛච්චේනෙ තේසිය කටතාසි ආලෙ මූටප්පට්ට නිලෛයිල් ඉරුක්කින්රතු. අතනෛක් කට්ටියෙළුප්පුංකල් එන්රු ඉන්ත නාට්ටින් පිරතමර් අවර්කළෝටු පල තටවෛකල් නාංකල් පේසියිරුක්කින්රේන්. අවරුක්කුක් කටිතමුම් කොටුත්තිරුක් කින්රෝම්. ආනාල්, අතු ඉන්තිල් කේට්ටු ඉනූරිල් විට්ට නිලෛමෙයාක ඉරුන්තු කොණ්ටිරුක්කින්රතු. මූවායිරම් පේර් තොළිල් චෙය්ත අන්තත් තොළිර්සාලෙයෙක් කට්ටියෙළුප්පාතු, අලෝසියස් පෝන්රවර්කල් කොණ්ටුවන්ත එතනෝල් තොළිර්සාලෙක්කු ඉක්කිය තේසියක් කට්සි අරසාන්කම් මරෙමුකමාක ආතරවු කොටුත්තිරුප්පතෙ ඉන්තච් සපෙයිලේ නාන් වන්මෙයාකක් කණ්ටික්කින්රේන්. ඉතු ඉක්කිය තේසියක් කට්සියින් ආතරවෝටුතාන් වන්තතු. ඒනෙන්රාල්, අන්තත් තොළිර්සාලෙයෙක් කට්ටුවතිල් පිරතිනිතිකල් සිලර් ඔත්තුළෛප්පාක නින්රාර්කල්. ආකවේ, ඉතු සාර්පාකවුම් තීවිරමාන විසාරණෙ මුන්නෙටුක්කප්පට වේන්ටුම්. ඒනෙන්රාල්, අන්ත මක්කල් පාතික්කප්පටුකින්ර නිලෛමෙ අන්තත් තොළිර්සාලෙයාල් ඒර්පටුත්තප්පට්ටුක්කොණ්ටිරුක් කින්රතු.

එනවේ, අන්තත් තොළිර්සාලෙ තොටර්න්තු ඉයංකා වණ්ණම් මූටිවෛක්කප්පටුවතර්කු ඉන්තච් සපෙ පූරණ ආතරවු තන්තු උතවි චෙය්යවේන්ටුම්. අතු අංකිරුන්තු අප්පුරප් පටුත්තප්පට වේන්ටුම්. ඉප්පොළුතු කෞරව උළ්නාට්ටලුවල්කල් අමෛච්චර් අවර්කල් ඉංකිරුක්කින්රාර්. අවර් ඉක්කිය තේසියක් කට්සි අරසාංකත්තින් මුක්කිය පිරතිනිතියොරුවර්. ආකවේ, අවර් මුක්කියමාක අරසාංකත් තිටම් ඉතනෛච් චොල්ල වේන්ටුමෙන්රු නාන් ඉන්තච් සපෙයිල් කේට්ටුක්කොළ්කින්රේන්. ඒනෙන්රාල්, උංකළ් මීතු නාංකල් නල්ල නම්පික්කෛ වෛත්තිරුක්කින්රෝම්. අන්ත මක්කල් මතුපානත්තාල් කූටුතලාකප් පාතික්කප්පට්ටුක් කොණ්ටිරුක් කින්ර නිලෛයිල්, අලෝසියස්ින් තොළිර්සාලෙ අංකු තොටර්න්තු උරුවාකුවතර්කු අනුමතික්ක මුටියාතු.

අතේනේරත්තිල්, වාළෛච්චේනෙ තේසිය කටතාසික් කම්පනි විරෛවාකක් කට්ටියෙළුප්පප්පට වේන්ටුම්. අතර්කාන මුතලීට්ටාළර්කළෙ නාංකල් පෙට්රුත්තරත් තයාරාක ඉරුක් කින්රෝම්. අතන්මූලම් අන්ත මක්කළින් වාළ්වාතාරත්තෙ මේම්පටුත්තුවතර්කු නටවටික්කෛ එටුක්කප්පට වේන්ටුම්. අතු සාර්පිල් කෞරව පිරතමර් අවර්කළුක්කු නීංකළුම් ආලෝසනෙ තෙරිවිත්තු එංකළතු වාළෛච්චේනෛත් තේසිය කටතාසි ආලෙ ඉයංකුවතර්කු උතව වේන්ටුමෙන්රු කේට්ටු, එනතු උරෛයෙ නිරෛවු චෙය්කින්රේන්. නන්රි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
මීළහට, ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.3.52]

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(මාණ්පුමිකු අනුර සිට්නි ජූයරත්න)
(The Hon. Anura Sidney Jayarathne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද "1990 සුවසැරිය ගිලන්රථ සේවය" ගැන මෙම පාර්ලිමේන්තුවේදී කථා බහට ලක් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙනකොට මේ සේවාව ලංකාවේ දිස්ත්‍රික්ක හයක ක්‍රියාත්මක වෙනවා. ඉදිරියේදී තව දිස්ත්‍රික්ක ගණනාවකට මේ සේවාව ව්‍යාප්ත කරන්න බලාපොරොත්තු වෙනවා. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වන ගරු අග්‍රාමාත්‍යතුමාට මා විශේෂයෙන්ම ස්තුතිවන්ත වනවා, රාජ්‍ය අමාත්‍ය ගරු හර්ෂ ද සිල්වා මැතිතුමාගේ පූර්ණ අධීක්ෂණය යටතේ මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳව. අපට මතකයි මේ වැඩසටහන ක්‍රියාත්මක කරනකොට විවිධ චෝදනා එල්ල වුණ හැටි. අපේ කෘෂිකර්ම අමාත්‍යතුමා කිව්වා වාගේ බොහෝ අය මේ වැඩසටහන දැක්කේ, ඉන්දියාව අපෙන් මොනවා හරි බලාපොරොත්තු ඇතිව අපට දෙන අල්ලසක් හැටියටයි. නමුත්, පසුගිය කාලයේ මේ ගිලන් රථ සේවාව මඟින් ඉටු වූ සේවාව අපි දැක්කා. ජනතාව මේ ගැන විශේෂයෙන්ම කථා කළා. මේ ගිලන් රථ සේවාව ලබා ගත්ත අය මාධ්‍යයට ඇවිල්ලා ඒ ගැන බොහොම ගුණාත්මක ආකාරයට කථා කරනවා අපි දැක්කා. නමුත් උදය ගම්මන්පිල මන්ත්‍රීතුමා කිව්වා, මේ වැඩසටහනත් එක්කම ඉන්දියාවයි ලංකාවයි යා කරන හනුමා පාලම හදලා, ඉන්දියාවේ රෝ ඔත්තු සේවය ඇවිල්ලා, ලංකාව ඉන්දියාවට පාවලා දෙයි කියලා.

කෘෂිකර්ම ඇමතිතුමා කිව්වා වාගේ, 1980 දශකයේ මේ රටේ ත්‍රස්තවාදී යුද්ධය තිබෙන කාලයේ අපේ රටේ තරුණයෝ දහස් ගණනක් යුද පිටියේදී මිය යනකොට, ඒ වෙනුවට ඉන්දියාවේ සෙබළු ඇවිල්ලා බේරල්ල දුන්නා. හැබැයි, ඒ කාලයේ ඒ ගැනත් සමහර අයට විවේචන තිබුණා. එදා අපට වුවමනා ප්‍රමාණයෙන් සන්නද්ධ හමුදාව හිටියේ නැහැ. එදා අපේ සන්නද්ධ හමුදාවට අවශ්‍ය අවි ආයුධ තිබුණේ නැහැ. මට මතක හැටියට ඉන්දියාවේ හමුදා භටයෝ 1,500කට වැඩි පිරිසක් ලංකාවේ යුද්ධය වෙනුවෙන් ජීවිතය දුන්නා. ඒ ජීවිත දීලා ඉන්දියාව ලංකාව වෙනුවෙන් ලොකු කාර්යයක් කළා. ඒ වාගේම, අපි ඉන්දියානු ආණ්ඩුව තරහ කර ගත්තාට පස්සේ ඒ එල විපාකත් අපට ලැබුණා. විශේෂයෙන්ම අපි ඉන්දියන් ආණ්ඩුවට ස්තුතිවන්ත වනවා, අදත් විවිධාකාරයෙන් අපට උදව් ලබා දෙන නිසා.

අද උතුරු-නැඟෙනහිර ප්‍රදේශ ගත්තොත්, ඒ ප්‍රදේශයේ පුනරුත්ථාපන කටයුතු කරන්න ඉන්දියාව අපට උදව් දෙනවා. උතුරු-නැඟෙනහිර යුද්ධය තිබුණු කාලයේ ඒ දුම්රිය මාර්ගය විනාශ වෙලා තිබුණේ. ඉන්දියන් ආණ්ඩුව තමයි දුම්රිය ඒ මාර්ගය ඉදි කරන්න අපට ආධාර දුන්නේ. ඒ වාගේම, ඒ ප්‍රදේශයේ යුද්ධයෙන් විනාශ වෙලා ගිය නිවාස ඉදි කරන්න අදත් ඉන්දියන් ආණ්ඩුව අපට උදව් දෙනවා. හැබැයි, එහා පැත්තේ

ඉන්න අපේ සහෝදර මන්ත්‍රීතුමන්ලා ඒ ගොල්ලන්ගේ දේශපාලන පැවැත්ම වෙනුවෙන් මේ කටයුතු ගැන විවිධාකාර විවේචන ඉදිරිපත් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුවසැරිය ගිලන් රථ සේවය අද ඉතාම ජනප්‍රිය සේවයක්. අපි ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, පොලොන්නරුව, අනුරාධපුරය, මඩකළපුව, ත්‍රිකුණාමලය, මන්නාරම වාගේ දුෂ්කර දිස්ත්‍රික්ක තුළත් මේ ගිලන් රථ සේවාව ඉදිරියේදී ක්‍රියාත්මක කරන්න කියලා. දැන් සමහර අය මෙහි අඩු පාඩු ගැන කථා කරනවා. මේ ගිලන් රථ සේවයේ නිරතවන රියැදුරන්ට සහ එහි උපස්ථායකයන්ට දැනෙන අඩු පාඩුවලට වඩා අපේ මන්ත්‍රීතුමන්ලා ඒ අයගේ අඩු පාඩු ගැන කථා කරනවා. ඒ රියැදුරන් සහ උපස්ථායකයන් බොහොම හොඳට මේ සේවය කරනවා. විශේෂයෙන්ම අපේ සෞඛ්‍ය සේවය ගැන අද අපට සන්තෝෂ වෙන්න පුළුවන්. අද එක පැත්තකින් අපි බෙහෙත් මිල අඩු කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් රජයේ රෝහල්වලින් බෙහෙත් ලබා ගැනීම සඳහා පළාත් සභාවලින් නැත්නම්, සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් වෙන් කරන මුදල් අවුරුද්දේ මාර්තු-අප්‍රේල් වන විට ඉවරයි. රෝහලේ වෛද්‍යවරයා බෙහෙත් ටික ලියලා දුන්නාට පස්සේ ෆාමසියකට ගිහිල්ලායි ඒ බෙහෙත් ටික ගන්න ඕනෑ; රෝහලේ බෙහෙත් ටික නැහැ. නමුත්, අද එවැනි තත්ත්වයක් නැහැ. අද රෝහල්වල අවශ්‍ය බෙහෙත් ටික තිබෙනවා.

ගරු සිසිර ජයකොඩි මහතා
(மாண்புமிகு சிசிர ஜயகொடி)
(The Hon. Sisira Jayakody)
දැන් පළාත් සභාවත් නැහැ නේ.

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
පළාත් සභා නැති වුණාට ඒ සේවාව ක්‍රියාත්මක වෙනවා. පළාත් සභාවෙන් වැඩක් නැහැ. පළාත් සභා ක්‍රමය ආවේ 1988න් පස්සේ. 1988දී පළාත් සභා ක්‍රියාත්මක වෙන්න ඉස්සෙල්ලා මධ්‍යම ආණ්ඩුවෙන් කෙරුණු පාලනයක් මේ රටේ තිබුණා. අපේ රටට පළාත් සභා ඇවිල්ලා තවම අවුරුදු 30ක් නැහැ. ඊට ඉස්සෙල්ලාත් මේ රටේ නිදහස් සෞඛ්‍ය සේවාව තිබුණා. හරි ද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත වේලාව දැන් අවසානයි.

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
හැබැයි, අද පළාත් සභාවල නිල කාලය අවසන් වෙලා තිබුණත් අද ඒ කටයුතු කරගෙන යනවා. අද රෝහල්වලින් අක්ෂි කාව නොමිලේ ලබා දෙනවා. බොහොම අඩුවට 'ස්ටෙන්ට්' දෙනවා. අද වෙනදාට වැඩිය රෝහල්වල පහසුකම් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා මම ස්තුතිවන්ත වෙනවා,-[බාධා කිරීමක්]-

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
පොලොන්නරුවට සේවය වැඩි වෙලා ඇති.

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
පොලොන්නරුවට විතරක් නොවෙයි, ලංකාවේ හැම තැනම. ලංකාවේ හැම රජයේ රෝහලකින්ම නිදහස් සෞඛ්‍ය සේවාව වෙනදාට වැඩිය හොඳට ලැබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට නියමිත කාලය අවසන් නිසා මගේ කථාව අවසන් කරන්නම්. විශේෂයෙන්ම "සුවසැරිය" ගිලන් රථ සේවය අපට ලබා දීම පිළිබඳව ඉන්දියානු ආණ්ඩුවටත්, ඉන්දියානු ජනතාවටත්, ඉන්දියාවේ සියලුදෙනාටමත් ගෞරව පූර්වකව ස්තුතිවන්ත වෙමින්, මේ සේවාව අපේ රටට ලබා ගන්න කටයුතු කරපු ගරු අගමැතිතුමාටත්, මේ සේවය ක්‍රියාත්මක කරන ගරු හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු දිළුම් අමුණුගම මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.59]

ගරු දිළුම් අමුණුගම මහතා
(மாண்புமிகு திளும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කථා කරන්න කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අපේ සියලු මන්ත්‍රීතුමන්ලා පැවසූ ආකාරයට මේ වැඩසටහන පිළිබඳව අපට ගැටලුවක් ඇත්තේ නැහැ. කලින් කථා කරපු ගරු කෘෂිකර්ම ඇමතිතුමා දිගින් දිගටම අපට චෝදනා කළාට, අපට ඕනෑ තරම් හැකියාව තිබෙනවා, ආණ්ඩුව වුණත් හොඳ වැඩක් කරනවා නම් එය පිළිගන්න. අපි හැමදේම අසුබවාදී ලෙස දකින කණ්ඩායමක් නොවෙයි. ඒ නිසා මේ වැඩසටහන හොඳ වැඩසටහනක්. ඉදිරියේදී ප්‍රශ්න, ගැටලු මතු නොවන ආකාරයට මෙය පවත්වාගෙන යෑමේ වගකීම රජයට තිබෙනවාය කියන කාරණය අපි මතක් කරන්න අවශ්‍යයි.

සෞඛ්‍යයට අදාළව රටේ රෝහල් බොහොමයක මේ වන විට බරපතළ තත්ත්වයක් උද්ගත වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මහනුවර මහ රෝහලේත් රජය විසින් අක්ෂි කාව නොමිලේ ලබා දෙන වැඩ සටහනක් ආරම්භ කළා. ඒවා එහෙම ලබා දෙනවා නම් ඒ පිළිබඳව ගැටලුවක් නැහැ. ඒක ඉතාම හොඳයි. හැබැයි, දැන් මතු වෙලා තිබෙන ප්‍රායෝගික ගැටලුව, ප්‍රශ්නය තමයි මේ සැත්කම කරගන්න දිනපතාම දීර්ඝ ලැයිස්තුවක් එකතු වෙන එක. ඇසේ සුද ආපු රෝගීන්ට දීර්ඝ කාලයක් ඒ සැත්කම නොකර බලාගෙන ඉන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒකට හේතුව තමයි, ඒ අයගේ කැමැත්තෙන් අද පෞද්ගලික මුදල් වියදම් කරලාවත් ඒ අක්ෂි කාව දාගන්න ක්‍රමවේදයක් නැතිකම.

මෙතෙක් කාලයක් නොයෙකුත් දානපති සමාගම් විසින් සහ රාජ්‍ය නොවන සංවිධාන විසින් මේ අක්ෂි කාව මිලදී අරගෙන දුප්පත් ජනතාවට ලබා දීලා, ඒ අයගේ ඇසේ සුද ඉවත් කරලා අක්ෂි කාව බද්ධ කිරීමේ සැත්කම් ක්‍රියාත්මක කළා. අද ක්‍රියාත්මක වන මේ නීතිය තුළ ඒකත් නතර වෙලා තිබෙනවා. අද නොමිලේ අක්ෂි කාව ලැබෙනතුරු දීර්ඝ කාලයක් ඒ ලැයිස්තුවල රැඳී සිටීම නිසා සමහර රෝගීන්ගේ ඇස් සැත්කම් කිරීමෙන් හෝ නැවත නිවැරැදි කළ නොහැකි තත්ත්වයට පත් වෙමින් පවතිනවා. මේ සම්බන්ධයෙන් මම මහනුවර මහ රෝහලට ඊයේත්, අදත් කථා කරලා බැලුවා. මහනුවර මහ රෝහලේ දවස් දෙකක් නතර කරගෙන හිටපු රෝගීන් විශාල පිරිසක් ඊයේත් ආපහු ගෙදර යවා තිබෙනවා. අක්ෂි කාව නැති නිසා තමයි ඔවුන් ගෙදර යවා තිබෙන්නේ. අදත් මහනුවර මහ රෝහලේ රෝගීන් පිරිසක් ගෙදර යවන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ ගැන වෛද්‍ය කාර්ය මණ්ඩලයට දොස් කියලා තේරුමක් නැහැ. එසේ ගෙදර යවන්න

[ගරු දිළුම අමුණුගම මහතා]

සිද්ධ වෙලා තිබෙන්නේ මා කලින් සඳහන් කළ අඩු පාඩු නිසායි. ඒ නිසා අපි රජයෙන් එක දෙයක් ඉල්ලන්න ඕනෑ. ඔබතුමන්ලා ඒ කටයුතු ආරම්භ කරන්නේ හොඳ අරමුණින් වෙන්න පුළුවන්. හැබැයි, රජය හරහා සියයට සියයක් ඒ කටයුතු කාර්යක්ෂමව කරන්න පුළුවන් ද කියන ප්‍රශ්නය අද මතු වෙලා තිබෙනවා.

මේ අවස්ථාවේ සෞඛ්‍ය ඇමතිතුමා සභාවේ නැති වුණත් අපි ගරු හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, පුළුවන් නම් ඔබතුමා මැදිහත් වෙලා ඒ පණිවුඩය ලබා දෙන්න කියලා. අඩුම තරමින් නොමිලයේ කාව ලබා දෙන අයට, ඒ ශල්‍යකර්මවලට නොමිලයේ කාව ලබා දෙන ආයතනවලට ඒ කාව ලබා දීමේ අවස්ථාව උදාකරලා දෙන්න. මම පසුගිය වතාවකදීත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ විෂයයක් යටතේ කථා කරන අවස්ථාවකදී ගරු රාජිත සේනාරත්න ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කළා, මේක නිවැරදි කරන්න කියලා. එතුමා ඒ අවස්ථාවේදී සඳහන් කළා එය නිවැරදි කරන බවට. නමුත් මේ දක්වා එය නිවැරදි කර නැහැ. ඒ අවස්ථාවේදී එතුමා කිව්වේ "ඒ මොහොතේදී ගෙන්වූ කාව පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. අපි ඒ වරද නිවැරදි කරනවා. මොකද, කොටසක් return කරන්න වුණා" කියලායි. හැබැයි, අද වන විට මේ වැඩ පිළිවෙළ ගෙනැල්ලා අවුරුදු එකහමාරක් වෙනවා. අවුරුදු එකහමාරක් තිස්සේ රෝගීන් සැත්කම්වලට භාජනය නොකර ගෙවල්වලට යවන්නට සිද්ධ වෙලා තිබෙනවා. මම කථා කරන්නේ මහනුවර ගැනයි. මේක සිද්ධ වන්නේ මහනුවර විතරක් වෙන්න බැහැ. මම හිතන විධියට හැම තැනම මේ ආකාරයම තමයි. ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා කියනවා, සීදුවේ අක්ෂි රෝහලේත් ඒ ගැටලුව තිබෙනවා කියලා. එම නිසා මෙය නිවැරදි කරන්න මැදිහත් වෙන්න කියන කාරණය ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ඇමතිතුමා කියපු ආකාරයට ඉන්දියාව පිළිබඳව අපට එහෙම ලොකු භයක් ඇත්තේ නැහැ. නමුත් එතුමා සිංගප්පූරු ගිවිසුම පිළිබඳව කථා කළා. එතුමාගෙන් ජනතාව සහ මාධ්‍ය ආයතන ප්‍රශ්න කරනවා මේ ගිවිසුමේ තිබෙන්නේ මොනවාද කියලා. ඇයි, එහෙම ප්‍රශ්න කරන්නට හේතුව? එහෙම ප්‍රශ්න කරන්නට හේතුව තමයි අඩුම තරමින් අපටවත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ටවත් නොදන්වා, රටේ ජනතාවටත් නොදන්වා හොර රහසේ මේ ගිවිසුම අත්සන් කිරීම. ඒක තමයි අද මාධ්‍ය ආයතන හෝ වෙනත් කවුරුන් හෝ ප්‍රශ්න කරනවා නම් ඒකට හේතු වෙලා තිබෙන්නේ. මේ කියන විධියේ අයහපත් දේවල් ඒ ගිවිසුමේ නැත්නම්, -ගරු හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමාත් මේ පිළිබඳව දන්නවා- එහෙම ගැටලුකාරී තත්ත්වයක් නැත්නම් අපට හංගන්න තිබෙන හේතුව මොකක්ද? මාධ්‍ය ආයතනවලට හංගන්නට තිබෙන හේතුව මොකක්ද? සියලු අණපනත් සම්මත කරන මේ පාර්ලිමේන්තුවට මේ ගිවිසුම විතරක් හංගන්න හේතුව මොකක්ද එහෙම අයහපත් කාරණා නැත්නම්? එහෙම අයහපත් කාරණා නැත්නම් ගිවිසුම අත්සන් කරන්නට කලින් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා නම්, - අපි දන්නේ නැහැ කැබිනට් මණ්ඩලයටවත් ඉදිරිපත් කළාද කියලා. අපි දන්නා තරමට කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කරලාත් නැහැ- ඒ හරහා අපි සියලුදෙනාටම කරුණු දැනගන්නට තිබුණා. ETCA ගිවිසුමක් අත්සන් කරනවා කියලා අපි කෑ ගැහුවා කියලාත්, ඒක අත්සන් කළේ නැහැයි කියලාත් එතුමා කිව්වා. හැබැයි, මේ සිංගප්පූරු ගිවිසුම අත්සන් කළාම ETCA ගිවිසුම අත්සන් කරන්න ඕනෑ වෙන්නේ නැහැ. මොකද, සිංගප්පූරුව හරහා ඒ සියලු ව්‍යාපාරිකයින්ට ලංකාවට ඇතුළත් වීමේ වරප්‍රසාදය ලබා දීලා තිබෙනවා. අපි දන්නා තරමට, අපි සොයාගෙන තිබෙන විස්තර අනුව ඒ ගිවිසුමෙන් අපට ඇති ලාභයක් නැහැ. මොකද, ඒ ගිවිසුමේ තිබෙන්නේ අපි එහේට යවන භාණ්ඩ තීරුබදුවලින් නිදහස් කරලා කියලා. හැබැයි, දැනටත් අපි එහේට යවන සියලු භාණ්ඩ තීරු බදුවලින් නිදහස්. ඒ අයට ඒ නිදහස භුක්ති විඳීමේ හැකියාව තිබෙනවා. අපි සොයාගෙන තිබෙන කරුණු අනුව මේ ගිවිසුම හරහා ඒ අයට රජයේ ඉඩම් ලබා දීලා, ඒ අය ආයෝජකයින් හැටියට ගෙන්වා ගන්නට පුළුවන්. නමුත්, අපට ඒ රජයේ ඉඩම් සම්බන්ධයෙන් සිංගප්පූරු රාජ්‍යයත් එක්ක කටයුතු කරන්නට බැහැ. අපට කටයුතු කරන්නට පුළුවන් පෞද්ගලික අංශයේ ඉඩම් එක්ක පමණයි. හැබැයි, ඔබ සියලු දෙනා දන්නා පරිදි ඒ රටේ සියයට 90ක් විතර ඉඩම් රජයේ ඉඩම් හැටියට තමයි පවතින්නේ. ඒ නිසා මේ ගිවිසුම හරහා විවෘත කරලා තිබෙන දොර, මෙතුමා සඳහන් කළ පාලම කියපු තැනින් හදලා නැහැ. හැබැයි, වෙන තැනකින් පාලම හදලා තිබෙනවා. පාර්ලිමේන්තුව ඇතුළු සියලු දෙනාට කොළේ වහලා පාලම හදලා තිබෙනවා, අපි කියපු තැනින් හදන්නේ නැතිව. සිංගප්පූරුව හරහා හදපු මේ පාලම නිසා මේ රටේ ඉන්න දේශීය ව්‍යාපාරිකයින්ට, නොයෙකුත් වෘත්තීන්වල යෙදෙන අයට තර්ජනයක් ඇති වීමේ අවදානමක් උදා වෙලා තිබෙනවා. අපි මේ ගැන කථා කරන්න හේතුවත් මේ ගිවිසුමේ සියලු කරුණු අපට අනාවරණය නොකිරීම. මම හිතන විධියට ඔබතුමන්ලාගේ සමහර මන්ත්‍රීතුමන්ලාත් මේ ගැන දන්නේ නැහැ. ජනාධිපතිතුමා දන්නේත් නැහැ, මම දන්නා තරමට. අපි සාකච්ඡා කළ දේවල් වාර්තාකාර මහත්වරුන් පත්තරයේ පළ කළොත් එතුමා දැන ගනීවි. හැබැයි, ඔබතුමන්ලාට යුතුකමක් සහ වගකීමක් තිබෙනවා මේ රටේ ජනතාව සහ ව්‍යාපාරිකයින් වෙනුවෙන් සාධාරණයක් ඉෂ්ට කරන්නට.

අනෙක් කාරණය, ඒකේ පාලම හදලා තිබෙනවා කියලා අපි කියන්නේ ඇයි? ඒ ගිවිසුමේ තිබෙන ආකාරයට සිංගප්පූරුවේ permanent resident කෙනෙකුට මේ ගිවිසුමේ තිබෙන සියලුම වරප්‍රසාද භුක්ති විඳින්න පුළුවන්. සිංගප්පූරුවේ permanent resident කෙනෙකු වෙන එක ඒ හැටි අමාරු නැති බව අපි සියලු දෙනාම දන්නවා. ECTA ගිවිසුම අත්සන් කෙරුවේ නැති වුණත්, ඒ ECTA ගිවිසුම හරහා කරන්න බලාපොරොත්තු වෙච්ච බහුතරයක් දේවල් සිංගප්පූරු ගිවිසුම හරහා කිරීමේ හැකියාව මේ වෙන කොටත් ඔබතුමන්ලා උදා කරලා තිබෙනවා. හැබැයි, කනගාටුවට කාරණය වන්නේ මේ පාර්ලිමේන්තුවේ 225දෙනාටත්, -225ටම නොවෙයි. අත්සන් කරපු කිහිප දෙනා දන්නවා ඇති. පාර්ලිමේන්තුවේ බහුතරයකටත්- රටටත්, මාධ්‍යයටත් සියලු දෙනාටම කොළය වහලා මේ ගිවිසුම අත්සන් කරන්න හේතු වුණේ බොහොම පැහැදිලිව අයහපත් කාරණා තිබෙන නිසාය කියන කාරණය මා මතක් කරන්න ඕනෑ.

ඊට වඩා දීර්ඝව ඒ ගැන කථා කරන්න මා බලාපොරොත්තු වෙන්නේ නැහැ.

බෙහෙත් ගැන අපේ ඇමතිතුමා කථා කළා. බෙහෙත් වර්ග කිහිපයක මිල අඩු කෙරුවා. ඒක බොහොම පැහැදිලිව හොඳ දෙයක්. හැබැයි, ඒ හරහා තවත් ප්‍රශ්න කිහිපයක් උද්ගත වෙලා තිබෙනවා. මෙතුමා කියපු ආකාරයට ඒ බෙහෙත් ගෙන්වන සමහර ආයතනවලට ඒ original බෙහෙත ඒ මිලට ලබා දීමට නොහැකි තත්ත්වයක් තිබෙනවා. ඒ බෙහෙත ගන්න බැරි කෙනාට ලාභ එක ගන්න පුළුවන්. ඒක වෙනම කථාවක්. අඩුම තරමින් ගන්න පුළුවන් කෙනාට ඒ original brand එක ගැනීමේ හැකියාව තිබෙන්න ඕනෑ. මූලාසනයේ ඉඳගන්න අපේ දිස්ත්‍රික්කයේ -ඊයේ- පෙරේදා රාජ්‍ය ඇමතිතුමා වෙච්ච- ලකී ජයවර්ධන මැතිතුමා, මම යම් බෙහෙත් වර්ගයක් ගන්න ගිය වෙලාවේ ඒ ෆාමසියට ඇවිත් බොහොම අසරණ තත්ත්වයට පත් වෙනවා මම දැක්කා. ඒ වෙලාවේ එතුමාටත් ඒ original බෙහෙත ගන්න තිබුණේ නැහැ. මේ මිලට ලබා දෙන්න බැරි නිසා ඒවා ගෙන්වන එක ඒ ආයතනවලින් නතර කරලා තිබෙනවා. ඔබතුමන්ලාට අපි මේක

කියන්නේ විවේචනාත්මකව නොවෙයි. හොඳ කොටස වාගේම ඉතුරු කොටස ගැන අවධානය යොමු කරලා මේවා නිවැරැදි කරන්න කටයුතු කරන්න කියන ඉල්ලීම කරනවා.

අද දින සාකච්ඡා කෙරුණු සුවසැරිය පදනම වැඩසටහන පිළිබඳව අපේ සතුටක් තිබෙනවා කියන කාරණය මතක් කරමින් හර්ෂ ද සිල්වා මැතිතුමාගෙන් එක ඉල්ලීමක් කරන්න ඕනෑ. අපි දන්නා තරමට මේ ගිලන් රථවලට ලැබිලා තිබෙන උපදෙස් තමයි යම් කිසි හදිසි අනතුරක් වෙච්ච වෙලාවක ළඟම තිබෙන රෝහලට ගෙන යන්න කියන එක. හැබැයි, ඔබතුමන්ලා ඇතුළු අපි සියලු දෙනා දන්නා පරිදි සමහර පළාත්වල ළඟම තිබෙන රෝහලට ගෙනිව්වාම ඒ රෝගියාගේ අවසානය තමයි එතැන සිදු වෙන්නේ. ඒක නිසා ඒ පිළිබඳවත් අවධානය යොමු කරලා අඩුම තරමේ ළඟම තිබෙන ක්‍රියාත්මක වෙන රෝහලට ගෙන යන්න කටයුතු කරන්න. ලැයිස්තුවේ රෝහල් තිබුණාට හුහාක් ඒවාවල බෙහෙත් නැහැ; වෛද්‍යවරු නැහැ. එහෙම තත්ත්වයක් තිබෙනවා. ඒ නිසා ඔබතුමන්ලා එයත් නිවැරැදි කරන්න. අඩුම තරමේ ළඟම තිබෙන මූලික රෝහල හෝ අඩුම තරමේ වෙන මොකක් හෝ ක්‍රමවේදයක් හොයාගෙන ළඟම තිබෙන ක්‍රියාත්මක රෝහලට ගෙනියලා ඒ ජීවිතය බේරා ගන්න පුළුවන් තත්ත්වයේ වැඩ පිළිවෙළක් යොදන්න කියන ඉල්ලීම කරමින්, කාලය ලබා දීම සම්බන්ධව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසාන කරනවා.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

දිළුම් අමුණුගම මන්ත්‍රීතුමනි, ඒක හරි. ළඟම තිබෙන රෝහල කිව්වාම ඒ රෝගියාගේ සෞඛ්‍ය තත්ත්වයට ප්‍රතිකාර ලබා දෙන්න පුළුවන් ළඟම තිබෙන රෝහලට තමයි ගෙන යන්නේ. ඒක complicated ප්‍රශ්නයක් නම් ඒ අවශ්‍ය තැනට ගෙන යන්න ඕනෑ. ළඟම තිබෙන රෝහල පහු කරලා තවත් රෝහලකට යන්න සිද්ධ වෙයි. ප්‍රශ්නය අනුව තමයි ඒ රෝහල තෝරා ගන්නේ.

ගරු දිළුම් අමුණුගම මහතා
(மாண்புமிகு திளும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)

රාජ්‍ය ඇමතිතුමනි, දැන් එහෙම වෙනවා නම් හොඳයි. නමුත් කලින් තිබුණු තත්ත්වයට අනුව ඒ ඒ පළාත්වලට ඉන්න අය ළඟ තිබෙනවා, යන්න ඕනෑ ළඟම රෝහල මොකක්ද කියලා. සමහර වෙලාවට ඒ රෝහල් ක්‍රියාත්මක නැහැ. රෝහල නමට තිබෙනවා. හෙදියෝ දෙන්නෙක් ඉන්නවා. සමහර වෙලාවට වෛද්‍යවරයා නැහැ. සමහර ඒවා පළාත් සභාව සතු රෝහල්. එහෙම තැන්වලදී තමයි ප්‍රශ්නය තිබෙන්නේ. මේක සෞඛ්‍ය අමාත්‍යාංශයට සම්බන්ධ නැති නිසා එහෙම අවස්ථාවකදී කවුද ඒ තීන්දුව ගන්නේ? රියැදුරාට හෝ කාට හරි ඒ තීන්දුව ගන්න පුළුවන්ද කියන කාරණය තමයි ප්‍රශ්නය තිබෙන්නේ.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු මන්ත්‍රීතුමනි, ඒ තීරණය ගන්නේ Command and Control Centre එකෙන්. රෝගියා ambulance එකට දා ගත්තාට පස්සේ Command and Control Centre එකත් එක්ක දිගටම automatically connect වෙලාමයි තිබෙන්නේ. එතැන වෛද්‍යවරු ඉන්නවා. ඒ ප්‍රශ්නයේ complexity එක අනුව ඒ ගොල්ලන්ට උපදෙස් දෙනවා, "මෙතැනට ගෙන යන්න එපා. වෙන තැනකට ගෙන යන්න" කියලා. මම ඔබතුමා කියන දේ පිළිගන්නවා. මුලදී මේකේ teething problems තිබුණා. අපි මෙය පළමුවැනි වතාවටයි පටන් ගත්තේ. දැන් වෙන කොට අපි ඒ ප්‍රශ්න ගොඩක් දුරට නිරාකරණය කරගෙන යනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට ගරු කේ.කේ. පියදාස මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු තුසිතා විජේමාන්න මහත්මිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

ගරු දිළුම් අමුණුගම මහතා
(மாண்புமிகு திளும் அமுணுகம)
(The Hon. Dilum Amunugama)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු හේෂාන් විතානගේ මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය.

අතන්පිටකු, மாண்புமிகு ஹேசான் விதானகே அவர்கள் அக்கிராசனத்திலிருந்து அகலவே, மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. HESHAN WITHANAGE *left the Chair, and* THE HON. (DR.) (MRS) THUSITHA WIJEMANNA *took the Chair.*

[අ.භා. 4.13]

ගරු කේ.කේ. පියදාස මහතා
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු අග්‍රාමාත්‍යතුමාගේ අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන, ඉන්දියානු ආධාර යටතේ මේ රටට ලැබුණු සුවසැරිය ගිලන් රථ සේවාව හා සම්බන්ධ "1990 සුවසැරිය පදනම පනත් කෙටුම්පත" ගැන වචන කීපයක් කතා කරන්න ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම මෙම පදනම හරහා මේ රටට විශාල සේවයක් පසු ගිය කාලය තුළ ලබා දුන්නා. එම වැඩ පිළිවෙළ වඩා පුළුල්ව ඉටු කිරීමේ කාර්යය භාරව අපේ ගරු හර්ෂ ද සිල්වා රාජ්‍ය අමාත්‍යතුමා කටයුතු කරනවා. පසු ගිය කාලය තුළ මේ රටේ දකුණු පළාතේත්, බස්නාහිර පළාතේත් විශාල සේවාවක් සිදු වුණා, සුවසැරිය පදනම හරහා.

1990 සුවසැරිය සේවය තුළින් රැකියා ප්‍රමාණයකුත් තරුණ තරුණියන්ට ලැබුණා. ඒ වාගේම දුප්පත්, අහිංසක ජනතාව විශාල පිරිසකට, යමක් කර කියා ගන්න බැරි අයට, ගම් පළාත්වල අයට එමඟින් විශාල සේවාවක් සිදු වුණා. මේ සේවාව තවත් පුළුල්ව ඉදිරියේදී දිවයින පුරා ක්‍රියාත්මක කරන්න මේ පදනම හරහා බලාපොරොත්තු වන බව සඳහන් වනවා.

[ගරු කේ.කේ. පියදාස මහතා]

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මධ්‍යම කඳුකරයේ නුවරඑළිය, මාතලේ ආදි දිස්ත්‍රික්කවල මෙම සේවාව ඉතාම ඉක්මනින් ආරම්භ කරන්න කියා මා විශේෂයෙන් ඉල්ලීමක් කරනවා. නුවරඑළිය දිස්ත්‍රික්කය ගත්තාම, නුවරඑළිය-මස්කෙළිය මැතිවරණ කොට්ඨාසයේ පොලිස් ස්ථාන 8ක් තිබෙනවා. එය, පොලිස් ස්ථාන 8ක් තිබෙන විශාල බල ප්‍රදේශයක්. නමුත් එක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි තිබෙන්නේ. එක ස්ථානයකට එක ගිලන් රථයක් පමණක් ලැබුණොත් එමඟින් මේ සේවාව සැපයීමේදී විශාල අපහසුතාවකට පත් වන නිසා ඉදිරි කාලය තුළදී ඒ ප්‍රදේශයට ලබා දෙන ගිලන් රථ සංඛ්‍යාව වැඩි කරන්න කියන ඉල්ලීම මා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මෙවැනි හොඳ කටයුත්තක් කරන කොට, "මේක ඉන්දියාවෙන් ලැබුණු දෙයක්" ආදි වශයෙන් නොයෙකුත් විවේචන පසු ගිය කාලය තුළ මේ ගරු සභාවේදීත්, ඉන් පිටතදීත් එක එක පාර්ශ්වවලින් අපට අහන්න ලැබුණා. මේ රටේ හොඳ දෙයක් කරන කොට සමහර පුද්ගලයන්ගෙන් එවැනි විවේචන අපට අහන්න ලැබෙනවා. යහපත් දේවල් කරන කොට ඒ වාගේ විවේචන ඇහෙනවා. ඒ යහපත් දේවලින් රටේ ජනතාවට - යමක් කර කියා ගන්න බැරි ජනතාවට- සේවයක් වනවා දකින්න අකමැත්තෙන් සිටින පිරිසක් මේ රටේ ඉන්නවා. ඒ රෝගය සුව කරන්න අපට පුළුවන්කමක් නැහැ කියන එක මා මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරනවා.

ඒ වාගේම අපි අපේ ආණ්ඩුව තුළින් පසු ගිය කාල පරිච්ඡේදය තුළ විශාල සේවාවක් මේ රටට කළා. අපි ඒවා ප්‍රසිද්ධ කරන්න ගියේ නැහැ. විශේෂයෙන්ම කියන්න ඕනෑ, කොත්මලේ, රම්බොඩ උමං මාර්ගය ගැන. එදා එම උමං මාර්ගය හදපු ගමන් ඒ ගැන cutout එක ගැහුවේ කොහේද? හබරාදුව පාලමේ තමයි cutout ගැහුවේ. තවත් කීප පොළකම මහා විශාල ප්‍රමාණයේ cutouts ගැහුවා. ඒ විධියට ප්‍රසිද්ධියක් ගන්න මේ ආණ්ඩුව වැඩ කටයුතු කළේ නැහැ. ජනතාවට සේවය කරන වැඩ පිළිවෙළක් තමයි ක්‍රියාත්මක කරගෙන ඇවිත් තිබෙන්නේ. ග්‍රාමීය මට්ටම ගත්තාම විශාල වැඩ කොටසක් පසු ගිය කාලය තුළ කර තිබෙනවා. ඒවා දකින්නේ නැහැ. උදේ සිට රෑ වන කල්, රෑ සිට එළි වන කල් විවේචනය කරනවා හැර, රටේ කරන හොඳ දේ ගැන, යහපත් දේ ගැන අගය කිරීමක් නොකිරීම ගැන මා බෙහෙවින්ම කනගාටු වෙනවා.

මේ පදනම හරහා ඉදිරියේදී රටේ ජනතාව වෙනුවෙන් තවත් සේවා එකතු වන්න පුළුවන්. "ඉන්දියාවෙන් ගෙන ආ මේ වාහන අවුරුදු තුනකින් සවුත්තු වුණාට පසුව අයිනකට දමන්න වෙනවා. ඊට පසුව මෙය දුවන්නේ කොහොමද?" කියා විරුද්ධ පාර්ශ්වයෙන් අසනවා ඇහුණා.

මොන දේත් එහෙම තමයි. අපි වුණත් පොඩි කාලයේ එක විධියක්; මැද වයසට එන කොට තවත් විධියක්; වයසට යන කොට තව විධියක්. වාහනයක් ගත්තත් ඒ විධියයි. ටික කාලයක් යන කොට ඒ වාහනය අබලන් වෙනවා. ඊට පස්සේ අලුතින් වාහනයක් ගන්න සිද්ධ වෙනවා. ඒ විධියට ඉදිරියට කටයුතු කරගෙන යන්න තමයි මෙවැනි පදනමක් පිහිටුවන්නේ. මේ පදනම ශක්තිමත් කිරීම තුළින්, ඒ හරහා අපට ඒ රටවලින් ආධාර උපකාර ගන්න පුළුවන්. මේ පදනම ශක්තිමත් කර ගත්තාම ඒ මඟින් තවත් වාහන මිලදී ගන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙනවා. ඒ නිසා මේ පදනම ශක්තිමත් කර ගෙන එයින් මේ රටට, රටේ ජනතාවට විශාල සේවයක් කරන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන්න පුළුවන් වෙනවා. ඉතින් ඒක දකින්නේ නැතිව, ඒ ගැන විවේචනය කරමින්, ඒක මෙතැනින් අහෝසි කිරීමට, ඉවත් කිරීමට තමයි කථා කරන්නේ. ඒ වාගේම, ඉන්දියානුවන්ටත් නොයෙකුත් දෝෂාරෝපණ කරනවා.

විශේෂයෙන්ම මීට අවුරුදු 200කට 250කට ඉස්සර මේ රටේ කඳුකරයේ තේ නිෂ්පාදනය ආරම්භ කළේ කවුද? සුද්දෝ ආරම්භ කළ ඒ ව්‍යාපාරයට උර දුන්නේ කවුද? ඉන්දියානුවන් ඇවිල්ලා තේ නිෂ්පාදනය කළා. අද රස කර කර තේ බොනවා. නමුත් දොස් කියන්නේ කාටද? ඉන්දියාවෙන් ඇවිල්ලා මේ මේ විධියට කළාය කියනවා. නමුත් ඉන්දියානුවන් ඇවිල්ලා මේ රටට වැඩ කරලා තිබෙනවා. අදත් ඒ අය ඒ සේවය කරනවා. අපේ ලාංකිකයන්ට ඒ සේවය කරන්න පුළුවන්ද? යම් පිරිසක් ඉගෙන ගෙන ඒක කරනවා. නමුත් හරි සේවාවක් ලබා දෙන්නේ ඉන්දියාවෙන් ආපු කම්කරුවන්.

ඒ නිසා යම් කිසි කෙනෙක් මේ රටට උදව්වක්, උපකාරයක් කළොත් කවදාවත් ඒක හෙළා දකින්න අවශ්‍යතාවක් නැහැ. ඒක අගය කරන්න ඕනෑ. ඒකට ගරු කරන්න ඕනෑ. ඒකට ස්තුති කරන්න ඕනෑ. ඒ අයගෙන් තව තවත් ආධාර උපකාර ලබා ගන්න උත්සාහ කරන්න ඕනෑ. ඒ කරන දේ ගැන ඇගයීමක් කරන්න ඕනෑ. නමුත් අද අපි එවැනි තත්ත්වයක් දකින්නේ නැහැ. සමහර ඇත්තන් ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, වෛරය වපුරාගෙන යන නිසා තමයි මේ තත්ත්වය ඇති වී තිබෙන්නේ කියන එක මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. අන්න ඒ නිසා තමයි මේ රට මේ තත්ත්වයට පත්වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගස් මැදීම සම්බන්ධයෙන් විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. ඒ සඳහා වන බලපත්‍ර ගාස්තු අඩු කරනවා; වැඩි කරනවා. ඒවා වැඩි කිරීම තුළින් සිදු වන්නේ මේ රටේ සාමාන්‍ය මිනිහාගේ ජන ජීවිතයට එයින් යම්කිසි ආධාරයක් උපකාරයක් ගන්න පුළුවන් තත්ත්වය නැති වීමයි. බලපත්‍ර ගාස්තු වැඩි කළාට කමක් නැහැ, රටේ සීමිත ප්‍රමාණයකින් නිෂ්පාදනය කරලා රටට ආදායමක් ලබා දෙන වැඩ පිළිවෙළක් ඇති කරනවා නම්. එහෙම නම් අපි ඒකට උදව් කරන්න ඕනෑ. ගහන්න පුළුවන් බදු විශාල ප්‍රමාණයක් ගැහුවාට පස්ස ඒ ආයතන බිඳ වැටෙනවා. ඒවා කරගෙන යන්න බැරි තත්ත්වයට පත් වෙනවා. මේ අවුරුද්දේ මත් පැන් නිෂ්පාදනයෙන් රුපියල් බිලියන 147ක ආදායමක් බලාපොරොත්තු වෙනවා. නමුත් මේ වන විට ලැබෙන ප්‍රමාණය බිලියන 113යි. ඒ ආදායම බැහැගෙන, බැහැගෙන යනවා. ඇයි ඒ? මේ බදු වැඩිවීම තුළ, මේවායේ මිල ගණන් වැඩිවීම තුළ තමයි ඒ තත්ත්වය ඇතිවෙලා තිබෙන්නේ. එම නිසා ඒවාට කැමැති අයට - අපි ඒවාට විරුද්ධයි.- ඒවා සාධාරණව ලබා ගන්නට, නිදහසේ කටයුතු කරන්නට ඉඩ දෙන්න ඕනෑ.

ඒ වාගේම බැදීම්වලින්, සීමාවලින් තොරව ඒවා ඉදිරියට කර ගෙන යන්න අවශ්‍ය පහසුකම් සලසා දෙන්න ඕනෑ; නීතිය හරියට ක්‍රියාත්මක කරන්න ඕනෑ. නීතියෙන් පිට, නීත්‍යානුකූල නොවන, නීති විරෝධී වැඩවලට උපරිම දඬුවම් දෙන වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කරන්න ඕනෑ. එතකොට නීති විරෝධී වැඩවලින් ඉවත් වෙනවා. මේ රටේ වැඩ කටයුතු නීත්‍යානුකූලව සිද්ධ වෙනවා. ඒ අනුව රාජ්‍ය ආදායම හොඳට ලැබෙනවා. නීති විරෝධී වැඩ නතර වෙනවා. රට හොඳට ඉදිරියට යනවා. ඒ නිසා මේ බදු වැඩි කිරීම සාධාරණ මට්ටමට ගෙනෙන්න ඕනෑය කියන එක තමයි මම විශේෂයෙන් මතක් කරන්නේ.

මේ "සුවසැරිය" වැඩ සටහන දිවයින පුරා ක්‍රියාත්මක කිරීමේදී මධ්‍යම කඳුකර ප්‍රදේශයට ඒ සහනය ඉතා ඉක්මනින් ලබා දීලා ඒ ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතයටත් ඒ ගිලන් රථ පහසුකම් ලබා දෙන්නය කියා මතක් කරමින්, මේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ අපේ ගරු හර්ෂ ද සිල්වා ඇමතිතුමාටත්, මෙයට ආධාර උපකාර කළ ඉන්දියානු රජයටත් ගෞරවනීය ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. මීළඟට ගරු හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු දහයක කාලයක් තිබෙනවා.

[අ.භා.4.22]

ගරු හර්ෂණ රාජකරුණා මහතා
(மாண்புமிகு ஹர்ஷன ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. අපේ යහ පාලන රජය මේ රට භාර ගත්තාට පසුව සෞඛ්‍ය ක්ෂේත්‍රය තුළ දැවැන්ත විපර්යාසයක් සිදු කරන්නට හැකිවෙලා තිබෙනවා කියලා මා හිතනවා. ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය භාරව කටයුතු කරන ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා, විශේෂයෙන්ම ඉන්දියානු අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා සමඟ සාකච්ඡා කරලා, 1990 සුවසැරිය ගිලන් රථ සේවාව මේ රටට හඳුන්වා දුන්නා. මේ කටයුත්ත පිටුපස ඉඳගෙන එහි සම්පූර්ණ වගකීම දරමින් කටයුතු කරපු, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා රාජ්‍ය අමාත්‍යතුමාට අපේ ගෞරවය හා ස්තුතිය මේ අවස්ථාවේ දී පුද කරන්නට ඕනෑ. එතුමා ශ්‍රී ලාංකිකයකු හැටියට මෙවැනි දැවැන්ත සේවාවක් මේ රටට හඳුන්වා දෙමින්, එය ඉතා සාර්ථකව ක්‍රියාත්මක කරගෙන යාමට කටයුතු කර තිබෙනවා. ඒ වාගේම මෙම කටයුත්ත සඳහා අපට මූල්‍යමය ශක්තිය ලබාදුන් ඉන්දියානු අග්‍රාමාත්‍යතුමාටත්, ඉන්දියානු ජනතාවටත් මේ අවස්ථාවේ දී අපේ ගෞරවය පුද කළ යුතුයි.

මෙය ඉතාම සාර්ථක වැඩ පිළිවෙළක්. මේක ලොකු පුණ්‍යකර්මයක්. විශේෂයෙන්ම දකුණු පළාතේ සහ බස්නාහිර පළාතේ අපි මෙම ගිලන් රථ සේවය ආරම්භ කළා. මරන ගෙදරකට ගියත්, වෙනත් කටයුත්තක් සඳහා ගියත්, අපේ ආසනයේ ජනතාව මෙම ගිලන් රථ සේවයෙන් සිදුවන කාර්ය භාරය පිළිබඳව ඉතා පැහැදීමෙන් කථා කරනවා මට අහන්නට ලැබිලා තිබෙනවා. හදිසි අවස්ථාවක දී ගිලන් රථයකින් ලැබෙන්නට ඕනෑ සේවය මේ 1990 ගිලන් රථ සේවාව තුළින් ඉතාම සාර්ථකව ලැබෙනවා. පසු ගිය කාලයේ අපි මේ සේවය හඳුන්වා දෙන්න යනකොට, විපක්ෂයේ නොයෙක් මැති ඇමතිවරු, ඒ වාගේම වෙනත් සංවිධාන මේ ආණ්ඩුවට විශාල බලපෑමක් එල්ල කළා. ඒ වාගේම නොයෙකුත් දේවල් කියමින් ජනතාව නොමඟ යවන්නට උත්සාහ කළා. "මෙම ගිලන් රථ සේවය තුළින් ඉන්දියානුවන් මේ රටට පැමිණෙනවා, අපේ රටේ රැකියාවන් මේ රටේ ජනතාවගෙන් අයින් කරලා ඉන්දියානු ජනතාවට දෙනවා, මේ තුළින් රෝ ඔත්තු සේවය ලංකාවට එනවා" වැනි නොයෙකුත් දේවල් කිව්වා. ඒ විධියේ අමූලික බොරු මවමින් ජනතාව නොමඟ යවන්නට උත්සාහ කළා මට මතකයි. එවැනි අමූලික බොරු කියමින් ජනතාව නොමඟ යවන්නට උත්සාහ කරන කොට අපි මේ වැඩ පිළිවෙළ නොපසුබටව හා ඉතා සාර්ථකව ක්‍රියාත්මක කර, ඔවුන්ගේ එම තර්ක අද පුස්සක් බවට පත් කරලා තිබෙනවා. අද මෙම සේවාව ඉතාම සාර්ථක වැඩ පිළිවෙළක් බවට පත්වෙලා තිබෙනවා. දකුණු පළාතට, බස්නාහිර පළාතට විතරක් නොවෙයි, අද මුළු ලංකාවටම මේ සේවාව ලබා දෙන්න කියලා ඉල්ලනවා. ගරු අග්‍රාමාත්‍යතුමා එම සේවාව මුළු රටටම ලබා දෙන්න තමයි අද මේ කටයුතු කරන්නේ. ඒක දැවැන්ත පුණ්‍යකර්මයක් හැටියට මම දකිනවා. මෙය සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විප්ලවීය වෙනසක් සිදු කරපු අවස්ථාවක්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම පෞද්ගලිකව දකින අපේ රජයේ යම් දුර්වලතාවක් තිබෙනවා. ඒ තමයි, මෙවැනි වැදගත් කටයුත්තක් කරන කොට ඒ පිළිබඳව ප්‍රමාණවත් ප්‍රචාරයක් ලබා නොදීම. මේ පිළිබඳව ප්‍රමාණවත් ප්‍රචාරයක් නොකරන නිසා තමයි, "මේ ආණ්ඩුව මොනවාද කරලා තිබෙන්නේ?" කියලා සමහර අය අහන්නේ. මෙවැනි ඓතිහාසික වැඩ කටයුත්තක් කරන කොට ඒ පිළිබඳව විශාල ප්‍රචාරයක් සිදු කරන්නත් දැනගන්න ඕනෑ. එය එක පැත්තකින් ආණ්ඩුව කරන කටයුතු පිළිබඳව ජනතාව දැන ගැනීම සඳහාත්, අනෙක් පැත්තෙන් හදිසි අවස්ථාවක දී 1990 අංකයට කථා කරන්න අවශ්‍යයි කියන එක ජනතාවගේ මතකයේ තබා ගැනීම සඳහාත් වැදගත් වෙනවා. ඒ පිළිබඳව මතකයේ තබාගන්න නම් පුළුල් ප්‍රචාරයක් සිදු කිරීම ඉතා වැදගත් වෙනවා. මෙවැනි සේවාවන් පිළිබඳව ප්‍රචාරය කිරීම තුළින් තමයි මේ රටේ ජනතාවට ඒ ගැන දැනුම් දෙන්න අපට පුළුවන් වෙන්නේ.

සෞඛ්‍ය සේවය ඉහළ නැංවීම සඳහාත් අපි අති දැවැන්ත වැඩ කටයුත්තක් කරලා තිබෙනවා. ඒ වාගේම මේ රටේ ඉගෙනුම ලබන සෑම දරුවෙකුටම රක්ෂණයක් ලබා දෙන්නත් අපට පුළුවන් වෙලා තිබෙනවා. එම රක්ෂණය ලබා දීම තුළින් සෞඛ්‍ය ක්ෂේත්‍රයේ, අධ්‍යාපන ක්ෂේත්‍රයේ සහන ලැබෙනවා වාගේම, ඔවුන්ගේ ජීවන බර අඩු කරගන්නත් එයින් දැවැන්ත කර්තව්‍යයක් සිදු වෙනවා. හැබැයි, මේ පිළිබඳව තවමත් ජනතාව දැනුවත් වෙලා නැහැ. ඔවුන්ව දැනුවත් කරන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා ගරු අකිල විරාජ් කාරියවසම් මැතිතුමා ඓතිහාසික වැඩ සටහනක් ක්‍රියාත්මක කර තිබෙනවා.

නමුත්, තවත් මේක පුළුල් කරලා, ආණ්ඩුවෙන් ලබා දී තිබෙන මේ දැවැන්ත සේවාවන් පිළිබඳව දැනුවත් කිරීමක් කරන්න ඕනෑ. එම කාර්ය කිරීමට මාධ්‍ය ආයතනවලටත් වගකීමක් තිබෙනවා. මාධ්‍ය ආයතනවලින් ඒ ගැන වඩාත් පුළුල් ප්‍රචාරයක් ලබා දෙන්න කටයුතු කරන්න ඕනෑ. මෙවැනි වැදගත් කටයුතුවලට ප්‍රමුඛත්වය දීලා, ජනතාවට ඒ පිළිබඳව නිවැරදි අවබෝධයක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම මාධ්‍ය ආයතනවලින් කාරුණික ඉල්ලීමක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, කවුරු මොන කථා කිව්වත්, සුවසැරිය වැඩ පිළිවෙළ ආරම්භ කර එම කටයුත්ත ඉතා සාර්ථකව ක්‍රියාත්මක කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, එහි යම් යම් අඩු පාඩු පිළිබඳව කියනකොට, එම අඩු පාඩු පිළිබඳව නිහතමානීව ඇහුම් කන් දීලා, ඒවා වෙනස් කරන්න පුළුවන් මට්ටමට ගරු හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා කටයුතු කර තිබෙනවා. සමහර මන්ත්‍රීවරු කථා කළේ මේ තුළ තිබුණු ප්‍රශ්න ගැන වෙන්න පුළුවන්. මේ වන විට ඒ තිබුණු ප්‍රශ්න නිරාකරණය කරලා, එය සාර්ථක වැඩ පිළිවෙළක් බවට පත් කරන්න පුළුවන් වෙලා තිබෙනවා.

මේ අවස්ථාවේ දී මා තව ඉල්ලීමක් කරන්න කැමැතියි. දැනට මේ ගිලන් රථ පොලිස් ස්ථානවල නවතා තිබෙනවා. මේ ගිලන් රථවල සේවය කරන සේවක සේවිකාවන්ට අවශ්‍ය පහසුකම් සමහර වෙලාවට මේ පොලිස් ස්ථානවල නැහැ. මේ සඳහා වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරන්න ඕනෑ. නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමාවත් සම්බන්ධ කර ගෙන, පොලීසිය තුළ මේ අයට අවශ්‍ය පහසුකම් ලබා දිය යුතුයි. සමාජයේ ජීවත් වන පුද්ගලයන් වගකීමකින් ජීවත් විය යුතු අය හැටියට සලකනවා. ඒ නිසා, ව්‍යාපාරික ප්‍රජාවත් සම්බන්ධ කර ගෙන ඒ සේවක පිරිසට තෘප්තිමත්ව, සාර්ථකව මේ සේවාව ඉටු කළ හැකි ආකාරයට අවශ්‍ය පහසුකම් ලබා දීමේ කටයුත්ත අප ක්‍රියාත්මක කරන්නට ඕනෑ. සමහර තැන්වල සේවය කරන අයට කාර්යාලයක් නැහැ; රෑට ඉන්න තැනක් නැහැ. එවැනි ගැටලු තිබෙනවා. එහෙත්, මේවා විසඳා ගත හැකි පොඩි ප්‍රශ්න. එවැනි ප්‍රශ්න තිබුණත්, මෙයින් වන සේවාවේ කිසිම අඩුවක් වෙන්නේ නැහැ. මෙවැනි අඩු පාඩු තිබුණත්, එම අඩු පාඩු මධ්‍යයේ කරන මේ සේවාව පිළිබඳව ඒ අයට මගේ ගෞරවය හා ස්තුතිය පුද කරනවා. අප සියලුදෙනාම

[ගරු හර්ෂණ රාජකරුණා මහතා]

එකතු වෙලා මේ සේවක සේවිකාවන්ගේ අඩු පාඩු හදලා, මෙම සේවාව ලංකාවේ පමණක් නොව මුළු ලෝකයේම ආදර්ශවත්, හදිසි ප්‍රතිකාර ඒකකයක් බවට පත් කර ගත යුතුයි. මේ සඳහා සියලු දෙනාගේම අදහස් ලබා ගෙන, මේ වැඩ පිළිවෙළ ඉතා සාර්ථකව ඉදිරියට ගෙන යෑම සඳහා කටයුතු කරන ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත්, මේ සම්බන්ධයෙන් සුවිශේෂීව කටයුතු කරන අපේ (ආචාර්ය) හර්ෂ ද සිල්වා මැතිතුමාටත් සුබ පතමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.31]

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. ඉතාමත් වැදගත් දවසක, රටේ ජනතාව වෙනුවෙන් මේ ආණ්ඩුව ක්‍රියාත්මක කරන, පැසසුමට ලක් කෙරෙන සහ ලක් කළ යුතු කාර්යක් පිළිබඳව කථා කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වනවා. "1990 සුවසැරිය පදනම" පිහිටුවීම ශ්‍රී ලාංකිකයින් විධියට, ඒ වාගේම මේ යහ පාලන රජය විධියට අපි සතුටු වෙන්නට ඕනෑ කාරණාවක්. මේ වෙනුවෙන් ගරු අග්‍රාමාත්‍යතුමාගේ අමාත්‍යාංශයේ, අපේ (ආචාර්ය) හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා මූලිකත්වය ගෙන කටයුතු කරනවා. ශ්‍රී ලාංකීය ජනතාවගේ ජන ජීවිතය සෞඛ්‍යමය වශයෙන් ශක්තිමත් කරන්නට, මඩ කාගෙන, දෝෂදර්ශන, විවේචන, ගැරහුම් සහ නින්දා මධ්‍යයේ මේ සුවසැරිය ගිලන් රථ සේවාව ආරම්භ කිරීම පිළිබඳව ගරු අගමැතිතුමාටත්, අපේ හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමාටත් මම ස්තුතිවන්ත වනවා.

දහසකුත් ප්‍රශ්න මැද්දේ, 2016 ජූලි මාසයේ 21වන දා බස්නාහිර සහ දකුණ යන පළාත් දෙකේ දිස්ත්‍රික්ක හයක් ඉලක්ක කරගෙන මේ සුවසැරිය වැඩසටහන ආරම්භ වුණා. පළමුවෙන්ම ගිලන් රථ 88කින් ආරම්භ වුණු මේ වැඩසටහන හරහා ශ්‍රී ලාංකික තරුණ තරුණියන්ට රැකියා 500ක් පමණ උත්පාදනය වුණා. දිනකට දුරකථන ඇමතුම් 880කට ආසන්න ප්‍රමාණයක් ලැබෙන, ඒ ලැබෙන දුරකථන ඇමතුම්වලින් සියයට 98.9කට පමණ සේවාවක් සපයන, ඉතාම කාර්ය බහුල, වැදගත් සේවාවක් බවට අද මේ සුවසැරිය ගිලන් රථ සේවය පත් වෙලා තිබෙනවා. ඒ නිසාම වෙන්න ඇති, මේ මොහොත වෙද්දී ඒකාබද්ධ විපක්ෂයේ කිසිදු මන්ත්‍රීවරයෙක් මේ සභා ගර්භය තුළ නැත්තේ. [බාධා කිරීමක්] නැහැ. ඒකාබද්ධ විපක්ෂයේ එක මන්ත්‍රීවරයෙක්වත් නැහැ. ඒ ඉන්නේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ වෛද්‍යතුමියයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් මන්ත්‍රීවරියක් මේ සභා ගර්භය තුළ සිටියත්, පොහොට්ටුවේ; ඒකාබද්ධ විපක්ෂයේ කිසිදු මන්ත්‍රීවරයෙක් මේ සභා ගර්භය තුළ නැහැ. ඒ ඇයි කියා මම සොයා බැලුවා. ඔවුන් ආපු ගමන්ම තල් අත්තට බොරලු දමනවා වාගේ කියෙව්වා. ඒ වාගේම රටේ ජනතාව තුළ අනියත බියක් මැව්වා; මේ තුළින් ඉන්දියාවට කොටසක් යනවා, ඔත්තු සේවාවකට මෙය දඩමීමා කරගෙන තිබෙනවාය කිව්වා. ඒ අතරතුර සමහර අය, "යන්නෙ කොහෙද" ඇහුවාම, "මල්ලෙ පොල්" කියනවා වාගේ කථා කළා. ගරු ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමා ළඟ මම ඉන්දෙද්දි එතුමාටත් මම මේ ගැන දැනුම් දුන්නා. අද අපි 1990 සුවසැරිය පදනම පනත් කෙටුම්පත පිළිබඳව විවාද කළත්, එතුමන්ලා ඒ පිළිබඳව නොවෙයි කථා කළේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. එතුමන්ලා රෝහල් පද්ධතියේ සමහර තැන්වල තිබෙන වැරදි, අඩු පාඩු පෙන්වා දෙන්න පටන් ගත්තා.

බෙහෙත් මිල අඩු කිරීම පිළිබඳවත් එතුමන්ලා යම් යම් දෝෂාරෝපණ එල්ල කළා. ඒකාබද්ධ විපක්ෂය කාලයක් තිස්සේ තජ්පුලලා මේ ආණ්ඩුව විවේචනය කරන්න හැදුවාට, වර්තමානය වෙද්දී මේ ආණ්ඩුව වැඩ සද්ද නැතුව; එදා වාගේ cutouts, posters, bannersවලින් නාවන්නේ නැතුව කළ ව්‍යාපෘතිවල ඵල ප්‍රයෝජන අද ජනතාව නෙළා ගනිමින් සිටිනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ පැරණි කියමනක් තිබෙනවා නේ, "සඳුන් ගස කපන්න කපන්න සුවඳ හමනවා" කියලා. ඒ වාගේ, එතුමන්ලා මොන තරම් විවේචන කළත්, අපේ ආණ්ඩුව ඒවායින් සැලෙන්නේ නැතිව ක්‍රියාත්මක කළ ඒ වැඩසටහන් අද යම්කිසි විධියකට සමාජගත වෙන්න පටන්ගෙන තිබෙනවා. මේ සුවසැරිය ගිලන් රථ සේවය තුළින් ඉන්දියාවට ලංකාව තුළට ඇතුළු වෙන්න, ලංකාවට බලපෑම් කරන්න හැකියාව ලැබෙනවාය කියා ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු කිහිපදෙනෙක් එය දැඩි ලෙස දෝෂදර්ශනයට ලක් කළා. හැබැයි ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මම මේ කාරණය කියන්න කැමැතියි. ඔබලාට අනියත බියක් ඇති. නමුත් ඔය බිය ඇති වෙන්න තිබුණේ අද නොවෙයි. රාජපක්ෂ රෙජීමේන්තුව එදා මේ රට පාලනය කරද්දී ශ්‍රී ලංකා යුද හමුදා මූලස්ථානය වීන සමාගමකට සින්නකරව විකුණලා, ෂැන්ග්‍රි-ලා හෝටලය හදන්න ගෝල්ෆේස් වෙරළ තීරය ඉස්සරහ තිබෙන බිම් තීරය දෙනකොට, අපේ රටේ ඉඩම් නේද මේ පිට රටකට විකුණන්නේ, අපේ රටට බලපෑම් කරන්න නොවෙයිද මේ එන්න දෙන්නේ කියලා හිතුණේ නැද්ද දන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂය විධියට ඊට එහා ගිය ප්‍රතිපත්තියක් තමයි අපට තිබුණේ.

විදේශ රටවලින් ලැබුණු යම් යම් ආධාර උපකාර මත මේ රට ගොඩ නැඟුණු ආකාරය පිළිබඳව, ඉන් ලැබුණු වරප්‍රසාද පිළිබඳව ගරු මහින්ද අමරවීර ඇමතිතුමාත් ප්‍රකාශ කළා. එතුමාගේ කථාවේදී එතුමාට මහ හැරුණු එක කාරණයක් පිළිබඳව මා කියන්න ඕනෑ. නැත්නම් එය දිවංගත ජේ.ආර්. ජයවර්ධන ශ්‍රීමතාණන්ට අසාධාරණයක් සිදු වෙනවා. ඒ වාගේම එදා තරුණ කටයුතු භාර ඇමතිවරයා විධියට කටයුතු කළ වත්මන් අග්‍රාමාත්‍යතුමාටත් කරන මදිපුංචිකමක් වෙනවා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එදා ජයවර්ධනපුර රෝහල ස්ථාපිත කිරීම පිළිබඳ කාරණය අපේ ගරු ඇමතිතුමාට මහ හැරුණා. ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එදා ජපන් ආධාර යටතේ ඇඳන් දහසකින් සමන්විත ජයවර්ධනපුර රෝහල අපේ රටට ලබා දුන්නා. අද තවමත් ඒ රෝහල මේ රටේ ජනතාවට සෞඛ්‍යමය වශයෙන් ඉතාම වැඩදායී, වැදගත් සේවාවක් සපයනවා. එක්සත් ජාතික පක්ෂය කියන්නේ, බලයට පත් වන හැම අවධියකම වාගේ මේ රටට විදේශ රටවලින් ආධාර, සහන ක්‍රමයට ණය ලබාගෙන අනාගත පරම්පරා ගණනාවකට ඉතිරි වන ව්‍යාපෘති නිර්මාණය කළ පක්ෂයක්.

එසේ නිර්මාණය කළ වැඩසටහන්වල ප්‍රතිලාභ අපි අදත් භුක්ති විඳිනවා. එම නිසා මේ සුවසැරිය වැඩ පිළිවෙළ දෙස කුහක විධියට බලන්නේ නැතිව යහපත් ආකල්පයකින් බලනවා නම් හොඳයි. සුවසැරිය වැඩ පිළිවෙළ පිළිබඳව ප්‍රශංසා කිරීමට, ඒ පිළිබඳව කථා කිරීමට, එහි තිබෙන අඩු පාඩු පෙන්වා දීමට, එම වැඩ පිළිවෙළට තවත් යමක් එකතු කර වැඩි ගුණාත්මක වැඩසටහනක් උදෙසා යෝජනා ඉදිරිපත් කිරීමට අද දවසේ වෙන් කර තිබෙන කාලය යොදාගෙනත් ඒකාබද්ධ විපක්ෂයේ අය උත්සාහ කරන්නේ

තමන්ගේ දේශපාලන මතිමතාන්තර වපුරා ගන්නයි. ඒකාබද්ධ විපක්ෂයේ අය අද දවසේ පන්සලට ගියත්, බන්ධනාගාරයට ගියත්, අධිකරණයට ගියත් සමහර මාධ්‍ය නාලිකා කුලියට අරගෙන වැඩ කරන ආකාරය අපට පෙනෙනවා. මේ ආණ්ඩුව හදන්න ගොඩක් මහන්සි වුණු තරුණ මන්ත්‍රීවරු විධියට රට තුළ මෙවැනි වැඩසටහන් තව තවත් ස්ථාපිත කරනවාට අපි සතුටු වෙනවා, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මැතිතුමනි.

වෙනදාට මොනවා හෝ අල්ලාගෙන කෑ ගහන්න ඒකාබද්ධ විපක්ෂයේ කණ්ඩායම පාර්ලිමේන්තුව තුළ හිටියා. අද දවසේ මේ අවස්ථාව වන විට ඒකාබද්ධ පක්ෂය නියෝජනය කරන කිසිම මන්ත්‍රීවරයකු මේ පාර්ලිමේන්තුව තුළ නැහැ. එතුමන්ලාට විළි ලජ්ජාවක් තිබෙනවා නම් මේ පාර්ලිමේන්තුවට එන්න බැහැ. මොකද, එතුමන්ලා එදා මෙම සේවාව නොයෙක් ආකාරයට විවේචනය කළා. 1990 සුවසැරිය පදනම පනත් කෙටුම්පත අද අපේ ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ඒ පිළිබඳව මම සතුටු වෙනවා. හදිසි වෙලා සමාජයට අනවශ්‍ය දේවල් පටවනවාට වඩා, ප්‍රමාද වී හෝ සමාජයට අවශ්‍ය, ජනතාවට අවශ්‍ය, ශ්‍රී ලංකාවට අවශ්‍ය, ශ්‍රී ලාංකීය ජනතාවගේ අභිමානය ආරක්ෂා වන වැඩ පිළිවෙළක් දියත් කරනවා නම් ඒ ගැන අපි සතුටු වෙන්න ඕනෑ. ගරු අග්‍රාමාත්‍යතුමාත්, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මැතිතුමාත් මේ කටයුත්තට බොහෝ වෙහෙස මහන්සි වුණා. ඒ වාගේම අපේ පාර්ලිමේන්තු කණ්ඩායමත් මේ පිළිබඳව සාකච්ඡාවට ගණනාවක් පැවැත්වුවා. මේ වැඩ පිළිවෙළ තුළ තිබෙන හොඳ නරක පිළිබඳව සංසන්දනාත්මකව කථා කරලා, වඩා ගුණදායී ප්‍රතිඵල සමාජයට අත්පත් කර දීමට අපි කටයුතු කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(මාණ්පුමිකු අසෝක පිරියන්ත)
(The Hon. Ashoka Priyantha)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

දුප්පත් අහිංසක ජනතාව ඉලක්ක කරගෙන, ඔවුන්ගේ ජන ජීවිතයට අවශ්‍ය කරන සුරක්ෂිතභාවය ලබා දෙන්න තමයි, ප්‍රශ්න මැද්දේ වුණත් අපි මේ ගිලන් රථ සේවය ස්ථාපිත කළේ. රජයක් විධියට අපේ අරමුණ අද සාර්ථක වෙලා තිබෙනවා. අපි ඒ පිළිබඳව සතුටු වෙනවා. එක්සත් ජාතික පක්ෂ රජය බලයට පත් වන හැම අවස්ථාවකම සෞඛ්‍යමය වශයෙන් මේ රටේ වැදගත්, දැවැන්ත ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබෙනවා. ඒවා හැම දාමත් ජනතාව තුළ නොමැකී පවතිනවා. සුවසැරිය වැඩසටහන, පාසල් සිසුන් ලක්ෂ 42ක් රක්ෂණාවරණය කිරීම වැනි වැඩසටහන් මේ කාලය තුළ අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රයට ඇතුළත් කිරීම පිළිබඳව මේ ආණ්ඩුවේ මන්ත්‍රීවරයෙක් විධියට මම සතුටු වෙනවා. ඒ වගේම බෙහෙත් වර්ග හතළිස් ගණනක මිල අඩු කරලා අහිංසක, අසරණ රෝගීන්ට තමන්ට අවශ්‍ය බෙහෙත් ප්‍රමාණය ලබා ගැනීමේ පහසුකම ඇති කළා. අපේ දිළුම් අමුණුගම මන්ත්‍රීතුමා අක්ෂි කාච ලබා දීම සම්බන්ධව කථා කළා. රෝහල්වලට ගිහින් බලන්නය කියා මම එතුමාට කියනවා. රෝගීන්ට අක්ෂි කාච ලබා දෙනවා. ඒ විතරක් නොවෙයි, රෝහල් තුළ ප්‍රශංසනීය සේවාවක් සපයනවා. සුවසැරිය පදනම ස්ථාපිත කරන පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම පිළිබඳව එක චෝදනාවක් නොවෙයි, සිය දහස්වෝදනාවක් ගරු අග්‍රාමාත්‍යතුමාටත්, ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමාටත් ස්තුතිය පුද කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.42]

ගරු ඉෂාක් රහුමාන් මහතා
(මාණ්පුමිකු இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 1990 සුවසැරිය පදනම පනත් කෙටුම්පත යටතේ ඉදිරිපත් කර තිබෙන යෝජනාව මේ රටට ඔබින යෝජනාවක්.

අපේ රට ආර්ථික වශයෙන් විශාල ප්‍රශ්නයකට මුහුණ දී ඇති මේ වෙලාවේ, ගරු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා එතුමාගේ දක්ෂතාව පෙන්වලා ඉන්දියාවේ අගමැති මෝදි මහතා එක්ක සාකච්ඡා කරලා, මේ භාරදූර වැඩ පිළිවෙළ සාර්ථකව කරන්න ඕනෑ කියලා, මේ කාර්ය භාරය ඉෂ්ට කරන්න ඕනෑ කියලා තීන්දු කර ගත්තා. මේකට සුදුස්සෙක් තමයි ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා රාජ්‍ය අමාත්‍යතුමා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මුලසුන ගන්නවා ඇති.

අනතුරුව ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටතු, மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. (DR.) (MRS.) THUSITHA WIJEMANNA left the Chair, and DEPUTY SPEAKER [THE HON. J. M. ANANDA KUMARASIRI] took the Chair.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා කථාව කරගෙන යන්න.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මෙම විවාදය ආරම්භයේ ඉඳලා බලාගෙන සිටියදී පැහැදිලිව දැක්කා, විපක්ෂයේ මන්ත්‍රීවරු විවිධ විධියට එතුමාට මඩ ප්‍රහාර ගැහුවා; චෝදනා කළා. ඇත්තටම මේ දැන් ඉපදිච්ච අය විධියට තමයි ඒ අය කථා කළේ. හැබැයි අද අපට දැන ගන්න පුළුවන් වුණා, 1990 සුවසැරිය පදනම හරහා කරන වැඩ පිළිවෙළ මොකක්ද කියලා. එය දැන ගන්න කලින් ලංකාවේ කොටසක් ඉන්දියානු රජයට භාර දෙන විධියට තමයි අපට පසුගිය කාලයේ අහන්න ලැබුණේ, දකින්න ලැබුණේ. ඒ විධියට තමයි කථා කළේ. ඇත්තටම මමත් හිතුවා, මේ අය මොකද මේ විධියට විවේචනය කරන්නේ කියලා. ගරු රාජ්‍ය අමාත්‍යතුමා මෙම පනත් කෙටුම්පත මඟින් පැහැදිලිව, ලිඛිතව පෙන්වලා තිබෙනවා මේකෙන් ලැබෙන ලාභ මොනවාද, අලාභ මොනවාද කියලා. එය දැන ගෙනත් මේ අය ඇයි, මෙහෙම කථා කරන්නේ කියලා හිතනකොට ගොඩක් දුකයි.

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා දැනට දිස්ත්‍රික් හයක මේ වැඩ පිළිවෙළ පටන් අරගෙන ක්‍රියාත්මක කරගෙන යනවා. නමුත් ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ලංකාවේ වැඩිම භූමි ප්‍රමාණයක් තිබෙන දිස්ත්‍රික්කයක් තමයි, අපේ අනුරාධපුර දිස්ත්‍රික්කය. එහි දුෂ්කරම ආසන හතක් තිබෙනවා. මගේ ආදරණීය අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඒ ආසන හතේ තමයි ලංකාවේ වැඩිපුර kidney රෝගීන් ඉන්නේ. දැනට හඳුනාගත් රෝගීන් 25,000ක් ඉන්නවා. හඳුනාගන්න බැරි කොටසකුත් ඉන්නවා. එපමණ විශාල සංඛ්‍යාවක් ඉන්නවා. අනුරාධපුරයේ තමයි මහ රෝහල තිබෙන්නේ. එතැන ඉඳලා පදවියට කිලෝමීටර එකසිය ගණනක් තිබෙනවා. පදවිය, කැබිතිගොල්ලෑව, රඹෑව හා මැදවච්චිය කියන මේ ආසන හතරේම kidney රෝගීන් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා හඳුන්වා දී තිබෙන මේ වැඩ පිළිවෙළ ඉතා ඉහළයි. මේ වාගේ ගිලන්රථ සේවාවක් අපේ දිස්ත්‍රික්කයේත් තිබුණා නම්, ඒ බල ප්‍රදේශවල ඉන්න දුප්පත් ජනතාවට ඉතා ඉක්මනින් ඒ අයගේ ප්‍රශ්නවලට විසඳුමක් ලබා ගන්න පුළුවන් වෙයි.

අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති තවත් දුෂ්කරම බල ප්‍රදේශ තමයි, තන්තිරිමලේ හා යාන්ඔය පිහිටි බල ප්‍රදේශය. එම බල ප්‍රදේශයේ රෝහලක් තිබෙනවා. නමුත්, රෝහලට තවම ambulance එකක් නැහැ. අපට දුකයි. බලන්න දුකයි. මේ වාගේ අලුත් වැඩ පිළිවෙළවල් මඟින් ඒ ජනතාවට උපරිම සේවාවක් ලබා දෙන්න පුළුවන් නම් ඉතා හොඳයි. මීට පෙර තිබුණු රජයන් කිව්වා, "ලෝකයේ රටවල් අතරින් අපි සෞඛ්‍ය ක්ෂේත්‍රය පැත්තෙන් ඉහළටම -ඉදිරි ගමනක්- ගියා." කියලා. මම පදවියට ගියා. පදවිය ඉස්පිරිතාලය මූලික රෝහලක් විධියට නම් කර තිබෙනවා. නමුත්, ඒ hospital එක හරියට පවත්වාගෙන යන්න තවම දොස්තරලා නැහැ. දොස්තරලා පමණක් නොවෙයි, ගොඩනැඟිලිත් නැහැ. ඒ විතරක් නොවෙයි. ඒ hospital එකට අවශ්‍ය කිසි දෙයක් නැහැ. අඩු පාඩු රාශියක් පදවිය මූලික රෝහලේ තිබෙනවා. ඒ මම අනුරාධපුර දිස්ත්‍රික්කයේ එක අඩු පාඩුවක් කිව්වේ. අනුරාධපුර දිස්ත්‍රික්කයේ ආසන හතම මේ වාගේ තමයි, බොහොම අඩු පාඩු තිබෙනවා.

මේ කරන්න යන වැඩවලටත් අකුල් හෙළනවා නම්, සමස්ත ලංකාවේම ඉන්නා ජාතීන්ට කරන අසාධාරණයක් විධියට තමයි අපට එය දකින්න වෙන්නේ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ඉස්සරහට ගත්ත කකුල අඩියක්වත් පස්සට ගන්න එපා. හොඳ වැඩක් කරනකොට, මඩ ගහනවා.

යම් යම් ආකාරයෙන් ඔබතුමාව විවේචනය කරනවා. ඒ තුළින් ඔබතුමා හිතට භයියක් ගන්න. ඔබතුමාට භයියක් දෙන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වශයෙන් අපි ඔබතුමාගේ පිටුපසින් ඉන්නවා. ඔබතුමා හොරෙක් නොවෙයි; වංචාකාරයෙක් නොවෙයි. මේ රටට හඳුන්වා දෙන මේ වැඩ පිළිවෙළට මේ විධියට විරුද්ධ වෙන්නේ ඇයි, කියලා හිතන එකත් අපට දුකක්.

ගරු රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා ඉන්දීය අගමැතිතුමා එක්ක සාකච්ඡා කරලා තව කොච්චර වැඩ පිළිවෙළක් ලංකාවට ගෙනෙන්න පුළුවන් විධියට සැලසුම් සකස් කරගෙන යනවා. අපි ඉන්දියානු රජයට ඇඟිල්ල දිගු කළා නම්, ඉදිරියේදී එම රජයෙන් අපේ රටට ආධාර ගන්න පුළුවන් වෙන්නේ කොහොමද? මේ වැඩ පිළිවෙළ ණයක් නොවෙයි, මේක ආධාරයක්. මේ අය කථා කරන්නේ ණය අරගෙන පළාතකට වැඩ පිළිවෙළක් සකස් කරන්න යනවා කියලා හිතා ගෙනද දන්නේ නැහැ. එහෙම නැහැ. මේක සම්පූර්ණ ආධාරයක්. අපි ශත දහයක පොලියක් ගෙවන්න ඕනෑ නැහැ. ඒ වාගේම අපි ණය වාරික ගෙවන්න ඕනැත් නැහැ. සම්පූර්ණ ආධාරයක් දෙනකොට, අපි ඒවා භාරගෙන කටයුතු කරන්න ඕනෑ කොහොමද කියලා හිතා, සමස්ත පාර්ලිමේන්තුවේ සිටින 225 දෙනාම එයට සැලකීමක් විධියට උදව් කරන්න ඕනෑ. මේ වාගේ හොඳ වැඩ පිළිවෙළ ගෙනෙනකොට, මේ 225 දෙනා දේශපාලන වාසි ගැනීම සඳහා එක එක්කෙනා ඒවාට අකුල් හෙළුවොත් මේ ආදරණීය ලංකාවේ ඉන්නා දෙකෝටියක් පමණ වන ජනතාවට අපි උත්තර දෙන්නේ කොහොමද? ඒ වාගේම අනුරාධපුර දිස්ත්‍රික්කයේ මගේ ආදරණීය ජනතාව 750,000ක් පමණ ඉන්නවා. එම ජනතාවට මේ වාගේ වැඩ පිළිවෙළ තුළින් සහන ලබා දීමේදී, ලංකාවේ ජනතාව පාර්ලිමේන්තුවට පත් කර එවපු 225 දෙනා ඒවාට අකුල් හෙළන දේවල් කළොත් මේ යන ගමනට බාධාවක් ඇති වෙනවා. එහෙම වුණොත් ඒ දුගී දුප්පත් ජනතාව ඉදිරියට ගමන් කරන්නේ කොහොමද කියලා හිතනකොට අපට මහා දුකක් ඇති වෙනවා.

අපේ රටට ආර්ථික අතින් මහා විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙලා තිබෙනවා. එසේ විශාල ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙලා තිබෙන වකවානුවකදී, මේ වාගේ ආධාරයක් ගන්නකොට අපේ රට ඉදිරියට ගමන් කරන්නේ කොහොමද? අද ඩොලරයක වටිනාකම කීයකින් ඉහළ ගිහින් තිබෙනවාද කියලා බලන්න. කවුද, ඒකට පළි? අද වනවිට ඩොලරයක විකුණුම් මිල රුපියල් 160 ඉක්මවා ගිය එකට අනිවාර්යයෙන්ම වගකිව යුත්තේ මා ඇතුළු මේ පාර්ලිමේන්තුවේ සිටිනා 225 දෙනායි. අපි අතර සාමය නැහැ, අපි අතර සමඟිය නැහැ. හොඳ වැඩ පිළිවෙළක් ගෙනාවොත්, ඒක කවුරු ගෙනාවත් අපට වැඩක් නැහැ; මොන ඇමතිතුමා ගෙනාවත් වැඩක් නැහැ. මේක එහෙම නොවෙයි. "අපේ කාලයේ මේවා කරගන්න බැරි වුණා. කොහොමද, ඔබලා කරන්නේ? අපි ඒකට ඉඩ දෙන්නේ නැහැ." කියලා අනවශ්‍ය විධියට යම් යම් චෝදනා එල්ල වෙන ආකාරය අපට දකින්න පුළුවන්.

බලන්න, සිංගප්පූරු ගිවිසුම ගැන. අද ලෝකයේ දියුණු වී තිබෙන හැම රටක් දිහාම බලනකොට, ලෝකයත් එක්ක ගනුදෙනු කෙරුවොත් විතරයි දියුණු ඉදිරි ගමනක් තිබෙන්නේ කියන එක අපට පෙනී යනවා. එහෙම නැති වුණොත් ඉතියෝපියාව, සෝමාලියාව, ටැන්සානියාව වාගේ රටවල තත්ත්වයට තමයි අපේ ලංකාවටත් ගමන් කරන්න වෙන්නේ. එදා, සිංගප්පූරුවේ අගමැතිතුමා අපේ ලංකාව දිහා බලා කිව්වා, "මම ලංකාව වාගේ සිංගප්පූරුව හදන්න ඕනෑ"ය කියලා. හැබැයි, අද අපේ අගමැතිතුමා කියනවා, "අපි සිංගප්පූරුව විධියට අපේ ලංකාව හදන්න ඕනෑ"ය කියලා. අපි කනගාටුවෙන් වුණත් ඒ ගැන කියන්න ඕනෑ. ගරු අගමැතිතුමනි, අපි කොහොම ගමන් කළත් පාර්ලිමේන්තුවේ ඉන්නා 225 දෙනා අතර සමඟියක් නැතිනම්, මේ ගමන යන්න බැහැ. මේ රටේ ඉන්නා ජනතාව මහා විශාල විශ්වාසයකින් තමයි මේ 225 දෙනා පාර්ලිමේන්තුවට එවීමට ඡන්දය දුන්නේ. මේ 225 දෙනා පාර්ලිමේන්තුවට ගිහිල්ලා ජනතාවගේ ප්‍රශ්න විසඳලා, ආර්ථිකය ශක්තිමත්ව ඉදිරියට ගමන් කරවයි කියලා ලොකු විශ්වාසයක් ඇතිව තමයි මේ රටේ ජනතාව ඡන්දය දුන්නේ. නමුත් කොටසක් අකුල් හෙළනකොට, ලංකාවට කවදාවත් ඉදිරි ගමනක් යන්න බැරි වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

එදා සිංගප්පූරුවේ අගමැතිතුමාට ඒ පාර්ලිමේන්තුවේ ඉන්නා සියලු දෙනාම උදව් කළා. බලන්න, වයස අවුරුදු 93ක් පමණ වන මහතීර් මොහොමඩ් මැතිතුමා මැලේසියාවේ අග්‍රාමාත්‍යවරයා

බවට පත් වී තිබෙනවා. ඒ රටේ දූෂිත විධියට, නාස්තිකාර විධියට පාලනයක් තමයි තිබුණේ. ඒ දූෂණය නැති කරන්න ඕනෑය කියලා, රටේ සියලු ජනතාව මහතීර් මොහොමඩ් මැතිතුමාට සහයෝගය දුන්නා වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුනුත් එතුමාට සහයෝගය දෙන අන්දම අද අපට දකින්නට පුළුවන්. හැබැයි, අපේ රටේ එහෙම නැහැ. අපේ රටේ වෙනස් වීමක් වෙමින් යනවා. අපේ රටේ කවදාවත් හොඳ වැඩක් කරන්න ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා මා ගෞරවනීය ඉල්ලීමක් කරනවා, පාර්ලිමේන්තුවේ ඉන්න සියලුම මැති ඇමතිවරුන්ට මම ආරාධනා කරනවා, "මේ ආණ්ඩුවේ පාලන කාලය අවුරුදු 3ක් ඉවරයි, තව ඉතුරු වෙලා තිබෙන්නේ පොඩි කාලයයි, ඒ කාලය තුළදී මේ රටේ ආර්ථිකය හදා ගන්න අපි හැම දෙනාම එකතුවෙමු" කියලා. අපේ රටේ ආර්ථිකය හදා ගන්න අපි හැම එක්කෙනාම එකතු වුණේ නැත්නම්, අනිවාර්යයෙන්ම ඩොලරයේ අගය රුපියල් 161ක් නොවෙයි, රුපියල් 200ටත් එහා ගිහින් තමයි නවතින්නේ. ඒ නිසා අපේ රටේ ආර්ථිකය සඳහා හොඳ වැඩ පිළිවෙළක් හදන්න ඕනෑ.

අපේ රටේ කෘෂි කර්මාන්තයට මුල් තැනක් දෙන්න ඕනෑ. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුවට කලින්, එතුමිය ජනාධිපති ධුරයට පත්වෙන්න කලින් ලංකාවේ සිට පිට රටවලට මිරිස් අපනයනය කළා. නමුත් අද මිරිස් වැනි කෘෂි නිෂ්පාදන ආනයනය සඳහා පිට රටවලට ඩොලර් ඇදී යන ආකාරය අපට දකින්න පුළුවන්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒවා අපේම රටේ නිෂ්පාදනය කර ගන්න පුළුවන් විධියට මේ ආර්ථිකය වැඩිදියුණු කරලා ඩොලරයේ අගය අඩු කරගන්න නම් අපේ කර්මාන්ත වැඩිදියුණු කරන්න ඕනෑ; කෘෂි නිෂ්පාදනවලින් ලැබෙන ආදායම වැඩි කරන්න ඕනෑ. එහෙම වුණොත් විතරයි ඩොලරයේ අගය ඉහළ යන එක අපට පාලනය කරන්න පුළුවන් වෙන්නේ. එහෙම නැත්නම් මේ ඩොලරයේ අගය ඉහළ යන එක කාටවත් වළක්වන්න බැහැ. ඒ නිසා අපි නිෂ්පාදන වැඩි කරන්න ඕනෑ; කර්මාන්තපුර වැඩි කර ගන්න ඕනෑ; කෘෂි නිෂ්පාදන වැඩි කර ගන්න ඕනෑ; මේ රටින් පිට රටට ඇදී යන ඩොලර් ප්‍රමාණය නවත්වා ගන්න ඕනෑ.

එදා අපේ දිවංගත ප්‍රේමදාස ජනාධිපතිතුමා අපේ රටේ garment factories පටන් ගත්තා. ඒ තුළින් ගොවි ජනතාවගේ දුප්පත් දරුවන්ට රැකියාව ලබා දුන්නා. අද බලන්න, අපේ garment factories සියල්ලම වැහිලා යනවා. මම මක්කම ගිය වෙලාවේ බංග්ලාදේශයේ අපේම යහළුවන් මුණ ගැහුණා. ඒ අය කිව්වා, " ඔබලාගේ රටේ කිහිපදෙනෙක් අපේ බංග්ලාදේශයට garment factories අරගෙන ඇවිත් වැඩ කරනවා"යි කියලා. ඒ වාගේ දේවලට අපි අවසර හදලා දෙන්න ඕනෑ. එහෙම නැති වුණොත් පිට රටට ඩොලර් ඇදී යන එක ගැන අහන්න දෙයක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි ඒ වාගේ වැඩ පිළිවෙළක් කරන්නේ නැතුව ඉන්නේ ඇයි? අපේ ගරු අගමැතිතුමාගෙනුත්, අපේ ජනාධිපතිතුමාගෙනුත්, අපේ කැබිනට් ඇමතිවරුන්ගෙනුත් ඉල්ලීමක් කරනවා, "විපක්ෂයේ අයට භය වෙන්න එපා" කියලා. ඒ අය කෑ ගහයි, ඒ අය කථා කරයි. නමුත් ඔබතුමන්ලා ඒ සම්බන්ධයෙන් හොඳ වැඩ පිළිවෙළක් ගෙනෙන්න. දිවංගත ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාටත්, දිවංගත ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමාටත්, ඒ වාගේම එතැනින් පස්සේ බලයට පැමිණි සියලුම ආණ්ඩුවලටත්, හිටපු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාටත් එහෙම කථා කළා. නමුත් මොනවාද වෙන්නේ? ඒක ගණන් ගන්න එපා. අපේ ගමන අපි යන්න ඕනෑ. කවුරු මොන විවේචන කළත් අපි ඒවා ගණන් ගන්නේ නැතුව ඉන්න ඕනෑ. අද තිබෙන ප්‍රශ්නය තමයි, ඩොලරයේ අගය ඉහළ යෑම. එය නවත්වා ගන්න නම් අපේම රටේ නිෂ්පාදන වැඩි කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹ்மான்)
(The Hon. Ishak Rahuman)
මට විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපේම රටේ නිෂ්පාදනය වැඩි කරලා රුපියලේ අගය වැඩි කර ගන්න ඕනෑ.

අපේ ගරු හර්ෂ ද සිල්වා රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා භය වෙන්න එපා. අද උදේ ඉඳලා මේ සභාවේ කළ කථා ඔබතුමා අහගෙන සිටියා. සමහර අය ඔබතුමාට මඩ ගැහුවා. ඔබතුමා ඒ මඩවලට උත්තර දුන්නා. මේ ගිලන් රථ සේවය ඇති කිරීම ලොකුම පිනක්. පින් වැඩක් තමයි ඔබතුමා කරන්නේ. දුගී දුප්පත් ජනතාවට උදව කිරීම ලොකු පිනක්.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මා නියෝජනය කරන අනුරාධපුරය දිස්ත්‍රික්කයේ තිබෙන ආසන හතේම බොහෝ අඩුපාඩු තිබෙන බව මම ඔබතුමාට කිව්වා. කොළඹට, මහනුවරට, ඒ වාගේම ඔබතුමා නියෝජනය කරන ප්‍රදේශවලට දක්වන සැලකිල්ලට වඩා වැඩි සැලකිල්ලක් අපේ අනුරාධපුරය දිස්ත්‍රික්කයට දක්වන්න. ඒකට හේතුව තමයි, අපේ දිස්ත්‍රික්කයේ වකුගඩු රෝගීන් 25,000කට වැඩි ප්‍රමාණයක් සිටීම. විශේෂයෙන්ම පදවිය, මැදවච්චිය, කැබිතිගොල්ලෑව, රඹෑව, තන්තිරිමලේ, යාන්ඔය යන ප්‍රදේශවල තිබෙන රෝහල්වල බොහෝ අඩුපාඩු තිබෙනවා. ඔබතුමා විශේෂ සැලකිල්ලක් දක්වා මේ අඩුපාඩු බොහොම ඉක්මනින් සම්පූර්ණ කරලා දෙයි කියා මම බලාපොරොත්තු වෙනවා. අවසාන වශයෙන්, ඉන්දියාවේ අගමැති මෝදි මැතිතුමාටත්, අපේ රටේ අගමැති ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාටත්, ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මම කථාව අවසන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඊළඟට, ගරු නියෝජ්‍ය කාරක සභාපති සෙල්වම් අඩෙක්කලනාදන් මැතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[පි.ප. 4.58]

ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා (නියෝජ්‍ය කාරක සභාපතිතුමා)
(மாண்புமிகு செல்வம் அடைக்கலநாதன் - குழுக்களின் பிரதித் தவிசாளர்)
(The Hon. Selvam Adaikkalanathan - Deputy Chairman of Committees)
நன்றி, பிரதிச் சபாநாயகர் அவர்களே! நீங்கள் பிரதிச் சபாநாயகராக வந்ததையிட்டு முதலில் உங்களுக்கு வாழ்த்துத் தெரிவிக்கின்றேன். இன்று இந்தச் சபையிலே வடக்கு, கிழக்கு உட்பட இந்த நாடு முழுவதும் கட்டணமின்றிய அம்பியுலன்ஸ் சேவையை நடத்துவது சம்பந்தமான 1990 சுவசெரிய மன்றம் சட்டமூலம் தொடர்பான விவாதம் நடைபெறுகின்றது.

உண்மையிலே இந்த அரசாங்கத்துக்கு நாங்கள் நன்றி சொல்லக் கடமைப்பட்டிருக்கின்றோம். காரணம், வடக்கு, கிழக்கிலே இலவச ambulance சேவை நடத்துவது மிக மிக முக்கியமான ஒரு விடயம். மாரடைப்பினால் பலர் மரணமாகின்ற துர்ப்பாக்கிய நிலை இன்று எங்களது பிரதேசத்திலே இருக்கிறது. அந்தப் பிரதேசம் போரால் பாதிக்கப்பட்டது என்றபடியால் இன்று அங்குள்ள மக்கள் திடீர் திடீர் என நோய்வாய்ப்படுகின்ற ஒரு சூழல் காணப்படு

[ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා]

කින්නතු. இந்தியாவின் உதவியோடு செயற்படுத்தப்படுகின்ற இந்தச் சேவை வடக்கு, கிழக்கில் குறிப்பாக எங்களுடைய வன்னிப் பிரதேசத்திலும் தொடர இருப்பதையிட்டு நாங்கள் உங்களுக்கு நன்றியைத் தெரிவித்துக் கொள்கின்றோம்.

இந்தச் சேவை சாதாரண கிராமப்புற மக்களையும் சென்றடைய வேண்டும். நகரப் புறத்தில் மட்டும் இந்த நிலவரம் இருக்கக் கூடாது. ஏனெனில் கிராமப்புறங்களிலே வாழ்கின்ற மக்கள்தான் இன்று கூடுதலாக நோய்வாய்ப்பட்டுப் பாதிக்கப்படுகின்றார்கள். எனவே, இந்த இலவச அம்பியுலன்ஸ் சேவையை நாங்கள் மிகவும் இன்றியமையாத விடயமாகப் பார்க்கின்றோம். அந்த வகையிலே அரசாங்கம் இந்த விடயத்திலே கவனம் செலுத்தியதை எண்ணி நாங்கள் நன்றி சொல்கின்றோம். குறிப்பாக கிராமப்புறங்களிலே இந்தச் சேவை இடம்பெற வேண்டும் என்பதுதான் எங்களுடைய வேண்டுகோளாக இருக்கின்றது.

இந்த வண்டிகளுக்கான ஓட்டுநர் - 'ட்ரைவர்' தெரிவு நியாயமான முறையிலே நேர்முகப் பரீட்சைமூலம் இடம்பெற வேண்டும். ஏனென்றால் இது உயிருடன் சம்பந்தப்பட்ட விடயம். எனவே, தகுதியானவர்களைத் தெரிவுசெய்ய வேண்டும். இந்த விடயத்தில் உங்களுடைய கவனத்தை ஈர்க்க விரும்புகின்றேன்.

இந்தியாவிலே இந்தச் சேவை முதன்மைப்படுத்தப் பட்டுள்ளது. குறிப்பாக இது தமிழ் நாட்டிலே முன்னாள் முதலமைச்சர் ஜெயலலிதா அவர்கள் அறிமுகப்படுத்திய விடயம். அது அங்கு மிக முன்னேற்றகரமாக நடைபெறு கின்றது. அதனால் ஏழை மக்கள் பயன்பெறுகின்றார்கள்; காப்பாற்றப்படுகின்றார்கள். அந்த நிலையில் இந்தச் சேவையை எங்களுடைய பிரதேசத்திற்கும் நீங்கள் கொண்டு வருவதை எண்ணி நாங்கள் உண்மையிலே உங்களுக்கு அந்த மக்கள் சார்பாக நன்றியையும் பாராட்டையும் தெரிவித்துக் கொள்கின்றோம். இது எங்களுடைய பிரதேசத்திற்கு நிச்சயமாகத் தேவையான விடயம்.

எங்களுடைய நாடாளுமன்றத்திலே 35 வருடங்களுக்கு மேல் சேவையாற்றிச் சென்ற திரு. ரஞ்சன் பத்திநாதர், செல்வி ரஞ்சனி ஜயமான்ன ஆகியோரின் சேவை அளப்பரியது. மேலும் பாராளுமன்றத்தின் உணவு வழங்கல், வீடு பராமரிப்புச் சேவைகள் திணைக்களத்தின் பணிப்பாளராகக் கடமையாற்றிய காலஞ்சென்ற திரு. சுரேன் பெரேரா அவர்களும் அளப்பரிய சேவையாற்றியுள்ளார். இளைப்பாறிய பின்னர் புதிய வாழ்க்கை ஆரம்பமாகின்றது என்று சொல்லலாம். அந்த வகையிலே அவர்களுடைய புதிய வாழ்க்கை சந்தோசமாக அமையவேண்டுமென்று வாழ்த்தி நிற்கின்றேன். இந்த நாடாளுமன்றக் குடும்பத்தவர்கள் மிகவும் அர்ப்பணிப்போடு சேவையாற்றி வருகின்றார்கள். அந்த வகையில் உழைத்தவர்களை நாங்கள் பாராட்டி நிற்கின்றோம். அதேநேரம் அவர்களின் எதிர்காலம் நல்ல முறையில் இருக்க வேண்டும் என்று சபாநாயகர் சார்பாகவும் பிரதிச் சபாநாயகர் சார்பாகவும் வாழ்த்தி, விடை பெறுகின்றேன். நன்றி.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.04]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දිනට නියමිත කටයුතු අතුරින් සාකච්ඡාවට භාජනය වන සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය තුළින් රා බෝතල් කිරීමේ බලපත්‍ර ගාස්තුව අඩු කරලා තිබෙනවා. උදේ ඉඳලා විපක්ෂයේ මන්ත්‍රීවරු මේ ගැන බොහොම කැක්කුමකින් යුතුව කථා කරනවා අපි දැක්කා. අපි මෙහිදී 'රා' කියන්නේ කෘත්‍රිම රාවලට නොවෙයි කියන කාරණය මතක් කර දෙන්න ඕනෑ. එතුමන්ලාගේ කාලයේ -රෙජීමය කාලයේ- මේ රටට කෘත්‍රිම රා ගෙනැල්ලා, බෝතල් කරලා, වෙළෙඳ පොළට දැමූ ආකාරය අපි දැක්කා. ඒවා පානය කරපු ජනතාව වැඩි කල් ජීවත් වුණේ නැහැ. ඒකට අන්තිමේදී නමකුත් හැදුණා, "ඇති හිටියා" කියලා. "ඇති හිටියා" කියා කියන්නේ, ඒවා බොන්නේ ජීවත් වෙලා ඇති වුණාම මැරෙන්න බලාගෙන නිසායි. ඒ විධියට මත්පැන් මේ රටට හඳුන්වා දීපු උදවිය තමයි අද මේ කාරණය සම්බන්ධයෙන් බොහොම කනගාටුවෙන් යුතුව කථා කරන්නේ.

සුවසැරිය ගිලන් රථ සේවය ආරම්භ කරලා, මේ වනකොට අවුරුදු දෙකක කාලයක් ගතවෙලා තිබෙනවා. රෝගීන් 69,000කට ආසන්න ප්‍රමාණයකට මේ තුළින් සේවය ලබා දීලා තිබෙනවා. විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා තදබල විධියට මේ කාරණය විවේචනය කළා. ඉන්දියාව, ලංකා රෝහල් ආක්‍රමණය කරන බව පැවසුවා. ලංකාවේ රෝහල් කාර්ය මණ්ඩල මෙයට විරුද්ධව කටයුතු කළා. බුද්ධිමත් කියන වෛද්‍යවරුන් පවා මෙයට විරුද්ධ වුණා. හැබැයි, අද ඒ සියලුම දේවල් හෝදාගෙන ගිහිල්ලා තිබෙනවා. අද රටේ සිටින හැමෝම පිළි අරගෙන තිබෙනවා, සුවසැරිය පූර්ව ප්‍රතිකාර ගිලන් රථ සේවය හරහා විශාල සේවයක් සිදු වන බව. ඇමෙරිකන් ඩොලර් මිලියන 7.55ක ආධාර ලබා ගෙන, ගිලන් රථ 88කින් පටන් ගත් මේ ව්‍යාපාරය අද මුළු රටටම ව්‍යාප්ත වෙමින් යනවා. එදා GVK EMRI Lanka (Private) Limited එකෙන් තමයි මේ සේවාව සැපයුවේ. මේ ගිලන් රථ සේවය ඇතුළු වෛද්‍ය සේවය, රෝහල් සේවය ඉන්දියාවට අත්පත් කර ගන්නවා කියලා එදා කිව්වා. හැබැයි, අවසානයේ මොකද වුණේ? සුවසැරිය පදනම ස්ථාපනය වුණාට පස්සේ GVK EMRI Lanka (Private) Limited එකේ සියලුම වත්කම් ටික සුවසැරිය පදනමට පූජා කරලා තිබෙනවා. ආණ්ඩු පක්ෂය වශයෙන් මේ යහ පාලන රජයෙන් ගන්නා ප්‍රතිපත්ති සහ සැලැසුම්, අද විපක්ෂයේ ඉන්න උදවියට හිතා ගන්නවත් බැරි සැලසුම් බවට පත්වෙලා තිබෙන බව අපි කියන්නට ඕනෑ.

දුරකථන ඇමතුම් 579,000ක් එනකොට 79,000කට සේවය සැපයෙනවා. දුරකථන ඇමතුම ලැබිලා තත්පර දෙකක් ඇතුළත සියයට 98.9කට ප්‍රතිචාර දක්වලා තිබෙනවා. දිනකට රෝගීන් 175ක් මේ ගිලන් රථ මඟින් ප්‍රවාහනය කරනවා. ඒ වාගේම දුරකථන ඇමතුමක් ලබා දීලා විනාඩි 12.56ක් ඇතුළත අදාළ ස්ථානයට ගිලන් රථය සේන්දු වෙනවා.

කලට වේලාවට වැඩ කරන්න බැරි ආයතන තිබෙන රටක් විධියට සැලකෙන අපේ රටේ මේ ගිලන් රථ සේවය මඟින් අද වනකොට ඔප්පු කර පෙන්වලා තිබෙනවා, දුරකථන ඇමතුමකින් දැනුම් දීලා, විනාඩි 12 තත්පර 56ක් ඇතුළත අදාළ තැනට සේන්දු වෙලා, රෝගියාව ගිලන් රථයට නංවා ගන්නවා කියන කරුණ.

ඇමෙරිකානු ඩොලර් මිලියන 15.02ක පරිත්‍යාගයක් වශයෙන් ගිලන් රථ 209ක් ඉදිරියේදී ලැබෙන්නට තිබීම සම්බන්ධයෙන් මා විශේෂයෙන් සතුටු වනවා. මේ වනකොට රටේ තවත් දිස්ත්‍රික්ක හයක මේ කටයුත්ත ක්‍රියාත්මක වීමට අවශ්‍ය වැඩ කටයුතු ආරම්භ කරලා තිබෙනවා. අනුරාධපුර දිස්ත්‍රික්කය ගත්තොත් පසුගිය

දවස්වල මේ සුවසැරිය ගිලන් රථ සේවාවට අවශ්‍ය රියැදුරන්, වෛද්‍ය සහායකවරුන් බඳවා ගැනීම් කළා. විද්‍යා විෂයයෙන් උසස් පෙළ හදාරා "S" සාමර්ථ 3ක් ලබා තිබෙන ගැහැනු සහ පිරිමි ළමුන් 36 දෙනෙකු මේ වනකොට අනුරාධපුර දිස්ත්‍රික්කයෙන් තෝරාගෙන තිබෙනවා. ඒ අතුරින් පළමුවැනි හතර පස් දෙනා මේ වනකොට ඉන්දියාවේ මාස දෙකක පුහුණුවීමකට යවා තිබෙනවා. ඒ නිසා අද මේ ආයතනය ගිලන් රථ සේවයක් පමණක් නොවෙයි; රැකියා ලබා දීමේ අවස්ථා සපයන ආයතනයක් විතරක් නොවෙයි; විශේෂඥ දැනුම ලබා දෙන, විදේශීය පුහුණුවීම්වලට යොමු කරන ආයතනයක් බවට පත්වෙලා තිබෙනවා.

අපට මතකයි, මාගම්පුර ආර්ථික කේන්ද්‍රයට මුල්ගල් තියපු අවස්ථාව. ඒ අවස්ථාවේ උදය ගම්මන්පිල මැතිතුමන්ලා වාගේ අය පිටුපස්සේ හැංගිලා, ඒ අයට රැවටිලා ආණ්ඩුවට විරුද්ධව උද්ඝෝෂණය කරන්නට ආව උදවිය අවදානමට ලක්වුණාම, ඒ අයටත් පිහිට වුණේ මේ ඉන්දියානු ගිලන් රථ සේවය කියන එක මම මතක් කරලා දෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අනුරාධපුරයේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි CKDu ප්‍රශ්නය. අපි මේකට "නිදන්ගත වකුගඩු රෝගය" කියලායි කියන්නේ. මේ වෙනකොට යහ පාලන ආණ්ඩුව යටතේ පදවිය, මැදවිච්චිය, අනුරාධපුරය කියන රෝහල් තුනේම මේ සඳහා ප්‍රතිකාර වාගේම රුධිර කාන්දුකරණ කටයුතු කරනවා. මේ වෙනකොට අනුරාධපුර රෝහලට අමතරව කැබතිගොල්ලෑව රෝහල මූලික රෝහලක් බවට පත් කරන්න අවශ්‍ය කටයුතු කරමින් පවතිනවා. කැකිරාව රෝහලත් මූලික රෝහලක් බවට පත් කරන්න අවශ්‍ය කටයුතු කරමින් පවතිනවා. ඉදිරියේදී හබරණ රෝහලත් අපි තුන්වන ශ්‍රේණියේ සිට දෙවන ශ්‍රේණියේ රෝහලක් බවට පත් කරන්න අවශ්‍ය කටයුතු කරනවා. මේ රෝහල්වලත් ගිලන් රථ හිඟයක් තිබෙනවා. 2012 අපි පළාත් සභාවේ හිටපු කාලයේ කෑලි හැලි හැලී දුවන ගිලන් රථ සම්බන්ධයෙන් ප්‍රශ්න කළාම කිව්වේ, ඒවාට දෙන්න වාහන නැහැ කියලායි. හැබැයි, ඒ කාලයේ බේබි මහත්වරුන්ට රේස් පදින්න වාහන ගෙනෙන්න සල්ලි තිබුණා. නමුත් ඉස්පිරිතාලයට ගිලන් රථයක් ගෙනෙන්න සල්ලි තිබුණේ නැහැ. අපි විපක්ෂයට මතක් කර දෙන්න ඕනෑ, අද සාමාන්‍ය ජනතාව බෙහෙත් ගන්න three-wheeler එකකින් ඉස්පිරිතාලයට යනවා වෙනුවට අපි ඒ අයට යන්න ගිලන් රථ පහසුකම් ලබා දෙනවා කියලා. මේ රටේ ජනතාවගේ සුවපහසුව වෙනුවෙන් තමයි අපි එහෙම කරන්නේ. අද වෙනකොට මේ ආණ්ඩුව කරලා තිබෙන කාර්යභාරය ජනතාව අතරට ගියේ නැති ප්‍රශ්නයක් තිබෙනවා. මේ රටේ ජනතාවට ඒවා තේරුම් ගන්න බැරි ප්‍රශ්නයක් තිබෙනවා. හැබැයි, අපි ආණ්ඩුවක් විධියට මේ අවුරුදු තුන ඇතුළත අපේ කාර්යභාරය සැලකිය යුතු මට්ටමකින් ක්‍රියාත්මක කරලා තිබෙනවා. අපට අවුරුදු තුනක් ඇතුළත සියලු දේවල් කරන්න බැරි බව පිළිගන්නවා. හැබැයි, සැලකිය යුතු මට්ටමින් ක්‍රියාත්මක වෙලා තිබෙනවා.

නිදන්ගත වකුගඩු රෝගය ගැන කථා කරද්දී, විශේෂයෙන්ම මට මතක් වෙනවා රාජාංගණයේ ජල ව්‍යාපෘතිය ගැන. රාජාංගණයේ ජල ව්‍යාපෘතිය යෝජනා කළේ අපේ ආණ්ඩුවෙන් නොවෙයි. රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුවෙන් තමයි ඒක යෝජනා කළේ. අපි පළාත් සභාවේ ඉන්න කාලයේ තමයි ඒ යෝජනාව ආවේ. ඒ යෝජනාවට විරුද්ධව අපි කථා කළාම අපට කිව්වා, මිනිසුන්ට බොන්න වතුර දෙන එකට විරුද්ධ වෙන අමුතු විධියේ ජාතියක් කියලා. රාජපක්ෂවරුන්ට ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න සල්ලි තිබුණේ නැති නිසා අන්තිමට ඒ ව්‍යාපෘතිය අත්හැර දැම්මා. හැබැයි, අපි ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන්න ප්‍රතිපාදන වෙන් කළාට පස්සේ, චීන සමාගමක කතන්දරයක් අල්ලා ගෙන විකෘති විරෝධයක් මවාපාලා අද ඒ කටයුත්ත කඩාකප්පල් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම මතක් කරන්න ඕනෑ, වකුගඩු රෝගය අද සෞඛ්‍ය ක්ෂේත්‍රයේ විශාල ප්‍රශ්නයක් වෙලා තිබෙන බව. එය දුරු කරන්න නම් අනිවාර්යයෙන් පිරිසිදු පානීය ජල සැපයුම තිබෙන්නට ඕනෑ. මේ වෙනකොට ඒ සඳහා ජල ව්‍යාපෘති ගණනාවක් ක්‍රියාත්මක වෙනවා. ඒ තමයි කනදරාව, පදවිය, විසල් දඹුළු ජල යෝජනා ක්‍රමය සහ රාජාංගණ ජල ව්‍යාපෘතිය. මේ වෙනකොට රාජාංගණ ජල ව්‍යාපෘතිය හැර අනිකුත් සියලු ව්‍යාපෘති ආරම්භ කරලා තිබෙනවා. රාජාංගණ ව්‍යාපෘතියට විතරක් කණකොකා හඬලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
ඒ වාගේම එදා අපි යෝජනා කළා, නීල බැම්ම ව්‍යාපාරය. අනුරාධපුර දිස්ත්‍රික්කයේ අවසාන කෙළවර වන පුත්තලමට මායිම්ව කලාඔය හරස් කරලා ජලාශයක් නිර්මාණය කරලා, ඒ නීල බැම්ම ව්‍යාපාරය හරහා නොච්චියාගම පැත්තෙන් අනුරාධපුර පැත්තටත්, රාජාංගණය - තඹුත්තේගම පැත්තටත් පානීය ජලය ලබා දෙන්න අවශ්‍යයි කියලා අපි යෝජනා කළා. නමුත් අද වෙලා තිබෙන්නේ මේකයි. යහ පාලන ආණ්ඩුවට සල්ලි ලැබුණාට, යහ පාලන ආණ්ඩුවට ඒ දැක්ම තිබුණාට, මේ රටේ ජනතාව තවමත් රාජපක්ෂ වහල් යුගයට යොමුවීම නවත්වා ගන්න අපට බැරිවෙලා තිබෙනවා. අපි බෝඩ් ලෑලි ගහන්නේ නැති එකේ ඵල විපාක, රාජ්‍ය මාධ්‍ය ආයතන රජයට කඩේ යන මට්ටමට නොගෙනෙන එකේ ඵල විපාක අද අපි බුක්ති විඳිමින් සිටිනවා. ඒ නිසා මේ රටේ ජනතාව සුවපත් කරන්න අපි හදපු යහ පාලන ආණ්ඩුව අද විපක්ෂයේ ඉන්න

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ග්‍රහණයට හසුවෙලා තිබෙනවා. එදා යමක් කර ගන්නට මුදල් තිබුණේ නැති විපක්ෂයේ උදවිය අද අපේ ක්‍රියාකලාපය, අපේ වැඩ පිළිවෙළ අවුල් කරනවා.

අද පාරට බැස්සාම හැම තැනම දකින්න තිබෙන්නේ විරෝධතා. එදා විරෝධතා කළා නම්, යන්න වෙන්නේ මීනී පෙට්ටියේ. මා ඒ එක්කම මතක් කරන්න ඕනෑ, හලාවත, කටුනායක, රතුපස්වල වුණු සිද්ධි. ඒ අවස්ථාවල 1990 ගිලන් රථ සේවාව තිබුණා නම් අවම වශයෙන් ඒ මැරුණු පස්, හය දෙනාගෙන් එක් කෙනකුවත් අපට බේරා ගන්න තිබුණා. නමුත්, මෙවැනි සේවාවක් එදා තිබුණේ නැහැ. රෝහල්වලට රෝගීන් භාර ගැනීම ප්‍රමාද කළා. ඒ නිසා වෙඩි වැදුණු කිහිප දෙනකු මරුමුවට පත් වුණා. එවැනි කාලකණ්ණි යුගයක තිබුණු මේ රට අපි යහ පාලනයට ගෙනාවාම, අද යහ පාලනයම උපයෝගි කර ගනිමින් පාරට බැහැලා උද්ඝෝෂණ, විරෝධතා පවත්වා මේ රටට එන ආයෝකයන්ට ඔප්පු කරලා පෙන්වන්න උත්සාහ කරනවා, මේ රට ආයෝජකයන්ට සුදුසු රටක් නොවෙයි, මේ රටේ ආයෝජනය කිරීමට සුදුසු නැහැ, මේ රටේ රාජ්‍ය පරිපාලනය, සිවිල් නීතියවත් ක්‍රියාත්මක නොවන රටක් විධියට.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මා අවසාන වශයෙන් කියනවා, දිගින් දිගටම යහ පාලනය කරපින්නා ගෙන මෙහෙම ගියොත් නම් මේ රටට ආයෝජකයන් ගෙනෙන්න හම්බ වෙන්නේ නැහැ කියලා. ඒ නිසා ඉතිරි අවුරුදු එකහමාර තුළවත් මේ යහ පාලනය සම්බන්ධයෙන් දෙවෙරක් සිතන්න සිද්ධ වෙනවායි කියා මතක් කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is Hon. Muhammad Ibrahim Muhammad Mansoor. You have six minutes.

[பி.ப. 5.15]

ගරු මුහම්මදු ඉබ්‍රාහිම් මුහම්මදු මන්සූර් මහතා
(மாண்புமிகு முஹம்மது இப்ராஹிம் முஹம்மது மன்சூர்)
(The Hon. Muhammad Ibrahim Muhammad Mansoor)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்தச் சபையிலே மிக முக்கியமான விடயம் ஒன்றை பேசுவதற்கு வாய்ப்புத் தந்தமைக்காக நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். சகாதார சேவையை ஒரு வகையில் மேம்படுத்தும்முகமாக மிக முக்கியமான ஏற்பாடு ஒன்று செய்யப்பட்டு, அது தொடர்பில் இன்று விவாதம் இடம்பெற்றுக் கொண்டிருக்கின்றது. இவ்வாறு பல்வேறு சேவைகள் மற்றும் சட்டங்கள் தொடர்பாக இந்தச் சபையின் ஒவ்வோர் அமர்விலும் நாங்கள் விவாதித்துக் கொண்டிருக்கின்றோம்; சட்டங்களை இயற்றிக் கொண்டிருக் கின்றோம். அந்த வகையில் மக்களுக்குப் புதிய புதிய சேவை களை ஆற்றுவதற்கு முயற்சி எடுத்துக்கொண்டிருக்கின்றோம். இந்தச் சந்தர்ப்பத்தில் நான் ஒரு விடயத்தின்மீது சபையின் கவனத்தை ஈர்க்க விரும்புகின்றேன். அதாவது புதிய சேவைகளை ஆற்ற முன்வருகின்ற எங்களுக்கு, மக்களின் அடிப்படை உரிமை சம்பந்தப்பட்ட விடயங்கள் எந்தப் பாகுபாடும் இல்லாமல் அமுல்படுத்தப்படுவதை உறுதிசெய்ய வேண்டிய கடப்பாடும் இருக்கின்றது என்று நான் நம்புகின்றேன்.

இந்த ஆட்சிக்கு வாக்களித்த மக்கள் குறிப்பாக முஸ்லிம் மக்கள் பல்வேறு வேதனைகளுக்குள் இருந்து கொண்டிருக் கின்றார்கள். இந்த அரசாங்கத்தை ஆதரித்ததில் எந்த அர்த்தமுமில்லை என்பதை இன்று அவர்கள் உணரத் தொடங்கியிருக்கின்றார்கள். நீண்டகாலமாக, குறிப்பாக யுத்தம் முடிவடைந்தவுடன் அவர்கள் சந்தித்த அல்லது அவர்களுக்கு நேர்ந்த நிர்க்கதியான நிலைமைகள் சம்பந்தமாகத் தீர்வு கிடைக்கும் என்று நம்பிய அவர்கள், இன்னும் ஏமாந்து கொண்டிருக்கின்றார்கள். குறிப்பாக அம்பாறை மாவட்டத் திலே பல ஆயிரக்கணக்கான ஏக்கர் காணிகளை இழந்த அவர்கள், அந்தப் பிரச்சினைக்குத் தீர்வு காணாத நிலையில் இருந்து கொண்டிருக்கின்றார்கள். வனப் பாதுகாப்புத் திணைக்களம், வன ஜீவராசிகள் பாதுகாப்புத் திணைக்களம், தொல்பொருள் திணைக்களம் என்று சகல திணைக்களங்களும் அப்பாவி முஸ்லிம்களுக்குச் சேவையாற்றுவதற்கு அப்பால், அவர்களின் காணிகளை அபகரிப்பதற்குப் பயன்படுத்தப் படுகின்ற நிலைமை இன்னும் நீடித்துக்கொண்டிருக்கின்றது.

அண்மையிலே கௌரவ பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்களுக்கு எதிராக, அவர்மீது நம்பிக்கையில்லாப் பிரேரணை கொண்டுவரப்பட்டபோது, அதைத் தோற்கடிப்பதற்குத் தேவைப்பட்ட ஆதரவை நாங்கள் வழங்க வேண்டிய நிலையில், அந்தச் சந்தர்ப்பத்திலாவது எங்களது பிரச்சினைகள் தீர்த்துத் தரப்படும் என்ற அடிப்படையிலே, ஸ்ரீ லங்கா முஸ்லிம் காங்கிரஸின் தலைவர் ரவூப் ஹக்கீம் அவர்களின் தலைமையிலே எங்களுடைய பாராளுமன்றக் குழு, அவரைச் சந்தித்து, குறித்த பிரச்சினைகளை முன்வைத்து, அவற்றைத் தீர்த்துத்தர வேண்டும் என்று கேட்டுக் கொண்ட போது, அவற்றைத் தீர்த்துத் தருவதாக வாக்குறுதி அளித்தும், இன்னும் தீர்த்துத் தரப்படாமையானது துரதிருஷ்ட வசமானதும் கண்டிக்கத்தக்கதுமான விடயம் என்பதை இந்தச் சபையிலே கூறிக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இவ்வாறான மிக முக்கியமான அடிப்படை உரிமைகளை இன்னும் உறுதிசெய்ய முடியாமல், தங்களுக்கே உரித்தான உரிமைகளை அனுபவிக்க முடியாமல், இந்த நாட்டிலே சிறுபான்மையின மக்கள் வாழ்ந்து கொண்டிருக்கிறார்கள். அதுமாத்திரமல்ல, சிறுபான்மையினர் என்ற ஒரேயொரு காரணத்துக்காக அவர்களது அடிப்படை உரிமைகள் பல்வேறு கோணங்களிலே மீறப்படுகின்ற நிலைமை இந்த நாட்டில் காணப்படுகின்றது. முஸ்லிம்களில் தகுதிவாய்ந்த உத்தியோகத்தர்கள் இருந்தும், முஸ்லிம் என்பதற்காக அவர்களில் ஒருவரையாவது மாவட்டச் செயலாளராக நியமிக்க வக்கில்லாத, தைரியமில்லாத அரசாங்கமாகவே நாங்கள் இந்த அரசாங்கத்தைப் பார்க்கின்றோம்.

அது மாத்திரமல்ல. மத்திய பொதுச் சேவை ஆணைக் குழுவினால் விசேட தரமுடைய SLAS அதிகாரியொருவர் கிழக்கு மாகாணப் பொதுச்சேவை ஆணைக்குழுவிற்கு நியமிக்கப்பட்டபோதும், அவருக்குரிய சரியான - தகுதியான பதவி 2 மாதங்களாக மறுக்கப்பட்டு, அவரைவிடத் தகுதி குறைந்த அதாவது தரம் 3 ஐச் சேர்ந்த ஒரு கனிஷ்ட அதிகாரிக்கு அந்தக் கிழக்கு மாகாணப் பொதுச் சேவை ஆணைக்குழுச் செயலாளர் பதவி வழங்கப்பட்டிருக் கின்றது. அதாவது திருமதி ஜலீல் என்ற விசேட தகுதியுடைய ஓர் அதிகாரிக்குச் சம்பந்தப்பட்டவர்கள் 2 மாத காலமாக அந்தப் பதவியை வழங்காமல், அவரைத் தனிமைப்படுத்தி மிக மோசமாக நடத்தியிருக்கின்றார்கள். அவருக்குத் தகுதியும் உரிமையும் இருந்தும், குறித்த ஒரு சிறுபான்மை இனத்தைச் சேர்ந்தவர் அவர் என்ற அடிப்படையில் அவருக்கு அந்தப் பதவி மறுக்கப்பட்டிருக்கின்றது.

மேலும், எங்களுடைய மக்களின் காணிகளுக்கு உரிமைப்பத்திரங்கள் இருந்தபோதிலும் அந்தக் காணிகளில் வேளாண்மைச் செய்வதற்கான அனுமதி சிறுபான்மை இனத்தினர் என்ற காரணத்தினால் அவர்களுக்கு மறுக்கப் பட்டிருக்கின்றது. இந்தச் சூழலிலேயே இந்த அரசாங்கத்தில் மூன்று வருடங்களாகக் காலங்களையும் நேரங்களையும் நாங்கள் செலவழித்துக் கொண்டிருக்கின்றோம். இதற்கும் அப்பால் இந்த அரசாங்கம், "நல்லாட்சி அரசாங்கம்" என்று நாங்கள் தம்பட்டம் அடித்துக் கொண்டிருக்கின்றோம். ஆனால், அரசாங்கத்திடம் நல்லாட்சிக்கான எந்தத் தகுதியுமில்லை என்று சொல்வதற்கு நான் கூசவில்லை என்பதை இந்தச் சபையிலே தைரியமாகக் கூற விளைகின்றேன். ஆகவே, எஞ்சியிருக்கும் காலத்திற்குள் இந்த ஆட்சி 'நல்லாட்சி' என்று உறுதி செய்யப்பட வேண்டுமாக இருந்தால், முஸ்லிம்களின் மீறப்பட்ட அடிப்படை உரிமைகள் மற்றும் காணி உரிமைகள் வழங்கப்பட வேண்டும். ஆகவே, முஸ்லிம்கள் எதிர்நோக் கியிருக்கின்ற அதிலும் குறிப்பாக அம்பாறை மாவட்ட முஸ்லிம்கள் சந்தித்துக்கொண்டிருக்கின்ற சகல காணிப் பிரச்சினைகளையும் இந்த அரசாங்கம் மிகத் துரிதமாகத் தீர்த்துத் தரவேண்டுமென்று விண்ணப்பம் செய்கின்றேன்.

	(ආ)	පදනමේ යම් සේවා නියුක්තිකයකු හෝ කළමනාකරුවකු, විසින් සිදු කරන ලද හෝ සිදු කිරීම පැහැර හරින ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් වන සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී මේ පනත යටතේ හෝ මේ පනත යටතේ නිකුත් කරන ලද හෝ සාදන ලද යම් නියමයක්, රීතියක්, නියෝගයක් හෝ විධානයක් යටතේ වන සිය වගකීම ඉටු කිරීමේ දී හෝ ඉටු කිරීමට අදහස් කිරීමේ දී හෝ ඒ සම්බන්ධිතව නිසි උද්‍යෝගය සහ සාධාරණ සැලකිල්ල ක්‍රියාත්මක කළ බවට සහ සද්භාවයෙන් කටයුතු කළ බවට ඔහු විසින් ඔප්පු කරන්නේ නම්, එය විත්තිවාචකයක් විය යුතු ය.' ";

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තිරුත්තම් විටුක්කප්පට්ටු එර්රුක්කොළ්ළප්පට්ටතු.
Amendment put, and agreed to.

20 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

20ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෙයිටප්පට්ටතු.

Clause 20, as amended, ordered to stand part of the Bill.

21 සහ 22 වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.

21ආම්, 22ආම් වාසකඞ්කළ් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.

Clauses 21 and 22 ordered to stand part of the Bill.

23 වන වගන්තිය.- (පදනමේ සාමාජිකයන්, නිලධරයන් සහ සේවා නියුක්තිකයන් රාජ්‍ය නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව.)

வாசகம் 23.- (மன்றத்தின் உறுப்பினர்கள், அலுவலர்கள் மற்றும் ஊழியர்கள் பகிரங்க சேவையாளர்களாகக் கருதப்படுதல்.)

CLAUSE 23.- (*Members, Officers and employees of the Foundation deemed to be public servants*.)

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"13 වන පිටුවේ, 18 වන පේළිය ඉවත්කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

'සහ සියලු නිලධරයන් සහ සේවා නියුක්තකයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ' ";

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

23 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

23ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.

Clause 23, as amended, ordered to stand part of the Bill.

24 සිට 26 තෙක් වගන්ති පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

24ආම් වාසකත්තිලිරුන්තු 26ආම් වාසකම් වරෛ සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.

Clauses 24 to 26 ordered to stand part of the Bill.

27 වන වගන්තිය.- (අර්ථ නිරූපණය).

வாசகம் 27.- (பொருள்கோடல்.)

CLAUSE 27.- (*Interpretation*.)

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"17 වන පිටුවේ, 32 වන පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

" 'සුව සත්කාර සපයන්නා' යන්නට යම් රෝගීභාවයකින්,' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

27 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

27ආම් වාසකම් තිරුත්තප්පට්ටවාරු සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.

Clause 27, as amended, ordered to stand part of the Bill.

28 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

28ආම් වාසකම් සට්ටමූලත්තින් පකුතියාක ඉරුක්ක වේණ්ටුමෙනක් කට්ටළෛයිටප්පට්ටතු.

Clause 28, ordered to stand part of the Bill.

පූර්විකාව

பாயிரம்

PREAMBLE

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"1 වන පිටුවේ, 14 වන පේළිය ඉවත් කර පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-

"පිහිටුවීමට සහ එකී පදනමෙහි බලතල, කර්තව්‍ය සහ කාර්ය නිශ්චිතව; "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.

Amendment put, and agreed to.

පූර්විකාව සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

பாயிரம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

Preamble, as amended, ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.

පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.

சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.

Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිමි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.

வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.

Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

සුරාබදු ආඥාපනත : නිවේදනය
மதுவரிக் கட்டளைச் சட்டம்: அறிவித்தல்
EXCISE ORDINANCE: NOTIFICATION

I

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 අප්‍රේල් 09 දිනැති අංක 2066/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.05 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 08/2018 දරන සුරාබදු නිවේදනය)
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"සුරාබදු ආඥාපනතේ (52 අධිකාරය වූ) 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2018 අප්‍රේල් 06 දිනැති අංක 2065/57 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.05 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 09/2018 දරන සුරාබදු නිවේදනය)
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආනයන හා අපනයන (පාලන) පනත : නියෝග
இறக்குமதிகள் மற்றும் ஏற்றுமதிகள் (கட்டுப்பாட்டுச்) சட்டம்: ஒழுங்குவிதிகள்
IMPORTS AND EXPORTS (CONTROL) ACT : REGULATIONS

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1985 අංක 48 දරන හා 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(3) වගන්තිය සහ 14 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 20 වගන්තිය යටතේ 2017 ආනයන හා අපනයන පාලන (ප්‍රමිතිකරණ හා තත්ත්ව පාලන) නියෝග සම්බන්ධයෙන් සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මාර්තු 29 දිනැති අංක 2064/34 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.05.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සභාව කල් තැබීම, ගරු සභානායකතුමා.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සභාව කල් තැබීමේ යෝජනාව, ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා.

වන වගාව සඳහා කාබන් අරමුදලෙන් දීමනාවක් ලබා ගැනීම
காபன் நிதியத்தின்மூலம் வனச் செய்கைக்கான கொடுப்பனவொன்றைப் பெற்றுக்கொள்ளல்
GRANT FROM CARBON FUND FOR FORESTATION

[පූ.භා. 6.26]

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීමට මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා. ඒ අනුව මා මෙම යෝජනාව ඉදිරිපත් කරනවා:

"කියොතෝ සම්මුතිය අනුව හරිතාගාර වායු විමෝචන අඩු කිරීමේ වැඩ පිළිවෙළ සඳහා කාබන් අරමුදලක් සහ ලෝක බැංකුව විසින් අරමුදල් කීපයක් නිර්මාණය කර ඇත.

මෙම කාබන් අරමුදල මඟින් හරිතාගාර වායු විමෝචනය අඩු කිරීම සහ විමෝචනය වූ වායුන් අඩු කිරීම සඳහා ගෙවීම් කරයි.

අප රටට ද, තිබෙන වනාන්තර හා අලුතින් වන වගා කිරීම තුළින් කාබන්ඩයොක්සයිඩ් ප්‍රතිශතය අඩුකරලීමට දක්වන දායකත්වය අනුව, ඉහත කී කාබන් අරමුදලින් දීමනා ලබා ගත හැකි වේ.

මේ සඳහා, වන වගාව කෙරෙහි ජනතාවගේ උනන්දුව ඇති කෙරෙන හෙයින්, ඔවුන්ට ප්‍රතිලාභ ද ලැබෙන වැඩ පිළිවෙළක් ඇති කිරීම සුදුසු යැයි මෙම ගරු සභාවට යෝජනා කර සිටිමි."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ලෝක බැංකු ආධාරවලින් පමණක් නොවෙයි, කාබන් අරමුදලිනුත් වන වගාවන් සඳහා රටවලට මුදල් ලබා දෙන බව අප දන්නවා. මේ සඳහා අපේ රටේ යම් කිසි සැලැස්මක් තිබෙනවාද කියලා අපේ පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමාගෙන් දැනගන්න කැමැතියි. ඒ වෙනුවෙන් වනාන්තර සිතියම් ගත කර තිබෙනවාද, එසේ සිතියම් ගත කර නොමැති නම් ඒකට හේතු මොනවාද කියලා. වනාන්තර සිතියම් ගත කර නැත්නම්, ඒවා සිතියම් කර ගත යුතුයි. ඒ තුළින් යම් කිසි වැඩ පිළිවෙළක් නිර්මාණය කර, ඒ සඳහා අවශ්‍ය කරන අරමුදල් ලබා ගෙන වනාන්තර දියුණු කර, රටේ පවතින කාලගුණ විපර්යාසයන් අවම කරන්න අපට පුළුවන් වනවා.

ඒ වාගේම, ලංකාවේ වන වගාවේ සාර්ථකත්වය දෙසත් අප බැලිය යුතුයි. තිරසර සංවර්ධන අරමුණු කරා අපි යනකොට, එහි පහළොස්වන අරමුණ තමයි "ජීවීන් සහ ගොඩබිම". අපේ රටේ බිම් ප්‍රමාණයෙන් සියයට 29ක් අද වන වැස්ම - forest cover එක තිබෙනවා. හැබැයි අපේ ඉලක්කය වන්නේ, 2030 වසර වන විට මේ රටේ බිම් ප්‍රමාණයෙන් සියයට 35ක් වනාන්තර ඇති කිරීමයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම කර්තව්‍යය ඉටු කර ගැනීම සඳහා අමාත්‍යාංශය තුළින් ගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද කියලා අපි ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි. අමාත්‍යාංශ කිහිපයක් තිබෙනවා. කෘෂිකර්ම අමාත්‍යාංශය තිබෙනවා; ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය තිබෙනවා. අපි දැකලා තිබෙනවා, මේ අමාත්‍යාංශ හරහා සුළු පරිමාණ ගොවීන්ට, එහෙම නැත්නම් අඩු ආදායම්ලාභීන්ට පැළ බෙදා දෙනවා; අඹ පැළ බෙදා දෙනවා; කොස් පැළ බෙදා දෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පැළ බෙදා දුන්නාට කිසිම පසු විපරමක් වෙන්නේ නැහැ. කිසිම ආයතනයකින් ඒ ගැන සොයා බැලීමක් වෙන්නේ නැහැ. ඒ නිසා මේ තුළින් විශාල හානියක් සිදු වෙනවා. ආර්ථිකමය වශයෙනුත් ලොකු හානියක් සිදු වෙනවා. මොකද, ඒ පැළ එච්චර ලාභ නැහැ, ගණන්. මේ සඳහා පසු විපරම් වැඩ පිළිවෙළක් ඉදිරියට ගෙන ගියොත්, අපේ වන වගාවන් සාර්ථක කර ගන්න පුළුවන්. අද වනාන්තර ඇති කරන්න, වන වගා කරන්න අතහිත දෙන, ආර්ථික වශයෙන් අවශ්‍ය සම්පත් ලබා දෙන අන්තර්ජාතික සමාගම් තිබෙනවා. එම අන්තර්ජාතික සමාගම් එක්ක කථා කරලා තිබෙනවාද? එම අන්තර් ජාතික සමාගම් එක්ක කථා කරලා, මේ වන වගාව ඉදිරියට ගෙන යන්න පුළුවන්. ආණ්ඩුව පමණක් නොවෙයි, ඒ සඳහා මහජනතාවත් එකතු කරගෙන, මහජනතාවට ඒ තුළින් යම් කිසි ලාභයක් ලැබෙන ක්‍රමවේදයක් හදනවා නම් එය ආර්ථික වශයෙන් විශාල ලෙස සාධාරණීකරණය කරන්න පුළුවන් වෙනවා. ඒක තමයි වැදගත්ම දේ. ජනතාවට ප්‍රතිලාභ ලැබුණොත් පමණයි අපි මේ කරන කර්තව්‍යය සාර්ථක වෙන්නේ .

අද ගස් කැපීම, පරිසර දූෂණය වැනි දේවල් සිදු වෙන බව අපි දන්නවා. විවිධ හේතු නිසා පරිසරය දූෂණය සිදු වෙනවා. පරිසර දූෂණය නිසා අද කාලගුණය වෙනස් වෙලා තිබෙනවා. ඉදිරි අනාගතයේ දී අපි මේ රට අපේ දරුවන්ට භාර දිය යුතුයි. නීල හරිත පරිසරයක් ගොඩ නඟන්න නම්, අපි සියලු දෙනාම ඒ අනුව කටයුතු කළ යුතුයි. ඒකට විශේෂයෙන්ම බලපාන්නේ වන වගාවයි. වන වගාව තුළින් අපේ රටේ තිබෙන මේ වායු ප්‍රශ්නය විසඳලා, හොඳ පරිසරයක ජීවත් වෙන්න පුළුවන් තත්ත්වයක් ඇති කරන්න පුළුවන්. මොකද, තිරසර සංවර්ධන අරමුණු කරා යන්න නම්, අපේ මේ පරිසරය -ගොඩබිම වේවා, අනෙකුත් පරිසර පද්ධති වේවා- ආරක්ෂා කර ගැනීම ඉතා වැදගත් වෙනවා. ඒ සඳහා ගෙන තිබෙන ක්‍රියාමාර්ග මොනවාද, පරිසර අමාත්‍යාංශය මොන විධියටද ඒවා ක්‍රියාත්මක කරන්නේ කියලා අපි ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් දැන ගන්න කැමැතියි. කනගාටුවෙන් වුණත් අපි කියන්න ඕනෑ, මධ්‍යම පරිසර අධිකාරියේ, එහෙම නැත්නම් භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයේ ඉන්න නිලධාරීන් ඒ ක්‍රියා සීමා කරලා තිබෙන්නේ බලපත්‍රයකට පමණයි. පසු විපරම් මොනවත් කරන්නේ නැහැ. මා නියෝජනය කරන රඹුක්කන ආසනයේ "මා ඔය" කියන්නේ ඉතා වැදගත් ඔයක්. එහි තනිකර වැලි ගොඩ දමනවා; වටේම තිබෙන ගස් ටික කපනවා; හොරෙන් ගස් පටවනවා. වටේටම ඒ දේවල් සිදු වෙනවා. මා හිතන විධියට අද තිබෙන දූෂිතම ආයතනයක් තමයි වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව. ඒ ගැනත් සොයා බලන්න කියලා ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මා කාරුණිකව ඉල්ලා සිටිනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, යෝජනාව ස්ථිර කිරීම, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා.

[අ.භා. 6.32]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහොම දුර්ලභ ගණයේ යෝජනාවක් තමයි අද මේ අවස්ථාවේ දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ පිළිබඳව මා ඉතාමත් සතුටු වෙනවා.

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

පරිසරයට ආදරය කරන, පරිසරය සුරක්ෂිත කිරීමට ඉතාම කැපවීමෙන් කටයුතු කරන ආණ්ඩුවක් විධියට තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයත් එක්කර ගනිමින්, මේ රටේ භූගෝලීය වෙනස්කම් හා පරිසර වෙනස්කම්වලට අනුකූල වන ලෙස අප නොයෙකුත් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කරන වෙලාවක, ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් ලද මෙම යෝජනාව මා ස්ථීර කරනවා. "කියොතෝ" සම්මුතිය අනුව හරිතාගාර වායු විමෝචන අඩු කිරීමේ වැඩ පිළිවෙළ සඳහා කාබන් අරමුදලක් සහ ලෝක බැංකුව විසින් තවත් අරමුදල් කිහිපයක් නිර්මාණය කර ඇති බව එතුමා තම යෝජනාවේ සඳහන් කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද ලෝකයේ විවිධ රටවල සිදු වන පරිසර දූෂණයන් දිහා බලන්න. ඇමෙරිකා එක්සත් ජනපදයේ චිකාගෝ නගරයේ පරිසරය දැඩි ලෙස දූෂිත වෙලා තිබුණා. ඒ වාගේම චිකාගෝ නගරය තුළ තිබුණු පරිසරයට අහිතකර වායූන්, තෙල් වර්ග, විවිධ අපද්‍රව්‍ය ආදී සියල්ල මුහුදට මුදා හැර තිබුණා. එමඟින් ඒ මුහුදු තීරය සම්පූර්ණයෙන්ම දූෂණය වුණා. අද ඒ සියල්ල වෙනස් කර, පරිසර හිතකාමී දේ නිර්මාණය කිරීමට අවශ්‍ය කටයුතු කරනවා. අද ලෝකයේ පරිසරයත් එක්ක ජීවත් වන රටවල -විශේෂයෙන් ශ්‍රී ලංකාව වැනි රටවල- පවතින අලංකාරය, පරිසර හිතකාමිත්වය ආරක්ෂා කර ගැනීමට විදේශ ආධාර පවා ලබාදෙන්න කටයුතු කරනවා.

පසුගිය කාලයේ අතිගරු ජනාධිපතිතුමා සමඟ අප එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සම්මේලනයකට සහභාගි වුණා. මෙම සම්මේලනය වැඩි අවධානය යොමු කර තිබුණේ පරිසර හිතකාමී රටක්, පරිසර හිතකාමී ලෝකයක් නිර්මාණය කිරීම කෙරෙහියි. බොහෝ රටවල ජනාධිපතිවරු, අගමැතිවරු, උප ජනාධිපතිවරු, බොහෝ නියෝජිතයන් මේ සම්මේලනයේදී කිව්වේ තමන්ගේ රට තුළ පරිසර හිතකාමී යම් කිසි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න කියායි. අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ, අද විවිධ අමාත්‍යාංශ යටතේ -ගරු දයා ගමගේ ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ වෙන්න පුළුවන්.- වගා සංග්‍රාමයක් හැටියට ක්‍රියාත්මක වන අලුත් වැඩ පිළිවෙළවලට නොයෙක් බෝග, පැළෑටි වැනි දේවල් ලබාදෙන ආකාරය අපි දැක්කා. ඒ වාගේම, අපනයන කෘෂි කර්මාන්තය මඟින් මේ රටේ පරිසරය ආරක්ෂා කරනවා වාගේම, නීල හරිත පරිසරයක් නිර්මාණය කරනවා වාගේම, මේ රටේ මිනිසුන්ට යම් ප්‍රතිලාභයක්, යම් කිසි වටිනාකමක් ලබාදීමේ හැකියාවක් අපට තිබෙනවා.

කොස් ගස් විශාල සංඛ්‍යාවක් වගා කිරීමේ වැඩ පිළිවෙළට අද කෘෂිකර්ම අමාත්‍යාංශය මුල් වී සිටිනවා. ඒ අනුව කොස් පැළ කෝටියක් වගා කිරීම සහ පලතුරු පැළ දසකෝටියක් වගා කිරීම වැනි වැඩ පිළිවෙළවල් තිබෙනවා. පරිසර හිතකාමී සමාජයක් ගොඩ නැඟීමේ කාර්යය දෙස බලන විට, ආයතනවලට, දෙපාර්තමේන්තුවලට පමණක් සීමා වුණු, එක්තරා දේවල්වලට පමණක් කොටු වුණු කණ්ඩායමක් විතරයි අපට දකින්නට ලැබෙන්නේ. පසුගිය අවුරුදු 3 1/2ක කාලය තුළ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවල සම සභාපතිවරු විධියට කටයුතු කරද්දී අපි ඒ දේවල් දැක්කා. පරිසරයට ආවේණික වුණු යම් යම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට, පරිසර හිතකාමී රටක් බිහි කිරීමට අතිගරු ජනාධිපතිතුමා වෙනම මුදලක් වැය කර තිබෙනවා. එතුමාගේ අමාත්‍යාංශය යටතේ අද හොඳ නියෝජ්‍ය ඇමතිවරයෙක් පත්වී සිටිනවා. අපේ ගරු අජිත් මාන්නප්පෙරුම මැතිතුමා තමයි පරිසර අමාත්‍යාංශයේ නව නියෝජ්‍ය අමාත්‍යවරයා වශයෙන් පත් වුණේ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම හිතන විධියට ඔබතුමාට මේ වෙනුවෙන් විශාල වැඩකොටසක් කරන්න තිබෙනවා. බොහෝ අය අද අපේ පරිසරය දූෂණය කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය කාලයේ නොයෙක් චෝදනා කළා; වැලි ටිකක්, පස් ටිකක් ප්‍රවාහනය කරනකොට, "ගෙපළක් කපලා අඩිතාලම දැම්මාම, ඒක පුරවන්න දැන් අපිට පස් ටිකක් ගෙනියන්න බැහැ, නිවසක් ඉදි කිරීමට වැලි ටිකක් ගෙනයන්න බැහැ" කියා කිව්වා. හැබැයි පසුගිය කාලය තුළ අප වියදම් කළ මුදල් ප්‍රමාණය ගැන මම දන්නවා. පසුගිය දවස්වල ගංවතුර ආධාර වශයෙන් ගාල්ල දිස්ත්‍රික්කයට පමණක් රුපියල් කෝටි 43ක් වැය කිරීමට අපට සිදු වුණා. අධික වර්ෂාව නිසා අහිංසක මිනිසුන්ගේ ගෙවල් දොරවල් විනාශ වෙලා, නාය ගිහින්, වගාවන් වැස්සට සේදිලා ගිහින් ආර්ථිකය සම්පූර්ණයෙන් කඩා වැටිලා තිබුණා. ව්‍යාපාරික ස්ථානවලට හානි වෙලා තිබුණා. අපි ආණ්ඩුව විධියට ඒ වෙනුවෙන් ගාල්ල දිස්ත්‍රික්කයට පමණක් රුපියල් කෝටි 43ක මුදලක් වෙන් කළා.

ලංකාවේ හැම තැනම මෙවැනි දේවල් සිද්ධ වනවා. ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා ජාත්‍යන්තරයේ නොයෙකුත් රටවලට ගිහින් අත් දැකීම් ලබපු කෙනෙක්. ඒ නිසා අපි දන්නවා, එතුමාට මේ පිළිබඳව හොඳ අවබෝධයක් තිබෙන බව. එතුමා පරිසරයට ආදරය කරන කෙනෙක්. එතුමා සිටින රඹුක්කන ප්‍රදේශයේ වන සතුන් සිටිනවා. එතුමා අලි ඇතුන් පිළිබඳව විශේෂ උනන්දුවක් දක්වනවා. මම හිතන හැටියට ඔබතුමා තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රීවරයෙක්. මම හරි නේද, ගරු මන්ත්‍රීතුමනි?

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
ඔව්.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
එතුමා එම අමාත්‍යාංශයේ අධීක්ෂණ මන්ත්‍රීවරයෙක් ලෙසත් පත් වෙලා තිබෙනවා. එතුමා එම ක්ෂේත්‍රයට ලොකු ආදරයක් දක්වන කෙනෙක් බව අපට එයින්ම පෙනෙනවා.

"පරිසරය" කියන විෂයය තිබෙන්නේ අතිගරු ජනාධිපතිතුමා යටතේයි. එතුමාට විශාල වැඩ කොටසක් පැවරී තිබෙනවා; ඒ නිසාම අවිවේකී බවක් තිබෙනවා. ගරු අජිත් මාන්නප්පෙරුම මැතිතුමනි, ඒ නිසා ඔබතුමා මේ කටයුත්තට තෝරාගෙන තිබෙන්නේ මේ රටේ අස්සක් මුල්ලක් නෑර ගිහින්, පරිසරය සම්බන්ධයෙන් සිදුවන දේවල් ගැන සොයා බලා කටයුතු කරන්නයි. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා අලින් ගැන සොයා බලන්න යනවා වාගේ, -මම හිතන විධියට එතුමන්ලා පසු ගිය කාලයේ කාර්යාලයකට වෙලා ඉඳලා නැහැ, රට වටා ගිහින්, ඒ සම්බන්ධයෙන් සොයා බලා, වනාන්තරවලට ගිහින්, වනජීවීන් ආරක්ෂා කරන්න වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා වාගේ; ඒ සතුන්ගෙන් වන අහිතකර බලපෑම්, අමානුෂික තත්ත්වයන් වෙනස් කරන්නත් වැඩ කටයුතු කරනවා වාගේ- මේ රටේ හැම පැත්තකටම ගිහින් -මධ්‍යම කඳුකරයේ වෙන්න පුළුවන්; මොනරාගල දිස්ත්‍රික්කයේ වෙන්න පුළුවන්; දකුණු පළාතේ වෙන්න පුළුවන්; උතුර නැඟෙනහිර වෙන්න පුළුවන්; වෙනත් ප්‍රදේශ වෙන්න පුළුවන්- ප්‍රායෝගික අත් දැකීමක් ලබන්න කියා අපි ඔබතුමාටත් කියනවා. සමහර වෙලාවට වනාන්තර විනාශ කරන, පාරිසරික තත්ත්වයන් විකෘති කරන නොයෙකුත් විධියේ වැඩ පිළිවෙළවල් මේ රට තුළ ක්‍රියාත්මක වනවා. ඒවාට අත් උදව් දෙන අයත් ඉන්නවා. ඒ නිසා විශේෂයෙන්ම නිලධාරීන් වැඩකටයුතු කරන ආකාරය බලන්න; ඔවුන් ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව සොයන්න; වැරැදි කරන නිලධාරීන්ට නිසි දඬුවම් දෙන්න ක්‍රියා කරන්න කියා අප ඔබතුමාට කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව නැවත වරක් ස්ථිර කරන අතරේ, මේ කටයුත්ත සාර්ථක කර ගන්න රජයේ සම්පූර්ණ අවධානය යොමු කරන ලෙස ඉල්ලමින්, අතිගරු ජනාධිපතිතුමාටත්, අද මේ අවස්ථාවේ මේ ගරු සභාවේ සිටින ගරු නියෝජ්‍ය අමාත්‍යතුමාටත් ඒ සඳහා අවශ්‍ය ශක්තිය හා ධෛර්යය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු මයිල්වාගනම් තිලකරාජා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[ප.ව. 6.40]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(මාණ්පුමිකු මයිල්වාකනම් තිලකරාජා)
(The Hon. Mylvaganam Thilakarajah)
කෞරව සභාපතිතුමනි, ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා අද ඉදිරිපත් කර තිබෙන යෝජනාව වැදගත් වන්නේ මොකද්? පරිසරය රැක ගන්නට නම් ගස්-වැල් සිටුවිය යුතුයි. නමුත්, මොනවාද වෙන්නේ? මා නියෝජනය කරන පළාතේ තේ වතුවල ඒ කාලයේ සිටුවා තිබෙනවා ගොඩක් ගස් වර්ග. දැන් "RPC" කියන කොම්පැනි යටතේ පවත්වාගෙන යන වැවිලි ක්ෂේත්‍රයේ දළු කඩනවාට වඩා, රබර් ගස් කපා කිරි ගන්නවාට වඩා කරන්නේ වෙනත් දෙයක්. කළුතර දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය අමාත්‍යතුමාත් දැන් ගරු සභාවේ ඉන්නවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, දැන් ගස් කපන එක තමයි ලොකු ව්‍යාපෘතියක් හැටියට කරගෙන යන්නේ. මාතලේ, කළුතර දිස්ත්‍රික්ක ගිහිල්ලා බලන්න. විශේෂයෙන්ම මාතලේ දිස්ත්‍රික්කයේ . මා මාතලේ දිස්ත්‍රික්කය නියෝජනය කරන්නේ නැහැ. නමුත්, මාතලේ ගැන මා දන්නවා. ගොඩක් අය ආදායම් උපයා ගන්නේ ගස් කපලා. තේ වවලා නොවෙයි; රබර් වවලා නොවෙයි. ගස් කැපීම තමයි කරන්නේ.

පෙරුන්තෝට්ටක් කෛත්තොෂිලෛප් පාදුකාප්පදර්කාකවුම් අදිලිරුන්දු ආදායම් - වරුමානම් පෙරුවදර්කාකවුම්දාන් අන්දත් තොෂිර්රුරෛ කෛයාළප්පට්ටු වරුකින්රදු. ආනාල්, අන්දක් කෛත්තොෂිල් පිරාන්දියක් කම්පනිකළිඩම් ඔප්පඩෛක් කප්පට්ටදන් පින්නර් - 1992ක්කු පින්නර්, පෙරුන්තෝට්ටත් තුරෛයින් පිරදාන අංගංගළාග ඉරුක්කක්කූඩිය තේයිලෛ, ඉරප්පර් පෝන්ර තුරෛකළ් වීළ්ච්චියඩෛන්ද නිලෛයිල්, අන්දක් කම්පනිකළ් ඉලාපත්තෛප් පෙර්රුක්කොළ්වදර්කාග අංගිරුන්ද මරංකළෛ වෙට්ටුවදෛප් පිරදාන විඩයමාගක් කොණ්ඩු සෙයර්පට්ටන.

එක ගහක් කපනකොට තේ ගස් 100ක්, 200ක් විනාශ වනවා. ප්‍රධාන කර්මාන්තය තේ. නමුත්, ගස් කපලා ආදායම් උපයා ගන්න ගිහිල්ලා තේ ගස් 20ක් මරනවා. මෙය පරිසරයට විතරක් නොවෙයි, අපේ ආර්ථිකයටත් බලපාන ප්‍රශ්නයක් වනවා.

මරංකළ් වෙට්ටප්පටුවදනාල් සූළල් පාදිප්පටෛවදු මාත්තිරමල්ලාමල්, තේයිලෛච් සෙඩිකළෛ ඉළප්පදනාලුම් නාංගළ් පොරුළාදාරත්තෛ ඉළක්කින්රෝම්. එනවේ, ඉදර්කු මාර්රීටාග මරංකළෛ නටුවදෛ ඉලක්කාගක්කොණ්ඩු සෙයර්පට වේණ්ටුම්. අන්ද විඩයම් නිලෛපේරාන අපිවිරුත්දි නිකළ්ච්චිනිරලිලුම් කාණප්පටුකින්රදු එන්ර අඩිප්පටෛයිල් ඉන්ද විඩයම් මික මුක්කියමානදාගුම්.

ඉප්පොළුදු නාටෙංකිලුම් hoardings - විළම්බරප් පලකෛකළ් නිරුවප්පටුවදෛ නාංගළ් පාර්ක්කින්රෝම්. රටේ හැම තැනම hoardings ගහනවා, පරිසරය රැක ගැනීම සඳහා. එහෙම නැත්නම් අපිට බොන්න වතුර නැති වේවි. ඒක තමයි ඇත්ත. අනාගතයේ වෙන්නේ ඒක තමයි. දැනටමත් අපිට මුදල් ගෙවා බෝතල් කළ වතුර ලබා ගෙන බොන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ වතුර බෝතලයක් රුපියල් 50ක් විතර වෙනවා. අපි බොන්නේ වතුර. අපි පරිසරය රැක ගත්තේ නැත්නම්, අනාගතයේදී අපට මේ වතුර ටිකටත් රත්තරන් වාගේ වටිනා මිල ගණන් ගෙවන්න සිද්ධ වෙයි.

එනවේ, කෞරව පාරාළුමන්ර උරුප්පිනර් අවර්කළ් මුන්වෛත්තිරුක්කුම් ඉන්ද යෝසනෛයෛ ඉන්ද සපෛයිලේ නාන් වළිමොළින්දු, මරම් වළර්ත්තල්, සූළලෛප් පාදුකාත්තල් නිකළ්ච්චිත් තිට්ටත්තෛ මුක්කිය පොරුප්පාගක් කරුදිච් සෙයර්පට වේණ්ටුම් එන්පදෛ වලියුරුත්දි, වාය්ප්පුක්කු නන්රිකූරි, විටෛපෙරුකින්රේන්. වණක්කම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සභානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මැතිතුමා. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලබා දී තිබෙනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(මාණ්පුමිකු අජිත් පී. පෙරේරා)
(The Hon. Ajith P. Perera)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

The term, “Sustainable Development” means if we lose our environment, our development will not be sustainable. This concept arose in 1990s but only from 2015, Sri Lanka had Sustainable Development Goals 2030.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථා කරනවාද?

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඔව්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ නම මට ලබාදුන් speakers' list එකේ නම් තිබුණේ නැහැ. ඒකට කමක් නැහැ. ගරු අජිත් පී. පෙරේරා මැතිතුමනි, ඔබතුමා කථා කරන්න.

[අ.භා.6.45]

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා අද දින සභාව කල් තබන අවස්ථාවේ ගෙනා මෙම යෝජනාව, ඉතාම වටිනා යෝජනාවක්. මේ කාරණය පිළිබඳව බොහොම හොඳින් හිතලා, ගැඹුරින් කල්පනා කරලා මෙම යෝජනාව ඉදිරිපත් කිරීම ගැන අපි ගරු මන්ත්‍රීතුමාට මේ අවස්ථාවේ ස්තුතිවන්ත වෙනවා.

ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමා මෙම යෝජනාව තුළින් ඉදිරිපත් කළ කාරණය පිළිබඳ වගකීම සහිත අමාත්‍යාංශ තුනක් මේ රටේ තිබෙනවා. ඒවා නම්, පරිසර අමාත්‍යාංශය, තිරසර සංවර්ධන අමාත්‍යාංශය හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයයි. අපේ රටේ පරිසරය විනාශ වන ක්‍රම කිහිපයක් තිබෙනවා. අපේ රටේ පරිසරය විනාශ කිරීමට වැඩියෙන්ම දායක වන අහිතකර වායු විමෝචනය කරන්නේ ප්‍රවාහන ක්ෂේත්‍රයයි. ගෝලීය උෂ්ණත්වය වැඩි කිරීමටත්, දේශීය කාලගුණික තත්ත්වය වෙනස් කිරීමටත් වැඩියෙන්ම දායක වන්නේ ප්‍රවාහන ක්ෂේත්‍රයයි. ගණන් හදා බලා තිබෙන විධියට සියයට 60ක පමණ ප්‍රමාණයකින් එය සිදුවෙනවා. ඒ වාගේම, දේශීය පරිසරය දූෂණය කිරීමට දායක වෙන ක්ෂේත්‍ර දෙකෙන් දෙවනුවට වැඩිම බලපෑමක් සිදු කරන්නේ එනම්, සියයට 40ක පමණ ප්‍රමාණයකින් බලපෑමක් සිදු කරන්නේ විදුලිබල ක්ෂේත්‍රයයි. අපේ රටේ අද ඩීසල් භාවිතයෙන් විශාල ප්‍රමාණයක් විදුලිය උත්පාදනය කරනවා. ඒ වාගේම ගල් අඟුරුවලින් විශාල ප්‍රමාණයක් විදුලිය උත්පාදනය කරනවා. මෙගාවොට් 900ක ධාරිතාවකින් යුත් නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරය, ඒ වාගේම මෙගාවොට් 700ක පමණ ධාරිතාවකින් යුත් ඩීසල් බලාගාර මේ රට පුරාම ක්‍රියාත්මක වෙනවා.

අපේ රටේ තවම ද්‍රවිකෘත ස්වාභාවික වායු -LNG- බලාගාර ක්‍රියාත්මක වන්නේ නැහැ. මොකද, අපිට ද්‍රවිකෘත ස්වාභාවික වායු ඇත්තේ නැහැ. ඒ වාගේම අපි දේශීයව වායු උකහා ගැනීමට තවම අසමත් වෙලා තිබෙනවා. හැබැයි, මේ පොසිල ඉන්ධන මොනවා දහනය කළත්, එයින් පරිසරය දූෂණය වෙනවා. මේ බලශක්ති ක්ෂේත්‍රයේදී අපිට තිබෙන අභියෝගය තමයි පරිසරයේ දූෂණය අවම කර ගැනීමට ඉවහල් වන ක්‍රියාමාර්ගවලට යොමු වෙන එක. නීලහරිත ආර්ථිකයක් පිළිබඳව විශ්වාස කරන අපේ ආණ්ඩුව, නීලහරිත අය වැයක් පසුගිය වසරේ ඉදිරිපත් කරපු අපේ ආණ්ඩුව එම අය වැයෙන් පමණක් නොවෙයි, ඊට කලින් ඉදිරිපත් කළ අය වැය මඟින් පවා පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීමට විශාල වැඩ පිළිවෙළක් දියත් කරලා තිබෙනවා. අපි සූර්ය බලය, සුළං බලය ඇතුළු පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රවල තිබෙන බදු සියල්ලම ඉවත් කරලා -zero tax කරලා- තිබෙනවා. විශාල වශයෙන් බදු පනවනවා කියලා අපිට චෝදනාවක් තිබෙනවා. නමුත් තිබෙන බදුත් ඉවත් කළ ක්ෂේත්‍රයක් තමයි පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය කියන්නේ. සූර්ය බලය, සුළං බලය, ජල විදුලිය වාගේම ජෛව ස්කන්ධ -biomass- යනාදී කිසිම ක්ෂේත්‍රයකට අදාළව ගෙන්වන කිසිම උපකරණයක් සඳහා අපි අද ආනයන බදු අය කරන්නේ නැහැ. ඒ වාගේම එම ව්‍යාපාරවලින් උපයන ලාභ තිබෙනවා නම්, එම ව්‍යාපාරවලින් උපයන ලාභ මත තිබුණු බද්ද සියයට 50කින් අඩු කළා. ඒ නිසා අපේ රටේ බදු ක්ෂේත්‍රයේ ප්‍රගතිශීලී වර්ධනයක් පෙන්නුම් කරපු, ජනතාව මත ඇති වුණු බර අඩු කරපු, පරිසර හිතකාමී ව්‍යාපාරිකයන් ශක්තිමත් කරපු ආණ්ඩුවක් වශයෙන් අපි මේ තත්ත්වය ගැන ආඩම්බර වෙනවා.

අද වෙනකොට අපේ රටේ සුළං බලය යොදා ගනිමින් මෙගාවොට් 126ක ධාරිතාවකින් විදුලිබලය උත්පාදනය කරනවා. ඒ වාගේම මෙගාවොට් 20ක බලාගාර ඉදිවෙමින් තිබෙනවා. ඒ වාගේම සූර්ය බලය යොදා ගනිමින් මෙගාවොට් 150ක ධාරිතාවකින් විදුලිබලය උත්පාදනය කරනවා. පසුගිය වසර දෙක තුළ පමණක් "සූර්යබල සංග්‍රාමය" කියන ඉතාම සාර්ථක ව්‍යාපෘතිය හරහා අපේ රටේ විදුලිබල පද්ධතියට මෙගාවොට් 100කට වැඩි ධාරිතාවක් එකතු කරලා තිබෙනවා, තවත් එකතු කරමින් තිබෙනවා.

මේ රටේ පරිසරය ආරක්ෂා කරන්න, ගෝලීය උෂ්ණත්වය අඩු කරන්න, ලෝකය කෙරෙහි තිබෙන අපේ දායකත්වය වාගේම රටේ පරිසරය ආරක්ෂා කරන්න අපේ රජය කටයුතු කර තිබෙනවාය කියන කාරණය ආඩම්බරයෙන් කියන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. සූර්ය බල ක්ෂේත්‍රයේ සහ සුළං බල ක්ෂේත්‍රයේ තිබුණු දූෂණ සම්පූර්ණයෙන්ම නැති කරලා, තරගකාරී ටෙන්ඩර් කාර්ය පටිපාටි හඳුන්වා දීම නිසා අපට පුළුවන් වුණා, මෙගාවොට් 60ක් ටෙන්ඩර් කරන්න. ඒ වාගේම මෙගාවොට් 1 බැගින් වූ සූර්ය බලාගාර 90ක් ටෙන්ඩර් කළා. එය සාර්ථකයි. මීලඟට ගැනීමේ මිල සියයට 50කින් අඩු වුණා. ඒ වාගේම මෙගාවොට් 10 බැගින් වූ බලාගාර දෙකක් ටෙන්ඩර් කළා. එය සාර්ථකයි. ලංකා විදුලිබල මණ්ඩලය පෞද්ගලික අංශයෙන් විදුලිය මිලදී ගැනීමේ මිල ඒකකයක් සඳහා රුපියල් 23.10 සිට රුපියල් 11.82 දක්වා අඩු කරන්න අපට පුළුවන්කම ලැබුණා. එය සියයට 50කටත් වඩා අඩුයි. කලින් තිබුණු දූෂිත බලපත්‍ර ක්‍රමය ඉවත් කළා. මේවායේ ප්‍රතිඵල ඉදිරියේදී ලැබෙනවා. ඊළඟ මාස කිහිපය තුළ සුළං බල විදුලිය සඳහා මෙගාවොට් 150ක ටෙන්ඩර් ගෙන එන බවත්, සූර්ය බල විදුලිය සඳහා තවත් මෙගාවොට් 150ක ටෙන්ඩර් ගෙන එන බවත් අපි බොහොම සතුටින් කියනවා. ඒ කියන්නේ එය ඩොලර් මිලියන 300ක පමණ ව්‍යාපාරික අවස්ථාවක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ඉතාම වේගයෙන් වර්ධනය වන ව්‍යාපාර ක්ෂේත්‍රයක් තමයි බලශක්ති ක්ෂේත්‍රය. එයිනුත් පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රයේ සාධාරණ තරගකාරී තත්ත්වයක් අද ඇති කර තිබෙනවා. ඒ කටයුතු කිසිම ගැටලුවක් නැතුව ඉදිරියට යනවාය කියන එක ආඩම්බරයෙන් කියන්න ඕනෑ. ඒවා සම්බන්ධ ප්‍රමිතීන් - standards - හඳුන්වා දීලා තිබෙනවා. ඒ හා සම්බන්ධ උපදේශන සේවා ඇති කරලා තිබෙනවා. ඒ වාගේම ජනතා හිතකාමී ක්‍රමවේදයන් ගොඩ නහා තිබෙනවා. ඒ නිසා අපි ඒ ගැන ආඩම්බර වෙනවා.

ඒ විතරක් නොවෙයි. ගල් අඟුරු පිළිබඳව අද ලොකු කථිකාවතක් තිබෙනවා. "ගල් අඟුරු මහ නපුරෙක්. ගල් අඟුරු නම් එපා"යි කියන පිරිසක් ඉන්නවා. රටක් විධියට අපි යථාර්ථවාදිව බලන්නට ඕනෑය කියලා මම කියනවා. අද්‍යත් ලෝකයේ හැම තැනම ගල් අඟුරු බලාගාර ඉදිවෙනවා. නොරොච්චෝලේ model එකේ පසුගාමී තාක්ෂණික බලාගාර නොවෙයි, supercritical, ultra-supercritical කියන ඉහළ තාක්ෂණයෙන් යුක්ත, විමෝචන වායු අඩු, පරිසර හානි අඩු, ඒ වාගේම පරිසර දූෂණය සඳහා තුඩු දෙන අනිකුත් සාධක අවම කරන බලාගාර ලෝකයේ අලුතින් ඉදි වෙනවා. රජයක් හැටියට අපි පිළිගෙන තිබෙනවා, අපේ රටට තවත් ගල් අඟුරු බලාගාරයක් අවශ්‍යයි කියලා. සාම්පූර්හි ඉදි කිරීමට ගිය බලාගාරය අවසාන මොහොතේ, ටෙන්ඩරය නිකුත් කිරීමට දින දෙකකට කලින් අපේ රජය විසින් නතර කළා. ඒ තීරණයේ හරි වැරැද්ද පිළිබඳව ඉදිරියේදී තීරණයක් ලැබෙයි. හැබැයි මෑතකදී කැබිනට් මණ්ඩලය අනුමත කළ බලශක්ති මූලාශ්‍ර පිළිබඳ සම්මිශ්‍රණය - energy mix - මත පදනම් වෙමින් අලුත් ගල් අඟුරු බලාගාරයක් අපි ඉදි කරනවාය කියන එක අපි කියනවා. ඒ වාගේම වඩාත් පරිසරහිතකාමී ස්වාභාවික ද්‍රවිකෘත වායු - LNG - බලාගාරත් අලුතින් ඉදි කරනවා. දැනුත් ඩීසල් බලාගාර තිබෙනවා. ගල් අඟුරු බලාගාරවලට විරුද්ධ වන අය, අතිශය පරිසරයට හානිකර කොළඹ නගරය මැද්දේ තිබෙන, දැවැන්ත පරිසර හානියක් කරන ඩීසල් බලාගාර ගැන වචනයක්වත් කියන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපි මේවා තේරුම් ගන්නත් අවශ්‍යයි. මේවායේ තිබෙනවා, යම් යම් තාක්ෂණික කාරණා. ගල් අඟුරු බලාගාරවලට අවංකව, පරිසර හිතකාමීව විරුද්ධ වන අය වාගේම තමන්ගේ ව්‍යාපාරික අවස්ථාවන් සහ තමන්ගේ ස්වාමීන්ගේ ව්‍යාපාරික අවස්ථාවන් ආරක්ෂා කරන්න ගල් අඟුරු බලාගාරවලට විරුද්ධ වන අයත් ඉන්නවා. ඒ අය ඩීසල් බලාගාරවලට විරුද්ධ නැහැ. මේ රටේ කිසිම බලාගාරයක් අලුතින් හැදුවේ නැති වුණත් ඒ අයට කමක් නැහැ. මොකද, හදිසි මිලදී ගැනීම් හරහා රටට නොවෙයි, පුරවැසියන්ට නොවෙයි, ව්‍යාපාරිකයන්ට, සමහර ව්‍යාපාරිකයන්ට ඒ ව්‍යාපාරික අවස්ථා ලැබෙනවා. ඒ නිසා ඩීසල් පිච්චුවත්, LNG පිච්චුවත්, ගල් අඟුරු පිච්චුවත්, heavy fuel පිච්චුවත් පරිසරය දූෂණය වෙනවා. ඒ නිසා තමයි අපේ සන්දීත් සමරසිංහ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ කල් තබන අවස්ථාවේ යෝජනාවේ වැදගත්කම තිබෙන්නේ. බලාගාරවලින් පිට කරන වායු, විමෝචනය කරන අහිතකර වායු, විශේෂයෙන්ම කාබන් ඩයොක්සයිඩ් වායුව අවශෝෂණය කර ගැනීමට අපි ගන්නා උපක්‍රමය මොකක්ද?

ලෝකය පිළිගත්, පහසු, පරිසර හිතකාමී, ආර්ථික වශයෙන් ලාභදායී උපක්‍රමය මේ වන වගාව කියන එක පිළිබඳව කිසිම සැකයක් නැහැ. ගරු පරිසර නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට මම සුබ පතන ගමන් මේ කාරණයත් කියන්න කැමැතියි. මගේ විෂයයට මේ කාරණය අදාළ නිසා වසර දෙකකට වැඩි කාලයක් මේ පිළිබඳව මම අධ්‍යයනය කරලා තිබෙනවා. අපි රටක් හැටියට ව්‍යාපාරික වන වගාව අත්හැර දමා තිබෙනවා. ලෝකයේ දියුණු වන රටවල් අද මේ කාබන් විමෝචනය යථාර්ථයක් වශයෙන් පිළිගෙන, බලශක්තිය හා සම්බන්ධ ආයතන විසින් හෝ ඒවායේ නියෝජිත ආයතන විසින් එලෙස විමෝචනය කරන කාබන් අවශෝෂණය කර ගැනීමට හැකි වන පරිදි ඊට ගැළපෙන ප්‍රමාණයකින් වන වගා කිරීම් කරනවා. සදාකාලයටම තිබෙන වනාන්තර කියලා දෙයක් නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. නමුත් ව්‍යාපාරික වශයෙන් වැදගත් වන, වන වගා කරන්න පුළුවන්කම අපට තිබෙනවා. ගහක් කැලේ වැවිලා, ඒ ගහ කැලේම දිරන කොට ඇති වන තත්ත්වය එකක්. අවුරුදු 20ක්, 25ක්, 30ක් ගහක් තිබිලා, ඒ කාලය තුළදී එම ගහෙන් කරන සේවය තවත් එකක්. මොකද, ගහක් වර්ධනය වනකොට ගහේ කඳ කියලා කියන්නේ වායුගෝලයෙන් උකහා ගන්නා වූ කාබන් ඩයොක්සයිඩ්, කාබන් හරහා ගොඩ නැඟෙන ජෛව ස්කන්ධවලටයි. මේ ජෛව ස්කන්ධ තමයි වසර කෝටි ගණනක් ගත වනවිට ඉන්ධන බවට පත් වන්නේ; ගල් අඟුරු වෙන්නේ; පොසිල ඉන්ධන වශයෙන් භාවිතයට ගන්නේ. ව්‍යාපාරික වශයෙන් කරන වන වගාවන්වලදී එම කඳන් අපට දැව වශයෙන් භාවිත කරන්න පුළුවන් වාගේම බලශක්ති උත්පාදනය කිරීමට ඉන්ධන වශයෙන් භාවිත කරන්නත් පුළුවන්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජෛව ස්කන්ධ - biomass - හරහා ක්‍රියාත්මක වන බලාගාර පරිසර හිතකාමීයි. ඒ වෙනුවෙන් වන වගා කළ යුතුයි. ඩීසල් බලාගාරයකින් පිට වන ඒ අහිතකර වායු උකහා ගෙන, ඒවා ජෛව ස්කන්ධ බවට පත් කරලා, තවත් වසර ගණනාවකට පස්සේ නැවත බලශක්ති බවට ඒවා පත් කරන්න පුළුවන්. "ජෛව ස්කන්ධ" කියලා කියන්නේත් පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක්. සූර්ය බලය, සුළං බලය, ජල විදුලිය පමණක් නොව, ජෛව ස්කන්ධත් පුනර්ජනනීය බලශක්ති මූලාශ්‍ර. මේ කටයුතු වෙනුවෙන් උනන්දු, නිර්මාණශීලී, තරුණ නියෝජ්‍ය ඇමතිවරයෙක් අද පරිසර අමාත්‍යාංශයට පත්වෙලා තිබෙන මොහොතේ මම මේ යෝජනාව කරන්න කැමැතියි. පැරිස් සම්මුතිය - COP 21 - සඳහා බොහොම උනන්දුවෙන් අත්සන් කරපු, ඒ සඳහා සහභාගි වන, පරිසරය ගැන ආදරය කරන ජනාධිපති කෙනෙකු, අගමැති කෙනෙකු වාගේම නියෝජ්‍ය ඇමති කෙනෙකු අපට ඉන්නවා. එතුමන්ලාට මම යෝජනා කරන්න කැමතියි, ව්‍යාපාරික වන වගාව ආරම්භ කරන්න කියලා. ව්‍යාපාරික වන වගාව ආරම්භ කළොත් පරිසරය ආරක්ෂා වනවා; කාබන් අවශෝෂණය කරනවා; පරිසරය රැකෙනවා; ආර්ථික වශයෙන් ලාභදායකයි. ඒ සඳහා සුදුසු ඉඩම් අක්කර ලක්ෂ ගණනක් මේ රටේ තිබෙනවා. ඒ සඳහා වූ තාක්ෂණය රට තුළ සහ රටින් පිටත තිබෙනවා. ඒ සඳහා අවශ්‍ය වන්නේ නියමිත ප්‍රතිපත්තියයි. කෘෂිකර්මයට යොදන ඉඩම් මොනවාද, ව්‍යාපාරික වන වගාවට සුදුසු ප්‍රදේශ මොනවාද කියන කාරණා හඳුනා ගැනීමත්, ඒවා සාධාරණව බෙදා දීමත් කියන කාරණා එහිදී වැදගත් වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න කැමැතියි. පරිසරයේ ආරක්ෂාව කියන දේ අද කාලය අනුව යථාවත් වෙන්නේ, "හුදු පරිසරය රැකීම යනු කිසි දෙයකින් වෙනස් නොකිරීම" කියන එකෙන් නොවෙයි. එක් පැත්තකින් ආරක්ෂිත වනාන්තර, ආරක්ෂිත ජීවීන්, ආරක්ෂිත සත්ව විශේෂ කිසිවක් වෙනස් නොකර ආරක්ෂා කරන ගමන් අපේ මේ වටිනා වූ මහ පොළොව නිසි ලෙස කළමනාකරණය කිරීම තමයි අපි පරිසරය ආරක්ෂා කිරීම කියලා කියන්නේ.

ධරණීය සංවර්ධනය - sustainable development - කියා කියන්නේත් මිනිසාත්, ගහ කොළත්, සතුනුත් රැකෙන, අපේ මේ මුළුමහත් පෘථිවියම ආරක්ෂා වන සංවර්ධනයටයි. අද වනකොටත් විනාශ නොවුණු පරිසරයක් සහිත, ලස්සන රටක් අපට උරුමවෙලා තිබෙනවා. ඒ රට අපට ආරක්ෂා කර ගත හැකියි. ඒ සඳහා විශේෂිතව කැපවීමෙන් යුතුව අපි කටයුතු කරන්න ඕනෑ. නතර කර දමා ඇති වාණිජ වන වගාව නැවත ආරම්භ කරන්න කියන කාරණය මම නැවත නැවතත් මතක් කරනවා. ඒ වගකීම කාටවත් බාර ගන්න බැරි නම් මේ රටේ ප්‍රධාන පරිසර දූෂකයා වන ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය මේ රටේ වාණිජ වන වගාව පිළිබඳ වගකීම් බාර ගන්න සූදානම්. මම වගකීමෙන් යුතුවයි මේ කාරණය කියන්නේ. ඒකට අවශ්‍ය පහසුකම් සපයන්න, ඉඩම් ටික වෙන් කර දෙන්න, අවශ්‍ය ප්‍රතිපත්ති හදලා දෙන්න අපි සූදානම්.

අපට ඒකට ආර්ථික ශක්තිය තිබෙනවා. ගරු සන්දීත් සමරසිංහ මැතිතුමනි, විදුලි බල මණ්ඩලය තමයි තනි ආයතනයක් විධියට මේ පරිසර දූෂණයට වැඩිම දායකත්වයක් දක්වන්නේ.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

මොකද, ඩීසල් පුච්චනවා. ජල විදුලි බලය ප්‍රමාණවත් නොවෙච්ච දවසේ ඉඳලා අද වෙනකම් අපි ගල් අඟුරුයි, ඩීසලුයි පුච්චනවා. එහෙම නම් අපට වගකීමක් තිබෙනවා, වන වගාව කරන්න. සාම්පූර් බලාගාරය පිළිබඳ ප්‍රශ්නය මතු වුණු වෙලාවේ මම කිව්වා, සාම්පූර් බලාගාරයේ මෙගාවොට් 500න් අමතර කාබන්ඩයොක්සයිඩ් පිට වෙන්නේ කොච්චරද; ඒ මුළු ප්‍රමාණය absorb කර ගන්න පුළුවන් වෙන අක්කර ප්‍රමාණය කියන්න, විදුලි බල මණ්ඩලයෙන් ටවන්නම් කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ටවන්න පුළුවන්. නොරොච්චෝලේ බලාගාරය පිළිබඳවත් විවේචන තිබෙනවා. අපට දෙන්න, වන වගා කරන්න. ඒක කරන්න පුළුවන්. ඒ සඳහා වූ ආර්ථිකමය වටිනාකම් සහිත ආකෘතිය අපි සකස් කරලා රජයත්, පුරවැසියාත්, සියලු දෙනාමත් ජයග්‍රහණය කරන පරිසරය රැකෙන ක්‍රමවේදයකට අපට යා හැකියි. ඒ නිසා අපට ඒ පරිසරය සකස් කරලා දෙන්න. අද අපට ලොකුම ප්‍රශ්නය වෙලා තිබෙන්නේ "කිසිවකට අත නොතියනු, මොනම ගහක්වත් නොකපනු, එතකොට තමයි පරිසරය රැකෙන්නේ" කියලා හිතන අන්තවාදී පුද්ගලයන් සිටීමයි. ඒ නිසා මෙය කළමනාකරණය කිරීම පිළිබඳව අවධානය යොමු වෙන්න අවශ්‍යයි. අනාගතය කරා යන්නේ කොහොමද කියලා බලන්න ඕනෑ. ආර්ථික වශයෙන් ලාභදායී ක්‍රමවේදය මොකක්ද කියලා බලන්න ඕනෑ. හැමෝම දිනන්නේ කොහොමද කියලා බලන්න ඕනෑ. පුරවැසියා, පරිසරය -ගහකොළ, සතා සිවුපාවා- සමස්තයක් වශයෙන් ආණ්ඩුව කොහොමද මේක ජයග්‍රහණය කරන්නේ කියලා බලලා අපි ඉදිරියට යන්න ඕනෑ. අපි බලමු කොහොමද මේක කරන්නේ කියලා. මේ වටිනා පාර්ලිමේන්තුවේ මේ මාතෘකාව සාකච්ඡා කරන්න අවස්ථාව සලසා දුන් අපේ ගරු මන්ත්‍රීතුමාට මගේ ආදරය, ගෞරවය පිරිනමමින් මා නතර වෙනවා. ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා මේ තනතුරට පත්වීම ගැන මම ඔබතුමාට නැවත වරක් සුබ ප්‍රාර්ථනා කරනවා. බොහොම ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තූතියි.

මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම නියෝජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා.7 02]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමාට ප්‍රථමයෙන්ම ස්තූතිවන්ත වෙනවා, රටක අවධානය යොමු වෙන්න ඕනෑ කාරණයක් ගැන, තව තවත් අවධානය යොමු වෙන්න ඕනෑ කාරණයක් ගැන, ඒ වාගේම ලෝකයේ අවධානය යොමු වෙන්න ඕනෑ කාරණයක් ගැන, ඒ වාගේම දැන් ලෝකයේ අවධානය යොමු වෙලා තිබෙන, අපේ රටේ අවධානය යොමු වෙලා තිබෙන කාලීන ප්‍රශ්නයක් ගැන, අවශ්‍යතාවක් ගැන යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන. ඒ වාගේම අපේ විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාත් ඒ ගැන අදහස් දැක්වුවා. එතුමාත් ඒ යෝජනාවට එකතු වුණා. සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමාගේ තිබෙන උනන්දුව ගැනත්, මේ වටිනා කාර්යභාරය ගැන දැනගෙන ඒ සඳහා අවශ්‍ය යෝජනා ඉදිරිපත් කිරීම ගැනත් එතුමාට ස්තූතිවන්ත වෙනවා.

ගරු තිලකරාජා මන්ත්‍රීතුමා එතුමාගේ ප්‍රදේශයේ සිද්ධවෙන වන හානි ගැන කථා කළා. ඒ වාගේම වැවිලි සමාගම් සතු ඉඩම්වල සිදු කරන ගස් කැපීම ගැනත් කථා කළා. ඇත්තටම ඒ සඳහා අප විශේෂ අවධානය යොමු කරන්න ඕනෑ. දැනට සිද්ධවන ඒ ක්‍රියාදාමයට අපි හැමෝටම එකතු වෙන්න පුළුවන්. අපට ඉස්සරහට කථා කරන්න පුළුවන්, මෙහි අඩුපාඩුවක් තිබෙනවා නම් තිබෙන්නේ කොතැනද කියලා. මොකද, වැවිලි සමාගම් සතු ඉඩම්වල ගස් කැපීම සිදු කරන්නේ වන කළමනාකරණ සැලැස්මක් අනුවයි. ආවාට ගියාට එහෙම ගස් කපන්න දෙන්නේ නැහැ. එම සැලැස්ම වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයත්, ඒ වාගේම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසිනුත් අනුමත කරන්න ඕනෑ. අනුමත කළාට පස්සේ තමයි ඒ වැවිලි සමාගම් සතු ගස් කපන්න දෙන්නේ. ඒ වාගේම ඒ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා පරිසර බලපෑම් තක්සේරුවක් සිදු කරන්න ඕනෑ. ඒ ගැන කථා කරන්න ඕනෑ. ඒක දිස්ත්‍රික් පරිසර කමිටුවේ අනුමත වෙන්න ඕනෑ. මේ පරිසර බලපෑමේ තක්සේරුව අනුමත කරන්න ඕනෑ. ගස් කැපීමෙන් පස්සේ අනිවාර්යයෙන්ම නැවත වන වගාව කරන්න අවශ්‍යයි. මේවා තමයි තිබෙන ක්‍රමවේද. මේවායේ යම් අඩුපාඩු තිබෙනවාද කියන එක ඉදිරියේදී අපි හොයලා බලන්න ඕනෑ. ඒ වාගේ දේවල් අපට ඉදිරිපත් කරලා මේ ගැන අවධානය යොමු කිරීමට කටයුතු කිරීම ගැන එතුමාට ස්තූතිවන්ත වෙනවා.

ගරු අජිත් පී. පෙරේරා නියෝජ්‍ය අමාත්‍යතුමා වාණිජ වගාව ගැන කථා කළා. ඇත්තටම දැනටත් රටේ වාණිජ වන වගාව සිද්ධ වෙනවා. මේ වාණිජ වගාව නිසා දැනට හෙක්ටයාර 700ක් පමණ වනය නැවත වගා වෙනවා. තේක්ක ගස් , යුකැලිප්ටස් ගස්, ඒ වාගේම මැහෝගනී ගස් වාණිජ වන වගාවට එකතු කරමින් පවතිනවා. අපට තිබෙන ප්‍රශ්නය වන්නේ අපේ ආණ්ඩුවේ තිබෙන ප්‍රශ්නය වාගේ කරන වැඩ ගැන රටේ ජනතාව දැනුවත් වෙන්නේ නැති කාරණයයි. ඉදිරියේදී අපි අමාත්‍යාංශයක් වශයෙන් ජනතාවගේ අදහස් එකතු කර ගැනීමේ අභිලාෂය සලකා ජනතාව දැනුවත් කිරීමට, මේවා ජනතාව අතරට යැවීමේ ක්‍රමවේද සහ ජනතාවගේ සහභාගිත්වය ඇති කිරීමේ ක්‍රමවේද නිර්මාණය කරනවා. ඒ වාගේම ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා අදහස් දැක්වුවා, "කියතෝ සම්මුතිය අනුව හරිතාගාර වායු විමෝචනය අඩු කිරීමේ වැඩ පිළිවෙළ සඳහා කාබන් අරමුදලක් සහ ලෝක බැංකුව විසින් අරමුදල් කිහිපයක් නිර්මාණය කර ඇත" කියලා.

මම ගරු මන්ත්‍රීතුමාට පැහැදිලි කරන්නම්, මේ කියොතෝ සම්මුතිය කියන්නේ මොකක්ද කියලා. 1997 ජපානයේ කියොතෝ නගරයේ පැවැති එක්සත් ජාතීන්ගේ දේශගුණික විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියෙහි තෙවන පාර්ශ්වකරුවන්ගේ සම්මේලනයේදී, එම සම්මුතියෙහි පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා නීත්‍යානුකූල සන්ධානයක් ලෙස කියොතෝ සම්මුතිය ඇති කර ගත්තා. 2002 සැප්තැම්බර් 03වැනි දා සිට ශ්‍රී ලංකාව මේ කියොතෝ සංවිධානයේ පාර්ශ්වකරුවකු බවට පත් වුණා. කියොතෝ සංවිධානයේ පළමු ධුර කාලය වන 2008 සිට 2012 දක්වා කාලය තුළ සංවර්ධිත රටවල් විසින් හරිතාගාර වායු විමෝචනය1990 මට්ටමට සාපේක්ෂව සියයට 5.2කින් අඩු කරන්න ඕනෑය කියන එකයි තීන්දු කළේ. රටවල් 144ක් පමණ මේකට සම්බන්ධ වුණා. නමුත්, ලෝකයේ වැඩිම හරිතාගාර වායු විමෝචනය කරන රටක් වන ඇමෙරිකාව මේකට එකතු වුණේ නැහැ. ඒ ගොල්ලන් මෙයට සම්බන්ධ වීම ප්‍රතික්ෂේප කළා. දැන් ලංකාවේ හරිතාගාර වායු විමෝචනය එක පුද්ගලයකුට කිලෝග්‍රෑම් 780ක් වෙනවා. නමුත්, ඇමෙරිකාවේ එක පුද්ගලයකුට කිලෝග්‍රෑම් 17,500ක් වෙනවා. එතකොට අපි කොහේද ඉන්නේ, අපි තවම ලොකු අවදානමකට මුහුණ දීලා තිබෙනවාද, නැද්ද කියන එක පෙනී යනවා. නමුත්, ලොකු අවදානමකට මුහුණ පා තිබෙන ප්‍රධාන රට වන ඇමෙරිකාව මේ

කියොතෝ සන්ධානයට එදා එකතු වුණේ නැහැ. නමුත්, ඒ සන්ධානය අනෙකුත් රටවල් සමඟ එකතු වෙලා වැඩ කරගෙන ගියා. මෙහි සාමාජික රටවල් විසින් සිය හරිතාගාර වායු විමෝචනය අඩු කළ යුතු වෙනවා. එහිදී හරිතාගාර වායු විමෝචනය අවම කරමින් ගෝලීය දේශගුණික විපර්යාස අවම කිරීම සඳහා කියොතෝ සන්ධානය යන්ත්‍රණ කිහිපයක් හඳුන්වා දුන්නා. එකක් තමයි පවිත්‍ර සංවර්ධන යන්ත්‍රණය - Clean Development Mechanism. අනික, තමයි එක්ව ක්‍රියා කිරීම - Joint Implementation. අනික, විමෝචන වෙළෙඳාම - Emissions Trading. මේ යන්ත්‍රණ තුන අතුරින් විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටක් හා සංවර්ධිත රටක් අතර ක්‍රියාත්මක කළ හැකි එකම යන්ත්‍රණය වුණේ, පවිත්‍ර සංවර්ධන යන්ත්‍රණයයි - Clean Development Mechanism.

සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රී ලංකාව මෙම යන්ත්‍රණයේ ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා ව්‍යාපෘති 37ක් අනුමැතිය සඳහා යැව්වා. එයින් 22කට අනුමැතිය ලැබී තිබෙනවා. ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා සඳහන් කළ ආකාරයට කියොතෝ සම්මුතිය අනුව අපට ඒ ව්‍යාපෘති 22ක ප්‍රතිලාභ ලැබෙනවා. ඒ අනුව, 2017 සැප්තැම්බර් මාසය වන විට කාබන් ටොන් එකොළොස්ලක්ෂ හතළිස්දහස් හාරසියහැටතුනක් සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක වනවා. අපි ඉදිරිපත් කරපු ව්‍යාපෘති 37න්, 22කට අනුමැතිය ලැබී තිබෙනවා. ඉදිරි කාලය තුළ තව වැඩි වෙන්න පුළුවන්.

ඒ විතරක් නොවෙයි. මෙම යන්ත්‍රණය යටතේ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කර, කාබන් ප්‍රතිලාභ ලබා ගත හැකි ක්ෂේත්‍ර ගත්තොත්, ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ බලශක්ති ක්ෂේත්‍රයේ කටයුතු කරන්න පුළුවන්; ප්‍රවාහන ක්ෂේත්‍රයේ කටයුතු කරන්න පුළුවන්; කර්මාන්ත ක්ෂේත්‍රයේ කටයුතු කරන්න පුළුවන්; කසළ කළමනාකරණය සහ වන සම්පත් ක්ෂේත්‍රවල කටයුතු කරන්න පුළුවන්. ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේත් විශේෂයෙන් වන සම්පත් ක්ෂේත්‍රය සම්බන්ධයෙනුයි.

ශ්‍රී ලංකාවේ මෙම යන්ත්‍රණය යටතේ කාබන් ප්‍රතිලාභ ලබා ගන්නා ව්‍යාපෘති අතර කුඩා ජල විදුලි බලාගාර මඟින් බලශක්තිය උත්පාදනය කිරීම, ජෛව ස්කන්ධ භාවිතයෙන් බල ශක්තිය උත්පාදනය කිරීම - biomass, කසළ කළමනාකරණය භාවිතයෙන් බලශක්තිය නිෂ්පාදනය සහ ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමා කිව්වා වාගේ සුළං බලය භාවිතයෙන් බලශක්තිය නිෂ්පාදනය කිරීම අපට අයිති වෙනවා.

මෙම යන්ත්‍රණය යටතේ වන සම්පත් ක්ෂේත්‍රයේ යෝජනා ක්‍රියාත්මක කිරීම ක්‍රම දෙකකට සිදු කෙරෙනවා. එනම්, අලුතින් වන වගා කිරීම සහ නැවත වන වගා කිරීම කියලා කොටස් දෙකක් යටතේ මේ කියොතෝ සම්මුතියට අපි බැඳෙනවා. එහිදී අලුතින් වන වගා කිරීම කියලා කිව්වේ, කැලෑවක් නොවන ඉඩමක වගා කිරීමයි. ඊළඟට, නැවත වගාවකින් පසු පවත්නා කැලෑ ඉඩමක් එළි පෙහෙළි කොට වගා කිරීමත් මෙකට අයිති වෙනවා. පවිත්‍ර සංවර්ධන යන්ත්‍රණය යටතේ, මෙම ක්‍රම දෙක හරහා කාබන් ප්‍රතිලාභ ලබා ගැනීමේදී ඒ භූමිය 1989 දෙසැම්බර් 31වැනි දාට පෙර වනාන්තරයක් නොවිය යුතුයි. ඒ කියන්නේ, පවතින වනාන්තරයක් සඳහා අපට මෙහි ප්‍රතිලාභ ලබා ගැනීමේ හැකියාව නැහැ.

එම කාබන් ප්‍රතිලාභ ලබා ගැනීම සිදු කළ යුතු ගණනය කිරීම් ඉතාම සංකීර්ණයි. ඒ වාගේම ලෝකයේ කාබන් මිල අනෙකුත් ක්ෂේත්‍රවලට සාපේක්ෂව අඩුයි. මෙම තත්ත්වය හේතුවෙන් අප මෙම පවිත්‍ර නිෂ්පාදන යන්ත්‍රණය යටතේ වන සම්පත් ක්ෂේත්‍ර ව්‍යාපෘති යෝජනා දෙකක් ඉදිරිපත් කළත් ඒ යෝජනා දෙක අනුමත වුණේ නැහැ. ඒ නිසා අපට ගොඩක් දුර, ඉතාම සාර්ථක විධියකට යන්න හැකියාව ලැබිලා නැහැ, අපි ඉදිරිපත් කළ ඒ යෝජනා දෙක මේ වන වගා කිරීමේ ව්‍යාපෘති සඳහා අපට ලැබිලා නැති නිසා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමනි, ලංකාවේ මධ්‍යම පරිසර අධිකාරිය යම් පොඩි මුදලක් මේ සඳහා දිස්ත්‍රික් මට්ටමින් වෙන් කරනවා. මට හිතෙන හැටියට මේ මුදල පැළ ටිකක් ගන්නවත් මදි. අපි පැළයක් ඉන්දනකොට ඉන්දන්නන්වාලේ නොවෙයි ඉන්දන්න ඕනෑ. අඩුම තරමින් දරුවෙකුට ඒකේ ප්‍රතිලාභයක් ලැබෙන විධියට, දරුවා ඒකට ආස කරන විධියේ මොනවා හරි වැඩ පිළිවෙළක් එහිදී ක්‍රියාත්මක කරන්න ඕනෑ. එතකොට, දරුවෝ ඉතාම කැමැත්තෙන් පාසල්වල, තමන්ගේ ගෙවත්තේ පැළ ඉන්දනවා. අද එවැනි ආකර්ශනීය වැඩ පිළිවෙළක් නොවෙයි තිබෙන්නේ. මේ කටයුතු සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යලයකට රුපියල් 15,000ක මුදලක් වාගේ තමයි ලැබෙන්නේ. එහි වෙනස්කම් කරන්න ඕනෑ. ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, මගේ අදහසක් හැටියට ඒ කරුණු ඔබතුමාට යෝජනා කරනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)

ඔබතුමා කියපු දේ හරි. මම ඒ කරුණු සැලකිල්ලට ගන්නවා. ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ රුපියල් කෝටි 7ක්, 8ක් වියදම් කරලා ඇට පැකට් බෙදුවා. පැළයක් තියා, ඒ එකක්වත් පැළ වුණේත් නැහැ. ඒ වාගේ දේවල් අපට වෙනස් කරන්න තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අනුව අපි 2015.12.04 වන දින කියෝතෝ සන්ධානයේ දෙවන ධුර කාලයට -2013 සිට 2020 දක්වා- අපි එකතු වුණා. එම කාල සීමාව තුළ රටවලින් නිකුත් කරන ලද හරිතාගාර වායු ප්‍රමාණය -1990 නිෂ්පාදනය කළ හරිතාගාර වායු ප්‍රමාණයට සාපේක්ෂව- අවම වශයෙන් සියයට 18කින්වත් අඩු කරන්න ඕනෑ කියන එකට තමයි එකඟ වුණේ. තනියම හෝ තවත් රටක් එක්ක එකතු වෙලා හෝ තවත් ආයතනයක් එක්ක එකතු වෙලා හෝ හරිතාගාර වායු ප්‍රමාණය අඩු කරන්න කියලා තමයි එදා කිව්වේ. නමුත් මේ කියෝතෝ සංධානයේ දෙවන ධුර කාලයේදී ඒ කටයුතු අකර්මන්‍ය වෙනවා. වර්තමානය වන විට ඒ තත්ත්වය උදා වෙලායි තිබෙන්නේ. ඇමෙරිකා එක්සත් ජනපදය පළමුවෙනි සම්මුතියට සම්බන්ධ වෙලා හිටියේ නැහැ. සම්බන්ධ වෙලා හිටපු කැනඩාව, ජපානය, රුසියාව, නවසීලන්තය කියන රටවල් මේ යෝජනාවට එකඟතාව පළ කළේත් නැහැ. එතකොට කාබන් වෙළෙඳාම කඩාගෙන වැටෙන්න පටන් ගත්තා. මොකද, ආර්ථිකය ශක්තිමත් ප්‍රබල රටවල් මේ සම්මුතියෙන් ඉවත් වෙලා තිබෙන නිසා. එදා අපට කාබන් ටොන් එකකට ඩොලර් 15කට වඩා වැඩි මුදලක් ලැබුණා. නමුත් මේ වනවිට කාබන් ටොන් එකකට ඩොලර් එකකටත් වඩා අඩු මුදලක් ලැබෙන්න පටන් ගෙන තිබෙනවා. ලෝකයේ බලවතුන් මේ කටයුත්තට සම්බන්ධ නොවීම නිසා, උනන්දුව අඩු වෙලා කියෝතෝ සම්මුතිය අද අකර්මන්‍ය තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. ඒ නිසා දැන් කාබන් මිල දැන් පහළ ගිහිල්ලා තිබෙනවා. නමුත් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි එතැනින් අතහැරුණේ නැහැ. අතිගරු ජනාධිපතිතුමා 2015දී මේ සඳහා උනන්දු වෙලා, පවිත්‍ර නිෂ්පාදනයේ යාන්ත්‍රණය මඟින් කාබන් වෙළෙඳාම තවදුරටත්

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

ආර්ථිකම වශයෙන් ඵලදායී නොවූ බැවින්, 2015 දෙසැම්බර් මස ප්‍රංශයේ පැරිස් නුවර පැවති එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතියෙහි පාර්ශ්වකරුවන්ගේ 21වෙනි සමුළුවේදී සම්මත කර ගත් දේශගුණ විපර්යාස පිළිබඳ පැරිස් ගිවිසුමෙහි 6වන වගන්තිය යටතේ කාබන් වෙළෙඳ පොළ නැවත නඟා සිටුවීම සඳහා මේ රට යොමු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම අතිගරු ජනාධිපතිතුමා මේ සඳහා එකඟතාව පළ කර තිබෙනවා.

ඒ අනුව, ලෝක බැංකුව විසින් කාබන් වෙළෙඳ පොළ ප්‍රවර්ධනය කිරීම සඳහා මෙවලම් කිහිපයක් හඳුන්වා දීලා තිබුණා. ඒවා අතුරින් කාබන් හවුල්කාරිත්ව පහසුකම සහ කාබන් වෙළෙඳ පොළ සඳහා සූදානම් වීමේ හවුල්කාරිත්වය ප්‍රධාන තැනක් ගන්නවා. ඒක තමයි අපට ආකර්ශනීය දේ වුණේ. කාබන් හවුල්කාරිත්ව පහසුකම - Carbon Partnership Facility - 2012 කියෝතෝ සංවිධානයේ පළමු ධුර කාලය අවසන්වීමත් සමඟම ලෝක බැංකුව විසින් හඳුන්වා දුන් නව කාබන් මූල්‍ය මෙවලමකි. මෙහි අරමුණ වන්නේ දිගුකාලීන ආයෝජන සඳහා මූල්‍ය පහසුකම් සැපයීම තුළින් වායු විමෝචනය අඩු කිරීම සඳහා කාබන් ප්‍රතිලාභ ලබා දීමයි. කාබනික මූල්‍ය ප්‍රාග්ධනය වැඩි කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවතින රටවල අඩු කාබන් ආර්ථික වර්ධනය හා තිරසර සංවර්ධන ප්‍රමුඛතාවලට අනුකූල වන ආයෝජන වැඩසටහනක් සඳහා කාබන් හවුල්කාරිත්ව පහසුකම ලබා දෙනවා.

මෙම කාබන් හවුල්කාරිත්ව පහසුකම - Carbon Partnership Facility - යටතේ දැනට ශ්‍රී ලංකාවේ පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය සහ ඒ යටතේ පවත්නා ආයතන ලෝක බැංකුව සමඟ මූලික සාකච්ඡා පවත්වා ඇති අතර, ඉදිරි වසර තුළදී ඒවා ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා. මීට අමතරව, ලෝක බැංකුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන වනාන්තර කාබන් හවුල්කාරිත්ව පහසුකම -Forest Carbon Partnership Facility - වන විනාශය හා වන හායනය අඩු කිරීම තුළින් වනාන්තර කාබනික තොග සංරක්ෂණය, වනාන්තර තිරසාර කළමනාකරණය හා වනාන්තරවල කාබන් තොග වැඩිදියුණු කිරීම මඟින් විමෝචන අවම කිරීමට කටයුතු කරයි. මෙම පහසුකම REDD-Plus - Reducing Emissions from Deforestation and forest Degradation - වැඩ සටහන යටතේ ක්‍රියාත්මක වේ. මෙහි ඇති කාබන් අරමුදල - Carbon Fund - මඟින් සංවර්ධනය වෙමින් පවතින රටවල්වල REDD-Plus ප්‍රතිපත්ති සඳහා දිරි දීමනා ලබා දෙනු ලැබේ. එමඟින් බොහෝ රටවල් REDD-Plus සඳහා සූදානම්වීමේ ව්‍යාපෘති තුළ කැපී පෙනෙන ප්‍රගතියක් ලබා ඇත. එවැනි කාර්ය සාධනය පදනම් කරගත් ගෙවීම්, කප්පාදු කරන ලද ප්‍රමාණයට වඩා වැඩි වන විට වනාන්තර ආරක්ෂා කිරීම සඳහා අත්‍යවශ්‍ය කටයුතු ඉටු කරනු ඇත. මෙම ලෝක බැංකු කාබන් අරමුදල 2011 මැයි මාසයේ සිට ක්‍රියාත්මක වේ. කාබන් අරමුදල විසින් ගෙවීම් සිදු කරනු ලබන්නේ වනාන්තර සංරක්ෂණය සඳහා දිගුකාලීන තිරසාර පැවැත්මක් ලබා ගැනීම සඳහාය.

ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමාගේ දෙවැනි ප්‍රශ්නය වුණේ, කියෝතෝ සම්මුතිය දැන් අකර්මණ්‍ය වෙලා තිබෙනවා, ඒ නිසා අපි ලෝක බැංකුවේ වෙනත් වැඩ සටහන්වලට එකතු වෙලා තිබෙනවා ද කියන එකයි. අපි දැන් ඒකට එකතු වෙලා තිබෙනවා.

මේ යටතේ ශ්‍රී ලංකාව ද කටයුතු කර ඇති අතර REDD-Plus සඳහා සූදානම් වීමේ ව්‍යාපෘතිය, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහන - UNDP -, එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩ සටහන - UNEP- සහ ආහාර හා කෘෂිකර්ම සංවිධානය - FAO - ආධාර ලබා ගනිමින් එම ව්‍යාපෘතිය සාර්ථක ලෙස ක්‍රියාත්මක කර පසුගිය වසර තුළ අවසාන කරන ලදී. එහිදී සකස් කරන ලද ඉදිරි ක්‍රියාත්මක සැලැස්ම - Sri Lanka National REDD-Plus Investment Framework and Action Plan - ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා හරිත දේශගුණික අරමුදල - Green Climate Fund - සඳහා ඉදිරිපත් කර ඇත. ඒ කටයුතු process වෙමින් පවතිනවා.

එලෙසම, ලෝක බැංකුව විසින් හඳුන්වා දුන් අනෙක් ක්‍රියා මාර්ගය වන්නේ කාබන් වෙළෙඳ පොළ සඳහා සූදානම් වීමේ හවුල්කාරිත්වයයි -Partnership for Market Readiness. අපි පැරිස් සම්මුතියට එකඟ වුණා. එයට අත්සන් කළා; එකඟතාව පළ කළා. එහි පළමුවැනි කාරණයට අනුව අපි කටයුතු කරලා තිබෙනවා. දෙවැනි කාරණයටත් අපි දැන් යොමු වුණා. එය හරිතාගාර වායු විමෝචනය අවම කිරීමේ උත්සාහය වැඩි කිරීම සඳහා සංවර්ධිත හා සංවර්ධනය වෙමින් පවතින රටවල් අතර ඇති කර ගන්නා හවුල්කාරිත්වයකි. ශ්‍රී ලංකාව ද මේ සඳහා ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කර ඒ සඳහා අනුමැතිය ලබාගෙන ඇති අතර, එමඟින් කාබන් වෙළෙඳ පොළ සඳහා සූදානම්වීමට සුදුසු කාබන් මිලකරණ හා වෙළෙඳ මෙවලම් - carbon pricing and trading instruments - හඳුනා ගැනීම අරමුණු කරගෙන 2018 - 2020 අතර කාලය තුළ ක්‍රියාත්මක වේ. ඒ සඳහා ලෝක බැංකුව මඟින් ශ්‍රී ලංකාවට ඇමරිකානු ඩොලර් මිලියන 3ක ප්‍රදානයක් ලබාදීමට එකඟ වී ඇත. ගරු මන්ත්‍රීතුමා සඳහන් කරපු ආකාරයට අපට කාබන් විමෝචනය සඳහා අවශ්‍ය දේවල් සකස් කරගන්න, ඒකට සැලසුම් සකස් කරගන්න, ඒ සඳහා train කරන්න, ඒ පරීක්ෂණ කරන්න, ගණනය කරන්න, ඒ කරුණු ඉදිරිපත් කරන්න යනාදී වැඩසටහන්වලට ලෑස්තිවීම සඳහා දැනටමත් අපට ඇමරිකානු ඩොලර් මිලියන 3ක ප්‍රදානයක් දීලා තිබෙනවා. ඒ නිසා ඉදිරියේදී අපට මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න පුළුවන්. අපි දැනටමත් ඉදිරි වැඩ කටයුතු කරමින් පවතිනවා.

ඒ වාගේම, කියෝතෝ සන්ධානයේ පවිත්‍ර සංවර්ධන යාන්ත්‍රණය යටතේ වන සම්පත් ක්ෂේත්‍රය සඳහා කාබන් ප්‍රතිලාභ ලබා ගැනීමට අපහසුයි. ඒ බව අපි කිව්වා. එක්සත් ජාතීන්ගේ දේශගුණ විපර්යාස පිළිබඳ රාමුගත සම්මුතිය යටතේ ඇති කර ගන්නා ලද එකඟතාව අනුව පැරිස් සමුළුවේ දී අතිගරු ජනාධිපතිතුමා එකඟතාවකට ආවා, 2030 දී ශ්‍රී ලංකාවේ වන ආවරණය සියයට 32ක් දක්වා වැඩි කරනවා කියලා. ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමාත් මේ ගැන සඳහන් කළා. වර්තමානයේ අපට සියයට 29.7ක වන ආවරණයක් තිබෙනවා. ඒක සියයට 32ක් දක්වා වැඩි කරනවා කියලා අපි එකඟතාවක ආවා. ඒක සියයට 35ක් නොවෙයි, සියයට 32ක් කරනවා කියලායි එකඟතාවට ආවේ, ගරු මන්ත්‍රීතුමනි. මේ සඳහා හෙක්ටයාර මිලියන 1.95ක් පමණ වන මුළු ස්වාභාවික වනාන්තර ප්‍රමාණය ආරක්ෂා කරගත යුතු වන අතර, නව වනාන්තර හෙක්ටයාර 145,000ක් පමණ ස්ථාපිත කළ යුතු වෙනවා. අපේ ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමා සඳහන් කළ ආකාරයට අපට අලුත් වනාන්තර හෙක්ටයාර 145,000ක් රටට හඳුන්වා දෙන්නට සිද්ධ වෙනවා, අතිගරු ජනාධිපතිතුමාගේ එකඟතාව අනුව.

මෙහිදී වනහරණයට පත් වූ භූමි හෙක්ටයාර 40,000ක් හඳුනාගෙන තිබෙන අතර, එහි වනාන්තර නැවත ප්‍රතිස්ථාපනය කිරීමට අපි බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම ශාක ගහනය අඩු ලඳු කැලෑ සහිත භූමි හෙක්ටයාර 90,000ක් ආරක්ෂා කර ස්වාභාවික පුනර්ජනනය වේගවත් කර, එම ලඳු කැලෑ උසස් තත්ත්වයේ වනාන්තර බවට පත් කිරීමට කටයුතු කිරීමටත් සූදානම් වෙනවා. මොකද, වනාන්තරයක් වෙන්න නම් යම් උස

මට්ටමකට ගස් වැවිලා තිබෙන්නට ඕනෑ. ලඳු කැලෑවකට අපට වනාන්තරයක් කියන්නට බැහැ. අපි මේ target එකට යන්නට ඕනෑ.

ගරු සන්දිත් සමරසිංහ මහතා
(*மாண்புமிகு சந்தித் சமரசிங்க*)
(The Hon. Sandith Samarasinghe)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපේ තිරසර සංවර්ධන අරමුණු කරා යන්නට අපි සංවර්ධන සැලැස්මක් හදලා තිබෙනවා. තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය එම සැලැස්ම හදලා තිබෙන්නේ අනෙකුත් ආයතන එකතු කරගෙනයි. එහි 15වෙනි තිරසර අරමුණ තමයි, "ජීවීන් සහ ගොඩබිම", - Life on Land - කියන එක. අපට ලංකාවේ forest cover එක, -වන ආවරණය- තිබෙන්නේ සියයට 29.7යි. මේ තිරසර සංවර්ධන අරමුණුවල සඳහන් වෙන්නේ අපේ target එක සියයට 35ක් කියලා. දැන් ඔබතුමා කිව්වා, අතිගරු ජනාධිපතිතුමා එකහ වුණේ සියයට 32කට කියලා. අනෙක් ආයතනත් එකතු වන විට, මේ සියයට 35 කියන එකට මොකද වෙන්නේ?

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(*மாண்புமிகு அஜித் மான்னப்பெரும*)
(The Hon. Ajith Mannapperuma)

ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමා සමඟ ඒ ගැන තර්ක කරන්නට යන්නේ නැහැ. අපට Forest Department එකෙන් දුන්නේ එය සියයට 32ක් කියලා. අපි ඒක නිවැරදි කර ගනිමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(*மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Hon. Deputy Speaker)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි 3ක කාලයක් තිබෙනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(*மாண்புமிகு அஜித் மான்னப்பெரும*)
(The Hon. Ajith Mannapperuma)

අපි ඒක නිවැරදි කර ගනිමු, සියයට 35 කියන එක නිවැරදිද, මගේ කථාව නිවැරදිද කියලා සොයා ගනිමු. අපි ඒ ගැන අවධානය යොමු කරන්නම්.

මේ සඳහා හෙක්ටයාර 90,000ක් තෝරා ගෙන තිබෙනවා. අහිතකර මානව ක්‍රියාකාරකම්වලින් මෙම භූමි ආරක්ෂා කිරීමට, ඒවා මැන මායින් කණු සිටුවා ඒවායේ ආරක්ෂාව තහවුරු කිරීමට සහ වනාන්තර නොවන ප්‍රදේශවල පිහිටි පෞද්ගලික ඉඩම්වල සහ වැවිලි ක්ෂේත්‍රයේ පිහිටි ඵලදායී නොවන ඉඩම්වල අදාළ පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් වනාන්තර ඇති කිරීමටද අපි බලාපොරොත්තු වෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා එම යෝජනාවත් කළා, ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමාත් ඒ යෝජනාව කළා. පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්වයෙන් තමයි මේ වනාන්තර වැඩි දියුණු කිරීමට බලාපොරොත්තු වන්නේ. ඒ අනුව මේ වන විට වනාන්තර ඇති කිරීම සඳහා සුදුසු ඉඩම් හෙක්ටයාර 50,000ක් පමණ හඳුනාගෙන ඇති අතර, වනාන්තර ඇති කිරීම සඳහා අවශ්‍ය ජාතික සහ ජාත්‍යන්තර සහාය ලබා ගැනීමට කටයුතු කරමින් සිටිනවා. ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමාගෙන් අපට දැන් යෝජනාවක් ආවා, විදුලිබල මණ්ඩලයටත් මේකට එකතු වෙන්න පුළුවන් කියලා.

එක්සත් රාජධානියේ පරිසර හා ග්‍රාමීය සංවර්ධන දෙපාර්තමේන්තුව සමඟ මෙම වනාන්තර ප්‍රතිෂ්ඨාපන කටයුතු පිළිබඳව සාකච්ඡා කරන ලද අතර, එම ආයතනය මඟින් මේ සඳහා රුපියල් මිලියන 3,364ක ණය නොවන මූල්‍ය ආධාර සැපයීමටද එකඟ වෙලා තිබෙනවා. මෙයට අමතරව මේ වන විට හරිත දේශගුණික අරමුදලෙන් වනාන්තර ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා ප්‍රදාන ලබා ගැනීමට සංකල්ප වාර්තාවක් එම අරමුදල වෙත ඉදිරිපත් කරලා තිබෙනවා. තවද, පෞද්ගලික අංශයේ සාමූහික සමාජ වගකීම් යටතේ වනාන්තර ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා ඔවුන්ගේ දායකත්වය ලබා ගැනීමට කටයුතු කර ඇති අතර, එම දායකත්වය තවදුරටත් ඉහළ දැමීමටද කටයුතු කරනු ලබනවා. ඒ වාගේම වනාන්තර ඇති කිරීමට ග්‍රාමීය දිළිඳු ජනතාවගේ සහභාගිත්වය අත්‍යවශ්‍ය වන අතර, ඔවුනට එමඟින් ප්‍රතිලාභ ද අත්විය යුතුයි. අපි ඒක පිළිගන්නවා. ඒ ගැන ඔබතුමාගේත් යෝජනාවකුත් තිබුණා, ඒ ගැන කථා කළා.

ඒ සඳහා ක්‍රියාත්මක කරනු ලබන කෘෂි වන වගා වැඩසටහන යටතේ රජයේ මුඩු ඉඩම් ග්‍රාමීය ජනතාවට ලබා දී එම වන වගාව යටතේ දැව නිෂ්පාදනය සඳහා සුදුසු ශාක විශේෂ වගා කිරීමට ඔවුන්ට ආධාර ලබා දෙනවා. වර්තමානයේත් ඒක කරනවා. ආධාර ලෙස වගා කිරීමට අවශ්‍ය පැළ, දිරි දීමනා ගොවීන් හට ලබා දෙනු ලැබේ. වසර 30කට පසු මෙම වගා කරන ශාකවල දැව අස්වනු නෙළීමේ අයිතියද ගොවීන්ට හිමි වේ. තවද, ගොවීන් හට වන වගාවේ මුල් කාලයේ දී එම භූමියේ කෘෂි භෝග වගා කිරීමටද හැකි වේ. 2015 සිට මේ දක්වා මෙම වැඩසටහන මඟින් හෙක්ටයාර 340ක කෘෂි වන වගා ස්ථාපිත කරලා තිබෙනවා. ග්‍රාමීය ජනතාවට අයත්වන ප්‍රතිලාභ ඉහළ නැංවීම සඳහා වන වගා කිරීමේ දී ආහාර, ඖෂධ හා ග්‍රාමීය ජනතාවට ප්‍රයෝජනවත් සුදුසු ශාක විශේෂ වගා කිරීමට කටයුතු කරන අතර අනාගතයේදී තිරසාර ලෙස ඒවායේ ඵලදාව ලබා ගැනීමට ජනතාවට අවස්ථාව ලබා දෙනවා. සමහර වෙලාවට බෙහෙත් වර්ග වෙන්න පුළුවන්; කොස් ගස් වාගේ දේවල් වෙන්න පුළුවන්; අඹ ගස් වෙන්න පුළුවන්. මේ වාගේ දේවල් ආශ්‍රිත වන වගාවන් නිර්මාණය කිරීමට අපි උත්සාහ කරනවා. ඒ වාගේම වනාන්තර ඇති කිරීම මඟින් ලබා ගත හැකි ආර්ථික ප්‍රතිලාභ දීර්ඝ කාලීන වන බැවින් එම ප්‍රදේශයේ ජීවත් වෙන දිළිඳු ජනතාව මේ සඳහා සහභාගී වීම අඩුයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දිළිඳු ජනතාව මේකට සහභාගී කරවා ගන්න අපි උත්සාහ කරනවා. අවුරුදු 20ක් තිස්සේ බලාගෙන ඉන්න ඕනෑ, මේකේ ප්‍රතිලාභ ලබා ගන්න. එතකොට ඉක්මනින්ම ආදායම් ලබා ගන්නේ කොහොමද කියන එක ගැනත් බලන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(*மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்*)
(The Hon. Deputy Speaker)
දැන් අවසාන කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(*மாண்புமிகு அஜித் மான்னப்பெரும*)
(The Hon. Ajith Mannapperuma)

ඉදිරියේදී අපි කල්පනා කරනවා; කටයුතු කරනවා; සැලසුම් සකස් කරනවා, ගමේ ඉන්න ජනතාවට ආධාර දීලා අවුරුදු දෙකක් පැළය බලාගන්න කටයුතු කරන්න. ඊට පස්සේ ව්‍යාපාරිකයෙකුට ඒක දෙනවා, ඉතිරි ටික කරගෙන යන්න. ඒ සඳහාත් වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මේ සඳහා කාලීන යෝජනාවක් ඉදිරිපත් කරපු -

ගරු අජිත් පී. පෙරේරා මහතා
(*மாண்புமிகு அஜித் பீ. பெரேரா*)
(The Hon. Ajith P. Perera)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එක කාරණයක් කියන්න අවශ්‍යයි. අපේ සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා මේ අදාළ විෂයේ අධීක්ෂණ මන්ත්‍රීතුමා හැටියට කටයුතු කරනවා. ගරු අජිත් මාන්නප්පෙරුම මැතිතුමා පරිසර නියෝජ්‍ය ඇමතිතුමා. මම මගේ

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

විෂයේ රාජ්‍ය ඇමතිතුමා. මේ ක්ෂේත්‍රයේ තිබෙන ලොකු අඩුපාඩුවක් තමයි මේ අමාත්‍යාංශ තුන එකට එකතු වෙලා වැඩ නොකිරීම. අපට සහයෝගයෙන් වැඩ කරන්න පුළුවන් වාතාවරණයක් ගොඩනැඟිලා තිබෙනවා. "Sustainable Development" කියන විෂයට අමාත්‍යාංශ තුනක් තිබීම නිසා දෝ මෙතැන ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අපි එකතු වෙලා වැඩ කළොත් අපට වඩා වැඩි සාර්ථකත්වයක් ගන්න පුළුවන්. Sri Lanka Sustainable Energy Authority එක මගේ අමාත්‍යාංශය යටතේයි තිබෙන්නේ. එය වඩා පහසුකම් තිබෙන, විශාල පිරිසක් සේවය කරන ශක්තිමත් ආයතනයක්. අපි මේ අමාත්‍යාංශ තුන එකතු වෙලා වැඩ කරමු කියලා මම යෝජනා කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
දැන් අවසාන කරන්න.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමනි, අමාත්‍යාංශ තුනක් විතරක් නොවෙයි, අමාත්‍යාංශ ගණනාවක් එකතු වෙන්න තිබෙනවා. මේකට ව්‍යාපාර ක්ෂේත්‍රය එකතු වෙන්න ඕනෑ. ව්‍යාපාර සහ සංවර්ධනය කරන කට්ටිය තමයි වන විනාශයට ගොඩක් මූලික වෙන්නේ. එක පැත්තකින් ඒ ගොල්ලන් කියනවා, ඒ ගොල්ලන්ට අවශ්‍ය පහසුකම් ලැබෙන්නේ නැහැ කියලා. අනෙක් පැත්තෙන් අපි කියනවා, පරිසරයේ ප්‍රශ්නයක් තිබෙනවා කියලා. අපි ඔක්කෝම එකතු වෙලා මේ සඳහා තීන්දු-තීරණ අරගෙන කටයුතු කරන්න ඕනෑය කියන එකත් විශේෂයෙන් සඳහන් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.26ට, 2018 ජූනි 22වන සිකුරාදා පූ.භා. 10.00 වන තෙක් කල් ගියේය.


அதன்படி பி. ப. 7.26 மணிக்கு பாராளுமன்றம், 2018 யூன் 22, வெள்ளிக்கிழமை மு.ப. 10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 7.26 p.m. until 10.00 a.m. on Friday, 22nd June, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

261 වන කාණ්ඩය - 7 වන කලාපය
தொகுதி 261 - இல. 7
Volume 261 - No. 7

2018 ජූනි 22වන සිකුරාදා
2018 யூன் 22, வெள்ளிக்கிழமை
Friday, 22nd June, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන :

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ (ඔම්බුඩ්ස්මන්) නිර්දේශය ක්‍රියාත්මක නොකිරීම පිළිබඳ වාර්තාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාව : සාමාජිකයන් නම් කිරීම

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය :

රජයේ බදු ප්‍රතිපත්තිය නිසා දේශීය කර්මාන්තකරුවන් මුහුණ දී ඇති ගැටලු

වරප්‍රසාද :

2018 ජූනි 21 වැනි දින "ලංකාදීප" වාර්තාව

ශෝක ප්‍රකාශ :

ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා
ගරු රේණුකා හේරත් මහත්මිය
ගරු මල්ලිකා රත්වත්තේ මහත්මිය

කල් තැබීමේ යෝජනාව:

වන සතුන්ගෙන් සිදුවන වගා හානිය

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:

நிருவாகத்திற்கான பாராளுமன்ற ஆணையாளரின் (ஒம்புட்ஸ்மன்) விதப்புரை நடைமுறைப்படுத்தப் படாமை தொடர்பான அறிக்கை

அரசியலமைப்பு அலுவல்கள் பற்றிய குழு: உறுப்பினர் கள் நியமனம்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:

அரசாங்கத்தின் வரிக்கொள்கையினால் உள்நாட்டுக் கைத்தொழிலாளர் எதிர்நோக்கும் பிரச்சினைகள்

சிறப்புரிமை:

2018 யூன் 21ஆம் தேதிய" லங்காதீப" அறிக்கை

அனுதாபத் தீர்மானம்:

மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர்
மாண்புமிகு (திருமதி) ரேணுகா ஹேரத்
மாண்புமிகு (திருமதி) மல்லிகா ரத்தவத்த

ஒத்திவைப்புப் பிரேரணை:

வன விலங்குகளால் ஏற்படும் பயிர்ச் சேதம்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Report on Non-Implementation of Recommendation by Parliamentary Commissioner for Administration (Ombudsman)

Committee on Constitutional Affairs: Nomination of Members

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Issues Faced by Domestic Industrialists Due to Government Tax Policy

PRIVILEGE:

"Lankadeepa" Report of 21st June, 2018

VOTES OF CONDOLENCE:

Hon. A.R.M. Abdul Cader
Hon. (Mrs.) Renuka Herath
Hon. (Mrs.) Mallika Ratwatte

ADJOURNMENT MOTION:

Crop Damage Caused by Wild Animals

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 ජූනි 22වන සිකුරාදා
2018 ஜூன் 22, வெள்ளிக்கிழமை
Friday, 22nd June, 2018

පූ.භා. 10.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගේ (ඔම්බුඩ්ස්මන්) නිර්දේශය ක්‍රියාත්මක නොකිරීම පිළිබඳ වාර්තාව
நிருவாகத்திற்கான பாராளுமன்ற ஆணையாளரின் (ஒம்புட்ஸ்மன்) விதப்புரை நடைமுறைப்படுத்தப்படாமை தொடர்பான அறிக்கை
REPORT ON NON-IMPLEMENTATION OF RECOMMENDATION BY PARLIAMENTARY COMMISSIONER FOR ADMINISTRATION (OMBUDSMAN)

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

කොළඹ ජාතික කලා භවන පරිශ්‍රයේ සේවයේ නියුතු කේ.ඩී. කල්‍යාන් මහතා විසින් සිදුකර ඇති පැමිණිල්ලක් මත පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) විසින් විමර්ශනයක් සිදුකර ඇති අතර, එම විමර්ශනය සඳහා සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂවරිය සහ ජාතික කලා භවනේ ස්ථාන භාර නිලධාරිනිය කැඳවා ඇති නමුත්, එම නිලධාරිනියන් වෙනුවෙන් අදාළ ආයතනයේ වෙනත් මාණ්ඩලික නිලධාරීන් සහභාගි වී ඇති අතර, පසුව එම විමර්ශනයේ නිර්දේශය සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂවරිය වෙත යොමු කළ විට එම නිර්දේශය අනුව කටයුතු කළ නොහැකි බවටත්, එය ඒක පාර්ශ්වීය නිර්දේශයක් ලෙසට හැඟී යන බවටත් සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂවරිය විසින් දන්වා ඇති බැවින්, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්) විසින් 1994 අංක 26 දරන පනතින් සංශෝධිත 1981 අංක 17 දරන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් පනතේ 17 (3) (ඇ) වගන්තිය යටතේ අවධානයට සහ වැඩිදුර කටයුතු සඳහා මා වෙත වාර්තාවක් එවා ඇති බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු කථානායකතුමනි, එම වාර්තාව සභාව ඉදිරියේ තබනවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මම එම වාර්තාව ඔබතුමන්ලාට ලැබෙන්න සලස්වන්නම්.

II

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම
அரசியலமைப்பு அலுவல்கள் பற்றிய குழு: உறுப்பினர்கள் நியமனம்
COMMITTEE ON CONSTITUTIONAL AFFAIRS: NOMINATION OF MEMBERS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 123 වැනි ස්ථාවර නියෝගයේ විධිවිධාන ප්‍රකාරව කථානායකවරයා සභාපතිවරයා වූ ද, අග්‍රාමාත්‍යවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා සහ ම'විසින් නම් කරනු ලබන වෙනත් මන්ත්‍රීවරයන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු පිළිබඳ කාරක සභාවේ සේවය පිණිස ගරු රවුෆ් හකීම්, ගරු චමල් රාජපක්ෂ සහ ගරු විජිත හේරත් නමැති මන්ත්‍රීවරයන් තිදෙනා ම'විසින් නම් කරනු ලැබ ඇති බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා මූලතිව් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව හා ගිණුම් ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා මහා භාරකාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු රංජිත් අලුවිහාරේ මහතා (සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ரஞ்சித் அலுவிஹாரே - சுற்றுலாத்துறை அபிவிருத்தி மற்றும் கிறிஸ்தவ சமய அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Ranjith Aluvihare - State Minister of Tourism Development and Christian Religious Affairs)

ගරු කථානායකතුමනි, මම මාතලේ, හත්තොට අමුණ, කළුගඟ යන ලිපිනයෙහි පදිංචි එච්.එම්.කේ. හේරත් මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி) (திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)

ගරු කථානායකතුමනි, මම කටාන, කෝංගොඩමුල්ල, පිටියමුල්ල පාර, අංක 411/5 දරන ස්ථානයෙහි පදිංචි ආර්.ජී. අජිත් පද්මසිරි මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, මම දෙහිවල, හිල් වීදිය, ධම්මාලංකාර මාවත, අංක 70/2,1/1 දරන ස්ථානයෙහි පදිංචි පී. රාමචන්ද්‍රන් මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු එස්. සී. මුතුකුමාරණ මහතා
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)

ගරු කථානායකතුමනි, මම මහඉලුප්පල්ලම, ගල්මඩුව, අංක 19 දරන ස්ථානයෙහි පදිංචි ජේ.ඒ. තිලක් සමරකෝන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අ. අරවින්ද් කුමාර් මහතා -*[සභා ගර්භය තුළ නැත.]*

ගරු රුවන් විජයවර්ධන මහතා (ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ருவன் விஜயவர்தன - பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Ruwan Wijayawardene - State Minister of Defence)

ගරු කථානායකතුමනි, මම ගම්පහ, මුදුන්ගොඩ, අංක 131/14 දරන ස්ථානයෙහි පදිංචි ටෙරන්ස් ප්‍රියන්ත තිරිමාන්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 1 - 19/'18-(1), ගරු ආනන්ද අලුත්ගමගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රාදේශීය වැවිලි සමාගම් : ලාභ /අලාභ
பிராந்திய பெருந்தோட்டக் கம்பனிகள்: இலாபம்/நட்டம்
REGIONAL PLANTATION COMPANIES: PROFIT/LOSS

41/'18

2. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 156ට අනුව, ප්‍රාදේශීය වැවිලි සමාගම් කොළඹ කොටස් වෙළඳපොළෙහි ලේඛනගත සමාගම් බවට පත් කිරීමේ අරමුණ සපුරා ගැනීම සඳහා 2016 වර්ෂය තුළදී අනුගමනය කළ ක්‍රියාමාර්ග කවරේද;

(ii) 1992 වර්ෂයේදී පිහිටවූ ප්‍රාදේශීය වැවිලි සමාගම් සහ ඒවායේ හිමිකාරිත්වය පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(iii) වර්ෂ 1992 සිට 2016 දක්වා, ඉහත එක් එක් ප්‍රාදේශීය වැවිලි සමාගම්වල ලාභාලාභ ප්‍රමාණයන් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඉහත එක් එක් ප්‍රාදේශීය වැවිලි සමාගම් විසින් හිමිකරගෙන ඇති ඉඩම් අක්කර ප්‍රමාණයන් සහ ඒවායේ ඵලදායිතාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

පෙරුන්තෝට්ටක් කෛත්තොෆිල් අමෛච්සරෛක් කේට්ට විනා:

(அ) (i) 2016 ஆம் ஆண்டுக்கான வரவுசெலவுத் திட்டப் பிரேரணை இலக்கம் 156 இன்படி, பிரதேச பெருந்தோட்டக் கம்பனிகளை கொழும்பு பங்குச் சந்தையில் பட்டியலிடப்பட்ட கம்பனிகளாக மாற்றும் நோக்கத்தை அடைவதற்காக 2016 ஆம் ஆண்டில் பின்பற்றப்பட்ட வழிமுறைகள் யாவை என்பதையும்;

(ii) 1992 ஆம் ஆண்டில் நிறுவப்பட்ட பிரதேச பெருந்தோட்டக் கம்பனிகள் மற்றும் அவற்றின் உரிமை தொடர்பாக முழுமையான ஓர் அறிக்கையை சமர்ப்பிப்பாரா என்பதையும்;

(iii) 1992 முதல் 2016 ஆம் ஆண்டு வரை மேற்கூறிய ஒவ்வொரு பிரதேச பெருந்தோட்டக் கம்பனியினதும் இலாப நட்டம் ஒவ்வொரு வருடத்திற்கமைய வெவ்வேறாக எவ்வளவு என்பதையும்;

(iv) மேற்குறித்த ஒவ்வொரு பெருந்தோட்டக் கம்பனியினாலும் உரிமையாக்கிக் கொண்டுள்ள ஏக்கர் அளவு மற்றும் அவற்றின் உற்பத்தித் திறன் வெவ்வேறாக யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation Industries:

(a) Will he inform this House-

(i) the measures taken in the year 2016 in order to achieve the objective of making regional plantation companies registered companies on the Colombo Stock Exchange, as per the proposal No. 156 of the 2016 budget;

(ii) whether he will submit a comprehensive report of the plantation companies established in the year 1992 along with the names of their owners;

(iii) the profits earned or the losses incurred by each of the plantation company mentioned above in each year during the period from the year 1992 up to 2016, separately; and

(iv) the number of acres owned by each regional plantation company mentioned above along with their productivity, separately?

(b) If not, why?

ගරු ඒ.ඩී. ප්‍රේමදාස මහතා (වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஏ.டி. பிரேமதாச - பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. A.D. Premadasa - State Minister of Plantation Industries)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ප්‍රාදේශීය වැවිලි සමාගම් කොළඹ කොටස් වෙළෙඳ පොළෙහි ලේඛනගත සමාගම් බවට පත් කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුකූලව ප්‍රතිපත්ති හා සැලසුම් කටයුතු අමාත්‍යාංශය යටතේ වැවිලි ප්‍රතිව්‍යුහකරණ කමිටුව පිහිටුවීම සිදු කර ඇත. ඒ යටතේ උප කමිටු පත් කිරීම සිදු කර නිර්දේශ ලබා දී ඇති අතර, ප්‍රධාන කමිටුව මඟින් පත් කළ ජාත්‍යන්තර ගිණුම්කරණ ආයතන 03ක් විසින් ප්‍රාදේශීය වැවිලි සමාගම්වල මූල්‍යමය හා කෘෂි කාර්මික ඇගැයීමක් සිදුකර ඇත. ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය.

(ii) ඇමුණුම I මඟින් ඉදිරිපත් කර ඇත.

(iii) ඇමුණුම II මඟින් ඉදිරිපත් කර ඇත.

(iv) පෞද්ගලීකරණය කරන ලද ප්‍රාදේශීය වැවිලි සමාගම් 20 යටතේ පාලනය වන ඉඩම් ප්‍රමාණයන් ඇමුණුම III මඟින් ඉදිරිපත් කර ඇත.

ප්‍රාදේශීය වැවිලි සමාගම් 20ට අදාළව වතුයායන් 400කට ආසන්න ප්‍රමාණයක තේ, පොල්, රබර් යන ප්‍රධාන බෝගයන්ට අමතරව විවිධ බෝග වගා කර ඇත. වතුවල ඵලදායිතාව වතුයායෙන් වතුයායට, වැවිලි සමාගමෙන් සමාගමට මෙන්ම විවිධ කාල පරාසයන් තුළදී ද වෙනස් වීම්වලට භාජනය වේ.

මෙහිදී ඵලදායිතාව යන්නෙන් අදහස් කරන සංඛ්‍යා දත්තයන් මොනවාද යන්න නිශ්චිතව සඳහන් කරන්නේ නම්, ඒ පිළිබඳව අදාළ දත්ත ලබා දිය හැකිය.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම් **සභාගත*** කරමි.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. මෙය ඉතාම ඉහළ ජාතික වැදගත්කමකින් යුත් ප්‍රශ්නයක්.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

මක්නිසාද යත්, 2016 අයවැය යෝජනා 156 යටතේ දක්වා තිබෙන්නේ, ප්‍රාදේශීය වැවිලි සමාගම් අපේ රටේ මහ පොළොව පිළිබඳ අයිතිය කොටස් වෙළෙඳ පොළේ හුවමාරු කිරීම පිළිබඳව අවශ්‍ය විධි විධාන යොදනවා කියලායි. මගේ පෞද්ගලික විශ්වාසය නම්, ගරු රාජ්‍ය ඇමතිතුමාට ඒ පිළිබඳව පැහැදිලි අවබෝධයක් නැහැ කියායි. නමුත්, කොටස් වෙළෙඳ පොළේ විකිණීම සහ මේ යෝජනාව එලෙසින් පාර්ලිමේන්තුවේ තිබියදී, වැවිලි සමාගම් සතු මහ පොළොව, මේ දේශයේ භූමිය කැබිනට් මණ්ඩලයට හෝ පාර්ලිමේන්තුවට නොදන්වා, විවිධාකාර ක්‍රමවේදයන් යටතේ අයිතිය හුවමාරු කිරීමේ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වන බව තමයි ඒකාබද්ධ විපක්ෂයේ -අපේ- අදහස වන්නේ.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, කොටස් වෙළෙඳ පොළ හරහා විකිණීම හැර, වැවිලි සමාගම් සතුව තිබෙන ඉඩම් දිගු කාලීන හෝ කෙටි කාලීන බදු පදනම යටතේ ලබාදීම් කෙරෙනවාද, එහෙම නැත්නම්, වැවිලි නොවන වෙනත් ක්ෂේත්‍ර සඳහා ලබාදීම් කරනවාද, සංචාරක හෝටල් ඉදිකිරීම සඳහා වෙන් කරනවාද, ගොවි පොළවල් ඇති කිරීම සඳහා වෙන් කරනවාද, යනාදිය පිළිබඳව අමාත්‍යාංශය භාර රාජ්‍ය ඇමතිවරයා වශයෙන් ඔබතුමාට යම් අදහසක් කියන්න පුළුවන්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, ඔබතුමා පිළිතුරක් දෙනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, 1995 චන්ද්‍රිකා මැතිනියගේ ආණ්ඩුව කාලයේ ඉඩම් අක්කර ලක්ෂ 9ක් සමාගම්වලට වික්කේ කොටස් වෙළෙඳ පොළ හරහා බව බන්දුල ගුණවර්ධන මැතිතුමාට මම ඊයේත් කිව්වා.

මොනවාද, මේ කථා කරන්නේ? චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය -[බාධා කිරීමක්] කොටස් වෙළෙඳ පොළ හරහා තමයි ලක්ෂ පහක් දුන්නේ. කොටස් වෙළෙඳ පොළෙන් ගත්තා නම්, කොටස් වෙළෙඳ පොළ හරහා ගනුදෙනු කරන්න පුළුවන්.

ඊළඟට මා කියන්න කැමැතියි, 1994 ආණ්ඩුව සමාගම්වලට ඉඩම් අක්කර ලක්ෂ නවයක් දුන් බව. යහපාලන ආණ්ඩුව එහෙම නොවෙයි. අපි වතු කම්කරු පවුල් එක්ලක්ෂ පනස්දහසකට පර්චස් හත ගණනේ ඉඩම් ලබා දෙන බව මා මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. [බාධා කිරීමක්] අපි දැන් ඒ කටයුත්ත පටන් අරගෙන තිබෙනවා. අපි පූලි මාසයේ පළමුවනදා ගරු අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කැලෑබොක්ක වත්තේ උත්සවයක් පවත්වනවා. එදාට අපි වතු කම්කරුවන්ට ඉඩම් කැබලි 500ක් ලබා දෙනවා. ඒ කාලයේ සමාගම්වලටයි දුන්නේ. ඔබතුමා මේ ප්‍රශ්නය පුන පුනා අහනවා. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය කොටස් වෙළෙඳ පොළෙන් විකිණුවා නම්,- She sold it on the Colombo Stock Exchange. That is what happened.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු මන්ත්‍රීතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග හිටපු ජනාධිපතිතුමිය කළ දේ එලෙසින් කිරීම වැරදි සහගතයි කියලා අධිකරණයෙන් තීන්දු කරලා, දඩ නියම කළ කතන්දරයක් තිබෙනවා කියලා ඔබතුමා පිළිගත යුතු වෙනවා; Waters Edge එක ගැන.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ඉන්න, මගේ ප්‍රශ්නය අහලා ඉවර නැහැ. මගේ ප්‍රශ්නය අහන්න දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, දෙවන අතුරු ප්‍රශ්නය අහලා අවසන් කරන්න.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
එතකොට, 2016 අය වැය ලේඛනයේ 156 වන යෝජනාව දැම්මේ මොකටද? ඔබතුමා කියන ආකාරයට එසේ කරන්න අයිතිය තිබුණා නම්, නැවත කොටස් වෙළෙඳ පොළට දමනවා කියලා මේ ගරු සභාවට යෝජනාවක් ඉදිරිපත් කළේ මොකටද? ඒ යෝජනාව සම්මත කරලා, ඊට සම්පූර්ණ පටහැනි ආකාරයට අද මේ මහ පොළොව පිළිබඳ තීන්දු තීරණ ගැනීමේදී තමුන්නාන්සේලා වෙළෙඳ පොළ ලිහිල්කරණය කියන පළල් ප්‍රතිපත්තිය යටතේයි මේ කරන්නේ. ඉඩම් වෙළෙඳ පොළ ලිහිල්කරණය;

ජාත්‍යන්තර මූල්‍ය ආයතනයට හා අනික් ඒවාට අවශ්‍ය ලෙස අපේ රටේ ශ්‍රම වෙළෙඳ පොළ, ප්‍රාග්ධන වෙළෙඳ පොළ, ඉඩම් වෙළෙඳ පොළ යන සියල්ල ලිහිල් කර ඉදිරිපත් කර තිබෙන වෙළෙඳ ප්‍රතිපත්තිය යටතේ, ලංකා ඉතිහාසයේ නොවූ විරූ පරිදි - ට්‍රම්ප් තමන්ගේ රට ආරක්ෂා කරනකොට- අපි රට සම්පූර්ණයෙන් විවෘත කරලා, ස්වජාතිකයන් වනසන, විජාතිකයන් සනසන ප්‍රතිපත්තියක් තමයි මේ ක්‍රියාත්මක කරන්නේ. ඒ සඳහා අපේ සභානායකතුමාත් සමඟ මේ ගරු සභාවේ ප්‍රබුද්ධ විවාදයක් ඇති කිරීමට සහාය දෙන්න. අපේ ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමා නම් උසස් අධ්‍යාපනය පිළිබඳ බොහොම ප්‍රබුද්ධ සංවාදයකට ලැහැස්තියි කියා තිබෙනවා. ඒ වාගේ, අපේ රටේ උරුමය පිළිබඳව, සංවේදී නකල්ස් කඳුවැටි කලාප පිළිබඳව ප්‍රසිද්ධ විවාදයක් කන්ද උඩරට උරුමකරුවන් විධියට සභානායකතුමා අපිට ලබා දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. අපි එය ගරු සභානායකතුමාට යොමු කරමු.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අපි විවාදයකට සූදානම්. මෙතුමා විවාදයක් ඉල්ලුවේ නැහැ නේ. මෙතුමා වෙන දේවල් නේ, කථා කළේ.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
දැන් ඉල්ලනවා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
මෙතුමා කථා කළේ මාධ්‍යයටයි. ගරු කථානායකතුමනි, මම දින සියයේ ආණ්ඩුවේ වැවිලි කර්මාන්ත ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ පර්චස් හතක ඉඩමක් සෑම වතු කම්කරු පවුලකටම දෙන්න ඕනෑය කියා කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කළා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය කාරණය ගැන කථා කරන එක අපි දැන් නවත්වමු.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
අපි දැන් එය ක්‍රියාත්මක කරනවා. තමුන්නාන්සේලා අවුරුදු 20ක් බලයේ ඉඳලත් වතු කම්කරු පවුලකට පර්චස් 7ක් දෙන්න බැරි වුණා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මම ඒකට තව කරුණක් එකතු කරන්නම්. වතු කම්කරු පවුල්වලට ඉඩම් ලබා දීමට අදාළව අපේ අමාත්‍යාංශයෙන් සින්නක්කර ඔප්පුවක් ලබා දීමේ කටයුතු දැන් ආරම්භ කර තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 3 -133/'18- (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ජීව විද්‍යා අංශයෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ සිසුන්: මාතලේ, නුවරඑළිය සහ මහනුවර දිස්ත්‍රික්ක

උයිරියල් තුරෙයිල් පල්කලෙක්කළක අනුමතික්කුත් තකෙමෙපෙට්‍ර මාණවර්කළ්: මාත්තළෙ, නුවරෙලියා මර්‍රුම් කණ්ඩි මාවට්ටඞ්කළ්

STUDENTS QUALIFIED FOR UNIVERSITY ENTRANCE IN BIOLOGY STREAM: MATALE, NUWARA ELIYA AND KANDY DISTRICTS

160/'18

4. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) 2015 වර්ෂයේදී අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා ජීව විද්‍යා විෂය ධාරාවෙන් මාතලේ, නුවරඑළිය සහ මහනුවර දිස්ත්‍රික්කවලින් පෙනී සිටි ශිෂ්‍යයන් සංඛ්‍යාව;

(ii) එම සංඛ්‍යාවෙන්, විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iii) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් සංඛ්‍යාව සහ ප්‍රතිශතය;

(iv) වෛද්‍ය පීඨ සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍යයා හෝ ශිෂ්‍යයාවගේ අවම ප්‍රතිඵලය, Z අගය, ඉගෙනගත් පාසල හා තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය;

එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

උයර්කල්වි මර්‍රුම් කලාසාර අලුවල්කළ් අමෙච්චරෙක් කේට්ට විනා:

(அ) (i) 2015 ආම් ආණ්ඩිල් ක.පොත. (උයර්තර) පරීට්සෙක්කු උයිරියල් පාඩත්තුරෙයිල් මාත්තළෙ, නුවරෙලියා මර්‍රුම් කණ්ඩි මාවට්ටඞ්කළිලිරුන්දු තෝර්‍රියුළ්ළ මාණවර්කළින් එණ්ණික්කෙ යාතෙන්පතෙයුම්;

(ii) මේර්පඩි එණ්ණික්කෙයිල්, පල්කලෙක්කළක අනුමතික්කාන තකෙමෙයෙයිප් පෙර්‍රුළ්ළ මාණවර්කළින් එණ්ණික්කෙයුම් සතවීතමුම් එව්වළවෙන්පතෙයුම්;

(iii) මරුත්තුව පීඩත්තිර්කාන තකෙමෙයෙයිප් පෙර්‍රුළ්ළ මාණවර්කළින් එණ්ණික්කෙයුම් සත වීතමුම් එව්වළවෙන්පතෙයුම්;

(iv) මරුත්තුව පීඩත්තිර්කාන තකෙමෙයෙයිප් පෙර්‍රුළ්ළ මාණවන් අල්ලතු මාණවියින් ආකක්කුරෙන්ත පෙරුපේපු, Z පෙරුමති, කල්වි කර්‍ර පාඩසාලෙ මර්‍රුම් තෙරිවුසෙය්යප්පට්ට මරුත්තුව පීඩම් යාතෙන්පතෙයුම්;

ඔව්වොරු මාවට්ටත්තින්පඩි තනිත්තනියාක අවර් ඉච්චපෙයික්කු අර්‍රිවිප්පාරා?

(ஆ) ඉන්‍රෙල්, ඒන්?

asked the Minister of Higher Education and Cultural Affairs:

[ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා]

(a) Will he inform this House in respect of each district, separately-

(i) the number of students who sat for the GCE (Advanced Level) Examination in the Biology Stream in 2015 from Matale, Nuwara Eliya and Kandy Districts;

(ii) the number and the percentage of the students who were qualified for university entrance;

(iii) the number and the percentage of the students qualified for medical faculties; and

(iv) the minimum result of the students who were qualified for the medical faculty, Z-score, the school in which each student studied and the Medical Faculty to which they got selected?

(b) If not, why?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - (Minister of Higher Education and Cultural Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ජීව විද්‍යා විෂය ධාරාවෙන් 2015 වර්ෂයේ පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව,

මාතලේ දිස්ත්‍රික්කය - 1,073

මහනුවර දිස්ත්‍රික්කය - 3,679

නුවරඑළිය දිස්ත්‍රික්කය - 1,196

(ii) විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව,

මාතලේ දිස්ත්‍රික්කය - 551

මහනුවර දිස්ත්‍රික්කය - 1,993

නුවරඑළිය දිස්ත්‍රික්කය - 549

එම සංඛ්‍යාව අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස,

මාතලේ දිස්ත්‍රික්කය - 51.35%

මහනුවර දිස්ත්‍රික්කය - 54.17%

නුවරඑළිය දිස්ත්‍රික්කය - 45.90%

(iii) වෛද්‍ය පීඨ සඳහා තෝරාගනු ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව,

මාතලේ දිස්ත්‍රික්කය - 21

මහනුවර දිස්ත්‍රික්කය - 83

නුවරඑළිය දිස්ත්‍රික්කය - 30

එම සංඛ්‍යාව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස,

මාතලේ දිස්ත්‍රික්කය - 3.81%

මහනුවර දිස්ත්‍රික්කය - 4.16%

නුවරඑළිය දිස්ත්‍රික්කය - 5.46%

(iv) ඇමුණුමෙහි දක්වා ඇත.

ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) පැන නොනඟී.

**** සභාමේසය මත තබන ලද ඇමුණුම:***
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :
Annex tabled:

විභාග අංකය	නම	දිස්ත්‍රික්කය	පාසල	විෂයය හා සාමාර්ථය		Z අගය	තෝරා ගනු ලැබූ වෛද්‍ය පීඨය
6062520	බී.ඒ.ඩී.ඒ. කුලරත්න	මාතලේ	පෞද්ගලික අයදුම්කරුවෙකු ලෙස විභාගයට ඉදිරිපත්ව ඇත.	භෞතික විද්‍යාව	B	1.7277	නැගෙනහිර විශ්වවිද්‍යාලය
				රසායන විද්‍යාව	B		
				ජීව විද්‍යාව	B		
6291317	ඩබ්ලිව්.ඒ.ඩී.ටී. විජේනායක	මහනුවර	මහ/ශාන්ත අන්තෝනි බාලක විද්‍යාලය	භෞතික විද්‍යාව	A	1.8943	රජරට විශ්වවිද්‍යාලය
				රසායන විද්‍යාව	B		
				ජීව විද්‍යාව	A		
6350240	ඩී.එම්.එම්.ජී.එස්.එම්. දිසානායක	නුවරඑළිය	නු/පොරමඩුල්ල ම.ම. විද්‍යාලය	භෞතික විද්‍යාව	C	1.4407	නැගෙනහිර විශ්වවිද්‍යාලය
				රසායන විද්‍යාව	B		
				ජීව විද්‍යාව	B		

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කර තිබෙන නිසාත්, පසුගිය විවාදයේදී මෙය අවධානයට ගත් නිසාත් මේ සම්බන්ධව මම අතුරු ප්‍රශ්න අහන්නේ නැහැ. නමුත් ගරු ඇමතිතුමාටම සම්බන්ධ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශයට දැන් පවරා තිබෙන ජාතික චිත්‍රපට සංස්ථාව සම්බන්ධයෙන් අතුරු ප්‍රශ්න දෙකක් අහන්න මා කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට අදාළ අමාත්‍යාංශයක් නිසා, ගරු මන්ත්‍රීතුමාට පිළිතුරු ලබා දෙන්න ඔබතුමා සූදානම්ද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු කථානායකතුමනි, මම ගරු මන්ත්‍රීතුමාට පිළිතුරු සපයන්න සූදානම්.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ඇත්තටම කාලයක් තිස්සේ මේ පාර්ලිමේන්තුව තුළත් කථා කළ, අපේ ගයන්ත කරුණාතිලක ඇමතිතුමා සිටියදීත්, රංජිත් මද්දුම බණ්ඩාර ඇමතිතුමා සිටියදීත් සාකච්ඡා කළ ප්‍රශ්නයකට විසඳුමක් ලැබී තිබෙනවා. ඒ කියන්නේ, චිත්‍රපට බෙදා හැරීමේ අයිතිය යළි ජාතික චිත්‍රපට සංස්ථාවට පවරා ගෙන තිබෙනවා. ඇත්තටම එය අගය කරන්න ඕනෑ කටයුත්තක්. චිත්‍රපට සංස්ථාවට තමයි එම අයිතිය තිබෙන්නේ. පනත අනුවම එම අයිතිය පැවරී තිබුණා. ඩික්සන් නිලවීර කම්ටු වාර්තාවෙන් කරපු වටවංගු වැඟීමකින් තමයි මෙම අයිතිය වෙනත් ආයතන කිහිපයකට පැවරී තිබුණේ.

ගරු ඇමතිතුමනි, මම පළමුවැනි අතුරු ප්‍රශ්නය අහන්නේ චිත්‍රපට සංරක්ෂණය සම්බන්ධයෙනුයි. චිත්‍රපට සංස්ථාවේ ඒ සම්බන්ධයෙන් සංරක්ෂණ ඒකකයක් තිබෙනවා. නමුත් එම සංරක්ෂණ ඒකකයේ කටයුතු විධිමත්ව සිද්ධ වෙන්නේ නැහැ, අඩු තරමේ එහි සංරක්ෂණය කර තිබෙන චිත්‍රපට මොනවාද කියාවත් සඳහන් වෙන්නේ නැහැ කියා පසුගිය දිනවල ලිපි කිහිපයක් පළ වී තිබෙන ආකාරය මම දැක්කා. චිත්‍රපට සංස්ථාවේ තිබෙන චිත්‍රපට සංරක්ෂණ ඒකකය විධිමත් කිරීම සඳහා ඔබතුමා ගන්නා වූ වැඩ පිළිවෙළ මොකක්ද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු කථානායකතුමනි, මෙතුමා ඇසූ ප්‍රශ්නයට අදාළව කෙටි පිළිතුරක් දෙන්නම්. 1971 රාජ්‍ය චිත්‍රපට සංස්ථා පනත අනුව චිත්‍රපට බෙදා හැරීමේ අනන්‍ය බලය, ඒකාධිකාරය චිත්‍රපට සංස්ථාවට තිබෙනවා. පනත අනුව තවම එම බලය තිබෙනවා. නමුත් ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ, 2000දී වට වංගුවක් ගිහින් ඩික්සන් නිලවීර වාර්තාව අනුව ගිවිසුම් තුනක් ඇති කරගෙන සමාගම් තුනකට බෙදා හැරීමේ අයිතිය පවරා තිබෙනවා.

ගරු කථානායකතුමනි, තවත් සමාගමකට කිසිදු ගිවිසුමක් නැතුව වාචිකව පැවරීම සිද්ධ කරලා තිබෙනවා. මේ සමාගම් හතර චිත්‍රපට බෙදා හැරීම ආරම්භ කළ දවසේ සිට මේ දක්වා චිත්‍රපට ශාලා 74ක් වැහිලා ගිහින් තිබෙනවා. චිත්‍රපට කර්මාන්තය සම්පූර්ණයෙන් බිඳ වැටීමකට ලක්වෙලා තිබෙනවා. ඒ නිසා ඒ නීති විරෝධී ගිවිසුම් සියල්ල අවලංගු කරලා, චිත්‍රපට බෙදා හැරීමේ ඒකාධිකාරී බලය මේ වනවිට අපේ සංස්ථාව විසින් ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා.

ඔබතුමා ඇසූ දෙවන ප්‍රශ්නයත් ඉතාම ජාතික වැදගත්කමක් ඇති ප්‍රශ්නයක්. 1983 වකවානුවේ තිබුණු අවාසනාවන්ත තත්ත්වය තුළ බොහෝ චිත්‍රපට අපට නැතුව ගියා, සංරක්ෂණය කරමින් තිබුණු චිත්‍රපටත් නැතිව ගියා. ඒ නිසා පසුගිය දිනවල ඇති වූ දීර්ඝ සාකච්ඡාවක ප්‍රතිඵලයක් හැටියට චිත්‍රපට සංරක්ෂණය කිරීම සඳහා අවශ්‍ය උපකරණයක් විශාල මුදලක් වියදම් කරලා ගෙනෙන්න කටයුතු කරනවා. ඒ වාගේම මා දන්නා තරමින් දැනටත් චිත්‍රපට 5ක් හෝ 6ක් සංරක්ෂණය කර තිබෙනවා. ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ - Department of National Archives - සියලු පහසුකම් තිබෙන නිසා ඒකාබද්ධ ව්‍යාපෘතියක් විධියට ඉතා ඉක්මනින් ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, බොහොම ස්තුතියි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, දෙවන අතුරු ප්‍රශ්නය ඇහුවේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අතුරු ප්‍රශ්න නොවෙයි. පැහැදිලි කර ගැනීමකටයි අවස්ථාව දුන්නේ. මෙය පිටස්තර ප්‍රශ්නයක්. පැහැදිලි කර ගැනීමට මා අවස්ථාවක් දුන්නා. ඇමතිතුමා කැමැති නම් මා ඉඩ දෙන්නම්. තවත් පැහැදිලි කිරීමක් අවශ්‍ය නම්, ඇමතිතුමා කැමැති නම් මා අවස්ථාව දෙන්නම්. මට ප්‍රශ්නයක් නැහැ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු කථානායකතුමනි, වෙලාව තිබෙනවා නම් ඒ සඳහා ඉඩ දෙන්න. මා පැහැදිලි කරන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. කෙටියෙන් අහන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මා දන්නා හැටියට චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ කාලයේ චිත්‍රපට සංරක්ෂණය සඳහා ප්‍රංශයෙන් යන්ත්‍රයක් ගෙනැල්ලා තිබෙනවා. ඒ යන්ත්‍රයෙන් වැඩක් ගන්නේත් නැහැ. ඒ යන්ත්‍රය වෙනුවෙන් විශාල මුදලක් වියදම් කරලා තිබුණත් එය මේ වනකොට ගබඩා කරලා තිබෙනවා. ලෙස්ටර් ජේම්ස් පීරිස් මැතිතුමා මා හිතන්නේ රේඛාව චිත්‍රපටය නිෂ්පාදනය කරපු කාලයේ ඉඳලාම කළ ඉල්ලීමක් තමයි, චිත්‍රපට සංරක්ෂණ ආයතනයක් රජය මඟින් ආරම්භ කරන්න කියන එක. එතුමා මීය ගිහිල්ලා තිබෙන නිසා අඩු ගණනේ එතුමාට ගෞරවයක් හැටියටවත් රජය මඟින් ප්‍රමාණවත් මුදලක් වෙන් කර චිත්‍රපට සංරක්ෂණය සඳහා කටයුතු කරනවාද?

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු කථානායකතුමනි, ඒ යන්ත්‍රය පිළිබඳවත් මා වාර්තාවක් ඉල්ලා තිබෙනවා. එම වාර්තාව ලැබුණු වහාම මා ඒ තොරතුරු මේ ගරු සභාවට දැනුම් දෙන්නම්. සංරක්ෂණය කිරීම පිළිබඳව මුදල්වල ගැටලුවක් නැහැ, ගරු කථානායකතුමනි. ඒ කටයුත්ත ඉතාම ඉක්මනටම ක්‍රියාත්මක වන ආකාරයේ වැඩ පිළිවෙළක් අපි අද හෙටම ආරම්භ කරමු.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා.
ප්‍රශ්න අංක 5-197/'18-(1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා. *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 6-218/'18-(1), ගරු ඩග්ලස් දේවානන්දා මහතා. *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 7-393/'18-(1), ගරු ටී. රංජිත් ද සොයිසා මහතා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබාදීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

සමෘද්ධිලාභීන්: මොනරාගල දිස්ත්‍රික්කය
சமூர்த்தி பயனாளிகள்: மொனறாகலை மாவட்டம்
SAMURDHI BENEFICIARIES: MONERAGALA DISTRICT

413/'18

8. ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මොනරාගල දිස්ත්‍රික්කයේ සමෘද්ධි ආධාර ලබන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් සංඛ්‍යාව ඔවුන් ලබන සමෘද්ධි මුද්දරවල වටිනාකම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පසු ගිය සමෘද්ධි සමීක්ෂණයෙන් ලද වාර්තා අනුව කිසියම් වර්ගීකරණයක් කර තිබේද;

(iv) එම සමීක්ෂණයෙන් අනතුරුව ලැබී ඇති අභියාචනා සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම අභියාචනා සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சமூக வலுவூட்டல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மொனறாகலை மாவட்டத்தில் சமுர்த்தி நிவாரணம் பெறும் குடும்பங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) அக்குடும்பங்களின் எண்ணிக்கை இவர்கள் பெறும் சமுர்த்தி முத்திரைகளின் பெறுமதிக் கேற்ப வெவ்வேறாக எவ்வளவென்பதையும்;

(iii) கடந்த சமுர்த்தி மதிப்பாய்வு மூலம் கிடைத்த அறிக்கைக்கேற்ப ஏதேனும் வகைப்படுத்தல் மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(iv) மேற்படி மதிப்பாய்வுக்குப் பின்னர் கிடைத்த மேன்முறையீடுகளின் எண்ணிக்கை ஒவ்வொரு பிரதேச செயலாளர் பிரிவுக்கேற்ப தனித்தனியாக எவ்வளவென்பதையும்;

(v) மேற்படி மேன்முறையீடுகள் சம்பந்தமாக மேற் கொள்ளப்படும் எதிர்கால நடவடிக்கைகள் யாவையென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Social Empowerment:

(a) Will he inform this House -

(i) the number of families benefited by Samurdhi relief in the Moneragala District;

(ii) the number of such families, in terms of the value of the stamps they receive, separately;

(iii) whether any categorization has been done on the information of the last Samurdhi survey;

(iv) the number of appeals received after that survey in relation to each Divisional Secretary's Division, separately; and

(v) the steps to be taken in future in regard to those appeals?

(b) If not, why?

ගරු පී. හැරිසන් මහතා (සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යතුමා)
(மாண்புமிகு பீ. ஹரிசன் - சமூக வலுவூட்டல்கள் அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Social Empowerment)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) පවුල් සංඛ්‍යාව 44,556 යි. (2018.04.30 දිනට)

(ii)

සහනාධාර වටිනාකම	සහනාධාර ලබන පවුල් සංඛ්‍යාව
රු. 420.00	6,665
රු. 1,500.00	12,678
රු. 2,500.00	7,672
රු. 3,500.00	17,541
එකතුව	44,556

(2018.04.30 දිනට)

(iii) ඔව්.

(iv)

අනු අංකය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය	සමීක්ෂණයෙන් අනතුරුව ලැබී ඇති අභියාචනා සංඛ්‍යාව
01	සෙවනගල	03
02	වැල්ලවාය	06
03	බිබිල	06
04	මොණරාගල	10
05	බුත්තල	01
	එකතුව	26

(v) ඉදිරියේදී සමෘද්ධි ප්‍රතිලාභ සඳහා අලුතින් පවුල් ඇතුළත් කර ගැනීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන නව පියවර යටතේ මෙම අභියාචනා ඉදිරිපත් කළ අය ගැනද සලකා බලනු ලැබේ.

(ආ) ඉහත පිළිතුර අනුව අදාළ නොවේ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දුන් පිළිතුර අනුව මට මතුවන විශේෂ ප්‍රශ්නයක් තිබෙනවා. තමුන්නාන්සේලා 2015 බලයට පත්වුණාට පස්සේ තමයි සමෘද්ධි සමීක්ෂණය ආරම්භ වුණේ. මට මතකයි, 2015 ඔක්තෝබර් 20වෙනි දා එවකට සිටි එස්.බී. දිසානායක අමාත්‍යවරයා මේ පාර්ලිමේන්තුවට පැහැදිලි කිරීමක් කළා, 2016 ඔක්තෝබර් 20 වෙන්න කලින් මේ රටට සමෘද්ධි සමීක්ෂණයේ ප්‍රතිඵලය ලබා දෙනවා කියලා.

2016 ඔක්තෝබර් මාසයේ 20වැනි දා වන විටත් තමුන්නාන්සේලාට ඒ සමීක්ෂණ ප්‍රතිඵලය රටට දෙන්න බැරි වුණා. ඉන්පස්සේ තමුන්නාන්සේලා -ආණ්ඩුව- කිව්වේ, තොරතුරු පරිගණකගත කිරීම - data feed - පිළිබඳ ගැටලුවක් තිබෙනවා කියලායි. ඒ විතරක් නොවෙයි. මා දන්නා තරමින් මේ සමීක්ෂණය කරන කාලය තුළ ලංකාවේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකම සමෘද්ධි සහනාධාර ඉල්ලීම් දහස් ගණනක් ආවා. එතකොට තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කිව්වා, "ඒ සමීක්ෂණය කරනවා, කරන ගමන්ම ඒ අභියාචනා සලකා බලනවා" කියලා. ඒ අනුවත් දහස් ගණන් ඉල්ලීම් ආවා. ගරු ඇමතිතුමනි, ඔබතුමාගේ මේ උත්තරය අනුව පැහැදිලියි, ඒ සමීක්ෂණ ප්‍රතිඵල ඉදිරිපත් කිරීමෙන් පසුව -මා හිතන විධියට මේ මෑතකදී එනම්, ගිය අවුරුද්දේ තමයි තමුන්නාන්සේලා ඉදිරිපත් කළේ- ලැබුණු අභියාචනා ටික තමයි තමුන්නාන්සේ මේ ඉදිරිපත් කළේ කියන එක. ඒ අනුව, පොදුවේ ගත් කල ඒ සමීක්ෂණය කරන කාලය ඇතුළත විශේෂයෙන් මොනරාගල දිස්ත්‍රික්කය ඇතුළු ලංකාවේ සෑම තැනකම ඒ, ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල අලුතින් ආපු සමෘද්ධි ඉල්ලීම්, අභියාචනා කොතරම් ප්‍රමාණයක් තිබුණාද කියලා මේ පාර්ලිමේන්තුවට වාර්තා කරන්න ඔබතුමාට පුළුවන්ද?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, මේ වාර්තා සම්බන්ධයෙන් එතුමා අලුත් ප්‍රශ්නයක් අහනවා නම් මට ඒ ගැන හොයා බලා උත්තර දෙන්න පුළුවන්.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු කථානායකතුමනි, මේ වන කොට රාවයක් යනවා, සමෘද්ධි බැංකු අහෝසි කරලා ඒවායෙහි මුදල් මහ බැංකුවට ගන්නවා කියලා. මේ රටේ සමෘද්ධිලාභී පවුල් අනාදිමත් කාලයක සිට-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම එකක් තිබෙනවාද ගරු ඇමතිතුමනි? ගරු ඇමතිතුමනි, එහෙම දෙයක් තිබෙනවාද නැද්ද කියලා උත්තරය දෙන්න.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
සමෘද්ධි ව්‍යාපාරය, දුගී ජනතාව වෙනුවෙන් ජාතික මට්ටමින් තිබෙන ඉතා වැදගත් ව්‍යාපාරයක් හැටියටයි අද මේ රට හඳුනා ගෙන තිබෙන්නේ.

ගරු අමාත්‍යතුමනි, සමෘද්ධි බැංකු අහෝසි කරලා එම බැංකුවල මුදල් මහ බැංකුවට ගැනීමට තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පියවරක් අරගෙන තිබෙනවාද? තමුන්නාන්සේට ඒ ගැන පිළිතුරක් මේ පාර්ලිමේන්තුවට දෙන්න පුළුවන්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම දෙයක් වෙනවාද, නැද්ද කියලා අහන්න. එච්චරයි.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, සමෘද්ධි බැංකුවල මුදල් වෙනත් ආයතනයකට පවරා ගන්නවා නම් මේ පාර්ලිමේන්තුවට ඒ පනත ගෙනැල්ලා වෙනස් කරලායි ඒ කටයුත්ත කරන්න ඕනෑ. එහෙම දෙයක් දැනට සිදු වෙන්නේ නැහැ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
අගමැතිතුමා කිව්වා කියලා තමයි කියන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඇමතිතුමා ඒක නැහැයි කියනවා නේ. අපි ඒක පිළිගනිමු ගරු මන්ත්‍රීතුමා. [බාධා කිරීමක්] ගරු අමාත්‍යතුමා වගකීමකින් යුතුව කියනවා නම් අපි ඒක පිළිගන්නවා.

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මහ බැංකුවට පුළුවන් ඕනෑම බැංකුවක මුදල් ගනුදෙනු පිළිබඳ අධීක්ෂණයක් කරන්න. ඒ නිසා සමෘද්ධි බැංකුවල මුදල් ගනුදෙනු අධීක්ෂණයක් කළාට ඒකේ වරදක් තිබෙනවා කියලා මම හිතන්නේ නැහැ. [බාධා කිරීම්]

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මට පොඩි වෙලාවක් දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු පද්ම උදයශාන්ත මන්ත්‍රීතුමනි,- [බාධා කිරීමක්] ගරු ඇමතිතුමනි, ඔබතුමා තවත් පැහැදිලි කරන්න කැමති ද?

ගරු පී. හැරිසන් මහතා
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
මාධ්‍යයට ඕනෑ කරන එතුමාගේ ප්‍රශ්නයට උත්තරදීමේ අවශ්‍යතාවක් මට නැහැ. මම කිව්වේ ඇත්ත තත්ත්වය.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මාධ්‍ය කථාව නොවෙයි මම කියන්නේ,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම දෙයක් නැත්නම් තවත් දැනගන්න දෙයක් නැහැ නේ ගරු මන්ත්‍රීතුමා.

ප්‍රශ්න අංක 9 - 425/'18, ගරු ඉෂාක් රහුමාන් මහතා - *[සභා ගර්භය තුළ නැත]*

තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය : නිල වාහන

வலுவாதார அபிவிருத்தி, வனசீவராசிகள் மற்றும் பிரதேச அபிவிருத்தி அமைச்சரின் பிரத்தியேக பதவியணி: உத்தியோகபூர்வ வாகனங்கள்

PERSONAL STAFF OF MINISTER OF SUSTAINABLE DEVELOPMENT, WILDLIFE AND REGIONAL DEVELOPMENT : OFFICIAL VEHICLES

449/'18

10. ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අනුයුක්ත නිල වාහන සපයා ඇති එක් එක් නිලධාරියාගේ නම, තනතුර, වෙන්කර ඇති වාහනයේ වර්ගය, ලියාපදිංචි අංකය සහ එම වෙන් කිරීම සඳහා අනුමතිය ලබා දුන්නේ කවුරුන් විසින්ද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

வலுவாதார அபிவிருத்தி, வனசீவராசிகள் மற்றும் பிரதேச அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) வலுவாதார அபிவிருத்தி, வனசீவராசிகள் மற்றும் பிரதேச அபிவிருத்தி அமைச்சரின் பிரத்தியேக பதவியணிக்கு இணைக்கப்பட்டுள்ள உத்தியோகபூர்வ வாகனங்கள் வழங்கப்பட்டுள்ள ஒவ்வோர் உத்தியோகத்தரினதும் பெயர், பதவி, ஒதுக்கப் பட்டுள்ள வாகனத்தின் வகை, பதிவிலக்கம் மற்றும் அவ்விதம் ஒதுக்குவதற்கு அங்கீகாரம் வழங்கியது யார் என்பதை வெவ்வேறாக அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Sustainable Development, Wildlife and Regional Development:

(a) Will he inform this House separately the name and designation of each officer who is attached to the personal staff of the Minister of Sustainable Development, Wildlife and Regional Development and official vehicle along with details of the type of vehicle allocated to them, registration number and the name of the officer who authorized such allocation of a vehicle?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.
(අ)

අනු අංකය	නිලධාරියාගේ නම	තනතුර	වෙන් කළ වාහන වර්ගය	ලියාපදිංචි අංකය	එම වෙන් කිරීමට අනුමැතිය ලබා දුන් අය
1.	ඩී.එන්.ආර්. පීරිස් මහතා	පෞද්ගලික ලේකම්	කාර්	WP CAQ - 2475	-ජනාධිපති ලේකම්ගේ අංක සීඒ/1/17/1 හා 2010 මැයි මස 14 දින දරන "රාජ්‍ය වියදම් කළමනාකරණය" චක්‍රලේඛයේ 3:4 වගන්තිය අනුව
2.	තොමසන් ඊ. විජේසූරිය මහතා	ගරු ඇමතිතුමාගේ උපදේශක	කාර්	WP CAQ - 2508	-2017 මැයි මස 23 වන දිනැති අංක අමප/17/0871/754/003 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව
3.	ජී.ඒ.සී. පොන්සේකා මෙය	සම්බන්ධීකරණ ලේකම්	කාර්	WP CAQ - 2495	-ජනාධිපති ලේකම්ගේ අංක සීඒ/1/17/1 හා 2010 මැයි මස 14 දින දරන "රාජ්‍ය වියදම් කළමනාකරණය" චක්‍රලේඛයේ 3:4 වගන්තිය අනුව
4.	සුදර්ශන් මනම්පේරි මහතා	සම්බන්ධීකරණ ලේකම්	කාර්	WP CAP - 3401	-ජනාධිපති ලේකම්ගේ අංක සීඒ/1/17/1 හා 2010 මැයි මස 14 දින දරන "රාජ්‍ය වියදම් කළමනාකරණය" චක්‍රලේඛයේ 3:4 වගන්තිය අනුව
5.	ඩබ්ලිව්.ජී.පී. මහින්ද කුමාර මහතා	මාධ්‍ය ලේකම්	කාර්	WP CAQ - 2528	-ජනාධිපති ලේකම්ගේ අංක සීඒ/1/17/1 හා 2010 මැයි මස 14 දින දරන "රාජ්‍ය වියදම් කළමනාකරණය" චක්‍රලේඛයේ 3:4 වගන්තිය අනුව

(ආ) පැන නොනඟී.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, කාර්ය මණ්ඩලයේ ඉන්න ප්‍රමාණය මට කියන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
කාර්ය මණ්ඩලයේ ඉන්නේ 5දෙනායි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
එතුමාගේ සම්පූර්ණ කාර්ය මණ්ඩලයේ ඉන්නේ 5දෙනා ද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
නැහැ. කාර්ය මණ්ඩලයට අයත්, වාහන පාවිච්චි කරන අය ඉන්නේ 5දෙනායි. මුළු කාර්ය මණ්ඩලය හැටියට 15දෙනෙක් ඉන්නවා. පෞද්ගලික ලේකම්වරයෙක් ඉන්නවා; සම්බන්ධීකරණ ලේකම්වරු දෙදෙනෙක් ඉන්නවා; මාධ්‍ය ලේකම්වරයෙක් ඉන්නවා; මහජන සම්බන්ධතා නිලධාරියෙක් ඉන්නවා; පෞද්ගලික සහකාර එක්කෙනෙක් ඉන්නවා; කළමනාකරණ සහකාර 5දෙනෙක් ඉන්නවා; කාර්යාල කාර්ය සහායකයන් දෙදෙනායි; ආරක්ෂක අංශයේ රියැදුරු හැර රියැදුරන් දෙදෙනායි. එකතුව 15යි. ඒ ගණන චක්‍රලේඛවලට අනුව හරි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, ඔබතුමා මට ඒ පිළිතුර ලබා දෙන්න.

ගරු කථානායකතුමනි, සමහර අමාත්‍යවරු තමන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩලය හැටියට 15දෙනාට වඩා බඳවාගෙන තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේදීම සමහර ඇමතිවරු මට උත්තර දීලා තිබෙනවා, තමන්ගේ කාර්ය මණ්ඩලයේ 15දෙනෙකුට වැඩියෙන් සේවය කරනවා කියලා. මම ඔබතුමාගේ අවසරය ඇතිව 2010 මැයි 14වැනි දා ජනාධිපති කාර්යාලයෙන් නිකුත් කරන ලද චක්‍රලේඛය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා. ඒ අනුව ඇමතිවරුන්ට පාවිච්චි කරන්න පුළුවන් කාර්ය මණ්ඩලයේ එකතුව 15දෙනායි. නමුත් සමහර ඇමතිවරු 21දෙනෙක් බඳවාගෙන තිබෙනවා.

ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නයට වනජීවී සම්බන්ධ නිසා, පළමුවැනි අතුරු ප්‍රශ්නය විධියට මම සභානායකතුමාගෙන් හෝ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගෙන් දැනගන්න කැමැතියි, තරුණයන් කණ්ඩායමක් විසින් දිවියෙක් අමු අමුවේ ඝාතනය කිරීම පිළිබඳව. තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය ඉතාම කඩිනම් පරීක්ෂණයක් කරලා මේ සම්බන්ධව ගන්න බලාපොරොත්තු වන පියවර මොකක්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ සම්බන්ධයෙන් හිටපු වනජීවී ඇමතිතුමා පිළිතුරක් දෙයි.

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.
Document not tendered.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (බුද්ධ ශාසන අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - புத்தசாசன அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of of Buddhasasana)
ගරු කථානායකතුමනි, මේක අමානුෂික ඝාතනයක්, මම බලන කොට හිතුවේ ඒක පිට රට එකක් කියලායි. ඒක කරලා තිබෙන්නේ මහා අමානුෂික විධියට. කවදාවත් නොකළ යුතු දෙයක්. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශාලතම සමුළුව වන CITES සමුළුව සඳහා ලබන අවුරුද්දේ රටවල් 183ක් අපේ රටට එනවා. මම අමාත්‍යවරයා විධියට සිටි කාලයේත් මෙවැනි දේවල් සම්බන්ධයෙන් නඩු දැම්මා. නිලධාරීන්ව යොදවා අදාළ පුද්ගලයන්ව අත් අඩංගුවට ගෙන දැඩි ලෙස නීතිය ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ධර්මය අදහන රටක මේ කළ දේ ලජ්ජා සහගතයි. ඔවුන් සියලුදෙනාම අත් අඩංගුවට ගෙන නීතිය ක්‍රියාත්මක කරන්න කියා අපි ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ඒ ගැන දැනුවත් කරන්නම්. ගරු මන්ත්‍රීතුමා, දෙවෙනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
ඇත්තටම ඔබතුමාත් දකින්නට ඇති, පසුගිය කාලයේ ගාල්ල ප්‍රදේශයේ දී මේ විධියට අල්ලාගෙන ගිහින් රාජාලියකුව මැරුවා. පසුව Facebook එකේ photo එකෙන් සැකකරුවන් හඳුනාගෙන ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගත්තා. මේ සිදු කරලා තිබෙන දෙය ඇත්තටම රටටත් අපකීර්තියක් වෙන දෙයක්. අනෙක් කාරණය තමයි, වනජීවී නිලධාරීන්ට තමන්ගේ රාජකාරිය කරන්නට ඉඩ දුන්නේ නැහැ කියලා, ඔවුන් එතැනින් ඉවත් වෙලා යනවා.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா)
(The Hon. Gamini Jayawickrama Perera)
මට ඒකට උත්තර දෙන්න බැහැ. දැන් විෂය භාර අමාත්‍යවරයා වශයෙන් සිටින්නේ ෆීල්ඩ් මාෂල් ගරු සරත් ෆොන්සේකා මැතිතුමා. එතුමා නීතියට බොහොම ගරු කරන කෙනෙක්. එම අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිතුමාත් එහෙමයි. එතුමන්ලා අවශ්‍ය පියවර ගනීවි කියලා මට විශ්වාසයක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක වෙයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමනි, ඒ ගැන ගරු අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් රජය මඟින් පරීක්ෂණයක් පවත්වනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයෙන් අසා තිබෙන්නේ ගරු සරත් ෆොන්සේකා අමාත්‍යතුමාගේ කාර්ය මණ්ඩලය ගැනයි. එතුමාගේ කාර්ය මණ්ඩලයට නියමිත නිලධාරීන් සංඛ්‍යාව වන 15දෙනෙක් පමණයි බඳවාගෙන තිබෙන්නේ. කවුරු හෝ ඇමතිවරයකු වැඩිපුර කාර්ය මණ්ඩලය යොදවා තිබෙනවා නම් කරුණාකර හෙළි කරන්න. එහෙම නැත්නම් හැමෝම ගැන එහෙම හිතයි.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මොකක්ද? පැහැදිලි කිරීමක් නම් ඉඩ දෙන්න පුළුවන්.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ඔව්, පැහැදිලි කිරීමක් ගරු කථානායකතුමනි. මම ගරු සරත් ෆොන්සේකා මැතිතුමා සම්බන්ධව නොවෙයි ඒ කරුණු ඉදිරිපත් කළේ. චක්‍රලේඛය අනුව එතුමාගේ කාර්ය මණ්ඩලයේ 15 දෙනෙක් පමණයි සිටින්නේ. ඒක හරි. නමුත් මම මීට කලින් වෙනත් ඇමතිවරුන් ගැන අහපු ප්‍රශ්නවලට දීපු පිළිතුරුවලින් අනාවරණය වුණා, 21දෙනෙකුගෙන් යුක්ත කාර්ය මණ්ඩලයක් පාවිච්චි කරන ඇමතිවරුත් සිටින බවට. ඒ වාගේම මම ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ ඇමතිතුමා දැනුවත්ද?

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, සමහර අමාත්‍යවරුන්ට අමාත්‍යාංශ දෙකක් තිබෙනවා. එක ඇමතිවරයා කාර්ය මණ්ඩල දෙක බැගින් පාවිච්චි කරනවා. ඒක වැරැදියි. එය ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක්. ඔබතුමා ඒ සම්බන්ධයෙන් මැදිහත් වෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඒ ගැන සොයා බලා අපව දැනුවත් කරන්න.
ප්‍රශ්න අංක 11 - 493/'18 - (1), ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 12 - 517/'18 - (1), ගරු ඉන්දික අනුරුද්ධ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ප්‍රශ්න අංක 13 - 527/'18 - (1), ගරු වාසුදේව නානායක්කාර මහතා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අසනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

වයඹ පළාත් සභාවේ අමාත්‍ය ධුර : විස්තර
வடமேல் மாகாண சபை அமைச்சுப் பதவிகள்: விபரம்
PORTFOLIOS IN NORTH WESTERN PROVINCIAL COUNCIL: DETAILS

552/'18

14. ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) වයඹ පළාත් සභාවේ අමාත්‍ය ධුර දරන අමාත්‍යවරයන්ගේ නම් කවරේද;

(ii) ඔවුන් දරන අමාත්‍යාංශ වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් අමාත්‍යවරයා යටතේ ඇති ආයතන හා වෙනත් ව්‍යවස්ථාපිත ආයතන කවරේද;

(iv) වත්මන් යහපාලන රජය බලයට පත්වීමෙන් පසුව එක් එක් අමාත්‍යවරයා විසින් ලබා දී ඇති පත්වීම් සංඛ්‍යාව කොපමණද;

(v) පත්වීම් ලබා ගත් පුද්ගලයන්ගේ නම්, ලිපිනයන්, අධ්‍යාපන සුදුසුකම් හා තනතුරු කවරේද;

(vi) එම පත්වීම් ලබාදීමේදී අනුගමනය කළ ක්‍රමවේදය කවරේද;

(vii) පත්වීම් ලබාදීමේදී යම් අක්‍රමිකතාවක් සිදුවී ඇත්නම්, අමාත්‍යාංශය ඒ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வடமேல் மாகாண சபையில் அமைச்சுப் பதவியை வகிக்கும் அமைச்சர்களின் பெயர்கள் யாவையென்பதையும்;

(ii) இவர்கள் ஏற்றுள்ள அமைச்சுக்கள் வெவ்வேறாக யாவையென்பதையும்;

(iii) ஒவ்வோர் அமைச்சரின் கீழும் உள்ள நிறுவனங்கள் மற்றும் ஏனைய நியதிச்சட்ட நிறுவனங்கள் யாவையென்பதையும்;

(iv) தற்போதைய நல்லாட்சி அரசாங்கம் ஆட்சிக்கு வந்த பின்னர் ஒவ்வோர் அமைச்சரினாலும் வழங்கப்பட்டுள்ள நியமனங்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(v) நியமனம் பெற்றுக்கொண்ட ஆட்களின் பெயர்கள், முகவரிகள், கல்வித் தகைமைகள் மற்றும் பதவிகள் யாவையென்பதையும்;

(vi) மேற்படி நியமனங்களை வழங்குகின்றபோது பின்பற்றப்பட்ட முறையியல் யாதென்பதையும்;

(vii) நியமனம் வழங்கும் விடயத்தில் ஏதேனும் முறைகேடுகள் நிகழ்ந்திருப்பின் அமைச்சு அது சம்பந்தமாக மேற்கொள்ளும் நடவடிக்கை யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils, Local Government and Sports:

(a) Will he inform this House-

(i) the names of the Ministers who hold ministerial portfolios in the North Western Provincial Council;

(ii) separately, the Ministries that come under them;

(iii) the institutions and other statutory bodies coming under each Minister;

(iv) the number of appointments that have been given by each Minister after the present Government of Good Governance came into power;

(v) the names, addresses, educational qualifications and the posts of the persons to whom the appointments were given;

(vi) the procedure followed in giving those appointments; and

(vii) if any irregularity taken place when these appointments were given, the steps taken by the Ministry in this regard?

(b) If not, why?

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය (පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය අමාත්‍යතුමිය)
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை இராஜாங்க அமைச்சர்)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama - State Minister of Provincial Councils and Local Government and Sports)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) වයඹ පළාත් සභාවේ අමාත්‍ය ධුර දරන අමාත්‍යවරුන්ගේ නම් පහතින් දක්වා ඇත.

01. ගරු ඩී.ජී.බී.එම්. ධර්මසිරි දසනායක මැතිතුමා.

02. ගරු පියසිරි රාමනායක මැතිතුමා.

03. ගරු ආර්.පී.ඩී. ගුණදාස දෙහිගම මැතිතුමා.

04. ගරු ඩබ්ලිව්.ජේ. සුමල් තිසේරා මැතිතුමා.

05. ගරු ලක්ෂ්මන් හරිස්චන්ද්‍ර වෙඩරුව මැතිතුමා.

(ii) වයඹ පළාත් සභාවේ අමාත්‍යවරුන් දරන අමාත්‍යාංශ වෙන් වෙන් වශයෙන් පහතින් දක්වා ඇත.

අනු අංකය	අමාත්‍යවරයාගේ නම	අමාත්‍යාංශය
01.	ගරු ඩී.ජී.බී.එම්. ධර්මසිරි දසනායක මැතිතුමා (ගරු ප්‍රධාන අමාත්‍ය)	ප්‍රධාන අමාත්‍ය සහ වයඹ පළාත් මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරුසේවා, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු අමාත්‍යාංශය
02.	ගරු පියසිරි රාමනායක මැතිතුමා	වයඹ පළාත් සමුපකාර සංවර්ධන හා වෙළඳ, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ක්‍රීඩා හා යෞවන කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යාංශය
03.	ගරු ආර්.පී.ඩී ගුණදාස දෙහිගම මැතිතුමා	වයඹ පළාත් මාර්ග, ප්‍රවාහන, නිවාස හා ඉදිකිරීම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය
04.	ගරු ඩබ්ලිව්.ජේ. සුමල් තිසේරා මැතිතුමා	වයඹ පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යාංශය
05.	ගරු ලක්ෂ්මන් හරිස්චන්ද්‍ර වේඩරුව මැතිතුමා	වයඹ පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය

(iii) එක් එක් අමාත්‍යවරයා යටතේ ඇති ආයතන හා වෙනත් ව්‍යවස්ථාපිත ආයතනයන් ඇමුණුම මඟින් දක්වා ඇත. එය **සභාගත*** කරමි.

(iv) අමාත්‍යවරුන් විසින් පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලබාදීමක් සිදු නොකෙරේ.

(v) අදාළ නොවේ.

(vi) අදාළ නොවේ.

(vii) අදාළ නොවේ.

(ආ) අදාළ නොවේ.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුරු ලබාදීම පිළිබඳව ගරු රාජ්‍ය ඇමතිතුමියට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා. අපි ප්‍රශ්නයක් යොමු කළාට පසුව, එම ප්‍රශ්නය න්‍යාය පත්‍රයට ඇතුළුවන්න ගතවන කාලයත් එක්ක එම ප්‍රශ්නයේ ස්වරූපය වෙනස් වෙනවා. නමුත්, ගරු රාජ්‍ය ඇමතිතුමියට මේ සම්බන්ධයෙන් අතුරු ප්‍රශ්න දෙකක් යොමු කරන්න මා බලාපොරොත්තු වනවා. අමාත්‍යවරුන් විසින් පළාත් රාජ්‍ය සේවයේ පත්වීම් ලබාදීමක් සිදු කර නැත්නම්, වෙනත් ක්‍රමයකින් එම පත්වීම් ලබා දීලා ඇති. ගරු රාජ්‍ය ඇමතිතුමියනි, ඔබතුමිය ඒ පිළිබඳවත් සොයා බලන්න.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අශෝක ප්‍රියන්ත මහතා]

ගරු කථානායකතුමනි, මේ ආණ්ඩුව රේඛීය අමාත්‍යාංශ, පළාත් අමාත්‍යාංශ සහ පළාත් පාලන ආයතන වශයෙන් කොටස් තුනකට බෙදී තිබෙනවා. පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයට පළාත් සභා මෙන්ම පළාත් පාලන ආයතනද අයිති වෙනවා. මේ වෙද්දි ලංකාවේ බොහෝ පළාත් පාලන ආයතනවල බලය නතු වෙලා තිබෙන්නේ ආණ්ඩුවට ප්‍රතිවිරුද්ධ මතයක් දරන කණ්ඩායමකටයි. ගරු රාජ්‍ය ඇමතිතුමියනි, මේ දවස්වල ගම් තුළ, එහෙම නැත්නම් ප්‍රදේශ තුළ සංවර්ධන වැඩ කටයුතුවලදී පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් දැවැන්ත මතයක් ගෙන යනවා, මේ රජය හරහා මේ පළාත් පාලන ආයතනවල වැඩ කටයුතු අකර්මණ්‍ය කරනවාය කියා. මෙම අමාත්‍යාංශයට දක්ෂ ඇමතිවරයකු ඉන්නවා. ඒ, ෆයිසර් මුස්තාපා ඇමතිතුමායි. ඒ වාගේම දක්ෂ රාජ්‍ය ඇමතිවරියක් විධියට ඔබතුමිය ඉන්නවා. අතිගරු ජනාධිපතිතුමාත් මේ කටයුතුවලට මැදිහත් වනවා. මෙහෙම තියෙද්දිත්, පළාත් පාලන ආයතන අකර්මණ්‍ය කරන්න මේ රජයෙන් යම් කිසි වැඩ පිළිවෙළක් ගෙන යනවාද, නැද්ද කියන එක පළමුවැනි අතුරු ප්‍රශ්නය වශයෙන් මම අහන්න කැමැතියි.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(මාණ්පුමිකු (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නය යොමු කිරීම සම්බන්ධව මම ඔබතුමාට විශේෂයෙන් ස්තුතිවන්ත වනවා. ඇත්තටම පළාත් පාලන ආයතනයක් කියන්නේ, එක් පැත්තකින් ස්වාධීනව ආදායම් ලබන ආයතනයක්. කෙසේ නමුත් මේ වන විටත් අපේ අමාත්‍යාංශයෙන් හැම පළාත් පාලන ආයතනයකටම රුපියල් ලක්ෂ 40 බැගින් පුනරාවර්තන වියදම් වශයෙන් ලබාදීමේ වැඩ කටයුතු ආරම්භ කර තිබෙනවා. හැබැයි, මේ වනකොටත් සමහර පළාත් පාලන ආයතනවලින් අපට ඒ සඳහා ඉල්ලීම් ලැබී නැහැ. එම ආයතනවලට මේ සම්බන්ධයෙන් නැවත මතක් කර එම ඉල්ලීම් ගෙන්වා ගන්නත් කටයුතු කළ අවස්ථා තිබෙනවා, ගරු කථානායකතුමනි. එම නිසා මේ මුදල් ප්‍රතිපාදන අවශ්‍ය නැති; මේ මුදල් ප්‍රතිපාදන ඉල්ලන්නේ නැති ආයතනවලට අපේ අමාත්‍යාංශයෙන් මේ මුදල් ප්‍රතිපාදන ලැබෙන්නේත් නැහැ. නමුත් අවශ්‍ය ආයතනවලට අපි ඒ මුදල් ලබාදෙනවා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

මගේ පළමු අතුරු ප්‍රශ්නයට රාජ්‍ය ඇමතිතුමිය ලබා දුන් පිළිතුර අනුව, පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් හිතාමතාම මේ රජය අපකීර්තියට පත් කරන්න, මේ ආයතන අකර්මණ්‍ය කරන්නද මේ රජයේ ප්‍රතිපාදන නොගෙන ඉන්නේ කියන ප්‍රශ්නය මතු වෙනවා. අපි මේ පිළිබඳව රටට කියන්න ඕනෑ.

මොකද, පළාත් පාලන ආයතනයක ප්‍රධානියකු රටේ ප්‍රධානියා වන ජනාධිපතිවරයා පැමිණෙන උත්සවයකට පවා පැමිණෙන්නේ නැති තත්ත්වයකට එම ආයතන පත්ව තිබෙනවා. මට ලැබී තිබෙන තොරතුරු අනුව පරිසර අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කළ පරිසර දිනයේ වැඩසටහන් පවා ක්‍රියාත්මක නොකරන තැනට ඇවිත් තිබෙනවා. පළාත් පාලන ආයතනය කියන්නේත්, රටේ ජනතාවගේ උපතේ සිට විපත දක්වා ජනතාව වෙනුවෙන් සේවය කරන්න ස්ථාපිත වූ ආයතනයක්. එම ආයතන හරහා පොහොට්ටුව ලකුණ කණ්ඩායමට, එහෙම නැත්නම් ඒකාබද්ධ විපක්ෂයේ කණ්ඩායමට ඕනෑ විධියට රජයේ වැඩසටහන් අකර්මණ්‍ය කරන්න සූදානමක් තිබෙනවාද කියා සොයා බලන්න, ගරු රාජ්‍ය අමාත්‍යතුමියනි. ඔබතුමියගේ පිළිතුර අනුව මට හැඟෙනවා, මේ රජය අපකීර්තියට පත් කරන්න පළාත් පාලන ආයතනවල ප්‍රධානීන් හිතාමතාම කටයුතු කරනවාද කියා. මට දැනගන්න ඕනෑ, ඔවුන් එසේ කටයුතු කරනවාද, නැද්ද කියන එකයි.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

ගරු මන්ත්‍රීතුමනි, මෙතැන දේශපාලන ප්‍රශ්නයක් තිබෙනවා. පසුගිය දවසක ජාත්‍යන්තර පරිසර දින උත්සවය අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වුවා. අපේ අමාත්‍යාංශයත් එයට සහය වුණා. කෑගල්ල දිස්ත්‍රික්කයේයි ඒ උත්සවය පැවැත්වුණේ. කෑගල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනවලට පරිසරය ආරක්ෂා කරන්න, කැළි කසළ ඉවත් කරන්න අවශ්‍ය කරන උපකරණ, වාහනවල යතුරු ලබාදීම එහිදී සිදු වුණා. ඒ අවස්ථාවට අමාත්‍යාංශයෙන් සහභාගි වුණේත් රාජ්‍ය ඇමතිතුමිය විධියට මමයි. සමහර පළාත් පාලන ආයතන ඒ වාහනවත් ලබා ගන්න ඒ අවස්ථාවට පැමිණියේ නැහැ. ඒ නිසා අවශ්‍ය නැති අයට ඒවා දෙන්න අවශ්‍ය නැහැ කියන තීන්දුව ගත්තා. ඒ වෙලාවේ අතිගරු ජනාධිපතිතුමා කිව්වෙත් එයයි. රජයට අවශ්‍යතාවක් නැහැ, ජනතාව අපහසුතාවට පත් කරන්න. හැබැයි ඒ පළාත් පාලන ආයතනවලට වැඩ කරන්න අවශ්‍යතාවක් නැත්නම් ජනතාවට ඒවායේ සේවය ඉෂ්ට වන්නේ නැහැ. ඒකයි මේ රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය. අමාත්‍යාංශයෙන් උදව් නොකරනවා නොවෙයි. අමාත්‍යාංශය සූදානමින් ඉන්නවා, ඒ ආයතනවලට සහය දෙන්න. ඒ තත්ත්වය තමයි දැනට රටේ තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීට පසුව වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා තුන් වතාවකට වඩා කල් ගන්න ඉඩ දෙන්නේ නැහැ. අලුත් ස්ථාවර නියෝග අනුව ඒවාට පිළිතුරු දීම අත්‍යවශ්‍යයි. එය දැන් සිදු වෙනවා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු කථානායකතුමනි, පළාත් පාලන ආයතන අකර්මණ්‍ය වුණොත්, රේඛීය අමාත්‍යාංශවලින්, පාර්ලිමේන්තුවෙන් මොන තරම් වැඩ කළත් ගමේ ජනතාවට ඒ පහසුකම් බෙදී යන්නේ නැහැ. ගම තුළ මේ තත්ත්වය දකින්න තිබෙනවා. ඒ නිසා ඔබතුමා මේ පිළිබඳව අවධානය යොමු කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාජ්‍ය අමාත්‍යතුමියනි, ඒ කෙරෙහි ඔබතුමියගේ අවධානය යොමු කරන්න.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)

හොඳමයි, ගරු කථානායකතුමනි. අමාත්‍යාංශය මේ සම්බන්ධයෙන් විශේෂ අවධානයෙන් වැඩ කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

දෙවන වටය, ප්‍රශ්න අංක 1 -19/'18- (1), ගරු ආනන්ද අලුත්ගමගේ මහතා. කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු ඒ ප්‍රශ්නය අහනවාද? මෙය ආණ්ඩු පාර්ශ්වයේ මන්ත්‍රීවරයකු ඉදිරිපත් කළ ප්‍රශ්නයක්.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, ගරු ආනන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය
(மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம)
(The Hon. (Mrs.) Sriyani Wijewickrama)
ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

2017 වසරේ ඇති වූ ගංවතුරින් සිදු වූ හානිය: වන්දි
2017இல் வெள்ளப்பெருக்கினால் ஏற்பட்ட பாதிப்பு: இழப்பீடு
DESTRUCTION CAUSED BY FLOODS IN 2017: COMPENSATION

197/'18

5. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා වෙනුවට)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - மாண்புமிகு உதய பிரபாத் கம்மன்பில சார்பாக)
(The Hon. Dinesh Gunawardena on behalf of the Hon. Udaya Prabhath Gammanpila)

වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) 2017 වර්ෂයේදී තෙත් කලාපයේ ගං වතුරෙන් සහ වැසි වතුරෙන් සිදු වූ ජල ගැලීමෙන්,

(i) මිය ගිය සංඛ්‍යාව කොපමණද;

(ii) ආබාධිත වූ සංඛ්‍යාව කොපමණද;

(iii) විපතට පත් පුද්ගලයන් වෙනුවෙන් රජය විසින් ගෙවන ලද මුළු වන්දි මුදල කොපමණද;

(iv) මියගිය පුද්ගලයෙකු වෙනුවෙන් රජය විසින් ගෙවන ලද වන්දි මුදල කොපමණද;

(v) හානියට පත් නිවාස වෙනුවෙන් ගෙවන ලද උපරිම සහ අවම වන්දි මුදල කොපමණද;

(vi) අවතැන් වූ සියලුම දෙනාට ස්ථිර නිවාස ලබා දී තිබේද;

(vii) අවතැන් වූ පවුලකට ස්ථිර නිවාසයක් ලබා දුන් ආසන්නතම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) 2017 ஆம் ஆண்டில் ஈர வலயத்தில் வெள்ளப்பெருக்கு மற்றும் மழையினால் ஏற்பட்ட நீர்ப்பெருக்கு காரணமாக,

(i) உயிரிழந்தவர்களின் எண்ணிக்கை எவ்வளவென் பதையும்;

(ii) அங்கவீனமுற்றவர்களின் எண்ணிக்கை எவ்வள வென்பதையும்;

(iii) பாதிக்கப்பட்டோருக்கு அரசாங்கத்தின் சார்பில் செலுத்தப்பட்ட மொத்த இழப்பீட்டுத் தொகை எவ்வளவென்பதையும்;

(iv) உயிரிழந்தவர்களுக்காக அரசாங்கத்தின் சார்பில் செலுத்தப்பட்ட இழப்பீட்டுத் தொகை எவ்வள வென்பதையும்;

(v) சேதமடைந்த வீடுகளுக்காக செலுத்தப்பட்ட கூடியபட்ச மற்றும் குறைந்தபட்ச இழப்பீட்டுத் தொகை எவ்வளவென்பதையும்;

(vi) இடம்பெயர்ந்த சகலருக்கும் நிரந்தர வீடுகள் பெற்றுக்கொடுக்கப்பட்டுள்ளதா என்பதையும்;

(vii) இடம்பெயர்ந்த குடும்பமொன்றிற்கு நிரந்தர வீடொன்று பெற்றுக்கொடுக்கப்பட்ட அண்மித்த திகதி யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Irrigation and Water Resources and Disaster Management:

(a) Will he inform this House in regard to the floods caused by river water and rainwater in the wet zone in the year 2017-

(i) the number of persons who lost their lives;

(ii) the number of persons who became disabled;

(iii) the total amount of compensation paid by the Government to the persons who were affected by the floods;

(iv) the amount of compensation paid by the Government on behalf of a person who lost his life;

(v) the maximum and minimum amount of compensation paid for the houses that were affected by the floods;

(vi) whether permanent houses will be provided to all those who were displaced; and

(vii) the nearest date on which a permanent house was provided to a family that was displaced?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) මිය ගිය සංඛ්‍යාව 62කි.

දිස්ත්‍රික්කය	මියගිය සංඛ්‍යාව
රත්නපුර	9
කළුතර	16
මාතර	20
ගාල්ල	8
හම්බන්තොට	5
ගම්පහ	4
එකතුව	62

(ii) නැත.

(iii)

දිස්ත්‍රික්කය	ජාතික ස්වාභාවික ආපදා රක්ෂණාවරණ වැඩසටහන යටතේ රු.10,000 අත්තිකාරම් ලබා දුන් ප්‍රමාණය	ජාතික ස්වාභාවික ආපදා රක්ෂණාවරණ වැඩ සටහන යටතේ වන්දි මුදල් ප්‍රමාණය	මුළු වන්දි මුදල් ප්‍රමාණය
රත්නපුර	84,266,000.00	215,180,505.00	299,446,505.00
කළුතර	149,870,000.00	163,504,250.00	313,374,250.00
මාතර	292,620,000.00	286,155,265.00	578,775,265.00
ගාල්ල	193,330,000.00	113,870,768.00	307,200,768.00
කෑගල්ල	2,400,000.00	8,940,220.00	11,340,220.00
මහනුවර	1,180,000.00	80,200.00	1,260,200.00
ගම්පහ	980,000.00	1,758,650.00	2,738,650.00
නුවරඑළිය	480,000.00		480,000.00
කොළඹ	49,045,900.00	16,689,910.00	65,735,810.00
තෙත් කලාපයේ විපතට පත් වූවන්ට ලබා දුන් මුළු වන්දි මුදල	774,171,900.00	806,179,760.00	1,580,351,668.00

ඒ අනුව 2017 මැයි මස තෙත් කලාපයේ ඇති වූ ගංවතුර හා නායයාමේ ආපදාව නිසා විපතට පත් වූවන්ගේ නිවාස වෙනුවෙන් ලබා දුන් මුළු වන්දි මුදල රු.1,580,351,668.00ක් වේ.

(iv) රු. 100,000.00

(v) 2017 වර්ෂයේ මැයි මස සිදු වූ ගංවතුර ආපදා තත්ත්වයෙන් හානියට පත් නිවාස වෙනුවෙන් රු. 2,500,000ක උපරිම සීමාවකට යටත්ව හානි පූරණ මූලධර්මය අනුව ගෙවන ලද උපරිම වන්දි මුදල රු. 1,010,000ක් වන අතර, අවම වන්දි මුදල රු. 10,100ක් වේ.

(vi) රජය විසින් 2016.04.01 දින සිට ක්‍රියාත්මක කරන ජාතික ස්වාභාවික රක්ෂණාවරණ වැඩ සටහන යටතේ හානි වන නිවාස හා සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්ත සඳහා සිදු වී ඇති හානි ආවරණය කරනු ලබයි. ඒ සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල මඟින් වන්දි ගෙවනු ලබයි. නිවාසයක් හා සුළු හා මධ්‍යම පරිමාණ කර්මාන්තයක් සඳහා උපරිම රු. 2,500,000.00ක වන්දි හිමිය. ප්‍රාදේශීය ලේකම් විසින් පත් කරන තාක්ෂණික කමිටුවක් මඟින් එම වන්දි මුදල තක්සේරු කරනු ලබයි. එම තක්සේරුව කර ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම්ගේ නිර්දේශ සහිතව ජාතික රක්ෂණ භාර අරමුදලට යැවූ පසු එමඟින් ඇගයීමට ලක් කර අදාළ වන්දි මුදල ප්‍රතිලාභීන්ට ලැබීමට සලස්වනු ලැබේ. වන්දි මුදල් කෙළින්ම ප්‍රතිලාභියාට චෙක්පත් මඟින් හෝ දිස්ත්‍රික් ලේකම් හෝ ප්‍රාදේශීය ලේකම් මඟින් අදාළ වන්දි මුදල් ලබා දීම සිදු කරයි. මෙයට අමතරව ගංවතුරෙන් පූර්ණ ලෙස හානි වූ නිවාස හිමි පවුල් හා නායයෑමෙන් හා නාය යෑමේ අධි අවදානම් කලාපවල ජීවත් වන ජනතාව ගංවතුර හා නායයාමේ අධි අවදානම් රහිත ප්‍රදේශයක පදිංචි කිරීමේ ව්‍යාපෘතියක් රජය මඟින් ක්‍රියාත්මක කර ඇත. ඒ සඳහා රජය මඟින් ක්‍රමවේද 03කට මුදල් ලබා දෙනු ලැබේ.

i. ඉඩමක් සමඟ නිවසක් මිලදී ගැනීමට රු. මි. 1.6ක් ලබා දීම.

ii. ඉඩමක් මිලදී ගෙන නිවස ඉදි කිරීම සඳහා ඉඩම සඳහා රු.මි. 0.4ක් සහ නිවස ඉදි කිරීමට රු.මි. 1.2ක් ලබා දීම (මිලදී ගන්නා ඉඩම පර්චස් 20ට නොවැඩි බිම් ප්‍රමාණයකින් යුක්ත විය යුතුය.)

iii. රජයේ ඉඩම් ලබා දී ඇත්නම් එම ඉඩමෙහි නිවස ඉදි කිරීම සඳහා රු.මි. 1.2ක් ලබා දීම.

(vii) හම්බන්තොට, ගාල්ල, මාතර, රත්නපුර, කෑගල්ල, කළුතර, මහනුවර යන දිස්ත්‍රික්කවල ගංවතුර නායයාම් හා නායයාම් අධි අවදානම හේතුවෙන් තම පදිංචි ස්ථානයෙන් ඉවත් කරන පුද්ගලයන් නැවත පදිංචි කිරීම සඳහා ඉහත අංක (vi) යටතේ නිවාස ඉදි කිරීමට ආධාර මුදල් අදියර 4ක් යටතේ ලබා දීමට දැනට අදාළ දිස්ත්‍රික් ලේකම්වරු/ප්‍රාදේශීය ලේකම්වරු කටයුතු කරමින් සිටිති.

(ආ) පැන නොනඟී.

යාපනය දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර තනතුර : පුරප්පාඩු

யாழ். மாவட்ட கமத்தொழில் ஆராய்ச்சி உற்பத்தி உதவியாளர் பதவிகள்: வெற்றிடங்கள்

POST OF AGRICULTURE RESEARCH AND PRODUCTION ASSISTANTS IN JAFFNA DISTRICT: VACANCIES

218/'18

6. ගරු බිමල් රත්නායක මහතා (ගරු ඩග්ලස් දේවානන්දා මහතා වෙනුවට)
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - மாண்புமிகு டக்ளஸ் தேவானந்தா சார்பாக)
(The Hon. Bimal Rathnayake on behalf of the Hon. Douglas Devananda)

කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර තනතුරෙහි සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට උක්ත තනතුරෙහි සේවයෙහි නිරත නිලධාරීන් සංඛ්‍යාව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iii) උක්ත දෙපාර්තමේන්තුවෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාව පුරවනු ලබන දිනය කවරේද;

(iv) උක්ත තනතුරෙහි වැඩබලන නිලධාරීන් සඳහා වැඩබැලීමේ පත්වීම් හා වැඩබැලීමේ දීමනා ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

කමත්තොழில් அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) யாழ்ப்பாணம் மாவட்ட கமநல அபிவிருத்தித் திணைக்களத்தில் கமத்தொழில் ஆராய்ச்சி உற்பத்தி உதவியாளர் பதவிகளிலுள்ள ஊழியர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) தற்போது மேற்படி பதவியில் பணியாற்றும் உத்தியோகத்தர்களின் எண்ணிக்கை மற்றும் நிலவும் வெற்றிடங்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) மேற்படி திணைக்களத்தில் நிலவும் வெற்றிடங்கள் நிரப்பப்படும் திகதி யாதென்பதையும்;

(iv) மேற்படி பதவியில் பதிற் கடமையாற்றும் உத்தியோகத்தர்களுக்கு பதில் கடமை நியமனங்கள் மற்றும் பதில் கடமை கொடுப்பனவுகள் வழங்கப்படுமா என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he inform this House-

(i) the cadre in the post of Agriculture Research and Production Assistant of the Department of Agrarian Development in the Jaffna District;

(ii) the number of officers who are currently serving on this post and the number of vacancies available;

(iii) the date on which the vacancies existing in the above Department would be filled; and

(iv) whether acting appointments are given or acting allowances paid to the officers who are acting in the above post?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 189

(ii) දැනට සේවයේ නිරතව සිටින නිලධාරීන් සංඛ්‍යාව - 16

යාපනය දිස්ත්‍රික්කයේ පවතින පුරප්පාඩු සංඛ්‍යාව - 173

(iii) කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර තනතුර සඳහා මෙතෙක් බඳවා ගන්නා ලද දීප ව්‍යාප්ත ක්‍රමවේදය වෙනුවට දිස්ත්‍රික් මට්ටමින් නිලධාරීන් බඳවා ගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇත. මේ වන විට එම තනතුරේ පවතින සියලු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ක්‍රමවේදයක් දිස්ත්‍රික් පදනම මත සිදු කිරීමට හැකි වන සේ බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම පිණිස ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාවට යටත්ව 2018.05.09 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත. (තීරණය - ඇමුණුම 01) ඒ අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ එකඟතාව ලබා ගෙන ඉදිරියේදී තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කරනු ලැබේ.

(iv) පුරප්පාඩු පවතින දිස්ත්‍රික්ක සඳහා 2016.01.01 දින සිට වැඩ බැලීමේ පත්වීම් හා වැඩ බැලීමේ දීමනා ලබා දීමට කටයුතු කර ඇත. එහෙත් යාපනය දිස්ත්‍රික්කය සඳහා වැඩ බැලීමේ පත්වීම් හා වැඩ බැලීමේ දීමනා මෙතෙක් ලබා දී නොමැත.

(ආ) යාපනය දිස්ත්‍රික්කයේ පුරප්පාඩු විශාල වශයෙන් පවතින බැවින් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසම් සඳහා අනුයුක්ත නොකර ගොවිජන සේවා මධ්‍යස්ථාන සමඟ සම්බන්ධ කර රාජකාරි කටයුතු සිදු කරගෙන යාමට යාපනය ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් විසින් පියවර ගෙන ඇත. ඒ අනුව එම නිලධාරීන්ට අනුයුක්ත වසමක් හෝ වැඩ බැලීමේ වසමක් නම් කළ නොහැකි බැවින්, වැඩ බැලීමේ පත්වීමක් ලබා දිය නොහැකි අතර වැඩ බැලීමේ දීමනාවක්ද ලබා දීමට හැකියාවක් නොමැත.

ඒ අනුව ඔවුන් සඳහා රුපියල් 2000ක මාසික ස්ථාවර දීමනාවක් හෝ පරිවර්තිත ගමන් වියදම් දීමනාවක් ලබා දීම සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගැනීමට පියවර ගෙන තිබේ. (ඇමුණුම 02)

ඇමුණුම් සභාගත* කරමි.

ඉපලෝගම "දියවර" ගම්මානයේ වෙසෙන පවුල්: ඉඩම් අයිතිය

இப்பலோகம "தியவர" கிராமத்தில் வசிக்கும் குடும்பங்கள்: காணி உரிமை

FAMILIES LIVING IN '"DIYAWARA" VILLAGE, IPALOGAMA: LAND OWNERSHIP

425/'18

9. ගරු අශෝක ප්‍රියන්ත මහතා (ගරු ඉෂාක් රහුමාන් මහතා වෙනුවට)
(மாண்புமிகு அசோக்க பிரியந்த - மாண்புமிகு இஷாக் ரஹுமான் சார்பாக)
(The Hon. Ashoka Priyantha on behalf of the Hon. Ishak Rahuman)

ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) පසුගිය රජය කාලයේදී ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කලා වැව ඉස්මත්තේ පිහිටුවන ලද දියවර ගම්මානයේ දැනට පවුල් 100ක් පමණ ස්ථිර නිවාස ඉදිකරගෙන ජීවත්වන බවත්;

(ii) මෙතෙක් එම අයට ඉඩම්වල අයිතිය ලැබී නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) එසේ නම්, ඔවුන්ට මෙම ඉඩම්වල අයිතිය ලබාදීමට කටයුතු කරනු ලබන දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

කාණි மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கடந்த அரசாங்க காலத்தில் இப்பலோகம பிரதேச செயலாளர் பிரிவில் கலாவெவவின் மேற்பகுதியில் நிறுவப்பட்ட தியவர கிராமத்தில் (Fishing Village) தற்போது ஏறக்குறைய 100 குடும்பங்கள் நிரந்தர வீடுகளை அமைத்துக் கொண்டு வசிக்கின்றனரென்பதையும்;

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අශෝක ප්‍රියන්ත මහතා]

(ii) இற்றைவரை இவர்களுக்கு காணிகளின் உரிமை கிடைக்கவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) ஆமெனில் இவர்களுக்கு மேற்படி காணிகளின் உரிமையை வழங்க நடவடிக்கை எடுக்கும் திகதி யாதென்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Lands and Parliamentary Reforms:

(a) Is he aware that -

(i) about 100 families have constructed permanent houses and are living in the "Diyawara" village (fishing village) established during the previous regime above the watershed of the Kala Weva Tank within the Ipalogama Divisional Secretary's Division; and

(ii) those people have not received ownership to those lands so far?

(b) If so, will he inform this House of the date on which action will be taken to grant them ownership of these lands?

(c) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කලා වැව ඉස්මත්තේ පිහිටුවන ලද දියවර ගම්මානයේ දැනට පවුල් 176ක් පමණ ස්ථිර නිවාස ඉදි කර පදිංචිව සිටී.

(ii) මෙතෙක් එම අයට ඉඩම්වල අයිතිය ලබා දී නොමැත.

(ආ) ඔවුන්ට එම ඉඩම්වල අයිතිය ලබා දීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත. එම කටයුතු ඉක්මනින්ම අවසන් කිරීමට හැකි වනු ඇත.

(ඇ) ඉහත (ආ)පිළිතුර අනුව අදාළ නොවේ.

බදුල්ල දිස්ත්‍රික්කයේ දිවිනැඟුම ප්‍රජා මූල බැංකු : විස්තර

பதுளை மாவட்ட திவிநெகும சமூக மைய வங்கிகள்: விபரம்

DIVINEGUMA COMMUNITY BASED BANKS IN BADULLA DISTRICT: DETAILS

493/'18

11. ගරු අශෝක ප්‍රියන්ත මහතා (ගරු චමින්ද විජේසිරි මහතා වෙනුවට)
(மாண்புமிகு அசோக்க பிரியந்த - மாண்புமிகு சமிந்த விஜேசிறி சார்பாக)
(The Hon. Ashoka Priyantha on behalf of the Hon. Chaminda Wijesiri)

සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) බදුල්ල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක දිවිනැඟුම ප්‍රජා මූල බැංකු (සමෘද්ධි බැංකු) සංඛ්‍යාව කොපමණද;

(ii) එම බැංකු පිහිටා ඇති ස්ථාන කවරේද;

(iii) එක් එක් බැංකු ශාඛාවෙන් ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත අ (i) හි සඳහන් එක් එක් බැංකුවක සේවයේ නියුතු සේවකයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ තනතුරු වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) දැනට එම බැංකුවල සේවක පුරප්පාඩු තිබේද;

(iii) එසේ නම්, එම පුරප්පාඩු සඳහා සේවකයන් බඳවා ගැනීමේ ක්‍රමවේදය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சமூக வலுவூட்டல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) பதுளை மாவட்டத்தில் இயங்கும் திவிநெகும சமூக மைய வங்கிகளின் (சமுர்த்தி வங்கிகள்) எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) மேற்படி வங்கிகள் அமைந்துள்ள இடங்கள் யாவை என்பதையும்;

(iii) ஒவ்வொரு வங்கிக் கிளையிலிருந்தும் அனுகூலங்களை பெறும் பயனாளிகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) மேற்படி (அ) (i) இல் குறிப்பிடப்பட்டுள்ள ஒவ்வொரு வங்கியிலும் பணியாற்றுகின்ற ஊழியர்களின் எண்ணிக்கை மற்றும் இவர்களின் பெயர்கள், பதவிகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(ii) தற்போது மேற்படி வங்கிகளில் ஊழியர் வெற்றிடங்கள் உள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், மேற்படி வெற்றிடங்களுக்கு ஊழியர்களை ஆட்சேர்க்கும் முறையியல் யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Social Empowerment:

(a) Will he inform this House-

(i) the number of Divineguma Community Based Banks (Samurdhi Banks) that operate within the Badulla District;

(ii) the locations of those banks; and

(iii) the number of beneficiaries who benefit from each bank branch?

(b) Will he also inform this House-

(i) the number of employees serving at each of the bank mentioned in (a) (i) above and their names and designations separately;

(ii) whether any vacancies exist at those banks at present; and

(iii) if so, of the methodology adopted to recruit employees for those vacancies?

(c) If not, why?

ගරු පී. හැරිසන් මහතා
(මාණ්පුමිකු පී. හැරිසන්)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ප්‍රජා මූල බැංකු ගණන 44කි.

(ii) ඇමුණුම (01)* මඟින් පිළිතුරු සපයා ඇත.

(iii) එක් එක් බැංකු ශාඛාවෙන් ප්‍රතිලාභ ලබන ප්‍රතිලාභීන් සංඛ්‍යාව සම්බන්ධයෙන් ඇමුණුම 02* මඟින් පිළිතුරු සපයා ඇත.

(ආ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රජාමූල බැංකු 44ක් ඇති අතර, ඒවායේ සේවය කරන මුළු සේවක සංඛ්‍යාව 261ක් පමණ වේ.

එබැවින් මෙම සේවකයින්ගේ නම් සහ තනතුරු ඇතුළත් විස්තර දීර්ඝ ලේඛනයක් බැවින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ලබා ගත හැක. නොඑසේ නම් පෞද්ගලිකව ලබා දිය හැක.

(ii) පුරප්පාඩු ඇත.

(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විධිවිධාන හා අනුමත පටිපාටින් අනුව බඳවා ගැනීම් සිදු කෙරේ.

(ඇ) ඉහත පිළිතුරු අනුව අදාළ නොවේ.

දහම් පාසල් අධ්‍යාපනය : විස්තර
அறநெறிப் பாடசாலைக் கல்வி: விபரம்
DHAMMA SCHOOL EDUCATION: DETAILS

517/'18

12. ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා වෙනුවට)
(மாண்புமிகு தினேஷ் குணவர்தன - மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத் சார்பாக)
(The Hon. Dinesh Gunawardena on behalf of the Hon. Indika Anuruddha Herath)

බුද්ධශාසන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දිවයින තුළ දහම් පාසල් අධ්‍යාපනය ලබන ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) දහම් පාසල් සංවර්ධනය සඳහා ස්ථාපිත කළ අරමුදලේ ඇති මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) එම අරමුදල තර කිරීම සඳහා 2017 අය වැයෙන් වෙන් කළ මුදල කොපමණද;

(iv) දහම් පාසල් ගුරුවරුන් සිදු කරනු ලබන ගරු සේවය දිරිගැන්වීම, අගය කිරීම හා ගුරුවරුන් එම පද්ධතිය තුළ රඳවා ගැනීම සඳහා රජය සිදු කරනු ලබන ප්‍රවර්ධනයන් කවරේද;

(v) ඉරිදා දින උදේ වරුවේ උපකාරක පංති පැවැත්වීම, දරුවන් දහම් පාසල් අධ්‍යාපනයට යොමු වීමට බරපතල බාධකයක් වන බැවින්, එම තත්ත්වය පාලනය කිරීමට හා වැළැක්වීමට ගනු ලබන නව පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

புத்த சாசன அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நாட்டினுள் அறநெறிக் கல்வியைப் பெறுகின்ற மாணவர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) அறநெறி பாடசாலை அபிவிருத்திக்கெனத் தாபிக்கப்பட்டுள்ள நிதியத்தில் உள்ள நிதித் தொகை எவ்வளவென்பதையும்;

(iii) அந்நிதியத்தை அதிகரிப்பதற்கு 2017 ஆம் ஆண்டுக்கு வரவு செலவு திட்டத்தின்மூலம் ஒதுக்கப்பட்ட நிதித் தொகை எவ்வளவென்பதையும்;

(iv) அறநெறிப் பாடசாலை ஆசிரியர்களினால் மேற்கொள்ளப்படுகின்ற கௌரவ சேவையை ஊக்குவித்தல், பாராட்டுதல் மற்றும் ஆசிரியர்களை மேற்படி முறைமையினுள் தக்கவைத்துக்கொள்வதற்கு அரசாங்கத்தினால் மேற்கொள்ளப்படுகின்ற மேம்பாட்டு நடவடிக்கைகள் யாவை என்பதையும்;

(v) ஞாயிற்றுக்கிழமைகளில் காலைவேளையில் மேலதிக போதனா வகுப்புகளை நடாத்துதல், பிள்ளைகள் அறநெறிப் பாடசாலைக் கல்வி நடவடிக்கைகளில் ஈடுபடுவதற்குப் பெரும் இடையூறாக இருப்பதால், அந்நிலைமையைக் கட்டுப்படுத்துவதற்கும் தடுப்பதற்கும் மேற்கொள்ளப்படும் புதிய நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Buddhasasana:

(a) Will he inform this House-

(i) the number of students who receive Dhamma School education in Sri Lanka;

(ii) the amount of money available in the fund set up for the development of Dhamma Schools;

(iii) the allocations made in the Budget 2017 to build up aforesaid fund;

(iv) the promotions carried out by the Government so as to complement and appreciate the services rendered by the teachers of Dhamma schools and to retain them in the service;

(v) the new measures taken by the Government to regulate and ban tuition classes held on Sunday morning hours as they stand in the way when the students are directed towards the Dhamma education?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, බුද්ධ ශාසන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ලියාපදිංචි කළ ශිෂ්‍ය සංඛ්‍යාව 2169368කි.

(ii) අදාළ නොවේ.

(iii) අදාළ නොවේ.

(iv)

වාර්ෂිකව දීමනාවක් ලෙස එක් ගුරුභවතකුට රු.5000/- බැගින් ලබා දීම

වාර්ෂිකව නිල ඇඳුමක් ලබාදීම

ගුරු සේවා සහතික ලබා දීම

දහම් පාසල් ගුරු හැදුනුම්පත් ලබා දීම.

ගුරු පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

රජයේ විශ්වවිද්‍යාල මඟින් දහම් සරසවිය ඩිප්ලෝමා පාඨමාලාව අඛණ්ඩව දිස්ත්‍රික්ක මට්ටමින් පවත්වන අතර, එමඟින් උපාධියක් ලබා ගැනීමේ ඉඩ ප්‍රස්ථාව ලබාදීම

පාලි භාෂා පුහුණු වැඩමුළු පැවැත්වීම

දහම් පාසල් ගුරු සහතික පත්‍ර විභාගය වාර්ෂිකව පැවැත්වීම

(v) අමාත්‍ය මණ්ඩල සන්දේශයක් ඉදිරිපත් කර ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 27(2) යටතේ ප්‍රශ්නය, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

රජයේ බදු ප්‍රතිපත්තිය නිසා දේශීය කර්මාන්තකරුවන් මුහුණ දී ඇති ගැටලු
அரசாங்கத்தின் வரிக்கொள்கையினால் உள்நாட்டுக் கைத்தொழிலாளர் எதிர்நோக்கும் பிரச்சினைகள்
ISSUES FACED BY DOMESTIC INDUSTRIALISTS DUE TO GOVERNMENT TAX POLICY

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තුවෙන් මා මෙම ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

ගරු කථානායකතුමනි, මෙය අද මුළු රටටම ජාතික අර්බුදයක් බවට පත් වී තිබෙන කාරණයක් නිසායි, මේ ප්‍රශ්නය යොමු කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

2006 අංක 10 දරන දේශීය ආදායම් පනත මඟින් ශ්‍රී ලංකාවේ කර්මාන්තකරුවන්ට ලබා දුන් සියලු බදු සහන සහ බදුසානුබල දැන් අහෝසි කොට ඇති බැවින්ද, 2017 නව දේශීය ආදායම් පනත, වැට් බදු පනත සහ වෙනත් බදු නීති රීති සංශෝධන සහන හා සෙස් බදු සංශෝධන තුළින් දේශීය කර්මාන්තකරුවන්ට අතිරේක විශාල බදු බරක් පටවා ඇති බැවින්ද, එක්සත් ජනපද ඩොලරයට ගෙවිය යුතු මුදල් ප්‍රමාණය රුපියල් 162ක් ඉක්මවා යෑම කරණ කොට ගෙන, -එය නොදන්නා ගණනකට යෑමට ඉඩ තිබෙන බැවින්ද,- දේශීය කර්මාන්ත හා නිෂ්පාදන සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හා වෙනත් යෙදවුම් ආනයනය කිරීමේදී අධික රුපියල් මිලක් ගෙවීමට සිදුවීමෙන් නිෂ්පාදන පිරිවැය ඉහළ ගොස් ඇති බැවින්ද,-

දේශීය ව්‍යාපාරිකයන්ට හුස්ම ගන්න තිබෙන ඉඩත් මේ ආණ්ඩුව ඕනෑකමින් වසා දමන්නයි හඳන්නේ. ඒකයි අපට මේ ප්‍රශ්නය අහන්න වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ ප්‍රකාශය කියවන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම කියවන්නම්. මට මේ කාරණයත් කියන්න වෙලා තිබෙනවා, ගරු කථානායකතුමනි. ආණ්ඩුව කොළඹ වහලා සියලුම දේශීය කර්මාන්තකරුවන්ගේ බෙල්ල මිරිකන්නයි හදන්නේ.

-ඉකුත් රජය යටතේ පැවතුණු ණය පොලී අනුපාතිකය සියයට සියයකටත් වඩා වැඩි ප්‍රමාණයකින් ඉහළ යෑම කරණ කොට ගෙන දේශීය කර්මාන්තකරුවන්ගේ මූල්‍ය පිරිවැය අසාමාන්‍ය ලෙස ඉහළ ගොස් ඇති බැවින්ද, වෙළෙඳාම ලිහිල් කිරීමේ නව වෙළෙඳ ප්‍රතිපත්තිය සහ ක්‍රියාත්මක කිරීමට බල කරන ද්විපාර්ශ්වික නිදහස් වෙළෙඳ ගිවිසුම් මඟින්, වක්කඩ කැඩුවා සේ විදේශීය නිෂ්පාදන රට තුළට ගලා ඒමට සැලැස්වීමෙන් දේශීය නිෂ්පාදකයන්ට හිමි තීරු බදු ආරක්ෂණයන් නැතිව යෑමෙන්, ආනයන තරගකාරිත්වයට මුහුණ දිය නොහැකි වීමෙන් සියලුම දේශීය කර්මාන්ත අනතුරට ලක්වන බැවින්ද, දේශීය කර්මාන්තකරුවන් මුහුණ දෙන ඉහත දැවැන්ත අර්බුදයන්ට විසඳුම් මාර්ග සකසා ගැනීම සඳහා ආණ්ඩුවේ බලධාරීන්ගේ කිසිදු මැදිහත් වීමක් සිදු නොවන බැවින්ද, දේශීය කර්මාන්ත රැසක් මේ වන විටත් විදේශිකයන් විසින් අත්පත් කරගෙන ඇති බැවින්ද, ලංකා ඉතිහාසයේ නොවූ විරූ පරිද්දෙන් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත රැසක් වැසී යෑමෙන් කර්මාන්ත අංශයෙහි රක්ෂා කරමින් සිටින ජනතාව දහස් ගණනින් රැකියා අහිමි ගොඩට දිනපතා එකතු වන බැවින්ද,

-ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාත් කිව්වා, ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් ඇමෙරිකාවේවත් මෙවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නේ නැති බව. මෙහේ සිටින ට්‍රම්ප්ගේ ගෝල බාලයෝ මොනවා කරනවාද මම දන්නේ නැහැ.-

දේශීය කර්මාන්තකරුවන් වනසන, විජාතික කර්මාන්තකරුවන් සනසන ආණ්ඩුවේ වැරදි ප්‍රතිපත්තිය නිවැරැදි කිරීමට ගරු ඇමතිතුමා සහ ආණ්ඩුව වහා මැදිහත් වන්නේ දැයි මේ ගරු සභාවට පැහැදිලි කරන ලෙස ඒකාබද්ධ විපක්ෂය වෙනුවෙන් මා ඉල්ලා සිටිනවා. ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු ඇමතිතුමනි, දේශීය කර්මාන්තකරුවන්ගේ කර්මාන්ත වැසී යාමට මත්තෙන්, ඒ භයානක තත්ත්වය වළක්වා ගැනීම සඳහායි මා මෙම ප්‍රශ්නය යොමු කරන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමනි, පිළිතුරු දෙන්න.

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)
I do not agree, because the Government does not implement or follow wrong policies. Further, I would like to mention the following facts.

There are no duty concessions removed by the Inland Revenue Act, No. 24 of 2017, which had been especially granted by the Inland Revenue Act, No. 10 of 2006. No new tax liabilities have been imposed by the VAT Act that affects the local industrialists. However, VAT has newly been imposed only on some imported items. In order to encourage local industries, I am happy to say that we have removed PAL -Port and Airport Development Levy- on construction, machineries used for agriculture, dairy production et cetera. Further, a 75 per cent of PAL waiver has been given on the machinery imported by local industrialists. In addition to those measures, my Ministry, the Ministry of Industry and Commerce, has taken the following actions in this regard.

On the advice given by His Excellency the President and the Hon. Prime Minister, the Industrialization Commission which has been introduced by the Industrial Promotion Act, No. 46 of 1990 has been re-activated. This Commission which is chaired by the Secretary to the Treasury also pays special attention for the issues faced by the local industrialists. Every two weeks, all industrialists meet the Chairman, Secretary to the Treasury, together with other officials and discuss their issues.

At present, there are 17 Advisory Councils which are functioning under the Ministry of Industry and Commerce. Some of the Chairmen of these Councils represent the members of the Industrialization Commission. At present, 29 industrial estates consisting of 330 industries are functioning. Around 20,000 employees are working in these industrial estates.

Further, the National Economic Council which is chaired by His Excellency the President has recently had several discussions on the issues faced by local industrialists which our Former Minister Hon. Dinesh Gunawardena mentioned. Accordingly, there has been a forum formed at the highest level to present the issues faced by the local industrialists.

The Government has taken all action to hold the "Exporters Forum" continuously under Minister Hon. Malik Samarawickrama's Chairmanship together with the EDB in order to facilitate the exporters.

Hon. Speaker, my Ministry has finalized the SME Policy and Action Plan for attaining sustainable development in the Small and Medium Enterprises. We are going to launch it as soon as possible. Further, my Ministry is providing financial support at a low interest rate for the SMEs through two different SME loan schemes such as SMILE III Loan Scheme and e-Friends II Loan Scheme. More than Rs. 10 billion has been released to the SME industrialists as of now.

For the development of the traditional and craft industries and handloom industries, my Ministry has implemented an Integrated Development Programme called"Production Village Programme and Women Empowerment through Small Industries".

My Ministry is in the process of establishment of the CERA - Centre of Excellence in Robotics Applications-Project with the objective of using Artificial Intelligence and Robotics for the manufacturing industry initially focusing apparel and light engineering. Our apparel exports are more than US Dollars 5 billion and I think we are safe.

Further, we have identified the value of having a firm "Industrialization Policy" for the country and we are working on that also. [*Interruption.]*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා පැහැදිලි කිරීමක් ඉල්ලනවා. ඔබතුමාට clarify කරන්න පුළුවන්ද?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මොකද, මෙය බරපතළ වූ,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, are you prepared to clarify this?.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
Yes, Sir.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Sir, the Hon. Minister will agree because this is about our national industries.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Yes, of course.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
During the time of our governments, there were national industries like Dasa Group, Piyadasa Group and Sri Ramya Group. All the national industries were started

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

during our governments. Now, what is happening? Hon. Minister, please answer my question because you never answered that question. The rupee is getting devalued; the interest rates have been raised; taxes are being imposed and as a result, our national industries are virtually closing down. There is an emergency disucssion that the President is holding. The Hon. Minister is trying to cover up. His Excellency the President has been holding an emergency meeting during the last three weeks because of this national crisis. We do not want our national industries to close down. You are trying to remove the cess. [*Interruption.*]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Yes, Hon. Leader of the House.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
Can you answer me? Are you trying to remove the cess?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Please allow him to reply. Hon. Leader of the House, you may go ahead. [*Interruption.*]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
මමයි ප්‍රශ්නය ඇහුවේ, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හරි, හරි. ඔබතුමා ප්‍රශ්නය අහන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
You cannot make a speech.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
ලක්ෂ ගණනක් මිනිසුන්ගේ රැකියා නැති කරලා, ජාතික ව්‍යාපාර නැති කරනතුරු කට වහගෙන ඉන්න කියලාද ඔබතුමා කියන්නේ?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
නැහැ, නැහැ. කට වහගෙන ඉන්න එපා. දැන් ප්‍රශ්නය අහන්න. [බාධා කිරීමක්]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
කට වහගෙන ඉන්න කියලා තමයි කියන්නේ. මට අහන්න අවසර දුන්න ප්‍රශ්නය අහන්න ඉඩ දෙන්න.

මේ රටේ කකුල් දෙකෙන් හිටගත්ත ජාතික ව්‍යාපාරිකයන් වනසා දමනවාට යූඑන්පී එකේ පසුපෙළත් විරුද්ධයි කියා මම හිතනවා. මේකයි භයානකකම. ඔබතුමාත් නැඟිට්ටේ C. W. Mackie & Company Limited එකෙන්. ඔබතුමාටත් මතකයි. මේ ක්‍රියාවෙන් අපේ කර්මාන්ත එකින් එක වසා දැමීමයි ඔබතුමන්ලා කරන්නේ. ඔබතුමන්ලා කර්මාන්ත වසා දමා, බඩු ආනයනය කරන ප්‍රතිපත්තියකටයි යන්නේ. එහෙම නේද, ගරු ඇමතිතුමනි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමාට ප්‍රශ්නය අහන්න අවස්ථාව දුන්නා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු තිනේෂ් කුණවර්තන)
(The Hon. Dinesh Gunawardena)
Hon. Minister, you are not answering the question.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
You ask the question. [*Interruption.*] ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මෙතුමා සංඛ්‍යා ලේඛන බැලුවොත්, අවුරුදු විස්සකට පස්සේ ලංකාවේ අපනයනය වැඩි වෙලා තිබෙන බව පෙනෙයි. Our exports have gone up for the first time in 20 years. ඒක තමයි ඇත්ත.

අනෙක් කාරණය, අද බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී මංගල සමරවීර අමාත්‍යතුමාගේ අමාත්‍යාංශයයි, මගේ අමාත්‍යාංශයයි එකතු වෙලා ව්‍යවසායකයන්ට ණය ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කරනවා. ඒ අනුව ණය යෝජනා ක්‍රම සියයක් තිබෙනවා. "Enterprise Sri Lanka" කියන වැඩසටහනෙන් අපි ගමට යනවා, ගමට ගිහිල්ලා අපි ණය දෙනවා. ඒ අනුව, ව්‍යවසායකයන්ට දිරි දීම සඳහා අවශ්‍ය පියවර අප විසින් ගෙන තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. Hon. Minister, are you going to respond?

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(මාණ්පුමිකු (කලානිති) පන්තුල කුණවර්තන)
(The Hon. (Dr.) Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(මාණ්පුමිකු ිසාට් පතියුතීන්)
(The Hon. Risad Badhiutheen)
ගරු කථානායකතුමනි, එතුමා කියන විධියට කර්මාන්තශාලා වසා දමලාය කියලා අපේ අමාත්‍යාංශයට තොරතුරු ලැබී නැහැ.

අපි ඊයේ පෙරේදා පත්තරෙන් call කළාම Horana Industrial Zone එකට invest කරන්න 120ක් ආවා. ඒ වාගේම අපි කර්මාන්තකරුවන්ට තිබෙන ප්‍රශ්න ගැන හැම සතියේම අපේ කැබිනට් මණ්ඩල රැස්වීමෙන් පසුව අතිගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා, ගරු මුදල් ඇමතිතුමා ඇතුළු ඒකට සම්බන්ධ වන සියලුම ඇමතිවරු සමඟ සාකච්ඡා කරලා, ඒ කර්මාන්තකරුවන්ගේ ප්‍රශ්න විසඳන්න වැඩ පිළිවෙළක් යොදාගෙන යනවා. ඒ වාගේම අද හවස ගරු මංගල සමරවීර ඇමතිතුමාගේ නායකත්වයෙන් මුදල් අමාත්‍යාංශය මඟින් "Enterprise Sri Lanka" වැඩසටහන සඳහා Rs. 80 billion මුදලක් - [බාධා කිරීමක්] එතුමා යටතේ අද අපි ඒ කටයුතු ආරම්භ කරනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මැතිතුමා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, අද බීඩි කර්මාන්තයත්-[බාධා කිරීමක්]

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
බීඩි කර්මාන්තයට කිසිම හානියක් වෙලා නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
හානියක් වෙලා නැද්ද කියලා ගිහිල්ලා බලන්න. එන්න යන්න කෑගල්ලට, පෙන්වන්නම්. [බාධා කිරීම්]

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු ඇමතිතුමනි, පොඩ්ඩක් ඉන්න. නිකම් කෑ ගහන්න ඕනෑ නැහැ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Do not go into an argument. එහෙම වුණොත් සභාවේ වැඩ කටයුතු මෙතැනින් නවත්වන්න වෙනවා.

ගරු ඒ.ඩී. ප්‍රේමදාස මහතා
(மாண்புமிகு ஏ.டி. பிரேமதாச)
(The Hon. A.D. Premadasa)
ගරු කථානායකතුමනි,-

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මට අවස්ථාව දීලා තිබෙන්නේ. පොඩ්ඩක් වාඩි වෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමාට අවස්ථාව දීලා තිබෙන්නේ. ඔබතුමාටත් අවස්ථාව දෙන්නම්. පොඩ්ඩක් වාඩි වෙන්න. එතුමාට අවස්ථාව දුන්නා වාගේම ඔබතුමාටත් අවස්ථාව දෙන්නම්.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම කථා කරනතුරු පොඩ්ඩක් වාඩි වෙලා ඉන්න.

ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නේ නැති බොහෝ දේ කර්මාන්ත සම්බන්ධයෙන් සිදු වෙනවා. අපනයන සංවර්ධන මණ්ඩලය - Sri Lanka Export Development Board - තිබෙන්නේ ඔබතුමා යටතේ. [බාධා කිරීම්] අන්න එතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. [බාධා කිරීම්] පාස්කරලිංගම් ගෙනැල්ලා, අපනයනකරුවන්ට ලබා දෙන සෙස් එක අදියරෙන් අදියර ඉවත් කරලා, සියලුම කර්මාන්තකරුවන්ගේ ආරක්ෂාව නැති කරන ප්‍රතිපත්තිය අවිවූ ගහලා පාර්ලිමේන්තුවට දීලා තිබෙනවා. මම ඒක කියවන්නම්. "ආනයන සීමා කිරීම. ගෙවුම් ශේෂය- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒක කියවන්න අවශ්‍ය නැහැ. අපි පසුව විවාදයක් පවත්වමු. පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය සහ විපක්ෂය වශයෙන් මත දෙකක් තිබෙනවා. ඒ නිසා සාකච්ඡා කරන්න මම විවාදයක් දෙන්නම්. බීඩි කර්මාන්තය සම්බන්ධයෙන් ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට මොකක්ද කියන්න තිබෙන්නේ?

ගරු ඒ.ඩී. ප්‍රේමදාස මහතා
(மாண்புமிகு ஏ.டி. பிரேமதாச)
(The Hon. A.D. Premadasa)
ගරු කථානායකතුමනි,- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Let him answer. [බාධා කිරීම්] ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කථා කරන්න. [බාධා කිරීම්]

ගරු ඒ.ඩී. ප්‍රේමදාස මහතා
(மாண்புமிகு ஏ.டி. பிரேமதாச)
(The Hon. A.D. Premadasa)
ගරු කථානායකතුමනි, විපක්ෂයෙන් කියන කාරණය සම්පූර්ණ සත්‍යයක්. බීඩි කර්මාන්තය අද කඩා වැටිලා ඉවරයි. [බාධා කිරීම්]

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
දැන් මොකද කියන්නේ?

ගරු ඒ.ඩී. ප්‍රේමදාස මහතා
(மாண்புமிகு ஏ.டி. பிரேமதாச)
(The Hon. A.D. Premadasa)
අද බීඩි කර්මාන්තයේ යෙදෙන කාන්තාවන් ලක්ෂ හයක් ඉන්නවා. [බාධා කිරීම්]

අද වරායට හොරට තමයි බීඩි කොළ ගෙනෙන්නේ. [බාධා කිරීම්] හොරට. මේ කොළ කිලෝ එකක් අඩු මිලකට තමයි එළියට දමන්නේ. වරායෙන් හොරුන්ට තමයි උදවු කරන්නේ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
We will close it.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
හොරට ගෙනෙන එක හොඳද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, give your attention to this. Now, both sides have come up with their comments.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
ගරු කථානායකතුමනි, සෙස් ගැනයි, EDB ගැනයි EDB භාර ඇමතිවරයාගෙන් අහන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, පාර්ලිමේන්තුවේ මත දෙකක් තිබෙනවා. අපි විවාදයක් කරමු. මම සභානායකතුමාට කිව්වා. අපි විවාදයක් කරමු. ඒ මත දෙක ඉදිරිපත් කරන්න. [බාධා කිරීම්] විවාදයක් දෙන්නම්. [බාධා කිරීම්] We will give a debate.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාගේ point of Order එක මොකක්ද? අද ශෝක ප්‍රකාශ යෝජනා තිබෙනවා. කරුණාකර, ඒ ගැන හිතන්න. [බාධා කිරීම්]

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ගරු කථානායකතුමනි, ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමාත් මේ ගරු සභාවේ සිටින නිසා ඔබතුමාගේ අවසරය -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, අද ගන්න බැහැ. ඒවා ගන්න බැහැ. මේක වෙනත් දෙයක්. [බාධා කිරීම්]

වරප්‍රසාද පිළිබඳ ප්‍රශ්නය ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මැතිතුමා. [බාධා කිරීම්] කරුණාකර, වාඩි වෙන්න. [බාධා කිරීම්] අද වැදගත් කරුණු කිහිපයක් ගැන කථා කිරීමට තිබෙනවා.

වරප්‍රසාද : 2018 ජූනි 21වැනි දින "ලංකාදීප" වාර්තාව

சிறப்புரிமை: 2018 யூன் 21ஆம் தேதிய “லங்காதீப” அறிக்கை

PRIVILEGE: "LANKADEEPA" REPORT OF 21ST JUNE, 2018

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள்)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe - (Minister of Higher Education and Cultural Affairs)
ගරු කථානායකතුමනි, 2018 වර්ෂයේ ජූනි මස 21වැනි දින "ලංකාදීප" පුවත් පතේ ප්‍රධාන ශීර්ෂය යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද උල්ලංඝනය කිරීමේ කාරණය සම්බන්ධයි. වසර තුනක පමණ කාලයක් නිස්සේ අප රටේ විශ්වවිද්‍යාල පද්ධතිය බොහෝ සෙයින් අකර්මණ්‍ය කරමින් සහ ජනතාවගේ සාමාන්‍ය ජන ජීවිතයට මහත් බාධා හිරිහැර ඇති කරමින් SAITM එකේ වෛද්‍ය පීඨයේ ප්‍රශ්නය හේතුකොටගෙන පෙළපාළි, උද්ඝෝෂණ, විරෝධතා 400කට වැඩි ප්‍රමාණයක් පවත්වන්නට යෙදුණු අතර, ඒ පිළිබඳ අප රටේ මුද්‍රිත ජනමාධ්‍ය ඉතා ප්‍රබල ප්‍රමුඛත්වයක් ලබා දෙමින් ශීර්ෂ පාඨවල පවා පුවත් පළ කරමින් විශාල ප්‍රසිද්ධියක් ලබා දෙනු ලැබුවා. එම දැවෙන ප්‍රශ්නය නිරාකරණය කරමින් පාර්ලිමේන්තුවේ කිසිදු මන්ත්‍රීවරයෙකුගේ විරෝධතාවකින් තොරව ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ජූනි මස 20වැනි දින ඡන්ද විමසීමකින් තොරව අප හට සම්මත කර ගැනීමට හැකි වූයේ සියලු දෙනාට පිළිගත හැකි සාධාරණ විසඳුමක් ලබා දීම හේතුවෙනි.

එහෙත්, කිසිදු පුවත් පතක් එකී ජාතික වැදගත්කමකින් යුතු ප්‍රවෘත්තිය ප්‍රමුඛතාවක් ලබා දෙමින් පළ කිරීමට තරම් අපගේ පුවත් පත් පද්ධතිය කාරුණික නොවූ අතර, පැවැති අර්බුදයන් ජාතික වැදගත්කමකින් යුත් ඒවා ලෙසත්, අර්බුදය විසඳීම ජාතික වැදගත්කමකින් තොර එකක් ලෙසත් හුවා දක්වා තිබීම කොතරම් සාධාරණද, නැද්ද යන්න ඔවුන්ගේ පාඨක ජනතාව තීරණය කරනු ඇත.

ජූනි 21වන දින "ලංකාදීප" පුවත් පත ඉතා වැඩි ප්‍රමුඛත්වය ලබා දෙමින් ශීර්ෂ පාඨය ලෙස පළකොට ඇත්තේ, මාගේ සහ නියෝජ්‍ය අමාත්‍ය ගරු හරීස් මැතිතුමාගේ ඡායාරූපද සහිතව, "ඇමති විජයදාස නි. ඇමති හරීස් මැතිසබෙදී ගැටෙති." යන මාතෘකාව යටතේයි. මීට පෙර දිනක මා විසින් පාර්ලිමේන්තුවේදී කළ කථාවක් පිළිබඳව සඳහන් කිරීමෙදී, ඒ පිළිබඳව කරුණු කාරණා ඉතා මිත්‍රශීලි ලෙස මේ ගරු සභාවේදී මා විසින් පැහැදිලි කිරීමක් කරනු ලැබූ අතර, එම පැහැදිලි කිරීම පිළිබඳව ගරු හරීස් නියෝජ්‍ය අමාත්‍යතුමාගේ කථාවේදී එතුමාගේ ස්තුතියද පළ කර සිටියේය. එවන් වූ මිත්‍රශීලි සංවාදයක් මේ ගරු සභාව තුළ ඇති වූ විට එය ඉතා අශෝභන, බරපතළ ගැටුමක් බවට පරිවර්තනය කරමින් පුවත් පත් වාර්තා කිරීම මාධ්‍ය සදාචාරයට කොතරම් ගැළපේද යන්න මුළු රටේම ජනතාව විමතියට පත් කරවන අතර, මුළු පාර්ලිමේන්තුවටත්, සියලුම මන්ත්‍රීවරුන්ටත් කරන අපහාසයක් මෙන්ම වරප්‍රසාද උල්ලංඝනය කිරීමක් ලෙසට මා සඳහන් කරනවා.

කරුණු විකෘති කර මෙවැනි අසත්‍ය තොරතුරු එවන් වූ ප්‍රමුඛත්වයක් ලබා දෙමින් පුවත් පතක ප්‍රධාන ශීර්ෂ පාඨය ලෙස පළ කරනු ලැබුවේ පහත සඳහන් විකල්ප දෙකෙන් එකක් හෝ දෙකම හේතුවෙන් බව අපගේ නිගමනයයි.

1. එක්කෝ මෙරට ජන ජීවිතයට වැදගත් වන්නා වූ ප්‍රමුඛ හා වැදගත් පුවත් කුමක්ද යන්න පිළිබඳව ඒවා පළ කරනු ලබන ජනමාධ්‍යවේදීන්ට අවබෝධයක් නොමැතිකමද?
2. මෙරට ජනතාවගේ ශුභ සිද්ධිය වෙනුවෙන් සිදු කරනු ලබන වැදගත් කටයුතු හෙළා දැකීම තුළින් ජන ජීවිත අවුල් කිරීමේ ද්වේෂසහගත චේතනාව පෙරදැරි කරගෙනද?

ඉහත සඳහන් කරුණු දෙකම බලපෑවේද, නැතහොත් එකක් බලපෑවේද යන්න කිව හැක්කේ එය පළ කළ මාධ්‍යවේදීන්ට පමණි. එසේ නොවන්නේ නම්, ඔවුන් කුමන හෝ බලවේගවල කොන්ත්‍රාත්තුවක් ඉටු කරන්නේද යන්න පිළිබඳව ජනතාව තුළ කුකුසක් හටගෙන ඇත. මේ රටේ ජන කොටස් අතර සහජීවන ක්‍රියාදාමයක් ආරම්භ කරමින් දැඩි කැප කිරීමකින් අප කටයුතු කරන මේ මොහොතේ ජාතිවාදී හැඟීම් ව්‍යාංග ලෙසින් උද්දීපනය කරමින් ඉහත කී ප්‍රවෘත්තිය පළ කර තිබීම පිළිබඳව අපි සියලුදෙනාම කනගාටු විය යුතුය.

මෙම කාරණය පිළිබඳව ඔබතුමාගේ සහ පාර්ලිමේන්තුවේ ගරු මැති-ඇමතිවරුන්ගේ අවධානය යොමු කරන ලෙස මා කාරුණිකව ඉල්ලා සිටිනවා. ස්තුතියි, ගරු කථානායකතුමනි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මැතිතුමනි, Ombudsman ගැන ඔබතුමාගේ පැහැදිලි කිරීමක් අවශ්‍යයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, ඉඩ ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි. පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලය ඔබතුමාගේ බලය යටතේ ක්‍රියාත්මක වන ආයතනයක්. මෙම ආයතනයේ තීන්දු-තීරණවලට හෝ කැඳවීම්වලට අවනත නොවෙමින්, අභියෝග කරමින්, අපහාස කරමින් ක්‍රියා කරන ඔබතුමාගේ වාර්තාවේ සඳහන් මෙබඳු නිලධාරීන් සම්බන්ධයෙන් ක්‍රියාත්මකවීමට අපට තිබෙන ඉඩකඩ මොකක්ද? ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් ඔබතුමා ගන්නා වූ ක්‍රියාමාර්ගය කුමක්ද? OMP කාර්යාලය වැනි කාර්යාලයකට යම් අවනතවීමක් නොවුණොත්, ඔවුන් ශ්‍රේෂ්ඨාධිකරණයට අපහාස කිරීමේ චෝදනාව මත යොමු කරන්න පුළුවන් තත්ත්වයක් තුළ, පාර්ලිමේන්තු කොමසාරිස් මෙවැනි අසරණ තත්ත්වයකට වැටෙන්නට ඉඩ හැර මේ පාර්ලිමේන්තුවේ අපි බලාගෙන ඉන්නවාද කියා මා විමසන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමා ඒ ගැන සඳහන් කිරීම හොඳයි. අපි ඊළඟ පක්ෂ නායක රැස්වීමේදී මේ ගැන සාකච්ඡා කරන්න බලාපොරොත්තු වෙනවා. ඊට පසුව අවශ්‍ය පියවර ගන්නවා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මම ඉතා වැදගත් ගැසට් නිවේදනයක් සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමු කරවනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අද දින න්‍යාය පත්‍රයට අනුව අපට ප්‍රධාන වශයෙන් විවාදයට ගැනීමට ශෝක ප්‍රකාශ යෝජනා තිබෙනවා. පළමුවෙන්ම තිබෙන්නේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, අභාවප්‍රාප්ත ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මැතිතුමාගේ ශෝක ප්‍රකාශ යෝජනාව. දෙවනුව තිබෙන්නේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, අභාවප්‍රාප්ත ගරු රේණුකා හේරත් මැතිනියගේ ශෝක ප්‍රකාශ යෝජනාව. තුන්වනුව තිබෙන්නේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අභාවප්‍රාප්ත ගරු මල්ලිකා රත්වත්තේ මැතිනියගේ ශෝක ප්‍රකාශ යෝජනාව.

මට මේ ගරු සභාවෙන් යෝජනාවක් ඉදිරිපත් කළා, මෙම ශෝක ප්‍රකාශ යෝජනා තුන එකවරම විවාදයට ගනිමු කියලා. සභාව එකඟ නම් ඒ විධියට කරන්න පුළුවන්. සභාව එකඟද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ගරු සභානායකතුමා.

ශෝක ප්‍රකාශ:
ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මහතා, ගරු රේණුකා හේරත් මහත්මිය සහ ගරු මල්ලිකා රත්වත්තේ මහත්මිය
அனுதாபத் தீர்மானங்கள் :
மாண்புமிகு ஏ.ஆர்.எம். அப்துல் காதர், மாண்புமிகு (திருமதி) ரேணுகா ஹேரத் மற்றும் மாண்புமிகு (திருமதி) மல்லிகா ரத்வத்த
VOTES OF CONDOLENCE: HON. A.R.M. ABDUL CADER, HON. (MRS.) RENUKA HERATH AND HON. (MRS.) MALLIKA RATWATTE

[ප.භා. 11.06]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, මහනුවර දිස්ත්‍රික්කයේ පොදු මහජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වශයෙන් මෙම උත්තරීතර සභාව හොබවන ලද කෘතහස්ත

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

දේශපාලනඥයෙකු වූ ගරු අබ්දුල් කාදර් මැතිතුමාගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මා මෙම අවස්ථාවේදී ගරු සභාවට ඉදිරිපත් කරමි.

1936 ඔක්තෝබර් මස 30 වන දින උලපනේහිදී උපත ලද අබ්දුල් කාදර් මහතාගේ දයාබර පියාණන් වූයේ වෙළෙඳ ව්‍යාපාරික අබ්දුල් රහීම් මහතාය. එතුමාගේ දයාබර මැණියන් වූයේ සාලිහා උම්මා මහත්මියයි.

නාවලපිටිය ශාන්ත මරියා විදුහලෙන් අධ්‍යාපනය හදාරා ඇති මෙතුමා අධ්‍යාපන කටයුතු නිමවීමත් සමඟම ක්‍රියාකාරී දේශපාලනයට පිවිසියේය. සිත්ති ෆරිකා මහත්මිය සමඟ යුගදිවි ගමන ඇරඹූ අබ්දුල් කාදර් මැතිඳුන් ෆාතිමා ශියාමා, ෆාතිමා ෂියානා සහ ෆාතිමා ෆසීනා යන දියණියන් තිදෙනා මෙලොවට දායාද කළේය.

1989 වසරේ පැවති පාර්ලිමේන්තු මැතිවරණය සඳහා මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් එක්සත් ජාතික පක්ෂයෙන් තරග කළ අබ්දුල් කාදර් මැතිතුමා ජනතා සහාය නොමඳව දිනා ගනිමින්, වැඩි මනාප ප්‍රමාණයක් ලබාගෙන පළමු වරට පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට භාග්‍ය උදා කර ගත්තේය. හිටපු ජනාධිපති අතිගරු ආර්. ප්‍රේමදාස මැතිතුමාගේ රජයේ විදුලිබල ව්‍යාපෘති ඇමති ලෙස හා ඉන් පසු ජනාධිපති ධුරය දැරූ අතිගරු ඩී.බී. විජේතුංග මැතිතුමාගේ රජය යටතේ නාගරික සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය තනතුරද දරමින් ජනතා සේවය උදෙසා කැප වී කටයුතු කළ කීර්තිමත් නායකයකු ලෙස මෙතුමා පෙන්වා දිය හැකිය.

1994 වසරේ පැවති පාර්ලිමේන්තු මැතිවරණය සඳහා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් මහනුවර දිස්ත්‍රික්කය සඳහා තරග කළ කාදර් මැතිතුමා මනාප විශාල සංඛ්‍යාවක් ලබා ගනිමින් දිස්ත්‍රික්කයේ දෙවන ස්ථානය හිමි කර ගනිමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස නැවත පත් වී 2000 වසර දක්වා පාර්ලිමේන්තුවේ විපක්ෂයේ මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කරන ලදී.

2000 වසරේ පැවති මහා මැතිවරණයට නැවතත් ඉදිරිපත් වී ඉන් ජය ගෙන පාර්ලිමේන්තුවට තේරී පත්වූ එතුමා 2001 වසරේදී ජාතික ලැයිස්තු මන්ත්‍රීවරයකු ලෙස නැවතත් පාර්ලිමේන්තුවට පිවිසියේය. ඉන් පසුව 2004 හා 2010 වසරවල පැවති මැතිවරණවලට ඉදිරිපත් වී වැඩි මනාප ප්‍රමාණයක් ලබා ගනිමින් මහනුවර දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුවට තේරී පත්වී මන්ත්‍රීවරයකු ලෙස කටයුතු කළ කාදර් මැතිතුමා වෙත එක්සත් ජාතික පක්ෂයේ සමස්ථ ලංකා මුස්ලිම් ජාතික සංවිධායක ධුරයද හිමි වී තිබුණි. එසේම නාගරික සංවර්ධන (ව්‍යාපෘති) අමාත්‍ය, සමුපකාර අමාත්‍ය, පරිසර නියෝජ්‍ය අමාත්‍ය සහ පරිසර හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍ය යන අමාත්‍ය ධුර දරමින් ගම්පොල, නාවලපිටිය, ගලගෙදර යන මැතිවරණ කොට්ඨාසවල ජනතාවට සුවිශාල මෙහෙවරක් ඉටු කළ ජනතා නියෝජිතයකු ලෙස එතුමා පෙන්වා දිය හැකිය.

මහනුවර දිස්ත්‍රික්කයේ අඩු ආදායම් ලබන පවුල් විශාල ප්‍රමාණයකට නිවාස ආධාර සඳහා තමාගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් සෙවිලි තහඩු, ඇස්බැස්ටෝස් ෂීට්, පොල් පරාල, බ්ලොක් ගල් හා සිමෙන්ති ලබා දීම, මහන මැෂින් ලබා දීම, 2004 වසරේ සුනාමියෙන් අසරණ වූ ජනතාව වෙනුවෙන් කල්මුණේ නගරයෙන් අක්කරයක පමණ ඉඩමක් තම ධනයෙන් මිලදී ගෙන ජනතා අයිතියට පත් කර දීම, ශ්‍රී දළ දා මාලිගාවට සිදු වූ ත්‍රස්ත ප්‍රහාරයේදී මහනුවර දිස්ත්‍රික්කයේ මුස්ලිම් වෙළෙඳ ව්‍යාපාරිකයන් සමඟ එක්වී මාලිගාවේ අරමුදලට මුදල් පරිත්‍යාග කිරීම වැනි සත්ක්‍රියාවන් මෙතුමා විසින් සමාජයේ ජනතාවට ඉටු කළ මෙහෙවර විදහාපාන සේවාවන් ලෙස පෙන්වා දිය හැකිය.

තවද, මාවතුර ප්‍රදේශයේ රජයේ ඉඩම් කොටසක් ලබාගෙන අඩු ආදායම්ලාභීන් සඳහා තම පෞද්ගලික ධනයෙන් අංග සම්පූර්ණ නිවාස 50ක් සාදා එම නිවාස ජනතා අයිතියට පත් කර දීමද දුප්පත් ජනතාව වෙනුවෙන් කළ උතුම් ක්‍රියාවක් වන අතර, එයට කෘතගුණ දැක්වීම පිණිස එම ගම්මානය "කාදර් ගම්මානය" යනුවෙන් හැඳින්වීමටද එම වැසියන් ක්‍රියා කළේය.

ගම්පොල නගරයේ ජුම්මා පල්ලියේ වසර 30කට අධික කාලයක් සභාපති ධුරය හොබවමින් තම ආගම වෙනුවෙන්ද ඉතා කැපවීමකින් කළ මෙහෙවරට පල්ලියේ දායක සභාව විසින් එතුමා මිය යන තෙක් දැරිය හැකි එහි සභාපති ධුරය පිරිනමන ලදී. තම ආගම හා ධර්මයට නිසි අයුරින් කැපවීමෙන් යුතුව කටයුතු කළ එතුමා එම නීති පිළිපදිමින් දිවයිනේ මුස්ලිම් ජනතාව වෙනුවෙන් විශාල සේවයක් කරන ලදී. ජිනීවා නුවර පැවති ජාත්‍යන්තර සමුළුවකට ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් සහභාගී වූ එතුමා එහිදී විශේෂ දේශනයක් පවත්වා ඇති අතර, එහිදී ලත් අත්දැකීම්ද තම ජනතාවගේ සුබසාධනය වෙනුවෙන් යොදවා ගැනීමට අමතක කළේ නැත. මෙසේ ජනතා සේවයට කැප වී කටයුතු කළ අබ්දුල් කාදර් මැතිතුමා අවුරුදු 79ක් ආයු වළඳා 2015 ඔක්තෝබර් මස 03වැනි දින මෙලොවින් සමු ගත්තේය.

ගරු කථානායකතුමනි, 1989 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අවුරුදු 25කට වැඩි කාලයක් පාර්ලිමේන්තුවේ රැඳී සිටිමින් මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාවට සුවිශාල මෙහෙවරක් ඉටු කළ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අබ්දුල් කාදර් මැතිඳුන්ට ජෙන්නතුල් ෆිර්දවිස් හිමි වේවායි ප්‍රාර්ථනා කරන අතර, මෙම උත්තරීතර සභාවේ ශෝකය එතුමාගේ දයාබර භාර්යාව, දියණියන් තිදෙනා ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙසට යෝජනා කරමි.

ගරු කථානායකතුමනි, නුවරඑළිය දිස්ත්‍රික්කයේ පොදු මහ ජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක ලෙස සුවිශේෂී මෙහෙවරක් ඉටු කළ රේණුකා හේරත් මැතිනියගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මෙම අවස්ථාවේදී ගරු සභාවට මම ඉදිරිපත් කරමි.

විදුහල්පතිවරයෙකු වූ බී.ඩී.එම්. හේරත් මහතාට සහ සෝමාවතී හේරත් මහත්මියට දාව 1945 සැප්තැම්බර් මස 07වැනි දින රේණුකා හේරත් මැතිනිය නුවරඑළියේ පදියපැලැල්ලේදී ජන්ම ලාභය ලැබුවාය. මෙතුමියට සහෝදරයින් දෙදෙනෙකු සහ එක් සහෝදරියක්ද විය.

පදියපැලැල්ල විදුහලෙන් මූලික අධ්‍යාපනය ලබා පොරමඩුල්ල මධ්‍ය මහා විද්‍යාලයෙන් වැඩිදුර අධ්‍යාපන කටයුතු සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ව්‍යක්තීය වශයෙන් ඉංග්‍රීසි පුහුණු ගුරුවරියක ලෙස වලපනේ අධ්‍යාපන කලාපයේ පාසල් කිහිපයකම සේවය කළ ඇය පසු කලෙකදී එස්.බී. රණවීර මැතිතුමා සමඟ යුග දිවියට එළඹ හිරණ්‍යා හේරත් රණවීර දියණිය මෙලොවට දායාද කළාය.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරියක ලෙස ක්‍රියාකාරී දේශපාලනයට මෙතුමිය පිවිසියේ ගුරු ව්‍යක්තියේ නියැළෙමින් සිටින අවධියේ පටන්ය. 1977 වසරේදී නුවරඑළිය ජාතික අධ්‍යාපන සේවක සංගමයේ දිස්ත්‍රික් ලේකම්වරිය ලෙස කටයුතු කළ ඇය එම වසරේම වලපනේ මැතිවරණ කොට්ඨාසයේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන සංවිධායිකාව වශයෙන්ද පත් වූ අතර, 1977 පැවති මහ

මැතිවරණයට ඉදිරිපත් වී වලපනේ ආසනය ජයගෙන ප්‍රථමවරට පාර්ලිමේන්තුවට පිවිසියාය. 1977දී සිදු වූ දේශපාලන පෙරළිය සමඟ රටේ ඇති වූ ආර්ථික, සමාජයීය හා දේශපාලන වෙනස්කම් තුළින් මධ්‍ය කඳුකරයේ ජන ජීවිතය නංවාලීම සඳහා වන සංවර්ධන ව්‍යාපෘති රැසක් ක්‍රියාත්මක වූ අතර, එහිදී වික්ටෝරියා, රන්දෙණිගල, රන්ටැඹේ වැනි ජලාශ ඉදි කිරීම, මහවැලි සංවර්ධන වැඩසටහන කඩිනම් කිරීම වැනි කටයුතුවලදී තම සහයෝගය ලබා දෙමින් වලපනේ, හඟුරන්කෙත වැනි මැතිවරණ කොට්ඨාසවල ද දැවැන්ත සංවර්ධනයක් ක්‍රමාකාරයෙන් එම ව්‍යාපෘති හරහා ඇති කිරීමට මෙතුමිය විශාල වැඩ කොටසක් කළාය.

1978 වසරේ නුවරඑළිය දිස්ත්‍රික් ඇමතිනිය වශයෙන් පත් වූ ඇය 1987 වර්ෂයේදී එක්සත් ජාතික පක්ෂ කෘත්‍යාධිකාරී මණ්ඩලයටද පත් වූ අතර, 1988 වසරේදී සංස්කෘතික නියෝජ්‍ය ඇමතිතුමිය වශයෙන් පත් වූවාය. 1989 වසරේ පැවති මහ මැතිවරණයෙන් ද ජයගත් මෙතුමිය සෞඛ්‍ය අමාත්‍ය ධුරය හිමි කර ගත් අතර, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ උන්නතිය උදෙසා විශාල වැඩ කොටසක් ඉටු කළාය. 1990 වසරේ ලක් වනිතා පෙරමුණේ සභාපතිනිය ලෙස පක්ෂයේ කාන්තා ශක්තිය වැඩි කිරීම සඳහා සුවිශේෂී සේවාවක් ඉටු කළ මෙතුමිය 2002 වසරේ රාජ්‍ය දැව සංස්ථාවේ සභාපතිනිය වශයෙන් පත් විය. 1994 වසරේ නෙදර්ලන්තයේ පැවති ලෝක ප්‍රථම කාන්තාවන්ගේ සමුළුවට ද සහභාගි වී ඇති මෙතුමිය එයින් ලද අත්දැකීම් ද මෙරට කාන්තාවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් යෙදවීමට අමතක නොකළාය.

එක්සත් ජාතික පක්ෂයේ සහකාර ලේකම්වරියක වශයෙන් ද උපසභාපතිනියක වශයෙන් ද කටයුතු කරමින් පක්ෂයේ උන්නතිය වෙනුවෙන් සුවිසල් කාර්යභාරයක් ඉටු කළ මෙතුමිය නුවරඑළිය දිස්ත්‍රික්කයේ මධ්‍යම පළාත් සභාවට තේරී පත්වී එහි විපක්ෂ කණ්ඩායමේ නායිකාව වශයෙන් මිය යන තෙක්ම කටයුතු කළාය.

1977 වර්ෂයේ සිට 2000 වර්ෂය දක්වා ද, ඉන්පසු 2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා ද අවුරුදු 26කට වැඩි කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් වලපනේ ආසනය ප්‍රමුඛ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ජනතාවට අගනා මෙහෙවරක් ඉටු කළ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හා හිටපු අමාත්‍යවරියක වූ ගරු රේණුකා හේරත් මැතිනිය අවුරුදු 72ක් ආයු වළඳා 2017 මාර්තු මස 12 වන දින මෙලොව හැර ගියා ය. එතුමියට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතර, මෙම උත්තරීතර සභාවේ ශෝකය එතුමියගේ දයාබර ස්වාමි පුරුෂයා, දියණිය ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙසට යෝජනා කරමි.

ගරු කථානායකතුමනි, ඊළඟට, රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ආසනයේ පොදු මහජනතාව නියෝජනය කරමින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක ලෙස සුවිසල් මෙහෙවරක් ඉටු කළ ගරු මල්ලිකා රත්වත්තේ මැතිනියගේ අභාවය පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනාව මෙම ගරු සභාවට මම ඉදිරිපත් කරමි.

විලියම් තියදෝර් එල්ලාවල මහතාට සහ මිලිසන්ට් දිඹුලාන එල්ලාවල මහත්මියට දාව 1932 අප්‍රේල් මස 13වැනි දින රත්නපුරදී උපත ලද එතුමිය මූලික අධ්‍යාපනය ලැබුවේ රත්නපුර ෆර්ගියුසන් බාලිකා විද්‍යාලයේනි. වැඩිදුර අධ්‍යාපනය සඳහා කොළඹ ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමයට ඇතුළත් වූ එතුමිය පසුව හේවුඩ් කලායතනයෙන් උසස් අධ්‍යාපන කටයුතු හැදෑරුවාය. දිවංගත සිරිමාවේ බණ්ඩාරනායක මැතිනියගේ බාලම සහෝදරයා වූ බලංගොඩ විසූ ක්ලිෆර්ඩ් සේනක රත්වත්තේ මහතා සමඟ 1959 වසරේ විවාහ දිවියට පත් ගරු මල්ලිකා රත්වත්තේ මැතිනිය දරුවන් දෙදෙනකුගේ දයාබර මාතාවක් විය. පුතණුවන් කමල් සේනක රත්වත්තේ වන අතර, එතුමා මේ වන විටත් ඓතිහාසික රත්නපුර මහා සමන් දේවාලයේ බස්නායක නිලමේ ලෙස සුවිසල් මෙහෙවරක් ඉටු කරමින් සිටියි. දියණිය භේෂානි අරම්පත්ත වන අතර ඇය විදේශ රටක පදිංචිව සිටියි.

විශාල ජනතා ආශීර්වාදයක් හිමි කරගත් ක්ලිෆර්ඩ් සේනක රත්වත්තේ මහතාගෙන් ලද දේශපාලන පන්තරය තුළින් 1966 පැවති අතුරු මැතිවරණයෙන් ජයගෙන පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක වීමේ භාග්‍යය එතුමිය උදා කර ගන්නා ලදී. නැවත 1970 වර්ෂයේදී පැවති මැතිවරණය සඳහා ද බලංගොඩ ආසනයට තරග කළ ගරු මල්ලිකා රත්වත්තේ මැතිනිය එම මැතිවරණයෙන් ජයගෙන එම ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ඉතා විශාල සේවයක් ඉටු කළාය.

එතුමිය විසින් කරන ලද සංවර්ධන කටයුතු අතර, බලංගොඩ රෝහල පරිශ්‍රය දියුණු කිරීම, පිහන් ගඩොල් කර්මාන්තශාලාව ඉදි කිරීම, තැපැල් කාර්යාලය ඉදි කිරීම, ශ්‍රී ලංගම ඩිපෝව ඉදි කිරීම හා මහජන බැංකුව ඉදි කිරීම වැනි සංවර්ධන කාර්යයන් විශාල ප්‍රමාණයක් වේ.

දුකට පත් ජනතාව වෙනට ගොස් ඔවුන්ගේ කඳුළු පිස දැමූ එතුමිය තමන් සතු ඉඩකඩම් පවා පන්සන්වලට, අහිංසක ජනතාවට නිර්ලෝභීව බෙදා දුන්නාය. දේශපාලනයේ යෙදුණු කාන්තාවක ලෙස තම කාර්යය මැනවින් ඉටු කළ එතුමිය අහිංසක දුප්පත් මිනිසුන් ඇතුළු සියලු ජනතාව සමඟ ඉතා ලෙන්ගතුකමින් කටයුතු කිරීම පැසසීමට ලක් කළ යුතු කරුණකි.

පාර්ලිමේන්තු කණ්ඩායම නියෝජනය කරමින් එංගලන්තය, ජර්මනිය හා ජපානය යන රටවල සංචාරය කර ඇති මල්ලිකා රත්වත්තේ මැතිනිය ඒවායින් ලද අත්දැකීම් තම මැතිවරණ ප්‍රදේශයේ ස්වයං රැකියා ප්‍රවර්ධනයට මහඟු පිටුවහලක් කර ගන්නා ලදී. චිත්‍ර ශිල්පිනියක් ලෙස කලා කටයුතුවල නිතරම නියැලුණු ඇය මහජන සේවයට නිබඳව කැප වී කටයුතු කළ උදාර තැනැත්තියක් ලෙස පෙන්වා දිය හැකිය.

ගරු කථානායකතුමනි, 1966 වර්ෂයේ සිට 1970 වර්ෂය දක්වාද, 1970 වර්ෂයේ සිට 1977 වර්ෂය දක්වා ද අවුරුදු 10කට වැඩි කාලයක් රත්නපුර දිස්ත්‍රික්කයේ බලංගොඩ ආසනයේ ජනතාවට සුවිසල් මෙහෙවරක් සිදු කළ ගරු මල්ලිකා රත්වත්තේ මැතිනිය අවුරුදු 86ක් ආයු වළඳා 2017 මැයි මස 19වෙනි දින මෙලොවින් සමුගත්තාය. එතුමියට නිවන් සුව ප්‍රාර්ථනා කරන අතරම, මෙම උත්තරීතර සභාවේ ශෝකය එතුමියගේ දයාබර පුතණුවන්, දියණිය ඇතුළු පවුලේ ඥාතීන් වෙත දන්වා යවන ලෙසට යෝජනා කරමි.

[පූ.භා. 11.20]

ගරු මහින්ද රාජපක්ෂ මහතා
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)

ගරු කථානායකතුමනි, අද දින මෙම සභාවට ඉදිරිපත් කළ ශෝක යෝජනා වෙනුවෙන් අදහස් පළ කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම පරලොව සැපත් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මල්ලිකා එල්ලාවල රත්වත්තේ මැතිනිය ගැන වවන ස්වල්පයක් ප්‍රකාශ කරන්න මා බලාපොරොත්තු වනවා.

1932 අප්‍රේල් 13වෙනි දින රත්නපුරදී උපත ලද එතුමිය මූලික අධ්‍යාපනය ලැබුවේ රත්නපුර ෆර්ගියුසන් බාලිකා විද්‍යාලයේ. ඉන්පසු වැඩිදුර අධ්‍යාපනය සඳහා කොළඹ ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමයට ඇතුළත් වුණා. එතුමිය විවාහ කර ගත්තේ දිවංගත ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ බාලම සහෝදරයා වූ

[ගරු මහින්ද රාජපක්ෂ මහතා]

බලංගොඩ විසූ ක්ලිෆර්ඩ් සේනක රත්වත්තේ මහතා. අපි දන්නවා මේ දෙදෙනාම තම ප්‍රදේශයේ විතරක් නොවෙයි මුළු රටටම සේවයක් කරපු නායකයන් දෙන්නෙක් බව. ක්ලිෆර්ඩ් සේනක රත්වත්තේ මැතිතුමාත්, රත්වත්තේ මැතිනියත් තමන්ගේ හිතට එකඟව අවංකවම අදහස් ප්‍රකාශ කළ දෙදෙනෙක්. මගේ පියාගේ මරණය දවසේත් එතුමිය පැමිණ ශෝකය ප්‍රකාශ කළා. ඒ අවස්ථාවේදී බණ්ඩාරනායක මැතිනිය ලංකාවේ හිටියේ නැහැ.

මල්ලිකා රත්වත්තේ මැතිනියත්, ක්ලිෆර්ඩ් රත්වත්තේ මැතිතුමාත් යන දෙදෙනාම මාත් එක්ක පාර්ලිමේන්තුව නියෝජනය කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, විපක්ෂ නායක ධුරය සම්බන්ධයෙන් සාකච්ඡා කළ එක් අවස්ථාවකදීත්, පක්ෂය පිළිබඳව සාකච්ඡා කරන අවස්ථාවකදීත් තමුන්ගේ ඥාතියා ගැන තිබෙන හැඟීමකට වඩා පක්ෂය පිළිබඳ හැඟීමකින් යුක්තව මා වෙනුවෙන් කථා කරන්න ඒ යුවල ඉදිරිපත් වුණු බව මා මතක් කරන්න කැමැතියි. ඒ කාරණය මා මේ අවස්ථාවේදී පෞද්ගලිකව කෘතවේදීව මතක් කරනවා. තමුන්ගේ හදවතට එකඟව ජනතාවගේ මතය ප්‍රකාශ කරන්න එතුමිය කොයි වෙලාවකවත් පසුබට වුණේ නැහැ.

ගම තුළට මහිලා සමිති සංකල්පය ඉදිරිපත් කරලා, ඒ ප්‍රදේශ තුළ ඒ කටයුතු ව්‍යාප්ත කරන්නටත් එතුමිය කටයුතු කළා. ඒ වාගේම, ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා කිව්වා වාගේ තමුන්ගේ ඉඩකඩම් පවා ජනතාවට බෙදා දෙන්නට තරම් එතුමිය නිර්ලෝභී වුණා.

බලංගොඩ ප්‍රදේශය දියුණු කිරීම සඳහා මල්ලිකා රත්වත්තේ මැතිනිය කළ සේවය අනිමහත්. බලංගොඩ රෝහල දියුණු කිරීම, පිහන් ගඩොල් කර්මාන්තශාලාවක් ඉදි කිරීම, තැපැල් කාර්යාලය, ලංගම ඩිපෝව ඉදි කිරීම ඇතුළු තවත් සංවර්ධන කාර්යයන් රාශියක් ඒ ප්‍රදේශයට ලබා දෙන්නට එතුමිය කටයුතු කළා.

ඒ වාගේම මට මතකයි, එතුමිය අසනීපයෙන් පසුවෙන අවස්ථාවල එතුමිය බලන්න අපි ඒ නිවසට ගියා. එවන් අවස්ථාවල අසනීපයෙන් සිටියත් එතුමිය අපට ආගන්තුක සත්කාර කරන්න පසුබට වුණේ නැහැයි කියන එක මා කෘතවේදීව මතක් කරනවා. ක්ලිෆර්ඩ් රත්වත්තේ මැතිතුමා ඡන්ද පෙත්සමින් පරාජය වීමත් සමඟ පැවැති - මා වැරදි නම් නිවැරදි කිරීමට යටත්ව- අතුරු මැතිවරණයෙන් තමයි එතුමිය පාර්ලිමේන්තුවට ආවේ. අද වාගේම එදාත් පක්ෂයට නොයෙක් කරදරවලට මුහුණ පාන්න සිද්ධ වුණා.

මේ අවස්ථාවේදී කමල් රත්වත්තේ පුතාටත්, දුවටත්, අනෙකුත් සියලු ඥාතීන්ටත් මල්ලිකා රත්වත්තේ මැතිනියගේ අභාවය වෙනුවෙන් අපගේ ශෝකය ප්‍රකාශ කරන්නට කැමැතියි.

ඒ වාගේම, එම පළාතේ ජනතාව තවමත් ගරු මල්ලිකා රත්වත්තේ මැතිනිය විසින් කරන ලද සේවය අගය කරන බව මතක් කරමින්, මේ අවස්ථාවේදී කමල් රත්වත්තේ පුතාටත්, දුවටත්, අනෙකුත් සියලු ඥාතීන්ටත් මල්ලිකා රත්වත්තේ මැතිනියගේ අභාවය වෙනුවෙන් අපගේ ශෝකය ප්‍රකාශ කරන්නට කැමැතියි.

අද දින සාකච්ඡා කරන ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මැතිතුමා පිළිබඳවත් එම පවුලේ අය වෙත අපගේ ශෝකය මේ අවස්ථාවේ දී පළ කරනවා. 1936.10.30වැනි දා උපත ලැබූ එතුමා නාවලපිටිය ශාන්ත මරියා විදුහලේ ආදී ශිෂ්‍යයෙක්. එතුමා දේශපාලනයට පිවිසියේ 1960දීයි. 1965දී ඔහු ගම් සභාවෙන් එළියට ආපු මන්ත්‍රීවරයෙක්. එතුමා මුලින්ම ගම් සභාවේ මන්ත්‍රීවරයකු ලෙස වෙලා, ඊට පසුව එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ලෙස පත්වුණා. එතුමා මධ්‍යම පළාත් සභාවේ සෞඛ්‍ය, ආහාර, සමූපකාර, වෙළෙඳ හා වාණිජ, ක්‍රීඩා හා සංචාරක ඇමතිවරයා වශයෙන් කටයුතු කළා. ඊට පස්සේ තමයි පාර්ලිමේන්තුවට ආවේ. එතුමා බොහොම අවංකව වැඩ කරපු කෙනෙක්. එතුමා හදවතින්ම තම යුතුකම ඉටු කළා.

ගරු කථානායකතුමනි, මට අමතක කරන්න බැරි මෙතුමාගේ විශේෂ කාරණයක් ගැන මම මේ අවස්ථාවේ දී මතක් කරන්න කැමැතියි. ඔබතුමාත් දන්නවා ඇති, උතුරේ ත්‍රස්තවාදී යුද්ධය තිබෙන අවස්ථාවේ දී එතුමා අපට සහයෝගය දක්වන්නට එදා අපේ ආණ්ඩුවට එකතු වුණු බව. එතුමා එදා කිව්වේ, "මේ යුද්ධය අවසන් කරන්න ඕනෑ. මේක හැම ජාතියකටම බලපාන යුද්ධයක්. මේ යුද්ධය අවසන් කිරීම සඳහා ඔබතුමාට සහයෝගය දැක්වීමට මම ආණ්ඩුවට එකතු වෙනවා" කියලා තමයි එතුමා අපේ ආණ්ඩුවට එදා එකතු වුණේ. ගරු කථානායකතුමනි, 2018 ජූනි මස 20වැනි බදාදා නිකුත් කර තිබෙන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ත්‍රස්තවාදීන් 14දෙනෙකුගේ නම් ප්‍රසිද්ධ කර තිබෙනවා. එතුමා අද වාගේ දවසක හිටියා නම් මේ සම්බන්ධයෙනුත් කුමන හෝ ක්‍රියා මාර්ගයක් ගනීවි කියලා මට හිතුණා. ඒ ත්‍රස්තවාදීන් 14දෙනා ලංකාවට ඇවිත් කිලිනොච්චියටත් ගිහිල්ලා සල්ලි ටිකත් එකතු කරගෙන ගියාට පස්සේ තමයි ගැසට් නිවේදනයෙන් ඒ නම් ටික එළියට ආවේ. මේ වාගේ වෙලාවක අබ්දුල් කාදර් වගේ හැඟීමක් තිබෙන මන්ත්‍රීවරු ඉන්නවා නම්, ඔවුන් මේ ගැනත් සලකා බලයි කියලා මම විශ්වාස කරනවා. එතුමාගේ ක්‍රියා කලාපය අනුගමනය කරන්න කියලා මම ගරු මන්ත්‍රීවරුන්ගෙන් ඉල්ලා සිටිනවා. මම ඒ ගැසට් නිවේදනය **සභාගත*** කරනවා. මොකද ඒක වැදගත් වෙනවා. එතුමාට කරන ගෞරවයක් වශයෙනුත්, එතුමා සමඟ එදා අපිත් එක්ක එකතු වුණු 10දෙනාටම දක්වන ගෞරවයක් වශයෙන් මම මෙය ඉදිරිපත් කරන්න කැමැතියි.

එතුමා අප සමඟ ඉතාමත් හිතවත්ව කටයුතු කළා. පාර්ලිමේන්තුව තුළ හැම විවාදයකදීම එතුමාගේ කථාවලට කාගේත් අවධානය යොමු වුණා. එතුමාට පහර දෙන්නන්ට, එතුමා ඉතාම සැරෙන් පහර දුන්නා. ඒකත් අපට අමතක කරන්න බැහැ. එතුමාගේ අභාවය වෙනුවෙන් අපගේ ශෝකය මේ අවස්ථාවේ දී පළ කරනවා.

රේණුකා හේරත් මැතිනිය එක්සත් ජාතික පක්ෂ මන්ත්‍රීවරියක් වශයෙන් එතුමියගේ පළාතට විශාල සේවාවක් කළා. ඒ වාගේම එතුමිය සෞඛ්‍ය ඇමතිවරිය වශයෙනුත් කටයුතු කළා. පාර්ලිමේන්තුවේදී අපිත් එක්ක ඉතාම සුහදව කටයුතු කරපු, අපි කියපු දේවල්වලට ඇහුම්කන් දුන් ඇමතිවරියක් වශයෙන් අපි එතුමියව හඳුනාගෙන සිටියා. එතුමිය වෙනුවෙනුත් එතුමියගේ පවුලේ සියලුදෙනා වෙත අපගේ ශෝකය මේ අවස්ථාවේ දී පළ කරමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මැතිතුමා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[පූ.භා. 11.29]

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා (බුද්ධ ශාසන අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி ஜயவிக்ரம பெரேரா - புத்தசாசன அமைச்சர்)
(The Hon. Gamini Jayawickrama Perera - Minister of of Buddhasasana)

ගරු කථානායකතුමනි, අබ්දුල් කාදර් මැතිතුමා හොඳ හිතක් තිබුණු හොඳ මහත්මයෙක් හැටියටයි මම සලකන්නේ. එතුමා මගේ මිත්‍රයෙක් විධියටත් මා සලකනවා. එක්සත් ජාතික පක්ෂයට අමාරු අවස්ථාවල එතුමා පුදුම විධියට ශක්තියක් දුන්නා. එතුමා පුදුම විධියට ධන පරිත්‍යාගවලින් පක්ෂය ශක්තිමත් කරන්න කටයුතු කළ කෙනෙක්. එතුමා තමන්ගේ ව්‍යාපාරවල විතරක් නොවෙයි, මුස්ලිම් ජනතාව වෙනුවෙනුත් බොහොම ආදර්ශවත් නායකයකු විධියට ක්‍රියා කළා. එතුමා අමාත්‍ය ධුරවල කටයුතු කිරීමේ දී මුස්ලිම් ජනතාවට විතරක් නොයෙකුත් ආකාරයෙන් සේවය කරන්න ගියා කියලා පාර්ලිමේන්තුව තුළ ප්‍රශ්නයක් මතු වෙලා තිබුණා. එතුමා කෙළින් උත්තර දුන්නා; ක්‍රියා කළා. මම ඒ පවුලේ අය එක්ක බොහොම සම්බන්ධයක් තිබුණු කෙනෙක්. මම මහනුවර ගියාම එතුමාගේ සහෝදරයන්, දරුවන් මගේ හොඳ මිත්‍රයන් විධියට මට සැලකුවා. ඒ පවුල, මම බොහොම ගරු කරන පවුලක්. අබ්දුල් කාදර් මැතිතුමා හොඳ මිත්‍රයෙක්; හොඳ මහත්මයෙක්; හොඳ ඇමතිවරයෙක්; හොඳ දේශපාලකයෙක්. එතුමාගේ වියෝව සම්බන්ධයෙන් මගේ ශෝකය ඒ පවුලේ සෑම දෙනා වෙත මේ අවස්ථාවේ දී පළ කරනවා.

ගරු කථානායකතුමනි, රේණුකා හේරත් මැතිනිය 1977 පැවැති මහ මැතිවරණයෙන් ප්‍රථම වතාවට මේ පාර්ලිමේන්තුවට පැමිණ, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ රජය යටතේ කටයුතු කළා. ගුරු වෘත්තියේ ඉඳලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් විධියට තේරී පත් වුණු එතුමිය, දේශපාලන ජීවිතයේ බොහොම එඩිතර කාන්තාවක් විධියට සේවය කළා. ගුරු වෘත්තියේ අවංකව කටයුතු කරමින් ලබා ගත් ජනප්‍රියතාව තුළ තමයි එතුමියට එම ආසනය ජයග්‍රහණය කිරීමට අවස්ථාව ලැබුණේ.

ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා කියන්නේ බොහොම තීක්ෂණ බුද්ධියක් තිබුණු කෙනෙක්. නායකයින් අතර උත්තම නායකයෙක්. රේණුකා හේරත් මැතිනිය නුවරඑළිය දිසා ඇමති ලෙස කටයුතු කරද්දි මමත් කුරුණෑගල දිසා ඇමති විධියට සිටියා. එතුමිය බොහොම ගෞරවයක් හා ගාම්භීරත්වයක් ඇතිව නිහතමානිකමින් තම සේවය ඉටු කළා. නිලධාරීන්ගෙන් වැඩ ගැනීමේ දක්ෂකමක් එතුමියට තිබුණා. එතුමිය කිසිම වෙලාවක තරහ ගත්තේ නැති වුවත්, මුහුණේ තරහක් තිබෙන විධියට පෙන්වා, හිනාවෙන් නියෝග දෙමින් තම සේවය ඉටු කළා.

ඊට පසුව 1989 සිට 1994 දක්වා සෞඛ්‍ය හා වනිතා කටයුතු ඇමති ලෙසත්, ලක් වනිතා පෙරමුණේ සභාපතිනිය ලෙසත් එතුමිය සේවය කළා. එම අවස්ථාව වනකොට මම පාර්ලිමේන්තුවෙන් අස් වෙලා ගිහිල්ලා වයඹ ප්‍රධාන ඇමති විධියට කටයුතු කරමින් සිටියා. සෞඛ්‍ය අමාත්‍යාංශය කියන්නේ ඉතාම අමාරු අමාත්‍යාංශයක්. සෞඛ්‍ය අමාත්‍යාංශයේ පැවැති වර්ජනවලට බොහොම දක්ෂ ලෙස මුහුණ දෙමින්, එම අමාත්‍යාංශයේ තිබුණු ප්‍රශ්න විසඳමින් හිටපු ජනාධිපති දිවංගත ප්‍රේමදාස මැතිතුමා එක්ක එතුමිය කටයුතු කළ ආකාරය ප්‍රශංසනීයයි. ඒක මම පැහැදිලිව කියන්නට ඕනෑ. එතුමිය සෞඛ්‍ය අමාත්‍ය ධුරය දරන අවස්ථාවේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ වර්ජනවලට මුහුණ දෙමින්, තමන්ගේ දක්ෂතාව තුළින් එම අමාත්‍යාංශයේ ප්‍රශ්න බොහොම හොඳට විසඳමින් නායිකාවක් ලෙස ක්‍රියා කළ කෙනෙකු තමයි රේණුකා හේරත් මැතිනිය. එතුමිය කවදාවත් එක්සත් ජාතික පක්ෂය අත් හැර ගියේ නැහැ. එතුමිය තමන්ට ඉදිරිපත් වූ හැම අභියෝගයකටම ඉතා දක්ෂ ලෙස මුහුණ දුන්නා. ලක් වනිතා පෙරමුණේ සභාපතිනිය වශයෙන් කාන්තා නායිකාවක් ලෙසත් එතුමිය කටයුතු කළා. පාර්ලිමේන්තු මැතිවරණයෙන් තම පක්ෂය පරාජය වුණා කියලා එතුමිය ඒකෙන් කලකිරිලා සිටියේ නැහැ. එම පක්ෂය තුළම සිටිමින් මධ්‍යම පළාත වෙනුවෙන් තරග කරලා පළාත් සභාවේ විපක්ෂ නායිකාව ලෙස එතුමිය තමන්ගේ කාර්ය භාරය බොහොම හොඳින් ඉටු කළා. එම කාර්ය භාරය ඉටු කිරීමේ දී තම කණ්ඩායම එකමුතු කර ගෙන එදා තිබුණු බාධක, තර්ජන සෑම දෙයකටම එතුමිය ඉතා දක්ෂ ලෙස මුහුණ දුන්නා.

මේ අවස්ථාවේදී මට යම් සිද්ධියක් මතක්වනවා. හිටපු ජනාධිපති ප්‍රේමදාස මැතිතුමාගේ කාලයේ දකුණේ තිබුණු භීෂණයත් එක්ක හේවාහැට ප්‍රදේශයේ එතුමිය රැස්වීමක් සංවිධානය කළා. ඒ කාලයේ මැතිවරණ ප්‍රචාරක රැස්වීම් පවත්වන්න දෙන්නේ නැහැ. තහනම් නියෝග, ඇඳිරි නීතිය වැනි නොයෙකුත් නීති දමා එක්සත් ජාතික පාක්ෂිකයන් ඝාතනය කළා. ගරු කථානායකතුමනි, අද මේවා අමතක වෙලා. රේණුකා හේරත් මැතිනිය සංවිධානය කළ එම රැස්වීම පැවැත්වෙන දවසට ඉස්සෙල්ලා දවසේ රාත්‍රියේ එක්සත් ජාතික පාක්ෂිකයන් 11දෙනෙකු ඝාතනය කළා. හිටපු ජනාධිපති ප්‍රේමදාස මැතිතුමා එක්සත් ජාතික පක්ෂයෙන් තරග කරන අවස්ථාවේ ජනතාව එම රැස්වීමට පැමිණීම තහනම් කරලා, එම රැස්වීම වළක්වන්න දකුණේ පැවැති භීෂණය තුළ එක්සත් ජාතික පාක්ෂිකයන් 11දෙනෙකු ඝාතනය කළා. ප්‍රේමදාස මැතිතුමා කියන්නේ නැහැයි, බැහැයි කියලා පුරුද්දක් නැති නායකයෙක්. මෙතුමියත් ඒ වාගේ අධිෂ්ඨානයක් තිබෙන කෙනෙක්. එවැනි අධිෂ්ඨානයක් තිබෙන මේ වීර කාන්තාව තමන්ගේ පාක්ෂිකයෝ රට වෙනුවෙන්; පක්ෂය වෙනුවෙන් ජීවිත 11ක් පූජා කරලා තිබෙන අවස්ථාවක රැස්වීමක් සංවිධානය කළා. රේණුකා හේරත් මැතිනිය කියන්නේ අන්න ඒ වාගේ කෙනෙක්. එතුමිය, මම බොහොම ගරු කරන කාන්තාවක්. කෙනෙකුගේ සේවය මනින්න පුළුවන් හොඳම අවස්ථාවක් තිබෙනවා. රේණුකා හේරත් මැතිනිය වලපනේ ප්‍රදේශයට සිදුකර තිබෙන සේවය සම්බන්ධයෙන් ඇඟිල්ලක් දිගු කරලා රේණුකා මැතිනියට විරුද්ධව චෝදනාවක් කරන්න කාටවත් බැහැ. එතුමිය යම් යම් වැරදිවලට, දූෂණවලට ගැවුණා කියලා එතුමියට කියන්න බැහැ. එතුමිය බොහොම නිහතමානීව මහජන නියෝජිතයෙකු විධියට සේවය කරමින් මේ උත්තරීතර සභාවේ උත්තරීතරකමට ආදර්ශයක් දුන්නා. ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂයේ හෝ කිසිවෙකුටත් මඩ ගහමින් තම ජීවිතය අඳුරු කර නොගත්, කිසිදු කැලලක් නැති මහා උත්තරීතර කාන්තාවක් තමයි රේණුකා හේරත් මැතිනිය. ඒක මම විශේෂයෙන් සඳහන් කරනවා. එතුමියගේ මරණය අප කාටත් එක පාරට දරා ගන්න බැරි වුණා. එතුමිය තමන්ගේ සෞඛ්‍ය ගැන කිසිම සැලකිල්ලක් දැක්වූයේ නැති බව මම දන්නවා. පක්ෂ මූලස්ථානයේදී අපි දෙදෙනා හම්බ වුණාම මට "අයියා" කියලායි එතුමිය කථා කරන්නේ. මම එතුමියට කථා කරන්නේ "නංගී" කියලායි.

ගරු කථානායකතුමනි, මම එතුමියගේ අවමඟුල් උත්සවයට සහභාගිවන්න ගියා. කඳුකරයේ වාහන යන්න අපහසු, වාහන දෙකක් එක විට මාරු වෙන්න බැරි ඒ ගෙදරට යන පාරේ පුදුම සෙනහක් මට දකින්න ලැබුණා.

ඒ සියලුදෙනාම කවුරුවත් සංවිධානය කරලා ගෙන්වූ අය නොවෙයි. තමන්ට සේවය කළ, දුෂ්කර පළාතක් දියුණු කළ එතුමිය වෙනුවෙන් අවසන් ගෞරව දක්වන්න ගුණමකුකම නැති, කෙළෙහිගුණය දන්නා, මනුස්සකම තිබෙන වලපනේ ජනතාව විශාල වශයෙන් එදා පැමිණි ආකාරය මම දැක්කා. එතුමියගේ ආදාහන උත්සවයට ගිය මට ඒ විශාල ජනකාය නිසා ආපසු

[ගරු ගාමිණී ජයවික්‍රම පෙරේර මහතා]

ඒමටත් අපහසු වුණා. එතුමියගේ ගුණය මම බෙහෙවින් අගය කරනවා. එතුමිය උත්තම කාන්තාවක්. එතුමිය පාර්ලිමේන්තුවේ මගේ පැරණි සගයෙක්.

ගරු කථානායකතුමනි, අභාවප්‍රාප්ත ගරු අබ්දුල් කාදර් මැතිතුමාත් මා බෙහෙවින් ගරු කරන කෙනෙක්. අභාවප්‍රාප්ත ගරු මල්ලිකා රත්වත්තේ මැතිනිය පාර්ලිමේන්තුවේ සිටි කාලයේ මා පාර්ලිමේන්තුවේ සිටියේ නැහැ. ඒ කාලයේ මා වයඹ පළාතේ ප්‍රධාන ඇමති ලෙස කටයුතු කරමිනුයි සිටියේ. අපේ රේණුකා හේරත් මැතිනියට අමා මහ නිවන් සුව අත් වේවායි කියා මා මුළු හදවතින්ම පතන අතර, එතුමියගේ පවුලේ සියලුදෙනාට මාගේ ශෝකය පළ කරනවා. ඒ වාගේම, අබ්දුල් කාදර් මැතිතුමාගේ සහ මල්ලිකා රත්වත්තේ මැතිනියගේ පවුල්වල සියලුදෙනාටත් මේ අවස්ථාවේ අපේ ශෝකය පළ කර සිටිනවා.

[පූ.භා.11.37]

ගරු සී.බී. රත්නායක මහතා
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)

මෙම ගරු සභාව නියෝජනය කළ මහත්ම මහත්මීන් තිදෙනෙකුගේ අභාවයන් පිළිබඳව අද අපගේ ශෝකය ප්‍රකාශ කරනවා. නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ආසනය නියෝජනය කරමින්, අභියෝග රාශියක් මධ්‍යයේ 1977 වර්ෂයේ පාර්ලිමේන්තුවට පැමිණි දිවංගත රේණුකා හේරත් මැතිනිය පිළිබඳව වවන ස්වල්පයක් කථා කරන්න ප්‍රථමයෙන්ම මම බලාපොරොත්තු වෙනවා. ගරු කථානායකතුමනි, මට මෙම අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක ලෙස මේ සභා ගර්භයට පැමිණියාට පසුව එතුමිය දිසා ඇමතිතුමියක හැටියටත් කටයුතු කළා. ලංකා ඉතිහාසයේ පළමුවන වතාවට දිසා ඇමතිනියක් හැටියට පත් වුණු කාන්තාව රේණුකා හේරත් මැතිනියයි කියා මා හිතනවා. අභියෝග රාශියකට මුහුණ දෙමින්, දේශපාලන ක්ෂේත්‍රයේ තම නායකත්වයට හැම දාම ගරු කරමින් කටයුතු කළ මන්ත්‍රීවරියක හැටියට, හිටපු ඇමතිවරියක හැටියට එතුමිය හඳුන්වන්න පුළුවන්. අපට විවිධ මතවාද තිබෙන්න පුළුවන්. මොන මතවාද තිබුණත් දේශපාලන ක්ෂේත්‍රය තුළ එකිනෙකා හා කථා කර ගනිමින්, අද්දැකීම් බෙදා හදා ගනිමින් කටයුතු කරන්න අපට පුළුවන්කම ලැබුණා. මා එහෙම කියන්න හේතුවක් තිබෙනවා. වලපනේ ආසනයේ එතුමියගේ පක්ෂයට ප්‍රතිවිරුද්ධ පක්ෂය නියෝජනය කළේ මමයි; එතුමියත් එක්ක තරග කළේ මමයි. ඒ කාලයේ අප අතර යම් යම් මතවාද ඇති වුණත්, ඒ දේශපාලන මතවාද තුළ අප බෙදී වෙන් වුණත් මනුෂ්‍යත්වයේ නාමයෙන් අප සියලුදෙනාට කටයුතු කරන්න පුළුවන්කම ලැබුණා. එතුමිය කළ සේවාව අප ඉතාම පැහැදිලිව දකින්න ඕනෑ, පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, එතුමිය නිහතමානී සේවාවක්, ගරු සේවයක් වලපනේ ප්‍රදේශයට කළා. ඒ ප්‍රදේශයට සේවය කළා වාගේම, වසර විසි ගණනක් දේශපාලන ක්ෂේත්‍රයේ රැඳිලා මේ පාර්ලිමේන්තුවෙන් ඉවත් වුණාට පසුව මධ්‍යම පළාත් සභාවේ පළාත් සභා මන්ත්‍රීවරියක හැටියටත්, තමා නියෝජනය කළ පක්ෂය වෙනුවෙන් විපක්ෂ නායිකාව හැටියටත් එතුමිය කටයුතු කළාය කියන එක අප දන්නා කාරණයක්. තමන් නියෝජනය කරන පක්ෂයට, එහි නායකත්වයට හැම දාම ගරු කරමින් ප්‍රතිපත්තිගරුකව කටයුතු කළ කාන්තාවක හැටියට එතුමිය හඳුන්වන්න පුළුවන්. ඒ වාගේම, එතුමිය මිනිසුන් අතර සිටිමින් ඔවුන් වෙනුවෙන් හඬක් නඟන්න, කථා කරන්න අවස්ථාව සලසා ගත් මන්ත්‍රීවරියක, ඇමතිවරියක වූ බවත් විශේෂයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. එතුමිය ආදර්ශවත් අම්මා කෙනකු හැටියටත්, ආදර්ශවත් ස්වාමි දියණියක හැටියටත් කටයුතු කළ කෙනකු බවද විශේෂයෙන් ප්‍රකාශ කරන්න ඕනෑ. එතුමියගේ අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන මේ වෙලාවේ, එතුමියට අමා මහ නිවන් සුව අත් වේවායි කියා මම ප්‍රාර්ථනා කරනවා.

දැනට එක්සත් ජාතික පක්ෂයේ සංවිධායකවරියක් වශයෙන් කටයුතු කරන එතුමියගේ ආදරණීය දියණිය වන හිරණ්‍යා හේරත් රණවීර මෙනෙවියටත්, රේණුකා හේරත් මැතිනියගේ ආදරණීය ස්වාමිපුරුෂයා වන රණවීර මැතිතුමාටත් අපගේ ශෝකය දන්වා යවන ලෙස මා ඉල්ලා සිටිනවා.

පාර්ලිමේන්තු ඉතිහාසයේ, දේශපාලන ක්ෂේත්‍රයේ මෙන්ම, ලෝකයේ ප්‍රථම අග්‍රාමාත්‍යවරිය හැටියට ලෝකයට හඬගා කියූ ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය අභියෝග මධ්‍යයේ වගකීම් අරගෙන ලෝකයට පාඩමක් කියා දුන්නා. එතුමියට උරුමකම් කියන මහවලතැන්න පරපුරෙන් පැමිණි මල්ලිකා රත්වත්තේ මැතිනියගේ අභාවය පිළිබඳවත් අපගේ ශෝකය පළ කරන අතර, එම පවුලේ උදවියටත්, විශේෂයෙන්ම සබරගමුව මහා සමන් දේවාලයේ බස්නායක නිලමේ හැටියට කටයුතු කරන කමල් රත්වත්තේ මැතිතුමාටත් අපගේ ශෝකය දන්වා යවන ලෙස මා ඉල්ලා සිටිනවා.

1994දී මම පාර්ලිමේන්තුවට එනකොට, අබ්දුල් කාදර් මැතිතුමා හැම වෙලාවේම සහයෝගිතාවෙන්, සුහදශීලිත්වය බෙදා හදා ගනිමින් කටයුතු කළ ආකාරය මම දැක්කා. අපි තර්ක විතර්කවලදී උරණ වුණත්, අපේ මතවාද විසඳාගෙන කටයුතු කළා. එතුමාටත් අල්ලා දෙවියන්ගේ පිහිට ලැබේවායි කියා ප්‍රාර්ථනා කරන අතර, එම පණිවුඩය එතුමාගේ පවුලේ සාමාජිකයන්ට දන්වා යවන ලෙසත් ඉල්ලා සිටිමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

[පූ.භා. 11.43]

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මේ උත්තරීතර සභාව ශෝභාවත් කළ නියෝජිතයන් තිදෙනෙකුගේ අභාවයන් පිළිබඳව ශෝකය පළ කරන මේ අවස්ථාවේ, ඒ අය පිළිබඳව වවන ස්වල්පයක් ප්‍රකාශ කරන්න අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට මගේ ස්තුතිය පුද කරනවා.

සුන්දර කන්ද උඩරට වලපනේ මැතිවරණ කොට්ඨාසය ගැන කථා කරනකොට අපට නිරන්තරයෙන්ම සිහියට නැහෙන්නේ රේණුකා හේරත් කියන නමයි. රේණුකා හේරත් මැතිනිය ගැන කථා කරනකොට වලපනේත්, වලපනේ කියනකොට රේණුකා හේරත් මැතිනියගේ නමත් සිහිපත් වන තරමටම එතුමිය ඒ ප්‍රදේශය හා බැඳී තිබෙනවා. ඇයගේ චරිත ස්වභාවය සියුම් විවරණයකට ලක් කළහොත්, විවිධ අංශ රැසක් පුරා අපේ මතකය ගමන් කරනවා.

රේණුකා හේරත් මැතිනිය විටෙක -මුල් යුගයේ- ඉතාම දක්ෂ ගුරුවරියක්. ඒ වාගේම සෙනෙහෙබර මවක්, හොඳ බිරිඳක්, යෝධ

ආත්ම ශක්තියක් තිබුණු අයෝමය ගැහැනියක් කිව්වොත් නිවැරැදියි. දේශපාලනයේදී එතුමිය පෙරළිකාර චරිතයක් හැටියට මුල ඉඳලා අග දක්වාම කටයුතු කළා. ඒ වාගේම එතුමිය එක් එක් කාලවල දේශපාලන ක්ෂේත්‍රයේ විවිධ තනතුරු දරපු හැටි අපට මතකයි. කලක් එතුමිය මධ්‍යම පළාත් සභාවේ මන්ත්‍රීවරියක් හැටියට කටයුතු කළා. ඉන් පසු එම පළාත් සභාවේම විපක්ෂ නායකවරිය හැටියට කටයුතු කළා. එතුමිය 1977දී වැඩි ඡන්ද විශාල සංඛ්‍යාවක් ලබාගෙන මන්ත්‍රීවරියක් හැටියට පාර්ලිමේන්තුවට පිවිසුණා. එතුමිය ජේ.ආර්. ජයවර්ධන ආණ්ඩුවේ නුවරඑළියේ පළමුවැනි දිස්ත්‍රික් ඇමතිවරිය හැටියට පත් වුණා. සංස්කෘතික නියෝජ්‍ය ඇමතිවරිය හැටියට ක්‍රියා කළා. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයේ ලක් වනිතා පෙරමුණේ සභාපතිවරිය හැටියට ක්‍රියා කළා. ඒ වාගේම රාජ්‍ය දැව සංස්ථාවේ මුල් පුටුව හොබවමින් කලක් එතුමිය එහි සභාපති ධුරය දැරුවා. විශිෂ්ට මෙහෙවරක් කළ සෞඛ්‍ය ඇමතිවරිය හැටියට එතුමියගේ සේවය කවුරුත් ගෞරවයෙන් යුතුව අදත් සිහිපත් කරනවා. එතුමිය වනිතාවන්ට ආදර්ශයක් ගත හැකි වනිතා කටයුතු ඇමතිවරියක්ය කියන එකත් අපට මතක් වෙනවා. එක්සත් ජාතික පක්ෂයේ ජ්‍යෙෂ්ඨතම සාමාජිකාවක් හැටියට, දේශපාලනයේ ඉතා පෙරළිකාර චරිතයක් හැටියටයි රේණුකා හේරත් මැතිනිය මිය යන තුරුම කටයුතු කළේ.

ගරු කථානායකතුමනි, රේණුකා හේරත් කියන චරිතය මම දකින්නේ, කිසිම දෙයකට භය නොවූ, අභියෝග හමුවේ **පළා** නොගිය චරිතයක් හැටියටයි. එතුමිය ගුරු ජීවිතය ගෙවා දමද්දී 13 වතාවක් ස්ථාන මාරුවීම්වලට ලක් වුණා; දේශපාලන පළිගැනීම්වලට ලක් වුණා. එහෙත්, මහ මෙරක් සේ නොබියව, නොසැලී ඒවාට මුහුණ දෙන්න එතුමියට ආත්ම ශක්තියක් තිබුණා. අභියෝගවලට අභියෝග කිරීමේ හැකියාවක් රේණුකා හේරත් මැතිනිය සතුව තිබුණා. කාන්තාවක් වුණත් රේණුකා හේරත් මැතිනිය මුහුණ දුන් දේශපාලන අත් දැකීම් සුළු පටු නැහැ, ගරු කථානායකතුමනි. දේශපාලන ජීවිතයේදී ඇයට පැසසුම් වාගේම, ගැරහුම්වලටත් නොඅඩුව මුහුණ දෙන්නට සිද්ධ වුණා.

එතුමිය පැසසුම්වලින් ඔළුව උදුම්මා ගත්තේත් නැහැ. ඒ වාගේම, ගැරහුම්වලින් කම්පා වුණේත් නැහැ. මහමෙරක් සේ නොසැලී, ඒ සෑම දෙයක්ම උපේක්ෂා සහගතව විඳ දරා ගැනීමේ හැකියාවක්; හැම විටම සිනහමුසු මුහුණින් ඕනෑම ප්‍රශ්නයක් ගැන කථා කිරීමේ හැකියාවක් එතුමිය සතුව තිබුණා.

වලපනේ මැතිවරණ කොට්ඨාසය කේන්ද්‍ර කර ගනිමින් පාර්ලිමේන්තුවට පැමිණියත්, නුවරඑළිය දිස්ත්‍රික්කයටත්, මුළු රටටත් විශාල සේවයක් කරන්න එතුමියට හැකියාව ලැබුණා. 1970 පෙරළිකාර යුගයේ දැවැන්ත සංවර්ධනයක් රට පුරා සිදු වෙනකොට, විශේෂයෙන්ම, මහවැලි සංවර්ධන ව්‍යාපෘතිය හරහා නුවරඑළිය දිස්ත්‍රික්කයේ සුවිශාල දියුණුවක් ඇති වෙනකොට, ඒ කටයුතුවලට එතුමියගෙන් විශාල දායකත්වයක් ලැබුණා.

එතුමිය වතුකරයේ අහිංසක ජනතාවගේ දියුණුව වෙනුවෙනුත් කටයුතු කළා. එතුමිය මට මුලින්ම හඳුනාගන්න ලැබුණේ, මම කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා හැටියට ක්‍රියා කරන කාලයේයි. ගිනිගත්හේන, වලපනේ, නිල්දණ්ඩාහින්න වැනි ප්‍රදේශවල සිදු කළ කටයුතු වෙනුවෙන් එතුමියගේ නායකත්වය, දායකත්වය සහ අපට ලබා දුන් ඉතාමත්ම ප්‍රශංසනීය සේවය මම මේ වෙලාවේ කෘතවේදීව සිහිපත් කරනවා.

කාන්තාවක් වුවත්, භීෂණ සමයේ එතුමිය භය නැතිව දේශපාලනයට මුහුණ දුන්නා. එම කාලයේදී එතුමියගේ වතුර හඬ නුවරඑළිය දිස්ත්‍රික්කයේ ජනතාව අතර කැපී පෙනෙන විධියට එතුමිය මතු කළා. එතුමිය බොහෝ ආදර්ශ ගන්න පුළුවන් කාන්තාවක්. දේශපාලනයේදී අමතක නොවන චරිතයක් හැටියට පාර්ලිමේන්තුව තුළ අපට ආශ්‍රය කරන්නට ලැබුණු කාන්තාවක්.

ආණ්ඩු පක්ෂයේ සිටියදී දිප්තිමත්ව කටයුතු කරන ඇතැම් දේශපාලන චරිත, විපක්ෂයට ගියාම ටිකක් දුර්වල වෙන හැටි අපි දැක තිබෙනවා, විරුද්ධ පක්ෂයට ගියාම සමහර අය මැලවිලා වාගේ යනවා. හැබැයි, රේණුකා හේරත් මැතිනිය එහෙම වුණේ නැහැ. ආණ්ඩු පක්ෂයේ සිටියදීත්, විපක්ෂයේ සිටියදීත් තමන්ගේ භූමිකාව මැනවින් හඳුනා ගෙන, තම පාක්ෂිකයන් වෙනුවෙනුත්, තමන්ගේ ජනතාව වෙනුවෙනුත් හැම විටම ඇය පෙනී හිටියා. අපේ පක්ෂයේ ප්‍රතිසංවිධාන වැඩවලට එතුමිය දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට, පළාතෙන් පළාතට ගොස් කරන ලද සේවය අපට මතක් වෙනවා. එක්සත් ජාතික පක්ෂයේ ජ්‍යෙෂ්ඨතම කාන්තාවක් ලෙස එතුමිය කටයුතු කළා. නවක මන්ත්‍රීවරුන්ට ඉතාම සුහදතාවක් දැක්වූවා. අපේ ගරු අග්‍රාමාත්‍යතුමාත් මේ ගරු සභාවට පැමිණ සිටිනවා. මේ අවස්ථාවේ කාලය ඉතිරි කරගත යුතු නිසා මම දීර්ඝව කථා කරන්නේ නැහැ.

රේණුකා හේරත් මැතිනිය අපේ නවක දේශපාලනඥයන්ට ආදර්ශ බොහොමයක් ලබා ගන්නට පුළුවන් චරිතයක් හැටියට මම දකිනවා. විශේෂයෙන්ම, එතුමියගේ අභාවය අපේ පක්ෂයට ලොකු පාඩුවක්, මධ්‍යම පළාතට පාඩුවක්, වලපනේට පාඩුවක්, නුවරඑළිය දිස්ත්‍රික්කයට පාඩුවක්. එතුමියගේ අභාවය ගැන අප සියලුදෙනාම කනගාටු වන අතර, එතුමියගේ අභාවය නිසා සංවේගයට පත් වී සිටින විමල් රණවීර මැතිතුමාටත්, එතුමියගේ දියණියටත්, පවුලේ සියලුදෙනාටත් අපේ ශෝකය ප්‍රකාශ කරමින්, රේණුකා හේරත් මැතිනියට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

අද දින ශෝක ප්‍රකාශ යෝජනා තුනක් ඉදිරිපත් වුණා. ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මැතිතුමාගේ අභාවය ගැනත් අපේ කනගාටුව ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. මේ ගරු සභාවේ අපට ආශ්‍රය කරන්න ලැබුණු ඉතාම හොඳ ගතිගුණ තිබුණු එතුමා විශේෂයෙන්ම දිළිඳු ජනතාව වෙනුවෙන් විශාල මෙහෙවරක් කළා. අබ්දුල් කාදර් මැතිතුමා තම ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් රජයේ ඉඩමක් වෙන් කර ගෙන, දුප්පත් මිනිසුන්ට ගෙවල් 50ක් සාදා දුන් හැටි අපට මතකයි. "කාදර් ගම්මානය" කියලා ඒක නම් කළා. එතුමා මහනුවර දිස්ත්‍රික්කයට විශාල සේවයක් කළා, දුප්පත් මිනිසුන් වෙනුවෙන් වැඩ කළා.

කාලය ගත වන නිසා මම කෙටියෙන් කියන්නම්. අවුරුදු 25කට වඩා වැඩි කාලයක් එතුමා මේ පාර්ලිමේන්තුව නියෝජනය කළා. අපි විරුද්ධ පක්ෂයේ සිටිනකොට එතුමා ආණ්ඩු පක්ෂයේ හිටියා මට මතකයි. අපි පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න අහනකොට එතුමා ද්විභාෂාවෙන් තමයි අපට උත්තර දෙන්නේ. එළියේදී මුණ ගැහුණාම කිව්වා, "දෙමළ භාෂාවෙන් උත්තර දුන්නාම වැඩිය අතුරු ප්‍රශ්න අහන්නේ නැහැ නේ." කියලා. ඒ විධියට විනෝදයෙන් වාගේ හිටපු කෙනෙක්. එතුමාගේ පළාතට ගිය කිසිවෙකුට එතුමාගේ ප්‍රණීත බුරියානි සංග්‍රහයක් බුක්ති නොවිඳ එන්න ලැබෙන්නේම නැහැ. ඒ තරමටම සංග්‍රහ කරන්න ළැදියාවක් දැක්වූවා. හිතවත්කම් පවත්වන්න හොඳම පුද්ගලයෙක් හැටියට අපි කාදර් මැතිතුමා සිහිපත් කරනවා. මේ අවස්ථාවේදී එතුමාගේ පවුලේ අයටත් අපේ ශෝකය පළ කරන්න කියා ඉල්ලා සිටිනවා.

මල්ලිකා රත්වත්තේ මැතිනිය අපට පාර්ලිමේන්තුවේදී ආශ්‍රය කරන්න ලැබී නැතත්, එතුමිය විශාල දේශපාලන පරපුරකින් පැවත එන කෙනෙක් හැටියට මා දකිනවා. විශේෂයෙන්ම, එතුමිය බලංගොඩ ප්‍රදේශයේ රෝහල් පරිශ්‍රය දියුණු කරන්න, පිහන් ගඩොල් කර්මාන්තශාලාවක් ඉදි කරන්න කටයුතු කළා. තැපැල් කාර්යාල හදලා, ලංගම ඩිපෝව හදලා, මහජන බැංකුව ඉදිකරලා

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

දැවැන්ත සංවර්ධනයක් ඉටු කළා. තමන්ගේ ඉඩකඩම් වෙහෙර විහාරස්ථානවලට පූජා කළා. ප්‍රදේශයේ සුබසිද්ධිය වෙනුවෙන් ඉඩකඩම් පවා නිර්ලෝභීව ලබා දීලා එතුමිය විශාල සේවයක් කළා කියන එක බලංගොඩ ජනතාවගේ හදවත් තුළ අදටත් නොමැකී පවතිනවා.

මේ අවස්ථාවේදී එතුමියගේ පවුලේ අයටත් අපේ සංවේගය පළ කරන්න කියා ඉල්ලා සිටිමින්, ශෝක ප්‍රකාශ යෝජනා සම්බන්ධයෙන් අපේ අදහස් ප්‍රකාශ කරන්න ඉඩකඩ ලබා දීම ගැන ගරු කථානායකතුමාටත් ස්තුති කරමින්, මාගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමා.

[පූ.භා.11.51]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs}

ගරු කථානායකතුමනි, මේ ගරු සභාවේ සේවය කළ මන්ත්‍රීවරු තුන්දෙනෙකුගේ අභාවයන් පිළිබඳව අද අපි ශෝකය ප්‍රකාශ කරනවා. රේණුකා හේරත් මන්ත්‍රීතුමිය මා දැන ගත්තේ, එතුමිය එක්සත් ජාතික පක්ෂයේ වැඩ කටයුතුවලට සම්බන්ධ වුණු අවස්ථාවේදීයි. ඒ කාලයේ එතුමිය ගුරුවරියක්. පසුව, ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එතුමිය තෝරලා, එතුමියට වලපනේ ආසනයේ සංවිධායකකම භාර දුන්නා. එදා වලපනේ ආසනය වෙනුවෙන් කිහිප දෙනෙක් ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කරලා තිබුණා. නමුත් රේණුකා හේරත් මැතිනිය තෝරා ගනිද්දී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා කිව්වේ, "මට ඒ ප්‍රදේශවල කාන්තා නියෝජනය වැඩි කරන්න ඕනෑ." කියලායි. එතුමිය සංවිධානය කළ වලපනේ ආසනය, කිසි විටෙක දිනන්න බැරි ආසනයක් හැටියටයි අපි හිතුවේ. ඒ ආසනය නියෝජනය කළ හේරත් නියෝජ්‍ය ඇමතිතුමා ඇත්ත වශයෙන්ම කාලයක් තිස්සේ ඒ ආසනය ජයග්‍රහණය කළා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව පරාජය වුණු අවස්ථාවේදීත් එතුමා ඒ ආසනයෙන් හොලවන්න බැරි තත්ත්වයක් තිබුණා. නමුත් 1977 වසරේදී රේණුකා හේරත් මැතිනිය එතුමා පරාජය කරලා පාර්ලිමේන්තුවට පැමිණියා. එතුමිය පාර්ලිමේන්තුවේ හිටපු ඉතා ක්‍රියාශීලී මන්ත්‍රීවරියක්. එතුමිය හැම වැඩ කටයුත්තකටම සහභාගි වුණා, පක්ෂයේ වැඩ කටයුතුවලට සහභාගි වුණා. අතුරු මැතිවරණයකදී, ඡන්ද ව්‍යාපාරයක් සංවිධානය කිරීමේදී, මැයි දිනය සැමරීමේදී ආදී වශයෙන් හැම කටයුත්තකටම රේණුකා හේරත් මැතිනිය සම්බන්ධ වුණා. එතුමිය කිසි විටෙක එතැනින් ඉවත් වුණේ නැහැ. හැම වෙලාවේම -අමාරුම කාලයේත්- එතුමිය ඉදිරියට ආවා. ඒ නිර්භීතකම එතුමියට තිබුණා.

එතුමිය විවාහ වුණා. විවාහ වුණාට පසුව එතුමිය පවුලේ වැඩ කටයුතුත්, ඒ වාගේම දේශපාලන වැඩ කටයුතුත් කරගෙන ගියා. රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා යටතේ එතුමියට ඇමතිකමක් ලැබුණා. ඊට ඉස්සර වෙලා එතුමිය නුවරඑළිය දිස්ත්‍රික් ඇමතිතුමිය හැටියට ක්‍රියා කරලා තිබුණා. ඒ කාලයේ තමයි "කොත්මලේ" වාගේ වැඩසටහන් ආරම්භ කළේ. ඉන් පසුව රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා යටතේ එතුමියට කැබිනට් ඇමතිකමක් ලැබුණා. කැබිනට් මණ්ඩලයේ හිටපු කාලයේදී තමයි මට එතුමිය සමඟ ළඟින්ම ක්‍රියා කරන්න අවස්ථාව ලැබුණේ. විශේෂයෙන්ම සභානායක හැටියට ඕනෑම අවස්ථාවක එතුමියගේ සහයෝගය ලබා ගන්න පුළුවන් වුණා. එතුමිය මේ ගරු සභාවේ හිටියා. කිසි වෙලාවක කිසිම දෙයකට අඩුවක් කළේ නැහැ, ඇමතිතුමිය හැටියට රට වටේ යන්න පටන් ගත්තා. මා දන්නවා, එතුමිය රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමා සමඟ ඉතා ළඟින් වැඩ කළ බව. විශේෂයෙන්ම දෝෂාභියෝගය අවස්ථාවේදී එතුමියගෙන් ලැබුණු සහයෝගය ගැන මා යළිත් සඳහන් කරන්න ඕනෑ.

මා අගමැති හැටියට පත් වුණු අවස්ථාවේ ඉඳන්ම එතුමිය මට පක්ෂයේ නායකයා හැටියට සම්පූර්ණ සහයෝගය ලබා දුන්නා. 1994 වසරේ අපේ පරාජයෙන් පසුවත් එතුමිය ඒ වාගේම කාර්යක්ෂමව වැඩ කටයුතු කළා, කිසි විටෙක අඩපණ වුණේ නැහැ. එතුමිය ඕනෑ වෙලාවක විශ්වාස කරන්න පුළුවන් වුණා. කිසිම ප්‍රශ්නයකදී එතුමිය ප්‍රශ්නය අත් හැරලා දිව්වේ නැහැ. එතුමිය හැම වෙලාවකම සහයෝගය දීලා වැඩ කටයුතු කළා. එහෙත් හැම වෙලාවේම පාර්ලිමේන්තුවට තේරී පත් වෙන්න අපට තිබුණු වාසනාව එතුමියට තිබුණේ නැහැ. එතුමිය ආසනය දිනුවාට, එතුමිය කොට්ඨාසය දිනුවාට, කොට්ඨාසයට වැඩ කළාට, මේ ක්‍රමවේදය යටතේ එතුමියට පාර්ලිමේන්තුවට එන්න අවස්ථාව ලැබුණේ නැහැ. ඒ නිසා එතුමිය පළාත් සභාවටත් ඉදිරිපත් කළා. එහෙම පසුබෑම් සිදු වුණා කියලා එතුමිය දේශපාලනය අත් හැරියේත් නැහැ, පක්ෂය අත් හැරියේත් නැහැ, කැපවීම අඩු කළේත් නැහැ. එතුමියට වුවමනා වුණේ, ඒ වැඩ කටයුතු කරලා, තමන් ඉදිරියෙන් ඉන්නවා කියලා පෙන්වන්නයි. අන්න එහෙම චරිතයක් හොයා ගන්න එක අපට ටිකක් අමාරුයි. එහෙම චරිත අපට දේශපාලන ක්ෂේත්‍රයේදී හමු වන්නේ නැහැ.

එතුමිය වලපනේ ආසනයට ගිහිල්ලා එහි වැඩ කටයුතු කරගෙන ගියා. අපි විරුද්ධ පක්ෂයේ හිටපු අන්තිම කාලයේදී එතුමිය සමඟ ඒ ප්‍රදේශවලට යන්න මටත් අවස්ථාව ලැබුණා. ඒ වාගේම අන්තිමට එතුමිය පළාත් සභාවට පත් වෙලා, පළාත් සභාවේ ඉඳගෙන ඒ කණ්ඩායමේ නායකත්වය ලබා ගත්තා. එතුමිය පක්ෂයට කැප වෙලා වැඩ කළා. එහෙත් එතුමියගේ එක අඩුපාඩුවක් තිබුණා. එතුමිය තමන්ගේ සෞඛ්‍යය ගැන හිතුවේ නැහැ; තමන් ගැන හිතුවේ නැහැ. එතුමිය අසනීප වී සිටින අවස්ථාවේදීත් විවේක ගන්නේ නැතිව වැඩ කටයුතු කළා. එහි විපාකය තමයි අද අපි විඳින්නේ. දැන් එතුමිය අපි අතර නැහැ. අපට සහයෝගය ලබා දුන්, අපත් එක්ක වැඩ කරපු කාන්තාවක් අද අපට නැති වෙලා තිබෙනවා. අපට විශාල කටහඬක් නැති වෙලා තිබෙනවා. එතුමිය නැති වීමේ පාඩුව අපට වචනවලින් කියන්න බැහැ. මෙතැන සිටින බොහෝ දෙනෙක් ඒ බව දන්නවා. ඒ නිසා රේණුකා හේරත් ඇමතිතුමිය කළ සේවය මතක් කරමින්, එතුමියට නිවන් සැප ලැබේවා! කියා මම ප්‍රාර්ථනා කරනවා.

මම ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මන්ත්‍රීතුමාව හඳුනා ගත්තේ එතුමා මහනුවර එක්සත් ජාතික පක්ෂ වැඩ කටයුතු සංවිධානය කරද්දීයි. එතුමා පළාත් සභාව නියෝජනය කළා. එතුමා ඉතා දුෂ්කර කාලයක පළාත් සභාව නියෝජනය කරමින් රන්ජන් විජේරත්න මැතිතුමා සමඟ එකට වැඩ කළා මට මතකයි. එතුමා 1989 වර්ෂයේ පාර්ලිමේන්තුවට පැමිණියා. 1994 වර්ෂයෙන් පසුව අපි විපක්ෂයේ හිටියේ. එතුමා හැම වේලාවේම ඉදිරියට ඇවිත් වැඩ කරපු කෙනෙක්. එතුමා කිසි දෙයකින් ඉවත් වුණේ නැහැ. එතුමා අපේ සංවිධානවලට උදව් කළා. එක්සත් ජාතික පක්ෂයේ අමාරුම කාලයේ එතුමා නාවලපිටිය ආසනය භාර ගෙන සංවිධාන කටයුතු කිරීමට ක්‍රියා කළා. එතුමා ඒ කාලයේ චින්ද දුක මම මෙතැන අලුතින් කියන්න වුවමනා නැහැ. 2001 වර්ෂයේ බලයට පැමිණි ආණ්ඩුවේදී එතුමාව සමුපකාර ඇමති වශයෙන් පත් කිරීමට අපට අවස්ථාව ලැබුණා. ඇමතිවරයෙක් හැටියට එතුමා නිශ්ශබ්ද වෙලා හිටියේ නැහැ. ඉන් පසුව අපි යළින්

විපක්ෂයට ගියා. ඒත් අවාසනාවකට අන්තිම කාලයේ එතුමා එක්සත් ජාතික පක්ෂය අතහැර මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුවට එකතු වුණා. එතුමා අපේ පක්ෂයේ සිටි කාලයේ විශාල සේවයක් කරපු කෙනෙක්. මම එතුමා සමඟ වැඩ කටයුතු කරලා, එතුමාගේ සහයෝගය ලැබූ නායකයෙක් හැටියට එතුමා ගැන විශේෂයෙන් මතක් කරමින් ඉස්ලාම් ආගමේ අල්ලා දෙවියන් වහන්සේගේ අනුකම්පාව එතුමාට ලැබේවා! කියා ප්‍රාර්ථනා කරනවා.

මල්ලිකා රත්වත්තේ මැතිනිය පාර්ලිමේන්තුවේ සේවය කළේ මම පාර්ලිමේන්තුවට පැමිණීමට පෙරයි. මම හිතන විධියට 1967 වර්ෂයේ එතුමියගේ ස්වාමි පුරුෂයා වන ක්ලිෆර්ඩ් සේනක රත්වත්තේ මැතිතුමාගේ මන්ත්‍රී ධුරය අහිමි වුණාට පසුව, එතුමිය අතුරු මැතිවරණයකට තරග කළා. එතුමිය 1970-1977 කාලයේ පාර්ලිමේන්තුවේ පසුපෙළ ක්‍රියාකාරී මන්ත්‍රීවරියක් හැටියට තමයි මට පෙනුණේ. එතුමිය බොහෝ වැඩ කටයුතු කරගෙන ගියා. මම හිතන විධියට බලන්ගොඩ ප්‍රදේශයට පිහන් ගඩොල් කර්මාන්තශාලාව ලබා දුන්නේ එතුමියගේ මැදිහත් වීමෙනුයි. එතුමිය එම ප්‍රදේශයට වැඩ කටයුතු කිහිපයක් කළා. එතුමිය පාර්ලිමේන්තුවේ සිටි කාලය තුළදී -එම දශකය තුළදී- ඒ ප්‍රදේශයට කැප වී වැඩ කරපු මන්ත්‍රීවරියක්. මම එතුමියව මන්ත්‍රීවරියක් හැටියට දැනගෙන හිටියා. ඒ වාගේම රත්වත්තේ පවුලේ සාමාජිකාවක් හැටියට මට එතුමියව විටින් විට හමු වෙලා තිබුණා. බලංගොඩ ප්‍රදේශයේ ජනතාව ලබා දුන් ජනවරම අනුව තමයි එතුමිය වැඩ කළේ. එතුමිය ඒ ප්‍රදේශය පිළිබඳ හොඳට දැනගෙන හිටියා. එතුමිය ෆර්ගියුසන් බාලිකා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා එම ප්‍රදේශයට තිබෙන සම්බන්ධකම නිසා ගුරුවරියක් හැටියට කටයුතු කරපු නිසා ඒ ජනතාවගේ වුවමනා එපාකම් පිළිබඳ හොඳ අවබෝධයකින් කටයුතු කිරීමට පුළුවන් වුණා. 1977 වර්ෂයේ පැවැති මැතිවරණයෙන් එතුමිය පරාජය වුණා. එතුමියට නැවත පාර්ලිමේන්තුවට පැමිණීමට අවස්ථාව ලැබුණේ. නැහැ. ඒත් එතුමිය එම ප්‍රදේශයට වැඩ කටයුතු කළා. මල්ලිකා රත්වත්තේ මැතිනිය කරපු සේවයට ස්තුති කරමින්, එතුමියට නිවන් සැප ලැබේවා!කියා මම ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මැතිනිය.

[මධ්‍යාහ්න 12.00]

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) சுதர்ஷினி பர்னாந்துபுள்ளே)
(The Hon. (Dr.) (Mrs.) Sudarshini Fernandopulle)
ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ විවිධ අවස්ථා නියෝජනය කරමින් මේ රටට විශාල සේවයක් කරපු කීර්තිමත් දේශපාලනඥයන් තිදෙනෙක් පිළිබඳ ශෝකය ප්‍රකාශයට පත් කරන මේ අවස්ථාවේ මටත් කාලය වෙන් කර දීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් තමන් නියෝජනය කරපු ආසනයට විශාල සේවයක් කරපු මල්ලිකා රත්වත්තේ මැතිනිය පිළිබඳ කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට මම බලාපොරොත්තු වෙනවා. ලෝකයේ පළමුවැනි අගමැතිතුමිය බිහි කළ මහවලතැන්න වලව්ව සමඟ සම්බන්ධ වුණු, කාන්තාවන් දේශපාලනයට අඩුවෙන් ඇතුළු වෙන අවස්ථාවක දේශපාලනයට ඇතුළු වී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරමින් විශාල සේවයක් කරපු කීර්තිමත් කාන්තාවක් හැටියට තමයි අපි ඇයව හඳුනන්නේ.

එතුමියගේ ස්වාමිපුරුෂයා වූ ක්ලිෆර්ඩ් සේනක රත්වත්තේ මැතිතුමාට බලංගොඩ ආසනය අහිමි වුණාට පස්සේ, 1966 පැවැති අතුරු මැතිවරණයෙන් ජයගෙන තමයි එතුමිය පාර්ලිමේන්තුව නියෝජනය කරන්න ආවේ. ඉතිහාසයේ සිට ගත්තාම ශ්‍රී ලංකාවේ බොහෝ කාන්තාවන් දේශපාලනයට ඇවිත් තිබෙන්නේ විශේෂයෙන්ම පවුල් දේශපාලනය හරහායි. එතුමිය එලෙස දේශපාලනයට අවතීර්ණ වෙලා, වරින් වර පැවැති මැතිවරණවලට ඉදිරිපත් වෙමින් මම හිතන විධියට අවුරුදු 10කට ආසන්න කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින්, බලංගොඩ ප්‍රදේශයේ ජනතාවට විශාල සේවාවක් කළා.

රත්නපුර ෆර්ගියුසන් බාලිකා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලබාදපු එතුමිය, පසුව කොළඹ ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමයට ඇතුළු වෙලා, ඊළඟට ලලිත කලාව පිළිබඳ ඩිප්ලෝමාධාරිනියක් හැටියට හොඳ අධ්‍යාපන පසු බිමක් එක්ක දේශපාලනයට ආපු කාන්තාවක්. එතුමිය විශේෂයෙන්ම බලංගොඩ ප්‍රදේශයේ අහිංසක, අසරණ ජනතාව වෙනුවෙන් විශාල කාර්ය භාරයක් කළා. එතුමිය වත්පොහොසත්කම් පිරි හොඳ ඉහළ රදල පරම්පරාවකින් පැවත ආවත් පොළොවේ හොඳින් පය ගහලා බලංගොඩ අහිංසක, අසරණ ජනතාව නියෝජනය කරමින් විශාල කාර්ය භාරයක් කළාය කියන එක අපි අසා තිබෙනවා. එතුමිය 1970 - 1977 කාලය තුළ බලංගොඩ රෝහල වැඩිදියුණු කරන්න, ඒ වාගේම බලංගොඩ ලංකා වෝල්ට් ටයිල්ස් සමාගමේ කර්මාන්තශාලාව, බලංගොඩ ලංකා ගමනාගමන මණ්ඩලයේ ඩිපෝව, බලංගොඩ ප්‍රධාන තැපැල් කාර්යාලය හා මහජන බැංකුව වාගේ විශේෂ ආයතන සංවර්ධනය කරන්න විශාල දායකත්වයක් ලබා දීපු බව අපි මතක් කරන්න ඕනෑ. එතුමිය රටට වැඩදායක හොඳ දරුවන් දෙදෙනෙක් දායාද කර තිබෙනවා. එතුමියගේ පුතා වන කමල් සේනක රත්වත්තේ මැතිතුමා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරියේ උප සභාපතිතුමා හැටියට, ඒ වාගේම රත්නපුර මහා සමන් දේවාලයේ ප්‍රධාන බස්නායක නිලමේ හැටියට විශාල කාර්ය භාරයක් කරනවා.

මල්ලිකා රත්වත්තේ මැතිනියට අපි නිවන් සුව ප්‍රාර්ථනා කරන ගමන්ම, එතුමියගේ අභාවයෙන් ශෝකයට පත්ව ඉන්න එතුමියගේ දරුවන් ඇතුළු පවුලේ ඥාති හිතමිත්‍රාදීන්ට අපේ ශෝකය පළ කරන්නත් අපි මෙය අවස්ථාවක් කර ගන්නවා.

ගරු කථානායකතුමනි, ගරු රේණුකා හේරත් මැතිනිය පිළිබඳව සඳහන් කරද්දී, ශ්‍රී ලාංකීය දේශපාලනයේ කාන්තා නියෝජනයේදී අපට ලොකු ආදර්ශයක් දීපු කාන්තාවක් හැටියට තමයි අපි ගරු රේණුකා හේරත් මැතිනිය හඳුන්වන්නේ. නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ කියන ඉතාම දුෂ්කර ආසනයක් නියෝජනය කරමින් එතුමිය 1977දී පළමු වරට මේ පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. ඊළඟට, 1977 සිට පැවැති මැතිවරණ ගණනාවකදී තරග කර එතුමිය පාර්ලිමේන්තුව නියෝජනය කළා. 1989දී මේ රටේ සෞඛ්‍ය අමාත්‍යවරිය හැටියට එතුමිය පත් වුණා. මම හිතන විධියට ලංකාවේ සෞඛ්‍ය අමාත්‍ය ධුරයට පත් දෙවැනි කාන්තා අමාත්‍යවරිය වීමේ ගෞරවය හිමි වන්නේ ගරු රේණුකා හේරත් මැතිනියටයි. එතුමිය යටතේ වෛද්‍යවරියක් හැටියට සේවය කරන්න මටත් වාසනාව ලැබුණාය කියන එක මතක් කරන්න ඕනෑ. එතුමිය සෞඛ්‍ය හා වනිතා කටයුතු අමාත්‍යවරිය හැටියට, මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රය දියුණු කරන්න, මේ රටේ ග්‍රාමීය ජනතාවට අවශ්‍ය කරන සෞඛ්‍ය පහසුකම් ලබා දෙන්න හා රෝහල් වැඩිදියුණු කරන්න විශාල කාර්ය භාරයක් කළාය කියන එක අපි ඉතාම ගෞරව පූර්වකව සිහිපත් කරනවා.

එතුමිය බොහොම අභීත -එඩිතර- කාන්තාවක්. එතුමියට චතුර කථිකත්වයක් තිබුණා. මා දන්නා තරමට එතුමිය කිසිදු දේශපාලන

[ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය]

පවුල් පසු බිමක් නැතිව දේශපාලනයට ආපු කාන්තාවක්. එතුමිය විවිධ තනතුරු හොබවමින් වසර ගණනාවක් විශාල සේවාවක් කළා. එතුමිය රෝහල්ගත වෙන්න සති කීපයකට පෙර පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංඝයේ මන්ත්‍රීවරියන් එක්ක දේශපාලනයේ කාන්තා නියෝජනය පිළිබඳව නුවරඑළිය දිස්ත්‍රික්කයේ පැවැති දැනුවත් කිරීමේ වැඩමුළුවකටත් සම්බන්ධ වුණා. එතකොට එතුමිය මධ්‍යම පළාතේ විපක්ෂ නායිකාව විධියට කටයුතු කළා. එතුමියගේ අභාවය අපට රටක් හැටියට බොහොම පාඩුවක්. එතුමියට නිවන් සුව ප්‍රාර්ථනා කරමින්, එතුමියගේ අභාවය නිසා ශෝකයට පත්ව සිටින එතුමියගේ දියණිය, ස්වාමිපුරුෂයා ඇතුළු පවුලේ ඥාති හිතමිත්‍රාදීන්ටත් අපගේ ශෝකය මේ අවස්ථාවේදී පළ කරනවා.

ගරු කථානායකතුමනි, අභාවප්‍රාප්ත ගරු අබ්දුල් කාදර් මැතිතුමා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පිවිස, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයක් හැටියට, නියෝජ්‍ය අමාත්‍යවරයෙක් හැටියට හා අමාත්‍යවරයෙක් හැටියට විවිධ තනතුරු හොබවමින් විශාල කාර්ය භාරයක් කරපු හොඳ මහත්මයෙක් හැටියට තමයි අපි හඳුනාගෙන හිටියේ.

මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් එතුමා මුස්ලිම් ප්‍රජාවට විතරක් නොවෙයි, සමස්ත ජනතාවටම විශාල සේවාවක් කළා. එතුමා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පැමිණියත්, අවුරුදු 30ක පමණ කාලයක් පැවති කුරිරු යුද්ධය අවසන් කරන අවස්ථාවේදී හොඳ, ස්ථාවර ආණ්ඩුවක් සෑදීම සඳහා එවකට සිටි අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමාට සහයෝගය පළ කරමින්, රට වෙනුවෙන් කළ ඒ කැප කිරීම විශේෂයෙන්ම අපි මේ අවස්ථාවේදී අගය කරනවා.

ගරු කථානායකතුමනි, එතුමාගේ අභාවයෙන් ශෝකයට පත් වී සිටින එතුමාගේ පවුලේ සියලුදෙනාට මේ අවස්ථාවේදී අපගේ සංවේගය පළ කරනවා. ඒ වාගේම මෙම ශෝක ප්‍රකාශ යෝජනා සම්බන්ධයෙන් කථා කිරීමට මට කාලය වෙන් කර දුන් ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා.

[අ.භා. 12.07]

ගරු ලකී ජයවර්ධන මහතා (කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு லக்கி ஜயவர்தன - மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)

(The Hon. Lucky Jayawardana - State Minister of Hill Country New Villages, Infrastructure and Community Development)

ගරු කථානායකතුමනි, රටට, සමාජයට වාගේම දේශපාලනයට අද්විතීය සේවාවක් ඉටු කළ උදාරතර චරිත කිහිපයක් පිළිබඳව කථා කරන මේ අවස්ථාවේදී, අදහස් ප්‍රකාශ කිරීමට කාලය ලබා දීම පිළිබඳව මා ඔබතුමාට බොහොමත්ම ස්තුතිවන්ත වෙනවා.

මේ රටේ ක්‍රියාකාරී දේශපාලනයේ නියැලෙමින් රටට විශිෂ්ට සේවාවක් ඉටු කළ රේණුකා හේරත් මැතිනිය, නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ මැතිවරණ කොට්ඨාසයෙන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් වශයෙන් තේරී පත් වුණා. මේ පාර්ලිමේන්තුවේ වාගේම දේශපාලන දිවියේ වසර 39කට -දශක 4කට- ආසන්න කාලයක් කටයුතු කළ උදාරතර රේණුකා හේරත් මැතිනියගේ අභාවය පිළිබඳව මා ශෝකය පළ කරන්නේ දැඩි සංවේගයෙන්. එතුමිය මේ රටට, සමාජයට හා දේශපාලනයට කළ සේවාව අනුස්මරණය කරන මේ අවස්ථාවේ එතුමිය ඉතා දක්ෂ මන්ත්‍රීවරියක් විධියටත්, දිසා ඇමතිවරියක් විධියටත්, සෞඛ්‍ය හා වනිතා කටයුතු ඇමතිවරිය විධියටත්, මධ්‍යම පළාත් සභා මන්ත්‍රීවරියක් විධියටත් ඒ වාගේම මධ්‍යම පළාත් සභාවේ විපක්ෂ නායිකාව විධියටත් කළ සේවාව ඉතාම අද්විතීයයි කියන එක මතක් කළ යුතු වෙනවා.

අපිට එතුමියව දීර්ඝ කාලයක් ඇසුරු කරන්නට අවස්ථාව ලැබුණා. එතුමිය ක්‍රියාකාරී දේශපාලනයේ නියැලුණා. තනතුරු ඇතත්, නැතත් එතුමියගෙන් විය යුතු සේවාව ඉටු කරන්නට එතුමිය විශාල කැපවීමකින් කටයුතු කළාය කියන එකත් මේ අවස්ථාවේදී සඳහන් කළ යුතු වෙනවා. රේණුකා හේරත් මැතිනිය මේ රටේ සෞඛ්‍ය සේවයට විශාල සේවාවක් ඉටු කළ සෞඛ්‍ය ඇමතිවරියක් විධියට අපි දකිනවා. වලපනේ වාගේ දුෂ්කර ප්‍රදේශවල ජීවත් වුණු තරුණ-තරුණියන්ට එතුමිය විශාල වශයෙන් රැකියා අවස්ථා සපයමින් කටයුතු කළ නිසා, අදත් එතුමියගේ ගුණ සිහි කරන විශාල පිරිසක් සිටිනවා කියන එක මතක් කළ යුතු වෙනවා. දහස් සංඛ්‍යාත ජනතාවක් රේණුකා හේරත් මැතිනියගේ අවමංගල්‍ය උත්සවයට එක් වෙලා, එතුමිය වෙනුවෙන් ශෝක වුණු ආකාරය අපට දැක ගන්න අවස්ථාව ලැබුණා.

රේණුකා හේරත් මැතිනිය එක්සත් ජාතික පක්ෂයේ ක්‍රියාකාරී සාමාජිකාවක් විධියට වාගේම එක්සත් ජාතික පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකාවක් විධියටත් පක්ෂය සමඟ එකට සිටිමින් කටයුතු කළ ඉතාම වීරෝදාර කාන්තාවක් කියන එක මතක් කරන්න ඕනෑ. අපේ ගරු අග්‍රාමාත්‍යතුමා මතක් කළ ආකාරයට එතුමියට පවරන ඕනෑම කටයුත්තක් එතුමිය නිසි ලෙස ඉටු කරන ආකාරය අප දුටුවා. ඇත්තවශයෙන්ම එතුමියගේ එම කටයුතු අපට ආදර්ශයක්ය කියන එකත් සඳහන් කළ යුතු වෙනවා. එතුමිය කිසිම අවස්ථාවක බිය වුණේ නැහැ. පසුගිය දවස්වල එතුමිය ගැන පළ වුණු ප්‍රවෘත්ති තුළ, එතුමිය වලපනේ මැතිවරණ කොට්ඨාස සංවිධායකවරිය විධියට 1988 පැවැති ජනාධිපතිවරණයේදී කටයුතු කළ ආකාරය සඳහන් වී තිබෙන ප්‍රවෘත්තියක් මම දුටුවා. එම ජනාධිපතිවරණය ඉතාම භීෂණකාරී වාතාවරණයක තිබුණේ. එතුමිය ආසනයේ සංවිධානය කළ රැස්වීමකට එවකට ජනාධිපති අපේක්ෂක රණසිංහ ප්‍රේමදාස මැතිතුමා සහභාගි වීමට නියමිතව තිබුණා. එම රැස්වීම පැවැත්වීමට නියමිතව තිබුණේ නිල්දණ්ඩාහින්න නගරයේ. නිල්දණ්ඩාහින්න නගරයේ පැවැත්වීමට නියමිතව තිබූ එම රැස්වීමේ වේදිකාව අසල පුද්ගලයින් 9දෙනෙක් ඝාතනය කර තිබුණා. නමුත් එතුමිය එවැනි අවස්ථාවකත් එම රැස්වීම පවත්වා, වීරෝදාර විධියට එම මැතිවරණ ව්‍යාපාරය මෙහෙයවූවා කියන එක මතක් කළ යුතු වෙනවා. ඒ ගැන ප්‍රශංසාත්මකව කථා කරපු පිරිස් පිළිබඳව එම පුවත් පතේ සඳහන් වී තිබුණා. බය කියන එක එතුමිය ළඟ තිබුණේ නැහැ. යුක්තිය හමුවේ අභීතව සටන් වැදුණු උදාරතර දේශපාලනඥවරියක් විධියට එතුමිය අපට හඳුන්වන්න පුළුවන්.

එතුමියගේ අභාවය මධ්‍යම කඳුකරයේ නුවරඑළිය දිස්ත්‍රික්කයට සිදුවුණු බලවත් පාඩුවක්. ඒ වාගේම වලපනේ මැතිවරණ කොට්ඨාසයට සිදු වුණු බලවත් පාඩුවක්. මරණය පොදු ධර්මතාවක්. ඒ පොදු ධර්මතාවට එතුමිය පත් වුණත් එතුමිය ගෙන ගිය ඒ දේශපාලන ගමන් මඟ ඉදිරියට ගෙන යන්නට එතුමියගෙන් බිහි වුණු හිරණ්‍යා හේරත් රණවීර දියණිය අප පක්ෂයට ශක්තියක්ය කියන එක මතක් කරන්න ඕනෑ. වලපනේ එක්සත් ජාතික පක්ෂ සංවිධායක විධියට අද ඇය කටයුතු කරනවා. මා හිතන හැටියට ඒ ව්‍යාපාරයට ශක්තිය දෙන්න හිටපු

පළාත් සභා මන්ත්‍රී රණවීර මැතිතුමා -රේණුකා හේරත් මැතිතුමියගේ දයාබර ස්වාමී පුරුෂයා- කැප වීමෙන් කටයුතු කරනවාය කියන එකත් අපි ඉතා අභිමානයෙන් සිහිපත් කරනවා. රේණුකා හේරත් මැතිනියගේ අභාවය පිළිබඳ මේ උත්තරීතර සභාවේ කියැවුණු අදහස් සියල්ලම සත්‍ය බව ප්‍රකාශ කරන අතර එම අදහස් සියල්ලම අනුමත කරමින්, අද එතුමිය අප අතර නැති වුණත්, එතුමිය කළ ඒ සේවාව සදානුස්මරණය කරමින්, එතුමියට උතුම් වූ අමා මහ නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමනි, ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මැතිතුමා ගැනත් වචන ස්වල්පයක් කථා කරන්න ඕනෑ. ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මැතිතුමා මහනුවර දිස්ත්‍රික්කයෙන් තරග කර පාර්ලිමේන්තුවට පිවිසුණු මන්ත්‍රීවරයෙක්. 1960 - 1965 කාලයේදී එතුමා නාවලපිටිය, ගහ ඉහළ ගම් කාර්ය සභාවට පත්වී බිම් මට්ටමින් දේශපාලනයට පිවිසුණු දේශපාලනඥයෙක්. 1988 බිහිසුණු වාතාවරණය තුළ පැවති පළාත් සභා මැතිවරණයට තරග කළ අබ්දුල් කාදර් මැතිතුමා එයින් ජයග්‍රහණය කර මධ්‍යම පළාත් සභාවට තේරී පත් වුණා. ඒ පළාත් සභාවේ සෞඛ්‍ය හා වාණිජ කටයුතු සහ ධීවර කටයුතු හා මුස්ලිම් කටයුතු ඇමතිවරයා විධියට අවුරුද්දක් වැනි කාලයක් කටයුතු කළා. එතුමා මධ්‍යම පළාත් සභාවේ සිටියදී, 1989 පැවති මහා මැතිවරණයට ඉදිරිපත්වෙලා, එයින් ජයග්‍රහණය කර මෙම පාර්ලිමේන්තුවට පිවිසුණා. මා හිතන හැටියට දීර්ඝ කාලයක් පාර්ලිමේන්තුවේ කටයුතු කරමින් සිටි එතුමාට 1993දී නාගරික සංවර්ධන ව්‍යාපෘති ඇමතිවරයා විධියට කටයුතු කරන්න අවස්ථාව ලැබුණා. ඒ අවස්ථාවේදී එතුමා මහනුවර ප්‍රදේශයේ තිබෙන කුඩා නගර දියුණු කරන්න යම් උත්සාහයක් දැරුවත්, ඊට පසුව පැවති මැතිවරණ ප්‍රතිඵල මත 1994දී එතුමාට විපක්ෂයට යෑමට සිදු වුණා. එතුමා විපක්ෂයේ සිටියත් ඒ කාලය තුළ මහනුවර දිස්ත්‍රික්කයට නායකත්වයක් දුන්නාය කියන එකත් මා සඳහන් කරන්න ඕනෑ. මහනුවර එක්සත් ජාතික පක්ෂ සංවිධානයේ දිස්ත්‍රික් සභාපතිවරයා විධියටත් විශේෂ සේවාවක් කරන්න එතුමා කැප වුණා. අපේ ගරු අග්‍රාමාත්‍යතුමා මතක් කළ ආකාරයට එතුමා අපේ පක්ෂයේ කටයුතුවලට විශාල ශක්තියක් දුන්නා.

ඒ විතරක් නොවෙයි, ගරු කථානායකතුමනි, එතුමා දුප්පත් මිනිසුන් වෙනුවෙන් විශාල සේවාවක් ඉටු කළා. "දුප්පතාගේ හිතවතා" නමින් විරුදාවලිය ලත් එතුමා දුප්පතුන් වෙනුවෙන් නිවාස තනන්න, නිවාස සඳහා සෙවිලි තහඩු ලබා දෙන්න, ඒ වාගේම ජනතාවගේ අවශ්‍යතාවන් වෙනුවෙන් නිරතුරුවම කටයුතු කළා. 2000 පැවති මැතිවරණයට තරග කළ එතුමා එයින් ජයග්‍රහණය ලැබුවා. ඉන් පසුව 2001දී ජාතික ලැයිස්තුවෙන් පාර්ලිමේන්තුවට පිවිසි එතුමා මහනුවර දිස්ත්‍රික්කයට විශාල සේවාවක් ඉටු කරන්න උත්සාහ කළා. 2005දී ආණ්ඩුව විසුරුවා හැරීමෙන් පසුව පැවති මහා මැතිවරණයෙන් නැවතත් පාර්ලිමේන්තුවට පිවිසි එතුමා එවකට පැවති ආණ්ඩුවට එක්වෙලා එක්සත් ජාතික පක්ෂයෙන් බැහැරව කටයුතු කළා. අවසාන කාලයේදී එතුමා ඉතා කනස්සල්ලට පත්වෙලා සිටියා. එවකට පැවති ආණ්ඩුව තුළ පාලනයක් නැතිකම නිසා ඒ කාලයේ මුස්ලිම් ජනතාවට සිදු වුණු කරදර පිළිබඳව එතුමා ඉතා විශාල කලකිරීමකට පත්වෙලා සිටියා. එතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට බැඳීම තුළ ලොකු කලකිරීමකින් සිටියාය කියන එකත් මතක් කළයුතු වෙනවා. එවන් අවස්ථා එතුමාට අභිමි වුණත්, එතුමා කළ සේවාව විශිෂ්ටයි කියන එක මතක් කරන්න ඕනෑ. එතුමා අපේ හොඳ මිත්‍රයෙක්. මිතුරන් ලෙස කටයුතු කරද්දී එතුමා අපට සහාය ලබා දුන්නු බවත් මතක් කරමින්, එතුමාගේ අභාවය මහනුවර දිස්ත්‍රික්කයට පමණක් නොවෙයි, සියලුම ජනතාවට සිදු වුණු පාඩුවක් සේ අපි දකිනවා. විශේෂයෙන්ම එතුමාගේ අභාවය නිසා මුස්ලිම් ජනතාවට සිදු වූ පාඩුව පිරිමහන්නට නොහැකියි කියන එකත් මතක් කළ යුතු වෙනවා.

අප අතරින් වෙන් වුණත් එතුමා කළ ඒ සේවාව මේ සමාජය තුළ සදානුස්මරණව පවතින බව මා මේ අවස්ථාවේදී මතක් කරනවා. අභාවප්‍රාප්ත වන්නට යෙදුණු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මැතිතුමාට එතුමා අදහන ආගම අනුව අල්ලාහ් දෙවියන්ගේ පිහිට ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමනි, අභාවප්‍රාප්ත ගරු මල්ලිකා රත්වත්තේ මැතිනිය පිළිබඳවත් අපි කථා කරන්න ඕනෑ. බලංගොඩ වාගේ දුෂ්කර ප්‍රදේශයකින් පාර්ලිමේන්තුවට පිවිසිලා, එවැනි දුෂ්කර ප්‍රදේශ දියුණු කරන්නට එතුමිය දැරූ උත්සාහය අපි අගය කළ යුතු වනවා. එතුමිය මේ පාර්ලිමේන්තුවට පිවිසිලා තිබෙන්නේ අතුරු මැතිවරණයකින්. පවතින ආණ්ඩුවක් යටතේ විපක්ෂයකට අතුරු මැතිවරණයකින් ජයග්‍රහණය ලබන්න අසීරු වුවත්, එතුමිය ඒ ජයග්‍රහණය ලබාගෙන තිබෙනවා. 1965 ආණ්ඩුවේ මුල් කාලය තුළදීම එතුමියට විරුද්ධ පක්ෂයෙන් පාර්ලිමේන්තුවට පිවිසෙන්න ලැබීමත් එතුමිය ලද ලොකු අවස්ථාවක් බව මා මතක් කළ යුතු වනවා. එතුමිය 1970 සිට 1977 දක්වාත් පාර්ලිමේන්තුව නියෝජනය කරලා තිබෙනවා. ඒ කාලයේ එතුමිය එම ප්‍රදේශයට අවශ්‍ය සේවය ඉටු කරන්න කැපවෙලා කටයුතු කර තිබෙනවා. මනුෂ්‍යයකු වශයෙන් ඉපදිලා, මනුෂ්‍යයකු වශයෙන් ජීවත් වෙමින් ඉටු විය යුතු යුතුකම් ඉෂ්ට කරන්න එතුමිය කරපු කැප වීම අපි මේ අවස්ථාවේදී අගය කරනවා.

අද දින ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර තිබෙන මහජන නියෝජිතයන් තිදෙනාටම මහනුවර දිස්ත්‍රික් ජනතාවගේ ශෝකය පළ කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

[අ.භා.12.17]

ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)

ගරු කථානායකතුමනි, මේ ගරු සභාවේ සේවය කරපු ගරු මන්ත්‍රීවරියන් දෙදෙනෙකු සහ මන්ත්‍රීවරයකු පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් කර ඇති මේ වෙලාවේ ඒ සම්බන්ධව වචන කීපයක් කථා කරන්න මා බලාපොරොත්තු වනවා. පළමුවෙන්ම මා නියෝජනය කරන රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ ආසනය නියෝජනය කරපු මල්ලිකා රත්වත්තේ මැතිනිය ගැන කථා කරන්න මා බලාපොරොත්තු වනවා. මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන් කීප දෙනෙකු ප්‍රකාශ කළා වාගේම එතුමිය බලංගොඩ මහවලතැන්න වලව්වේ ක්ලිෆර්ඩ් සේනක රත්වත්තේ මහත්මයා සමඟ 1959දී විවාහ වුණා. ඉන් පසුව ඔහුගේ සමාජ, දේශපාලන කටයුතුවලට සහාය ලබා දුන්නා. ක්ලිෆර්ඩ් සේනක රත්වත්තේ මහත්මයා බලංගොඩ නගර සභාවේ නගරාධිපති වශයෙන් කටයුතු කරපු කාලයේ මෙතුමියට දේශපාලන ආභාසයක් ලැබුණාය කියා මා හිතනවා. එතුමා පාර්ලිමේන්තුවට ආවේ 1960 වර්ෂයේ. 1960 පාර්ලිමේන්තු කාලය අවසානයේ, 1965 මැතිවරණයෙනුත් ක්ලිෆර්ඩ් සේනක රත්වත්තේ මහත්මයා ජයග්‍රහණය කළා. නමුත් ඒ මැතිවරණ ප්‍රතිඵලයට විරුද්ධව ඡන්ද පෙත්සමක් ගොනු කිරීම නිසා එතුමාට ඒ මන්ත්‍රී ධුරය අහිමි වුණා. ඒ නිසා 1966 පැවැත්වූ අතුරු මැතිවරණයෙන් මල්ලිකා රත්වත්තේ මහත්මිය අපේක්ෂිකාව වශයෙන් ඉදිරිපත් වෙලා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් ජයග්‍රහණය කළා. ඉන්පසු 1977 වනතුරු එතුමිය පාර්ලිමේන්තුවේ හිටියා. මා හිතන හැටියට ඒ කාලය තුළ එතුමිය ඒ ප්‍රදේශයට විශාල වැඩ කොටසක් කළා. එතුමියගේ විශේෂ ලක්ෂණයක් තමයි එඩිතර බව. මල්ලිකා රත්වත්තේ මහත්මිය කොයි තරම් එඩිතරව එදා ඒ ප්‍රශ්නවලට මුහුණ දුන්නාද කියලා අදත් ඒ ප්‍රදේශයේ ජනතාව කථා කරනවා. ගම්බද මිනිසුන් සමඟ ඇයගේ ඉතා කිට්ටු සම්බන්ධතාවක් තිබුණා. ඒ අයගේ ඕනෑ

[ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා]

එපාකම් වෙනුවෙන් එතුමිය ඉදිරිපත් වුණා. ඒ ජනතාවට අසාධාරණයක්, අයුක්තියක් වුණාම ඒ සඳහා එතුමියි කෙළින්ම ඉදිරිපත් වුණා. බොහෝ විට සාමාන්‍ය ඒ මිනිසුන්ගේ ගැලවුම්කාරිය වුණේ එතුමියයි. මහිලා සමිති ව්‍යාපාරය ව්‍යාප්ත කරලා, ඒ ප්‍රදේශයේ කාන්තාවන්ගේ සහ ගම්බද ජනතාවගේ ආර්ථික මට්ටම නහා සිටුවන්න පුළුවන් හැම දෙයක්ම එතුමිය කළා. මන්ත්‍රීතුමන්ලා කීප දෙනෙකුම කිව්වා වාගේ, බලංගොඩට පළමුවෙන්ම පිහන් කර්මාන්ත ශාලාවක් ගෙනාවේ එතුමියයි. එදා රත්නපුර දිස්ත්‍රික්කයටම එවැනි කර්මාන්ත ශාලාවක් තිබුණේ නැහැ. සම්ප්‍රදායික තේ කර්මාන්ත ශාලා කීපයක් තිබුණා හැරුණු කොට රත්නපුර දිස්ත්‍රික්කයේ කර්මාන්ත ව්‍යාප්තියක් තිබුණේ නැහැ. එවැනි අවස්ථාවක එතුමිය මේ පිහන් කර්මාන්ත ශාලාව ආරම්භ කරලා, සිය ගණනකට රක්ෂා ලබා දෙන්න කටයුතු කළා.

ඒ වාගේම, බලංගොඩට අවශ්‍ය වෙලා තිබුණු පොදු පහසුකම් ගොඩක් ලබා දුන්නා. ආරෝග්‍යශාලා දියුණු කරලා, ඒ කටයුතු කළා. ඒ වාගේම, අංග සම්පූර්ණ ලංගම ඩිපෝවක් හැදුවා. රත්නපුර දිස්ත්‍රික්කයේ එහෙම ඩිපෝවක් ඒ වෙලාවේ තිබුණේ නැහැ; රත්නපුර නගරයේවත් තිබුණේ නැහැ. ඉතා අංග සම්පූර්ණ ඩිපෝවක් හැදුවා. අදත් ඒක පාවිච්චි වෙනවා. මේ ආකාරයට ඒ ප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන් එතුමිය ඇප කැප වෙලා කටයුතු කළා. එතුමිය දේශපාලනයෙන් ඉවත් වුණාට පසුවත් ජනතාව සමඟ තිබුණු ඒ සම්බන්ධතාව ගෙන ගියා. බොහෝ විට ඒ ප්‍රදේශයේ පැවති උත්සවවලදී අපට එතුමිය මුණ ගැසුණා. එතුමිය වයස අවුරුදු 86ක් ආයු විඳලා තමයි මිය ගියේ. එතුමියගේ ජීවිතයේ අවසාන කාලයේදී පවා පොදු අවස්ථාවලදී, ජනතාව රැස්වෙන, ජනතාවගේ චුවමනාකම් ඉෂ්ට වෙන අවස්ථාවලදී අපට මුණ ගැසුණා. එතුමිය ඒ විධියට ජනතා සේවයට කැපවෙච්ච කාන්තාවක්. එතුමිය රත්නපුරයේ ඉපදුණා. රත්නපුරයේ මූලික අධ්‍යාපනය ලබලා, ද්විතීය අධ්‍යාපනය ශාන්ත බ්‍රිජට් කන්‍යාරාමයෙන් ලබා ගත්තා. ඒ අනුව, එතුමියට හොඳ උගත්කමක් තිබුණා. ඒ වාගේම එතුමියට හොඳ කලා හැකියාවක්, කෞශල්‍යයක් තිබුණා. චිත්‍ර ඇඳීමට ඇය විශාල උනන්දුවක් දැක්වූ බව අපි අහලා තිබෙනවා. මෙවැනි ඉතාම අංගසම්පූර්ණ ජීවිතයක් එතුමිය ගත කළා.

එතුමියගේ පුත්‍ර රත්නය වන කමල් සේනක රත්වත්තෙ මැතිතුමා අද රත්නපුර සමන් දේවාලයේ බස්නායක ධුරය දරමින් ප්‍රදේශයට සේවයක් කරනවා. ආගමික ස්ථානවලට සම්බන්ධ වෙලා එතුමා කටයුතු කරනවා. එතුමාත් ජනතාව සමඟ කිට්ටු සම්බන්ධතාවක් පවත්වනවා. ඒ වාගේම එතුමියට දියණියකුත් සිටිනවා. මේ දරු දෙදෙනාගෙන් අපි බලාපොරොත්තු වෙන්නේ ඒ මව සහ පියා ගෙන ගිය සේවය ඉදිරියටත් ජනතාව අතරට ගෙන යයි කියලායි. මේ වචන කිහිපය ප්‍රකාශ කරමින් එතුමියට නිවන් සැප ලැබෙවායි කියා මා ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට අබ්දුල් කාදර් මැතිතුමා ගැනත් මා කථා කරන්න ඕනෑ. එතුමාත් පසුගිය කාලයේ මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් හිටියා. මේ ප්‍රධාන පක්ෂ දෙකේම එතුමා කටයුතු කළා. එතුමා පළමුවෙනි වතාවට පාර්ලිමේන්තුවට ආවේ මාත් සමඟ 1989 වසරේ. එහෙම ඇවිල්ලා ටික කලකින් එතුමා නියෝජ්‍ය ඇමතිවරයෙක් වුණා. ඩී.බී. විජේතුංග ජනාධිපතිතුමා යටතේත් එතුමා නියෝජ්‍ය ඇමතිවරයකු වශයෙන් කටයුතු කළා. එතුමා බොහොම මිත්‍රශීලි පුද්ගලයෙක්. හැම වෙලාවේම එතුමා හිනා වෙලා කථා කරලා, කොලොප්පමක් කරලා කාලය ගෙවූ නියෝජ්‍ය ඇමතිවරයෙක්. ඒ වාගේම, අන්තිම කාලයේ එතුමා මහින්ද රාජපක්ෂ මහත්මයාගේ රජයට එකතු වෙලා පරිසර නියෝජ්‍ය ඇමති ධුරය දැරුවා. පරිසර නියෝජ්‍ය ඇමති ධුරය දරනකොට එතුමා කිව්වා, "මට ඔක්කෝම කරන්න පුළුවන්, නමුත් පරිසර අමාත්‍යාංශයේ වැඩ කටයුතුවලට පිටරට යන්න කිව්වාම ටිකක් අකමැති කමක් තිබෙනවා, දැන් මට ඒක අපහසුයි" කියලා. සමහර අය පිටරට යන්න බොහොම කැමති වුණත් අබ්දුල් කාදර් මන්ත්‍රීවරයා ඒකට එච්චර කැමති වුණේ නැහැ. පරිසර අමාත්‍යාංශයෙන් අපට යම් කටයුත්තක් කරගන්න තිබුණාම අපි හමු වුණේ, එතුමා. ඇමතිතුමාට වඩා අපි එතුමායි හමු වුණේ. එතුමා කොහොම හරි ඒ වැඩේ කරලා දෙන්න බලනවා; නිලධාරීන්ට කථා කරනවා. කොතැන හිටියත් දුරකථනයෙන් නිලධාරියාට කථා කරලා, සම්බන්ධ වෙලා, "මේ ඇමතිතුමාගේ වැඩක් තිබෙනවා, මේක කරන්න ඕනෑ" කියලා උපදෙස් දීලා ඉතා උනන්දුවෙන් කටයුතු කළා. එතුමාට හොඳ මහජන සම්බන්ධතාවක් තිබුණා. ඒ වාගේම අපි අතරත් කිට්ටු සම්බන්ධතාවක් තිබුණා. මේ විධියට ඉතාම මිත්‍රශීලි චරිතයක් වුණු එතුමාට එතුමාගේ ආගම අනුව අල්ලා දෙවියන්ගේ පිහිට ලැබේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට, ගරු රේණුකා හේරත් මහත්මිය ගැනත් කථා කරන්න අවශ්‍යයි. අපි දන්නවා, එතුමිය දීර්ඝ කාලයක් දේශපාලන කටයුතුවල නිරත වෙලා සිටි බව. එතුමිය එක්සත් ජාතික පක්ෂයේ සංවිධාන කටයුතුවල නිරත වෙලා හිටපු බොහොම එඩිතර, ක්‍රියාශීලි කාන්තාවක්. එතුමියගෙන් පසුව මම සෞඛ්‍ය අමාත්‍ය ධුරයට පත් වුණා. සෞඛ්‍ය අමාත්‍යාංශයේ වැඩකටයුතුවලදී මම බොහෝවිට එතුමියටත් ආරාධනා කළා. ආරාධනා කරලා, එතුමියත් වාඩි කරවාගෙන යම් යම් ප්‍රශ්න සාකච්ඡා කළා. ඇත්ත වශයෙන්ම යම් යම් ප්‍රශ්න ගැන එතුමියට හොඳ අවබෝධයක් තිබුණා. එවැනි අවස්ථාවලදී එතුමියගේ අදහස්වලට අපි ගරු කළා. ඒ වාගේම, එතුමිය ඉතාම මිත්‍රශීලි කාන්තාවක්. එතුමිය ආණ්ඩුවේ තනතුරු කීපයක් දැරුවා. එතුමිය පළාත් සභාවේත් හිටියා.

1989 දී එතුමිය සෞඛ්‍ය ඇමතිවරිය වශයෙන් කටයුතු කළා. එවැනි සේවාවක් කළ එතුමියටත් නිවන් සුව ප්‍රාර්ථනා කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. දිවා ආහාර විවේකය ලබා දීමට පෙර තව එක් ගරු මන්ත්‍රීවරයකුට කථා කිරීමට අවස්ථාව ලබා දීමට සභාව එකඟ ද?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. මීළඟට, ගරු ජේ.සී. අලවතුවල නියෝජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 12.33]

ගරු ජේ. සී. අලවතුවල මහතා (ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல - உள்நாட்டலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. J.C. Alawathuwala - State Minister of Home Affairs)
ගරු කථානායකතුමනි, මෙම ගරු සභාව නියෝජනය කළ ගරු මන්ත්‍රීවරයකු සහ ගරු මන්ත්‍රීවරියන් දෙදෙනකුගේ අභාවයන්

පිළිබඳ ශෝකය පළ කිරීමේ යෝජනා ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේ දී මට කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මුලින්ම, නුවරඑළිය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක හැටියට වලපනේ ආසනය නියෝජනය කරමින් 1977දී අභිනවයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වුණු ගරු රේණුකා හේරත් මැතිනියගේ අභාවය සම්බන්ධයෙන් ශෝකය පළ කරමින් වන කිහිපයක් කථා කරන්නට මම කැමැතියි.

ගරු රේණුකා හේරත් මැතිනිය තරුණ කාන්තාවක් හැටියට 1977 ජේ.ආර්. ජයවර්ධන ජනාධිපතිතුමාගේ යුගයේ දී පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. පාර්ලිමේන්තුවට එන්න පෙර එතුමිය ගුරු වෘත්තියේ යෙදුණු තරුණ කාන්තාවක්. එතුමිය ගුරු වෘත්තිය තුළ සිටියදීම වෘත්තිය සමිතිවල කටයුතු කරලා, නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ එම වෘත්තිය සමිති සාර්ථකව ක්‍රියාත්මක කළා. එවකට එක්සත් ජාතික පක්ෂයේ නායකයා වුණු ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, වලපනේ ආසනයේ එක්සත් ජාතික පක්ෂ සංවිධායකවරිය හැටියට එතුමියව පත් කළා. ඉතාම කෙටි කාලයකින් පසු 1977 පැවැති මැතිවරණය ජයග්‍රහණය කරලා තරුණ මන්ත්‍රීවරියක් හැටියට මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න එතුමියට පුළුවන් වුණා. ඉන්පසු ඉතාම කෙටි කාලයක් තුළ දිසා ඇමතිවරියක හැටියට කටයුතු කරන්නත් එතුමිය වාසනාවන්ත වුණා. 1978 වර්ෂයේ දී දිසා ඇමතිවරුන් පත් කරන අවස්ථාවේ දී තමන් තේරී පත් වුණු නුවරඑළිය දිස්ත්‍රික්කයේ දිසා ඇමතිවරිය හැටියට කටයුතු කරන්න එතුමියට අවස්ථාව උදා වුණා. ඒ තුළින් තමන් නියෝජනය කරන වලපනේ ආසනයේ සංවර්ධන කාර්ය භාරයන් විශාල ප්‍රමාණයක් එතුමිය විසින් ඉටු කළා. ඒ වාගේම නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක වුණු සංවර්ධන කටයුතු මෙහෙයවීම හා සම්බන්ධීකරණය කිරීමටත් එතුමියට අවස්ථාව උදා වුණා. විශේෂයෙන්ම නුවරඑළිය දිස්ත්‍රික්කයේ මහවැලි යෝජනා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ අවස්ථාවේ දී එම කටයුතුවලට විශේෂ සහයෝගයක් ලබා දීමට එතුමියට අනර්ඝ අවස්ථාවක් උදා වුණා. එතුමියගේ දේශපාලන කාලය තුළ දිසා ඇමතිවරියක වශයෙන් කටයුතු කළා වාගේම, ඊට පසුව නියෝජ්‍ය අමාත්‍යවරියක් හැටියටත්, සෞඛ්‍ය අමාත්‍යවරිය හැටියටත් විශාල කාර්ය භාරයක් සමස්ත ශ්‍රී ලාංකික ජනතාව වෙනුවෙන් ඉෂ්ට කරන්නට එතුමියට අවස්ථාව උදා වුණා. අවුරුදු 26ක් තරම් දීර්ඝ කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් කාන්තාවක් හැටියට ඉතා නිර්භීතව, එඩිතරව තමන්ගේ අදහස් පාර්ලිමේන්තුව තුළ ඉදිරිපත් කරමින්, විශේෂයෙන්ම කාන්තාවන් වෙනුවෙන් ලොකු කාර්ය භාරයක් ඉටු කරන්නට ගරු රේණුකා හේරත් මැතිනියට අවස්ථාව උදා වුණා.

එතුමියගේ අභාවය අපි කාටත් ඉතාම ශෝකජනක අවස්ථාවක් වුණා. ඒ විතරක් නොවෙයි, එතුමිය නියෝජනය කළ වලපනේ ආසනය ඇතුළු නුවරඑළිය දිස්ත්‍රික්කයේ ජනතාවටත්, ලංකාවාසී ජනතාවටත් එතුමියගේ අභාවය ඉමහත් පාඩුවක් බව මේ අවස්ථාවේ දී මතක් කළ යුතු වෙනවා.

ගරු කථානායකතුමනි, එතුමිය 2000 වර්ෂයේ දී පමණ පළාත් සභාව නියෝජනය කරමින් මධ්‍යම පළාත් සභාවේ විපක්ෂ නායකවරිය හැටියටත් කටයුතු කළා. පාර්ලිමේන්තුවේ කටයුතු කරන්න බැරි වුණු අවස්ථාවලදී වුණත්, ජනතාව වෙනුවෙන් කැප වෙලා පළාත් සභාව නියෝජනය කරමින් කටයුතු කිරීම තුළ, එතුමියගේ ජීවිතය තිබෙන තාක් කල් ජනතාවත් එක්ක වැඩ කරන්න තිබුණු උනන්දුව, කැප වීම අපට පැහැදිලිව පෙන්නුම් කරලා තිබෙනවා.

එතුමිය විශාල කාර්ය භාරයක් අපේ රට වෙනුවෙන් ඉටු කළා. ඒ සඳහා එතුමියගේ ස්වාමි පුරුෂයා වන රණවීර මැතිතුමාගේ සහය, ශක්තිය නො අඩුව එතුමියට ලබා දුන්නා. වර්තමානයේ එතුමියගේ දියණියටත් එම කටයුතු ඉදිරියට කරගෙන යන්න ශක්තිය ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින්, එතුමිය වෙනුවෙන් එම පවුලේ සියලු දෙනා වෙත අපගේ ශෝකය ප්‍රකාශ කරනවා.

ඊළඟට, නුවර දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරපු අබ්දුල් කාදර් මැතිතුමා ගැන මම කථා කරන්න කැමතියි. එතුමා 1994දී පාර්ලිමේන්තුව නියෝජනය කරමින් විපක්ෂයේ මන්ත්‍රීවරයකු හැටියට විශාල කාර්ය භාරයක් ඉටු කළා. එවකට එතුමා අප සමඟ ඉතාමත් සුහදව කටයුතු කළ ආකාරය මට මතකයි. අබ්දුල් කාදර් මැතිතුමා එතුමාගේ පෞද්ගලික මුදල් පරිත්‍යාග කරමින් තම ප්‍රදේශයේ ජනතාවට නොයෙකුත් ආකාරයේ සමාජ සේවා කටයුතු ගණනාවක් ඉටු කරපු නායකයෙක්. ඒ පිළිබඳව මහනුවර දිස්ත්‍රික්කයේ ජනතාව වාගේම එතුමා ආශ්‍රය කරපු සියලු දෙනාම දන්නවා. එතුමාට පුළුවන් විධියට ජනතාවට නිවාස සාදා දෙමින්, නොයෙකුත් ආකාරයෙන් උදව් උපකාර කළා. ජනතාවට නොයෙකුත් අපහසුකම් ඇති වූ අවස්ථාවලදී පවා එතුමාගේ පෞද්ගලික මුදල් වැය කරමින් විශාල වශයෙන් සහයෝගය ලබා දුන් මන්ත්‍රී කෙනෙක්. නුවර දිස්ත්‍රික්කයේ එතුමා පෞද්ගලිකව උදව් කරපු විශාල පිරිසක් ඉන්නවා. ඒ සියලුදෙනාටම එතුමාගේ කාර්ය භාර්ය සම්බන්ධයෙන් මනා වැටහීමක් තිබෙනවා. එතුමාගේ අභාවය වෙනුවෙන් එතුමාගේ පවුලේ සියලුදෙනා වෙත අපගේ ශෝකය ප්‍රකාශ කරනවා.

ගරු කථානායකතුමනි, මා මුලින්ම සඳහන් කළා වාගේ මෙම අවස්ථාව ගරු මන්ත්‍රීතුමියන්ලා දෙදෙනෙකු සහ ගරු මන්ත්‍රීතුමකු වෙනුවෙන් ශෝකය ප්‍රකාශ කරන අවස්ථාවක්. රත්නපුර දිස්ත්‍රික්කයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් විශාල කාර්ය භාරයක් ඉටු කරපු ගරු මල්ලිකා රත්වත්තේ මැතිනිය සම්බන්ධයෙනුත් මා වවන කිහිපයක් ප්‍රකාශ කරන්නට කැමැතියි. එතුමිය අපට ගොඩක් කලින් පාර්ලිමේන්තුව නියෝජනය කළ මන්ත්‍රීතුමියක්. එතුමිය සම්බන්ධයෙන් දැක්වෙන තොරතුරු අනුව එතුමිය බලංගොඩ මැතිවරණ කොට්ඨාසයේ විශාල ජනතා මෙහෙවරක් ඉටු කරලා තිබෙනවා. වසර 10කට වඩා කාලයක් පාර්ලිමේන්තුව නියෝජනය කරමින් තමන්ගේ ප්‍රදේශයේ ජනතාවට විශාල කාර්ය භාරයක් ඉටු කරපු මන්ත්‍රීතුමියක් හැටියට එතුමිය වෙනුවෙන් එම පවුලේ සියලු දෙනා වෙත අපගේ බලවත් ශෝකය ප්‍රකාශ කරමින්, මට මෙම අවස්ථාව ලබා දුන් ගරු කථානායකතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වවන ස්වල්පය අවසන් කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දිවා ආහාරය සඳහා අපරභාග 1.30 දක්වා සභාවේ කටයුතු අත්හිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.30ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා (ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා) ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.30 p.m. and then resumed, DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *in the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු ටී. රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමා.

[අ.භා.1.31]

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ පාර්ලිමේන්තුව විටින් විට නියෝජනය කළ මහජන නියෝජිත මහත්ම මහත්මීන් තිදෙනෙකුගේ අභාවයන් පිළිබඳව අද දින අපගේ ශෝකය ප්‍රකාශ කරනවා. රත්නපුර දිස්ත්‍රික්කයේ මහජන නියෝජිතවරියක් හැටියට දශකයකට අධික කාලයක් එම දිස්ත්‍රික්කයේ උන්නතිය වෙනුවෙන් සහ ජනතාව වෙනුවෙන් විශාල සේවාවක් කළ, රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රගතිශීලී කඳවුරට දැවැන්ත ශක්තියක් වුණු, මහජන මන්ත්‍රී, මල්ලිකා එල්ලාවල රත්වත්තේ මැතිනිය පිළිබඳව එම දිස්ත්‍රික්කයේ මහජන නියෝජිතයකු ලෙස වචන කිහිපයක් කථා කරන්න ප්‍රථමයෙන්ම මම බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රත්නපුරය කියන්නේ, මේ පාර්ලිමේන්තුව තුළ කාන්තා නියෝජනයට බොහෝ ඉඩකඩක් ලබා දුන් දිස්ත්‍රික්කයක්. ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය ලෝකයේ පළමුවැනි අග්‍රාමාත්‍යවරිය ලෙස පත් වුණා. එතුමිය රත්නපුර දිස්ත්‍රික්කයේ උපත ලද කාන්තා නායිකාවක්. එතුමිය පසු කාලයේ ලෝක ජනාදරයටත් පත් වෙලා, රටේම නායිකාව බවට පත් වුණා. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට ඥාතිකම් තිබෙන, එතුමිය නායකත්වය දුන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් තමයි මල්ලිකා රත්වත්තේ මැතිනිය දේශපාලනයට ප්‍රවිෂ්ට වුණේ. රත්නපුර දිස්ත්‍රික්කයේ ප්‍රභූ පවුලකට අයත් රත්වත්තේ පරම්පරාවෙන් දේශපාලනයට පිවිසුණු එතුමිය උපත ලැබුවේ 1932 අප්‍රේල් මාසයේ 13වන දායි. එතුමිය රත්නපුර ෆර්ගියුසන් උසස් බාලිකා විද්‍යාලයෙන් අධ්‍යාපනය ලබා, අනතුරුව හේවුඩ් කලායතනයෙන් උසස් අධ්‍යාපනය ලැබුවා. මල්ලිකා රත්වත්තේ මැතිනිය අපේ දිස්ත්‍රික්කයේ සිටි ඉතා දිරිය කාන්තා නායිකාවක් හැටියටයි අප හඳුන්වන්නේ. 1950-1960 කාල පරිච්ඡේදයේ අපේ රට යටිතල පහසුකම් අතින් ඌන සංවර්ධන තත්ත්වයක තිබෙද්දි, බලංගොඩ ආසනයට දේශපාලන වශයෙන් සම්බන්ධ වෙලා, එම ප්‍රදේශයේ මහිලා සමිති කටයුතුවලට ඉතා කාර්යක්ෂම දායකත්වයක් ලබාදෙමින්, කාන්තා අයිතිවාසිකම් සහ කාන්තා සංවර්ධනය වෙනුවෙන් එතුමිය ඉතා වටිනා වැඩකොටසක් ඉටු කළා.

එතුමිය 1959දී බලංගොඩ නගර සභාවේ නගරාධිපතිවරයා ලෙස කටයුතු කළ ක්ලිෆර්ඩ් රත්වත්තේ මැතිතුමාගේ ආදරණීය භාර්යාවයි. එදා බලංගොඩ නගර සභාවේ බලය ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙත ලබාගෙන දැවැන්ත කාර්ය භාරයක් කරලා, නගර සභාවට අයිති ප්‍රදේශය තුළ ජීවත් වන වැසියන්ගේ ජන ජීවිතය වැඩිදියුණු කිරීමට, නාගරික පහසුකම් ලබාදීමට තමන්ගේ ආදරණීය ස්වාමිපුරුෂයා වන ක්ලිෆර්ඩ් රත්වත්තේ මැතිතුමාට විශාල ධෛර්යයක්, ශක්තියක් වුණු දිරිය කාන්තාවක් තමයි මල්ලිකා රත්වත්තේ කියන්නේ. ඉන් අනතුරුව දේශපාලන කටයුතුවලට ප්‍රවිෂ්ට වුණු එතුමිය 1966දී ක්ලිෆර්ඩ් රත්වත්තේ මැතිතුමාට ඡන්ද පෙත්සමකින් තමන්ගේ ආසනයේ; මැතිවරණ කොට්ඨාසයේ මන්ත්‍රී ධුරය අහිමි වන වෙලාවේ, පවත්වපු අතුරු මැතිවරණයේදී විශාල ජනතා ප්‍රසාදයක් ලබා ගනිමින්, බලංගොඩ මහජන මන්ත්‍රීවරිය හැටියට පත් වෙනවා. 1966 වන විට මේ රටේ තිබුණු එක්සත් ජාතික පක්ෂයේ හත්හවුල් ආණ්ඩුව බලයට පත් වෙලා වසරක් වැනි කෙටි කාලයක් ඇතුළත, පවතින ආණ්ඩු බලයට අභියෝග කරමින් කාන්තාවක් හැටියට එම මැතිවරණ කොට්ඨාසය ජයග්‍රහණය කරන්න එතුමිය කොයි විධියේ ජන ප්‍රසාදයක් ලබාගෙන තිබුණාද යන්න ගැන අපි කථා කළ යුතු නැහැ. 1966දී බලංගොඩ මහජන මන්ත්‍රීවරිය ලෙස පත් වූ එතුමිය, නැවත වතාවක් සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ නායකත්වයෙන් 1970දී සමගි පෙරමුණ තුළින් බලංගොඩ ආසනයේ මැතිවරණයට ඉදිරිපත් වෙලා අතිවිශිෂ්ට ජයග්‍රහණයක් ලබා ගන්නවා. 1970දී රත්නපුර දිස්ත්‍රික්කයේ සියලු මැතිවරණ කොට්ඨාස සමගි පෙරමුණ විසින් ජයග්‍රහණය කරන වෙලාවේ, එතුමිය ඉතාම ශක්තිමත්ව, කිසිදු ජාති භේදයකින් තොරව - බලංගොඩ ආසනය තුළ ජීවත් වන දෙමළ සහ මුස්ලිම් ජනතාවගේත් සහයෝගය ලබා ගනිමින්- අතිවිශිෂ්ට ජයග්‍රහණයක් ලබාගෙන එම ප්‍රදේශයේ මන්ත්‍රීවරිය බවට පත් වෙනවා. එසේ පත්වීමෙන් අනතුරුව, යටිතල පහසුකම් අතින් ඉතාම අඩු සංවර්ධනයක් අත් කරගෙන තිබුණු බලංගොඩ ආසනයට සංවර්ධනයේ අරුණලු ගෙන ඒමට එතුමිය ක්‍රියා කළා.

සිරිමාවෝ බණ්ඩාරනායක රජයේ එදා තිබුණු කර්මාන්ත ප්‍රතිපත්තිය ඉතා ඉහළින් ප්‍රයෝජනයට ගනිමින් -ගරු අගමැතිතුමියත් සමඟ තිබුණු පෞද්ගලික සම්බන්ධතා, ඥාති සම්බන්ධතාත් මෙයට උපයෝගි වෙන්න ඇති කියා අපි හිතනවා.- දකුණු ආසියාවේ විශාලම පිහන් කර්මාන්තශාලාව බලංගොඩට ලබාගෙන, ප්‍රදේශයේ අමුද්‍රව්‍ය උපයෝගි කරගෙන එහි නිෂ්පාදන වැඩ කටයුතු ආරම්භ කළා. ඒ වාගේම, ප්‍රදේශයේ රැකියා විරහිත තරුණ තරුණියන්ට විශාල වශයෙන් රැකියා උත්පාදනය කිරීමටත් එම කර්මාන්තශාලාව උපයෝගී කරගත්තා. රටේ ජාතික ආදායමට විදේශ මුදල් එක්කර ගැනීමත් මේ තුළින් සිද්ධ වුණාය කියන එක අපි ආඩම්බරයෙන් මතක් කරන්න ඕනෑ. ඒ වාගේම බලංගොඩට අංග සම්පූර්ණ තැපැල් කාර්යාලයක් හා ලංකා ගමනා ගමන මණ්ඩලයේ විශාල පරිමාණයේ ඩිපෝවක් ලබාදීම, එම නගරය නවීකරණය කිරීම සහ බලංගොඩ රෝහල වැඩිදියුණු කිරීම වැනි ජනතා සිත් සතන්වලට, හදවත්වලට සමීප වුණු; දැනෙන සේවාවක් මල්ලිකා රත්වත්තේ මැතිනියගේ කාලය තුළ සිද්ධ වුණාය කියන එක එතුමියට ගරු කිරීමක් හැටියට අපි මතක් කරන්න ඕනෑ. ඒ සේවාව මේ වනතුරුත් බලංගොඩ ජනතාව ඉතාම ආදරයෙන්, ගෞරවයෙන් සිහිපත් කරනවා. මීට වසරකට පෙරාතුව එතුමිය අභාවප්‍රාප්ත වුණු වෙලාවේ, ඒ නිවසට ආ ගිය සෙනඟ දෙස බැලුවාම ඒ බව පෙනෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එම ප්‍රදේශයේ ජනතාව මල්ලිකා රත්වත්තේ මැතිනිය පිළිබඳවත්, ක්ලිෆර්ඩ් රත්වත්තේ මැතිතුමා පිළිබඳවත් අදත් ඉතාම ගෞරවනීය ආකාරයෙන්, පැසසුම් ලබාදෙමින් කථා කරන ආකාරය අපි දැක තිබෙනවා. එතුමිය 1977දී මැතිවරණ පරාජයෙන් පසුව දේශපාලනයෙන් යම් ආකාරයකට ඉවත්ව සිටියා වුණත්, දිස්ත්‍රික්කයේ කෙරෙන සෑම ප්‍රගතිශීලී කටයුත්තකටම ඉතා සක්‍රියව දායක වෙමින්, ඒ සඳහා අපට ආශිර්වාද කළ බව අපි මතක් කරන්න ඕනෑ. පසුගිය ජනාධිපතිවරණයේදී ලද පරාජයෙන් පසුව මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ අපි විපක්ෂයට එනකොට, එතුමිය අපේ දේශපාලන කටයුතුවලට ආශිර්වාද කරමින් කථා බහ කරලා, අපව දිරිමත් කළ, ශක්තිමත් කළ ආකාරය මම ඉතාම ගෞරවනීයව මේ අවස්ථාවේදී මතක් කරනවා. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය මේ රටේ ජනාධිපතිනිය හැටියට කටයුතු කළ කාල සීමාව තුළත් එතුමිය සමඟ තිබුණු ඒ සම්බන්ධතා උපයෝගි කරගෙන බලංගොඩ ප්‍රදේශයට සේවාවක් කිරීමට එතුමිය බොහෝ උත්සාහ ගත්තාය කියන කාරණයත් මම මේ වේලාවේ සඳහන් කළ යුතුයි.

මල්ලිකා රත්වත්තේ මැතිනියගෙන් ගිලිහුණු ඒ ජාතික සේවාව, සමාජ සේවාව අද පාර්ලිමේන්තුව නියෝජනය නොකළත්, මහජන නියෝජිතයකු නොවුණත් එතුමියගේ දයාබර පුත්‍ර අපේ හිතවත් කමල් රත්වත්තේ මැතිතුමා ඉටු කරනවා. එතුමා එයාර්ලංකා සමාගමේ හිටපු උප සභාපතිවරයෙක්. ඉන් අනතුරුව අද වන විට කමල් රත්වත්තේ මැතිතුමා ජාතික, ආගමික, ශාසනික සහ සංස්කෘතික වශයෙන් සබරගමුවේ අපට බොහෝ වැදගත් වන සමන් දේවාලයේ බස්නායක නිලමේවරයා හැටියට විශාල සේවාවක් කරනවා. මල්ලිකා රත්වත්තේ මැතිනියට දරුවන් දෙදෙනෙකු සිටිනවා. කමල් රත්වත්තේ මැතිතුමා සහ හේෂානි අරම්පත්ත මැතිනිය. ඒ වාගේම ඒ පවුලට සම්බන්ධ වී සිටින කමලිනී වෑදණ්ඩ මහත්මිය සහ වෛද්‍ය සංජය අරම්පත්ත මැතිතුමා ඇතුළු ඒ පවුල්වල දූ දරුවන් සියලුදෙනාම සාමාන්‍ය පුරවැසියන් ලෙස රටට සහ සමාජයට විශාල සේවාවක් ඉටු කරනවා. එතුමන්ලා අදටත් ප්‍රදේශයේ ජනතාව සමඟ ගැටෙමින් ප්‍රදේශයේ සංවර්ධනාත්මක කටයුතුවලට බොහෝ සහයෝගය දෙමින් කටයුතු කරන ප්‍රගතිශීලී කණ්ඩායමක් බව හඳුන්වන්නට පුළුවන්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මල්ලිකා රත්වත්තේ මැතිනිය පිළිබඳව බලංගොඩ ජනතාව වාගේම රත්නපුරයේ ජනතාව තව බොහෝ කාලයක් කථා කරයි. ඒ වාගේම එතුමිය බොහෝ කාලයක් කථා කළ යුතු චරිතයක්. සමහර පුද්ගලයන් දේශපාලනයට ඇවිල්ලා එතැනින් ඉවත්වෙලා ගියාට පසුව ජනතාව ඔවුන් පිළිබඳව කථා කරන්නේ අප්‍රසාදයෙන් සහ පිළිකුලෙන්. එහෙම චරිත අපේ රටේ දේශපාලන ඉතිහාසය තුළ තිබෙනවා. හැබැයි, රත්නපුරයේ මන්ත්‍රීවරයෙක් හැටියට මම විශ්වාස කරනවා මල්ලිකා රත්වත්තේ මැතිනිය පිළිබඳව තව දශක ගණනාවක්, පරම්පරා ගණනාවක් යනතෙක් ඒ ප්‍රදේශවල ජනතාව ප්‍රසංශනාත්මකව කථා කරන බව. මොකද, තමන්ගේ පෞද්ගලික දේපොළ, ඉඩකඩම් සාමාන්‍ය ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් ලබා දෙමින්, ආයුර්වේද බෙහෙත්ශාලා, රජයේ රෝහල්, ඖෂධ උයන්, මං මාවත්, ප්‍රජා ශාලා වැනි දේ ගොඩ නහන්නට තමන්ගේ පෞද්ගලික දේපොළ පරිත්‍යාග කරමින් ප්‍රදේශයේ දියුණුව වෙනුවෙන් කටයුතු කළ ජනතා නියෝජිතවරියක් හැටියට එතුමිය හඳුන්වන්නට පුළුවන්. විශේෂයෙන් ක්ලිෆර්ඩ් රත්වත්තේ මැතිතුමා ඇතුළු ඒ පරම්පරාවේ උදවිය මහජන නියෝජිතයන් හැටියට කළ සේවාව පිළිබඳව අපි ගෞරවයෙන් සිහිපත් කරනවා. අපි අදහන ආගමේ හැටියට, බෞද්ධ දර්ශනයේ හැටියට මල්ලිකා රත්වත්තේ මැතිනියට අමා මහ නිවන් සම්පත් ලැබෙවායි ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම රත්නපුරයේ මහජන නියෝජිතයකු වශයෙන් මාගේ ශෝකය ඒ පවුලේ උදවිය වෙත දැනුම් දීමට කටයුතු කරනවා ඇති කියා මා විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අභාවප්‍රාප්ත ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මැතිතුමාගේ ශෝක යෝජනාව පිළිබඳවත් අද දිනයේ සාකච්ඡා කරනවා. මම එතුමා සමඟ පසුගිය පාර්ලිමේන්තුවේ සිටි මන්ත්‍රීවරයෙක්. වැඩිහිටි දේශපාලනඥයෙකු වශයෙන් අපි ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මැතිතුමාව ඉතාමත් සමීපව ඇසුරු කළා. එතුමා එක්සත් ජාතික පක්ෂයේ ඉඳලා මහින්ද රාජපක්ෂ මැතිතුමාත් සමඟ අපේ ආණ්ඩුවට, අපට එකතුවෙලා පරිසර හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය ඇමතිවරයා විධියට, - ඒ කාල වකවානුව තුළ- ඉතාමත්ම හොඳින්, සුහදව අපත් සමඟ කටයුතු කළා. එතුමා අපට බොහෝ උදවු උපකාර කරලා තිබෙනවා. ඒ වාගේම එතුමා අවසාන කාලයේ, මහින්ද රාජපක්ෂ මැතිතුමා සමඟ ඒකාබද්ධ විපක්ෂයට සම්බන්ධව කටයුතු කළ කාලය තුළ අපේ වැඩ කටයුතු පිළිබඳව බොහෝ ඇගයීමකින්, අපව දිරිමත් කරමින් කටයුතු කළ මහජන නියෝජිතයකු බව ප්‍රකාශ කළ යුතු වෙනවා. අප අදහන ආගමේ හැටියට අබ්දුල් කාදර් මැතිතුමාටත් නිවන් සම්පත් ලැබේවා කියලා අපි ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අභාවප්‍රාප්ත රේණුකා හේරත් මැතිනිය පිළිබඳ ශෝක ප්‍රකාශ යෝජනාවත් අද දිනයේ සාකච්ඡා වෙනවා. එක්සත් ජාතික පක්ෂයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයේ දේශපාලනය කළ නායිකාවක් හැටියට අපි රේණුකා හේරත් මැතිනියව දැකලා තිබෙන්නේ පත්තරවලින්, රූපවාහිනියෙන් පමණයි. එතුමියව පෞද්ගලිකව දැන කියාගෙන, හඳුනාගන්න මට අවස්ථාවක් ලැබිලා නැහැ. නමුත් එතුමිය විශේෂයෙන් කාන්තා නායිකාවක් වශයෙන් මේ රටේ කාන්තා පරපුර වෙනුවෙන් සහ සෞඛ්‍ය සේවය වෙනුවෙන් අභීතව කටයුතු කළ මහජන නියෝජිතවරියක් බවත්, එක්සත් ජාතික පක්ෂයට විශාල සේවාවක් කළ නායිකාවක් බවත් එක්සත් ජාතික පක්ෂය පැත්තෙන් ප්‍රකාශ වුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් ගරු මල්ලිකා රත්වත්තේ මැතිනියටත්, ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මැතිතුමාටත්, ගරු රේණුකා හේරත් මැතිනියටත් නිවන් සම්පත් ලැබේවායි ප්‍රාර්ථනය කරන අතර, එම තිදෙනාගේම පවුල්වල සාමාජිකයන් වෙත අපගේ ශෝකය දන්වා යැවීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමින්, වේලාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා.

[පි.ප. 1.43]

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(මාණ්පුමිකු අප්තුල්ලා මහ්රූප්)
(The Hon. Abdullah Mahrooff)
බිස්මිල්ලාහිර් රහ්මානිර් රහීම්.

කෞරව කුලුක්කළින් පිරතිත් තවිසාලර් අවර්කළේ, ඉන්තච් සපෙයිලේ අංකත්තුවම් පෙට්‍රු, මක්කළුක්කුච් සේවෙ සෙය්තු, එම්මෙවිට්ටුප් පිරින්ත මූන්‍රු තලෙවර්කළින් මරෙවෙයිට්ටු ඉන්‍රු නිරෙවේට්‍රප්පට්ටවුළ්ළ අනුතාපප් පිරේරණෙයින්මීතු පේස එනක්කුච් සන්තර්ප්පමළිත්තමෙක්කාක නන්‍රියෙයිත් තෙරිවිත්තුක්කොළ්කින්‍රේන්. එනතු අරසියල් පිරවේසත්තිර්කු ඔරු මුන්නෝටියාකත් තිකළ්න්ත මරෙන්ත කණ්ටි පාරාළුමන්‍ර උරුප්පිනර් අප්තුල් කාතර් අවර්කළෙප් පර්‍රි මුතලිල් සිල වාර්ත්තෙකළෙ නාන් කූර ආසෙප්පටුකින්‍රේන්.

තනි මනිත වාළ්ක්කෙයිල් ඔරුවර් එප්පටි නටන්තුකොළ්ළ වේණ්ටුමෙන්පතර්කුත් තනතු කුටුම්පත්තුක්කු, තනතු සුර්‍රත්තාරුක්කු, තනතු ආතරවාළර්කළුක්කු, තනතු තොකුති මර්‍රුම් මාවට්ට මක්කළුක්කු, ඒන්, ඉන්ත නාට්ටුප් පිරජෛකළුක්කේ උතාරණ පුරුෂරාකත් තිකළ්න්තවර්තාන් මරෙන්ත තලෙවර් ඒ.ආර්.එම්. අප්තුල් කාතර් අවර්කළ්. ඉවර් මික වෙළිප්පටෙයාන තනතු සේවෙයෙය, තනතු පංකළිප්පෙ ඉන්ත නාට්ටු මක්කළුක්කුම් තනතු සමූකත්තිර්කුම් වළංකියිරුක්කින්‍රාර්. ඉන්ත නාට්ටිලේ එමතු සමූකත්තවරුක්කුප් පල අනර්ත්තංකළ් ඒර්පට්ටිරුක්කින්‍රන. අන්‍රු විටුතලෙප් පුලිකළ් එමතු මුස්ලිම් කිරාමංකළිලේ, පළ්ළිවාසල්කළිලේ තාක්කුතල්කළෙ නටත්තියපෝතු, වෙළිමාවට්ටත්තිලිරුන්තු වන්ත මුතල් තලෙවනාක, උයිර්කළෙයිළන්ත, උටෙමෙකළෙ යිළන්ත අන්ත මක්කළුක්කු අළ්ළික් කොටුත්තවරාක එමතු කිළක්කු මණ්ණිලේ අවරුටෙය පෙයර් ඉන්‍රුම් පේසප්පටුකින්‍රතු. අන්‍රු තලතා මාළිකෙ තාක්කප්පට්ටපෝතු තන්නුටෙය පණත්තිලිරුන්තු 10 ඉලට්සම් රූපාෙයයුම් තන්නුටෙය මක්කළිටමිරුන්තු 25 ඉලට්සම් රූපාෙයයුම් අන්ත මක්කළුක්කුම් තලතා මාළිකෙයිනුටෙය පුනර්නිර්මාණත්තිර්කුම් කොටුත්තු ඒනෙය සමූකත්තිර්කුම් සේවෙ සෙය්තාර්. ඔරු කුටුම්පත්තිර්කු, ඔරු සමූකත්තිර්කු, නණ්පර්කළුක්කු, කට්සි ආතරවාළර්කළුක්කු එප්පටි උතවි සෙය්ය වේණ්ටුමෙන්පතිලේ මිකත් තිරන්ත, වෙළිප්පටෙයාන පෝක්කුටෙයවරාක අවර් ඉරුන්තාර්.

[ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා]

நான் அவரோடு 25 வருட காலங்கள் நட்போடு பழகியிருக்கின்றேன். தேர்தல் என்றாலும் சரி, சமூகப் பணியென்றாலும் சரி, எனக்கு முதலிலே கைகொடுத்தவராக அவர் திகழ்ந்திருக்கின்றார். சுனாமி அனர்த்தம் ஏற்பட்டபோது கிழக்கு மண்ணிலே, திருகோணமலை மாவட்டத்திலே 935 மக்களின் உயிர்களைக் காவுகொண்டபோது கிண்ணியா மண்ணிலே 547 பேர் மரணித்தார்கள். அதுமட்டுமல்ல, கரையோரத்திலே கிட்டத்தட்ட 4,000 வரையில் வீடுகள் பாதிக்கப்பட்டன. மாணவர்கள் உடுதுணிகளை இழந்தார்கள். அந்த நேரத்திலே சவூதி அரேபியாவிலிருந்து பெறப்பட்ட உடுதுணிகளை அந்த மக்களுக்கு வழங்கி, வெள்ளைத் துணிகளைப் பாடசாலை மாணவர்களுக்கு வழங்கிக் கௌரவித்த மனிதர் அவர். அனர்த்தங்கள் ஏற்படுகின்றபோது, தாக்குதல்கள் ஏற்படுகின்றபோது, அவர்கள் கைவிட்ட நிலையிலே பரிதவிக்கின்றபோது, ஒரு தகப்பனாக அல்லது ஒரு சமூகத்தினுடைய தலைமைத்துவமாக இருந்து அவர் செய்த பணிகள் இன்றும் பேசப்படுகின்றன.

1989ஆம் ஆண்டில் பாராளுமன்றத்திற்குப் பிரவேசித்த அவர், இந்த நாட்டின் நகர அபிவிருத்திப் பிரதி அமைச்சராக இருந்தார். 2001ஆம் ஆண்டு கூட்டுறவுத்துறை அமைச்சராக இருந்தார். இந்த நாட்டிலே மிக இலகுவாகச் சந்திக்கக்கூடிய ஓர் அமைச்சாகவும் இன்முகத்துடன் மக்களை வரவேற்கின்ற ஓர் அமைச்சராகவும் இருந்தார். ஓர் அமைச்சர் எப்படி நடந்துகொள்ள வேண்டும் என்பதிலே தெளிவான போக்குடையவராக இருந்தார். அவர் 25 வருட காலம் தொடர்ச்சியாகத் தனது ஹஜ் கடமையை நிறைவேற்றுகின்ற போது, அவரோடு இருந்தவர்களை, அவருக்குப் பணி செய்தவர்களை, அவரது பிரதேசத்திலே இருக்கின்ற ஏழை, எளிய மக்களை அழைத்துச் சென்று அவர்களும் ஹஜ் கடமைகளை நிறைவேற்றுவதற்கு உதவி செய்தார். அவரது நற்பண்புகளின் காரணமாக கம்பளை மாநகரத்திலே யிருக்கின்ற பெரிய பள்ளியினுடைய தலைவராகத் தொடர்ச்சியாக 25 வருடங்கள் தனது கடமையைச் செய்தது மட்டுமல்ல, அதன் ஆயுட்காலத் தலைவராகவும் அவரை அந்த மக்கள் ஏற்றுக்கொண்டார்கள்.

கம்பளை சாஹிராவினதும் ஏனைய பாடசாலைகளி னுடைய கல்வி முயற்சிகளிலும் அவருடைய அளப்பரிய சேவை இருந்தது. அவரது சேவை கண்டியில் மட்டுமல்ல கிழக்கு மண்ணிலும் வியாபித்திருந்தது. இப்படிச் சமூகத்தினுடைய தலைவராக நம்பிக்கை பெற்றிருந்த அவர், ஐக்கிய தேசியக் கட்சியிலே 44 வருடங்கள் பிரதிநிதித்துவம் பெற்றிருந்தபோது, அந்தக் கட்சி பொருளாதார ரீதியாக நலிவுற்றிருந்தபோது, அந்தக் கட்சியினுடைய ஆரோக்கியமான முன்னெடுப்புக் களுக்குப் பொருளாதார ரீதியாகத் திறந்த மனதோடு உதவி செய்தவர். அன்று நானும் 20 வருடங்களுக்கு மேலாக அந்தக் கட்சியில் ஒரு செயற்குழு உறுப்பினராக இருந்தபோது, கட்சியினுடைய நிதிக்கு உதவி செய்யவேண்டும் என்று கேட்கின்றபோது, அவர் யோசிக்கவே மாட்டார்; கோடிக்கணக்கான தனது சொந்தப் பணத்தைக் கட்சிக்காக வழங்கி உதவி செய்யக்கூடிய ஒரு மாமனிதராக இருந்தார். கட்சியை ஆட்சிக்குக் கொண்டுவரும் நடவடிக்கைகளில் ஒன்றாக கண்டியிலிருந்து கொழும்பிற்குப் பாத யாத்திரை சென்றபோது, அந்த மக்களனைவருக்கும் மதிய உணவையளித்து, பசியைத் தீர்த்துச் சந்தோசப்பட்டவர் அவர். அதேபோன்று, கட்டுநாயக்கவிலிருந்து கொழும்பு வரை வந்தபோதும் அந்தக் கட்சிக்குப் பலவழிகளிலும் நம்பிக்கை யூட்டுபவராக இருந்தார். இப்படி தான் சார்ந்த கட்சிக்காகவும் சார்ந்த சமூகத்திற்காகவும் செயற்பட்ட அவரை, தான் சார்ந்த மாவட்டத்திலிருந்த சிங்கள, தமிழ் மக்களுடைய அன்பைப் பெற்ற ஒரு தலைவராகச் செயற்பட்ட அவரை நினைவு கூர்வதிலே நான் பெருமைப்படுகின்றேன்.

இந்த நேரத்தில் அவருடைய மனைவியார், புத்திரிகள், அவருடைய மூத்த மருமகன் பௌமி அவர்கள், இரண்டாவது மருமகன் ஹம்ஜட் அவர்கள், மூன்றாவது மருமகன் அனஸ் ஆகியோருக்கும் மற்றும் அவருடைய குடும்பத்தவருக்கும் எனது ஆழ்ந்த அனுதாபத்தைத் தெரிவிப்பதுடன், அவரது ஆத்ம சாந்திக்காகப் பிரார்த்திக்கின்றேன்.

இரண்டாவதாக எங்களுடைய முன்னாள் அமைச்சர் ரேணுகா ஹேரத் அவர்களை நினைவுகூர்கின்றேன்.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! The Hon. Speaker will now take the Chair.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වියෙන්, කථානායකතුමා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. SPEAKER *took the Chair.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, please continue with your speech.

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(மாண்புமிகு அப்துல்லா மஹரூப்)
(The Hon. Abdullah Mahrooff)

அன்று முன்னாள் அமைச்சர் ரேணுகா ஹேரத் அவர்கள் என்னுடைய கோரிக்கைக்கிணங்கத் திருகோணமலை மாவட்டத்திற்கு வருகைதந்தபோது, அவர் மூதூருடைய வைத்தியசாலையையும் கிண்ணியாவினுடைய வைத்திய சாலையையும் Base Hospitals - தள வைத்தியசாலைகளாகத் தரமுயர்த்தியது மட்டுமல்ல, இரண்டு மருத்துவ மனைகளுக்கும் நிரந்தரக் கட்டிடங்களையும் தந்துதவினார். அதேபோன்று, திருகோணமலை நகரத்திலேயிருக்கின்ற ஆஸ்பத்திரியை General Hospital - பொது வைத்தியசாலையாகத் தரமுயர்த்தித் தந்தார். அமைச்சர் ரேணுகா ஹேரத் அவர்கள் எப்பொழுதும் என்னைச் செல்லமாகச் 'சின்னா' என்றழைப்பார். அவருடைய பல உதவிகளை நாங்கள் பெற்றிருக்கின்றோம். அந்த வகையில், நாங்கள் தொடர்ச்சியாக அவருடைய பணிகளை இன்முகத்தோடு அனுபவித்தவர்கள் என்ற வகையிலே, அவரது மறைவையிட்டு குடும்பத்தாருக்கும் நுவரெலியா மாவட்ட மக்களுக்கும் எனது ஆழ்ந்த அனுதாபத்தைத் தெரிவித்துக் கொள்கின்றேன்.

அதேபோன்று இங்கு மல்லிகா ரத்வத்த அவர்களது மறைவு தொடர்பாகவும் நாங்கள் நினைவுகூருகின்றோம். அவரைப் பொறுத்தவரையில் ஒரு பெரிய குடும்பத்தோடு, அதாவது சிறிமாவோ பண்டாரநாயக்க குடும்பத்தோடு தொடர்புடைய ஒருவர். ரத்வத்த அவர்களுடைய குடும்பத்திலேயிருந்து வந்த பலரது பணிகள் இந்த நாட்டினுடைய சேவையிலே முதன்மை பெற்றிருக்கின்றன. அந்தவகையிலே, அவர் இருந்த காலப்

பகுதியில் நாங்கள் இச்சபையில் இல்லாவிட்டாலும், அந்தக் குடும்பத்தினுடைய செயற்பாடுகளை நாங்கள் அறிந்திருக் கின்றோம். எனவே, அவருடைய குடும்பத்தாருக்கும் அவர் சார்ந்த மக்களுக்கும் எனது ஆழ்ந்த அனுதாபத்தைத் தெரிவித்து விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා. 1.53]

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

ගරු කථානායකතුමනි, පරලෝ සැපත් හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීතුමියක වන මල්ලිකා රත්වත්තේ මැතිනිය පිළිබඳව වචනයක් කථා කරන්න ලැබීම ගැන මා සතුටු වෙනවා. එතුමිය වසර 86ක් ආයු වළඳා 2017 මැයි මස 19වැනි දින පරලෝ සැපත් වුණා. එතුමියට, කමල් සේනක රත්වත්තේ, හේෂානි අරම්පත්ත යන දරුවන් දෙදෙනා සහ ලේලියක් සහ බෑනනුවන් කෙනෙකු සිටිනවා.

එතුමිය ක්ලිෆර්ඩ් රත්වත්තේ මැතිතුමාගේ භාර්යාව හැටියට දේශපාලනයට ආවා. ඒ පරම්පරාවටම දේශපාලන උරුමයක් තිබුණා. නන්ද එල්ලාවල මැතිතුමාගේ ලොකු තාත්තාගේ දියණිය වූ එතුමියගේ ඒ පරම්පරාවත්, රත්වත්තේ පරම්පරාවත් එකතු වීම තුළ බලංගොඩට පමණක් නොවෙයි, රත්නපුර දිස්ත්‍රික්කයටම ලොකු සේවයක් සිද්ධ වුණා. රත්වත්තේ පරම්පරාවත්, එල්ලාවල පරම්පරාවත් රත්නපුරයේ ජනතාවගේ හදවත් තුළ සෑම දාම ජීවත් වෙනවා. එතුමිය දැනට අවුරුදු ගණනාවකට කලින් පාර්ලිමේන්තුව නියෝජනය කළත්, අදටත් ඒ ගම්වල මිනිස්සු එතුමිය ගැන කථා කරනවා.

එතුමිය වලව් පැලැන්තියෙන් ආවාය කියලා, ඒක තමන්ගේ හිස මත තියා ගන්නේ නැතුව, ගමේ අහිංසක ජනතාවගේ ඕනෑ-එපාකම් ඉෂ්ට කරන්න වලව්වෙන් එළියට බැහැලා ගමේ පැල්පතට ගිහිල්ලා ඒ ජනතාවගේ දුක සැප සොයා බලපු නිසා තමයි දෙවතාවක් ඒ ආසනය ජයග්‍රහණය කරන්න හැකියාව ලැබුණේ. ඒ ආසනය, සිංහල බෞද්ධ වාගේම ද්‍රවිඩ, මුස්ලිම් කියන සෑම ජන කොටසක්ම ජීවත් වෙන ආසනයක්. ඒ හැමෝගේම හිත දිනා ගන්න එතුමියට පුළුවන්කම ලැබුණා. එතුමියට ඒ ආභාසය තිබුණා. එතුමිය තමන්ගේ තනතුර ගැන බලලා කටයුතු කළේ නැහැ. එහෙම කටයුතු කරපු නැති නිසා තමයි, දෙවතාවක් පාර්ලිමේන්තුවට එන්න එතුමියට පුළුවන්කම ලැබුණේ. එතුමිය එදා හදපු රෝහල, එතුමිය හදපු ඩිපෝව තමයි අදටත් ප්‍රයෝජනයට ගන්නේ. එතුමිය ආරම්භ කළ ඒ වෝල්ටයිල් කර්මාන්තශාලාව අද වැහිලා තිබුණත්, ඒ කාලයේ ඒ ප්‍රදේශයේ ජනතාවට එමඟින් විශාල සේවයක් සිද්ධ වුණා. එතුමිය රත්වත්තේ පරම්පරාවට සම්බන්ධ වුණත්, අගමැතිතුමියට ඥාතිකම තිබුණත් ඒවා පාවිච්චි කරන්න යන්නේ නැතුව, ගමේ ජනතාව සමඟ හොඳ සුහදශීලීව හිටපු නිසා තමයි ගමේ අය අදටත් එතුමිය මතක් කරන්නේ.

අපි දන්නවා, යමෙකුට තනතුර තිබෙන තෙක් විතරයි අගය කරන්නේ. එතුමිය පාර්ලිමේන්තුවෙන් නික්මිලා අවුරුදු 30කට විතර පස්සේ තමයි -තනතුර නැති වෙලාවේ තමයි- එතුමියගේ දේහයට අවසන් ගෞරව දක්වන්න දහස් ගණන් සෙනහ ආවේ.

එතුමියගේ පුත්‍ර රත්නය අපේ සමන් දේවාලයේ බස්නායක නිලමේතුමායි. එතුමාත් එහෙමයි. අම්මාගේ, තාත්තාගේ ආභාසයට අනුව, ඒ තනතුර හරහා ඒ ප්‍රදේශයේ ජනතාවට කරන්න තිබෙන කාර්යභාරය ඉෂ්ට කරමින් සෑම දාම කටයුතු කරනවා. එතුමා සමන් දේවාලයේ පෙරහැර තිබෙන කාලයට විතරක් නොවෙයි, හැම දාම මිනිසුන්ට යමක් කරන්න තිබෙනවා නම් ඒ දේ ඉෂ්ට කරන්න කටයුතු කළා. දේවාලයට නින්දගම් රාශියක් තිබෙනවා. ගොඩක් අය, තමන් ඒ තනතුරේ ඉන්න කොට ඒවා තමන්ගේ බූදලය හැටියට තමයි පරිපාලනය කරන්නේ. අහිංසක මිනිහෙක් යමක් කරන්න හැදුවොත් ඒකට අකුල් හෙළන එක ගොඩක් අය කළා. නමුත් මෙතුමා එහෙම නැහැ. ඒ කරුණු හරියට හොයලා බලලා, ඒ දේපළ භුක්ති විඳින මිනිසුන්ට යමක් කර ගන්න ඕනෑ වුණාම ඒකට ඉඩ දීලා කටයුතු කරලා තිබෙනවා.

අම්මාගේ, තාත්තාගේ ආශීර්වාදයත් එක්ක අපේ බස්නායක නිලමේතුමා ඒ සේවය ඉදිරියට කර ගෙන ඇවිල්ලා තිබෙනවා. ඒ සඳහා අපි එතුමාට සුබ පතනවා. තමන්ගේ දෙමව්පියන් ගිය මාර්ගයේ යමින් රුවන්පුරයේ ජනතාවට තවත් ඉදිරියට ඒ සේවය කරන්න එතුමාට ශක්තිය ලැබෙන්න කියා මා ප්‍රාර්ථනය කරනවා.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුවේ දෙවතාවක් සිටි, ඒ වාගේම, රටට වැඩදායි වැඩ කොටසක් කරපු මල්ලිකා එල්ලාවල රත්වත්තේ මැතිනියට මා නිවන් සුව ප්‍රාර්ථනය කරනවා.

ගරු කථානායකතුමනි, ඊළඟට රේණුකා හේරත් මැතිනිය ගැනත් වචනයක් කියන්න ඕනෑ. එතුමිය මැතිවරණවලට තරග කළේ නුවරඑළිය දිස්ත්‍රික්කයෙන්. මට මතකයි, මම ඉස්කෝලේ යන කාලයේ රත්නපුරයේ ඔසු හල විවෘත කරන්න එතුමිය ආවා. ඒ, එතුමිය සෞඛ්‍ය හා වනිතා කටයුතු ඇමතිවරිය වශයෙන් සිටි කාලයේදී. එතුමියත් මේ රටට විශාල වැඩ කොටසක් ඉෂ්ට සිද්ධ කරපු නායිකාවක්. එතුමියගේ ගම් ප්‍රදේශයට පමණක් නොවෙයි, රටේ හැම තැනකටම එතුමියට කරන්න පුළුවන් ආකාරයෙන් එතුමිය ඒ කටයුතු ඉෂ්ට සිද්ධ කරලා තිබෙනවා. මේ අවස්ථාවේදී මා එතුමියටත් නිවන් සුව ප්‍රාර්ථනය කරමින්, එතුමියගේ පවුල් අයට මගේ ශෝකය පළ කරනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම, අප සමඟත් දේශපාලන කටයුතු කළ අබ්දුල් කාදර් මැතිතුමා බොහොම නිහතමානී පුද්ගලයකු හැටියට සඳහන් කරන්න පුළුවන්. එතුමා එක්සත් ජාතික පක්ෂයෙන් දේශපාලනය ආරම්භ කළත්, යුද්ධය පැවැති පසුගිය කාලයේදී මහින්ද රාජපක්ෂ මැතිතුමාට ශක්තියක් දෙන්න අපේ පැත්තට ඇවිල්ලා ඒ යුද්ධය අවසන් කරන්න එතුමාගේ සහයෝගය දුන්නා වාගේම, මේ පාර්ලිමේන්තුවේ සිද්ධවන හරි දේට හරියි කියන්නත්, වැරදි දේට වැරදියි කියන්නත් නිර්භයව කටයුතු කරපු කෙනෙක්. ඒ නිසා එතුමා නැති වුණු එක රටටත්, අප සියලුදෙනාටමත් විශාල පාඩුවක්. එතුමාගේ පවුලේ අයටත් මාගේ ශෝකය පළ කරමින්, නැවත වරක් අපේ මල්ලිකා එල්ලාවල රත්වත්තේ මැතිනියගේ පවුලේ සියලුදෙනාටම මගේ පෞද්ගලික ශෝකය පළ කරමින් මා නිහඬවනවා. ස්තුතියි.

[2.00p.m.]

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)

Hon. Speaker, when I entered Parliament in 1977, late (Hon.) Mrs. Renuka Herath also entered Parliament. I had come to know her very well during that period. She was a very friendly person and a person who interacted with everybody. She was a person who held very liberal views, very progressive views. She was for the unity of all people in this country and that all of us should live as

[ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා]

equal citizens in a united country. She gave expressions to such views very clearly and very forthrightly. She was a Deputy Minister, subsequently a Minister, and during the period she held office as both Deputy Minister and Minister, she served the people and the country well. They all appreciated her services. She was an active member of the United National Party. So, I join my Friends in this House in expressing our condolences at the passing away of a very active and valuable Member of Parliament.

I also join my Friends, Sir, in expressing our condolences to the families of the late Hon. A. R. M. Abdul Cader and the Hon. (Mrs.) Mallika Ratwatte who were also Members of Parliament, who rendered a distinguished service during their term of office.

Thank you, Sir.

[අ.භා. 2.02]

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)

ගරු කථානායකතුමනි, අද පාර්ලිමේන්තු දවස වෙන් වෙලා තිබෙන්නේ පාර්ලිමේන්තු ඉතිහාසයේ මේ රටට අමරණීය සේවයක් කළ මන්ත්‍රීවරියන් දෙපළක් ගැන සහ එවැනිම සේවයක් කළ මන්ත්‍රීතුමකු ගැන කතා කරන්නයි. විශේෂයෙන්ම රේණුකා හේරත් මහත්මිය නුවරඑළිය දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමිය හැටියට 1977 අවුරුද්දේ මුලින්ම පාර්ලිමේන්තුවට ඇවිල්ලා 1978 වන විට දිස්ත්‍රික් අමාත්‍යවරියක හැටියට ද පත්වීමක් ලැබුවා. අවුරුදු 25ක කාලයක් දේශපාලනයේ රැදෙමින් මේ රටේ අමතක නොවන සංවර්ධන ක්‍රියාවලි ගණනාවකට දායක වෙලා එතුමිය පසු ගිය අවුරුද්දේ -2017 අවුරුද්දේ- අවසන් ගමන් ගියා. අපට මතකයි එතුමිය බොහොම දක්ෂ, චතුර කථිකාචියක වූ බව. ඒ වාගේම එතුමිය දක්ෂ දේශපාලනඥවරියක් ද වුණා. එතුමිය එක්සත් ජාතික පක්ෂයට බෙහෙවින් ආදරය කරමින් එම පක්ෂය ඉදිරියට ගෙන යෑම සඳහා විශාල සේවයක් කළ කෙනෙකු වූ බව අපට මතකයි.

ගරු කථානායකතුමනි, එතුමිය සෞඛ්‍ය අමාත්‍යතුමිය හැටියට පත් වුණේ 1989 අවුරුද්දේයි. සෞඛ්‍ය අමාත්‍යාංශය කියන්නේ, බොහොම භාරදූර, කටයුතු කරන්න ඉතාම අමාරු අමාත්‍යාංශයක්. සෞඛ්‍ය අමාත්‍යාංශය පාලනය කරනවා කියන එක ඉතාම අමාරු කාර්යයක්. හැබැයි ඒ කාලය තුළදී එහි වෘත්තීය සමිතිවල සිත් දිනාගෙන සෞඛ්‍ය සේවය දියුණු කරන්න සෞඛ්‍ය ඇමතිවරිය හැටියට එතුමිය විශාල කාර්ය භාරයක් කළා. මා 1991 අවුරුද්දේ මැදිරිගිරිය ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා හැටියට කටයුතු කරන කොට මට මතකයි එතුමිය අපේ ආසනය තුළට ඇවිත් අපේ ආසනය තුළ ග්‍රාමීය සෞඛ්‍ය මධ්‍යස්ථාන ඇති කිරීම සඳහා කටයුතු කරපු හැටි. එතුමිය අපේ ආසනය තුළ සෞඛ්‍ය මධ්‍යස්ථාන රාශියක් ඇති කළා. ඒවායේ ප්‍රතිලාභ ඒ ප්‍රදේශයේ ජනතාව අද ලබනවා.

ගරු කථානායකතුමනි, එතුමිය දේශපාලනයට ආවේ බොහොම උගත් කාන්තාවක හැටියටයි. ගුරුවරියක හැටියට කටයුතු කරමින් සිටින විට තමයි එතුමිය දේශපාලනයට ආවේ. ඒ දැනුම, ඒ උගත්කම, ඒ අද්දැකීම් දේශපාලනයට ඇවිත් සේවය කරද්දීත් එතුමිය උපයෝගි කර ගත්තා. විශේෂයෙන්ම සෞඛ්‍ය ඇමතිවරිය හැටියට එතුමිය කළ සේවය ගැන අපේ ගරු මන්ත්‍රීතුමන්ලා අදහස් දැක්වුවා. සෞඛ්‍ය ඇමතිවරිය හැටියට සිටි කාල පරිච්ඡේදය තුළ එතුමිය හැම දිස්ත්‍රික්කයකම, හැම ආසනයකම සෞඛ්‍ය ක්ෂේත්‍රය වෙනුවෙන් කරපු සේවාවන් ගැන බොහොම ගෞරවනීය විධියට එතුමන්ලා හැම කෙනෙක්ම කථා කළා. මමත් කියන්න ඕනෑ එතුමිය ඒ වාගේ බොහොම ගෞරවනීය සේවයක් කරපු කාන්තාවක් වූ බව. එතුමිය දේශපාලන ක්ෂේත්‍රය තුළ බොහොම චතුර කථිකත්වයක් තිබුණු කාන්තාවක් වුණා. අවුරුදු 25කට ආසන්න කාලයක් පාර්ලිමේන්තුව තුළ රැදෙමින් කටයුතු කරලා තමයි එතුමිය පසු ගිය අවුරුද්දේ අවසන් ගමන් ගියේ. එතුමිය ඒ කාලය තුළ අපේ පක්ෂයේ විවිධ තනතුරු දැරුවා; වැඩි කාලයක් පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලය නියෝජනය කළා. පක්ෂයේ ජාතික තලයේ දේශපාලනය නියෝජනය කරමින්, ප්‍රධාන තනතුරු දරමින්, හොඳ නමක් තියාගෙන කටයුතු කරමින්, නුවරඑළිය දිස්ත්‍රික්කයට, විශේෂයෙන්ම වලපනේ ආසනයට අමරණීය සේවයක් ඉෂ්ට කරමින් සිටි රේණුකා හේරත් මහත්මිය පසු ගිය වසරේ අවසන් ගමන් ගියා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට මම එතුමියගේ අභාවය වෙනුවෙන් මාගේ ශෝකය එතුමියගේ දයාබර ස්වාමි පුරුෂයා වන රණවීර මැතිතුමාට, ඒ වාගේම එතුමියගේ එකම දියණියට මේ අවස්ථාවේදී පුද කරනවා.

ගරු කථානායකතුමනි, අපි අද කතා කරන්න ඕනෑ ගරු අබ්දුල් කාදර් මැතිතුමා ගැනත්. අපට මතකයි එතුමා එක්සත් ජාතික පක්ෂයෙන් දේශපාලනය ආරම්භ කරලා, 1989 අවුරුද්දේ පළමුව පාර්ලිමේන්තුවට පැමිණ රණසිංහ ප්‍රේමදාස ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේ තම පාර්ලිමේන්තු දේශපාලනය ආරම්භ කළ බව. එතුමා විශේෂයෙන්ම මුස්ලිම් නායකයකු හැටියට ලොකු සේවයක් කරපු කෙනෙක්; බොහොම ප්‍රිය මනාප පුද්ගලයෙක්; බොහොම විහිළුවෙන් තහළුවෙන් කටයුතු කරපු කෙනෙක්.

ඕනෑම කෙනෙකු එතුමා සමඟ එක දවසක් කථා කළා නම්, තව දවසක් කථා කරන්න මැළි වන්නේ නැහැ. පාර්ලිමේන්තුව තුළදීත්, ඉන් පිටතදීත් බොහොම ප්‍රියමනාප ආකාරයට හැසිරෙමින්, බොහොම හොඳ ජන නායකයෙකු හැටියට කටයුතු කරලා එතුමා පසුගිය කාලයේ අප අතරින් වෙන් වුණා. ඇමතිවරයෙකු හැටියට; මන්ත්‍රීවරයෙකු හැටියට පාර්ලිමේන්තුව තුළදීත්, ඉන් පිටතදීත් මේ රටට, මේ සමාජයට කරපු සේවාව වෙනුවෙන් ගරු අබ්දුල් කාදර් මැතිතුමා අදහන ලද ඉස්ලාම් ධර්මය අනුව එතුමා බලාපොරොත්තු වුණු දේ ලැබේවායි ප්‍රාර්ථනය කරමින්, එතුමාගේ පවුලේ සියලුදෙනාටම මන්ත්‍රීවරයෙකු හැටියට මගේ ශෝකය මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

රත්නපුරය දිස්ත්‍රික්කය නියෝජනය කරමින් කටයුතු කළ ගරු මල්ලිකා රත්වත්තේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමිය ගැනත් අද ඉතා ගෞරවයෙන් කථා වුණා. එතුමිය 1966 අවුරුද්දේ මුලින්ම පාර්ලිමේන්තුවට පිවිස, ඊට පස්සේ 1970දී නැවතත් පාර්ලිමේන්තුවට පිවිස 1977 අවුරුද්ද දක්වා කාලය තුළ අවුරුදු 10කට වැඩි කාලයක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක හැටියට කටයුතු කරපු කෙනෙක්. ලංකාවේ දේශපාලන ඉතිහාසයේ අමතක කරන්න බැරි දේශපාලන පවුලක සාමාජිකාවක් හැටියට තමයි මල්ලිකා රත්වත්තේ මන්ත්‍රීතුමිය දේශපාලනයට ඇවිල්ලා තිබෙන්නේ. එතුමිය, හිටපු අග්‍රාමාත්‍යතුමියක් වන ගරු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට ඥාති සම්බන්ධකම් පවත්වමින් දේශපාලනය ආරම්භ කරපු මන්ත්‍රීතුමියක්. එතුමිය ඒ කාලය තුළදී ඒ ප්‍රදේශයට කළ සේවාවන් ගැන රත්නපුරය දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමන්ලා බොහොම ගෞරවනීය විධියට අද සිහිපත් කළා. එතුමිය වෙනුවෙනුත් ශෝකය ප්‍රකාශ

කරන මේ අවස්ථාවේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට මම අද ඒ පවුලේ සියලුදෙනාටම මගේ ශෝකය ප්‍රකාශ කරනවා.

අද අපි විශේෂයෙන්ම ශෝකය ප්‍රකාශ කරපු ගරු රේණුකා හේරත් හිටපු ඇමතිතුමියටත්, ඒ වාගේම ගරු මල්ලිකා රත්වත්තේ හිටපු මන්ත්‍රීතුමියටත් අජරාමර නිවන් සුව අත්වේවා! කියාත්, ඒ වාගේම ගරු අබ්දුල් කාදර් හිටපු ඇමතිතුමා අදහන ලද ආගම අනුව එතුමා බලාපොරොත්තු වන දේ ලැබේවා! කියාත් මේ අවස්ථාවේදී මම ප්‍රාර්ථනය කරනවා.

අද ඉදිරිපත් කරන ලද ශෝක ප්‍රකාශ යෝජනා සම්බන්ධයෙන් කථා කරන්න මට අවස්ථාව ලබා දීම ගැන ගරු කථානායකතුමාට ස්තුතිවන්ත වෙමින් මම නිහඬවනවා.

[අ.භා. 2.10]

ගරු රවීන්ද්‍ර සමරවීර මහතා (කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමා)

(மாண்புமிகு ரவீந்திர சமரவீர - தொழில் மற்றும் தொழிற்சங்க உறவுகள் அமைச்சர்)

(The Hon. Ravindra Samaraweera - Minister of Labour and Trade Union Relations)

ගරු කථානායකතුමනි, 1977 වර්ෂයේ අපේ පක්ෂයෙන් දේශපාලනයට පිවිසිලා මන්ත්‍රීවරියක හැටියට, අමාත්‍යවරියක හැටියට කටයුතු කළ රේණුකා හේරත් මැතිනියගේ අභාවය පිළිබඳව අද මේ ගරු සභාවේ ශෝකය ප්‍රකාශ කරන අවස්ථාවේ එයට සහභාගි වන්නට මටත් අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

මට මතකයි, 1977ට කලින්, 1975, 1976දී විතර දිවංගත ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ කාලයේ තමයි එතුමිය වලපනේ ආසනය නියෝජනය කරමින් මුලින්ම දේශපාලනයට පිවිසුණේ. ඒ කාලයේ එතුමියගේ ඥාතිවරයෙක් තමයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන් වලපනේ ආසනය නියෝජනය කළේ. ඒ තමයි මේ ගරු සභාවේ හිටපු ටී.බී.එම්. හේරත් මැතිතුමා. ඒ කාලයේ මම දේශපාලනයට පිවිසිලා හිටියේ නැහැ. මට අද වාගේ මතකයි, 1975 හෝ 1976 වර්ෂයේ වලපනේ ආසනය සඳහා සංවිධායකවරයෙක් තෝරා ගන්නා වෙලාවේ දිවංගත ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, එදා හිටපු අපේ නායකතුමා නුවරඑළියට පැමිණිලා නුවරඑළිය නගරයේ රැස්වීමක් තිබ්බා. ඒ රැස්වීමේදී රේණුකා හේරත් මැතිනියට දේශපාලන වශයෙන් පළමුවැනි වතාවට අවස්ථාවක් දුන්නා, විශාල ජනකායක් හිටපු ඒ රැස්වීම ආමන්ත්‍රණය කරන්න. එතුමියගේ පළමුවැනි - කුළුදුල්- කථාව මම අහගෙන හිටියා. කථාව ආරම්භ කළ වෙලාවේ එතුමියට දේශපාලන වශයෙන් කථාව කරන්නට ගැලපීමක් තිබුණේ නැහැ. එතුමියට වැරැදිලා කථාව නතර වුණා. එතුමියත් සමග තව කිහිප දෙනෙක් එදා ඒ ආසනය සඳහා නාම යෝජනා අපේක්ෂාවෙන් හිටියා. ඒ උදවිය ඒක අවස්ථාවක් කරගෙන ඒ වෙලාවේ එතුමියට විරුද්ධව යම් යම් කටයුතු කළා; කෑ කෝ ගැහුවා. ජේ.ආර්. ජයවර්ධන මහත්මයා එතුමියට දෙවැනි වතාවත් ලබා දුන්නා. දෙවැනි වතාවේත් එතුමියට කථාව කරගන්න බැරි වුණා. දෙවැනි වතාවේත් අනෙක් උදවියගේ විරෝධතාව දැකලා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා නැඟිටලා මයික්‍රෆෝනය ළඟට ගිහින් කිව්වා, "මේ අනෙක් උදවියගේ විරෝධතාවෙන් මට පෙනෙන්නේ සුදුසුම කෙනා මෙතුමිය තමයි" කියලා. එහෙම කියලා එදා එතුමියට ඒ අවස්ථාව ලබා දුන්නා.

පසුව එතුමිය වලපනේ ආසනයේ මන්ත්‍රීවරිය හැටියට පත්වෙලා, ඊටත් පසුව සෞඛ්‍ය අමාත්‍යවරිය හැටියට මේ රටට විශාල සේවයක් කළ බව අපි දන්නවා. 1987 අවුරුද්දේ අතුරු මැතිවරණයේදී මම පළමුවෙන්ම පාර්ලිමේන්තු මැතිවරණයකට ඉදිරිපත් වුණු වෙලාවේ එතුමිය මගේ ආසනයට පැමිණිලා ඒ මැතිවරණ කටයුතුවලට සම්බන්ධ වුණා. ඒ දවස්වල සෞඛ්‍ය අමාත්‍යාංශය තුළින් මගේ ආසනයේ යම් කිසි වැඩ කොටසක් කරන්න එතුමියගේ ආශිර්වාදයත් මට ලැබුණා. ඒ වාගේම එතුමිය තුළ එක විශේෂ ලක්ෂණයක් තිබුණා. ආණ්ඩු පක්ෂයේ හෝ විරුද්ධ පක්ෂයේ සිටියත් ඉතාම ප්‍රබලව මේ පාර්ලිමේන්තුව තුළ හඬ නඟලා එතුමිය නියෝජනය කළ පක්ෂය වෙනුවෙන් සුවිශේෂී වූ වැඩ කොටසක් කළා. එතුමිය විරුද්ධ පක්ෂයේ මන්ත්‍රීවරියක් හැටියට සිටි වානුවක කොළඹ නගරයේ පැවති අපේ උද්ඝෝෂණයකදී එදා රාජ්‍ය බලයේ හිටපු උදවියගේ ප්‍රහාරයට පවා ලක් වුණා. කාන්තාවක් වුණත් ඒ උදවියගේ ප්‍රහාරයට ලක්වෙලා එතුමියට තුවාල වුණා. මමත් ගියා එතුමිය බලන්න. එතුමිය ඒ කිසිම දෙයකින් නොසැලුණු චරිතයක්. 1977 ජේ.ආර්. ජයවර්ධන රජය යටතේ වලපනේ වාගේ දුෂ්කර ආසනයක් නියෝජනය කරමින් දේශපාලන වශයෙන් අපේ පක්ෂයට විශාල සේවාවක් කරන්නට එතුමියට අවස්ථාව ලැබුණා. එය මේ වෙලාවේ සිහිපත් කිරීම අප සියලුදෙනාගේම යුතුකමක්.

ගරු කථානායකතුමනි, ඒ වාගේම, මහනුවර දිස්ත්‍රික්කයේ ගම්පොළ ආසනය නියෝජනය කළ ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මැතිතුමා අපේ එක්සත් ජාතික පක්ෂයෙන් තමයි දේශපාලනය ආරම්භ කළේ. එතුමා තුළ කිසිම ජාති භේදයක් තිබුණේ නැහැ. එතුමා අවසානයේ කාලයේ පැවති රජයට සම්බන්ධ වුණත්, පක්ෂ භේදයෙන් තොරව සියලුදෙනාටම සැලකූ මහත්මයෙක්. මුස්ලිම් ජාතිකයෙක් වුණත්, තමන්ගේ පෞද්ගලික ධනය පවා වෙහෙර විහාරස්ථානවලට පරිත්‍යාග කරමින් සුවිශේෂ වූ වැඩ කොටසක් ඉටු කළ මන්ත්‍රීවරයෙක්, අමාත්‍යවරයෙක් හැටියට අබ්දුල් කාදර් මැතිතුමා අපට මේ අවස්ථාවේ සිහිපත් කරන්නට පුළුවන්.

ගරු කථානායකතුමනි, ඒ වාගේම, අද මේ සභාවේ ශෝක ප්‍රකාශ යෝජනාවක් ඉදිරිපත් කරන රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කළ මල්ලිකා රත්වත්තේ මැතිනිය පිළිබඳවත් යමක් කිව යුතුයි. එතුමිය ගැන මා දැන නොසිටියත්, යම් කාලයක මම ක්ලිෆර්ඩ් රත්වත්තේ මැතිතුමා ඇසුරු කළා. ගුරුතලාව ශාන්ත තෝමස් විද්‍යාලයේ ආදි ශිෂ්‍යයකු හැටියට එතුමා මට නිතර මුණ ගැසී තිබෙනවා. කාලයක් මම එතුමාත් සමඟ බොහොම සුහදව කටයුතු කළා. ඒ නිසා, මේ වෙලාවේ මල්ලිකා රත්වත්තේ මැතිනිය ගැනත් සිහිපත් කිරීම මගේ යුතුකමක්.

අබ්දුල් කාදර් මන්ත්‍රීතුමාත්, මේ මන්ත්‍රීවරියන් දෙපළත් වෙනුවෙන් මේ අවස්ථාවේදී අපේ ශෝකය ප්‍රකාශ කරන අතර, ඒ පවුල්වල උදවියට අපගේ ශෝකය පිළිගන්වන ලෙසත් ගරු කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා.

විශේෂයෙන්, රේණුකා හේරත් මැතිනිය ගෙන ගිය දේශපාලන වැඩ පිළිවෙළ, එතුමියගේ ස්වාමිපුරුෂයා වන විමල් රණවීර මහතා මධ්‍යම පළාත් සභාවේ මන්ත්‍රීවරයකු හැටියට කටයුතු කරමින් කර ගෙන යන බව අප දන්නවා. මවගේ අඩි පාරේ ගමන් කරන එතුමියගේ දියණිය වලපනේ ආසනය නියෝජනය කරමින් අපේ පක්ෂයේ සංවිධායකවරිය හැටියට කටයුතු කරනවා. එතුමියටත් ඒ කටයුතු සාර්ථකව කර ගැනීමට අවශ්‍ය ශක්තිය ලැබේවා කියාත් මා ප්‍රාර්ථනා කරනවා.

අද දින ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් වූ අයගේ පවුල් වෙත මාගේ ශෝකය ප්‍රකාශ කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

[අ.භා.2.19]

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු කථානායකතුමනි, අද දින මෙම ශෝක ප්‍රකාශ යෝජනා සම්බන්ධයෙන් කථා කිරීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිය පළ කරනවා. මෙම ශෝක ප්‍රකාශ යෝජනාවල සඳහන් රේණුකා හේරත් මැතිනියත්, අබ්දුල් කාදර් මැතිතුමාත්, මල්ලිකා රත්වත්තේ මැතිනියත් වෙනුවෙන් මගේ ශෝකය පළ කරනවා.

විශේෂයෙන්ම රේණුකා හේරත් මහත්මිය පිළිබඳව මා යමක් මතක් කරන්නට ඕනෑ. තරුණයන් වශයෙන් දේශපාලනයට පැමිණි කාලයේ සිට අපි එතුමිය දන්නවා. ඒ වාගේම, පාසල් යන කාලයේ සිට එතුමිය ගැන අප අසා තිබුණා. එතුමිය ගුරුවරියක් වශයෙන් තමන්ගේ රැකියාව ආරම්භ කළා. ඊට පසුව දේශපාලනයේදී දිසා ඇමතිවරියක වශයෙනුත්, සෞඛ්‍ය හා වනිතා කටයුතු ඇමතිවරිය වශයෙනුත් ආදී වශයෙන් විවිධ තනතුරු දරමින් දීර්ඝ කාලයක් දේශපාලනයේ රැඳී සිටි ශ්‍රේෂ්ඨ කාන්තාවක්. එතුමිය ආශ්‍රය කරන්න, කටයුතු කරන්න අපට පුළුවන්කම ලැබුණා. එතුමිය ඉතාම කාරුණිකයි. එතුමිය කිව යුතු දේ මුහුණට කියනවා වාගේම, විහිළු තහළුවෙන් කටයුතු කළ කාන්තාවක්.

ගරු කථානායකතුමනි, යොවුන් පෙරමුණෙන් අපි දේශපාලනයට ආ කාලයේ ඔබතුමාත් පක්ෂයේ සභාපතිවරයා වශයෙන් අපට උදවු කළා. ඒ අවස්ථාවේ රේණුකා හේරත් මහත්මිය ජ්‍යෙෂ්ඨ දේශපාලනඥවරියක වශයෙන් අපට ඉතාම කාරුණිකව උදවු කළා මට මතකයි.

ඇත්තවශයෙන්ම එතුමිය අපේ පක්ෂයට විශාල සේවයක් කළ කෙනෙක්. හැම දාම එතුමියගේ එකම බලාපොරොත්තුව වුණේ එක්සත් ජාතික පක්ෂය බලයට එන්න ඕනෑය කියන කාරණයයි. සමහර අවස්ථාවලදී පාර්ලිමේන්තුවට එන්න බැරි වුණත්, එතුමිය විවිධ කාන්තා සංවිධාන හරහා ඉතාම කැපවීමෙන් වැඩ කළා. ඒ වාගේම එතුමිය කාලය නොතකා වැඩ කළා. එතුමිය පළාත් සභාවත් නියෝජනය කළා. එතුමිය තුළ තිබුණු මෘදු ගුණාංග නිසා සෑම කෙනෙක්ම එතුමියට ආදරය කළා.

විශේෂයෙන්ම අපේ පක්ෂයේ හිටපු කෘත්‍යාධිකාරී මණ්ඩලය, පාර්ලිමේන්තු මැති-ඇමතිවරු එතුමිය සමඟ බොහොම කැමැත්තෙන්, බොහොම ආදරයෙන් කටයුතු කළා. එතුමිය මරණයට පත් වුණු අවස්ථාවේදීත් ඒ හැමෝම කනගාටුව ප්‍රකාශ කළා. එතුමියගේ අභාවය පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන මේ අවස්ථාවේදී, එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්වරයා වශයෙනුත්, ඒ වාගේම ගුරුවරියක් වූ එතුමියගෙන් ඉගෙන ගත් කෙනෙකු වශයෙනුත් මා එතුමිය පිළිබඳව වචනයක් හෝ කථා කළ යුතු වෙනවා. ඒ වාගේම අපට සතුටු විය හැකි කාරණාවකුත් තිබෙනවා. එතුමියගේ දියණිය අද නීතිඥ වෘත්තියේ නියැලී සිටින අතරම, වලපනේ ආසනයේ එක්සත් ජාතික පක්ෂයේ ප්‍රධාන සංවිධායකවරිය වශයෙනුත් කටයුතු කරමින් රේණුකා හේරත් මැතිතුමිය ගෙන ගිය වැඩ පිළිවෙළ දිගටම ගෙන යාම සඳහා කටයුතු කරනවා. මේ අවස්ථාවේ දී මා රේණුකා හේරත් මහත්මියට නිවන් සුව ප්‍රාර්ථනා කරනවා.

අපේ පක්ෂයේ හිටපු අබ්දුල් කාදර් මැතිතුමාත් මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පක්ෂයට විශාල සේවයක් කළ මහත්මයෙක්. අපි බොහොම තරුණ කාලයේ; ඉස්කෝලෙ යන කාලයේ යොවුන් පෙරමුණුවලට බැඳිලා කටයුතු කරනකොට, එතුමා පක්ෂයේ බොහෝ දේවල්වලට අපට උදව් උපකාර කළා, මට මතකයි. විශේෂයෙන්ම අරමුදල් නැති අවස්ථාවලදී තරුණ පෙරමුණුවලට, ගොඩක් තරුණ තරුණියන්ට; මහනුවර දිස්ත්‍රික්කයෙන් බිහි වුණු තරුණ තරුණියන්ට බොහෝ උදව් උපකාර කළා. එතුමාටත්, මල්ලිකා රත්වත්තේ මහත්මියටත් නිවන් සුව ප්‍රාර්ථනා කරමින්, මට කාලය ලබා දීම පිළිබඳව ගරු කථානායකතුමාට ස්තුතිවන්ත වෙමින්, මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, ගරු වෛද්‍ය රාජිත සේනාරත්න මැතිතුමා.

[අ.භා.2.22]

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු කථානායකතුමනි, ඇත්තටම අද මෙම ශෝක ප්‍රකාශ යෝජනා ඉදිරිපත් වී තිබෙන රේණුකා හේරත් හිටපු ඇමතිතුමියත්, අබ්දුල් කාදර් හිටපු ඇමතිතුමාත්, මල්ලිකා රත්වත්තේ හිටපු මන්ත්‍රීතුමියත් යන තිදෙනාම නොයෙක් අවස්ථාවලදී නොයෙක් ආකාරයෙන් ආශ්‍රය කරන්නත්, එකට එකතු වෙලා නොයෙකුත් වැඩ කටයුතු කරන්නටත් මට ඒ කාලයේ අවස්ථාව ලැබුණා. මා ප්‍රථමයෙන් රේණුකා හේරත් මහත්මිය ගැන කථා කරනවා නම්, 1977 වසරේ දී තමයි මට මුලින්ම ඇය හමු වුණේ. 1977 වසරේ දී එක්සත් ජාතික පක්ෂය ලද විශාල ජයග්‍රහණයත් සමඟ එතුමිය පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් වශයෙන් පත් වෙලා, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, හඟුරන්කෙත ආසනයේ මන්ත්‍රීවරිය වශයෙන් කටයුතු කළා. එදා අපි එතුමියට විරුද්ධව මැතිවරණ ව්‍යාපාරයේ යෙදුණා. මොකද, එදා අපි එස්.බී. දිසානායක හිටපු ඇමතිතුමාගේ වාමාංශික ව්‍යාපාරයේ කටයුතු කළේ. අපි එතුමාටයි වැඩ කළේ. රේණුකා හේරත් මහත්මිය එදා මහ රෝහලේ අධ්‍යක්ෂතුමාගෙන් ඉල්ලීමක් කර තිබුණා, එතුමියට හොඳ දන්ත වෛද්‍යවරයෙක් හඳුන්වා දෙන්න කියලා. ඒ එක්කම එතුමිය කොන්දේසියකුත් දමලා තිබුණා, එක්සත් ජාතික පක්ෂයට හිතවත් කෙනෙක් තෝරා දෙන්න කියලා. නමුත් මගේ දේශපාලන කටයුතු පිළිබඳව දැනගෙනත්, මහ රෝහලේ අධ්‍යක්ෂතුමා මා තෝරාගෙන තිබුණා. එතුමා මට කිව්වා, "රාජිත, පක්ෂය, අරවා මේවා හිතන්නේ නැතුව මෙන්න මේ වැඩ කටයුත්ත කරලා දෙන්න" කියලා. පසුව එතුමියට මාව හඳුන්වා දුන්නා. කාලයක්ම අපි දෙදෙනා කටයුතු කරගෙන ගියා. නමුත් එතුමිය දන්නේ නැහැ, මම එක්සත් ජාතික පක්ෂ රජයට විරුද්ධව දැඩිව ක්‍රියා කරන පුද්ගලයෙක්ය කියලා. එක දවසක් මගේ වාහනයේ තිබුණු "ඇත්ත" පත්තරය ඇතුළු වාමාංශික පුවත්පත් දැකලා එතුමියට පොඩි ප්‍රශ්නාර්ථයක් ආවා. ඒ වෙනකොට අපි බොහොම සම්බන්ධ වෙලා කටයුතු කරමින් සිටියා. එතුමියත්, එතුමියගේ ස්වාමිපුරුෂයා වන රණවීර මැතිතුමාත් දෙදෙනාත් එක්කම සම්බන්ධ වෙලා කටයුතු කරමින්, එතුමියගේ දන්ත වෛද්‍යවරයා විධියට මම දිගටම ක්‍රියා කළා. ඒ වාගේම නොයෙකුත් වෛද්‍යවරුන්ගේ අවශ්‍යතා ඇති වුණාම ඒ කාලයේ එතුමිය මට කියනවා. එතකොට මම එතුමියට විශාල වශයෙන් උදව් කළා. ඊට පසුව 1989 වසරේ දී එතුමිය සෞඛ්‍ය ඇමතිතුමිය ලෙස පත්වුණා. පත්වීම ලැබුණු දවසේම මහ රාත්‍රියේ එතුමිය මට කථා කළා. කථා කරලා කිව්වා, උදව් දෙකක් කරන්න කියලා. පළමුවන එක වශයෙන් එතුමිය මට කිව්වා, එතුමියගේ

උපදේශකවරයා විධියට පත් වෙලා එන්න කියලා. මම කිව්වා, "ඒක කොහොමවත් කරන්න බැහැ, මම ඔබතුමියලාගේ ආණ්ඩුවට විරුද්ධව ඉන්නේ, මම කොහොමද ඒක කරන්නේ" කියලා. එතුමිය කිව්වා, "නැහැ, ඒකට ප්‍රශ්නයක් නැහැ, ජනාධිපතිතුමාත් එක්ක කථා කළා, රාජිත එනවා නම් පක්ෂ දේශපාලනය සවස හතරෙන් පසුවත්, උපදේශක තනතුරේ වැඩ උදේ අටයි, සවස හතරයි අතරත් කරන්න කියලා ජනාධිපතිතුමා කිව්වා" කියලා. මම කිව්වා, "මගේ ප්‍රතිපත්තිය අනුව මට ඒක කරන්න බැහැ" කියලා. ඒ වෙලාවේ මට තිබුණු ආරක්ෂාවත් මදි. ජනතා විමුක්ති පෙරමුණේ විශාල තර්ජනවලට මැදිහත් වෙලා සිටි බව එතුමිය දන්නවා. එතුමිය මට නිල නිවසක් දෙන්න කථා කළා. මම ඒකත් ප්‍රතික්ෂේප කළා. නමුත් එතුමිය ඊට පහුවදා උදේම රණවීර මහත්මයා අතේ මට application එක එවා තිබුණා, වෙනත් පක්ෂයක පුද්ගලයෙක් බව දැන දැනත්. මම එතකොට මන්ත්‍රීවරයකුවත් නොවෙයි. නමුත් මම ඒක ප්‍රතික්ෂේප කළා.

මම කිව්වා, "ආණ්ඩුවෙන් උදවු අරගෙන, ආණ්ඩුවට විරුද්ධව ක්‍රියා කරන එක මගේ ආත්ම ගරුත්වයට හොඳ නැහැ. බොහොම ස්තුතියි" කියලා. මම 1989 වර්ෂයේ රැකියාව අතහැරලා එළියට ආවේ විජය කුමාරතුංග මහත්මයා වෙනුවෙන් තරග කිරීමට කොළඹ දිස්ත්‍රික්කයේ නායකත්වය ගන්නයි. එතුමිය කිව්වා, "මගේ රැකියාව නැවත හදලා දෙන්නම්" කියලා. ටික දවසක් ගිහින් මම ඒකත් ප්‍රතික්ෂේප කළා. එතුමිය පක්ෂ භේද බලන්නේ නැතිව ඉතාම ගුණගරුකව ඒ සියලු දේවල් කළා. මම ඒක ප්‍රතික්ෂේප කළත්, එතුමිය මට උදව් කිරීමට සූදානම් වීම මා මේ වෙලාවේ දී අනුස්මරණය කරන්නට ඕනෑ.

1994 වර්ෂයේ දී එතුමියත්, මමත් දෙදෙනාම එක පැත්තේ සිටියේ. මම එක්සත් ජාතික පක්ෂයට බැඳිලා එකට වැඩ කළා. උපදේශක කාරක සභාවේ අපි දෙන්නාම හිටියා. එතුමිය සෞඛ්‍ය හා වනිතා කටයුතු ඇමතිතුමිය වශයෙන් සිටි කාල පරිච්ඡේදයේ දී සියලුම සෞඛ්‍ය වෘත්තීය සමඟ සාකච්ඡා කර වෘත්තීය සමිති අරගල නැතිව සෞඛ්‍ය සේවය ඉදිරියට ගෙන යෑමට එතුමියට පුළුවන් වුණා. එතුමිය සෞඛ්‍ය ඇමති ධුරයට පත් වුණු අවස්ථාවේ මට කිව්වා, "මම දන්නේ නැහැ මාව මේ ධූරයට මොකට පත් කළාද කියලා. මට කිසිම දෙයක් තේරෙන්නේ නැහැ, doctor" කියලා. නමුත් එතුමිය ඉතාම හොඳින් සෞඛ්‍ය අමාත්‍යාංශය මෙහෙයවුවා. එම කාල පරිච්ඡේදයේදී ජාතික සෞඛ්‍ය ප්‍රතිපත්තිය ඇතුළු අනෙකුත් දේ සම්බන්ධව නිවැරදි තීන්දු, තීරණ අරගෙන සෞඛ්‍ය සේවය ඉතා හොඳ තත්ත්වයකට ගෙන ඒමට එතුමියට පුළුවන් වුණා. එතුමිය සියලුදෙනා සමඟ සාකච්ඡා කරමින්, සියලුදෙනා සමඟ සහජීවනයෙන් වැඩ කළා. 1994 වර්ෂයේ පරාජයෙන් පසුව මමත්, එතුමියත් විපක්ෂයේ සිටියදී සෞඛ්‍ය කටයුතු පිළිබඳ උපදේශක කාරක සභාවේ එකට වැඩ කළා. බොහෝ වේලාවට සෞඛ්‍ය වැය ශීර්ෂයේ දී මම විවාදය ආරම්භ කළා, එතුමිය විවාදය අවසන් කළා. මම ඒ කාලයේ පසුපෙළ මන්ත්‍රීවරයකු වශයෙන් පාර්ලිමේන්තුවේ අන්තිම පේළියේ වාඩි වෙලා හිටියේ. හැමදාම මම පාර්ලිමේන්තුවේ කථා කරනකොට එතුමිය මා ළඟ වාඩි වෙලා මාව උනන්දු කරවමින් කටයුතු කළා. එතුමියගේ රැස්වීම්වලට සහභාගී වීමට මම එතුමියගේ ආසනයට ගියා. එහිදි එතුමියත්, මමත් පහරදීම්වලට පවා ලක් වුණා. ඒ කාලයේ අපේ රැස්වීම්වලට පහර දීලා මගේ වාහනත් කුඩු කරලා තිබුණා. එතුමිය 1977 එක්සත් ජාතික පක්ෂ ජයග්‍රහණයත් සමඟ පාර්ලිමේන්තුවට ඇවිත් එදා සිට නොවෙනස්ව වැඩ කටයුතු කරගෙන ගියා. එතුමිය අප අතරින් වෙන්ව යන අවස්ථාව වනතුරුම එක්සත් ජාතික පක්ෂ නායක රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ නායකත්වය වෙනුවෙනුත් නොසැලී දිගටම ක්‍රියා කළා. 1977 දී එක්සත් ජාතික පක්ෂය ලැබූ විශාල ජයග්‍රහණයට පාදක වූ කාන්තාවක් වශයෙනුත්, දීර්ඝ දේශපාලන ඉතිහාසයක් තිබෙන කාන්තාවක් වශයෙනුත්, ඉතාම හොඳින් සෞඛ්‍ය අමාත්‍යාංශය මෙහෙය වූ සෞඛ්‍ය ඇමතිවරියක් වශයෙනුත් මම එතුමියට ඉතා ගරු කරනවා. අද එතුමිගේ දියණිය එම සටන ඉදිරියට ගෙන යනවා. අපි ඒ වෙනුවෙන් ඇයට ශුභාශිංසනය කරනවා. ඒ වගේම රණවීර මැතිතුමා අභිංසක, නිහතමානී ස්වාමි පුරුෂයෙක්. රේණුකා හේරත් මැතිනියගේ අභාවය වෙනුවෙන් එතුමියගේ ස්වාමි පුරුෂයා ඇතුළු පවුලේ සියලු දෙනාට අපගේ ශෝකය පළ කරනවා. එතුමියට නිවන් සැප ලැබේවා!යි මම ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමනි, ඒ.ආර්.එම්. කාදර් මැතිතුමා ගැනත් මා වචන කිහිපයක් කථා කරන්නට බලාපොරොත්තු වෙනවා. ඒ.ආර්.එම්. කාදර් මැතිතුමා එක්සත් ජාතික පක්ෂයට විශාල, කීර්තිමත් සේවයක් කරපු පුද්ගලයෙක්. එතුමාගේ ධනයෙන් කෝටි, ප්‍රකෝටි ගණන් මේ පක්ෂය වෙනුවෙන් වියදම් කළා. අපි දෝෂාභියෝගය වෙනුවෙන් ක්‍රියා කරද්දී, දිවංගත රණසිංහ ප්‍රේමදාස මහත්මයා දෝෂාභියෝගයෙන් ගළවා ගැනීම සඳහා එතුමාගේ මුළු මහත් මූල්‍ය ශක්තියම වැය කළා. මන්ත්‍රීවරුන් කැඳවා සාකච්ඡා කරමින්, භෝජන සංග්‍රහ පවත්වමින් හැකි සියලු ක්‍රමවලින් දෝෂාභියෝගය පරාජය කිරීම සඳහා එතුමා මූලිකත්වය ගත්තා. එදා එතුමා අමාත්‍යවරයකු හැටියට මමත් සමඟ කැබිනට් මණ්ඩලයේ හිටියා. ඒ විතරක් නොවෙයි, පක්ෂයේ මැයි දින සැමරුම් ආදී සියලු දේ වෙනුවෙන් අවශ්‍ය මුදල් ප්‍රමාණය පිළිබඳ විමසා බලා, එතුමා තමයි පළමුවැනි cheque එක ලියා දුන්නේ.

දේශපාලනයට එනකොට එතුමා ධන කුවේරයෙක්; විශාල ධනපතියෙක්. නමුත් තමන්ගේ දේශපාලන ජීවිතයේ අවසාන කාලය වනකොට එතුමාගේ සියලු ව්‍යාපාර කඩාකප්පල් වෙලා, බොහෝ අලාභ හානි සිදු වුණා. දේශපාලනය නිසා එතුමාගේ ධනස්කන්ධයෙන් විශාල කොටසක් නැති වුණා. එතුමා එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් වැඩ කරලා, නොයෙකුත් පහරකෑම්වලට ලක් වෙලා, නඩු-හබවලට මැදිවෙලා, නොයෙකුත් දුක් කම් කටුලුවලට මුහුණ දුන්නා. නමුත් පක්ෂය අත නොහැර, මන්ත්‍රීවරයකු, ඇමතිවරයකු සහ පක්ෂ ක්‍රියාකාරිකයකු විධියට අවසාන මොහොත දක්වාම අපත් සමඟ සිටිමින්, එතුමා මේ රට වෙනුවෙන් කීර්තිමත් සේවාවක් කළාය කියන කාරණය මම මතක් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, මල්ලිකා රත්වත්තේ මැතිනිය මට හොඳටම මතක මේ කාරණය නිසායි. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව පැවැති 1970-74 කාලයේ මම අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලයේ ලේකම් ධුරය දැරුවා. එම කාලයේ අභාවප්‍රාප්ත ගරු මල්ලිකා රත්වත්තේ මැතිනිය විශ්වවිද්‍යාල සනාතන සභාවේ සිටියා. ඒ වාගේම අපේ හිටපු අමාත්‍ය එස්.බී. හේරත් මැතිතුමාත් එම සභාවේ හිටියා. ඒ සනාතන සභාවේදී ශිෂ්‍යයන්ගේ ප්‍රශ්න වෙනුවෙන් එතුමිය ඉතා ක්‍රියාශීලීව මැදිහත් වුණා. ශිෂ්‍යයන් වෙනුවෙන් හැම දාම සනාතන සභාවේ කථා කළේ, ගරු මල්ලිකා රත්වත්තේ මැතිනියයි. ශිෂ්‍යයන්ට ප්‍රශ්න ඇති වූ බොහෝ අවස්ථාවල මම එතුමියත් එක්ක කථා කරන්න ගියාම, එතුමිය බොහොම සාවධානව අහගෙන ඉඳලා, ඒවා ලියාගෙන, අපි ඉදිරිපත් කළ කරුණු ඒ විධියටම ඉතාම හොඳින් ව්‍යක්තව ඉදිරිපත් කරලා, ඔවුන්ගේ ප්‍රශ්නවලදී සාධාරණය ඉෂ්ට කර දුන්නා. එතුමිය සනාතන සභාවේදී ඉතාම කාර්යශූර -ක්‍රියාශීලී- කාන්තාවක් හැටියට ක්‍රියා කළා. ශිෂ්‍ය අයිතිවාසිකම් වෙනුවෙන් එතුමිය හැම විටම ඉදිරිපත් වුණා. ශිෂ්‍යයන්ට සිදුවන අසාධාරණකම් ගැන විස්තර අපි ගිහින් එතුමියට භාර දුන්නාම, ඒවා සනාතන සභාවට දීලා, ශිෂ්‍යයන්ට බොහෝ වරප්‍රසාද ඒ කාලයේදී එතුමිය අරන් දුන්නා. අපි ඒ කාරණය අමතක කරන්න හොඳ නැහැ. එතුමිය මන්ත්‍රී ධුරයේ ඉන්නකොට මගේ ඒ තරම් සම්බන්ධතාවක් තිබුණේ නැහැ. එතුමියට නිවන් සුව ලැබේවායි කියා මා ප්‍රාර්ථනා කරනවා.

[ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා]

ඇත්තටම මෙවැනි ඉතා වැදගත් දේශපාලනඥයන් අප අතරින් වියෝ වීම, දේශපාලන තීරයෙන් ඉවත් වීම මේ රටේ දේශපාලන ක්ෂේත්‍රයට බරපතළ පාඩුවක් බව ප්‍රකාශ කරමින්, ගරු රේණුකා හේරත් මැතිනියටත්, ගරු මල්ලිකා රත්වත්තේ මැතිනියටත් අපේ ආගම අනුව, නිවන් සුව ලැබෙවායි කියා ප්‍රාර්ථනා කරමින්, ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මැතිතුමාටත් එතුමාගේ ආගම අනුව අල්ලාහ් දෙවියන් වහන්සේගේ පිහිට ලැබෙවායි ප්‍රාර්ථනා කරමින්, මගේ කථාව අවසන් කරනවා.

[අ.භා.2.33]

ගරු කේ.කේ. පියදාස මහතා
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa

ගරු කථානායකතුමනි, නුවරඑළිය දිස්ත්‍රික්කය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පිවිසි ගරු ගරු රේණුකා හේරත් මැතිනියගේත්, මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කළ ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මැතිතුමාගේත්, රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කළ ගරු මල්ලිකා රත්වත්තේ මැතිනියගේත් අභාවයන් පිළිබඳව ශෝකය ප්‍රකාශ කරන මේ වෙලාවේ, ඒ අය ගැන කථා කරන්න මට අවස්ථාවක් ලබාදීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

නුවරඑළිය දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට මා මුලින්ම මතක් කරන්න ඕනෑ, මා 1994දී නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් දේශපාලනයට අවතීර්ණ වුණේ නුවරඑළිය දිස්ත්‍රික්කයට නායකත්වය දුන් ගරු රේණුකා හේරත් මැතිනියගේ පූර්ණ ආශීර්වාදය මත බව. එතුමියගේ අවවාද අනුව, ඒ මාර්ගය ඔස්සේ දේශපාලනයට පිවිසිලා තමයි, මට පාර්ලිමේන්තුව දක්වා ගමන් කරන්න පුළුවන්කම ලැබුණේ. නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ කියන්නේ ඉතාම දුෂ්කර ආසනයක්. එතුමිය පසුගිය කාලය තුළ එම ආසනයේ සංවර්ධනය වෙනුවෙන් වැඩකටයුතු රාශියක් කර තිබෙනවා. එතුමිය නුවරඑළිය දිස්ත්‍රික් අමාත්‍යාතුමිය හැටියට පත් වුණු අවස්ථාවේදීත් සංවර්ධන සභා හරහා ග්‍රාමීය මට්ටමින් විශාල වැඩකොටසක් ඉටු කර තිබෙනවා. ඒ තුළින් ග්‍රාමීය මං මාවත් වැඩිදියුණු වුණා; විදුලිය නොමැති ග්‍රාමීය ප්‍රදේශ විශාල සංඛ්‍යාවකට විදුලිය ලබා දුන්නා. එතුමිය සෞඛ්‍ය අමාත්‍යවරිය ලෙස පත් වුණාට පසුව නුවරඑළිය දිස්ත්‍රික්කයේ ග්‍රාමීය රෝහල්, සෞඛ්‍ය මධ්‍යස්ථාන ආරම්භ කරන්න කටයුතු කළා. එතුමිය ඒ වෙනුවෙන් විශාල වැඩකොටසක් කළා. තරුණ තරුණියන් රාශියකට රැකීරක්ෂා ලබා දෙන්නත් එතුමිය කටයුතු කර තිබෙනවා. ලංකාවේ විවිධ ප්‍රදේශවල සිටි තරුණ තරුණියන් 20,000කට අධික ප්‍රමාණයකට එතුමිය රැකී රක්ෂා ලබා දී තිබෙනවා. එතුමිය රැකී රක්ෂා ලබා දුන් අය දැන් හොඳින් ජීවත් වනවා. එම නිසා ඒ අය දෙන පින් එතුමියට ලැබෙනවාය කියන කාරණයත් මම විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මතක් කරනවා.

අපේ පක්ෂය වෙනුවෙන් එතුමිය ලංකාවේ නොගිය ප්‍රදේශයක් නැහැ. ඕනෑම ප්‍රදේශයක සංවිධාන කටයුතු භාර දුන්නාම, එම කටයුතු භාරගෙන එතුමිය අවංකවම වැඩ කළා. සමහර අවස්ථාවලට එතුමිය අපත් කැඳවාගෙන, එතුමියගේ නායකත්වය ලබාදෙමින් ඒ සියලු කටයුතු කළා. එතුමිය තමන්ගේ ජීවිතයේ අවසාන කාලය වන තෙක්ම අවංකව එම කටයුතු කරලා, පක්ෂය වෙනුවෙන් තම යුතුකම් කොටස ඉටු කළා. තම දිස්ත්‍රික්කයට නායකත්වය දෙමින් එම වැඩ කටයුතු කරන අතරේ, දිස්ත්‍රික්කය තුළ භාර දීපු වැඩ කටයුතුත් එතුමිය ඒ විධියටම කළා. අපිට යම් වැඩක් භාර දුන් අවස්ථාවක එහි යම්කිසි ප්‍රමාදයක් වුණා නම්, ඒ අවස්ථාවේදී අපෙන් නොයෙක් ප්‍රශ්න අසමින්, අතපසු නොකර කෙසේ හෝ එම වැඩ කටයුතු කරන්න කියා අවවාද, අනුශාසනා නිතරම ලබාදීලා, අපව මේ තත්ත්වයට ගෙනෙන්න කටයුතු කළේ එතුමියයි.

පසුගිය කාලයේ යෙදුණු පා ගමන් වැනි වැඩසටහන්වලදී එතුමිය නොයෙක් ප්‍රහාරවලට පවා ලක් වුණා. නමුත් ඒ කිසි දෙයකින් නොසැලී, පක්ෂයට ගරු කරමින්, පක්ෂයේ නායකත්වය රැක ගෙන, පක්ෂයේ සිටින නායකයාට ගරු කරමින් එතුමිය දිගටම කටයුතු කළා. පසු කලෙක එතුමිය මධ්‍යම පළාත් සභාවට තේරී පත් වුණා. එතුමිය මධ්‍යම පළාත් සභාවේ විපක්ෂ නායකතුමිය හැටියට කටයුතු කළා. එසේ කටයුතු කරමින් සිටින අවස්ථාවේ තමයි එතුමියට අවාසනාවන්ත අන්දමින් අප අතරින් වෙන් වෙන්න සිදු වුණේ. එතුමියගේ අභාවය නුවරඑළිය දිස්ත්‍රික්කයට පමණක් නොවෙයි, මුළු රටටත්, අපේ පක්ෂයටත් සිදු වුණු විශාල පාඩුවක්.

එතුමිය ගැන මීට වඩා දීර්ඝව කථා කළ යුතුව තිබුණත්, කාල වෙලාව ඉක්ම යන නිසා මම වැඩිදුර කථා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. එතුමියගේ අඩුව පුරවන්න දැන් එතුමියගේ දියණිය ඉදිරියට ඇවිත් සිටිනවා. එතුමියගේ දියණියට කොටියාසය භාරදීලා, එහි සංවිධායකවරිය විධියට එතුමිය අපේ පක්ෂය වෙනුවෙන් කටයුතු කරනවා. එම දියණියගේ අනාගතය වෙනුවෙන් අපට කරන්න පුළුවන් උදවු අපි හැම විටම කරන බව මේ අවස්ථාවේදී විශේෂයෙන්ම මතක් කරනවා. ගරු කථානායකතුමනි, රණවීර මැතිතුමාටත්, එම දියණියටත්, ඒ පවුලේ සියලුදෙනාටත් මේ අවස්ථාවේදී මගේ ශෝකය ප්‍රකාශ කර සිටිනවා.

ඊළඟට මම අබ්දුල් කාදර් මැතිතුමා පිළිබඳව කථා කරන්න බලාපොරොත්තු වෙනවා. අබ්දුල් කාදර් මැතිතුමා මහනුවර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු වශයෙන් කටයුතු කළා. එතුමා ජාති, කුල, ආගම් භේදයෙන් තොරව හැම ප්‍රදේශයකටම, හැම කෙනෙකුටම සේවයක් කළ කෙනෙක්. විශේෂයෙන්ම පසුගිය කාලය තුළ එතුමා මටත් විශාල වශයෙන් උදවු උපකාර කළා. මට ප්‍රශ්නයක් පැන නැඟුණු හැම අවස්ථාවකදීම එතුමා ඉදිරියට ඇවිත් මට උදවු උපකාර කළා. හිටපු අතිගරු ජනාධිපතිවරුන් වන ඩී.බී. විජේතුංග මැතිතුමා, රණසිංහ ප්‍රේමදාස මැතිතුමා වැනි නායකයන් සමඟ කටයුතු කිරීමේදී, එතුමා මා සමඟත් එකතු වී එම කටයුතු කරන්න මට උදවු උපකාර කළා. ඒ වාගේම නාවලපිටිය ආසනයේත්, ගම්පොළ ආසනයේත්, මහනුවර දිස්ත්‍රික්කයේ ආසනවලත් වැඩ කටයුතු කිරීමේදී එතුමා මා සමඟ එකතු වී කටයුතු කළා. එතුමා ඒ ප්‍රදේශවල ජීවත් වුණු දුප්පත්, අහිංසක ජනතාව වෙනුවෙන් නිවාස ඉදිකර දීලා, එම ජනතාවට විශාල සේවයක් කරමින් ඔවුන්ට හැම විටම උදව් උපකාර කළා. එතුමා කාලයක් අපේ පක්ෂයේ ඉඳලා, පසුව පැවති ආණ්ඩු පක්ෂයට එකතු වී වැඩකටයුතු කළා. එම පක්ෂයට එකතු වී සිටින කාලයේ තමයි එතුමා අපෙන් වියෝ වුණේ. එතුමාගේ අභාවය පිළිබඳව එම පවුලේ සියලුදෙනාටම මගේ ශෝකය පළ කරනවා.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ බලංගොඩ හිටපු මන්ත්‍රිනි, ගරු මල්ලිකා රත්වත්තේ මැතිනිය ගැන මම වැඩි විස්තරයක් කියන්න දන්නේ නැහැ. එතුමියගේ අභාවය සම්බන්ධවත් මේ අවස්ථාවේදී එතුමියගේ පවුලේ අයට මගේ ශෝකය ප්‍රකාශ කරනවා. අවසාන වශයෙන්, ගරු රේණුකා හේරත් මැතිනියට අමා මහ නිවන් සුව ලැබෙවායි ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම ගරු අබ්දුල් කාදර් මැතිතුමාට අල්ලා දෙවියන් වහන්සේගේ පිහිට ප්‍රාර්ථනා කරමින්, ගරු මල්ලිකා රත්වත්තේ මැතිනියටත් අමා මහ නිවන් සුව ලැබෙවායි ප්‍රාර්ථනා කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා.2.40]

ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ගරු කථානායකතුමනි, මෙම ගරු සභාව නියෝජනය කළ ගරු රේණුකා හේරත් මැතිනියගේත්, ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මැතිතුමාගේත්, ගරු මල්ලිකා රත්වත්තේ මැතිනියගේත් අභාවයන් පිළිබඳ ශෝක යෝජනා අද මෙම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ඉතාම කීර්තිමත් දේශපාලන නායිකාවකව සිටි මල්ලිකා රත්වත්තේ මැතිනිය පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම මට ලැබුණු මහඟු අවස්ථාවක් ලෙස මා සලකනවා.

විශේෂයෙන්ම මල්ලිකා රත්වත්තේ මැතිනිය මගේ මතකයට එන්නේ, මා ඉතා කුඩා අවධියේදී මගේ පියතුමා රත්නපුරය දිස්ත්‍රික්කයේ ජනතාවගේ ජීවිත යහපත් කරවන්න ගත් සියලු උත්සාහයන්වලදී, මගේ පියතුමාත් සමඟ අපේ නිවසට පැමිණි පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් විධියටයි. විශේෂයෙන් එතුමිය 1960 ගණන්වලදී මගේ පියතුමාත් සමඟ පාර්ලිමේන්තුවේ කටයුතු කළ මන්ත්‍රීවරියක්. බලංගොඩ ජනතාවගේ ආදරය අදටත් කිසිදු අඩුවක් නැතුව ලැබෙන, ඉතාම භක්තියෙන්, ඉතාම ආදරයෙන්, ඉතාම ගෞරවයෙන් සලකන චරිතයක් තමයි මල්ලිකා රත්වත්තේ මැතිනියගේ චරිතය. කාන්තාවන් දේශපාලනයට ඒම අද වාගේම එදාත් විරල වෙලා තිබුණු වකවානුක 1960 දශකයේ මුල් භාගයේ සිටයි මල්ලිකා රත්වත්තේ මැතිනිය දේශපාලනයට පිවිසියේ. මල්ලිකා රත්වත්තේ මැතිනියට රත්නපුරය ජනතාවගේ ගෞරවය අදත් හිමිවෙලා තිබෙන්නේ, විශේෂයෙන්ම ඉතාම පිරිසිදුව තමන්ගේ දේශපාලනය කළ දේශපාලන නායිකාවක් නිසායි. වර්තමාන ලෝකයේ දේශපාලනය කරන සමහරුන් නොයෙකුත් ආකාරයේ වංචාවලට වැරදිකරුවන් වන අවස්ථාවක, මල්ලිකා රත්වත්තේ චරිතය ඉතාම පිරිසිදු දේශපාලන චරිතයක්ය කියන එක මා මතක් කරන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, එතුමියගේ ස්වාමිපුරුෂයා වන ක්ලිෆර්ඩ් රත්වත්තේ මැතිතුමාත් මේ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය ඇමතිවරයකු විධියට කටයුතු කළා. ඒ වාගේම මල්ලිකා රත්වත්තේ මැතිනිය නැවතී දේශපාලනය කළ මහවලතැන්න වලව්වෙන් තමයි මේ රටට කීර්තිමත් සේවාවක් කළ, අපේ ගෞරවනීය, සදානුස්මරණීය නායිකාව සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය බිහි වුණේ. මල්ලිකා රත්වත්තේ මැතිනිය ක්ලිෆර්ඩ් රත්වත්තේ මැතිතුමා සමඟ විවාහ ජීවිතයට ඇතුළත් වුණාට පස්සේ මල්ලිකා රත්වත්තේ මැතිනිය නැවතී සිටියේ ක්ලිෆර්ඩ් රත්වත්තේ මැතිතුමාගේ මහවලතැන්න වලව්වේයි. රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවට ඒ නිවසින් අතිවිශාල සේවාවක් සිද්ධ වුණා. අපට මතකයි, ක්ලිෆර්ඩ් රත්වත්තේ මැතිතුමාගේ එක සහෝදරයෙක් ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිසුරුවරයකු වශයෙන් සිටි බව. වෛද්‍ය මැකී රත්වත්තේ මැතිතුමා ඇතුළු දොස්තරවරු දෙදෙනෙක් ඒ පවුලේ සිටියා. මල්ලිකා රත්වත්තේ මැතිනිය ඒ පවුලට සම්බන්ධ වීමෙන් පසු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ සහ බණ්ඩාරනායක මැතිතුමාගේ ඉතා ප්‍රගතිශීලී දේශපාලන ක්‍රියාවලිය, පිරිසිදු දේශපාලන ක්‍රියාවලිය එතුමිය ඉදිරියට ගෙන ගිහින් රත්නපුර දිස්ත්‍රික්කයේ ජනතාවගේ ආදරය දිනා ගත්ත නායිකාවක් විධියට මල්ලිකා රත්වත්තේ මැතිනිය කටයුතු කරගෙන ගියා.

මල්ලිකා රත්වත්තේ මැතිනියගේ පුතණුවන් -කමල් රත්වත්තේ මැතිතුමා- අද රත්නපුරය දිස්ත්‍රික්කයේ සිටින, කවුරුත් ගෞරවයෙන් සලකන ප්‍රභූවරයෙක්. සබරගමුව මහ සමන් දේවාලයේ බස්නායක නිලමේවරයා හැටියට ඒ ප්‍රදේශයේ ජනතාවට ගෞරවනීය සේවාවක් කළ අපේ දිස්ත්‍රික්කයේ සිටින හොඳ වැදගත් ප්‍රභූවරයෙක් විධියට කමල් රත්වත්තේ මැතිතුමාට අපි කවුරුත් සලකනවා. එතුමියගේ දියණිය හේෂානි රත්වත්තේ මැතිනිය අද විදෙස් රටකයි ජීවත් වන්නේ.

මල්ලිකා රත්වත්තේ මැතිනිය ලෙඩ වෙලා හිටපු අවස්ථාවන්හිදී එතුමිය බලන්න මා මහවලතැන්න වලව්වට ගියා. එලෙස මහවලතැන්න වලව්වට මා ගිය බොහෝ අවස්ථාවන්හිදී විදෙස්ගත වෙලා හිටපු එතුමියගේ දියණිය වන හේෂානි රත්වත්තේ මැතිනිය ලෙඩවෙලා හිටපු මල්ලිකා රත්වත්තේ මැතිනියගේ නිවසට ඇවිල්ලා, එතුමිය ළඟ සිටිමින් ඇප උපස්ථාන කළා මට මතකයි. රත්වත්තේ පවුල -විශේෂයෙන්ම මල්ලිකා රත්වත්තේ මැතිනිය- මේ රටේ ජනතාවට, රත්නපුර දිස්ත්‍රික්කයට ලබා දුන්නු ඒ පරමාදර්ශී නායකත්වය ඉතාම භක්තියෙන් යුතුව එතුමියට කරන ගෞරවයක් විධියට මා මේ අවස්ථාවේදී සිහිපත් කරන්න ඕනෑ. මගේ පියතුමා එක්ක 60 දශකයේ සිට කටයුතු කළ මෙතුමිය 1977 අවුරුද්ද වනතුරු පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය හෙබවූවා.

1994 පාර්ලිමේන්තුවට එනකොට දැකපු, මා ආසා කරපු චරිතයක් තමයි රේණුකා හේරත් මැතිනියගේ චරිතය. 1994 අවුරුද්දේ සෞඛ්‍ය හා සමාජ සේවා නියෝජ්‍ය ඇමතිවරිය විධියට පත්වෙලා මා සෞඛ්‍ය අමාත්‍යාංශයට ගියාම සෞඛ්‍ය අමාත්‍යාංශයේ හිටපු බහුතරයක් නිලධාරීන් මාත් එක්ක කියපු කාරණයක් තමයි, "රේණුකා හේරත් මැඩම් මේ අමාත්‍යාංශය හොඳට කළා." කියන කාරණය. එතුමියගේ කාලයේ කිසිම වැඩ වර්ජනයක් තිබුණේ නැහැ. එතුමිය සියලුම ව්‍යාත්තීය සමිති එක්ක ඉතාම සහයෝගයෙන් කටයුතු කරමින් ඒ අමාත්‍යාංශයට විශාල නායකත්වයක් ලබා දීපු බව 1994 අවුරුද්දේ ඒ අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිවරිය විධියට පත් වුණාම මට අත් විඳින්න ලැබුණා.

රේණුකා හේරත් මැතිනිය කාන්තාවක් විධියට ලංකාවේ දේශපාලනයෙන් පෙරට ආපු ඉතාම ශක්තිමත් කාන්තාවක්. එතුමිය පාර්ලිමේන්තුවේ නොහිටියත් එක්සත් ජාතික පක්ෂය ශක්තිමත් කරන්න, ඒ පක්ෂයේ හිටපු දැවැන්ත කාන්තා නායිකාවක් බව අපි දන්නවා. එතුමියගේ අභාවය පාර්ලිමේන්තුවටත්, එක්සත් ජාතික පක්ෂයටත් විශාල පාඩුවක් කියා මා විශ්වාස කරනවා. එමෙන්ම අපිත් එක්ක පාර්ලිමේන්තුවේ දීර්ඝ කාලයක් කටයුතු කරපු අබ්දුල් කාදර් මැතිතුමාත්, ඉතාම හිත හොඳ, අපත් එක්ක හැම අවස්ථාවකදීම සුහදව කථා කරපු ගෞරවනීය පුද්ගලයෙක්. මට ලැබී තිබෙන මේ කෙටි කාලය තුළ අබ්දුල් කාදර් මැතිතුමාට එතුමා ප්‍රාර්ථනා කළ ආකාරයට දෙවියන්ගේ ආශීර්වාදය ලැබෙවා කියා මා පතනවා. හොඳ සිතුවිලි පහළ කර ගනිමින්, හොඳ වැඩ කරමින් අපි ජීවිතය තුළ රැස් කර ගත් සියලු පින් රේණුකා හේරත් මැතිනියටත්, මල්ලිකා රත්වත්තේ මැතිනියටත් අනුමෝදන් වෙවා! කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වනවා.

[අ.භා. 2.49]

ගරු නවින් දිසානායක මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு நவின் திஸாநாயக்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Navin Dissanayake - Minister of Plantation Industries)

ගරු කථානායකතුමනි, ගරු රේණුකා හේරත් රණවීර මැතිනිය, ගරු මල්ලිකා එල්ලාවල රත්වත්තේ මැතිනිය සහ ගරු අබ්දුල් කාදර් හිටපු ඇමතිතුමාගේ අභාවයන් ගැන වූ ශෝක ප්‍රකාශ පණිවුඩ පිළිබඳව සාකච්ඡා කරන අද දවසේ ඒ

[ගරු නවින් දිසානායක මහතා]

සම්බන්ධයෙන් කථා කරන්න මටත් සුළු මොහොතක් හෝ ලබා දීම ගැන මා ඔබතුමාට මගේ ස්තුතිය පුද කරනවා. විශේෂයෙන්ම රේණුකා හේරත් රණවීර මැතිනිය මා නියෝජනය කරන නුවරඑළිය දිස්ත්‍රික්කයෙන් බිහි වුණු ශ්‍රේෂ්ඨතම දේශපාලන චරිතයක් හැටියට හඳුන්වන්න පුළුවන්. එතුමියගේ උපත 1945 සැප්තැම්බර් මාසයේ 07 වැනිදා. 2017 මාර්තු 12 වැනිදා තමයි එතුමියගේ විපත සිදු වුණේ. දීර්ඝ කාලයක් එතුමිය අපේ පක්ෂය වෙනුවෙන් ක්‍රියා කළා. විශේෂයෙන්ම 1976 එක්සත් ජාතික පක්ෂය ප්‍රතිසංවිධානය කරන අවස්ථාවේ, අපේ හිටපු ශ්‍රේෂ්ඨ නායක ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා විශේෂයෙන්ම කාන්තා නියෝජනයක් අපේ පක්ෂයට ලබා දීමට උත්සාහ කළා. එතුමාගේ ඒ උත්සාහයට අනුව එතුමා වලපනේ ආසනයට කාන්තාවක් ඉදිරිපත් කළා. ඒ තමයි රේණුකා හේරත් මැතිනිය. එතුමිය ඒ අවස්ථාවේ ගුරුවරියක්.

එතුමිය ගුරු වෘත්තිය පසෙක තබා ඒ භාරදූර වගකීම බාර ගත්තා. 1976 වාගේ ඉතාම අමාරු කාලයක, විශේෂයෙන්ම එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් බලයට පත්වෙන්නේ නැහැ කියපු අවස්ථාවක තමයි එතුමිය ඒ භාරදූර වගකීම ලබා ගත්තේ. නමුත් ඉතාම ක්ෂණිකව වලපනේ ආසනයේ ජනතාවත් සමඟ බද්ධ වෙලා, එකතු වෙලා ඔවුන්ගේ දුක සැප බෙදා ගෙන එක්සත් ජාතික පක්ෂයේ නව පරපුරේ කාන්තා නායිකාවක් හැටියට එතුමිය ඉදිරියට ආවා.

1977 මැතිවරණය පැවැති අවස්ථාව මට මතක් වෙනවා. එදා මම පුංචි දරුවෙක්; අවුරුදු 7, 8ක පුංචි කොල්ලෙක්. මගේ පියා, රේණුකා හේරත් මැතිනිය ඇතුළු ඒ සියලුදෙනාම නුවරඑළිය දිස්ත්‍රික්කය ජයග්‍රහණය කරවීමට ඉතාම උදෙග්ගයෙන් යෝධ බල කැපවීමකින් කටයුතු කළා. ඒ කැපවීම නිසා එතුමියට වලපනේ ආසනය ජයග්‍රහණය කිරීමට 1977 අවස්ථාව ලැබුණා. 1977 සිදුවූ ඒ විශාල පෙරළියත් සමඟ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා එතුමාගේ කණ්ඩායමේ කාන්තා නායිකාවක් හැටියට රේණුකා හේරත් මැතිනියට ප්‍රමුඛත්වය ලබා දුන්නා. ඒ නිසා අප දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් නායකත්වය, දිස්ත්‍රික් ඇමතිනිය හැටියට පරිවර්තනය වීමට එතුමියට අවකාශයක් ලැබුණා. ඇත්ත වශයෙන්ම අදත් මම පුදුම වෙනවා. මොකද, මම නුවරඑළිය දිස්ත්‍රික්කයේ ගම්දනව්වලට යනකොට ඒ ජනතාව මට අත දිගු කරලා පෙන්වනවා, මේක රේණුකා මැඩම් කරපු වැඩ කොටසක් කියලා. එතුමියගේ දිස්ත්‍රික් නායකත්වය තුළින් විශාල මුදලක් යට කරලා නුවරඑළිය දිස්ත්‍රික්කයට ඇළ, දොළ, මාර්ග පන්සල් ඇතුළු විශාල සම්පත් ප්‍රමාණයක් ලබා දුන්නා. විශේෂයෙන්ම එවැනි අවස්ථාවක ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා දිස්ත්‍රික් නායකයන් පත් කිරීමෙන් බලාපොරොත්තු වුණේ, මධ්‍යම රජයෙන් ලබා ගන්න පුළුවන් උපරිම සම්පත් ප්‍රමාණයක් ඒ ඒ දිස්ත්‍රික්කවලට යොමු කිරීමයි. ඇත්ත වශයෙන්ම රේණුකා හේරත් මැතිනිය දිස්ත්‍රික් ඇමතිකමෙන් විශාල වැඩ කොටසක් කළ නායිකාවක් කියලා මම හිතනවා. එම නායකත්වය තුළින් සම්පත් ලබාගෙන එතුමිය වැඩ කළා. එතුමිය යම්කිසි විනයක් ඇතිව, යම්කිසි පරිපාලනයක් ඇතුව වැඩ කරලා ජනතාවගේ හොඳ හිත දිනාගත් නායිකාවක්. ඒ වාගේම ජනතාව සුවපත් කිරීමටත්, ජනතාවට අවශ්‍ය සම්පත් ප්‍රමාණය ලබා දීමටත්, විශාල රැකියා ප්‍රමාණයක් ලබා දීමටත් එතුමියට ශක්තිය ලැබුණා. ඒ අවස්ථාවේදී එක්සත් ජාතික පක්ෂයේ අපි සියලුදෙනාම වැඩ කළේ කණ්ඩායම් හැඟීමෙන්. මාගේ දිවංගත පියාණන්ගේ දිස්ත්‍රික් නායකත්වය යටතේ සියලුම මන්ත්‍රීවරුන්, ඇමතිවරුන් එකමුතු වෙලා වැඩ කළා. ඒ වාගේම රේණුකා හේරත් මැතිනිය සමඟ එකතුවෙලා අපගේ දිස්ත්‍රික්කයට විශාල වැඩ කොටසක් ඉටු කරන්නට එතුමාට පුළුවන් වුණා. රේණුකා හේරත් මැතිනියගේ ඉවසීම, ඒ වාගේම පරිණතභාවය නිසා 1989 මහමැතිවරණයෙන් පසුව අපගේ හිටපු නායක දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ නායකත්වය යටතේ මේ රටේ මහ ආණ්ඩුවේ සෞඛ්‍ය ඇමතිනිය හැටියට පරිවර්තනය වෙන්නත් එතුමියට හැකියාව තිබුණා. විශේෂයෙන්ම අවුරුදු තුන හතරක කාලය තුළ සෞඛ්‍ය සේවයේ විශාල පරිවර්තනයක් ඇති කරන්නත් එතුමියට පුළුවන් වුණා. අද හැමෝම කියනවා, රේණුකාගේ කාලයේ කිසිම ගැටලුවකින් තොරව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ එම කාර්ය භාරය එතුමිය ඉටුකළා කියලා. සෞඛ්‍ය අමාත්‍යාංශය කියන්නේ විශාල සම්පත් තිබෙන අමාත්‍යාංශයක්. විශාල ටෙන්ඩර් තිබෙන අමාත්‍යාංශයක්. කවදාවත්, කොයි මොහොතකවත් අපේ කනට ඇහිලා නැහැ, රේණුකා හේරත් මැතිනිය එම ඇමති ධුරයෙන් සල්ලි හම්බ කළා කියලා කියනවා. මම හිතන විධියට එතුමිය, එතුමියගේ නම හරියටම ආරක්ෂා කර ගත්තා. ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ඔබතුමා වැනි දක්ෂ, old-school, hard-working, dedicated and clean politician කෙනෙක් තමයි රේණුකා හේරත් මැතිනියත්. එතුමිය දේශපාලනයෙන් හම්බ කළේ නැහැ. එතුමිය හම්බ කළේ ජනතාව පමණයි. 1994දී අපේ පක්ෂය විපක්ෂයට ගිය අවස්ථාවේ එතුමිය අපේ පක්ෂයේ මන්ත්‍රීවරියක් බවට පරිවර්තනය වුණා. ඉන්පසු අපගේ නායක රනිල් වික්‍රමසිංහ මැතිතුමා එතුමියට අපේ කාන්තා සංවිධානය ශක්තිමත් කිරීමේ වගකීම ලබා දුන්නා. එතුමිය අප පක්ෂය වෙනුවෙන් කළ එම කාර්ය භාරය මට මතකයි. ඉතාම කටුක අවස්ථාවක විපක්ෂයේ ඉඳගෙන කාන්තාවන් සංවිධානය කිරීම, එකතු කිරීම, කාන්තාවන්ට අනුබලදීම එතුමිය කළා. 2000 පැවති මැතිවරණයෙන් එතුමියට ජයග්‍රහණය කරන්න බැරි වුණා. නමුත් එතුමිය ඒකෙන් අධෛර්යවත් වුණේ නැහැ. එතුමිය අපේ පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේත් හිටියා. පක්ෂයත් එක්ක දිගටම බද්ධ වෙලා ක්‍රියා කළා. මේ අවස්ථාවේ මම එක කාරණයක් කියන්න අවශ්‍යයි. විශේෂයෙන්ම මාගේ දිවංගත පියාණන් සහ ආර්. ප්‍රේමදාස මැතිතුමා අතර යම් මතභේදයක් ඇති වුණා. නමුත් එතුමිය පක්ෂ නායකත්වය සමඟ හැම වෙලාවේම හිටියා.

ඒක එතුමියගේ සුවිශේෂී ගුණාංගයක්. පක්ෂ නායකත්වයට අවනත වෙලා, නායකත්වයට ගරු කරලා, නායකත්වයත් එක්ක රැඳී සිටිමින් පක්ෂය ආරක්ෂා කළා. මාගේ පියාණන් වන ගාම්ණී දිසානායක මැතිතුමා නැවතත් එක්සත් ජාතික පක්ෂයේ ප්‍රබලයකු වෙලා, නියෝජ්‍ය නායක වෙලා, විපක්ෂ නායක වෙලා, ජනාධිපති අපේක්ෂක වුණාට පසුව නැවතත් එතුමා සමඟ බද්ධ වෙලා අත්වැල් බැඳගෙන එතුමිය පක්ෂය හා ගරු ගාම්ණී දිසානායක මැතිතුමා වෙනුවෙන් විශාල වැඩ කොටසක් ඉටු කළා. හිතේ තිබුණු පරණ කහට, ප්‍රශ්න සියල්ල අමතක කරලා එතුමිය නැවතත් මාගේ පියාණන් වෙනුවෙනුත්, පක්ෂය වෙනුවෙනුත් උපරිම ශක්තියෙන් කටයුතු කළා. එතුමිය කළ එම වැඩ කොටස වෙනුවෙන් එතුමියට මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරනවා.

ගරු කථානායකතුමනි, මම 2000 මැතිවරණයට තරග කරන කොට එතුමිය මවක් මෙන් මට උපදෙස් දුන්නා මතකයි. "පුතේ, මේ විධියට කරන්න; මේ විධියට මිනිස්සු අතරට යන්න; මේ විධියට දේශපාලන කටයුතු සංවිධානය කරන්න" කියලා එතුමිය මට උපදෙස් දුන්නා. එතුමිය මට සැලකුවේ එතුමියගේ ප්‍රතිගාමියකු හැටියට නොවෙයි. "තරුණයකු දේශපාලනයට එනවා, මේ තරුණයාට අපි අත දෙන්න අවශ්‍යයි; සහයෝගය දෙන්න අවශ්‍යයි" කියන වචනය එතුමිය හැම දෙනාටම කිව්වා. මට මෙම පාර්ලිමේන්තුව නියෝජනය කිරීම සඳහා අවස්ථාව ලබා ගැනීමට එතුමිය විශාල ශක්තියක් වුණා. මට එතුමිය ලබා දුන් ශක්තිය පිළිබඳව මේ මොහොතේ ඉතාමත් ආදරයෙන් මා සිහිපත් කරනවා. ඊට පසුවත් අපි දෙදෙනා ඉතා සුහදතාවෙන් යුතුව වැඩ කළා. යම් කිසි අවස්ථාවල මනාප පිළිබඳ ගැටලු ඇති වුණා. එවැනි ගැටලු අපි හැමෝටම ඇති වනවා. නමුත්, ඒවා දේශපාලන ගැටලු මිස පෞද්ගලික ගැටලු නොවෙයි. ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම මට මතක් වෙන්නේ ගරු රේණුකා හේරත්

මැතිනිය අපගේ දිස්ත්‍රික්කයට කළ ඒ යෝධ බල සේවය ගැනයි. එතුමිය ලබා දුන් රැකිරක්ෂා ප්‍රමාණය, අපගේ දිස්ත්‍රික්කයට ලබා දුන් සම්පත් ප්‍රමාණය අපරිමිතයි. අපට ඒවා වචනවලින් තක්සේරු කරන්න බැහැ. ඒ නිසා රේණුකා හේරත් මැතිනිය මිය ගියත්, එතුමිය අද ජනතාවගේ හදවත් තුළ ජීවත් වෙනවා. ඒ විතරක් නොවෙයි, පවිත්‍ර දේශපාලන නායිකාවක් හැටියට එතුමියගේ නම ආරක්ෂා වෙලා තිබෙනවා. ඒ නිසා එතුමිය වෙනුවෙන් කරන්න පුළුවන් සෑම වැඩ කොටසක්ම; එතුමියගේ නමින් කරන්න පුළුවන් සෑම වැඩ කොටසක්ම අපි කරන්න කැමැතියි කියන පණිවුඩය දෙන්න කැමැති බව එක්සත් ජාතික පක්ෂයේ දිස්ත්‍රික් නායකයා හැටියටත්, එක්සත් ජාතික පක්ෂයෙන් පත් වුණු ඇමතිවරයකු හැටියටත් මා මේ අවස්ථාවේ දී ප්‍රකාශ කරනවා.

අද වන විට එතුමිය වෙනුවෙන් කටයුතු කරන්න එතුමියගේ ස්වාමි පුරුෂයා වන රණවීර මැතිතුමා පළාත් සභාවේ ඉන්නවා. එතුමියගේ දියණිය වන හිරණ්‍යා හේරත් රණවීර මැතිනිය වලපනේ ආසනයේ සංවිධායකවරිය හැටියට අපේ පක්ෂයෙන් පත් කරලා තිබෙනවා. එතුමියටත්, එතුමියගේ මවගේ දේශපාලන ගමන ගොස් නුදුරු අනාගතයේ පැවැත්වෙන මහ මැතිවරණයෙන් මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අවස්ථාව ලැබේවා කියා අපි ප්‍රාර්ථනා කරනවා.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කය වෙනුවෙන් ගරු රේණුකා හේරත් මැතිනියටත්, අප පක්ෂයට විශාල සේවයක් කළ මහනුවර දිස්ත්‍රික්කයේ ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මැතිතුමාටත්, රත්නපුර දිස්ත්‍රික්කයේ ගරු මල්ලිකා රත්වත්තේ එල්ලාවල මැතිනියටත් නිවන් සුව ප්‍රාර්ථනා කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 2.59]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

கௌரவ சபாநாயகர் அவர்களே, ஏ.ஆர்.எம். அப்துல் காதர், திருமதி ரேணுகா ஹேரத், திருமதி மல்லிகா ரத்வத்த ஆகிய முன்னாள் பாராளுமன்ற உறுப்பினர்களின் அனுதாபப் பிரரேணையின் மீது உரையாற்றுவதற்கு வாய்ப்பளித்தமைக்காக உங்களுக்கு எனது நன்றிகளை முதற்கண் தெரிவித்துக் கொள்கின்றேன். இந்த மூவரதும் ஆத்மா சாந்தியடையப் பிரார்த்திப்பதோடு, இந்த மூன்று முன்னாள் பாராளுமன்ற உறுப்பினர்களின் குடும்பத்தாருக்கும் எனது அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ சபாநாயகர் அவர்களே, நுவரெலியா மாவட்டமானது தேசிய ரீதியாகப் பல தலைவர்களை இலங்கைக்குப் பெற்றுக்கொடுத்த மாவட்டமென்பது உங்களுக்குத் தெரியும். அந்த வகையில், அந்த மாவட்டத்திலிருந்து வெளிப்பட்ட முக்கியமான ஒரு பெண்ணாக, ஆளுமை கொண்ட ஒருவராக நாங்கள் திருமதி ரேணுகா ஹேரத் அவர்களைப் பார்க்கின்றோம். குறிப்பாக, நுவரெலியா மாவட்ட அரசியல் பிரதிநிதியான காலஞ்சென்ற திருமதி ரேணுகா ஹேரத் அவர்கள் மாவட்ட அமைச்சராகவும், சுகாதார அமைச்சராகவும் பணியாற்றியதோடு மாத்திரமல்லாமல் மாகாண மட்டத்தில் மாகாண சபை உறுப்பினராகவும் இருந்து எமது மாவட்டத்திற்குப் பெருமை சேர்த்திருக்கிறார். அவரது உறுதியான மன எண்ணத்தின் காரணமாக அவரை நாங்கள் 'இரும்புப் பெண்மணி' என வர்ணிப்பதுண்டு. அதைவிடுத்துப் பார்க்கும்போது, எப்போதும் இன்முகத்தோடு விடயங்களைக் கையாளுகின்ற ஒருவராக திருமதி ரேணுகா ஹேரத் அவர்களை நாங்கள் கண்டிருக்கிறோம்.

அவர் முதன்முதலாக இந்தப் பாராளுமன்றத்திற்கு வருகைதந்த 1977ஆம் ஆண்டு என்பது நான் எனது பாடசாலைக் கல்வியைக்கூட ஆரம்பிக்காத பிள்ளைப் பருவம்! என்றாலும், நான் முதன் முதலாகக் கடந்த 2015ஆம் ஆண்டு தேர்தலிலே போட்டியிட்டபோது அவரும் குறித்த தேர்தலிலே போட்டியிட்டிருந்ததனால் அவருடன் நெருங்கிப் பழகுவதற்கான வாய்ப்பு எனக்குக் கிடைத்திருந்தது. அந்த வகையில் பார்க்கும்போது, அந்த மாவட்டத்திலிருந்து வந்திருக்கின்ற இளம் பாராளுமன்ற உறுப்பினராகிய நான், எங்களது மாவட்டத்தின் மூத்த தலைவர்களில் ஒருவரான காமினி திஸாநாயக்க அவர்கள் காலத்தில் ஐக்கிய தேசியக் கட்சியின் தலைமைத்துவப் பெண்மணியாக விளங்கிய அவருடன் இணைந்து அரசியல் களங்களிலே செயற்படுவதற்கு எனக்கு ஒரு வாய்ப்புக் கிடைத்தமைக்குப் பாக்கியம் பெற்றிருக்கிறேன். அந்தத் தருணத்தில் அவரோடு உரையாடக் கிடைத்த சந்தர்ப்பங்களிலெல்லாம் எவ்வாறு அரசியல் செயற்பாடுகளை முன்னெடுக்க வேண்டுமென்பது பற்றி எனக்கு அவர் அறிவுறுத்தியிருக்கிறார்.

பாராளுமன்ற உறுப்பினராகத் தெரிவுசெய்யப்பட்ட நான், புதிய அரசியலமைப்பை உருவாக்குவதற்காக எமது பாராளுமன்றம் அரசியலமைப்புச் சபையாகவும் செயற்படுகின்ற சந்தர்ப்பத்தில், அந்த அரசியலமைப்புச் சபைக்குக் கீழாக உருவாக்கப்பட்ட உபகுழுக்களில் ஒன்றான மத்திய சுற்றயல் உறவுகள் - Sub-Committee on Centre-Periphery Relations - என்ற உபகுழுவின் உறுப்பினராகவும் செயற்பட்டேன். அப்போது மாகாண சபையின் அதிகாரங்களை எவ்வாறு பகிர்ந்துகொள்வது என்பது தொடர்பாகக் கருத்துத் தெரிவிப்பதற்காக மத்திய மாகாண சபையின் எதிர்க்கட்சித் தலைவியாக இருந்த திருமதி ரேணுகா ஹேரத் அவர்கள் வந்திருந்த சந்தர்ப்பத்தில், மாகாண சபையின் அதிகாரங்கள் சம்பந்தமாக அவர் எடுத்துக்கூறிய விடயங்கள் எங்களுக்கு வியப்பைத் தந்தன. அந்தளவுக்கு அனுபவம் மிக்கவராக அவர் காணப்பட்டார். அதிகாரப் பரவலாக்கல் செய்யப்பட வேண்டுமா, இல்லையா? என்பது தொடர்பான வாதப் பிரதிவாதங்கள் இடம்பெற்றுக்கொண்டிருக்கின்ற சந்தர்ப்பத்தில், மாகாண சபைகளுக்கு உரிய அதிகாரங்கள் வழங்கப்பட வேண்டுமென்ற கருத்தை ஆணித்தரமாக அவர் வலியுறுத்தியதை நான் இந்த உயரிய சபையிலே பதிவுசெய்ய விரும்புகின்றேன்.

ஓர் ஆசிரியையாகத் தொழிலைத் தொடங்கிய அவர், தான் பெற்றுக்கொண்ட அனுபவங்களினூடாகப் பல்வேறு உயர் பதவிகளை வகித்தார். கடைசியாக மாகாண சபை உறுப்பினராக இருந்த அவர், தனது உயிர் பிரியும் தறுவாயிலும்கூட அரசியல் செயற்பாட்டாளராகவே எங்கள் மாவட்டத்தில் இருந்திருக்கிறார். பல்லின மக்கள் வாழும் எங்கள் மாவட்டத்தில் குறிப்பாக, வலப்பனைத் தேர்தல் தொகுதிக்கு உட்பட்ட தமிழ் மக்களும், முஸ்லிம் மக்களும் வாழ்கின்ற பிரதேசத்திலிருந்து ஒரு தமிழ்ப் பிரதிநிதி தெரிவு செய்யப்படுவதென்பது கேள்விக்குறியாக இருந்த நிலையில் தமிழ், சிங்கள மக்களோடு சக வாழ்வை ஏற்படுத்தி, எங்களது மக்களோடு மிகுந்த பரிவோடு சேவையாற்றிய ஓர் உறுப்பினர் அவர் என்பதையும் நான் இந்த சபையிலே ஞாபகப்படுத்துகின்றேன்.

எங்களது தொழிலாளர் தேசிய சங்கம், அதேபோல தொழிலாளர் தேசிய முன்னணியின் சார்பாக ஒரு பெண்மணி - திருமதி சரஸ்வதி சிவகுரு அவர்கள் - மாகாண சபையிலே அங்கம் வகித்திருந்தார். அதே சம காலத்தில் ரேணுகா ஹேரத்

[ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා]

අවර්කළුම් මාකාණ සපෙයිල් අංගම් වකිත්තවර් එන්ර වකෙයිලේ, එංකළතු ඉරණ්ටු අමෙප්පුකළුක්කුම් ඔර් උරවු මුරෙ ඉරුන්තතු. තිරුමති සරස්වති සිවකුරු අවර්කළෙ වළිනටාත්ති, අවර්කළුක්කු ආලෝසනෙ වළංකි, අන්තප් පතවියිනූටාක මක්කළුක්කුච් සේවෙයාට්රක්කූටිය වළිමුරෙකළ් පලවර්රෙ අවර් එංකළතු අමෙප්පුක්කාකප් පෙට්රුක්කොටුත්තිරුක්කිරාර්. අන්ත වකෙයිල්, තොළිලාළර් තේසිය සංකත්තින් තලෙවරුම් අමෙච්චරුමාන පළනි තිකම්පරම් අවර්කළින් චාර්පිලුම් එංකළතු සංකත්තින් උරුප්පිනර්කළ් චාර්පිලුම් අන්නාරතු කුටුම්පත්තාරුක්කු එමතු ආරුතල්කළෙත් තොරිවිත්තුක්කොළ්ළ විරුම්පුකින්රේන්. අවරතු පණියෙක් කෙවිට්ටුවිටාමල්, අවරතු තුණෙවර් රණසිංක අවර්කළුම් අවරතු මකළ් හිරණ්යා රණසිංක හේරත් අවර්කළුම් තොටර්න්තු අරසියල් පයණත්තෙ මේර්කොණ්ටු වරුකින්රාර්කළ්.

කටන්ත උළ්ළූරාට්චි මන්රත් තේර්තලිල් වලප්පනෙ පිරතේස සපෙක්කු එංකළතු තමිල් මුර්පෝක්කුක් කූට්ටණි ඉක්කිය තේසියක් කට්චියෝටු ඉණෙන්තු පෝට්ටියිට්ට තරුවායිල්, තිරුමති රේණුකා හේරත් අවර්කළින් ඉල්ලත්තිල් වෙත්තු, නාංකළ් අවරතු තුණෙවරුටනුම් මකළුටනුම් ඉණෙන්තු අනෙත්තු නටවටික්කෙකළිලුම් ඊටුපට්ටෝම්. තේර්තල් පිරච්චාර නටවටික්කෙකළිලේ මිකවුම් අන්නියෝනියමාක විරුන්තු චෙයර්පට්ටු, නාංකළ් අන්නත් තොකුතියෙ අල්ලතු අන්නප් පිරතේස සපෙයෙ වෙර්රිකොණ්ටෝම්. නාංකළ් අන්නත් තේර්තලුක්කාක එමතු වලප්පනෙ පෙරුන්තෝට්ටප් පකුතිකළුක්කු පිරච්චාරත්තුක්කාකච් චෙන්රවේළෙ, තිරුමති රේණුකා හේරත් අවර්කළින් මකළාන හිරණ්යා හේරත්තෙක් කණ්ටවුටන්, එමතු මක්කළ් අනෙවරුම් "නීංකළ් හේරත් නෝනාවෙ ඥාපකප්පටුත්තුකින්රීර්කළ්" එන්රු අවරෙ අන්පෝටු වරවේර්රතෙ නාන් නේරටියාක ඉරුන්තු අවතානිත්තේන්. රේණුකා හේරත් අවර්කළින් කුණාම්සම් උණ්මෙයිලේ හිරණ්යා අවර්කළුක්කුම් වරවේණ්ටුම්; අවරතු තාය් එව්වාරු අන්නප් පිරතේස මක්කළෝටු ඔන්රිණෙන්තු චෙයර්පට්ටාරෝ, අතේ ඉලට්චණങ්කළෝටු අවරතු එතිර්කාල අරසියල් වාළ්වුම් මිළිරවේණ්ටුමෙන එමතු මක්කළ් චාර්පාක වාළ්ත්තුවතෝටු, -

Mr. Speaker, the Hon. Mayantha Dissanayake, the Hon. Member from the Kandy District also wanted to participate in this Vote of Condolence, but unfortunately, due to some unavoidable reasons, he could not attend this august Assembly today and wanted me to table his speech. Therefore, Sir, I **table*** the speech of the Hon. Mayantha Dissanayake.

Thank you.

සභාමේසය මත තබන ලද ගරු මයන්ත දිසානායක මහතාගේ කථාව:
சபாபீடத்தில் வைக்கப்பட்ட மாண்புமிகு மயந்த திசாநாயக்கவினது உரை:
Hon. Mayantha Dissanayake's Speech tabled:

අභාවප්‍රාප්ත හිටපු අමාත්‍ය ගරු රේණුකා හේරත් මැතිනිය වෙනුවෙන් සහ හිටපු අමාත්‍ය අල්හාජ් අබ්දුල් කාදර් මැතිතුමා වෙනුවෙන් ශෝකය පළ කිරීම.

"Iron lady of the hill country" යනුවෙන් හඳුන්වනු ලැබූ අභාවප්‍රාප්ත හිටපු ගරු අමාත්‍යතුමිය වූ රේණුකා හේරත් මැතිනිය වෙනුවෙන් ශෝක යෝජනාවක් ඉදිරිපත් කිරීමට ලැබීම සංවේගයක් මෙන්ම සතුටක් ගෙන දෙන්නක්. දිවංගත මාගේ පියාණන්ගේ ජීවිතයේ අවස්ථා කිහිපයකදීම ධෛර්යයක් ලබා දුන් දේශපාලන චරිතයක් වූ රේණුකා හේරත් මැතිනියගේ අභාවය අපේ රටට ඉමහත් පාඩුවක්. රේණුකා මැතිනිය මාගේ පියාණන්ගේ සහෝදරියක් වාගේ එතුමාට මුහුණදීමට සිදු වූ අභියෝගාත්මක අවස්ථාවලදී අභීතව ඒ සඳහා සහය දැක්වූවා. දිවංගත ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා සමඟ එක්සත් ජාතික පක්ෂයේ සිදු වූ අරගලකාරී අවස්ථාවලදී මෙතුමිය ඒ දෙදෙනාටද ශක්තියක් වූවා. නැවත එක්සත් ජාතික පක්ෂය සමඟ එක්වී ගාමිණී දිසානායක මැතිතුමා මහවැලි අමාත්‍යවරයා වශයෙන් ක්‍රියාකරන අවස්ථාවේදී රේණුකා හේරත් මැතිනිය ඒ සඳහා ද ලොකු සහයෝගයක් ලබා දුන්නා. එක්සත් ජාතික පක්ෂයේ විපක්ෂ නායකවරයා තෝරන අවස්ථාවේදී ඡන්ද මොනවා වුනත් කන්ද උඩරට නායකයාට ඡන්ද දෙන්න ඕනයි කියලයි ගාමිණී දිසානායක මාගේ පියාණන්ට සහයෝගය ලබා දුන්නේ.

මම කුඩා කාලයේ මට මතකයි, එතුමිය දේශපාලන ක්ෂේත්‍රයේ ඉතා දක්ෂ ලෙස ක්‍රියා කළා. වතුර ලෙස කථා කළා. එතුමියගේ වියෝවීමෙන් ඇති වූ ඒ පෞඪ දේශපාලන චරිතයේ හිස්තැන පියවීමට කන්ද උඩරටින් ශ්‍රේෂ්ට වනිතා මන්ත්‍රීවරියක් බිහිවේවා කියා මම ප්‍රාර්ථනා කරනවා. මගේ සහෝදර වැවිලි කර්මාන්ත අමාත්‍ය නවින් දිසානායක මැතිතුමා දේශපාලනයට ප්‍රවේශ වූ අවධියේ මෙතුමිය උදව් කළා. ගුරු හරුකම් ලබා දුන්නා. ඒ වාගේම මම මධ්‍යම පළාත් සභාව තුළින් දේශපාලනයට ප්‍රවේශ වූ අවස්ථාවේ මාගේ ගුරුවරියක ලෙස දේශපාලනය කරන ආකාරය මට කියා දුන්නා. ජීවිතයේ අමතක නොවන උතුම් කාන්තා රත්නයක් වූ දිවංගත රේණුකා හේරත් මැතිනියට නිවන් සුව ලැබෙවා කියා මම ප්‍රාර්ථනා කරනවා.

ඒ වාගේම මහනුවර දිස්ත්‍රික්කයේ මධ්‍යම පළාත් සභාවෙන් මුස්ලිම් අමාත්‍යවරයෙක් වශයෙන් දේශපාලනයට පිවිස පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් මෙන්ම ගරු අමාත්‍යවරයෙක් වශයෙන් දේශපාලන ක්ෂේත්‍රයෙන් සමුගත් අභාවප්‍රාප්ත ඒ.ආර්.එම්. අල්හාජ් අබ්දුල් කාදර් මැතිතුමා වෙනුවෙන් අද දින මාගේ සහ අප පවුලේ ශෝකය පළ කර සිටිනවා. අභාවප්‍රාප්ත අබ්දුල් කාදර් මැතිතුමා දිවංගත මධ්‍යම පළාත් සභාවේ ගරු මහ අමාත්‍ය ඩබ්ලිව්.පී.බී.දිසානායක මැතිතුමාගේ ආරාධනයෙන් එක්සත් ජාතික පක්ෂයට එක් වූ කන්ද උඩරට මුස්ලිම් නායකයෙක්. කාදර් මැතිතුමා එක්සත් ජාතික පාක්ෂිකයන්ට එදා මහත් ශක්තියක් වුණා. පක්ෂය වෙනුවෙන් ලොකු වගකීමක් ඉටු කළා. එතුමාගේ අභාවය ද විශේෂයෙන් උඩරට ප්‍රදේශයට මහත් පාඩුවක්. ඒ.ආර්.එම්.අල්හාජ් අබ්දුල් කාදර් මැතිතුමාගේ අභාවය පිළිබඳ මාගේ සහෝදර අමාත්‍ය නවින් දිසානායක මැතිතුමාගේත් මාගේ මෑණියන්ගේත් මා ඇතුළු පවුලේ සියලු දෙනාගේම ශෝකය ප්‍රකාශ කරනවා.

අභාවප්‍රාප්ත රේණුකා හේරත් මැතිනිය වෙනුවෙන් සහ ඒ.ආර්.එම්.අල්හාජ් අබ්දුල් කාදර් මැතිතුමා වෙනුවෙන් සිදු කරන මෙම ශෝක යෝජනා එතුමන්ලාගේ පවුලේ ඥාතීන් වෙතට දන්වා යවන ලෙසට ගරු කථානායකතුමාගෙන් මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමිය.

[අ.භා.3.06]

ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය
(மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன)
(The Hon. (Dr.) (Mrs) Thusitha Wijemanna)

ගරු කථානායකතුමනි, රේණුකා හේරත් මැතිනිය, මල්ලිකා එල්ලාවල රත්වත්තේ මැතිනිය සහ අබ්දුල් කාදර් මැතිතුමා කියන මහජන නියෝජිතවරුන්ගේ අභාවයන් පිළිබඳ ශෝක ප්‍රකාශ කරන අවස්ථාවේ දී මටද වචන ස්වල්පයක් කථා කිරීමට මෙම අවස්ථාව ලබා දීම පිළිබඳ විශේෂයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මම එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරියක් හැටියට රේණුකා හේරත් මැතිනිය ගැන කථා කරනවා නම්, අපේ එක්සත් ජාතික පක්ෂයේ කාන්තා නායිකාවන්ට නායකත්වයක් දුන්න ආදරණීය මවක් විධියටයි මම එතුමියගේ චරිතය දකින්නේ. ගරු කථානායකතුමනි, රේණුකා හේරත් මැතිනිය කියන්නේ පොඩි ශරීරයකින් හෙබි කාන්තාවක්

වුණත්, බොහොම අභීත කාන්තාවක් විධියට අපි සියලු දෙනාටම කාන්තා නායකත්වයට ආදර්ශවත් චරිතයක් වුණු කාන්තාවක්. මම එතුමියව ප්‍රථමයෙන්ම හඳුනා ගත්තේ රාජ්‍ය සේවයේ ඉන්නා විටයි. වැල්ලවාය ප්‍රදේශයේ කරපු සෞඛ්‍ය සායනයකට එතුමියත් සමඟ ස්වේච්ඡාවෙන්ම ගිහිල්ලා ඒ ප්‍රදේශයේ ජනතාවට මම සහයෝගය දැක්වුවා. ඉන් අනතුරුව ක්‍රියාකාරී දේශපාලනයේ දී මම දැනගත් දෙයක් තමයි, එතුමිය තමන්ගේ නායකත්වයට, තමන්ගේ පක්ෂයට බොහොම ලැදි, බොහොම ගුණගරුක කාන්තාවක් බව. එතුමිය තමන්ගේ නායකත්වය ආරක්ෂා කරන්න හැමදාමත් කටයුතු කළා. එතුමිය හැමදාම නායකත්වයත් එක්ක, තම පක්ෂයත් එක්ක හිටපු කාන්තාවක්. එතුමිය මට බෙහෙවින්ම සමීප වුණේ පසුගිය මධ්‍යම පළාත් සභා මැතිවරණයේදීයි. රේණුකා හේරත් මැතිනිය පළාත් සභා මැතිවරණයට ඉදිරිපත්වීමත් එක්කම එතුමියත් සමඟ වැඩ කරන්න අපේ පක්ෂයේ නායකතුමා මාව වලපනේ ආසනයට දැම්මා. එතුමියත් එක්ක බලන විට කනිෂ්ඨ දේශපාලනඥවරියක් විධියට මම එතුමියට "මැතිනිය, madam, මේ විධියට අපි සංවිධානය කරමු" කියනකොට, කොච්චර තද වුණත්; කොච්චර දැඩි තීන්දු ගත්තත් සමහර වෙලාවට එතුමිය පොඩි ළමයෙක් වාගේ අපේ අදහස්වලටත් ඇහුම්කන් දුන්නා. එතුමියගෙන් දැකපු සමහර ගතිගුණවලට සමහර අවස්ථාවල දී මම බොහොම සංවේදී වුණා. එතුමියගේ නිවසේ ඔෆිස් කාමරේ දිවංගත රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ ඡායාරූපයට විදුලි බල්බයක් දාලා පැය 24ම එතුමිය ඒ නායකත්වයට ගෞරව කළා. මැතිවරණ ව්‍යාපාරය කරනකොට සජිත් ප්‍රේමදාස මැතිතුමාව මැතිවරණ ප්‍රචාරක රැලියකට ගෙන්වා ගන්න අපහසු වෙනකොට බොහොම සංවේදී වෙලා හිටපු අවස්ථා මම දැක්කා. එතුමිය බොහොම සරල ජීවිතයක් ගත කළා. අපේ නවින් දිසානායක මැතිතුමා කිව්වා වාගේ එතුමිය අවංකවම දේශපාලනය කරපු වීර කාන්තාවක් කිව්වොත් නිවැරදියි. ගරු කථානායකතුමනි, වලපනේ තිබුණු එතුමියගේ නිවසේ නැවතිලා එතුමිය සමඟ ගත කළ කාලය තුළ මම දෙයක් තමයි, බොහොම අවංක දේශපාලනයක් එක්ක සරල ජීවිතයක් ගත කරපු කාන්තාවක් විධියට එතුමිය හම්බ කරලා තිබුණේ ජනතාව විතරයි කියන එක. ඒවාගේම මම විශේෂයෙන්ම දැකපු දෙයක් තමයි සෞඛ්‍ය අමාත්‍යාංශයේ රැකියා අවස්ථාවලට වලපනේ ප්‍රදේශයේ ජනතාව කොතරම් ඇතුළත් කරලා තිබෙනවාද කියන එක. එතුමියගේ මැතිවරණ පරාජයන් ගැන හිතනකොට මට හිතෙනවා, ඒ අයුරින් රැකියාවන් ලබා දීම නිසා ඒ ජනතාව වලපනේ ප්‍රදේශය අතහැර කොළඹ පදිංචිවීමත් එතුමියගේ මැතිවරණ ව්‍යාපාරයට බාධාවක් වුණාද කියලා. එතුමිය මට බොහොම සමීප වුණු කාන්තා චරිතයක්. මගේ නායිකාවක් විධියට මම එතුමියගේ අවසාන කාලයේදීත් ඇයට බොහොම සමීප වුණා. අවසානයේ දී මහනුවර ශික්ෂණ රෝහලේ ලෙඩ වෙලා ඉන්නකොට, එතුමියගේ ආදරණීය ස්වාමිපුරුෂයා මාව දැනුවත් කළාට පසුව මම එතුමියව බලන්න ගියා. එතුමිය දැඩි සත්කාර ඒකකයේ ඉඳගෙන කඳුළු පිරුණු දෙනෙතින් යුතුව අප දෙස බලා ඉන්නකොට අපව අතහැර දාලා යයි කියලා අප හිතුවේ නැහැ.

නායිකාවක් වූ එතුමියගෙන් අපට ඉගෙන ගන්න ගොඩක් කරුණු කාරණා තිබෙනවා. ගරු කථානායකතුමනි, එතුමිය හොඳ විනයක් එක්ක තමන්ගේ නායකත්වයට, තමන්ගේ පක්ෂයට ගරු කරපු කාන්තාවක්. නායකත්වයට ළැදි කෙනෙක්. දැඩි තීන්දු තීරණ ගත්තත් බොහොම මෙලෙක් හිතක් තිබෙන කාන්තාවක් විධියටයි මම රේණුකා හේරත් මැතිනිය දකින්නේ. මම හැමදාම ආදරය කරන රේණුකා හේරත් මැතිනිය එක්සත් ජාතික පක්ෂයේ කාන්තා සංවිධානයේ "ලක් වනිතා" සංවිධානයේ සභාපතිතුමිය විධියට ලොකු මෙහෙවරක් කරපු කාන්තාවක්.

විමල් රණවීර මහත්මාත් රේණුකා හේරත් මැතිනියට ලොකු ශක්තියක් වුණා. ආදරණීය ස්වාමිපුරුෂයකු හැටියට එතුමා එතුමියට ලොකු සහයෝගයක් ලබා දුන්නා. අද අපට සතුටු වෙන්න පුළුවන්, එතුමියගේ ආදරණීය දියණිය හිරණ්‍යා හේරත් රණවීර අද දේශපාලනයට අවතීර්ණ වෙලා ඉන්න නිසා. රේණුකා හේරත් මැතිනිය කියන්නේ කාන්තාවන් වන අපටත් හොඳ දේවල් ඉගෙන ගත හැකි ආදර්ශවත් චරිතයක් තිබූ කාන්තාවක්. දේශපාලනය සහ පවුල් ජීවිතය බොහොම හොඳින් සමබරව තියාගෙන ගිය කාන්තාවක්, ආදර්ශවත් මාතාවක් වූ එතුමිය අපෙන් වෙන්වීම එක්සත් ජාතික පක්ෂයට විතරක් නොවෙයි, ලාංකීය සියලු කාන්තා පරපුරටත්, දේශපාලනයට පිවිසෙන්න ඉන්න කාන්තාවන්ටත් විශාල පාඩුවක්.

ගරු කථානායකතුමනි, මා මේ අවස්ථාවේදී බොහොම ආදරයෙන් රේණුකා හේරත් මැතිනිය කරපු ඒ කාර්ය භාරය සිහිපත් කරන ගමන්ම, මා සබරගමුව පළාත නියෝජනය කරන මහජන නියෝජිතවරියක හැටියට හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී මල්ලිකා රත්වත්තේ මැතිනිය ගැනත් කථා කරන්න ඕනෑ. මා පෞද්ගලිකව එතුමිය හඳුනන්නේ නැති වුණත්, එතුමිය කරපු මෙහෙවර අපේ රත්නපුර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන්ගෙන් අහලා තිබෙනවා. එතුමියත් මා අධ්‍යාපනය ලැබූ රත්නපුර ෆර්ගියුසන් උසස් බාලිකා විද්‍යාලයේ ආදි ශිෂ්‍යාවක්. මා සබරගමුව පළාත් සභාවේ විපක්ෂ නායකවරිය විධියට සිටියදී එතුමියගේ ආදරණීය පුතනුවන් වන සමන් දේවාලයේ බස්නායක නිලමේ, කමල් රත්වත්තේ මැතිතුමා සමඟ බොහොම සමීපව කටයුතු කළා. එතුමියත් තමුන්ගේ දේපොළ මේ රටේ ජනතාව වෙනුවෙන් වියදම් කරලා ලොකු කැප කිරීමක් කරපු රත්වත්තේ පවුලේ කාන්තාවක්. එතුමියත්අපි ආදර්ශයට ගත යුතු කාන්තාවක්.

ගරු කථානායකතුමනි, ඒ වාගේම, මේ අවස්ථාවේදී මම අපේ ගරු අබ්දුල් කාදර් මැතිතුමාත් සිහිපත් කරන්න ඕනෑ. මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරපු අපේ අබ්දුල් කාදර් මැතිතුමා බොහොම ජනප්‍රිය චරිතයක්. ජීවිතයේ ලොකු කාලයක් දේශපාලනය වෙනුවෙන් තමුන්ගේ පෞද්ගලික ධනය වියදම් කරපු ජනතා නියෝජිතයකු විධියට එතුමාත් ඉතාම ආදරයෙන් සිහිපත් කරන්න ඕනෑ.

මේ අවස්ථාවේදී දිවංගත රේණුකා හේරත් මැතිනියටත්, මල්ලිකා රත්වත්තේ මැතිනියටත් නිවන් සුව අත්වේවායි කියා ප්‍රාර්ථනා කරන අතර, අබ්දුල් කාදර් මැතිතුමාට එතුමා ඇදහූ ආගම අනුව අල්ලා දෙවියන්ගේ පිහිට ලැබේවායි කියා ප්‍රාර්ථනා කරනවා.

[පි.ප. 3.14]

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා (ජාතික ඒකාබද්ධතා, සංහිඳියා සහ රාජ්‍ය භාෂා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா - தேசிய ஒருமைப்பாடு, நல்லிணக்கம் மற்றும் அரச கரும மொழிகள் பிரதி அமைச்சர்)
(The Hon. Seyed Ali Zahir Moulana - Deputy Minister of National Integration, Reconciliation and Official Languages)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ සභානායකතුමනි, இந்த நாட்டுக்கு மிகவும் நல்ல பல சேவைகளை ஆற்றி, அமரத்துவமடைந்த மூபெரும் மக்கள் பிரதிநிதிகளை இன்று நினைவுகூர்கின்றோம். அந்த வகையில் அல்ஹாஜ் ஏ.ஆர்.எம். அப்துல் காதர், திருமதி ரேணுகா ஹேரத், திருமதி மல்லிகா ரத்வத்த ஆகியோரைப் பற்றி இங்கே இந்தச் சபை பேசிக்கொண்டிருக்கின்றது.

[ගරු සෙයිඩ් අලී සාහීර් මවුලානා මහතා]

குறிப்பாக, திருமதி ரேணுகா ஹேரத் அவர்கள், நான் ஐக்கிய தேசியக் கட்சியின் பாராளுமன்ற உறுப்பினராக இருக்கின்ற காலகட்டத்திலே எனது ஒரு சகோதரி போன்று என்னுடன் மிகவும் நட்பாகப் பழகியவர். கண்டி மாவட்டத்திலும் எனைய பகுதிகளிலும் பல கூட்டங்களிலே, பல அரசியல் மேடைகளிலே எல்லாம் நாம் ஒன்றாகக் கலந்துகொள்வோம். அந்தக் காலத்திலே, ஏ.சி.எஸ். ஹமீட் அவர்களுடனும் அப்துல் காதர் அவர்களுடனும் அங்கு செல்கின்ற நேரத்திலெல்லாம் திருமதி ரேணுகா ஹேரத் அவர்கள் எம்முடன் கலகலப்பாகப் பேசுவார். ஐக்கிய தேசியக் கட்சியின் ஆதரவுக்காகப் பல தேர்தல் பிரச்சார மேடைகளில் நாங்கள் ஒன்றாகக் கலந்துகொண்டிருக்கின்றோம். அதே போன்றுதான், அவர் சுகாதார அமைச்சராக இருந்தபோது எந்தளவு நேர்மையான முறையிலே மிகவும் முக்கியமான அந்தப் பதவியை வகித்தார் என்பது எனக்குத் தெரியும். தமிழிலே ஒரு பழமொழி சொல்வார்கள், "கடுகு சிறிதாக இருந்தாலும் காரம் பெரிது" என்று. அவ்வாறுதான் அவர் தோற்றத்திலே சிறியவராக இருந்தாலும், ஒரு iron lady போன்று தொழிற்பட்டாரென இங்கு எல்லோரும் சொல்லிக் கொள்கின்றார்கள். அந்த அடிப்படையில் அவருடைய மறைவினால் துயருற்றிருக்கும் குடும்பத்தினருக்கு எங்களுடைய அனுதாபத்தைத் தெரிவித்துக்கொள்கின்றோம்.

அடுத்து, 'காதர் ஹாஜியார்' என எல்லோராலும் அன்பாக அழைக்கப்படுகின்ற முன்னாள் பிரதியமைச்சரும், முன்னாள் அமைச்சரும் இன, மத, பேதம் பாராத மனித நேயருமான ஏ.ஆர்.எம். அப்துல் காதர் அவர்கள் தனது 79வது வயதில், 2015ஆம் ஆண்டு ஒக்டோபர் மாதம் 3ஆம் திகதி இறையடி சேர்ந்தார். 1980களிலேயே அரசியலில் புகுந்த மனித நேயமிக்க காதர் ஹாஜியார் அவர்கள் பாராளுமன்ற உறுப்பினராக இருந்த காலகட்டத்திலே, 1994ஆம் ஆண்டு நான் ஐக்கிய தேசியக் கட்சியிலே பாராளுமன்றத்திற்குத் தெரிவு செய்யப்பட்டு வந்த நேரத்திலே, எனது அன்புக்குரிய ஒரு நண்பராக எவ்வளவு நட்புத் தன்மையுடன் என்னுடன் பழகினார் என்பதை இங்கு நான் சொல்லவேண்டும்.

கம்பளை உலப்பனையில் வசித்து வந்த சாதாரண குடும்பமொன்றில் முதலாவது பிள்ளையாக 1936ஆம் ஆண்டு ஒக்டோபர் மாதம் 10 ஆம் திகதி பிறந்த காதர் ஹாஜியார் ஆறு சகோதரிகளையும் மூன்று சகோதரர்களையும் கொண்ட வராவார். இவர் தனது ஆரம்பக் கல்வியை நாவலப்பிட்டி சென் மேரிஸ் கல்லூரியில் பெற்றார். அதனைத் தொடர்ந்து வியாபாரத்தில் ஈடுபடத் தொடங்கிய இவர், முன்னாள் பிரதமரான சேர் ஜோன் கொத்தலாவல 1956இல் உலப் பனைக்கு வருகை தந்திருந்தபோது, ஐக்கிய தேசியக் கட்சியில் இணைந்து, அவரிடமிருந்து கட்சி அங்கத்துவத்தையும் பெற்றுக்கொண்டதாகச் சொல்வார். அவர் தனது 20ஆவது வயதிலேயே அரசியலிலே பிரவேசித்ததை எங்களிடம் பெருமையாகச் சொல்லிக்கொள்வார்.

ஐக்கிய தேசியக் கட்சியினூடாக அரசியலில் பிரவேசித்த இவர், 2010ஆம் ஆண்டு மே மாதம் வரை இக்கட்சியினூடாகப் பல்வேறு அரசியல் பதவிகளையும் வகித்திருக்கின்றார். ஐக்கிய தேசியக் கட்சியின் கம்பளை, நாவலப்பிட்டி, கலகெதர தொகுதிகளின் அமைப்பாளர் பதவியையும் இவர் வகித்துள்ளார். ஆரம்பத்தில் கிராம சபையில் அங்கத்தவராகப் பதவி வகித்த இவர், 1988ஆம் ஆண்டில் அறிமுகப் படுத்தப்பட்ட மாகாண சபை முறைமையின் கீழ் மத்திய மாகாண சபைக்கான தேர்தலில் கண்டி மாவட்டத்தில் போட்டியிட்டு வெற்றி பெற்றார். அதனைத் தொடர்ந்து இவர் மாகாண சபை அமைச்சராக நியமிக்கப்பட்டார். அதேநேரம் 1989ஆம் ஆண்டில் நடைபெற்ற பொதுத் தேர்தலில் கண்டி மாவட்டத்தில் ஐக்கிய தேசியக் கட்சிப் பட்டியலில் போட்டியிட்டு வெற்றிபெற்ற இவர், நகர அபிவிருத்தி பிரதி அமைச்சராக சிறிது காலம் பதவி வகித்தார். அதன் பின் 1994ஆம் ஆண்டு நடைபெற்ற பொதுத் தேர்தலிலும் போட்டியிட்டு வெற்றிபெற்றார். 2001ஆம் ஆண்டில் பிரதமர் ரணில் விக்கிரமசிங்க தலைமையிலான அரசாங்கத்தில் கூட்டுறவு அமைச்சராக நியமனம் பெற்ற இவர், 2004 வரையும் இப்பதவியை வகித்தார்.

அதனைத் தொடர்ந்து எதிரணி பாராளுமன்ற உறுப்பினராக இருந்து வந்த காதர் ஹாஜியார், முன்னாள் சனாதிபதி மஹிந்த ராஜபக்ஷவின் அழைப்பை ஏற்று, 2010ஆம் ஆண்டு மே மாதம் ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியில் இணைந்தார். அதனைத் தொடர்ந்து சுற்றாடல் மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி பிரதியமைச்சரான இவர், அரச ஹஜ் குழுவின் இணைத் தலைவராகவும் நியமிக்கப்பட்டு நல்ல பல சேவைகளை ஆற்றினார். அத்தோடு, ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியின் அக்குரணைத் தொகுதி அமைப்பாளர் பதவியும் அவருக்கு வழங்கப்பட்டது. ஐக்கிய தேசியக் கட்சியில் 44 வருடங்களும், ஸ்ரீ லங்கா சுதந்திரக் கட்சியில் 05 வருடங்களும் எனச் சுமார் அரை நூற்றாண்டு காலம் அரசியலில் ஈடுபட்டு, சுறுசுறுப்பாக மக்கள் சேவையாற்றிய காதர் ஹாஜியார், 1989ஆம் ஆண்டு முதல் தொடர்ச்சியாக 26 வருடங்கள் பாராளுமன்ற உறுப்பினராகப் பதவி வகித்துள்ளார். இப்பதவிகள் ஊடாகப் பிரதேச மக்களுக்கும் மாவட்ட மக்களுக்கும் மாத்திரமல்லாமல் முழு நாட்டுக்கும் பல்வேறு விதமான சேவைகளை இவர் ஆற்றியுள்ளார்.

குறிப்பாக, கம்பளை நகர ஜும்மா பள்ளிவாசலில் தொடராக 25 ஆண்டுகள் தலைவராக இருந்து ஆற்றிய சேவையின் காரணமாக இவர் பள்ளிவாசலின் ஆயுட்காலத் தலைவராக நியமிக்கப்பட்டார். அதேநேரம், கண்டி தலதா மாளிகை மீது புலிகள் இயக்கத்தினர் தாக்குதல் நடத்தியபோது அங்கு உடனடியாகச் சென்ற காதர் ஹாஜியார், அதன் புனரமைப்புக்காகத் தனது சொந்த நிதியிலிருந்து பத்து இலட்சம் ரூபாயைத் தலதா மாளிகை நிர்வாகத்தினரிடம் அன்பளிப்பாக வழங்கினார். This is a very significant event. When the Sri Dalada Maligawa was attacked, he immediately rushed there. He gave rupees ten lakhs from his own money for the immediate restoration. அத்தோடு கண்டி மாவட்ட முஸ்லிம்களிடமிருந்து சுமார் 25 இலட்சம் ரூபாயைச் சேகரித்து வழங்கினார். எல்லோருடனும் அன்பாகப் பழகக் கூடியவராக விளங்கிவந்த காதர் ஹாஜியார் இன, மத, பிரதேச வேறுபாடுகள் பாராது உதவிகளையும் ஒத்துழைப்புக்களையும் வழங்கக்கூடியவராக இருந்தார். அந்த வகையில் அவர் அரசியல்வாதிக்கும் அப்பால் ஒரு மனித நேயராகவே விளங்கினார் என்றால் அது மிகையாகாது.

என்னைப் பொறுத்தவரையில், அவர் என்னுடன் நல்ல நண்பராக இருந்த காலகட்டத்தில் நாங்கள் இருவரும் ஹஜ்ஜுக்குப் பல தடவைகள் சென்றிருக்கின்றோம்; 'உம்றா' செய்யச் சென்றிருக்கின்றோம். மட்டக்களப்பு மாவட்டத்திலே நான் ஒரு பாராளுமன்ற உறுப்பினராக இருக்கின்ற காலத்திலும் சரி, இல்லாதிருந்த காலத்திலும் சரி அவர் பல உதவிகளை வழங்கியிருக்கின்றார். எங்களது மாவட்டம் 2012ஆம் ஆண்டு வெள்ளப்பெருக்கால் மிகவும் மோசமான முறையிலே பாதிக்கப்பட்டிருந்தது. அந்த நேரத்திலே அவர் அங்கு நேரடியாக வந்து, அவருடைய நண்பர்களுடன் சேர்ந்து பல இலட்சக்கணக்கான ரூபாய் பெறுமதியான உணவுப் பொருட்களையும் உதவிப் பொருட்களையும் லொறிகள் மூலமாகத் தருவித்து, பாதிக்கப்பட்ட அந்த மக்களுக்கு வழங்கினார். இவ்வாறு எனது தொகுதிக்கு மாத்திரமல்ல, எங்களுடைய எனைய பாராளுமன்ற உறுப்பினர்கள் ஒவ்வொருவருடைய தொகுதிகளுக்கும் சென்று மிகவும் தனிப்பட்ட முறையிலே அவர்களுக்கு உதவுபவராக இருந்தார்.

இப்படிப்பட்ட பல சேவைகளை ஆற்றிய எங்களது காதர் ஹாஜியார் அவர்கள் அவரது மத நம்பிக்கையில் தூய்மையாக இருந்தார்; அவரது தேசாபிமானத்தில் பரிசுத்தம் இருந்தது; அவரது அரசியலில் சாந்தியும் சமாதானமும் முக்கியத்துவம் பெற்றிருந்தன; நாட்டில் முன்னேற்றமும் மக்களின் திருப்தியும் தான் அவரது இலக்காக இருந்தது. அவரது ஒவ்வொரு செயலிலும் ஜனநாயகமும் அஹிம்சையும் இருந்தது. இனியொரு நீண்ட காலத்திற்கு கண்டி மாவட்டத்திலே இவரைப்போல் ஒருவர் வரக்கூடிய ஒரு சந்தர்ப்பம் கிடைக்காதென்று கூறுமளவுக்கு அரசியலுக்கப்பால் ஆத்மீகத் துறையிலும் ஒருங்கே உயர்ந்தவராக அவர் வாழ்ந்து பிரகாசித்தார்.

அவர் அந்தக் குடும்பத்திலே சாதாரண ஒரு குட விளக்கல்ல, ஒரு குல விளக்கு! அவரைப் பார்த்து அவரது குடும்பமும் அவரது சமூகமும் "அவரைப் பார்க்க ஒளி தேவையில்லை!" என்று சொல்வார்கள். அவரது செயல்களுக்கும் சேவை களுக்கும் பட்டியல் போடத் தேவையில்லை. இன்று இந்தச் சபை அவரது சாதனைகளைக் கூறிக் கொண்டாடுகின்றது. வரலாற்றில் அவரின் பெயர் பொன் எழுத்துக்களால் பொறிக்கப்படும். அவரது ஆன்மீகப் போக்கும் எளிமையும் பணிவும் தாழ்மையும் நாட்டுப் பற்றும் சமூக சேவையும் மறு உலகிலும் அவருக்கு அழகிய வாழ்வையும் உயர்ந்த பதவியையும் கொடுக்குமென்று அல்லாஹ்வின் அருளில் ஆதரவு வைத்து நான் பிரார்த் திக்கின்றேன். அவருக்கு அல்லாஹ் "ஜன்னத்துல் பிர்தௌஸ்"ஐ உரித்தாக்கி வைப்பானாக! அவரது உயர்ந்த குணங்களுக்காக அல்லாஹ் தனது 'லிகாஹ்' என்ற சந்திப்பை அளிப்பானாக! என்று பிரார்த்தித்து, சந்தர்ப்பமளித்தமைக்கு நன்றி கூறி, பிரார்த்தனையுடன் விடைபெற்றுக் கொள்கின்றேன். நன்றி. வஸ்ஸலாம்!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීවරුනි, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී අභාවප්‍රාප්ත ගරු ඒ.ආර්.එම්. අබ්දුල් කාදර් මැතිතුමා, අභාවප්‍රාප්ත ගරු රේණුකා හේරත් මැතිනිය සහ අභාවප්‍රාප්ත ගරු මල්ලිකා රත්වත්තේ මැතිනියගේ අභාවයන් පිළිබඳව පාර්ලිමේන්තුවේ දෙපාර්ශ්වයෙන්ම කරන ලද ශෝක යෝජනාවන් අනුමත කරමින්, මමද ඒ සමඟ එකතු වීමට කැමැත්තෙමි. සර්වප්‍රාකාරයෙන්ම ගරු මන්ත්‍රීතුමා හෝ ගරු මන්ත්‍රීතුමිය වශයෙන් ආමන්ත්‍රණ ලැබීමට සුදුසු විශිෂ්ට චරිත තුනක් වශයෙන් මේ තිදෙනාම මම හැඳින්වීමට කැමැතියි. ඒ වාගේම එම පවුල්වල සාමාජිකයින් සමඟ මම තවමත් සුහදව ඇසුරු කරන බව සඳහන් කරමින්, අද දින රැස්වීමට අදාළ නිල වාර්තාවේ එනම් හැන්සාඩ් වාර්තාවේ පිටපත් ශෝකයට පත් එම පවුල්වල අය වෙත යවන මෙන් මම මේ අවස්ථාවේ දී පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාට නියෝග කරමි.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මන්ත්‍රීතුමියගේ නම යෝජනා කරන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, "ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු (වෛද්‍ය) තුසිතා විජේමාන්න මහත්මිය මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு (வைத்திய கலாநிதி)(திருமதி) துஸிதா விஜேமான்ன அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* THE HON. (DR.) (MRS.) THUSITHA *WIJEMANNA took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමා.

වන සතුන්ගෙන් සිදුවන වගා හානිය
வன விலங்குகளால் ஏற்படும் பயிர்ச் சேதம்
CROP DAMAGE CAUSED BY WILD ANIMALS

[අ.භා.3.26]

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද දින සභාව කල් තබන අවස්ථාවේ දී මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"අම්පාර දිස්ත්‍රික්කය ඇතුළුව රටේ සියලුම දිස්ත්‍රික්කවල වන සතුන්ගෙන් හා ගවයින්ගෙන් සිදුවන වගා හානි නිසා ජාතික ආහාර නිෂ්පාදනයෙන් සියයට 25කට ආසන්න ප්‍රමාණයක් ජාතියට අහිමිවෙමින් පවතින අතර, එම හේතුව මත දිනපතා එම හානිවලට මුහුණ දෙන ගොවි ජනතාව දිළිඳුකමට ඇද වැටෙමින් සිටී.

වන අලින්, රිළවුන්, වඳුරන්, මොනරුන් හා ගවයින්ගෙන් සිදුවන වගා හානි නිසා දිනපතා ගොවීන් ගොවිතැනින් ඉවත් වෙමින් සිටින අතර, මෙම ගොවි පවුල් විශාල සංඛ්‍යාවක් කුලීකරුවන් බවට පත්වෙමින් සිටී. එක් අතකින් මෙම තත්ත්වය නිසා ජාතික ආහාර නිෂ්පාදනය බිඳ වැටෙන අතර අනෙක් අතින් ජාතික නිෂ්පාදනය හීන වෙයි. තවත් අතකින් සිය ශ්‍රමයෙන් දහදියෙන් ස්වාධීන ජීවනෝපායක් ලෙස ගොවිතැන තෝරා ගත් බොහෝ දෙනෙකුට ජීවත්වීම මහත් අභියෝගයක්ව, අසරණ ඉරණමකට යටත් වීමට සිදුව ඇත.

එසේම මෙම අර්බුදකාරී ත්ත්වය මත අහිංසක වන සතුන්ගේ ජීවිතද විනාශ වීම බෙදයට කරුණකි. මෙම ගැටලුව මත විපතට පත් වන ජීවිත

[ගරු ඩී. ටී. ඩබලිව්. විමලවීර දිසානායක මහතා]

ගැන සේම ජාතික නිෂ්පාදනයට එයින් ඇති වන අහිතකර බලපෑම ප්‍රමාණිකව හෝ ගුණාත්මකව තක්සේරු කොට ඇති බවක්ද නොපෙනේ. එහෙයින් මෙම තත්ත්වය ජාතික විපත්තිදායක තත්ත්වයක් මෙන්ම අර්බුදයක් ලෙස සලකා එම විනාශකාරී ඉරණමින් රට ගලවා ගැනීමට ආණ්ඩුව ඉක්මන් ක්‍රියා මාර්ගයක් ගත යුතු යැයි යෝජනා කර සිටිමු."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සමස්ත ශ්‍රී ලංකාවේ, විශේෂ කොට වියළි කලාපයේ සහ තෙත් කලාපයේ ගොවි ජනතාව මුහුණ දෙන ඉතාම බැරෑරුම් බෙදනීය ප්‍රශ්නයක් ගැන අවධානය යොමු කරන්නට කැමැතියි. වන ජීවීන්ගෙන් සිදු වන හානියෙන් මේ රටේ ජාතික ආහාර නිෂ්පාදනයෙන් සියයට 25ක් වාර්ෂිකව විනාශයට පත් වෙනවා. ආණ්ඩුවේම සංඛ්‍යා ලේඛන අනුව පසුගිය වසර ගණනාව තුළ කෘෂිකර්ම නිෂ්පාදනය පහළ යාමටත්, දුප්පත්කම සහ නැති බැරිකම ඉහළ යාමටත් ඉතාම තීරණාත්මකව බලපාන ලද කාරණයක් තමයි වන ජීවීන්ගෙන් සිදුවන වගා හානිය.

වන ජීවීන් යනු විනාශ කළ යුතු, ඝාතනය කළ යුතු සත්ව කොට්ඨාසයක් නොවෙයි. වන ජීවීන් යනු ස්වභාව ධර්මයාගේම නිර්මාණයක්. අපද එසේමයි. එම නිසා ස්වභාව ධර්මයාගේ නිර්මාණයන් සමතුලිත නොවූ විට, එම නිර්මාණයන් ස්වභාව ධර්මයාගේම තවත් අංගයන් වෙත අභියෝගාත්මකව හැසිරෙනවා. මේ එවැනි අවස්ථාවක්. මීට අවුරුදු 200 ගණනකට පෙර ඇමෙරිකාවේ රතු ඉන්දියානු නායක සියටල් විසින් කළ සුප්‍රසිද්ධ ප්‍රකාශයක් මට මතක් වෙනවා. "මේ ගලන ගංගාවෝ, මේ කඳු වැටි, මේ තුරු ලතාවෝ අපගේ මුතුන් මිත්තෝය; අපගේ නෑදෑයෝය; අපගේ සහෝදරයෝ ය" කියලා එතුමා ප්‍රකාශ කර තිබුණා. මමද, බෞද්ධයෙක් ලෙස එසේ සිතමි. ඊයේ පෙරේදා උතුරේ දී ඉතා කෲර ලෙස, සාහසික ලෙස ඝාතනය කළ දිවියාට පමණක් නොව මම මගේ ඇහේ වසන මදුරුවාටද මෛත්‍රී කරමි, මම බෞද්ධයෙක් නිසා. අද මේ ස්වභාව ධර්මයාගේ සමතුලිතතාව බිඳ වැටීම නිසා මේ රටේ පසුගිය ඉතිහාසයේ, 1983 ඉඳලා යුද්ධය නිසා පීඩනයට පත් වුණු, දුකට පත් වුණු මිනිසුන්මයි මේ මොහොතේ නියහයෙන් දුකට පත් වෙලා සිටින්නේ.

මේ මොහොතේ වන ජීවීන්ගෙන් වැඩිම හානිය සිදු වෙන්නේත් ඔවුන්ටමයි. කථාවක් තිබෙනවා නේ, "දෙන දෙයියෝ කානුවේ දාගෙන හොම්බට ඇන ඇන දෙනවා" කියා. මේ සියලු විපත් ඔවුන්ටයි. ඔවුන් ගලවා ගන්න ශක්‍ර දේවේන්ද්‍රයා එනතුරු ඉඳලා හරියන්නේ නැහැ. මේක මේ ආණ්ඩුව නිර්මාණය කළ දෙයක් නොවෙයි. මේක ඉතිහාසය විසින්ම නිර්මාණය වුණු කාරණයක්. තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමා වෙන්න ඇති, සභාව කල් තබන අවස්ථාවේ ඉදිරිපත් කළ මේ යෝජනාවට පිළිතුරු දෙන්න ඉන්නේ. එතුමා මගේ ආදරණීය මිත්‍රයායි. එතුමාටත් මේකට විසඳුමක් තිබෙනවාද කියන එක ප්‍රශ්නයක්. දුප්පත්කම; නැති-බැරිකම; මිනිසුන්ගේ අසරණකම් ගැන කථා කරන්න මේ පාර්ලිමේන්තුවේදී ලක්ෂ ගණනක් වචන පාවිච්චි කරනවා. හැබැයි අපේ අඩුම අවධානය තිබෙන්නේත් මම මේ කියන තීරුවටයි; මේ ජන කොටසටයි.

අපේ ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ගිය සතියට එපිට සතියේ මට අම්පාරේ බිම්තැන්නපත්තුවේ පූලාවල ගමේ සෝමාවතී අක්කා හම්බ වුණා. "සර්, මම අවුරුදු 22ක් මහඔය පොළේ මෑකරල්, බණ්ඩක්කා, බටු විකුණලා හදා ගත්තු පුංචි ගේ, ඊයේ රෑ එක පැයට අලි ඇවිල්ලා කඩලා විනාශ කෙරුවා" කියා ඒ අභිංසක මනුස්සයා ඇහේ කඳුළු පුරවාගෙන අඬමින් මට කිව්වා. වනජීවී දෙපාර්තමේන්තුව ඒකට රුපියල් ලක්ෂයක් දුන්නාට ඒ අභිංසක මනුස්සයාගේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ.

පසුගිය සිංහල අලුත් අවුරුදු කාලයේ -හරියටම අප්‍රේල් 12වන දා- ටැම්පිටිය, මහඔය ගමේ අවුරුදු 16ක අහිංසක තරුණ දියණියක් අම්මයි, තාත්තයි ඉස්සරහදී අලියා පාගලා මැරුවා. ඒ අවුරුද්ද සමරන්න හෙට වාගේ දවසක් තියලායි. මේ කඳුළු පිසදමන්නේ, දුක් වේදනා විසඳන්නේ කවුද? අම්පාර දිස්ත්‍රික්කයේ ගොවි පවුල් දහස් ගණනක් ගොවිතැනින් ඉවත් වෙලා ඉන්නවා. ඇයි? ඔවුන්ගේ අස්වැන්න වඳුරන්ගෙන්, රිළවුන්ගෙන් බේරා ගන්න බැහැ; මොනරුන්ගෙන් බේරා ගන්න බැහැ; දඬු ලේනුන්ගෙන් බේරා ගන්න බැහැ; වන අලින්ගෙන් බේරා ගන්න බැහැ. ස්වාධීන ගොවි වෘත්තියේ යෙදී සිටි හම්බන්තොට, කිලිනොච්චිය, වව්නියාව, පුත්තලම, මොනරාගල, පොළොන්නරුව, අනුරාධපුර, මඩකලපුව, අම්පාර කියන දිස්ත්‍රික්කවල ගොවි පවුල් දහස් ගණනක් එයින් ඉවත් වෙලා කුලීකරුවෝ බවට පත් වෙලා ඉන්නවා. මේ ප්‍රදේශවල දුප්පත්කම වැඩි වෙනවා; මේ මිනිසුන් දවසින් දවස දුප්පත්කමට වැටෙමින් සිටිනවා. සජිත් ප්‍රේමදාස ඇමතිතුමා දවසකට ගෙවල් 50ක් හදනවා නම්, අලි දවසකට ගෙවල් 100ක් කඩනවා.

කාටවත් කියලා වැඩක් නැහැ කියා මේ මිනිස්සු උඩ බලාගෙන ඉන්නවා. පාරට එනවා; උද්ඝෝෂණය කරනවා. පාර හරස් කළාය කියා පොලීසියෙන් අරගෙන ගිහින් නඩු දමන්නේත් ඒ අහිංසක මිනිසුන්ටමයි. තමුන්නාන්සේට මේකට විසඳුමක් තිබෙනවාද, නැද්ද කියා කියන්න මම දන්නේ නැහැ, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. අලි වෙඩිත් නැහැ. අලි වෙඩි දෙන්නේත් කළු නික දෙනවා වාගෙයි. "අලි වෙඩිල්ලක්වත් දැන් නැහැ" කියනවා; "ඒවා දෙන්න සල්ලි නැහැ" කියනවා. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නැහැ; වාහන නැහැ; අවශ්‍ය සම්පත් නැහැ. මේ දේවල් ඉතිහාසයේ හරියටම තිබුණාය කියා මට කියන්න බැහැ. හැබැයි මේ මොහොතේ තිබෙන බෙදවාචකය තමයි මම මේ කියන්නේ. මේ නිලධාරීන්ටත් මේ අර්බුදයට මුහුණ දෙන්න බැහැ. අර ගොවි පවුල්වලට කන්න නැහැ. තමන්ගේ ගේ විනාශ කරනවා. කුඹුර රකින්න ගියොත් ගෙදර විනාශ කරනවා. ගෙදර රැක්කොත් කුඹුර විනාශ කරනවා. රෑ කුඹුරට ගිහින් උදේ ගෙදරට එනකොට තමන්ගේ බිරිඳයි, දරුවොයි අලියා ගහලා මැරිලා. එහෙම නැත්නම් මුළු වත්තම විනාශ කරලා. කෙහෙල් වගාව නැහැ; වී වගාව නැහැ. ජාතික ආහාර නිෂ්පාදනය වැඩි කරන්න මේ සභාව මොන යෝජනා ගෙනාවත්, මොන නිලධාරියා මොන සැලසුම් හැදුවත්, වන ජීවීන් මේ සියල්ල විනාශ කරනවා නම් කුමක්ද කරන්නේ?

මේ සත්තු මරන්න ඕනෑය කියා මම බෞද්ධයෙකු විධියට කිසිසේත්ම හිතන්නේ නැහැ; කියන්නේත් නැහැ; යෝජනා කරන්නේත් නැහැ. ඉස්සර මොනරු දකින්න නම්, අපි විල්පත්තුවට හෝ යාලට හෝ යන්න ඕනෑ. නමුත් දැන් මගේ ගේ ඉස්සරහා මොනරු ඉන්නවා. මම උදාහරණයක් කියන්නම්. මම පදිංචි වෙලා ඉන්නේ හිඟුරාන සීනි සමාගමේ නිල නිවාසයකයි. එතැන වටේට ගෙවල් 1,000ක් පමණ තිබෙනවා. හැබැයි, මම ජීවත් වෙලා සිටින ඉඩමේ මඤ්ඤොක්කා දණ්ඩක් හිටවන්න බැහැ, රිළවු කනවා. මෑ කරල් වැලක් හැදී ගෙන එනකොටම මොනරු කනවා. මේ ඉරණම අනික් හැමෝටමත් පොදුයි. එම නිසා නිෂ්පාදනය වැඩි වෙන්නේ නැහැ, පහළට කඩාගෙන වැටෙනවා. මේකට විසඳුමක් විධියට අලි වැට ගහනවා. මේ රටේ කිලෝමීටර් 4,000ක් දැන් අලි වැට ගහලා තිබෙනවා. නමුත්, මේ ප්‍රශ්නය විසඳිලාද? නැහැ. මේකට විසඳුම් ගණනාවක් තිබෙනවා. "ජීව වැට" කියා එක විසඳුමක් තිබෙනවා. දැනට හණ, තල්, දෙහි වැනි ගස් ජීව වැටට යොදා ගන්නවා. මේ සඳහා බෝගන්විලාත් යොදා ගන්න පුළුවන්. හැබැයි, අපි ඒක ව්‍යාප්ත කරලාත් නැහැ. දැන් වන අලින්ගෙන් එල්ල වන කරදර එල්ටීටීඊ යුද සමයට වඩා භයානකයි. හැන්දෑවේ හයෙන් පස්සේ මේ ගම්වල මිනිස්සු අල්ලපු ගෙදරටවත් යන්න භයයි. මොකද, මහදි අලියා මුණ ගැහෙනවා. හවස් වනකොට ඒ ගම්වලට ඇදිරි නීතිය දමා වාගේයි. ඒ ගම්වල මිනිසුන්ගේ ජීවිත අද සම්පූර්ණයෙන්ම කඩාගෙන වැටිලා.

මම ඊයේ පෙරේදා දිනයක මහනුවර දිස්ත්‍රික්කයේ හතරලියැද්ද කියන ගමට ගියා. ඒ ගම වටේ හැම තැනම පොල් වතු තිබෙනවා. මම ඒ ගමේ කඩයකින් ඇහුවා, පොල් ගෙඩියක් කීයද කියා. "රුපියල් 95යි" කිව්වා. මෙපමණ පොල් තියෙද්දි, පොල් ගෙඩියක් මෙපමණ ගණන් ඇයි කියා මම ඇහුවා. "මහත්තයෝ, ඔය එක ගහකවත් පොල් ඇට්ටියක් නැහැ, පොල් ඇට්ටි ඔක්කෝම රිළවි කාලා. එක ගහකවත් පොලොස් ගෙඩියක් නැහැ, පොලොස් ඔක්කෝම සත්තු කාලා" කියා ඒ කඩයේ මුදලාලි කිව්වා. පොලොස් ගෙඩියක් ගහේ නැත්නම්, පොල් ගහේ කුරුම්බැට්ටියක් නැත්නම් සිදුවෙමින් තිබෙන්නේ කුමක්ද? කොපමණ පොල් හිටෙව්වත්, අපේ කෘෂිකර්ම ඇමතිතුමා කොස් ගස් දස ලක්ෂයක් හිටෙව්වත් ඒවායේ ගෙඩි කෝ? මේකට තිබෙන විසඳුම මොකක්ද? අලි වැටක් ගහලා කම්බියක් ඇදලා මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්කමක් නැහැ. හැබැයි, විනාශයට පත්වන ඒ ගම්වල වගාවන්ට තිබෙන සාධාරණ විසඳුම මොකක්ද? තම වගාවන් හරකුන්ගෙන් බේරාගන්න බැරි නිසා; අලින්ගෙන් බේරාගන්න බැරි නිසා මිනිස්සු දැන් මා ඔය පැත්තේ කුලියට හරක් බලනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(මාණ්පුමිකු ඩෙ.ටී.ඩබිළ්යු. විමලවීර තිසානායක්ක)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ප්‍රශ්නය දිගයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
එහෙම නම්, අනික් කථිකයන්ගෙන් වෙලාව ගන්න.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(මාණ්පුමිකු ඩෙ.ටී.ඩබිළ්යු. විමලවීර තිසානායක්ක)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
ඒ පිළිබඳව මා දන්නේ නැහැ. මම මේ දේවල් කිව්වාය කියා මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැතිවන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ ප්‍රශ්නය ඉතා බරපතළ එකක්. මේ ප්‍රශ්නය ඔබතුමියට බලපාන්නේ කොහොමද කියා මම දන්නේ නැහැ. ප්‍රශ්නයත් කෙටි කරනවා නම්, මගේ කථාව කෙටි කරන්න පුළුවන්. මගේ කථාව දික් වුණාය කියා ප්‍රශ්නයට විසඳුමක් ලැබෙයි කියාත් මම හිතන්නේ නැහැ.

දැන් තිබෙන ප්‍රශ්නය මෙයයි. කුලියට හරක් බලන මිනිසුන්ගේ කිරි ටිකත් දැන් ගන්නේ නැහැ. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කිරි ගත්තත් මාස ගණනාවකින් මේ මිනිසුන්ට ශත පහක්වත් ගෙවා නැහැ. මිල්කෝ සමාගමට සල්ලි ගෙවන්න විධියකුත් නැහැ. මේ මිනිසුන්ට කුඹුර නැහැ; හේන නැහැ; ජීවත් වන්න මහක් නැහැ. කුලියට හරක් බලන්න ගියා, කිරි ටික දුන්නාට සල්ලි දෙන්නේත් නැහැ. අපි අජීවී ඉලක්කම්වලින්, "අර වාර්තාව", "මේ වාර්තාව" කියා මේ පාර්ලිමේන්තුවේ කථා කළාට; චීන ලෝක හදාගෙන හිටියාට මහ පොළොවේ යථාර්ථය මේකයි. මගේ මිත්‍රයකු වන පාලිත තෙවරප්පෙරුම මැතිතුමා මම මේ කියන දේ විශ්වාස කරයි කියා මම හිතනවා. මේ මහ පොළොවේ මෙවැනි දේවල් සිදුවනවාය කියන එක ගැන එතුමාට යම් අවබෝධයක් තිබෙනවා. කරුණාකරලා ඔබතුමන්ලා මේ ප්‍රශ්නයට විසඳුමක් දෙන්න. විසිඑක්වන සියවසේ මොන "ස්මාර්ට්" තාක්ෂණය තිබුණත්, "ස්මාර්ට්"පන්ති හැදුවත් මේ බෙදවාචකයට විසඳුමක් ලැබෙන්නේ නැහැ.

අම්පාර දිස්ත්‍රික්කයේ තරුණ දරුවන්ගෙන් කොටසක් දැන් "ගාර්මන්ට්" වලට එනවා. තවත් කොටසක් සිවිල් ආරක්ෂක බලකායට ගියා. ඒ ගොල්ලන් කොළඹට ගෙනැත් පාර්ලිමේන්තුව එහා පැත්තේ තිබෙන කුණු කානු සුද්ද කරන්න දමා තිබෙනවා. ඉස්කෝලේ යන ළමයි ඒ අයට කියන්නේ, "කුණු මාමලා" කියායි.

ඒ අය කඩෙකට ගිහින් තේ එකක් ඉල්ලුවාම කියනවා, "කෝප්පයක් අරගෙන එන්න." කියලා. අම්පාරේ ඒ දරුවන්ට කඩේ කෝප්පයෙන් තේ දෙන්නේ නැහැ. ගොවි බිම් නැති නිසා ඉතිරි තරුණ පිරිස කොළඹ එනවා මෙසන් බාසුන්නැහේලාට කුලියට අත් වැඩ දෙන්න. මේ, දිගාමඩුල්ලේ දරුවාගේ ඉරණමයි. මේ සීතල සභා ගර්භයට මෙය දැනෙනවාද, නැද්ද කියා මම දන්නේ නැහැ. තවත් ටික දවසකින් අපේ සරත් ෆොන්සේකා ඇමතිතුමා කියාවි, 'පිටකොටුවේ බෝධිය ළඟත් අලි රංචුවක් ඉන්නවා.' කියා. එදා වනතුරු ද අප බලාගෙන ඉන්නේ. මේ බේදනීය ඉරණමට ගොදුරු වූ ඒ අහිංසක මිනිසුන්ගේ දුක්ගැනවිල්ලට මේ පාර්ලිමේන්තුවට විසඳුමක් නැතිනම් මෙය තිබෙන එකේ තේරුමක් නැහැ. වඩා දුකට පත් වූ මිනිසුන්ගේ හඬ මේ ගරු සභාවට ඇහෙන්නේ නැතිනම් කෝටි ගණනක් වියදම් කරලා මේ ගරු සභාව නඩත්තු කරන එකේ තේරුමක් නැහැ. ඉලක්කම් සෙල්ලමෙන් මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම මීට වඩා කතා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. දෙයිහාමුදුරුවනේ, ඒ අහිංසක මිනිස්සු යුද්ධයෙන් දුකට පත් වුණා, නියඟයෙන් දුකට පත් වුණා, දැන් වන ජීවීන් නිසාත් දුකට පත් වෙනවා! ඔවුන් ගලවා ගන්න කවුරුත් නැත්නම් මා මේ ගරු සභාවේ සිටින එකේ තේරුමක් තිබෙනවා කියා මම විශ්වාස කරන්නේ නැහැ. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමා ගෙන ආ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ස්ථිර කරන්නේ, ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා.

[අ.භා.3.40]

ගරු ජානක වක්කුඹුර මහතා
(මාණ්පුමිකු ජානක වක්කුම්පුර)
(The Hon. Janaka Wakkumbura)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියගෙන් අවසරයි. ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමා ගෙන ආ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මඟින් එතුමා කියා සිටියේ, වන සතුන්ගෙන් සිදු වන හානි නිසා රටේ ආහාර නිෂ්පාදනය පහළ වැටීමත්, නිවාස, දේපළ හා ජීවිත විනාශ වීමත් පිළිබඳවයි. එතුමා ගෙනාවේ කාලෝචිත යෝජනාවක්. මේ දින ගණනාව තිස්සේම රටේ හැම තැනම පාහේ වන ජීවීන්ට සිදු වන හානියත්, වන ජීවීන් නිසා ජනතාවට වන හානියත් අපි මාධ්‍ය තුළින් දකිනවා. අපි ඊයේ දැක්කා කිලිනොච්චියේ සිද්ධියක්. ටිකක් ප්‍රමාද වෙලා ගිය වනජීවී නිලධාරීන්ට තම රාජකාරිය කරන්න නොදී ගමේ අය නීතිය අතට අරගෙන ලංකාවේ වඳ වී යන සතකු වන දිවියකු ඝාතනය කරලා, සෙල්ෆි ගහලා, මැරුණු ඒ දිවියා අරගෙන පාරේ ඇවිද ඇවිද, රහ දක්වමින් හරියට රටක් විනාශ කරපු හොරෙකු ඇල්ලුවා වාගේ, එහෙම නැත්නම් පාතාලකාරයකු ඇල්ලුවා වාගේ -ලොකු චණ්ඩිකමක් කළා වාගේ- පෙන්වනවා අපි මාධ්‍ය තුළින් දැක්කා. ඊයේ නියෝජ්‍ය අමාත්‍යතුමා කියනවා මම දැක්කා, "ඒ වෙනුවෙන් නීතිය හරියාකාරව ක්‍රියාත්මක කරාවි." කියා. කොටියකු මරලා විශාල පිරිසක් බලා සිටියදී අර විධියට හැසිරුණු අයට විරුද්ධව නීතිය ක්‍රියාත්මක නොකරනවා නම් කුමක් වේවිද?

[ගරු ජානක වක්කුඹුර මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, සිංහරාජයට අයිතිව සිටින වන අලි දෙදෙනා මීට හරියටම අවුරුද්දකට පෙර ඒ ගමේ දෙදෙනකුට ගහලා එකම තැනදී මැරුවා. අපේ දිස්ත්‍රික්කයේ සයිප්‍රස්වත්ත කියා ගමක් තිබෙනවා. ඒ ගමේ ඉඳලා පහළට කිලෝමීටර පහක හයක දුරක් ගෙවලා පාරට ඇවිල්ලා තමයි ඉස්කෝලයට යන්න ඕනෑ. දරුවන් ඉස්කෝලේ ඇරිලා ගෙදර යනකොට කොහොමටත් හවස 4.00, 5.00 විතර වනවා. අලියා ඉන්න නිසා ඒ දරුවන් ගන්න අම්මලා මහට එනවා. දවසක් අම්මා කෙනෙක් ආවා තමන්ගේ දරුවා ගන්න. ඒ අම්මාගේ වයස අවුරුදු 35යි. 2017.05.16 වන දායි මේ කියන සිද්ධිය වුණේ. ඒ කියන්නේ මීට අවුරුද්දකට ඉස්සර වෙලායි. "ලක්මාලි" තමයි ඒ අම්මාගේ නම. ඒ අම්මා දරුවා අරගෙන එනකොට අලියා ඒ අයගේ ඉස්සරහට ආවා. දරුවා බේරාගන්න ඕනෑ නිසා අම්මා කළ වැඩේ, දරුවා පල්ලමට තල්ලු කරපු එකයි. අම්මට අලියා ගහලා මැරුවා. අර පල්ලමෙන් පෙරළී ගිය දරුවා කැලේ අස්සෙන් ගිහින් තාත්තාට කිව්වා, "අම්මට අලියා ගැහුවා." කියලා. තාත්තා අල්ලපු ගෙදර කෙනාත් අඩ ගහගෙන ගියා මිනිය බලන්න. ඒ යනකොට මහදී අල්ලපු ගෙදර කෙනාට අලියා ගහලා මැරුවා. ඒ ගෙදර දරුවෝ පස් දෙනායි. ඒ දරුවන් පස්දෙනාට තාත්තා අහිමි වුණා. අනෙක් ගෙදර දරුවන් තුන්දෙනාට අම්මා අහිමි වුණා. එය සිදු වුණේ මීට අවුරුද්දකට ඉස්සර වෙලා එකම දවසේයි. ඊළඟ අවුරුද්දේ, එනම් 2018 මැයි මාසයේ 21වන දා -අර සිද්ධියට හරියටම අවුරුද්දකට පස්සේ- ආයෙත් අලියා ඇවිත් ය 12.00ට විතර අවුරුදු 80ක් වයස මාමා කෙනෙකු ගෙයින් එළියට බහිනකොටම ගැහුවා.

ගහලා මැරුවා. 2000 ඉඳලා මේ වාගේ සිද්ධීන් 15ක් සිදුවෙලා තිබෙනවා. සිද්ධීන් 15 සම්බන්ධයෙන්ම කිසිම කාර්ය භාරයක් ඉෂ්ට වුණේ නැහැ. මේ වෙනකොට යටන්තැන්න කියන ප්‍රදේශයේ මහ පාර අයිනේ මේ අලි දෙදෙනා ගැවසෙනවා. මිනිස්සු කොහේවත් යන්නේ නැහැ. දැන් මට අපේ එක්කෙනෙක් කථා කරලා කිව්වා, "අලි වෙඩි ගහනවා." කියනවා. හරියට අර උතුරේ යුද්ධය තිබුණා වාගේ. මිනිස්සු රක්ෂාවලට යන්නේ නැහැ. පෙරේදා ය කෝපිකැල්ල ඉස්කෝලෙට අලි ඇවිල්ලා කුඩු කරලා දැම්මා. දැන් ඉස්කෝලේ ඇරෙනතුරු අම්මලා තාත්තලා එතැන ඉන්නවා. ඇමතිතුමන්ලා කියලාද කොහේද, මේ දවස්වල නම් වනජීවී නිලධාරිවරයකුත් ඉස්කෝලේ ළඟ ඉන්නවා. ඉස්කෝලෙන් ගෙදර යනකොට ආරක්ෂාව දෙන්නේ කවුද? ඉස්කෝලේ ඉන්නකොට ආරක්ෂාව ලබා දෙයි. ඉස්කෝලෙන් ගෙදර යනකොට ආරක්ෂාව දෙන්න බැහැ. අලි කොහේ ඉන්නවාද කියලා දන්නේ නැහැ. මේ ප්‍රශ්නය ගැන සානුකම්පිකව හිතන්න ඕනෑ. මේ කොහේවත් පැත්තක ඉන්න අයට මේක දැනෙන්නේ නැහැ. මමත් ඉන්නේ රත්නපුරයේ. මගේ ආසනය කලවාන වුණාට මම ඉන්නේ රත්නපුරයේ. නියෝජ්‍ය ඇමතිතුමා ඉන්නේ කොහේද? එතුමා ඉන්නේ කළුතර. ඇමතිතුමා ඉන්නේ කොළඹ. හැබැයි, ගමේ මිනිස්සුන්ටයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. තව කට්ටියකට අර වේදීන්, මේ වේදීන් කියලා කියනවා. ගමේ ඉන්න අහිංසක මිනිස්සුන්ගේ දුකට, ඒ මර බියට ඇහුම්කන් දෙන්න ඕනෑ. දැන් කියනවා, ලෝක උරුමයෙන් සිංහරාජය අයින් කරනවාලු. මේ අලි දෙදෙනාගේ වයස කීයද? නියෝජ්‍ය ඇමතිතුමනි, අලි තුන් දෙනෙක් හිටියා. කෝ අම්මා? ඇතින්න කෝ? ගිය අවුරුද්දේ හිටියා. මේ අවුරුද්දේ ඇතින්න නැහැ. මේ පිළිබඳව කිසි කෙනෙක් ඇහුවාද? සිංහරාජයේ හිටපු අලි තුන් දෙනාගෙන් එක්කෙනෙක් අඩු වුණාය කියලා ලෝක උරුමය ගැන කථා කරන යුනිසෙෆ් එකෙන් ඇහුවාද? හොයන්න කිව්වාද? අලියාට බෙහෙත් දමන්න කිව්වාද? නැහැ. ඇතින්න නැහැ. දැන් ඉන්නේ පුතාලා දෙන්නා. තව බෝ වෙයිද? ලෝකයේ කොහේවත් එහෙම වෙන්නේ නැහැ නේ. එහෙම බෝ වෙන්නේ නැහැ. මේ අලි දෙදෙනාගෙන් එක අලියෙකුට වයස අවුරුදු 60යි. මීට අවුරුදු 20කට ඉස්සරවෙලා මේ පොඩි අලියා ඇල්ලුවා. එදා ඌට වයස අවුරුදු 35යි. මට මතක හැටියට දොස්තර අතපත්තු මැතිතුමා තමයි ගිහින් ඇල්ලුවේ. එතුමා එදා කිව්වා, "මේ අලියාට වයස අවුරුදු 35යි." කියලා. ඒ අනුව දැන් අවුරුදු 55ක් වෙන්න ඕනෑ. අලියාගේ පරම ආයුෂ අවුරුදු 75යි, නැත්නම් 80යි. අවුරුදු 60න් පස්සේ අලින්ගේ හක්කේ දත්වලින් මොකුත් අල්ලන්න බැරි වුණාම, වැඩි කාලයක් ජීවත් වන්නේ නැහැ. මේ දෙදෙනා තව වැඩිම වුණොත් අවුරුදු 15ක් ජීවත් වෙයි. එතකොට ලෝක උරුමයෙන් සිංහරාජය අයින් කරනවාද? දැන් කියනවා, සිංහරාජයේ ඉන්න අලි දෙදෙනා වෙනත් පැත්තකට ගෙන ගියොත් මැරෙනවා කියලා. ඇයි, තෙත් කලාපයේ අලි දෙදෙනකුට වෙනත් ප්‍රදේශයක ජීවත් වෙන්න බැරිලු. එහෙම නම් මේ අලි දෙදෙනා මැරුණු දවසකට වෙනත් පැත්තකින් අලි ගිහිල්ලා සිංහරාජයට දමන්න ඕනෑ, ලෝක උරුමය බේරා ගන්න. එහෙම නම් වියළි කලාපයේ අලින්ට තෙත් කලාපයේ ජීවත් වෙන්න පුළුවන්ද? මේ ලෝක උරුමය, ලෝක කරුමයක් කරන්න එපා. මිනිස්සු වෙනුවෙන් ලෝක උරුමය රැක ගන්න. මේවා ලෝක විහිළු. ඒ එක එක ඒවා දමනවා. මම කියන්නේ නැහැ, මේ අලි දෙදෙනා මරන්න ගෙන යන්න හරි වෙන කොහේ හරි ගෙන යන්න කියලා. මමත් අලින්ට කැමැතියි. පෞද්ගලිකව මටත් අලි හිටියා. දැන් උන් වයසට ගිහිල්ලා මැරිලා. අපේ ගෙදරත් අලි තුන් දෙනෙක් හිටියා. උන් වයසට මැරුණේ. දැන් අලි කාටවත් හදා ගන්න දෙනවාද? එහෙම දෙන්නේ නැහැ. පන්සලේ හාමුදුරුවෝ අලියා හදා ගන්නකොට උසාවි ගිහිල්ලා නඩු දමනවා. අර කොටියා මරපු උදවිය බොහොම හොඳින් ඉන්නවා. ඇමතිතුමනි, මම කියන්නේ අලි වැඩි නම් මිනිස්සුන්ට හදා ගන්න දෙන්න කියලා. එතකොට මිනිස්සු හදා ගනිවි. ඒ නිසා ඔබතුමා මේ ගැන බොහොම සානුකම්පිකව හිතන්න. ඇමතිතුමාත් එක්ක ගමට ගියාම, ගමේ මිනිසුන්ගේ දුක දැක්කා. ඊයේ නැත්නම් පෙරේදා "දෙරණ" නාලිකාවේ පෙන්නුවා, ඔබතුමන්ලා හිටපු රැස්වීමේදී අම්මා තාත්තා නැති වුණු දරුවෙක්, "අපට ඉස්කෝලේ ගිහින් ඉගෙන ගන්න බැහැ"යි කියලා කියනවා. ඒ නාලිකාවේ ඒක හොඳට පෙන්නුවා. මේ අය අහිංසක දරුවෝ. කොළඹ ඉන්න අයගේ දරුවන්ට යුද්ධය නැති නිසා බොහොම සැපෙන් ඉගෙන ගන්න පුළුවන් වාගේ අපේ අහිංසක දරුවන් ඉගෙන ගන්න කෝපිකැල්ල ගමේ වහලා තිබ්බා ඇරලා දුන්න ඉස්කෝලේ වහන්න දෙන්න එපා. කපුගස්වත්ත ඉස්කෝලෙට ඔය කැලේ හරහා ළමයි එන්නේ. ඒ අය එන්නේ 7.30 පහුවෙලා. ඇයි? හොඳට එළිය වැටුණාට පස්සේ තාත්තා පාර බලලා එනවා අලියා ඉන්නවාද කියලා. ඇයි? තාත්තා මැරුණත් දරුවාට ආදරෙයි. මේ මිනිස්සු බොහොම දුකෙන් ජීවත් වන්නේ. කලවානේ ඉස්කෝලෙට එන්න ඉස්සර 5.00ට නැඟිටිනවා. දැන් කවුරුවත් එන්නේ නැහැ. මේ දරුවන්ගේ ජීවිත අලින් දෙදෙනා රැක ගෙන මේ දරුවන්ගේ ජීවිතත් රැක ගන්න. ඒ ප්‍රදේශයේ මිනිස්සුන්ට පොල් ගහක් නැහැ. මේ වෙනකොට අලි කෙසෙල් ගස් ලක්ෂයකට වඩා විනාශ කර තිබෙනවා. තේ වත්තක වැඩ කරන්න බැහැ. අලියා දැක්ක ගමන් මිනිස්සු දුවනවා. අලිම තමයි. හැබැයි, ඒ ජාතියේ අලි දෙදෙනෙක් කොහේවත් නැතිව ඇති.

එහෙම නේද, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි? සිංහරාජයේ ඉන්නේ බොහොම ලස්සන, හොඳ අලි දෙන්නෙක්. උන් දෙන්නා රැක ගන්න ඕනෑය කියා අපි කියනවා. සිංහරාජ වනයේ හෙක්ටෙයාර 25,000ක භූමි ප්‍රමාණයක් තිබෙනවා. දවස් කිහිපයකට හෝ මේ අලි දෙන්නා ඒ කැලයට පන්නන්න කියා මම ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා. එතකොට ඒ දින කිහිපයේවත් මේ ගමේ මිනිසුන්ට කරදරයක් නැතිව ඉන්න පුළුවන්.

අනෙක් සතුන්ට වාගේ නොවෙයි, අලින්ට මද කිපෙනවා කියා කාලයක් තිබෙනවා. ඒ අලි දෙන්නාට වෙන ගැහැනු සත්තු එහේ

නැහැ. ඒ කාලයේ තමයි ගමට ඇවිත් ගමේ මිනිසුන්ට ගහන්නේ. ඒක නවත්වන්න කාටවත් පුළුවන්කමක් නැහැ. ඒ කාලයට උන් අහු වුණු කෙනෙකුට ගහනවා. සතා නේ. හැම දාම මේ කාලයට තමයි ඇවිල්ලා මිනී මරන්නේ. ඔබතුමන්ලා මේ ප්‍රශ්නයට විසඳුමක් දෙන තෙක්, අඩුම ගණනේ මේ අලි දෙන්නා කැලේට හෝ පන්නලා, මේ මිනිසුන්ගේ ජීවිතවලට සිදු වන හානිය නවත්වන්න කියා මම ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මම ඔබතුමාට යෝජනාවක් කරනවා. මේ අලි දෙන්නා අක්කර 15ක, 20ක, 30ක, 40ක ඉඩමකට දමන්න එපා. කන්න දෙයක් නැතිව ඒ සත්තු මැරිලා යයි. සිංහරාජයට යාව, ඉලුඹකන්දවත්ත කියා අක්කර 500ක ඉඩමක් තිබෙනවා. මේ අලි දෙන්නා වෙන කොහාටවත් ගෙන යන්නම බැරි නම්, අලි වැටක් ගහලා ඒ අක්කර පන්සියයේ ඉඩමට මේ අලි දෙන්නා දමන්න පුළුවන්. අවශ්‍ය නම් මම ඔබතුමාට ඒ ස්ථානය පෙන්වන්නම්. ඒක සිංහරාජයටත් අයිති නැහැ. එය LRC එකට අයිති ඉඩමක්. ඒ ඉඩමේ කවුරුවත් මොනවත් කරන්නේ නැහැ. කැලයක්ම තිබෙනවා. මෙන්න මේ කැලය අලි වැටකින් වට කරලා, මේ අලි එතැනට ගිහින් දැම්මොත්, අලි දෙන්නාත් බේරෙයි, මේ ගම්වල මිනිසුන්ගේ ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුමකුත් ලැබෙයි. එහෙම නොකර, ගමේම කොහේ හෝ අයිනකට මේ අලි දෙන්නා කොටු කරන්න ගියොත්, මේ සතුන් නිකම්ම නැති වෙයි. උන්ගේ පරම ආයුෂ විඳින්න ඉඩ දෙන්න.

මෑතකදී දිවියෙක් මැරුවා. දැන් විල්පත්තු වනාන්තරයේ අලි මරනවා. ඒ සතුන්ගේ දළ කපනවා. මේවා සම්බන්ධයෙන් කිසිම කෙනෙක් මොනවත් කරන්නේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට තව සුළු වෙලාවක් දෙන්න.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නයට මැදිහත් වෙන්න. ඔබතුමා දෙතුන් වතාවක් එහාට ගිය නිසා ඒ ගමේ මිනිසුන්ගේ දුක, කදුළු දකින්න ඇති. ඒ මළ ගෙදරට ගියා නේ. ඒ වෙලාවේ මිනිසුන් අඬ අඬා කිව්වේ එකම දෙයයි. ඒ නිසා අපි ඒවාට ඇහුම්කන් දෙන්න ඕනෑ. සමහර මිනිස්සු අපට බණිවි. හොඳ දෙයක් කළත් බණිනවා, නරක දෙයක් කළත් බණිනවා. මම කථා කරන්නේ මේ මිනිස් ජීවිත වෙනුවෙනුයි.

කෝපිකැල්ල කියන ගමේ කෙනෙකුට අලියෙක් ගහලා මරා දමා තිබුණා. එක දවසක් ය 11.45ට විතර මම ඒ මළ ගෙදරට ගියා. අලියා මහ ඉන්න නිසා ඒ මළ ගෙදර හිටිය මිනිස්සු පාන්දර හතරහමාර වනතුරු මට එන්න දුන්නේ නැහැ. "සර්, යන්න එපා, එළිවෙනතුරු ඉඳලා යන්න" කියා ඒ මිනිසුන් මට කිව්වා. මමත් රාත්‍රිය එහේ ඉඳලා බයෙන් ආවේ. මම එදා එනකොට අලියා පාරේ ඉඳලා මගේ security අංශයෙන් වෙඩි තිබ්බා නම්, "වක්කුඹුර ගිහිල්ලා අලියා මැරුවා" කියාවි. "ජානක වක්කුඹුරට අලියා ගහන්න හැදුවා" කියා එතකොට කවුරුවත් කියන්නේ නැහැ. "මේ අලි දෙන්නා මරන්න හදනවා, ඒ ගැන පරීක්ෂණයක් කරන්න" කියන්න දෙන්නෙක් යනවා මම දැක්කා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කවුරු හෝ මේ අලි දෙන්නා මරන්න හදනවා නම්, ඒ වෙනුවෙන් නීතිය තදින්ම ක්‍රියාත්මක කරන්න. ඒ වාගේම, අර දිවියා මරපු අයටත් නීතිය හරියටම ක්‍රියාත්මක කරන්න.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, අලි දෙන්නා ගෙනයන්න කියා කලවානේ මිනිස්සු පසුගිය කාලයේ උද්ඝෝෂණයක් කළා. රක්වාන පොලීසිය ඒ මිනිස්සු අරගෙන ගිහින් මොකද කළේ? ඔවුන් දින 14කට රිමාන්ඩ් බන්ධනාගාරගත කළා. එහිදී නීතිය හොඳින්ම ක්‍රියාත්මක කළා. ඒ දරුවන් දෙමව්පියන් වෙනුවෙන් උද්ඝෝෂණය කරනකොට, පාර අවහිර කළාය කියා තමයි එහෙම කළේ. අන්න නීතිය ක්‍රියාත්මක වුණු තැන! තමන්ගේ අම්මා, තාත්තා මැරුණාම, ඒ ගොල්ලන් වෙනුවෙන් නීතිය ක්‍රියාත්මක කරන්න කියා ඉල්ලීමක් කරන්න ගියාම, එහෙම ක්‍රියා කළා. දිවියා මරපු අයටත් ඒ විධියටම, හරියටම නීතිය ක්‍රියාත්මක කරන්න කියා මම කියනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ ප්‍රශ්නය විසඳන්න ඔබතුමාට පුළුවන්කමක් තිබෙනවා. කවුරු නියෝග දුන්නත්, මේ ප්‍රශ්නය විසඳන්න කටයුතු කරන්න. ඔබතුමා ඒ ගමේ අහිංසක මිනිසුන්ගේ පැත්ත අරගෙන කටයුතු කරන්න කියා ඉල්ලා සිටිමින්, ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමාගේ කාලෝචිත යෝජනාව නැවත වතාවක් ස්ථිර කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සන්දිත් සමරසිංහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා.3.53]

ගරු සන්දිත් සමරසිංහ මහතා
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මට කථා කිරීමට කාලය ලබාදීම පිළිබඳව පළමුවෙන්ම ඔබතුමියට ස්තුතිවන්ත වනවා. ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමා අද ඉදිරිපත් කර තිබෙන කාරණය අද ඊයේ ඇති වුණු දෙයක් නොවන බව අප දන්නවා. ඒ කාලයේ ඉඳලාම අලි-මිනිස් ගැටුම් ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම, වෙනත් සත්වයන් එක්කත් අපේ අහිංසක ජනතාව ගැටිලා තිබෙනවා. මේ ගැටීම් වැඩි වෙන්න හේතුවක් තිබෙනවා. ඒ තමයි, ජනගහනය වැඩිවීම සහ සත්වයන්ට ජීවත් වෙන්න වනාන්තරවල ඉඩ නැතිවීම. නමුත්, රජයක් හැටියටත්, ඒ වාගේම අමාත්‍යාංශයක් හැටියටත්, ජනතාව ආරක්ෂා කරන වැඩ පිළිවෙළකට අප යා යුතුයි.

පසුගිය ආණ්ඩුව කාලයේත් ඇමතිවරු හිටියා; එතුමන්ලා මේ විෂයය ගැන කථා කළා; ඒ සම්බන්ධ විශේෂඥයන් හිටියා. හැබැයි කවුරුවත් ඒ ප්‍රශ්නවලට තිරසර උත්තරයක් දුන්නේ නැහැ. අලි ගැන දන්නා විශේෂඥයන් හිටියා, වන ජීවීන් ගැන දන්නා විශේෂඥයන් - consultants - හිටියා. නමුත් ඒ අයට ඇහුම්කන් දීලා, ලංකාවට ඔබින, අපේ ගම්වලට ඔබින විසඳුමක් දීලා නැහැ. ඒ වාගේම මේ දෙපාර්තමේන්තු -විශේෂයෙන්ම වනජීවී දෙපාර්තමේන්තුව- දිහා බලනකොට අපි දකිනවා, එහි ඉන්න පිරිස -සංඛ්‍යාව- අඩු බව. හැබැයි අපේ ගරු සරත් ෆොන්සේකා ඇමතිතුමාත්, ගරු පාලිත තෙවරප්පෙරුම නියෝජ්‍ය ඇමතිතුමාත් මේ අමාත්‍යාංශය භාරගෙන, අලි මිනිස් ගැටුම ජාතික ප්‍රශ්නයක් හැටියට හඳුනාගෙන, අද විශාල පිරිසක් බඳවාගෙන, විදුලි වැටවල් ගහන්න ක්‍රමවත් වැඩ පිළිවෙළක් හදාගෙන යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, පසුගිය කාලයේ විදුලි වැටවල් ගහන්න ලොකු කොම්පැනිවලට භාර දුන්නා. මේවා තමයි ප්‍රශ්න. ඒ විදුලි වැටවල් ක්‍රමවත්ව, සැලැස්මකට අනුව ගැහුවේ නැහැ. අපි දන්නවා, එදා ඒ තිබුණු කොම්පැනි එදා හිටපු ඇමතිවරු අල්ලාගෙන, නිලධාරීන් අල්ලාගෙන, ඒ කට්ටිය නිෂ්පාදනය කළ විදුලි වැටවල් ලබා

[ගරු සන්දිත් සමරසිංහ මහතා]

ගන්න විධියට pilot projects හැදූ බව. එය ව්‍යාපාරයක් හැටියට අලෙවි කරන්න පමණයි කටයුතු කළේ. ඒවායින් ජනතාවට නිසි ප්‍රයෝජනයක් ලැබෙන විධියට ඒ දේවල් කළේ නැහැ. හැබැයි අද ඒ දෙය හරියාකාරව, විනිවිදභාවයෙන් යුතුව කරන්න අපේ ගරු ඇමතිතුමා සහ නියෝජ්‍ය ඇමතිතුමා ඉදිරිපත් වෙලා ඉන්නවා. අපි ඒ ප්‍රදේශවල ඇවිදලා තිබෙනවා. ඒ අහිංසක ජනතාව කොච්චර බයෙන්ද ඉන්නේ කියා අපි දන්නවා. සිංහරාජ අඩවියේ කෝපිකැල්ල ප්‍රදේශයේ ඉන්න ජනතාව වාගේම අනිකුත් ප්‍රදේශවල ඉන්න ජනතාව, කන්තලේ, ගල්ගමුව ආදී ප්‍රදේශවල ඉන්න ජනතාවත් අද මේ ප්‍රශ්නයට මුහුණ දෙනවා. මේ අලි මිනිස් ගැටුමට මුහුණ දෙන ජනතාව කොයි තරම් බයෙන් සැකයෙන්ද ජීවත් වෙන්නේ කියා අපි දන්නවා. ඒ දරුවන්ට පාසල් යන්න බැහැ; ගොවිතැනක් හරියට කර ගන්න බැහැ. හැබැයි මේ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න අපි මේ අමාත්‍යාංශය හරහා වැඩ පිළිවෙළක් හදා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ තව මන්ත්‍රීවරයෙක් අලි ගැන කිව්වා. මේ රටේ පරිසරවේදීන් - environmentalists - ඉන්නවා. ඒ අය හරියට මේ ප්‍රශ්න දිහා බලලා, ඒවා තේරුම් අරගෙන, ප්‍රායෝගිකව කථා කරන්නේ නැහැ. ඕනෑම පොතක් කියවා බලන්න, අලි කියන්නේ සංක්‍රමණික සත්ත්ව කොට්ඨාසයක්. ඒ අය කෑම හොයාගෙන එක තැනකට නැත්නම් තව තැනකට සංක්‍රමණය වෙනවා; ඇවිදගෙන යනවා. ඒ අයට කාලගුණයේ, දේශගුණයේ කිසිම බලපෑමක් නැහැ. ඒක තමයි ඇත්ත කථාව. හොඳම උදාහරණයක් ගත්තොත්, අප්‍රිකාවේ අලිත්, අපේ රටේ අලිත් කෑම හොයාගෙන විශාල ප්‍රදේශයක ඇවිදිනවා. ඒ වාගේම නියඟයක් තිබුණොත්, ජලය තිබෙන, හොඳට කෑම තිබෙන ප්‍රදේශවලට යනවා. අද මේ වන අලි දෙදෙනා එතැන රැඳිලා ඉන්නේ, එතැන තිබෙන ආහාරත්, වටපිටාවත් නිසායි. හැබැයි ඒ තුළින් සිංහරාජ අඩවියේ, කෝපිකැල්ල ප්‍රදේශයේ ලොකු ප්‍රශ්නයක්, අලි මිනිස් ගැටුමක් ඇති වෙලා තිබෙනවා. ඒ ප්‍රශ්නය විසඳන්න තමයි එදා ගරු ඇමතිතුමා තීරණයක් ගත්තේ. විශේෂඥයන්ටත්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින්ටත් කථා කරලා, ඒ අලි ටික කෙළින්ම හොරොව්පතානට ගෙන ගිහින් එතැන ආරක්ෂාව දීලා, සිංහරාජ අඩවියේ තෝරා ගත්ත ඉඩමක විශාල වැටක් ගහලා, ඒ අලි දෙදෙනා ආරක්ෂා වෙන විධියට සකස් කරලා, ඒ අලි දෙදෙනා නැවත එතැනට ගෙනෙන්න කථා කර ගත්තේ ඒ නිසායි. එතුමා ඒ වැඩ පිළිවෙළ කරන්න යනකොට, එක එක කියමන් කියලා, මේ විෂයය ගැන දන්නේ නැති අය බලපෑම් කරලා තමයි ඒ කටයුත්ත නවත්වා ගත්තේ. ප්‍රායෝගික විසඳුම් දෙනකොට, ඒ ගැන දන්නේ නැති අය දන්න අයගෙන් පොඩ්ඩක් අහන්න ඕනෑ. එහෙම නැතුව මේ ප්‍රශ්නවලට විසඳුම් දීලා, අහිංසක ජනතාවටත්, වන සතුන්ටත් ජීවත් වෙන්න පුළුවන් ලෝකයක් ගොඩ නහන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අද අපේ ප්‍රදේශවල ජනතාවටත් රිළවුන්ගෙන්, වඳුරන්ගෙන්, ඒ වාගේම වල් ඌරන්ගෙන් ප්‍රශ්න ඇති වෙනවා. ඒ ප්‍රශ්න නිරාකරණය කිරීම සඳහා අපි දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා වැඩ කටයුතු කර තිබෙනවා. ඒ වාගේම වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවත් වැඩ පිළිවෙළවල් දියත් කර තිබෙනවා. ඒ වාගේම වඳුරන් සහ රිළවුන් වඳ කිරීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලය පරීක්ෂණ කරගෙන යනවා; programmes කරනවා. ඒ කාර්ය භාරය වෙනුවෙන් ජාත්‍යන්තර වශයෙනුත් කටයුතු කරගෙන යනවා.

දිවියෙක් ඝාතනය කිරීම පිළිබඳ සිද්ධිය අපි මේ දවස්වල ජනමාධ්‍යයෙන් දකිනවා. ඒ දිවියා අහිංසක සතෙක් වුණාට, එදා ඒ ජනතාව තුළ විශාල බයක් ඇති වෙලා තිබුණා. හැබැයි, කුරිරු ලෙස සත්වයින් දඩයම් කිරීමට විරුද්ධව හුඟක් අය කථා කරනවා. ඒ සම්බන්ධව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව නීතිමය පියවර අරගෙන තිබෙනවා. එම දිවියා ඝාතනය කිරීමේ සිද්ධියට අදාළ ඡායාරූප සහ විස්තර මාධ්‍ය ජාල හරහා පළ කරලා තිබෙනවා. ඒවා සාක්ෂි ලෙස ගෙන නීතිය ක්‍රියාත්මක කිරීමට අද වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් කටයුතු කරනවාය කියන එකත් මම මේ වේලාවේ ප්‍රකාශ කරනවා. වන සතුන් සහ මිනිසුන් අතර තිබෙන ප්‍රශ්නය දිගටම ඇවිත් තිබෙන ප්‍රශ්නයක්. අපි ආණ්ඩුවක් හැටියට ජනතාව ආරක්ෂා කිරීමට, ජනතාවගේ අභිවෘද්ධිය වෙනුවෙන් කටයුතු කිරීමට සෑම විටම බැඳී සිටිනවා. ඒ වාගේම අපේ රටේ සිටින වන සතුන් ආරක්ෂා කරමින් සියලු දෙනාට එකට ජීවත් විය හැකි පරිසරයක් ගොඩ නැඟීමට කටයුතු කරනවාය කියමින් මම මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

බොහොම ස්තුතියි, ගරු සන්දිප් සමරසිංහ මන්ත්‍රීතුමනි. මීළඟට, ගරු විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.00]

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු විමලවීර දිසානායක මැතිතුමා ඉතා වැදගත් යෝජනාවක් පිළිබඳ අපි කාගේත් අවධානය යොමු කළා. අද දවසේ ජාතික පුවත් පත්වල වන ජීවීන්ගෙන් සිදුවන හානි සහ ජීවිත හානි පිළිබඳව සඳහන් වෙලා තිබෙනවා. "ලක්බිම" පුවත් පතේ සඳහන් වී තිබෙනවා, "වනජීවී මායිම් වැට ගම් සමීපයට යාමෙන් ගම්මුන්ගේ ජීවිත අනතුරේ" කියලා. මිනිසුන් ජීවත් වන ගම්මානවල කිට්ටුවටම ඇවිත්, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වනාන්තරවල මායිම් වැට ගහනවා. පසුගිය කාලයේ ලොකු, ආන්දෝලනාත්මක දේවල් ඇති වුණා අපි දැක්කා. මොකද, පදිංචි ඉඩම, හදපු ගේ වැටෙන් මෙහා පැත්තේ. වැසිකිළිය සහ දර මඩුව වැටෙන් එහා පැත්තේ. වැසිකිළියට යන්න ඕනෑ වන ජීවී දෙපාර්තමේන්තුවට අයත් භූමියට. ඒ සම්බන්ධව එදා ගම්මුන් සහ නිලධාරින් අතර ගැටුම් ඇති වුණා.

අද පුවත් පතක සඳහන් වී තිබෙනවා, "සිංහරාජ වන අලින් දෙදෙනා රක්වාන කෝපිකැල්ල ප්‍රදේශයේ සැරිසැරීම නිසා ජනතාව දැඩි භීතියකට" කියලා. මේ වන අලින් දෙදෙනා පාසලකට ගිහින් පාසලේ සෙල්ලම් මිදුල කඩලා, ඒ ළමයින් භීතියට පත් කර තිබෙනවා. මේ අවස්ථාවේ තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන නියෝජ්‍ය ඇමතිතුමාත් මේ ගරු සභාවේ ඉන්නවා. මාස දෙකක් හෝ මාස තුනක් ඇතුළත මේ වන අලින් දෙදෙනා වෙනම කොටසකට කොටු කිරීමට ඉඩ නොලැබුණොත් ඇමතිතුමා සහ නියෝජ්‍ය ඇමතිතුමා ධුරයෙන් ඉල්ලා අස් වෙනවා කියලා සරත් ෆොන්සේකා ඇමතිතුමා ප්‍රකාශ කරලා තිබෙනවා අපි දැක්කා. එතුමන්ලාටත් ලොකු අභියෝගයක් තිබෙනවා. "ලංකාදීප" පුවත් පතේ තිබෙනවා, "මාතලේදී වල් අලියෙක් තව ජීවිත දෙකක් බිලිගනී." කියලා. තරුණයන් දෙදෙනෙක් යතුරු පැදිවලින් යනකොට වන අලි ප්‍රහාරයකට ගොදුරු වෙලා මිය ගිහින් තිබෙනවා. අද මිනිස් ජීවිතවලට විතරක් නොවෙයි, වන සතුන්ටත් ලොකු ප්‍රශ්නයක් තිබෙනවා.

විශේෂයෙන් වියළි කලාපීය භූමිවල වගා කරන බෝගවලට ගවයන්ගෙන්, ඌරන්ගෙන්, දඬුලේනුන්ගෙන්, මොනරුන්ගෙන්, රිළවුන්ගෙන්, වදුරන්ගෙන් සහ වන අලින්ගෙන් බරපතළ හානි සිදු වෙනවා. මේක බරපතළ උවදුරක්. එක පැත්තකින් ජාතික නිෂ්පාදනයට අවශ්‍ය ආහාර නිෂ්පාදනයේදී වන ජීවීන්ගෙන් හානි සිදු වෙනවා. අනෙක් පැත්තෙන් වර්ෂාව නොමැතිකම, පොහොර කලට වේලාවට නොලැබීම, අළෙවි පහසුකම් නොමැතිවීම, ගබඩා පහසුකම් නොමැතිවීම සහ කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් මේ ප්‍රශ්න සඳහා නිසි වැඩ පිළිවෙළක් නොමැති වීම නිසා ජාතික නිෂ්පාදනයට විශාල ප්‍රමාණයක් එකතු කර ගැනීමට නොහැකි වී තිබෙනවා. ඒ එක පැත්තක්. අනෙක් පැත්ත තමයි වන සතුන්ගෙන් සිදුවන හානිය සහ විනාශය. මේ නිසා අපේ රටට විදේශ විනිමය ලබා ගැනීමේදීත් ප්‍රශ්නයක් මතු වෙනවා. මොකද, අපට බොහෝ ආහාර ද්‍රව්‍ය විදේශ රටවලින් තමයි ගෙන්වීමට සිදු වන්නේ. එක පැත්තකින් රටේ ණය ප්‍රමාණය වැඩි වෙනවා; ජනතාවගේ ජීවන බර වැඩි වෙනවා; ජීවන තත්ත්වය පහත වැටෙනවා. මේ තත්ත්වයන් තුළ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ගෙන්වා ගැනීමට හැම වසරකම විදේශ විනිමය ඩොලර් මිලියන ගණන්වලින් වැය වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රටේ වගා කළ හැකි භෝග විදේශ රටවලින් ගෙන්වන්න 2017 වසරේත් විදේශ විනිමය වැය කර තිබෙනවා. බඩ ඉරිභූ මෙට්‍රික් ටොන් 179,600ක් ගෙන්වන්න, ඩොලර් මිලියන 53ක් වැය කර තිබෙනවා. මුං ඇට කියන්නේ, ලංකාවේ හොඳින් වැවෙන භෝගයක්. 2017දී මුං ඇට ගෙන්වන්න ඩොලර් බිලියන 15ක් වැය කර තිබෙනවා. උඳු, කුරක්කන්, කවුපි, මෑ හා වියළි මිරිස් යනාදී මේ සියලුම භෝග විදෙස් රටවලින් ගෙන්වනවා. හැබැයි මේ භෝග අපම නිෂ්පාදනය කර, රටේ අවශ්‍යතාව සම්පූර්ණ කර ගැනීමේ හැකියාව තිබෙනවා. මෙම භෝග ආනයනය නිසා, එක පැත්තකින් ඩොලර් මිලියන ගණනින් විදේශ විනිමය වැය වනවා. අනෙක් පැත්තෙන්, අපේ රටේ කෘෂි නිෂ්පාදනවලට අවශ්‍ය වාතාවරණය නොමැති වෙලා තිබෙනවා.

දිගාමඩුල්ල දිස්ත්‍රික්කය නියෝජනය කරන ගරු විමලවීර දිසානායක මැතිතුමා දන්නවා, දුෂ්කර ප්‍රදේශවල ජීවත්වන මිනිස්සු තමන්ගේ දහඩිය හා කඳුළු හෙළලා, තම මහන්සිය තමයි අස්වැන්න බවට පත් කර ගන්නේ කියලා. මේ අස්වැන්නට බරපතළ විනාශයක් වනජීවීන්ගෙන් සිදු වනවා නම්, මේ පිළිබඳව රජය අවධානය යොමු කළ යුතු වනවා. මේක තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයට විතරක් බලන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒ වාගේම එතුමන්ලාට ඒ වගකීම නිදහසේ ඉෂ්ට කර ගන්නට අවශ්‍ය ස්වාධීනත්වය හා අවකාශය සැලසෙන්නට ඕනෑ. ඒ නිසා අපි විශේෂයෙන් සිහිපත් කරනවා, මේ රට කෘෂි කාර්මික රටක් බවත්, තම වගාවන් කරන්නට ගොවි ජනතාවට ඉඩකඩ සැලසෙන්න ඕනෑ බවත්. අනෙක් පැත්තෙන් වනජීවීන්ට ජීවත් වන්නට අවශ්‍ය වාතාවරණය සකස් කරන්නට ඕනෑ. මොකද, 1882දීත් අපේ භූමියේ වනාන්තර සියයට 70ක් තිබුණා. අද වනකොට තිබෙන්නේ, සියයට 29යි. තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශයට target එකක් දීලා තිබෙනවා, වනාන්තර ප්‍රමාණය සියයට 32 දක්වා වැඩි කරන්න කියලා. අද දැව සඳහා විශාල වශයෙන් ගස් කපනවා. එම නිසා වනාන්තර විනාශ වනවා. එක පැත්තකින් වනාන්තර වැඩි කර ගන්නත් ඕනෑ. අනෙක් පැත්තෙන් වනජීවීන්ට නිදහසේ ජීවත් වෙන්නට ඉඩ තිබෙන්නටත් ඕනෑ. තවත් පැත්තකින් ගොවීන්ට තමන්ගේ කෘෂි කර්මාන්තය ආරක්ෂා කරගෙන, තමන්ගේ දරු පවුල ජීවත් කරගෙන ජාතික නිෂ්පාදනයට දායක වෙන්නත් ඕනෑ. මේ හැම දෙයක්ම සමබර කරන එක ලෙහෙසි පහසු කාර්යයක් නොවෙයි. නමුත්, මේ සම්බන්ධයෙන් රජයට හා අදාළ අමාත්‍යාංශවලටත් වග කීමක් තිබෙනවා.

සිංහරාජ අඩවිය කියන්නේ, ලෝක උරුමයක්. ඒකේ තිබෙන්නේ, සමක වනාන්තර. මේ සමක වනාන්තර ආසන්නයේ ජීවත්වන පිරිස්වලට අද ලොකු ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා මේ වන අලි දෙදෙනා. මේ දවස්වල බොහෝ කථාවට ලක්වන කාරණයක් ඒක. ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්න කියා සිහිපත් කරමින්, මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමාට බොහොම ස්තුතියි. මීළඟට පිළිතුරු කථාව, ගරු පාලිත තෙවරප්පෙරුම නියෝජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා. 4.07]

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා (තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு பாலித தெவரப்பெரும - வலுவாதார அபிவிருத்தி, வனசீவராசிகள் மற்றும் பிரதேச அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Palitha Tewarapperuma - Deputy Minister of Sustainable Development, Wildlife and Regional Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇත්තටම අද දවසේ අපේ ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමා ගෙනැවිත් තිබෙන්නේ ඉතාමත්ම කාලෝචිත කල් තැබීමේ යෝජනාවක්. මොකද, මේක ජාතික ගැටලුවක්; ජාතික ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නය මේ රටේ හිටපු දේශපාලන අධිකාරිය, පාලකයන් සහ මේ අමාත්‍යාංශය භාර ඉහළ නිලධාරීන් තේරුම් නොගත්ත එකේ වරද නිසා තමයි අද අපට ඒ ගැන කථා කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඒක තමයි ඇත්ත. මේ සිද්ධියේදී කාටවත් ඇඟිල්ල දික් කළ යුතු නැහැ. ඒ කාලයේ මේ වැඩේ කෙරුණේ නැහැ, මේ කාලේ මේ වැඩේ කෙරුණේ නැහැ කියලා ගහ ගන්න, මරා ගන්න එක නොවෙයි කළ යුත්තේ. අප හැමෝගේම යුතුකම, මේ ප්‍රශ්නයට කාලීන විසඳුමක් ලබා දීමයි. මොකද මේ ප්‍රශ්නයෙන් දුක් විඳින්නේ, අහිංසක ජනතාවයි.

අපේ ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා කිව්වා, මම ඉන්නේ කළුතර; අපේ ඇමතිතුමා ඉන්නේ කොළඹ කියලා. ඇත්තටම අපි දෙදෙනා මේ ප්‍රශ්නයට මුහුණ දීලා නැහැ. නමුත්, මේ වගකීම අපේ කරට අරගෙන තිබෙනවා. මේ ප්‍රශ්නය ගැන අපි අධ්‍යයනය කර තිබෙනවා. මේ මිනිස්සු විඳින දුකට, මේ සත්තු මැරෙන එකට කළ යුත්තේ මොනවාද කියලා අපි අධ්‍යයනය කර තිබෙනවා. අපේ ජීවිත අවදානම ගැන නොතකා අපි ගිහින් ඒ ගැන සොයා බලා තිබෙනවා. මේක ජාතික ගැටලුවක්; ජාතික ප්‍රශ්නයක්. ඇත්තටම මේක කිසිම පාලකයෙක් තේරුම් ගත්තේ නැහැ. වනජීවීන් ආරක්ෂා කිරීමේ අයිතිය තිබෙන්නේ, තිරසර හා වනජීවී දෙපාර්තමේන්තුවට. මේ කවුරුවත් ඒක තේරුම් ගත්තේ නැහැ. හැම කෙනෙක්ම හිතුවේ, තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය කියන්නේ, punishment එකක් ලෙස transfers දෙන තැනක් කියලා; ඇමතිවරයෙක්, තමන්ට හිතවත්කමක් නැති, පක්ෂ නැති කෙනෙක්ව තල්ලු කරන තැනක් කියලා හිතුවේ.

අපි ඒක දැක්කා. කවුරුවත් තරහා වෙන්න එපා එහෙම කිව්වාට. වනජීවී අමාත්‍යාංශයට ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මැතිතුමාත්, මාත් පත් කළාට පස්සේ, රටේ මිනිස්සු විවිධ අදහස් ප්‍රකාශ කරන්න පටන් ගත්තා. මේ තිබෙන ගැටලු විසඳීමේ හැකියාවක් අපට තිබෙනවාය කියලා ගොඩක් අය ලොකු සතුටකින් සිටියා, ලොකු බලාපොරොත්තුවක් තියාගෙන සිටියා. හැබැයි, හිටපු සමහර පාලකයෝ ඒ ගැන විවිධ කථා කිව්වා. අපි ඒවා අහගෙන සිටියා. අපේ හිටපු ජනාධිපතිතුමා පවා කිව්වා විද්‍යාත්මක ක්‍රමයටම මෙම පත්වීම් හරියටම තෝරා තිබෙනවා,

[ගරු පාලිත තෙවරප්පෙරුම මහතා]

ඥාන විද්‍යාව අනුව තෝරා මෙම අමාත්‍යාංශය ෆීල්ඩ් මාර්ෂල් සරත් ෆොන්සේකා මහත්මයාට දුන්නා කියලා. ඒකේ අර්ථය තමයි, සතුන් බලන්න සතෙක්ම දමන්න ඕනෑය කියන එක. ඔබතුමන්ලා ඉදිරිපත් කර තිබෙන ගැටලුවේ හැටියට ඒ ගැන අධ්‍යයනය කරන්න, ඒ ගැටලු විසඳන්න සතෙක් දමලා හරියන්නේ නැහැ. ඒක තමයි ඇත්ත අර්ථය. ඒ කියන්නේ මේ මිනිසුන් විඳින පීඩාව ඒ අය තේරුම් ගත්තේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම ඇත්තටම මේ අමාත්‍යාංශයේ නියෝජ්‍ය ඇමතිකම ඉල්ලලා තමයි ගත්තේ. මොකද, අලි ගහලා මැරුණු මිනිසුන්ගේ මීනී මහ පාරේ තියාගෙන ඒ අයගේ ඥාතීන් කෑ ගහන විධිය සහ මේ රටේ මැරෙන අලි සංඛ්‍යාව කොපමණ ද කියලා මම දැක්කා. මම ඒවා සියැසින් දැක්කා. මම ඒවා අධ්‍යයනය කළා. මම මුලින් කිව්වා වාගේ මෙතැන තිබුණු මූලික වරද තමයි, කිසිම පාලකයෙක්වත්, මෙම අමාත්‍යාංශයේ ඉහළ නිලධාරියෙක්වත් මේ ගැන අවධානය යොමු කළේ නැති එක. ඔවුන් හදපු කිසිම ව්‍යාපෘතියක මේ රටේ සිටින අලි ආරක්ෂා කරන ව්‍යාපෘතියක් තිබුණේ නැහැ. මිනිහෙක් අලියෙකුට වෙඩි තියලා හෝ මොකක් හරි කරලා මැරුවාට පස්සේ, ඒ මනුස්සයාට ලක්ෂ දෙකේ සිට තුන දක්වා වූ දඩයක් තමයි නියම කරන්නේ. හැබැයි, ඒ අලියාගේ වටිනාකම කිසිම කෙනෙක් තක්සේරු කරලා නැහැ. ඒ වාගේ ක්‍රමවේදයක් තමයි මේ රටේ අනුගමනය කළේ. මම මේ ගැන පහළ සිටම සොයාගෙන ගියාම, මෙතැන මහා විශාල නිලධාරි හිඟයක් තිබෙන බව පෙනුණා. අපි මෙතැනදී, "ඔබතුමාගේ කාලයේ මේක කළේ නැහැ" කියලා කාටවත් ඇඟිල්ල දික් කරන්නේ නැහැ. හැමෝම මේ වගකීම භාර ගත යුතුයි. මේ දෙපාර්තමේන්තුව තුළ නිලධාරින්ගේ විශාල හිඟයක් තිබෙනවා. අපි ඒක තේරුම් ගත්තා.

ඊළඟට, අපේ වනජීවී නිලධාරින්ට යන්න වාහන පහසුකම් නැහැ; ඉන්ධන නැහැ; අවි නැහැ; අලි වෙඩි නැහැ. මෙවැනි ප්‍රශ්න ගොඩක් තිබෙනවා. ජනවාර්ගික යුද්ධය අවසන් කළා වාගේ මේ ප්‍රශ්නය අලි මරලා ඉවර කරන්නත් බැහැ; මිනිස්සු ඒ තැන්වලින් එළවා ඉවර කරන්නත් බැහැ. මේක ඒ දෙක අතර මැද ප්‍රශ්නයක්. මේ ප්‍රශ්නයට මැදි වෙලා දුක් විඳින්නේ මේ රටේ අන්ත අසරණ මිනිස්සු. ගරු විමලවීර දිසානායක මැතිතුමා කිව්වා වාගේ, නියඟයට හසු වෙච්ච, ජීවත් වෙන්න විධියක් නැති, හොඳ අධ්‍යාපනයක් නැති, ඒ පැත්තේ කරන්න රැකියාවක් නැති ගොවිතැනට යොමු වුණු අහිංසක මිනිස්සු තමයි මේ ප්‍රශ්නයෙන් දුක් විඳින්නේ. මේ අය තමයි මේ ප්‍රශ්නයෙන් පීඩාවට පත් වෙන්නේ. අපි මේ ගැන සොයා බැලුවා. ඇත්තටම බිම් මට්ටමින් තමයි මේ ප්‍රශ්නයට යොමු විය යුත්තේ. ඉහළ නිලධාරින්ගෙන් මේ ගැන ඇසුවාට, පහළ තිබෙන ඇත්ත උඩට ආවේ නැහැ. ඒ නිසා ගරු මන්ත්‍රීතුමනි, මම මේ ගැන සොයා බැලුවා. මම හැම වනජීවී කාර්යාලයකටම ගිහින් මේ ගැන සොයා බැලුවා. ඇත්තටම ඒ මිනිස්සු අසරණයි. අලියෙක් මිනිහෙක් මැරුවාම, ඇත්තම ඒ නිලධාරින්ට එතැනට යන්න බැහැ. ඇයි යන්න බැරි? ඒ නිලධාරින්ට අලියාගෙන් මිනිසා ආරක්ෂා කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නැහැ. ඒ වාගේම, නිලධාරින්ගේ හිඟයක් තිබෙනවා. මේක තේරුම් ගත් අපේ ඇමතිතුමා ගරු ජනාධිපතිතුමාගෙන් ඉල්ලීමක් කළා, "අපිට නිලධාරින් අවශ්‍යයි. දැන් යුද්ධය නැති නිසා අපට යුද සෙබළුන් 3,000ක් දෙන්න" කියලා. ගරු ජනාධිපතිතුමා හමුදාවෙන් නොවෙයි, සිවිල් ආරක්ෂක බලකායෙන් 3,000ක් අපට ලබා දෙන්න පොරොන්දු වුණා. ලිඛිතව අපට අවශ්‍ය කටයුතු කර දුන්නා. එතකොට එතැනින් අපට 3,000ක පිරිසක් ලැබෙනවා. ඊළඟට, අපේ ගරු අගමැතිතුමා කම්කරුවන් වශයෙන් 2,500 දෙනෙකු බඳවා ගැනීමට අපට අවසර දුන්නා. ඒ අනුව අපට 6,000ක පමණ අලුත් බල ඇණියක් හදා ගන්න පුළුවන් වෙනවා.

ඊළඟට, අපි මේ රටේ තව විදුලි වැටවල් කිලෝමීටර් 4,500ක් අලුතින් ඉදිකරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඇත්තටම ඉදිකර තිබෙන විදුලි වැටවල්වලින් සියයට 20ක්වත් ප්‍රමිතිගතව ඉදිකර තිබෙන ඒවා නොවෙයි. ඒවා හදා තිබෙන්නේ අලින්ගෙන් මිනිසුන් ආරක්ෂා කරන්නවත්, අලි ආරක්ෂා කරන්නවත් නොවෙයි. ඒ අයගේ පැවැත්ම සඳහා තමයි ඒවා ඉදිකර තිබෙන්නේ. අපි ඒක ඇඟින් දුටුවා. අලි, විදුලි වැටවල් කඩා දමන විධිය අපි මාධ්‍යවලින් දැක්කා. අලි කියන්නේ තීක්ෂණ බුද්ධියක් තිබෙන සත්ව වර්ගයක්. සමහර අලි ඔපින් බෑග් එක කකුලට දමගෙන විදුලි වැට තල්ලු කරනවා. අපි ඒක ප්‍රායෝගිකව දැක්කා. සමහර අලි කැලෙන් කෙක්කක් කඩා ගෙන ඇවිල්ලා ඒකෙන් ඇදලා විදුලි වැට කඩනවා. ඒ තරම් බුද්ධියක් ඒ සතුන්ට තිබෙනවා. හැබැයි, ඒ බුද්ධියට, ඒ දැනුමට හරියන විධියේ විදුලි වැටවල් ඉදිකරන්න අපේ අයට වුවමනාවක් තිබුණේ නැහැ. ඇයි ඒ? විදුලි වැටවල් කඩා වැටෙන තරමට ඒ අයගේ සාක්කුවලට හොඳයි. අලි විදුලි වැටවල් පෙරළනවා නම්, නැවත ඒවා හදන්න මුදල් අනුමත වෙනවා. අපේ අමාත්‍යාංශයේ මුදල් තිබෙනවා. හැබැයි ඒ මුදල් ප්‍රයෝජනවත් ලෙස යෙදුණේ නැහැ. දැන් අපට සිවිල් ආරක්ෂක බලකායෙන් නිලධාරීන් 3,000ක් ලැබී තිබෙනවා. අපේ ගරු අගමැතිතුමා කම්කරුවන් 2,500ක් බඳවා ගැනීමට අවසරය ලබා දීලා තිබෙනවා. නිලධාරීන් හිඟයක් තිබුණු නිසා, කිලෝමීටර් 30කට සිටියේ නිලධාරීන් තුන්දෙනායි, නැත්නම් හතරදෙනායි. අපි දැන් එක කිලෝමීටරයකට එක නිලධාරියෙක් බැගින් අනුයුක්ත කරලා තිබෙනවා. අපි ඒ කිලෝමීටර් තුනක් ඇතුළත ටෙන්ට් එකක් ගහලා, එම නිලධාරීන්ට අවශ්‍ය ඇඳන් ආදි පහසුකම් ලබා දෙනවා.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ ප්‍රශ්නයට ඔබතුමන්ලා යම්කිසි වැඩ පිළිවෙළක් යොදනවා නම්, මේ ප්‍රශ්නයට මුහුණ දෙන ප්‍රදේශවල සිටින මහජන නියෝජිතයෝත් කැඳවන්න. මොකද, මෙතැන වන අලින්ගේ ප්‍රශ්නයක් විතරක් නොවෙයි තිබෙන්නේ.

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)

ගරු මන්ත්‍රීතුමනි, අපි දැන් ඒ ප්‍රදේශවල මිනිස්සු හමුවෙලා, ඒ දේශපාලන අධිකාරිය හමුවෙලා, රාජ්‍ය නිලධාරීන් හමුවෙලා ඒ සියලුදෙනාගෙන්ම අදහස් ලබාගෙන තමයි මේ කටයුතු කරගෙන යන්නේ. හැම සති අන්තයේම අපි ඒ ක්‍රියාවලියේ යෙදෙනවා. එක් එක්කෙනාගේ දේශපාලන වුවමනා අනුව අපි කටයුතු කරන්නේ නැහැ.

ගරු ඩී. ටී. ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)

වනජීවී ඇමතිතුමා අම්පාරට ගියා. නමුත් මා ඒ ගැන දැනගෙන සිටියේ නැහැ. මේ කාරණය පිළිබඳව මීට වඩා පුළුල් සාකච්ඡාවක් කරන්න ඕනෑ. වන අලිගෙන් විතරක් නොවෙයි, ගවයින්ගෙන්, වඳුරන්ගෙන්, රිළවුන්ගෙන්, මොනරුන්ගෙන් පවා මේ ප්‍රශ්නය මතුවෙලා තිබෙන්නේ මිනිසුන්ට. පසුගිය 2010 වර්ෂයේ සිට මේ දක්වා අලි එක්දහස් -

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)

ගරු මන්ත්‍රීතුමනි, ඒ සංඛ්‍යාලේඛන ඔක්කෝම මා ළඟ තිබෙනවා. ඒ අනුව, 2010 සිට 2017 දක්වා අලි 1,909දෙනෙක්

මැරිලා තිබෙනවා. මිනිස් ජීවිත 589ක් අහිමිවෙලා තිබෙනවා. ඒ සංඛ්‍යාලේඛන අපි ළඟ තිබෙනවා. ගරු මන්ත්‍රීමනි, මේ කාරණය අහන්නකෝ. ඔබතුමා කිව්වා, ඇමතිතුමා අම්පාරට ගිය එක ගැන ඔබතුමා දැනගෙන සිටියේ නැහැ කියලා. අපි අම්පාරට යන එක ගැන හැමදෙනාම දැනුවත් කිරීමට අපට පුළුවන්කමක් නැහැ. අපි වනජීවී එකේ සහකාර අධ්‍යක්ෂවරයාට දැනුම් දීලා තිබෙනවා, සියලු දේශපාලනඥයන් කැඳවන්න කියලා. ඒ එක්කම ප්‍රාදේශීය ලේකම්ටත්, දිස්ත්‍රික් ලේකම්ටත් දැනුම් දීලායි අපි යන්නේ. ඇත්ත වශයෙන්ම එතැන පොඩි අඩුපාඩුවක් වෙලා තිබෙනවා. අපේ ඇමතිතුමා කිව්වා, කිසිම දේශපාලන පක්ෂයක් බලන්න එපා, සියලු දේශපාලන අධිකාරියට සහභාගි වෙන්න කියලා. පහළ තිබෙන ඇත්ත සහවන්න ඕනෑ නිසා සමහර අය ඒ අයට දැනුම් දීලා තිබුණේ නැහැ. අපි ගල්ගමුවට ගියා. ඒ සාකච්ඡාවට ගමේ බොහෝදෙනෙක් සහභාගිවෙලා හිටියේ නැහැ. නිලධාරීන් විතරයි එයට සහභාගිවෙලා සිටියේ. ගමේ ඇත්ත හෙළිවන එක එකෙන් නවත්වා තිබුණා. ඒ නිසා තමයි අපි ප්‍රායෝගිකව ඒ තැන්වලට ගිහින් කරුණු සොයන්නේ.

අලි වැට සම්බන්ධව අපේ ඇමතිතුමා තීරණයක් ගත්තා, අලි වැට තව කිලෝමීටර් 4,500ක් වැඩිපුර ඉදි කරන්න සහ සේවකයන් 6,000ක් බඳවා ගන්න. ඒ කිලෝමීටර් 3ක් ඇතුළත ටෙන්ට් එකක් ගහලා, ඇඳන්, කෑම ආදී පහසුකම් ඒ ගොල්ලන්ට දෙනවා. අපි ඒ ගොල්ලන්ට කෑම දෙන්නේ මොකද්? එතකොට ඒ ගොල්ලන්ට මඤ්ඤොක්කා සොයන්න, බතල සොයන්න, ඉරිඟු සොයන්න යෑමේ අවශ්‍යතාවක් නැහැ. එතකොට, එතැන ඉඳලා අලි වැට ආරක්ෂා කිරීමේ අයිතිය ඒ ගොල්ලන්ට දීලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. අපි මේ කාරණය ගැනත් බැලුවා. ඒ ගොල්ලන්ට වාහන නැහැ; අලි වෙඩි නැහැ; ඉන්ධන නැහැ; දීලා තිබෙන රිපීටර් තුවක්කු පත්තු වෙන්නේ නැහැ; රබර් උණ්ඩ නැහැ. ඒ විධියේ විවිධ අඩුපාඩුකම් තිබෙනවා. ඒ වාගේම, ඒ නිලධාරීන්ට අවශ්‍ය දීමනා දෙන්නේ නැහැ. ඊයේ පෙරේදා වනජීවී දෙපාර්තමේන්තුවේ ranger කෙනෙක් මිය ගියා. ඔහු ගිරාඳුරුකෝට්ටේ හිටපු ඉතාම හොඳ දක්ෂ නිලධාරී මහත්මයෙක්. අඩු ගණනේ ඔහු ගෙයක් දොරක්වත් හදාගෙන නැහැ. ඔහුට කඩා වැටුණු ගෙයක් තමයි තිබෙන්නේ. ඔහුට තරුණ දුවරු තුන්දෙනෙක් ඉන්නවා. එක දුවෙක් A/L කරනවා, දෙවෙනි දුව O/L කරනවා, අනික් දුව ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටිනවා. ඒ තුන්දෙනාම එකට සැටියේ වැටිලා ඉන්නවා. ඒක දකිනකොට අපේ පපුව පත්තු වුණා. ඔහු දක්ෂ නිලධාරියෙක්. හැබැයි ඉතාම සුළු දීමනාවක් තමයි ඔහුට ලැබුණේ. ඒ අන්තරායකාරී රාජකාරිවලට ගෙවන දීමනාව ඒ ගොල්ලන්ට ගෙවන්නේ නැහැ. ඒ දීමනා ගෙවීමේ ක්‍රමවේදය හදලා නැහැ. අපි මේ අඩුපාඩු දැකලා ඒ අයට වාහන ලබා දෙන්න රුපියල් මිලියන 500ක් වෙන්කර තිබෙනවා. ඒ ගෙන්වන වාහන සුඛෝපභෝගී ජපන් වාහන නොවෙයි, ඉන්දියන් වාහන. ඒ සඳහා රුපියල් මිලියන 500ක් වෙන් කර තිබෙනවා. ඒ ප්‍රදේශවලට අවශ්‍ය කරන chainsaw, JCB machine, grass cutter, binocular, torch ආදී සියලු දේවල් දෙන්න අපි ලැස්ති කරලා තිබෙනවා.

ගරු මන්ත්‍රීතුමනි, මා ඊයේ සූරියවැව ප්‍රදේශයට ගියා. ඒ ප්‍රදේශයේ ජනතාව පාරවල් වහලා, උද්ඝෝෂණය කරලා, අවසානයේ තමන්ගේ ගැටලුව ඉදිරිපත් කරන්න ඕනෑ නිසා මාරාන්තික උපවාසයක් පටන් ගත්තා. ඒ අවස්ථාවේදී මා මනියංගනයේ සිට කොළඹ එන අතර මහ දහඅට වංගුව ප්‍රදේශයේ සිටියේ. ඒ වෙලාවේ වාහනය හරවාගෙන සූරියවැව උද්ඝෝෂණ කළ ස්ථානයට මා ගියා. ඇත්තටම ගොවීන් ඉතාම අසරණ වෙලායි සිටියේ. සාධාරණ ඉල්ලීම් තමයි ඒ මිනිස්සු ඉල්ලුවේ. ඒ අයට ඉල්ලීම් හතරයි තිබුණේ. එතැන පක්ෂ භේදයක් තිබුණේ නැහැ. එතැන ජේවීපී සහෝදරයෝ සිටියා. ජේවීපී සහෝදරයෝ තමයි ඒ උද්ඝෝෂණය මෙහෙයවුයේ. හැබැයි ඒ අය අපට කිසිම බලපෑමක්, තර්ජනයක්, උපහාසයක් කළේ නැහැ. ඔවුන්ට ගැටලු කිහිපයක් තිබුණා. එතැන ජේවීපී අය සිටියා, විවිධ පක්ෂවල අය සිටියා. හැබැයි ඒ කවුරුවත් දේශපාලන ප්‍රශ්න එතැනට ගෙනාවේ නැහැ. ඔවුන් පොදු ඉල්ලීමක් කළේ. ඉතාම සරල ඉල්ලීම් හතරක් තමයි තිබුණේ. මා එතැනට ගිහින් ඒවාට විසඳුම් දෙන බවට පොරොන්දු වුණා. මේ මාසයේ 26වන දා ඇමතිවරයකු හැටියට මාත් උදැල්ලක්, යකඩයක් අරගෙන ගිහින් ඒ ගොල්ලන් එක්ක ඒ වැඩ කටයුතුවල යෙදෙනවා. එහෙම නැත්නම් මේ වැඩ කෙරෙන්නේ නැහැ. මෙය ජාතික ගැටලුවක්; ජාතික ප්‍රශ්නයක්. මේ යහ පාලන ආණ්ඩුවේ ධුර කාලය අවුරුදු 5යි. අද වනකොට මේ අමාත්‍යාංශයට ඇමතිවරු හතරදෙනෙක් පත්වුණා. අවසාන වශයෙන් පත්වුණු ඇමතිවරයාට යාල ඉඳලා පින්නවලට යන්න වෙලාවක් නැහැ. එහෙම වුණේ ඇයි? මේ ප්‍රශ්නය රටේ නායකයන්, පාලකයන් කිසි කෙනෙක් තේරුම් ගත්තේ නැහැ. ඒ වරදේ ඵලවිපාක විඳින්නේ ඒ පාලකයන් නොවෙයි; ඒ නිලධාරීන් නොවෙයි. ඔබතුමා කියපු විධියට ගමේ දුප්පත්, එදිනෙදා ජීවත් වෙන්න බැරි අහිංසක මිනිස්සු තමයි මැරෙන්නේ; මැරෙන්නේ අහිංසක දරුවෝ. ගරු වක්කුඹුර මන්ත්‍රීතුමනි, ඔබතුමා දැක්කාද ඒ දරුවන් අඬන විධිය? ඒ දරුවන් අඬනකොට අපේ ඇස්වලටත් කඳුළු ආවා. අපේ ඇමතිතුමා අවුරුදු 34ක් යුද්ධය කරලා, යුද්ධය අවසන් කරපු නායකයෙක්. එතුමාත් ඇඬුවා. ඒ කථාවට අම්මලා සියලුදෙනාම ඇඬුවා.

එතැනදී සිදු වුණු සිද්ධිය මා පසුව විග්‍රහ කරන්නම්. සූරියවැවදී ගොවියෝ ටික ලොකු උද්ඝෝෂණයක් කළා. ඒගොල්ලන් ඉල්ලීමක් කළා, තිබෙන අලි වැටේ ප්‍රමිතියක් නැහැ කියලා. ඒගොල්ලන් අත් හදා බලපු අලි වැටක් තිබෙනවා. ඒක එල්ලෙන අලි වැටක්. ඇත්තටම සූරියවැවට අලි ටික ගෙනැල්ලා දාලා තිබෙන්නේ වෙන ව්‍යාපෘතියක් ඉදිකිරීම සඳහායි. මා ගොවීන්ගෙන් අහපු කතන්දරය තමයි මේ කියන්නේ. වනජීවී දෙපාර්තමේන්තුවෙන් ගහපු අලි වැට අක්‍රිය කරලා තිබෙනවා. ඒ අලි වැට ක්‍රියාකාරී නැහැ. හැබැයි, තමන්ගේ දේශපාලනයට උදව් කරපු අයට ඉඩම් අක්කර 50, 100, 200, 300 දීලා තිබෙනවා. ඒ අය තමන්ගේ ඉඩම වටේ සක්‍රිය, හොඳ, ශක්තිමත් විදුලි වැටක් ඉදි කරලා තිබෙනවා. ශක්තිමත් විදුලි වැටක් ඉදිකරලා පරණ විදුලි වැට අක්‍රිය කළාම, කෙසෙල් වගාවට එන අලි ටික වනජීවී දෙපාර්තමේන්තුවෙන් ගහපු විදුලි වැටෙන් ගම් වදිනවා. ඒවා තමන්ගේ දේශපාලනය වෙනුවෙන්, පාක්ෂිකයන් හදා ගන්න; තමන්ගේ අයට මුදල් හම්බ කරන්න කරපු ව්‍යාපෘතිය. ඒ සියලු දේවල් අසාර්ථකයි. මා කිව්වේ ඒකයි. මේක ජාතික ප්‍රශ්නයක්. මේකෙදි ඇමතිවරු මාරු කරලා හරි යන්නේ නැහැ. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියගේ කාලයේ ඇමතිවරයෙකු පත් කළා නම්, එතුමා මේ වෙනුවෙන් ජාතික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න ඕනෑ. ඒ වැඩ පිළිවෙළ නිවැරදි වැඩ පිළිවෙළක් විය යුතුයි. ඒ වැඩ පිළිවෙළ එතැනින් පසුව මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේත් දිගටම ක්‍රියාත්මක වෙන්න ඕනෑ. ගහපු අලි වැට ඉවත් කරලා, වෙනත් අලි වැටක් ගහන එක නොවෙයි කරන්න තිබෙන්නේ. ජාතික ප්‍රතිපත්තියක් මෙහි තිබෙන්න ඕනෑ. මේවා මිනිසුන් තේරුම් ගත්තේ නැහැ. මේ කාරණා තේරුම් ගත්තේ නැති නිසා මිනිසුන් විතරක් නොවෙයි, අහිංසක අලි ටිකත් මැරෙනවා. අහිංසක අලි මැරෙන විධිය දැක්කාම, ඇත්තටම මගේ පපුවට ඔරොත්තු දෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. අඩි හතරක් දිග දළ තිබෙන "දීග දන්තු" කියන සද්දන්ත ඇතෙක් කලා වැවේ ඉන්නවා. ඒ ඇතා අහිංසක සතෙක්. ඒ ඇතා මිනිසුන්ට ගහලා නැහැ; මිනිසුන් මරලා නැහැ. හැබැයි, ඌරන්ට බඳින තුවක්කුවක් පත්තුවෙලා අද වනකොට එම ඇතා ඉතාම අසාධ්‍ය තත්ත්වයේ පසු වෙනවා. එතැනට යන්න බැහැ කියලා නිලධාරීන් අදිමදි කළා. ඒ වෙලාවේ නියෝජ්‍ය ඇමතිවරයා හැටියට මා මගේ වගකීම් පැත්තක දමලා

[ගරු පාලිත තෙවරප්පෙරුම මහතා]

කලාවැවට ගියා. මගේ ජීවිත අවදානම ගැනවත් සලකන්නේ නැතිව අලියා පිටුපසින් ගිහිල්ලා, නිර්වින්දන බෙහෙත් එන්නත් කරලා, අලියාගේ තුවාලවලට ප්‍රතිකාර කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ වාගේ අලි විශාල ප්‍රමාණයක් ඉන්නවා. හොරොව්පතාන වැවේ වෙඩි වැදුණු තව අලියෙක් ඉන්නවා. කකුලට වෙඩි වැදිලා, අසාධ්‍යව මරණාසන්නව තමයි ඒ අලියා හිටියේ. මම පාන්දර තුනට එතැනට ගියා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මම එතැනට යනකොට වනජීවී දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍යවරු එතැනට ඇවිල්ලා හිටියේ නැහැ. අලියා ඉතාම අසාධ්‍ය තත්ත්වයෙන් මරණාසන්නව හිටියේ. මට ඒ දිහා බලාගෙන ඉන්න බැරි වුණා. ඇත්තටම ඒ අවස්ථාවේ දී අපේ වනජීවී නිලධාරින්ට - rangersලාට- අවශ්‍ය කරන බෙහෙත් තිබුණේ නැහැ. ඇතින්නියගේ යෝනිය පැත්ත පණුවෝ ගහලා මී වදයක් වාගේ තිබුණේ. මම ඇතින්නියගේ ඔළුව අත ගාලා, ඇහේ තිබුණු මඩ හෝදලා "පුතේ, පුතේ, මොකද වුණේ?" කියලා ඇහුවාම ඒ ඇතින්න කකුල උස්සලා මට පිටු පස පැත්ත පෙන්නුවා. පිටු පස පැත්තේ මී වදයක් වාගේ පණුවෝ හිටියා. මේවා තමයි අහිංසක සතුන් විඳින දුක. අන්තිමට මට ඒ දිහා බලාගෙන ඉන්න බැරි වුණා. වනජීවී නිලධාරින් ළඟ අවශ්‍ය කරන බෙහෙත් තිබුණේ නැහැ. පශු වෛද්‍යවරු එතැනට ඇවිල්ලා හිටියේ නැහැ. මම ලොකු දුම් කොළයක් ගෙනැල්ලා, පොඩි කරලා, මගේ අතින්ම ඇතින්නගේ පිටු පස පෙදෙසේ පණුවෝ කන වේදනාව නැති කරලා දැම්මා. උදේ වනකොට මේ ඇතින්න මැරෙයි කියා මා තීරණය කළා. නමුත් පශු වෛද්‍යවරුන් ආවාට පසුව ඒ තීරණය වෙනස් වුණා. ඒගොල්ලන් ප්‍රතිකාර කළා; සේලයින් දුන්නා. උපරිම ප්‍රතිකාර කළා. කකුලට වෙඩි වැදිලා සැරව වැක්කෙරෙනවා. මම එළිවනතුරු එතැන ඉඳලා, පන්සලට ගිහිල්ලා, පන්සලේ හාමුදුරුවන්ට කියලා මේ ඇනාට පිරිත් කිව්වා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. පිරිත් කියලා පැය ගණනක් ගත වනකොට මේ ඇනා මැරුණා. පසුව මගේ අතින්ම පාංශුකූලය දීලා, ඇනා වළලා දැම්මා. මේ ඇතුන් වැරදිකරුවන් නොවෙයි. ඇතුන් ඉල්ලන්ගේ උන්ගේ අයිතිය. උන්ගේ අයිතිය නැති කරන්නේ අපේ රටේ මනුෂ්‍යයන්. තිරිසන්නු මේවාට වග කියන්න ඕනෑ නැහැ. ඇතෙක් හෝ ගැබ්බර ඇතින්නක් අලි මංකඩක හෝ පාරක යනකොට පැටියාටත් එය දැනෙනවා. පැටියාටත් ඒ පාර මතකයි. ඇතුන් එච්චරටම සංවේදියි. ඇතුන් ඉල්ලන්නේ ඒ, සතුන්ගේ අයිතිය. ඇතුන්ගේ එම අයිතිය අපි ලබා දෙන්න ඕනෑ.

තව කාරණයත් මම කියන්න කැමතියි. මේ කියන ගමේ අලි මංකඩක් තිබෙනවා. මේ අලි මංකඩ, අලි 300ක්, 400ක් මාරු වුණු අලි මංකඩක්. වනජීවී දෙපාර්තමේන්තුවෙන් මේ අලි මංකඩ නැති කරන්න එපා කියලා තිබෙනවා. නීතිපති දෙපාර්තමේන්තුවෙනුත් කියලා තිබෙනවා, මේ අලි මංකඩ වෙනත් කටයුත්තකට යොදා ගන්න එපා කියලා. නමුත් පසු ගිය රජයේ හිටපු නිවාස ඇමතිවරයා මේ ඉඩමේ බලහත්කාරයෙන් රජයේ නිලධාරින්ට ගෙවල් හදා දීලා තිබෙනවා. එහෙම ගෙවල් හදා දීලා තිබෙන්නේ නැති බැරි මිනිසුන්ට නොවෙයි. ප්‍රාදේශීය ලේකම්තුමියට ගෙවල් දෙකක් තිබෙනවා; පොලීසියේ OIC මහත්තයාට ගෙයක් තිබෙනවා; ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඉහළ නිලධාරින්ට ගෙවල් දීලා තිබෙනවා. ඒ ගෙවල් හතර පහක තමයි පදිංචිකරුවන් සිටින්නේ. අනෙක් ගෙවල් වසා දමා තිබෙනවා. තවත් ගෙවල් විකුණා දමා තිබෙනවා. හැබැයි, නිවාස හැදීම නිසා අලි මංකඩ ඇඟිරීමෙන් අලි 300ක් විතර ගම් වැදිලා, මිනිස් ජීවිත විශාල ප්‍රමාණයක් විනාශ කරලා තිබෙනවා.

ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා සඳහන් කළ ආකාරයට පොල් වගාව විනාශ කරලා තිබෙනවා; අඹ ගස් ටික විනාශ කරලා තිබෙනවා. මේවා ගැන අධ්‍යයනය නොකර, තේරුම් නොගෙන කටයුතු කළ අයයි මේවාට වැරදිකාරයෝ වෙන්නේ. මේ විධියේ ගොඩක් වැරදි සිද්ධ වෙලා තිබෙනවා.

ඊළඟට, තව කාරණයක් තිබෙනවා. අනුරාධපුරය දිස්ත්‍රික්කයේ, නොච්චියාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 341 දරන ග්‍රාමසේවා වසමේ අලි මංකඩ හරස් කරලා හෝටලයක් ඉදි කරනවා. මේ රක්ෂිතය අයිති මහවැලියටයි. ඒ නිසා හෝටලය හදන එක මහවැලියෙන් තහනම් කර තිබෙනවා. පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවෙනුත් කියනවා, හදන්න එපා කියලා. පරිසර අධිකාරියෙනුත් එපා කියනවා. ඒහෙත් ඒ සියල්ල නොසලකා හෝටලයේ අයිතිකාරයා දේශපාලන හයිය අරගෙන මේ කියන හෝටලය හදලා තිබෙනවා. හෝටලයේ අයිතිකාරයාගේ නම වන්ද්‍රසිරි. "ෆොරස්ට් රොක් ගාඩන්" හෝටලයේ අයිතිකරු. මේ වාගේ විනාශකාරී ව්‍යාපෘති නිසා තමයි අලින්ගේ අයිතිය ඉල්ලා අලින් ගම් වැදිලා මිනිස්සු මරන්න පටන් ගෙන තිබෙන්නේ. මේකට විසඳුම තමයි මේ අලි ටික එක තැනකට ගාල් කිරීම. ඒකත් ලෙහෙසි පහසු කාරණයක් නොවෙයි. ගමේ ඉන්නේ අලියෙක් දෙන්නෙක් නොවෙයි, තුන් හාරසියය ඉන්නවා. මේ අලි අද වන විට අඹ කන්න පුරුදු වෙලා; කොස් කන්න පුරුදු වෙලා; කෙසෙල් කන්න පුරුදු වෙලා; ගමේ කෑමට හුරු වෙලා තිබෙනවා.

අද ඔබතුමන්ලා ගවයින් ගැනත් කථා කළා. අද ඒ ගම්වල ඉන්න ව්‍යාපාරිකයින් දේශපාලන බලය අරගෙන සියලුම ගවයින් ටික අපේ රක්ෂිතවලට දාලා තිබෙනවා. ඒ ගවයින් ටික අයින් කරන එක ලොකු ගැටලුවක්. අයින් කරන්න හැදුවාම දේශපාලනඥයින් මහ පාරට බහිනවා. නමුත්, අලින්ට කන්න තිබෙන තණ කොළ ටික තමයි ඒ ගවයින් කන්නේ. අලින්ට කන්න දෙයක් නැහැ. මේවා ජාතික ගැටලු. ඒ නිසා හැමෝම මෙතැනදී එකතු වෙන්න ඕනෑ. අපි ගවයින් ටික එළවා දමන්න හැදුවොත් දේශපාලනඥයින් මැදිහත් වෙනවා. "එහෙම කරන්න දෙන්න බැහැ, මේකෙන් තමයි මිනිසුන් ජීවත් වෙන්නේ" කියනවා. හැබැයි, එතැන ලොකු ගැටලුවක් තිබෙනවා. මේවා තමයි ජාතික ප්‍රශ්න. මේකට විසඳුමක් තිබෙන්නට ඕනෑ. අලින්ට කන්න තණ කොළ නැහැ. ඒ ටික ගවයින් කනවා. අලි ගම් වදිනවා. අලි ගමේ කෑමවලට පුරුදු වෙලායි ඉන්නේ. ඒ සතුන් කොටු කරන්න ඕනෑ. මේක ලොකු ප්‍රශ්නයක්. අපට තිබෙන්නේ තව මාස 15යි. මේක අධ්‍යයනය කරන්නම අවුරුද්දක් විතර යනවා. ඒක තේරුම් ගන්න. මේකට මොකක්ද කරන්න ඕනෑ කියලා හොයන්න ඕනෑ; අධ්‍යයනය කරන්න ඕනෑ. අපේ කාලය තුළ මේකට යම් කිසි විසඳුමක් දෙන්න තමයි 6,000ක නිලධාරින් කණ්ඩායමක් බඳවා ගන්න රුපියල් මිලියන 500ක් වෙන් කරලා කටයුතු කළේ. පහළ මට්ටමේ සිට මේකට අවශ්‍ය කරන ප්‍රතිපාදන ලබා දීලා මේ මිනිසුන් ආරක්ෂා කරන වැඩ පිළිවෙළක් අපි දැනට යොදලා තිබෙනවා. අපි ඒක ඉදිරියේ දී ක්‍රියාත්මක කරනවා.

ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් කිව්වා සිංහරාජ වනාන්තරයේ හිටපු තුන්පත් අලි රැන ගැන. ඔබතුමා දන්නවා, සබරගමුව ඡන්දය වෙලාවේ මමත් හිටියේ සබරගමුවේ. අපේ ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමාට මතක ඇති. ඒ අවස්ථාවේ මම දැක්කා, ඔය තුන්පත් අලි රැන. මව් ඇතින්නයි, පැටවුන් දෙදෙනායි හිටියේ. ඒ අලි තුන්දෙනාට මිනිසුන් දෙන වධ හිංසා මම දැක්කා. ලෑලිවල අහල් 6 පරාල ඇණ ගහලා පෑගෙන්න තියනවා. හැබැයි, එහෙම කරන කොට ඔය එක පරිසරවේදියකුවත් ඒ ගැන ප්‍රශ්න කළේ නැහැ. පරිසර සංවිධාන හදාගෙන, NGO හදා ගෙන, විදේශ රටවලින් සල්ලි ගෙනැල්ලා කටයුතු කරන එක්කෙනකුවත් ඇහුවේ නැහැ, එහෙම කරන්නේ ඇයි කියලා. ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ දැනට අවුරුද්දක් තිස්සේ එම මව් ඇතින්න ආ ගිය

අතක් නැහැ. ඒ, මව් ඇතින්න කෝ කියලා එක පරිසරවේදියකුවත් කථා කරලා ඇහුවේ නැහැ. දැන් සිංහරාජයේ සිටින ඔය කියන අලි දෙදෙනා මිනිස් ජීවිත 15ක් විනාශ කරලා තිබෙනවා. එක පරිසරවේදියකුවත් සිනි කිලෝ එකක් අරගෙන ඒ එක මනුෂ්‍යයකුගේවත් මළ ගෙදරකට ගියේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් දෙන්නම්.

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)

හොඳයි. වන ජීවී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ගිහිල්ලා ඒ මව් ඇතින්න නිර්වින්දනය කරලා, කඹවලින් ගැටගහලා අරගෙන යන්න හැදුවා. එතකොට තරුණ අලි දෙදෙනා කඹ ගැන ලොකු වෛරයක් ඇති කර ගත්තා. ඒ අලි දෙදෙනා කැලේ සීතල වන විටයි ගමට එන්නේ. ඒ එන කොට පෙර සිදු වුණු වැරැද්ද නිසා කවුරුන් හෝ මරාගෙනයි එන්නේ. තමන්ගේ අම්මාව ගැට ගහපු වෛරයට කඹය තිබෙන ගවයින් දැක්කොත් මරනවා. ඒ ප්‍රදේශයේ ගවයින් 200ක් විතර මරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මිනිසුන්වත් මරලා තිබෙනවා. මේක සංවේදී ක්‍රියාවක්. ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ ගමට ගියා. ඔබතුමාත් දන්නවා ඇති, අවුරුදු 85ක පුද්ගලයකු මරා දැම්මා. මම ඒ මැරුණු පුද්ගලයාගේ ගෙදරටත් ගියා. මම ඔබතුමාටත් කථා කරලා ඒ ගැන කිව්වා, මතක ඇති. මම ඔබතුමාට දිගටම මේ ගැන කථා කළා. වෙනත් සංවේදී සිද්ධියක් ගැනයි අපි කථා කළේ. නමුත්, ගමේ මිනිසුන්ගේ තිබෙන වේදනාව, විලාපය, ගැටලුව අපි ඇහුවා. හැම කෙනකුම කියන්නේ ඒ අලි දෙදෙනා අරගෙන යන්න කියලයි. මුල් වෙලාවේ මව් ඇතින්න අරගෙන යන්න හදන කොට කලවාන ප්‍රදේශයේ ඔක්කෝම උද්ඝෝෂණ කළා, අරගෙන යන්න එපා කියලා. පාසල් ශිෂ්‍යාවක් උද්ඝෝෂණය කරලා වනජීවී නිලධාරීන්ට

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

-පෙන්නුවා අරගෙන යන්න එපාය කියලා. ඒ තරුණ කෙල්ලවත්, එයාගේ අම්මාවත් ඇතින්න ඇවිල්ලා මැරුවා. හැබැයි, දැන් මේ සිද්ධියේදී මුළු ගමම එක හඬින් කියනවා, "මේ අලි දෙදෙනාව අරගෙන යන්න" කියලා. ගමේ මිනිසුන්ගේ වේදනාවේ, විලාපයේ අවසාන තීන්දුව; ඒ අය දෙන අවසාන පණිවුඩය තමයි "ඒ අලි දෙදෙනා අපි මරණවා" කියන එක. දිවියාට වුණු දේ තමයි වෙන්නේ. ඒ දෙදෙනා පිරිමි සතුන් දෙදෙනෙක්. එතකොට බෝ වීමකුත් නැහැ. හැබැයි, තව අවුරුදු ගණනක් ඒ සතුන් දෙදෙනා ජීවත් වෙනවා. ඒ නිසා මිනිස්සුන්ගේ ජීවිත ආරක්ෂා කිරීම වෙනුවෙනුත්, ඒ අලි දෙදෙනාගේ ජීවිත ආරක්ෂා කිරීම වෙනුවෙනුත් අපි තීරණය කළා, ඉක්මනින්ම මේ අලි දෙදෙනාව නිර්වින්දනය කරලා හොරොව්පතාන අලි සුරැකුම් මධ්‍යස්ථානයට අරගෙන යන්න. මේකත් පොඩ්ඩක් අහ ගන්න. අපි නිකරුණේ අලි අරගෙන ගිහිල්ලා එතැනට දමන්නේ නැහැ. හොරොව්පතාන අලි සුරැකුම් මධ්‍යස්ථානයේ සිටින්නේ මේ රටේ මිනී මරපු අලි. මිනිසුන් 10, 15ක් මරපු අලි සිටිනවා.

ඒ අලි වැට ළඟින්, අයින දිගේ අඩු ගණනේ වනජීවී නිලධාරීන්ට වාහනයකින් යන්න දෙන්නේ නැහැ. අලි එළවාගෙන ඇවිත් හොඬවැලින් ගහනවා. අපේ වනජීවී නිලධාරී මහත්වරු ඒක ඇතුළට අලියෙක් අරගෙන ගිහින් වාහනයෙන් බෑවාම, අලි අපේ නිලධාරීන් පසුපස එළෙව්වා. නිලධාරීන් වාහනය දමලා දිව්වා. උදේ වෙනකොට අලි පටවන වාහනය කුඩු පට්ටම් කර දමා තිබුණා. හැබැයි මේ අලි දෙන්නාගේ ජීවිත ආරක්ෂාව වෙනුවෙන් මම හොරොව්පතානට ගිහින්, උදේ 10.00ට මේ වනයට ඇතුළු වුණා. වනජීවී නිලධාරීන් කවුරුවත් ආවේ නැහැ. මම හවස 5.30 වනතුරු වනයේ හැමතැනම ඇවිද්දා. මට හමුවුණේ එකම එක ඇතායි. ඒ, කටුකැලියාවෙන් අරගෙන ගිය මිනීමරු ඇතායි. ඒ ඇතා පැත්තකටයි යන්නේ. ඒ ඇතාගේ කකුලේ තුවාලයක් තිබෙනවා. මම එය වීඩියෝ කළා. හැබැයි ඒ ඇතා මට හිරිහැරයක් කළේ නැහැ. ඊට පසුව මම නැවතත් හවස 5.30ට වනයට ඇතුළු වෙලා, ට්‍රෝර්ච් එකක් අරගෙන මුළු වන භූමි ප්‍රමාණය වූ අක්කර 2,600ම තුළම ඇවිද්දා. මට අලින් 4දෙනකු හම්බ වුණා. හොඳට වතුර පිරුණු වැව් මේ වනයේ තිබෙනවා. මගේ ජීවිතය පරදුවට තියලා, මේ අලි දෙන්නාගේ ජීවිතය වෙනුවෙන් තමයි මම එහෙම ගියේ. පරිසරවේදීන් මේවා දැක්කේ නැහැ. මට අලින් 4දෙනකු හම්බ වුණා. ඒ හතරදෙනා සහ දවල් හම්බ වුණු ඇතාත් සමඟ සේරම පස්දෙනායි ඉන්නේ. "අලි 37ක් මේ වනයට දැම්මා, දැන් අලි 17ක් ඉන්නවා" කියා වනජීවී නිලධාරී මහත්වරු කියනවා. නමුත් දැක්කේ නැහැ. අපේ අමාත්‍යාංශ හරහා හොරොව්පතානේ අලි සුරැකුම් මධ්‍යස්ථානයේ මේ අලි 17දෙනාට කෑම ගිහින් දෙනවා. ඒ තත්ත්වය බලලා තමයි, මේ අලි දෙදෙනාත් මාස තුනකට හොරොව්පතානේ අලි සුරැකුම් මධ්‍යස්ථානයට දමන්න තීන්දු කළේ. මේක ලොකු risk එකක්. මේ අලි දෙදෙනා මාස තුනක් මෙම අලි සුරැකුම් මධ්‍යස්ථානයේ තියලා, සිංහරාජයේ වතුර තිබෙන, අලින් වැඩිපුර කන ශාක තිබෙන තැනක් බලලා ක්‍රමානුකූලව එහේ ගිහින් දමන්නයි අපි හැදුවේ. කැලේ සීතල වැඩි වෙනකොට තමයි අලි ගමට එන්නේ. ගමේ සීතල වැඩි වෙනකොට ඒ අලි ආයෙත් කැලයට යනවා. ඒක තමයි අලින්ගේ චර්යාව. මේ අලි flat පොළොවේ යන අලි නොවෙයි. ඔබතුමා ඒක දන්නවා, ගරු මන්ත්‍රීතුමනි. වලංකන්ද රක්ෂිතයේයි මේ අලි දෙන්නා ඉන්නේ. උන් කඳු නඟිනවා. මේ ඉනිමහේ නඟින අලි.

අපි මේ ගමේ ජනතාවගේ පීඩනය දැක්කා. මම පළමුවැනි රැස්වීම පැවැත්වුවා. ඇමතිතුමා දෙවැනි රැස්වීම පැවැත්වුවා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ සභාපතිවරයා, විපක්ෂ නායකවරයා, සංවිධායකවරයා ඇතුළු සියලුදෙනාත්, ඒ සංවිධානය නියෝජනය කළ මහත්මයාත් කිව්වා, "මේ අලි දෙන්නා අරගෙන යන්න" කියා. හැබැයි, මේ අලි දෙන්නා අරගෙන යන්නේ කොහොමද? අර, වලහාගේ සිද්ධියේදී අපේ වනජීවී නිලධාරීන් මහත්වරුන්ට නීත්‍යානුකූලව ක්‍රියා මාර්ග ගත්තාය කියා ඒ අය අන්තරාදායක රාජකාරියෙන් අයින් වුණා. අපට පශු වෛද්‍යවරු නැහැ. අපේ ඇමතිතුමා Air Force එකෙන් පශු වෛද්‍යවරු දෙදෙනෙක් ගෙන්වා ගත්තා. පශු වෛද්‍යවරු දෙන්නෙක් ගෙන්වා ගෙන, වාහනයකුත් ගෙනැත්, අලි පටවා ගෙන අරගෙන යන්න හදනකොට ජනාධිපතිතුමා කෝල් එකක් දීලා ඇහුවා, "අලි දෙන්නාට මොකද කරන්නේ? ඒ සතුන් තියා ගන්න බැරිද?" කියා. මේ අලි දෙදෙනාගේ ගැටලුව ඇමතිතුමා ජනාධිපතිතුමාට කිව්වා; මිනිසුන්ට මුහුණ පාන්න වෙලා තිබෙන ප්‍රශ්නය ගැන කිව්වා. මේ අලි දෙදෙනා ගෙන යනකොට තිබෙන අනාරක්ෂිත බව ගැනත් කිව්වාම, "පරිස්සමින් ඔය කටයුත්ත කරන්න" කියා ජනාධිපතිතුමා කිව්වා. එතුමා ඒක කියලා මට දුරකථනය තියන්න හම්බ වුණේ නැහැ, අපේ Air Force Commander අපේ ඇමතිතුමාට කථා කර කිව්වා, "ජනාධිපතිතුමාගේ නියමයෙන් නැවත පශු වෛද්‍යවරු කැඳෙව්වා" කියා. එතකොට ඇමතිතුමාත්, මමත් අසරණ වුණා. එතකොට අපේ වනජීවී නිලධාරීන් ස්ට්‍රයික් කරලා හිටියේ. Air Force එකෙන් ආපු දෙන්නාත් නැහැ. ඇමතිතුමා පෞද්ගලිකව කථා කරලා Dr. Atapattu කියන වෛද්‍යවරයා ගෙන්වලා, අලි මෙහෙයුම පටන් ගන්න හදනකොටම අපේ පශු වෛද්‍ය නිලධාරී මහත්වරු තමන්ගේ දෙපාර්තමේන්තුවේ ගරුත්වය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් ඒ

[ගරු පාලිත තෙවරප්පෙරුම මහතා]

වැඩ වර්ජනය අවසන් කරලා, අලි දෙදෙනා නිර්විඳ්දනය කරලා අරගෙන යන්න අපට සහයෝගය ලබා දෙන්න කැමැත්ත පළ කළා. අමාත්‍යාංශයේ ගරුත්වය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් පැමිණීම පිළිබඳව වනජීවී දෙපාර්තමේන්තුවේ පශු වෛද්‍යවරුන්ට මේ වෙලාවේ අපේ ස්තුතිය පුද කරනවා.

ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමනි, මේ කලාපය වියළි කලාපය වාගේ නොවෙයි. කඳු බෑවුම්, පල්ලම් තමයි මේ පරිසරයේ තිබෙන්නේ. මේ අලි දෙදෙනාගේ ජීවිත ආරක්ෂා නොකළොත් අපට ලොකු ගැටලුවකට මුහුණ පාන්න සිදුවෙනවා. අලියෙක් ලෙහෙසියෙන් වාහනයකට පටවා ගන්න බැහැ. ඒ පාරේ ලොකු ලොරියක් අරගෙන යන්නත් බැහැ. කැබ් එක යන්නත් ඕනෑ 4-wheel දමලයි. දෙපාරක් විතර reverse කරලා ගන්නත් ඕනෑ. 10 -wheel ලොරියක් ඒ පාරේ අරගෙන ගිහින් අලි පටවන්න බැහැ. පොඩි කණ්ඩියක් කපලා ලොරිය reverse කරලා අලියාව ගන්න පුළුවන් විධියට මේ කැලයේ තැන් නැහැ. අපි ඒ තැන් හොයන්න වනජීවී නිලධාරි මහත්වරු අනුයුක්ත කරලා තිබෙද්දි, ජනාධිපතිතුමා නැවත කථා කර කිව්වා, "අලි දෙන්නා අරගෙන යන්න එපා, ඒ සතුන්ට එතැනම ඉන්න තියලා වැට ගහන්න" කියා. මේක එතුමාගේ නියෝගයක්. ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමනි, අපි නැවතත් ඉල්ලීමක් විධියට මේ ගැන කථා කරලා, අලින්ට ඉන්න සුදුසු තැනක් පෞද්ගලිකවම සොයා බැලුවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා
(மாண்புமிகு பாலித தெவரப்பெரும)
(The Hon. Palitha Tewarapperuma)
හොඳයි,මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඇමතිතුමා ඒ සඳහා අක්කර 100ක විතර ඉඩමක් තෝරා ගත්තා. "සර්, අලි දෙන්නා ගමට ඇවිත් මෙතැන තමයි ඉන්නේ" කියා ගමේ පුද්ගලයෙක් කිව්වා. කවුරුත් කියලා නොවෙයි, අපේ ඇමතිතුමා මේ ගැන අධීක්ෂණය කර බලලා, එතුමාම තමයි, එම ඉඩම පෙන්නුවේ. අලි දෙන්නා ඉන්න තැන දොළ පාරක් ළඟ හොඳ ඉඩමක් තිබෙනවා. අලි දෙන්නා එතැනට ගාල් කරලා, කපොල්ලක් තියලා වැට ගහන්න අපි සැලසුම් කර තිබෙනවා. එහෙම කළාය කියා අපි ඒ වගකීමෙන් නිදහස් වෙන්නේ නැහැ, අලි දෙන්නාට අවශ්‍ය කරන කෑම බීම අපි සපයනවා. ගරු ඇමතිතුමාත්, මමත් මෙම අමාත්‍යාංශය භාරව සිටින තාක් කල් අපි ඒ දෙය කරනවා. හැබැයි, මේක ජාතික ප්‍රශ්නයක්. ඊළඟට පත්වන ඇමතිවරු මෙය තේරුම් අරගෙන, ඒ වගකීම දිගටම දැරිය යුතු වෙනවා. එතකොට මෙම ප්‍රශ්නය අනිවාර්යයෙන්ම විසඳෙනවා. "පසුගිය ආණ්ඩුවෙන් මේක කළේ නැහැ, ගිය ආණ්ඩුවෙන් ඉඩම් ටික මංකොල්ල කෑවා" කියා මේ ප්‍රශ්නයේදී කාටවත් ඇඟිල්ල දිගු කරන්න ඕනෑ නැහැ. ඒවා කියලා මේ වගකීමෙන් නිදහස් වෙන්න බැහැ.

අපි සියලුදෙනාම මෙය තේරුම් ගන්න ඕනෑ. මේක ජාතික ප්‍රශ්නයක්. මේ ගැටලුවට මැදි වෙලා ඉන්නේ දුගී දුප්පත් අහිංසක මිනිස්සුයි.

ගරු විමලවීර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ, රිළවුන්, මොනරුන්, ඌරන් නිසාත් විශාල ගැටලුවක් මතු වෙලා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, ඌරන්ට බඳින තුවක්කුවෙන් තමයි අද අපේ අලි දහස් ගණනක් මැරෙන්නේ. ඒ ආකාරයට අනන්ත අප්‍රමාණ අලි මැරෙනවා. කලා වැව ප්‍රදේශයේ " දීඝදන්තු 1" නමින් හඳුන්වන ඇතාට දැන් වෙඩි වැදිලා ඉන්නවා. හොරොව්පතාන වැව ආශ්‍රිත ප්‍රදේශයේ තවත් අලියෙක් වෙඩි වැදිලා ඉන්නවා. ගෝමරන්කඩවල තවත් අලියෙකුට වෙඩි වැදිලා ඉන්නවා. මේ විධියට අලි සිය ගණනකට වෙඩි වැදිලා ඉන්නවා. මේවා අපේ මිනිසුන් දැක්කේ නැහැ. අපි ගිහින් හොයපු නිසා තමයි මිනිසුන් මේ දේවල් දැක්කේ. අපි මේ වගකීම තේරුම් අරගෙන, ජීවිතය පැත්තකින් තියලා; අලි ගහලා මැරුවත් කමක් නැහැ කියා හිතලා, ගමක් ගමක් ගණනේ, වැවක් වැවක් ගණනේ ගිහින් මේ දේවල් හොයපු නිසා තමයි අද මේවා දැන ගත්තේ. ඒ දවස්වල මේ දේවල් යට වෙලායි තිබුණේ. අලියෙක් මැරුණාම, මේ අලියා මැරිලා තිබෙන්නේ වෙඩි වැදිලා නොවෙයි, කරන්ට් එක වැදිලා නොවෙයි" කියා පශු වෛද්‍යවරයා ඇවිත් වාර්තාවක් දෙනවා. අලියා වළලන්නේවත් නැහැ. එහෙම තමයි ඉස්සර ඒ ක්‍රියාවලිය සිද්ධ වුණේ. ඒ ක්‍රමය වැරැදියි. මෙතැනදී අපි හැමෝම එකතු වෙන්න ඕනෑ. මේ ප්‍රශ්නය වෙනුවෙන් අපි හැමෝම එක මතයක ඉන්න ඕනෑ. එක මතයක ඉඳගෙන මේ ප්‍රශ්නය ගැන කථා කරලා එය විසඳන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කිව්වා වාගේ, අපි යනකොට දේශපාලන අධිකාරියේ සියලුදෙනාම දැනුවත් කරන්නය කියනවා. හැබැයි, ඒ ගොල්ලන් ඒක කරන්නේ නැහැ. මොකද, ප්‍රශ්නය උඩට ආවොත් ඇත්ත හෙළි වෙනවා. ඒකයි වෙලා තිබෙන්නේ. මේක ජාතික ප්‍රශ්නයක්. මේ නැති වෙන්නේ සතුන්ගේ ජීවිතයි. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ යුතුකම තමයි, මේ රටේ වනජීවීන් ආරක්ෂා කිරීම සහ මිනිසුන් ආරක්ෂා කිරීම. අපි එතැන ඉන්නවා. ඒ වෙනුවෙන් කරන්න පුළුවන් උපරිම දෙය අප කරනවා. ඒ වෙනුවෙන් ශක්තිය, සහයෝගය දෙන්න කියා තමුන්නාන්සේලා සියලුදෙනාගෙන්ම මා ඉල්ලා සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 4.35ට, 2018 ජූලි 03වන අඟහරුවාදා අ. භා. 1.00 වන තෙක් කල් ගියේය.


அதன்படி பி. ப. 4.35 மணிக்கு பாராளுமன்றம், 2018 யூலை 03, செவ்வாய்க்கிழமை பி. ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 4.35 p.m. until 1.00 p.m. on Tuesday, 03rd July, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

261 වන කාණ්ඩය - 8 වන කලාපය
தொகுதி 261 - இல. 8
Volume 261 - No. 8

2018 ජූලි 03වන අඟහරුවාදා
2018 யூலை 03, செவ்வாய்க்கிழமை
Tuesday, 03rd July, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන:

කථානායකතුමාගේ සහතිකය

සාපරාධී කාරණාවලදී අන්‍යෝන්‍ය සහයෝගිතාව දැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය

ශ්‍රී ලංකාවේ සැමට සෞඛ්‍ය - විශ්වීය සෞඛ්‍ය ආවරණය ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ කාර්යභාරය යන මැයෙන් සම්මන්ත්‍රණය

විගණකාධිපතිවරයාගේ වාර්තාව

සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව

විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:

சபாநாயகரது சான்றுரை

குற்றவியல் கருமங்களில் பரஸ்பர உதவியளித்தல் (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு

"இலங்கையில் அனைவருக்கும் சுகாதாரம் - உலகளாவிய சுகாதாரத்திற்கான செயலெல்லையை அடைவதில் பாராளுமன்ற உறுப்பினர்களின் பங்களிப்பு" பற்றிய மாநாடு

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

எல்லை நிர்ணய ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை

கணக்காய்வு சேவை ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Speaker's Certificate

Mutual Assistance in Criminal Matters (Amendment) Bill: Determination of the Supreme Court

Conference on " Health for All in Sri Lanka - Role of Parliamentarians in Achieving Universal Health Coverage"

AUDITOR-GENERAL'S REPORT

PERFORMANCE REPORT OF THE DILIMITATION COMMISSION

PERFORMANCE REPORT OF THE AUDIT SERVICE COMMISSION

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 ජූලි 03වන අඟහරුවාදා
2018 யூலை 03, செவ்வாய்க்கிழமை
Tuesday, 03rd July, 2018

අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.

பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව, 2018 ජූනි 22 වැනි දින "ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන)" සහ 2018 ජූනි 28 වැනි දින "ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය (විශේෂ විධිවිධාන)" නමැති පනත් කෙටුම්පත්වල සහතිකය ම'විසින් සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

II

සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ (සංශෝධන) පනත් කෙටුම්පත : ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය
குற்றவியல் கருமங்களில் பரஸ்பர உதவியளித்தல் (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றத் தீர்ப்பு
MUTUAL ASSISTANCE IN CRIMINAL MATTERS (AMENDMENT) BILL: DETERMINATION OF THE SUPREME COURT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 121(1) වන ව්‍යවස්ථාව අනුව "සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ (සංශෝධන)" නැමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ ඉදිරිපත් කරන ලද පෙත්සම් සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය දැන්වීමට කැමැත්තෙමි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123(1) ව්‍යවස්ථාවට අනුව, පනත් කෙටුම්පතෙහි 5(3) වගන්තිය සහ 5ආ වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(1) යන ව්‍යවස්ථාවට අනනුකූල වන බවත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84 ව්‍යවස්ථාවේ 2වන ඡේදයෙහි විධිවිධානයට අනුව විශේෂ බහුතර ඡන්දයකින් පමණක් අනුමත කළ හැකි වන බවත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කොට ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණය තව දුරටත් තීරණය කර ඇත්තේ, අධිකරණය යෝජනා කර ඇති පරිදි එකී වගන්ති සංශෝධනය කළහොත් එකී අනනුකූලතාව ඉවත්ව යනු ඇති බවයි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරමි.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය :
உயர் நீதிமன்றத் தீர்ப்பு:
Determination of the Supreme Court:

THE SUPREME COURT OF THE DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA

In the matter of the ordinary exercise of jurisdiction of the Supreme Court under Article 121 of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka read with rule 63 of the Supreme Court rules of 1978 against the Bill titled "Mutual Assistance in Criminal Matters (Amendment)"

S.C. S.D. 16/2018	Petitioner:	Rear Admiral (Dr) Sarath Weerasekera, 262G, First Lane, Shanthipura, Thalawathugoda.
	Counsel:	Manohara de Silva PC, with Canishka G. Witharana and Boopathi Kahathuduwa and H.M. Thilakaratna
S.C. S.D. 17/2018	Petitioner:	Ven. Maduruoye Dhammissara Thero, Gampaha "Dakshinaramaya", Hokandara South, Hokandara.
	Counsel:	Sanjeewa Jayawardena PC with Lakmini Warusavithana and Kethmini Dharmasena
S.C. S.D. 18/2018	Petitioner:	Hewa Kurumburege Yasasvi Kumarajith Dharmadasa, No 38/3, Madapatha Road, Piliyandala.
	Counsel:	Canishka Witharana with H.M. Thilakarathne

[ගරු කථානායකතුමා]

Senior Additional Solicitor General PC. Sanjay Rajaratnam with Additional Solicitor General Parinda Ranasinghe, Deputy Solicitor General Mahen Gopallawa and Senior State Counsel Dr. Avanthi Perera for the Attorney General

Before: B. P. Aluwihare PC. J
Sisira J. de Abrew J.
H. N. J Perera J.

The Bench assembled for hearing on 18·06. 2018 and 20. 06. 2018.

A Bill in its short title referred to as "MUTUAL ASSISTANCE IN CRIMINAL MATTERS (AMENDMENT)" was published in the Government Gazette on 18th May 2018 and placed on the order of Parliament on 5th June 2018.

3 petitions numbered S.C S.D. 16/18, S.C. S.D. 17/18, S.C.S.D. 18/18 were filed by citizens invoking the jurisdiction of the Supreme Court in terms of Article 120 to determine whether the Bill or any provisions of the Bill are inconsistent with the Constitution. Upon receipt of the petitions the Court issued notice on the Attorney General as required under Article 134 (1) of the Constitution.

At the outset, the learned President's Counsel for the Petitioner in S.C S. D 16/18 contended that this Bill ought not even to have been placed on the Order Paper on the premise that Parliament has sought to legislate, circumventing the Constitutional process in Article 154G (3), on matters within the Provincial Council List.

According to Article 154G (3) of the Constitution,

> *No Bill in respect of any matter set out in the Provincial Council List shall become law unless such Bill has been referred by the President, after its publication in the Gazette and before it is placed on the Order Paper of Parliament, to every Provincial Council for the expression of its views thereon, within such period as may be specified in the reference, and –*
>
> *(a) where every such Council agrees to the passing of the Bill, such Bill is passed by a majority of the Members of Parliament present and voting; or*
>
> *(b) where one or more Councils do not agree to the passing of the Bill, such Bill is passed by the special majority required by Article 82:*
>
> *Provided that where on such reference, some but not all the Provincial Councils agree to the passing of a Bill, such Bill shall become law applicable only to the Provinces for which the Provincial Councils agreeing to the Bill have been established, upon such Bill being passed by a majority of the Members of Parliament present and voting.*

The learned President's Counsel contended that the objects of the Bill as set out in clause 3 broadly fall in the category of '*prevention, detection and investigation*' of offences, which is a subject delegated to the Provincial Police Division under item 12.1 of Appendix I in the 9th Schedule. Accordingly, the Bill cannot be allowed to stand as the President has not, in terms of Article 154G (3), referred the Bill to Provincial Councils for expression of their views.

We have carefully considered the submission made by the learned President's Counsel in relation to the relevant provision of the Constitution and observed certain factors which militate against the said construction.

Although clause 3 of the Bill lists down the instances in which the provisions of the Act, as amended by the Bill shall be made applicable, it is clear that the overarching object of the Bill is to streamline a national policy on receiving and extending international assistance in criminal related activities. This is fortified by the language in Clause 3 (1) of the Bill which states that "*The object of this Act is to facilitate the provision and obtaining by Sri Lanka of assistance in criminal and related matters.*" Within the framework of the Bill, State and its instrumentalities assume a single identity for the purposes of rendering and receiving assistance in relation to criminal matters of national and transnational character. It is untenable to construe clause 3 as one inviting the Provincial provenance when the Bill intends to regulate matters not between the center and the periphery but between the state and the international forums. The object in simple terms is not one falling within the subject of Police powers which, as correctly contended by the Learned President's Counsel, is shared between the Centre and the Periphery; but an object which falls within the subject of Foreign Affairs defined in the Reserved List in the Ninth Schedule as including "*all matters which bring the Government of Sri Lanka into relation with any foreign country.*"

Furthermore, the arrangement which the 13th Amendment to the Constitution has put in place is one that gravitates around the Centre. It presupposes the central intervention whenever a subject matter requires coordination among one or more provinces. This is made bare by the reference to "All Subjects and Functions not Specified in List I or List III" in the Reserved List and item 10 (Any Offence in respect of which Courts in more than one Province have Jurisdiction) in the Schedule to the Provincial List in the Ninth Schedule-all of which leave to the center matters that transcend a purely provincial level. To the extent that a subject has an impact on more than one province, it invites the Central intervention as oppose to the Provincial. If we were to interpret otherwise, it would have the undesirable consequence of altering the power sharing arrangement from one of delegation to that of a partnership.

This scheme must be borne in mind when approaching sub-clauses (a) to (q) in Clause 3. The unambiguous intention of the legislature as adverted to above, is to streamline a policy on international co-operation. The several instances set out therein cannot be artificially classified into matters falling exclusively within one province. The direct reference to intellectual property in clause 3(h), which is also a matter left to the center under the Reserved List, is illustrative of this rationale. Functions stipulated under clause 3 require a uniform policy and extensive coordination. The actual implementation of the decisions would no doubt be carried out by the provincial level, where it is necessary. Thus, the instances stipulated under clause 3 cannot be deemed a violation of or an encroachment on the provincial powers. To all intents and purposes, those powers remain unaffected and in tact within this legislative framework.

In any event, Article 154G (11) of the Constitution overrides Article 154 G (3) when Parliament legislates for the purposes of upholding the State's international obligations.

> "*Notwithstanding anything in paragraph (3) of this Article, Parliament may make laws, otherwise than in accordance with the procedure set out in that paragraph, in respect of any matter set out in the Provincial Council List for implementing any treaty, agreement or convention with any other country or countries or any decisions made at an international conference, association, or other body*"

As observed earlier, the principal objective of this Bill is to facilitate the relationship between Sri Lanka and subjects of international law. The international character of the Bill is further reflected in Clause 2 of the Bill, which extends the application of this Bill to situations where the State has either a direct or an indirect international obligation to foster the best interests of sovereign nations. Thus, the Bill falls under the purview of 154 G (11) which permits Parliament to legislate otherwise than in accordance with Article 154 G (3).

For the foregoing reasons we are of the view that the proposed Bill does not attract the provision of Article 154 G (3) of the Constitution.

Petitioners' second ground of challenge was made with regard to the powers vested in the Competent Authority under clause 5 (3) and clause 10 of the Bill.

One of the principal features of the Bill under review is introducing a 'Competent Authority' under Clause 4 to receive and process the Mutual Legal Assistance

Requests. The Bill bifurcates the reception and sending points of Mutual Legal Assistance requests by a Central Authority and in certain instances by the Competent Authority, in order to provide efficient administration of the Act.

However, while section 6 of the principal enactment obliges the Central Authority to refuse a request in whole or in part when the said request, *inter alia*, violates the Constitution, no such restrictions have been put in place to regulate the conduct of the Competent Authority. This omission carries significant constitutional implications for the reason that clause 5 (3) of the Bill makes it mandatory for the said Competent Authority to directly receive and immediately proceed to implement Mutual Legal Assistance requests.

> *'Notwithstanding the provisions of subsection (1), a request which conforms to the provisions of subsection (2) may be forwarded through electronic means directly to the relevant competent authority through the appropriate authority of a specified country or specified organization. Such competent authority shall, subject to subsection (4), immediately proceed to implement the request'*

During his submission, the learned Senior Additional Solicitor General proposed to amend clause 5 (3) by the deletion of the second sentence.

The amended clause 5 (3) will henceforth include;

> *'Notwithstanding the provisions of subsection (1), a request which conforms to the provisions of subsection (2) may be forwarded through electronic means directly to the relevant competent authority through the appropriate authority of a specified country or specified organization.'*

While this prevents the Competent Authority from processing the request immediately, it is observed that the Competent Authority still remains, in strict sense, denude the power to refuse a request on the grounds stipulated under section 6. The issue is confounded by clause 5 (4) of the Bill which only requires the Competent Authority to "*inform the Central Authority by forwarding a copy of the relevant request.*" The statutory language and the framework does not indicate that the onus to filter the request reverts to the Central Authority. *Ex facie*, the Competent Authority could still act outside the statutory framework. In those circumstances, we observe that the said clause, even in its amended form remains inconsistent with Article 12 (1) of the Constitution. It is imperative that the Competent Authority be amenable to section 6 of the principal enactment to allow the refusal of, in whole or in part, a request. This would enable both the Competent Authority and the Central Authority to filter requests at their respective ends without compromising on expediency or the legal safeguards imbued in the framework.

Extensive submissions were also made on Clause 10 of the Bill which amends section 10 (1) of the principal enactment to expedite the process of taking evidence or receiving documents or articles.

The said clause 10 (1) reads;

> *"(1) where the appropriate authority of a specified country makes a request to the Central Authority that-*
>
> *(a) evidence be taken in Sri Lanka ; or*
>
> *(b) documents or other articles in Sri Lanka produced.*
>
> *for the purposes of a proceeding in relation to a criminal matter in the specified country or specified organization, the Central Authority shall promptly refer such request to a competent authority or where necessary, to the Chief Magistrate of the Colombo Magistrate's Court to take such evidence or to receive such documents or articles, and shall, upon receipt of such evidence, documents or articles from such Magistrate or competent authority, as the case may be, transmit the same to the appropriate authority of the specified country or specified organization"*

The learned President's Counsel in S.C S. D 17/18 strenuously argued that the phrase 'as necessary' in the clause would have the undesirable consequence of normalizing the practice of evidence taking by the Competent Authority and make the Magistrate's intervention the exception. In the result, it would leave a section of witnesses unprotected and deprived of the numerous safeguards provided under section 10 (3) to section 10 (9) in the principal enactment.

In response, the learned Senior Additional Solicitor General submitted that clause 10 (1) envisages two types of requests –those that specify *evidence* and *documents to be made and produced under oath* and requests pertaining to obtaining *only statements and documents*. Between the two, it was submitted that the Central Authority will only forward the latter to the Competent Authority which would rule out any apprehension of making the Magistrate's intervention the exception.

He also agreed to amend the clause by the substitution of the words 'where necessary' with 'as required'. Accordingly, the new clause 10(1) would read;

> *"(1) where the appropriate authority of a specified country makes a request to the Central Authority that-*
>
> *(a) evidence be taken in Sri Lanka; or*
>
> *(b) documents or other articles in Sri Lanka produced.*
>
> *for the purposes of a proceeding in relation to a criminal matter in the specified country or specified organization, the Central Authority shall promptly refer such request to a competent authority or* ***as required*** *, to the Chief Magistrate of the Colombo Magistrate's Court to take such evidence or to receive such documents or articles, and shall, upon receipt of such evidence, documents or articles from such Magistrate or competent authority, as the case may be, transmit the same to the appropriate authority of the specified country or specified organization"*

Bearing in mind the objective of expediency, we nevertheless observe that the distinction which the Learned Senior Additional Solicitor General elaborated in his submission is not reflected in the statutory language.

However, considering the scheme of the Act and safeguards embodied in Section 8 of the Act, we are of the view that Clause 10 (1) of the Bill is not inconsistent with the Constitution.

An observation is also made in respect of Clause 5B which enables the Central Authority to direct a Competent Authority to spontaneously transmit information notwithstanding the provisions of the Act. This Court agrees with the submission made by the Learned Senior Additional Solicitor General that clause 5B is a legislative response to address the issue of expediency. Nevertheless, to the extent that clause 5B sets an exception to the normal process, there must be a corresponding justification or a circumstance which warrants the invocation of clause 5B. The clause in its present form permits digression from the normal process *ad hoc* and *ad hominem* and thereby violates Article 12 (1) of the Constitution. If the Legislature amends clause 5B reserving it as a response to exigent situations, the inconsistency would cease to be.

The Petitioners further challenged clause 2 (1) (c), 2 (1) (d) and clause 20 (definition of Competent Authority) during their submissions.

amendments to the said clauses.

Clause 2 (1) (d) will be amended by the substitution of the word "organization" with the words "an intergovernmental organization combatting corruption, money laundering, or terrorism financing" and will be read as follows;

> *"an* ***intergovernmental organization combatting corruption, money laundering, or terrorism financing****, on such terms and conditions as may be necessary and on the assurance of reciprocity."*

Clause 2 (1) (c) will be amended by the addition of words "on the basis of reciprocity" and will be read as follows;

> *"a country which has not entered into any agreement with Sri Lanka, where the Minister may determine that it is in the best interests of the sovereign nations that Sri Lanka extends and obtains assistance* ***on the basis of reciprocity"***

The definition of Competent Authority in clause 20 will be amended as follows;

> *"competent authority"* ***means a law enforcement authority or any other authority established by law"***

In view of the assurances given by the learned Senior Additional Solicitor General with the concurrence of the Minister, we do not consider it necessary to make a determination in respect of these matters.

[ගරු කථානායකතුමා]

For the aforesaid reasons, we determine in terms of Article 123 (1) of the Constitution that clauses 5(3) and 5B of the Bill are inconsistent with Article 12(1) of the Constitution and may only be passed by a special majority required under the provision of paragraph 2 of Article 84. However, if the said clauses are amended as opined by this Court the said inconsistency would cease to be.

We place on record our deep appreciation of the assistance given by all learned Counsel for the Petitioners and the learned Senior Additional Solicitor General who appeared on behalf of the Hon. Attorney General.

B. P. Aluwihare PC. J.,
Judge of the Supreme Court

Sisira J. de Abrew J.,
Judge of the Supreme Court

H.N.J Perera J.,
Judge of the Supreme Court

[මෙම ලේඛනය පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த ஆவணம் நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This document is also placed in the Library.]

III

"ශ්‍රී ලංකාවේ සැමට සෞඛ්‍ය - විශ්වීය සෞඛ්‍ය ආවරණය ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ කාර්ය භාරය" යන මැයෙන් සම්මන්ත්‍රණය

"இலங்கையில் அனைவருக்கும் சுகாதாரம் - உலகளாவிய சுகாதாரத்திற்கான செயலெல்லையை அடைவதில் பாராளுமன்ற உறுப்பினர்களின் பங்களிப்பு" பற்றிய மாநாடு

CONFERENCE ON "HEALTH FOR ALL IN SRI LANKA - ROLE OF PARLIAMENTARIANS IN ACHIEVING UNIVERSAL HELTH COVERAGE"

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා වෛද්‍ය සංගමය විසින් වර්තමාන "සෞඛ්‍ය පහසුකම් ලබා දීමේ රාමුව සහ අපේ සෞඛ්‍ය පද්ධතිය" 21 වැනි සියවස තුළ පැවැතිය යුතු ආකාරය පිළිබඳ ඔවුන්ගේ දැනුම බෙදාදීම සඳහා "ශ්‍රී ලංකාවේ සැමට සෞඛ්‍ය - විශ්වීය සෞඛ්‍ය ආවරණය ලබා ගැනීම සඳහා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ කාර්ය භාරය" යන මැයෙන් සම්මන්ත්‍රණයක් 2018 ජූලි මස 04 වැනි බදාදා, එනම් හෙට දින පූර්ව භාග 9.30 සිට පූර්ව භාග 11.30 දක්වා පාර්ලිමේන්තු සංකීර්ණයේ කාරක සභා කාමර අංක 01හිදී මාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීමට සියලු කටයුතු සූදානම් කර තිබෙන බැවින්, එම අනති අවස්ථාවට පැමිණ සහභාගී වන මෙන් සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනු කැමැත්තෙමි.

විගණකාධිපතිවරයාගේ වාර්තාව

கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை

AUDITOR-GENERAL'S REPORT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

2015 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXIV කොටස; සහ

2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XVIII සහ XIX කොටස් සහ නවවැනි කාණ්ඩයේ IV කොටස

මම ඉදිරිපත් කරමි.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - அரச தொழில்முயற்சிகள் மற்றும் கண்டி நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Public Enterprise and Kandy City Development and Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වාර්තාව මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.
அறிக்கை அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.
Ordered that the Report be printed.

සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව

எல்லை நிர்ணய ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை

PERFORMANCE REPORT OF THE DELIMITATION COMMISSION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2017 වර්ෂයේ සිව්වැනි කාර්තුව (2017.10.01 - 2017.12.31) සඳහා සීමා නිර්ණය කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
கணக்காய்வுச் சேவை ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
PERFORMANCE REPORT OF THE AUDIT SERVICE COMMISSION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2018 වර්ෂයේ පළමුවැනි කාර්තුව (2018.01.01 - 2018.03.31) සඳහා විගණන සේවා කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2017 වර්ෂය සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2017 වර්ෂය සඳහා ගාල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු කථානායකතුමනි, 2017 වර්ෂය සඳහා සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා දෙක ඉදිරිපත් කරමි.

(1) 2016 වර්ෂය සඳහා සමුපකාර සේවක කොමිෂන් සභාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2017 වර්ෂය සඳහා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

එම වාර්තා නිෂ්පාදන හා සේවා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම පහත සඳහන් වාර්තා දෙක ඉදිරිපත් කරමි.

(i) 2017 වර්ෂය සඳහා තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 2017 වර්ෂය සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව.

එම වාර්තා අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ගරු කථානායකතුමනි, නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන් මම නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද, "අල්ලස් (සංශෝධන) පනත් කෙටුම්පත" සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා (අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எட்வட் குணசேகர - உள்ளக அலுவல்கள் மற்றும் வடமேல் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Edward Gunasekara - Deputy Minister of Internal Affairs and Wayamba Development)

ගරු කථානායකතුමනි, මම මිනුවන්ගොඩ, පන්සිළුගොඩ, පන්සිළුපුර පාර, අංක 55/සී දරන ස්ථානයෙහි පදිංචි එන්. ශීලියා ශාන්තිනී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු ජේ. සී. අලවතුවල මහතා (ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல - உள்நாட்டலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. J.C. Alawathuwala - Deputy Minister of Home Affairs)

ගරු කථානායකතුමනි, මම ඉබ්බාගමුව, බක්මීගොල්ල, 8වන පටුමහ, රජසිරිල, අංක 87 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්.එම්. රත්නායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ගාමිණී ලොකුගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ටී. බී. ඒකනායක මහතා
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

ගරු කථානායකතුමනි, මම කොළඹ 06, වැල්ලවත්ත, පීටර්සන් පාර, අංක 43, 5/1 දරන ස්ථානයෙහි පදිංචි ප්‍රියන්ත උදය කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) තංගල්ල, ඉදිපොකුණුගොඩ, පොළොම්මාරුව පාර, රජසෙවන, අංක 141 දරන ස්ථානයෙහි පදිංචි එන්.ඩබ්ලිව්. රාජපක්ෂ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) කුණ්ඩසාලේ, දර්ශනපුර, අංක 26 දරන ස්ථානයෙහි පදිංචි පී.ආර්.පී.වයි. පල්ලේමුල්ල මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු අ. අරවින්ද් කුමාර් මහතා
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)

Hon. Speaker, I present a petition from Mrs. B.T.J. Niyaz of No. 22, Dehigasthalawa, Balangoda.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)

ගරු කථානායකතුමනි, මම ගොඩකවෙල, වරායාය යන ලිපිනයෙහි පදිංචි එන්.එම්. මුදියන්සේ මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 1 -20/'18- (1), ගරු ආනන්ද අලුත්ගමගේ මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

2016 අය වැය යෝජනා : කුකුළු ගොවිපොළ කර්මාන්තය
2016 வரவு செலவுத்திட்டப் பிரேரணை: கோழி வளர்ப்பு
BUDGET PROPOSALS 2016: POULTRY FARMING

42/'18

2. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2016 අය වැය ලේඛනයෙහි, කුකුළු පාලනය වෙනුවෙන් වූ එකම යෝජනාව, අංක 155 වශයෙන් ඉදිරිපත් කරන ලද බව පිළිගන්නේද;

(ii) එම යෝජනාවෙහි 2016 වර්ෂය සඳහා වූ ප්‍රගතිය කවරේද;

(iii) වර්ෂ 1977 සිට 2016 දක්වා ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද සහ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද කුකුළු මස් ප්‍රමාණය හා ඒවායේ වටිනාකම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

කඩ්ප්‍රොෂිල්, නීරක වළමූල අපිවිරුත්ති මත්‍රුම් කිරාමියප් පොරුළාතාර අළුවල්කළ් අමෛච්චර෈ක් කේට්ට විනා:

(අ) (i) 2016ආම් ආණ්ඩුක්කාන වරවු චෙලවුත්තිට්ට අරික්කෙයිල්, කෝළි වළර්ප්පු තොඩර්පාන ඔරෙයොරු පිරේරණෙ, 155ආම් ඉලක්කත්තින් කීළ් මුන්වෛක්කප්පට්ටදු එන්පතෙ ඒත්‍රුක් කොළ්වාරා;

(ii) ඉප්පිරේරණෙයින් 2016ආම් ආණ්ඩුක්කාන මුන්නේට්‍රම් යාදු;

(iii) 1977 තොඩක්කම් 2016 වරෙ ඉලංකෙයිලිරුන්දු ඒත්‍රුමදි චෙය්යප්පට්ට මත්‍රුම් ඉලංකෙක්කු ඉරක්කුමදි චෙය්යප්පට්ට කෝළි ඉරෙච්චියින් අළවු මත්‍රුම් අවත්‍රින් පෙරුමදි ඔව්වොරු වරුඩත්තින් අඩිප්පඩෙයිල් වෙව්වේරාග යාදු;

එන්පතෙ අවර් ඉච්චපෛක්කු අරිවිප්පාරා?

(ආ) ඉන්‍රේල්, ඒන්?

asked the Minister of Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs:

(a) Will he inform this House -

(i) whether he will admit that the only Proposal on poultry industry in the 2016 Budget was presented as per Proposal No. 155;

(ii) the progress of the said Proposal for the year 2016; and

(iii) separately in respect of each year from 1977 to 2016, the quantity of chicken exported from Sri Lanka and imported to Sri Lanka and their value?

(b) If not, why?

ගරු ගාමිණි විජිත් විජයමුණි සොයිසා මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா - கடற்றொழில், நீரக வளமூல அபிவிருத்தி மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் அமைச்சர்)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa - Minister of Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) 2016 වර්ෂය සඳහා වූ ප්‍රගතිය;

2016 වර්ෂයේ දිනක් වයසැති බ්‍රොයිලර් කුකුළු පැටවුන් නිෂ්පාදනය මිලියන 138.32ක් වන අතර, එය 2015 වර්ෂයට සාපේක්ෂව 10%ක වර්ධනයකි.

2016 වර්ෂයේ බ්‍රොයිලර් මස් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 182,690ක් වන අතර, 2015 වර්ෂය හා සංසන්දනය කර බලන විට එය 11%ක වර්ධනයකි.

වාර්ෂික ඒක පුද්ගල කුකුළු මස් පරිභෝජනය 2015 වර්ෂයේ කිලෝග්‍රෑම් 7.8ක් වූ අතර, 2016 වර්ෂයේ එය කිලෝග්‍රෑම් 8.5ක් දක්වා වර්ධනය වී ඇත.

අගය එකතු කළ කුකුළු මස් නිෂ්පාදනය 2015 වර්ෂයේ මෙට්‍රික් ටොන් 11,825ක් වූ අතර, 2016 වර්ෂයේ එය මෙට්‍රික් ටොන් 12,605ක් දක්වා වර්ධනය වී ඇත.

- 2015 වර්ෂයේ අපනයනය කළ අගය එකතු කළ කුකුළු මස් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 96.45ක් වූ අතර, 2016 වර්ෂයේ අපනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 124.7කි.
- 2016 වර්ෂයේ බිත්තර සඳහා වූ දිනක් වයසැති කිකිළි පැටවුන් නිෂ්පාදනය මිලියන 8.76ක් වූ අතර, 2015 වර්ෂයට සාපේක්ෂව එය 20% ක වැඩිවීමකි.
- 2015 වර්ෂයේ කිකිළි බිත්තර නිෂ්පාදනය මිලියන 2,294.08ක් වූ අතර, 2016 වර්ෂයේ බිත්තර නිෂ්පාදනය මිලියන 2,304.06 දක්වා වර්ධනය වී ඇත.
- වාණිජ කුකුළු ආහාර නිෂ්පාදන 2015 වර්ෂයේ මෙට්‍රික් ටොන් 501,820ක් වූ අතර, 2016 වර්ෂයේ එය මෙට්‍රික් ටොන් 620,310ක් විය. 2015 වර්ෂය හා සංසන්දනය කරන විට එය 24%ක වර්ධනයකි. ගොවිපළ තුළ සිදුකරන කුකුළු ආහාර නිෂ්පාදනයද ඇතුළත්ව 2015 වර්ෂයේ සම්පූර්ණ කුකුළු ආහාර නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 897,820ක් වන අතර, 2016 වර්ෂයේ එය, මෙට්‍රික් ටොන් 1,033,850ක් දක්වා වර්ධනය වී ඇත.

(iii) පිළිතුර ඇමුණුමෙහි දක්වා ඇත.

ඇමුණුම **සභාගත*** කරමි.

(ආ) පැන නොනඟී.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, ගරු ගාමිණී විජිත් විජයමුණි ද සොයිසා මැතිතුමා නව අමාත්‍යවරයා වශයෙන්, නිලධාරීන් විසින් සපයන ලද පිළිතුර මෙම සභාවට ඉදිරිපත් කළා. ඒ පිළිබඳව එතුමාට මා ස්තුතිවන්ත වෙනවා.

2016 අය වැය කථාවේ 155 වන අය වැය යෝජනාව මම කියවන්න කැමැතියි.

එහි මෙසේ සඳහන් වනවා:

"දේශීය කුකුළුමස් නිෂ්පාදනවල තත්ත්වය හා ඵලදායීතාවය වර්ධනය කිරීම සඳහා එම නිෂ්පාදනයන් සඳහා තවදුරටත් අවශ්‍ය ආයෝජන පුළුල් කිරීම උනන්දු කරවීමට මම කැමැතියි.

** ප්‍රශ්නකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

ශ්‍රී ලංකාව කලාපය තුළ කුරුළු උණ රෝගයෙන් නිදහස් රටක් ලෙස ඇති වාසිය විශේෂයෙන්ම මැද පෙරදිග ඇතුළු විදේශ වෙළඳපලවල් වෙත පිවිසීම සඳහා යොදා ගැනීමටත් උනන්දු කරනවා."

ගරු කථානායකතුමනි, මම පළමුවෙනි අතුරු ප්‍රශ්නය ලෙස අහන්නේ එම 155 වන අය වැය යෝජනාව අනුව එලෙස උනන්දු වීමෙන් පස්සේ මැද පෙරදිග ඇතුළු රටවලට ශ්‍රී ලංකාවෙන් කුකුළු මස් අපනයනයක් සිදුවෙලා තිබෙනවාද, නැද්ද කියලායි.

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(මාණ්පුමිකු කාමිණී විජිත් විජයමුණි සොය්සා)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

ගරු කථානායකතුමනි, මම අධ්‍යාපන නියෝජ්‍ය ඇමති හැටියට දීර්ඝ කාලයක් නිස්සේ බන්දුල ගුණවර්ධන මැතිතුමා වෙනුවෙන් පාර්ලිමේන්තුවේදී නිලධාරීන් විසින් සපයන ලද උත්තර ලබා දුන්නා. එතුමා මගෙන් අහන ප්‍රශ්නයට මම නිවැරදි පිළිතුරක් සැපයුවා. ඊට අමතරව අරාබි රටවලට අපි කුකුළු මස් අපනයනය කරනවාද කියන ප්‍රශ්නය ඔබතුමාට වෙනම අහන්න වෙයි. මම ඒකට වෙනම උත්තරයක් දෙන්න සූදානම්.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය, ගරු කථානායකතුමනි. මලික් සමරවික්‍රම ඇමතිතුමාගේ සිංගප්පූරු - ශ්‍රී ලංකා නිදහස් වෙළෙඳ ගිවිසුම අනුව තිරු බදු සහිතව හා තිරු බදු රහිතව කුකුළු මස් හා කුකුළු මස් ආශ්‍රිත නිෂ්පාදන ආනයනය කරන්න ඉඩ ප්‍රස්ථා දෙනවා නම්, එවැනි තත්ත්වයක් තුළදී විෂයය භාර අමාත්‍යතුමා වශයෙන් ඔබතුමා දේශීය කුකුළු කර්මාන්තය වෙනුවෙන් මැදිහත් වෙලා ආරක්ෂණකාරී පිළිවෙතකට මාරු වෙන්න අදහස් කරනවාද?

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(මාණ්පුමිකු කාමිණී විජිත් විජයමුණි සොය්සා)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

මේක මම කරපු දෙයක් නොවෙයි. අපේ හැරිසන් ඇමතිතුමා ඇති කරපු අභිජනන ක්‍රියාවලිය හා සම්බන්ධ දෙයක්. [බාධා කිරීම්] මම ඒක කියන්නම්. පොඩ්ඩක් ඉන්න කෝ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලි කරන්න.

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(මාණ්පුමිකු කාමිණී විජිත් විජයමුණි සොය්සා)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

ගරු කථානායකතුමනි, අපි ඒ සම්බන්ධයෙන් විශේෂ පියවර අරගෙන තිබෙනවා. බිත්තර ආනයනය කිරීම මම සම්පූර්ණයෙන්ම නැවැත්වුවා.

මව් කිකිළියන් ආනයනය කිරීම සම්පූර්ණයෙන් නැවැත්තුවා. ඒ වාගේම මේ රටේ විවිධ මස් වර්ග නිෂ්පාදනය කරනවා. [බාධා කිරීමක්] ඒ සියල්ල නැවැත්තුවා. අපි දේශීය වශයෙන් කුකුළු මස්, බිත්තර, මව් කිකිළියන්ගෙන් ස්වයං පෝෂිතයි. මා ඒකයි කිව්වේ, මෙතුමායි ඒ වැඩේ කළේ කියා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

මා අහුවේ සිංගප්පූරු ශ්‍රී ලංකා ගිවිසුම අනුව-

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

මා ඒවා නවත්වලායි තිබෙන්නේ. සිංගප්පූරු ගිවිසුම මට අදාළ නැහැ.

ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ පුරප්පාඩු : මාතලේ දිස්ත්‍රික්කය

இலங்கை கல்வி நிருவாக சேவை வெற்றிடங்கள்: மாத்தளை மாவட்டம்

VACANCIES IN SRI LANKA EDUCATION ADMINISTRATIVE SERVICE: MATALE DISTRICT

134/'18

3. ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කය සඳහා වන ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තනතුරු සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට එම තනතුරුවල සේවය කරන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) පවතින පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

(iv) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට බඳවා ගැනීම සඳහා පැවති (සීමිත/විවෘත) තරග විභාගයෙන් සමත් වූ අයගේ නම් සහ ලිපිනයන් කවරේද;

(v) එම පිරිසට අදාළ පත්වීම් ලබා දීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மாத்தளை மாவட்டத்துக்கான இலங்கை கல்வி நிருவாக சேவையிலுள்ள பதவிகளின் எண்ணிக்கை யாது;

(ii) தற்போது இப்பதவிகளில் பணிபுரியும் அலுவலர்களின் எண்ணிக்கை யாது;

(iii) நிலவுகின்ற வெற்றிடங்களை நிரப்ப அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

(iv) இலங்கை கல்வி நிருவாக சேவைக்கு ஆட்சேர்ப்பதற்காக நடாத்தப்பட்ட (வரையறுக்கப்பட்ட/திறந்த) போட்டிப் பரீட்சைகளில் சித்தியடைந்தவர்களின் பெயர், முகவரி ஆகியவை யாவை;

(v) இவர்களுக்கு குறித்த நியமனங்களை வழங்க அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House -

(i) the total number of posts available in Sri Lanka Education Administrative Service for the Matale District;

(ii) the total number of officers presently serving in the aforesaid posts;

(iii) the steps that will be taken by the Ministry to fill the existing vacancies;

(iv) the names and addresses of the candidates who passed the competitive Limited/Open examinations for the recruitment to Sri Lanka Education Administrative Service; and

(v) the steps that will be taken by the Ministry to grant appointments to those candidates?

(b) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) තනතුරු 88කි.

(ii) නිලධාරීන් සංඛ්‍යාව 40කි.

(iii) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 2015.08.01 දිනට තිබූ පුරප්පාඩු 852ක් සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් පුවත්පත් දැන්වීමක් පළ කර අයදුම්පත් කැඳවා, විවෘත පදනම මත පුරප්පාඩු 219ක් ද, සීමිත පදනම මත පුරප්පාඩු 515ක් ද, ජ්‍යෙෂ්ඨ කුසලතා පදනම මත පුරප්පාඩු 118ක් ද සඳහා බඳවා ගැනීමට විභාග පවත්වා ඇත.

ඒ අනුව, විවෘත පදනම මත නිලධාරීන් 195 දෙනෙක් ද, සීමිත පදනම මත (පළමු වටයේදී) නිලධාරීන් 308දෙනෙක් ද ජ්‍යෙෂ්ඨතාව හා කුසලතා පදනම මත නිලධාරීන් 108දෙනෙක් ද දැනට බඳවා ගෙන අවසන් කර ඇත.

සීමිත පදනම මත නැවත (දෙවන හා තුන්වන වටයෙන්) නිලධාරීන් 104දෙනෙක් බඳවාගෙන, දැනට එම නිලධාරීන් මාස 03ක සේවාස්ථ පුහුණුව ලබන අතර, එම නිලධාරීන් ස්ථානගත කිරීමෙන් පසු ඉතිරි පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීමේ ගැසට් නිවේදනය ඉදිරියේදී නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

(iv) ඇමුණුමෙහි සඳහන් වේ. ඇමුණුම **සභාගත*** කරමි.

(v) ඔව්.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුව විසින්, සුදුසුකම් සපුරන ලද ඉහත (iv) හි සඳහන් අයදුම්කරුවන් වෙත විධිමත් පත්වීම් ලිපි ලබා දීමට කටයුතු කර ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ගරු ඇමතිතුමනි එහෙම වෙනකොට අපේ ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ තිබෙන පුරප්පාඩු සම්පූර්ණ වෙනවා ඇති කියලා මම හිතනවා.

ගරු කථානායකතුමනි, එම නිසා මම මගේ අතුරු ප්‍රශ්නය වෙනත් පැත්තකට යොමු කරවනවා. පනතට අනුව විද්‍යා පීඨ පුහුණුව ලබන අයට උපාධියක් ප්‍රදානය කිරීමේ හැකියාවක් තිබෙනවා. එහෙම වුණොත් දැනට උසස් පෙළ පන්ති සඳහා පවතින ගුරු හිඟය සපුරා ගැනීමේ හැකියාව අපට ලැබෙනවා. එහෙම නම් ඒ පනතට අනුව ඒක සිද්ධ නොවන්නේ ඇයි? ඇත්තටම මේ පුහුණුව උපාධියක් විධියට ප්‍රදානය නොකරන්නේ ඇයි?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, ඇත්තටම මේ පනතට අනුව උපාධියක් හිමි කර දීමට හැකියාව තිබුණත්, දීර්ඝ කාලයක් තිස්සේ ඒක සිද්ධවෙලා නැහැ. නමුත් දැන් අපි ඒක ආරම්භ කරන්න අවශ්‍ය කටයුතු සූදානම් කර තිබෙනවා. ගරු මන්ත්‍රීතුමියනි, ජාතික අධ්‍යාපන ආයතනය මඟින් දැන් එය ආරම්භ කරන්න සියලු කටයුතු සූදානම් කරලායි තිබෙන්නේ. උපාධිය විතරක් නොවෙයි, පශ්චාත් උපාධිය දක්වා යාමට අවශ්‍ය කටයුතු අපි දැන් සිද්ධ කර තිබෙනවා.

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය
(மாண்புமிகு (திருமதி) ரோஹிணி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය. වතුකරයේ පාසල්වල විදුහල්පති පුරප්පාඩු වාගේම, විශේෂයෙන් විද්‍යා හා ගණිත ගුරු පුරප්පාඩු ඉතාම බහුලව තිබෙනවා. ඒ පුරප්පාඩු පිරවීම සඳහා ඔබතුමා ගන්නා පියවර කුමක්ද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, පසු ගිය කාලවල පැවැති ගුරු පුරප්පාඩුවලින් සෑහෙන ප්‍රමාණයක් මේ වන විට පුරවා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මීට සෑහෙන කාලයකට කලින් තිබුණු පුරප්පාඩු ප්‍රමාණයත් දැන් තිබෙන ප්‍රමාණයත් අතර පරතරය ගත්තොත් දැන් ඒක සෑහෙන දුරට අවම කර තිබෙනවා.

නමුත්, මේ සඳහා අපි තවමත්, ඊයේ පෙරේදාත්, 2,100ක් දෙනා සම්මුඛ පරීක්ෂණයකට භාජන කරලා ඒ ගුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් සිටිනවා. එකම ප්‍රශ්නය, විද්‍යා ගුරුවරුන්ගේ හිඟයක් තිබීම. දැනට අපි විද්‍යා ගුරුවරුන් බඳවා ගැනීම සඳහා ගැසට් කළත්, ඒ සඳහා ඉදිරිපත් වන ප්‍රමාණය හරි අඩුයි. ඒ ප්‍රශ්නය තමයි තිබෙන්නේ. මම හිතන විධියට ඒ සඳහා විකල්ප මාර්ගවලට යෑමට දැන් සිද්ධ වනවා. එහෙම නැතිව අපට මේ පුරප්පාඩු පුරවන්න පුළුවන්කමක් නැහැ. [බාධා කිරීමක්]

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා කැමැති නම්, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න පුළුවන්.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු මන්ත්‍රීතුමනි, ප්‍රශ්නය අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මට mike එක දීලා නැහැ නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් mike එක දීලා තිබෙන්නේ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා කිව්වාට පසුව නේ ආවේ.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු ඇමතිතුමනි, අධ්‍යාපන පරිපාලන සේවයේ වැඩ බලන විදුහල්පතිවරුන්ගේ දීමනාවක් ගෙවීම පිළිබඳව ප්‍රශ්නයක් තිබුණා. ඒ සම්බන්ධව ඔබතුමන්ලාගේ අමාත්‍යාංශයේ ලේකම්තුමා, "මේ දීමනාව ගෙවන්න" කියලා ලිපියක් යවා තිබුණා. නමුත්, ඊට සතියකට පසුව, "ඒ දීමනාව ගෙවීම නතර කරන්න" කියලා ආපහු ලියුමක් යවා තිබුණා.

අපේ වැඩ බලන විදුහල්පතිවරු තුන්දහස් ගණනක් විශාල වැඩ කොටසක් කරලා තිබුණා. එහි යම් යම් අඩු පාඩු තිබෙන්න පුළුවන් කියා මා හිතනවා. නමුත්, මෙවැනි අසාධාරණයක් ඔවුන්ට කරන්නේ ඇයි කියලා ඔබතුමාගෙන් මම දැනගන්න කැමැතියි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, මේ දීමනාව සඳහා කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කළේ මා විසින්. අපේ ආණ්ඩුවෙන් රාජ්‍ය සේවකයන්ට රුපියල් දසදහසකින් වැටුප් වැඩි කරලා තිබියදීත්, පළමු ශ්‍රේණියේ විදුහල්පතිවරයෙකුට ලැබෙන දීමනාව රුපියල් 6,500කින් වැඩි කිරීමට, ශ්‍රේණිධාරින් සඳහා මෙම වැඩි කිරීම සිදුකිරීමට, අප කැබිනට් මණ්ඩලයෙන් අනුමත කරගනු ලැබුවා.

ගරු කථානායකතුමනි, පසුගිය කාලයේ -මම ඔබතුමාටත් මේ කාරණය කියා තිබෙනවා.- දේශපාලනය බින්දුවක්වත් එකතු කරන්නේ නැතිව, විභාග පවත්වා විදුහල්පතිවරුන් 4,000ක් අපි බඳවා ගත්තා. බඳවා ගෙන, ඒ ගොල්ලන්ට හොඳ පුහුණුවක් දීලා පද්ධතියට ඇතුළත් කරලා තිබෙනවා. ඒ හාරදහසෙන් පන්සියයක් -හයසියයක් -දහසකටත් අඩු සංඛ්‍යාවක්,- තමයි මේ වන විට විදුහල්පතිවරු විධියට ස්ථානගත කරලා තිබෙන්නේ. දේශපාලනය ඇද ගන්නේ නැතුව ගුරු සේවා ව්‍යවස්ථාව අනුව, නැත්නම් විදුහල්පති සේවා ව්‍යවස්ථාව අනුව හාරදහසක් බඳවා ගෙන, පද්ධතියට ඇතුළත් කරලා තිබෙනවා. නමුත් සමහර පළාත් සභාවලින් ඇත්තටම සුදුසුකම් ලත් විදුහල්පතිවරුන්ට මේ අවස්ථාව දෙන්නේ නැහැ. වැඩ බලන විදුහල්පතිවරුන්ටත් මේ විභාගයට ලිවීමේ හැකියාව තිබුණා. ඒ ගොල්ලනුත් ඒ විභාගය ලියලා, කොටසක් සමත් වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ විදුහල්පතිවරු ස්ථානගත කළොත්, වයස අවුරුදු පණහට වැඩි අය සඳහා නැවත විභාගයක් පවත්වන්නත් අපි සැලසුම් කරලා තිබෙනවා. නමුත් ඒක සිදු වන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම මේ වැඩ බලන විදුහල්පතිවරුන් සඳහා නොවෙයි, ශ්‍රේණිධාරින් සඳහා තමයි අපි අනුමැතිය ගත්තේ. ඒ නිසා තමයි අපට ඒ මුදල් ප්‍රමාණය ගෙවීමට නොහැකි වෙලා තිබෙන්නේ. අනෙක් පැත්තෙන් ඒ ශ්‍රේණිධාරින් ප්‍රශ්න කරනවා, "විභාග පවත්වලා තමුන්නාන්සේලා අප බඳවාගෙන, විදුහල්පතිවරු විධියට පත් කරන්නේ නැතුව නිකම් ගුරුවරු විධියට තියාගෙන ඉන්නවා, අපි මෙහෙම ඉන්දැද්දී වැඩ බලන විදුහල්පතිවරුන්ටත් මේ දීමනාව දුන්නොත්, ඒ අය කවදාවත් යන්නේ නැහැ නේද?" කියලා. මේ ප්‍රශ්නය තමයි තිබෙන්නේ, ගරු කථානායකතුමනි. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න, ගරු ඇමතිතුමනි.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
මම උත්තරයක් දෙන්නම්. අපි විභාග පවත්වලා විදුහල්පතිවරු හාරදහසක් බඳවා ගත්තා. මන්ත්‍රීතුමා හිටපු ඇමතිතුමෙක් නේ. ඔබතුමාම කියන්න, ඒ විදුහල්පතිවරුන්ට මොකක්ද කරන්නේ කියලා. ඒ විදුහල්පතිවරු පාසල්වල ස්ථානගත කරන්න ඕනෑ. වැඩ බලන විදුහල්පතිවරු නියෝජ්‍ය විදුහල්පතිවරු විධියට වෙනත් පාසල්වලට අනුයුක්ත කරන්න කියලා අපි කිව්වා. එහෙම කරන්නේත් නැහැ. ඉතින් මේ වැඩබලන විදුහල්පතිවරුන්ට දීමනාවත් වැඩි කළොත් ඒ අය කොහොමවත් යන්නේ නැහැ.

අපට ඕනෑකම තිබෙන්නේ ශ්‍රේණිධාරින් විදුහල්පතිවරුන් විධියට ස්ථානගත කරන්නයි. ඒ නිසා තමයි එහෙම නොකරන්නේ. [බාධා කිරීමක්] ඔබතුමන්ලා ඒ කාලයේ දුන්න දේශපාලන පත්වීම් තමයි මේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි මේ ගැන විවාදයකට යන්නේ නැතිව මේ ප්‍රශ්නය අවසන් කරමු. මීළඟට ප්‍රශ්න අංක 4.

රජයේ වෛද්‍ය පීඨවල සේවය කරනු ලබන ආචාර්ය මණ්ඩල : විස්තර

අරස මරුත්තුව පීඩංකළිල් සේව෈යාට්‌රුම් විරිවුරෛයාළර්කළ්: විපරම්

LECTURERS SERVING IN GOVERNMENT.MEDICAL FACULTIES: DETAILS

161/'18

4. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2017 ජූනි 30 දින වනවිට රජයේ වෛද්‍ය පීඨවල සේවය කරනු ලබන ආචාර්ය මණ්ඩලය එක් එක් පීඨය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වන විට එම පීඨවල පවතින ආචාර්යවරුන්ගේ පුරප්පාඩු සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) අය වැය යෝජනා අනුව විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව 50,000 දක්වා වැඩි කිරීමේදී,වෛද්‍ය පීඨ සඳහා වැඩි කිරීමට අපේක්ෂා කරනු ලබන සිසුන් සංඛ්‍යාව කොපමණද;

(iv) වැඩි වන සිසුන් සංඛ්‍යාව සඳහා අවශ්‍ය ආචාර්යවරු සංඛ්‍යාව වැඩිකිරීමට රජයට ඇති සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

උයර්කල්වි මර්‍රුම් කලාසාර අලුවල්කළ් අමෛච්සරෛක් කේට්ට වින්නා:

(அ) (i) 2017 යූන් 30 ආම් තිකතියළවිල් අරස මරුත්තුව පීඩංකළිල් සේව෈යාට්‌රුකින්‍ර විරිවුරෛ යාළර්කළ් ඔව්වොරු පීඩත්තින් අඩිප්පඩෛයිල් තනිත්තනියේ එව්වළවු එන්පතෛයුම්;

(ii) තර්පොළුතු අප්පීඩංකළිල් කාණප්පඩුම් විරිවුරෛයාළර්කළින් වෙට්‍රිඩංකළින් එණ්ණික්කෛ වෙව්වේ‍රාක එව්වළවු එන්පතෛයුම්;

(iii) වරවු සෙලවුත්තිට්ටප් පිරේරණෛකළුක්කු අමෛය පල්කලෛක්කළකංකළුක්කු අනුමතික්කප් පඩුම් මාණවර්කළින් එණ්ණික්කෛයෛ 50,000 ආක අතිකරික්කුම්පෝතු, මරුත්තුව පීඩංකළුක්කු අතිකරික්ක එතිර්පාර්ක්කින්‍ර මාණවර්කළින් එණ්ණික්කෛ යාතු එන්පතෛයුම්;

(iv) අතිකරික්කින්‍ර මාණවර්කළින් එණ්ණික්කෛක්කු අවසියමාන විරිවුරෛයාළර්කළින් එණ්ණික් කෛයෛ අතිකරිත්තුක්කොළ්වතර්කාක අරසාංකත් තිටමුළ්ළ තිට්ටංකළ් යාවෛ එන්ප තෛයුම්;

අවර් ඉච්සපෛක්කු අරිවිප්පාරා?

(ஆ) ඉන්‍රෙල්, ඒන්?

asked the Minister of Higher Education and Cultural Affairs:

(a) Will he inform this House-

(i) the number of lecturers serving in each Government Medical Faculty separately as at 30.06.2017;

(ii) the number of vacancies of lecturers exist on those Faculties separately, by now;

(iii) the number of students expected to be increased to Medical Faculties when the student intake to universities is increased up to 50,000 according to the budget proposals; and

(iv) the plans that the Government has to increase the number of lecturers to cater to the increasing number of students?

(b) If not, why?

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා (උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மொஹான் லால் கிரேரு - உயர் கல்வி மற்றும் கலாசார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Mohan Lal Grero - State Minister of Higher Education and Cultural Affairs)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 2 017 ජූනි 30 දිනය වන විට රජයේ වෛද්‍ය පීඨවල සේවය කරනු ලබන ආචාර්ය මණ්ඩලය එක් එක් පීඨය අනුව වෙන් වශයෙන් මෙසේ

විශ්වවිද්‍යාලය	පීඨය	ආචාර්ය මණ්ඩලය	
		ස්ථිර	තාවකාලික
කොළඹ විශ්වවිද්‍යාලය	වෛද්‍ය පීඨය	147	4
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	වෛද්‍ය පීඨය	110	20
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	වෛද්‍ය විද්‍යා පීඨය	132	1
කැලණිය විශ්වවිද්‍යාලය	වෛද්‍ය පීඨය	125	2
යාපනය විශ්වවිද්‍යාලය	වෛද්‍ය පීඨය	53	1
රුහුණ විශ්වවිද්‍යාලය	වෛද්‍ය පීඨය	117	-
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය	32	1
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය	47	7
එකතුව		763	36

[ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා]

(ii) 2017 දෙසැම්බර් 31 දිනය වන විට රජයේ වෛද්‍ය පීඨවල පවතින ආචාර්යවරුන්ගේ පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් පීඨය අනුව මෙසේයි.

විශ්වවිද්‍යාලය	පීඨය	ආචාර්ය මණ්ඩල පුරප්පාඩු	
		ස්ථිර සේවක සංඛ්‍යාව මත පමණක් පදනම්ව	ස්ථිර හා තාවකාලික සේවක සංඛ්‍යා දෙකම මත පදනම්ව
කොළඹ විශ්වවිද්‍යාලය	වෛද්‍ය පීඨය	42	41
පේරාදෙණිය විශ්වවිද්‍යාලය	වෛද්‍ය පීඨය	48	--
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය	වෛද්‍ය විද්‍යා පීඨය	31	29
කැලණිය විශ්වවිද්‍යාලය	වෛද්‍ය පීඨය	25	20
යාපනය විශ්වවිද්‍යාලය	වෛද්‍ය පීඨය	66	65
රුහුණ විශ්වවිද්‍යාලය	වෛද්‍ය පීඨය	34	34
ශ්‍රී ලංකා නැගෙනහිර විශ්වවිද්‍යාලය	සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය	37	34
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය	වෛද්‍ය හා සමාන්තර විද්‍යා පීඨය	67	49
එකතුව		350	272

(iii) තිබෙන ප්‍රායෝගික ප්‍රශ්නත් එක්ක විශ්වවිද්‍යාලවල උගන්වනු ලබන සමස්ත විෂයයන් අතුරින් ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කරන්න අමාරුම වෛද්‍ය පීඨවලටයි. කොහොම වුණත්, 2016/ 2017 වර්ෂයේදී වෛද්‍ය උපාධි පාඨමාලා සඳහා ඇතුළත් කරගත් සිසුන් සංඛ්‍යාව 1,310ක් වූ අතර, එය 2015/ 2016 වර්ෂයේදී ඇතුළත් කරගත් සංඛ්‍යාවට වඩා සිසුන් 50ක වැඩි වීමකි.

2017/ 2018 අධ්‍යයන වර්ෂය සඳහා දැනට වෛද්‍ය පීඨවලට ඇතුළත් කර ගන්නා සිසුන් සංඛ්‍යාව ඉතිහාසයේ නොවූ විරූ විධියට 160ක් වැඩියෙන් ඇතුළත් කර ගැනීමට නියමිතය. ඉන් 75ක් වයඹ විශ්වවිද්‍යාලයේ අලුතින් ආරම්භ වන වෛද්‍ය පීඨය සඳහා ද, තවත් 75ක් සබරගමුව විශ්වවිද්‍යාලයේ අලුතින් ආරම්භ වන වෛද්‍ය පීඨය සඳහා ද, ඉතිරි 10 අනෙකුත් විශ්වවිද්‍යාල සඳහා ද බඳවා ගැනේ. අනාගතයේදීත් මේ වැඩ පිළිවෙළ දිගටම ක්‍රියාත්මක වනවා. ඒ කියන්නේ, අපි මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය ලබන අවුරුද්දේ පටන් ගන්නවා. ඒ වාගේ ක්‍රම හරහා අපි වෛද්‍ය පීඨවලට ඇතුළත් කර ගන්නා සිසුන් ප්‍රමාණය ක්‍රමයෙන් වැඩි කරන්න බලාපොරොත්තු වනවා.

(iv) ශිෂ්‍ය සංඛ්‍යාව අනුව සිටිය යුතු ආචාර්යවරු සංඛ්‍යාව කොපමණද යන්න සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සම්මතයන් සකස් කර ඇත. (ශිෂ්‍යයන් හා ආචාර්යවරුන් අතර අනුපාතය) ඒ අනුව වැඩි වන සිසුන් සඳහා අවශ්‍ය වන ආචාර්ය මණ්ඩලය වැඩි කිරීම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේද එකඟතාව අනුව සිදු කෙරේ.

(ආ) පැන නොනඟී.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(*மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ*)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, පසුගිය අය වැය යෝජනාවේ තිබුණු ඉතාම ආකර්ෂණීය පොරොන්දුවක් තමයි මේ විශ්වවිද්‍යාල සිසුන් සංඛ්‍යාව 50,000 දක්වා වැඩි කරනවා කියන එක. නමුත් දැන් ඔබතුමා ලබා දුන් පිළිතුර අනුව පෙනී යන්නේ වෛද්‍ය පීඨ සඳහා විතරක් නොවෙයි, අනෙක් පීඨවලටත් 50,000 වැඩි කරන්නේ කොහොමද කියන එක පිළිබඳව සැලසුමක් නැහැ කියන එකයි. මම අහපු ප්‍රශ්නය අනුව දැනටමත් වෛද්‍ය පීඨවල ස්ථිර ආචාර්ය මණ්ඩලයේ 350ක සහ තාවකාලික ආචාර්ය මණ්ඩලයේ 272ක හිඟ පාඩුවක් තිබෙනවා.

ආචාර්ය මණ්ඩලයට වෛද්‍ය පීඨවලින් බිහිවන දක්ෂ උපාධිධාරීන් ආකර්ෂණය කර ගන්න නම්, ඔවුන්ට යම්කිසි වරප්‍රසාද, දීමනා ප්‍රමාණයක් ලබා දෙන්නට ඕනෑ. මේ අයට වරප්‍රසාද නිමි වෙන්නේ සාමාන්‍ය රජයේ සේවකයන්ට වාගේ නොවෙයි කියන එක ඔබතුමා දන්නවා. උදාහරණයක් ගත්තොත් විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ටත්, අනධ්‍යයන සේවකයන්ටත්, පරිපාලන නිලධාරීන්ටත් තිබෙන්නේ විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල; University Provident Fund, UPF එක. එම අර්ථ සාධක අරමුදලේ මුදල්, බැඳුම්කර මගඩියට යොදවා ගැනීම නිසා එම අනධ්‍යයන, අධ්‍යයන සහ පරිපාලන නිලධාරීන්ට පාඩුවක් වුණාය කියන කථාවක් දැන් තිබෙනවා. මම දැක්කා, ඊයේ ආචාර්ය නිර්මාල් රංජිත් දේවසිරි මහතා පුවත් පතකට කියා තිබුණා, UPF එකේ අරමුදල් බැඳුම්කරයේ ආයෝජනය කිරීම නිසා, ඔහුට මේ වනවිට රුපියල් ලක්ෂ 10ක පාඩුවක් වෙලා තිබෙනවා කියලා. මේක තනිකර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් තමයි මෙහෙයවන්නේ. ඒ නිසා ආචාර්යවරුන්ට ලබා දිය යුතු, ඔවුන් දායක වෙන විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලේ මුදල් මෙහෙම අවභාවිත කිරීම පිළිබඳව ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ගන්නා තීරණය මොකක්ද?

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(*மாண்புமிகு மொஹான் லால் கிரேரு*)
(The Hon. Mohan Lal Grero)

ඇත්තටම, එසේ ආයෝජනය කිරීමේදී රුපියල් බිලියනයක් ආයෝජනය කරලා තිබෙනවා.

බැඳුම්කර සිද්ධියත් එක්ක ඇති වුණු රුපියල් මිලියන එකසිය හැත්තෑ ගණනක පාඩුව ගැනයි මේ කියන්නේ. ඒක මමත් දැක්කා. සම්පූර්ණයෙන් වැරැදි ක්‍රියාවක් හරහා තමයි ඒ පාඩු සිද්ධ වෙලා තිබෙන්නේ. ඒකේ කථා දෙකක් නැහැ. මෙය සිදු වෙලා තිබෙන්නේ 2015 වර්ෂයේදීයි. ඇත්තටම මේ මුදල මේ විධියට ආයෝජනය කිරීමෙන් අවසානයේදී දැනුවත්ව හෝ නොදැනුවත්ව යම් අවදානමක් ඇති වෙලා තිබෙනවා. ආයෝජනයක් කිරීමකදී අවදානමක් තිබෙනවා නේ. ලාභයක් ලබන්න ආයෝජනය කරනවා. නමුත් අවසානයේ ඒකේ අවදානමක් තිබෙනවා. ඒක ඕනෑම කටයුත්තකදී සිද්ධවන දෙයක් නේ. ඒ අවදානම තමයි මෙතැනදී සිද්ධ වෙලා තිබෙන්නේ. යම් පාඩුවක් සිද්ධ වෙලා තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ඒ බව දැන දැනයි ආයෝජනය කර තිබෙන්නේ.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
ඒක කරපු කෙනාගෙන් තමයි අහන්න ඕනෑ, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමාගේ අනික් ප්‍රශ්නයට උත්තරය මෙයයි. ඔබතුමා ඉතා පැහැදිලිව දන්නවා, ආචාර්යවරුන්ට සියයට 135ක, සියයට 140ක අධ්‍යයන දීමනාවක් දෙනවාය කියලා. ඒ දීමනාවත් එක්ක අනිකුත් විවිධ දීමනාත් දෙනවා. ඒ කියන්නේ, අවුරුදු පහෙන් පහට වාහන බලපත්‍ර දෙනවා. මේ ආචාර්යවරුන්ට සෑහෙන හොඳ package එකක් තිබෙනවා, ඒවා නැතුව නොවෙයි. නිදහස් අධ්‍යාපනය ගැන දිගින් දිගට කථා කරන බොහෝ වෛද්‍යවරුන්ගෙන්, මහාචාර්යවරුන්ගෙන්, කොළඹ, මහනුවර නගරබද විතරක් රැඳී ඉන්න වලිකන ආචාර්යවරුන්ගෙන්, මහාචාර්යවරුන්ගෙන් මා ප්‍රසිද්ධියේ මේ ප්‍රශ්නය අහනවා. ඈත දුෂ්කර පළාත්වල තිබෙන නැහෙනහිර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට, රජරට විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට, යාපනය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට ගිහින් අඩු ගණනේ අවුරුදු දෙකක් හෝ අවුරුදු තුනක්වත් උගන්වන්න ඉදිරිපත් වෙන්නේ නැත්තේ ඇයි, එතුමන්ලාට කැක්කුමක් නැත්තේ ඇයි? මේ ප්‍රශ්නයයි මෙතැන තිබෙන්නේ. මේ දේවල් ගැන අපි පණ යන කල් කථා කළාට, අපි සියලුදෙනාම ආචාර්යවරුන්ගේ අයිතිවාසිකම් ගැන කථා කළාට දරුවන්ගේ ප්‍රශ්න ගැන අපි කථා කරන්නේ නැහැ. ඒ ගොල්ලන් ඒ ප්‍රදේශවලට ගිහින් උගන්වන්නේ නැත්තේ ඇයි? හැම දාම නොවෙයි. ප්‍රශ්න තිබෙන්න පුළුවන්. ඇත්තටම ඒ ප්‍රදේශවලට ගිහින් එක අවුරුද්දක් උගන්වනවා නම් ඒක විශාල දෙයක්. මා මේ කාරණය කියන්නේ ඔබතුමාගේ ප්‍රශ්නයට උත්තරයක් හැටියට නොවෙයි. එවැනි ආචාර්යවරුන්ගෙන්, මහාචාර්යවරුන්ගෙන් පාර්ලිමේන්තුවේදී ඉල්ලීමක් කරන්නේ, කරුණාකරලා මේ භාරදූර කර්තව්‍යය භාරගෙන ඒ ප්‍රදේශවලට ගිහින් වසරක්වත් උගන්වන්න කියලායි.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)
මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ගරු කථානායකතුමනි, එතුමා කියපු හැටියට මේ පුරප්පාඩු ප්‍රමාණය පවතින්නේ රජරට, මඩකළපුව, යාපනය වාගේ ඈත විශ්වවිද්‍යාලවල පමණක් නොවෙයි. ගරු ඇමතිතුමනි, මේ පුරප්පාඩු 350න්, පුරප්පාඩු 42ක් තිබෙන්නේ කොළඹ වෛද්‍ය පීඨයේ කියලා ඔබතුමාම කිව්වා. ඒ අනුව, ඈත විශ්වවිද්‍යාලවල විතරක් නොවෙයි මේ ප්‍රශ්නය තිබෙන්නේ. ඒ කියන්නේ, විශ්වවිද්‍යාල පද්ධතියට ආචාර්යවරු ආකර්ෂණය කර ගැනීමට අපි හරිහමන් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා නැහැ කියන එකයි.

විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල සම්බන්ධයෙන් මා අහපු ප්‍රශ්නයට තවත් ප්‍රශ්නයක් එකතු කරනවා නම් ගරු කථානායකතුමනි, මහපොළ භාරකාර අරමුදලේ මුදලුත් මේ විධියට අවභාවිත කර තිබෙනවා. විශේෂයෙන්ම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට සම්බන්ධ මේ අරමුදල් අවභාවිත කිරීම කියන කාරණය මහ බැංකුවට පමණක් පවරලා, UGC එකට ගැළවෙන්න විධියක් නැහැ. විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ සහ මහපොළ භාරකාර අරමුදලේ මුදල් අවභාවිත කිරීම සම්බන්ධයෙන් කෝප් කමිටුවෙන් වෙනම පරීක්ෂණයක් කරන්න කියලා අපි යෝජනා කරනවා.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
මේ කාරණය කෙළින්ම මහ බැංකු බැඳුම්කර ගනුදෙනුවට සම්බන්ධ කාරණයක්නේ. බැඳුම්කර කොමිසමේ ප්‍රශ්නයටම ඒ ප්‍රශ්නයත් ඇතුළත් කරන්න කියලා යෝජනාවක් ඉදිරිපත් කළා නම් ඉතාම හොඳයි. ඒ වාගේ දෙයක් සිදුවෙලා තිබෙනවා නම් ඒ ගැන පරීක්ෂා කරලා, ඊට අදාළ අයට අවශ්‍ය දඬුවම් කරන්න ඕනෑය කියලා මා හිතනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මැතිතුමා, පස්වන ප්‍රශ්නය-

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි. මට පොඩි අවස්ථාවක් දෙන්න. දැන් ගරු රාජ්‍ය ඇමතිතුමා පිළිගත්තා, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මුදල්,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමා, මෙතුමාට පිළිතුරු දෙන්න කැමැතිද?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
පැහැදිලි කර ගැනීමක්.

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
පිළිතුරක් අවශ්‍ය නැහැලු, පැහැදිලි කර ගැනීමක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ඒකට කැමැතිද?

ගරු මොහාන් ලාල් ග්‍රේරු මහතා
(மாண்புமிகு மொஹான் லால் கிரேரு)
(The Hon. Mohan Lal Grero)
ප්‍රශ්නයක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. එහෙනම් ගරු මන්ත්‍රීතුමා කෙටියෙන් අහන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මා කෙටියෙන් මේ කාරණය අහනවා.

ගරු කථානායකතුමනි, ගරු ඇමතිතුමා දීපු පිළිතුර මා අහගෙන හිටියා. විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලේ මුදල් අවභාවිත වීමක් සිද්ධ වෙලා තිබෙනවා කියලා එතුමා පිළිගත්තා.

[ගරු විමල් වීරවංශ මහතා]

ඒ මුදල් අවභාවිත වීම සිදු වූ කාලයේ හිටපු ඒ විෂය භාර අමාත්‍යවරයා මෙම සභාවේ ඉන්නවා; ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා. එතුමා මේකට පිළිතුරු දෙන්න ඕනෑ. එතුමාගේ අනුදැනුමකින් තොරව ඒ මුදල් අවභාවිත වීමට, බැඳුම්කර ගනුදෙනුවට යන්න විධියක් නැහැ. තමුන්නාන්සේ මේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න. ඒ කරපු මහා හොරකම ගැන තමුන්නාන්සේ වගකීම ගන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා පිළිතුරක් දෙනවාද?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මගේ නම කියපු නිසා උත්තරයක් දෙන්නම්. UGC එකේ සල්ලි NSB එකට දාලා, NSB එකෙන් ඒ සල්ලි යෙදෙව්වා. ඒකයි වුණේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. ඒ ගැන නැවත වාදයක් අවශ්‍ය නැහැ.

ප්‍රශ්න අංක 5 - 198/18 - (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා. *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 - 219/'18 - (1), ගරු ඩග්ලස් දේවානන්දා මහතා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Hon. Lakshman Kiriella, what is the point of order?

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඑල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා මගේ නම සඳහන් කළා. නමුත් බිමල් රත්නායක මැතිතුමා මට කිව්වා, ඒ අවස්ථාවේ වෙන ඇමතිවරයෙක් හිටියේ කියලා. පසුගිය කාලයේ උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ඇමතිවරු ගණනාවක් හිටියා. ගිය අවුරුදු තුනට උසස් අධ්‍යාපන ඇමතිවරු හතර පස් දෙනෙක් හිටියා. මේ ප්‍රශ්නයේ අග මුල හොයා ගන්න විවාදයක් දුන්නාට මගේ විරුද්ධත්වයක් නැහැ. ඒ අග මුල හොයමු කවුද මුදල් දුන්නේ කියලා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමාගේ නමත් කියැවුණා ද? දැන් ආපහු වාදයකට යනවා නේ.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මට පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. මොකක්ද, පැහැදිලි කිරීම?

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු පිමල් රත්නායක්ක)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මම ඒ අදාළ ඇමතිතුමාගේ නමත් කිව්වා. බැඳුම්කර වංචාව සිද්ධ වෙන වෙලාවේ මගේ දැනීමේ හැටියට උසස් අධ්‍යාපන ඇමති ධුරය දැරුවේ, -2015 පෙබරවාරි මාසයේ- කබීර් හාෂීම් ඇමතිවරයා. මම ඒක තමයි එතුමාට කිව්වේ.

ගොවීන්ට සහනදායී පදනම මත විදුලිබලය සැපයීම: විස්තර
விவசாயிகளுக்குச் சலுகை அடிப்படையில் மின்சாரம் வழங்குதல்: விபரம்
PROVISION OF ELECTRICITY TO FARMERS ON CONCESSIONARY BASIS: DETAILS

219/'18

6. ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(මාණ්පුමිකු ඩக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) ගොවි ජනතාවට සහනදායී පදනම මත විදුලිබලය ලබාදීමේ ව්‍යාපෘතිය දැනට ක්‍රියාත්මක වන ආකාරය කවරේද;

(ii) ඉහත ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන දිස්ත්‍රික්ක කවරේද;

(iii) මෙම ජාතික වැඩසටහනේ සමාරම්භක උත්සවය පැවැත්වූ යාපනය ඇතුළු උතුරු පළාතේ ගොවි ජනතාවට මෙම ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ලැබෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

මින් වලු මට්‍රුම් පුදුප්පික්කත්තක්ක සක්ති අමෛච්චරෛක් කේට්ට වින්නා:

(அ) (i) විවසායිකළුක්කුච් සලුකෛ අඩිප්පඩෛයිල් මින්සාරම් වළංගුම් කරුත්තිට්ටම් තර්පෝදු සෙයර්පඩුත්තප්පඩුකින්ර මුරෛ යාදු;

(ii) මේර්පඩි කරුත්තිට්ටම් සෙයර්පඩුත්තප්පඩුකින්ර මාවට්ටඞ්කළ් යාවෛ;

(iii) ඉත්තේසිය නිකළ්ච්චිත්තිට්ටත්තින් අඞ්කුරාර්ප්පණ වෛපවම් නඩෛපෙර්ර යාළ්ප්පාණම් උළ්ළිට්ට

வட மாகாணத்தில் விவசாயிகளுக்கு இக்கருத் திட்டத்தின் நன்மைகள் கிடைக்கும் திகதி யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Power and Renewable Energy:

(a) Will he inform this House-

(i) the manner in which the project to supply electricity to the farmers at a concessionary basis is implemented at present;

(ii) the districts in which this project is implemented; and

(iii) the date on which the farmers in the Northern Province including Jaffna where the inauguration ceremony of this national programme was held, get the benefits of this project?

(b) If not, why?

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)

ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ගොවි ජනතාවට සහනදායී පදනම මත විදුලි බලය ලබා දීමේ ව්‍යාපෘතිය අපි ආරම්භ කළා. එම ව්‍යාපෘතිය යටතේ සහනදායී ගාස්තු ක්‍රියාත්මක කිරීමට පෙර, පහත වගුවෙහි දක්වා ඇති පරිදි කර්මාන්ත අයකුම ගොවීන්ගෙන් අයකර ගන්නා ලදී.

මාසයක් සඳහා පරිභෝජනය (kWh)	බලශක්ති ගාස්තු (LKR/kWh)	ස්ථිර ගාස්තු (LKR/ Month)
<300	10.80	600
>300	12.20	

ගොවීන් සඳහා සහනදායී ගාස්තු 2016.10.05 දින හඳුන්වා දුන් අතර, ගොවීන්ගේ අයකුම පහත වගුවෙහි දක්වා ඇත. අමතර ගාස්තු නොමැතිව මෙම සහනදායී පරිභෝජන කාල වෙත යොමු වීමට ගොවීන්ට හැකියාව ඇත.

වේලාව	බලශක්ති ගාස්තු **(LKR/ kWh)**	ස්ථිර ගාස්තු (LKR/ Month**)**
දිවා කාලය (5.30-18.30)	11.00	300
ඉල්ලුම වැඩි කාලසීමාව (18.30-22.30)	20.50	
ඉල්ලුම අඩු කාලසීමාව (22.30-05.30)	6.85	

මෙය තමයි අපි ලබාදුන් සහනය. රාත්‍රී 10.30න් ආරම්භ වෙලා පාන්දර 5.30දක්වා කාලය තුළ රුපියල් 6.85ක් වැනි ඉතාම අඩු මුදලකට විදුලි ඒකකයක් ලබා ගැනීමට ගොවීන්ට අවස්ථාව ලබා දුන්නා. ඒ වාගේම රුපියල් 600ක්ව තිබුණු ස්ථිර ගාස්තුව රුපියල් 300 දක්වා අඩු කළා. ඒ මඟින් ගොවීන්ට ලොකු සහනයක් ලැබුණා.

(ii) මෙම ව්‍යාපෘතිය උතුරු පළාතේ යාපනය, කිලිනොච්චිය, මුලතිව්, වවුනියාව සහ මන්නාරම් දිස්ත්‍රික්ක තුළ ක්‍රියාත්මක වේ. එම වැඩ සටහනේ ආරම්භක උත්සවය අපි යාපනය ඇතුළු එම ප්‍රදේශවල පැවැත්වුවා.

(iii) අද වන විට උතුරු පළාතේ ගොවීන් 74දෙනෙක් මෙම සහනදායී යෝජනා ක්‍රමය යටතේ අඛණ්ඩව ප්‍රතිලාභ ලබනවා. සමහර ගොවීන් මෙම වැඩ පිළිවෙළට සම්බන්ධ වුණත්, ඔවුන්ට ආවේනික යම් යම් භාවිත කිරීමේ ගැටලු නිසා අඛණ්ඩව සම්බන්ධ වුණේ නැහැ. විශේෂයෙන්ම මෙම ක්‍රමවේදය යටතේ ඔවුන්ට අඩු මිලකට විදුලිය ලබා ගන්න පුළුවන්. ඒ කියන්නේ, රාත්‍රී 10.30 සිට පාන්දර 5.30 දක්වා කාලය තුළ විදුලිය ඒකකයක් රුපියල් 6.85කට ගන්න පුළුවන්.

මෙහි වෙනසකුත් ඇතිවෙලා තිබෙනවා ගරු මන්ත්‍රීතුමනි. මීට කලින් රුපියල් 10.80ක් තමයි විදුලි ඒකකයක අවම ගාස්තුව විධියට තිබුණේ. නමුත් දැන් ඒකකයක් රුපියල් 6.85කට ගන්න පුළුවන්.

(ආ) අදාළ නොවේ.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

நன்றி! கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, நீங்கள் சொன்ன விடயம் தொடர்பில் குறித்த விவசாய மக்களுக்குத் தெளிவற்ற நிலைமை இருக்கின்றது. ஆனபடியால், அந்த மக்களுக்கு இவ்விடயம் தொடர்பில் தெளிவுபடுத்துமாறு கேட்டுக்கொள்கின்றேன்.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු මන්ත්‍රීතුමනි, මෙම ව්‍යාපෘතියේ සාර්ථකත්වයට තිබෙන ලොකුම ගැටලුව තමයි මේ සඳහා ප්‍රමාණවත් පිරිසක් සම්බන්ධ නොවීම. අපි උත්සවයක් පවත්වා, දැනුවත් කරලා, පුවත්පත් දැන්වීම් පළ කරලා මේ ගැන කටයුතු කළා. ඇත්තටම මේ ව්‍යාපෘතිය සාර්ථක වෙන්න නම්, එම ප්‍රදේශයේ ගොවීන් වැඩි වැඩියෙන් මෙයට සම්බන්ධ වෙන්න ඕනෑ. නමුත් අපටත් හිතාගන්න අමාරුයි, මෙතරම් විශාල සහනයක් දීලා තිබෙද්දිත් 74දෙනෙකු පමණයි තවමත් මෙයට අඛණ්ඩව සම්බන්ධ වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලා ප්‍රදේශයේ නායකයන් හැටියට මේ ගැන දැනුවත් කරනවා නම්, අපිත් ඒ ගැන සතුටු වෙනවා. මොකද, මේ තත්ත්වය දිගින් දිගට පවත්වාගෙන යන්න අපට අවශ්‍යයි. දැනට ඉතාම අඩු ඉල්ලුමක් තමයි මෙම ව්‍යාපෘතිය සඳහා තිබෙන්නේ.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

அந்த மக்களுக்கு இவ்விடயம் தொடர்பில் போதிய தெளிவில்லாத நிலைமை இருக்கின்றது.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ගරු කථානායකතුමනි, බොහොම සරලව කිව්වොත්, රාත්‍රී 10.30 ඉඳලා පාන්දර 5.30 වෙනතුරු කෘෂිකර්මාන්තය සඳහා විදුලිය ලබා ගන්නවා නම්, විදුලි ඒකකයකට අය කරන්නේ රුපියල් 6.85ක් පමණයි. ඊට කලින් අවමය රුපියල් 10.80යි. රුපියල් 4.00කට ආසන්න ප්‍රමාණයේ වාසියක් හැම ගොවියෙකුටම තිබෙනවා. ඒක තමයි වාසිය.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ இராஜாங்க அமைச்சர் அவர்களே, நீங்கள் சொல்கின்ற விடயம் தொடர்பில் அந்த விவசாய மக்களுக்குப் போதிய தெளிவில்லை என்றுதான் சொல்கின்றேன்.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)

ඒ පිළිබඳව අදාළ සියලු දෙනා තවදුරටත් දැනුවත් කිරීමට අපි කටයුතු කරනවා. ඔබතුමා ප්‍රශ්නය යොමු කළාට බොහොම ස්තුතියි.

කුඩා බුත්ගමුව රාජසිංහ විද්‍යාලය : භෞතික හා මානව සම්පත් හිඟය

குடா புத்கமுவ ராஜசிங்க வித்தியாலயம்: பௌதிக மற்றும் மனித வளப் பற்றாக்குறை

KUDA BUTHGAMUWA RAJASINGHE VIDYALAYA: SHORTAGE OF PHYSICAL AND HUMAN RESOURCES

234/'18

7. ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොළොන්නාව අධ්‍යාපන කොට්ඨාසයේ පිහිටි එකම මිශ්‍ර ජාතික පාසල කුඩා බුත්ගමුව රාජසිංහ විද්‍යාලය බවත්;

(ii) මේ වනවිට එම විද්‍යාලය භෞතික හා මානව සම්පත් හිඟ වීමෙන් දිනෙන් දින අභාවයට යමින් පවතින බවත්;

(iii) මෙම ජාතික පාසලේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 26ක් සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 10ක් පවතින බවත්;

(iv) මේ හේතුවෙන් මෙම විද්‍යාලයේ සිසු සිසුවියන් අ.පොස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් පසුව අ.පොස. (උසස් පෙළ) හැදෑරීමට වෙනත් පාසල් කරා යොමු වන බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) ඉහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා ඇති සැලසුම් කවරේද;

(ii) ඒ සඳහා පියවර ගනු ලබන දිනය කවරේද;

(iii) 2017 වර්ෂයේදී මෙම විද්‍යාලයේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය සඳහා ලබා දී ඇති ප්‍රතිපාදන වෙන් වශයෙන් කවරේද;

(iv) එම ප්‍රතිපාදනවලින් දැනට සිදුකර ඇති වැඩසටහන්වල ප්‍රගතිය කවරේද;

(v) 2018 වර්ෂයේ මෙම විද්‍යාලයේ භෞතික හා මානව සම්පත් සංවර්ධනය සඳහා ප්‍රතිපාදන ලබාදීමට සැලසුම්කර තිබේද;

(vi) එසේ නම්, එම ප්‍රතිපාදන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொலன்னாவ கல்விக் கோட்டத்தில் அமைந் துள்ள ஒரேயொரு கலவன் தேசிய பாடசாலை, குடா புத்கமுவ ராஜசிங்க வித்தியாலயமாகும் என்பதையும்;

(ii) தற்போது மேற்படி வித்தியாலயம் பௌதிக மற்றும் மனித வளப் பற்றாக்குறை காரணமாக நாளுக்குநாள் வீழ்ச்சியடைந்து வருகின்றது என்பதையும்;

(iii) மேற்படி தேசிய பாடசாலையில் கல்விசார் பணியாட்டொகுதியில் 26 வெற்றிடங்களும், கல்விசாராப் பணியாட்டொகுதியில் 10 வெற்றி டங்களும் காணப்படுகின்றன என்பதையும்;

(iv) இதன் காரணமாக இக்கல்லூரியின் மாணவர்கள் க.பொ.த. (சாதாரண தரப்) பரீட்சையின் பின்னர் க.பொ.த. (உயர் தரம்) கற்பதற்காக வேறு பாடசாலைகளுக்குச் செல்கின்றார்கள் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மேற்படி வெற்றிடங்களை நிரப்புவதற்குள்ள திட்டம் யாது என்பதையும்;

(ii) அதற்காக நடவடிக்கை மேற்கொள்ளும் திகதி யாது என்பதையும்;

(iii) 2017ஆம் ஆண்டில் இந்த வித்தியாலயத்தின் பௌதிக மற்றும் மனித வள அபிவிருத்திக்காக வழங்கப்பட்டுள்ள நிதி ஏற்பாடுகள் தனித்தனியே யாது என்பதையும்;

(iv) மேற்படி நிதி ஏற்பாடுகள்மூலம் தற்போது மேற்கொள்ளப்பட்டுள்ள நிகழ்ச்சித்திட்டங்களின் முன்னேற்றம் யாது என்பதையும்;

(v) 2018ஆம் ஆண்டில் இந்த வித்தியாலயத்தின் பௌதிக மற்றும் மனித வள அபிவிருத்திக்காக நிதி ஏற்பாடுகளை வழங்கத் திட்டமிடப் பட்டுள்ளதா என்பதையும்;

(vi) ஆமெனில், அந்நிதி ஏற்பாடுகள் யாவை என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

* පු
* தா

asked the Minister of Education:

(a) Is he aware that-

(i) Kuda Buthgamuva Rajasinghe Vidyalaya is the only mixed National School available in Kolonnawa Education Division;

(ii) at present, that school is facing decline day by day due to the shortage of physical and human resources;

(iii) currently there are 26 vacancies in the academic staff and 10 vacancies in the non-academic staff of that school; and

(iv) due to this situation, the students of that school tend to go to other schools to do G.C.E. (Advanced Level) after passing the G.C.E. (Ordinary Level) Examination?

(b) Will he inform this House-

(i) the nature of the plans that are in place to fill these vacancies;

(ii) the date on which steps will be taken to implement those plans;

(iii) separately of the provisions that have been allocated for the development of physical and human resources of this school in year 2017;

(iv) the progress of the programmes that have been implemented at present utilizing such provisions;

(v) whether it has been planned to allocate provisions for the development of physical and human resources of this school in year 2018; and

(vi) if, so what those provisions are?

(c) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(*மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்*)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) ජාතික පාසල්වල පවතින අඩුපාඩු සම්බන්ධයෙන් අමාත්‍යාංශය වෙත ලැබී ඇති තොරතුරු අනුව අදාළ අඩුපාඩු සම්පූර්ණ කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

(iii) මෙම විද්‍යාලයේ අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 14ක් පවතින අතර අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 10ක් පවතී.

(iv) විවිධ හේතූන් මත අ.පො.ස (සාමාන්‍ය පෙළ) සමත්වන සිසු සිසුවියන් වඩා ජනප්‍රිය යැයි සැලකෙන පාසල් වෙත යොමු වීම දීර්ඝකාලීනව සිදුවේ.

(ආ) (i) උපාධිධාරී ගුරුවරුන් බඳවා ගැනීම යටතේ මෙම පාසලට උපාධි ගුරුවරුන් එක් අයෙකු ද (01), ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා ගුරුවරුන් ස්ථානගත කිරීමේ වැඩපිළිවෙල යටතේ මෙම පාසලට ගුරුවරුන් තිදෙනෙක් ද (03) ලබා දී ඇත. ඊට අමතරව දැනට සිදු කරනු ලබන දස අවුරුදු ගුරු මාරු වැඩසටහන යටතේ ගුරු පුරප්පාඩු හැකි උපරිම මට්ටමින් සම්පූර්ණ කිරීමට පියවර ගැනීමට බලාපොරොත්තු වේ.

එසේම අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ජාතික පාසල් සඳහා අනධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගනු ලබන අවස්ථාවේ දී එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ.

ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම එතැන දෙමළ මාධ්‍ය පුරප්පාඩු දෙකක් තිබෙනවා, දෙමළ මාධ්‍ය ගුරුවරුන් සොයා ගැනීමට නොහැකි ප්‍රශ්නයක් තිබෙනවා. ඒ වාගේම ප්‍රාථමික අංශයේ ගුරුවරියක් ප්‍රසූත නිවාඩු ලබා සිටිනවා. අලුතින් ප්‍රාථමික අංශයට පැමිණි තවත් ගුරුවරියක් විශ්‍රාම ගොස් තිබෙනවා. පුරවැසි අධ්‍යාපනය සඳහාත් ගුරු පුරප්පාඩුවක් තිබෙනවා. එවැනි කාරණා තමයි පුරප්පාඩු ඇති වීමට හේතු වෙලා තිබෙන්නේ.

(ii) ගුරු භවතුන් බඳවා ගන්නා ආකාරය අනුව මෙම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අඛණ්ඩව කටයුතු කරනු ලැබේ.

අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩුද අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ඉදිරියේ දී ජාතික පාසල් සඳහා අනධ්‍යයන කාර්ය මණ්ඩලය බඳවා ගන්නා අවස්ථාවේ දී සම්පූර්ණ කිරීමට කටයුතු කරනු ලැබේ.

(iii) මෙම විද්‍යාලයට 2017 වර්ෂයේ දී ජාතික පාසල් ශාඛාවෙන් පමණක් ලබා දී ඇති ප්‍රතිපාදන පහත පරිදි වේ.

01. පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන (SBLIG)
- රු. 621,225.00

02. ලී බඩු උපකරණ අලුත්වැඩියාව සඳහා
- රු. 100,000.00

03. ද්විතීක අංශය සඳහා ගුණාත්මක යෙදවුම්
- රු. 73,857.00

- රු. 795,082.00

මෙහි ද්විතියික අංශයේ ගුණාත්මක යෙදවුම් සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන පාසලේ සංවර්ධන ගිණුමට බැර වී ඇත්තේ 2018 වර්ෂයේදීය. ඉහත සඳහන් ප්‍රතිපාදනවලට අමතරව 2016/2017 වර්ෂයේදී අධ්‍යාපන අමාත්‍යාංශයේ වෙනත් අංශ වෙතින් පාසලට ලැබී ඇති මූල්‍ය ප්‍රතිපාදන හා භෞතික සම්පත් ලේඛනය ඇමුණුම මඟින් දැක්වේ. ඇමුණුම **සභාගත*** කරමි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු අකිල විරාජ් කාරියවසම් මහතා]

ගරු මන්ත්‍රීතුමනි, මම ඉන් කිහිපයක් කෙටියෙන් සඳහන් කරන්නම්. 2016 වර්ෂයේ, විද්‍යාගාර හා පන්ති කාමර අලුත්වැඩියාවට රුපියල් 2,000,000.00යි, මාර්ටින් වික්‍රමසිංහ ශාලාව හා කුමාරතුංග මුණිදාස ශාලාව අලුත්වැඩියාවට රුපියල් 1,650,000.00යි, ලී බඩු අලුත්වැඩියාවට රුපියල් 51,253.56යි. ගුණාත්මක යෙදවුම් (පරිභෝජ්‍ය) සඳහා රුපියල් 67,056.00යි, පුස්තකාල පොත් මිලට ගැනීමට රුපියල් 100,000.00යි, පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදාන සඳහා රුපියල් 621,225.00යි.

2017 වර්ෂයේ, ලී බඩු අලුත්වැඩියාවට රුපියල් 100,000.00යි, මහසෙන් ශාලාව (තෙමහල්) අලුත්වැඩියා කිරීමට වෙන් කළ මුදල රුපියල් 9,318,200.00යි, මද්දුම බණ්ඩාර ශාලාව අලුත්වැඩියාවට වෙන් කළ මුදල රුපියල් 7,579,500.00යි.

ඊට අමතරව 2017 වර්ෂයේ, විද්‍යාලයීය තාක්ෂණික පීඨයට අදාළ උපකරණ ගොඩක් දීලා තිබෙනවා. ඒ අතර, multimedia, laptops, fax machines සහ ක්‍රිකට් බඩු ඇතුළු ගොඩක් දේවල් දීලා තිබෙනවා. සියල්ලම කියවන්නට ගියොත් කාලය නාස්ති වෙන නිසා මම ඇමුණුම සභාගත කළා.

(iv) ලී බඩු, ඩෙස්ක්-පුටු අලුත්වැඩියාව, සිසු සිසුවියන්ගේ විෂය සහ විෂය බාහිර ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම, පුස්තකාල පොත් මිලදී ගැනීම, ගොඩනැඟිලි අලුත්වැඩියාව ආදී කටයුතු සඳහා මෙම ප්‍රතිපාදන යොදාගෙන ඇත.

(v) ඔව්.

(vi) සියලුම ජාතික පාසල්වල පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන, ලී බඩු උපකරණ අලුත්වැඩියාව, ගුණාත්මක යෙදවුම් ආදී කටයුතු සඳහා 2018 වර්ෂයේදී ජාතික පාසල් ශාඛාව වෙත වෙන් කර ඇති ප්‍රතිපාදන එම පාසල් අතර අදාළ පාසලේ ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව පදනම් කර ගනිමින් ලබා දෙනු ලැබේ.

මෙම පාසල සඳහා 2018 වර්ෂය වෙනුවෙන් රු.338,850.00ක් පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදාන ලෙස ලබා දීමට සැලසුම් කර ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු ඇමතිතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. කොළොන්නාව අධ්‍යාපන කොට්ඨාසයේ පිරිමි දරුවන්ට යන්න තිබෙන එකම ජාතික පාසල මේක. ඔබතුමා කරපු ටික කිව්වා. නොකරපු දේවල් සෑහෙන්න ප්‍රමාණයක් තිබෙනවා. "ළඟම පාසල - හොඳම පාසල" වැඩසටහන යටතේ පළාත් පාසල්වලට විශාල මුදලක් වෙන් කරද්දී, ජාතික පාසල්වලට වෙන් කරලා තිබෙන මුදල් ප්‍රමාණය අඩුයි කියලා ඔබතුමා පිළිගන්නවාද? ඔබතුමා ලබාදුන් පිළිතුර අනුව අධ්‍යයන කාර්ය මණ්ඩලය 14දෙනෙක් හිහයි කියලා කිව්වා. නමුත් 20දෙනෙකුගේ හිහයක් තිබෙනවා. මට ඒ විස්තර ඔක්කෝම ලිඛිතව තමුන්නාන්සේට ලබා දෙන්න පුළුවන්. මම ඔබතුමාට 2017.07.26වැනි දා ලිඛිතව මේ සියලු විස්තර එවලා තිබෙනවා. ඒ ඔක්කෝම බලලා, ඒ අඩු පාඩු ටික හදලා අපට මේ අවුරුද්ද අවසන් වෙන්න කලින් අවශ්‍ය පහසුකම් ලබා දෙන්න පුළුවන්ද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, මන්ත්‍රීතුමා කියපු පුරප්පාඩු සංඛ්‍යාව වැරැදියි. අපට ඕනෑ-ඕනෑ විධියට පුරප්පාඩු පුරවන්න බැහැ. එහි cadre එකක් තිබෙනවා. අවශ්‍ය ප්‍රමාණය අනුව තමයි ගුරු පුරප්පාඩු පුරවන්න පුළුවන්කම තිබෙන්නේ. ඒක නිසා මම ලබාදුන් සංඛ්‍යා ලේඛන නිවැරැදියි. ගරු කථානායකතුමනි, ඒ වාගේම ජාතික පාසල්වලටත් අපි විශාල වැඩ කොටසක් ඉටු කරලා තිබෙනවා. ඔබතුමන්ලාත් ඒක දන්නවා; අපේ ගරු මන්ත්‍රීතුමාත් දන්නවා. මේ රටේ ඕනෑ තැනකට ගිහිල්ලා බලන්න, කවදාවත් දීලා නැති විධියට ගොඩනැඟිලි ආදී භෞතික සම්පත් දීලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම දැන් දාහකට වැඩි ප්‍රමාණයක් තට්ටු දෙකේ, තුනේ ගොඩනැඟිලි, පුස්තකාල, විද්‍යාගාර විවෘත කරන්න තිබෙනවා. මේ ආදී වශයෙන් භෞතික සම්පත් විශාල ප්‍රමාණයක් ලබා දීලා තිබෙනවා. මේ පාසලට වුණත් එහෙමයි. මම ඒ ලැයිස්තුව කියෙවිවේ නැහැ. ඔබතුමා ඒ ගැන බැලුවොත් පෙනෙයි. කෝටි ගණනක් මේ පාසලටත් ලබා දීලා තිබෙනවා. දැන් මම කිව්වා - [බාධා කිරීමක්] මදියි කියලා කිව්වාට, ආර්ථික විද්‍යාව අනුව සීමිත සම්පත් ප්‍රමාණයකින් අසීමිත වුවමනාවන් ඉෂ්ට කරගන්න පුළුවන්කමක් නැහැ. අපි පුළුවන් තරම් සම්පත් දීලා තිබෙනවා. තවත් දෙන්නම්. හැම තැනටම දෙන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම අනෙක් පාසල්වලට සාපේක්ෂව මේ පාසලට ගොඩක් පහසුකම් තිබෙනවා. මහියංගනය වාගේ ප්‍රදේශවල, මොනරාගල වාගේ ප්‍රදේශවල පාසල්වලට වැසිකිළි-කැසිකිළි වාගේ දේවල්වල ඉඳලා ගොඩක් සම්පත් දෙන්න ඕනෑ. අපි මොනරාගල දිස්ත්‍රික්කයේ වැසිකිළි 14,000ක් හදනවා. අපේ රංජිත් මද්දුම බණ්ඩාර මැතිතුමා දැන් මේ සභාවේ හිටියා, එතුමා දන්නවා ඇති, අපේ රජය ඉදිරි කාලය තුළ "ගම්පෙරළිය" වැඩසටහන යටතේ මුළු දිස්ත්‍රික්කයේම අවශ්‍යතා සපුරන බව. මේ වාගේ සමානව බෙදී යන විධියට අපි මේ සම්පත් දෙන්න ඕනෑ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, ප්‍රශ්නය අහපු මන්ත්‍රීතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු ඇමතිතුමාට මම කියන්නේ, පළාත් සභා පාසල්වලට සාපේක්ෂව ජාතික පාසල්වලට මදියි කියන එකයි.

ගරු ඇමතිතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. ඔබතුමා කැබිනට් මණ්ඩලයේ සාමාජිකයෙක්. ඒ වාගේම ඔබතුමා එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්වරයායි. ඒ නිසා මම ඔබතුමාගෙන් මේ ප්‍රශ්නය අහන්න කැමැතියි. ඔබතුමා කැමැති නම් මට මේකට උත්තරයක් දෙන්න. විජයකලා මහේස්වරන් රාජ්‍ය ඇමතිතුමිය ජාතිද්‍රෝහී, අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය වන ආකාරයේ ප්‍රකාශයක් කර තිබෙනවා. අපි එම ප්‍රකාශය හෙළා දකිනවා වාගේම, එයට විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. එය රජයේ මතයද, එක්සත් ජාතික පක්ෂයේ මතයද? ඔබතුමා මේ සම්බන්ධයෙන් මොකක්ද කියන්නේ?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂය විධියට අපි ඒ ප්‍රකාශය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනවා. එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්වරයා විධියට මම දුරකථනයෙන් කථා කරලා, එතුමිය කළ ප්‍රකාශය පිළිබඳව එතුමියගෙන් විමසුවා. එතුමිය මට කිව්වේ, දැරිවියක් ඝාතනය කිරීම සම්බන්ධයෙන් ඇතිවුණු හිතේ අමාරුවට ඒ වෙලාවේ ඒ වාගේ ප්‍රකාශයක් කළා කියායි. ඒ නිසා පක්ෂයක් විධියට අපි ඒ ප්‍රකාශය ප්‍රතික්ෂේප කරනවා. ගරු කථානායකතුමනි, පසුගිය දවස්වල හිටිලර්ව උදාහරණයට අරගෙනත් මේ විධියට නායකයෝ සමාන කළා. මේකත් ඒ වාගේ දෙයක් තමයි. [ඝෝෂා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් අපිට වාදයකට යන්න බැහැ.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නය අහන්න අවස්ථාව දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ ප්‍රශ්නය අහලා අවසන් කරන්න.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු ඇමතිතුමනි, අපේ කොලොන්නාව පැත්තේ අංගොඩ මානසික රෝහල තිබෙනවා. එතුමියට හිතේ අමාරුවක් තිබෙනවා නම් එතුමිය ඒකට එවන්න පුළුවන්.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)
ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට ඔබතුමාම ඒක රාජ්‍ය ඇමතිතුමියට කිව්වා නම් හොඳයි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද? ගරු අධ්‍යාපන ඇමතිතුමා එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම්වරයා විධියට මේ ප්‍රශ්නය ගැන දැන් පැහැදිලි කිරීමක් කළා. ඒ ගැන දැන් වාද කරන්න අවශ්‍ය නැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රමාද නොවී කියන්න. ඔබතුමා කියන්නේ මොකක්ද?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, අපි මන්ත්‍රීවරයකු හැටියට මේ පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු පටන් ගන්නකොට දිවුරුම් දෙනවා; ප්‍රතිඥාවක් දෙනවා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව රකින බවට; රටේ ඒකීයභාවය රකින බවට සහ ත්‍රස්තවාදය ප්‍රවර්ධනය නොකර සිටින බවටයි අප ඒ ප්‍රතිඥාව දෙන්නේ. මේ මන්ත්‍රීතුමිය රාජ්‍ය අමාත්‍යවරියක්. එතුමිය ඇමතිවරු දෙදෙනකු සිටින චේදිකාවක ඉදගෙන, LTTE සංවිධානය නැවත ගොඩ නහන්න ඕනෑය කීමෙන් ත්‍රස්තවාදය ප්‍රවර්ධනය කිරීමක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කිරීමක් කර තිබෙනවා. මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න තවදුරටත් එතුමියට අයිතියක් නැහැ. ගරු කථානායකතුමනි, මේ සභාවේ ඉඳගෙන ත්‍රස්තවාදය ප්‍රවර්ධනය කරන්න දෙන්න බැහැ. එතුමියගේ හිතේ අමාරුවට වෙන මොකක් හරි කරගන්න කියන්න. හිතේ අමාරුවට ත්‍රස්තවාදය, - [බාධා කිරීමක්] -

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්නේත් මේ කාරණය ගැනම නම්, ඒ ගැන හතර පස් සැරයක් කියන්න ඕනෑ නැහැ. ඔබතුමා කියන්න හදන්නේ මොකක්ද?

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා සඳහන් කළ කාරණයට මම තවත් යමක් එකතු කරන්න කැමැතියි. අපේ ස්ථාවර නියෝගවල අංක 1. (ආ)හි මෙසේ සඳහන් වෙනවා:

> "මහ ලේකම්වරයා විසින් ගනු ලබන පරිදි කථානායකවරයා විසින් පාර්ලිමේන්තුව ඉදිරියේ දී සිය නිල ප්‍රතිඥාව හෝ දිවුරුම් දීම;"

එම නිසා මේ ගැන CID එකෙන් පැහැදිලි පරීක්ෂණයක් කරලා, එතුමියට විරුද්ධව ගන්න පුළුවන් සියලුම පියවර ගන්න ඕනෑ.

[ගරු දයාසිරි ජයසේකර මහතා]

ඒ විතරක් නොවෙයි, එතුමිය මෙම පාර්ලිමේන්තුවට පැමිණීම තහනම් කරන්නත් ඕනෑ. පැහැදිලිවම, මේ රට බෙදන ප්‍රකාශයක් එතුමිය විසින් කර තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඒ ගැන අපි හොයා බලා කටයුතු කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්පුමිකු දයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
විනාශ කර දැමූ එල්ටීටීඊ‍ය නැවත නැඟිටුවන්න ඕනෑය කියා මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු කථා කරනවා නම්, ඔවුන් මේ පාර්ලිමේන්තුවෙන් එළවන්න ඕනෑ. ඒ නිසා ඔබතුමා ඒ සම්බන්ධයෙන් ගන්නා පියවර මොකක්ද කියා කරුණාකර අපට කියන්න, ගරු කථානායකතුමනි. [බාධා කිරීම්]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත අබේගුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardana)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත අබේගුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardana)
ගරු කථානායකතුමනි, එතුමිය කළ ප්‍රකාශය නිසා මේ මොහොත වන විට මුළු රටම අස්ථාවරභාවයට පත් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මම ඒ ගැන අවධානය යොමු කරන්නම්. අපි දැන් ප්‍රශ්නවලට යමු.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(මාණ්පුමිකු රෝහිත අබේගුණවර්තන)
(The Hon. Rohitha Abeygunawardana)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න. [බාධා කිරීම්] එතුමියගේ මහත්තයා මැරුවෙත් එල්ටීටීඊ සංවිධානයයි. අපට සැකයක් තිබෙනවා, - [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
එතුමියගේ ප්‍රකාශය ගැන අගමැතිවරයාගේ මතය කියන්න.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(මාණ්පුමිකු එස්.එම්. මරික්කාර්)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන්න හදන්නේ මොකක්ද?

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(මාණ්පුමිකු එස්.එම්. මරික්කාර්)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, අපි ඒකට විරුද්ධයි වාගේම, ඒ බෝලය උඩ දමාගෙන ගහන අයගෙන් අහනවා, චීනයෙන් ගත්තු අර සල්ලි ගැන මොනවාද කියන්නේ, හිට්ලර් ගෙනෙන්න කැමැතිද කියා. [බාධා කිරීම්]

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(මාණ්පුමිකු අසෝක්ක පිරියන්ත)
(The Hon. Ashoka Priyantha)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු අශෝක ප්‍රියන්ත මන්ත්‍රීතුමනි, ඔබතුමා කියන කාරණය මොකක්ද? [බාධා කිරීම්] මෙතැනින් එහාට points of Order are not allowed.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(මාණ්පුමිකු අසෝක්ක පිරියන්ත)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, ඒක එක පැත්තක විතරක් මතයක් නොවෙයි. අපේ රට යුද්ධය නිසා බොහොම දුක් විඳපු රටක්. එතුමිය එවැනි ප්‍රකාශයක් කරලා ආණ්ඩුවේ රාජ්‍ය ඇමති ධුරයක් දැරීම ගැන අපිත් විරුද්ධයි. අපිත් කියන්නේ එතුමියට රාජ්‍ය ඇමති ධුරයෙන් ඉවත් වෙන්න කියායි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මීළඟට, ප්‍රශ්න අංක 8.

කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහායක නිලධාරීන් : රත්නපුර දිස්ත්‍රික්කය

කමත්තොழිල්, ஆராய்ச்சி உற்பத்தி உதவி உத்தியோகத்தர்கள்: இரத்தினபுரி மாவட்டம்

AGRICULTURAL RESEARCH PRODUCTION ASSISTANT OFFICERS: RATNAPURA DISTRICT

237/'18

8. ගරු හේෂාන් විතානගේ මහතා
(මාණ්පුමිකු හේසාන් විතානගේ)
(The Hon. Heshan Withanage)
කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කය සඳහා අනුමත කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහයක නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) දැනට සේවයේ නියුතු නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ඔවුන් සේවයේ නියුතු ග්‍රාම නිලධාරී වසම් කවරේද;

(iv) දැනට එම තනතුරෙහි පවතින පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) එම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

කමත්තොழිල් அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) இரத்தினபுரி மாவட்டத்துக்காக அங்கீகரிக்கப் பட்டுள்ள கமத்தொழில், ஆராய்ச்சி உற்பத்தி உதவி உத்தியோகத்தர்களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) இன்றளவில் சேவையில் ஈடுபட்டுள்ள உத்தியோகத்தர்களின் எண்ணிக்கை எவ்வள வென்பதையும்;

(iii) இவர்கள் சேவையில் ஈடுபட்டுள்ள கிராம உத்தியோகத்தர் பிரிவுகள் யாவை என்பதையும்;

(iv) இன்றளவில் மேற்படி பதவியில் நிலவுகின்ற வெற்றிடங்களின் எண்ணிக்கை எவ்வள வென்பதையும்;

(v) அவ் வெற்றிடங்களை நிரப்புவதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச் சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture:

(a) Will he inform this House -

(i) the number of Agricultural Research Production Assistant Officers that have been approved for Ratnapura District ;

(ii) the number of officers who are in service at present;

(iii) names of the Grama Niladhari Divisions in which they serve;

(iv) the number of vacancies that exist in the aforesaid post at present; and

(v) the action taken by the Ministry to fill the aforesaid vacancies?

(b) If not, why?

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
දැන් ඒ කාරණය ගැන කථා කර අවසානයි, ගරු මන්ත්‍රීතුමනි. No points of Order could be raised now. ගරු කෘෂිකර්ම අමාත්‍යතුමනි, ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු දෙන්න. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු කථානායකතුමනි, මේ කාරණය සම්බන්ධයෙන් ගන්නා පියවර මොකක්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන අපි තීරණයක් ගන්නම්. [බාධා කිරීම්] ඒ ගැන කරන්න දෙයක් නැහැ. ඒක ගැන පක්ෂය විසින් තීරණයක් ගන්න ඕනෑ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
එතුමියට විරුද්ධව ඔබතුමා ගන්නා පියවර මොකක්ද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන අපි සාකච්ඡා කරලා තීරණයක් ගන්නම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමියව පාර්ලිමේන්තුවෙන් එළියට දමන්න. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම තීරණයක් ගන්නම්. [බාධා කිරීම්] ඒක ඉතාම බරපතළ ප්‍රකාශයක් බව දන්නවා. මට මෙතැන ඉඳගෙන තීරණ ගන්න බැහැ. [බාධා කිරීම්]

එහෙම නම් මට පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු නවත්වන්න වෙනවා. තර්ජනය කරලා මෙතැන කටයුතු කරන්න බැහැ.[බාධා කිරීම්] අපි තීරණයක් ගන්නම්. මම පක්ෂ නායකයන් සමඟ කථා කරලා ඒ ගැන තීරණයක් ගන්නම්. කරුණාකර ඔබතුමන්ලා වාඩි වෙන්න.[බාධා කිරීම්]

[මේ අවස්ථාවේදී විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු පිරිසක් සභා ගර්භය මැදට පැමිණ ඝෝෂා කරන්නට වූහ.]

[இச்சந்தர்ப்பத்தில் எதிர்த்தரப்பு உறுப்பினர்கள் சிலர் சபாமண்ட பத்தின் மத்திக்கு வந்து கோஷமிட்டனர்.]

[At this stage, some Members of the Opposition walked into the Well of the House and created an uproar.]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අගමැතිට එන්න කියන්න; මේවට උත්තර දෙන්න කියන්න.

ගරු ටී. බී. ඒකනායක මහතා
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, වාඩිවෙන්න දැන්.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළදු]
[Expunged on the order of the Chair.]

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළදු]
[Expunged on the order of the Chair.]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට ආපහු කියනවා, වාඩිවෙන්න කියා. මට වැඩ කටයුතු කරන්න අවස්ථාව දෙන්න.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළදු]
[Expunged on the order of the Chair.]

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළදු]
[Expunged on the order of the Chair.]

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
මේවට උත්තර -

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළදු]
[Expunged on the order of the Chair.]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමන්ලා මේක රහ මඩලක් කර ගන්න එපා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළදු]
[Expunged on the order of the Chair.]

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළදු]
[Expunged on the order of the Chair.]

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
මේවට උත්තර -

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුළ්ළදු]
[Expunged on the order of the Chair.]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මේ අවස්ථාවේදී පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු තාවකාලිකව අත්හිටුවනවා.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 2.09ට නැවත පවත්වන ලදී.
අතන්පඩි අමර්වු ඉිටෙනිරුත්තප්පට්ටු, පි.ප. 2.09 මණික්කු මීණ්ටුම් ආරම්පමායිර්රු.
Sitting accordingly suspended till 2.09 p.m. and then resumed.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
කරුණාකර ගරු මන්ත්‍රීවරු තමන්ගේ ස්ථානවල වාඩිවෙන්න. සුළු වේලාවකට හෝ පාර්ලිමේන්තුවේ කටයුතු අත් හිටුවීමට සිදුවීම ගැන අපි කනගාටු වන්න ඕනෑ. මේ සිද්ධිය කථානායකවරයාට බලපාන සිද්ධියක් නොවෙයි. ඒවාට දේශපාලන පක්ෂ තිබෙනවා; ඒ වාගේම දේශපාලන නායකයෝ ඉන්නවා. ඒ අනුව මම දැන් ගරු අගමැතිතුමාට මේ සම්බන්ධයෙන් කථා කළා. අගමැතිතුමා ඒ ගැන පරීක්ෂණයක් කර අවශ්‍ය පියවර ගන්නවා ඇති. ගරු සභානායකතුමාත් මේ සම්බන්ධව විස්තර කියන්න.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(මාණ්පුමිකු ලක්ෂ්මන් කිරිඇල්ල)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් ඉදිරි පියවර ගන්න අපි අගමැතිතුමාත් එක්ක සාකච්ඡා කරනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order. - [*Interruption*.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No, no more arguments will be allowed on this. මේකට මෙතැනින් එහාට arguments නැහැ. [බාධා කිරීම්] I am sorry.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No point of Order can be allowed. I have already allowed you to raise a point of Order. ඒ ප්‍රශ්නය ඉවරයි. අපි දැන් සභාවේ ඉතිරි වැඩ කටයුතු කර ගෙන යනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order. - [*Interruption*.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8, ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක මෙතැනින් එහාට යන්නේ නැහැ. We have finished it. - [*Interruption.*] I gave an assurance. -[*Interruption*.] No. විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, මේ කරුණ මතක තබාගන්න. මට එහෙම කියනවා නම්, මේ පාර්ලිමේන්තුවට බෝම්බ ගහනවාය කිව්ව අය ඉන්නවා; පාර්ලිමේන්තුවට ගිනි තියන්න කියපු අය ඉන්නවා. මට කවුරුවත් නවත්වන්න බැහැ. ඒක අයිති නැහැ. දැන් මගේ යුතුකමක් තිබෙනවා, පාර්ලිමේන්තුවේ ඉතිරි වැඩ කටයුතු කර ගෙන යන්න. [බාධා කිරීම්] No way. - [*Interruption.*] Then, I will suspend Parliament.

[මෙම අවස්ථාවේදී ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා සභා ගර්භය මැදට පැමිණියේය.]

[இச்சந்தர்ப்பத்தில் மாண்புமிகு விமல் வீரவங்ச அவர்கள் சபாமண்டபத்தின் மத்திக்குப் பிரவேசித்தார்.]

[At this stage, the Hon. Wimal Weerawansa *walked into the Well of the House.]*

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order. -[*Interruption*.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභා ගැබ මැදට ඇවිල්ලා points of Order ඉල්ලන්න බැහැ නේ? [බාධා කිරීම්] No, sorry. මට අද පාර්ලිමේන්තුවේ වැඩ කටයුතු කරන්න මගේ යුතුකමක් තිබෙනවා. මේ ගැන අගමැතිතුමා ප්‍රකාශයක් කළාට පස්සේ raise කරන්න. [බාධා කිරීම්] No, there is no way I can allow you.

ගරු හේෂාන් විතානගේ මහතා, ප්‍රශ්නය අහනවාද?

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
උත්තර දෙන්න කියන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
තමුන්නාන්සේ මට රීති ප්‍රශ්නයක් අහන්න ඉඩ දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභා ගැබ මැදට ඇවිල්ලා රීති ප්‍රශ්න අහන්න ඉඩ දෙන්න බැහැ. ඒක ඉවරයි. හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහන්න.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රතන ස්වාමීන් වහන්ස, මේ ගැන අග්‍රාමාත්‍යතුමා පරීක්ෂා කර ප්‍රකාශයක් කරනවා. කථානායකවරයා වශයෙන් මේ ගැන මට කළ යුතු දෙයක් නැහැ. ඔබ වහන්සේ එන්න පෙර අපි මේ ගැන කථා කළා. ගරු ස්වාමීන් වහන්ස, මොකක්ද කියන්නේ?

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රකාශය "පාර්ලිමේන්තුවට බෝම්බ ගහනවා" කියනවා වාගේ ප්‍රකාශයක් නොවෙයි. රටේ වග කිව යුතු කැබිනට් ඇමති ධුරයක් දරන-

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
කැබිනට් ඇමති ධුරයක් නොවෙයි.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ඇමති ධුරයක් දරන, එක්සත් ජාතික පක්ෂයෙන් ප්‍රජාතන්ත්‍රවාදිව තේරී පත් වූ මන්ත්‍රීවරියක් නවත් ඇමතිවරුන් දෙදෙනකු ඉදිරියේ කරපු ප්‍රකාශයක්, එය. ඒ වාගේම අප මේ කාරණයත් කියන්න ඕනෑ. අප සියලුදෙනාම දිවුරුම් දුන්නා මේ රටේ බෞද්ධවාදයට ඉඩ නොදෙන බවට සහ ඒකීයභාවය ආරක්ෂා කරන බවට.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබ වහන්සේ පැමිණීමට පෙර මේ ගැන කථා කළා; අවධානය යොමු කළා.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
ගරු කථානායකතුමනි, පක්ෂවලට නොවෙයි, කථානායකතුමා හැටියට ඔබතුමාට වගකීමක් තිබෙනවා, විනය පරීක්ෂණයක් කරලා එතුමිය පාර්ලිමේන්තුවට සහභාගි වීම අත් හිටුවන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒ කටයුතු කරනවා, ගරු ස්වාමීන් වහන්ස.

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි
(மாண்புமிகு (வண.) அத்துரலியே ரதன தேரர்)
(The Hon. (Ven.) Athuraliye Rathana Thero)
විනය පරීක්ෂණයක් පවත්වා, ඒ තීරණය ඔබතුමා ගන්න. ඒ තීරණය ඔබතුමාට ගන්න පුළුවන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඒක ඔබතුමාගේ තීරණයක්; පක්ෂයේ තීරණයක් නොවෙයි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order. - [*Interruption*.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
No point of Order can be allowed. අද- [බාධා කිරීමක්] මේක මෙහෙම කරන්න බැහැ. මේ පාර්ලිමේන්තුව පවත්වාගෙන යන්න ඕනෑ. පාර්ලිමේන්තුව විහිළුවක් කර ගන්න එපා. වීරවංශ මන්ත්‍රීතුමා ඇවිල්ලා මෙතැන සෙල්ලම් කළා. පාර්ලිමේන්තුවේ විනයක් තිබෙන්න ඕනෑ. [බාධා කිරීම්] අග්‍රාමාත්‍යවරයා -එක්සත් ජාතික පක්ෂයේ නායකතුමා- ඇවිල්ලා හෙට ඒ ප්‍රකාශය ගැන පරීක්ෂා කරාවි. පාර්ලිමේන්තුව පැත්තෙන් අවශ්‍ය පියවර මම ගන්නවා. ඒවා මෙතැන ඉඳලා ගන්න බැහැ. ඉස්සර වෙලාම ඒ ඇමතිවරියගේ ප්‍රකාශය ගැන සොයා බලන්න ඕනෑ. ඒකට ඉඩ දෙන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අත්හිටුවන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තු රැස්වීම අත් හිටුවන්න බැහැ. ජාතික වැදගත්කමකින් යුත් පනතක් සම්බන්ධයෙන් අද විවාදයට ගන්න තිබෙනවා. මේ පාර්ලිමේන්තුව පවත්වා ගෙන යන්න ඕනෑ, මේ රට ගෙන යන්න ඕනෑ. මහජන මුදල් වියදම් කරනවා,- [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
කරුණාකර ඔබතුමා නින්දුවක් දෙන්න. ලජ්ජයි!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමායි ලජ්ජා වෙන්න ඕනෑ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ලජ්ජයි!

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මා නොවෙයි ලජ්ජා වෙන්න ඕනෑ, ඔබතුමායි. [බාධා කිරීම්] නැහැ, දෙන්න බැහැ. ගරු මන්ත්‍රීතුමා කතා කරන්න. [බාධා කිරීම්] අපි ඒවා කරන්නම්.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
එතකල් අත් හිටුවන්න. [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
එතකල් අත් හිටුවන්න. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
මට අවශ්‍ය කටයුතු කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්] ඒ කටයුතු මෙතැන ඉඳලා කරන්න බැහැ. මට ඒ කටයුතු කරන්න අවස්ථාව දෙන්න. ඒක තමයි කථා කරලා තිබෙන්නේ. [බාධා කිරීම්] ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීතුමා, කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ප්‍රශ්නය අහන්න.

ගරු හේෂාන් විතානගේ මහතා
(මාණ්ඩලික හේසාන් විතානකේ)
(The Hon. Heshan Withanage)
ප්‍රශ්නය ඇහුවා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්ඩලික විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order. -[*Interruption*.]

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
කෘෂිකර්ම ඇමතිතුමාගේයි උත්තරය. ගරු කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා.

ගරු වසන්ත අලුවිහාරේ මහතා (කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)
(මාණ්ඩලික වසන්ත අලුවිහාරේ - කමත්තොෂිල් ඉරාජාංක අමෙච්සර්)
(The Hon.Wasantha Aluvihare - State Minister of Agriculture)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) 467

(ii) 460යි.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(මාණ්ඩලික පිරසන්න රණවීර)
(The Hon. Prasanna Ranaweera)
ඔබතුමා ප්‍රකාශයක් කරන්න.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
මට ඔබතුමාව නම් කරන්න සිද්ධ වෙනවා.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(මාණ්ඩලික පිරසන්න රණවීර)
(The Hon. Prasanna Ranaweera)
ඔබතුමා ප්‍රකාශයක් කරන්න.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ප්‍රකාශය තමයි මම කළේ. එතුමියගේ ප්‍රකාශය ගැන පරීක්ෂණයක් කරනවා. [බාධා කිරීම්] විමල් වීරවංශ මැතිතුමා, මට ඔබතුමාව නම් කරන්න සිද්ධ වනවා. [බාධා කිරීම්] ඔබතුමාව නම් කරන්න සිද්ධ වනවා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්ඩලික විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
මේක ජාතික ප්‍රශ්නයක්. අවස්ථාව දෙන්න. තමුන්නාන්සේට ඕනෑ විධියට වැඩ කරන්න බැහැ.

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ඔබතුමා නම් කරන්න සිද්ධ වෙනවා. [බාධා කිරීම්] ඒකට ඉඩ දෙන්න බැහැ. [බාධා කිරීම්] ඔබතුමා වාඩි වෙන්න. [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්ඩලික විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
කථා කරන්න අවස්ථාව දෙන්න. [බාධා කිරීම්] අවස්ථාව දෙන්න. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
මේක පාර්ලිමේන්තුව.

[මේ අවස්ථාවේදී විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු පිරිසක් සභා ගර්භය මැදට පැමිණ ඝෝෂා කරන්නට වූහ.]

[ඉිච්චසන්තර්ප්පත්තිල් එතිර්ත්තරප්පු උරුප්පිනර්කළ් සිලර් සභා මණ්ඩපත්තින් මත්තික්කු වන්තු කෝෂමිට්ටනර්.]

[At this stage, some Members of the Opposition walked into the Well of the House and created an uproar.]

ගරු ප්‍රසන්න රණවීර මහතා
(මාණ්ඩලික පිරසන්න රණවීර)
(The Hon. Prasanna Ranaweera)
අපට කථා කරන්න අවස්ථාව දෙන්න. ඒකාධිපතියෙක් වෙන්න එපා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
ඒකාධිපතියෙක් නොවෙයි. මට කථා කරන්න අවස්ථාව දෙන්න. [බාධා කිරීම්]

ගරු ප්‍රසන්න රණවීර මහතා
(මාණ්ඩලික පිරසන්න රණවීර)
(The Hon. Prasanna Ranaweera)
ඔබතුමාට ඕනෑ විධියට වැඩ කරන්න ද මිනිස්සු එව්වේ?[බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්ඩලික සභානායකතුමා)
(The Hon. Speaker)
මට ඕනෑ විධියට වැඩ කරන්නේ නැහැ. [බාධා කිරීම්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(මාණ්ඩලික තයාසිරි ජයසේකර)
(The Hon. Dayasiri Jayasekara)
ගරු කථානායකතුමනි, ඔබතුමා ඉදිරියේ තමයි අපි දිවුරුම් දෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, ඒක තමයි. [බාධා කිරීමක්] මම එතුමිය කැඳවනවා. මම එතුමිය කැඳවලා පරීක්ෂණයක් කරනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ලජ්ජයි. ලජ්ජයි. [බාධා කිරීම්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එතුමිය ඔබතුමා ඉදිරියේ දුන්න දිවුරුම තමයි කඩ කරලා තිබෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි පරීක්ෂණයක් කරන්නේ. [ඝෝෂා කිරීම්] අපි එතුමිය ගැන විනය පරීක්ෂණයක් කරනවා. මම විනය පරීක්ෂණයක් කරනවා. ඒක කරන්නම්. [ඝෝෂා කිරීම්] ඒකට ඉඩ දෙන්නේ නැහැ නේ. මෙතැන ඉඳන් තහනම් කරන්න බැහැ නේ. [බාධා කිරීම්] වීරවංශ මන්ත්‍රීතුමා කට පරෙස්සම් කර ගන්න. මට කථා කරන්න අවස්ථාව දෙන්න. ඔබතුමාගේ මුඛය පරීක්ෂා කර ගන්න. [බාධා කිරීම්] ඔබතුමාගේ මුඛය පරෙස්සම් කර ගන්න. වීරවංශ මන්ත්‍රීතුමා ඉතාම කැත විධියට කථා කරනවා. මට මේ වැඩ කටයුතු කරගෙන යන්න ඉඩ දෙන්න. [ඝෝෂා කිරීම්]

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
ගරු කථානායකතුමනි, ඔබතුමාගේ තීන්දුව අපි බලාපොරොත්තු වෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තීන්දුව තමයි, අගමැතිතුමාත් හමුවෙලා කථා කරලා අවශ්‍ය නම් පාර්ලිමේන්තුවේ විනය පරීක්ෂණයක් කරනවා. [ඝෝෂා කිරීම්] ඒක මමත් දන්නවා. [ඝෝෂා කිරීම්] ඒක මම කරන්නම්.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අපට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට කථා කරන්න දුන්නොත් පාර්ලිමේන්තුවේ කටයුතු තවත් අවුල් කරනවා. [ඝෝෂා කිරීම්] ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමනි, මම ඒක කරනවා. ඉඩ දෙන්න. ඔබතුමන්ලා උගත් මිනිස්සුනේ. පරීක්ෂණය කරන්න ඉඩ දෙන්න.

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
පාර්ලිමේන්තුවේ ගෞරවය ආරක්ෂා කරන්න. [බාධා කිරීම්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමාගේ බලය ක්‍රියාත්මක කර ඔබතුමා තීන්දුවක් අරගෙන ඇයට පාර්ලිමේන්තුව තහනම් කරන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හරි, ඒක කරනවා. මට ඒක කරන්න ඉඩ දෙන්නකෝ. [බාධා කිරීම්] කරන්න ඉඩ දෙන්නේ නැහැ නේ.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා.

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, අපි මේ සිද්ධිය සම්බන්ධයෙන් විනය පරීක්ෂණයක් පවත්වලා සියලු දෙනාටම අදහස් ඉදිරිපත් කරන්න අවස්ථාවක් දෙන්නම්. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම හොඳයි, නේද? [බාධා කිරීම්]

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ඔබතුමා මොන පැත්තේද? [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Allow me to take a decision. [*Interruption*.] What is the meaning of this? - [*Interruption*.]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order. - [*Interruption*.]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා සති දෙකක් පාර්ලිමේන්තුව තහනම් කරලා, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම දන්නවා පාර්ලිමේන්තුවේ - [බාධා කිරීම්] මම කරන දේ මම දන්නවා. ඒක කරන්න ඉඩ දෙන්න. මෙතැන නටන්නේ නැතිව ඒකට ඉඩ දෙන්න.[බාධා කිරීම්] So, let me handle it.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
එහෙම පරීක්ෂණයක් කරන්න කලින් සති දෙකක් එතුමියගේ පාර්ලිමේන්තු පැමිණීම තහනම් කරන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මට වෙලාව දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට වෙලාව දෙන්නේ නැහැ. ඔබතුමා කථා කරන්න ගත්තාම ඔක්කෝම අවුල් කරනවා. [බාධා කිරීම්] ඔබතුමා දැන් පාවිච්චි කළ වචන -[බාධා කිරීම්] ඔබතුමා දැන් මේ සභාවේ ඉතාම අශෝභන විධියට කථා කළා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ලජ්ජයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා ලජ්ජා වෙන්න. මම ලජ්ජා වෙන්නේ ඔබතුමා ගැනයි. [බාධා කිරීම්] ගරු නියෝජ්‍ය ඇමතිතුමා. [බාධා කිරීම්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
අපි ඔබතුමාගෙන් ඉල්ලන්නේ, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඒක කරනවා; සිංහල භාෂාවෙන් කිව්වා. I will do that. -[*Interruption.*] මම ඒක කරන්නම්.දැන් අහගෙන ඉන්න. ඒක කරන්න ඉඩ දෙන්න. මේ සභාව නාඩගමක් කරගන්න එපා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඔබතුමා ඇයට පාර්ලිමේන්තුව තහනම් කරලා,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මට ඒක කරන්න ඉඩ දෙන්න. [බාධා කිරීම්] I will conduct an inquiry into that. මම ඒකාධිපතියෙක් නොවෙයි. එතුමිය කියපු දේ මුලින්ම tape එකෙන් හොයලා බලන්න ඕනෑ. [බාධා කිරීම්] දැන් ගිහිල්ලා ඉඳගන්න.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
කලා කලා විජයකලා. යූඑන්පිය ඉවර කළා.

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
ගරු කථානායකතුමනි, මේ රටේ විදේශ කටයුතු අමාත්‍යතුමා හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා යන දෙදෙනාම ඉදිරියේයි එතුමිය ඒ ප්‍රකාශය කළේ. අපට කථා කරන්න අවස්ථාව දෙන්න. [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, අපට වෙලාව දෙන්න. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ හැසිරීම ඉතාම නින්දිතයි. වීරවංශ මන්ත්‍රීතුමා ඉතාමත්ම පහත් විධියට හැසිරුණා. ඔබතුමා මුළු සභාවටම අපහාස වන විධියට හැසිරුණා. ඔබතුමා මිනිත්තුවක් ඉල්ලලා, ඉතාම නින්දිත විධියට හැසිරුණා. ඔබතුමාගේ හැසිරීම ගැන ඔබතුමා ලජ්ජා වෙන්න ඕනෑ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඇහෙන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඇහෙන්නේ නැත්නම් කන ශුද්ධ කර ගන්න.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
ගරු කථානායකතුමනි, ඊළඟ වැඩසටහනට යන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8. ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
එම ප්‍රශ්නය මම අහනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අපට වෙලාව දෙන්න. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විමල් වීරවංශ මන්ත්‍රීතුමා, මට ඔබතුමාව නම් කරන්න වෙනවා. [බාධා කිරීමක්] ඔබතුමා බෝම්බ ගහන්නත් කථා කළ එක්කෙනා. දැන් එයා තමයි සුදනා.

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 467යි.

(ii) 460යි.

(iii) ග්‍රාම නිලධාරී වසම් 575කි. ඇමුණුම 01 මඟින් දක්වා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

(iv) 07යි.

(v) රත්නපුර දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසම් අනුව පවතින පුරප්පාඩු සඳහා එම දිස්ත්‍රික්කයේ සිටින කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර තනතුරේ නිලධාරීන් 06දෙනෙකු වැඩ බැලීම සඳහා පත් කර ඇත.

ඊට අමතරව එම තනතුරේ පවතින සියලු පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා ක්‍රමවේදයක් දිස්ත්‍රික් පදනම මත සිදු කිරීමට හැකි වන සේ බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධන කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම පිණිස අංක 11/2018 හා 2018.02.28 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශය මඟින් අමාත්‍ය මණ්ඩල ලේකම් වෙත යොමු කර ඇත.

(ආ) අදාළ නොවේ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමා, ප්‍රවේශම් වෙන්න. කැලණියේ කරපු ඒවා මෙහේ කරන්න බැහැ.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
විජයකලාට පියවර ගන්නේ නැත්නම් අපට ගන්නේ-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විජයකලාගේ ප්‍රශ්නය මම ගන්නම්. [බාධා කිරීම්] ඔබතුමා මන්ත්‍රීවරයෙක් වශයෙන් හැසිරෙන්න. [බාධා කිරීම්] ගරු මන්ත්‍රීවරයෙක් වශයෙන් හැසිරෙන්න. මොකක්ද මේ හැසිරීම? නිකම් චණ්ඩි වාගේ නේ. අත ඔසවලා කෑ ගහන්නේ? ඉස්සර වෙලාම පාර්ලිමේන්තුවේ හැසිරෙන්න දැන ගන්න.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
හැසිරෙන්න? රට කන්න එපා. බෙදුම්වාදයට ඉඩ දෙන්න එපා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බෙදුම්වාදයට මම ඉඩ දෙන්නේ නැහැ. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා - ඔබතුමන්ලා නිසා තමයි බෙදුම්වාදය- [බාධා කිරීම්]

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
මොකක්ද මේ රට? අවුරුදු තිහක් යුද්ධ කරලා බේරා ගත්ත රටක්. ආපසු යුද්ධයක් ඇති කරන්න-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගිහිල්ලා ඉඳ ගන්න. [බාධා කිරීම්]

ප්‍රශ්න අංක 9 - 384/'18 - (1), ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම ප්‍රශ්නය අහන්නේ නැහැ. ප්‍රශ්න අහන්න බැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නම්, ප්‍රශ්න අංක 10 - 394/'18 - (1), ගරු ටී. රංජිත් ද සොයිසා මැතිතුමා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
විජයකලා එහෙම කියනකොට ඔබතුමා මොකද කරන්නේ කියලා මම අහනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නය අහන්න.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
විජයකලාගේ ප්‍රකාශය ගැන මොකද කරන්නේ කියලා ආයෙත් අහනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්නය අහන්නේ නැද්ද?

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
ප්‍රශ්නය ඒක තමයි. විජයකලා රට බෙදන්න හදනකොට අගමැති බුදිද?

** ප්‍රස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11 - 414/'18 - (1), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මැතිතුමා.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
විජයකලා මහේස්වරන් එහෙම ප්‍රකාශ කළාම මොකද කරන්නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි මම කිව්වේ, පරීක්ෂණයක් කරනවා කියලා. [බාධා කිරීම්] ඉස්සර වෙලා මම ඒ කථාවට කන් දෙන්න ඕනෑ. ඒකට ඉඩ දෙන්න. [බාධා කිරීම්] ප්‍රශ්නය අහන්න. [බාධා කිරීම්] ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා ප්‍රශ්නය අහනවාද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නය මේක තමයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක මම බේරා ගන්නම්. මම පරීක්ෂණයක්-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා ඕනෑ එක නැතුව අනවශ්‍ය ප්‍රශ්න අහන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම සිංහල භාෂාවෙන් කිව්වා, මම පරීක්ෂණයක් කරනවා කියලා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු කථානායකතුමනි, ඔබතුමා මේ ප්‍රශ්නය පොඩ්ඩක් තේරුම් ගන්න. ඔබතුමා කලබල වෙන්න එපා. ඔබතුමා මේ ප්‍රශ්නය පොඩ්ඩක් තේරුම් ගන්න, ගරු කථානායකතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි මම කරන්නේ. මට ඒක කරන්න ඉඩ දෙන්න. මම කරන්න හදන්නේ හෙට ටේප් එක බලලා, ඒ ගැන පරීක්ෂණයක් කරන්නයි. ඒක කරන්න ඉඩ දෙන්න. මම ඒකාධිපතියෙක් නොවෙයි. ඒවා කරන්න ක්‍රමවේදයක් තිබෙනවා.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
සාමාන්‍යයෙන් ඕනෑ තැනක පරීක්ෂණයක් කරන්න කලින් මිනිහෙකුගේ වැඩ තහනම් කරලා ඉන්නවා නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉස්සර වෙලා බලන්න ඕනෑ, මොනවාද තිබෙන්නේ කියලා. [බාධා කිරීම්] මම ඒ reports ඉල්ලලා තිබෙන්නේ. [බාධා කිරීම්] මම වාර්තාව ඉල්ලලා තිබෙන්නේ. මම හොයන්නම්. [බාධා කිරීම්] ඒක කරන්න තමයි හදන්නේ. සිංහල භාෂාවෙන් කිව්වේ ඒකයි. [බාධා කිරීම්] I will do it. [බාධා කිරීම්]

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
රාජ්‍ය සේවකයෙකුගේ නම් ඉස්සර වෙලා වැඩ තහනම් කරලා තමයි පරීක්ෂණය කරන්නේ. [බාධා කිරීම්] එතැනින් පස්සේ තමයි පරීක්ෂණය කරන්නේ. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
නැහැ, වීරයෙක් වෙන්න ඕනෑ නැහැ. මම අවශ්‍ය දේ කරන්නම්.

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
ගරු කථානායකතුමනි, අභිංසක රාජ්‍ය සේවකයෙක් මේ වාගේ කථාවක් කළා නම්, එයාට විරුද්ධව ගන්න පියවර මොකක්ද? පාර්ලිමේන්තුවේ ඇමතිවරියක් හැටියට කටයුතු කරන නිසාද පියවර ගන්නේ නැත්තේ? [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක තමයි. මම මේ පැය 48 බලලා-

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
පාර්ලිමේන්තුව උත්තරීතරයි.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තව හොයන්න දෙයක් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ සභාවේ වැඩ කටයුතු ඉවර වෙලා ගිහින් මම පරීක්ෂණය කරන්නම්.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
තව බලන්න දෙයක් නැහැ, ගරු කථානායකතුමනි. මම කොළේ ගෙනැත් දෙන්නද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එපා ඕනෑ නැහැ. මම අනෙක් අයගේ කොළවලට අත්සන් කරන්නේ නැහැ. ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මන්ත්‍රීතුමා ප්‍රශ්නය අහනවාද? ප්‍රශ්නය අහනවාද? [බාධා කිරීම්]

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මගේ මේ ප්‍රශ්නයට කලින් ඔබතුමාගෙන් අහපු ප්‍රශ්නයට උත්තරයක් ලබා දෙන්න. මේක ඉතාම වගකීමක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එහෙම නැහැ.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මගේ ප්‍රශ්නයට කලින්-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා, අතුරු ප්‍රශ්නය අහන්න. [බාධා කිරීම්] පාර්ලිමේන්තුවේ කටයුතු පවත්වා ගෙන යන්න ඕනෑ. පාර්ලිමේන්තුවේ කටයුතු නවත්වන්න බැහැ.

ගරු දයාසිරි ජයසේකර මහතා
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
දෙවැනි අතුරු ප්‍රශ්නය, විජයකලා රාජ්‍ය ඇමතිතුමියට මොකද වුණේ?

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මම අහනවා. අපේ ගරු රාජ්‍ය ඇමැතිතුමා ලබා දුන් පිළිතුර මට හරියට ඇහුණෙත් නැහැ. ගරු කථානායකතුමනි, -[බාධා කිරීම්]

ගරු ප්‍රසන්න රණවීර මහතා
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
අපට වෙලාව දෙන්න.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
අපට වෙලාව දෙන්න. [බාධා කිරීමක්] ලජ්ජයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔය දෙන්නා කට ප්‍රවේසම් කර ගන්න. ගරු කෘෂිකර්ම රාජ්‍ය ඇමැතිතුමා උත්තර දෙන්න. [බාධා කිරීම්]

ගරු වසන්ත අලුවිහාරේ මහතා
(மாண்புமிகு வசந்த அலுவிஹார)
(The Hon. Wasantha Aluvihare)
ගරු කථානායකතුමනි, - [බාධා කිරීම්]

(අ) (i) 467යි.

(ii) 460යි. [ඝෝෂා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමා, ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමාව මට ඉවත් කරන්න සිද්ධ වෙනවා. ගරු ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමා ඉවත් වෙන්න. [ඝෝෂා කිරීම්] දෙවැනි වතාවට කියන්නේ, ඔබතුමා ඉවත් වෙන්න. [ඝෝෂා කිරීම්] ගරු ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමා, ඔබතුමා ඉවත් වෙනවාද, නැද්ද? Go out of the Chamber. ඉවත් කරන්න. [ඝෝෂා කිරීම්]

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
දැන් සෙංකෝලය නැහැ, [ඝෝෂා කිරීම්]

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ අවස්ථාවේදී පාර්ලිමේන්තුව හෙට පස්වරු 1.00 දක්වා කල් තබනවා.

ඊට අනුකූලව, ගරු කථානායකතුමා විසින් 81 වන ස්ථාවර නියෝගය යටතේ, ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව 2.27ට, 2018 ජූලි මස 04 වන බදාදා අ. භා. 1.00 වන තෙක් කල් තියේය.

අතන්පටි, மாண்புமிகு சபாநாயகர் அவர்கள் 81ஆம் இலக்க நிலைக்கட்டளைப்படி வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

அதன்படி, பி.ப. 2.27 மணிக்கு பாராளுமன்றம், 2018 யூலை 04, புதன்கிழமை பி.ப. 1.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.


Accordingly, THE HON. SPEAKER adjourned Parliament, without Question put, under Standing Order No. 81.

Parliament adjourned accordingly at 2.27 p.m. until 1.00 p.m. on Wednesday, 04th July, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

261 වන කාණ්ඩය - 9 වන කලාපය
தொகுதி 261 - இல. 9
Volume 261 - No. 9

2018 ජූලි 04වන බදාදා
2018 யூலை 04, புதன்கிழமை
Wednesday, 04th July, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන

2018.07.03 දින සභා ගර්භය තුළ අශෝභන ලෙස හැසිරීම

කථානායකතුමාගේ සහතිකය

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව

ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:

ඉන්දියාවේ සිට පැමිණෙන ශ්‍රී ලාංකික සරණාගතයන් මුහුණපාන ප්‍රශ්න

වරප්‍රසාද:

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය කඩ කිරීම

විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත:

නියම

රේගු ආඥා පනත:

යෝජනා

වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු පනත:

නියමය

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත:

නියම

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:

2018.07.03இல் சபையில் நெறிமுறையற்று நடந்துகொண்டமை

சபாநாயகரது சான்றுரை

அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை

பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:

இந்தியாவிலிருந்து இலங்கை திரும்பும் அகதிகள்

முகம்கொடுக்கும் பிரச்சினைகள்

சிறப்புரிமை:

பாராளுமன்ற உறுப்பினர்களுக்கான நடத்தைக் கோவையை

மீறுதல்

விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டம்:

கட்டளைகள்

சுங்கக் கட்டளைச் சட்டம்:

தீர்மானங்கள்

துறைமுக மற்றும் விமான நிலைய அபிவிருத்தி அறவீட்டுச் சட்டம்:

கட்டளை

உற்பத்தி வரி (விசேட ஏற்பாடுகள்) சட்டம்:

கட்டளைகள்

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Unethical Behaviour in the Well of the House on 03.07.2018
Speaker's Certificate

PUBLIC FINANCE COMMITTEE REPORT

QUESTIONS POSED TO HON. PRIME MINISTER

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Problems Faced by Sri Lankan Refugees Returning from India

PRIVILEGE:

Breach of Code of Conduct for Members of Parliament

SPECIAL COMMODITY LEVY ACT:

Orders

CUSTOMS ORDINANCE:

Resolutions

PORTS AND AIRPORTS DEVELOPMENT LEVY ACT:

Order

EXCISE (SPECIAL PROVISIONS) ACT:

Orders

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 ජූලි 04 වන බදාදා
2018 யூலை 04, புதன்கிழமை
Wednesday, 04th July, 2018

අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் பி.ப. 1.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய) தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I
2018.07.03 දින සභා ගර්භය තුළ අශෝභන ලෙස හැසිරීම
2018.07.03இல் சபையில் நெறிமுறையற்று நடந்துகொண்டமை
UNETHICAL BEHAVIOUR IN THE WELL OF THE HOUSE ON 03.07.2018

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ජනතාවට ඉතා වැදගත් වන ජාතික ඖෂධ නියාමන අධිකාරි පනත යටතේ නියෝග රීතියේ සම්මත කිරීමට නියමිතව තිබියදී ජනතා ශුභ සිද්ධිය ගැන කිසිම හැඟීමක් නොමැතිව එයට බාධා කර පාර්ලිමේන්තුවේ උත්තරීතර සංකේතය වූ සෙංකෝලය උදුරා එයට හානි කිරීමට ගත් උත්සාහයත්, එම වැදගත් නියෝග අනුමත කිරීමට ඉඩ නොදී පාර්ලිමේන්තුවේ කටයුතු කඩාකප්පල් කිරීමත්, මෙයින් රටට දෙන පණිවුඩය ගැනත් අප කනගාටු විය යුතුය.

ගරු විජයකලා මහේස්වරන් රාජ්‍ය අමාත්‍යවරිය විසින් කරන ලද ප්‍රකාශය අප දැනගත් විගසම එහි බැරෑරුම්කම් වටහා ගෙන එය පරීක්ෂා කිරීමට එදින උදේම මවිසින් ක්‍රියා කර තිබිණි. අවශ්‍ය කැසට් පටය ලබාගෙන එහි පරිවර්තනය ගැන අධ්‍යයනය කර කථානායක වශයෙන් ව්‍යවස්ථානුකූලව මට ගත හැකි සෑම පියවරක්ම ගැනීමටත්, ඇය නියෝජනය කළ පක්ෂ නායකත්වයද දැනුවත් කර නීතිපතිවරයාගේ උපදෙස් ලබාගැනීම මේ අතර ක්‍රියාත්මක වෙමින් තිබිණ.

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ක්‍රියාකාරිත්වයෙන් ලෝකයේ ආදර්ශවත් පාර්ලිමේන්තුවක් වශයෙන් ලෝක අන්තර්ජාතික පාර්ලිමේන්තු සංගමය විසින් පිළිගෙන තිබියදී කීපදෙනෙකු විසින් කරනු ලැබූ මෙම අශෝභන හැසිරීම තුළ මුළු පාර්ලිමේන්තුවේම ගරුත්වයට හා කීර්තිනාමයට බලවත් හානියක් සිදුවන බව සඳහන් කරන්නේ බලවත් කනගාටුවෙනි.

එසේ තිබියදී, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙදෙනෙකු ඉතාම අශෝභන ලෙස සහ පාර්ලිමේන්තුවේ ගරුත්වයට හානි කරමින් කටයුතු කළ ආකාරය පාර්ලිමේන්තුවටම අපකීර්තියකි.

මා රීයේම නීතිපතිවරයාට උපදෙස් දුන්නේ, වහා ක්‍රියාත්මක වී අදාළ නීති ප්‍රකාරව කටයුතු කරගෙන යන ලෙසයි. කථානායක වශයෙන් ව්‍යවස්ථානුකූලව මට ගත හැකි ඉහළම පියවර එයයි.

II
කථානායකතුමාගේ සහතිකය
சபாநாயகரது சான்றுரை
SPEAKER'S CERTIFICATE

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව, 2018 ජූලි 04 වැනි දින ම' විසින් "1990 සුවසැරිය පදනම" නැමැති පනත් කෙටුම්පතෙහි සහතිකය සටහන් කරන ලද බව දැනුම් දීමට කැමැත්තෙමි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs}

ගරු කථානායකතුමනි, ඔබතුමා සඳහන් කළ සිද්ධිය ගැන ආණ්ඩුවෙත්, එක්සත් ජාතික පක්ෂයේත් ස්ථාවරය ගැන මම කියන්න කැමැතියි. අපි හැම වෙලේම මේ රටේ ඒකීයභාවය ආරක්ෂා කරනවා. ඒකීයභාවය ආරක්ෂා කරනවා විතරක් නොවෙයි, එල්ටීටීඊ සංවිධානය තහනම් කර තිබෙනවා. එසේ තහනම් කරපු එල්ටීටීඊ සංවිධානය යළිත් ඇති කරන්නට වුවමනා නැහැ. එම පදනම උඩ තමයි අපි ක්‍රියා කරන්නේ. එම පදනම, රාමුව තුළ සිටිමින් මේ රටේ ඒකීයභාවය ආරක්ෂා කරමින්, බුද්ධාගමට ප්‍රමුඛස්ථානය ලබා දෙමින් කටයුතු කරනවා. මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව බලාපොරොත්තු වන දේශපාලන විසඳුමක් සඳහා එම මූලික අයිතිවාසිකම් පිළිබඳ ප්‍රශ්නත්, බලය බෙදා හැරීමේ ප්‍රශ්නයත් අපට විසඳන්නට තිබෙනවා. ඒ වාගේම උතුරේ ඉඩම් ආපසු ලබා දීම සම්බන්ධයෙන් මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා ප්‍රමුඛ ආණ්ඩුව ක්‍රියාකරමින් සිටිනවා. උතුරට හා නැඟෙනහිරටත් විශාල සංවර්ධනයක් වුවමනායි. එම සංවර්ධනය නැතිව දියුණු වෙන්න බැහැ. නීතිය, සාමය, මේ සියල්ලම විකුණාගෙන තිබෙන්නේ මේ රාමුව තුළයි.

රීයේ ඔබතුමාත්, මමත් -අප දෙදෙනාම- සාකච්ඡා කළා. අපේ මහේස්වරන් රාජ්‍ය ඇමතිතුමියගේ කථාව ගැන දැන ගත් අවස්ථාවේ දීම මමත් ඒ ගැන සොයා බැලුවා. අපේ දේශපාලන කොමිටිය රීයේ රැස් වුණා. විජයකලා මහේස්වරන් රාජ්‍ය ඇමතිතුමියට මා කථා කළා. එතුමිය රීයේ අසනීප තත්ත්වයෙන් යාපනයේ සිටියේ. එතුමිය අද කොළඹට එනවා කිව්වා. එතුමිය කොළඹ පැමිණියාට පසුව මට එතුමිය මුණගැසීමට අවශ්‍ය බව මා එතුමියට කිව්වා. ඒ වාගේම ඒ සම්බන්ධයෙන් ගත යුතු පියවර, පරීක්ෂණ ගැනත් අපි දැන් තීරණය කරලා තිබෙනවා. එතුමිය මුණ ගැසුණාට පසුව අපි ඒ අදාළ පියවර ගන්න කැමැතියි.

මොකද, අපි හැම වෙලාවකම එක ස්ථාවරයක ඉඳගෙනයි කටයුතු කරන්නේ. අපේ කවුරුහරි එයට පටහැනි යම් ප්‍රකාශයක් කර තිබෙනවා නම්, ඒකට හේතුව මොකක්ද කියා සොයා බලා අපි ඒ පිළිබඳව ක්‍රියා කරනවා. මොකද, මේ රටේ ජනතාව, අපේ ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක අංශ පසුගිය කාලය තුළ විශාල කැප කිරීමක් කළා; ජීවිත පරිත්‍යාග කළා. මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව මේ රට බෙදන්නේ නැහැ කියන ප්‍රතිපත්තිය තුළ ක්‍රියා කළා.

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

අපේ පක්ෂයේත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේත්, ද්‍රවිඩ පක්ෂවලත් නායකයන් මරුමුවට පත් කළා. ඒත් අපි කටයුතු කරන්නේ එක මූල ධර්මයක ඉඳගෙනයි. ඒ නිසා එම ප්‍රකාශය සම්බන්ධයෙන් එයට විරුද්ධව අපි ක්‍රියා කරනවාය කියන එක මා කියන්න කැමැතියි. මොකද, එල්ටීටීඊ සංවිධානය වැනි අය උත්සාහ කරන්නේ රට බෙදන්න විතරක් නොවෙයි, මේ පාර්ලිමේන්තුවත් ක්‍රියා විරහිත කරන්නයි. එදා පාර්ලිමේන්තුවට බෝම්බයක් ගහපු අවස්ථාවේ දීත් මා අනුරුද්ධ රත්වත්තේ මැතිතුමා එක්කත්, කේ.බී රත්නායක මැතිතුමා එක්කත් කථා කළා, මොකක් වුණත් පාර්ලිමේන්තුව රැස් කරන්න ඕනෑය කියලා. පාර්ලිමේන්තුවේ කටයුතු කඩා කප්පල් කිරීම නොවෙයි කළ යුත්තේ. ගරු කථානායකතුමනි, ඊයේ ඔබතුමා විශේෂයෙන්ම එම කාරණය ගැන කිව්වා. කථානායකතුමා වශයෙන් එය ඔබතුමාගේ තීරණය. එය ඔබතුමාගේ අයිතියක්. මා හිතන විධියට ඔබතුමා නිසි ලෙස ඒ වැඩ කටයුතු කළා.

අනෙක් කාරණය, මේ විධියට කටයුතු කළේ කවුද කියන එකයි? පොලීසියේ 600 දෙනෙකු මරපු කරුණා අම්මාන්ව තමන්ගේ පක්ෂයේ උපසභාපති කළා නම්, ප්‍රභාකරන්ට මුදල් දීලා ජනාධිපතිවරණයක් දිනුවා නම්, මේ රටේ එල්ටීටීඊය පරාජය කරපු හමුදාපති හිරේ දැම්මා නම්, අද ඇවිල්ලා මේ ගැන කථා කරන්නේ කොහොමද? [බාධා කිරීම්] මා අහන්නේ ඒකයි. [බාධා කිරීම්] ගරු කථානායකතුමනි, ඔබතුමා තදින් ක්‍රියා කරන්න ඕනෑ. මෙන්න මෙහෙම අයට ඔබතුමා තදින් ක්‍රියා කරන්න ඕනෑ. [බාධා කිරීම්] නැත්නම් හැමදාම මේ වාගේ සිද්ධ වෙයි.

මා තව කාරණයක් කියන්නම්. අද මේ සියලුදෙනාම කෑ ගහනවා. සරත් ෆොන්සේකා ඇමතිතුමා සම්බන්ධයෙන් කළ දේශපාලන පළිගැනීම් ගැන ඔබතුමාට ලිපියක් දීලා තිබෙනවා. එහෙම නම් අපි සියලු දෙනාම එකහවෙලා එය අනුමත කරමු. සරත් ෆොන්සේකා ඇමතිතුමා හිරේට යැව්වේ ඇයි? අපි දන්නවා, ඊයේ කෑ ගැහුවේ "නිව්යෝර්ක් ටයිම්ස්" පුවත් පතේ පළ වූ වාර්තාව සම්බන්ධයෙන් කළ කථාව නවත්වන්නයි කියලා. ඒක නේ වුණේ. ඒ ගැන අපි ක්‍රියා කරන්නම්. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. දැන් භයවෙලා ඉන්නවා. ඇත්ත නේ. පොලීසියේ 600ක් මරපු මිනිහා තමන්ගේ පක්ෂයේ උපසභාපති කරලා, ප්‍රභාකරන්ව මරපු මිනිහා හිරේ දැම්මා. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. [බාධා කිරීම්] Order, please!

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, රාජ්‍ය ව්‍යවසාය හා මහනුවර නගර සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම 2016 - 2017 වර්ෂය සඳහා ශ්‍රීලන්කන් එයාර්ලයින්ස්හි වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු නවින් දිසානායක මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு நவின் திஸாநாயக்க - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Navin Dissanayake - Minister of Plantation Industries)

ගරු කථානායකතුමනි, 2017 වර්ෂය සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය සහ ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

එම වාර්තාව නෛතික කටයුතු (දූෂණ විරෝධී) සහ මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු මලික් සමරවික්‍රම මහතා (සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යතුමා)
(மாண்புமிகு மலிக் சமரவிக்ரம - அபிவிருத்தி உபாய முறைகள் மற்றும் சர்வதேச வர்த்தக அமைச்சர்)
(The Hon. Malik Samarawickrama - Minister of Development Strategies and International Trade)

Hon. Speaker, I present the Annual Report of the Board of Investment of Sri Lanka for the year 2016.

I move that this Report be referred to the Sectoral Oversight Committee on International Relations.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
PUBLIC FINANCE COMMITTEE REPORT

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Speaker, I present the Report of the Committee on Public Finance on,

(i) National Audit Bill;

(ii) Orders under Excise (Special Provisions) Act;

(iii) Orders under Special Commodity Levy Act;

(iv) Resolutions under Customs Ordinance; and

(v) Note on the Supplementary Allocations given from the Budgetary Support Services and Contingent Liabilities provision made under the Department of National Budget as per the Introduction Note of the Annual Estimates

which were referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු එස්.බී. නාවින්න මහතා (අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு எஸ்.பி. நாவின்ன - உள்ளக அலுவல்கள் மற்றும் வடமேல் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. S.B. Nawinne - Minister of Internal Affairs and Wayamba Development)

ගරු කථානායකතුමනි, මම ලෝකාහෙට්ටිය, පනාගමුව යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්.ඒ. සුසිලාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු හරින් ප්‍රනාන්දු මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු පාලිත තෙවරප්පෙරුම මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු පියංකර ජයරත්න මහතා
(மாண்புமிகு பியங்கர ஜயரத்ன)
(The Hon. Piyankara Jayaratne)

ගරු කථානායකතුමනි, මම ඉහිණිමිටිය, එච්. 1 ඒ ගම්මානය, අංක 82 දරන ස්ථානයෙහි පදිංචි ආර්.ඩී. ජයවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු කථානායකතුමනි, මම පුත්තලම, නොරොච්චෝලය, කල්පිටිය පාර යන ලිපිනයෙහි පදිංචි එස්.එල්. මොහොමඩ් හසීම් මහතාගෙන් ලැබුණු පෙත්සමක් පිළිගන්වමි.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.
சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.
Petitions ordered to be referred to the Committee on Public Petitions.

ගරු අග්‍රාමාත්‍යතුමාට යොමු කළ ප්‍රශ්න
பிரதம அமைச்சரிடம் விடுக்கும் வினாக்கள்
QUESTIONS POSED TO HON. PRIME MINISTER

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් මා විසින් අසනු ලබන ප්‍රශ්නය මෙයයි.

(i) 2016 මැයි මස කැලණි ගඟ ආශ්‍රිතව කොළඹ දිස්ත්‍රික්කයට බලපෑ ගංවතුරින් පීඩාවට පත් ජනතාව සඳහා කොපමණ වන්දි මුදලක් ගෙවා ඇතිද?

(ii) එසේ නම් එම මුදල එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් කවරේද?

(iii) මෙහිදී වන්දි නොලැබුණු පවුල් ගණන කීයද?

(iv) මේ සම්බන්ධව ලැබී ඇති අභියාචනා ප්‍රමාණය කොපමණද?

(v) එම අභියාචනා සඳහා මුදල් ගෙවීමට කටයුතු කරන්නේද?

(vi) එසේ නම් දින වකවානු සඳහන් කළ හැකිද?

(vii) නො එසේ නම් ඒ මන්ද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා විසින් අසනු ලැබූ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

2016 මැයි මස කැලණි ගඟ ආශ්‍රිතව කොළඹ දිස්ත්‍රික්කයට බලපෑ ගංවතුරින් පීඩාවට පත් ජනතාව වෙනුවෙන් රුපියල් මිලියන 2,196ක, එනම් රුපියල් බිලියන 2කට වැඩි මුදලක් වන්දි වශයෙන් ප්‍රතිලාභීන් 52,025ක් වෙත ලබා දී තිබෙනවා.

එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව එම වන්දි මුදල ගෙවූ ආකාරය පිළිබඳව සඳහන් වන වාර්තාව මම **සභාගත*** කරනවා.

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

ගරු කථානායකතුමනි, මේ වන විට එම ගංවතුරින් පීඩාවට පත් සියලුම පවුල්වලට වන්දි පිරිනමා අවසානයි. මේ සම්බන්ධයෙන් අභියාචනා 20,961ක් ලැබී තිබෙනවා. ජාතික රක්ෂණ භාර අරමුදලේ වන්දි ගෙවීමේ සීමාව අනුව ගෙවිය හැකි වන්දි මුදල් ගෙවා අවසානයි. අභියාචනා අනුව ගෙවිය යුතු අතිරේක වන්දි මුදල් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ගෙවීමට මේ වන විට අවශ්‍ය පියවර ගනිමින් සිටිනවා.

**** සභාමේසය මත තබන ලද වාර්තාව:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட அறிக்கை:*
** Report tabled:*

ඇමුණුම 1

2016 මැයි මස කැළණි ගඟ ආශ්‍රිතව කොළඹ දිස්ත්‍රික්කයට බලපෑ ගංවතුරින් පීඩාවට පත් ජනතාව වෙනුවෙන් ජාතික රක්ෂණ භාර අරමුදල මගින් ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල අනුව ගෙවීම් විස්තර.

ප්‍රාදේශීය ලේකම් කාර්යාල	වන්දි ලබාදුන් පුද්ගලයින් ගණන	ලබාදුන් මුළු වන්දි මුදල (රු.)
කොළඹ	60	1,391,600.00
හංවැල්ල	2,166	36,568,335.75
හෝමාගම	691	11,991,109.00
කඩුවෙල	6,043	138,653,150.00
කැස්බෑව	24	664,675.00
කොළොන්නාව	42,985	2,005,739,086.00
මහරගම	9	301,741.80
මොරටුව	39	693,800.00
පාදුක්ක	6	506,000.00
රත්මලාන	2	18,000.00
කොට්ටාව	0	0
එකතුව	**52,025**	**2,196,527,497.55**

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමනි, අතුරු ප්‍රශ්න තිබෙනවා නම් අහන්න.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු අගමැතිතුමනි, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනක් - හංවැල්ල, කොළොන්නාව, කඩුවෙල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස- මෙම ගංවතුරින් යටවෙලා තිබුණා. විශේෂයෙන්ම පළමුවැනි වතාවට තමයි මෙපමණ මුදල් ප්‍රමාණයක් ගෙවා තිබෙන්නේ. කෙසේ නමුත්, ගරු අගමැතිතුමා කියූ ආකාරයට කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට පමණක් රුපියල් මිලියන 3,000කට වැඩි මුදල් ප්‍රමාණයක් ගෙවා තිබෙනවා. එහි පවුල් 27,000ක් පීඩාවට පත්වෙලා තිබෙනවා. මෙතැනදී දෙවිධියකට වන්දි ලබා දෙනවා. පළමුවැනි වටයේදී ගෘහ භාණ්ඩ වන්දිය විධියට රුපියල් 10,000ක් සහ දෙවැනි වටයේදී රුපියල් 15,000ක් හම්බවෙලා, තුන්වැනි වටයේදී නිවාස වන්දිය නොලැබුණු අය ඉන්නවා. ඒ වාගේම රුපියල් 10,000 හම්බවෙලා, රුපියල් 15,000 වන්දිය නොලැබුණු කොටසක් ඉන්නවා. ඊළඟට, විශේෂයෙන්ම කිසිදු වන්දි මුදලක් නොලැබුණු අය වශයෙන් තව කොටසක් ඉන්නවා. අභියාචනා 3,000ක් පමණ ප්‍රමාණයක් තමයි ලැබෙන්න ඕනෑ කියා අපිත් දන්නවා. හැබැයි, 20,000ක් ඉල්ලීම් කර තිබෙනවා. මොකද, ආණ්ඩුව ලක්ෂ ගණන් නිකම් ගෙවන නිසා තව ටිකක් නිකම් ගන්න බලාගෙන තමයි එහෙම කර තිබෙන්නේ. එම ගංවතුර ඇතිවෙලා දැන් අවුරුදු දෙකකට වැඩි නිසා, ඇත්තටම අසාධාරණයට ලක් වුණු අයට මෙම වන්දි මුදල ඉක්මනටම ලබාදෙන්න පුළුවන් කොයි කාල වකවානුවේද කියා මම ඔබතුමාගෙන් අහන්න කැමැතියි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
අදාළ අංශ සමඟත් කථා කරලා මේ පිළිබඳව සාකච්ඡා කරමු, ගරු මන්ත්‍රීතුමනි.

ගරු එස්.එම්. මරික්කාර් මහතා
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට සම්බන්ධ නැති වුණත් ගරු අගමැතිතුමාගෙන් මගේ දෙවන අතුරු ප්‍රශ්නය විධියට මේ කාරණය අහන්න කැමතියි. "ද නිව්යෝර්ක් ටයිම්ස්" පුවත්පතේ වාර්තා කරලා තිබුණා, ජනාධිපතිවරණය ආසන්නයේදී ඩොලර් මිලියන 7.6ක් හිටපු ජනාධිපතිතුමාගේ මැතිවරණ ව්‍යාපාරයට ලබා දුන් බව. එයින් T-shirtsවලට මෙච්චරයි; සාරිවලට මෙච්චරයි; අරලිය ගහ මන්දිරයට වෙක් දුන්නේ මෙච්චරයි; අරකට-මේකට මෙච්චරයි කියලා විමර්ශනාත්මක ලිපියක් තිබුණා. ගරු අගමැතිතුමනි, මේ සම්බන්ධවත් අර Bond Commission එක පත් කළා වාගේ කොමිසමක් පත් කරලා, විභාග කරන්න ආණ්ඩුව කටයුතු කරනවාද නැද්ද කියලා දැන ගන්න කැමතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක අදාළ ප්‍රශ්නයක් නොවෙයි. නමුත් ගරු අගමැතිතුමා කැමැති නම් පමණක් ඊට පිළිතුරු දෙන්න පුළුවන්.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගරු කථානායකතුමනි, ඒ ප්‍රශ්නය අදාළ නැහැ නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අගමැතිතුමා. [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඔබතුමන්ලාට මොකක් හෝ කියන්න ඕනෑ නම්, කියන්න පුළුවන්. [බාධා කිරීම්] රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා විසින් පොලීසියට කරන ලද පැමිණිල්ලක් අනුව පොලීසිය මේ කාරණය විභාග කරගෙන යන්න CID එකට භාරදීලා තිබෙනවා. ඒ ගැන විභාග කරලා, ඊට පසුව ඒ අදාළ පියවර ගන්නම්. ඒ වාගේම 'ද නිව්යෝක් ටයිම්ස්' පුවත්පතේ කර්තෘ ප්‍රකාශ කරලා තිබෙනවා, ඒ මාධ්‍යවේදීන්ට තර්ජනය කරලා තිබෙනවා කියලා. මේක හොඳ නැහැ. මේ රටේ හිටපු මාධ්‍යවේදියෙක් වූ

එක්නැළිගොඩ මැරුවා. [බාධා කිරීම්] මේක තමයි පුරුද්ද. ලසන්ත වික්‍රමතුංග මැරුවා; කීත් නොයාර්ට ගැහුවා; උපාලි තෙන්නකෝන්ට ගැහුවා. [බාධා කිරීම්] දැන් වෙලා තිබෙන දේ කොච්චර ලොකුද කිව්වොත්, මේවා කළේ ආණ්ඩුවේ ඉඳගෙන. දැන් විපක්ෂයේ ඉඳගෙන කියනවා, ද නිව්යෝර්ක් ටයිම්ස් එකට අපි ගහනවා කියලා. [බාධා කිරීම්] ඒක වැරැදියි. ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරනවා නම්, කරුණාකරලා ඒ කරපු තර්ජනය ඉල්ලා අස් කර ගන්න. මාධ්‍ය මේ ගැන පියවර ගනියි කියලා මම බලාපොරොත්තු වෙනවා. නැත්නම් මෙයින් වෙන්නේ ලංකාවේ නම නැති වෙන එකක්. [බාධා කිරීම්] ඔබතුමා මාධ්‍යවේදියෙක්. ඔබතුමා මාධ්‍යවේදියෙකු හැටියට ක්‍රියා කරන්න. මගෙන් අහන්නේ?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. මීළඟ ප්‍රශ්නය ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා.

ගරු මන්ත්‍රීවරු
(මාණ්පුමිකු උරුප්පිනර්කළ්)
(Hon. Members)
මේ රටේ අගමැතිගේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් කට්ටළෙප්පඩි අකට්රප්පට්ටුල්ළතු]
[Expunged on the order of the Chair.]

[බාධා කිරීම්] ඉල්ලන් කෑවා. ලජ්ජයි, ලජ්ජයි. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
Order, please! ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා, ප්‍රශ්නය අහන්න.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(මාණ්පුමිකු ටලස් අழහප්පෙරුම)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් ප්‍රශ්න අසන වටයේදී මා අසන ප්‍රශ්නය මෙයයි.

2017 සැප්තැම්බර් මාසයේ පළාත් සභා තුනක (03) කාලය දීර්ඝ කිරීම සඳහා ආණ්ඩුව විසින් ගන්නා ලද උත්සාහය ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ව්‍යර්ථ කරනු ලැබුවේ අප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතර බව මැනවින් ආරක්ෂා කරමිනි. එහෙත්, තම උත්සාහය අත් නොහළ ආණ්ඩුව දින කිහිපයක් ඇතුළත සකස්කොට ගත් නව මැතිවරණ ක්‍රමයක් සහ කාරක සභා අවස්ථාවේ ඇතුළත් කරනු ලැබූ සංශෝධන කිහිපයක් හරහා පළාත් සභා තුනක (03) මැතිවරණ කල් දැමීමට තාක්ෂණික පියවර කිහිපයක් ගනු ලැබිණි. ඒ අනුව, උතුරු මැද, සබරගමුව සහ නැඟෙනහිර පළාත් සභා මැතිවරණ කල් දමා අදට මාස නවයක (09ක) කාලය ඉක්ම ගොස් තිබේ.

2017 සැප්තැම්බර් 20වෙනි දින පැවති පළාත් සභා මැතිවරණ (සංශෝධන) පනත පිළිබඳ විවාදයේදී ගරු අග්‍රාමාත්‍යවරයා විසින් මෙම උත්තරීතර සභාවට සහතික කරනු ලැබුයේ 2018 මාර්තු මාසය වන විට එකී මැතිවරණ පැවැත්වීමේ මූලික පියවර ගන්නා බවයි. එහෙත්, අවම වශයෙන් සීමා නිර්ණය ජාතික කමිටුව සකස් කරනු ලැබූ නව සීමා නිර්ණය පිළිබඳ වාර්තාවට අදාළ විවාදය පැවැත්වීමටද ආණ්ඩුව අසමත් වී තිබේ. ඉදිරි දින අසූවක (80) කාලය තුළ උතුර, මධ්‍යම සහ වයඹ පළාත් සභා තුනද විසිරුවා හැරීමට නියමිතය. මැතිවරණ නොපැවැත්වීමෙන් රටේ ප්‍රජාතන්ත්‍රවාදය සාතනය වන බැව් ස්වාධීන මැතිවරණ කොමිසම විසින්ද, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන විසින්ද තහවුරුකොට ඇත.

එහෙත්, අවාසනාවකට මෙන් පළාත් සභා මැතිවරණ පැවැත්වෙන්නේ කවදා ද යන පැනයට නිශ්චිතව පිළිතුරු දීමට රාජ්‍ය නායකයා ලෙස අතිගරු ජනාධිපතිතුමා ද, උත්තරීතර ලෙස පිළිගන්නා පාර්ලිමේන්තුව ද, විෂය භාර ගරු අමාත්‍යවරයා ද, ස්වාධීන මැතිවරණ කොමිසම ද මේ මොහොතේ අපොහොසත්ය. එම නිසා ප්‍රජාතන්ත්‍රවාදයට හා ජනතා පරමාධිපත්‍යයට ඇති ගරුත්වය පෙරදැරිව, ආණ්ඩුවේ ප්‍රධානියා වන ගරු අගමැතිතුමාගෙන් ඉල්ලා සිටින්නේ, පළාත් සභා මැතිවරණ පැවැත්වෙන නිශ්චිත කාල වකවානුව අවම වශයෙන් ඔබතුමා හෝ දන්නවා නම් රට හමුවේ අනාවරණය කරන ලෙසයි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව විධායකයේ ප්‍රධානියා ජනාධිපතිතුමායි. විශේෂයෙන්ම පසුගිය අවුරුද්දේදී ප්‍රාදේශීය සභා හා නගර සභා ඡන්ද ක්‍රමය පිළිබඳව අපට එකඟ වෙන්න අවස්ථාව ලැබුණා. මෙතැනදී එකඟ වුණාට පසුව අපි සාකච්ඡා කළේ ඒ ක්‍රම අනුවම පළාත් සභා ඡන්දත්, ඊට පස්සේ පාර්ලිමේන්තු ඡන්දත් ඒ සමඟම පවත්වන්නයි. ඒ නිසයි මේ පනත ඉදිරිපත් කළේ. නමුත්, ප්‍රාදේශීය සභා හා නගර සභා ඡන්දවල අත් දැකීම තිබෙන්නේ බොහෝ දුරට ස්ථාවර පාලනයක් ඇති කරන්න පුළුවන් ද, නැද්ද කියන එකයි. ඒ ක්‍රමවේදයේත් අඩු පාඩුකම් තිබෙන නිසා බොහෝ දෙනෙක් කථා කළේ මෙයින් ස්ථාවරභාවය තියෙයි ද, හානියක් ඇති වෙයිද කියලයි. විශේෂයෙන්ම මෙය අපේ පළාත් සභාවලට බලපානවා.

මේ පළාත් සභා ඡන්දය අපි පවත්වන්න ඕනෑ. මොකද, මේ අවුරුද්දෙත් තව පළාත් සභා තුනක නිල කාලය අවසන් වෙනවා. ඒ සම්බන්ධයෙන් මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා එක්කත් අප කථා කළා. ජනාධිපතිතුමාත් ප්‍රකාශ කර තිබෙනවා, පළාත් සභා ඡන්දය පවත්වන්න වුවමනායි කියලා. එතෙක් අපට නව සීමා නිර්ණය පිළිබඳ වාර්තාවට අදාළ විවාදය පාර්ලිමේන්තුවේ පටන් ගන්න බැහැ. ගරු කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් ඔබතුමා එක්කත් සාකච්ඡා කළා. ඒ විවාදය ආරම්භ කරන්න ප්‍රථමයෙන් මේ ඡන්ද ක්‍රමය ගැන සාකච්ඡා කරන්න ඕනෑ. මොකද, දැන් බොහෝ දෙනකුගේ මතයක් තිබෙනවා, අපි ප්‍රාදේශීය සභා ඡන්දයේදී අනුගමනය කළ ක්‍රමය පළාත් සභා ඡන්දයේදී අනුගමනය කළොත්, ස්ථාවර පාලන ක්‍රමයක් ඇති කරන්න බැරි වේවි කියලා. මේ ගැන පක්ෂවල විවිධ මත තිබෙනවා. ඒ නිසා සමහර පක්ෂ දැන් තීරණය කර තිබෙනවා, තාවකාලිකව පැරණි ක්‍රමයට යන්න. "ඊළඟ ඡන්දයෙන් පසුව අලුත් ක්‍රමයක් ගැන බලලා ක්‍රියාත්මක කරමු" කියලා කියනවා. සමහර පක්ෂවල තවම ඒ ගැන තීරණයක් ගන්න තිබෙනවා. මට පෙනෙන විධියට ඊළඟ පාර්ලිමේන්තු ඡන්දයේදීත් මේ ක්‍රමය වෙනස් කරන්න බැරි වෙනවා. මොකද, වෙන් කිරීම් කරලා අලුත් ක්‍රමයකට යාමේදී ප්‍රශ්නයක් ඇති වෙනවා. ඒ නිසා සමහරුන් කියන්නේ, පාර්ලිමේන්තු ඡන්දය පැවැත්වූ ක්‍රමයම පළාත් සභා ඡන්දයේදීත් අනුගමනය කරන්න කියලයි. සමහර අය කියනවා, ප්‍රාදේශීය සභා ඡන්දය පැවැත්වූ ක්‍රමයට යමු කියලා. මේ ගැන එක් එක් පක්ෂවල විවිධ මත තිබෙනවා. පක්ෂ ගණනාවක් දැන් තීරණයකට ඇවිත් තිබෙනවා. ගරු කථානායකතුමනි, ඉතිරි පක්ෂවලිනුත් හෙට අනිද්දා වන විට තීරණයක් ගත්තාම ඔබතුමාත්, අපත් හමු වෙලා සාකච්ඡා කරලා ඉදිරියේදී මේ සම්බන්ධයෙන් නීති සංශෝධනයක් වුවමනා නම් ඒවා

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

සංශෝධනය කරලා මේ ගැන විවාදය පවත්වන්න අපි බලාපොරොත්තු වෙනවා. පක්ෂවල එකඟත්වයකට ඒමයි අවශ්‍ය වන්නේ. සාකච්ඡා කරලා ඒ තීරණ ගන්න තිබෙනවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳ විවාදය 2017 සැප්තැම්බර් මාසයේ 20වැනි දා පැවැත්වෙන කොට, එදින අපර භාග 3.53ට ගරු අගමැතිතුමා මේ සභාවට සහතිකයක් දුන්නා.

ගරු අගමැතිතුමනි, 2017 සැප්තැම්බර් 20වන දින හැන්සාඩ් වාර්තාවේ තීරු අංක 305හි ඔබතුමා මෙසේ කියනවා:

"…. විශේෂයෙන්ම මම මෙතැනදී එක කාරණයක් සඳහන් කරන්න ඕනෑ. මාර්තු මාසය අවසන් වෙන්න කලින් අපි ක්‍රියා කරනවා, අපි බලාපොරොත්තු වනවා, පළාත් සභා තුනේ මැතිවරණත්, පළාත් පාලන ආයතනවල මැතිවරණත් සියල්ලම අවසන් කරන්න. …."

ගරු අගමැතිතුමා මේ මොහොතේ කරන ලද ප්‍රකාශයත් එක්ක ඊට ආනුෂංගික තව කරුණු කීපයක් තිබෙනවා, ගරු කථානායකතුමනි.

පළමුවෙනි කාරණය, පනත ප්‍රකාරව විෂය භාර ඇමතිතුමා වන ෆයිසර් මුස්තාපා මැතිතුමා මාර්තු මාසයේ 06 වැනි දා සීමා නිර්ණය ජාතික කමිටුවේ වාර්තාව සභාගත කරනවා. තමන්ට වාර්තාව ලැබිලා දින 14ක් ඇතුළත එය සභාගත කළ යුතු නිසා එතුමා එම වාර්තාව සභාගත කරනවා. ගරු කථානායකතුමනි, ඒ වාර්තාව සභාගත කළ දින සිට දින 30ක් ඇතුළත එම වාර්තාව විවාද කළ යුතුව තිබෙනවා. ගරු අගමැතිතුමනි, එතකොට ගරු කථානායකතුමා මාර්තු මාසයේ 19 වෙනි දා න්‍යාය පත්‍රයේ සඳහන් කරලා තිබුණා, මේ වාර්තාව විවාදයට ගන්නා බව. එහෙම සඳහන් කරලා තිබියදී ගරු සභානායකතුමා අවසන් මොහොතේ එය ආණ්ඩුවේ අවශ්‍යතාවක් මත ඉවත් කර ගන්නා බව දැනුම් දුන්නා. ඉන් අනතුරුව තිබෙන්නේ ගරු අගමැතිතුමා නායකත්වය දරන සමාලෝචන කමිටුව විසින් ඒ පිළිබඳව තීන්දුවක් ගැනීමයි. ලබන සතිය වනකොට මේ වාර්තාව සභාගත කරලා මාස තුනක් ගත වනවා.

ගරු අගමැතිතුමනි, ඔබතුමා දැන් කරන ප්‍රකාශයෙනුත්, මේ සියලු කාරණාවලිනුත් අපට පෙනෙන්නේ පළාත් සභා මැතිවරණය දින නියමයක් නැතිව කල් දැමීම සඳහා ආණ්ඩුව තුළ වැඩ පිළිවෙළක් තිබෙන බවයි. ආණ්ඩුව එසේ ක්‍රියා කරන්නේද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

පළාත් සභා මැතිවරණය දින නියමයක් නැතිව කල් දමන්න අපට චුවමනාවක් නැහැ. ගරු මන්ත්‍රීතුමනි, පසුගිය අවුරුද්දේ නොවැම්බර් මාසයේ අග හෝ දෙසැම්බර් මාසයේ ප්‍රාදේශීය සභා, නගර සභා මැතිවරණ පවත්වන්න අපි බලාපොරොත්තු වුණු බව ඔබතුමාත් දන්නවා.

ඒත් ඒක ප්‍රමාද වුණා. එය ඒ ක්‍රමය අනුව පැවැත්වූවා නම් ඒ දිහා බලා මාර්තු මාසය ගැන තීරණයක් ගන්න අපට අවස්ථාවක් තිබුණා. එහෙත් අප කිව්වේ එය ක්‍රියාත්මක කරලා අද්දැකීම් අනුව ඉදිරියට යන්න කියලා. කෙසේ හෝ ඒ මැතිවරණය පැවැත්වූවාට පසුව පෙබරවාරි මාසයේත් අපට කාලය තිබුණේ නැහැ. මා නොවෙයි, මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා කිව්වා, "ඒක කරන්න බැහැ. කාලය මදි" කියා. එහෙම නම් අඩු ගණනේ සිංහල අවුරුද්ද අවසන් වුණාමයි එය කරන්න තිබුණේ. ඒ අවස්ථාවේදී තමයි මේ ප්‍රශ්නය ආවේ. මේ ප්‍රශ්නය අපි කල් දැමීමේ, පක්ෂ නායකයන් එකඟ වෙන්න ඕනෑ කියපු නිසායි. ගරු කථානායකතුමනි, පක්ෂ නායකයෝ ඔබතුමාත් හමු වෙලා කතා කළා. ඔබතුමා මට කතා කළා. මමත් දැන් පක්ෂ නායකයන්ට කතා කර තිබෙනවා. මා හිතන්නේ ඉතිරි පක්ෂත් තීරණය කරාවි, මොකක්ද කරන්නේ කියා. එවිට අපට පුළුවන් ඉදිරියට යන්න. මොකද, අපේ කමිටුවත් දැනගන්න ඕනෑ, පක්ෂ නායකයන්ගේ අදහස් මොනවාද කියා. මම බලාපොරොත්තු වෙනවා, එන සතියෙන් පසුව ආපසු පක්ෂ නායකයන් මුණ ගැසී ඒ පිළිබඳව අන්තිම තීරණය දැන ගන්න. ඊට පසුව අපට පුළුවන් ඉදිරියට ක්‍රියා කරන්න. අපට මැතිවරණය කල් දමන්න වුවමනා නැහැ. මම මුණ ගැසී තිබෙනවා, මැතිවරණ කොමිෂන් සභාවේ සභාපතිතුමා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)

ගරු කථානායකතුමනි, ඒ පනතට ඔබතුමා අත්සන් කරලායි තිබෙන්නේ. එය රටේ බලාත්මක නීතියක්. ගරු අගමැතිතුමනි, පක්ෂ නායකයන් මුණ ගැසී නැවත සාකච්ඡා කිරීම ප්‍රජාතන්ත්‍රවාදයේ ලක්ෂණයක්. අපි එය පිළිගන්නවා. නමුත් ඒ නීතිය ක්‍රියාත්මක කිරීමේ වගකීම තිබෙන්නේ ඔබතුමාගේ අතේයි, ගරු කථානායකතුමනි. එය මේ රටේ බලාත්මක නීතියක්. ගරු කථානායකතුමනි, පළාත් සභා මැතිවරණය කල් දමන්න බැහැ කියන තීන්දුව ශ්‍රේෂ්ඨාධිකරණය දුන්නාට පසුව තමයි හදිසියේ, කඩිමුඩියේ ඒ පනත් කෙටුම්පත සම්පාදනය වුණේ. ඒ දුර්වලතාව තිබෙන බව අපි පිළිගන්නවා. අපි දන්නවා, ඒ පනත් කෙටුම්පත සම්මත කිරීමේ අවස්ථාවේදී ඔබතුමා අපහසුවට පත් වෙලා පැය ගණන් මේ සභාවේ කාලය දීර්ඝ කරගෙන එදා මෙතැන වූ දේ. හැබැයි ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමා දැන් පාර්ලිමේන්තුවට සහතිකයක් දුන්නා, මේ වර්තමාන තත්ත්වය යටතේ පාර්ලිමේන්තු මැතිවරණය කොටියාස ක්‍රමය අනුව පවත්වන්න බැහැ කියා.

පරණ ක්‍රමයටම තමයි මැතිවරණය පවත්වන්න වෙන්නේ කියලා එතුමා ඉතා පැහැදිලිව කිව්වා. එහෙම නම් ඊළඟ විකල්පය විය යුත්තේ පරණ ක්‍රමයටම මැතිවරණය පැවැත්වීමයි. ගරු කථානායකතුමනි, ගරු අගමැතිතුමනි, ක්‍රමයට වඩා වැදගත් වන්නේ මැතිවරණය පැවැත්වීමයි. ඒක ජනතාවගේ අවශ්‍යතාවක්. මැතිවරණ කොමිසමේ ඇතැම් අයගේ මතය අනුව නම්, තනි පරිච්ඡේදයකින් යුත් පනතකින් ඒක කරන්න පුළුවන්, ගරු අගමැතිතුමනි. ඒ නිසා අඩු ගණනේ මැතිවරණය ඒ ආකාරයෙන් හෝ පවත්වන දින වකවානු ඔබතුමා මේ ගරු සභාවට ප්‍රකාශ කරන්නේද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

මම පක්ෂ නායකයින් මුණ ගැහෙන්න ඕනෑ. ඔබතුමාගේ පක්ෂ නායකයනුත් ඉන්නවා. අපි ඒ අය මුණගැහිලා ඒ ගැන දැනුම් දෙන්නම්. මේක මම තනිවම කරන එකක් නොවෙයි. මහ මැතිවරණය පවත්වන කාලය වන විට අලුත් ක්‍රමයට යන්න

අපහසුයි කියන එකයි, සාමාන්‍යයෙන් පක්ෂ නායකයින්ගේ අදහස. මේ ක්‍රමය සම්පූර්ණයෙන්ම වෙනස් කරලා මහ මැතිවරණයට යන්න පක්ෂ නායකයින් ලැහැස්ති නම් මට ප්‍රශ්නයක් නැහැ. මම මෙතන ප්‍රකාශ කළේත්, පක්ෂ නායකයින්ගේ එකඟත්වය අවශ්‍යයි කියන එකයි. මොකද, මේ ඡන්ද ක්‍රමය මට තනිවම ඇති කරන්න පුළුවන් දෙයක් නොවෙයි. ඒ නිසා මම නැවතත් පක්ෂ නායකයින් මුණ ගැහෙන්න ඕනෑ. ගරු කථානායකතුමනි, මේ ගැන ඔබතුමාත් දන්නවා. අපි මේ මැතිවරණය පවත්වන්නේ කොහොමද කියන එක ගැන ඔබතුමාත් සාකච්ඡා කළා; මමත් සාකච්ඡා කළා. අපි මේ මැතිවරණය පවත්වන්න ඕනෑ. මොකද, රටේ ජනතාවත් අහනවා පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය වෙනස් කරන්නේ නැත්නම් මේ මැතිවරණ ක්‍රමය වෙනස් කරන්න වුවමනා ඇයි කියලා. තවත් පැත්තකින් කියනවා, අපි යම්කිසි අන්දමකින් මේ ක්‍රමයේ සංශෝධනයක් කළ නිසා කොටියාස ක්‍රමයට මැතිවරණය පවත්වන්න කියලා. අපි ඒ ගැන සාකච්ඡා කරලා යම්කිසි එකඟත්වයකට එන්න ඕනෑ. එච්චරයි කරන්න තිබෙන්නේ. පක්ෂ නායකයන් එක්ක සාකච්ඡා කරලා වැඩ කරන්න අපහසු නම්, වෙන මොකක්ද කරන්නේ කියා මම දන්නේ නැහැ. මගේ නම් ප්‍රතිපත්තිය වෙලා තිබෙන්නේ පක්ෂ නායකයන් එක්ක සාකච්ඡා කිරීමයි. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමනි, පොඩ්ඩක් ඉන්න. මටත් පොඩි පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි. අන්තිමටම තිබුණු පක්ෂ නායක රැස්වීමේදීත් මැතිවරණ ක්‍රමවේදය සම්බන්ධයෙන් එකඟත්වයකට එන්න බැරි වුණා. ඒ පිළිබඳව මත දෙකක් තිබුණා.

ඒක තමයි අපි කල්පනා කළේ. මේ සම්බන්ධයෙන් සිකුරාදා සාකච්ඡා කරන කොට අපට යම්කිසි මතයකට එන්න පුළුවන් කියා මම විශ්වාස කරනවා. ඒ නිසා අපි සිකුරාදා මේ ගැන කථා කරමු. ඊට පසුව මේ ගැන තීරණයකට එන්න පුළුවන් වෙයි. [බාධා කිරීමක්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
හරි, ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලා තීරණයකට එන්න. මගෙන් අහන්නේ මොකටද? ඕනෑ නම් මට එක්සත් ජාතික පක්ෂයේ තීරණය කියන්න පුළුවන්. [බාධා කිරීම්] පක්ෂ නායකයින්ගේ තීරණය ඕනෑ. මේ වන විට එක්සත් ජාතික පක්ෂයේ තීරණය අරගෙන ඉවරයි; එක්සත් ජාතික පෙරමුණේ තීරණයත් අරගෙන ඉවරයි. ඔබතුමන්ලා තීරණය කරලා කියන්න. එච්චරයි. [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඩලස් අලහප්පෙරුම මැතිතුමා, ඔබතුමා කියන්න.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(මාණ්පුමිකු ඩලස් අழහප්පෙරුම)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, මැතිවරණ පැවැත්වීම පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා සහ ගරු අගමැතිතුමා අතර එකඟතාවක් නොමැතිකම නිසාවෙන් මෙසේ කල් යනවාය කියන ප්‍රශ්නයක් තිබෙනවා. [බාධා කිරීම්]

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්පුමිකු உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
මණ්ඩලේ කවල්.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(මාණ්පුමිකු ඩලස් அழහප්පෙරුම)
(The Hon. Dullas Alahapperuma)
අපි අහන්නේ දැනගන්නයි.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අපට සිකුරාදාට මතය දැනගන්න පුළුවන් නේ. සිකුරාදා මතය දැනගෙන,- [බාධා කිරීම්]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංඝ)
(The Hon. Ranil Wickremesinghe)
ඒකට මම මොනවා කරන්නද?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
සිකුරාදාට සාකච්ඡා කරලා අපි අදහස් ප්‍රකාශ කරමු.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මැතිතුමා.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(මාණ්පුමිකු இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ பிரதம அமைச்சர் அவர்களே, நாட்டில் கிட்டத்தட்ட 55,000 வேலையற்ற பட்டதாரிகள் இருக்கின்றார்கள். தங்களுடைய அரசாங்கம் கிட்டத்தட்ட 5 முறை அவர்களை விண்ணப்பிக்கும்படி கோரியிருக்கின்றது. அவ்வாறு 5 முறை அவர்கள் விண்ணப்பித்தும் அவர்களுக்குரிய நியமனங்கள் இன்னும் வழங்கப்படவில்லை. குறிப்பாக, ஜனாதிபதிகூட ஒருமுறை online மூலம் பட்டதாரிகளை விண்ணப்பிக்கும்படி கூறியிருந்தார். அதனடிப்படையில் பட்டதாரிகள் விண்ணப்பிப்பதற்காகத் திணைக்களம் திணைக்களமாக அலைந்துகொண்டிருக்கின்றார்கள். அண்மையில் தங்களுடைய அமைச்சால் 20,000 பட்டதாரிகளுக்கு அபிவிருத்தி உத்தியோகத்தர் நியமனம் வழங்குவதாக அறிவித்திருந்தீர்கள். அதன்பின்பு அவர்களுக்கு நேர்முகத் தேர்வு நடைபெற்றது. அந்த நேர்முகத் தேர்வில் அவர்களுக்குப் புள்ளிகள் வழங்கப்பட்டன. புள்ளி வழங்கலின்போது சம்பந்தப்பட்டவர் தன்னுடைய கிராம அபிவிருத்திச் சங்கத்தினுடைய தலைவராக இருந்தாரா? பொதுப்பணிகளில் ஈடுபட்டிருந்தாரா? என்று எல்லாம் கேட்கப்பட்டு, அவ்வாறான விடயங்களுக்கெல்லாம் புள்ளிகள் இடப்பட்டன. ஆனால், கௌரவ பிரதம அமைச்சர் அவர்களே, அந்தப் பட்டதாரிகளுக்குப் புள்ளி அடிப்படையல்லாமல், பட்டம் பெற்ற ஆண்டின் அடிப்படையில் நியமனங்கள் வழங்கப்பட வேண்டும். கடந்த 2012ஆம் ஆண்டு மார்ச் மாதம் 31ஆம் திகதி வரை பல்கலைக்கழகங்களிலிருந்து வெளியேறிய பட்டதாரிகளுக்கு ஏற்கனவே நியமனங்கள் வழங்கப்பட்டிருக்கின்றன. ஆனால், தற்பொழுது புள்ளிரீதியான நியமனங்கள் வழங்கப்படுகின்றபோது, அந்த நியமனம் அரசியல் ரீதியான நியமனமாக இருக்குமோ என்ற சந்தேகம் பட்டதாரிகள் மத்தியில் பரவலாக இருக்கின்றது; எனக்கும்கூட அந்தச்

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

සන්තේකම් இருக்கின்றது. ஆகவே, கௌரவ பிரதம அமைச்சர் அவர்களே, அவர்களுக்கு ஆண்டு அடிப்படையில் நியமனங்கள் வழங்கப்பட வேண்டும். நீங்கள் முதலில் 5,000 பேருக்கு நியமனம் வழங்கவிருக்கின்றீர்கள். அந்த நியமனங்களை 2012, 2013ஆம் ஆண்டுகளில் பட்டம் பெற்ற பட்டதாரிகளுக்கு வழங்கும்படியும், அதன்பின்பு வழங்கப்படும் 15,000 நியமனங்களை 2014, 2015, 2016ஆம் ஆண்டுகளில் பட்டம் பெற்ற பட்டதாரிகளுக்கு வழங்குமாறும் கேட்டுக்கொள் கின்றேன். அப்போதுதான் அவை அரசியல் ரீதியான நியமனங்களாக இல்லாமல், நாட்டிலிருக்கின்ற அனைத்து வேலையற்ற பட்டதாரிகளையும் அவர்கள் கற்ற கல்விக்கேற்ப உள்வாங்கும் நடவடிக்கையாக அமையும். அதேநேரத்தில், அவர்களுடைய வயதெல்லையை 45 ஆக அதிகரிக்க வேண்டுமென்றும் கௌரவ பிரதம அமைச்சர் அவர்களிடம் கேட்டுக்கொள்கின்றேன்.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා සඳහන් කරලා තිබෙන්නේ උපාධිධාරී පත්වීම් පිළිබඳවයි. උපාධිධාරීන් පත් කිරීමේදී ඒ අය තේරීම සඳහා අපි ලකුණු ක්‍රමයක් අනුමත කරලා තිබුණා. එම ලකුණු ක්‍රමය අනුව එක් එක් කාරණාවට ලකුණු ලබා දුන්නා. ගරු මන්ත්‍රීතුමාත් ඒ ගැන සඳහන් කළා. ඒ අනුව තමයි අපි ක්‍රියා කරලා තිබෙන්නේ. එතුමාගේ ඉල්ලීම් දෙකෙන් එකක් වන්නේ විශ්වවිද්‍යාලයෙන් පිට වුණු වර්ෂය අනුව පත්වීම් ලබා දෙන්න කියන එකයි. එහෙම කරන්න ගියොත් ඒක මේ ලකුණු දෙන ක්‍රමයට පටහැණි වෙනවා. එහෙම නම් මේ කටයුත්ත අලුතෙන් කරන්න වෙනවා. එතකොට තවත් කල් යනවා. ඒ නිසා දැන් තෝරන විධියටම තෝරලා, අනාගතයේදී අපට මේ කාරණය ගැන අවධානය යොමු කරන්න පුළුවන්. ඉල්ලීම අනුව, බඳවා ගැනීමේ උපරිම වයස් සීමාව අවුරුදු 45ට වැඩි කරන එක අපි කරලා තිබෙනවා. උපරිම වයස් සීමාව අවුරුදු 45 දක්වා වැඩි කිරීමට අපි 2018 ජූනි මාසයේ තීරණය කළා. ඒ අනුව එම කාරණය ඉෂ්ට කර තිබෙනවා. නැත්නම්, we will have a problem about the criteria. You cannot change the criteria after this has been done. That is the problem that we have.

ඊළඟට, රියදුරු සහ කාර්යාල කාර්ය සහායක පුරප්පාඩු පිළිබඳව ගරු මන්ත්‍රීතුමා අහලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම අපේ තිබෙන ක්‍රියා පටිපාටිය අනුව දැන් ඒ තෝරා ගැනීම් දිස්ත්‍රික්ක පදනමින් කරන්න බැහැ, ජාතික මට්ටමින් ඒ තෝරා ගැනීම් කළ යුතුයි.

මා යාපනයට ගොස් පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා, පළාත් සභා මන්ත්‍රීතුමන්ලා මුණ ගැසුණු අවස්ථාවේදී ඒ ප්‍රශ්නය නිසා යාපනයට ඇති වන විපාක මොනවාද කියලා එතුමන්ලා ප්‍රකාශ කළා. රියැදුරු, කාර්යාල කාර්යය සහායක පුරප්පාඩු පවතින සමහර දිස්ත්‍රික්කත් සඳහන් කර තිබෙනවා. ඒ දිස්ත්‍රික්කවලට ප්‍රමුඛතාවක් දෙන්නේ කොහොමද කියලා බලලා, අපි ඒ ගැනත් කැබිනට් මණ්ඩලයේදී සාකච්ඡා කරන්නම්.

As it stands now, recruitment is for all-island. We cannot confine it to one district. But the problem that arises in certain districts, including Jaffna, came up when I went there last time. So, I am looking at how we can address it. It is a problem not only for Jaffna; some other districts also have the same issue. It is more acute in Jaffna because some of them cannot go outside for employment. So, we are looking into that.

Finally, for Jaffna, for the entire North, we have to create employment opportunities; we have to create new jobs. Without development, new income opportunities will not arise in the North. So, we are addressing that issue also.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ பிரதம அமைச்சர் அவர்களே, தாங்கள் பட்டதாரிகளுக்கான வயதெல்லையை 45 ஆக நீடித்திருப்பதாகக் கூறியமைக்காக நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். அதேநேரம் இந்தப் பட்டதாரி நியமனங்கள் எப்போது வழங்கப்படும் என்பதையும் நீங்கள் தெரிவிக்க வேண்டும்.

நீங்கள் சாரதி நியமனம் சம்பந்தமாகவும் குறிப் பிட்டிருந்தீர்கள். அதுபற்றித் தற்பொழுது நான் உங்களுக்கு விளக்கமாகக் கூறுகின்றேன். குறிப்பாக, மன்னார் மாவட்டத்தில் ஒரு குறிப்பிட்ட திணைக்களத்தில் சாரதிகள், labourers ஆகியோர் casual ஆக வேலைசெய்து கொண்டிருக் கின்றார்கள். அவ்வாறே KKS என அழைக்கப்படுகின்ற அலுவலக உதவியாளர்களும் 4 - 5 வருடங்களாக casual ஆக வேலைசெய்து கொண்டிருக் கின்றார்கள். என்றாலும், குறித்த சில அமைச்சர்கள் தங்களுடைய மாவட்டங்களைச் சார்ந் தவர்களுக்கு அத்தகைய நியமனத்தை வழங்குகின்றார்கள். இந்த நிலையில், அங்கு casual ஆக வேலை செய்தவர்கள் எங்களிடம் வந்து, "நாங்கள் இவ்வளவு காலமும் casual ஆக வேலை செய்தோம். தற்பொழுது நிரந்தர நியமனம் பெற்று காலியிருந்தும் குளியாப்பிட்டியிருந்தும் ஆட்கள் வருகின் றார்கள்" என்று கூறி, இதற்கு என்ன செய்வதென்று எங்களிடம் கேட்கிறார்கள். அதற்கு எங்களிடம் பதில் இல்லை. ஆகவே, கௌரவ பிரதம அமைச்சர் அவர்களே, தனிப்பட்ட ரீதியில் அமைச்சர்களால் பெற்றுக்கொடுக்கப்படுகின்ற driver, KKS, labourer போன்ற அத்தகைய வேலைவாய்ப்புக்களை வடக்கு, கிழக்கு மாவட்டங்களைச் சேர்ந்தவர்களுக்குக் கொடுங்கள்! அவர்கள் தமிழர்களாக இருக்கலாம்; முஸ்லிம்களாக இருக்கலாம்; சிங்களவர்களாக இருக்கலாம். அவற்றை அந்தந்த மாவட்டங்களைச் சேர்ந்தவர்களுக்கு வழங்க வேண்டுமென் பதுதான் என்னுடைய தாழ்மையான வேண்டுகோளாகும்.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

අපි දැන් ඒගැන තමයි අවධානය යොමු කරන්නේ. මේක උතුරේත්, අනෙක් සමහර දිස්ත්‍රික්කවලත් ගරු මන්ත්‍රීවරු මතු කරලා තිබෙන කාරණයක්.

ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා
(மாண்புமிகு இ. சார்ள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)

கௌரவ பிரமத அமைச்சர் அவர்களே, வடக்கு - கிழக்கு அபிவிருத்தி அதிகார சபையை உருவாக்குவதாகவும் கூறியிருந்தீர்கள். அது தொடர்பான ஒருசில நடவடிக்கைகளை எடுத்திருப்பதாகவும் நாங்கள் அறிந்தோம். அந்த North-East Development Authority எப்போது ஆரம்பிக்கப்படும்; அது தொடர்பாக என்னென்ன முயற்சிகளை எடுத்திருக்கின்றீர்கள் என்பதையும் நான் அறிய விரும்புகின்றேன்.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

අපි විශේෂයෙන්ම බලාපොරොත්තු වන්නේ, පරිපාලන වශයෙන් අධිකාරි ඇති කරන්නයි; දැනට ආණ්ඩුවේ අදාළ අංශත්, පළාත් සභාවේ අදාළ අංශත් සම්බන්ධීකරණය කරන්නයි. දැනට නැහෙනහිර පළාත් සභාව පිහිටුවා නැහැ. නමුත් අපි එය නැහෙනහිරත් ක්‍රියාත්මක කරනවා. අපි නීතියක් ගෙනෙනවා නම්, පළාත් සභාවත් එකඟ වෙන්න අවශ්‍යයි. ඕනෑ නම් ඒ ගැන මට මහ ඇමතිතුමාගෙන් අසා බලන්න පුළුවන්.

දැනට අගමැති කාර්යාලය යටතේ වෙනම කාර්යාලයක් ඇති කරලා තිබෙනවා. අපි දැනට නිලධාරින් කීපදෙනෙකුව එම කාර්යාලයට පත් කර තිබෙනවා. තවත් එක්කෙනෙකු හෝ දෙදෙනෙකු පත් කරන්නට බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම උතුරේ නිවාස ප්‍රශ්නය ගැන, සංවර්ධනය ගැන සාකච්ඡා කරන්න අපි නිලධාරින් පත් කර තිබෙනවා. මේ ගැන තවදුරටත් සාකච්ඡා කරන්න උතුර පළාතේ ගරු මන්ත්‍රීතුමන්ලාවත් කැඳවන්න මා බලාපොරොත්තු වනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Okay. Thank you.

මීළඟට, ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මන්ත්‍රීතුමා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මම ගරු අගමැතිතුමාගෙන් මෙම ප්‍රශ්නය අහනවා.

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ ආරම්භ කරන ලද, විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල - UPF - සඳහා මේ වන විට දායක වී ඇති විශ්වවිද්‍යාල සේවකයින් සංඛ්‍යාව කොපමණද?

(ii) මේ වන විට එම අරමුදලේ වටිනාකම කොපමණද?

(iii) 2015 සිට 2018 ජූනි 30 දක්වා එම අරමුදලේ මුදල් වාර්ෂිකව ආයෝජනය කළ ප්‍රමාණය, ආයෝජනය කළ ක්ෂේත්‍ර සහ ඊට ලැබුණු ආදායම වෙන් වෙන්ව දක්වන්නේද?

(iv) එම ආයෝජන සඳහා ගෙවූ බදු ප්‍රමාණයන් කොපමණද?

(v) 2015 සිට විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් මහ බැංකු බැඳුම්කරවල ආයෝජනය කර තිබේද? ඒ කවර ප්‍රාථමික ගැනුම්කරුවකු හරහාද?

(vi) එම ආයෝජනය මඟින් විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලට පාඩුවක් සිදු වී ඇද්ද? එසේ නම් එය කොපමණද?

(vii) 2014 සිට මේ දක්වා විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල මඟින් එහි සාමාජිකයන්ට ලබා දුන් පොලී අනුපාත කවරේද? එහි අඩුවීමක් තිබේ නම්, ඒ සඳහා හේතු කවරේද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත යටතේ ආරම්භ කරන ලද විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල - UPF - සඳහා 2018 ජනවාරි 01 වැනි දින වනවිට සේවකයින් 39,822ක් දායක වී තිබෙනවා. එයින් ක්‍රියාකාරී සාමාජිකයින් සංඛ්‍යාව 22,718ක් වන අතර, අක්‍රිය සාමාජික ගිණුම් ප්‍රමාණය 17,104ක් වෙනවා.

2018 ජනවාරි 01 වැනි දින වනවිට මෙම අරමුදලේ වටිනාකම රුපියල් මිලියන 37,027ක් වෙනවා. එනම්, රුපියල් බිලියන 37ක පමණ මුදලක්.

2015 සිට 2018 ජූනි 30 දක්වා මෙම අරමුදලේ මුදල් ස්ථාවර තැන්පතු, රජයේ බැඳුම්කර, රාජ්‍ය අංශයේ ණයකර හා කෙටි කාලීන තැන්පතු වශයෙන් ආයෝජනය කොට තිබෙනවා. එම ආයෝජන ප්‍රමාණයන්, ආයෝජන ක්ෂේත්‍ර, ලැබූ ආදායම හා එම ආයෝජන සඳහා ගෙවූ බදු මුදල් පිළිබඳ වාර්තාව ඇමුණුම වශයෙන් දක්වා තිබෙනවා. මම එම ඇමුණුම **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, 2015 වසරට පෙර සිටම විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලේ මුදල්, මහ බැංකු බැඳුම්කරවල ආයෝජනය කර තිබෙනවා. එසේම 2015 වර්ෂයේ සිටද මෙම ආයෝජන තරගකාරී මිල ගණන් කැඳවීමකින් පසුව ජාතික ඉතිරි කිරීමේ බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව, වෙල්ත් ට්‍රස්ට් සෙකියුරිටීස්, ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් හා කොමර්ෂල් බැංකුව මඟින් සිදුකර තිබෙනවා. වෙල්ත් ට්‍රස්ට් සෙකියුරිටීස්, ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් හා කොමර්ෂල් බැංකුව මඟින් සිදු කරනු ලබන ආයෝජන, ලංකා බැංකුවේ භාරකාර ගිණුම - Custodian Account- මඟින් පාලනය කරනු ලබනවා.

ගරු කථානායකතුමනි, මෙම කිසිදු බැඳුම්කර ආයෝජනයකින් විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලට පාඩුවක් සිදු වූ බවට වාර්තා වී නැහැ. සියලුම බැඳුම්කර ආයෝජන තරගකාරී මිල ගණන් කැඳවා ඇගයීමකට ලක් කර එදිනට වඩාත් වාසිදායක සපල පොලී - yield - අනුපාතයට අනුව ආයෝජනය කිරීම සාමාන්‍ය ක්‍රමවේදයයි.

2014 වසරේ සිට මේ දක්වා විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදල මඟින් එහි සාමාජිකයන්ට ලබා දුන් පොලී අනුපාත පහත පරිදි වනවා.

2014 - සියයට 15යි; 2015 - සියයට 11යි; 2016 - සියයට 11.3යි; 2017 - සියයට 10.5යි; 2018 - සියයට 10යි.

ගරු කථානායකතුමනි, 2012 හා 2013 වසරවලදී බැංකු පොලී අනුපාතිකය සියයට 14 සිට සියයට 19 දක්වා ඉහළ යාමත්, පෙර වසරවල ඉතුරු වී තිබුණු නොබෙදු ලාභ රුපියල් මිලියන 469ක් 2014 වසර සඳහා සාමාජිකයන් අතර බෙදා දීමත් නිසා 2014 වසරේ පොලී අනුපාතය සියයට 2.5කින් පමණ විශේෂ ඉහළ යාමක් සිදු වී තිබෙනවා.

ඉන් අනතුරුව මෙම පොලී අනුපාතයන් අඩු වීමට පහත හේතු බලපා තිබෙන බව විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මා වෙත වාර්තා කර තිබෙනවා.

1. 2015 සිට 2017 දක්වා බැංකු පොලී අනුපාත හා රජයේ බැඳුම්කර සඵල පොලී අනුපාතය - yield - ඉතා පහළ මට්ටමක පැවතීම.

2. 2012 සිට 2014 දක්වා අර්ථසාධක අරමුදල් ආයෝජනය කළ බැංකු පොලී අනුපාතය සියයට 15 සිට සියයට 19.35ක ඉහළ අගයක් පැවතීම හා එම පොලී අනුපාතයන් යටතේ කරන ලද ආයෝජන 2015 සිට 2017 දක්වා කාලය තුළ රුපියල් බිලියන 10.4ක් පමණ කල්පිරීම නිසා නව ආයෝජන අඩු පොලී අනුපාත යටතේ නැවත ආයෝජනය කිරීමට සිදු වීම.

**** කථාව අවසානයේ පළ කර ඇත.***
** உரையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of speech.*

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

3. 2018.04.01 දින සිට අර්ථසාධක අරමුදල සඳහා බදු අනුපාතිකය සියයට 10 සිට සියයට 14 දක්වා වැඩිවීම.

4. 2018.04.01 දින සිට රජයේ සුරැකුම්පත් ආදායම සඳහා වූ නාම මාත්‍ර බදු ඉවත් කිරීමත් සමඟ ඒ සඳහා වූ බදු සහනය අහිමි වීම; ඒ අනුව එම ආදායම සියයට 14 දක්වා බද්දකට යටත් වීම.

5. 2018.04.01 දින සිට ස්ථාවර තැන්පතු පොලී ආදායම සඳහා බදු අනුපාතය සියයට 14ක් දක්වා සියයට 6කින් වැඩි වීම.

**** සභාමේසය මත තබන ලද වාර්තාව:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட அறிக்கை:*
** Report tabled:*

ඇමුණුම

2015 සිට 2018 ජූනි 30 දක්වා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ වාර්ෂිකව ආයෝජනය කළ ප්‍රමාණය, ආයෝජනය කළ ක්ෂේත්‍ර හා ඊට ලැබුණු ආදායම

(I) ස්ථාවර තැන්පතු රු. 000

වර්ෂය / ආයෝජනය	2014	2015	2016	2017	2018 ජූනි 30 දක්වා
වර්ෂය අවසාන ශේෂය	10,595,500	8,200,000	7,190,000	10,740.000	11,055,000
පොලී ආදායම	**1,966,184**	**1,585,499**	**1,239,887**	**1,402,171**	**818,792**

(II) රජයේ බැඳුම්කර රු. 000

වර්ෂය / ආයෝජනය	2014	2015	2016	2017	2018 ජූනි 30 දක්වා
වර්ෂය අවසාන ශේෂය	7,996,216	9,343,271	13,977,201	13,692,910	15,086,141
බැඳුම්කර ආදායම	**695,364**	**1,059,870**	**1,442,965**	**1,404,336**	**741,174**

(III) රාජ්‍ය අංශයේ ණයකර රු. 000

වර්ෂය / ආයෝජනය	2014	2015	2016	2017	2018 ජූනි 30 දක්වා
වර්ෂය අවසාන ශේෂය	-	1,000,000	2,595,367	2,595,367	3,595,367
පොලී ආදායම	**-**	**13,808**	**129,131**	**327,886**	**188,196**

(IV) දෛනික මුදල් ශේෂය හා කෙටිකාලීන තැන්පතු රාජ්‍ය බැංකුවල ආයෝජනය කිරීමේ ආදායම

රු. 000

	2014	2015	2016	2017	2018 ජූනි 30 දක්වා
පොලී ආදායම	**9,355**	**17,101**	**38,539**	**22,883**	**23,782**

සටහන : 2018 වසරේ ජූනි 30 දක්වා ඉදිරිපත් කර ඇති තොරතුරු විගණනය නොකළ ගිණුම් මත පදනම් වේ.

එම ආයෝජන සඳහා ගෙවූ බදු ප්‍රමාණයන්

රු. 000

වර්ෂය	2014	2015	2016	2017	2018 (ඇස්තමේන්තුගත)
බදු රුපියල්	157,295	131,888	57,488	113,374	543,000

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි. රුපියල් බිලියන 37ක වටිනාකමක් තිබෙන විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලේ මුදල් විශේෂයෙන් ජාතික ඉතිරි කිරීමේ බැංකුව හරහා ශ්‍රී ලංකා මහ බැංකු බැඳුම්කරවල ආයෝජනය කිරීමේදී යම් පාඩුවක් සිදු වුණාය කියලා මේ දිනවල මාධ්‍ය විසින් වාර්තා කරනු ලැබ තිබෙනවා. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මේ මුදල් ආයෝජනය කරන්නේ තමන්ට වැඩිම වාසියක් ලබාදෙන ආකාරයටයි. නමුත් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2015 පෙබරවාරි 27වන දිනට පසුව නිකුත් කරන ලද පොලී අනුපාතවල නිරවද්‍යතාවේ ගැටලුවක් නිසා තමයි මේ තත්ත්වය පැන නැඟී තිබෙන්නේ කියලායි කියන්නේ. නිවැරැදි දත්ත නැත්නම් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට ඒ පිළිබඳව තීරණය කරන්න බැහැ. එක් ආචාර්යවරයෙක් කියා තිබෙනවා මා දැක්කා, ඔහුට පමණක් සිදු වුණු පාඩුව රුපියල් ලක්ෂ 10ක් කියලා. ශ්‍රී ලංකා මහ බැංකු බැඳුම්කර ගනුදෙනුව නිසා සේවක අර්ථසාධක අරමුදලට ලැබිය යුතු ප්‍රතිලාභ ප්‍රමාණයක් අහිමිවෙලා නැද්ද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා ඒ ප්‍රශ්නයට පිළිතුරු දෙයි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු කථානායකතුමනි, මේ මත භේදයට තුඩු දී තිබෙන රුපියල් මිලියන 880ක ආයෝජනය සියයට 10 පොලියට ප්‍රාථමික ගිණුම්කරුවකු විධියට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තමයි ආයෝජනය කළේ.

හැබැයි, බැංකුව පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමත් එක්ක එම මුදල් ආයෝජනය කිරීමේ ගනුදෙනුවකට ඇතුළත් වෙලා තිබෙනවා. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට සියයට 10 අනුපාතයට අනුව ලැබෙන්න ඕනෑ ඒ සම්පූර්ණ මුදල ලැබිලා තිබෙනවා. නමුත් පාඩුව කියලා කියන්නේ මේකයි. බැඳුම්කර කොමිසමේදී මතු වුණු යම් කාරණා පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව කරපු පරීක්ෂණයකින් හෙළිදරව් වෙලා තිබෙනවා, මේ මුදල් ආයෝජනය කිරීමේ ප්‍රතිඵලයක් විධියට අයුතු ආකාරයට ලාභ ලැබීමේ සංකල්පය -සිද්ධාන්තය- මත පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම මිලියන 141ක ලාභයක් වැඩිපුර උපයා තිබෙනවා කියලා. මිලියන 141ක මුදලක් වැඩිපුර උපයා තිබෙනවා කියලා අපට දැනුම් දුන්නා. මේ වනවිට එම මුදල අය කර ගැනීම සඳහා අපි නීතිපතිතුමා මාර්ගයෙන් නඩු පවරා තිබෙනවා. ඇත්තටම මේ කාරණය ගැන දැන ගත්තේත්, මේ කාරණය මාධ්‍යයට ආවේත් අපි මේ පිළිබඳව නඩු පවරලා, සියලු පියවර අරගෙන අවසන් වුණාට පසුවයි.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ගරු කථානායකතුමනි, මෙතුමා කියපු කාරණයට අමතරව මා තව කාරණයත් කියන්න කැමතියි. මුදල් ඇමතිතුමා නීතිපතිතුමාගෙන් අහලා තිබෙනවා, "මේ පිළිබඳව නීතිමය තත්ත්වය ඉදිරිපත් කරන්න පුළුවන්ද?" කියලා. මොකද, මේ ගැන සොයා බලා නීතිමය තත්ත්වය ඉදිරිපත් කරන්න කියලා කොමිසම් වාර්තාවේ තිබෙනවා. ඇමතිතුමා කිව්වාට එතැන තිබෙන්නේ අලාභයක් නොවෙයි, ලාභයක්. ඇත්ත වශයෙන්ම ඒ හා සමාන මුදලක් -පර්පෙචුවල් ට්‍රෙෂරීස් ගිණුමේ තිබෙන මුදල් ටික- දැන් මහ බැංකුව විසින් රඳවා ගෙන තිබෙනවා. නීතිපතිතුමා අපේ මුදල් ඇමතිතුමාට දැනුම් දෙයි, දැන් තිබෙන නීතිමය තත්ත්වය කුමක්ද කියලා.

ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ)
(The Hon. (Dr.) Nalinda Jayathissa)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. විශ්වවිද්‍යාල අර්ථ සාධක අරමුදලට සිදු වුණු වැඩේම දැන් මහපොළ භාරකාර අරමුදලටත් සිදුවෙලා තිබෙනවා. මහපොළ භාරකාර අරමුදලේ මුදලුත් මේ ආකාරයටම භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කිරීම නිසා මහපොළ භාරකාර අරමුදලට ලැබිය යුතු ආදායම අහිමිවෙලා තිබෙනවා. ඒකෙන් වෙලා තිබෙන්නේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් ගණනාවකට දෙන්න පුළුවන් ශිෂ්‍යත්ව ප්‍රමාණයක් අහිමි වීමයි. මහපොළ භාරකාර අරමුදලේ මුදල් සම්බන්ධයෙන් ඇතිවෙලා තිබෙන අපයෝජනය ගැනත් සෙවීමට තමුන්නාන්සේලා යම්කිසි ක්‍රියාමාර්ගයක් ගන්නවාද?

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)

ප්‍රශ්නයක් තිබෙනවා නම්, අපි ඒ පිළිබඳව විස්තර අහලා දැනුම් දෙන්නම්. මෙතැන අලාභයක් සිදුවෙලා නැහැ. ප්‍රශ්නය මතු කරන්න. එම ප්‍රශ්නය කල් තැබීමේ යෝජනාවක් හැටියට ඉදිරිපත් කළාම පිළිතුරු දෙන්නම් කියලා තමයි ඇමතිතුමා කිව්වේ. විශේෂයෙන්ම මහපොළ භාරකාර අරමුදලේ සභාපති හැටියට අපේ අග්‍රවිනිශ්චයකාරතුමාත් ක්‍රියා කරනවා.

විශේෂයෙන්ම මම මතක් කරන්න කැමතියි, මෙම සිද්ධිය මත අලාභයක් සිදු වී නැති බව. මෙතැන ප්‍රශ්නයක් තිබෙන්නේ මහ බැංකුව සහ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම අතරයි. එහෙත් අලාභ කිසිවක් සිදු වෙලා නැහැ. මහ බැංකුව කියන්නේ, රුපියල් බිලියන 11ක අයුතු ලාභයක් ලැබුණා කියායි. ඒකට උසාවියේ නඩුවක් දමා තිබෙනවා. දැනට මුදල් තිබෙන්නේ පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ ගිණුමෙයි. අපි ඒ මුදල් රඳවාගෙන තිබෙනවා. අපි සාකච්ඡා කර තිබෙනවා, අපට නීති පනවන්න පුළුවන්ද කියා බලන්න. ඒ මුදල් ලැබුණොත් ඒවා යන්න තිබෙන්නේ මහ බැංකුවටයි. වෙන කාටවත් ඒ මුදල් බෙදන්න හැකියාවක් නැහැ. ඒ මුදල අයිති වන්නේ මහ බැංකුවටයි. ඒක රජයට අයිති මුදලක්.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

2016 අයවැය යෝජනා : ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම සඳහා බලපත්‍ර
2016 வரவுசெலவுத் திட்டப் பிரேரணை: ஆழ்கடலில் மீன் பிடிப்பதற்கான உரிமப்பத்திரங்கள்
BUDGET PROPOSALS 2016: LICENCES FOR DEEP SEA FISHING

43/'18

1. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

(අ) (i) 2016 අය වැය යෝජනා අංක 154ට අනුව, ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීමේ බලපත්‍ර ලබාදීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබුවේද;

(ii) එම යෝජනාවට අනුව, 2016 වර්ෂය තුළදී බලපත්‍ර ලබා ගත් තැනැත්තන්ගේ නම් හා ලිපිනයන් කවරේද;

(iii) එකී බලපත්‍රලාභියකු විසින් අවම වශයෙන් යිවරයන් 100දෙනෙකු එම කාර්යයන් සඳහා යොදවා ගැනීමේ කොන්දේසිය ඉටු කරනු ලැබුවේදැයි නිරීක්ෂණය කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

කටුපොතොළ, නීරක වලමූල අපිවිරුත්ති මත්‍රුම් කිරාමියප් පොරුළාතාර අලුවල්කළ් අමෛච්චර෈ක් කේට්ට විනා:

(අ) (i) 2016ආම් ආණ්ටුක්කාන වරවුච්චෙලවුත් තිට්ටප් පිරේරණෙ ඉලක්කම් 154 ඉර්කමෛය, ආළ්කටල් මීන් පිටිප්පතර්කු උරිමප්පත්තිරංකළ෈ වළංකුම් මුරෛයියලොන්රු අරිමුකම් චෙය්යප් පට්ටුළ්ළතා එන්පතෛයුම්;

(ii) අප්පිරේරණෛයින්පටි 2016ආම් ආණ්ටිල් උරිමප් පත්තිරංකළ෈ප් පෙර්රවර්කළින් පෙයර් මර්රුම් මුකවරිකළ් යාවෛ එන්ප තෛයුම්;

(iii) අත්තකෛය උරිමෛප්පත්තිරම් පෙර්ර ඔරුවරි නාල් කුරෛන්තපට්චම් මීනවර්කළ් 100 පේරෛ අන්තක් කාරියත්තිල් ඊටුපටුත්තුම් නිපන්තනෛ නිරෛවේර්රප්පට්ටුළ්ළතා එන්පතු අවතානික්කప්පට්ටතා එන්පතෛයුම්;

අවර් ඉච්චපෛයිල් අරිවිප්පාරා?

(ආ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs:

(a) Will he inform this House -

(i) whether a system was introduced to provide licences to fish in the deep sea, as per the Proposal No. 154 of the 2016 budget;

(ii) the names and the addresses of the persons who obtained licences in the year 2016 as per the aforesaid Proposal; and

(iii) whether it was observed that the condition of deploying at least 100 fishermen in the aforesaid activity by a licence holder mentioned above was fulfilled?

(b) If not, why?

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා (යිවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යතුමා)

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா - கடற்றொழில், நீரக வளமூல அபிவிருத்தி மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் அமைச்சர்)

(The Hon. Gamini Wijith Wijayamuni Zoysa - Minister of Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

(ii) අදාළ ලේඛනය අමුණා ඇත.

එම ලේඛනය **සභාගත*** කරමි.

(iii) ඔව්.

(ආ) ඉහත පිළිතුරු ප්‍රකාරව පැන නොනඟී.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)

(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගැඹුරු මුහුදේ මසුන් ඇල්ලීම සඳහා බලපත්‍ර ලබා දුන් තැනැත්තන්ගේ නම් හා ලිපිනයන් කවරේද කියා මා අසන ලද ප්‍රශ්නයට ඔබතුමා ලබාදුන් පිළිතුරේ සඳහන් එම බලපත්‍ර ලබාදුන් තැනැත්තන් සංඛ්‍යාව කොපමණද කියා මට කියන්න පුළුවන්ද?

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)

(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

පුළුවන්, ගරු මන්ත්‍රීතුමනි. පුද්ගලයන් සංඛ්‍යාව 1,434යි.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)

(The Hon. (Dr.) Bandula Gunawardane)

ඒ යෝජනාව අනුව එක් බලපත්‍රලාභියකු විසින් අවම වශයෙන් 100දෙනකුට රැකියා අවස්ථා ලබාදෙන්න ඕනෑ. ඒ අනුව, ඔබතුමා ඒ පිළිබඳ නිරීක්ෂණය කර වාර්තාවක් ලබාගත යුතු වනවා. මේ යෝජනාව අනුව දහස් ගණනකට රැකියා සුරක්ෂිතතාවක් සිදු වෙන්න ඕනෑ. එය ප්‍රායෝගිකව එලෙසින් සිදු වුණාද, ගරු ඇමතිතුමනි?

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා

(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)

(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)

ගරු කථානායකතුමනි, යිවර කර්මාන්තයේ යෙදෙන යිවරයා හැම දාම මුහුදු යන්නේ නැහැ. ඒක එහෙම යන්න පුළුවන් ගමනක් නොවෙයි. "සියදෙනකු" කියා කියන්නේ ඒකයි. අද මුහුදු ගිය 10දෙනා හෙට යන්නේ නැහැ. සෘජු සහ වක්‍ර රැකියා ඒ මඟින් උත්පාදනය වෙලා තිබෙනවා.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා

(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)

(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

** පුස්තකාලයේ තබා ඇත.*

** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

** Placed in the Library.*

ඒ බලපත්‍රලාභීන් 1,434දෙනාම මහින් එලෙසින් සිදු වුණාද කියන එක පිළිබඳව පොඩි විස්තරයක් දළ වශයෙන් අපට ලබා දෙන්න පුළුවන්ද, ගරු ඇමතිතුමනි?

ගරු ගාමිණී විජිත් විජයමුණි සොයිසා මහතා
(மாண்புமிகு காமினி விஜித் விஜயமுனி சொய்சா)
(The Hon. Gamini Wijith Wijayamuni Zoysa)
පුළුවන්. එය ඔබතුමාට ලබාදෙන්නම්.

යාපනය දිස්ත්‍රික්කයේ වාරිමාර්ග : විස්තර
யாழ்ப்பாண மாவட்ட நீர்ப்பாசன முறைமைகள்: விபரம்
IRRIGATION SYSTEMS IN JAFFNA DISTRICT: DETAILS

415/'18

2. ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) යාපනය දිස්ත්‍රික්කය තුළ 1983 වර්ෂය වන විට තිබූ,
  (i) වාරිමාර්ග සංඛ්‍යාව;
  (ii) කුඩා වැව්, අමුණු සහ ඇළ මාර්ග සංඛ්‍යාව;
  (iii) අස්වද්දන ලද ගොවිබිම් ප්‍රමාණය;
  කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) 1983 සිට 2009 වර්ෂයේ යුද්මය තත්ත්වය නිමවන තෙක් වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල;
  (ii) යුද්මය තත්ත්වය නිම වීමෙන් පසු 2015 වර්ෂය දක්වා, සමස්ත වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණයට රජය විසින් වෙන් කරන ලද මුදල්;
  එක් එක් වර්ෂය අනුව කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

මාකාණ සභைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத் துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) 1983 ஆண்டளவில் யாழ்ப்பாண மாவட்டத்தினுள் காணப்பட்ட,
  (i) நீர்ப்பாசன முறைமைகளின் எண்ணிக்கை;
  (ii) சிறு குளங்கள், அணைக்கட்டுகள் மற்றும் கால்வாய்களின் எண்ணிக்கை;
  (iii) அவற்றின் மூலம் பயிர்செய்கை மேற்கொள்ளப் பட்ட விவசாய நிலங்களின் அளவு;
  எவ்வளவென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) (i) 1983 முதல் 2009ஆம் ஆண்டில் யுத்தம் முடிவடையும் வரை நீர்ப்பாசன முறைமைகள், குளங்கள், அணைக்கட்டுகள் மற்றும் கால்வாய் களை புனரமைப்பதற்காக ஒதுக்கப்பட்ட பணத் தொகை ஆண்டு வாரியாக எவ்வளவென் பதையும்;
  (ii) யுத்த நிலவரம் முடிவடைந்த பின்னர் 2015ஆம் ஆண்டுவரை ஒட்டுமொத்த நீர்ப்பாசன முறைமைகள், குளங்கள், அணைக்கட்டுகள் மற்றும் கால்வாய்களின் புனரமைப்புக்காக அரசாங்கத்தினால் ஒதுக்கப்பட்ட பணத்தொகை ஆண்டு வாரியாக எவ்வளவென்பதையும்;
  அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils, Local Government and Sports:

(a) Will he inform this House in relation to the Jaffna District by the year 1983 -
  (i) the number of irrigation systems that had existed;
  (ii) the number of small-scale tanks, anicuts and canals that had existed; and
  (iii) the extent of lands that had been brought under cultivation?

(b) Will he also inform this House -
  (i) separately on a year basis from year 1983 until the war situation had ended in 2009 the amount of money that had been allocated for restoration of irrigation systems, tanks, anicuts and canals; and
  (ii) separately on a year basis from the time the war situation ended until year 2015 the total amount of money the Government had allocated for the restoration of irrigations systems, tanks, anicuts and canals?

(c) If not, why?

ගරු කථානායකතුමනි, එතුමා මේ ප්‍රශ්නයට උත්තර දෙන්න කලින් මට ඔබතුමා වෙත ප්‍රශ්නයක් යොමු කරන්න තිබෙනවා. මේ ප්‍රශ්නය මම මීට කලිනුත් යොමු කළා. යාපනය දිස්ත්‍රික්කයේ වාරිමාර්ග විෂයට සම්බන්ධ ප්‍රශ්නයක්මයි මම අහන්නේ. මේ විෂයය සම්බන්ධව උතුරු පළාතට අදාළව අසන මෙම ප්‍රශ්නය යොමු වෙලා තිබෙන්නේ පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යවරයාටයි. ගරු කථානායකතුමනි, මට මතුවී ඇති ප්‍රශ්නය මෙකයි. මේ ආණ්ඩුව හෝ වෙන කුමන ආණ්ඩුවක් හෝ -මධ්‍යම රජය- යටතේ මේ වාරිමාර්ග කියන විෂයය සම්බන්ධයෙන් වග කියන වාරිමාර්ග අමාත්‍යවරයෙක් සිටිනවා. ගරු කථානායකතුමනි, එම වාරිමාර්ග අමාත්‍යවරයා උත්තර දුන්නොත් තමයි, එම විෂයය සම්බන්ධයෙන් විවිධ ගැටලු මතුවෙන කොට අපට අතුරු ප්‍රශ්න අහන්න පුළුවන් වෙන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ සම්බන්ධයෙන් වන නීතිමය තත්ත්වය මොකක්ද කියා මම සොයා බලන්නම්. [බාධා කිරීමක්] මම පිළිතුරු දෙනතුරු පොඩ්ඩක් ඉන්න, ගරු මන්ත්‍රීතුමනි.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ප්‍රශ්නය තිබෙන්නේ මෙතැනයි. මගේ අදහස ඉදිරිපත් කළාට පසුව ඔබතුමා පැහැදිලි කරන්න, ගරු කථානායකතුමනි. උතුරු පළාත සම්බන්ධයෙන් අසන ප්‍රශ්නවලට ඇයි මෙහෙම වෙන්නේ

[ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා]

කියන එකයි මට තිබෙන ප්‍රශ්නය. මේ සඳහා මධ්‍යම රජයේ සම්බන්ධයක් නැද්ද? වාරිමාර්ග අමාත්‍යවරයා උතුරට -යාපනයට- වග කියන්නේ නැද්ද? උතුරු පළාත් සභාවේ විග්නේස්වරන්ටද මේ වග කියන්නේ? මේක මට හැම දාමත් ප්‍රශ්නයක් වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, දැන් ඔබතුමාගේ ප්‍රශ්නය අහන්න.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නය මම ඇහුවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා ඉන්නවාද? එතුමා නැත්නම් ගරු පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා රාජ්‍ය ඇමතිතුමිය සභාවේ ඉන්නවාද? එතුමියත් නැහැ වාගෙයි. ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමා පිළිතුර ලබාදෙන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) වාරිමාර්ග සංඛ්‍යාව 38යි.

(ii) කුඩා වැව් හා අමුණු සංඛ්‍යාව 1,033යි.

(iii) අස්වද්දන ලද ගොවි බිම් ප්‍රමාණය හෙක්ටෙයාර 21,149යි.

(ආ) (i) වැඩ කටයුතු හා ගිණුම් සම්බන්ධයෙන් වූ සියලුම ලේඛන 1995 වර්ෂයේ සිදු වූ අවතැන්වීමේදී අස්ථානගත විය. එබැවින්, මෙම ප්‍රශ්නයට අදාළව 1983-1995 දක්වා වන තොරතුරු ඇතුළත් කිරීමට නොහැකි වී ඇත. නැවත පදිංචි කිරීමෙන් පසු පුනරුත්ථාපන කටයුතු සඳහා වාර්ෂිකව ලබාදෙන ලද ප්‍රතිපාදනවල තොරතුරු පහත සඳහන් කර ඇත.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැය විස්තර:

වර්ෂය	ප්‍රතිපාදන මුදල (රු. මිලියන)	මූල්‍ය ප්‍රභවය
1996-2001	නඩත්තු කටයුතු සඳහා ප්‍රතිපාදන කිසිවක් ලැබුණේ නැත.	-
2001-2002	8.50	උතුරු නැඟෙනහිර වාරිමාර්ග පදනම් කරගත් කෘෂි කර්මාන්ත ව්‍යාපෘතිය.
2003-2004	23.43	උතුරු නැඟෙනහිර වාරිමාර්ග පදනම් කරගත් කෘෂි කර්මාන්ත ව්‍යාපෘතිය.
2005-2009	433.83	රජයේ ප්‍රතිපාදන, යළි පිබිදීමේ ව්‍යාපෘතිය, උතුරු නැඟෙනහිර ප්‍රජා ප්‍රතිෂ්ඨාපන සහ සැලසුම් කිරීමේ ව්‍යාපෘතිය.

ගොවිජන සේවා මධ්‍යස්ථානවලට අයත් කුඩා වැව් ප්‍රතිසංස්කරණ වැය විස්තර:

වර්ෂය	ප්‍රතිපාදන මුදල රු.(මිලියන)	මූල්‍ය ප්‍රභවය
1996	0.20	රජයේ ප්‍රතිපාදන
1997	1.50	රජයේ ප්‍රතිපාදන
1998	6.92	රජයේ ප්‍රතිපාදන
1999	6.34	රජයේ ප්‍රතිපාදන
2000	0.24	රජයේ ප්‍රතිපාදන
2001	3.12	රජයේ ප්‍රතිපාදන
2002	2.71	රජයේ ප්‍රතිපාදන
2003	0.53	රජයේ ප්‍රතිපාදන
2004	20.00	රජයේ ප්‍රතිපාදන
2005	30.70	රජයේ ප්‍රතිපාදන
2006	10.00	රජයේ ප්‍රතිපාදන
2007	22.92	රජයේ ප්‍රතිපාදන
2008	7.18	රජයේ ප්‍රතිපාදන
2009	33.98	රජයේ ප්‍රතිපාදන

(ii) 2009 -2015 වර්ෂවලදී ලැබුණු ප්‍රතිපාදන

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වැය විස්තර:

වර්ෂය	ප්‍රතිපාදන මුදල රු. (මිලියන)	මූල්‍ය ප්‍රභවය
2010 - 2013	200.19	රජයේ ප්‍රතිපාදන, අර්බුද මඟින් බලපෑමට ලක් වූ ප්‍රදේශවල හදිසි අවශ්‍යතා ඉටු කිරීමේ ව්‍යාපෘතිය, යළි පිබිදීමේ ව්‍යාපෘතිය, උතුරු නැඟෙනහිර ප්‍රජා ප්‍රතිෂ්ඨාපන සහ සංවර්ධන ව්‍යාපෘතිය
2014	ප්‍රතිපාදන නැත.	-
2015	598	වෙලි ආරක්ෂාව සහ ජල සම්පත් සැලසුම් කිරීමේ ව්‍යාපෘතිය

ගොවිජන සේවා මධ්‍යස්ථානවලට අයත් කුඩා වැව්වල ප්‍රතිසංස්කරණ වැය විස්තර:

වර්ෂය	ප්‍රතිපාදන මුදල රු. (මිලියන)	මූල්‍ය ප්‍රභවය
2010	45.04	රජයේ ප්‍රතිපාදන
2011	7.24	රජයේ ප්‍රතිපාදන
2012	70.28	රජයේ ප්‍රතිපාදන
2013	90.29	රජයේ ප්‍රතිපාදන
2014	1.58	රජයේ ප්‍රතිපාදන
2015	15.01	රජයේ ප්‍රතිපාදන

(ඇ) අදාළ නොවේ.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු කථානායකතුමනි, මා ඔබතුමාට කලින් යොමු කළ කාරණයෙන්ම අතුරු ප්‍රශ්න දෙකක් අහන්න තිබෙනවා. උතුර පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ වාරි මාර්ග විෂයය සම්බන්ධයෙන් මා අසන ලද මෙම ප්‍රශ්නය පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාවරයාට යොමු කර තිබෙන නිසායි මට මේ ප්‍රශ්නය මතු වන්නේ.

වත්මන් රජය 2015 වසරේ සිට මේ දක්වා පැමිණි කාලය තුළ, උතුර පළාතේ වාරි මාර්ග විෂයය සම්බන්ධයෙන් සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කර තිබෙනවා. මධ්‍යම රජයේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව හරහා ක්‍රියාත්මක වන ඒ වැඩසටහන් උතුරු පළාත් සභාව හරහාද ක්‍රියාත්මක වෙන්නේ? වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් කාර්යාලයක් යාපනයේ නැද්ද? එම කාර්යාලයේ වාරි මාර්ග ඉංජිනේරුවරයෙක් නැද්ද? එම ආයතනය මධ්‍යම රජයට වගකියන්නේ නැද්ද? මේ ප්‍රශ්නය පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා විෂයය භාර අමාත්‍යාවරයාගෙන් අහන්නේ ඇයි? ගරු කථානායකතුමනි, මම අහන පළමුවැනි අතුරු ප්‍රශ්නය ඒකයි. මම මේ ප්‍රශ්නය ඇහුවේ වාරි මාර්ග ඇමතිවරයාගෙන්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, ඔබතුමාට පිළිතුරු දෙන්න පුළුවන්ද?

වාරි මාර්ග ඇමතිතුමා මේ ගරු සභාවේ ඉඳලා දැන් ගියා. මේ කාරණය ගැන අපට සොයා බලන්න වෙනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මේ ප්‍රශ්නය යොමු කර තිබෙන්නේ මෙම අමාත්‍යාංශයටයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි මේකට හේතුව සොයා බලමු. හේතුවක් ඇති. අලුත් පළාත් සභාවලට එහෙම නැත්නම් මෙහි විතරක්,- [බාධා කිරීමක්]

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
අදාළ අමාත්‍යාංශයටයි ප්‍රශ්නය යොමු කරන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්, අපි ඒ ගැන සොයා බලමු. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දෙවන අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ගරු ගයන්ත කරුණාතිලක ඇමතිතුමනි, ඔබතුමාත් ඒ කාරණය පිළිගන්නවා නේද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
එතුමා ඒ කාරණය පිළිගත්තා නේ. දැන් ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
ඒක තමයි මම මේ අහන්නේ. මට අහන්න ඉඩදෙන්න, ගරු කථානායකතුමනි. අනික් විෂයයන් සම්බන්ධයෙන් ප්‍රශ්න අහන වෙලාවක, ඒ පළාත්වල තිබෙන ප්‍රශ්න -අධ්‍යාපනය සම්බන්ධයෙන් වේවා, කෘෂිකර්මය සම්බන්ධයෙන් වේවා, ඉඩම් සම්බන්ධව හෝ වෙන ඕනෑම විෂයයක් සම්බන්ධව වේවා- පිළිබඳව මෙතැන සිටින මධ්‍යම රජයේ වගකිවයුතු අමාත්‍යාවරුන්ට උත්තර දෙන්න පුළුවන්.

මේ ප්‍රශ්නය පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාවරයාට යොමු කරන්නේම ඒ පළාතට මධ්‍යම රජය වගකියන්නේ නැති නිසාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී පාර්ලිමේන්තුවේ මහ ලේකම්තුමා කියනවා පළාත් සභාවලට අදාළ සියලුම කරුණුවලට දැන් පිළිතුරු දෙන්නේ පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශයෙන් කියලා. ඒ විධියටයි කෙරෙන්නේ.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)
පළාත් සභාවේ සෞඛ්‍ය සම්බන්ධ ප්‍රශ්නවලට මම උත්තර දෙනවා.

ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මම අහන්නේ පළාත් පාලන විෂය සම්බන්ධ ප්‍රශ්නයක් නොවෙයි, මම අහන්නේ වාරිමාර්ග විෂය සම්බන්ධ ප්‍රශ්නයක්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, එතුමා කියන කාරණයේ යම්කිසි සත්‍යයක් තිබෙනවා. දැන් සෞඛ්‍ය සම්බන්ධයෙන් පළාත් සභාවට අදාළ කාරණාවලට ගරු රාජිත සේනාරත්න මැතිතුමා උත්තර දෙනවා. ඉඩම් සම්බන්ධයෙන් පළාත් සභාවට අදාළ කාරණාවලට වුණත් මම උත්තර දෙනවා. මේක විතරක් වැරදිලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි සොයලා බලමු, Minister of Irrigation සමඟ කථා කරන්නම්.

ගම්බිරිස්වැව ගම්මානයේ පිහිටි ග්‍රාමීය රෝහල : වෛද්‍ය හිඟය

கம்பிரிஸ்வெவ கிராமிய வைத்தியசாலை: மருத்துவர் பற்றாக்குறை

RURAL HOSPITAL IN GAMBIRISWEWA VILLAGE : SHORTAGE OF DOCTORS

426/'18

3. ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) අනුරාධපුර මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගම්බිරිස්වැව ගම්මානයේ, පිහිටා ඇති ග්‍රාමීය රෝහල දැනට ගොඩනැඟිල්ලකට පමණක් සීමා වී ඇති බවත්;

(ii) දිවා කාලයට පමණක් බාහිර රෝගී අංශයට වෛද්‍යවරයෙකු අනුයුක්ත කර සිටියද රාත්‍රී කාලයේදී හදිසි අවස්ථාවක හෝ ප්‍රතිකාර ගැනීම සඳහා වෛද්‍යවරයෙකු නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් අවධානය යොමුකර විසඳුමක් ලබා දීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) அனுராதபுரம், நுவரகம்பலாத்த மத்தி பிரதேச செயலாளர் பிரிவின், கம்பிரிஸ்வெவ கிராமத்தில் அமைந்துள்ள கிராமிய வைத்தியசாலை தற்போது ஒரு கட்டடத்திற்கு மாத்திரம் மட்டுப்படுத்தப்பட்டதாயுள்ளது என்பதையும்,

(ii) பகல் வேளைகளில் மாத்திரம் வெளிநோயாளர் பிரிவிற்கு ஒரு மருத்துவர் இணைக்கப்பட்டுள்ள போதிலும் இரவு நேரங்களில் அவசர சந்தர்ப்பத்திலும்கூட சிகிச்சை பெறுவதற்கு மருத்துவரொருவர் இல்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இது சம்பந்தமாகக் கவனம் செலுத்தி, தீர்வொன்றைப் பெற்றுக்கொடுக்க நடவடிக்கை எடுப்பாரா என்பதையும்;

(ii) ஆமெனில், அத்திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine :

(a) Is he aware that-

(i) the rural hospital located at Gambiriswewa village in the Central Nuwaragampalatha Divisional Secretary's Division, Anuradhapura is currently confined only to a building; and

(ii) though a doctor has been attached to the Outpatients Department during daytime, there is no doctor at night even for emergency treatment?

(b) Will he inform this House-

(i) whether he will pay attention to this matter and take action to offer a solution; and

(ii) if so, the date on which it will be done?

(c) If not, why ?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) නැත.

(ii) මෙම රෝහල ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකයක් බැවින් පෙ.ව. 08.00 සිට ප.ව. 04.00 දක්වා පමණක් විවෘතව පවතී.

(ආ) (i) ඔව්, රෝහලට පැමිණෙන බාහිර රෝගීන් සංඛ්‍යාව හා සේවා අවශ්‍යතාව යන නිර්ණායක මත පදනම් වී ග්‍රාමීය රෝහලක් බවට උසස් කළ හැකිය. මේ සඳහා ප්‍රතිපත්තිමය තීරණයක් ගත යුතුය.

(ii) අවශ්‍යතාව පැන නඟින පරිදි පළාත් සභාව විසින් තීරණය කළ යුතුය.

(ඇ) පැන නොනඟී.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

ගරු ඇමතිතුමනි, මේ රෝහල upgrade කරලා දුන්නොත් බොහොම වටිනවා. මොකද, ඒ පළාතේ ජනගහනය වැඩියි. අනුරාධපුර නගරයේ සිට ගම්බිරිස්වැව ගම්මානයට ලොකු දුරක් තිබෙනවා. පසුගිය රජය මේ රෝහල වහලා තිබුණා. මම කළ ඉල්ලීමක් නිසා ඔබතුමා නැවත එය ප්‍රාථමික වෛද්‍ය සත්කාර ඒකකයක් කරලා දුන්නා. ඒ වාගේම මම නැවත වතාවක් ඉල්ලීමක් කරනවා ගම්බිරිස්වැව රෝහල තවදුරටත් upgrade කරලා දෙන්න කියලා.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ඒ පළාත් සභාවේ පළාත් සභා අධ්‍යක්ෂ ඉන්නේ මධ්‍යම ආණ්ඩුව යටතේයි. එතුමාත් සමඟ සාකච්ඡා කරලා, මේක ග්‍රාමීය රෝහලක් කරන්න කියලා එතුමා කියනවා නම් ඉල්ලීම ඉදිරිපත් කරන්න. මම මුදල් වෙන් කරලා දෙන්නම්.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

දෙවෙනි අතුරු ප්‍රශ්නය මෙයයි, ගරු කථානායකතුමනි. මැදවච්චිය ආසනයේ පදවිය ප්‍රදේශයේ මූලික රෝහලක් තිබෙනවා. මම පසුගිය දිනක ඔබතුමා සමඟ ඒ ගැන කථා කරන විට ඔබතුමා කිව්වා, "අවශ්‍ය කටයුතු කරලා දෙන්නම්." කියලා. තව පාරක් ඒ ඉල්ලීම කරනවා, ගරු ඇමතිතුමනි. මොකද, ඒකේ හුහක් අඩු පාඩු තිබෙනවා. මම පසුගිය දිනක ඒක බලන්නට ගියා. ඒ සියලුම අඩු පාඩු සකස් කරලා දුන්නොත් ලොකු දෙයක්, ගරු

ඇමතිතුමනි. මොකද, අනුරාධපුර දිස්ත්‍රික්කයේ තමයි වැඩිම වකුගඩු රෝගීන් සංඛ්‍යාවක් ඉන්නේ. එයිනුත් පදවිය පළාතේ තමයි වැඩිපුරම ඉන්නේ.

පදවිය එම රෝහලේ තවමත් විශේෂඥ වෛද්‍යවරු නැහැ, ගරු ඇමතිතුමනි. ඒ සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු ඔබතුමාට මා දුන්නාට පසුව ඔබතුමා එය සෞඛ්‍ය අමාත්‍යාංශයේ ලේකම්තුමාට ලබා දෙන්න කියලා කිව්වා. මම ඒ සියල්ල සෞඛ්‍ය ලේකම්තුමාට ඉදිරිපත් කළා. එතුමා ප්‍රකාශ කළා, ඉක්මනින්ම එය ලබා දෙන්නම් කියලා. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, පදවියේ එම රෝහලට අවශ්‍ය පහසුකම් ඉක්මනින් ලබා දෙන්න කියලයි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒ අවශ්‍ය අඩු පාඩුකම් ලැයිස්තුව ඔබතුමා මට දුන්නා ද?

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ඒ සියල්ල ඔබතුමාට ලබා දුන්නා, ගරු ඇමතිතුමනි.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
හොඳයි, එහෙම නම් මම ඒ පිළිබඳව සොයා බලන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 4 -468/'18- (1), ගරු චමින්ද විජේසිරි මහතා.

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අධ්‍යාපන ඇමතිතුමාගෙන් තමයි ප්‍රශ්නය අසා තිබෙන්නේ. අධ්‍යාපන ඇමතිතුමා සභාවේ නැත්නම්, අධ්‍යාපන රාජ්‍ය ඇමතිතුමා ඉන්නවා ද? එතුමාත් නැත්නම්, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා පිළිතුරක් දෙන්න.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන්, එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු චන්දිම වීරක්කොඩි මන්ත්‍රීතුමාගේ point of Order එක මොකක්ද?

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(மாண்புமிகு சந்திம வீரக்கொடி)
(The Hon. Chandima Weerakkody)
ගරු කථානායකතුමනි, අධ්‍යාපනය සම්බන්ධ ප්‍රශ්නයක් මතු වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ප්‍රශ්නය ගැන වෙනම කථා කරන්න. අද ඒ ගැන කථා කරන්න අවශ්‍ය නැහැ නේ. අපි ඊළඟ ප්‍රශ්නයට යමු, ගරු මන්ත්‍රීතුමා.

මාර්ග අනතුරු : වන්දි
வீதி விபத்துக்கள்: நஷ்டஈடு
ROAD ACCIDENTS: COMPENSATION

518/'18

5. ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මාර්ග අනතුරුවලින් මියයන හෝ තුවාල ලබන මගීන් හා පදිකයන් වෙනුවෙන් වන්දි ලබා දීමක් සිදු වන්නේද;

(ii) එසේ නම්, එම වන්දි ලබා දීම වෙනුවෙන් 2017 වර්ෂයට වෙන් කළ මුදල කොපමණද;

(iii) එම වන්දි ලබා දීමේදී පාදක කර ගනු ලබන කරුණු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) (i) ත්‍රිරෝද රථ අනතුරකින් මියයන ත්‍රිරෝද රථ රියැදුරන් වෙනුවෙන් ලබා දෙන වන්දි සඳහා 2017 වර්ෂයට වෙන් කළ මුදල කොපමණද;

(ii) 2017 වර්ෂයේ මැද භාගය වන විට වන්දි ලැබීමට සුදුසුකම් ලැබූ පිරිස කොපමණද;

(iii) 2017 වර්ෂයේ මැද භාගය වන විට වන්දි ලබා දුන් පිරිස කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

පෝක්කුවරත්තු මත්‍රුම් සිවිල් විමාන සේවෛකළ් අමෛච්සරෛක් කේට්ටවිනා:

(அ) (i) වීදි විපත්තුක්කළිනාල් මරණික්කුම් අල්ලතු කායංකළුක්කු උළ්ළාකුම් පයණිකළ් මත්‍රුම් පාතසාරිකළුක්කාක නෂ්ටඈටු වළංකුතල් නටෙපෙරුකින්රතා;

(ii) ආමෙනිල්, මේර්පටි නෂ්ටඈටු වළංකුවතර්කාක 2017ආම් ආණ්ටුක්කාක ඔතුක්කප්පට්ට පණත් තොකෛ යාතු;

[ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා]

(iii) මේරපටි නෂ්ටඋපතු වහංකලින්පෝතු අටිප් පටෙයාකක් කොළ්ළප්පටුම් විටයංකළ් යාවෙ;

එන්පතෙ අවර් ඉච්චෙයික්කු අරිවිප්පාරා?

(ஆ) (i) මුච්චක්කරවණ්ටි විපත්තිනාල් මරණික්කුම් මුච්චක්කරවණ්ටි චාරතිකළුක්කාක වහංකප්පටුම් නෂ්ටඋට්ටුක්කාක 2017 ආම් ආණ්ටුක්කෙන ඔදුක්කප්පට්ට පණත්තොකෙ යාතු;

(ii) 2017ආම් ආණ්ටින් නටුප්පකුතියිළවිල් නෂ්ටඋට්ටෙප් පෙර්රුක්කොළ්වතර්කු තකෙමෙ පෙර්රවර්කළින් එණ්ණික්කෙ යාතු;

(iii) 2017 ආම් ආණ්ටින් නටුප්පකුතියිළවිල් නෂ්ටඋටු වහංකප්පට්ටවර්කළින් එණ්ණික්කෙ යාතු;

එන්පතෙ අවර් ඉච්චෙයික්කු අරිවිප්පාරා?

(இ) ඉන්රේල්, ඒන්?

asked the Minister of Transport and Civil Aviation :

(a) Will he inform this House -

(i) whether compensation is provided for passengers and pedestrians who are killed or injured by road accidents;

(ii) if so, the money allocated for the year 2017 in order to grant the aforesaid compensation; and

(iii) the factors considered in providing the aforesaid compensation?

(b) Will he also inform this House-

(i) the amount of money allocated for compensation for three-wheeler drivers who lose their lives due to three-wheeler accidents, for the year 2017;

(ii) the people got qualified for compensation by the middle of the year 2017; and

(iii) the people who were granted with compensation by the middle of the year 2017?

(c) If not, why?

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)

(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)

(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

ගරු කථානායකතුමනි, ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් හදුනා නොගත් වාහනවලින් සිදුවන අනතුරු සඳහා පමණක් වන්දි ගෙවීම සිදු කරයි.

(ii) හදුනා නොගත් වාහනවලින් සිදුවන අනතුරු සඳහා වන්දි ගෙවීම වෙනුවෙන් 2017 වසරේදී රුපියල් මිලියන දහයක මුදලක් වෙන් කර ඇත.

(iii) මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව මඟින් වන්දි ගෙවනු ලබන්නේ යම් අනතුරක් සිදු කර පලා ගිය වාහන නිසා මරණයට හෝ තුවාල සිදුවීමට ලක්වූ චින්දිතයන් හෝ එම පවුලේ සාමාජිකයන්ට පමණි. එම ගෙවීම් සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කර ඇත. වර්තමානයේදී එවැනි අනතුරකින් මරණයට පත්වූ පුද්ගලයන් වෙනුවෙන්, එම පවුලේ සැමියා මිය ගියේ නම් බිරිඳට ද, බිරිඳ මිය ගියේ නම් සැමියාට ද, දෙදෙනාම මිය ගියේ නම් එම පවුලේ සාමාජිකයන්ට රුපියල් ලක්ෂ 2ක වන්දි මුදලක් හිමි වේ. හදුනා නොගත් වාහන අනතුරකින් බරපතළ තුවාල ලැබූ හෝ ආබාධිත වූ තැනැත්තෙකුට රුපියල් ලක්ෂයක මුදලක් පිරිනමනු ලබයි.

වන්දි ගෙවීම සිදුවන ආකාරය:

පුද්ගලයා විසින් තමාගේ වසමේ ග්‍රාම නිලධාරි හා ප්‍රාදේශීය ලේකම්තුමා විසින් නිර්දේශ කරන ලද අයදුම්පතක් මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. මෙහිදී තුවාලකරුවකු සඳහා වන්දි ලබාදීමේදී අයදුම්පත සමඟ පහත සඳහන් ලියවිලිවල සහතික කළ ඡායා පිටපත් අවශ්‍ය වේ.

අනතුර සම්බන්ධයෙන් පොලීසිය වෙත කරන ලද පැමිණිල්ල, ජාතික හැඳුනුම්පත, වෛද්‍ය වාර්තා හා බැංකු ගිණුම.

පුද්ගලයකු වෙනුවෙන් වන්දි අයදුම් කිරීමේදී උක්ත ලියවිලිවලට අමතරව පහත සඳහන් කළ ඡායා පිටපත් ද අවශ්‍ය වේ.

මරණ සහතිකය, පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව, ඉල්ලුම්කරුගේ ජාතික හැඳුනුම්පත, ඉල්ලුම්කරුගේ හා මරණකරුගේ විවාහ සහතිකය, දරුවන්ගේ උප්පැන්න සහතික හා අවශ්‍ය නම් දිවුරුම් ප්‍රකාශ.

ලියවිලි සහිතව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව වෙත ලැබෙන අයදුම්පත්‍ර රථ වාහන පොලිස් මූලස්ථානය වෙත යොමු කර මෙම අනතුර පිළිබඳව සවිස්තර වාර්තාවක් ලබා ගැනීම සිදු වේ.

එම අනතුර සිදු කළ වාහනය හඳුනා ගත නොහැකි බවට පොලිස් මූලස්ථානය -රථ වාහන- මඟින් නිර්දේශ කර ඇත්නම්, අනතුර පිළිබඳව පැමිණිලි කරන ලද පොලිස් ස්ථානයෙන් නැවත අවසන් පොලිස් වාර්තාවක් ගෙන්වා ගැනීම සිදු වේ. මෙසේ අවසන් පොලිස් වාර්තාව ලැබෙන්නේ අනතුර සිදු වී මාස 6ක් ගත වූ පසුවයි. එසේ එවනු ලබන වාර්තාව මඟින් එම අනතුර සිදු කළ වාහනය ඒ වන තෙක් හඳුනාගෙන නොමැති බව සහතික කර ඇත්නම්, ලිපිගොනුව සම්බන්ධයෙන් පවතින සියලුම විස්තරද සමඟ මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවේ, චින්දිතයින්හට වන්දි ගෙවීම පිළිබඳ ස්ථාවර කමිටුවට ඉදිරිපත් කරනු ලැබේ.

අදාළ ලිපිගොනු සඳහා වන්දි ගෙවිය හැකිද, නොහැකිද යන්න තීරණය කරනු ලබන්නේ කමිටුව මඟිනි. ස්ථාවර කමිටුව විසින් ගනු ලබන තීරණය මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාවෙහි සභා සාමාජික රැස්වීමට ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අයදුම්කරුවන්ට වන්දි ගෙවීම් සිදු වේ.

(ආ) (i) ත්‍රිරෝද රථ අනතුරුවලින් මිය යන ත්‍රිරෝද රථ රියදුරන් වෙනුවෙන් වන්දි ගෙවීමක් සිදු නොවන අතර, එක් රථ වාහන වර්ගයක් වෙනුවෙන් එසේ මුදල් වෙන් කිරීමක් ද සිදු නොවේ.

(ii) 2017 වසරේ මැද භාගය වන විට හප්පා පලා යාමේ අනතුරු නිසා විත්දිතභාවයට පත් වූ පුද්ගලයන් 54දෙනෙකු නිසි ක්‍රමවේදයට අනුව සිදු කළ තෝරා ගැනීම තුළින් වන්දි ලබා ගැනීම සඳහා සුදුසුකම් ලබා ඇත.

(iii) වන්දි ලබා දුන් පුද්ගලයන් ගණන 54ක්ද, ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය රුපියල් 8,275,000.00ක්ද වේ.

(ඇ) පැන නොනඟී.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු කථානායකතුමනි, මගේ පළමු අතුරු ප්‍රශ්නය.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, 2017 වසර වෙනුවෙන් ඉදිරිපත් කළ අය වැය වාර්තාවේ ඔබතුමන්ලා කියනවා, "ත්‍රිරෝද රථ අනතුරකින් මිය යන පුද්ගලයින් වෙනුවෙන් රක්ෂණ ක්‍රමයක් ආරම්භ කරලා රක්ෂණ භාර අරමුදලින් ගෙවීම් කටයුතු කරනවා." කියලා. නමුත්, ඔබතුමා අද සඳහන් කරනවා, එහෙම ගෙවීම් ක්‍රමවේදයක් නැහැ කියලා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු කථානායකතුමනි, එම අය වැය යෝජනාව අනුව මාර්ග ආරක්ෂාව පිළිබඳ ජාතික සභාව දැන් යම්කිසි ක්‍රමවේදයක් සකස් කරමින් යනවා. මේ රටේ ත්‍රිරෝද රථ ලක්ෂ 12ක් ලියාපදිංචි වෙලා තිබෙනවා. මේ කටයුත්ත හැකි ඉක්මනින් කරන්න බැහැ. නමුත්, එම අය වැය යෝජනාව අනුව ක්‍රියාත්මක වෙමින් දැන් ඒ වැඩ කටයුතු කරගෙන යනවා. එය නොබෝ දිනකින් ක්‍රියාත්මක කරන්නත් බලාපොරොත්තු වනවා.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ගරු කථානායකතුමනි, මගේ දෙවන අතුරු ප්‍රශ්නය සිවිල් ගුවන් සේවාව සම්බන්ධ ප්‍රශ්නයක්.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, දැන් මේ වෙද්දී අපි දැනගෙන තිබෙනවා, මත්තල ගුවන් තොටුපොළ ඉන්දියානු -විදේශීය- සමාගමකට විකුණන්න සූදානම් වෙලා තිබෙනවා කියලා. ඒකේ ඇත්තක් තිබෙනවා ද?

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නයට අදාළ නැතත් මා ඒකට උත්තරයක් දෙන්න ඕනෑ. කිසිසේත්ම අපි මත්තල ගුවන් තොටුපොළ විකුණන්න බලාපොරොත්තු වන්නේ නැහැ. එහෙම විකිණීමක් සිදු කෙරෙන්නේ නැහැ. නමුත්, මත්තල ගුවන් තොටුපොළ දැනට විශාල වශයෙන් පාඩු ලබමින් පවතිනවා. පසුගිය රජය ලබා ගත් ණයවලින් දැනට බිලියන තුනක් කටුනායක ගුවන් තොටුපොළේ මුදල්වලින් අපි ගෙවා තිබෙනවා. මෙය දිගටම කරන්න බැහැ.

කෙසේ වෙතත් අපි අද ඉන්දියානු රජය සමඟ මේ සම්බන්ධයෙන් සාකච්ඡාවක් පවත්වනවා. විශේෂයෙන්ම ඒ සාකච්ඡාව සාර්ථක වුණොත් ඉන්දියානු රජය සහ ලක් රජය එකතු වෙලා ඒකාබද්ධ ව්‍යාපාරයක් විධියට මේ මත්තල ගුවන් තොටුපළේ එම වැඩකටයුතු ඉදිරියට කරගෙන යෑමට බලාපොරොත්තු වනවා.

ශ්‍රී ලංකාවේ විදේශ සංචිත : විස්තර
இலங்கையின் வெளிநாட்டு ஒதுக்கம்: விபரம்
FOREIGN RESERVES OF SRI LANKA: DETAILS

528/'18

6. ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) විදේශීය විශ්වවිද්‍යාලයන්හි අධ්‍යාපනය සඳහා යන ශ්‍රී ලාංකික ශිෂ්‍යයන් වෙනුවෙන් වසරකට වැයවෙන මුදල සඳහා ශ්‍රී ලංකාවේ විදේශ මුදල් සංචිතයට දැරීමට සිදුවන බර කොපමණද;

(ii) පෞද්ගලික විදේශ සංචාරයන් සඳහා විදේශ ගතවන පුද්ගලයන් වෙනුවෙන් ශ්‍රී ලංකාවේ මුදල් සංචිතයට වසරකට දැරීමට සිදුවන බර කොපමණද;

(iii) ශ්‍රී ලංකාවෙන් යැවෙන වෙළඳ භාණ්ඩ හෝ සේවාවන් වෙනුවෙන් ශ්‍රී ලංකාවට අයවිය යුතු විදේශ මුදලින් කොපමණ මුදලක් නොලැබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නො එසේ නම්, ඒ මන්ද?

நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சரைக் கேட்டவினா:

(அ) (i) வெளிநாட்டுப் பல்கலைக்கழகங்களில் கல்விக் காக இலங்கை மாணவர்கள் சார்பில் ஒரு வருடத்திற்குச் செலவாகும் பணத்தொகைக்கு இலங்கையின் வெளிநாட்டு நாணய ஒதுக்கத் தினால் ஏற்க நேரிடுகின்ற சுமை எவ்வளவு என்பதையும்;

(ii) தனிப்பட்ட வெளிநாட்டு சுற்றுப்பயணங் களுக்காக வெளிநாடு செல்லும் ஆட்களுக்காக இலங்கையின் நிதி ஒதுக்கத்தினால் வருடாந்தம் ஏற்க நேரிடுகின்ற சுமை எவ்வளவு என்பதையும்;

(iii) இலங்கையிலிருந்து அனுப்பப்படுகின்ற வர்த் தகப் பண்டங்கள் அல்லது பணிகளுக்காக இலங்கைக்கு அறவிடப்பட வேண்டியதான வெளிநாட்டு நிதியில் எவ்வளவு பணத்தொகை கிடைக்காதுள்ளது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Finance and Mass Media:

(a) Will he inform this House-

(i) the amount of money drawn from the foreign reserves of the country annually for the education of Sri Lankan students in foreign universities;

(ii) the amount of money drawn from the reserves of Sri Lanka for persons who make personal tours in foreign countries; and

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

(iii) the amount of foreign exchange which is not received, out of the amount of foreign exchange that is due to Sri Lanka for the goods exported or services provided by it?

(b) If not, why?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත, ශ්‍රී ලංකා මහ බැංකුවේ සහ රජයේ සංචිතවලින් සමන්විත වේ.

රජයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශීය ණය ගෙවීම් සඳහා සහ විනිමය අනුපාතිකයේ දැඩි උච්චාවචනයන් මහ හරවා ගැනීම සඳහා දේශීය විදේශ විනිමය වෙළඳ පොළට මැදිහත් වීමට විදේශීය සංචිත උපයෝගි කර ගනී. කෙසේ වෙතත්, දෛනික ගනුදෙනු සඳහා සංචිත උපයෝගී කර නොගන්නා අතර, බාහිර කම්පනවලින් ආර්ථිකය රැක ගැනීමට අවශ්‍ය වූ අවස්ථාවන්හිදී ආරක්ෂකයක් ලෙස යොදා ගැනීම සඳහා සංචිත එක් රැස් කෙරේ.

ඒ අනුව, පුද්ගලයන්ගේ අධ්‍යාපන වියදම් සඳහා ගෙවීම් සිදු කිරීමට රටේ විදේශ සංචිත භාවිත නොකෙරේ. මෙම වියදම සඳහා ගෙවීම පුද්ගලයන්ගේ පෞද්ගලික ආදායමෙන් සිදු කෙරේ.

(ii) ඉහත සඳහන් කළ පැහැදිලි කිරීමට අනුව විදේශීය සංචාරයන් සඳහා සිදු කරන වියදම් රටෙහි විදේශීය සංචිත මඟින් සිදු නොවේ. මෙම වියදම් සඳහා ගෙවීම් පුද්ගලයන්ගේ පුද්ගලික ආදායමෙන් සිදු කෙරේ.

(iii) අපනයන සඳහා වූ විදේශ විනිමය ලැබීම්, වාණිජ බැංකුවල අපනයනකරුවන් වෙනුවෙන් පවත්වාගෙන යන විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලට බැර කරනු ලැබේ. අපනයන ලේඛනවල සඳහන් නියමයන්ට සහ කොන්දේසිවලට අනුව කිසියම් කාල පරාසයකට පසුව මෙම ලැබීම් රට තුළට පැමිණේ.

වර්තමානයේදී අපනයන ලැබීම් රට තුළට ගෙන්වා ගැනීමේ අවශ්‍යතාවක් පවතී. 2017 නොවැම්බර් මස 17 දිනැති ගැසට් අංක 2045/56 පවත්නා විදේශ විනිමය රෙගුලාසිවලට අනුව පහත සඳහන් කොන්දේසි අදාළ වේ:

සෑම අපනයනකරුවෙකුම අපනයනය කරන භාණ්ඩ සඳහා වන ලැබීම්, අපනයනය කළ දින සිට දින 120ක් ඇතුළත ශ්‍රී ලංකාවට ගෙන්වා ගත යුතු වේ.

ඉහත සඳහන් අවශ්‍යතාව කඩ වූ විට, ඊට එරෙහිව පියවර ගැනීමට පෙරාතුව, දින 120ක කාල සීමාව අවසාන වීමෙන් පසු දින 30ක අතිරේක සහන කාලයක් ශ්‍රී ලංකා මහ බැංකුවට ලබා දිය හැක.

(ආ) පැන නොනඟී.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු රාජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමාගේ පිළිතුර මඟින් ඔබතුමා කියන්නේ විදේශයන්හි ඉගෙනීමට යන ශිෂ්‍යයන් වියදම් කරන මුදල් ලංකාවේ සංචිතයෙන් ගෙවෙන්නේ නැහැ කියලායි; ඒක ගෙවෙන්නේ ඒ අයගේ මුදල්වලින් කියලායි. ඒ අය ගෙවන්නේ රුපියල්වලින්. ඒවා ඩොලර්වලින් ගෙවන්න සිදු වන කොට ලංකාවේ විදේශ මුදල් සංචිතයෙන් නේද ඒවා වැය වන්නේ?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

අප කතා කරන්නේ රජයේ සංචිත ගැනයි. අපි ඒවා නේ මනින්නේ. ඒවා තමයි මනින්නේ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ලංකාවේ සංචිත; රජයේ සංචිත නොවෙයි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ලංකාවේ සංචිතය කියන්නේ මහ බැංකුවේ සංචිතය නේ. මහ බැංකුවේ සංචිතයෙන් ඒවා ගෙවන්නේ නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මම මගේ ශිෂ්‍යයකු වෙනුවෙන් වියදම් කරන්න රුපියල් අරගෙන ඇවිල්ලා ඩොලර් කරගන්නවා නම්, ඩොලර් ගන්නේ කොහෙන්ද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

පුළුවන් ගන්න. ගරු මන්ත්‍රීතුමනි, උදාහරණයක් ලෙස වාණිජ බැංකුවක් ගනිමු. ඒ බැංකුවේ ඉතිරිය තිබෙනවා නේ. ඒ ඉතිරිය තිබෙන්නේ ඒ අයගේ ගිණුම්වලයි. ඒ ගිණුම- [බාධා කිරීමක්] ඩොලර් එකක් නම් නිව්යෝර්ක්වල වෙන්න පුළුවන්, පවුම් එකක් නම් ලන්ඩන්වල වෙන්න පුළුවන්. ඒවා හරහා තමයි ගෙවන්නේ. මහ බැංකුවේ සංචිතය ගැන පමණයි අපට කතා කරන්න පුළුවන්. අනෙක් ඒවා ගැන කතා කරන්න බැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

දෙවන අතුරු ප්‍රශ්නය අහන්න, ගරු මන්ත්‍රීතුමා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

මම කියන්නේ මේකයි. මේ රටේ පුද්ගලික බැංකුවල තිබුණත් - [බාධා කිරීමක්] අපි දන්නවා, official reserves කියා එකක් තිබෙනවා; ඒ වාගේම, reserves කියා තවත් එකක් තිබෙනවා කියලා. අපි මේ රටේ මුදල් ඩොලර් කර විදේශවල වියදම් කරන කොට ඒ වියදම් කරන මුදල් මේ රටේ විදේශ මුදල් ප්‍රමාණයෙන් නේද අඩු වෙන්නේ? [බාධා කිරීමක්] මගේ point එක මේකයි. තමුන්නාන්සේලා නිදහස් අධ්‍යාපනය නැති කරලා උසස් අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීම සඳහා පෙන්වන දෙයක්

තමයි, "මෙන්න, විදේශ අධ්‍යාපනය නිසා මෙච්චර විදේශ මුදල් වැය වෙනවා" කියන එක. මා කියන්න හදන්නේ ඊට වඩා ලොකු මුදලක් වැය වීමක් ගැනයි. මේ card holdersලා පිටරටවල ගිහින් තමන්ගේ සවාරි ගහලා වියදම් කරන මුදල් නිසා ඊට වඩා මුදලක් වැය වෙනවා. මේ කරන වෙළඳාමෙන් ලංකාවට එන්න තිබෙන මුදල් දින 120ක් ඇතුළත ගෙන්වූයේ නැති වුණත්, ඒ මුදල් ගෙන්වීමට තමුන්නාන්සේලා ගන්නා පියවර මොකක්ද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)
මම ඉහතින් සඳහන් කළා වාගේ අපනයනය පිළිබඳව රෙගුලාසි තිබෙනවා. මම ඒක නැවතත් කියවන්නම්.

"සෑම අපනයනකරුවෙක්ම අපනයනය කරන භාණ්ඩ සඳහා වන ලැබීම අපනයනය කළ දින සිට දින120ක් ඇතුළත ශ්‍රී ලංකාවට ගෙන්වා ගත යුතු වේ. ඉහත අවශ්‍යතාව කඩ වූ විට - ඒක මම නැවතත් කියනවා.- ඊට එරෙහිව පියවර ගැනීමට පෙරාතුව දින 120ක කාල සීමාව අවසන් වීමෙන් පසුව දින 30ක අතිරේක සහන කාලයක් ශ්‍රී ලංකා මහ බැංකුවට ලබා දිය හැක."

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
එතකොට මොකක්ද කරන්නේ? ඊළඟට ගන්නා පියවර මොකක්ද?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)
රෙගුලාසිය කඩ වුණොත් මොකක්ද කරන්නේ කියලා මහ බැංකුව තීරණය කරයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
මොකක්ද කරන්න පුළුවන්? කරන්න පුළුවන් දෙයක් නැහැ, තමුන්නාන්සේලාට. තමුන්නාන්සේලා current account එකක් ඇරලා තිබෙන්නේ.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(මාණ්පුමිකු ඉරාන් වික්කිරමරත්න)
(The Hon. Eran Wickramaratne)
නැහැ, නැහැ. ඔබතුමා කියන එක සම්පූර්ණයෙන්ම වැරැදියි. ඔබතුමාගේ දැන ගැනීම සඳහා මෙක කියන්නම්. ඉතිහාසයේ විශාලම විදේශ විනිමය ශේෂය තිබෙන්නේ දැනුයි. දැන් ඩොලර් කෝටි 990ක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(මාණ්පුමිකු වාසුදේව නාණායක්කාර)
(The Hon. Vasudeva Nanayakkara)
නිකම් බොරුවට රෙගුලාසි කියන්න එපා. රෙගුලාසිය අනුව සිදු වන්නේ නැත්නම් ඊළඟට ගන්න තිබෙන පියවර ගන්න. ඒවා මොකක්වත් කරන්නේ නැහැ. විදේශ අධ්‍යාපනයට මුදල් වෙන් කරලා නිදහස් අධ්‍යාපනය මරන්නයි තමුන්නාන්සේලා හදන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඊළඟට ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා, වරප්‍රසාද ප්‍රශ්නය.

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්පුමිකු සන්තිම වීරක්කොඩි)
(The Hon. Chandima Weerakkody)
ගරු කථානායකතුමනි, ප්‍රශ්නයක් ඉදිරිපත් කිරීමට ඔබතුමා මට අවස්ථාව දෙනවාද?

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මොකක් ගැනද, කියන්න.

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්පුමිකු සන්තිම වීරක්කොඩි)
(The Hon. Chandima Weerakkody)
ගරු කථානායකතුමනි, අපේ ප්‍රදේශයේ අධ්‍යාපනය සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇතිවෙලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
දැන් ඒකට ඉඩ දෙන්න අමාරුයි. අධ්‍යාපනය සම්බන්ධයෙන් කථා කරන්න කිහිප දෙනකුටම අවස්ථාව දෙන්න බැහැ.

දැන් ස්ථාවර නියෝග 27(2)යටතේ ප්‍රශ්නය, ගරු ඩග්ලස් දේවානන්දා මැතිතුමා.

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්පුමිකු සන්තිම වීරක්කොඩි)
(The Hon. Chandima Weerakkody)
අද ඒ ප්‍රදේශයේ පාසල් සම්පූර්ණයෙන්ම වැහිලා. ඒ පාසල් විවෘත කිරීම සඳහා කඩිනම් පියවර ගන්න. [බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අද දිනයට එම ප්‍රශ්නය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ඇතුළත් වෙලා නැහැ, ගරු මන්ත්‍රීතුමනි. මට ලිඛිතව ඉල්ලීමක් කරලාත් නැහැ. [බාධා කිරීමක්] අද මේ වාගේ ප්‍රශ්න ගොඩක් තිබුණා. ගරු මන්ත්‍රීතුමනි, මේ විධියට මට මේ සභාවේ කටයුතු ගෙන යන්න අමාරුයි. ඊයේ දවසේත් සභාවේ කටයුතු කඩාකප්පල් වුණා.

ගරු චන්දිම වීරක්කොඩි මහතා
(මාණ්පුමිකු සන්තිම වීරක්කොඩි)
(The Hon. Chandima Weerakkody)
අද දරුවන්ගේ අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම කඩා වැටිලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමා ජ්‍යෙෂ්ඨයෙක්. ඒ නිසා ඔබතුමා මේ වාගේ ප්‍රශ්නයක් කල් ඇතිව, ලිඛිතව ඉල්ලන්න. [බාධා කිරීමක්] Hon. Douglas Devananda, you go ahead.

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

ඉන්දියාවේ සිට පැමිණෙන ශ්‍රී ලාංකික සරණාගතයින් මුහුණපාන ප්‍රශ්න
இந்தியாவிலிருந்து இலங்கை திரும்பும் அகதிகள் முகம்கொடுக்கும் பிரச்சினைகள்
PROBLEMS FACED BY SRI LANKAN REFUGEES RETURNING FROM INDIA

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு அபிவிருத்தி மற்றும் இந்து மத அலுவல்கள் அமைச்சர் கௌரவ டி.எம். சுவாமிநாதன் அவர்களிடம் நிலையியற் கட்டளை 27(2)இன் கீழ் கேள்வி கேட்பதற்கு அனுமதித்தமைக்கு நன்றி தெரிவிக்கின்றேன்.

கடந்த கால யுத்தம் காரணமாக இடம்பெயர்ந்து இந்தியாவுக்குச் சென்றிருந்த இலங்கை அகதிகள் இலங்கை திரும்பிக்கொண்டிருக்கின்ற நிலையில், சட்டவிரோதமாக இலங்கை திரும்புகின்ற அகதிகளின் எண்ணிக்கையும் அதிகரித்து வருவதாகத் தெரிய வருகின்றது. குறிப்பாக, கடந்த ஒரு மாதகாலப் பகுதிக்குள் நான்கு தடவைகளில் 24 பேர் சட்டவிரோதமாக இலங்கை திரும்பிய நிலையில் கைதுசெய்யப்பட்டுள்ளனர் என்பது தெரியவருகின்றது.

மேலும், இலங்கை திரும்பியுள்ள இலங்கை அகதிகளின் பிள்ளைகள் இந்தியப் பிறப்புச் சான்றிதழ்களைக் கொண்டிருப்பதன் காரணமாகப் பாடசாலைக் கல்வி வசதிகள் மறுக்கப்படுகின்றதாகவும், இந்தியாவில் கல்வி கற்று 'ஏ பிளஸ்', 'பிளஸ் 2' பெறுபேறுகளைக் கொண்ட பிள்ளைகளுக்கான வேலைவாய்ப்புக்களும் மறுக்கப்பட்டு வருவதாகவும் தெரிய வருகின்றது. அந்த வகையில், பின்வருகின்ற கேள்விகளுக்கான பதில்களை கௌரவ அமைச்சர் டி.எம். சுவாமிநாதன் அவர்களிடமிருந்து எதிர்பார்க்கின்றேன்.

இலங்கை அகதிகளை இந்தியாவிலிருந்து இலங்கைக்கு அழைத்து வருவதற்கான ஏற்பாடுகள் எந்த வகையில் முன்னெடுக்கப்படுகின்றன?

சட்டவிரோதமான முறையில் மீள இலங்கை வருகின்ற இலங்கை அகதிகள் கைதுசெய்யப்படுகின்ற நிலையில், அவர்கள் தொடர்பில் தங்களது அமைச்சு ஏதேனும் ஏற்பாடுகளை முன்னெடுக்கின்றதா?

இலங்கை திரும்புகின்ற அகதிகளின் பிள்ளைகள் கல்வி மற்றும் வேலைவாய்ப்புக்களைப் பெறுவதற்கு உரிய ஏற்பாடுகளைக் கல்வி உட்பட ஏனைய அமைச்சுக்களுடன் இணைந்து, பொருந்தக்கூடிய வகையிலான ஏற்பாடுகளை முன்னெடுக்க முடியுமா?

மேற்படி, மக்கள் இலங்கைப் பிரஜைகளாக சமூகத்தில் ஏற்றத்தாழ்வற்ற வகையில், வாழ்வதற்கான ஏற்பாடுகளை முன்னெடுக்க முடியுமா?

ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා (නැවත පදිංචි කිරීම, පුනරුත්ථාපන, උතුරු සංවර්ධන සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன் - மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு அபிவிருத்தி மற்றும் இந்துமத அலுவல்கள் அமைச்சர்)
(The Hon. D.M. Swaminathan - Minister of Resettlement, Rehabilitation, Northern Development and Hindu Religious Affairs)

கௌரவ சபாநாயகர் அவர்களே, கடந்த கால யுத்தம் காரணமாக இடம்பெயர்ந்து இந்தியாவுக்குச் சென்றிருந்த இலங்கை அகதிகள் மீண்டும் தாயகம் திரும்புவதற்கான ஏற்பாட்டை அகதிகளுக்கான ஐக்கிய நாடுகள் உயர்ஸ்தானிகராலயம் - UNHCR மேற்கொள்கின்றது. இவ்வாறு தாயகம் திரும்ப விருப்பம் தெரிவிக்கும் அகதிகளுக்காக இலவச விமானப் பயணச் சீட்டுக்களும் மற்றும் உள்ளூர் போக்குவரத்துக்காக நபர் ஒருவருக்கு 2,500 ரூபாவும் மீள் இணைவுக் கொடுப்பனவாக 18 வயதுக்கு மேற்பட்ட நபருக்கு 10,000 ரூபாவும் 18 வயதுக்குக் குறைந்த நபருக்கு 7,500 ரூபாவும் உணவல்லாத பொதிக்காகக் குடும்பமொன்றுக்கு 10,000 ரூபாயும் தனி நபரைக் கொண்ட குடும்பமொன்றுக்கு 5,000 ரூபாயும் வழங்கப்படுகின்றது. அத்துடன் எனது அமைச்சினால், இவ்வாறு தாயகம் திரும்பும் குடும்பமொன்றுக்கு விமான நிலையத்திலே 5,000 ரூபாய் பெறுமதியான ஒரு காசோலையும் உணவுப்பொதிக்காக வழங்கப்படுகின்றது.

மிகச் சமீப காலமாகவே சட்டவிரோதமாக அகதிகள் தாயகம் திரும்புகின்றனர். இவர்கள் சம்பந்தமான விபரங்கள் மாவட்டச் செயலாளரிடம் கோரப்பட்டுள்ளன. இவ்வகதிகள் சம்பந்தமான விபரங்கள் கிடைக்கப்பெற்றதும் எனது அமைச்சு வெளிநாட்டு மற்றும் இது சம்பந்தமான ஏனைய அமைச்சுக்களுடன் கலந்துரையாடித் தேவையான நடவடிக்கைகளை எடுப்பதற்கு உத்தேசித்துள்ளது.

இலங்கையின் கல்விக் கொள்கைக்கமைவாகப் பாடசாலையில் பிள்ளைகளை இணைப்பது தொடர்பாகக் கல்வி அமைச்சே நடவடிக்கை எடுக்கவேண்டும். இது தொடர்பாகக் கல்வி இராஜாங்க அமைச்சருடன் நாங்கள் கலந்துரையாடி வருகின்றோம்.

இவ்வகதிகள் தமது சொந்த இடங்களில் குடியேறி, கிராம சேவையாளரிடம் பதிவை மேற்கொண்ட பின்னர், 25,000 ரூபாய் தற்காலிகக் குடியிருப்பு வசதிகளுக்காகவும் 5,000 ரூபாய் காணி துப்புரவாக்குவதற்கும் மற்றும் 3,000 ரூபாய் காணி துப்புரவாக்கும் கருவிகளை வாங்குவதற்காகவும் என மொத்தமாக 33,000 ரூபாய் வழங்கப்பட்டுவருகின்றது. மேலும், உள்ளூரில் இடம்பெயர்ந்து மீளக்குடியேறிய குடும்பங்களுக்கு வழங்கப்படும் வீட்டுத்திட்டம், சுகாதார மேம்படுத்தல், வாழ்வாதாரத் திட்டங்கள் என்பன அதே அடிப்படையில் இம்மக்களுக்கும் வழங்கப்படுகின்றன.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

பொருட்களுக்கு விலையேறியுள்ள இந்தக் காலகட்டத்தில் இவ்வாறான உதவியுடன் மாத்திரம் அவர்கள் இங்கு வந்து வாழ்வது மிகவும் கஷ்டமான ஒரு விடயமாகும். ஆகவே, அதை மீள ஒருமுறை ஆராயுமாறு கேட்டுக் கொள்கின்றேன். அதைவிட, இந்தியாவின் தமிழ் நாட்டில் இருக்கின்ற அந்த இடம்பெயர்ந்த மக்கள் இங்கு வருவதில் இருக்கின்ற தடைகள்

மற்றும் அவர்களுடைய பிரச்சினைகளை ஆராய்வதற்கு இங்கிருந்து குழுவொன்றினை அங்கு அனுப்புமாறும், அவர்கள் நம்பிக்கையோடு இங்கு வந்து தங்களுடைய எதிர்கால நடவடிக்கைகளை மேற்கொள்ளக்கூடிய ஒரு சூழலை உருவாக்குமாறும் கேட்டுக் கொள்கின்றேன். நன்றி.

ගරු ඩී.එම්. ස්වාමීනාදන් මහතා
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
நன்றி.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුව කල් තැබීමේ යෝජනාවක් අද ඉදිරිපත් කිරීමට නියමිතව තිබෙනවා. ඒ නිසා ඔබතුමාගේ ප්‍රශ්නය කියවීමට පමණක් අවස්ථාව ලබා දෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
ගරු කථානායකතුමනි, මට එය කියවීමට අවස්ථාව ලබාදීම ගැන ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියවීමට පමණයි අවස්ථාව ලබා දෙන්නේ. එතැනින් එහාට වාදයක් නැහැ.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හොඳයි, ගරු කථානායකතුමනි. දේශපාලන පළිගැනීම්වලට මුවාවී, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සිටින රජයේ හිතවතුන්ගට පෙරදාතම් කර උසස්වීම් ලබා දීමට ක්‍රියා කිරීමට විරුද්ධව අද දිනයේ අධ්‍යාපන වෘත්තීය සංගම් ගණනාවක දහස් සංඛ්‍යාත ගුරුවර ගුරුවරියන් වැඩට නොපැමිණීමට කටයුතු කරන බවත්, එය කරණකොටගෙන දරු දැරියන්ගේ අධ්‍යාපනයට බලවත් පහරක් වැදෙන බවත්, එබැවින් මෙය නිරාකරණය කර ගැනීමට රජය ක්‍රියා කරන්නේ ද යන බවත් විමසමි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි.

මීළඟට, වරප්‍රසාද ප්‍රශ්නය, ගරු අජිත් පී. පෙරේරා මැතිතුමා.

වරප්‍රසාද : පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය කඩ කිරීම
சிறப்புரிமை : பாராளுமன்ற உறுப்பினர்களுக்கான நடத்தைக் கோவையை மீறுதல்
PRIVILEGE: BREACH OF CODE OF CONDUCT FOR MEMBERS OF PARLIAMENT

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)
ගරු කථානායකතුමනි, පසුගිය කාලයේ මෙම පාර්ලිමේන්තුව විසින්, "පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය" හඳුන්වා දුන්නා. මේ චර්යා ධර්ම සංග්‍රහය 2018 මාර්තු මාසයේ 07වැනි දා අනුමත කරන ලදුව, 2018 අප්‍රේල් මාසයේ 15වැනි දා සිට ක්‍රියාත්මක වනවා.

මේ චර්යා ධර්ම සංග්‍රහයේ 30වැනි වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

"මන්ත්‍රීවරුන් ආචාරශීලීව කටයුතු කළ යුතු අතර, දේශපාලන කථාවල දී සහ විශේෂයෙන්ම පාර්ලිමේන්තු විවාදවල දී උචිත භාෂාවක් පාවිච්චි කළ යුතු ය."

ඒ වාගේම, එහි 31වැනි වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

"කිසිම මන්ත්‍රීවරයෙකු යම් තැනැත්තෙකුට පහර දීම, හිරිහැර කිරීම හෝ තර්ජනය කිරීම නොකළ යුතු ය."

එහි 32වන වගන්තියේ මෙසේ සඳහන් වෙනවා:

"සෑම මන්ත්‍රීවරයෙකු ම සිය සාමාජික මන්ත්‍රීවරුන් සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයද මහජනතාව ද සම්බන්ධයෙන් ගෞරවාන්විතව, ආචාරශීලීව සහ පාර්ලිමේන්තුවේ ගරුත්වයට හානි නොවන ආකාරයෙන් කටයුතු කළ යුතු ය."

එතකොට ඔබතුමාත් එයට ඇතුළු වනවා.

ගරු කථානායකතුමනි, මෙම ආචාර ධර්ම සංග්‍රහය අපි හඳුන්වා දුන්නේ, මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු රටේ අනෙක් පුරවැසියන්ටත් වඩා ආචාරශීලීව සහ වැදගත්ව කටයුතු කළ යුතුයි කියන ඒ මූල ධර්මයේ විශ්වාසයෙනුයි. ඒ නිසාම මේ ආචාර ධර්ම සංග්‍රහය ඒකමතිකව සම්මත වුණා.

ගරු කථානායකතුමනි, නමුත්, ඊයේ දිනයේ මුළු රටටම වැදගත්කමක් තිබෙන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග සම්මත කිරීමට පාර්ලිමේන්තුවේ අවශ්‍ය කටයුතු කිරීමට සූදානම් වන අවස්ථාවේදී, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ප්‍රශ්න ඇසීමේ කාල සීමාව තුළදී සහ ගර්හයේදී ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා සහ ගරු ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමා ඇතුළු තවත් කණ්ඩායමක් ගරු කථානායකතුමාට පෞද්ගලිකවම පහත් අන්දමේ වචන භාවිත කරමින් දෝෂාරෝපණය කරමින්, තර්ජනය කරමින්, ඉතාම අශෝභන ආකාරයෙන් හැසිරෙමින් පාර්ලිමේන්තුවේ සියලු කටයුතුවලට දැඩි ලෙස බාධා කරමින් පාර්ලිමේන්තුව ඊළඟ දිනයට කල් තැබීමට කටයුතු සැලැස්වීම සිද්ධ කළා.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

ගරු කථානායකතුමනි, එලෙස කටයුතු කිරීමෙන් රටේ ජනතාවට රුපියල් දසලක්ෂ ගණනක මුදලක් අහිමි වුණා. ඉතාම වැදගත් පනතක් යටතේ නියෝග පාර්ලිමේන්තුවේ විවාදයට ගන්න තිබියදී ඒ කටයුතු ඉදිරියට කරගෙන යාමට නොහැකි වුණා. ඒ වාගේම මේ රටේ ජනතාව ඉදිරියේ අවනීතිය ක්‍රියාත්මක කිරීමට ඔබතුමාට බල කළා. ගරු විජයකලා මහේස්වරන් රාජ්‍ය අමාත්‍යතුමිය කළ ප්‍රකාශය වැරදියි කියලා පක්ෂ විපක්ෂ භේදයකින් තොරව අපි පිළිගන්නවා. ඒ ප්‍රකාශය පිළිබඳව කළ යුතු දේ කුමක්ද කියන කාරණය ගැන, ගත යුතු පියවර පිළිබඳව ඔබතුමා විසින් විමර්ශනය කොට තීරණය කළ යුතුයි. එසේ තිබියදී පාර්ලිමේන්තුවේ සභා ගර්භය මැදට පැමිණ වහාම පියවර ගත යුතුයයි බල කරමින්, ඉතුරු සියලු කටයුතු නතර කළ යුතුයයි බල කරමින්, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවලට පටහැනිව, ආචාර ධර්ම නීතිවලට පටහැනිව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිව අසභ්‍ය වචන ප්‍රකාශ කරමින්, තර්ජනය කරමින්, සෙංකෝලය පැහැරගෙන යන බවට තර්ජනය කරමින් කරන ලද ක්‍රියාවෙන් මා ඇතුළුව මේ පාර්ලිමේන්තුවේ ඉන්න සියලු මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද උල්ලංඝනය වී තිබෙනවා. මීට අදාළ සියලු සාක්ෂි, වීඩියෝ පට පරීක්ෂා කරලා, වාචික සාක්ෂි විමසලා, මා විසින් නම් කරන ලද මන්ත්‍රීන් දෙදෙනාට සහ ඊයේ දිනයේදී ඉතාම අසාධාරණ විධියට, අශෝභන විධියට හැසිරුණු, ඔබතුමාට පෞද්ගලිකව පරිභව කරපු මන්ත්‍රීවරුන්ට විරුද්ධව විනයානුකූලව කටයුතු කරන ලෙස මා ඔබතුමාගෙන් ගෞරවයෙන් අයැද සිටිනවා.

ගරු කථානායකතුමනි, මීට කලින් අවස්ථාවලදී වරප්‍රසාද පිළිබඳ කාරක සභාවේදී ඉතාම ලිහිල්ව, සමාදානයට කටයුතු කිරීම නිසා තමයි අද මේ තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ. අද කිසිම මන්ත්‍රීවරයෙකුට බයක් නැහැ, මේ පාර්ලිමේන්තුව ඉස්සරහ විනය විරෝධීව කටයුතු කරන්න. ආචාර ධර්ම සංග්‍රහය ඔබතුමාගේ මූලිකත්වයෙන් හදුන්වා දීලා තිබෙන මොහොතක, ඔබතුමා මේ ආචාර ධර්ම සංග්‍රහය පරීක්ෂාවට ලක් කරන්න. මේ ආචාර ධර්ම සංග්‍රහයට භයියක් තිබෙනවා කියලා පෙන්වන්න. මේ ආචාර ධර්ම සංග්‍රහයේ 30, 31, 32 වගන්ති තුනම කඩ කරලා තිබෙනවා. ඒ නිසා මා ඔබතුමාගෙන් ඉතාම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා, මේ ප්‍රශ්නය වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට ඉක්මනින්ම යොමු කරලා, ආචාර ධර්ම නීති කඩ කිරීම ගැන පරීක්ෂා කරලා, කඩිනමින් -වහාම- පියවර ගන්න කියලා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ සම්බන්ධයෙන් වරප්‍රසාද කමිටුවට ඉදිරිපත් කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(මාණ්පුමිකු පිරසන්න රණවීර)
(The Hon. Prasanna Ranaweera)
Sir, I rise to a point of Order. මගේ නම ප්‍රකාශ කළා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
No point of Order can be allowed. ප්‍රධාන කටයුතු. [බාධා කිරීමක්] ඔබතුමා වාඩි වෙන්න.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(මාණ්පුමිකු පිරසන්න රණවීර)
(The Hon. Prasanna Ranaweera)
මගේ නම කිව්වා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔබතුමා වාඩි වෙන්න.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(මාණ්පුමිකු පිරසන්න රණවීර)
(The Hon. Prasanna Ranaweera)
මගේ නම කිව්වා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මම කියන්නේ වාඩි වෙන්න කියලා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
මෙතුමාගේ නම කිව්වා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
නම කිව්වාට කමක් නැහැ. ඒ ඉදිරිපත් කළේ යෝජනාවක්. ඒ ගැන පරීක්ෂණයක් කරනවා. [බාධා කිරීම්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අළුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)
එතුමාගේ නම කිව්වා නේ. කවුරුහරි නැගිටලා එතුමාගේ නම කිව්වාම එතුමාට කථා කරන්න අවස්ථාවක් දෙන්න. ඔබතුමා කොහොමද එහෙම කියන්නේ? එතුමාට කථා කරන්න අවස්ථාවක් දෙන්න. ඔබතුමා කොහොමද එහෙම කියන්නේ? [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
යෝජනාවක් ඉදිරිපත් කළේ. යෝජනාවකදී නම කියන්න පුළුවන්. [බාධා කිරීම්] ඔබතුමා වාඩි වෙන්න.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(මාණ්පුමිකු පිරසන්න රණවීර)
(The Hon. Prasanna Ranaweera)
ගරු කථානායකතුමනි, මගේ නම කිව්වාට පස්සේ - [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1 සිට 16 දක්වා විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන් අටක්, රේගු ආඥා පනත යටතේ යෝජනා පහක්, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියමයක් හා නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමයන් දෙකක් අනුමත කිරීමට නියමිතයි. ගරු මුදල් ඇමතිතුමා. [බාධා කිරීම්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඇලෝසියස්ගෙන් සල්ලි ගන්නකොට හොඳයි. [බාධා කිරීම්]

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කවුද ඒ වචන කිව්වේ? පාර්ලිමේන්තුවේ එහෙම අය නැහැ. පාර්ලිමේන්තුවේ ඉන්නේ ගරු මන්ත්‍රීතුමන්ලා. බලන්න, මේ ගැලරියේ ඉස්කෝල ළමයි ඉන්නවා. [බාධා කිරීම්] ස්ථාවර නියෝග අනුව අද මට ඒකට අවසර දෙන්න බැහැ. මම හොයලා බැලුවා. දෙන්න බැහැ. [බාධා කිරීම්] ඒ මන්ත්‍රීවරු කිව්වා නම් පිළිතුරු දෙන්න පුළුවන්. [බාධා කිරීම්] ඒ වචනය ඔබතුමා අයින් කර ගන්න. එහෙම කිව්වා නම් ඒක අයින් කර ගන්න. පාර්ලිමේන්තුවේ වචන භාවිත කරන්න ඉගෙන ගන්න. වහාම ඒක withdraw කර ගන්න. නැත්නම් මට මේ සම්බන්ධයෙන් විනය පියවර ගන්න වෙනවා. ඊයේ අර මන්ත්‍රීතුමා හැසිරුණු විධියෙන් දවසම කඩාකප්පල් වුණා. එහෙම කරලා මේ පාර්ලිමේන්තුවේ - [බාධා කිරීමක්] ඔබතුමා වාඩි වෙන්න. මන්ත්‍රීතුමා වාඩි වෙන්න.

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
කථා කරන්න අවස්ථාවක් දෙන්න. මේ සම්බන්ධයෙන් කථා කරන්න අයිතියක් නැද්ද, ගරු කථානායකතුමනි?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මම ඔබතුමාට කියනවා වාඩි වෙන්න කියලා. ඔබතුමා වචන පාවිච්චි කරන්න ඉගෙන ගන්න. ගරු මන්ත්‍රීතුමන්ලාට එහෙම කියන්න පුළුවන්ද? [බාධා කිරීම්] වාඩි වෙන්න.

Hon. Minister of Finance and Mass Media to move the items.

විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත : නියමය
விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டம் : கட்டளை
SPECIAL COMMODITY LEVY ACT: ORDER

[අ.භා. 2.27]

ගරු මංගල සමරවීර මහතා (මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி மற்றும் வெகுசன ஊடக அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance and Mass Media)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 පෙබරවාරි 23 දිනැති අංක 2059/52 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ගරු කථානායකතුමනි, විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියම 8ක්, රේගු ආඥා පනත යටතේ යෝජනා 5ක්, නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියම දෙකක් මම මේ අවස්ථාවේ මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීමට කැමතියි.

Mr. Speaker, actually, as we are talking about the Customs Ordinance. I would like to take this opportunity to briefly talk about the reward system in the Sri Lanka Customs. In fact, the problem with the reward system, as it is, Mr. Speaker, is that under the current law, Customs Officers have both the power and the strong incentives to impose large penalties even for trivial customs violations. The fact that appealing a Customs ruling is expensive and time consuming, legitimate traders and other private-sector persons face considerable legal risks and many of them, I am afraid to say, have to pay large irregular payments to avoid penalties and this, from the information I have, is fairly a common situation in the Department. This also affects the material impact on efficiency of the trading process and as a result, we are getting lower customs revenue and higher prices for consumers.

The way to address this problem, which has been there for many, many years, I feel, would be to reduce the officers' incentives to impose large penalties for trivial violations, ensure by law that penalties are proportional to the violations and create an effective appeal system. And also I would say, with the automation of Sri Lanka Customs, with less and less interaction between traders and Custom Officers, this issue can be addressed fairly effectively.

The way things stand now, 50 per cent of the incentives, the rewards, are going to the Customs Officers' Reward Fund, 20 per cent to the Customs Officers' Compensation and Management Fund and 30 per cent to the Consolidated Fund. In fact, very, very few countries have any compensation scheme for Customs Officials like we have in Sri Lanka. In fact, the schemes which are operational in our part of the world are uniformly less generous than that of Sri Lanka. For example, in India, 20 per cent, not 50 per cent, of the reward is given to the Customs Officials concerned with a limit of Indian Rupees 2 million - there is a ceiling of Indian Rupees 2 million which is the equivalent of Sri Lankan Rupees 3 million - and Indian Rupees 20 million over an officer's entire career. Over the entire career, no Customs Officer is allowed to earn more than Indian Rupees 20 million as reward. In Pakistan, the reward is 20 per cent, diminishing 5 per cent for amounts above Pakistani Rupees 1 million which is approximately US Dollars 8,000. For smuggling detection, there is a cap at

[ගරු මංගල සමරවීර මහතා]

Pakistani Rupees 1 million and however big the detection is the officer concerned will not get any more than Pakistani Rupees 1 million. In Thailand, it is 10 to 20 per cent with the cap of Baht 5 million which is the equivalent of US Dollars 150, 000.

Mr. Speaker, I have here the rewards list of the Sri Lanka Customs for the period 1st April, 2017 to 31st March of this year.

ශ්‍රී ලංකා රේගුව ලබා ගන්නා rewardsවල සම්පූර්ණ ලැයිස්තුව මාළඟ තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

මේ අවස්ථාවේ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, you may continue.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Thank you, Mr. Deputy Chairman of Committees.

In fact, I do not want to read the names. The individuals' names are all here with me, but I will not read them because I do not want to embarrass the officials. But, for example, there is one gentleman here who has got as rewards Rs. 95,466,938.00 just for twelve months.

ශ්‍රී ලංකා රේගුවේ එම නිලධාරියා මාස 12ක් තුළ තමන්ගේ පඩියට අමතරව rewards හැටියට රුපියල් මිලියන 100කට ආසන්න මුදලක් එකතු කරගෙන තිබෙනවා. ඒ කියන්නේ රුපියල් ලක්ෂ 1,000කට ආසන්න මුදලක්. ඒ ලැබුණු මුදල් ප්‍රමාණය රුපියල් මිලියන 95යි, 46යි, 24යි, 37යි හා 12යි යනාදි ලෙස අපට කියාගෙන, කියාගෙන යන්න පුළුවන්. එසේ මුදල් ලැබීම ගැන අපි ඒ අයට ඊර්ෂ්‍යා කරන්න ඕනෑ නැහැ. නමුත්, එය අසාධාරණ ක්‍රමයක්. එය අසාධාරණ ක්‍රමයක් කියලා මා කියන්නේ මොකද? අපි මේ කාරණා analyze කරලා බැලුවාම, ඇත්ත වශයෙන්ම මුළු රේගුවෙන්ම කුඩා කණ්ඩායමක් විතරයි මේ තරම් විශාල rewards, එහෙම නැත්නම් penaltiesවලින් හම්බ කර ගන්නේ.

In any given year, 20 officers or around one per cent of the Customs workforce receive reward payments above Rs. 10 million. ඒ කියන්නේ රේගුවේ මුළු workforce එකෙන් සියයට 1ක් වැනි ඉතාම සුළු පිරිසක් අවුරුද්දකට රුපියල් මිලියන 10ට වඩා එක් අයෙක් ඒ අවුරුදුවල හම්බ කරගෙන තිබෙනවා. Reward payments to those officers amounted to 20 per cent or more of the total rewards paid out in 2015, 2016 and 2017 and payments to the highest rewarded ten officers amounted to around 15 per cent of the total payments. වැඩියෙන්ම හම්බ කර ගත්ත නිලධාරීන් 10දෙනා, අපට එම මුළු අවුරුද්ද තුළ ලැබුණු සම්පූර්ණ ආදායමෙන් සියයට 15ක් ලබා ගන්නවා කියන දේ තමයි මේ තොරතුරුවලින් අපට හෙළිවෙන්නේ.

The officers who receive large reward payments in one year usually also received high payments in other years. ඒ කියන්නේ, අවුරුද්දෙන් අවුරුද්දට ඒ ලැබෙන මුදලට එකම පිරිසක් හිමිකම් ලබනවා. For example, the highest rewarded one per cent of the Customs officers in 2015 not only received around 21 per cent of reward payments in 2015 -ඒ කියන්නේ, Customs Officersලාගෙන් සියයට 1ක් 2015දී reward paymentsවලින් සියයට 21ක්, එනම් රුපියල් මිලියන 400ක් 2015දී විතරක් ලබාගෙන තිබෙනවා - but also 12 per cent in 2016 was received Rs. 230 million and 10 per cent in 2017. මේ එකම පිරිසක්. Five Customs Officers were among the 20 highest rewarded officers in all three years. All of them received at least Rs. 12 million per year. මේ අවුරුදු තුනම දිහා බැලුවොත්, හැම අවුරුද්දේම rewardsවලින් රුපියල් මිලියන 12කට වඩා වැඩි මුදලක් ලබා ගත් Customs Officersලා 5දෙනෙක් ඉන්නවා.

Taking together all years for which there is data, a large inequality remains. A group of around 130 Officers or six per cent of the Customs' workforce collected more than half of the overall rewards payment from 2015 to 2018. The highest rewarded 10 Officers collected 12 per cent of total rewards, which is Rs. 660 million and the highest rewarded 20 Officers collected 18 per cent of total rewards which is more than Rs. 1 billion. The 10 highest rewarded Officers all received more than Rs. 40 million each from 2015 to 2017, while the average reward was less than Rs. 1 million per year. This suggests that there is a substantial lifetime inequality in rewards.

මේකෙන් පෙන්වන්නේ ඇත්තවශයෙන්ම ඉතාම සුළු කණ්ඩායමක් විසින් අද රේගුව මෙහෙයවනවා කියන එකයි. අන්න ඒ නිසා අපි දැනටමත් රේගු දෙපාර්තමේන්තුව ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අලුත් නීති රීති ගෙනෙන්න, අලුත් පනතක් ගෙනෙන්න කටයුතු කරමින් සිටිනවා. මොකද, රේගු දෙපාර්තමේන්තුවට අදාළව තවම තිබෙන්නේ 1860 ගණන්වල සංශෝධිත පනතක්. අද ලෝකයට එය ගැළපෙන්නේම නැහැ. ඒක නිසා අපි එම කටයුත්ත කරනවා. එසේ කරන තෙක්, මේ ලැබෙන reward payment එක මින් ඉදිරියට වරායේ ඉන්නා සියලුම සේවකයන්ට සමසේ බෙදන්නය කියලා යෝජනාවක් කරන්න අපි කටයුතු කරනවා. වරායේ 1,600ක විතර සේවකයන් ප්‍රමාණයක් ඉන්නවා ලු. සමාවෙන්න, "වරායේ" කියලා මට පරණ පුරුද්දට කියවුණේ. Sri Lanka Customs එකේ 1,600ක විතර සේවකයන් ප්‍රමාණයක් ඉන්නවා ලු. මම කියන්නේ, මේකටත් හෝටල්වල වාගේ service charge එකක් තිබෙනවා. Service charge එක එම හෝටලයේ වැඩ කරන සියලු දෙනාටම සමානව බෙදෙනවා. කුස්සියේ පිහන් සෝදන මනුෂ්‍යයාටත්, General Managerටත්, ඔක්කෝටම එක හා සමානව බෙදෙන්නේ. මින්

ඉදිරියට රේගුව තුළත් අන්න එවැනි දෙයක් කිරීමට මම යෝජනා කරලා තිබෙනවා. මම ඒ නියෝගය මේ සභයේ නිකුත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඇත්ත වශයෙන්ම අපි යෝජනා කරන ආකාරයට මින් ඉදිරියට රේගු කටයුතුවලට සම්බන්ධ වී එවැනි සිදුවීම් ගැන සොයන පුද්ගලයාට හෝ එම කණ්ඩායමට සියයට 10ක් දෙනවා. ඒකටත් අපි සීලිමක් දමනවා, රුපියල් මිලියන 2කට වඩා අඩු වෙන්න ඕනෑය කියලා. ඉතුරු සියයට 40 අපි රේගුවේ සියලුම සේවකයන්ට සමසේ බෙදනවා. ඇත්ත වශයෙන්ම අපිට 2016 වර්ෂයේ දී බිලියන දෙකයි ගණනක් rewards හැටියට ලැබී තිබුණා. බිලියන දෙකකට වැඩි ගණනක් ලැබී තිබුණා. ගණන් හදා බැලුවාම, Customs එකේ සෑම සේවකයෙකුටම ඒ තුළින් අවුරුද්දකට ලක්ෂ හයහමාරක්, හතක් වැඩිපුර ලබා ගන්න පුළුවන්. සුළු පිරිසකට විතරක් ලැබෙන මේ මුදල මින් ඉදිරියට රේගුවේ වැඩ කරන සියලු දෙනාටම සමව බෙදා දෙන්නට අපි කටයුතු කරනවා.

ඊළඟට, මම කියපු විධියට, විශේෂයෙන් ඊළඟ අය වැයට ප්‍රථම අපි Customs Ordinance එක හදනවා. දැන් එම කටයුතු කරගෙන යනවා. වෘත්තිය සමිති සහ අනෙක් අය එක්කත් කථා කරලා, එම Customs Ordinance එකත්, ඒ වාගේම Excise Ordinance එකත් අලුත් කරනවා. මේ දෙකම නොවැම්බර් මාසයේ මීළඟ අය වැය ඉදිරිපත් කරන්නට ප්‍රථම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා, විශේෂයෙන්ම රේගුවටත්, Excise Department එකටත් නව යුගයක් ලබා දෙන්නට කටයුතු කරන බව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
මීළඟට, ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් ලබා දී තිබෙනවා.

[අ.භා. 2.45]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු මුදල් අමාත්‍යතුමා විසින් එතුමාගේ අමාත්‍යාංශයට අදාළව අද දින ඉදිරිපත් කරන ලද නියමයන් සහ යෝජනා කිහිපයක් ගැන විවාද කරන මේ අවස්ථාවේ, විශේෂයෙන් මුදල් අමාත්‍යාංශයට සම්බන්ධ කාරණා කිහිපයක් පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්නට මා බලාපොරොත්තු වෙනවා.

ගරු මුදල් ඇමතිතුමනි, යහ පාලන ආණ්ඩුවේ දෙවැනි මුදල් ඇමතිතුමා තමයි ඔබතුමා. යහ පාලන ආණ්ඩුවේ පළමුවැනි මුදල් ඇමතිතුමාට අවුරුදු එක හමාරක් යනකොට ගෙදර යන්න සිදු වුණා. එම මුදල් අමාත්‍යවරයාව පත් කිරීමත් නීති විරෝධියි. මොකද, යහ පාලන ආණ්ඩුවකට එවැනි මුදල් ඇමතිවරයෙක් පත් කරන්න බැහැ. හිටපු මුදල් ඇමතිතුමාට විනිමය සම්බන්ධ චෝදනාවක් තිබුණා. එතුමාට රේගුව සම්බන්ධ ව්‍යාපාරයක් තිබුණා. විනිමය සම්බන්ධ චෝදනාවක් තිබෙන, රේගුවට සම්බන්ධ ව්‍යාපාරයක් තිබෙන කෙනෙකු මුදල් ඇමතිවරයෙකු හැටියට පත් කිරීමට යහ පාලන ආණ්ඩුවකට සදාචාරාත්මක අයිතියක් නැහැ. කෙසේ වෙතත් මලික් සමරවික්‍රම ඇමතිතුමාගේ මැදිහත්වීම මත එතුමා ඉවත් කර ගැනීමට යහ පාලන ආණ්ඩුවට හැකියාව ලැබුණා. තනිකරම ඒ පිටුපස මලික් සමරවික්‍රම ඇමතිතුමා හිටියා කියලා තමයි කියන්නේ. දැන් අලුත් මුදල් ඇමතිතුමා තමයි මංගල සමරවීර ඇමතිතුමා. ඔබතුමාටත් මේ ආණ්ඩුව ටිකක් බයයි. ඒක නිසා තමයි ඔබතුමාට මුදල් ඇමතිකම දීලා තිබෙන්නේ. චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය සම්බන්ධ කරගෙන ඔබතුමා අගමැති වෙන්න යනවා කියලා දැන් මේ ආණ්ඩුවට පොඩි බයක් තිබෙනවා. මෙහෙම දෙයක් ඔබතුමාගේ හිතේවත් නැහැ කියලා මම දන්නවා. මම මේ කියන්නේ තිබෙන බය ගැනයි. [බාධා කිරීමක්] ඔබතුමාට බේරෙන්නයි මම මේ කියන්නේ. මම ඔබතුමාට උදව්වක් කරන්නේ. ඔබතුමාට මුදල් ඇමතිකම දීලා කුණු ටික ඔක්කොම බෙංගාල බොක්කට වාගේ ඔබතුමාට දමලා, ඔබතුමාවත් විනාශ කරන්න හදනවා. ඒක තමයි මම ඔබතුමාට කියන්න ගියේ. ගරු ඇමතිතුමා, - [බාධා කිරීමක්] ඔබතුමා දන්නවා නේ මම ආදරෙයි කියලා. ගරු ඇමතිතුමනි, 2015 ජනවාරි මාසයේ 08වැනි දින තමුන්නාන්සේලාගේ ආණ්ඩුව බලයට පත් වන විට මේ රටේ මිනිසුන්ගේ ලොකු බලාපොරොත්තුවක් තිබුණු බව ඔබතුමා දන්නවා ඇති.

ඊට හේතුව තමයි, මේ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ සියල්ල එකට සංකලනය වුණු ආණ්ඩුවක් නිර්මාණය කිරීම. ඉතිහාසයේ පළමුවන වතාවට එක්සත් ජාතික පක්ෂයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් එකතුවෙලා ආණ්ඩුවක් හැදුවා, ඇමතිතුමනි. "ටීඑන්ඒ" එකයි, ජාතික හෙළ උරුමය පක්ෂයයි වේදිකාවේ එකට ඉඳියි කියා අපි කවදාවත් හිතුවේ නැහැ. හැබැයි ඒ පක්ෂ දෙක වේදිකාවේ එකට ඉඳ ගත්තා. එක්සත් ජාතික පක්ෂයත්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, "ටීඑන්ඒ" එකත්, ජාතික හෙළ උරුමය පක්ෂයත් මේ ආණ්ඩුව හදන්න වේදිකාවට නැග්ගා. ඒ විතරක් නොවෙයි. තමන්ගේ සාමාජිකයන් 60,000ක් මරපු එක්සත් ජාතික පක්ෂය එක්ක ජනතා විමුක්ති පෙරමුණත් මේ ආණ්ඩුව හදන්න වේදිකාවට නැග්ගා. ගරු ඇමතිතුමනි, ප්‍රධාන පක්ෂ සියල්ල එකට එකතුවෙලා මේ ආණ්ඩුව හදපු නිසා මේ රටේ ආර්ථිකය සංවර්ධනය කරලා දැවැන්ත විප්ලවීය වෙනසක් වෙයි කියා මේ රටේ මිනිස්සු බලාපොරොත්තු වුණා.

ගරු මුදල් ඇමතිතුමනි, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුව 2015දී භාර දෙනකොට මේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 7ක් වශයෙනුයි තිබුණේ කියා තමුන්නාන්සේ දන්නවා. ඒ වාගේම ඔබතුමා දන්නවා, 2015 අග භාගය වනකොට ආර්ථික වර්ධන වේගය සියයට 5යි, 2016 වනකොට ආර්ථික වර්ධන වේගය සියයට 4.5යි, 2017 වනකොට ආර්ථික වර්ධන වේගය සියයට 3.1යි කියා. මට ආරංචි වුණු හැටියට 2018 මුල් කාර්තුව වනකොට මේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 2.7ක් කියලා තමයි කියන්නේ.

ගරු කබීර් හාෂිම් ඇමතිතුමනි, අපේ රටේ ඉතිහාසයේ අහලා තිබෙන්නේ, එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබුණොත් මිනිසුන්ගේ අත මිට සරු වනවාය කියායි. ජේ.ආර්. ජයවර්ධන මහත්මයාගේ ආණ්ඩුව කාලයේ සිට ඉතිහාසයේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු යටතේ මිනිසුන්ට එවැනි දේවල් සිද්ධ වුණා. අදත් එහෙම වෙලා තිබෙනවාය කියා ඔබතුමා කෑගල්ලට ගිහින් කියන්න එපා. එහෙම කිව්වොත්, ඔබතුමාට 2 X 2 පොල්ලකින් තමයි කන්න වෙන්නේ. මොකද, ඔබතුමා දන්නවා, මිනිසුන්ගේ අතේ සල්ලි නැහැ කියා. මහාමාර්ග ඇමතිතුමනි, වෙන මොනවත් ඕනෑ නැහැ නේ. ඔබතුමාගේ අමාත්‍යාංශයේ මුදල් ටික ගෙවා ගන්න ඔබතුමා පසුගිය අවුරුදු කීයක් තුළ උත්සාහ කරනවාද කියලා මට කියන්න. මා ඔබතුමාට මගේ, - [බාධා කිරීම්]

ගරු කබීර් හෂිම් මහතා (මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு கபீர் ஹாஷீம் - நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Highways and Road Development)
තමුන්නාන්සේලාගේ පරණ බිල් ටිකයි ගෙවන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒ කියන්නේ 2014 ඒවා ගෙවලාත් නැද්ද?

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඔබතුමන්ලාගේ කාලයේ ඒවාට රුපියල් බිලියන 70ක් ගෙවන්න සිද්ධ වුණා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා ඒ රුපියල් බිලියන 70ම ගෙවිවේ කරපු වැඩවලට නේ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එහෙම නම් මොනවාටද ගෙවිවේ? එහෙම නම් මට කියන්න, කරපු වැඩවලට ගෙවන්නේ නැතුව එක රුපියල් බිලියනයක් හෝ ගෙවිවේ මොනවාටද කියලා? ගරු ඇමතිතුමනි, ඒ රුපියල් බිලියන 70ම ගෙවිවේ කරපු වැඩවලටයි. හැබැයි ගරු ඇමතිතුමනි, මතක තබා ගන්න, බැඳුම්කරයෙන් විතරක් රුපියල් බිලියන 800ක් ගැහුවාය කියලා. [බාධා කිරීම්] ඇමතිතුමනි, වැඩ කරපුවාට නේ, ගෙවිවේ. තමුන්නාන්සේලා බැඳුම්කරයෙන් රුපියල් බිලියන 800ක් ගැහුවා නේ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ජනතාව රවට්ටන්න ශතයක්වත් නැතුව සංවර්ධන යෝජනා පටන් ගත්තා; මුල්ගල් තැබුවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ඇමතිතුමනි, මේ කාරණය මතක තබා ගන්න.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
අපි ඇවිත් තමයි ඒවාට සල්ලි වෙන් කළේ.

ගරු කබීර් හෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, what is your point of Order?

ගරු කබීර් හෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
Hon. Deputy Chairman of Committees, the Hon. Member said that Rs. 70 billion was paid for the work done. But, Rs. 70 billion that we had to pay was to - පොදු ජනයාගේ ඉඩම් බලෙන් පවරා ගත්තා. ඒවාට තඹ ශතයක්වත් ගෙවිවේ නැහැ. රෝට මිනිසුන් දොට්ට දමලා බලෙන් ගත්ත ඉඩම්වලට අපි තමයි ගෙවිවේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
That is not a point of Order.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Thank you, Hon. Minister.

ගරු ඇමතිතුමනි, ඒ මිනිසුන්ගේ ඉඩම් අත් පත් කර ගත්තේ රාජපක්ෂ මහත්මයලාට ගෙවල් හදන්න නොවෙයි කියන එක ඔබතුමා මතක තබා ගන්න. දකුණු අධිවේගී මාර්ගය හදන්නයි ඒ මිනිසුන්ගේ ඉඩම් අත් පත් කර ගත්තේ. කටුනායක අධිවේගී මාර්ගය හදන්නයි ඒ ඉඩම් අත් පත් කර ගත්තේ. මහනුවර අධිවේගී මාර්ගය හදන්නයි ඒ ඉඩම් අත් පත් කර ගත්තේ. ගරු ඇමතිතුමනි, වට රවුම් පාර හදන්නයි ඒ ඉඩම් අත්පත් කර ගත්තේ. ඒ නිසා මහාමාර්ග අමාත්‍යාංශය ඒ සියලු ඉඩම් අත් පත් කර ගත්තේ අධිවේගී මාර්ග හදන්නයි; මහාමාර්ග හදන්නයි. එහෙම නැතුව තමන්ට ගන්න නොවෙයි. ඒවාට වන්දි ගෙවන්න ඕනෑ. ඒක තමයි නීතිය, ඇමතිතුමනි. අපි බලයට පත් වුණා නම් අපි ඒ වන්දි මුදල් ගෙවනවාය කියන එක මා වග කීමෙන් ඔබතුමාට කියනවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ගරු මන්ත්‍රීතුමනි, ඒ ඉඩම් පවරා ගත්තේ මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන් නොවෙයි, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුවෙන්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ඇමතිතුමනි, මා ඔබතුමාට බාධා කළේ නැහැ. පක්ෂයේ සභාපතිතුමාටයි, අනාගත අගමැතිතුමාටයි දෙදෙනාටම මා බාධා කළේ නැහැ. [බාධා කිරීමක්] විනාඩියක්වත් දෙන්න බැහැ; තත්පරයක්වත් දෙන්නේ නැහැ; this is my time.

ගරු ඇමතිතුමනි, මා ඔබතුමාට කියනවා, මේ රටේ සියයට 7ක් වශයෙන් තිබුණු ආර්ථික වර්ධන වේගය තමුන්නාන්සේලා අද

සියයට 2.7 දක්වා අඩු කර තිබෙන බව. ඒ නිසා මෙය හොඳට මතක තබා ගන්න.

ගරු මංගල සමරවීර ඇමතිතුමනි, මා තවම හිතන්නේ තමුන්නාන්සේ මේ පැත්තට එන්න ඕනෑය කියලායි. තමුන්නාන්සේ ඉන්න ඕනෑ ඔය පැත්තේ නොවෙයි. තමුන්නාන්සේ ඉන්නේ වැරදි පැත්තේ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
හරියට හරි තැනයි මා ඉන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මංගල සමරවීර ඇමතිතුමනි, ඔබතුමාට මතක ඇති, මේ ආණ්ඩුව බලයට පත් වුණාම රුකියා දසලක්ෂයක් දෙනවාය කියා තමුන්නාන්සේලාගේ මැනිවරණ ප්‍රකාශනයෙන් කිව්ව බව.

එක්සත් ජාතික පක්ෂයේ හිටපු සභාපතිතුමාත්, දැන් සභාපතිතුමාත් එක ළඟ ඉඳගෙන ඉන්නවා. හැබැයි, අපේ ගරු කබීර් හෂිම් ඇමතිතුමාට සභාපතිකමට වඩා පක්ෂයේ මහ ලේකම්කමට අවශ්‍ය බලය තිබුණා. නමුත් ඔබතුමා එතුමාගේ බෙල්ල කැපුවා. දැන් බොරුවට එතුමාව "ෂේප්" කරන්න එපා, ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමනි. එතුමා පක්ෂයේ මහ ලේකම්කමට අවශ්‍ය බලතල තිබුණු කෙනෙක්. වැඩ කරපු කබීර් හාෂිම් ඇමතිතුමාගේ බෙල්ල කපලා, දැන් නිකම් එතුමාට සභාපති කැරට් අලය දෙන්න හදනවා. ඒවාට කබීර් හාෂිම් ඇමතිතුමා අහු වෙන්නේ නැහැ. මා ඔබතුමාට කියමින් සිටියේ මේ කාරණයයි, ගරු ඇමතිතුමනි. තමුන්නාන්සේලා 2015දී බලයට පත් වනකොට, රුකියා දසලක්ෂයක් දෙනවාය කිව්වා. 2014 මහ බැංකු වාර්තාවේ සංඛ්‍යා ලේඛන බලන්න, ගරු මංගල සමරවීර ඇමතිතුමනි. අපි 2015දී ඔබතුමන්ලාට මේ ආණ්ඩුව භාර දෙනකොට රුකියා ලක්ෂ 84ක් තිබුණා. ඔබතුමන්ලාගේ 2017 මහ බැංකු වාර්තාව අරගෙන බලන්න. 2017 මහ බැංකු වාර්තාවේ කීයද තිබෙන්නේ? රුකියා ලක්ෂ 82යි. තිබුණු රුකියා ලක්ෂ අසූහතරෙන් ලක්ෂ දෙකක් වාෂ්ප වෙලා. රුකියා ලක්ෂ 10ක් දෙනවාය කියපු ආණ්ඩුව අවුරුදු දෙකකට පස්සේ දීලා තිබෙන්නේ රුකියා ලක්ෂ දෙකයි. තමුන්නාන්සේලා මහ බැංකු වාර්තාව අරගෙන බලන්න. රුකියා ලක්ෂ 10ක් දෙනවා කියා බලයට පත් වුණු මේ ආණ්ඩුව මේ කාලය තුළදී දීලා තිබෙන්නේ රුකියා කීයද කියා අපි අහනවා. ඒ විතරක් නොවෙයි, තමුන්නාන්සේලා රුපියලේ අගයට කළ දේ බලන්න. 2014 අවුරුද්දට සාපේක්ෂව රුපියල සියයට 20කින් බාල්දු වෙලා තිබෙනවාය කියා ඔබතුමා දන්නවා, ගරු මුදල් ඇමතිතුමනි. ඒකේ පාඩුව -විදේශ ණයවල දේශීය අගය- බිලියන 800යි. රුපියලේ අගය බාල්දු වීම නිසා සිදු වුණු පාඩුව බිලියන 800ක්, ගරු ඇමතිතුමනි. අද වනකොට ණය ප්‍රමාණය බිලියන 800ක් දක්වා වැඩිවෙලා තිබෙනවා. මේ කියපු සියලු සංවර්ධන වැඩවලට මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ බිලියන 500යි වියදම් වුණේ.

දකුණේ අධිවේගී මාර්ගය හදන්න, මහනුවර අධිවේගී මාර්ගය සැලසුම් කරන්න, කටුනායක අධිවේගී මාර්ගය හදන්න, හම්බන්තොට වරාය හදන්න, හම්බන්තොට ගුවන් තොටුපොළ හදන්න, නොරොච්චෝලේ බලාගාරය හදන්න -මේ සියල්ලටම- ගියේ බිලියන 500යි, ගරු ඇමතිතුමනි. රුපියලේ අගය අවම වීම නිසා අපේ ණය වැඩි වීමේ ප්‍රමාණය විතරක් බිලියන 800ක් වෙනවා. මොන තරම් අකාර්යක්ෂම පාලනයක්ද? තමුන්නාන්සේලාගේ ආර්ථික ප්‍රතිපත්තිය මොන තරම් වැරැදිද? තමුන්නාන්සේලාගේ ආර්ථික ප්‍රතිපත්තිය වැරැදි බව මා තමුන්නාන්සේලාට කියනවා. තමුන්නාන්සේලා මේ රටට කර තිබෙන දේවල් මතක තබා ගන්න.

ගරු කබීර් හෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Minister.

ගරු කබීර් හෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
Sir, the Hon. Member is misleading the House.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
No, I am not misleading the House.

ගරු කබීර් හෂිම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
Hon. Member, you cannot mislead the House. Sri Lanka's currency has not dropped. There is an international gauge.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, that is not a point of Order.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට මා මේ කාරණය කියන්න ඕනෑ. එක පැත්තකින් තමුන්නාන්සේලා එහෙම කළා. ඒ විතරක්ද? 2015 ජනවාරි මාසයේ 08වැනි දා බලයට පත් වුණාට පස්සේ, තමුන්නාන්සේලා බැදුම්කර වංචාවෙන් මේ රටට කළ විනාශය කොපමණද? තමුන්නාන්සේලා බැදුම්කර වංචාවෙන් මේ රටට කළ විනාශයේ අගය රුපියල් ට්‍රිලියනයයි. කබීර් හෂිම් ඇමතිතුමනි, මේකටත් උත්තරයක් දෙන්න. බැදුම්කර වංචාවෙන් මේ රටට වුණු පාඩුව රුපියල් ට්‍රිලියනයක්; Rs. 1 trillion! මේ ආණ්ඩුව බලයට පත්වුණාට පසුව සිද්ධ වුණු බැදුම්කර වංචාවෙන් මේ රටට වුණු පාඩුව ට්‍රිලියනයක්, ගරු ඇමතිතුමනි. තමුන්නාන්සේලා දැන් ඒ ට්‍රිලියනය අය කරන්නේ කොහොමද? 2015දී අපි ආණ්ඩුව භාර දෙනකොට මේ රටේ රාජ්‍ය බදු ආදායම ට්‍රිලියනයයි. 2018 දෙසැම්බර් වනකොට රාජ්‍ය බදු ආදායම ට්‍රිලියන දෙකක් වෙනවා. තමුන්නාන්සේලා ට්‍රිලියනයකින් බදු ගහලා තිබෙන්නේ ඇයි? තමුන්නාන්සේලා බැදුම්කර වංචාවෙන් කළ හොරකම වහ ගන්න තමයි බදු ගහලා තිබෙන්නේ. එක්

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

පුද්ගලයකු මේ බැඳුම්කර හොරකම කළා. මේ රටේ ජීවත් වන මිලියන විසිදෙකම ඒ බැඳුම්කර වංචාවට බදු ගෙවන බව තමුන්නාන්සේලා හොඳට මතක තියා ගන්න. එක් පුද්ගලයකු කළ බැඳුම්කර වංචාව නිසා; එක් පුද්ගලයකු ගත් තීන්දුව නිසා රටට වුණු පාඩුව ට්‍රිලියනයයි; ගරු ඇමතිතුමනි, one trillion! One trillion! ගණන් හිලව් තමුන්නාන්සේ හදලා බලන්න.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ට්‍රිලියනයට බින්දු කීයද, ගරු මන්ත්‍රීතුමනි?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
තමුන්නාන්සේලා හිතාගෙන ඉන්නවා නේද? ට්‍රිලියනයට බින්දුද? කවුද, මේ අහන්නේ? විමල් වීරවංශ මැතිතුමාගේ සපත්තු හෝදපු මන්ත්‍රීතුමා අහනවා, "ට්‍රිලියනයට බින්දු කීයද?" කියා. විමල් වීරවංශ මන්ත්‍රීතුමාගේ සපත්තු හෝදලා සභාපතිකම් ගත් මන්ත්‍රීතුමා අහනවා, "ට්‍රිලියනයට බින්දු කීයද?" කියා. රෑට රෑට සිරිකොතට ගිහින්, එක් එක්කෙනා හිරේ දමන්න ෆයිල් හදපු නිසා මහ මොළකාරයා කියා තමුන්නාන්සේ හිතාගෙන ඉන්නවා. තමුන්නාන්සේ ජපානයේ කළේ මොනවාද කියා අපි දන්නවා. තමුන්නාන්සේ මගෙන් ඒ ගැන අහගන්න එපා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
හරි කියන්නකෝ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා කියමින් සිටියේ මේ කාරණයයි. බැඳුම්කර වංචාව නිසා මේ රටට වුණු පාඩුව ට්‍රිලියනයක් වෙනවා. ඒ ට්‍රිලියනය හා සමානවම තමුන්නාන්සේලා ජනතාවට බදු ගහලා තිබෙනවා.

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
තමුන්නාන්සේ ගණන හදන්නේ කොහොමද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගණන හදන හැටි මා තමුන්නාන්සේට කියා දෙන්නම්. "මේ බැඳුම්කර වංචාවේ පාඩුව බිලියන 12යි, දැන් මහ බැංකුව පර්පෙචුවල් සමාගමේ බිලියන 12ක් තහනම් කර තිබෙනවා, ඒ පාඩුවට මේ මුදල රෙපෝරුයි" කියා ඔබතුමන්ලා හිතාගෙන ඉන්නවා.

ගරු මන්ත්‍රීතුමා, බැඳුම්කර වංචාව නිසා සිදු වූ පාඩු දැන් දැන් එකින් එක එළියට එනවා. තමුන්නාන්සේලා හිතුවා ද, මහබැංකු බැඳුම්කර හොරකමට මහපොළ ශිෂ්‍යත්ව අරමුදලත් යොදා ගනීවි කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ කාල වේලාවත් ලැබී තිබෙනවා.

මහපොළ ශිෂ්‍යත්ව අරමුදල යොදා ගනිමින් බැඳුම්කර හොරකම කරයි කියලා තමුන්නාන්සේලා හිතුවා ද? එකෙන් මහපොළ ශිෂ්‍යත්ව අරමුදලට සිදු වුණු පාඩුව තමුන්නාන්සේලා දන්නවාද? උසස් අධ්‍යාපන අමාත්‍යාංශය බැඳුම්කර වංචාවට සම්බන්ධ වුණා කියලා තමුන්නාන්සේලා දන්නවාද? ඒකෙන් වුණු පාඩු තමුන්නාන්සේලා දන්නවාද? ඒ විතරක් නොවෙයි. තමුන්නාන්සේලා මතක තියා ගන්න. [බාධා කිරීමක්] ඒවායේ වුණු පාඩුව තමුන්නාන්සේ කියන්න. [බාධා කිරීමක්] ඒ කාලයේ සපත්තු හෝදලා වුණු පාඩුව තමුන්නාන්සේගේ කථාවේදී කියන්න. ඒ නිසා ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, -

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Yes, Hon. Minister, what is your point of Order?

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
Let me explain, Hon. Member.

In 2013, under His Excellency Mahinda Rajapaksa, there was a Committee set up to approve the UGC to invest their moneys on their own in any place they wanted.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, that is not a point of Order.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Hon. Minister, we have not done so during our time. -[*Interruption.*] That is rubbish. තමුන්නාන්සේට පුළුවන්ද අපේ කාලයේ- [බාධා කිරීමක්] අපේ කාලයේ මේවා කළා කියලා ඔබතුමාට කියන්න පුළුවන්ද? ඔබතුමාට කියන්න පුළුවන්ද, 2015ට කලින්-[බාධා කිරීමක්] කබීර් හෂීම් ඇමතිතුමා, ඔබතුමායි, මමයි හෙට විවාදයකට එන්න ලැහැස්ති වෙලා තමයි හිටියේ. -[බාධා කිරීමක්] ඇයි, ඔබතුමාට තරහා යන්නේ? Hon. Minister, why are you getting angry? ගරු ඇමතිතුමා ඔබතුමායි, මමයි, අජිත් පී. පෙරේරා රාජ්‍ය අමාත්‍යතුමායි "බලය" වැඩසටහනට සහභාගි වෙන්න හෙට දින වෙන් කරගෙන හිටියා. අවසාන මොහොතේදී ඔබතුමා ඒක අවලංගු කළා. ඔබතුමා හෙට ඒ විවාදයට එන්න. ඒ

විවාදයට ඔබතුමා එන්න, මම ඒ විවාදයට ලැහැස්තියි. ඔබතුමාත් සමඟ අජිත් පී.පෙරේරා මැතිතුමාත් "බලය" වැඩසටහනට එනවා කියලා මටත් එන්න කියලා දැනුම් දුන්නා. මම ලැහැස්ති වෙලා හිටියා. අවසාන මොහොතේ ඔබතුමාට අසනීපයි කියලා එය අවලංගු වුණා කිව්වා.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(මාණ්පුමිකු இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
එන්න ඔබතුමා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
Hon. Minister, you challenged me. Do you want me to come? [බාධා කිරීමක්] මට සමාවෙන්න. ඔබතුමා ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක්. ඔබතුමා වාගේ අමාත්‍යවරයෙකු එක්ක මම විවාද කරන එක අවශ්‍ය නැහැ. එහෙමනම් මම පසුපෙළේ මන්ත්‍රී කෙනෙකු එක්ක ගිහිල්ලා විවාද කරන්නම්. ඔබතුමා එච්චර උසස් ගණයේ කෙනෙක් කියලා ඔබතුමා හිතනවා නම්, එහෙම හිතාගන්න. ප්‍රශ්නයක් නැහැ. ඇමතිතුමා, ඔබතුමාත් ආණ්ඩුවේ කැබිනට් ඇමතිවරයෙක්, මමත් හිටපු ඇමතිවරයෙක් කියන එක මතක තියා ගන්න. ඔබතුමාට කලින් මම දේශපාලනය කරලා තිබෙනවා. ඒකත් ඔබතුමා මතක තියා ගන්න. [බාධා කිරීමක්] ඔබතුමා අපට එහෙම කියන එක සාධාරණ නැහැ නේ, ගරු ඇමතිතුමා. මට ඔබතුමාගේ වේදනාව තේරෙනවා. [බාධා කිරීමක්] සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පිළිබඳ කටයුතු සොයා බලන්න තමුන්නාන්සේලාට අවුරුදු තුනහමාරක්ම තිබුණා නේ දෙවිහාමුදුරුවනේ! ඒ පිළිබඳ තමුන්නාන්සේලාට නඩු දමන්න තිබුණා නේ. ඊයේ කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණයේදී කිව්වා, "විශේෂ අධිකරණයට පළමුවෙන්ම ගෙනෙන්නේ මහින්දානන්දගේ නඩුව." කියලා. ඊයේ නීතිපති එකෙන් කිව්ව නේ, විශේෂ අධිකරණයට කැරම් බෝඩ් නඩුව ගෙනෙනවා කියා. එතකොට මේ රටේ සිදු වෙලා තිබෙන ලොකුම වංචාව කැරම් බෝඩ් වංචාවයි. නීතිපතිතුමා ඊයේ කියනවා, විශේෂ අධිකරණයේ ගන්නා පළමුවෙනි නඩුව මහින්දානන්ද අලුත්ගමගේ ගේ නඩුව කියලා. ගන්නකෝ. අපි බලාගෙන ඉන්නේ ගන්නතුරුයි. තමුන්නාන්සේ හිතනවාද, නඩු ගත්තා කියලා අපි කටවල් වහයි කියලා. තමුන්නාන්සේලා හිතනවාද නඩු දාලා අපේ කටවල් වහන්න. තමුන්නාන්සේලා විශේෂ අධිකරණ හැදුවේ දේශපාලන පළිගැනීම් කරන්නද? මන්ත්‍රීවරුන් හිරේ දමන්නද? තමුන්නාන්සේලාගේ විශේෂ අධිකරණයේ **හෙලුවැලි** ඊයේ ගැලවුණා. තමුන්නාන්සේලා කිව්වා, "විශේෂ අධිකරණයේ පළමුවෙනි නඩුව හැටියට ගන්නේ මහින්දානන්දගේ නඩුව." කියලා. මහින්දානන්දගේ කැරම්බෝඩ් නඩුව කියලා ඊයේ නීතිපති දැනුම් දුන්නා. තමුන්නාන්සේලාගේ දේශපාලනය ඊයෙම දැක්කා. තමුන්නාන්සේලා අපව බය කරලා, කෑ ගහලා උත්සාහ කරනවා- [බාධා කිරීමක්]

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
නුවර ගිහිල්ලා බයේ පැනලා දිව්වා. සංවිධායකකම් හොයා ගෙනයි ගියේ.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
කැරම් බෝඩ් නඩුව-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කියාගෙන ආවේ මේකයි. විමල් වීරවංශ මැතිතුමා ඇමති ධුරයේ හිටපු කාලයේ එතුමාගේ අමාත්‍යාංශය යටතට එන ආයතනයක සභාපති කෙනෙක් හිටියා. ඔහු සියලු කොන්ත්‍රාත්වලින් සියයට තුනක කොමිස් මුදලක් ගත්තා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මන්ත්‍රීතුමා, ඔබතුමා ඔප්පු කරලා පෙන්වන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඇයි ඔබතුමා කලබල වුණේ? [බාධා කිරීමක්]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
හොඳයි. පුළුවන් නම් ඔප්පු කරලා පෙන්වන්න.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ආශු මාරසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමාට කිව්වේ නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ආශු මාරසිංහ මන්ත්‍රීතුමනි, ඔබතුමා කලබල වුණේ ඇයි? ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම ඒ සභාපතිවරයා ගැන කථා කරන්නේ නැහැ.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
පුහුල් හොරා කරෙන් දැනේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම කියාගෙන ආවේ,- [බාධා කිරීමක්] ආණ්ඩුව මෙච්චර කලබල වෙලා ඇයි? ඔබතුමන්ලාගේ අවස්ථාවේ උත්තර දෙන්නකෝ. අර බලන්නකෝ, මුදල් ඇමතිතුමා ගෞරවනීය විධියට අහගෙන ඉන්න හැටි.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
අසත්‍ය කියනකොට කොහොමද කථා නොකර ඉන්නේ?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මම කියන්නේ අසත්‍ය නම්, ඔබතුමන්ලා ඔබතුමන්ලාගේ වෙලාවේදී උත්තර දෙන්නකෝ. [බාධා කිරීමක්] තමුන්නාන්සේලා කියනවා,-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
I had 30 minutes, Sir.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාට extra five minutes දුන්නා. තව two minutes තිබෙනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාට විනාඩි 15ක කාලයක් තිබුණා. මට විනාඩි 15ක කාලයක් තිබුණා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
I gave you only five minutes.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාගේ විනාඩි 15ත් මම ගත්තා. එතකොට මට විනාඩි 30ක කාලයක් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම වෙලාව බලාගෙනයි සිටියේ. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමාගෙන් ලබාගත් වේලාවෙන් මම තවමත් විනාඩි 7යි කථා කරලා තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
විනාඩි 5යිද, විනාඩි 15යිද?

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
විනාඩි 15යි. ගරු බන්දුල ගුණවර්ධන මන්ත්‍රීමා වෙනුවෙන් වෙන් වුණු විනාඩි 15ක කාලයක් තිබෙනවා. ඔබතුමා list එක බලන්න.

මම කියපු එකක් හරි වැරැදියි කියලා කියනවා නම්, තමුන්නාන්සේලා තමුන්නාන්සේලාගේ කථාවලදී උත්තර දෙන්න.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
ඔය අසත්‍ය එළියේදී කියන්න. පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා මෙතැන අසත්‍ය කියන්න එපා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු මන්ත්‍රීතුමා, ඩොලර් එක අවම වීම නිසා අපේ ණය ප්‍රමාණය රුපියල් බිලියන 800කින් වැඩිවෙලා නැත්නම් මොකක්ද වෙලා තිබෙන්නේ කියලා තමුන්නාන්සේ කියන්නකෝ. [බාධා කිරීමක්] ආර්ථික වර්ධන වේගය සියයට 2.4ට අඩුවෙලා නැත්නම් ඒ පිළිබඳව ඔබතුමන්ලා කියන්නකෝ. තමුන්නාන්සේලා කරපු බැඳුම්කර වංචාවෙන් ඒ වගේ විශාල පාඩුවක් වෙලා නැත්නම් ඒ පිළිබඳවත් කියන්නකෝ.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වෙලා ඔබතුමා අසත්‍ය කියන්න එපා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ඇමතිතුමා, කියන්න.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මේ කාර්තුවේදී ආර්ථික වර්ධන වේගය සියයට 2.3ට අඩු වෙලාත් නැහැ, ඩොලරයේ වටිනාකම ඉහළ යෑම නිසා ඔය කියන මුදල අපට අහිමි වෙලාත් නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ගරු ඇමතිතුමනි, මට සමාවෙලා තව වතාවක් කියන්න. ඔබතුමා කියපු එක මට ඇහුණේ නැහැ.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
මම කිව්වේ, මේ කාර්තුවේදී ආර්ථික වර්ධන වේගය සියයට 2.3ට අඩු වෙලාත් නැහැ,-

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඇමතිතුමා, ගිය අවුරුද්දේ ආර්ථික වර්ධන වේගය කීයද?

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
සියයට 3.1යි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හරි, එච්චරයි. අපි ආණ්ඩුව දෙනකොට සියයට 7යි. පසු ගිය අවුරුද්දේ සියයට 3.1යි. Thank you, Hon. Minister.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
ඒ වාගේම ඇමෙරිකානු ඩොලරයට අනුව රුපියලේ අගය අඩු වුණා කියලා අපේ ණය ප්‍රමාණය වැඩි වෙලාත් නැහැ. ඒකත් අසත්‍යයක්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

ගරු ඇමතිතුමා, ඩොලරයේ වටිනාකම රුපියල් 131ට තිබියදී ගෙවන්න තිබුණු ණය ප්‍රමාණයට වඩා ඩොලරය රුපියල් 162ට වැඩි වුණාම ගෙවන්න වන ණය ප්‍රමාණය වැඩි වෙන්නේ නැද්ද? ඩොලරයේ අගය වැඩිවීම නිසා අපට පාඩුවක් වෙලා නැහැ කියලා මේ රටේ මුදල් ඇමතිතුමා කියනවා නම්,-

ගරු මංගල සමරවීර මහතා
(මාණ්පුමිකු මඞ්කළ සමරවීර)
(The Hon. Mangala Samaraweera)

ඩොලර් එක අඩු වැඩි වුණාට අපි ගෙවිය යුතු ණය ප්‍රමාණය වෙනස් වෙන්නේ නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

හරි, හරි. මේ රටේ මුදල් ඇමතිතුමා මේ රටට කියනවා, "ඩොලරයේ වැඩිවීම නිසා මේ රටේ ආර්ථිකයට කිසිදු බලපෑමක් නැත." කියලා. හරිනේ? ඒකනේ මුදල් ඇමතිතුමා කියන්නේ? ඔබතුමාගේ ඉල්ලීම මම පිළිගන්නවා. තීරණය මේ රටේ මිනිසුන්ගේ. ඇමතිතුමා, මගේ ප්‍රශ්නය මොකක්ද කියලා ඔබතුමා දන්නවා. 2015 අපි මේ ආණ්ඩුව භාරදෙන්න ඉස්සෙල්ලා 2014දී රාජ්‍ය බදු ආදායම රුපියල් ට්‍රිලියන 1යි. හැබැයි, 2018 දෙසැම්බර් වෙනකොට ඔබතුමා රාජ්‍ය බදු විධියට රුපියල් ට්‍රිලියන 2ක් ගන්නවා. මිනිසුන්ගෙන් අය කරන බදු මුදල තමුන්නාන්සේලා සියයට 100කින් වැඩි කරලා තිබෙනවා. තමුන්නාන්සේලා බදු නොගහන්නේ මොනවාටද කියලා කියන්න. මිනිසුන්ට මේ බදු මුදල් ගෙවන්න බැහැ.

ගරු මංගල සමරවීර මහතා
(මාණ්පුමිකු මඞ්කළ සමරවීර)
(The Hon. Mangala Samaraweera)

හොර සල්ලිවලට බදු ගහන්න ඕනෑ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

හොර සල්ලිවලට සියයට 100ක් බදු ගහන්න. ඒක හොඳයි. හැබැයි, ඔබතුමා බදු ගහන්නේ හොර සල්ලිවලට විතරද? මේ රටේ ජනගහනයට වැඩිය ජංගම දුරකථන තිබෙනවා. ජංගම දුරකථන පාවිච්චි කරන හැම කෙනෙකුටම මේ බද්ද බලපානවා.

ගරු මංගල සමරවීර මහතා
(මාණ්පුමිකු මඞ්කළ සමරවීර)
(The Hon. Mangala Samaraweera)

චීනයෙන් ආපු සල්ලිවලට බදු ගහන්න බැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

මොකක්ද ඇමතිතුමා?

ගරු මංගල සමරවීර මහතා
(මාණ්පුමිකු මඞ්කළ සමරවීර)
(The Hon. Mangala Samaraweera)

"The New York Times" පුවත් පතේ තිබෙන විධියට ගත් මුදල්වලට අපට tax ගහන්න බැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

ඒකට නීතියක් හැදුවා නම් හොඳයි. ඒ විතරක් නොවෙයි ගරු ඇමතිතුමනි, අපේ ආණ්ඩුව කාලයේ තිබුණු ලොකුම වැඩ පිළිවෙළ තමයි සංවර්ධනය. ගරු ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, construction field එක දැන් සියයට 16කින් අඩු වෙලා. මේ රටේ සංවර්ධන ක්ෂේත්‍රය සියයට 16කින් කඩාගෙන වැටිලා. ඒ විතරක් නොවෙයි, රාජ්‍ය බැංකුවල non performing loansවල percentage එක තිබුණේ සියයට 3ක් ලෙසයි. අද ඒක සියයට 7 දක්වා වැඩි වෙලා. එදා මූල්‍ය සමාගම්වල නොගෙවන ණය විධියට තිබුණේ සියයට 5යි. අද ඒක සියයට 15 දක්වා වැඩි වෙලා. ඔබතුමන්ලා මේවා හොඳට බලන්න. තමුන්නාන්සේලා කියනවා, සල්ලි තිබෙනවා කියලා. තමුන්නාන්සේලා බලන්න, NDB එකේ non performing loansවල percentage එක විධියට තිබුණේ කීයද? Three per cent. Now it has gone up to seven per cent. සියයට 7යි. මිනිස්සු ණය ගෙවන්නේ නැහැ. ආයෝජනයක් කිරීම සඳහා ෆිනෑන්ස් සමාගමක් රුපියල් මිලියන 100ක් දුන්නාම, ඒ ෆිනෑන්ස් සමාගමට ආපසු ලැබෙන්නේ රුපියල් මිලියන 85යි. ඒවායින් සියයට 15ක් මිනිස්සු ආපසු ගෙවන්නේ නැහැ. එතකොට ෆිනෑන්ස් සමාගම් දුවන්නේ කොහොමද? එතකොට බැංකු දුවන්නේ කොහොමද?

ගරු මංගල සමරවීර මහතා
(මාණ්පුමිකු මඞ්කළ සමරවීර)
(The Hon. Mangala Samaraweera)

ඔබතුමාගේ යාළුවා කරපු වැඩේ නිසානේ ඒක වුණේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

ඇමතිතුමා, ඔබතුමන්ලා හැම දේම අපේ යාළුවන්ට භාර දෙනවා.

ගරු මංගල සමරවීර මහතා
(මාණ්පුමිකු මඞ්කළ සමරවීර)
(The Hon. Mangala Samaraweera)

විනාශ කරපු ආර්ථිකය තමයි අපි මේ හදන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

එහෙම නම්, තමුන්නාන්සේලා ඇයි, බැඳුම්කරයෙන් හොරකම් කළේ? ඔබතුමා මට කියන්න, බැඳුම්කරයෙන් හොරකම් කළේ ඇයි කියලා.

ගරු මංගල සමරවීර මහතා
(මාණ්පුමිකු මඞ්කළ සමරවීර)
(The Hon. Mangala Samaraweera)

කිසි බැඳුම්කරයකින් අපි හොරකම් කරලා නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(මාණ්පුමිකු මහින්දානන්ද අලුත්කමකේ)
(The Hon. Mahindananda Aluthgamage)

හොරකම් කරලා නැහැ! හරි. මේ රටේ ජනතාවගේ දැනගැනීම පිණිස මේ රටේ මුදල් ඇමතිවරයා කියනවා, බැඳුම්කරයෙන් හොරකමක් වෙලා නැහැ කියලා; ඩොලරයේ වැඩිවීම නිසා මේ රටට පාඩුවක් වෙලා නැහැයි කියලා. මුදල් ඇමතිතුමනි, මේ රටේ විගණකාධිපතිවරයා කියනවා, බැඳුම්කර ගනුදෙනුවේ හොරකමක් වෙලා තිබෙනවා කියලා. ජනාධිපති පත් කරපු කොමිසම කියනවා, බැඳුම්කර ගනුදෙනුවේ හොරකමක් වෙලා තිබෙනවා කියලා.

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

නමුත් ඔබතුමා කියනවා, බැඳුම්කරයෙන් හොරකමක් වෙලා නැහැ කියලා. ගරු ඇමතිතුමනි, මම මේ කියාගෙන එන්නේ මේ වෙලා තිබෙන, ආර්ථිකයේ කඩා වැටීම ගැනයි. මිනිසුන්ට ජීවත් වෙන්න බැහැ. තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමනි, තමුන්නාන්සේ අද මට කෑ ගැහුවා. තමුන්නාන්සේගේ ගමේ රුපියල් ලක්ෂ 5ට, ලක්ෂ 10ට රාජ්‍ය ආයතනවල කොන්ත්‍රාත් කරන කොන්ත්‍රාත්කාරයන් ඉන්නවා. ඔබතුමා කියන්න, මාර්ග සංවර්ධන අධිකාරියේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වැඩ කරපු තමුන්නාන්සේලාගේ කොන්ත්‍රාත්කාරයන්ට අද සල්ලි ගෙවනවාද කියලා. ගරු මන්ත්‍රීතුමා කියන්න, අද ඒ අයට සල්ලි ගෙවනවාද කියලා. අද සල්ලි ගෙවන්නේ නැහැ. පසුගිය කාලයේ, කිරිඇල්ල ඇමතිතුමාගේ කාලයේ, කරපු වැඩවල මුදල් ගෙවන්නේ නැහැ. මම ඔබතුමාට දොස් කියන්නේ නැහැ; නමුත් ඒවාට ගෙවන්න මුදල් නැහැ. [බාධා කිරීමක්] ඇමතිතුමනි, මතක තියාගන්න, සංවර්ධනය නැවතුණු නිසා අද මේ රට සම්පූර්ණයෙන් කඩාගෙන වැටිලා තිබෙන බව. අද මිනිසුන්ගේ වාහන finance companiesවලින් seize කරනවා. අද මිනිසුන්ට පඩි ගෙවා ගන්න බැහැ. මංගල සමරවීර ඇමතිතුමනි, මහනුවර රෝහලට ගියාම මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රධාන කොන්ත්‍රාත්කරුවන් දෙන්නෙක් මට හමුවුණා. මේ දෙන්නා මාව ඇඳ ළඟට ගෙන්වා ගෙන කථා කළා. ඒ දෙන්නාම මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රබල කොන්ත්‍රාත්කරුවෝ. දෙන්නාම අද හෘදයාබාධවලට ලක්වෙලා. ඒ අයට ලබා ගන්නට තිබෙන මුදල රුපියල් මිලියන 80යි, මිලියන 120යි. අවුරුදු දෙකහමාරක්ම මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සතපහක් ගෙවලා නැහැ; මහනුවර මාර්ග සංවර්ධන අධිකාරිය ගෙවලා නැහැ; මහනුවර Water Board එක ගෙවලා නැහැ. මේ මිනිසුන් කොන්ත්‍රාත් කරලා අද ගෙවා ගන්න බැහැ; ලොරි ටික seize කරලා; මිනිසුන්ට කන්න දෙන්න බැහැ; සේවකයන්ට පඩි දෙන්න බැහැ. මිනිසුන් ගෙවල් වට කරලා. ඉඳුනිල් තුෂාර අමරසේන මන්ත්‍රීතුමනි, සාමාන්‍ය ව්‍යාපාරිකයන් අද වහ බොන තත්ත්වයට පත් වෙලා. මේක තමයි යථාර්ථය. ඒ නිසා ඔබතුමන්ලා අපත් සමඟ රණ්ඩු වෙන්න එපා. මේක තමයි ඇත්ත කථාව. අද මේ රටේ සල්ලි නැහැ, මිනිසුන්ට ජීවත් වෙන්න බැහැ. ඉතාම බරපතළ ආර්ථික කඩා වැටීමක් වෙලා තිබෙන්නේ. තමුන්නාන්සේලා උත්සාහ කරනවා. තමුන්නාන්සේලා විවිධ යෝජනා දානවා. තමුන්නාන්සේලා විශේෂ අධිකරණ හදලා, මේ ප්‍රශ්න විසඳන්න හදනවා. තමුන්නාන්සේලා නිවි යෝර්ක් ටයිම්ස්වල තිබෙන තොරතුරු අරගෙන මේ මාතෘකා වෙනස් කරන්න හදනවා. ඒවා වෙනස් කළාට හරියන්නේ නැහැ. මොකද, රටේ සල්ලි නැහැ. ඒක හොඳට තේරුම් ගන්න. ගරු මුදල් ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් විශේෂ ඉල්ලීමක් කරනවා, සාමාන්‍ය පන්තියේ කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන්. මධ්‍යම පළාතේ කොන්ත්‍රාත්කරුවන්ගේ සංගමයේ නිලධාරීන් එකසිය ගණනක් ඇවිල්ලා අපව හමුවුණා. අද ඒ මිනිසුන්ට ජීවත් වෙන්න බැහැ. ඒ මිනිසුන්ගේ වාහන සියල්ල seize කරලා. ඒ මිනිසුන්ගේ බැංකු ණය ගෙවා ගන්න බැහැ. ඒ මිනිසුන් ආතතියෙන් පෙළෙනවා; ලෙඩ වෙලා; පිස්සෝ වෙලා. ඒ මිනිසුන්ට කියන්න කෙනෙක් නැහැ. ඒ සල්ලි ඉල්ලන්න ගියාම commissions ඉල්ලනවා. ඒ නිසා ඇමතිතුමා, බරපතළ ප්‍රශ්නයක් මේක ඇතුළේ තිබෙනවා. කරුණාකරලා මොනවා හෝ කරලා, මේ මුදල් ගෙවීමට තමුන්නාන්සේලා කටයුතු කරන්න. මේ යන විධියට මේක යන්න බැහැ. මේ රටේ ආර්ථිකය ගැන තමුන්නාන්සේලා මොන සංඛ්‍යා ලේඛන දක්වමින් කථා කළත් වැඩක් නැහැ. ගරු මුදල් ඇමතිතුමාත් පිළිගත්තා, මේ කාරණය.

ඔබතුමාත් පිළිගත්තා, ආර්ථිකයේ යම් කඩා වැටීමක් තිබෙනවා කියලා. ඒ නිසායි අපි ඔබතුමාට කියන්නේ.

තමුන්නාන්සේලා කථා කරනවා, සමෘද්ධිය රුපියල් ලක්ෂ 5ක් දෙනවා කියලා. තමුන්නාන්සේලා කථා කරනවා, තව තව දේවල් දෙනවා කියලා. තමුන්නාන්සේලා එහෙම දෙන එක හොඳයි. හැබැයි, මොනවා කරන්නත් මිනිසුන් අතේ සල්ලි ගැවසෙන්න ඕනෑ. අපි අද පිළිගන්න ඕනෑ, මිනිසුන්ගේ අතේ සල්ලි නැහැ කියන කාරණය. කබීර් හෂීම් ඇමතිතුමනි, මම හිතනවා, මම කථා කරපු කාරණා ගැන ඔබතුමා මා සමඟ අමනාප නැහැ කියලා. ගරු ඇමතිතුමනි, එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් ආපු හැමදාම මේ රටේ මිනිසුන්ගේ එක්තරා මතයක් තිබුණා. ඒ තමයි, එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක් ආවොත් අත මිට සරු වෙනවා; සාක්කුවට සල්ලි හම්බ වෙනවා කියන මතය. අද ඒ මතය වෙනස් වෙලා. අද මිනිසුන්ගේ අතේ සල්ලි නැහැ. ඔබතුමා රෙදි කඩයකට ගිහිල්ලා බලන්න, වෙනදා අලුත් අවුරුද්දට වෙච්ච රෙදි ගනුදෙනු අද වෙනවාද කියලා. තමුන්නාන්සේලා hardware shop එකකට ගිහිල්ලා බලන්න. මේ රටේ සංවර්ධන ක්ෂේත්‍රය සම්පූර්ණයෙන් කඩාගෙන වැටිලා. අද මිනිසුන්ට ජීවත් වෙන්න බැහැ. බරපතළ ආර්ථික අර්බුදයකට මුහුණ දීලා තිබෙනවා. ඒ නිසා අපි මේ ආණ්ඩුවට කියන්නේ, ගරු මුදල් ඇමතිතුමාට කියන්නේ, මේ පිළිබඳව යම් වැඩපිළිවෙළක් සකස් කරන්න කියලායි. මේ පිළිබඳ යම් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරලා මිනිසුන්ට ජීවත් වෙන්න පුළුවන් වටාපිටාවක්, පරිසරයක් හදන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.12]

ගරු කබීර් හෂීම් මහතා (මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා)
(மாண்புமிகு கபீர் ஹாஷீம் - நெடுஞ்சாலைகள் மற்றும் வீதி அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Kabir Hashim - Minister of Highways and Road Development)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද විපක්ෂයේ ඉඳගෙන කෑ ගහන අය හැසිරෙන හැටි දැක්කාම මට මතක් වෙන්නේ පැරණි සිංදුවක්. ඒ තමයි "සීලවතී සිල් අරගෙන මකුණෝ මරනවා" කියන සිංදුව. මොකද, ඒ අය කථා කරන, හැසිරෙන ආකාරය බැලුවාම නම් පෙනෙන්නේ හරියට හතර පෝයට සිල් ගන්න උදවිය වාගේයි. නමුත් බලයේ ඉන්න කොට සිල් පද පහම කඩලා, එක එක දේවල් කරලා, මේ රටේ ජනතාවගේ අයිතිවාසිකම් නැති කරලා, කරන්න පුළුවන් සියලුම වැරදි වැඩ කරලා තිබෙනවා.

අද මේ සභාවට ඇවිල්ලා මේ අය මේ ඕපාදූප, අසත්‍යය කියන කොට ඇත්තටම කේන්තියක් නොවෙයි පිළිකුලක් ඇති වෙන්නේ. ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා විශේෂයෙන්ම විනිමය අනුපාතිකය - exchange rate එක - ගැන කථා කළා. අපේ ගරු මුදල් ඇමතිතුමා ගරු සබා ගැබේ ඉන්න වෙලාවේම මම මේක ඒ මන්ත්‍රීතුමාට කියන්නට ඕනෑ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ආර්ථික න්‍යායයන් ගැන දැනගෙන කථා කරන්න. ලංකාවේ ආර්ථිකයේ දුර්වලකමක් නිසා නොවෙයි,- [බාධා කිරීමක්] මට කථා කරන්නට ඉඩ දෙන්න. ඔබතුමාට වාගේ වැඩි කාලයක් මට නැහැ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

Sir, I rise to a point of Order. Hon. Minister mentioned my name. මම කියන්නද?

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)

හරි, කියන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා සින්දු දෙකක් කිව්වා. ඒ සින්දු දෙකට -

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
මම කෑල්ලක් දා ගන්නම්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන ඇමතිවරයා හැටියට - [බාධා කිරීමක්]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, that is not a point of Order.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
විනිමය ගැන කථා කරන විට කියන්නට ඕනෑ, සමස්තයක් හැටියට ගත්තාම පසුගිය කාලයේ ඇමෙරිකානු ඩොලරය ශක්තිමත් වෙලා ලෝකය වටේම රටවල මුදල් ඒකකයන්ගේ අගය අඩු වෙලා තිබෙන බව. රුසියාවේ "රූබලය" අඩු වෙලා තිබෙනවා, කොලොම්බියාවේ "පේසෝ" එක අඩු වෙලා තිබෙනවා, South Africaවල "රෑන්ඩ්" එක අඩු වෙලා තිබෙනවා, ඉන්දියාවේ රුපියල අඩුවෙලා තිබෙනවා, කැනඩාවේ ඩොලරය සියයට 4.7කින් අඩු වෙලා තිබෙනවා. ඒ වාගේම ඕස්ට්‍රේලියාවේ ඩොලරය සියයට 6.2කින් අඩු වෙලා තිබෙනවා. ඒ අනුව ලංකාවේ රුපියල සියයට 2.2කින් තමයි අඩු වෙලා තිබෙන්නේ. අනෙක් රටවල විනිමයට සාපේක්ෂව බලන විට ඒක අඩු ප්‍රතිශතයක්. එම නිසා විෂය දන්නේ නැතිව ආර්ථික ප්‍රශ්න ගැන කියලා, මේ රට කඩා වැටුණා කියන එක අමූලික බොරුවක්. ආර්ථික න්‍යායක් තේරෙන්නේ නැති මිනිසුන්ට මම කියන්නේ ඒවා කථා කරන්නට එපා කියලායි. අද රාජපක්ෂ රෙජීමයේ අය මේ සභාවට ඇවිල්ලා උපාසක වෙන්න බලනවා.

මම මතක් කරන්නට කැමැතියි, 2005 සිට ආණ්ඩු කළ ඒ අය මොකක්ද කළේ කියලා. මහින්ද රාජපක්ෂ මහත්මයා ඇතුළු කණ්ඩායම බදු ගැන කථා කරන විට මට හරි සතුටක් දැනුණා. ඒ අය කියනවා, අපි බදු වැඩි කළා ලු. හිනා වෙන්නට ඕනෑ කාරණාවක් මම පත්තරයේ දැක්කා. ඒ, රාජපක්ෂ උන්නැහේ ජූනි මාසයේ 06 වෙනි දා "දිවයින" පත්තරයට කරලා තිබෙන ප්‍රකාශයක්. එහි මෙසේ සඳහන් වෙනවා:

"අපේ රජයක් යටතේ බදු 20% කින් අඩුකරනවා - මහින්ද රාජපක්ෂ"

මේක මාර වැඩක්!

තවදුරටත් එහි මෙසේ සඳහන් වෙනවා:

"රජය හිතු හිතු ආකාරයට අය කරන බදු නිසා ජනතාව බලවත් අසරණ තත්ත්වයට පත් වී ඇති බවත් ඒ නිසා තමන්ගේ රජයක් බලයට පත් වූ විට දැනට පවතින බදු සියයට 20 කින් අඩුකරන බවත් හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ඊයේ (5 දා) "දිවයින"ට කීය."

පොඩ්ඩක් ඉන්න, කෑ ගහන්නේ නැතිව.

මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ, 2011 නොවැම්බර් මාසයේ අය වැයේදී, මුදල් ඇමතිවරයා හැටියට මහින්ද රාජපක්ෂ මහත්මයා මේ පාර්ලිමේන්තුවේදී තොග සහ සිල්ලර වෙළෙඳාමට ජාතිය ගොඩනැඟීමේ බද්ද අය කරනවා. බදු අඩු කරනවා කියන මහින්ද රාජපක්ෂ මහත්මයා මේ රටේ පළමුවෙනි වතාවට තොග සහ සිල්ලර වෙළෙඳාමට ජාතිය ගොඩ නැඟීමේ බද්ද අය කරලා ඒකත් සමඟම කිරි පිටිවලට, පාන් පිටිවලට, සීනිවලට, පරිප්පුවලට, කරවලවලට, කොත්තමල්ලිවලට, හාල්මැස්සන්ට VAT එක වැඩි කරනවා. මේ අත්‍යවශ්‍ය ආහාරවලට VAT එක වැඩි කරනවා. රාජපක්ෂ උන්නැහේ එදා එහෙම කරලා දැන් කියනවා, "අපේ රජයක් ආවාම බදු අඩු කරනවා" කියලා. ඒ වුණත් රාජපක්ෂ උන්නැහේගේ කාලයේ බදු ප්‍රතිශතය දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 14කට අඩු වෙනවා. ඇයි ඒ අඩු වෙන්නේ? 2011 තොග සහ සිල්ලර වෙළෙඳාමට NBT එක ගහලා VAT එක වැඩි කළාට රාජපක්ෂ උන්නැහේගේ ප්‍රතිපත්තිය වුණේ මොකක්ද? කොළඹ 07 ඉන්න කොන්ත්‍රාත්කාරයන්, පොහොසතුන්, ගජමිතුරන් සහ පවුලේ අයට උදව්වු කිරීම. ඒ අනුව මොකක්ද කරන්නේ? 2011දී IMF නියමයක් අනුව සමාගම් බද්ද සියයට 35 සිට සියයට 28 දක්වා අඩු කරනවා. හාල්මැස්සන්ට, පරිප්පුවලට VAT එක වැඩි කරලා, සමාගම් බද්ද සියයට 35 සිට සියයට 28 දක්වා අඩු කරනවා. දැන් ලජ්ජා නැතිව මේ සභාවට ඇවිල්ලා කියනවා, තමුන් මිනිසුන් වෙනුවෙන් පෙනී සිටියා කියලා. ඉන් පසුව මොකක්ද කරන්නේ? සමාගම් බද්ද අඩු කළා විතරක් නොවෙයි, මේ රාජපක්ෂ උන්නැහේ සමාගම්වලට අය කරන VAT එක සියයට 20 සිට සියයට 12 දක්වා අඩු කරනවා. ඒකයි කළේ. සමාගම්වල VAT එක සියයට 12 දක්වා අඩු කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Minister, you have two minutes more.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
දැන් කියනවාද, තමුන්නාන්සේලා ජනතාව නියෝජනය කළාද, කොම්පැනි නියෝජනය කළාද කියලා? දැන් මේ සභාවට ඇවිල්ලා කථා කරන්නේ රෙදි ඇඳගෙනද කියලා අපට හිතෙනවා. නිරුවතින් ඉන්න අය මේ සභාවේ කථා කරන්න එපා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ රජයේ චින්තන තටාකය වන Institute of Policy Studies කියන ආයතනය කියනවා, මේ රටේ 2009 වර්ෂය වන විට රුපියල් බිලියනයකට වැඩිය ආදායම් උපයන සමාගම් 20ක් තිබුණා කියලා. 2011 වර්ෂය වන විට රුපියල් බිලියනයකට වඩා ආදායම් උපයන සමාගම් ගණන 45කට පරිවර්තනය වුණා. නමුත්, අපි අය කරන බදු ප්‍රමාණය ප්‍රතිශතයක් හැටියට අඩු වුණා. VAT එකයි, ජාතිය ගොඩ නැඟීමේ බද්දයි අපි මිලදී ගන්න පරිප්පුවලට, සීනිවලට, කරවලවලට, පාන් පිටිවලට, ඖෂධ වර්ගවලට, හාල්මැස්සන්ට රාජපක්ෂ උන්නැහේ සියයට 20කින් වැඩි කරනවා. නමුත්, බදු අය වෙන්නේ නැහැ. ඒ ඇයි? අර සමාගම්වලින් අය කරන බද්ද අඩු කරපු නිසා. දැන් මේක තමයි ප්‍රශ්නය. මහින්ද රාජපක්ෂ මහත්මයා මුදල් ඇමතිවරයා හැටියට මේ පාර්ලිමේන්තුවේ ඉඳගෙන 2012 වර්ෂයේ අය වැයේදී මොකක්ද කිව්වේ? එතුමා කිව්වා, "සමාගම්වලට බදු ගෙවන්න බැරිව ප්‍රමාදයක් වුණා නම්, ඒ බදු හෙමින් ගෙවන්න කියලා අපි එයාලාට සහන පොලියට ණයක් දෙනවා." කියලා. විදුලිබල මණ්ඩලයේ බිලක් ගෙවපු නැති මිනිහාගේ නිවසට ගිහින් ඊළඟ දවසේ විදුලි බලය කප්පාදු කරනවා. බදු ගෙවන්නේ නැති කෝටිපතියන්ට සහන මිලකට ණයකුත් දෙනවා. මේකත් රාජපක්ෂ උන්නැහේගේ ප්‍රතිපත්තියක්. මෙතැනට ඇවිල්ලා තව

[ගරු කබීර් හෂීම් මහතා]

ලජ්ජා නැතිව කථාත් කරනවා. රාජපක්ෂ මහත්මයා දැන් කථා කරනවා, දේශීය කර්මාන්ත ආරක්ෂා කරන්න.

දේශීය කර්මාන්ත ගැන මම කියන්නම්. 2010 අය වැයේදී රාජපක්ෂ මහත්මයා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, "මේ රටේ අපි නිෂ්පාදනය කරන ශීතකරණ හා යන්ත්‍රෝපකරණ තිබියදී, පිට රටින් ගෙන්වන ශීතකරණ හා යන්ත්‍රෝපකරණවලට අය කරන ආනයන බද්ද සියයට 30කින් අඩු කරනවා." කියලා. ඊළඟට එතුමා කිව්වා, "පිට රටින් ගෙනෙන වායු සමීකරණ යන්ත්‍රවල බද්ද සියයට 98කින් අඩු කරනවා." කියලා. දැන් කියනවා, මේ රටේ දේශීය කර්මාන්ත ආරක්ෂා කරන්න කියලා. මේ රටේ නිෂ්පාදනය කරන භාණ්ඩ තියෙද්දී, පිට රටින් ගෙන්වන භාණ්ඩවලට අය කරන බදු ප්‍රමාණය එදා අඩු කළා. මොකද, IMF එකෙන් ඒ වෙලාවේ නියෝගයක් කළා, "පිට රටින් මේ බඩු ගෙන්වන්න." කියලා. ඒ නිසා පී.බී. ජයසුන්දර මහතා එදා මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා වශයෙන් සිටියදී ප්‍රකාශයක් කළා, "මේ රටේ නිපදවිය හැකි භාණ්ඩ පිට රටින් ගෙන්වීමට කෝටි දහස් ගණනක් වැය කිරීම මේ රටට කරන ලෝක අපරාධයක්." කියලා. ඒක කිව්වේ මහින්ද රාජපක්ෂ මහත්මයාටයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2013දී ඖෂධ, පරිප්පු, සීනි ආදි හැම දේකටම බදු ගැහුවා.

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Hon. Minister, I will give you five more minutes from my time.

ගරු කබීර් හෂීම් මහතා
(மாண்புமிகு கபீர் ஹாஷீம்)
(The Hon. Kabir Hashim)
Thank you.

2013දී මහින්ද රාජපක්ෂ මහත්මයාගේ ඊළඟ ප්‍රතිපත්තිය වුණේ, Louis Vuitton, Gucci, Bossini කියන සන්නම් කළ භාණ්ඩවලට - branded goodsවලට - අය කරන බදු අඩු කිරීමයි. විමල් වීරවංශ මහත්මයා අදින ෂර්ට් branded goods. ඒවාට මොකක්ද කළේ? අපි ඇදගෙන ඉන්න මේවා ලංකාවේ පොස්ලීන්. [බාධා කිරීම්] අහගන්න. හරිද? පිට රටින් ගෙන්වන Louis Vuitton, Gucci, Bossini කියන භාණ්ඩවලට අය කරන බදු ඒ කාලයේ සම්පූර්ණයෙන්ම අඩු කළා. ඒ ඇයි? මේ රටේ ඉන්න කෝටිපතියන්ටයි, ඒ අයගේ පවුල්වල අයටයි අඳින්න. ඊළඟට මතක තියා ගන්න, ඔබතුමන්ලාගේ ආණ්ඩුවම තමයි බලු කෑමවලට බදු අඩු කළේ. බලු කෑමට බදු අඩු කරලා, එදාම පරිප්පුවලට, සීනිවලට, කොත්තමල්ලිවලට බදු වැඩි කළා. ඇයි ඒ? තමන්ගේ ගෙදර ඉන්න සුපිරි බල්ලන්ට බලු කෑම ගෙන්නන්න. දැන් මෙතැනට ඇවිල්ලා මේවා ගැන කථා කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට පෞද්ගලීකරණය ගැන කියනවා. දැන් නිතරම කථා කරනවා, අපි මේ රටේ ආයතන පෞද්ගලීකරණය කරන්න යනවා කියලා. එතුමා නේ එහෙම කළේ. එතුමා කරපු දේවල් මම කියන්නම්. 2009 අය වැයේදී මහින්ද රාජපක්ෂ මහත්මයා කිව්වා, "ඇඹිලිපිටිය කඩදාසි සමාගම අපි භදනවා. මේක විශාල වශයෙන් පරිවර්තනයකට ලක් කරනවා." කියලා. එහෙම කියලා ඊළඟට මොකක්ද කළේ? එතැන් සිට තව අවුරුද්දක් යනකොට කඩදාසි සමාගම ඕස්ට්‍රේලියාවේ ඉන්න රාජපක්ෂ පවුලේ ඥාතියෙකුට තොග පිටින්ම සෙලාන් බැංකුවේ ණයත් එක්ක විකුණුවා. ඒක පෞද්ගලීකරණය කළා. තඹ සතයක් ගන්න බැරි වුණා. තවමත් ඒක වහලා දාලා තිබෙනවා. ඊළඟට චන්ද්‍රිකා මැතිනියගේ කාලයේ පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට - NLDB එකට - අයිති අඹේවෙල සහ New Zealand ගොවිපොළ හැරී ජයවර්ධනට විකුණුවා. මේ රටේ තිබෙන වැවිලි සමාගම් ටිකට ප්‍රේමදාස ජනාධිපතිතුමා අවුරුදු 5කට පමණයි බදු ගිවිසුම ලිව්වේ. චන්ද්‍රිකා මැතිනියගේ කාලයේ ඒ බදු ගිවිසුම අවුරුදු 50කට දික් කළා. ඒ, තමුන්නාන්සේලාගේ කාලයේයි.

ඊළඟට, මහින්ද රාජපක්ෂ මහත්මයාගේ කාලයේ 2009න් පස්සේ මහවැලියට අයිති මුතුවැල්ල-සිද්ධපුර ගොවිපොළ සොහිල් කැප්ටන්ට විකුණුවා. මාවනැල්ල කුට්ටි රබර් කර්මාන්තශාලාව පෞද්ගලීකරණය කළා. ත්‍රස්තවාදීන්ගෙන් මුදා ගත් කිලිනොච්චි ගොවිපොළ සොහිල් කැප්ටන්ට විකුණුවා. Port City එකේ අක්කර 50ක් සින්නක්කරව චීන ආණ්ඩුවට ලියලා දුන්නා. ඊළඟට, අපේ හමුදා මූලස්ථානය සින්නක්කරව ලියා දුන්නා, චීන සමාගමකට. ඊළඟට, ෂැන්ග්‍රී-ලා හෝටලයට දුන්නා. දැන් මෙතැනට ඇවිල්ලා ලජ්ජා නැතිව පෞද්ගලීකරණය ගැන කථා කරනවා. තමුන්නාන්සේලා බලයේ ඉන්න කොට හැසිරුණු ආකාරය ගැන හරියට හිතන්න. ඒ ගැන මහ ජනතාව දැනුවත් කරන කාලය ඇවිල්ලා තිබෙනවා.

දැන් ගත්තා, "The New York Times" පුවත් පතේ සිද්ධිය. "The New York Times" පුවත් පතේ කථාව දැන් කියන්න වේලාව නැහැ. නමුත්, මෙන්න තිබෙනවා විස්තරේ. Concessionary Framework Agreement එක මේ තිබෙන්නේ. [බාධා කිරීම්] පොඩ්ඩක් ඉන්න. මෙන්න තිබෙනවා, Key Terms of Agreement. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2014 සැප්තැම්බර් මාසයේ - මැතිවරණයට මාස තුනක් තිබියදී - මහින්ද රාජපක්ෂ මහත්තයාගේ උපදෙස් මත භාණ්ඩාගාරය China Harbour Engineering Company Limited එකත් එක්ක Key Terms of Agreement අත්සන් කළා. අත්සන් කරලා මොකක්ද කිව්වේ? හම්බන්තොට වරායේ ඒ ගොල්ලන්ට දෙන අයිතිය මොකක්ද? ඒ ගොල්ලන්ට එතැන අක්කර 50ක් ඩොලරයකට දෙනවා කියලා පොරොන්දු වුණා. එක ඩොලරයකට අක්කර 50ක් දෙනවා කියලා කිව්වා. ඒ ගොල්ලන්ට එතැන සම්පූර්ණ අයිතිය තිබෙනවා. හමුදාවට එතැන අයිතියක් තිබෙනවාද, නැද්ද කියන එක පිළිබඳ කිසි දෙයක් Key Terms of Agreementහි නැහැ. මේ ඔක්කෝම කළේ ඡන්දයට මාස තුනකට කලිනුයි. මේක අත්සන් කරන්නද "The New York Times" එකෙන් කියාපු අර ඩොලර් මිලියන 7.3ක් ගෙව්වේ කියන ප්‍රශ්නය අපට මතු වෙනවා. මේකට අපට විවාදයක් ඕනෑ. ඒ විතරක් නොවෙයි. මේකට කොමිසමකුත් පත් කරන්න ඕනෑ. මෙන්න මේවා තමයි නියම හොරකම්. දැන් මෙතැනට ඇවිල්ලා අපට ඇඟිල්ල දිගු කරනවා, "මෙන්න කරපු දේවල්" කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ agreements දැක්කාම තේරෙනවා, මේවා ලියා දීලා තිබෙන්නේ තුට්ටුවට, දෙකට කියලා.

හම්බන්තොට වරාය විතරක් නොවෙයි, එතැන නාවික හමුදාවට අයිතියක් නැතිව, හමුදාවට අයිතියක් නැතිව ඉඩම් සින්නක්කරව ලියා දීපු එකයි අපි මේ වෙනස් කරන්න හදන්නේ කියන එක මම විශේෂයෙන්ම කියන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. කොළඹ Port City එක කියන්නේ, අධි ආරක්ෂිත කලාපයක්. අධි ආරක්ෂිත කලාපයේ අක්කර 50ක් කෙළින්ම, සින්නක්කරව චීන ආණ්ඩුවට ලියා දීලා තිබෙනවා, ඕනෑම දෙයක් කරන්න කියලා. ඒ ආකාරයට මේ රටේ ස්වෛරීත්වය නැති කරන්න කටයුතු කරපු, ස්වෛරීත්වය පාවා දීපු කණ්ඩායමක් තමයි දැන් මෙතැනට ඇවිල්ලා උපාසකයින් වාගේ කථා කරන්නේ. එදා ඒ සිදු කළ දේ අද වෙනස් කරන්නේ ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමායි. ඒ ගිවිසුම වෙනස් කරලා, ඒක බදු ගිවිසුමක් බවට පරිවර්තනය කරන්නේ අපේ ආණ්ඩුවයි කියන එක මා

කියන්න කැමැතියි. ඒ නිසා කරුණු නැතිව, ලජ්ජා නැතිව කථා කරන්න එපා. මේ සම්බන්ධයෙන් තවත් කරුණු කියන්න වෙනම විවාදයක් ලබා දෙන්න. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is Hon. Vijitha Herath. Before he starts, will an Hon. Member propose the Hon. Velu Kumar to the Chair?

ගරු මංගල සමරවීර මහතා
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

I propose that the Hon. Velu Kumar do now take the Chair.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

[අ.භා. 3.26]

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බදු පැනවීම සහ බදු නිදහස් කිරීම පිළිබඳව සාකච්ඡා වන මේ අවස්ථාවේදී මම මතක් කරන්න කැමැතියි, 2004 දෙසැම්බර් මාසයේ සුනාමිය ආපු වෙලාවේ නිවාස ඉදි කිරීම සඳහා ඇස්බැස්ටොස් ෂීට්වලට පනවා තිබූ බද්ද අඩු කළ බව. ඒ නිසා එදා නිවාස ඉදි කිරීමේදී, ඇස්බැස්ටොස් ෂීට් සෙවිලි කළ අයට යම්කිසි සහනයක් ලැබුණා. නමුත්, ගරු මුදල් ඇමතිතුමනි, ඒ බදු අඩු කිරීම කළේ, විශේෂයෙන් ඇස්බැස්ටොස් ෂීට්වලට අවශ්‍ය අමුද්‍රව්‍ය ගෙන්වීමේදී තීරු බදු අඩු කළේ, සුනාමියත් එක්කයි. නමුත්, සුනාමිය අවසන් වෙලා දැනට අවුරුදු ගණනාවක් ගිහිල්ලාත් ඒ තත්ත්වය වෙනස් කළේ නැහැ. මේකත් එක්ක පසුගිය කාලය තුළ අපේ රටේ උළු නිෂ්පාදනකරුවන් බරපතළ ප්‍රශ්නයකට මුහුණ දීලා සිටියා. පසුගිය කාලයේ නිෂ්පාදනය කරන ලද උළු රජය මඟින් රජයේ ව්‍යාපෘතිවලට මිලදී ගනු ලැබුවා.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ඉදිකරනු ලබන නිවාස ව්‍යාපෘතිවලදී දේශීය උළු නිෂ්පාදකයන්ගේ උළු ඒ නිවාස සඳහා ගන්නා ලෙස නියම කළා. ඒ විතරක් නොවෙයි, ඒවා මිලදී ගනු ලැබුවා. නමුත්, දැන් එය එලෙස ක්‍රියාත්මක වන්නේත් නැහැ. දැන් නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය තීරණයක් අරගෙන තිබෙනවා, ඒ අමාත්‍යාංශයෙන් හදන නිවාසවලට උළු සෙවිලි කරන්නේ නැහැ කියලා. ඒ නිවාසවලට ඇස්බැස්ටෝස් ෂීට් පාවිච්චි කරන්නය කියලා අනිවාර්ය කිරීමකුත් කරලා තිබෙනවා. සුනාමියෙන් පස්සේ ඇස්බැස්ටෝස් සඳහා වන තීරු බදු අඩු කිරීමකුත් කළා. ඒ අඩු කරපු එක මේ වන තෙක් නැවත වෙනස් කරලාත් නැහැ. ඒ වාගේම, රජය මඟින් ඉදිකරන ගොඩනැගිලි සහ නිවාස සඳහා දේශීය නිෂ්පාදනයක් වන උළු මිලදී ගන්නේත් නැහැ. ඒ ඉදිකිරීම් සඳහා උළු භාවිත කිරීමක් දැන් සිද්ධ කරන්නේත් නැහැ. නමුත් අපට මතකයි, ගරු ජනාධිපතිතුමා මීට වසර දෙකකට පමණ කලින් පැහැදිලි ප්‍රකාශයක් කළා, "2018 ජනවාරි පළමුවැනි දා සිට ඇස්බැස්ටොස් ආනයනය සම්පූර්ණයෙන්ම තහනම් කරනවා. ඒ වාගේම, කිසිදු ගොඩනැගිල්ලකට හෝ නිවාසයකට ඇස්බැස්ටොස් ෂීට් පාවිච්චි කරන්න දෙන්නේ නැහැ, එය නීතියෙන් තහනම් කරනවා" කියලා. ඒ ප්‍රකාශය කළේ මීට අවුරුදු දෙකකට පමණ කලින්.

අද වනකොට 2018 වසරේ ජනවාරි පළමුවැනි දාත් පහුවෙලා මාස හතක් ගත වෙලා තිබෙනවා. නමුත්, ඒ තීන්දුව මෙතෙක් ක්‍රියාත්මක වෙලාත් නැහැ. ඇත්තටම ඒක රජයේ ප්‍රතිපත්තිමය තීන්දුවක්ද? එය ප්‍රතිපත්තිමය තීන්දුවක් නම්, දැන් ඒ ප්‍රතිපත්තියට මොකද වෙලා තිබෙන්නේ? අපි කියන්නේ නැහැ, ඇස්බැස්ටෝස් ෂීට් භාවිතය මේ රටේ තහනම් කරන්න කියලා. නමුත් මා ප්‍රශ්න කරන්නේ ආණ්ඩුව වෙනුවෙන් රටේ නායකයා විධියට ජනාධිපතිවරයා එදා කළ ඒ ප්‍රකාශය ගැන. ඒ ප්‍රකාශය එදා කළේ ප්‍රතිපත්තිමය ප්‍රකාශයක් විධියටයි. නමුත් දැන් ඒ ප්‍රතිපත්තියත් නැහැ. දැන් තිබෙන ලොකුම විහිළුව තමයි, ජනාධිපතිවරයා සම්බන්ධ වන නිවාස ව්‍යාපෘතිවලටත් දැන් පාවිච්චි කරන්නේ ඇස්බැස්ටෝස් ෂීට් වීම. මීට සති දෙකකට පමණ කලින් පොළොන්නරුවේ ඉදිකළ නිවාස ව්‍යාපෘතියක් විවෘත කිරීමකට ජනාධිපතිතුමාත් සම්බන්ධ වුණු බව මම දැක්කා. එතුමා සාමාන්‍යයෙන් එතුමාගේ දිස්ත්‍රික්කයේ උත්සවවලට සහභාගි වනවා නේ. පොළොන්නරුවේ පැවැති ඒ නිවාස ව්‍යාපෘතිය විවෘත කිරීමේ උත්සවයට නිවාස හා ඉදිකිරීම් ඇමතිතුමායි, ජනාධිපතිතුමායි දෙදෙනාම සහභාගි වී සිටියා. ඒ නිවාස සඳහාත් පාවිච්චි කරලා තිබුණේ ඇස්බැස්ටෝස් ෂීට්! ජනාධිපතිවරයාම ප්‍රතිපත්තිමය තීන්දුවක් ගැන රටට ප්‍රකාශයක් කරලා, අවසානයේදී ලොකුම විහිළුවක් විධියට, ඇස්බැස්ටෝස් ෂීට් සෙවිලි කළ, රජය විසින්ම ඉදිකළ නිවාස ව්‍යාපෘති විවෘත කරන්නත් එතුමාම යනවා. එතකොට ඔබතුමන්ලාගේ ඒ ප්‍රතිපත්තියට මොකද වුණේ? ඒක එහෙමම ක්‍රියාත්මක වනවාද? එහෙම නැත්නම්, ඒ ප්‍රතිපත්තිය වෙනස් කළාද? වෙනස් කළා නම්, ජනාධිපතිවරයා විසින් හෝ ආණ්ඩුව විසින් රටට එය පැහැදිලිව ප්‍රකාශ කළ යුතුයි, "නැහැ, ජනවාරි පළමුවැනි දා සිට ඒ ඇස්බැස්ටෝස් තහනම එලෙස ක්‍රියාත්මක කරන්නේ නැහැ. ජනාධිපතිතුමා එහෙම කිව්වාට ආණ්ඩුව -අපි- එහෙම කරන්නේ නැහැ"යි කියලා. නමුත්, මේ වන තෙක් ආණ්ඩුවෙන් එහෙම කියලාත් නැහැ. එහෙම නොකීමෙන් ප්‍රශ්නයක් ඇති වුණේ දේශීය උළු නිෂ්පාදකයාටයි. ජනාධිපතිතුමා කළ ඒ ප්‍රකාශයත් එක්ක දේශීය නිෂ්පාදකයා උළු කර්මාන්තය නහා සිටුවීම සඳහා වැඩි ධෛර්යකින් මැදිහත් වුණා. මොකද, එදා සුනාමියෙන් පස්සේ ඇස්බැස්ටොස්වල තීරු බදු අඩු කළා.

දැන් සම්පූර්ණයෙන්ම ඇස්බැස්ටෝස් තහනම් කළොත් උළු නිෂ්පාදකයන්ට යම්කිසි තැනක් ලැබෙයි කියලා ඔවුන් හිතුවා. එම නිසා ඔවුන් මේ කර්මාන්තය දියුණු කරන්න තමන්ගේ ආයෝජනය තවත් වැඩි කළා. බැංකු ණය අරගෙන තමන්ගේ කර්මාන්තය දියුණු කරන්න මැදිහත් වුණා. ඇත්තටම ගත්තොත් දැන් මේ වනකොට ලංකාවේ මේ නිෂ්පාදනය තුළ සෘජු හා වක්‍ර රැකියා ලබන විශාල පිරිසක් සිටිනවා. ඔවුන් අද පරිසරයට හානිවන ආකාරයට තමන්ගේ උළු නිෂ්පාදන සඳහා මැටි ලබා ගන්නේත් නැහැ. රජය එක්ක සාකච්ඡා කරලා පසුගිය කාලයේ ඒකටත් ක්‍රමවේදයක් සකස් කර ගෙන තිබුණා, වැව් හෑරීමේදී ඒ වැව්වලින් උළුවලට අවශ්‍ය මැටි ලබා ගන්න. ඒ නිසාම බොහෝ උළු නිෂ්පාදකයන්ට එස්එල්එස් ප්‍රමිති සහතිකයත් ලැබී තිබෙනවා. එතකොට ඒ ප්‍රමිති සහතිකයත් ආණ්ඩුව මඟින්ම ඔවුන්ට දීලා තිබෙනවා. එම නිසා උළු නිෂ්පාදනය වැඩි කරන්න ඔවුන් ඉලක්කසහගතව මැදිහත් වුණා.

[ගරු විජිත හේරත් මහතා]

අද වන කොට විශේෂයෙන් පුත්තලම දිස්ත්‍රික්කයේ හලාවත, දංකොටුව ආදි ප්‍රදේශවලත්, කුරුණෑගල, ගම්පහ ආදි දිස්ත්‍රික්කවලත්, අනුරාධපුරය, පොළොන්නරුව දිස්ත්‍රික්කවලත් මේ කර්මාන්තයේ නිරත වන නිෂ්පාදකයන් විශාල පිරිසක් ඉන්නවා. ඔවුන්ට අද තමන්ගේ නිෂ්පාදනය කරගෙන යන්න බැරි වෙලා තිබෙනවා. මොකද, ඇස්බැස්ටෝස් ෂීට් සඳහා අඩු කරපු තීරු බද්ද -2004 වර්ෂයේ අඩු කරපු තීරු බද්ද- එලෙසම පැවැතීම නිසා උළු කැටයක් විකුණා ගන්න බැහැ. ඔවුන්ගේ නිෂ්පාදන වියදම ඊට වඩා වැඩි වෙලා. ඒ නිසා අද එක පැත්තකින් අපේ දේශීය කර්මාන්තයක් කඩා ගෙන වැටිලා තිබෙනවා. අනෙක් පැත්තෙන්, විදේශ විනිමය විශාල ප්‍රමාණයක් අපේ රටින් පිටට ගලා ගෙන යනවා. සාමාන්‍යයෙන් ගත්තොත්, ඩොලර් බිලියන 10ක විතර ප්‍රමාණයක් මේ හරහා පිටරටට ඇදී යනවා කියන එක තමයි ඒ ක්ෂේත්‍රයේ නියුක්ත අය ගණන් හදලා කියන්නේ. රටේ නිෂ්පාදනයක් වැඩිදියුණු කිරීම හරහා රටේ රැකියා ප්‍රශ්නයට උත්තරයක් ලැබෙනවා වාගේම දේශීය නිෂ්පාදනය නහා සිටුවන්නත් පුළුවන්කම ලැබෙනවා. විශේෂයෙන්ම ඇස්බැස්ටෝස් ෂීට් හරහා ඇති වන පිළිකා රෝගයෙන් ජනතාව මුදා ගන්නත් පුළුවන්කම ලැබෙනවා. අනෙක් පැත්තෙන්, ඒ පිළිකා රෝගීන්ගේ සෞඛ්‍ය සඳහා වියදම් කරන මුදල් ප්‍රමාණය අඩු කර ගන්නත් පුළුවන් වනවා. මහරගම පිළිකා රෝහල විතරක් නොවෙයි, දැන් එවැනි පිළිකා රෝහල් ගණනාවක් අවශ්‍ය වෙලා තිබෙනවා. එවැනි තත්ත්වයක් යටතේ මේ ප්‍රශ්නය මීට වඩා බැරෑරුම්ව දකින්න ඕනෑය කියන එක මා පළමුවෙන්ම අවධාරණය කරන්න කැමැතියි. මේ කර්මාන්තයට ජනාධිපතිවරයා කරපු ප්‍රකාශය සහ සුනාමිය වෙලාවේ ඇස්බැස්ටෝස් සඳහා වන තීරු බදු අඩු කිරීම කියන කාරණා දෙකම බලපා තිබෙනවා. ඒ කාරණා එලෙසම පවත්වාගෙන යෑම පිළිබඳව ආණ්ඩුවේ මතය මොකක්ද කියන එක දැන ගන්නත් මා කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය කාලයේ අපි දැක්කා අපේ රටේ නිෂ්පාදන අපනයනය කරද්දී ඒ අපනයනකරුවන්ට, නිෂ්පාදකයන්ට යම් සහනයක් ලැබෙන තත්ත්වයක් තිබුණ බව. නමුත් එය වෙනස් කළා, ඔබතුමන්ලාගේ ආණ්ඩුවේ පළමුවැනි අය වැයෙන්. ඔබතුමන්ලා තේ ප්‍රතිඅපනයනය සඳහා ඉඩ ලබා දුන්නා; එය නීත්‍යානුකූල කළා. එදා හොරෙන් සිද්ධ වෙච්ච දේ නීත්‍යානුකූල කරමින් කෙන්යාව ආදි රටවලින් තේ ගෙනැල්ලා අපනයනය කරන්න පුළුවන් කියන එක රජයේ ප්‍රතිපත්තියක් විධියට, අය වැය යෝජනාවක් විධියට ඉදිරිපත් කළා. කරුංකා සම්බන්ධයෙන් තිබුණු ප්‍රතිපත්තියත් ඒ විධියටම ලිහිල් කළා. ඒ නිසා අද අපේ රටේ කරුංකා නිෂ්පාදකයෝ, අපේ කුඩා පරිමාණ තේ නිෂ්පාදකයෝ විශාල ගැටලුවකට මුහුණ දීලා තිබෙනවා. තේවලින් පටන් ගත් මෙය කරුංකාවලට, ගම්මිරිස්වලට පමණක් නොව, දැන් වන කොට සියඹලාවලටත් බලපා තිබෙනවා. සියඹලා ගස්වල හැදෙන සියඹලා කරල් ටික නිකම් බිමට වැටෙනවා කියන එක තමයි පෙනෙන්න තිබෙන්නේ. එයින් ආදායමක් ලබන්න පුළුවන් කියන එක අපි හිතන්නේවත් නැහැ. නමුත්, කුරුණෑගල, අනුරාධපුරය, හම්බන්තොට ආදි දිස්ත්‍රික්කවල කුඩා පරිමාණයෙන් ගම් මට්ටමින් එකතු කරන සියඹලා ටික මහා පරිමාණයෙන්, කන්ටේනර් ගණන් අපේ රටින් අපනයනය කළා. එසේ අපනයනය කරද්දී කර්මාන්තයක් විධියට එය දියුණු වෙමින් ආවා. පොහොර දාලා, වතුර දාලා හදන ගහක් නොවෙයි සියඹලා ගහ. එය නිකම් ඉබේ හැදෙන ගහක්. සියඹලා අපනයනය මඟින් ලැබුණේ කිසිදු වියදමක්, පිරිවැයක් දරන්නේ නැතිව ලැබුණු ලාභයක්. ඒ ලාභය රටට සම්පතක් කර ගන්න ලොකු අවස්ථාවක් තිබුණා. කර්මාන්තයක් විධියට එය දියුණු වෙමින් ආවා. නමුත් ඔබතුමන්ලා සියඹලා ප්‍රතිඅපනයනය සඳහාත් අවස්ථාව දීලා තිබෙනවා. කර්මාන්තයක් විධියට දියුණු වෙමින් ඇවිල්ලා, ගම් මට්ටමේ සිටි ග්‍රාමීය ජනතාවටත් යම්කිසි ආදායමක් ඒ කර්මාන්තය හරහා ලැබෙමින් තිබුණු අවස්ථාවක, ප්‍රතිඅපනයනයට ඉඩ දීමෙන් අද වෙනත් රටවලින් මේ රටට සියඹලා ගෙනැල්ලා ලංකාවේ සියඹලා විධියට වරායෙන් ඒ වෙලාවේම ආපසු අපනයනය කරනවා. කරුංකා ඉන්දුනීසියාවෙන් ගෙනැල්ලා මේ රටේ ගොඩ බාන්නේත් නැතිව කන්ටේනර්වලින්ම මාරු කරලා එතැනින්ම export කළා වාගේම, තේ කෙන්යාවෙන් මේ රටට ගෙනැල්ලා ආපසු export කළා වාගේම, ගම්මිරිස් වියට්නාමයෙන් මේ රටට ගෙනැල්ලා export කළා වාගේම අද සියඹලා ටිකත් පිටරටින් මේ රටට ගෙනැල්ලා export කරන තත්ත්වයට ඇවිත් තිබෙනවා. ඔබතුමන්ලාගේ පැත්තෙන් -විශේෂයෙන් මුදල් අමාත්‍යාංශය පැත්තෙන්- මේ තත්ත්වය පාලනය කරන්න මොනවාද ගන්නා ක්‍රියා මාර්ග?

මේවා පිටුපස මහා ජාවාරම් තිබුණා. මේ ජාවාරම්වලට ඇමතිවරු සෘජුවම සම්බන්ධයි කියන එක හරි පැහැදිලිව තිබෙනවා. එම ඇමතිවරුන්ගේ ගෝලයෝ තමයි කරුංකා අපනයනයේ ඉන්නේ; එම ඇමතිවරුන්ගේ ගෝලයෝ තමයි ගම්මිරිස් අපනයනයේ යෙදී සිටින්නේ. ඒ අය තමයි වියට්නාමයෙන් ගම්මිරිස් ගෙන්වන්නේ. විෂය භාර ඇමතිවරයාගෙන් එම ප්‍රශ්නය අහන කොට මුලින් කිව්වා "දන්නේ නැහැ" කියලා. නමුත් පසුව ඒවා re-export කළ ආකාරය පිළිබඳව අදාළ documents සාක්ෂි සහිතව ඉදිරිපත් කළාට පසුව පිළිගත්තා, එහෙම දෙයක් වෙනවාය කියලා. එතුමා නොදැන හිටියා නොවෙයි. සම්පූර්ණ බොරුවක් කළේ. සියඹලා සම්බන්ධයෙනුත් එහෙමයි. මුලින් කිව්වා "දන්නේ නැහැ" කියලා. නමුත් අදාළ ලිපිලේඛන දුන්නාම, ගෙන්වූ ව්‍යාපාරිකයෝ, re-export කළ ආකාරය, ඒවාට අදාළ documents පෙන්වුවාට පස්සේ එහෙම දෙයක් වෙනවාය කියලා පිළිගත්තා. ඒක නිසා අපේ රටට ලැබෙන්න තිබෙන විශාල විදේශ විනිමය ප්‍රමාණයක් අපට අහිමි වෙනවා.

ඒ විතරක් නොවෙයි, අපේ රටේ නිෂ්පාදන දියුණු වන්නේ නැහැ. දේශීය නිෂ්පාදන කඩා වැටෙනවා. රුපියල බාල්දුවීමත් එක්ක අපේ අපනයන වැඩි වෙනවා නම්, රුපියල බාල්දුවීම ඒ අපනයන වැඩිවෙන එකට වාසියක් වෙන්න පුළුවන්. නමුත් අපේ අපනයන වැඩිවෙලා නැහැ. කරුංකා ටික පිටරටින් ගෙන්වනවා නම්, තේකොළ ටික පිට රටින් ගෙන්වලා නැවත export කරනවා නම්, ගම්මිරිස් ටික පිට රටින් ගෙන්වලා export කරනවා නම්, සියඹලා ටිකටත් එහෙම කරනවා නම් අපේ දේශීය නිෂ්පාදනය වැඩිවන්නේ නැහැ. එතකොට අපනයන ආදායම වැඩිවන්නේත් නැහැ. මේ හරහා වන විදේශ විනිමය අහිමි වීම, දේශීය කෘෂි කර්මාන්තය කඩා වැටීම ගැන කල්පනා කරලා, ඒ පිළිබඳව ඔබතුමන්ලාගේ රාජ්‍ය ප්‍රතිපත්තිය වහාම වෙනස් කළ යුතුය කියලා නැවත අපි අවධාරණය කරනවා. මේකට ඉඩ තියන්න එපා. මොකද, අපට අපනයනය කරන්න ඕනෑ තරම් ගම්මිරිස් තිබෙනවා. රුපියල් 1200ට, 1300ට තිබුණු ගම්මිරිස් කිලෝව අද රුපියල් 500යි, 600යි. රුපියල් 500ට විකුණා ගන්නත් බැහැ, අමාරුයි. රුපියල් 500ට, 600ට විකුණා ගන්න එකත් ඉතාම දුෂ්කර වැඩක් වෙලා තිබෙනවා. ඒ නිසා දැන් රට පුරාම; මොණරාගල, ඇඹිලිපිටිය, රත්නපුර, හම්බන්තොට, බදුල්ල වාගේම මහනුවර දිස්ත්‍රික්කයේත් ගම්මිරිස් ගොවීන් විශාල ප්‍රමාණයක් මේ ප්‍රශ්නය නිසා විවිධ පීඩාවන්ට ලක්වෙලා සිටිනවා. ඔවුන් ගම්මිරිස් වගාවෙන් ඉවත්වෙලා. ඔබතුමන්ලාගේ මේ ආනයන අපනයන ප්‍රතිපත්තියේ වැරැද්ද නිසා වගාවන් විධියට වර්ධනය කළ යුතු මේ භෝග වගාවන් අද කඩා වැටිලා තිබෙනවා. ඒ නිසා ගම්මිරිස් ප්‍රතිඅපනයනය කරන්න ඉඩ දෙන එක, කරුංකා ප්‍රතිඅපනයනය කරන්න ඉඩ දී තිබෙන එක විතරක් නොවෙයි, සියඹලා ප්‍රතිඅපනයනය කරන එකත් වහාම නතර කරන්න. එහෙම නැති වුණොත් මේ රටේ ගම්මිරිස් ගොවීන්ගේ වාගේම,

වගාවක් විධියට කරන්නේ නැතිව, නිකම් හැදෙන පුවක් ගස්වලින් කරුංකා නිෂ්පාදනය කරලා යම්කිසි ආදායමක් උපයන ග්‍රාමීය ජනතාවගේත් ආර්ථිකය කඩාගෙන වැටෙනවා. සියඹලා ප්‍රතිඅපනයනය කරන්න ඉඩ දීම නිසා ග්‍රාමීය ජනතාව තවදුරටත් කබලෙන් ළිපට වැටෙනවා. ඒ නිසා මේ තීරුබදු සහ ආනයන අපනයන ප්‍රතිපත්තිය වහාම වෙනස් කරන්න කියන එක අපි අවධාරණය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රුපියල බාල්දුවීමත් එක්ක අපට වැඩිපුර ගෙවන්න සිදු වන ණය වාරිකය සහ පොලිය පිළිබඳව මුදල් අමාත්‍යාංශය මහ බැංකු වාර්තාවේ ඉතා පැහැදිලිව, නිශ්චිතව සඳහන් කර තිබෙනවා. රුපියල බාල්දුවීමත් එක්ක ණය ආපසු ගෙවීමේදී වැඩි වූ පොලී ප්‍රමාණය මෙච්චරයි කියලා මහ බැංකු වාර්තාවේ සඳහන් කර තිබෙනවා. ඒ නිසා කවුරු හරි කියනවා නම් රුපියල බාල්දු වීමත් එක්ක අපේ ණයවලට බලපෑමක් නැහැ, ණය වාරිකවලට, පොලීවලට කිසි බලපෑමක් නැහැ කියලා, ඒක අමූලික අසත්‍යයක්. එහෙම නම් මහ බැංකුවෙන් නිකුත් කළ මහ බැංකු වාර්තාවේ එහෙම සඳහන් කළේ ඇයි? ඒ කියන්නේ මුදල් අමාත්‍යාංශය පිළිගන්නවා, රුපියල බාල්දුවීමත් එක්ක අපි ලබා ගත් ණයවලට වැඩිපුර මුදල් ප්‍රමාණයක් පොලිය වශයෙන් ගෙවන්න සිදු වෙලා තිබෙනවා කියලා. මේ රුපියල බාල්දුවීම කියන එක නිකම් ඇති වුණා නොවෙයි. රුපියල බාල්දුවීම ඇති වන්නේ රටේ සමස්ත නිෂ්පාදනයේ කඩා වැටීමත් එක්කයි. නිෂ්පාදනය වැඩි කරන්න නම් ඔබතුමන්ලාගේ තීරු බදු ප්‍රතිපත්ති වෙනස් කරන්න ඕනෑ.

සාමාන්‍යයෙන් විභිළුකාරී විධියට තමයි අපේ රටේ හැම දාමත් අල සහ ලූනු සම්බන්ධයෙන් තීරුබදු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වෙන්නේ. අල ගලවන කාලයට; ඒ ගොවීන් එලදාව ලබන කාලයට ඔබතුමන්ලා හැම දාම කරපු දෙයක් තමයි, පිට රටින් අල ගෙන්වීම වැඩි කිරීම සහ බදු අඩු කිරීම. ඊට පස්සේ ගොවියෝ පාරට ඇවිල්ලා උද්ඝෝෂණ කරලා, පෙළපාළි ගිහිල්ලා විරෝධතා දක්වන කොට, හිටපු ගමන් හීනෙන් භය වුණා වාගේ ගැසට් එකක් ගහලා තීරු බද්දක් පනවනවා. එහෙම බදු පනවන කොට අල ගොවියෝ අල ටික වෙළෙඳ පොළට දමලා ඉවරයි; ඒ ගොල්ලන්ට වෙන්න තිබෙන අලාභය සිද්ධ වෙලා ඉවරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බී ලූනුවලටත් මේ ප්‍රශ්නයම තමයි හැම දාම තිබෙන්නේ. මාතලේ, දඹුල්ලේ බී ලූනු ගොවීන් හැම දාම මුහුණ දෙන ප්‍රශ්නයක් තමයි, ඔවුන් ඒ එලදාව ලබන කාලයට අවශ්‍ය කරන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක නොවීම. ඔවුන් වෙළෙඳ පොළට බඩු ටික දැම්මාට පස්සේ; තමන්ගේ එලදාව දැම්මාට පස්සේ; තමන්ට වෙන්න ඕනෑ අලාභය සිද්ධ වුණාට පස්සේ, රජයෙන් ගැසට් නිවේදනයක් නිකුත් කරලා බදු පනවනවා. එතකොට අශ්වයා ඉස්තාලයෙන් පැනලා ඉවරයි. අපේ රටේ පරිභෝජනයට අවශ්‍ය කරන බී ලූනුවලින් සියයට 80ක් තවමත් අපි පිට රටින් ගෙන්වනවා; පරිභෝජනයට අවශ්‍ය සීනිවලින් සියයට 91.5ක් අපි තවමත් පිට රටින් ගෙන්වනවා; මිරිස්වලින් සියයට 80ක් අපි තවමත් පිට රටින් ගෙන්වනවා. එහෙම වුණාම රුපියලේ කඩා වැටීම, රුපියලේ බාල්දුවීම පිට රටින් ගෙනෙන සීනිවලට බලපානවා; පිට රටින් ගෙනෙන මිරිස්වලට බලපානවා; පිට රටින් ගෙනෙන බී ලූනු ගෙඩියටත් බලපානවා. එක පැත්තකින් දේශීය ගොවියාත් කඩා වැටෙනවා, අපේ ආනයන වියදමත් වැඩි වෙනවා. අපනයන ආදායම අඩු වෙනවා.

එදා ආනයනය වියදම ඩොලර් බිලියන 20ක් වශයෙනුයි තිබුණේ. අපනයන ආදායම තිබුණේ ඩොලර් බිලියන 10යි. අද ඒ පරතරය ටිකක් වෙනස් වෙලා තිබෙනවා. එහෙම ටිකක් වෙනස් වෙලා තිබුණත් ආනයන වියදම අඩු වෙලා නැහැ. අද අපේ ආනයන වියදම ඩොලර් බිලියන 20යි. අපනයන ආදායම ඩොලර් බිලියන 18යි. ආනයන වියදම් පොඩි ප්‍රමාණයකින් වෙනස් වෙලා තිබෙනවා, ඩොලර් බිලියන දහඅටහමාරක් වෙලා තිබෙනවා. හැබැයි, අපනයන ආදායමේ කිසිදු වෙනසක් වෙලා නැහැ. ඔබතුමන්ලා මේ රටේ ආර්ථිකය භාර ගන්න කොට කිව්වේ, අපනයනය වැඩි කිරීම සඳහා දේශීය නිෂ්පාදනය වැඩි කිරීම රජයේ ප්‍රතිපත්තිය කියලායි. ඔබතුමන්ලා ඉදිරිපත් කළ පසුගිය අය වැය නම් කළේ "නීල හරිත" කියලායි. නීල හරිත අය වැය ඇතුළේ මොනවාද අපේ ආර්ථිකයට සිද්ධ වුණේ? දැන් "නීල හරිත" කියන වචනයත් මතක නැහැ. අඩුම ගණනේ ඔබතුමන්ලාවත් ඒ වචනය පාවිච්චි කරන්නේ නැහැ. "නීල හරිත" අය වැය කියලා ලස්සන වචනයක් දැම්මා. ඒක හරි සෞන්දර්යාත්මක විධියට කියෙව්වා. දවස් තුන, හතරක් ලස්සන පොල් ගෙඩි අකුරෙන් ඒක පුවත්පත්වල පළ වුණා. ඒ වාගේම, රූපවාහිනී නාළිකාවල පෙන්නුවා. හැබැයි, "නීල හරිත" අද පෙනෙන්නත් නැහැ. අද බදු පිට බදු! පසුගිය අප්‍රේල් මාසයේ ඉඳලා දැන් තිබෙන ලොකුම ප්‍රශ්නය බදු වැඩිවීම, ණය වැඩිවීම සහ ණය පොලී වාරිකය වැඩිවීම; IMF එකෙන් තවත් ණය ගන්න සිදුවීම; අපේ තිබෙන සම්පත් ටික, වරාය විකුණා දමන්න සිද්ධවීම. අපේ වරාය විකුණන්නේ, අපි IMF එකෙන් තවත් ණය වාරික ගන්නේ, අපේ නිෂ්පාදනය කඩා වැටුණු නිසායි. ඔබතුමන්ලාගේ මේ තීරු බදු ප්‍රතිපත්තිය නිෂ්පාදනය කඩා වැටෙන්න ප්‍රධාන හේතුවක් වෙලා තිබෙනවා. ඒ වාගේම, ආනයන, අපනයන ආර්ථික ප්‍රතිපත්තිය ඇතුළේ යම් යම් භාණ්ඩවලට අය කරන බදුවල තිබෙන විෂමතාව තවත් එකක්. එක් එක් ඇමතිවරයාගේ වුවමනාවලට ගහපු සමහර බදු තිබෙනවා. සමහර ව්‍යාපාරිකයන්ගේ වුවමනාවලට ඇමතිවරු හරහා ගහපු බදු තිබෙනවා.

ඊයේ-පෙරේදා අපේ රටට අලුත්ම photocopy machines ආනයනය කළා; ඒ වාගේම පාවිච්චි කළ ඒවාත් ආනයනය කළා. ඔබතුමන්ලා සාකච්ඡා පවත්වා තිබෙනවා මම දැක්කා, පාවිච්චි කරන ලද photocopy යන්ත්‍ර ගෙන්වීම තහනම් කිරීම පිළිබඳව. නමුත්, පාවිච්චි කළ -second-hand- වාහන ගෙන්වනවා. ඒවා අවුරුදු දෙක, තුන කියලා යම්කිසි කාල සීමාවක් දක්වා සීමා කිරීමක් කර තිබෙනවා. ඒක ප්‍රශ්නයක් නැහැ. හැබැයි, අපේ රටට,- [බාධා කිරීමක්] photocopy machinesවලටත් පුළුවන්. ඒවායේත් මීටර් තිබෙනවා. [බාධා කිරීමක්] ඒක ඉතින් වාහනවලටත් කරන්න පුළුවන් නේ. වාහනයේත් හොරට එහෙම කරනවා නේ. නමුත්, photocopy machinesවල එහෙම නැහැ. ඒක කොච්චර කාලයක් පාවිච්චි කළාද කියන එක toner පාවිච්චි කළ ප්‍රමාණයෙන් මනින්න පුළුවන්. [බාධා කිරීමක්]

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා (අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எட்வட் குணசேகர - உள்ளக அலுவல்கள் மற்றும் வடமேல் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Edward Gunasekara - Deputy Minister of Internal Affairs and Wayamba Development)

එහෙම ගෙනාවොත්, මම හිතන්නේ පරණ computer ගෙනාවා වාගේ, -

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

E-waste එක වැඩි වෙනවා. [බාධා කිරීමක්] සිංගප්පූරු ගිවිසුම යටතේ, -

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)

Washing machines මෙහාට ගෙනාවා වාගේ, මෙහේ කුණු ගොඩ ගැහෙන්න පටන් ගනීවි.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

පරණම ඒවා ගෙනෙන්න එපා. ඒ සඳහා සීමාවක් දමන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. ඒකට condition එකක් දමන්න. ඒකයි මම මේ කිව්වේ. ඕනෑ කුණු ගොඩක් ගෙනෙන්න හදන්න එපා. ඕනෑම කුණු ගොඩක් ගෙනෙන එක දැන් සිදු වෙනවා.

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)

මම කිව්වේ ඒක නොවෙයි. එහෙම ගෙන්වා ගත්තොත්, ජාවාරම්කරුවෝත් ඒවා ගෙනෙයි කියලායි මම කිව්වේ.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

දැනට ගෙනෙනවා. ඒකට condition එකක් දමන්න; condition එකක් දමලා, ඒක මනින ක්‍රමයක් හදන්න. වාහන ගෙන්වනකොටත් අවුරුදු කීයක් පාවිච්චි කළාද කියන කාරණය මත තීරු බදු තීරණය කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු විජිත හේරත් මහතා
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)

හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

Photocopy machines සහ වෙනත් ඒ වාගේ පාවිච්චි කළ machines - photocopy machine එක තමයි මම උදාහරණයට ගත්තේ.- ගෙන්වීම සම්පූර්ණයෙන්ම තහනම් කළොත්, අලුත්ම photocopy machine එකක් තමයි ගෙනෙන්නේ. අලුත්ම photocopy machine එකක් ගෙනාවාම photocopy එකක් සඳහා යන වියදම වැඩි වෙනවා. ඒකට දරන පිරිවැය වැඩි වුණාම අනිවාර්යයෙන්ම photocopy එකක් සඳහා යන වියදමත් වැඩි වෙනවා. දැන් අපට රුපියල් 5ට, 6ට photocopy එකක් ගහ ගන්න පුළුවන් නම්, ඒ මුදල රුපියල් 10ට, 15ට වැඩි වෙනවා. ඇයි ඒ? අර පිරිවැය වැඩි වන නිසායි. නමුත් අවුරුද්දක් දෙකක් පාවිච්චි කළ, විශේෂයෙන්ම ජපානය, ජර්මනිය වැනි කාර්මික වශයෙන් දියුණු රටවලින් ගෙන්වන machines හොඳයි කියා මට හිතෙනවා. ඒ අය පාවිච්චි කළාය කියා ඒවා අයින් කළාට, ඇත්තටම අපේ රටේ ඒවා එහෙම සම්පූර්ණයෙන් අයින් කරන්න අවශ්‍ය නැහැ. අවුරුද්දක් පාවිච්චි කළ photocopy machine එකක් තවදුරටත් පාවිච්චි කරන්න පුළුවන්. නමුත් ඔබතුමන්ලා දැන් ප්‍රතිපත්තිය හදන්න යන්නේ, එය සම්පූර්ණයෙන්ම නතර කිරීම සඳහායි; සාකච්ඡාව සිදු වෙලා තිබෙන්නේ එතැනටයි. නමුත් එහෙම කරන එක සාධාරණ නැහැ කියායි අපි නම් හිතන්නේ. ඒ නිසා, අවශ්‍ය දේ සලකා බලා, තීරු බදු ප්‍රතිපත්තිය තීරණය කළ යුතුයි කියන කාරණය මා අවධාරණය කරනවා.

මම කලින් මතු කළ, ඇස්බැස්ටෝස් ෂීට් සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රතිපත්තිය සහ ජනාධිපතිවරයා කළ ප්‍රකාශය ගැනයි ඊළඟට මම කියන්නේ. එය වලංගු ප්‍රකාශයක්ද, නැත්නම් දැන් එය අවලංගු වෙලාද? ඒ හරහා සිදු වී තිබෙන උළු නිෂ්පාදනයේ කඩා වැටීම සම්බන්ධයෙන් ඔබතුමන්ලා ගනු ලබන ක්‍රියා මාර්ගය මොකක්ද? රජයේ ගොඩනැඟිලිවලට, රජයේ නිවාසවලට ඇස්බැස්ටෝස් ෂීට් පාවිච්චිය අනිවාර්ය කරලා, ජනාධිපතිවරයාගේ ඒ ප්‍රකාශය හැල්ලුවට ලක් කර තිබෙන්නේ ඇයි? තමන්ගේ ආණ්ඩුවෙන් ඇස්බැස්ටෝස් ෂීට් සෙවිලි කරලා හදන නිවාස -ඒ ව්‍යාපෘති- විවෘත කරන්න ජනාධිපතිවරයාම යන්නේ ඇයි? ඇස්බැස්ටෝස් ෂීට් භාවිතය තහනම් කරනවාය කියා එතුමා කිව්වා නම්, ඇස්බැස්ටෝස් ෂීට් සෙවිලි කළ නිවාස විවෘත කරන්න එතුමාම යන්නේ කොහොමද? ඒ සම්බන්ධයෙන් ආණ්ඩුවේ ප්‍රතිපත්තිය මොකක්ද කියාත් මා දැන ගන්න කැමැතියි. අවසාන වශයෙන්, ගම්මිරිස්, සියඹලා, කරංකා ආදි අපේ වැවිලි භෝග නිෂ්පාදනය දිරිගැන්වීම සඳහා ප්‍රති අපනයන ප්‍රතිපත්තිය වහාම වෙනස් කරන්නය කියන කාරණයත් අවධාරණය කරමින්, මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.50]

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා (අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு எட்வட் குணசேகர - உள்ளக அலுவல்கள் மற்றும் வடமேல் அபிவிருத்தி பிரதி அமைச்சர்)
(The Hon. Edward Gunasekara - Deputy Minister of Internal Affairs and Wayamba Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින මුදල් අමාත්‍යාංශයට සම්බන්ධ නියමයන් හා යෝජනා කිහිපයක් පිළිබඳව අප සාකච්ඡා කරනවා. ඒ පිළිබඳව කථා කරන්න අවස්ථාවක් ලබාදීම පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

විශේෂයෙන්ම අපේ මුදල් ඇමතිතුමා මේ ගරු සභාවේ සිටින මොහොතේ, එම අමාත්‍යාංශයේ නිලධාරි මහත්වරුන් රාජ්‍ය නිලධාරීන්ගේ මැදිරියේ සිටින මොහොතේ, මා නියෝජනය කරන මිනුවන්ගොඩ ආසනයට බලපාන ප්‍රශ්න කිහිපයක් ගැන පමණයි මේ කෙටි කාලය තුළදී කථා කරන්න මා බලාපොරොත්තු වන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා නියෝජනය කරන මිනුවන්ගොඩ ආසනයේ කජු ව්‍යාපාරය කරන අය 15,000ක් පමණ සිටිනවා. දේශීය කජු අස්වැන්න අඩු නිසා, විදේශ රටවලින් පොතු පිටින් කජු ගෙඩි ගෙන්වන්න ඒ ව්‍යාපාරය කරන අයට පසුගිය කාලයේ අවසර ලැබිලා, ඔවුන්ට කජු අවශ්‍ය නිසා දැන් කජු ගෙන්වනවා. නීති රීති රාශියක් පනවලා තමයි ඒවා ගෙනෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ ලෙල්ල ඉවත් කළ කජු මේ රටට ගෙනාවා. කජු එහෙම ගේනකොට විශාල බද්දක් අය කරනවා. කජු ගෙන්වීම නැවැත්වීම සඳහායි එහෙම කර තිබෙන්නේ. මම හරියටම දන්නේ නැහැ, එහිදී කජුවල වටිනාකමට වඩා විශාල මුදලක් - සියයට 400ක විතර මුදලක් - ගෙවන්න වෙනවා. නමුත් එහෙම තිබෙද්දී, තක්සේරුව සහවලා - undervalue කරලා - පසුගිය කාලයේ කජු විශාල වශයෙන් ගෙනැත් තිබෙනවා. යම් යම් ජාවාරම්කරුවන් මේ බදුවලට හොරෙන් කජු ගෙන්වීම නිසා, අපේ මිනුවන්ගොඩ ආසනයේ මේ කර්මාන්තය කරන ජනතාව ඇතුළුව මේ රටේ සිටින විශාල පිරිසක් දේශීය කර්මාන්තයක්, ස්වයං රැකියාවක් හැටියට කරන කජු ව්‍යාපාරය කඩාගෙන වැටුණා. මේ පිළිබඳව රේගුවෙන් සොයා බලා, එවැනි සිද්ධි කිහිපයක් අහු වුණාට පසුව ඒ අයගෙන් විශාල බදු මුදලක් අය කළා.

දැනට එහෙම ගෙනෙන එකත් නවත්වලා, කුඩු ගෙනෙනවා වාගේ, අනිකුත් භාණ්ඩ අස්සේ හොරෙන්ම මේ රටට කජු ගෙනෙනවා. ඊයේත් ඒ වාගේ containers දෙකක් ආවාය කියා මට ආරංචියක් ලැබුණා. කලින් නම් ආණ්ඩුවට බදු මුදලක් වශයෙන් පොඩි මුදලක් හෝ ලැබුණා. දැන් ඒ මොකුත්ම නැතිව පිටකොටුවේ සිටින මුදලාලිලා ටිකක් - මුදලාලිලාම නොවෙයි, brokersලා ටිකක් - එකතු වෙලා කජු ගෙන්වනවා. එය කරන්නේ නීත්‍යානුකූලව නොවෙයි. පොතු ඇරපු කජු containers අස්සේ

දමාගෙන හොරෙන් ගෙනෙනවා. අපේ මිනුවන්ගොඩ ආසනයේම කජු කර්මාන්තයේ නියැළෙන විශාල පිරිසක් ඉන්නවා. මම දන්නා ආසන්නම පිරිස ඉන්නේ මිනුවන්ගොඩ ප්‍රදේශයේ නිසායි මම එම ප්‍රදේශය ගැන කථා කරන්නේ. නමුත් කජු කර්මාන්තයේ නියැළෙන අය ලංකාව පුරාම ඉන්නවා. මේක 15,000ක් පමණ පිරිසක් විශාල වශයෙන් ණය අරගෙන ස්වයං රැකියාවක් හැටියට කරගෙන යන ව්‍යාපාරයක් කජු ටික ගෙනෙනවා; වේළනවා; ගෙවල්වලට බෙදනවා; පැකට් කරන්න දෙනවා. අපේ ප්‍රදේශයේ ජනතාව රැකියා ඉල්ලාගෙන අපේ ගෙවල්වලට එන්නේ නැහැ. සමහර උපාධිධාරි දරුවෝ පවා කජු ව්‍යාපාරයේ නියැළී සිටිනවා. දැන් ඔවුන් සියලුදෙනාටම මේ ව්‍යාපාරය කරන්න බැරි තත්ත්වයට මේක වට්ටලායි තිබෙන්නේ, ගරු ඇමතිතුමනි. කුඩු ගෙනෙන විධියට, කජු හොරෙන් ගෙන්වීම -smuggle කිරීම- නවත්වන ක්‍රමයක් ඉතා ඉක්මනින් සොයා ගන්න වෙනවා. සමහර විට මේ සම්බන්ධව කටයුතු කරන ප්‍රධාන නිලධාරි මහත්මියත් අද මේ රාජ්‍ය නිලධාරීන්ගේ මැදිරියේ ඇති. කරුණාකර මේ ගැන සොයා බලන්න. මම හිතන විධියට මෙය ඔබතුමියලා නොදැන සිදුවන දෙයක්. මේ හේතුව නිසා මේ රටේ පවතින ව්‍යාපාරයක්, ස්වයං රැකියාවක් විශාල වශයෙන් විනාශ වෙමින් යනවා. මේ පිළිබඳව කරුණු දක්වන්න තමයි මම මේ මොහොතේ කථා කිරීමට අවස්ථාව ඉල්ලා සිටියේ.

ගරු ඇමතිතුමනි, මේ රටට යම් යම් භාණ්ඩ ගෙන්වන කොට පසුගිය කාලයේ අපි දැකපු දෙයක් තිබුණා. අද අය කරන බද්ද නොවෙයි, හෙට අය කරන්නේ. යම් භාණ්ඩයක් ආනයනය කරද්දී, මේ භාණ්ඩය මෙපමණ cost වෙයි කියා අපි හිතනවා. නමුත් වරායෙන් ගොඩබාන කොට තිබෙන්නේ වෙන බදු මුදලක්. එම තත්ත්වය නිසා අපේ ව්‍යාපාරිකයන් විශාල වශයෙන් අමාරුවේ වැටෙනවා. පසුගිය කාලයේ ලීෆ් වාහනය ගෙනැත්, මම දන්නා එක්තරා ව්‍යාපාරිකයෙක් හිඟමනට වැටුණා. එම වාහනයට අය කරන බද්ද වැඩි කළා. මේ ව්‍යාපාරිකයා වාහන 10ක් විතර ගෙන්නුවා. ඔහු එහෙම කළේ අතේ විශාල මුදලක් තිබිලා නොවෙයි. මේ රටේ සාමාන්‍ය ව්‍යාපාරිකයන්ට වාහන ආනයනය කිරීම බොහොම පහසු ව්‍යාපාරයක්. මොකද හොරයක්, බොරුවක් නැතිව විදේශ රටකින් මේ රටට ගෙන්වන්න පුළුවන් නේ. ඒ ව්‍යාපාරිකයා විනාශ වුණා; ඔහුගේ මුදල නැතිව ගියා. ඔහු බංකොලොත් වෙලා, අද නන්නත්තාර වෙලා ඉන්නේ. මම දන්නා විධියට දැන් ඉතා හොඳ ක්‍රමයක් ක්‍රියාත්මක කරනවා; 1000ccට එක බදු මුදලක්, 1500ccට එක බදු මුදලක් වශයෙන් දැන් අය කරනවා. නමුත් අද ජනතාව තුළ සැකයක් ඇති වෙලා තිබෙනවා. හෙට අනිද්දා Budget එකේදී මේක වෙනස් වෙනවාද, අද හෙට මොකක් හෝ හේතුවක් නිසා වෙනස් වෙනවාද, භාණ්ඩාගාරයේ මුදල් නැති නිසා වෙනස් වෙනවාද කියා ඔවුන් කල්පනා කරනවා. එම නිසා මේ රටේ ව්‍යාපාරිකයාටත් යම් තත්ත්වයක් හදා දෙන්න කියා මම ඉල්ලා සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු එඩ්වඩ් ගුණසේකර මහතා
(மாண்புமிகு எட்வட் குணசேகர)
(The Hon. Edward Gunasekara)
හොඳයි. මම මගේ කථාව අවසන් කරනවා.

මුදල් අමාත්‍යාංශය කරන කටයුතු, රේගුව ඒ පිළිබඳව කරන දේවල් ඒ ව්‍යාපාරිකයනුත් ආරක්ෂා වන විධියට, බොහොම පිරිසිදු විධියට කරනවා නම් හොඳයි.

විජිත හේරත් මන්ත්‍රීතුමා කියූ ආකාරයට ජපානය වැනි රටවල් පාවිච්චි කර ඉවත දමන භාණ්ඩ ගෙනැත් අපේ ප්‍රදේශයේ ගොඩ ගහගෙන හිටියාය කියා අපි දන්නවා. එය ඒ තරම් හොඳ දෙයක් නොවෙයි කියා මම විශේෂයෙන් මතක් කරනවා. විජිත හේරත් මන්ත්‍රීතුමා photocopy machines ගැන කථා කළේ මොකද දන්නේ නැහැ. මම දන්නා හැටියට එහෙම කුණු ගොඩවල් මේ රටට ගෙනෙන එකත් හොඳ නැහැ. Customs එකේ නිලධාරීන්ට, හොරෙන් කජු ගෙන්වන වැඩේ කජු කනවා වාගේ අවසන් කරන්න පුළුවන්. මිනුවන්ගොඩ සහ ඒ අවට ප්‍රදේශයේ කජු ව්‍යාපාරිකයන් ආරක්ෂා කර ගැනීමට, හොරෙන් කජු ගෙන්වීම නතර කර දෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි.

මීළඟට, ගරු විජිත බේරුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.56]

ගරු විජිත බේරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියමයන්, රේගු ආඥා පනත යටතේ යෝජනා සහ නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමයන් පිළිබඳව සාකච්ඡා කරන මේ මොහොතේ, මේ රටේ ආර්ථිකය ගැනත් මම විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මහ බැංකු වාර්තාව අනුව, 2017 වර්ෂයේ මේ රටේ ආර්ථික වර්ධන වේගය සියයට 3.1 දක්වා අඩු වෙලා තිබෙනවා. විශේෂයෙන්ම රටක ජනතාවගේ මූලික අවශ්‍යතා ඉටු කිරීමට සහ රටක් සංවර්ධනය කිරීමට නම්, නිවැරැදි දර්ශනයක් මත, නිවැරැදි ආර්ථික ප්‍රතිපත්තියක් මත ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළක් රජයකට තිබිය යුතුයි.

මේ ආණ්ඩුව බලයට එනකොට වර්ණවලින්, රසකාරකවලින් සරසපු අයිසින් කේක් එකක් වාගේ බොහෝ ආකර්ෂණීය පොරොන්දු ජනතාවට දුන්නා. රැකියා දස ලක්ෂයක් ඇති කිරීම, සාක්කුවට සල්ලි වැටෙන ආර්ථිකයක් හැදීම ඇතුළු ඒ පොරොන්දු පිළිබඳව ටික මොහොතකට කලිනුත් කථා කළා. මෙය මූල්‍ය විනයක්, රටේ විනයක් සහ සොරකම්, දූෂණ, අක්‍රමිකතා නැති කරලා ලිච්ඡවි රාජ්‍යයක් බිහි කරන්නට ආව ආණ්ඩුවක්. හැබැයි, අවුරුදු තුනහමාරක් ගත වනකොට රටේ ආර්ථිකය කඩා වැටිලා. මේ වනකොට ආණ්ඩුව තේරුම් අරගෙන තිබෙනවා, ආණ්ඩුව ආවේ වැරදි ගමනක් කියලා. ඒක තේරුම් ගන්න අවුරුදු තුනහමාරක් ගියා. රටේ විද්වතුන්, වෘත්තිකයන්, සිවිල් සංවිධාන ආණ්ඩුවට එය පෙන්වා දුන්නා. අධ්‍යාපනයක් නොලබපු හෝ වැඩිදුර අධ්‍යාපනයක් නොලබපු රටේ සාමාන්‍ය ජනතාව -ගොවීන් වෙන්න පුළුවන්, කම්කරුවන් වෙන්න පුළුවන්, ධීවරයන් වෙන්න පුළුවන්.- ආණ්ඩුවට විරුද්ධව තම විරෝධතා උද්ඝෝෂණ සහ විරෝධතා මඟින් තමයි එය පෙන්නුම් කළේ. හැබැයි, ආණ්ඩුව ඒක පිළිගත්තේ නැහැ. ආණ්ඩුවට ඒක පිළිගන්න සිද්ධ වුණේ, පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵල නිකුත් වුණාට පස්සේ.

2015 පෙබරවාරි 10වැනි දා බලයට පත් වුණු ප්‍රධාන පක්ෂ දෙක බිමට ඇද දාලා අලුත් පක්ෂයක්, "ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ" කියන අවුරුද්දක් පමණ වයස අලුත් පක්ෂයක් ඉහළින්ම ජයග්‍රහණය කළා. ඒ වෙලාවේ තමයි ආණ්ඩුවේ ඇස් ඇරිලා, ජනතාවගේ හඬට ඇහුම් කන් දෙන්න පටන් ගත්තේ.

[ගරු විජිත බෙරුගොඩ මහතා]

ජනතාව ආණ්ඩුවත් එක්ක මේ ගනුදෙනුව බේරා ගත්තේ කොහොමද? ජනතාවගේ ජනමතය ප්‍රකාශයට පත් කරලායි. ඉන් පසුව තමයි ආණ්ඩුව කල්පනා කළේ, රටේ කෘෂි ආර්ථිකය කඩා වැටී ඇති බව. ආණ්ඩුව ඒ ගැන මීට කලින් කල්පනා කළේ නැහැ, අවධානය යොමු කළේ නැහැ. මැතිවරණ ප්‍රතිඵල නිකුත් වුණාට පස්සේ තමයි ආණ්ඩුව කල්පනා කළේ, නැවත පොහොර සහනාධාරය දෙන්න ඕනෑ කියලා. ඒ වෙලාවේ ආණ්ඩුවේ ඉන්න ඇමතිවරු මාධ්‍ය ඉදිරියට ඇවිත් කිව්වේ, "මීට කලින් සිටි ආණ්ඩුව ජනතාවට ලබා දුන් සහන නැවත ඒ විධියටම ලබා දෙන්න ඕනෑ." කියලා. හැබැයි, මේ ආණ්ඩුවේ ඇස් ඇරුණේ පළාත් සභා මැතිවරණයේ ප්‍රතිඵලයත් එක්කයි.

ආණ්ඩුව අද ආර්ථිකය ගැන කොච්චර උදම් ඇනුවත් ගමේ තිබෙන සිල්ලර කඩයකට ගොඩවැදිලා මුදලාලිගෙන් ඇහුවා නම්, "ආදායම් තත්ත්වය කොහොමද?" කියලා, මුදලාලි කියන්නේ මොකක්ද? "මිනිසුන් බඩු ගන්නේ නැහැ. ආදායමක් නැහැ. එදා ගත්ත බඩු ප්‍රමාණයෙන් භාගයකටත් වඩා අඩුවෙන් අද ගන්නේ." කියලායි. ඒ වාගේම පිටිසර ගමක් ආසන්නයේ ඇති කුඩා නගරයක වෙසෙන තොග වෙළෙන්දෙකුගෙන් ඇහුවාම කියන්නේ, "මීට කලින් අළෙවි වුණ ප්‍රමාණයෙන් භාගයක්වත් දැන් අළෙවි වෙන්නේ නැහැ. මිනිස්සු අතේ දැන් සල්ලි නැහැ." කියලායි. සති පොළට ගියත් තත්ත්වය ඒකයි. එහෙම නම් ආණ්ඩුව තේරුම් ගන්නට ඕනෑ, රටේ බහුතර ජනතාවක් ජීවත් වෙන්නේ බොහොම අමාරුවෙන් බව. අමාරුවෙන් ජීවත් වනවා විතරක් නොවෙයි, ජනතාවගේ කෘෂි නිෂ්පාදන අළෙවි කර ගන්න විධියක් නැහැ. කෘෂි නිෂ්පාදන අඩු මිලටයි ඉල්ලන්නේ. වෙළෙඳ පොළක් නැහැ. ආණ්ඩුව මේ පිළිබඳව තමයි අවධානය යොමු කරන්නට ඕනෑ. හැබැයි, ආණ්ඩුව මොනවාද කරන්නේ? එක පැත්තකින් ජනතාව මත වැඩි වැඩියෙන් බදු පටවනවා. එම නිසා ජනතාවගේ ජීවන වියදම දිනෙන් දින ඉහළ යනවා; ජීවන තත්ත්වය පහතට යනවා. විශේෂයෙන්ම කෘෂි කාර්මික ජීවිතයක් ගත කරන ජනතාවට අද වියදම් කරන්න ලැබෙන්නේ මීට කලින් වියදම් කළ මුදලින් භාගයයි. වේල් තුනක් කෑවා නම්, වේල් දෙකයි කන්නේ. දරුවන්ට ඇඳුම් අරගෙන දෙනකොට කලින් අරගෙන දුන්නාට වඩා බොහොම අඩුවෙනුයි අරගෙන දෙන්නේ. දරුවොත් අරපිරිමැස්මෙන් යුතුව මේ අඩු පාඩු දරාගෙන ජීවත් වනවා. මේක මේ රටේ පුරවැසියන්ට දරා ගන්නට බැහැ. පුරවැසියන්ගේ අභිලාෂයන් ඉෂ්ට කරන්නට ආපු ආණ්ඩුව ජනතාවගේ හඬට කන් දුන්නේ නැහැ.

දැන් මේ ආණ්ඩුව භාරගෙන අවුරුදු තුනහමාරයක් ගත වෙලා. තව අවුරුදු එකහමාරකින් මැතිවරණයකට යනවා. ආණ්ඩුව කටයුතු කරන්නේ ජනතාවගේ අවශ්‍යතා දිහා බලලා නොවෙයි, ජනතාවට ඕනෑ මොනවාද කියා බලලා නොවෙයි. ආණ්ඩුව කටයුතු කරන්නේ, 2020 මැතිවරණයේ ඡන්ද ප්‍රමාණය බලාගෙනයි. මේ වනකොට ආණ්ඩුවේ ප්‍රතිපාදන යොදවලා කඩිනමින් සංවර්ධන කටයුතු ගම්වලට අරගෙන යනවා කියලා මොනවාද කරන්නේ?

බොහෝ වේලාවට තමන්ගේ පාක්ෂිකයන්ගේ පෞද්ගලික අවශ්‍යතා ඉෂ්ට කරන්නට සෘජු ප්‍රතිලාභ ලබා දීමේ වැඩ පිළිවෙළක් තිබෙනවා. අවාසිදායක පරිසරවල ජීවත් වෙන, දිළිඳු බවේ රේඛාවෙන් පහළ සිටින ජනතාවට ප්‍රතිලාභ දෙනවා නම් කමක් නැහැ. හැබැයි, තමන්ගේ පාක්ෂිකයන්ට පමණයි දෙන්නේ. මීට මොහොතකට කලින් මංගල සමරවීර ඇමතිතුමා කිව්වා, "රේගුවේ පරීක්ෂණවලට සම්බන්ධ වන නිලධාරීන්ට ලබා දෙන rewards මෙතෙක් කල් ලැබුණේ නිලධාරීන් සුළු පිරිසකට විතරයි." කියලා. හැබැයි, එතුමා අලුතින් ගන්නා ක්‍රියාමාර්ගය තුළින් රේගුවේ ඉන්නා නිලධාරීන් 1,600ටම එම ප්‍රතිලාභ සමානව ලැබෙන විධියට බෙදා දෙනවා කිව්වා. හැබැයි, රටේ සමස්ත ප්‍රජාවටම මෙසේ ප්‍රතිලාභ සමසේ දෙන්න මේ ආණ්ඩුවට බැරි ඇයි? ආණ්ඩුව එහෙම කරන්නේ නැහැ. ආණ්ඩුව තමන්ගේ අගය කිරීම් මත තමන්ගේ පාක්ෂිකයා පමණක් සතුටු කරන්න උත්සාහ කරනවා. හැබැයි, මේක ලිච්ඡවී පාලනයට ගැළපෙන්නේ නැහැ, මේක සම්මුති ආණ්ඩුවට ගැළපෙන්නේ නැහැ.

සම්මුති ආණ්ඩුවේ පාර්ශ්ව දෙක වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හා එක්සත් ජාතික පක්ෂය -මේ කණ්ඩායම් දෙක- අද දෙපැත්තටයි යන්නේ. එක පැත්තකින් අගමැතිතුමා ප්‍රමුඛ එක්සත් ජාතික පක්ෂයේ මැති-ඇමතිවරුන් අද ගමට ගිහිල්ලා "ගම් පෙරළිය" වැඩසටහන ක්‍රියාත්මක කරන්නයි උත්සාහ කරන්නේ. අනෙක් පැත්තෙන් ජනාධිපතිතුමා ප්‍රමුඛ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කණ්ඩායම "ග්‍රාම ශක්ති" වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න උත්සාහ කරනවා. හැබැයි, ජනතාවගේ අවශ්‍යතා සොයා බලා, ජනතාවගේ මතයට කන් දීලා, රටේ අවශ්‍යතා සොයා බලා කාලීන ප්‍රශ්නවලට -කාලීන ගැටලුවලට- ආමන්ත්‍රණය කරන්නේ නැතුව 2020 මැතිවරණය බලාගෙන ක්‍රියාත්මක වෙනවා නම්, මේ රටේ අනාගතයක් ගැන අපට හිතන්න බැහැ. ඒ නිසා තමයි මේ රටේ ආර්ථික සංවර්ධනය 3.1ට අඩු වෙලා තිබෙන්නේ. එක පැත්තකින් රුපියලේ වටිනාකම අඩු වෙලා තිබෙනවා. ඩොලරයේ මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා. ඩොලරයේ මිල ඉහළ යනකොට, මොකද වෙන්නේ? පිට රටින් ගෙන්වන හැම භාණ්ඩයකටම අපි වැඩිපුර මුදල් දෙන්නට ඕනෑ. ආනයන වියදම් දිනෙන් දින වැඩි වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු විජිත බෙරුගොඩ මහතා
(மாண்புமிகு விஜித பேருகொட)
(The Hon. Vijitha Berugoda)

රටේ ආර්ථිකය කඩා වැටෙනකොට, රටේ නිෂ්පාදනය ඇනහිටිනකොට, අපනයන ප්‍රමාණය අඩු වෙනවා. එවිට අපනයන ආදායම අඩු වෙනවා. අනෙක් පැත්තෙන් රටේ නිෂ්පාදනයක් නොවනවිට, ඒවා සියල්ල පිට රටින් ගෙන්වනකොට, ආනයන වියදම් වැඩි වෙනවා. මේකේ ප්‍රතිඵලය තමයි වෙළෙඳ ශේෂයේ හිඟයක් ඇතිවීම. වෙළෙඳ ශේෂයේ හිඟයක් ඇති වුණාම, විදේශ විනිමය ප්‍රශ්නයක් එනවා. එමනිසා රුපියල බාල්දු වෙනවා වාගේම මේ රටේ ආර්ථිකයත් බාල්දු වෙනවා. මේ රටේ ග්‍රාමීය ආර්ථිකය බාල්දු වෙනවා; මේ රටේ කෘෂි ආර්ථිකය බාල්දු වෙනවා. එමනිසා අපි මේ ගැන ආණ්ඩුවට අවධාරණය කරනවා. විශේෂයෙන්ම අපකීර්තිමත් ගනුදෙනු පිළිබඳව රටේ ජනතාවගෙන් ආණ්ඩුවට චෝදනාවක් තිබෙනවා. බැඳුම්කර වංචාව පිළිබඳව චෝදනාවෙන් තවම ආණ්ඩුවට ගැලවෙන්න තවම බැරි වෙලා තිබෙනවා. මේ සියලු වැරදිවලට, මේ සියලු අඩුපාඩුවලට ආණ්ඩුව වගකියන්නට ඕනෑ කියලා අපි කියනවා. එමනිසා මේ ආණ්ඩුව ජනතාවගේ පැත්තෙන් හිතලා, තීන්දු-තීරණ ගන්න ඕනෑය කියන කාරණය සඳහන් කරමින් මම නතර වෙනවා. බොහොම ස්තුතියි.

[பி.ப. 4.06]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)

அமர்வுக்குக் தலைமைதாங்கிக் கொண்டிருக்கின்ற கௌரவ உறுப்பினர் அவர்களே, துறைமுக மற்றும் விமான நிலைய அபிவிருத்தி அறவீட்டுச் சட்டத்தின் கீழான கட்டளை, விசேட

வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டத்தின்கீழான கட்டளைகள், சுங்கக் கட்டளைச் சட்டத்தின் கீழான தீர்மானங்கள் முதலிய விடயங்கள் தொடர்பாக இன்றைய விவாதம் அமைந் திருக்கின்றது. அந்த வகையில், துறைமுக மற்றும் விமான நிலைய அபிவிருத்தி அறவீட்டுச் சட்டத்தின் கீழான கட்டளை தொடர்பாக நான் முதலில் பேச விரும்புகின்றேன். துறைமுகங்கள், விமான நிலையங்கள் என்பன சர்வதேச ரீதியாகவும் இலங்கைக்குப் பொருளாதாரத்தை ஈட்டித் தருகின்ற முக்கியமான கேந்திர நிலையங்களாகக் கருதப் படுகின்றன. இப்படியான கேந்திர நிலையங்கள் எந்தளவுக்கு அபிவிருத்தி செய்யப்பட்டிருக்கின்றவென்பது பற்றியும், எந்தளவுக்கு அபிவிருத்தி செய்யப்பட வேண்டுமென்பது பற்றியும் நாங்கள் சிந்தித்தாக வேண்டும்.

இலங்கையைப் பொறுத்தமட்டில் திருகோணமலைத் துறைமுகம், காங்கேசன்துறைத் துறைமுகம், கொழும்புத் துறைமுகம், ஹம்பாந்தோட்டைத் துறைமுகம் எனப் பல துறைமுகங்கள் காணப்படுகின்றன. இந்தத் துறைமுகங்களை அபிவிருத்தி செய்வதன் மூலமாக இலங்கையின் வருமானத்தை உயர்த்திக்கொள்வதற்கும், எமது நாட்டில் காணப்படக்கூடிய பொருளாதார ரீதியான வளர்ச்சிக் குறைவு நிலையினை உயர்த்திக்கொள்வதற்கும் வாய்ப்புக் கிடைக்கின்றது. இயற்கைத் துறைமுகங்களை இலகுவாக அபிவிருத்தி செய்ய முடியும். கடந்த யுத்த காலத்தின்போது திருகோணமலைத் துறைமுகத்தையும் காங்கேசன்துறைத் துறைமுகத்தையும் அபிவிருத்தி செய்கின்ற விடயத்தில் சில தடங்கல்கள், தடைகள் இருந்திருக்கலாம். ஆனால், யுத்தம் முடிவடைந்திருக்கின்ற இந்த நிலையில் கடந்த காலங்களில் காணப்பட்ட தொய்வு நிலைகளை அகற்றி இந்தத் துறைமுகங்களை விரைவாக அபிவிருத்தி செய்வதன் மூலமாகப் பொருளாதார ரீதியான வளர்ச்சியினை ஏற்படுத்திக் கொள்வதற்கு வாய்ப்புக் கிடைக்கின்றது. அதேவேளை, இந்தத் துறைமுகங்களூடாக நாங்கள் பெற்றுக்கொள்கின்ற நன்மைகளை மேலும் அதிகரிக்கவேண்டியதொரு சூழ்நிலை காணப்படுகின்றது.

இன்னுமொரு விடயத்தையும் இங்கு நான் சுட்டிக்காட்ட வேண்டும். அதாவது, இந்த விமான நிலையங்கள், துறைமுகங்கள் என்பன சர்வதேச ரீதியான தொடர்புகளை ஏற்படுத்தக்கூடிய கேந்திர நிலையங்களாக இருக்கின் றபடியால், அவற்றை வெளிநாட்டு விமான நிலையங்கள், துறைமுகங்கள் என்பவற்றோடு ஒப்பிட்டு அபிவிருத்தி செய்வதன்மூலமாக எமது துறைமுகங்களும் விமான நிலையங்களும் ஏனைய நாடுகளுடன் சளைக்காமல் போட்டியிடுவதற்கு வாய்ப்பு ஏற்படும்.

மட்டக்களப்பில்கூட வலையிறவு என்கின்ற இடத்தில் ஒரு விமான நிலையம் அமையப் பெற்றிருக்கின்றது. இது யுத்த காலத்தின்போது மிகவும் விஸ்தரிக்கப்பட்ட ஒரு விமான நிலையமாகக் காணப்பட்டது. அவ்வாறே, யுத்தத்துக்காக முழுமையாகப் பயன்படுத்தப்பட்ட ஒரு விமான நிலையமாகவும் இருந்தது. அண்மையில் அந்த விமான நிலையத்திலிருந்து சிவில் விமான சேவையினை ஆரம்பித்து வைக்கின்ற நிகழ்வு நடைபெற்றது. அதில் போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர் கௌரவ நிமல் சிறிபால த சில்வா அவர்களும் அவருடைய பிரதி அமைச்சராக இருக்கின்ற அசோக்க அபேசிங்க அவர்களும் மற்றும் அதிகாரிகளும் கலந்துகொண்டிருந்தார்கள். அங்கிருந்து சிவில் விமான சேவையை ஆரம்பிக்கின்ற செயற்பாடுகளை மக்கள் வரவேற்கின்றார்கள். அங்கு நடைபெற்ற கூட்டத்தின்போது, மக்கள் மத்தியிலிருந்து கருத்தறிகின்ற ஒரு செயல்பாட்டினை அமைச்சர், பிரதியமைச்சர் ஆகியோர் மேற்கொண்டிருந்தனர். அந்த வேளையில் மக்கள் மத்தியிலிருந்து ஒரு கருத்துச் சொல்லப்பட்டது. அதாவது, அந்த விமான நிலையம் யுத்தம் நடந்த காலத்தில் வலையிறவு, திமிலைதீவு, புதூர், சேற்றுக்குடா போன்ற பல கிராமங்களை உள்வாங்கி விஸ்தரிப்பு செய்யப்பட்டது. அங்கு யுத்தத்திற்கு முற்பட்ட காலத்தில் மக்கள் சுமார் 500 மீற்றர் பயணம் செய்து நேரடி வழியினூடாக தங்களுடைய போக்குவரத்தினைச் செய்யக்கூடிய ஒரு வாய்ப்பிருந்தது. ஆனால், யுத்தத்தைக் காரணங்காட்டி மூடப்பட்ட மக்களின் போக்குவரத்து வழிக்கான அந்தப் பாதை யுத்தத்தின் பின்னரும் திறக்கப்படாமல், அதற்கு மாற்றீடாக - 500 மீற்றருக்குப் பதிலாக - ஏறத்தாழ 3 கிலோ மீற்றர் தூரம் வரையான சுற்றுப் பாதையொன்று அமைக்கப்பட்டது. அந்தச் சுற்றுப் பாதையில் ஏறத்தாழ 8 வளைவுகள் காணப்படுகின்றன. அதன் காரணமாக அங்கு அடிக்கடி விபத்துக்கள் ஏற்பட்டு, மனித உயிர்கள் காவு கொள்ளப்படுகின்ற நிலைமையும் காணப்படுகின்றது. எனவே, இந்த நிலைமையைச் சீர்செய்து தர வேண்டும் என்று மக்கள் மற்றும் மாநகர சபையின் உறுப்பினர்கள் கோரிக்கை முன்வைத்தனர். அப்போது கௌரவ அமைச்சர் அவர்கள், இதுதொடர்பான ஒரு தீர்மானத்தினை மாவட்ட அபிவிருத்திக் கூட்டத்தில் நிறைவேற்றி, அறிவிக்குமாறு கேட்டுக் கொண்டார். அதற்கிணங்கத் தீர்மானம் நிறைவேற்றப்பட்டு அறிவிக்கப்பட்டது.

மட்டக்களப்பு விமான நிலையத்தைச் சிவில் சேவைக்காகப் பயன்படுத்துகின்ற விடயத்தினை நாங்கள் வரவேற்கின்றோம். ஆனால், யுத்தம் முடிந்த பின்னரும்கூட அந்தப் பாதை திறக்கப்படாமையால் அவர்களின் பயணம் ஓர் இலகு வழியாக இல்லாமல் கடினமான வழியாகவே இருக்கின்றது. ஆகவே, விசாலமாக்கப்பட்ட அந்த விமான நிலையத்திற்கு பக்கத்தில் ஒரு வழியினைத் திறந்து, அங்கு மக்கள் கஷ்ட நஷ்டங்கள் இல்லாமல் பயணிப்பதற்குரிய வழிமுறையினை மேற்கொள்ள வேண்டும் என்ற கோரிக்கையை, கௌரவ அமைச்சர் மற்றும் கௌரவ பிரதி அமைச்சர் அவர்கள் இங்கு இல்லாதபோதும்கூட நான் இங்கு முன்வைக்க விரும் புகின்றேன். இந்தக் கருத்துக்கள் அமைச்சரின் காதுகளுக்கு எட்டி அவர் அதற்குரிய நடவடிக்கைகளை எடுப்பார் என்று எதிர்பார்க்கின்றேன். அந்த மக்கள் போக்குவரத்துச் செய்வதற் கான அந்தப் பாதையை இந்த விமான நிலையத்திற்குப் பக்கத்தில் திறந்துவைப்பதன்மூலம் இது நல்லாட்சி அரசாங்கம் என்பதை நிரூபிப்பதற்கு நடவடிக்கை எடுக்க வேண்டும் என்று இந்த இடத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து, துறைமுகங்களைத் திறக்கின்ற விடயத்தில், நாட்டின் அபிவிருத்திக்காகத் திறப்பது, சொந்த அரசியலுக் காகத் திறப்பது என்ற இரண்டு வகைச் செயற்பாடுகள் இருக்கின்றன. அபிவிருத்திக்காகத் திறப்பது என்பது, பொதுவாகச் சகல மக்களையும் அரவணைத்து மக்களின் நன்மைக்காகவும் நாட்டின் நன்மைக்காகவும் செயற் படுவதாகும். இவ்வாறான துறைமுகங்கள் நாட்டின் பொருளாதாரத்தை மற்றும் வருவாயை அதிகரிக்கும் நோக்கில் அமைந்திருக்கும், அல்லது நாட்டுக்கு நன்மை பயக்கக்கூடிய விதத்தில் அமைந்திருக்கும். அந்த வகையில் இயற்கைத் துறைமுகங்களாக இருக்கின்ற திருகோணமலைத் துறைமுகம், மற்றும் காங்கேசன்துறை துறைமுகம், கொழும்புத் துறைமுகம் போன்றவற்றை விஸ்தரித்து, அபிவிருத்தி செய்வது வரவேற்கத்தக்க ஒரு விடயமாகும். அதற்காக மக்களின் காணிகளை எடுத்து அந்தத் துறைமுகங்களை விஸ்தரிப்புச் செய்ய வேண்டுமென்ற கருத்தை நான் கூற வரவில்லை. அதேவேளை அரசியலுக்காகத் துறைமுகங்களை, விமான நிலையங்களை உருவாக்குவது என்பது உண்மையில் மக்களை

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

நட்டப்படுத்துகின்ற அல்லது நாட்டின் வருமானத்தை இழக்கச்செய்கின்ற செயற்பாடாகும். கடந்த காலத்தில் அபிவிருத்தியை விடுத்து அரசியலுக்காகத் துறைமுகங்கள், விமான நிலையங்கள் திறக்கப்பட்ட சம்பவங்களும் நிகழ்ந்திருக்கின்றன. இதனால் இன்று எமது நாட்டுக்குக் கிடைக்கவேண்டிய வருமானத்தை ஈட்டமுடியாத நிலையில், அவற்றைச் சீனாவுக்குக் கொடுக்க வேண்டிய துர்ப்பாக்கிய நிலைமை ஏற்பட்டிருக்கின்றது. இவற்றை எல்லாம் அரசியலுக்காக மேற்கொள்ளப்பட்ட செயற்பாடுகளாகவே நாங்கள் கருதுகின்றோம்.

அடுத்து, விசேட வியாபாரப் பண்ட அறவீட்டுச் சட்டம் தொடர்பாக ஒரு விடயத்தைச் சுட்டிக்காட்ட விரும்புகின்றேன். நாட்டில் பொருளாதார ரீதியாக ஏற்றுமதிகள், இறக்குமதிகள் மேற்கொள்ளப்படுகின்றன. அந்த விடயத்தில் மிகவும் விழிப்பாக இருக்கவேண்டும். நாட்டின் பொருளாதாரம் ஏற்றுமதிப் பொருளாதாரமாக, அதாவது உற்பத்தியில் தன்னிறைவு பெற்று, மிகுதியாக இருக்கின்ற மிகையான உற்பத்திகளை வெளிநாடுகளுக்குக் கொண்டு செல்லக்கூடிய பொருளாதார முறைமை இருக்குமாகவிருந்தால் அது நாட்டுக்குப் பயனுள்ளதாக அமையும். அதேவேளை, இன்று நாடு இறக்குமதியில் தங்கியிருக்கக்கூடிய நிலைமையில் இருப்பதால், அது நாட்டுக்குப் பாதகமாக அமைவதற்கு வாய்ப்பிருக்கின்றது.

பண்டங்களுக்கான வரிகள் பற்றிக் குறிப்பிடுகின்றபோது, உண்மையில் கவனத்திற்கொள்ள வேண்டிய ஒரு விடயம் இருக்கின்றது. உள்நாட்டில் உற்பத்தியாளர்கள் தமது உற்பத்திகளை மேற்கொண்டிருக்கின்றபோதிலும், மக்களுக்கு அல்லது நுகர்வோருக்குப் போதியளவு பண்டங்கள் இல்லாமலிருக்கின்றது என்ற அடிப்படையில் வெளிநாடுகளிலிருந்து இறக்குமதிகள் செய்யப்படுகின்றது. அதாவது, நுகர்வோர் குறைந்த விலையில் அல்லது சாத்தியமான விலையில் பொருட்களைக் கொள்வனவு செய்வதற்கு வாய்ப்பளிக்க வேண்டும் என்ற அடிப்படையில் வெளிநாடுகளிலிருந்து பொருட்கள் இறக்குமதி செய்யப் படுகின்றன. ஆனால், துறைமுகங்களில் பொருட்களுக்கு விதிக்கப்படுகின்ற வரிகள் சிலவேளைகளில் நுகர்வோரைக் கூடுதலாகப் பாதிக்கக்கூடியதாக இருக்கின்றது. அதாவது, உள்நாட்டு உற்பத்தியாளர்களைப் பாதுகாக்க வேண்டும் அல்லது அவர்களது உற்பத்திப் பொருட்களைக் கீழ்நிலைக்கு - வீழ்ச்சி நிலைக்குக் கொண்டுசெல்லக்கூடாது என்பதற்காக வெளிநாடுகளிலிருந்து கொண்டுவரப்படுகின்ற பண்டங் களுக்கு வரிகள் விதிக்கின்றபோது, நுகர்வோர் எவ்வாறு பாதிக்கப்படுவார்கள் என்பதைப் பற்றிச் சிந்திப்பதற்குச் சம்பந்தப்பட்டவர்கள் தவறிவிடுகின்றார்கள். உதாரணமாக, முதலாளித்துவ நாடுகளில் பெரும்பாலும் முதலாளித்துவப் பொருளாதாரத்தைப் பற்றிக் கூடுதலாகக் கவனமெடுக் கின்றபோது, நுகர்வோரைப்பற்றி, அடிமட்ட ஏழைகளைப் பற்றி மற்றும் தொழிலாளர்களைப் பற்றிச் சிந்திக்கின்ற தன்மைகள் குறைந்து கொண்டு செல்கின்றன. அந்தவகையில் உள்நாட்டு உற்பத்தியாளர்கள் பாதுகாக்கப்படவேண்டும் என்பதில் மாற்றுக் கருத்துக்கள் இருக்கமுடியாது.

ஒரு நாடு உள்நாட்டு உற்பத்தியாளர்களைத் தட்டிக்கொடுப்பதன் மூலமாகத்தான் உற்பத்தியை அதிகரித்து, சுயதேவையைப் பூர்த்தி செய்யக்கூடிய நாடாக மாறுவதற்கு வாய்ப்பிருக்கின்றது. குறித்த பொறிமுறையினைக் கையாள் கின்றபோது, இரண்டு பக்கங்களையும் கூர்மையாக அவதானித்து முடிவுகளை எடுக்கவேண்டும். அதாவது உற்பத்தியாளர்களையும் பாதுகாக்க வேண்டும்; நுகர்வோரையும் பாதுகாக்க வேண்டும். அதேவேளை, நுகர்வோரது நலனைக் கருத்திற்கொண்டு நுகர்வோரைப் பாதுகாப்பதற்கான சபைகளும் உருவாக்கப்படுகின்றன. நுகர்வோருக்கு ஏற்ற விதத்தில் அல்லது நுகர்வோரைப் பாதிக்காத விதத்தில் விலை நிர்ணயம் செய்தல் என்கின்ற அடிப்படையில் அவை உருவாக்கப்பட்டிருக்கின்றன. ஆனால், சிலவேளைகளில் முதலாளித்துவ நாடுகளில் பொருட்களுக்கு இவ்வாறான தட்டுப்பாடுகளைச் செயற்கையாக ஏற்படுத் திவிட்டு, நுகர்வோர் பாதுகாப்புச் சபையின் மூலமாக விலைகளை உயர்த்திக்கொண்டு செல்கின்ற தந்திரோபாய வழிமுறைகளும் காணப்படுகின்றன. அதாவது, சிலவேளைகளில் செயற்கையான முறையில் பொருட்களுக்குத் தட்டுப்பாடுகளை உருவாக்கிவிட்டு, நுகர்வோரைக் கருத்திற்கொண்டு அவர்களையும் உற்பத்தியாளர்களை கருத்திற்கொண்டு அவர்களையும் பாதிக்காத விதத்தில் பொருட்களுக்கு விலை நிர்ணயம் செய்வதாகக் கூறிக்கொண்டு, முதலாளித்துவம் சார்ந்த அல்லது குறிப்பிட்ட துறையினர் செய்யும் செயற்பாடுகள் நேரடியாக நுகர்வோரைப் பாதிக்கக்கூடிய ஒரு நிலைமையினை உருவாக்குவதை நாங்கள் மறந்துவிடக்கூடாது.

அதேவேளை, விமான நிலையங்களில் இலவசமான Wi-Fi வசதிகள் செய்துகொடுப்பதாகச் சொல்லியிருந்தும்கூட, அது எந்தளவிற்கு நடைமுறையிலிருக்கின்றது? என்பது பற்றி நாங்கள் அவதானிக்க வேண்டியிருக்கின்றது. பொதுவாக துறைமுகங்களில், விமான நிலையங்களில் கட்டணங்கள் அதிகரிக்கப்படுகின்றபோது, அவற்றினால் வழங்கப்படும் சேவைகளும் அதற்கேற்ற விதத்தில் நேர்கணியமாக அதிகரிக்கப்பட வேண்டும். அவ்வாறில்லாமல் வரிகளை அதிகமாக அறவிட்டுவிட்டு மக்களுக்கான வசதிகள் அல்லது சேவைகளைக் குறைவாகச் செய்கின்றபோது, அந்தச் செயற்பாடுகள் துறைமுகங்கள் மற்றும் விமான நிலையங்களுக்குச் செல்கின்ற மக்களை - நுகர்வோரைப் பாதிக்கக்கூடியதாக இருக்கின்றது. இப்போது விமான நிலையங்களுக்குரிய நுழைவுக் கட்டணம் 300 ரூபாயாக உயர்த்தப்பட்டிருக்கின்றது. நுழைவுக்கட்டணம் உயர்த்தப் பட்டிருப்பதால், அவர்களுக்குச் செய்கின்ற சேவகம் - சேவை சிறப்பாக இருக்கவேண்டும் அல்லது அவர்களுக்குத் திருப்தியை ஏற்படுத்தக்கூடிய விதத்தில் அமைந்திருக்க வேண்டும். ஆனால், வரிகள் அறவிடப்படுகின்ற அதேயளவிற்கு அங்கு செல்கின்றவர்களுக்குரிய வசதி வாய்ப்புக்கள் செய்து கொடுக்கப்பட்டிருக்கின்றனவா என்பதைப்பற்றி உண்மையில் நாங்கள் ஆழமாக ஆராய்ந்து பார்க்கவேண்டியுள்ளது.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මෙම අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

ගරු බුද්ධික පතිරණ මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு புத்திக பதிரண - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Buddhika Pathirana - Deputy Minister of Industry and Commerce)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ගරු එස්. වියාලේන්දිරන් මහතා
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)

වීසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு வேலு குமார் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. VELU KUMAR *left the Chair, and* THE HON. WIJEPALA HETTIARACHCHI *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
நான் இறுதியாகக் கூறிய விடயத்திலிருந்து தொடர்கின்றேன்.

இப்படியாக வரிகள் - கட்டணங்கள் அதிகரிக்கின்ற அதேவேளை, மக்களுக்கு வழங்கப்படுகின்ற சேவைகளும் அதற்கு ஏற்ற விதத்தில் நேர்க்கணியமாக அமைந்திருக்க வேண்டும். வரிகள் அதிகரிக்கின்றபொழுது அதற்கு எதிர்க்கணியமான விதத்தில் சேவைகள் குறைந்துகொண்டு செல்லுமாக இருந்தால் அதனை ஏற்றுக்கொள்ள முடியாத ஒரு விடயமாகப் பார்க்கவேண்டிய ஒரு சூழ்நிலை மக்களுக்கு ஏற்படும்.

இதைவிடுத்து, இன்னுமொரு விடயத்தையும் சொல்ல விரும்புகின்றேன். அதாவது விமான நிலையங்கள் மற்றும் துறைமுகங்களில் தொழில்வாய்ப்புக்கள் வழங்கின்ற விடயத்திலும் கூடுதலான கவனம் செலுத்தவேண்டிய தேவை குறிப்பிட்ட அமைச்சர்களுக்கு இருக்கின்றது. ஏனெனில், தொழில்வாய்ப்புக்கள் என்பதும் மக்களின் பொருளாதார உரிமையோடு சம்பந்தப்பட்ட ஒரு விடயமாகும். 1975ஆம் ஆண்டுக் காலப்பகுதியில் எமது கட்சியான தமிழர் விடுதலைக் கூட்டணி ஆறு அம்சக் கோரிக்கையினை விடுத்திருந்தது. "இன விகிதாசார அடிப்படையில் தொழில்வாய்ப்புக்களை வழங்குகின்ற ஒரு முறை இருக்க வேண்டும்" என்பது அந்தக் கோரிக்கைகளில் ஒன்றாகும். இன்றைய நிலையில் தொழில்வாய்ப்புக்களை வழங்குகின்ற சூத்திரத்தை எடுத்துப் பார்க்கின்றபோது, அதில் இன விகிதாசாரம் பின்பற்றப்படாமல் இருப்பது தெரிகின்றது. உண்மையில் குறித்த ஒரு பிரதேச மக்கள் தொழில்வாய்ப்புக்கள் இல்லாமல் இருக்கின்ற அதேவேளையில், பிற மாவட்ட அல்லது பிற மாகாணங்களைச் சேர்ந்தவர்கள் அந்தக் குறிப்பிட்ட இடங்களில் தொழில்களுக்காக அனுப்பப்படுகின்ற ஒரு துர்ப்பாக்கிய நிலைமை காணப்படுகின்றது. அரசு இந்த விடயத்திலும் கூடுதலான கவனம் செலுத்த வேண்டும். ஏனெனில், குறித்த விடயங்கள் சிறிய விடயங்கள், மக்களுக்குத் தெரியாத விடயங்கள் என்று சொல்லி அவை புறக்கணிப்புக்களுக்கு உள்ளாகின்றபோது, அவை பாரிய பிரச்சினைகளை உருவாக்குகின்ற விடயங்களாக மாறிவிடுவதையும் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது.

பொருளாதாரத்தோடு அல்லது மனிதவள அபிவிருத்தியோடு சம்பந்தப்பட்ட இன்னுமொரு விடயத்தினையும் நான் இந்த இடத்தில் சொல்ல வேண்டும். அதாவது கௌரவ பிரதம அமைச்சர் அவர்கள் பத்து இலட்சம் இளைஞர் யுவதிகளுக்கு தொழில்வாய்ப்புக்களைக் கொடுக்கின்ற ஒரு பிரகடனத்தைச் செய்திருந்தார். கணிசமான அளவு இளைஞர் யுவதிகள் தொழில்வாய்ப்பைப் பெறக்கூடிய இந்தத் திட்டம் ஒரு நல்ல விடயமாகக் கருதப்பட்டது, ஆனால், அந்தப் பிரகடனத்தின் மூலமாக இதுவரை எத்தனை இலட்சம் பேர் தொழில்வாய்ப்புக்களைப் பெற்றிருக்கின்றார்கள் என்பது பற்றி நாங்கள் சிந்திக்க வேண்டும். இந்த நிலையில் ஏறத்தாழ எழுபது சதவீதமான பதவிக்காலத்தை நல்லாட்சி அரசாங்கம் நிறைவு செய்திருக்கின்றது. இன்னும் ஒன்றரை வருடங்கள் மீதமிருக்கின்றன. எனவே, அந்தக் காலத்திற்குள் அவர்களுக்குத் தொழில்வாய்ப்புக்களை வழங்கவேண்டிய தேவை இருக்கின்றது.

அதேநேரம் இன்று பட்டதாரிகளுக்கு நேர்முகப் பரீட்சைகளை நடாத்தி தொழில்வாய்ப்புக்களைப் பெற்றுக் கொடுக்கின்ற விடயம் மேற்கொள்ளப்பட்டிருக்கின்றது. ஆனால், அதில் உள்வாரி, வெளிவாரிப் பட்டதாரிகள் என்று அவர்களை வகைப்படுத்தி நோக்குகின்ற தன்மையை நிச்சயமாகப் புறந்தள்ளிவிட வேண்டும். உள்வாரிப் பட்டதாரிகள், வெளிவாரிப் பட்டதாரிகள் என்று பாரபட்சம் காட்டாமல் சகல பட்டதாரிகளுக்கும் தொழில்வாய்ப்புக்களைப் பெற்றுக் கொடுப்பதுதான் நீதியான செயலாக இருக்கும். அதேநேரம் பட்டதாரிகளுக்குத் தொழில் வழங்குவதற்கான வயதெல்லையானது 45 ஆக அதிகரிக்கப்பட்டிருப்பதாகப் பிரதமர் அவர்கள் குறிப்பிட்டிருந்தார். அது வரவேற்கத்தக்க ஒரு விடயமாக இருக்கின்றது. மேலும், பட்டம் பெற்ற காலத்தை அடிப்படையாகக் கொண்டு தொழில்வாய்ப்புக் களைப் பெற்றுக் கொடுக்க வேண்டும். ஏனெனில், 2012ஆம் ஆண்டில் பட்டம் பெற்றபோதிலும், இதுவரை தொழில்வாய்ப்புக்களின்றி இருக்கின்ற பட்டதாரிகளும் இருக்கின்றார்கள். ஆகவே, நியமனம் வழங்குகின்றபோது நீண்டகாலமாகத் தொழில்வாய்ப்புக்களின்றி இருப்பவர் களுக்கு முக்கியத்துவம் கொடுக்க வேண்டுமென்று இந்த இடத்தில் கேட்டுக்கொள்கின்றேன்.

இன்னும் ஒரேயொரு முக்கியமான விடயத்தைக் கூறி எனது உரையினை நிறைவு செய்ய எண்ணுகின்றேன். அதாவது, மட்டக்களப்பில் நுண்கடன் வழங்குவது தொடர்பாக மிகவும் பாரதூரமான நிலை காணப்படுகின்றது. அங்கு தற்கொலைகள் அதிகரித்துக்கொண்டு செல்கின்றன. அண்மையில் வாழைச்சேனையில் முனிதாஸ் ஸ்ரீதாஸ் என்பவர், நுண்கடன்கள் மூலமாக ஏற்படுகின்ற பாதிப்புக்கள், தற்கொலைகளைக் கருத்திற்கொண்டு உண்ணாவிரதம் மேற்கொண்டார். நுண்கடன் மூலமாக தற்கொலைகள் அதிகரித்துக்கொண்டு செல்கின்ற அந்த நிலை இனியும் இருக்கக்கூடாது. எனவே, சமுர்த்தித் திட்டத்தின் மூலம் மக்கள் இலகுவாகவும் துரிதமாகவும் உதவி பெறக்கூடிய ஒரு சூழ்நிலையை உருவாக்கி, நுண்கடன்களால் பாதிக்கப் படுகின்ற மக்களுக்கு நிவாரணம் வழங்குவதற்கு நல்லாட்சி அரசாங்கம் உதவ வேண்டுமென்று கூறி, எனது உரையினை நிறைவு செய்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා.

[අ.භා. 4.26]

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාවරයා විසින් ඉදිරිපත් කරන ලද විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියම 8ක්, රේගු ආඥා පනත යටතේ යෝජනා 5ක්, වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියමයක් හා නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියම 2ක් සම්බන්ධයෙන් අදහස් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා ස්තුතිවන්ත වෙනවා.

රජයේ සංවර්ධන ක්‍රියාවලිය, එහෙම නැත්නම් රජයේ වැඩ පිළිවෙළ, රාජ්‍ය සේවකයාගේ ආරක්ෂාව යන සියල්ල පවත්වාගෙන යන්න රජයට ආදායමක් අවශ්‍යයි. රජය ඒ ආදායම උත්පාදනය කර ගන්නා ක්‍රමවේද ගණනාවක් තිබෙනවා. ඒ ක්‍රමවේද තුළ බදු අදායම සුවිශේෂීයි. බදු ආදායම ගැන කථා කරන අපි ඉතිහාසයේ ඉඳලා, රජ කාලයේ ඉඳලා අහලා තිබෙන දෙයක් තමයි, දේශීය ව්‍යාපාරිකයාගෙන්, ව්‍යවසායකයාගෙන්, එහෙමත් නැත්නම් බදු ගෙවන්න නියමිත පුද්ගලයන්ගෙන් බොහොම සියුමැලිව, මල නොතලා රොන් ගන්නා ආකාරයට ඒ බදු ලබා ගන්නවාය කියන කාරණය. එසේ බදු ලබා ගැනීම තමයි ඕනෑම රටක, ඕනෑම ව්‍යාපාරයක පැවැත්මට හේතු වෙන්නේ. හැබැයි, අද මොකක්ද සිද්ධ වෙන්නේ? මේ අවස්ථාවේදී මේ ගරු සභාවේ මුදල් අමාත්‍යවරයාත් නැහැ; මුදල් රාජ්‍ය අමාත්‍යවරයාත් නැහැ; ඒ විෂය භාර කිසිම අමාත්‍යවරයෙක් නැහැ. හැබැයි, මේ සභාවේ කටයුතු පවත්වාගෙන යනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ කියන දේවල් හිස් ආකාශයට යන්නේ. අද ඉදිරිපත් කරන මේ නියම, යෝජනා හරියාකාරව ක්‍රියාත්මක නොවුණොත් රුපියල් ලක්ෂ ගණනක් වියදම් කරලා මේ සභාවේ කටයුතු පවත්වාගෙන යෑමේ ප්‍රතිඵලයක් තිබෙනවාද කියන එක ගැන සොයා බලන්න ඕනෑ. ඒ සඳහා වියදම් වෙන්නේත් බදු මුදල්. ඒ නාස්ති වෙන්නේත් බදු මුදල්. ජනතාව දේශපාලනඥයා අප්‍රිය කරන තත්ත්වයට අද පත්වෙලා තිබෙන්නේ, මෙවැනි වටපිටාවක් තුළයි. පාර්ලිමේන්තු රැස්වීම් පවත්වන්නේ මාසයකට දවස් 8යි. ඒ දවස් අටේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා මේ රටේ, ගමේ, ප්‍රදේශයේ, නගරයේ තිබෙන ගැටලු, ව්‍යාපාරවල තිබෙන ගැටලු, ජීවත් වීමට තිබෙන ගැටලු, අධ්‍යාපනයේ, සෞඛ්‍යයේ තිබෙන ගැටලු කථා කරනකොට ඒවාට ඇහුම් කන් දෙන්න ඒ මැති ඇමතිවරුන් මේ සභාවේ නැත්නම්, එය මේ රටේ අභාග්‍යයක් මිසක්, රටේ ජනතාවගේ අභාග්‍යයක් මිසක් දේශපාලනඥයාගේ අභාග්‍යයක් නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වනකොට දේශීය ව්‍යාපාරිකයා මොන තැනකටද වැටී තිබෙන්නේ කියලා අපි පැහැදිලිවම දන්නවා. ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලා, ඇමතිතුමන්ලා, ඒ වාගේම විපක්ෂයේ ඉන්න මන්ත්‍රීතුමන්ලා, උතුරු පළාත නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලා යන සියලුදෙනාම අද කිව්වේ මොකක්ද? ඒ ගොල්ලෝ කියන කාරණය තමයි, අද මේ රටේ ව්‍යාපාර කරන්න පුළුවන් තත්ත්වයක් නැහැයි කියන එක.

මේ අවස්ථාවේදී ගරු එඩ්වඩ් ගුණසේකර මැතිතුමාට මා ශුභ පතනවා, එතුමාට අභ්‍යන්තර කටයුතු හා වයඹ සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය ධුරය ලැබීම ගැන. අද එතුමන්ලාගේ ගමේ ප්‍රශ්න ගැන එතුමන්ලාගේ ආණ්ඩුව තුළම එතුමන්ලා කථා කරනවා. ඒ ප්‍රදේශයේ ගොවියාට, ව්‍යාපාරිකයාට අද අත්වෙලා තිබෙන ඉරණම ගැන එතුමන්ලා කියනවා.

ඒ විතරක් නොවෙයි. උළු කර්මාන්තයේ යෙදෙන දහස් සංඛ්‍යාත ව්‍යාපාරිකයන්ට, ව්‍යවසායකයන්ට, කම්කරුවන්ට අද සිද්ධ වෙලා තිබෙන දේ පිළිබඳව ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා. මේ වනකොට මගේ ගම් ප්‍රදේශය වන දිවුලපිටියේ මරදගහමුල ප්‍රදේශයේ සහල් කර්මාන්තයට සිද්ධ වෙලා තිබෙන දේ අද අපට දකින්න පුළුවන්. රට වටේම තිබෙන මහා පරිමාණ, මධ්‍ය පරිමාණ වී මෝල් අද බොහොම දරුණු විධියට කඩා වැටී තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මේ ආණ්ඩුවට උත්තර නැහැ; මුදල් අමාත්‍යාංශයට උත්තර නැහැ. මුදල් අමාත්‍යාංශය ඒ සම්බන්ධයෙන් කථා කරන්නේ නැහැ. අද ගෙවන බදු මුදල ගෙව්වාට පස්සේ ඒ ව්‍යාපාරිකයාට ණය වාරිකයක් ගෙවා ගන්න බැහැ; ඒ ණය වාරිකය ගෙවන්න තරම් වත්කමක් ඔහුට ලැබෙන්නේ නැහැ. අවශ්‍ය වෙලාවට වී ටික ලැබෙන්නේ නැතුව, නියමිත මිලට සහල් ටික විකුණා ගන්න බැරිව අද ඒ ව්‍යාපාරිකයා අන්ත අසරණ තත්ත්වයට පත්වෙලා ඉන්නවා විතරක් නොවෙයි, ඔහුට ඒ ණය මුදල මෙන් දෙගුණයක් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා, පොලිය දෙතුන් ගුණයකින් වැඩිවෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා ණය වශයෙන් රුපියල් ලක්ෂයක් ගෙවපු පුද්ගලයාට අද වනකොට රුපියල් ලක්ෂ දෙකක් ගෙවන්න සිද්ධවෙලා. ඒකට වග කියන්න ඕනෑ මහ දවල් මහ බැංකුවේ මුදල් කොල්ල කාපු පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම වාගේ ආයතන නඩත්තු කරපු මහ බැංකු අධිපතිතුමා වාගේම, එතුමා මහ බැංකු අධිපති විධියට පත් කරපු ජනාධිපති, අගමැති වාගේ අය. ඒගොල්ලෝ මේවාට වගකියන්න ඕනෑ.

දැන් අපට පෙනෙනවා එක එක කාලයට එක එක නාඩගම් එළියට දමන හැටි. පසු ගිය දවස්වල ඥානසාර හාමුදුරුවන්ගේ "ජම්පරය" එළියට දැම්මා. ඊට පස්සේ පාතාලය එළියට දැම්මා; මිනිස් ඝාතන වැලක් සිද්ධ වුණා. දැන් "විජයකලා නාඩගම" ඇවිල්ලා තිබෙනවා. මේ නාඩගම් දවසින් දවස එන්නේ ඇයි? මේ නාඩගම් මොහොතින් මොහොත, තත්පරයෙන් තත්පරයට එළියට දමන්නේ ඇයි? "ද නිව්යෝර්ක් ටයිම්ස්" පුවත වාගේ දේවල් එළියට එන්නේ ඇයි? මේවා එළියට එන්නේ වෙන දෙයක් නිසා නොවෙයි. මේවා එළියට එන්නේ මහ බැංකු බැඳුම්කර වංචාව වහන්නයි. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ඉතිහාසයේ කළ පාවා දීම්, රටේ ජනතාවගේ මුදල් නාස්ති කිරීම් වාගේම, විශාලම මංකොල්ලය වූ මහ බැංකු බැඳුම්කර වංචාවෙන් කළ පාඩුව ට්‍රිලියනයක් දක්වා අද වැඩිවෙලා තිබෙනවා. අද ඇමතිවරු අහනවා, "මහ බැංකු බැඳුම්කර වංචාවෙන් සිදු වූ පාඩුව ට්‍රිලියනයක් වෙන්නේ කොහොමද, බිලියන 12 යි නේ?" කියලා. එයින් සිදු වූ පාඩුව බිලියන 12 ද කියලා ගණනය කරලා බලන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොලිය සියයට 7ට, 8ට ගත්ත බැංකු ණයට අද සියයට 15, 20 පොලී ගෙවනවා. අද බැංකු අයිරාවක් දෙන්නේ නැහැ. අද බැංකුවකට ණයක් ගන්න යන පුද්ගලයකුට වෙලාවට ඒ ණය ගන්න බැහැ. බැංකු අද ඒ කටයුතු අත්හැර දාලා තිබෙනවා. අද රටේ හැම ක්ෂේත්‍රයක්ම -කෘෂි කර්මාන්තය, කර්මාන්ත, ඉදිකිරීම්- කඩා වැටිලා තිබෙනවා. දැන් ගුවන් තොටුපොළ බද්ද, වරාය බද්ද කියලා බදු ගහන්න හදනවා. දැන් අපට කොහේද ගුවන් තොටුපොළක් තිබෙන්නේ? ඉන්දියානු සමාගමක් ඊයේ අපේ රටට ආවා. ඔවුන් මත්තල ගුවන් තොටුපොළ මිලදී ගන්න අවශ්‍ය සියලු පිඹුරු පත් හැදුවා. අද අපි පාර්ලිමේන්තුවේදී රාජ්‍ය ඇමතිවරයාගෙන් මේ ගැන ඇහුවාම එතුමා කිව්වා, "මත්තල ගුවන් තොටුපොළ සම්බන්ධයෙන් අද රාත්‍රියේ තීරණාත්මක සාකච්ඡාවක් පවත්වනවා" කියලා. හැබැයි, සිවිල් ගුවන් සේවා පනත අනුව මත්තල ගුවන් තොටුපොළ බදු දෙන්න හැකියාවක් නැහැ. සිවිල් ගුවන් සේවා පනත අනුව රජයේ ගුවන් තොටුපොළක් බදු දීමේ ක්‍රමවේදයක් නැහැ. හැබැයි, මේ

ආණ්ඩුව සිවිල් ගුවන් සේවා පනත සංශෝධනය කරලා හෝ මේ ගුවන් තොටුපොළ බදු දෙන්න දැන් අවශ්‍ය කටයුතු කරනවා.

හම්බන්තොට වරාය බද්දට දීලා මුදල් ගත්තා. මේ වෙද්දී ඒ මුදල විනාශ කරලා තිබෙනවා. මේ වෙද්දී ඒ මුදලට වෙච්ච දෙයක් නැහැ. මා හිතන හැටියට ඒ ගනුදෙනුවෙන් මිලියන හත් අටසියයක් ආණ්ඩුව ගත්තා. හැබැයි, ශත පහක් ණය ගෙවිවේ නැහැ. හම්බන්තොට වරාය වෙනුවෙන් ගත්ත ඩොලර් මිලියන 1,200 ගණනක ණය මුදල පසු ගිය ආණ්ඩුව විසින් ගෙවිවා මිසක් මේ ආණ්ඩුවෙන් ශත පහක් ගෙවිවේ නැහැ. මේ ආණ්ඩුව ඒ මුදල් ටික වියදම් කරමින් යනවා. දැන් ගමේ සංවර්ධනය, රටේ සංවර්ධනය, "ගම් පෙරළිය" කියලා නොයෙකුත් නම් දාගෙන එනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 9ක් තමයි වෙන් වෙලා තිබුණේ. රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමාගේ විනාඩි 9කුත් තිබෙනවා. එතුමාගේ වේලාවෙන් මට විනාඩි 5ක් ලබා දෙන්න කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා කියාගෙන ආවේ මේකයි. මේ විධියට තමයි කටයුතු සිද්ධ වෙන්නේ. ගමේ කථාවක් තිබෙනවා, "වත්ත බද්දට දීලා ඇස්සට දත නියවනවා වාගේ" කියලා. දැන් රටේ සම්පත් 99 අවුරුද්දකට බදු දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දරුවන්ටවත්, ඔබතුමාගේ දරුවන්ගේ දරුවන්ටවත්, ඔබතුමාගේ දරුවන්ගේ දරුවන්ගේ දරුවන්ටවත් කිසිම දවසක මේ හම්බන්තොට වරායට අයිතිවාසිකමක් කියන්න ලැබෙන්නේ නැහැ. මේ රට දූපත් රාජ්‍යයක්. මේ රට දූපතක් වීම නිසා සුවිශේෂීව පිහිටු වූ වරායක් තමයි හම්බන්තොට වරාය. මේ රටේ ආදායම් උත්පාදනය කරන්න තිබුණු සුවිශේෂී වූ මර්මස්ථානයක් තමයි මේ ආණ්ඩුව ආපු ගමන්ම බදු දුන්නේ. හම්බන්තොට වරාය බදු දුන්නාට කමක් නැහැ කියමුකෝ. ඒක හදන්න ගත්තේ "ණය කන්දක්" කියලා කියනවා. ඒ ණය කන්ද ගෙවීම් කටයුතු කළා නම්, අද මේ ප්‍රශ්නය උද්ගත වෙන්නේ නැහැ. අද සිදු වෙලා තිබෙන්නේ මොකක්ද? නාවික හමුදාව වරායට ආරක්ෂාව දෙනවා. චීන සමාගම කියනවා, ඒ ආරක්ෂාව දීම වෙනම කතන්දරයක්; නාවික හමුදාව වරාය ඇතුළේ ඉන්නවා නම් වාර්ෂිකව ඩොලර් මිලියන 55ක ගෙවීම් කටයුතු කරන්න කියලා. කොහොමද, රටට අත්වෙන ඉරණම? අපි දැක්කා සිංහ කොඩිය කඩලා චීන කොඩිය උඩට ගෙනිච්චා. දැන් මත්තල ගුවන් තොටුපොළ ඉන්දියාව ගන්න හදනවා. මේ ගුවන් සමාගම පාඩුයි, ගුවන් තොටුපොළ පාඩුයි කියලා කියනවා. මේවා අධ්‍යයනයකින් තොරව කියන පුවිච්චානම් කථා. අධ්‍යයනය කරලා කිව්වානම් කමක් නැහැ. ගුවන් තොටුපොළකින් පාඩු ලබන්නේ නැහැ. හැබැයි, ඉන්ධන මිල වැඩිවීම් තුළ ගුවන් සේවාවල යම් යම් පාඩු සිදුව තිබෙනවා.

පසුගිය රජයන්වල වැරදි තිබුණා නම්, අලුතින් රජයක් පත් වෙන්නේ ඒ වැරදි නිවැරදි කරගෙන ඉදිරියට යන්නයි. හැබැයි, අද සිදු වන්නේ ඒක නොවෙයි. පසුගිය රජය තුළ තිබුණු වැරදි පෙන්වා පෙන්වා, "අපි ඔය ටිකක් කළාට මොකද" කිව්වාට හැබැයි ඊට වඩා දෙතුන් ගුණයක් වැඩිපුර වැරදි කෙරෙනවා. අපි අතින් යම් යම් වැරදි අඩුපාඩු වුණා කියලා අපි පිළිගත්තා. දැන් අපි බලය ඉල්ලන්නේ, අපි ආණ්ඩු භදනවා කියන්නේ ඒ වැරදි නිවැරදි කරගෙන යන්නයි. ඒකට පෙබරවාරි 10 වෙනිදා ජනතාව උත්තරයක් දුන්නා. ඒ තිබුණු ආණ්ඩුව හොඳයි. 'ඉහුරු දීලා මිරිස් ගත්තා වාගේ' යහපාලන ආණ්ඩුව ගත්තාට, ඒ ආණ්ඩුව තුළ තිබුණු වැරදි නිසා-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ. මොකද, ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා වෙනුවෙන් ඔබතුමාට වෙලාව දෙන්න කියලා අපට දන්වලා නැහැ. ඒ නිසා තව විනාඩියකින් අවසන් කරන්න.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
හොඳයි. මම අවසන් කරන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කිව්වේ මේ රට අද පත් වෙලා තිබෙන තැන පිළිබඳවයි. ව්‍යාපාරිකයා ඉවරයි; ව්‍යවසායකයා ඉවරයි. හැබැයි, බදු ටික ගොඩගැහෙනවා. ගුවන් සමාගම ඉවරයි; ගුවන් තොටුපොළ ඉවරයි; වරාය ඉවරයි. දැන් අපි හම්බ කරන්නේ; උපයන්නේ මොනවායින්ද? මේ රජය ගෙනියන්නේ, නිදහස් අධ්‍යාපනය දෙන්නේ මොනවායින්ද? නිදහස් සෞඛ්‍ය දෙන්නේ මොනවායින්ද? ව්‍යාපාරිකයාට සහන දෙන්නේ මොනවායින්ද? හැමදේම විකුණා විකුණා හැමදේම බදු දෙමින් ලබා ගන්නා සල්ලිවලින් මන්ත්‍රීවරු, ඇමතිවරු සුරසැප විඳිනවා. ජනතාවගේ බඩගින්දර දවසින් දවස වැඩි වෙනවා. තුන්වේල කාපු මනුෂ්‍යයාට දෙවේලට සීමා වෙන්න වෙනවා. තුන්වේලෙට කාපු මනුෂ්‍යයාට දෙවේලට සීමා වෙලා, අද එක වේලක් නිරාහාරව සිටීමට සිදු වෙලා තිබෙනවා. අද බොහොම භයානක තැනකට රට ගෙනියලා තිබෙනවා. ඒ නිසා අපි බොහොම පැහැදිලිව කියනවා, ගුවන් තොටුපොළ බද්ද නොවෙයි, මුළු ගුවන් තොටුපොළෙන්ම ආදායමක් උත්පාදනය කරන වැඩ පිළිවෙළක් ගෙනෙන්න කියලා. මේක බදු දෙන්න එපා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, කාලය අවසානයි.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තත්පරයෙන් අවසන් කරන්නම්. මත්තල ගුවන් තොටුපොළ බදු දෙන්න එපා, ඒක විකුණන්න එපා. හම්බන්තොට වරාය වික්කා, දැන් ඒක ඉවරයි. ඒ මුදල් තමුන්නාන්සේලා විනාශ කරලා ඉවරයි. අධීක්ෂණ මන්ත්‍රී ධුර ලබාගෙන, මාස් පතා රුපියල් ලක්ෂ දෙකහමාර ගණනේ පාර්ලිමේන්තු මන්ත්‍රී වැටුපට වඩා වැටුපක් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් ගන්නවා. මේවා නවත්වලා රටේ අධ්‍යාපනය, රටේ සෞඛ්‍යය වෙනුවෙන් යොදවන්න කියමින් මට මෙම අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා කිව්වා අධික්ෂණ මන්ත්‍රීවරුන්ට රුපියල් ලක්ෂ දෙකහමාරක වැටුපක් ලැබෙනවාය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාත් අධික්ෂණ මන්ත්‍රීවරයෙක්. [බාධා කිරීමක්] අපි කාටවත් අධික්ෂණ මන්ත්‍රීවරුන් හැටියට එවැනි ගෙවීමක් හෝ කිසිදු වරප්‍රසාදයක් ලැබෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාවට අසත්‍ය ප්‍රකාශ කරන්න එපා කියලා ඔබතුමා ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමාට කිව්වොත් හොඳයි කියලා මම හිතනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මම හිතන්නේ මේ ගැන වාදයක් අවශ්‍ය නැහැ. එතුමා,-

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
වාදයක් නොවෙයි. ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා කියපු කාරණය වැරැදියි.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒක ඉල්ලා අස් කර ගන්න.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ඒක ඔබතුමන්ලා දන්නවා. ඒක ඔප්පු කරන්න මට අවස්ථාව දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒකට අවස්ථාව දෙන්න බැහැ.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මට අවස්ථාව දෙන්න ඒක ඔප්පු කරන්න. මූලාසනයේ ඉන්න ඔබතුමාගේ ඉදලා රුපියල් ලක්ෂ දෙකහමාර ගන්නවා. ඒ නිසා මට අවස්ථාව දෙන්න.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මූලාසනයට චෝදනා කරන්න එපා.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා හදිසියේම කඩා පැනලා කිව්වේ, සල්ලි ගන්නේ නැහැ කියලායි. මම ඔප්පු කරනවා, මහජන බදු මුදලෙන් රුපියල් ලක්ෂ දෙකහමාරක් ලබා ගනිමින් මහජන බදු මුදලෙන් නඩත්තු වෙනවා කියන එක.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මන්ත්‍රීතුමා, එවැනි මුදලක් අධික්ෂණ මන්ත්‍රීවරුන් ගන්නේ නැහැ. කාර්යාලයක්වත් නැහැ.

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනයේ සිටින ඔබතුමාටත් හම්බ වෙනවා. මට අවස්ථාව දෙන්න, මම ඔප්පු කරන්නම්. මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, සියලුම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුනි, ඒ නිසා මම කියන්නේ - [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු වඩිවෙල් සුරේෂ් මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජීබුර් රහුමාන් මහතා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මගේ නම ප්‍රකාශ කළ නිසයි මම කථා කරන්නේ. පළමුවැනි කාරණය තමයි, එතුමා මීට කලින් ප්‍රකාශ කළ විධියට අධික්ෂණ මන්ත්‍රීවරුන් හැටියට අපට කිසිම වරප්‍රසාදයක්, එහෙම නැත්නම් වෙනත් ගෙවීමක් කරන්නේ නැහැ. මූලසුනේ සිටින ඔබතුමාත් අධික්ෂණ මන්ත්‍රීවරයකු හැටියට ක්‍රියා කරනවා. එතකොට ඔබතුමා දන්නවා, අපට යම්කිසි ගෙවීමක් කරනවාද, එහෙම නැත්නම් වෙනත් කුමක් හෝ වරප්‍රසාදයක් ලබා දී තිබෙනවාද කියලා. ඒ නිසා මේ සභාවට අසත්‍ය දේවල් ප්‍රකාශ කරන්න එපා කියලා අපි එතුමාගෙන් ඉල්ලනවා. තමුන්නාන්සේලාගේ කාලයේ අධික්ෂණ මන්ත්‍රීවරුන්ට වාහන දුන්නා, හැම එකක්ම දුන්නා. නමුත් අපට ඒ කිසි දෙයක් ලබා දී නැහැ. [බාධා කිරීමක්] අසත්‍ය ප්‍රකාශ කරන්න එපා, අසත්‍ය කියන්න එපා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාවේ දී ඒ පිළිබඳව පැහැදිලි කරන්න පුළුවන්. දැන් ගරු වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමා කථා කරන්න. ඔබතුමාගේ අවස්ථාව. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
කෞරව තලෛමතාංකුම උරුප්පිනර් අවර්කළේ, ඉන්‍රු විසේටමාක *[இடையீடு]*

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉන්දික අනුරුද්ධ මන්ත්‍රීතුමා, කරුණාකර කථාව නවත්වන්න. ඔබතුමාට කාලය වැඩිපුර දීලා තිබෙනවා. ඔබතුමා කරුණාකර කථාව නවත්වන්න. ගරු වඩිවේල් සුරේෂ් මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[ප.ව. 4.41]

ගරු වඩිවේල් සුරේෂ් මහතා
(மாண்புமிகு வடிவேல் சுரேஷ்)
(The Hon. Vadivel Suresh)
සභාපක්ෂයේ නායකතුමා වන ගරු රවූෆ් හකීම් මැතිතුමා සහ ගරු ඇමතිවරු, ගරු නියෝජ්‍ය ඇමතිවරු, ගරු මන්ත්‍රීවරු, ගරු ලේකම් මහත්මිය සහ සභාවේ නිලධාරීන් සියලු දෙනාම, මා මේ සභාවට පැමිණීමට පෙර මා ගැන කතා කළ සියලු දෙනාට මා ස්තුතිවන්ත වෙනවා.

[ගරු වඩිවේල් සුරේෂ් මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම ලේඛනයේ සඳහන් ආකාරයට, නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව භාර චීන සමාගමකින් ඇමෙරිකානු ඩොලර් මිලියන 25.4ක කොමිස් මුදලක් -පොඩි ගණනක් එහෙම නොවෙයි, ඇමෙරිකානු ඩොලර් මිලියන 25.4ක්.- ගැනීම සම්බන්ධයෙන් "CRI/AML/CFT/05/16" කියන අධි චෝදනා පත්‍රය යටතේ එතුමාට විරුද්ධව කොළඹ මහාධිකරණයේ නඩුවක් තිබෙනවා.

ඊළඟට, ශ්‍රී ලංකා රුපියල් මිලියන 3ත්, 27ත් අතර මුදල් ප්‍රමාණයක් විශුද්ධිකරණය සම්බන්ධයෙන් එතුමාට කොළඹ මහාධිකරණයේ නඩුවක් තිබෙනවා. රුපියල් පන්කෝටිතිස්එක් ලක්ෂයක ක්‍රීඩා උපකරණ මිලදී ගෙන ඒවා බෙදා නොදීම සම්බන්ධයෙනුත් එතුමාට නඩුවක් තිබෙනවා. රුපියල් පන්කෝටිතිස්එක් ලක්ෂයක් කියන්නේ, ඒ ගොල්ලන්ට සුළු මුදලක් වෙන්න ඇති. ඒක ඒ ගොල්ලන්ට සුළු මුදලක් නේන්නම්. මොකද, නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ඉදිකිරීමේ කොන්ත්‍රාත් එක භාර චීන සමාගමකින් ඩොලර් මිලියන 25.4ක කොමිස් මුදලක් අරගෙන තිබෙනවා නම් මේක සුළු මුදලක් තමයි. අයථා ලෙස උපයා ගත් දේපළ අතරින්, කොළඹ ප්‍රදේශයේ විතරක් දේපළ නවයක් තිබෙනවා. දෙවි හාමුදුරුවනේ! නාවලපිටිය නියෝජනය කරන මන්ත්‍රීවරයකු; සිංගර් සමාගමේ වෙළෙඳ නියෝජිතයකු ලෙස සිටි මේ මන්ත්‍රීවරයා මෙපමණ උපයා ගන්නේ කොහොමද? අපි මේ දේවල් සම්බන්ධයෙන් කථා කරනකොට එතුමාට තරහා යනවා. ඒ මන්ත්‍රීතුමන්ලා වැරදි කළා නම්, මේවාට මුහුණ දෙන්න ඕනෑ. එලෙස මුහුණ දීලා මේ වැරදි හෙළිදරව් කරන්න ඕනෑ.

ඊළඟට, මුදල් අවභාවිත කිරීම සම්බන්ධයෙන් එතුමාට එල්ල වන කාරණා අටක් තිබෙනවා.

මුදල් අවභාවිත කිරීම සම්බන්ධයෙන් තිබෙන කාරණා අටට සහ අයථා ලෙස උපයා ගත් දේපළ යටතේ වූ කාරණා නවයටත්, නඩු හතර පිළිබඳවත් එතුමා එළියේදී උත්තර දිය යුතුයි. ඒක තමයි අපි මේ පාර්ලිමේන්තුවේදී කියන්නේ. එතුමා උදේට මේ ගරු සභාවේ කථා කරලා, අපි උත්තර දෙන වෙලාවට ඉන්නේ නැතිව පැනලා දුවනවා. අසත්‍ය ප්‍රකාශ කරන ඒකාබද්ධ විපක්ෂයේ

[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]
[අක්කිරාසනක් கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]
[Expunged on the order of the Chair.]

-කවුරුවත් අද මේ ගරු සභාවේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිවුලපිටිය ආසනය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් අසත්‍ය දේ කියමින් අපට අභියෝග කළා. අපට ලැබෙන පඩිපත හෙට මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න අපි ලැහැස්තියි. ඒ අය අපට ඔප්පු කරන්න කිව්වා නේ. රුපියල් දෙලක්ෂ ගණනකට වැඩියෙන් ගන්නවාය කියා අපට අසත්‍ය චෝදනා කරනවා. කවුද එහෙම ගන්නේ? ඒක අසත්‍යයක්. එතුමන්ලා මෙවැනි දේවල් කියමින් ජනතාව මුළා කරනවා. අධීක්ෂණ මන්ත්‍රීවරුන් හැටියට අපට පඩි ලැබෙනවා ලු. කවුද මේ අසත්‍ය දේවල් කියන්නේ? අපි අධීක්ෂණ මන්ත්‍රීවරු හැටියට සම්පූර්ණයෙන් voluntary service එකක් කරන්නේ. ආණ්ඩුව වෙනුවෙන් අමාත්‍යාංශවලට ගිහින් අපි වැඩ කරනවා. ස්වේච්ඡා සේවයක් අපි කරන්නේ. එහෙම කරන්නේ, අපේ ආණ්ඩුවේ වැඩසටහන් ටික ඉදිරියට කරගෙන යන්න ඕනෑ නිසායි. එහෙම නැතිව, කිසිම වෙලාවක අපි ජනතා මුදල් අයථා ලෙස පාවිච්චියට අරගෙන නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ ගරු සභාවෙන් අපි ඉල්ලා සිටින්නේ, පාර්ලිමේන්තු සම්ප්‍රදායන් උල්ලංඝනය කරමින් මේ ආකාරයට අසත්‍ය චෝදනා කරන මන්ත්‍රීවරුන්ට දඬුවම් පමුණුවන්න කියායි. ඉක්මනින් නඩු අහන අධිකරණ අපට අවශ්‍ය වෙන්නේත් ඒ නිසායි.

ඒ විතරක් නොවෙයි, "ඔබතුමන්ලාගේ ආයු කාලය තව මාස දහඅටයි" කියා එතුමන්ලා ඉතාම පහත් විධියට අපට චෝදනා කළා. එතුමන්ලා කියන විධියට, ඒ මේ ආණ්ඩුවේ ආයු කාලය නොවෙයි, අපේ ආයු කාලයයි. අපට ජීවත් වෙන්න පුළුවන් තව මාස දහඅටයි කියා අද මට අභියෝග කළා. එවැනි අභියෝගවලට අප බය නැහැ. එහෙම බය නම් අපේ වෘත්තීය සුදුසුකම් මත කළ රැකියාවලින් ඉවත් වෙලා මේ රට හදන කාර්යයට සහයෝගය ලබා දෙන්න අපි පාර්ලිමේන්තුවට එන්නේ නැහැ. අපි එහෙම බය මන්ත්‍රීවරු නොවෙයි. අපි එළියේත් සටන් කරන්න කැමැතියි,

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

ඇතුළේත් සටන් කරන්න කැමැතියි. එතුමන්ලා කියන විධියට මාස දහඅටක් නොවෙයි, අපේ ආයුෂ තිබෙන තෙක් අපි මෙතැන ඉන්නවා. අපගේ ආයු කාලය මාස දහඅටක් කියා ඔබතුමන්ලා කියනවා නම්, අපි සටන් කරන්න ලැහැස්තියි කියා ඔබතුමන්ලාට කියනවා. බොරුවට කෑ ගහන්න එපා. ඒ වාගේම තර්ජන කරන්න ලැහැස්ති වෙන්නත් එපා. මේ සම්බන්ධයෙන් ගරු කථානායකතුමාට සහ පොලීසියට පැමිණිලි කරන්න අපි බලාපොරොත්තු වනවා. එවැනි මරණ තර්ජන ඉදිරිපත් කරමින් තමයි මේ ගොල්ලන් අද හැසිරෙන්නේ. අද ඒකාබද්ධ විපක්ෂයේ සිටින ඒ අයට එල්ල වුණු චෝදනා විභාග වෙනකොට, ඒවා ඔප්පු වෙනකොට තමයි අපට මරණ තර්ජන කරන්නේ. මෙවැනි අය නැවත බලයට ආවොත් සුදු වෑන් සංස්කෘතිය, මිනී මරන සංස්කෘතිය වැනි මේ රටට එපා වුණු සංස්කෘතීන් ටික නැවත පැමිණෙනවා. ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ අපේ ආර්ථික ක්‍රමය ඉදිරියට යන ක්‍රමයකුයි මේ රටට අවශ්‍ය වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථිකය ගැන කථා කරනකොට මම විශ්වාස කරන දෙයක් තිබෙනවා. අපේ රටට ඉදිරියට යන්න පුළුවන් ප්‍රධාන ආර්ථික ක්‍රමයක් තමයි knowledge economy එක; අපේ දරුවන්ගේ අධ්‍යාපන තත්ත්වය උසස් කිරීම. විශ්වවිද්‍යාලවලට ඇතුළත් වන සිසුන් ප්‍රමාණය වැඩි කරලා, රටේ අවශ්‍යතාව අනුව -ලෝක අවශ්‍යතාවත් එක්ක- අවශ්‍ය උපාධිධාරීන් බිහි කිරීම කළයුතුයි. මම ඊට උදාහරණයක් කියන්නම්. IT උපාධිධාරීන් - IT engineersලා- 18,000ක් අපට වුවමනා කරනවා. නමුත් තවම 16,000ක පිරිසක් පමණයි බිහි වන්නේ. ඒ වාගේම, 2020 වසරේදී ජපානය වැනි රටවල් පිට රටවලින් IT engineersලා ලක්ෂ තුනක් බලාපොරොත්තු වනවා. හෙද, හෙදියන් ගත්තාමත් ඒ විධියයි. ඒවා අභියෝග හැටියට භාරගෙන, මේ රට knowledge economy එකක් හරහා ඉදිරියට දිවෙන රාජ්‍යයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය වටපිටාව හදන්නයි අපි කැප වී සිටින්නේ. එම නිසා මෙවැනි මන්ත්‍රීවරුන් කරන අසත්‍ය චෝදනාවලට නිසි පිළිතුරු දෙන්න අපි ලැහැස්තියි; එම චෝදනාවලට එළියේදීත් පිළිතුරු දෙන්න අප ලැහැස්තියි. අපි පාර්ලිමේන්තු වරප්‍රසාදවලට යට වෙලා කථා කරන මන්ත්‍රීවරුන් නොවෙයි කියන කාරණය මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහයක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.57]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මුදල් අමාත්‍යාංශයට අදාළව ඉදිරිපත් කර ඇති නියමයන් සහ යෝජනා කිහිපයක් පිළිබඳව කථා කරන මේ අවස්ථාවේ, ඊට සම්බන්ධ වීමට මටත් අවස්ථාවක් ලැබීම ගැන සතුටු වනවා. විශේෂයෙන්ම, අද මේ ආර්ථික විග්‍රහවලදී මන්ත්‍රීවරු නොයෙක් අදහස් ඉදිරිපත් කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන විජයකලා මහේස්වරන් රාජ්‍ය ඇමතිතුමිය විසින් කරන ලද ප්‍රකාශයක් නිසා ඊයේ මේ පාර්ලිමේන්තුව කාල ගෝට්ටියක් බවට පත් වුණු ආකාරය අපි දැක්කා.

අපි දැක්කා, ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු -නම් වශයෙන් කිව්වොත්, විශේෂයෙන්ම විමල් වීරවංශ මන්ත්‍රීතුමා- ගරු කථානායකතුමාට -සාමාන්‍ය වචනවලින් කියනවා නම්, කුණු හරුපවලින්- බැණ වදිමින්, සිහි බුද්ධිය නැති පුද්ගලයෙක් විධියට මේ සභා ගර්භය තුළ හැසිරුණා. විජයකලා මහේස්වරන් රාජ්‍ය ඇමතිතුමියගේ ඒ විග්‍රහය, එහෙම නැත්නම් එතුමිය එදා කළ ඒ ප්‍රකාශය අපි කවුරුවත් පිළිගන්නේ නැහැ. පක්ෂ, විපක්ෂ භේදයකින් තොරව අපි සියලු දෙනාම එතුමියගේ ඒ ප්‍රකාශයට විරුද්ධව අදහස් දැක්වුවා. අපි කවුරුවත් ඒ ප්‍රකාශය පිළිගන්නේ නැහැ. ලංකාව තුළ ඉන්න අපි සියලු දෙනාම ඒ ප්‍රකාශයට කිසිදු වටිනාකමක් දෙන්නේ නැතුව, පක්ෂ භේදයකින් තොරව ඒ ප්‍රකාශය ප්‍රතික්ෂේප කළා. එහෙම ප්‍රතික්ෂේප කරලා තිබෙද්දීත් ඊයේ මේ පාර්ලිමේන්තුව තුළ හැසිරුණු ආකාරය ඉතාම නින්දා සහගතයි. මොකද, එතුමා අවුරුදු ගණනාවක් තිස්සේ පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්. මා හිතන විධියට 2000 වසරේ පමණ සිට අවුරුදු දහයකට වඩා අධික කාලයක් තිස්සේ එතුමා මේ පාර්ලිමේන්තුව නියෝජනය කරනවා. අවුරුදු පහළොවක්, දහඅටක් තිස්සේ මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන එතුමා ඊයේ මේ පාර්ලිමේන්තුවේදී හැසිරුණු ආකාරයට නවක මන්ත්‍රීවරයෙක්වත් හැසිරිලා නැහැ. ඉතාම අශෝභන විධියට තමයි එතුමා හැසිරුණේ. විජයකලා මහේස්වරන් රාජ්‍ය ඇමතිතුමියගේ ප්‍රකාශය මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනියි, ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට විරුද්ධව කළ ප්‍රකාශයක්, ඒ නිසා එතුමියට විරුද්ධව නීතිමය ක්‍රියා මාර්ග ගන්න පුළුවන්ද, ගන්න හැකියාව තිබෙනවාද කියලා බලන්න කියලා නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කරනවාය කියලා ඊයේ අපේ කථානායකතුමා ප්‍රකාශ කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුව විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කරනවාය, ඒ නිසා පාර්ලිමේන්තුවට බෝම්බ ගහන්න ඕනෑය කියලා එදා විමල් වීරවංශ මන්ත්‍රීතුමා කිව්වා. ඒ කථාවත් අපි කවුරුවත් පිළිගත්තේ නැහැ. පාර්ලිමේන්තුවට බෝම්බ ගහන්න ඕනෑය කියලා කියන්නේ, මේ රටේ ජනතා පරමාධිපත්‍යය නියෝජනය කරන මේ ආයතනයට බෝම්බ ගහන්න ඕනෑය කියන එකයි. ඒ කියන්නේ, මේ රටේ ජනතාවගේ පරමාධිපත්‍ය බලයට තමයි බෝම්බ ගහන්න කථා කරන්නේ. එතකොට ඒකත් ත්‍රස්තවාදී ක්‍රියාවක්. ත්‍රස්තවාදී සංවිධානවලට අනුබල දෙනවා වාගේම, ත්‍රස්තවාදී සංවිධාන වෙනුවෙන් පෙනී සිටිනවා වාගේම ත්‍රස්තවාදී ක්‍රියාවක් කරන්න කථා කිරීමත් ඒ හා සමානම අපරාධයක්. එහෙම නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කථානායකතුමා දැනුවත් කරන්න කියලා ඔබතුමාට කියනවා, විමල් වීරවංශ මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවට බෝම්බ ගහන්න ඕනෑය කියලා කියපු කථාවත් මේ රටේ අපරාධ නීතිය අනුව වරදක්. එහෙම නම් ඒ කථාව පිළිබඳවත්, ඒ සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියලාත් නීතිපති දෙපාර්තමේන්තුවෙන් විමසන්න කියලා අපි කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා. මොකද, ඒකත් බලවත් කථාවක්. ඒකත් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට එල්ල කරපු ඉතාම බලවත් ප්‍රහාරයක්. ඒ වාගේම මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය අගයන, ජනතා පරමාධිපත්‍යය අගයන සියලු දෙනාටම විරුද්ධව කරපු ප්‍රකාශයක් තමයි පාර්ලිමේන්තුවට බෝම්බ ගහන්න ඕනෑය කියන එක. ඒ නිසා වහාම ඒ ගැනත් පරීක්ෂණයක් කරලා, ඒකත් නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කරන්න කියලා අපි කථානායකතුමාගෙන් ඉල්ලා සිටිනවා. විජයකලා මහේස්වරන් රාජ්‍ය ඇමතිතුමියගේ ප්‍රකාශයට අපි විරුද්ධයි වාගේම, ත්‍රස්තවාදී සංවිධානවලට අනුබල දීමට අපි විරුද්ධයි වාගේම, ඕනෑම ත්‍රස්තවාදී ක්‍රියාවකට අපි විරුද්ධයි. උතුරේ වෙන්න පුළුවන්,

දකුණේ වෙන්න පුළුවන්, ලංකාවේ නොවෙයි ලෝකයේ ඕනෑම තැනක වෙන්න පුළුවන්, ත්‍රස්තවාදය එකයි. අපි කවුරුවත් ත්‍රස්තවාදය පිළිගන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථිකය ගැන කථා කරනකොට අපේ ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව -TRC එක- ගැන ගැන කිව්වා. මුදල් අමාත්‍යාංශයයි ඒකයි අතර පවතින යම් සම්බන්ධයක් ගැන එතුමා කථා කළා. මමත් ඒ ගැන කියන්න ඕනෑ. එතුමාගේ කථාවට මමත් කරුණු කිහිපයක් එකතු කරන්න ඕනෑ. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සතුව තිබෙන සංඛ්‍යාත -frequency- වික්‍රිණීමේදී, එහෙම නැත්නම් ලබා දීමේදී පවතින ක්‍රමවත්භාවය, විධිමත්භාවය, එහෙම නැත්නම් transparency එක සම්බන්ධ ගැටලු රාශියක් තිබෙනවා.

විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මේ සංඛ්‍යාත ලබා දෙන්නේ කොහොමද? මේක ජනතාව සතු දෙයක්, පොදු වස්තුවක්, ජනතාවට අයිතිය තිබෙන වස්තුවක්. එක එක්කෙනාට ඕනෑ විධියට frequency විකුණන්න බැහැ. අද Skynet කියලා සමාගමක් සංඛ්‍යාත -frequency- විකුණන්න යුරෝපීය රටවල, එංගලන්තය වැනි රටවල සැරිසරනවා. කොහොමද එහෙම වෙන්නේ කියන ගැටලුව අද අපට තිබෙනවා. විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ -TRC එකේ- ක්‍රියා පටිපාටිය ගැන, ක්‍රියා පිළිවෙත ගැන, ඒ අය අනුගමනය කරන වැඩ පිළිවෙළ ගැන යම්කිසි ආකාරයේ ප්‍රශ්න ගණනාවක් අද වන විට අපට පැන නැඟිලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විදේශ රටවලට ගිහින් එක එක්කෙනාට සංඛ්‍යාත විකුණන්න මේ Skynet කියන සමාගමට බලය දුන්නේ, අයිතිය දුන්නේ, පූර්ණ අධිකාරියක් ලබා දුන්නේ කවුද කියන ගැටලුව අද අපි ඉදිරියේ තිබෙනවා. එම නිසා මේ රටේ සම්පතක්, රටට ආදායමක් ලැබෙන මාර්ගයක්, රටේ තිබෙන පොදු දේපළක් එක එක්කෙනාට ඕනෑ විධියට, එක එක ආයතනවලට ඕනෑ විධියට විදේශ රටවලට ගිහින් විකිණීම පිළිබඳ සොයා බැලීමට මුදල් අමාත්‍යාංශයටත් වගකීමක් තිබෙනවා කියලා මම කියනවා. මුදල් අමාත්‍යාංශය යටතේ මෙම ආයතනය නොතිබුණත් මෙය රටේ ජනතාව සතු දේපළක් වන නිසා මේ පිළිබඳ යම් සොයා බැලීමක් කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙක් පැත්තෙන් අපේ ආර්ථිකය ගැන කථා කරනකොට විපක්ෂය ඩොලරය ගැන දිගින් දිගටම චෝදනා කළා. මේ රට භාර ගන්නකොට තිබුණු තත්ත්වය ගැන අපි දන්නවා. අද වන විට මේ රටේ තිබෙන තත්ත්වය ගැනත් අපි දන්නවා. අද වන විට ඩොලරය ශක්තිමත්වීම තුළ ලෝකයේ මුදල් වර්ග කිහිපයක් අවප්‍රමාණ වෙලා තිබෙනවා. ලංකාවේ රුපියල විතරක් නොවෙයි, ලෝකයේ අනෙකුත් රටවල තිබෙන මුදල් ඒකක පවා අද අවප්‍රමාණය වෙලා තිබෙනවා. ඇමෙරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් මැතිතුමාගේ ප්‍රතිපත්තිය මත ඩොලරය ශක්තිමත්වීම නිසා අනෙකුත් රටවල මුදල් ඒකක යම්කිසි ප්‍රමාණයකට අවප්‍රමාණය වෙලා තිබෙනවා. තුන්වැනි ලෝකයේ රටක් හැටියට අපට ඒක අනිවාර්යයෙන්ම බලපා තිබෙනවා. ඒක අපට අනිවාර්යෙන්ම බලපානවා. මොකද, අපි අධික මට්ටමින් ආනයන මත රඳා පවතින රටක්. අපේ ආනයන අපනයන අතර වෙනස -පරතරය- ඉතා විශාලයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපක්ෂයේ මන්ත්‍රීවරු කථා කරනකොට එතුමන්ලාට එතුමන්ලාගේ කාලයේ සිදු වුණු දේවල් අමතක වෙලා තිබෙනවා. මේ රටේ පවතින රාජ්‍ය ආයතන විකුණන්න හදනවාය කියලා අද අපට චෝදනා කරනවා. අපි ඒ රාජ්‍ය ආයතන කුණු කොල්ලයට දෙන්න යනවාය කියලා අපට චෝදනා තිබෙනවා. 2015 වර්ෂය වන විට අපේ රටේ රාජ්‍ය ආයතන ලබා තිබූ අලාභ පිළිබඳව අපි ඒ මන්ත්‍රීවරුන්ට මතක් කරන්න ඕනෑ. 2015 වර්ෂය වන විට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව රුපියල් බිලියන 18.4ක අලාභයක් ලබා තිබෙනවා. වරාය අධිකාරියේ ශුද්ධ අලාභය රුපියල් මිලියන 9,575ක් බවට පත් වෙලා තිබෙනවා. ගමනාගමන මණ්ඩලයේ ශුද්ධ අලාභය රුපියල් මිලියන 4,038ක් බවට පත් වෙලා තිබෙනවා. සීමාසහිත ගුවන් තොටුපළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ ශුද්ධ අලාභය රුපියල් මිලියන 16,433ක් බවට පත් වෙලා තිබෙනවා. මීහින් ලංකා පෞද්ගලික සමාගමේ ශුද්ධ අලාභය රුපියල් මිලියන 915ක් බවට පත් වෙලා තිබෙනවා. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ ශුද්ධ අලාභය රුපියල් මිලියන 586ක් බවට පත් වෙලා තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මගේ කථාව ඉක්මනින් අවසන් කරන්නම්. සීමාසහිත ලංකා සතොස සමාගමේ ශුද්ධ අලාභය රුපියල් මිලියන 3,647ක් බවට පත් වෙලා තිබෙනවා. ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ ශුද්ධ අලාභය රුපියල් මිලියන 168ක් බවට පත් වෙලා තිබෙනවා. ලංකා සීනි සමාගමේ ශුද්ධ අලාභය රුපියල් මිලියන 981ක් බවට පත් වෙලා තිබෙනවා. ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ ශුද්ධ අලාභය රුපියල් මිලියන 374ක් බවට පත් වෙලා තිබෙනවා. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ශුද්ධ අලාභය රුපියල් මිලියන 287ක් බවට පත් වෙලා තිබෙනවා.

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ ශුද්ධ අලාභය රුපියල් මිලියන 250ක් බවට පත් වෙලා තිබෙනවා. 2015 වන විට මෙන්න මේ විධියට අපේ රාජ්‍ය ආයතන රුපියල් මිලියන ගණනින් අලාභ ලබා තිබෙනවා. අපේ රටේ රාජ්‍ය ආයතනවල, පොදු ආයතනවල සභාපතිවරුන් ලෙස තමන්ගේ මස්සිනාලා ඇතුළු නෑදෑ - හිත මිත්‍රයන් පත් කරලා, අපේ රටේ සම්පතක් වන ඒ ආයතන කාබාසිනියා කර තිබෙනවා. අද ඒ ණයත් අපේ කර මත වැටිලා. ඒ ණයත් අද ගෙවන්න වෙලා තිබෙන්නේ මේ රටේ ජනතාවට.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් කියන්නේ මෙයයි. ලෝක ආර්ථික අවපාතයත් එක්ක, ලෝක ආර්ථිකයෙන් එල්ල වන අභියෝගත් එක්ක අද මේ රටේ ආර්ථිකය කළමනාකරණයක් තුළින් යම්කිසි ප්‍රමාණයකට ඉහළට ගෙන යන්න, ආර්ථික වර්ධන වේගය වැඩි කර ගන්න අපි ක්‍රම ක්‍රමයෙන් යම් උත්සාහයක් ගන්නවා. අපට අභියෝග තිබෙනවා. ඒ අභියෝගවලට අපි සැලෙන්නේ නැහැ. අපි 2025 වැඩ පිළිවෙළ කරා යන ගමන තුළින් මා හිතනවා, අපට තව අවුරුද්දක් හෝ අවුරුදු එකහමාරක් යන විට මීට වඩා හොඳ පොහොසත් රටක්, වේගවත් ආර්ථික සංවර්ධනයක් සහිත සියලුදෙනාගේ අත්වල මුදල් සැරිසරන ආර්ථිකයක් ගොඩනහන්න පුළුවන් වෙයි කියලා. ඒ විශ්වාසය තබමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි.

මීළඟට, ගරු චන්දිම ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 05ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.10]

ගරු චන්දිම ගමගේ මහතා
(மாண்புமிகு சந்திம கமகே)
(The Hon. Chandima Gamage)

මට අවස්ථාව ලබා දීම ගැන මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ස්තුතියි.

මුදල් අමාත්‍යාංශය යටතේ අද නියමයන් සහ යෝජනා අනුමැතිය සඳහා ඉදිරිපත් වෙලා තිබෙන මේ අවස්ථාවේ විපක්ෂයේ මන්ත්‍රීවරු කථා කරපු විලාසය අපි දැක්කා. විපක්ෂයේ මන්ත්‍රීවරු කථා කළේ හරියට, 2015දී යහ පාලන ආණ්ඩුව බලයට පත් වන කොට මේ රට සර්ව ආකාරයෙන් සුඛිත මුදිත වෙලා තිබුණු රටක් විධියටයි. පාරට බහින්න බැරි, ආර්ථිකය නැත්තට නැති වුණු, සම්බාධක පැනවෙන්න ඔන්න මෙන්න කියා තිබුණු අවස්ථාවක තමයි මහින්ද රාජපක්ෂ මහත්තයා තමන්ට අවුරුදු දෙකක කාලයක් තිබෙද්දීත් මේ ආණ්ඩුව දාලා ගියේ කියන එක එතුමන්ලා මතක තබා ගන්නට ඕනෑ.

දැනට රුසියාවේ පැවැත්වෙන ලෝක පාපන්දු තරගාවලිය උදාහරණයට ගෙන මම මේ තත්ත්වය පැහැදිලි කරන්න කැමැතියි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අයිස්ලන්තය කියන්නේ 350,000ක පමණ ජනගහනයක් ඉන්න රටක්. ලෝක ශ්‍රේණිගත කිරීම් අනුව මීට අවුරුදු 7කට කලින් 135 වන ස්ථානයේ පසු වූ අයිස්ලන්තය අද වන විට 22 වන ස්ථානය දක්වා ඉදිරියට ඇවිත් තිබෙනවා. එම රටේ සිටිය සහ සිටින රාජ්‍ය නිලධාරීන්ගේ, අගමැතිවරුන් හා ජනාධිපතිවරුන් ඇතුළු දේශපාලනඥයන්ගේ සැලසුම් සහගත ක්‍රියා කලාපය නිසා තමයි අද අයිස්ලන්තය ඒ ස්ථානයට ඇවිත් තිබෙන්නේ. අපේ විපක්ෂයේ උදවියට වෙන මති මතාන්තර, තර්ක විතර්ක ගෙනාවාට තේරෙන්නේ නැහැ. අයිස්ලන්තය ඉදිරියට ගිය විධියට තමයි මේ යහ පාලන ආණ්ඩුව ඉදිරියට යන්නේ. යහ පාලන ආණ්ඩුව 2025 වන කොට මේ රටේ සියලුම ණය ගෙවා අවසන් කරනවා කියන එක මම මුලින්ම මතක් කරන්න කැමැතියි.

ඇත්ත වශයෙන්ම මෙවැනි සරල දෙයක්වත් තේරුම් ගන්න බැරි විකෘති මානසිකත්වයක තමයි විපක්ෂයේ උදවිය ඉන්නේ. විශේෂ අධිකරණ තුන පිහිටුවලා, මේ ආණ්ඩුව දිගින් දිගටම බලයේ සිටියොත් ඒ උදවියට දේශපාලනය කරන්න නොවෙයි, හිර කුඩුවට වෙලා කූරු ගණන් කර කර ඉන්න සිදු වන බව ඔවුන් දන්නවා. ඒක නිසා අද ඒ උදවිය කලබල වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ රජය භාර ගන්නකොට කඩා වැටුණු ආර්ථිකයක් තිබුණේ. ලෝකයේ බලවත් රටවල් අපව කොන් කරලා තිබුණේ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල තඹ සතයක්වත් අනුමත කළේ නැහැ. එදිනෙදා අවශ්‍යතා සපුරා ගන්න සිංගප්පූරුවේ වාණිජ්‍ය බැංකුවලින් ණය අරගෙන, චීනයට හමුදා මූලස්ථානය, Port City එකේ කොටසක් විකුණන්න පොරොන්දු වෙලා තිබුණු යුගයක තමයි අපි මේ ආණ්ඩුව භාර ගත්තේ. මෑතක සිට බැදුම්කරය අල්ලාගෙන ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා තුන්වන උපලේඛනයක් හොයන්න ආයතන ගානේ යන බව අපි දකිනවා. එතුමාට ඒ තුන්වන උපලේඛනය මතක් වෙලා තිබෙන්නේ දැන්. ඒ කාලයේ තුන්වන උප ලේඛනය තිබුණාද කියලා ප්‍රශ්නයක් තිබෙනවා. ඒ කාලයේ තුන්වන උප ලේඛනය තිබුණා නම් එතුමන්ලාට මෙහෙම ඉන්න අවශ්‍ය වෙන්නේ නැහැ. අද ඒකාබද්ධයේ අනෙක් මන්ත්‍රීවරුන්ටත් මම ආරාධනා කරනවා, ජයන්ත සමරවීර මන්ත්‍රීවරයත් එක්ක එකතු වෙලා මේ තුන්වන උපලේඛනය හොයන ව්‍යාපාරයට ඇතුළු වෙන්න කියලා. තුන්වන උප ලේඛනය හොයා ගත්තොත් එතුමන්ලාට පුළුවන්, "වයිනා හාබර් සමාගමෙන් ලැබුණු ලක්ෂ 11,400ට මොකද වුණේ?" කියලා රාජපක්ෂ මහත්මයාගෙන් අහන්න.

ඒ වාගේම ඒක හොයා ගන්න පුළුවන් වුණොත්, එතුමන්ලාට "Helping Hambantota" ව්‍යාපෘතියේ සල්ලිවලට මොකද වුණේ කියලා රාජපක්ෂ මහත්මයාගෙන් අහන්න හැකියාව ලැබෙනවා. ඒ වාගේම ඒ ගොල්ලන්ට අහන්න හැකියාව ලැබෙනවා, ඩෙසි ආච්චිගේ මැණික් මල්ලේ තිබුණේ රතු කැටද, නිල් කැටද කියලා. ඒ වාගේම අහන්න හැකියාව ලැබෙනවා, නිෂ්පාදනය කරලා අභ්‍යවකාශ ගත කළ රොකට් එක දැන් මොන රටටද යන්නේ කියලා. ඒ වාගේම ලංකාව නැති කරන්නම ණය උගුලක පැටලුවේ ඇයි කියලා අහන්න කොන්ද පණ ලැබෙනවා. ඒ වාගේම රණ විරුවන් ලවා බල්ලන් නාවා ගත්තේ ඇයි කියලා අහන්න හැකියාව ලැබෙනවා. ඒ වාගේම බේබි මහත්තයලාට රේස් පදින්න හමුදාව ලවා වැලි කොට්ට ගස්සවා ගත්තේ ඇයි කියලා අහන්න හැකියාව ලැබෙනවා. ඒ වාගේම නෝනලාගේ සාරි කට්ට ගහගන්න හමුදාවේ නිලධාරීන් පාවිච්චි කළේ ඇයි කියලා අහන්න හැකියාව ලැබෙනවා. ඒ වාගේම, "මල්වානේ තිබෙන ඉඩම සහ බංගලාව ඔයාගේ නේද?" කියලා බැසිල් රාජපක්ෂ උන්නැහේගෙන් අහන්න කොන්ද පණ ලැබෙනවා. මේ වාගේ උදවිය තමයි අද සුදනන් වාගේ කථා කරන්නේ. ඒ වාගේම එදා "ද සන්ඩේ ලීඩර්" නඩුවට ගල්කිස්සේ උසාවියට ගියේ, ත්‍රිවිධ හමුදාපතිවරුන් අරගෙනයි. ඒ සන්නද්ධ හමුදාවල නායකයොත් එක්ක, එම නිලධාරීන් එක්ක තමයි එම භූමිවලට ගියේ.

ඒ චිතරක් නොවෙයි, එදා ආරක්ෂක අමාත්‍යාංශයේ නිල වෙබ් අඩවියේ පළ කළා, "කළු කෝට්කාර දෝහියෝ කල්ලි ගැසෙති" කියලා. එදා ඒ විධියට තමයි එම නිල වෙබ් අඩවිය පවා රාජපක්ෂලාට කඩේ ගියේ. ඒ තත්ත්වය අද වෙනස් වෙලා තිබෙනවා. අද මේ රට දීර්ඝ කාලීන සැලැස්මක් තුළ ශීඝ්‍රයෙන් ඉදිරියට යනකොට, විටින් විට සිදුවන ඩොලරයේ උස් පහත්වීම් මත ඇති වන තත්ත්වය විග්‍රහ කරලා බලය පෙරළන්න පුළුවන් කියලා හිතනවා නම්, ඒවා සදාකාලික හීන බව මතක් කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ඉෂාක් රහුමාන් මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි පහක කාලයක් ලබා දී තිබෙනවා.

[අ.භා. 6.16]

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්තටම මම අද කථා කරන්නේ කනගාටුවෙන්. එදා රජවරු වැව් හැදුවේ, මියැදී යන්නට නොවෙයි; ජීවත් වෙන්නයි. ඒ වාගේම මේ උත්තරීතර පාර්ලිමේන්තුව හැදුවේ සෙල්ලම් කරන්න නොවෙයි; රටේ ඉන්නා ජනතාවගේ ප්‍රශ්න විසඳන්නයි; රටේ ඉන්නා ජනතාවගේ ප්‍රශ්නවලට උත්තරීතර තීන්දුවක් ගන්නයි. මන්ත්‍රීවරුන් මේ පාර්ලිමේන්තුව තුළදී කටයුතු කරන්න පටන් ගන්නේ නාඩගමක් විධියටයි කියන එක දවස් කිහිපයක් තුළදීම අපි දුටුවා. එහෙම සෙල්ලම් කරනවා නම්, මේ පාර්ලිමේන්තුව අවශ්‍ය වෙන්නේ නැහැ. ගෝල්ෆේස් පිටිටනිය තිබෙනවා, තව ක්‍රීඩා පිටිටනි බර ගණනක් තිබෙනවා. ඒවාට ගිහිල්ලා සෙල්ලම් කරන්න පුළුවන්.

මේ පාර්ලිමේන්තුවේ වැඩිපුර ඉන්නේ බෞද්ධ මන්ත්‍රීවරුන්. බුදු හාමුදුරුවෝ දේශනා කළ එක් දේශනාවක් තිබෙනවා. මට ඒක සිංහල භාෂාවෙන් කියන්න අමාරුයි. ඒ නිසා මම ඉංග්‍රීසි භාෂාවෙන් ඒ අදහස ගැන කියන්නම්, "A single moment of

misunderstanding is so poisonous that it makes us forget the hundred lovable moments spent together within a minute". ඒ විධියට මේ පාර්ලිමේන්තුවේ උත්තරීතර සභාවෙන් කෙරෙන සියලු හොඳ දේ අපි තත්පරයක කරන නරක දේ තුළින් විනාශ කරනවා. ඒ නිසා තමයි බුදු හාමුදුරුවෝ දේශනා කළේ, එක මොහොතක් වැරදි අවබෝධයෙන් යුතුව ක්‍රියා කළොත් අපි කළ සියලු හොඳ දේවල් එයින් විනාශ වන බව. ඊයේ සිදුවුණු සිද්ධිය සමස්ත රටම බලා ගත්තා. ඒ සිදුවීමෙන් "උත්තරීතර" කියන නමට මහවිශාල කැලැලක් ඇති කළා. අලුත් මන්ත්‍රීවරයෙක් වන මා ඇතුළු මේ 225 දෙනාටම ඒක ලජ්ජාවට කාරණයක්.

අද රටේ ආර්ථිකය විනාශ වෙලා තිබෙනවා. ඇත්තටම විජයකලා මහේස්වරන් රාජ්‍ය ඇමතිතුමිය කියපු කථාව තුළ පක්ෂයේ මතයකුත් නැහැ; පාර්ලිමේන්තුවේ අනෙක් මන්ත්‍රීවරුන්ගේ මතයකුත් නැහැ. එතුමියට ලැබෙන ඡන්ද වැඩි කරන්න ඕනෑය කියලා -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාඞුම් உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු වීජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිරකු, මාණ්පුමිකු ඛිජේපාල හෙට්ටිආරච්චි අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, පිරතිච් සපානායකර් අවර්කළ් [මාණ්පුමිකු ජේ.එම්. ආනන්ද කුමාරසිරි] තලෛමෛ වකිත්තාර්කළ්.

Whereupon THE HON. WIJEPALA HETTIARACHCHI *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] *took the Chair.*

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(මාණ්පුමිකු இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමියගේ මතයක් ඒක. ඒ මතය අල්ලාගෙන නාඩගම් නටපු එක වැරදියි.

අද මේ රටේ ආර්ථිකය විනාශ වෙලා තිබෙනවා. මේ රටේ ඉන්නා මුස්ලිම්, දෙමළ, සිංහල, ක්‍රිස්තියානි වැනි සියලුම ජනතාවට එකට එකතු වෙලා යන්න පුළුවන් රටක් තමයි මේ ලංකාව. මේ ආදරණීය රටේ මේ පාර්ලිමේන්තුවේ ඉන්නා 225 දෙනා එකතු වුණොත් තමයි අද මේ රටේ ආර්ථිකය ඉහළට අරගෙන යන්න පුළුවන් වෙන්නේ. මලයාසියාව දිහා බලන්න, සිංගප්පූරුව දිහා බලන්න. ඒ පාර්ලිමේන්තුවල ඉන්නා සියලු දෙනාම එකට එකතු වෙලා තමයි ඒ රටවල ආර්ථිකය හදාගෙන යන්නේ කියන එක අපට දකින්න පුළුවන්. අද එක එක්කෙනාට චෝදනා කරමින්, මේ ආර්ථිකය විනාශ වෙන්න ඉඩ හරිමින්, අප අතර සමඟියක්, සාමයක් නැතිව වැඩ කරන එක අපට කනගාටුවට කාරණයක් කියන එක අප දකිනවා.

මේ ගෞරවනීය පාර්ලිමේන්තුවේ ඉන්න සියලුම මන්ත්‍රීවරුන්ට මා කියන්නේ, පිට රටට ඩොලර් ඇදී යන එක අඩු කරන්න නම්, ආදායම් වැඩි කරන මාර්ගයක් අපි ඇති කරන්න ඕනෑය කියන එකයි. ආදායම් මාර්ග ඇති කරන්න නම් කර්මාන්තපුර වැඩි කර ගන්න ඕනෑ. අද අපි කර්මාන්තපුර වැඩි කරනවාද? අපි ඇති කරපු ඇඟලුම් කර්මාන්ත ටික වසාගෙන යන එක ගැන අපට දුකයි. ලෝකයේ අනිකුත් රටවල ඉන්න ව්‍යාපාරිකයන්ට අපේ ලංකාව දිහා බලා සතුටු වෙන්න පුළුවන් විධියට අපි මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ හැසිරුණොත්, ඒ විධියට වැඩ කටයුතු කළොත් තමයි ලෝකයේ ව්‍යාපාරිකයන් අපේ රටට එන්නේ. "ලංකාව හොඳම රටක්. ආර්ථික වශයෙන් ඉහළට යන්න පුළුවන් රටක්" කියලා ලෝකයේ ඉන්න හැම ව්‍යාපාරිකයකු හිතනවා නම්, ලංකාවට ඇවිල්ලා ආනයන, අපනයන කටයුතුවලට සම්බන්ධ වෙනවා. එතකොට අපේ ආදායම වැඩි කරන්න පුළුවන් වෙනවා.

අපේ රට කෘෂි කාර්මික රටක්. ඒ නිසා කෘෂි කර්මාන්තයට මුල් තැනක් දෙන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ මංගල සමරවීර ඇමතිතුමා "ගම්පෙරළිය" වැඩසටහනක් පටන් ගන්න යනවා. එතුමාගේ වැඩ පිළිවෙළ හරියාකාරව ක්‍රියාත්මක කළොත් අනිවාර්යයෙන්ම ඩොලර් යන එක අඩු කරගන්න පුළුවන්; ගම්වල සංවර්ධනය වැඩි කරන්න පුළුවන්; ගම්වල ආර්ථිකය දියුණු කරන්න පුළුවන්; ගම්වල තරුණයින්ගේ රැකියා ප්‍රශ්නවලට උත්තරයක් ලබා දෙන්න පුළුවන්. එදා සිංගප්පූරුවේ අගමැතිතුමා ලංකාව දිහා බලා තමයි කිව්වේ, "ලංකාව වාගේ සිංගප්පූරුවක් මා හදනවා"යි කියලා. හැබැයි අද අපේ අගමැතිතුමා කියනවා, "සිංගප්පූරුව වාගේ ලංකාවක් හදන්න මා බලාපොරොත්තු වෙනවා"යි කියලා. ඒ සඳහා මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීතුමන්ලා 225දෙනා එකතු වෙන්න ඕනෑ. එහෙම එකතු වෙන්නේ නැත්නම්, කවදාවත් ආර්ථිකය ගොඩ නහන්න බැහැ. ආර්ථිකය ගොඩ නහන්න නම් අපි අතර සමඟියක් තිබෙන්න ඕනෑ. රටේ ජනතාව විශාල බලාපොරොත්තුවකින් තමයි මේ උත්තරීතර පාර්ලිමේන්තුවට අප එව්වේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමස්තයක් වශයෙන් බලනකොට අද ව්‍යාපාර කඩා වැටිලා තිබෙනවා. මා නියෝජනය කරන අනුරාධපුර දිස්ත්‍රික්කයේ මෝල් කර්මාන්තය වාගේම අනිකුත් කර්මාන්ත 100කට වැඩි ප්‍රමාණයක් දැනට වසා දමා තිබෙනවා. ඒ ගැන මා කනගාටු වෙනවා. ඒ ව්‍යාපාරිකයන් සියලුදෙනාම තමන්ගේ ව්‍යාපාර කටයුතු කරන්න බැරි ලොකුම ප්‍රශ්නයකට මුහුණ දීලා තිබෙනවා. ඒ ව්‍යාපාරිකයන් නැති වුණොත්, ඉදිරියේදී ඒ ප්‍රදේශවල නිෂ්පාදනය කරන වී වෙන්න පුළුවන්, මිරිස් වෙන්න පුළුවන්, අල වෙන්න පුළුවන්, ලූනු වෙන්න පුළුවන්, ඒවා මිලදී ගන්නවත් ව්‍යාපාරිකයන් නැති වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්පුමිකු පිරතිච් සපානායකර් අවර්කළ්)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(මාණ්පුමිකු இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ අයට බැංකු ප්‍රශ්න තිබෙනවා. හැම බැංකුවකම seize වෙලා තිබෙනවා. මේ අවස්ථාවේදී බැංකුවලට කථා කරලා ඉදිරියේදී ඒ ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙන්න කටයුතු කරන්න පුළුවන්. ඒ අයට ඔවුන්ගේ ණය ගෙවන්න පුළුවන් විධියට කාල සීමාවක් ලබා දුන්නොත්, ඒ ණයත් ගෙව්ලා, ඒ අයගේ කර්මාන්තයත් ශක්තිමත්ව ඉදිරියට ගෙන යන්නට පුළුවන්. අද දහස් ගණනක් ව්‍යාපාරිකයන්, කම්කරුවන් මහ පාරට බැහැලා ඉන්නේ, ඒ ව්‍යාපාර කඩා වැටුණු නිසායි. ඒ කර්මාන්තවල වැඩ කරපු අයට නැවත රැකියාවක් දෙන්න ඕනෑ.

[ගරු ඉෂාක් රහුමාන් මහතා]

මා නියෝජනය කරන අනුරාධපුර දිස්ත්‍රික්කය කෘෂි කාර්මික ප්‍රදේශයක්. කෘෂි කාර්මික නිෂ්පාදන ඇති කරන්න ව්‍යාපාරිකයින් ඕනෑ. ව්‍යාපාරිකයන් නැත්නම් කෘෂි කර්මාන්තය කරලා වැඩක් නැහැ. එදා 1997 වසරේ චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය තමයි ජනාධිපතිතුමිය වශයෙන් සිටියේ. මට මතක් වෙනවා, රුපියල් 120ක් දක්වා මිල ඉහළ ගිහින් තිබුණු මිරිස් කිලෝව එතුමියගේ කාලයේදී රුපියල් 25ක්, රුපියල් 35ක් දක්වා පහළට බැසීම නිසා මහ පාරේ මිරිස් ගිනි තැබූ යුගයක් තිබුණු බව. එවැනි යුගයක් නැවත ඇති කරන්න එපා.

ගරු අගමැතිතුමා හොඳ මුදල් ඇමතිවරයකු පත් කර තිබෙනවා. එතුමාත් එක්ක කථා කරලා ව්‍යාපාරිකයින්ගේ බැංකු ප්‍රශ්න විසඳන්න අවශ්‍ය කටයුතු කරයි. එහෙම කටයුතු කළොත් විතරයි මේ පහළට වැටී තිබෙන ඩොලර් මිල උස්සන්න පුළුවන් වෙන්නේ. පළමුවෙන්ම බිම් හදලා, ගම් හදලා තමයි රට හදන්න ඕනෑ. ගම හදන්න කලින් රට හදලා වැඩක් වෙන්නේ නැහැ. ගම් හදලා තමයි රට හදන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)
ඒ තේමාවත් එක්ක තමයි, අපේ මුදල් ඇමතිතුමාත්, අතිගරු ජනාධිපතිතුමාත්, අගමැතිතුමාත් "ගම්පෙරළිය" වැඩසටහන ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ගම්පෙරළි වැඩසටහන් හෝ ක්‍රියාත්මක කරලා, අපේම ව්‍යාපාරිකයන්ට නිසි තැන දීලා මේ ප්‍රශ්න විසඳන්න අවශ්‍ය කටයුතු කරයි කියලා මා බලාපොරොත්තු වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමාට ස්තුතියි මට කථා කරන්න වේලාව දීම ගැන.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඊළඟට, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.25]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කථා කරන්න විනාඩි පහක් හෝ ලබා දීම සම්බන්ධයෙන් මා ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්න වනවා. අද දවසේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය මඟින් විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නියම කිපයක් සහ රේගු ආඥා පනත යටතේ යෝජනා කිපයක් මේ ගරු සභාවට ඉදිරිපත් කර තිබෙනවා.

අපට ප්‍රශ්න රාශියක් මතු වුණා, අපේ ආණ්ඩුවේ සමහර බදු සම්බන්ධයෙන්. අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීතුමන්ලා කණ්ඩායම් රැස්වීමේදීත් විශේෂ කතිකාවතකට යොමු වුණා, මේ බදු පැනවීම නිසා රටේ ජනතාවට යම් යම් හානි සිද්ධ වනවාද කියලා. මේ ආකාරයට බදු පනවන්නේ ඇයි කියලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපිත්, මුදල් අමාත්‍යාංශයේ නිලධාරි මහත්වරුන් ප්‍රමුඛ ගරු අමාත්‍යතුමාත් මහ ජනතාව දැනුවත් කරනවා මදියි කියා මා විශ්වාස කරනවා. අපි බදු පනවද්දි ක්‍රම දෙකකට බදු පනවනවා. රටේ ආදායම් වැඩි කර ගන්න වාගේම සමහර දේවල් පාලනය කර ගන්නත් අපි බදු පනවනවා. මේ කාරණා දෙක සඳහා අපි බදු පනවනවා. මේ බදුවලින් ලබා ගන්නා ආදායමින් රටේ මොනවාද කරන්නේ කියන කාරණය පිළිබඳව අපි ජනතාව දැනුවත් කළ යුතුයි. ඒ කාරණා අපි රටට කියනවා මදි. පසුගිය අවුරුදු තුන තුළදී මේ රටට කරපු සේවාව පිළිබඳව අපි රටේ ජනතාව දැනුවත් කළේ නැහැ. ඒ නිසා රටේ ජනතාව හැම තිස්සේම හිතුවේ අපි රටේ ජනතාවගෙන් බදු අය කර ගන්නවා කියලායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා ඉතාම විනිවිදභාවයෙන් යුතුව, විධිමත්ව මේ බදු පිළිබඳ රටේ ජනතාව දැනුවත් කිරීම අපේ ආණ්ඩුවේ වගකීමක් වනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කාලයක් තිස්සේ මේ රටේ ක්‍රියාත්මක වුණේ වක්‍ර බදු බව අපි දන්නවා. අඩු ආදායම් ලබන ජනතාවට විශේෂයෙන්ම බලපාන බදු ක්‍රමයක් තමයි අපේ රටේ තිබුණේ. අපේ මුදල් අමාත්‍යතුමා, අතිගරු ජනාධිපතිතුමා වාගේම ගරු අග්‍රාමාත්‍යතුමා ප්‍රමුඛ මේ කණ්ඩායම වක්‍ර බදු වෙනුවට සෘජු බදු වැඩි කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළක් අද සකස් කරලා තිබෙනවා. එලෙස සෘජු බදු වැඩි කිරීමේ ප්‍රතිඵලයක් හැටියට තමයි අලුතින් බදු ලිපි ගොනු විවෘත වෙන්නේ. එලෙස සෘජු බදු අයකර ගන්න යනකොට ඇඟිල්ල දික් වෙන්න පුළුවන්, 'මෙන්න මෙහෙම බදු ගන්නවා' කියලා. හැබැයි, ඒ කාරණයත් ජනතාවට හරියට පහදා දෙන්න ඕනෑ. අපි සෘජු බදු වැඩි කරන්නේ ඇයි? බදු ගෙවන්නේ නැතිව මෙච්චර කල් හැංගිලා හිටපු අයගෙන් නියමිත බදු අය කර ගන්න තමයි අපි සෘජු බදු වැඩි කරන්නේ. අපි වක්‍ර බදු අඩු කරන්නේ ඇයි? අපි වක්‍ර බදු අඩු කරන්නේ ජනතාවගේ ජීවන තත්ත්වය නහා සිටුවන්න අවශ්‍ය නිසායි. රටේ ජනතාවගේ ජීවන වියදම අඩු වෙන්න ඕනෑ. රටේ ජනතාවගේ ජීවන වියදම අඩු වෙන්න නම් වක්‍ර බදු ප්‍රමාණය අපි අඩු කරන්න ඕනෑ. ඒක තමයි ආණ්ඩුවක වගකීම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ ජනතාව මේ කාරණා පිළිබඳව විශේෂ දැනුවත් කිරීමක් කරන්න ඕනෑ.

මා මේ කාරණයත් කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මන්ත්‍රීවරුන් හැටියට අප මේ උත්තරීතර පාර්ලිමේන්තුවට මහ ජනතාව පත් කරලා එවන්නේ මේ රටට අවශ්‍ය නීති හදන්න, මේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න අවශ්‍ය කරන සැලැසුම් නිර්මාණය කරන්න වාගේම, අපේ දරුවන් වෙනුවෙන් හොඳ, යහපත් රටක් නිර්මාණය කරන්න අවශ්‍ය නිසායි. හැබැයි, අපි මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා මොකක්ද කරන්නේ? පාර්ලිමේන්තුවට ඇවිල්ලා අපි කරන්නේ මුදල් කාබාසිනියා කිරීමයි. පාර්ලිමේන්තුව එක දිනක් සඳහා රුපියල් ලක්ෂ ගණනක් වියදම් කරනවා. එහෙම නම්, පාර්ලිමේන්තුවට ඇවිල්ලා අපි මොනවාද කරන්නේ කියලා අපි ස්වයං විවේචනයක් කර ගන්න ඕනෑ. අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා කරන්නේ කවුරුන් හෝ විවේචනය කරන එක, කාට හෝ බණින එක, 'මෝඩ වූන්' ගන්න කථා කරන එක.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පැහැදිලිවම ඉගෙන ගත යුතු කාරණයක් තිබෙනවා. ඊයේ මේ සභාවේ ඒකාබද්ධ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු හැසිරුණු ආකාරය බලන්න.

මේ පාර්ලිමේන්තුවේ ගරු කථානායකතුමාටත්, විශේෂයෙන්ම නිලධාරි මහත්වරුන්ටත් කථා කරපු භාෂාව ගැන හිතද්දි, මේ අය පාර්ලිමේන්තුවට නොවෙයි වටින්නේ. මට හිතෙන හැටියට ගමේ කඩයක තේ හදන්නවත් වටින්නේ නැති සමහර අය මෙතැන හිටියා. ඒ නිසා කනගාටුවෙන් හරි කියන්න ඕනෑ, මෙවැනි අය පාර්ලිමේන්තුවට එවලා මේ පාර්ලිමේන්තුවේ ගරු සභාව දූෂණය කරනවා පමණක් නොවෙයි, රටේ ජනතාවගේ මුදල් ටික කාබාසිනියා කරලා, මේ රට ජීවත් වෙන්න බැරි රටක් විධියට, එහෙම නැත්නම් හොඳ නැති රටක් විධියට රටේ ජනමතයක් ගොඩ නඟනවා කියා. මෙක අපි සියලුදෙනාටම ප්‍රශ්නයක්. මෙක රටේ සමස්ත ජනතාවටම ප්‍රශ්නයක්. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ විතරක් නොවෙයි, ඉන් පිටතත් වෙනස් කළ යුතු බොහෝ දේවල් අපට තිබෙනවා. මාධ්‍යයෙන් අද ප්‍රචාරය වන සමහර දේවල් දිහා බැලුවාම අපේ රට කොහේටද ගෙනයන්නේ කියන එක පිළිබඳව අපි නැවත හිතන්න ඕනෑ. මේ තත්ත්වය වෙනස් කරන්න සුදුසු වැඩ පිළිවෙළක් සකස් කිරීමේ වගකීම ඔබතුමන්ලා සතු වෙනවා. මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ නායකයා ගරු කථානායකතුමායි. එතුමා නියෝජ්‍ය කථානායකතුමාත් එක්ක එකතු වෙලා හොඳ වැඩ පිළිවෙළක් සකස් කරලා රටට වැඩදායි වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න, මේ ගෞරවනීය පාර්ලිමේන්තුව ඉදිරියට ගෙන යන්න කියලා මා යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට වෙලාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මාර්තු 07 දිනැති අංක 2061/22 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

III

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මාර්තු 19 දිනැති අංක 2063/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.) "

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

IV

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 අප්‍රේල් 01 දිනැති අංක 2064/49 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.) "

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

V

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මැයි 01 දිනැති අංක 2069/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.) "

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

VI

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මැයි 08 දිනැති අංක 2070/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

VII

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මැයි 09 දිනැති අංක 2070/6 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

VIII

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ විශේෂ වෙළඳ භාණ්ඩ බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 මැයි 20 දිනැති අංක 2071/85 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

රේගු ආඥා පනත: යෝජනාව
சுங்கக் கட்டளைச் சட்டம் : தீர்மானம்
CUSTOMS ORDINANCE: RESOLUTION

I

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2018 මාර්තු 16 දිනැති අංක 2062/45 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2018 අප්‍රේල් 17 දිනැති අංක 2067/2 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

III

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2018 මැයි 01 දිනැති අංක 2069/2 දරන අති විශේෂ ගැසට් පත්‍රය)
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

IV

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2018 මැයි 02 දිනැති අංක 2069/19 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

V

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"(235 අධිකාරය) රේගු ආඥා පනතේ 10 වගන්තිය යටතේ ආනයන තීරු ගාස්තු සම්බන්ධයෙන්, 2018.06.21 දින ඉදිරිපත් කරන ලද යෝජනාව අනුමත කළ යුතු ය.

(2018 මැයි 15 දිනැති අංක 2071/15 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය)
(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත: නියමය

துறைமுக மற்றும் விமான நிலைய அபிவிருத்தி அறவீட்டுச் சட்டம் : கட்டளை

PORTS AND AIRPORTS DEVELOPMENT LEVY ACT: ORDER

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3 (3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2017 දෙසැම්බර් 13 දිනැති අංක 2049/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.05 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත : නියමය

உற்பத்தி வரி (விசேட ஏற்பாடுகள்) சட்டம் : கட்டளை

EXCISE (SPECIAL PROVISIONS) ACT: ORDER

I

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 පෙබරවාරි 15 දිනැති අංක 2058/33 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

II

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 පෙබරවාරි 15 දිනැති අංක 2058/34 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2018.06.19 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.30ට, 2018 ජූලි මස 05 වන බ්‍රහස්පතින්දා පූ. භා. 10.00 වන තෙක් කල් ගියේය.


அதன்படி பி. ப. 6.30 மணிக்கு பாராளுமன்றம், 2018 யூலை 05, வியாழக்கிழமை மு. ப.10.00 மணிவரை ஒத்திவைக்கப்பட்டது.

Parliament adjourned accordingly at 6.30 p.m. until 10.00 a.m. on Thursday, 05th July, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

261 වන කාණ්ඩය - 10 වන කලාපය
தொகுதி 261 - இல. 10
Volume 261 - No. 10

2018 ජූලි 05වන බ්‍රහස්පතින්දා
2018 யூலை 05, வியாழக்கிழமை
Thursday, 05th July, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

නිවේදන

වරප්‍රසාද: 2018 ජූනි 21වන දින 'ලංකාදීප' වාර්තාව

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

'ද නිව්යෝක් ටයිම්ස්' පුවත් පත් වාර්තාව:

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

වරප්‍රසාද යෝජනා:

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය කඩ කිරීම

ජාතික විගණන පනත් කෙටුම්පත:

දෙ වන වර සහ තුන් වන වර කියවා සංශෝධිතාකාරයෙන් සම්මත කරන ලදී

කල් තැබීමේ යෝජනාව:

මත්තල ගුවන් තොටුපොළ කළමනාකරණය සඳහා විධිමත් යාන්ත්‍රණයක්

பிரதான உள்ளடக்கம்

அறிவிப்புக்கள்:

சிறப்புரிமை: 2018 யூன் 21ம் திகதிய" லங்காதீப" அறிக்கை

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

"நியூயோர்க் டைம்ஸ்" பத்திரிகை அறிக்கை :

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரின் கூற்று

சிறப்புரிமைப் பிரேரணைகள்:

பாராளுமன்ற உறுப்பினர்களுக்கான நடத்தைக் கோவையை மீறுதல்

தேசிய கணக்காய்வு சட்டமூலம்:

இரண்டாம், மூன்றாம் முறைகள் மதிப்பிடப்பட்டு திருத்தப் பட்டவாறு நிறைவேற்றப்பட்டது

ஒத்திவைப்புப் பிரேரணை:

மத்தள சர்வதேச விமான நிலைய முகாமைத்துவம் தொடர்பான சரியான பொறிமுறை

PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Privilege : "Lankadeepa" Report of 21st June, 2018

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

"THE NEW YORK TIMES" REPORT:

Statement by Prime Minister, Minister of National Policies and Economic Affairs

PRIVILEGE MOTIONS:

Breach of Code of Conduct for Members of Parliament

NATIONAL AUDIT BILL:

Read a Second and the Third time, and passed as amended

ADJOURNMENT MOTION:

Proper Mechanism for Management of Mattala International Airport

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 ජූලි 05වන බ්‍රහස්පතින්දා
2018 யூலை 05, வியாழக்கிழமை
Thursday, 05th July, 2018

පූ.භා. 10.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

නිවේදන
அறிவிப்புக்கள்
ANNOUNCEMENTS

I

වරප්‍රසාද : 2018 ජූනි 21වැනි දින "ලංකාදීප" වාර්තාව
சிறப்புரிமை: 2018 யூன் 21ம் திகதிய "லங்காதீப" அறிக்கை
PRIVILEGE: "LANKADEEPA" REPORT OF 21ST JUNE, 2018

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා විසින් 2018 ජූනි 22 වැනි දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කළ හැකිය.

II

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම
பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழுக் கூட்டம்
MEETING OF COMMITTEE ON PARLIAMENTARY BUSINESS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ රැස්වීමක් 2018 ජූලි මස 05වන බ්‍රහස්පතින්දා, එනම් අද දින මධ්‍යාහ්න 12.00ට මාගේ නිල කාමරයේ දී පැවැත්වීමට නියමිත බැවින්, ඊට පැමිණ සහභාගි වන ලෙස ගරු සභික මන්ත්‍රීන් සියලුදෙනාට මෙයින් දැනුම් දීමට කැමැත්තෙමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් 2017 වර්ෂය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා වෙනුවෙන් 2015 වර්ෂය සඳහා ජල සම්පත් මණ්ඩලයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව කෘෂිකර්මය හා ඉඩම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් 2017 වර්ෂය සඳහා කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යතුමා වෙනුවෙන් 2017 වර්ෂය සඳහා සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

එම වාර්තාව ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(මාණ්පුමිකු නිහාල් කලප්පත්ති)
(The Hon. Nihal Galappaththi)

ගරු කථානායකතුමනි, අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමා වෙනුවෙන්, අභ්‍යන්තර පරිපාලන හා රාජ්‍ය කළමනාකරණ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) තැපැල් කාර්යාල ආඥා පනතේ 7 වැනි වගන්තිය යටතේ ව්‍යවස්ථාව;

(ii) 2015 සහ 2016 වර්ෂ සඳහා තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තා; සහ

(iii) 2015 සහ 2016 වර්ෂ සඳහා තැපැල් දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු දුමින්ද දිසානායක මහතා (වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍යතුමා)
(මාණ්පුමිකු දුමින්ද දිසානායක - நீர்ப்பாசன, நீர் வளங்கள் மற்றும் அனர்த்த முகாமைத்துவ அமைச்சர்)
(The Hon. Duminda Dissanayake - Minister of Irrigation and Water resources and Disaster Management)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) උපුල්දෙණිය, කනදරා රත්මලේ යන ලිපිනයෙහි පදිංචි ඩී.එම්. ධර්මදාස මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) නොච්චියාගම, පහළවැටියාව යන ලිපිනයෙහි පදිංචි එම්.කේ.බී. කාශ්‍යප බණ්ඩාර මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) තඹුත්තේගම, මලියදේවපුර, අංක 404/05/151 යන ලිපිනයෙහි පදංචි පී.ඩබ්ලිව්.ඒ.එස්. ජයවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු බුද්ධික පතිරණ මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு புத்திக பதிரண - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Buddhika Pathirana - Deputy Minister of Industry and Commerce)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) බත්තරමුල්ල, තලංගම උතුර, අංක 487/16 දරන ස්ථානයෙහි පදිංචි අජිත් දේවප්‍රිය මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) හලාවත, සිංහපුර පාර, අංක 24 දරන ස්ථානයෙහි පදිංචි එස්.ඩබ්ලිව්.සී.යූ. සිල්වා මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) බූස්ස, අඩප්පගොඩවත්ත යන ලිපිනයෙහි පදිංචි ටී.ඩබ්ලිව්. ගුණරත්න මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු සාලින්ද දිසානායක මහතා
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க)
(The Hon. Salinda Dissanayake)

ගරු කථානායකතුමනි, බත්තරමුල්ල, තලංගම දකුණ, පැලවත්ත, පෙරේරා මාවත අංක 47/47 දරන ස්ථානයෙහි පදිංචි ඩී.එම්.පී.එන්. දිසානායක මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු කථානායකතුමනි, මොරවක, කළුබෝවිටියන, දංගල යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්, එල්. ප්‍රේමාවතී මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

ගරු අනුරාධ ජයරත්න මහතා
(மாண்புமிகு அநுராத ஜயரத்ன)
(The Hon. Anuradha Jayaratne)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) කුණ්ඩසාලේ, පල්ලේකැලේ, ජය ශ්‍රී උයන, අංක 368/බී දරන ස්ථානයෙහි පදිංචි ඒ.එම්.එස්.කේ. අබේසිංහ මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) නිල්ලඹ, වාරියගල එස්ටේට්, අංක 1/16 දරන ස්ථානයෙහි පදිංචි බී.ඩී. ගුණසේකර මහතාගෙන් ලැබුණු පෙත්සම.

ගරු දිලිප් වෙදආරච්චි මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு திலிப் வெத-ஆரச்சி - கடற்றொழில், நீரக வளமூல அபிவிருத்தி மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Dilip Wedaarachchi - State Minister of Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් තුන පිළිගන්වමි.

(1) බරවකුඹුක, වැටිය, උලහිටියාව ගෙදර යන ලිපිනයෙහි පදිංචි ලියනාරච්චිගේ කරෝලිස් මහතාගෙන් ලැබුණු පෙත්සම;

(2) ලුණුගම්වෙහෙර, පඩිවගම, දියවරගම, අංක 113 දරන ස්ථානයෙහි පදිංචි එස්.අබේනායක මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(3) අම්බලන්තොට, වාදුරුප්ප, "ජයන්ත" යන ලිපිනයෙහි පදිංචි යූ.ජී. ප්‍රදීප් ශ්‍රී කුමාර මහතාගෙන් ලැබුණු පෙත්සම.

ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලෙස නියෝග කරන ලදී.

சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.

Petitions ordered to be referred to the Committee on Public Petitions.

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

අලි - මිනිස් ගැටුම : ඉලක්කගත විසඳුම
யானை - மனித மோதல்: இலக்குகளுடனான தீர்வு
HUMAN-ELEPHANT CONFLICT: TARGET SOLUTION

45/'18

1. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
මම අහන්නේ ඔබතුමාගෙන්.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ඇමුණුම් අංක 01** මඟින් දක්වා ඇත.

(ii) උතුරු පළාත් ප්‍රධාන ලේකම් එවා ඇති තොරතුරුවලට අනුව මෙම ප්‍රශ්නයට අදාළ පිළිතුරු මධ්‍යම රජයේ කෘෂිකර්ම අමාත්‍යාංශ යටතේ පාලනය වන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ලබා ගත යුතු බව දන්වා ඇත.

(iii) 2009 වසරෙන් පසු වූ වගා කටයුතු පිළිබඳ තොරතුරු ඇමුණුම් අංක 02** මඟින් දක්වා ඇත.

(ආ) (i) 2008-2009 වර්ෂවල ඇති වූ යුද වාතාවරණය හේතුවෙන් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ලේඛන විශාල ප්‍රමාණයක් විනාශයට පත් විය. තවද, එම ලියකියවිලි නැවත ලබා ගත හැකි මාර්ග ද දක්නට නොතිබුණි. එබැවින් 1983 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා පැවති යුද්ධය තත්ත්වය නිම වනතෙක් වාරිමාර්ග, වැව්, අමුණු සහ ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වෙන් කරන ලද මුදල් පිළිබඳ තොරතුරු ද ලබාගත නොහැක.

(ii) ඇමුණුම් අංක 03** මඟින් දක්වා ඇත.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 -442/'18- (1), ගරු ජයන්ත සමරවීර මහතා.

***** ප්‍රස්තකාලයේ තබා ඇත.***
*** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මහාමාර්ග හා මාර්ග සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

ජාතික හා පළාත් පාසල් සඳහා බඳවාගත් ගුරුවරුන්: විස්තර

தேசிய மற்றும் மாகாணப் பாடசாலைகளுக்கு ஆட்சேர்க்கப்பட்ட ஆசிரியர்கள்: விபரம்

TEACHERS RECRUITED TO NATIONAL AND PROVINCIAL SCHOOLS: DETAILS

519/'18

11. ගරු විමල් වීරවංශ මහතා (ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා වෙනුවට)
(மாண்புமிகு விமல் வீரவங்ச - மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத் சார்பாக)
(The Hon. Wimal Weerawansa on behalf of the Hon. Indika Anuruddha Herath)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දිවයිනේ ඇති මුළු රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) දිවයිනේ ඇති මුළු ජාත්‍යන්තර පාසල් සංඛ්‍යාව කොපමණද;

(iii) 2015, 2016 සහ 2017 වර්ෂවලදී දිවයිනේ ජාතික පාසල් සඳහා බඳවාගත් ගුරුවරුන් සංඛ්‍යාව වර්ෂය අනුව කොපමණද;

(iv) 2015, 2016 සහ 2017 වර්ෂවලදී දිවයිනේ ඇති පළාත් පාසල් සඳහා බඳවාගත් ගුරුවරුන් සංඛ්‍යාව වර්ෂය අනුව කොපමණද;

(v) 2016 වර්ෂයේ පළමු භාගය තුළ බාහිර හා අභ්‍යන්තර ඇගයීම් පද්ධති මඟින් ඇගයීමට ලක් කළ ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(vi) 2016 අයවැයෙන් ග්‍රාමීය හා ප්‍රාදේශීය පාසල්වල ගුරු නිල නිවාස/ විවේකාගාර ස්ථාපිත කිරීම වෙනුවෙන් වෙන් කළ මුදල කොපමණද;

(vii) එම ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நாட்டிலுள்ள மொத்த அரசாங்க பாடசாலை களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(ii) நாட்டிலுள்ள மொத்த சர்வதேச பாடசாலை களின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(iii) 2015, 2016 மற்றும் 2017ஆம் ஆண்டுகளில் நாட்டிலுள்ள தேசிய பாடசாலைகளுக்கு ஆட்சேர்க்கப்பட்ட ஆசிரியர்களின் எண்ணிக்கை ஆண்டு அடிப்படையில் எவ்வளவென்பதையும்;

(iv) 2015, 2016 மற்றும் 2017ஆம் ஆண்டுகளில் நாட்டிலுள்ள மாகாணப் பாடசாலைகளுக்கு ஆட்சேர்க்கப்பட்ட ஆசிரியர்களின் எண்ணிக்கை ஆண்டு அடிப்படையில் எவ்வளவென்பதையும்;

(v) 2016ஆம் ஆண்டின் முதல் பகுதியினுள் வெளிவாரி மற்றும் உள்வாரி மதிப்பீட்டு முறைமையின் ஊடாக மதிப்பீட்டுக்கு உட்படுத் தப்பட்ட ஆசிரியர்களின் எண்ணிக்கை எவ்வள வென்பதையும்;

(vi) 2016ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டத்தின்மூலம் கிராமிய மற்றும் பிராந்திய பாடசாலைகளில் ஆசிரியர் பணிமனைகள்/ ஓய்வறைகளை நிறுவுவதற்காக ஒதுக்கப்பட்ட நிதி எவ்வளவென்பதையும்;

(vii) மேற்படி கருத்திட்டத்தின் தற்போதைய முன்னேற்றம் யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) the total number of government schools in the island;

(ii) the total number of international schools in the island;

(iii) the number of teachers recruited for national schools in the years of 2015, 2016 and 2017, according to each year;

(iv) the number of teachers recruited for provincial schools in the years of 2015, 2016 and 2017, according to each year;

(v) the number of teachers appraised from the external and internal appraisal systems in the first half of year 2016;

(vi) the amount of money allocated to establish teachers' quarters / rest rooms in rural and regional schools from the 2016 Budget; and

(vii) the present progress of the project?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්පුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 10,194කි.

(ii) 265කි.

(iii)

වර්ෂය	බඳවාගත් ගුරුවරුන් සංඛ්‍යාව
2015	1,151
2016	2,421
2017	2,606
එකතුව	6,178

(iv)

වර්ෂය	බඳවාගත් ගුරුවරුන් සංඛ්‍යාව
2015	5,145
2016	9,671
2017	11,031
එකතුව	25,847

(v) ගුරුවරුන් සංඛ්‍යාව 132,984කි. (එක්ලක්ෂ තිස්දෙදහස් නවසිය අසූහතරකි)

(vi) රුපියල් මිලියන 2,289.052

(vii) ඔව්.

"ළඟම පාසල හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ කාර්යයන් 224ක් ආරම්භ කර ඉන් 131ක් 2018.03.31 දින වනවිට අවසන් කර ඇත. මේ දක්වා මෙම කාර්යයන් සඳහා මිලියන 169ක් වියදම් දරා ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා

(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)

(The Hon. Speaker)

ඊළඟට ස්ථාවර නියෝග අංක 27 (2) යටතේ ප්‍රශ්නය, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා. එතුමා එකඟ වුණා, අද දින වේලාව ඉතිරි කර ගැනීම සඳහා එය හෙට දිනයේ ඉදිරිපත් කරන්න.

ඊළඟට අමාත්‍යාංශ නිවේදන, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා.

"ද නිව්යෝර්ක් ටයිම්ස්" පුවත් පත් වාර්තාව : අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

“நியூயோர்க் டைம்ஸ்” பத்திரிகை அறிக்கை : பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரின் கூற்று

"THE NEW YORK TIMES" REPORT: STATEMENT BY PRIME MINISTER, MINISTER OF NATIONAL POLICIES AND ECONOMIC AFFAIRS

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)

(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs}

ගරු කථානායකතුමනි, හම්බන්තොට වරාය පිළිබඳව පසුගිය දින "ද නිව්යෝර්ක් ටයිම්ස්" පුවත් පතේ පළ වූ වාර්තාවක් සම්බන්ධයෙන් ජනතාව අතරත්, මාධ්‍ය අතරත් විශාල කථා බහක් ඇති වුණා. මේ සම්බන්ධව මෙම ගරු සභාව ඉදිරියේ කරුණු කිහිපයක් පැහැදිලි කිරීම සුදුසු යැයි මා කල්පනා කළා.

හම්බන්තොට වරාය ඉදිකිරීම සඳහා මහින්ද රාජපක්ෂ ආණ්ඩුව විසින් ඩොලර් මිලියන 1,320ක ණය මුදලක් චීනයෙන් ගත්තා. නමුත් වරායට නැව් ගෙන්වා ගන්න ශක්තියක් ශ්‍රී ලංකා වරාය අධිකාරියට හෝ ශ්‍රී ලංකා ආණ්ඩුවට තිබුණේ නැහැ.

2015 ජනාධිපතිවරණ අවස්ථාව වන විට මෙය විශාල ප්‍රශ්නයක්ව තිබුණා. නැව් එන්නේ නැති වරායක් හදන්න ලබාගත් මේ ණය කන්දරාව ගෙවන්න රජයට ආදායමක් තිබුණේ නැහැ. මෙම ණය ගෙවීම විශාල ප්‍රශ්නයක්ව තිබුණා. වරායෙන් කිසිම ආදායමක් ලැබුණේ නැහැ. සිදු වුණේ තව තවත් පාඩු වුණු එකයි. මේ බර කොළඹ වරායට කර ගහන්න සිදු වුණා. 2011 සිට මේ දක්වා හම්බන්තොට වරායේ පාඩුව රුපියල් බිලියන 47යි. රටට ඉතා අහිතකර මෙම වරාය ප්‍රශ්නයට විසඳුමක් සෙවීම යහ පාලන රජයේ මැතිවරණ පොරොන්දුවක් ද වුණා.

අපට තිබුණේ තෝරා ගැනීම් දෙකයි. එකක්, මේ ණය ගිවිසුම නීති විරෝධී බවට තීරණය කරලා ඉදිරි කටයුතු කරන එකයි. අනෙක් විකල්පය වුණේ චීන රජය සමඟ සාකච්ඡා කිරීමයි. අපි ප්‍රමුඛත්වය දුන්නේ චීන රජය සමඟ සාකච්ඡා කරලා විසඳුමක් ලබා ගැනීමටයි.

ගරු කථානායකතුමනි, අප රජය බලයට පත් වූ වහාම මෙම ප්‍රශ්නය විසඳීම පිළිබඳ සාකච්ඡා ආරම්භ කළා. සුදු අලියෙක්ව තිබූ වරායෙන් ප්‍රයෝජනයක් ගත හැකි ආකාරයත්, මහා ණය කන්දෙන් නිදහස් විය හැකි ආකාරයත් අපි සාකච්ඡා කළා. ජනාධිපතිතුමාත් පළමුව චීන රජය සමඟ සාකච්ඡා කළා. ඊට පසුව මමත්, නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමාත්, මලික් සමරවික්‍රම ඇමතිතුමාත් ඇතුළු ඇමති කණ්ඩායම චීන රජය සමඟ මේ පිළිබඳව බීජිං නුවරදී සාකච්ඡා කළා. මේ සම්බන්ධයෙන් චීනයේ අගමැතිතුමාත්, චීනයේ ජනාධිපතිතුමාත් මුණ ගැසුණා.

අප රජයේ මතය වූයේ, වරායේ මෙහෙයුම් රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව සමාගමකට පැවරීම තුළින් ණය බරින් නිදහස් වීමත්, හම්බන්තොට වරාය ලාභ ලබන, නැව් ගෙන්වා ගත හැකි වරායක් බවට පත් කිරීමත්ය. අප රජය මෙම ස්ථාවරයේ දිගටම රැඳී සිටියා. මෙම ස්ථාවරය සඳහා චීන රජයෙන් කිසිදු පීඩනයක් එල්ල නොවූ බව මා වග කීමෙන් ප්‍රකාශ කර සිටිනවා. There, we had no pressure. We had many options and we could have followed whatever we wanted.

චීන රජයෙන් කළ ඉල්ලීම වූයේ වරාය මෙහෙයුම් කටයුතු සඳහා පළමුවෙන් චීන සමාගම්වලින් යෝජනා කැඳවන ලෙසයි. ඒ අනුව චීන සමාගම්වලින් විවෘත යෝජනා කැඳවනු ලැබුවා. අප වෙත ලැබුණු යෝජනා අතරින් වඩාත්ම වාසිදායක යෝජනාව වූයේ චයිනා මර්චන්ට් පෝර්ට් හෝල්ඩිංග්ස් සමාගම විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවයි. එතැනදී යෝජනා කළේ මේ ප්‍රදේශයේ කර්මාන්තකරණයක් ඇති කරලා, නැව් කැඳවා ගෙන මේ වරාය ලාභදායක ලෙස දශකයෙන් පසුව ගෙනි යන්නයි. ඒ ශක්තිය මේ සමාගමට තිබුණා. ඩොලර් මිලියන එක්දහස් අසූවක ආයෝජනයකට ඔවුන් එකඟ වුණා. චීන ජනාධිපතිතුමාත්, චීන රජයත් මේ සම්බන්ධව පූර්ණ එකඟතාව පළ කළා. ඒ අනුව චයිනා මර්චන්ට් පෝර්ට් හෝල්ඩිංග්ස් සමාගම හා ශ්‍රී ලංකා වරාය අධිකාරිය එක්ව පිහිටුවනු ලබන සමාගමක් යටතේ හම්බන්තොට වරායේ මෙහෙයුම් කටයුතු සිදු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත 2016 දෙසැම්බර් 08වන දින ගිවිසුමකට ඇතුළත් වුණා. ඒ අනුව චයිනා මර්චන්ට් පෝර්ට් හෝල්ඩිංග්ස් සමාගමෙන්

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

2017 දෙසැම්බර් 22 දින ඩොලර් මිලියන 293කුත්, 2018 ජනවාරි 28 දින ඩොලර් මිලියන 97කුත් ශ්‍රී ලංකා රජයට ගෙවනු ලැබුවා. ඉතිරි ඩොලර් මිලියන 584 මේ වනවිට ශ්‍රී ලංකා වරාය අධිකාරියට ගෙවා තිබෙනවා. මීට අමතරව හම්බන්තොට ප්‍රදේශයේ කර්මාන්ත සඳහා යටිතල පහසුකම් සකස් කිරීමේ සැලැස්ම ඉදිරිපත් කරලා තිබෙනවා. දැනට LNG විදුලි බලාගාරයක් අනුමත කරලා තිබෙනවා. අනිකුත් ආයෝජනත් දැන් ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට ඉල්ලීම් ඉදිරිපත් කරලා තිබෙනවා. මෙය අප රජය මෙන්ම මේ රටේ ජනතාව ලැබූ විශාල ජයග්‍රහණයක් බව මා කියන්න කැමතියි.

මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන් ඩොලර් මිලියන ගණනින් ණයවෙලා නැව් නැති වරායක් හැදුවා. ණයෙනුත් නිදහස් වෙලා හම්බන්තොට වරාය නැව් එන වරායක් බවට පත් කරන්නත් අපට හැකි වුණා. වරාය විකිණීමක් මෙතැන කිසිසේත්ම සිදු වෙලා නැහැ. වරායේ මෙහෙයුම් රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව සමාගමකින් සිදු කිරීම පමණයි සිදු වන්නේ. මේ කටයුත්ත චීනයට බාර දීලා නැහැ. හම්බන්තොට වරාය ඉදිරියේදී දියුණු වරායක් බවට පත් වේවි. එසේම මෙම වරාය කිසිදු යුද්ධමය අරමුණක් සඳහා යොදා ගන්නේ නැහැ. අපේ වරායන්, අපේ භූමිය වෙනත් රටවල යුද්ධ කටයුතුවලට අපි යොදවන්නේ නැහැ. ඒ බව පැහැදිලිව චයිනා මර්චන්ට් ගිවිසුමේ සඳහන් වෙනවා. චීන ජනාධිපතිතුමා සමඟ පැවති සාකච්ඡාවේදීත් අපගේ ස්ථාවරය ඉතා පැහැදිලිව ප්‍රකාශ කර තිබෙනවා. එතුමා ඒ ස්ථාවරය පිළිගත්තා.

ගරු කථානායකතුමනි, නැව් නැති වරාය වාගේම අහස් යානා එන්නේ නැති ගුවන් තොටුපොළකුත් මත්තල තිබෙනවා. ඒකත් මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ ණයක්. මත්තල ගුවන් තොටුපොළ පිළිබඳවත් අප පළමුව චීන සමාගමක් සමඟ සාකච්ඡා කළා. නමුත් එතැනින් යහපත් ප්‍රතිචාරයක් ලැබුණේ නැහැ. ඒ නිසා අප ඉන්දියාව සමඟ ඒ ගැන සාකච්ඡා කරමින් සිටිනවා.

ඉදිරියේදී මත්තල ගුවන් තොටුපළේ ණයෙනුත් නිදහස් වී ගුවන් යානා පැමිණෙන ගුවන් තොටුපොළක් බවට මත්තල ගුවන් තොටුපොළ පත්වෙන බව මට විශ්වාසයි.

ඇත්තවශයෙන්ම චීනය අපට බල කළා නම්, මේ වරායත් ගුවන් තොටුපොළත් චීනයට දෙන්න -[බාධා කිරීමක්] අපි චීනය එක්කත්, ඉන්දියාව එක්කත් ගනුදෙනු කරන්නේ ස්වාධීන රාජ්‍යයක් හැටියට කියලා මම කියන්න කැමතියි.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
මේ ගැන විවාදයක් කරන්න නම් අමාරුයි. අගමැතිතුමා කැමති නම් පැහැදිලි කිරීමක් කරන්න පමණක් අවස්ථාව දෙන්නම්. ඔබතුමා point of Order එකක් අරගෙන දිගටම කථා කරනවා. අගමැතිතුමා සූදානම්ද? [බාධා කිරීමක්] Yes, Hon. Prime Minister?

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මම ප්‍රශ්නය අහනවා. [බාධා කිරීමක්] කථානායකතුමා අහන්න කිව්වා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
නැහැ. නැහැ. මට කියන්න බැහැ. ගරු අගමැතිතුමා කැමති නම් මම අවස්ථාව දෙන්නම්.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)
හොඳයි. අහන්න කියන්නකෝ. හැබැයි, පිළිතුරෙන් පසුව වාඩි වෙන්න ඕනෑ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
කෙටියෙන් ප්‍රශ්නය අහන්න. ආයෙත් ඒ ගැන argument එකක් නැහැ. [බාධා කිරීම්]

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
අහන්න දෙන්නකෝ. [බාධා කිරීම්] අහන්න දෙන්නකෝ.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඉතින්, අහන්නකෝ.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්පුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, තමුන්නාන්සේ මේ අවස්ථාව මට ලබා දීම පිළිබඳ ස්තුතිවන්ත වෙනවා. මා දන්නා විධියට දැනටත් හම්බන්තොට වරාය සඳහා ගනු ලැබූ ණය මුදල් වරාය අධිකාරියෙන් ගෙවනවා. ඒ ණය මුදල් පියෙව්වාට පසුව වරාය අධිකාරිය එදා සිට මේ දක්වා ලාභයි. ඒ වාගේම හම්බන්තොට, මත්තල ගුවන් තොටුපොළ සඳහා ලබා ගත් ණය ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමෙන් -Airport and Aviation Services (Sri Lanka) Limited එකෙන් - ගෙවනවා. ඒ ණය වාරික ගෙවලාත් එම ආයතනය ලාභදායී ආයතනයක්. එතකොට මේ ආයතන දෙකේම ණය බර මහා භාණ්ඩාගාරයට බලපාලා නැහැ. එක ණයක් වරාය අධිකාරියෙන් ගෙවා ගෙන යනවා; තවමත් ගෙවනවා. ඔබතුමන්ලා විකුණලා සල්ලි ටික ගත්තත් තවමත් ගෙවනවා. මත්තල ගුවන් තොටුපොළ සඳහා ලබා ගත් ණයෙහි ණය වාරික ඒ ගුවන් සේවා ආයතනය ගෙවනවා. ඒ ගුවන් සේවා ආයතනය ලාභදායී ආයතනයක්. ඒ නිසා ඔබතුමා කියන තර්කය වැරදියි. ණයෙන් නිදහස්වීමක් නැහැ. ඒ අදාළ ආයතන ණය වාරික තවමත් ගෙවනවා; ලාභදායීව පවත්වාගෙන යනවා. ඒ නිසා මේ රටේ සම්පත් විකුණාගෙන කන එක ආඩම්බරයට කාරණයක් කියා ඔබතුමා -[බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. ගරු අගමැතිතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්පුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, මේ මුදල් ටික අපේ සංචිතයේ යොදවලා තිබෙන්නේ. වරාය අධිකාරියෙන් ගෙවුවත්, කවුරු ගෙවුවත් මේ මුදල් අපි එක්ක තිබෙන්නේ. ඒ නිසා අපේ ණය බර

අඩුවෙලා තිබෙනවා. අපේ සංචිතය වැඩි වෙලා තිබෙනවා. "The New York Times"හි කථාවේ කොටස් දෙකක් තිබුණා. මට බලපෑවේ එක කොටසක් විතරයි. මම ඒ කාරණය ගැන ප්‍රකාශයක් කළා. මම හිතුවා මගේ මිත්‍ර මන්ත්‍රීතුමා අනෙක් කොටස ගැන ප්‍රකාශයක් කරන්න යනවා කියලා. ඒ ගැන සම්පූර්ණයෙන්ම නිශ්ශබ්ද වෙලා ඉන්නේ.

ගරු කථානායකතුමා
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි. මීළඟට, අමාත්‍යාංශ නිවේදන. වාරිමාර්ග සහ ජල සම්පත් හා ආපදා කළමනාකරණ අමාත්‍ය, ගරු දුමින්ද දිසානායක මහතා.

ගරු මන්ත්‍රීවරයෙක්
(මාණ්ඩුමිකු උරුප්පිනර් ඔරුවර්)
(An Hon. Member)
ගරු කථානායකතුමනි, වරාය සම්බන්ධ අනෙක් කොටස අහනවාද කියලා අහන්න.

ගරු කථානායකතුමා
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමා අහනවාද? [බාධා කිරීමක්] නැහැ. නැහැ. ඔබතුමා ඉල්ලුවොත් විතරයි. එහෙම නැතිව මට බලෙන් දෙන්න ඕනෑ නැහැ. ඔබතුමා ඉල්ලනවා නම් අගමැතිතුමාගේ එකඟත්වයක් තිබෙනවා නම් මට අවස්ථාව දෙන්න පුළුවන්.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්ඩුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
මම අහනවා.

ගරු කථානායකතුමා
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
වේලාව ගතවෙලා තිබෙන්නේ.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්ඩුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ඉල්ලනවාද කියා ඔබතුමා අහනවා; ඉල්ලන කොට තව එකක් කියනවා.

ගරු කථානායකතුමනි,-

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(මාණ්ඩුමිකු රණිල් වික්කිරමසිංහ)
(The Hon. Ranil Wickremesinghe)
ගරු කථානායකතුමනි, වරාය ගැන දැන් වාද කළා ඇති. තව වාදයක් වුවමනා නැහැ. එහි අනෙක් කොටස ගැන ඕනෑ නම් වාදයක් කරමු.

ගරු කථානායකතුමා
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
අද ඉතා වැදගත් පනත් කෙටුම්පතක් ගැන සාකච්ඡා කරන්නත් තිබෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(මාණ්ඩුමිකු විමල් වීරවන්ස)
(The Hon. Wimal Weerawansa)
ඔබතුමා නේ මට වෙලාව දෙන්නම් කියලා කිව්වේ. පස්සේ බය වුණා.

ගරු කථානායකතුමා
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු දුමින්ද දිසානායක මැතිතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

වරප්‍රසාද යෝජනා
சிறப்புரிமைப் பிரேரணைகள்
PRIVILEGE MOTIONS

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය කඩ කිරීම
பாராளுமன்ற உறுப்பினர்களுக்கான நடத்தைக் கோவையை மீறுதல்
BREACH OF CODE OF CONDUCT FOR MEMBERS OF PARLIAMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(මාණ්ඩුමිකු කයන්ත කරුණාතිලක්ක)
(The Hon. Gayantha Karunatileka)
Sir, I move,

"That the question of privilege arising out of the matter raised by the Hon. Ajith P. Perera, M.P. on 04th July, 2018 in Parliament to the effect that privileges of the Members of Parliament have been infringed, be referred to the Committee on Ethics and Privileges under Standing Order No. 118 of the Parliament."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු කථානායකතුමා
(මාණ්ඩුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ජාතික විගණන පනත් කෙටුම්පත දෙවැනිවර කියැවීම.

අද දින විවාද කිරීමට නියමිත, න්‍යාය පත්‍රයේ විෂය අංක 1 ලෙස සඳහන් ජාතික විගණන පනත් කෙටුම්පත 2018 අප්‍රේල් මස 3වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදුව, 2018 ජූලි මස 3වැනි දින රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී සලකා බලා, එකී කාරක සභාවේ වාර්තාව 2018 ජූලි මස 4වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර ඇති බව දැනුම් දීමට කැමැත්තෙමි.

ගරු අගමැතිතුමා.

ජාතික විගණන පනත් කෙටුම්පත
தேசிய கணக்காய்வு சட்டமூலம்
NATIONAL AUDIT BILL

දෙ වන වර කියවීමේ නියෝගය කියවන ලදී.
இரண்டாம் மதிப்பிற்கான கட்டளை வாசிக்கப்பட்டது.
Order for Second Reading read.

[11.28a.m.]

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(මාණ්ඩුමිකු රණිල් වික්කිරමසිංහ - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs}
Hon. Speaker, I move,

"That the Bill be now read a Second time"

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

Hon. Speaker, a lot of time has been taken, so I will be very brief because there are a large number of Members who want to express their views on this important piece of legislation. The House has been waiting for this piece of legislation for long and the Government and I have been criticized for the delay.

Firstly, I would like to remind this House that the National Audit Bill and the Right to Information Bill were things proposed by the Government in 2003 of which you and I were Members. Unfortunately, before these Bills could see the light of day, the Government changed. The succeeding governments promised to carry on, but no one ever produced this Bill again. So, while we are going to get criticized that we did not want to bring in this Bill and we have delayed it, I just want to remind everyone that everyone here had a chance of bringing in the Bill. But they did not do that. Then, we decided when we backed the present President Maithripala Sirisena that we will again produce the Right to Information Bill and the National Audit Bill before this House.

There were two Committees appointed. When the Right to Information Bill was produced before this House, it differed slightly from the older draft and therefore it went through the House without too much of discussion outside this House. But, when the National Audit Bill came, it was different from the original one and the whole power structure of the Constitution came into play. Because, you had the Executive power which was wielded by the President, the Prime Minister and the Ministers; then you had the Judicial power and we also had Parliament's Legislative power. It was under the power of Parliament that the Auditor-General operated. This is an important power of Parliament.

The Parliament's powers came around as a result of a conflict with the Executive or the King of England as to who had the right to control finance - the King or Parliament. It was a matter not resolved in the court, it was resolved by a war in which the Parliament won and the King was executed. That is how the Parliament's supremacy on financial matters has been established.

Firstly, it was a question that taxation could not take place without the consent of Parliament and secondly, that the annual spending of the government must be approved by Parliament. Firstly, it was a three-year budget. Then, it came down to a one-year budget. Then, Parliament also set up what was called a "Ways and Means Committee" to look at ways and means of raising money required to run the government. That was the first part.

Once that was established, then Parliament started looking at controlling the expenditure and they realized that to control expenditure the accounts had to be audited. Therefore, the audit also became a very important part of the Parliament and there came around the office of the Auditor-General. So, our office of the Auditor-General is fairly old. Some of the countries have a Controller General. Then, the importance of an audit and the independence to ensure efficient functioning of government and to ensure that proper data was available before Parliament became an important issue. At the 66th General Assembly of the United Nations it was decided that a supreme audit body should be strengthened for the promotion and efficiency, responsibility, effectiveness, transparency and accountability of public administration and it indicates that the legality of the audit body should be enshrined in the Constitution of a State or in any other law. So, this is what we accepted.

In 2003, we only envisaged legislation, but we brought in the Audit Service Commission by an Amendment to the Constitution. It was enshrined in the Nineteenth Amendment.

This law seeks to give the details for exercising the powers of the Commission so that it becomes an independent Commission operating under Parliament. We have some bodies which operate with the Judiciary. There are other bodies which operate with the Executive. But, this is a body that operates under the sovereignty of Parliament. So, this is the main purpose of the National Audit Bill.

Now, the issues we have had been about the imposition of surcharges. I thought I will underline it. Who has the power? Because, surcharges were imposed by the Secretary to the Ministry or the Chief Accounting Officer. Can it go to the Audit Service Commission? Can the Audit Service Commission exercise any power which is judicial in nature or is the Secretary's power executive in nature? So, we actually had a different number of committees. There is a subcommittee of Ministers, there is a committee of Secretaries and there is a committee of other government officials. Then, there were discussions with the Auditor-General, discussions here, and finally with the Public Service Commission. All of them came and they have made their representations to ensure that their powers are not infringed. Of course, there have been changes.

One of the big areas of concern was the power of audit. The second has been the duties of the Secretary as the Chief Accounting Officer and of the Accounting Officers. They are held responsible. How are the directions to be given? Actually, it was only when the Audit Service Commission Bill came in and these disputes were taking place I realized, having been in government, how detailed the working out of the Government expenditure and the audit was; that it cuts through all the three different branches of the government.

So, these were issues that had been sorted out. Even after we tabled the Bill in April, there were still amendments coming in from some of the public bodies. But all have been accommodated now. I hope this is a satisfactory Bill and when it becomes a law, we must give a chance for this law to be executed and thereafter, Parliament can, from time to time, exercise the oversight powers to ensure what amendments are required.

Auditing of the government itself is a big issue. Firstly, audit must be timely. It is useless us having Audit Reports of four years hence. This Parliament is, at the

moment, looking at Audit Reports of the last Parliament and Parliament before that. Current Audit Reports must be available.

Secondly, on the principles of auditing, some of the Auditor-Generals, some of the Audit Commissions have come under criticism in those countries about the auditing techniques used. But it is not only confined to the State sector, it happens even with the private auditors. Private Auditors are coming under audit firms in South Africa. Recently, the regulator in the UK has pulled up the four leading audit firms for not having audited properly and being responsible for the collapse of some of the largest companies in the United Kingdom. So, auditing itself is now coming under scrutiny and Parliament must now exercise its powers to ensure that proper auditing principles are taken.

Some issues would arise. For instance, some public servants would say, "No, we cannot take this decision because we will come under audit query." Now we have to sort this out. The Government must also function. Auditing must also take place. So, these are issues that are going to arise and this House will have to go into the matters.

Then, there is also other powers of Parliament. I think this will be completed when we pass the law on the Parliamentary Budget Office. Then, the Parliamentary Budget Office will be the final authority looking at the estimates given by the Executive and the reports given by the National Audit Commission. I think the specialist knowledge that is required will have to be carried in the Parliamentary Budget Office. National Audit Commission will have to be in the auditing side and where specialist knowledge is concerned, we will have to meet up or we have to find some system. So, I think the Parliamentary Budget Office will have to have specialization, separate from the specialization, a specialist available to the Government.

So, I do not want to take any more of your time on this, but would like to say that we can be happy that since 2015, after the election of Maithripala Sirisena as President, after the election of this Parliament, a total democratic structure has come into place and you can enjoy the freedoms today. You have all the Independent Commissions - the Judicial Service Commission, the Election Commission, the Public Service Commission, the National Police Commission and the Constitutional Council; independence of the Supreme Court and the other courts. Then, we will be having the Audit Service Commission and the Right to Information law as well.

These are all legislations brought in by this Government which has put a democratic structure in place. There will be shortcomings - the Police Commission and all have shortcomings. We can correct those. But the fact is we have put a structure in place where the Executive or the Administration can function and the Judiciary can function without coming under undue political pressure in the work that they have to do. So, we have to look at the National Audit Commission in the background of democracy and how democracy has been established.

Now, for the first time, the Prime Minister comes to Parliament and answers questions in Parliament. So, this Parliament is becoming more and more powerful. As we go along and take over the new offices and get the J. R. Jayewardene Centre legislation amended by the end of this year, we will have a Parliament which we can be proud of and would be on par or even have more functions available than the Lok Sabha in India.

Thank you.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලාගේ අවධානය මේ කාරණය කෙරෙහි යොමු කරන්න කැමැතියි. අද කාලය හුඟක් ඉක්ම ගොස් තිබෙන නිසා ගරු සභාවේ එකඟත්වයක් තිබෙනවා නම් අපට දිවා භෝජනය සඳහා කාලය ගන්නේ නැතුව විවාදය කරන්න පුළුවන්. ඒකට ඔබතුමන්ලාගේ එකඟත්වය ලැබෙනවාද? Does the House agree?

ගරු මන්ත්‍රීවරු
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඊළඟට, ගරු සුනිල් හඳුන්නෙත්ති මැතිතුමා.

[පූ.භා. 11.39]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු කථානායකතුමනි, මේ පාර්ලිමේන්තුවේ ඉතාම වැදගත්, ඓතිහාසික වශයෙන් වටිනා, ජාතික වැදගත්කමක් සහිත පනත් කෙටුම්පතක් හැටියට තමයි මේ ජාතික විගණන පනත් කෙටුම්පත අද දිනයේ දී සලකා බලන්නේ; සාකච්ඡා කරන්නේ. ඒ නිසාම ජාතික විගණන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ විවාද කරන මේ මොහොත දක්වා ආපු ගමන පිළිබඳවත්, අද දිනයේ දී අපි මේ ඉදිරිපත් කරන පනත් කෙටුම්පතේ ඇත්තටම ජාතික විගණන ක්‍රියාවලියක් සඳහා බලාපොරොත්තුවන අපේක්ෂාවන් සාක්ෂාත් කර ගන්න අන්තර්ගතය ශක්තිමත් කරලා තිබෙනවාද, එහෙම නැත්නම් ඒ අන්තර්ගතය අඩපණ කරලා, දුර්වල කරලා තිබෙනවාද කියන එක ගැනත් මුලින්ම අපි තේරුම් ගන්න ඕනෑය කියලා අපි විශ්වාස කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please! මේ අවස්ථාවේ දී ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනය සඳහා පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික විගණන පනත් කෙටුම්පත මේ මොහොත දක්වා ආපු ගමන පිළිබඳව බලන විට, අපේ රටේ විගණකාධිපති ගාමිණී විජේසිංහ මැතිතුමාත්, ඒ වාගේම හිටපු විගණකාධිපතිවරුනුත් ඒ වෙනුවෙන් දක්වපු විශාල දායකත්වයක් තිබෙනවා. විශේෂයෙන්ම 1983 දී විගණකාධිපතිවරයෙක් වෙලා හිටපු ගාමිණී යාපා මැතිතුමා තමයි මුලින්ම විගණන පනත් කෙටුම්පතක් සකස් කළේ. එතුමාගේ ඉඳලා 2002 විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ධාරිතා වර්ධන ව්‍යාපෘතියක් මඟින් විගණන පනතක් පිළිබඳව සාකච්ඡා කළා. මම මේ කාරණයත් කියන්න කැමැතියි. 2003දී පළමුවරට කැබිනට් මණ්ඩලයේ මෙවැනි පනත් කෙටුම්පතක් අනුමත කළා. 2003 ඉඳලා 2015 දින 100 වැඩසටහන දක්වා වරින් වර අමාත්‍ය මණ්ඩලයට ඒ කෙටුම්පත ඉදිරිපත් වුණත් අවසාන වශයෙන් සම්මත වුණේ නැහැ.

අවසානයේ දී, 2015 ජනවාරි 8වැනි දා පත් වුණු පාලනය විසින් තමයි ජාතික විගණන පනත් කෙටුම්පතක් සකස් කිරීම පිළිබඳ කාරණාව නැවත සාකච්ඡාවට ගත්තේ. හැබැයි, 2015 පෙබරවාරි 19වැනි දා විගණන පනත් කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය සම්මත කරන්නත්, 2015 මාර්තු 19වැනිදා විගණන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවේ සම්මත කරන්නත් තමයි දින නියම කරගෙන තිබුණේ.

2015 මාර්තු 19 ඉඳලා අවුරුදු තුනකුත් මාස තුනක් ගතවුණාට පසුව තමයි අද මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ. හැබැයි, අපි ඒ ගැන සතුටු වෙනවා. මම කලින් කිව්වා වාගේම ඒ විධියට හරි මෙම පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ගෙනෙන්න දායක වුණේ වර්තමාන විගණකාධිපති ගාමිණී විජේසිංහ මැතිතුමාත්, හිටපු විගණකාධිපතිවරුනුත්, විශේෂයෙන්ම මායාදුන්නේ මැතිතුමා වැනි අය සහ විගණන දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන්, සියලුම වෘත්තීය සමිති මේ වෙනුවෙන් අතිමහත් කැප කිරීමක් කරපු නිසා සහ අතිමහත් වෙහෙසක් දරපු නිසයි. වර්තමාන විගණකාධිපතිතුමාටත්, එම සියලුම නිලධාරීන්ටත් මම පළමුවෙන්ම ස්තුතිවන්ත වෙනවා. මොකද, ඔවුන් මෙම විගණන පනත් කෙටුම්පතේ අඩංගු ඇත්ත හරය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් අතිමහත් වෙහෙසක් දැරුවා; මහන්සියක් ගත්තා. දැන් මේ පාර්ලිමේන්තුව හමුවේ මෙම පනත් කෙටුම්පත තිබෙනවා. මෙම පනත් කෙටුම්පතට ඇත්ත ජීවයක් දීලා, ඇට, ලේ, මස්, නහර එකතු කරලා ජනතාව ඉදිරියට ගෙන යනවාද, එහෙම නැත්නම් මෙම පනත් කෙටුම්පතට විගණකාධිපතිතුමා, විගණකවරුන්, දෙපාර්තමේන්තුවේ නිලධාරීන් බලාපොරොත්තු වුණු ඇට, ලේ, මස්, නහර ගලවලා හිස් පඹයෙක් කරලා, "ජාතික විගණන පනත" කියලා නමක් දාලා සමාජගත කරනවාද කියන එක තමයි අපට දැන් තිබෙන ප්‍රශ්නය. මොකද, මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන්නේ නැතිව කල් අරිද්දී; මහ හරිද්දී; කැබිනට් මණ්ඩලය තුළ වරින් වර, වරින් වර එහාට මෙහාට වීසි කරද්දී, ඒ වාගේම පරිපාලන සේවා සංගම් නිලධාරීන්, අමාත්‍යාංශවල ලේකම්වරු මට්ටමින් මෙම පනත් කෙටුම්පත වීසි කරලා, අධි භාරය නිසා තමන්ට චෝදනා ඉදිරිපත් වෙයි, තමන්ට දඩ කන්න වෙයි, ඒ නිසා තමන්ට දඩ ගෙවන්න සිද්ධ වෙයි කියලා හැල්ලු කරද්දී, මේක යටපත් කරන්න හදපු වෑයමේදී තමයි එක් අවස්ථාවක ජනතා විමුක්ති පෙරමුණේ පාර්ලිමේන්තු කණ්ඩායම හැටියට අපි තීරණය කරන්නේ, පෞද්ගලික මන්ත්‍රී යෝජනා පනත් කෙටුම්පතක් හැටියට හෝ මෙම පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගේනවා කියලා. දැන් මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙනවා. මෙම පනත් කෙටුම්පත රජය විසින් ඉදිරිපත් කරලා තිබෙනවා. හැබැයි, රජය විසින් ඉදිරිපත් කර තිබෙන මෙම පනත් කෙටුම්පත ඇත්තටම ඇට, ලේ, මස්, නහර සහිතව, රුධිරය සහිතව, හෘදය වස්තුවක් සහිතව, ජීවයක් සහිතව ගලන ක්‍රියාවලියක් සහිත, ජාතික විගණනය ශක්තිමත් කරන්න පුළුවන් පනත් කෙටුම්පතක් හැටියටද තිබෙන්නේ, එහෙම නැත්නම් හිස් පඹයෙකුට "ජාතික විගණන පනත" කියලා නමක් දාලාද තිබෙන්නේ කියන එක ගැන මේ ගරු පාර්ලිමේන්තුවේ සියලු දෙනා විතරක් නොවෙයි, රටේ ජනතාවත් අවධානයට ගන්න ඕනෑ.

අපට මතකයි ජාතික ඖෂධ ප්‍රතිපත්තිය හැටියට "සේනක බිබිලේ ඖෂධ ප්‍රතිපත්තිය" නම් කළාට, ඒකේ පිටකවරයේ තමයි සේනක බිබිලේ මහත්මයා සිටියේ. ඒක ඇතුළේ සේනක බිබිලේ මහත්මයාට ඒ ක්‍රියාවලිය කරගෙන යන්න ඉඩක් තිබුණේ නැහැ. ඒක අවුරුදු ගණනක් තිස්සේ ඇදිලා, ඇදිලා, වාද විවාද කරලා, අද වන විටත් සේනක බිබිලේ ප්‍රතිපත්තිය, ජාතික ඖෂධ ප්‍රතිපත්තිය හැටියට හරි මට්ටමින් ක්‍රියාත්මක වෙනවාද කියලා සැක සහිතයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඒ වාගේම අද දිනයේදී මෙම පනත් කෙටුම්පතට සාධාරණය ඉෂ්ට කරන්න පුළුවන්, යුක්ති සහගත කරන්න පුළුවන්, පණ දෙන්න පුළුවන් යෝජනා 16ක් සංශෝධන හැටියට අපි ඉදිරිපත් කරනවා. එම සංශෝධන පිළිගන්න කියලා මම ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා. අපි එම සංශෝධන ඉදිරිපත් කරන්නේ ඉතා පැහැදිලිව මේ පනත් කෙටුම්පත ඉතාමත්ම ජීවය සහිත පනතක් හැටියට පාර්ලිමේන්තුව තුළ සම්මත කර ගැනීමේ අවශ්‍යතාව වෙනුවෙන්මයි. මෙම පනත් කෙටුම්පත සංශෝධනය වෙලා, ජාතික විගණන ක්‍රියාවලියෙන් මෙහාට ඇවිල්ලා, අද වන විට මෙම පනත් කෙටුම්පත ඇවිල්ලා තිබෙන්නේ කොතැනටද කියලා මම මගේ කථාවේදී කියන්නම්. ඒ වෙනුවෙන් මම කරුණු දක්වන්නම්. හැබැයි, මම මේ දේ අවධාරණය කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ තිබෙන ආකාරයට නම් මෙම පනත් කෙටුම්පත සම්මත වෙන්නේ, හොරුන්, වංචාකාරයින්, රාජ්‍ය මූල්‍ය දූෂිතයින්, අපරාධකාරයින්, මහ බැංකු බැඳුම්කර වංචාකාරයෝ වාගේ අය මෙම පනත් කෙටුම්පතට භය වෙන්න ඕනෑ නැහැ. මොකද, ඒ අයට මොකුත් වෙන්නේ නැහැ. රාජ්‍ය අංශයේ - රාජ්‍ය ආයතන, මණ්ඩල, දෙපාර්තමේන්තු, අධිකාරිවල - කවුරු හෝ මං කොල්ල කන්න බලාගෙන සිටින නිලධාරීන් ඉන්නවා නම්, මේ තිබෙන විධියට නම් මෙම පනත් කෙටුම්පත අද සම්මත වෙන්නේ, ඒ අය තමන්ට දඩ වදිනවා කියලා හිතාගෙන ඉන්නවා නම් භය වෙන්න එපා, ඒ අයට මොකුත් වෙන්නේ නැහැ. වෙන එකක් තියා, දැන් ඉදිරිපත් කර තිබෙන පනත් කෙටුම්පතේ තිබෙනවා, දණ්ඩනයක් සඳහා ගෙවිය යුතු උපරිම දඩය රුපියල් ලක්ෂයක් කරන්න කියලා. ඔබතුමන්ලා ඒ සඳහා අද සංශෝධනයක් ඉදිරිපත් කරනවා. එම සංශෝධනයේ තිබෙනවා, එම රුපියල් ලක්ෂයේ දඩය රුපියල් 5,000ට අඩු කරන්න කියලා. ඒ කියන්නේ, මෙම පනත් කෙටුම්පත ක්‍රියාත්මක වුණොත් අනිවාර්යයෙන්ම සිද්ධ වෙන්නේ, උපරිම දඩය - surcharge-, අධිභාර පනවන දඩය විධියට වදින්නේ රුපියල් 5,000යි.

කෝටි ගණනක් මං කොල්ල කෑවත්; මහ බැංකුව මං කොල්ල කෑවත්; මහ බැංකුව මං කොල්ල කන්න උදව් කළ නිලධාරීන්ටත්; අමාත්‍යාංශ ලේකම්වරයකුටත්; විදුලිබල මණ්ඩලය මං කොල්ල කෑවත්; ඒක විකුණන්න උදව් කළත් -ඒ ඕනෑම දෙයකට- ජාතික විගණන පනත අනුව නම් උපරිම දඩය රුපියල් 5,000යි; රාජ්‍ය මූල්‍ය අවභාවිතාවක් සම්බන්ධයෙන් දඩය රුපියල් 5,000යි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවම දඩය රුපියල් 5,000 කරන්න ඕනෑය කියා අපි සංශෝධනයක් ගෙනෙනවා. රුපියල් 5,000න් තමයි එය පටන් ගන්න ඕනෑ. "රුපියල් ලක්ෂයක්" කියා

පනත් කෙටුම්පතේත් සඳහන් වෙලා තිබෙනවා, හැබැයි, පසුගිය දවසක මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට පළමුවන වර ඉදිරිපත් කළාට පසුව, ඒ ගැන ආංශික අධීක්ෂණ කාරක සභාවේත්, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේත් සාකච්ඡා කළාට පසුව, කැබිනට් මණ්ඩලය නැවත රැස්වෙලා, ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කරන ඇමතිතුමා වන රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ අත්සනින් යුතුව කැබිනට් පත්‍රිකාවක් නිකුත් කළා. එම කැබිනට් පත්‍රිකාව මා ළඟ දැන් තිබෙනවා. මම එය **සභාගත*** කරනවා.

රුපියල් ලක්ෂය, රුපියල් 5,000ට අඩු කරන්න කියා එම කැබිනට් පත්‍රිකාවෙන් යෝජනා කරනවා. දැන් අපිට නිතාගන්න පුළුවන්, මේ පනතට කර තිබෙන්නේ මොකක්ද කියා.

ඊළඟට, විගණකාධිපතිතුමාගේ බලතල දිහා බලන්න. අපේ රටේ විගණකාධිපති දෙපාර්තමේන්තුවක් තිබෙනවා; එහි විගණකාධිපතිවරයෙක් ඉන්නවා; විගණකාධිපතිතුමාගේ මණ්ඩලයක් තිබෙනවා. මේ පනත ගේන්නේ විගණකාධිපතිගේ බලතල අඩු කරන්න නොවෙයි; කප්පාදු කරන්න නොවෙයි. මේ පනතේ අරමුණ වුණේ, එතුමාගේ බලතල වැඩි කිරීම, ශක්තිමත් කිරීම සහ එතුමාට වැඩිපුර වගකීම පවරා දීමයි. හැබැයි දැන් කර තිබෙන්නේ මොකද්ද? ජාතික විගණන පනත් කෙටුම්පතේ I වන කොටසේම ඇතුළත් වන, "විගණකාධිපතිවරයා විසින් සිදු කරන විගණනවල විෂය පථය" කියන මාතෘකාව යටතේ, "ඒකාබද්ධ අරමුදලෙන් වන සියලු වියදම් විගණනය කරනු ලැබිය යුතු ය;" කියන තැනට එය සීමා කර තිබෙනවා. වියදම් විතරක් නොවෙයි, ආදායමත් ඇතුළත් කරන්න ඕනෑය කියා පසුව අපි ආංශික අධීක්ෂණ කාරක සභාවේදී කිව්වා. මම පෞද්ගලිකව සතුටු වෙනවා, ඒ සංශෝධනය ගෙනෙන්න පුළුවන් වීම ගැන. ඒ කාරණයත් එකතු කරනවාය කියා ඔබතුමන්ලා දැන් සංශෝධන ඉදිරිපත් කරන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා. එතකොට, "ඒකාබද්ධ අරමුදලෙන් කරන වියදම් විතරක් විගණනය කිරීමද විගණකාධිපතිතුමාගේ විෂය පථය?" කියා අහන්න ඇස් පෙනෙන, කන් ඇසෙන කවුරු හෝ හිටියේ නැද්ද? ඒකාබද්ධ අරමුදලෙන් කරන වියදම් විතරද, එතුමාගේ විෂය පථය වන්නේ? ඒකාබද්ධ අරමුදලට එන ආදායම එතුමාගේ විෂය පථය නොවෙයිද? "ඒකාබද්ධ අරමුදලට පිටින් ආදායම් එක එක ආයතනවලට අරගෙන තිබෙනවා; රට ණය කරලා තිබෙන්නේ භාණ්ඩාගාරයෙන් විතරක් නොවෙයි, භාණ්ඩාගාරයට සෘජුව නොවන වක්‍රව එන ව්‍යාපෘතිවලින් එක එක ආයතන වෙන වෙනම ගිණුම් හදලා විවිධ රටවලින් ණය අරගෙන තිබෙනවා, ඒවාත් විගණනය වෙලා නැහැ" කියා විගණකාධිපති ගාමිණී විජේසිංහ මහත්මයා පසුගිය දවස්වල වාර්තා ඉදිරිපත් කළා. ඒවාත් එකතු වෙන්න ඕනෑය කියා එතුමා සඳහන් කළා. මහ නැහුම, ගම නැහුම, අර නැහුම, මේ නැහුම කියා ඕනෑ තරම් ව්‍යාපෘති තිබෙනවා. ඒවාට පිටින් ණය ගත්තා. ඒවා විගණනය වෙන්න ඕනෑය කියනවා. [බාධා කිරීමක්] හැබැයි, ඒක පිළිගත්ත ඔබතුමන්ලා දැන් මේ පනත් කෙටුම්පතට ඇතුළත් කරනවා, "ඒකාබද්ධ අරමුදලෙන් වන සියලු වියදම් විගණනය කරනු ලැබිය යුතුය" කියා. හැබැයි අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154වන ව්‍යවස්ථාවේ සඳහන් වන, "විගණකාධිපතිවරයාගේ කාර්ය හා කර්තව්‍ය" යටතේම එතුමාට රාජ්‍ය මූල්‍ය පාලන බලය තිබෙනවා. විගණකාධිපතිවරයාට රාජ්‍ය මූල්‍ය පාලන බලය තිබෙනවා නම්, ඒ වාක්‍යය මේ විෂය පථයට ඇතුළත් කරන්න බැරි ඇයි? ඒ නිසා මෙතැනදී ඉතා පැහැදිලිව අපට තේරෙනවා, විගණකාධිපතිතුමාගේ බලතල, එතුමාගේ විෂය පථය කොයිතරම් දුරට කප්පාදු වෙලා තිබෙනවාද කියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම උදාහරණයක් කියන්නම්. 2015 දෙසැම්බර් 24වැනි දා කෙන්යාවේ මේ වාගේම විගණන පනතක් සම්මත කළා. කෙන්යාව ගැසට් නිවේදනයකින් ඒ විගණන පනත ඉදිරිපත් කළා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහි විගණකාධිපතිවරයාගේ බලතල සඳහන් වන 64. (1) උපවගන්තියේ මෙසේ සඳහන් වී තිබෙනවා:

"Where the Auditor-General establishes that any person, supplier or company has been involved in fraud or corrupt practice, the Auditor -General shall report to the police."

යම් පුද්ගලයකු හෝ ආයතනයක් කුමන හෝ වංචාවකට හෝ දූෂණයකට සම්බන්ධයි කියා විගණකාධිපතිවරයා හඳුනා ගන්නවා නම්, ඒ පනත අනුව ඒ ගැන සෘජුව පොලීසියට පැමිණිලි කරන්න එතුමාට පුළුවන්. වටේ යන්නේ නැතුව පැමිණිලි කරන්න එතුමාට පුළුවන්. එහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

"Ethics and Anti-Corruption Commission or the Public Procurement Oversight Authority for their action."

විගණකාධිපතිවරයාට පොලීසියට වාර්තා කරන්න පුළුවන්; දූෂණ විරෝධී කොමිසාරිස්වරයාට වාර්තා කරන්න පුළුවන්; Public Procurement Oversight Authority එකට වාර්තා කරන්න පුළුවන්. මෙන්න, එතුමාගේ බලතල. කෙන්යාව කියන්නේ, දේශපාලනමය වශයෙන්, සංස්කෘතිකමය වශයෙන්, මූල්‍ය පාලනය පැත්තෙන් අපට වඩා ශක්තිමත් රටක්ය කියා මම නම් හිතන්නේ නැහැ. අප්‍රිකානු රාජ්‍ය පද්ධතියේ තිබෙන කෙන්යාව අපට වඩා ශක්තිමත් රටක් නොවෙයි. නමුත් ඔවුන් ඔවුන්ගේ බලතල විගණකාධිපතිවරයාට දීලා තිබෙන්නේ ඒ විධියටයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අවස්ථාවේදී එම විගණන පනත මම **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ බලතල සම්බන්ධ ප්‍රශ්නය මොකක්ද? යම්කිසි විගණනයක් සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමක් සඳහා විගණකාධිපතිවරයා යම්කිසි පුද්ගලයකු කැඳවනු ලබන අවස්ථාවක ඒ පුද්ගලයාට එන්න බැරි නම්, ඒ සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය ගැන මෙම පනත් කෙටුම්පතේ 7. (4)උප වගන්තියේ සඳහන් වී තිබෙනවා.

".....එකී තැනැත්තාට නොවැළැක්විය හැකි තත්ත්වයක් හේතුවෙන් පෞද්ගලිකව පෙනී සිටීමට නොහැකි අවස්ථාවක දී, ඔහු විසින් ඒ වෙනුවෙන් විගණකාධිපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු ඉදිරියේ පෙනී සිටීම සඳහා එම විෂයය පිළිබඳ මනා දැනුමක් ඇති වෙනත් තැනැත්තකු නම් කරනු ලැබිය හැකි ය." කියා එම උපවගන්තියේ සඳහන් වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම මේ උදාහරණයක් කියන්නේ. විගණකාධිපතිතුමා කියනවා, අර්ජුන මහේන්ද්‍රන්ට එන්න කියා. එහෙම නැත්නම් විගණනයට අදාළ කරන පුද්ගලයකුට එන්න කියනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ඒ කාරණය පැහැදිලි කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි. මේ ජාතික විගණන පනත කියන්නේ, කිසි බලතලයක් නැති, මහා පරිමාණ

** ලියවිල්ල ඉදිරිපත් නොකරන ලදී.*
ஆவணம் சமர்ப்பிக்கப்படவில்லை.
Document not tendered.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා]

හොරු අල්ලන්න නොහැකි, කිසිම ප්‍රතිඵලයක් නැති එකක් කියා තමයි ඔබතුමා කරුණු ඉදිරිපත් කරන විධියට තේරුම් යන්නේ. ගරු මන්ත්‍රීතුමනි, විගණන කාර්යයේදී යම් දෝෂයක්, වරදක්, දූෂණයක් සිද්ධ වෙලා තිබෙනවා නම්, ඒ පිළිබඳව ගත යුතු විනය ක්‍රියාමාර්ග සහ නීතිමය ක්‍රියාමාර්ග තමයි මේ ජාතික විගණන පනත මඟින් ඉදිරිපත් කර තිබෙන්නේ. මේ පනත් කෙටුම්පත සම්මත වුණාම දණ්ඩ නීති සංග්‍රහය අහෝසි වෙන්නේ නැහැ, ඒ වාගේම අනිකුත් අපරාධ නීති එකක්වත් අහෝසි වෙන්නෙත් නැහැ. ඔබතුමා උදාහරණයක් විධියට මහ බැංකු බැඳුම්කරය ගැන සඳහන් කළා. ඒකේ වංචාවක් වෙලා තිබෙනවා නම්, මේ නීතිය අනුගමනය කරලා ඒක සුළු කාරණයක් හැටියට ලඝු කරලා මෙතැනින් අවසන් කරනවා කියා කථාවක් නැහැ. රටේ අපරාධ නීති ඒ විධියටම තිබෙනවා. ඔබතුමා මේ පනත ඒ තරම් ලඝු කරන්න එපා. මේක රටේ පවතින සියලුම නීතිවලට අමතරව එන නීතියක් මිස, අනික් නීති යටපත් කරගෙන, ඒවා හැල්ලු කරගෙන එන නීතියක් නොවෙයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ඒක හරි, ගරු ඇමතිතුමනි. ඇත්තටම මම කියන්නේ, මේ තිබෙන යථාර්ථය යටතේ; තිබෙන තත්ත්වයට අදාළව; "උන්නු හැටියට මළා මදැයි" කියනවා වාගේ, මේක හොඳයි කියන එකයි. ඒක මම පිළිගන්නවා, ඒ වාගේම මම ඔබතුමා කියන කාරණයත් පිළිගන්නවා. අනිකුත් නීති රීතිත් තිබෙනවා. ඒකත් ඇත්තයි. හැබැයි, ඒ යටතේදී අපට මේ වෙනුවෙන් තව අර්ථ නිරූපණයක් දෙන්න පුළුවන් නම්; තව එකතු කරන්න පුළුවන් නම්; මේ පනත තව ශක්තිමත් කරන්න පුළුවන් නම් හොඳයි. අන්න ඒ පැත්තෙන් අදහස් දැක්වීමක් පමණයි මම මේ කරන්නේ. යථාර්ථයක් හැටියට මේක මේ මට්ටමින් හෝ; නමක් හැටියට හෝ; "පතෝල" මට්ටමෙන් හෝ - ඇති වුණු තත්ත්වය යටතේ, ඇති වුණු බලපෑම් යටතේ - සම්මත කිරීමට කටයුතු කිරීම අප අගය කරනවා. මෙම පනත් කෙටුම්පත සම්මත වෙන්න ඕනෑ. හැබැයි, මේ පනතේ දුර්වල වුණු තැන් ගැන කියන්න ඒ යටතේ අපට අයිතිය දෙන්න. ඒක තමයි මම මේ කරන්නේ. ඔබතුමා කියන දේ ඇත්තයි. රටේ අනිකුත් නීති රීති ටික සියල්ලම නවත්වලා මේ නීතිය පමණක් රටේ මූලික නීතිය වෙන්නේ නැහැ. ඒක මම පිළිගන්නවා. ඒ වාගේම තමයි, මේක මේ විධියට හදද්දි, තිබුණු තැන ඉඳන් ගොඩාක් පසුපසට ගිහින් තිබෙනවා. ඒ ගැන මම දැන් කියන්නම්.

තමන් වෙනුවෙන් වෙනත් පුද්ගලයකුට විගණකාධිපතිවරයා ඉදිරියේ පෞද්ගලිකව පෙනී සිටීමට පුළුවන්ය කියන කාරණය අපි උදාහරණයකට ගනිමු. "නොවැළැක්විය හැකි හේතුවක් මත" කියා ඒ විධියට පුද්ගලයෙක් එනවා නම්, අඩු තරමින් ඒ නම් කරන තැනැත්තා විගණකාධිපතිවරයාගේ අනුමැතිය මත එන්න ඕනෑය කියා අපි සංශෝධනයක් ගේනවා. ඒක හොඳ නැද්ද? මේ පනත අනුව චූදිතයා වෙනුවට ඕනෑම කෙනෙකු ඉදිරිපත් කරනවා වෙනුවට විගණකාධිපතිවරයාගේ අනුමැතිය මත පුද්ගලයකු ඉදිරිපත් කිරීම හොඳ නැද්ද? මම අහවල් පුද්ගලයා කැඳවනවා නම්; අර්ජුන මහේන්ද්‍රන් කැඳවනවා නම්, අර්ජුන මහේන්ද්‍රන් වෙනුවට එන පුද්ගලයාගෙන් අර්ජුන මහේන්ද්‍රන්ගෙන් දැන ගන්න තිබෙන කාරණා ටික දැන ගන්න පුළුවන් කියා විගණකාධිපතිවරයා සෑහීමකට පත් වෙන්න ඕනෑ. එහෙම නැතිව, විගණකාධිපතිවරයා ඉස්සරහට ඕනෑම කෙනෙකුට එන්න බැහැ නේ. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, විගණකාධිපතිවරයා යම් තැනැත්තෙක් කැඳවනවා නම්, ඒ පුද්ගලයා වෙනුවට ඕනෑම කෙනෙකු ආවාට හරියන්නේ නැහැ නේ. ඒ වෙනුවට විගණකාධිපතිවරයා සෑහීමකට පත්වන පුද්ගලයකු; විගණකාධිපතිවරයා පිළිගන්නා පුද්ගලයකු; "ඒ" වෙනුවට "බී" කියන තැනැත්තා හොඳයි කියා විගණකාධිපතිවරයාට සෑහීමකට පත් වෙන්න පුළුවන් නම් එවැනි පුද්ගලයකු එවන්න කියා තමයි අපි කියන්නේ. ඒකෙන් මේ පනත ශක්තිමත් වෙනවා.

අද ඉදිරිපත් කරන මේ යෝජනා, සංශෝධන ඉතාම සාධනීය ලෙස තේරුම් ගන්න කියාත් මම ඉල්ලා සිටිනවා. අපි විගණන පනතක් හැදුවා. හැබැයි මේ පනත් කෙටුම්පත සම්මත කරන්නේ මේ විධියට නම්, ඔබතුමන්ලා බලාපොරොත්තු වන දේවත් මේ පනත තුළින් කරන්න බැහැ. මේ පනතේ අවුල් වියවුල් තිබෙනවා. මේ පනත් කෙටුම්පත වරින් වර කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් වෙලා ඇවිත් තිබෙන්නේ. මෙහි සඳහන් යම් යම් කාරණා සංශෝධනය කරද්දී, රාජ්‍ය සේවා කොමිෂන් සභාව ගැන නීතිපතිතුමා දීලා තිබෙන නිර්දේශය මොකක්ද කියා මම කියන්නම්. "රාජ්‍ය සේවා කොමිෂන් සභාව නිරීක්ෂණයක්; නිගමනයක් කැබිනට් මණ්ඩලයට එවා තිබෙනවා, ඒ නිරීක්ෂණය එවා තිබෙන්නේ මේ පනත් කෙටුම්පත ගැන නොවෙයි, මෙයට පිටින්, වෙනත් පනත් කෙටුම්පතක් ගැනයි" කියා එක වෙලාවකදී නීතිපතිවරයා කියා තිබෙනවා. එවැනි තත්ත්වයක් තුළ තමයි මේ පනත් කෙටුම්පත සම්පාදනය වෙලා තිබෙන්නේ. එම නිසා, මේ පනත් කෙටුම්පත මේ විධියට සම්මත කර ගත්තොත් ඔබතුමන්ලා බලාපොරොත්තු වන දේවත් මේ පනත තුළින් ඉෂ්ට කර ගන්න ලැබෙන්නේ නැහැ. ඒකයි අපි කියන්නේ. මේ පනත් කෙටුම්පත සම්මත කරන්න. හැබැයි මේ සාධනීය යෝජනා ගැන හිතන්න. විගණකාධිපතිවරයා කවුරුන් හෝ කෙනෙකු කැඳෙව්වොත්, නොවැළැක්විය හැකි හේතුවක් මත ඔහු වෙනුවට වෙනත් කෙනෙකු එවනවා. හැබැයි, ඒ එවන එක්කෙනා මෙලෝ දෙයක් දන්නේ නැති කෙනෙක්, ඒ ගැන තේරුමක් නැති කෙනෙක් වෙන්න පුළුවන්.

එහෙම නැත්නම් විගණකාධිපතිතුමාගේ පරීක්ෂණය අඩාළ කරන්න, දුර්වල කරන්න ඉදිරිපත් කරන කෙනෙක් වෙන්න පුළුවන්. එහෙම වෙන්න බැරි ද? එහෙම කරන්න පුළුවන්. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට එන්න ඕනෑ කෙනා වෙනුවට වෙන කෙනෙක් එව්වොත් මොකද වෙන්නේ? ඔහු ඇවිල්ලා කියනවා, "මම දන්නේ නැහැ. මට එන්න කිව්වා. මම ආවා." කියලා. එහෙම වෙනකොට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව පවත්වාගෙන යන්න බැහැ නේ. විගණන පරීක්ෂණයක් සඳහා කොමිෂන් සභාවට විගණකාධිපතිවරයා කවුරු හෝ කෙනෙක් කැඳෙවුවොත්, එතුමා වෙනුවට ඉදිරිපත් වෙන කෙනා පිළිබඳව අඩු තරමේ විගණකාධිපතිවරයා සෑහීමකට පත් වෙන්න ඕනෑ, "ආදේශකයා පිළිගත හැකි කෙනෙක්." කියලා. අපේ තර්කය එච්චරයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතට අදාළව අපි දන්නවා, විගණකාධිපතිවරයා පාර්ලිමේන්තුවටයි වාර්තා කරන්නේ කියලා. ඒක හරි. පාර්ලිමේන්තුවට වාර්තා කළාට පස්සේ පාර්ලිමේන්තුවෙන් තමයි ඒක publish කරන්නේ. ඒවාත් ඇත්ත. දැන් අගමැතිතුමා අපේ රටේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ගැන කිව්වා. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5.(1) උප වගන්තියෙනුත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 14අ. (2) ව්‍යවස්ථාවෙනුත් තොරතුරු සීමා කිරීම කරලා තිබෙනවා. ගරු ඇමතිතුමනි, ඔබතුමා කියපු වෙනත් නීති-රීති සීමා කරලා තිබෙනවා. හැබැයි, ඒ අතරේ ජාතික විගණන පනත් කෙටුම්පතේ 9. (ආ) උප වගන්තියත්, තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ -RTI Act එකේ- 36 වැනි වගන්තියත් උල්ලංඝනය වෙනවා, ඒකේ කාරණා අඩාළ කෙරෙනවා.

ජාතික විගණන පනත් කෙටුම්පතේ 13 වැනි වගන්තිය මම ගරු ඇමතිතුමාට පෙන්වන්නම්. 13 වැනි වගන්තියේ මෙන්න මෙහෙම කාරණයක් සඳහන් වෙනවා:

"...තව ද යම් වාර්තාවක්, තොරතුරක්, ලේඛනයක්, පොතක්, ගොනුවක් හෝ පරිගණක ආශ්‍රයෙන් ලබාගත් පිටපතක් ඔහු විසින් නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙත ලබා දෙනු ලැබ ඇත්නම් හෝ එසේ ලබා දීමට අදහස් කරනු ලබන්නේ නම් එම වාර්තාව ප්‍රකාශයට පත් නොකළ යුතු ය."

මම හිතන්නේ නැහැ, මේක ගාමිණී විජේසිංහ විගණකාධිපතිතුමාගේ අදහසක් කියලා. ඒ කියන්නේ, යම් තොරතුරක් හෝ වාර්තා කරන දෙයක් විගණකාධිපතිවරයා හිතාගෙන ඉන්නවා නම් අධිකරණයට ගෙනියන්න හෝ නීති කටයුත්තකට යොමු කරන්න, "ඒක ප්‍රකාශයට පත් නොකළ යුතුයි." කියලයි මේ කියන්නේ. එතකොට හොරෙක් ආරක්ෂා කරන්න හිතාගෙනම යම් විගණකාධිපතිවරයෙක් ඇවිත් කියනවා, "මේක දෙන්න බැහැ. දෙන්න බැරි, මම හිතාගෙන ඉන්නවා ලබන අවුරුද්දේ නඩු දමන්න." කියලා. නැත්නම්, ආණ්ඩුවේ කවුරු හෝ කෙනෙක් කියනවා, "මේ සම්බන්ධයෙන් අපි අධිකරණ ක්‍රියා මාර්ග ගන්න බලාපොරොත්තු වෙනවා. බලාපොරොත්තු වෙන නිසා මේක ඉදිරිපත් කරන්න එපා." කියලා. බලන්නකෝ, විශේෂ වාර්තා පිළිබඳව තිබෙන්නේ එහෙම කාරණයි. කලින් කාරණා අපට තේරෙනවා. විගණනය පිළිබඳව විගණකාධිපතිවරයා පාර්ලිමේන්තුවට වාර්තා කරන්න ඕනෑ. ඒ වාර්තා විගණන කාර්යාලයේ වෙබ් අඩවියේ දමන්න ඕනෑ. පාර්ලිමේන්තුවට වාර්තා කළාට පස්සේ මහජනතාවට ඒක ගන්න පුළුවන්. නීතිය හමුවට තොරතුරක් දෙන්න අදහස් කරන්නේ නම්, -නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන වෙත ලබා දෙනු ඇත්නම් නොවෙයි.- නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනවලට ලබා දෙන්න හිතාගෙන ඉන්නවා නම්, CID එකට දෙන්න හිතාගෙන ඉන්නවා නම්, -හිතාගෙන ඉන්නවා කියන එක අනන්ත කාලයක්. ඒක අනන්ත දෙයක් වෙන්න පුළුවන්.- එතකොට යම් කෙනෙකුට අභිලාෂයෙන්ම,- [බාධා කිරීමක්] අනේ! ගරු ඇමතිතුමනි, මේ මගේ වෙලාව නේ. ඔබතුමා ඔබතුමාගේ වෙලාවේදී පැහැදිලි කරන්න. එතකොට යම් කෙනෙකුට අභිලාෂයෙන්ම ඕනෑ නම් තොරතුරු වසන් කිරීමක් සිද්ධ කරන්න පුළුවන්. ඒක බරපතළ කාරණාවක් හැටියටයි මම දකින්නේ. ඒ නිසා මම කියනවා, ඒ ගැන සැලකිලිමත් වෙන්න කියලා. විගණන වාර්තාවේ ක්‍රියාවලිය මම ඔබතුමාට කියන්නම්. විගණකාධිපතිවරයාගේ දෙපාර්තමේන්තුව ආයතනයක විගණන පරීක්ෂණයක් කරනවා. පරීක්ෂණයක් කරලා ඉවර වෙලා ඒක බාර දුන්නාට පස්සේ විගණන කොමිසම විසින් තීරණය කරනවා, "මේ පරීක්ෂණයට අදාළව දණ්ඩනයක් පනවන්න තිබෙනවා, අධිභාරයක් පනවන්න තිබෙනවා; මූල්‍ය වංචාවක් සිද්ධ කරලා තිබෙනවා, මේක අපි අය කරගන්න ඕනෑ." කියලා. එහෙම අය කරගැනීමේ ක්‍රියාවලිය තමයි ඊට පස්සේ මේකේදී මූලික වශයෙන් සිද්ධ වෙන්නේ. එතකොට අය කරගැනීමේ ක්‍රියාවලිය දැන් බාරදීලා තිබෙන්නේ කාට ද? එම ක්‍රියාවලිය බාරදීලා තිබෙන්නේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා හැටියට අමාත්‍යාංශ ලේකම්වරුන්ටයි. විගණන කොමිසමේ තීරණයක් අනුව අධිභාර පැනවීමක් හෝ අයකර ගැනීමක් බාර දෙන්නේ අමාත්‍යාංශ ලේකම්වරුන්ටයි. අමාත්‍යාංශ ලේකම්වරුන්ට භාර දුන්නාට පස්සේ අධිභාර පැනවීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන පුද්ගලයා අමාත්‍යාංශ ලේකම්වරයා වෙනවා.

ගරු ඇමතිතුමනි, ජාතික විගණන පනත් කෙටුම්පතේ 19. (2) උප වගන්තිය කෙරෙහි මම ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. එහි මෙහෙම සඳහන් වනවා:

"විනය බලධාරියා විසින් ගනු ලබන විධිමත් විනය ක්‍රියාමාර්ගයකින් හෝ අධිකරණ ක්‍රියාවලියකින් අනතුරුව, විගණනය කරනු ලබන ආස්ථානයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින්, යම් ඌනතාවයට හෝ පාඩුවට වගකිව යුතු යම් තැනැත්තකුගෙන් එක්ව හෝ වෙන් වෙන් ව, (1) වන උපවගන්තිය යටතේ වූ අධිභාරයක් අය කර ගනු ලැබිය යුතු ය."

මේකට විනය ක්‍රියා මාර්ගයක් පටලැවෙනවා. එතකොට ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාට ඕනෑ නම් පුළුවන් විගණන කොමිසමෙන් අධිභාරයක් පැනෙවුවාට පස්සේ ඒ අධිභාරය ගැන විනය කමිටුවක් පත් කරන්න, ඒකට විනය බලධාරියෙක් පත් කරන්න. ඊට පස්සේ විනය බලධාරියාගේ report එක අනුව විනය බලධාරියා එක්කෝ කියනවා, "මේ අධිභාරය සුදුසු නැහැ." කියලා. එතැනින්ම කථාව ඉවරයි. මොකද, අධි භාරය නැවත ආපස්සට හැරවීමක් පිළිබඳ බලය තිබෙන්නේ විගණන කොමිසමට නොවෙයි, ගණන් දීමේ නිලධාරියා වන ලේකම්තුමාටයි. එතකොට ලේකම්තුමා තමයි තීරණය කරන්නේ විනය ක්‍රියාමාර්ගයට අනුව අධි භාරය ආපස්සට යවනවාද, නැද්ද කියලා. එතකොට ප්‍රශ්නය එන්නේ කොහොමද? ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, ඔබතුමා කිව්වා වාගේ ඕනෑම ආයතනයක විනය ක්‍රියාමාර්ග තිබෙනවා, අධිකරණ ක්‍රියාමාර්ග තිබෙනවා. කිසිම රජයේ ආයතනයක අධිකරණයට ඉදිරිපත් වුණු කාරණයකට අධිකරණ ක්‍රියා මාර්ගයක් තිබෙනවා කියලා ආයතනය විනය ක්‍රියාමාර්ග ගැනීම අත් හරින්නේ නැහැනේ. ආයතනය විනය ක්‍රියාමාර්ග ගන්නවා. අධිකරණයේ තීරණයත් එනවා. අධිකරණ තීරණය නිසා විනය ක්‍රියාමාර්ගය නතර වෙන්නේ නැහැ. හැබැයි, මේකෙන් මොකද කරන්නේ? අධි භාර පැනවීමේ ක්‍රියාවලිය ඕනෑ නම් අදාළ පුද්ගලයා pension යනතුරු කල් දමන්න පුළුවන්. මොකද, මේකේ කොතැනකවත් කියලා නැහැ, විනය ක්‍රියාමාර්ගය ඉවර කරන්න ඕනෑ කවදා ද කියලා. අධිකරණ ක්‍රියාමාර්ගය කවදා ඉවර වෙනවාද කියලාත් අපි දන්නේ නැහැ. එතකොට මොකද වෙන්නේ? ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා හැටියට ලේකම්තුමාට පුළුවන්, ලේකම්තුමාගේ යහළුවෙකු නම් මේ අධි භාරයෙන් පරිස්සම් කර ගන්න තිබෙන්නේ-

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

ගරු මන්ත්‍රීතුමනි, ආයතන සංග්‍රහය අනුව, මාස 12ක් ඇතුළත විනය ක්‍රියාමාර්ගය ඉවර වෙන්න ඕනෑ. ඒක මේකට එන්න ඕනෑ. රජයේ නිලධාරින්ට විනය ක්‍රියාමාර්ග තිබෙනවා. ඒ නිසා ඒක විකෘති කරලා ඉදිරිපත් කරන්න එපා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

එහෙම නම් ඒක මෙතැනට අදාළ කළේ ඇයි? මම අහන්නේ ඒකයි. අධි භාරය අය කරන්න ඕනෑ ගණන් දීමේ නිලධාරියා මහින් නම්, -මේක නිකම් විගණකාධිපතිතුමාගේ ඔළුවේ අමාරුවට දාපු අධිභාරයක් නොවෙයිනේ.- විගණන විමසුමක් යවලා, විගණන පරීක්ෂණයක් කරලා, ඒ අනුව විගණන කණ්ඩායමක් ඒ තීරණය අරගෙන, ඒ ගොල්ලන්ට නැවත එය ඉදිරිපත් කරන්න ඉඩ දීලා දමන දණ්ඩනයක්, අය කිරීමක් මේක. අධිභාර අභියාචනා කමිටුවකුත් තිබෙනවා. යම් පුද්ගලයකුට අධිභාරය පිළිබඳව අගතියක් ඇති වනවා නම්, ඔහුට විනය ක්‍රියාමාර්ගය පටලවා ගන්න ඕනෑ නැහැ. ඔහුට අධිභාර අභියාචනා කමිටුවට යන්න පුළුවන්. ගිහිල්ලා "මට පැනවූ අධිභාරය අසාධාරණයි. මම මේකට අදාළ නැහැ." කියලා කියන්න පුළුවන්. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවම පත් කරන අධිභාර අභියාචනා කමිටුවක් මේකේ තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවම පත් කරන අධිභාර අභියාචනා කමිටුවකුත්

[ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා]

තිබෙනවා. එහෙම නම් අධිභාරය final decision එක නොවෙයි. ඒක විගණකාධිපතිතුමා නිසා හෝ විගණන කොමිසම නිසා ගන්නා අවසාන තීරණය නොවෙයි. ඔහුට අධිභාර අභියාචනා කමිටුවක් තිබියදී, විනය බලධාරියකු ඇඳා ගත්තේ ඇයි? ඒකෙන් කෙරෙන්නේ මොකක්ද? මේක අවුල් කරන එකයි. මේකේ ඉතාම පැහැදිලිව තිබෙන්නේ ඒකයි. ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා මේ තීරණය ගන්නේ, දණ්ඩනය පිළිබඳ තීරණය ගන්නේ විනය ක්‍රියාමාර්ගය සහ අධිකරණ ක්‍රියාමාර්ගයෙන් පසුවයි. මම කියන්නේ, දැනට තිබෙන විගණන කටයුත්ත ඊට වඩා හොඳයි කියන එකයි.

ගරු විජේදාස රාජපක්ෂ මැතිතුමනි, ඔබතුමා COPE එකේ සභාපතිතුමා හැටියට "මාසයක් ඇතුළත, අවුරුද්දක් ඇතුළත තීරණයක් දෙන්න." කියලා කිව්ව අවස්ථා ඕනෑ තරම් තිබෙනවා. එතකොට මේක ඇතුළත් කළාට පස්සේ මොකද වෙන්නේ? මේකෙන් ගණන් දීමේ නිලධාරින්ට - ලේකම්තුමන්ලාට- ආවරණයක් දමනවා, විනය ක්‍රියාමාර්ගයකටත් ගිහිල්ලා අධිකරණ ක්‍රියාමාර්ගයකටත් ගිහිල්ලා ඊට පස්සේ දණ්ඩනය නියම කරන්න. ඊට පස්සේ අධිභාර අභියාචනා කමිටුවක් තිබෙනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, සම්පූර්ණයෙන්ම වැරදියි එතුමා කියන කාරණය.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
හරි, කමක් නැහැ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මුළු රටම නොමහ යවන ප්‍රකාශයක් මේක.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා පැහැදිලි කරන්න.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කාරණය පැහැදිලි කරන්න ඕනෑ. විනාඩි දෙක තුනක් ඕනෑ නම් අපෙන් අඩු කර ගන්න. ඒකට කමක් නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මෙවැනි පනතක් මඟින් සිද්ධ කරන්නේ, රජයේ නිලධාරින් කටයුතු කිරීමේදී වන අක්‍රමිකතා, මූල්‍ය දූෂණ යනාදිය සම්බන්ධව පියවර ගැනීමයි. ඒකට එක පැත්තකින් විනය ක්‍රියාමාර්ගය ගැනීමේ ක්‍රියාමාර්ගය දැනටත් ආයතන සංග්‍රහයේ තිබෙනවා. ඒකේ තිබෙන ක්‍රියා පිළිවෙත අනුගමනය කළ යුතුමයි. දෙවනුව, අපරාධ නීතිය යටතේ වරදක් වෙලා තිබෙනවා නම්, දණ්ඩ නීති සංග්‍රහය යටතේ වරදක් වෙලා තිබෙනවා නම් ඒවා අධිකරණ ක්‍රියාකලාපයේ වෙනම යනවා. හැබැයි, මේ නිලධාරින් අතින් යම්කිසි මූල්‍ය දූෂණයක්, අක්‍රමිකතාවක් සිදු වනවායි කියලා ජාතික විගණන පනත යටතේ ගෙනෙන වරදකදී අනුගමනය කරන්න ඕනෑ ක්‍රියා පිළිවෙත විතරයි මෙතැන තිබෙන්නේ. සමහර විට රජයේ නිලධාරියකු වරදක් කළායි කියලා ලේකම් හෝ නිලධාරියකු වැරදි තීන්දුවක් දෙනවා නම් ඒ උදව්යට අභියාචනයක් කරලා ඒ පිළිබඳව සත්‍ය කරුණු ගවේෂණය කර ගන්න අයිතිය දෙන එකේ තිබෙන වරද මොකක්ද?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඒක හොඳයි. කිසි වරදක් නැහැ.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
එහෙම නම් ඔබතුමා ඇයි ඒක වැරදියි කියලා කිව්වේ?

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ කාරණය පටලවා ගත්ත හැටි බලන්න. මම කිව්වේ ඒක නොවෙයි. මම කියන්නේ, - [බාධා කිරීමක්] මට කථා කරන්න ඉඩ දෙන්න.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඔබතුමාම කිව්වා, මම COPE එකේ ඉඳගෙන කිව්වා කියලා, - ඔබතුමාත් එහෙම කරනවා ඇනි.- යම් යම් වාර්තා නිරීක්ෂණය කරලා මාසයක් ඇතුළත ඉදිරිපත් කරන්න කියලා. හැබැයි, අපේ Standing Orders වල කිසිම තැනක කියලා නැහැ, එහෙම නියෝග දෙන්න අපට බලයක් තිබෙනවා කියලා.

ඒක ඕනෑම inquiry officer කෙනෙකුගේ; විනිශ්චයකාරවරයෙකුගේ තිබෙන අභිමතය. එතකොට අදාළ විනය පරීක්ෂණයට අමාත්‍යාංශයේ ලේකම්ට එන්න බැරි නම්, අතිරේක ලේකම් හෝ වෙනත් කෙනෙක්ව ඔහු එවනවා. හැබැයි, විනය පරීක්ෂණය කරන නිලධාරියා එම නිලධාරියා සම්බන්ධයෙන් සෑහීමකට පත්වන්නේ නැත්නම් මොකක්ද කරන්නේ? "නැහැ, ඔබට මේ ගැන කථා කරන්න තේරෙන්නේ නැහැ"යි කියලා විනය පරීක්ෂණය කරන නිලධාරියා අදාළ ලේකම්වරයාට එන්න කියලා වෙනත් දිනයක් ලබා දෙනවා. ඒක තමයි මෙහිදී සිදුවන ක්‍රියාවලිය. එහෙම නැතිව මේක අමුතු දෙයක් නොවෙයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
පැහැදිලියි. මම කියන්නේ මේකයි. අධිභාර සම්බන්ධව විගණන සේවා කොමිෂන් සභාව පැනවිය යුතු ක්‍රියාවලිය මේක තමයි කියන එක මට පැහැදිලියි; ඒක මම දන්නවා; ඒක මට හොඳටම තේරෙනවා. ඒකට තවත් ආයතන පද්ධතියක් තිබෙන බවත් ඇත්ත.

නමුත්, මෙම පනත් කෙටුම්පතේ 19. (2) උප වගන්තියෙහි ඉතා පැහැදිලිව මෙසේ සඳහන් වනවා:

> "විනය බලධරයා විසින් ගනු ලබන විධිමත් විනය ක්‍රියාමාර්ගයකින් හෝ අධිකරණ ක්‍රියාවලියකින් අනතුරුව, විගණනය කරනු ලබන ආස්ථාපනයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින්, යම් ඌනතාවයට හෝ පාඩුවට වගකිව යුතු යම් තැනැත්තකුගෙන් එක්ව හෝ වෙන් වෙන් ව, (1) වන උපවගන්තිය යටතේ වූ අධිභාරයක් අය කර ගනු ලැබිය යුතු ය."

මෙහි ඇති 'අනතුරුව' කියන වචනය මම නැවතත් අවධාරණය කරනවා. මම කියන්නේ මේකයි. අධිභාර අය කර ගන්න අභියාචන ඉදිරිපත් කරන්න වෙනම අභියාචන ක්‍රියාවලියකුත් තියෙද්දි; වෙනම අභියාචන කමිටුවකුත් තියෙද්දි; මේ 'අනතුරුව' කියන එක ගත්තාට පස්සේ මේ සඳහා ගතවන කාලය නිසා මේ කටයුත්ත දුර්වල වනවා. ඒක එකක්. අනික, 'විනය බලධාරියා' කියන පුද්ගලයා මේ නිසා විගණන කොමිසමත් එක්ක සමාන මට්ටමකට හැදෙනවා. මේක නිකම් කවුරුවත් ගත් තීරණයක් නොවෙයි. මේක ජාතික විගණන කොමිසම ගත් තීරණයක්. ජාතික විගණන කොමිසමයි, විනය බලධාරියායි සමාන වන්නේ කොහොමද? එහෙම වුණොත්, විනය බලධාරියා විසින් ජාතික විගණන කොමිසමට අභියෝග කරනවා නේ? මේ දණ්ඩනය සාධාරණ නැහැයි කියලා විනය බලධාරියා කිව්වොත් එහෙම මොකක්ද වෙන්නේ? ඔබතුමන්ලාට ඕනෑ නම්, මේ පනත් කෙටුම්පත සම්මත කර ගන්න. හැබැයි, මේ තුළින් ගැටුමක් ඇතිවනවා. එම නිසා විනය බලධාරියාගේ තීරණය සහ ජාතික විගණන කොමිසමේ තීරණය පටලැවිල්ලක් බවට පත්වනවා. මේකෙන් අගතියට පත්වන පුද්ගලයාට අභියාචන කමිටුවට යන්න කලින්ම ජාතික විගණන කොමිසමට අභියෝග කරන්න පුළුවන්, "විනය බලධාරියා මෙහෙම කියලා තිබෙනවා, ඔය ගොල්ලන් කොහොමද, මට දණ්ඩනයක් පනවන්නේ?" කියලා. මේ තුළින් ඒ ගැටුම එන එක විතරයි මම කියන්නේ. මේ පනත් කෙටුම්පත සම්මත කර ගත්තාට අපට කමක් නැහැ. තිබෙන අවුල වෙනුවට මේ තුළින් තව අවුලක් හදනවා නම්, ඒකට ඉතින් අපට කියන්න තිබෙන්නේ "සොරි" කියලා තමයි.

ඊළඟට, තිබෙන ප්‍රශ්නය මෙයයි. දැන් අධිභාර අභියාචන කමිටුවක් තිබෙනවා. අධිභාර අභියාචන කමිටුව පත් කරන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව මඟින්. මට තිබෙන ප්‍රශ්නය තමයි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට ඒක කරන්න පුළුවන්ද, බැරිද කියන එක. නමුත්, අද මේ පනත් කෙටුම්පත සම්මත කරනවා නම්, ඒක කරන්න පුළුවන්. ඒකට කමක් නැහැ.

මෙම පනත් කෙටුම්පතේ 21. (1) උප වගන්තියෙහි මෙසේ සඳහන් වනවා:

> "... ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව විසින් පත්කරනු ලැබූ විගණනය, නීතිය හා රාජ්‍ය මූල්‍ය කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය සහ ඉංජිනේරු විද්‍යාව යන ක්ෂේත්‍රයන්හි පළපුරුද්දක් සහිත තැනැත්තන් අතරින් සාමාජිකයන් පස්දෙනෙකුට අඩු නොවන සංඛ්‍යාවකින් කමිටුව සමන්විත විය යුතු ය."

ඒක හරි පැහැදිලියි. ඒකේ විගණනය තිබෙනවා. එතකොට අභියාචන කමිටුව, විගණන කොමිසමෙන් ස්වාධීන වනවා. ඒක හොඳයි; checks and balances තිබෙනවා. අභියාචන කමිටුව ගෙන ඒම ස්වාධීනත්වය වෙනුවෙන් කරන හොඳ දෙයක්. ඒ විධියට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවෙන් ඒ කමිටුව පත් කරන එකත් හොඳයි. හැබැයි, විගණනය පිළිබඳව විශේෂ පුද්ගලයෙකු මේ කමිටුවේ ඉන්න ඕනෑය කියලා ඒකේ සඳහන්ව තිබෙනවා. ඒක හරි නේ? මේකේ ප්‍රධාන දේ විගණනය නේ?

මෙම පනත් කෙටුම්පතේ 21. (2) උප වගන්තියෙහි මෙසේ සඳහන් වනවා:

> "ජාතික විගණන කාර්යාලයේ සහ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ කිසිදු සාමාජිකයකු කමිටුවේ සාමාජිකයකු නොවිය යුතු ය. විගණකාධිපතිවරයා කමිටුවේ සාමාජිකයකු නොවිය යුතු ය. කමිටුව, විගණකාධිපතිවරයාගෙන් ස්වාධීනව කටයුතු කළ යුතු ය."

ඒ සියල්ලම හරි. එතකොට රාජ්‍ය විගණන සේවයේ කිසිදු පුද්ගලයෙකුට මේ කමිටුවට එන්න බැහැ. විගණනය පිළිබඳ ප්‍රවීණත්වයක් තිබෙන කෙනෙකුට තමයි මේ කමිටුවට එන්න වෙන්නේ. ඒ සඳහා විගණනය පිළිබඳ ප්‍රවීණත්වයක් තිබෙන පුද්ගලයෙකු කොහෙන්ද හොයා ගන්නේ? එතකොට මේ සඳහා අනිවාර්යයෙන් පෞද්ගලික විගණකයෙකු තමයි හොයන්න වෙන්නේ. ඒ සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට විගණකයෙකු හොයන්න වනවා. එම විගණකයා රාජ්‍ය විගණන ක්‍රියාවලිය ගැන විගණන අභියාචන කමිටුවට එනවා. රාජ්‍ය විගණනයෙන් තමයි එම නිලධාරියා අභියාචන කමිටුවේ ඉන්නේ. හැබැයි, එම නිලධාරියා රාජ්‍ය විගණන සේවයේ කෙනෙකු වෙන්න බැහැ. මේක මොකක්ද කියලා මම දන්නේ නැහැ, නමුත් මේකේ පටලැවිල්ලක් තිබෙනවාය කියලා විතරක් මට තේරෙනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)

විශ්‍රාමික විගණන සේවකයෙකු තමයි දැන් ඔය කමිටුවට පත්වන්නේ. අනික් කොමිෂන් සභාවලටත් එම නිලධාරින් ආවේ ඒ විධියටයි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

හොඳයි. ඒක ඔබතුමන්ලා බේරා ගත යුතු දෙයක් විධියටයි මම මතු කරන්නේ. මේක මහා දෙයක් නොවෙයි. නමුත් මට තේරෙන විධියට මේ සඳහා රාජ්‍ය විගණනය ගැන විශේෂ දැනුමක් තිබෙන කෙනෙකු පත් වෙන්න ඕනෑ. ඒකයි විය යුත්තේ කියන එක තමයි මම අවධාරණය කරන්නේ.

ඊ ළඟට, තිබෙන ප්‍රශ්නය මෙයයි.

විගණන සේවා කොමිෂන් සභාව විසින් කරනු ලබන මේ කටයුත්තේදී ප්‍රධාන ගණන් දීමේ නිලධාරින්ගෙන් යට නිලධාරින්ට -අමාත්‍යාංශ ලේකම්වරුන් නොවන අනෙක් නිලධාරින්ට- මේ දණ්ඩනය පැනවීමේ, එය සුදුසුද නැද්ද කියා තීරණය කිරීමේ බලය පවරන්නේ ලේකම්වරුන්ටයි. හැබැයි මේ පනත් කෙටුම්පත අනුව ලේකම්වරයකුට දණ්ඩනය දීම පවරන්නේ ජනාධිපතිතුමාටයි. ජනාධිපතිවරයා තමයි ඒ තීරණය ගන්නේ. ජනාධිපතිවරයා තමයි ලේකම්වරයකුට දණ්ඩනයක් තිබෙනවාද නැද්ද කියා තීරණය කරන්නේ. හැබැයි මේ පනත් කෙටුම්පතෙන් ලේකම්වරයාට සාධාරණයක් ඉෂ්ට කරලා නැහැ. ලේකම්වරයාට අභියාචනයක් ඉදිරිපත් කරන්න පුළුවන් ක්‍රමවේදය මොකක්ද කියා මෙහි සඳහන් කරලා නැහැ. අධිභාර අභියාචනා කමිටුවක් තිබෙනවා. ලේකම්ගෙන් දණ්ඩනයක් පැනවෙන කෙනකුට ඒ සම්බන්ධයෙන් අභියාචනයක් ඉදිරිපත් කරන්න පුළුවන්. හැබැයි ලේකම්වරයකුට එහෙම කරන්න පුළුවන්ද? මම ලේකම්වරුන් වෙනුවෙනුත් පෙනී සිටිනවා. ලේකම්වරයාට දණ්ඩනය දෙන්නේ කවුද? ජනාධිපතියි. ලේකම්වරුන් පත් කරන්නේත් ජනාධිපතියි. ජනාධිපතිතුමා ම දණ්ඩනයක් දෙන්න තීරණය කරන කොට මොකද වෙන්නේ? එය විගණන සේවා කොමිෂන් සභාවෙන් තමයි යවන්නේ. මම එය දන්නවා. හැබැයි ජනාධිපතිවරයා විසින් පනවනු ලබන දණ්ඩනයට ලේකම්වරයකුට අභියාචනයක් ඉදිරිපත් කරන්න ඉඩ තිබෙන බව සඳහන් තැන මේ පනත් කෙටුම්පතේ තිබෙන්නේ කොහේද? එහෙම නැති වුණොත්, එය ලේකම්වරයකුට අගතියක් කිරීමක් වනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමනි.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
කියන්න, ගරු අමාත්‍යතුමා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
මේ අභියාචනා ක්‍රියා දාමයෙන් අනතුරුව තමයි දණ්ඩනය තීරණය වන්නේ. ඒ දණ්ඩනය පැනවීම සාමාන්‍යයෙන් මේ ක්‍රියා පිළිවෙත අනුව සිද්ධ වනවා. ලේකම්වරයා පිළිබඳව දණ්ඩනය පැනවීම තීරණය වන්නේත් අභියාචනයෙන් පසුවයි. ලේකම්වරයා සම්බන්ධයෙන් එය ක්‍රියාත්මක කරන්නේත් ජනාධිපතිවරයායි. මොකද, ඒ, පත් කිරීමේ බලධාරියා ජනාධිපතිවරයා වන නිසා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම කිව්වේ මෙයයි. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා වාක්‍ය හැටියට කිව්වාට, ලේකම්වරයාට ඒ අයිතිය තිබෙන ප්‍රතිපාදනයක් මෙහි කොතැනකවත් නැහැ. ලේකම්වරයකුට අභියාචනා ඉදිරිපත් කරන්න ප්‍රතිපාදනයක් නැහැ. අපි ඒ සම්බන්ධව සංශෝධනයක් ඉදිරිපත් කර තිබෙනවා. අපේ විජයදාස රාජපක්ෂ උගත් නීතිඥ අමාත්‍යතුමා පිළිගන්නවා නම් ලේකම්වරයකුට එවැනි අවස්ථාවක් තිබෙන්න ඕනෑ කියා, එවැන්නක් මේ පනත් කෙටුම්පතේ සඳහන්ව නැති නිසා අප ඉදිරිපත් කර තිබෙන සංශෝධනය පිළිගන්න.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ඔබතුමා ඒ ගැන කියනවා නම් හොඳයි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ඒ ක්‍රියා දාමයේ හැම එකක්ම අභියාචනයෙන් පසුවයි තීරණය වන්නේ. ඒ නිසා ලේකම්වරුන්ටත් ඒ අයිතිය තිබෙනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
නමුත් ලේකම්වරුන්ට එය අදාළ කර නැහැ. ඒ හින්දා මා සංශෝධනයක් -වගන්තියක්- ඉදිරිපත් කර තිබෙනවා. එවැන්නක් තිබෙන්න ඕනෑ කියා ඔබතුමන්ලා පිළිගන්නවා නම්, මගේ සංශෝධනය පිළිගන්න. එච්චරයි. මොකද, මෙහි තිබෙන විධියට නම් එවැන්නක් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඊළඟට මතු වන ප්‍රශ්නය මෙයයි. ජාතික විගණන පනත් කෙටුම්පතේ 20. (1) වන උප වගන්තිය යටතේ මෙසේ සඳහන් වනවා:

"19 වන වගන්තිය යටතේ විගණනය කරනු ලබන ආස්ථාපනයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයා විසින් කරන ලද තීරණයකින් අගතියට පත් යම් තැනැත්තකු විසින් අධිභාර සභාතිකය ලැබුණු දින සිට එක් මාසයක් ඇතුළත එම තීරණයට එරෙහිව 21 වන වගන්තිය යටතේ පත් කරනු ලැබූ අධිභාර අභියාචනා කමිටුව වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය."

හැබැයි "යම් තැනැත්තා" කියන එක සම්බන්ධයෙන් definition එකක් දීලා නැහැ. යම් තැනැත්තෙකු අභියාචනා කමිටුවට අධිභාරයක් සම්බන්ධ තීන්දුවක් දුන්නාට පසුව එය නැවත සලකා අභියාචනය වෙනස් කරනවාද, එයින් ගණන් හිලව් තීරණය කරන්නේ කොහොමද, තීරණය සංශෝධනය කරනවාද නැද්ද කියන එක තීරණය කිරීමේ බලය සම්පූර්ණයෙන්ම දෙන්නේ ගණන් දීමේ නිලධාරියාටයි.

හැබැයි ගණන් දීමේ නිලධාරියා -ලේකම්තුමා- ඒක කර නැවත වාර්තා කිරීමක් ගැන සඳහන් වන්නේ නැහැ. ඒ පිළිබඳව කාට හෝ වාර්තා කිරීමක් කෙරෙන්න ඕනෑ. එයට හේතුව මොකක්ද? විගණකාධිපතිවරයා තීරණය කරන දණ්ඩනයක් ගණන් දීමේ නිලධාරියා වෙනස් කළොත් පළමුවෙන් අගතියට පත් වන පුද්ගලයා කවුද? ඒ, විගණකාධිපතිතුමායි. විගණකාධිපතිතුමාටත් ඉඩක් තිබෙන්න ඕනෑ ඇවිත් කියන්න, "මගේ තීරණය අභියෝගයට ලක් කර තිබෙනවා. මමත් අගතියට පත් වෙලා තිබෙනවා" කියා. ඒ නිසා අපි සංශෝධනයක් ඉදිරිපත් කරනවා, අඩු තරමින් විගණන සේවා කොමිෂන් සභාවට එය වාර්තා කරන්න විගණකාධිපතිතුමාට ඉඩ දෙන්න කියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම තවත් දෙයක් කියන්න ඕනෑ. මා ළඟ තිබෙනවා, චක්‍ර ලේඛයක්. මම එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා සභාගත කරන්න බලාපොරොත්තු වනවා. දැන් ඔබතුමන්ලා ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් හැටියට ලේකම්තුමන්ලාට නේ මේ බලය -අධිභාර ක්‍රියාත්මක කිරීමේ බලය- පවරා තිබෙන්නේ. අද නොවෙයි, 1993.07.21 පාස්කරලිංගම් මහතා භාණ්ඩාගාර ලේකම් හැටියට චක්‍ර ලේඛයක් -භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපි අංක මුදල් 320- නිකුත් කර තිබෙනවා, "රාජ්‍ය නිලධාරීන් මත අධිභාර පැනවීම" කියන ශීර්ෂය යටතේ. ලේකම්වරුන්ට තමයි බලය පවරා තිබෙන්නේ. 1993 ඉඳලා අද වන කල් ලේකම්වරුන් අධිභාරයක් පනවා තිබෙන්නේ කාටද? ඒ සඳහා ලේකම්වරුන්ට බලය දී තිබෙනවා, 1993 වර්ෂයේ ඉඳලා. ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න රාජ්‍ය අමාත්‍යතුමනි, නමුත් කවුරුවත් අධිභාරයක් පනවා නැහැ. මෙන්න චක්‍ර ලේඛය. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනිමා මෙම ලේඛනය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

එහෙම නම්, මෙය ක්‍රියාත්මක කරන්නම හිතාගෙන කරපු දෙයක් නොවෙයි. ලේකම්වරුන්ට ඒ බලය -අධිභාර පැනවීමේ බලය- දුන්නා කිව්වත්, ඒ බලය 1993 වර්ෂයේ ඉඳලා ලේකම්වරුන්ට තිබුණා.

නමුත් ක්‍රියාත්මකවෙලා නැහැ. මේ කරන්නේ මොකක්ද? මේක ලේකම්වරයාට පටවනවා. හැබැයි, නැවත විගණන කොමිසමට වාර්තා කරන්නවත් ක්‍රියාවලියක් හදලා නැහැ. හරි නම්, ලේකම්තුමා මේක ක්‍රියාත්මක කරනකොට අධිභාර, අභියාචනා කමිටුවෙන් ප්‍රතික්ෂේප වෙනවා නම්, දණ්ඩනය වෙනස් වෙනවා නම් ලේකම්තුමා ඒක වාර්තාගත කරන්න ඕනෑ. ලේකම්තුමා විගණන කොමිසමට දැනුම් දෙන්න ඕනෑ, "ඔයගොල්ලෝ ගත්ත තීරණය වැරදියි, නැත්නම් ඒක අභියාචනා කමිටුවෙන් වෙනස් වුණා, මෙන්න අලුත් තීරණය" කියලා. ඒක එතැනින්ම ඉවර කරනවා. 1993 ඉඳන් ලේකම්තුමන්ලා මේක ක්‍රියාත්මක කර නැත්නම් අලුතින් ක්‍රියාත්මක කරාවිය කියලා පෙනෙන්නේ නැහැ.

අනෙක් කාරණාව මේකයි. විගණන කොමිසම මේ පරීක්ෂණය කරනවාය කියලා විගණකාධිපතිතුමාත්, ඒ කමිටුවත් අතර conflict of interest එකක් ඇති වන්නේ නැහැ. ලේකම්වරු

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

සම්බන්ධයෙන් ඕනෑ නම්; ලේකම්වරුන්ට අධිභාරයක් පැනවීම සම්බන්ධයෙන් ඕනෑ නම් විගණන කොමිසමෙන් වෙනත් නිලධාරීන් පත් කරන්න පුළුවන්. මේ විගණන කොමිසමේ විනිශ්චයකාරතුමෙක් -මහෙස්ත්‍රාත්වරයෙක්- ඉන්නවා. ඒ විනිශ්චයකාරතුමාගෙන් වෙනම කමිටුවක් පත් කරන්න පුළුවන්. ඒ නිසා ලේකම්වරු සම්බන්ධ අධිභාරයක කාරණාවක් ආවොත් ජනාධිපතිවරයා අතට යවන්න එපා. ඒක විගණන කොමිසමේ කමිටුවකට යොමු කරන්න. ඒ කොමිසමේ මහෙස්ත්‍රාත්වරයෙක් ඉන්නවා. අධිකරණ ක්‍රියාවලියකට තරම් වටිනා කෙනෙක්. ඔහුගෙන් පත් කරන්න. එතැනින් විගණකාධිපතිතුමා අයින් කරන්න. කමක් නැහැ. ඇයි, විගණකාධිපතිතුමාගේ විගණනයකින් වරදකරුවෙක් වන කෙනකුට විගණකාධිපතිතුමාම ඉන්න කමිටුවකින් දණ්ඩනයක් පනවන එක සාධාරණ නැහැ. ඒ නිසා අපි ළබැඳියාවකින් එතැන ගැටුම ඉවත් කරමු. ඒ සඳහා අපි යෝජනාවක් කරනවා, ලේකම්වරයෙක් සම්බන්ධයෙන් අධිභාරයකදී විගණකාධිපතිතුමා ඉවත් කළ කමිටුවකින් ඒක කරන්න කියලා. එහෙම කළොත් මේ විගණන පනතට පණ එනවා; ශක්තිය එනවා. ඒකට කමක් නැහැ. මේ තිබෙන්නේ විගණන කොමිසමක්. මේකෙන් කර තිබෙන්නේ "අපි ජාතික විගණන පනතක් හැදුවා; මෙන්න පනත තිබෙනවා; අපි ඒකත් කළා"ය කියලා පෙන්වන්න හදන එක නම්, සේනක බිබිලේ ප්‍රතිපත්තියට වුණ දේම තමයි, මේ ජාතික විගණන පනතටත් වෙන්නේ. ඒක නම් සහසුද්දෙන්ම ඇත්ත.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තවත් කාරණා ගණනාවක් කියන්න තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි සංශෝධන ඉදිරිපත් කර තිබෙනවා. සංශෝධන 16ක් මේකට ඇතුළත් කර තිබෙනවා. ඒ වාගේම ඔබතුමන්ලා බොහොම වැරැදි වැඩක් කර තිබෙනවා. මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනාවාට පස්සේ, ඒක ආංශික අධීක්ෂණ කාරක සභාවටත් ගියාට පස්සේ, කැබිනට් මණ්ඩලය නැවත රැස්වෙලා විගණකාධිපතිවරයාගේ බලය නැවත ශුද්ධ කර තිබෙනවා. ඒ මොකක්ද? අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් විගණකාධිපතිතුමාට නිර්දේශ, විධානයන් දෙන්න පුළුවන් බලය ඔබතුමන්ලා අද මේ සංශෝධනවලින් ඉවත් කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි, ඔබතුමන්ලා විගණන කමිටු තියෙන්න ඕනෑ නැහැයි කියලා සංශෝධනයක් ඉදිරිපත් කර තිබෙනවා. මම දන්නේ නැහැ, මේවා කොහොම කරනවාද කියලා. කළමනාකරණ හා විගණන කමිටුව හැම ආයතනයකම තියෙන්න ඕනෑ කියලා අපි කෝප් කමිටුවේදී ගොඩක් කථා කරනවා. ඒ ගැන ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න රාජ්‍ය ඇමතිතුමා දන්නවා. හැබැයි, ඔබතුමන්ලා මොකක්ද කරන්නේ? නීතියකින් රජයට පවරා ගත් ආයතනවල කළමනාකරණ හා විගණන කමිටුව තියෙන්න ඕනෑ නැහැයි කියලා සංශෝධනයක් ඉදිරිපත් කර තිබෙනවා.

ඊළඟට මේ පනත් කෙටුම්පතේ කියා තිබෙනවා, අභ්‍යන්තර විගණකවරුන්ගේ වාර්තා විගණකාධිපතිතුමාට ඉදිරිපත් කරන්න කියලා. ඒක හොඳ දෙයක්. අභ්‍යන්තර විගණනය සම්බන්ධ වාර්තා විගණකාධිපති දෙපාර්තමේන්තුවට එවන්න ඕනෑ කියලා තිබුණා. ඔබතුමන්ලා ඒක අයින් කරලා තිබෙනවා. මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට දැම්මාට පසුවත්, අලුතින් කැබිනට් සංශෝධන එනවා . අද උදේ කියනවා, ලක්ෂයේ දඩය 5000ට අඩු කරන්න, අභ්‍යන්තර විගණන වාර්තා විගණකාධිපතිවරයාට එවන එක නතර කරන්න, විගණකවරුන්ට නිර්දේශ, විධානයන් නිකුත් කරන එක විගණකාධිපතිවරයාගෙන් අයින් කරන්න.

ඊළඟට, රජයට පවරා ගත් ආයතන ගැන කියනවා. දැන් ඒවා රජයේ ආයතන. හිඟුරාන සීනි සමාගම රජයට පවරා ගත්තාට පස්සේ, ඒක රජයේ නොවෙයි නම් වෙන කාගේද? රජයට පවරා ගත් ආයතනවලට විගණන කළමනාකරණ කමිටු ඕනෑ නැහැයි කියනවා. ඇයි, මෙහෙම කරන්නේ? තියෙන එකත් නැති කරනවා නේ. එහෙම කියලා බෝඩ් එක දමනවා, "ඔන්න ජාතික විගණන පනත ගෙනාවා, ඒක ක්‍රියාත්මක කරනවා"ය කියලා. මේ ගෙනැල්ලා තිබෙන්නේ ජාතික විගණන පනත් කෙටුම්පත නොවෙයි, ලේකම්වරුන්ගේ පනත් කෙටුම්පත. ලේකම්වරුන්ගේ පනත් කෙටුම්පත ගෙනැල්ලා ජාතික විගණන පනත් කෙටුම්පත ගෙනාවා කියනවා. ඒ නිසා ඔබතුමන්ලා සාධාරණ වෙන්න. ඔබතුමන්ලා ඉතිහාසයට තවත් දෙයක් එකතු කරන්න එපා. මෙය විසින් ඉතිහාසයට ලොකු කළු පැල්ලමක් ඇති කරනවා. ඒ නිසා කරුණාකරලා, අපි සාධාරණව, යුක්ති සහගත ලෙස ඉදිරිපත් කරන සංශෝධනවලින් මේ පනතට ලේ දෙන්න; ධෛර්යය දෙන්න; පණ දෙන්න. පණ දීලා මේ පනත් කෙටුම්පත සම්මත කරන්න කියලා මේ ගරු සභාවේ සිටින සියලුම මහජන නියෝජිතයින්ගෙන් බොහොම බැගෑපත්ව, කාරුණිකව ඉල්ලා සිටිමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

[අ.භා.12.21]

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද දින දෙවන වර කියැවීම සඳහා ඉදිරිපත් කර තිබෙන ජාතික විගණන පනත් කෙටුම්පත පිළිබඳ විවාදයට සහභාගි වීමට මටත් අවස්ථාව ලබා දීම ගැන සියලු දෙනාටම ස්තුතිවන්ත වෙනවා.

මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය මුදල් පාලනය පාර්ලිමේන්තුවට භාර දීලා තිබෙනවා. රටේ ජනතාව නියෝජනය කරන මහ ජන නියෝජිතයින්ගෙන් සමන්විත පාර්ලිමේන්තුවට ඒ බලතල භාර දී තිබෙන්නේ, තමන් ගෙවන බදු මුදල්, ඒ වාගේම මේ රටට එන ආදායම් වියදම් වෙන්නේ කොහොමද, ඒවා ජනතා සේවයට කැප කරන්නේ කොහොමද කියා දැනගැනීමේ අයිතිය ජනතාවට තහවුරු කිරීමටයි. මේ රටේ විශාල මුදලක් රාජ්‍ය සේවය හරහා පරිහරණය වෙනවා. සංවර්ධන වැඩ කටයුතු, මහ ජන සේවාවන් ඇතුළු සේවාවන් රාශියක් මේ රාජ්‍ය සේවාව තුළින්, රජය තුළින් සිද්ධ වන නිසා වංචාව හා දූෂණය, ඒ වාගේම මුදල් නාස්තිය වැනි දේවල් අපේ රටේ ඉතිහාසය පුරාම අපට අහන්න සිද්ධ වෙලා තිබෙනවා. කාර්යක්ෂම රාජ්‍ය සේවයක් හරහා ජනතාවට සේවය කිරීම, ඒ වාගේම අපේ රටේ ආර්ථිකය ඉදිරියට ගෙන යෑම වැනි ඉතාම භාරදූර කාර්යයන් කරන අවස්ථාවේදී, ජාතික විගණන පනත් කෙටුම්පත මඟින් මුදල් නාස්තියකින් තොරව, මුදල් වංචාවකින් තොරව ඒවා නිසියාකාරයෙන් සිදු කිරීම සඳහා අපි ප්‍රවේශයක් අරගෙන තිබෙනවා.

අද මෙම විවාදයේදී අපට අහන්නට ලැබුණා, ජාතික විගණන පනත් කෙටුම්පත යෝජනා කර තිබුණේ 2003 වසරේ බවට. එදා සිට අද වන තුරු කොපමණ කාලයක් ගිහිල්ලාද මේ පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ? ඒ කාල සීමාවෙන්ම අපට බලාගන්න පුළුවන්, ඇත්තටම මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට ක්‍රියා කර තිබෙන්නේ කවුද කියලා.

මේ පනත් කෙටුම්පතේ යම් යම් අඩු පාඩු ගැන මට පෙර කථා කළ ජනතා විමුක්ති පෙරමුණේ ගරු මන්ත්‍රීතුමා සඳහන් කළා. අපි ජනතා විමුක්ති පෙරමුණට කියා සිටිනවා, 2020දී මේ රටට එන්න ඉන්නේ කවුද කියලා හොඳට හිතන්න කියලා. එක පැත්තකින්,

[ගරු නිරෝෂන් පෙරේරා මහතා]

මේ රටට එන්න ඉන්නේ හිට්ලර් කෙනෙක්. මේ රටට හිට්ලර් ආවාම, ජාතික විගණන පනතෙන් හිට්ලර්ට වැඩක් තිබෙනවාද? මේ රටේ මූල්‍ය පාලනය කරන්න හිට්ලර් ජාතික විගණන පනත පාවිච්චි කරයිද? මේ පාර්ලිමේන්තුව කියන ආකාරයට හිට්ලර් තමන්ගේ වැඩ කටයුතු කරයිද කියලා අපි ජනතා විමුක්ති පෙරමුණෙන් අහනවා. [බාධා කිරීමක්] නැහැ, මම දන්නවා. ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමනි, අපි, ඔබතුමන්ලා ඒක ගෙනාවේ නැහැ. නමුත් ඒ අවදානම තිබෙනවා, ගරු මන්ත්‍රීතුමනි. ඒ අවදානම ගන්න එපා.

එදා හිට්ලර් ජර්මනිය දියුණු කළාය කියා සමහර අන්තවාදී කල්ලි අද හිතාගෙන ඉන්නවා. නමුත් හිට්ලර් කළේ මුළුමනින්ම ජර්මනියේ තිබුණු ආර්ථිකය, ජර්මනියේ තිබුණු සමාජය විනාශ කරලා, විශේෂයෙන්ම තරුණ ජීවිත බිල්ලට දීලා අවසානයේ දිවි නසාගැනීමයි. සමහර ඇමෙරිකන් යුද හමුදා කඳවුරු අද වන විටත් ජර්මනියේ තිබෙනවා. බොහෝ කාලයක් යන කල් රුසියාවේ කඳවුරු ජර්මනියේ තිබුණා. ජර්මනිය මුළුමනින්ම ස්වාධීන රාජ්‍යයක් හැටියට දශක ගණනාවක් ක්‍රියාත්මක කරන්න බැරි තැනට තල්ලු කර තමයි එදා හිට්ලර් දිවි නසාගත්තේ. මේ රටටත් 2020දී හිට්ලර්ලා ඕනෑය කියන අයට අපි කියනවා, ඒ තැනට අපව තල්ලු කරන්න ආවොත්, මරා ගෙන මැරෙන සටනක් තමයි 2020දී අපි කරන්නේ කියා. මේ රටට 1948දී සුද්දාගෙන් ගත්ත නිදහස නැවත කාටවත් පූජා කරන්නට අපි ලැහැස්ති නැහැ කියා මේ අවස්ථාවේදී මතක් කරනවා.

කවුරු මොනවා කිව්වත්, දූෂණ මර්දන ක්‍රියාවලිය අද අපි ආරම්භ කර තිබෙන බව විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ. අද දූෂණ හඳුනා ගෙන තිබෙනවා. ඒවා සම්බන්ධයෙන් පරීක්ෂණ කරගෙන යනවා. අද වන විට අපේ අධිකරණවල තිබෙන ප්‍රමාද දෝෂයන් නිවැරැදි කරගන්නට අවශ්‍ය පනත් සම්මත කරගෙන, ඒවා කඩිනම් කරලා, ඒ කරුණු-කාරණා ඉදිරියට කරගෙන යන කොට හොරකම් කරපු සමහර අයම අහනවා, "අද මොනවාද වෙලා තිබෙන්නේ?" කියලා. එදා මේ රටේ හම්බන්තොට වරාය වැනි දේවල් හැදුවා. හම්බන්තොට වරාය හදලා, මේ රටට විශාල ණයක් ඉතුරු කරලා, හම්බන්තොට වරායට නැව් එන්නේ නැති තත්ත්වයට පත් කරන්න එදා ක්‍රියා කළ නායකයා ඇතුළු රජයට එදා තිබුණු විගණනයෙන් මොනවාද වුණේ කියලා අපට අහන්න සිදු වෙනවා. එදා අපට විගණන දෙපාර්තමේන්තුවත් තිබුණා. දැන් "The New York Times" පුවත්පත වාර්තා කරලා තිබෙනවා, China Harbour සමාගම එදා හිටපු මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ඡන්ද ව්‍යාපාරයට ඩොලර් මිලියන කෝටි ගණනක් දීලා කියලා. කොහොමද ඒ වැඩ කටයුතු කළේ? පරිසර අධ්‍යයනයකින් තොරව, එතැනට නැව් එන්න පුළුවන්ද කියලා බලන්නේ නැතුව විශාල මුදල් කන්දරාවක් චීනයට ණය වෙලා තමයි ඒ වැඩ කටයුතු කළේ. ඒ එක්කම මත්තල ගුවන් තොටුපොළ හැදුවා. එක ගුවන් සමාගමයි එතැනට ආවේ. ඒ තමයි flydubai ගුවන් සමාගම. නමුත් ඒ අයත් කිව්වා, ජනතාව එන්නේ නැහැ, සංචාරකයන් එන්නේ නැහැ, හැම වෙලාවේම කුරුල්ලෝ planeවල හැප්පෙනවා, ඒ නිසා අපිත් මත්තල ගුවන් තොටුපොළට එන්නේ නැහැ කියලා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ඔව්. ඒවා කියනකොට ටිකක්-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඉන්දියාව ඒක ගත්තාම කුරුල්ලෝ හැප්පෙන එක නතර වෙනවාද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
It is not a point of Order.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
එතුමා දැන් ඉන්දියාව ගැන කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මත්තල ගුවන් තොටුපොළ එතැන හදන්න එපා කියද්දී, ජනතාවගේ විශාල විරෝධය මැද එදා හිටිලර් කෙනෙක් වාගේ කාටවත් ඇහුම්කන් දෙන්නේ නැතුව ජනතාව මුළා කරලා, ඒ ජනතා හඬ යටපත් කරලා, ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරලා අද වන විට ජනතාවට ඒ ණය බර දීලා තිබෙනවා. එදා අපි කිව්වා, නොරොච්චෝලේ බලාගාරය හදන්න එපා, පාරිසරික ප්‍රශ්න ඇති වෙනවා කියලා. එදා ජනතාව මර්දනය කරලා නොරොච්චෝලේ බලාගාරය හැදුවා. අද වන විට එතැන අළු කන්දක් ඇති කරලා තිබෙනවා. ඒ ව්‍යාපෘති තුළින් අදටත් ජනතාව පීඩා විඳිනවා; ජනතාවට අදටත් ඒ ණය ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. නමුත් මෙතුමා දැන් මෙතැනට ඇවිල්ලා ඉන්දියාව ගැන කථා කරනවා. එතුමා මෙතැනට ඇවිල්ලා කථා කරන්න ඕනෑ පාස්පෝට් එක ගැන; ඒ පාස්පෝට් එක ගන්නේ කොහොමද කියලා. නමුත් ඒ ගැන කථා නොකර ඉන්දියාව ගැන කථා කරලා මේ රටේ ජනතාව නොමඟ යවන්න හදනවා.

2020 වසරේදී මේ රටට හිට්ලර් කෙනෙක් ඕනෑ නැහැ කියලා අපි කියනවා. මේ රටේ යම් කිසි ප්‍රජාතන්ත්‍රවාදයක් තිබෙනවා නම් ඒක ශක්තිමත් කිරීම තමයි 2020 වසරේදී කරන්න ඕනෑ. හිට්ලර් කෙනෙක්, නැත්නම් ප්‍රභාකරන් කෙනෙක් නැවතත් මේ රට භාර ගෙන මේ රට සුරපුරයක් කරයි කියලා කවුරු හරි හිතනවා නම් ඒ ගොල්ලන් ඉතාම වැරදි සහගත මතයක තමයි ඉන්නේ.

ජාතික විගණන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා අපි මේ රටේ වංචාව හා දූෂණය පිටු දැකීම සඳහා තවත් පියවරක් අරගෙන තිබෙනවා. මේ නීතිය ගෙනාවාය කියලා මේ රටේ අනෙකුත් නීති අහෝසි වෙන්නේ නැහැ, මේ තුළින් ඒවා තවත් ශක්තිමත් වෙනවා මිස. විශේෂයෙන්ම මේ පාර්ලිමේන්තුව තුළ ක්‍රියාත්මක වන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ශක්තිමත් කරලා, මූල්‍ය පාලනය, මූල්‍ය වගවීම ස්ථාපිත කරන්න ඕනෑ. ඒ වාගේම රාජ්‍ය දේපළවලට පාඩු සිදු කරන පුද්ගලයන්ට පුද්ගලිකව ඒ වගකීම පැවරීම මේ පනත තුළින් සිද්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
අපි 2015 ජනවාරි 08 වන දා දුන් පොරොන්දු ඉෂ්ට කරලා ක්‍රියාත්මක කළ තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ

පනත, ස්වාධීන කොමිෂන් සභා වැනි දේවල්වලට මෙම ජාතික විගණන පනතත් එකතු කරලා, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරගෙන ඉදිරියට ගෙන යන බව ප්‍රකාශ කරමින් මාගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 12.31]

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ තරම් ප්‍රමාද වී නමුත් ජාතික විගණන පනත් කෙටුම්පත සම්මත කර ගන්න අද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සතුටට කරුණක්.

මෙම ප්‍රමාදයට හේතුව වශයෙන් විචාරකයන් සඳහන් කරන්නේ, කොන්ත්‍රාත්කරුවන්, දේශපාලනඥයන් සහ රජයේ නිලධාරීන් මෙය ප්‍රමාද කිරීමට හේතු වන ලෙස කරුණු ඉදිරිපත් කළාය කියන එකයි. එය ජනමාධ්‍යවලත් වාර්තා කර තිබුණා. අධිභාරය පැනවීමේ ප්‍රශ්නය තමයි මෙහි ප්‍රධානම කේන්ද්‍රීය ප්‍රශ්නය වුණේ. මේ ආරවුලට, මේ පනත් කෙටුම්පත ප්‍රමාද වීමට, මේ පනත් කෙටුම්පත කල් දැමීමට හේතු වීමේ කාරණාව වුණේ අධිභාරයයි. මේ අධිභාරය පනවන්නේ යම් වරදකට වගකිව යුතු නිලධාරියාටයි. වරදට හසු වන මේ නිලධාරීන් -හැම නිලධාරියාම නොවෙයි- බොහෝ විට කොන්ත්‍රාත්කරුවන් සමඟ එකතු වෙලා, දේශපාලනඥයන් සමඟ එකතු වෙලා රජයේ සම්පත් සාවද්‍ය පරිහරණය, රජයේ සම්පත් අවභාවිත කරනවා. එහෙම කළාම, එයට වගකිව යුත්තාට, ඒ පාඩුව සිදු කළ තැනැත්තාට අධිභාරයක් පැනවීමේ අයිතිය, වගකීම, ඒ පිළිබඳ බලය යන මේ කාරණා ගැන, ඒ නිලධාරීන්ගේ පැත්තෙන්, ඒ නිලධාරීන් සමඟ එක් වුණු කොන්ත්‍රාත්කරුවන්ගේ පැත්තෙන්, ඔවුන්ට අනුබල දෙන දේශපාලනඥයන්ගේ පැත්තෙන් දිගටම බලපෑමක් ආපු බව අපි දන්නවා. අන්තිමට, මේ අධිභාරය පැනවීම පිළිබඳ කාරණය ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට තින්දු වෙලා තිබෙනවා. ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා ඒ කටයුත්ත කළාට පස්සේ, ඒකට ලොකු කාර්ය ක්‍රමයක් තිබෙනවා.

මේ අධිභාර අය කර ගැනීමට කොමිසමකට දමලා, ඒ කොමිසම උසාවියට ගිහින්, උසාවියේ තීරණයකින් පසුව ඇපැලකට ගිහින්, ඒ ඇපැලෙන් පසුව තමයි මේ අධිභාරය පිළිබඳ කාරණය තීන්දු වෙන්නේ. මේක දිග ක්‍රියාවලියක්. ඇත්තටම රජයේ සම්පත් අවභාවිත කරන, රජයේ සම්පත් ගසා කන මේ නිලධාරීන් යම් ආකාරයකට මේ නීතියට යටත් කර ගන්න නම්, මේ නිලධාරීන්ගේ සාවද්‍ය පරිහරණය ගැන, අවභාවිතය ගැන තීන්දු තීරණ අරගෙන පොදු දේපළ පනත යටතේ ක්‍රියා කිරීමට හා මහෙස්ත්‍රාත් උසාවියේ ලඝු නඩු විභාගයකින් මේ කටයුතු ඉවර කරන්න පුළුවන් වෙන්න ඕනෑ. මේ අධිභාරය තිබෙන්න ඕනෑ. කාර්ය දක්ෂ උඩ වැරදි ගෙවීමක් කරලා තිබෙන්න පුළුවන්. අන්න ඒක අධිභාරයට අයිති වැඩක්. ගෙවීමක් නොකළ යුතු තැනක වැරදි ගෙවීමක් කරලා තිබෙනවා නම්, විශේෂ උපකාරයක් වශයෙන් යම් ගෙවීමක්, වියදමක් කරලා තිබෙනවා නම්, යම් ආදායමක් එකතු කිරීම ප්‍රමාද කරලා තිබෙනවා නම් ඒවාට අධිභාරය දමන්න පුළුවන්. නමුත් ඉතා පැහැදිලිව සාවද්‍ය පරිහරණයක්, මහජන දේපළ ගසා කෑමක්, එහෙම නැත්නම් වංචනික ක්‍රියාවක් කරපු බවක් අපට තහවුරු වෙනවා නම්, අධිභාර දම දමා ඉන්න එකේ තේරුම කුමක්ද කියලා මම අහන්න කැමතියි. එහෙම නම් මේ කරුණු වෙන්ව දැක්වීමක් තිබෙන්න ඕනෑ. අධිභාර දමන්න ඕනෑ මෙන්න මේ වාගේ ඒවාටයි. සාවද්‍ය පරිහරණය, පොදු දේපළ ගසා කෑම යන දේවල් සම්බන්ධයෙන් මහෙස්ත්‍රාත් උසාවියේ ලඝු නඩු විභාගයකින් තීන්දුවක් දීලා ඉවර වෙන්න ඕනෑ. අය කර ගැනීමේ පැත්තේ කථාව තමයි මේ පනත් කෙටුම්පතේ වැඩිය තිබෙන්නේ. අය කර ගැනීමේ කථාවට අනුව අන්තිමට කරන්න තිබෙන්නේ, ඒ කොමිසම උසාවියට ගිහින්, "මේ මිනිහා ගෙවන්නේ නැහැ. අපට ඒ මුදල අය කරලා දෙන්න" කියලා ඉල්ලන එකයි. එතකොට උසාවිය ඒ මුදල දඩයක් හැටියට අය කරලා දෙනවා. ඒ ක්‍රියාදාමය අධිභාරය සම්බන්ධයෙන් එහෙම වුණාවේ. නමුත් සාවද්‍ය පරිහරණය හා වංචාව පිළිබඳව වෙනත් කාර්ය ක්‍රමයක් තිබීම අවශ්‍යයි. නමුත් එහෙම ක්‍රමයක් මේ පනතේ නැහැ. අපේ විගණකාධිපතිවරයා හෝ ඔහුගේ නිලධාරීන් කරගෙන යන පරීක්ෂණවලදී නීතිය උල්ලංඝනය වීමක් සිදු වෙලා තිබෙනවා, අපරාධයක් සිදු කරලා තිබෙනවා, වංචාවක් කරලා තිබෙනවා, පොදු දේපළ පැහැර ගැනීමක් සිදු වෙලා තිබෙනවා කියලා පෙනී යනවා නම්, එබඳු වංචනික අවස්ථාවක් දුටු සැණින් -විගණනය අවසන් වන තෙක් ඉන්න ඕනෑ නැහැ- එය නීතිය ක්‍රියාත්මක කිරීමේ අංශවලට යොමු කිරීමේ වගකීමක් ඔවුන්ට පැවරෙන්න ඕනෑ.

අපරාධයක් නම්, එය පොලීසියට යොමු කරන්න. විගණනය කරගෙන යන විට තමයි ඒ බව පෙනී යන්නේ. එතකොට පොලීසියට පුළුවන් ඒ ගැන සොයා බලලා, එහි ඇත්ත නැත්ත හොයලා, අපරාධයක් සිදු වෙලා තිබෙනවා නම් ඒ අපරාධය සම්බන්ධයෙන් නීතිය අනුව ක්‍රියා කරන්න. එහෙම නැතුව, විගණනය අවසන් වන තෙක් ඉන්න ඕනෑ නැහැ. එය මේ රටේ සාමාන්‍ය මිනිහෙකුටත් තිබෙන වග කීමක්. අපරාධයක් සිදු වනවා දැක්කා නම්, අපරාධයක් සිදු වන බවට තමන්ට තොරතුරක් තිබෙනවා නම්, එය නීතිය ක්‍රියාත්මක කරන අංශවලට දැන්වීමේ වග කීමක් හැම පුරවැසියෙකුටම තිබෙනවා. විගණනය කරගෙන යන අතරතුර විගණකාධිපතිවරයාට හා ඔහුගේ නිලධාරීන්ට එබඳු දෙයක් දැක ගන්නට පුළුවන් වුණොත්, ඒ කාරණය වහාම නීතිය ක්‍රියාත්මක කරන අංශවලට යොමු කරන්නට ඔවුන්ට වග කීමක් හා බැඳීමක් තිබෙන හැටියට මෙහි නීතිය හැදිය යුතුයි කියන එකයි අපි කියන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, බැඳුම්කර මගඩිය හෙළිදරවු කර ගැනීමට අපේ මේ විගණකාධිපතිවරයාගෙන් ලැබුණා වූ දායකත්වය අපි මේ අවස්ථාවේ දී අගය කළ යුතුයි. බොහොම ඍජු ගුණයෙන් යුක්ත, අපක්ෂපාතීව ක්‍රියා කරන, භයගැන්වීම්වලට යටත් නොවන පුද්ගලයකු හැටියට එතුමාට මා ප්‍රශංසා කරන්න කැමැතියි. එතුමා COPE එකට ඇවිල්ලා සාක්ෂි ඉදිරිපත් කළා. එතුමාගේ විගණනයෙන් ඔප්පු වෙලා තිබෙනවා, රජයේ මුදල් වන මහජන මුදලින් රුපියල් බිලියන 26කට ක්ෂණිකව හානි සිදුවෙලා තිබෙනවා කියලා. COPE එකේ සිටිය UNP එකේ මන්ත්‍රීවරු බොහොම උත්සාහ කළා, කිසිම අලාභයක් නොවුණු බව පෙන්වන්න. ඒ වෙනුවෙන් පොත් ලිව්වා. දැන් පොත් පුච්චන්න වෙලා තිබෙන්නේ. එය ක්ෂණික අලාභයක්. තව අවුරුදු 30ක් යනකොට ඒක බිලියන 140ක අලාභයක් වෙන්නත් පුළුවන් බව පෙනී යමින් තිබෙනවා.

ඊයේ අගමැතිතුමා තමන්ගේ සහයන්ගේ වැරැදි වහන්නත්, වැරැදිවලට සුදු හුනු ගාන්නත් පොඩි උත්සාහයක් ගත්තා. පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම විසින් කරපු ඒ ගනුදෙනුව නිසා සේවක අර්ථසාධක අරමුදල්වලට, UGC අරමුදල්වලට හා මහපොළ අරමුදල්වලට ලොකු අලාභයක් සිදුවෙලා තිබෙනවා. ඒකට ඉතින් UGC එකේ අයත් අල්ලා ගන්න ඕනෑ. ඒ වාගේම අල්ල ගන්න ඕනෑ, සේවක අර්ථසාධක අරමුදලේ අයත්. ඔවුන්ගේත් අනුමැතිය ඇතිව තමයි ඒ ගනුදෙනුව කෙරුණේ. ඒ ගනුදෙනුවෙන් පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම ලොකු ලභයක් ලබා ගත්තා. ඒ ගොල්ලෝ ඒක කළේ, හරක් වාගේ නොවෙයි. හොඳ මොළකාරයන් හැටියට තමයි පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගම එක්ක එකතු වෙලා එම ගනුදෙනුවෙන් ලොකු ලාභයක් එම සමාගමට දුන්නේ. එතකොට අපේ අගමැතිතුමා කියනවා, "ඒකෙන්

[ගරු වාසුදේව නානායක්කාර මහතා]

අලාභයක් වෙලා නැහැ, අයුතු ලාභයක් ලබාගෙන තිබෙනවා" කියලා. ඒ තමයි කියන කථාව. අයුතු ලාභයක් ලබාගෙන තිබෙනවා කියන කථාව කිව්වේ, විජයදාස රාජපක්ෂ ඇමතිතුමා. එතුමා, අගමැතිතුමාගේ කථාව අතරතුර නැඟිටලා කිව්වා, "අයුතු ලාභයක් ලබාගෙන තිබෙනවා. අපට අයුතු අලාභයක් සිදුවෙලා තිබෙනවා. අපි ඒ ගැන නඩු පවරාගෙන යනවා" කියලා. ඒ කියන්නේ, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයෙන්. ඒත් අගමැතිතුමා කියනවා, "නැහැ, එහෙම අලාභයක් සිදුවෙලා නැහැ. අයුතු ලාභයක් ගැනීමක් විතරයි සිදුවෙලා තිබෙන්නේ" කියලා.

අර්ජුන මහේන්ද්‍රන් පිළිබඳව අගමැතිතුමා මේ ගරු සභාවේ බොහෝ දේවල් කිව්වා. අර්ජුන මහේන්ද්‍රන් කියන්නේ අද අපේ රටේ උසාවිය මඟ හැර සිටින වරෙන්තුකාරයෙක්. මේ වරෙන්තුකාරයා වෙනුවෙන් අගමැතිතුමා කොච්චර සහතික දීලා තිබෙනවාද? අගමැතිතුමා පසුගිය හැන්සාඩ් වාර්තා අරගෙන බැලුවොත්, තමන්ගේ අගමැති ධුරයෙන් ඉල්ලා අස් වෙලා යන්න ඒකම ඇති.

අර්ජුන මහේන්ද්‍රන් -මේ වරෙන්තුකාරයා- මේ රටට ගෙන්වා ගැනීම සම්බන්ධව සිංගප්පූරු රජයට මේ ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරලා තිබෙනවාද? "මේ පුද්ගලයා අපරාධකාරයෙක්; තමුන්නාන්සේලාගේ පුරවැසියෙක්. ඔහු අපේ රටේ උසාවිය මඟ හැර ඉන්නවා. ඔහුට වරෙන්තු නිකුත් කරලා තිබෙනවා. ඔහුව මෙහේ එවන්න" කියලා සිංගප්පූරු රජයෙන් ඉල්ලීමක් කළාද?

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
හොඳමයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. එහෙම ඉල්ලීමක් කරලා නැහැ. අද වෙනකම් එහෙම ඉල්ලීමක් කරලා නැහැ. ඇයි, එහෙම කළේ නැත්තේ? එහෙම කළේ නැත්තේ මේ හාදයාට වසංවෙලා සිංගප්පූරුවේ සිටීමට අනුබල දීම මේ ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වෙලා තිබෙන නිසායි; අගමැතිගේ වුවමනාව වෙලා තිබෙන නිසායි. ජනාධිපතිතුමා ඒකට අනුකූලත්වය දක්වනවාද, නැද්ද කියලා මම දන්නේ නැහැ. ජනාධිපතිතුමාට පුළුවන්, මේ පිළිබඳව රාජ්‍ය තාන්ත්‍රික පියවරක් ගන්න. රටේ මහජන මුදල් ගසා කාපු මේ සිද්ධිය, ලංකාවේ මේ තාක් කාලයකට නොවූ විරූ විශාලතම මහජන මුදල් ගසා කෑම හැටියට වාර්තා වෙලා තිබෙනවා.

මේ විගණකාධිපතිතුමා කෝප් එකට ආපු වෙලාවේ, හරියට අපරාධකාරයෙකුගෙන් හරස් ප්‍රශ්න අහනවා වාගේ තමයි යූඇන්පී මන්ත්‍රීවරුන් එදා හරස් ප්‍රශ්න ඇසුවේ. ඊට අමතරව අගමැතිතුමා ඇතුළු රාජ්‍ය නායකයන් විගණකාධිපතිතුමාව කැඳවා එක්තරා විධියකට බලපෑම් කළා. හරි විධියට බලනවා නම්, විගණකාධිපතිතුමාගේ රාජකාරිවලට අයුතු හෝ කිසියම්ම වූ හෝ බලපෑමක් යම් කෙනෙක් කළා නම්, ඒ බලපෑම් කරපු උදවියට විරුද්ධව නීතිය අනුව කටයුතු කළ හැකියි; ඒ අයට විරුද්ධව අපරාධ උසාවියේ නඩු දැමිය හැකියි.

අගමැතිතුමා ගැනයි මා කථා කරගෙන යන්නේ. අගමැතිතුමා ශ්‍රී ලංකා මහ බැංකු මගඩියේ සැකකරුවකු හා චිත්තිකරුවකු හැටියට අපි දැනටම අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට පැමිණිලි කර තිබෙනවා. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම මේ ගැන කරපු කෙහුරක් නැහැ. "මේ හේතු නිසා මේ ගැන පියවරක් ගන්නේ නැහැ"යි කියලාවත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසම අපට දන්වා නැහැ. මේ පනත් කෙටුම්පතේ හැම තැනම තිබෙනවා, යම් යම් තීරණවලට එළඹුණේ ඇයි කියලා ගණන් දීමේ නිලධාරී හේතු දක්වන්න ඕනෑය කියලා. ඊළඟට ගණන් දීමේ නිලධාරියාගේ අභියාචනා -

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

ගරු වාසුදේව නානායක්කාර මහතා
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார)
(The Hon. Vasudeva Nanayakkara)
මා අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අධිභාර අභියාචනා කමිටුව ගැන මේ පනත් කෙටුම්පතේ සඳහන් වෙනවා. ඊට පසු අධිකරණය මඟින් මුදල් අය කර ගැනීම පිළිබඳව මේ පනත් කෙටුම්පතේ සඳහන් වෙනවා. මේ ක්‍රියාදාමයට අතිරේකව රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව මේ සියලුම වාර්තා විමර්ශනය කරන බව මා නැවතත් කියනවා. මෙතැන සාවද්‍ය පරිහරණයක් තිබෙනවාය කියලා එවැනි අවස්ථාවලදී රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව නිර්දේශ කරනවා නම්, COPE එක නිර්දේශ කරනවා නම්, ඒ ගැන විගණකාධිපතිතුමාත් එකඟත්වය පෙන්වනවා නම්, නීතිය ක්‍රියාත්මක කරන අදාළ අංශවලට, නීතිපතිතුමාට ඒ අනුව ක්‍රියා කරන්නය කියලා මේ පාර්ලිමේන්තුව නියමයක් කළ යුතුයි. ඒ ගැන නැවත ඒ අය පාර්ලිමේන්තුවට පිළිතුරු වාර්තා කළ යුතුයි කියලා යම් ආකාරයක නියමයක් අවශ්‍ය බව කියමින් මා නිහඬ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි.

ඊළඟට, ගරු ඉරාන් වික්‍රමරත්න රාජ්‍ය ඇමතිතුමා.

[අ.භා. 12.45]

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன - நிதி இராஜாங்க அமைச்சர்)
The Hon. Eran Wickramaratne - State Minister of Finance)
ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාතිතුමනි. අද දිනයේ ජාතික විගණන පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම මා හිතන විධියට බොහොම වැදගත් කාර්ය භාරයක්. අපේ රජය 2015 දී ඉදිරිපත් කළ "පංච විධ ක්‍රියාවලිය" ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ තිබුණු එක කරුණක් තමයි ජාතික විගණන පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම. දැනටම සඳහන් කර තිබෙන පරිදි ජාතික විගණන පනත් කෙටුම්පත ගෙනෙන්න ප්‍රමාදයක් ඇතිවෙලා තිබෙනවා. ඇත්තටම මේ ජාතික විගණන පනත් කෙටුම්පතින් කරන්න හදන්නේ විගණකාධිපති හා විගණන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමක්.

අපේ රටේ විශේෂයෙන්ම මුදල් වැනි සම්පත්වල විශාල අවභාවිතයක් තිබෙන බව අපි දන්නවා. මෙය සෑහෙන දීර්ඝ කාලයකට පවතින අවභාවිතයක්. මේ අවභාවිතය අවම කර

ගැනීමට පාර්ලිමේන්තුවේ අධීක්ෂණය තිබෙනවා. පාර්ලිමේන්තුවේ අධීක්ෂණයට උපකාරී වෙන්නේ ප්‍රධාන වශයෙන්ම විගණකාධිපති දෙපාර්තමේන්තුවේ ක්‍රියාවලියයි. විශේෂයෙන්ම ඒ රපෝර්තු තමයි අපට උපකාරී වෙන්නේ. ඒ නිසා අනිවාර්යයෙන්ම එම ක්‍රියාදාමය ශක්තිමත් කළ යුතුයි. මේ පනත් කෙටුම්පතේ අරමුණ වෙන්නේ ඒකයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තව ගැටලුවක් තිබෙනවා. ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කථා කරනකොට මේ යෝජිත පනත් කෙටුම්පත තුළ තිබෙන නොයෙකුත් අඩුපාඩු පෙන්වා දුන්නා. මා හිතන හැටියට මෙහි තිබෙන තවත් ගැටලුවක් තමයි, පනත් කෙටුම්පතක් ඉදිරිපත් කරනකොට විගණන බලයයි, අධිකරණ බලයයි සමතුලිත කර ගන්නේ කොහොමද කියන කාරණය. මොකද, විගණනය කියන්නේ එකක්. කවුරුන් හෝ වරදක් කර තිබෙනවා නම්, දූෂණයක් කර තිබෙනවා නම් ඒ අය එයට වග කියන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි, ඒ අයට දඬුවමක් දෙන්නත් ඕනෑ. ඒ දඬුවම කොතැනින්ද දෙන්න ඕනෑ, කවුද දෙන්න ඕනෑ කියන ගැටලුව තිබෙනවා. විගණන බලතලයි, අධිකරණ බලතලයි පිළිබඳව ගැටලුවක් තිබෙනවා. මා හිතන විධියට මේ එකක් අනෙක් එකෙන් වෙන් වෙන්න ඕනෑ. සමතුලිතභාවයක් තිබෙන්නට ඕනෑ. ඒ වාගේම විගණකාධිපතිගේ බලය ශක්තිමත් කරන්න ඕනෑ, එතුමාට යම් පියවරයන් ගන්න.

ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කථා කරනකොට, කෙන්යාවේ අලුත් විගණන පනත ගැන සඳහන් කළා. කෙන්යාවේ අලුත් විගණන පනතට අනුව, විගණනය කරන අවස්ථාවේදී දූෂණයක්, වංචාවක් දැක්කොත් විගණකාධිපතිතුමාට කෙළින්ම ඒ බව පොලීසියට දන්වන්න පුළුවන් කියා ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා. ඒ වාගේ බලතල ඇත්තටම අපිට එතුමාට දෙන්න පුළුවන්ය කියා මා හිතනවා. මොකද, ඒක අධිකරණ බලයක් නොවෙයි. කෙළින්ම ක්‍රියාවලියට යොමු කිරීමක්; පටන් ගැන්මක්. එවැනි දෙයක් තිබෙනවා නම් හුඟක් හොඳයි කියා මමත් හිතනවා.

2015 ජනවාරි 08වන දා අපේ රජය බලයට පත් වුණාට පසුව අපි දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනාවා. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ අපි කොමිෂන් සභා කීපයක්ම පත් කළා. විගණන සේවා කොමිෂන් සභාව ගැනත් එහි සඳහන් කර තිබෙනවා. මෙම පනත් කෙටුම්පත ගෙන එන්න ප්‍රමාද වුණාය කියා සමහර අය කිව්වා. ඔව්, ප්‍රමාදයක් ඇතිවෙලා තිබෙනවා. මේ පනත් කෙටුම්පත ඉතා සුපරීක්ෂාකාරීව සකස් කිරීමට රජය උපරිම සැලකිල්ලක් දක්වා තිබෙනවා. නිලධාරීන්ගෙන් හා වෙනත් ස්ථානවලින් ලැබුණු අදහස්, නිරීක්ෂණ සියල්ලක්ම සැලකිල්ලට අරගෙන තමයි අපි මේ ජාතික විගණන පනත් කෙටුම්පත ඉදිරිපත් කර තිබෙන්නේ. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය මූල්‍ය සම්බන්ධව විගණකාධිපතිවරයාට දෙන බලතලවලට අමතරව, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 41වා. අනුව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් ස්වාධීන කොමිෂන් සභාවත් මේ යටතේ අපි පිහිටුවා තිබෙනවා.

විගණකාධිපතිවරයා විගණන ආයතනවල ස්වාධීනත්වය රකින්න ඕනෑ; ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ වෙනම පනතක් ගෙනැත් හෝ එතුමා එය රකින්න ඕනෑය කියා එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 66වන සැසි වාරය පවත්වන අවස්ථාවේ සඳහන් කළා. මේ පනත් කෙටුම්පත සම්මත කරගැනීමෙන් අපි අද ඒ දෙය සිදු කරනවා.

බොහොම කෙටියෙන් මම මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. අද ගරු සභාව තුළ ඇති වුණු විවාදයේදී යෝජනා කීපයක්ම ඉදිරිපත් වුණා. විශේෂයෙන්ම වරදක් වෙලා තිබෙනකොට, අභියාචනයක් ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදයේ අඩුපාඩු තිබෙනවා කියා එක් අවස්ථාවකදී කිව්වා. නමුත් මා මේ කාරණය කියන්න ඕනෑ. මට කලින් කථා කළ සමහර මන්ත්‍රීවරුන් මේ කාරණය සඳහන් කළා. හොරකමක් වෙලා තිබෙනවා නම් -ක්‍රමවේදයේ ප්‍රශ්නයක් තිබෙනවා නම්- අධිභාරයක් පනවන්න පුළුවන්. ඒකට අභියාචනයක් ඉදිරිපත් කරන්න පුළුවන්. සමහර වෙලාවට, ලබාදෙන දඬුවමේ ප්‍රමාණය අඩුද, වැඩිද කියා අපිට හිතෙන්න පුළුවන්. නමුත් අලාභයක් ඇති වුණා නම්, ඒ මුළු අලාභයම මේ පනත හරහාම පියවන්න බැරි බව මමත් පිළිගන්නවා. දූෂණය, වංචාව වාගේ දෙයක් සඳහා නම් දැනට තිබෙන ක්‍රමවේදය වන දණ්ඩ නීති සංග්‍රහය හරහා කටයුතු කරන්න පුළුවන්. නමුත් අපිට තිබෙන ගැටලුව මෙකයි. අපේ රටේ නීතිය ක්‍රියාත්මක වීමේ ප්‍රමාදය මූලික ප්‍රශ්නයක්. ඒ නිසා මෙවැනි දේවල් තුළින් ඒ ප්‍රශ්නත් විසඳන්න පුළුවන්ද බලන්න සමහර වෙලාවට වෑයමක් තිබෙන්න පුළුවන්. ඇත්තටම මේ වාගේ නීති පැනවීමෙන් ඒ මූලික ප්‍රශ්නය විසඳන්න අපහසුයි. මොකද, ඒක මූලික ප්‍රශ්නයක්. වංචාව, දූෂණය සම්බන්ධයෙන් කටයුතු කරන්න උසස් අධිකරණ හඳන්න පනත් කෙටුම්පතක් ගෙනැත් ළඟදී අපි එය සම්මත කර ගත්තා. ඒ ක්‍රියාවලිය දැන් ඉදිරියට යනවා. අධිකරණය හරහා ඒ දේ ඉෂ්ට කරන්න නම් එවැනි ක්‍රියාවලි අපිට හොයන්න වනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ජාතික විගණන පනත් කෙටුම්පතේ 7. (4) උපවගන්තියේ මෙසේ සඳහන් වනවා:

> "....එකී තැනැත්තාට නොවැළැක්විය හැකි තත්ත්වයක් හේතුවෙන් පෞද්ගලිකව පෙනී සිටීමට නොහැකි අවස්ථාවක දී, ඔහු විසින් ඒ වෙනුවෙන් විගණකාධිපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු ඉදිරියේ පෙනී සිටීම සඳහා එම, විෂයය පිළිබඳ මනා දැනුමක් ඇති වෙනත් තැනැත්තකු නම් කරනු ලැබිය හැකි ය."

ලොකු වගකීම් තිබෙන නිලධාරීන්ට -ලේකම්වරු වාගේ අයට - සමහර වෙලාවට හැම අවස්ථාවකදීම පෙනී සිටින්න බැරි වෙන්න පුළුවන්; ඒ අයට නොයෙකුත් හේතු තිබෙන්න පුළුවන්, එතකොට ඒ පිළිබඳ දැනුම තිබෙන වෙනත් කෙනෙක් ඒ වෙනුවට යන්න ඕනෑය කියන එකයි මා හිතන විධියට එයින් අදහස් කළේ. නමුත් ඊළඟ වගන්තියෙන් කියන්නේ මොකක්ද බලන්න.

ජාතික විගණන පනත් කෙටුම්පතේ 7. (5) උපවගන්තියේ මෙසේ සඳහන් වනවා:

> "ස්වකීය කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේදී විගණකාධිපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධරයෙකු, වෙනත් යම් තැනැත්තකුගේ හෝ අධිකාරියක මැදිහත්වීමකට හෝ බලපෑම් කිරීමකට යටත් නොවිය යුතු ය."

මම මේ කාරණය විතරක් අදාළ කර ගන්නේ නැහැ. නමුත්, සාමාන්‍යයෙන් ඒ පෙනී සිටින තැනැත්තා විගණකාධිපතිවරයාට පිළිගත හැකි තැනැත්තෙක් විය යුතුයි. මම හිතන්නේ අපට ඒකෙන් පිටට යන්න බැහැ. වරදක් වෙලා තිබෙනවා නම්, වංචාවක් වෙලා තිබෙනවා නම් වෙනත් කවුරු හෝ එවලා එය වසන් කරන්න අපට බැහැ. ඒ එවන තැනැත්තා විගණකාධිපතිවරයාට පිළිගත හැකි පුද්ගලයෙක් වෙන්න ඕනෑ. එතකොට විගණකාධිපතිවරයාට කියන්න පුළුවන්, අද එන්න බැරි නම් අනාගතයේදී ඒ පුද්ගලයාට එන්න පුළුවන් කියා. වෙනත් දිනයක කථා කරන්නත් පුළුවන්.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මම ඔබතුමාගේ අදහසට එකඟ වනවා. මම කියන්නෙත් ඒකමයි. නමුත්, "විගණකාධිපතිවරයා විසින් අනුමත කරන; විගණකාධිපතිවරයා විසින් පිළිගන්නා තැනැත්තෙක්" කියන කොටස මේ වාක්‍යය තුළට ඇතුළත් වෙන්න ඕනෑ. ඒ කොටස ආවා නම් ඔබතුමා කියන දෙය සම්පූර්ණ වෙනවා. වාක්‍යයේ අවසාන කොටසින් ඒ කරුණ මතු වන්නේ නැහැ. අවසාන කොටසින් කියන්නේ, "විගණකාධිපතිවරයා හෝ ඔහුගේ බලය පවරපු තැනැත්තෙකුට බලපෑම් කරන්න බැහැ" කියා විතරයි. නම් කරන තැනැත්තා විගණකාධිපතිවරයාට ප්‍රතික්ෂේප කරන්න පුළුවන් කියා ඒකෙන් කියන්නේ නැහැ. සුදුසුකම් නැති පුද්ගලයෙක් නම්. "මනා දැනුම ඇති පුද්ගලයා" කියා තීරණය කරන්නේ විගණකාධිපති නොවෙයි නේ. නම් කරන තැනැත්තා නේ. ඒ නිසා, "විගණකාධිපතිවරයා ඒකට සෑහීමකට පත් විය යුතුයි" කියන කොටස එකතු වෙන්න ඕනෑ. එහෙම වුණා නම් හොඳටම හොඳයි.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

ඒකේ අපැහැදිලිතාවක් වෙන්න පුළුවන්. නමුත්, මූලධර්මය වන්නේ අනිවාර්යෙන්ම විගණකාධිපතිවරයා පිළිගත යුතු තැනැත්තෙක් වෙන්නම ඕනෑය කියන එකයි. වෙන තැනැත්තකුට ඇවිත් ඉදිරිපත් වෙන්න බැහැ. පිළිගත හැකි තැනැත්තෙක් විය යුතුයි. නැත්නම් අපට මේ ගැන සම්බන්ධයක් නැති පුද්ගලයෙක් එතැනට එවන්න පුළුවන්. මම හිතුවේ ඒ මූලධර්මය මෙතැන අඩංගුයි කියායි. එහි අපැහැදිලිතාවක් තිබෙනවා නම්, ඒක අපි නීතිපති දෙපාර්තමේන්තුවට යොමු කළ යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මම තව එක කරුණක් කියන්න කැමතියි. තව කාරණයක් කිව්වා, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත මෙයින් සීමා වෙන බවක් පෙනෙනවාය කියා. ජාතික විගණන පනත් කෙටුම්පතේ 9වන වගන්තියේ එය සඳහන් වෙනවා. ඒ වාගේම "...පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන තුරු..." කියාත් සඳහන් වෙනවා. ඇත්තටම වෙන වෙන පනත් ගෙනැත්, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත සීමා කරන්න අපේ කිසිම අදහසක් නැහැ. මොකද, එම පනත ගෙනාවේත් අපේ රජයයි. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ගැන මේ සභාව තුළ අවුරුදු ගණනාවක් සාකච්ඡා වෙලා තිබෙනවා. සමහර රටවල් අවුරුදු 200කට කලින් තමයි පුරවැසියාට මේ අයිතිවාසිකම දුන්නේ. ආසියාවේ හැම රටකම වාගේ මේ අයිතිය තිබෙනවා. ලංකාවේ පුරවැසියාට මේ අයිතිය ලැබුණේ 2015 අප්‍රේල් මාසයෙන් පසුවයි. ඒක සීමා කරන්න රජයට කිසිම අදහසක් නැහැ. ජාතික විගණන පනත් කෙටුම්පත අනුව ඒ ගැන අපැහැදිලිතාවක් තිබෙනවා නම් අපි එය නිරවුල් කර ගනිමු. ඒක සීමා කරන්න අපේ අදහසක් නැහැ. නමුත්, criminal investigation එකක් වැනි දෙයක් ගැන නම් විගණකාධිපතිවරයාට ප්‍රශ්නයක් තිබෙන්න පුළුවන්. ඒ වාගේ දූෂිත දෙයක් සොයා ගෙන යනකොට සමහර වෙලාවට ඒ කරුණු ප්‍රසිද්ධ කරන්න බැහැ. නැත්නම් ඒ කරන සොයා ගැනීමටත්, පසුව ඉදිරිපත් කරන්න යන අධිකරණ ක්‍රියාවලියටත් ඒක ගැටලුවක් වෙන්න පුළුවන්. ඒ නිසා මෙතැන අපැහැදිලිතාවක් තිබෙනවා නම් තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනතට කිසිම පටලැවිල්ලක් නොවන ආකාරයට ඒ ආරක්ෂාව විගණකාධිපතිතුමාට ලබා දිය යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පර්පෙචුවල් ට්‍රෙෂරීස් සමාගමේ ගනුදෙනුව නිසා අර්ථසාධක අරමුදල්වලට සිදු වුණු අක්‍රමිකතා සහවන්න රජය මේ වාගේ ක්‍රියාවලියක යෙදෙනවාය කියා මට ප්‍රථමයෙන් කථා කළ මන්ත්‍රීතුමා යම් ඇඟවීමක් කළා.

එහෙම කිසිම දෙයක් නැහැ. විශේෂයෙන් සඳහන් කළා, අර්ථ සාධක අරමුදල-

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

විශේෂයෙන්ම අර්ථ සාධක අරමුදල ගැන සඳහන් කළා. අපි අනිවාර්යයෙන්ම අර්ථ සාධක අරමුදල ආරක්ෂා කරන්න ඕනෑ. මගේ ජීවිත කාලයේම මමත් මුදල් දැම්මේ අර්ථ සාධක අරමුදලට තමයි. ඒ මුදලෙන් තමයි විශ්‍රාම ජීවිතය ගත කරන්න බලාපොරොත්තු වෙන්නේ. ඒක අපි අනිවාර්යයෙන්ම ආරක්ෂා කරන්න ඕනෑ. නමුත් අර්ථ සාධක අරමුදලේ මුදල් අවභාවිතයක් වෙලා තිබෙනවා. ඒක වෙලා තිබෙන්නේ, ඊයේ-පෙරේදා විතරක් නොවෙයි. සෑහෙන කාලයක ඉඳන් මේ අවභාවිතය වෙලා තිබෙනවා. ඒක නිසා මහ බැංකුව දැන් ක්‍රියාත්මක කරගෙන යනවා, Forensic Audit එකක් කරන්න. ඒවා පත්තරවල ප්‍රකාශ කරලා තිබෙනවා, විදේශ විගණන සමාගම්වලට ආරාධනා කරලා තිබෙනවා. 2018 ජූලි මාසය අවසන් වෙන්නට ප්‍රථමයෙන් ඒ අයට ඉල්ලන්නට පුළුවන් ඒ Forensic Audit එකට සහභාගී වෙලා අර්ථ සාධක අරමුදලේ- 2015 වසරේ ඒවා විතරක් නොවෙයි. 2015ට ඉස්සර කාලයටත් ගිහිල්ලා ඒ ගැන හොයලා බලලා ඒක අපි ප්‍රසිද්ධ කරලා හොරකම් කරපු අයට දඬුවම් දෙනවා දෙනවාමයි කියන එක මේ ගරු සභාවේදී සඳහන් කරන්න අවශ්‍යයි. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is Hon. Anura Priyadharshana Yapa. Before that, will an Hon. Member propose Hon. Heshan Withanage to the Chair?

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

I propose that the Hon. Heshan Withanage do now take the Chair.

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

විසින් ස්ථිර කරන ලදී.
ஆமோதித்தார்.
Seconded.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු හේෂාන් විතානගේ මහතා මූලාසනාරූඪ විය.

அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹேசான் விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. HESHAN WITHANAGE *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථා කරන්න, ගරු මන්ත්‍රීතුමා.

[අ.භා. 1.00]

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටේ ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න, මහජන පරමාධිපත්‍ය රැක ගන්න, රජයේ මුදල් අවභාවිත වීම වළක්වන්න ඕනෑම රටක් ක්‍රියා කිරීම ඉතාම අත්‍යාවශ්‍ය කාරණාවක්. ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදී රටක මේ මූලධර්ම අඩංගු වුණොත්, ඒ පිළිබඳ නීතියේ පැහැදිලිතාවන් තිබෙනවා නම් ඒ රටවල් බොහොම වේගයෙන් ඉදිරියට ගොස් තිබෙනවා. විශේෂයෙන්ම ලංකාවේ විගණනය පිළිබඳ සැහෙන ඉතිහාසයක් තිබෙනවා. බ්‍රිතාන්‍ය යුගයේ තමයි මේ විගණන ක්‍රමය පටන් ගත්තේ. අඩු පාඩු සහිතව වුණත් ලොකු වැඩ කොටසක් විගණන දෙපාර්තමේන්තුව හරහා සිදු වුණා කියන එක විතරක් මම මේ අවස්ථාවේදී කියන්න කැමැතියි. පාර්ලිමේන්තුවට පැමිණි දා පටන් මටත් අවස්ථාවක් ලැබුණා, ප්‍රධාන කමිටු දෙකේම -කෝප් එකේත්, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේත්- ක්‍රියා කරන්න. මට වසර කිහිපයක් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියටත් වැඩ කරන්න පුළුවන් වුණා. අපි දන්නවා, කොයි තරම් දුරට වැදගත්ද කියලා රාජ්‍යයක වියදම් පිළිබඳ නිවැරදි ගිණුම් පවත්වා ගැනීම.

විගණකාධිපති දෙපාර්තමේන්තුවට මොන පනතක් ගෙනාවත් රාජ්‍යයේ සියලුම ගිණුම් එලෙසම විගණනය කරන්න හරි අමාරුයි. ඔවුන්ටත් පුළුවන් වන්නේ යම් නියැදියක් මත පරීක්ෂණයක් කරන්න. විශේෂයෙන්ම අපේ ව්‍යවස්ථාවෙනුත් විගණකාධිපතිවරයාව විශේෂ පුද්ගලයෙක් බවට පත් කරලා තිබුණා. නමුත් දිගින් දිගටම තිබුණු ප්‍රශ්නය තමයි, රාජ්‍ය අංශයේ සිදු වුණු යම් යම් දේවල් සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා ක්‍රියා කිරීමේදී හෝ විගණකාධිපතිවරයාගේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ක්‍රියා කිරීමේදී සෘජු තීන්දු ගැනීමට අවශ්‍ය කරන නීති පද්ධතියක් අපේ රටේ නැතිකම. ඒ වෙනුවට තිබුණේ, අපේ තිබෙන ටෙන්ඩර් පටිපාටිය, අපේ තිබෙන මුදල් රෙගුලාසි. මේ මත තමයි බොහෝ විට ඒ අවශ්‍ය කටයුතු කෙරුණේ. අද මම ස්තුතිවන්ත වෙනවා, ජාතික විගණන පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන්. පසු ගිය කාලය පුරාම විශේෂයෙන්ම හිටපු විගණකාධිපති මායාදුන්නේ මැතිතුමා සහ වර්තමාන විගණකාධිපතිතුමා දක්වා වන මා දන්නා කාලය ඇතුළත ඒ විගණකාධිපතිවරුන් විශාල ස්වාධීනතාවකින් තමන්ගේ අදහස් ප්‍රකාශ කරලා ජාතික විගණන පනතක් ගෙනෙන්න උත්සාහ කෙරුවා.

මට මෙතැන කථාවේදී තේරුණු දෙයක් තමයි, ජාතික විගණන පනත් කෙටුම්පතෙන් ක්‍රියාත්මක වෙන්න උත්සාහ කරන්නේ අධිභාරයක් පැනවීම කියලා. ඒක විතරක් ජාතික විගණන පනත් කෙටුම්පතේ අත්‍යාවශ්‍ය දෙයක් හැටියට මම හඳුන්වන්නේ නැහැ. ප්‍රධාන කාරණා හතරක් සිදු නොවුණොත් තමයි අධිභාරයක් පනවන්නේ. යම් නිලධාරියෙක් සිදු කළ වංචාවක්, නොසැලකිල්ලක්, සාවද්‍ය පරිහරණයක් හෝ දූෂණයක් හේතුකොටගෙන කරන විගණන පරීක්ෂණයකදී අන්න ඒ නිලධාරියාට හෝ තැනැත්තන්ට එරෙහිව කටයුතු කරන්න පුළුවන්. අපි පිළිගන්න ඕනෑ, මේ වැඩ පිළිවෙළේදී එක පැත්තකින් සමහර අංශවල ඌනතා තිබෙන බව. බොහෝ රාජ්‍ය නිලධාරීන් - අපි ඒ පැත්තත් කියන්න ඕනෑ.- ඉතාම අවංක සේවාවකුත් ඉටු කරනවා. මේක, මේ දෙපාර්ශ්වය අතර තිබෙන ප්‍රශ්නයක්.

නමුත්, සමහරුන්ගේ තිබෙන වැරදි ක්‍රියාමාර්ග නිසා රටට ඇතිවෙලා තිබෙන පාඩුව කුඩා+ පාඩු හැටියට ගණන් ගන්න බැහැ; මහා පාඩු හැටියට තමයි ගණන් ගන්න වෙන්නේ. මට කලින් කථා කළ ගරු වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා කිව්වා වගේ, අපේ රටේ මහ බැංකු බැඳුම්කර වංචාව මඟින් සිදුවෙලා තිබෙන පාඩුව ඇත්ත වශයෙන්ම විගණකාධිපතිතුමාටත් හරියාකාරව කියාගන්න බැරි තරමටම වැඩියි. වංචාවන් නොසැලකිල්ල කියන්නේ ඒකයි. අපේ රටේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ඒ වාගේම ආයතන විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ලෝකයේ දියුණු රටවල්වල එවැනි දැවැන්ත ප්‍රමාණයක් නැහැ. පෞද්ගලික අංශය විසින් පාලනය කරනු ලබන අංශ තමයි ඒ රටවල තිබෙන්නේ. නමුත්, අපේ රටේ එවැනි රජයේ ආයතන විශාල සංඛ්‍යාවක් තිබෙනවා. ඒ විශාල සංඛ්‍යාව අපි මේ පාර්ලිමේන්තුවෙන් අනුමත කරලා ඉදිරියට දමන මුදල්, අය වැයකින් යොදවන මුදල් පාවිච්චි කරනවා. එසේ පාවිච්චි කිරීමේදී සිදුවන තත්ත්වයන් පිළිබඳව පාර්ලිමේන්තුවටත්, ඒ වාගේම රටටත් ප්‍රශ්නයක් තිබෙනවා. එම නිසා විගණන පනතක් හරහා එය යම් ආකාරයක ක්‍රමවේදයකට යටත් කිරීම ඉතාමත්ම අවශ්‍යයි කියා මම හිතනවා.

ඇත්ත වශයෙන්ම මෙම පනත ක්‍රියාත්මක කිරීම සඳහා වැදගත් වන අංශ දෙකක් මම ඔබතුමන්ලාගේ අවධානයට යොමු කරවන්න කැමැතියි. එකක් තමයි පුහුණුව ලබාදීම. මොකද, අද අපි ඉන්නේ වාණිජ සමාජයක් ඇතුළේ. රජය වාණිජ ක්‍රියාකාරකම් විශාල ප්‍රමාණයක් කරනවා. එම වාණිජ ක්‍රියාකාරකම් කරන සමහර අවස්ථාවලදී රාජ්‍ය නිලධාරීන්ට විවිධාකාර තීන්දු ගන්න වෙනවා. ඒ තීන්දුවක් ප්‍රශ්නගත තීන්දුවක් බවට පත් වෙන්නත් පුළුවන්. නමුත්, තමන් සද්භාවයෙන් ක්‍රියා කළා කියලා ඔප්පු කරන්න පුළුවන්කමක් ඇති වුණොත්, ඒ සම්බන්ධයෙන් විගණනයන් සාධාරණ ලෙස බලාවි කියා මම විශ්වාස කරනවා. එහෙම නැතුව, විගණනය පොලිස්කාරයෙක් බවටත්, රාජ්‍ය නිලධාරියා හැම විටම සැකයට භාජන වන පුද්ගලයෙක් හැටියටත් තිබුණොත් එය කිසිම ආණ්ඩුවකට යහපත් ප්‍රතිඵලයක් ඇති කරන්නේ නැහැ. එම නිසා මෙම විගණන පනත් කෙටුම්පතත් එක්ක එන්න ඕනෑ වැදගත් දෙයක් තමයි දෙපාර්ශ්වයටම පුහුණුව ලබා දීම. හැම වෙලාවේම විගණනය කරන නිලධාරිනුත්, විගණනයට ලක්වන නිලධාරිනුත් තමන් කරන කාර්ය පිළිබඳව මනා පරිචයකින් වැඩ කරන්න ඕනෑ කියලා පිළිගන්න ඕනෑ.

මම දන්නවා, අපේ ලංකාවේ, විශේෂයෙන්ම භාණ්ඩ මිලදී ගැනීම වැනි කටයුතුවලදී බොහෝ වෙලාවට ටෙන්ඩර් කැඳවලා අවම මිලට තමයි ටෙන්ඩර් ලබා දෙන්න ඕනෑ බව. හැබැයි, ලංකාවට විවිධ තැන්වලින් ගෙනෙන කිසිම ප්‍රමිතියක් නැති භාණ්ඩ හරහා ලංකාවේ ආණ්ඩුවට විශාල පාඩුවක් සිද්ධ වන බව අපි නිරන්තරයෙන්ම දැකලා තිබෙනවා. රජයේ සමහර කාර්යාලවලට තත්ත්වයෙන් ඉතා බාල භාණ්ඩ ලබා ගැනීමට සිදුවීම නිසා ඇති වන තත්ත්වයන් අපි දැක තිබෙනවා. ඒ වෙනුවට හොඳ භාණ්ඩයක් ගන්න ගියොත්, ඊට ඉහළ මිලකට අනුමැති දුන්නොත්, අනිවාර්යයෙන්ම ඒක මේ ක්‍රමය යටතේ විතරක් නොවෙයි, සාමාන්‍ය ක්‍රමය යටතේත් වැරදියි. ඒ නිසා, මේකේ අරමුණ මොකක්ද කියලා අපි සියලුදෙනාම තේරුම් ගන්න ඕනෑ. මේකේ අරමුණ තව පොලිස්කාරයෙක් හදන එක නොවෙයි. රටේ තිබෙන වියදම් කරන ආයතන, පුද්ගලයන් සහ නිලධාරීන් එම වියදම සාධාරණීකරණය කිරීමට සහ වඩා හොඳ විධියට ක්‍රියා කරන්න දිරි ගැන්වීමක් සිදු වන හැටියටයි අපි ක්‍රියා කරන්නට ඕනෑ. එහෙම නැතුව හැම පනතකින්ම සිදු කරන්නේ යම් යම් අය තුළ භීතියක් ඇති කිරීම නම්, ඒක සාධාරණ සමාජයකට හොඳ අදහසක් නොවෙයි.

විගණකාධිපති දෙපාර්තමේන්තුවට විශාල වැඩ කොටසක් තිබෙන බව මම දන්නවා. ඒ වැඩ කොටස ඉටු කිරීම සඳහා එම

[ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා]

නිලධාරීන් විශාල ප්‍රයත්නයක් දරනවා. එසේ ප්‍රයත්න දරන කොට ඒ හා සමඟ එන විගණනයකදී, විශේෂයෙන්ම යම් පුද්ගලයෙක් විගණනය සඳහා කැඳවනවා නම් හෝ ඔහු වෙනුවෙන් සහභාගි වෙනවා නම්, ඒ පුද්ගලයා විගණකාධිපතිවරයාගේ පිළිගැනීමට ලක් වෙන්නට ඕනෑය කියන කාරණයට මමත් එකඟ වෙනවා. එහෙම නැත්නම් ඒක සාධාරණ වෙන්නේ නැහැ. එම නිසා මෙම පනත් කෙටුම්පත ඇතුළේ රාජ්‍ය නිලධාරියෙකුටත් පුළුවන් තරම් සාධාරණයක් ඉටු කරලා තිබෙනවා.

ඒ අභියාචනා කමිටු පත් කිරීමෙන්, ඒ වාගේම අධිකරණයට යාමට තිබෙන ඉඩකඩ වැඩි කිරීමෙන්, අධිභාරයන් පිළිබඳ විවිධ කරුණු ඉදිරිපත් කිරීමෙන් සාධාරණය ඉටු කර තිබෙනවා. මූලික අධිභාරයෙන් පසු ඒ අභියාචනා කමිටු ඇති කිරීමේදී පුළුවන්තරම් දුරට සාධාරණය ඉටු කිරීමට මේ පනත් කෙටුම්පතෙන් ඉඩ ලැබිලා තිබෙනවා. අපේ රටේ ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඒ තමයි රාජ්‍ය මුදල් වියපැහැදීම් කිරීමේදී ඒ රාජ්‍ය මුදල් වියපැහැදීම් කරන ආකාරය සහ ඉන් ලැබෙන ප්‍රතිලාභය පිළිබඳ ගණනයක් බොහෝවිට සිදු නොවීම. ඒ කියන්නේ forensic audit එකක් සිදු වෙන්නේ නැහැ. අපි රුපියලක් වියදම් කරනවා නම්, අපට ඒ රුපියලම ප්‍රතිලාභයක් හැටියට ලැබෙනවාද කියලා අපි කොහේවත් තැනක ගණන් හදන්නේ නැහැ. මේක විශාල අඩුපාඩුවක් හැටියටයි මම දකින්නේ. ඇමතිවරයෙක් හැටියට මම බොහෝ කාලයක් වැඩ කරලා තිබෙනවා. රාජ්‍ය ආයතනවල කරුණු පිළිබඳව අත්දැකීම් රාශියක් මට තිබෙනවා. අපි වියදම් කරන හැම මුදලකටම ඒ ප්‍රතිලාභය ලැබෙන්න ඕනෑ කියන එකත් විගණනයේ ඉතා වැදගත් කාරණාවක්. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වර්තමාන සභාපති ගරු ලසන්ත අලගියවන්න මැතිතුමාත් මෙම අවස්ථාවේදී ගරු සභාවේ ඉන්නවා. මට මතකයි, ඉස්සර අපි ගිණුම් කාරක සභාවට, කෝප් කමිටුවට යනකොට අපට දකින්න ලැබුණේ අවුරුදු පහකට, හයකට එහා අවුරුදුවල විගණන වාර්තා. හැබැයි, ඒ කාලය වෙනකොට ඒ නිලධාරියා විශ්‍රාම ගිහිල්ලා; ඒ ගනුදෙනු සිද්ධ වුණු විධිය අපි දන්නේ නැහැ. ඒ නිසා ඇත්තටම ඒකෙන් සාධාරණයක් වුණේ නැහැ. මේ ආණ්ඩුව කොච්චර පම්පෝරි ගැහුවත් කලින් රජය තිබෙන කාලයේ මේ තත්ත්වය අපි නිරවුල් කෙරුවා. නිරවුල් කරලා නියමිත වසරවලට ඒක ගෙනාවා. මම මුලින් කිව්වා වාගේ ලෝකයේ ඕනෑම රටක ප්‍රජාතන්ත්‍රවාදය කියන වචනයේ මූලික ලක්ෂණය තමයි ආණ්ඩුවේ වැඩ කටයුතුවලින් රටේ මහජනයාට ප්‍රතිලාභයක් ඇති විය යුතු වීම. ඒ වාගේම රටේ වැඩ කටයුතු කිරීම සඳහා කාර්යාලවලට යන පුද්ගලයන් අතින් ඒවා අනලස්ව සිදු කෙරෙනවාද කියලා බලන එකත් මේ විගණන කාර්යයේම කොටසක් කියලා මම හිතනවා. බොහෝ වෙලාවට වැඩක් කර ගන්න රජයේ කාර්යාලයකට ගියාම දවස් ගණනාවක් රස්තියාදු වෙන්න ඕනෑ, හේතු විරහිතව. සමහර වෙලාවට තමන් පුරවාගෙන ආ පෝරමයක අන්තර්ගත ලේඛන පිළිබඳව විවිධ අවස්ථාවල, විවිධ දැනුම් දීම් කරලා ඒ අය රස්තියාදු කරවනවා. ඒ නිසා ලංකාවේ සාමාන්‍ය ජනයා රජයේ කාර්යාලයකට යනවා කියන්නේ මහමඟ රස්තියාදු වෙනවා කියන එකයි. සමහර වෙලාවට ඒ අය පැය ගණන් අදාළ නිලධාරියා ඉදිරිපිට වාඩිවෙලා ඉන්නවා. සාධාරණ හේතුවක් නිසාවත් ඒ නිලධාරියා ඒ ෆයිල් එක දෙස බලන්නේ නැහැ. ඒ නිසා රජයේ කාර්යාල ඇතුළේ අතපසු වුණු ලිපි ගොනු, වැඩ කරන්නේ නැති ලිපිගොනු රාශියක් තිබෙනවා. විගණනයේදී ඒවාත් බලන්න ඕනෑ. එවැනි ලිපිගොනු කොච්චර තිබෙනවාද කියලා බලන්න ඕනෑ. ඒ නිසා එකිනෙකා එකිනෙකාව විමර්ශනය කර ගැනීමේ ක්‍රමයක් ඇති කිරීමෙන් පමණයි විගණන පනතක් සාර්ථක කර ගන්න පුළුවන් වෙන්නේ. විගණන පනත හදලා, විගණකාධිපතිතුමාට භාරදීලා, වැඩේ වුණේ නැති වුණාම මේක කෙරෙන්නේ නැහැ කියලා ඒ පැත්තට ඇහිල්ල දිගු කරනවාට වඩා සෑම දෙනාම එකතුවෙන ක්‍රමවේදයක් රාජ්‍ය සේවයේ ඇති කරන්න ඕනෑ. රාජ්‍ය සේවය ඇතුළේ හැම කෙනෙකුටම වගකීමක් තිබෙන්න ඕනෑ. ඒ වගකීම මත තමයි සාමාන්‍ය ජනතාවට සේවයක් ඇති කරන්න අපට පුළුවන් වෙන්නේ. මේ පනත්වල පරමාර්ථය මොකක්ද? පරමාර්ථය හොරු අල්ලන එක විතරක් නොවෙයි නේ. ඒකත් කෙරෙන්න ඕනෑ. එහි අනිත් ප්‍රතිඵලය තමයි මහජනතාවට අනලස්ව වැඩ කරන එක. ඒ නිසා විගණන පනත් කෙටුම්පතේ යම් යම් සංශෝධන සිදුවිය යුතුයි. ඒවා සිදුවෙන්න ඕනෑ, මේ විගණන පනත අපි ක්‍රියාත්මක කළාට පසුව. ඒ නිසා මම හිතනවා, සෑම කෙනෙකුම මතක තබාගත යුතු ප්‍රධාන කරුණ තමයි විගණනය මඟින් කොහේවත් පොලීසියක් හදන්නේ නැහැ කියන කාරණය; පොලීසියක් හැදෙන්නේ නැහැ කියන කාරණය. ඒ වාගේම රාජ්‍ය සේවය ඉදිරියට ගෙන යෑමට, කාර්යක්ෂම කිරීමට මෙය හේතුවක් වේ යැයි මම විශ්වාස කරනවා. බොහෝ වෙලාවට අපි කථා කරන්නේ හොරකමක් ගැන විතරයි. පාර්ලිමේන්තුවේ කවුරු හෝ කට ඇරියොත් කියන්නේ හොරකමක් ගැන. හැබැයි, කථා කරන මනුෂ්‍යයාගෙත් මොකක් හෝ තිබෙනවා. ඒක ප්‍රජාතන්ත්‍රවාදයට සරිලන වැඩක් නොවෙයි. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නේ රටක පාලනය ගෙන යාම සඳහා සියලුදෙනාම එක්ව ක්‍රියාකිරීම සහ ඒ සඳහා වන නීති රීති, අණ පනත් ඇති කිරීම.

ඇත්ත වශයෙන්ම වර්තමාන ලෝකයේ බොහෝ කරුණු සම්බන්ධයෙන් නව නීතිරීති ගොඩාක් පැනවිලා තිබෙනවා. මානව අයිතිවාසිකම් රැකීම, පුවත් පත් නිදහස, මාධ්‍ය නිදහස, ඡන්ද අයිතිය වැනි බොහෝ කාරණා ඇති කිරීමට නීතිරීති ඇති කරලා තිබෙනවා. මට මතකයි අපි ආණ්ඩු කරන කාලයේ තමයි ලංකාවේ මැතිවරණයකදී ඡන්දය පාවිච්චි කිරීමට අනිවාර්යයෙන්ම ජාතික හැඳුනුම්පත අවශ්‍යයි කියලා නීතියක් ගෙනාවේ. ඒ අනුව, ප්‍රජාතන්ත්‍රවාදය ඇති කිරීම සඳහා පසු ගිය රජයෙනුත් විශාල කාර්යයක් ඉටු වුණා. කවුරුන් හෝ කියනවා නම් එසේ නොවුණා කියලා, ඒක වැරදියි. අපි හැමෝම මහන්සි වෙන්නට ඕනෑ, මහ ජනතාවට හිතවත් රාජ්‍ය සේවයක් නිර්මාණය කරන්නටත්, ඒ රාජ්‍ය සේවය නිසි ලෙස කළමනාකරණය කරන්නටත්. එතැනදී රාජ්‍ය නිලධාරියා තුළත් භියක් ඇති වෙන්නට නරකයි අපිට උඩින් තොණ්ඩුවක් එල්ලලා තිබෙනවා නේද කියලා. එහෙම වුණොත් ඒ අය වැඩ කිරීම අත හරිනවා. ඒ වැඩ කිරීම අත හැරියොත් අපි හිතන පතන කාර්යයන් සම්පූර්ණයෙන් ඉටු වෙන්නේ නැහැ. මේ විගණන පනත් කෙටුම්පත සම්මත කරගෙන ඒ හරහා හොරු අල්ලන්න යන එක නොවෙයි කරන්නට ඕනෑ. වඩා කාර්යක්ෂම පාලනයක් ඇති කිරීමට අන්‍යෝන්‍ය සහාය ලබා දීමයි කරන්නට ඕනෑ. මේ තත්ත්වය ඇති කරන්න පුළුවන් වුණොත් විතරයි මේ විගණන පනත් කෙටුම්පත වඩාත් සාර්ථක වෙන්නේ. මේ විගණන පනත් කෙටුම්පත ගෙනාවේ හොරුන් අල්ලන්නයි කියන මූලික තර්කය ඉස්සරහට ගෙනාවොත් කවදාවත් මේක සාර්ථක වෙන්නේ නැහැ. රාජ්‍ය පාලනයේ නොයෙකුත් කාරණාවලදී රාජ්‍ය නිලධාරීන් තමන්ගේම තීන්දු ගත යුතුයි.

සමෘද්ධි දීමනාව අලුතෙන් ලබා දීමේදී ඒ බලය ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් ඉවත් කරලා විශේෂ චක්‍රලේඛයක් නිකුත් වෙලා තිබෙනවා කියලා අද මට දැන ගන්නට ලැබුණා. ඒ කියන්නේ සමෘද්ධි දීමනාව ලබා දීමේදී අවසන් තීන්දුව ගැනීමේ වගකීම ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් ඉවත් කරලා. ඒ වගකීම දෙන්න හදන්නේ කාටද දන්නේ නැහැ. නමුත් ඒ වගකීම ප්‍රාදේශීය ලේකම්වරුන්ගෙන් ඉවත් කරලා තිබෙනවා. අද මේ ජාතික විගණන පනත් කෙටුම්පත සම්මත වුණාට පසුව මේ චක්‍රලේඛනය නීත්‍යානුකූල චක්‍රලේඛනයක්ද, නිකුත් කළ නිලධාරියා නොසැලකිල්ලක් කරලා තිබෙනවාද, ඒ හරහා දූෂණයක් ඇති වෙනවාද කියන කාරණය ගැනත් සොයලා බලන්නට ඕනෑ. අන්තිමට සමෘද්ධිය ලබා දෙන්නට යන්නේ දේශපාලන වශයෙන්

නම් ඒක ඒ තරම් හොඳ දෙයක් හැටියට ජේන්නේ නැහැ. එම නිසා මතක තියා ගන්න, යම් නිලධාරියකු වුණත් වැරදි තීන්දුවක් ලබා දුන්නොත් මේ පනත මඟින් ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළ හැකියි. එම නිසා අද පටන් නිලධාරීන් එවැනි වැරදි සිදු කිරීමෙන් වැළකී සිටීම තමයි වඩාත් ඥාණවන්ත වන්නේ. එහෙම තමයි මට හිතෙන්නේ. මේ ජාතික විගණන පනත් කෙටුම්පත ඉතාම හොඳ දෙයක්. අපි මේ ගැන වාර ගණනාවක් සාකච්ඡා කරලා තිබෙනවා. මේ රට දියුණු රටක් බවට පත් කිරීමේ මූලික කාරණාවලදී අපි කොයි පැත්තේ හිටියත් සහාය දෙන බව මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 1.17]

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා (පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் மான்னப்பெரும - சுற்றாடல் பிரதி அமைச்சர்)
(The Hon. Ajith Mannapperuma - Deputy Minister of Environment)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසයේ ආපු ගමන් මහ කණපිට හරවන්නට පුළුවන් පනත් කෙටුම්පතක් පිළිබඳව විවාද වන අවස්ථාවේදී ඒ ගැන අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. විශේෂයෙන්ම අපි දන්නවා දේශපාලනඥයාව ගමේ, ප්‍රදේශයේ, රටේ සලකන්නේ හොරෙක් විධියටයි කියලා. මොකද, මේ ක්ෂේත්‍රය තුළ ඒ තරමට දූෂණ සිදු වෙනවා. ඒ වාගේම පසුගිය දවස්වල මේ රටේ ප්‍රධාන රාජ්‍ය නිලධාරීන් දේශපාලනඥයින් වාගේම වංචා සහ දූෂණ කළ බව හෙළි දරවු වෙන්නට පටන් ගත්තා. ඒ අවකාශය නැති කරන්නට, රාජ්‍ය මුදල් අව භාවිතය නවත්වන්නට අවශ්‍ය නීතියක් රටට හඳුන්වා දෙන මේ අවස්ථාව, ඇත්ත වශයෙන්ම ස්වර්ණමය දවසක් ලෙසට ඉතිහාසයට එක් වේවි.

අපි ඉතිහාසය ගැන බැලුවොත් 1799දී, - බ්‍රිතාන්‍යය ශ්‍රී ලංකාව යටත් කර ගන්නටත් අවුරුදු 16කට කලින්- මේ රටේ රාජ්‍ය මූල්‍ය පනතක් තුළින් විගණනය වුණා කියලා සඳහන් වෙලා තිබෙනවා. ඒ වාගේම සිංහල රජ කාලය ගැන බැලුවොත්, පස්වෙනි මිහිඳු රජ්ජුරුවන්ගේ සෙල් ලිපිවල සඳහන් වෙනවා ස්වාමීන් වහන්සේලා මඟින් රාජ්‍ය මූල්‍ය විගණනය කරලා -audit කරලා- තිබෙනවා කියන එක.

විගණනය කරලා ඒ ලියකියවිලි මංජුසාවක තැන්පත් කළායි කියන එක මිහින්තලාවේ තිබෙන ඒ සෙල්ලිපිවල සඳහන් වෙනවා. ඒකෙන් පෙනී යනවා, මේ "විගණනය" කියන එකට අපේ රටේ දීර්ඝ ඉතිහාසයක් තිබෙන බව. හැබැයි, ප්‍රශ්නය වුණේ කාලය යන්න, යන්න මේ "විගණනය" පිළිබඳ අවධානය යොමු කිරීම රාජ්‍යය නොසලකා හැර එය එදා තිබුණු තත්ත්වයටම පවත්වාගෙන යෑම නිසා සංකීර්ණ වූ මේ සමාජය තුළ නොයෙකුත් රාජ්‍ය මුදල් වංචා ශීඝ්‍රයෙන් වැඩි වෙන්න පටන් ගැනීමයි. පස්වැනි මිහිඳු රජ්ජුරුවන්ගේ කාලයේ මේවා විගණනය කරන්න, පරීක්ෂා කරන්න රජ්ජුරුවන්ට නිතෙෂී කණ්ඩායමක් පත් කරන්න අවස්ථාව තිබුණා. නමුත්, ගෞරවනීය සංඝයා වහන්සේලාට භාර දීලා තිබුණා රාජ්‍ය ආදායම, වියදම පරීක්ෂා - check - කර ඒවා පිළිබඳ වාර්තාවක් දෙන්න. ඒ වාර්තාවේ පිටපතක් මංජුසාවක තැන්පත් කරන්න ඕනෑ. ඒ කියන්නේ, කොයි කාලයේ හෝ අවශ්‍ය වුණොත් බලන්න. ඒ කාලයේ හැටියට හොඳ ස්වාධීන විගණනයක් රටේ සිද්ධ වෙලා තිබෙනවා.

නමුත්, මේ රටේ අධිකරණ පද්ධතිය තිබුණා වාගේම "විගණනය" කියන එකත් වෙනස් වෙන්නේ නැතිව පැවතුණා, රට කොපමණ සංකීර්ණ භාවයකට පත් වුණත්. ණය ගැනීම්, වෙනත් විවිධ හේතූන්වලින් රටේ මූල්‍ය පරිපාලනය, මූල්‍ය භාවිතය, මූල්‍ය ලබා ගැනීමේ ක්‍රමවේදය වෙනස් වෙද්දී, පුද්ගලයන්ගේ ජීවන රටාව, අදහස්, ගති පැවතුම් වෙනස් වෙද්දී, ඒ අනුව සංශෝධනය නොවන විගණන ක්‍රමවේදයකුයි මේ රටේ පැවතුණේ. කවුරුත් ඒ ගැන ඇහිලි ගහන්න, හොයන්න බලන්න ගියේ නැහැ. හොරා රිසි සේ රාජ්‍ය මුදල් සොරකම් කළා. "හොරා" කිව්වාම, දේශපාලනඥයකු වෙන්න පුළුවන්; රාජ්‍ය නිලධාරියකු වෙන්න පුළුවන්. ඒ අයට රිසි සේ හොරකම් කරන්න අවස්ථාව, ඉඩ කඩ තිබුණා. කොහොම වුණත්, 1978වන කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153, 154 ව්‍යවස්ථාවලින් මේකට එකතු වුණා "විගණන පනත" කියන එක. ඒ අනුව, මේ රටේ රාජ්‍ය මූල්‍ය පාලනය විගණනය කළ යුතුයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148වන ව්‍යවස්ථාවේ තිබෙනවා, "රාජ්‍ය මූල්‍ය පිළිබඳ සම්පූර්ණ පාලනය පාර්ලිමේන්තුව සතු වන්නේ ය" කියලා. මේ ගැන සැලකිල්ලට අරගෙන තිබෙනවා, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළත්. හැබැයි, ඒ සඳහා අවශ්‍ය ක්‍රමවේදයක් නිර්මාණය වුණේ නැහැ. නමුත්, සැකිල්ලක් තිබුණා, විගණනය කරන්න ඕනෑ; රාජ්‍ය මුදල් පිළිබඳව පාර්ලිමේන්තුවට ගණන් දෙන්න ඕනෑ කියා. ඒකෙන් කියන්නේ, රටේ ජනතාවට රාජ්‍ය මූල්‍ය භාවිත කරන්නේ කොහොමද, ණය ගත්තා නම් කොපමණ ගත්තාද, ඒවායින් කළ දේවල් මොනවාද, කියන එක පිළිබඳව ගණන් දෙන්න ඕනෑය කියන එකයි. නමුත්, එහෙම කරන්න ඕනෑ කියලා තිබුණාට, ඒ සඳහා වැඩ පිළිවෙළක්, යන්ත්‍රණයක් මේ රටේ නිර්මාණය කර තිබුණේ නැහැ.

1977දී බර්නාඩ් සොයිසා වැනි වාමාංශික නායකයන් මේ ගැන කථා කළා. හැබැයි, හීනෙකින්වත් හිතන්න නැතිව ඇති, එක්සත් ජාතික පක්ෂය කියන දක්ෂිණාංශික පක්ෂයකින් මේ රාජ්‍ය මුදල් අවභාවිතය නැති කරන්න, ජනතාවගේ මුදල් මංකොල්ලකෑම නැති කරන්න මෙවැනි පනතක් රටට හඳුන්වා දේවි; ඉදිරිපත් කරාවි; ශක්තිමත් කරාවි කියන එක. ඒ වෙනස කරන්නට අපට හැකි වීම ගැන ඉතාම සතුටුයි. ඒ අනුව, අද දවස ස්වර්ණමය දවසක් ලෙස ඉතිහාසයට එක් වෙනවා. මෙය විශේෂයෙන්ම රාජ්‍ය, මහජන මුදල් වංචා, දූෂණවලට තිත තියන්න ගත්ත ප්‍රබලම අවියක් විධියට සඳහන් කරන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත මඟින් audit කරන්නේ, විමර්ශනය කරන්නේ මොනවාද? රාජ්‍ය මුදල් හොරකම, හොරා කෑම ගැන විතරක් නොවෙයි මේ තුළින් පරීක්ෂා කර බලන්නේ. රාජ්‍ය මුදල් සකසුරුවම් සහිතව වියදම් කරනවාද, කාර්යක්ෂමභාවයක් ඇතිව වියදම් කරනවාද, ඵලදායී ආකාරයට යොදවනවාද කියන එක ගැනත් විශේෂයෙන්ම අවධානය යොමු කරනවා. රටේ ජනතාවගේ මුදල් නිසියාකාරව පාලනය කරන්න අවුරුදු හතරක, පහක කෙටි කාලයකට අපට භාර දෙනවා. එහිදී අයිතිකාරත්වයක් නොවෙයි, භාරකාරත්වයකුයි දෙන්නේ. මේ භාරකාරත්වය තුළ තමන්ට ඕනෑ ඕනෑ විධියට වැඩ කරලා බලය හදා ගන්න, දේශපාලන ගමන් මඟ යන්න, දරුවන්ට වත්කම් හදන්න ජනතා මුදල් අවභාවිත කරනවාද කියන එක ගැනයි මේ තුළින් පරීක්ෂා කර බලන්නේ. ඒකයි කිව්වේ, ජනතා මුදල් වියදම් කිරීමේදී සකසුරුවමින් එය සිදු කරනවාද, යම් කාර්යක්ෂමභාවයක් ඇතිව සිදු කරනවාද, මේවායින් මීට වඩා හොඳ දෙයක් කරන්න බැරිද, එහෙම නැත්නම් ඒ කරන දෙය රටට කොපමණ ඵලදායී, වැඩදායී දෙයක්ද කියන එක මේ තුළින් පරීක්ෂා කර බලනවා කියා.

හම්බන්තොට වරාය හැදුවාට, ඒක හදන්න ණය ගත්තාට ඒක රටට කොච්චර ප්‍රතිඵලදායකද? නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය හැදුවාට ඒක රටට කොච්චර වැඩදායකද? මේ තාප විදුලි බලාගාරය හදන්න මුදල් වියදම් කළ විධිය වැඩදායකද? එහෙම වැඩදායි නම්, ඒ ඉන්න ඉංජිනේරුවෝ කියන්නේ නැහැ, "අපි ඉල්ලපු මැෂින් එක නොවෙයි ආවේ, වෙන මැෂින් එකක්" කියලා. ඉංජිනේරුවෝ එහෙම කියනකොට මේ පනත තිබුණා නම්, අපට ඒ ගැන ස්වාධීනව පරීක්ෂා කරන්න තිබුණා. මේ

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

විගණන කොමිෂන් සභාව ජනාධිපතිතුමාගේ අතකොළුවක් නොවෙයි, අගමැතිතුමාගේ අතකොළුවක් නොවෙයි, ඇමතිතුමාගේ අතකොළුවක් නොවෙයි. මේ පනත තිබුණා නම්, පාර්ලිමේන්තුවට වග කියන විධියට මේ කොමිෂන් සභාව මඟින් මේ කටයුතු පිළිබඳව ස්වාධීනව කටයුතු කරන්න තිබුණා. අද අධිකරණයෙන් නඩු තීන්දු දෙන්නේ අගමැතිතුමාට, ජනාධිපතිතුමාට ඕනෑ විධියටද? අද කොච්චර ස්වාධීනව රජයට විරුද්ධව නඩු තීන්දු දෙනවාද? ඒ වාගේ ස්වාධීන ආයතනයක් නිර්මාණය කරලා රාජ්‍ය මූල්‍ය පාලනය කරන්න ගත්ත පියවර දේශපාලන වශයෙන් අපට අවාසියක් වන්න පුළුවන්. නමුත්, වංචාවෙන්, දූෂණයෙන් තොර රටක් නිර්මාණය කරමින් යන ඉදිරි ගමන මේ තුළින් ඉතාම ශක්තිමත් වනවා; සාර්ථක වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේදී මම විශේෂයෙන් මේ කරුණත් කියනවා. මේ සිදුවන අක්‍රමිකතා පාලනය කරද්දි රාජ්‍ය ණය, රාජ්‍ය සම්පත් ගැනත් බලන්න වනවා. රාජ්‍ය සතු දේපළ, ණය, රාජ්‍ය ආදායම, රාජ්‍ය වියදම් ආදී මේ හැම දේම රාජ්‍ය සම්පත්වලට අයිති වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රනිල් වික්‍රමසිංහ මැතිතුමා එදා 2001-2004 ආණ්ඩුව පැවැති කාලයේදී මේ පනත් කෙටුම්පත ගේන්න උත්සාහ කළා. අපේ ඒ ආණ්ඩුව කාලයේ මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කළා. සිවිල් සංවිධාන සමඟ, අමාත්‍යාංශ සමඟ, ඒ වාගේම, පාර්ලිමේන්තුවේ සාකච්ඡා කරලා මේ පනත් කෙටුම්පත එදා අපි ගෙනාවා. නමුත්, අපට ආණ්ඩුවේ කාලය කෙටි වීම නිසා අපට මේ පනත සම්මත කර ගන්න බැරි වුණා. නමුත්, ඊ ළඟට බලයට පැමිණි ආණ්ඩුව මේ පනත් කෙටුම්පත ගෙනාවේ නැහැ. විශේෂයෙන්ම ඒ අවස්ථාවේදී මුදල් අමාත්‍යාංශයේ ලේකම්තුමා කිව්වා, මේ පනත් කෙටුම්පතට තව අදහස් හොයන්න ඕනෑ කියලා. එදා ආණ්ඩුව කිව්වා, මේ සම්බන්ධයෙන් තවත් සාකච්ඡා කරන්න ඕනෑ, තවත් මේ කරුණු බැරෑරුම් කරන්න ඕනෑ කියලා. එහෙම කියලා එදා මේ පනත් කෙටුම්පත හමස් පෙට්ටියට දැම්මා. එහෙම කරලා එදා මේ පනත් කෙටුම්පත ගෙනාවේ නැහැ. එදා හමස් පෙට්ටියට දමපු මේ පනත් කෙටුම්පත ආයෙත් කරළියට ගේන්න එක්සත් ජාතික පක්ෂයේ ආණ්ඩුවක්, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමාගේ - රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාගේ ආණ්ඩුවක් එන තෙක් බලා සිටින්න අපට සිද්ධ වුණා. ඊට පස්සේ දින සියයේ වැඩ පිළිවෙළ යටතේ අපි පොරොන්දුවක් වුණා, මේ ජාතික විගණන පනත ගෙනෙනවා කියලා. මේ රටේ යහ පාලනයක් නිර්මාණය කරන්න කියලායි ජනතාව අපට බලය දුන්නේ. රාජ්‍යයේ ඉහළ නිලධාරීන්, දේශපාලනඥයන් රටේ සල්ලි හොරකම් කරද්දි, ණයක් ගන්න කොට ඒ ණයේ කොටසක් හොරකම් කරද්දි යහ පාලනයක් නිර්මාණය කරන්නේ කොහොමද?

දැන් "The New York Times" සඟරාව කියනවා, මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුවට සල්ලි දීපු විධිය. චීනයෙන් සල්ලි ගෙනැල්ලා හම්බන්තොට වරාය හැදුවාට, ඒ වරායට කොච්චර වියදම් කළාද, සාක්කුවට කොච්චර ගියාද කියන එක ඒ සඟරාව කියනවා. දේශපාලන යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම සඳහා, ඊ ළඟට බලය ලබා ගැනීම සඳහා හම්බන්තොට වරායට ගත් ණයෙන් කොච්චර වියදම් කළාද කියලා "The New York Times" සඟරාව කියනවා. නමුත් අද අපේ අය කියනවා, මේක කැලෑ පත්තරයක් කියලා. එහෙම නැත්නම්, ලංකාවේ ලසන්ත වික්‍රමතුංගලාට වාගේ, එක්නැළිගොඩලාට වාගේ, උපාලි මැතිතුමාට වාගේ ඒ මාධ්‍යවේදින්ටත් තර්ජනය කරනවා, "ලංකාවට ආවොත් උඹ මරණවා" කියලා. ආණ්ඩුව අපේ වුණත්, යහ පාලන ආණ්ඩුව තිබුණත් පසුගිය ආණ්ඩුවේ හොල්මන් අවතාර තවමත් තිබෙනවා. අපට ඒවාත් විසඳන්න තිබෙනවා. ජාතික විගණන පනත ගෙන ඒම අපේ දින සියයේ වැඩ පිළිවෙළේ දීපු පොරොන්දුවක්. ඒක ජනතාවගේ මුදල් ආරක්ෂා කර ගන්න දීපු පොරොන්දුවක්. ඒ වාගේම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත අපි ගෙනාවා, ස්වාධීන කොමිෂන් සභා පිහිටෙව්වා. ඒ වාගේම, අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය අද අපි ලබා දීලා තිබෙනවා. ඒ අනුව ජනතාව අද උද්ඝෝෂණ පවත්වනවා. ආණ්ඩුවට විරුද්ධව වැඩ කරන්න, ජනතාවට නැඟී සිටින්න අයිතිය දුන්නා. එදා වාගේ අද වෙඩි තියලා ජනතාව මරන්නේ නැහැ. ඒ නිසා ආයෙත් මේ රටට ණයක් ගන්න කොට හුඔසක් පෙන්නුවාම ඒකට ජනතාව රැවටෙන්න ඕනෑ නැහැ. ඒ ණය පාවිච්චි කළේ මොනවාටද, ඒ සල්ලි ඔක්කෝම ලංකාවට ආවාද, නැත්නම් මේ සල්ලි ගියේ සීෂෙල්ස්වල, ඩුබායිවල තිබුණු ගිණුම්වලටද කියලා දැන් දැනගන්න පුළුවන්. ඒවා සම්බන්ධයෙන් ස්වාධීනව පරීක්ෂණයක් කරන්න ආයතනයක් නිර්මාණය කරන්න ගෙනාපු පනතක් විධියට මා මෙම පනත් කෙටුම්පත සලකනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ සම්බන්ධයෙන් අදහස් දක්වන්න මා හට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මී ළඟට, ගරු ලසන්ත අලගියවන්න නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 18ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.28]

ගරු ලසන්ත අලගියවන්න මහතා (මුදල් හා ජනමාධ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு லசந்த அலகியவன்ன - நிதி மற்றும் வெகுசன ஊடக பிரதி அமைச்சர்)
The Hon. Lasantha Alagiyawanna - Deputy Minister of Finance and Mass Media)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටට ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් විවාදයට ගන්නා මේ අවස්ථාවේදී ඒ සම්බන්ධයෙන් කරුණු කිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම පිළිබඳව මා ඉතා සතුටුවනවා.

අද ගෙන එනු ලබන මේ පනත් කෙටුම්පත මඟින් විශේෂයෙන්ම සිද්ධ වන්නේ, විගණන සේවා කොමිෂන් සභාවත්, විගණන සේවයත්, ඒ හා ආනුෂංගිකව තිබෙන කටයුතුත් නීතිමය රාමුවකට ගෙන ඒමයි. සමහර විට ඇතැම් අය මේ පිළිබඳව වැරැදි අර්ථකථන නිරූපණය කරමින්, මෙය මේ රටේ සංවර්ධන ක්‍රියාවලිය තවදුරටත් ඇණ හිටුවීම සඳහා ගෙන එන පනත් කෙටුම්පතක් ලෙසටත් කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. සමහරුන් එසේ කරුණු ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත් ඒක වැරැදි මතයක්. සමහර අය කියනවා මට ඇහෙනවා, "දැනටමත් අපේ රටේ නීති රීති තිබෙනවා. චක්‍රලේඛ තිබෙනවා. මේ පනත

නිසා රාජ්‍ය නිලධාරීන් බිය වේවි. රාජ්‍ය නිලධාරීන්ට වැඩ කරන්න පුළුවන්කමක් නැති වේවි. එම නිසා මෙය රටේ සංවර්ධන ක්‍රියාවලියට බාධාවක්" කියලා. සමහර අය මාධ්‍යවලටත් එසේ කියනවා මට ඇහිලා තිබෙනවා. මේක වැරැදි මතයක්. අපේ රටේ පරිපාලන සේවයේ සහ නිලධාරීන්ගේ කටයුතු මා දකින්නේ සුබවාදීවයි. නිදහසින් පසු මේ දක්වා අපේ රට යම් දියුණුවක් අත්පත් කරගෙන තිබෙනවා. සමාජ ආර්ථිකමය කරුණු පැත්තෙන්, අධ්‍යාපනය, සෞඛ්‍ය පැත්තෙන් ලෝකයේ දියුණු රටවල් මට්ටමටම අපේ රටත් දියුණු වෙලා තිබෙනවා. මේ දියුණුව ලබා ගත්තේ හුදෙක්ම දේශපාලනඥයන් නිසා පමණක් නොවෙයි. රාජ්‍ය නිලධාරීන් කැප වෙලා කටයුතු කිරීම තමයි මේ දියුණුව ලබා ගැනීමට එක් හේතුවක් වුණේ. ඒ වාගේම, අපේ රටේ ග්‍රාමීය සෞඛ්‍ය ගත්තොත්, ප්‍රාථමික සෞඛ්‍ය ක්‍රියාවලිය ගත්තොත්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිනිය රාජ්‍ය නිලධාරිනිය විධියට ගෙයින් ගෙට ගිහින් දැනුවත්භාවය ලබා දීලා තමයි ඒ ප්‍රගතිය ලබාගෙන තිබෙන්නේ. නිදහස් අධ්‍යාපනයෙන් ප්‍රතිඵල ගත් අතිබහුතර රාජ්‍ය නිලධාරීන් පිරිසක් රට වෙනුවෙන් කැප වෙලා කටයුතු කරන අතර, දේශපාලනඥයන් වාගේම රාජ්‍ය නිලධාරීන් සුළු පිරිසකගේ වැරැදි ක්‍රියා මාර්ග නිසා මේ රටේ සංවර්ධනය, දියුණුව අඩාළ වෙලා තිබෙනවා කියන එකත් අප පිළිගත යුතුයි; තේරුම් ගත යුතුයි. මේ රටේ සමස්ත රාජ්‍ය නිලධාරීන්ගෙන් අතිබහුතරයක් නියෝජනය කරන අවංක හොඳ රාජ්‍ය නිලධාරීන් මේ ජාතික විගණන පනතට බය විය යුතු වන්නේ නැහැ. මේක තමයි යථාර්ථය. සුළුතරයකගේ වුවමනාවට අපි බය විය යුතු වන්නේත් නැහැ. මේක තමයි අපි තේරුම් ගන්න ඕනෑ. වර්තමානයේ රටේ සිදු වන දේවල් දිහා බැලුවාම, මේ ජාතික විගණන පනත් කෙටුම්පත ගෙන ඒම තුළින් දේශපාලනඥයන්ගේත්, රාජ්‍ය නිලධාරීන්ගේත් ආරක්ෂාව ශක්තිමත් කර ගන්න පුළුවන්කමක් ලැබෙනවා කියන එකයි මා පෞද්ගලිකව දකින්නේ. ඒ වාගේම, මේ මඟින් ජනතාවගේ මුදල්වලින් උපරිම ප්‍රයෝජනයක් රටට ලබා ගන්න පුළුවන්කමක් ලැබෙනවා කියන එකයි මගේ විශ්වාසය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අප දකින සමහර සිද්ධි ගත්තොත් ඒවා අපි දකින්න අකැමැති ඒවායි. දේශපාලනඥයන් විවිධ වැරැදිවලට හසු වෙලා විවිධ දඬුවම් ලබනවා. අපි ඒවා දකින්න කැමැති නැහැ. නිලධාරීන් විවිධ වැරැදිවලට හසු වෙලා දඬුවම් ලබනවා. ඒ නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප අහිමි වෙනවා. නිලධාරීන්ගේ පෞද්ගලික දේපළ විකුණා නීතිඥයන්ට සල්ලි ගෙවන්න අද සිද්ධ වෙලා තිබෙනවා. ඔවුන්ට බන්ධනාගාරගත වෙන්න අද සිද්ධ වෙනවා.

මේවා සිද්ධ වෙන්නේ විශේෂයෙන්ම ඒ නිලධාරීන් විධියට කටයුතු කිරීමේදී සිදු වුණු අඩු පාඩුකම් නිසයි. සමහර විට නොදැනුවත්ව වෙන්න පුළුවන්. සමහර විට වංචාසහගත චේතනාවෙන් වෙන්න පුළුවන්. මම හිතන විධියට මේ දෙකම නීතිය ඉදිරියේ එක සමානයි. එම නිසා මෙවැනි පනතක් ගෙන ඒම තුළින් අපේ රටේ රාජ්‍ය ආයතනවල මූල්‍ය කටයුතු විධිමත් කිරීමට අවස්ථාව උදා වෙලා ඉදිරි අනාගතයේ දී දේශපාලනඥයන්ගෙන් වෙන්න පුළුවන්, නිලධාරීන්ගෙන් වෙන්න පුළුවන්, අද අපට දකින්න ලැබෙන අමිහිරි සිද්ධීන් ඉදිරියේ දී දකින්න සිදු නොවෙයි කියන විශ්වාසයක් තමයි මා තුළ තිබෙන්නේ. එම නිසා මේ ඉදිරිපත් කර තිබෙන ජාතික විගණන පනත් කෙටුම්පත රටේ සංවර්ධනයට බාධාවක් වෙන්නේ නැහැ. අවංකව කටයුතු කරන නිලධාරීන් මොනම ආකාරයකටවත් මේ පනත් කෙටුම්පතට බිය විය යුතු වන්නේ නැහැ. මේක තමයි ඇත්ත යථාර්ථය. විශේෂයෙන්ම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විධියටත්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ අද දක්වා අවුරුදු 14ක් තිස්සේ සිටින සාමාජිකයකු විධියටත්, මේ රාජ්‍ය ආයතනවල සිදුවන කටයුතු පිළිබඳව මට අත් දැකීම් තිබෙනවා. රාජ්‍ය ආයතනවල මොනවාද සිද්ධ වෙන්නේ, රාජ්‍ය නිලධාරීන් කොහොමද කටයුතු කරන්නේ කියන එක පිළිබඳව. පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා විධියට ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා මේ සංශෝධන ඉදිරිපත් කළේ අපි මුහුණ දීපු අත් දැකීම්වලිනුයි. මේක තමයි ඇත්ත යථාර්ථය. ඒ වාගේම, විගණකාධිපතිවරයා ශක්තිමත් කිරීම; විගණන කොමිෂන් සභාව ශක්තිමත් කිරීම; විගණකාධිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම නොවෙයි මෙයින් සිද්ධ වෙන්නේ. මේක වැරැදි විධියට අර්ථ දක්වන්න හොඳ නැහැ.

වර්තමාන විගණකාධිපති ගාමිණී විජේසිංහ මහත්මයා ශක්තිමත් කිරීමක් නොවෙයි මෙයින් සිද්ධ වෙන්නේ. විගණන කොමිෂන් සභාව ශක්තිමත් කිරීමක් නොවෙයි. මේ ශක්තිමත් කිරීම පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීමක් විධියටයි අපි දැකිය යුතු වන්නේ. ඇයි එහෙම කියන්නේ? අපි පාර්ලිමේන්තුවෙන් හැම අවුරුද්දකම අය වැය මඟින් මුදල් වෙන් කරනවා. පාර්ලිමේන්තුවෙන් වෙන් කරපු එම මුදල් රාජ්‍ය ආයතන, අදාළ අමාත්‍යාංශ සහ දෙපාර්තමේන්තු විසින් ඉදිරිපත් කරපු වක්‍රලේඛවලට අනුව, පාර්ලිමේන්තුවම සකස් කරපු නීති-රීතිවලට අනුව වියදම් කළාද කියා සොයා බලා සෑම අවුරුද්දකම විගණකාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වෙනවා. පාර්ලිමේන්තුව වාර්ෂිකව අය වැය මඟින් අදාළ ආයතනවලට වෙන් කරන මුදල් නිසි පරිදි ඒ ආයතන වියදම් කළාද කියලා සොයා බලන්නේත් මේ පාර්ලිමේන්තුවමයි. පාර්ලිමේන්තුවට තනියම මේ කාර්ය භාරය කරන්න පුළුවන්කමක් නැහැ. මේ පාර්ලිමේන්තුවේ අපි එකතු වෙලා අය වැය සම්මත කරනවා. අය වැය සම්මත කිරීම අපි මේ පාර්ලිමේන්තුව තුළ කළත්, අපි අනුමත කරන මුදල් රාජ්‍ය ආයතන හරි හැටි වියදම් කළාද කියලා අපි බලන්නේ විගණකාධිපතිවරයාගේ වාර්තාව අනුවයි. විගණකාධිපතිවරයාගේ වාර්තාව අපි සියයට සියයක්ම පිළිගත යුතුයි කියලා සම්ප්‍රදායක් නැහැ; නීතියක් නැහැ. ඒ අදාළ කරුණු සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා ඉදිරිපත් කරන වාර්තාව පිළිබඳව අදාළ නිලධාරිනුත් කැඳවලා අවසාන තීන්දුව, තීරණය ගන්නේ මහජන නියෝජිතයන් විධියට අපියි. මේක තමයි ඇත්ත; යථාර්ථය.

විගණකාධිපතිවරයා කරන කටයුතු අවසානයේ වාර්තා කරන්නේ කොහේටද? එතුමා වාර්තා කරන්නේ පාර්ලිමේන්තුවට. විගණකාධිපතිවරයා අවුරුද්දක් තුළ කරන කටයුතු ඊළඟ අවුරුද්දේ මාස 10ක් ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුයි. ඒ නිසා මේ නව පනත් කෙටුම්පත තුළ යම් හෙයකින් විගණකාධිපතිවරයා වැරැදි විධියට අධිභාරයක් කර තිබෙනවා නම් ඒ පිළිබඳව බලන්න, විගණකාධිපතිවරයාගේ වාර්තාවේ කාර්ය සාධනය බලන්න මේ පාර්ලිමේන්තුවට අවස්ථාව තිබෙනවා. එම නිසා ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමාගේ සංශෝධන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ හිටපු සභාපතිවරයා විධියට මමත් අනුමත කරනවා. මේවා විය යුතු සංශෝධන. අපි ජාතික විගණන පනත් කෙටුම්පත ගේනවා කියලා නමට ජාතික විගණන පනත් කෙටුම්පතක් ගෙන එම තුළින් බලාපොරොත්තු වන අරමුණු ඉටු කර ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. හැබැයි, මෙහෙම හෝ පනතක් නොමැති අවස්ථාවක, මෙහෙම හෝ පනත් කෙටුම්පතක් ගෙන ඒම පිළිබඳව අපි සතුටු විය යුතුයි.

එතකොට කලින් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ පනත සංශෝධනය කරන්න බලපාන කරුණු අපි රටට කියන්න ඕනෑ. උදාහරණයක් විධියට ගත්තොත් රාජ්‍ය මූල්‍ය අවභාවිතාවක් සම්බන්ධයෙන් ගෙවිය යුතු දඩය ලක්ෂයක් හැටියට තිබුණු මුදල රුපියල් 5,000ට අඩු කරනවා නම් අඩු කරන්නේ ඇයි කියන එක රටේ ජනතාව දැන ගන්න ඕනෑ. මේ රුපියල් ලක්ෂයක දඩය, රුපියල් 5,000ට අඩු කිරීම පිළිබඳව අදහස් ඉදිරිපත් කරන අය ඒක රටට කියන්න ඕනෑ. ඒ අනුව අපි දකින පැත්ත වැරැදි නම්,

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

නිවැරදි කර ගන්න අපි සූදානම්. ඒකයි ඇත්ත කථාව. අපි කියන දේ හරියි කියලා අපි කියන්නේ නැහැ. අපි කියන දේම කියන්න ඕනෑය කියන තැන අපි නැහැ. එම නිසා අපි මේ විගණන පනත් කෙටුම්පත යථාර්ථයක් බවට පත් කර ගන්න නම්, විගණකාධිපතිවරයා සහ විගණන කොමිෂන් සභාව ශක්තිමත් කිරීම අනිවාර්යයෙන්ම කළ යුතුයි. එසේ ශක්තිමත් කළොත් පමණයි, මෙහි සැබෑ පරමාර්ථය හා අරමුණු අපට ඉටු කර ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ. මෙහිදී විගණකාධිපතිවරයා හා විගණකාධිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් කිරීම එම දෙපාර්තමේන්තුව සහ කොමිෂන් සභාව ශක්තිමත් කිරීමක් නොවෙයි, පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීමක් කියන එක අපි අවබෝධ කර ගත යුතුව තිබෙනවා. මේක තමයි යථාර්ථය. මේ පනත් කෙටුම්පත 2015 කැබිනට් එක අනුමත කළා. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ නැහැ. ඊට පස්සේ මේ පිළිබඳව විවිධ සංවාද ඇති වුණා. නමුත් විවිධ හේතූන් නිසා මෙය ක්‍රියාත්මක කිරීම ප්‍රමාද වුණා. අතිගරු ජනාධිපතිතුමාත් මේ පිළිබඳව පාර්ලිමේන්තුවේ ප්‍රකාශයක් කළා. ප්‍රමාද වෙලා හෝ මේ පනත් කෙටුම්පත මේ ආකාරයෙන් ගෙන ඒමට අවස්ථාව ලැබීම පිළිබඳව අපි සතුටු වෙන්න ඕනෑ. ප්‍රමාදවෙලා හරි මේ ආකාරයෙන් මේ පනත් කෙටුම්පත ගෙන ඒමට කටයුතු කිරීම පිළිබඳව ජනාධිපතිතුමාටත්, අග්‍රාමාත්‍යතුමාටත් අපි ස්තුතිවන්ත වෙන්න ඕනෑ. හැබැයි, මේ සංශෝධන ඉදිරිපත් කරනවාය කියලා මේක කල් දමන්න පුළුවන්කමකුත් නැහැ. මේක කල් දැමිය යුතු වන්නේත් නැහැ. නමුත් මේ ඉදිරිපත් කළ සංශෝධන අපට අනවශ්‍යයි කියලා අහක දමන්න පුළුවන්කමකුත් නැහැ. අහක දැමිය යුතු වන්නේත් නැහැ. අනිවාර්යයෙන්ම අපි මේ පිළිබඳව තීරණයක් ගත යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුව සතු බලතල නිසා අපේ කාරක සභාවලට නිලධාරීන් සහභාගි වන බව අපි දන්නවා. නමුත් විවිධ අය සහභාගි වන්නේ නැහැ. අපි කියපු පළියට සියයට 100ක්ම සහභාගි වෙනවා කියලා අපි කියන්නේ නැහැ. සමහර අය අපේ කාරක සභාවලට කැඳෙව්වාට පස්සේ විදේශ රටවලට යනවා. සියයට 100ක්ම නොවෙයි, සියයට 10ක් විතර. සියයට 90ක්ම නිලධාරීන් අපේ කාරක සභාවලට පැමිණෙනවා.

නමුත්, අපේ කාරක සභාවලට සමහර නිලධාරීන් කැඳෙව්වාම රෝහල්ගත වෙනවා. රෝහල්ගතවී වෛද්‍ය වාර්තා එවනවා. එවැනි අවස්ථා අනන්තවත් අපේ කාරක සභාවල දකින්න තිබෙනවා. නිලධාරීන් අදාළ කාරක සභාවට ආවේ නැති වුණාම පැමිණෙන නිලධාරියා කියන්නේ මොකක්ද? "අහවල් නිලධාරියාගෙන් අහලා මේක වාර්තා කරන්නම්" කියලා කියනවා. එතකොට මේ ක්‍රියාවලිය සාර්ථක වෙන්නේ නැහැ. එම නිසා, විගණකාධිපතිවරයාට අවශ්‍ය කරන නිලධාරීන් කැඳවීමේ බලය අනිවාර්යයෙන් විගණකාධිපතිවරයාට ලබා දිය යුතුයි. මෙහිදී නිලධාරීන්ට බේරීමේ අවශ්‍යතාවක් ඇති වන්නේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු ලසන්ත අලගියවන්න මහතා
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ පිළිබඳව විශේෂයෙන්ම අභ්‍යන්තර විගණනය, විගණන කමිටුවල අපට අනන්තවත් උදාහරණ තිබෙනවා. මේ විගණන කමිටු කැඳවුවාම, ආයතනයක සිදුවන අඩු පාඩුකම් නිවැරදි වනවා. ඒ නිසා අපි මේවා තවත් ධෛර්යමත් කරන්න ඕනෑ; මේවා ශක්තිමත් කරන්න ඕනෑ. මෙවැනි ආකාරයට විගණන කමිටුවක් කැඳවීම නිලධාරීන්ට කරන හිරිහැරයක් නොවෙයි; ඒ ආයතනයට කරන හිරිහැරයක් නොවෙයි; සංවර්ධන ක්‍රියාවලියට කරන බාධාවක් නොවෙයි. ආයතනයක් විසින් අවුරුද්දකට කැඳවිය යුතු විගණන කමිටු ගණන හතරයි. මේ විගණන කමිටු කැඳවීම තවත් ශක්තිමත් කළ යුතුයි; අනිවාර්ය කළ යුතුයි. ඒ වාගේම අභ්‍යන්තර විගණනය තවත් ශක්තිමත් කළ යුතුයි; අනිවාර්ය කළ යුතුයි. මෙවැනි දේවල් ශක්තිමත් කිරීම තුළින් නිලධාරීන්ට ගැටලුවකින් තොරව කටයුතු කිරීම සඳහා අවස්ථාව ලැබෙනවා මිස, වෙනත් කරදරයක් සිද්ධ වෙන්නේ නැහැ කියන කාරණය අවබෝධ කරගන්න ඕනෑ.

එම නිසා සෑම විටම අපි උත්සාහ කරන්නේ, අපි දකින්නේ, මෙවැනි දේවල් සඳහා නීතිරීති ගෙනෙන්නේ ඇයි කියන කාරණයයි. අපට තිබෙන අත් දැකීම් අනුව අපි දන්නවා, රාජ්‍ය මුදල් විවිධ ආකාරයෙන් අවභාවිත වුණාට පසු, වංචාවන්, දූෂණයන් සිද්ධ වුණාට පසු කොපමණ පශ්චාත් පරීක්ෂණ කළත්, කොපමණ වාර්තා ඉදිරිපත් කළත්, ඒ නැති වුණු මුදල්වල නිසි ඵලදායිකත්වයක් රටේ ජනතාවට ලැබෙන්නේ නැහැ; රටට ලැබෙන්නේ නැහැ කියන කාරණය. ඒ නිසා, අඩු පාඩුකම් නොවන පරිදි මේ කටයුතු සිද්ධ කරගන්න පුළුවන් නම්, ඒක තමයි හොඳම දේ.

මෙවැනි විගණන පනත් කෙටුම්පතක් ගෙන ඒම හරහා අභ්‍යන්තර විගණනය ශක්තිමත් කිරීම තුළින්; විශේෂයෙන්ම විගණන කමිටු ශක්තිමත් කිරීම තුළින්, මේ ආයතනවල සිදුවන අඩු පාඩුකම් අඩු වෙනවා. එහෙම අඩු වුණාට පසුව ඒ මුදල්වලින් උපරිම ප්‍රයෝජනයක් රටට ලැබෙනවා. එවිට නිලධාරීන්ට ගැටලුවක් ඇති වන්නේ නැහැ. එම නිසා මේ පිළිබඳව අප අවංකව සිතා බලා කටයුතු කළ යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම නැවත නැවතත් සඳහන් කරන්නේ, මේ විගණන පනත් කෙටුම්පත ගෙන ඒම තුළින් "පාර්ලිමේන්තුව තමයි අපි ශක්තිමත් කරන්නේ" කියන කාරණය අපි අවබෝධ කරගත යුතු බවයි. එය තවදුරටත් ශක්තිමත් කරගැනීම සඳහා පක්ෂ භේදයෙන් තොරව අප සියලුදෙනාගේම සහයෝගය; දායකත්වය දෙමුය කියන ඉල්ලීම කරමින්, පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති, සුනිල් හඳුන්නෙත්ති මැතිතුමාගේ සංශෝධනවලට අපගේ සහයෝගයත් ලබා දෙන බව සඳහන් කරමින් මම නිහඬ වනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

මීළඟට, ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි විස්සක කාලයක් තිබෙනවා.

[ප.ව. 5.09]

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
சபைக்குத் தலைமைதாங்குகின்ற கௌரவ உறுப்பினர் அவர்களே, இன்றைய விவாதப் பொருளாகத் தேசியக் கணக்காய்வுச் சட்டமூலம் பற்றிய விடயம் சபையில்

கருத்தாடப்படுகின்றது. தேசியக் கணக்காய்வு என்பதைவிட, "சகல நிறுவனங்களிலும் கணக்காய்வு" என்பது மிக முக்கியமான, தேவையான ஒரு விடயமாக அமைந்திருக் கின்றது. எமது மிக முக்கியமான வளங்களின் வரிசையில் நிதி வளம் என்பது பிரதானமானதாகக் காணப்படுகின்றது. இந்த நிதியினைக் கையாளுதலின்போது, கையாளல், கையாடல் என்ற இரு விடயங்கள் இடம்பெறுகின்றன; கையாளல் நடைபெறுகின்றபோது, கையாடல்களும் நடைபெற்றுக் கொண்டிருக்கின்றன. அந்த அடிப்படையில் இந்த நிதியினை எவ்வாறு கையாள வேண்டும்? எவ்வாறு கையாளக்கூடாது? என்ற விடயங்கள் தொடர்பாக நாங்கள் கவனம் செலுத்த வேண்டியவர்களாக இருக்கின்றோம்.

எமது நாட்டின் நிதி வளம் எந்தளவிற்குத் துஷ்பிரயோகம் செய்யப்பட்டிருக்கின்றது என்கின்ற விடயம் பாராளு மன்றத்தில் காரசாரமான விவாதங்களுக்குட்பட்டு வருகின்றது. இந்த நாடு தொடர்ந்தும் அபிவிருத்தியடைந்து வரும் நாடு என்று சொல்லப்பட்டு வருவதற்கு ஒரு காரணமாக அமைந்திருப்பது இந்த நிதிக் கையாள்கையில் காணப் படுகின்ற கையாடல்கள்தான். "விரலுக்குத் தக்க வீக்கம் - ஆளுக்குத் தக்க ஊழல்" என்று சொல்வார்கள். அதுபோன்று இந்த நிதிக் கையாடல் விடயங்களை எடுத்துக்கொண்டால், சிறியவர்கள் இந்த நிதிக் கையாடல்களைச் செய்கின்றபோது, அவை சிறியளவாக இருக்கின்ற அதேவேளையில், பெரிய வர்கள் செய்கின்ற கையாடலின் அளவு உயர்ந்துகொண்டு போவதையே காணமுடிகின்றது. எனவே, இந்தக் கையாடல்கள் கட்டாயம் தவிர்க்கப்படல் வேண்டும். நிதித்துறையில் கையாடல்கள் இருக்குமாக இருந்தால், இந்த நாட்டின் அபிவிருத்தியென்பது ஓர் எதிர்மறையான நிலையில் காணப்படக்கூடிய வாய்ப்பிருக்கின்றது. எனவே, நிதியினைக் கணக்காய்வு செய்யவேண்டியது அவசியம். அதற்கான சட்டமூலம் நிறைவேற்றப்படுவதும் முக்கியமான ஒன்றாகும்.

குறிப்பாக, இந்த நிதிக் கையாள்கை என்ற விடயத்தை எடுத்துக்கொண்டால், இந்த விடயத்தில் வெளிப்படைத் தன்மை இருக்கின்றதா? நம்பகத் தன்மை இருக்கின்றதா? பொறுப்புக்கூறுகின்ற தன்மை இருக்கின்றதா? தகவலறியும் உரிமைச் சட்டத்திற்கேற்ப இதனைச் சகலரும் அறிந்து கொள்ளக்கூடிய இலகு வழிகள் இருக்கின்றனவா? என்கின்ற விடயங்களை நாங்கள் புரட்டிப் பார்க்க வேண்டியிருக்கின்றது. எமது நாட்டில் அபிவிருத்திக்காகப் பயன்படுத்தப்படுகின்ற நிதியில் 30 வீதத்திலிருந்து 40 வீதம் வரை அபகரிக்கப் படுவதாக அல்லது சுரண்டப்படுவதாக அல்லது தனிப்பட்ட தரகுப் பணங்களாக அல்லது 'கொமிஷன்'களாகக் கொண்டு செல்லப்படுவதாகக் கூறப்படுகின்றது. இந்த விடயம் சம்பந்தமாக கௌரவ பிரதம மந்திரி அவர்களும் பிரஸ்தாபித்திருந்தார். நிதியைக் கையாள்கின்ற விடயத்தில் காணப்படுகின்ற வழுக்கள் அல்லது வேண்டுமென்று செய்யப்படுகின்ற அபகரிப்புக்கள் அல்லது சம்பந்தப் பட்டவர்கள் தனிப்பட்ட முறையில் தங்களின் பணப் பைகளை நிரப்பிக்கொள்கின்ற செயற்பாடுகள் மூலமாக நிதி வீண் விரயம் செய்யப்படுகின்றது; அதாவது, மோசடி செய்யப் படுகின்றது. எனவே, இந்த ஊழல், மோசடி, இலஞ்சம் போன்றவை இந்த நாட்டில் கட்டுப்படுத்தப்பட வேண்டும் அல்லது அகற்றப்பட வேண்டும். இவை அகற்றப்படாமல் இருக்கின்ற வரைக்கும், குறிப்பிட்ட ஓர் அதிகார வர்க்கம் அல்லது முதலாளித்துவ வர்க்கம் மேலும் மேலும் அபிவிருத்தியடைந்து கொண்டு செல்ல, வறுமைக் கோட்டின்கீழ் வாழ்கின்ற சாதாரண தொழிலாளர் வர்க்கம் தொடர்ந்தும் வறுமை நிலைக்குள் வாழக்கூடிய நிலைமை காணப்படும்.

இந்த நாட்டில் அபிவிருத்திக்காகப் பல துறைகளில் செலவுகள் செய்யப்படுகின்றன. தேசிய கணக்காய்வு சட்ட மூலத்தின் அடிப்படையில் இவ்வாறு செலவு செய்யப்படுகின்ற நிதிகள் வினைத்திறன் மிக்கதாகச் செலவு செய்யப்படு கின்றனவா? அதன் விளைதிறன்கள் எவ்வாறு இருக்கின்றது? நாங்கள் உற்பத்திக்காகச் செய்கின்ற உள்ளீடுகளில் எங்களுக்குக் கிடைக்கின்ற வெளியீடுகள் எவ்வாறு இருக்கின்றன? உற்பத்தித்திறன் எவ்வாறு இருக்கின்றது? என்ற விடயங்கள் பற்றிக் கவனமாகப் பரிசீலிக்கப்பட வேண்டியிருக்கின்றது. இந்தப் பரிசீலனைகள் மூலமாக இந்த நிதி எந்தளவுக்கு வினைத்திறன்மிக்கதாகப் பயன்படுத்தப் பட்டிருக்கின்றது? அல்லது அந்த நிதி எவ்வளவு வீண் விரயம் செய்யப்பட்டிருக்கின்றது? என்கின்ற விடயம் பற்றி ஆராய வேண்டியிருக்கின்றது.

இன்று அரசு சார்ந்த பல நிறுவனங்கள் நட்டத்தில் இயங்குகின்ற ஒரு நிலைமை காணப்படுகின்றதென்றால், அந்த நிறுவனங்களின் நிதிக் கையாளுகை மோசமாக இருக்கின்றது என்றுதான் கூறவேண்டும். குறிப்பாக விமானச் சேவையோடு சம்பந்தப்பட்ட விடயங்கள் கடந்த காலத்தில் எவ்வாறு இருந்தன என்பது பற்றிக் கூறப்பட்டது. அது நட்டத்தில் இயங்குவது பற்றியும் கூறப்பட்டிருந்தது. எனவே, அரச நிறுவனங்கள் நட்டத்தில் இயங்குகின்றன, அரச துறைகள் வினைத்திறன் அற்ற நிலையில் செயலிழந்து போகின்றன என்கின்ற விடயங்கள் எல்லாம் பேசப்பட்டுக் கொண்டு வந்தாலும்கூட, அந்த நிலைமையில் இருந்து மீண்டு, இலாபகரமான முறையில் முன்னேறிச் செல்வதற்கு ஏற்ற விதத்தில் என்ன நடவடிக்கை மேற்கொள்ளப்பட்டிருக்கின்றது என்ற விடயத்திலும் கவனம் செலுத்தப்படல் வேண்டும்.

யுத்த காலத்தின்போது அதிகளவான தங்கம் அந்தப் பிரதேசங்களில் இருந்து பெறப்பட்டதாகக் கூறப்படுகின்றது. தொலைக்காட்சியில் நான் ஒரு விடயத்தைப் பார்க்கக் கூடியதாக இருந்தது. அதாவது சாதாரண பெண் ஒருவர் "அந்தக் காலத்தில் பொருளாதாரத் தேவைக்காக 22 பவுண்களை நான் அடைமானம் வைத்திருந்தேன். ஜனாதிபதித் தேர்தலின்போது அதில் ¼ பவுண் மாத்திரம்தான் எனக்குத் தரப்பட்டது" என்று சொல்லி அந்தத் தொலைக்காட்சி நிகழ்ச்சியில் கண்ணீர் வடிக்கின்றார். ஆகவே, இந்த நிதி மற்றும் பெறுமதியான திரவியங்கள் விடயத்தில் நாங்கள் எந்தளவுக்கு வெளிப்படைத் தன்மையாக அல்லது நம்பகத் தன்மையாக, பொறுப்புக்கூறக்கூடிய அல்லது வகைகூறக் கூடிய விதத்தில் நடந்திருக்கிறோம் என்பதைப் பற்றி நாமே எம்மை ஆய்வு செய்ய வேண்டிய ஒரு நிலையில் நாங்கள் இருக்கின்றோம். எனவே, தேசிய கணக்காய்வு சட்டத்தின் மூலமாக பல்வேறு விடயங்கள் ஆய்வுக்குட்படுத்தப்பட வேண்டும். குறித்த விடயங்கள் ஆய்வுகள் செய்யப்பட்டு அறிக்கைகளாகக் குவிக்கப்பட்டிருந்தால் மாத்திரம் போதாது. அந்த அறிக்கைகள்மூலம் யார் யார் மோசடிகள் செய்திருக்கிறார்கள், யார் யார் ஊழல்கள் செய்திருக்கிறார்கள், யார் யார் அரச நிதியினை ஏப்பம் விட்டிருக்கிறார்கள் என்கின்ற விடயங்கள் வெளிக்கொணரப்பட வேண்டும். அவ்வாறு வெளிக்கொணரப்படுகின்றபோது மோசடிகள், ஊழல்கள், இலஞ்சங்களைக் களைவதற்குரிய வாய்ப்புகள் அதிகமாக இருக்கும்.

இன்று தனியார்துறைகளை எடுத்துக்கொண்டால், அவை இலாபமீட்டும் துறைகளாக மிகவும் கம்பீரமாக நடைபோட்டுக் கொண்டிருக்கின்றன. அரச துறைகளை எடுத்துக் கொண்டால், அவை மிகவும் நட்டமடைந்த துறைகளாக அல்லது மூடப்படக்கூடிய துறைகளாக மாறிக் கொண்டிருக்கின்றன.

[ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා]

இதற்கான காரணம் என்ன? அரசினால் இயக்கப்பட்டு வந்த பல தொழிற்சாலைகள் இன்று மூடப்பட்டுக் கிடக்கின்றன. அதாவது, அரசினால் செயற்படுத்தப்பட்டு வந்த பொருளாதார முக்கியத்துவம்வாய்ந்த தொழிற்சாலைகள் இன்று செயற்பட முடியாத நிலையில் காணப்படுகின்றன. அப்படியென்றால் அரச துறைகளினால் இலாபத்தை ஈட்டக்கூடிய விதத்தில் எதனையும் செய்யமுடியாத நிலை எழுந்துள்ளது. இதனால் எமது மக்கள் அதிகமானோர் வறுமைக்கோட்டின்கீழ் வாழக்கூடிய நிலைமை காணப்படுகின்றது.

'அபிவிருத்தி' என்கின்ற சொல் வார்த்தையளவில் இருந்தால் போதாது; வாசகங்களாக இருந்தால் போதாது; கோட்பாடுகளாக இருந்தால் போதாது. செயற்பாடுகளை அடையவேண்டும். செயற்பாடுகள் இல்லாத கோட்பாடுகள் எமது நாட்டுக்கு உதவாத கருத்துக்களாகத்தான் இருக்க முடியும். எனவே, தேசிய கணக்காய்வுச் சட்டத்தின்மூலம் ஒவ்வொரு துறையும் முறையாகக் கணக்காய்வு செய்யப்பட வேண்டும். இந்தக் கணக்காய்வுகள்மூலமாக வெளிப்படைத் தன்மையுடன் விடயங்கள் வெளிக்கொணரப்பட்டு, குறித்த நிதியினைக் கையாடல் செய்கின்றவர்கள் யார்? என்பது வெளிப்படுத்தப்படுவதற்கு நடவடிக்கை எடுக்கப்பட்டாக வேண்டும். எனவே, ஒவ்வோர் அரச துறையிலும் கணக்காய்வுக்குப் பொறுப்பாக இருக்கின்றவர்கள் இந்த விடயத்தில் மிகக் கவனமாகச் செயல்படவேண்டும். யார் தவறுகளை இழைத்திருந்தாலும் அந்தத் தவறுகளை வெளிக் கொணரக்கூடிய விதத்தில் சம்பந்தப்பட்டவர்கள் செயற்பட வேண்டிய தேவை இருக்கின்றது.

அரச நிறுவனங்கள் சரியான முறையில் கொண்டு செல்லப்படுவதற்குரிய விதப்புரைகளும் கணக்காய்வுகளும் வெளிப்படுத்தப்பட்டு, குற்றமிழைத்தவர்கள்மீது நடவடிக்கை எடுப்பதற்கான தேவை இன்று உணரப்படுகின்றது. இந்த நாடு சுதந்திரம் அடைந்ததன் பின்னர் 70 ஆண்டுகள் ஆட்சி நடாத்தப்பட்டிருக்கின்றது அல்லது காலம் கடந்திருக்கின்றது. இந்த 70 ஆண்டுக் காலத்தில் என்ன விடயம் சாதிக்கப் பட்டிருக்கின்றது? அரச துறைகள் எந்தளவுக்கு வளர்க்கப் பட்டிருக்கின்றன? அரச துறைகளில் நிதி மோசடிகள் செய்யப்படுவது அல்லது கபளீகரம் செய்யப்படுவது எந்தளவுக்குத் தடுக்கப்பட்டிருக்கின்றது? என்கின்ற கேள்வி களுக்கான விடை தொக்குநிற்கின்றது. எனவே, அரச கணக்காய்வுத் துறையானது இந்த விடயத்தில் கூடிய கவனம் செலுத்தவேண்டும். அதேநேரம் ஆளுமைமிக்க தலைவர்கள் மூலமாக அரச கணக்காய்வுத் துறையானது நிருவகிக்கப்படல் வேண்டும்.

இன்று இலஞ்சம் என்பது பஞ்சமில்லாத அளவுக்கு எங்கும் இடம்பெற்றுக்கொண்டிருக்கிறது. அதேநேரத்தில் இலஞ்சத்தில் 'பாலியல் இலஞ்சம்' என்ற விடயம் ஒரு புதுவடிவமாகத் தோற்றம் பெற்றிருப்பதையும் அவதானிக்கக்கூடியதாக இருக்கின்றது. பாடசாலைகளுக்கு மாணவர்களை அனுமதிக் கின்ற விடயத்தில்கூட இலஞ்சம் பெறுகின்ற கலாசாரம் உருவாகியிருக்கின்றது. மாணவர்களுக்குச் சமத்துவமான கல்வி வழங்கப்படுகின்ற நிலையங்களான பாடசாலைகளில் கூட பணம் இலஞ்சமாகப் பெறப்படுகின்றது. ஆனால், இது சம்பந்தமாக விசாரணை செய்து, தயாரிக்கப்படுகின்ற அறிக்கைகள் சிலவேளைகளில் அப்படியே கிடப்பில் போடப்படுகின்றன. அதேநேரம் குற்றமிழைத்தவர்களைத் தப்பிக்க வைக்கக்கூடிய செயல்பாடுகளும் இடம்பெற்றுக் கொண்டிருக்கின்றன. எனவே, பாடசாலை போன்ற அரச நிறுவனங்களில் மாணவர்கள் அனுமதியின்போது, பாடசாலையின் அபிவிருத்தியென்று முலாம் பூசிக்கொண்டு ஏதோ ஒரு வடிவத்தில் இலஞ்சம் வாங்கப்படுகின்ற நிலைப்பாடுகளைக் கண்டறிந்து, அவ்வாறு செயற்பாடுகளில் ஈடுபடுகின்றவர்கள்மீது முறையான நடவடிக்கைகள் எடுக்கப்படவேண்டும். இதில் காலதாமதங்கள் இருக்கக் கூடாது.

சரியாக இயங்குகின்ற நிறுவனத் தலைவர்களை நாங்கள் பாராட்டுகின்ற அதேவேளையில், இலஞ்சங்களைப் பெற்று, மோசடிகள் செய்கின்றவர்களுக்கு உரிய தண்டனைகளைக் காலதாமதம் இல்லாமல் வழங்கவேண்டும் என்று கேட்டுக் கொள்கின்றோம். சில உயர்தரப் பாடசாலைகளிலும் இவ்வாறான இலஞ்சம் மற்றும் மோசடிகள் இடம்பெறுகின்ற நிலைமை காணப்படுகின்றது. இவை சம்பந்தமாக விசாரணை செய்யப்பட்டு, அறிக்கைகள் தயாரிக்கப்பட்டிருக்கின்றன. எனினும், அதற்குரிய நடவடிக்கைகள் இன்னும் எடுக்கப்படாத நிலைமை காணப்படுகின்றது. எனவே, இலஞ்சம், மோசடி களில் ஈடுபடுகின்றவர்கள் யாராக இருந்தாலும் அவர்கள்மீது நடவடிக்கை எடுக்கும்போது தயவு தாட்சணியம் காட்டாமல் நல்லாட்சியின் தர்மத்தை அதன்மீது செலுத்தவேண்டுமென்று இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன். அதேவேளை, நட்டமடையக்கூடிய துறைகளாகத் தொடர்ந்தும் அரச துறைகள் இல்லாமல், இலாபத்தை ஈட்டக்கூடிய துறைகளாக அவற்றை மாற்றுவதற்குரிய வழிமுறைகளையும் செயல்பாடு களையும் கொண்டுசெல்ல வேண்டியவர்களாக நாங்கள் இருக்கின்றோம்.

வடக்கு, கிழக்குப் பிரதேசங்களைப் பொறுத்தமட்டில், இந்த அரசு பதவிக்கு வந்து மூன்று ஆண்டுகள் கடந்த நிலையிலும் அங்கு அபிவிருத்தி என்கின்ற விடயம் மந்தமான போக்கில்தான் காணப்படுகின்றது. அபிவிருத்தி விடயத்தில் கணிசமான அளவு உத்வேகமான தன்மை காணப்படவில்லை. ஆனால், இந்த அரசாங்கத்தின் பதவிக் காலத்தில் இன்னும் ஒன்றரை ஆண்டுகள் மீதமாக இருக்கின்றன. இந்த நிலையில் யுத்தத்தால் பாதிக்கப்பட்ட பிரதேசங்கள் இந்த ஒன்றரை ஆண்டுகளில் எவ்வாறு அபிவிருத்தி செய்யப்படப் போகின்றன? எவ்வாறு மேற்பார்வை செய்யப்படப் போகின்றன? அங்கு மக்களின் வறுமைநிலை நீங்கி, அவர்களுடைய வாழ்க்கை நிலை எவ்வாறு மேலோங்கச் செய்யப்படப்போகின்றது? என்ற பல கேள்விகள் இன்று எழுந்திருக்கின்றன.

இன்றைய நிலையில், இன்னுமொரு விடயத்தையும் சுட்டிக்காட்ட வேண்டிய ஒரு நிலைப்பாட்டில் நான் இருக்கின்றேன். அதாவது, வடக்கு, கிழக்கு மாகாணங்களை எடுத்துப்பார்க்கின்றபோது, குறிப்பாக வடபுலத்தை எடுத்துக் கொண்டால், அங்கு பல்வேறுபட்ட எதிர்மறையான கலாசாரங்கள் வளர்ந்துகொண்டு வருவதைக் காணலாம். குறிப்பாகப் போதைப்பொருட் பாவனை அதிகரித்துக் கொண்டு செல்கின்றது; மதுக் கலாசாரம் அதிகரித்துச் செல்கின்றது; வாள் வெட்டுக் கலாசாரம் உயர்ந்து கொண்டு செல்கின்றது. அதேபோன்று, வயது வேறுபாடுகளில்லாமல் பாலியல் துஷ்பிரயோகங்களும் அதிகரித்துக்கொண்டு செல்கின்றன. குழந்தையென்று பார்ப்பதில்லை, சிறுமியென்று பார்ப்பதில்லை, தாய்மார்களென்று பார்ப்பதில்லை. பாட்டிகள் தொட்டு பூட்டிகள் வரைக்கும் பாலியல் கொடுமைகளுக்கு உட்படுத்தப்படுகின்ற நிலைமை வடபுலத்தில் காணப் படுவதை எங்களால் அவதானிக்க முடிகின்றது. இன்று சட்டபூர்வமான படையினர் அங்கிருக்கின்றார்கள், சட்ட பூர்வமான பொலிஸார் அங்கிருக்கின்றார்கள். இவ்வாறு

இருக்கத்தக்கதாக அண்மையில் அங்கு ஆறு வயதுச் சிறுமி காம வெறியர்களால் கடத்திச் செல்லப்பட்டு, பாலியல் வல்லுறவுக்குட்படுத்தப்பட்டுக் கொல்லப்பட்டிருக்கின்றார். இப்படியான சூழ்நிலை எவ்வாறு உருவாகின்றது? யுத்த காலத்திலும் யுத்தத்திற்கு முற்பட்ட காலத்திலும்கூட இவ்வாறான பாலியல் துஷ்பிரயோகங்கள் காணப்படாத ஒரு பிரதேசத்தில், அத்தகைய செயற்பாடுகளை இன்று யார் மறைமுகமாக இருந்து ஊக்குவிக்கின்றார்கள்? கேரளக் கஞ்சா போன்ற போதை வஸ்துக்கள் தாராளமாக அந்த மண்ணுக்குக் கொண்டு செல்லப்படுவதற்கு யார் காரணமாக இருக்கின் றார்கள்?

ஒரு காலத்தில் 'கிரீஸ் மனிதர்'களைத் தயார் செய்து தமிழ்ப் பெண்களின் பண்பாட்டின்மீது பாய்ச்சல் செய்கின்ற ஒரு செயற்பாடு காணப்பட்டது. இப்போது 'ஆவா குழு' என்று சொல்லப்படுகின்றவர்கள்மூலம் அங்கு வாள்வெட்டுக் கலாசாரம் அதிகரித்துக்கொண்டு செல்கின்றது. பாலியல் துஷ்பிரயோகங்கள் அதிகரித்துக்கொண்டு செல்வதால் அங்கிருக்கின்ற பெண்கள் மிகவும் வேதனைப்படுகின்ற ஒரு சூழ்நிலை காணப்படுகின்றது' இந்த நிலையில், இராஜாங்க அமைச்சர் ஒருவர் கூறிய கருத்துத் தொடர்பாகக் கடந்த 3ஆம் திகதிய பாராளுமன்ற அமர்வின்போது அமளி துமளி ஏற்பட்டிருந்தது. குறித்த விடயம் பற்றிச் சிலவற்றை உண்மையில் நாங்கள் ஏற்றுக்கொண்டுதான் ஆக வேண்டும். ஏனென்றால், இன்று சட்டம், ஒழுங்கு பேணப்படாத ஒரு சூழ்நிலையை வைத்துக்கொண்டு, பாலியல் துஷ்பிரயோகத் திற்கு உட்படுத்தப்பட்டுச் சிறுமிகள் கொல்லப்படுகின்றார்கள். போர்க்காலத்திலும்கூட இந்தப் பண்பாடுகள்மீது கைவைக்கப் படாத ஒரு நிலையில், இப்போது அந்த நிலைமை ஏற்பட்டிருப்பது தொடர்பாகவே இராஜாங்க அமைச்சர் அவர்கள் குறிப்பிட்டிருந்தார். இருந்தாலும் சில விடயங்களை மேலதிகமாகக் குறிப்பிட்டிருந்தது நோக்கத்தக்க விடயமாகும்.

எமது நாட்டுக்கென்று ஒரு பண்பாடு காணப்படுகின்றது. மேலைத்தேய கலாசாரத்திலிருந்து விடுபட்டு கீழைத்தேயக் கலாசாரம், பண்பாடுகள், நாகரிகம் போன்றவற்றுக்கு முக்கியத்துவம் கொடுக்கின்ற ஒரு நாடாக இது இருக்கின்றது. அந்த வகையில், எமது பண்பாடுகளை, நாகரிகங்களை, விழுமியங்களைப் பேணிப் பாதுகாக்க வேண்டியவர்களாக நாங்கள் இருக்கின்றோம். எனவே, போதைவஸ்துக் கலாசாரம் தவிர்க்கப்பட வேண்டும்; மதுக் கலாசாரம் தவிர்க்கப்பட வேண்டும்; வாள்வெட்டுக் காலாசாரம் தவிர்க்கப்பட வேண்டும். அதேபோன்று, பாலியல் துஷ்பிரயோகம் போன்ற கலாசாரங்கள் தவிர்க்கப்பட வேண்டும். இதன்மூலம் எமது நாட்டின் உயர்ந்த விழுமியச் செயற்பாட்டினை முன்கொண்டு செல்வதற்குரிய நடவடிக்கைகளை மேற்கொள்ள முடியும். நாங்கள் மதத்தால் வேறுபடலாம், இனத்தால் வேறுபடலாம், குலத்தால் வேறுபடலாம், மொழியால் வேறுபடலாம். ஆனால், எமது நாட்டுக்கென்று ஓர் உயர்ந்த விழுமியக் கலாசாரம் இருக்கிறது. இந்த விழுமியக் கலாசாரம் சிலவேளைகளில் போதை வஸ்துக்காரர்களாலும் அல்லது திட்டமிட்ட அரசியல் நோக்கம் கொண்டவர்களாலும் மோசமான நிலைக்குள் தள்ளப்பட்டுக் கொண்டிருக்கின்றது. எனவே, இந்த விடயத்தில் நாங்கள் கூடிய கவனம் செலுத்த வேண்டும். குறிப்பாக, நல்லாட்சி அரசாங்கம் என்று சொல்லப்படுகின்ற ஆளும் அரசாங்கம் இந்த விடயத்தில் கவனம் செலுத்துவதன் மூலமாக வடபுலத்தில் ஏற்பட்டிருக்கின்ற துர்ப்பாக்கிய நிலையினைக் கட்டுப்படுத்தலாம்.

இன்று அளவுக்கதிகமாக வடக்கு, கிழக்கு மாகாணங்களில் மதுக்கடைகள் அல்லது மதுச்சாலைகள் திறக்கப்பட்டுக் கொண்டிருக்கின்றன. அதேநேரம் அங்கு சட்ட விரோதமாகக் கஞ்சா கடத்தப்படுவதும் அவை பிடிபடுவதும் மீண்டும் கடத்தப்படுவதுமான நிலை காணப்படுகின்றது. அதேநேரம் போதைக்குட்படுத்தப்பட்ட அல்லது போதையால் விழுங்கப் பட்ட காமுகர்கள் படுமோசமான முறையில் சில கைங்கரியங்களைச் செய்து கொண்டிருக்கின்றார்கள். எனவே, இந்த விடயங்கள்மீது கூடிய கவனம் செலுத்தி இவற்றை எதிர்காலத்தில் தடுக்கக்கூடிய விதத்தில் நடவடிக்கையெடுக்க வேண்டுமென்று இந்த உயரிய சபையில் கேட்டுக் கொள்கின்றேன்.

அபிவிருத்தியென்கின்ற ஒரு விடயம் ஒரு பக்கம் சென்று கொண்டிருக்கின்றபோது, பொருளாதார அபிவிருத்தியை மட்டும் அபிவிருத்தி என்று கருதக்கூடாது. இதில் சமூக அபிவிருத்தி, கலாசார அபிவிருத்தி, பண்பாட்டு அபிவிருத்தி, விழுமிய அபிவிருத்தி என்றெல்லாம் காணப்படுகின்றது. இந்த விழுமிய அபிவிருத்தி அல்லது சமூக அபிவிருத்தி இல்லாத நிலையில் எதனையும் சாதித்துவிட முடியாது. எனவே, இதற்குரிய நடவடிக்கைகளை எதிர்காலத்தில் துரிதமாகச் செய்யவேண்டிய கடப்பாட்டில் இப்போதைய அரசாங்கம் இருக்கின்றது. இந்த அரசாங்கம் ஆட்சிக்குவந்து 3 ஆண்டுகளுக்கு மேல் கடந்து செல்கின்றது. இன்னும் இருக்கின்ற காலம் மிகக் குறைந்த காலமாக இருக்கின்றது. இந்தக் குறைந்த காலத்தில் செய்யவேண்டிய செயற்பாடுகளை மிகவும் திட்டமிட்டுச் செய்து, மக்களுக்கு விமோசனம் கிடைக்கக்கூடிய செயற்பாடுகளை முன்னெடுக்க வேண்டும். வெறுமனே வார்த்தைகளால் பேசிவிட்டுச் செல்வதைவிட, யுத்தத்தால் பாதிக்கப்பட்ட எமது பிரதேசங்களைச் செயற் பாடுகள் மூலமாக அபிவிருத்தி செய்வதற்குரிய நடவடிக்கைகளை ஆக்கபூர்வமாக எடுக்கவேண்டும் என்று இந்த இடத்தில் கேட்டுக்கொள்வதோடு, மீண்டும் இன்றைய தலைப்புக்குள் வருகின்றேன்.

தேசியக் கணக்காய்வுச் சட்டமூலம் மூலமாக நிச்சயமாக எமது நாட்டில் இப்பொழுது காணப்படக்கூடிய, எதிர் காலத்தில் விளையக்கூடிய ஊழல்கள், மோசடிகள், இலஞ்சங்கள் போன்ற எதிர்மறையான விளைவுகளை ஏற்படுத்தக்கூடிய போக்குகளை, நோக்குகளைக் கட்டுப்படுத் துவதன்மூலமாக இந்த நாட்டை உண்மையான ஓர் அபிவிருத்திப் பாதைக்குக் கொண்டுசெல்லக்கூடிய விதத்தில் நாங்கள் செயற்பட முனைய வேண்டும் என்கின்ற விடயத்தை இந்த இடத்தில் சொல்லிக்கொள்ள விரும்புகின்றேன். இந்த நாட்டில் பல்வேறு தலைமைத்துவங்கள் ஆட்சி செய்திருக் கின்றன.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා
(மாண்புமிகு ஞானமுத்து ஸ்ரீநேசன்)
(The Hon. Gnanamuthu Srineshan)
Okay.

பல தலைமைத்துவங்கள் ஆட்சி செய்திருந்தாலும் இந்தத் தலைமைத்துவங்களுக்கப்பால் இனத்துவேசம், மதத்துவேசம் என்பனவும் இந்த நாட்டை ஆண்டு கொண்டிருக்கின்றன. எனவே, இந்தத் துவேசங்களிலிருந்து விடுபடாத வரைக்கும் எமது நாட்டில் ஒரு நல்லிணக்கமான சூழலை ஏற்படுத்த முடியாது. ஆனால், அந்த நல்லிணக்கத்தை நாங்கள் ஏற்படுத்தியே ஆகவேண்டும் என்று கூறி, எனது உரையினை நிறைவுசெய்கின்றேன்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා. ඔබතුමාට විනාඩි 14ක් තිබෙනවා.

[අ.භා. 2.08]

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික විගණන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් විවාද කරන මේ අවස්ථාවේ අපේ රටේ විගණකාධිපති දෙපාර්තමේන්තුව අඛණ්ඩව ඉටු කර තිබෙන වැදගත් කර්තව්‍ය අපි ඉතා ඕනෑකමින් සඳහන් කරන්න ඕනෑ. එකක් තමයි විගණනයට ඇති අයිතිවාසිකම. ඒ බව ගරු අගමැතිවරයාත් සඳහන් කළා; මම කලින් දවසක ගරු කථානායකතුමාට සුබ පතන අවස්ථාවේදීත් සඳහන් කළා. මහජනයා හා රජතුමා අතර ඇති වුණු අරගළයක ප්‍රතිඵලය ලෙස තමයි පාර්ලිමේන්තු බලය වැඩි වුණේ. මහජනයා ගෙවන බදුවලට අයිතියක් කියන්න ඉල්ලා සිටි සටන තමයි කිරුළ හා ජනතා නියෝජිතයන් අතර ඇති වුණේ. මෙය තමයි පාර්ලිමේන්තු ඉතිහාසයේ විකාශනය. මේ විකාශනයේදී මහජනතාව බදු ගෙවනකොට මහජන නියෝජිතයන් එයට වගකිව යුතු බවත්, මහජන නියෝජිතයන්ගේ වගකීම හරියාකාරව ඉෂ්ට වෙන බවට, රාජ්‍ය මුදල් පරිහරණය, ආයෝජනය, වියදම් කිරීම ආදිය පිළිබඳ පරීක්ෂා කර විගණන කටයුතු කිරීමට ලෝකයේ සෑම රටකම විගණන දෙපාර්තමේන්තු පවතිනවා. ඒවායේ ස්වභාවය වෙනස්. එක පොදු මූල ධර්මයක සිටියද, විගණන අධිකාරිය, විගණන කොමිෂන් සභා, විගණන දෙපාර්තමේන්තු හා විගණන අධිකරණ - Courts of Audit - ආදී වශයෙන් පවතිනවා. හිටපු විගණකාධිපති ගාමිණී ඇපා මහතාගේ කාල පරිච්ඡේදයේ, 1990 යුගයේදී, අපත් - පාර්ලිමේන්තුව- සමඟ සාකච්ඡා කරලා Court of Audit එකක් ඇති කිරීමට එකඟ වුණා මට මතකයි. කොමිෂන් සභා මාර්ගය එක මාර්ගයක්. අවශ්‍ය කර්තව්‍ය ඊටත් වඩා ඉෂ්ට කිරීමට මේ Court of Audit එකට පුළුවන් වෙනවා. එහි අරමුණ දඬුවම් කිරීම නොවෙයි. අරමුණ දඬුවම් කිරීම කියලා අපි හිතන්න හොඳ නැහැ. එහි අරමුණ විගණනයකින් ඇති වන තොරතුරු සම්භාරය, එය උල්ලංඝනය කර තිබෙන අවස්ථා පිළිබඳව, වගකිව යුතු නිලධාරීන්, වගකිව යුතු තීරණ ගන්නන් පිළිබඳ කටයුතු කිරීමේ යම් යම් සීමාවන් ඇති කර දීමයි. එම සීමාවන් තුළ අපි අතිරේක ගෙවීම් විගණකාධිපතිවරයාට නියම කරනවා. ඒ තුළින් බලාපොරොත්තු වන්නේ යළිත් වරක් එය ඇති නොවන ආකාරයට අදාළ තීරණ ගන්නා නිලධාරීන් හෝ අනෙක් අය හැසිරෙයි කියන දේයි. ඒ තුළින් පොදු මහජන මුදලට, පොදුවේ ජාතියේ අයිතිකරුවන්ට වැරදි නොකරන ලෙසයි බලාපොරොත්තු වන්නේ. මේ නිසා ජාතික විගණන පනත් කෙටුම්පත ගැන අද යුගය අනුව දීර්ඝ සාකච්ඡා සිදු වෙනවා කියලා මම හිතනවා. In relation to imposition of surcharge, there have been a lot of arguments. I remember raising this issue when the Vote of His Excellency the President was being taken up. So many months have gone. The President got up and gave me an answer. He said, "I will introduce the Bill within three months." Now, three months have gone. That is okay as long as we have the Bill today. But, the Bill is inadequate. That is the issue. බලාපොරොත්තු සියල්ල මේ පනත් කෙටුම්පත මඟින් ඉෂ්ට නොවන නිසා මහා මතභේදයක් සහ අර්බුදයක් පවතිනවා. පළමුවැනි එක මම ඉතාම ඕනෑකමින් කියන්නට ඕනෑ. Transparency International Sri Lanka ආයතනය මේ පිළිබඳව අධ්‍යයනයක් කරලා වාර්තාවක් ඉදිරිපත් කළා. එම වාර්තාව මහජන මන්ත්‍රීවරුන්ට භාර දීලා තිබෙනවා. අඩු පාඩුකම් රාශියක් එහි ඉතා ඕනෑකමින් සඳහන් වෙනවා. ඒ අඩු පාඩුකම් සියල්ල ඉදිරිපත් කරන්න පුළුවන් අවස්ථාවක් බවට මේ අවස්ථාව පත් වී නැති වීම ගැන අපි කනගාටු වෙනවා.

එය අන්තර්ගත කර ගැනීමේ ක්‍රියා මාර්ගය ඉදිරි කාලයේදී ඇති කරගත යුතුයි. මම එක අතකින් විගණකාධිපති දෙපාර්තමේන්තුවට ස්තුතිවන්ත වනවා. විගණන සේවා කොමිෂන් සභාව පිහිටුවීම වාගේම, ජාතික විගණන පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීම ඒ සඳහා ගෙන තිබෙන මූලික ක්‍රියා මාර්ගයක්. මෙම පනත් කෙටුම්පත ගෙන ඒම වළක්වන්න කොපමණ උත්සාහ දැරුවද එය අද පාර්ලිමේන්තුවේ සම්මත කරගනු ඇතැයි අපි බලාපොරොත්තු වනවා. Transparency International Sri Lanka ආයතනය විසින් ඉදිරිපත් කරන ලද කෙටුම්පතේ 5වන පිටුවේ සිට 11වන පිටුව දක්වා සිංහල හා ඉංග්‍රීසි පිටපත් මම **සභාගත*** කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහි ඇතුළත් කරුණු ගැන කියන්න වෙලාව නැති නිසා එම කෙටුම්පත මගේ කථාවට අන්තර්ගත කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

මෙය ප්‍රසිද්ධ ලියවිල්ලක්. අනාගත ක්‍රියා මාර්ගයන් සඳහා එය හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වීම ඉතාම වැදගත්. මා එම ඉල්ලීම කරන්නේ, අධිභාරය පිළිබඳ සංකල්පය දැරීම, ප්‍රවර්ධනය වූ අභියාචනා කාර්ය පටිපාටිය, පුද්ගලික ගිණුම් පරීක්ෂා කිරීමේදී ආරක්ෂා කරනු ලබන පුද්ගලිකත්වය පිළිබඳ අයිතිවාසිකම්, අද්විතීය අය වැය යන්ත්‍රණයක් රඳවා ගැනීම ආදී මූලික කරුණුවල සිට නිර්දේශ ගණනාවක් දීර්ඝ වශයෙන් ඉදිරිපත් වී තිබෙන නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය මූල්‍ය අවභාවිතාවක් සම්බන්ධයෙන් ජාතික විගණන පනත් කෙටුම්පත අනුව නම් උපරිම දඩය රුපියල් 5,000යි. ගරු සභාවේදී මීට පෙර සඳහන් වුණා, අවම දඩ මුදල හැටියට රුපියල් 5,000ක් නියම කරන්න යෝජනා කළ බව. නිශ්චිතව යම් මුදලක් ප්‍රමාණවත් කියලා මම යෝජනා කරන්නේ නැහැ. නමුත්, මේ මුදල් ප්‍රමාණය විගණකාධිපතිවරයාට වෙනස් කරන්න වනවා. මොකද, "රුපියල් 5,000 මොකක්ද?" කියලා සමහර විට කල්පනා කරනවා. විගණනයට හසු වන එක වාක්‍යයක තිබෙන ඉන්ධන වියදම බැලුවොත් රුපියල් 5,000ට වැඩියි. මේ නීති හදන්නේ වෙනස් වන කාල පරිච්ඡේදයට අවශ්‍ය වන පරිදි හා අනාගතය සඳහායි; අතීතය සඳහා නොවෙයි. අපේ රටේ වර්තමානය සහ අනාගතය සඳහායි මේ පනත් සැකසෙන්නේ. එලෙස කල්පනා කරන්න බැරි වීම ගැන අපේ කනගාටුව ප්‍රකාශ කරනවා.

ඊළඟට, පෞද්ගලික අංශයේ ආයෝජනය කරන ලද රාජ්‍ය ආයෝජන පිළිබඳ විගණනය කිරීමේ ඇති සීමාවන් පිළිබඳව තිබෙන විශේෂතා ගැනත් මම කිය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව සාකච්ඡා කරන විට මට මතක් වෙනවා, අපි ජර්මනියට ගිය අවස්ථාව. එහි ලුෆ්තන්සා ජර්මන් ගුවන් සේවාව is a public investment. Government has invested but they did not have the majority shares. They had a very small number of shares, but it was also subject to audit control by their central audit commission.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

අපේ රජයෙන් දැන් මෙවැනි ආයතන රාශියකට ආයෝජන අවස්ථා ලබා දීලා තිබෙනවා. ඒ නිසා, ඒවා ගැන සොයා බැලීමේ අයිතියක් තිබීම වැදගත් වනවා. විවෘත ආර්ථික ක්‍රමය කරා අපි ගමන් කරපු වෙලාවේ සිට සිද්ධ වුණේ පාර්ලිමේන්තුවට මුදල් පිළිබඳව තිබුණු බලය සේදී යාමට පටන් ගැනීමයි. මේක තමයි යථාර්ථය. දැන් අපි උත්සාහ දරනවා, කෙසේ හෝ යළිත් විගණන කළමනාකරණයකට භාජන කරන්න පුළුවන් වෙයි කියලා. එසේ භාජන කිරීමේදී රජය ආයෝජනය කර තිබෙන සියලු අංශවල මුදල් පිළිබඳ වගකීමක් පාර්ලිමේන්තුවට අය වැයකින් ආවාට පස්සේ ඒ වත්කම් පිළිබඳව හා වියදම් පිළිබඳව විගණනය කිරීමේ බලයක් තිබිය යුතුයි කියලා අපි විශ්වාස කරනවා. පළාත් පාලනය ආයතන හා පළාත් සභාවලටත් මෙය ඒ වාගේම වැදගත්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය යටතේ පත් කළ ගරු බන්දුල ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් තිබුණු මුදල් අනු කමිටුවේ වාර්තාව - Report of the Subcommittee on Finance - මම කියවන්නම්. එම කමිටුව සර්ව පාක්ෂික එකඟතාවකට ඇවිත් තිබෙනවා, සුදුසුකම් ලත් වෘත්තිකයෙක් විගණකාධිපතිවරයා වශයෙන් පත් විය යුතුය; ඔහුගේ ධුර කාලය සීමා විය යුතුය; විගණකාධිපතිවරයා හා කොමිසම අදාළ විශේෂඥයන්ගෙන් සමන්විත වීම ඉතාම වැදගත් කියලා.

සමුපකාර දෙපාර්තමේන්තුව කියන්නේ, මුළු රට පුරාම පැතිර තිබෙන දෙපාර්තමේන්තුවක්. මෙය විගණනය කිරීම මම හිතන හැටියට ප්‍රාදේශීය මට්ටමටයි පවරා තිබෙන්නේ. එහි වත්කම් පිළිබඳව අවධානයක් යොමු කරනවා නම් හොඳයි. පෞද්ගලික අංශවල ආයෝජනය කර තිබෙන සියලු වත්කම් විගණනය කිරීමට විගණකාධිපතිවරයාට සම්බන්ධ වෙන්න පුළුවන් ක්‍රියා මාර්ගය ඉතා වැදගත්.

විගණන කොමිසමට එසේ කටයුතු කරන්න පුළුවන් වුණොත් තමයි මේ මහා නාස්තිය, වැරදි වියදම් කිරීම් රටේ යහපත පිණිස යළිත් වරක් සිදු නොවන තත්ත්වයට පරිවර්තනය කර ගන්න පුළුවන් කාල පරිච්ඡේදයක් එන්නේ. එක අතකින් අපි ස්තුතිවන්ත වෙනවා, පසුගිය කාලයේ විගණකාධිපතිවරයා මහජන මන්ත්‍රීවරුන්ගේ හඬට සවන් දීම ගැන. වැදගත්ම කාරණය, මහ බැංකු වංචාව, හොරකම -සිංහල අපේ කථාවෙන් කියනවා නම් මහ බැංකු වංචාව සහ හොරකම- පිළිබඳව විගණන දෙපාර්තමේන්තුවේ මූලික වාර්තාව පාර්ලිමේන්තුව ලබා ගැනීමෙන් තමයි මා හිතන විධියට මේ දොරටුව විවෘත කරනු ලැබුවේ. අද වෙනකල් ආණ්ඩුවට මොකක් කර ගන්නට සිද්ධ වෙනවාද කියලා දන්නේ නැති මට්ටමට අපේ ඉතිහාසයේ ලොකුම මහ බැංකු වංචාව සිදු වුණු අවස්ථාවයි පසු කරලා තිබෙන්නේ. ඒ මූලික කටයුතුවලදී විගණන දෙපාර්තමේන්තුවට විවිධ තර්ජන, ගර්ජන තිබුණා. අපි දැක්කා, පසුගිය කාල පරිච්ඡේදයේදී මහනුවර වැනි ඈත පළාතක විගණන සේවයේ යෙදී හිටපු විගණන නිලධාරියෙකුට ඇසිඩ ගසා තිබුණා. ඇයි? පෞද්ගලික තරහකටද? නැහැ. විගණන කටයුතු කරලා වැරැද්දක් සොයා ගෙන ඒ පිළිබඳ කටයුතු කළ නිසා. ඒ අනුව බලන විට කොයි තරම් තර්ජන මැදද විගණන නිලධාරීන් කටයුතු කරන්නේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිංහල කථාවක් තිබෙනවා, -ඔබතුමාත්, මමත් කිව්වු ගම්වල අය නිසා කියන්න පුළුවන්- රැවුලයි, කැඳයි දෙකම බේරා ගෙන තමයි වැඩ කරන්න වෙලා තිබෙන්නේ කියලා. රාජ්‍ය සේවය පවත්වාගෙන යන්න රාජ්‍ය නිලධාරීන් අවශ්‍යයි. රාජ්‍ය සේවයේ කාර්යක්ෂමතාවත් අවශ්‍යයි; රාජ්‍ය සේවයේ එලදායිතාවත් අවශ්‍යයි. රාජ්‍ය දෙපාර්තමේන්තු යම් කිසි ඉලක්ක සපුරන දෙපාර්තමේන්තු බවට පරිවර්තනය කර ගන්න නම්, විගණනය අත්‍යවශ්‍යයි. ඒ විගණනය ප්‍රමාද වී ලැබෙන විගණනයක් විය නොහැකියි. ඒ නිසා විගණනය වෙනුවෙන් ඇති කරන ක්‍රියාමාර්ග ඉතාම වැදගත්.

අනෙක් කාරණය මේකයි. විගණකාධිපතිවරයාත් මේ පාර්ලිමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ කුටියේ ඉන්න අවස්ථාවේදී ඒ කාරණයට එතුමාත් සවන් දෙයි. ඒ කාරණය මම මේ සභාවටත් කියන්න ඕනෑ. අපට විගණන වර්ග දෙකක් තිබෙනවා. සාමාන්‍යයෙන් පවත්වාගෙන යන විගණන හා එලදායී විගණන - progress audit - ගැන සොයා බැලීම. උදාහරණයක් වශයෙන් අරගෙන බලන්න, මහවැලිය. අපි කෝටි ගණන් මහවැලියට ආයෝජනය කරලා තිබෙනවා. නමුත් මහවැලියේ ධාරිතාව අපි ප්‍රයෝජනයට ගන්නේ නැහැ. That comes under progress audit. It has to be done so that the engineers and the other professionals, after so many years, can go into that; those angles have to be studied. එතකොට තමයි වඩාත් ප්‍රයෝජනවත් තත්ත්වයට පරිවර්තනය වෙන්නේ. මට සතුටුයි, මේ අවස්ථාවේදී මගේ මිත්‍ර ගාමිණී දිසානායක හිටපු ඇමතිතුමාගේ ආදරණීය පුතා -ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා- මේ පාර්ලිමේන්තු සභා ගර්භයේ සිටීම ගැන. ඒ කාලයේ තරුණ මන්ත්‍රීවරු හැටියට අපි ගාමිණී දිසානායක හිටපු ඇමතිතුමාගේ කථාවලට සවන් දුන්නා. මට මතකයි, එතුමා මේ progress audit එක ගැන ඉතාම බරපතළ ලෙස පාර්ලිමේන්තු කථාවලදී, අය වැය විවාදවලදී කිව්වා. එතැනින් තමයි අප විසින් කරන ලද ආයෝජනයේ එලදායිතාව පිළිබඳව දැන ගන්න පුළුවන් වන්නේ. වැරදි දෙයට මුදල් භාවිතා කරලා හෝ මුදල් වැඩියෙන් භාවිතා කරලා, නැත්නම් දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුගෙන්, committee එකෙන් ගත්ත නිර්දේශය ක්‍රියාත්මක කර ගන්න බැරි වුණා කියනවාටත් වඩා එය වැදගත්. අපේ විදුලි බලය, අපේ ජලය, මේවා නිසා තමයි අද අපේ රට ඉදිරියට යන්නේ. ගොවියාට වතුර නැත්නම් අපේ රට හාමතේ. Auditor-General's Department එකට පුළුවන්ද මේ ගැන සොයා බලා කියන්න, මොකද වුණේ කියලා? වැරදි වෙලාවට වතුර යැව්වාද, වතුර තියා ගන්න තිබෙන තැන හරි ධාරිතාව තියා ගත්තේ නැද්ද කියලා කියන්න පුළුවන්ද? These things do not come under audit. මම බොහොම කනගාටුවෙන් කියනවා, විදුලිබල දෙපාර්තමේන්තුව-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මම කථාව අවසන් කරනවා. මම මේ කිව්වේ, අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා අලුතෙන් හිතන්න ඕනෑ කියලායි. මේවා අලුත් දේවල් නොවෙයි. පවතින දේවල් ප්‍රයෝජනයට ගැනීමේ අවශ්‍යතාවයි තිබෙන්නේ.

මම මගේ කථාව අවසන් කිරීමට ප්‍රථම කාරණා දෙකක් කියනවා. අපේ රටේ බැංකු පද්ධතිය මත තමයි මූල්‍ය ක්ෂේත්‍රය පවතින්නේ. විශාල ලෙස අවධානය යොමු කළ යුතු බරපතළ ප්‍රශ්නයක් මහජන බැංකුවේ පවතිනවා. ලංකා බැංකුවේත් ඒ හා සමාන ප්‍රශ්නයක් පවතිනවා.

මේ බැංකු දෙකෙහි පැවැත්ම ශක්තිමත් නොකර, විගණකාධිපතිවරුන් අපේ දේශපාලනඥයන්ට ඕනෑ ආකාරයට කටයුතු කරන්න දීමෙන් මේ බැංකු දෙක කඩා වැටුණොත්, මුළුමහත් මූල්‍ය ක්ෂේත්‍රයට හා ආර්ථිකයට එය බලපානවා. ඒ නිසා ඒ සම්බන්ධව දැඩි අවධානය යොමු කරන්න.

අද මහජන බැංකුව digital banking ක්‍රමය යටතේ විවිධ තීරණ අරගෙන, ඉතාම බරපතළ ලෙස ඇති කරගෙන යන භයානක තත්ත්වය පිළිබඳව බැංකු සේවක සංගමය ඉදිරිපත් කරපු

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

කිසිම කරුණක් අවධානයට අරගෙන නැහැ; ලංකා බැංකු සේවක සංගමය විසින් ඉදිරිපත් කරන ලද කරුණු අවධානයට ගෙන නැහැ. සිද්ධියක් සිද්ධ වුණාට පසුව බලා වැඩක් නැහැ. ඒ සඳහා තමයි මේ ජාතික විගණන කොමිසම පත් වෙන්නේ.

පසුගිය කාලය තුළ වැදගත් පනත් සම්මත කර ගත්තා කියලා අද අගමැතිතුමා සඳහන් කළා. But, there are areas in this Bill which are being subject to control or which are not in the domain of the Auditor General because of the RTI Act. එහෙම නම් මේ RTI Act එකේ තේරුම මොකක්ද? Auditor General, ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව සුපිරි බලවතෙක්. හැම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවකටම අනුව ඒක එහෙමයි. ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුකාරවරු වාගේම Auditor General බලවතා. නමුත් යම් යම් තොරතුරු නිකුත් කිරීමේදී Auditor Generalට නිලධාරීන්ගේ කටයුතු සම්බන්ධයෙන් මේ පනත් කෙටුම්පත යටතේ පාලනයක් ඇති කරලා තිබෙනවා. එවැනි පාලනයක් තුළ කොහොමද, විගණන දෙපාර්තමේන්තුවක, විගණන කොමිසමක ඵලදායීත්වය ඇති වෙන්නේ?

මේ පනත් කෙටුම්පත ආරම්භයක් හැටියට ඉතාම වැදගත්. අපි හිතනවා, ඉදිරි කාලයේදී මේ අඩුපාඩුකම් යළිත් සැලකිල්ලට ගෙන සංශෝධන ඉදිරිපත් කිරීමෙන් විගණන දෙපාර්තමේන්තුවටත්, විගණන නිලධාරීන්ටත් කටයුතු කරන්න පුළුවන් වෙයි කියලා. ඒ වාගේම රාජ්‍ය සේවය හරහා වැඩ කරන්න සිද්ධ වෙලා තිබෙන නිසා රාජ්‍ය දෙපාර්තමේන්තුවලටත් ඒ විශාල වගකීම ඉහළ සිට පහළට පැවරෙනවා. අපේ රටේ මූල්‍ය අර්බුද පිළිබඳව වාගේම, අය වැය ලේඛන ආදියේ ඵලදායීත්වය කුමන ප්‍රමාණයකින්ද සිද්ධ වෙලා තිබෙන්නේ කියන එක පාර්ලිමේන්තුවට හා රටට දැන ගන්න වෙනදාට වැඩිය අවස්ථාවක් ජාතික විගණන කොමිසමෙන් ලැබෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු රවි කරුණානායක මැතිතුමා.

[අ.භා. 2.26]

ගරු රවී කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික විගණන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කිරීමට ඉඩප්‍රස්තාව ලබා දීම මා ඉතා අගය කොට සලකනවා. ඊට වැඩියෙන් මම සතුටු වෙනවා, දිනේෂ් ගුණවර්ධන ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමාගේ කථාවෙන් පසුව මේ ගැන කරුණු එකතු කරන්නට මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව.

ජාතික විගණන පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න පරක්කු වුණත්, යම් කාලයකට පසුව හෝ එය සිදු කිරීමට හැකි වීම අප ලබා ගත් අතිවිශිෂ්ට ජයග්‍රහණයක් ලෙස මා සලකනවා. 1994 සිට අඛණ්ඩව පාර්ලිමේන්තුවේ සිටි මන්ත්‍රීවරයෙක් වශයෙන් මූල්‍ය ගණනය කිරීම, විගණනය කිරීම, එහි තිබෙන දුර්වලතා, මූල්‍ය විනය පාලනය සම්බන්ධයෙන් තිබෙන ප්‍රශ්න යනාදිය මට පෙනී ගියා. මම 1994 ඉඳලා ඒ සම්බන්ධව මේ පාර්ලිමේන්තුවේ හඬ අවදි කරපු පුද්ගලයෙක්.

මට මතකයි, 1996දී "ගුප්තා" කියන ලෝක බැංකු නියෝජිතයා ලංකාවට පැමිණියා. ඔහු ඉන්දියානු ජාතික පුද්ගලයෙක්. ඔහු අතිවිශිෂ්ට කාරණා හෙළිදරව් කළා. එවකට විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සිටි මායාදුන්නේ මැතිතුමාත් සමඟ එසේ අදහස් හෙළිදරව් කිරීම නිසා, අද මෙවැනි තත්ත්වයකින් එළිදැක්වීමක් කරන්න අපට පුළුවන් වුණා. ඒ අවස්ථාවේදී තිබුණු දුර්වලතා නොදන්නවා නොවෙයි. ඒ තිබුණු තොරතුරු සම්පිණ්ඩනය කරලා, නීති පද්ධතියක් ඇති කිරීම තමයි තිබුණු ප්‍රශ්නය. ඒ නිසා අද මේ සාර්ථකත්වය ගැන අපි සතුටු වෙනවා.

දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා මේ අවස්ථාවේ මේ සභාවේ සිටින නිසා මම යමක් මතක් කරන්න කැමැතියි. ගරු මන්ත්‍රීතුමනි, right to information ගැන ඔබතුමා මේ මොහොතේ ඇසුව නිසා, ඔබතුමා මේ ගරු සභාවෙන් එළියට යන්න ඉස්සෙල්ලා ඒ ගැන සඳහන් කළ යුතුයි. ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට right to information කියන එක අපේ මේ ආණ්ඩුව බලයට ආවාට පසුව ඉතාම අමාරුවෙන් ලබා ගත් ජයග්‍රහණයක්.

ඒ තුළින් අද යම් යම් දේවල් හෙළිදරවු වීම විපක්ෂයට ලොකු උදව්වක් වෙලා තිබෙනවා. ඒත් අපට අවශ්‍ය වුණේ සැබෑ තත්ත්වය ඇති කිරීමයි. මට මතකයි, එවකට තිබුණු ආණ්ඩුවෙන් ප්‍රශ්නයක් ඇහුවාම, ඒ ප්‍රශ්නයකට පිළිතුරු නොදී සිටියා. ඒ නිසා තමයි Right to Information Act එක ගෙනාවේ. ඔබතුමා පිළිගන්නවා ඇති, මා හිතන හැටියට ඒ ජයග්‍රහණය අනිවාර්යයෙන්ම රටට ඔබින මට්ටමට ගෙනැවිත් තිබෙන බව. ඒ තුළින් සමහර තොරතුරු දෙන්න පුළුවන්ද, බැරිද කියන ප්‍රශ්නය මතුවෙලා තිබෙනවා. ඒ ගැන අපි නැවත විශ්ලේෂණය කරලා බලන්න ඕනෑ. අපි ඒ සම්බන්ධයෙන් කථානායකතුමා එක්කත් සාකච්ඡා කළා. ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඉතාම ඕනෑකමින් ඒ සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් කළා. එහි නිවැරැදි කිරීමක් කළ යුතුව තිබෙනවා. නමුත් මා මතක් කළේ, එදා කිසිම තොරතුරක් ලැබුණේ නැති වුණත්, අද අඩු ගණනේ සියයට 90ක්වත් තොරතුරු ලැබෙන බව කියන්නයි. එය ජයග්‍රහණයක් ලෙස සලකන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. ජාතික විගණන පනත් කෙටුම්පත තුළින් අපි ක්‍රමවේදයක් ඇති කරනවා, මේ තුළින් නිල මට්ටමින් දෙයක් කරන්නේ කොහොමද කියලා. විගණකාධිපති වශයෙන් දැන් අලුත් පුද්ගලයෙක් ඉන්නවා. යම් දෙයක් වුවමනාවෙන් කරන්න ඕනෑය කියන මතයක් ඇති වී තිබෙන එක ගැනත් සතුටුයි. ඒ සඳහා කාර්ය මණ්ඩලයේ ඕනෑකම තිබුණත්, ඒ දේවල්වල material value එක අනුව විගණනය කරන්න අවශ්‍යයි. සමහර විට රුපියල් 100ක් වටිනා දෙයක් සම්බන්ධයෙන් විගණනය කරන්න රුපියල් ලක්ෂයක් පමණ වියදම් කරනවා. එවැනි දේවල් කරන්නේ නැතුව ජාතික විගණන පනත ඉදිරියට ගෙන යන්න අවශ්‍යයි. අද විගණනය විභිළුවට ලක්වෙලා තිබෙනවා. සමහර විට ඔපදුප අනුව විගණනය කරනවා. සමහර තැනක් ගැන නිර්නාමික දේවල් ලියපු හැටියේම ඒ ගැන විගණනයක් කරනවා. ඒ සමහර ඒවා කිසිම වටිනාකමක් නැති - non material - ඒවා. ඒවා ගැන විගණනයක් කරගෙන යනවා. තවත් සමහර විට පළිගැනීමේ ස්වරූපයේ විගණනයන් කරගෙන යනවා. අමාත්‍යාංශ ගණනාවක කටයුතු කරලා මා ලැබූ අත්දැකීම් තුළින් තමයි මා මේ කරුණු ප්‍රකාශ කරන්නේ.

මුළු ලෝකයේම විගණනය ඉතාම වැදගත් ක්‍රියාවක්; අත්‍යවශ්‍ය ක්‍රියාවක්. හැම රටකම Auditor General කෙනෙක් සිටිනවා. ඒ වාගේම විගණන කටයුතු කරන පෞද්ගලික අංශයේ කොම්පැනි ගණනාවක් තිබෙනවා. ලෝක ප්‍රසිද්ධ KPMG, Ernst & Young, PricewaterhouseCoopers වැනි විගණන කොම්පැනි

ගණනාවක් තිබෙනවා. මේ සියලු පෞද්ගලික විගණන කොම්පැනි අප රටෙත් තිබෙනවා. දැන් අපට තිබෙන්නේ, විගණකාධිපති සමඟ ඒ පෞද්ගලික අංශ ඒකාබද්ධවෙලා කටයුතු කරන්නේ කොහොමද කියන ප්‍රශ්නයයි. 2015 අය වැය වාර්තාව ඉදිරිපත් කරන අවස්ථාවේදී, මුදල් ඇමති වශයෙන් මට අවශ්‍ය වුණේ ජාතික මට්ටමින් විගණකාධිපතිතුමාට සම්පූර්ණ පාලන බලය දෙන්නයි. පළාත් සභා සහ ප්‍රාදේශීය සභා මට්ටමින් හෝ ආසන මට්ටමින් පෞද්ගලික අංශයෙන් විගණකාධිපතිවරයාට උදව් කරන්න පුළුවන් ස්වරූපයේ වැඩ කටයුත්තක් කරන්න ඕනෑ.

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා balance sheet items සහ off balance sheet items ගැන කිව්වා. උදාහරණයක් වශයෙන් කිව්වොත්, කෘෂිකර්ම ක්ෂේත්‍රයට අවශ්‍ය කරන ජලය නියමිත වේලාවට පිට කළේ නැත්නම් ඒ තුළින් රටට සිදුවන පාඩුව off balance sheet කරුණක්. එය විගණනය කරන්නේ කොහොමද? ඒ හැම කරුණක්ම විගණනය කරන්න විගණකාධිපති දෙපාර්තමේන්තුවට දුන්නා නම් ලක්ෂ ගණනක සේවක පිරිසක් අවශ්‍ය වෙනවා. ඒ නිසා ඒ ප්‍රදේශයේ තිබෙන පෞද්ගලික අංශයේ audit companies හෝ එහි නිලධාරීන් මඟින් අපට ඒ දත්ත ලබා ගැනීමේ හැකියාව තිබෙනවා. මා අගය කරනවා, off balance sheet items සම්බන්ධයෙන් මතක් කිරීම ගැන. අද හැම දෙයක්ම රුපියල් ශතවලට සීමාවෙලා තිබෙනවා මිස, ශේෂ පත්‍රයෙන් පිටස්තර, ගණනය කරන්න බැරි ගිණුම් විගණනය ගැන කවුරුත් කථා කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විගණන කටයුතු කොටස් 4කට හෝ 5කට බෙදන්න පුළුවන්. පළමුවන එක තමයි, statutory audit කියන එක. ඒ කියන්නේ, අවුරුද්දකට වරක් නීත්‍යානුකූලව කළ යුතු audit එක. දෙවන එක තමයි, management audit එක. තුන්වන එක තමයි, balance sheet audit එක. හතරවන එක තමයි systems audit එක. අද රටේ වැඩියෙන්ම තිබෙන්නේ නීත්‍යානුකූලව අවශ්‍ය statutory requirement විගණනය කිරීම විතරයි, මූලාසනාරූඪ මන්ත්‍රීතුමනි. මේ තුළින් රටට ලොකු හානියක්, පාඩුවක් ඇති වෙනවා. මේ කටයුතු මීට වඩා විධිමත් කරන්න පුළුවන් නම්, මා හිතන විධියට මේ රටේ තිබෙන මුදල් අපතේ යෑම අපට වළක්වන්න හෝ අඩු කරන්න පුළුවන් වෙනවා. ඉංග්‍රීසියෙන් කියනවා, "Auditor is a watchdog, not a bloodhound" කියලා. අපට අවශ්‍ය වන්නේ බුරන බල්ලෙක් මිස හපා කන බල්ලෙක් නොවෙයි. මේ දෙක අතර වෙනස අපි හඳුනා ගත යුතුයි. සමහර වෙලාවට යම් දේශපාලන පක්ෂ මේ තුළින් දේශපාලන අරමුණ ඉෂ්ට කරන්න ගිහිල්ලා ප්‍රශ්න ඇති වන අවස්ථා තිබෙනවා. මා හිතන විධියට මේ ජාතික විගණන පනත් කෙටුම්පත තුළින් යම් වගකීමක් එනවා වාගේම, ඒ අයිතිවාසිකම් රැකීමත් අවශ්‍යයි.

අපේ රටේ තිබෙන්නේ Island Audit එකක්. නව විගණකාධිපතිතුමා ඒ කාරණය ලස්සනට පෙන්වලා දුන්නා. රටේ සමස්ත ආදායම එකතු කරලා විගණනය කරනකොට ඒක Island Audit එකක් හෝ National Audit එකක් වෙනවා. නමුත් අපේ රටේ මෙතෙක් කල් තිබිලා තිබෙන්නේ ආණ්ඩුවේ එක කොටසකට පමණක් සීමා වූ audit එකක්. පළාත් සභාව ඒ කටයුතුවලින් වෙන් කරලා තිබෙනවා. ඒ දෙකම එකතු කරන වැඩ පිළිවෙළක් අපි ඇති කරන්න අවශ්‍යයි. ඒ වාගේම, අපි මේ ගෙනයන්නේ cash audit එකක්. ඒ කියන්නේ, සල්ලි වියදම් කරන ආකාරය සහ ආදායම් උපයන ආකාරය අනුව කරන විගණනයක් මිස, accrual based audit එකක් නොවෙයි. මෙන්න මෙච්චර ප්‍රමාණයක් ගිය අවුරුද්දේ ලැබෙන්න ඕනෑය කියන කාරණය අපි මේ විගණනය යටතට ගෙනැල්ලා නැහැ. ඒක 2015 අය වැයේදී එකතු කරන්න තිබුණා. නමුත් අපේ මන්ත්‍රීවරු වුණත් නූතන ලෝකයට හැඩ ගස්සන්න අමාරුවෙලා තිබුණු නිසා ප්‍රශ්නයක් ඇති වුණා. හැබැයි, 2019, 2020 වනකොට මේ කටයුත්ත අනිවාර්යයෙන්ම කළ යුතු කාර්යභාරයක් ලෙස මා සලකනවා. මේ ජාතික විගණන පනත් කෙටුම්පතට අනුව අපට අවශ්‍ය වන්නේ Audit Commission එකක්. ඒ විගණන කොමිසම අත්‍යාවශ්‍යයි. විගණන කොමිසම පත් කරලා තිබෙන එක හොඳයි. අමාත්‍යාංශයේ ලේකම් තමයි ප්‍රධාන ගිණුම් නිලධාරියා - Chief Accounting Officer. අමාත්‍යාංශයේ වැඩ සම්බන්ධයෙන් එතුමා තමයි සම්පූර්ණයෙන් වග කියන්නේ. මෙතෙක් කල් මේ ජාතික විගණන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන්න පරක්කු වුණේ ප්‍රධාන ගිණුම් නිලධාරි තනතුර සහ විගණන කොමිසමේ බලතල අතර සටහනයක් තිබුණු නිසායි. දේශපාලනඥයන් මැදට පැනලා, ජාතික විගණන පනත් කෙටුම්පත ගෙනෙනවාට ඔවුන් තුළ අකැමැත්තක් තිබුණා කියලා තමයි හුඟ දෙනෙක් හිතුවේ. නමුත් කිසිසේත්ම එහෙම දෙයක් සිදු වුණේ නැහැ. Dr. Sarath Amunugama මැතිතුමාත්, අනුර ප්‍රියදර්ශන යාපා හිටපු ඇමතිතුමාත්, මාත් Subcommittee එකක වාර්තාවකින් ඒ කාරණය පෙන්වලා දුන්නා මට මතකයි. මේ තනතුරු අතර ස්වාධීනත්වයක් ඇති කිරීමේ අවශ්‍යතාවක් තිබුණා. නමුත් එක පැත්තකට අනවශ්‍ය ලෙස බරක් පැටවීම නිසා ප්‍රශ්නයක් ඇති වුණා. අධිභාරය සම්බන්ධයෙන් තිබුණු ප්‍රශ්නය නිසා සම්පූර්ණයෙන්ම මේ කටයුතු විගණන කොමිසමට දෙන්න රජයේ නිලධාරීන්ගේ අකැමැත්තක් තිබුණා. මේ කරුණු දෙක අතර සමබරතාවක් ඇති කරන්න කටයුතු කළ නිසා තමයි මා හිතන විධියට මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙන එන්න කාලයක් ගත වුණේ. නමුත් සියලුදෙනාම කථා කරලා, ඒ සමබරතාව ඇති කිරීම නිසා අපට අද එහි සාර්ථකත්වයක් පෙනෙන්න තිබෙනවා. මේ පනත් කෙටුම්පතේ දුර්වලතා නැතිවා නොවෙයි. නමුත් මේ පනත් කෙටුම්පත, අනිවාර්යයෙන්ම ලොකු වෙනසක්; ඉදිරියට යන්න පුළුවන් පිම්මක්. ඒ නිසා තමයි අපි මේ කරුණු වැඩිදියුණු කරලා කටයුතු කරන්න අවශ්‍ය වන්නේ. මෙහි තිබෙන දුර්වලතා අවම කිරීම තමයි අපට අවශ්‍ය වන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Transparency International ආයතනය ඉතාම විශිෂ්ට ගණයේ වැඩ පිළිවෙළක් ලංකාව තුළ ක්‍රියාත්මක කිරීම පිළිබඳව මා සන්තෝෂ වනවා. මේ වැඩ පිළිවෙළ තුළින් මොනවාද කරන්න අවශ්‍ය කියලා ඔවුන් අප සියලුදෙනාම දැනුවත් කරලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් අපි මොනවාද කරන්න ඕනෑ කියන කාරණය මා මෙතැනදී හෙළිදරව් කරනවා.

ජාතික විගණන පනත් කෙටුම්පතේ 19.(1) (අ) සහ 19. (2) වගන්ති යටතේ තිබෙන අධිභාරයක් පැනවීමේ කාරණය සම්බන්ධයෙන් යම් ප්‍රශ්න ටිකක් තිබෙනවා. යම් කරුණක් විගණනයට ලක්වෙලා ප්‍රශ්නයක් ඇති වෙලා, ඒ සඳහා අධිභාරයක් පනවන්න අවශ්‍ය නම්, ඒ අයට ඒ වගකීම දෙන්න ඕනෑය කියන කාරණයට විගණන කොමිසමේ සභාපති ඇතුළු සියලුදෙනාගේම කැමැත්තක් තිබෙනවා. ඒ වගකීම විගණන කොමිසමට දෙන්නේ නැතිව ස්වාධීන කමිටුවක් තුළින් විසඳන්න කියන එකයි මගේ මතය. Transparency International ආයතනයේ සහ විද්වතුන් ගණනාවකගේ මතය වන්නේත් ඒකයි. ස්වාධීන කොමිටියක් තුළින් ඒ කටයුත්ත කරනවා නම් මේ ආයතන දෙක අතර සමබරතාවක් ඇති වනවා. විගණන කොමිසම යම් කාරණයක් ගැන හොයා බලලා ප්‍රධාන ගිණුම් නිලධාරියාට දුන්නාම, ඔහු ඒ කටයුතු ඉදිරියට ගෙනයන්නේ කොහොමද කියන එකයි විගණන කොමිසම අහන්නේ. එතැන ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා ස්වාධීන කමිටු ඇති කිරීම ඉතාම විශිෂ්ට ගණයේ යෝජනාවක් ලෙස අපි සලකනවා.

අනෙක් කාරණය තමයි, Audit Service Commission එක දෙන තීන්දුවකට appeal කරන එක. "අපි මේක කරන්නේ නැහැ"

[ගරු රවි කරුණානායක මහතා]

කියලා ප්‍රධාන ගිණුම් නිලධාරියා කිව්වොත්, ඔවුන් එහෙම කරන්නේ නැත්තේ ඇයි කියන හේතුව විගණන කොමිසම විසින් දැනගන්න අවශ්‍යයි. කෙනකු උසාවියට ගෙන ගියා නම් කොයි ආකාරයෙන්ද කටයුතු කරන්නේ කියන කාරණය දැනගැනීම අත්‍යවශ්‍යයි. ස්වාධීන කොමිටියක් තුළින් ඒ කටයුත්ත කරන්න පුළුවන් නම් ඒක වටිනවාය කියා මා හිතනවා. නමුත් ඒ විගණනය විය යුත්තේ රුපියල් 50කට, රුපියල් 100කට, රුපියල් 1,000කට නොවෙයි. ඒක මිලියන 10ක් හෝ යම් වටිනාකමක් -material value- තිබෙන එකක් විය යුතුයි. ඒක තමයි වටිනාම දේ. මොකද, විගණනය කියන්නේ රුපියල ශත වශයෙන් හැම කොටසක්ම ගැන හොයන එක නොවෙයි. ක්‍රමවේදය සහ එහි වටිනාකම සෙවීම තමයි අවශ්‍ය වන්නේ.

අද සීමිත සම්පත් තිබෙන නිසාත්, වෙලාව සීමිතව පැවතීම නිසාත් වඩාත්ම අවශ්‍ය වන්නේ එහි වටිනාකම හොයා ගැනීමයි. ඒ වාගේම ජාතික විගණන පනතේ Section 7 (4) යටතේ සඳහන් වනවා, විගණන කොමිසම ඉදිරියට යම් පුද්ගලයන් ගෙන්වීමේ දී , එන්නේ නැතිව සිටීමේ හැකියාව තිබෙනවා කියලා. මම කියන්නේ එන්න අවශ්‍යයි කියන එකයි. මොකද, යම් විධියකින් පුද්ගලයෙකුට එන්නේ නැතිව ඉන්න හැකියාවක් තිබෙනවා නම්, ඒ පුද්ගලයා එන්නේ නැතිව ඉන්න ඕනෑ හේතුවක් තිබිය යුතුයි. නමුත් විශ්වාසය මත එතැනට පැමිණීම තමයි වටින්නේ. ඒකයි වටිනාකම. ඒ සම්බන්ධයෙන් වෙනත් පුද්ගලයෙක් එවන එක එතරම්ම යෝග්‍ය නැහැ. එය නිවැරදි කළ යුතුයි කියන යෝජනාව තමයි මම මේ අවස්ථාවේ දී එකතු කරන්නේ.

ඊළඟට, තොරතුරු හෙළිදරව් කිරීම. විගණකාධිපති සහ එහි කාර්ය මණ්ඩලයේ කාර්ය භාරය තමයි තමන් පත් කරන පුද්ගලයාට තොරතුරු ලබා දීම. ඊට වැඩියෙන් කටයුතු කිරීමේ අවශ්‍යතාවක් නැහැ. පාර්ලිමේන්තුවට එම වාර්තාව ඉදිරිපත් කළාට පසුව අවශ්‍ය නම් එය ප්‍රසිද්ධ කරන්න පුළුවන්. නමුත් ඒ සම්බන්ධයෙන් කථා කිරීමේ අවශ්‍යතාවක් නැහැ. මම හිතන විධියට අපට කරන්න පුළුවන් ලොකුම වෙනස මෙකයි. මෙම විගණන කොමිසම මීට වැඩිය වැදගත් සහ අර්ථවත් වැඩ පිළිවෙළක් සකස් කළ යුතු වනවා. විගණකාධිපති දෙපාර්තමේන්තුව සමඟ එකතු වී ඒ හා බැඳුණු සියලු කාර්ය භාරය ඒ ආකාරයෙන්ම නීත්‍යානුකූලව කරන්න පුළුවන්කම තිබුණා නම් මේ තිබෙන ප්‍රශ්න ගණනාවක් ගැන එදා හොයා බලන්න තිබුණා. මහ බැංකුවේ අද තිබෙන කතන්දරයත් ඒකයි. මීට පෙර දීලා තිබෙන තොරතුරු ගැනවත් තවම හෙළිදරව් වෙලා නැහැ. හිටපු මුදල් ඇමති වශයෙන් මම ප්‍රශ්නයක් ඇහුවා, "2008-2014 වෙනකන් සිදු වූ සියලුම අලාභ කොයි ආකාරයෙන් ද සිදු වුණේ? යම් දෙයක් ගණනය කරලා තිබෙනවා නම්, ඒ ආකාරයෙන්ම 2008-2014 වර්ෂයන් සම්බන්ධයෙනුත් අලාභය කීයද?" කියලා. ඒ සම්බන්ධයෙන් වාර්තාවක් තවම නිශ්චිත වශයෙන් දෙන්න පුළුවන්කම නැහැ. මහ බැංකුවෙන් දෙන්න බැහැ කියලා තිබෙනවා. මහ බැංකුවේ පණ්ඩිතයෝ ටිකක් ඉන්නවා. මේ වකවානුවේ දෙන්න පුළුවන් වාර්තා තිබෙනවා, නමුත් ඒ කාලයේ දෙන්න බැරි වාර්තා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් දිනේෂ් ගුණවර්ධන මැතිතුමා කිව්වේ, off balance sheet items. ඒ සම්බන්ධව ප්‍රශ්නයක් ඇහුවාම ඒකට උත්තර දෙන්නේ කොහොමද? අනිවාර්යෙන්ම මෙක නීතිගත කරන්න අවශ්‍යයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වේලාව බාධාවක් වෙනවාද?

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔව්, ගරු මන්ත්‍රීතුමනි.

ගරු රවි කරුණානායක මහතා
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තව මිනිත්තු දෙක, තුනකින් මම අවසන් කරන්නම්. අපට අවශ්‍ය වන්නේ මෙවැනි දේවල් නීතිගත කරන්න පුළුවන් විධියේ මාර්ගයක් ඇති කිරීම සහ ඒ සම්බන්ධයෙන් හෙළිදරව් කිරීමයි. ඇමතිවරයෙක් සම්බන්ධයෙන් කටයුතු කරන අවස්ථාවේ දී, අමාත්‍යාංශයේ තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි සමහර වෙලාවට විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සිටින නිලධාරීන් වෙනත් අමාත්‍යාංශයකට යන එක. ඒ අමාත්‍යාංශයට යම් කොටසක් ගත්තේ දේශපාලන අරමුණකින් නම්, ඒ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් ඇති කරනවා. මට මතකයි එදා චන්ද්‍රිකා බණ්ඩාරනායකගේ ආණ්ඩුව කාලයේ අපේ වෙළෙඳ අමාත්‍යාංශය යටතේ පාන් රුපියල් 3.50ට විකුණන්න ගිහිල්ලා, සතොස ආයතනය රුපියල් බිලියන 14ක -රුපියල් කෝටි 1400ක- අලාභයක් ලැබුවා. මේ අලාභය දිගින් දිගටම පැවතුණා. 2002 වර්ෂයේ දී ආණ්ඩුව වෙනස් වෙනකොට අලාභය කියන එක සුද්ධ කරලා අලුත් ශේෂ පත්‍රයකින් ඉදිරියට ගෙනයන්න පුළුවන් විධියේ හැකියාවක් තිබුණා. නමුත්, එතැනදී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයන් වෙළෙඳ අමාත්‍යාංශයේ තොරතුරු විකෘති කර වැරදි විධියට දීලා සම්පූර්ණයෙන්ම අවුලක් ඇති කළා. ඒ සම්බන්ධයෙන් මාධ්‍ය ලබා ගත්තේ වැරදි තොරතුරු. අවසානයේ දී රටට සහ ඒ ආයතනයට ප්‍රශ්නයක් ඇති වෙලා, ඉදිරියට යාමට නොහැකි අවස්ථාවක් ඇති වුණා. එම නිසා මේ සම්බන්ධයෙන් තොරතුරු ලබා ගැනීම, ප්‍රසිද්ධ කිරීම වරදක් ලෙස සලකා කටයුතු කරන්න ඕනෑය කියන එක නීතියට එකතු කිරීමට අවශ්‍යයි කියා මා මේ අවස්ථාවේදී සඳහන් කරනවා. මෙම ජාතික විගණන පනත් කෙටුම්පතේ එවැනි දේවල් සඳහන්ව තිබෙනවා මට පෙනුණේ නැහැ. ඒ අයිතිය තිබෙනවා. නමුත් එමඟින් යම් විධියකට තහවුරු වෙන වගකීම නීතිගත කරන්නත් අවශ්‍යයි කියන එක මේ අවස්ථාවේදී මතක් කරන්න කැමැතියි. මොකද, එක පැත්තකට ගමන් කිරීමක් නොවෙයි, දෙපැත්තකට යන්න පුළුවන් විධියට කටයුතු කරන්න අවශ්‍යයි කියන එක මම මේ අවස්ථාවේ දී මතක් කරන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වේලාව බාධාවක් වෙලා තිබෙන බව මට පෙනෙනවා. මෙවැනි වැදගත් විගණන පනත් කෙටුම්පතක් නීතිගත කිරීම පිළිබඳව පැවැත්වෙන මෙම විවාදයේ දී මටත් කථා කිරීමට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් සතුටු වනවා. 1994 ඉඳලා කියනවා මෙවැනි පනත් කෙටුම්පතක් ගෙනෙන්න ඕනෑ, එහි ස්වාධීනත්වයක් තිබිය යුතුයි කියලා.

ස්වාධීනත්වය වාගේම එහි නිර්දේශපාලනීකරණයත් තිබිය යුතුයි කියලා මතයකුත් තිබෙනවා. රටේ ආයතන 350ක් විතර තිබෙනවා. මේ හැම එකකම යම් විධියක අලාභයක් තිබෙනවා. නමුත් අපට පෙනුණේ නැහැ, විගණකාධිපති දෙපාර්තමේන්තුවට මේ වාගේ අතිදුෂිත දේවල් හෙළිදරව් කර ගැනීමේ හැකියාවක් තිබුණා කියලා. ලංකා විදුලිබල මණ්ඩලයේ බිලියන ගණන් අලාභ තිබෙනවා. ගිය අවුරුද්දේ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අලාභය බිලියන 350යි. නමුත් විගණකාධිපති දෙපාර්තමේන්තුවට කිසිසේත්ම කියන්න බැරි වුණා, going concern concept එකක් අනුව මේ ප්‍රශ්නය ඇති වෙනවා කියලා. පටු මට්ටමින් බලනවා මිසක්, මේක ලෝක මට්ටමින් බලලා වාර්තා කිරීමේ හැකියාව, දක්ෂතාව ඒ ගොල්ලන්ට නැහැ. ඒ දක්ෂතාව නැත්නම් ඒක outsource කරන්න පුළුවන් හැකියාවත් අපි මේකට එකතු කරන්න ඕනෑ කියන එක මතක් කරමින්, මට කථා කිරීමට ඉඩප්‍රස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින්, මීට වඩා ස්වාධීනත්වයෙන් වැඩ කරන්න පුළුවන් විගණන පනතක් ඉදිරියේ දී ක්‍රියාත්මක වේවිය කියන බලාපොරොත්තුවෙන් මා නිහඬ වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.44]

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම හිතන විධියට මේ පාර්ලිමේන්තු වාරයේ සාකච්ඡා කරනු ලබන ඉතාම වැදගත්ම පනත් කෙටුම්පතක් ගැන තමයි අද මේ උත්තරීතර සභාවේ සාකච්ඡා කරනු ලබන්නේ. මේ පිළිබඳව විවාදයේ දී මටත් අදහස් කිහිපයක් එකතු කරන්නට අවස්ථාව ලැබීම ගැන මා ඉතාම සතුටට පත් වෙනවා. අපි විශ්වාස කරන විධියට ලාංකීය ප්‍රබුද්ධ සමාජය දැකපු සිහිනයක් තමයි එක පැත්තකින් අද මේ යථාර්ථයක් බවට පත් වෙන්නේ. ලාංකීය සමාජය මේ විගණන පනත නැමැති දරුවා උපදවා ගන්න -බිහි කර ගන්න- කාලාන්තරයක් තිස්සේ විලිරුදාවෙන් පෙළුණා. හැබැයි, ඒ විලිරුදාවෙන් පෙළිලා-පෙළිලා අද අපි බිහි කර ගනු ලබන්නේ අඩු බර ඇති දරුවෙක් කියන එකයි අපේ විශ්වාසය. කොහොම වුණත් අපේ රටට විගණන පනත් කෙටුම්පතක් නිර්මාණය කරලා, රාජ්‍ය සම්පත්, බදු ගෙවන ජනතාවගේ මුදල්, වඩා විධිමත් විගණනයකට ලක් කිරීමට ගත් මේ ප්‍රයත්නයට අපි හිස නමා ආචාර කරනවා.

විශේෂයෙන්ම ඒ වෙනුවෙන් කැප වුණු විගණකාධිපති දෙපාර්තමේන්තුවේ හිටපු විගණකාධිපතිවරුන්ටත්, ඒ වාගේම වර්තමාන විගණකාධිපති ගාමිණී විජේසිංහ මැතිතුමාටත්, ඒ වෙනුවෙන් මේ සටනේ නියැළී සිටි විගණකාධිපති දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිතිවලට, බහුජන ව්‍යාපාරවලට, විගණන පනත් කෙටුම්පත වහා ගෙන ඒමේ වුවමනාව පෙරදැරිව පාර්ලිමේන්තුවේත්, ඉන් පිටතත් කටයුතු කරපු සියලුම දේශපාලන ව්‍යාපාරවලටත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැටියට විතරක් නොවෙයි, බදු ගෙවන පුරවැසියකු හැටියට අපේ ආචාරය හිමි විය යුතුයි කියලා මා විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික විගණන පනත් කෙටුම්පත පිළිබඳව සාකච්ඡා කරන මේ අවස්ථාවේ, මට ලැබී තිබෙන කෙටි වෙලාවේදී කරුණු කිහිපයක් පමණක් ඉදිරිපත් කරන්න මම කැමැතියි. පළමුවෙන්ම මම මේ කාරණය කියන්න කැමැතියි. මෙම ජාතික විගණන පනත අඩු පාඩු සහිත, අඩු බරැති දරුවකු වුවත්, මෙයින් අපට අත්වන වැදගත් වාසියක් තිබෙනවා. ඒ අන් කවරක්වත් නොවෙයි, ස්වාධීන විගණන සේවා කොමිසමක් ස්ථාපිත වීමයි. මේක අප ලැබූ මහා ජයග්‍රහණයක්. විගණන සේවා කොමිසමක් ස්ථාපිත වීම ජාතියක් හැටියට, රටක් හැටියට, සමාජයක් හැටියට අප ලැබූ මහා ජයග්‍රහණයක් ලෙස මා සලකනවා. එසේ බිහි වන මේ අඩු බරැති දරුවාගේ කකුල් ඇදවෙලා තිබෙනවා පුළුවන්; අත් ඇදවෙලා තිබෙනවා පුළුවන්; ඇස් පෙනීම දුර්වල වෙන්න පුළුවන්; නහය මුක්කම් වෙලා තිබෙන්න පුළුවන්; කන් ඇකිළිලා තිබෙන්න පුළුවන්. ඒවා කෙළින් කරලා, හදලා වඩලා, මස් පුරවලා ගන්න එක තමයි මේ උත්තරීතර සභාවේ කාර්යය විය යුත්තේ. මෙහි මස් පුරවන්න ඕනෑ තැන් තිබෙනවා. බලන්න, තමුන්නාන්සේලා මෙම විගණන පනතට ගෙනැත් තිබෙන සංශෝධනවලින් -ඒවා මොනවාට ගෙනාවාද කියා අපි දන්නේ නැහැ.- ව්‍යවස්ථාපිත ආයතනවල, සංස්ථාපිත ආයතනවල තිබෙන විගණන කළමනාකරණ කමිටු - Audit and Management Committees - ගලවා තිබෙනවා. ඒවා තිබිය යුතුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Audit and Management Committee එකේ වාර්තාව විගණකාධිපතිවරයාට ලබා දිය යුතුයි කියා මේ පනතින් යෝජනා කර තිබෙනවා. හැබැයි සංශෝධනවලදී එම කමිටු ගලවා තිබෙනවා; එය අවශ්‍ය නැහැය කියනවා. කවුද ඒක කළේ? ඇයි ඒක කළේ? අපි දන්නවා සංස්ථාපිත ආයතනවල audit and management කටයුතු කෙරෙන්නේ, අභ්‍යන්තර විගණකවරු කටයුතු කරන්නේ එම ආයතනවල සභාපතිවරුන්ගේ වුවමනා අනුව බව. ඔහුට විගණන හා කළමනාකරණ කමිටුව අක්‍රිය කරන්නත් පුළුවන්, සක්‍රිය කරන්නත් පුළුවන්; එන්නේ නැතුව ඉන්නත් පුළුවන්, එන්නත් පුළුවන්. හැබැයි, අභ්‍යන්තර විගණන වාර්තාව විගණකාධිපතිවරයාට ලබාදීමට මෙම පනතේ තිබෙන ප්‍රතිපාදන සංශෝධනවලින් ගලවන්නේ නැතුව තබා ගන්නවා නම් ඒක වළකිනවා. අන්න එතකොට ආයතනවල තිබෙන විගණන හා කළමනාකරණ කමිටුව - Audit and Management Committee එක- ක්‍රියාත්මක වෙනවා වාගේම, විගණකාධිපති දෙපාර්තමේන්තුවේ අනුදැනුම, උපදෙස්, මඟ පෙන්වීම සහ බලපෑම යටතේ ආයතනය විගණනය හා කළමනාකරණය කරන්න අභ්‍යන්තර විගණකවරු බැඳී ඉන්නවා. නමුත්, මෙම පනතින් එය සිද්ධ වෙන්නේ නැහැ, සංශෝධනය මඟින් ඒ කොටස ගලවා තිබෙනවා. එය ගැලෙව්වේ කවුද කියා අපි දන්නේ නැහැ. පනත් කෙටුම්පතේ එය තිබෙනවා, නමුත් තමුන්නාන්සේලා ඉදිරිපත් කර තිබෙන සංශෝධනවලින් එම කොටස ගලවා තිබෙනවා.

ඇතැම් ආයතනවලට -විශේෂයෙන්ම රජයට පවරාගත් ආයතනවලට සහ නීති මත ස්ථාපිත කළ ආයතනවලට- විගණන හා කළමනාකරණ කමිටුවක් - Audit and Management Committee එකක් - අනවශ්‍යයි කියා මෙහි සඳහන් වෙනවා. ඒක කළේ කවුද දන්නේ නැහැ. ඒ පේළි අයින් කර තිබෙන්නේ ඇයි කියා අපි දන්නේ නැහැ. කාගේ වුවමනාවටද ඒක කළේ? ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා. රජයට පවරාගත් ආයතනවල, නීති මඟින් ස්ථාපිත කළ ආයතනවල Audit and Management Committee එක පවත්වන්න පුළුවන් නම් ඉඩ දෙන්න කියා අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමනි, මම පොඩි පැහැදිලි කිරීමක් කරන්නද?

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
මට පොඩි වෙලාවයි තිබෙන්නේ, ගරු ඇමතිතුමනි. කියන්න.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
ගරු මන්ත්‍රීතුමනි, ඒ පිළිබඳව මේ සභාවේ ඉදිරිපත් වුණු කරුණු අපි සලකා බැලුවා. ඔබතුමා කියන්නේ, 8 සහ 9 පේළි ගැන නේද?

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)
ඔව්, 8 සහ 9 පේළි ගැනයි.

ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතා
(மாண்புமிகு (கலாநிதி) விஜயதாஸ ராஜபக்ஷ)
(The Hon. (Dr.) Wijeyadasa Rajapakshe)
අපි එය නිවැරැදි කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ කොටස ඊට ඇතුළත් කරනවා.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමනි. ඔබතුමා මේ පිළිබඳව සොයා බලනවා කියා මම දන්නවා. ඒ වාගේම, අභ්‍යන්තර විගණකගේ වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතු කියන කාරණයත් අයින් තිබෙනවා. පනත් කෙටුම්පතේ එය තිබෙනවා, නමුත් සංශෝධනවලදී එය අයින් කර තිබෙනවා. අභ්‍යන්තර විගණකගේ වාර්තා විගණකාධිපතිට ඉදිරිපත් කිරීම සංශෝධනවලින් නවත්වා තිබෙනවා. එය තිබෙන්නේ 40වන වගන්තියේයි. පුළුවන් නම්, ඒ කාරණයත් තිබෙන්න හරින්න. ඒක ඉතාම වැදගත්. එතකොට මේ පනතේ මස් ටික හොඳට පිරෙනවා ගරු අමාත්‍යතුමනි.

මෙන්න මේ කාරණය කෙරෙහිත් මම විශේෂ අවධානයක් යොමු කරන්න කැමැතියි. ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමනි, ඔබතුමා උගත් කෙනෙක්; රජයේ නීතිඥවරයෙක්. මේ පනතින්වත් ආවරණය නොවුණු අපේ රටේ ස්ථානයක් පිළිබඳව දැන් මගේ අවධානය යොමු කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කවුරුත් දන්නවා, රාජගිරියේ ජයසිංහ ගොඩනැඟිල්ල කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහා බද්දට ගත් බව. එය බද්දට ගැනීමේ ක්‍රියාවලියේදී, ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා සහ අමාත්‍යාංශ ලේකම්වරයා අමතලා විගණකාධිපතිවරයා ඉතා පැහැදිලිව කියනවා, මේ ගනුදෙනුව විචක්ෂණශීලී නැහැය කියා. "ඔබට රජමල්වත්ත ප්‍රදේශයේ අක්කරයක පමණ -මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ මතකයේ හැටියට එම ඉඩමේ විශාලත්වය අක්කරයක් පමණ වෙනවා.- ඉඩමක් තිබෙනවා, එම ඉඩමේ ඔබට ගොඩනැඟිල්ලක් තැනිය හැකියි, එසේ තැනීමට පුළුවන්කමක් තිබියදී අධික මිල ගණනකට ජයසිංහ ගොඩනැඟිල්ල ගන්න එපා, එය විචක්ෂණශීලී ගනුදෙනුවක් නොවේ" කියා විගණකාධිපතිවරයා කියනවා. මොකද වෙන්නේ? විගණකාධිපතිවරයාට ඇහුම්කන් දීලා, ඒ ගනුදෙනුව නවත්වනවාද? එය නවත්වන්නේ නැහැ. එය නැවැත්තුවේ නැති වුණාම විගණකාධිපති දෙපාර්තමේන්තුව ඊට විරුද්ධව නඩු යනවාද? නඩු යන්නත් බැහැ. ඒ ගොඩනැඟිල්ලට මාසයකට රුපියල් දෙකෝටි විසි ලක්ෂයක් ගෙවමින් ඉන්නවා; තවමත් ගෙවමින් ඉන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික විගණන පනතිනුත් මේකට උත්තරයක් නැහැ. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, යෝජනාවක් කරන්න. අශ්වයා ගියාට පස්සේ ඌ ගිය විධිය හොයන්න තමයි වෙලා තිබෙන්නේ. එහෙම වෙන්න කලින්; මේ ගනුදෙනුව විචක්ෂණශීලී නැති බව කියා තිබියදීත්, අඩු ගණනේ ගනුදෙනුව නවත්වා ගන්න බැරි වුණා. මේ, ජනතාවගේ බදු මුදල්. කෘෂිකර්ම අමාත්‍යාංශය කෝටි ගණනින් නාස්ති කළා. හරි නම් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා මේවාට වගකියන්න ඕනෑ; ඔහුට අධිභාර පනවන්න ඕනෑ. මේ ගනුදෙනුව විචක්ෂණශීලී ගනුදෙනුවක් නොවෙයි කියලා කියා තිබියදීත් එය සිදු කළා. "මේ ගොඩනැඟිල්ල ගන්න එපා, මෙහි වර්ග අඩියකට ගෙවන මුදල වැඩියි, තමන්ට ඉඩමක් තිබෙනවා, ඒ ඉඩමේ ගොඩනැඟිල්ලක් හදන්න පුළුවන්, ඒ නිසා මේ විධියට රුපියල් බිලියන ගණනින් විනාශ කරන්න එපා" කියා විගණකාධිපතිවරයා කියා තියෙද්දිත්, ගොඩනැඟිල්ලක් ගන්නවා. එහෙම අරගෙන, බදු ගෙවන ජනතාවගේ අරමුදල්වලට සහගහන අපරාධයක් කරනවා. තවම ඒකට උත්තරයක් නැහැ. ඒ නිසා, මේ විගණන පනත් කෙටුම්පත අද සම්මත වුණාට පස්සේ පළමුවැනි අධිභාරය ගෙවන්න ඕනෑ පුද්ගලයා ඒ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියායි කියා මා හිතනවා. ජනාධිපතිතුමා තමයි ඒ ලේකම්තුමා පත් කර තිබෙන්නේ. ජනාධිපතිතුමාට තමයි ප්‍රධාන ගණන් දීමේ නිලධාරින්ට අධිභාර පැනවීමේ වගකීම පැවරී තිබෙන්නේ. ජනාධිපතිවරයා ඔහුට මේ අධිභාරය පනවයිද කියා අපට ප්‍රශ්නයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එය පැනවිය යුතුයි. මොකද, මේවා බදු ගෙවන ජනතාවගේ මුදල්. තුන්වේල කන්න විධියක් නැතුව මිනිසුන් හිඟමනට පත්වෙලා ඉන්නවා; බෙහෙත් නැතිව දරුවෝ ඉස්පිරිතාලවල ඇඳන් උඩ වෙවුල වෙවුලා ඉන්නවා; අහිංසක දරුවන් පොත පත, පෑන පැන්සල ගන්න විධියක් නැතිව ඉන්නවා. මේ වැසිකිළියක් නැති ඉස්කෝල තිබෙන රටක්; පාසල් යා යුතු වයසේ දරුවන් 458,000ක් සිටියත්, ඒ සියලු දරුවන් පාසල් නොයන රටක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු ජයන්ත සමරවීර මහතා
(மாண்புமிகு ஜயந்த சமரவீர,)
(The Hon. Jayantha Samaraweera)

හොඳයි.

එහෙව් රටේ තමයි මේ මහජන මුදල් කාබාසිනියා කරන්නේ. එම නිසා මේ ජාතික විගණන පනතින් ඔබතුමන්ලා ආදර්ශයක් දෙන්න. මහජන අරමුදල්වලට වගකිව යුතු කෘෂිකර්ම අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට අධිභාර පනවා තමුන්නාන්සේලා මේකේ සමාරම්භක පියවර තියන්න කියා අපි මේ වෙලාවේ යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. "රුපියල් ලක්ෂයක්" කියා මෙම පනතින් දඩයක් පනවනවා නේ. මේ ගැන මන්ත්‍රීවරු කිහිප දෙනෙක් කථා කරන්න ඇති. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමනි, රුපියල් ලක්ෂයේ මේ දඩය රුපියල් පන්දහසට අඩු කර තිබෙනවා. දඩය රුපියල් පන්දහසට අඩු කිරීමට ඔබතුමා එකඟයිද? අනේ! මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් පවරන්නම - දඩයක් ගැසීම දක්වා වූ නඩු ක්‍රියාවලියටම- රාජ්‍ය මුදල් රුපියල් ලක්ෂ තුන හතරක් වියදම් වෙනවා. ඒ බදු ගෙවන ජනතාවගේ මුදල්. හැබැයි, ගහන්නේ රුපියල් 5,000ක දඩයක්. එහි යුක්තිසහගතභාවය මොකක්ද? ඒකද අපට ඕනෑ කරන නූතන විගණනය? ඒක නොවෙයි, ගරු විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමනි. ඔබතුමා මේ කාරණය පිළිබඳව බැරෑරුම් ලෙස කල්පනා කරයි කියා මා හිතනවා. නමුත් ඔබතුමාට කරන්න දෙයක් නැතුව ඇති. කාගේ වුවමනාවටද, කොයි තක්කඩියාද මේක වැළැක්වුයේ? මේ, "රුපියල් ලක්ෂයක්" කියන වචන පනතින් ගැලෙව්වේ කොයි තක්කඩියාද කියා අපි අහනවා.

අපි පිළිගන්නවා මේ පනත් කෙටුම්පත ප්‍රගතිශීලී පියවරක් කියලා. මේක ප්‍රගතශීලී පියවරක් වෙන්නේ වෙන මොකක්වත් නිසා නොවෙයි, විගණන සේවා කොමිසමක් පිහිටු වීම නිසයි. ලාංකීය සමාජය විලි රුදාවෙන් පෙළිලා පෙළිලා බිහි කරන ජාතික විගණන පනත් කෙටුම්පත කියන දරුවා අඩු බරැති දරුවෙක්. ඒ අඩු බරැති දරුවාගේ පාද දෙක හරියට කෙළින් කරලා, අත් පා හදලා, නහයේ මුක්කම ඇරලා, කන් පෙති කෙළින් කරලා ගැනීම මේ උත්තරිතර පාර්ලිමේන්තුවේ හෙට දවසේ වගකීමක් වෙනවා. ඒ වගකීම අපි හැමෝම ඉෂ්ට කරමු. ඒ වගකීම ඉෂ්ට කරලා මේ රටේ බදු ගෙවන ජනතාවගේ අරමුදල් අරපිරිමැස්මෙන් පවත්වාගෙන යාමටත්, නාස්තියෙන් දූෂණයෙන් වංචාවෙන් තොරව පවත්වාගෙන යාමටත් රටට වග කියන ජනතාවට වග කියන ජනතාවගේ සම්පත් ආරක්ෂා කරන අප හැම කටයුතු කරමු. ඒ සම්පත් කාබාසිනියා කරන කවුරු වුණත් තරාතිරම

නොබලා ඒවාට විරුද්ධව නිසි නීති ක්‍රියාමාර්ග ගන්නට පුළුවන් ශක්තිමත් විගණනකරණයක් මේ රටට හඳුන්වා දීමේ කාර්යයට පාර්ලිමේන්තුව දායක වෙමු, නායකත්වය දෙමු. ඒ වෙනුවෙන් මේ පනත් කෙටුම්පත ගෙන ඒමට කැප වුණු සියලු දෙනාට අපේ ආචාරය හිස නමා පුද කරමින්, මා නවතිනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.58]

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවස්ථාව ලබාදීම සම්බන්ධයෙන් මම ප්‍රථමයෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ජාතික විගණන පනතට රජයේ නිලධාරීන් වාගේම දූෂණයට සහ වංචාවට කැමැති දේශපාලනඥයෝ මුලින්ම විරුද්ධ වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මතක් කරන්නට කැමැතියි 1994දී එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙනුත් මේ පනත් කෙටුම්පත ගෙන එන්නට උත්සාහ කළා. ඒ වාගේම අපේ නායක, වර්තමාන අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා 2002දී මේ වාගේ පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේදී සම්මත කර ගැනීමට උත්සාහ කළා. නමුත්, 2002 - 2004 එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් පසුව කිසිම රාජ්‍ය නායකයෙක්, නායිකාවක් හෝ අගමැතිවරයෙක් මේ වාගේ පනත් කෙටුම්පතක් සම්මත කර ගැනීමට උත්සාහ දැරුවේ නැහැ. යහ පාලන ආණ්ඩුව බලයට ඇවිල්ලා අවුරුදු තුනක කාලයක් ගත වෙලා තිබුණත්, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අද මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. අපි මේ පනත් කෙටුම්පත ගැන කාරක සභාවලදී සාකච්ඡා කරලා තිබෙනවා. එහිදී අපි විශේෂයෙන්ම විගණකාධිපතිවරයාගෙන් අහපු ප්‍රශ්නයක් තමයි, මේ පනත හරහා එතුමා බලාපොරොත්තු වෙන දේවල් ක්‍රියාත්මක වෙනවාද, නැද්ද කියන එක. එවිට එතුමා අපට පැවසුවේ, "ආරම්භයක් හැටියට මේ පනත හොඳයි. පාර්ලිමේන්තුවේ සියලුම දේශපාලන පක්ෂ නායකයන් එකතුවෙලා මේ පනත් කෙටුම්පත සම්මත කරන්නට ඕනෑ. ඒ විධියට භේදයකින් තොරව මේ පනත් කෙටුම්පත සම්මත කර ගත්තාම මේ හරහා ජනතාවටත්, ආණ්ඩුවටත්, රටේ අනාගතයටත් විශේෂ වටිනාකමක් ලැබෙනවා." කියා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ අවස්ථාවේදී මතක් කළ යුතු කාරණා කිහිපයක්ම තිබෙනවා. 2015දී අපේ ආණ්ඩුව බලයට පැමිණි පසුව 19වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ඉදිරිපත් කළා. ඒ වාගේම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත සම්මත කළා, ආංශික අධීක්ෂණ කාරක සභා හඳුන්වා දුන්නා. ඒ ආංශික අධීක්ෂණ කාරක සභා ක්‍රමය අද මේ පාර්ලිමේන්තුව තුළ සාර්ථක අන්දමින් ක්‍රියාත්මක වෙනවා. අපි ඒ කාරක සභාවල සභාපති ධුර විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ලබා දීලා තිබෙනවා. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගැන අනාගතයේදී කථා කරන විට, එතුමාගේ legacy ගැන කථා කරන විට තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත මේ පාර්ලිමේන්තුවේදී සම්මත කර ගැනීමට කටයුතු කිරීම ගැන අපේ මිනිස්සු, මේ රටේ ජනතාව එතුමාට ස්තුතිවන්ත වෙයි. ඒ වාගේම මම මේ සභාව දැනුවත් කරන්නට අවශ්‍යයි, 2018 සැප්තැම්බර් මාසයේ 17වෙනි දා ඉඳන් අපි "EvalColombo" කියලා විශේෂ සම්මන්ත්‍රණයක් පවත්වන බව. ඒ සම්මන්ත්‍රණයට රටවල් 100ක පමණ මන්ත්‍රීවරුන් ලංකාවට එනවා. කැබිනට් මණ්ඩලය තීරණයක් ගත්තා ඒ සම්මන්ත්‍රණයට සති දෙකකට පමණ පෙර හැම අමාත්‍යාංශයකම evaluation පිළිබඳව යම්කිසි නිලධාරියකු පත් කරලා, ඒ වැඩ කටයුතු කරන්නට අවශ්‍යයි කියලා. ඒකත් මම මේ සභාවට මම මතක් කරලා දෙනවා.

තිරසර සංවර්ධන ව්‍යාපෘති පිළිබඳවත් මම මේ සභාවට ඉතා කෙටියෙන් දැනුම් දෙන්න කැමැතියි. මොකද, ඒකත් ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ නායකත්වයෙන් තමයි ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපි හැමෝම දේශපාලන පක්ෂවල සාමාජිකයන් හැටියට යම්කිසි කාලයක් ආණ්ඩු බලයේ ඉන්න බව දන්නවා. අනෙක් කාලවලදී අපි විපක්ෂයේ ඉන්නවා. හැබැයි, රටේ අනාගතය වෙනුවෙන් ඉතිරි වෙන්නේ මේ අවුරුදු තුනහමාර තුළ එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ මේ ආණ්ඩුවෙන් පාර්ලිමේන්තුව තුළදී සම්මත කර ගන්නා පනත් පමණයි කියන එක මේ ගරු සභාවට මතක් කරමින් මට කාලය ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ සම්පූර්ණ කථාවේ ඉතිරි කොටස හැන්සාඩ් වාර්තාවට ඇතුළත් කිරීම සඳහා **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද කථාවේ ඉතිරි කොටස:
சபாபீடத்தில் வைக்கப்பட்ட உரையின் எஞ்சிய பகுதி::
Rest of the speech tabled:

බලයට පත් වන ආණ්ඩුවේ මැති ඇමතිවරු, රාජ්‍ය නිලධාරීන් විසින් කරන රාජ්‍ය වියදම් පිළිබඳ ගිණුම් පරීක්ෂාකොට නිවැරදි තොරතුරු රටට හෙළිකිරීම විගණකාධිපති දෙපාර්තමේන්තුවේ හා විගණකාධිපතිගේ කාර්යයයි. ජනතාවගේ මුදල් මුල්‍ය වියදමක් ඇතිව වියදම් කළ යුතුය. වාර්ෂිකව අය වැය හිඟය -පරතරය- වැඩි වන රටක දුප්පත්කම දරිද්‍රතාව වැඩි ශ්‍රී ලංකාවේ බදු ආදායම් හා විදේශවලින් ලැබෙන මුදල් වියදම් කිරීම සිදුවී ඇත්තේ මුල්‍ය වියදමක් නොමැතිවයි. බොර දියේ මාළු බාන්නා වාගේ මෙම මුදල් ජාත්‍යන්තරය පිළිගත් මුල්‍ය වියදමක් නොමැතිව වියදම් කිරීම නිසා වැඩි වන දුප්පත්කමේ දර්ශක මකා දැමීමේ ප්‍රධාන ක්‍රමෝපායකට වත්මන් රජය පියවර ගෙන තිබීම ප්‍රශංසා කළ යුතුය. විගණන පනතක් නොමැති ශ්‍රී ලංකාවේ ඉවක් බවක් නොමැතිව සිදු වන මුල්‍ය වංචාවන් වළකාලීම මෙම පනතේ අපේක්ෂාවයි. විගණකාධිපතිගේ කාර්ය සාර්ථක වන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඔහුගේ ස්වාධීනත්වය ආරක්ෂාකොට ඇති ආකාරයටයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 194.(1) අනු ව්‍යවස්ථාවෙන් ආණ්ඩුවේ සියලු ආයතනවල ගිණුම් කටයුතු විගණකාධිපතිවරයා විසින් සිදු කළ යුතුය යනුවෙන් සඳහන් වුවත්, අංක 194.(2) අනු ව්‍යවස්ථාවෙන් අදාළ රාජ්‍ය සංස්ථා, වෙළඳ ව්‍යාපාර, වෙනත් ව්‍යාපාර අමාත්‍යාංශය හාර ඇමතිවරයාගේ මුල්‍ය පාලනයට යටත්කොට තිබීම පරස්පර හා වංචා දූෂණවලට ඉඩ සලසා තිබෙනවා. මේ නිසා මුල්‍ය වංචාවන් සිදු වෙනවා. සොරුන් බිහි කරන, සොරුන් රකින චෞර දේශපාලනඥයන් රජ කරන චෞර දේශපාලන සංස්කෘතියක් ශ්‍රී ලංකාව තුළ මුල් බැස ගෙන ඇත්තේ බෙලහීන විගණකාධිපති ධුර සහිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නිසාය. 1948 ශ්‍රී ලංකාව එංගලන්තයෙන් නිදහස් වන විට රට දෙවැනි වූයේ ආසියාවේ ජපානයට පමණි. සිංගප්පූරු රාජ්‍ය නායකයා ප්‍රකාශ කළේ සිංගප්පූරුව ලංකාවක් කරන බවය. එයට හේතු වී තිබුණේ විගණකාධිපතිගේ බලයේ ප්‍රමාණයයි. එහෙත් අද ශ්‍රී ලංකාව දැඩි මුල්‍ය අර්බුදයකට මුහුණදී සිටිනවා.

පසුගිය රාජ්‍ය අවධියේ මුල්‍ය පාලන නොතිබුණු නිසා මුල්‍ය වංචා දූෂණ රාශියක් සිදුවී තිබෙනවා. එමෙන්ම, ඒවා ගැන නිසි පියවරක් ගැනීම අසීරු වී තිබෙනවා. පැවැති නීතිවල දුර්වලතා නිසා බයක්, ලජ්ජාවක් නැතිව මුල්‍ය වංචාවන් සිදු කර තිබෙනවා. එයට හේතු වූයේ විගණන කාර්යයේ පැවැති දුර්වලතාවයි. ඒ නිසා රට ඉදිරියට ගෙන යන්න මේ විගණන පනත වහා සම්මත කළ යුතුයි.

හම්බන්තොට වරාය විගණනයට යටත් මූල්‍ය පාලනයක් තිබුණේ නැත. ශිරාන් බණ්ඩාරනායක අගවිනිසුරුවරියට සිය තනතුරෙන් ඉවත්වීමට සිදු වුණේ දිවිනැහුම පනතේ මූල්‍ය පාලනය සුරක්ෂිත කිරීමට පියවර ගැනීම නිසාය. විදේශ ණය ගෙවීම වාගේම අද රටට ඉසිලිය නොහැකි බරක් වී තිබෙන්නේ රාජ්‍ය ආයතන හා සංස්ථා අධික ලෙස පාඩු ලැබීමත්, එම ආයතන නඩත්තු කිරීමට භාණ්ඩාගාරයෙන් මුදල් යෙදවීමට සිදුවීමත් නිසාය. රාජ්‍ය නිලධාරීන්ගේ අවධිමත් මූල්‍ය ක්‍රියාකාරකම් සිදුවීම. රාජ්‍ය නායකයින් හිරිකිතයක් නැතිව රජයේ මුදල් තමාට සම්බන්ධ ගිණුම්වලට ලබා ගැනීම.

[ගරු මයන්ත දිසානායක මහතා]

සිරිලිය සවිය, යොවුන් බලකාය, හෙල්පින් හම්බන්තොට ගිණුම, එල්ටීටීඊ එකෙන් ලබා ගත් මුදල් හා රන් භාණ්ඩ. මේවා රටේ ජනතාවගේ දුප්පත්කම තුරන් කිරීමට යෙදිය යුතුව තිබුණා. මෙම චෞර පාලනය නිසා රට බංකොලොත් වුණා. "වැටක්, නියරත් ගොයම් කා නම් කාට පවසම් ද" යන ප්‍රකාශය වාගේ මූල්‍ය සුරක්ෂණ ප්‍රතිපත්තියක් හා බලයක් නොමැතිකම මෙම මුදල් වංචාවලට හේතු වුණා. මෙම පනත එම දූෂණ වංචාවලට වැට බැඳීමක් වෙනවා.

රාජ්‍ය ආයතනවල, දෙපාර්තමේන්තුවල අයථා පාලනය රටේ මුදල් භීභයට බලපානවා. නිමක් නොමැතිව සිදු වන වැඩ වර්ජන නිසා සිදු වන ආදායම් අහිමිවී යාම කොපමණ ද? මේ නිසා රටක්, ජනතාවක් අන්ත අගාධයකට ඇද වැටෙනවා. එහෙත් මේ පිළිබඳ සොයන විගණන ක්‍රමවේදයක් නැහැ. මෙම විගණන පනතින් රාජ්‍ය පාලනයත්, මූල්‍ය පාලනයත්, රටේ සංවර්ධනයත් සුරක්ෂිත විය යුතුයි. තරුණ මන්ත්‍රීවරයෙක් වශයෙන් රටේ අනාගත පරපුර ගැන හිතන දේශපාලනඥයෙක් වශයෙන් අපේ වගකීම මේ රට දියුණු කරන්නට ප්‍රධාන ආරක්ෂණ පියවරක් වශයෙන් මේ විගණන පනත් කෙටුම්පත සම්මත කිරීමයි. විගණන පනතක අවශ්‍යතාව ඇති වූයේ 2004 වසරේදී විගණකාධිපති දෙපාර්තමේන්තුවේ මූල්‍ය හා පරිපාලනයේ ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට විගණනයේදී හෙළි වන අප්‍රමාණ වංචා, දූෂණ, අක්‍රමිකතා සඳහා පිළියම් යෙදීමටය. එහෙත්, මේ වනතෙක් එම අවශ්‍යතාව ඉටු කර ගැනීමට හැකි වුණේ නැහැ.

පසුගිය පාලන සමයේ මූල්‍ය පාලන සුරක්ෂිතතාව ආරක්ෂා කරනවා තියා යන්තම් හෝ මූල්‍ය පාලනය සඳහා රැකවරණය ලබා දුන් රාජ්‍ය සේවා සහ අධිකරණ සේවා කොමිෂන් සභා පවා විසුරුවා හැරියා. මූල්‍ය පාලනයට තිබූ ආරක්ෂිත බැම්ම බිඳ හෙළුවා. අත්තනෝමතික ලෙස මූල්‍ය සංස්කෘතියක් නිර්මාණය කර ගත්තා. මේ නිසා විදේශ ණයවලින් නිසි සංවර්ධනයක් වුණේ නැහැ. 2007 පැවැති එක්සත් ජාතීන්ගේ උත්තරීතර විගණන ආයතන පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේදී "මෙක්සිකෝ ප්‍රකාශනය" තුළින් විගණන ආයතනවල ස්වාධීනත්වය ආරක්ෂා කිරීමට විධිවිධාන සැකසුවා. ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර ආධාර හා රට තුළ ක්‍රියාත්මක කළ යුතු මූල්‍ය ආරක්ෂණ ක්‍රම ක්‍රියාත්මක නොකළ නිසා විදේශ රටවල් හා මූල්‍ය ආයතන අප රට ගැන තිබූ විශ්වාසය කඩ වුණා. ඒ නිසා අවාසි බොහොමයක් සිදු වුණා. විදේශ ණය මත රැඳෙන රටක් වශයෙන්, දියුණු විය හැකි භෞතික සම්පත් සුලභ රටක් වශයෙන්, කුසලතා පූර්ණ ජනතාවක් සිටින රටක් වශයෙන් ශ්‍රී ලංකාව වැටී තිබෙන ආර්ථික අගාධයෙන් ගොඩ ගැනීම සඳහා මෙම විගණන පනත ඉවහල් කර ගැනීම, යහ පාලනයේ තිරසර සංකල්පය මල්පල ගැන්වීමටත් මෙම පනත ප්‍රයෝජනවත් වෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 3.03]

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
නමෝ බුද්ධාය!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික විගණන පනත් කෙටුම්පත පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්න ලැබීම ගැන මම සන්තෝෂ වෙනවා. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමාත් මේ ගරු සභාවේ සිටින නිසා මා පනත් කෙටුම්පතේ සංශෝධන පිළිබඳවත් කියන්න ඕනෑ. මොකද, මෙහි යම් යම් සංශෝධන Committee Stage එකේ සංශෝධනය කරන්න බැරි නිසා ඔබතුමාගේ අවධානය ඒ කෙරෙහි යොමු කරවන්න පුළුවන් වුණොත් හොඳයි කියලා හිතුණා. ජාතික විගණන පනත් කෙටුම්පත අද දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට හැකිවීම පිළිබඳව ප්‍රථමයෙන්ම අපි රටක් හැටියට සන්තෝෂ වෙන්න ඕනෑ. මොකද, මීට අවුරුදු එකහමාරකට විතර කලින් විගණකාධිපතිතුමා මාධ්‍ය සාකච්ඡාවක් තියලා කිව්වා, "දැන් අවස්ථා 22කදී මේ සංශෝධන කළා. තවම මේක ආවේ නැහැ. නියෝජ්‍ය විගණකාධිපතිවරු 15 දෙනෙක් පත් කරන්න ඕනෑ. නමුත්, එක්කෙනයි ඉන්නේ. බොහොම අමාරුවෙන් තමයි මේ කර්තව්‍ය කරන්නේ." කියලා. මොකද, ස්වාධීන කොමිසමක් හැදුනාට පසු මෙම පනත නැතිව ක්‍රියාත්මක කරන්න යම් යම් බාධාවන් තිබුණා. එම නිසා ප්‍රමාද වී හෝ හොඳ වැඩක් රටට කිරීම ගැන අපි හැමෝම සන්තෝෂ වෙන්න ඕනෑ. නමුත්, මෙය සම්පූර්ණ වෙච්ච ජාතික විගණන පනත් කෙටුම්පතක් කියලා අපට දැනට එකඟ වෙන්න පුළුවන්කමක් නැහැ. ඒ කෙසේ වෙතත්, Transparency International ආයතනය විසින් විග්‍රහයක් කරලා තිබෙන නිසාත්, ඒ වාර්තාවේ තිබෙන යම් යම් යෝජනා ඔබතුමාට ලැබිලා ඇති. ඒවා සියල්ල වාගේ සංශෝධනය වෙනවා නම් හොඳයි. නමුත්, එහි කරුණු කිහිපයක් කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරවන්න කැමැතියි. ජාතික විගණන පනත් කෙටුම්පතේ 7. (4) (1) වන උපවගන්තියේ මෙහෙම සඳහන් වෙනවා:

> "... විගණකාධිපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද වෙනත් යම් තැනැත්තකු ඉදිරියේ පෙනී සිටීම සඳහා එම, විෂයය පිළිබඳ මනා දැනුමක් ඇති වෙනත් තැනැත්තකු නම් කරනු ලැබිය හැකි ය."

නමුත් මම හිතනවා, ඒක ඔහුගේ අනුදැනුම ඇතිව තමයි වෙනස් වෙන්න ඕනෑ කියලා. මගේ කථාවට වෙලාව මදි නිසා පුළුවන් නම් අද හැන්දෑවට ඉස්සෙල්ලා මේ යෝජනා නැවත ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ගරු ඇමතිතුමනි, අවස්ථාවක් තිබුණොත් ඒ වෙනස්කම් කරන්න.

ඒ වාගේම, ජාතික විගණන පනත් කෙටුම්පතේ 23. (10) උප වගන්තියේ මෙහෙම සඳහන් වෙනවා:

> "මේ පනතේ IV වන කොටසේ කාර්ය සඳහා, විගණනය කරනු ලබන ආස්ථානයේ ප්‍රධාන ගණන් දීමේ නිලධාරයා විසින් වෙනත් යම් ලිඛිත නීතියකට පටහැනිව සිදුකරන ලද ගනුදෙනුවක දී වංචාව, නොසැලකිලිමත්කම, සාවද්‍ය පරිහරණය හෝ දූෂණය හේතුවෙන් යම් ඌනතාවක් හෝ පාඩුවක් ඇති කිරීමට හේතු වී ඇත්නම් හෝ ඒ සඳහා සම්බන්ධ වී ඇති බව විගණන සේවා කොමිෂන් සභාව විසින් හඳුනාගත් අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින්, 19 වන වගන්තියේ (3) (ඉ) (ii) උපවගන්තියේ දක්වා ඇති මුදල, එම විගණනය කරනු ලබන ආස්ථානයේ ප්‍රධාන ගණන් දීමේ නිලධරයාගෙන් අය කර ගනු ලැබිය යුතු ය."

ඒකෙත් සංශෝධනයක් බලාපොරොත්තු වෙනවා. විගණකාධිපතිතුමාට එතැනදී කටයුතු කිරීමේ හැකියාවක් නැති වෙන නිසා එතුමා නැතිව එය සහභාගී කරගත යුතුයි කියන එකයි කියන්නේ. ඒ වාගේම, ජාතික විගණන පනත් කෙටුම්පතේ 23. (10) උප වගන්තියට පහත සඳහන් කොටස එකතු කරන්න කියලාත් ඉල්ලා සිටිනවා. "20 වගන්තිය යටතේ ඌනතාවයට හෝ පාඩුවට වග කිවයුතු තැනැත්තෙකුට භාවිත කළ හැකි අභියාචනා ක්‍රමවේදය 23. (10) (i) වගන්තිය යටතේ අධිභාර පැනවීමකට ලක්වන ප්‍රධාන ගණන්දීමේ නිලධරයෙකුට ද අදාළ වේ" යන සංශෝධනය එකතු වෙයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. මේ සංශෝධනයත් මම ඔබතුමාට ඉදිරිපත් කරනවා. 26. (1) උප වගන්තියටත් ඇතුළත් විය යුතුයි, "23. (10) (ii) වගන්තිය යටතේ කාර්යයට සහභාගී නොවී නිදහස් වූ විට, පැමිණ සිටින සාමාජිකයන් අතරින් තෝරාගනු ලබන සාමාජිකයකු විසින් රැස්වීමේ මුලසුන දැරිය යුතු ය." කියන එක.

කාරක සභා අවස්ථාවක් නැති නිසා මම මේ අවස්ථාවේදී මේ සංශෝධන ඉදිරිපත් කරනවා.

මෙම පනත් කෙටුම්පතේ 42. (1) (ආ) හි මෙසේ සඳහන් වනවා:

"විගණකාධිපතිවරයා හෝ ඔහු විසින් බලය පවරන ලද යම් තැනැත්තකු ඉදිරියේ පෙනී සිටින ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට එසේ පෙනී සිටීම ප්‍රතික්ෂේප කරන හෝ එම විෂය පිළිබඳ මනා අවබෝධයක් ඇති තැනැත්තකු නම් කිරීමට අපොහොසත් වන;"

ඒ සංශෝධනය සම්බන්ධයෙන් අපි මෙසේ කියනවා. සාමාන්‍යයෙන් කෙනෙකුට එන්න බැරි නම්, වෙනත් කෙනෙකු ඉදිරිපත් කිරීමේ අයිතියක් තිබෙන්න ඕනෑ. එහිදී "අපොහොසත් වන" කියන කොටස තිබෙනවා. නමුත්, ඔහු එන්න බැහැයි කියලා ප්‍රතික්ෂේප කළොත්, එතකොට ඒ පරීක්ෂණය පැවැත්වීමේ අපහසුතාවක් තිබෙනවා. එම කරුණ එකතු වන්න ඕනෑ. ඒ වාගේම මෙහිදී යම් කිසි කෙනෙකුට නීති උපදෙස් ලබා ගන්න නීතිඥයෙකු ගන්න බැරි නම්, ඔහු නියෝජනය කරන්න legal aid ලබා ගැනීමට හෝ වෙනත් කුමන හෝ අවස්ථාවක් තිබෙන්න ඕනෑ.

මෙවැනි කරුණු කීපයක් තමයි මම ඉදිරිපත් කරන සංශෝධනවලින් බලාපොරොත්තු වන්නේ. ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ පැය කීපය තුළ අවශ්‍ය සංශෝධනවලට අවධානය යොමු කරයි කියලා මම හිතනවා.

කෙසේ වෙතත් විගණකාධිපතිතුමාගේ පැත්තෙන් බැලුවොත් මෙම කටයුතු ප්‍රමාද වීමෙන් අපට පෙනෙන දෙයක් තිබෙනවා.

The Secretary to the Ministry is the Chief Accounting Officer. He is responsible and his responsibility lies not only on the action taken on the directives but also on the viability of the project - financial input of the project and the sustainability of the project - and he has to make sure that the money spent is properly investigated into. We can see that by bringing in this Bill, the powers of the Auditor -General is made much stronger. The Auditor-General is an officer who is answerable to Parliament. Therefore, by bringing in this Bill, what we are doing is, we are simply strengthening Parliament and that is something that we have to applaud. The fact is that we are bringing in these changes through a Commission. At the end of the day, the Auditor-General is doing a post-audit. So, what is lacking here is that the audit should be done during or before the approval is given and that is why we need an Audit Office in Parliament.

අපට පාර්ලිමේන්තුවේ අය වැය කාර්යාලයක් -Audit Office එකක්- නැහැ. අය වැය පාර්ලිමේන්තුවෙන් අනුමත කළාට පස්සේ තමයි, අදාළ අමාත්‍යාංශවලින් මුදල් වැය කරන්නේ. එලෙස අමාත්‍යාංශ මුදල් වැය කරපු විධියේ අඩු පාඩුකම් ඇතුළු සියලු දේ අධීක්ෂණය කිරීමේ හැකියාව විගණකාධිපතිතුමා ප්‍රමුඛ විගණකාධිපති දෙපාර්තමේන්තුවට තිබෙනවා. නමුත්, අපට දැනට පාර්ලිමේන්තුවේ අය වැය කාර්යාලයක් නැහැ. මෙවර අය වැය සම්මත කරන්න කලින් ඔබතුමන්ලා හැකි ඉක්මනට පාර්ලිමේන්තුවේ අය වැය කාර්යාලයක් ස්ථාපිත කරන්න. එය අනිවාර්යයෙන් තිබිය යුතුයි. ඒ වාගේම එම ආයතනය ස්වාධීන විය යුතුයි. අය වැයක් සම්මත කරන්න කලින් ඒ අදාළ අමාත්‍යාංශයට වෙන් කරන ලද මුදල් මොන ව්‍යාපෘතිය සඳහාද, මොන කරුණු සඳහාද වෙන් කරන්නේ කියලා අපේ මන්ත්‍රීවරු සියලුදෙනාට දැනගැනීමේ අයිතියක්; දැනගැනීමේ හැකියාවක් තිබිය යුතුයි. ඒ සඳහා අපේ පාර්ලිමේන්තුවේ ස්ථිර Budget Office එකක් ස්ථාපිත කළ යුතුයි. ලෝකයේ දියුණු වූ බොහෝ රටවල් මේ වනකොට Budget Office එක හදා අවසන්. සමහර රටවල Upper House එකයි, Lower House එකයි තිබෙන නිසා ඒ අයට Budget Office එක හරහා එම කටයුතු ඉතාම සාර්ථකව හා ස්වාධීනව කර ගෙන යන්න පුළුවන් වෙලා තිබෙනවා. අය වැයෙන් කරන මුදල් වෙන් කිරීම් සම්බන්ධයෙන් Budget Office එකෙන් වාර්තාව ලැබුණාට පස්සේ තමයි අය වැය අනුමත කරන්නේ. එහෙම දෙයක් නොකර මේ මුදල් වෙන් කළේ මොන හේතුව මතද කියලා සංසන්දනාත්මකව බලන්න අපට අමාරුයි. එහෙම නැති වුණොත් අපට මේ දේවල් සංසන්දනාත්මකව බලන්න වෙන්නේ අදාළ දෙපාර්තමේන්තුවෙන් හෝ අමාත්‍යාංශයෙන් දෙන වාර්තා මතයි.

ගරු මයන්ත දිසානායක මහතා
(மாண்புமிகு மயந்த திசாநாயக்க)
(The Hon. Mayantha Dissanayake)

ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට බාධා කරනවා නොවෙයි. පාර්ලිමේන්තුවේ Budget Office එක පිහිටුවීම සඳහා වූ පනත් කෙටුම්පතත් අපි ඉක්මනටම ඉදිරිපත් කරනවා. ඒක වෙන්නේ ගරු අගමැතිතුමාගේ සම්පූර්ණ සහයෝගය ඇතිවයි. කාරක සභා රැස්වීම්වලදීත්, ඒ වාගේම ආණ්ඩු පක්ෂයේ රැස්වීම්වලදීත් ඒ ගැන අපි කථා කළා.

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

ගරු අගමැතිතුමා වෙනුවෙන් ඔබතුමා අදහස් ඉදිරිපත් කිරීම ගැන මම බොහොම සන්තෝෂ වනවා, ගරු මයන්ත දිසානායක මැතිතුමනි.

කෙසේ වෙතත්, අපි මෙය සාර්ථක කරගන්න නම්, මෙහි මූල ධර්මය මොකක්ද කියලා බලන්න ඕනෑ. දැන් අපි අමාත්‍යාංශවලට මුදල් වෙන් කරනවා; වෙන් කරලා අපි අනුමත කරනවා. පසුව ඒක විගණනය කරනවා. අපේ Budget Office එක ඉක්මනින් ස්ථාපනය කළාම, එය විගණකාධිපතිතුමාට ශක්තියක් වෙනවා.

ඒ Budget Office එකට නිලධාරීන් ගැනීමේදී ඒ අය අනිවාර්යයෙන්ම ස්වාධීන විය යුතුයි. ඒ අය කිසිසේත්ම අග්‍රාමාත්‍යතුමාට හෝ ජනාධිපතිතුමාට හෝ ඇමතිවරුන්ට සෘජුව වග කියන කණ්ඩායමක් නොවිය යුතුයි.

පෞද්ගලික අංශයේ හොඳ Accountant කෙනෙක් රුපියල් ලක්ෂ දෙකක, තුනක වැටුපක් ගෙවන්නේ නැතිව ගන්න බැහැ. ප්‍රධාන ගණකාධිකාරී, එහෙම නැත්නම් CFO -Chief Finance Officer- වැනි කෙනෙක් ගන්න කොට වැටුප වශයෙන් රුපියල් ලක්ෂ හයක්, හතක් පෞද්ගලික අංශයේ ගෙවනවා. මෙවැනි අත් දැකීම් බහුල ආයතනවලින් හොඳට විශ්ලේෂණයක් කරලා අපේ ව්‍යාපෘතියක් - project එකක්- ගත්තොත් බිලියන ගණන් මුදල් වැය කරනවා. ඒක විශ්ලේෂණය කළ හැකි හොඳ විගණන කණ්ඩායමක් අවශ්‍ය නම්, ඒ අය වෙනුවෙන් වෙනම මුදලක් වෙන් කරලා අවංකව ඒ අය ශක්තිමත් කරන්න ඕනෑ. එතකොට මන්ත්‍රීවරුන් හැමෝටම වාර්තාවක් ලැබෙනවා, මෙච්චර මුදලක් මේ ව්‍යාපෘතියට වැය කරනවා; මේ මුදලින් මෙච්චර ප්‍රමාණයක් වැය කරන්නේ මේ හේතුව මතයි. මෙච්චර මුදලක් අපි කෙටි කාලීන ණය ගන්නවා; මෙච්චර මුදලක් දීර්ඝ කාලීනව ගන්නවා, ඒ සඳහා මෙච්චර පොලියක් වෙන් වෙනවා කියලා. ඒ ගැන ස්වාධීන විශ්ලේෂණයක් ආවාම, ඒ ස්වාධීන වාර්තාව සංසන්දනය කිරීමේ හැකියාව තිබෙනවා. එය ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලයේදී විගණකාධිපතිතුමාගේ කාර්යයක් වනවා. අන්න එතැනදී රජයේ සේවය කරන ප්‍රධාන නිලධාරීන් ක්‍රියාත්මක වුණු විධිය බලන්නට පුළුවන්.

අපි හැමෝම දන්නවා, සාමාන්‍යයෙන් දේශපාලනඥයා බැණුම් අහනවා; නොයෙකුත් චෝදනා ලබනවා කියා. නමුත්, ස්ථිර සේවාවේ සිටින රජයේ සේවයේ අයගෙන් සිදු වන අඩු

[ගරු තිලංග සුමතිපාල මහතා]

පාඩුකම් නිසා සමහර වෙලාවට වන හානිය සහ පාඩුව ඊටත් වැඩියි. මේ පනත් කෙටුම්පතෙන් ඒක අඩු කර ගන්න පුළුවන් වෙයි කියා අපි විශ්වාස කරනවා. එහිදී සමගාමීව සංසන්දනාත්මක වාර්තාවක් හැදීමේ හැකියාවක් මෙහි නැහැ. ඒ කෙරෙහි අපේ අවධානය යොමු කරන්න ඕනෑය කියා මම හිතනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා (විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - மின்வலு மற்றும் புதுப்பிக்கத்தக்க சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ajith P. Perera - State Minister of Power and Renewable Energy)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු තිලංග සුමතිපාල මන්ත්‍රීතුමනි, Budget Office එක ඉක්මනින් ස්ථාපිත කළ යුතු යැයි ඔබතුමා සඳහන් කළ කාරණය ඉතාම වැදගත් වනවා.

විගණනය පිළිබඳ කාරණයේදී ගණකාධිකාරිවරුන්ට පමණක් මේ විගණන කටයුතු කිරීමේ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ සඳහා විෂයය මූලික විශේෂඥයන් සිටින්නට ඕනෑ. ඇමෙරිකා එක්සත් ජනපදයේ ඉංජිනේරුවන්, ඒ වාගේම ආර්ථික විශේෂඥයන් වැනි අය ඒ කටයුතුවල ඉන්නවා. මොකද, ගණකාධිකරණය එකක්; ආර්ථික විද්‍යාව තවත් එකක්. ඒ වාගේමයි විද්‍යාත්මක විෂයයන් හා සම්බන්ධවත්. අපේ energy අංශය ගත්තත්, එහෙම නැත්නම් transport අංශය ගත්තත්, එහෙම නැත්නම් විද්‍යාත්මක කරුණු ගත්තත් ගරු මන්ත්‍රීතුමනි, මෙතැන ස්වාධීනත්වය පමණක් ප්‍රමාණවත් නැහැ. ඒ සඳහා විෂයානුබද්ධ විශේෂඥතාව අවශ්‍යයි. මේ කාරණය සම්බන්ධව අපි හැමෝම අවධානය යොමු කරන්න ඕනෑ.

ඒ Budget Office එකට බඳවා ගැනීමේදී ගණකාධිකාරිවරුන්ට අමතරව,-

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මගේ වෙලාව ගත වනවා.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
විශේෂඥයන්ගේ සේවාව ලබා ගන්න ඕනෑ කියා මම යෝජනා කරන්න කැමැතියි. ඔබතුමාත් ඒ මතයේ සිටින බව අපි දන්නවා. මෙවැනි ප්‍රශ්නයක් මතු කිරීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

ගරු තිලංග සුමතිපාල මහතා
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. අද දින ඉතාමත් වැදගත් පනත් කෙටුම්පතක් ගැන සාකච්ඡා කරන අවස්ථාවේදී ඒ සම්බන්ධව කථා කරන්න ලැබීම මම ඉතාමත් අගය කොට සලකනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ කථා කරන්නේ දූෂණ, වංචාවලින් තොර රටක් බිහි කර ගැනීම සඳහා කළ යුතු කාර්යයන් පිළිබඳවයි. මේ සාකච්ඡාව, මේ විවාදය පැවැත්වෙන අතරතුරත් අපට අහන්න ලැබෙන ප්‍රවෘත්තිය තමයි, ඇලෝසියස් මහත්තයා සිටි සිරමැදිරිය තුළදී දුරකථන තුනක් සහ SIM cards 5ක් හසුවුණා කියලා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධිකරණයට වාර්තා කර තිබෙන බව. මම දැන ගන්න කැමතියි පරණ දුරකථන ඇමතුම්වලට අමතරව මෙම SIM cards පහ පාවිච්චි කරලා දුරකථන ඇමතුම් ලබා දුන්නේ කාටද කියලා. ඒ ගැනත් ඉදිරියේදී මේ පාර්ලිමේන්තුව හමුවේ කරුණු ඉදිරිපත් වෙනවා නම් සිරමැදිරිය ඇතුළේ සිට සොරකම වහගන්න කටයුතු කළ ආකාරය අපට නිරවුල්ව විග්‍රහ කර ගන්න ලැබේවි. ඒ එක්කම අද අධිකරණයට ඉදිරිපත් කරපු තොරතුරක් තමයි පසුගිය කාලයේ මුදල් ඇමතිවරයා විධියට රවි කරුණානායක මහත්මයා විගණකාධිපතිතුමාත් එක්ක මුහුණට මුහුණ ද්වන්ධ සටනක නිරත වුණාය කියන කාරණය. රවි කරුණානායක මහත්තයාගේ පවුලේ සමාගමකටත්, ඇලෝසියස් මහත්තයාගේ අරක්කු සමාගමෙන් රුපියල් මිලියන 5ක චෙක් පතක් 2017 වසරේදී නිකුත් කර තිබෙනවා කියන ප්‍රවෘත්තියත් අපට මේ වන විට ආරංචි වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ලැබෙන තොරතුරුත් එක්ක, ඇලෝසියස් මහත්තයා හිර ගෙදර ඉඳගෙන කාටද දුරකථන ඇමතුම් ලබා දුන්නේ, තව කාටද හිර ගෙදර ඉඳගෙන චෙක්පත් යැවුවේ, හිර ගෙදර ඉඳගෙන අලුතෙන් කරපු හොරකම් මොනවාද කියලා මේ පාර්ලිමේන්තුවට කියනවා නම් ඒ ගැන දැනගන්න අපි කැමතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම පනත් කෙටුම්පත් රට වෙනුවෙන් ගෙනෙන පනත් බවට පත් වෙන්නේ රටේ සංවර්ධනයටත්, රටේ මිනිසුන්ගේ සංවර්ධනයටත් දායක වනවා නම් විතරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලසීමාව තුළ අවංකව වැඩ කරපු විගණකාධිපතිවරුන් හිටපු බව අපට මතකයි. අතිරේක විගණකාධිපතිව සිටි ලලිත් අඹන්වල මහත්මයා අවංකව වැඩ කරන්න ගිහිල්ලා, කෝටි 5ක වංචාවක් ගැන හොයන්න ගිහිල්ලා ඇසිඩ් ප්‍රහාරයකට ලක් වුණා. අවංකව වැඩ කළ එතුමාට, විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරපු එතුමාට අවසානයේදී සිද්ධ වුණේ ශාරීරිකව විකෘතිභාවයට පත්වීමටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත් ගෙනෙන්නේ වෙන කිසිම හේතුවකට නොවෙයි. මේ පාර්ලිමේන්තුවේ ඉන්නේ පෘථග්ජන මිනිස්සු. නිලධාරීන්

[ගරු එස්. ප්‍රේමරත්න මහතා]

වෙන්නේත් පෘථග්ජන මිනිස්සු. ඒ මිනිසුන්ගේ හොරකම, වංචාව, දූෂණය, කපටිකම, බොරුව යනාදී මේ සියල්ලම ගැබ් වෙලා තිබෙනවා. යම් යම් පුද්ගලයන් සතුව යම් යම් ප්‍රමාණවලින් තිබෙන දූෂණ, වංචා අවම කර ගැනීමට නම් විගණකාධිපතිවරයාට ස්වාධීනව වැඩ කළ හැකි, ස්වාධීනව කටයුතු කළ හැකි නිදහසක් ලබා දිය යුතුයි; ඒ වාගේම වගකීම් සමුදායක් ලබා දිය යුතුයි. අපට විගණකාධිපතිවරයාගේ සාර්ථකත්වය, අසාර්ථකත්වය තීරණය කරන්න වෙන්නේ ඔහුට ලැබෙන නිදහස සහ ඔහුට ලැබෙන වගකීම ඇතුළේ පමණයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද රන්ජන් රාමනායක නියෝජ්‍ය ඇමතිතුමා කථා කළා. තවත් ඇමතිවරු කිහිප දෙනෙක් කථා කළා. එතුමන්ලා සඳහන් කළා පසුගිය කාලයේ වුණු හොරකම් ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1948දී අපේ රට නිදහස ලබා ගන්න විට අපේ භාණ්ඩාගාරයේ තැන්පත් ධනය විධියට රන් පවුම් කෝටි 120ක් තිබුණා. අපි මූල්‍යමය අතින් ආසියාවේ දෙවැනි තැනට පත් වෙලා තිබුණේ ජපානයට විතරයි. අපේ රට තිබුණේ රන් පවුම් කෝටි 120ක් සපිරි රටක් විධියටයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්පසු ලෝකයේ සමහර රටවල් අපේ රට අනුගමනය කරන්න හූරු වුණා. සිංගප්පූරුව වාගේ රටවල් කිව්වා, "ලංකාව වාගේ රටක් වෙන්න ඕනෑ" කියලා. ඒ කාලයේ -1948- ඩොලරය සඳහා ගෙව්වේ, රුපියල් 3.50යි. අද ගෙවන ගණන රුපියල් 160යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආපු ක්‍රමය මෙහෙම හැදුණේ 1948දී අපි නිදහස ලබාගන්නා විට විගණකාධිපතිවරයා සතුව ඉතාමත් පුළුල් සහ වගකීම් සහගත බලතල ප්‍රමාණයක් පැවති නිසායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1978දී නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙනාවා. හොරුන් බිහි කරන, මංකොල්ලකාරයන් ඇති කරන, වංචා දූෂණ අලුතින් නිෂ්පාදනය කරන ව්‍යවස්ථාවක් බවට 1978 ව්‍යවස්ථාව පත් වුණා. ඒ කාලයේ -ජේ.ආර්.ජයවර්ධන මහත්තයාගේ ආණ්ඩුව කාලයේ- අපට අහන්න ලැබුණේ මහා පරිමාණ දූෂණ ගැන. අපට ඒ කාලයේ මොනවාද කිව්වේ? මහවැලිය හදනකොට වුණු දූෂණ ගැන; වංචා ගැන.

අපිට මතකයි, ඒ කාලයේ ලෝක බැංකුවෙන් ඩෙවිඩ් හෝප්ස් කියලා මහත්මයෙක් ලංකාවට එව්වා. ලෝක බැංකුවෙන් ඩෙවිඩ් හෝප්ස් මහත්මයා ලංකාවට එවන්නේ වෙන මොකකටවත් නොවෙයි, මහවැලියේ සිද්ධ වෙච්ච දූෂණ-වංචා හොයන්නයි. ඔහු ඒ සම්බන්ධයෙන් සොයා බලා වාර්තාව යවනවා. වාර්තාවට අනුව ඔහු කියන්නේ, "මහවැලිය සඳහා අපි ලබා දුන් රුපියල් බිලියන ගණන් මුදල්වලින් සියයට 35ක් මහවැලිය සඳහා වියදම් කරලා තිබෙනවා. අනෙක් සියයට 65ම ඇමතිවරුන්ගේ සහ රාජ්‍ය නිලධාරීන්ගේ සාක්කුවලට ගිහිල්ලා තිබෙනවා." කියලායි. මේක තමයි ඩෙවිඩ් හෝප්ස් යවන වාර්තාව.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා නේද, කවුද මූලාසනයේ ඉන්නේ කියලා?

ගරු එස්. ප්‍රේමරත්න මහතා
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)
ඔව්. ඒක දැනගෙන තමයි, මම ඒ ගැන කිව්වේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රන්ජන් රාමනායක නියෝජ්‍ය අමාත්‍යතුමා මහින්ද රාජපක්ෂ මහත්මයාට "හොරා" කියන කොටත්, අනෙක් ඇමතිවරුන් මහින්ද මහත්මයා ඇතුළු හිටපු ඇමතිවරුන්ට "හොරු" කියන කොටත්, මම කිව්වේ මහවැලියේ වෙච්ච දූෂණ-වංචා පිළිබඳවයි. එම වාර්තාවට අනුව, ලෝක බැංකුවෙන් ලබා දුන් මුදල්වලින් සියයට 35ක් යොදවා තමයි මහවැලිය හදා තිබුණේ; සියයට 65ක් හොරකම් කරලා තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හොරුන්ට පැන යන්න සීමා මායිම් හදපු නිසා තමයි මේ රටේ ඒ විධියට හොරකම් කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට පසුව අපේ රටේ විවිධ ආකාරයේ ආණ්ඩු බිහි වුණා; විවිධ ආකාරයේ අමාත්‍යවරුන් බිහි වුණා; රටේ සංවර්ධනය විවිධ දිශාවලට පෙන්වූවා. නමුත් වංචා-දූෂණය නවත්වා ගන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. ඒවා නවත්වන්න බැරි වුණා. හැබැයි, අපිට වුවමනාවක් තිබුණා නම්, පසුගිය කාලසීමාව තුළම මේවා නවත්වන්න තිබුණා. එසේ නවත්වන්න බැරි වුණු ප්‍රධාන හේතුව මොකක්ද? ආණ්ඩුව හැම තිස්සේම කිව්වේ, "දූෂකයන්ට දඬුවම් දෙන්න ඕනෑ; දූෂකයන්ට දඬුවම් දෙන්න ඕනෑ" කියලා විතරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දූෂිතයන්ට දඬුවම් කළ පමණින් දූෂණ නතර වෙනවා කියලා මගේ ජීවිතයේ මම කවදාවත් අහලා නැහැ. දූෂිතයන්ට දඬුවම් දුන් පමණින් දූෂණ නතර වෙන්නේ නැහැ. දූෂණ නතර වෙන්න නම්, පරිපාලන ව්‍යූහය වෙනස් කරන්න ඕනෑ; නීතිමය ව්‍යූහය වෙනස් කරන්න ඕනෑ. පරිපාලන ව්‍යූහයයි, නීතිමය ව්‍යූහයයි වෙනස් කළොත් විතරයි, දූෂණවලින් තොර සමාජයක් මේ රට තුළ බිහි කරන්න පුළුවන්කම ලැබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විගණකාධිපතිතුමාගේ බලතල එක්ක, විගණකාධිපතිතුමා විසින් කළ යුතු කාර්ය භාරය එක්ක මේ රට නිවැරදි දිශාවට අරගෙන යන්න පුළුවන් කියන කාරණය මම මේ වේලාවේ මතක් කරන්න කැමැතියි. එසේ මේ රට නිවැරදි දිශාවට අරගෙන යන්න නම්, ඒ සීමාසහිත බලතල වෙනුවට, තටු කැපූ -තටු සිඳපු- විගණකාධිපතිවරයෙක් වෙනුවට, නිදහසේ වැඩ කරන්න පුළුවන් විගණකාධිපතිවරයෙක් බිහි කළ යුතුයි. එසේ බිහි කළොත් විතරයි මේ රට දූෂණවලින් වළක්වා ගන්න පුළුවන්කම ලැබෙන්නේ. මේ රට දූෂිතයන්ගෙන් ආරක්ෂා කර ගන්න පුළුවන්කම ලැබෙන්නේ විගණකාධිපතිවරයාට නිසි බලතල පැවරුවොත් විතරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත අනුව විගණකාධිපතිවරයා පත් කිරීමේ බලතල ජනාධිපතිවරයාට තිබෙනවා. හැබැයි, විගණකාධිපතිවරයා ඉවත් කිරීම පිළිබඳව මෙහි මොකුත් සඳහන් වෙන්නේ නැහැ. නමුත් ජනාධිපතිවරයා ඉවත් කිරීමේ බලතල පාර්ලිමේන්තුවට තිබෙන්නේ කොහොමද? පාර්ලිමේන්තුව තුළ තුනෙන් දෙකේ බලයක් ඇති කළොත් විතරයි, ජනාධිපතිවරයා ඉවත් කරන්න පුළුවන්කම ලැබෙන්නේ. හැබැයි, සාමාන්‍ය යෝජනාවක් සම්මත කිරීමෙන් විගණකාධිපතිවරයා ඉවත් කිරීමට පුළුවන්කමක් මේ පනත් කෙටුම්පත ඇතුළේ සුරක්ෂිත කරලා තිබෙනවා. එතකොට අපිට අහන්න තිබෙන්නේ මෙයයි. සාමාන්‍ය දූෂණයන්ට, වංචාවලට විරුද්ධ මිනිහෙකුට එල්ලෙන්න තිබෙන එකම තුත්තිරි ගහ, එකම පිදුරු ගහ විගණකාධිපති විතරයි. සාමාන්‍ය දූෂණයකට, වංචාවකට එරෙහි, රට ගැන හැඟීමක් තිබෙන මිනිහෙකුට එල්ලෙන්න තිබෙන එකම තනතුර, විගණකාධිපති තනතුරයි. හැබැයි, විගණකාධිපති තනතුර එහෙන්-මෙහෙන් ඕනෑ කෙනෙකුට අයින් කරන්න පුළුවන් තනතුරක් බවට පත් කර ගත්තොත්, සාධාරණත්වය හා යුක්තිය ආරක්ෂා කරන, එය අපේක්ෂා කරන මිනිහෙකුට සාධාරණයක් ඇති වෙනවාද කියන ප්‍රශ්නය අපි ඉස්සරහා මතු වෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපේ ඉස්සරහා ඒ ප්‍රශ්නය තිබෙනවා. ඒ නිසා පාලකයන් විධියට, පනත් කෙටුම්පත් සම්මත කරන, ව්‍යවස්ථා හදන මිනිසුන් විධියට අපට කරන්න තිබෙන්නේ එකම එක දෙයයි. විගණකාධිපතිවරයාගේ බලතල, විගණකාධිපතිවරයා සතුව තිබිය යුතු බලතල

පාර්ලිමේන්තුව තුළින් විගණකාධිපතිවරයා සතු කිරීම තමයි අප කළ යුතුව තිබෙන්නේ. එහෙම නැති වුණොත් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොරකමින් තොර, වංචාවෙන් තොර දේශපාලනඥයෙක් මේ රටේ හැදෙන්නේත් නැහැ; නිලධාරියෙක් මේ රටේ හැදෙන්නේත් නැහැ. දේශපාලනඥයාට රිංගන්න පුළුවන් තැන් ටිකක් පනත් ඇතුළේ හදා තිබෙනවා නම්, රිංගන්න පුළුවන් තැන් ටිකකින් හොරකම් කරගෙන එන්න පුළුවන්කමක් හදා තිබෙනවා නම්, අඩුම තරමේ නීතිමය ප්‍රතිපාදනවත් හදලා, නීතිමය නවෝත්පාදන හෝ හදලා නීතිය පැත්තෙන් හෝ ඔහු හිර කරන්න පුළුවන් තැනක් හදන්න ඕනෑ. මෙහි එවැනි දෙයක් අපිට පෙනෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලයක් තිස්සේ කථා කරපු පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ගෙනෙනවා. ඒකත් නිකම්ම නිකම් පනත් කෙටුම්පතක් විනා, පූර්ණ බලතල සහිත එකක් නොවෙයි. පූර්ණ බලතල සහිත පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවට ගෙනැවිත් සම්මත කරන්න මේ ආණ්ඩුවට බැරි වෙනවා. ඒක තමයි සත්‍යය. ඒක තමයි නිවැරදිම ඉදිරිපත් කිරීම. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, යහපත් දේශපාලන වාතාවරණයක් ඇතුළේ, නිවැරදි දේශපාලන වටපිටාවක් ඇතුළේ හිඳිමින් අපි මේ රට ඉදිරියට ගෙන යන්න ඕනෑය කියලා මා විශ්වාස කරනවා. ඒ මූලාරම්භයේදී -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තුවක පමණ කාලයක් තිබෙනවා.

ගරු එස්. ප්‍රේමරත්න මහතා
(மாண்புமிகு எஸ். பிரேமரத்ன)
(The Hon. S. Premarathna)
පසුගිය ආණ්ඩුව බලයට ආපු වේලාවේ, ඒ ආණ්ඩුව හඳුන්න ජනතා විමුක්ති පෙරමුණ ඇතුළු විවිධ කණ්ඩායම් එකතු වුණා. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ කටයුතු කළ නිලධාරියෙක් ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පැමිණියා. හැබැයි, එතුමා ගෙදර යවා, ඔහු වෙනුවට තව කෙනෙක් පාර්ලිමේන්තුවට ආවා.

ජනතා විමුක්ති පෙරමුණට මා කියන්න කැමැතියි, රට බෙදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පාර්ලිමේන්තුවට ගෙනෙන්න කලින්, දැනට තිබෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළ විගණකාධිපතිවරයා සතු බලතල වැඩි කරලා, විගණකාධිපතිවරයා ආරක්ෂා කරලා රට නිවැරදි තැනට ගෙන යන්න කටයුතු කරන්නය කියලා. රට බෙදන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙනෙනවාට වඩා ඒක රටේ මිනිසුන්ට වැදගත් වෙයි කියන විශ්වාසය මට තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත අපේ රටේ යහපත වෙනුවෙන්, අපේ රටේ මිනිසුන්ගේ යහපත වෙනුවෙන්, දූෂණයට එරෙහි මිනිසුන්ගේ යහපත වෙනුවෙන් විගණකාධිපතිවරයාට ඉදිරියටත් නිසි අයුරින් කටයුතු කරන්නට ශක්තියක් දෙන පනතක් බවට පත් කරන්නට, ඉදිරියේදී හෝ යම් යම් සංශෝධන හරහා එතුමන් සතු බලතල වැඩි කරන්නට මේ පාර්ලිමේන්තුවේ අපි සියලුදෙනාටම හැකියාව ඇත්නම් පමණයි, අපේ රටට සුදුසු, සුරක්ෂිත සහ නිසි විධියේ අනාගතයක් අපට දකින්න පුළුවන්කම ලැබෙන්නේ. අවංක, කාර්යශූර, දක්ෂ විගණකාධිපතිතුමන්ට ඒ අනාගතය හදන්න හැකියාව ලැබේවා, ශක්තිය ලැබේවා, දූෂිතයන්ගෙන්, දූෂණවලින් තොර ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පත් කරන්න හැකියාව ලැබේවායි කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දැන ගැනීම සඳහායි මා මේ කාරණය කියන්නේ. ඩේවිඩ් හොපර් තමයි ඒ වාර්තාව ඉදිරිපත් කරලා තිබෙන්නේ. ඔබතුමා කැමැති නම් ඒ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න පුළුවන්.

ගරු හේෂාන් විතානගේ මන්ත්‍රීතුමා.

[අ.භා.4.27]

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික වැදගත්කමක් තිබෙන ජාතික විගණන පනත් කෙටුම්පත පිළිබඳ විවාදය පැවැත්වෙන මේ අවස්ථාවේදී ඒ පිළිබඳව අදහස් දක්වන්න අවස්ථාවක් ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. විපක්ෂයේ මන්ත්‍රීවරු මේ පනත් කෙටුම්පත පිළිබඳව ප්‍රශංසා මුඛයෙන් කථා කරනවා අපි දැක්කා. ඒ අතරම, මේ පනත් කෙටුම්පත ගෙනෙන්න පරක්කු වුණා වැඩියි, අවුරුදු 3ක් පරක්කු වුණා කියලා කථා කළා. හැබැයි එතුමන්ලාට මතක නැහැ, අවුරුදු 20ක් මේ රටේ ආණ්ඩු කළත් මෙවැනි යෝජනාවක් ගෙනෙන්නවත් එතුමන්ලාට අදහසක්වත් තිබුණේ නැහැයි කියලා. ගරු විජයදාස රාජපක්ෂ ඇමතිතුමා කිව්වා, 2007 වසරේදී මේ ගැන යෝජනාවක් ඉදිරිපත් වුණත්, ඉන් පසුව ඒ ගැන වචනයක්වත් කථා කළේ නැහැයි කියලා. 2015දී මෙය යෝජනාවක් විධියට ඉදිරිපත් කරලා, අද වනකොට එය යථාර්ථයක් බවට පත් කරන්න පුළුවන්වෙලා තිබෙනවා.

ජාතික විගණන පනත් කෙටුම්පත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ක්‍රියා කරපු අපේ ආණ්ඩුව, මේ අවුරුදු තුන තුළ මේ රටේ ජනතාවට ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් කොපමණ දීලා තිබෙනවාද? අද ප්‍රජාතන්ත්‍රවාදය ගැන කථා කරන, පාරම්පරා පුරන මේ උදවිය පසුගිය කාලයේ මෙවැනි පනත් කෙටුම්පත් ගෙනෙනවා තියා, මිනිසුන්ට තිබුණු සාමාන්‍ය ප්‍රජාතාන්ත්‍රීය නිදහස පවා අහිමි කළා. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත ගෙනෙන වෙලාවේ එක එක විකාර කියලා, ඒ පනත් කෙටුම්පත සම්වචලයට ලක් කළා. "මේවා කරන්න බැහැ" කියලා ඒ පනත් කෙටුම්පතේ දෝෂ පෙන්නුවා. හැබැයි, අද වනකොට ආණ්ඩු පක්ෂය විධියට අපි අපේ පාලන කාල සීමාව තුළ මේ රටේ ජනතාවට විනිවිදභාවයකින් යුතුව ඕනෑම තොරතුරක් දැනගැනීමේ අවස්ථාව සලසා දීලා තිබෙනවා. ඉතිහාසය පුරා මේ රටේ ජනතාවට මෙවැනි අවස්ථාවක් ලැබුණේ නැහැ.

ඒ විතරක් නොවෙයි. කොමිෂන් සභා පත් කිරීමත් හීනයක් වෙලායි තිබුණේ. "අපි කොමිෂන් සභා ගෙනෙනවා. රාජ්‍ය යාන්ත්‍රණය ක්‍රියාත්මක වීමේදී විනිවිදභාවයක් ඇති කරනවා. ප්‍රජාතන්ත්‍රවාදය සුරකිනවා"යි කියලා තමයි පසුගිය කාලයේ ජනාධිපතිවරණ පොරොන්දු පත්‍රිකාවල තිබුණේ. ඒ මොකක්වත් සිද්ධ වුණේ නැහැ. නමුත් අද අපි ඒවා යථාර්ථයක් බවට පත් කරලා තිබෙනවා. අද ජාතික පොලිස් කොමිෂන් සභාව ඉතාම ක්‍රියාකාරියි. එදා එහෙම නොවෙයි. එදා අපේ දිස්ත්‍රික්කවල හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හිතවත් අය පොලිසියේ ස්ථානාධිපති පුටුවේ වාඩි කරවනවා විතරක් නොවෙයි, තමන්ට හිතුණු වෙලාවට ස්ථානාධිපතිවරයාගේ පුටුවේ වාඩිවෙලා, ඔහුගේ බෙල්ලෙන් අල්ලා පැමිණිලි විභාග කරපු සිද්ධි ඕනෑ තරම් තිබෙනවා. අපට ඒ ගැන පැහැදිලි කරන්න පුළුවන්.

මේ විගණන පනත් කෙටුම්පත මේ රටේ සමාජගත වෙන කොට දැන් කියනවා, මේ පනත් කෙටුම්පතේ තටු කපලාලු.

[ගරු හේෂාන් විතානගේ මහතා]

මහත්තයෝ, තටු කපලා නොවෙයි, මේ පනත් කෙටුම්පත මේ විධියටවත් මෙච්චර ඉක්මනින් අරගෙන එන්න කටයුතු කිරීම ගැන ඔබතුමන්ලා සතුටු වෙන්න ඕනෑ. අපි මේ හැම එකකින්ම රටේ ප්‍රජාතන්ත්‍රීය අයිතියයි තහවුරු කරන්නේ. පසු ගිය දවස්වල කියපු හිටලර් පන්නයේ ආණ්ඩුවක් බිහි වෙනවා නම් මෙවැනි පනත් වැඩක් නැහැ. ඒ වාගේ පන්නයේ ආණ්ඩුවක් තිබෙන යුගයකට මෙවැනි පනත් වැඩක් නැහැ. එතකොට විගණකාධිපතිගේ බලතල ඒ ඔක්කෝම ටික බිඳිලා යනවා. එතකොට හිටලර්ගේ විධියට ඒ ඔක්කෝම වැඩ කරගෙන යනවා. එතකොට ප්‍රජාතන්ත්‍රීය අයිතිය නැති වෙනවා; මේ පනත් හමස් පෙට්ටියට යනවා. මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙන, ඒ වෙනස් දේශපාලන අත්දැකීම අද රටේ ජනතාවට දැක ගන්න පුළුවන් විධියට මේ ආණ්ඩුව ක්‍රියාත්මක වන බව මම කියනවා. මම දැක්කා, ජයන්ත සමරවීර මන්ත්‍රීතුමා හරිම වේදනාවෙන් කථා කළා, මේවා මේ මේ විධියට වෙන්න ඕනෑ කියලා. හැබැයි, ජයන්ත සමරවීර මන්ත්‍රීතුමාට මතක නැහැ, එතුමාගේ හිටපු අමාත්‍යාංශයේ අක්කාගේ දුවගේ මඟුල කෑවේ අමාත්‍යාංශයේ සල්ලිවලින් කියලා. අපි කියනවා, ඒවා විගණනය කරන්න කියලා.

අපේ දිනේෂ් ගුණවර්ධන ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීතුමා කිව්වා බැදුම්කරය ගැන විගණනය කරන්න කියලා. අනිවාර්යයෙන්ම ඒක විගණනය කරන්න, ඒ චූදිතයන්ට දඬුවම් දෙන්න. ඒ අය එල්ලුම් ගහේ එල්ලන්න පුළුවන් තැනට අරගෙන යන්න. හැබැයි, එදා අහිංසක මිනිසුන්ගේ බදු මුදලින් තමන්ගේ අක්කාගේ දුවගේ මඟුල කෑවා. මේක විලිලජ්ජා නැති කථාවක්. මේ පාර්ලිමේන්තුවේ කියන්නත් ලජ්ජයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. තමන්ගේ අක්කාගේ දුවගේ විවාහ මංගල්‍ය උත්සවය -මඟුල- ගන්න මේ රටේ මුදල් පාවිච්චි කරපු උදවිය අද සුදු චරිත වෙලා මෙතැනට ඇවිල්ලා කියනවා, "මේ පනත් කෙටුම්පතේ මේ වෙනස්කම් ටික ඇති කරලා රාජ්‍ය නිලධාරීන්ට හොඳ ශක්තියක් වන විධියට කටයුතු කරන්න" කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ රට හරි තැනට අරගෙන යනවා. ඒක තමයි, මේ රටේ ජනතාව බලාපොරොත්තු වෙන වෙනස. රටේ ජනතාව බලාපොරොත්තු වෙච්ච ඒ නිදහස, රටේ ජනතාව බලාපොරොත්තු වෙච්ච ඒ ප්‍රජාතාන්ත්‍රීය අයිතිය තහවුරු කරන්න අපි කටයුතු කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විගණකාධිපතිතුමාත් ඉන්න වෙලාවේ මම මේ කාරණය කියනවා. මේ රටේ රාජ්‍ය මුදල් භාවිතය පිළිබඳව, මූල්‍ය විනය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු විධියට අපි දන්නවා, රජයේ මුදල් ටිකවත්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයාගේ විමධ්‍යගත මුදල් ටිකවත් නිවැරැදිව ජනතාවාදී විධියට පරිහරණය කිරීමට ක්‍රමවේදයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සකස් වෙලා නැති බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනක සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා විධියට ඒ කාරණය දන්නවා. මා උදාහරණයක් කියන්නම්. එකම භාණ්ඩය ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුනකින් මිලදී ගන්නේ මිල ගණන් තුනකට. එකම භාණ්ඩයේ මිල ඒ විධියට වෙනස්වීමට හේතුව කුමක්ද? ඒ භාණ්ඩයේ ප්‍රමිතිය පිළිබඳ පාලනයක් නැහැ. අපි ඒ භාණ්ඩ ජනතාවට දෙනවා. නමුත් ජනතාව -ඒ ප්‍රතිලාභියා- ඒ ගැන හොයන්නේ නැහැ. නිකම් හම්බ වෙන නිසා අරගන්නවා. හැබැයි, අපි හිතන හැටියට මේ හරහා සමහර දූෂිත නිලධාරීන් තමන්ගේ අරමුණු කරා යනවා. ඒ නිසා ටෙන්ඩර් පටිපාටිය තුළ නිසි ක්‍රමවේදයක් ඇති කරන්න කටයුතු කළ යුතුයි. ඒ කටයුතු සිද්ධ වුණාට පස්සේ මේ ගනුදෙනුවලදී වැරැදි සිද්ධ වෙලා තිබෙනවා කියලා විගණන කරලා ඒ විගණන විමසීම් තුළින් උත්තර හොයනවාට වඩා රාජ්‍ය මුදල් නිවැරැදිව පාවිච්චි කරන්න අවශ්‍ය නීති සකස් කළ යුතුයි කියලා මම හිතනවා. අඩුම තරමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින්, දිස්ත්‍රික් ලේකම් කාර්යාල මට්ටමින් නිවැරැදි ක්‍රමවේදයක් තුළ මේ කටයුතු කළ යුතුමයි. විශේෂයෙන්ම ප්‍රාදේශීය සභාවක හිටපු සභාපතිවරයෙක් විධියට මා දන්නවා, ප්‍රාදේශීය සභාවල භාණ්ඩ මිලදී ගැනීමේ ක්‍රියාදාමය කොහොමද කියලා. භාණ්ඩ මිලදී ගැනීමේ ඒ ක්‍රියාදාමය තුළ කිසි විනිවිදභාවයක් නැහැ. සභාපතිට නිදහස දීලා තිබෙනවා ඕනෑ විධියට ඒ කටයුතු කරන්න. ඒ සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ට - සභිකයන්ට- මේ පිළිබඳ අවබෝධයක් නැති වෙන්න පුළුවන්. මේ වාගේ තැන්වලින්ම මේ අකටයුතුකම් නතර වෙන්න ඕනෑ. මහා ලොකු, කෝටි ගණන් මුදල් වංචා කරන චරිත බිහි වෙලා එන්නේ මේ වාගේ තැන්වලින් තමයි. අද සමහර අය කියනවා, 78 විවෘත ආර්ථිකය ගෙනාවාට පස්සේ 'මහවැලිය' වාගේ මහා ව්‍යාපෘති තුළින් තමයි හොරු බිහි වුණේ කියලා. හැබැයි, ඒක පිළිගන්න එක ගැන මම සතුටු වෙනවා. මොකද, "අපි හොරු වුණේ 77 ගෙනා ක්‍රමවේදය තුළ" කියන එක ඒ අය පිළිගැනීම ගැන අපි සතුටු වෙනවා. මේ රටේ පුංචි අහිංසක මිනිහාගේ රුපියල් 500 ගැන හොයන්න, මේ රටේ ගමේ පුංචි ව්‍යාපාරයක් කරන අහිංසක මිනිහාගේ බදු ආදායම ගැන හොයන්න කටයුතු කරනවා වාගේම විශාල වශයෙන් බදු පැහැර හැරලා ඉන්න මේ රටේ සමාගම් පිළිබඳවත් හොයන්න පුළුවන් ක්‍රමවේදයක් ඇති වෙන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තුවක කාලයක් තිබෙනවා.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි කවුරුත් දන්නා කාරණයක් තමයි, ලක්ෂ ගණන්, කෝටි ගණන්, මිලියන ගණන් ආදායම් බදු ගෙවන්න තිබෙන මනුස්සයාට මේ ප්‍රශ්නය විසඳාගන්න පුළුවන් ක්‍රමයක් අද නිර්මාණය වෙලා තිබෙනවා. කොමසාරිස්තුමා හෝ කොමසාරිස්තුමිය හෝ හම්බවෙලා අත යට ගණනක් දීලා ඒක විසඳාගන්න පුළුවන්. එම සුප්‍රකට ක්‍රමය අද මේ රටින් තුරන් වෙන්නට ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Sri Lanka Customs එක ගත්තොත්, Sri Lanka Customs එකේ හයිය තිබෙන කෙනාට භය නැතුව එළියට එන්න පුළුවන් කියලා අපි දන්නවා. මේ පාර්ලිමේන්තුවේ ඉන්න අමාත්‍යවරු, මන්ත්‍රීවරුත් ඒක දන්නවා. එම ක්‍රමවේද ටික වහන්න ඕනෑ. අල්ලසක් නැතුව වැඩක් කරගන්න බැරි රාජ්‍ය ආයතන කොපමණ තිබෙනවාද? විගණකාධිපතිතුමනි, ඒ නිසා මේ මහින් ඔබතුමාටත් ශක්තියක් නිර්මාණය වෙනවා. එසේ නිර්මාණය වීම තුළ අඩුම තරමින් මේ රටේ දේශපාලනඥයන්ගේ අවශ්‍යතා නිසා, මේ රටේ අහිංසක මිනිසුන්ගේ බදු මුදල් ටික විනාශ වීමේ පාපකර්මය නැති කරන්න ඔබතුමා කටයුතු කරන්න. ඒ සඳහා ශක්ති දෙන්න. මේ යහපාලන ආණ්ඩුවේ රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාට එල්ලගෙන ගහන උදවියට අපි කියනවා, මේවා භය නැතුව අරගෙන මේ රටේ මිනිසුන්ට අනාගතය උදා කර දෙන්න කියලා. පසු ගිය කාලයේ වගේ හොර, තක්කඩි රැළක් නැවතත් මේ රට තුළ බිහි නොවෙන්න වග බලාගන්න කියන එක මතක් කරමින් මගේ වචන කිහිපය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමා.

[අ.භා. 4.37]

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාපති නාමාවලියට අලුතින් පත්වී ඔබතුමා ප්‍රථමයෙන් මූලාසනයට පැමිණ සිටින අද දිනයේ මා ඔබතුමාට සුබ පතන්නට මේ අවස්ථාව යොදා ගන්නවා. ඔබතුමා මූලාසනයේ සිටින වෙලාවක මට කථා කරන්නට ලැබීම ඉතාමත්ම සතුටට කරුණක්. මොකද, අද අපි සාකච්ඡාවට භාජනය කරන මාතෘකාව වන ජාතික විගණන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න කලින් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ දී දීර්ඝ වශයෙන් සාකච්ඡා කළ බව රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙකු වන ඔබතුමා දන්නවා ඇති. මෙම ජාතික විගණන පනත් කෙටුම්පත පිළිබඳව අපි මාස ගණනක් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී - Public Finance Committee එකේදී - වාද විවාද කළා. ඒ හරහා මෙම ජාතික විගණන පනත් කෙටුම්පතේ ඇති අවශ්‍යතාව අපි ඉතාමත් හොඳින් දැක්කා. මෙම ජාතික විගණන පනත් කෙටුම්පත ගැන කථා කරන කොට කියන්නට ඕනෑ, ජාතික විගණන පනත් කෙටුම්පත පිළිබඳව මුලින්ම සාකච්ඡා වෙන්නේ 2000 වර්ෂයේ දියි. ඒ වාගේම ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ජනාධිපතිවරයා වශයෙන් ඉදිරිපත් වුණු වෙලාවේ එතුමාගේ මැතිවරණ ප්‍රකාශයේත් රාජ්‍ය විගණනය පාලනය කිරීම සහ ශක්තිමත් කිරීම සඳහා නීතියක් පැනවීම කඩිනම් කිරීම සම්බන්ධයෙන් පොරොන්දු වුණා. ඒ පොරොන්දුව ඉටු කිරීමත් එක්කම 2015 වර්ෂයේ මැයි මාසයේදී දහනවවැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මඟින් විගණකාධිපතිවරයාගේ බලතල පුළුල් කරනු ලැබුවා. ඉන් පසුව පරිපූරක ව්‍යවස්ථාදායක රාමුවක් මඟින් එය තහවුරු කරන්න අවශ්‍ය බලතල ලබා දීම සඳහා වන ජාතික විගණන පනත් කෙටුම්පතක් හැටියට අපට මෙය හඳුන්වා දෙන්නට පුළුවන්. රටේ ප්‍රජාතන්ත්‍රවාදී රාමුවක් තුළ, ප්‍රජාතන්ත්‍රවාදය අගයන ජනතාවට ඉතාමත් සතුටු විය හැකි පනත් කෙටුම්පතක් හැටියටයි අපි දකින්නේ.

විගණකාධිපතිවරයා සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්ම මහත්මීන් පසු ගිය කාලයේ මේ ගැන විශාල සාකච්ඡාවක් කරනවා අපි දැක්කා. සමහර වෙලාවට සටනක් වුණා, සමහර වෙලාවට චෝදනා කළා. සමහර අය කිව්වා, ආණ්ඩුව මේක කරන්න දෙන්නේ නැහැ, ආණ්ඩුව මේකට විරුද්ධයි කියලා. නමුත් ඒ සියලුම චෝදනා, යෝජනා සියල්ල මල් පොකුරු හැටියට අරගෙන අද අපට සතුටු වෙන්න පුළුවන්. මේ ආණ්ඩුව ජනතාවට අවශ්‍ය ජාතික විගණන පනත් කෙටුම්පතක් හැටියට මෙය ඉදිරිපත් කරලා තිබෙනවා.

විගණකාධිපතිවරයා සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයන් පිළිබඳව විශේෂයෙන් රජයේ මුදල් සම්බන්ධයෙන් කටයුතු කරන රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ දී -Public Finance Committee එකේ දී - අපි සමාලෝචනයට ලක් කළා. ඉදිරියේ දී Public Finance Committee එක හරහා අපි Budget Office එකක් ඇති කරනවා. මෙම ජාතික විගණන පනත් කෙටුම්පත හරහා පාර්ලිමේන්තුවට වගකීම් පැවරෙන්නේ කොතැනද කියන කාරණයත් එක්ක බද්ධ කරලා අනාගතයේ දී Budget Office එක හරහා මේ ගැන තව තවත් සමාලෝචනය කරන්න, මේ කාර්යන් විශ්ලේෂණය කරන්න අපට හැකියාව ලැබෙනවා. මම හිතන විධියට අවසානයේ දී එහි බලතල පැවරෙන්නේ පාර්ලිමේන්තුවටයි.

මේ පාර්ලිමේන්තුවට බලතල පැවරෙන විගණන පනත හරහා Budget Office එක ඇති කිරීම තුළින් එය ක්‍රමානුකූල කරගෙන මෙහි කාර්යභාරය තව තවත් ශක්තිමත් කරන්න අපට හැකියාව ලැබෙනවා. කලින් කථා කරපු ගරු හර්ෂ ද සිල්වා අපේ රාජ්‍ය ඇමතිතුමා, ඒ වාගේම ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමාත් මේ ගැන සාකච්ඡා කළා. විශේෂයෙන් තාක්ෂණික විගණනයන් ගැන සාකච්ඡා කළා. Public Finance Committee එකේදීත් අපි ඒ ගැන සාකච්ඡා කළා. ප්‍රධාන වශයෙන්ම අපි point out කළේ තාක්ෂණික විගණනයන් හරියාකාරව සිදු නොවුණොත් වියහැකි අක්‍රමිකතා ගැනයි. ඒ නිසා විශේෂයෙන් රාජ්‍ය සේවකයා, තීරණ ගන්න නිලධාරීන් වාගේම දේශපාලන අධිකාරියත් පාඩු ලබන්න පුළුවන්. මේක සංවේදී කාරණයක්. විශේෂයෙන් තාක්ෂණික සහ ඉංජිනේරු කාර්යයන් පිළිබඳ විගණනය. එම කාරණය පිළිබඳ විගණකාධිපතිවරයාගේ අවධානය අපි යොමු කරවනවා. මොකද, ගල් අඟුරු සම්බන්ධයෙන් වූ ප්‍රශ්නයකදී වරෙක අපි මේ බව දැක්කා. අපි බලශක්ති පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ දී ගල් අඟුරු සම්බන්ධයෙන් වූ වාර්තාවේ තිබූ අඩුපාඩු ගැන දීර්ඝ වශයෙන් සාකච්ඡා කළා. අපි මේ විවේචන කරන්නේ බොහොම සුබවාදී විධියට. ඒවා positive විධියට ගන්න කියා අපේ විගණකාධිපතිවරයාගෙන් සහ එම කණ්ඩායමෙන් ඉල්ලා සිටිනවා. අපි එතැනදී දැක්කා, තාක්ෂණික ගැටලු තිබෙන බව.

අපට සන්තෝෂ වෙන්න පුළුවන් කාරණයක් තිබෙනවා. වත්මන් පාර්ලිමේන්තුවේ, අපේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා වාගේම තවත් මන්ත්‍රීවරු රාශියක් තාක්ෂණික දැනුමෙන් සන්නද්ධව සිටිනවා. ඒ නිසා Oversight Committees වල නැත්නම්, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ අපි සාකච්ඡා කරනකොටත් දැනුම ඇති මන්ත්‍රීවරු හැටියටයි සාකච්ඡා කරන්නේ. එතුමන්ලා දැනුම ඇති මන්ත්‍රීවරු හැටියට සාකච්ඡා කරනවා. නමුත් සමහර වෙලාවට විගණකාධිපතිවරයාගේ වාර්තාව අරගෙන එන විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සාකච්ඡා කරන්නේ සියල්ල දත් අය වාගේයි. ඇත්තටම අපි මේ ගැන දැඩි වේදනාවෙන් කථා කරන්නේ. සමහර වෙලාවට ඔවුන් අපට ඇහුම්කන් දෙන්නේ නැහැ. "නැහැ, නැහැ. අපි කියන වාර්තාව හරි; අපි කියන එක තමයි හරි" කියලා කියනවා. නමුත් එය නොවෙයි විය යුත්තේ. මේක සාකච්ඡාවට භාජනය වෙන්න ඕනෑ. Positive thinkersලා විධියට කටයුතු කරන්න ඕනෑ. තාක්ෂණික ප්‍රශ්නයක් -ගැටලුවක්- තිබෙනවා නම් ඒ පිළිබඳ සාකච්ඡා කළ යුතුයි. මොකද, පාර්ලිමේන්තුවේ තාක්ෂණික දැනුමින් සන්නද්ධ වෙච්ච, දැනුම තිබෙන වෘත්තිකයන් ඉන්න පුළුවන්. එම වෘත්තිකයන් කියන දෙයට ඇහුම්කන් දිය යුතුයි කියා අපි යෝජනා කරනවා.

විශේෂයෙන් මේ කාරණය විගණන පනත හරහා සාකච්ඡාවට භාජනය විය යුතුයි. එහෙම වුණොත් විතරයි මේ විගණන පනතේ කාර්ය භාරය යථානුරූපීව සිදුකරගත හැකි වන්නේ. එහෙම නැති වුණොත් ගැටලු මතු වනවා. ගල් අඟුරු ගණනය කිරීමවල තිබුණු වැරැදි මට මතකයි. මොකද, තාක්ෂණික දැනුමක් නැතුව ගණනය කරලා තිබීමෙන් පාඩු සිදුවෙලා තිබෙන බව; සමහර වෙලාවට වාසියක් සිදුවෙලා තිබෙන බව අපි දැක්කා. සමහර වෙලාවට තාක්ෂණික ගැටලුත් එක්ක පාඩුව, වාසිය දෙකම positive, negative විධියට කොයි පැත්තට යයිද කියන බරපතළ ගැටලුවක් ඇති වෙනවා. මේ පනත් කෙටුම්පතේ සඳහන් වෙලා තිබෙනවා, තාක්ෂණික කාරණාවලදී විගණකාධිපතිවරයා එම තාක්ෂණික ගැටලු සම්බන්ධයෙන් උපදෙස් ගත යුතු ආයතනවලින් උපදෙස් ගත යුතුය කියන කාරණය. නමුත් ඒ සඳහා වගකීම තිබෙන තැන් මොනවාද කියන එක ගැන සාකච්ඡාවට භාජනය කරන්න පුළුවන් නම් හොඳයි කියලා මා හිතනවා. එය සාකච්ඡාවට භාජනය විය යුත්තේ කොහොමද කියන එක සංශෝධන හැටියට ඉදිරිපත් කරන්න පුළුවන්කමක් ලැබුණොත් හොඳයි. ඒ පිළිබඳව අපට සාකච්ඡාවට භාජනය කරන්න ලැබුණොත් හොඳයි. උදාහරණයක් වශයෙන් ඉංජිනේරුමය කාර්යයන් හැටියට ගත්තොත් අපට

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

පුළුවන් අදාළ Oversight Committee එකට අරගෙන එතැනදී තාක්ෂණික දැනුම සම්බන්ධයෙන් කථා කරලා, විශේෂයෙන් තාක්ෂණික දැනුම සම්බන්ධයෙන් expertsලා ගෙනැල්ලා third eye එකකිනුත් බලලා මේකේ comment එක ගන්න. එහෙම නැති වුණොත් වෙන්න පුළුවන් අගතිය තමයි වැරැදි තීරණයකින් වැරැදිම වැරැදි චිත්‍රයක් මැවෙන්න පුළුවන්වීම.

ඊළඟ කාරණය තමයි විගණකාධිපතිවරයා ඇතුළු විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සේවක මහත්වරුන්ගේ political biasness එක. ඒ කියන්නේ politically එක පක්ෂයකට සම්බන්ධ විය හැකි පුද්ගලයන් සිටිය හැකි වෙනවා. එතකොට සමහර වෙලාවට ඒ ගොල්ලන් ඒ යාළු මිත්‍ර දේශපාලනඥයන් විසින් මෙහෙයවන්න පුළුවන්කම ලැබෙනවා. මේ වාගේ වෙලාවට ස්වාධීනව කටයුතු කරන්නේ කොහොමද කියා මේ ජාතික විගණන පනත් කෙටුම්පතේ සඳහන් වෙන තැන අඩුපාඩු තිබෙනවා කියලා මා දකිනවා. එහෙම නම්, ස්වාධීනත්වය ආරක්ෂා කරන්නේ කොහොමද? වර්තමාන විගණකාධිපතිවරයා දේශපාලනීකරණය නූනත්, දේශපාලනීකරණය වෙච්ච විගණකාධිපතිවරයෙක් ඒ තැනට පත් වුණා කියා අපි හිතමු. ඒ පත්වූ කෙනාගේ කාර්යයන් විමර්ශනය කරන්නේ කොහොමද? ඒ සම්බන්ධයෙන් බලය පැවරෙන්නේ කොතැනටද කියන එක ගැන සාකච්ඡා කළ යුතුයි. ඒක අපි Budget Office එක ඇතුළේද, නැත්නම් Public Finance Committee එක ඇතුළේද සාකච්ඡා කළ යුත්තේ කියන කාරණය අපි Budget Office එක හරහා සමාලෝචනය කරගත යුතු වෙනවා.

මෙම විගණන පනත ඉතාම හොඳයි. නමුත් එය තවත් පොලිස්කාරයෙක් නොවිය යුතුයි. ඒ කියන්නේ, මේ රටට බලපාන අනාගත තීරණවලදී තවත් පොලිස් පොල්ලක් වෙලා මේ කරන ක්‍රියාදාමයන් නවත්වන තැනට එය නොයා යුතුය කියා අපි දැඩි සේ විශ්වාස කරනවා. විශේෂයෙන්ම ඉංජිනේරු කාර්යයන්, තාක්ෂණික කාර්යයන් සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුමෙන් සන්නද්ධ වෘත්තිකයන්ගේ දැනුම හරියාකාරව ලබා ගත්තේ නැති වුණොත් අගතිගාමී තත්ත්වයන් ඇති වෙන්න පුළුවන්. ඒක බොහොම බරපතළ කාරණයක්. එම නිසා ජාතික විගණන පනත සම්බන්ධයෙන් මේ කාරණාව සාකච්ඡාවට භාජන විය යුතුයි කියන යෝජනාව මම කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේත් අපි මේ කාරණය ගැන කථා කළා. එහිදී අපට තේරුණා, TRC එකේ illegal cable TV operatorsලා ලංකාව පුරාම සිටින බව. නමුත්, ඒ අය සම්බන්ධයෙන් TRC එක ඇතුළේ තාක්ෂණික විගණනයක් වෙන්නේ කොහොමද කියා අපට පැහැදිලි කර ගත හැකි වුණේ නැහැ. ඒ වාගේ වෙලාවක මේ කාරණා සම්බන්ධව තාක්ෂණික විගණනයක් කරගෙන, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව ඒ නියාමනය කරන්නේ කොහොමද? ඒ වාගේම විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවත් නියාමනය කළ යුතු වෙනවා. එම නිසා මෙම විගණන පනත හරහා හෝ මේ කොමිෂන් සභාවත් නියාමනය කරන්න අවස්ථාවක් ලැබෙන්න ඕනෑ. ඒ ලැබෙන අවස්ථාව තාක්ෂණික දැනුමෙන් සන්නද්ධ වුණු පිරිසක් හරහා කර ගත්තේ නැත්නම් -විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හරහා හෝ- මේ රටට අය කර ගත හැකි මුදල් විශාල ප්‍රමාණයක් අපට නොලැබී යනවා. ඒ වාගේම තමයි, අත්තනෝමතිකභාවය. ඒ කියන්නේ, විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව මේ මොහොතේ ක්‍රියා කරන්නේ සම්පූර්ණයෙන්ම ඒකාධිපතියෙක් විධියටයි. ඒකාධිපතියකුගේ ස්වරූපය අරගෙන -රජ වාසල වඳුරාගේ ස්වරූපයෙන්- මේ ආයතනය ක්‍රියාත්මක නොවිය යුතුයි. රජ වාසල වඳුරා කඩුව ගත්තාම මොකද කරන්නේ කියා අපි කවුරුත් දන්නවා; සාමාන්‍ය කථා බහේදී අපි ඒ ගැන කියනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා; you have only one more minute.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එවැනි දේවල් සමඟ බලන විට මෙවැනි කාරණා සම්බන්ධයෙන් විශේෂ විමර්ශන සිදු කළ යුතු වෙනවා. මෙවැනි ආයතන විමර්ශනය කරන විට තාක්ෂණික දැනුම උපයෝගි කරගෙන හරියාකාරව කළොත් විතරයි රටට ආදායම ලබාගත හැකි වන්නේ. ඒ සඳහා මම උදාහරණයක් කියන්නම්. පසුගිය කාලයේ සිද්ධ වුණු වංචා, දූෂණ ගැන අපි සාකච්ඡා කරනවා. මේ වංචා දූෂණ, අයථා ලෙස උපයා ගත් දේපොළ ගැන කථා කරන විට ඒ සම්බන්ධයෙන් විශාල වශයෙන් චෝදනා තිබෙන මන්ත්‍රීවරුත් මේ ගරු සභාවේ ඉන්නවා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
කවුද, කවුද?

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මන්ත්‍රීවරයාගේ නම පස්සේ කියන්නම්. මට තව කාලය දුන්නොත්, ඒ ගැන තව පොඩ්ඩක් කථා කරන්නම්.

ඒ මන්ත්‍රීවරයාට තිබෙන චෝදනා මෙවායි. රුපියල් ලක්ෂ 87.75කට මිලට ගත් නිවසක් නාවල කොස්වත්තේ පැවතීම; බොරැල්ල කුරුප්පු පාරේ, අංක 66 දරන ස්ථානයේ පර්චස් 20.85ක ඉඩමක් පැවතීම; කටුනායක, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ පිටවීමේ පර්යන්තයේ, "චේම්බර් ඔෆ් ගිෆ්ට්ස්" සහ "වී-ඩූ ශ්‍රී ලංකා" නමැති තීරු බදු සාප්පු දෙක පවත්වාගෙන යාම.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
කවුද, කවුද ඒ මන්ත්‍රීවරයා?

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
පොඩ්ඩක් ඉන්න ගරු මන්ත්‍රීතුමනි. අවසානයේදී කියන්නම්.

මහනුවර ජෝර්ජ් ආර්. ද සිල්වා මාවතේ පර්චස් 12, පර්චස් 13.5 සහ පර්චස් 18.3ක ඉඩම් කැබලි තිබීම; රුපියල් ලක්ෂ 285කට ඇල්විටිගල මාවතේ, ට්‍රිලියම් රෙසිඩන්සීස් නිවාස සංකීර්ණයේ අංක 153/9/2 දරන නිවස බිරිඳගේ නමට මිලට ගැනීම; කොළඹ 07, කින්සි පාරේ අංක 70/3/1 හි නිවස පැවතීම; පවුම් 320,000ක් ගෙවා එංගලන්තයෙන් නිවසක් මිලට ගැනීම; අංක 15/1, චන්ද්‍රා වෙත්තසිංහ මාවත, කොස්වත්ත -නාවල පර්චස් 15.58ක ඉඩම සහ උපයා ගත් ආකාරය හෙළි කිරීමට නොහැකි රුපියල් මිලියන 27ක් යොදා කොළඹ ප්‍රදේශයේ දේපළක් මිලදී ගැනීම. මේ සියලු වත්කම් තිබෙන්නේ මේ පාර්ලිමේන්තුවේ සිටින මන්ත්‍රීවරයකුටයි. තමන් සුදනෙක් වාගෙයි කියා හිතාගෙන කථා කරන, අභූත චෝදනා ඉදිරිපත් කරන මන්ත්‍රීවරයෙක් මේ. [බාධා කිරීමක්]

පොඩ්ඩක් ඉන්න, මුදල් අවභාවිතාව සම්බන්ධයෙනුත් එතුමාට චෝදනා තිබෙනවා. 2015 ජනාධිපතිවරණයේ ප්‍රචාරක කටයුතු සඳහා ලක් සතොස ආයතනයේ රුපියල් ලක්ෂ 390ක් වටිනා කැරමී බෝඩ්- [බාධා කිරීමක්] කවුද කියා දැන් දන්නවා නේ. ඒ වාගේම, 2014දී පැවති උෟව පළාත් සභා මැතිවරණයේදී හා 2015දී පැවති ජනාධිපතිවරණයේදී වරාය සේවකයන් 573ක් ඔවුන්ගේ සම්පූර්ණ පඩිය සහ අතිකාල සමඟ මැතිවරණ ක්‍රියාකාරකම් සඳහා යොදා ගනිමින් රජයේ මුදල් අවභාවිත කර තිබෙනවා.

එතුමාට විරුද්ධව තවත් චෝදනාවක් තිබෙනවා. ඒක තමයි බරපතළම චෝදනාව. නොරොච්චෝලේ තාප විදුලි බලාගාරය ඉදි කිරීමේ කොන්ත්‍රාත්තුව භාර චීන සමාගමකින් ඇමෙරිකානු ඩොලර් මිලියන 25.4ක කොමිස් මුදලක් ගැනීම සම්බන්ධයෙන් එතුමාට නඩුවක් තිබෙනවා. මේ ආදී වශයෙන් චෝදනා රාශියක් තිබෙන මන්ත්‍රීවරුත් මේ සභාවේ ඉන්නවා. මේ වාගේ නිවැරැදි විගණන පනතක් ආපු දාට මෙවැනි මන්ත්‍රීවරුන් සම්බන්ධ සියලුම කාරණා ගැන තීන්දු; අකුරටම ක්‍රියා කරන්න හැකියාවක් ලැබෙනවා. ඒ නිසා වීදුරු ගෙවල් ඇතුළේ ඉඳගෙන ගල් ගහන මහින්දානන්ද අලුත්ගමගේ වැනි මන්ත්‍රීවරුන්ට අපි මෙන්න මේ කාරණය කියනවා.

ගරු මන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ආ, එතුමාද?

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
එතුමා තමයි. එතුමාට අපි එළිපිටම පාර්ලිමේන්තුව ඇතුළෙත් කියනවා; එළියෙත් කියනවා. අපි පාර්ලිමේන්තුවේ වරප්‍රසාදවලට යට වෙලා අභූත චෝදනා නඟන්නේ නැහැ. අපි එළියෙදීත් මේවා කථා කරනවා. එවැනි මන්ත්‍රීවරුන්ට අපි කියනවා, මෙවැනි විගණන පනතක් ආවාම මේ ගැන අපට තවත් හරියට විගණනය කරගන්න පුළුවන් බව. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.51]

ගරු චමින්ද විජේසිරි මහතා
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesi
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද ඓතිහාසික දිනයක්. මෙවැනි ඓතිහාසික මොහොතක් නිර්මාණය කර දීලා, ඒ වෙනුවෙන් පවත්වන විවාදයට එක්වීමට අවස්ථාව ලබාදීම පිළිබඳව මා ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම හොරකමට, වංචාවට, දූෂණයට විරුද්ධව හැම දාම පෙනී සිටින, ඒ වෙනුවෙන් සටන් කරන මන්ත්‍රීවරයකු මූලාසනයේ ඉඳිද්දී කථා කරන්න ලැබීම පිළිබඳවත් මම සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පාර්ලිමේන්තුවේදී අපි විවිධ අණපනත් සම්මත කරලා, මේ රටේ අහිංසක ජනතාවට ලැබෙන්න තිබෙන මුදල් මේ රටේ රාජ්‍ය ආයතනවල, දෙපාර්තමේන්තුවල අවශ්‍යතා වෙනුවෙන් යොදවනවා. මේ රටේ පිළිගත් නීතිය අනුව, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිත් එක්ක කටයුතු කරමින් අපි ඒ මුදල් රාජ්‍ය ආයතන වෙනුවෙන් යොදවනකොට, ඒ සියලු දේවල් ඉක්මවා රාජ්‍ය නිලධාරීන් හෝ දේශපාලන නායකයන් තමන්ගේ පෞද්ගලික ප්‍රයෝජනය සඳහා, තමන්ගේ සුඛවිහරණය සඳහා එම මුදල් පාවිච්චි කිරීම වළක්වීම සඳහා කටයුතු කරන්න තමයි මේ විගණන පනත ගෙනෙන්නේ. විශේෂයෙන්ම මෙම ජාතික විගණන පනත තුළින් අලුත් නීති පද්ධතියක් ගොඩ නඟලා, මා කලින් සඳහන් කළ ආකාරයට මේ රටේ ධනය ආරක්ෂා කරන වැඩ පිළිවෙළ නිර්මාණය කරන්න අපි කටයුතු කර තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒක හොඳයි. හැබැයි, මේවාට නතු වන, මේවාට අත් උදව් දෙන, මේ හොරකමට වංචාවට, දූෂණයට එකතු වන ඒ නිලධාරීන්ට, දේශපාලන නායකයන්ට ලබාදෙන දඬුවම් පිළිබඳව නම් මා සතුටු වන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හොරකම, වංචාව, දූෂණය නිවාරණවටම මේ රටින් තුරන් කරන්න නම් මේ විගණන පනතේ තිබෙන දඬුවම් තවත් තද කළ යුතුයි කියා මා විශ්වාස කරනවා. පසුපෙළ මන්ත්‍රීවරයෙක් හැටියට මම මේ ගැන අත් දැකීමෙන් කියන්නම්. අපි ද්වේෂ සහගතව කථා කරනවාය කියා සමහර වෙලාවට හැමෝම හිතනවා ඇති. පසුගිය කාල වකවානුව තුළ අපේ උෟව පළාතේ සිදුවුණු සිදුවීම් පිළිබඳව නිරන්තරයෙන් අපි කථා කරනවා. හැබැයි, ඇමතිවරයා එන්නේ නැහැ. ඇමතිවරයා උත්තර දෙන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා ලද හොඳ අත් දැකීමක් මම කියන්නම්. එක්තරා අවස්ථාවක, අටවැනි පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවට මේ නිලධාරීන් කැඳවනවා. විගණන විමසුමක් එනවා. මොකක්ද එන්නේ? උෟව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ අවශ්‍යතාව අනුව පෙර පාසල් දරුවන්ට පොත් බෑග් ලබා දෙන්න කටයුතු කර තිබෙනවාය කියා මේ විගණන විමසුම තුළ තිබෙනවා. ඒ පොත් බෑග් ලබා දෙන්න පළාත් සභා අරමුදලෙනුත්, මහජන බැංකුව, ලංකා බැංකුව යන රාජ්‍ය බැංකුවලිනුත් තවත් මුදල් ප්‍රමාණයක් ලැබී තිබෙනවා. එම මුදල් ඍෂුවම ප්‍රධාන අමාත්‍යවරයාගේ පෞද්ගලික ගිණුමකට දමා තිබෙනවා. ඒක අද ඔප්පු වෙලා තිබෙනවා. විගණනයෙන් අද ඒක පැහැදිලි කර දීලා තිබෙනවා. විගණනයෙන් විතරක් නොවෙයි, පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ ප්‍රධාන ලේකම්වරයා කියනවා, "මේ ගිණුම ප්‍රධාන ඇමතිවරයාගේ පෞද්ගලික ලේකම්ගේ" කියා. ඒ වෙනුවෙන් දීලා තිබෙන දඬුවම් මොනවාද? ලැබිලා තිබෙන දඬුවම් මොනවාද? ලැබුණු දඬුවමක් නැහැ. නමුත් ඒ පළාතේ උගත්, බුද්ධිමත් විදුහල්පතිතුමියක් දණ ගැස්සුවා. ඒ වෙන කවුරුවත් නොවෙයි, ඒ හොරකම, ඒ වංචාව කළ දේශපාලන නායකයා තමයි විදුහල්පතිතුමිය දණ ගැස්සුවේ. ඒ දේශපාලන නායකයා විතරක් නොවෙයි, ඒකට අත් උදව් දීලා තිබෙන ඒ නිලධාරි කණ්ඩායමත් අද ඒ පළාත තුළ ඒ කාර්යය ඒ විධියටම කරන්න පුළුවන් තත්ත්වයක් නිර්මාණය කර තිබෙනවා. පොඩි දඩයක් ගහලා, පොඩි අධිභාරයකට ලක් කරලා එවැනි කටයුතු නතර කරන්න පුළුවන් කියා මම හිතන්නේ නැහැ. ඒ නිසා මම විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා, මේවාට තව දඬුවම් දෙන්න කියා. හොරකමට, වංචාවට අපි තිත තැබිය යුතුයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ආණ්ඩුවක් හැටියට අපි යම් ප්‍රමාණයක හෝ වැඩ පිළිවෙළක් නිර්මාණය කර තිබෙනවාය කියා මම විශ්වාස කරනවා. ඒක හොඳයි. මේ ජාතික විගණන පනත ගෙනෙන්නේ නැහැය කිව්වා; ඒක ගේන්න ප්‍රමාද කරනවාය කිව්වා; එම පනත ගේන්න අපට භයියක් නැහැය කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම කථා කළ හොරු රැළේ කිසිම කෙනෙක් අද මේ උත්තරීතර සභාව තුළ නැහැ, "මේක හොඳයි, මේ වැඩ පිළිවෙළ සාර්ථකයි" කියන්න.

ඔවුන් දැන් වෙවුලනවා ඇති. ආණ්ඩු පක්ෂයේ හෝ වේවා විපක්ෂයේ හෝ වේවා කිසිම දේශපාලන කණ්ඩායමකට මේ රටේ සිටින අහිංසක ජනතාවත් එක්ක සෙල්ලම් කරන්න බැහැ. මේ

[ගරු චමින්ද විජේසිරි මහතා]

තත්ත්වය මේ රටෙන් තුරන් වෙන්න ඕනෑ. අප නියෝජනය කරන්නේ දුක් විඳින ජනතාවක් ජීවත් වන ප්‍රදේශ. අපි ඒ ජනතාවගේ දුක දන්නවා. එහෙම නම්, මේ ජනතාවට ලැබෙන්න යන දේවල්වලින් සුඛෝපභෝගී ජීවිත ගත කරන කණ්ඩායම් නතර කිරීම සඳහා ගන්නා වූ මේ උත්සාහයට -වෑයමට- එක පැත්තකින් අපි ගරු කරනවා. හැබැයි, මේ තුළත් යම් රිංගීම් තිබෙනවා නම්, මේ හදන පනත් තුළත් යම් අඩු පාඩු තිබෙනවා නම්, ඒවාත් මහ හරවා ගත හැකි වැඩ පිළිවෙළක් අපි යෝජනා කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. සමහර කණ්ඩායම් කියන්න උත්සාහ කරනවා, මේ රටට ගැළපෙන්නේ, එහෙම නැත්නම් අවශ්‍ය කරන්නේ එක්තරා වූ පාලනයක්ය -හිට්ලර් පාලනයක්- කියන කාරණය. පසුගිය දිනක විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු සභා ගර්භය තුළට බැහැලා සෙංකෝලය පැහැරගන්න උත්සාහ කළ ආකාරය මම දැක්කා. අද මේ ගරු සභාව තුළ සිටින අපේ සහකාර මහලේකම්තුමිය ඉදිරිපිට එදා පරුෂ වචනයෙන් කථා කරලා කථානායකවරයාට ඇඟිල්ල දිගු කරමින් හැසිරුණු කණ්ඩායම්වලට අද යම් කිසි බලයක් තිබුණා නම්, ඔවුන් කොහොම හැසිරෙයිද කියන කාරණය උගත් වූ බුද්ධිමත් වූ මේ නිලධාරි මණ්ඩලයට පමණක් නොවෙයි, මේ රටේ සිටින සාමාන්‍ය පුරවැසියන්ටත් කල්පනා කරන්න කියලා මා ඉල්ලීමක් කරනවා. අපි අද මේ වැඩ පිළිවෙළ සාර්ථකව නිර්මාණය කරලා තිබෙනවා. මේවා ටිකෙන් ටික මේ රටේ ජනතාව ඇඳ ගන්න ඕනෑ. මේ රටේ ජනතාව හැම දාම ළිඳට වැටුණු ගෙම්බා වාගේ ළිදේ තිබෙන වපසරිය දැකලා, ඒ ප්‍රමාණය පමණයි ලෝකය කියලා හිතනවා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමාට අපි හැම දාම ගරු කරනවා. විශේෂයෙන්ම මෙම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් අපේ මන්ත්‍රීතුමන්ලා කථා කරපු දේවල් බොහොමයක් තිබෙනවා. පාර්ලිමේන්තුව තුළ කථා කරන බොහෝ දේවල් තුළින් අපට හැඟෙනවා, සමාජය තුළ සිටින සමහර කණ්ඩායම් හිතන්නේ අමුතු විධියට කියලා. අපි ගරු කරන, රටට වග කියන ඇමතිවරයෙකු විධියට එදා සිටි අපේ මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා මේ පනත් කෙටුම්පත සම්මත කරන්න එකඟ වෙයි කියලා අපි විශ්වාස කරනවා. පසුගිය ආණ්ඩු කාලය තුළ දක්නට ලැබුණු, සමහර විට මේ ආණ්ඩු කාලය තුළත් දක්නට ලැබෙන අභිංසක ජනතාවගේ මුදල් හොරා කන වැඩ පිළිවෙළ අපි නැති කරන්න ඕනෑ. එම නිසා ඔබතුමන්ලා මේ පනත් කෙටුම්පතේ අඩු පාඩු පෙන්වන්න, එතකොට ඒවා අපි හදා ගන්නම්. මේ රටේ ජනතාවට කථා කරන මන්ත්‍රීවරයෙකු විධියට ඔබතුමා මේ පනත් කෙටුම්පත හොඳයි කියන්න, මේකට එකඟ වෙලා මේක අනුමත කරන්න. ඒ සඳහා තමුන්නාන්සේගේ අත ඉහළට එසවෙයි කියන බලාපොරොත්තුවෙන්, මා හට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬවනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක් තිබෙනවා.

[අ.භා. 4.58]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා හට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතියි. විශේෂයෙන්ම අද ජාතික විගණන පනත් කෙටුම්පත ඉදිරිපත් කරලා විගණකාධිපතිවරයාට දැනට තිබෙනවාට වඩා ශක්තිමත් බලතල ලබා දීලා අපි කාලයක් තිස්සේ කථා කරපු විධියට මේ රටෙන් දූෂණය, වංචාව තුරන් කරන්න අපි බලාපොරොත්තු වනවා. 2015දී අපි ලබා දුන් පොරොන්දුවක් ඉෂ්ට කිරීම සඳහා අද අපි මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි 2015දී යහ පාලන ආණ්ඩුව ගෙනෙනකොට අපට තිබුණු ලොකු අභියෝගයක්, ඒ වාගේම අපි කථා කරපු දෙයක් තමයි, ජාතික විගණන පනත මඟින් විගණකාධිපතිවරයාට අවශ්‍ය බලතල ලබා දීම. ඒ සඳහා අලුත් පනතක් ගෙනැල්ලා අලුත් අදහස් හා යෝජනා ඉදිරිපත් කරලා මේ රටේ තිබෙන වංචා, දූෂණ අවම කර ගන්නේ කොහොමද කියන ගැටලුව අප ඉදිරිපිට තිබුණා. 2003 වසරේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබුණු කාලයේ තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කරන්න ඕනෑය කියලා පළමු වතාවට යෝජනාව ගෙනාවේ. ඒ අනුව මේ කටයුත්ත 2003දී පටන් ගත් එකක්. නමුත්, ඊට පස්සේ බලයට පැමිණි ආණ්ඩු, එහෙම නැත්නම් 2005 වසරේ සිට 2015 වසර වන තෙක් මේ රටේ බලයේ සිටි මහින්ද රාජපක්ෂ මහත්තයාගේ ආණ්ඩුවට එය කරන්න වුවමනාවක් තිබුණේ නැති බව අපි දැක්කා. ඊ ළඟට, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව ගත්තත්, ඒ ආයතන ස්වාධීන කරලා; ඒ ආයතනවලට අවශ්‍ය බලතල දීලා; ඒ ආයතන ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවක් පසුගිය කාලයේ පැවැති ආණ්ඩුවට තිබුණේ නැහැ. අපි 2015 වසරේ බලයට පැමිණියාට පස්සේ මේ රටේ පැවැති දූෂණය හා වංචාව අවම කර ගන්න අවශ්‍ය යම් යම් දේශපාලන තීන්දු ගන්න අපට පුළුවන් වුණා. ඒ තුළින් අපට මේ රටේ සිදු වූ වංචා හා දූෂණ අවම කර ගන්න පුළුවන් වුණා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමනි, මෙතුමාගේ කතාවෙන් පසුව මම ඔබතුමාට වේලාවක් දෙන්නම්. ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කතාව කරගෙන යන්න.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව ශක්තිමත් කරලා ස්වාධීනව වැඩ කරන්න පුළුවන් ආයතනයක් බවට එය පත් කළා. ඒ වාගේම, අපි ජනාධිපති විමර්ශන කොමිෂන් සභාවක් පත් කළා; FCID එක ආදි ආයතන ඇති කළා. වංචා දූෂණ, මූල්‍යමය අවභාවිත කිරීම්, මූල්‍යමය වංචා කටයුතු පරීක්ෂා කරන්න ඒ ආකාරයට අලුත් ආයතනයක් පිහිටුවන්න අපට පුළුවන් වුණා. පසුගිය කාලයත් එක්ක සසඳා බලනකොට, 2015 වර්ෂයෙන් පසුව රජයක් හැටියට අපට පුළුවන් වෙලා තිබෙනවා මේ රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්න, වංචා දූෂණ අවම කරන්න, යම් යම් දේවල් කරලා, යම් යම් අලුත් නීති රීති ගෙනැල්ලා, අලුත් ආයතන හදලා වංචා දූෂණවලට වැට බඳින්න පුළුවන් ආකාරයේ පරිසරයක් නිර්මාණය කරන්න. පසුගිය දශක කීපය දෙස බැලුවාම අපි හිතනවා ඒ දශක කීපය තුළ අපට කරන්න බැරි වූ දේවල් 2015 වර්ෂයෙන් පසුව -මේ අවුරුදු දෙකහමාර, තුනහමාර වාගේ කෙටි කාලය තුළදී- කරන්න, මේ රට තුළ දේශපාලන වශයෙන් පරිවර්තනයක් ඇති කරන්න අපට හැකියාව ලැබුණා කියා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අප සියලුදෙනා ඒ ගැන සන්තෝෂ වන්න ඕනෑ. අප අවුරුදු 70ක නිදහස සමරනකොට, ඒ

අවුරුදු 70 ඉතිහාසය තුළ කරන්න බැරි වූ දේවල් මේ පාර්ලිමේන්තුව තුළ ප්‍රජාතන්ත්‍රවාදීව කරන්න මේ ඉතා කෙටි කාලය තුළදී -අවුරුදු තුනක් වාගේ කෙටි කාලය තුළදී- අපට පුළුවන් වුණා. විශේෂයෙන්ම කියන්න ඕනෑ, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ගැන. එත්මන් ගරු කථානායකතුමා විපක්ෂයේ සිටි කාලයේ ඒ පනත් කෙටුම්පත ඉදිරිපත් කරනකොට එදා හිටපු ජනාධිපතිතුමා කිව්වේ මොකක්ද කියා අපි දන්නවා. එතුමා කිව්වා, "තොරතුරු දැනගන්න පනතක් ඕනෑ නැහැ. ඕනෑ තොරතුරක් මගෙන් අහන්න. මා කියන්නම්." කියා. ප්‍රජාතන්ත්‍රවාදීව මේ රටේ තොරතුරු දැනගැනීමේ අයිතිය වෙනුවෙන් පනත් කෙටුම්පත් ගෙනෙනකොට එදා පැවැති ආණ්ඩුව සැලකුවේ, ඒ ගැන කතා කළේ එහෙම තමයි. නමුත් අද අපට පුළුවන් වුණා අපේ රජයක් යටතේ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත් කෙටුම්පත ගෙනැල්ලා එය සම්මත කරන්න. අද මේ රටේ ජනතාවට ඒ හරහා තමන්ට ඕනෑ දෙයක් දැන ගන්න පුළුවන්. අපි අද ඒ අයිතිය ලබා දී තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය පැත්තෙන් අපට කරන්න පුළුවන් ඒ වාගේ හුහක් දේවල් අපි කළා. ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරණ රාශියක් මේ අවුරුදු දෙකහමාර, තුන තුළදී කරන්න අපට පුළුවන් වුණා. ඒ වාගේ ජයග්‍රහණවලින් තවත් එකක් ලෙස තමයි අප ජාතික විගණන පනත් කෙටුම්පත ගෙනැවිත් තිබෙන්නේ. ඒ ජයග්‍රහණත් එක්ක තමයි මේ පනත් කෙටුම්පත ඉදිරිපත් වන්නේ. කාලයක් තිස්සේ අපට විශාල චෝදනාවක් තිබුණා, අප මෙය පමා කරනවා කියා; අප මෙය පරක්කු කරනවා කියා. පසු ගිය කාලය තුළ අපි දැක්කා, රජය ඕනෑකමින්ම මෙය ගෙනෙන්නේ නැහැ කියන කාරණය කෙරේ මාධ්‍ය තුළ විශාල අවධානයක් යොමු කරනවා. එය විශාල වශයෙන් මාධ්‍ය තුළ සාකච්ඡාවට බඳුන් වූ කරුණක් වනවා අපි දැක්කා. නමුත් අපි දන්නවා මෙය ප්‍රමාද වීමට බලපෑ යම් යම් කරුණු කාරණා තිබෙන බව. මෙය ප්‍රමාද වෙන්න හේතු මොනවාද? යම් යම් යෝජනා, අලුත් අදහස් මෙයට අවශ්‍ය වුණා. මොකද, රජයක් හැටියට සහ මන්ත්‍රීවරුන් හැටියට අප බලාපොරොත්තු වන දෙයක් තිබෙනවා. අප පනත් කෙටුම්පතක් ගෙනෙනවා නම් ඒ පනත් කෙටුම්පත ප්‍රජාතන්ත්‍රවාදී වෙන්න ඕනෑ, ඒ පනත තුළ ලබා දෙන බලතල ක්‍රියාත්මක කරන්න පුළුවන් වන්න ඕනෑ, නමුත් ඒ හරහා ගිහින් මේ රට තුළ නිලධාරිවාදයක්, මේ රට තුළ නිලධාරීන්ගේ ආධිපත්‍යයක් හදන්න ඉඩ දෙන්න බැහැ කියන කාරණය නිසා පසු ගිය කාලයේ අප අතර යම් යම් අදහස් පළවනවා, ලොකු ගැටුමක් ඇති වනවා මම දැක්කා. එක් පැත්තකින් රජයේ නිලධාරීන් මෙය තවත් ශක්තිමත් කරන්න, මෙහි නීතිමය තත්ත්වය තවත් වැඩි කරගන්න, තමන්ගේ අතට නීතිය ගන්න යම් යම් උත්සාහයන්, යම් යම් යෝජනා ගෙනෙනකොට ඇමතිවරු, මන්ත්‍රීවරු එදා එයට විරුද්ධව යම් යම් අදහස් ඉදිරිපත් කරනවා අපි දැක්කා. මා හිතන්නේ හැම තිස්සේම මෙහි සමතුලිතභාවයක් අනිවාර්යයෙන්ම අවශ්‍ය වනවා කියායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අප ආයතන හැදුවාට ඒ ආයතන නීතිය පැත්තෙන් ක්‍රියාත්මක වන්නේ නැත්නම් වැඩක් නැහැ. නීතිය ක්‍රියාත්මක කරන්න බැරි ආයතන හැදුවාට, ඒ සඳහා අණ පනත් පාර්ලිමේන්තුව තුළ සම්මත කළාට වැඩක් නැහැ. ඒ ආයතනවල වැඩ කරන නිලධාරීන්ට නීතිය ක්‍රියාත්මක කිරීමේදී යම්කිසි නෛතික බලයක් ලැබෙන්නේ නැත්නම් ඒ ආයතනත් ඔවුන්ට ප්‍රයෝජනවත් වන්නේ නැහැ.

පාර්ලිමේන්තුව තුළ තිබෙන රාජ්‍ය ගිණුම් කාරක සභාව ගැන අපි දන්නවා. රාජ්‍ය ගිණුම් කාරක සභාව තුළින් හැම රාජ්‍ය ආයතනයක්ම විමර්ශනයට ලක් කරනවා. රජයේ ආයතනවල ඉන්න නිලධාරීන් ඒ රාජ්‍ය ගිණුම් කාරක සභාව හමුවට ගෙනැල්ලා ප්‍රශ්න කරනවා. අවසානයේ රාජ්‍ය ගිණුම් කාරක සභාවට කරන්න දෙයක් නැහැ. ඒ නිසා අපට ඒක හදුන්වන්න පුළුවන්, "දත් නැති කටක් වාගේ" කියලා. හැපුවාට හැපෙන්නේ නැහැ. මොකද, ඒකෙන් ඊට එහා නීතිමය ක්‍රියා මාර්ගවලට යන්න බැහැ; නිර්දේශ දෙන්න පුළුවන්. නමුත් ඒ නිර්දේශවලට එහා නෛතික පැත්තෙන් ඉස්සරහට යන්න පුළුවන් යම් නීතිමය තත්ත්වයක් තිබෙන කාරක සභාවක් හැටියට ආයතනයක් හැටියට ඒක ඉස්සරහට යන්නේ නැහැ. යම් තැනක හිරවීමක් තමයි අපට ඒ තුළ දකින්න ලැබෙන්නේ. මේ වාගේ ආයතන තිබුණාට, පසුගිය කාලයේ නිලධාරීන් හා දේශපාලනඥයන් අතර සාකච්ඡා, යම් වාද විවාද ඇති වුණේ මේ තත්ත්වය මත තමයි කියලා අපට නිතාගන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ඒ තිබුණු තත්ත්වයට එහා යන තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. ළඟදි දවසක විගණකාධිපතිතුමාගේ ප්‍රකාශයක් අපි දැක්කා. හම්බන්තොට වරාය පිළිබඳව මාධ්‍යවේදීන් එතුමාගෙන් ප්‍රශ්න කළාම එතුමා කිව්වා, "හම්බන්තොට වරාය ව්‍යාපෘතිය විගණනය කරන්න එතුමාට බලයක් නැහැ, නමුත් පාර්ලිමේන්තුව එතුමාට බලය පවරනවා නම් ඒක කරන්න කැමැතියි" කියලා. අපට දැන ගන්න ලැබී තිබෙනවා, දැනට විගණකාධිපතිවරයාට විගණනය කරන්න බැරි ව්‍යාපෘති රාශියක් මේ රට තුළ ක්‍රියාත්මක වන බව. අපේ ආණ්ඩුව තුළ වෙන්න පුළුවන්, පසුගිය ආණ්ඩුව ගෙනා ඒවා වෙන්න පුළුවන්, එවැනි ව්‍යාපෘති රාශියක් අද වන විටත් ක්‍රියාත්මක වෙනවා. විශේෂයෙන්ම අපි විදේශීය ණය මත ව්‍යාපෘති පටන් ගන්නකොට "මේක රජයේ විගණකාධිපතිවරයා යටතේ විගණනය කළ යුතුය" කියන කොන්දේසිය අපි ඒ ගිවිසුම්වලට ඇතුළත් කරන්නේ නැහැ. එසේ ඇතුළත් නොකිරීම තුළම අද රජයේ විගණනයට ඒවා යටත් වන්නේ නැහැ. එහෙම නම් එවැනි ව්‍යාපෘති ආරම්භ කරන කොට මේ පටන් ගන්නා වූ ව්‍යාපෘතිත් අනිවාර්යයෙන්ම රජයේ විගණකාධිපතිවරයාගේ විගණනයට යටත් කළ යුතුය කියලා යම් ප්‍රතිපත්තිමය තීන්දුවක් රජයක් හැටියට අපි ගත යුතුයි. මොකද, අද අපට තේරිලා තිබෙනවා, විදේශීය ණය මත පටන් ගන්නා ව්‍යාපෘති පිළිබඳව. හොඳම උදාහරණයක් තමයි හම්බන්තොට වරාය ව්‍යාපෘතිය. අපි ඒකට විශාල ධනස්කන්ධයක් යොදා තිබෙනවා. ඒවා විගණනය නොවීම මත අද නොයෙකුත් දේවල් එළියට එන්න පටන් ගෙන තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි රජයක් හැටියට ණය අරගෙන පටන් ගන්නා ව්‍යාපෘති වෙන්න පුළුවන්, එහෙම නැත්නම් සමාගම් පනත යටතේ ලියාපදිංචිවෙලා පටන් ගන්නා පෞද්ගලික ව්‍යාපාර වෙන්න පුළුවන්, ආයතන වෙන්න පුළුවන්, ඒ ආයතන පවා අනිවාර්යයෙන්ම විගණකාධිපතිතුමාගේ අධීක්ෂණය යටතේ විගණනයට යටත් කළ යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මම ඔබතුමාට මෙසේ කියන්න කැමැතියි. අද එතිහාසික දිනයක්. අපි යහ පාලන ආණ්ඩුව හැටියට පසුගිය අවුරුදු තුන තුළ යම් යම් ප්‍රතිසංස්කරණ ගෙනැල්ලා මේ රට තුළ ප්‍රජාතන්ත්‍රවාදය ස්ථාපිත කරන්න පුළුවන් වුණා. අද සිට අපි අලුත් අවධියකට නැවත පියමං කරනවා. මේ පනත් කෙටුම්පත තුළ යම් අඩුපාඩු තියෙන්න පුළුවන්. මෙම පනත් කෙටුම්පතේ අඩුපාඩු තිබෙනවා නම් ඒවා සකස් කරලා, ඉදිරියේදී එය තවත් ශක්තිමත් කරලා, ජනතාවගේ මුදල්, ජනතාවගේ ධනය, ජනතාවගේ සම්පත් ආරක්ෂා කිරීම වෙනුවෙන් අවශ්‍ය තීන්දු තීරණ ගත යුතුය කියමින් මට කාලය ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

[අ.භා. 5.09]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික විගණන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ මම කථා කරන්න බලාපොරොත්තුව හිටියේ නැහැ. නමුත් ආශු බෝධි

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

මාරසිංහ - ආශු මෝඩ මාරසිංහද, මෝදු මාරසිංහද දන්නේ නැහැ,- මන්ත්‍රීතුමා මගේ දේපොළ ලැයිස්තුවක් පිළිබඳව ඊයේ ප්‍රකාශ කර තිබුණා. ඒ නිසා මම ඒ පිළිබඳව අදහස් ප්‍රකාශ කළේ නැත්නම් හොඳ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊට කලින් මම මේක කියන්න ඕනෑ. පසුගිය කාලය පුරා වෘත්තීය සමිති විසින් විශාල කැප කිරීමක් කරලා දැඩි උත්සාහයක යෙදිලා කළ සටනක ප්‍රතිඵලයක් තමයි මේ ජාතික විගණන පනත් කෙටුම්පත. මොනවා වුණත් මේ වැඩ පිළිවෙළ පිළිබඳව රජයට ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

විගණකාධිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් වෙන්න ඕනෑ. විගණකාධිපති දෙපාර්තමේන්තුව ශක්තිමත් නොවීම නිසා තමයි මේ රටේ දූෂණ කටයුතු බොහොමයක් සිද්ධ වන්නේ. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ වෘත්තීය සමිති බලාපොරොත්තු වුණු දේ ඉෂ්ට නොවුණත්, මේ තාක්දුරට හෝ මෙය අරගෙන ඒම පිළිබඳව අපි රජයට ස්තුතිවන්ත වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට කලින් ආශු මාරසිංහ මන්ත්‍රීතුමා, මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාගේ දේපොළ ලැයිස්තුවක් කියාගෙන ගියා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හැටියට අපි වත්කම් බැරකම් ප්‍රකාශයක් ලබා දෙන බව මම මුලින්ම කියන්නට ඕනෑ. 2002 ඉඳලා නියෝජ්‍ය ඇමතිවරයෙක්, ඇමතිවරයෙක් හැටියට මගේ වත්කම් බැරකම් ප්‍රකාශ මම මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. මේ වත්කම් බැරකම් ප්‍රකාශ සියල්ලේම මට අයිති දේපොළ සියල්ල පිළිබඳව මම සඳහන් කර තිබෙනවා. ඒ වාගේම මම 2000 අවුරුද්දේ ඉඳලා ආදායම් බදු ගෙවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ පාර්ලිමේන්තු වැටුපට වැඩි මුදලක් ආදායම් බදු විධියට අවුරුද්දකට ගෙවනවා. මම මේ ආණ්ඩුවට ආදායම් බදු ගෙවනවා. මම ව්‍යාපාරිකයෙක්. මම ඉඩම් හිමි දේපොළ හිමි අයෙක්. මම කැමැති නැහැ, පාර්ලිමේන්තුවේදී මගේ දේපොළ ගැන කියන්න. නමුත්, මේ ගැන කිව්ව නිසායි මම මේ දේවල් කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වත්කම් බැරකම් ප්‍රකාශවල සඳහන් කර තිබෙන සියල්ල උපයාගත් ආකාරය පිළිබඳ ආදායම් බදු දෙපාර්තමේන්තුවට විස්තර ලබා දී තිබෙනවා. ඒ අනුව ආදායම් බදු ගෙවලා තිබෙනවා. ඒක හංගන්න දෙයක් නොවෙයි.

පසුගිය සතියේ අනුර දිසානායක ජනතා විමුක්ති පෙරමුණේ නායකතුමාත් මට කිව්වා, "ඔබතුමාගේ වත්කම් බැරකම් ප්‍රකාශය මම ළඟ තිබෙනවා. ඒකේ ඔබතුමාගේ සියලු වත්කම් ටික මම කියෙව්වා" කියලා. ඒක ප්‍රසිද්ධ දෙයක්. ඒ නිසා එතුමා සඳහන් කළ කරුණු දෙක, තුනක් හැර අනෙක් සියල්ල මා සතුව තිබෙන වත්කම්. ඒ පිළිබඳව කිසිම ප්‍රශ්නයක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මගේ දෙමව්පියන්ට තිබුණු දේපොළ ගැන මම කියන්නම්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා, මගේ අම්මාගේ තාත්තා "කොත්මලේ මානිස් මුදලාලි" ගැන. ඔබතුමා දන්නවා, මානිස් මුදලාලිට තිබුණු දේපොළ මොනවාද කියලා. ඔබතුමා දන්නවා, මානිස් මුදලාලි තමයි ඒ කාලයේ ලක්ෂෙට කොඩි දැම්මේ කියලා. එතුමාට කොත්මලේ විතරක් අක්කර 150ක් තිබෙනවා. මගේ අම්මාගේ තාත්තාට අක්කර 150ක් ඉඩම් තිබෙනවා. රත්නපුරේ අක්කර 100ක් තිබුණා. ඒ අනුව මගේ සීයාට විතරක් ඉඩම් අක්කර 250ක් තිබෙනවා.

මගේ පියා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් වෙන්න කලින් තේ කර්මාන්තශාලා දෙකක් එතුමාට තිබුණා. එතුමාට තේ තිබුණා; පොල් තිබුණා; කුඹුරු තිබුණා; අක්කර සිය ගණන් තිබුණා. 2015 වර්ෂයේදී අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේදී මේ සියල්ලේ ඔප්පු මම පෙන්නුවා. අක්කර තුන්සිය ගණනක දේපොළ අපේ පවුලේ මගේ පියාට, මවට තිබුණාය කියන කාරණය මම පෙන්නුවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවුරුදු 20න් මම රැකියාවට ආවේ. දැන් මගේ වයස අවුරුදු 52යි. ව්‍යාපාරිකයෙක් හැටියට අවුරුදු 32ක් මම ඉපැයූ දේපොළ තිබෙනවා. ඒ දේපොළ සියල්ල ගැන ආදායම් බදු දෙපාර්තමේන්තුවට මම දැනුම් දී තිබෙනවා. මම එක දෙයක්වත් හොරෙන් හම්බ කරලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ මේ සියලු දේපොළ පිළිබඳ අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට, FCID එකට, CID එකට දැනුම් දුන් පසුව එහි සියලුදෙනා ඒවා පරීක්ෂා කළා. එහෙම පරීක්ෂා කරලා අන්තිමට මට රුපියල් ලක්ෂ 14කට නඩුවක් දැම්මා. මහාධිකරණයේ මොකක් සම්බන්ධයෙන්ද නඩුව තිබෙන්නේ? රුපියල් ලක්ෂ 14යි! මහින්දානන්ද අලුත්ගමගේ අයථා විධියට හම්බ කළා නම්, මහින්දානන්ද අලුත්ගමගේ හොරකම් කළා නම්, මහින්දානන්ද අලුත්ගමගේට අයත් දේවල් නම්, ඇයි මාව හිරේ දමන්නේ නැත්තේ? දැන් මේ ආණ්ඩුව විශේෂ අධිකරණයක් පිහිටුවලා මාව හිරේ දමන්න යන්නේ මොකටද? කැරම් බෝඩ් නඩුවට. ඇයි, මගේ වත්කම්, දේපොළවලට හිරේ දමන්නේ නැත්තේ?

නොරොච්චෝලේ කොමිස් මුදල් කියලා මොකක්ද එකක් කියනවා මම අහගෙන හිටියා. අන්තිම මොහොතේ මට අහගන්න බැරිවුණා මොකක්ද කියලා. මේ ආණ්ඩුව මේවා හොයන්නේ නැත්තේ ඇයි කියලායි මම අහන්නේ. මේ ආණ්ඩුව නපුංසක ආණ්ඩුවක්ද?

ඒ නිසා ආශු මාරසිංහ මහත්තයාට මම මේ කාරණය කියනවා. ඊයේ මේ සභාවේ මම කථා කරන වෙලාවේ මම එතුමාගේ නම සඳහන් කළේත් නැතිව මගේ කථාවට එතුමා බාධා කළාම අපි දෙන්නා අතර පොඩි argument එකක් ගියා. ඒ වෙලාවේ එතුමා කිව්වා, "මම ගහනවා" කියලා. එතුමා ගැහුවා. හැබැයි, මහත්තයෝ මතක තියා ගන්න! මිනුවන්ගොඩ ඉන්න ඔබතුමාගේ අභිංසක අම්මාට අද කන්න නැහැ. තමන්ගේ මවට කන්න නැහැ; තමන්ගේ අම්මාට කන්න නැහැ. තාත්තාට කන්න දෙන්නේ නැහැ. ඒ විතරක් නොවෙයි, ජපානයේ වාහන එකලස් කරලා, ගලවලා විකුණලා, ජපානයේ නඩුවක් තිබෙනවා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කරුණක් පැහැදිලි කරන්න මට අවසර දෙන්න.

මෙය වරප්‍රසාද ප්‍රශ්නයක්. මගේ දයාබර මැණියන් මේ වෙලාවේ බොහොම ගෞරවයෙන් මම සිහිපත් කරනවා. මේ අවුරුද්දේ ජනවාරි මාසයේ මගේ මැණියන් නැසී ගියා. එවැනි මැණි කෙනෙක් වෙනුවෙන් මෙතුමා මෙවැනි ප්‍රචාරයන් කරන එක ගැන මම කනගාටු වනවා. මගේ මැණියන්ට මම ඉතා හොඳින් සැලකුවා. ඒක හැමෝම දන්නවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒක වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමනි.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ මැණියෝ දැන් නැහැ. මෙන්න මේ බොරුව තමයි මේ ගොල්ලෝ හැමදාම කරන්නේ. ජනතාව දැනගන්න ඕනෑ මේ අසත්‍ය. මට ජපානයේ නඩු තිබෙනවා නම් කියන්න. [බාධා කිරීමක්]

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමාට කථාවක් දෙන්න බැහැ නේ.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මට ජපානයේ නඩු තිබෙනවා නම් මම ඉදිරිපත් වෙන්න ලැහැස්තියි. මේ කියන්නේ පට්ටපල් අසත්‍යය.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමාගේ මව මිය ගියා. ඒ බව මා දන්නවා. හැබැයි, ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමාගෙන් අහන්න, ලිපිනයත් දෙන්නම්. මම වැරදි නම්, ඔබතුමා සැලකුවා නම්, ඒවායේ ප්‍රතිඵල ඔබතුමාට ලැබෙයි. හැබැයි ජපානයේ වාහන කෑලිවලට කඩලා විකුණලා, මෙහාට එව්වා කියලා නඩු තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, මේක මඩ ගහන විවාදයකට පත්කර ගන්න එපා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
හරි, ඉවරයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අද ඉතා වැදගත් දිනයක්. ඒ නිසා විෂයයට අදාළව කථා කරන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒ වැදගත් දිනය විනාශ කළේ කවුද? [බාධා කිරීමක්] මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. විමල් වීරවංශ හිටපු ඇමතිතුමාගේ අමාත්‍යාංශය යටතේ රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ හිටපු සභාපතිවරයා කවුද? සමාවෙන්න, ඒ ආයතනයේ හිටපු සභාපතිවරයා සෑම කොන්ත්‍රාත්කාරයෙකුගෙන්ම සියයට තුන ගණනේ කොමිස් ගත්තා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
පුළුවන් නම් ඔය කියන ඒවා එළියේදී කියන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මාධ්‍ය හමුවක් තියලා, දිවුරුම් ප්‍රකාශත් එක්ක ඒවා ගැන අපි කියන්නම්. [බාධා කිරීමක්] නිකම් අනුන්ට මඩ ගහන්න එපා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, අද දින විවාද වන විෂයයට අදාළව කථා කරන්න. වැදගත් විවාදයක් අද දින පවත්වන්නේ.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දැන් ජපානයෙන් කොම්පැනි වගයක් ගෙන්වලා බිස්නස් කරන්න හදනවා. ජපන්නු ගෙන්වලා, දැන් ඒ කොම්පැනිවලට වෙනම frequencies දෙන්න හදනවා. දැන් ඒවා ගෙනෙන්න කථා කරන්න හදනවා. දැන් ඒ බිස්නස් සියල්ල කරගෙන යනවා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ කියන ඒවා නිවැරදි කරන්න අවස්ථාව ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
අපි හෙට අනිද්දා වන විට-

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
නැහැ. මේ කියන චෝදනා සියල්ල වැරදියි. මට ඒ බව ඔප්පු කරන්න පුළුවන්, මෙතුමා මේවා පාර්ලිමේන්තුවෙන් පිටතදී කියනවා නම්. [බාධා කිරීමක්] එළියේදී කියන්න. මේ අභියෝගය එළියේදී කරන්න, වරප්‍රසාදවලට යට වෙලා, හැංගිලා කියන්නේ නැතුව. මට නඩු තිබෙනවා නම්, මම සියයට තුනක් කොමිස් ගත්තා නම්, ඒවා ගැන එළියේදී කියන්න. මම ඔප්පු කරන්න ලැහැස්තියි. මේ සභාව ඇතුළේදී කියන්නේ නැතුව එළියේදී කියන්න. මම ඒ දේවල් සියල්ල එළියේදී කියන්න ලැහැස්තියි.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඇයි, ඔච්චර කලබල වෙන්නේ? මම කලබල වුණේ නැහැ නේ. [බාධා කිරීමක්] මේ පිළිබඳව මාධ්‍ය හමුවක් තියලා, සියයට තුනක් කොමිස් ගත්ත කොන්ත්‍රාත්කරුවන්ගේ දිවුරුම් ප්‍රකාශත් එක්ක මාධ්‍ය හමුවේදී අපි ඔබතුමාට ඉදිරිපත් කරන්නම්.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
එළියට එන්න. එළියට එන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
කරුණාකරලා බොරුවට මඩ ගහන්න හදන්න එපා. [බාධා කිරීමක්] කරපු වැරදි ගැන තමුන්නාන්සේ ඕනෑ දෙයක් කියන්න. තමුන්නාන්සේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා දැන් මේ වනකොට ජපන් කොම්පැනි කීයක් ගෙන්වලා ඇමතිවරු එක්ක සාකච්ඡා කළාද? තමුන්නාන්සේ කොන්ත්‍රාත් කීයක් ගෙනාවාද? ඒ නිසා අනුන්ට මඩ ගහන්න එපා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ හිටපු ඇමතිතුමනි, කරුණාකරලා විෂයයට අදාළව කථා කරන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
සමාවෙන්න. මම කනගාටු වෙනවා, මේ වෙලාවේ මේ පිළිබඳව කථා කරන්නට වීම පිළිබඳව. ගරු මන්ත්‍රීතුමනි, හැබැයි ඔබතුමන්ලා අවුරුදු හතරක් තිස්සේ මහින්දානන්ද අලුත්ගමගේගේ සියලු දේපළ පිළිබඳව ආයතන තුනකින් පරීක්ෂා කළා. ඒක හොඳට මතක තියා ගන්න. ආයතන තුනකින් පරීක්ෂා කළා. අන්තිමට නඩු දමන්න පුළුවන් වුණේ, රුපියල් ලක්ෂ දහහතරකටයි. තමුන්නාන්සේලා අධිකරණ හදනවා. හැබැයි හොඳට මතක තියා ගන්න, ඒ අධිකරණ හැදෙන්නේත් තමුන්නාන්සේලාටම බව. ඒක හොඳට මතක තියා ගන්න. ලබන අවුරුද්දෙන් පස්සේ මේ අධිකරණ හැදෙන්නේ තමුන්නාන්සේලාටමයි. [බාධා කිරීමක්] ඒ නිසා නිකම් බොරුවට මිනිසුන්ට පෞද්ගලිකව මඩ ගහන්න එපා. [බාධා කිරීමක්] පෞද්ගලිකව මඩ ගහන්න එපා. අයථා ලෙස හම්බ කරපු ඕනෑ දෙයක් ගැන ඔබතුමා කියන්න. හැබැයි ටයි එකක් දමාගෙන ගෞරවනීය විධියට ඉන්නවා වාගේම ඔක්කෝටම කලින් තමන්ගේ අම්මාට, තාත්තාට සලකන්න. මැරුණු අම්මාට අපහාස කරන්න එපා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ඒ කියපු ඒවාට උත්තර දෙන්න අවස්ථාවක් දෙන්න.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
එහෙම නම් මටත් අවස්ථාවක් දෙන්න. ආයෙත් මටත් අවස්ථාව දෙන්න ඕනෑ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමා.

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මඩ ප්‍රචාර එල්ල කරනකොට, අභූත චෝදනා එල්ල කරනකොට මේ ගොල්ලන්ට කියන්න තිබෙන්නේ, පුළුවන් නම් එළියට ඇවිල්ලා මේ දේවල් කියන්න කියලායි. මම එළියේදී උත්තර දෙන්න ලැහැස්තියි. එළියට එන්න. පාර්ලිමේන්තු වරප්‍රසාදවලට යට වෙලා බොරු කියන්න එපා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි.

ඊළඟට, ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මැතිතුමා. ඔබතුමාට මිනිත්තු අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.18]

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ සම්මත කෙරෙන අණ පනත්වලින් ඉතාම සුවිශේෂී, වැදගත්, මුළු රටම ඉල්ලපු මෙබඳු පනත් කෙටුම්පතක් පිළිබඳ විවාද වන අද දවසේ ඔබතුමා වැනි දක්ෂ, තරුණ මන්ත්‍රීවරයෙක් මූලාසනයේ සිටින අවස්ථාවේ අදහස් දක්වන්න ලැබීම ගැන මා අතිශයින්ම සතුටු වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජාතික විඥාන පනතක අවශ්‍යතාව ගැන බොහෝ කාලයක සිට මේ රටේ කථා බහට ලක් වුණු බව අපට මතකයි. පසුගිය කාලයේ මේ රටේ හුඟක් මාධ්‍ය ප්‍රශ්න කළා, විවිධ සිවිල් සංවිධාන ප්‍රශ්න කළා, බොහෝ දෙනෙකුගේ විමසුමට ලක් වුණා, ජාතික විඥාන පනත ප්‍රමාද වෙන්නේ ඇයි කියලා. ජාතික විඥාන පනත පාර්ලිමේන්තුවට ගෙනැත් සම්මත කරන බවට අපේ වත්මන් රජය පසුගිය මහ මැතිවරණයේදී ජනතාවට පොරොන්දුවක් දුන්නා. ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. 2001 වසරේදී එක්සත් ජාතික පක්ෂය බලයට පත් වුණාම ජාතික විඥාන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන්න අපි සූදානම් වුණා. ඊට පසුව විවිධ අංශවලින්, විවිධ අවස්ථාවලදී කවර ඉල්ලීම් ආවත් විඥාන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනෙන්න පසුගිය පාලකයන්ට පුළුවන්කමක් තිබුණේ නැහැ; එහෙම හැකියාවක් තිබුණේ නැහැ. ඒ නිසා ප්‍රථම වරට පාර්ලිමේන්තුවට තේරී පත් වුණු මන්ත්‍රීවරු හැටියට අද අපි අතිශය සතුටට පත් වෙනවා, ජාතික වැදගත්කමකින් යුත් මෙවැනි පනත් කෙටුම්පතකට අපේ සහයෝගය ලබා දෙන්න හැකි වීම ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද සමහර මන්ත්‍රීවරු මේ ගරු සභාව කොයි තරම් පහත් තැනකට ඇද දමන්න ක්‍රියා කරනවාද කියලා බලන්න. උත්තරීතර පාර්ලිමේන්තුවේ වටිනා කාලය ප්‍රයෝජනයට අරගෙන කරන කථා ඒ උත්තරීතරත්වයට ගැළපෙනවාද කියන ප්‍රශ්නය මට තිබෙනවා. ඒකට හොඳම නිදසුන තමයි මීට කලින් කථා කරපු අපේ මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමාගේ කථාව. එතුමා වාගේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක්, මේ පාර්ලිමේන්තුව දීර්ඝ කාලයක් නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක් තමන්ට යම් කිසි චෝදනාවක් එල්ල වන විට එය වසා ගැනීමට, එයින් ගැලවීමට එක් එක් මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලිකත්වයට ඇඟිල්ල දිගු කිරීම ගැන මම කනගාටු වෙනවා. දෙමවුපියන්ට සැලකීම, වැඩිහිටියන්ට ගරු කිරීම, හාමුදුරුවරුන්ට ගරු කිරීම ඒ ඒ මන්ත්‍රීවරයාගේ වර්යාධර්ම අනුව එතුමාට අයිති දෙයක්.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා.

ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මගේ නම සඳහන් කරපු නිසායි මම පැහැදිලි කිරීමක් කරන්නේ. ගරු මන්ත්‍රීතුමනි, මට පෞද්ගලිකව මඩ ගහන්න අවශ්‍යතාවක් නැහැ. නමුත් එතුමා මට නැති දේපළ සම්බන්ධ ලේඛනයක් මේ සභාවට ඉදිරිපත් කළා. මට එය නිවැරදි කිරීමේ අයිතිය තිබෙන අතර, එහෙම කියපු මන්ත්‍රීතුමා පිළිබඳව -මම කවදාවත් එහෙම කියලා නැහැ. ඒක වැරදියි කියලා මම පිළිගන්නවා. නමුත් මට බොරු හදලා කියපු නිසා- මට මේ පාර්ලිමේන්තුවේ ඇත්ත කියන්න සිද්ධ වුණා.

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)

තමන්ට යම් කිසි චෝදනාවක් එල්ල වූ විට ඒ චෝදනාවට පිළිතුරු දෙනවා විනා, එහි සත්‍ය අසත්‍යතාව ප්‍රකාශ කරනවා විනා මඩ ගැසීම නොකළ යුතුයි. මඩ කුට්ටිය අනනකොට තමන්ගේ අතේ තමයි මුලින්ම මඩ ගෑවෙන්නේ කියන එක අපි කවුරුත් මතක තියා ගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දීර්ඝ කාලයක් පළාත් සභාව නියෝජනය කර මේ පාර්ලිමේන්තුවට ආපු කෙනෙක්. පාර්ලිමේන්තුවේ තරම් ශක්තිමත්, ප්‍රබල විගණන වැඩ පිළිවෙළක් අදටත් පළාත් සභාවේ නැහැ. අපේ පළාත් සභාවල දැනටත් ගිණුම් කාරක සභාවක් තිබෙනවා. මේ ගිණුම් කාරක සභාවලට විගණන විමසුම් එන්නේ, විගණන විමසුම් පිළිබඳ ගිණුම් කාරක සභාවේ අවධානය යොමු වෙන්නේ අවුරුදු 10ක්, 15ක් නැත්නම් ඊටත් වඩා වැඩි කාලයක් ගත වුණාට පසුවයි. සමහර කාරණා පිළිබඳ සාකච්ඡා කරනකොට එම සිද්ධියට අදාළ දේශපාලනඥයනුත් නැහැ; නිලධාරිනුත් නැහැ; බොහෝ දෙනෙක් මිය ගිහින්; එහෙම නැත්නම් සේවයෙන් විශ්‍රාම ගිහින්. පසුගිය කාලයේ අපේ සමහර රාජ්‍ය ආයතනවලට එවැනි තත්ත්වයකට මුහුණ දීමට සිද්ධ වුණා. ඒ නිසා "විගණනය" කියන එක, මේ රටේ මහජනතාවගේ මුදල්, පොදු දේපළ ආරක්ෂා කර ගැනීමට ශක්තියක් වීම අනිවාර්ය දෙයක් හැටියට අපි සලකනවා. තොරතුරු දැන ගැනීමේ පනත සම්මත කර ගැනීමට හැකි වුණා වාගේම, මේ රජයට කෙටි කාලයක් ඇතුළත මේ වටිනා පනත් කෙටුම්පත සම්මත කර ගැනීමට අවකාශය ලැබීම ගැන මම සතුටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ මේ ප්‍රකාශයත් එක්ක මේ රටේ වැදගත්, තමන්ගේ තනතුරේ වගකීම හරි හැටි දන්න, රටට ආදරය කරන දේශපාලනඥයන්, නිලධාරීන් කිසිසේත්ම අමනාප විය යුතු නැහැ. මේ රටේ යම් කිසි විධියක මූල්‍ය විනය පිරිහීමක් දකින්න ලැබුණා නම්, මහජනයාගේ පොදු දේපළ අවභාවිතයට ලක් වුණා නම්, පසුගිය කාලයේ රජයේ මුදල් විනාශ වුණා නම් ඒකට වග කිව යුත්තේ දේශපාලනඥයන් පමණක්ද කියන ප්‍රශ්නය අපට අහන්න සිදු වෙනවා.

අපි රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේ වාඩි වී සිටින විට හුනක් කාරණාවලට ඇතැම් නිලධාරීන් වග කිව යුතුයි කියා පැහැදිලිව පෙනෙනවා. හැමදෙනාම නොවෙයි. ඉතාම හොඳින් වැඩ කරන, පිරිසිදු, වග කිව යුතු නිලධාරීන් සිටින අතරේ ඇතැම් වෙලාවට නිලධාරීන්ගේ පැත්තෙන් සිදු වුණු යම් යම් අඩු පාඩුකම් අපට දකින්න ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් අපේ රටේ පාඩු ලබන රාජ්‍ය ආයතන තිබෙනවා. මේ රාජ්‍ය ආයතන දිගින් දිගටම පාඩු ලබනවා. කවර රජයක් බලයට පත් වුණත් මේ රාජ්‍ය ආයතන ලාභ ලබන තැනකට ගෙන ඒම ඉතාම අපහසු දෙයක්. හැබැයි, මේවායේ ගැඹුරට ගිහින් සොයා බැලුවොත්, මේවාට නායකත්වය දුන් දේශපාලන අධිකාරිය වාගේම ඊටත් වඩා එහාට ගිහින් ක්‍රියා කරපු සමහර නිලධාරීන් වග කිව යුතුයි කියලා අපට පැහැදිලිව පෙනෙන්න තිබෙනවා. හැබැයි, ඒ නිලධාරීන්ට ඒවා පිළිබඳ චෝදනා එල්ල වෙලා, නඩු පැවරිලා, අධිභාරයකට යටත් වුණා නම් ඉතිහාසයේ සිදුවීම් එක්ක සාපේක්ෂව බැලුවොත් ඉතාම අතලොස්සක් විතරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න ප්‍රමාද වුණේ, මෙය ගෙන ඒමේදී යම්කිසි පසු බෑමකට අපට මුහුණ දෙන්න වුණේ, මේ සම්බන්ධයෙන් යම් යම් විරෝධතා එල්ල වුණ නිසාය කියන එක මට මේ අවස්ථාවේ කියන්න සිද්ධ වනවා. මාධ්‍ය සාකච්ඡාවලට ගියාම අවස්ථා ගණනාවකදී බරපතළ විධියට අපට ඇහිල්ල දික් කළා, "ජාතික විගණන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙනාවේ නැත්තේ ඇයි, ගෙන එන්න ඇයි ප්‍රමාද?" කියලා. මේ පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ගෙන එන්න මේ තාක් කල් ප්‍රමාද වුණේ, දේශපාලන අධිකාරියේ තිබුණ ප්‍රශ්නයකට වඩා ඇතැම් නිලධාරීන් මේ සම්බන්ධයෙන් දක්වපු මැළිකම නිසායි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය යුගවල ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයාගේ ඉඳලා මේ රටේ ඉහළම දේශපාලන නායකත්වය දරපු සමහර අයට මේ වනකොට බරපතළ චෝදනා එල්ල වෙමින් පවතිනවා. සිල්ලර කථා කියලා ඒ චෝදනාවලින් ගැලවෙන්න පුළුවන් කමක් නැහැ; සරල කථා කියලා ගැලවෙන්න පුළුවන්කමක් නැහැ. සමහර දේශපාලනඥයන් කුට්ටි පිටින් කොමිස් ගත්ත විධිය අද එළියට එනවා. ඒ තොරතුරු එළියට ආවාම කවුරු හෝ කියපු තවත් කථාවක් පාවිච්චි කරලා, මයින හමට තඩිබානවා වාගේ ඒ කථාව ඉස්සරහට දානවා. අද විජයකලා මහේස්වරන් රාජ්‍ය ඇමතිතුමියගේ ඒ ප්‍රකාශය මයින හමක් කරගෙන, ඒ ප්‍රකාශය ප්‍රයෝජනයට ගනිමින් අද තමන්ට එල්ල වෙච්ච චෝදනාවලින් සැහවෙන්න, ඒවා යටපත් කරන්න හදනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ මහ ජනයාගේ විනාශ වෙච්ච ධනය සියයට 60ක් ඉතුරු කර ගන්න අපට පුළුවන්කම ලැබුණා නම්, අපේ ගමේ වචනයෙන් සරලව කිව්වොත් ඒ ගසා කාපු සල්ලි සියයට 60ක් ඉතුරු කර ගන්න අපට පුළුවන්කම ලැබුණා නම්, මේ රටට ණය ගන්න වුවමනා නැහැ. එහෙම නම් මේ තරම් අපහසු තැනකට, අමාරු තැනකට මේ රට වැටෙන්නේ නැහැ; අපේ ජාතිය වැටෙන්නේ නැහැ.

පසුගිය කාලයේ මහා පරිමාණයේ සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කරන බව පෙන්ව පෙන්වා පිට රටවලින් ණය ගත්තා. එම ව්‍යාපෘතිවලට තමන්ගේ නම් දමාගෙන, ඒවා වෙළෙඳ භාණ්ඩ කරගෙන ප්‍රචාරණය සඳහා පාවිච්චි කළා. මේ රටේ ජාතික ධනය පිට රටවලට ඇදිලා යන විධියට මහා පරිමාණයෙන් ඒ ණය ගන්න ගමන් අත යටින් කොමිස් කුට්ටි අරගෙන මේ රටට කරපු විනාශය පිළිබඳව සොයා බලන්න තිබුණා, මෙවැනි පනතක් එදා සම්මත කර තිබුණා නම්.

මට මතකයි අපේ විගණකාධිපතිතුමා පසුගිය කාලයේ කිව්වා, "වරාය සංවර්ධන ව්‍යාපෘතිය විගණනය කරන්නත් අවස්ථාව නැහැ, ඒක විගණනය කරන්න බැහැ" කියලා. නමුත් මගේ අදහස අනුව, මුදල් අවභාවිතය ඇතුළු ඉදිරිපත් වෙලා තිබෙන චෝදනා පිළිබඳව සොයා බලන්න පුළුවන් කුමන හෝ ආයතනයකට - FCID වෙන්න පුළුවන්, CID වෙන්න පුළුවන්- පැමිණිලි කළාම ඒ ගැන ගැඹුරින් සොයා බලා විමර්ශනය කළ හැකියි. මා පළාත් සභා මන්ත්‍රීවරයකු හැටියට හිටපු යුගයේ අපේ දකුණු පළාත්

[ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා]

සභාවේ යෝජනාවක් සම්මත වුණා, ටෙන්ඩර් පටිපාටියෙන් පරිබාහිරව රුපියල් ලක්ෂ 20 දක්වා කොන්ත්‍රාත් දෙන්න පුළුවන් කියලා. කලින් ඒ සීමාව තිබුණේ, රුපියල් ලක්ෂ 5යි. රුපියල් කෝටියක් වැනි මුදලක් එක ව්‍යාපෘතියකට වෙන් වුණාම ඒ මුදල කඩනවා කොටස් පහකට. කොටස් පහකට කඩලා, රුපියල් ලක්ෂ 20 බැගින් කොටස් පහක් හදනවා. "ගම නැහුම", "එක ගමට එක වැඩක්" වාගේ විවිධ පුවරු ගහගෙන ඒ මුදල්වලින් ව්‍යාපෘති කළා. කෝටි ගණනින් මහජන මුදල් වැය කර, ටෙන්ඩර් පටිපාටියෙන් තොරව දුන්න ඒ සමහර ව්‍යාපෘතිවලින් සියයට 99ක් අද වනකොට අසාර්ථකයි. ඒ හදපු සමහර පාරවල්වල යන්න බැහැ. ඒ පාරවල් විනාශ වෙලා ඉවරයි. හැබැයි, මහ ජනයා අදටත් ඒවාට වන්දි ගෙවනවා; පොලියත් එක්ක ණය ගෙවනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට නියමිත කාලය නම් අවසානයි.

ගරු බන්දුල ලාල් බණ්ඩාරිගොඩ මහතා
(மாண்புமிகு பந்துல லால் பண்டாரிகொட)
(The Hon. Bandula Lal Bandarigoda)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මා කියන්න ඕනෑ, පසුගිය කාලයේ මේ විධියට ප්‍රාදේශීය සභා මට්ටමේ ඉඳලා ඉහළ මට්ටමේ දේශපාලනඥයන්ට සල්ලි සාක්කුවේ දා ගන්න පාර හදා දුන්නා; මාර්ගය විවෘත කර දුන්නා. මේවා පිළිබඳව විගණනය එන කොට ඒවා කරපු මිනිස්සුන් නැහැ, ඒවාට සම්බන්ධ නිලධාරීනුත් නැහැ, හදපු පාරකුත් නැහැ, සංවර්ධන ව්‍යාපෘතියත් නැහැ. මේක තමයි ඇත්ත කථාව.

අපි 2015 ජනවාරි 08වැනි දා පැවැති ජනාධිපතිවරණයේදීත්, ඊට පසුව අගෝස්තු 17වැනි දා පැවැති මහ මැතිවරණයේදීත් මේ රටේ ජනතාවට පොරොන්දුවක් දුන්නා. ඒ තමයි, රටේ යහ පාලනය ඇති කර, රට හරි මඟක ගෙන යමින්, මේ රටේ සුපිරිසිදු පාලනයක් ස්ථාපිත කරන බව. ජනතාවට ඒ දුන්නු පොරොන්දුව ඉෂ්ට කරන්න මේ ඉදිරිපත් කර තිබෙන ජාතික විගණන පනත් කෙටුම්පත ලොකු ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමින්, එයට ඔබ සියලුදෙනාගේ ශක්තිය හා ධෛර්ය ලබා දෙන්න කියා ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 10ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.30]

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මූලාසනය හොබවන ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබාදීම ගැන. මුදල් සම්බන්ධව කටයුතු කිරීමට අදාළ ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් වන ජාතික විගණන පනත් කෙටුම්පත පිළිබඳ දෙවැනිවර කියැවීමේ විවාදය අද දවසේ සිදු කරනවා. මෙම පනත් කෙටුම්පත සම්මත කිරීමෙන් පසුව ඉදිරි අනාගතයේදී රටේ බොහෝ දේවල් වෙනස් වෙයි කියලා මා හිතනවා. ඒ නිසා මෙම පනත් කෙටුම්පත ගැන මේ උත්තරීතර පාර්ලිමේන්තුවේදී කථා කරන්න ලැබීම නවක මන්ත්‍රීවරයකු හැටියට මට ලැබුණු භාග්‍යයක් හැටියට සලකනවා.

මා විශේෂයෙන්ම එක කාරණයක් මතක් කරනවා. අලුතින් පාර්ලිමේන්තුවට පැමිණි මම, මේ අවුරුදු තුනක කාලය තුළදී බොහෝ දේවල් ඉගෙන ගත්තා; පාඩම් හැටියට බොහෝ දේවල් ඉගෙන ගත්තා. එසේ අධ්‍යයනය කළ කාරණා අතර "විගණනය" කියන විෂයයට විශේෂ ස්ථානයක් දීලා කථා කරන්න මට පුළුවන් කියලා මා හිතනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

අනතුරුව ගරු මයන්ත දිසානායක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටකු, මාණ්පුමිකු මයන්ත දිසානායක්ක අවර්කළ් අක්කිරාසනත්තිනින්රු අකලවේ, පිරතිච් සපානායකර් අවර්කළ් [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. MAYANTHA DISSANAYAKE *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] *took the Chair.*

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා කියමින් සිටියේ, අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා කළ යුතු දේවල් මොනවාද, අපි ඉගෙන ගත්ත දේවල් මොනවාද සහ ඉගෙන ගනිමින් සිටින දේවල් මොනවාද කියන කාරණයයි. මා අද ඉතාම කනගාටු වෙනවා. මොකද, මේ ජාතික විගණන පනත් කෙටුම්පත ගැන මේ රටේ අවුරුදු ගණනාවක් තිස්සේ සාකච්ඡා කරමින්, ඒක යට ගසමින්, කුණු කූඩයට දමමින් මේ රටේ දේශපාලනය කරපු සමහර කණ්ඩායම් අද මේ පාර්ලිමේන්තුවේදී කිඹුල් කඳුළු හෙළමින් අපට ඇහිල්ල දිගු කරලා, 'මේ පනත් කෙටුම්පත ඒ අය සකස් කරලා අද සම්මත කරන්න කටයුතු කරනවා' වැනි කථාවක් ජනතාවට ඒත්තු ගන්වන්න උත්සාහ කරන නිසා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා දකින විධියට මේ රටේ පැහැදිලි ලෙසම සිද්ධ වෙන්නේ මේක තමයි. අද මේ රටේ පැහැදිලි ලෙසම සිද්ධ වෙන්නේ, ඇත්ත වසන් කරලා, ඇත්ත වෙනුවට බොරුව රජ කරවීමයි. බොරුව රජ වන රටක් හැටියට අද මේ රටේ කටයුතු සිද්ධ වීගෙන යනවා.

විශේෂයෙන්ම ජාතික විගණන පනත් කෙටුම්පත ගැන කථා කරද්දී, විගණනය සම්බන්ධයෙන් කථා කරද්දී අපට කාරණා කිහිපයක් කථා කරන්න තිබෙනවා. ප්‍රධාන වශයෙන් මා විශ්වාස කරන දේ තමයි, විශේෂයෙන්ම මේ රටේ තිබෙන රාජ්‍ය ආයතන එහෙම නැත්නම් පොදු ව්‍යාපාර කියන මේ සියල්ලම විගණනය කරන්න පෙර ඒ සම්බන්ධයෙන් දැනුවත් කිරීමක් කළ යුතුයි කියන කාරණය. ඒකට හේතුව මොකක්ද? මම ප්‍රාදේශීය සභාවක සභාපතිවරයා හැටියට කාලයක් සිටියා. ඒ කාලයේ එක ආයතනයකට ගිය චේලාවක එක නිලධාරියෙක් එකවරම කිව්වා, "අද ඔන්න Audit එකෙන් පැන්නා" කියලා. Audit එකෙන් පැන්නා කියලා නිලධාරින් ඒ අත-මේ අත දුවනවා. "අර file එකමයි සොයාගෙන ආවේ" කියලා කියනවා. ඒ කියන්නේ මොකක්ද? ඔවුන් කියන ඒ file එක ගැන තොරතුරු තමයි විගණන අංශයට දීලා තිබෙන්නේ. ඒ ගොල්ලන් ඒ file එක බලන්නේ ඊට පසුවයි. ඒ නිලධාරියා ඒ file එක අරගෙන ඒ අත-මේ අත බලනවා. මොකද, ඒ නිලධාරියා අතින් වෙන්න තිබුණු රාජකාරිය හරියට සිද්ධ වෙලා නොතිබුණු නිසා තමයි Audit එකට බය වෙලා තිබෙන්නේ. හේතුව ඒකයි.

මම හිතන විධියට අද විගණනයක් ගැන කථා කරන්නේ හොරු අල්ලන්න නොවෙයි. මම දකින විධියට විගණනය තිබෙන්නේ කාටවත් දඩුවම් දෙන්න නොවෙයි. විගණනය තිබෙන්නේ නිවැරදි කරන්නයි. මා කියන කථාව නිවැරදියි කියලා මා හිතනවා. විගණනය තිබෙන්නේ මේ රට නිවැරදි කරන්නයි. හැබැයි, ඒ නිවැරදි කරන ආකාරය රාජ්‍ය ආයතනත්, පොදු ව්‍යාපාරත් හරියාකාරව හඳුනා ගත යුතුයි. අපි යම් ආයතනයක විගණනය ගැන කථා කරන්නේ කොයි වේලාවේද? අපි විගණනය ගැන අපේ කාරක සභාවල කථා කරන්නේ කොයි වේලාවේද? අවුරුදු හතරක්-පහක් ගියාට පස්සේ එවැනි වාර්තාවක් ගෙනාවාට පසුවයි අපි ඒ ගැන කථා කරන්නේ. එතකොට ඒ ක්‍රියාවට සම්බන්ධ වුණ, අද විගණනයට භාජන වුණ නිලධාරීන් සමහර වේලාවට අද ජීවතුන් අතර නැහැ. එහෙම නැත්නම් ඒ අය අබල දුබල වෙලා ප්‍රශ්නයකට උත්තර දෙන්න බැරි තත්ත්වයක ඉන්නේ. එහෙම වුණොත් ඒ විගණනයට උත්තර දෙන්න වෙන්නේ අලුතින් එතැන සිටින නිලධාරියාටයි. සමහර වේලාවට ඒ නිලධාරියාට ඒ උත්තරය නිවැරදි ආකාරයෙන් දෙන්නත් බැහැ; ඒ සිද්ධ වූ ක්‍රියාව ආවරණය කරන්නත් බැහැ. එවැනි හේතු නිසා මේ රටට විශාල පාඩුවක් සිද්ධ වුණාය කියලා මම විශ්වාස කරනවා. ඒ නිසා මම විගණකාධිපතිතුමා ප්‍රමුඛ ඒ සියලු විගණන අංශවලින් ඉල්ලීමක් කරනවා. එතැනදී සමහර වේලාවට ඔබතුමන්ලාට අයිති නැති කාර්යයක් කරන්න සිද්ධ වෙයි. ජාතික විගණන පනත් කෙටුම්පත සම්මත වුණාට පසු, රාජ්‍ය ආයතනත්, දේශපාලනයත් කියන මේ සියල්ල එකට එකතු කරගෙන -යම්කිසි අවැඩක් වෙන්න පෙර, එහෙම නැත්නම් හානියක් වෙන්න පෙර, එහෙමත් නැත්නම් දූෂණයක්-වංචාවක් වෙන්න පෙර- මේ අය නිවැරදි කරන වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න කියලා මා ඉල්ලා සිටිනවා. එහෙම කරන්න පුළුවන් නම්, ඒක මේ රටට කරන විශාල සේවයක් හැටියට මා දකිනවා.

ජාතික විගණන පනත් කෙටුම්පත ගැන අවුරුදු ගණනාවක් තිස්සේ කථා කරලා, මඩ යට පල් කරලා තිබුණේ. අද දින එය සම්මත කිරීම සඳහා මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ සාකච්ඡාවට බඳුන් කරන්නට අවස්ථාව සලසා දීම සම්බන්ධයෙන් ගරු අග්‍රාමාත්‍යතුමාට ස්තුතිවන්ත වෙන්නට ඕනෑ.

ඒ විතරක් නොවෙයි. අපි ආපසු හැරිලා බලන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මන්ත්‍රීවරුන් හැටියට අපි පාර්ලිමේන්තුවට පත් වෙන්නේ මහජන ඡන්දයෙනුයි. මහජන ඡන්දයෙන් පාර්ලිමේන්තුවට පත්වෙලා ඇවිල්ලා, මේ එක රැස්වීමකට පාර්ලිමේන්තුව රුපියල් ලක්ෂ ගණනක් වියදම් කරනවා. එහෙමත් නැත්නම් අපේ වැඩ මුළුවකට රුපියල් ලක්ෂ ගණනක් වියදම් කරනවා. ඒ විතරක් නොවෙයි, අපි ජනතාවට සේවය කරන කාල සීමාව තුළදී, පෞද්ගලිකව අපේ ගම්වල වැඩ කටයුතු කරද්දී අපට යම්කිසි මුදලක් ගෙවනවා. ඒවා ජනතාවගේ මුදල්. එහෙම නම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපි දවස පුරා මොනවාද කරන්නේ, පාර්ලිමේන්තුවට ඇවිල්ලා මොනවාද කරන්නේ කියලා අපි, අපි ගැන ස්වයං විගණනයක් කර ගන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් පොඩ්ඩකට ඉස්සෙල්ලාත් මා කිව්වා, මා ඉතා කලකිරීමෙන් ඉන්නවාය කියලා. මේ පාර්ලිමේන්තුවේ කථා කරන්න හොඳ විෂයයන් ලැබෙනවා. හැබැයි ඒ විෂයයන් ගැන නොවෙයි පාර්ලිමේන්තුවේ දී කථා කරන්නේ. එහෙම නම් මොනවා ගැනද කථා කරන්නේ? එකිනෙකාට හොරා කියා ගනිමින්, එකිනෙකාට ඇඟිල්ල දිගු කර ගනිමින්, මේ රටේ කථා කරන්න හොඳ නැති ඉතාමත් පහත් අන්දමේ කථා කියනවා. ඒ විතරක් නොවෙයි, ඕපදූප තමයි මේ පාර්ලිමේන්තුවේ වැඩිපුර කථා කරන්නේ. මේ රටේ ජනතාවගේ මුදල් කොතරම් කාබාසිනියා කරනවාද කියන එක තමුන්නාන්සේලා හැම දාම දකිනවා ඇති. මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ ඉඳගෙන, කාලය ලබාගෙන කාගේවත් ඕපදූප තමයි කථා කරන්නේ. මෙන්න මේ ක්‍රමවේදය නැති කරන්න ඕනෑ. අපි ජනතාවගේ මුදල් කොපමණ නාස්ති කරනවාද කියලා අපි ගැන ස්වයං විගණනයක් කිරීමේ වග කීමක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට, අමාත්‍යවරුන් හැටියට අපි සියලුදෙනාටම තිබෙනවා. අපේ වගකීම හරිහැටි ඉෂ්ට කළාද කියා අපි ආපසු හැරිලා බලන්න ඕනෑ. මොකද, අපි මේ පාවිච්චි කරන්නේ, ජනතාවගේ සල්ලි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි හැම මොහොතකම දකිනවා, ඉතාමත් හොඳ, මේ රටට ප්‍රයෝජනවත් වන, සැලසුම් සහගත, නිර්මාණශීලී වැඩසටහන් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කරන යෝජනා මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් වන බව. හැබැයි එවැනි යෝජනාවක් ඉදිරිපත් වුණු ගමන් කොහේවත් තිබෙන එකක් අරගෙන ඉස්සරහට දමනවා. ඊට පස්සේ අර යෝජනාව පැත්තකින් තබා දෙපැත්තම ගහගන්නවා; කියවා ගන්නවා; ඒ සඳහා කාලය ගන්නවා; මඩ ගහගන්නවා. තමන් පාර්ලිමේන්තුවට ඇවිල්ලා කොයි ආකාරයෙන්ද පාර්ලිමේන්තුවේ හැසිරිය යුත්තේ කියන කාරණය පසෙක තබා, රටේ නීති සම්පාදනය කරන, මේ රට හදන තැන වන පාර්ලිමේන්තුවේ පෞද්ගලිකව එකිනෙකාගේ දෙමවුපියන්ගේ වගතුග ගැනත් කථා කරන්න තරම් පහත් තත්ත්වයට අපි වැටිලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කථානායකතුමා සහ ඔබතුමා තමයි මේ පාර්ලිමේන්තුවේ ඉහළින්ම සිටින්නේ. ඔබතුමන්ලාට පුළුවන් නම්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා මහජන මුදල් පාවිච්චි කරන ආකාරය සම්බන්ධව ප්‍රගති සමාලෝචනයක් කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කරන්න. පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා ජනතා හිතවාදීව මේ රට හදන්න, ආර්ථිකය හදන්න, සමාජය හදන්න, සංස්කෘතිය හදන්න, ආගම ධර්මය ඉදිරියට ගෙන යන්න, දරුවන් වෙනුවෙන් මේ රට නැවත නිර්මාණය කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළට කොතරම් කාලයක් වැය කරලා තිබෙනවාද, ඒ කාලය සඳහා වැය වූ මුදල කොපමණද කියා ගණනය කරලා, නැවත ඒ දිනා හැරිලා බලලා, ඒ කාලයේ තමන් ඇඳුම් ඇඳගෙනද සිටියේ, නිරුවත්වද සිටියේ කියලා හඳුනා ගන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අවස්ථාව දෙන්න. ඒක තමයි වැදගත් වෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙන්න මේක අපි කළ යුතුමයි. මොකද, රස්තියාදු කථා කියමින්, එහෙම නැත්නම් නොසංඛ්‍යාල කථා කියමින්, මාධ්‍යවල පෙනී සිටීමේ වැඩසටහන පමණයි මේ පාර්ලිමේන්තුවේ ක්‍රියාත්මක වෙන්නේ. එය මේ රටට කරන හානියක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාමත් වැදගත් පනත් කෙටුම්පතක් පිළිබඳවයි අද කථා කරන්නේ. රටේ පරිහරණය වන මුදල් ආරක්ෂාකාරී විධියට රටේ ආර්ථිකය සහ රටේ ඉදිරි අනාගතය ශක්තිමත් කරන වැඩ පිළිවෙළක් සඳහා යෙදවීමට අවශ්‍ය කරන ශක්තිය ලබා දෙන්නයි මේ ජාතික විගණන පනත් කෙටුම්පත සම්මත කරන්නේ. පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන් කොපමණ දුරට මහජන මුදල් නාස්ති කරනවාද; අපතේ යවනවාද, ඒ සම්බන්ධයෙන් සකස් කරන වැඩ පිළිවෙළ කොපමණ හරිද,

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

වැරැදිද කියලා පෙන්වා දීලා, හෙට දිනයේ දී මේ උත්තරීතර පාර්ලිමේන්තුව මේ රටේ ජනතාවගේ යහපත්ම ස්ථානය හැටියට නිර්මාණය කරන්න පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට අවස්ථාවක් ලබා දෙන්න කියලා යෝජනා කරමින්, මට මෙම අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිය පළ කරමින් මා නිහඬ වනවා. බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම ස්තුතියි. මීළඟට ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි අටක් තිබෙනවා.

[අ.භා.5.40]

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම වැදගත් පනත් කෙටුම්පතක් වන ජාතික විගණන පනත් කෙටුම්පත අද දින මේ ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. එම පනත් කෙටුම්පත සම්බන්ධයෙන් වූ කරුණු කීපයකට අවධානය යොමු කරන්න ඔබතුමා මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මා ඔබතුමාට මගේ ස්තුතිය පුද කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය කාල පරිච්ඡේදය තුළ අපේ ආණ්ඩුවට එරෙහිව දිගින් දිගටම එල්ල වුණු චෝදනා අතරේ තිබුණු එක් චෝදනාවක් තමයි, මේ ජාතික විගණන පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේ කවදාද කියන කාරණය. 2015 ජනවාරි 08 වැනිදා මේ රටේ අලුත් සංස්කෘතියක් නිර්මාණය කරලා, අපි යහ පාලන ආණ්ඩුවක් හැදුවා. ඒ අනුව අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළින් ඉතාම පැහැදිලිව කියපු කාරණා ගණනාවක් අපි ඉෂ්ට කළා. අද බොහෝ දෙනෙකු මේවා පැත්තකට දාලා, අමතක කරලා තමයි කථා කරන්නේ. කොමිෂන් සභා ස්ථාපිත කළා වාගේම තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත වාගේ පනත් ගෙනැල්ලා ඉතිහාසයේ පළමුවැනි වතාවට ස්වාධීනව කටයුතු කරන්න පුළුවන් අවස්ථාව යහ පාලන ආණ්ඩුව තුළින් අපි උදා කරලා දුන්නා. සමහර අය ඒ අතරේ ඇහුවා, "බලයට ඇවිල්ලා දැන් වසර තුන හමාරක් විතර වනවා. ජාතික විගණන පනත කෝ?" කියලා. නමුත් ප්‍රමාද වෙලා හෝ විගණකාධිපතිවරයාට ඉතාම ශක්තිමත්ව, ස්වාධීනව, කොන්ද කෙළින් තියාගෙන කටයුතු කරන්න අවශ්‍ය වටපිටාව මේ පනත් කෙටුම්පත තුළින් හදලා තිබෙනවා. ඒ වෙනුවෙන් අපි සංශෝධන කීපයක් ඉදිරිපත් කරලා තිබෙනවා. ජාතික විගණන පනත් කෙටුම්පත අද සම්මත කිරීම තුළින් එතුමාගේ ස්වාධීන බලය ස්ථාපිත කරන්නට අවශ්‍ය කටයුතු සිදු වනවා වාගේම, එමඟින් සමස්ත රටේ ජනතාවට සැනසුම් සුසුම් හෙළන්නට පුළුවන්කමක් ලැබෙනවාය කියා මා හිතනවා. රාජ්‍ය සේවය තුළ කටයුතු කරන රජයේ නිලධාරීන්ට, මැති- ඇමතිවරුන් හැටියට අපි සියලු දෙනාට, ආණ්ඩු පක්ෂයට, විරුද්ධ පක්ෂයට ඕනෑ විධියට විගණකාධිපතිවරයා නටවන්න මින් ඉදිරියට පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. පසු ගිය කාල පරිච්ඡේදයේ -මහින්ද රාජපක්ෂ පාලන කාලය තුළ- ජාතික විගණන පනත් කෙටුම්පත ගෙනැල්ලා සම්මත කරලා තිබුණා නම්, ජනාධිපති ලේකම්වරයාට -ලලිත් වීරතුංග මහත්මයාට- මහ උළු ගෙදරට ගිහිල්ලා තපින්න සිදු වෙන්නේ නැහැ කියා මා හිතනවා. ජනාධිපතිවරයා වෙන්න පුළුවන්; අගමැති වෙන්න පුළුවන්; වෙනත් මැති-ඇමතිවරු වෙන්න පුළුවන්; තමන්ට ඕනෑ විධියට හිතූ මතයට නියෝග දීලා, මූල්‍ය පාලනය පිළිබඳව විනිවිදභාවයකින් තොරව කටයුතු කරන්න ඔවුන්ට තිබුණු අවස්ථාව මේ පනත් කෙටුම්පත සම්මත වීම තුළින් අහිමි වනවාය කියා මා හිතනවා.

අපි පාර්ලිමේන්තුව තුළින් අණ පනත් සම්මත කරනවා. බදු ගෙවන ජනතාවගේ සල්ලි මේ රටේ සංවර්ධන ක්‍රියාදාමයට කොයි ආකාරයට යොදවනවාද කියන කාරණය පිළිබඳවත් මේ තුළින් සොයා බලන්න පුළුවන්කම ලැබෙනවා. රාජ්‍ය අංශයට විතරක් නොවෙයි භාණ්ඩාගාරයෙන් මුදල් ලබා දෙන්නේ. විශේෂයෙන්ම මේ පනත් කෙටුම්පත තුළින් සියයට 51ක් තිබෙන රජය සතු ආයතන පිළිබඳව වාගේම 200කට වැඩි ප්‍රමාණයක් තිබෙන අර්ධ රාජ්‍ය ආයතන වන සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල වාගේ ආයතනවලත් විගණන කටයුතු කරන්න පුළුවන්කම ලැබිලා තිබෙනවා. මේ පනත් කෙටුම්පත සම්මත කිරීම තුළින් ලැබෙන වාසිය මොකක්ද? මෙතෙක් කාලයක් මේ රටේ සිදු වෙච්ච යම් යම් වංචා, දූෂණ පිළිබඳව කථා කරනවා නම්, පළාත් රාජ්‍ය ගිණුම් කාරක සභාවලදී වාගේම පාර්ලිමේන්තුවේ පවත්වන රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව තුළදී ලබා දෙන ඇතැම් නිර්දේශ, නියෝගයන් එම ආයතනවල නිලධාරීන් ක්‍රියාත්මක කරන්නේ නැහැ. ඒ තත්ත්වය ඉතාම කනගාටුදායකයි. පළාත් සභාවේ, රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියට මා අවුරුදු පහක් කටයුතු කර තිබෙනවා. අවුරුදු 16ක් එහි සාමාජිකයෙකු හැටියට කටයුතු කර තිබෙනවා. ඒ දවස්වල අපි ඉතාම පැහැදිලිව යම් යම් නිර්දේශයන් ඉදිරිපත් කරලා, මේ කටයුතු මේ විධියට සිදු වෙන්න ඕනෑ කියලා කියා තිබෙනවා. නමුත් බොහෝ අවස්ථාවලදී ඒ අදාළ නිලධාරීන්ට නිවැරැදි තීන්දු ගන්න පුළුවන් විධියේ කොන්දක් තිබුණේ නැහැ. නමුත් මේ තුළින් එය පැහැදිලිව ක්‍රියාත්මක වනවා. හැබැයි, මේ තුළින් බරපතළ වැරැදි සිදු වන බවත් අපි දන්නවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ජාතික විගණන පනත් කෙටුම්පත ගෙනැල්ලා, විගණකාධිපතිවරයාගේ බලතල ගැන කියලා, රජය මඟින් ක්‍රියාත්මක වන ඇතැම් ව්‍යාපෘති කල් දමන්න -කල් මරන්න- පුළුවන්, ඒ වෙනුවෙන් ක්ෂණිකව ක්‍රියා කරන්න බැහැයි කියලා බොහෝ දෙනෙකු කියනවා.

ඒ ප්‍රශ්නයත් එනවා. රාජ්‍ය නිලධාරීන්ගේ මැදිරියේ ඉඳගෙන විගණකාධිපතිතුමාත් මේවා අහගෙන ඇති. ඇතැම් විගණකාධිපතිවරු, සහකාර විගණකාධිපතිවරු ඉතාම හොඳින් මේ කටයුතු කරනවා. හැබැයි, සමහර අවස්ථාවලදී ඇතැම් නිලධාරීන් විසින් යම් යම් නිලධාරීන් බිය ගන්වන තත්ත්වයක් තිබෙනවා. ඒ අයුරින් බිය ගන්වලා, ද්වේෂ සහගතව මේ කටයුතු ගෙන ගිය අවස්ථාත් තිබෙනවා. මේ ජාතික විගණන පනත තුළින් තමුන්නාන්සේලාට බලතල දෙනවා වාගේම, ස්වාධීනව තීන්දු ගන්නත් හැකියාව ලැබෙනවා. ඒ වාගේම තමයි, යම් යම් දුර්වලතාවලින් පෙළෙන රාජ්‍ය නිලධාරීන්ව අපි ආරක්ෂා කරගන්නත් ඕනෑ. අද සමහර ආයතනවලට මේ අය පොලීසිය වාගේ කඩා පනින තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ අහන ප්‍රශ්නවලදී එම ආයතනවල නිලධාරීන් දැඩි ලෙස අසීරුතාවලට ලක් වෙනවා. හැබැයි, රටට ඉතාම ආදරය කරන, රාජ්‍ය මුදල්වලට ආදරය කරන නිලධාරීන් පිරිසකුත් ඉන්නවා. ඒ අය රජය මඟින් කරන සියලු කටයුතුවලදී බොහොම ආදරයෙන් කටයුතු කරනවා. කවුරු මොනවා කිව්වත්, ඒ අය වැරැද්ද වැරැද්ද විධියට දකිනවා. අපි දන්නවා, සමහර වෙලාවට ඇතැම් ස්ථානවලදී නිලධාරීන්ට යම් යම් බලපෑම් ඇති වෙලා තිබෙන බව. තම රාජකාරී කටයුතු කරනකොට ඒ කටයුතුවල යම් යම් ප්‍රමාදයන් කරන්න කියූ අවස්ථා තිබුණා. විගණකාධිපතිතුමනි, මේ ජාතික විගණන පනත් කෙටුම්පත සම්මත කරලා, එම පනතින් ඔබතුමාට බලතල පැවරෙනකොට ඔබතුමා ඉතාම සාධාරණ සහ යුක්තිසහගත ලෙස මේ කටයුතු විමර්ශනය කරයි කියා අප විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඕනෑම ආයතනයක් ගත්තාම, එම ආයතනයේ දැක්ම, ආයතනයේ අතීතය, අනාගතය

පිළිබඳව අපට යම්කිසි චිත්‍රයක් ලැබෙන්නේ විගණන වාර්තා තුළිනුයි. අපි දන්නවා, ඇමතිවරයෙක්, නියෝජ්‍ය ඇමතිවරයෙක් හෝ ආයතන ප්‍රධානියෙක් ඕනෑම රාජ්‍ය ආයතනයකට පළමුවෙන්ම පැමිණියාම එම ආයතනයේ විගණන වාර්තාව තමන්ගේ මේසය මත තිබෙන්න ඕනෑ බව. පළමුවෙන්ම කරන්න ඕනෑ වන්නේ, විගණනය තුළින් දැකපු, ඒ ආයතනයේ තිබුණු යම් යම් දුර්වලතා මහඟරවන්නේ කොහොමද, ඒවාට විගණකාධිපතිවරයා ලබාදුන් නිර්දේශ මොනවාද, ඒවායින් කීයක් ඉෂ්ට කර තිබෙනවාද කියා බලලා, ඒ පිළිබඳව පැහැදිලිව තීන්දු ගැනීමයි. ඒ කටයුතුවලින් අපට ආයතනය ගැන පැහැදිලිව වැටහෙනවා.

රජයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කරනකොට ඇතැම් අවස්ථාවලදී විගණනය බාධාවක් වන බව අප දන්නවා. වර්තමානයේ -මේ ළඟදි - වුණු සිදුවීමක් ගැන මා දැන් කියන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ගංවතුරෙන් සිදුවුණු හානියට සහන සලසන්න දකුණු පළාතට -ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවලට- විශාල මුදල් ප්‍රමාණයක් ලැබුණා. දෙසැම්බර් 31වන දාට කලින් මේ කටයුතු කරන්න කියා රජය නියම කර තිබුණා. ඒ මුදල් ආයෙත් අව්‍යවිශේද්‍ය වෙන්නෙත් නැහැ. මේ තුළින් මාර්ග සංවර්ධනයට විශාල මුදලක් ලැබුණා. නමුත්, මේ මාර්ග සංවර්ධන කටයුතු කඩිනමින් කරන්න ගිහින් ඇතැම් තැන්වල ඒ වැඩ නතර වෙලා තිබෙනවා; අද මාතර දිස්ත්‍රික්කයේ මාර්ග කිහිපයක ඒ වැඩකටයුතු නතර වෙලා තිබෙනවා. සමහර වෙලාවට ඒ මාර්ගවල ගල් දමලා, අනික් වැඩකටයුතු අතරමඟ නතර වෙලා තිබෙනවා. මේ පාරවල් හදන්න ලැබෙන්නේ නැහැ. ඒකට හේතුව හැටියට කියන්නේ මොකක්ද? "මේ සම්බන්ධයෙන් විගණන අංශය මඟින් විමර්ශනයක් කර තිබෙනවා; ඒ අනුව මේ වැඩකටයුතු නතර කර තිබෙනවා" කියායි කියන්නේ. හැබැයි, මම එක දෙයක් කිව යුතුයි. ඒ කටයුතු විගණනයෙන් පසු නතර කළා වාගේම, විගණන අංශයෙන් කළ එම පරීක්ෂණවල නිගමන, නිර්දේශ ඉක්මනින්ම ලබා දීලා එම කටයුතු යථා තත්ත්වයට පත් කිරීමත් විගණකාධිපතිවරයාගේ කාර්ය භාරයක් කියා මම හිතනවා. විගණකාධිපතිතුමනි, ඔබතුමා ඉතාම ස්වාධීනව කටයුතු කළා. බැදුම්කර සිද්ධියේදී ඔබතුමන්ලා ඒ වෙනුවෙන් විශාල කැප කිරීම් කරලා කටයුතු කළ ආකාරය අපි දැක්කා. ඉතිහාසයේ මේ රටේ බොහෝ දේවල් සිද්ධ වෙලා තිබෙනවා. පසුගිය කාල පරිච්ඡේදය තුළ රාජ්‍ය ආයතන 18ක බරපතළ වංචා හා දූෂණ සිදු වෙලා තිබෙනවා. මේ අවස්ථාවේදී ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා මෙම ගරු සභාවේ හිටියා නම් හොඳයි. ආණ්ඩුවට බොහෝ විට අලාභ හානි සිදු වෙලා තිබෙනවා. නමුත් ඒවා පිළිබඳව කළ විගණන තුළින් දුන් නිර්දේශ ක්‍රියාත්මක කරන්න පසුගිය රජය කාලයේ කටයුතු කර තිබුණේ නැහැ. වංචා, දූෂණ සිදු වූ ආයතන විශාල සංඛ්‍යාවක් තිබෙනවා. අපි දන්නවා, බොහෝ ආයතනවල -විශේෂයෙන්ම ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, වතු සමාගම් සහ තවත් විවිධ ආයතනවල- සිදු වුණු බරපතළ පාඩු විගණනය මඟින් පෙන්වා දී තිබෙන බව. ඒ කරුණු "කෝප්" වාර්තාවට පවා ගිහින් තිබෙනවා. නමුත් ඒ ගැන අඹ මල් රේණුවක් තරම්වත් සිතා කටයුතු කර තිබුණේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අතිගරු ජනාධිපතිතුමාගේත්, ගරු අග්‍රාමාත්‍යතුමාගේත් මහ පෙන්වීම යටතේ වර්තමාන රජය කටයුතු කරන ආකාරය ගැන අප සතුටු වනවා. ගරු අග්‍රාමාත්‍යතුමා අද උදෑසන කථා කළා. මෙම ජාතික විගණන පනත් කෙටුම්පත අද දෙවැනි වර, තුන්වන වර කියවා සම්මත කරනවා. මේ රටේ ජනතාවට දුන් පොරොන්දු එකින් එක අපි ඉෂ්ට කර තිබෙනවා. අපේ ආණ්ඩුවට තව අවුරුදු දෙකක් තිබෙනවා. ඔබතුමන්ලා මතක තියා ගන්න, අපි කියූ බොහෝ දේවල් 2020 වසරේ අගෝස්තු මාසය වන විට සම්පූර්ණ කරන්න පුළුවන් ශක්තිය අපට තිබෙනවා. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ පනත ගෙන එන්න පුළුවන් වුණේ කාටද? ඒ කාලයේ ඒවා ප්‍රතික්ෂේප කළා. ඒවා ගැන කථා කළේ නැහැ. විගණන පනත ගෙනෙන්න පුළුවන් වුණේ කාටද? මේවා වසර ගණනාවක් තිස්සේ ඇදි ඇදී තිබුණා. මේ පාර්ලිමේන්තු ඉතිහාසයේ එවැනි අවස්ථා නිර්මාණය කරන්න අද අපිට පුළුවන්කමක් ලැබී තිබෙනවා.

ඒ දේවල් කරද්දී තමයි අපට මේ චෝදනා කරන්නේ; අපේ ආණ්ඩුවට නොයෙක් දේවල් කියන්නේ. ඒවා කරන්න බැරි වුණු අය ඒ තුළින් අගාධයට වැටිලා, මේ රටේ මූල්‍ය විනිවිදභාවය සම්පූර්ණයෙන්ම කාබාසිනියා කළා. මේ රටේ අභිංසක ජනතාවගේ මුදල් නියමානුකූලව පරිපාලනය කරන්නේ කොහොමද කියන එක ගැන ප්‍රශ්නයක් තිබුණා. ඒක නිසා තමයි අපට විගණන පනතක් ගෙනෙන්න ඕනෑකමක් තිබුණේ. මේ දේවල් නිසා මේ ආණ්ඩුවේ ඉදිරි කටයුතු පිළිබඳව අපට ලොකු විශ්වාසයක් ඇති වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විගණකාධිපතිවරයා වාගේම ඉතාම සම්භාවනීය, සමාජයේ ගරුත්වයක් තිබෙන, මේ රටට ආදරය කරන කණ්ඩායමක් මේ සඳහා පත් වෙන්න ඕනෑය කියා මම ඉතාම ගෞරවයෙන් කියනවා. ඒ සියලුදෙනාම සාමූහිකව මේ පිළිබඳව තීන්දු ගන්න ඕනෑ. සාධාරණව හා යුක්ති සහගතව දෙන තීරණ, නිර්දේශ අපේ ජනාධිපතිතුමා, අගමැතිතුමා ඇතුළු අමාත්‍යවරුන් විසින් ක්‍රියාත්මක කළොත්, වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම මූල්‍ය විනිවිදභාවයෙන් යුතු ඉතාම වාසනාවන්ත රටක් හැටියට ඉදිරියට යන්න පුළුවන් ශක්තියක් මේ රටට ලැබෙනවා. ඒ ශක්තිය ගරු අගමැතිතුමාගේ නායකත්වයෙන් යුතුව මේ රටේ ස්ථාපිත කරන්න අපි නිරන්තරයෙන් කටයුතු කරනවාය කියන කාරණය මතක් කරමින්, මේ රටේ බදු ගෙවන, දුක් විඳින අභිංසක ජනතාවට, රටට ආදරය කරන ජනතාවට මේ පනත තුළින් ශාන්තියක්ම වේවායි කියා ප්‍රාර්ථනා කරමින්, මගේ කථාව අවසන් කරනවා.

බොහොම ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. Hon. Mylvaganam Thilakarajah. You have eight minutes.

[අ.භා.5.51]

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටට ඉතාම වැදගත් වන ජාතික විගණන පනත් කෙටුම්පත විවාදයට ගන්නා මේ අවස්ථාවේදී, ඒ පිළිබඳව කථා කරන්න අවස්ථාවක් ලබාදීම පිළිබඳව පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ වාගේ ජාතික වැදගත්කමක් තිබෙන තවත් වැඩසටහනක් ඔබතුමාගේ නායකත්වයෙන් අපි දැනටමත් කරගෙන යන බව මම මතක්

[ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා]

කරන්න කැමැතියි. ජාතික විගණන පනත් කෙටුම්පත වාගේම, ඇගයීම් පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් මේ පාර්ලිමේන්තුවට ගෙන්වා ගන්නට ඔබතුමාගේ හා අපේ ගරු කබීර් හාෂීම් ඇමතිතුමාගේ නායකත්වයෙන් දැනටමත් අපි වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරගෙන යන බවත්, ඒ වැඩ පිළිවෙළට කැබිනට් අනුමැතිය ලබා ගත් බවත් මේ උත්තරීතර සභාවට දැනුම් දෙන්න මා කැමැතියි. ඒකත් මේ වාගේම වැදගත් වැඩ පිළිවෙළක් බව පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ සංචිතයේ සාමාජිකයකු ලෙස මා විශ්වාස කරනවා.

මෙම පනත ගැන බොහෝ සාකච්ඡා තිබුණා. Committee on Public Finance එකේ Member කෙනෙක් හැටියට මම පසුගිය කාලයේදී මේ ගැන ගොඩක් උනන්දුවෙන් වැඩ කළා. අද මේ සභාවට මේ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට දායකවීමට හැකිවීම සහ මේ විවාදයට සහභාගී වීමට ලැබීම මගේ භාග්‍යයක් ලෙසයි මම සලකන්නේ.

කෞරව ප්‍රතිච් සභානායකර් අවර්කලේ, තේසිය මුක්කියත්තුවම් වාය්න්ත තේසියක් කණක්කාය්වුච් චට්ටමූලම් චම්පන්තප්පට්ට ඉන්ත විවාතත්තිල් උරෙයාට්රුවතර්කු වාය්ප්පළිත්තමෙක්කාක උංකළුක්කු එනතු නන්රිකළෛත් තෙරිවිත්තුක් කොළ්කින්රේන්. කටන්ත කාලංකළිල් ඉන්තක් කණක්කාය්වු චම්පන්තමාක ඉන්ත නාට්ටිල් පල්වේරු කුරෛපාටුකළ් කාණප්පට්ටන. පල්වේරු පොතුමුයර්චිකළ් චම්පන්තමාක උරිය කණක්කාය්විනෛ මේර්කොළ්ළ මුටියාත නිලෛමෛ නිලවියමෛ තොටර්පාක පල තටවෛකළ් නාංකළ් ඉන්තච් චපෛයිලේ පිරස්තාපිත්තිරුන්තෝම්. අතර්කුච් චට්ටත්තිලුළ්ළ ඒර්පාටුකළ් කුරෛවාක ඉරුන්ත නිලෛයිලේයේ ඉන්තච් චට්ටමූලම් කොණ්ටුවරප්පට්ටුළ්ළතු. අතාවතු පොතුවාක නාට්ටිලේ පල්වේරු පොතුමුයර්චිකළ් තොටර්පාක උරිය කණක්කාය්වුකළෛ මේර්කොළ්වතර්කු ඉටමළික්කුම් වකෛයිල් ඉන්තච් චට්ටමූලම් ඉන්රු පාරාළුමන්රත්තිලේ චමර්ප්පික්කප්පට්ටිරුක්කින්රතු. කුරිප්පාක, නාට්ටින් පිරතමර් එන්කින්ර වකෛයිල් මිකුන්ත පොරුප්පුටන් ඉත්තකෛය ඔරු කණක්කාය්වුච් චට්ටමූලත්තෛක් කොණ්ටුවන්තමෛක්කාක එංකළතු කෞරව පිරතමර් රණිල් වික්කිරමසිංක අවර්කළුක්කු නාංකළ් නන්රි තෙරිවික්කක් කටමෛප්පට්ටිරුක්කින්රෝම්. පොරුප්පුවාය්න්තවර් එන්කින්ර වකෛයිලේ ඉන්ත වේලෛත්තිට්ටත්තෛ අවර් මුන්නෙටුත්තිරුක්කින්රාර්.

අතේනේරම්, කුරිත්ත කණක්කාය්වරික්කෛකළ් එත්තකෛය විටයංකළෛ ඉතර්කු මුන්නර් වෙළික් කොණ්ටුවන්තිරුක්කින්රන එන්පතු තොටර්පාක විළක්කුවතර්කාක කණක්කාය්වාළර් තලෛමෛ අතිපති තිණෛක්කළත්තිනාල් වෙළියිටප්පට්ටිරුක්කින්ර කණක්කාය්වරික්කෛ ඔන්රෛ නාන් ඉන්තච් චපෛයිලේ චමර්ප්පිත්තු එනතු වාතත්තෛ මුන්වෛක්ක විරුම්පුකින්රේන්.*

2018ආම් ආණ්ටු පෙප්රවරි මාතම් 19ආම් තිකති කණක්කාය්වාළර් තලෛමෛ අතිපති තිණෛක්කළත්තිනාල් වෙළියිටප්පට්ට ඕර් ආවණමොන්රු එන්නිටමිරුක්කින්රතු. චෞළමියමූර්ත්ති තොණ්ටමාන් ඥාපකාර්ත්ත මන්රත්තින් 2015 ටිචම්පර් 31ඉල් මුටිවුර්ර ආණ්ටිර්කාන නිතික් කූර්රුක්කළ් මීතු 1971ආම් අණ්ටින් 38ආම් ඉලක්ක නිති අතිකාරච් චට්ටත්තින් කීළ් 14(2)(ශ්) පිරිවින් පිරකාරම් කණක්කාය්වාළර් තලෛමෛ අතිපතියින් අරික්කෛ එන්කින්ර ඉන්ත අරික්කෛයිලේ, 14ආම් පක්කත්තිල් කුරිප්පිට්ටිරුක්කින්ර චිල විටයංකළෛ නාන් ඉංකේ එටුත්තුච් චොල්ල විරුම්පුකින්රේන්. අතාවතු "2009 යූන් 09ආන් තිකතිය මර්රුම් 2011 ටිචම්පර් 23ආන් තිකතිය මුරෛයේ DMA/2009 (1) මර්රුම් DMA/ADM/2011/1/26 ආම් ඉලක්ක මුකාමෛත්තුවක් කණක්කාය්වුච් චුර්රරික්කෛ කළින්මීතු කවනම් චෙලුත්තප්පට්ටු විනෛත්තිරනුටනාන උළ්ළකක් කට්టුප්පාට්ටු වියූකත්තෛ ඒර්පටුත්තුවතර්කු උළ්ළකක් කණක්කාය්වුප් පතවියණියෛප් පයන්පටුත්ත වේණ්ටියපෝතුම්, වෙර්රිටමාක ඉරුන්ත කණක්කාළරතු පතවික්කුරිය චේවෛකළෛ උළ්ළකක් කණක්කාය්වාළර් මේර්කොණ්ටමෛයාල් මීළාය්වාණ්ටින්පෝතු, උළ්ළකක් කණක්කාය්වු නටෛපෙරවිල්ලෛ." එන්රු කණක්කාය්වාළර් තලෛමෛ අතිපති තිණෛක්කළමේ කූරුකින්රතු. අතාවතු, උළ්ළකක් කණක්කාය්වොන්රු කුරිත්ත මන්රත්තිල් ඉටම්පෙරවිල්ලෛ එන්පතෛක් කණක්කාය්වාළර් තලෛමෛ අතිපති තිණෛක්කළමේ චොල්කින්රතු.

අත්තුටන් අන්ත අරික්කෛයින් 5.3 එන්කින්ර කුරිප්පිල් පාතීට්ටුක් කට්టුප්පාටු එන්ර තලෛප්පින් කීළ් "මීළාය්වාණ්ටින් පොරුට්ටු මන්රම් තයාරිත්ත පාතීට්ටුක්කුප් පණිප්පාළර් චපෛයින් අංකීකාරම් පෙරප්පට්ටිරුක්කවිල්ලෛ." එන්රු කූරප්පට්ටුළ්ළතු.

කෞරව ප්‍රතිච් සභානායකර් අවර්කලේ, 5.5 මික මුක්කියමානතුම් පාරාළුමන්රම් කවනත්තිර්කොළ්ළ වේණ්ටිය ඔරු විටයමුමාකුම්. අතිල්, "2003ආම් ආණ්ටු යූලෛ 2ම් තිකති පී‍ඊ/12ආම් ඉලක්කප් පොතුමුයර්චිකළ් චුර්රරික්කෛයින් 6.5.3ආම් පන්තියින් පිරකාරම් ආණ්ටරික්කෛ පාරාළුමන්රත්තිල් මුන්වෛක්කප්පට වේණ්ටුමායිනුම්, මන්රම් තොටങ්කිය 2005ආම් ආණ්ටු මුතල් මීළාය්වාණ්ටු මුටිවුවරෛ අව්වාරු චෙය්යප්පට්ටිරුක්කවිල්ලෛ." එන්රු කුරිප්පිටප්පටුකින්රතු. අතාවතු චෞමියමූර්ත්ති තොණ්ටමාන් ඥාපකාර්ත්ත මන්රම් 2005ආම් ආණ්ටු තොටංකප්පට්ටිරුක්කින්රතු. අතු තොටංකප්පට්ට ආණ්ටු මුතල් ඉන්ත අරික්කෛ වෙළියිටප්පට්ට 2018 පෙප්රවරි, 19ආම් තිකතිවරෛ අන්ත මන්රත්තින් කණක්කීට්ටු චෙයර්පාට්ටු අරික්කෛකළ් ඉන්ත උයිරිය චපෛයාන පාරාළුමන්රත්තිර්කු චමර්ප්පික්කප්පටවිල්ලෛ එන්පතු කණක්කාය්වාළර් තලෛමෛ අතිපති තිණෛක්කළත්තින් අරික්කෛයිල් චුට්ටික්කාට්ටප්පට්ටුළ්ළතු.

එනවේ, "පොරුප්පුක්කූර වේණ්ටිය උයිරිය පාරාළුමන්රත්තිනාල් ඔතුක්කප්පටුකින්ර නිතියෛප් පයන්පටුත්ති නටාත්තප්පට්ටු වන්ත මන්රම් තොටර්පාන නිති අරික්කෛකළ් ඉන්තප් පාරාළුමන්රත්තුක්කු උරිය මුරෛයිල් චමර්ප්පික්කප්පටවිල්ලෛ." එන්රු චොල්ලුකින්ර කණක්කාය් වාළර් තලෛමෛ අතිපති තිණෛක්කළුම් අතු තොටර්පාක නටවටික්කෛයෙටුක්ක මුටියාත නිලෛයිල්තාන් තේසිය කණක්කාය්වු පට්රිය චට්టම් ඉරුන්තිරුක්කින්රතු. ඉන්රු නාංකළ් අතනෛත්තාන් තිරුත්තියිරුක්කින්රෝම්. එනවේ කණක්කාය්වාළර් තලෛමෛ අතිපති තිණෛක්කළුම් චෙයර්පාට්ටිල් ඉරුන්තපෝතුම් අතර්කුරිය නටවටික්කෛකළෛ මේර්කොළ්වතර්කාන වාය්ප්පුකළ් කාණප්පට්ටිරුක්කවිල්ලෛ. කණක්කාය්වින්පෝතු අවතානික්කප්පට්ට මුරෛමෛකළ් මර්රුම් කට්టුප්පාට්ටුක් කුරෛපාටුකළ් අව්වප්පෝතු මන්රත්තින් තලෛවරින් කවනත්තිර්කුක් කොණ්ටු වරප්පට්ටන.

පින්වරුම් කට්టුප්පාට්ටුත් තුරෛකළිල් විචේට කවනම් තේවෛප්පටුකින්රතු. අතාවතු කුරිත්තපටි ඔප්පන්ත නිර්වාකම්

---

* *පුස්තකාලයේ තබා ඇත.*

* *නූනිලෛයත්තිල් වෛක්කප්පට්ටුළ්ළතු.*

* *Placed in the Library.*

நிறைவேறாமை, பதவியணி நிர்வாகம் மேற்கொள்ளப்படாமை என்பனவாகும். இதுபோன்ற பல்வேறு குறைபாடுகள் அந்த அறிக்கையில் சுட்டிக்காட்டப்பட்டுள்ளதோடு, பொதுக் கணக்குகளை மேற்கொள்வதற்குரிய கணக்குப் புத்தகங்களை சமர்ப்பிக்க வேண்டும், பராமரிக்க வேண்டும் என்பது சம்பந்தமாகச் சுற்றறிக்கைகளில் சுட்டிக்காட்டப்பட்டுள்ளபோதும், கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களத்தினால் அறிவிக்கப்பட்ட அறிக்கையிலே வெறும் CR books களிலே கணக்குகள் பேணப்பட்டிருக்கின்றன என்று சொல்லப்பட்டிருக்கின்றது. இத்தகைய குறைபாடுகளைக் கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம் கண்டுபிடித்தபோதும்கூட, 2005ஆம் ஆண்டிலிருந்து 2018ஆம் ஆண்டுவரையான 13 ஆண்டுகள் சௌமியமூர்த்தி தொண்டமான் ஞாபகார்த்த மன்றத்தில் இடம்பெற்றிருக்கக்கூடிய பல்வேறு கணக்கீடுகள் தொடர்பான முறைகேடான விடயங்கள் பற்றிய அறிக்கையைத் தயாரிப்பதற்கோ அல்லது விசாரணைகளை நடத்துவதற்கோ கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களத்தினால் முடியாமல் போயிருக்கின்றது. எனவே, இத்தகைய குறைபாடுகளைச் சரி செய்வதற்காகவே இந்தச் சட்டத்தின் ஊடாக நாங்கள் பல்வேறு நிவாரணங்களை எதிர்பார்க்கின்றோம்.

இப்பொழுது இந்தச் சபையில் இருக்கின்ற COPE குழுவின் தலைவர் கௌரவ சுனில் ஹெந்துன்னெத்தி அவர்களுக்கு நாங்கள் நன்றி தெரிவிக்க வேண்டும். ஏனென்றால் தொடர்ச்சியாக இந்தப் பாராளுமன்றத்தில் நாங்கள் வலியுறுத்தி வந்ததன் அடிப்படையில் - எங்களது தொடர்ச்சியான அழுத்தங்களின் ஊடாக - அவர் இப்பொழுது குறித்த மன்றத்தை COPE குழுவுக்கு அழைத்துள்ளார். கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம் குறித்த விசாரணைகளை உரிய முறையில் மேற்கொள்வதற்குப் பல்வேறு தடங்கல்கள் இருந்த நிலையில்தான் அவர் COPE குழுவின் தலைவர் என்கின்ற முறையிலே அந்தக் குழுவின் முன்னிலையில் குறித்த மன்றத்தினரை தற்போது அழைத்திருக்கின்றார்.

I want to thank the Chairman of the Committee on Public Enterprises, the Hon. Sunil Handunnetti. You have directed the Chairman of Savumiamoorthy Thondaman Memorial Foundation to submit a report signed by him on or before 04th August, 2018 to the Secretariat through the Secretary to the Ministry with regard to the matters referred to in the Auditor General's Report for the year 2015 and a Report on the Performance and the Current Affairs of the institution indicating the audit paragraph numbers referred to in the AG's report.

සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, ඔබතුමා වැදගත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරලා තිබෙනවා. විගණකාධිපති දෙපාර්තමේන්තුවට කලින් පනතෙන් කරන්න බැරි වෙච්ච දේවල් කෝප් එකට වාර්තා කරන්න කියලා ඔබතුමාගේ ලිපියේ සඳහන් කරලා තිබෙනවා. ඒ ගැන ඔබතුමාට බොහොම ස්තුතිවන්ත වෙනවා. අද අපි මේ සම්මත කරන්න යන පනත් කෙටුම්පත එන තුරු ඉන්නේ නැතුව අපේ ඉල්ලීම පරිදි ඔබතුමා සභාපතිතුමා විධියට ඉදිරිපත් වෙලා මේ වැඩ කටයුතු කරන්න පටන් ගත්තාට බොහොම ස්තුතිවන්ත වෙනවා. මේ වාගේ -

இதுபோன்ற முறைகேடான பல நிறுவனங்கள் இருக்கின்றன. ஆனால், உதாரணத்திற்காக குறித்த மன்றம் சம்பந்தமான அறிக்கையை நான் இங்கு முன்வைக்கின்றேன். இதுபோன்ற பல பொறுப்புமுயற்சிகளில் முறையாகக் கணக்குகள் பேணப்படாமை பற்றி நாங்கள் இந்த உயரிய சபையிலே தெரிவித்திருக்கின்றோம். எனவே, கணக்காய்வுத் திணைக்களமாக இருக்கட்டும், COPE குழுவாக இருக்கட்டும் அல்லது COPA குழுவாக இருக்கட்டும் இது எல்லாமே கணக்கு நடவடிக்கைகள் முடிவுற்ற பின்னரே அவதானிப்புகளைச் செய்திருக்கின்றன. எனவேதான் நான் உட்பட 16 பாராளுமன்ற உறுப்பினர்கள் ஒன்று சேர்ந்து இந்தப் பாராளுமன்றத்திலே மதிப்பாய்வுக்கான குழுவொன்றை கோரி நிற்கின்றோம்.

අපට ඕනෑ, ඇගයීම් පිළිබඳව කමිටුවක්. ඕනෑම ව්‍යාපෘතියක් පටන් ගන්නට කලින් අපි ඒ ගැන අධ්‍යයනය කරලා බලන්න ඕනෑ මේක වැදගත්ද- whether it is viable to this country- කියලා. ඒ වාගේ දෙයක් අපට අනිවාර්යයෙන්ම ඕනෑ. ඒ සම්බන්ධයෙන් වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කරගෙන යනවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතුමා ඉදිරිපත් කරන්නේ වැදගත් යෝජනාවක්. දහනවවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යටතේ හදපු ජාතික ප්‍රසම්පාදන කොමිසමත් - National Procurement Commission එකත්- මේ වාගේම බලාත්මක කළෝතින් ඒ ක්‍රියාවලිය ආරම්භ කරන්න පුළුවන්.

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

අනිවාර්යයෙන්ම. අපි දැනටමත් කැබිනට් අනුමැතිය ලබා ගෙන තිබෙනවා, ඇගයීම් පිළිබඳව ප්‍රතිපත්තියක් මේ රටට යෝජනා කරන්නට. සංවර්ධන ව්‍යාපෘති සඳහා ඒ වාගේ වාර්තාවක් ලබා ගන්න ඕනෑ. ඒකට අමතරව ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමනි, අපේ අගමැතිතුමා, ජනාධිපතිතුමා හා කථානායකතුමා ඉදිරියේදී මගේ පෞද්ගලික යෝජනාවක් හැටියට පාර්ලිමේන්තු කමිටු meeting එකේදී මම යෝජනා කරලා තිබෙනවා, COPE, COPA වාගේම ඇගයීම් පිළිබඳව කමිටුවක් පත් කරන්න කියලා. We must have a committee on evaluation in Parliament before we start any development project. පක්ෂ-විපක්ෂ භේදයකින් තොරව ඕනෑම මන්ත්‍රී කණ්ඩායමකට ඒකට සහභාගී වෙන්න පුළුවන්. එතකොට ඒ කමිටුව ඇතුළේදී ඒ වාගේ දේවල් හදන්න අපට තීරණ ගන්න පුළුවන්.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இதுவரை காலமும் இதுபோன்ற மன்றங்களினூடாகத்தான் மலைநாட்டு அபிவிருத்தி தொடர்பான விடயங்கள் முன்னெடுக்கப்பட்டு வந்தன. தனிப்பட்ட கட்சிகளின் அல்லது குடும்பங்களின் செல்வாக்கினூடான இத்தகைய மன்றங்களின்மூலம் மக்கள் சார்பான அபிவிருத்தித் திட்டங்களை முன்னெடுக்க முடியாது என்ற அடிப்படையிலே, பெருந்தோட்டப் பகுதிகளில் புதிய கிராமங்களை அமைப்பதற்கான அதிகாரசபையொன்றை நிறுவுவதற்குக் கடந்த மூன்றாண்டு காலமாக நாங்கள் கடினமாக உழைத்தோம். அதேநேரம் அது சம்பந்தமான குறித்த சட்டமூலமொன்றை அமைச்சரவையின் அனுமதியைப் பெற்றுக்கொண்டு, அடுத்த மாதமளவில் இந்த உயரிய சபையிலே சமர்ப்பிக்கவிருக்கின்றோம். மலைநாடு சார்ந்த அபிவிருத்தித் திட்டங்களை முறைகேடான கணக்கீடுகளின் ஊடாக மேற்கொள்கின்ற நிலைமையை மாற்றியமைக்கும் முகமாக பாராளுமன்றத்துக்குப் பொறுப்புக்கூறக்கூடிய, கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களத்துக்குப் பொறுப்புக்கூறக்கூடிய வகையிலான பொதுமக்களின்

[ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා]

நிதியைச் சரியாகப் பயன்படுத்தக்கூடிய அதிகாரசபையை அமைப்பது தொடர்பிலான சட்டமூலம் இந்தச் சபையில் விவாதத்துக்கு வரும்பொழுது அனைத்துப் பாராளுமன்ற உறுப்பினர்களும் அதனை ஆதரிக்க வேண்டும் என்று கோரி, வாய்ப்புக்கு நன்றி கூறி, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Thank you. Next, the Hon. Risad Badhiutheen.

[பி.ப. 6.04]

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு றிஸாட் பதியுதீன் - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ சபைக்குத் தலைமைதாங்குகின்ற பிரதிச் சபாநாயகர் அவர்களே, வரலாற்று முக்கியத்துவம் வாய்ந்த தேசிய கணக்காய்வுச் சட்டமூலம் தொடர்பான விவாதத்திலே பேசுவதற்குச் சந்தர்ப்பம் தந்தமைக்காக உங்களுக்கு நன்றி கூறிக் கொள்கின்றேன். தேசியக் கணக்காய்வுச் சட்டமூலம் நிறைவேற்றப்படுமா? இல்லையா? என்பது குறித்துப் பல ஊடகங்கள் தொடர்ந்தேர்ச்சியாக எழுதிக் கொண்டிருந்ததையும், சில அதிகாரிகள் இந்தச் சட்டமூலம் தொடர்பாக அச்சப்பட்டதையும் நாங்கள் பார்த்தோம். ஆனால், மக்கள் தந்த ஆணைக்கு மதிப்பளித்து, இந்த நல்லாட்சியிலே இந்தச் சட்டமூலம் நிறைவேற்றப்பட இருப்பதையிட்டு நான் மிகவும் சந்தோசப்படுகின்றேன். நமது நாட்டில் சில அதிகாரிகள் மற்றும் அரசியல்வாதிகள் பல தவறுகளைச் செய்திருக்கிறார்கள்; செய்து கொண்டிருக்கிறார்கள். ஆனால், சிலநேரங்களில் தவறு செய்யாத அதிகாரிகளும் அரசியல் வாதிகளும் தண்டிக்கப்படுகின்றார்கள். எவ்வாறாயினும் இன்று குறித்த சில அதிகாரங்களைக் கொண்ட இந்தச் சட்டமூலமானது நிறைவேற்றப்படுகின்றபோது, நிச்சயமாக ஒரு சுபீட்சமிக்க எதிர்காலம் நமது நாட்டுக்குக் கிடைக்குமென்ற பெரிய நம்பிக்கை எனக்கு இருக்கின்றது. எனவே, கணக்காய்வாளர் நாயகம் அவர்களும் மற்றும் அதிகாரிகளும் தங்களுடைய கடமையை மதத்துக்கு அப்பால், அரசியலுக்கு அப்பால், சுயநலன்களுக்கு அப்பால், ஒரு புண்ணிய பணியாகக் கருதிக் கண்ணியமாக, நேர்மையாகச் செய்வதற்குப் பழகிக்கொள்ள வேண்டும்.

இன்று ஒரு சில தேரர்மார் வில்பத்து சம்பந்தமான கணக்காய்வாளர் நாயகத்தின் அறிக்கையின் ஒரு துண்டைப் பிடித்துக் கொண்டு, 1990ஆம் ஆண்டு பிரபாகரன் காலத்தில் வடக்கிலிருந்து வெளியேற்றப்பட்ட முஸ்லிம் மக்களுடைய மீள்குடியேற்றத்தை என்னுடன் சம்பந்தப்படுத்தி, சிறிது காலமாக இந்த நாட்டிலே மிக மோசமான முறையில் பெரிய ஒரு நாடகத்தை அரங்கேற்றி வந்தார்கள். ஆனால், அண்மையிலே பீல்ட் மார்ஷல் சரத் பொன்சேகா அவர்கள் வன வளத்துக்குப் பொறுப்பான அமைச்சராக நியமிக்கப்பட்ட பின்னர், அந்தப் பிரதேசத்துக்கு விஜயம் செய்து, குறித்த அதிகாரிகளோடு கலந்துரையாடி, அந்தப் பகுதி முழுவதையும் பார்வையிட்ட பிறகு "வில்பத்து வனப் பிரதேசத்துக்குள் எந்தவோர் அத்துமீறிய குடியேற்றமும் இடம்பெறவில்லை" என்று சொல்லியுள்ளார். அதற்காக அவருக்கு நான் நன்றி கூறுகின்றேன்.

ஆனால், இந்த ஆட்சி மாற்றத்துக்குப் பங்காளியாக என்னுடைய கட்சியோடு நான் சென்றேன் என்ற காரணத்தினால் என்னைப் பழிவாங்க வேண்டும் என்பதற்காக, அரசியலுக்காக, சுயநலத்துக்காக, 'கொமிஷன்'க்காக, பணத்துக்காக, NGO களின் தேவைக்காக ஒரு சில தேரர்களும் ஒரு சில வெளிநாட்டு diaspora களுடைய agent களும் இவ்வாறான ஓர் அபத்தமான - உண்மைக்குப் புறம்பான குற்றச்சாட்டை என்மீதும் என்னுடைய சமுதாயத்தின் மீதும் - ஓர் இலட்சம் அகதிகள்மீதும் சுமத்தி வந்தனர். அதேநேரம் Auditor-General's Department இனுடைய குறித்த அறிக்கை பிழையாக அதாவது தெளிவில்லாமல் வெளியிடப் பட்டதனூடாக இன்று எங்களுடைய முழுச் சமூகமும் வேதனைப்படுகின்றது. குறித்த கூட்டத்தினர் அந்த அளவுக்குத் தங்களுடைய செயல்பாட்டை முன்னெடுத்திருக்கின்றார்கள். எனவே, இவ்வாறான அறிக்கைகளை வெளியிடுகின்ற பொழுது நேர்மைத் தன்மையோடும் புனிதத் தன்மையோடும் செயற்பட வேண்டுமென்பதைச் சம்பந்தப்பட்ட திணைக்கள அதிகாரிகள் அத்தனை பேரும் புரிந்துகொள்ள வேண்டும்.

எமது நாடு சுபிட்சமானதொரு நாடாக மலருவதற்குப் பணம் மாத்திரமல்ல, அரச திணைக்களங்களிலுள்ள அதிகாரிகள் மற்றும் உத்தியோகத்தர்கள்கூட காரணமாக அமையலாம். அதேநேரம் இன்று தனியார் நிறுவனங்களிலே வேலை செய்வதற்கு ஆட்கள் இல்லாத ஒரு நிர்ப்பந்த சூழல் கைத்தொழிற்பேட்டைகளிலே ஏற்பட்டிருப்பதை நான் பார்க்கின்றேன். காரணம், அரச தொழிலினூடாகத் தங்களுடைய pension இனை உறுதிப்படுத்திக் கொள்ளலாமென்ற எண்ணத்தில் இன்று மக்கள் அரச தொழில் வாய்ப்புக்களைத் தேடிச் செல்கின்றார்கள். தாங்கள் எந்தவொரு productivity இல்லாதவர்களாக இருந்தாலும் தங்களால் எந்தவொரு பிரயோசனமான வேலைத்திட்டம் மேற்கொள்ளப்படாவிட்டாலும், காலை 8.30 மணியிலிருந்து மாலை 4.15 மணிவரை காரியாலயத்தில் இருந்துவிட்டு, 60 வயதுவரை எந்தப் பிரச்சினையும் இல்லாமல் அரச தொழிலினூடாகச் சம்பளத்தைப் பெற்றுக்கொண்டு வாழலாமென்ற ஒரு நம்பிக்கையிலேயே சம்பந்தப்பட்டவர்கள் அரச தொழில் வேண்டிப் போராட்டம் நடாத்துகின்றார்கள். தனியாக நின்று முன்னேறலாமென்ற நம்பிக்கை இல்லாததால்தான் இவ்வாறு இவர்கள் போராடுகின்றார்கள்.

சில வெளிநாடுகளோடு ஒப்பிடுகின்றபொழுது நமது நாடு கல்வி ரீதியாக உச்சத்தில் இருக்கின்றது. அதேநேரம் நம்மிடத்திலே மனித வலு இருக்கின்றது. ஆனால், நம்பிக்கை இல்லை. அதேநேரம் எந்தவிதமான நல்ல சிந்தனையுமில்லாமல் அரசியலை மாத்திரம் மையமாகக் கொண்டு ஒவ்வோர் அரசாங்கமும் தன்னுடைய ஆட்சியைத் தக்கவைத்துக்கொள்ள வேண்டுமென்பதற்காகப் பல்வேறு வகையான நியமனங்களை வழங்குகின்றபொழுது அதிக பணம் செலவாகின்றது. ஆனால், அந்தப் பணத்தைச் செலவழிப்பதன்மூலம் எந்தப் பிரயோசனமுமில்லாது போவதையும், பல்வேறு வகையான ஊழல்களும் சிக்கல்களும் ஏற்படுவதையும் நாங்கள் பார்க்கின்றோம்.

ගරු සභාපතිතුමනි, මා පහත සඳහන් සංශෝධනය ඉදිරිපත් කරනවා:

"43 වන පිටුවේ, 19 වන පේළිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කරන්න:-
'(ඊ) (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ නිකුත්' "

සංශෝධනය පිළිගත යුතුය යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
திருத்தம் விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Amendment put, and agreed to.

55 වන වගන්තිය, සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
55ஆம் வாசகம் திருத்தப்பட்டவாறு சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 55, as amended, ordered to stand part of the Bill.

56 වන වගන්තිය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතු යයි නියෝග කරන ලදී.
56ஆம் வாசகம் சட்டமூலத்தின் பகுதியாக இருக்கவேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Clause 56 ordered to stand part of the Bill.

උප ලේඛනය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
அட்டவணை சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
Schedule ordered to stand part of the Bill.

ප්‍රඥප්ති වගන්තිය සහ නාමය පනත් කෙටුම්පතෙහි කොටසක් හැටියට තිබිය යුතුයයි නියෝග කරන ලදී.
පනත් කෙටුම්පත, සංශෝධන සහිතව වාර්තා කරන ලදී.
சட்டமாகு வாசகமும் தலைப்பும் சட்டமூலத்தின் பகுதியாக இருக்க வேண்டுமெனக் கட்டளையிடப்பட்டது.
சட்டமூலம் திருத்தங்களுடன் அறிக்கை செய்யப்பட்டது.
Enacting Clause and Title ordered to stand part of the Bill.
Bill reported with Amendments.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පනත් කෙටුම්පතෙහි සෝදුපත්වල මුද්‍රණ දෝෂ, ව්‍යාකරණ දෝෂ, අංක දෝෂ නිවැරදි කර ගැනීම හා ආනුෂංගික සංශෝධන සඳහා අවසර දෙන ලෙස ද ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පනත් කෙටුම්පත සංශෝධිතාකාරයෙන් දැන් තුන්වන වර කියවිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
පනත් කෙටුම්පත ඊට අනුකූලව සංශෝධිතාකාරයෙන්, තුන් වන වර කියවා සම්මත කරන ලදී.
வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.
அதன்படி, சட்டமூலம் திருத்தப்பட்டவாறு மூன்றாம்முறையாக மதிப்பிடப்பட்டு நிறைவேற்றப்பட்டது.
Question put, and agreed to.
Bill, as amended, accordingly read the Third time, and passed.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව, ගරු කනක හේරත් මන්ත්‍රීතුමා.

ඊට ප්‍රථම, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා මූලාසනාරූඪ විය.

அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு விஜேபால ஹெட்டி ஆரச்சி அவர்கள் தலைமை வகித்தார்கள்.

Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. WIJEPALA HETTIARACHCHI *took the Chair.*

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කනක හේරත් මන්ත්‍රීතුමා, කථා කරන්න.

මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළ කළමනාකරණය සඳහා විධිමත් යන්ත්‍රණයක්

மத்தள சர்வதேச விமான நிலைய முகாமைத்துவம் தொடர்பான சரியான பொறிமுறை

PROPER MECHANISM FOR MANAGEMENT OF MATTALA INTERNATIONAL AIRPORT

[අ.භා. 6.49]

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සභාව කල් තබන අවස්ථාවේ මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ අසාර්ථක ව්‍යාපෘතියක් බව ප්‍රකාශ කරමින් එම ගුවන් තොටුපොළ ආරම්භයේ සිට මේ දක්වා ක්‍රියාත්මකව තිබුණු එකම ගුවන් සමාගම වන ෆ්ලයිඩුබායි ගුවන් සමාගම සමඟ ඇති කරගෙන ඇති ගිවිසුමද නොසලකා හරිමින් ඉන්දියානු සමාගමකට විකිණීමට

වර්තමාන රජය කටයුතු කරයි. ශ්‍රී ලංකාවට වටිනා සම්පතක් වන මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ රැක ගනිමින් එහි උපරිම ඵල නෙළා ගැනීමට හැකි ආකාරයේ විධිමත් වැඩ පිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයයි මෙම ගරු සභාවට මම යෝජනා කරමි."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම යෝජනාව පිළිබඳව කරුණු කීපයක් ඉදිරිපත් කිරීමටත් මා බලාපොරොත්තු වනවා. ඔබ අප සියලුදෙනාම දන්නා මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ යුගයේදී ආරම්භ වුවත්, 1994 වසරේදීත් ඒ පිළිබඳව යෝජනා ඉදිරිපත් වී තිබෙනවා. දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය යටතේ, එවකට නාගරික සංවර්ධන අමාත්‍යවරයා ලෙස කටයුතු කළ වර්තමාන මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමාගේ අමාත්‍යාංශය යටතේ තමයි ඒ යෝජනාව පළමුවෙන්ම ඉදිරිපත් වෙලා තිබෙන්නේ. මෙය ඊටත් කලින් කිහිප වතාවක්ම ඉදිරිපත් වුණු යෝජනාවක්. වර්තමාන අග්‍රාමාත්‍ය, ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා අග්‍රාමාත්‍යවරයා ලෙස කටයුතු කළ 2004 වසරේදීත් වැල්ලවාය, කුඩාඔය කියන ප්‍රදේශයේ -මත්තලට කිලෝමීටර දෙකක් පමණ ඈතින්- එතුමා පළමු වතාවට මේ සඳහා මුල්ගල තැබුවා. නමුත් මේ සඳහා මුදල් හොයාගෙන, ඒ මුදල් වෙන් කරගෙන මත්තල ගුවන් තොටුපොළේ වැඩ කටයුතු ආරම්භ කරන්න පසුගිය රජය සමයේ මහින්ද රාජපක්ෂ මැතිතුමාට හැකියාව ලැබුණා. ඒ අනුව, පළමුවන අදියරට ඩොලර් මිලියන 209ක් පමණ වියදම් කරලා මත්තල ගුවන් තොටුපොළ හදා අවසන් කළා. ඒ තුළින් අපට තේරුම් යන්නේ, මොන රජය වුණත් එදා එවැනි ගුවන් තොටුපොළක අවශ්‍යතාව හඳුනාගෙන තිබුණාය කියන එකයි. අවශ්‍යතාව හඳුනාගෙන තිබුණාට, එය ක්‍රියාත්මක කරන්න කිසිම කෙනෙකුට හැකියාවක් ලැබුණේ නැහැ; හරි ප්‍රතිපත්තියක් තිබුණේ නැහැ. එදා රනිල් වික්‍රමසිංහ මහත්මයා ඡන්ද දායකයන්ට පොරොන්දු වුණා, 2004 වසරේදී මුල්ගල තැබූ එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනවාය කියා. නමුත් ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක වුණේ නැහැ. කෙසේ වෙතත්, 2015දී මේ යහපාලන රජය බලයට පත් වෙලා පළමුවෙන්ම කළේ මොකක්ද? මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ ඉතිරි වැඩකටයුතු අවසන් කරලා එය සංවර්ධනය කරනවා වෙනුවට එතුමන්ලා එහි වී ගබඩා කළා. මේ වී ගබඩා කිරීම තුළින් ජාත්‍යන්තර වශයෙන් එම ගුවන් තොටුපොළට තිබෙන පිළිගැනීම නැති කරන්න මේ රජය කටයුතු කළා. එපමණක් නොවෙයි, එම ගුවන් තොටුපොළට ලැබෙන මිලියන ගණනක මුදලක් අහිමි කළා. එදා එහි වී ගබඩා කළ නිසා මිලියන ගණනාවක අලාභයක් සිදු වුණා.

ඊළඟට, මේ රජය මොකක්ද කළේ? ශ්‍රීලන්කන් ගුවන් සමාගමෙන් මත්තල ගුවන් තොටුපොළට ගොඩ බස්වන සියලුම ගුවන් යානා ගොඩ බැස්වීම නතර කළා. තමන්ට හදා ගන්න බැරි වුණු මත්තල ගුවන් තොටුපොළ විකිණීමට අද කටයුතු කිරීමෙන් මේ රජය බලාපොරොත්තු වන්නේ මොකක්ද? මත්තල ගුවන් තොටුපොළට ගුවන් යානා ගොඩ බස්වපු එකම ගුවන් සමාගම වූ ෆ්ලයිඩුබායි ගුවන් සමාගමේ ගුවන් යානා ගොඩ බස්වන එකත් නවත්වන්න, අත් හිටුවන්න තමයි මේ කටයුතු කරන්නේ. "පාඩු ලබන ආයතනයක් නිසා, මත්තල ගුවන් තොටුපොළේ කටයුතු තාවකාලිකව නවත්වනවා" කියා අපේ නියෝජ්‍ය අමාත්‍යතුමා ප්‍රකාශ කර තිබෙනවා අප රූපවාහිනියෙන් දැක්කා. නමුත් අපි කියන්න ඕනෑ, ෆ්ලයිඩුබායි ගුවන් සමාගම කියන්නේ, මත්තල ගුවන් තොටුපොළ ආරම්භ කරනවාත් සමඟම ගුවන් ගමන් ආරම්භ කළ ගුවන් සමාගමක් බව. මා හිතන විධියට එදා සිවිල් ගුවන් සේවා අධිකාරිය සමඟ ඔවුන් ගිවිසුම්ගත වෙලා තිබුණා, ලංකාවට -කටුනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළට- ගුවන් ගමන් වාර දෙකකදී ගොඩ බැස්සවීම් කරනවා නම්, අඩුම තරමේ එයින් එකක් මත්තල ගුවන් තොටුපොළට ගොඩබස්සන්න ඕනෑය කියා.

2013 වසර වන විට ෆ්ලයිඩුබායි කියන ගුවන් සමාගම තුන් වතාවක් ගුවන් යානා ගොඩ බස්සනවා. 2016 වෙද්දී එය හතරවතාවක් වෙනවා. 2017 වෙද්දී ඒක පස් වතාවක් වෙනවා. ෆ්ලයිඩුබායි ගුවන් සමාගම, එමිරේට්ස් ගුවන් සමාගම සමඟ ගිවිසුමක් ඇති කරගෙන 2017දී වාර ප්‍රමාණය ඒ අය අතර බෙදා ගන්නවා. මේකම තමයි එදාත් කළේ. එදා ශ්‍රීලන්කන් ගුවන් සමාගමට තිබුණු slots ටික ලබා ගැනීමට එමිරේට්ස් ගුවන් සමාගම කටයුතු කළා වාගේ, නැවතත් එමිරේට්ස් ගුවන් සමාගම මෙය ලබාගැනීමට කටයුතු කර තිබෙනවා.

[ගරු කනක හේරත් මහතා]

අපේ නියෝජ්‍ය අමාත්‍යතුමා කියූ ආකාරයට, මෙය අලාභ ලබන සමාගමක් නොවෙයි. 2017දී සමාගමේ මුළු ලාභය ඇමෙරිකානු ඩොලර් බිලියන 10.1යි. ඒ කියන්නේ, ලංකාවට එන එක පාඩුවක් නොවෙයි. ඊට අමතරව, අපේ රටේ cargo ප්‍රමාණය ඉහළම ප්‍රතිශතයකින් වැඩි වෙලා තිබෙන්නේ මත්තල ගුවන් තොටුපොළ මඟිනුයි. දකුණු පළාතේ පමණක් නොවෙයි, උඟව පළාතේ තිබෙන පලතුරු සහ එළවළු මාලදිවයිනට, සවුදි අරාබියට, ඩුබායිවලට යැවීමටත් මේ තුළින් හැකියාව ලැබී තිබෙනවා. එම නිසා මෙයින් කිසිම පාඩුවක් සිදු වෙලා නැහැ. අපේ කෘෂි කර්මාන්තය ඉහළ නැංවීමට හැකි ආකාරයට තමයි මේ ගුවන් තොටුපොළ නිර්මාණය කර තිබෙන්නේ.

"ගුවන් තොටුපළේ වැඩකටයුතු තාවකාලිකව නවත්වලා ඔක්තෝබර් මාසයේ නැවත ආරම්භ කරනවා" කියා ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා කියා තිබෙනවා. ලබන වර්ෂයේ මාර්තු මාසය වන තෙක් ෆ්ලයිඩුබායි ගුවන් සමාගමේ ගමනාන්ත සියල්ල cancel කර තිබෙන බව පසුගිය දවසක සිදු කළ විපරමකින් පසු මට සොයා ගැනීමට හැකි වුණා. මත්තල ගුවන් තොටුපොළ විකිණීමට පිඹුරු පත් සකස් කිරීමේ අරමුණින් තමයි ෆ්ලයිඩුබායි ගුවන් සේවය නැවැත්වීමට කටයුතු කර තිබෙන්නේ. ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා මේ ගරු සභාවේ දැන් ඉන්නවා. ගරු ඇමතිතුමනි, මේ සම්පත විකිණීමට කටයුතු කිරීම සිවිල් ගුවන් සේවා පනතට පටහැනියි. එම නිසා ඒ පනත වෙනස් කරනවාද, නැද්ද කියාත් දැන ගැනීමට මම කැමතියි. විශේෂයෙන්ම මේ ගුවන් තොටුපොළ විකුණන්න නම් සිවිල් ගුවන් සේවා පනත වෙනස් කිරීමට සිදු වෙනවා. එතකොට රටේ ආරක්ෂාවටත් ලොකු බලපෑමක් ඇති වෙනවා. ඒ පිළිබඳව තමුන්නාන්සේලා දන්නවා. ඉන්දියාවට හෝ වෙනත් රටකට හෝ මේ ගුවන් තොටුපොළ ලබා දුන්නාට පසුව රටේ ආරක්ෂාවට විශාල බලපෑමක් ඇති වෙනවාය කියන කාරණයත් මේ අවස්ථාවේ ප්‍රකාශ කරන්න ඕනෑ. මෙම ගුවන් තොටුපළ විකිණීමට හේතු වශයෙන් නොයෙකුත් කරුණු කියනවා. ලාභ ලබන්නේ නැහැය කියනවා; කුරුල්ලන්ගෙන් ප්‍රශ්න තිබෙනවාය කියනවා; bird strikes තිබෙනවාය කියනවා. සෑම ගුවන් තොටුපොළකම ඒ ආකාරයේ ප්‍රශ්න තිබෙනවා, ගරු ඇමතිතුමනි. නමුත් මෙම ගුවන් තොටුපොළ අපේ ඉදිරි අනාගතයට තිබෙන සම්පතක් බව මම මේ අවස්ථාවේ කියනවා.

මෙම ගුවන් තොටුපොළ අලාභ ලබනවාය කිව්වාට, මෙහි තිබෙන ණය ගෙවා ගැනීමට බැරිව කවදාවත් අපට ප්‍රශ්නයක් ඇති වෙලා නැහැ. වරාය සමාගමෙන් හම්බන්තොට වරායේ ණය ගෙව්වා වාගේ, අපේ ගුවන් තොටුපොළ සමාගම අද ලාභ ලබලා ඒ ලාභයෙන් මේ ණය ප්‍රමාණය ගෙවා තිබෙනවා. ඒ වාගේම ඉදිරියටත් එය ගෙවීමේ හැකියාව තිබෙනවා. එපමණක් නොවෙයි, මෙම ගුවන් තොටුපොළේ ගුවන් සීමාවේ පියාසර කිරීම - overfly - තුළින් පමණක් එක් දිනකට ඇමෙරිකානු ඩොලර් 15,000ක් අපට නිකම් ඉදලාත් ලැබෙනවා. මේ ගුවන් තොටුපළට එක ගුවන් යානයක්වත් ආවේ නැතත්, ඒ මුදල් ප්‍රමාණය අපට ලැබෙනවා. මේ කාරණය වැරැදියි නම් නිවැරැදි කරන්න. අපට දිනකට ඇමෙරිකානු ඩොලර් 15,000ක් ලැබෙනවා. ඒ ඩොලර් 15,000 ලැබුණා නම් අපට ඇති. මේ ආණ්ඩුව සැලැස්මක් ඇතිව ක්‍රියා කළා නම්, සැලැස්මක් ඇතිව මේ ගුවන් තොටුපොළ හරියට අළෙවිකරණය කළා නම්, අපට අද වන විට මේ ගුවන් තොටුපොළ වහන්න වන්නේ නැහැ; විකුණන්න වන්නේ නැහැ. එසේ වුණා නම් අද වන විට අපේ රටට තව තවත් ගුවන් සමාගම් ගෙන ඒමට හැකියාව ලැබෙනවා. මේ ගුවන් තොටුපොළ තමුන්නාන්සේලාට, අපට පමණක් නොවෙයි, ඉදිරි අනාගතයේ අපේ දරුවන්ගේත් සම්පතක්. ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට අපි ගරු කරනවා. එම නිසා ඔබතුමා අමාත්‍ය ධුරය දරන කාල වකවානුවේදී මෙම සම්පත විනාශ කරන්න දෙන්න එපාය කියා අපි ඉල්ලා සිටිනවා. එහෙම කළොත්, එය ඔබතුමාට දේශපාලන වශයෙන් ලොකු කැලලක්ය කියන එකත් අපි මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. විශේෂයෙන්ම මේ අවස්ථාවේදී මෙම යෝජනාව ගෙන එන්නේත් අපි ආදරය කරන, අපේ රටේ තිබෙන මේ සම්පත ආරක්ෂා කර ගැනීම සඳහායි.

ගරු ඇමතිතුමනි, ඔබතුමා මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන්න. උදේ වරුවේ ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා ප්‍රකාශ කර තිබුණා, සියයට 30ක් ශ්‍රී ලංකාවටත්, සියයට 70ක් ඉන්දියානු සමාගමකටත් ලබා දෙනවා කියලා. අපි ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ, මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විදෙස් සමාගම්වලට විකුණන්න එපා; එය රැක ගන්න කටයුතු කරන්න; දේශපාලන වශයෙන් කුහක හැඟීමෙන් බලා කටයුතු කරන්න ඉඩ දෙන්න එපාය කියන ඉල්ලීම කරමින් මා නවතිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. යෝජනාව ස්ථිර කිරීම, ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා.

[අ.භා. 6.59]

ගරු ඩී. වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හම්බන්තොට දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් වශයෙන්, ඒ වාගේම මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විදේශීයකරණයට විරුද්ධ මන්ත්‍රීවරයෙක් වශයෙන් ගරු කනක හේරත් මන්ත්‍රීතුමා ගෙනා ඒ යෝජනාව මා ස්ථිර කරනවා.

මිහිදු හාමුදුරුවන්ගේ දේශනයකින් මගේ කථාව මා ආරම්භ කරන්නම්. එදා මිහිදු හාමුදුරුවෝ දේවානම්පිය තිස්ස රජතුමාට දේශනා කර තිබෙනවා, "රටක සම්පත්වල අයිතිය තිබෙන්නේ අනාගතයට. ඔබතුමා මෙහි භාරකරුවා මිසක්, අයිතිකරුවා නොවෙයි." කියලා. මෙය එදාටත් වැඩිය අදට තමයි වලංගු වන්නේ. අපේ රටේ ජනාධිපතිතුමාට, අගමැතිතුමාට අපි අද මතක් කර දෙන්න කැමැතියි, මේ රටේ සම්පත් තමන්ට ඕනෑ විධියට විකුණා දමන්න ඔබතුමන්ලා අයිතිකරුවන් නොවෙයි. ඔබතුමන්ලා මේ රටේ සම්පත්වල භාරකරුවෝ මිසක්, අයිතිකරුවෝ නොවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ-පෙරේදා "The New York Times" පුවත් පත පළ කරපු වාර්තාවක් පදනම් කරගෙන රටේ අවධානය හා මතය වෙන පැත්තකට ගෙන යන්න උත්සාහයක් දරන බව අපි දැක්කා. එක පැත්තකින් මහ බැංකු බැඳුම්කර සිද්ධියත්, අනෙක් පැත්තෙන් මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විකිණීමත්, එහෙම නැත්නම් විදේශීයකරණය රට තුළට ගෙන ඒම ගැන එල්ල වන ජනතා විරෝධය යට ගහන ගමන් ජනතාවගේ අවධානය වෙන පැත්තකට ගෙන යන්න එතුමන්ලා උත්සාහයක් දරන බව අපි දැක්කා. විශේෂයෙන් අද ඉන්දියාවෙන් ගෙනෙන ආයෝජනය කොච්චර දුරට වාණිජ්‍යමය ආයෝජනයක්ද, රට වෙනුවෙන් ගෙනෙන ආයෝජනයක්ද කියලා අපට ලොකු ප්‍රශ්නයක් තිබෙනවා. ඉන්දියාවේ ප්‍රධාන ජාතික පුවත් පතක් වන "The

Hindu" පුවත් පත අද සඳහන් කරන ආකාරයට, ඉන්දියාව මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපළේ ආයෝජනය කිරීමට ප්‍රධානම හේතුව, උපාය මාර්ගික අවශ්‍යතාවක්. මේක උපාය මාර්ගික අවශ්‍යතාවක් වශයෙන් තමයි ඉන්දියාව දකින්නේ. මන්දයත්, අතිශය තීරණාත්මක ජාත්‍යන්තර වරායක් වන හම්බන්තොට වරාය චීනය විසින් 99 අවුරුද්දකට බදු ගැනීමත් සමඟ ඉන්දියානු සාගර කලාපයේ චීන ආධිපත්‍යයෙන් ඉන්දියාවට බලපෑමක් ඇති විය හැකියි. තවද, හම්බන්තොටින් අක්කර 15,000ක භූමියක් චීනයට කර්මාන්ත කලාපයක් වෙනුවෙන් බදු දීමට සූදානමක් පවතී. මේ නිසා හම්බන්තොට ආශ්‍රිත කලාපය, කලාපීය බලවතා වන ඉන්දියාවට අතිශය වැදගත් භූමි භාගයක් බවට පෙරළී හමාරය. ඉන්දියාවේ ප්‍රධාන පුවත් පතක් වන "The Hindu" පුවත් පත වාර්තා කරන ආකාරයට අපට පැහැදිලිව පෙනෙනවා, ඉන්දියාවෙන් ආයෝජනය ගෙනෙන්නේ මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ දියුණු කරන්නවත්, අපේ රටට සුවිශාල ආයෝජනයක් ගෙනෙන්නවත් නොවෙයි, එතුමන්ලාට තිබෙන අභියෝගය නිසා බව. හම්බන්තොට වරාය චීනයට දීමට විරුද්ධව මතයක් ගොඩ නැඟෙනකොට ලංකාවේ රජය විසින් ඒක මැඩ පවත්වන්න දෙන ලද තෑග්ගක් විධියට තමයි අපි මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විදේශීයකරණය, එහෙම නැත්නම් ඉන්දියාවට ලබා දීම දකින්නේ.

මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ කියන්නේ, හුදෙකලා ව්‍යාපෘතියක් නොවෙයි. මෙම ගුවන් තොටුපොළ හදන්න ඕනෑ කියලා අපට කලින් උත්සාහයන් දරා තිබෙනවා. 1994දී චන්ද්‍රිකා මැතිනියගේ ආණ්ඩුව කාලයේදී උත්සාහයක් දරා තිබෙනවා. 2003දී රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා මුල් ගලකුත් තබා තිබෙනවා. හැබැයි, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා අනුගමනය කළ අසාර්ථක ආර්ථික ප්‍රතිපත්ති නිසාත්, එතුමාට ආයෝජන ගෙනෙන්න හැකියාව නැති නිසාත්, එතුමාට ඒ මුදල් ටික ගෙනෙන්න බැරි වූ නිසාත්, මත්තල ගුවන් තොටුපොළ හදා ගන්න එතුමාට බැරි වනවා. හැබැයි, මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ දක්ෂතාවත් එක්ක, හිටපු අමාත්‍ය ගරු චමල් රාජපක්ෂ මැතිතුමාගේ සහ තාරුණ්‍යයට හෙටක් සංවිධානයේ සභාපති නාමල් රාජපක්ෂ මැතිතුමාගේ මැදිහත් වීමෙන් එතුමන්ලාට පුළුවන්කම ලැබුණා, චීන ආයෝජන ලංකාව තුළට ගෙනෙන්න.

ලංකාවට ආයෝජන ගෙනැල්ලා මේ ඉතාම සුවිශාල මත්තල ගුවන් තොටුපොළ හදා ගන්න අපට පුළුවන්කමක් ලැබුණා. හැබැයි, මෙය ගුවන් තොටුපොළක් වශයෙන් විතරක් නොවෙයි හැදුවේ. එක පැත්තකින් වරායක් ගොඩනැඟුවා. අනෙක් පැත්තෙන් ගුවන් තොටුපොළ ගොඩනැඟුවා. අනෙක් පැත්තෙන් highway ආවා. මේ සියලුම දේවල් එක ව්‍යාපෘතියක් වශයෙන් ගොඩනඟා මේ රට සංවර්ධනය කරන්න තමයි අපි එම කටයුතු සූදානම් කළේ. හැබැයි, අද වනවිට මොකක්ද, වෙලා තිබෙන්නේ? අද වනවිට ආයෝජන ඔක්කෝම ටික එකින් එක කඩලා විකුණන්න කටයුතු ආරම්භ කරලා තිබෙනවා. රටේ අපනයනය වැඩි කරන්න ඕනෑ, රටේ කෘෂි කර්මාන්තය දියුණු කරලා කෘෂි අපනයනය එන්න-එන්නම දියුණු කරන්න ඕනෑ කියලා ජනාධිපතිතුමා කියන ආකාරය අපි දකිනවා. හැබැයි, රටේ ජනාධිපතිතුමාට අපි මතක් කරන්න කැමැතියි, දිනෙන්-දින, මාසයෙන්-මාසය, අවුරුද්දෙන්-අවුරුද්ද හම්බන්තොට ගුවන් තොටුපොළ හරහා පිටරට යන බහලු ප්‍රමාණය වැඩි වුණා කියන කාරණය. ඒ වාගේම ඌව වෙල්ලස්සෙන්, රත්නපුරයෙන්, ඇඹිලිපිටියෙන් අපේ එළවළු ටික මැද පෙරදිග රටවලට -ඩුබායි-යන්න පටන් ගත්තා. පළමුවැනි ගුවන් යානයේ සිට අන්තිම ගුවන් යානය දක්වා එම කටයුතු ක්‍රමානුකූලව එන්න-එන්නම වැඩි වුණා. හැබැයි, මේ ආණ්ඩුව බලයට ආවේම මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විකුණන්න ඕනෑය කියාගෙනයි. "මේක අසාර්ථක ව්‍යාපෘතියක්." කියා ගෙන තමයි මේ ආණ්ඩුව බලයට පත් වුණේ. ඒ නිසා මෙතුමන්ලා මේවා ක්‍රමානුකූලව නැවැත්වූවා. පත් වෙන ඕනෑම රජයක්, ඒ වෙනකොට එම රටේ තිබුණු ප්‍රතිපත්ති ඒ විධියටම ඉදිරියට ගෙන යා යුතුයි. පැවති රජය රටක ගුවන් තොටුපොළක් හැදුවාම, ඒකට ගුවන් යානා ගෙන්වා ගැනීමේ වගකීම අලුතින් පත් වන රජය සතු වෙනවා. මේ රටේ අගමැතිතුමා 2016 අය වැය යෝජනා තුළින් කියනවා, "තව ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් හදන්න ඕනෑ." කියලා. හැබැයි, එහෙම කියන අගමැතිතුමාම 2015දී මත්තල ගුවන් තොටුපොළ වී ගබඩාවක් කළා. එහි ප්‍රතිඵලයක් වශයෙන් ගුවන් යානා එන එක නැවතුණා. එහි ප්‍රතිඵලයක් වශයෙන් ලෝකය තුළ මේ airport එකට තිබුණු ratings වැටුණා. ඒවායේ ප්‍රතිඵල වශයෙන් තමයි අන්තිමට අද මත්තල ගුවන් තොටුපොළ ඉන්දියාවට දෙන්න වුණේ. හැබැයි, මේක දෙන්න වුණා නොවෙයි, මේක දෙන්න ඉඩ සැලසුවේ අගමැතිතුමා ඇතුළු මේ ආණ්ඩුව කියලා අපි වගකීමෙන් කියන්න කැමැතියි.

අපි දන්නවා, නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අමාත්‍යවරයෙක්, බණ්ඩාරනායක ප්‍රතිපත්ති අනුගමනය කළ යුතු අමාත්‍යවරයෙක් බව. රටේ සම්පත් විදේශීයකරණය කරන්න කියලා බණ්ඩාරනායක ප්‍රතිපත්තිවල කොහේවත් සඳහන් වෙලා නැහැ. අඩුම ගණනේ පිට රටකට දෙන්න ඕනෑය කියලාවත් එදා ඒ ප්‍රතිපත්තිවල තිබුණේ නැහැ. හැබැයි, අද අපිට ලොකු දුකක් සහ ලජ්ජාවක් තිබෙනවා. රටේ ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සභාපති වශයෙන් සිටියදී, රටේ ජනාධිපතිතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නායකයා වශයෙන් සිටියදී අපේ රටේ සම්පත් මෙහෙම කෑලි කෑලිවලට කඩා විකුණන්නේ කොහොමද, කියලා අපට ප්‍රශ්නයක් තිබෙනවා. මේ ආණ්ඩුව ගැන අපි දන්නවා. මේ ආණ්ඩුව එදා ඉඳලා ගෙනා එක විදේශීය ආයෝජනයක් සම්බන්ධයෙන්වත් අපි සෑහීමට පත් වෙන්නේ නැහැ. මේ කියපු එක ගිවිසුමක් ගැනවත් අපි සෑහීමට පත් වෙන්නේ නැහැ. අපි දැක්කා, හම්බන්තොට වරායේ ගිවිසුම. හම්බන්තොට වරායේ ගිවිසුම, පළමුවෙන්ම කැබිනට් එකට ඉදිරිපත් කළ ගිවිසුම නොවෙයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක පමණ කාලයක් තිබෙන්නේ.

ගරු ඩී. වී. චානක මහතා
(மாண்புமிகு டி.வீ. சானக)
(The Hon. D. V. Chanaka)
පළමුවෙන්ම කැබිනට් එකට ඉදිරිපත් කරපු ගිවිසුම නොවෙයි, පාර්ලිමේන්තුවට ආවේ. පාර්ලිමේන්තුවට ආ ගිවිසුම නොවෙයි, අන්තිමට අත්සන් කළේ. ඒ දෙයම තමයි මත්තල ගුවන් තොටුපොළට කරන්න යන්නේත්. හම්බන්තොට වරායේ ඩොලර් මිලියන 200ක් වටිනා දූපත නොමිලයේ ලබා දුන් බව අපි දන්නවා. ඒකම තමයි මත්තල ගුවන් තොටුපොළට කරන්නේත්.

අද මේ ලෝකයේ තිබෙන ප්‍රශ්න ඇතුළට අපව ඇද දමන්න එපා, අපේ රටේ සම්පත් විකුණන්න එපා කියලා අපි මේ ආණ්ඩුවට කියන්න කැමැතියි. මේ රජය යටතේ කටයුතු කරන කැබිනට් අමාත්‍යවරුන් දෙදෙනෙක් අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරනවා. අද අපේ ජාතික සම්පත් විකුණද්දී එතුමන්ලා දෙදෙනාගේම කට වැසී තිබෙනවා. මහින්ද අමරවීර ඇමතිතුමා, සජිත් ප්‍රේමදාස ඇමතිතුමා ඇයි, මේ ගොළු වෙලා ඉන්නේ? එසේ ගොළු වෙලා ඉන්නේ කටට ඩොලර් වැටිලාද, කියලා අපි එතුමන්ලාගෙන් අහන්න කැමැතියි.

අපේ රටේ සම්පත් විකුණනවාට අපි විරුද්ධයි කියන එක මම අවසාන වශයෙන් කියනවා. මත්තල ගුවන් තොටුපොළ විකුණනවාට විරුද්ධව හිරේ ගිය මන්ත්‍රීවරයෙක් වශයෙන්, එක වතාවක් හිරේ ගිය මන්ත්‍රීවරයෙක් වශයෙන් මා කියන්නේ, දෙවතාවක්, තුන්වතාවක් නොවෙයි, සියවතාවක් හිරේ දැම්මත් මේ ගිවිසුම්වලට විරුද්ධව, අපේ රටේ සම්පත් විජාතීයකරණය කරනවාට විරුද්ධව අපි සටන් කරනවා කියන එකයි. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමනි. ඊළඟට, ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලැබෙන්නේ විනාඩි හතක කාලයක් පමණයි.

[අ.භා.7.07]

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(மாண்புமிகு சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ අසාර්ථක ව්‍යාපෘතියක් හැටියට සලකා ඉන්දියානු සමාගමකට පැවරීමට විරුද්ධව තමයි අපේ කනක හේරත් මන්ත්‍රීතුමා අද දින සභාව කල් තබන අවස්ථාවේ මෙම යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ.

මෙතැනදී මූලික වශයෙන් අදහස් දැක්විය යුතු කරුණු කිහිපයක් තිබෙනවා. මත්තල ගුවන් තොටුපොළ, ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් හැටියට නම් කළත්, ජාත්‍යන්තර ගුවන් තොටුපොළකට අවශ්‍ය කරන ශක්‍යතා අධ්‍යයනයක් කරලා නිසි හඳුනා ගැනීමක් එක්කද, මේක ස්ථානගත කළේ කියන ගැටලුව මුලින්ම තිබෙනවා.

මොකද, හේතුව මේ ගුවන් තොටුපොළ මුලින්ම වීරවිලට යෝජනා වෙලා, වීරවිලෙන් මත්තලට මාරුවෙලා, විශාල ක්‍රියාවලියක් සමඟ, මෙතුමාම කිව්ව විධියට ඒ කාලයේදී එය පොදු ව්‍යාපෘතියේ කොටසක් වුණාට යම් කාලයක එය දේශපාලන ව්‍යාපෘතියක් හැටියට තමයි තිබුණේ කියලා අපි දන්නවා. මොකද, ගුවන් තොටුපොළක් ස්ථානගත කර ගැනීමේදී ඒ ස්ථානගත කිරීම ගුවන් ගමන් වෙළෙඳ පොළක් සමඟින් සම්බන්ධ වෙන්න ඕනෑ. කොහේ හෝ රටක නිකම් ගුවන් තොටුපොළක් දමා ගත්ත පළියට ගුවන් යානා යන එන එක තීරණය වෙන්නේ නැහැ. ඒක ගුවන් ගමන් බෙදා ගන්න වෙළඳ පොළක් එක්ක සම්බන්ධ වෙන්න ඕනෑ. ගරු නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා දන්නවා, ඒ කාලයේ එහෙම තීන්දු තීරණ ගත්තේ එවැනි විශාල ජාත්‍යන්තර ගුවන් පථයකට අවශ්‍ය කරන ශක්‍යතා අධ්‍යයනයක් එක්ක නොවෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හම්බන්තොට වරාය හම්බන්තොට ස්ථානගත වෙන්න ඕනෑය කියන කාරණය විශේෂයෙන් අපි දැකපු දෙයක්. ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් හැටියට මෙය නිවැරදි විධියට ස්ථානගත වුණා නම්, ඒකට අවශ්‍ය කරන ගුවන් ගමන් වෙළෙඳ පොළකුත් තිබෙන්න ඕනෑකම තිබුණා. ගුවන් තොටුපොළ ඉදි කරලා, සියලු කටයුතු කරලා, ගුවන් ගමන් සොයන්නේ ඊට පසුවයි. එහෙම වුණාම තමයි ෆ්ලයිඩුබායි සමාගමත් සමඟ ගිවිසුමකට එන්න සිද්ධ වෙන්නේ. ඇත්තටම ෆ්ලයිඩුබායි සමාගමත් එක්ක ගිවිසුමකට එන්නේ, මුලින්ම කොළඹට ගුවන් යානා ගෙන්වා ගන්නයි; එහෙම නැතුව මත්තලට ගුවන් යානා ගෙන්වා ගන්න නොවෙයි. ඊට පස්සේ ඔවුන්ගේ පැත්තෙන් නැවත දෙවන ගුවන් යානයක් යෝජනා කරන කොට රජය යෝජනා කරනවා, එහෙම නම් මත්තලට එන්න කියලා. එහෙම තමයි මත්තලට මේ ගුවන් යානා ගෙනෙන්නේ. මේ කාලය තුළ ෆ්ලයිඩුබායි සමාගම හැර වෙන මොනවාද මත්තලට ආවේ? එය සෙල්ලම් බඩුවක් හදලා විකුණනවා වාගේ නොවෙයි. මත්තල ගුවන් තොටුපොළ ජාත්‍යන්තර ගුවන් වෙළෙඳ පොළේ තරගකාරී ගුවන් තොටුපොළක් බවට පත් වුණා නම්, ලංකාවේ කේන්ද්‍රීය ස්ථානගත වීම අනුව අපට මෙය සංවර්ධනය කළ හැකිව තිබුණා. හැබැයි එයට අවශ්‍ය කරන ශක්‍යතා අධ්‍යයනයක්, marketing plan එකක් රටක් හැටියට අපට තිබුණේ නැහැ. ඒ නිසා තමයි බොහෝ විට එක ගුවන් සමාගමක් මත යැපෙන්න අපට සිද්ධවෙලා තිබෙන්නේ.

ගරු ඇමතිතුමනි, එහි ඊළඟ අදියර තමයි ඔබතුමන්ලා දැන් ක්‍රියාත්මක කරන්නේ. මත්තල ගුවන් තොටුපොළේ අසාර්ථකත්වය පෙන්වන්න ඔබතුමන්ලා වී වේළන්න පටන් ගත්තා. එවැනි දේශපාලන ක්‍රියාවලියක් ගෙන ගියා. අපි කියන්නේ ඒක නොවෙයි. ශ්‍රීලන්කන් ගුවන් සමාගමෙන් මෙය ගැලෙව්වා. මා දන්නා තරමට ඊට පස්සේ මත්තල වෙනම management එකක් හැටියට ස්ථානගත කරලා තිබෙනවා. දැන් ඔබතුමන්ලාට තිබෙන සැලැස්ම මොකක්ද? අටුව කඩා පුටුව හදනවා වාගේ ඊළඟට මත්තල ගුවන් තොටුපොළ ඉන්දියානු සමාගමකට දෙනවාද කියලා තමයි මෙතුමන්ලා අහන්නේ. ඒ සම්බන්ධයෙන් මෙතුමන්ලාට තිබෙන දේශපාලන විවේචනය අඩුවක් නැතුව අපටත් තිබෙනවා. ඒ කාරණය මම කියන්න ඕනෑ. මත්තල ජාත්‍යන්තර ගුවන් වෙළෙඳ පොළ ආක්‍රමණය කරලා අත් පත් කර ගන්න පුළුවන් වපසරියක් අත් පත් කර ගැනීමේ පදනමකින් නොවෙයි ස්ථානගත කළේ. හැබැයි දැන් ඇත්තටම ඉන්දියානු ගුවන් සමාගමකට හෝ ඉන්දියාව සම්බන්ධ ගුවන් සමාගමකට මත්තල ගුවන් තොටුපොළ විකුණන්න ඔබතුමන්ලා කටයුතු කරනවාද? මොකද, චීනයට හම්බන්තොට වරාය දෙනකොට, චීනයට හම්බන්තොට වරාය දීම සම්බන්ධයෙන් දේශපාලන වශයෙන් ඉන්දියාවේ තිබෙන විරෝධය පාන්න - මාධ්‍යවල පළ වුණු ආකාරයට, - ඉන්දියාව ඉල්ලුම් කළේ, මත්තල ගුවන් තොටුපොළ අවශ්‍ය බවයි. මත්තල ගුවන් තොටුපොළ ඉන්දියාවට දීමේ එකඟතාව තිබෙන්නේ චීනයට හම්බන්තොට වරාය දුන්නු නිසාද? එහෙම එකඟතාවක් තිබෙනවාද? ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා වහන්නේ නැතුව, හංගන්නේ නැතුව නිශ්චිත වශයෙන් කියන්න ඕනෑ. මොකද, මෙහි තිබෙන ප්‍රධාන කාරණය තමයි ඒක. මේ යෝජනාවේ මුඛ්‍ය හරය වන්නේ, හම්බන්තොට ගුවන් තොටුපොළ ඉන්දියානු ගුවන් සමාගමකට විකිණීමට කටයුතු කරනවාද, නැද්ද කියන එකයි. එතුමාගේ කථාවෙන් හරිහැටි සාක්ෂි ඉදිරිපත් වුණේ නැති නිසා තමයි මම ගරු ඇමතිතුමාගෙන් ඒ ගැන අහන්නේ. රජය හැටියට එයට වහාම උත්තරයක් දෙන්න, එසේ විකිණීමට කටයුතු කරනවාද, නැද්ද, එහෙම කරන්නේ මොන පදනමින්ද කියලා. කථාවක් පැතිර ගියා, ඉන්දියාවේ ගුවන් හමුදාවේ පිරිස් ඇවිල්ලා ගුවන් පුහුණුව සඳහා මත්තල ගුවන් තොටුපොළ ලබා ගන්න කටයුතු කරනවාය කියලා. ඒක බරපතළයි. මොකද, චීනයට හම්බන්තොට වරාය දීලා, මත්තල ගුවන් තොටුපොළ trainingවලට ඉන්දියාවට දුන්නොත්, කොහේ හෝ යුද්ධයක් ඇවිළුණු වෙලාවකට ලංකාවේ මිනිසුන් දෙපැත්තෙන්ම පරිප්පු කන්න ඕනෑ. ඒක ජාත්‍යන්තර ආරක්ෂාව පිළිබඳවත්, ස්වෛරීත්වය පිළිබඳවත් ලංකාවට බරපතළ ප්‍රශ්නයක් වෙනවා. මම මේකෙන් අදහස් කරන්නේ නැහැ, හම්බන්තොට වරාය චීනයට දුන්නා නම්, මත්තල ගුවන් තොටුපොළත් චීනයටම දුන්නොත් හරියි කියලා.

දැන් මෙතුමා ඉතා වැදගත් ප්‍රශ්නයක් ඇහුවා, "කාගේ කටෙද, ඩොලර් තිබෙන්නේ?" කියලා. ඒක දැන් ටිකක් විවාදාත්මක සාකච්ඡාවක්.

දැන් ඩොලර් කාගෙ කාගේත් කටවල්වල තිබෙනවා වාගේ තමයි පෙනෙන්නේ. මත්තල ගුවන් තොටුපොළ ඉන්දියාවට දීමේ ගිවිසුමක් තිබෙනවාද, එහෙම ගිවිසුමක් තිබෙනවා නම් ඒකේ පදනම මොකක්ද කියලා නිශ්චිත වශයෙන් ඔබතුමන්ලා කියන්න ඕනෑ. ඒක තමයි අපට මෙතැනදී මූලික වශයෙන් පැහැදිලි කර ගන්න තිබෙන්නේ. එහෙම තත්ත්වයක් නම් තිබෙන්නේ ඒක ඉතා බරපතළයි. ඒ වෙනුවට ශ්‍රී ලංකා රජය යටතේ මත්තල ගුවන් තොටුපොළ සංවර්ධනය කරන්න ශක්‍යතා අධ්‍යයනයක් - feasibility study එකක් - අලුත් තත්ත්වය යටතේ ඔබතුමා ඉදිරිපත් කරනවාද?

ඉන්දියාවට නොදෙනවා නම් ශ්‍රී ලංකා රජය යටතේ මත්තල ගුවන් තොටුපොළ සංවර්ධනය කිරීමට සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශයට තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියන එකත් පැහැදිලි කර ගන්න ඕනෑකම තිබෙනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. මීළඟට, ගරු කංචන විජේසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා.7.14]

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මට කථා කරන්න කාලය ලබා දීම සම්බන්ධයෙන් මම පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද දවසේ කනක හේරත් මන්ත්‍රීතුමා විසින් මත්තල ජාත්‍යන්තර ගුවන් තොටුපොළ විදේශීකරණයට විරුද්ධව ගෙන එනු ලබන යෝජනාව අනුමත කරමින් මම ඒ සම්බන්ධයෙන් කරුණු කීපයක් පමණක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඕනෑම රටක ව්‍යාපෘතියක් හෝ ව්‍යාපාරයක් ආරම්භ කළ පමණින් එය ලාභදායී ව්‍යාපෘතියක් බවට පත් වෙන්නේ නැහැ. ඒ සඳහා ටික කාලයක් ගත වන බව අපි දන්නවා. ලාභදායී ව්‍යාපෘති බවට පවත්වාගෙන යන්න බැරි වුණත් සමහර ව්‍යාපෘති ආරම්භ කරනවා. ඒ, එම ව්‍යාපෘතිය හරහා ඊට වක්‍රව දායකත්වය දක්වන වරාය වෙන්න පුළුවන්; නිෂ්පාදන ආර්ථිකය වෙන්න පුළුවන්; කලාපයේ තිබෙන අනිකුත් අංශ දියුණු කරන්න වෙන්න පුළුවන්. ඒ තුළින් රටට යම්කිසි ආදායමක් ගෙන ඒමේ ව්‍යාපෘති හැටියට ක්‍රියාත්මක වන ව්‍යාපෘති තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ වානක මන්ත්‍රීතුමා කිව්වා වාගේ මත්තල ගුවන් තොටුපොළ ආරම්භ කිරීම මහින්ද රාජපක්ෂ ආණ්ඩුවෙන් ගත් තනි තීන්දුවක් නොවෙයි. රජයන් කීපයක් අවස්ථා ගණනාවකදී මේ වෙනුවෙන් උත්සාහ කළා. නමුත් එය යථාර්ථයක් බවට පත් වුණේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ නායකත්වය යටතේයි. මේ ස්ථානය තෝරා ගැනීම, ශක්‍යතා වාර්තා ඉදිරිපත් කිරීම කියන මේ කරුණු කාරණා වසර ගණනාවක් මුළුල්ලේ කරපු දේවල් බවත්, රනිල් වික්‍රමසිංහ අගමැතිතුමා එදා දවසේ මේ සඳහා මුල් ගලක් තබද්දිත් ශක්‍යතා වාර්තාවක් ලබාගෙන ඒ කටයුත්ත කළ බවත් මම මේ ගරු සභාවට මේ අවස්ථාවේදී මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ෆ්ලයිඩුබායි ගුවන් යානය පමණයි මත්තල ගුවන් තොටුපොළ පාවිච්චි කරපු එකම ගුවන් යානය බවට පත් වුණේ කියලා අපේ සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා. මම දන්නේ නැහැ, එතුමා හිටියේ ලංකාවේද කොහේද කියලා. එයාර් ඇරබියා ගුවන් යානයත්, ලුෆ්තාන්සා ගුවන් යානයත් ගිවිසුම්ගත වෙලා හිටියා, මත්තල ගුවන් තොටුපොළත් එක්ක. ශ්‍රීලන්කන් ගුවන් සේවයටත්, මිහින් ලංකා ගුවන් සේවයටත් අයිති එවැනි ගුවන් යානා ගණනාවක් මේ මත්තල ගුවන් තොටුපොළ ආශ්‍රිත ඉදිරි වැඩ පිළිවෙළක් වෙනුවෙන් ගිවිසුම්ගත වෙලා කටයුතු කරමින් හිටපු අවධියක් තිබුණා. මේ ගුවන් තොටුපොලේ පළමුවැනි අදියර පමණයි අවසන් වෙලා තිබුණේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි

. හෝටල් සංකීර්ණය වාගේම මේ ව්‍යාපෘතිය වැඩිදියුණු කිරීමේ අනිකුත් අංග ඉදි වෙමින් පවතින අවස්ථාවක තමයි 2015 අවුරුද්දේ ජනාධිපතිවරණය පැවැත්වුණේ. එම ජනාධිපතිවරණ පරාජයෙන් පසුව තමයි වර්තමාන රජය මත්තල ගුවන් තොටුපොළ විකිණීමට තීන්දු කළේ. වානක මන්ත්‍රීතුමා කිව්වා වාගේ එක රැයින් මත්තල ගුවන් තොටුපොළ වී ගබඩාවක් බවට පත් කරලා, මත්තල ගුවන් තොටුපොලේ තිබුණු සියලු භාණ්ඩ - පුටුවේ ඉඳලා ගෘහ භාණ්ඩ - ඉවත් කරලා, ක්‍රමානුකූලව තමයි මත්තල ගුවන් තොටුපොළ විකිණීමේ කටයුත්තට මේ රජය සැලැසුම් සූදානම් කළේ. හම්බන්තොට වරාය විකිණීම තුළින් අපේ රටට සිදුවෙලා තිබෙන පාඩුව අද අපි දකිනවා. මේ රජය බලයට පත් වෙද්දි ජනතාවට කිව්වේ මොකක්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? ආර්ථික ඔස්තාර්ලා ඉන්නේ එක්සත් ජාතික පක්ෂයේය කිව්වා. ආර්ථික ඔස්තාර්ලා ඉන්නේ එක්සත් ජාතික පක්ෂයේ නම් අපි අහනවා, රටක පාලනය බාර අරගෙන, ඒ රටේ සම්පත් විකිණීමද ආර්ථික ඔස්තාර්ලාගේ හැකියාව කියලා. එවැනි දෙයක් කරන්න නම් ඔස්තාර්ලා රටේ බලයට පත් විය යුතු නැහැ.

අද වනකොට මේ රටේ තිබෙන ජාතික සම්පත් ටික එකින් එක විවිධ රටවලට විකුණමින් තිබෙනවා. එක පැත්තකින් හම්බන්තොට වරාය චීනයට ලබා දීලා තිබෙනවා. ඉන්දියාවට ගනුදෙනුවක් සඳහා මත්තල ගුවන් තොටුපොළ ලබා දෙන්න දැන් සාකච්ඡා කරමින් යනවා. ඉදිරියේදී අපිට මෙහි භයානක දෙයක් පෙනෙන්න තිබෙනවා. ලංකාව ලෝක බලවතුන්ගේ පොර පිටියක් බවට පත් වෙයිද කියන සැකය අපට තිබෙනවා. විශේෂයෙන්ම අද නිමල් සිරිපාල ද සිල්වා ඇමතිතුමා නියෝජනය කරන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ප්‍රතිපත්තිය නොවෙයි කියලා වානක මන්ත්‍රීතුමා කිව්වා. අපි දැක්කා, අර්ජුන රණතුංග ඇමතිතුමා හම්බන්තොට වරායේ කටයුතුවලට විරුද්ධව කටයුතු කරද්දි, මෛත්‍රිපාල සිරිසේන මැතිතුමාත්, මහින්ද සමරසිංහ මැතිතුමාත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නියෝජිතයෙකු දාලා තමයි හම්බන්තොට වරායේ ඉදිරි කටයුතු කරගෙන ගියේ කියලා.

අද තත්ත්වය ගැන අපි කනගාටු වෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන ජ්‍යෙෂ්ඨ උප සභාපතිවරයෙක් හැටියට නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමාගේ නායකත්වයෙන් ඒ කටයුතු ඉදිරියට ගෙන යාම ක්‍රියාත්මක කරනවා නම්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, මත්තල ගුවන් තොටුපොළත් එක්කම බිමටම සමතලා වෙයි කියලා මම හිතනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විනාඩි දෙකක් දෙන්න. අද මේ ක්‍රමානුකූල වැඩ පිළිවෙළ තුළ අපට සැකයක් තිබෙනවා. මත්තල ගුවන් තොටුපොළ ලබා දීම එක අරමුණක් පමණයි. හම්බන්තොට වරාය අද ලබා දීලා ඉවරයි. රජය එක පැත්තකින් කියනවා, මුදල් කළමනාකරණය කර ගන්න හැකියාවක් නැහැ කියලා. සෑම සියලු දෙයකටම පසුගිය රජයට චෝදනා කරනවා. මතක තියා ගන්න, මහින්ද රාජපක්ෂ මැතිතුමා ජාතික සම්පත් එකින් එක, එකින් එක රටට එකතු කළේ විකිණීමේ අරමුණින් නොවෙයි; විජාතිකකරණය කිරීමේ අරමුණින් නොවෙයි කියන එක. රාජ්‍ය සම්පත් විකුණලා තිබෙන අවස්ථාවක "එම්ටෙරේටිස්" ගුවන් සේවය, රාජ්‍ය ආයතන, රාජ්‍ය සම්පත්, පෞද්ගලික ආයතන විකුණලා තිබෙන වෙලාවක, ආයතන 46ක් මේ රටේ ජාතික සම්පත් හැටියට නැවත එකතු කරපු ආණ්ඩුවක් තමයි මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව. ඒ නිසා අපි මතක් කරනවා, මේ වෙනුවෙන් අත තියන්න සූදානම් වෙන්න එපා කියලා. මේ වෙනුවෙන් උද්ඝෝෂණය කරන්න ගිහිල්ලා ඩී.වී. චානක මන්ත්‍රීතුමා, නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමා, ප්‍රසන්න රණවීර මන්ත්‍රීතුමා ඇතුළු හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාව 37 දෙනෙක් මාසයක කාලයක් සිරගත කරලා තිබුණා. නමුත්, එදා දවසේ ඒ කරපු ක්‍රියාදාමයෙන් අපව නවත්වන්න හම්බ වන්නේ නැහැ. මේක ඉන්දියානු විරෝධය නොවෙයි. සමහරු කියනවා, මේක චීන විරෝධය, ඉන්දියානු විරෝධය කියලා. චීනයට කැමති අපි ඉන්දියාවට විරුද්ධයි කියලා කියනවා. එහෙම එකක් නොවෙයි මෙතැන තිබෙන්නේ. චීනයට හෝ ඉන්දියාවට හෝ වෙනත් ඕනෑම රාජ්‍යයකට අපේ රටේ සම්පත් ලබා දෙනවා නම් ඒ වෙනුවෙන් අපේ විරෝධතාව ප්‍රකාශ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගත්ත තීන්දුව පිළිබඳ නැවතත් කල්පනා කර බලන්න කියලා විෂය භාර ඇමතිවරයාගෙන් අවසාන වශයෙන් ඉල්ලීමක් කරන්න කැමතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ කාලය අවසානයි.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
70: 30 අනුපාතයට කොටස් අයිතිය දුන්නා කියලා මේ රටට ලැබෙන සම්පත මොකක්ද කියලා ඔබතුමා කල්පනා කරලා බලන්න. මත්තල ගුවන් තොටුපොළ ලබා දීමෙන් -අපේ හම්බන්තොට වරාය දැන් ලබා දීලා ඉවරයි. හම්බන්තොට-

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය දැන් අවසානයි. ගරු අමාත්‍යතුමාටත් පිළිතුරු කථාව කරන්න තිබෙනවා.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
විනාඩියක් දෙන්න මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විජයකලා යනකොට විජේපාල ඇමතිකමට යනවා. ඇමතිතුමා මට විනාඩියක කාලයක් ලබා දෙන්න. මම ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා මේ පිළිබඳ නැවත අධ්‍යයනයක් කරලා, නවීකරණය කරලා රටේ සම්පතක් හැටියට -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා වෙලාව නැහැ. මීළඟට, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා.7.20]

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2015 ජනවාරි 8වෙනි දා වත්මන් යහපාලන ආණ්ඩුව බලයට පත් වෙනකොට රනිල් වික්‍රමසිංහ අගමැතිතුමාත්, ඒ වාගේම අනෙකුත් මැති ඇමතිවරුත්, සජිත් ප්‍රේමදාස මහත්මයාත් මේ හැම කෙනාම කිව්වේ, "රාජපක්ෂලා හදාපු ගුවන් තොටුපොළට අද ගුවන් යානා එන්නේ නැහැ. ඒ වාගේම රාජපක්ෂලා හදාපු වරායට නැව් එන්නේ නැහැ. ඒ නිසා අපි වරායට දෙනිකව නැව් ගෙනැල්ලා වරාය පුරවනවා. මත්තල ගුවන් තොටුපොළට ගුවන් යානා ගෙනැල්ලා ඒක ජාත්‍යන්තර ගුවන් තොටුපොළක් බවට පත් කරනවා" කියලායි. එහෙම කියලා තමයි පටන් ගත්තේ. නමුත් තමුන්නාන්සේලාගේ ක්‍රියාකාරිත්වයෙන් මොකක්ද වුණේ කියලා අපි දන්නවා .

පසුගිය දවස්වල නියෝජ්‍ය අමාත්‍ය අශෝක් අබේසිංහ මහත්මයා ප්‍රසිද්ධියේම මාධ්‍යවලට ප්‍රකාශ කළා, "මත්තල ගුවන් තොටුපොළට ගොඩබසින 'ෆ්ලයිඩුබායි' සමාගමට අයත් ගුවන් යානා නැවැත්තුවේ මත්තලට ගොඩබසින එක එම ගුවන් සමාගමට දිගින් දිගටම පාඩු නිසායි" කියලා. මම ඒ වෙලාවේ කිව්වා, "ඇමතිතුමා ඔබතුමා ඒ කරපු ප්‍රකාශය සම්පූර්ණ සාවද්‍යයි. එහෙම තත්ත්වයක් නැහැ" කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියයි තිබෙන්නේ.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මොකද, තමුන්නාන්සේලා මේ ගුවන් සමාගමත් එක්ක ගිවිසුම් ගහනකොට පළමුවෙනි ගුවන් යානය ගියේ, කොළඹ-ඩුබායි. ඒ ගොල්ලන් දෙවැනි ගුවන් යානය ඉල්ලුවා, ලංකාවට එන්න අපට දෙන්න කියලා. එතැනදී ඔබතුමන්ලා ගුවන් යානය දුන්නා, ඩුබායි -කොළඹ-මත්තල. දවස් 4ක්, 5ක් ගියා. නැවත වතාවක් ආපහු ගුවන් යානය මත්තලට ගොඩබැස්සුවේ නැහැ. තුන්වෙනි එකත් ඉල්ලුවා. තුන්වෙනි එකත් දුන්නා, ඩුබායි-කොළඹ. දෙවැනි එක දුන්නේ මත්තලට ගොඩබස්සන පදනම මත. නමුත්, ඒ ගොල්ලන්

ඒක කළේ නැහැ. හතරවෙනි එකත් දුන්නා. ඒ ගොල්ලන් හතරවැනි එකත් අවේ, ඩුබායි - කොළඹ. පස්වැනි එකත් දුන්නා. ඒකත්, ඩුබායි - කොළඹ. තමුන්නාන්සේලා දිගින් දිගටම ඒ ගුවන් සමාගමේ ආධිපත්‍යයට යට වෙලා, යම් ප්‍රමාණයකට ආදායම් ලැබෙමින් තිබුණු මත්තල ගුවන් තොටුපොළට ඒ ගුවන් සමාගමේ ගුවන් යානා එන එක නතර කරන්න උත්සාහ ගත්තා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි.

ගරු නිහාල් ගලප්පත්ති මහතා
(මාණ්පුමිකු நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
තමුන්නාන්සේලා දෙගොල්ලන්ම එකතු වෙලා අපේ ස්වාධීනත්වය මුළුමනින්ම පාවා දීලා, අපේ ආර්ථිකයට යම් ආකාරයකින් සහනයක් ලබන්නට තිබුණු අවස්ථාව නැති කරලා තිබෙනවා. තමුන්නාන්සේලා දෙගොල්ලන්ම "වත්ත බද්දට දීලා ඇස්සට දත නියවනවා" වාගේ තත්ත්වයකුයි ඇති කරලා තිබෙන්නේ. ඒක නිසා ඒක වහාම නවත්වන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි. ගරු නිමල් සිරිපාල ද සිල්වා අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 15ක කාලයක් තිබෙනවා.

[අ.භා. 7.23]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු කනක හේරත් මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳව වචන ස්වල්පයක් කථා කරන්නට ලැබීම ගැන මම සතුටු වෙනවා. එතුමාගේ යෝජනාව ආරම්භ කරලා තිබෙන්නේ, ෆ්ලයිඩුබායි සමාගම සමඟ ඇති කරගත් ගිවිසුම නොසලකා හරිමින් ඉන්දියානු සමාගමකට විකුණන්න යනවා කියලායි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, flights හතරක් ඩුබායිවල ඉඳන් බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළට ඇවිල්ලා, එතැනින් මත්තලට ඇවිල්ලා එතැනින් යන්න තමයි අපි මේ ෆ්ලයිඩුබායි සමාගමට අවසර දීලා තිබුණේ. නමුත් මේ කාල සීමාව තුළදී මත්තලට යන එක නතර කළේ, කුරුල්ලන්ගේ ප්‍රශ්නය නිසා ෆ්ලයිඩුබායි සමාගමට විශාල අර්බුදයක් පැන නැඟුණු නිසායි. කුරුල්ලෝ හැප්පිලා විශාල වශයෙන් එන්ජින්වලට අලාභහානි වෙලා ඔවුන් ඉල්ලීමක් කළා, මේ කාලය තුළදී -

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

නැඟී සිටියේය.
எழுந்தார்.
rose.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
ඔබතුමා කථා කළා නේ. දැන් මගේ කථාව අහගන්න කෝ. ඒ අනුව අපි තාවකාලිකව කුරුල්ලන් ගහනය වැඩි මේ කාලය තුළදී නැවිත් ඉන්න ඔවුන්ට ඒ සහනය ලබා දුන්නා. ඒ මිසක් ඉන්දියාවට විකුණන්න ඕනෑ හින්දා එහෙම කළා නොවෙයි. ෆ්ලයිඩුබායි සමාගම මොකක්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? Flights හතරයි එන්නේ. තුන්දෙනායි, හතර දෙනායි ඒ ගුවන් තොටුපොළෙන් ගුවන් යානාවට නග්ගා ගන්නේ. මේක නාමිකව එනවා මිසක් passengersලා විශාල සංඛ්‍යාවක් ගෙන එන එකක් නොවෙයි. මම පළමුවෙන්ම ඒ කාරණය නිවැරැදි කරන්න ඕනෑ.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ගරු ඇමතිතුමනි, bird strikes යටතේ, incidents එහෙම නැත්නම් accidents වෙන්න ඕනෑ. මෙතැන මේ දක්වා ෆ්ලයිඩුබායි සමාගමට major incidents වෙලා නැහැ. ෆ්ලයිඩුබායිවලට "ඇස්මාරා" කියන ගුවන් තොටුපොළේ මීට වඩා incidents වෙලා තිබෙනවා. ඒ නිසා මේක හේතුවක් නොවෙයි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
Major incidents සිද්ධවෙලා තිබෙනවා කියලා මට වාර්තා වෙලා තිබෙනවා.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
Major incidents සිද්ධවෙලා නැහැ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
ඔබතුමා නැහැ කියලා කිව්වාට එහෙම වෙලා තිබෙනවා කියලා මට වාර්තා වෙලා තිබෙනවා. අපට ඒවා බලෙන් ගෙන්වා ගන්න පුළුවන්කමක් නැහැ නේ. ෆ්ලයිඩුබායි ගුවන් යානා නතර කළේ මත්තල ගුවන් තොටුපොළ ඉන්දියාවට විකුණන්න ඕනෑ නිසා නොවෙයි. ඒ ඇරෙන්න සමහර charter flights කිහිපයක් ආවා. ඒ මිසක් විශාල වශයෙන් ගුවන් යානා මෙතැනට පැමිණියේ නැහැ. SriLankan Airlines එකත් එන්න බැහැ කිව්වා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමා මේ කියන පදනම සම්පූර්ණයෙන් වැරැදියි. එපමණක් නොවෙයි. මේ ගුවන් තොටුපොළ පිළිබඳව අපි කථා කළොත්, මේක විශාල වශයෙන්ම අලාභයට පත් වෙච්ච ගුවන් තොටුපොළක්. දැන් බලන්න, 2018දී total revenue එක කීයද කියලා. ආදායම මිලියන 14යි. ණය වාරිකත් එක්ක වියදම මිලියන 1,910යි. 2017දී ආදායම මිලියන 78යි; වියදම මිලියන 3,468යි. 2016දී ආදායම මිලියන 49යි; වියදම මිලියන 3,947යි. 2015දී ආදායම මිලියන 72යි; වියදම මිලියන 5,947යි. 2014දී ආදායම මිලියන 136යි; වියදම මිලියන 3,235යි. 2013දී ආදායම මිලියන 48යි; වියදම මිලියන 2,828යි. මේ වෙන කොට accumulated loss එක බිලියන 20ක් වෙලා තිබෙනවා. අපට ඕනෑ, මේක විනාශ කරන්න නොවෙයි; මේ ගුවන් තොටුපොළ හදලා ගන්නයි. එහෙම නම් මේකට තව ආයෝජන ගෙන්වා ගන්න ඕනෑ. මේ සඳහා ගුවන් යානා ගෙන්වා ගන්න ඕනෑ.

[ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා]

අපි මේ ගුවන් තොටුපොළ ඉන්දියාවට දෙන්න නොවෙයි හදන්නේ. මුලින්ම මේ තත්ත්වය සඳහන් කරලා මා කැබිනට් සංදේශයක් ඉදිරිපත් කළා, 2016 දෙසැම්බර් මාසයේ 1වැනි දා. ඊට පස්සේ, මෙම ගුවන් තොටුපොළ ක්‍රියාකාරී තත්ත්වයට ගෙනඑන්න පුළුවන් partner කෙනෙක් ඇවිල්ලා, අපිත් එක්ක එකතු වෙලා, මෙම ගුවන් තොටුපළ හදන්න යෝජනා දෙන්න කියලා පත්තරේ දැන්වීම් දැම්මා; විදේශ පුවත් පත්වලත් දැම්මා. ඒ අනුව යෝජනා 6ක් ආවා. ඒවා TEC එකෙනුයි, Cabinet Appointed Tender Board එකෙනුයි විශ්ලේෂණය කළා. නමුත්, ඒ එකක්වත් සුදුසු යෝජනා හැටියට ගණන් ගැනුණේ නැහැ. "අපට solar power හදන්න ඉඩ දෙන්න" වාගේ වෙන වෙන දේවල් තමයි ඒ අය ඉල්ලුවේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේවා කරන්නේ මේ ගුවන් තොටුපොළට බෝම්බ දාලා විනාශ කරන්න නොවෙයි. ගරු සුනිල් හඳුන්නෙත්ති මන්ත්‍රීතුමා කිව්වා වාගේ, වැරදි ස්ථානයක, වැරදි සහිතව හදන ලද ගුවන් තොටුපොළ නිසි ආකාරයට ක්‍රියා කරවීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධනය සොයාගෙන, ඒ සඳහා අවශ්‍ය ජාත්‍යන්තර සහයෝගය ලබාගෙන, ගුවන් යානා සහ ගුවන් යානා අංශයට සම්බන්ධ කර්මාන්ත ගෙන එන්න පුළුවන් partner කෙනෙක් ලබාගන්නයි අපි උත්සාහ කරන්නේ. අපි පුවත් පත්වල දැන්වීම් දාලා මුළු ලෝකයෙන්ම ඒකට යෝජනා ඉල්ලුවා.

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා
(මාණ්පුමිකු சுனில் ஹந்துன்னெத்தி)
(The Hon. Sunil Handunnetti)
ගරු ඇමතිතුමනි,-

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු *நிமல் சிறிபால த சில்வா*)
(The Hon. Nimal Siripala De Silva)
ඔබතුමා ඉන්නකෝ. මුළු ලෝකයෙන්ම ඉල්ලුවා. නමුත්, ආවේ නැහැ. ඒ අවස්ථාවේ තමයි ඉන්දියාව joint venture වැඩ පිළිවෙළක් සඳහා අපට යෝජනාවක් ඉදිරිපත් කළේ. මේ ගුවන් තොටුපොළ කාටවත් විකුණලා නැහැ. AASL සමාගමයි, Indian Airport Authority එකයි ඒකාබද්ධ සමාගමක් හදලා,-

ගරු ඩී. වී. චානක මහතා
(මාණ්පුමිකු ටි.වී. சானக)
(The Hon. D. V. Chanaka)
Sir, I rise to a point of Order.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු *நிமல் சிறிபால த சில்வா*)
(The Hon. Nimal Siripala De Silva)
ඔබතුමා කථා කරන කොට මම බාධා කළේ නැහැනේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මොකක්ද point of Order එක ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමා?

ගරු ඩී. වී. චානක මහතා
(මාණ්පුමිකු ටි.වී. சானக)
(The Hon. D. V. Chanaka)
ගරු ඇමතිතුමනි, මේ ගුවන් තොටුපළ විවෘත කිරීමේ අවස්ථාවට ඔබතුමායි, මෛත්‍රීපාල සිරිසේන මැතිතුමායි සහභාගි වුණා. දෙදෙනාම එක ළඟ seats දෙකක සිටියේ. ඔබතුමා දැන් කියනවා, මෙම ව්‍යාපෘතිය කිසිම ඵලදායී ව්‍යාපෘතියක් නොවෙයි කියලා. ඔබතුමන්ලා දෙදෙනා ඒ රජයේ හිටපු ප්‍රධාන ඇමතිවරු දෙදෙනෙක්.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු *நிமல் சிறிபால த சில்வா*)
(The Hon. Nimal Siripala De Silva)
නැහැ, නැහැ. ඒක ඵලදායී ව්‍යාපෘතියක් නොවෙයි කියලා අපි කිව්වේ නැහැ.

ගරු ඩී. වී. චානක මහතා
(මාණ්පුමිකු ටි.වී. சானக)
(The Hon. D. V. Chanaka)
ඔබතුමන්ලා ජෝෂ්ඨ ඇමතිවරු හැටියට එදා එම අවස්ථාවට සහභාගි වුණා.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(මාණ්පුමිකු *நிமல் சிறிபால த சில்வா*)
(The Hon. Nimal Siripala De Silva)
එම ව්‍යාපෘතිය කරගෙන යනකොට අඩු පාඩු පෙනුණා. එම අඩු පාඩු මකලා හොඳ ව්‍යාපෘතියක් බවට පත් කරගන්න තමයි මේ රජය කටයුතු කරන්නේ. ඒ නිසා, ඒකට අවශ්‍ය සහායකයෙක් ලබා ගන්නයි, ඒ ආයෝජනය ලබාගන්නයි අපි කටයුතු කරන්නේ. එහෙම නැතුව මේ ගුවන් තොටුපොළ විනාශ කරලා දමන්න නොවෙයිනේ අපි මේ හදන්නේ.

ඒ වාගේම කිව්වා, අපි එතැන තිබුණු පුටු, බඩු මුට්ටු ආදිය අරගෙන ගියා කියලා. නමුත් ඒ කිසි දෙයක් අරගෙන ගියේ නැහැ. අගමැතිතුමා ගිහිල්ලා එතැන වී ගබඩා කරනකොට, ඒකට මාත් එකඟ වුණේ නැහැ. ඒක වෙනම ප්‍රශ්නයක්. එම ගුවන් තොටුපොළ ආරක්ෂා කර ගන්නයි මට ඕනෑ වුණේ. එය ආරක්ෂා කර ගැනීමේ වැඩ පිළිවෙළ ගැන තමයි මා කියන්නේ. එතකොට ඔබතුමන්ලා කියනවා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උප සභාපති හැටියට මම මේක විකුණන්න යනවා කියලා. එහෙම නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා Port City එකේ අක්කර 200ක් අනුනම අවුරුදු බද්දකට දෙනකොට අපි විරුද්ධ වුණාද? ෂැංග්‍රිලා එකට ඉඩම් දෙනකොට අපි විරුද්ධ වුණාද? එහෙම නම් අපි එතුමාටත් දොස් කියන්න එපායැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මෙවැනි දේශපාලන සටන් පාය නොවෙයි අපට අවශ්‍ය. අපට ඕනෑ මේ airport හදලා ගන්නයි.

දැන් කියනවා ඉන්දියාවේ ගුවන් හමුදාව එනවා කියලා. අමූලික බොරුනේ. අපි විශේෂයෙන්ම මේක commercial airport එකක් විතරයි කියලා කිව්වා. මේක වෙළෙඳ airport එකක් විතරයි. Perimeter security එක පවා අපේ Air Force එකෙන් කරන්න ඕනෑ. එහි security එකට සම්බන්ධ වෙන්න කිසිම ඉන්දියානුවෙකුට පුළුවන්කමක් නැහැ කියන මූලික කොන්දේසිය අපි දාලා තිබෙනවා. ඔබතුමන්ලාට වාගේම අපටත් මේ රට පිළිබඳව ආදරයක් තිබෙනවා. [බාධා කිරීමක්] එහෙම හිතන්න එපා.

ගරු කනක හේරත් මහතා
(මාණ්පුමිකු கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
Sir, I rise to a point of Order.
ගරු ඇමතිතුමනි, පැහැදිලි කර ගැනීමක් පමණයි මට අවශ්‍ය. එතකොට මේ පනත වෙනස් කරන්න වෙනවාද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
මම එතැනට එන්නම්කෝ. මම කියනකල් ඉන්න. ඔබතුමා හදිසි වෙන්න එපා.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
ඔබතුමා ඒ ගැන පැහැදිලි කරපු නැති නිසායි මම අහන්නේ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
පනත වෙනස් කරන්න අවශ්‍ය නම් වෙනස් කරනවා. ඒක ප්‍රශ්නයක් නැහැ. අපි මේ ආයෝජනය ලබා ගැනීම සඳහා කටයුතු කරලා, මේ airport එක හොඳ airport එකක් බවට පත් කරනවා. ඒක විකුණන්නේ නැහැ. කාටද විකුණන්නේ? අපේ රටට ඒකාබද්ධ ව්‍යාපෘති -joint ventures- කොච්චර එනවාද? ඇයි, අපේ ආණ්ඩුව කාලයේ ඒකාබද්ධ ව්‍යාපෘති තිබුණේ නැද්ද? ඒ නිසා "මේක විකුණනවා, මේක විකුණනවා" කියලා බොරුවට සටන් පාඨ කියන්න එපා. ඒක සම්පූර්ණයෙන්ම වැරැදියි. අපේ අවශ්‍යතාව තිබෙන්නේ, මේක හොඳ airport එකක් බවට, ගුවන් යානා එන airport එකක් බවට පත් කරන්නයි.

මාතර සිට බෙලිඅත්ත දක්වා යන දුම්රිය මාර්ගය ඒ airport එක දක්වා දීර්ඝ කරන්න දැනටමත් ශක්‍යතා අධ්‍යයනය පටන් ගෙන තිබෙනවා. ඒ වාගේම අපි highway එකත් ඒ දක්වා ගෙන ගියාට පස්සේ මේ airport එක වඩාත් ක්‍රියාත්මක airport එකක් බවට පත්වෙනවා. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ කරපු ව්‍යාපෘතිවලට අපිත් සම්බන්ධයි. ඒ නිසා අපට ඒවා විනාශ කරන්න වුවමනාවක් නැහැ. අපට ඕනෑ මේ airport එක ශක්තිමත් කරලා viable airport එකක් බවට, මගීන් එන airport එකක් බවට, අහස් යාත්‍රා එන airport එකක් බවට පත් කිරීමටයි. ඒක තමයි අපේ අරමුණ. අපි මේ joint venture එකට එන්නේ මොන කොන්දේසි මතද කියන කාරණා සාකච්ඡා කරනවා. ඒ විතරක් නොවෙයි, මා අමාත්‍යවරයා වශයෙන් පොරොන්දු වෙනවා, ඒ joint venture එකට ඇතුළත් වෙන්න ඉස්සර වෙලා, ඒ පිළිබඳ පූර්ණ දැනුවත් කිරීමක් මේ පාර්ලිමේන්තුවට කරනවා කියලා. එහි ඇතුළත් වන කොන්දේසි මොනවාද, ඒ ඉන්න සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්නේ කොහොමද, මේ ව්‍යාපෘතියට අනාගත ආයෝජන ලබා ගන්නේ කොහොමද, ඒවා බෙදා ගන්නේ කොහොමද -සියයට 70 -30 අනුපාතයටද- අපි ව්‍යාපෘතිය දෙන්නේ මොන මිල ගණනකටද කියන කාරණා පිළිබඳව රජයේ තක්සේරුකරුගේ තක්සේරුව ලබාගෙන ඉතාම පාරදෘශ්‍යභාවයකින් යුතුව මේ කටයුත්ත කිරීමට මාත් මගේ අමාත්‍යාංශයේ සෑම දෙනාත් කටයුතු කරනවා. මේක මගේ තනි තීරණයක් නොවෙයි. අමාත්‍යවරයා වශයෙන් මට තනි තීරණයක් ගන්න බැහැ. කැබිනට් මණ්ඩලය මේ කාරණය පිළිබඳව මූලික ප්‍රතිපත්තිමය තීරණයක් අරගෙන තිබෙනවා. මේ රජයේ ඉන්න කවුරුත් ඒකට වගකියන්න ඕනෑ. එහෙම තමයි රජයකට බැඳුනාම වෙන්න ඕනෑ. රජය කරන කටයුතුවලට අපි වගකියන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා මේ කාරණය ඉතා පැහැදිලිවම කියන්න ඕනෑ. විදේශ ආයෝජන ලබා ගැනීම අපරාධයක් නොවෙයි. විදේශ ආයෝජන ලබා ගැනීමේදී අපේ රට ආරක්ෂා වන ආකාරයෙන් අපි ඒ ආයෝජන ලබාගත යුතුයි. ඒ කටයුත්ත කිරීමට අපි බැඳිලා ඉන්න බව මා ප්‍රකාශ කරන්න කැමතියි. මේ පිළිබඳව මගේ නිලධාරීන් සමඟ සාකච්ඡා කරන්න ඊයේත් ඉන්දියානු කණ්ඩායමක් ආවා. මේ වෙනකොට සාකච්ඡා වට තුනක් පැවැත්වුවා. අපි සෑම කාරණයක් පිළිබඳවම දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා, මේ රටේ ආරක්ෂාවට කිසිම තර්ජනයක් වෙන්න ඉඩ දෙන්නේ නැහැ. ඉන්දියානු ආරක්ෂක අංශ හෝ වෙනත් කිසිවෙක් තියා Air Traffic Controllersලා වත් ඒ අයට ගෙනෙන්න අපි ඉඩ දෙන්නේ නැහැ. ඒ කටයුතු කරන්නේත් අප විසින්මයි. මේ විධියට අපි ඉතා ගැඹුරින් කල්පනා කරලා කටයුතු කරනවා. මේ රටේ ආරක්ෂාව පිළිබඳව තමුන්නාන්සේලාට විතරක් නොවෙයි, අපටත් වගකීමක් තිබෙනවා. අපිත් මේ රට වෙනුවෙන් වැඩකටයුතු කරපු අය. ඔබතුමන්ලා නිතන්න එපා ඉන්දියාවට ඕනෑ ඕනෑ විධියට අපි මේ ව්‍යාපෘති ලබා දෙනවා කියලා. එහෙම කියන්න එපා ඒ කථා දේශපාලන සටන් පාඨ වශයෙන් හොඳයි; ඒවා කරන්න. අපිත් විපක්ෂයේ හිටියා නම්, කරන්නේ ඒක තමයි. අපි ඒක දන්නවා. නමුත් යථාර්ථවාදී ලෙස මේ රට යන ඉදිරි ගමනට ඇයි මෙච්චර බාධා කරන්නේ?

මම කිව්වා, මේ වෙනකොට බිලියන 20ක් අපි මේ ව්‍යාපෘතියෙන් පාඩු ලබලා තිබෙන බව. මේ පාඩුව අපි අවම කර ගන්න ඕනෑ. ඉන්දියානු සමාගම සමඟ අපි joint venture එකක් හැදුවාට පස්සේ, ලාභ ලබනතුරු අනිවාර්යයෙන්ම මේ පාඩුවෙන් සියයට 70ක් ඒ ගොල්ලන් දරන්න ඕනෑ. ඉතින් බලන්න, මොනතරම් සූක්ෂම විධියටද අපි මේ පාඩුව ඒ අය උඩට දමන්නේ කියලා. මේ විධියේ හොඳ business deal එකක් දැම්මාම ඒකටත් දේශපාලන මඩ ගහනවා. ඒකට කමක් නැහැ. ඒක මේ රටේ දේශපාලනයේ ස්වභාවය නේ. නමුත් මා කියන්න කැමැතියි, මේ රටේ ගුවන් ගමන් කර්මාන්තය දියුණු කරලා, මේ රට ඉදිරියට ගෙන යෑමේ බලාපොරොත්තුව ඇතිව ඉතාම සද්භාවයෙන් මේ කටයුත්ත කරන බව. ඒ නිසා මේ කටයුතු ගැන අනිසි බියක් ඇති කර ගන්නට එපා. මා පොරොන්දු වුණු පරිදිම මේ පිළිබඳව ඇති කර ගනු ලබන ගිවිසුම අනිවාර්යයෙන්ම පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තමයි ඒ කටයුතු කරන්නේ කියන පොරොන්දුව ලබාදෙමින් මගේ කථාව අවසන් කරනවා.

මීළඟට, මගේ Deputy Minister අදහස් ප්‍රකාශ කරයි. [බාධා කිරීමක්]

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කනක හේරත් මන්ත්‍රීතුමා, ඔබතුමා මොන කාරණයක් ගැනද කථා කරන්නේ? [බාධා කිරීමක්]

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
දැනට අපේ මතය තිබෙන්නේ අවුරුදු 40ක කාල සීමාවක් කියලා. ෂැන්ග්‍රි - ලා එක වාගේ අවුරුදු 99කට නොවෙයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බොහොම ස්තුතියි, ගරු ඇමතිතුමා. ගරු අශෝක අබේසිංහ නියෝජ්‍ය අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

[අ.භා..7.38]

ගරු අශෝක් අබේසිංහ මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அசோக் அபேசிங்க - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் பிரதி அமைச்சர்)
(The Hon. Ashok Abeysinghe - Deputy Minister of Transport and Civil Aviation)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු කනක හේරත් මන්ත්‍රීතුමා විසින් ගෙන එන ලද යෝජනාවම වැරදියි. මොකද, එතුමා කියලා තිබෙන්නේ මත්තල ගුවන් තොටුපොළ විකිණීමක් පිළිබඳව. එහෙම විකිණීමක් කවදාවත් කරන්නේ නැහැ. එතුමාගේ යෝජනාවම වැරැදි බව මම විශේෂයෙන් ප්‍රකාශ කරනවා. මම කනගාටු වෙනවා, එතුමන්ලා නවක මන්ත්‍රීවරුන් නිසා එතුමන්ලාට මතක නැතිව ඇති, කලින් පැවැති එතුමන්ලාගේ ආණ්ඩුව තමයි ෂැන්ග්‍රී - ලා හෝටලයට ඉඩමක් සින්නක්කර විකිණුවේ. ඒ විධියට සින්නක්කරයට ඉඩමක් විකුණපු ආණ්ඩුවක වර්තමාන මන්ත්‍රීවරුන් විධියට මෙවැනි යෝජනාවක් ගෙන ඒම පිළිබඳව මම කනගාටු වෙනවා. ඒ වාගේම Colombo Port City එකේ අක්කර 500ක් සින්නක්කර දෙන්න නියමිතව තිබුණා. අපි කවදාවත් එහෙම කරන්නේ නැහැ. විකිණීමක් නොවෙයි, මේක හවුල් ව්‍යාපාරයක්.

2009දී මේක ආරම්භ කරලා, 2010 මාර්තු මාසයේ දී Exim Bank එකෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 190ක් ණය අරගෙන තිබෙනවා. පසුගිය 2007 වසරේ මත්තල ගුවන් තොටුපොළේ මාසයක ආදායම රුපියල් ලක්ෂ 65යි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මාසික වියදම රුපියල් ලක්ෂ 2,900යි. මාසික අදායම රුපියල් ලක්ෂ 65යි; මාසික වියදම රුපියල් ලක්ෂ 2,900යි. ඒ අනුව අපි වසරකට රුපියල් ලක්ෂ 17,000ක් ණය ගෙවන්නට ඕනෑ, රුපියල් කෝටි 170ක්. ඉතින් කොහොමද මේක කරන්නේ? අපි දැන් කටුනායක ගුවන් තොටුපොළෙන් එන ආදායමෙන් තමයි මේක ගෙවන්නේ. 2015 ඉඳන් 2030 වෙනකම් අවුරුදු 15ක් මේක ගෙවන්නට ඕනෑ, රුපියල් ලක්ෂ 17,000 ගණනේ. ඉතින් රජයකට මේක කරන්න පුළුවන්ද? අපි හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරන්න යද්දි, දැන් මේ පිළිබඳව කෑ ගහනවා.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

මේ ණය ගෙවලා ඔබතුමන්ලා කටුනායක ගුවන් සමාගමෙන් අලාභයක් ලබනවාද?

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ඒක වෙනම කථාවක්.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

ඒක තමයි. ඕකම තමයි වරායටත් වුණේ.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)

ඒක වෙනම කථාවක්. කටුනායක ගුවන් තොටුපොළින් අපි රජයටත් මුදල් දෙනවා. අපි ඒක ලාභ ලබන ආයතනයක් බවට පත් කරලා තිබෙනවා. පසුගිය වසර 30 තිස්සේම කටුනායක ගුවන් තොටුපොළේ ධාවන පථය අලුත්වැඩියා කරලා තිබුණේ නැහැ, අපේ ආණ්ඩුව ආවාට පසුව, අපේ ගරු ඇමතිතුමා මූලික වෙලා ඒ කටයුත්ත අවසන් කළා. පසුගිය රජය ඇමෙරිකානු ඩොලර් මිලියන 80කින් කරන්නට නියමිතව තිබුණු එක අපි ඇමෙරිකානු ඩොලර් මිලියන 49කින් කළා. එම ගුවන් තොටුපොළ ලාභ ලබන නිසා තමයි අපට මේක ගෙවන්නට පුළුවන් වෙලා තිබෙන්නේ. එම නිසා අපි කිසිසේත්ම මත්තල ගුවන් තොටුපොළ විකුණන්නේ නැහැ, අපි ඒ හරහා හවුල් ව්‍යාපාරයක් කරනවා .

ගරු ඇමතිතුමා කිව්වා වාගේ අපි මේක පත්තරවල දැම්මා; website එකේ දැම්මා. අපිට මේ සඳහා ඉල්ලුම්කරුවන් 06 දෙනෙකු ඉදිරිපත් වුණා. අපේ තක්සේරුවෙන් පිට සතයක්වත් අපි අඩු කරන්නේ නැහැ. රජයට තක්සේරුවක් තිබෙනවා, ඒ තක්සේරුවෙන් සියයට 70ක් සහ සියයට 30ක් වශයෙන් ලැබෙනවා. ගරු ඇමතිතුමා කිව්වා වාගේ මේක පාඩු ලැබුවත් එම පාඩුව ඒගොල්ලන් දරනවා. මේක අපට කරන්න පුළුවන්ද? මාසයකට රුපියල් ලක්ෂ 65ක ආදායමක් හම්බ වෙලා, මාසයකට රුපියල් ලක්ෂ 2,900ක් වියදම් කරලා, අවුරුද්දකට රුපියල් ලක්ෂ 17,000ක් ණය ගෙවන්නේ කොහොමද? මේක තව තවත් මේ විධියට යන්න ගියාම කොපමණ පාඩුවක් සිද්ධ වෙනවාද? එම නිසා මේක ලාභ ලබන ගුවන් තොටුපොළක් බවට පත් කරන්නට ඕනෑ. එහෙම කළොත් පමණයි මේ රටේ ආර්ථිකයට යම්කිසි ආදායමක් ලැබෙන්නේ; ආර්ථිකය ඉහළට යන්නේ. මම ගරු ඇමතිතුමා සමඟ විශේෂයෙන්ම සාකච්ඡා කරමින් සිටිනවා, ඒ ප්‍රදේශයෙන් විදේශවලට යන අපේ ශ්‍රී ලාංකිකයන් එම ගුවන් තොටුපොළ හරහා විදේශවලට යැවීමේ වැඩ පිළිවෙළක් ගැන.

දැන් මේ සභාවේදී ඔබතුමා කිව්වා, වෙනත් රටවල ගුවන් යානා අපේ ගුවන් සීමාව හරහා පියාසර කිරීම නිසා එම ගුවන් තොටුපොළට ආදායමක් ලැබෙනවා කියලා. එම නිසා ඒ, ගුවන් තොටුපොළට ආදායමක් ලැබෙන්නේ නැහැ. අපේ රටේ භූමි ප්‍රමාණය වාගේ විසි ගුණයක් තිබෙනවා අපට අයත් ගුවන් සීමාව. මේ ගුවන් සීමාව තුළ පියාසර කරන ගුවන් යානාවලින් සිවිල් ගුවන් සේවා අධිකාරියට ආදායමක් ලැබෙනවා. ගුවන් තොටුපොළට ලැබෙන්නේ නැහැ. සිවිල් ගුවන් සේවා අධිකාරියට මේ ගුවන් සීමාව තුළ, වර්ග කිලෝමීටර් 65,000 ඒවා 20ක් තුළ පියාසර කරන ගුවන් යානාවලින් ආදායමක් ලැබෙනවා. [බාධා කිරීමක්]

පොඩ්ඩක් ඉන්න. සියයට 70 සහ සියයට 30 ඒකට බලපාන්නේ නැහැ. සිවිල් ගුවන් සේවා අධිකාරියට ලැබෙන්නේ. මේකත් සමඟ ඒකට සම්බන්ධයක් නැහැ. ඒ යන ගුවන් යානාවකින් දැනට ගෙවන්නේ ඇමෙරිකානු ඩොලර් 250යි. දවසකට ගුවන් යානා 200ක් පමණ යනවා. අපි දැන් වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා, එම ගුවන් යානයක් අපේ ගුවන් සීමාවට ඇතුළු වුණාම ඒක එළියට යන කාලය, ගුවන් යානයේ බර සහ මහීන් ප්‍රමාණය අනුව මුදල් අය කරන්නට. එවැනි වැඩ පිළිවෙළක් අපි සකස් කරමින් යනවා.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)

සිවිල් ගුවන් සේවා අධිකාරියට තමයි ඒ මුදල ලැබෙන්නේ.

නමුත් අපි කියන කාරණය වන්නේ, මේ ගුවන් තොටුපොළ මෙතැන තිබුණු නිසා නේ ඒක ලැබෙන්නේ.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
නැහැ, නැහැ. ගුවන් තොටුපොළ එතැන තිබෙන නිසා නොවෙයි.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
නැති වෙන්නේ කොහොමද?

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ඔය ගුවන් තොටුපොළට ඒක සම්බන්ධයක් නැහැ.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
මොකද, දැන් කටුනායක ගුවන් තොටුපොළට A380 ගුවන් යානා බස්සන්න පුළුවන්. ඒ නිසා ඒකෙන් බලපෑමක් වෙන්නේ නැහැ.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා වැරැදි අර්ථකථනයක් දෙන්නේ. ඒ ගුවන් තොටුපොළ තිබුණත් නැතත්, අපේ ගුවන් සීමාවෙන් යන ගුවන් යානාවලින් අපට මුදල් ලැබෙනවා. ඒ, ගුවන් තොටුපොළට කියලා එකක් නැහැ. ඒ, ගුවන් තොටුපොළට වැඩියෙන් ගුවන් යානා ආවොත්, අපට ඒ එන ගුවන් යානාවලින් මුදල් ලැබෙනවා නේ. එතකොට ආදායම වැඩි වෙනවා.

ගරු කනක හේරත් මහතා
(மாண்புமிகு கனக ஹேரத்)
(The Hon. Kanaka Herath)
මත්තල ගුවන් තොටුපොළ විකල්ප ගුවන් තොටුපොළක් හැටියට භාවිතා කරනවා. කටුනායක ගුවන් තොටුපොළක් තිබෙන එක වෙනම දෙයක්. කටුනායකට විකල්පය තමයි මත්තල ගුවන් තොටුපොළ. එහෙම නැත්නම් ගුවන් යානා යන්නේ දිල්ලිවලට, එහෙමත් නැත්නම් කරච්චිවලට. ඒක නිසා මේ ගුවන් තොටුපොළ විකල්ප ගුවන් තොටුපොළක් හැටියට භාවිත කිරීම වෙනුවෙන් මුදලක් ලැබෙනවා.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
මේ ගුවන් තොටුපොළ ජනාකීර්ණ ගුවන් තොටුපොළක් බවට පත් වුණාම ගුවන් යානා එද්දී අපට ලැබෙන ආදායම් වැඩි වෙනවා. මොකද, ගුවන් යානා එද්දී අපේ ගුවන් සීමාවේ නේ එන්නේ. ඒ නිසා ආදායම් වැඩි වෙනවා. අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ ආයෝජකයෙක් සමඟ එකතු වෙලා හවුල් ව්‍යාපාරයක් තුළින්, පාඩු ලබන ගුවන් ආයතනය ලාභ ලබන ගුවන් ආයතනයක් බවට පත් කර, ඒ ආයතනයෙන් මේ රටට ප්‍රතිලාභ ලබා දෙන්නයි. එහෙම නැතිව කිසිසේත්ම විකිණීමක් නොවෙයි කරන්නේ. ඒ බව මම වගකීමෙන් කියනවා. ඒ වාගේම, මේ සම්බන්ධයෙන් ඊයේ සාකච්ඡාවක් තිබුණා. ඒ සාකච්ඡාවලින් යම් යම් තීන්දුවලට ඇවිල්ලා තිබෙනවා. ගරු ඇමතිතුමා කිව්වා වාගේ ඉදිරියේ දීත් මේ සම්බන්ධව සාකච්ඡා පවත්වා කැබිනට් මණ්ඩලයට යෝජනා ඉදිරිපත් කර අනුමැතිය ලැබුණාට පසුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනවා. පාර්ලිමේන්තුවත් දැනුවත් කරලා මේ ගිවිසුම් අත්සන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අපි කිසිම විධියකට මෙය විකිණීමක් කරන්නේ නැහැ. -[බාධා කිරීමක්]- කියන්න, මන්ත්‍රීතුමා.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා ඉන්දියානු සමාගමකට,-[බාධා කිරීමක්]-

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු ඇමතිතුමා කිව්වා වාගේ අපි ඒ සම්බන්ධයෙන් පත්තරවල දැන්වීම් දැම්මා. ඉන්දියාවේ යෝජනාවක් විතරයි අපට ගන්න පුළුවන් වුණේ. අනෙක් සෑම යෝජනාවක්ම අපි බලාපොරොත්තු වෙච්ච තත්ත්වයට ඇවිල්ලා තිබුණේ නැහැ. වෙන වෙන රටවල්වලිනුත් යෝජනා ආවා. නමුත්, ඉන්දියාවේ යෝජනාව විතරයි සාකච්ඡා කරන්න පුළුවන් යෝජනාවකට හරි තිබුණේ. ඒ නිසා තමයි අපි ඉන්දියාවත් එක්ක සාකච්ඡා කළේ. -[බාධා කිරීමක්]- චීන රජයෙනුත් ඇවිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම ඉන්දියාවේ යෝජනා විතරයි අපට සාකච්ඡා කරන්න පුළුවන් වුණේ.-[බාධා කිරීමක්]-

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලා වෙනත් රටවල්වලටත් යෝජනා ඉදිරිපත් කරන්න අවස්ථාව දුන්නාද?

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ඔව්. පත්තරේට දැම්මා, website එකට දැම්මා. දැන් ඒ කාලසීමාව ඉවරයි.

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
කැබිනට් තීන්දුව අනුව අපි Expression of Interest මුළු ලෝකෙන්ම කැඳෙව්වා. එතැනදී මුළු ලෝකයෙන්ම parties 6ක් Expressions of Interest එව්වා. ඒ අය කිව්වේ, MRO එකක් හදන්න; flying school එකක් දාන්න වාගේ පොඩි පොඩි යෝජනා විතරයි. මේ වාගේ විශාල යෝජනාවක් ආවේ නැහැ. ඒ නිසයි අපි මේ යෝජනාව පිළිගත්තේ.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු ඇමතිතුමනි, දේශීය ව්‍යවසායකයන් කවුරුවත් මේකට ඉදිරිපත් වුණේ නැද්ද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
දේශීය ව්‍යවසායකයන් ඉදිරිපත් වුණා, flying school වගේ එකක් හදන්න.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු ඇමතිතුමනි, ඔවුන්ට ඒ අවස්ථාව දෙන්නේ නැත්තේ ඇයි?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
ඒ අය ඔක්කෝටම පොඩි පොඩි වැඩවලට අවස්ථාව ලැබෙනවා.

ගරු කංචන විජේසේකර මහතා
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
දේශීය ව්‍යවසායකයන් කීප දෙනෙක් එකතු කරගෙන මේ දේ කරන්න බැරි ද?

ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா)
(The Hon. Nimal Siripala De Silva)
එහෙම නම්, ඔබතුමාට ව්‍යවසායකයන් කීප දෙනෙක් එකතු කරගෙන proposal එකක් දෙන්න තිබුණා නේ.

ගරු අශෝක් අබේසිංහ මහතා
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඒ යෝජනාවල flying school දාන්න වාගේ පොඩි පොඩි යෝජනා ආවා මිසක්, මේක සංවර්ධනය කරන්න මේ වාගේ දැවැන්ත යෝජනා ආවේ නැහැ. අපි ඒකයි කිව්වේ. මේ ගුවන් තොටුපොළ හදන්න ගිය මුදලටත් වඩා වැඩි මුදලක් මේකෙන් ලැබෙන සියයට 70න් ලැබෙනවා. විශේෂයෙන්ම මේ රටට අහිතකර යෝජනා අපි කරන්නේ නැහැ. අපි මේ පිළිබඳව කැබිනට් මණ්ඩලය දැනුවත් කරනවා; රටේ ජනතාව දැනුවත් කරනවා. ඔබතුමන්ලා වගේ අපි අපේ රටේ ඉඩම් සින්නක්කරව විකුණන්නේ නැහැ. අපේ රටේ ඉඩම් සින්නක්කරව විකුණපු ආණ්ඩුවක සාමාජිකයන් මේ ගැන කීම පිළිබඳව මම ඉතා කනගාටු වෙනවා. -[බාධා කිරීමක්]- ගරු ඇමතිතුමා ඒ වෙලාවේ එම සිද්ධිය ගැන කිව්වා නේ. අපේ රජය කිසිසේත්ම විකිණීමක් කරන්නේ නැහැ. අපි කරන්නේ මේක හවුල් ව්‍යාපාරයක්. අලාභ ලබන මත්තල ගුවන් තොටුපොළ ලාභ ලබන තත්ත්වයක් බවට පත් කරලා, මේ රටේ ආර්ථිකය ඉහළ නැංවීමේ වැඩ පිළිවෙළක් තමයි අපි කරන්නේ. ඒ නිසා ඔබතුමා මෙවැනි යෝජනාවක් ගෙන ඒම පිළිබඳව විශේෂයෙන්ම මම කනගාටු වෙනවා. බොහොම ස්තුතියි.

එකල්හි වේලාව අ.භා. 7.30 පසු කර තිබුණෙන් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමා විසින් ප්‍රශ්නය නොවීමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 7.47ට 2018 ජූලි මස 06 වන සිකුරාදා පූ.භා. 10.00 වන තෙක් කල් ගියේය.

அப்பொழுது நேரம் பி.ப. 7.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.

இதன்படி, பி.ப. 7.47க்கு பாராளுமன்றம், 2018 யூலை 06, வெள்ளிக்கிழமை மு.ப. 10.00 மணி வரை ஒத்திவைக்கப்பட்டது.


And it being past 7.30 p.m., THE HON. PRESIDING MEMBER adjourned Parliament without Question put.

Parliament adjourned accordingly at 7.47 p.m. until 10.00 a.m. on Friday, 6th July, 2018.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

261 වන කාණ්ඩය - 11 වන කලාපය
தொகுதி 261 - இல. 11
Volume 261 - No. 11

2018 ජූලි 06වන සිකුරාදා
2018 யூலை 06, வெள்ளிக்கிழமை
Friday, 06th July, 2018



පාර්ලිමේන්තු විවාද

(හැන්සාඩ්)

பாராளுமன்ற விவாதங்கள்

(ஹன்சாட்)

PARLIAMENTARY DEBATES

(HANSARD)

නිල වාර්තාව

அதிகார அறிக்கை

OFFICIAL REPORT

අන්තර්ගත ප්‍රධාන කරුණු

මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා

ප්‍රශ්නවලට වාචික පිළිතුරු

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:
නෙත් එෆ් එම් ගුවන්විදුලි නාළිකාවට බලපෑම්
නන්දිකඩල් ප්‍රදේශය සංවර්ධනය කිරීම

හජ් වන්දනා වැඩ පිළිවෙළ සම්බන්ධ අසත්‍ය චෝදනා:
තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු
අමාත්‍යතුමාගේ ප්‍රකාශය

වරප්‍රසාද යෝජනා:
2018 ජූනි 21වන දින 'ලංකාදීප' වාර්තාව

කල් තැබීමේ යෝජනාව:
පළාත් සභා මැතිවරණ නීති ප්‍රතිසංස්කරණ

பிரதான உள்ளடக்கம்

நிதி ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை

துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்

வினாக்களுக்கு வாய்மூல விடைகள்

தனி அறிவித்தல் மூல வினா:
நெத் எப்எம் வானொலி நிலையத்துக்கு அச்சுறுத்தல்
நந்திக்கடல் பகுதியை அபிவிருத்தி செய்தல்

ஹஜ் யாத்திரை நடைமுறை பற்றிய தவறான குற்றச் சாட்டுக்கள்:
தபால், தபால் சேவைகள் மற்றும் முஸ்லிம் சமய அலுவல்கள் அமைச்சரினது கூற்று

சிறப்புரிமைப் பிரேரணைகள்:
2018 யூன் 21ஆம் திகதிய"லங்காதீப" அறிக்கை

ஒத்திவைப்புப் பிரேரணை:
மாகாண சபைத் தேர்தல்கள் சட்டச் சீர்திருத்தங்கள்

PRINCIPAL CONTENTS

PERFORMANCE REPORT OF THE FINANCE COMMISSION

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Undue Influence on Neth FM Radio Station
Development of Nandikadal Area

FALSE ALLEGATIONS LEVELLED AGAINST HAJJ PILGRIMAGE:
Statement by Minister of Post, Postal Services and Muslim Affairs

PRIVILEGE MOTIONS:
"Lankadeepa" Report of 21st June, 2018

ADJOURNMENT MOTION:
Reforms to Provincial Councils Election Laws

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
PARLIAMENT

2018 ජූලි 06වන සිකුරාදා
2018 யூலை 06, வெள்ளிக்கிழமை
Friday, 06th July, 2018

පූ.භා. 10.00ට පාර්ලිමේන්තුව රැස් විය.
කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.
பாராளுமன்றம் மு.ப. 10.00 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 10.00 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව
நிதி ஆணைக்குழுவின் செயலாற்றுகை அறிக்கை
PERFORMANCE REPORT OF THE FINANCE COMMISSION

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41ආ(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2018 වර්ෂයේ පළමුවැනි කාර්තුව (2018.01.01 - 2018.03.31) සඳහා මුදල් කොමිෂන් සභාවේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
PAPERS PRESENTED

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු කථානායකතුමනි, ස්වදේශ කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් 2017 වර්ෂය සඳහා පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සහ ගිණුම් වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව අභ්‍යන්තර පරිපාලනය හා රාජ්‍ය කළමනාකරණ පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන්, 2017 වර්ෂය සඳහා ශ්‍රී ලංකා පොලිසියේ කාර්ය සාධන වාර්තාව මම ඉදිරිපත් කරමි.

එම වාර්තාව ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)

ගරු කථානායකතුමනි, උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4)(ආ) වගන්තිය යටතේ අග්නිදිග විශ්වවිද්‍යාලයේ උපකුලපති වෙනුවට නිසි බලධරයෙකු පත් කිරීම සම්බන්ධයෙන් උසස් අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2018 ජූනි 19 දිනැති අංක 2076/13 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය මම ඉදිරිපත් කරමි.

එම නියමය අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කළ යුතුයැයි මම යෝජනා කරමි.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ගරු කරුණාරත්න පරණවිතාන මහතා (විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - விஞ்ஞான, தொழில்நுட்ப, ஆராய்ச்சி, திறன்கள் அபிவிருத்தி, தொழில் பயிற்சி மற்றும் கண்டி மரபுரிமைகள் பிரதி அமைச்சர்)
The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Science, Technology, Research, Skills Development and Vocational Training and Kandyan Heritage)

ගරු කථානායකතුමනි, ප්‍රතිසන්ධානය හා උතුර හා නැගෙනහිර නැවත ගොඩ නැගීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) 2015 සහ 2016 වර්ෂ සඳහා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තා හා වාර්ෂික ගිණුම්;

(ii) 2012, 2013, 2014 සහ 2015 වර්ෂ සඳහා තැනැත්තන්, දේපළ සහ කර්මාන්ත පුනරුත්ථාපන අධිකාරියේ වාර්ෂික වාර්තා සහ ගිණුම් ප්‍රකාශ;

(iii) 2016 සහ 2017 වර්ෂ සඳහා ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තා; සහ

[ගරු කරුණාරත්න පරණවිතාන මහතා]

(iv) 2014 වර්ෂය සඳහා ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ වාර්ෂික වාර්තාව

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව එහි සභාපතිතුමා වෙනුවෙන් මම ඉදිරිපත් කරමි.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)

Hon. Speaker, I present the Report of the Sectoral Oversight Committee on Health and Human Welfare, Social Empowerment on, "Apartment Ownership (Special Provisions) Bill" which was referred to the said Committee.

සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.
சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.
Ordered to lie upon the Table.

පෙත්සම්
மனுக்கள்
PETITIONS

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අජිත් පී. පෙරේරා මහතා- ***[සභා ගර්භය තුළ නැත.]***
ගරු ගාමිණී ලොකුගේ මහතා- ***[සභා ගර්භය තුළ නැත.]***

ප්‍රශ්නවලට වාචික පිළිතුරු
வினாக்களுக்கு வாய்மூல விடைகள்
ORAL ANSWERS TO QUESTIONS

මහනුවර දිස්ත්‍රික්කයේ ජාතික පාසල් : විස්තර
கண்டி மாவட்டத் தேசிய பாடசாலைகள்: விபரம்
NATIONAL SCHOOLS IN KANDY DISTRICT: DETAILS

21/'18

1. ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ ඇති ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් හා ලිපිනයන් කවරේද;

(iii) එම එක් එක් පාසලේ ඉගෙනුම ලබන ශිෂ්‍ය සංඛ්‍යාව සහ සේවයේ නියුතු ගුරුවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පාසල්වල පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(v) මහනුවර දිස්ත්‍රික්කයේ පවතින ජාතික පාසල් සංඛ්‍යාව වැඩි කිරීම කෙරෙහි අමාත්‍යාංශයේ අවධානය යොමු වී තිබේද;

(vi) මහනුවර දිස්ත්‍රික්කයේ පවතින ජාතික පාසල්වල භෞතික හා මානව සම්පත් සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

කල්වි අමைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கண்டி மாவட்டத்தில் உள்ள தேசிய பாடசாலைகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(ii) மேற்படி பாடசாலைகளின் பெயர்கள் மற்றும் முகவரிகள் யாவை என்பதையும்;

(iii) மேற்படி ஒவ்வொரு பாடசாலையிலும் கல்வி பயிலும் மாணவர்களின் எண்ணிக்கை மற்றும் சேவையில் ஈடுபட்டுள்ள ஆசிரியர்களின் எண்ணிக்கை தனித்தனியே யாது என்பதையும்;

(iv) மேற்படி பாடசாலைகளில் நிலவும் ஆசிரியர் வெற்றிடங்களின் எண்ணிக்கையையும்;

(v) கண்டி மாவட்டத்தில் காணப்படுகின்ற தேசிய பாடசாலைகளின் எண்ணிக்கையை அதிகரிப்பது தொடர்பாக அமைச்சின் கவனம் செலுத்தப் பட்டுள்ளதா என்பதையும்;

(vi) கண்டி மாவட்டத்தில் காணப்படுகின்ற தேசிய பாடசாலைகளின் பௌதீக மற்றும் மனித வளங்களை அபிவிருத்தி செய்வதற்கு அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கை யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-
(i) the number of National Schools in Kandy District;
(ii) the names and addresses of those schools;
(iii) the number of students studying and the number of teachers serving in each of those schools, separately;
(iv) the number of vacancies for teachers that exists in those schools;
(v) whether the Ministry has paid attention to increase the number of National Schools in Kandy District;
(vi) the steps taken by the Ministry to develop the physical and human resources of the National Schools in Kandy District?

(b) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා (ඉඩම් සහ පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය හා ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)
(மாண்புமிகு கயந்த கருணாதிலக்க - காணி மற்றும் பாராளுமன்ற மறுசீரமைப்பு அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Gayantha Karunatileka - Minister of Lands and Parliamentary Reforms and Chief Government Whip)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) ජාතික පාසල් 35කි.

(ii) ඇමුණුම බලන්න.

(iii) ඇමුණුම බලන්න.

(iv) ඇමුණුම බලන්න. ඇමුණුම **සභාගත*** කරමි.

(v) ඔව්. පේරාදෙණිය විශ්වවිද්‍යාලයට අයත් භූමියෙන් කොටසක නව ජාතික පාසලක් ඉදි කිරීම සඳහා අවශ්‍ය මූලික ක්‍රියා මාර්ග ගනිමින් සිටී.

(vi) ඔව්.

- ජාතික පාසල්වල ඉගෙනුම ප්‍රවර්ධනය සඳහා පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධනය ලෙස ප්‍රදානයන් ලබා දීම. ඉන් සියයට 50ක් අධ්‍යාපන ගුණාත්මක සංවර්ධනයටද සියයට 50ක් සුළු අලුත්වැඩියා කටයුතු සඳහා ද යොදවයි. (2017 වර්ෂයේ ඒ සඳහා වෙන් කළ මුදල රුපියල් මිලියන 6.1928කි.)
- ද්විතීයික අංශයේ ගුණාත්මක යෙදවුම් සඳහා සෑම ජාතික පාසලකටම ප්‍රතිපාදන වාර්ෂිකව ලබා දෙනු ලැබේ. (2017 වර්ෂයේ ඒ සඳහා වෙන් කළ මුදල රුපියල් මිලියන 3.7420 කි.)
- එමෙන්ම ලී බඩු හා උපකරණ හා යන්ත්‍රෝපකරණ අලුත්වැඩියාව සඳහා වාර්ෂිකව ප්‍රතිපාදන වෙන් කෙරේ. (2017 වර්ෂයේ ඒ සඳහා වෙන් කළ මුදල රුපියල් මිලියන 4.379කි.)
- මානව සම්පත් සංවර්ධනය සඳහා විදුහල්පති පුහුණු වැඩසටහන් සංවිධානය කර පාසල් පරිපාලනය වඩාත් කාර්යක්ෂම කිරීමට පියවර ගැනීම.
- වාර්ෂිකව ජාතික පාසල්වලට ලී බඩු උපකරණ හා යන්ත්‍රෝපකරණ ලබා දීම.

(ආ) අදාළ නොවේ.

සභාමේසය මත තබන ලද ඇමුණුම:
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :
Annex tabled:

ඇමුණුම- I

(ඇ)(ii), (ඇ)(iii), (ඇ)(iv)

No.	CensusNo	School Name	Address	No. of Students	No. of Teachers, who are teaching at school	Deficit
1	03004	GALAGEDARA M.M.V	GALAGEDARA	966	65	4
2	03010	SUJATHA B.V.	GALAGEDARA	898	54	0
3	03011	HATHARALIYADDHA CENTRAL COLLEGE.	HATHARALIYADDHA.	1119	56	12
4	03045	POOJAPITIYA CENTRAL COLLEGE.	POOJAPITIYA.	1134	65	0
5	03046	ANKUMBURA PARAKRAMA M.M.V.	ANKUMBURA	661	51	0
6	03048	ALAWATHUGODA M.M.V	ALAWATHUGODA.	1015	56	0
7	03075	NUGAWELA CENTRAL COLLEGE.	NUGAWELA.	4481	155	13
8	03169	RANASINGHE PREMADASA N.S.	HASALAKA	1092	49	13
9	03181	AMUPITIYA N.S.	UDISPATTUWA	697	42	0
10	03184	TELDENIYA N.S.	TELDENIYA.	1914	91	0
11	03217	S.W.R.D.BANDARANAYAKA N.S.	KUNDASALE	852	70	0
12	03256	RAJAWELLA HINDU N.S	RAJAWELLA, DIGANA	1245	53	0
13	03263	MADINA N.S.	MADAWALA BAZAAR	1803	76	24
14	03284	AZHAR CENTRAL COLLEGE.	AKURANA.	1931	74	33
15	03285	AL MANAR MUS.V.	GALHINNA.	635	34	16
16	03286	AKURANA ZAHIRA CENTRAL COLLEGE.	BULUGAHATHANNA, AKURANA.	1152	58	17
17	03314	BOPITIYA RAJASINGHE M.V	POTHGODA,MARASSANA	681	47	0
18	03320	MARASSANA M.M.V.	MEERUPPA, MARASSANA	635	35	6
19	03350	DHARMARAJA COLLEGE	KANDY	4788	193	0
20	03351	MAHAMAYA GIRLS COLLEGE	KANDY	4532	200	0
21	03379	GIRL'S HIGH SCHOOL	KANDY	5837	209	17
22	03380	KINGSWOOD COLLEGE	KANDY	3699	143	23
23	03382	PUSHPADANA B.V	KANDY	2648	108	0
24	03387	SRI RAHULA COLLEGE	KATUGASTOTA	2345	129	0
25	03405	KADUGANNAWA N.S	KADUGANNAWA	1058	79	0
26	03406	SRI SWARNAJOTHI N.S.	KIRIBATHIKUBURA	1014	79	0
27	03441	D.B.WIJETHUNGA M.M.V	DASKARA, MURUTHAGAHAMULA	724	64	0
28	03488	WICKRAMABAHU M.M.V.	GAMPOLA	1608	83	0
29	03490	WIMALADHARMA N.S	ATABAGE GAMPOLA	770	56	0
30	03532	SENADHIKARI NATIONAL SCHOOL	UDAHENTENNA	1043	57	0
31	03553	ANURUDDA KUMARA MMV	NAWALAPITIYA	1603	88	0
32	03575	BADI UDDIN MAHMUD GIRLS' COLLEGE	KANDY	2008	131	14
33	03617	HINDU NATIONAL SCHOOL	NUWARA-ELIYA ROAD PUSSELLAWA	1141	54	6
34	03648	AL MANAR MUS.M.M.V	HANDESSA	1183	61	24
35	03658	ZAHIRA COLLEGE	ZAHIRA COLLEGE GAMPOLA	2933	154	1
Total				61845	3019	223

2017 ජූනි 01 දිනට අදාළව ලබා ගෙන ඇති පාසල් සංගණන දත්ත මත පදනම්ව ගුරු හිඟය ගණනය කර ඇති බව සලකන්න.

[මෙම ඇමුණුම පුස්තකාලයේ ද තබා ඇත.]
[இந்த இணைப்பு நூல் நிலையத்திலும் வைக்கப்பட்டுள்ளது]
[This annex is also placed in the Library.]

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

ගරු අධ්‍යාපන අමාත්‍යතුමා අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විශාල දියුණුවක් ඇති කිරීම සඳහා ගන්නා වූ උත්සාහය මේ රටේම ජනතාව අගය කරනවා. විශේෂයෙන්ම පාසල් දරුවන් සඳහා රක්ෂණ ක්‍රමයක් ඇති කිරීම ඉතා වැදගත් කාරණයක් හැටියට අප සලකනවා.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අප මේ කාරණය දැනගන්න කැමැතියි. "ළඟම පාසල හොඳම පාසල" කියන වැඩ පිළිවෙළ ඇති කරලා පාසල්වල විශාල දියුණුවක් ඇති කළත්, ඒ අවශ්‍ය මුදල් පළාත් සභාවට ලබාදීලා අපේ ආසනවල පාසල්වල සිදු කරන අධ්‍යාපන කටයුතු සම්බන්ධයෙන් අප දැනුවත් නැහැ. ගරු අමාත්‍යතුමනි, මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරනවාද කියා මම අහන්න කැමැතියි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ඒ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යතුමාගේ අවධානය යොමු කරවන්නම්, ගරු මන්ත්‍රීතුමනි

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අතුරු ප්‍රශ්න එපමණද, ගරු මන්ත්‍රීතුමනි?

ගරු ආනන්ද අලුත්ගමගේ මහතා
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ඔව්, ගරු කථානායකතුමනි. බොහොම ස්තුතියි.

2016 අය වැය යෝජනා : විශේෂිත කෘෂිකාර්මික හා ධීවර අපනයන කලාප

2016 வரவு செலவுத்திட்ட முன்மொழிவு: விசேட கமத்தொழில் மற்றும் மீன்பிடி ஏற்றுமதி வலயங்கள்

BUDGET PROPOSALS 2016: SPECIALIZED AGRICULTURAL AND FISHERY EXPORT ZONES

46/'18

2. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(ඇ) (i) 2016 අයවැයෙහි අංක 183 වැනි යෝජනාවට අනුව, අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ සඳහන් කර ඇති පරිදි, පිහිටුවීමට යෝජනා කරන ලද විශේෂිත කෘෂිකාර්මික හා ධීවර අපනයන කලාපවලින්, 2016 වර්ෂය තුළ පිහිටවනු ලැබූ කලාප සංඛ්‍යාව සහ ඒවා පිහිටවූ ස්ථාන කවරේද;

(ii) උක්ත යෝජනාවට අනුව පිහිටවූ එක් එක් කලාපයක් වෙනුවෙන් රජය විසින් දරනු ලැබූ මුළු වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මෙම කෘෂිකාර්මික හා ධීවර අපනයන කලාපයන්හි වගකීම දරන්නේ කවර රාජ්‍ය ආයතනයක් විසින්ද;

(iv) 2016 වර්ෂය තුළ එවැනි කලාප පිහිටවනු ලැබුවේ නම්, එම එක් එක් කලාපයක අපනයන ඉපයුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා]

சமூக நலன்புரி மற்றும் ஆரம்பக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016 வரவு செலவுத்திட்டத்தில் 183ஆம் இலக்க முன்மொழிவின் பிரகாரம், கௌரவ பிரதம அமைச்சரின் கொள்கைப் பிரகடனத்தில் குறிப்பிடப்பட்டுள்ளவாறு, தாபிப்பதற்கு முன்மொழியப்பட்ட விசேட கமத்தொழில் மற்றும் மீன்பிடி ஏற்றுமதி வலயங்களில், 2016 ஆம் ஆண்டில் தாபிக்கப்பட்ட வலயங்களின் எண்ணிக்கை மற்றும் அவை தாபிக்கப்பட்டுள்ள இடங்கள் யாவை என்பதையும்;

(ii) மேற்படி பிரேரணைக்கு அமைய, தாபிக்கப்பட்ட ஒவ்வொரு வலயத்திற்காகவும் அரசாங்கத் தினால் ஏற்கப்பட்ட மொத்தச் செலவினம் தனித்தனியே எவ்வளவு என்பதையும்;

(iii) இந்தக் கமத்தொழில் மற்றும் மீன்பிடி ஏற்றுமதி வலயங்களின் பொறுப்பை எந்த அரச நிறுவனம் ஏற்றுள்ளது என்பதையும்;

(iv) 2016ஆம் ஆண்டில் அவ்வாறான வலயங்கள் தாபிக்கப்பட்டிருப்பின், மேற்படி ஒவ்வொரு வலயத்தினதும் ஏற்றுமதி வருவாய் யாதென்பதை யும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Social Welfare and Primary Industries:

(a) Will he inform this House -

(i) how many of the specialized agricultural and fishery export zones proposed to be established according to Budget Proposal No. 183 in the Budget 2016, as mentioned in the manifesto of the Hon. Prime Minister, were established in the year 2016 and where they have been located;

(ii) the total expenditure borne by the Government separately for each of the zones so established according to the aforesaid Proposal;

(iii) what Government agency bears the responsibility for these specialized agricultural and fishery export zones; and

(iv) what export income was earned through each such zone if such zones have been established in the year 2016?

(b) If not, why?

ගරු දයා ගමගේ මහතා (සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යතුමා)
(மாண்புமிகு தயா கமகே - சமூக நலன்புரி மற்றும் ஆரம்பக் கைத்தொழில் அமைச்சர்)
(The Hon. Daya Gamage - Minister of Social Welfare and Primary Industries)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) වීවර අධි කලාප 10ක් සහ කෘෂි කලාප 24ක් පිහිටුවීමට යෝජනා කරන ලදී.

කෘෂි අධි කලාප යටතේ:

- 2016 වර්ෂයේ කෘෂි අධි කලාප සඳහා ඉඩම් හඳුනාගන්නා ලෙස දිස්ත්‍රික් ලේකම්වරුන් දැනුවත් කරන ලදී. ඒ අනුව, අම්පාර, ගාල්ල සහ මාතලේ දිස්ත්‍රික්ක සඳහා අවශ්‍ය ඉඩම් හඳුනාගන්නා ලදී.
- 2017 සහ 2018 වර්ෂවලදී මෙම කලාප පිහිටුවීමට අදාළ පාරිසරික ඇගයීම්, මිනින්දෝරු කටයුතු සහ ගෘහ නිර්මාණ සැලසුම් කටයුතු ආරම්භ කළ අතර, දැනට ඒවා අවසන් කර ඇත. අදාළ ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්කරුවන් හඳුනා ගැනීම ආරම්භ කොට ඇත.
- 2018 වර්ෂයේදී පුත්තලම දිස්ත්‍රික්කය අධිකලාප පිහිටුවීම සඳහා හඳුනාගෙන ඇත.

වීවර අධිකලාප යටතේ:

- 2016 වර්ෂයේදී ඔලුවිල් (අම්පාර ඇතුළුව) සහ කල්පිටිය (මන්නාරම සහ කිලිනොච්චිය ඇතුළුව) කලාප පිහිටුවීම සඳහා හඳුනා ගන්නා ලදී.
- 2016 සහ 2017 වර්ෂයේ මෙම අධිකලාප පිහිටුවීමේ කටයුතු ආරම්භ කොට ඉදිකිරීම් කටයුතු කරගෙන යන ලදී.
- 2018 වර්ෂයේදී ද මෙම කලාපවල ඉදිකිරීම් කටයුතු කරගෙන යන අතර, දැනට නිෂ්පාදන කටයුතුද අරඹා ඇත.
- 2018 වන විට කන්ද උඩරට කලාපය (නුවරඑළිය බදුල්ල ඇතුළු), මාතලේ - පොළොන්නරුව කලාපය සහ යාපනය හා මුලතිව් කලාපය හඳුනාග�ෙන ඇත.

(ii) <u>කෘෂිකර්ම</u>

	2016	2017	2018
අම්පාර	-	මිලියන 05	මිලියන 100
ගාල්ල	-	මිලියන 05	මිලියන 100
මාතලේ	-	මිලියන 03	මිලියන 100

<u>වීවර</u>

කල්පිටිය	මිලියන 01	මිලියන 08	මිලියන 30
ඔලුවිල්	මිලියන 01	මිලියන 12	මිලියන 18

(iii) සමාජ සුබසාධන හා ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය වගකීම දරයි.

(iv) කෘෂි කලාප සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය දිවයින පුරා වගා කිරීමට කටයුතු කරන ලදී. මේ තුළින් අපනයන අගයදාමය වැඩි වෙමින් පවතී.

ඒ අනුව, 2016 වර්ෂයේ ඇමෙරිකානු ඩොලර් මිලියන 326ක් වූ ප්‍රාථමික අපනයන වටිනාකම 2017 වර්ෂයේදී ඇමෙරිකානු ඩොලර් මිලියන 454ක් දක්වා සියයට 39කින් වර්ධනය විය. කලාපවල නිෂ්පාදනය ආරම්භ වීම තුළින් ප්‍රාථමික අපනයන වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 1,500ක් දක්වා වැඩි කිරීමට අපේක්ෂිතය.

(ආ) අදාළ නොවේ.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, පැහැදිලි පිළිතුරක් ලබාදීම පිළිබඳව ගරු ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. ගරු ඇමතිතුමනි, මම මේ ප්‍රශ්නය විශේෂයෙන් ඔබතුමාගේ අවධානයට යොමු කරන්නේ, රාජ්‍ය මූල්‍ය පිළිබඳව මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ප්‍රධානම ලියවිල්ල වන අය වැය යෝජනාවල සඳහන් වන ආකාරයයි, එය ක්‍රියාත්මක වන ආකාරයයි අතර වෙනස තුළ අපට පසුවිපරම් හා මූල්‍ය ගිණුම්කරණය පිළිබඳ විශාල ප්‍රශ්නයක් තිබෙන බව දැනුම් දීමටයි.

ගරු කථානායකතුමනි, 2016 අය වැය ලේඛනයේ අය වැය යෝජනා 183න් මේ සඳහා මුදල් වෙන් වන්නේ මේ විධියටයි.

"ගරු අගමැතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශයේ සඳහන් කර ඇති පරිදි විශේෂිත කෘෂිකාර්මික හා ධීවර අපනයන කලාප රට තුළ පිහිටුවනු ඇත. ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය වෙත මෙම යෝජිත කෘෂිකාර්මික හා ධීවර අපනයන කලාප පිහිටුවීම සඳහා රුපියල් මිලියන 2,000ක් වෙන් කරනවා."

මේ ගරු සභාවේ 2/3ක ඡන්දයෙන් සම්මත කරගෙන, 2016 වර්ෂයට තමයි මේ රුපියල් මිලියන 2,000 වෙන් කරන්නේ. එසේ වෙන් කළ රුපියල් මිලියන 2,000න්, ඔබතුමා දැන් සඳහන් කළ පරිදි 2016 වර්ෂයේදී ඉතාම කුඩා මුදලක් තමයි මේ වෙනුවෙන් වැය වෙන්නේ, ගරු ඇමතිතුමනි. ඉතිරි මුදල් ප්‍රමාණය භාණ්ඩාගාරයට යනවාය කියා එකක් නැහැ නේ. එම මුදල භාණ්ඩාගාරයෙන් ඔබතුමාගේ අමාත්‍යාංශයට එන්නේ නැහැ.

මේ ගැටලුව නිසා, අය වැය යෝජනා වශයෙන් අපි පාර්ලිමේන්තුවට දැනුම් දෙන්නේ ව්‍යාජයක් කියා ඔබතුමා පිළිගන්නවාද? ගරු ඇමතිතුමනි, ඔබතුමාට කියන්න පුළුවන්ද, රුපියල් මිලියන 2,000න් -ඒ කියන්නේ, රුපියල් බිලියන 2න්- 2016 වර්ෂයේදී මේ ව්‍යාපෘතිය සඳහා වියදම් කරපු නිශ්චිත මුදල කොපමණද කියලා.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)

ගරු කථානායකතුමනි, බන්දුල ගුණවර්ධන මැතිතුමා ඇමතිවරයෙක් හැටියට මෙම ගරු සභාවේ හිටියා. එතුමා ඇමති ධුරයේ රාජකාරි ඉටු කර තිබෙනවා. සාමාන්‍යයෙන් අය වැයෙන් අපට මුදල් වෙන් කළාම මා දැක තිබෙනවා, සමහර අමාත්‍යාංශ තමන්ට වෙන් කරන මුදල් ටික අරගෙන ඒ අවුරුද්ද අන්තිම වනකොට කුමක් හෝ ක්‍රමයකින් වියදම් කරන්න තමයි උත්සාහ දරන ආකාරය. ඒ නිසාම තමයි අද අපේ රට මේ තත්ත්වයට වැටිලා තිබෙන්නේ. දැන් අපි හම්බන්තොට වරාය වාගේ ව්‍යාපෘතියක් අරගනිමු. කිසිම සැලැස්මක් නැතුව වරායක් හැදුවා. ඒ වරායට නැව් 58යි ඇවිල්ලා තිබුණේ. හම්බන්තොට වරාය ව්‍යාපෘතිය වෙනුවෙන් අත්සන් කර තිබෙන ගිවිසුම් අනුව ඒ වරාය චීනයට සින්න වෙනවා. ඒ මුදල අපි වරායෙන් හම්බ කළේ නැත්නම්, අපට අවසානයේදී- [බාධා කිරීමක්]

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඔය අසත්‍ය.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)

ගරු කථානායකතුමනි, අපි ගිවිසුමක් අත්සන් කර තිබෙනවා. අපි ඒ මුදල් වරායෙන් හොයාගෙන තමයි ණය ගෙවන්න වෙන්නේ. එහෙම නැත්නම් වෙන්නේ, මේ රටේ අහිංසක ගොවි ජනතාව ඇතුළු වැඩ කරන ජනතාව උපයන මුදල් අපි බදු හැටියට අය කරගෙන වරායේ ඒ ණය මුදල ගෙවන්න ඕනෑ. ණය මුදල ගෙව්වේ නැත්නම්, වරාය සින්න වෙනවා. අඩු ගානේ සින්න වෙන එක නවත්වා ගන්න අපට පුළුවන් වුණා. ඒ වරාය බදු දීලා, බේරා ගන්න අවස්ථාවක් අපි ඇති කර තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, අහපු අතුරු ප්‍රශ්නයට පිළිතුරු දෙන්න.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
ගරු කථානායකතුමනි, මේක අපි ගත්තොත් එහෙම- [බාධා කිරීම්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමාට පිළිතුරු දෙන්න ඉඩ දෙන්න.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)

ගරු අගමැතිතුමා මට මේ වගකීම භාර දුන්නා. මේ වගකීම භාර දුන්නාම මම මේ ගැන බැලුවා, අපි මේ හදන කර්මාන්ත කලාපවල ඇති කරන කර්මාන්තශාලාවලට අමුද්‍රව්‍ය අවශ්‍ය කරනවා.

අපි මුලින්ම 2015දී කෘෂිකර්ම අපනයන භෝග වගා කරන්න පටන් ගත්තා. අපි 2015දී කෘෂිකර්ම අපනයන භෝග ලක්ෂ 70ක් සිටුවීම සඳහා ජනතාවට බෙදා දුන්නා. අපි "දන සවිය" කියලා ව්‍යාපෘතියක් පටන් ගත්තා, දිරිය කාන්තාවන් දසලක්ෂයකගේ ගෙවල්වල ගෙවතු වගාව කරලා ඒ ගොල්ලන්ගේ ආදායම ලක්ෂ දෙකහමාරකින් වැඩි කරන්න. 2016 අවුරුද්දේ අපි පැළ ලක්ෂ 170ක් වවලා, බෙදුවා. පසු ගිය අවුරුද්දේ අපි පැළ ලක්ෂ 250ක් බෙදුවා. මේ අවුරුද්දේ අපි පැළ දස කෝටියක් සිටුවා ඒවා බෙදා දෙන්න බලාපොරොත්තු වෙනවා. දැන් අපි ලැහැස්තියි. මොකද, ඒ අස්වැන්න නැත්නම්, කර්මාන්තශාලා හෝ මිනිසුන් යොදවා මොන අගයදාම වැඩි කරන්නද, මොනවා නිෂ්පාදනය කරන්නද? ඒ නිසා පසුගිය ආණ්ඩුව කළා වාගේ සැලැස්මක් නැතුව වැඩ කරන්න අපට පුළුවන්කමක් නැහැ. අගමැතිතුමා අපිට යම්කිසි වගකීමක් භාර දුන්නාම, එතුමා බලාපොරොත්තු වෙන්නේ එම වගකීම අපි හරියට ඉෂ්ට කරයි කියලායි. ගරු මන්ත්‍රීතුමනි, අපි රජයේ මුදල් නාස්ති කරන්නේ නැතුව හරියාකාරව රජයේ මුදල් වියදම් කරලා තිබෙනවාය කියන එක මම ඔබතුමාට කියන්න කැමැතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, ප්‍රාථමික කර්මාන්ත ගරු ඇමතිතුමා කළ ප්‍රකාශය අසා ගෙන සිටියාම, එතුමා මේ තරම්ම ප්‍රාථමික මට්ටමට වැටෙයි කියලා මම විශ්වාස කළේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ අතුරු ප්‍රශ්නය අහන්න.

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, එතුමා කියන විධියට අපි කැබිනට් මණ්ඩලවල සිටියාට, ඕනෑ-ඕනෑ විධියට එහෙම ව්‍යාපෘතිවල මුදල් මොනවා හෝ කරලා වියදම් කර ඉවර කරන්න බැහැ. දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා, විමල් වීරවංශ මන්ත්‍රීතුමා, ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා ඇතුළු අපි ඔක්කෝම කැබිනට් මණ්ඩලවල ඉඳලා තිබෙනවා. නමුත් ඇමතිවරයාට හෝ අමාත්‍යාංශයට ඕනෑ ඕනෑ විධියට එම මුදල් වියදම් කරන්න බැහැ. යම්කිසි නිශ්චිත ව්‍යාපෘතියක් සඳහා වෙන් කළ මුදල් වෙනත් දේ සඳහා යොදවන්න බැහැ කියලා ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුවක් තිබෙනවා. ඒක තමයි රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය.

ගරු ඇමතිතුමනි, ඒ නිසා ඔබතුමා ඒ කියන දේ වැරදියි. මම කියන්නේ මේකයි. ඔබතුමා අවංකව, ඉතාම පිරිමැසුම්දායකව වියදම් කරන, වැදගත් ඇමතිවරයෙක් බවත්, ඔබතුමා ඒ කටයුත්තට ආදරය කරන ඇමතිවරයෙකු බවත් අගමැතිතුමා පිළිගන්නවා.

-අගමැතිතුමා දැන් මේ ගරු සභාවේ ඉන්නවා නේ.- ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. මා කියන්නේ, ඔබතුමාට රාජ්‍ය අය වැයෙන් වෙන්කර දෙන මුදල ව්‍යාජයක් කියලායි. එතැන රුපියල් බිලියන 2ක් වෙන් කළාට, ඒ නිශ්චිත ව්‍යාපෘතියට රුපියල් බිලියන 2 වෙන් කිරීම අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩිපුර වෙන් කිරීමක්. ඒ නිසා අය වැය ලේඛනයේ ඒ සංඛ්‍යා පුරෝකථනයන් සාධාරණ නැහැයි කියන එක ඔබතුමා පිළිගන්නවාද කියන එකයි මා ඇහුවේ.

ගරු දයා ගමගේ මහතා
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)

ගරු කථානායකතුමනි, මා එතුමා කියන එක පිළිගන්නේ නැහැ. මොකද, අපට රුපියල් මිලියන 2,000ක් වෙන් කර තිබෙන නිසා අපට භය නැතුව ඒ වැඩ සැලසුම් කරන්න පුළුවන්. එහෙම නැතුව අපට අය වැයෙන් රුපියල් මිලියන 100ක් පමණයි නම් වෙන් කරලා තිබෙන්නේ, ඊළඟ අවුරුදු දෙක සඳහා අපි සැලසුම් කරන්නේ කොහොමද? ඒ මුදල වෙන් කර තිබෙන නිසා අපට භය නැතුව සැලසුම් කරන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා. එතුමා කියන කාරණය මා පිළිගන්නේ නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. මත ගැටුම් දෙකක් තිබෙනවා. බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 3 -163/'18- (1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 4 -200/'18- (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

මීසාලේ නව කාර්මික විදුහල ඉදිකිරීම: වෙන් කළ මුදල්
மீசாலையில் புதிய தொழில்நுட்பக் கல்லூரியை நிர்மாணித்தல்: நிதி ஒதுக்கீடுகள்
CONSTRUCTION OF MEESALAI NEW TECHNICAL COLLEGE : FUNDS ALLOCATED

220/'18

5. ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ පිහිටි රජයේ කාර්මික විදුහලට, වෘත්තීය පුහුණුව සඳහා වාර්ෂිකව ඉල්ලුම්පත් විශාල සංඛ්‍යාවක් ලැබෙන අතර තෝරාගනු ලබන්නේ ඉතා සීමිත අපේක්ෂකයන් සංඛ්‍යාවක් පමණක් බවත්;

(ii) යාපනය දිස්ත්‍රික්කයේ රැකියා අවස්ථාවන් නොමැති තරුණ තරුණියන් දහස් ගණනකට මෙම කාර්මික විදුහලෙන් පුහුණුව ලැබීමට අවස්ථාව නොලැබෙන බවත්;

(iii) එකී තරුණ තරුණියන්ගේ යහපත උදෙසා යාපනය දිස්ත්‍රික්කය තුළ තවත් කාර්මික විදුහලක් ඉදිකිරීම සඳහා තෙන්මරච්චි ප්‍රදේශයේ, මීසාලේ වීරසිංගම් මධ්‍ය මහ විදුහලට අයත් ඉඩම් අක්කර 06ක් පරිත්‍යාග කර ඇති බවත්;

(iv) ඉහත ඉඩම නිරීක්ෂණය කළ වෘත්තීය පුහුණු දෙපාර්තමේන්තුවේ බලධාරීන් විසින්, ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලද ව්‍යාපෘති යෝජනාව අනුමත වී ඇති බවත්;

එතුමා දන්නේද?

(ආ) (i) මීසාලේ නව කාර්මික විදුහල ඉදිකිරීම සඳහා මූලික වැඩ කටයුතු හා මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(ii) එසේ නම්, ඉහත විදුහලේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නො එසේ නම්, ඒ මන්ද?

விஞ்ஞான, தொழில்நுட்ப, ஆராய்ச்சி, திறன்கள் அபிவிருத்தி, தொழிற்பயிற்சி மற்றும் கண்டி மரபுரிமைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) யாழ்ப்பாணம் மாவட்டத்தில் அமைந்துள்ள அரச தொழில்நுட்பக் கல்லூரிக்கு தொழிற்பயிற்சியின் நிமித்தம் வருடாந்தம் பெருமளவிலான விண்ணப் பங்கள் கிடைப்பதோடு, மிகவும் வரையறுக்கப் பட்ட எண்ணிக்கையிலான விண்ணப்பதாரிகளே தெரிவு செய்யப்படுகின்றனர் என்பதையும்;

(ii) யாழ்ப்பாண மாவட்டத்தில் தொழில்வாய்ப்புக் களற்ற ஆயிரக்கணக்கான இளைஞர் யுவதிகளுக்கு இத்தொழில்நுட்பக் கல்லூரியில் பயிற்சி பெறுவதற்கு வாய்ப்புக் கிடைப்பதில்லை என்பதையும்;

(iii) குறித்த இளைஞர் யுவதிகளின் நலன் கருதி யாழ்ப்பாண மாவட்டத்தில் மேலும் ஒரு தொழில்நுட்பக் கல்லூரியை நிர்மாணிக்கும் பொருட்டு தென்மராட்சிப் பிரதேசத்தில் மீசாலை வீரசிங்கம் மத்திய மகா வித்தியாலயத்திற்குரிய 06 ஏக்கர் காணி நன்கொடையாக வழங்கப் பட்டுள்ளதென்பதையும்;

(iv) குறித்த காணியை அவதானித்த தொழிற் பயிற்சித் திணைக்களத்தின் அதிகாரிகளால் தேசிய திட்டமிடல் திணைக்களத்திற்குச் சமர்ப்பிக்கப்பட்ட கருத்திட்ட முன்மொழிவு அங்கீகரிக்கப்பட்டுள்ளதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) மீசாலையில் புதிய தொழில்நுட்பக் கல்லூரியை நிர்மாணிப்பதற்கான பூர்வாங்க நடவடிக்கைகள் மற்றும் நிதி ஒதுக்கீடுகள் மேற்கொள்ளப் பட்டுள்ளனவா என்பதையும்;

(ii) ஆமெனில், மேற்படி கல்லூரியின் நிர்மாணிப்புப் பணிகள் ஆரம்பிக்கப்படும் திகதி யாதென் பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Science, Technology, Research, Skills Development and Vocational Training and Kandyan Heritage:

(a) Is he aware that -

(i) the Government Technical College in the Jaffna District receives a large number of applications annually for vocational training but only a limited number of applicants are selected;

(ii) thousands of unemployed youth in the Jaffna District lose the opportunity of receiving training from this Technical College;

(iii) an extent of 6 acres belonging to the Weeerasingham Central College in Meesalei in Thenmarachchi area has been given for constructing another technical college in the Jaffna District for the benefit of those young persons; and

(iv) the project proposal sent to the National Planning Department by the authorities of the Department of Vocational Training that inspected the said land, has been approved?

(b) Will he inform this House -

(i) whether financial allocations have been made to commence the preliminary work relating to the construction of the Meesalai new Technical College; and

(ii) if so, the date on which the construction work of the said Technical College would commence?

(b) If not, why?

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
The Hon. Karunarathna Paranawithana)

ගරු කථානායකතුමනි, විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) යාපනය තාක්ෂණ විද්‍යාලය වෙත පසු ගිය වර්ෂවල ලැබූ අයදුම්පත් සංඛ්‍යාව පිළිබඳ විස්තර පහත දැක්වේ.

වර්ෂය	අයදුම්පත් ගණන	බඳවා ගත් ගණන
2016	3320	1076
2017	3458	1350
2018	2749	1127

(ii) ඉහත සටහනට අනුව පුහුණු අවස්ථාවන් සෑම අයදුම්කරුවෙකුටම නොලැබෙන බව පැහැදිලිය.

(iii) යාපනය දිස්ත්‍රික්කයේ තෙන්මාරච්චි ප්‍රදේශයේ නව කාර්මික විද්‍යාලයේ ඉදිකිරීමට වීරසිංහම් මධ්‍ය මහා විද්‍යාලයට අයත් ඉඩමින් අක්කර හයක්

ලබා දීමට එකඟතාව එම විද්‍යාලයේ විදුහල්පති විසින් ලිඛිතව දන්වා ඇත. ඒ ඉඩම පවරා ගැනීමේ කටයුතු අවසන් වී නැත.

(iv) ජාතික සැලසුම් දෙපාර්තමේන්තුව මඟින් ව්‍යාපෘති යෝජනාව අනුමත කර ඇත.

(ආ) (i) නව කාර්මික විද්‍යාලය ඉදිකිරීම සඳහා ඉඩම ලබා දීමට එකඟතාව ලබා දී ඇතත්, අදාළ ඉඩම් දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමේ කටයුතු අවසන් වී නොමැති බැවින් 2018 වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කර නොමැත.

(ii) ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය නිශ්චිතව තීරණය කර නොමැත.

(ඇ) ඉඩම පවරා ගැනීමේ කටයුතු මෙතෙක් අවසන් වී නොමැති බැවින්.

අපේ අමාත්‍යාංශය මේ ඉඩම පවරා ගැනීමේ කටයුතු වේගවත් කිරීම සඳහා වැඩ කරගෙන යනවාය කියන කාරණය මම මේ වෙලාවේදී සඳහන් කරන්න කැමැතියි.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ சபாநாயகர் அவர்களே, நன்றி. என்னுடைய முதலாவது மேலதிகக் கேள்வி, இன்று வட மாகாணத்தில் இருக்கின்ற வேலை வாய்ப்பற்ற பிரச்சினைகள், அதனால் ஏற்படக்கூடிய சமூகப்பாதிப்புக்கள் போன்றவற் றிலிருந்து மக்களை, இளைஞர்களை விடுவிக்க வேண்டியிருப்பதனால் இந்தப் புதிய தொழில்நுட்பக் கல்லூரியை எவ்வளவு காலத்தில் நிறுவ முடியும்?

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)
ගරු මන්ත්‍රීතුමනි, අපට තිබෙන ප්‍රශ්නය තමයි මෙම ඉඩම පවරා ගැනීමේ කටයුතු ප්‍රමාදවීම. අපි ඉදිරි මාස දෙක, තුන ඇතුළත එම කටයුතු අවසන් කළ වහාම ඉදිරි වර්ෂය සඳහා ප්‍රතිපාදන වෙන් කරලා විද්‍යාලය පටන් ගන්න බලාපොරොත්තු වන බව සඳහන් කරන්න කැමැතියි.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ பிரதி அமைச்சர் அவர்களே, நன்றி.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 - 235/'18 - (1), ගරු එස්.එම්.මරික්කාර් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

සබරගමුව පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ විදේශ සංචාර: විස්තර

சப்ரகமுவ மாகாண முதலமைச்சரின் வெளிநாட்டு விஜயங்கள்: விபரம்

FOREIGN TOURS OF CHIEF MINISTER OF SABARAGAMUWA PROVINCE : DETAILS

245/'18

7. ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය- (1):

(අ) (i) සබරගමුව පළාත් වත්මන් ප්‍රධාන අමාත්‍යවරයා එම ධුරයට පත්වූ දිනය කවරේද;
(ii) ධුරයට පත් වූ දිනයේ සිට අද දක්වා ඔහු නිරත වී ඇති විදේශ සංචාර කවරේද;
(iii) එම එක් එක් විදේශ සංචාරයේ අරමුණු කවරේද;
(iv) ඒ සඳහා වැය වූ මුදල් ප්‍රමාණය කොපමණද;
(v) එම සංචාර තුළින් සබරගමුව පළාතේ ජනතාවට අත්වූ ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

මාකාණ සපෙකල්, උල්ලූරාට්චි මට්රුම් විලෙයාට්ටුත් තුරෙ අමෙච්චරෙයිර් කේට්ට විනා:

(அ) (i) சப்ரகமுவ மாகாணத்தின் தற்போதைய முதலமைச்சர் அந்தப் பதவிக்கு நியமனம் பெற்ற திகதி யாது;
(ii) பதவிக்கு நியமிக்கப்பட்ட திகதி தொடக்கம் இன்றுவரை இவர் மேற்கொண்ட வெளிநாட்டு விஜயங்கள் யாவை;
(iii) அந்த ஒவ்வொரு வெளிநாட்டு விஜயத்தினதும் நோக்கம் யாது;
(iv) அதற்குச் செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவு;
(v) அந்த விஜயங்களினூடாகச் சப்ரகமுவ மாகாண மக்களுக்கு கிடைத்த நன்மைகள்' யாவை;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils, Local Government and Sports:

(a) Will he inform this House -
(i) the date on which the present Chief Minister of the Sabaragamuwa Province assumed office;
(ii) `the number of foreign visits he has engaged in from the date that he assumed office up to now;
(iii) the objects of each of those foreign visits;
(iv) the expenditure incurred in that regard; and
(v) the benefits received by the people of Sabaragamuwa as a result of those visits?

(b) If not, why?

ගරු ෆයිසර් මුස්තාපා මහතා (පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு பைசர் முஸ்தபா - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Minister of Provincial Councils, Local Government and Sports)
ගරු මන්ත්‍රීතුමා, වත්මන් මහඇමති කෙනෙක් නැහැ.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
වත්මන් ප්‍රධාන අමාත්‍යවරයා කියලා කිව්වාට, හිටපු මහඇමතිවරයා ගැන අහන්නේ.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
මට උත්තරයක් තිබෙනවා. හැබැයි, දීර්ඝ උත්තරයක් තිබෙන්නේ. මම ඒක සභාගත කරන්නම්. ඔබතුමා මහඇමතිගේ විදේශ සංචාර ගැනත් අහලා තිබෙනවා; වියදම් ගැන අහලා තිබෙනවා; කා සමඟ ද ගියේ කියලාත් අහලා තිබෙනවා. එයින් ලැබුණු ප්‍රතිලාභ කවරේද කියලාත් අහලා තිබෙනවා.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු අමාත්‍යතුමනි, මට දැනට (අ) (ii) ප්‍රශ්නයට පමණක් පිළිතුරු ලබා දෙන්න.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
වර්ෂයෙන් වර්ෂය විස්තර දීලා තිබෙන්නේ ගරු මන්ත්‍රීතුමා. ඒ සංඛ්‍යාව කියන්න මට ගණන් කරන්න වෙයි.

ගරු කථානායකතුමනි, ඒ නිසා මම එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) හිටපු සබරගමු පළාත් ප්‍රධාන අමාත්‍යවරයා එම ධුරයට පත් වූ දිනය - 2012.09.24

(ii) නිටපු සබරගමු පළාත් ප්‍රධාන අමාත්‍යවරයා ධුරයට පත් වූ දිනයේ සිට අද දක්වා ඔහු නිරත වී ඇති විදේශ සංචාර ඇමුණුමෙහි (I - X)** තෙක් පිටුවල දක්වා ඇත.

(iii) එම එක් එක් විදේශ සංචාරයේ අරමුණ ඇමුණුමෙහි (I - X) දක්වා පිටුවල iv තිරුවෙහි දක්වා ඇත.

(iv) ඒ සඳහා වැය වූ මුදල ඇමුණුමෙහි (I - X) දක්වා පිටුවල v තිරුව යටතේ දක්වා ඇත.

(v) එම සංචාරය තුළින් සබරගමුව පළාතේ ජනතාවට අත් වූ ප්‍රතිලාභ ඇමුණුමෙහි (I - X) දක්වා පිටුවල vi තිරුව මඟින් දක්වා ඇත.

(ආ) අදාළ නොවේ.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
කමක් නැහැ, ගරු කථානායකතුමනි, පිළිතුර සභාගත කළා නේ?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔව්. බොහොම ස්තුතියි.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මමත් සබරගමුව පළාත් සභාවේ හිටපු මන්ත්‍රීවරයෙක්. ගරු ඇමතිතුමනි, අපි ඒ දවස්වල දැඩි විරෝධතාවක් දැක්වූවා, මේ විදේශ සංචාර පිළිබඳව. අපි ඒ ගැන ප්‍රශ්න කළා. 2012 වර්ෂයේ එක වසරක් ඇතුළත විදේශ සංචාර 123ක් ගිහිල්ලා තිබෙනවා. යනවා-එනවා විතරයි. පළාත් සභාවේ මුදල් වියදම් කරලා තිබුණා. අපි අහන්නේ, සබරගමුව පළාත් සභාව ගැන. මධ්‍යම රජයේ නම් මේ ගැන නියාමනයක් තිබෙනවා. ඒ ගැන ප්‍රශ්න කරන්න පුළුවන්. පළාත් සභාවේදී තමන්ට හිතෙන- හිතෙන පරිදි තමන්ගේ ගෙදර සල්ලි වියදම් කරලා යන විධියට තමයි මේ ප්‍රධාන අමාත්‍යවරු මෙක පාලනය කරන්නේ. ගරු ඇමතිතුමනි,-

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
2012ට සංචාර තිබෙන්නේ තුනයි.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
ඔබතුමා හොඳට බලන්න. මම කියන්නේ, මුළු පළාත් සභාව ගැනයි. පළාත් සභාවේ 120 ගණනක් -

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ඔබතුමා අහලා තිබෙන්නේ, මහ ඇමතිතුමාගේ චාරිකා ගැන.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
මහ ඇමතිතුමාගේ චාරිකා කීයක් තිබෙනවාද?

*** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
තුනයි, මන්ත්‍රීතුමා.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
මම හිතන්නේ ඔබතුමාට වැරැදීමක් වෙලා කියලායි.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
මම ඔබතුමාට එක කාරණයක් කියන්න කැමැතියි. ප්‍රධාන ලේකම් මට එවන වාර්තා මත තමයි මම පාර්ලිමේන්තුවට දැනුම් දෙන්නේ. මම එදත් කිව්වේ ඒකයි. ඊට අමතරව සොයා බැලීමක් කරන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි. මට ලැබී තිබෙන වාර්තාව අනුව 2012 චාරිකා තුනයි.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, මේ පිළිතුරේ ඊට වඩා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තිබෙනවාද?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඔව්.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
2012ට තිබෙන්නේ තුනයි නේ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඒ තිබෙන්නේ සැප්තැම්බර් සිට නේ.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ඒක තිබෙන්නේ 2013. මම නේ උත්තර දෙන්නේ, ඇමතිතුමා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
මටත් පිළිතුරක් ඇවිල්ලා තිබෙනවා.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
මට ලැබී තිබෙන පිළිතුරට අනුව 2013දී තිබෙනවා, අටක්.

ගරු හේෂාන් විතානගේ මහතා
(மாண்புமிகு ஹேசான் விதானகே)
(The Hon. Heshan Withanage)
අපට මහ ඇමතිතුමා කොච්චර tours ගියත් ප්‍රශ්නයක් නැහැ. මේ යන විදේශ සංචාරවල අරමුණු මොකක්ද කියන එක ගැනයි අපට ප්‍රශ්නය තිබෙන්නේ.

[ගරු හේෂාන් විතානගේ මහතා]

අන්න ඒ අරමුණ ගැන කථා කළොත්, පෞද්ගලික සංචාරවලට පළාත් සභාවේ මුදල් වියදම් කරලා තිබෙනවා. ඒක තමයි මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය. පෞද්ගලික සංචාර විශාල ප්‍රමාණයක් සඳහා පළාත් සභාව මුදල් වියදම් කරලා තිබෙනවා. ඒක වහගන්න එතුමා කරන්නේ, පළාත් සභාවේ සියලුම මන්ත්‍රීවරු එකතු කරලා කොහේ හෝ tour එකක් යවන එකයි. එතකොට ඒ මන්ත්‍රීවරුන්ගේ සද්දෙ වැහෙනවා. මම අහන්නේ මේකයි. මේක සබරගමුවේ විතරක් නොවෙයි, රටේ අනෙක් පළාත් සභාවලත් වෙන්න පුළුවන්. එතුමා පෞද්ගලික සංචාර විශාල ප්‍රමාණයක් ගිහිල්ලා තිබෙනවා. මට ඔබතුමාගේ පිළිතුර ලැබුණා නම් මම ඒ ගණන් එක්ක කථා කරන්නයි සිටියේ. මම වෙනත් දවසක එම ගණන් ටිකත් ඔබතුමාට දෙන්නම්. Tours තුනක් පමණයි කියලා කියන්නේ, ප්‍රධාන ලේකම්තුමා නින්දෙන් ඇහැරිලා වෙන්න ඇති. මහ ඇමතිවරයා පළාත් සභාවේ ඉන්නේත් නැතුව දිගින් දිගටම විදේශ සංචාර ගිය හේතුව අපි දන්නවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමා, මේ පිළිබඳව සොයලා බලන්න.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(මාණ්පුමිකු පෛසර් මුස්තපා)
(The Hon. Faiszer Musthapha)
ගරු මන්ත්‍රීතුමා, මම මේ පිළිතුර සභාගත කළා. ඔබතුමා මේ පිළිතුර බලා, මීට වඩා හාත්පසින් වෙනස් දෙයක් කියන්න තිබෙනවා නම් අහන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ඔව්, එහෙම හොඳයි.

ගරු හේෂාන් විතානගේ මහතා
(මාණ්පුමිකු හේසාන් විතානකේ)
(The Hon. Heshan Withanage)
මම අහන්නේ, ඔබතුමා මේ පිළිබඳව මොනවා හෝ ඉදිරි ක්‍රියාමාර්ගයක් ගන්නවාද කියන එකයි. අඩුම තරමින් මේ වාගේ සංචාර නතර කරන්න, ඒ පිළිබඳ නියාමනයක් කරන්න පියවර ගන්නවාද? පළාත් සභාවේ මහ ඇමතිවරයාට ඕනෑ විධියට පෞද්ගලික සංචාර යන්න පුළුවන්ද, නැත්නම් එහි මොකක් හෝ ක්‍රමවේදයක් තිබෙනවාද කියා දැනගන්න කැමැතියි.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(මාණ්පුමිකු පෛසර් මුස්තපා)
(The Hon. Faiszer Musthapha)
ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභාවල මහ ඇමතිවරු විදේශ සංචාර යනකොට ආණ්ඩුකාරවරයාගේ අවසරය ඇතුව තමයි යන්නේ. එම විදේශ ගමන් සම්බන්ධයෙන් කිසිම පරිපාලනයක් පාර්ලිමේන්තුවට නැහැ. ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය තමයි ඒ සඳහා අවශ්‍ය.

ගරු හේෂාන් විතානගේ මහතා
(මාණ්පුමිකු හේසාන් විතානකේ)
(The Hon. Heshan Withanage)
ගරු කථානායකතුමනි, ආණ්ඩුකාරවරයාගේ හෝ ජනාධිපතිතුමාගේ හෝ අවසරය අරන් පළාත් මහ ඇමතිතුමා විදේශ සංචාර යන එක ඇත්ත. මම අහන්නේ එහි limit එකක් තිබෙනවාද කියායි. එහෙම නැත්නම් ඕනෑ ඕනෑ විධියට, ඒ කියන්නේ කිසි පදනමක් නැතුව, අඩුම ගණනේ සභාව දැනුවත් කරන්නේ නැතුව, කිසිම ක්‍රමවේදයක් නැතුව සභාවේ මුදල් වියදම් කරලා ඒ විධියට යන්න පුළුවන්ද කියන එකයි මම අහන්නේ.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(මාණ්පුමිකු පෛසර් මුස්තපා)
(The Hon. Faiszer Musthapha)
ආණ්ඩුව ප්‍රතිපත්තිමය තීන්දුවක් ගත්තා, සභාවේ මුදල්වලින් කරන පිට රට සංචාර පුළුවන් තරම් අඩු කිරීම පිළිබඳව. ඒ විධියේ ප්‍රතිපත්තියක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වාර්තාව ආවාට පස්සේ නැවත ප්‍රශ්නය යොමු කරන්න පුළුවන්. [බාධා කිරීමක්] Hon. Member, let the Hon. Minister table it.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(මාණ්පුමිකු පෛසර් මුස්තපා)
(The Hon. Faiszer Musthapha)
ගරු කථානායකතුමනි, මම මේ පිළිතුර සභාගත කළා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මේ පිළිතුර කියවලා මේක පදනම් කරගෙන ප්‍රශ්න අහන්න.

ගරු කථානායකතුමා
(මාණ්පුමිකු සභානායකර් අවර්කළ්)
(The Hon. Speaker)
ජාතික වැදගත්කමක් ඇති ප්‍රශ්න තිබෙනවා නම්, ඒවා ගැන දැන ගන්න එපා යැ. ඒක බලලා අහන්න. ඒක කමක් නැහැ.

අපොස (සා.පෙළ) සහ අපොස (උ.පෙළ) සමත් ශිෂ්‍ය සංඛ්‍යාව :මොණරාගල දිස්ත්‍රික්කය

ක.பொ.த. (சா.தரம்) மற்றும் க.பொ.த. (உ.தரம்) சித்திபெற்ற மாணவர்கள்: மொணறாகல மாவட்டம்

STUDENTS QUALIFIED AT G.C.E. (O/L) AND G.C.E. (A/L) EXAMINATIONS : MONERAGALA DISTRICT

417/'18

8. ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(මාණ්පුමිකු ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ අපොස (සා.පෙළ) විභාගය සඳහා මොණරාගල දිස්ත්‍රික්කයෙන් පෙනී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(ii) එම ශිෂ්‍ය සංඛ්‍යාවෙන් අපොස (සා.පෙළ) විභාගය සමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iii) 2015 වර්ෂයේ ඉහත දිස්ත්‍රික්කයෙන් අපොස (උ.පෙළ) විභාගය සඳහා පෙනී සිටි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කොපමණද;

(iv) එම ශිෂ්‍ය සංඛ්‍යාවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව, එක් එක් පාඨමාලාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය, අපොස (සා.පෙළ) සහ අපොස (උ.පෙළ) යන විභාග තුනෙහි මොණරාගල දිස්ත්‍රික්කයේ ප්‍රතිඵලය, සමස්ත ජාතික ප්‍රතිඵලය සමඟ සංසන්දනාත්මක වාර්තාවක් ඉදිරිපත් කරන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015ஆம் ஆண்டில் க.பொ.த.(சா.தர) பரீட்சைக்கு மொணறாகல மாவட்டத்திலிருந்து தோற்றிய மாணவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(ii) மேற்படி மாணவர்களில் க.பொ.த. (சா.தரம்) பரீட்சையில் சித்தியடைந்துள்ள மாணவர்களின் எண்ணிக்கை யாதென்பதையும்;

(iii) 2015 ஆம் ஆண்டில் மேற்படி மாவட்டத்திலிருந்து க.பொ.த. (உ.தர) பரீட்சைக்காகத் தோற்றிய மொத்த மாணவர்களின் எண்ணிக்கை யாதென் பதையும்;

(iv) மேற்படி மாணவர்களில் பல்கலைக்கழக அனுமதி பெற்றுள்ள மாணவர்களின் எண்ணிக்கை, ஒவ்வொரு பாடநெறியின்படி தனித்தனியாக யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) 5ஆம் ஆண்டு புலமைப்பரிசில் பரீட்சை, க.பொ.த. (சா.தரம்) மற்றும் க.பொ.த. (உ.தரம்) ஆகிய மூன்று பரீட்சைகளில் மொணறாகல மாவட்டத்தின் பெறுபேறுகளை முழுமொத்த தேசிய பெறுபேறு களுடன் ஒப்பீடுசெய்து அறிக்கையொன்றைச் சமர்ப்பிப்பாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Education:

(a) Will he inform this House-

(i) the total number of students who appeared for the G.C.E (Ordinary Level) Examination form Moneragala District in 2015;

(ii) the number of students who got through the G.C.E. (Ordinary Level) Examination, out of the above number;

(iii) the total number of students who appeared for the G.C.E. (Advance Level) Examination from the above district in 2015; and

(iv) the number of students who gained admission to universities out of the above number, in relation to each course separately?

(b) Will he also inform this House whether he will present to this House a report comparing the results of the Grade 5 Scholarship Examination, G.C.E (Ordinary Level) and G.C.E. (Advance Level) Examinations of the Moneragala District with the overall national result?

(c) If not, why?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)

(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)

(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) 6,192 කි. (හයදහස් එකසිය අනූදෙකකි)

(ii) 3,936 කි. (තුන්දහස් නවසිය තිස් හයකි)

(iii) 4,544 කි. (හාරදහස් පන්සිය හතලිස් හතරකි)

(iv) නැත. විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ලබාගත යුතුය.

(ආ) ඔව්. ඇමුණුම **සභාගත*** කරමි.

(ඇ) අදාළ නොවේ.

**** සභාමේසය මත තබන ලද ඇමුණුම:***
சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :
Annex tabled:

(ආ) 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය, අ.පොස.(සා.පෙළ) විභාගය සහ අ.පොස.(උ.පෙළ) විභාගය 2015 වර්ෂය

විභාගය	සමත් කඩඉම් ලකුණට වඩා ඉහළ ලකුණු ලැබූ ප්‍රතිශතය		අ.පොස.(උ.පෙළ) හැදෑරීම සඳහා සුදුසුකම් ලැබූ ප්‍රතිශතය		විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලැබූ ප්‍රතිශතය	
	ජාතික මට්ටම	මොණරාගල	ජාතික මට්ටම	මොණරාගල	ජාතික මට්ටම	මොණරාගල
5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය	9.55%	9.06%	-	-	-	-
අ.පොස. (සා.පෙළ) විභාගය	-	-	69.33%	63.57 %	-	-
අ.පොස. (උ.පෙළ) විභාගය	-	-	-	-	62.35%	63.80%

*සැ.යු. : අ.පොස. (සා.පෙළ) විභාගය සම්බන්ධයෙන් පළමු වතාවට විභාගයට පෙනී සිටි පාසල් අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු සහ අ.පොස. (උ.පෙළ) විභාගය සම්බන්ධයෙන් පාසල් අයදුම්කරුවන් පිළිබඳ තොරතුරු මෙහි ඇතුළත් කර ඇත.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා

(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)

(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, අධ්‍යාපන ඇමතිතුමා දැන් සභාවේ ඉන්න නිසා මම මේ අතුරු ප්‍රශ්නය අහන්නේ. මම එතුමාගෙන් මොණරාගල දිස්ත්‍රික්කයට අදාළ ප්‍රශ්නයක් ඇහුවේ.

ගරු ඇමතිතුමනි, ඔබතුමා ඊයේ හෝ පෙරේදා දිනයේ පාර්ලිමේන්තුවට පැහැදිලි කළා, ලංකාවේ ජාතික පාසල් මට්ටමින් විශාල විවෘත කිරීම් ගණනාවක් අනාගතයේ සිදුකිරීමට නියමිතව තිබෙන බව. ඒ අනුව, අග්‍රාමාත්‍යතුමාගේත්, ඔබතුමාගේත් ප්‍රධානත්වයෙන් 8වෙනි දා මොණරාගල මහානාම ජාතික පාසලේ උත්සවයක් පැවැත්වීමට නියමිතව තිබෙනවා. මම ඔබතුමාගෙන් පළමුවෙනි අතුරු ප්‍රශ්නය හැටියට අහන්න කැමැතියි, එවැනි ජාතික මට්ටමේ උත්සවයක් ඒ පාසලට එනකොට, ඒ ජාතික මට්ටමේ උත්සවයට වියදම් දැරිය හැකි ක්‍රමය පිළිබඳව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකට හෝ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකට හෝ විදුහල්පතිවරයාට හෝ ඔබතුමාගේ පැත්තෙන් -අධ්‍යාපන අමාත්‍යාංශයෙන්- චක්‍රලේඛානුකූලව දන්වා තිබෙන්නේ කුමක්ද කියලා.

මොකද, ඒ සම්බන්ධව ඔබතුමන්ලා ලබා දී තිබෙන උපදේශය අප හරියට දැනගත යුතුයි. එහෙම නැත්නම් ඒ දෙමාපියන් ඒ වියදම දරනවාද?

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, ඒ වාගේ උත්සවයකදී අධ්‍යාපන අමාත්‍යාංශය ඒ වියදම දරනවා.

ගරු ආර්. එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා
(மாண்புமிகு ஆர். எம். பத்ம உதயசாந்த குணசேகர)
(The Hon. R.M. Padma Udhayashantha Gunasekera)

ගරු කථානායකතුමනි, දෙවෙනි අතුරු ප්‍රශ්නයත් ඒකටම අදාළයි. මම දැන් දන්නා තරමින්, -ඔබතුමා සොයලා බලන්න- අමාත්‍යාංශය එතැන වියදමක් දරලා නැහැ. ඒ ප්‍රදේශයේ ජනතාව, දෙමාපියන්, පාසල් සංවර්ධන සමිතිය සහ ගුරුවරුන් විශාල අපහසුතාවකට පත් වෙලා තිබෙනවා, 08වෙනි දා පැවැත්වීමට නියමිත ඒ ජාතික උත්සවය නිසා. මම දන්නා තරමට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ඒ වියදම දරන ක්‍රමයක් නිශ්චිත ලෙස නැහැ. ඔබතුමා මේ වේලාව වන විට දන්නේ නැතිව ඇති, පෞද්ගලිකව ඔබතුමා දන්නවාද දන්නේ නැහැ. නමුත් ඒ ප්‍රශ්නය බරපතළ ලෙස තිබෙනවා, ඒ ප්‍රදේශයේ ජනතාවට.

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம்)
(The Hon. Akila Viraj Kariyawasam)

ගරු කථානායකතුමනි, අපේ චක්‍රලේඛ ප්‍රකාරව මුදල් එකතු කරන්නට බැහැ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව. පළාත් පාසලක නම් පළාත් ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව හිතූ මතයට, අවිධිමත්ව මුදල් එකතු කරන්නට පුළුවන්කමක් නැහැ. සාමාන්‍යයෙන් මේ වාගේ උත්සවයකදී අපි ඒ බර දෙමාපියන්ට දරන්නට දෙන්නේ නැහැ, ඒක අමාත්‍යාංශයෙන් දරනවා. සමහර වේලාවට පාසල් සංවර්ධන සමිතියෙන් දරලා තිබුණත් අපි ඒක ප්‍රතිපූර්ණය කරනවා. එහෙම තමයි ක්‍රමවේදය තිබෙන්නේ. තමුන්නාන්සේ මේ ගැන කියන නිසා මම නැවතත් සොයලා බලන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, සොයලා බලන්න ගරු ඇමතිතුමා. අයථා ලෙස සිද්ධ වුණා නම් ඒ ගැන සොයලා බලන්න.

විජිතපුර තැපැල් කාර්යාල ගොඩනැඟිල්ල : ප්‍රතිසංස්කරණය
விஜிதபுர தபால் அலுவலகக் கட்டிடம்: புனரமைப்பு
VIJITHAPURA POST OFFICE BUILDING: RECONSTRUCTION

427/'18

9. ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 1994 වර්ෂයේ විවෘත කරන ලද විජිතපුර තැපැල් කාර්යාල ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය නොකිරීම හේතුවෙන්, දැඩිසේ අබලන්වී, කඩා වැටීමේ අවදානමක පවතින බව දන්නේද;

(ii) එම ගොඩනැඟිල්ල ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

தபால், தபால் சேவைகள் மற்றும் முஸ்லிம் சமய அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 1994ஆம் ஆண்டு திறந்துவைக்கப்பட்ட விஜிதபுர தபால் அலுவலகக் கட்டிடம் புனரமைக்கப் படாமையின் காரணமாக மிக மோசமாக பழுதடைந்து உடைந்துவிழும் ஆபத்து நிலையில் உள்ளதென்பதை அறிவாரா என்பதையும்;

(ii) மேற்படி கட்டிடத்தைப் புனரமைப்பதற்கு நடவடிக்கை மேற்கொள்ளப்படும் திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Post, Postal Services and Muslim Religious Affairs:

(a) Will he inform this House-

(i) whether he is aware that the building which houses the Vijithapura Post Office opened in 1994 has been in a ramshackle condition and is faced with the risk of collapsing due to lack of reconstruction; and

(ii) of the date on which action will be taken to reconstruct the building concerned?

(b) If not, why?

ගරු අබ්දුල් හලීම් මහතා (තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு அப்துல் ஹலீம் - தபால், தபால் சேவைகள் மற்றும் முஸ்லிம் சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. Abdul Haleem - Minister of Post, Postal Services and Muslim Affairs)

ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

එම ගොඩනැඟිල්ලේ වහලය දිරාපත් වීම නිසා වහලයේ කොටසක් පහත් වී ඇත.

වහලයේ පහත්වී ඇති කොටස පමණක් අලුත්වැඩියා කළ නොහැකි අතර, සම්පූර්ණ වහලයම ගලවා අලුත්වැඩියා කළ යුතුව ඇත. මෙම ගොඩනැඟිල්ල 1998 වර්ෂයේ අලුත්වැඩියා කිරීමෙන් පසුව සුළු සුළු අලුත්වැඩියා කටයුතු කාර්ය මණ්ඩලයේ ශ්‍රම දායකත්වයෙන් ඉටු කරගෙන ඇත.

(ii) 2018 වර්ෂයේ ප්‍රතිපාදනවලින් 308-01-01-2001 වැය ශීර්ෂය යටතේ රුපියල් 1,250,800ක ඇස්තමේන්තුගත මුදල තැපැල් කාර්යාල ගොඩනැඟිල්ලේ හා නිල නිවාස ගොඩනැඟිල්ලේ වහලය ගලවා අලුත්වැඩියා කිරීම සඳහා වෙන්කර ඇති අතර, එම කාර්යයට අදාළ ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමෙන් අනතුරුව 2018 වර්ෂය තුළදී අලුත්වැඩියා කටයුතු අවසන් කිරීමට හැකියාවක් පවතී.

(ආ) අදාළ නොවේ.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, ඒ තැපැල් කන්තෝරුවේ තවත් අඩු පාඩු තිබෙනවා. ඔබතුමා රුපියල් ලක්ෂ දොළහක් තමයි ඒකට දීලා තියෙන්නේ. ඒ මුදල මදි. ඒ කටයුතු වෙනුවෙන් තව මුදල් ප්‍රමාණයක් වෙන් කරන්න පුළුවන් නම් ගොඩක් හොඳයි. අනුරාධපුර දිස්ත්‍රික්කයේ තැපැල් කන්තෝරු 28ක් තිබෙනවා. මේ අවුරුද්දේ ඒ තැපැල් කන්තෝරු දෙකක් අලුත්වැඩියා කරන්න ඔබතුමා මුදල් වෙන් කරලා තිබෙනවා. මේ විධියට අවුරුද්දට තැපැල් කන්තෝරු දෙක ගණනේ අලුත්වැඩියා කරන්න ගියොත්, තවත් අවුරුදු 10ක්වත් යයි අනුරාධපුර දිස්ත්‍රික්කයේ තැපැල් කන්තෝරු සියල්ල අලුත්වැඩියා කරන්න. ඒ නිසා ගරු ඇමතිතුමනි, ඔබතුමා මුදල් ඇමතිතුමා එක්ක කථා කරලා මේ වෙනුවෙන් විශේෂ මුදලක් වෙන් කරවා ගන්න. ගල්කිරියාගම, ගල්නෑව, කැකිරාව කියන ප්‍රධාන තැපැල් කන්තෝරු ඔක්කෝම අබලන් තත්ත්වයේ තිබෙන්නේ. තැපැල් කන්තෝරු දෙක, දෙක අලුත්වැඩියා කරන්නේ නැතිව ඉතා ඉක්මනින් මේ අවුරුද්දේ හරි මුදල් ඇමතිතුමාගෙන් මුදල් ඉල්ලාගෙන ඔබතුමාට තිබෙන ඉදිරි මාස 16 තුළදීවත් මේ තැපැල් කන්තෝරු සියල්ල හදා දෙන්න කියලා ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා.

ගරු අබ්දුල් හලීම් මහතා
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)

ගරු මන්ත්‍රීතුමනි, මුදල් ප්‍රතිපාදන වෙන් කරන්නේ ඇස්තමේන්තුගත ප්‍රමාණය අනුවයි. ඒ වාගේම, අපේ අමාත්‍යාංශයෙන් උපතැපැල් කාර්යාලවලට මුදල් වෙන් කරන්නේ නැහැ. අමාත්‍යාංශයෙන් මුදල් වෙන් කරන්නේ ප්‍රධාන කාර්යාලවලට පමණයි.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

මම ඔබතුමාට ප්‍රධාන තැපැල් කාර්යාල ගැනත් සඳහන් කළා.

ගරු අබ්දුල් හලීම් මහතා
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)

ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්න කටයුතු කරනවා.

ගරු ඉෂාක් රහුමාන් මහතා
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

ගරු කථානායකතුමනි, දෙවෙනි අතුරු ප්‍රශ්නය.

ගරු ඇමතිතුමනි, ලංකාවේ තිබෙන දිස්ත්‍රික්කවලින් වැඩිම භූමි ප්‍රදේශයක් තිබෙන්නේ අනුරාධපුරය දිස්ත්‍රික්කයේ. නමුත්, නිදහසට කලින් ඉඳලා මේ වනතෙක් ඒ දිස්ත්‍රික්කයේ තැපැල් මහත්වරු යන්නේ pushbike එකෙන්. ගරු අගමැතිතුමනි, ඔබතුමාත් මේ අවස්ථාවේ ඉන්න නිසා අපේ තැපැල් මහත්වරුන්ට motorcycle ලබා දුන්නොත් බොහොම හොඳයි කියලා මා කියනවා. එදා pushbike එකෙන් ලියුම් බෙදන්න ගියේ ගෙවල් සුළු ප්‍රමාණයක් තිබුණු නිසා. දැන් ගෙවල් විශාල ප්‍රමාණයක් තිබෙනවා; ජනගහනයේ වැඩිවීමකුත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් අලුත් වැඩ පිළිවෙළක් යටතේ විශේෂ අවධානයක් යොමු කරන්න. motorcycle එකකින් ගිහිල්ලා ලියුම් බෙදන්න පුළුවන් විධියේ වැඩ පිළිවෙළක් සකස් කරන්න කියා මා ඉල්ලා සිටිනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න.

ගරු අබ්දුල් හලීම් මහතා
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)

අපි ඒ ගැන සොයා බලා කටයුතු කරන්නම්. නමුත්, මේ ආණ්ඩුව බලයට පත් වුණාට පස්සේ තමයි බොහෝ කාලයකට පස්සේ බයිසිකල් හරි ලබා දුන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 10 - ගරු චමින්ද විජේසිරි මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

තැලසීමියාව තුරන් කිරීමේ අරමුදල: අයථා පරිහරණය
தலசீமியா நோய் ஒழிப்பு நிதியம்: முறைகேடான பயன்பாடு
THALASSEMIA ERADICATION FUND: MISUSE

554/'18

11. ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) වර්ෂ 2020දී වයඹ පළාත තුළ තැලසීමියා රෝගය සම්පූර්ණයෙන්ම තුරන් කිරීම වෙනුවෙන් විශේෂ අරමුදලක් 2009 වර්ෂයේදී පිහිටුවනු ලැබූ බවත්;

(ii) එම අරමුදලින් රුපියල් මිලියන දහයකට අධික මුදලක් අයථා ලෙස පරිහරණය කිරීම පිළිබඳව සොයා බැලීමට විශේෂ විමර්ශන කමිටුවක් පත් කරන ලද නමුත් මේ දක්වා එහි වාර්තාව ප්‍රකාශයට පත් වී නොමැති බවත්;

එතුමා දන්නේද?

(ආ) එසේ නම්, මෙම විමර්ශන වාර්තාව ප්‍රකාශයට පත් කර, අදාළ පුද්ගලයන්ට එරෙහිව අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2020ஆம் ஆண்டில் வடமேல் மாகாணத்தில் தலசீமியா நோயை முற்றாகவே ஒழித்துக் கட்டுவதற்கான விசேட நிதியமொன்று 2009 ஆம் ஆண்டில் தாபிக்கப்பட்டதென்பதையும்;

(ii) மேற்படி நிதியத்திலிருந்து ரூபா 10 மில்லியனுக்கு மேற்பட்ட பணத்தொகை முறை கேடாகப் பாவிக்கப்பட்டமை பற்றிக் கண்டறிவதற்கான விசேட புலனாய்வுக் குழு வொன்று நியமிக்கப்பட்டபோதிலும் இற்றை வரை அதன் அறிக்கை வெளியிடப்படவில்லை என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) ஆமெனில், இந்தப் புலனாய்வு அறிக்கையை வெளியிட்டு, சம்பந்தப்பட்ட ஆட்களுக்கு எதிராக அமைச்சு மேற்கொள்ளப்போகும் நடவடிக்கை யாதென்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

[ගරු අශෝක ප්‍රියන්ත මහතා]

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Is he aware that-

(i) a special fund was established in year 2009 with the objective of eradicating Thalassemia from the North Western Province by year 2020; and

(ii) although a Special Investigation Committee was appointed to look into the misuse of more than 10 million rupees of that fund, its report is yet to be published?

(b) if so, will he inform this House, the measures that will be taken by the Ministry against the relevant persons after publishing the investigation report?

(c) If not, why?

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) ඔව්.

(ii) විමර්ශනයෙන් අනතුරුව චෝදනා පත්‍ර කෙටුම්පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යවා ඇත.

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විධිමත් විනය පරීක්ෂණය පැවැත්වීමෙන් අනතුරුව තීරණය කළ යුතුය.

(ඇ) පැන නොනඟී.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, අපේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය ඇමතිතුමාම ඇවිල්ලා මගේ ප්‍රශ්නයට පිළිතුරක් ලබා දීම ගැන එතුමාට බොහොම ස්තුතියි. ඒ වාගේම ජාත්‍යන්තර තලය දිනාගන්න වුවත් පුළුවන් මට්ටමට වර්තමානයේ අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ඔසවා තිබීම ගැන අපේ ඇමතිතුමන් අගය කරන්න ඕනෑ. නමුත්, අද තිබෙන තත්ත්වය අනුව, ජනතාව අපේ සෞඛ්‍ය ක්ෂේත්‍රය ඇගැයීමකට ලක් කිරීම ප්‍රමාණවත් මදි බවයි මට හැඟෙන්නේ. මේ වෙද්දී අපේ රජය විශාල ලෙස බෙහෙත් මිල අඩු කරලා තිබෙනවා. ස්ටෙන්ට් සහ ඇස් කාව නොමිලේ ලබා දෙන්නත් අපේ රජය කටයුතු කරලා තිබෙනවා. මා ගරු ඇමතිතුමාට මේ සම්බන්ධයෙන් යෝජනාවක් කරනවා. මේක ප්‍රශ්නයක් විධියට නොවෙයි, යෝජනාවක් විධියටයි ඉදිරිපත් කරන්නේ. ගරු ඇමතිතුමනි, මේ වෙලාවේ මට ඔබතුමාගේ අමාත්‍යාංශය ගැන ප්‍රශ්න අහන්න අවශ්‍යතාවක් නැහැ. එහෙම වුණොත් මා ඔබතුමාට කරන්නේ අසාධාරණයක්.

ජනතාව ආරක්ෂා කර ගන්නා තැනට වර්තමාන රෝහල් පද්ධතිය ගෙනෙන්න, නිදහස් සෞඛ්‍ය වෙනුවෙන් රජය මුදල් වියදම් කරනවා. එක රෝගියෙක් වෙනුවෙන් විශාල මුදලක් වියදම් කරනවා. රෝහල්ගත වූ රෝගියෙක් සුව වෙලා ආපසු යනකොට, රජය විසින් තමන් වෙනුවෙන් මෙපමණ මුදලක් වියදම් කළ බවට හැඟීමක් ඇති කර ගැනීම සඳහා අඩුම තරමින් ඒ අය වෙනුවෙන් වැයවූ මුදල පිළිබඳව සඳහන් බිල් පතක්වත් ලබා දෙන්න පුළුවන් ක්‍රමයක් තිබෙනවා නම්, මේ කාලයේ හැටියට සෞඛ්‍ය වෙනුවෙන් ජනතාවගේ දායකත්වය ලබා ගන්න එය වැදගත් වෙනවාය කියා මා යෝජනා කරනවා, ගරු ඇමතිතුමනි

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ වැඩ පිළිවෙළ ආරම්භ කරන්නයි හිටියේ. ඊට පෙර ඇත්තටම අපේ වෛද්‍යවරු මෙය ආරම්භ කර තිබෙනවා. කළුබෝවිල රෝහලේ අපේ IT Section එකේ ප්‍රධානියාම ඒක ආරම්භ කර තිබුණා. එදා මා එම රෝහලේ වෙනත් අංශයක් විවෘත කරන්න ගිය වෙලාවේ, ඒ විධියට එතුමා එහි පළමුවැනි බිල මගේ අතින්ම රෝගියකුට ලබා දුන්නා. එම ඖෂධ සහ අනෙකුත් ප්‍රතිකාරවලට යන මුදල විතරක් ඇතුළත් කරලා එතුමා බිලක් ලැහැස්ති කර තිබුණා. ඒක ඉතා හොඳයි. හැම රෝහලකටම ඒ ක්‍රමය ක්‍රියාත්මක කරන්න අපි කටයුතු කරනවා.

ගරු අශෝක ප්‍රියන්ත මහතා
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු කථානායකතුමනි, මට තව විනාඩියක් දෙන්න. ගරු සෞඛ්‍ය ඇමතිතුමනි, විශේෂයෙන්ම පිළිකා රෝගීන් වෙනුවෙන් දැවැන්ත මුදලක් වියදම් වෙනවා. නමුත් පිළිකා රෝගියා ඒ බෙහෙත් අරගෙන යන්නේ නිකම් රජයෙන් ශත 25ක දෙයක් කළේ නැහැ වාගේයි. ඒ නිසා ඒ පිළිබඳවත් ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න.

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
පසු ගිය රජය යටතේ පිළිකා රෝගීන්ගේ ඖෂධ වෙනුවෙන් රුපියල් ලක්ෂ 15ක සීමාවක් තිබුණා. පිළිකා රෝගීන්ට දෙන Trastuzumab injection කියන ඉන්ජෙක්ෂන් එක එදා රුපියල් 2,80,000යි. Injections 05යි දෙන්නේ. එකක් bonus . ඒ විධියටයි තිබුණේ. නමුත් අද ඒ සීමාවන් ඉවත් කරලා ජීවිත කාලය තුළම පිළිකා රෝගීන්ට නිදහස් සෞඛ්‍ය සේවය යටතේ සියලුම ප්‍රතිකාර ලබා දෙනවා. සමහර රෝගීන් ඉන්නවා, ඒ අය වෙනුවෙන් රුපියල් ලක්ෂ 200ක් පමණ වියදම් කර තිබෙනවා. ඒකේ සීමාවක් නැහැ. දැන් දිගටම දෙනවා. ගිය ආණ්ඩුව පිළිකා ඖෂධ සඳහා වියදම් කළේ අවුරුද්දකට රුපියල් මිලියන 1,300යි. අද රුපියල් 2,80,000ක්වූ එම ඖෂධයේ මිල අපි රුපියල් 1,44,000ට අඩු කර ගෙන තිබෙනවා. එම ඖෂධයේ මිල භාගයක් දක්වා අඩු වුණත් දැන් අපි අවුරුද්දකට රුපියල් මිලියන 4,800ක් වියදම් කරනවා. මට ඒ මිල අඩු කර ගන්න බැරි වුණා නම්, මේ වියදම රුපියල් මිලියන 9,600ක් වෙනවා. ඒකෙන් තේරෙනවා, ඒ කාලයේ වියදම් වුණු රුපියල් මිලියන 1,300, හත් ගුණයකින් වැඩිවෙලා තිබෙන බව. ඒ වාගේ ප්‍රමාණයකට පිළිකාව වැඩිවෙලා නැහැ. නමුත් ඒ, මැරෙන්න හිටපු මිනිස්සු ඔක්කොම මේ රජය නිසා අද ජීවත් වෙනවා. ඒක තමයි යහපාලනය කියන්නේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, බොහොම ස්තුතියි. ප්‍රශ්න අංක 12 - 573/'18-(1), ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මැතිතුමා. - *[සභා ගර්භය තුළ නැත.]*

දෙවන වටය.

දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය : විස්තර
ஊழல் ஒழிப்பு குழு செயலகம்: விபரம்
ANTI-CORRUPTION COMMITTEE SECRETARIAT: DETAILS

163/'18

3. ගරු නිහාල් ගලප්පත්ති මහතා (ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා වෙනුවට)
(மாண்புமிகு நிஹால் கலப்பத்தி - மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ சார்பாக)
(The Hon. Nihal Galappaththi on behalf of the Hon. (Dr.) Nalinda Jayathissa)

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1)

(අ) (i) දූෂණ මර්දන කමිටු ලේකම් කාර්යාලය පිහිටුවන ලද දිනය කවරේද;

(ii) එය පවත්වාගෙන ගිය කාල වකවානුව කවරේද;

(iii) එම කාර්යාලයට අනුයුක්තව සේවය කළ කාර්ය මණ්ඩලය කොපමණද;

(iv) අදාළ කාලසීමාව තුළ එම කාර්යාලයට ලැබුණු පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

(v) වැඩිදුර විමර්ශනය සඳහා එක් එක් ආයතනයට එම පැමිණිලි යොමු කළ ආකාරය කවරේද;

(vi) අදාළ කාල සීමාව තුළ එම කාර්යාලයේ නඩත්තු සඳහා දරන ලද වියදම් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) (i) ஊழல் ஒழிப்பு குழுச் செயலகம் நிறுவப்பட்ட திகதி யாதென்பதையும்;

(ii) இவ்வலுவலகம் எவ்வளவு காலம் பேணிவரப் பட்டது என்பதையும்;

(iii) மேற்படி அலுவலகத்தில் இணைக்கப்பட்டுச் சேவையாற்றிய ஆளணியினர் எவ்வளவென் பதையும்;

(iv) குறித்த காலகட்டத்தினுள் இவ்வலுகத்திற்குக் கிடைத்த முறைப்பாடுகளின் எண்ணிக்கை எவ்வளவென்பதையும்;

(v) மேலதிக விசாரணைகளுக்காக ஒவ்வொரு நிறுவனத்திறக்கும் இம்முறைப்பாடுகள் ஆற்றுப் படுத்தப்பட்ட முறை யாதென்பதையும்;

(vi) குறித்த காலகட்டத்தினுள் மேற்படி அலுவலத் தின் பராமரிப்புக்காக ஏற்பட்ட செலவு எவ்வள வென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies and Economic Affairs:

(a) Will he inform this House-

(i) the date on which the Anti-Corruption Committee Secretariat was established;

(ii) the duration which the aforesaid Secretariat functioned;

(iii) the strength of the staff that had been attached to that Secretariat;

(iv) the number of complaints received by that Secretariat during the aforesaid period;

(v) the manner in which such complaints were referred to relevant institutes for further investigation; and

(vi) the total expenditure that was incurred on maintaining that Secretariat during the aforesaid period?

(b) If not, why?

ගරු නිරෝෂන් පෙරේරා මහතා (ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நிரோஷன் பெரேரா - தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Niroshan Perera - State Minister of National Policies and Economic Affairs)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) 2015 පෙබරවාරි 19 වන දින.

(ii) 2015 පෙබරවාරි මස 19 දින සිට 2017 ජූනි මස 30 දක්වා.

(iii) නිලධාරීන් 42යි.

(iv) 1,148යි.

(v) කාර්යාලය වෙත ලැබුණු පැමිණිලි නීතිපති දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ රජයේ නීතීඥවරයෙකුගේ සමාලෝචනයෙන් පසු එක් එක් විමර්ශන කොට්ඨාස වෙත යොමු කර ඇත.

ආයතනය වෙත ලැබෙන පැමිණිලි වර්ග කර බරපතළ ගණයෙහි ලා සැලකිය හැකි මූල්‍ය වංචා හා දූෂණ සම්බන්ධයෙන් ලැබෙන පැමිණිලි (481) විමර්ශනය කර පහත පරිදි ආයතන සඳහා යොමු කර ඇති අතර, පරිපාලන අක්‍රමිකතා සම්බන්ධයෙන් ලැබී ඇති පැමිණිලි (547) හා අනෙකුත් පැමිණිලි (120) විමර්ශනය සඳහා විවිධ ආයතන වෙත යොමු කර ඇත.

විමර්ශන සඳහා යොමු කරන ලද ආයතන	පැමිණිලි ගොනු සංඛ්‍යාව
මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාසය	258
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව	43
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව	148
අනෙකුත්	32

(vi) රුපියල් 65,237,416.00.

(ආ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 4 -200/'18- (1), ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මැතිතුමා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழஹப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු කථානායකතුමනි, ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු නිරෝෂන් පෙරේරා මහතා
(மாண்புமிகு நிரோஷன் பெரேரா)
(The Hon. Niroshan Perera)
ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

කොළොන්නාව නගර සභා සීමාව තුළ ජලය කපා හැරීම සහ ජල පීඩනය අඩුවීම : විකල්ප විසඳුම්
கொலொன்னாவ நகர சபை எல்லைக்குள் நீர் வெட்டு மற்றும் நீரழுத்தக் குறைவு: மாற்றுத் தீர்வுகள்
WATER CUTS AN DROP IN WATER PRESSURE IN KOLONNAWA UC LIMITS: ALTERNATIVE SOLUTIONS

235/'18

6. ගරු කේ.කේ. පියදාස මහතා (ගරු එස්.එම්. මරික්කාර් මහතා වෙනුවට)
(மாண்புமிகு கே.கே. பியதாஸ - மாண்புமிகு எஸ்.எம். மரிக்கார் சார்பாக)
(The Hon. K.K. Piyadasa on behalf of the Hon. S.M. Marikkar)

නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) කොළොන්නාව නගර සභා සීමාව තුළ දීර්ඝ කාලයක සිට දිනකට පැය 02 ක් ජලය කපා හරින බවත්;

(ii) එසේම, දවසේ බොහෝ වේලාවක් නල ජලයේ පීඩනය අඩු මට්ටමක පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙලෙස ජලය කපා හැරීමට සහ ජල පීඩනය අඩුවීමට හේතු කවරේද;

(ii) මේ සඳහා දැනට පවතින විකල්ප විසඳුම් කවරේද;

(iii) එම විසඳුම් ක්‍රියාවට නැංවීම සඳහා කිසියම් වැඩපිළිවෙළක් සකසා තිබේද;

(iv) ඉහත (i)හි සඳහන් ගැටලු සඳහා විසඳුම් ලබාදෙන නිශ්චිත දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

නගරත් තිට්ටමිටල් මත්‍රුම් නීර් වළඟ්කල් අමෛච්චරෛක් කේට්ට වින‍ා:

(அ) (i) கொலொன்னாவ நகர சபை எல்லைக்குள் நீண்டகாலம் தொடக்கம் நாளொன்றுக்கு 02 மணி நேரம் நீர்வெட்டு அமுல்படுத்தப்பட்டு வருகின்றதென்பதையும்;

(ii) அத்துடன், தினமும் கூடுதலான நேரம் குழாய் நீரின் அழுத்தம் குறைந்த மட்டத்தில் காணப்படுகின்றதென்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) (i) இவ்வாறு நீர்வெட்டு அமுல்படுத்தப்படுவதற்கும் நீர் அழுத்தம் குறைவடைவதற்குமான காரணம் யாதென்பதையும்;

(ii) இதற்கெனத் தற்சமயம் காணப்படும் மாற்றுத் தீர்வுகள் யாவை என்பதையும்;

(iii) மேற்படி தீர்வுகளைச் செயற்படுத்துவதற்கு ஏதேனும் வேலைத்திட்டமொன்று தயாரிக்கப் பட்டுள்ளதா என்பதையும்;

(iv) மேலே (i)இல் குறிப்பிடப்பட்டுள்ள பிரச்சினைக்குத் தீர்வு பெற்றுக் கொடுக்கப்படும் திட்டவட்டமான திகதி யாதென்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of City Planning and Water Supply:

(a) Is he aware that-

(i) a 02 hour-water cut per day has been in operation in Kolonnawa Urban Council limits for a long time; and

(ii) at the same time, the pressure of pipe-borne water remains very low for most part of the day?

(b) Will he inform this House-

(i) the reasons for such water cuts and drop in water pressure;

(ii) what alternative solutions it has at present;

(iii) whether any course of action has been formulated to implement those solutions; and

(iv) what the specific dates for giving solutions to problems referred to in (i) above?

(c) If not, why?

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) කොළොන්නාව ප්‍රදේශයට ජලය සපයන ප්‍රධාන නලයේ ධාරිතාවේ සුළු අඩුවක් පැවතීම නිසා දිනකට පැය 22ක් පමණක් ජලය සැපයීමට කටයුතු කර ඇති අතර, පැය 02ක කාලයක් පමණක් ජලය ලබා දීමට නොහැකි වී ඇත.

(ii) ධාරිතාවේ සුළු අඩුවීම මත සමහර ප්‍රදේශවලට සැලකිය යුතු වේලාවක් ජල නලවල පීඩනය අඩු මට්ටමක පවතී.

(ආ) (i)

* කොළොන්නාව නගර සභා බල ප්‍රදේශය, කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ කොටසක් සහ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභා බල ප්‍රදේශයේ කොටසක් ආවරණය වන පරිදි කොළොන්නාව භූගත ජල තටාකය මඟින් පානීය ජලය බෙදා හරිනු ලැබේ. ජලය සැපයෙන ජල සම්බන්ධන ගණන 35,000ක් වන අතර, ඒ සඳහා දිනකට අවශ්‍ය ජල ප්‍රමාණය ගණ මීටර 35,000ක් වේ. නමුත්, අඹතලේ ජල පවිත්‍රාගාරය වෙතින් මෙම ජල තටාකය වෙත ලැබෙනුයේ ජලයගණ මීටර 32,000ක් පමණි. ඒ අනුව දිනකට ජල හිඟය ගණ මීටර 3,000කි. එම හේතුව නිසා කොළොන්නාව නගර සභා සීමාවට හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභා බල ප්‍රදේශත්, මොරගස්මුල්ල, ඔබේසේකරපුර හා නාවල යන ප්‍රදේශ සඳහාත් දිනකට පැය 22ක් ජලය ලබා දීමට කටයුතු කරන අතර, පැය 02ක පමණ කාලයක් ජල සැපයුම ලබා දීමට නොහැකි වී ඇත.

* තවද, පැය දෙකක් පමණ ජලය සැපයීම නතර කර නැවත ජලය ලබා දුන් පසු පාරිභෝගිකයන් තම ගබඩා ටැංකි පිරවීමට උත්සාහ කිරීම නිසාත් තවත් සැලකිය යුතු වෙලාවක් ජල පීඩනය අඩු මට්ටමක පවතී.

(ii) මෙම තත්ත්වයට පිළියමක් වශයෙන්, ගොතටුව ජල කුළුණ අසල ඉදිකිරීමට යෝජිත භූගත ජල තටාකයේ සිට මොරගස්මුල්ල ජල කුළුණ දක්වා වෙනම සම්ප්‍රේෂණ නල මාර්ගයක් එලීම මඟින් කොළොන්නාව ජල තටාකයේ සිට මොරගස්මුල්ල දක්වා දැනට පොම්ප කරන ජල ප්‍රමාණය ගණ මීටර 15,000ක් පමණ ජල ප්‍රමාණය ඉතිරි කරගෙන, කොළොන්නාව නගර සභා බල ප්‍රදේශයට අඛණ්ඩව හා ප්‍රමාණවත් පීඩනයකින් යුතුව දවස පුරා ජලය සැපයීමට හැකිවනු ඇත. මේ සඳහා අවශ්‍ය ජල නල ගෙන්වා ඇති අතර, එහි ජල නල එලීමේ වැඩ ඉතා ඉක්මනින් ආරම්භ කිරීමට නියමිතව ඇත. එහි ඉදිකිරීම් 2020 වන විට නිම කිරීමට ද සැලසුම් කර ඇත.

(iii) මහකොළඹ අප ජල කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉඩ කඩ සලසා ඇත. ගොතටුව භූගත ජල තටාකය සහ වෘද්ධිකරණ පොම්පාගාරය ඉදිකිරීම සහ 1,200 මිලිමීටර නල මාර්ගයක් එලීම (පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 20)

(iv) දැනටමත් ටෙන්ඩර් ප්‍රදානය කර ඇති අතර, එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත. ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2020 වසර අවසානයේ දී අවසන් කිරීමට නියමිතය.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 10 -470/'18- (1), ගරු චමින්ද විජේසිරි මැතිතුමා.

ගරු කේ.කේ. පියදාස මහතා
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa
ගරු කථානායකතුමනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.
வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.
Question ordered to stand down.

වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය : විස්තර
வடமேல் மாகாணப் பயணிகள் போக்குவரத்து அதிகாரசபை: விபரம்
ROAD PASSENGER TRANSPORT AUTHORITY OF NORTH WESTERN PROVINCE: DETAILS

573/'18

12. ගරු කේ.කේ. පියදාස මහතා (ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා වෙනුවට)
(மாண்புமிகு கே.கே. பியதாஸ - மாண்புமிகு துஷார இந்துனில் அமரசேன சார்பாக)
(The Hon. K.K. Piyadasa on behalf of the Hon. Thushara Indunil Amarasena)

පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ දැනට සේවයේ නියුතු සේවකයන්ගේ නම් කවරේද;

(ii) එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ නම්, ලිපිනයන් හා අධ්‍යාපන සුදුසුකම් කවරේද;

(iii) දැනට එම අධිකාරියෙන් නිකුත් කර ඇති මගී ප්‍රවාහන බලපත්‍ර සංඛ්‍යාව, එක් එක් මාර්ග අංකය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම අධිකාරියේ මගී ප්‍රවාහන ධාවන බලපත්‍ර පොත් 4ක් අස්ථානගත වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් ගෙන ඇති නීතිමය පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) වර්තමානයේදී වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය දූෂිත ආයතනයක් බවට චෝදනා නැගී ඇති බැවින්, එය වත්මන් යහපාලන රජයේ ප්‍රතිපත්තිවලට අනුව පාලනය කිරීමට අමාත්‍යාංශය ගන්නා පියවර කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) வடமேல் மாகாண பயணிகள் போக்குவரத்து அதிகாரசபையில் தற்போது பணிபுரியும் ஊழியர்களின் பெயர்கள் யாவை;

(ii) அதன் பணிப்பாளர் சபையிலுள்ளோர்களின் பெயர்கள், முகவரிகள் மற்றும் கல்வித் தகைமைகள் யாவை;

(iii) தற்போது அந்த அதிகாரசபையினால் வழங்கப் பட்டுள்ள பயணிகள் போக்குவரத்து உரிமப் பத்திரங்களின் எண்ணிக்கை ஒவ்வொரு வீதி இலக்கத்துக்கமைய வெவ்வேறாக யாது;

என்பதை அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) (i) அந்த அதிகாரசபையின் பயணிகள் வாகன போக்குவரத்து உரிமப்பத்திர புத்தகங்கள் நான்கு காணாமல் போயுள்ளதை அவர் அறிவாரா ;

(ii) ஆமெனின், அது தொடர்பாக எடுக்கப்பட்டுள்ள சட்ட நடவடிக்கைகள் யாவை;

என்பதையும் அவர் இச்சபையில் அறிவிப்பாரா?

[ගරු කේ.කේ. පියදාස මහතා]

(இ) தற்போது வடமேல் மாகாண பயணிகள் போக்குவரத்து அதிகாரசபை ஓர் ஊழல் நிறைந்த நிறுவனமெனக் குற்றம் சாட்டப்பட்டுள்ளதனால் அதனைத் தற்போதைய நல்லாட்சி அரசின் கொள்கைகளுக்கமைய நிர்வகிக்க அமைச்சு எடுக்கும் நடவடிக்கைகள் யாவை என்பதை அவர் மேலும் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Minister of Provincial Councils, Local Government and Sports:

(a) Will he inform this House of-

(i) the names of the current employees of the Road Passenger Transport Authority of North Western Province;

(ii) the names, addresses and educational qualifications of the Board of Directors; and

(iii) the number of passenger transport permits issued by the said Authority, separately for each route number?

(b) Will he also inform this House-

(i) whether he is aware of the fact that 4 passenger transport permit books of that Authority have been misplaced; and

(ii) if so, what legal action has been taken in that regard?

(c) Will he further inform this House of the steps taken by the Ministry to administer the Road Passenger Transport Authority of North Western Province in line with the good governance policies of the current Government, as allegations of being a corrupt institution at present have been leveled against that institution?

(d) If not, why?

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

සභාමේසය මත තබන ලද පිළිතුර:
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ දැනට සේවයේ නියුතු සේවකයන්ගේ නම් **ඇමුණුම්**** අංක 01 මඟින් දක්වා ඇත.

(ii) එහි අධ්‍යක්ෂ මණ්ඩලයේ නම්, ලිපිනයන් හා අධ්‍යාපන සුදුසුකම් **ඇමුණුම්**** අංක 02 මඟින් දක්වා ඇත.

(iii) දැනට එම අධිකාරියෙන් නිකුත් කර ඇති මගී ප්‍රවාහන බලපත්‍ර සංඛ්‍යාව 1,516කි.

එක් එක් මාර්ග අංකය අනුව වෙන් වෙන් වශයෙන් **ඇමුණුම්**** අංක 03 මඟින් දක්වා ඇත.

(ආ) (i) ඔව්.

(ii) 2017.04.21 දින සිට 2017.06.02 දින අතරතුර කාලයේදී මෙම අධිකාරියේ ධාවන බලපත්‍ර පොත් අංක 9413, 9414, 9458, 9459 අස්ථානගත වී ඇත. මේ පිළිබඳව දැනගත් වහාම සාමාන්‍යාධිකාරිවරයා විසින් අස්ථානගත වූ බලපත්‍ර පොත් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා ඇති අතර, එහිදී අනාවරණය වී ඇති තොරතුරු අනුව මීට වග කිවයුතු කළමනාකරණ සහකාර නිලධාරීන් 05 දෙනෙකු සහ ධාවන කළමනාකාර (වැ.බ) යන අය අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ 2017.07.31 දින සිට වැඩ තහනමට ලක් කරන ලදී. එම පරීක්ෂණය පවත්වා ඇත්තේ එවකට සිටි සාමාන්‍යාධිකාරිවරයා හෙයින්, නැවත අධ්‍යක්ෂ මණ්ඩල නියමය පරිදි අධිකාරියට පරිබාහිර නිලධාරීන් මඟින් මෙම අස්ථානගතවීම සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පවත්වා ඇත. එමඟින් ලබා දී ඇති නිර්දේශ අනුව, මෙම අස්ථානගතවීම සම්බන්ධයෙන් සැකපිට ධාවන කළමනාකාර (වැ.බ) හා කළමනාකරණ සහකාර නිලධාරීන් දෙදෙනෙකුට චෝදනා පත් නිකුත් කර මේ වන විට විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කර ඇත. තවත් කළමනාකරණ නිලධාරීන් තිදෙනෙකුට චෝදනා පත් නිකුත් කර විධිමත් පරිදි විනයානුකූලව කටයුතු කිරීමට තරම් කරුණු නොමැති බැවින්, ඔවුන් වෙත දැඩි ලෙස අවවාද කිරීමට නිර්දේශ කර තිබිණ.

ඒ අනුව අධ්‍යක්ෂ මණ්ඩලයට අදාළ වාර්තාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව විධිමත් විනය පරීක්ෂණයකට යටත්ව ධාවන කළමනාකාර (වැ.බ) හා කළමනාකරණ නිලධාරීන් දෙදෙනෙකු සේවයේ පිහිට වූ අතර, ධාවන කළමනාකාර (වැ.බ) පුත්තලම කලාප කාර්යාලය වෙත ස්ථාන මාරු කරන ලදී. එසේම, විධිමත් විනය පරීක්ෂණයකට යාමට තරම් කරුණු හෙළි නොවූ කළමනාකරණ සහකාර නිලධාරීන් තිදෙනාට අවවාද කර නැවත සේවයේ පිහිටුවන ලදී.

(ඇ) මේ වන විට සිසුසැරිය ඇතුළත්ව මාර්ග බලපත්‍ර ලබාගත් බස් හිමියන් 1,700කට ආසන්න ප්‍රමාණයක් වයඹ පළාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය යටතේ සේවාවන් සපයයි. මේ දක්වා කිසිදු බස්රථ හිමියෙකුගෙන් මෙවැනි චෝදනාවක් එල්ල වී නොමැත. 2015.03.08 වන දින දක්වා කොන්ත්‍රාත් පදනම මත වැඩ බලන සාමාන්‍යාධිකාරිවරයා වශයෙන් සිටි අයගේ සේවා කාලය අවසන්වීම හේතුකොට ගෙන 2015.03.08 වන දින සිට ඩී.ජී. කුමාරතුංග මහතා එම තනතුරට පත් කරන ලදී. මේ වන විට සභාපතිවරයා ලෙස කටයුතු කළේ නයනජිත් උපේන්ද්‍ර මහතාය. ඔහුගෙන් පසුව 2015.09.28 දින සිට සභාපතිවරයා ලෙස දේශාන් සම්පත් වර්ණපුර මහතා පත් කර ඇත. සාමාන්‍යාධිකාරිවරයාගේ යම් යම් අක්‍රමිකතා පිළිබඳව ගරු අමාත්‍යතුමා වෙත වාර්තාවීම හේතුකොට ගෙන ඔහුව තනතුරෙන් ඉවත් කර ඇත. ඊට එරෙහිව සාමාන්‍යාධිකාරිවරයා අධිකරණයේ නඩුවක් ගොනු කිරීම මත රිට් ආඥාවකින් නැවත සාමාන්‍යාධිකාරිවරයා ලෙස රාජකාරී කිරීමට තීන්දුවක් ලබා ගෙන සේවයේ නිරත විය. එසේ වුවද මේ සම්බන්ධයෙන් ඔහු විසින් ගොනු කර තිබූ නඩුව නිෂ්ප්‍රභවීම හේතුකොට ගෙන ඔහුගේ සේවය ඉවත් කිරීම තහවුරු විය. 2017.09.08 දින සිට සාමාන්‍යාධිකාරිවරයා ලෙස ශ්‍රී ලංකා පරිපාලන සේවයේ විශ්‍රාම ලබා ඇති ආර්.ඩී. සඳරත්න මහතා පත් කර ඇති අතර, සභාපතිවරයා ලෙස කටයුතු කළ දේශාන් සම්පත් වර්ණපුර මහතාව ද ඉවත් කර 2017.02.21 දින සිට අයි.ජී.ඩී. ගුණතිලක මහතා සභාපති ලෙස පත් කර ඇත. මේ වන විට අධිකාරියේ සිදු වූ බවට වාර්තා වී තිබූ අක්‍රමිකතාවන් මහඟරි ගොස් ඇති අතර, එම කටයුතු විධිමත්ව හා නිවැරදිව යහ පාලන රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුව සිදුවන බව ද දන්වා සිටිමි.

(ඇ) අදාළ නොවේ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමා.

*** පුස්තකාලයේ තබා ඇත.*
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
தனி அறிவித்தல் மூல வினா
QUESTION BY PRIVATE NOTICE

නෙත් එෆ් එම් ගුවන්විදුලි නාලිකාවට බලපෑම්
நெத் எப்எம் வானொலி நிலையத்துக்கு அச்சுறுத்தல்
UNDUE INFLUENCE ON NETH FM RADIO STATION

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ මෙම ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමාගෙන් පිළිතුරු බලාපොරොත්තුවෙන් මා මෙම ප්‍රශ්නය ඉදිරිපත් කරනවා. ජන මාධ්‍ය නිදහසට බලවත් තර්ජනයක් මතු වී තිබෙන කාරණාවක් අවධානයට ගෙනෙන්නට හා එයට විසඳුමක් ඇති කර ගැනීමටයි මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ. එනම්, නෙත් එෆ් එම් රේඩියෝ ආයතනයට අද ඇති වී තිබෙන තර්ජන පිළිබඳවයි.

මාධ්‍ය නිදහස ආරක්ෂා කරන බවට රට ඉදිරියේ හා පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කර, ආණ්ඩුව විසින් ජන මාධ්‍ය දඩයම් කිරීමේ ඉතා අහිතකර තත්ත්වයක් නිදහස් ජන මාධ්‍යයට හා එම අයිතිය භුක්ති විඳින ජනතාවට අත්කරමින් ඇත. මෙය හදිසි කාරණාවක් හැටියටයි ගෙනෙන්නේ. එනම්, නෙත් එෆ් එම් රේඩියෝව වසර 12ක කාලයක් අසන්නන් වෙනුවෙන් ගුණාත්මක සේවයක් පවත්වන ආයතනයකි. එම සේවාව මඟින් සතියේ දිනවල උදෑසන විකාශය වන "බැලුම්ගල" වැඩසටහන මඟින් රටේ සිදුවන වංචා, දූෂණ, අක්‍රමිකතා හා කාලීන සිදුවීම් සුවිශේෂ ආවරණයක් කරන බව අගමැතිතුමා පිළිගන්නවාද?

2018 මාර්තු 09 වන දින පැවැති, නියෝජ්‍ය අමාත්‍යවරයකු සම්බන්ධයෙන් කරන ලද වැඩසටහනින් පසුව නෙත් FM ආයතනයට තර්ජනය කරමින් සිටින අතර, පසුව පොලීසියද සම්බන්ධ කරගෙන ආයතනයට හා ශ්‍රාවකයන්ට බලපෑම් කරමින් සිටින බවත් කියන්නට ඕනෑ. ගරු කථානායකතුමනි, කොල්ලුපිටිය පොලීසිය විසින් කරනු ලබන තර්ජන නිසා මේ ආයතනයේ එදිනෙදා කටයුතුවලට බාධා සිදු වෙලා තිබෙනවා. එපමණක් නොවෙයි, ආයතනයෙන් විවිධ ඉල්ලීම් කරන ප්‍රේක්ෂකයන්ගේ, ගීතයක් ඉල්ලන්න කථා කරන අයගේ පවා telephone නොමිමර අරගෙන කථා කරලා, පොලීසියට එන්න කියනවා. නෙත් FM එකට කථා කළේ ඇයි කියලා අහනවා. බණ දේශනා කළ ස්වාමීන් වහන්සේලාට පොලීසියට එන්න කියලා කියනවා. එබැවින්, විචාරාත්මක වැඩසටහන්වලට සම්බන්ධ වූ අය පොලීසියට කැඳවා ප්‍රශ්න කිරීම, ජනමාධ්‍ය ආයතනයට හා එහි වැඩසටහන්වලට සවන් දෙන සැමට තර්ජන, කරදර, බලපෑම් කිරීම වහා නැවැත්වීමට මැදිහත් වී පියවර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා. එසේ කරන ලද තර්ජන, බලපෑම් සම්බන්ධයෙන් නෙත් FM ආයතනය විසින් රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂතුමා වෙත යවන ලද 2018.05.25 දිනැති ලිපිය මේ අවස්ථාවේ දී මා **සභාගත*** කරනවා.

ගරු කථානායකතුමනි, මේ අයුරින් ජනමාධ්‍ය නිදහස දැවැන්ත තර්ජනයකට ලක් වී තිබෙනවා. ඔබතුමාත් දන්නවා ඇති, මේ වැඩ සටහන ආණ්ඩු ගණුනාවක කාලයක් තුළ පවත්වාගෙන එන එකක් බව. පිළිතුරු දීමට අයිතියක් - right of reply - තිබෙනවා. ඒ අය පිළිතුරු දීමේ අයිතියත් දෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි. අපි ඒ සම්බන්ධයෙන් පැහැදිලි කරන්න ගරු අගමැතිතුමාට අවස්ථාව දෙමු.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු අගමැතිතුමා පිළිතුරු දෙන්න ඉස්සර වෙලා මම මේ කාරණය ගැන අහන්න ඕනෑ. ඒ සියලු අයිතිවාසිකම් දීලා තිබෙද්දී, පොලීසිය මෙහෙම දඩයම් කරන්නේ ඇයි? රහස් පොලීසිය, දුරකථනවලින් කථා කළ අයගේ දුරකථන නොමිමර පොලීසියට දෙන්නේ, ජනමාධ්‍ය ආයතනවල සෑම දුරකථන ඇමතුමක්ම tape කරන භයානක තත්ත්වයක් අද ඇති කර තිබෙන නිසයි, ගරු අගමැතිතුමනි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු අගමැතිතුමා.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs}

ගරු කථානායකතුමනි, මේ රජය මාධ්‍ය නිදහස ඇති කළා. ඒක ආරක්ෂා කරලා තිබෙනවා. මෙතැන තිබෙන්නේ, නෙත් FM සේවයේ විකාශය වූ එක පුවතක් ගැන පොලීසිය ගත් ක්‍රියාමාර්ගයක් ගැන. ඒ පොලිස් පැමිණිල්ලක් නිසයි. නැත්නම් පොලීසියට වුවමනාවක් නැහැ නේ.

2018 මාර්තු 09 වන දින ප්‍රචාරය කළ "බැලුම්ගල" නමැති වැඩසටහනින් විකාශනය වූ එක් පුවතක් ගැන කළුතර දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී හා තිරසර සංවර්ධන, වනජීවී සහ ප්‍රාදේශීය සංවර්ධන නියෝජ්‍ය අමාත්‍ය පාලිත කුමාර තෙවරප්පෙරුම මැතිතුමා ලිඛිතව පැමිණිල්ලක් කර තිබෙනවා. කවුරු හෝ ලිඛිතව පැමිණිල්ලක් කළා නම් ඒ ගැන විමර්ශනයක් කළ යුතුයි.

විමර්ශනය කිරීමේ පදනම අනුව මෙම වැඩසටහන මෙහෙය වූ දෙදෙනාගෙන් -චරිත් ජීවන්ත ධර්මසේන හා චාමික ගීත් ගයාන් යන අයගෙන්- පොලිස් ස්ථානයට පැමිණි පසු ප්‍රකාශ සටහන් කරගෙන තිබෙනවා. ඉන් පසුව, මේ ගැන තව දුරටත් කරුණු ලබාගෙන පොලීසිය 2018 වර්ෂයේ මැයි මස 8වන දින අංක බී 9055/1 යටතේ කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයට කරුණු වාර්තා කර, තොරතුරු ලබා ගැනීම සඳහා තව තිදෙනෙකුගේ ප්‍රකාශ ඉල්ලා තිබෙනවා. මේ කටයුතු කර තිබෙන්නේ කොල්ලුපිටිය පොලීසියයි. වෙන කවුරුවත් නොවෙයි. මේ සියලු කටයුතු අවසන් කර වාර්තාව ලබා දුන් පසු ගන්නා පියවර මොකක්ද කියා තීරණය කරන්න පුළුවන්. දැනට ඒ අයට සම්පූර්ණ වාර්තාවක් එවීමට තිබෙනවා. ඊට වඩා අපි "නෙත් එෆ්එම්" ගුවන් විදුලි වැඩසහනට කිසිවිටක මැදිහත් වෙලා නැහැ. ඒ වාගේම මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය කිව්වේ, මාධ්‍ය මඟින් මෙවැනි වැඩසටහන් විකාශනය කරනු ලබන්නේ ඒ සඳහා ප්‍රමාණවත් මාධ්‍ය නිදහසක් තිබෙන නිසා බවයි. අපි මාධ්‍යවේදීන්ට තර්ජනය කරන එකට විරුද්ධයි. දැන් ලංකාවේ අයට තර්ජනය කරනවා, මරනවා විතරක් නොවෙයි, "The New York Times" පුවත් පතේ කර්තෘටත්, අනික් අයටත් තර්ජනය කර තිබෙනවා. "අපට තර්ජනය කළා" කියා "The New York Times" පුවත් පත ප්‍රසිද්ධියේ පළ කර තිබෙනවා.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூலகத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Before you go to the New York Times, තමුන්නාන්සේලා පටිගත කිරීම් කරන්නේ නැත්නම්, මෙම ආයතනයට ප්‍රේක්ෂකයන් කථා කරන දුරකථන අංක සියල්ල පටිගත වෙලා පොලීසියට යන්නේ කොහොමද කියායි මම අහන්නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
පොලීසිය දැනට වරින් වරින්ත ධර්මසේන සහ චාමික ගීත් ගයාන් යන දෙදෙනාගේ ප්‍රකාශ සටහන් කරගෙන තිබෙනවා. මම ඒ ප්‍රකාශ දැකලා නැහැ. ඉල්ලුවෙත් නැහැ. ඒකෙන් මට වැඩක් නැහැ. ඉන් පසුව උහන චම්පික නිරෝෂන්, රත්නපුර, පලාබද්දල රේණුකා චාන්දනි කුමාරි, මහනුවර එච්. ඩිලානි, රත්නපුර ඩී.එම්. දොන් සමන් කුමාර යන හතරදෙනාගෙන් පමණක් ප්‍රකාශ ලබා ගැනීමට මහෙස්ත්‍රාත් උසාවියෙන් අවසර ලබාගෙන තිබෙනවා.

ඒ හතර දෙනාගෙන් විතරයි. ඕනෑ නම්, විභාගය අවසන් වුණාට පස්සේ කියන්න පුළුවන්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු අගමැතිතුමනි, "අපේ ශ්‍රාවකයන්ට තර්ජනය කරන්න" කියා ඔබතුමායි මමයි කියන්නේ නැහැ. ශ්‍රාවකයන්ට තර්ජනය කරන්න, මේ ආයතනයට තර්ජනය කරන්න කියා කවුරු හෝ පොලීසියට කියන්න ඇති. නැත්නම් ගීතයක් ඉල්ලපු ඒ කාන්තාවට ටෙලිෆෝන් කරන්නේ මොකටද? මේ අංක කොහොමද ආවේ? "නෙත් එෆ්එම්" එකට කථා කරපු ඒ දුරකථන අංක නාමාවලියම පොලීසිය අතේ තිබෙනවා. මේකෙන් කියන්නේ, අද මේ ආයතනවල ඇමතුම් tape කරනවාය කියන එක නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මේක කළේ කවුද කියා අපි දන්නේ නැහැ. "නෙත් එෆ්එම්" එකෙන් දුන්නාද, කොහොමද ලැබුණේ කියා දන්නේ නැහැ. එම අංක ලැබුණේ කොහොමද කියා සොයා බලා මම ඔබතුමාට වාර්තාවක් ලබා දෙන්නම්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ ගැන සොයා බලන්න, ගරු අගමැතිතුමනි.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
දුරකථන අංක එහෙම දෙන්න බැහැ නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මම දන්නේ නැහැ. මම අහන්නම්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒවා tape කරනවාද කියන එකයි මම අහන්නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
මම දන්නේ නැහැ.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ඉස්සර නේ, tape කළේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
ඒ ගොල්ලෝ සම්පූර්ණ වැඩසටහන -programme එක- tape කරලා දුන්නා නම්, කවුද කථා කළේ, කිව්වේ මොනවාද කියා ඒකෙන්ම හොයා ගන්න පුළුවන්. මොකද, ඒකේ පටිගත වනවා නේ. ඔබතුමා කියපු නිසා මම මේ ගැන හොයා බලන්නම්. The New York Times පුවත් පතේ වාර්තාවක් පළ වෙලා තිබෙනවා නේ. ඒ වාර්තාවට අපි මොකද කරන්නේ?

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
The New York Times පුවත් පතේ එම වාර්තාව දැම්මේ තමුන්නාන්සේලා නේ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
නැහැ, අපි නොවෙයි. අපි දන්නේවත් නැහැ.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
We will move on to the next Item.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා (රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ - அரச நிருவாக முகாமைத்துவ மற்றும் சட்டமும் ஒழுங்கும் பிரதி அமைச்சர்)
(The Hon. Nalin Bandara Jayamaha - Deputy Minister of Public Administration and Management and Law and Order)
ගරු කථානායකතුමනි, මටත් කාරණයක් කියන්න තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, මේ කාරණයට අදාළව කථා කරන්න.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
The New York Times පුවත් පතේ පළ වූ වාර්තාව ගැන අගමැතිතුමා ඊයේ ප්‍රකාශයක් කළා. මහින්ද රාජපක්ෂ මහත්මයාත් මේ පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කරන්න ඕනෑ. ඒක එතුමාගේත් වගකීමයි. අපි සියලුදෙනා බැඳී සිටිනේ පාර්ලිමේන්තුවටයි. නැතුව, තැන් තැන්වල කියලා වැඩක් නැහැ.

ගරු රනිල් වික්‍රමසිංහ මහතා
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க)
(The Hon. Ranil Wickremesinghe)
එතුමා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රකාශයක් කළා නම් ප්‍රශ්නය ඉවරයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ස්ථාවර නියෝග 27(2) යටතේ ඊළඟ ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා. You may go ahead now.

II

නන්දිකඩාල් ප්‍රදේශය සංවර්ධනය කිරීම
நந்திக்கடல் பகுதியை அபிவிருத்தி செய்தல்
DEVELOPMENT OF NANDIKADAL AREA

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ சபாநாயகர் அவர்களே, வலுவாதார அபிவிருத்தி, வனசீவராசிகள் மற்றும் பிரதேச அபிவிருத்தி அமைச்சர் கௌரவ சரத் பொன்சேகா அவர்களிடம் கேள்வி கேட்க அனுமதித்ததற்கு நன்றி.

வடக்கு மாகாணத்தின் முல்லைத்தீவு மாவட்டமானது தொடர்ந்தும் வறுமை நிலையில் இருந்து வருகின்ற நிலையில், சுமார் பத்தாயிரத்திற்கும் மேற்பட்ட குடும்பங்களின் வாழ்வாதாரங்களை மேம்படுத்தும் வகையில் முன்னாள் கடற்றொழில் மற்றும் நீரியல் வளத்துறை அமைச்சர் கௌரவ மஹிந்த அமரவீர அவர்களிடம் நான் முன்வைத்த கோரிக்கைக்கு இணங்க, நந்திக்கடல் ஆற்றுப் பகுதியை அபிவிருத்தி செய்வதற்குக் கடந்த வரவு செலவுத் திட்டத்தின் மூலமாக நடவடிக்கை எடுக்கப்பட்டிருந்தது. மேற்படி நந்திக் கடலாற்றினை அபிவிருத்தி செய்வதனூடாக சுமார் பத்தாயிரத்திற்கும் மேலான கடற்றொழிலாளர் குடும்பங் களுக்கு வாழ்வாதாரங்களை ஈட்டிக்கொள்ள முடியுமென்பது குறிப்பிடத்தக்கது.

இத்தகையதொரு நிலையில் முல்லைத்தீவு மாவட்டத்தில் நந்நிக்கடல், வட்டுவாகல் மற்றும் நாயாறு போன்ற பகுதிகளை இயற்கை ஒதுக்கிடமாக அடையாளப்படுத்துவதற்கு வன ஜீவராசிகள் திணைக்களம் நடவடிக்கை எடுத்து வருவதாக ஊடகங்கள் செய்திகளை வெளியிட்டு வருகின்றன.

மேற்படி நந்நிக்கடல், வட்டுவாகல் மற்றும் நாயாறு போன்ற பகுதிகளை இயற்கை ஒதுக்கிடமாக அடையாளப் படுத்துவதற்கு நடவடிக்கைகள் எடுக்கப்படுகின்றனவா?

நந்திக்கடல் பகுதியை அபிவிருத்தி செய்வதற்குக் கடந்த வரவு செலவுத் திட்டத்தில் ஏற்கனவே நிதி ஒதுக்கீடுகள் மேற்கொள்ளப்பட்டுள்ள நிலையில், அதனை இயற்கை ஒதுக்கிடமாக அடையாளப்படுத்துவதனூடாக அதனை நம்பி வாழ்ந்து வருகின்ற சுமார் பத்தாயிரத்திற்கும் மேற்பட்ட குடும்பங்களின் வாழ்வாதாரங்களுக்கு ஏற்படக் கூடிய பாதிப்புத் தொடர்பில் அவதானம் செலுத்தப் பட்டுள்ளதா?

இயற்கை ஒதுக்கிடமாக மேற்படி பகுதிகள் அடையாளப் படுத்தப்படுமானால் எமது மக்களின் வாழ்வாதாரங்கள் பாதிக்கப்படுமென்பதால், மேற்படி திட்டத்தினைக் கைவிட்டு, எமது மக்களது வாழ்வாதாரங்களுக்குப் பாதிப்புக்கள் ஏற்படாத வகையில் திட்டங்களை மேற் கொள்ள நடவடிக்கை எடுக்க முடியுமா?

மேற்படி எனது கேள்விகளுக்கான பதில்களையும் எடுக்கப் படக்கூடிய நடவடிக்கைகள் தொடர்பான விளக்கங்களையும் கௌரவ அமைச்சர் பீல்ட் மார்ஷல் சரத் பொன்சேகா அவர்கள் வழங்குவாரென எதிர்பார்க்கின்றேன்.

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, ගරු ඩග්ලස් දේවානන්දා මන්ත්‍රීතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කළ එම ප්‍රශ්නයට ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා ඇමතිතුමා ඊළඟ පාර්ලිමේන්තු දිනයේදී පිළිතුරු ලබාදෙන බව දැනුම් දුන්නා. He said that he is going to reply next week.

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
Okay.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, අමාත්‍යාංශ නිවේදන.

තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, මට ඔබතුමාගෙන් පැහැදිලි කර ගැනීමක් කරගන්න අවශ්‍යයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේ කටයුතු අවසානයේදී ඔබතුමාට පැහැදිලි කර ගැනීමකට ඉඩ ලබා දෙන්නම්, ගරු මන්ත්‍රීතුමනි. වැඩකටයුතු අතරමැද එසේ කරනවිට අවුල් සහගත තත්ත්වයක් ඇති වෙනවා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
හොඳයි, ගරු කථානායකතුමනි.

හජ් වන්දනා වැඩ පිළිවෙළ සම්බන්ධ අසත්‍ය චෝදනා : තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමාගේ ප්‍රකාශය

ஹஜ் யாத்திரை நடைமுறை பற்றிய தவறான குற்றச்சாட்டுக்கள்: தபால், தபால் சேவைகள் மற்றும் முஸ்லிம் சமய அலுவல்கள் அமைச்சரினது கூற்று

FALSE ALLEGATIONS LEVELLED AGAINST HAJJ PILGRIMAGE: STATEMENT BY MINISTER OF POST, POSTAL SERVICES AND MUSLIM AFFAIRS

ගරු අබ්දුල් හලීම් මහතා (තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා)

(மாண்புமிகு அப்துல் ஹலீம் - தபால், தபால் சேவைகள் மற்றும் முஸ்லிம் சமய அலுவல்கள் அமைச்சர்)

(The Hon. Abdul Haleem - Minister of Post, Postal Services and Muslim Affairs)

ගරු කථානායකතුමනි, හජ් වන්දනා කටයුතු සම්බන්ධයෙන් දූෂණ සිදු වී ඇතැයි පසුගිය කාලවලදී සමහර මාධ්‍යවල අසත්‍ය ප්‍රවෘත්ති පළ වුණා. ඒ නිසා අමාත්‍යාංශයේ වැඩ කටයුතු සම්බන්ධව කරන ප්‍රකාශය යටතේ මේ ප්‍රකාශය කරන්න මා අදහස් කළේ, එම කටයුතුවල නිවැරදිතාව පිළිබඳව මෙම ගරු සභාවට ප්‍රකාශ කිරීම මගේ යුතුකමක් සහ වගකීමක් ලෙස මා සලකන නිසායි.

ගරු කථානායකතුමනි, වාර්ෂික හජ් වන්දනාව නියාමනය කිරීම සඳහා හජ් විෂයය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන හජ් කමිටුවේ උපදෙස් පරිදි, එකී වන්දනා කටයුතු මෙහෙයවීමේ මූලික වගකීම මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව වෙත පැවරෙන අතර, එසේ කරනු ලබන්නේ ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට වඩාත් සුරක්ෂිත මෙන්ම ඵලදායී අඛණ්ඩ සේවාවක් ලබාදීමට සහ මෙම කටයුතු විනිවිදභාවයෙන් යුතුව වඩාත් වගකීම් සහිත වූ ඉතාම හොඳ සේවාවක් ලබාදීමේ රජයේ අරමුණ සාක්ෂාත් කර ගැනීම පිණිස බව මම ප්‍රථමයෙන්ම පැහැදිලිව ප්‍රකාශ කළ යුතුයි.

ගරු ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබා දී ඇති මාර්ගෝපදේශ අනුව, කීර්තිමත් වෘත්තියවේදීන් සහ රජයේ සිවිල් සේවකයන්ගෙන් සමන්විත වූ හජ් වන්දනා නියාමන කමිටුව, "හජ් කමිටුව" ලෙස ඉතාම පිරිසිදු හා ව්‍යුහගත සේවාවක් සහතික කිරීම සඳහා විධිමත් ක්‍රියාවලියක් මඟින් හජ් වන්දනාකරුවන්ට බලපාන ඕනෑම ගැටලුවකදී එම ගැටලු නිරාකරණය කර දෙමින් ඔවුන්ට සහාය වීම පිණිස කටයුතු කරනු ලබනවා. ඒ වාගේම වගකිව යුතු සංචාරක මෙහෙයුම්කරුවන් ලෙසින් ස්වකීය ගනුදෙනුකරුවන් සහ නියාමන බලධාරීන් අතර වගවීමෙන් යුතුව කටයුතු කිරීම මෙකී සංචාරක මෙහෙයුම්කරුවන්ගේ වගකීම වේ.

මෙම වාර්ෂික හජ් වන්දනාව යනු ආගමානුකූලව සුදුසුකම් සපුරාලනු ලබන සෑම මුස්ලිම්වරයකු විසින් ඉටු කළ යුතු ආගමික වාරිත්‍රයකි. වාර්ෂිකව දසදහසකට ආසන්න වූ මුස්ලිම් බැතිමතුන් සංඛ්‍යාවක් වාර්ෂික හජ් වන්දනාව ඉටු කිරීමට අපේක්ෂාවෙන් පසු වුවද, එකී වාසනාවන්ත අවස්ථාව හිමිවනුයේ, එනම් වීසා අවසරපත් ලැබෙනුයේ 3,000ක් පමණ වූ ඉස්ලාමීය බැතිමතුන්ට පමණි. මෙසේ ඉතාම සීමිත වූ වීසා ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට ලැබීම සහ අවශ්‍ය ප්‍රමාණයට ප්‍රමාණවත් වීසා ප්‍රමාණයක් නොලැබීම හේතුවෙන් කෘත්‍රිමව මිල උච්චාවචනයක් ඇතිවීම නිරන්තරයෙන්ම සිදුවන තීරක බලපෑම වේ.

කෙසේ වෙතත් මේ සුදුසුකම් ලත් බහුතර මුස්ලිම් බැතිමතුන්ට ස්වකීය ජීවිතයේ එක් වතාවක් පමණක් ඉටු කිරීමට ලැබෙන මෙම සුවිශේෂී අවස්ථාව ඉවසා දරා ගැනීමට සිදුවනු ඇත.

මීට කලින් පැවති ආණ්ඩු විසින් හජ් වන්දනාව සඳහා ලැබෙන වීසා බලපත් සෘජුව සංචාරක මෙහෙයුම්කරුවන්ට ලබා දී ඇති නමුත් අදාළ වන්දනාකරුවන්ට මෙම වීසා බලපත් නිකුත් කිරීමක් සිදු වූයේ නැහැ. සංචාරක මෙහෙයුම්කරුවන් විසින් වන්දනාකරුවන් තෝරා ගැනීම සහ මිල නියම කිරීමේ ඒකාධිකාරිය හමුවේ බොහෝ බැතිමතුන්ට මෙම අවස්ථාව ගිලිහී යෑමක් සිදු වුණා. වීසා බලපත් ලැබෙනුයේ රජයට බැවින් රජය මඟින් සාධාරණ ලෙස මෙම අවස්ථාව සියලු පුරවැසියන්ට සමානව බෙදා හැරීමේ ක්‍රමවේදයක් නොතිබීම නිසා මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වීමක් සිදු වුණා මෙන්ම සුදුසුකම් සහිත බැතිමතුන්ට මෙකී අවස්ථාවද අහිමි වුණා.

ඉහත දැක්වූ කරුණු කාරණා මවිසින් අවබෝධ කර ගැනීමත්, මෙම වීසා තුලනාත්මකව සමානව බෙදා හැරීමේ අවශ්‍යතා හඳුනාගත් නිසාත් ශ්‍රේෂ්ඨාධිකරණයේ මාර්ගෝපදේශයන්ට අවනතව මාගේ උපදෙස් පරිදි හජ් කමිටුව විසින් සුදුසුකම් සහිත සංචාරක මෙහෙයුම්කරුවන් තෝරා ගැනීමටත්, වන්දනාකරුවන් සඳහා විවෘත විනිවිදභාවයෙන් යුතු වූ ලියා පදිංචි කර ගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කිරීමට සැලැස්වීම නිසාත් වන්දනාකරුවන්ට විවෘත වෙළෙඳ පොළ හමුවේ තමන් කැමැති සංචාරක මෙහෙයුම් ආයතනයක් මඟින් තමන්ගේ වන්දනාව සංවිධානය කර ගැනීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම තුළින් දැරිය හැකි මිලකට ස්වකීය වන්දනාව ඉතාමත් විශ්වාසී සහ සෞඛ්‍ය සම්පන්න වූත් තරගකාරී අළෙවිකරණ පරිසරයක් තුළ තිරසර සංචාරක කර්මාන්තයක් ප්‍රවර්ධනය කිරීම දිරිගැන්වීමට මට හැකි වුණා.

මෙම කර්මාන්තය ආරක්ෂා කර ගැනීම සඳහා වන්දනාකරුවන්ට අධික බර පැටවීමෙන් වැළකී මෙම වාර්ෂික හජ් වන්දනාමාන කටයුතු නියාමනය කිරීමේ ප්‍රතිපත්තිය දිගටම ක්‍රියාත්මක කිරීම මාගේ අරමුණයි.

මෙම නව වැඩ පිළිවෙළ යටතේ ඇතැම් සංචාරක ව්‍යාපාරිකයනට ස්වකීය ව්‍යාපාරික කටයුතු අහිමි වීමේ ප්‍රවණතාවක් උදා වී තිබෙනවා. එයට හේතුව වන්දනාකරුවන් අතර පිළිගැනීමක් හෝ ආකර්ෂණීය බවක් ඇති කර ගැනීමට ඔවුන්ට නොහැකි වීමයි. ඒ නිසා ඔවුන් කුඩා කණ්ඩායමක් ඒකරාශි වී අසත්‍ය චෝදනා හජ් කමිටුව වෙත ඉදිරිපත් කිරීමට පෙලඹී තිබෙනවා.

මොවුන් විසින් මෑතකදී පවත්වනු ලැබූ මාධ්‍ය සාකච්ඡා කිපයක් තුළින් හජ් වන්දනා කටයුතුවලදී නීතිය උල්ලංඝනය වීම් සහ විවිධ චෝදනා හජ් කමිටුව වෙතත්, විෂයය භාර අමාත්‍යවරයා ලෙස මා වෙතත් එල්ල කරනු ලැබුවා. එය හුදෙක් අපගේ කීර්ති නාමයට හානි කිරීමටයි.

මෙම පුවත් පත් මාධ්‍ය සාකච්ඡාවලදී ඉදිරිපත් වූ කරුණු කාරණා බොහොමයක් අසත්‍ය තොරතුරු සහ ජනතාව නොමඟ යැවීමේ අදහසින් කළ සාවද්‍ය ප්‍රබන්ධ වූ නිසා ඒවාට පිළිතුරු දීමෙන් වැළකී සිටීමට මා උත්සාහ කළා. නමුත් දිගින් දිගටම මෙම අසත්‍ය, අභූත චෝදනා හමුවේ මුනි වත රැකීමෙන් අපගේ කීර්ති නාමයට සිදු වන හානිය නිසා මොවුන්ගේ එක් එක් චෝදනාවන්ට සෘජු පිළිතුරු සැපයීමට මා තීරණය කරනු ලැබුවා.

ඉතාම සීමිත, අල්ප සංඛ්‍යාවක් වූ වන්දනාකරුවන් පිරිසක් මෙකී සංචාරක මෙහෙයුම්කරුවන් සමඟ ඒක රාශී වීමත් සමඟ

පදනම් විරහිත වූ චෝදනා ඉදිරිපත් කරන්නට උත්සාහ දරනවා. එමඟින් වාර්ෂික හජ් වන්දනාව කඩාකප්පල් කිරීමටත්, හජ් කමිටුව අපහසුතාවට පමුණුවන්නටත් ඔවුන් උත්සාහ දරනවා. මෙකී සංචාරක මෙහෙයුම්කරුවන් විවෘත වෙළෙඳ පොළ හමුවේ අසාර්ථක ව්‍යාපාරිකයන් බවට නිරායාසයෙන්ම පත් වීම නිසා මෙම තත්ත්වය ඇති වී තිබෙනවා. නමුත් එය සිදු වූයේ හජ් කමිටුවේ ක්‍රියාකාරිත්වය නිසා නොවෙයි.

හජ් කමිටුව විසින් මුදල් විශුද්ධිකරණය සඳහා රුපියල් මිලියන 84ක මුදලක් වැය කර ඇති බවට මෙම අභූත චෝදනා ඉදිරිපත් කරනු ලබන සංචාරක මෙහෙයුම්කරුවන් චෝදනා කරනවා. මෙය හුදෙක් විෂයය භාර ඇමතිවරයාගේ හා හජ් කමිටුවේ සාමාජිකයන්ගේ ප්‍රතිරූපය කෙලෙසීම සඳහා ව්‍යාජ, නොමඟ යවන සුළු සහ ද්වේෂ සහගත කරුණු ඉදිරිපත් කිරීමක් විනා කිසිදු සත්‍යතාවක් නොමැති කරුණු බව අවධාරණය කරනු කැමැත්තෙමි. සත්‍ය වශයෙන්ම වන්දනාකරුවන්ගේ අවශ්‍යතාවන් ඉටු කිරීම පිණිස සිටින්නා වූ සංචාරක මෙහෙයුම්කරුවන්ගේ වගකීම විවිධ වූ අවශ්‍යතාවන් සඳහා මුදල් එකතු කර ගැනීමයි. එය වන්දනාකරුවන් සහ වන්දනා සංචාරක මෙහෙයුම්කරුවන් අතර ඒකාබද්ධ වූ වගකීමක්. සුපුරුදු පරිදි වන්දනාකරුවන්ගෙන් මෙම මුදල් එකතු කර ගැනීම සංචාරක මෙහෙයුම්කරුවන්ගේ කාර්යයක් විනා හජ් කමිටුවේ හෝ විෂයය භාර අමාත්‍යවරයාගේ හෝ මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ වගකීමක් නොවන බව අවධාරණය කරන්න කැමතියි.

මෙහිදී සවුදි රියාල් 3371.50ක් එනම්, ශ්‍රී ලංකා රුපියල් 140,041ක් බැඟින් වන්දනාකරුවන් 600 දෙනෙකුගෙන් රුපියල් මිලියන 84ක් පමණ එකතු කිරීමත්, එම මුදල් එකතු කිරීමේදී පිළිගත් සංචාරක මෙහෙයුම්කරුවන් විසින් රිසිට් පත් නිකුත් කර ඇති බවත්, එම මුදල් පිළිවෙළින් සවුදි අරාබි රාජධානියේදී ආහාර පාන ඉඳුම් හිටුම් සහ සවුදි රජයට ගෙවීමට නියමිත වූ මුදල් සහ තවත් අවශ්‍යතාවන් සඳහා ගෙවීමට නියමිත වූ මුදල් බවත්, මෙම මුදල් එකතු කිරීම කිසිම අවස්ථාවක දෙපාර්තමේන්තුව හෝ හජ් කමිටුව නොකරන බවත් පැවසිය යුතුයි.

ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ මාර්ගෝපදේශයන්ට අනුව වර්ෂ 2013දී එක් වන්දනාකරුවෙකුගෙන් අවම පරිපාලන ගාස්තුව ලෙස රුපියල් දෙදහසක් අය කිරීමට උපදෙස් ලබා දී ඇති නමුත් මෙම වර්ෂයේදී එකී අවම ගාස්තුව රුපියල් හාරදහස දක්වා ඉහළ දැමීමට හජ් කමිටුව තීරණය කරනු ලැබුවේ සුවිශේෂී වූ පසුවිපරම් ක්‍රියාවලියක් ශ්‍රී ලංකාවේදී මෙන්ම සවුදි අරාබි රාජ්‍යයේදී පවත්වාගෙන යාම පිණිසයි. මෙම ක්‍රියාවලිය තුළින් වංචනික සංචාරක මෙහෙයුම්කරුවන් පිටුදැකීමටත්, ඉතාමත් හොඳම සංචාරක මෙහෙයුම්කරුවන් සමඟ වන්දනාකරුවන්ට තම තමන්ගේ වන්දනාමාන කටයුතු නොපිරිහෙළා ඉටු කර ගැනීමට අත්වැලක් සැපයීමට හජ් කමිටුවට ශක්තිය ලැබුණා. මේ තුළින් වර්ෂ ගණනාවක් තිස්සේ වංචාවන් සිදු කරමින් කටයුතු කරනු ලැබූ වංචනික සංචාරක මෙහෙයුම්කරුවන් හඳුනා ගැනීමට සෑම බැතිමතෙකුටම අවස්ථාව හිමි වුණා. ඒ තුළින් මෙකී වංචනික සංචාරක මෙහෙයුම්කරුවන්ට බැතිමතුන් ඒකරාශි කර ගැනීමට පවා නොහැකි වුණා. ඔවුන් තමයි මේ පදනම් විරහිත චෝදනා ඉදිරිපත් කරමින් මාධ්‍ය සංදර්ශන පවත්වන්නේ.

ආපසු ගෙවනු ලබන රුපියල් 25,000ක තැන්පත් මුදලක් සෑම වන්දනාකරුවෙකුම දෙපාර්තමේන්තුව තුළ තැන්පත් කළ යුතු බවට හජ් කමිටුව තීරණය කරනු ලැබුවේ, හුදෙක් ව්‍යාජ ලියා පදිංචි කිරීම් අවම කිරීම පිණිස වන්දනාකරුවන් පෙලඹවීමටයි. එම මුදල සඳහා දෙපාර්තමේන්තු රිසිට් පතක් ලබා දුන්නා. එකී තැන්පතුව වන්දනා සංචාරක මෙහෙයුම් ආයතන හරහා නැවතත් වන්දනාකරුවන්ට ලබාදීමට කටයුතු කරනු ලබනවා. මෙම ක්‍රමවේදය වන්දනා සංචාරක මෙහෙයුම්කරුවන්ගේ එකඟතාව මත නැවතත් හඳුන්වා දී ඇති බවත් සිහිපත් කරන්න කැමතියි. මෙම ආපසු ගෙවනු ලබන තැන්පත් මුදල වන්දනාකරුවන්ට හෝ සංචාරක මෙහෙයුම්කරුවන් මඟින් නැවත ඉල්ලා සිටීමට ඔවුන්ට පුළුවන්.

මෙම අමාත්‍යාංශය අපකීර්තියට පත් කිරීමේ අරමුණින් නඟන්නා වූ අභූත චෝදනා අතර ලියා පදිංචි ලේඛන වංචා සහගත අයුරින් වෙනස් කරනු ලබන බව පවසන නමුත්, පරිගණක ආශ්‍රිත ක්‍රමවේදයන් හමුවේ මෙකී ලියා පදිංචි කිරීමේ ක්‍රමවේදය කිසිවෙකුටත් වංචා කිරීමට ඉඩක් හෝ අවස්ථාවක් තබා නැති බව පවසන්නට ඕනෑ.

වාර්ෂික හජ් වන්දනා කටයුතු විධිමත්ව පවත්වා ගැනීම සඳහා ස්වකීය ආයතනික කටයුතු මැනවින් මෙහෙයවීමට හජ් කමිටුව ක්‍රියා කරමින් පවතී. එමඟින් වන්දනාකරුවන් සහ වන්දනා සංචාරක මෙහෙයුම්කරුවන් අතර ඉතා හොඳ ආචාර ධර්ම, එකිනෙකා අතර වගකීම් මෙන්ම වගවීම් ද මැනවින් ප්‍රවර්ධනය කිරීමට හජ් කමිටුව විසින් කටයුතු කරනු ලබයි. යහපත් ක්‍රියාවන් හෙළා දකින්නාවූ සියලුදෙනා ද, අප කෙරෙහි අපහාසාත්මකව කටයුතු මෙහෙයවන්නාවූ බංකොලොත් පිරිස් ද සර්වබලධාරී අල්ලාගේ නාමයෙන් හෙළා දැකීමට අපි කටයුතු කරන්නෙමු.

විෂය භාර අමාත්‍යවරයා ලෙස මගේත්, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඇතුළු කාර්ය මණ්ඩලයේත්, මවිසින් පත් කරනු ලැබූ වෘත්තීයවේදීන් සහ සිවිල් රාජ්‍ය සේවකයන්ගෙන් සමන්විත හජ් කමිටු සාමාජික මහත්වරුන්ගේත් කීර්ති නාමයට හානි පැමිණ වීමේ අදහසින් විවිධ වූ අභූත චෝදනා ඉදිරිපත් කරන්නා වූ බංකොලොත් සංචාරක මෙහෙයුම්කරුවන්ට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා නීති උපදෙස් ලබා ගැනීමට කටයුතු කරනු ලබන බව මෙම උත්තරීතර සභාව හමුවේ පවසනවා.

පුද්ගලිකව උපහාසයන් සහ අපහාස කිරීම්වලට භාජන වීම ඉතාම කනගාටුදායක අවාසනාවන්ත තත්ත්වයක්. එවැනි දේ හජ් වන්දනාකරුවන්ට පහසුකම් සැපයීමක් නොවෙයි. එය ඔවුන්ගේ ජීවිතයේ එක් වතාවක් පමණක් ඉටු කිරීමට අවස්ථාව ලැබී ඇති ශුද්ධ වූ අවස්ථාවන් ගිලිහී යාමට උදවු කිරීමක් ලෙසයි මම දකින්නේ. මෙසේ හජ් වන්දනාකරුවන් තුළ අල්ලා දෙවියන් කෙරෙහි පවතින භක්තිය හීන කිරීම පිණිස ගොතනු ලබන කට කතා, අභූත චෝදනා මෙන්ම ඒවාට දායක වීම තුළින් සිදු විය හැකි හානිය ඉතා බොහෝ බව මොවුන් අවබෝධ කර ගත යුතුව තිබෙනවා. දේශපාලන වශයෙන් බංකොලොත් වූ ඉතා සුළුතරයකගේ මෙවන් උත්සාහයන් හමුවේ රජයක් ලෙස ශ්‍රී ලාංකීය මුස්ලිම් බැතිමතුන්ගේ ශුභ සිද්ධිය උදෙසා නිර්භීතව කටයුතු කරනු ලබන බව මෙම උත්තරීතර සභාව හමුවේ ප්‍රකාශ කරමින් මගේ කතාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තූතියි. මේ වන විටත් කාල සීමාව ඉක්මවා ගොස් තිබෙනවා. නමුත් මන්ත්‍රීවරුන් කීපදෙනෙක්ම මගෙන් අවස්ථා ඉල්ලා තිබෙනවා. පළමුවෙන්ම, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා අවස්ථාවක් ඉල්ලා තිබුණා.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

ගරු කථානායකතුමනි, ඔබතුමාගේ අවසරය පරිදි මවිසින් පොදු වැදගත්කමක් තිබෙන කරුණක් මතු කරනු ලබනවා.

[ගරු බිමල් රත්නායක මහතා]

ඒ, මෑතකදී සම්මත කරන ලද, "පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන චර්යා ධර්ම සංග්‍රහය" පිළිබඳවයි. ගරු කථානායකතුමනි, එහි VI වන කොටසේ, "මන්ත්‍රීවරුන්ගේ මූල්‍යමය බැඳියාවන් පිළිබඳ ලේඛනය සහ එම බැඳියාවන් අනාවරණය කිරීම සහ ප්‍රකාශයට පත් කිරීම" මැයෙන් කරුණු සඳහන්ව තිබෙනවා.

ප්‍රථමයෙන් ඔබතුමා ඇතුළු පාර්ලිමේන්තුවට ස්තුතිවන්ත වෙනවා, මෙවැනි චර්යා පද්ධතියක් මේ පාර්ලිමේන්තුවේ නීතිගත කිරීම පිළිබඳව. ගරු කථානායකතුමනි, එහි 14වැනි වගන්තියේ මෙහෙම තිබෙනවා;

> "..."මන්ත්‍රීවරුන්ගේ මූල්‍යමය බැඳියාවන් පිළිබඳ ලේඛනය" යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින්මතු "ලේඛනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ලේඛනයන් මහ ලේකම්වරයා විසින් ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව විසින් නිශ්චය කරනු ලබන යම් ආකෘතියකින් සහ ආකාරයකින් යුක්තව පවත්වාගෙන යා යුතු ය."

එහි 16 වැනි වගන්තියේ මෙහෙම තිබෙනවා;

> "මන්ත්‍රීවරුන් කෙරෙහි මහජන විශ්වාසය වැඩි කරනු පිණිස මන්ත්‍රීවරුන් විසින් ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ද ඇතුළු එම මන්ත්‍රීවරුන්ගේ ව්‍යාපාර සම්බන්ධතා සහ මූල්‍යමය බැඳියාවන් අනාවරණය කළ යුතු ය."

අවසාන කරුණ මෙයයි, ගරු කථානායකතුමනි. ඒක ඉතාම වැදගත්. එහි 19වැනි වගන්තයේ මෙසේ තිබෙනවා;

> "පාර්ලිමේන්තුවේ හෝ එහි යම් කාරක සභාවක සලකා බැලීමට භාජනය වී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් මන්ත්‍රීවරයෙක් කෙළින්ම හෝ අන්‍යාකාරයෙන් යම් පෞද්ගලික හෝ මූල්‍යමය බැඳියාවක් ඇති අවස්ථාවක, එම මන්ත්‍රීවරයා විසින් එම බැඳියාව මන්ත්‍රීවරුන්ගේ අදාළ ලේඛනයේ ලියාපදිංචි කර ඇත්තේ වුව ද, එය නොතකා, එම මන්ත්‍රීවරයා විසින් එම බැඳියාවේ ස්වභාවය ප්‍රකාශ කළ යුතු අතර, ඔහු විසින් මේ ඡේදයේ නියම කොට ඇති ආකාරයට ප්‍රකාශය කර ඇත්නම් මිස පාර්ලිමේන්තුවේ හෝ එහි යම් කාරක සභාවක ඒ සම්බන්ධයෙන් කරනු ලබන කිසිම විවාදයකට ඔහුට සහභාගී විය නොහැකි ය."

ගරු කථානායකතුමනි, මා මේ කරුණ ඉදිරිපත් කරනු ලැබුවේ මේ හේතුව නිසායි. මේ ආචාර ධර්ම පද්ධතිය අපි ක්‍රියාත්මක කරනවා, පසුගිය අප්‍රේල් 15 සිට. පළමුවැනි කරුණ විධියට මම දැන ගන්න කැමැතියි, මේ ආකාරයේ මූල්‍යමය බැඳියාවක් ඇති ලේඛනයක් අපි හඳුන්වා දී තිබෙනවාද කියලා. ගරු කථානායකතුමනි, දෙවැනි කරුණ මෙයයි. මේකට අනුව මූල්‍යමය බැඳියාවන් තමාට හෝ පවුලේ අයට තිබෙනවා නම් අඩු ගණනේ විවාදයකටවත් සහභාගි වෙන්න එපා කියන එක තමයි තිබෙන්නේ. මම ඔබතුමාට උදාහරණයක් වශයෙන් මේ සභාවේ නැති කෙනෙක් ගැන කියන්නම්. අපි හිතමු, SAITM එකේ නිර්මාතෘ නෙවිල් ප්‍රනාන්දු මැතිතුමා කියලා. එතුමා හිටපු මන්ත්‍රීතුමෙක්. නැවත එතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා උසස් අධ්‍යාපන ඇමතිවරයා හෝ උසස් අධ්‍යාපන රාජ්‍ය ඇමතිවරයා වශයෙන් පත් වුණොත් එවැනි කෙනෙකුට බලයක්, අයිතියක් තිබෙනවාද ඒ හා සම්බන්ධ අණ පනත් සම්මත කරන්න හෝ ඒ සම්බන්ධ වාද විවාදවලට සම්බන්ධ වෙන්න? මොකද, ඒ හා සමාන සිද්ධියකට අපි මෙතැන මුහුණ දුන්නු නිසායි මම එහෙම අහන්නේ.

මෙය ඉතා වැදගත් කරුණක් පාර්ලිමේන්තුව ශක්තිමත් කිරීම පැත්තෙන්. ඒක නිසා මම ඔබතුමාගෙන් ඉල්ලනවා, මෙය සම්පූර්ණයෙන් ක්‍රියාවට නැඟීමට අවශ්‍ය පියවර අධ්‍යයනය කරලා, නිලධාරීන් මාර්ගයෙන් එය ක්‍රියාවට නඟන්නට ඔබතුමා කටයුතු කරන්න කියලා.

ඒ වාගේම මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, විශේෂයෙන්ම අමාත්‍යවරු පත් කරද්දී මේ ගැන අවධානය යොමු කරන්න කියලා. ඒක පාර්ලිමේන්තුවට පිටින් කෙරෙන කාරණයක් බව ඇත්ත. මන්ත්‍රීවරයෙක් වුණාට පස්සේයි කෙනෙක් ඇමතිවරයෙක් වෙන්නේ. මන්ත්‍රීවරයා මෙවැනි මූල්‍යමය බැඳියාව පිළිබඳව ප්‍රකාශනයක් ඔබතුමාට කරලා තිබෙනවා නම්, ජනාධිපතිවරයාට සහ අගමැතිවරයාටත් වගකීමක් එනවා, ඒ නිශ්චිත ව්‍යාපාර ක්ෂේත්‍රයන්ට සම්බන්ධ පුද්ගලයන්ට ඒ අමාත්‍යාංශය භාර නොදී ඉන්න.

අන්න එවැනි නිර්දේශ පද්ධතියක් ඔබතුමාගේ පැත්තෙන් සකස් කරන්න කියන ඉල්ලීම කරනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි, ගරු මන්ත්‍රීතුමා. ඇත්තටම අනෙකුත් කාරක සභා සමඟ වරප්‍රසාද පිළිබඳ කාරක සභාව ස්ථාපිත කළේත් මේ සතියේ. ඒ නිසා ඒ අයට අවස්ථාවක් දෙන්න ඕනෑ. මේ කරුණු සියල්ල වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට ඉදිරිපත් කරලා; වැදගත් අදහස් ඉදිරිපත් කරලා, ඒ අනුව අවශ්‍ය පියවර ගන්න මම බලාපොරොත්තු වෙනවා. මීළඟට ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)

ගරු කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ගරු කථානායකතුමනි, පසුගිය ජූලි 7වැනි දා උතුරේ බොහෝ ප්‍රදේශවල කළු කොටි සැමරුමක් සිදු වුණා. පාරවල්වල කොටි ලාංඡන ඇඳලා, තාප්පවල ඒ සමරු වැකි ඇඳලා, ගුරුවරු දරුවන් සමඟ පාසල්වලින් එළියට ඇවිල්ලා, පාරේ පහන් පත්තු කරලා, මරාගෙන මැරෙන කොටි ත්‍රස්තවාදීන් සැමරුවා. ඒ විධියේ සැමරුමක් පැවැත්වුණා. ඒ අතරේ "ආවා" කල්ලිය වැනි විවිධ කල්ලි උතුරු ප්‍රදේශයේ බලවත් වෙනවා. ඒවා නිදහසේ සිටුවන විට උතුරේ ජන සමාජයේ නීතියේ ආධිපත්‍ය කඩාගෙන වැටිලා තිබෙනවා. ඒකේ ප්‍රතිඵලයක් මත, ඒ ආකාරයේ හේතුවක් මත තමයි විජයකලා මන්ත්‍රීතුමියගේ ඝාතනය වැඩි වුණාය කියන්නේ. ගරු කථානායකතුමනි, මේ විධියට කළු කොටි සමරමින්, නීතියේ ආධිපත්‍යය බිඳ වැටීමෙන්, උතුරේ ප්‍රදේශ අරාජිකත්වයට ඇදලා දමන්න, ත්‍රස්තවාදීන්ට නිදහසේ නැවත නැඟිටින්න ඉඩ කඩ හදලා දෙන්නේ මොන විධියේ අරමුණක් පෙරදැරි කරගෙනද කියලා මම දැනගන්න කැමැතියි. දැන් පොලීසියේ නිවාඩු තහනම් කරලා තිබෙනවා. නීතිය ක්‍රියාත්මක කරගන්න බැරුව පොලීසිය අසරණ වෙලා. ඒ අතරේ උතුරු ප්‍රදේශයේ සේවයේ යෙදී සිටින හමුදාවේ සියයට 25ක් අඩු කරනවා. ඒ අතරේ රටේම හමුදා කඳවුරු 100ක් ගැලවෙනවා. උතුර සහ නැඟෙනහිර විතරක් හමුදා කඳවුරු ඉතා විශාල සංඛ්‍යාවක් ගැලවෙනවා. මෙහෙම කරන ගමන් තමයි හිටපු රාජ්‍ය අමාත්‍ය ගරු විජයකලා මහත්මිය කිව්වේ, එල්ටීටීඊය ඒ ප්‍රදේශවලට නැවත අවශ්‍යයි කියලා.

ගරු කථානායකතුමනි, මගේ ප්‍රශ්නය මෙයයි. හිටපු රාජ්‍ය අමාත්‍ය විජයකලා මහත්මිය ඊයේ ප්‍රකාශයක් කරලා තිබෙනවා මම මාධ්‍යවලින් දැක්කා. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරපු බව එතුමිය ඒ ප්‍රකාශයෙන් පිළිගෙන තිබෙනවා. එතුමියගේ ප්‍රකාශය මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය වෙලාද නැද්ද කියලා ඔබතුමා නීතිපතිතුමාගෙනුත් අදහස් විමසුවා. හිටපු රාජ්‍ය අමාත්‍ය විජයකලා මහත්මියම පිළිගෙන තිබෙනවා, එතුමියගේ ප්‍රකාශය මඟින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය වීමක් සිදු වුණාය කියලා. එතකොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය

කරපු බව එතුමියම පිළිගන්නවා නම්, එතුමියට තව දුරටත් මන්ත්‍රී ධුරයේ රැඳෙන්න අයිතිවාසිකමක් තිබෙනවාද? නීතිපතිතුමාගේ නිර්දේශය ඔබතුමාට ලැබී තිබෙනවාද? නැත්නම්, ලැබෙන්නේ කවදාද? දෙමළ ජනතාවගේ අයිතිවාසිකම් ගැන කථා කරනවා නම්, අපි ඒක වරදක් කියලා කියන්නේ නැහැ. දෙමළ ජනතාවට යම් විශේෂ අසාධාරණයක් වෙලා තිබෙනවා නම් ඒ වෙනුවෙන් කථා කරනවා නම්, ඒක අපි කවදාවත් හෙළා දකින්නේ නැහැ. හැබැයි, ත්‍රස්තවාදය බලසම්පන්න කරන්න කටයුතු කිරීම බලවත් වරදක්. ගරු කථානායකතුමනි, එම නිසා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එතුමියම පිළිගන්නවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කළා කියලා. එහේ කළු කොටි සමරනවා, හමුදාවේ සියයට 25ක් අඩු කරනවා. හමුදා කඳවුරු 100ක් ගලවනවා. මේ සියල්ලම වෙන අතරේ, බෙදුම්වාදී ත්‍රස්තවාදයට උඩ ගෙඩි දෙන්න එතුමියට හෝ වෙන කෙනෙකුට හෝ බැහැ කියන කරුණ සනාථ කරමින් ඔබතුමා ඔබතුමාගේ තීරණය දෙන්න.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පැහැදිලි කළා, බොහොම ස්තුතියි. මම පළමුවෙන්ම කියන්න කැමැතියි, උතුරේ ආරක්ෂක තත්ත්වය සම්බන්ධයෙන් කථානායකවරයා විසින් නොව ගරු අග්‍රාමාත්‍යතුමා විසින් පැහැදිලි කරාවි කියලා. දෙවන කරුණ තමයි, රාජ්‍ය අමාත්‍යවරිය විසින් කරපු කථාව. අද සභාවේ කථා කිරීමට ප්‍රථම උදේම මම ඒ සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගත්තා. මට ඒකාධිපතියෙකු ලෙස ක්‍රියා කරන්න බැහැ. ඒ පිළිබඳව නීත්‍යානුකූලව මම කටයුතු කළ යුතුයි. ඒ අනුව, අදාළ නීති අංශ විමසා නීතිපතිතුමාට යොමු කරලා තිබෙනවා. නීතිපතිතුමා ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වාගෙන යනවා. එකී පරීක්ෂණයේ වාර්තාව ලැබුණාට පසු අවශ්‍ය පියවර ගන්න මට පුළුවන්. සෑම දෙයක්ම මම කරන්නේ පක්ෂ නායකයන්ගේ අනුමැතිය ඇතිවයි. ඒ වාර්තාව අද ලැබෙයිද, ලබන සතියේ ලැබෙයිද කියා මට කියන්න බැහැ. නමුත් මට වාර්තාව ලැබුණු වහාම පාර්ලිමේන්තුවට කතා කරලා, අවශ්‍ය පියවර ගන්නවා. මට කරන්න පුළුවන් වෙන්නේ එපමණයි. හැබැයි, ගතහැකි වැඩිම - maximum - ක්‍රියාමාර්ගය ගැනීම සඳහා තමයි මම එදා ක්‍රියා කළේ. බොහොම ස්තුතියි. අපට මේ ගැන දීර්ඝ විවරණයක් අවශ්‍ය වෙන්නේ නැහැ.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු කථානායකතුමනි, බොහොම ස්තුතියි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා මට ස්තුති කළේ නැති වුණත් කමක් නැහැ. මොකද, ඒක මගේ යුතුකමක් නේ. ඒකට බොහොම ස්තුතියි. [බාධා කිරීමක්] මොකක්ද, ගරු මන්ත්‍රීතුමා?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
මට විනාඩියක් ලබා දෙන්න.

ගරු කථානායකතුමනි, ඔබතුමා පියවර ගනු ලබන බව ගැන සඳහන් කළා. ඒ ගැන ස්තුතිවන්ත වනවා. ආරක්ෂක අමාත්‍යවරයා තමයි අර මම කියපු හමුදා කතන්දර ගැන හොයලා බලන්න ඕනෑ. මම ඔබතුමා මාර්ගයෙන් ඉල්ලීමක් කරනවා, හමුදා කඳවුරු 100ක් ගලවලා,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක මම refer කරන්නම්. ඒක මට අයිති කාර්යයක් නොවෙයි.

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ඒක මම පිළිගන්නවා.

හමුදාව සියයට 25ක් අඩු කළාම, හමුදාවේ මැද පෙළේ නිලධාරීන්ට උසස්වීම් ලැබෙන්නේ නැහැ. විශාල ආතතියක් අද හමුදාවට තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා පළමු වතාවේ ඒ ගැන සඳහන් කළා. ඒ නිසා ඒ report එක දෙවතාවක් දාන්න ඕනෑ නැහැ. ගරු මන්ත්‍රීතුමා මම ඒ කාරණය ඉදිරිපත් කරන්නම්.

ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ඊයේ රාත්‍රියේ ඉන්ධන මිල වැඩිවීමක් ප්‍රකාශයට පත් කළා. 92 Octane පෙට්‍රල් ලීටරයක් රු. 137 සිට 145 දක්වා රුපියල් අටකින්ද, 95 Octane පෙට්‍රල් ලීටරයක පවතින මිල රුපියල් 148 සිට 155 දක්වා රුපියල් හතකින්ද, ඩීසල් ලීටරයක් රුපියල් 109 සිට රුපියල් 118 දක්වා රුපියල් නවයකින්ද, සුපර් ඩීසල් ලීටරයක් රුපියල් 119 සිට 129 දක්වා රුපියල් දහයකින්ද වැඩි වුණා. ඊයේ මධ්‍යම රාත්‍රී 12.00 සිට තමයි මෙය ක්‍රියාත්මක වුණේ. ඊයේ මධ්‍යම රාත්‍රී 12.00 සිට petrol shedsවලින් මේ මිලට තමයි තෙල් විකුණා දමනු ලැබුවේ. හැබැයි, දැන් ජනාධිපතිවරයා විසින් තෙල් සංස්ථාවට නියෝගයක් ලබා දී තිබෙනවා, පරණ මිලටම තෙල් ලබා දෙන්න කියලා. ඒ නිසා පළමුකොටම අපි දැන ගන්න ඕනෑ, තෙල් මිල වැඩි කිරීම ආණ්ඩුව,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමනි, අපි ඒ කාරණය ගරු බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාට refer කරමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඔව්, ඒ නිසා තමයි ගරු කථානායකතුමනි,-

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන සංවිධායකතුමාට පුළුවන්නේ ඒක බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාට යොමු කරන්නට. මොකද, අද අපට වැදගත් කරුණු කිහිපයක්ම සාකච්ඡා කරන්නට තිබෙනවා. ඒ කරුණ බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යතුමාට refer කරන්නම්. [බාධා කිරීමක්] කවුද ඒ පාර්ලිමේන්තුවේ-

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, ශරීරය වර්ධනය වුණාට, කට මුඛරි වුණාට මොළය වර්ධනය නොවුණාම ඇති වෙන ප්‍රශ්න, මේ පාර්ලිමේන්තුවේදී සිද්ධ වෙනවා. එම නිසා අපි ඒවා ඒ තරම් ගණන් ගන්නේ නැහැ. පොඩි බබාලාට සුප්පුවක් කටේ ගහලා කියන්නට ඕනෑ කරුණු ඇවිල්ලා මේ සභාවේදී කියනවා. එම නිසා අපි ඒවා ඒ තරම් ගණන් ගත යුතු නැහැ ගරු කථානායකතුමනි. හරි ළාමක, -මෝරලා නැති- කට වාචාලකමට දොඩවන මහත්වරු ඔහේ විගඩම් කරනවා. මේ සභාව සහ ගැලරියේ සිට පාසල් දරුවන් බලාගෙන ඉන්නවා. තොටිල්ලේ දාලා නළවන්නට ඕනෑ බබෙක්.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අපි අදාළ කාරණය refer කරමු.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, මම දැන් ඔබතුමාගෙන් දැනගන්නට කැමැතියි, මේ තෙල් මිල වැඩි වීම -[බාධා කිරීමක්] දැක්කා නේ ගරු කථානායකතුමනි? මොළයේ අමාරුවක් තිබෙනවා ගරු කථානායකතුමනි. මම දන්නවා පවුලටම තිබෙන ලෙඩක්, ඕක. [බාධා කිරීමක්] ඒක මම කියන්නේ නැහැ. නංගිට වුණේ මොකක්ද, අම්මාට වුණේ මොකක්ද, -[බාධා කිරීමක්]

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුවේ ගෞරවය ආරක්ෂා කිරීමට හැමදාම බණ කියන්නට අමාරුයි. මේ සභාව නැරඹීමට පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් පැමිණ සිටිනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
පවුලටම මොළයේ අමාරුවක් තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
"ගරු මන්ත්‍රීතුමා" කියන ආමන්ත්‍රණයට හානි කර ගන්නට එපා ගරු මන්ත්‍රීතුමනි [බාධා කිරීමක්] ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා, කියන්න. [බාධා කිරීමක්]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම දන්නවා අම්මත් පිස්සන්කොටුවේ හිටියා, නංගිත් පිස්සන්කොටුවේ හිටියා, -

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මේක වාදයක් කර ගන්නට බැහැ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මම මේවා කියන්නට හිටියේ නැහැ. ලජ්ජයි. [බාධා කිරීමක්] වාඩි වෙන්න. ලජ්ජයි, ගරු කථානායකතුමනි. මම මේවා කියන්නේ නැහැ. නමුත් මම දන්නවා ඔය පවුලටම ඔය ලෙඩේ තිබෙනවා කියලා.

ගරු කථානායකතුමනි, එක ප්‍රශ්නයක් තමයි වැඩි මිලට තෙල් ගත්තු අයට ඒ සල්ලි ආපහු දෙනවාද?

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒක මට කියන්නට අමාරුයි.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ඇයි, ගරු කථානායකතුමනි, ප්‍රශ්නයක් තිබෙනවානේ? [බාධා කිරීමක්] සමහර අය වැඩි මිලට තෙල් ගහලා තිබෙනවා.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඒ හැම එකම මගේ ඇහට දාන්නට එපා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
වැඩි මිලට තෙල් ගහපු අයට ඒ සල්ලි ආපහු දෙනවාද? ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා ගන්නා තීරණය මොකක්ද? ඒ වාගේම, මේකට කැබිනට් මණ්ඩලයෙන් අනුමැතියක් ගත්තාද? ඒක දෙවෙනි එක. තුන්වෙනි එක තමයි, තෙල් සංස්ථාවෙන් තෙල් මිල වැඩි කරලා තිබියදී ජනාධිපතිවරයා නැවත අඩු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේ ද,ඒ මොකක්ද කියලා ආණ්ඩුව මේ පාර්ලිමේන්තුවට ප්‍රකාශයක් කළ යුතුයි.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ප්‍රධාන සංවිධායකතුමනි, ඒ කාරණය බනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යවරයාට යොමු කරන්න.

මීළඟට, ප්‍රධාන කටයුතු ආරම්භයේදී යෝජනා.

පාර්ලිමේන්තුවේ රැස්වීම්
பாராளுமன்ற அமர்வு
SITTINGS OF THE PARLIAMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
Sir, on behalf of the Leader of the House of Parliament, I move,

"That notwithstanding the provisions of Standing Order No. 8 of the Parliament and the motion agreed to by Parliament on 20.06.2018, the hours of sitting of Parliament on this day shall be 10.00 a.m. to

12.30 p.m. and 1.30 p.m. to 6.30 p.m.. At 11.00 a.m., Standing Order No. 8(5) of the Parliament shall operate. At 6.30 p.m., Mr. Speaker shall adjourn the Parliament without question put."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

වරප්‍රසාද යෝජනා
சிறப்புரிமைப் பிரேரணைகள்
PRIVILEGE MOTIONS

2018 ජූනි 21 දින "ලංකාදීප" වාර්තාව
2018 யூன் 21ம் திகதிய "லங்காதீப" அறிக்கை
"LANKADEEPA" REPORT OF 21ST JUNE, 2018

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

Sir, on behalf of the Leader of the House of Parliament, I move,

"That the question of privilege arising out of the matter raised by the Hon. (Dr.) Wijeyadasa Rajapakshe, M.P. on 22nd June, 2018 in Parliament to the effect that his privileges have been infringed, be referred to the Committee on Ethics and Privileges under Standing Order No. 118 of the Parliament."

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

කල්තැබීම
ஒத்திவைப்பு
ADJOURNMENT

ගරු ගයන්ත කරුණාතිලක මහතා
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.
வினா எடுத்தியம்பப்பெற்றது.
Question proposed.

ගරු කථානායකතුමා
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව ඉදිරිපත් කිරීම, ගරු එම්.ඒ. සුමන්තිරන් මන්ත්‍රීතුමා. ඊට පෙර ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෙක්කලනාදන් මහතා] මූලාසනාරූඪ විය.

අතන්පිටකු, මාණ්පුමිකු සභානායකර් අවර්කළ් අක්කිරාසනත් තිනින්රු අකලවේ, කුළුක්කළින් පිරතිත් තවිසාළර් අවර්කළ් [මාණ්පුමිකු සෙල්වම් අටෙක්කලනාතන්] තලෙමෙ වකිත්තාර්කළ්.

Whereupon THE HON. SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The Hon. M.A. Sumanthiran, please.

පළාත් සභා මැතිවරණ නීති ප්‍රතිසංස්කරණ
மாகாண சபைகள் தேர்தல்கள் சட்டச் சீர்திருத்தங்கள்
REFORMS TO PROVINCIAL COUNCILS ELECTION LAWS

[11.23a.m.]

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Deputy Chairman of Committees, I will move the following Adjournment Motion:

"Whereas the terms of office of three Provincial Councils came to an end in October, 2017.

And whereas no election to the said three councils have been conducted to date owing to the fact that the Provincial Councils Elections Act was amended in order to introduce reforms to the electoral process.

And whereas three more Provincial Councils will end their respective terms of office by October 2018.

No election to any Provincial Council can be held due to the fact that the electoral reforms are not yet complete.

An urgent priority has arisen to complete the electoral reforms so that the franchise of the people of the several provinces are not denied any further.

We urge the Government to complete the electoral reforms to the Provincial Councils Election laws immediately without any further delay.

And if it is not possible to complete the said reforms within the next two months, we urge that the Provincial Councils (Amendment) Act, No. 17 of 2017 be repealed immediately so that elections to the Provincial Councils can be held without any further postponement."

Sir, I think it is important to set out the background to the present situation. After this Government took office in August, 2015, several reform processes were undertaken. There were important reforms to the Constitution that were pledged and in January, 2016, a Resolution was presented to Parliament to appoint a Constitutional Assembly and undertake that task of drafting a Constitution for this country. That was adopted unanimously by this House on the 09th of March, 2016.

There were three important issues that were identified in that particular process: one was to address the national issue, to finally settle the issue that had plagued this country for 70 years by proper devolution of powers to provinces; secondly, to address the issue of the Executive Presidency and to make a decision with regard to the pledges given to this country continuously prior to every Presidential Election that the Executive Presidency would be abolished and thirdly, to reform the electoral laws.

Since 1978 this country has been using the Proportional Representation System and after several

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

years, various shortcomings of this System were identified. The most important of them being that there is no Member of Parliament who is accountable to a particular constituency. All Members of Parliament represent a district or another and in that context it is difficult to identify Members who are accountable to the people of particular constituencies. So, a promise was given that the electoral system would be reformed.

There was also allegation with regard to preferential voting system in the PR System and therefore, in that Constitutional Assembly process, the Steering Committee started discussing the reforms to electoral process as the first item. One or two Parties insisted that that must be urgently addressed and so that issue was taken up as the first matter. In those discussions, an alternate proposal was put forward that is extant in some countries in the world known as the "Mixed Member Proportion" - MMP - which is meant to be an overall PR System. Within it you accommodate persons who are elected from specific constituencies and in order to maintain that overall proportional representation, a certain percentage of Members are then appointed. So, it was necessary to identify the ratio between those Members who would be directly elected by constituencies and those Members who would be appointed as a compensatory PR so that the overall representation in Parliament would be in accordance with the vote that was cast by the people.

In those discussions several models were examined and at one stage, there was a policy decision taken, that Parties were generally in agreement with the MMP with 60:40 ratio: 60 to come from constituencies directly and the other 40 to be appointed so that the entire 100 per cent would be proportionally representative. Thereafter, there were disputes with regard to various details such as cutoffs, bonus, et cetera. The Steering Committee of the Constitutional Assembly left it as it was with that position on the principle of MMP - 60:40 - and then we moved on to discuss other issues.

By this time, there were local authorities - several municipal councils, urban councils and pradeshiya sabhas - that had run their terms and election to those local authorities was pending and there was a long delay in holding those elections.

Since there was an overall agreement that the election to Parliament would be on MMP - 60:40, it was decided to introduce the same system to the other two tiers, namely, the provincial councils and the local authorities also. So, the Local Authorities Elections Law was amended introducing the MMP principle and making it 60:40 - 60 from wards and the balance 40 as a compensatory PR. Similarly, the Provincial Councils Elections Act was also amended.

As I have said in the Motion, three councils ended their terms in October last year and the elections were due to those three councils. But in keeping with these overall general agreement of a Mixed Member Proportion system and a 60:40 ratio, the Provincial Councils Elections Act was sought to be amended. Now, at that stage, some political Parties insisted that 60:40 ratio will not be acceptable to them and that it must be made 50:50. So, that change - 50:50 - was made to Both in the Local Authorities Election Law reform and the Provincial Council Election reform, there was no cut-off that was introduced and in accordance with the Amendment that had been effected to the Local Authorities Elections Act, elections to all the local authorities, except one, were held in the country on the 10th of February this year. The Government said, " Let us have the elections to local authorities under the new system on an experimental basis and see the results, see what we get." This was what the Hon. Prime Minister repeatedly said, “on an experimental basis.”

Hon. Deputy Chairman, when results came for the local authorities elections that was held on the 10th of February this year, we found that almost half the number of councils did not have a majority for any single party to form an administration. There was a serious issue of stability to form an administration. In the next few months, we found, we saw for ourselves, the difficulties in forming administrations to those councils. So that experiment, the so-called experiment of a 60:40 MMP without a cut-off and without bonus in order to achieve stability was exposed. It was shown to be a failure.

In the meantime, in the Provincial Councils Elections Law reform which this Parliament approved and was certified on the 22nd of September, 2017 - I refer to the Provincial Councils Elections(Amendment) Act, No. 17 of 2017 - it was provided that a Delimitation Committee would be tasked with proposing boundaries to electorates for the provincial councils and thereafter that report would be submitted to Parliament.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ சுமந்திரன் அவர்களே, உங்களுக்கு ஒதுக்கப் பட்டிருக்கின்ற 15 நிமிடங்களும் நிறைவடைந்துவிட்டன. நீங்கள் மேலதிகமாக நேரத்தை எடுக்கிறீர்களா?

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
I am still moving the Adjournment Motion. So, there cannot be a time limit.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Okay.

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
The Committee should submit the report to the Minister who within two weeks should present it to Parliament. On the 14th of February, this year, the Committee submitted its Report to the Hon. Minister and he, within two weeks, presented it to Parliament. I refer to Section 3A of the Provincial Councils Elections Act, as amended by Act No. 17 of 2017. Subsection (11) of Section 3A of the Act states, I quote:

"The Committee shall submit its report to the Minister, who shall within two weeks of the receipt of such report, table it in Parliament for its approval by not less than two-thirds of the whole number of Members of Parliament (including those not present) voting in its favour."

And, Subsection (12) of Section 3A states:

"Where Parliament does not approve such report in terms of subsection (11) within one month of the tabling of the report, then the Speaker shall appoint a Review Committee, consisting of five persons representing the major communities and, headed by the Prime Minister."

Now, by the end of March this year, that one month had elapsed. Therefore, in terms of the law, Parliament had not approved the Report that was submitted to Parliament by the Minister in terms of Subsection (11) of the Act and therefore, it was obligatory on the part of the Speaker to appoint a Review Committee. That Review Committee had to make its report within two months. So, by the end of March, Parliament had not approved it. Therefore, by the end of May, the Report of the Review Committee should have come to Parliament but no Review Committee has been appointed and nothing has been done after the Hon. Minister presented the Delimitation Report to Parliament in February 2018. Five months have elapsed since the submission of the Delimitation Report to Parliament by the Minister.

That is why in the Motion, I have said that the reform process has not yet been completed. But, what is the effect of this whole process being deadlocked like this or being in limbo like this? The net effect is, when no elections are being held in the three Provincial Councils that completed their terms last year, and if this continues, the three more Provincial Councils which complete their terms in October this year, no election can be held for those three Provincial Councils also.

Periodical elections are the foundation of a democratic system. I have heard many times that holding periodical elections is not the only feature of democracy. That is true. But, that is the foundation. Without timely periodical elections, there cannot be democracy; it cannot be even called a democratic system. Here, we are faced with a situation where due to an amendment that was approved by this House by two-thirds majority and due to the fact that that is not being worked, elections are not being held and the franchise of the people of those three provinces have denied now for several months.

I think it is important that this House undo those knots that were put in place by ourselves in that Amendment Act, No. 17 of 2017 expeditiously so that elections can be held. Our experience with the Local Government Elections that were held in February, 2018 is that even 60:40 is not acceptable and will not result in stable institutions. How much worse will it be when you have a system of 50:50 ratio? No Provincial Council will be able to form an administration. So, that must be reviewed; that must be changed. An amendment must be brought in to this House to change that ratio. Our position is that it must be 70:30 if stable administrations are to be formed in the provinces. But, that must be discussed.

Here, we are in a situation where even the time prescribed by our own Act, which we approved in September last year has not been followed. We have not even debated the Delimitation Report within one month. That has not been accepted. And if it is not accepted, the law says, there must be a Review Committee which must submit a Report within two months. More than three months have lapsed beyond that and we do not have a Review Committee. So, we have a situation where by inaction of Parliament, elections to Provincial Councils are being delayed and long delayed. If the local authorities elections were held on an experimental basis, as I said before, that exposed the shortcomings of a 60:40 system. So, that must be remedied immediately and an acceptable ratio be found and we must immediately move forward and have the elections.

I have also said that if this process cannot be completed within the next two months, elections must nevertheless be held. Elections cannot be postponed or put off merely because we are unable to complete a reform process to the Election Law. That is totally unacceptable, that violates, that shakes the very foundation of democracy and that is why I move with respect that if within the next two months this reform process cannot be completed by consensus, then Provincial Councils Elections (Amendment) Act, No. 17 of 2017 must be repealed in order that elections are held on time. Already it is late, but elections must be held on time and then we can take our own cool time to discuss what is acceptable system of elections for the Provincial Councils.

Thank you.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
அடுத்து, வழிமொழிந்து உரையாற்றுவதற்காக எதிர்க் கட்சித் தலைவர் அவர்களை அழைக்கின்றேன்.

[11.45am.]

ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)
Thank you, Mr. Deputy Chairman of Committees.

I am happy to second the Motion that has been moved by the Hon. M.A. Sumanthiran, Member of Parliament. He has dealt, Sir, primarily with the issue of the elections not being held and discussed various steps that have been taken thus far and also discussed what needs to be done to ensure that democracy is functional in the provinces and that elections are held without undue further delay.

That, no doubt Sir, is a very serious issue which also raises the question of whether Governments in this country are seriously committed to democracy functioning in regard to provincial governance.

[ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා]

There has been a long-standing demand in this country in regard to the sharing of powers of governance. This has been invoked for a long time. In fact, I might mention that the first person in this country who talked in terms of arrangements that would ensure a credible sharing of powers of governance was the late Hon. S.W.R.D. Bandaranaike when he returned to this country in the 1920s. He delivered several speeches and wrote several articles advocating a system of governance that would enable the sharing of power; that would enable regions or provinces to be able to exercise powers of governance. It has been almost a century since that happened. That happened in the 1920s. Almost a century will pass in a few more years since that happened and we have not been able to have in place a credible power-sharing arrangement, an effective power-sharing arrangement where we can also ensure that elections are held at the proper time.

I propose, Sir, to use the little time that is available to me to address the issue of not merely holding the Provincial Council Election which has been dealt with fairly comprehensively by the Mover of the Motion, but I would also like to ensure that Provincial Councils are able to function effectively so as to serve the people in the provinces in terms of the powers vested in the provinces. That too is a very serious issue which needs to be addressed.

Provincial Councils, Sir, came about in this country in 1987, 1988 when there was the Thirteenth Amendment to the Constitution and it will be interesting for us to observe what happened after 1987 and 1988 when there was the Thirteenth Amendment. When the Thirteenth Amendment came about, the late President Jayewardene was the President of this country. He was succeeded by the late President Ranasinghe Premadasa. The late President Ranasinghe Premadasa being fully aware that the Thirteenth Amendment was inadequate to enable provinces to govern their areas effectively and to ensure that the people were really, truly the beneficiaries of provincial governance, appointed a Select Committee chaired by the late Hon. Mangala Moonesinghe, a leading Member of the Sri Lanka Freedom Party, to submit a report in regard to a new Constitution which would also encompass the issue of provincial governance. There was a Report submitted by the late Hon. Mangala Moonesinghe that took the constitutional arrangements pertaining to provincial governance far beyond the Thirteenth Amendment to the Constitution. That was followed, Sir, in 1994 when ex-President Chandrika Bandaranaike Kumaratunga became the President.

She came up with Proposals in 1995, 1997 and eventually there were Constitutional Proposals that were tabled in Parliament in 2000 August with the blessings of the present President, Hon. Maithripala Sirisena and the former President, Hon. Mahinda Rajapaksa, both of whom were Cabinet Ministers in the Cabinet of Madam Chandrika Bandaranaike Kumaratunga and they had approved the Proposals that came to Parliament in 2000 August.

Then, during President Mahinda Rajapaksa's time, there was the All Party Representative Committee - APRC - appointed by him and the Multi Ethnic Experts Committee appointed by him and statements and speeches made by him which talked of maximum possible devolution, which talked of power-sharing arrangements that are available in the other countries which he wanted the experts to study as a basis for their Proposals. He wanted people to determine their destiny in the areas in which they lived and there was the Hon. (Prof.) Tissa Vitarana's All Party Representative Committee - APRC - which came up with these Proposals. These are all, Sir, matters of record. I am mentioning these matters to show, Sir, that after the enactment of the Thirteenth Amendment, from the time of the enactment of Thirteenth Amendment until now, steps have been taken by every single President and every single Government to enact the new Constitution which contains proposals in regard to provincial governance that went far beyond the Thirteenth Amendment to the Constitution.

Hon. Sumanthiran, Sir, in the course of his speech, has referred to the steps that have been taken by the present Government: the Resolution adopted in 2016; the Constitutional Assembly being set up; the Steering Committee and the Subcommittees being set up; the work they have performed; the Reports they have submitted and the Debates that have taken place on those Reports. We have done all this.

Sir, one might ask the question as to why all the steps taken by the former Governments of President Premadasa, President Chandrika Bandaranaike Kumaratunga and President Mahinda Rajapaksa were not successful. It could probably be said that those governments were not in a position to muster a two-thirds majority. But, we are now in a position in this Parliament with an alliance within the two main Parties, though some Members of the SLFP and the UPFA are presently in the Opposition. We know that their thinking on this question has always been progressive. I can see the Hon. A.D. Susil Premajayantha looking at me; I am aware personally that, for instance, his thinking on this issue has always been progressive. We may be in a position; we are in a position to muster a two-thirds majority which will enable the enactment of a new Constitution within the framework of an undivided and perpetually indivisible country that will put this problem to an end; that will bring this issue to an end. Give this country the freedom to move forward. That is why, Sir, I think it is fundamental that we also address the question of what needs to be done to ensure that the failures of the former governments do not deter us under the new context in which we are.

There has been substantial consensus built around all the earlier proposals during President Premadasa's time, during President Chandrika Bandaranaike Kumaratunga's time and during President Mahinda Rajapaksa's time. We are able now in the present Parliament as presently constituted to take this process forward.

Sir, our country has no future unless we have a new Constitution which would end the conflict that has arisen

in this country as a result of the national question. In fact, in the last few days in Parliament, over a speech made by a State Minister, there has been a lot of agitation. Understandably, why is all this happening? All this is happening because there is no final resolution of the conflict and because we have not been able to frame a Constitution, which all of us can accept while every opportunity has existed to frame such a Constitution.

The late Hon. Bandaranaike, as I said Sir, in 1926 when he returned from Oxford, almost a century ago, suggested arrangements that could keep this country as a united, undivided country. That is what he wanted. He remained committed to that position, Sir, and he was the first Sinhalese leader who entered into a pact with a Tamil Leader, my Leader, the late Hon. S.J.V. Chelvanayakam, in order to give this country regional autonomy. The late Hon. Bandaranaike was the first Sinhalese leader who did that. Nobody else was able to do that. Today, I see that the late Hon. Bandaranaike's Party, the Party which he founded, the Sri Lanka Freedom Party is sought to be dispensed with and there is coming into existence a new political party called the *"Pohottuwa"* - the Sri Lanka Podujana Peramuna - which is said to be comprising of - I am not saying, "comprising of" I am saying, "said to be comprising of" - even some senior members of the SLFP. I want to raise a question in Parliament and raise it before the whole country as to how it can ever be possible for anyone to dispense with the Party founded by the late Hon. S.W.R.D. Bandaranaike in the 50s' when he resigned from the then UNP Government and crossed over to the Opposition. It was a Party which he led, a Party through which he governed, a Party through which several of his successors governed in this country; how that Party can be abandoned in favour of the new Party that came into existence just a couple of months ago?

What I think, Sir, is that Provincial Council Elections must be held. They are important, they cannot be delayed and they must be held early. But, before the Provincial Council Elections are held, to make provincial autonomy meaningful, something that will effectively give power to people at the provincial level, the new Constitution that we are proposing must be enacted addressing primarily the main issues referred to by the Mover of the this Adjournment Motion, the national question, provincial governance, provincial or regional autonomy, Executive Presidency and the new electoral reform process.

This proposed Constitution must be brought to Parliament and enacted by Parliament before the Provincial Council Elections are held. I find the Hon. Dinesh Gunawardena looking at me and listening to me very carefully. I am sure he is in agreement with me that we must bring a Constitution before the Provincial Council Elections are held without delaying the Provincial Council Elections and the Constitution must be passed giving the provinces real power, substantial power, as the Hon. Mahinda Rajapaksa said, "maximum possible devolution". People must be able to determine their destiny in the areas in which they live and we must adopt models of devolution that prevail in the other parts of the world. That I think, Sir, must happen even before the Provincial Council Elections are held.

So, my submission would be, Sir, that while I am in total agreement with this Motion, that democracy must be restored in the provinces and there must be early Provincial Council Elections and this tendency to give step-motherly treatment to provinces is unacceptable. I would also urge that the only way in which that can be ensured is by introducing the new Constitution that gives the provinces substantial power and ensures that elections are held in due time and that the people in the provinces as the beneficiaries of such power are able to govern themselves in the areas in which they live. Thank you, Sir.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Thank you very much. The next speaker is, the Hon. Karunarathna Paranawithana.

[අ.භා.12.04]

ගරු කරුණාරත්න පරණවිතාන මහතා (විද්‍යා, තාක්ෂණ, පර්යේෂණ, නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු සහ කන්ද උඩරට උරුමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான - விஞ்ஞான, தொழில்நுட்ப, ஆராய்ச்சி, திறன்கள் அபிவிருத்தி, தொழில் பயிற்சி மற்றும் கண்டி மரபுரிமைகள் பிரதி அமைச்சர்)
The Hon. Karunarathna Paranawithana - Deputy Minister of Science, Technology, Research, Skills Development and Vocational Training and Kandyan Heritage)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද මෙම විවාදයට එක්වීමට ලැබීම ගැන මම බෙහෙවින්ම සතුටට පත් වෙනවා. අද විවාදයේදී අපේ ප්‍රධාන අවධානය යොමු වන්නේ මැතිවරණය පැවැත්වීම සහ පළාත් සභා මැතිවරණයට අදාළ ඡන්ද ක්‍රමය මොකක්ද කියන කාරණය සම්බන්ධයෙනුයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ව්‍යවස්ථාදායක, විධායක සභාවට උගත් ලාංකිකයෙක් තෝරා ගැනීම සඳහා 1910දී මැතිවරණයක් පැවැත්වූ දවසේ ඉඳලා අවුරුදු 110කට ආසන්න කාලයක් තිස්සේ ලංකාවේ මැතිවරණ පවත්වා තිබෙනවා. පාර්ලිමේන්තු මැතිවරණ, පළාත් සභා මැතිවරණ, පළාත් පාලන මැතිවරණ, ජනාධිපතිවරණ ආදී වශයෙන් මැතිවරණ පවත්වා තිබෙනවා. ඒ මැතිවරණ සඳහා අපි විවිධ මැතිවරණ ක්‍රමත් යොදාගෙන තිබෙනවා. කේවල මන්ත්‍රී කොට්ඨාස මැතිවරණ ක්‍රමය, සමානුපාතික ක්‍රමය, මාරු කළ හැකි තනි ඡන්ද ක්‍රමය; ඒ කියන්නේ ජනාධිපතිවරණයට යොදා ගන්නා STV ක්‍රමය සහ මේ වාගේ මිශ්‍ර ක්‍රම යනාදී වශයෙන් විවිධ මැතිවරණ ක්‍රමත් අපි මේ අවුරුදු 110ක කාලය ඇතුළත යොදාගෙන තිබෙනවා. ඇත්ත වශයෙන්ම කියනවා නම්, ලංකාව කියන්නේ ආසියානු කලාපයේ මැතිවරණ ක්‍රම පිළිබඳ පර්යේෂණාගාරයක් කියලා ඕනෑ නම් කෙනෙකුට නම් කරන්නත් පුළුවන්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මැතිවරණ ක්‍රම සහ දේශපාලන පක්ෂ පිළිබඳව ලෝකයේ ඉතාමත්ම ප්‍රසිද්ධ විද්වතෙක් වන අරෙන් ලිජ්ජාට් කියන විද්වතා අධ්‍යයනය කර තිබෙනවා. මැතිවරණ ක්‍රම සකස් කිරීම වාගේ දේවලදී ගොඩාක් අය ඒවා ප්‍රයෝජනයට ගන්නවා. ඒ විද්වතා කිව්ව ප්‍රධාන කාරණය තමයි මැතිවරණ ක්‍රමයක් කියන්නේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ අති මූලික අංග ලක්ෂණයක්- a fundamental element of representative democracy- කියලා කියනවා. කිසිම මැතිවරණ ක්‍රමයක් සර්ව සම්පූර්ණ නැති බව අපි හැමෝම දන්නවා. එහෙම සර්ව සම්පූර්ණ නොවුණත් සාපේක්ෂ වශයෙන් හොඳ මැතිවරණ ක්‍රමයක් අපට අවශ්‍යයි. ඒ කියන්නේ අර ලිජ්ජාට් කියන විධියට මේක නියෝජන ප්‍රජාතන්ත්‍රවාදයේ අති මූලික අංගයක් වන නිසා. හොඳ මැතිවරණ

[ගරු කරුණාරත්න පරණවිතාන මහතා]

ක්‍රමයක, සාපේක්ෂ වශයෙන් හොඳ මැතිවරණ ක්‍රමයක ප්‍රධාන අංග දෙකක් අපට හඳුනා ගන්න පුළුවන්. පළමු වැනි කාරණය තමයි නියෝජනය මැනවින් තහවුරු වෙන්න අවශ්‍යයි කියන එක. හැම අංශයක්ම බලලා නියෝජනය හරියට තහවුරු වෙන්න අවශ්‍යයි. ඊළඟ වැදගත් අංගය තමයි ආණ්ඩුකරණය මැනවින් කරගෙන යන්න අවශ්‍ය කරන ස්ථාවරභාවය මැතිවරණ ක්‍රමය විසින් ලබා දිය යුතුයි. අවාසනාවකට අපේ රටේ මැතිවරණ ප්‍රතිසංස්කරණ ගැන අපි සෑහෙන දුරට කථා කර තිබෙනවා, කොමිෂන් සභා හදලා තිබෙනවා, ක්‍රම හදලා තිබෙනවා. නමුත් මේ මෑත කාලයේ මෑත දශකවලදී අපි බර තබා තිබෙන්නේ නියෝජනය මැනවින් තහවුරු කර ගන්නයි. ඒ කියන්නේ පොදුවේ ජනතාවගේ නියෝජනය එන විධියට, සුළු ජන කොටස්වලට නියෝජනය එන හැටියට, සුළු ජනවාර්ගික කොටස්වලට, පක්ෂවලට, සංඛ්‍යාත්මක වශයෙන් සුළු පක්ෂවලට, කාන්තාවන්ට, තරුණයින්ට යනාදී වශයෙන් විවිධාකාරයට, නියෝජනය පළල් වන ආකාරයට නියෝජනය දිහා බර තබලා, නියෝජන මූලධර්මය දිහා බර තබලා අපි මැතිවරණ ක්‍රම හදලා තිබෙනවා. නමුත් ස්ථාවරභාවය දිහා බලලා අපි මැතිවරණ ක්‍රම හදලා නැහැ. අපි හදපු මැතිවරණ ක්‍රමවල තුලනයක් නැහැ. ඒකට හොඳම උදාහරණය තමයි පසු ගියදා අපි පැවැත්වූ පළාත් පාලන මැතිවරණය ක්‍රමය. ඒ යටතේ අපි නියෝජනය පැත්තෙන් අරමුණු ගණනාවක් ඉෂ්ට කර ගත්තා. එහෙම කරලා 4,000ක් වුණු නියෝජිත සංඛ්‍යාව 8,000 කර ගත්තා. නමුත් අද මොකක්ද වෙලා තිබෙන්නේ? අද ලංකාව පුරාම තිබෙන පළාත් පාලන ආයතනවල ආණ්ඩුකරණ අර්බුදයක් මතුවෙලා තිබෙන බව අපි හැමෝම දන්නවා. දැන් අප ඉදිරියේ පළාත් සභා මැතිවරණයක් තිබෙනවා. අපි දැන් යොදා ගන්න හදන 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් පනත කියන්නේත් ඒ-

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

ගරු විමල් වීරවංශ මහතා
(மாண்புமிகு விமல் வீரவங்ச)
(The Hon. Wimal Weerawansa)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව මම මේ ප්‍රශ්නය අහනවා.

ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා දන්නවා, කලින් ඒ මැතිවරණ ක්‍රමය හැදිලා තිබුණේ සියයට 70යි, 30යි විධියටයි; ඒ වාගේම දිනන පැත්තට බෝනස් එකක් ලැබෙන විධියටයි කියලා. ඒ ක්‍රමය තිබුණා නම්, දැන් මේ ඇති වෙලා තිබෙන අනවශ්‍ය අරාජිකත්වය ඇති වෙන්නේ නැහැ. නමුත්, ආණ්ඩු පක්ෂයේ අයව සතුටු කරන්න මෙහි ප්‍රතිශතය වෙනස් වුණා. ඒ වාගේම, අර බෝනස් එක නැති කළා. ඒක තමයි අර්බුදයට හේතුව.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)
මම ඒ ගැන සඳහන් කරනවා, ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි, මේ කාරණය සඳහන් කළාට. ඒ සම්බන්ධයෙන් තමුන්නාන්සේ සමඟ මගේ වාදයක් නැහැ. එතැන ස්ථාවරභාවය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා.

අපි මේ යොදා ගන්නට උත්සාහ කරන මැතිවරණ ක්‍රමය; හදන මැතිවරණ ක්‍රමය, තවම සම්පූර්ණ වෙලා නැහැ. ඒ තමයි, 2017 අංක 17 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ (සංශෝධන) පනත. අපි බොහොම කලබලෙන් ඒක සම්මත කළා. විමල් වීරවංශ මන්ත්‍රීතුමා කිව්වා වාගේම, බොහොම කඩිමුඩියේ, විශාල කාල ගෝට්ටියක් මැද්දේ අපි ඒ පනත් කෙටුම්පත සම්මත කළා.

මේ ක්‍රමය තුළ නියෝජන මූල ධර්මයේ ප්‍රශ්නයකුත් තිබෙනවා; ස්ථාවරභාවය පිළිබඳ ප්‍රශ්නයකුත් තිබෙනවා. මෙයින් නියෝජන ක්‍රමය හරියට විසඳා ගෙන තිබෙනවාය කියා අපි හිතුවත්, මෙයින් ලොකු ප්‍රශ්නයක් ඇති වෙනවා.

සුමන්තිරන් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා වාගේ, මෙයට පත් වන නියෝජිතයන්ගෙන් සියයට 50ක් මහජන ඡන්දයෙන් සෘජුව පත් වන අය නොවෙයි. මෙයට අමතරව ස්ථාවරභාවය රකින්න බෝනස් මන්ත්‍රී ධුර පහකුත් දෙනවාය කියලා තිබෙනවා. සභා ගර්භයේ අපගේ මේසය මත තිබෙන පත්‍රිකාවේත් එය සඳහන් වෙනවා. අර සියයට 50යි, තව බෝනස් මන්ත්‍රීවරු පහකුයි ගත්තාම, මේ විධියට එන සියල්ලන්ම "විටි" මන්ත්‍රීවරු. මේ අය ඡන්දයෙන් සෘජුව පත්වන අය නොවෙයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එහෙම ගත්තාම, මේ සභාවකට පත්වන මන්ත්‍රීවරුන්ගෙන් සියය 50ක් -ඒ කියන්නේ හරි අඩක්ම,- මහජන මන්ත්‍රීවරුන් නොවන විට, මේවා මහජන නියෝජිත සභාද?

මම නැවතත් ඒ ප්‍රශ්නය අහනවා. මේ ක්‍රමය යටතේ මේ පළාත් සභා හදලා මෙහෙම මන්ත්‍රීවරු තෝරා ගත්තාට පස්සේ ඒකෙන් සියයට 50ක් ඡන්දයෙන් පත් වන මන්ත්‍රීවරු වෙන්නේ නැත්නම්, ඒගොල්ලන් "විටි" මන්ත්‍රීවරුන් නම්, පක්ෂවල නාමකරණයෙන් නම් මේ අය පත් වෙන්නේ, මේ පළාත් සභා මහජන නියෝජිත සභා කියලා අපට හඳුන්වන්න පුළුවන් ද? එහෙම හඳුන්වන්න බැහැ කියන එකයි අපේ අදහස.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ගරු නියෝජ්‍ය අමාත්‍යතුමනි, ඒ කාරණය පිළිබඳව ඇත්ත වශයෙන්ම අපි එකඟ වෙන්න ඕනෑ. පළාත් පාලන මැතිවරණයෙන් පස්සේ විශේෂයෙන්ම දෙවන, තුන්වන ස්ථාන දිනාගත්ත පක්ෂ සමානුපාතික ලැයිස්තුවට පත් කරද්දී ඒ පක්ෂවල පවා අභ්‍යන්තරයේ විශාල ගැටුම් ඇති වුණා.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)
ඔව්.

ගරු අජිත් පී. පෙරේරා මහතා
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒ මැතිවරණයට ඉදිරිපත් වුණු අපේක්ෂකයොත්, සමානුපාතික ලැයිස්තුවේ ඉන්න අපේක්ෂකයොත් විශාල අසතුටකට පත් වුණා. මේ තත්ත්වය ඉතාම අසතුටුදායකයි. මොන ක්‍රමයකින් හෝ පාර්ලිමේන්තුවට, පළාත් සභාවට හෝ පළාත් පාලන ආයතනවලට පක්ෂවල මහලේකම්වරු විසින් විශාල ලැයිස්තුවලින් පත් කරන මේ ක්‍රමය කිසිසේත්ම සුදුසු වන්නේ නැහැ. එහෙම කළොත්, පක්ෂවල අධිකාරි බලය වැඩි වෙනවා; මහජනතාවගේ බලය අඩු වෙනවා. ඒ වාගේම, ඒ ඒ පක්ෂවලට, නායකයන්ට ගැතිකම් කරන පුද්ගලයන්ට ජනතාවගේ

කැමැත්තකින් තොරව පැමිණීමට හැකි වෙනවා. එම නිසා මම ඔබතුමා එක්ක සියයට 100ක් එකඟයි. එක්සත් ජාතික පක්ෂය වශයෙන් අපි අත් දැකීමෙනුත් මෙය ඉගෙනගෙන තිබෙනවා. එම නිසා මේ විශාල ලැයිස්තුවලට අපේ කිසිම කැමැත්තක් නැහැ කියන කාරණය කියන්න අවශ්‍යයි.

ගරු කරුණාරත්න පරණවිතාන මහතා
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)

ගරු අජිත් පී. පෙරේරා රාජ්‍ය ඇමතිතුමාගේ පැහැදිලි කිරීමට මම එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ නිසා අපි මේ වාගේ යෝජනාවක් කරන්න කැමැතියි. ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව අපි අනුමත කරන අතර, මේ පනත් කෙටුම්පත භාගෙටයි හදලා තිබෙන්නේ කියන එකත් අපි කියන්න ඕනෑ. දැන් මෙහි අවශ්‍යතාවක් හැටියට තිබෙනවා, සීමානිර්ණ කමිටු වාර්තාව තුනෙන් දෙකකින් මේ පාර්ලිමේන්තුවේ අනුමත කරන්න. ඒ වාගේ එකකට තුනෙන් දෙකක් හම්බ වෙයි ද කියලා මට නම් සැකයකුත් තිබෙනවා. එහෙම හම්බ වෙන්නේ නැත්නම් අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවකින් මේක විසඳා ගන්නයි තිබෙන්නේ. නමුත්, ඒ ක්‍රියාදාමය එහෙම තිබෙද්දී අපට පේනවා, මේ මැතිවරණ ක්‍රමයේ ලොකු අර්බුදයක් තිබෙන බව. ඒ නිසා අපි කියන්නේ, මේ යෝජිත මැතිවරණ ක්‍රමය අහෝසි කරලා දාන්න කියලයි.

ඊයේ ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා මේ ගැන සඳහන් කරමින් කථා කළා. එතුමා අදත් කථා කරයි. එතුමා කියන්නේ, මෙහි සරල වෙනස්කමක් කරලා පැරණි දිස්ත්‍රික් සමානුපාතික ක්‍රමයට අපි යමුයි කියන එකයි. මගේ අදහසත් ඒකයි. අපි අපේ ඡන්දය ඉක්මනට තියන්න අවශ්‍යයි. පළාත් සභා ඡන්දය වහාම පැවැත්විය යුතුයි. පළාත් සභා මැතිවරණය පවත්වන්න මේ දුර්වල විකෘති මැතිවරණ ක්‍රමය හද හදා ඉන්නවාට වඩා හොඳයි, සාපේක්ෂ වශයෙන් සාර්ථක වෙලා තිබෙන දිස්ත්‍රික් සමානුපාතික ක්‍රමයට යෑම. ඒ ක්‍රමය සම්පූර්ණ හොඳයි කියලා අපි කියන්නේ නැහැ. නමුත්, මේ හදන්න යන විකෘති ක්‍රමයට වැඩිය ඒක හොඳයි. එම නිසා අපි යෝජනා කරන්නේ, පැරණි දිස්ත්‍රික් සමානුපාතික ක්‍රමයටම මේ මැතිවරණය පවත්වන්න කියලායි.

අපට තිබෙන ප්‍රශ්නය මෙයයි. අපි න්‍යායන්ට බොහෝ ආදරය කරන පිරිසක්. පසුගිය පළාත් පාලන මැතිවරණය නව මැතිවරණ ක්‍රමයකට පවත්වන්න ඕනෑය කියලා ඒ සඳහා වූ නව ක්‍රමයක් හදන්න ගිය අවස්ථාවේදී කොටියාසයට මන්ත්‍රීවරයා ගේන්න ඕනෑය කියන එක සම්බන්ධයෙන් විශාල වශයෙන් කථා කරලා ඒකට අපි එකඟ වුණා. ඊට පස්සේ ඒ සංශෝධනය ගේන කොට සමානුපාතික ක්‍රමයක් තිබෙන්න ඕනෑ, නැත්නම් අනික් ඒවාට අසාධාරණයක් වනවා කිව්වාම ඒකත් අපි ගෙනාවා. ඊට පස්සේ ඒ සමානුපාතික ක්‍රමය ඇතුළේත් සුළු ජන කොටස්වලට අයිනිවාසිකමක් එනවා කියලා ඒක ඇතුළේ බහුඅාසන ක්‍රමයක් ඕනෑය කියලා ඒකත් අපි ගෙනාවා. ඊට පස්සේ කාන්තාවන්ට සියයට 25ක නියෝජනයක් ඕනෑය කිව්වා, ඒකත් අපි ගෙනාවා. මෙවැනි අරමුණු ගණනාවක් ඉෂ්ට සිද්ධ කරන්න ගිහිල්ලා අර කිව්ව ස්ථාවරභාවයේ ප්‍රශ්නය අපි අමතක කරලා දැම්මා. එම නිසා ඕනෑ කරන සමහර සංශෝධන සමහර පැතිවලින් ගෙනාවේත් නැහැ. එතැනදි මේක මහා විශාල අවුලක් බවට පත් වුණා. දැන් අපි මෙතැනට ගෙනැල්ලා තිබෙන්නේත් ඒ පනතේම කාබන් කොපියක්. එම නිසා මේ පාර්ලිමේන්තුවට ලොකු වගකීමක් තිබෙනවා, ඒ දෛනික පීඩනය දිහා බලන්නේ නැතිව; දෛනික දේශපාලන කරුණු දිහා බලන්නේ නැතිව; එක් එක් දේශපාලන පක්ෂවලට තිබෙන පටු වුවමනාවන් දිහා බලන්නේ නැතිව මේ සම්බන්ධයෙන් කටයුතු කරන්න. රටක් හැටියට අවුරුදු 110ක් පුරා මැතිවරණ ක්‍රම සම්බන්ධයෙන් විශාල වශයෙන් පර්යේෂණ කරපු මිනිස්සු නේ අපි. ඒ පර්යේෂණවල අත් දැකීම් උපයෝගි කර ගෙන පැරණි දිස්ත්‍රික් සමානුපාතික ක්‍රමයටම පළාත් සභා මැතිවරණය පවත්වන්න කියන එක තමයි අපේ යෝජනාව වෙලා තිබෙන්නේ. එම නිසා ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා සභාව කල් තබන අවස්ථාවේ මෙම යෝජනාව මේ ආකාරයට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් එතුමාට අපේ ගෞරවය හිමිවන අතර, මේ පාර්ලිමේන්තුව ඒ සඳහා පොදු එකඟතාවකට එනු ඇතැයි අපි බලාපොරොත්තු වනවා. බොහොම ස්තුතියි.

[අ.භා.12.15]

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම අද දවසේදී ප්‍රධාන වශයෙන්ම රටක ජීවත් වන ජනතාවගේ අයිතිය, මහජන ඡන්දය, පරමාධිපත්‍ය අයිතිය සම්බන්ධයෙන් කථා කරන, සුමන්තිරන් මන්ත්‍රීතුමා විසින් සභාව කල් තබන අවස්ථාවේ ගෙන එන ලද, මෙම යෝජනාවට මටත් සම්බන්ධ වන්න ලැබීම ගැන මම සතුටුවනවා.

සබරගමුව පළාත, උතුරු-මැද පළාත සහ නැඟෙනහිර පළාත කියන පළාත් සභා තුනේ කාලය අවසන් වෙලා මේ වන විට මාස 9ක් ගත වෙලා තිබෙන බව අපි දන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රජය 2017 සැප්තැම්බර් මාසයේ 20 වෙනි දා පළාත් සභා මැතිවරණය වෙනස් ක්‍රමයකට ගේන්න ඕනෑය කියලා මේ පාර්ලිමේන්තුව ඇතුළේම විවාදයක් පවත්වා ඡන්දයක් ලබා ගත් බව අපට මතකයි. අනිවාර්යයෙන්ම 2018 වර්ෂයේ මාර්තු මාසය වනකොට මේ සියලු සීමා නිර්ණයන් අවසන් කරලා මැතිවරණය පවත්වන්න ලෑස්ති කරනවා කියලා තමයි ඒ ඡන්දය ගත් දවසේ රටේ ජනතාවට මේ පාර්ලිමේන්තුව තුළින් දුන් පණිවුඩය වුණේ. නමුත්, කල් ඉකුත් වුණු මේ පළාත් සභා 3 සම්බන්ධයෙන් මැතිවරණයක් පවත්වන දිනයක් අපට, රටට කියන්න අද වන තුරුත් මේ ආණ්ඩුවට හැකියාවක් ලැබුණේ නැහැ.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ වර්ෂයේ ඔක්තෝබර් මාසය පමණ වන විට විශේෂයෙන් වයඹ පළාත් සභාව, මධ්‍යම සහ උතුරු පළාත කියන පළාත් සභා තුනේත් කාලය අවසන් වනවා. ආණ්ඩුව වෙනුවෙන් වග කියන අගමැතිතුමා හෝ එහෙම නැත්නම් පළාත් සභා හා පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමා හෝ අද දවසේවත් අපට කියනවා නම්; රටට පණිවුඩයක් දෙනවා නම් හොඳයි, අහවල් පැරණි ක්‍රමය යටතේ හෝ අලුත් ක්‍රමය යටතේ හෝ, "අපි මෙන්න මේ ක්‍රමයට මේ පළාත් සභා මැතිවරණය පවත්වනවා, ජනතාවගේ පරමාධිපත්‍ය අයිතිය අපි ඔවුන්ට ලබා දෙනවා" කියලා. ආණ්ඩුවට එය නිශ්චිතව ප්‍රකාශ කරන්න පුළුවන්ද කියන ප්‍රශ්නය අද අප ඉදිරියේ තිබෙනවා. අපි ආණ්ඩුවට අභියෝග කරනවා, මේ විවාදය අවසන් වනකොට ඒ පණිවුඩය ලබා දෙන්න කියලා.

මේ අවස්ථාවේදී පළාත් පාලන විෂය භාර ඇමතිවරයා මේ ගරු සභාවට ආපු එක හොඳයි. මන්ත්‍රීවරු අදහස් දක්වනකොට ඒ අදහස් එතුමාගේ අවධානයට යොමු වන එක හොඳයි. මොකද, එතුමා තමයි ලංකාවේ ඡන්ද පවත්වන වෙලාව තීන්දු කරන ඇමතිවරයා. එතුමා නැකත් බලනවා, මේ වෙලාව ආණ්ඩුවට වාසිද, අවාසිද කියලා. ඒ අනුව ගිහිල්ලා ජනාධිපතිතුමාට කියනවා, මේ වෙලාව නම් අපට හොඳයි කියලා. හැබැයි ගිය වතාවේ දීපු නැකත වැරදුණා. 2018 පෙබරවාරි 10වන දා -[බාධා කිරීමක්]

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

නැහැ, නැහැ ඇමතිතුමා. මොකද, අපි කෑම වේලාවට සභාවේ කටයුතු නවත්වනවා. ඔබතුමාට වෙලාව තිබෙනවා. ඔබතුමාගේ කථාවට වෙලාව තිබෙනවා. ඔහොම ඉන්න, ඔහොම ඉන්න. [බාධා කිරීමක්] පොඩ්ඩක් ඉන්න. [බාධා කිරීමක්] නැහැ, නැහැ. ඔහොම ඉන්න කෝ. [බාධා කිරීමක්] නැහැ, නැහැ. පොඩ්ඩක් ඉන්න කෝ, මගේ මිත්‍ර ඇමතිතුමා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමාගෙන් මම අහන්නේ මේකයි. ගරු ඇමතිතුමනි, නොයෙකුත් හේතු කියලා කල් දමලා පළාත් පාලන මැතිවරණය පැවැත්වූවා. කරුණාරත්න පරණවිතාන නියෝජ්‍ය ඇමතිතුමා ඒ මැතිවරණයේ අවාසිදායක තත්ත්වයන් ගැන රටට පැහැදිලි කළා. මම එතුමාට ස්තුතිවන්ත වෙනවා, ඒ තත්ත්වය පැහැදිලි කිරීම ගැන. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගම්වල කියන කථාවක් තිබෙනවා, බල්ලා නාවන්න ගෙනයනවා වාගෙයි කියලා. සාමාන්‍යයෙන් බල්ලන් නාවන්න ගෙන යන්න හරි අමාරුයි. ගැට ගහගෙන, බෙල්ලෙන් ඇදගෙන තමයි බල්ලන් නාවන්න ගෙන යන්නේ. දැන් මේ ආණ්ඩුව ඡන්දයකට ගෙන යනවා කියන එකත් හරියට බල්ලෝ නාවන්න ගෙන යනවා වාගෙයි. ඡන්දයකට ගෙන යන්න හරි අමාරුයි. බුර බුරා බෑ කිව්වත්, මොනවා කළත්, බල්ලන්ව නම් ගැට ගහලා හරි, කොහොම හරි ඇදගෙන හරි නාවන්න ගෙන යන්න පුළුවන්. ආණ්ඩුවක් ඇදගෙන යන්න පුළුවන්ද? බැහැ. නයාට අඳුකොළ වාගෙයි මේ ආණ්ඩුවට මැතිවරණ. නයාට අඳුකොළ පෙනෙනවා වාගේ තමයි මේ ආණ්ඩුවට "ඡන්ද" කියනකොට; බයයි. "ඡන්ද" කියනකොට බය වෙන්න හේතු තිබෙනවා. අපේ සහෝදර ඇමතිතුමනි, හැබැයි ඡන්ද කෙසේ වෙතත් ඡන්ද ප්‍රතිඵල නම් අපට හම්බ වෙනවා. ඊයේ මධ්‍යම රාත්‍රී දොළහට ලැබුණු ඡන්ද ප්‍රතිඵලය තමයි ඩීසල් ලීටරයක මිල රුපියල් නවයකින් සහ පෙට්‍රල් ලීටරයක මිල රුපියල් අටකින් ඉහළ දැමීම. එහෙම ඡන්ද ප්‍රතිඵල නම් හම්බ වෙනවා. ඒකේ අඩුවක් නැහැ. ඒක හොඳ ඡන්ද ප්‍රතිඵලයක්. වෙනස ඉල්ලපු ලක්ෂ හැටදෙකක ජනතාවට සහ රටේ අනෙකුත් ජනතාවට ඩීසල් ලීටරයක් සහ පෙට්‍රල් ලීටරයක් රුපියල් නවයකින් සහ අටකින් ඉහළ දැමීමේ ඡන්ද ප්‍රතිඵල නම් හම්බ වෙලා තිබෙනවා, පළාත් සභා ඡන්ද කෙසේ වෙතත්.

සභාව කල් තබන අවස්ථාවේ මේ යෝජනාව ඉදිරිපත් කළ ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමාත් කිව්වේ, අපට මැතිවරණයක් දෙන්න කියලා. මාස දෙකක් ඇතුළත මැතිවරණයක් පවත්වන්න කියලායි කිව්වේ. ඔක්තෝබර් මාසය වන විට උතුරු පළාත් සභාව අනිවාර්යයෙන්ම විසිරෙනවා, ගරු ඇමතිතුමනි. එතකොට ඒ ඒ පළාත් සභා විසිරෙනකොට- සුමන්තිරන් මන්ත්‍රීතුමා කිව්වා නේ මාස දෙකක් ඇතුළත මැතිවරණයක් දෙන්න කියලා. මාස දෙකක් වනකොට සැප්තැම්බර් වෙයි කියලා අපි කියමු. හරි. අපට ඔක්තෝබර් මාසයේවත් නිශ්චිත දිනයක් කියන්න, ඇමතිතුමනි. විසුරුවා තිබෙන පළාත් සභා තුනෙත්, උතුරු පළාත් සභාව ඇතුළුව අනෙකුත් පළාත්වල විසුරුවන පළාත් සභා හයකත් ඡන්දය පවත්වන්න ඕනෑ. එහෙම නොපැවැත්වුවොත් ඔබේ ආණ්ඩුවට ප්‍රශ්නයක් වෙනවා. ඇයි? මේ ආණ්ඩුව කියනවා, බලය බෙදන්න ඕනෑ කියලා. මේ ආණ්ඩුව බලය බෙදන්න ඕනෑ කියා කියනවා නම්, උතුරු පළාත් සභාව අහෝසි වනකොට ඡන්දයක් පවත්වන්න ඕනෑ නේ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඔබතුමාත් ඒකට අත ඔසවනවා නේ, උතුරු පළාත නියෝජනය කරන ගරු මන්ත්‍රීතුමෙක් හැටියට. ඔබතුමාත් කියන්නේ, අපට ඡන්දයක් ඕනෑ කියලා. නමුත් ආණ්ඩුවට ඡන්දයක් පැවැත්වීමට නිශ්චිත වැඩ පිළිවෙළක් තිබෙනවාද? අපි කියන්නේ, ඡන්දය පවත්වන්න කියලා. ඡන්ද කල් දමන්න එපා. මේ ආණ්ඩුවේ නම "යහපාලන ආණ්ඩුව". ප්‍රජාතන්ත්‍රවාදය ළඟම තිබෙන එකක් තමයි යහපාලනය.

"යහ පාලනය" කියන්නේ මැතිවරණ කල් දමන එකටද? මෙය යහ පාලනය නම්, මැතිවරණ පවත්වන්න ඕනෑ; ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන්න ඕනෑ. ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පරමාධිපත්‍ය අයිතිය ජනතාවට ලබා දෙන්න ඕනෑ. නමුත් පළාත් සභා මැතිවරණය පවත්වන තත්ත්වයක් ගැන අපට දැක ගන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මගේ මිත්‍ර ගරු අමාත්‍යතුමා ගරු සභාවේ සිටින වෙලාවේ මේ කාරණය මතක් කරන්න ඕනෑ. 2018 පෙබරවාරි මාසයේ 10වන දා මේ රටේ පළාත් පාලන මැතිවරණය පැවැත්වූවා. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා ගොඩක් මහන්සි වුණා ඒ මැතිවරණය පවත්වන්න. ඒ මැතිවරණයට බොහෝ අපේක්ෂකයන් ඉදිරිපත් වුණා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මා මේ මතක් කරන්නේ මැතිවරණ කල් දමන ක්‍රමවේදයයි; මැතිවරණ කල් දමන්න හේතු වන පදනම් මොනවාද කියන එකයි. මුළු ලංකාවම ගත්තොත්, පළාත්, මහ නගර සභා, නගර සභා සහ ප්‍රාදේශීය සභා කියන සියලු ඒවායේ ඡන්ද කොට්ඨාස ප්‍රමාණය 5,075යි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඡන්ද කොට්ඨාස 5,075 වෙනුවෙන් 2018 පෙබරවාරි 10වන දා පළාත් පාලන මැතිවරණය මුළු ලංකාවේම පැවැත්වූවා. ඒ මැතිවරණය පැවැත්වූවාම ඒකට නොයෙකුත් පක්ෂවලින් තරග කළා. ආණ්ඩු පක්ෂය නියෝජනය කරන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, එක්සත් ජාතික පක්ෂය, ඊට පසුව ආ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ, ජනතා විමුක්ති පෙරමුණ, TNA එක ආදි ඔක්කෝම පක්ෂ තරග කළා. තරග කළාම මොකද වුණේ? ඒ ඒ කොට්ඨාසවල ජීවත් වන මිනිසුන්ගේ පරමාධිපත්‍යයට අයත් ප්‍රධානම එකක් තමයි, ඡන්ද බලය. කොට්ඨාසයක ඡන්ද සංඛ්‍යාව ඡන්ද 3,000ක් වෙන්න පුළුවන්. ඒ ඡන්ද 3,000 ප්‍රමාණයේ අයිතිය වෙනුවෙන් අප තෝරා පත් කර ගන්නේ කවුරුන්ද කියන එක ගැන ජනතාව තීන්දුවක් දුන්නා. ජනතාව කිව්වා අහවල් කෙනා තමයි තෝරා පත් කරන්න ඕනෑ කියා.

උතුර පළාත ගත්තොත්, TNA එකේ අහවල් කෙනා අපේ සභිකයා ලෙස තෝරා පත් කර ගන්නවා කියා ඒ කෙනාට කතිරය ගහලා තමයි ඔහු සභික මන්ත්‍රීවරයා හැටියට සභාවට පත් කර යැව්වේ. ඒ මැතිවරණයේ අවසාන ප්‍රතිඵලය මොකක්ද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි? එහි අවසාන ප්‍රතිඵලය වුණේ, ඒ ඡන්ද කොට්ඨාස 5,075න් කොට්ඨාස 3,325ක් පොහොට්ටුව ලකුණ හිමි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ජයග්‍රහණය කිරීමයි. ලැයිස්තුවෙන් පත් වූ මන්ත්‍රීවරුන් ගැන නොවෙයි මා මේ කියන්නේ. මිනිස්සු තම ඡන්ද බලය මඟින් 3,325ක් මන්ත්‍රීවරුන් හැටියට පත් කරලා කියනවා, "අපට ඕනෑ පොහොට්ටුව ලකුණෙන්, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් ඉදිරිපත් වූ අයයි" කියා. ලංකාවේ සියලු ඡන්ද කොට්ඨාස සංඛ්‍යාව වන 5,075න් 3,325කට එම පෙරමුණේ සභිකයන් තෝරා පත් කර ගන්නවා. එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් ජනතාව ඡන්ද බලයෙන් මන්ත්‍රීවරුන් තෝරා ගන්නවා කොට්ඨාස 825කට. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගන්නේ කොට්ඨාස 200ක් සඳහායි. ජනතා විමුක්ති පෙරමුණට මුළු ලංකාවෙන්ම එක මන්ත්‍රී ආසනයක් තමයි ලැබුණේ. මෙන්න මේක තමයි ඉතාම ආසන්නයේ පැවැති මැතිවරණයේ ඡන්ද ප්‍රතිඵලය. මේ ප්‍රතිඵලය ගන්න කොට මොකද වෙන්නේ, මගේ මිත්‍ර පළාත් සභා සහ පළාත් පාලන විෂය භාර නව ක්‍රීඩා ඇමතිතුමනි? උණ ගන්නවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, උණවල වර්ග තිබෙනවා. සමහරුන්ට උණ හැදුණාම නම් ඩිස්ප්‍රීන් දෙකක්, පැනඩෝල් දෙකක් බිව්වාම හොඳ වෙනවා. සමහර විට සහලෝලා උණ ගන්නවා. දැන් ආණ්ඩුවට සහලෝලා උණ අරගෙන. එහෙම උණ ගන්න එක සාධාරණයි නේ. මොකද, මේ වාගේ මර්දනකාරී ආණ්ඩුවක් එක්ක තරග කරලා ලංකාවේම ඡන්ද කොට්ඨාස 5,075න් 3,325ක් අවුරුදු

එකහමාරක්වත් වයස නැති පොහොට්ටුව ලකුණ හිමි ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ජයග්‍රහණය කරන කොට, ඇමතිතුමා ඇතුළු ආණ්ඩුවට සහලෝලා උණ ගන්නා එක වැරැදිද? ඒක සාධාරණයි. හැබැයි පළාත් පාලන මැතිවරණයේ ඒ ප්‍රතිඵලය නිසා පළාත් සභා මැතිවරණය කල් යවන එක ගැන මේ රටේ ජනතාවට සැකයක් මතු වෙනවා. මොකක්ද, ඒකට හේතුව? පෙබරවාරි 10වන දා ඉඳන් මේ දවස වන කල් ආණ්ඩුව රටේ මිනිසුන්ගේ විශ්වාසය දිනාගන්න මොනවා හෝ කර තිබෙනවාද, ගරු අමාත්‍යතුමනි? කළා නම්, එකයි. මංගල සමරවීර ඇමතිවරයා ඊයේ රෑ පෙට්ටල්, ඩීසල් මිල වැඩි කළා. ජනාධිපතිතුමා අද කියනවා, නෑ, ඒවා පරණ මිලටම දෙන්න කියා. මරු ආණ්ඩුව! මුදල් අමාත්‍යවරයා දකුණට සිග්නල් දමන කොට ජනාධිපතිවරයා වමට හරවනවා. දැන් මරු! මෙහෙම ආණ්ඩුවක් ලංකා දේශපාලන ඉතිහාසයේ කවදාවත් හම්බ වුණේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් තිබෙන්නේ.

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
හොඳයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ ආණ්ඩුව පක්ෂ දෙකක් -එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය - එකතු වෙලා හදපු හවුල් ආණ්ඩුවක්; සමඟි ආණ්ඩුවක්. මේ ආණ්ඩුවට ජාතික ආණ්ඩුවක් කියලාත් කියනවා. අද මේ පාර්ලිමේන්තුව ඇතුළේ ඒකාබද්ධ විපක්ෂය සමඟ සුමන්තිරන් මන්ත්‍රීතුමන්ලා "මැතිවරණය ඕනෑ" කියන අදහසට බොහොම පැහැදිලිව එකඟ වෙනවා. අපේ සම්පන්දන් විපක්ෂ නායකතුමා කියනවා, "අපට මැතිවරණය ඕනෑ" කියලා. මම හිතන විධියට අපේ රවුෆ් හකීම් ඇමතිතුමාත් කියන්නේ කරුණාකර මැතිවරණ තියන්න කියලායි. නැඟෙනහිර පළාතේ පළාත් සභා මැතිවරණය පැවැත්විය යුතු දිනය පහුවෙලා දැන් මාස නවයක් වෙනවා නේද, ඇමතිතුමනි? ඔව්, මාස නවයක් වෙනවා. එහෙම නම්, ප්‍රබලම කණ්ඩායම් රාශියක් බොහොම පැහැදිලිව මේ පාර්ලිමේන්තුව ඇතුළේ අද කියන පණිවුඩයේ තිබෙන්නේ මොකක්ද?කරුණාකර මැතිවරණය තියන්න කියන පණිවුඩය තමයි තිබෙන්නේ. හැබැයි, ඒක නොකෙරෙන විධියට වැඩ කරන්න අවශ්‍ය නම් ඒකත් කරන්න පුළුවන්. අපට ඒ පිළිබඳ අත්දැකීම් තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ ගැන සොයන්න කමිටු පත් කරන එක ලේසි වැඩක් නේ. ඔන්න කමිටුවක් පත් කරනවා. ඒක මදි නම්, ජනාධිපති නිර්දේශ කමිටුව කියලා එකකුත් දමනවා. ඒවා දමා ගත්තොත් වැඩේ "බඩුම" තමයි. ගමේ භාෂාවෙන් කියන විධියට බඩුම තමයි, මැතිවරණය නැහැ. මේ මැතිවරණ ඒ තත්ත්වයට පත් කරන්න එපා, මගේ මිත්‍ර ඇමතිතුමනි. ඔබතුමා තමයි මහ මොළකරුවා. මැතිවරණ තියන්න ජනාධිපතිතුමාට අවශ්‍ය කරන ඉඟිය දෙන මහ මොළකරුවා තමයි ඔබතුමා. 2018 පෙබරවාරි 10 වන දින වැරදුණු කුරුමානමවත් හරිගස්සන්න. ඒක හරිගස්සලා ලකුණු ටිකක් දමා ගන්න. "ඔන්න ජනාධිපතිතුමනි, මම වේලාව බැලුවා. දැන් හොඳයි. දැන් පළාත් සභා ඡන්ද තියමු" කියලා හරි වේලාව බලලා, වේලාව දුන්නොත් හොඳයි. ගරු ඇමතිතුමනි, මොන විධියෙන් හරි කමක් නැහැ, මැතිවරණයක් පවත්වන්න. තමුන්නාන්සේලා මැතිවරණ නොපවත්වන්න, නොපවත්වන්න තමුන්නාන්සේලා පරාජය වීමේ ප්‍රතිශතය තමුන්නාන්සේලාටම බලාගන්න පුළුවන්. ඒකාබද්ධ විපක්ෂය, ද්‍රවිඩ සන්ධානය, රවුෆ් හකීම් ඇමතිතුමා ඇතුළු මුස්ලිම් කොන්ග්‍රසය සහ අනෙකුත් දේශපාලන පක්ෂ කියන්නේ මැතිවරණය පවත්වන්න කියලායි. එක්සත් ජාතික පක්ෂයත් මැතිවරණ ඕනෑ කියලා කියනවා මම දැක්කා. පරණවිතාන නියෝජ්‍ය ඇමතිතුමා ඉතා ඉක්මනින් මැතිවරණ ඕනෑ කියලා කිව්වා. එහෙම නම් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇමතිතුමනි, මේ කාරණය ඔබට භාරයි. කරුණාකර අපට මැතිවරණයක් දෙන්න. පළාත් සභා මැතිවරණය මොන යම් ක්‍රමයකින් හෝ ඉක්මනට ලබා දෙන්න කියා ඉල්ලා සිටිමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The Sitting is suspended for lunch till 1.30 p.m.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.30ට නියෝජ්‍ය කථානායකතුමා (ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා) ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.

අතුන්පදී, අමර්වු පි.ප. 1.30 මණිවරෙ இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.

Sitting accordingly suspended till 1.30 p.m. and then resumed, DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] *in the Chair.*

[1.30 p.m.]

ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)

Bismillahir Rahmanir Raheem.

Hon. Deputy Speaker, I must first congratulate you as this is the first time I am addressing this august Assembly while you are in the Chair after having assumed office in this exalted place as its Deputy Speaker. Let me wish you all the very best in carrying out your functions of looking after the affairs of this House.

Having said that, Mr. Deputy Speaker, we are debating today the Adjournment Motion moved by the Hon. Sumanthiran relating to the Provincial Councils Election System that we have introduced recently and we are caught up in a dilemma as to proper implementation of that system since it is in a state of limbo having not presented the Delimitation Committee Report. Though having presented it in March, we are now well passed the time frame within which this particular Report should have been discussed and passed.

Having said that, Mr. Deputy Speaker, in our country ever since the adult franchise was introduced, we have been having different systems of elections at different periods of times. But, subsequently, of late, we have now come to a position where virtually the country has become a veritable laboratory for testing out election systems. None of these tests have become positive for the reason that we cannot address the concerns of different sections of the people, different communities, and there are complaints about the features of whatever system we introduce. But, of late, the system that we introduced, even in the process, I have pointed out that it was introduced very surreptitiously without even the majority of the Members knowing as to what they were going to

[ගරු රවුෆ් හකීම් මහතා]

do. All of a sudden, in the pretext of introducing some amendments which were originally in the Order Paper relating to women representation, an entire new system of election was stealthily and surreptitiously introduced to the House. I was one of those people, a Party Leader, who had taken strong objections to the process in which that Provincial Council Elections Law was brought to the House and introduced. We made several protests and having got some assurances from the Prime Minister that we agreed to look at all the concerns that the minority communities have, particularly the dispersed communities like the upcountry Tamils and the Muslims who had got very serious issues pertaining to the new system, they agreed even to convert the proportion of First-Past-the-Post Electorates to that of the Proportional Representation Seats; the amended 60:40 proportion was to be amended further to 50:50.

Having observed what happened in the Local Government Elections under the new system on the 10th of February, it became very clear to most of us that the new system - though was meant to get rid of a variety of negative features - it further aggravated the existing situation. For instance, as far as the amount of money spent on territorial constituency, a ward is concerned, we expected, if we got rid of the preferential voting system, the tendency for giving inducements to voters would be reduced. But, what we observed was, the tendency to induce voters became much easier. It was within a limited territorial ward, people started doling out money and various other inducements to buy votes.

This is what we observed. And the Election Commission was quite aware that even religious places of worship such as mosques, Buddhist temples, Hindu temples and churches became places where you could do political activities. There were some specific instances where we even took up objections with the Election Commission and they sent special observers. There were several letters exchanged between the Returning Officers in that area to prevent such abuse taking place. But the electoral abuse was increased in many folds despite the fact that these were to be addressed through the new system.

Now, looking at this Delimitation Committee Report, I must point out that we have only got Volume I of the Delimitation Committee Report that has been tabled. There is a further volume which contains representations made by various different organizations in every district. We are not furnished with that second volume for us to examine whether sufficient attention has been paid by the Delimitation Committee to the observations and memoranda submitted by different organizations at district level. This includes not only political parties but also civil society organizations and individuals. This had to be placed before the House for us to have a complete discussion. But in any event, this is only an exercise in hindsight the relevant period within which this should be debated had passed and now almost five months have lapsed since the presentation of the Delimitation Committee Report. That is one matter.

Then, the Provincial Councils Elections (Amendment) Act, No. 17 of 2017 proposes to consider multi-member electorates in demarcation. The Committee deliberately turned down all the proposals for multi-member electorates made by us in many places such as Akkaraipattu, Pottuvil, Mawanella, Deltota, Hewaheta, Galle and Kuliyapitiya. For these areas, we made very valid presentations to create multi-member electorates to accommodate minority representation in those areas. Those were turned down without giving sufficient reasons.

Then, the criteria defined to demarcate the electorates by the Delimitation Commission were very unrealistic and fundamentally wrong. For instance, population range for an electorate was determined very arbitrarily. Some criteria for majority and the minorities living in geographically scattered areas had been determined without sufficient concern for the need to create smaller electorates or to ensure multi-member constituencies are created. Also, they have rejected some proposals saying that we have no mandate to divide a historical area into two electorates. For instance in Polonnaruwa, we made a very, very strong representation in order to have at least one member from the Muslim community elected from the Lankapura area and from certain adjoining areas dividing certain Grama Niladhari Divisions. That was even turned down. Up to date, we have continuously been having certain members elected.

We have today a document that the Hon. Speaker has circulated to all the Members of Parliament which has been received from the Chairman of the Delimitation Commission which very clearly enunciates what type of injustice will be done to smaller communities. I can refer to the Muslim community here. The Chairman of the Delimitation Commission in his letter very clearly lays out a table in the very first page. At the last Provincial Council Election, the number of members returned to each Provincial Council on behalf of the Muslim community was 43. But in the proposed 50 per cent electorates in the new system, they have been able to demarcate only 13 electorates in the entire country, whereas we have had 43 members in all the Provincial Councils in the previous election. If you add further 50 per cent, it will become 26 members. That is far below the 43 members we have had in the earlier system. This has seriously done injustice when you look at the Muslim community's interests alone.

Then, if you look at the up-country Tamils too this issue will arise. Of course, they have not divided the up-country Tamils separately. They have not shown it separately, perhaps for the reason that they have put them into the same category as Tamils and have given a table for us to look at to see how the representation will get affected. It has already got affected by this delimitation that has already been done.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Minister, you have only one more minute.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
Hon. Deputy Speaker, I have two other Members who will be speaking on behalf of my Party somewhere down the line. I will take their time as well.

We suspect that whether the Committee works on a fixed agenda. Demarcation was done prior to public announcement. That is how we see what has happened here. They have had a particular mindset with which they have approached this issue, because only a limited period was available. Such an exercise will have to take several months to complete. But since they were forced to complete it within a particular period of time, they ignored a variety of different, very valid and justifiable representations that have been made on behalf of different communities. Those representations have arbitrarily been turned down by the Commission. It failed to accommodate very reasonable appeals of political parties, civil society organizations and individuals.

The Committee divided and negated the appeals and proposals of renowned scholar and a Muslim representative Prof. Hasbullah who was there as a Member of the Commission. He too was talking to us in a very dejected mindset saying that his appeals fell on deaf ears. Of course, he may not admit it in public but this is something that he shared with us whenever we had discussions with him on this issue.

Therefore, from the Report the Chairman himself has sent to the Hon. Speaker it is very evident and very obvious for all of us to see the way in which they have advised themselves to do this Report and how the impact of this is going to affect different communities. This is quite apparent for all of us to see. To convince the Muslim community to accept this Report is impossible as far as we are concerned.

Therefore, what we are asking is that we totally ignore this new system and get back to the old system. I must also very clearly say here there are a variety of parties which are attempting to continue to tinker with this new system, refine it further in order to appease various different sections and hold elections thereafter. The purpose there I must say very clearly - ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සම්මත කරගත් අලුත් මැතිවරණ ක්‍රමයට අවශ්‍ය සංශෝධන ඉදිරිපත් කරලා, එහි තිබෙන අඩු පාඩු සකසලා, සීමා නිර්ණ කමිටුවක් පත් කරලා, එම සීමා නිර්ණ කමිටුවේ වාර්තාවක් නැවත මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරගන්න පුළුවන් කියන ස්ථාවරයේ සමහර පක්ෂවල අය ඉන්න පුළුවන්. එම ස්ථාවරයේ ඉන්න අය එය වෙනම උප්පරවැට්ටියක් සඳහා පාවිච්චි කරන ක්‍රමවේදයක් කියායි අපට නම් හිතෙන්නේ. මොකද, ඒකෙන් කිසිදාක අපට නිසි වෙලාවට මේ මැතිවරණය පවත්වා ගැනීමට හැකි වෙන්නේ නැති බව ඉතාම පැහැදිලියි. එබැවින් අපි ඉල්ලා සිටින්නේ, පැරණි මැතිවරණ ක්‍රමයයි. මීට කලිනුත් අප එය කිව්වා.

අපේ ගරු කරුණාරත්න පරණවිතාන නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාවේදී කිව්වා, "ලංකාව දැන් මැතිවරණ ක්‍රම පිළිබඳ පර්යේෂණාගාරයක් වෙලා" කියා. ඒ තරම් අපි මේ යුගයේ මැතිවරණ ක්‍රම පිළිබඳව නොයෙක් අත්හදා බැලීම් කරගෙන යනවා. කලට වෙලාවට මැතිවරණයක් පැවැත්විය යුතුයි නම්, අපි අත ගගා ඉන්නේ නැතුව එම කාර්යයට යා යුතුයි. අලුත් මැතිවරණ ක්‍රමයේ අඩු පාඩු හදා ගන්න දරන මේ උත්සාහය පැත්තක තබා අප පරණ මැතිවරණ ක්‍රමයට යා යුතුයි කියා මා තරයේ අවධාරණය කරනවා. ඒ තුළින් තමයි කාටත් යම් සාධාරණයක් ඉටු වන්නේ. පළාත් සභා ඡන්ද විමසීම් පනතින් අපි ඉවත් කරන්න හැදූ සමහර ලක්ෂණ, එහි අඩු පාඩු මේ ක්‍රමයේත් තිබෙන බව අපට පෙනී යනවා. පැවති පළාත් පාලන මැතිවරණයේදී සෑහෙන දුෂණ සිද්ධ වුණු ආකාරය අප දැක්කා. ඒ දූෂණ වළක්වන්න අපට බැරි වුණා. සුළු කොට්ඨාසවල අපේක්ෂකයන් නොයෙකුත් ආකාරයෙන් දීමනා දෙමින් ඒ කොට්ඨාස දිනා ගැනීම සඳහා උත්සාහ කළ බව අපට පැහැදිලිව පෙනුණා. ඒක වළක්වා ගන්න බැරි වුණා. මනාප ඡන්ද ක්‍රමයේ තිබුණු අඩු පාඩුවලට වඩා දූෂණ සිදු වූ ක්‍රමයක් හැටියටයි අප අලුත් මැතිවරණ ක්‍රමය දකින්නේ. එබැවින් නැවත පරණ මැතිවරණ ක්‍රමයට යාම තුළින් තමයි කලට වෙලාවට මැතිවරණයක් පවත්වා ගැනීමට හැකි වන්නේ කියන කාරණය මම ඉතාම වග කීමකින් යුතුව අවධාරණය කරනවා. අපි මේ සම්මත කරගත් අලුත් පළාත් සභා මැතිවරණ ක්‍රමය හදලා, දෙසැම්බර් මාසය වනකොට ඉතිරි පළාත් සභාවල මැතිවරණ පවත්වනවාය කියා කවුරු කිව්වත්, ඒක කිසි විටෙක වන්නේ නැහැය කියන එක පැහැදිලියි. ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය එවැනි ප්‍රෝඩාවකට එකතු වීමට කවදත් සූදානම් නැති බව මම ඉතාම පැහැදිලිව කියා සිටිනවා.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු ඇමතිතුමනි, ඉදිරිය බැලුවාම දැන් ඔබතුමන්ලාට තේරෙනවා ඇති, මේක කරන්න බැරි වැඩක් බව. මේ ක්‍රමය සම්මත කර ගන්න තුනෙන් දෙකක ඡන්ද බලයක් අවශ්‍ය වුණා. මේ මැතිවරණ ක්‍රමය වැරැදියි කියා අප කියද්දි, එදා රාත්‍රියේ තමුන්නාන්සේලා ඒ පනත් කෙටුම්පතට පක්ෂව ඡන්දය පාවිච්චි කළේ ඇයි? අද කථාව නොවෙයි, ඒකට උත්තරයක් දෙන්න කෝ?

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
තුනෙන් දෙකක අනුමැතිය අපි ඉල්ලුවේ නැහැ.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා ඡන්දය පාවිච්චි කළා නේ. ඔබතුමා තමයි 50:50 ඉල්ලුවේ.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
ඔව්, 50:50 අපේ ඉල්ලීමක්.

ගරු දිනේෂ් ගුණවර්ධන මහතා
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඔබතුමා 50:50 ඉල්ලුවා. තුනෙන් දෙකේ ඡන්ද බලය ලැබෙන තෙක් මේ පාර්ලිමේන්තුව පැය තුනක් බලාගෙන හිටියා. එහෙම දෙයක් වුණේ නැති විධියට දැන් කථා කරනවා. ආණ්ඩුවේ හැටිද මේ? ඊයේ පෙට්‍රල් මිල නොවෙයි, අද තිබෙන්නේ.

ගරු රවුෆ් හකීම් මහතා
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
පෙට්‍රල් කථාව පැත්තකින් තියමු කෝ. ගරු මන්ත්‍රීතුමනි, මැතිවරණ ක්‍රම පිළිබඳ පර්යේෂණාගාරයක තත්ත්වයටයි අද අපේ රට පත් වෙලා තිබෙන්නේ. ඒක පැත්තක තියලා පරණ මැතිවරණ

[ගරු රවුෆ් හකීම් මහතා]

ක්‍රමයට යාම තුළින් තමයි කාටත් යුක්තියක් ඉටු කරන්න පුළුවන් වෙන්නේ. මොකද, අපේ සමාජයට; මුස්ලිම් ප්‍රජාවට මේ සීමා නිර්ණය තුළින් විශාල අසාධාරණයක් සිදු වෙලා තිබෙනවා. 43දෙනෙක් හිටපු තැන 13දෙනායි ඉන්නේ. "අපට වෙන් කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ කොටියාස 13යි" කියා සීමා නිර්ණය කමිටු වාර්තාවේ පැහැදිලිව කියනවා. එහෙම තත්ත්වයක් තුළදී මේ ක්‍රමයට එකඟ වෙන්න අපට කිසිසේත්ම පුළුවන්කමක් නැහැ. අලුත් ක්‍රමය සංශෝධනය කරන්න එක එක්කෙනා නොයෙක් උප්පරවැට්ටි ඉදිරිපත් කරන්න පුළුවන්. නමුත්, අපි පරණ ක්‍රමයට යා යුතුයි. පරණ මැතිවරණ ක්‍රම තුළින් තමයි කාටත් යුක්තියක් ඉටු කරන්න පුළුවන් වන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය දිනක යහ පාලන ආණ්ඩුවේ පක්ෂ නායකයෝ රැස් වුණා. එතුමන්ලා ආණ්ඩුවේ ප්‍රධානීන් හමු වුණා. "මේ මැතිවරණ ක්‍රමය අපට අත ගගා ඉන්න බැහැ. අපි පරණ මැතිවරණ ක්‍රමයට ගිහින් කලට වෙලාවට මැතිවරණ පවත්වලා, ජනතාවට මුහුණ දීලා, ලැබෙන ප්‍රතිඵලය පිළිගනිමු" කියා එම සාකච්ඡාවේදී අපි ඉතාම පැහැදිලිව කිව්වා. අපි එම කාරණය ඉතා පැහැදිලිව අවධාරණය කර තිබෙනවා. අලුත් මැතිවරණ ක්‍රමය තුළින් කිසි විටෙක සුළු ජාතීන්ට සාධාරණයක් වන්නේ නැහැයි කියන කාරණය අවධාරණය කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තූතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 22ක් තිබෙනවා.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
මට විනාඩි 25ක් තිබුණා නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කාලය ගත වෙලා තිබෙන නිසා විනාඩි 3ක් අඩු කර තිබෙන්නේ.

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
තව පස්සට ගියොත් වෙලාව තවත් අඩු වෙන්න ඉඩ තිබෙනවා නේද, ගරු නියෝජ්‍ය කථානායකතුමනි?

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සමහර විට එහෙම වෙන්න පුළුවන්.

[අ.භා.1.49]

ගරු අනුර දිසානායක මහතා
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මෙම අවස්ථාව ලබා දීම පිළිබඳව මුලින්ම ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා.

දේශපාලන පක්ෂයක් හැටියට, පළාත් සභා මැතිවරණය නිසි පරිදි, නිසි කාලයට පැවැත්විය යුතුයි කියන ස්ථාවරයේ අප ඉන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ කාලාන්තරයක් මුළුල්ලේ පැවැති ඡන්ද ක්‍රමය පිළිබඳව විශාල විවේචනයක් ගොඩ නැඟී තිබුණා. 2012දී අතාවුල්ලා අමාත්‍යවරයා විසින් පළාත් පාලන මැතිවරණ ක්‍රමයක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා.

එම මැතිවරණ ක්‍රමය මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනකොට, එම ඡන්ද ක්‍රමයේ තිබෙන අසාර්ථකභාවය අප ඉතා පැහැදිලිව පෙන්වා දෙනු ලැබුවා. ඒ වාගේම, සමානුපාතික ඡන්ද ක්‍රමය වඩාත් යෝග්‍ය ඡන්ද ක්‍රමයක්ය කියන යෝජනාව අප ඉදිරිපත් කළා. එදා විවාදයේ හැන්සාඩ් වාර්තාව බැලුවොත්, එම පළාත් පාලන ඡන්ද ක්‍රමය -යෝජිත ඡන්දය ක්‍රමය- වැරැදි බවත්, සමානුපාතික මනාප ඡන්ද ක්‍රමයට අපි එකඟ බවත් මේ හැමදෙනාටම තේරුම් ගන්න පුළුවන් වෙයි. හැබැයි ඒ වෙලාවේ මේ පාර්ලිමේන්තුවේ බොහෝ අය අපව විවේචනය කළා. "කොටියාස ප්‍රමුඛ කරගත් මීශ්‍ර ක්‍රමයකට යාම හරහා ජනතා විමුක්ති පෙරමුණට අතිශය අවාසි සහගත තත්ත්වයක් ඇති වෙනවා, එම නිසා තමයි සමානුපාතික මනාප ඡන්දය ක්‍රමය වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණ පෙනී සිටින්නේ" කියා ඔවුන් අපට චෝදනා කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ දේශපාලනයේ ඇති වී තිබෙන මේ විනාශය අප හොඳින් තේරුම් ගෙන තිබෙනවා. මුදල් වියදම් කිරීම; ඒක කොටියාසයටද, මනාපයක් ලබා ගන්නද; නැත්නම් ඒකෙන් කණ්ඩායමක් දිනවන්නද යන මේ සියල්ල රඳා පවතින්නේ ඡන්ද ක්‍රමය මත නොවෙයි කියා එදාත් අපි පිළිගත්තා. මේක අපේ රටේ දේශපාලන සංස්කෘතියේ පිරිහීමක්. අද අපේ රටේ දේශපාලනය කියන්නේ, ඉතාම ලාභදායී ව්‍යාපාරයක්. අද අවදානම අඩුම, ලාභම ව්‍යාපාරය දේශපාලනය බවට පත් වෙලා තිබෙනවා. මේක තමයි ඇත්ත තත්ත්වය. අද බොහෝ මන්ත්‍රීවරුන්ගේ, මන්ත්‍රීකම ගන්න පෙර දේපළ සහ මන්ත්‍රීකම ලබා ගත්තාට පසු දේපළ සහ මන්ත්‍රීවරයෙක් ඇමති කෙනෙක් වීමට පෙර ඔහුගේ දේපළ සහ ඇමති වුණාට පසු ඔහුගේ දේපළ හා ඔවුන්ගේ ජීවන රටාව අධ්‍යයනය කර බැලුවොත්, මෙවැනි ආර්ථික විපර්යාස අත්පත් කරගත හැකි ලාභම ව්‍යාපාරය දේශපාලනය බව අපට තේරුම් ගන්න පුළුවන්.

දේශපාලනය ලාභම ව්‍යාපාරයක් බවට පත් වෙලා තිබෙන වේලාවක දේශපාලනයේ ඇතිවන පිරිහීම් ඡන්ද ක්‍රමවලින් වසා ගන්න හදනවා නම්, ඒක කිසිසේත්ම කළ හැක්කක් නොවෙයි. ඒක ඡන්ද ක්‍රමවලින් වහන්න පුළුවන් එකක් නොවෙයි. අපි ඡන්ද ක්‍රමයක් හදන්නේ කුමකටද? ජනතාවගේ කැමැත්තේ සාධාරණ පිළිබිඹුවක් ඇතිවීම තමයි අපි හදන ඡන්ද ක්‍රමයක තිබෙන වැදගත්කම වන්නේ.

පසුගිය කාලයේ පැවැති පළාත් පාලන ඡන්ද ක්‍රමයටත් බොහෝ විවේචන ගොඩනැඟී තිබෙනවා, මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වැඩිවීම සම්බන්ධයෙන්. හැබැයි, එසේ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වැඩිවීම පිළිබඳව කිසිවෙකු එකඟතාවකට ආවේ නැහැ. නමුත් කොටියාස 5,000කට ආසන්න ප්‍රමාණයක් තිබුණා. එම ඡන්ද ක්‍රමයට අනුව එම කොටියාස ගැළපුවාම, මන්ත්‍රීවරුන් සංඛ්‍යාව 8,000 බවට පත් වුණා. මන්ත්‍රීවරු සංඛ්‍යාව අඩු කළ හැකි වන්නේ, නැවත සීමා නිර්ණයක් හරහා කොටියාස 5,000 කොටියාස 3,000කට අඩු කිරීමෙනුයි. එසේ කිරීමෙන් මන්ත්‍රී ධුර සංඛ්‍යාව 5,000 සීමාවේ රඳවා ගන්න පුළුවන්. ඒ නිසා ගරු අමාත්‍යතුමාගෙන් මා ඉල්ලීමක් කරනවා. අපි එකඟ වී තිබෙනවා, මන්ත්‍රී ධුර සංඛ්‍යාව අඩු කරන්න. මම දැක්කා, ජනාධිපතිවරයාත් ප්‍රකාශයක් කරලා තිබෙන බව. ඒ නිසා ඉක්මනින්ම පළාත්පාලන

ආයතන සඳහා නැවත සීමා නිර්ණය සභාවක් පත් කරන්න. කොටියාස 3,000ක සීමාව ගෙනාවොත්, මන්ත්‍රී ධුර සංඛ්‍යාව 5,000න් නතර කර ගන්න පුළුවන්.

ඊළඟට, මේ සභාවල අස්ථාවරය පිළිබඳ ප්‍රශ්නය ගැන කථා කරන්න මා කැමැතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මන්ත්‍රීවරුන් 423 දෙනෙක් සභාවලට තේරුණා. බොහෝ අවස්ථාවල අපේ මන්ත්‍රීවරයා එහි සභාපතිවරයා බවට පත් වෙනවාද, නැද්ද කියන එක තීරණාත්මක ඡන්දය බවට පත් වුණා. උදාහරණයක් හැටියට පොතුවිල්, දෙහිවල, කෝට්ටේ වැනි තැන්වල අපේ මන්ත්‍රී කණ්ඩායම මත තමයි "කවුද බලය පිහිටුවන්නේ?" කියන එක තීරණය වුණේ. හැබැයි, අපි හිටපු ස්ථාවරය මොකක්ද? යම් පළාත් පාලන ආයතනයක් තුළ බහුතර ජනතාවගේ කැමැත්තක් තිබෙන දේශපාලන ව්‍යාපාරයට තමයි එම පළාත්පාලන ආයතනය පිහිටුවීමේ සදාචාරාත්මක අයිතිය තිබෙන්නේ. ඒ නිසා අපේ 423 දෙනා කිසිදු තැනක මුදලට හෝ වෙන වරප්‍රසාදවලට හෝ - දෙහිවල වාගේ තැන්වල සමහර අය යෝජනා කළා, "නගරාධිපති ධුරය දෙන්නම්. ඔයගොල්ලන්ගේ සහාය දෙන්න" කියලා. අපි කිව්වා, "ඒක ප්‍රතිපත්තියක් හැටියට වැරදියි. අපිට එහෙම ඡන්ද ප්‍රමාණයක් ලැබී නැහැ, නගරාධිපති ධුරය හොබවන්න." කියලා. තංගල්ල නගර සභාවෙන් පවා එවැනි යෝජනාවක් ආවා. නමුත් අපි කිව්වා, "ඒක සාධාරණ නැහැ. පළාත්පාලන ආයතනයක වැඩිම ඡන්ද සංඛ්‍යාව අරගෙන තිබෙන මන්ත්‍රීවරු කණ්ඩායම හිමි කණ්ඩායමට සභාවක් පිහිටුවා ගන්න දෙන්න." කියලා. එවැනි දේශපාලන සංස්කෘතියකින් තමයි ඒක බේරන්න පුළුවන්කම තිබෙන්නේ. එහෙට-මෙහෙට විකිණෙනවා නම් - මම දැක්කා, ගාල්ලේ 7 දෙනෙකුම එහෙට-මෙහෙට විකිණෙනවා.- විකිණෙන මන්ත්‍රීවරුන් ඉන්නා තැනක ඡන්ද ක්‍රමවලින් ස්ථාවරත්වය බලාපොරොත්තු වෙන්න එපා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඡන්ද ක්‍රම හදන්නේ ශිෂ්ට සම්පන්න දේශපාලනයක් තිබෙන රටකටයි. දේශපාලනය අශිෂ්ටත්වයට ගිහිල්ලා, මන්ත්‍රීවරුන් විකුණන තැනට ඇවිල්ලා ඡන්ද ක්‍රමවලින් බොහෝ දේවල් බේරා ගන්න අපේක්ෂා කරනවා. නමුත් බොහෝ දේවල් බේරා ගත හැකි වන්නේ, ඡන්ද ක්‍රමවලින් නොවෙයි, දේශපාලන සංස්කෘතියේ ඇති කර ගන්නා ලද වෙනසකින්.

පළාත් පාලන මැතිවරණයේදී පැරණි සමානුපාතික ඡන්ද ක්‍රමයට විශාල විවේචනයක් තිබුණා. ඒ වේලාවේත් අපි පෙන්වා දුනු ලැබුවා, මේ ප්‍රශ්නය තිබෙන්නේ ඡන්ද ක්‍රමයේ නොවෙයි කියලා. හැබැයි, එතකොට අපිට කිව්වා, "සමානුපාතික මනාප ඡන්ද ක්‍රමයෙන් 'ජවිපෙ'ට වාසියක් තිබෙනවා. ඒකෙන් ඉවත් වෙන්න අකැමැති නිසා තමයි, මේකට එරෙහිව කථා කරන්නේ." කියලා. නමුත් ඊට පසුව කොටියාසයට නියෝජිතයෙක් ඕනෑය කියලා කිව්වා, මනාප ක්‍රමය අහෝසි වෙන්න ඕනෑය කියලා කිව්වා, ජනතාවගේ කැමැත්තේ සාධාරණ පිළිබිඹුවක් ආයතනවල සිදු වෙන්න ඕනෑය කියන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණය ගැන කිව්වා. ඒ ලක්ෂණවලින් සමන්විත ඡන්ද ක්‍රමයක් හදලා තිබෙනවා. මේ ඡන්ද ක්‍රමය ගත්තොත්, මනාප ක්‍රමය ඉවත් වෙනවා; කොටියාසයට මන්ත්‍රීවරයෙක් ලැබෙනවා; ඒ වාගේම සමානුපාතිකය නියෝජනය වෙනවා. ඒ නිසා ජනතාවගේ කැමැත්තේ සාධාරණ පිළිබිඹුවක් හැදෙන ඡන්ද ක්‍රමයක් සකස් වී තිබෙනවා.

කාසියක් උඩ දමා සභාපති තෝරන තත්ත්වයක් ඇති වී තිබෙනවා කියලා සමහර අය කියන ආකාරය මම දැක්කා. තැන් දෙකක මේක වුණා. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හරියට ගත්තොත් අපේ රටේ ජනාධිපති තෝරන්නෙත් සමහර වේලාවට කාසියක් උඩ දමලා තමයි. එසේ සභාපතිවරුන් දෙදෙනෙක් තේරුවාම, මුළු ඡන්ද ක්‍රමය සම්බන්ධවම ඒත්තු ගන්වන්න හැදුවා, "කාසිය උඩ දමා සභාපති තෝරනවා. ඒක විකෘතියක්." කියලා. හැබැයි, ජනාධිපති තෝරන අවස්ථාවේදී පළමුවැනි වර කාටවත් සියයට 51ක් තිබුණේ නැත්නම්, ප්‍රධාන දෙදෙනා අතර දෙවැනි මනාපය ගණන් කරනවා. එවරත් සමාන වුණොත්, තුන්වැනි මනාපය ගණන් කරනවා. ඒකත් සමාන වුණොත්, කාසියක් උඩ දමනවා. ජනාධිපති තෝරන්නේ එහෙම තමයි. ඒ නිසා තැන් දෙකක සභාපතිවරයා සමාන වීම නිසා, මුළු ඡන්ද ක්‍රමයකටම දෝෂාරෝපණය කරන එක වැරදියි. අඩුපාඩුකම් තිබෙනවා නම්, වෙනස් කර ගන්න ඕනෑ.

ඊට පසුව තමයි පළාත් සභා ඡන්ද ක්‍රමය එන්නේ. පළාත් සභා ඡන්ද ක්‍රමයේත් මූලික ගති ලක්ෂණ තිබෙනවා. මොකක්ද? කොටියාසයට මන්ත්‍රීවරයෙක්, මනාප ක්‍රමය ඉවත් වෙනවා, සමානුපාතිකයට අනුව මන්ත්‍රීවරුන් සංඛ්‍යාව තේරෙනවා, පළාත්පාලන ආයතනවල අස්ථාවරත්වය පිළිබඳව බියක් තිබුණා නම්, ඒකත් නැති කරන්න බෝනස් මන්ත්‍රීවරුන් දෙදෙනා ආරක්ෂා කරලා තිබෙනවා.

පළාත් පාලන මැතිවරණයේදී ඒ බෝනස් මන්ත්‍රීවරුන් දෙදෙනා ඉවත් කළා. නමුත් මෙහිදී බෝනස් මන්ත්‍රීවරුන් දෙදෙනාත් ආරක්ෂා කර තිබෙනවා. පැරණි මැතිවරණ ක්‍රමය යටතේ යම් පක්ෂයකට මන්ත්‍රී ධුර සංඛ්‍යාවක් ලැබුණා නම්, මෙම මැතිවරණ ක්‍රමය යටතේත් එම මන්ත්‍රීවරුන් සංඛ්‍යාව එලෙසම ලැබෙනවා. ඒ නිසා මේ මැතිවරණ ක්‍රමය නිසා පළාත් සභාවක් කිසිසේත්ම අස්ථාවරභාවයට පත් වෙන්නේ නැහැ. එහෙම අස්ථාවරභාවයට පත් වෙනවා නම් කලිනුත් අස්ථාවරභාවයට පත් වෙන්න ඕනෑ. මොකද, බෝනස් මන්ත්‍රීවරුන් දෙදෙනා මෙම මැතිවරණ ක්‍රමය යටතේත් යෝජනා කර තිබෙන නිසායි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් ඇති වී තිබෙන ප්‍රශ්න කුමක්ද? මේ සීමා නිර්ණයත් එක්ක ප්‍රශ්නයක් මතු කර තිබෙනවා. මේ අවස්ථාවේදී, රවුෆ් හකීම් අමාත්‍යවරයා මේ සභාවේ සිටියා නම් හොඳයි. මොකද, එතුමාගේ කථාවේදී එතුමා වැරදි අර්ථ කථනයක් දුන්නා. සීමා නිර්ණය කොමිසම විසින් එවන ලද වාර්තාවක් කථානායකතුමා ඇතුළු හැම මන්ත්‍රීවරයකුගේම මේසය මත තිබෙනවා. එම වාර්තාව හැමදෙනාම කියවනවා ඇතැයි කියා මා බලාපොරොත්තු වෙනවා. ගරු රවුෆ් හකීම් ඇමතිතුමා කියනවා, පැවති මැතිවරණ ක්‍රමය අනුව පසුගිය පළාත් සභා මැතිවරණ සංසන්දනය කරලා බැලුවොත්, පළාත් සභා සියල්ලේම මුස්ලිම් මන්ත්‍රීවරුන් 43 දෙනෙක් සිටියාය කියලා. එතකොට මේ මැතිවරණ ක්‍රමය අනුව ගණනය කරන්නේ කොහොමද? මේ සියයට 50කටයි. තව සියයට 50ක් ලැයිස්තුවෙන් පත් කරනවා. මේ සියයට 50 දිහා බලා කියනවා, 43ක්ව තිබුණු මන්ත්‍රී ධුර සංඛ්‍යාව 13 දක්වා අඩුවෙලා තිබෙනවාය කියලා. එය අසත්‍යයක්. 43ක්ව තිබුණු මන්ත්‍රී ධුර සංඛ්‍යාව 13 දක්වා අඩුවෙලා නැහැ. හැබැයි මේ කොමිෂන් සභා වාර්තාව පෙන්වා තිබෙනවා, පසුගිය මැතිවරණ ක්‍රමය හා සංසන්දනය කර බලනකොට මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව 3කින් පමණ, ඒ කියන්නේ කොටියාස පදනමින් සියයට 50 සංසන්දනය කරලා බැලුවොත්, මුස්ලිම් මන්ත්‍රීවරුන් තිදෙනෙකුගේ අඩුවක් තිබෙනවාය කියලා පෙන්වනවා; දෙමළ මන්ත්‍රීවරුන් පස්දෙනකුගේ අඩුවක් සිදු වනවාය කියලා පෙන්වනවා. කොටියාස පදනමින් සියයට 50ක් එක්ක සංසන්දනය කරලා බැලුවාම මුස්ලිම් අයගේ 3ක් අඩුවෙනවා. දෙමළ අයගේ 5ක් අඩු වෙනවාය කියලා. ඒ විතරක් නොවෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ මැතිවරණ ක්‍රම හැදෙන්න ඕනෑ මොකටද කියලා අපි අවධානය යොමු කරන්න කැමැති. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, යම් යම් දේශපාලන පක්ෂ තමන්ගේ ජාතිකත්වය පදනම් කරගෙන දේශපාලන ව්‍යාපාර හදාගෙන තිබෙනවා. දේශපාලන පක්ෂයක් හැටියට අපි එයට එකඟ නැහැ. අපේ රටේ තිබෙන්න ඕනෑ, ජාතික දේශපාලන

[ගරු අනුර දිසානායක මහතා]

ව්‍යාපාරයි. සෑම දේශපාලන ව්‍යාපාරයක්ම සිංහල, දෙමළ, මුස්ලිම් ජනයාගේ අයිතීන් නියෝජනය කරන සහ ඔවුන්ගේ නියෝජිතයන් නියෝජනය වන දේශපාලන ව්‍යාපාර බවට පත් විය යුතුව තිබෙනවා. අපේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් ජනයා අතර ගැටුමක්, බෙදීමක් ඇති වී තිබෙනවා නම්, මේ ගැටුම, බෙදීම පිටුපස තිබෙන්නේ, එක් එක් ජන කොට්ඨාසයන් පදනම් කරගෙන ගොඩ නැඟූ දේශපාලන ව්‍යාපාරයි. අදත් සිංහල, දෙමළ, මුස්ලිම් ජනයා අතර සමඟිය පලුදු වීමකට ලක් වී තිබෙනවා නම්, යම් මනෝභාවයක්, ගැටුම්කාරී තත්ත්වයක් ඇති වී තිබෙනවා නම් එයට ප්‍රධාන සාධකය මේ ජන කණ්ඩායම් මත පදනම්ව දේශපාලන ව්‍යාපාර ගොඩ නැඟී තිබීමයි. යම් ජාතිකත්වයක් මත පදනම්ව දේශපාලන ව්‍යාපාරයක් ගොඩ නැඟුවාම එම දේශපාලන ව්‍යාපාරය එම ජනතාව කේන්ද්‍ර කරගෙන තමන්ගේ දේශපාලනය ගොඩ නඟන්න අත්‍යන්තයෙන්ම පෙලඹෙනවා. එයට ජාතිවාදය උපයෝගී කර ගන්නවා, එයට ප්‍රාදේශීයවාදය උපයෝගී කර ගන්නවා, එයට කථා කරන භාෂාව උපයෝගී කර ගන්නවා, එයට තමන්ගේ සංස්කෘතිය උපයෝගී කර ගන්නවා. මේ සියල්ල උපයෝගී කර ගන්නේ කුමක් වෙනුවෙන්ද? තමන්ට මන්ත්‍රීවරුන් වැඩි සංඛ්‍යාවක් ලබා ගැනීම වෙනුවෙනුයි. ඒක තමයි වෙලා තිබෙන්නේ.

අද අපේ රටේ ජනතාව අතර ඇති වී තිබෙන බෙදීමේ ප්‍රධාන ලක්ෂණය තමයි දේශපාලනික වශයෙන් එක් එක් ජන කොට්ඨාසයන් පදනම් කරගෙන දේශපාලන ව්‍යාපාර ගොඩ නැඟී තිබීම. මැතිවරණ ක්‍රමයක් හදන්න ගියත්, රටකට නීතියක් හදන්න ගියත් දැන් පෙරටු කර ගන්නේ මොකක්ද? අපට කියද, අපේ නියෝජනය කුමක්ද කියන එකයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒකද විය යුතු වන්නේ? යම් නීතියක් හදනකොට ඒ නීතිය රටේ පොදු නීතියක් බවට පත් විය යුතුයි. අපි හැමදෙනාම ඒ නීතියට යටත් විය යුතුයි. ඒ නීතිය හැමදෙනාටම බලපාන්නේ කොහොමද කියන සාකච්ඡාවකට තමයි අපි යා යුතු වන්නේ. හැබැයි අපි නීතියක් හදනකොට කල්පනා කර බලනවා ඒ තුළින් මුස්ලිම් අයට කොහොම වෙයිද, දෙමළ අයට කොහොම වෙයිද, කඳුකරයේ දෙමළ අයට කොහොම වෙයිද, දකුණේ සිංහල අයට කොහොම වෙයිද කියලා. රටකට එහෙම නීති හදන්න ඕනෑද? මැතිවරණ ක්‍රමයක් හදනකොටත් අපි බලනවා දෙමළ අයට මොකක් වෙයිද, මුස්ලිම් පක්ෂයට මොකක් වෙයිද, සිංහල පක්ෂයට මොකක් වෙයිද කියලා. එහෙම කරන එක වැරැදියි. මැතිවරණ ක්‍රමයක් සැකසිය යුතු වන්නේ ජනතාවගේ කැමැත්තේ සාධාරණ පිළිබිඹුවක් එම ආයතන තුළ සිද්ධ වන ලෙසයි. හැබැයි එම ආයතන තුළ එම ජන කොට්ඨාසයන්ගේ සාධාරණ නියෝජනයකුත් තිබෙන්න ඕනෑ. දේශපාලන පක්ෂවලට ඒකේ වග කීමක් තිබෙනවා. ඒකේ වග කීමක් තිබෙන්නේ ඒ ඒ ජන කොට්ඨාස මත පදනම් කර ගත් දේශපාලන ව්‍යාපාරවලට පමණක් නොවෙයි.

අපේ හැම දේශපාලන ව්‍යාපාරයකටම වගකීමක් පැවරී තිබෙනවා, අපේ රටේ තිබෙන මේ නියෝජනය සකස් වෙන්නේ කොහොමද කියන කාරණය සම්බන්ධයෙන්. ඒ විතරක් නොවෙයි, අපේ රටට ජනාධිපතිවරයෙක්, අගමැතිවරයෙක්, බලගතු අමාත්‍යවරයෙක් බවට අනික් ජන කොට්ඨාසයන්ගෙන් පත් වීමේ ඉඩකඩ හැදෙන්නේ කොහොමද කියලා කල්පනා කරනවා. පොදු - සාමූහික- තත්ත්වයකට අපේ රට ගෙන එන්නේ නැතිව, තම- තමන් කථා කරන භාෂාව අනුව, සංස්කෘතිය අනුව, තමන්ගේ අනන්‍යතාව අනුව සහ තමන්ගේ ජාතිකත්වය මත පදනම් කරගෙන ඡන්ද ක්‍රමය ඉල්ලා සිටීම ඒ තරම් යුක්ති සහගත නැහැ කියන එක තමයි අපගේ ස්ථාවරය වන්නේ. හැබැයි, අපි මොන තරම් ලාංකීය ජාතිය ගැන කථා කළත්, වළක්වන්න බැරි විධියටම මේ එක් එක් ජාතිකත්ව පදනම් කර ගත් විෂමතාවක් අපේ රටේ තිබෙන බව අපි පිළිගන්නවා. ඒ විෂමතාව අවම වීම සඳහා, එම විෂමතාව තුනී කිරීම සඳහා අපි සැලැසුම් හදන්න ඕනෑ. එතෙක් ඒ ඒ ජන කොට්ඨාසයන් නියෝජනය වීම සඳහා යම් වගන්ති ඇතුළත් වන එකට අපි එකඟයි. හැබැයි, ඒක කවදාවත් අවසන් වගන්ති බවට පත් විය යුතු නැහැ. ලාංකීය ජාතිය ගොඩ නඟන්න කාලයක් ගත වනවා. අපි බෙදෙන්නද, අපි ඈත් වෙන්නද; අපි ඡන්දය ක්‍රමය ඉල්ලා සිටින්නේ අපේ නියෝජනය වැඩි කර ගන්න කියලාද; ඡන්ද ක්‍රමය ඉල්ලා සිටීමෙන් අපිට හානියක් සිදු වෙනවාද? නැහැ. රටක් හැටියට පොදුවේ මේ ඡන්ද ක්‍රමය හිතකරද, අහිතකරද කියන කාරණයයි අපි කල්පනා කළ යුතු වන්නේ. නමුත් බොහෝ අය මොකක්ද කරන්නේ? මා මේ විවෘතවයි මෙම කාරණා කියන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කිසිවෙක් තමන්ගේ පක්ෂයේ නියෝජනය වැඩි කර ගන්නේ තමන්ගේ ජනතාව ගැන කල්පනා කරමින් නොවෙයි. තමන්ගේ මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වැඩි වන තරමට තමන්ට වැඩි ගණනකට විකිණෙන්න පුළුවන්. මේක තමයි ඇත්ත කථාව. තමන්ගේ විකිණීම -bargaining power එක- වැඩි කර ගැනීම සඳහා තමයි සමහර යෝජනාවන් ඉදිරිපත් වෙමින් තිබෙන්නේ. ඒ නිසා ඡන්ද ක්‍රමය ගැන අපි එසේ කල්පනා කළ යුතුද? තමා බ්‍රෝකර්වරයෙක්ද? ඒවා බ්‍රෝකර්වරුන්ට කල්පනා කරන්න පුළුවන්. මට ඉඩමෙන් හොඳ, ලොකුම කෑල්ල ලැබුණොත් වැඩි ගණනට විකුණා ගන්න පුළුවන්. ඉඩමෙන් අඩු ගණනට ගලක්, වළක් තිබෙන තැනක් දෙන එක බ්‍රෝකර්ලාගේ වැඩක්. හැබැයි, මොවුන් දේශපාලකයන්. දේශපාලකයන් අද ජන කොට්ඨාසයන්ගේ බ්‍රෝකර්ලා බවට පත්වෙලා තිබෙනවා. තමන්ගේ විකුණා ගැනීමේ පංගුව වැඩි කර ගැනීම සඳහා ප්‍රයත්නයක් දරනවා නම් එය කිසිසේත්ම අපි අනුමත කළ යුතු නැහැ. ඒ නිසා මෙම පළාත් සභා ඡන්ද ක්‍රමය නිකම් ආවාට ගියාට කථා කළ යුතු දෙයක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේදී මේ ඡන්ද ක්‍රමයන් පිළිබඳව දීර්ඝ කාලයක් තිස්සේ සාකච්ඡා කළා. මේ තිබෙන ඡන්ද ක්‍රමය වෙනස් කිරීම පිළිබඳව දීර්ඝ කාලයක් තිස්සේ ඒ වෙලාවේ බලයට පත් වන කණ්ඩායම් විසින් ජනතාවට පොරොන්දු ලබා දී තිබුණා. විශේෂයෙන්ම ජනවාරි මාසයේ 08 වැනිදා මෛත්‍රීපාල සිරිසේන මහත්තයා ජනාධිපති ධුරයට පත් වනකොට එතුමාගේ පොරොන්දු අතර විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනවා හා සමාන ලෙස බරකින් මේ ඡන්ද ක්‍රමය වෙනස් කිරීම පිළිබඳව තිබුණා. ඡන්ද ක්‍රමය වෙනස් විය යුතුයි කියන මතයක් තිබුණා. ඒ සඳහා සාකච්ඡාවකින් අනතුරුව ඡන්ද ක්‍රමයක් හැදුවා. පෙබරවාරි මාසයේ 10 වැනිදා ඡන්ද ප්‍රතිඵල දිහා බලලා කියනවා, "දැන් අපි ඡන්ද ක්‍රමය වෙනස් කරමු" කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බැරි වෙලාවත් පෙබරවාරි මාසයේ 10 වැනිදා ඡන්ද ප්‍රතිඵලය වෙන අතකට හැරුණා නම්, "ඡන්ද ක්‍රමය වෙනස් කරන්න" කියලා අද කවුරුවත් ඇවිල්ලා කියන්නේ නැහැ. ඡන්ද ක්‍රමය හොඳද, නරකද කියලා මනින්නේ තමන්ට ලැබෙන ඡන්ද ප්‍රමාණය සහ මන්ත්‍රීවරු සංඛ්‍යාව අනුවද? පෙබරවාරි මාසයේ 10 වැනිදාට පෙර මේ ඡන්ද ක්‍රමයට පක්ෂව මේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක් අනුමැතිය ලබා දුන්නා. මට පෙර කථා කරපු රවුල් හකීම් අමාත්‍යවරයාත් ඒ ඡන්ද ක්‍රමයට අනුමැතිය ලබා දුන්නා. එක්සත් ජාතික පක්ෂයේත් සමහර මන්ත්‍රීවරු -කරුණාරත්න පරණවිතාන මහත්මයා,- ඡන්දය ක්‍රමය ගැන කථා කරනවා මම අහගෙන හිටියා. එතුමාගේ පක්ෂය හෙළ උරුමයද, එක්සත් ජාතික පක්ෂයද කියලා කියන්න මට හරියට තේරුමක් නැහැ. කෙසේ හෝ එතුමාත් මේ ඡන්ද ප්‍රතිඵලයෙන් පස්සේ දැන් ඡන්ද ක්‍රම ගැන කථා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඡන්ද ක්‍රමය අනික් පැත්තට හැරුණා නම් ඕක නොවෙයි සාකච්ඡාව. ඡන්ද ක්‍රමයකින් තමන්ට ලැබී තිබෙන ප්‍රතිඵල මත ඡන්ද ක්‍රමයක් විශ්ලේෂණය කිරීම සාධාරණද? එය සාධාරණ නැහැ. හැබැයි, ඡන්ද ක්‍රමයෙන් පස්සේ ඇති වෙච්ච තත්ත්වය බලන්න. මන්ත්‍රීවරු 8,000ක් පමණ වැඩි වී තිබෙනවා. ඒ ප්‍රමාණය අඩු කරන්නේ කොහොමද? සභාවන්ගේ ස්ථාවර භාවය පිළිබඳව යම් ගැටලුවක් මතු විය හැකියි. එය ස්ථාවර කිරීම සඳහා අපි මීට ඇතුළත් කළ යුතු වගන්ති කුමක්ද? ඒ දිසාවෙන් බලනවා මිසක් "මේ ඡන්ද ක්‍රමය අනුව පෙබරවාරි මාසයේ 10 වැනිදා ඡන්දය පරාදයි. ඒ නිසා ඡන්ද ක්‍රමය වෙනස් කළොත් අපිට වාසියක් වෙයි" කියලා තමන්ට වාසි වන විධියට ඡන්ද ක්‍රමය වෙනස් කරන්න යන්න එපා. ඇයි, ඒ? තමුන්නාන්සේලා මේ ඡන්ද ක්‍රමවලින්ම තමුන්නාන්සේලාගේ පැවැත්ම හදා ගන්න යන්න එපා.

බලන්න, ඊයේ මධ්‍යම රාත්‍රී 12.00ට තෙල් මිල වැඩි කළා. සියලුම මාධ්‍ය ආයතන වාර්තා කළා, "මධ්‍යම රාත්‍රී 12.00ට තෙල් මිල වැඩි කරනවා" කියලා. තෙල් පිරවුම්හල්වල පෝලිම් තිබෙනවා මම දැක්කා. මම මේ කියන්නේ ජනතාව මුහුණ දී තිබෙන දුෂ්කරතාව පිළිබඳවයි. පෙට්‍රල් ලීටරයක, ඩීසල් ලීටරයක මිල වැඩි වනවාය කියලා දැන ගත්තාම ජනතාව රු. 12.00 දක්වා හෝ පෝලිමේ ඉඳලා තෙල් ටිකක් ගහ ගන්නවා. ඒක අඩු තරමින් ලීටරයකින් රුපියල් 7ක, රුපියල් 9ක වාසියක්. ටැංකියට බවුසර් ගණන් තෙල් ගහන්නත් බැහැ. නමුත් ඒ වාසිය හෝ අපේක්ෂාවෙන් පැය දෙක තුනක් පෝලිමේ ඉඳලා තෙල් ටිකක් ගහ ගන්නවා. ඔවුන් එසේ කරන්නේ අඩුම තරමින් ඒ වාසිය හෝ තමන්ගේ ජීවිතයට වැදගත් වනවාය කියලා දන්නා නිසයි.

හැබැයි, දැන් වෙලා තිබෙන්නේ මොකක්ද? මම දැක්කා, මාධ්‍ය වාර්තා කරලා තිබෙනවා, "තෙල් පරණ මිලටම දෙන්න" කියලා ජනාධිපතිවරයා කියලා තිබෙනවා කියලා. ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ -CEYPETCO එකේ- වැඩ බලන කළමනාකාර (අළෙවි) ඩබ්ලිව්.ඩී.එල්.සී. අබේගුණවර්ධන මහතා විසින් නිකුත් කරන ලද නිවේදනයක් මා ළඟ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිවේදනයේ "ඉන්ධන මිල ගණන් සංශෝධනය" යන මාතෘකාව යටතේ මෙසේ සඳහන් වනවා:

"සියලුම CEYPETCO බෙදුම්කරුවන් වෙත. හිතවත් බෙදුම්කාර මහත්මියනි, මහත්වරුනි. ඔබ අප සංස්ථාව සමඟ අත්සන් තබා ඇති බෙදුම්කාරත්ව ධුර ගිවිසුම් පත අනුව, සංස්ථාවේ ලිඛිත අවසරයකින් තොරව ඔබගේ බෙදුම් පොළෙහි ඉන්ධන මිල ගණන් සංශෝධනය කළ නොහැක. තවද, මාධ්‍ය ආයතනවල පළවන පුවත්පත නම් කර ඔබ පිරවුම් පොළෙහි ඉන්ධන මිල ගණන් වෙනස් කිරීම කිසිසේත්ම සිදු නොකළ යුතු අතර, එය බෙදුම්කාර ගිවිසුම් බරපතළ ලෙස උල්ලංඝනය කිරීමකි. ඉහත කරුණු ඔබ වෙත නැවත සිහිකැඳවීම් පිණිස දන්වන අතර, එයට අනුගතවීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වා සිටිමු."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව කියන්නේ මොකක්ද? පත්තරවල, විද්‍යුත් මාධ්‍යවල තෙල් මිල වැඩි කළා කියලා සඳහන් වුණාට, අප අතර තිබෙන ගිවිසුම අනුව තෙල් මිල වැඩි කරන්න බැහැ කියලායි කියන්නේ. දැන් මේ රටට වග කියන්නේ කවුද? මුදල් අමාත්‍යාංශයෙන් නිවේදනයක් නිකුත් කරනවා, "තෙල් මිල වැඩි කරනවා" කියලා. ජනාධිපතිවරයා නිවේදනයක් නිකුත් කරලා කියනවා, "තෙල් පරණ මිලටම දෙන්න" කියලා. තෙල් සංස්ථාව අළෙවි නියෝජිතයන්ට කියනවා, "ඔය ගොල්ලන් සහ අප අතර තිබෙන බැඳීම අනුව, මාධ්‍ය වාර්තා අනුව ඔයගොල්ලන්ට තෙල් මිල වැඩි කරන්න අයිතියක් නැහැ. අපි කියනකම් ඉන්න" කියලා. CEYPETCO එකෙන් තෙල් මිල වැඩි කරන්න කියලා කියලත් නැහැ. එහෙම නම්, සියලුම අළෙවිකරුවන්ගේ බලපත්‍ර cancel කරන්න ඕනෑ. ඇයි? CEYPETCO එකේ අවසරයකින් තොරව තෙල් මිල වැඩි කිරීම පිළිබඳව. හැබැයි, ඒකට අළෙවිකරුවන් වග කියන්න ඕනෑ නැහැ, ආණ්ඩුවක් හැටියට. තමුන්නාන්සේලා ආණ්ඩුවක් නැති තත්ත්වයක් රටේ හදලා; වගකියන්න කෙනෙක් නැති තත්ත්වයක් හදලා, අරාජිකත්වයක් හදලා, ඡන්ද ක්‍රම තමයි මේකට හේතුව කියලා ඊටපසු කල්පනා කරනවා.

2018 පෙබරවාරි මාසයේ 10 වෙනිදා ඇති වූ ප්‍රතිඵලයට හේතුව ඒ පැවැති ඡන්ද ක්‍රමය නොවෙයි. තමුන්නාන්සේලා රටක් පාලනය කරන්නේ නැහැ; රටකට වග කියන්නේ නැහැ; වගකිව යුතු ලෙස කටයුතු කරන්නේ නැහැ. ඒ නිසා තමුන්නාන්සේලාට දේශපාලනික වශයෙන් අත්පත් වී තිබෙන ඉරණම ඡන්ද ක්‍රමයක් මත සංසන්දනය කරන්න එපා. පළාත් සභා ඡන්ද ක්‍රමය පිළිබඳ නව සංශෝධනයක් පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක ඡන්දයෙන් සම්මත කරලා තිබෙනවා. අපි ඒ ඡන්ද ක්‍රමයට දායකත්වය ලබා දීලා තිබෙනවා. අපි දායකත්වය ලබා දුන්නේ කුමන අරමුණකින්ද? දිගින් දිගටම ඉල්ලා සිටියා, සමානුපාතික ඡන්ද ක්‍රමය ඉවත් විය යුතුයි; කොටියාසයකට මන්ත්‍රීවරයෙක් ලැබිය යුතුයි; මනාප ඡන්ද ක්‍රමය ඉවත් විය යුතුයි; සමානුපාතික නියෝජනයක් සකස් විය යුතුයි කියලා. මෙම ඡන්ද ක්‍රමයේ එම මූලධර්ම සකස් වී තිබෙනවා. අපි එම මූලධර්මවලට එකඟයි. ඒක අපට ප්‍රශ්නයක් නොවෙයි. අපි, මනාප ඡන්ද ක්‍රමයෙන් ලොකු ගැටලුවක් නොතිබුණ දේශපාලන ව්‍යාපාරයක්. අනෙක් අය මනාපවලට ගහ ගන්නකොට අපි මනාප නොඉල්ලපු දේශපාලන ව්‍යාපාරයක්. අනෙක් අය මනාප මත තමන්ගේ දේශපාලන පක්ෂ තුළ ගැටුම් ඇති කර ගන්නකොට, අපි මනාපයට පොර බදන්නේ නැති දේශපාලන ව්‍යාපාරයක්. එම නිසා දේශපාලන පක්ෂයක් විධියට මනාප ක්‍රමය අපට කවදාවත් අහිතකරව තිබුණේ නැහැ. හැබැයි, අපේ රටේ දේශපාලන සංස්කෘතියේ ඇති වෙලා තිබුණු බරපතළ පිරිහීමට මෙම මනාප ඡන්ද ක්‍රමය හේතු සහගත වුණු හැටි අපි දැක්කා. එක එක පක්ෂවල ගැටුම් ඇති වුණු ආකාරය පිළිබඳව හොඳ අත්දැකීමක් අපට තිබෙනවා. අපි ඒ සියල්ල තුළම පසුගිය පළාත් පාලන මැතිවරණයත් අත්වින්දා. ඒ පළාත් පාලන මැතිවරණය ලංකාවේ පැවැති මැතිවරණවලින් අඩුම ගැටුම් වාර්තා වුණු මැතිවරණයක් බවට පත් වී තිබුණා; ප්‍රචණ්ඩ සිදුවීම් අඩු මැතිවරණය බවට පත් වුණා. ඊට ප්‍රථම සාධකයක් තමයි මෙම ඡන්ද ක්‍රමය. ඒක තමයි සත්‍ය කථාව. එහෙම නැතිව ඡන්දය ඉල්ලපු හිටපු සභාපතිවරුන් නැවත බෝධිසත්වයන් වෙලා නොවෙයි. ඡන්දයෙන් පත් වුණු සභාපතිලා කටයුතු කරන ආකාරය ගැන අපි දන්නවා. නේද? හිටපු ගමන් ළමයින් පැහැර ගෙන යනවා. අන්න! නුවර එළිය පැත්තේ සභාපතිවරයෙක් ළමයින් පැහැරගෙන, හංගාගෙන ගිහිල්ලා ළමයින් විකුණනවා. තව සභාපතිවරයෙක් කසිප්පු පෙරළා අහුවෙනවා මම දැක්කා. තව සභාපතිවරයෙක් කොටන් පටවලා අහුවෙනවා. ඉතින් මේ වාගේ අය තමයි ඡන්ද කළේ. හැබැයි, ඒ අය වෙනදා ඡන්ද කරනකොට කරන්නේ කොහොමද? මුළු පළාතකම තමන්ගේ මැර බලය යොදවමින් මැතිවරණ කළා. හැබැයි, මෙදා එක කොටියාසයකට හිර වුණා. ප්‍රචණ්ඩකාරිත්වය ගැන කල්පනා කරලා බැලුවොත් ඒක ඉතාමත් අවම මැතිවරණයක් බවට පත් වුණා. අපි ඇයි ඒවා දැන් මතින්නේ නැත්තේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දේශපාලන ව්‍යාපාරවල වියදම් තත්ත්වය බැලුවාම සැලකිය යුතු ප්‍රමාණයකින් වියදම් අඩු මැතිවරණයක් බවට පත් වුණා. රවුල් හකීම් අමාත්‍යාතුමා කිව්වා, සමහර කොටියාසයන්වල මුදල් බෙදුවා කියලා. ඔව්, මම දන්නවා, නැහෙනහිර පළාතේ ඔවුන් ගිනිපෙට්ටියේ දාලා ස්ටිකරයක් එක්ක රුපියල් 5,000 කොළ බෙදපු බව. එතුමා ඒක පාර්ලිමේන්තුවේදී

[ගරු අනුර දිසානායක මහතා]

කියපු එක ගැන බොහොම සතුටුයි. එතුමා මේ ගරු සභාවේ ඉන්නවා නම් මම මුණටම කියනවා. ඉතින්, මෙහෙමයි කියන්නේ? දේශපාලන සංස්කෘතියේ එවැනි දේවල් වෙනස් කරන්න ඕනෑ.

ඒවා වෙනස් කරන්න බැහැ, ඡන්ද ක්‍රමවලින්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ස්ථාවරය මෙයයි. නව ඡන්ද ක්‍රමයක් මේ පාර්ලිමේන්තුව සම්මත කරලා තිබෙනවා. ඡන්ද ප්‍රතිඵලවලින් පස්සේ ඡන්ද ක්‍රම වෙනස් කරන එකට අපි එකඟ නැහැ. මන්ත්‍රීවරු සංඛ්‍යාව වැඩි වීම පිළිබඳව අඩුවක් තිබෙනවා නම්, ඒ ගැන සාකච්ඡා කරන්න ඕනෑ. නමුත් මේකේ එහෙම බාධාවක් නැහැ. අස්ථාවරත්වය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා නම් ඒ ගැන සාකච්ඡා කරන්න ඕනෑ. මේකේ එහෙම බාධාවකුත් නැහැ. බෝනස් එක ලැබෙනවා. මෙතැන තිබෙන්නේ යම් ජාතිකත්වයන්ගේ නියෝජනයේ ගැටලුවක් නම්, අපට ඒ ගැන සාකච්ඡා කරන්න පුළුවන්. ඒ සම්බන්ධයෙන් සීමා නිර්ණය කොමිසම විසින්ම මාතෘකාවක් ලබා දීලා තිබෙනවා. බෝනස් මන්ත්‍රීවරු සංඛ්‍යාව පහ දක්වා වැඩි කරන්න බැරිද කියන යෝජනාවක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම ඒ පහ බෙදෙන ආකාරය ගැන යෝජනාවක් ලබා දීලා තිබෙනවා. ඒ පහ බෙදෙන ආකාරය ගැන ලබා දීපු යෝජනාවලට එකඟද, නැද්ද කියන එක වෙනම සාකච්ඡාවක්. දකුණු පළාත් සභාවේ කවදාවත් මුස්ලිම් මන්ත්‍රීවරයෙක් ඉඳලා නැහැ. නමුත් ඒ යෝජනාව අනුව මුස්ලිම් මන්ත්‍රීවරුන් දෙදෙනෙක් දකුණු පළාත් සභාවට ලැබෙනවා.

ඌව පළාත් සභාවේ මුස්ලිම් මන්ත්‍රීවරුන්ට වැඩිපුර අවස්ථාවක් ලැබෙනවා. ඒක නිසා බෝනස් මන්ත්‍රීවරුන් සංඛ්‍යාව 45කින් වැඩි වුණාම -ඉතුරු 27ට අමතරව - ඒ බෝනස් මන්ත්‍රීවරුන් 45 බෙදෙන්නේ සිංහල 16යි; දෙමළ 14යි; මුස්ලිම් 15යි ලෙස. ඒක තමයි සීමා නිර්ණය කොමිෂන් සභාව දීලා තිබෙන සංශෝධනය. මා කියන්නේ ඒ සංශෝධන අපි මුළුමනින්ම පිළිගන්නවා කියන එක නොවෙයි. නමුත් එහෙම විකල්ප යෝජනා ඉදිරිපත් වෙමින් තිබෙනවා, ඒ ජාතිකත්වයන්ගේ සාධාරණ නියෝජනයක් නැත්නම් එය වෙනස් කිරීම සඳහා. එසේ නැතිව මා විශ්වාස කරන්නේ නැහැ, නැවත අපි පැරණි සමානුපාතික ඡන්ද ක්‍රමයට යා යුතුයි කියලා. ඉතාම කෙටි සංශෝධනයක් හරහා ඉතා ඉක්මනින් මේ පළාත් සභා මැතිවරණ පැවැත්වීමේ හැකියාව තිබෙනවා. අමාත්‍යතුමා ඒ පිළිබඳව තීන්දු-තීරණ අරගෙන කටයුතු කරාවි කියන බලාපොරොත්තුවෙන් මම නතර වෙනවා. මෙම අවස්ථාව ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Faiszer Musthapha. You have 25 minutes.

[2.13p.m.]

ගරු ෆයිසර් මුස්තාපා මහතා (පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යතුමා)
(மாண்புமிகு பைசர் முஸ்தபா - மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Faiszer Musthapha - Minister of Provincial Councils, Local Government and Sports)
Hon. Deputy Speaker, I am thankful for the opportunity to speak on the Adjournment Motion dealing with Provincial Councils and their Electoral System.

Firstly, I would like to state in this House that the Provincial Councils Elections cannot be delayed at any cost. Since the Hon. Anura Dissanayake is leaving the House, I would like to mention something before he goes. Political parties should think of the country first before they think of their pound of flesh. I am very thankful to the Hon. Member - I know that the PR System would be more beneficial to the JVP than a Mixed System - for realizing the consequences the country had faced as a result of the Preferential Vote System.

The responsibility of holding the Provincial Councils Elections does not lie only with the Government, but with the entire 225 Members. Normally, being the Minister of Provincial Councils and Local Government, the finger would be pointed at me. But, as you all know, my function was to table the Delimitation Committee Report and I did it within the time.

Today, we are debating, not the Provincial Councils Electoral System, but the Delimitation Committee Report. I state with responsibility that the Delimitation Committee appointed should take the total responsibility with regard to this mess. I wrote to the Delimitation Committee requesting that before the Report was handed over to me that an All Party Conference be called, that all Parties be consulted and consequent to that, the Report be tabled to be gazetted. Sir, I **table*** that letter written by me to Mr. K Thavalingam, Chairman of the Delimitation Committee and also the Report of the Delimitation Committee.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම සීමා නිර්ණය කමිටුවෙන් ඉල්ලීමක් කළා, තමුන්නාන්සේලා මේ වාර්තාව හෙළිකරන්න කලින් සියලුම දේශපාලන පක්ෂ සමඟ සාකච්ඡා කරන්න අවස්ථාව දෙන්න කියලා. මම ලිඛිතව ඒ ඉල්ලීම කළා. ඒ උදවිය මොනවාද කිව්වේ? ඒ සඳහා නෛතික ප්‍රතිපාදන නැහැ කිව්වා. අද අපි මේ සභාවේ විවාද කරන්නේ මේ ක්‍රමය පිළිබඳව නොව, සීමා නිර්ණය වාර්තාව පිළිබඳවයි. සීමා නිර්ණය වාර්තාවේ අඩුවක් තිබියදී අපට ඡන්ද ක්‍රමයේ වෙනසක් ඇති කරන්න බැහැ. අද වන විට සමහර පළාත් සභාවල කාලය අවසන් වී තිබෙනවා; ආණ්ඩුකාරවරුන්ගේ පාලනයට යටත් වී තිබෙනවා. It affects the franchise of the people. As regards to the Local Government Elections, I would like to state this. බැසිල් රාජපක්ෂ මැතිතුමා ක්‍රමවේදයක් ඉදිරිපත් කළා. එම ක්‍රමවේදයට අනුව සියයට 75ක් කොට්ඨාස ක්‍රමය යටතේත්, සියයට 25ක් සමානුපාතික ක්‍රමය යටතේත් තෝරන්න පුළුවන්. සියයට 25ක් කිව්වාට සියයට 23යි එන්නේ. ජනතා විමුක්ති පෙරමුණ වැනි ප්‍රගතිශීලී ප්‍රක්ෂ මේ ගැන දිගින් දිගටම කථා කළා. නමුත්, අපට සියලුම දේශපාලන පක්ෂවල එකඟත්වයෙන්, එක් වට මේස සාකච්ඡාවකින් අවශ්‍ය කරන වෙනස්කම් කිරීමේ හැකියාව තිබුණා. සමහර අය කිව්වා, අවුරුදු දෙකහමාරක් ගත්තා කියලා. ඔව්, කාලයක් ගත්තා. හැබැයි, අපට සියලු දෙනාගේම එකඟත්වය අවශ්‍ය වුණා. ඒ එකඟත්වය ලැබුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම PAFFREL, CMEV යන ඡන්ද නිරීක්ෂණ සංවිධාන ඊයේ මට හමුවුණා. කිසිසේත්ම ඡන්ද ක්‍රමය වෙනස් කරන්න එපා, අපි ප්‍රගතිශීලී

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

ගමනකට ඇවිල්ලා තිබෙන්නේ, ඒ මිශ්‍ර ක්‍රමය තුළින් දූෂණය අඩු වෙනවා කියලා තමයි ඒ උදවියත් කිව්වේ. The preferential vote has created intra-party rivalry. The last Local Government Election was the most peaceful election in the history of Sri Lanka. So, we have to consider these aspects. මේ සභාවේ සමහර මන්ත්‍රීවරු ඇඳුම් ඇඳගෙනද කථා කරන්නේ කියන ප්‍රශ්නය මතු වෙනවා. එදා තුනෙන් දෙකක පිරිසක් ඡන්දය දීලා, මේ ක්‍රමය වර්ණනා කළා. දැන් කියනවා, මේ ක්‍රමය හොඳ නැහැ කියලා. හරියට අර මෙසන් බාස්ගේ කථාව වාගේ. ගෙයක් හදනකොට upset එක තිබෙන්නේ ආයුධවල කියන එක තමයි ඔවුන් කියන්නේ. ගරු රවුෆ් හකීම් අමාත්‍යතුමාත් මේකට අත ඉස්සුවා. අත ඉස්සුවා නම් එතුමාට වග කීමක් තිබෙනවා. මොකද, තමුන්නාන්සේලා ජනතාවගේ පරමාධිපත්‍ය ක්‍රියාත්මක කරන්නේ. එදා අත උස්සලා අද කියන්න බැහැ, "අපි දැනගෙන හිටියේ නැහැ, ආණ්ඩුවට අපි එකඟතාවක් දුන්නා කියන එක". අපි මේ පාර්ලිමේන්තුවේ වගකීම ආරක්ෂා කරන්න ඕනෑ. No Hon. Member can raise his hand in this House without responsibility and here, we are talking about minority representation. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, බොහෝ සුළු ජාතික පක්ෂ ජාතික පක්ෂයක footboard එකේ නැඟලා ජාතිවාදයෙන් ඡන්ද කරලා මනාප අරගෙන ඒ අයගේ මන්ත්‍රීධුර වැඩිකර ගන්නවා කියා අපි දන්නවා. මේ ක්‍රමය යටතේ ඒ අවස්ථාව නැතිවෙන එක තමයි ඔවුන්ට තිබෙන ප්‍රශ්නය. එහෙම නැතුව මේ ඡන්ද ක්‍රමය තුළ මන්ත්‍රීධුර බෙදන්නේ සමානුපාතික ක්‍රමයටයි. එම නිසා කිසිම ජාතියකට අවාසිදායක තත්ත්වයක් උදාවෙන්නේ නැහැයි කියන එක මම වග කීමකින් යුතුව ප්‍රකාශ කරනවා.

Hon. Deputy Speaker, no Party, no citizen in this country should think only of their community. Unfortunately, they do not think of their community, but only about how best they could bargain. "මන්ත්‍රී සංඛ්‍යාවක් අරගෙන මට හොඳම ඇමතිකමක් ගන්න පුළුවන් කොහොමද, මට මගේ මන්ත්‍රීධුරය පාවිච්චි කරලා මහ ඇමති වෙන්න පුළුවන් කොහොමද" කියන එක ගැන තමයි බලන්නේ. අපි නැඟෙනහිර පළාතේ දැක්කානේ. තනතුර හදාගන්න මන්ත්‍රී සංඛ්‍යාව එකතු කරනවා. හැබැයි, බොහෝ පක්ෂ තනිවම තරග කරන්නේ නැහැ; ජාතික පක්ෂත් සමඟයි තරග කරන්නේ. Footboard එකේ නැඟලා, මන්ත්‍රීධුර අරගෙන, අන්තිමට ජාතියත් විකුණනවා. මම සුළු ජාතිකයෙක් වුණත්, මම රටට ආදරෙයි.

මා මුලින්ම මේ රට දිහා බලන්නේ, ලාංකිකයකු හැටියට. නොයෙක් අය මට නොයෙක් දේවල් කියන්න පුළුවන්. අපි අවුරුදු 30ක් ත්‍රස්තවාදයෙන් බැට කෑවා. අපි බැට කෑවේ මොනවාටද? ඒ ලාංකිකයන් හැටියට මේ රට ඉදිරියට ගෙන යන්නයි. මෙතැන කථා කරනවා, මුස්ලිම් ප්‍රජාවගේ ඡන්ද අඩුවෙන එකක් ගැන. මුස්ලිම් ප්‍රජාවගේ ඡන්ද අඩුවීමක් වෙන්නේ නැහැ කියන එක මම වග කීමකින් කියනවා. හැබැයි, footboard එකේ නැඟලා යන සමහර පක්ෂවලට ලැබිය හැකි ආසන සංඛ්‍යාවේ අඩු වීමක් තිබෙන්න පුළුවන්. මුස්ලිම් ප්‍රජාව කියන්නේ, මුස්ලිම් ජනතාව නියෝජනය කරනවාය කියන දේශපාලන පක්ෂ නොවෙයි. අද මුස්ලිම් ජාතිය නියෝජනය කරන පක්ෂ බහුතරයක් ජාතික පක්ෂවලට මුස්ලිම් ප්‍රජාව විකුණලා ඉවරයි. අද ඒකයි වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසයේ ජාතික පක්ෂත් එක්ක සුළු ජාතිකයන් හිටියා. දැන් හුඟක් ජාතික පක්ෂ කරන්නේ සුළු ජාතික ඡන්ද outsource කරන එක. Outsource කිරීම තුළින් අන්තිමට බල්ලා නටන්නේ නැටිටට ඕනෑ විධියට. ඒක, මේ රටේ ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. මේ සභාවේ ඉන්න 225 දෙනාම වෙනසක් ඇති කරන්න කැප වී සිටින්න ඕනෑ. මේ පළාත් සභා ඡන්දය පරක්කු වෙනවා කියලා දූෂිත මනාප ක්‍රමයකට යන එක සදාචාරාත්මක නැහැ.

Hon. Deputy Speaker, there are certain quarters who are trying to blame the Hon. Speaker for the delay. සද්භාවයෙන් මෙතැන ඉන්න මන්ත්‍රීවරුන් 225 දෙනාම ක්‍රියා කළා නම් මැතිවරණ ක්‍රමයේ තිබෙන අඩු පාඩු හදලා වෙනසක් ඇති කරන්න තිබුණා. අපට ඒ වෙනස ලබා ගන්න පුළුවන්. හැබැයි, අද මේ සභාවේ තිබෙන මේ විවාදයට කී දෙනෙක් ඉන්නවාද? Hon. Deputy Speaker, I have summoned meetings at my Ministry to discuss the electoral system. අනුර දිසානායක මන්ත්‍රීතුමා දන්නවා, මහ ලොකුවට කෑ ගහන, අද මෙතැන කථා කරපු නායකයන් කී දෙනෙක්ද ඒ රැස්වීම්වලට ආවේ කියලා. ඒ රැස්වීම්වලට එන්නේ නැහැ; අලුත් ක්‍රමයක් හදන්න උදව් කරන්නේ නැහැ. හැබැයි, මෙතැනට ඇවිල්ලා ජාතිය විකුණලා දේශපාලනය කරන්න හදනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේක ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්.

මට ඊයේ PAFFREL, CMEV වැනි සංවිධාන කිව්වේ, "අඩු පාඩු තිබෙනවා. ඒ අඩු පාඩු හදන්න අපි යමක් කරන්න ඕනෑ. බෝනස් මන්ත්‍රීවරුන් පහ දක්වා වැඩි කරන්න" කියලා. ඒ වාගේම කාන්තා නියෝජනය සම්බන්ධයෙන් සමානුපාතික ලැයිස්තුවේ "zigzag" ක්‍රමයක් පාවිච්චි නොකර, ඒ කියන්නේ, ඒ පිළිවෙළ වෙනස් කරන්න බැරි ආකාරයට සමානුපාතික ලැයිස්තුව හැදිය යුතුයි කියන මතය ඒ ගොල්ලන් ඉදිරිපත් කළා.

ඒ වාගේම, පරදින අපේක්ෂකයන් ඒ ලැයිස්තුවේ තුනෙන් එකකට සීමා කළ යුතුයි කියන මතයත් ඉදිරිපත් කළා. මා හිතන හැටියට අද පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සමහර අවස්ථාවල ජනතාවගේ පැත්තෙන් විහිළුවක් වෙලා. අද සිවිල් සමාජය උත්සාහ ගන්නවා, මේ මැතිවරණ ක්‍රමවේදය වෙනස් කරලා මේ ක්‍රමවේදයේ තිබෙන අඩුපාඩු හදන්න. අද මේ පාර්ලිමේන්තුවේ කථා කරපු මන්ත්‍රීවරුන්ගෙන් කී දෙනෙක්ද මේ සඳහා විකල්ප ක්‍රමවේදයක් ඉදිරිපත් කළේ? කී දෙනෙක්ද මේ මැතිවරණ ක්‍රමයේ තිබෙන අඩුපාඩු ගැන කථා කළේ? සියලුදෙනාම කථා කළේ පසුගිය පළාත් පාලන මැතිවරණයේදී අපේ පංගුව ලැබුණේ නැති නිසා පරණ ක්‍රමයට යමු කියන එකයි. ප්‍රසිද්ධ පුද්ගලයන් දෙන්නෙක්, තුන්දෙනෙක් දාලා සල්ලි ටිකක් විසි කරලා, මනාප ක්‍රමය තුළින් මන්ත්‍රී ධුර වැඩි කර ගැනීමේ විශ්වාසය තමයි දැන් ඇතිවෙලා තිබෙන්නේ. මා හිතන හැටියට ඒක මේ රටට ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. ඒ නිසා මේ සභාවේ ඉන්න මන්ත්‍රීවරු 225දෙනා සද්භාවෙන් කටයුතු කරන්න ඕනෑ; සද්භාවයෙන් ක්‍රියා කරන්න ඕනෑ. මගේ කාර්යාලයේ රැස්වීමක් තිබුණා. එහිදී දෙමළ ජාතික සන්ධානය මේ ක්‍රමය තුළ තිබෙන අඩුපාඩු හදන එක ගැන හොඳ අදහස් ටිකක් ඉදිරිපත් කළා. දූෂිත මනාප ක්‍රමය නිසා මේ රටේ දේශපාලන පිරිහීමක් ඇති වුණා. මේ මනාප ක්‍රමය නිසා දිස්ත්‍රික්කයක් පුරා ඡන්ද ඉල්ලන්න ඕනෑ. මැතිවරණයට ඉදිරිපත් වෙන්න සම්මුඛ පරීක්ෂණයකට ගිය ගමන්ම දේශපාලන පක්ෂ - ජනතා විමුක්ති පෙරමුණ හැර- පළමු ප්‍රශ්නය හැටියට අහන්නේ "සල්ලි තිබෙනවාද ඡන්ද කරන්න" කියන එකයි. ඒ සංස්කෘතියද අපට අවශ්‍ය? පාර්ලිමේන්තුවේ, පළාත් සභාවේ, පළාත් පාලන ආයතනවල මුදල් මත පදනම් වූ දේශපාලන සංස්කෘතියක් ඇති කිරීමට මේ දූෂිත මනාප ක්‍රමය තබා ගැනීම සදාචාරාත්මක නැහැ කියන එක මම වගකීමකින් කියනවා. I would also state that if we go back to the PR System then, අපට විරුද්ධව ජනතාව පෙළ ගැසෙනවා; the common man will rise against us. අතිගරු ජනාධිපතිතුමා සහ ගරු අගමැතිතුමා 2015 මැතිවරණයේදී කිව්වා, මේ දූෂිත මනාප ක්‍රමයෙන් ඈත් වෙනවා, ගමට වගකියන මන්ත්‍රීවරයෙක් බිහි කරනවා කියලා. ඒ වාගේම වැඩි කාන්තා නියෝජනයක් ඇති කරනවා කිව්වා. අපි පනතටත් ඒ කරුණු ඇතුළත් කළා. ගරු ජනාධිපතිතුමනි, ගරු අගමැතිතුමනි, තමුන්නාන්සේලා දෙදෙනාම දැන් ඒ දූෂිත මනාප ක්‍රමයට යනවා නම්, ඒ ලැබුණු ජනවරමට කරන ද්‍රෝහිකමක් ලෙස මා දකිනවා .

[ගරු ෆයිසර් මුස්තාපා මහතා]

ඒ නිසා දේශපාලන පක්ෂවලට මේ පිළිබඳ වගකීමක් තිබෙනවා. අපි මේ ගැන කථා කරමු. අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමා දන්නවා, පළාත් පාලන මැතිවරණයේදී හුඟක් පක්ෂවලට ප්‍රශ්න තිබුණ බව. හැබැයි, එක වට මෙසයකදී අපි ඒ ප්‍රශ්න සාකච්ඡා කළා. මේ සීමා නිර්ණ වාර්තාව විවාද කරන්න කලින් අපි එකඟතාවකට එන්න ඕනෑ. පනතේ තිබෙන්නේ විවාද කරන්න කියලායි. කොහොමද අපි සීමා නිර්ණය පිළිබඳ වාර්තාවක් ගැන විවාද කරන්නේ? ඒ නිසා සද්භාවයෙන් -ඡන්ද කල්දැමීමේ චේතනාවෙන් නොවෙයි- අපි වට මෙසයක වාඩි වෙලා මෙහි තිබෙන අඩුපාඩු හැදුවා නම්, මාසයකින්, මාස එකහමාරකින් අපට මේ කටයුත්ත ඉවර කරන්න පුළුවන්. ඒ වාගේම මම වගකීමකින් කියනවා, කිසිසේත්ම මේ සීමා නිර්ණය වාර්තාව අනුව අපට මැතිවරණයක් පවත්වන්න බැහැ කියලා. එහි අඩුපාඩු තිබෙනවා. පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ගත්තාම දෙකට කඩලා තමයි ඡන්ද කොට්ඨාස පිහිටලා තිබෙන්නේ. ඒ නිසා විශාල අසාධාරණකම් වෙලා තිබෙනවා. ඒ අසාධාරණකම් නැති කරන්න ක්‍රමවේදයක් තිබෙනවා. තමුන්නාන්සේලා දන්නවා, මේ මැතිවරණය කල් දමනවා කියලා මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරු 225දෙනාට ජනතාව දොස් කියනවාද කියලා. පළාත් පාලන මැතිවරණයේදී නම් ඇඟිල්ල දිගු කළේ මටයි. හැබැයි, අද මේ සභාවේ එක්කෙනෙකුටවත් මට ඇඟිල්ල දිගු කරන්න බැහැ, මම සීමා නිර්ණ වාර්තාව හරි වෙලාවට ඉදිරිපත් කරපු නිසා. මේ ගරු සභාවේ ඉන්න මන්ත්‍රීවරුන්ට මා කියා සිටිනවා, අපට මේ වෙනස්කම ඇති කරන්න පුළුවන් කියලා. අපි මේ මැතිවරණ ක්‍රමයෙන් කොට්ඨාසයට වගකියන මන්ත්‍රීවරයෙක් බිහි කරලා තිබෙනවා. සියයට 25ක කාන්තා නියෝජනයක් ලබා දීලා තිබෙනවා. සුළු ජාතික පක්ෂවලට සියයට 50ක සමානුපාතික නියෝජනයක් ලබා දීලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද කථා කරපු සමහර සුළු ජාතික පක්ෂ නායකයන් කිව්වා, අපි මේකට කැමැත්ත දෙන්නේ සියයට 50 : 50 දෙනවා නම් කියලා. ඒ උදව්ය එහෙම ඡන්දය දීලා, මේ ක්‍රමය වැරැදියි කියලා අද කියනවා. කොට්ඨාස මදි කියනවා. කොට්ඨාස මදි නොවෙයි, footboard එකේ ගිහිල්ලා ජාතිය විකුණලා මන්ත්‍රී ධුර ලබන්න, කේවල් කරලා මන්ත්‍රී ධුර ගන්න, පළාත් සභාවේ ඇමතිකම් දරන්න කරන විහිළුවක්. හැබැයි, මේ රටේ තවමත් මහ ජාතික, සුළු ජාතික කියන මානසිකත්වය තිබෙන බව ඇත්ත. අපි දූෂිත මනාප ක්‍රමයට ගියා නම්, සමානුපාතික ක්‍රමයට ගියා නම් ඒ මානසිකත්වය තව තවත් වැඩි වෙනවා මිස අඩු වෙන්නේ නැහැ. අපි සියලුදෙනාම පරිත්‍යාගශීලී විය යුතුයි.

අද මේ සභාවේ දී එක මන්ත්‍රීවරයකු කිව්වා, සල්ලි බෙදුවා කියලා. නැහෙනහිර පළාතේ සල්ලි බෙදපු හැටි අපි සියලුදෙනාම දන්නවා. කවුද කළේ; කොහොමද කළේ කියන එක අපි දන්නවා. අනෙක් පළාත්වල වුණේ නැහැ, නැහෙනහිර පළාතේ තමයි වැඩිපුරම සල්ලි බෙදුවේ. මේවා ගැන කථා කරන උදව්ය ඇඳුම් ඇඳගෙන කථා කරන එක තමයි ප්‍රශ්නය. මේ සමහර කට්ටිය හිතාගෙන සිටින්නේ ඒ කට්ටිය උතුම් මහත්වරු කියලා. හැබැයි අසූචි දේශපාලනය කරන්නේ. තමන්ගේ ජාතිය, ආගම විකුණන දේශපාලනය කරන්නේ. අද ජාතික දේශපාලන පක්ෂ හිරවෙලා සිටින්නේ සමහර සුළු ජාතික පක්ෂ ඒ අයට කරන බලපෑම් නිසා. ජාතික දේශපාලන පක්ෂවල ප්‍රශ්නයක් නැහැ. මම කිව්වා වාගේ අද දේශපාලනයේ බල්ලා නටන්නේ නැට්ටට ඕනෑ විධියටයි. ඒ ප්‍රශ්නය අපි විසඳන්නට ඕනෑ. අද සමහර සුළු ජාතික පක්ෂ, ජාතික පක්ෂවලට තුවක්කුව තියලා තමයි දේශපාලනය කරන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම සංස්කෘතිය වෙනස් කළේ නැත්නම් මේ රටේ දේශපාලනයේ ඉදිරි ගමනක් නැහැ. මම ඒ ගැන කනගාටු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මුස්ලිම් ජාතිකයෙක්. හුඟාක් අය හිතන්නේ මුස්ලිම් ජාතිකයන් නියෝජනය කරන්නේ මුස්ලිම් ජාතිය නියෝජනය කරන මුස්ලිම් ලේබල් තිබෙන පක්ෂ කියලා. නමුත් සමස්තයක් හැටියට ගත්තාම මුස්ලිම් ජාතිකයන් ජාතික පක්ෂවලට ඡන්දය දෙනවා, ජාතිය නියෝජනය කරන පක්ෂවලට වඩා. අවාසනාවට වාගේ අද දේශපාලන භූමිකාව තුළ ජාතික දේශපාලන පක්ෂ ජාතිය නියෝජනය කරන පක්ෂවලට තැනක් දීලා තිබෙනවා; outsource කරලා තිබෙනවා. ඒ නිසා තමයි අද-

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
Sir, I rise to a point of Order.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මොකක්ද ඔබතුමාගේ point of Order එක?

ගරු ටී. රංජිත් ද සොයිසා මහතා
(மாண்புமிகு ரீ. ரஞ்ஜித் த சொய்சா)
(The Hon. T. Ranjith De Zoysa)
මම ගරු ඇමතිතුමාගේ කථාවට බොහොම අවධානයෙන් යුක්තව සවන් දුන්නා. එතුමා ඉතාම වැදගත් අදහස් ටිකක් ප්‍රකාශ කළා, ඒක අපට වැදගත්. එතුමා සඳහන් කළ ඒ බොහෝ කරුණුවලට මම එකඟ වෙනවා. එතුමා ප්‍රකාශ කළා ජාතිය විකුණමින් අසූචි දේශපාලනයේ යෙදෙන පක්ෂ සහ නායකයෝ ඉන්නවා කියලා. ඒ ආණ්ඩුවේද, විපක්ෂයේද කියලා මම එතුමාගෙන් දැන ගන්නට කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒක point of Order එකක් නොවෙයි, ගරු මන්ත්‍රීතුමා. ඇමතිතුමා කැමති නම් උත්තර දෙයි.

ගරු ෆයිසර් මුස්තාපා මහතා
(மாண்புமிகு பைசர் முஸ்தபா)
(The Hon. Faiszer Musthapha)
ගරු මන්ත්‍රීතුමා, තමුන්නාන්සේලා මේ රටට ආදරයක් තිබෙනවා නම් පටු දේශපාලනය කරන්නට එපා. මෙවැනි ප්‍රශ්න ඇසීම තුළින් බලාපොරොත්තු වන්නේ මොකක්ද? අපි රටට ආදරෙයි. මම මේ කථාව කරන්නේ මේ රටට ආදරයක් තිබෙන නිසා. මටත් හරිම ලේසියි මගේ දේශපාලන ගමනට ජාතියේ ලේබල් එකක් දාලා, එය කරන්න. සුළු ජාතික ලේබලයක් දාලා කරන්නටත් පුළුවන්. එහෙම නේද ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා? අද අපි ජාතික පක්ෂවල සිටීම නිසා අපට විශාල අභියෝග තිබෙනවා. සහජීවනය සහ රටේ ඉදිරි ගමන ගැන හිතලා තමයි අද මේ කථාව කරන්නේ. මම මේ කථාව ඉතාමත් කනගාටුවෙන් කරන්නේ. හේතුව, මේ රට නැවතත් ජාතිවාදී දේශපාලනයට යාමේ පළමුවෙනි පියවර තමයි පරණ මැතිවරණ ක්‍රමයට යන එක. ඔබතුමා දන්නවා, ඔබතුමන්ලාගේ බල ප්‍රදේශයේ ජාතිය විකුණලා දේශපාලනය කරන බව. ඒ වාගේම තමුන්නාන්සේලා දැන ගත යුතු දෙයක් තමයි, අද රටේ ජනතාවගේ මානසිකත්වය ගැන. බොහෝ දෙනෙක් තමන්ගේ ජාතියට තමයි ඡන්දය දෙන්නේ, මොන ජාතියක් වුණත්. ඒ මානසිකත්වයෙන් ඉවත් වෙන්න පුළුවන් වන්නේ මෙවැනි මිශ්‍ර ක්‍රමයක් තුළිනුයි. නැවත වතාවක් මනාප ඡන්ද ක්‍රමයට ගියොත් අපි ඒ තුළින්ම ජාතිවාදී දේශපාලනයේ අත්තිවාරම දමනවා කියන එක මේ අවස්ථාවේ දී මා වගකීමකින් ප්‍රකාශ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අප සියලුදෙනා එකතු වෙලා මේ දිහා ලාංකික චින්තනයෙක්, දෘෂ්ටි කෝණයෙන් බලලා, මේකේ තිබෙන අඩු පාඩු හදා ගෙන රට වෙනුවෙන් කැප වෙමු.

සමහර අය තමන්ගේ දේශපාලන පංගුව ගන්න හදනවා. සමහර අය ආණ්ඩු බලය අල්ලන්න හදනවා. සමහර අය විපක්ෂයේ ඉඳගෙන ඇඟිල්ල දිගු කරනවා. අපි එයින් ඈත් වෙන්න ඕනෑ. මේ රට ප්‍රගතිශීලී රටක් වෙන්න නම්, අපි ප්‍රගතිශීලීව හිතන්න ඕනෑ; කටයුතු කරන්න ඕනෑ. අද මේ රටේ බොහෝ දෙනෙකුට ඕනෑම ක්‍රියාවක් කරනකොට තමන්ගේ ජාතිය, ආගම මතක් වෙනවා. හැබැයි, ඒ මානසිකත්වයෙන් අපට ප්‍රගතිශීලී වෙන්න බැහැ. අපි ලාංකිකයන් හැටියට හිතන්න ඕනෑ. අපේ අසල්වැසි ඉන්දියාව දිහා බලන්න. ඉන්දියාව යම්තාක් දුරට ජාතිවාදී දේශපාලනයෙන් ඈත් වෙලා, ඒ ගොල්ලන් "ඉන්දියන් ජාතිකයෝ" කියන හැඟීමට ප්‍රමුඛත්වය දීලා තිබෙනවා. ඒ හැඟීම ඇති කරන්න අපි සියලු දෙනාම එකතු විය යුතුයි කියන එක මම මේ සභාවෙන් ඉල්ලා සිටිනවා. පළාත් සභා, පළාත් පාලන ඇමති හැටියට මම ඉල්ලා සිටිනවා, කරුණාකරලා මේ දූෂිත මනාප ක්‍රමය ගෙනෙන්න ඉඩ දෙන්න එපා කියලා. මේ ගරු සභාවේ සිටින මන්ත්‍රීවරු 225දෙනා තමන්ගේ පංගුව ගැන නොවෙයි රටේ පංගුව ගැන හිතලා, මෙහි තිබෙන අඩු පාඩු හදලා, අපි මේ රට ප්‍රගතිශීලී රටක් කරමු කියමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(මාණ්ඩලික පාර්ලිමේන්තු නියෝජ්‍ය අධ්‍යක්ෂ අවර්කල්)
(The Hon. Deputy Speaker)
බොහොම ස්තුතියි. The Hon. Douglas Devananda. You have 12 minutes.

[பி.ப. 2.35]

ගරු ඩග්ලස් දේවානන්දා මහතා
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

நன்றி, கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே! மாகாண சபைத் தேர்தல் மற்றும் தேர்தல் முறைகள் பற்றி இன்றைய தினம் நடைபெறுகின்ற சபை ஒத்திவைப்புவேளைப் பிரேரணை மீதான விவாதத்தில் கலந்துகொண்டு எனது கருத்துக்களையும் பதிவுசெய்வதற்கு வாய்ப்பு வழங்கியமைக்கு முதலில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். எமது நீண்டகால அர்ப்பணிப்புடன்கூடிய போராட்டத்தின் பயனாக எமக்குக் கிடைத்துள்ள மாகாண சபை முறைமையினை நாம் ஒரு பொன்னான வாய்ப்பாகவே கருதி வருகின்றோம். இந்த அரசு ஆட்சிபீடமேறிய காலந்தொட்டுப் புதிய அரசியல் யாப்பு தொடர்பில் கூறப்பட்டு, அதற்கான ஏற்பாடுகளும் முன்னெடுக்கப்பட்டு வருகின்ற நிலையில், அது எந்தளவுக்குச் சாத்தியமானது என்பது தொடர்பில் சந்தேகங்களே நிலவுகின்ற நிலையில், எமது மக்களின் அரசியல் உரிமைப் பிரச்சினைக்குத் தீர்வாக, 13வது திருத்தச் சட்டத்தினை முழுமையாக நடைமுறைப்படுத்த வேண்டும் என்பதையும், அதிலிருந்து ஆரம்பித்துப் படிப்படியாக முன்னேற்றம் காணவேண்டும் என்பதையும், அந்த வகையில் மேலும் பெறவேண்டிய அதிகாரங்களை, அதாவது, 02வது சபை, மேலதிக விசேட அதிகாரங்கள் போன்றவற்றைப் பெற்றுக்கொள்ள வேண்டும் என்பதையும் நாம் தொடர்ந்து வலியுறுத்தி வந்திருக்கின்றோம்.

இருப்பினும், இன்று வடக்கு மாகாண சபையை எடுத்துக் கொண்டால், அதன் செயற்றிறன் இன்மை காரணமாக அதன் மூலமான பலன்கள் எமது மக்களுக்குக் கிட்டாமல் உள்ளது. தற்போது வடக்கு மாகாண சபையின் ஆட்சி நிர்வாகத்தினை மேற்கொண்டு வருகின்ற பிரதான கட்சியினரே "வடக்கு மாகாண சபையின் முதலமைச்சர் தெரிவானது தவறானது" எனக் கூறும் நிலை ஏற்பட்டுள்ளது என்பதை இங்கு ஞாபகப்படுத்த விரும்புகின்றேன். நாம் வடக்கு மாகாண சபையின் ஆட்சியினைக் கைப்பற்றியிருந்தால், வடக்கு மாகாணத்தில் தேனும் பாலும் ஓட வைத்திருப்போம். எனினும், எமது மக்களது துரதிருஷ்டம் காரணமாக வடக்கு மாகாண சபையானது எமது மக்களுக்கு எவ்விதமான பலனையும் பெற்றுக்கொடுக்காமல், வெறும் பதவிகளுக்கான சபையாகவே மாறிவிட்டுள்ளது.

இன்று வடக்கு மாகாணத்தைப் பொறுத்தவரையில், அங்கு நாளுக்குநாள் வன்முறைச் செயற்பாடுகள் அதிகரித்தே வருகின்றன. அண்மையில் சுழிபுரம் பகுதியில் ஆறு வயது சிறுமியொருவர் கொல்லப்பட்ட சம்பவம் பாரிய பதற்றத்தை ஏற்படுத்தியிருந்தது. நேற்று முன்தினம் அராலிப் பகுதியில் வயோதிபப் பெண்ணொருவர் கடுமையான பாலியல் வன்புணர்விற்கு உட்படுத்தப்பட்டுள்ளதுடன், அங்கு கொள்ளைச் சம்பவமும் இடம்பெற்றுள்ளது. அதேபோன்று நேற்று முன்தினம் யாழ்ப்பாணம் நாச்சிமார் கோவிலடிப் பகுதியில் வாள் வெட்டுக் கும்பல்களின் அட்டகாசங்கள் இடம்பெற்றிருக்கின்றன. இவ்வாறான சம்பவங்களால் வடக்கு மாகாணத்தில், குறிப்பாக யாழ்ப்பாணத்தில், தொடர்ந்தும் பதற்ற நிலையே நிலவி வருகின்றது. எனவே, வடக்கில் அண்மைக் காலமாக இடம்பெற்று வருகின்ற வன்முறைச் சம்பவங்கள் மற்றும் சமூகச் சீர்கேடுகளை உடனடியாக நிறுத்தி, இயல்பு நிலை தோற்றுவிக்கப்பட வேண்டும். இத்தகைய சம்பவங்களின்போது சட்டம், ஒழுங்கினைப் பேணுகையில், மிகுந்த அவதானத்துடனான நடவடிக்கைகளே முன்னெடுக்கப்பட வேண்டும். ஏனெனில், கடந்த காலங்களில் சட்டம், ஒழுங்கினைப் பேணுவதற்காக எனக் கூறப்பட்டு, மேற்படி செயற்பாடுகளில் இறங்கியவர்களால் அதற்கு மாற்றமான விளைவுகளே அங்கு தோற்றுவிக்கப்பட்டு, நீண்ட கால மோதல் நிலைமை ஏற்பட்டிருந்தமையை இங்கு சுட்டிக்காட்ட வேண்டியுள்ளது.

எமது பகுதியில் தினந்தோறும் நடந்தேறி வருகின்ற சமூகச் சீர்கேடுகளுக்கு நிலையற்ற, கொள்கையற்ற தலைமைத்துவமே காரணமாக இருக்கின்றது. எமது மக்களுக்கான தலைமைத்துவம் என்பது எமது மக்களை நேர்வழிப்படுத்தி, முன்னேற்றப் பாதையில் அவர்களை அழைத்துச் செல்வதாக இருத்தல் வேண்டும். எமது மக்களுக்கான நேரிய வழியினை வகுத்துக் கொடுப்பதற்காகவே நாம் அரசியல் பிரவேசம் செய்துள்ளோம். எனினும், போதியளவு அரசியல் பலம் இல்லாத காரணத்தினால் எம்மால் முழுமையாகச் செயற்பட இயலாதுள்ளதை இங்கு நான் சுட்டிக்காட்ட வேண்டும். இருப்பினும் எங்களுக்குக் கிடைத்துள்ள அரசியல் அதிகாரங்களை நாங்கள் எமது மக்களுக்குப் பயனுள்ள வகையில் பயன்படுத்தி வருகின்றோம். இதனை எமது மக்கள் உணர்ந்து வருவதாலேயே எமக்கான அரசியல் பலம் என்பது அதிகரிக்க ஆரம்பித்துள்ளது. எனவே, வடக்கு மாகாண சபையின் தற்போதைய ஆட்சிக் காலம் நிறைவுற்றதன் பின்னர், வடக்கு மாகாண சபைக்கான தேர்தலைத் துரிதமாக நடாத்த வேண்டும் என்ற கோரிக்கையினை நாம் முன்வைத்து வருகின்றோம்.

இந்தச் சந்தர்ப்பத்தில் மாகாண சபையின் தேர்தல்களைப் புதிய முறைமையின்கீழ் நடத்துவது தொடர்பில் பல்வேறு தரப்பினராலும் திருத்தங்கள் முன்வைக்கப்பட்டு வருகின்ற ஒரு நிலை காணப்படுகின்றது. இத்தகைய காரணங்களைக் காட்டித் தேர்தலைப் பிற்போடாமல், புதிய தேர்தல் முறைமையில் உடனடித் திருத்தங்களை மேற்கொண்டோ அல்லது பழைய முறையில் திருத்தங்களை மேற்கொண்டோ

[ගරු ඩග්ලස් දේවානන්ද මහතා]

உடனடியாக மாகாண சபைத் தேர்தல்களை நடத்தி முடிப்பது சிறந்த வழியாகும் என்பதை இந்தச் சந்தர்ப்பத்திலே வலியுறுத்திக் கூற விரும்புகின்றேன். குறிப்பாக கிழக்கு மகாண சபையின் ஆட்சி அதிகாரம் இன்னும் ஆளுநர் அவர்களின் கைகளிலேயே தொடர்கின்ற நிலை ஏற்பட்டுள்ளது. எனவே, தற்போது ஆளுநர்களது கைகளில் ஆட்சியதிகாரங்கள் உள்ள ஏனைய அனைத்து மாகாண சபைகளுக்கான மற்றும் இந்த வருடத்திற்குள் உத்தியோகபூர்வ ஆட்சி நிர்வாகக் காலம் முடிவடைகின்ற ஏனைய மாகாண சபைகளுக்கான தேர்தல்களை விரைந்து நடாத்தி, அவற்றின் நிர்வாகங்களை மக்கள் பிரதிநிதிகளிடம் ஒப்படைக்க நடவடிக்கை எடுக்க வேண்டும்.

வடக்கு மாகாண சபையின் ஆட்சியதிகாரத்தை எமது மக்களிடமிருந்து அபகரித்துக் கொண்டவர்களால் அதனைத் திறம்பட இயங்கவைக்க இயலாத காரணத்தினால், மாகாண சபை முறைமையை நிராகரித்துவிட முடியாது. வடக்கு மாகாண சபையானது எமது மக்களின் நன்மை கருதியதாக மாற்றிமைக்கப்பட்டால், அதன் மூலமாக எமது மக்களின் தேவைகள் பலவற்றினைத் தீர்க்க முடியும். என்றாலும், மாகாண சபை முறைமை தோற்றுவிக்கப்பட்ட காலத்திலேயே அதனை ஏற்றுத் திறம்பட நிர்வகித்திருந்தால், இன்றைய நிலையில் எமது மக்களின் பிரச்சினைகள் பல தீர்ந்திருக்கும் என்பதை நான் தொடர்ந்தும் கூறிவருகின்றேன். அன்று இந்த மாகாண சபை முறைமையினை எதிர்த்தவர்கள், "அதனைத் தும்புத்தடியால்கூட தொட்டுப் பார்க்கமாட்டோம்" என்ற வர்கள், தமது அரசியல் சுயலாப பதவிகளுக்காக மட்டுமே ஆட்சியதிகாரத்தில் இருந்துகொண்டு, மாகாண சபை முறைமை யினையே பழுதாக்கிவிட்டுள்ள நிலையே காணப்படுகின்றது.

அதுபோல், இன்றைய நிலையில் போதைப் பொருட்களின் கூடாரமாக வடக்கு, கிழக்கு மாகாணங்கள் காணப்படுகின்றன. அந்த மாகாணங்களிலே அதிகளவு போதைப் பொருட்கள் விற்பனையில் இருப்பதாக நாளாந்த ஊடகங்களில் செய்திகள் வெளிவந்தவண்ணம் இருக்கின்றன. இந்தப் போதைப் பொருட்கள் ஏற்படுத்துகின்ற சமூகச் சீர்கேடுகள் கொஞ்சநஞ்சமல்ல. பாலியல் வன்புணர்வுகளுக்கும் இந்தப் போதைப் பொருட்களே பெருமளவில் காரணமாக இருக்கின்றன. அதாவது, இளைஞர்கள் மத்தியில் காணப்படு கின்ற அமைதியின்மை என்பது வடக்கிலே பாரியதொரு கேள்விக்குறியாகவே வளர்ந்துவருவதை அவதானிக்கக் கூடியதாக இருக்கின்றது. இத்தகைய அமைதியின்மையின் எதிரொலியாகவே வன்முறை சார்ந்த பல்வேறு சம்பவங்கள் யாழ். குடாநாட்டிலே இடம்பெற்று வருகின்றன. ஒருபுறத்தில் வேலைவாய்ப்புகளற்ற பிரச்சினை தலைதூக்கி வருவதும், மறுபுறத்தில் விவசாயம் உள்ளிட்ட செய்கைகள் தொடர்பில் காலநிலையின் பாதிப்புகளும் கடற்றொழிலாளர்கள் எதிர்கொள்ளுகின்ற பிரச்சினைகளுமென வடக்கின் அனைத்து மாவட்டங்களும் பாரிய வறுமை நிலைக்கே தள்ளப்பட்டுள்ளன. இந்த நிலையில், எமது மக்களைத் தலைநிமிர்ந்து வாழச் செய்வதற்காகவே நாம் உழைத்து வருகிறோம். எனினும், போதிய அரசியல் பலத்துடன் எம்மால் செயற்பட முடியுமானால், இன்னும் பல்வேறு விடயங்களை எமது மக்களது நலன்கருதி எம்மால் சாதிக்க முடியும் என்பதையே நான் மீண்டும் மீண்டும் வலியுறுத்திக் கூற விரும்புகின்றேன். அந்த வகையில் மாகாண சபையென்பது எமது மக்களுக்கு முக்கியமானதொரு ஏற்பாடாகும். இதனைத் திறம்பட இயங்கச் செய்வதிலேயே அதனது வெற்றியானது தங்கியுள்ளது.

இன்றைய நிலையில் "மாகாண சபைகளுக்கு அதிகாரங்கள் இல்லை" என்போர், அந்த அதிகாரப் பதவிகளில் அமர்ந்துகொண்டு அதிகார துஷ்பிரயோகம் செய்து வருகின்றனர். சரியான முறையில் மாகாண சபை முறைமையினை இயங்கச் செய்திருந்தால் எமது பகுதிகள் இன்று வறுமை நிலைக்கு உட்பட்டிருக்காது. எனவே, எமது மக்களின் நலன்களிலிருந்து சிந்தித்துச் செயற்படத்தக்கவர் களாகிய எமது கைகளில் வடக்கு மாகாண சபையின் ஆட்சி தரப்படுமானால், ஒரு குறிப்பிட்ட காலகட்டத்திற்குள் எமது பகுதிகளை எம்மால் அபிவிருத்தி செய்து கொள்ள முடியுமென்பதை மிகவும் வலியுறுத்திக் கூறிவைக்க விரும்புகின்றேன்.

மாகாண சபைகள் குறித்து இந்தச் சபையில் மூவின மக்கள் பிரதிநிதிகளும் ஒன்றுகூடி இன்று விவாதித்துக் கொண்டிருக் கின்றார்கள். இதை நான் அகமகிழ்ந்து வரவேற்கின்றேன். ஏனெனில், 13 ஆவது திருத்தச் சட்டம் குறித்தோ அன்றி அதன் பிரகாரம் உருவாக்கப்பட்ட மாகாண சபைகள் குறித்தோ தமிழர் தரப்பிலிருந்து பலரும் பேச மறுத்து வந்திருக்கிறார்கள். மாகாண சபைத் தீர்வானது உழுத்துப்போன தீர்வென்றும், ஒன்றுக்கும் உதவாத தீர்வென்றும், அதை "துப்புத்தடியால்கூட தொட்டும் பார்க்க மாட்டோம்" என்றும் தமிழர் தரப்பிலிருந்து சிலர் கூறிவந்திருக்கிறார்கள். தீண்டப்படாத தீர்வாக நினைத்த மாகாண சபை குறித்துக் காலம் கடந்தாவது சிலர் பேச வந்திருப்பது 'சுடலை ஞானம்' என்றே சொல்லத் தோன்றுகிறது. இன்று பிறந்திருக்கும் ‘சுடலை ஞானம்’ அன்றே பிறந்திருந்தால் எமது மண்ணில் பேரழிவுகள் நடந்திருக்காது; பெருந்துயரம் நிகழ்ந்திருக்காது. எமது மக்கள் கொத்துக்கொத்தாகச் செத்தொழிந்து போன அவலம் நடந்திருக்காது! 'இரு தேசம் ஒரு நாடு' என்று கூறிக் கற்பனைத் தேரேறி வருவோரும், "இது எமக்குத் தீர்வல்ல" என்று மாகாண சபை முறைமையை மறுத்தவர்களும் இன்று அடுத்த மாகாண சபைத் தேர்தலுக்கே தம்மைத் தயார்ப்படுத்தி வருகின்றார்கள். அதேவேளை தமது பதவி சுகத்திற்காக தங்களது பதவிக் காலத்தை நீடிக்குமாறும் கோரிக்கை விடுத்து வருகின்றார்கள்.

மாகாண சபையை எமது கட்சியின் அரசியல் தீர்க்கதரிசனத்திற்கு வரலாறு வழங்கியிருக்கும் பெரு வெற்றி என்றே கூற வேண்டும். 13வது திருத்தச் சட்டமோ அதன் பிரகாரம் உருவான மாகாண சபைகளோ தமிழ்த் தேசிய இனத்தின் பிரச்சினைக்கு முழுமையான தீர்வாகாது. ஆனாலும், 13வது திருத்தச் சட்டத்தை முழுமையாக நடைமுறைப்படுத்தி, மாகாண சபைகளுக்கு மேலதிக அதிகாரங்களைப் பெற்று, அதாவது இரண்டாவது சபையையும் உள்ளடங்கலாக விசேட அதிகாரங்களையும் பெற்று மேலும் அதைப் பலப்படுத்தி எமது இறுதி இலக்கு நோக்கிச் செல்வதே எமது விருப்பமாகும். ஆனாலும், மக்களை உசுப்பேற்றி, போலி வாக்குறுதிகளை வழங்கி மக்களின் வாக்குகளை அபகரித்தவர்கள், தாம் பெற்ற அரசியல் அதிகாரத்தை வைத்து மாகாண சபையை முன்நோக்கி நகர்த்தியிருக்கவில்லை. ஆடம்பர வாகனங்களுக்காகவும் சொகுசு மாளிகைகளுக்காகவும் தமது சுகபோகங்களுக்காகவும் ஒன்றுக்கும் உதவாத நிறைவேறாத பிரேரணைகளுக்காகவும் வெறும் கூச்சலிடும் கூடாரமாகவே வடக்கு மாகாண சபையை அவர்கள் இன்றுவரை பயன்படுத்தி வருகின்றார்கள்.

பதின்மூன்றாவது திருத்தச்சட்டம் என்பதோ அன்றி மாகாண சபைகள் என்பதோ நாங்கள் யாரிடமும் இரந்து கேட்டுப் பெற்ற பிச்சையல்ல! ‘மயிலே மயிலே இறகு போடு’ என்பதுபோல் யாரிடமும் இதை நாங்கள் கேட்டுப் பெற்றதில்லை. எமது ஆரம்பகால உரிமைப் போராட்டத்தில்

பங்கு பற்றிய அனைத்து விடுதலை இயக்கங்களும் போராடிப் பெற்ற உரிமை இது! ஆனாலும், தமிழ் மக்களின் இரத்தமும் தசையுமாகச் சேர்ந்து பெற்ற இந்த மாகாண சபையின் நாற்காலியில் உட்கார்ந்து இருப்பவர்கள் யார்? என்ற கேள்வியையே நான் இன்று கேட்கின்றேன். அரசியல் தீர்வுமின்றி, போதிய அபிவிருத்தியுமின்றி நடுக்கடலில் தத்தளித்துக் கொண்டிருந்த தமிழ் பேசும் மக்களுக்கு, அவர்கள் கரையேறி வரும் ஒரு கப்பலாகவே இந்த மாகாண சபை இருந்திருக்க வேண்டும். ஆனாலும், அந்தக் கப்பலின் மாலுமியாக இருப்பவர்கள் தமிழ் மக்கள் கரையேற வேண்டிய கலங்கரை விளக்கை நோக்கி அந்தக் கப்பலைக் கொண்டு செல்லாமல் இருப்பது யார் செய்த குற்றம்? என்று இன்று தமிழ் பேசும் மக்கள் மத்தியில் கேள்விகள் எழுந்திருக்கின்றன. வலிகளையும் வதைகளையும் சுமந்த எமது மக்களின் வரலாற்றுடன் பின்னிப் பிணைந்தவர்களே எமது மக்களை ஆளும் தகுதி படைத்தவர்கள், வலிகள் சுமந்தோரே எம் மக்களுக்கு வழிகாட்ட உரித்துடையோர் என்று கூறி, சந்தர்ப்பத்திற்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

ගරු නියෝජ්‍ය කථානායකතුමා
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මී ළඟට ගරු මුජීබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 17ක කාලයක් තිබෙනවා.

ඊට පෙර, ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම අමාත්‍යතුමා සහ මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் அமைச்சரும் மகாவலி அபிவிருத்தி இராஜாங்க அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera - Minister of Agriculture and State Minister of Mahaweli Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතු ය"යි මා යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු වේලු කුමාර් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வேலு குமார் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. VELU KUMAR *took the Chair.*

[අ.භා.2.49]

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම සභාව කල් තැබීමේ යෝජනාව තුළින් පළාත් සභා මැතිවරණය පිළිබඳව, එහෙම නැත්නම් අලුත් මැතිවරණ ක්‍රමයක් ගැන සාකච්ඡා කරන අද දවසේ ඒ සම්බන්ධයෙන් කථා කරන්න මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

මේ රටට අලුත් මැතිවරණ ක්‍රමයක් අවශ්‍යයි කියන මතය සම්බන්ධයෙන් පසුගිය කාලය පුරාම පාර්ලිමේන්තුව තුළ සාකච්ඡා වුණා. මොකද, මනාප ඡන්ද ක්‍රමය තුළ තිබෙන නොයෙකුත් අඩු පාඩුකම් නිසාම අප සියලුදෙනාටම අලුත් ඡන්ද ක්‍රමයක් අවශ්‍යයි, ඒ අලුත් ඡන්ද ක්‍රමය තුළින් සියලුදෙනාටම සාධාරණත්වය ඉටු වෙන්න ඕනෑය කියන මතය අප සියලුදෙනාම පිළිගත්තා. අපි පළාත් පාලන මැතිවරණ ක්‍රමය වෙනස් කරලා අලුත් මැතිවරණ ක්‍රමයකට ගියේ ඒ මතයි. පසුගිය පළාත් පාලන මැතිවරණය පැවැත්වූවාට පස්සේ අපට පෙනුණා, එම මැතිවරණ ක්‍රමය තුළත් නොයෙකුත් අඩු පාඩු තිබෙන බව; ඒ ක්‍රමය සම්බන්ධයෙනුත් නොයෙකුත් චෝදනා තිබෙන බව; ඒ ක්‍රමයෙනුත් නොයෙකුත් වංචා දූෂණ සිදුවනවා කියලා. ඒ සම්බන්ධයෙන් අද මේ ගරු සභාවේදීත් නොයෙකුත් අදහස් ප්‍රකාශ වුණා. දැන් අපට කරන්න තිබෙන්නේ මේකයි. ඒ මැතිවරණ ක්‍රමයේ අඩු පාඩු තිබෙනවා නම්, යම් යම් ප්‍රශ්නගත දේවල් තිබෙනවා නම්, අප සියලුදෙනාම එකතු වෙලා ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කරලා ඒ අඩු පාඩු හදාගෙන ඉදිරියට යා යුතුයි.

පළාත් සභා මැතිවරණ ක්‍රමය ගැනත් දැන් නොයෙකුත් ප්‍රශ්න මතු වෙලා තිබෙනවා. මේ රටේ පැවැති ජන වාර්ගික අර්බුදයකට දේශපාලනික විසඳුමක් හැටියට බලය විමධ්‍යගත කළ යුතුය කියන අදහස මත තමයි පළාත් සභා ක්‍රමය මේ රටට ගෙනාවේ කියලා අපි දන්නවා. ඒක තමයි මේකේ මූලිකම පරමාර්ථය, මූලිකම අරමුණ වුණේ. අපේ රටේ යුද්ධයක් තිබෙනවා, අපේ රටේ ජන වාර්ගික අර්බුදයක් තිබෙනවා කියලා මේ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ පිළිගෙන, ඒ මත මේකට විසඳුමක් දෙන්න ඕනෑය කියලා තමයි මේ පළාත් සභා ක්‍රමය හඳුන්වා දුන්නේ. පළාත් සභා ක්‍රමය හඳුන්වා දුන්නත්, ඒ පළාත් සභා ක්‍රමය පිළිගත්තේ නැති උදවියත් අද මේ ක්‍රමය තුළින් පළාත් සභාවලට තරග කරලා පළාත් සභාවලට ඇතුළු වෙලා තිබෙනවා. ඒවා හොඳ දේවල්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය කාලයේ අපි මේ මැතිවරණ ක්‍රමය සම්මත කරනකොට යම් යම් කොන්දේසි ඉදිරිපත් වුණා. මට මතකයි, විශේෂයෙන්ම අපේ ආණ්ඩුව තුළ සිටින මුස්ලිම් කොංග්‍රසය, රිසාඩ් බදියුදීන් ඇමතිතුමාගේ පක්ෂය, ඒ වාගේම මනෝ ගනේසන් ඇමතිතුමාගේ පක්ෂය වැනි පක්ෂ අපේ ආණ්ඩුවත් එක්ක මේ නිර්ණායක සම්බන්ධයෙන් සාකච්ඡා කරලා යම් එකඟත්වයකට පැමිණි බව. විශේෂයෙන්ම සීමා නිර්ණය කොමිසම විසින් ඉදිරිපත් කරන ලද යම් යම් යෝජනා තිබෙනවා නම්, ඒවා පිළිබඳව නැවත සාකච්ඡා කළ යුතුයි; ඒවා නැවත අධ්‍යයනය කළ යුතුයි කියලා යම් එකඟත්වයකට ඇවිල්ලා තමයි එදා නව මැතිවරණ ක්‍රමය යටතේ පසුගිය මැතිවරණයට ඔවුනුත් ඡන්දය පාවිච්චි කළේ. දැන් සීමා නිර්ණය කොමිෂන් සභාව කථානායකතුමාට යවා තිබෙන වාර්තාවේ ගැටලු රාශියක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1981දී කළ සංගණනය මත තමයි 1988 පළාත් සභා ඡන්ද විමසීම් පනත යටතේ එදා පළාත් සභාවට පත් කරන මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව හැදුවේ. ඊට පසුව 2001දී නැවත මේ රටේ සංගණනයක් කළා. එවකට සිටි මැතිවරණ කොමසාරිස්තුමා වූ දයානන්ද දිසානායක මැතිතුමා පළාත් සභාවලට පත්වන මන්ත්‍රී සංඛ්‍යාව වැඩි කරලා 2003 දෙසැම්බර් මාසයේ 16 වෙනි දා අලුත් ගැසට් නිවේදනයක් නිකුත් කළා. අද බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරු 104ක් ඉන්නවා. 2001දී කළ සංගණනය අනුව බස්නාහිර පළාත් සභාවට මන්ත්‍රීවරු 139ක් පත්වන්න ඕනෑ. ඒ විධියට හැම පළාත් සභාවකම මන්ත්‍රීවරු සංඛ්‍යාව වැඩි වෙලා තිබෙනවා. නමුත් අවසානයකට වාගේ, 2003දී නැවත පාර්ලිමේන්තුවට යෝජනාවක් ගෙනැල්ලා ඒ ගැසට් නිවේදනය අවලංගු කරනවා. එතකොට 2003දී නැවත එම ක්‍රමය අවලංගු වනවා. නමුත්, 2001දී කළ සංගණනය අනුව පළාත් සභා මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව මීට වඩා වැඩි වෙන්න ඕනෑ.

එතකොට කොමිෂන් සභාව මේක සලකලා නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට තිබෙන දේ තමයි

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

කොමිෂන් සභාව මේ දීලා තිබෙන ලියැවිල්ල. මේ ලියැවිල්ල අනුව ඔවුන් මතු කරලා තිබෙන කාරණය ගැන මේ ගරු සභාවේ කථා කරපු සමහර මන්ත්‍රීවරු පැහැදිලි කළා. ඔවුන් මෙතැනදී මුස්ලිම් මන්ත්‍රීවරුන්ගේ සංඛ්‍යාව ගැන පැහැදිලි කරලා තිබෙනවා. ඒ කොමිෂන් සභාවේ වාර්තාව පිළිබඳව කථා කරද්දී විශේෂයෙන්ම මේ ගරු සභාවේදී හුහාක්ම චෝදනා එල්ල වුණේ මුස්ලිම් මන්ත්‍රීවරු පිළිබඳ තර්කය හින්දා මේකට සමහර අය විරුද්ධ වෙනවා කියලා. ඒක පළාත් සභා, පළාත් පාලන ඇමතිතුමාත් කිව්වා. නමුත්, කොමිෂන් සභාවේ වාර්තාව නිවැරදි නැහැ කියලා එතුමාටත් මම පෙන්වන්න ඕනෑ. මේක වැරදියි. මම දන්නේ නැහැ, ඒ වාර්තාව කොහොමද ඉදිරිපත් කළේ කියලා. දැන් ඒ ගොල්ලන් කියනවා, ලංකාව පුරාම පළාත් සභාවලින් මුස්ලිම් මන්ත්‍රීවරු 43දෙනෙක් පත් වෙනවා කියලා. පනහට, පනහ යනකොට ලංකාවේ සියලුම පළාත් සභාවලින් මුස්ලිම් මන්ත්‍රීවරු 13දෙනෙක් පත් වෙනවා. ඊළඟට, ඉතිරි පනහට මන්ත්‍රීවරු 13දෙනෙක් දැම්මත්, මන්ත්‍රීවරු 26දෙනයි පත් වෙන්නේ. නමුත්, කොමිසම ඒ ගොල්ලන්ගේ දෙවැනි පිටුවේ Table 4 එකෙන් පෙන්වනවා, මුස්ලිම් මන්ත්‍රීවරු තුන්දෙනයි අඩු වෙන්නේ කියලා. එහෙම තුන්දෙනෙක් අඩු වෙන්නේ නැහැ. පනහට, පනහ ගණනේ අපි මන්ත්‍රීවරු 13යි, 13යි බැලුවත් සියලුම දෙනා 26යි. දැන් මුස්ලිම් මන්ත්‍රීවරු 43ක් ඉන්නවා. එහෙම බැලුවොත් අපට මුස්ලිම් මන්ත්‍රීවරු 17ක් පළාත් සභාවලින් අඩු වෙනවා. සියයට 50ක් කියන්නේ මන්ත්‍රීවරු 13ක් පත් වෙනවා. දැනට පළාත් සභාවල මුස්ලිම් මන්ත්‍රීවරු 43ක් ඉන්නවා. ඒ ගොල්ලන් හදලා තිබෙන ගණන් දෙස බැලුවාම සියයට 50ක් කියන්නේ මුස්ලිම් මන්ත්‍රීවරු 13යි. ඊළඟට, අනෙක් සියයට 50ට තවත් මන්ත්‍රීවරු 13ක් එකතු කළොත්,-[බාධා කිරීමක්]- ඒක තමයි මම කිව්වේ. අද තිබෙන ක්‍රමය අනුව සම්පූර්ණ සංඛ්‍යාවෙන් මුස්ලිම් මන්ත්‍රීවරු 43ක් පත් වෙලා තිබෙනවා. එතකොට ඒ ගොල්ලන් කියන ක්‍රමය අනුව සියයට 50න් මුස්ලිම් මන්ත්‍රීවරු 13ක් පත් වෙලා, ඉතිරි සියයට 50න් ලැයිස්තුවෙන් 13 දෙනෙක් පත් වුණත්, ඔක්කෝම මුස්ලිම් මන්ත්‍රීවරු 26යි. එහෙම බැලුවොත් ලංකාවේ පළාත් සභාවලින් අපට මුස්ලිම් මන්ත්‍රීවරු 17 දෙනෙකුගේ අඩුවීමක් තිබෙනවා. නමුත් සීමා නිර්ණය කොමිසම පෙන්වන්න හදනවා, මුස්ලිම් මන්ත්‍රීවරු 3යි අඩු වෙන්නේ කියලා. ඒක වැරදියි. 3ක් නොවෙයි, 17ක් අඩු වෙනවා. මේ අනුව පත් වන්නේ මුස්ලිම් මන්ත්‍රීවරු 26යි නම්, මන්ත්‍රීවරු 17ක් අපට අඩු වෙලා තිබෙනවා. එහෙම බැලුවොත් සීමා නිර්ණය කොමිසම වැරදි අදහසක් දෙනවා. ඊළඟට, අනෙක් කාරණය බහු ආසන ගැනයි.

සීමා නිර්ණය කොමිෂන් සභාව ආසනයක් හදා තිබෙන්නේ ඡන්ද දායකයන් 116,000ක් වන පරිදියි. ඒ අය බහු ආසන කියන ඒවා ගණන් අරගෙන නැහැ. ඒ අය කියනවා, බහු ආසනයක් වෙන්න ඕනෑ නම්, ඡන්ද දායකයන් 230,000ක් ඉන්න ඕනෑ කියා. ඒ කියන විධියට බහු ආසනයක් වෙන්න නම් එක ආසනයකට තිබෙන ඡන්ද ප්‍රමාණය වාගේ දෙගුණයක් තිබෙන්න ඕනෑ. ඒ තර්කය වැරදියි. ඒ මූලධර්මය වැරදියි. බහු ආසනයක් කියන්නේ සියලු ජන කොටස් නියෝජනය වන ප්‍රමාණයත් එක්ක සලකා හදන ආසනයයි. අනෙකුත් ජන කොටස්වලටත් නියෝජනයක් දෙන්න තමයි බහු ආසන හදන්නේ. එය සියයට 10ද, 5ද කියන එක නොවෙයි වැදගත්. සීමා නිර්ණය කොමිසම බහු ආසන ගැන දී තිබෙන නිර්වචනය සම්පූර්ණයෙන්ම වැරදි නිර්වචනයක්. අපි උදාහරණයක් ගනිමු. 1977 වර්ෂයට කලින් බහු ආසන තිබුණා. මැද කොළඹ ආසනය ඉන් එකක්. එම ආසනයෙන් ආර්. ප්‍රේමදාස මැතිතුමා පත් වුණා, ජබීර් ඒ. කාදර් මැතිතුමා පත් වුණා, හලීම් ඉෂාක් මැතිතුමා පත් වුණා. එම ආසනයට ඡන්ද තිබුණේ 116,000යි. බෙරුවල ආසනයත් එහෙමයි. මන්ත්‍රීවරු දෙදෙනායි. ඡන්ද 54,000යි. එම ආසනයෙන් පත් වුණා, ආර්.ජී. සමරනායක මැතිතුමා සහ බකීර් මාකාර් මැතිතුමා. නුවරඑළිය -මස්කෙළිය ආසනය තවත් උදාහරණයක්. 1977 වර්ෂයේ එම ආසනයේ තිබුණේ ඡන්ද 64,000යි. එම ආසනයෙන් මන්ත්‍රීවරු 3දෙනෙක් පත් වුණා. ඒ අය තමයි, ගාමිණී දිසානායක මැතිතුමා, අනුර බණ්ඩාරනායක මැතිතුමා සහ එස්. තොණ්ඩමන් මැතිතුමා. මඩකලපුව ආසනය තවත් උදාහරණයක්. එයින් බහු මන්ත්‍රීවරු දෙදෙනෙක් පත් වුණා. මට මතක විධියට ඡන්ද තිබුණේ 40,000 ගණනක ප්‍රමාණයක්. මඩකලපුව ආසනයෙන් එක්සත් ජාතික පක්ෂයේ අහමඩ් කරීම් මැතිතුමා පත් වුණා. රාජදුරෛ මැතිතුමාත් පත් වුණා. එතුමන්ලා පත් වුණා මඩකලපුව ආසනයේ මන්ත්‍රීවරුන් දෙදෙනකු හැටියට. හාරිස්පත්තුවත් එහෙමයි. මන්ත්‍රීවරු දෙදෙනෙක් පත් වුණා. ඒ.සී.එස්. හමීඩ් මැතිතුමා පත් වුණා. තවත් මන්ත්‍රීවරයෙක් පත් වුණා. මට මතක නැහැ, එතුමාගේ නම.

ගරු මයිල්වාගනම් තිලකරාජා මහතා
(மாண்புமிகு மயில்வாகனம் திலகராஜா)
(The Hon. Mylvaganam Thilakarajah)
සිරිසේන මැතිතුමා.

ගරු මුජිබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
සිරිසේන මැතිතුමා පත් වුණා. පොතුවිල් ආසනයත් එහෙමයි. එම ආසනයෙන් මන්ත්‍රීවරු දෙදෙනෙක් පත් වුණා. පොතුවිල් ආසනයෙන් ජලාල්ඩීන් මැතිතුමා පත් වුණා, කණගරත්නම් කියා තවත් මන්ත්‍රීවරයෙක් පත් වුණා. බහු ආසන කියන සංකල්පය ආවේ, යම් ආසනයක් තුළ සුළු ජන කොටස් ජීවත් වනවා නම් ඒ ජන කොටස්වල නියෝජනය සඳහායි. ඒ සඳහා තමයි බහු ආසන කියන සංකල්පය ඇති වුණේ. නමුත් අද මේ සීමා නිර්ණය කොමිෂන් සභාව එය මහ හැර තිබෙනවා, එය පැහැර හැර තිබෙනවා. ඒ අයගේ criterion එකට, විෂය පථයට බහු ආසන කියන එක අරගෙන නැහැ. ඒ අය අරගෙන තිබෙන්නේ නිකම් ඡන්ද ගණන විතරයි. ආසනයකට ඡන්ද දායකයන් සංඛ්‍යාව 116,000යි නම් බහු ආසනයකට 230,000ක් ඉන්න ඕනෑ. ඒක වැරදියි. එහෙම එකක් නොවෙයි බහු ආසනය කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එහෙම නම් සීමා නිර්ණය කොමිෂන් සභාවේ වාර්තාව පිළිබඳ ගැටලුවක් තිබෙනවා. අප එදා එකඟ වුණේ මන්ත්‍රී සංඛ්‍යාව අඩු කරන්න නොවෙයි, නියෝජනයන් අඩු කරන්න නොවෙයි. නියෝජනයන් තවත් වැඩි කරන්න ඕනෑ. ඒකයි ප්‍රජාතන්ත්‍රවාදය. එහෙම නැතිව, තිබෙන නියෝජනය නැති කරන එක ප්‍රජාතන්ත්‍රවාදයක් නොවෙයි. අලුත් මැතිවරණ ක්‍රමයකට යන්න අප සියලුදෙනා එකඟත්වයට ආවේ ඇයි? පැවැති නියෝජනය වැඩි වනවාද, පැවැති නියෝජනය ආරක්ෂා වනවාද කියන කාරණය මත තමයි ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරන්න අපට පුළුවන් වන්නේ. එහෙම නොකර, ඡන්ද ක්‍රමයක් ගෙනැල්ලා, තිබෙන නියෝජනයත් නැති කරලා තිබෙන නියෝජනයත් අඩු කර ගන්න කවුරුවත් කැමැති වන්නේ නැහැ. ඒක වැරදි අදහසක්. එහෙම නියෝජනයකට කවුරුත් විරුද්ධයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා පාර්ලිමේන්තු මැතිවරණයේදී cut-off point එක තිබුණේ සියයට 12ක් ලෙසයි. එදා දකුණේ තරුණයෝ කැරලි ගැහුවා. ඒ කැරලි ප්‍රහාරය ගැනත් සලකා පාර්ලිමේන්තුව තුළ ඔවුන්ට යම් නියෝජනයක් ලබා දෙන්න ඕනෑ කියා ප්‍රේමදාස මැතිතුමා ඒ cut-off point එක සියයට 5ක් දක්වා අඩු කළා. ඒ අඩු කිරීම නිසා තමයි වෙනත් දේශපාලන අදහස් දරන කුඩා කණ්ඩායම්වලට, කුඩා පක්ෂවලට අද පාර්ලිමේන්තුව නියෝජනය කරන්න අවස්ථාව ලැබී තිබෙන්නේ. අප සියයට 12 cut-off point එකේ සිටියා නම් අද මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන්න, වෙනත් දේශපාලන

අදහස් තිබෙන අයට, වෙනත් මතවාද තිබෙන අයට අවස්ථාව ලැබෙන්නේ නැහැ. ඒ අවස්ථාව නොදී සිටියා නම් ඔවුන් අද පාර්ලිමේන්තුවෙන් එළියේ ඉඳන් නැවත ටී-56 තුවක්කුව අරගෙන ඒවි, වෙඩි තබා අප මරා දමන්න. අද ඔවුන් පාර්ලිමේන්තුවට ඇවිල්ලා, ඒ අයගේ අදහස් කියලා පාර්ලිමේන්තුව තුළ ලොකු සංවාදයක් ඇති කර තිබෙනවා.

ගරුමන්ත්‍රීවරයෙක්
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කාටද, ඔය කියන්නේ?

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
කාටවත් නොවෙයි, මේ ගරු සභාවටයි කියන්නේ. අද ඒ සංවාද ඇති වෙලා තිබෙනවා. ඒ නියෝජනය අවශ්‍යයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ප්‍රජාතන්ත්‍රවාදය කියා බහුතර කැමැත්තට සුළුතර අදහස් යට කරන්න දෙන්න බැහැ. ඒක වැරැදියි. එහෙම යට කරන්න හදනවා නම් ඒක වෙනත් වෙනත් තැන්වලින් පිපිරෙන්න පුළුවන්. එහෙම වූ නිසා තමයි 1988-1989 කාලය තුළදී එවැනි තත්ත්වයක් ඇති වුණේ. එහෙම යට කරන්න ගිය නිසා ඒ මතවාද, ඒ තරුණ අදහස් වෙනත් වෙනත් තැන්වලට ගිහින් පිපිරිලා මුළු රටෙම කැරලිකාරිත්වයක් ඇති වුණා. ප්‍රේමදාස මැතිතුමා එදා ඒ ඡන්ද ප්‍රමාණය, ඒ cut-off point එක -ගත යුතු අවම ප්‍රතිශතය- සියයට 5 දක්වා අඩු කළා.

අද අපට පෙනෙනවා, මේ ගරු සභාව තුළ නොයෙකුත් අදහස් තිබෙන මන්ත්‍රීවරු ඉන්නා බව. ඒ අය නොයෙකුත් දේශපාලන අදහස් කියනවා. දේශපාලන වශයෙන් අපි ඒවා පිළිගන්නේ නැති වෙන්න පුළුවන්. දේශපාලන වශයෙන් අපි ඒවාට එකඟ නොවෙන්න පුළුවන්. නමුත් ඔවුන්ටත් මේ ගරු සභාව තුළ ඒ අදහස් කියන්න; ඒ අදහස් වෙනුවෙන් පෙනී සිටින්න; ඒ අදහස් මේ ගරු සභාව තුළට ගෙනැල්ලා කථා කරන්න හැකියාව ලැබිලා තිබෙනවා. ඒ තුළින් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වෙලා තිබෙනවා. ඒකයි අපි ඡන්ද ක්‍රමයකින් බලාපොරොත්තු වන්නේ. එහෙම නැතිව නිකම් ඡන්ද ක්‍රමයක් හදලා, නියෝජනයන් කපා දමලා, තිබෙන නියෝජනයන් නැති කරලා ඇති කරන ප්‍රජාතන්ත්‍රවාදයකින් වැඩක් නැහැ. එහෙම ප්‍රජාතන්ත්‍රවාදයක් ඇති කරන්න නොවෙයි, අපි ඡන්ද ක්‍රමය වෙනස් කරන්න ඕනෑ කිව්වේ. ප්‍රජාතන්ත්‍රවාදය තුළ ඡන්ද ක්‍රමය වෙනස් වෙනවා නම්, තිබෙන ඡන්ද ක්‍රමයට වඩා හොඳ ක්‍රමයක් එන්න ඕනෑ; තිබෙන නියෝජනයන් ආරක්ෂා වෙන්න ඕනෑ. තිබෙන නියෝජනයත් නැති කරගෙන යන ප්‍රජාතන්ත්‍රවාදයක් ඇති කරන්න ගියාම එතැන කෝලාහලයක් බවට පත් වෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි ඒක කියන්න ඕනෑ.

ඊළඟට අපේ ඇමතිතුමා කියපු දේවල් ගැනත් කියන්න ඕනෑ. ඇමතිතුමා කිව්ව සමහර දේවලට මගේ එකඟත්වය තිබෙනවා; සමහර දේවලට එකඟ වන්නේ නැහැ. මම එකඟ වන්නේ නැති දේ මෙකයි. එතුමා චෝදනා කරනවා, ශ්‍රී ලාංකික අනන්‍යතාවට. මේ රටේ ප්‍රධාන ජාතීන් තුනක් සිටින බව අපි පිළිගන්නවා; වෙනම භාෂාවන් කථා කරනවා; වෙනම සංස්කෘතීන් තිබෙනවා; වෙනස් ආකාරයට කෑම ගන්නවා. ඒ විධියට එක එක ජන කොටස්වලට ආවේනික වූ ලක්ෂණ තිබෙනවා. ඊළඟට අපි කුල වශයෙන් බෙදී සිටිනවා. ඒ වාගේ දේවල් මේ රටේ තිබෙනවා. මේ රටේ මේ කියන සියලු දේවල් නැත්නම් එතුමා කියන දේ හරි. අපට එහෙම අවශ්‍යතාවක් නැහැ. නමුත් මේ රට තවම ජාතික ප්‍රශ්නය විසඳා ගන්න බැරිව සිටිනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මට තවත් මන්ත්‍රීවරයකුගේ වෙලාව එකතු කර තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ සියලු වේලාවන් එකතු කරලායි.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ඒ ජාතික ප්‍රශ්නය විසඳනවාය කියන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ තිබෙන මූලික කර්තව්‍යයක්. මේ රටේ ඒ කර්තව්‍යය ඉෂ්ටවෙලා තිබෙනවාද? එහෙම ඉෂ්ටවෙලා නැහැ. මේ රටේ ජාතික ප්‍රශ්නය විසඳලා නැහැ. තවම අපි මේ රටේ ජාතීන් වශයෙන් බෙදිලා. අපි වෙනත් භාෂාවන් කථා කරනවා; වෙනත් සංස්කෘතීන් තිබෙනවා. අපි ඒවා සියල්ලම ආරක්ෂා කර ගන්න උත්සාහ කරනවා. තමන්ගේ අනන්‍යතාව නැති කර ගන්න කවුරුවත් කැමැති නැහැ. ඒක හැම වර්ගයා තුළම තිබෙන වුවමනාවක්. ඒවා බලහත්කාරයෙන් නැති කරන්න බැහැ. ප්‍රජාතන්ත්‍රවාදය ඇති කරනවාය කියලා ඒ තිබෙන නියෝජනයන් නැති කරන්න බැහැ. අපි ඒවා පිළිගන්න ඕනෑ. ඒක පිළිගැනීම අත්‍යවශ්‍යයි කියලා අපි දන්නවා. ඒක පිළිනොගැනීම නිසා තමයි අපි අවුරුදු තිහක යුද්ධයකට පැටලුණේ. ඒක පිළිගන්න බැරි නිසා තමයි, අපට තවම ඉස්සරහට යන්න බැරිව ඉන්නේ. මේ රට තුළ විවිධ භාෂා කථා කරන, විවිධ ජන කොටස්, විවිධ ජාතීන් ඉන්නවා. ඒ විවිධත්වය පිළිගන්න තවම සමහරුන් ලැහැස්ති නැහැ. ඒ ලැහැස්ති නැති නිසා තමයි උතුරේ ප්‍රභාකරන්ලා වාගේ අයට, උතුරේ අන්තවාදයකට හිස ඔසවන්න පුළුවන්කම ලැබුණේ. අපි ඒ විවිධත්වය පිළිගන්න ලැහැස්ති නැහැ; ඒවා පිළිගන්න කැමැති නැහැ. එහෙම කැමැති නැති වුණාම ප්‍රශ්න ඇති වෙනවා; සණ්ඩු සරුවල් ඇති වෙනවා. ඒ නිසා ඒක පිළිගැනීම අත්‍යවශ්‍යයි. ප්‍රජාතන්ත්‍රවාදය තුළ සෑම ජන කොටසකටම තමන්ගේ නියෝජනය ඉතාම වැදගත්. ඒක අහක දමන්න බැහැ. ඒක නිකම් ජාතිවාදය කියලා ලේබල් ගහලා අයින් කරන්න බැහැ. ඒක හදලා තිබෙන්නේ.

රවුල් හකීම් මැතිතුමන්ලා, රිසාඩ් බදියුදීන් මැතිතුමන්ලාගේ දේශපාලනය පිළිබඳ ප්‍රශ්න මටත් තිබෙනවා. මම ඒවා සියයට 100ක්ම පිළිගන්නේ නැහැ. නමුත් අපි සියලුදෙනාම පිළිගන්න ඕනෑ, මේ රටේ විවිධ ජාතීන් ජීවත් වන බව. ඒ ජාතීන් අංග සම්පූර්ණ වෙලා ශ්‍රී ලාංකික අනන්‍යතාව ඇතිව, 'අපි ශ්‍රී ලාංකිකයෝ' කියන එකමුතුභාවය හදාගෙන, "මේ රටේ ජාතික ප්‍රශ්නයක් කියලා එකක් නැහැ, එක එක ජනවර්ගවලට විශේෂිත වූ ප්‍රශ්න නැහැ, මේ රටේ එහෙම ප්‍රශ්න මොකුත් නැහැ "යි කියලා කියන්න පුළුවන් නම් අන්න එදාට අපට කථා කරන්න පුළුවන්, එහෙම ක්‍රමයක් අවශ්‍ය නැහැයි කියලා. අද තවමත් එහෙම තත්ත්වයක් අපේ රටේ නැහැ. තවමත් මේ රටේ කඳුකරයේ දෙමළ ජනතාව මුහුණ දෙන විශේෂ වූ ප්‍රශ්න තිබෙනවා; උතුරේ දෙමළ ජනතාව මුහුණ දෙන විශේෂ වූ ප්‍රශ්න තිබෙනවා; උතුර, නැගෙනහිර ජීවත් වන සිංහල ජනතාව මුහුණ දෙන විශේෂ වූ ප්‍රශ්න තිබෙනවා; උතුර, නැගෙනහිර ජීවත් වන මුස්ලිම් ජනතාව මුහුණ දෙන විශේෂ වූ ප්‍රශ්න තිබෙනවා; දකුණේ ජීවත් වන මුස්ලිම් ජනතාව මුහුණ දෙන විශේෂ වූ ප්‍රශ්න තිබෙනවා. ඒ හැම ප්‍රශ්නයක්ම තිබෙන නිසා තමයි එක එක ජනවර්ග නියෝජනය

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

කරන දේශපාලන පක්ෂ හැදෙන්න අවකාශය ලැබුණේ. එක පැත්තකින් ඒගොල්ලන්ට වැඩෙන්න අවකාශය ලැබුණේ එහෙමයි. මේ රටට නිදහස ලැබිලා අවුරුදු 70ක් වෙනවා. මේ රටේ ප්‍රධාන දේශපාලන පක්ෂ දෙකක් තිබෙනවා.

ඒ පක්ෂ දෙකම මේ ඉන්න සුළු ජන කොටස්වල ප්‍රශ්න විසඳා දීමට අපොහොසත්වීම නිසා තමයි එක එක වර්ගයාට අනුව පක්ෂ බිහි වුණේ. ඒ ප්‍රශ්න විසඳා ගන්න අපට පුළුවන් වුණා නම්, මේ එක පක්ෂයක්වත් බිහි වෙන්නේ නැහැ; මේ එක පක්ෂයක්වත් අවශ්‍ය නැහැ. ඒ නිසා, -

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

ගරු මුජීබුර් රහුමාන් මහතා
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසන් කරන්නම්.

අලුත් ඡන්ද ක්‍රමයකට අප ආ යුතුයි කියන එක ගැන අපට විවාදයක් නැහැ; අලුත් ඡන්ද ක්‍රමයක් අවශ්‍යයි කියන එක ගැන අපට විවාදයක් නැහැ. නමුත්, ඒ සඳහා යන ගමනේදී අනෙකුත් ජන කොටස්වල නියෝජිතයන්, ඒ වාගේම අනෙකුත් මත දරන සුළු පක්ෂවල නියෝජිතයන් සියලුදෙනාටම සාධාරණ වන විධියට ඒ ඡන්ද ක්‍රමය අපි සෑදිය යුතුයි; ඒ ඡන්ද ක්‍රමය අපි සැලැස්විය යුතුයි. එහෙම නැතිව අපි මේ ගමන යනවා නම් මේ රට තුළ තවත් අර්බුදයක් නිර්මාණය කරනවාය කියන කාරණය මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු ඩලස් අලහප්පෙරුම මන්ත්‍රීතුමා.

[අ.භා.3.07]

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභා මැතිවරණය සම්බන්ධයෙන් අද දිනයේ සභාව තුළ පවත්වන කල් තැබීමේ විවාදයේ මම පාර්ශ්වකරුවකු වෙන්නේ, මෙතෙක් කථා කළ ආණ්ඩු පක්ෂයේ බොහෝ මන්ත්‍රීවරුන් - අපේ හිත මිත්‍ර මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා ඇතුළුව, - කරනු ලැබූ ඒ සාකච්ඡාව ඒ ආකාරයෙන් ගෙන යන්න නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද උදේ ඉර පෑවිවේ, පළාත් සභා මැතිවරණ තුනක් දින නියමයක් නැතිව කල් දමලා මාස නවයකුත් දවස් පහක් කල් පිරෙන අවස්ථාවේයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට දින තුනකට පෙර ඔබතුමාත් මේ සභාවේ සිටි වෙලාවේ, ගරු අගමැතිතුමාගෙන් මා විසින්ම මේ සභාවේදී මේ සම්බන්ධයෙන් ප්‍රශ්න කළා. හැකි නම්, මේ මැතිවරණය පවත්වන නිශ්චිත කාල වකවානුවක් නම් කරන්න කියලායි ප්‍රශ්න කළේ. එතුමාට ඒකට උත්තරයක් දුන්නේ නැති බව මටත් වඩා හොඳින් ඔබතුමා දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ විවාදයට අපි එකතු වෙන මේ මොහොතේ මේ රටේ විධායක ජනාධිපතිතුමාට -රාජ්‍ය නායකයාට- කියන්න බැහැ, පළාත් සභා මැතිවරණය පවත්වන්නේ කවදාද කියලා. ආණ්ඩුවේ ප්‍රධානියා විධියට ගරු අගමැතිතුමා දන්නේ නැහැ, මේ මැතිවරණය පැවැත්වෙන්නේ කවදාද කියලා. උත්තරීතරයි කියන මේ පාර්ලිමේන්තුවේ මූලාසනයේ සිටින ඔබතුමාගෙන් දැන් ඇහුවොත්, " මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැතිවරණය පවත්වන්නේ කවදාද?" කියලා, ඔබතුමාට ඒ වෙනුවෙන් කියන්න උත්තරයක් නැහැ. ඔබතුමාට උත්තරයක් නැහැ! විෂය භාර ඇමතිතුමා -අපේ මිත්‍ර ෆයිසර් මුස්තාපා ඇමතිතුමා- මොහොතකට පෙර මේ සභාවේ හිටියා. එතුමාගෙන් ඇහුවොත්, "කවදාද, මේ මැතිවරණය පවත්වන්නේ?" කියලා, -මේ මාස නවයක් කල් ගිය මැතිවරණය,- එතුමාට ඒකට උත්තරයක් නැහැ. ස්වාධීනයි කියලා අපි විශ්වාස කරන මැතිවරණ කොමිසමෙන් ඇහුවොත්, "මේ මැතිවරණය පවත්වන්න පුළුවන් නිශ්චිත කාල වකවානුව කවදාද?" කියලා, - කොමිසමේ වැරැද්දක් නොවෙයි, - එතුමන්ලාට ඒකට උත්තරයක් නැහැ. රාජ්‍ය නායකයා ඇතුළු උත්තරීතර පාර්ලිමේන්තුවේ ඉඳලා මැතිවරණ කොමිසම දක්වා කිසිම පුද්ගලයෙක් මේ කිසිම ආයතනයක්, මැතිවරණය පවත්වන්න පුළුවන් ආසන්න වකවානුවත් දන්නේ නැත්නම්, ඒ රටට කියන්න තිබෙන්නේ මොකක්ද? ඒ ආණ්ඩුවට කියන්න තිබෙන වචනය මොකක්ද? ඒ තමයි, "අරාජිකභාවය".

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක තවත් උත්සන්න වෙන්න හේතුවක් තිබෙනවා. ඒ තමයි, මීට මාස නවයකට පෙර ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීන්දුවක් දීලා තිබෙනවා,"පළාත් සභා මැතිවරණ කල් දමන්න බැහැ" කියලා. ඒ පසු බිම ඇතුළේ, අපි මුළු දවසක්ම වෙන් කරලා තිබෙන්නේ මේ විවාදය වෙනුවෙනුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විවාදයට අවතීර්ණ වෙන්න ඉස්සරවෙලා මම කැමැතියි, අද විවාදය සම්බන්ධයෙනුත්, අද විවාදයේ තිබෙන මාතෘකාව සම්බන්ධයෙනුත් ගරු කථානායකතුමාට -කරු ජයසූරිය මැතිතුමාට- 'අ'යනු තුනක් පිළිගන්වන්න. 'අ'යනු තුනක් ! ගෞරවයෙන් එතුමාට පුද කරන පළමුවැනි 'අ'යන්න තමයි, අගෞරවය. අගෞරවය, අසතුට සහ අප්‍රසාදය. "අ"යනු තුනක්! ඒ කුමක් සඳහාද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මන්ත්‍රීවරු විසිතුන්දෙනෙක් අත්සන් කරලා, - ඒකාබද්ධ විපක්ෂයේ ප්‍රධාන සංවිධායකවරයා විධියට මගේ අත්සන උඩින්ම තිබුණා; ගරු ඩී.වී. චානක මන්ත්‍රීතුමාගේ අත්සන විසිතුන්වැනියාට තිබුණා.- මේ මැතිවරණ කල් දැමීම සම්බන්ධයෙන් අපට විවාදයක් අවශ්‍යයි, ප්‍රජාතන්ත්‍රවාදයේ නාමයෙන් ඒ විවාදය අපට දෙන්න කියලා මැයි මාසයේ විසිදෙවන දා අපේ ඉල්ලීම භාර දුන්නා. දැන් මාස එකහමාරක් ඉක්මවා ගිහිල්ලා තිබෙනවා, අපට ඒ විවාදය දුන්නේ නැහැ. ඒ වෙනුවට අපේ TNA එක නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලාට ඒ අවස්ථාව දුන්නා, වෙන මාතෘකාවක් යටතේ. ඒ පිළිබඳව අපි අපේ නොකැමැත්ත ප්‍රකාශ කරන්න ඕනෑ. මේ පිළිබඳව අපේ මන්ත්‍රීවරු අවස්ථා කිහිපයකදී පාර්ලිමේන්තුවේදී ප්‍රශ්න කරලා තිබෙනවා. ඒ නිසා ඒ සම්බන්ධයෙන් අපේ අසතුට, අප්‍රසාදය පළ කරන්න ඕනෑ.

පළාත් සභා මැතිවරණ පවත්වන්නේ නැති වීම නිසා මේ ඇති වී තිබෙන අරාජිකත්වයට ප්‍රධාන හේතුව වුණෙත් මේ සභාවේදී ගරු කථානායකතුමා විසින් නායකත්වය දීලා ගනු ලැබූ තීන්දු තීරණ කිහිපයක වැරැද්දයි. නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිපතිවරයා ඇතුළු ඒ නියෝජිතයන් -මේ පාර්ලිමේන්තුවේ රජයේ නිලධාරීන්ගේ කුටියේ ඒ අය ඉන්නවා නම් මා සතුටු වෙනවා- 2017 සැප්තැම්බර් මාසයේ විසිවන දා පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත පිළිබඳව මේ සභාවේ සාකච්ඡා කළ වෙලාවේ ඓතිහාසික වැරැද්දක් කළා. ඒ වැරැද්ද නිසාවෙන් මැතිවරණය කල් ගියා විතරක් නොවෙයි, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට බරපතළ අර්බුදයකට ලක් වෙන්න, අනතුරක්

වෙත සමීප වෙන්න සිද්ධවෙලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මේ විවාදය තුළදී සාකච්ඡා කරන කාරණා පදනම් කරගෙන මැතිවරණයක් පවත්වන්න ආණ්ඩුව සූදානම් කියලා මම විශ්වාස කරන්නේ නැහැ; මොහොතකටවත් විශ්වාස කරන්නේ නැහැ. මම සැක කරන විධියට මේ විවාදය පැවැත්වීමේ ආණ්ඩුවේ මූලික අරමුණ තමයි මැතිවරණය කල් දැමීම සඳහා තාක්ෂණික හේතු නිර්මාණය කර ගැනීම. මැතිවරණය කල් දමන්න තාක්ෂණික හේතු අවශ්‍යයි, ගරු ෆවුසි රාජ්‍ය ඇමතිතුමනි. ප්‍රාදේශීය සභා මැතිවරණය අවුරුදු දෙකහමාරක් තිස්සේ කල් ගියේ, තාක්ෂණික වටපිටාවක් නිර්මාණය කරලායි. ඒ තාක්ෂණික හේතු මතු කර ගන්න ආණ්ඩුවට මේ විවාදය අවශ්‍යයි, එක පැත්තකින්.

අනෙක් පැත්තෙන්, මැතිවරණය කල් දැමීම සඳහා වූ වැඩ පිළිවෙළට පාර්ලිමේන්තුවේ මුද්‍රාව -කථානායකතුමාගේ මුද්‍රාව- තියන්න අවශ්‍යයි. ඒකටයි මේ විවාදය පාවිච්චි කරන්නේ. ඒ නිසා ඒ විවාදයට අපි සම්බන්ධ වන්නේ එහි කොටස්කරුවන් වන්න නොවෙයි. අපේ බලවත් විරෝධය මැද්දේ තමයි පසුගිය සැප්තැම්බර් මාසයේ විසිවන දා පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත තුනෙන් දෙකක ඡන්දයෙන් සම්මත කර ගත්තේ. ඒකට සම්බන්ධ වුණු, මේ පාර්ලිමේන්තුවේ ඉන්න හැම දෙනාටම අපි ඉතාම ගෞරවයෙන්, මිත්‍රත්වයෙන් ආරාධනා කරන්න කැමැතියි, රෑ වැටුණු වළේ දවල් වැටෙන්න එපා; ආණ්ඩුවේ මේ කූට වූ අභිලාෂයත් එක්ක අත් වැල් බැඳ ගන්න එපා කියලා. ඔවුන්ගේ සැබෑ අරමුණ, මැතිවරණය මඟ හැර යාමයි. ඇයි, එහෙම කියන්නේ? එදා පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත සම්මත කර ගන්න අසීරු වුණු වෙලාවේ TNA එක අවංකව වෙන්න ඇති, සද්භාවයෙන් වෙන්න ඇති තුනෙන් දෙකක ඡන්ද බලය ලබා ගන්න උදව් කළේ; තුනෙන් දෙකක බලය ලබා දුන්නේ. හැබැයි මා හිතන විධියට අද එතුමන්ලාට ඒකේ බරපතළකම තේරෙනවා ඇති. මා හිතන විධියට එතුමන්ලා මේ විවාදයට සම්බන්ධ වෙන්නේත් ඒ අර්ථයෙන් වෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු වේලු කුමාර් මන්ත්‍රීතුමනි, අපි සිංහලෙන් කියනවා, "කුම්බලා මාළු කෑවා නම් විඳවාපන් බළලෝ" කියලා. ඔබතුමාගේ ගෞරවනීය මාතෘ භාෂාව වන්නේ දමිළ භාෂාව. දමිළ භාෂාවෙන් කියනවා, "*தன்வினை தன்னைச் சுடும். ஓட்டப்பம் வீட்டைச் சுடும்.*" කියලා. මම හරිද? ඒ කියන්නේත් ඒක තමයි. TNA එකේ අපේ මිත්‍රයන්ට අද වෙලා තිබෙන්නේ ඒකයි, ඒ වැරැද්දේ පාපයට හවුල්කරුවන් වුණු නිසා. ඒ නිසා අපි සැක කරන්නේ, මේක මැතිවරණයක් තබා ගැනීම සඳහා කරන දෙයක් නොවෙයි කියලායි. ඇයි, අපි එහෙම කියන්නේ? සැප්තැම්බර් විසිවන දාට අපි ආපහු යමු, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි ඉතිහාසයට ඇවිදගෙන යමු; මාස නවයයි.

මේ පනත කොහොමද ආවේ; කොහොමද මතු වුණේ? ආණ්ඩුවට අවශ්‍ය වුණා පළාත් සභා මැතිවරණය කල් දමන්න. ආණ්ඩුව පළාත් සභා මැතිවරණය කල් දැම්මා. අපි උසාවි ගියා; ශ්‍රේෂ්ඨාධිකරණයට ගියා. මම ඒ නඩුවේ එක් පාර්ශ්වකරුවෙක්. මේ මැතිවරණය කල් දමන්න බැහැ කියලා ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් දුන්නා. ඊට පසුව ආණ්ඩුව මොකද කළේ? ශ්‍රේෂ්ඨාධිකරණය පරම පූජනීයයි කියලා නතර වුණාද? නැහැ. පාර්ලිමේන්තුවට හොයා ගෙන ආවා. පාර්ලිමේන්තුවට සොයා ගෙන එනකොට පළාත් සභා මැතිවරණය කාන්තා නියෝජනය වෙනස් කිරීම සඳහා වූ එක පිටුවක පනතක් පාර්ලිමේන්තුවේ තිබුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මතක් කර ගන්න. එක තනි පිටුවක පනතක් තිබුණා. මේ තනි පිටුවේ කාන්තා නියෝජනය සම්බන්ධයෙන් වූ පනත වෙනුවට සමස්ත පළාත් සභා මැතිවරණ ක්‍රමය විතැන් කරන, වෙනස් කරන නව ක්‍රමයක් පාර්ලිමේන්තුවේ මූලධර්ම මුළුමනින්ම උල්ලංඝනය කරමින් කාරක සභා අවස්ථාවේදී ආදේශ කිරීමට ආණ්ඩුව තීරණය කළා. ඒක මේ පාර්ලිමේන්තුවේ සිදු වුණු නිවැරදි කළ නොහැකි වැරැද්දක්.

ගරු කරු ජයසූරිය කථානායකතුමාට ඉතිහාසයක් තිබෙනවා. ඒ ඉතිහාසයට අපි ආදරය කළා. ඒ ඉතිහාසයට අපි ගෞරව කළා. මේ මොහොතේත් එතුමා සම්බන්ධයෙන් වූ ඉතිහාසයේ ගෞරවය පැත්තකින් තියලා නැහැ. හැබැයි, එදා ගත්ත තීන්දුව කිසිම ආකාරයකින් අපට එකඟ වෙන්න බැරි තීන්දුවක් බව අප කිව්වා. ඒ පනතේ මූලිකාංගවලට මුළුමනින්ම වෙනස් වුණු, ගැටගහන්න බැරි කාරණා ගෙනැත් පනතක් තියලා අවසන් මොහොතේ තුනෙන් දෙක අවශ්‍යයි කියලා පැය තුනක් කල් අරගෙන එම පනත සම්මත කර ගත් ආකාරය ඔබතුමාට මතක ඇති. එදා හෙලිකොප්ටර් එවන්නත් සිද්ධ වුණා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ගරු පියල් නිශාන්ත ද සිල්වා මන්ත්‍රීතුමාගේ විනාඩි 5ත් ලබා දී තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

ගරු ඩලස් අලහප්පෙරුම මහතා
(மாண்புமிகு டலஸ் அழகப்பெரும)
(The Hon. Dullas Alahapperuma)
ගරු පියල් නිශාන්ත ද සිල්වා මන්ත්‍රීතුමාටත්, ඔබතුමාටත් බොහොම ස්තුතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පනත ගෙනාපු විධියටම ආණ්ඩුවට අවශ්‍ය වුණේ මොකකක්ද?ශ්‍රේෂ්ඨාධිකරණයේ තීන්දුව මඟ හැර ගොස් මැතිවරණය කල් දමා ගන්නයි. ප්‍රාදේශීය සභා පනතේ සියයට 60 : 40 කියන අනුපාතය වෙනස් කරලා අන්තිම මොහොතේ සියයට පනහට පනහ විධියට සම්මත කර ගත්තා. අද පැරණි ක්‍රමයට හෝ මැතිවරණය පවත්වන්න ඕනෑ කියලා කථා කරන සියලුදෙනා එදා "පනහට පනහ ඕනෑ, ඒක තමයි සාධාරණ ක්‍රමය" කියලා අපට පරිභව කළා. එදා ඒකාබද්ධ විපක්ෂයට ඇඟිල්ල දිගු කළා. කොහොම හරි පනත සම්මත කර ගත්තා. ප්‍රේමසර ඇපාසිංහ මහත්මයාගේ භාෂාවෙන් කිව්වොත් ආසන්නතම දැවී යාමක් වාගේ තුනෙන් දෙක ලබා ගත්තා. අරගෙන මොකද වුණේ? සීමා නිර්ණය ජාතික කමිටුව පත් කළා. එතැනින් පසුව මොකද වුණේ? ඇයි මේ හිර වෙලා තිබෙන්නේ? මැතිවරණය වහාම අවශ්‍යයි කියලා යෝජනා කරන හැමදෙනාටම මම කියන්නේ, ඇයි මේ හිරවුණේ කියන එක හොයන්න කියලායි. ඒ විවාදයේදී ගරු අගමැතිතුමා පොරොන්දුවක් වුණා. අපි අද දෙන පොරොන්දු විශ්වාස කරන්නේ කොහොමද? ගරු අගමැතිතුමා, මේ ආණ්ඩුවේ, පාර්ලිමේන්තුවේ ප්‍රධානියා රටට දීපු පොරොන්දුව මොකක්ද? 2017 සැප්තැම්බර් මස 20වැනි දින සවස 3.53ට හැන්සාඩ් වාර්තාවේ 305වන තීරුවේ මෙසේ සඳහන් වනවා:

[ගරු ඩලස් අලහප්පෙරුම මහතා]

"විශේෂයෙන්ම මම මෙතැනදී එක කාරණයක් සඳහන් කරන්න ඕනෑ. මාර්තු මාසය අවසන් වෙන්න කලින් අපි ක්‍රියා කරනවා, අපි බලාපොරොත්තු වෙනවා, පළාත් සභා තුනේ මැතිවරණත්,

පළාත් පාලන ආයතනවල මැතිවරණත් සියල්ලම අවසන් කරන්න."

අගමැතිතුමා තවදුරටත් මෙහෙම කියනවා:

"කෙසේ හෝ අපේ කිසිම බලාපොරොත්තුවක් නැහැ, මාර්තු මාසය පහුවෙලා මේ මැතිවරණ පවත්වන්න."

මේ ගරු අගමැතිතුමා 2017 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ 20වැනි දින සවස ජාතියට, රටට දීපු පොරොන්දුව. ඔබ විශ්වාස කළා. අපි විශ්වාස කළේ නැහැ. තුනෙන් දෙකේ ඡන්දය වෙනුවෙන් අත ඔසවපු හැමදෙනාම විශ්වාස කළා වෙන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අද මේ විවාදය ගෙන යන්නේ 2018 වර්ෂයේ මාර්තු මාසයේ නොවෙයි. 2018 වර්ෂයේ ජූලි මාසයේ දෙවැනි සතියට ළංවෙලායි දැන් අපි ඉන්නේ. හොඳයි, ඒ ඉතිහාසයත් අමතක කරන්න. සීමා නිර්ණය කමිටුව පිහිටෙව්වා. 2018 මාර්තු මාසයේ 6වැනි දින වාර්තාව ගෙනාවා. ඒ පිළිබඳව ෆයිසර් මුස්තාපා ඇමතිතුමාට මම ස්තුතිවන්ත වෙනවා.

පනත ප්‍රකාරව, එතුමා දින 15ක් අතුළත සීමා නිර්ණය කමිටුවේ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරන්න ඕනෑ. නියමිත දිනයේ එතුමා වාර්තාව සභාගත කළා. ඒක සභාගත කරලා මාසයක් ඇතුළත දෙවන උප වගන්තියේ නියම ප්‍රකාරව එම වාර්තාව පාර්ලිමේන්තුව විසින් අනුමත කරන්න ඕනෑ. මාසයක කාලයක් ඇතුළත. ඒ මාසයක කාලයේ ඔබතුමන්ලා විවාදයට දිනයක් නියම කළා. ඔබතුමන්ලා ඒ විවාදය මැයි මාසයේ 19වැනි දාට නියම කළා. එය න්‍යාය පත්‍රයට ඇතුළත් කර, 19වැනි දා න්‍යාය පත්‍රය අපේ මේස උඩ තිබුණා. නමුත් අවසන් මොහොතේ ආණ්ඩුව ඒක ඉවත් කර ගත්තා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල සභානායකතුමා, "ආණ්ඩුවේ අවශ්‍යතාවක්" කියලා ඒක ඉවත් කර ගත්තා. ඒ මාසයක කාලය ඉකුත් වුණා. එම පනත් කෙටුම්පත ආබාධිත තත්ත්වයේ තිබුණේ. ඊට පස්සේ අගමැතිතුමා කමිටුවක් පත් කළා. ඒ කමිටුව ඉදිරියට ගියේත් නැහැ. අද වනකොට මාස තුනක් ගතවෙලා තිබෙනවා. මේකෙන් මොකක්ද පැහැදිලි වෙන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? මේ නිසා මැතිවරණය පවත්වන්න ආණ්ඩුවට වුවමනාවක් තිබෙන බවක් අප කිසි ආකාරයකින් දකින්නේ නැහැ. අපට හිතෙන විධියට ආණ්ඩුව බරපතළ ව්‍යාධියකින් ඔත්පළ වෙලා තිබෙනවා. මැතිවරණ භීතිකාවකින්, election phobia එකකින්, ආණ්ඩුව ඔත්පළ වෙලා තිබෙනවා. ඒ නිසා මේ පළාත් සභාවල මැතිවරණ පවත්වන්න ආණ්ඩුවට වුවමනාවක් තිබෙනවාය කියා මා විශ්වාස කරන්නේ නැහැ. දැන් වැදගත් වෙන්නේ, "මැතිවරණ ක්‍රමය මොකක්ද" කියන එක නෙවෙයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වෙලාව නැති නිසා මගේ කථාවේ අවසාන භාගයට මම එන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මදුරු උවදුර නිසා පීඩා විඳිමින් සුවසේ නිදා ගන්න බැරිව ඉන්න මුළු සමාජයට මොකක්ද අවශ්‍ය වෙන්නේ? අවශ්‍ය වන්නේ මදුරුවා පලවා හැරීම සහ නින්දක්. ඒ නින්ද ලබා ගැනීම වෙනුවෙන් මදුරුවන් පලවා හැරීමට ගත හැකි ක්‍රමවේද රාශියක් තිබෙනවා. ඒ සඳහා මදුරු කොයිල් එකක් පත්තු කරන්න පුළුවන්; නෙට් එකක් දාන්න පුළුවන්; කජු ලෙලි පුළුස්සන්න පුළුවන්; ටයර් පුළුස්සන්න පුළුවන්; බේගෝන් ගහන්න පුළුවන්. මේ ඕනෑ ක්‍රමයකින් මදුරුවන් පලවා හරින්න පුළුවන්. ඒ මොකක් හෝ කරලා මදුරුවන් පලවා හැරලා මිනිස්සු බලාපොරොත්තු වෙන්නේ සුව නින්දක්. ඒ නිසා අද මේ ගරු සභාවට මා කියන්නේ ජනතා පරමාධිපත්‍යයට පයින් ගහමින් මැතිවරණය කල් දැමීමේ ආණ්ඩුවේ උත්සාහය අපි පරාජය කරන්න ඕනෑ බවයි. මේ ගරු සභාවේ ඉන්න හෘදය සාක්ෂියක් සහිත සියලු මන්ත්‍රීවරු තමන් මොන දේශපාලන වර්ණයට ආදරය කළත්, ආණ්ඩුවේ මේ උත්සාහය පරාජය කරන්න ඕනෑ. මදුරු පීඩාවෙන් දුක් විඳලා සුව නින්දක් ලබා ගන්න බැරි වුණු මිනිහාට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නින්දක් අවශ්‍යයි. සුව නින්දක් ලබා ගන්නේ, මොන විධියට මදුරුවන් පලවා හැරලාද කියන එක වැඩක් නැහැ. ඒ නිසා අපි යෝජනා කරන්නේ, වහාම ජනතාවට අවශ්‍ය මැතිවරණය පවත්වන්න කියලායි. මැතිවරණය අවුල් කළා නම් අවුල් කළේ කවුද? අවුල් කළේ ආණ්ඩුවෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මැතිවරණය අවුල් කළේ ඔබතුමාද, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ද? නැහැ. ආණ්ඩුව තමයි අවුල් කරලා තිබෙන්නේ. කරුණාකරලා මැතිවරණය පැවැත්වීමේ වගකීම බැහැර කරන්න, ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ සභාපතිත්වයෙන් පැවැති කමිටුවේ වාර්තාව ගැන කියන්න එපා; ඒක පාවිච්චි කරන්න එපා. එතුමාගේ කමිටු වාර්තාව දැන් මුළුමනින්ම විකෘති කරලායි තිබෙන්නේ. පළාත් පාලන ආයතනවලින් සියයට 40ක් විතර පිහිටුවා ගන්න බැරි වුණේ ඇයි? එහෙම වුණේ ඒ වාර්තාව විකෘති කළ නිසා. ඒ නිසා අපි බල කරන්නේ, හැකි ඉක්මනින් -කඩිනමින් - මැතිවරණ පවත්වන්න කියලායි. තමුන්නාන්සේලා මැතිවරණ කල් දාන්න එපා. මැතිවරණ කොමිසමේ සභාපතිතුමා පැහැදිලිව කිව්වා, "මැතිවරණය කල් දමනවා කියන්නේ, රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඝාතනය කිරීමක්" කියලා. මැතිවරණ කොමිසමේ සභාපති මහින්ද දේශප්‍රිය මහතා එසේ රටට කියා තිබෙනවා. මැතිවරණ නිරීක්ෂණ සංවිධාන සියල්ලමත් එය කියා තිබෙනවා. ඒ නිසා තමුන්නාන්සේලාගේ වගකීම තමයි ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරන එක. අපි ආණ්ඩුවට බල කරලා කියනවා, විපක්ෂයේ මහජන පිබිදීමට භයේ තාක්ෂණික උප්පරවැට්ටි හොයමින් මැතිවරණය කල් දමන්නේ නැතුව පවත්වන්න කියලා.

උතුරු පළාත් සභාව ඇතුළු පළාත් සභා තුනක නිල කාලය අවසන් වන්න තිබෙන්නේ තව දින 75යි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 21වන ශත වර්ෂයේ අසිරිමත් සිදු වීම තමයි, උතුරු පළාත් සභාව පිහිටුවීම. උතුරු පළාත් සභා මැතිවරණය තියන්න දෙන්නේ නැහැ, දැන්. දැන් තමයි ටීඑන්ඒ සංවිධානයටත් ඒ ගැන මතක් වෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැඩිපුර විනාඩියක කාලයක් ලබා දීම පිළිබඳව මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අද ඉතාම අවාසනාවන්ත දිනයක්. අපේ ජනාධිපති ලේකම්තුමා කිසිදු හේතුවක් නොදන්වා ඉල්ලා අස් වෙලා. මා දන්නේ නැහැ, ඒ ඇයි කියලා. විජයකලා මහේස්වරන් රාජ්‍ය ඇමතිතුමිය ධුරයෙන් ඉල්ලා අස් වෙලා. මේ රටේ මහ බැංකු කොල්ලයට ප්‍රධාන වගඋත්තරකරු වන ඇලෝසියස් මහත්මයා සිටින්නේ හිර ගෙදර. ඔහුගේ මෙට්ටය යටින් දුරකථන හසු වෙලා. තෙල් මිල වැඩි කළා; දැන් ආපසු අඩු කරලා. අපි උදේට නැඟිටින්නේ ඒ ප්‍රවෘත්ති එක්ක. අද අපට රාත්‍රිය එළිවෙන්නේ එහෙමයි. ඒ නිසා රට තල්ලු වෙලා යන දිසාව පිළිබඳව අපට බයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කන්ද උඩරටින් බිහි වුණු තරුණ නායකයකු විධියට ඔබතුමාගේ ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය පැහැර ගන්න, කප්පාදු කරන්න, කොල්ල කන්න ආණ්ඩුවට ඉඩ තබන්නේ නැතුව, මැතිවරණයක් ලබා ගැනීමේ සටන වෙනුවෙන් අප සමඟ අත්වැල් බැඳ ගන්න කියලා ඔබතුමාටත් ආරාධනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[අ.භා. 3.27]

ගරු අබ්දුල් හලීම් මහතා (තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා)
(மாண்புமிகு அப்துல் ஹலீம் - தபால், தபால் சேவைகள் மற்றும் முஸ்லிம் சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. Abdul Haleem - Minister of Post, Postal Services and Muslim Affairs)

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභා මැතිවරණ ක්‍රමය පිළිබඳව අද දින ඉදිරිපත් කරන ලද සභාව කල් තැබීමේ යෝජනාවට අදාළව සිදු කෙරෙන මේ විවාදයේදී විවිධ අදහස් පළ වුණු බව මා දැක්කා. සමහර මන්ත්‍රීවරු ඒ ගැන වැදගත් අදහස් ගණනාවක්ම ඉදිරිපත් කළා.

ඉන්දු-ලංකා ගිවිසුම අනුව 1987දී මේ පළාත් සභා ක්‍රමය ඇති වුණු හැටි මට මතකයි. ඒ කාලයේ පළාත් සභා ගැන නොයෙක් විවේචන තිබුණා. පළමුවැනි පළාත් සභාවට තේරී පත් වුණු මන්ත්‍රීවරයකු හැටියට, ඒ වාගේම මධ්‍යම පළාත් සභාවේ අවුරුදු 12ක් වැනි කාලයක් අමාත්‍ය ධුරයක් දැරූ කෙනෙකු හැටියට මට මතකයි, එදා පළමුවැනි පළාත් සභා මැතිවරණයේදී ප්‍රධාන පක්ෂ කිහිපයක් මේ පළාත් සභා ක්‍රමයට කැමැති වුණේ නැති බව. විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ජනතා විමුක්ති පෙරමුණ, මහජන එක්සත් පෙරමුණ වැනි පක්ෂ ඒ මැතිවරණයට ඒ කාලයේ ඉදිරිපත් වුණේ නැහැ. ඒ වාගේම, ඒ පළාත් සභා මැතිවරණය පවත්වන කොට, ඒ මැතිවරණයේදී ඡන්දය දෙන්න එන අයට විශාල මරණ තර්ජනයකුත් තිබුණා. මට මතක විධියට ඒ කාලයේ සමහර දේශපාලන නායකයන් දිගින් දිගටම ප්‍රකාශ කළා, එතුමන්ලා බලයට පත් වුණාට පස්සේ පළාත් සභා අහෝසි කරන බව. එහෙම වුණත්, අද වනවිට ඒ හැම පක්ෂයක්ම පළාත් සභා පිළිගෙන හමාරයි.

පළාත් සභා ක්‍රමය වෙනස් කිරීම සම්බන්ධව පැවැත්වෙන මේ විවාදයේදී මා කියන්න කැමැතියි, අද තිබෙන මේ පළාත් සභා ක්‍රමය තුළ අපි හැමෝම විශාල වශයෙන් බලතල භුක්ති විඳින බව. දහතුන්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය හරහා බලතල විමධ්‍යගත කිරීම තුළින් අපේ පළාත්වල ගොඩක් කටයුතු ඉතාම සාර්ථකව කරගෙන යන්න අපට හැකි වුණා. නමුත්, මේ ක්‍රමය, මේ කියන අලුත් ක්‍රමයට වෙනස් කළොත්, සුළු ජාතීන්ට විශාල වශයෙන් අසාධාරණයක් සිදු වන බවයි මට නම් පෙනෙන්නේ. විශේෂයෙන්ම මෙතැනදී බොහෝ අය මතක් කළා, පළාත් සභාවල සිටින මුස්ලිම් නියෝජනය ගැන පමණක් බලනවා නම්, - මා මේක උදාහරණයක් වශයෙන් විතරයි කියන්නේ- දැනට පළාත් සභාවල සිටින මුස්ලිම් මන්ත්‍රීන් සංඛ්‍යාව 43දෙනයි. අනුර දිසානායක මැතිතුමාගේ කථාවේදී එතුමා කිව්වා, සියයට 50ක් ලැයිස්තුවෙන් පත් කළාම ඒ ප්‍රශ්නය විසඳෙනවා කියලා. මා නම් හිතන විධියට සියයට 50ක් ලැයිස්තුවෙන් පත් කළොත්, තව මන්ත්‍රීවරු 13 දෙනෙක් වැඩි වෙයි. නමුත් මා හිතන විධියට සංසන්දනාත්මකව බලන විට තවත් 17 දෙනෙකුගේ පමණ අඩුවීමක් සිදු වෙයි. මේ නිසා සුළු ජාතීන් නියෝජනය කරන හැමෝම වාගේ මේ අදහසට විරුද්ධ බවයි මා නම් දකින්නේ.

හැබැයි, මෑතකදී පැවැත්වුණු පළාත් පාලන මැතිවරණයෙන් අපි හැමදෙනාටම හොඳ අත් දැකීමක් ලැබුණා. අලුත් ක්‍රමය යටතේ පැවැති ඒ මැතිවරණයේ දී ඇති වුණු අවුල්සහගත තත්ත්වය අපට හොඳ පාඩමක් වුණා කියලයි මා හිතන්නේ. එම මැතිවරණ ක්‍රමය විශාල අවුලකට තුඩු දුන් මැතිවරණ ක්‍රමයක් හැටියටයි මා දැක්කේ. එම මැතිවරණයට තරග කරලා පරාජයට පත් වුණු මන්ත්‍රීවරුන් එම සභාවේම සභාපති ධුරයත් භාරගෙන කටයුතු කරන ආකාරය දැන් අපි දකිනවා. ඒකට හොඳම උදාහරණයක් තමයි අකුරණ ප්‍රාදේශීය සභාව. සමහර ප්‍රාදේශීය සභා පිහිටුවීම සඳහා තවත් පක්ෂවල සහාය අවශ්‍ය නිසා විශාල මුදල් හුවමාරු වීම්ද සිදු වුණා. ඒ විතරක් නොවෙයි. සමහර ස්වාධීන කණ්ඩායම්වල සියලුදෙනාම පරාජයට පත් වුණාට පස්සේ ලැයිස්තුවෙන් පත් කළ මන්ත්‍රීවරයා සභාපති ධුරය දරන තත්ත්වයකුත් දකින්න තිබෙනවා. ඒ නිසා පසුගිය පළාත් පාලන මැතිවරණයේ ඉතාම අවුල්සහගත තත්ත්වයකුයි අපට දකින්න තිබුණේ. ඒ නිසා ඉදිරියේදී පවත්වනු ලබන පළාත් සභා මැතිවරණයේ එවැනි අවුලක් ඇති නොවන්නට පළාත් සභා මැතිවරණ ක්‍රමය වෙනස් කළ යුතුයි.

අලුත් මැතිවරණ ක්‍රමය යටතේ එක හොඳ දෙයක් සිද්ධ වෙනවා. ඒ තමයි හැම කොට්ඨාසයකටම එක් මන්ත්‍රීවරයකු බැගින් පත් වීමට අවස්ථාව ලැබීම. ඒ විතරක් නොවෙයි. මේ නව ක්‍රමය පළාත් සභාවලට ඇතුළත් කිරීම සඳහා සීමා නිර්ණය කමිටුවක් පත් කළා. එම සීමා නිර්ණය කමිටුවට මහනුවර දිස්ත්‍රික්කය වෙනුවෙන් යෝජනා කිහිපයක් මා ඉදිරිපත් කළා. මා නියෝජිතයන් සමඟ ගිහින් සීමා නිර්ණය කමිටුවට සහභාගී වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහනුවර දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයකු හැටියට ඔබතුමාත් දන්නවා, මා නියෝජනය කරන හාරිස්පත්තුව මැතිවරණ කොට්ඨාසය ඒ කාලයේ සිටම පැවතියේ බහු ආසනයක් විධියටයි කියලා. ඒ මැතිවරණ කොට්ඨාසය බහු ආසනයක් වීමට විශේෂ හේතු තිබුණා. විශේෂයෙන්ම මුස්ලිම් හා සිංහල ජනතාව බහුලව ජීවත්වන ප්‍රදේශයක් නිසා එම මැතිවරණ කොට්ඨාසය බහු ආසනයක් වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද තිබෙන තත්ත්වය තුළ, විශේෂයෙන්ම ජාති භේදය සම්බන්ධයෙන් මෑතකදී යම් යම් ප්‍රශ්න ඇති වුණු නිසා මා ඉල්ලීමක් කළා, ඒ මැතිවරණ කොට්ඨාසය කඩන්න එපාය කියලා. නමුත් ඒ අයගේ මතය වුණේ, හාරිස්පත්තුව මැතිවරණ කොට්ඨාසය දෙකට කඩලා, එක කොටසක් සම්පූර්ණයෙන්ම මුස්ලිම් ජනතාවටත්, තවත් කොටසක් සිංහල ජනතාවටත් වෙන් කරලා, ඉතිරි වන ඡන්ද සංඛ්‍යාව එයට ආසන්නම ආසනය වන ගලගෙදර ආසනටත් එකතු කරන්නයි. ඒ නිසා අද වන විට බෞද්ධ ජනතාව තුළ විශාල කැලඹීමක් ඇති වෙලා තිබෙනවා, මම ආණ්ඩුව නියෝජනය කරන ඇමතිවරයකු නිසා මෙය මගේ කුමන්ත්‍රණයක්ය කියලා. මෙවැනි චෝදනා අපට එල්ල වනවා.

අද ගරු ෆයිසර් මුස්තාපා ඇමතිතුමා සඳහන් කළා, පූජාපිටියේ ප්‍රශ්නයක් තිබෙනවාය කියලා. මේකයි තිබෙන ප්‍රශ්නය. ජාතීන් අතර සමඟිය අත්‍යවශ්‍ය වෙලා තිබෙන මෙවැනි කාලවකවානුවක මා නියෝජනය කරන හාරිස්පත්තුව මැතිවරණ කොට්ඨාසයේ දැනට පවතින බහු ආසන ක්‍රමය ඉදිරියටත් එලෙසින්ම ක්‍රියාත්මක කළොත්, මෙම ප්‍රශ්නය විසඳෙනවාය කියන එකයි මගේ අදහස. මේ කොට්ඨාස ක්‍රමය ඇති කිරීමේ දී අප කොතරම් යෝජනා ඉදිරිපත් කළත්, සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාව මිශ්‍ර වී සිටින සමහර ප්‍රදේශ සඳහා බහු ආසන ලබා දෙන ලෙස ඉල්ලීම් කළත්, සීමා නිර්ණය කමිටුව එතරම් ඇහුම්කන් දුන්නේ නැහැ. මේක විශාල ප්‍රශ්නයක්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, තව විනාඩියකින් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

ගරු අබ්දුල් හලීම් මහතා
(மாண்புமிகு அப்துல் ஹலீம்)
(The Hon. Abdul Haleem)

හොඳයි. හාරිස්පත්තුව ආසනයේ ජීවත් වන ජනතාවගෙන් බහුතරයක් සිංහල ජනතාවයි. එම ප්‍රදේශයේ සමඟියෙන් ජීවත්

[ගරු අබ්දුල් හලීම් මහතා]

වන සිංහල, මුස්ලිම් ජනතාව අසමඟි කරන්න එපාය කියලා මේ අවස්ථාවේ දී මා විශේෂයෙන් ඉල්ලීමක් කරනවා.

මේ පළාත් සභා මැතිවරණය කල් දැමීම ගැන අපේ කැමැත්තක් නැහැ. පළාත් සභා මැතිවරණය ඒ නියමිත කාලවකවානුව තුළ පැවැත්විය යුතුයි. සියල්ල වෙනස් කිරීමට කාලය ප්‍රමාණවත් නොවන නිසා, දැනට පවතින ක්‍රමය අනුව එළඹෙන පළාත් සභා මැතිවරණය පවත්වා, ඉන් පසුව මේ ප්‍රශ්නය සම්බන්ධයෙන් සමාජයේ කථිකාවතක් කරලා, සියලුදෙනාම සාකච්ඡා කරලා අලුත් ක්‍රමයක් ඇති කිරීම වැදගත් බව මතක් කරමින් මා නිහඬ වනවා. ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු බිමල් රත්නායක මන්ත්‍රීතුමා.

[අ.භා.3.37]

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභා මැතිවරණය කල් දැමීම සහ එම මැතිවරණ ක්‍රමය සම්බන්ධයෙන් වූ කල් තැබීමේ විවාදයේදී මතු වූ කරුණු කීපයක් සම්බන්ධයෙන් පිළිතුරු ලබා දෙන්නට මා මේ අවස්ථාවේදී බලාපොරොත්තු වනවා. ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමාගේ පැත්තෙන් මේ පිළිබඳව කරුණු ගණනාවක් කියැවුණා.

පළමුවැනි කරුණ මෙයයි. මේ පළාත් සභා මැතිවරණය කල් යන්නේ ඡන්ද ක්‍රමයේ ප්‍රශ්නයක් නිසා නොවෙයි. මේ පනත් කෙටුම්පතට අනුව ඉතා පැහැදිලිව පනත් කෙටුම්පත සම්මත වූ දවසේ සිට මාස හතරක් ඇතුළත දී සීමා නිර්ණය කිරීම අවසන් කරන්නත්, සීමා නිර්ණය වාර්තාව ඉදිරිපත් කළාට පසුව මාස දෙකක් ඇතුළතදී අභියාචනා ක්‍රියාවලිය අවසන් කරන්නත් තිබුණා. ඒ අනුව ජූනි මාසයේ මුල වනකොට අභියාචනා ක්‍රියාවලිය අවසන්වෙලා, පළාත් සභා ඡන්දයට යන්නයි තිබුණේ. තවමත් ඒ ඉඩකඩ නැතිවා නොවෙයි. ඒක තමයි පනතේ සඳහන්ව තිබෙන්නේ. මොකද, ඡන්දය කල් දමන්න දේශපාලන පක්ෂ දෙකට තිබෙන වුවමනාව නැති කරන්න, ඒකට බාධා කරන්න පනතින් නිශ්චිත නීතියක් දැම්මා. අවසානයේ ඒකට එකඟ වෙන්න ආණ්ඩුවට සිදු වුණා. විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ ඇති වී තිබෙන සංවිධාන අර්බුදය හා එක්සත් ජාතික පක්ෂය ආණ්ඩුවක් වශයෙන් විශාල ලෙස ජනතා අප්‍රසාදයට ලක් වෙලා තිබෙන නිසා තමයි අපි දන්නා තරමින් නම් ඡන්දය කල් ගිහිල්ලා තිබෙන්නේ. ඔක තමයි සරල කථාව. දැන් මේ මුව හමට තඩි බාන්නේ ඇත්ත කථාව වහලා. මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුළ තිබෙන විශාල අර්බුදය නිසා ඔවුන් ඡන්දයකට කැමති නැහැ. ඒක තමයි ඇත්ත.

ජනාධිපතිතුමා තෙල් මිල අඩු කළ එක හොඳයි. නමුත් ආණ්ඩුව ඇතුලේ තිබෙන ගැටුම තෙල් මිලෙන් පවා පෙනෙනවා නේ. ඒක තමයි ඇත්ත කථාව. එක්සත් ජාතික පක්ෂය සමඟ විට ඡන්දයකට අකැමැති වෙන්න පුළුවන්. එක්සත් ජාතික පක්ෂය ඡන්දයකට කැමතිද දන්නේත් නැහැ; පරදින්නේ නැතිව තව කාලයක් ඉන්න ඔවුන් කැමතිද දන්නේත් නැහැ. එහෙම නැතිව ආර්ථික වශයෙන් නන්නත්තාර වෙලා සිටින නිසා එක්සත් ජාතික පක්ෂයත් මේ වෙලාවේ ඡන්දයකට අකැමැති වෙන්න පුළුවන්. නමුත් අපි දන්නා සත්‍යය ඕකයි. එහෙම නැතිව ඡන්ද ක්‍රමයේ ප්‍රශ්නයක් නොවෙයි මෙතැන තිබෙන්නේ.

තුන්වැනි කාරණය මොකක්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? අලුතින් හදපු ඡන්ද ක්‍රමය අනුව තමන්ගේ කොට්ඨාසය දිනන්න ඕනෑ. දැන් මේ කවුරුත් නොකියන කථාව මොකක්ද? තමන්ගේ කොට්ඨාසය දිනන්න බැහැයි කියන එක තමයි කවුරුත් නොකියන කථාව. මේ ඡන්ද ක්‍රමය වැරැදි වෙලා තිබෙන්නේ ඇයි? ඡන්ද ක්‍රමයේ වැරැද්ද ගැන කියන්නේ තමන්ගේ කොට්ඨාසය පරදින නිසයි. දේශපාලන ස්වරූපයන් අනුව සමහර මන්ත්‍රීතුමන්ලා මුළු දිස්ත්‍රික්කයක් පුරාම තමයි ගොඩක් වැඩ කරලා තිබෙන්නේ. ප්‍රතිපාදන ලබා දීලා තිබෙන්නේ, ඥාති හිතවතුන් ඉන්නේ, උදවු පදවු කරලා තිබෙන්නේ අවුරුදු ගණනාවක් තිස්සේ මුළු දිස්ත්‍රික්කයටමයි. එතැනින් මනාප එකතු කරගෙන තමයි ඔවුන් දිනලා තිබෙන්නේ. තමන්ගේ කොට්ඨාසය තුළ තමන්ට දිනන්න බැරි වෙන්න පුළුවන්. තමන් කොට්ඨාසය තුළ කොච්චර වැඩ කරලා තිබුණත්, පාරම්පරික වශයෙන් සමහර කොට්ඨාස සමහර පක්ෂවලට ටිකක් සමීපයි. අවුරුදු 60ක්, 70ක් තිස්සේ මේ දේශපාලන ක්‍රියාවලිය ඇතුලේ එහෙම වෙලා තිබෙනවා. මන්ත්‍රීතුමා කොච්චර හොඳ වුණත් වැඩක් නැහැ, කොට්ඨාසය දිනන්න බැරි නම්. ඒක තමයි මෙහි තිබෙන ඊළඟ කාරණය.

පසු ගිය කාලයේ මේ සම්බන්ධයෙන් ගොඩක් කථා කළා. අපි මැතිවරණ ක්‍රමය සම්බන්ධයෙන් ලොකුවට හැප්පුණු පක්ෂයක් නොවෙයි. මොකද, ආණ්ඩුවලින් මැතිවරණ ක්‍රම හදන්නේ අපි වෙනුවෙන් නොවෙයි කියලා අපි දන්නවා. අපේ පක්ෂය පාර්ලිමේන්තුවට එන එක වළක්වන්න ජේ.ආර්. ජයවර්ධන අපිව තහනම් කළා. ජේ.ආර්. ජයවර්ධන හිටපු ජනාධිපතිවරයා මිය යන්න කලින් "The Sunday Times" පුවත් පත විසින් කරපු interview එකේ දී ඒ ගැන කිව්වා. ජනතා විමුක්ති පෙරමුණ හැටියට අපි දීලා තිබෙන pitch එකේ සෙල්ලම් කරනවා. ඒ නිසා ඡන්ද ක්‍රම ගැන මාරාන්තික ප්‍රශ්නයක් අපිට නැහැ. දෙන pitch එකේ අපි සෙල්ලම් කරනවා. නමුත් දැන් මේවා ගැන කථා කරන කට්ටියගේ bottom line එක ගැනයි මා මේ කියන්නේ. ඡන්දය කල් යන්නේ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධාන ගැටලුවක් නිසා; එක්සත් ජාතික පක්ෂය ආර්ථික හා පරිපාලන වශයෙන් අසාර්ථක වී තිබෙන නිසා; තනි තනිව මෙහි සිටින මන්ත්‍රීවරුන් ගත්තාට පස්සේ ඔවුන්ට තමන්ගේ කොට්ඨාසය දින්න බැරි නිසා. ඔක තමයි ඇත්ත. මීට කලින් තිබුණු සාකච්ඡාව මොකක්ද, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි? "මනාප ක්‍රමය මහා විනාශයක්. මේක අහෝසි කරන්න ඕනෑ"යි කියලා මේ රටේ නොකිව්වේ කවුද? මේ රටේ මනාප ක්‍රමය ලොකු අවුලක් කියලා තමයි කිව්වේ. ජවිපෙ අපි කිව්වා, "අපිට නම් ප්‍රශ්නයක් නැහැ" කියලා. අපිට කවදාවත් මනාප හුටපටයක් ඇවිල්ලා නැහැ. අපි මුහුණු වහගෙන ඡන්ද කරලා නැහැ. ජවිපෙ වශයෙන් අපි ඡන්දය ඉල්ලද්දි එහෙම දෙයක් කරලා නැහැ. සන්ධාන වශයෙන් ඡන්දය ඉල්ලද්දි අපි එහෙම දේවල් කරලා ඡන්දය දිනලා තිබෙනවා. ඒ නිසා අපිට මනාප ප්‍රශ්නයක් තිබුණේ නැහැ. ඊළඟට කිව්වා, "කොට්ඨාසයට මන්ත්‍රීවරයෙක් ඉන්න ඕනෑ"යි කියලා. කොට්ඨාසයේ දැනුත් මන්ත්‍රීවරයෙක් ඉන්නවා. ඔබතුමන්ලා ආසන සංවිධායකවරු පත් කරනවා. ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු විසින් ඔබතුමන්ලාගේ ආසන සංවිධායකවරුන් පත් කරනවා.

දැනටත් ඡන්ද ගණන් කරන්නේ කොට්ඨාස විධියටයි. ඒ නිසා කොට්ඨාසයකට අමුතුවෙන්ම මන්ත්‍රී කෙනෙක් ඕනෑ නැහැය කියා අපි කිව්වා. මේ ගරු සභාවේ ඉන්න ඇමතිවරු ගත්තත්, මන්ත්‍රීවරු ගත්තත්, එතුමන්ලා දැනටත් වැඩිපුර මුදල් වියදම් කරන්නේ තමන්ගේ ආසනයටයි; වැඩිපුර සොයා බලන්නේ තමන්ගේ ආසනය ගැනයි. දිස්ත්‍රික්කයම කියා කිව්වාට, තමන්ට ආසනයක් තිබෙනවා. ඒක තමයි ඇත්ත කථාව වන්නේ. නමුත් ඒ වෙලාවේ කිව්වා, "එහෙම නැහැ, කොට්ඨාසයටම ඕනෑ" කියා. ඉතින් දැන්

කොටියාස ක්‍රමය ලැබුණාම මොකක්ද කියන්නේ? දැන් ඒ මොනවත් කියන්නේ නැහැ. දැන් මනාප ක්‍රමයේ අවුල ගැන කියන්නෙත් නැහැ; කොටියාස ක්‍රමයේ ප්‍රශ්නය ගැන කියන්නෙත් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට මම කාන්තා නියෝජනය ගැනයි කථා කරන්නේ. එය අලුතින් කවුරුත් පිළිගත් දෙයක්. කාන්තා නියෝජනය ඕනෑය කිව්වා. "කාන්තා නියෝජනයත් ලොකු කරදරයක් වෙලා" එහෙම තමයි දැන් කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා මෙතැන තිබෙන්නේ ඡන්ද ක්‍රමයේ ප්‍රශ්නයක් නොවෙයි. ඡන්ද කල් යන්නේ අර හේතු දෙක නිසායි. ඡන්ද ක්‍රමයේ ඇත්ත ප්‍රශ්නය ඇවිත් තිබෙන්නේ කොතැනටද? ඇත්ත ප්‍රශ්නය ඇවිත් තිබෙන්නේ තමන්ට -ප්‍රධාන පෙළේ නායකයන්ට - දිනන්න බැහැ කියා ඒ අය භීතන නිසායි. නැත්නම් ඡන්ද ක්‍රමය සමානුපාතිකයි. මේ අලුත් ඡන්ද ක්‍රමය අනුවත්, පැරණි ඡන්ද ක්‍රමය අනුවත් මන්ත්‍රීවරු ප්‍රමාණය තීරණය වන්නේ කොහොමද? කිසිම වෙනසකින් තොරව සෑම පක්ෂයක්ම ගන්නා වූ ඡන්ද සංඛ්‍යාව මත, සමානුපාතිකව ගණන් හදලා තමයි මන්ත්‍රීවරු සංඛ්‍යාව නිමි වන්නේ. දැන් තර්කයක් ගෙනෙනවා, "මේ ඡන්ද ක්‍රමය නිසා සභා අස්ථාවර වෙලා" කියා. "සල්ලිවලට මන්ත්‍රීවරු ගන්නවා" කියා මට කලින් කථා කළ මන්ත්‍රීතුමා කිව්වා. ඉතින් මේ ක්‍රමයේදීත් සල්ලිවලට මන්ත්‍රීවරු ගන්නවා නේ; කේවල ක්‍රමයේදීත් ගන්නවා නේ. ඉන්දියාවේ තිබෙන්නේ කේවල ක්‍රමයක්. රුපියල් කෝටි ගණන්වලටයි ජනාධිපතිවරණයේදී විකිණෙන්නේ. අපි දන්නවා, ජනාධිපතිවරණයේදී ජනාධිපති අපේක්ෂකයන්ට පක්ෂ විකුණන බව. ඒ නිසා නේ, සමහර පක්ෂ -පසුගිය ජනවාරි 8වන දා- ඡන්දය මැද්දේ එකතු වෙන්නේ. අඩුම ගණනේ nomination දෙන්න කලින්වත් නොවෙයි. අපේ අනුර දිසානායක සහෝදරයාත් කිව්වා, දේශපාලනය සල්ලිවලට කරන දේශපාලනඥයන් බහුතරයක් ඉන්න රටක තමුන්නාන්සේලාට ඡන්ද ක්‍රමයකින් ඒක හදන්න නොහැකි බව. අපේ -ජනතා විමුක්ති පෙරමුණේ- මන්ත්‍රීවරු 436ක් ඉන්නවා. මේ සභා පිහිටුවද්දි -අනුර දිසානායක මන්ත්‍රීතුමාත් මේ කාරණය කිව්වා.- අපේ කිසිම අපේක්ෂකයෙක් අඩුම ගණනේ එකම තැනකවත් වෙනස් වුණේ නැහැ. තමුන්නාන්සේලාට යූඑන්පී එකේ අය විකිණුනා. පොහොට්ටුවේ මන්ත්‍රීවරියක් රුපියල් ලක්ෂ දෙකක් අරගෙන අනික් පැත්තට ඡන්දය දුන්නාය කියා අරණායක ප්‍රදේශයේදී -මට මතක විධියට- press conference එකක් තියලා කිව්වා. යූඑන්පී එකට වැඩි ඡන්ද තිබුණු දෙහිවල අනික් පැත්තට ගියා. යූඑන්පී එකට වැඩි ඡන්ද තිබුණු මීගමුව අනික් පැත්තට ගියා. ගාල්ලත් එහෙම වුණා. ඒ සල්ලිවලට විකිණෙන නිසායි. එය ඔබතුමන්ලාගේ පක්ෂවල ප්‍රශ්නයක්. ඒක මේ රටේ ප්‍රශ්නයක් නොවෙයි. ඔබතුමන්ලාගේ නායකයෝත් සැලකිය යුතු ප්‍රමාණයක් දූෂිත අය නිසා ඔබතුමන්ලාගේ පහළ අයත් සල්ලිවලට පක්ෂය පාවා දෙනවා. ගමේ යූඑන්පීකාරයාගේ ඡන්ද අරගෙන මන්ත්‍රී වෙලා, ඒක සල්ලිවලට විකුණනවා. ඒකට ඡන්ද ක්‍රමයක් හදන්න පුළුවන්ද? මුස්ලිම් මිනිහාගේ ඡන්ද අරගෙන ඇවිත්, මම මුස්ලිම් කොංග්‍රසයේ හෝ වෙන කුමක් හෝ පක්ෂයකයි කියා, මුස්ලිම් මිනිසුන් වෙනුවෙන් පෙනී ඉන්නවාය කියා, වෙනත් පැත්තකට යනවා. දෙමළත් එහෙමයි; සිංහලත් එහෙමයි. ඒක ඡන්ද ක්‍රමයට බේරන්න බැහැ. ඒ නිසා මම පැහැදිලිවම කියනවා, මෙම ඡන්ද ක්‍රමයේ වෙන අඩු පාඩුකම් තිබෙනවා, ඔය කියන ප්‍රශ්න මේකේ නැහැ කියා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ ප්‍රශ්න පසුගිය ඡන්ද ක්‍රමයේත් තිබුණා; කේවල ඡන්ද ක්‍රමයේත් තිබුණා.

අවසාන වශයෙන් මම මේ කාරණය කියන්න කැමතියි. ජනතා විමුක්ති පෙරමුණ වශයෙන් අප කියන්නේ, මේ හැදුණු ඡන්ද ක්‍රමය හොඳම ඡන්ද ක්‍රමය නොවන බවයි. නමුත්, මෙහි මනාප ක්‍රමයක් නැහැ. මේකේ ගැටුම් තිබුණේ නැහැ. කොටියාසයකට මන්ත්‍රීවරයෙක් ඉන්නවා. කාන්තා නියෝජනයත් ලැබිලා තිබෙනවා. දැන් යම්කිසි ප්‍රශ්නයක් මතු කර තිබෙනවා. ඒක තමයි, මේ ජාතිකත්වය නියෝජනය පිළිබඳ ප්‍රශ්නය. ජාතිකත්වයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වෙන්න ඕනෑ බව අපි පිළිගන්නවා. නමුත්, සුද්දෝ කරපු දෙයමද දැන් අපි මේ කරන්නේ? රාජ්‍ය අමාත්‍ය, ගරු ඒ.එච්.එම්. ෆවුසි මැතිතුමාත් එක්ක දේශපාලනමය වශයෙන් වෙනත් ගැටලු තිබෙන්න පුළුවන්. නමුත්, සිංහල මිනිසුන්ගේ ඡන්දවලින් බොරැල්ලෙන් ෆවුසිලා, මොහොමඩ්ලා පත් වෙනවාට අපි කැමැතියි. සුද්දෝ කළේ එහෙම නේ. සුද්දෝ "Divide and Rule" strategy එක මඟින් ඇති කළේ මොකක්ද? ඔවුන් ලංකාවේ ජාතික දේශපාලන පක්ෂ හැදෙන්න දුන්නේ නැහැ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙන්නේ.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

සුද්දෝ කළේ මොකක්ද? ඔවුන් ජනතාවට භාර දුන්නේ, "සිංහල මන්ත්‍රීවරු", "දෙමළ මන්ත්‍රීවරු", "මුස්ලිම් මන්ත්‍රීවරු" තෝරන්නයි. ඒ නිසා අපේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම් කියන ජාති තුන කලවම් වෙලා "ශ්‍රී ලාංකීය ජාතිය" කියන එක හැදුණේ නැහැ. පසුකාලීනව ඒවා වෙනස් වුණා. නමුත් දැන් ෆවුසි ඇමතිතුමා, එම්.එච්. මොහොමඩ් ඇමතිතුමා වාගේ අය සිංහල ජනතාව බහුතරයක් ඉන්නා ආසනවල ලොකු පක්ෂවලින් ඡන්දය ඉල්ලලා දිනුවා. දැන් අපි බලන්න ඕනෑ ඒක නොවෙයිද? ඒක තමයි වෙන්න ඕනෑ දෙය. හැබැයි, දැන් මේ තර්ක කරන්නේ මොකක් ගැනද? මුස්ලිම් ජනගහනය සියයට 9.7ක්, සියයට 10ක් විතර ඉන්නවා. පාර්ලිමේන්තුවේ මුස්ලිම් මන්ත්‍රීතුමන්ලා 21දෙනකු ඉන්නවා. ඒ අනුව, ආසන්න වශයෙන් ජන අනුපාතය රැකිලා තිබෙනවා. ඊට වැඩි වුණා නම් තවත් හොඳයි.

නමුත් ආසන්න වශයෙන් රැකිලා තිබෙනවා. ඒක 5ක් වුණා නම් හොඳ නැහැ. හැබැයි, ඒ 21දෙනාගෙන් කීදෙනෙක්ද, මුස්ලිම් පක්ෂවලින් ඇවිත් තිබෙන්නේ? නිල වශයෙන් ගත්තොත්, මුස්ලිම් පක්ෂවලින් තරග කරලා මේ පාර්ලිමේන්තුවට ඇවිත් තිබෙන්නේ එක මන්ත්‍රීතුමායි. අනික් මන්ත්‍රීතුමන්ලා සන්ධානවලිනුයි ඇවිත් තිබෙන්නේ. රිසාඩ් බදියුදීන් ඇමතිතුමා සන්ධානයකින් ආවාට, මන්නාරමේ වැඩි බලය තිබෙන්නේ එතුමාටයි කියා මම පිළිගන්නවා. නමුත් 21දෙනාගෙන් ඔබතුමා, අලි සාහීර් මවුලානා නියෝජ්‍ය ඇමතිතුමා සහ, -පස්දෙනෙක්ම එහෙම ආවාය කියා අපි භිතමු.- ඉතිරි අය ඇවිත් තිබෙන්නේ කොහොමද? වැඩි පිරිසක් ඇවිත් තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයෙන්. තව පිරිසක් ඇවිත් තිබෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙන්.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

ගරු බිමල් රත්නායක මහතා
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මට තව සුළු වෙලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

[ගරු බිමල් රත්නායක මහතා]

මෙහිදී තව වැරැදි කාරණයක් කිව්වා. අපි ශ්‍රී ලාංකික ජාතියක් හදන්න කථා කරන අතරේ, සිංහල මිනිසුන් සිංහල ගල් ගුහාවක ජීවත් වෙන්නයි, දෙමළ අය දෙමළ ගල් ගුහාවක ජීවත් වෙන්නයි, මුස්ලිම් අය මුස්ලිම් ගල් ගුහාවක ජීවත් වෙන්නයි හිතුවොත්, කවදාද මේ රට හැදෙන්නේ? කවුරුත් ඒ කාරණය ගැන හිතන්න ඕනෑ.

දෙවැනි කාරණය මෙයයි. අනුර දිසානායක මන්ත්‍රීතුමා කියපු කාරණය ටිකක් වැරැදි විධියට තේරුම් අරගෙන තිබෙන නිසා, මම එය නිවැරැදි කරලා කථාව අවසන් කරන්නම්. දැනට පළාත් සභා නවයේම, මුස්ලිම් මන්ත්‍රීතුමන්ලා -විවිධ පක්ෂවලට අයත් අය - 43ක් ඉන්නවාය කියා මෙම වාර්තාවේ තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මුළු මන්ත්‍රීවරු සංඛ්‍යාව වන 455න් තමයි මේ මුස්ලිම් මන්ත්‍රීවරු 43ක් ඉන්නේ. මේ 455න් කොටියාස 222යි තිබෙන්නේ. එතකොට මේ කොටියාස 222ට තමයි මුස්ලිම් මන්ත්‍රීවරු සංඛ්‍යාව 13ක් වෙලා තිබෙන්නේ. එහෙම නැතිව, 455ට 13ක් නොවෙයි. ඒක මේ වාර්තාවේ පළමුවැනි පිටුවේ ලියා තිබෙනවා. මේ සංඛ්‍යාව 13ක් වුණේ ඇයි? ප්‍රතිශතාත්මකව බැලුවත්, සාමාන්‍යයෙන් හැම ජන අනුපාතයකටම කිට්ටු වෙන්න මේ සංඛ්‍යාව තිබෙනවා. ඒක සියයට 100ක් සම්පූර්ණ කරන්න නොහැකි බව අප දන්නවා. පළාත් සභාවල මන්ත්‍රීවරුන් ප්‍රමාණය බෙදී තිබෙන ආකාරය ගත්තොත්, එය රටේ ජන සංගණනයට බොහොම කිට්ටුයි කියා අපට පෙනෙනවා. සියයට දශම එකකින්, දෙකකින් තමයි එය වෙනස් වෙලා තිබෙන්නේ. අපි එහෙමම හිතුවා වුණත්, මේක 455න් 13ක් නොවෙයි, 222න් 13ක්. ඒ ගණන 13 වුණේත් මෙතැන හිටපු සමහර ඇමතිවරුන්ගේ ක්‍රියා කලාපය නිසා බව මතක තබාගන්න. අපි විශේෂයෙන්ම මුස්ලිම් දේශපාලන පක්ෂවල නායකයන්ට කථා කර කිව්වා. ඔබතුමන්ලාගේ ගැටලුව ගැන අපට හැඟීමක් තිබෙනවා. හැබැයි, ඒ වෙලාවේ ඒක තේරුම් ගත්තේ නැහැ. ඔබතුමන්ලා තමයි 60:40 ලෙස තිබුණු එක 50:50 කළේ. සියයට 60ක් කේවල වුණා නම් මොකද වෙන්නේ? මුස්ලිම් කොටියාස ප්‍රමාණය 16ක් වෙනවා.

ගරු රිසාඩ් බදියුදීන් මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමා)
(මාණ්පුමිකු නිසාට් පතියුදීන් - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் அமைச்சர்)
(The Hon. Risad Badhiutheen - Minister of Industry and Commerce)
Sir, I rise to a point of Order.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රිසාඩ් බදියුදීන් ඇමතිතුමනි, ඔබතුමාගේ රීති ප්‍රශ්නය මොකක්ද?

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(මාණ්පුමිකු නිසාට් පතියුදීන්)
(The Hon. Risad Badhiutheen)
ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගේ පක්ෂයටයි, ඔබතුමාගේ නායකයාටයි, ඔබතුමාටයි ගරු කරනවා. ගරු මන්ත්‍රීතුමනි, අපේ යහ පාලන ආණ්ඩුව ගෙනෙන්න ජනාධිපතිවරණයේදී ඔබතුමන්ලාගේ උදව්වත් ඇත්තටම ලොකුවට තිබුණා. අපිත් ඒ වාගේ උදව් කරලා තමයි ඒ ජනාධිපතිවරණයට මහන්සි වුණේ. ඒ ඡන්ද ක්‍රමය වෙනස් කරන්න එදා කරපු වැඩ ගැන නායකතුමා දන්නවා. "අපි විරුද්ධයි" කියා පක්ෂ නායක රැස්වීමේදීත් අපි කිව්වා. තව වෙන වුවමනාවක් හිතේ තියාගෙන, මැතිවරණය කල් දමන්න තමයි ඒ වැඩේ කළේ. හිතාමතා තමයි ඒක වුණේ, ගරු මන්ත්‍රීතුමනි. මේ විධියට කථා බහ කරලා ඒවා කළා නම් එහෙම ප්‍රශ්න එන්නේ නැහැ. එදා අපට ලොකු ප්‍රශ්නයක් වුණා. ඒක නිසා තමයි අපි අන්තිමට මෙහෙම හෝ කරන්න කියා කිව්වේ. අද ඒකට කථා කරන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා.

ගරු බිමල් රත්නායක මහතා
(මාණ්පුමිකු பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු ඇමතිතුමනි, ඔබතුමන්ලාගේ දේශපාලන පක්ෂය ගැන මට අදහසක් තිබෙනවා. මම කිව්වේ, මේක 60:40 විධියට තිබුණා නම් සියල්ල විසඳෙනවාය කියන එක නොවෙයි. හැබැයි, 60:40 ලෙස තිබුණු එක 50:50 කළ නිසා මොකද වෙලා තිබෙන්නේ? "ඒක කරන්න එපා, ඔබතුමන්ලාටම තමයි අවාසි වෙන්නේ" කියා අපි ඒ වෙලාවේ කිව්වා. මුස්ලිම් කොටියාස 16ක් වෙන්න තිබුණු එක 13ක් වෙලා තිබෙන්නේ ඒකෙන් තමයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

[පි.ප. 3.50]

ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා (ධීවර හා ජලජ සම්පත් සංවර්ධන සහ ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)
(மாண்புமிகு அமீர் அலி சிஹாப்தீன் - கடற்றொழில், நீரக வளமூல அபிவிருத்தி மற்றும் கிராமியப் பொருளாதார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Ameer Ali Shihabdeen - Deputy Minister of Fisheries and Aquatic Resources Development and Rural Economic Affairs)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மாகாண சபைத் தேர்தல் தொகுதிக்கான எல்லை நிர்ணயம் தொடர்பிலான விடயத்தின்மீது நாங்கள் பேசிக்கொண்டிருக்கின்றோம். மாகாண சபை விடயத்திலே எங்களுடைய அகில இலங்கை மக்கள் காங்கிரஸ் கட்சியினுடைய தெளிவான நிலைப்பாட்டினைக் கடந்த காலத்திலே இந்தப் பாராளுமன்றத்தில் நீங்கள் அவதானித்திருப்பீர்கள். அந்த வகையிலே கடந்த காலத்திலிருந்த விகிதாசார பிரதிநிதித்துவ முறைமையைத்தான் எங்களுடைய கட்சி எதிர்பார்க்கின்றது. விசேடமாக, இந்த நாட்டிலே இருக்கின்ற சிறுபான்மைச் சமூகங்களைச் சேர்ந்த முஸ்லிம்கள், தமிழர்கள், மற்றும் மலையகத் தமிழர்களுடைய பிரச்சினை இதற்குள் புதைந்து கிடக்கின்றது.

எதிர்த்தரப்பிலே இருந்து பேசிய கௌரவ பாராளுமன்ற உறுப்பினர் ஒருவர், சகல மாகாண சபைகளுக்குமான 455 உறுப்பினர்களிலே 43 முஸ்லிம் உறுப்பினர்கள் இருந்தார்களென்றும், புதிய தொகுதி முறைமையின்படி 222 உறுப்பினர்கள் தெரிவு செய்யப்படுகின்றபோது, அதில் 13 முஸ்லிம் உறுப்பினர்கள்தான் இருக்கப்போகிறார்களென்றும் சொன்னார். 455 உறுப்பினர்களில் 43 முஸ்லிம் உறுப்பினர்கள் என்றால், 222 உறுப்பினர்களில் கிட்டத்தட்ட 24 உறுப்பினர்களாவது இருக்க வேண்டும். அப்போதுதான் எங்களுடைய அந்த இலக்கை நாங்கள் எதிர்பார்க்கலாம். அதாவது, கடந்த காலத்திலே நடந்த தேர்தல் முறைமையின்படி இந்த நாட்டிலே 455 உறுப்பினர்கள் தெரிவு செய்யப்பட்டிருக்கிறார்கள். அதில் 43 முஸ்லிம் உறுப்பினர்கள் தெரிவு செய்யப்பட்டிருக்கிறார்கள். ஆனால், புதிய தொகுதிவாரி முறையின்படி, 222 உறுப்பினர்கள் தெரிவு செய்யப்படுவார்கள். அதிலே 13 உறுப்பினர்கள் முஸ்லிம்களாகவும், 35 உறுப்பினர்கள் தமிழ் உறுப்பினர்களாகவும் தெரிவு

செய்யப்படுவார்கள். இது இந்த நாட்டிலே இருக்கின்ற சிறுபான்மைச் சமூகங்களாகிய தமிழர்கள், முஸ்லிம்கள், மலையத் தமிழர்களுக்குச் சாதகமாக இல்லையென்ற காரணத்தினால் அண்மையில் நடைபெற்ற சம்பந்தப்பட்ட வாக்கெடுப்பின்பொழுது மிகுந்த சிரமத்திற்கு மத்தியிலே நாங்கள் 'ஐம்பதுக்கு ஐம்பது' என்ற விடயத்தை முன்வைத்தோம்.

இந்தப் பாராளுமன்றத்திலே இருக்கின்ற சிறுபான்மைச் சமூகத்தின் குரலுக்கு மதிப்புத் தரவேண்டுமென்று நாங்கள் கோரியதற்கிணங்க, பிரதம மந்திரி அவர்களாலும், ஜனாதிபதி அவர்களாலும் அளிக்கப்பட்ட வாக்குறுதியின் அடிப் படையிலேதான் நாங்கள் அன்று வாக்களிப்பிலே கலந்துகொண்டோம். அந்த நிகழ்வு இந்தப் பாராளுமன் றத்திலே ஒரு சரித்திரத் திருப்புமுனையாக இருந்ததை இவ்விடத்தில் சுட்டிக்காட்ட வேண்டும். அதிகாரப் பகிர்வு விடயத்தில் சிறுபான்மை இன மக்களுக்கு ஏதாவது செய்ய வேண்டுமென்பதற்காகத்தான் மாகாண சபை முறைமையே ஏற்படுத்தப்பட்டது. அதாவது சிறுபான்மைச் சமூகத்தைத் திருப்திப்படுத்தவேண்டும் என்பதற்காகத்தான் 13ஆவது திருத்தத்தின்மூலம் மாகாண சபை முறைமை சொண்டு வரப்பட்டது. ஆனால், இன்று மீண்டும் அந்த மக்களிடத்தில் ஓர் அவலக் குரலை ஏற்படுத்துகின்ற அல்லது அவர்களைத் திட்டமிட்டு நசுக்குகின்ற அல்லது அவர்களது பிரதிநிதித் துவத்தைப் பறிக்கின்ற வேலைத்திட்டம் கொண்டுவரப்படுமாக இருந்தால், எங்களைப் போன்ற சிறுபான்மைக் கட்சிகள் அதை எதிர்த்து வாக்களிப்பதைத் தவிர, வேறு வழி இருக்க முடியாது என்பதை இந்த இடத்திலே நாங்கள் தெளிவாகச் சொல்லியாக வேண்டும்.

அண்மையில் நடந்த உள்ளூராட்சி மன்றத் தேர்தலிலே நாங்கள் படிப்பினையைப் பெற்றிருக்கின்றோம். அதாவது, எதிர்பார்த்த இலக்கை இத்தேர்தல் திருத்தச் சட்டம் எங்களுக்குத் தரவில்லை என்பதை மிகவும் தெளிவாகக் கண்டு கொண்டோம். எதிர்காலத்திலே இது சாத்தியப்படக்கூடிய ஒரு முறைமையல்ல என்று நாங்கள், நீங்கள் எல்லோரும் இன்று பேசிக்கொண்டிருக்கிறோம். அதுபோன்று இன்னுமொரு சாத்தியப்படாத முறையைப் பலவந்தமாகக் கொண்டு வந்து புகுத்தி, அதன்மூலமாகச் சிறுபான்மைச் சமூகத்தினுடைய அரசியல் குரல்வளையை நசுக்குகின்ற வேலைத்திட்டத்தை இந்தச் சபை முன்னெடுக்கக்கூடாது என்பதுதான் எங்களுடைய அகில இலங்கை மக்கள் காங்கிரஸ் கட்சியினுடைய நிலைப்பாடு என்பதை இந்தச் சபையில் நான் தெளிவாகச் சொல்லியாக வேண்டும்.

விகிதாசார பிரதிநிதித்துவ முறையில் இடம்பெற்ற கடந்த உள்ளூராட்சி மன்றத் தேர்தலில், சில பிரதேசங்களிலே, பெரும்பான்மைச் சமூகத்தோடு ஒட்டி உறவாடிக்கொண்டிருந்த உறுப்பினர்கள் - முஸ்லிம் சமூகத்தைச் சேர்ந்தவர்களாக இருக்கலாம், தமிழ் சமூகத்தைச் சேர்ந்தவர்களாக இருக்கலாம் - பிரதிநிதித்துவத்தைப் பெற்றதை நாங்கள் கண்டோம். ஆனால், அதற்குப் பிறகு, வட்டாரமுறையில் இடம்பெற்ற தேர்தலில் சம்பந்தப்பட்ட சமூகங்கள் தேவையான பிரதிநிதிகளைப் பெற முடியாமல் போனது. அந்த வகையில் சிறுபான்மையினர் எதிர்பார்த்த இலக்கை அந்தத் தேர்தல் திருத்தம் கொண்டுவரவில்லை; சிறுபான்மைச் சமூகத்துக்கு அது வெற்றியைத் தரவில்லை. இது அடிப்படையிலேயே பிரச்சினையை ஏற்படுத்துகின்ற ஒரு நிகழ்வாகும். உதாரணமாக, என்னுடைய மட்டக்களப்பு மாவட்டத்தை எடுத்துக்கொண்டால், அங்கு 2008ஆம் ஆண்டு 5 முஸ்லிம் உறுப்பினர்களை நாங்கள் பெற்றோம். பின்பு 2012ஆம் ஆண்டு 4 உறுப்பினர்களைப் பெற்றோம். ஆனால், புதிய நடைமுறையின்கீழ் 2 உறுப்பினர்களையே பெறுவோம். பெரும்பான்மைச் சமூகம் வாழ்கின்ற பிரதேசங்களாக இருக்கின்ற குருநாகல், அநுராதபுரம், புத்தளம், காலி ஆகிய மாவட்டங்களிலே பரந்து வாழ்கின்ற எங்களுடைய சிறுபான்மை மக்கள் விகிதாசார அடிப்படையின்மூலம்தான் போதுமான பிரதிநிதித்துவத்தைப் பெற்றுத் தங்களுடைய குரலை குறித்த சபைகளில் ஒலிக்கச் செய்ய முடியும். எனவே, புதிய தேர்தல் முறையை எமது மக்களின் பிரதிநிதித்துவத்தைக் குறைக்கும்வகையில் திட்டமிட்டு மேற்கொள்ளப்பட்ட ஒரு செயற்பாடாகத்தான் எங்களுடைய கட்சி பார்க்கின்றது; ஆரம்பத்திலிருந்தே இதற்கெதிராகக் குரல் கொடுத்து வருகின்றது.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 13வது திருத்தச் சட்டத்திலுள்ள நன்மைகளைக்கூட அந்த மக்களுக்குப் பூரணமாகத் தராமல் இருப்பது என்பது, இந்த நாட்டிலேயிருக் கின்ற ஒட்டுமொத்தச் சிறுபான்மைச் சமூகத்திற்கும் செய்கின்ற மாபெரும் துரோகம் என்பதை இந்த நாட்டிலேயிருக்கின்ற பெரும்பான்மைச் சமூகத்தைச் சேர்ந்த அரசியல் தலைவர்கள் தெளிவாகப் புரிந்துகொள்ள வேண்டும். எங்களுடைய மக்களுடைய குரல்கள் ஒலிப்பதற்கான சந்தர்ப்பத்தை ஏற்படுத்தித் தர வேண்டும். அதாவது சிறுபான்மைச் சமூகங்களாகிய முஸ்லிம் சமூகம், தமிழ்ச் சமூகம், மலையகத் தமிழ்ச் சமூகம் தத்தமது குரல்களை அந்தந்த மாகாண சபைகளில் ஒலிப்பதற்கான சந்தர்ப்பம் கொடுக்கப் படாதுவிட்டால், ஜனநாயகத்தைப் பற்றிப் பேசுவதிலே எந்த அர்த்தமும் கிடையாது.

அதேநேரம் இந்தத் தேர்தல் முறையில் இருக்கின்ற பிரச்சினையைக் காரணம் காட்டி எதிர்காலத்திலே குறித்த தேர்தலை இன்னும் இழுத்தடித்துக்கொண்டுபோகின்ற வேலைத்திட்டத்தையும் இந்தச் சபை செய்யக்கூடாது. அப்படிச் செய்தால் அந்தச் செயற்பாடு எதிர்காலத்திலே முரண்பாடுகளையும் பிரச்சினைகளையும் தோற்றுவிக்கும். சிறுபான்மை மக்களுடைய பலத்தை அள்ளிக்கொண்டு வந்த நல்லாட்சி அரசாங்கம், மீண்டுமொரு தடவை சிறுபான்மைச் சமூகம் துவம்சம் செய்யப்படுவதற்கு இடமளிக்கக்கூடாது என்பதுதான் எங்களுடைய பிரார்த்தனை. ஆகவே, இந்த நாட்டிலே எதிர்காலத்திலே இந்தத் தேர்தலை எக்காரணங் கொண்டும் நிறுத்திவிடாது, பழைய தேர்தல்ச் சட்டத்தின்கீழ் - விகிதாசார முறையின்கீழ் அந்தத் தேர்தலைக் குறித்த காலத்தில் நடத்தவேண்டும். அந்த முறையின்கீழ் நடத்தப்பட்ட கடந்தகாலத் தேர்தல்களில் கிழக்கு மாகாணத்தில் மாத்திரமல்ல, வட மாகாணத்திலும் ஏனைய மாகாணங் களிலும் சிறுபான்மையாக இருந்தவர்கள் போதுமானளவு பிரதிநிதித்துவங்களைப் பெறக்கூடிய வாய்ப்பு ஏற்பட்டது. அந்த வகையில்தான் சிங்களச் சகோதரர்களான கௌரவ ஜெயதிலக அவர்களும் கௌரவ தர்மபால அவர்களும் வட மாகாணத்திலே மாகாண சபை உறுப்பினர்களாக இருக்கின்றார்கள்.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

கௌரவ பிரதி அமைச்சர் அவர்களே, உங்களுக்கு இன்னும் ஒரு நிமிடம் இருக்கின்றது.

ගරු අමීර් අලි ශිහාබ්දීන් මහතා
(மாண்புமிகு அமீர் அலி சிஹப்தீன்)
(The Hon. Ameer Ali Shihabdeen)
நன்றி!

[ගරු අමීර් අලි සිහාබ්දීන් මහතා]

ආනාල්, இன்று கொண்டுவரப்படுகின்ற குறித்த வேலைத்திட்டங்களின் காரணமாக குறித்த பிரதேசங்களிலே சிறுபான்மையினராக இருக்கின்றவர்களின் நிலைவரங்கள் என்னவாகும் என்பதைப் பற்றி நீங்கள் யோசித்துப் பார்க்க வேண்டும். அதேநேரம் குறித்த விடயத்தைக் காரண காரியமாக வைத்துத் தேர்தலைப் பிற்போடுகின்ற முயற்சியில் எந்த அரசியல் தலைவர்களும் கங்கணம் கட்டிக்கொண்டு இறங்கக்கூடாது என்பதிலே எமது அகில இலங்கை மக்கள் காங்கிரஸ் கட்சி மிகவும் தெளிவாக இருக்கின்றது. எனவே, உரிய நேரத்தில் ஜனநாயக முறைப்படி இந்தத் தேர்தல் நடத்தப்பட வேண்டும். சிறுபான்மைச் சமூகத்திற்கெனக் கொண்டுவரப்பட்ட மாகாண சபை உறுப்பினர் பதவிகள் மற்றும் 13வது திருத்தச் சட்டத்திலே சொல்லப்பட்ட விடயங்கள் சிறுபான்மைச் சமூகத்திற்கு வில்லங்கமாக மாறுவதை எங்களுடைய கட்சி மிகவும் வன்மையாகக் கண்டிக்கின்றது. ஒவ்வொரு மாகாணத்திலும் இருக்கின்ற முஸ்லிம் சமூகமாக இருக்கலாம், தமிழ்ச் சமூகமாக இருக்கலாம், மலையகத் தமிழர்களாக இருக்கலாம் அல்லது எங்களுடைய பிரதேசங்களிலே வாழ்கின்ற சிங்களச் சகோதரர்களாக இருக்கலாம், எல்லோரும் நியாயபூர்வமாக உறுப்பினர்களைப் பெறுவதற்கான வாய்ப்பு பழைய தேர்தல்ச் சட்டத்தின்மூலம் கிடைக்கின்றது. எனவே, அந்தச் சட்டத்தின் பிரகாரம் மாகாண சபைத் தேர்தலை நடத்தவேண்டும் என்று அகில இலங்கை மக்கள் காங்கிரஸ் சார்பில் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ජානක වක්කුඹුර මන්ත්‍රීතුමා.

Order, please! ඊට ප්‍රථමයෙන් කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතාගේ නම යෝජනා කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

ගරු රිසාඩ් බදියුදීන් මහතා
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Risad Badhiutheen)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.
வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.
Question put, and agreed to.

අනතුරුව ගරු වේලු කුමාර් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනාරූඪ විය.
அதன்பிறகு, மாண்புமிகு வேலு குமார் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, மாண்புமிகு க. துரைரெட்ணசிங்கம் அவர்கள் தலைமை வகித்தார்கள்.
Whereupon THE HON. VELU KUMAR *left the Chair, and* THE HON. K. THURAIRETNASINGAM *took the Chair.*

[අ.භා.4.00]

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභා මැතිවරණ සහ මැතිවරණ ක්‍රමය පිළිබඳව විවාද කරන සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව සම්බන්ධයෙන්, තුන් වතාවක් සබරගමුව පළාත් සභාවේ හිටපු කෙනෙක් හැටියට මට කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා.

මේ වන විට පළාත් සභා තුනක මැතිවරණය පැවැත්වීම මාස 10ක් කල් ගිහින් තිබෙනවා. ඒ පළාත් සභා තුනේම ජනතාව පළාත් සභා හරහා කෙරෙන්න තිබෙන කටයුතු මේ වන විට හරියාකාරව ඉෂ්ට සිද්ධ වෙන්නේ නැහැ. මහජන නියෝජිතයෙක් හිටියොත් ඒ අය තමන්ට ඡන්දයක් බලාපොරොත්තුවෙන් හෝ ඒ ජනතාවට සේවය කරනවා. නමුත්, අද ඒ තත්ත්වය උදාවෙලා නැහැ. බොහෝ වෙලාවට තම තමන්ගේ අභිමතය පරිදි කටයුතු කරනවා. ඡන්දය කල් ගියාම ඒ පළාත් සභාව යටතේ තිබෙන සමුපකාර සමිතියක ඡන්දයවත් පවත්වන්නේ නැහැ. "නිවිතිගල සමුපකාර සමිතියේ ඡන්දය පවත්වන්නේ හෙටයි" කියලා තිබුණා. නමුත්, "අද" කියන දවසේ ආණ්ඩුකාරතුමිය විසින් ඒක කල් දැම්මා. ගොඩකවෙල සමුපකාර සමිතියේ ඡන්දයත් ඒ විධියට කල් දැම්මා. ප්‍රජාතන්ත්‍රවාදී රටක ජනතාවගේ ඡන්ද අයිතිය ලබා දෙන එකයි අපි බලාපොරොත්තු වෙන්නේ. අවුරුද්දකට වතාවක් ඡන්දය ලියා පදිංචි කරලා විතරක් වැඩක් නැහැ, ඒ අයට ඒ අයිතිය දෙන්න ඕනෑ. එක දවසෙන් පළාත් සභා මැතිවරණය කල් දැම්මා. ඒ විධියට පළාත් සභා මැතිවරණය කල් දමන්න අවශ්‍ය නිසා කාන්තා නියෝජනයක් අවශ්‍යයි කියලා පනත් කෙටුම්පතක් ගෙනාවා. කොටියාස ක්‍රමය ගේන්න තිබෙන වුවමනාවට නොවෙයි ඒක කල් දැම්මේ. එදා කථා කරපු බොහෝ මන්ත්‍රීවරු රැවැට්ටුවා. 50:50 ගෙනැල්ලා මේක කරන්න බැහැ කියලා ඕනෑ කෙනෙක් දන්නවා. රජයට ඡන්දයකට යන්න තිබුණු භය නිසා එහෙම කරන්න බැහැ කියලා පළාත් සභාව අකර්මණ්‍ය කිරීමේ වුවමනාවක් තිබුණා. මොකද, ප්‍රාදේශීය සභා මැතිවරණයට ඉස්සෙල්ලා පළාත් සභා මැතිවරණයකට ගියා නම් ඒ මැතිවරණය පරදිනවා කියලා දන්නවා. පළාත් පාලන මැතිවරණය පවත්වලා බැලුවා. ඒ මැතිවරණය පරාදයි. පළාත් සභා මැතිවරණය තව ටිකක් කල් දමන්නේ කොහොමද කියලා දැන් බලනවා. අපට ලැබුණු ආරංචිය අනුව, අවසන් පළාත් සභාවේ කාලය ඉවර වෙනකොට තමයි මැතිවරණය පවත්වන්න බලාපොරොත්තු වෙන්නේ. ඒ කියන්නේ, 2019 නව වැනි මාසයේ තමයි අන්තිමට කාලය අවසන් වීමට නියමිත ඌව පළාත් සභාවේ කාලය අවසන් වෙන්නේ. එතෙක් අල්ලාගෙන යන්න තමයි එක එක උප්පරවැට්ටි කරන්නේ. මේක වෙන කාගෙන්වත් අහලා වැඩක් නැහැ, ආණ්ඩුව කරන්න ඕනෑ වැඩක්. මේ වගේ විවාදයක් පවත්වලා වැඩක් නැහැ. එක්කෝ කලින් තිබුණු ක්‍රමය යටතේ පළාත් සභා ඡන්දය පවත්වලා, තව අවුරුදු 4කින් හෝ 5කින් හෝ එන මැතිවරණයේදී හරියට කොටියාස ක්‍රමයට මැතිවරණයක් පවත්වන්න ඕනෑ. ප්‍රාදේශීය සභා ඡන්දය කොටියාස ක්‍රමයට පවත්වලා ප්‍රාදේශීය සභා සභාපතිවරු පත්කර ගන්නවත් බැරි වුණා. ඒ ක්‍රමය වැරැදියි කියලා මැතිවරණ කොමසාරිස්තුමා කියනවා. හැබැයි, මේ රටේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සංඛ්‍යාව අඩු කරන්න කියලා, ඒ සංඛ්‍යාව දෙගුණයක් කළා. අපි බැලුවාම ගැසට් නිවේදනයේ තිබෙන ගණනට වඩා ප්‍රාදේශීය සභාවල මන්ත්‍රීවරුන් සංඛ්‍යාව වැඩියි. අද ප්‍රාදේශීය සභා රැස්වීමක් පවත්වන්න ගියාම ඉඩ පහසුකම් නැහැ. දැන් කොළඹ නගර සභාවේ පාර්ලිමේන්තුවේ වගේ මන්ත්‍රීවරු පිරිසක් ඉන්නවා. හැබැයි, මේ ක්‍රමය ගේන්නේ වියදම අඩු කරන්න කියලා තමයි කලින් කිව්වේ. දැන් ජනාධිපතිතුමාම කියනවා, වියදම වැඩි වුණා කියලා. ඒ නිසා මේ අත්හදා බලන වැඩ පසුවට තියලා ආණ්ඩුව කොහොම හෝ මේ මැතිවරණය පවත්වන්න ඕනෑ කියලා අපි කියනවා.

උතුරු පළාත් සභාවේ කාලය 10වන මාසයෙන් අවසන් වනවා. මහින්ද රාජපක්ෂ මැතිතුමා යුද්ධය අවසන් කරලා, උතුර සංවර්ධනය කරලා, උතුරු පළාත් සභාව පරදිනවා කියලා දැන දැනත් මැතිවරණයට භය නැතුව උතුරේ මිනිසුන්ට ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය දුන්නා; උතුරේ ජනතාවට තමන් කැමැති කෙනෙක් පත් කර ගන්න අයිතිය දුන්නා. එතුමා උතුරු පළාත් සභාව පරදිනවා කියලා දැන දැනම තමයි ඒක කළේ. අද මේ ආණ්ඩුව මොකක්ද

කරන්නේ? අපි එදා ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය දීපු උතුරේ ඡන්දදායකයාගේත් අයිතිය උදුරා ගන්න තමයි අද මේ ආණ්ඩුව හදන්නේ. එහෙම හය නැත්නම් මැතිවරණය පවත්වන්න. මොකද, 10වන මාසයෙන් පසුව උතුරු පළාත් සභාවත් අකර්මණ්‍ය වෙනවා. ඒ නිසා අපි ආණ්ඩුවට කියනවා, මැතිවරණ කල් දාලා මේ ප්‍රශ්න විසඳන්න බැහැ කියලා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කාලය අවසානයි.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දිනේෂ් ගුණවර්ධන මැතිතුමා එන්නේ නැහැ. ඒ නිසා එතුමාගේ කාලය ගන්න කියලා මට කිව්වා. එතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි.

ගරු ජානක වක්කුඹුර මහතා
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)
ඒ නිසා අපි ආණ්ඩුවට කියනවා, හය නැතුව මැතිවරණයට මුහුණ දෙන්න කියලා. තමුන්නාන්සේලා කොටියාස ක්‍රමයට මැතිවරණය පවත්වනවා නම්, ඒ ක්‍රමයට පවත්වන්න. අපි ඒ ඕනෑ ක්‍රමයකට කැමැතියි. මනාප ක්‍රමයට පවත්වනවා නම්, ඒ ක්‍රමයට පවත්වන්න. මේ කොයි ක්‍රමයකට හෝ ගිහිල්ලා මැතිවරණය පවත්වන්න කියලා අපි ආණ්ඩුවට කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොටියාස කඩලා තිබෙන හැටි බලන්න. රත්නපුර දිස්ත්‍රික්කයේ මගේ මැතිවරණ කොටියාසය කලවාන. අපේ රංජිත් ද සොයිසා මන්ත්‍රීතුමාගේ මැතිවරණ කොටියාසය රක්වාන. ඊළඟට නිවිතිගල, කොලොන්න කියන මැතිවරණ කොටියාස දෙකත් සමඟ ඒ හතරම එකතු කරලා කිලෝමීටර 40ක් විතර දිගට පටියක් කඩලා තිබෙනවා. අඩුම ගණනේ ඒ කොටියාසයට පත්වෙන මන්ත්‍රීවරයාට කොටියාසයේ ඇවිදින්න යන්නවත් හරියට පාරක් නැහැ. මොකද, එක එක තැන්වලින් කඩලා තිබෙන්නේ. මේ කොටියාස ක්‍රමයේ විකෘති කැඩිල්ලක් තිබෙන්නේ. මෙය හරියට කරනවා නම්, ලෙහෙසි ක්‍රම තිබුණා. එක ප්‍රාදේශීය ලේකම් කොටියාසයකට නැත්නම් එක ප්‍රාදේශීය සභාවකට එක කොටියාසයක් කඩන්න තිබුණා. දැන් ප්‍රාදේශීය සභා හතරක් එක පළාත් සභා කොටියාසයක් බවට පත් කරලා තිබෙනවා. ඒ නිසා අපි කියනවා, ආණ්ඩුවට වුවමනාවක් තිබුණා නම්, බොහොම ලෙහෙසියෙන් සරලව මේක කරන්න පුළුවන්කම තිබුණු බව. ඒ සරල වැඩේ වෙනුවට විකෘතිභාවයක් ඇති කරන්න තමයි ආණ්ඩුව කටයුතු කරලා තිබෙන්නේ. ඒ නිසා අපි ආණ්ඩුවට කියනවා, ඡන්ද මංකොල්ල කන්නේ නැතුව කටයුතු කරන්න කියලා.

1982 සංවර්ධන සභා ඡන්දය උතුරේ ගෙනැල්ලා කළේ මොකක්ද කියලා අපි දන්නවා. අඩුම ගණනේ මේ සභාවන් 6ක ඡන්දය එකවර පවත්වන්න පුළුවන්. දැන් මේ ආණ්ඩුව කියනවා, ගම්පෙරළිය අර පෙරළිය, මේ සියල්ල කරනවා කියලා. හැබැයි, රෑ 12.00ට අපි පෙරළිය හරියටම දැක්කා. රෑට මිනිසුන් නිදා ගන්නකොට තිබෙන තෙල් මීල නොවෙයි, එළි වෙනකොට තිබෙන්නේ. නැවතත් උදේ 10.00, 11.00 වෙනකොට ඒක නැවත වෙනස් වෙනවා. මේක පුදුම ආණ්ඩුවක්! අන්න තෙල් ගහපු filling station එකකට ගිහිල්ලා මිනිසුන් රණ්ඩු වෙලා තිබෙනවා, "අපේ සල්ලි ආපසු දෙන්න" කියලා. මේ ආණ්ඩුවේ කට්ටියට එකට ඉඳලා එක වැඩක්වත් කරන්න බැරි වෙච්ච එකේ එකට ඉඳලා ඡන්දයක් පවත්වා ගන්නත් බැහැ. අද ආණ්ඩුවට වෙලා තිබෙන්නෙත් ඒ ටිකමයි. ඊයේ රෑ තෙල් මිල වැඩි කරලා, උදේ අඩු කළා වාගේම මේ ආණ්ඩුවේ සිටින දෙමුහුං කට්ටියට අද එකට එකතුවෙලා එක තීන්දුවක් ගන්න බැහැ. එක කට්ටියක් කියනවා, මැතිවරණය මනාප ක්‍රමයට තියන්න ඕනෑ කියලා. තව කට්ටියක් කියනවා, කොටියාස ක්‍රමයට තියන්න ඕනෑ කියලා. ඒක තමයි දැන් වෙලා තිබෙන්නේ. නමුත් බොහෝ වෙලාවට මෙය අපේ පිටින් දමන්න හදනවා. ඊයේ අගමැතිතුමා කියනවා, සියලුදෙනාම එකතුවෙලා මේ මැතිවරණය කරන්න ඕනෑ කියලා. ආණ්ඩුවක් තියෙන්නේ, ආණ්ඩුව කැමැති විධියකට කටයුතු කරන්න. අපි කියනවා, ආණ්ඩුවට කැමති විධියට මේ මැතිවරණය පවත්වන්න කියලා. තමුන්නාන්සේලාට දිනන්න පුළුවන් විධියට තියන්න. මම අභියෝගයක් කරනවා. සබරගමු පළාතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ගණනාවක් ඉන්නවා. සබරගමු පළාතේ ඉන්න, මේ ආණ්ඩුව නියෝජනය කරන සියලුදෙනාටම මම කියනවා, හය නැත්නම් තමුන්නාන්සේලා තියන ඕනෑ ක්‍රමයකට ඡන්දයට එන්න. මම මේ පාර්ලිමේන්තුවෙන් ඉල්ලා අස්වෙලා පළාත් සභා ඡන්දයට එනවා, පුළුවන් නම් ඇවිල්ලා දිනන්න කියලා. අපි මැතිවරණවලට යන්න හය නැහැ. මැතිවරණයකට යන්න හය වෙන්නේ නැතුව මැතිවරණය පවත්වන්න. ආණ්ඩු බලය යොදවා පුළුවන් නම් ජයග්‍රහණය කරන්න. මේ රටේ මිනිසුන්ට දීලා තිබෙන අයිතිය නැති කරන්නේ නැතුව තමුන්නාන්සේලා මේ මැතිවරණය පවත්වන්න. අද පළාත් සභා තුනක පළාත් සභා මැතිවරණය කල් දාලා තිබෙනවා. මම පළාත් සභාවේ හිටපු කාලයේ මන්ත්‍රීවරයෙක්, නියෝජ්‍ය සභාපතිවරයෙක්, ඇමතිවරයෙක් විධියට වැඩ කළා.

අද ඒ පළාත්වල මිනිසුන්ට තමන්ගේ පාසලට ගුරුවරයෙක් නැති වුණාම කියන්නට කෙනෙක් නැහැ. තමන්ගේ ගමේ පාර කැඩුණා නම්, හදලා දෙන්න කියලා කියන්න කෙනෙක් නැහැ. පළාත් සභාව අකර්මණ්‍ය කළාම ප්‍රාදේශීය සභාවලට දෙන්න තිබෙන දඩ මුදලවත් පළාත් සභාවලින් දෙන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුවේදී අපි මොනවා කිව්වත් ගමේ මිනිසුන්ට අවශ්‍ය කරන සංවර්ධන කටයුත්ත අද කෙරෙන්නේ නැහැ. පළාත් සභාවෙන් තමයි වැඩි දෙයක් කෙරෙන්නේ. එම නිසා අපි ආණ්ඩුවට බල කරලා කියනවා එක එක ඒවා කියන්නේ නැතිව, එක එක සූත්‍ර දාන්නේ නැතිව මේ මැතිවරණයට මුහුණ දෙන්න කියලා. සමහර අය කියනවා පරණ මැතිවරණ ක්‍රමයට වඩා අලුත් ක්‍රමය හොඳයි කියලා. අලුත් ක්‍රමයට ඡන්දය දීලා මොකක්ද වුණේ? මම කියනවා, මනාප ක්‍රමය තිබුණා නම් ප්‍රාදේශීය සභාවේ කිසිම ප්‍රශ්නයක් වෙන්නේ නැහැ කියලා. අඩුම තරමින් ඒ ප්‍රදේශයේ ජනතාවගේ ඡන්දයෙන් වැඩිම මනාප ගත්ත පුද්ගලයා සභාපති කරන්නට තිබුණා. අද ඒක කරන්න පුළුවන්කමක් ලැබුණාද? සභා පිහිටුවන්නට ගියාම පොහොට්ටුවෙන් ඡන්දය ඉල්ලපු අය ගිහින් යූඑන්පී එකේ අයත් එක්ක සභා පිහිටෙව්වා. යූඑන්පී එකෙන් ඡන්දය ඉල්ලපු අය පොහොට්ටුවේ අයත් එක්ක සභා පිහිටෙව්වා. එක එක්කෙනා තමන්ගේ බලය ප්‍රතිපත්තියක් නැතිව උරගා බලන්නට කටයුතු කළා; තමන්ගේ කෙනා සභාපති කරන්නට කටයුතු කළා. මොන දේ කළත් සියලුදේම හොඳට කරන්නට බැරි වෙනවා, කොයි මැතිවරණ ක්‍රමය ආවත්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 50:50 ක්‍රමයට මැතිවරණය පැවැත්වුවොත් මහජන ඡන්දයෙන් පත් වෙන්නේ සියයට 50යි. පක්ෂ මහ ලේකම්වරයාට ඕනෑ විධියට නිතරගයෙන්, -කිසිම දෙයක් නොකර- ජනතාවට වග කියන්නේ නැති සියයට 50ක් පළාත් සභාවට යනවා. ඒගොල්ලන් කාටද වග කියන්නේ? ඒගොල්ලන් වග කියන්නේ ඒගොල්ලන්ගේ පක්ෂයට විතරයි; ජනතාවට වග කියන්නේ නැහැ. මේ පාර්ලිමේන්තුවේ

[ගරු ජානක වක්කුඹුර මහතා]

225දෙනාගෙන් හරියටම භාගයක් ලැයිස්තුවලින් ආවොත් මොකද වෙන්නේ? වග කියන්නට කෙනෙක් නැහැ. එම නිසා මේ ගැන ඉතා ඉක්මනින් කටයුතු කරන්න කියා අපි ඉල්ලා සිටිනවා.

මම නැවත වරක් කියනවා, අඩුම තරමින් ඉදිරි කාලය තුළ මේ පළාත් සභා හයේ ඡන්දය තියන්න, ආණ්ඩුව භය නැතිව ඇවිල්ලා ඡන්දය තියන්න කියලා. තමුන්නාන්සේලාට පුළුවන් නම් ආණ්ඩුවේ තිබෙන සෑම මුදලක්ම යොදවලා හෝ ඒ පළාත් සභා හය ජයග්‍රහණය කරවන්න පුළුවන් ද බලන්න. තමුන්නාන්සේලා රබර් බෝලය දිය යට දාගෙන අල්ලාගෙන හිටියා; පෙබරවාරි 10වන දා ඒක අත හැරුණා. තමුන්නාස්සේලා ඉදිරි පළාත් සභා මැතිවරණයේදීත් නියත වශයෙන්ම පරාජයට පත් වෙනවා. තව කල් යන්න යන්න පැරදීමේ වේගය වැඩි වෙනවා. පුළුවන් නම් ඊට කලින් මේ මැතිවරණය පවත්වන්න උත්සාහයක් හෝ ගන්න කියලා මම ආණ්ඩුවට කියා සිටිනවා.

සබරගමුව පළාතේ කවුරුන් හෝ මන්ත්‍රීවරයෙක් මගේ අභියෝගය භාර අරගෙන පළාත් සභා මැතිවරණයට එයි කියන බලාපොරොත්තුව මට තිබෙනවා. පුළුවන් නම් ඇවිල්ලා ජයග්‍රහණය කරන්න කියා අභියෝග කරමින්, කාලය ලබා දීම පිළිබඳව මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ කථාව අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you. මීළඟට, ගරු අනුර සිඩ්නි ජයරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.13]

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට ගරු ජේ.සී. අලවලතුවල නියෝජ්‍ය ඇමතිතුමාගේ කාලයත් අවශ්‍ය නම් ගන්න කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභා මැතිවරණය කල් යාම සම්බන්ධයෙන් ගරු සුමන්තිරන් මන්ත්‍රීතුමා විසින් සභාව කල් තැබීමේ යෝජනාවක් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම මේ පළාත් සභා මැතිවරණය කල් යාම සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක් හැටියට මම දකින දෙයක් තමයි, පක්ෂයක් හැටියට අපට මෙය බලපාන බව. මම එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක් වාගේම එක්සත් ජාතික පක්ෂයේ කෘත්‍යාධිකාරී මණ්ඩලයේ සාමාජිකයෙක්.

2015 අගෝස්තු මාසයේ මැතිවරණ ජයග්‍රහණයෙන් පසුව අපි ප්‍රාදේශීය සභා මැතිවරණය පැවැත්වූවා නම්, ප්‍රාදේශීය සභා තුළ අපට මීට වැඩිය ජයග්‍රහණයක් ලබා ගන්නට තිබුණා.

මොකක්දෝ අහේතුවකින් අපි කාගේ හරි ලණුවක් කෑවා කියලා මට හිතෙනවා. කෙසේ නමුත්, පළාත් පාලන මැතිවරණයෙන් අපි බලාපොරොත්තු වුණු ප්‍රතිඵල අපට ලබා ගන්න බැරි වුණා. මම පළාත් සභාව 5 වතාවක් නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක්. මුලින්ම මම 1993 අවුරුද්දේ තමයි උතුරු මැද පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් හැටියට පත් වුණේ. පාර්ලිමේන්තුවට එන්න ප්‍රථම මම 5 වතාවක් උතුරු මැද පළාත් සභාව නියෝජනය කළා. එම නිසා මට ඒ සම්බන්ධයෙන් අත් දැකීම් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සීමානිර්ණය කොමිෂන් සභාවේ මේ කණ්ඩායම කොතැන ඉඳලා මේ කටයුතු කළා ද කියලා අපට හිතාගන්න බැහැ.

මම නියෝජනය කරන්නේ පොලොන්නරුව දිස්ත්‍රික්කය. පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 7ක් තිබෙනවා; ප්‍රාදේශීය සභා 5ක් තිබෙනවා; නගර සභාවක් තිබෙනවා. මේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හත මෙවර සීමානිර්ණය කිරීමේදී, මේ සීමාවන් වෙනස් කිරීමේදී හිතාගන්නවත් බැරි තීන්දු ක්‍රියාත්මක කරලා තිබෙනවා. ලංකාවේ දිගම ගඟ වන මහවැලි ගඟ පොලොන්නරුව දිස්ත්‍රික්කය හරහා මුහුදට ගලා බසින බව ඔබතුමන්ලා කවුරුත් දන්නවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පොලොන්නරුව දිස්ත්‍රික්කයේ ලංකාපුර කියන කොට්ඨාසයේ එක කොටසක් මහවැලි ගඟෙන් එගොඩ, අනෙක් කොටස මහවැලි ගඟෙන් මෙගොඩ වශයෙන් සීමානිර්ණය කොමිසම විසින් තීන්දු කර තිබෙනවා. මේ කොට්ඨාසයේ ඉන්න මන්ත්‍රීවරු මහවැලි ගඟ තරණය කරලා තමුන්ගේ අනෙක් කොටසට යන්න අමුඩයක් ගහගෙන පීනන්න ඕනෑ. මහවැලි ගඟ කියන්නේ ලංකාවේ තිබෙන විශාලම ගඟ. මේ කොමිටිය විසින් සීමා නිර්ණය කිරීමේදී වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි, ලංකාපුර සෝමාවතිය වෛත්‍යය රාජයාණන් වහන්සේ පිහිටලා තිබෙන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි, ඒකට මැදිරිගිරියේ කොට්ඨාසයකුත් එකතු කරලා තිබෙනවා.

අපි සාමාන්‍යයෙන් සීමානිර්ණයක් කරනකොට, ග්‍රාම සේවා වසමක් බෙදනකොට, ආසනයක් බෙදනකොට යම් යම් සීමාවන් ගන්නවා; ස්වාභාවික පිහිටීම් ගන්නවා. ස්වාභාවිකව පිහිටි කඳු යායවල්, ස්වාභාවිකව පිහිටි ගංගාවන්, ස්වාභාවිකව පිහිටි සමහර විශාල පාරවල්වලින් වෙන් වුණු සීමාවන් ගන්නවා. සීමානිර්ණය කමිටුව මුද්‍රණය කරලා නිකුත් කරපු ඒ පොත බැලුවාම මට මොකුත් හිතා ගන්න බැහැ. මම නම් හිතා ගත්තා, "මේ පක්ෂයෙන් ඉවත් කළත් මම මේ සීමානිර්ණයට ඡන්දය දෙන්නේ නැහැ." කියලා. මොකද, මෙයට පක්ෂව ඡන්දය දීලා මේ සීමානිර්ණය තුළ මගේ ආසනයේ මට වැඩ කටයුතු කරන්න බැහැ. ඒක නිසා මම හිතනවා, මේ පළාත් සභා මැතිවරණය ඉක්මනට තැබිය යුතුයි කියලා. මෙම පළාත් සභා මැතිවරණය තිබිය යුත්තේ පරණ තිබ්විව ක්‍රමයටමයි කියන ස්ථාවරයේ මම ඉන්නවා. ඒක මගේ පක්ෂයේ නායකතුමා වන ගරු අගමැතිතුමාට මම කියලා තිබෙනවා. අපේ මන්ත්‍රීවරු සියලුම දෙනා කණ්ඩායම් රැස්වීම්වලදී ඒ බව කියලා තිබෙනවා. දැන් කාගේවත් න්‍යාය පත්‍රයක් අපට අවශ්‍ය නැහැ. දැන් කාගේවත් ගෙවල් ඇතුළේ තිබෙන රණ්ඩු බේරා ගන්නකම් අපට ඉන්න අවශ්‍ය නැහැ. අපි එක එක අයගේ රණ්ඩු බේරා ගන්නකම් ඉඳලා දැන් අපට **කෙළවිලා** තිබෙන්නේ. අනික් අයගේ රණ්ඩු බේරා ගන්නකම් ඉඳලා තමයි පළාත් පාලන මැතිවරණය තියන එකත් පහු වුණේ. පළාත් පාලන මැතිවරණයෙන් අපට බලාපොරොත්තු වෙච්ච මන්ත්‍රීවරු ගණන අහිමි වුණෙත් අපි වෙන අයගේ ලණු කාපු නිසායි. ඒ නිසා මන්ත්‍රීවරයෙක් හැටියට මේ අලුත් මැතිවරණ ක්‍රමයට මම තරයේම විරුද්ධයි. මම මේ සීමානිර්ණයට විරුද්ධයි. මම මේ පක්ෂයෙන් අයින් කළත් පරණ ක්‍රමයට මේ ඡන්දය තිබිය යුතුයි කියන මතයේ මම ඉන්නවා. මේ සීමානිර්ණය කමිටුව අභූත විධියේ අද්භූත වැඩක් කරලා තිබෙනවා. සීමානිර්ණය කමිටුව මේ තීන්දු ගන්න ඕනෑ; ඒ තීන්දු ක්‍රියාත්මක කරන්න ඕනෑ ඒ කොටසට ඇවිල්ලා, කොටස බලලා, ලොකු සමාලෝචනයක් කරලායි. එක දවසක් ගිහිල්ලා කොහේ හරි තැනෙක නතර වෙලා ඉඳලා, එතන පාටියක් දාලා කුකුලෙක් කපලා බෝතලයක් ගහලා ඉවරවෙලා පහුවදාට තීන්දු ගන්න එක නොවෙයි කරන්න ඕනෑ. එහෙමයි මේ සීමානිර්ණය කමිටුව තීන්දු අරගෙන තිබෙන්නේ. ප්‍රදේශයේ ප්‍රායෝගික භූගෝලීය පිහිටීම බලන්නේ නැතිවයි තීන්දු අරගෙන තිබෙන්නේ.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු අනුර සිඩ්නි ජයරත්න මහතා
(மாண்புமிகு அனுர சிட்னி ஜயரத்ன)
(The Hon. Anura Sidney Jayarathne)
එහෙම නිත්දු තීරණ ගත්තාම අවුරුදු ගණනාවක් තිස්සේ ඒ ප්‍රදේශවල දේශපාලනය කරන අපට අමාරුයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු පෙළ ගරු මන්ත්‍රීතුමන්ලා මේ අවස්ථාවේ නැති වුණත් පක්ෂයක් හැටියට අපේ සියලුම පසු පෙළ මන්ත්‍රීතුමන්ලා මේ අලුත් ක්‍රමයට විරුද්ධයි. ඒ ගැන පසු පෙළ අපේ මන්ත්‍රීවරු කවුරුත් කථා කරනවා. අපේ තීරණයත් පරණ ක්‍රමයට මේ මැතිවරණය තියන්න ඕනෑ කියන එකයි. අපි කාගේවත් ලඟු කන්න හොඳ නැහැ. එක්සත් ජාතික පක්ෂය කියන්නේ මේ රටේ කෙළින් ආණ්ඩු කරපු, කෙළින් හිටගත්ත පක්ෂයක්. අපට යම් තැනෙක වැරදුණා නම්, ඒ වැරැදීම් හදාගෙන කාගේවත් ලඟු කන්නේ නැතිව ඉස්සරහට යන්න අපි කටයුතු කරනවා. බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අඩුත්තු, වෛද්‍ය කලානිති කෞරව සී. සිවමෝහන් අවර්කළ්! උංකළුක්කු 7 නිමිඩංකළ් ඉරුක්කින්රන.

[පි.ප. 4.20]

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා
(மாண்புமிகு (வைத்திய கலாநிதி) சி. சிவமோகன்)
(The Hon. (Dr.) S. Sivamohan)
කෞරව තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළේ, මාකාණ සභෛත් තේර්තල් මර්රුම් තේර්තල් මුරෛමෛකළ් පර්රිය ඉන්රෛය ඔත්තිවෛප්පුවේළෛ විවාතත්තිල් කලන්තුකොණ්ටු පේසුවතර්කු එනක්කුම් සන්තර්ප්පම් තන්තමෛක්කු මුතලිල් උංකළුක්කු නන්රියෛත් තෙරිවිත්තුක් කොළ්කින්රේන්. 2018 යූලෛ 2ආම් තිකතිටයිටප්පට්ට, මාකාණ සභෛත් තේර්තල් තොකුතිකළින් එල්ලෛ නිර්ණයම් පර්රිය අරික්කෛයොන්රු සභෛයිල් සමර්ප්පික්කප්පට්ටිරුක්කින්රතු. ඉන්ත අරික්කෛයෛ ඕර් අරසියල් අරිවියල් රීතියාන theory එන්රු මට්ටුම් සොල්ලලාම්. ආනාල්, ඉතු නටෛමුරෛයිල් නිච්සයමාක වේරොන්රාක ඉරුක්කුම් එන්පතු එන්නුටෛය නම්පික්කෛ. ඉතිල් පෙරුම්පාන්මෛච් සනත්තොකෛයින්පටි මුන්මොළියප්පට්ට උරුප්පිනර්කළින් එණ්ණික්කෛ පර්රියුම් කුරිප්පිටප්පට්ටුළ්ළතු. ආනාල්, ඉතු නටෛමුරෛයිල් සාත්තියප්පටාතතොන්රු එන්පතු එංකළ් අනෛවරුක්කුම් තෙරියුම්. ඒනෙන්රාල් ඉනරීතියිල් සිංකළවර්කළ්, සිංකළවර්කළුක්කුම් තමිළර්කළ්, තමිළර්කළුක්කුම් මුස්ලිම්කළ්, මුස්ලිම්කළුක්කුම් වාක්කළිත්තාල් මට්ටුමේ ඉන්ත අට්ටණෛ පොරුන්තුම්. ආනාල්, එන්ත ඔරුවරෛයුම් අප්පටිප් පලාත්කාරප්පටුත්ත මුටියාතු එන්පතෛ කුරිත්ත නිපුණර්කළ් අරියවිල්ලෛප්පෝල් තෙරිකින්රතු. එනවේ, නාන් ඉන්ත සභෛයිලේ ඉන්ත නිපුණර් කුළු අරික්කෛයෛ ඔට්ටුමොත්තමාක නිරාකරික්කින්රේන්.

කටන්ත උළ්ළූරාට්චිත් තේර්තලිල් 50:50 එන්ර අටිප්පටෛයිල් තෙරිවු ඉටම්පෙර වේණ්ටුම් එන්රු තීර්මානික්කප්පට්ටිරුන්තතු. ඉතනාල් වරප්පෝකුම් පිරති කූටලංකළ් එන්නවෙන්රු පාර්ක්ක වේණ්ටුම්. ආනාල්, පිරතේස සභෛත් තේර්තල් පල පාටංකළෛක් කර්පිත්තිරුක්කින්රතු. අතිල් 60:40 එන්ර අටිප්පටෛයිල් තෙරිවුකළ් ඉටම්පෙර්රිරුන්තන. ඕර් උතාරණත්තෛක් කුරිප්පිට විරුම්පුකින්රේන්. අතාවතු මුල්ලෛ. මාවට්ටත්තිල් පුතුක්කුටියිරුප්පුප් පිරතේස සභෛයිල් 12 වට්ටාරංකළිල්, 11 වට්ටාරංකළෛ වෙන්ර එමතු කට්චි ඉරුතියාක, 11:11 එන්ර නිලෛයිල් ආට්චියිල් පෙරිය චික්කල් නිලෛයෛච් චන්තිත්තතු. එනවේ, ඉතු ජනනායක විරෝතමානතු. එනිනුම් නාම් මුන්නරේ ඉන්ත මුරෛයෛ ඒර්රුක්කොණ්ටුවිට්ටෝම් එන්පතු මිකවුම් කවලෛක්කුරියතු. ආනාල්, නීංකළ් ඉව්වාරාන ස්තිරත්තන්මෛයර්ර ආට්චික්කුරිය තේර්තල් මුරෛකළෛ ඒන් මීණ්ටුම් මීණ්ටුම් කොණ්ටුවරුකිරීර්කළ් එන්පතු විළංකවිල්ලෛ. ඉන්ත වකෛයිල් ඉන්රු නාංකළ් පළෛය තේර්තල් මුරෛයෛ නාටවේණ්ටිය තේවෛ වන්තිරුක්කින්රතු. ආකවේ, මේතකු ජනාතිපති අවර්කළ් නිච්සයමාක ඉන්ත විටයත්තිල් නේරටියාකත් තලෛයිට්ටු උරිය නටවටික්කෛයෛ මේර්කොළ්ළ වේණ්ටුම්.

කටන්ත පිරතේස සභෛත් තේර්තලිල් 10 වාක්කුකළෛප් පෙර්රුක්කොණ්ටවර්කූට මුල්ලෛත්තීවු මාවට්ටත්තිල් පෝනස් ආසනත්තෛප් පෙර්රුක්කොණ්ටාර්. ඉතු ඔරු වරලාරු! අතේනේරම් අතේ පිරතේස සභෛයිල් 1,400 වාක්කුකළෛප් පෙර්රුක් කොණ්ටවර් අංකත්තුවත්තෛ පෙර මුටියවිල්ලෛ. ආකවේ, ඉන්තත් තේර්තල් මුරෛ ජනනායක රීතියානතු අල්ල එන්පතු ඉතන්මූලම් තෙරිකින්රතු. ඉන්නුමොරු විටයත්තෛයුම් කුරිප්පිට විරුම්පුකින්රේන්. අතාවතු කටන්ත වවුනියා නකර සභෛක්කාන උළ්ළූරාට්චිත් තේර්තලිල් 3 පෝනස් ආසනංකළෛප් පෙර්රුක්කොණ්ට කට්චි, අන්තච් සභෛයින් තවිචාළර් පතවියෛප් පෙර්රුක් කොණ්ටතු; නේරටියාක 7 වට්ටාරංකළෛ වෙන්රතුටන් පෝනස් ආසනම් ඔන්රෛයුම් පෙර්රුක්කොණ්ට කට්චි ආට්චියෛ ඉළන්තතු. අතේනේරම් ඉන්තච් සභෛකළෛ අමෛප්පතිල් උච්චමාන අළවු පේරම් පේචප්පට්ටතු; කළුත්තරුප්පුක්කළ්, කටත්තල් නාටකංකළ් නිකළ්න්රන. ආනාල්, ඉන්තත් තවරුකළ් අනෛත්තෛයුම් අන්තත් තේර්තලිල් තොරිවාන පිරතේස සභෛ උරුප්පිනර්කළින් තලෛකළිල් පෝට්ටුවිට්ටුත් තප්පිත්තුවිට මුටියාතු. ඉන්තත් තේර්තල් මුරෛයෛක් කොණ්ටුවන්ත පාරාළුමන්රමුම් ඉන්තත් තවරුකළුක්කුප් පොරුප්පුක් කූර වේණ්ටුම් එන්පතු එන්නුටෛය කරුත්තාකුම්.

"පළෛය විකිතාචාරත් තේර්තල් මුරෛයිල් අතික චෙලවුකළ් ඒර්පටුකින්රන. අතනාල්තාන් පුතිය මුරෛ නාටප්පටුකින්රතු" එන්රු චිලර් කරුත්තුක් කූරියිරුන්තාර්කළ්. ආනාල්, පුතිය මුරෛයිල් නටත්තප්පට්ට පිරතේස සභෛත් තේර්තලිල් කුරිත්ත ඔරු වට්ටාරත්තෛ වෙල්වතර්කු මාකාණ සභෛත් තේර්තලෛවිට අතික පණම් චෙලවළික්ක වේණ්ටියිරුන්තතු. එනවේ, පළෛය මුරෛයිල් අතිකම් පණම් චෙලවළික්කප්පටුකින්රතු එන්ර කරුත්තු තර්පොළුතු පොය්ත්තුප් පෝයිරුක්කින්රතු එන්පතු එන්නුටෛය කරුත්තු.

අටුත්තතාක, කට්චිච් චෙල්වාක්කුള්ළ නපර්කළ් නේරටියාක ආසනංකළෛප් පෙර්රුක් කොළ්කින්රාර්කළ්; පෝනස් ආසනත්තිර්කුප් පෙයර් කුරිප්පිටප්පට්ටවර්කළින් මුතුකිල් ඒරිච් චවාරි චෙය්කින්රාර්කළ්; අරුවටෛ චෙය්කින්ර වාක්කුකළෛත් තමතු පතවියෛ නිලෛනිරුත්තුවතර්කාකප් පාවික්කින්රාර්කළ්. අතේනේරම් චිල ඉටංකළිල් පෝනස් ආසනම් වළංකුවතර්කුත් තීර්මානික්කප්පට්ටවර්කළ් මුයර්චියින්රි ඉරුක්කින්රාර්කළ්. එනවේ, එව්වළවුතූරම් ඉන්තත් තේර්තල් මුරෛ පොරුත්තමාක ඉරුක්කුම් එන්පතු තෙරියාතු.

ඉන්තප් පුතිය මුරෛයිල් මක්කළින් විරුප්පුක්කු ඉටමිල්ලෛ. ඒනෙනිල් ඉන්ත මුරෛයින්මූලම් මක්කළ් තමක්කුප්

[ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා]

පිඩිත්තවර්කළෙ නූරු සතවීතම් තෙරිවු සෙය්ය මුඩියාත නිලෙමෙ කාණප්පටුකින්රතු. අතේනේරම් ඉන්ත මුරෙයින්කීල් කට්සියෙ මට්ටුම් ආතරිත්තු වාක්කළික්ක වේණ්ටිය නිලෙමෙ කාණප්පටුකින්රතු. එනවේ, ඉතු මක්කළින් ජනනායක උරිමෙයෙ මරුක්කින්ර විටයමාක අමෙන්තිරුක්කිරතෙන්පතු එන්නුටෙය කරුත්තු.

නාන් ඉන්නුමොරු විටයත්තෙයුම් ඉන්තච් සපෙයිල් සොල්ල වේණ්ටුම්. අතාවතු වර්ත්තමානිප් පත්තිරිකෙක්කු ඔරු කෙරවම් ඉරුක්ක වේණ්ටුම්. අතනාල්තාන් "The Gazette of the Democratic Socialist Republic of Sri Lanka" එන්රු අතර්කුත් තලෙප්පිටප්පටුකින්රතු. අතේනේරම් පොරුප්පුල්ල පාරාළුමන්ර උරුප්පිනර්කළ් නිරෙවේර්රුම් තීර්මානංකළ් මක්කළ් විරෝතමානතාක ඉරුක්කක්කූටාතු; තාන්තෝන්රිත් තනමාක ඉරුක්කක්කූටාතු; තනිනපර්කළින්, තනිප්පට්ට නිරුවනංකළින්, තිණෙක්කළංකළින් එණ්ණංකළෙප් මාත්තිරම් පූර්ත්ති සෙය්වතාක ඉරුක්කක්කූටාතු.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෙමෙතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
උංකළුටෙය නේරම් මුඩින්තුවිට්ටතු. තයවුසෙය්තු උරෙයෙය නිරුත්තික්කොළ්ළුංකළ්!

ගරු (වෛද්‍ය) එස්. සිවමෝහන් මහතා
(මාණ්පුමිකු (වෛත්තිය කලානිති) සි. සිවමෝකන්)
(The Hon. (Dr.) S. Sivamohan)
Give me only one minute, Sir.

ආනාල්, ඉන්ත වර්ත්තමානිප් පත්තිරිකෙයින්මූලම් පල අනීතිකළ් අරංකේර්රප්පට්ටු වරුකින්රන. ඉතර්කු 2013.08.16ආම් තිකතිය 1823/73 ආම් ඉලක්ක වර්ත්තමානි අරිවිත්තලෙ උතාරණමාක එටුක්කලාම්. ඉතු තොල්ලියල් කට්ටළෙච් චට්ටත්තින්කීලාන අරිවිත්තලාකුම්. අන්ත අරිවිත්තලිල් වට මාකාණම්, මුල්ලෛත්තීවු මාවට්ටම් පර්රිය විටයත්තිල් "මුකුතුපටපත්තුව පිරතේස සෙලයකම්" එන්රු කුරිප්පිටප්පට්ටුල්ළතු. ආනාල්, මුල්ලෛත්තීවිල් අප්පටියොරු පිරතේස සෙලයකම් ඉල්ලෙ. මර්රුම් "සෙට්ටිමලෙ කිළක්කු" එන්රුම් කුරිප්පිටප්පට්ටිරුක්කින්රතු. "සෙට්ටිමලෙ කිළක්කු" එන්රු ඔරු පිරතේසමුම් අංකු ඉල්ලෙ. අතේනේරම් කොක්කිළායිල් එමතු මක්කළින් වාළ්විටංකළෛත් තොල්ලියලුක්කාකප් පරිමුතල් සෙය්වතර්කුච් චම්පන්තප් පට්ටවර්කළ් නටවටික්කෙ එටුත්තිරුක්කින්රාර්කළ්. එනවේ, වර්ත්තමානි අරිවිත්තල්කළෛක් කණ්මූටිත්තනමාක වෙළියිටුවතු පිළෙයානතොරු විටයම් එන්පතෛ ඉන්තප් පාරාළුමන්රත්තිල් නේරටියාකච් චුට්ටික්කාට්ටි එන්නුටෙය පේච්සෛ මුටිත්තුක් කොළ්කින්රේන්. නන්රි.

[අ.භා.4.28]

ගරු ප්‍රසන්න රණවීර මහතා
(මාණ්පුමිකු පිරචන්න රණවීර)
(The Hon. Prasanna Ranaweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පළාත් සභා මැතිවරණය පිළිබඳව අද පැවැත්වෙන විවාදයේදී අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා. මේ ආණ්ඩුව බලයට පත් වුණේ ප්‍රජාතන්ත්‍රවාදය, ජනතා පරමාධිපත්‍යය, බලය බෙදීම ආදී සුරංගනා කතා රාශියක් මේ රටේ ජනතාවට කියලායි; පොරොන්දු ගොන්නක් ලබා දීලායි. 2015 මාර්තු 31වන දාට කාලය අවසන් වන්න තිබුණු පළාත් පාලන ආයතන වීකේ මැතිවරණය පවත්වන්නේ නැතිව 2018 පෙබරවාරි 10 දක්වා කල් දැම්මා. ඒ නිසා ජනතාවගේ නියෝජිතයන් තෝරා ගන්න බැරි වුණා. මේ වන විට උතුරුමැද, සබරගමුව, නැගෙනහිර කියන පළාත් සභාවලත් මැතිවරණය කල් දමා තිබෙනවා. ඒ නිසා ඒවාට මහජන නියෝජිතයන් තෝරා ගන්න බැරිවෙලා තිබෙනවා. හෙට අනිද්දා වන විට -සැප්තැම්බර් මාසය වන විට- තවත් පළාත් සභා කීපයක ධුර කාලය අවසන් වන නිසා මැතිවරණ පවත්වන්න සූදානම් වන්න ඕනෑ. නමුත් මේ වන විටත් ඒ සඳහා කිසිදු වැඩ පිළිවෙළක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2017 සැප්තැම්බර් මාසයේ අලුත් පනත් කෙටුම්පතක් ගෙනාවා. එදා එය ගෙනාවේ පළාත් සභාවලට සියයට 25ක කාන්තා නියෝජනයක් එකතු කරන්න ඕනෑ කියලායි. ඒ සඳහා පිටුවක දෙකක සංශෝධන ගෙනෙනවා වෙනුවට එදා පිටු 31ක යෝජනා ගෙනාවා. පළාත් පාලන මැතිවරණයට අදාළ නව ක්‍රමය ඇතුළත් පනත් කෙටුම්පත ගෙනාපු දවසේ කථිකයන් නැතිවත් පාර්ලිමේන්තුව පවත්වාගෙන යමින් මධ්‍යම රාත්‍රිය වන කල් ඉඳලා, ඇතැම් මන්ත්‍රීවරුන් හෙලිකොප්ටර්වලින් ගෙන්වාගෙන තුනෙන් දෙකක ඡන්දයෙන් එදා ලිහි ලහියේ, කඩි මුඩියේ ඒ පනත් කෙටුම්පත සම්මත කරවා ගත්තා. ඊට පසුව අගමැතිතුමා පොරොන්දුවක් දුන්නා, මාර්තු මාසය වන කොට පළාත් සභා මැතිවරණය පවත්වනවා කියලා. අද වන විට මාර්තු නොවෙයි ජූලි මාසයත් ලබා තිබෙනවා. දෙසැම්බර්වලදීවත් එම මැතිවරණය පැවැත්වෙන්නේ නැහැ. අපට බොහෝ විශ්වාසයි, ඉදිරි ජනාධිපතිවරණය පවත්වන කල් මේ පළාත් සභා මැතිවරණ පවත්වන්නේ නැහැ කියලා. ඉතිහාසයේත් ඡන්ද කල් දැමූ යුගවල, ඒ හැම මොහොතකම පාලක පක්ෂය පරාදයි. 1972 සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියගේ ආණ්ඩුව කාලයේත් මැතිවරණ කල් දැම්මා. ප්‍රතිඵලය හැටියට 1977දී අපි පරාදයි. 1982දී "ලාම්පු-කළගෙඩි" සෙල්ලම ගෙනාවා. ඉන් පසුව ලොකු ව්‍යසනයක් ඇති වුණා. 2015 මැයි මාසයේ පවත්වන්න තිබුණු පළාත් පාලන මැතිවරණය 2018 දක්වා කල් දැම්මා. ඒ නිසා මුළු පළාත් පාලන ආයතන 341න් දෙසිය ගණනක ජයග්‍රහණය පොහොට්ටුව ලකුණින් තරග කළ කණ්ඩායමට හිමි කර ගන්න පුළුවන් වෙලා තිබෙනවා. ඒ නිසාම අද මේ ආණ්ඩුව පොහොට්ටුවට බය වෙලා ඉන්නවා. මේ ආණ්ඩුව මැතිවරණවලට බය වෙලා ඉන්නේ ඒ නිසායි. මහින්ද රාජපක්ෂ මැතිතුමා ඊයේ පෙරේදා නැවත වරක් කිව්වා, "දෙවැනි ඉනිමට අපි ලෑස්තියි" කියලා. මහින්ද රාජපක්ෂ මහත්මයා දෙවන ඉනිම ආරම්භ කරන්න පිටියට බහින කොට මේ ආණ්ඩුවේ අය මොකක්ද කරන්නේ? තරගයට එන්නේ නැතිව අම්පයර්ලා අන්දනවා. එහෙව් තත්ත්වයක් තිබෙන්නේ. අද අම්පයර්ස්ලා අන්දලායි තිබෙන්නේ. එහෙම කරලා තිබෙන්නේ මිනිස්සු තමන් කැමැති පුද්ගලයන්ට, තමන් කැමැති පක්ෂයට බලය දෙන එක වළක්වන්නයි. අද මේ ආණ්ඩුවේ සිටින මැති ඇමතිවරුන්ටත් ප්‍රතිපත්තියක් නැහැ.

පළාත් සභා, පළාත් පාලන ඇමතිවරයා වන ෆයිසර් මුස්තාපා එක මතයක් ප්‍රකාශ කරනවා, රවුල් හකීම් ඇමතිවරයා තව මතයක් ප්‍රකාශ කරනවා. මේක හරියට ඊයේ දින සිදු වුණු පෙට්‍රල් මිල ඉහළ යෑම වාගේයි. ඊයේ අගමැතිතුමා කළේ මොකක්ද? ජනාධිපතිතුමා රාත්‍රී 10.00ට නිදා ගන්නා තුරු ඉඳලා මධ්‍යම රාත්‍රී 12.00ට තෙල් මිල ඉහළ දැම්මා. ජනාධිපතිතුමා උදේ නැඟිටලා පත්තරය බලා, "මට නොකියා අගමැති තෙල් මිල ඉහළ දැම්මා, මම තෙල් මිල අඩු කරනවා" කියලා තෙල් මිල අඩු කළා. ඒ වාගේ මේ ආණ්ඩුවට ප්‍රතිපත්තියක් නැහැ. මිනිසුන් තමන්ගේ වාහනවලට ඉන්ධන පුරවාගන්න petrol shedsවලට ගිහිල්ලා රණ්ඩු කරනවා. මේ ආණ්ඩුවේ අද තිබෙන්නේ එවැනි තත්ත්වයක්.

අද ජනතා විමුක්ති පෙරමුණ මේ පිළිබඳව විවාදයකට එන්නේ නැහැ; කථා කරන්නේ නැහැ. මේ ඡන්ද ක්‍රමය ඇති කරන්න තුනෙන් දෙකේ බලය ලබා දෙන්න ඔවුනුත් සහයෝගය දුන්නා. පළාත් සභා ක්‍රමයේ 50:50 ඡන්ද ක්‍රමය ඇති කරන්න ඔවුනුත් ඡන්දය දුන්නා. මට කලින් කථා කළ කථිකයනුත් කිව්වා, පළාත් පාලන ආයතන බහුතරයක බලය අස්ථාවරයි කියලා. සභාව පිහිටුවන්නේ දිනන පක්ෂය නොවෙයි, වෙනත් පක්ෂ. එදා ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පත් කළ කමිටුවේ වාර්තාවෙන් කිව්වා, නැවතත් සියයට 70, සියයට 30 ක්‍රමය ගෙනෙන්න කියලා. අපි කිව්වා, අඩුම තරමින් දිනන පක්ෂයට බෝනස් ආසන දෙකවත් දෙන්න කියලා. ඒකත් අහෝසි කළා. ඒ නිසායි අද බොහෝ තැන්වල අස්ථාවර ප්‍රාදේශීය සභා පිහිටුවන්න සිදු වෙලා තිබෙන්නේ. දැන් මේ ආණ්ඩුව කරන්න හදන්නේ මොකක්ද? මේ ක්‍රමය ගෙනැල්ලා අස්ථාවර පළාත් සභා ටිකක් නිර්මාණය කරන්නයි මේ ආණ්ඩුව හදන්නේ. මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් යුක්ත ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ඕනෑම වේලාවක, ඕනෑම මැතිවරණයකට, ඕනෑම විධියකට මුහුණ දෙන්න ලෑස්තියි. අපි කියන්නේ මැතිවරණය පවත්වන්න කියලායි. පරණ ක්‍රමයටම මැතිවරණය පවත්වන්න නම්, පනතට පොඩි සංශෝධනයකුයි කරන්න තිබෙන්නේ. ඒ සංශෝධනය ගෙනැල්ලා අපි මැතිවරණයට මුහුණ දෙමු. මහින්ද මහත්මයා දෙවැනි ඉනිමට ලෑස්ති වෙලා ඉන්නවා. මේ ආණ්ඩුව තවම පළමු ඉනිමටවත් ලෑස්ති නැහැ; මැව් එකට සූදානම් නැහැ. මේ අවස්ථාවේ පළාත් සභා, පළාත් පාලන ඇමතිවරයා ගරු සභාවේ නැහැ; රාජ්‍ය අමාත්‍යවරියත් නැහැ. ෆයිසර් මුස්තාපා ඇමතිවරයා ඉතිහාසයට එකතු වෙන්නේ පළාත් සභා, පළාත් පාලන ඇමතිවරයා විධියට නොවෙයි. එතුමා මේ පාර්ලිමේන්තු ඉතිහාසයට එකතු වන්නේ පළාත් සභා හා පළාත් පාලන මැතිවරණ කල් දැමීමේ ඇමතිවරයා විධියටයි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි 05ක කාලයක් පමණයි තිබෙන්නේ.

ගරු ප්‍රසන්න රණවීර මහතා
(මාණ්පුමිකු පිරසන්න රණවීර)
(The Hon. Prasanna Ranaweera)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එක පැත්තකින්, මේ ආණ්ඩුව එදා බලයට ආවේ විධායකය අහෝසි කරනවා කියලායි. 2015 අගෝස්තු මාසයේ පැවැති මැතිවරණයේ දී මේ ආණ්ඩුව බලයට පත් වුණේ ස්ථාවර ආණ්ඩුවක් විධියට නොවෙයි. මේ ආණ්ඩුව එකතු වුණු ආණ්ඩුවක්. ඒ වාගේම පළාත් පාලන මැතිවරණය ගෙනාවේත් ස්ථාවර පළාත් පාලන ආයතන බිහි වන්න නොවෙයි, අස්ථාවර පළාත් පාලන ආයතන බිහි වන්නයි. ඒ වාගේම සූදානම් වන්නේ අස්ථාවර පළාත් සභා ක්‍රමයක් ඇති කරන්නයි. කලින් පැවැති සමානුපාතික ඡන්ද ක්‍රමය තුළ ස්ථාවර පළාත් සභා ටිකක් බිහි වුණා. ඒ නිසා අපි කියනවා, ඒවා ඒ විධියටම ගෙනෙන්න කියලා. අහවල් දවසේ අපි අහවල් පළාත් සභාවේ මැතිවරණය පවත්වනවා කියලා මේ ආණ්ඩුවට නිශ්චිත දිනයක් නැහැ. එදා මහින්ද රාජපක්ෂ මැතිතුමා යුද්ධය අවසන් කළා විතරයි, සියලුම පළාත් සභාවල මැතිවරණ පැවැත්වුවා. පළාත් පාලන ආයතනවල මැතිවරණ පැවැත්වුවා. කාලය අවසන් වන්න කලිනුත් සමහර මැතිවරණ පැවැත්වුවා. එතුමාගේ කාලයේදී මේ රටේ ජනතා පරමාධිපත්‍ය හරියටම ක්‍රියාත්මක වුණා.

ජනතා පරමාධිපත්‍ය ඇති කරන්න ආපු මේ ආණ්ඩුව අද ජනතාවට කොකා පෙන්වනවා. බලය බෙදන්න ආපු මේ ආණ්ඩුව අද බලය තමන් අතට නතු කර ගන්න හදනවා. අපි ආණ්ඩුවට අභියෝගය කරනවා. අපි ඕනෑම මැතිවරණයකට සූදානම්; ඕනෑම මැතිවරණ ක්‍රමයකට සූදානම්. ඒ නිසා මොනම ක්‍රමයකින් හරි කඩිනමින් පළාත් සභා මැතිවරණය පවත්වන්න. එහෙම නැතිව ඉදිරි ජනාධිපතිවරණය පැවැත්විය යුතු කාලය එන තෙක් පැලැස්තර අලව අලවා ඡන්ද කල් දමන ව්‍යාපෘතිය වහාම නවත්වා පළාත් සභා මැතිවරණය පවත්වන්නය කියා අපි ආණ්ඩුවට බල කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව අපගේ අවංක ආදර ස්තුතිය පුද කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(මාණ්පුමිකු තලෛමෛතාංකුම් උරුප්පිනර් අවර්කළ්)
(The Hon. Presiding Member)
ස්තුතියි. මීළඟට, ගරු අබ්දුල්ලා මහරූෆ් මන්ත්‍රීතුමා.

[ප.ව. 4.39]

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා
(මාණ්පුමිකු අප්තුල්ලා මහ්රූප්)
(The Hon. Abdullah Mahrooff)
பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, தேர்தல்கள் பற்றிய சட்டத்தின்மூலமாக எமது சமூகம் பாதிக்கப்பட்ட விதம் பற்றி நான் இந்தச் சபைக்கு எடுத்துச் சொல்வது எனது கடமையாகும். அதேநேரம் மாகாண சபைத் தேர்தல்கள் நடைபெறுமா, இல்லையா? என்று சந்தேகம் கிளப்பப்பட்டுள்ள இன்றைய சூழலிலே அந்தத் தேர்தல் உடனடியாக நடத்தப்பட வேண்டும் என்பதிலே அகில இலங்கை மக்கள் காங்கிரஸ் கட்சியினராகிய நாங்கள் உறுதியாக இருக்கின்றோம். இறுதியாக நடைபெற்ற மாகாண சபைத் தேர்தலிலே 348 பெரும்பான்மை இனத்தைச் சேர்ந்தவர்களும் 64 தமிழர்களும் 43 முஸ்லிம்களும் என மொத்தமாக 455 பேர் தெரிவு செய்யப்பட்டிருக்கின்றார்கள். 50:50 அடிப்படையில் தேர்தல் நடத்தினால் 174 பெரும்பான்மை இனத்தைச் சேர்ந்தவர்களும் 35 தமிழர்களும் 13 முஸ்லிம்களுமே நேரடியாகத் தெரிவு செய்யப்படுகின்ற சந்தர்ப்பம் இருக்கின்றது. மிகுதி 50 வீதமான உறுப்பினர்கள் தெரிவு முறையில் நியமிக்கப்படுவார்கள் என்றாலும், அது உரிய முறைப்படி நடைபெறுமா? என்று இந்த நாட்டிலுள்ள சகல சிறுபான்மையின மக்களும் கேள்வி எழுப்பியிருக் கின்றார்கள். இதை நான் ஏன் உங்களுக்குக் கூறுகின்றேன் என்றால், 60:40 என்ற அடிப்படையில் நடந்து முடிந்த தேர்தலில் நாங்கள் சில பெரும்பான்மைக் கட்சிகளோடு இணைந்து போட்டியிட்டாலும், அந்தத் தேர்தல் வெற்றிக்காக உழைத்த எங்களுடைய உறுப்புரிமைகள் மறுக்கப் பட்டிருப்பதை நாங்கள் அவதானித்தோம்.

இந்த நாட்டிலே தற்போதைய சூழலிலே பல ஆணைக்குழுக்கள் நியமிக்கப்பட்டுள்ளன. புதிய அரசியலமைப்புத் தொடர்பில் மக்கள் கருத்தறியும் ஆணைக்குழுவின் தலைவர் லால் விஜயநாயக்க அவர்கள் அது சம்பந்தமாக எமது மாவட்டத்துக்கு வருகைதந்தபோது, ஏனைய பாராளுமன்ற உறுப்பினர்களைவிட முதலில் நானே அவரிடம் முன்மொழிவுகளைச் சமர்ப்பித்திருந்தேன். எமது சமூகம் இந்த நாட்டிலே மொழி ரீதியாக அல்ல, மத ரீதியாக இனம் காணப்படுவதோடு, கிராம சேவகர் பிரிவிலிருந்து பிரதேச சபை, உள்ளூராட்சி மன்றங்கள் என்று பிரதேசச் செயலகம் வரையும் எமது இன விகிதாசாரம் பேணப்பட வேண்டுமென்று அதிலே கேட்டிருந்தோம். காரணம், 44 வீதம் முஸ்லிம்களும், 32 வீதம் தமிழ் மக்களும், 24 வீதம்

[ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා]

பெரும்பான்மை சிங்கள மக்களும் வாழுகின்ற அந்தப் பிரதேசத்திலே, இம்முறை புதிய தேர்தல்முறைமூலம் மிக மோசமான அநியாயம் நடந்ததை நாங்கள் கண்டோம். அதாவது 229 ஆசனங்களிலே, 44 வீதமாக வாழுகின்ற முஸ்லிம்கள் மிகக் குறைந்த உறுப்பினர்களையும் 24 வீதம் வாழுகின்றவர்கள் 96 உறுப்பினர்களையும் பெற்றிருந்தார்கள். நாங்கள் எதிர்வரும் மாகாண சபைத் தேர்தலிலும் இந்த மோசமான நிலைமையை எதிர்கொள்ள வேண்டிய சூழல் ஏற்பட்டிருக்கின்றது.

புதிய அரசியலமைப்புத் தொடர்பில் மக்கள் கருத்தறியும் ஆணைக்குழுவின் தலைவர் லால் விஜயநாயக்க அவர்களும் எமது உள்ளூராட்சி மன்றங்களை அதிகரிக்க வேண்டும் என்ற அடிப்படையிலே எல்லை நிர்ணயக் குழுவின் தலைவர் அசோக்க பீரிஸ் அவர்களும் அதேபோன்று, தற்போதைய மாகாண சபைத் தேர்தல் தொகுதிகளுக்கான எல்லை நிர்ணய ஆணைக்குழுத் தலைவர் தவலிங்கம் அவர்களும் எமது மாவட்டத்துக்கு வருகை தந்தபோது எமது முன்மொழிவுகள் அடங்கிய ஆவணங்களை நாங்கள் அவர்களிடம் சமர்ப்பித் திருந்தோம். எனினும், நாம் சமர்ப்பித்த விடயங்கள் இந்த ஆணைக்குழுக்களின் தலைவர்களாலும் நிராகரிக்கப்பட்டிருக் கின்றன. அதாவது அவர்களுடைய அறிக்கைகளில் எங்களுடைய கோரிக்கைகள் சம்பந்தமான எந்த விடயம் பற்றியும் குறிப்பிடப்படவில்லை. ஆகவே, இவற்றில் எமது சமூகத்துக்கு எந்தவித நம்பிக்கையுமில்லை. அங்கு இரண்டு நாட்கள் உயர்மட்ட ஆலோசனை நடாத்திய அசோக்க பீரிஸ் அவர்கள், திருமலை மாவட்டத்திலே முஸ்லிம்களுக்குப் பெரும் அநீதி இழைக்கப்பட்டிருக்கின்றது என்று கூறியிருந்தார். அன்று இந்தச் செய்தி அனைத்துப் பத்திரிகைகளிலும் வெளிவந்தது. அப்படியிருந்தும் நாங்கள் முன்வைத்த கோரிக்கைகளில் ஒன்றுகூட நிறைவேற்றப்படவில்லை.

1976ஆம் ஆண்டு எல்லை நிர்ணயம் மேற்கொள்ளப்படுகை யில், அந்த மாவட்டத்தை அரசியல் கட்சித் தலைவர்களும் மற்றும் பாராளுமன்ற உறுப்பினர்களும் பிரதிநிதித்துவப் படுத்தியபோதிலும், 1,879 சதுர கிலோமீற்றர் பரப்பளவைக் கொண்ட மூதூர் தேர்தல் தொகுதி 362 சதுர கிலோ மீற்றராகச் சுருக்கப்பட்டது. அதேபோன்று 967 சதுர கிலோமீற்றர் பரப்பளவைக் கொண்ட திருகோணமலை 670 சதுர கிலோ மீற்றராகக் குறைக்கப்பட்டது. இவ்வாறு செயற்பட்டு அங்கு 1,689 சதுர கிலோமீற்றர் பரப்பளவுடைய புதிய தொகுதி உருவாக்கப்பட்டபோதுதான், அங்கு எங்களுடைய மக்களுக்குச் சொந்தமாகவிருந்த மேய்ச்சல் தரை, காணிகள் மற்றும் குளங்கள் என அத்தனையும் பறிபோயின.

இன்று எமது பிரதேசம் நிதி ஒதுக்கீடுகளிலும் மிகவும் மோசமாகப் பாதிக்கப்பட்டிருக்கின்றது. இந்த நிலையில் நேற்று முன்தினம் "அபிவிருத்திக்காக ஒவ்வொரு DS Division க்கும் 200 மில்லியன் ரூபாய் ஒதுக்கப்படும்" என்று கௌரவ நிதியமைச்சர் அவர்கள் கூறியிருக்கின்றார். அதேநேரம் எங்களுக்கு இன ரீதியாக இன்னும் 3 DS Divisions கட்டாயம் தரப்பட வேண்டும்; குறைந்தபட்டம் 06 உள்ளூராட்சி மன்றங்கள் தரப்பட வேண்டும். நாட்டில் 159 குடும்பத்திற்கு ஒரு GN Division இருக்கின்றபோது, எங்களுடைய பிரதேசங்களிலே 3,600 - 5,000 குடும்பங்களுக்கு ஒரு கிராம சேவகர் பிரிவு இருக்கின்றது. இந்த விடயங்களை எல்லாம் நாங்கள் எடுத்துக்கூறியபோதும்கூட, எந்த ஆணைக்குழுவும் எமது கோரிக்கையை நிறைவேற்றவுமில்லை; அவற்றுக்காகப் பரிந்துரைக்கவுமில்லை. கடைசியாக, மாகாண சபைத் தேர்தல் தொகுதிகளின் எல்லை நிர்ணய ஆணைக்குழுத் தவிசாளர் தவலிங்கம் அவர்களிடமும் நாங்கள் இது சம்பந்தமாகக் கோரிக்கை விடுத்திருந்தோம்.

